(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ කාන්තා රෝග නිවාරණය පිළිබඳ වෙනම අංශයක් ආරම්භ කිරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම අංශය විවෘතව පවතින්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) "மஹிந்த சிந்தனை தொலைநோக்கு" கொள்கைத் தொடர் மூலமாக சுகாதார அமைச்சில் பெண் நோய் தடுப்பு தொடர்பான தனி வேறான பிரிவொன்றை ஆரம்பிக்க வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) தற்போது மேற்படி பிரிவு திறந்து வைக்கப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that a pledge was made under the "Mahinda Chintana - Vision for the future" manifesto that a separate unit for the prevention of women's diseases, would be started in the Ministry of Health?

(b) Will he inform this House whether the aforesaid unit is operative at present?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

[ගරු ලලිත් දිසානායක මහතා]

(ආ) කාන්තා රෝග නිවාරණය පිළිබඳව වෙනම අංශයක් පවුල් සෞඛ්‍ය කාර්යාංශය මඟින් මේ වනවිටත් ක්‍රියාත්මක කර තිබේ. කාන්තා රෝග නිවාරණය මූලික කරගත් සුවනාරී සායන දිවයින පුරාම සෑම වෛද්‍ය නිලධාරී කොට්ඨාසයකම පිහිටුවීමට කටයුතු කර ඇති අතර එහිදී කාන්තා රෝග නිවාරණය සඳහා වැඩසටහන්ද පවත්වනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමන්ලා කාන්තා රෝග නිවාරණ අංශයක් ස්ථාපනය කළත්, අද වන විට අපේ රටේ බහුලව තිබෙන ප්‍රශ්නයක් තමයි, බාල ඖෂධ, කල් ඉකුත් වූ ඖෂධ, ප්‍රමිතියෙන් තොර ඖෂධ ප්‍රශ්නය. මේ කාන්තා රෝග නිවාරණ ඒකකය පිහිටුවපු පමණින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයක් සිදු වන්නේ නැහැ. එම නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, කාන්තාවන්ගේ පමණක් නොව රටේ ජනතාවගේම රෝග නිවාරණයට බාධා වන බාල ඖෂධ ප්‍රශ්නයට, ප්‍රමිතියෙන් තොර ඖෂධ ප්‍රශ්නයට ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද කියලා. ඖෂධ මාෆියාව, බාල ඖෂධ මාෆියාව තුරන් කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයෙන් නම් අහලා තිබෙන්නේ කාන්තාවන් ගැනයි. දැන් මෙතුමා අහන්නේ බෙහෙත් ගැනයි. කාරණා දෙකක්. නමුත් මා ඔබතුමාට පිළිතුරක් දෙන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා ඇහුවේ, රෝග නිවාරණය ගැන.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
බාල බෙහෙත් දෙන්න අපි කටයුතු කරන්නේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා රුපියල් බිලියන 125ක මුදලක් වෙන් කරලා තිබෙනවා ජාතික නිදහස් සෞඛ්‍ය සේවාව ආරක්ෂා කරන්න. අපි රුපියල් මිලියන 6,800ක මුදලක් හම්බන්තොට රෝහල වෙනුවෙන් වෙන් කරලා ඊයේ පෙරේදා එහි වැඩ ආරම්භ කළා. ටෙන්ඩර් පටිපාටියක් තිබෙනවා, ගිවිසුම් අත්සන් කරලා බාල බෙහෙත් ලබා දුන්නොත් අදාළ කොමිපැනිවලින් මුදල් අය කර ගන්න කටයුතු කරනවා කියලා. බෙහෙත් සපයන අය නියමිත ක්‍රමවේදයන්ට පරිබාහිරව ගියා නම්, අපි ඔවුන් සම්බන්ධයෙන් අදාළ ක්‍රමවේදය අනුව කටයුතු කර තිබෙනවා. සමහර විට බාල බෙහෙත් එවනවා. එතකොට අපි ඒවා ප්‍රතික්ෂේප කරලා ඔවුන්ගෙන් වන්දි ගන්න කටයුතු කරනවා. මේවා අප නිෂ්පාදනය කරන ඒවා නොවෙයි; පිට රටින් ගෙන්වන ඒවායි.

එම නිසා ඒ අදාළ කොමිපැනි බැඳිලා ඉන්නවා, අදාළ සාමිපල් අනුව නිවැරැදි ඒවා දෙන්න. බෙහෙත් වර්ග එක්දහස් ගණනක් ගෙන්වන කොට යම් යම් පොඩි පොඩි අඩු පාඩුකම් ඇති වනවා. ඒකෙන් සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය නැති වෙලා නැහැ. විශේෂඥ වෛද්‍යවරුන්, හෙද හෙදියන් හා අනිකුත් කාර්ය මණ්ඩලත් එක්ක ඉතා ඉහළ වූ සෞඛ්‍ය සේවාවක් අපි මේ රටේ පවත්වා ගෙන යනවා. මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේත් අපි කාන්තා කටයුතු සම්බන්ධ ඒකකයෙන් ඉතා විශාල සේවාවක් පවත්වා ගෙන යනවා. ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. සුවනාරී සායන, ගැබ් ගෙල පිළිකා කලින් හඳුනා ගැනීම, නව විවාහත් පවුල් සඳහා සේවා සැපයීම, විදේශ රැකියා කරන කාන්තාවන් සම්බන්ධයෙන් පවුල් සෞඛ්‍ය සේවාවන් සැපයීම, ස්ත්‍රී පුරුෂ සම්භවය පදනම් කර ගත් හිංසනය වැළැක්වීම, අවදානම් සහිත කාන්තා පිරිස් හඳුනා ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය සේවාවන් සැපයීම වැනි විශාල සේවාවක් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ කාන්තාවන් සඳහා ක්‍රියාත්මක කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දෙවන අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරෙන් පැන නැඟෙන ආකාරයට මා මෙම අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. එතුමා සෞඛ්‍ය සේවයේ විශිෂ්ට කාර්ය භාරයන් සම්බන්ධයෙන් වට්ටෝරුවක් කියවා ගෙන ගියා. ඩෙංගු රෝගයට අවශ්‍ය, ඩෙංගු ප්‍රතිකාරකයක් හැටියට ලබා දෙන Dextran 40 කියන සේලයින්; බාල සේලයින් බෝතල් 5,000ක් ඊයේ දවසේ හෝමාගම රෝහලෙන් සහ කුරුණෑගල රෝහලෙන් අහු වුණා. මේ රටේ ලක්ෂ 51ක් වූ බදු ගෙවන්නන්ගේ සල්ලි උපයෝගි කර ගෙනයි තායිලන්තයේ M.E. Meditec කියන ආයතනයෙන් නිෂ්පාදනය කරන Dextran 40 කියන සේලයින් වර්ගය මෙරටට ගෙනැවිත් තිබෙන්නේ. හැබැයි මේ බාල Dextran 40 සේලයින් බෝතල් 5,000 අද වන කල් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහල්වල භාවිතයෙන් ඉවත් කරලා නැහැ.

ඔබතුමන්ලා මේ තරම් විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරනවා කිව්වාට, හිතා මතාම මේ රටේ බදු ගෙවන්නන්ගේ සල්ලිවලින් ලක්ෂ 51ක් වැය කරලා බාල සේලයින් බෝතල් 5,000ක් ගෙන්වලා තිබෙනවා. සමා වෙන්න, ලක්ෂ 87ක් වැය කරලා. මොකද, එක බෝතලයක් රුපියල් 1,742යි. Dextran 40 කියන්නේ ඩෙංගු රෝගීන්ට ලබා දෙන සේලයින්. මේ බාල සේලයින් මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තවම භාවිතයේ පවත්වා ගෙන යන්නේ ඇයි කියන එක මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කාන්තාවන් ගැනයි ප්‍රශ්නය අසා තිබෙන්නේ. "යන්නේ කොහේද - මල්ලේ පොල්" වාගේ තමයි ඔබතුමාගේ මේ ප්‍රශ්නය. මහින්ද චින්තනයෙන් කාන්තාවන් -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා දුන්නු පිළිතුරෙන් පැන නැඟෙන ආකාරයටයි මම දෙවෙනි අතුරු ප්‍රශ්නය ඇහුවේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඔබතුමා මේ ප්‍රශ්න අහන කොට පොඩ්ඩක් දැනුවත් වෙන්න. කාලීන ප්‍රශ්නයක් තමයි ඩෙංගු. ඩෙංගු රෝගය සම්බන්ධයෙන් අපට - සෞඛ්‍ය අමාත්‍යාංශයට - පැවරී තිබෙන ප්‍රධාන කාරණාව තමයි මරණ සංඛ්‍යාව අඩු කිරීම. පසු ගිය කාලයේ වර්ෂයකට තුන්සිය හැට ගණනක් මැරුණා. අද ඒක අපි 41 දක්වා අඩු කර තිබෙනවා. ඔබතුමා සේලයින් බෝතලයක් ගැන කථා කරන කොට ඒ ගැන කථා කරන්නේ නැද්ද? High dependency units, ඒ කියන්නේ අධිසත්කාර ඒකක 50ක් **අපි** පිහිටුවලා තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක් ඒකකයකට රුපියල් මිලියන 50ක් වැනි විශාල මුදලක් වැය කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඩෙක්ස්ට්‍රෝන් බෝතලයකට - සේලයින් බෝතලයකට - වඩා අපට වටිනවා ඩෙංගු රෝගීන් වෙනුවෙන් කරන සෞඛ්‍ය සේවාව. අපි high dependency units 50ක් ආරම්භ කරලා ඒ වෙනුවෙන් කටයුතු කරනවා. ඊයේ පෙරේදා අපි අව්ස්සාවේල්ල රෝහලටත් එවැනි unit එකක් ලබා දුන්නා. ගිය අවුරුද්ද තුළ අව්ස්සාවේල්ල රෝහලේ එක ඩෙංගු මරණයක්වත් සිදු වෙලා නැහැ. ඒ විධියට විශාල මුදලක් ඒ වෙනුවෙන් වැය කරනවා. BTI bacteria ලීටර් 10,000ක් ගෙන්වලා ඒ අවශ්‍ය කටයුතු අපි කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේ විශාල සේවාවක් කරමින් රුපියල් මිලියන ගණනක් වැය කරන අවස්ථාවක මේ ඩෙක්ස්ට්‍රෝන් බෝතල් ගැන කථා කරනවා. ඒවා සම්බන්ධයෙන් ඊට අදාළව කටයුතු කළ සමාගමට විරුද්ධව අපට කටයුතු කරන්න පුළුවන්. මේ සේලයින් බෝතලයක් නිසා සෞඛ්‍ය සේවාව කඩා වැටිලා නැහැ. ඩෙංගු මරණ සංඛ්‍යාව අපි අඩු කරලා තිබෙනවා. ඒක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූලික දේ.

High dependency unit කියන අධිසත්කාර ඒකකයකට රුපියල් මිලියන 50ක් වැය කරලා තිබෙනවා. එවැනි units 50ක් ආරම්භ කරලා අපි මේ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක මේ සේලයින් බෝතලයක් ගැන අහලා මේ ඩෙංගු ගැන තිබෙන තත්ත්වය වෙනස් කරන්න උත්සාහ කරන්න එපා.

ඒ අදාළ සමාගම් වැරදි බෙහෙත් සපයා තිබෙනවා නම් ඒවාට විරුද්ධව නඩු දානවා. ඒ ගිවිසුම් අනුව ඒ අය ඒකට වග කියන්නට ඕනෑ. ඒ අලාභය අය කර ගන්නට අප කටයුතු කරනවා. මේ කාරණයයි, සෞඛ්‍ය සේවයයි දෙකක්. ඩෙංගු රෝගය නිසා සිදු වන මරණ සංඛ්‍යාව අඩු කරලා ඒ අභියෝගය අපේ වෛද්‍යවරු ජයග්‍රහණය කර තිබෙනවා. මොකද, අපේ ප්‍රධානම දෙය තමයි ඩෙංගු රෝගය නිසා සිදු වන මරණවලින් වටිනා ජීවිත බේරා ගැනීම. අනෙක් කාරණය මේකයි. සෞඛ්‍ය අමාත්‍යාංශය විතරක් නොවෙයි, මුළු සමාජයම - අප ඔක්කොම - එකතු වෙලා, ප්‍රධාන කොටම පළාත් පාලන ආයතන එකතු වෙලා, ඩෙංගු මදුරුවා ව්‍යාප්ත වීම වළක්වන්නට ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇසූ අතුරු ප්‍රශ්නය මේ කාන්තා රෝග සම්බන්ධයෙන් අදාළ වන්නේ නැහැ. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය හරියාකාරව ඇහුවා නම් හොඳයි. නමුත් ඔබතුමා කාලීන ප්‍රශ්නයක් ඇසූ නිසායි මා උත්තර දුන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ස්ථාවර නියෝගවලට අනුව ඔබතුමා ලබා දෙන පිළිතුරුවලින් පැන නැහෙන කරුණු ගැන ප්‍රශ්න අහන්නට මට අයිතියක් තිබෙනවාය කියා මා ඔබතුමාව දැනුවත් කරන්නට ඕනෑ. ඔබතුමා පොට වරද්දා ගත්තා. ඔබතුමා බාල ඖෂධ ගැන කථා කළ නිසායි මා එම ප්‍රශ්නය ඇහුවේ.

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. "ඩෙක්ස්ට්‍රෝන්" නොවෙයි, ඒ බෙහෙතේ නම Dextran 40. දැනට සේලයින් බෝතල් 5,000ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම වෛද්‍ය සැපයුම් අංශයේ තවත් බෝතල් 2960ක් තිබෙනවා. ලක්ෂ 51ක බෝතල්. 2012 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ගෙන් වූ Cloxacillin ඖෂධය ගැනත් මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. එය ප්‍රතිජීවක ඖෂධයක්; antibiotic එකක්. බාල ඖෂධ ගෙන්වුවේ. ඒවායේ වීදුරු කැලි තිබුණා; අපද්‍රව්‍ය තිබුණා. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් ගත්තේ නැහැ. ගිය සතියේ කුරුණෑගල ශික්ෂණ රෝහලෙන් සහ හෝමාගම රෝහලෙන් මේ බාල බෙහෙත් හමු වුණා. මේ බාල බෙහෙත් තහනම් කරන්නට සෞඛ්‍ය අමාත්‍යාංශය ගත් පියවර මොකක් ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමකු අසන ලද ඔය විධියේම ප්‍රශ්නයකට මේ පාර්ලිමේන්තුවේදී මා උත්තර දී තිබෙනවා, කොයි ආකාරයෙන් ද අප මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කියා. මේවා තහනම් කර වන්දි අය කර ගැනීමට කටයුතු කර තිබෙනවාය කියන එක මා කිව්වා.

ඔබතුමා ඒ වාගේ ප්‍රශ්නයක් අහන්න. එතකොට මා උත්තර දෙන්නම්. මොකද- [බාධා කිරීමක්] නැහැ, නැහැ. එහෙම උත්තරයක් දෙන්න බැහැ. මම වගකීමෙන් උත්තර දෙන්න ඕනෑ. මම අමතරවයි මේ උත්තරය දුන්නේ. ඔබතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රශ්නයක් අහන්න. එතකොට මම ඒකට පිළිතුරු දෙන්නම්. ඔබතුමා අද අහලා තිබෙන්නේ කාන්තා රෝග නිවාරණය පිළිබඳවයි. මහින්ද චින්තනය යටතේ අප කාන්තාවන් ආරක්ෂා කරනවා. ඔබතුමා දැන් අසන ලද කාරණය ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න. ඔබතුමා පොට පටලවා ගන්න එපා. [බාධා කිරීමක්] ඔබතුමාගේ පොට පැටලිලා තිබෙන්නේ. ඒ නිසා පොට හරියට කරකවා ගන්න. පොට හරියට කැරකිලා නැහැ. ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Sajith Premadasa, what is your point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අහපු ප්‍රශ්නය මේ රටේ සමස්ත ජනතාවට බලපාන ප්‍රශ්නයක්. ඇයි ඒකට උත්තර දෙන්නේ නැත්තේ?

රජයේ භාෂා පරිවර්තක සේවය: නිලධාරි හිඟය
அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவை :
உத்தியோகத்தர் பற்றாக்குறை
GOVERNMENT TRANSLATOR SERVICE: DEARTH OF OFFICERS

3286/'12

5. ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ඒකාබද්ධ සේවයට අයත් රජයේ භාෂා පරිවර්තක සේවය තුළ උග්‍ර නිලධාරි හිඟයක් පවත්නා බවත්;

(ii) එම සේවයට බැඳීමට හා සේවයේ රැඳීමට දිරි දෙන වැටුප් හා වරප්‍රසාද ලබා නොදීම තුළ බාහිරින් පිරිස් සේවයට ආකර්ෂණය නොවීමත්, සේවයට බැඳුණු පිරිස්ද නොකඩවා සේවය හැර යාමත් මෙම නිලධාරි හිඟයට හේතු වන බවත්;

(iii) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සමස්ත සේවය, පෙරදී එයට සමාන්තරව පැවති සෙසු සේවා හා සාපේක්ෂව වැටුප් පරිමාණ අගයන්ගෙන් පහත හෙළා ඇති බවත්;

(iv) මෙම තත්ත්වය ත්‍රිභාෂාමය ශ්‍රී ලංකාවක් උදෙසා වූ වැඩ පිළිවෙළට මුළුමනින්ම පටහැනි වූවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භාෂා පරිවර්තක සේවයට අහිමි කරන ලද නිසි පිළිගැනීම හා සේවා තත්ත්වය නැවත ලබා දීම සඳහා මේ වන විට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ගනු ලැබ ඇති එම පියවර කවරේද;

(iii) එම පියවර ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இணைந்த சேவைக்கு உரித்தான அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையில் பாரிய உத்தியோகத்தர் பற்றாக்குறை நிலவுகின்றது என்பதையும்;

(ii) மேற்படி சேவையில் இணைவதற்கும் சேவையில் நிலைத்து நிற்பதற்கும் உற்சாகமளிக்கும் வகையில் சம்பளம் மற்றும் சிறப்புரிமைகள் வழங்கப் படாமையினால் வெளியிலிருந்து நபர்கள் சேவைக்குள் ஈர்க்கப்படாமையும், சேவையில் இணைந்துகொண்டவர்கள் தொடர்ச்சியாக சேவையை விட்டு நீங்கிச்செல்வதும் மேற்படி உத்தியோகத்தர் பற்றாக்குறைக்கான காரணங்களாகும் என்பதையும்;

(iii) 06/2006ஆம் இலக்க பொது நிர்வாகச் சுற்றறிக்கையின்மூலம் ஒட்டுமொத்த சேவையும், முன்னர் அதற்கு சமமான மட்டத்தில் காணப்பட்ட ஏனைய சேவைகளுடன் ஒப்பிடுகையில் சம்பள அளவுத் திட்டங்களைப் பொறுத்தவரை கீழ் மட்டத்துக்கு தள்ளப்பட்டுள்ளதென்பதையும்;

(iv) இந்த நிலைமையானது மும்மொழி ரீதியிலான இலங்கையை முன்னிட்டான வேலைத்திட்டத்துக்கு முற்றிலும் முரணானது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மொழிபெயர்ப்பாளர் சேவை இழந்துள்ள உரிய வரவேற்பையும் சேவை அந்தஸ்தினையும் மீண்டும் பெற்றுக்கொடுப்பதற்கு தற்போது ஏதேனும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்கொள்ளப்பட்டுள்ள குறித்த நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகளை நடைமுறைப் படுத்தும் திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that -

(i) there is a dearth of officers within the Government Translator Service which belongs to the Combined Service;

(ii) external personnel not being attracted to this service due to lack of salaries and privileges that encourages them to join and remain in the service and even those who have joined the service leaving it on a constant basis are the reasons for this dearth of officers;

(iii) the entire service has been downgraded by the Public Administration Circular No.06/2006 in terms of salary scales, in comparison to the other services that had been allied to it earlier; and

(iv) this situation is totally in contradiction with the programme for a tri-lingual Sri Lanka ?

(b) Will he state -

(i) whether any steps have been taken by now to reinstate the due recognition and service status that the said Translator Service has been deprived of;

(ii) if so, what those steps are; and

(iii) the date on which the above steps will be implemented ?

(c) If not, why ?

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) භාෂා පරිවර්තක සේවයේ වාර්තා වන පුරප්පාඩු සංඛ්‍යාව 136කි.

(ii) වැඩි වරප්‍රසාද වැටුප් සහිත වෙනත් තනතුරු සොයා යාම භාෂා පරිවර්තක සේවයට පමණක් නොව රාජ්‍ය සේවයේ දීප ව්‍යාප්ත සේවාවන් නොවන සෑම සේවාවකටම පොදු ලක්ෂණයකි.

(iii) භාෂා පරිවර්තක සේවයේ දැනට සිටින කිසිදු නිලධාරියෙකුට ලැබෙන වැටුප අඩු වීමක් සිදුව නැත. භාෂා පරිවර්තක සේවයේ ආරම්භක වැටුප රුපියල් 21,245.00කි.

(iv) පිළි නොගනී.

(ආ) (i) භාෂා පරිවර්තක සේවයට පවතින පිළිගැනීමේ අහිමි වීමක් සිදු කර නැත. කෙසේ වුවද භාෂා පරිවර්තක සේවයට පැවති තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක් ඇති කිරීමට පියවර ගෙන ඇත.

(ii) 1. භාෂා පරිවර්තක සේවය සඳහා නව සේවා ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර ඇත.

2. පුහුණු අවස්ථාවන් ඇති කිරීම සඳහා කටයුතු කරගෙන යනු ලබයි.

(iii) නව සේවා ව්‍යවස්ථාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අමාත්‍ය මණ්ඩලය මඟින් පිළිගනු ලැබූ දිනය වන විට.

(ඇ) පැන නොනඟී.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, භාෂා පරිවර්තකයන්ට උසස්වීම් දෙන විභාගයක් තිබුණා. අවුරුදු 14කින් එම විභාගය පවත්වා නැහැ. ඒ නිසා උසස්වීම් ලැබීමට තිබුණු අවස්ථා ඔවුන්ට අහිමි වෙලා තිබෙනවා. එබැවින් අවුරුදු 8 ඉක්ම වූ පළමුවෙනි පන්තියේ සිටින නිලධාරීන්ට සාධාරණයක් වන පරිදි විශේෂ පන්තියට අන්තර්ග්‍රහණය කරන්න පුළුවන්කම තිබෙනවාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමනි, භාෂා පරිවර්තක සේවයේ ගැටලු රාශියක් තිබෙනවා.

නව කෙටුම්පතත් එක්ක, මෙය ආකර්ෂණීය සේවාවක් හැටියට තේරුම් ගෙන, අලුතින් අය මේ සේවයට බැඳීමට එයි කියලා අප විශ්වාස කරනවා. ඒ වනකොට මේ සේවාවේ තිබෙන හිඟය අපට ඉතා අවම තත්ත්වයකට පත් කර ගන්නට පුළුවන් වෙයි. ඒ එක්කම ඔවුන් ඉල්ලීම් කර තිබෙන ඒ කාරණා සම්බන්ධවත් අමාත්‍යාංශ කමිටුව හරහා අවශ්‍ය පියවර ගන්නට සූදානම් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රජයේ භාෂා ප්‍රතිපත්තිය ගැන 2013.06.20වැනි දා කැබිනට් තීන්දුවක් දීලා තිබෙනවා. ඒ අනුව උසස් නිලධාරීන්ට අදාළ සහන ගැන ඊට පහුවෙනි දාම චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. හැබැයි, මේ භාෂා පරිවර්තකයන්ගේ ප්‍රශ්නය 2006 වසරේ ඉඳලාම තිබෙනවා. නමුත් තවම චක්‍රලේඛයක් නිකුත් කර නැහැ. ඒ නිසා මේ භාෂා පරිවර්තකයන්ගේ ප්‍රශ්නයට අඩු ගණනේ මේ අවුරුද්දේවත් විසඳුමක් දෙන්නට පුළුවන් වෙයි කියලා ඔබතුමාට සහතික වන්නට පුළුවන්ද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමනි, අංක එම්/එන්/ 06/2006/ඒ චක්‍රලේඛය යටතේ මේ සේවාව රුපියල් 21,245ක වැටුප් තලයෙන් ආරම්භ කරලා, අවසානයේ මූලික වැටුප රුපියල් 31,645ක් දක්වා වැඩි වනවා. ඒ නිසා මේ වර්ෂය තුළදී එම කටයුතු සියල්ලම අපට සාර්ථකව ඉෂ්ට කර ගන්නට පුළුවන්කම ලැබෙයි කියලා අප විශ්වාස කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේ වසර ඇතුළත නේද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ඔව්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ අයගේ තත්ත්වය ඉහළ දමනතුරු 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ක්‍රියාත්මක වීමට පෙර ඔවුන් හිටපු වැටුප් පරිමාණවල, එනම් පළමුවැනි පන්තියේ භාෂා පරිවර්තකයින් එම්/එන් /7 යටතේත්, විශේෂ පන්තියේ භාෂා පරිවර්තකයින් එස්/එල්/1 යටතේත් තබන්න කටයුතු කරන්න පුළුවන්ද කියන එක මා අහනවා. මොකද, ඔවුන්ගේ සමාන්තර ශ්‍රේණිවල අයට එම වැටුප් පරිමාණ ලැබෙනවා.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කාරණා සම්බන්ධයෙන් ඒ අදාළ නිලධාරිනුත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය පියවරක් ගන්නම්. එය කරන්න පුළුවන්කමක් තිබේද, නැද්ද කියන එක පිළිබඳවත් මා ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
බොහොම ස්තුතියි.

නීති විරෝධී සංක්‍රමණිකයන් : නීතිමය ක්‍රියා මාර්ග

சட்டவிரோத குடியகல்வோர் : சட்ட நடவடிக்கை

ILLEGAL MIGRANTS: LEGAL ACTION

3335/'12

6. ගරු අනෝමා ගමගේ මහත්මිය

(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)

(The Hon. (Mrs.) Anoma Gamage)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2012 ජනවාරි සිට මේ දක්වා කාල සීමාව තුළ විසා රහිතව අනවසරයෙන් රටින් බැහැරවීමට ක්‍රියා කිරීම සීඝ්‍රයෙන් වැඩි වී ඇති බව පිළිගන්නේද;

(ii) එම කාල සීමාව තුළ නීතියේ රැහැනට හසු කරගත් නීති විරෝධී සංක්‍රමණිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම නීති විරෝධී සංක්‍රමණික ක්‍රියාවලිය ඉහත සඳහන් කාල සීමාවට පෙර සිට ක්‍රියාත්මක වී තිබේද;

(ii) නොඑසේ නම්, එම ක්‍රියාවලිය මැතකදී ආරම්භ වී තිබේද;

(iii) නීති විරෝධී සංක්‍රමණිකයින් නීතියේ රැහැනට හසු කර ගැනීම මින් පෙර ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2012 சனவரி மாதம் தொடக்கம் இற்றை வரை வீசா இன்றி சட்டவிரோதமாக நாட்டைவிட்டு வெளியேறும் நடவடிக்கைகள் துரிதமாக அதிகரித்துள்ளதென்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மேற்படி காலகட்டத்தினுள் சட்டத்தின் பிடியில் சிக்கவைக்கப்பட்ட சட்டவிரோத குடியகல்வோரின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) அவர்கள் தொடர்பில் எடுக்கப்பட்டுள்ள சட்ட ரீதியான நடவடிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி சட்டவிரோத குடியகல்வு நடவடிக்கை மேற்கூறப்பட்ட காலகட்டத்திற்கு முன்னரும் இடம்பெற்றுள்ளதா என்பதையும்;

(ii) இல்லையெனில், மேற்படி நடவடிக்கை அண்மைக்காலத்தில் ஆரம்பிக்கப்பட்டதா என்பதையும்;

(iii) சட்டவிரோத குடியகல்வோரை சட்டத்தின் பிடியில் சிக்கவைப்பதற்கு இதற்கு முன்னர் நடவடிக்கை எடுக்காதிருந்தமைக்குரிய காரணங்கள் யாவையென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) whether he admits the fact that the attempts by Sri Lankans to leave the country illegally without obtaining visas have steadily increased from January 2012 to date;

(ii) the number of illegal migrants nabbed during that period; and

(iii) the legal action taken against them ?

(b) Will he inform this House -

(i) whether this process of illegal migration was in operation prior to the aforesaid period;

(ii) if not, whether it had started recently; and

(iii) of the reasons for not implementing measures to nab those illegal migrants before the aforesaid period?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2012 ජනවාරි මස සිට ජූලි මස දක්වා කාලය තුළදී ඉතා අවම නීති විරෝධී සංක්‍රමණිකයන් ප්‍රමාණයක් වාර්තා වූ අතර, 2012 ජූලි මස සිට දෙසැම්බර් මස අවසානය දක්වා එහි ශීඝ්‍ර වැඩි වීමක් සිදුව ඇත. එහෙත් 2012 දෙසැම්බර් සිට මේ දක්වා කාලය තුළ එහි සැලකිය යුතු අඩු වීමක් දැකිය හැක.

(ii) 4833ක් පමණ වේ.

(iii) * නීති විරෝධී ලෙස රටින් පිටවන්නන් සඳහා පහසුකම් සපයන්නන් සහ නීති විරෝධී ලෙස රටින් පිටවීමට උත්සාහ දැරීමේදී අත් අඩංගුවට ගත් මුහුදු යාත්‍රා කාර්ය මණ්ඩල සාමාජිකයින් අධිකරණය මඟින් රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

තවද මෙම නීති විරෝධී සංක්‍රමණිකයන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප මත මුදා හැර ඇත.

* මුහුදු මාර්ග ඔස්සේ නීති විරෝධීව රටින් පිට වී ආපසු මෙරටට පිටුවහල් කරනු ලදුව සහ නීති විරෝධී ලෙස ඇතුළු වීමට තැත් කිරීමේදී අත් අඩංගුවට ගත් සැකකරුවන් 155 දෙනකු සම්බන්ධයෙන් විමර්ශන අවසන් කර නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත.

* ගුවන් තොටුපොළ හරහා නීතිවිරෝධී ලෙස විදේශගත වීමට තැත් කරන ලද සංක්‍රමණිකයන් 53ක් පිළිබඳව විමර්ශන අවසන් කර නීතිපතිතුමා වෙත ගොනු

ඉදිරිපත් කරන ලදුව ඉන් 15කට විරුද්ධව නඩු පවරා ඇත. සෙසු සැකකරුවන් සම්බන්ධයෙන් නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් සිටී.

* සෙසු සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන අවසන් කර නීතිපති උපදෙස් අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතව ඇත.

(ආ) (i) ඔව්.

(ii) නැත. දිගු ඉතිහාසයක් ඇති අතර නිශ්චිත කාලසීමාවක් ප්‍රකාශ කළ නොහැක.

(iii) මීට පෙරද නීතිය ක්‍රියාත්මක කරන සියලුම ආයතන විසින් මෙම නීති විරෝධී සංක්‍රමණිකයන් අත් අඩංගුවට ගැනීම සඳහා වර්තමානයේ මෙන්ම ක්‍රියාත්මක වී නීත්‍යානුකූලව කටයුතු කර ඇත.

(ඇ) පැන නොනඟියි.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, වාර්තා වෙලා තිබෙන ආකාරයට අපේ රටින් මේ වසරේ මැයි මාසය දක්වා කාලය තුළ බෝට්ටු 127කින් 8,767ක් ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය වසරේ 17,200ක් ගිහිල්ලා තිබෙනවා. මේ යාත්‍රා පිළිබඳ අධීක්ෂණයක් ධීවර වරායන් මඟින් කෙරෙන්නේ නැත්තේ ඇයි කියලා මා අහන්න කැමැතියි. මොකද, මේ බහුදින යාත්‍රා හැම තැනකින්ම යාත්‍රා කරන්න බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමියගේ සංඛ්‍යා ලේඛන වැරදි බව මා පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ. 2012 පිළිබඳ සංඛ්‍යා ලේඛන ඉතා පැහැදිලිව ඉදිරිපත් කළා. එතුමිය වෙනම සංඛ්‍යා ලේඛන එකතු කරගෙන තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න කියන එකයි මට දෙන්න තිබෙන එකම පිළිතුර.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු ඇමතිතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නයට උත්තරය දුන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමිය 2013 ගැන ප්‍රශ්නයක් අහලා නැහැ. ඔබතුමිය අහලා තිබෙන ප්‍රශ්නයට පිළිතුර දීලා තිබෙනවා. අතිරේක ප්‍රශ්න අහනවා නම්-

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

මා ඇහුවේ යාත්‍රා පිළිබඳව ධීවර වරායන් මඟින් අධීක්ෂණයක් කෙරෙන්නේ නැත්තේ ඇයි කියලායි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිරේක ප්‍රශ්නයක් අහනවා නම් ඒක ප්‍රධාන ප්‍රශ්නයට සම්බන්ධ එකක් වෙන්න ඕනෑ

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, දෙවන අතුරු ප්‍රශ්නයක් අහනවාද?

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මෙම ගමන් රහසිගතව සිදු වෙනවායි කියලා කිව්වාට වෙරළ ආරක්ෂාවට නාවික හමුදාව ඉන්නවා.

නාවික හමුදාවත් තිබෙද්දී මේ වාගේ ගමන් සිදු වන නිසා ඒ සඳහා ගෙන තිබෙන පියවර මොනවාද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම ඒ ප්‍රශ්නයට කලින් පිළිතුරු දුන්නා. නීති විරෝධී සංක්‍රමණිකයන් සම්බන්ධ ක්‍රියාවලියට සමගාමීව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සමස්ත වෙරළ තීරය හා දිවයිනේ අභ්‍යන්තරය ආවරණය වන පරිදි විධිමත් බුද්ධි ජාලයක් ක්‍රියාත්මක කර තිබෙනවා. නීති විරෝධී සංක්‍රමණිකයන් සහ එම කටයුතු මෙහෙයවන ජාවාරම්කරුවන් අත් අඩංගුවට ගැනීම සිදු කර ගෙන යනවා. ඒ අනුව මේ වන විට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ධීවර යාත්‍රා 88ක් අත් අඩංගුවට ගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අනෝමා ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ සංක්‍රමණිකයන් නිසා අපේ රටට ලොකු අපකීර්තියක් ඇති වෙනවා. විශේෂයෙන්ම දැනට මේ රටේ තිබෙන දේශපාලන තත්ත්වය අනුව අපේ රටින් සරණාගතයන් යනවා කියලා ඕස්ට්‍රේලියාව වාගේ රටවලින් බොහෝ විට අපට දෝෂාරෝපණය කරනවා. ඒ නිසා අපේ අය යන්නේ ආර්ථික රැකවරණය සඳහා ද, එහෙම නැතිව වෙනත් හේතු නිසාද කියන එක ගැන විශ්ලේෂණයක් මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඇත්ත වශයෙන්ම මේ රටින් වෙනත් රටකට නීති විරෝධීව කවුරු හරි යනවා නම් එහිදී අත් අඩංගුවට ගැනීම සිදු වෙනවා. එහෙම නැත්නම් ඒ රට කැමැත්තෙන් තමන්ගේ රටට එන්න ඉඩ දීලා පසුව අත් අඩංගුවට ගන්නවා. ඒ නිසා අපකීර්තියක් සිදු වීම ගැන අපට වාර්තා වෙලා නැහැ. නමුත් නීති විරෝධීව කෙරෙන මේ කටයුත්ත වළක්වන්න අපේ රජයත් - ඔබතුමිය ඕස්ට්‍රේලියානු රජය ගැන සඳහන් කළා- ඕස්ට්‍රේලියානු රජයත් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අදාළ නීතිමය කටයුතු කරනවා. බොහෝ දෙනා ඕස්ට්‍රේලියානු රජය විසින් අත් අඩංගුවට ගෙන එරට නීතිය යටතේ ආපසු පිටත් කර එවීම අපේ රජය සමඟ බොහොම සුහදව සිදු වෙලා තිබෙනවා.

"උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" : වියදම සහ ප්‍රතිලාභ

"வடக்கின் வசந்தம்" மற்றும் "கிழக்கின் உதயம்" : செலவு மற்றும் நன்மைகள்

"UTHURU WASANTHAYA" AND "NAGENAHIRA UDANAYA": COST AND BENEFITS

2463/'12

8. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී, "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වැඩසටහන්වලට අදාළව,

(i) දැරීමට සිදුවූ වියදම සහ ඒවායින් ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(ii) ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) මුදල් ප්‍රවාහයන් මඟින් සත්‍ය වශයෙන් වැය කළ මුදල් ප්‍රමාණය ලෙස තහවුරු වූ නිශ්චිත වියදම කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වෙනුවෙන් 2010, 2011 සහ 2012 වර්ෂයන් සඳහා ලැබුණු මුළු ආධාර මුදල් සහ ප්‍රදානයන් ප්‍රමාණය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) "வடக்கின் வசந்தம்" மற்றும் "கிழக்கின் உதயம்" ஆகியன தொடர்பாக 2010ஆம், 2011 ஆம் மற்றும் 2012ஆம் ஆண்டுகளில்,

(i) ஏற்பட்ட செலவு மற்றும் அடைந்த நன்மை களையும்;

(ii) ஏற்படுத்தப்பட்ட தொழில் வாய்ப்புகளின் எண்ணிக்கையையும்; மற்றும்

(iii) ஏற்பட்ட சரியான செலவையும் மற்றும் காசோட் டத்தினைக்கொண்டு செலவிடப்பட்ட முழுப் பணத்தொகைக்கான சான்றுகளையும்

ஆண்டு அடிப்படையில் வெவ்வேறாக அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) 2010ஆம், 2011ஆம் மற்றும் 2012ஆம் ஆண்டுகளுக் கான "வடக்கின் வசந்தம்" மற்றும் "கிழக்கின் உதயம்" ஆகியவற்றுக்காகப் பெறப்பட்ட மொத்த உதவி களையும் கொடைகளையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform this House for the years 2010, 2011 and 2012 separately on per year basis pertaining to the "Uthuru Wasanthaya" and "Nagenahira Udanaya"-

(i) the cost incurred and the benefits accrued;

(ii) the number of jobs that have been created; and

(iii) the exact expenditure incurred and corroborate through cash flows as to the actual amount spent?

(b) Will he state the total aid and grants obtained on account of "Uthuru Wasanthaya" and "Nagenahira Udanaya" for the years 2010, 2011 and 2012?

(c) If not, why?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන ඇමතිතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර සූදානම් කර තිබෙනවා. මෙම පිළිතුර දීර්ඝ වැඩියි. එය ඉදිරිපත් කරන්න සෑහෙන වෙලාවක් යනවා. ඒ ඔක්කොම ඉදිරිපත් කරන්නද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇහෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

පිළිතුරේ පිටු 15ක් විතර තිබෙනවා. මේ පිළිතුර කියවන්න ගියොත් පැයක් විතර යයි. ඔබතුමා කියන්නේ මොකක්ද? ඔක්කොම කියවන්නද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ. පේළිවලින් කියවන්න උත්තර නැද්ද? ප්‍රශ්නයේ (iii) කොටස අනුව ඒ සම්පූර්ණ වියදම කොපමණද කියා කියන්න පුළුවන්ද? මුළු පිටු ගණනම ඕනෑ නැහැ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

වියදම එක එක ව්‍යාපෘති යටතේ තිබෙනවා. ඒත් විශාල ප්‍රමාණයක්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවායේ සම්පූර්ණ එකතුව කියන්න පුළුවන්ද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු මන්ත්‍රීතුමා, "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වාගේ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් උතුරු - නැගෙනහිර

කරලා තිබෙනවා. ඒවා කලේ විදේශ ආධාර යටතේ වාගේම දේශීය මුදල් යොදවලා. ඒ නිසා මේ ප්‍රශ්නවලට උත්තර වෙන වෙනම කියන්න වෙනවා. ඒ හැම එකකටම එකම උත්තරයක් දෙන්න බැහැ. ඒ නිසා මේ පිළිතුර සභාගත කළොත් හොඳ නැද්ද? අවුරුදු තුනක -2010, 2011,2012- විස්තර ඔක්කොම තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නයේ (ආ) කොටසින් අහලා තිබෙන, කොච්චර ආධාර ප්‍රමාණයක් ලැබුණාද කියන එකට උත්තර දෙන්න පුළුවන්ද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ කොටසට පමණක් පිළිතුරු කියන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමා කියන දේ මට ඇහෙන්නේ නැහැ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක් තිබෙන නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) 2010, 2011 හා 2012 වර්ෂයන් සඳහා උතුරු වසන්තය හා නැඟෙනහිර නවෝදය වැඩසටහන් වලට අදාළව දැරීමට සිදුවූ වියදම හා ඒවායින් ලැබුණු ප්‍රතිලාභ

පුරා දශක 3 ක පමණ කාලයක් පුරාවට තිබූ යුද්ධය වාතාවරණය තුළ අඩාලව පැවති සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම සඳහා රජය විසින් විශාල පරිශ්‍රමයක් දරණු ලදි. මානුෂීය බිම් බෝම්බ ඉවත්කිරීමේ කාර්යයෙන් ආරම්භ කරන ලද සාමාන්‍ය ජනජීවිතය ස්ථාපිත කිරීමේ මෙහෙයුම සඳහා රජය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානත්, පෞද්ගලික ආශය හා විදේශාධාර ලබාදෙන ආයතනද විශාල දායකත්වයක් දක්වන ලදී.

බිම් බෝම්බ ඉවත්කිරීමේ කාර්යයත් සමගම ජනතාව නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ආර්ථික යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට රජය කටයුතු කරන ලදී. ඒ අනුව උතුරු පළාත තුළ මාර්ග ඉදිකිරීම හා සංවර්ධනය කිරීම , දුම්රිය මාර්ග නැවත ස්ථාපිත කිරීම, විදුලිය සම්ප්‍රේෂණ මාර්ග නැවත ස්ථාපිත කිරීම ආදී කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම A-9 මාර්ගය ඉහළ ප්‍රමිතියකින් යුතුව සංවර්ධනය කරන ලද අතර ඒ හා සම්බන්ධ වන වෙනත් A ශ්‍රේණියේ මාර්ග මෙන්ම B ශ්‍රේණියේ මාර්ගද සංවර්ධනය කරන ලදී. දුම්රිය මාර්ගය මැදවච්චියේ සිට මඩු දුම්රිය ස්ථානය දක්වා සංවර්ධනය කරන ලදී. ඉතා නුදුරේදීම යාල්දේවිය යාපනයට සම්ප්‍රාප්ත වනු ඇත. මෙමඟින් උතුර දකුණ ඉතා කාර්යක්ෂම අන්දමින් සම්බන්ධ වන බැවින් එය සියළුම ජනතාවට ප්‍රතිලාභ ගෙන දුන් සංවර්ධන ව්‍යාපෘතියක් වනු නොඅනුමානය.

මීට අමතරව නැඟෙනහිර වෙරළ සමාන්තරව උතුර සම්බන්ධ කරන මාර්ගයේ තිබූ පාලම් පාරු 17 ක් ඉවත් කර නව පාලම් ඉදිකිරීම තුළින් උතුර සඳහා නව විකල්ප මාර්ගද, ඒ තුළින් ජනතාවට සියදිරු ආර්ථික හා සාමාජීය සම්බන්ධතා සඳහා මඟපාදන ලදී.

සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා වෙනුවෙන් විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් දේශීය මෙන්ම විදේශීය අරමුදල් යොදවා ගනිමින් ක්‍රියාත්මක කරන ලදී. යාපනය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ වැල්වට්ටුරෙයි, මරදන්කර්නි හා පේදුරුතුඩුව ජල සම්පාදන ව්‍යාපෘති කැපී පෙනේ.

වගා බිම්වලට අවශ්‍ය වාරි ජලය ලබාදීම සඳහාද රජය විශාල මුදල් ප්‍රමාණයක් වැය කළ අතර මෙහිින් උතුරේ ජනතාව තම ගොවි නිෂ්පාදන ප්‍රමාණය හා වර්ගයන් ව්‍යාප්ත කරගන්නා ලදී. පුළුල් වූ මවුන්ගේ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොළක්, මාර්ග පද්ධතියේ පුළුල් වීමත් සමඟම ඇති විය.

ජනතාව නැවත පදිංචි කිරීමත් මවුන්ගේ ජීවිකාව උදෙසා විවිධාකාර ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීමත් සිදු කරන ලදී. මෙහිදී ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබාදීමත්, මවුන් ඒ සඳහා සංවිධානය කිරීමත්, අවශ්‍ය ණය පහසුකම් ලබාදීමත් සඳහා කටයුතු කරන ලදී. එසේම ධීවර කටයුතුත්, පශු සම්පත් කටයුතුත් වල නියැළීමටත්, ඒ තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමටත් අවශ්‍ය පියවර රාශියක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. බිඳවැටී තිබූ සිවිල් සමාජය නැවත පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.

යුක්තිය පසිඳලීමේ උසාවි පද්ධතිය නැවත පිහිටුවීම, අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් අවශ්‍ය පරිදි අනුයුක්ත කොට සිවිල් ජන සමාජය ශක්තිමත් කිරීම පිණිස රජයේ සේවය ශක්තිමත් කරන ලදී. මේ තුළින් ජනතාවට අවශ්‍ය වන රාජ්‍ය සේවය ලබාදීමටත්, සිවිල් සමාජය හා නීතිය පිළිබඳ විශ්වාසය ගොඩනැඟීමටත් කටයුතු කරන ලදී.

රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයෝජනයන්ද උතුරු ප්‍රදේශය සඳහා පුළුල් ලෙස යොමුකරන ලදී. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම තුළ කර්මාන්තශාලා ඇතිවීමත් සමඟම ප්‍රදේශයේ රැකියා උත්පාදනයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

ඉහත සඳහන් කළ කරුණු වල විස්තරාත්මක තොරතුරු ඇමුණුම් 01 හා 02 හි සඳහන් කර ඇත.

බිම්බෝම්බ ඉවත් කිරීම හා යළි පදිංචි කිරීමේ ව්‍යාපෘතිය

උතුරු හා නැඟෙනහිර පළාත්වල 2010, 2011 හා 2012 වර්ෂ සඳහා

සංවර්ධන පාර්ශ්වකරුවන් වන අන්තර්ජාතික හා දේශීය, රාජ්‍ය නොවන සංවිධාන 8ක් හා යුද්ධ හමුදාවේ සහයෝගය ඇතිව 2012 වර්ෂය වන විට සම්පූර්ණ බිම් ප්‍රමාණයෙන් 95% ක (වර්ග කිලෝ මීටර් 1,967,299,992) පමණ බිම්බෝම්බ ඉවත් කිරීමට රජය සමත් විය.

ව්‍යාපෘතිය	වියදම් වූ මුදල (රු.මි) 2010	වියදම් වූ මුදල (රු.මි) 2011	වියදම් වූ මුදල (රු.මි) 2012	වියදම් වූ මුදල (රු.මි)	ප්‍රතිලාභ
බිම්බෝම්බ ඉවත් කිරීම	6,591.85	2,292.46	2,490.15	11,374.46	අවතැන්වූ පවුල් 295, 136ක ජනතාව යළි පදිංචි කර ඇත.

විස්තරාත්මක ප්‍රගතිය අමුණුම් අංක 1 හි දක්වා ඇත.

යළි පදිංචි කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක වූ මානුෂික ආධාර සැපයීම

මානුෂික ආධාර	වියදම් වූ මුදල (රු.මි)	ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව
මුදල් ආධාර රු.5000 බැගින්	444.54	88,907
මුදල් ආධාර රු.25,000 බැගින් - UNHCR	2043.15	81,726
මුදල් ආධාර රු.25,000 බැගින් -NECORD	920.63	36,825
වියළි ආහාර ද්‍රව්‍ය කට්ටල	14,254.67	83,015
සෙවිලි තහඩු (1,008,025)	436.65	80,573
සිමෙන්ති බැග් (400,000)	209.27	50,000
යන්ත්‍රෝපකරණ ලබාදීම	252.5	-
එකතුව	18,561.41	

උතුරු වසන්තය - ආංශික ආයෝජන 2010 - 2012

අංශය	සමස්ත ආයෝජනය (රු.මි)			සමස්ත ආයෝජනයන්හි එකතුව (රු.මි) 2010-2012
	2010	2011	2012	
කෘෂිකර්මය	2,559.81	3,590.54	2,951.67	9,102.02
කර්මාන්ත, සංචාරක හා වෙළඳ	99.20	499.42	755.43	1,354.05
ජනතාව පදිංචිකරවීම්	7,567.99	7,226.92	9,799.16	28,632.38
ආර්ථික යටිතල පහසුකම්	2,777.08	4,539.06	3,168.24	10,484.38
ප්‍රවාහන	11,606.17	43,266.53	39,077.14	93,949.84
සමාජ යටිතල පහසුකම්	5,915.96	5,552.66	4,191.22	15,659.84
පරිපාලන පොදුකාර්යය	587.47	330.05	1,221.12	2,138.64
සමස්ත එකතුව	31,113.68	65,005.18	61,164.44	161,321.61

* ජල සම්පාදනය සඳහා 2010,2011 හා 2012 වර්ෂ සඳහා ආයෝජනය කර ඇති මුළු මුදල රු.මි. 4038.31 කි.

- විස්තරාත්මක ප්‍රගතිය ඇමුණුම් අංක: 2 හි දක්වා ඇත

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

නැඟෙනහිර නවෝදය - ආංශික ආයෝජන 2010 - 2012

අංශය	සමස්ත ආයෝජනය (රු.මි)			සමස්ත ආයෝජනයන්හි එකතුව (රු.මි) 2010-2012
	2010	2011	2012	
කෘෂිකර්මය	2,390.43	1,694.91	718.82	4,804.16
කර්මාන්ත, සංචාරක හා වෙළඳ	283.23	259.21	279.92	822.36
ජනතාව පදිංචිකරවීම	9,843.09	1,619.02	565.56	18,515.53
ආර්ථික යටිතල පහසුකම්	2,750.40	1,059.08	1,619.98	5,429.46
ප්‍රවාහන	4,106.65	11,708.97	24,330.33	40,145.95
සමාජ යටිතල පහසුකම්	1,990.79	1,284.64	2,788.13	6,063.56
පරිපාලන පොදුකාර්යය	726.47	259.57	799.30	1,785.34
සමස්ත එකතුව	**22,091.06**	**17,885.40**	**31,102.04**	**77,566.36**

* ජල සම්පාදනය සඳහා 2010,2011 හා 2012 වර්ෂ සඳහා ආයෝජනය කර ඇති මුළු මුදල රු.මි. 6,487.86 කි.

- විස්තරාත්මක ප්‍රගතිය ඇමුණුම් අංක: 3 හි දක්වා ඇත

(ii) ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව

පූරා දශක 3ක පමණ කාලයක් පූරා පැවති කුරිරු ත්‍රස්තවාදය හේතුවෙන් කාලයක් තිස්සේ අසරණව පැවති ජනජීවිත නැවත යථාතත්වයට පත්කිරීම සඳහා රජය විසින් විශාල පරිශ්‍රමයක් දරමින් ලද අතර ඊට සමගාමීව විවිධ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් ජනනය කර ඇත.

රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන දේශීය විදේශීය සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති මඟින් විවිධ ක්ෂේත්‍රයන් හරහා සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් උදා කර ඇත.

එසේම උතුරු පළාත හා නැඟෙනහිර පළාත්වල රාජ්‍ය සේවයේ සිවිල් සේවය ඇතුළු දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් ගුරුවරුන්, හෙදියන්, උපාධිධාරීන්, සමෘද්ධි නිලධාරීන්, සුළු සේවකයින් වැනි විවිධ ක්ෂේත්‍රයන් සඳහා රැකියා අවස්ථා ලබා දෙන ලදී.

උතුරු වසන්තය හා නැඟෙනහිර නවෝදය හරහා විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මඟින් සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් උත්පාදනය කර ඇති අතර ඒකක වශයෙන් ගණනය කිරීමක් සිදු කළ නොහැක.

එසේම, යුධවර ආම්පන්න බෙදාදීම් වැනි ව්‍යාපෘති හරහා යුධවර කර්මාන්තයද, පශු සම්පත් අංශයන් දියුණු කිරීම තුළින් පශු සම්පත් ක්ෂේත්‍රයේද රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් උදාකර ඇත.

උතුරු නැඟෙනහිර පළාත්වල ගොවීන්ට සිය කෘෂිකාර්මික කටයුතු නැවත යථා තත්වයට පත්කිරීම සඳහා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු, කෘෂි යන්ත්‍රෝපකරණ ලබා දීම, බිත්තර වී හා අනෙකුත් බෝග වල බීජ වර්ග ලබා දීම වැනි ක්‍රියාකාරකම් හරහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා අවස්ථාද වැඩි වී ඇත.

(iii) සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණය ලෙස තහවුරු වූ නිශ්චිත වියදම

පිළිතුර (අ) (i) පරිදි වේ.

(ආ) උතුරු වසන්තය හා නැඟෙනහිර උදානය වෙනුවෙන් 2010, 2011 සහ 2012 වර්ෂයන් සඳහා ලැබුණු ආධාර මුදල් හා ප්‍රදානයන් ප්‍රමාණය

විස්තරය	2010 (රු. මි.)	2011 (රු. මි.)	2012 (රු. මි.)	එකතුව (රු.මි)
විදේශ ප්‍රදානයන් (Loans)	22,347.82	38,355.46	56,576.69	117, 279.97
විදේශ ආධාර (Grants)	12,221.62	8,153.42	7,261.84	27,636.88
ශ්‍රී ලංකා රජය	18,635.00	36,381.70	28,427.95	83,444.65

ඉහත සඳහන් අගයන්ට අමතරව රු.මි 10,526.09 ක් උතුරු හා නැඟෙනහිර පළාත් තුළ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් අංක: 1

නියෝජිත ආයතනයේ නම	නියෝජිත ආයතනයේ වියදම (රු.මි)				විශේෂ කරුණු (ආධාර සපයන ලද රට)
	2010	2011	2012	එකතුව	
ශ්‍රී ලංකා රජය (MED/NMAC/SLA/HDU)	2,342.88	694.89	208.33	3,246.10	
HALO Trust	736.82	376.2	691.83	**1,804.85**	මහා බ්‍රිතාන්‍ය, නෝර්වේ,ජපානය,ඇමරිකා එක්සත් ජනපදය
DDG	692.7	216.41	225.09	**1,134.20**	ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ඩෙන්මාර්කය
MAG	520.56	341	607.42	**1,468.98**	ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, නෙදර්ලන්තය
FSD	1022.08	287.81	552.69	**1,862.58**	ඇමරිකා එක්සත් ජනපදය,, ECHO, ස්විට්සර්ලන්තය
Sarvatra	408.61	134	28.80	**571.41**	2012 වර්ෂයේදී ක්‍රියාකාරී ව්‍යාපෘති වලින් ඉවත් වීඇත
Horizon	330.11	121.77	19.80	**471.68**	
MMIPE	85.62	75	6.30	**166.92**	
DASH	22.47	45.375	149.89	**217.74**	ඕස්ට්‍රේලියාව, ජපානය
සංවර්ධන හවුල්කරුවන්ගේ දායකත්වය (AUSAID,UNHCR)	430			**430.00**	බිම් බෝම්බ ඉවත්කිරීමේ යන්ත්‍ර සපයාදීම
එකතුව	**6591.85**	**2292.455**	**2490.15**	**11,374.46**	

වර්ෂ 2010 සිට 2012 සඳහා මුළු වියදම - රු.මි 11,374.46

සටහන: The HALO Trust, Danish Demining Group (DDG), Mines Advisory Group (MAG), Fondation Suisse de Deminage (FSD)

Delvon Assistance for Social Harmony (DASH), ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වන මිලින්ද මොරගොඩ පදනම (MMIPE)

ශ්‍රී ලංකා යුධ හමුදාව -මානුෂීය බිම් බෝම්බ ඉවත්කිරීමේ ඒකකය
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික බිම් බෝම්බ ඉවත්කිරීමේ මධ්‍යස්ථානය (MED NMAC)

- මුදල් වර්ෂයක් අප්‍රේල් සිට මාර්තු 31 දක්වා භාවිතාවන ආයතන තිබේ

ඇමුණුම් අංක 2

උතුරු වසන්තය
ආයෝජන හා ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් 2010 - 2012

අනු අංකය	අංශය/සංරචක	ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම්	සමස්ත ආයෝජනය (රු.මි) 2010	සමස්ත ආයෝජනය (රු.මි) 2011	සමස්ත ආයෝජනය (රු.මි) 2012	සමස්ත ආයෝජනයෙහි මුළු වටිනාකම (රු.මි) 2010 - 2012	ප්‍රතිලාභ
කෘෂිකර්මය							
1	වාරිමාර්ග	වාලුක්කයිආරු,ඉරණමඩු, කලෙයිමඩු, පිරමන්තාරු, කෙන්නියන්කුලම්, පාවිච්කුලම්, මාමඩුව, නාමළුන්, මුගතන්කුලම් සහ යෝධවැව ආදී මහා පරිමාණ වැව් පුනරුත්ථාපනය කිරීම හා සුළු හා මධ්‍ය පරිමාණ වැව් 348 ක් පුනරුත්ථාපනය කිරීම.	1610.47	3237.10	2378.81	7226.38	යාපනය, කිලිනොච්චි, මුලතිවු, මන්නාරම, වවුනියාව දිස්ත්‍රික්ක වල ගොවි පවුල් හා එහි සාමාජිකයින් , උතුරු පළාතේ ජනතාව හට පානීය ජල පහසුකම් ලබාදීම.
2	කෘෂිකර්මය	අපි වවමු රට නගමු වැඩසටහන, වවුනියාව දිස්ත්‍රික්කයේ කෘෂි විද්‍යාලය, ප්‍රාදේශීය සම්පත් මධ්‍යස්ථානය, තිරසාර කෘෂිකාර්මික ජල කළමනාකරණ ව්‍යාපෘතිය හා උතුරු පළාතේ ක්‍රියාත්මක කරනු ලබන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	774.65	130.66	223.05	1128.36	උතුරු පළාතේ ජීවත් වන ගොවි පවුල් වල සාමාජිකයින්
3	ධීවර	ධීවර කර්මාන්තය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු, දැල් ආදී පහසුකම් ලබාදීම	128.04	103.84	162.78	394.66	උතුරු පළාතේ ධීවර ජනතාව
4	පශු සම්පත්	කිරි ගම්මාන 25, සත්ව අභිජනන මධ්‍යස්ථාන 82ක් කිරි අලෙවිහල් 25 ක්,කුකුළු පැටවු ප්‍රවාහනය සඳහා වෑන් රථයක් ලබාදීම, ජීව වායු ඒකක 8 ක් ස්ථාපනය කිරීම	46.65	118.94	187.03	352.62	කිරි ගම්මාන වල ප්‍රතිලාභීන් 500 ක්, සත්ව අභිජනන මධ්‍යස්ථාන නිෂ්කරුවන් 54 ක් හා උතුරු පළාතේ කිරි නිෂ්පාදන පාරිභෝගිකයින් රසකට ප්‍රතිලාභ ලත්වේ.
කෘෂිකර්මය (උප එකතුව)			***2559.81***	***3590.54***	***2951.67***	***9102.02***	

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

කර්මාන්ත, සංචාරක හා වෙළඳ							
5	කර්මාන්ත, වෙළඳ, ග්‍රාමීය සුළු පරිමාණ හා සමුපකාර	අත්තම්, නව තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ පුහුණුව. මත්තාරම දිස්ත්‍රික්කයේ ඉදි කරනු ලැබූ තල් නිෂ්පාදන කර්මාන්ත කලාපය හා යාපනය, වවුනියාව දිස්ත්‍රික්ක වල ඉදි කරන ලද ජෙෂකර්ම ගම්මාන	99.20	499.42	755.43	1354.05	යාපනය, මත්තාර හා වවුනියාව දිස්ත්‍රික්කයන්හි ජීවත් වන මුළු ජනගහනය
කර්මාන්ත, සංචාරක හා වෙළඳ (උප එකතුව)			*99.20*	*499.42*	*755.43*	*1354.05*	

ජනතාව පදිංචිකරවීම							
6	ජනතාව පදිංචිකරවීම	පදිංචිකිරීම් සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් සම්පාදනය හා පිහින ලද ආහාර ලබාදීම.	1293.08	88.40	79.01	1460.49	
7	සහනාධාර (ලෝක ආහාර වැඩසටහන)	මාතෘ හා ළමා පෝෂනය, අධ්‍යාපනය සඳහා ආහාර, වැඩ සඳහා ආහාර/ අනාතුරට භාජනය විය හැකි කණ්ඩායම් සුනුණුකිරීම සඳහා ආහාර ලබාදීම	4174.69	2780.22	2415.54	9370.45	ප්‍රතිලාභීන් 1644731
8	නිවාස	ඉන්දියානු නිවාස වැඩසටහන, උතුරු නැගෙනහිර නිවාස ව්‍යාපෘතිය හා සම්දේයි නිවාස වැඩසටහන	2100.22	4358.30	7304.61	13763.13	නිවාස 16902 ක් ඉදිකර ඇත.
9	ජල සම්පාදනය	යාපනය දිස්ත්‍රික්කයේ වැල්වැටිතුරය,මරදන්කර්නි හා පේදුරුතුඩුවෙහි ජල සම්පාදන ව්‍යාපෘති වවුනියාව දිස්ත්‍රික්කයේ නැදුන්කර්නිහි ජල සම්පාදන ව්‍යාපෘතිය, මත්තාරම දිස්ත්‍රික්කයේ අඩම්පන්,කේවෘන්පිඩිවි, මඩු , පල්ලිමුනෙයිහි ජල සම්පාදන ව්‍යාපෘති, මුලතිවු දිස්ත්‍රික්කයේ මලාවි, ඔඩුසුඩාන්, පාන්ඩියන්කුලම්. ප්‍රදේශවල ජල සම්පාදන ව්‍යාපෘති,මැණික් ෆාම් සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම ජනතාව පදිංචි කරන ලද ප්‍රදේශවල ළිං 745 ක් හා ජල යෝජනා ක්‍රම 2 ක් 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර ඇත.				4038.31	ප්‍රතිලාභීන් 220,000 කට ආරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දී ඇත.
ජනතාව පදිංචිකරවීම් (උප එකතුව)			*7567.99*	*7226.92*	*9799.16*	*28632.38*	

ආර්ථික යටිතල පහසුකම්							
10	විදුලි බල හා බලශක්ති	වවුනියාව - කිළිනොච්චිය විදුලි සම්ප්‍රේෂණ දිගුව. කිළිනොච්චිය - චුන්නාකම් විදුලි සම්ප්‍රේෂණ දිගුව. චුන්නාකම් හා වවුනියාව ප්‍රදේශවල විදුලි උප පොළ පිහිටුවීම	2775.89	4532.04	3152.23	10460.16	උතුරු පළාතේ සමස්ත ජනගහනය
11	විදුලි සංදේශ	යාපනය හා මත්තාරම දිස්ත්‍රික්කයන්හි තොරතුරු තාක්ෂණ උද්‍යාන පිහිටුවීම	1.19	7.02	16.47	24.68	ශිෂ්‍යයින් 313 හා කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකු හට ප්‍රතිලාභ ලැබේ.
ආර්ථික යටිතල පහසුකම් උප එකතුව)			*2777.08*	*4539.06*	*3168.70*	*10484.84*	

ප්‍රවාහනය							
12	දුම්රිය මාර්ග	උතුරු පළාතේ දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය මැදවච්චිය - තලෙයිමන්නාරම දක්වා,ඕමන්තෙයි - කන්කසන්තුරය දක්වා	49.72	13906.13	9550.12	23505.97	මේ යටතේ දුම්රිය මාර්ගය කි.මී.252 ක් සංවර්ධනය කරනු ලබන අතර එම දුම්රිය මාර්ගයෙහි පිහිටි දුම්රිය පොළ ද ඉදිකරනු ලබයි. මෙමඟින් උතුරු පළාතේ සමස්ත ජනතාවට හා දුම්රියෙන් එම පළාතෙහි සංචාරය කරන්නන් සඳහාද ප්‍රතිලාභ අත්වේ.
13	මාර්ගස්ත මඟී ප්‍රවාහනය (CTB)	නව බස් රථ 40 ක් ලබාදීම, බස් රථ 62 ක් හා බස් ඩිපෝ නවීකරණය කිරීම	37.29	311.60	285.00	633.89	ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම

14	ග්‍රාමීය මාර්ග	ග්‍රාමීය මාර්ග කි.මී. 1077.95 ප්‍රතිසංස්කරණය හා ග්‍රාමීය පාලම් 17 ක් ප්‍රතිසංස්කරණය කිරීම.	498.37	856.85	3346.81	4702.03	ග්‍රාමීය ජනතාවට උතුරු පළාතට පහසු ප්‍රවේශ පහසුකම් ලබාදීම
15	පළාත් මාර්ග	පළාත් මාර්ග කි.මී.452 ක් ප්‍රතිසංස්කරණය කිරීම.	280.08	1592.44	1504.49	3377.01	උතුරු පළාතේ සමස්ත ජනගහනය
16	මාර්ග හා පාලම්	A හා B ශ්‍රේණිවල මාර්ග කි.මී. 1865.55 සංවර්ධනය කිරීම හා පාලම් 32 ක් සංවර්ධනය කිරීම මන්නාරම හා වන්ගුප්පෙඩි පාලම් ආදිය	10740.71	26599.51	24390.72	61730.94	මෙමඟින් උතුරු පළාතේ සමස්ත ජනතාවට හා දුම්රියෙන් එම පළාතෙහි සංචාරය කරන්නන් සඳහාද ප්‍රතිලාභ අත්වේ.
ප්‍රවාහනය (උප එකතුව)			***11606.17***	***43266.53***	***39077.14***	***93949.84***	
සමාජීය යටිතල පහසුකම්							
17	සෞඛ්‍ය	කිළිනොච්චිය දිස්ත්‍රික් රෝහල සංවර්ධනය, යාපනය හෙද අභ්‍යාස විද්‍යාලෙහි බිම් මහළ හා සැත්කම් ඒකකය, යාපනය රෝහල නවීකරණය, යාපනය ශික්ෂණ රෝහලෙහි වාට්ටු නවීකරණය කර තීන්ත ආලේප කිරීම, යාපනය වාවකච්චේරි ප්‍රදේශයේ වාට්ටු සංකීර්ණයට විදුලි සෝපාන පද්ධතියක් ස්ථාපනය කිරීම, යාපනය දිස්ත්‍රික්කයේ කරවෙඩ්ඩි ප්‍රදේශයට ප්‍රාදේශීය රෝහලක් ඉදිකිරීම, වවුනියාව රෝහලෙහි වාට්ටු සංකීර්ණය හා කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ රෝහල් සංකීර්ණය නවීකරණය කිරීම, තෙලිප්පලෙයි රෝහලෙහි ජල සම්පාදන පද්ධතිය හා කසළ අපවහන පද්ධතිය සුනාරුක්ථාපනය කිරීම, වවුනියාව මූලික රෝහලට විදුලි සෝපාන පද්ධතියක් ලබාදීම හා මන්නාරම දිස්ත්‍රික් රෝහලට වෛද්‍ය උපකරණ ලබාදීම. ගිලන් රථ, වෛද්‍ය උපකරණ ලබාදීම, මන්නාරම රෝහල සඳහා විශේෂ ළදරු ඒකකයක් ඉදිකිරීම හා කිළිනොච්චිය රෝහල සඳහා මෘත ශරීරාගාරයක් ඉදිකර දීම.	4275.80	3980.14	2359.67	10615.61	උතුරු පළාතේ සමස්ත ජනගහනය
18	අධ්‍යාපනික	පාසල් නිල ඇඳුම්, පොත්පත්, ලබා දීම, පාසල් ගොඩනැගිලි නවීරණය, කොරතුරු තාක්ෂණික උපකරන ලබාදීම, ද්වීකීයික අධ්‍යාපනික කටයුතු හා පරිගණක මධ්‍යස්ථාන ඉදිකිරීම.	833.69	1074.39	1508.33	3416.41	උතුරු පළාතේ සමස්ත ශිෂ්‍ය ප්‍රජාව
19	සමාජීය, සංස්කෘතික හා අධ්‍යාත්මික සංවර්ධනය	තිරුකේස්වරම් කෝවිල,වල්ලිපුරම් ආල්වාර් කෝවිල, මාවිද්දපුරම් කන්දස්වාමි කෝවිල, සෙල්වා සන්නිදි මුරුගන් කෝවිල, කිළිනොච්චි කන්දස්වාමි කෝවිල, මුස්ලිම් ආගමික ස්ථාන , නාගදීප ජැටිය ප්‍රතිසංස්කරණය හා භික්ෂු කෝවිල් 294 ක් ප්‍රතිසංස්කරණය කිරීම, යාපනය දිස්ත්‍රික්කයේ සංස්කෘතික මධ්‍යස්ථාන හා බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම.	806.47	498.13	323.22	1627.82	හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානි හා මුස්ලිම් අගමිකයන්.
සමාජීය යටිතල පහසුකම් (උප එකතුව)			***5915.96***	***5552.66***	***4191.22***	***15659.84***	
රිපාලන පොදුකාර්යය							
20	දිස්ත්‍රික් පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම	පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීම (අධ්‍යාපනික, ප්‍රාදේශීය ලේකම් කාර්යාල), යාපනය දිස්ත්‍රික්කයේ තක්ත්ව පාලන ගොඩනැගිලි,වාවකච්චේරි ,කයිට්ස් ප්‍රදේශ වල උසාවි සංකීර්ණ ඉදිකිරීම හා යාපනය,කිළිනොච්චි, මුලතිවු ,වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි වඩු කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම.	221.65	272.63	821.65	1315.93	උතුරු පළාතේ; සමස්ත ජනගහනය
21	වෙනත්	සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය අමුදුව්‍ය සම්පාදනය (කළගල්)	365.82	57.42	399.47	822.71	ඉදිකිරීම් අමුදුව්‍ය සම්පාදනය
පරිපාලන පොදු කාර්යය (උප එකතුව)			***587.47***	***330.05***	***1221.12***	***2138.64***	
මුළු එකතුව			**31113.68**	**65005.18**	**61164.44**	**161321.61**	

ඇමුණුම් අංක 3

නැගෙනහිර නවෝදය
ආයෝජන සහ ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් - 2010- 2012

අනු අංකය	අංශය / සංරචකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	සමස්ථ ආයෝජනය (රු. මී.) 2010	සමස්ථ ආයෝජනය (රු.මී.) 2011	සමස්ථ ආයෝජනය (රු.මී.) 2012	සමස්ථ ආයෝජනය යන්හි එකතුව (රු.මී.) 2010 -2012	ප්‍රතිලාභ
කෘෂිකාර්මික අංශය							
1	වාරි මාර්ග	රූගම්, පුලුනුගම්, මඩකලපුව, කරවහුව, බොරපොල, මොටවැව, කරුන්කුපන්චම්, ආදී ප්‍රධාන වැව් 59 ප්‍රතිසංස්කරණය කිරීම.	545.08	1445.97	475.99	2467.04	නැගෙනහිර පළාත් ගොවි ජනතාවට කෘෂිකාර්මික කටයුතු සඳහා ජල පහසුකම් සැපයීම.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

2	කෘෂිකාර්මික අංශය	අපි වවමු රට නගමු වැඩසටහන, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආදර්ශ කෘෂිකාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීම, මඩකලපුව දිස්ත්‍රික්කයේ තිරසාර කෘෂිකාර්මික හා ජල කලමනාකරණ ව්‍යාපෘතිය ,ආදර්ශ ගම්මාන වැඩසටහන, නැගෙනහිර පළාත් ආහාර සුරක්ෂිත කිරීමේ වැඩසටහන	1444.06	220.96	153.62	1818.64	නැගෙනහිර පළාත් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා ආර්ථිකය තත්වය ඉහල නැංවීම , රටේ සමස්ථ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමට දායකවීම
3	ධීවර කර්මාන්තය	ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීම හා ධීවර කර්මාන්තයේ නියැලෙන්නන් සඳහා අවශ්‍ය බෝට්ටු ආදි ආම්පන්න ලබා දීම,	372.44	12.33	70.66	455.43	නැගෙනහිර පළාත් ජනතාවගේ පෝෂණ තත්වය ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම
4	පශු සම්පත් සංවර්ධන අංශය	පශු සම්පත් ගම්මාන 22 ක් සංවර්ධනය කිරීම , සත්ත්ව අභිජනන මධ්‍යස්ථාන 69 සංවර්ධනය කිරීම, කිරි අලෙවිසල් 24 ස්ථාපිත කිරීම, කුකුළු පැටවුන් ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීම හා ජීව වායු ඒකක 16 ස්ථාපිත කිරීම	28.85	15.65	18.55	63.05	නැගෙනහිර පළාත් ජනතාවගේ පෝෂණ තත්වය ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම
කෘෂිකාර්මික අංශය (උප එකතුව)			***2390.43***	***1694.91***	***718.82***	***4804.16***	

9

කර්මාන්ත හා සංචාරක							
5	කර්මාන්ත, ග්‍රාමීය කුඩා කර්මාන්ත හා සමුපකාර	ත්‍රිකුණාමලය ආයෝජන කලාපය, හස්ත කර්මාන්ත සංවර්ධනය , උසස් තාක්ෂණ පුහුණුවීම් ලබාදීම , ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ,ආරියම්පත්තු, නවතනවේලයි යන ගම්මාන හස්ථ කර්මාන්ත ගම්මාන ලෙස සංවර්ධනය කිරීම.	283.23	259.21	279.92	822.36	නැගෙනහිර පළාත් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම
6	සංචාරක (පුද්ගලික අංශයේ ආයෝජනය)	රු.මි. 6,533 ක් ආයෝජනය කරමින් පාසිකුඩා සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම, රු.මි. 850 ක් ආයෝජනය කරමින් කුච්චිවේලි සංචාරක නිකේතනය සංවර්ධනය කිරීම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 18 ක්, අම්පාර දිස්ත්‍රික්කයේ 24 ක් හා මඩකලපුව දිස්ත්‍රික්කයේ 03 ක් ලෙස එක් වහලක් යට පහසුකම් සැලසීමේ ඒකක ස්ථාපිත කිරීම					මෙම ප්‍රදේශවල ගොවීන් හා රුකියා විරහිත තරුණ කොටස් සඳහා ප්‍රතිලාභ ලබාදීම
කර්මාන්ත හා සංචාරක (උප එකතුව)			***283.23***	***259.21***	***279.92***	***822.36***	
ජනතාව පදිංචි කිරීම							
7	ජනතාව පදිංචි කිරීම	පදිංචිකරනු ලබන ජනතාව සඳහා අවශ්‍ය මූලික පහසුකම් ඇති කිරීම හා පිසිනලද ආහාර ලබා දීම.	1223.35	97.65	12.83	1333.83	
8	සහනාධාර ලබාදීම	මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය , අධ්‍යාපනය සඳහා ආහාර, වැඩ සඳහා ආහාර / පුහුණුව සඳහා ආහාර ආබාධිත පුද්ගලයන් පෝෂණය කිරීම	939.44	884.55	9.41	1833.40	පුද්ගලයින් 1,100,939 සඳහා ප්‍රතිලාභ ලබාදීම
9	නිවාස පහසුකම්	උතුරු නැගෙනහිර නිවාස වැඩසටහන , සමෘද්ධි නිවාස වැඩසටහන, සුනාමි නිවාස වැඩසටහන,ඉරාන නිවාස වැඩසටහන,සෙවන නිවාස අධාර	7680.30	636.82	543.32	8860.44	නිවාස 6872 ඉදි කිරීම මගින් නිවාස නොමැති ජනතාවට නිවාස පහසුකම් ලබාදීම
10	ජලසම්පාදනය	නැගෙනහිර පළාත් ජලසම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය (අම්පාර,මඩකලපුව දිස්ත්‍රික්ක වල ද්විතික නගර හා ග්‍රාමීය ප්‍රජාව මූලික කොටගෙන ක්‍රියාත්මක කිරීම) ළිං 76 ඉදි කිරීම හා කි.මී. 17. 26 ක නල පද්ධතිය ඉදි කිරීම				6487.86	පුද්ගලයින් 200,000 සඳහා සුරක්ෂිත පානීය ජලය ලබදීම
ජනතාව පදිංචි කිරීම (උප එකතුව)			***9843.09***	***1619.02***	***565.56***	***18515.53***	

ආර්ථික යටිතලපහසුකම්							
11	විදුලිබල හා බලශක්ති	විදුලිමුලංකා ව්‍යාපෘතිය, ට්‍රාන්ස්ෆෝමරයක් සවිකිරීම	2750.40	1051.60	1542.58	5344.58	නැගෙනහිර පළාතේ ජනතාව
12	විදුලි සංදේශ	අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය පාසල් සඳහා පරිගණක විද්‍යාගාර	0.25	7.48	77.40	85.13	සිසුන් 26000 ක්
ආර්ථික යටිතලපහසුකම් (උප එකතුව)			*2750.65*	*1059.08*	*1619.98*	*5429.71*	
ගමනාගමනය							
13	බස් ගමනාගමනය (සි ටී බී)	අලුත්බස් සැපයීම, බස් අලුත්වැඩියාව, බස් ඩිපෝ ඉදිකිරීම		37.27	109.32	146.59	අලුත්බස් 28, අලුත්වැඩියාකර න ලද බස්.44, නැගෙනහිර පළාතේ ජනතාව
14	ග්‍රාමීය මාර්ග	අලුත්වැඩියාකල ග්‍රාමීය මාර්ග කි .මී 563.44, කුඩා ග්‍රාමීය පාලම 55	1110.95	3496.59	9045.74	I3653.28	නැගෙනහිර පළාතේ ජනතාව
15	පළාත් මාර්ග	අලුත්වැඩියාකරන ලද ග්‍රාමීය මාර්ග කි.මී. 354	2995.70	3381.90	3651.82	10029.42	නැගෙනහිර පළාතේ ජනතාව
16	මාර්ග හා පාලම (අධිවේගි)	අලුත්වැඩියාකරන ලද ඒ බී වර්යේ මාර්ග කි. මී. 238, මාර්ග 6ක් ගොඩනැගීම උදා : කල්අඩි පාලම		4793.21	11523.45	16316.66	නැගෙනහිර පළාතේ ජනතාව
ගමනාගමනය (උප එකතුව)			*4106.65*	*11708.97*	*24330.33*	*40145.95*	
සමාජ යටිතලපහසුකම්							
17	සෞඛ්‍ය	පදියතලාව රෝහල සඳහා වෛද්‍ය උපකරණ ලබාදීම, රෝහල් ප්‍රතිසංස්කරණය , ත්‍රිකුණාමලය ශික්ෂණ රෝහලේ වාට්ටුවල තිත්ත ආලේපකිරීම, ත්‍රිකුණාමලය රෝහල සඳහා කි. වෝ. 500 ක ට්‍රාන්ස්ෆෝමරයක් ඉදි කිරීම	506.64	309.11	280.95	1096.70	නැගෙනහාර පලාතේ ජනතාව
18	අධ්‍යාපන	පසල් නිළ ඇදුම් ලබාදීම,පාසල් පෙළපොත් ලබාදීම,පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම,පරිගණක උපකරණ ලබාදීම,විශේෂ දිවිහිමික පාසල් සංවර්ධන වැඩසටහන හා පරිගණක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම	1296.77	940.24	2442.03	4679.04	නැගෙනහාර පලාතේ පාසල් සිසුන්
19	සමාජ,සංස්කෘතික හා සුභසාධන සංවර්ධනය	මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරියම්පති හා පාතලායි සංස්කෘතික මධස්ථාන ඉදි කිරීම, අම්පාර දිස්ත්‍රික්කයේ බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීම	187.38	35.29	65.15	287.82	නැගෙනහිර පලාතේ ජනතාව
සමාජ යටිතල පහසුකම් (උප එකතුව)			*1990.79*	*1284.64*	*2788.13*	*6063.56*	
පරිපාලන වියදම්							
20	ශක්තිමත් කරනලද දිස්ත්‍රික් පරිපාලනය	ගෙඩනැගිලි තත්ත්ව පාලන රසායනාගාර, පෙදරේරු සහ වඩු සුභුණුව	128.81	3.59		132.40	නැගෙනහිර පළාතේ ජනතාව
21	වෙනත්	උපස්ථම්භක පොදු ක්‍රියාකාරකම්	597.66	255.98	799.30	1652.94	නැගෙනහිර පළාතේ ජනතාව
පරිපාලන වියදම් (උප එකතුව)			*726.47*	*259.57*	*799.30*	*1785.34*	
මුළු එකතුව			**22091.31**	**17885.40**	**31,102.04**	**77,566.36**	

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උතුරේ සංවර්ධනය සඳහා පිට රටින් ලැබෙන ආධාර - grants - ප්‍රමාණය නොවෙයි, පරිත්‍යාග ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා, රුපියල් මිලියන 12,000 සිට-රුපියල් මිලියන 8,000 දක්වාත්, රුපියල් මිලියන 7,000 දක්වාත්. ඒ වාගේම ඔබතුමන්ලාගේ රජයෙන් ඒ සඳහා වෙන් කරලා තිබෙන මුදලත් අඩු වෙලා තිබෙනවා. පළාත් සභා ඡන්දයක් පවත්වන්න තිබෙන මේ වාගේ අවස්ථාවක ඉඩම් ප්‍රශ්න සහ තවත් ප්‍රශ්න තිබෙනවා කියලා ආණ්ඩුවක් වශයෙන් ඔබතුමන්ලා පෙන්වන්න හදනවා. මේ සංවර්ධන කටයුතු කරන අවස්ථාවල ඒ වාගේ ප්‍රශ්න තිබුණේ නැද්ද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
මේ ප්‍රශ්නයට ඒක අදාළ නැහැ. ඉඩම් බලතල, පොලිස් බලතල ගැන දැන් අහන්න බැහැ. ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා මේ ප්‍රදේශ සංවර්ධනය කරනවා නම්, ඒ සංවර්ධනය අහසේ කරන්න බැහැ නේ. ඉඩම්වල නේ සංවර්ධන කටයුතු කරන්නේ. අද ඉඩම් සම්බන්ධයෙන් භීතිකාවක් හදලා බිල්ලෝ මවන කොට මේ සල්ලි වියදම් කරන්නේ-

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේගේ ප්‍රශ්නයට මම පිළිතුරු දුන්නා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පිළිතුර දුන්නේ නැහැ. පිළිතුරේ යම් කොටසක් කිව්වා. ඔය පිළිතුරේ මොනවාද තිබෙන්නේ කියලා මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ප්‍රදේශ සංවර්ධනය සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා නේ. මේ අවස්ථාව ඉඩම් සම්බන්ධ ප්‍රශ්න තිබෙන අවස්ථාවක් කියලා පෙන්වන ඔබතුමන්ලාට, ඒ සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කරන කොට එවැනි ප්‍රශ්නයක් ඇති වුණාද, නැද්ද? මම අහන ප්‍රශ්නය බොහොම සරලයි.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ ගැන වෙනම ප්‍රශ්නයක් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උතුරු වසන්තයට මුදල් වෙන් කරලා ඒ ප්‍රදේශවල ගෙවල් හදනවා නම්, ඒ ගෙවල් හදන්නේ ඉඩම්වල නේ. අහසේ නොවෙයි නේ. දැන් මේ පළාත් සභා පිළිබඳව ඔබතුමන්ලා බිල්ලෙක් මවනවා නේ. ඔය මවන බිල්ලා ප්‍රශ්නයක් වශයෙන් ඇත්තටම උතුරේ තිබෙනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේ කියන්නේ මේ ප්‍රදේශවල සංවර්ධන කටයුතු කරන්න එපා කියලාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගෙන් අහන දේට නොවෙයි නේ පිළිතුරු දෙන්නේ. ඔබතුමන්ලා මෙතැන ලොකු ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා. ඒ උතුරු පළාත් සභාවට ඡන්දයක් පවත්වන්න ඕනෑය කියලා දැන් තීරණය කරලා තිබෙනවා. නැති ප්‍රශ්නයක් ඇති කරලා තව ප්‍රශ්න ඇති කරන්නේ ඇයි කියලා තමයි අපි අහන්නේ.

මේක ඕනෑ නැත්නම් තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා, අහෝසි කරන්නකෝ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේට නැති ප්‍රශ්න අහලා හොඳට පුරුදුයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේක විවාදයක් නොවෙයි. අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විවාදයට තුඩු දෙන කරුණු තමයි මෙතුමා කියන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
පිළිතුරු දුන්නා. මෙතුමා ඉඩම් බලතල පොලිස් බලතල ගැන අහනවා, මගෙන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම පොලිස් බලතල ගැන ඇහුවේ නැහැ නේ. මම ඇහුවේ ඉඩම් බලතල ගැන. මම ප්‍රශ්න අහන විට බොහොම ප්‍රවේශමෙන් අහන්නේ. මම අහන්නේ ඉඩම් බලතල ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. ඉන්දියාවෙන් ගෙවල් 50,000ක් හදනවාලු. මේ ව්‍යාපෘතිවලට ඒකත් ඇතුළත් කර තිබෙනවාද? නැත්නම් ඒක මේ ව්‍යාපෘතිවලට පරිබාහිරව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක්ද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
විදේශ ආධාර ප්‍රදාන කියන්නේ ඒ ඔක්කොම තමයි. සියලුම රටවලින් දෙන විදේශ ආධාර. ඉන්දියාව කියලා වෙන් කර නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන් වන අතුරු ප්‍රශ්නය.

මේ රටේ ගෙවල් 50,000ක් හදන්න ඉන්දියාවෙන් ලැබිලා තිබෙන ආධාර ප්‍රමාණයට වැඩිය වියදම් කරනවා. එහෙම නම් ඒ පළාත සංවර්ධනය කිරීම ඉන්දියාවට භාර දීලා ආණ්ඩුව මොකුත් කරන්නේ නැතුව ඉන්නවාද? ආණ්ඩුව තුළින් ඔබතුමන්ලා ගෙවල් කීයක් හදලා තිබෙනවාද? උතුරු වසන්තය තුළින් ඔබතුමන්ලා ගෙවල් කීයක් හදලා තිබෙනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඒ ප්‍රශ්නය මේ ප්‍රශ්නයෙන් අහලා නැහැ. ඔබතුමා අහන්න ඕනෑ කෙනාගෙන් නොවෙයිනේ මේ ප්‍රශ්නය අහන්නේ. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය තිබෙනවා. තවත් අමාත්‍යාංශ තිබෙනවා. ඒ අදාළ අමාත්‍යාංශවලින් අහන්න. තමුන්නාන්සේ අහලා තිබෙන ප්‍රශ්නවලට උත්තර අපි සපයනවා. නිවාස ඇමතිතුමාගෙන් අහන ඒවා මගෙන් අහලා හරි යන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උතුරු වසන්තයෙන් කළ සංවර්ධන වැඩ කටයුතු මොනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැවත පදිංචි කිරීමේ ඇමතිතුමාගෙන් ඇසිය යුතු දේවල් මගෙන් අහලා වැඩක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහන්නේ ඔබතුමන්ලා ගෙවල් කීයක් හදලා තිබෙනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔබතුමන්ලා අහන්න ඕනෑ කෙනාගෙන් නොවෙයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ. ඔබතුමා අපට ඉදිරිපත් කළ ප්‍රශ්නවලට අපි උත්තර සපයනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි උත්තර දෙන්න බැරි නම් පිටු ගණනින් උත්තර කියලා වැඩක් නැහැ. පෙනෙන්න නැති දෙයක් තමයි ඔබතුමා පිටු ගණනකින් කියලා තිබෙන්නේ.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
එහෙම ප්‍රශ්නයක් තමුන්නාන්සේ අහලා නැහැ. අහලා තිබෙනවා නම් මම කොරතුරු අරගෙන එන්නම්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9 - 2504/'12- (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් මා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ටෙස්ට් ක්‍රිකට් තරගාවලිය : ටිකට් පත් අළෙවිය
டெஸ்ட் கிரிக்கட் போட்டித் தொடர்: டிக்கெட் விற்பனை
TEST CRICKET MATCH SERIES : SALE OF TICKETS

2634/'12

10. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2012 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වූ ටෙස්ට් ක්‍රිකට් තරගාවලියට ඇතුළත් වූ තරග සංඛ්‍යාව කොපමණද;
(ii) එම තරග පැවත්වූ ක්‍රීඩාංගණ කවරේද;
(iii) එම එක් එක් ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂකාගාරයේ ඇති ආසන සංඛ්‍යාව කොපමණද;
(iv) එම ක්‍රීඩාංගණවල ප්‍රේක්ෂකාගාරවල ආසන සඳහා අය කරනු ලැබූ ගාස්තු කවරේද;
(v) මෙම තරගමාලාව නැරඹීම සඳහා අළෙවි කළ එක් ටිකට්පතක මිල කොපමණද;
(vi) එම ටිකට්පත වලංගු වූ කාල සීමාව කවරේද;
(vii) ඉහත ක්‍රීඩාංගණවල එක් ප්‍රේක්ෂක ආසනයක් සඳහා රු. 5000.00ක අවම මුදලක් අයකර තිබේද;
(viii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

විළයාට්ටුත්තුරෙ අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) 2012ஆம் ஆண்டின் மார்ச் மற்றும் ஏப்பிரல் மாதங்களில் இலங்கையில் நடத்தப்பட்ட டெஸ்ட் கிரிக்கட் போட்டித் தொடரில் உள்ளடங்கிய போட்டிகளின் எண்ணிக்கை யாவையென் பதையும்;
(ii) மேற்படி போட்டிகள் நடாத்தப்பட்ட விளையாட்டரங்குகள் யாவையென்பதையும்;
(iii) மேற்படி ஒவ்வொரு விளையாட்டரங்கிலும் பார்வையாளர் கூடங்களிலுள்ள ஆசனங்களின் எண்ணிக்கை யாவையென்பதையும்;
(iv) மேற்படி விளையாட்டரங்குகளில் ஆசனங்களுக்காக அறவிடப்பட்ட கட்டணங்கள் யாவை யென்பதையும்;
(v) இப்போட்டித் தொடரைக் கண்டுகளிப்பதற்காக சந்தைப்படுத்திய டிக்கெட் ஒன்றின் விலை யாதென்பதையும்;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(vi) மேற்படி டிக்கெட்டின் செல்லுபடியாகும் காலப்பகுதி யாதென்பதையும்;

(vii) மேற்படி விளையாட்டரங்குகளில் பார்வையாளர் ஆசனமொன்றுக்கான குறைந்தபட்ச பணத் தொகையாக ரூபா 5000.00 அறவிடப் பட்டுள்ளதா என்பதையும்;

(viii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports :

(a) Will he inform this House of -

(i) the number of matches included in the test cricket match series held in Sri Lanka in the months of March and April in the year 2012;

(ii) the stadiums in which the aforesaid matches were played;

(iii) the number of seats available in the spectators' stands in each of the aforesaid stadiums;

(iv) the amounts charged for the seats in the spectators' stands in the aforesaid stadiums;

(v) the price of one ticket for watching this match series;

(vi) the period of time for which the aforesaid ticket was valid;

(vii) whether a minimum amount of Rs. 5,000 has been charged for one seat at the spectators' stands in the aforesaid stadiums; and

(viii) if so, the reasons for it?

(b) If not, why ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) එංගලන්ත සංචාරයේ ටෙස්ට් තරග 2ක්.

(ii) ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය - පළමු තරගය

පී. සරවනමුත්තු ක්‍රීඩාංගනය - දෙවන තරගය

(iii) ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය - ආසන සංඛ්‍යාව 9,250යි. පී. සරවනමුත්තු ක්‍රීඩාංගනය - ආසන සංඛ්‍යාව 4,800යි.

(iv) ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය - ආසන සඳහා අය කරනු ලැබූ ගාස්තු

රු.100.00, රු. 250.00, රු. 300.00, රු. 1,000.00, රු. 1,500.00, රු. 5,000.00, රු. 7,500.00

පී. සරවනමුත්තු ක්‍රීඩාංගනය - ආසන සඳහා අය කරනු ලැබූ ගාස්තු

රු. 250.00, රු. 1,500.00, රු. 5,000.00, රු. 6,000.00, රු. 7,500.00

(v) ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගනය - එක් ටිකට් පතක මිල

රු. 100.00, රු. 250.00, රු. 300.00, රු. 1,000.00,

රු. 1,500.00, රු. 5,000.00, රු. 7,500.00

පී. සරවනමුත්තු ක්‍රීඩාංගනය - එක් ටිකට් පතක මිල

රු. 250.00, රු. 1,500.00, රු. 5,000.00, රු. 6,000.00, රු. 7,500.00

(vi) එක් දිනකට පමණි.

(vii) ඔව්.

(viii) විශේෂයෙන් විදේශිකයින්ගෙන් පැවති දැඩි ඉල්ලුම නිසා මෙම මුදලට ටිකට් පත් අළෙවි කරන ලදී.

(ආ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, විශේෂයෙන් ඕස්ට්‍රේලියා - ශ්‍රී ලංකා තරගාවලියේදී ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මේක Australia Tour එක නොවෙයි, England Tour එක.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, England Tour එක. ඇයි, ඒකෙදී රුපියල් 5,000කට ටිකට් පත් අළෙවි කළේ? ගරු ඇමතිතුමනි, මොකද හේතුව, tickets විකුණන්න තිබෙන කවුන්ටරයෙන් ඔබතුමා දැන් කියපු ගණන්වලට tickets විකුණන්නේ නැතුව ඊට අමතරව tickets එළියට අරගෙන ඒවා රුපියල් 5,000 ගණනේ සහ ඊටත් වැඩි මුදලකට විකුණා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, එහෙම වුණේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් රුපියල් 5,000ට විකුණුවේ ඇයි?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක තමයි අපේ මිල.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ tickets එළියට අරගෙන ගිහිල්ලා විකුණුවේ නැහැ කියලාද ඔබතුමා කියන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මගේ උත්තරයේ සඳහන් වන විධියට අපි රුපියල් 5,000ට නොවෙයි, රුපියල් 7,500ටත් tickets විකුණුවා. England tour එකේදී විතරයි අපි එහෙම කළේ. ඒකෙදී අපට ලොකු ඉල්ලුමක් තිබුණා. එංගලන්ත කණ්ඩායම සමඟ ක්‍රිකට් තරගාවලියක් තිබුණොත් ඒ තරගාවලිය බලන්න වෙනම කණ්ඩායමක් එනවා. ලංකාවේ අයට අපි බොහොම අඩුවෙන් - රුපියල් 100ට- ටිකට් දුන්නා. විදේශිකයෝ රුපියල් 7,500ක් දීලා බැලුවා. ඒකයි තත්ත්වය. ලංකාවේ අය නොමිලේත් ඇතුළු කළා. ඔබතුමා දකින්න ඇති, කිසිම දේශීය ප්‍රේක්ෂකයෙකුට ප්‍රශ්නයක් වුණේ නැහැ. අපි නොමිලේත් අවස්ථාව දුන්නා. මොකද, එංගලන්තයේ ඉඳලා කණ්ඩායමක් එනවා කෙහෙළිය ඇමතිතුමනි. මට හරියට මතක නැහැ. මොකක්ද, ඒ ගොල්ලන්ට කියන්නේ? [බාධා කිරීමක්] Barmy Army. ඒ කට්ටිය එනවා මේ තරගාවලි බලන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි, කෙහෙළිය ඇමතිතුමාගෙන් ඇහුවේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි දෙන්නාගේ මනාප ගණන එකයිනේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බලන්න, කෙහෙළිය ඇමතිතුමනි, ඔබතුමාව පටලවන හැටි. ඒක හොඳ නැහැනේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමා මගේ මේ මිත්‍රයා. බොහොම අමාරුවෙන් ඡන්දයෙන් පස්සේ යාළු කර ගෙන ඉන්නවා, ආයෙත් තරහා කරන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කාදර් නියෝජ්‍ය ඇමතිතුමාටත් ඕකම කිව්වා නම් හරි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් අතුරු ප්‍රශ්න ඉවරයිනේ. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසානයේ අතුරු ප්‍රශ්න නැත. ප්‍රශ්න විසඳී ඇත, ගරු මන්ත්‍රීතුමා.

සම්පත්නුවර රෝහල : සම්පත් ඌනතාවන්
சம்பத்நுவர வைத்தியசாலை: வளப் பற்றாக்குறை
SAMPATHNUWARA HOSPITAL : RESOURCE DEFICIENCIES

2515/'12

12. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර රෝහලේ භෞතික සහ මානව සම්පත් ඌනතාවන් රැසක් පවතින බව පිළිගන්නේද;

(ii) එම රෝහලේ පවතින භෞතික සහ මානව සම්පත් ඌනතාවන් සහ අඩු පාඩු කවරේද;

(iii) එම අඩු පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மாகாணத்தின் சம்பத்நுவர வைத்தியசாலை யில் பல்வேறு பௌதீக, மனித வள பற்றாக்குறைகள் காணப்படுவதை ஏற்றுக் கொள்கின்றாரா என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலையில் காணப்படும் பௌதீக, மனித வள பற்றாக்குறை, குறை பாடுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி குறைபாடுகளை நிவர்த்தி செய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனின், இதற்காக எடுக்கும் காலம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

]

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) whether he admits that there are many physical and human resource deficiencies in Sampathnuwara Hospital in the Northern Province;

(ii) the physical and human resource deficiencies and the shortcomings that exist in the aforesaid hospital;

(iii) whether action will be taken to address the aforesaid shortcomings; and

(iv) if so, of the time required for that purpose?

(b) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) වෛද්‍ය නිලධාරීන්, පරිපූරක වෛද්‍ය හා අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල හිඟයක් පවතී. ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීමට දැනට පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවේ.

(iii) ඔව්.

(iv) 2013 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවක සංඛ්‍යාව අනුමත කිරීමෙන් අනතුරුව සියලුම කාර්ය මණ්ඩල ගණන සම්බන්ධයෙන් පවතින පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. එසේම අත්‍යවශ්‍ය ගොඩනැඟිලි කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීමටද කටයුතු කර ඇත.

(ආ) පැන නොනඟී.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා (අ) (ii) කොටසට දුන්නු උත්තරය මට ඇහුණේ නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

රෝහලේ වෛද්‍ය නිලධාරීන්, පරිපූරක වෛද්‍ය හා අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල අඩු පාඩුවක් පවතිනවා. ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීමට දැනට පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නැහැ. ඒ කියන්නේ, දැනට යම් යම් අඩු පාඩු තිබෙනවා. ඒ අඩු පාඩු එක්ක තමයි රෝහල පවත්වා ගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම රෝහල අයත් වන්නේ පළාත් සභාවට. රෝහලට 2012 වර්ෂයේදී පළාත් සභාව විසින් රුපියල් මිලියන 10,725ක පිරිවැයකින් යුතුව හෙද නිල නිවාස ඉදි කර දී තිබෙනවා. ළිඳක් ඉදි කර දී තිබෙනවා. රුපියල් බිලියන 1,882ක් තමයි එහි මුළු පිරිවැය. ජාත්‍යන්තර වෛද්‍ය කණ්ඩායමක් විසින් රෝහලට ගිලන්රථයක් ලබා දී තිබෙනවා. ඒ වාගේම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 12ක මුළු පිරිවැයකින් යුතුව දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි හා වෛද්‍ය නිලධාරි නිල නිවාස ඉදි කිරීම සඳහා දැනට වැඩ ආරම්භ කර තිබෙනවා. මාතෘ වාට්ටුව ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 15ක් වෙන් කර තිබෙනවා. දැන් එම කටයුතු ආරම්භ කරලා, එහි වහලය දක්වා වැඩ කර තිබෙනවා. ඊළඟට, අභ්‍යන්තර මාර්ගය, තාප්පය ඇතුළු රෝහලේ ගොඩනැඟිලි. මෙයින් තාප්පයේ කටයුතු හතරෙන් එකක් පමණ නිම කර තිබෙනවා. මාර්ගයේ කටයුතුත් භාගයක් පමණ නිම කර තිබෙනවා. ඊළඟට සුළු සේවක නිල නිවාස අලුත්වැඩියා කිරීමට රුපියල් මිලියන 3ක් වෙන් කර තිබෙනවා. දැන් එම නිල නිවාස 2ක් පමණ අලුත්වැඩියා කර තිබෙනවා. ඊට අමතරව ඒඩ්ස්, ක්ෂය රෝග හා මැලේරියා, බාහිර රෝගී - OPD - අංශයටත් රුපියල් මිලියන 26ක් වැය කර එම අංශයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර තිබෙනවා. ඒ විධියට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතිනවා. දැනට ඉන්නේ එක වෛද්‍යවරයෙක් පමණයි. වෛද්‍යවරු තුන් දෙනෙකු අවශ්‍ය තැන ඉන්නේ එක වෛද්‍යවරයයි. අලුත් පත්වීම් ලබා දෙන කොට ඒ රෝහලට වෛද්‍යවරයකු ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ රෝහල ගත්තාම නේවාසිකව ඉන්නේ 55 දෙනයි. බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ගන්නේ 120යි. අපට දැන් ඒ රෝහලෙන් ජනතාවට පහසුකම් සපයන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා දන්නවා, මම මේ කථා කරන්නේ යුද සමයේ රුදුරු කොටි ත්‍රස්තවාදයෙන් බැට කෑපු ප්‍රදේශයක් පිළිබඳව බව. විශේෂයෙන්ම මේ මුදා ගත් ප්‍රදේශයේ පවතින ජනගහනයට අමතරව තවත් 3,000කට වැඩි ප්‍රමාණයක් නැවත පදිංචි කරවා තිබෙනවා. එතකොට මේ රෝහලෙන් ලබා දුන් සේවාව ඉහළ නංවන්නට කාලය ඇවිල්ලායි තිබෙන්නේ. ඔබතුමා කිව්වා වාගේ 11,000ක් පමණ වූ සාමාන්‍ය ජනගහනයටත්, අලුතෙන් නැවත පදිංචි කරවලා සිටින 4,000ක පමණ සංඛ්‍යාවකටත් හැම දේටම ඉන්නේ එක වෛද්‍යවරයායි.

ඔබතුමන්ලා උතුරු වසන්තයක් ගැන කථා කරනවා. මේ සම්පත්නුවර රෝහලට ඒ වසන්තය උදා වෙන්නේ කවදාද, ඒ රෝහලේ ඌනතාවන් -භෞතික සහ මානව සම්පත් ඌනතාවන්- විසඳන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද කියා මා ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මේ ප්‍රදේශවලට වසන්තය උදා කළේ අපේ නායකතුමා වන අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. මේ ප්‍රදේශවලට වෛද්‍යවරයෙකු නොවෙයි, මැක්කෙකුටවත් යන්න බැරි තත්ත්වයක් තිබුණා, ප්‍රභාකරන් සිටි කාලයේ. තමුන්නාන්සේගේම කටින් කිව්වා, මේ රෝහල යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවට, අපේ මැරුණු, අතපය නැති වුණු අපේ යුද හමුදාවේ සෙබළුන්ට ප්‍රතිකාර කරපු රෝහලක්ය කියා. අද අපේ අතිගරු ජනාධිපතිතුමා විසින් ඒ කොටි ත්‍රස්තවාදය නැති කරලා තිබෙනවා. ඒක තමයි පළමුවැනි ජයග්‍රහණය.

ඒ පළාතේ රෝහල් 400 ගණනක් විතර වසා දමා තිබුණා. ඒ පළාත්වලට වෛද්‍යවරුන්ට යන්න බැරි තත්ත්වයක් තිබුණා. සමහර වෛද්‍යවරු මැරුවා. නමුත් දැන් අපි ඒ රෝහල්වලට වෛද්‍යවරු ලබා දෙනවා. පළාත් සභාවෙන් විශාල සම්පත් ප්‍රමාණයක් දීලා මේ රෝහල සංවර්ධනය කරගෙන යනවා. හෙට, අනිද්දා වන විට අලුත් පත්වීම් ලබන වෛද්‍යවරයෙකුත් මේ රෝහලට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. සියල්ල එක වරම කරන්න බැහැ. නැවත පදිංචි කරවන කොට ඒ අයට මේ සම්පත් ලබා දෙන්න තමයි අපි කටයුතු කරන්නේ.

දැන් හෙද නිල නිවාස අලුත්වැඩියා කරලා තිබෙනවා. සුළු සේවක නිවාස අලුත්වැඩියා කරලා තිබෙනවා. OPD එක හදලා තිබෙනවා. පාර හදලා තිබෙනවා. ඒවාට විශාල මුදලක් වැය කරලා තිබෙනවා. ඒක තමයි යුද්ධයෙන් පස්සේ ඇති වන සංවර්ධනය. මේ රෝහලටත් ඒ තත්ත්වය ඇති කර තිබෙනවා. යුද්ධය අවසන් කරන්න ඔබතුමාගේ පියාටත් බැරි වුණා, ඔබතුමාගේ නායකතුමාටත් බැරි වුණා. නමුත් අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය අවසන් කරලා මේ රටට සාමය ගෙනාවා. සමහරවිට හෙට, අනිද්දා වන විට මේ ප්‍රශ්න අහන මන්ත්‍රීතුමන්ලාත් අපේ පැත්තට ඒවි. ඔබතුමා ඒ ගැන කනගාටු වෙන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායනතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා උදා කර තිබෙන වසන්තය තුළින් මේ රටට බාල පොහොර ගෙන්වලා -කැඩ්මියම්, ආසනික් අඩංගු පොහොර ගෙන්වලා- දැන් මේ වන විට සම්පත්නුවර බල ප්‍රදේශය බරපතළ වකුගඩු ආසාදනය නිසා විපතට පත් වුණු කොට්ඨාසයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත් මේ රෝහලේ රුධිර කාන්දුකරණය ඒ කියන්නේ hemodialysis පහසුකම් මොනවාත් නැහැ. මම වසන්තය ගැන කථා කළේ බාල පොහොර ගෙන්වලා -ආසනික්, කැඩ්මියම් අඩංගු පොහොර ගෙන්වලා- මේ රටේ ජනතාව පීඩා විඳින එක ගැනයි. දැන් රුපියල් 350ට පොහොර නැහැ. රුපියල් 1,200ටත් පොහොර නැහැ.

විශේෂයෙන්ම, විපතට පත් වූ ඒ ජනතාවට තිබෙන වකුගඩු ආසාදනය පිළිබඳ ප්‍රශ්නය විසඳන්න hemodialysis machines ලබා දෙන්නේ කවදාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරණය මේකයි. මේ ආණ්ඩුව 2005 ඉඳන් පොහොර නිකම් දෙන්නේ. නිකම් දෙන බව තමුන්නාන්සේ දන්නවා නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිකම් දෙන්නේ බාල පොහොර. ආසනික්, කැඩ්මියම් අඩංගු පොහොර.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
තමුන්නාන්සේගේ තාත්තාටත් -හිටපු ජනාධිපති ප්‍රේමදාස මහත්මයාටත්- බැරි වුණා මේ රට සහලින් ස්වයංපෝෂණය කරන්න. නමුත් අපේ අනිගරු ජනාධිපතිතුමා එය කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අර උතුරු අප්‍රිකාවෙන් ගෙන්වන බාල පොහොරයි දෙන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
2005 ඉඳන් නිකම් පොහොර ලබා දෙනවා. ඒක එක කාරණයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආසනික් පොහොර.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවටත් බැරි වුණා තමුන්නාන්සේගේ තාත්තාව ආරක්ෂා කර ගන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒ කථාව මොකක්ද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක තමයි අප කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"කොහේද යන්නේ, මල්ලේ පොල්" උත්තර නේ දෙන්නේ. උත්තර දෙන්න, ප්‍රශ්නයට අදාළව.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපි නිකම් පොහොර දීලා අද මේ රට සහලින් ස්වයංපෝෂණය කර තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔය කාර්යය කරන්න ඩී.එස්. සේනානායක අගමැතිතුමා බලාපොරොත්තු වුණා; ඩඩ්ලි සේනානායක මැතිතුමා බලාපොරොත්තු වුණා. හඳෙන් හාල් ගෙන්නලා දෙන්නම් කියලා කිව්වා. 2005 ඉඳන් විශාල මුදලක් වැය කරලා පොහොර සහනාධාරය දෙන නිසා, අද ඔය කථාව තමුන්නාන්සේලා කිව්වාට ගොවියා කියන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සජිත් ප්‍රේමදාස මහත්මයා පාර්ලිමේන්තුවේදී ඔය කථාව කිව්වාට දකුණේ ගොවියාත්, අනුරාධපුරයේ ගොවියාත් ඔය කථාව කියන්නේ නැහැ. ඒ අය අපට ඡන්දය දෙනවා. අපි ගොවියාට පොහොර ටික දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අද ගොවියා අඬනවා ගොවි විශ්‍රාම වැටුප නැතිව.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
පොඩි ප්‍රමාදයක් වුණාම, නිකම් දෙන පොහොර සම්බන්ධයෙන් වුණත් වර්ජනය කරන්න අද අයිතිය තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහන්න ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන්. අඳ ගොවියාත් අඬනවා. එහෙම නේද ගරු ඇමතිතුමනි? අඳ ගොවියාත් අඬනවා. ගරු ඇමතිතුමා, කථා කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වකුගඩු රෝගය එක දවසකින් හැදුණු රෝගයක් නොවෙයි. තමුන්නාන්සේ එය මේ ආණ්ඩුවට ආරෝපණය කරන්න එපා. අද අපි dialysis machines දීලා තිබෙනවා. Dialysis machines කියන එක හැම රෝහලටම දෙන්න අවශ්‍යතාවක් නැහැ. ඒ සඳහා අපි රෝහල් කීපයක් කේන්ද්‍රගත කරලා තිබෙනවා. තවත් machines ගෙන්නන්න අපි කටයුතු කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ, කොටින්ගෙන් බැට කෑපු සම්පත්නුවර ජනතාවට hemodialysis machines අවශ්‍ය නැහැ කියලාද?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Dialysis කරන්නේ නැතිව රෝගීන් මිය යන තත්ත්වයක් ඇති කරලා නැහැ. අපි සියලු වකුගඩු රෝගීන් සඳහා බෙහෙත් ලබා දීලා තිබෙනවා. වකුගඩු සැත්කමකට භාජනය කරන රෝගියකු මිය යන්න ඉඩ දෙන්නේ නැහැ. ඔවුන් සඳහා බෙහෙත් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. සමහර තැන්වල අඩු පාඩුකම් තිබෙනවා. අපි ඒ අඩු පාඩුකම් නිවැරැදි කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වකුගඩු රෝගීන් වැඩි වශයෙන් ඉන්න ගමට මම ගියා. ඒ ප්‍රදේශයේ අය කිව්වා, "අපට වතුර දෙන්න සර්" කියලා. අපේ ගරු ජල සම්පාදන හා ජලාපවහන ඇමතිතුමා අන්තර් කමිටුවක් හදලා තිබුණා. වතුර බවුසර් ප්‍රමාණයක් දුන්නා. දැන් අපි ඒ ප්‍රදේශයට වතුර ලබා දෙනවා. මේ වාගේ ප්‍රායෝගික ප්‍රශ්න තමයි ඒ අයට තිබෙන්නේ. ඒ හින්දා ඒ අයට වතුර ටික ලබා දෙන්න අපි කටයුතු කරනවා. අපි ඒ වාගේ ප්‍රායෝගික වැඩ සටහන් දැන් ක්‍රියාත්මක කරනවා. Hemodialysis machines හයක් ගෙන්වන්න මුදල් ප්‍රතිපාදන වෙන් කරලා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. අපි ඒවා ඉක්මනින් ගෙන්වනවා. ඒ විධියට අපි ඒ රෝගීන්ගේ ප්‍රශ්න ගැන අවධානය යොමු කරනවා. වකුගඩු රෝගය සම්බන්ධයෙන් එක එක මත තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ලෝකයේ වකුගඩු රෝගය හැදුණු ජනතාව සිටින, ඒ රෝගය සම්බන්ධයෙන් නිශ්චිත හේතුවක් තවම සොයා ගෙන නැති රටවල් තිබෙන බව. නමුත් අපි පවතින හේතුන්ට අනුකූලව කටයුතු කර තිබෙනවා. අපේ ගරු තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා වළං බෙදුවා. එතකොට සමහරු හිනා වුණා. ඒ කාලයේ ඉඳන් මේ රෝගය තිබුණා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවක් නිසා කරන කටයුත්තක් නොවෙයි මෙය. අපි ඊට පෙර ඉඳලා මේ රෝගය හඳුනා ගෙන තිබුණා. අපි 2002 දී තමයි මහනුවර රෝහලේ වකුගඩු ඒකකය ආරම්භ කළේ. අපි ඒ කාලයේ ඉඳලාම ඒ කටයුතු කර තිබෙනවා. මේ තත්ත්වය ක්ෂණිකව ඇති වූ දෙයක් නොවෙයි. තමුන්නාන්සේ ද්වේෂසහගතව, නිකම් දෙන පොහොර සමඟ වකුගඩු රෝගය ඇඳන්න හදන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිකම් දෙන පොහොර?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒකෙන් අපි ජනතාවට සහනයක් දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වග කීමෙන්ද කියන්නේ, නිකම් දෙන පොහොර කියලා?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ පොහොර සහනාධාරයේ වටිනාකම බාල කරන්න උත්සාහ කරන්න එපා, වකුගඩු රෝගයක් මෙයට සම්බන්ධ කරලා. ඒක ජනතාව විශ්වාස කරන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රුපියල් 350ට පොහොර ගන්න පුළුවන්ද? අසත්‍ය කථා කරන්න එපා, නියෝජ්‍ය ඇමතිතුමනි.

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, බොහොම කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න. දැන් අතුරු ප්‍රශ්න ඇසීම විවාදයක් කර ගෙනයි තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නවලට පිළිතුරු දෙන පුද්ගලයකු හැටියට මේ අහන ප්‍රශ්නයෙන් පැන යන්න එපා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකද, මෙය මේ රටේ ජනතාවට බලපාන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රෝහල හැදුවාට වැඩක් වන්නේ නැහැ, මේ රෝහලට යන්නේ බාල බෙහෙත් -බාල ඖෂධ- නම්. ඔබතුමන්ලා දැන දැන Dextran 40 බාල සේලයින් ගෙන්වා තිබෙනවා. මුළු රටම දන්නවා, බාල සේලයින් ගෙන්වන්නේ කියලා. මේ වරද දැන දැන මෙය ක්‍රියාත්මක කරන්නට ඔබතුමා කටයුතු කළේ ඇයි? මා දන්නවා, මෙයින් ඔබතුමාට කොමිස් මුදලක් හම්බ වෙන්නේ නැහැයි කියලා; ඔබතුමාට පංගුවක් ලැබෙන්නේ නැහැයි කියලා. ඔබතුමා පිරිසිදු දේශපාලනඥයෙක්. මා දන්නේ නැහැ, පිරිසිදුයි කියලා කියනවා. M.E. Meditec ආයතනයෙන් ගෙන්වපු Dextran 40 බාල සේලයින් බෝතල් 5,000ක් තිබෙනවා. මේවාට වැය වන සල්ලි මේ රටේ 87,00,000ක් වන බදු ගෙවන ජනතාවගේ සල්ලි. තවත් සේලයින් බෝතල් 2,960ක් තිබෙනවා, වෛද්‍ය සැපයීම් අංශ ශාලාවේ. මා ඔබතුමාගෙන් අහන්නේ, මේ බාල සේලයින් තහනම් කරන්නේ කවදාද කියලායි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දේශපාලනය පිරිසිදුයි. මගේ නිල නිවාසයේ තිබුණු දෙයක් -පින්තූර එහෙම- මා එංගලන්තයට අරගෙන ගියේ නැහැ. මගේ නම එහෙම ඉතිහාසයේ ලියවිලා නැහැ. අපි පිරිසිදුයි; එදා විධියටමයි ඉන්නේ. ඔබතුමා පිරිසිදුභාවය ගැන කථා කළ නිසායි මා කිව්වේ.

බාල බෙහෙත් නිෂ්පාදනය කරලා දෙන්නේ අපි නොවෙයි. යම් බෙහෙතක් බාල වුණාට ඔබතුමා මේ සෞඛ්‍ය සේවාව පහත දමන්න උත්සාහ කරන්න එපා. මා හිතන හැටියට ඊයේ තමයි ඔබතුමාට මේ ආරංචිය වෘත්තීය සමිතියකින් දුන්නේ. මා එය දන්නවා. මා මේ සම්බන්ධයෙන් මාධ්‍යයටත් කථා කළා. බාල බෙහෙතක් ගෙන්වා තිබෙනවා නම් එය පරීක්ෂා කර බලා ඒ බාල බෙහෙත් සැපයූ අයට නීත්‍යානුකූලව කටයුතු කරනවා. එයට යම් කිසි නිලධාරියකු සම්බන්ධ නම් ඔහුට විරුද්ධවත් නීත්‍යානුකූලව කටයුතු කරනවා. පසු ගිය කාලයේ gloves ගෙන්වපු නිලධාරියකු සිටියා. ඒ නිලධාරියාට දඬුවම් කරලා ඔහුගේ වැඩ තහනම් කරන්න කටයුතු කරලා තිබෙනවා. එම නිසා -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවදාද වැඩ තහනම් කරන්නේ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුරු දෙන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මේ කියන විධියට වැඩ කරන්න බැහැ. ඒවාට යම් ක්‍රමවේදයක් තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවදාද වැඩ තහනම් කරන්නේ? උත්තරයක් දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි ජනතාවට බාල බෙහෙත් දෙන්න කටයුතු කරලා නැහැ. අපි ඉතාම හොඳ බෙහෙත් දෙන්නේ. පිළිකා රෝගීන්ට රුපියල් ලක්ෂ තුනක්, රුපියල් ලක්ෂ හතරක් පමණ වටිනා බෙහෙත් අපි ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නියෝජ්‍ය ඇමතිතුමනි, බෙහෙත්ද දෙන්නේ, බෙහෙත් තුණ්ඩුද දෙන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එම නිසා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න තමුන්නාන්සේ උත්සාහ කරන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බෙහෙත්ද දෙන්නේ, බෙහෙත් තුණ්ඩුද නොමිලයේ දෙන්නේ?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අපේ ජනාධිපතිතුමා රුපියල් බිලියන 125ක් මේ නිදහස් සෞඛ්‍ය සේවයට වෙන් කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බෙහෙත් තුණ්ඩු නේද නොමිලයේ දෙන්නේ?

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම : විමර්ශන කටයුතු

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு : புலனாய்வுகள்

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION : INVESTIGATIONS

2719/'12

13. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මඟින් විමර්ශනය කරන ලද සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(ii) විභාග කිරීමෙන් අනතුරුව අධිචෝදනා බාර දෙනු ලැබූ සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(iii) (අ) (ii) හි ඇති එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් සඳහන් කොට ඇති වරද, නියම කළ දඩය සහ ලබා දුන් දඬුවම කවරේද;

(iv) එම කොමිසමට ලැබුණු එක් සිද්ධියක් සම්බන්ධව කටයුතු කර අවසන් කිරීමට ගනු ලබන සාමාන්‍ය කාල සීමාව කොපමණද;

යන්න 2011 සහ 2012 වර්ෂ සඳහා, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජයදාස රාජපක්ෂ මහතාගේ සභාපතිත්වය යටතේ නිකුත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවට අනුව ඉහත සඳහන් කොමිසම මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත කරුණු කවරේද;

(ii) එම වාර්තාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එකී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ දක්වා ඇති නිර්දේශයන්ට අනුකූලව ක්‍රියාත්මක නොවීමටත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියා නොකිරීමටත් හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු රවි කරුණානායක මහතා]

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2011ஆம் மற்றும் 2012ஆம் ஆண்டுகளில்,

(i) இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினால் புலனாய்வு செய்யப்பட்ட வழக்குகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) விசாரணைகளின் பின்னர் குற்றப்பகர்வுகள் தாக்கல் செய்யப்பட்ட வழக்குகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி வழக்கு வாரியாக (அ) (ii) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு வழக்குத் தொடர்பாகவும் கூறப்பட்டுள்ள குற்றம், வழங்கப்பட்டுள்ள அபராதம் மற்றும் தண்டனை யாவையென்பதையும்;

(iv) கிடைக்கப்பெறும் வழக்கொன்றை முடிவுறுத்துவதற்கு மேற்படி ஆணைக்குழுவிற்குத் தேவைப்படும் சராசரி காலப்பகுதி யாதென்பதையும்

அவர் வெவ்வேறாகக் கூறுவாரா?

(ஆ) (i) கௌரவ விஜேதாஸ ராஜபக்ஷ பா.உ. அவர்களின் தலைமையின் கீழ் வெளியிடப்பட்டுள்ள அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவின் அறிக்கையின் பிரகாரம் மேற்படி ஆணைக்குழுவினால் நடைமுறைப்படுத்தப்படவுள்ள விடயங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி அறிக்கையின் விதப்புரைகளின் பிரகாரம் நடைமுறைப்படுத்திய நடவடிக்கை யாவையென்பதையும்;

(iii) மேற்படி அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய அறிக்கையில் தரப்பட்டுள்ள விதப்புரைகளுக்கு இணங்காமை மற்றும் மேலதிக நடவடிக்கை மேற்கொள்ளாமைக்கான காரணம் யாவையென்பதையும்;

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state for the years 2011 and 2012 separately -

(i) the number of cases investigated by the Commission to Investigate Allegations of Bribery or Corruption;

(ii) the number of cases to which the indictments were served after the examinations;

(iii) the offence stated in the case, the fine and the punishment given pertaining to each case referred to in (a) (ii) on per case basis; and

(iv) the average length of time period taken by the aforesaid Commission to complete a case received?

(iv) the matters to be implemented by the aforesaid Commission according to the COPE Report issued under the Chairmanship of Hon. Wijeyadasa Rajapakshe, MP;

(v) the actions implemented regarding the recommendations of the aforesaid Report; and

(vi) the reason for not conforming to and not following up the recommendations given in the said COPE Report?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2011-1217යි.

2012-1383යි.

(ii) 2011-26යි.

2012- 55යි.

(iii) 2011- ඇමුණුම -01 යටතේ සම්පූර්ණ විස්තරය ඉදිරිපත් කරනවා.

2012 - ඇමුණුම 02 යටතේ සම්පූර්ණ විස්තරය ඉදිරිපත් කරනවා.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරනවා.

(iv) කොමිසම වෙත ලැබෙන පැමිණිල්ලේ ස්වභාවය අනුව එක් එක් විමර්ශනය සඳහා ගත වන කාලය වෙනස් වනු ඇත.

(ආ) (i) පාර්ලිමේන්තු මහ ලේකම් විසින් 2007.08.31 දිනැති ලිපියෙන් මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාවේ සඳහන් සිද්ධීන් අතරින් මෙම කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වන කරුණු සඳහන් ආයතන සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් පවත්වන ලදි.

එකී විමර්ශනවලදී අනාවරණය වූ කරුණු අනුව අධිකරණය ඉදිරියේ නඩු පැවරීමට ප්‍රමාණවත් කරුණු නොමැති අවස්ථාවන්හිදී අදාළ බලධාරීන් වෙත නිසි පියවර ගැනීම සඳහා කොමිෂන් සභා පනතේ 4(2) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව යොමු කරන ලද අතර, අනෙකුත් ආයතන සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියා මාර්ග සඳහා නීති අංශයෙන් වාර්තා කැඳවා ඇත. මේ සෑම පියවරක්ම පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත කොමිෂන් සභාව විසින් වරින් වර දැන්වීමට කටයුතු කර ඇත.

(ii) ඇමුණුම 03 යටතේ සම්පූර්ණ විස්තරය ඉදිරිපත් කරනවා. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) එකී පොදු ව්‍යාපාර කාරක සභාවේ පළමු වාර්තාවේ සඳහන් කරුණු අතරින් මෙම කොමිෂන් සභාවේ විෂය පථයට ගැනෙන කරුණු සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට කොමිෂන් සභාව තීරණය කරන ලද අතර, ඒ අනුව ඉහත සඳහන් පරිදි කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :
Annexes tabled:

ඇමුණුම් - 01

2011

අනු අංකය	නඩු අංකය	වරද /කිරියේ වගන්තිය	නඩු පවරන ලද දිනය සහ ඉදිරි දිනය	වත්මන් තත්වය
01	බී 1869/2011	මුදල් ලබා ගැනීමක් 16 (අ) 19(ඇ)	2011.07.08 2013.07.11	
02	බී 1870/2011	මුදල් ලබා ගැනීමක් 16 (අ), 19(ඇ)	2011.07.12	2012.10.31 දින වුදිත නිදොස්කොට නිදහස් කර ඇත
03	බී 1871/2011	මුදල් ලබාගැනීමක් 19(අ) 19(ඇ)	2011.07.20 2013.07.29	
04	බී 1872/2011	මුදල් ලබා ගැනීමක් 16(අ) 19(ඇ)	2011.07.20 2013.09.10	
05	බී 1873/2011	මුදල් ලබාගැනීමක් 19(අ) 19(ඇ)	2011.07.25	චෝදනා 1.2.3.4 සඳහා රු. 20000/ක් දඩය නොගෙවන්නේ නම් වසර 1 බැගින් සිරදඩුවම් අමතරව එක් එක් චෝදනාවට වසර 2 බැගින් වසර 8 ක බ.ප.වැ. සිර දඩුවම් වසර 5 කට අත්හිටුවා ඇත ප්‍රජා අයිතිය වසර 5 කට අත්හිටුවා ඇත. අල්ලස් ලෙස ලබා ගත් මුදල රු. 8000/- මුදල දඩයක් ද නොගෙවන්නේ නම් වසරක සිර දඩුවම් අමතරව රු. 80000/- ක රජයේ ගාස්තුවක් ද නොගෙවන්නේ නම් වසර 2 ක සිර දඩුවම් නියම කර ඇත.
06	බී. 1874/2011	මුදල් ලබාගැනීමක් 16(අ) 19(ඇ)	2011.08.02	2013.01.28 දින වුදිත නිදොස්කොට නිදහස් කරන ලදී
07	බී. 1875/2011	රු. 60000/- ක මුදලක් අයැද ලබාගැනීම 19(අ) 19(ඇ)	2011.08.02 2013.05.21	
08	බී 1876/2011	මුදල් ලබාගැනීමක් 19(අ) 19(ඇ)	2011.08.08 2013.07.05	
09	බී 1877/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.08.22	2012.09.17 වුදිත වරද පිළිගනී වරදකරුවිය රු.20000 ක් දඩ මුදල සහ රු.70000 ක දණ්ඩනය ද මාස 6 ක සිර දඩුවම වසර 15 කට අත්හිටුවා 29 වගන්තිය ප්‍රකාරව ප්‍රජා අයිතිය අහෝසි කර ඇත
10	බී 1878/2011	මුදලක් ලබාගැනීමක් 16(අ) 19(ඇ)	2011.08.22	2012.11.19 දින වුදිත නිදොස්කොට නිදහස් කරන ලදී
11	බී 1879/2001	මුදල් ලබා ගැනීමක් 19 (අ) සහ (ඇ)	2011.08.22 2013.06.05	
12	බී 1880/2011	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2011.09.01	2012.11.19 වුදිත වරද පිළිගනී වරදකරු විය වසර 2 ක සිර දඩුවම වසර 10 කට අත්හිටුවා ඇත. රු. 5000 ක දඩයක් නියම කර ඇත.
13	බී.1881/2011	මුදල් ලබා ගැනීමක් 16(අ) 19(ඇ)	2011.09.01	චෝදනා 1.2.3.4 චෝදනාවලට වරද පිළිගනී. 1 චෝදනාවට රු. 5000/ක් දඩයක් සහ වසර 2 ක බ.වැ.ඇතිව සිරදඩුවම් තුටු පඳුරේ වටිනාකම රු. 5000/- ට දඩයද 2 චෝදනාවට රු. 5000/- බැගින් දඩයක් සහ වසර 2 ක් බ.ප.වැ. සිර දඩුවම් චෝදනා 3 ට රු. 5000/- දඩයක් සහ වසර 2 ක් බ.වැ. සිරදඩුවම් වසර 5 කට අත්හිටුවා ඇත
14	බී 1882/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.09.01 2013.05.13	
15	බී 1885/2011	මුදල් ලබා ගැනීමක් 19 (ඇ)	2011.09.29 2013.06.06	
16	බී 1886/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.09.29 2013.06.05	
17	බී 1887/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.10.17 2013.06.26	
18	බී 1888/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.10.17 2013.07.03	
19	බී 1889/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.10.25 2013.05.29	
20	බී 1892/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.12.06 2013.07.29	
21	බී 1893/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.12.21	2013.03.28 දින වුදිත වරද පිළිගන්නා ලදී වසර 2 ක සිර දඩුවම වසර 7 ට අත්හිටුවා ඇත. රු. 20000ක දඩ මුදලක් නියමකර ඇත
22	බී 1894/2011	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2011.12.21 2013.07.23	
23	බී 1891/2011	මුදල් හා දේපල අත්පත් කර ගැනීම 23(අ 1) සහ (අ 2)	2011.12.02 2013.05.15	
24	බී.1883/2011	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19 (ඇ)	2011.09.01 2013.07.08	
25	බී.1884/2011	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19 (ඇ)	2011.09.20 2013.07.11	
26	බී 1890/2011	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19 (ඇ)	2011.12.02 2013.09.04	

ඇමුණුම - 02

2012

01	බී 1895/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19 (ඇ)	2012.01.10 2013.05.28	
02	බී 1897/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19 (ඇ)	2012.01.19 2013.06.13	
03	බී 1898/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19 (ඇ)	2012.01.19 2013.05.22	
04	බී 1899/2012	මුදල් ලබා ගැනීමක් 16 (අ) 19(අ) සහ 19 (ඇ)	2012.01.27 2013.07.18	
05	බී 1900/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ) 20 සහ (අ) 20 (අ4)	2012.01.27 2013.06.05	
06	බී 1903/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.02.14 2013.07.04	

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

07	බී 1904/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.02.14 2013.06.06	
08	බී 1905/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.02.16 2013.06.19	
09	බී 1907/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) (ඇ) සහ 16 (අ)	2012.03.01 2013.06.05	
10	බී 1908/2102	මුදල් ලබා ගැනීමක් 19(අ)සහ (ඇ)	2012.03.13	2012.10.23 වන දින වුදිත වරද පිලිගනී මෙය 6 ක සිර දඩුවම් වසර 7 කට අත්හිටුවා ඇත රු. 20000 ක දඩ මුදල් හා රු. 4000 දණ්ඩනයක් නියම කර ඇත
11	බී 1909/2012	මුදල් ලබා ගැනීමක් 16 (අ) (ඇ) සහ 19 (අ)	2012.03.13 2013.07.12	
12	බී 1910/2012	මුදල් ලබා ගැනීමක් 20(අ 4) 19 (ඇ)	2012.03.20 2013.05.15	
13	බී 1911/2012	මුදල් ලබා ගැනීමක් 19(අ)සහ (ඇ)	2012.03.20 2013.05.21	
14	බී 1912/2012	මුදල් ලබා ගැනීමක් 19(අ)සහ (ඇ)	2012.03.20	2012.01.15 වුදිත වරද පිලිගනී වරදකරුවිය මාස 6ක සිර දඩුවම් වසර 7 කට අත්හිටුවා ඇත රු. 20000 ක දඩයක් ද රු. 4000 ක දණ්ඩණයක් ද නියම කර ඇත
15	බී 1913/2012	මුදල් ලබා ගැනීමක් 16(අ)සහ 19 (ඇ)	2012.03.23 2013.07.02	
16	බී 1914/2012	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19 (ඇ)	2012.03.23 2013.05.14	
17	බී 1915/2012	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19 (ඇ)	2012.04.18 2013.07.03	
18	බී 1916/2012	මුදල් ලබා ගැනීමක් 20(අ) (අ) 4) සහ 25-(4)	2012.05.20	2012.09.12 වන දින වුදිත 1 සහ 2 වරද පිලිගන්නා ලදී. වරදකරුවන් විය වසර 1 ක සිර දඩුවම් වසර 7 කට අත්හිටුවා රු. 20000 ක දඩයක්ද රු. 50000 ක දණ්ඩනයක්ද නියම කර ඇත. 29 වගන්තිය අනුව ප්‍රජා අයිතිය අහෝසි කර ඇත
19	බී 1918/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.05.16 2013.06.12	
20	බී 1919/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.05.16 2013.07.04	
21	බී 1921/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.06.07 2013.06.19	
22	බී 1922/2102	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19(ඇ)	2012.06.07 2013.06.17	
23	බී 1923/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.06.20 2013.05.31	
24	බී 1924/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.06.20 2013.07.17	
25	බී 1925/2012	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19(ඇ)	2012.06.20	2012.11.15 දින වුදිත වරද පිලිගන්නා ලදී වරදකරුවිය මාස 6 ක සිර දඩුවම් වසර 10 කට අත්හිටුවා ඇත රු. 20000ක දඩයක්ද රු. 15000 ක දණ්ඩනයක්ද නියම කර ඇති අතර 29 වගන්තිය ප්‍රකාරව ප්‍රජා අයිතිය අහෝසි කර ඇත
26	බී 1926/2012	මුදල් ලබා ගැනීමක් 16(අ) සහ 19(ඇ)	2012.06.27 2013.06.05	
27	බී 1928/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.07.10 2013.07.11	
28	බී 1929/2102	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.07.20 2013.07.12	
29	බී 1930/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.07.25 2013.06.17	
30	බී 1931/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.08.02 2013.06.04	
31	බී 1932/2012	සංචාසයේ යෙදීමට තැන්කිරීම 19(අ) සහ 19(ඇ)	2012.08.02 2013.07.15	
32	බී 1933/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.98.03 2013.07.15	
33	බී 1934/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.08.10 2013.05.21	
34	බී 1935/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.08.10	2012.11.21 දින වුදිත වරද පිලිගන්නා ලදී වරදකරුවියමාස 3 ක සිර දඩුවම් වසර 10 කට අත් හිටුවා ඇත. රු. 40000 ක දඩයක්ද රු. 130000 ක දණ්ඩනයක්ද 29 වගන්තිය ප්‍රකාරව ප්‍රජා අයිතිය අහෝසි කර ඇත
35	බී 1936/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ 19(ඇ)	2012.08.10 2013.07.29	
36	බී 1937/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.09.12 2013.05.16	
37	බී 1938/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.09.26 2013.07.08	
38	බී 1939/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.09.28 2013.09.12	
39	බී 1940/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.10.16 2013.06.10	
40	බී 1943/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.10.25 2013.08.02	
41	බී 1945/2012	මුදල් පිටිනැමීමක් 16 (අ)	2012.11.15 2013.05.13	
42	බී 1946/2012	මුදල් ලබා ගැනීමක් 16 (අ) සහ 19(අ)	2012.11.23 2013.07.10	
43	බී 1947/2012	මුදල් ලබා ගැනීමක් 16 (අ) සහ 19(අ)(ඇ)	2012.11.23 2003.06.12	
44	බී 1948/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.12.07 2013.06.10	
45	බී 1949/2012	මුදල් ලබා ගැනීමක් 16 (අ) සහ 19(අ) (ඇ) 25 (11)	2012.12.07 2013.07.04	
46	බී 1896/2012	මුදල් දේපල අත්පත් කර ගැනීම 23(අ 1) සහ (අ 3)	2012.01.12 2013.07.05	
47	බී 1942/2012	23(අ 1) සහ (අ 3)	2012.10.25 2013.09.24	
48	බී 1901/2012	මුදල් ලබා ගැනීමක් 20(අ 4)	2012.01.27 2013.05.16	
49	බී 1902/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.02.14	2012.02.27 වන දින චෝදනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.
50	බී 1906/2012	මුදල් ලබා ගැනීමක් 19(අ) සහ (ඇ)	2012.03.01 2013.06.05	
51	බී 1917/2012	මුදල් පිටිනැමීමක් 16(අ)	2012.05.02	2012.10.12 වන දින වුදිත වරද පිලිගන්නා ලදී. වරදකරුවිය
52	බී 1920/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ) සහ 20(අ)	2012.05.23 2103.07.02	
53	බී 1927/2012	මුදල් ලබා ගැනීමක් 11 සහ 19(අ)	2012.07.10 2013.06.17	
54	බී 1941/2102	මුදල් ලබා ගැනීමක් 11 සහ 19(අ)	2012.10.23 2013.06.18	
55	බී 1944/2012	මුදල් ලබා ගැනීමක් 19(ඇ)	2012.10.30 2013.07.17	

ඇමුණුම - 03

අනු අංකය	ආයතනය	කොමිෂන් සභාවේ නිරීක්ෂණය
01	විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	BC 2950 – 2/07 යටතේ විමර්ශනයක් පවත්වන ලද අතර මෙම ආයතනයේ පොදු සංඛ්‍යාත භාවිතා කරන්නන්ගෙන් අයවිය යුතු මුදලින් රු.1,436,679.17 ක් අය කර ගෙන ඇති අතර, තවද එකී සංඛ්‍යාත භාවිතා කරන්නන්ගෙන් එම සංඛ්‍යාත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර ඇත.
02	ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය	BC 2950 – 3/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2010.03.04 දින නිරීක්ෂණය කර ඇත.

03	ලංකා බැංකුව	BC/2950 – 4/07 යටතේ විමර්ශය කිරීමෙන් අනතුරුව අදාළ නීති වාර්තා කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීමට නියමිත බව දන්වමි.
04	ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව	BC/2950 – 5/07 යටතේ පවත්වන ලද විමර්ශනය අවසන් වී ඇති අතර ඉදිරිපත් කරන ලද නීති වාර්තා කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීමට නියමිත බව දන්වමි.
05	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	BC/2950 – 10/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2011.12.07 තීරණය කර ඇත.
06	හු විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	BC 2950 – 7/07 යටතේ යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2010.03.04 දින තීරණය කර ඇත.
07	ශ්‍රී ජයවර්ධනපුර රෝහල	BC/2950 – 9/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.
08	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	BC/2950 –13/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.
09	ජාතික ලොතරැයි මණ්ඩලය	BC/2950 – 17/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.
10	ශ්‍රී ලංකා මහජන බැංකුව	BC/2950 – 19/07 ගොනුව සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා ඇති අතර, ඉදිරි නීතිමය ක්‍රියා මාර්ග සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි.
11	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	BC/2950 – 22/07 යටතේ පූර්ණ විමර්ශයක් කිරීමෙන් අනතුරුව අදාළ නීති වාර්තා කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීමට නියමිත බව දන්වමි.
12	ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය හා ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	BC/2950 – 24/07 යටතේ පවත්වන ලද විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වන වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව තීරණය කර ඇත.
13	වරාය අධිකාරිය	BC/2950 – 25/07 යටතේ පවත්වන ලද විමර්ශයක් කිරීමෙන් අනතුරුව අදාළ නීති වාර්තා කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීමට නියමිත බව දන්වමි.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි ගරු අමාත්‍යතුමනි. දැන් ඔබතුමා කිව්වා වාගේ ගරු කථානායකතුමාගේ කොමිටියක් වන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් ඉදිරිපත් කරලා ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ සහ විගණකාධිපති ඇතුළු එම කමිටුව වාර්තාවක් ඉදිරිපත් කරලා තිබුණේ එතැන ප්‍රශ්නයක් තිබෙන නිසා. මොන ආකාරයෙන්ද අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව කියන්නේ මේකේ පදනමක් නැහැයි කියලා? අපි මන්ත්‍රීවරුන් වශයෙන් කරන වැඩේ ගැන දන්නේ නැද්ද, නැත්නම් පාර්ලිමේන්තුවෙන් ඒක හාස්‍යයට ලක් කරලා උත්තරයක් ලැබිලා තිබෙනවාද, නැද්ද කියන එකට ඇමතිතුමනි කරුණාකරලා උත්තරයක් දෙන්න පුළුවන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මා ඒ පිළිබඳ පිළිතුරක් දුන්නා. ඔබතුමා ඉතා පැහැදිලිව දන්නවා, අල්ලස් හෝ දූෂණ පිළිබඳ කොමිෂන් සභාව කටයුතු කරන නීති ප්‍රකාරය අනුව කටයුතු කළ යුතුයි. COPE වාර්තාවේ සියලු දෙය ඒ ආකාරයෙන් නොවෙයි, විමර්ශන වාර්තාවල තිබුණේ. ඒ අතර පරතරයක් තිබුණා. ඒ පරතරය තමයි කොමිෂන් සභාව ගත යුතු ක්‍රියා මාර්ග දෙකක් හැටියට හැටියට තිබෙනවා. එනම්, පරීක්ෂා කොට අධිකරණයට ඉදිරිපත් කිරීම, පරීක්ෂා කොට වෙනත් වගන්ති යටතේ අදාළ ආයතන ප්‍රධානීන්ට මේ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග දැනුම් දීම. එම නිසා යවන සියලුම වාර්තා අධිකරණයට දාන්නටය කියා අපේ කැමැත්තක් තිබුණාට එහෙම කරන්නට ඒ කොමිෂන් සභාවට බලයක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒකෙන් පෙනෙන්නේ, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වළලා තිබෙන නිසා මේකේ ස්වාධීනත්වය නැති වෙලා අද ආණ්ඩුවට ඕනෑ විධියට නැටීමයි. එහෙම නැත්නම් මෙතැන පාර්ලිමේන්තුවේ කථානායකතුමා මහින් එවන වාර්තාවක් නිකරුණේ පුද්ගලයකු එවන වාර්තාවක්ය කියා හිතනවා ද? විගණකාධිපති ඇතුළුව ඒ කොමිටියේ සියලු දෙනාම ඒකමතිකව දෙන තීන්දුවකට ඔවැනි උත්තරයක් ලැබෙන්නේ නැත්තේ ස්වාධීනත්වයක් නැති නිසා වන්නට ඇති. ඒක ඔබතුමා පිළිගන්නවා ද? නැත්නම් ඒකට හාත්පසින් වෙනස් උත්තරයක් ඔබතුමා ලබා දෙනවා ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

COPE එකේ ගෞරවනීය මන්ත්‍රීවරයෙකු හැටියට ඔබතුමා දන්නවා, රජයේ වාහනයක් පාවිච්චි කළාය කියා Auditor-General's Report එකක වැටෙනවාය කියන එක. ඒක වාර්තාවේ තිබෙන නිසා අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවට ඒක උසාවියට දාන්නය කියා දැන් ඔබතුමා කියනවා. ඒක බොළඳ කථාවක් නෙ. මට ඒ වාගේ උදාහරණ රාශියක් දෙන්නට පුළුවන්. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභා නීතියට යටත් වන කරුණු සමඟ ඇමුණුම 01, ඇමුණුම 02, ඇමුණුම 03 යටතේ නීතිමය පියවර අරගෙන දඩුවම් කළ ඒවාත් ඉදිරිපත් කර තිබෙනවා. ඒක පාර්ලිමේන්තුවට මේ කොමිෂන් සභාව වාර්තා කර තිබෙනවා. එම නිසා තමුන්නාන්සේ කියනවා නම් කොමිෂන් සභාව කටයුතු කර නැහැ කියා, ඒක තමුන්නාන්සේගේ වැරදි මතයක් කියන ටිකත් පිළිතුරු වශයෙන් කියන්නට ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා ඒකට හරස් උත්තරයක් දුන් නිසා මා කියන්නේ, ලක්ෂ 15ක ප්‍රාදේශීය සභාවේ අල්ලසක් ගත්තාම ඕක හොයනවා. ලක්ෂ 10ක හෝ රුපියල් 100ක අල්ලස් දූෂණයක් තිබුණොත් ඕක හොයලා ඒ අයටත් දඩුවම් දෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[ගරු රවි කරුණානායක මහතා]

ඇමතිවරු -[බාධා කිරීමක්] මා ගිහිල්ලා මහ බැංකුවේ අධිපති ගැන අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවට වාර්තා කළා. මේ සම්බන්ධයෙන් මොනවාද කර තිබෙන්නේ? අප වගකීම කින් කියනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ සමාගම් තෝරා ගෙන ටෙන්ඩරයක් ප්‍රදානය කළා. එතකොට මේ පොහොර අප්‍රේල් මාසයටයි මැයි මාසයටයි නියමිත පරිදි ලැබිය යුතු පොහොර. ටෙන්ඩර් දෙකක් විවෘත කරලා, ඒ ටෙන්ඩර් දෙක ප්‍රදානය කළා. ප්‍රදානය කළාට පසු මොකක්ද සිද්ධ වුණේ? මැයි මාසයට අදාළ සැපයුම් සඳහා පෙබරවාරි මස ටෙන්ඩර් කැඳවා මාර්තු මාසයේ 06වැනි දින කොන්ත්‍රාත් ප්‍රදානය කළා. එතකොට අප්‍රේල් මාසයට අදාළ ඒවා ජනවාරි මාසයේ දුන්නා. මැයි මාසයට අවශ්‍ය වන ටෙන්ඩරය පෙබරවාරි මාසයේ ප්‍රදානය කළා. කෙසේ වුවද, අප්‍රේල් හා මැයි මාසවල ලැබිය යුතු පොහොර තොග සඳහා ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරුවන් වෙත ණයවර ලිපි විවෘත කිරීම - L/C open කිරීම - පිළිවෙළින් පෙබරවාරි සහ මාර්තුවලදී සිදු කළ යුතුව තිබුණා. කෙසේ නමුත් මුදල් අමාත්‍යාංශය මොකද කළේ? 2013 මාර්තු මාසය අවසන් වන විට අදාළ ණයවර ලිපි විවෘත කිරීමට රාජ්‍ය පොහොර සමාගම් වෙත ලබා දිය යුතු අනුමැතිය ප්‍රමාද කරමින් සිටියා. පොහොර සංස්ථාව පොහොර ගෙනෙන ටෙන්ඩරය ප්‍රදානය කළා; ඒ නියමිත සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණා; ඒ සඳහා ටෙන්ඩරය ප්‍රදානය කළා. මුදල් අමාත්‍යාංශය මොකක්ද කළේ? මුදල් අමාත්‍යාංශය ණයවර ලිපි නිකුත් කරන්න ඉඩ කඩ දුන්නේ නැහැ. 2013 මාර්තු මාසය අවසන් වන විටද අදාළ ණයවර ලිපි විවෘත කිරීමට රාජ්‍ය පොහොර සමාගම් වෙත ලබා දිය යුතු අනුමැතිය ප්‍රමාද කරමින් සිටියා. භාණ්ඩාගාර නිලධාරීන් මාධ්‍ය මඟින් වහසි බස් දොඩමින් සිටියේ, 2014 මහ කන්නය වන තෙක් අවශ්‍ය පොහොර ආනයනය කර ලංකාව තුළ දැනටමත් තිබෙන බවටයි. මේ නිලධාරීන් සැලැස්මක් හදලා තිබුණා. ඊට අනුව පොහොර ගෙන්විය යුතුව තිබුණා. හැබැයි මුදල් අමාත්‍යාංශය මොකක්ද කළේ? ණයවර ලිපි විවෘත කරන්න අනුමැතිය දුන්නේ නැහැ. ඊට පස්සේ මොකක්ද වුණේ?

2013 පෙබරවාරි මාසයේ 06වැනි දා සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව පොහොර විෂයය ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට මාරු වුණා. තමුන්නාන්සේලා හිතුවක්කාරී ලෙස අමාත්‍යාංශ කඩලා එහෙට මෙහෙට කරනවා. ගොවීන්ට මොකක්ද වුණේ? ඒ අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර බෙදා හැරීමේ සැලසුම නැවත සකස් කළා. ඒ කියන්නේ හදලා තිබුණු සැලැස්ම වෙනස් කළා. ඒ අනුව, 2013 යල කන්නය ආරම්භ වී තිබියදී, 2013 මාර්තු මාසයේ 21වැනි දින සකස් කරන ලද මෙම නව සැලැස්ම අනුව, 2012 යල කන්නයට සාපේක්ෂව යූරියා පොහොර සියයට 30කින්ද, TSP පොහොර සියයට 21කින්ද, MOP පොහොර සියයට 31කින්ද කප්පාදු කරනු ලැබුවා. මෙය සාපේක්ෂ වශයෙන් පොහොර වර්ග තුනෙන්ම සියයට 33ක කපා හැරීමක්.

දැන් බලන්න, යල කන්නයට සැලැස්මක් හදලායි තිබුණේ. ඒක පැත්තකින් තියලා නැවත පොහොර ලබා දීම කප්පාදු කරන්න පටන් ගත්තා. මේ වන විට 2013 යල කන්නයේ පොහොර බෙදා හැරීම් ඇරඹී තිබූ අතර, අප්‍රේල් හා මැයි මාසවල පොහොර අවශ්‍යතාවන්ට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබියදී, පොහොර ආනයන සැලැස්ම සංශෝධනය කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ වගකීමෙන් තොර හැසිරීමක් වුණා. පොහොර සැලැස්මක් හදලා, දෙන්න ටෙන්ඩර් කැඳවා තිබියදී කෘෂිකර්ම අමාත්‍යාංශය මේක මුළුමනින්ම සංශෝධනය කළා. මේ සමඟ සිදු වූයේ ආනයන කටයුතුවලට අදාළ ණයවර ලිපි සඳහා අනුමැතිය ලබා දීම මුදල් අමාත්‍යාංශයෙන් තවදුරටත් ප්‍රමාද කිරීමයි. අවසානයේ මෙම ණයවර ලිපි විවෘත කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණේ 2013 ජූනි මාසයේදීයි. ඒ වන විට යල කන්නය ආරම්භ වී මාස 03ක් ගත වී තිබුණා. ඒ අනුව ඊට අදාළ පොහොර තොග ලැබීමට නියමිත වන්නේ 2013 ජූනි, ජූලි සහ අගෝස්තු මාසවලදීයි. අවශ්‍ය වෙලාවට නොවෙයි පොහොර ලැබෙන්නේ.

මෙහි විශේෂත්වය වන්නේ, මේ කන්නයට අවශ්‍ය මඩ පොහොර ජූලි මාසය තුළ ලංකාවට පැමිණීමයි. මඩ පොහොර එන්නේ ජූලි මාසයේයි. වපුරලා සතියෙන් මඩ පොහොර ගහන්න ඕනෑ. එහෙම නැත්නම් ගොයම හිටවලා දවස් දෙකෙන් මඩ පොහොර ගහන්න ඕනෑ. හැබැයි මඩ පොහොර ආවේ ජූලි මාසයේයි. සැබවින්ම මේ වන විට ඒවා අවශ්‍ය කල් පසුවී අවසන්. මොකක්ද වුණේ? බන්ඩ් පොහොර ගහන්න ඕනෑ වෙලාවට මඩ පොහොර දෙනවා. බන්ඩ් පොහොර දෙන්න වෙන්නේ ගොයම් කපලා ඉවර වුණාම පිදුරුවලට ගහන්නයි. ඒකයි තමුන්නාන්සේලා ගොවි ජනතාවට කළේ. රටේ කෘෂිකර්මය, ගොවිජන කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති හා සැලසුම් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් විද්‍යානුකූල පදනමකින් සකස් කළ යුතු වුවද මේ වන විට රාජකාරී පවරාගෙන ඇත්තේ මුදල් අමාත්‍යාංශය විසිනුයි. මුදල් අමාත්‍යාංශයෙන් තමයි මේ ණයවර ලිපි නිකුත් කරන්න ඉඩ නොදී මුළුමනින්ම කප්පාදු කළේ. එසේම කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කිසිදු වග කීමකින් තොරව ඒවා ක්‍රියාත්මක කිරීම කනගාටුදායකයි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මුදල් අමාත්‍යාංශයට පැහැදිලි කරන්න තිබුණා, මේවා කරන්න එපා කියලා. "මේ ගොවි ජනතාවගේ යල කන්නයත් මැරිලා තිබෙන්නේ, පසු ගිය මහ කන්නයත් මැරිලා තිබෙන්නේ, මේ යල කන්නයත් මරන්නද හදන්නේ කියලා...."-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එසේම කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කිසිදු වග කීමකින් තොරව ඒවා ක්‍රියාත්මක කිරීම කනගාටුදායකයි. දැන් ඊළඟ මහ කන්නයට මොකක්ද කරන්න හදන්නේ? 2013 - 2014 මහ කන්නය සඳහා මුදල් අමාත්‍යාංශයේ නිර්දේශ මත සිදු කරනු ලැබ ඇති පොහොර ඇස්තමේන්තු කප්පාදුව මෙසේයි. 2012 - 2013 මහ කන්නයට සාපේක්ෂව යූරියා පොහොර සියයට 35කින්ද, TSP සියයට 58කින්ද, MOP සියයට 29කින්ද ආදී වශයෙන් සමස්තයක් වශයෙන් පොහොර ප්‍රමාණයෙන් සියයට 39ක් කප්පාදු කරනු ලැබ තිබෙනවා. ඒ ලිපිලේඛන සියල්ල මා සතුව තිබෙනවා. මීට අමතරව ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික පොහොර සමාගම් මඟින් පවත්වාගෙන යන වී නොවන භෝග සඳහා වූ පොහොර සැපයුමටද බාධා එල්ල වී තිබෙනවා.

මේ සහනාධාර ක්‍රමය යටතේ අමිශ්‍ර පොහොර කිලෝග්‍රෑම් 50ක මිටියක් රුපියල් 1200කටත් මිශ්‍ර පොහොර මිටියක් රුපියල් 1300කටත් ගොවීන් වෙත ලබා දෙමින් තිබුණා. මේ වෙනුවෙන් රජය විසින් එම සමාගම් වෙත ගෙවිය යුතු මුදල රුපියල් බිලියන 09 ඉක්මවා තිබෙනවා. මෙම මුදල් මාස 06ක් තුළ ගෙවීමට රජය එකඟ වී තිබුණද, බොහෝ විට වසරකට වැඩි කාලයක් ගත වීම නිසා එම සමාගම් පොහොර ගෙන්වීම අත්හිටුවා හෝ ප්‍රමාද කරමින් සිටිනවා.

2013 ජූනි මාසයේ මුදල් අමාත්‍යාංශය විසින් පොහොර ආනයන සමාගම්වලට ක්වෝටා ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. මේ මුළු පොහොර ක්වෝටාව මෙට්‍රික් ටොන් 3,75,000ක් වෙනවා. මේ වසර සඳහා ක්වෝටා ලබා ගත් සමහර සමාගම් ශ්‍රී ලංකාව තුළ ප්‍රායෝගිකව ගොවීන්ට පොහොර බෙදා හැරීම නොකරන ඒවායි. උදාහරණයක් හැටියට ETA Lanka (Pvt.) Limited සමාගමට මෙට්‍රික් ටොන් 10,000ක ක්වෝටා එකක් දීලා තිබෙනවා. ඔවුන් ලංකාවේ පොහොර බෙදා හරින්නේ නැහැ. Blue Deebaj Chemicals LLC සමාගමට ක්වෝටා එකක් ලබා දී තිබෙනවා. ඔවුන් ලංකාවේ පොහොර බෙදා හරින්නේ නැහැ. Swiss Singapore Overseas Enterprises (Pvt.) Limited සමාගමට පොහාර ක්වෝටා එකක් ලබා දී තිබෙනවා. ඔවුන් ලංකාවේ පොහාර බෙදා හරින්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයේ සඳහන් කර තිබෙන දේවල් පමණක් කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. මේ වසර සඳහා ක්වෝටා ලබා ගත් සමහර සමාගම් ශ්‍රී ලංකාව තුළ ප්‍රායෝගිකව ගොවීන්ට පොහොර බෙදා හැරීම නොකරන ඒවායි.

ඇතැම් සමාගම් මේ වන විටත් අදාළ ව්‍යාපාරික කටයුතුවලින් ඉවත් වී තම සමාගම් වසා දමමින් සිටිනවා. මේ තත්ත්වය තුළ ඒවා විසින් ලබා ගන්නා ලද ක්වෝටා ප්‍රමාණයන්ට අදාළ පොහොර මෙරටට ළඟා නොවනු ඇති. ක්වෝටා වෙන් කර දී ඇති බැවින් වෙනත් කිසිවකුටද එම පොහොර ප්‍රමාණය ආනයනය කිරීමට ඉඩ සැලසෙන්නේ නැත. ක්වෝටා ලබා ගත් ප්‍රධාන සමාගම් වැඩි ප්‍රමාණයක් 2013 ජූනි මාසය වන විට ඒවා ගොවීන් වෙත බෙදා හැර අවසන් කර තිබෙනවා. මේ තත්ත්වය තුළ 2013 වසරේ ඉතිරි කාලය සඳහා වී නොවන අනෙකුත් භෝග සඳහා සහනාධාර පොහොර හිඟයක් දැනටමත් උද්ගත වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිලා සැලකිය යුතු තවත් කරුණක් වන්නේ ලෝක වෙළෙඳපොළෙහි යූරියා පොහොර මිල ශීඝ්‍ර ලෙස අඩු වී මේ වන විට මෙට්‍රික් ටොන් එකක මිල ඇමෙරිකන් ඩොලර් 325ක් පමණ වී තිබීමයි. එසේ නමුත් පෞද්ගලික සමාගම්වලට මේ වසරේ තුන්වන කාර්තුව වෙනුවෙන් සහනාධාර මුදල් ප්‍රතිපූරණය කිරීමේදී යූරියා මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකන් ඩොලර් 450ක් ලෙස සලකා ගෙවීම් කටයුතු කිරීමට මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කර තිබෙනවා. ඒකට කිසිදු පැකිලීමක් නැහැ. මෙය පැහැදිලිව පෙනෙන පරිදි විශාල මහජන මුදල් ප්‍රමාණයක් ගසා කෑමකට ලක් විය හැකි පියවරක් ද වනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

1. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර ආනයන සැලැස්ම සංශෝධනය කිරීමට තීරණය කරන ලද්දේ කවර විද්‍යාත්මක නිර්ණායක උපයෝගී කර ගනිමින්ද?
2. මුදල් අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය කප්පාදු කිරීමට නිර්දේශ කිරීමේ දී සලකා බලා ඇති නිර්ණායක කවරේද? අඩු කරන්න හේතුව මොකක්ද?
3. පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදු කළ යුතු වූ ණයවර ලිපි විවෘත කිරීම ජූනි මාසය දක්වා කල් යාමට හේතු කවරේද? LC විවෘත කරන්න ඉඩ නොදී කල් හැරියේ ඇයි?
4. 2013 වර්ෂය සඳහා ක්වෝටාවලට නියමිත පොහොර තොග ලංකාවට ආනයනය සහතික කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ගය කුමක්ද?
5. ලෝක වෙළෙඳ පොළේ පොහොර මිල ගණන් වෙනස් වීමට අනුව සමාගම් වෙත සහනාධාර ප්‍රතිපූර්ණ කිරීමේ ක්‍රමවේදයක් සැකසිය නොහැක්කේ මන්ද?
6. පොහොර හිඟය සහ ප්‍රමාදය හේතුවෙන් ගොවීන්ගේ අස්වැන්නට ඇති වන අහිතකර බලපෑමට වගකීම භාර ගන්නේ කවුරුන් විසින්ද? අස්වනු හානි වී ඇත්නම් ගොවීන්ට හානි පූර්ණ වන්දි ප්‍රදානයක් සිදු වනු ඇත්ද?

මේවා පිළිබඳව විශේෂයෙන්ම කෘෂිකර්ම ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා. එතුමා නම් නැහැ. කෝකටත් තෙලය වාගේ සිටින නියෝජ්‍ය මුදල් ඇමතිතුමා හරි උත්තර දෙනවා නම් බොහොම හොඳයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින කෘෂිකර්ම ඇමතිතුමා කොළඹින් බැහැරව "ගොවි සකිය" පිළිබඳ වැඩ කටයුතුවල යෙදී සිටිනවා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට සම්පූර්ණ උත්තරයක් ඉතා ඉක්මනින් ලබා දෙන ලෙස අපි එතුමාට දන්වා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධගයාවේ සිදු වුණ බෝම්බ පිපිරීම ගැන පරීක්ෂණ සම්පූර්ණයෙන් ඉවර වුණාට පසුව ඒ පිළිබඳව අපව දැනුවත් කරන ලෙසට, විදේශ කටයුතු අමාත්‍යාංශය මාර්ගයෙන් ඉන්දියානු රජයෙන් ඉල්ලා සිටින්නය කියා මේ ගරු සභාව මාර්ගයෙන් මා ඉල්ලීමක් කරන්න කැමැතියි.

ඒ වාගේම බුද්ධගයාවේ ආරක්ෂාව ශක්තිමත් කිරීම ගැනත් ඉල්ලීමක් කරන්න කැමැතියි. අද වන විට ඉන්දියාවෙන් ලැබෙන වාර්තා අනුව මෙවැනි තර්ජනයක් එල්ල වෙන්න පුළුවන් බවට බුද්ධි කාර්යාංශයෙන් දැනුම් දී තිබුණත් ඇත්ත වශයෙන්ම බුද්ධගයා පාලක කමිටුවත් ඒ ගැන වැඩි පියවර අර ගෙන නැහැ. මම හිතන හැටියට දැනට බිහාර් ප්‍රදේශයට Central Industrial Security Force එක යොදවන්න කියා රජයෙන් ඉල්ලා තිබෙනවා.

මේ වග කීම සම්පූර්ණයෙන් තිබෙන්නේ ඉන්දියාවේ ප්‍රාන්ත රජයයි, මධ්‍යම රජයයි අතර. ඒ පරීක්ෂණ සියල්ල අවසන් වුණාට පසුව අපට ඒ විස්තර ලබා දෙන්න කියන ඉල්ලීම අපේ මේ සභාව වෙනුවෙන් කරන්න පුළුවන්. ජනාධිපතිතුමාත් මේ බෝම්බ ප්‍රහාරය හෙළා දැකලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධගයාවේ ඒ බෝ රුක මුලදී බුද්ධත්වය ලැබූ බුදුරජාණන් වහන්සේ ගැන මා ලිපියක් ලිව්වා. දැන් ඒ වාගේ ලිපියක් ලිව්වත් පොලීසිය ඒ ගැන විභාග කරනවා. විශේෂයෙන්ම මේ ගැන හොයා බලන්න කියලා ඔබතුමාට කියන්න මා කැමැතියි. මා තවත් ලිපියක් ලියා තිබෙනවා, ධර්මාශෝක අධිරාජයා දිග් විජයේ ඉඳලා ධර්ම විජයට ගිය ආකාරය පිළිබඳව. ඒ වාගේම දේශපාලනය හා ධර්මය කියලා බුද්ධාගම ගැන ලිපියක් ලියලා තිබෙනවා. දැන් අපට තිබෙන එක තර්ජනයක් තමයි ඒ තැන්වල බෝම්බ පිපිරෙන එක. අපට ඇති වෙලා තිබෙන අනික් තර්ජනය තමයි බුද්ධාගම ගැන පොත් ලියන කොට CID එකෙන් ඇවිල්ලා ඒ ගැන විභාග කරන එක. ඒ ගැන විදේශ ඇමතිතුමාට කියලා වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඒ ගැන ඔබතුමාට කියන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව අනුව කියනවා, බුද්ධාගම ආරක්ෂා කරනවා කියලා. නමුත් බුද්ධාගම ගැන මම පොතක් ලිව්වාම ඒකට විරුද්ධ වනවා නම් මා දන්නේ නැහැ, බුද්ධාගම ගැන ලිපි ලියන අනික් අයට මොන විධියේ ප්‍රශ්න ඇති වෙයිද කියලා. මා නියෝජ්‍ය කථානායකතුමාට කියනවා, ඒ ගැන හොයා බලන්න කථානායකතුමාට දැනුම් දෙන්න කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ ගැන ගරු කථානායකතුමාගේ අවධානය යොමු කිරීමට කටයුතු කරනවා.

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා දැනටමත් බිහාර් ප්‍රාන්තයේ මහ ඇමතිතුමාට කථා කරලා තිබෙනවා. ඒ සම්බන්ධ පරීක්ෂණ ඉන්දියානු රජය කරගෙන යනවා. අපට දැන් තිබෙන ආරංචි අනුව, මේ සිද්ධිය ශ්‍රී ලංකාවට සම්බන්ධ සිද්ධියක් නොවෙයි. ඒක පැහැදිලියි. අප කනගාටු වෙනවා, අපේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා "මේකට ශ්‍රී ලංකා රජය වග කිව යුතුයි" කියලා කරපු ප්‍රකාශය ගැන. මේ සිද්ධිය ශ්‍රී ලංකාවේ උද්ගත වෙච්ච කිසිම තත්ත්වයකට සම්බන්ධයක් නැති බව තමයි ඉන්දියානු රජයෙන් කරනු ලබන පරීක්ෂණවලින් දැනට හෙළිදරව් වෙලා තිබෙන්නේ. තවමත් ඒ පරීක්ෂණ කෙරී ගෙන යනවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ වාර්තා ඉදිරිපත් වුණාම මම කියපු ඒවායේ සත්‍යයක් තිබෙනවාද කියලා කථා කරමු.

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පැහැදිලියි කියලා අපට දන්වලා තිබෙනවා. ආරක්ෂාව පිළිබඳ අවශ්‍ය සියලුම පියවර ඉන්දියානු රජය අරගෙන තිබෙනවා. බෞද්ධ වන්දනා ස්ථානවලට අවශ්‍ය ආරක්ෂාව සපයා දෙනවා. ඒ සම්බන්ධයෙන් ඉන්දීය රජය ඉතාම දැඩි ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන බව පැහැදිලි වනවා. ඉන්දියානු රජයත්, අපේ රජයත්, වෙන රටවල් කීපයකුත් මේ සිද්ධිය ඉතාම පිළිකුල් සහගතව විවේචනය කරලා තිබෙනවා; ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරලා තිබෙනවා. අප මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් ඉන්දියානු රජය සමඟ සාකච්ඡා පවත්වාගෙන යනවා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஸிவ்முனி ஸே வெஹெர பௌத்த மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SIVMUNI SE VEHERA BUDDHIST FOUNDATION (INCORPORATION) BILL

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය".

ගරු ජානක බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி புத்தசாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග
இறக்குமதிகள், ஏற்றுமதிகள் (கட்டுப்பாடு) சட்டம் : ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

I

[අ.භා. 2.35]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 ජූනි 5 දිනැති අංක 1813/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට නියමිත කටයුතු යටතේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග අංක 1 හා නියෝග අංක 2 සාකච්ඡාවට ගැනීමට නියමිතයි. ඒ නියෝග සම්බන්ධව අතිවිශේෂ ගැසට් නිවේදන දෙකක් පළ කරලා තිබෙනවා. ඒ නියෝග මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා. ඒ වාගේම මා බලාපොරොත්තු වනවා මොනවාද මේ නියෝග කියලා ගරු සභාවට පැහැදිලි කරන්න.

1813/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඉදිරිපත් කර තිබෙන නියෝගයෙන් කෙරෙන්නේ මේ රටේ කුරුඳු අපනයනය පිළිබඳව ඇති යම් යම් නීති සංශෝධන කිරීමයි.

අංක1813/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කළ නියෝගය අද අපි ඉදිරිපත් කරන්නේ, පසු ගිය අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කරන ලද යම් යම් යෝජනා අනුව, රේගු පනත යටතේ කරන ලද සංශෝධනවලට අනුකූලව, ආනයන හා අපනයන (පාලන) පනතේ යම් යම් වෙනස්කම් කිරීමට මෙම ගරු සභාවේ අනුමැතිය ලබා ගන්නයි.

න්‍යාය පත්‍රයේ සඳහන් දෙවන නියෝගය ගැන කථා කරන විට, අප සියලු දෙනාගේම විශේෂ අවධානය යොමු වනවා, මේ රටේ කුරුඳු කර්මාන්තය ගැන. සාමාන්‍යයෙන් අපේ රටේ සාම්ප්‍රදායික වෙළෙඳ කෘෂිකර්මය දිහා බැලුවොත් තේ, රබර්, පොල් ගැන අපි කථා කරනවා. ඒ වාගේම කුරුඳු කර්මාන්තය ගැනත් අපි කථා කළ යුතුයි. අද අපේ රටේ ආර්ථිකයට කුරුඳු කර්මාන්තයෙන් කෙරෙන සේවාව ගැන අපේ අවධානය මීටත් වඩා යොමු විය යුතුයි.

අපි මේ ගැන විස්තර ටිකක් බැලුවොත් අද තිබෙන සංඛ්‍යා ලේඛන අනුව 350,000කට වැඩි ජනතාවක් පවුල් වශයෙන් මේ කර්මාන්තයේ අද නියැලී සිටිනවා. විශේෂයෙන්ම දකුණු පළාතේ ප්‍රධාන කර්මාන්තයක් බවට මෙය පත් වෙලා තිබෙනවා. වෙනත් වෙළෙඳ කෘෂිකර්ම භෝගවලට වඩා වෙනසක් වශයෙන් මෙහි පෙනෙන්න තිබෙන්නේ සුළු සහ මධ්‍ය පරිමාණ යන දෙයාකාරයෙන්ම මේ කර්මාන්තයේ නියැලීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන ඔබතුමාත් හොඳට දන්නවා. ඔබතුමාගේ නියෝජනය කරන ආසනයේත් මේ කර්මාන්තය කෙරෙනවා. ගොවිතැනක් විධියට කරන කර්මාන්තයක් මේක. අපි තේ, රබර්, පොල් ගැන කථා කරන විට විශාල වතු යායන් ගැන කථා කරනවා. නමුත් මේ කර්මාන්තයේ සුවිශේෂ ලක්ෂණය තමයි පවුල් විශාල සංඛ්‍යාවක් මේ කර්මාන්තයට සම්බන්ධ වනවා, මෙය සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තයක් නිසා. ඒ නිසා මේ කර්මාන්තය අපේ ආර්ථිකයේ ඉතාම වැදගත් කොටසක්.

ඒ වාගේම මම තව තරුණක් කියන්න ඕනෑ. මේ කර්මාන්තයෙන් දැනට අපට ඇමෙරිකන් ඩොලර් මිලියන සියයක විතර විදේශ විනිමය ගලා ගෙන එනවා. අපි හැම වෙලාවේම බලන්නේ අපේ දේශීය නිෂ්පාදන තුළින් -කෘෂිකර්ම වේවා, කර්මාන්ත වේවා- මේ රටට වැඩි වැඩියෙන් ආදායම ලබා ගන්නයි. විශේෂයෙන් විදේශ විනිමයට සම්බන්ධ ආදායම ලබා ගන්නයි. මේ ක්ෂේත්‍රය වැඩිදියුණු කර ගන්න ඇත්ත වශයෙන්ම අද අපි ලොකු මහන්සියක් ගත යුතුයි. අද ලෝකයේ ආර්ථිකයෙහි තියුණු තරගයක් තිබෙනවා. හැම දෙනාම හදන්නේ තමන්ගේ අපනයන වැඩි කර ගන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝක ආර්ථික අර්බුදයේ ප්‍රධානම ලක්ෂණයක් තමයි ඉල්ලුම පහළ බැසීම. අද බටහිර රටවල ආර්ථික කඩා වැටිලා. ඇමෙරිකාවේ ආර්ථිකය කඩා වැටීමේ, යුරෝපා හවුලේ ආර්ථිකය කඩා වැටීමේ සුවිශේෂ ලක්ෂණයක් තමයි ඉල්ලුම අඩු වීම. අද භාණ්ඩවලට තිබෙන demand එක අඩු වනවා. මොකද, ඒ මිනිසුන්ගේ අතේ තිබෙන මුදල් ප්‍රමාණය අඩු වෙලා. එතකොට ඒක කෙළින්ම ඒ භාණ්ඩ විකුණන රටවල්වලට බලපානවා. චීනයට විශාල වශයෙන් එය බලපානවා. ඉන්දියාවටත් බලපානවා. යම් කිසි ප්‍රමාණයකට අපටත් බලපානවා. විශේෂයෙන් අපේ තේ කර්මාන්තයට. ඒ වාගේම අපේ අනෙක් කෘෂි කර්මාන්තවලට සම්බන්ධ වෙළඳ ව්‍යාපාරවලටත් බලපානවා. ඒ නිසා එක්තරා විධියකට මේ කර්මාන්ත දිහා අපේ අවධානය යොමු කරන්න ඕනෑ. දැන් මේ කර්මාන්තවල තරගකාරී තත්ත්වය වැඩියි. බටහිර රටවල ආර්ථිකය දියුණු වේ ගෙන යනකොට ඇමෙරිකානු ඉල්ලුම වැඩි වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. දැනටමත් අපට පෙනෙන්න තිබෙනවා, ඇමෙරිකානු ආර්ථිකයේ ඉල්ලුම වැඩි වෙලා තිබෙන බව. නමුත් යුරෝපා හවුලේ ඉල්ලුම වැඩි වෙලා නැහැ. ඒගොල්ලන් තව තවත් අර්බුදවලට යනවා. මේවා හැම එකක්ම අපේ අපනයන ක්ෂේත්‍රයට බලපානවා. ඒ සෑම අපනයන භාණ්ඩයක්ම රැක ගන්න අපි හුඟක් විමසිලිමත්ව ඉන්න ඕනෑ. ඒ වාගේම පුළුවන් නම් ඒ කර්මාන්ත තව තවත් ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ පසු බිමේ සිටිමින් වර්ෂයකට අපි කුරුඳු මෙට්‍රික් ටොන් 13,000ක් අපනයනය කරනවා.

විශාල ජනකායක් නියැලී සිටින ඒ වාගේම විශාල මුදල් ප්‍රමාණයක් යොදවන අපේ අපනයන උපාය මාර්ගවලට ඉතාමත් කේන්ද්‍රගත වූ මේ කර්මාන්තය රැක ගැනීම අවශ්‍ය වෙලා තිබෙනවා. මේ නියෝගය ඉදිරිපත් කිරීමෙන් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? අපේ සම්ප්‍රදායික කුරුඳු කර්මාන්තය වැඩි දියුණු කර ගැනීමයි. ගරු මන්ත්‍රීවරුන් හොඳට දන්නවා; අපි හැම දෙනාම පිළිගන්නවා, ලෝකයේ තිබෙන

හොඳම කුරුඳු නිෂ්පාදනය වන්නේ ලංකාවේයි කියා. අපේ කුරුඳු තමයි ලෝකයේ ඉහළම මට්ටමේ කුරුඳු හැටියට පිළිගන්නේ. මෙක්සිකෝව, ඇමෙරිකාව යනාදී රටවලට වෙන වෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීමට විශේෂයෙන් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කිරීමට මූල ද්‍රව්‍යයක් හැටියට කුරුඳු අත්‍යවශ්‍යයි. අද ඊයේ නොවෙයි. ලංකාවට පෘතුගීසීන් එන්න, ඒ වාගේම ඕලන්දකාරයෝ එන්න, ඉංග්‍රීසීන් එන්න, වෙනත් විවිධ ජාතීන් එන්න; ඒ වෙළෙන්දන් එන්න ප්‍රධානම හේතුව වුණේ මේ රටේ කුරුඳු කර්මාන්තයයි. ඒ නිසා මේ කුරුඳු කර්මාන්තයට හොඳ ඉතිහාසයක් තිබෙනවා. මෙක අපේම සුවිශේෂ ලක්ෂණයක්.

අපි මුතු මැණික් ගැන කථා කරනවා. ඒකත් ඉතිහාසයේ ඉඳන්ම අපේ රටට වැදගත් දෙයක්. ඒ වාගේම අපි කුරුඳු කර්මාන්තය ගැනත් කථා කරන්න ඕනෑ. මේ වෙනස්වීම අපි ගෙනාවේ ඇයි? අපේ කුරුඳු කර්මාන්තයට දැන් කිසියම් තර්ජනයක් තිබෙනවා. Cassia කියන පැළැටියේ නිෂ්පාදන බාල බඩු හැටියට වෙළෙඳ පොළට එනවා. ඒක ඔබතුමා -මගේ හිතවත් ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා- හොඳට දන්නවා. එතුමා වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට කටයුතු කරපු කාලයේ පටන් අපේ තේ වෙන්න පුළුවන්, අපේ රබර් වෙන්න පුළුවන්, අපේ පොල් වෙන්න පුළුවන්, ඒ වාගේම අපේ කුරුඳු වෙන්න පුළුවන් මේ හැම නිෂ්පාදනයකටම තර්ජනයක් තිබුණා.

අද බාල භාණ්ඩ ලෝක වෙළෙඳ පොළට ගලා ගෙන එනවා. අපේ අයත් ලාභ ගන්න මේවා ගෙනැවිත් මිශ්‍ර කරලා වෙළෙඳ පොළට යවන්න හදනවා. මේක අපි හුඟක් ගැඹුරට කල්පනා කරලා කිසිම පක්ෂ භේදයකින් තොරව විසඳන්න ඕනෑ ප්‍රශ්නයක්. සමහර කර්මාන්තවලදී blend කරන්නත් ඕනෑ. තේ කර්මාන්තයට සම්පූර්ණ නීතියක් දමා වෙන ඒවා ගෙනෙන්න එපා කියලා කියන්න බැහැ. මොකද, තේ කර්මාන්තය ගත්තාම මුල් කාලයේ ඉඳන්ම blending තිබෙනවා. අපි බෲක්බොන්ඩ්, ලිප්ටන් කියා කිව්වත් ඒ තේ හුඟක් දුරට මිශ්‍ර කරලා - blend කරලා - තමයි විකුණන්නේ. අපේ තේ පිට රට යවන ලොකු කොම්පැනියකට ගියොත් ඒකේ තිබෙන ඉතාම වැදගත් දේ තමයි laboratory එක. එහෙම නැත්නම් ඒ ගොල්ලන්ගේ විද්‍යා අංශය. මොකද, ඉල්ලුම අනුව ඒ තේ එක එක විධියට වෙනස් කරනවා. සමහර පළාත්වලට light tea එකක් ඕනෑ. මැද පෙරදිග වාගේ රටවලට තද තේ එකක් ඕනෑ. බොහෝ විට අපනයන සම්බන්ධව කටයුතු කරන කොම්පැනිවල අය කියනවා, අපට මේ විධියේ, මේ සාම්පලයේ තේ තමයි අවශ්‍ය කියා. ඒ විධියට සකස් කර තමයි අපි තේ වෙළෙඳ පොළට නිකුත් කරන්නේ. ඒ නිසා අපට ඉතාමත්ම අවශ්‍ය වෙනවා, මේක හොඳම subtle විධියට, පරීක්ෂාකාරී විධියට මේ ප්‍රශ්නයට එළඹෙන්න. බාල බඩු ගෙනෙන එකත්, අපේ රටින් බාල නිෂ්පාදන පිට රට යවන එකත් විශේෂයෙන්ම ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුවේ නීති-රීති තුළින් අපි නවත්වන්න ඕනෑ.

අපේ රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමා කුරුඳු කර්මාන්තයේ දියුණුවට ලොකු සේවයක් සිදු කර තිබෙනවා. ඇත්ත වශයෙන් මේ රටේ කුරුඳු කර්මාන්තයේ නියැලී සිටින උසස්ම වෙළෙඳ ව්‍යාපාරිකයෝ ඒ ගොල්ලන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව පසු ගිය සතියේ මාත් සමඟ සාකච්ඡාවක් කළා. ඒ ගොල්ලෝ කියන්නේ, අපේ කුරුඳු "ලංකාවේ කුරුඳු" කියා හැම දෙනාම පිළිගන්න ඕනෑ කියලායි. අපි “Ceylon Tea” කියා විකුණන විධියට “Sri Lanka Tea” කියා විකුණන විධියට ඒක brand කරන්න ඕනෑ. ඒකට සන්නාමනය කරනවා කියලා කියනවා. ඒක අලුත් සංකල්පයක්. අපේ තේවලට ඒක වෙනවා. නමුත් රබර් සහ කුරුඳුවලට ඒක තවම වෙලා නැහැ. ඒ නිසා අපේ කුරුඳු කර්මාන්තයේ ඉල්ලීමක් තිබෙනවා, අපේ කුරුඳුත් ඒ විධියට සන් නාමගත කරන්නය කියා; එහෙම නැත්නම් ඒ වාගේ brand කරන්නය කියා. ඒක කුරුඳු කර්මාන්තයේ එක ඉල්ලීමක්.

අනෙක, පුහුණුව. මොකද, අපි මෙතැන කියලා තිබෙනවා පවුල් 350,000ක් විතර මේ කර්මාන්තයෙන් ජීවත් වෙනවා කියලා. ඒ අයට අවශ්‍ය පුහුණුව, නව තාක්ෂණය ලබා දීම ඉතාමත්ම අවශ්‍යයි. මට වඩා හොඳින් ගරු ඇමතිතුමා ඒ පිළිබඳව පැහැදිලි කරයි. මොකද, මම දන්නා තරමින් අවුරුදු සිය ගණනකට ඉස්සෙල්ලා කුරුඳු කපලා, තලලා, වේළපු විධියටම තමයි තවමත් අපි ඒක කරන්නේ. ඒ සඳහා හොඳ නමක් තිබුණත් මීට වඩා කාර්යක්ෂම ක්‍රම අපට යොදා ගන්න පුළුවන් වෙයි. ඉතින් ඒවා ඔක්කෝම සලකා බලා තමයි එක පැත්තකින් cassia කියන තරගකාරී නිෂ්පාදනයට මුහුණ දෙන්න අපි කටයුතු කරන්නේ. විශේෂයෙන්ම මේ රටින් පිට වන සන්නාමනය කරපු - brand කරපු- කුරුඳු ඉහළම මට්ටමේ කුරුඳු හැටියට ඉදිරිපත් කරන්න ඕනෑ.

මට මතකයි මම ගාල්ල දිසාපතිවරයා හැටියට වැඩ කරපු කාලයේ මේ කර්මාන්තය ගැන හොඳට හොයලා බැලුවා. විශේෂයෙන්ම ගම් පළාතේ කුරුඳු කපලා, තලලා, ඊට පස්සේ අම්බලන්ගොඩ, බලපිටිය වාගේ ප්‍රදේශවලට ගෙනැල්ලා, එතැන ඉන්න වෙළෙඳ මහත්වරු ඒවා ගබඩා කරලා, කොළඹ Hayleys, Freudenberg වැනි කොම්පැනිවලට -ඒවා පිට රටවලට යවන විශාල කොම්පැනිවලට- තමයි විකුණන්නේ. ඒ නිසා ඒක ලොකු වාණිජ ක්‍රියාදාමයක් වුණා. කුරුඳුගහහැටැප්මේ තිබෙන කුරුඳු පැළයේ සිට Hayleysලා, Freudenbergලා වාගේ කොම්පැනි හරහා නැව්ගත කරන තෙක්ම ලොකු ව්‍යාපාරයක් සිද්ධ වෙනවා. ඉතින් ඒ හැම තැනකදීම අපි ඒවාට උදව් කරන්නට ඕනෑ. ඒ නිසා මේ කුරුඳු කර්මාන්තය දියුණු කිරීම සඳහා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අද දින ඉදිරිපත් කරන තිබෙන අංක 2 දරන නියෝගය -2013 ජූනි 05 දිනැති අංක 1813/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.20 දින ඉදිරිපත් කරන ලද නියෝගය- සම්මත කර ගැනීමට සහයෝගය දෙන්නය කියා මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව හරහා, අපි තේවලට ලබා දෙන සන්නාමවලට වගේ, නැත්නම් branding වාගේ කරන්න වඩාත්ම හොඳ තත්ත්වයක් ඇති කිරීම සඳහා බලතල ඉල්ලන්න තමයි අපි මේ නියෝගයට අනුමැතිය ඉල්ලන්නේ.

ඊ ළඟට, මා ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අද දින න්‍යාය පත්‍රයේ පළමුවෙන් ඉදිරිපත් කර තිබෙන නියෝගය ගැන -2013 ජූනි 05 දිනැති අංක 1813/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරනු ලැබ, 2013.06.20 වන දින ඉදිරිපත් කරන ලද නියෝගය ගැන- වවන ස්වල්පයක් කථා කරන්න කැමැතියි. මේකට හේතුව තමයි අපි පසු ගිය අය වැය ලේඛනය තුළ "ආදායම් සංරක්ෂණ ආඥාව" යටතේ රේගු සංකේතාංක වර්ගීකරණය සංශෝධනය කිරීම. නැවත වරක් ඒක ගැසට් කළා. තමුන්නාන්සේලා දන්නවා, Customs Classification කියලා එකක් තිබෙනවා කියා. ඕනෑම භාණ්ඩයක් අපි මේ රටට ගෙනෙන විට ඒ සඳහා අවශ්‍ය සලකුණ, නැත්නම් සංඛ්‍යාත්මක තත්ත්වය අනුව තමයි ඒවා මේ රටට ගෙනෙන්නේ. නැත්නම් ඒ වෙළෙඳාම කරන්න බැහැ. මොකද, ලෝකයේම තිබෙන රේගු දෙපාර්තමේන්තු එකතු වෙලා, සාකච්ඡා කරලා Global Classification එකක් හදලා තිබෙනවා. ඒවායේ එහෙන් මෙහෙන් පොඩි පොඩි වෙනස්කම් සිද්ධ වෙනවා. නමුත් අපට එක රටකින් තව රටකට ගෙනෙන කොට ඒ රටවල රේගු දෙපාර්තමේන්තුවලත් සහ මේ රටේ රේගු දෙපාර්තමේන්තුවේත් ඒ ඔක්කෝටම කටයුතු කරන්න classification system එකක් තිබෙනවා. එතකොට අය වැය ලේඛනයට පස්සේ ඒ classification system එකට අපි ගිහින් තිබෙනවා. සමහර ඒවා සංශෝධනය කරලා තිබෙනවා, අපේ දෙපාර්තමේන්තු කිහිපයක්ම ආනයනය සහ අපනයනය භාරව සිටිනවා. එකක් තමයි රේගුව. Customs Code එකේ තිබෙන වෙනස්වීම් පරිපාලන හේතූන් නිසා, නීතිමය හේතූන් නිසා ආනයන හා අපනයන (පාලන) පනත

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

යටතේත් අපට භාර ගන්න සිද්ධ වෙනවා. ඒ classification එකම අපට භාර ගන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි නිදසුනක් වශයෙන් ගනිමු ඕසෝන් ස්තරය; එහෙම නැත්නම් ඕසෝන් වියන. ඒ සම්බන්ධව "හානිකර ද්‍රව්‍ය තුරන් කිරීම පිළිබඳ වූ මොන්ට්‍රියල් සන්ධානය" සමඟ අපිත් සම්මුතීන් අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේම "වියනා සම්මුතිය" ආදී වශයෙන් ජාත්‍යන්තර එකඟතාවලට අපි ගිහිල්ලා තිබෙනවා.

ඒ අනුව යම් යම් දේ classification codesවලට වැටෙනවා; යම් යම් දේ තහනම් වනවා. අපිත් ජාත්‍යන්තර සම්මුති යටතේ ඒ හා සමානව, consequential changes එක්කම සමයාන්තරව අපේ නීති-රීතිත් වෙනස් කරන්න සිද්ධ වනවා. ඒ වාගේම ඕසෝන් තීරයට හානි කරවන රසායනික ද්‍රව්‍ය, කාර්මික රසායන ද්‍රව්‍ය, පළිබෝධ නාශක ආනයනය පිළිබඳ පොදු රෙගුලාසි ඇති කිරීමටත් අපට සිද්ධ වනවා. ඒවා සාමාන්‍යයෙන් රටට හිතකර, අපේ පරිසරයට හිතකර, ස්වභාව ධර්මයාට හිතකර නීති රීති. දැන් අපිටත් ඒවා අඩංගු කර ගන්න සිද්ධ වනවා.

ඊළඟට අපි යෝජනා කරලා තිබෙනවා, තේ ශ්‍රී ලංකාවට ආනයනය කර මිශ්‍ර කර නැවත අපනයනය කරන කොට ඒ බාල තේ පාලනය කිරීමට තවත් ශක්තිමත් රෙගුලාසි. ඒ වාගේම, energy drinks, පරිසරයට හානි කරන ඉලෙක්ට්‍රොනික උපකරණ ආදිය ගැන යම් යම් සීමාවන් පනවලා. එක පැත්තකින් මේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ, එක පනතක නෛතික අවශ්‍යතාවන් හා ආනුෂංගිකව ඇති විය යුතු අනෙක් වෙනස්කම් සහ ජාත්‍යන්තරව පිළිගත් නිර්ණායක අනුව කෙරෙන සංශෝධන අපේ නීතිය යටතටත් ගෙන ඒමටයි.

අද මෙම නියෝග ගෙන ඒමට ප්‍රධාන වශයෙන් කරුණු තුනක් බලපානවා. එක කාරණයක් තමයි අපේ කුරුඳු කර්මාන්තය රැක ගැනීම. දෙවැනි කරුණ තමයි, අය වැයේ තිබෙන යෝජනාව ආනුෂංගික වශයෙන් අනෙක් පනත්වලටත් විශේෂයෙන් ආනයන හා අපනයන (පාලන) පනතටත් ආදේශ කිරීම. තුන්වන කාරණය අපේ හොඳ වෙළෙඳ භාණ්ඩ, හොඳ සන්නමක් - brand එකක්- තිබෙන වෙළෙඳ භාණ්ඩ රැක ගැනීම. එම නිසා මෙම නියෝග දෙක සඳහා මෙම ගෞරවනීය සභාවේ අනුමැතිය ලැබේවි යැයි මා බලාපොරොත්තු වනවා.

මෙම විවාදය තුළින් අපට පුළුවන් වනවා, තමුන්නාන්සේලාගේ අදහසුත් සලකා බලන්න. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එවුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

[අ.භා. 2.54]

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා බොහොම පැහැදිලිව විස්තරව කළා ආනයන හා අපනයන සම්බන්ධව. මා අපනයන ගැන වචන ස්වල්පයක් මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වනවා.

අපි පලතුරු, එළවලු, තේ, රබර්, කුරුඳු, සම් භාණ්ඩ, ආයුර්වේද බෙහෙත් වර්ග, යකඩ භාණ්ඩ, ආභරණ, මැණික් හා garments වැනි දේවල් අපනයනය කරනවා. කුරුඳු වාගේම අනෙක් භාණ්ඩත් වැඩි වශයෙන් අපනයනය කිරීම සඳහා අපි ඒවා දියුණු කිරීම තමයි කරන්න ඕනෑ. නමුත් අපට පෙනෙන්නේ නැහැ ඒ නිෂ්පාදනවල දියුණුවක් සිද්ධ වනවා කියලා. ඒ නිෂ්පාදන දියුණු කිරීම සඳහා ඒ ඒ අංශවලින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එකයි මගේ විශ්වාසය.

දැන් බලන්න, ඇමෙරිකාවේ තේ තිබෙනවා. ඔවුන් ඒ තේ පැකට් ඒකේ ගාලා තිබෙන්නේ, "English Tea" කියලා. එංගලන්තයේ තේ ගහක්වත් හැදෙන්නේ නැහැ. තේ ගහක් හදන්න ඕනෑ කරන සුදුසුකම් ඒ රටේ නැහැ. අපේ රටේ තේ තිබෙනවා. ඒ තේ පැකට්වල "Sri Lanka" කියලා ගාලා නැහැ. තේ පැකට් නම් කරලා තිබෙන්නේ වෙන වෙන නම්වලින්. අපි හැම තැනම බැලුවාම දකින්න ලැබෙන්නේ වෙන නම්වලින් තේ පැකට් තිබෙන බවයි. ඒවා තමයි අපි පාවිච්චි කරන්නේ. අපිත් පාවිච්චි කරනවා; වෙන රටවලටත් යවනවා. ලෝකයේ තිබෙන හොඳම තේ ලංකාවේ තේ කියලා ප්‍රසිද්ධියට පත් කළාට මොකද ඒවා පිට රටවලට යවන කොට යන්නේ වෙනත් නම්වලින්.

අනෙක් කාරණාව තමයි ලංකාවටත් වෙන රටවල්වලිනුත් තේ වර්ග ගෙනැල්ලා මිශ්‍ර කරලා නැවත අපනයනය කරනවා. ඒකට හේතුව ලෙස කියන්නේ, ඒ රටවල ජනතාව ඒ තේවලට කැමැතිය කියන එකයි. ඒ නිසා ඒ තේ අපේ තේ එක්ක මිශ්‍ර කරලා යවනවා. පිට රටවලින් ලංකාවටත් තේ ආනයනය කරනවා. ආනයනය කරලා අපනයනය කරනවා. බොහෝ රටවල් ලංකාවේ තේ අරගෙන ගිහිල්ලා ඒ රටවලදී මිශ්‍ර කරලා අලෙවි කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කෙරෙනවා. මේවා ගැනත් අපි ටිකක් කල්පනා කරලා බලන්න ඕනෑ.

අපේ පළතුරු, එළවලු පිට රටවල අය මිලදී ගන්න බොහෝම ආසයි. ජපානයේ කට්ටියක් ආවාම මම අඹ ටිකක් කපලා දුන්නා. ඒක කෑලා කිව්වා, “Oh! Very nice, very nice. Why do you not send these to Japan?” කියලා. ඒ ගොල්ලන් ඒ ගැන කථා කළා. පුදුම විධියේ රසක් තිබෙනවා කියලා ඒ මිනිස්සුන්ට දැනෙනවා කියලා කිව්වා. අඹවලට එච්චර කැමැතියි. අපේ මේ ගම්බද ප්‍රදේශවලින් ආපු මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා දන්නවා ඇති, අඹ ගස් යට බැලුවොතින් කොච්චර අඹ ගෙඩි ඉදිලා වැටිලා තිබෙනවාද කියලා. ඒවායින් එච්චර ඵල ප්‍රයෝජන ගන්නේ නැහැ. මේවා ප්‍රයෝජන ගන්න ආකාරයක් සකස් කරන්න වුවමනා කරනවා. එහෙම වුණොතින් ඒවා අපනයනය කරලා අපට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්.

කෙසෙල් අපනයනය කිරීම එක්තරා ප්‍රමාණයකට කරගෙන යනවා. ඒකේ අපහසුවක් තිබෙනවා. ලංකාවේ තිබෙන කෙසෙල්වල ලෙල්ල ඉක්මනට කුණු වෙනවා. ඒ කුණු වෙන නිසා ඒවා පිට රටවලට යවන්න අමාරුකමක් තිබෙනවා. මම දෙලක්ෂයක් කෙසෙල් පැළ ඊශ්‍රායලයෙන් ගෙන්වූවා. ඊශ්‍රායලයෙන් ගෙන්වලා මහවැලි ප්‍රදේශයට ඒවා බෙදා දුන්නා. ඒකේ පොත්ත සනකමයි. මම හිතුවේ ඒක ලංකාව පුරාම වවලා බොහොම ප්‍රසිද්ධියක් වෙයි කියලා. එහෙම තත්ත්වයක් ඇති වුණේ නැහැ. ඒකට හේතුව, ඒ අපනයනය කරන අය කැමති නැහැ, ඒක ඊට වඩා වැඩි වශයෙන් බෝ වෙනවාට. මොකද අනෙක් අයත් ඒවා අපනයනය කරන්න පටන් ගනීවි කියලා. මේ ගැනත් අපි කල්පනා කර බලන්න ඕනෑ. කෙසෙල් යුරෝපයට යවන්නත් පුළුවන්. ඒ වාගේම චීනය වුණත් බලාපොරොත්තු වෙනවා මේ කෙසෙල් ලබා ගැනීමට. චීනයේ අය මාත් එක්ක සාකච්ඡා කරන කොට කිව්වා, ලංකාවේ එළවලු, පලතුරු වැඩි වශයෙන් අපි ලබා ගන්නට සතුටුයි, ඒවා එවා ගන්න ක්‍රමයක් සකස් කරන්න කියලා. ඒ ගොල්ලන් ඒ ගැන මාත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා.

ඊ ළඟට සම් භාණ්ඩ සම්බන්ධව කියන්න ඕනෑ. සම් භාණ්ඩ සෑහෙන ප්‍රමාණයක් යවනවා. දැන් සතුන් ගැන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එහෙම වුණොත්ින් සම් භාණ්ඩ සකස් ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මම දන්නේ නැහැ, ඒකට මොන වාගේ තීරණයක් ගනීවිද කියලා. ඒ තීරණය අනුව ඒකේ වෙනසක් ඇති වෙන්න පුළුවන්.

අනෙක් එක, ආයුර්වේද බෙහෙත් වර්ග. ඒවා විශාල ප්‍රමාණයක් ඉන්දියාවෙන් ගෙනෙනවා. ලංකාවේ මේවා විශාල වශයෙන් වගා කරන්න පුළුවන්. ඉස්සර හැම ගමකම වාගේ සිංහල වෙද මහත්මයෙක් හිටියා. ඔහු බෙහෙත් තුන්ඩුවක් ලියලා එවනවා. ඒ තුණ්ඩුවේ තිබෙන බෙහෙත් සෑම වත්තකම වාගේ නොයෙක්, නොයෙක් වර්ගවලින් සෑහෙන ප්‍රමාණයක් තිබුණා. ඒවායේ මුල්, පොතු, කොළ, මල්, දළු අරගෙන අට එකට තම්බලා දෙසැරයක්, හතර සැරයක් බොනවා. මේක තමයි බෙහෙතක් හැටියට අපේ ආදි කාලයේදී පාවිච්චි කළේ. අද නම් කවුරුවත් ඒ වාගේ එකක් තිබෙනවාද කියලා දන්නවාද කියලා හිතා ගන්න අමාරුයි. දැන් ආයුර්වේද බෙහෙත් ඔක්කෝම තිබෙන්නේ බෝතල්වල. දැන් මේවා උණු කරන්න, මුල් ගලවන්න, කොළ කඩන්න කාලය මදි හින්දා ඕනෑම කෙනෙකු කැමැතියි, අර බෝතලයේ තිබෙන බෙහෙත් බොන්න. නමුත් ඊට වඩා ගුණදායකයි තම්බලා බොන එක.

පිට රටින් මේවා ගෙන්වන එකේ ලොකු වැරැද්දක් තිබෙනවා. මේ සියල්ලම වාගේ ලංකාවේ වගා කරන්න පුළුවන්. ලංකාවේ වගා කරපු බෙහෙත් වර්ග හුහක් දෙනෙකු හොරෙන් අරගෙන යනවා. ඒක ගැන කල්පනා කරලා බලන්න ඕනෑ, ඇයි ඒ ගොල්ලන් අපේ රටේ තිබෙන ඒවා හොරෙන් අරගෙන යන්නේ කියලා. එතකොට ඒ බෙහෙත් වර්ග ලංකාවේ වගා කරන්න පුළුවන් නිසා ඒක ලංකාවේ වගා කිරීමට වැඩ පිළිවෙළක් සකස් කළෝතින් ඉන්දියාවට යන, වෙනත් රටවලට යන මුදල් ප්‍රමාණයන් අපට ඉතිරි කර ගන්න පුළුවන්. ආනයනය කිරීම නතර කරලා අපනයනය කරන්න අපට පුළුවන් අවස්ථාවක් ලැබෙනවා.

අපේ යකඩ භාණ්ඩ ගැන යමක් කිව යුතුයි. මම හිතන්නේ නැහැ කවුරුවත් හිතනවා කියලා අපේ රටේ නිෂ්පාදනය කරන යකඩ භාණ්ඩ වර්ග -පිහිය, කැති, පොරව, මුල්ලුව වාගේ දේවල්- එච්චර හොඳයි කියලා. පිට රටවල ඒවා බොහොම හොඳයි, ඒවා තමයි හොඳට හයිය, කැපෙන්නේ කියලා අපි හිතනවා.

ඒ වුණාට මොකද, අපේ ගම්පළ නිෂ්පාදනය කරපු ආයුධ ඒ දවස්වල සුද්දන්ගේ කොම්පැනිවලට දුන්නා. ඒ superintendentsලා ඉංග්‍රීසියෙන් ලියාපු සහතික දීලා තිබෙනවා, පිට රටවලින් ගෙනෙන ආයුධවලට වඩා මේ ආයුධ ඉතාම හොඳයි කියලා. මම ඒ සහතික බැලුවා. ඒ ආයුධ යැවීම සම්බන්ධයෙන් මම ක්‍රියා කළා. ඒ ආයුධ හුහක් හදවලා යැව්වා. දැන් එය නතර කරලා තිබෙනවා. මොකද, හුහදෙනෙක් කැමැති නැහැ ඒ කම්හල්වල වැඩ කරන්න. මෙන්න මේ වාගේ තත්ත්වයක් නිසා එය පහළ බැහැලා තිබෙනවා. ඒවා ඔක්කෝම අපේ රටේ නිෂ්පාදනය කරලා ආනයනය නතර කරන්න පුළුවන්කම අපට තිබෙනවා. අප මේ ගැනත් කල්පනා කර බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් එක තමයි ආභරණ. ලංකාවේ ආභරණවලට, මැණික්වලට අනෙක් රටවල් ඉතාම කැමැතියි. වෙන රටවල හදන ආභරණවලට වඩා අපේ ආභරණ ඉතාම ලස්සණයි; ඉතාම හොඳයි. පිට රටවල අය ඒවාට බොහොම ආසයි; බොහොම කැමැතියි. ඒ ආභරණ නිෂ්පාදනය සෑහෙන ප්‍රමාණයෙන් කරන්න ඕනෑ. මම අපේ කුඩා ව්‍යවසාය සංවර්ධන ඇමති ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමාගෙන් ඉල්ලීමක් කළා. අපි හාගෙට හදලා තිබෙනවා කර්මාන්තශාලාවක්, ආභරණ නිෂ්පාදනය කිරීම සඳහා. විශාල ප්‍රමාණයක් ඉන්නවා ආභරණ නිෂ්පාදනය කරන. එහි එක තට්ටුවක් හදලා තිබෙනවා. අනෙක් එකත් හදන්න එතුමා මොකක්දෝ කොමිටි එකකට දැම්මා කිව්වා. ඒක කරන්න පුළුවන්කම ලැබුණොත් අපට විශාල ප්‍රමාණයෙන් ආභරණ නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒවා සියල්ල අපනයනය කරන්න පුළුවන්. අපේ රටට වුවමනා ප්‍රමාණය ලබා ගන්නවා වාගේම අපනයනය කරලා ඊට වඩා විශාල ප්‍රමාණයක මුදලක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ අයට වුවමනා කරන රත්න්, රිදී, මැණික් වාගේ ද්‍රව්‍ය ලබා ගැනීමට අපි පහසුකම් සලසා දෙනවා නම් රජය ඒ සඳහා දරන වියදමට වඩා අතිවිශාල ලාභයක් අපට ඒ අපනයනවලින් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට garments ගැන කථා කරන්න ඕනෑ. අපි ඇඟලුම් නිෂ්පාදනය කරලා පිට රට යවනවා. ඒවා බොහොම හොඳ තත්ත්වයක තිබෙන බව ලෝකයාත් පිළිගත්තා; ලංකාවත් පිළිගත්තා. වතාවක්, මම රුසියාවට ගිහිල්ලා, හොඳම කමීසයක් දෙන්න කියලා ඉල්ලුවා. ඊට පස්සේ ඒ අය තැන් තැන්වල බලලා කමීසයක් ගෙනාවා. නම බැලුවාම "සිලෝන්". "සිලෝන්" කියන කමීසය තමයි ඉතාම හොඳ කමීසය හැටියට භාර දුන්නේ. ඊට පස්සේ මම ඒක පෙන්නලා කිව්වා, “This is from my country” කියලා. Oh! Is it from your country? Very good, very good! කියලා ඒ අය නටන්න පටන්ගත්තා. Russia වාගේ රටක ගිහිල්ලා විකුණන්න තිබෙන භාණ්ඩ දෙස බැලුවත් තත්ත්වය ඒකයි. අද එංගලන්තයට ගිහිල්ලා බැලුවත් තත්ත්වය ඒකයි. එංගලන්තයේ අපේ ඇඟලුම් නිෂ්පාදන විශාල වශයෙන් තිබෙනවා. ඒ රටවල අය බොහොම කැමැත්තෙන් ඒවා ගන්නවා. ඒවා බොහොම ලස්සණයි. බොහොම හොඳට සකස් කරනවා. නමුත් අද ඒ තත්ත්වය පහත වැටිලා තිබෙනවා, කර්මාන්තශාලා විශාල වශයෙන් වැහිලා තිබෙන නිසා. මගේ ආසනයේත් 500කට වඩා වැඩි ප්‍රමාණයක් වැඩ කරපු එක කර්මාන්තශාලාවක් වැහුණා. 250ක් පමණ වැඩ කරපු කර්මාන්තශාලාවකුත් වැහිලා තිබෙනවා. මේ නිසා, යුරෝපයෙන් අපට ලැබුණු ඒ වාසිදායක තත්ත්වය අද අපට නැති වෙලා තිබෙනවා. නමුත් අනෙක් රටවල් එක්ක අප සාකච්ඡා කරලා බලන්න ඕනෑ අපේ මේ භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන්. එහෙම කළොත් ඒ අය අනෙක් රටවල ඇඳුම් පැළඳුම්වලට වඩා අපේ රටේ ඇඳුම් පැළඳුම් ආසාවෙන් මිලදී ගනීවි කියලා මම හිතනවා. ඒ නිසායි මේ භාණ්ඩ සම්බන්ධයෙන් මා කියන්න කල්පනා කළේ. මේ වාගේ, අපේ රටේ නිෂ්පාදනය කරන තවත් භාණ්ඩ විශාල ප්‍රමාණයක් පිට රටවලට යවන්න පුළුවන්කම තිබෙනවා. මේවා ප්‍රමාණයෙන් වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම ලස්සණට හරි ගස්සන්න ඕනෑ. ගරු ඇමතිතුමා කිව්වා වාගේ ඒවා නියම තත්ත්වයකින් තිබෙන්නත් වුවමනා කරනවා. එහෙම වුණොත් අපට පුළුවන් වනවා වැඩි වාසි ලබන්න. නමුත් අපි නිෂ්පාදන කරලා යවනවා මිසක් ඒවායෙන් වැඩි ආදායම් ලබා ගැනීමට උත්සාහ කරනවා අඩුයි.

අපේ රබර් කර්මාන්තය ගනිමු. අපි අතිවිශාල ප්‍රමාණයෙන් රබර් නිෂ්පාදනය කරනවා. ඒවා අමු අමුවෙන්ම පිට රට යවනවා. නමුත් ඊට වඩා දෙයක් කරන්න ඕනෑ. ඒ රබර්වලින් විවිධ නිෂ්පාදන බිහි කිරීම සුළු සුළු කර්මාන්ත වශයෙන් හරි පටන් ගෙන මහා කර්මාන්ත බවට පරිවර්තනය කරන්න උත්සාහ කරන්න ඕනෑ. එතකොට මේ වාගේ දස ගුණයක ආදායමක් ලබා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. අපි ඒ ගැන කල්පනා කර තිබෙනවා මදි. අවුරුදු එකසිය ගණනක් වෙනවා රබර් වගා කරන්න පටන් ගෙන. තවම පුළුවන් වෙලා නැහැ රබර්වලින් ප්‍රයෝජනයක් ගන්න. ඒවා නිකම්ම පිට රට යවනවා. අපි මෙන්න මේ තත්ත්වයන් ගැන කල්පනා කර බලන්න ඕනෑ.

[ගරු දි.මු. ජයරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ රටේ නොයෙකුත් ගල් වර්ග තිබෙනවා. පොහොර සකස් කරන ගල් තිබෙනවා. හන්තානයේ තිබෙන ගල් කඩලා, ගල් කැට වශයෙන් තමයි ජපානයට යවන්නේ. නමුත් ඒ විධියට ගල් කැට යවන්නේ ඇයි කියලා අපි කල්පනා කර බලන්න ඕනෑ. ඒවායෙන් ගන්න පුළුවන් ප්‍රයෝජන මොනවාද කියලා අපි සොයා බලන්න ඕනෑ.

එහෙම සොයා බලා ඒවා ලංකාවේ නිෂ්පාදනය කරලා යවනවා නම් අපට මීට වඩා විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. මේ වාගේ කරුණු විශාල ප්‍රමාණයක් කියන්න තිබෙනවා. නමුත් ඒ සියල්ලම ගැන කථා කරන්න මා කල්පනා කරන්නේ නැහැ. අපි කල්පනා කරන්න ඕනෑ, මේවා මේ රටේ නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළක් සකස් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,වගා කටයුතු සම්බන්ධයෙන් බලන කොට අද කුඹුරු අක්කර 18,00,000ක් තිබෙනවා, එයින් අක්කර 12,00,000යි වගා කරන්නේ; 6,00,000ක් වගා කරන්නේ නැහැ. ඒ කුඹුරු අක්කර 6,00,000ත් වගා කරනවා නම් අපට විශාල වශයෙන් හාල් පිට රට යවන්න පුළුවන්. අපේ භූමියෙන් නියම ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නියම කරන දෙයක් වගා කරන්න ඕනෑය කියන එක අපේ නීතියේ තිබෙනවා. එතකොට කිසිම කෙනකුට වගා කරන්නේ නැතුව ඉන්න පුළුවන්කමක් නැහැ. 2000 අවුරුද්දේ මමයි ඒ නීතිය පාර්ලිමේන්තුවට ගෙනාවේ. ඒ චුණාට අද එහෙම වගා කිරීමක් කරන්නේ නැහැ. එයට හේතුව මොකක්ද? අවුරුද්දකට වරක්, අවුරුදු දෙකකට වරක් මැතිවරණ පැවැත්වෙනවා. "වගා කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඉඩම වෙන කාටවත් දෙනවා"යි කියලා ජනතාවට තර්ජනය කරලා වගා කිරීමේ කටයුතු කරන්න පුළුවන්කමක් නැහැ. ඇයි? එතකොට ඡන්දය හම්බ වෙන්නේ නැහැ. එක පැත්තකින් මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය. එම නිසා වගා කටයුතු කරන්න බැරි තත්ත්වයක් හා කෘෂි කර්මාන්තයේ දියුණු වීමේ අඩු තත්ත්වයක් ඇති වනවා. එම නිසා ඒ ගැනත් කල්පනා කරලා බලන්න ඕනෑ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කථා කරන කොට ඒ ගැනත් කල්පනා කරලා බලන්න කියා මා ඉල්ලනවා.

අපේ දියුණුව සඳහා අපනයනය කළ හැකි භෝග වැඩි වශයෙන් වගා කිරීමටත්, ඒ ඒ රටවල් බලාපොරොත්තු වන පරිදි උසස් තත්ත්වයෙන් ඒවා නිෂ්පාදනය කර යැවීමටත් අපි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඒ ඒ අමාත්‍යාංශවලින් ඉතා උසස් මට්ටමින් ක්‍රියා කළ යුතු වනවා වාගේම මේ ගැන දැනුමක් තිබෙන පුද්ගලයන්ට අවස්ථාවක් ලබා දීලා ඒ තුළින් මෙම නිෂ්පාදනයන් වැඩි කිරීමේ සැලසුම්සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් මීට වඩා විශාල ආදායමක් අපට ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මෙන්න මේ හැඟීම ඇති කර ගෙන අපේ නිෂ්පාදනයන් වැඩි කර ගැනීමට අපි උත්සාහ කරමුය කියා මා ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Udith Lokubandara to take the Chair?

ගරු ගාමිණි විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
"ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

[අ.භා. 3.08]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අගමැතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම භාග්‍යයක් හැටියට මා සලකනවා. එතුමා බොහෝ වේලාවක් කථා කළා, මේ කුඩා කර්මාන්ත ගැන. එතුමා කථා කළා, කුඩා ගොවීන්ගේ නිෂ්පාදනයන් පිට රට යවන්න ඕනෑ කොහොමද, මධ්‍යම පරිමාණයේ කර්මාන්ත දියුණු කරන්නේ කොහොමද, shirts නිෂ්පාදනය කරලා පිට රට යවන්නේ කොහොමද කියලා. එතුමා පිට රටදී shirt එකක් ගත්තාම එය ලංකාවේ නිෂ්පාදනයක් කියා කිව්වාම එතුමා කොපමණ සතුටු වුණාද කියලාත් එතුමා කිව්වා. කුඩා කර්මාන්තකරුවන් නහා සිටුවන්න අපි ඉදිරියට වැඩ කටයුතු කරන්න ඕනෑය කියලාත් එතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, 2013 අප්‍රේල් 08වන දාතම දරන ලේඛනයක්. ගරු අගමැතිතුමනි, Sri Lanka Chamber of Small and Medium Industries එකේ සභාපතිවරයා, ඇලෝයි ජයවර්ධන මහතා කියනවා, පසු ගිය අවුරුදු දෙක තුළ කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත සියයට 25ක් වසා දමා තිබෙනවාය කියලා. ඇලෝයි ජයවර්ධන සභාපතිතුමා කියනවා, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 75කට දායක වන්නේ මේ කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත කියලා. ඇත්ත වශයෙන්ම අපි මේ ගැන කථා කර කර ඉඳලා

වැඩක් නැහැ. මේ ගැන අපි ක්‍රියා කරන්න ඕනෑ. අපි ක්‍රියා කළේ නැත්නම් අපනයනය කඩා වැටීමත් එක්ක විශාල ප්‍රශ්නයකට අපි මැදි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුඳු ගැන අපේ ගරු ඇමතිතුමා කථා කළා. මා හිතන හැටියට කුරුඳු සඳහා ප්‍රමිතිය තබා ගන්න ඕනෑය කියලා මෙම නියෝග කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන්නේ එතුමා තමයි. එය ඉතාමත් හොඳ දෙයක්. මොකද, මා දන්නා බොහෝ දෙනකුත් මේ කුරුඳු අපනයනයේ යෙදිලා ඉන්නවා. The Spice Council එකේ Chairman සාරද ද සිල්වා මහතා කුරුඳුවල ප්‍රමිතිය ඉදිරියට ගෙන යන්න පෞද්ගලික අංශයත්, රජයත්, UN එකත්, World Bank එකත් එක්ක එකතු වෙලා අවුරුදු තුනක විශාල programme එකක් කරන්න උත්සාහ කරනවා. ගිය අවුරුද්දේ කුරුඳු මෙට්‍රික් ටොන් 13,000ක් පිට රට යවා තිබෙනවා කියලා කියනවා. ඔවුන් ඒක තවදුරටත් වැඩි කර ගන්නට බලාපොරොත්තු වනවා.

පසු ගිය ඉරිදා "The Sunday Times" පත්තරය ඔබතුමා කියෙව්වාද දන්නේ නැහැ ගරු ඇමතිතුමනි. එහි "Sweet success of bitter veggie" යන සිරස්ත‍ලය යටතේ Dr. Suranjan de Silva ගැන ලොකු විස්තරයක් තිබුණා. කරපිංචා, කරවිල, ගොටුකොළ වාගේ natural දේ පොඩි capsules, syrups හැටියට හදලා පිට රට යවන ආයතනයක් පිළිබඳව ඔවුන් එතැන කථා කරලා තිබුණා. මම හිතන හැටියට අපි මේවා ගැන තමයි බලන්න ඕනෑ. අපේ අපනයන ආර්ථිකය තවදුරටත් වැඩි දියුණු කරන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. කුරුඳුවලට වඩා එහාට ගිහිල්ලා අද තත්ත්වය ගැන පොඩ්ඩක් කථා කරන්න මම බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැනට විනාඩි පහකට කලින් HSBC බැංකුවට call එකක් දීලා ඇහුවා, දැන් මේ වෙලාවේ ඩොලර් එක විකිණෙන්නේ රුපියල් කීයකටද කියලා. එම බැංකුවෙන් SMS එකක් එවලා තිබෙනවා. මම ඒ SMS එක කියවන්නම්: "Note selling at Rs. 134.65". මේ ටික කාලයට 134.65ක අගයකට රුපියල බාල්දු වෙලා තිබෙනවා. මොකක්ද, මේකට හේතුව? කාට හෝ කියන්න පුළුවන්, එම රුපියල අවප්‍රමාණය වීම එක පැත්තකින් අපනයනයට හොඳයි කියලා. ඔව්, ඒකේ එක පැත්තක් තිබෙනවා. නමුත් ජන ජීවිතයට මොකද වෙන්නේ? මේ විධියට රුපියල බාල්දු වෙන කොට සාමාන්‍ය ජනතාවගේ ජීවනෝපායට මොකද වෙන්නේ? මේ විධියට රුපියල බාල්දු විය යුතුද? එවිට ජනතාවගේ ජීවන රටාවට මොකද වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න, යුද්ධයෙන් පස්සේ සෑහෙන කාලයක් ඩොලරයේ අගය රුපියල් 109ට තියා ගත්තා. ඊට පසුව ඩොලරයට සාපේක්ෂව රුපියල 134ට අවප්‍රමාණය වුණා. ජනාධිපතිවරයා අය වැය ලේඛනය ඉදිරිපත් කළ වෙලාවේ, හදිසියේම, මේ රුපියල අවප්‍රමාණය කිරීමත් එක්ක ටික දවසකට පසුව ඩොලරයට සාපේක්ෂව -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳටම දන්නවා, මෑත කාලයේදී මේ ඩොලර් එකේ ශක්තිමත් වීම මත අපේ රුපියල විතරක් නොවෙයි, සියලුම කලාපීය මුදල් අවප්‍රමාණය වෙලා තිබෙනවා කියලා. ඔබතුමා දන්නවා, ඇමෙරිකන් ආර්ථිකය ශක්තිමත් වන කොට, ඒ වාගේම යුරෝපා හවුල දුර්වල වෙන කොට සල්ලි ඇමෙරිකාවට ගලා ගෙන යන බව. ඔබතුමා මට වඩා හොඳට දන්නවා, එතකොට ඇමෙරිකන් ඩොලරය ශක්තිමත් වන බව. ඒ නිසා පිට - exogenous - හේතූන් අපි බලන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්, ඔබතුමා කියන කථාවේත් යම් කිසි ඇත්තක් තිබෙනවා. මම ඒක පිළිගන්නවා. නමුත් මගේ කථාවේදී මම මෙය ඊට වඩා සවිස්තරාත්මකව ඉදිරිපත් කරන්නම්.

ගරු ඇමතිතුමනි, ඩොලරයට සාපේක්ෂව 109ට තිබුණු රුපියලේ අගය 134ට ගිය අවස්ථාවේ ඇමෙරිකාවේ green shoots තිබුණේ නැති බව ඔබතුමා හොඳට පිළිගන්නවා. එදා ඇමෙරිකාවේ තිබුණේ, QE1, QE2, QE3. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේම තර්කය මම නැවත පෙරළලා ඔබතුමාටම ඉදිරිපත් කරනවා. එතැනදී ඔබතුමා කියන exogenous වැඩ පිළිවෙළ තිබුණේ නැහැ. ඒ කාලයේ ඇමෙරිකාවට ඇමෙරිකන් ඩොලර් ගලාගෙන ගියේ නැහැ. ඇමෙරිකන් ඩොලර් ඇමෙරිකාවෙන් වෙන රටවලට ගලාගෙන ආවා. වෙන රටවලට ගලාගෙන ආවාට, අපේ රටේ තිබුණු ආර්ථික කළමනාකරණයේ දුර්වලතා නිසා මේ රුපියල කඩා වැටුණු බව ඔබතුමාත්, මමත් හොඳටම දන්නවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අනේ, ඇමතිතුමනි, -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ විධියටම ඉන්දියානු රුපියල ඇතුළු අනෙක් currencies සියල්ලක්ම ඒ වාගේ පහළට වැටිලා තිබෙනවා කියන එක ඔබතුමා පිළිගන්නේ නැද්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමා, ඒ අවස්ථාවේදී අනෙක් රටවල currencies පහළට වැටුණේ නැහැ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
වර්තමානයේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

වර්තමානයේ යම් කිසි විධියකට කඩා වැටීමක් තිබෙන බව මම පිළිගන්නවා. නමුත් ඒක නොවෙයි, මම කියන්නේ. මම කියන්නේ ඩොලරයට සාපේක්ෂව 109ට තිබුණු රුපියලේ අගය 134කට කඩා ගෙන වැටුණාය කියන එකයි. මම කියන්නේ ගිය අවුරුද්දේ මැද හරියේදීයි. ඊට පස්සේ මෙය 129ක අගයකට ඉහළ ගිහිල්ලා නැවතත් අද වන කොට 134.65කට අඩු වෙලා තිබෙනවා. දැන් මෙතැන මොකක්ද වෙන්නේ කියලා අපි පොඩ්ඩක් ගැඹුරින් බලන්න ඕනෑ. ඇමෙරිකාවට මුදල් නැවත සංක්‍රමණය කිරීම එක හේතුවක්. හරි. නමුත්, ඊට වඩා පුළුල් හේතුවක් තිබෙනවා. ඒක තමයි අපේ අපනයනය කඩා වැටීම.

ගරු අගමැතිතුමා කිව්වා, එතුමාගේ ආසනයේ කර්මාන්තශාලා දෙකක් වැහුණා කියලා. එකකින් රක්ෂා 500ක් නැති වුණා කිව්වා. අනෙක් එකින් රක්ෂා 250ක් නැති වුණා කිව්වා. ඒ අපනයන කර්මාන්තයේ කඩා වැටීම. ගරු ඇමතිතුමනි, අපනයන කර්මාන්තය කඩා වැටුණා නම් කිසිසේත්ම රුපියල ශක්තිමත්ව තබා ගන්නට බැරි බව ඔබතුමා හොඳට දන්නවා.

ඇත්ත වශයෙන්ම මොකක්ද වුණේ කියලා අපි පොඩ්ඩක් කල්පනා කරලා බලමු. ඩොලර් එකක අගය රුපියල් 109ට, 114කට තබා ගෙන හිටපු කාලයේ අපි මූල්‍ය ප්‍රතිපත්තියත් ලිහිල් කළා. මේක තමයි මෙතැන තිබෙන වැරැද්ද. මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම තුළ තමයි අපනයන අඩු වෙලා ආනයන වැඩි වෙන්නේ. මම මේක විග්‍රහ කරන්නම්.

අඩු පොලියට ණය ගන්න පුළුවන් වෙලාවේ හුගක් දෙනා ගිහිල්ලා ණයට බඩු ගන්නවා. මහ බැංකුවේ අධිපතිවරයා දවසක් කියනවා මා අහගෙනයි, " 'Hit Ad' එකේ සයිස් එක බලන්න" කියා. "Hit Ad" එක ලොකු වෙනවා නම්, මෝටර් සයිකල් විකිණෙනවා, refrigerators විකිණෙනවා, televisions විකිණෙනවා, වාහන විකිණෙනවා. නමුත් මේ කිසිම දෙයක් ලංකාවේ නිෂ්පාදනය කරන දේවල් නොවෙයි ගරු අගමැතිතුමනි. මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම තුළින් සිද්ධ වුණේ, ආනයනය වැඩි වීම සහ රුපියල ශක්තිමත්ව 109ට කෘත්‍රිම ලෙස තබා ගැනීම තුළ අපනයනය කඩා වැටීමයි. ස්වායත්ත ආර්ථික විද්‍යාඥයෝ විවාදයකින් තොරව මේක පිළිගන්නවා. [බාධා කිරීමක්]

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

යුරෝපයේ ආර්ථිකයක් කඩාගෙන වැටුණා. ඒ අනුව අපට ගෙවන ගෙවීම් ඒ අයට ගෙවා ගන්නට බැරි වුණා. මේ නිසා අපේ කර්මාන්තශාලාවල නිෂ්පාදනය අඩු වුණා. ඒක තමයි මේකට හේතුව වෙලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම හොඳයි ගරු අගමැතිතුමනි. මෙතැනදී එක හේතුවක් හැටියට යුරෝපයේ ඒ ඉල්ලුම අඩු වීම අපට කියන්නට පුළුවන් ගරු අගමැතිතුමනි. නමුත් ඇත්තවශයෙන්ම තරගකාරිත්වයෙනුත් අප බොහෝදුරට අඩු වී තිබෙනවා. අපට තරගකාරිත්වය පවත්වා ගන්නට පුළුවන් වුණා නම් අපේ අපනයන කඩා වැටෙන්නේ නැහැ. ගරු අගමැතිතුමනි, ඇලොයි ජයවර්ධන මැතිතුමා හේතුවක් හැටියට මෙතැන කියන්නේ, ණය පොලිය සියයට 18යි ලු. සියයට 18ක පොලියට ණය අර ගෙන අප අපනයන තරගකාරිත්වය තබා ගන්නේ කොහොමද කියා එතුමා අහනවා. අපත් එක්ක තරගයට බංග්ලාදේශය ඉන්නවා; වියට්නාමය ඉන්නවා. සියයට 18ක පොලියට ණය අර ගෙන ඒ වාගේ අනෙක් රටවල් එක්ක අප තරග කරන්නේ කොහොමද?

අනෙක් කාරණය ගරු අගමැතිතුමනි, අපට GSP Plus එක නැති වුණු බව ඔබතුමා හොඳට දන්නවා. GSP Plus එක තිබුණා නම් එතැන සියයට 10ක, 12ක වාසියක් තිබෙනවා. එතකොට GSP Plus එක තිබුණා නම්, අර පහත වැටෙන තරගකාරිත්වය නැවත ලබා ගන්න අපට හැකියාවක් තිබුණා. දැන් නැවතත් GSP Plus එක ලබා ගන්න රජය සමහරවිට ඉල්ලුම් පත්‍රයක් දාවි කියා පත්තරවල කියා තිබුණා මා දැක්කා. මා හිතන හැටියට ඉල්ලුම් පත්‍රයක් දැම්මොත් ඒක හොඳයි. මොකද, යම් කිසි විධියකින් GSP Plus එක නැවත ලබා ගන්න පුළුවන් වුණොත් ඔබතුමා කියන ඔය තරගකාරිත්වය නැවත ගොඩ නඟා ගන්න පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරුමන්ත්‍රීතුමනි, දැන් අප වෙළඳ ශේෂය අර ගෙන බලමු. අපේ අපනයන, ආනයනය වැඩ කටයුතු සිද්ධ වෙන්නේ කොහොමද කියා අප මනින්නේ වෙළඳ ශේෂයෙන් නේ. 2010 දී අපේ වෙළඳ ශේෂ හිඟය තිබුණේ ඩොලර් බිලියන 4.8යි. 2012 වෙනකොට වෙළඳ ශේෂ හිඟය ඩොලර් බිලියන 9.5 වෙනතුරු වැඩි වෙලා තිබෙනවා. හිඟය දෙගුණ වෙලා තිබෙනවා. හිඟය දෙගුණ වෙලා තිබෙන්නේ එක හේතුවක් නිසාය කියා අපට කියන්නට බැහැ. එක හේතුවක් නිසා අපේ අපනයනය අඩු වෙනවා නම්, ඒ වෙනුවට වෙන විකල්පයක් සොයා ගන්න රජයක් හැටියට උත්සාහ කරන්නට ඕනෑ. ඒකට තමයි අණ්ඩුවක් පිහිටුවා තිබෙන්නේ. ඒකට තමයි නිලධාරින් පත් කර තිබෙන්නේ. ඒකට තමයි "ඔව් අප මේ රටේ ආර්ථිකය ඉහළ තත්ත්වයකින් පවත්වාගෙන යනවා"ය කියා ඡන්දය අර ගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කිව්ව ඔබතුමාගේ ආසනයේ කර්මාන්තශාලා දෙක විතරක් නොවෙයි මේ රටේ වැහිලා තිබෙන්නේ. 2012 දී ඇහලුම් අපනයනය ඇමෙරිකන් ඩොලර් සියයට 12කින් අඩු වෙලා තිබෙනවා. සම්භාණ්ඩ ගැන ඔබතුමා කථා කළා. සම්භාණ්ඩ අපනයනය ඇමෙරිකන් ඩොලර් සියයට 15කින් අඩු වෙලා තිබෙනවා. රබර් ගැන එක මන්ත්‍රීවරයෙකු කථා කළා. රබර් අපනයනය ඇමෙරිකන් ඩොලර් සියයට 3කින් අඩු වෙලා තිබෙනවා. සියලුම කර්මාන්ත නිෂ්පාදන අපනයනය ඇමෙරිකන් ඩොලර් සියයට 8කින් අඩු වෙලා තිබෙනවා. ඔය මා කිව්වේ, 2012 වර්ෂය ගැනයි. අද තත්ත්වය මීටත් වඩා භයානකයි. මා මේ දැන් JAAF එකෙන් check කර බැලුවා. JAAF එකේ අලුත්ම දත්ත තිබෙනවා. 2013 අප්‍රේල් මාසයේ දත්ත තිබෙනවා. 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 17.2කින් අපනයන අඩු වෙලා තිබෙනවා. එතකොට මා කියන්නේ -[බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

අප චීනයත් එක්ක ඇති කර ගන්නා වෙළඳ ගිවිසුම අනුව, අපේ garment කර්මාන්තයේ නිෂ්පාදන අවශ්‍ය ප්‍රමාණයට ගන්න චීනය ලැහැස්ති බව ඔබතුමාට මා කියන්නට කැමතියි. එය ඉතාම හොඳ බවට JAAF එක ප්‍රකාශයක් කළා. ඔබතුමා දන්නවා ඇති.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

දිගින් දිගටම ඔබතුමාට මගේ කාල වේලාව ලබා දෙනවා. ඇත්ත වශයෙන්ම මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නම්. දැන්

මම පිළිතුරු බලාපොරොත්තු වෙන්නේ නැහැ. පස්සේ කියන්න. අපේ අපනයනවලින් සියයට කීයක් චීනයට අපනයනය කරනවාද? සියයට එකයි. [බාධා කිරීමක්] වැඩි කර ගන්නට පුළුවන් නම් හොඳයි. ඒක තමයි මා කියන්නේ. අප විකල්ප සොයා බලන්න ඕනෑ. ඒ ගැන තමයි අප අවුරුදු 10ක් තිස්සේ කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවතත් මේ ගරු සභාවට කියන්න කැමැතියි මීට අවුරුදු 10කට කලින් අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 35ක පමණ ප්‍රමාණයක් අප අපනයනය කළ බව. නමුත් අවුරුදු 10කට පස්සේ අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ප්‍රමාණය සියයට 17ට වඩා අඩු වෙලා! මේ අවුරුදු දහයේ මේ ආර්ථිකය පරිපාලනය කළේ කවුද? ඒ ඔබතුමන්ලා. මම එහෙම කිව්වාට සමාවෙන්න. ආර්ථික කළමනාකරණයේ ඒ නොහැකියාව තුළ තමයි අපේ අපනයනය සියයට 50කින් කඩා වැටිලා තිබෙන්නේ. ඒක එහෙම නොවෙයි කියන්න කාටවත් බැහැ.

මම මේ පිළිබඳව සොයා බැලුවා. මා ළඟ දැන් තිබෙනවා වැදගත් සංඛ්‍යාලේඛන ටිකක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මේක අහගන්න. ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා වූ කාලය තුළ සමස්තය මා කියන්නම්. ඇඟලුම්වලින් අප හොයා ගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 1.3යි. තේවලින් ඩොලර් මිලියන 440යි. රබර්වලින් ඩොලර් මිලියන 260යි. පිට රට වැඩ කරන අපේ අම්මලා, අක්කලා, නංගිලා ඩොලර් මිලියන 2,109ක් මෙරටට එවා තිබෙනවා. වෙන රටවල් සමඟ ගනුදෙනු කරලා ආදායම් හැටියට අප හම්බ කර ගෙන තිබෙන්නේ ඔන්න ඔය මුදල් ප්‍රමාණය තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රජය අරගෙන තිබෙන ණය ප්‍රමාණය කොපමණද කියලා බලන්න. වෙළෙඳ ශේෂ හිඟය පියවා ගන්න අපි යම් කිසි ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕනෑ. අපට පිට රටින් ලැබෙන ඩොලර් ප්‍රමාණය මදි නම් අපට අවශ්‍ය ඒ ඩොලර් ප්‍රමාණය ණයට ගන්න ඕනෑ. මම කිව්වා නේ, අපි වැඩිපුරම විකුණා තිබෙන්නේ ඇඟලුම් නිෂ්පාදන කියලා. එයින් අප ලැබූ ආදායම ඩොලර් 1,325යි. නමුත් රජය ගත්ත ණය -භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මඟින්- ඩොලර් බිලියන 1.5යි. එහෙම නැත්නම් ඩොලර් මිලියන 1,582යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව රජය අවුරුද්දේ පළමුවෙනි මාස හතරේදී පමණක් අප ඇඟලුම්වලින් අපනයන ආදායම හැටියට ලබා ගත්ත මුළු ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වලින් ණය අරගෙන තිබෙනවා. ඊට අමතරව තවත් ඩොලර් මිලියන 546ක් ණය වශයෙන් අරගෙන තිබෙනවා. එතකොට, අපනයනය කරලා ලබා ගන්නවාට වඩා ඩොලර් බිලියන 2.1 අප ණයවලින් ලබා ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී තමයි මේ ප්‍රශ්නය පැන නඟින්නේ.

ඊටත් අමතරව අපි අලුතින් පටන් ගත්ත ක්‍රියාවලියක් තිබෙනවා. ඒක තමයි, වාණිජ බැංකුවලට ණය ගන්න කියන එක. මෙච්චර කල් ආණ්ඩුවෙන් නේ ණය ගත්තේ. මේ ළඟදී ලංකා බැංකුවට කිව්වා ඩොලර් මිලියන 500ක ණයක් ගන්න කියලා. මට මතක නැහැ පොලිය කීයද කියලා. ඩොලර් මිලියන 500ක ණයක් ගත්තා. මේ ගත්ත ඩොලර් මිලියන 500ක ණයට මොකද වුණේ? ඒ ඩොලර් මිලියන 500ක ණය අපනයනකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත දියුණු කර ගන්න දුන්නාද? නැහැ. අපට ආරංචි වුණු විධියට ඒ මුදල SriLankan Airlines එකේද කොහේද ණයක් ගෙවන්න -ගෙවා ගන්න බැරි බිලක් ගෙවන්න- පාවිච්චි කර තිබෙනවා. ඉතින්, ඔය විධියට ණය අරගෙන අපට මේ රට සංවර්ධනය කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශාල ආන්දෝලනයකට තුඩු දුන් තවත් කාරණයක් තිබෙනවා. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ආණ්ඩුව අණ කර තිබෙනවා, ඩොලර් බිලියනයක ණයක් ගන්න කියලා. මම එදා උපදේශක කාරක සභාවේදී එහි සභාපතිවරයාගෙන් මේ පිළිබඳව ඇහුවා. මම ඇහුවා, "ඔබතුමා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය දෙන්නේ ඩොලර්වලින්ද, රුපියල්වලින්ද, මොනවාටද මේ ණය දෙන්නේ?" කියලා. එතුමා කිව්වා, "ගරු මන්ත්‍රීතුමනි, මම ණය දෙන්නේ රුපියල්වලින්" කියලා. එහෙනම් මොනවාටද ඩොලර්වලින් ණයක්? ජාතික ඉතිරි කිරීමේ බැංකුවට මේ වාගේ අකරතැබ්බයකට පත් කරන්නේ ඇයි? එතුමා කියනවා, "රජයේ අවශ්‍යතාවක් නිසා අපට ගන්න සිද්ධ වෙනවා" කියලා. ඒ වාගේම DFCC හා NDB කියන බැංකු දෙකටත් කියා තිබෙනවා ඩොලර් මිලියන 250 ගණනේ ණය ගන්න කියලා. ආණ්ඩුවත් එක්ක සාකච්ඡා කරලා පසු ගිය දිනවල ඒකට ලකලෑස්ති වුණා. නමුත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ඩොලර් බිලියනයේ ණයවත්, DFCC එකට හා NDB එකට ඩොලර් 250 බැගින් වූ ණයවත් ගන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා කියලා තමයි අපට ආරංචි වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්න හදන්නේ අපනයනය කඩා වැටීමත් සමඟ ඩොලරයත් රුපියලත් අතර තිබෙන සම්බන්ධතාවේ පහත වැටීම -බිඳ වැටීම- ගැනයි. මම මේ දේශපාලන කථාවක් කරනවා නොවෙයි. ඇත්ත වශයෙන්ම අප ණය පඔගාලක පැටලෙමින් සිටින බව අසතුටෙන් හරි මට කියන්න සිද්ධ වෙනවා. මේ පිළිබඳව අප කොයි තරම් කිව්වත් ආණ්ඩුව කියන්නේ, "නැහැ, කිසිම ගැටලුවක් නැහැ, ඉතාම හොඳට අපි වැඩ කටයුතු කරගෙන යනවා" කියන එකයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව කොයි තරම් හොඳට වැඩ කටයුතු කරගෙන යනවාද කිව්වොත්, MOODY's කියන ආයතනය අපේ රටේ ශ්‍රේණිගත කිරීම පහළට දැම්මා.

ඒ ශ්‍රේණිගත කිරීම පහළට දමලා, මොකක්ද කියලා තිබෙන්නේ? ඒගොල්ලන් කියනවා, "… following the sizable loss of foreign reserves in 2011, but without enough improvement to support a positive rating action at this time; …." කියලා. ඒගොල්ලන් කියනවා, රුපියල කෘත්‍රිමව පවත්වා ගැනීම තුළ, රජය අතිශයින් ඔවුන්ගේ සංචිත විකුණා දැමීම තුළ සහ විදේශ ණය ලබා ගැනීම තුළ ඉතාම අමාරු අවස්ථාවකට පත් වෙලා සිටිනවා කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම විනාඩියකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will give him two minutes from my time.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you are given two minutes from the time allotted to the Hon. Lakshman Kiriella.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you, Hon. Lakshman Kiriella.

මා කියමින් සිටියේ, මේ ප්‍රශ්නය දිහා අපි පුළුල්ව බලන්න ඕනෑ කියන එකයි. අගමැතිතුමා කියන කථාවත් හරි. සරත් අමුණුගම ඇමතිතුමා කියන කථාවත් හරි. මම කියන කථාවත් හරි. විපක්ෂයේ අපි විවේචනයක් ඉදිරිපත් කළාම අපට හැම වෙලාවෙම මඩ ගහන්න එපා. අපට දේශ ද්‍රෝහියන් කියලා කියන්න එපා. අප කරන විවේචන, විවේචන හැටියට පිළිගන්න ඔබතුමන්ලාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා, බොහොම ස්තුතියි.

[අ.භා. 3.27]

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආර්ථික විශේෂඥයකු වන හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වනවා. විශේෂයෙන්ම එතුමා කථා කළා රුපියල බාල්දු වීම සම්බන්ධයෙන්. අපට මතකයි, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ සංවෘත ආර්ථිකයක් මේ රටේ ක්‍රියාත්මක වුණා. නමුත් ඊට පසුව බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ රජය 1977 දී මේ රටේ ආර්ථිකය විවෘත ආර්ථිකයක් බවට පරිවර්තනය කළා. ඒ පරිවර්තනය කිරීමේ දී තමයි රුපියලේ අගය පාවෙන්න හැරලා, රුපියල බාල්දු කරවන වැඩ පිළිවෙළ පටන්ගත්තේ. අදත් අපි ඒ විවෘත ආර්ථිකය ඔස්සේ මේ ගමන ගියත්, රජය වෙනස් වුණත්, අපි ඊට වඩා මානුෂිකව කල්පනා කරලා කටයුතු කරනවා. හැබැයි, ඒ කාලයේ වාගේ මේ රටේ රාජ්‍ය දේපොළ විකිණීම සහ රාජ්‍ය දේපොළ අවසතු කිරීම අප කළේ නැහැ.

රාජ්‍ය ආයෝජන කෙරෙහි අපේ විශ්වාසයක් තිබෙනවා. රාජ්‍ය ආයෝජන කෙරෙහි මේ රටේ ජනතාවගේත් විශ්වාසයක් තිබෙනවා. රාජ්‍ය ආයතනයක සහ පෞද්ගලික ආයතනයක රැකියා සම්බන්ධයෙන් පත්තරයක පළ වෙලා තිබුණොත්, රාජ්‍ය ආයතනයේ වැටුප අඩු වුණත් රාජ්‍ය ආයතනයේ රැකියාවක් සඳහා ඉල්ලුම් කරනවා මිසක්, පෞද්ගලික ආයතනයේ රැකියාවකට යන්න අපේ රටේ ජනතාව කැමැත්තක් දක්වන්නේ නැහැ. ඒ තරමටම මේ රටේ ජනතාව මුල් බැසගත් මතවාදයක් තිබෙනවා; රාජ්‍ය ආයෝජන කෙරෙහි මේ රටේ ජනතාවගේ විශ්වාසයක් තිබෙනවා.

අධිවේගී මාර්ග, ගුවන් තොටු පොළවල්, වරායවල් වැනි මහා දැවැන්ත ආයෝජනවලට මේ රජය අතගහලා තිබෙනවා. ඒවා ගැන විවේචන ඇති. ප්‍රශ්න ඇති. නමුත් ඒවා මේ රටේ අනාගත අවශ්‍යතාවන්වලට ගැළපෙන පරිදි සැලසුම් කර තිබෙනවා. අපේ රජය වෙනස් වුණත් මේ හදපු දේවල් අපි ආපසු අරගෙන යන්නේ නැහැ. ඒවා රටේ ජනතාවට දායාද හැටියට ඉතිරි වෙලා තිබෙනවා. මේවායේ ප්‍රතිලාභ ලැබෙන්නේ මේ රටේ පුරවැසියන්ටයි; මේ රටේ ඊළඟ පරම්පරාවටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ රටේ පුරවැසියන්ට ඒවා ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද මේ රටේ ආර්ථිකය ගැන කථා කළා. රටේ ආර්ථිකය ගැන කථා කරනකොට අපේ දේශීය නිෂ්පාදන ගැනත් අප කථා කළ යුතුයි. විශේෂයෙන්ම අද දින 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මේ නියෝග ඉදිරිපත් කිරීමෙන් අපේ රටේ කුරුඳු කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ලෝක වෙළෙඳ පොළට ඉදිරිපත් කර තිබෙන "Cassia" කියන විකල්ප නිෂ්පාදනය නිසා අපේ කුරුඳු වගාව අනාගතයේ දී අනතුරකට පත් වෙයි කියන බියක් ඇති වී තිබෙනවා. අපේ රටින් වර්ෂයකට කුරුඳු මෙට්‍රික් ටොන් 13,000ක් පමණ අපනයනය කරනවා. එයින් අපට සැලකිය යුතු විශාල ආදායමක් ලැබෙනවා. කුරුඳු කර්මාන්තයේ නියැළීමෙන් තුන් ලක්ෂ පනස් දහසකට අධික පවුල් සංඛ්‍යාවක් ජීවත් වනවා. ඒ වාගේම, කුරුඳු නිෂ්පාදනයෙන් රුපියල් මිලියන 100කට අධික විදේශ විනිමයක් අපට ලැබෙනවා.

හලාවත ඉඳලා මාතරට යනතෙක් මුහුදු තීරයේ කුරුඳු වගාවෙන් මහ බද්ද අය කරන්න විශේෂිත කණ්ඩායමක් ඉතිහාසයේ හිටියා. මම හිතන හැටියට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඒක දන්නවා ඇති.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මා ඒ ගැන කථා කළා. ඔබතුමා ඒ අවස්ථාවේ සිටියේ නැහැ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
බොහොම හොඳයි. මම ඔබතුමාගේ කථාව අහගෙන සිටියා. මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි, අපි ආනයන බදු සම්බන්ධයෙන් වූ රේගු සංකේතාංක වර්ගීකරණයේ ජාත්‍යන්තර ප්‍රමිතියට අවතීර්ණ වෙලා තිබෙනවා. මේ නියෝග තුළින් ඒකත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඕසෝන් වියන සුරැකීම, වියනා සම්මුතිය, මොන්ට්‍රියල් සන්ධානය වැනි එකහත්වයන් තිබෙනවා. එවැනි ඉතාමත් අර්ථවත් වැඩ පිළිවෙළක් සඳහා අද මේ නියෝගයන් ගෙනැවිත් තිබෙනවා. මම හිතනවා අපි ඔක්කොම එකතු වෙලා, නිෂ්පාදනය තුළින් අනාගතයේ වෙළෙඳ ශේෂය අඩු කර ගන්නේ කොහොමද කියන එක ගැන ඉතාම හොඳ අර්ථවත් සාකච්ඡාවක් කරන්න ඕනෑ කියලා. අපි නිෂ්පාදනයට නැඹුරු වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ නිෂ්පාදන ගැන, වතු ආර්ථිකය ගැන කථා කරන කොට අපට පෙනෙන්න තිබෙන දෙයක් තමයි මහා පරිමාණයේ වතු ආර්ථිකය අද යම් ප්‍රමාණයකට කඩා වැටිලා තිබෙන බව. වතු ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ නිකම් නොවෙයි. ඒකට හේතු තිබෙනවා. විශේෂයෙන්ම විශාල වතු වෙනුවට යැපීම් පදනම මත කරන්නා වූ කෘෂිකර්මාන්තය

තුළින් සෑම ක්ෂේත්‍රයකම අපේ රටේ විශාල ඵලදායිතාවක් අද පෙන්නුම් කර තිබෙනවා. අපි දන්නවා, අද ඌව පළාතේ විතරක් මහා පරිමාණයේ වතුවලින් හෙක්ටෙයාර් 3,500කට වැඩි ප්‍රමාණයක තේ වගාව අත්හැර තිබෙන බව. අපේ අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් පෙන්වා දී තිබුණා, මේ හෙක්ටෙයාර් 3,500 කුඩා කැබලිවලට කඩලා මේ රටේ ශ්‍රමය වගුරුවන; වැඩ කරන ජනතාවට, තරුණ පිරිසට ඒ ඉඩම් බෙදා දීලා යැපීම් පදනම මත වගා කිරීම ගැන. තමන්ගේ මුළු පවුලම එකතු වෙලා ශ්‍රමය වගුරලා සුළු බිම් කොටසකින් ඉතාමත් හොඳ ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් ආර්ථික ඒකක බවට පත් කිරීමේ කුටුම්බ ශක්තිමක් කිරීමේ නව වැඩ පිළිවෙළකට; ආර්ථික පෙරළියකට මේ වර්ෂයේ අය වැයෙන් මේ රජය අතගහලා තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි පහත රට තේ ගොවියා. පහත රට තේ ගොවියා කුඩා බිම් කැබැල්ලක ඉතාම සශ්‍රීක ලෙස තේ වගාව කරලා, ඉතාම හොඳ නිෂ්පාදනයක් ලබලා ඒවාට ඉතාම ඉහළ මිලක් ලබා ගන්න පුළුවන් ශක්තිය ඇති කර ගෙන තිබෙනවා.

මම හිතන හැටියට වතු ආර්ථිකය පිළිබඳව අපට ලබා ගන්න තිබෙන හොඳම ආදර්ශය ඉන්දියාවයි. අද ඉන්දියාවේත් ඉතාමත් ශක්තිමත් වෙලා තිබෙන්නේ යැපීම් පදනම මත කරන්නා වූ කෘෂිකර්මාන්තයයි. ඊළඟට අපි දන්නවා, තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස්, මුං, මෑ, කව්පි, අඹ කාලෙට අඹ, දිවුල් කාලයට දිවුල්, දෙහි කාලයට දෙහි, දොඩම් කාලයට දොඩම්, වට්ටක්කා, පුහුල් යන මේ වගාවන් ඔක්කොම තිබෙන්නේ ඌව පළාතේ බව. මේ රටේ දළ ජාතික නිෂ්පාදිතයේ දායකත්වය ලැබෙන්නේ සියයට 4යි. ඉතින් මේක මහා පුදුමයක්. මම දන්නේ නැහැ, මේ බැංකු වාර්තා පිළිබඳව. මම විමතිය පළ කරනවා, සියයට 4ක් වන්නේ කොහොමද කියලා. ඊළඟට අපේ වැලි, ගල්, ගඩොල්, උළු. ඒ විතරක් නොවෙයි. මහා දැවැන්ත වූ ශ්‍රම බලකායක් ඌව පළාතේ වැඩ කරනවා. ඒ වැඩ කරන ශ්‍රම බලකාය දැක ගන්න පුළුවන් එක අවස්ථාවක් තමයි සිංහල අවුරුද්ද. ඒ කාලයට ඒ වැඩ කරන ජනතාව ඌව පළාතට ප්‍රවාහනය කරන්න මුළු ලංකාවේම ඩිපෝවලින් බස් දමනවා.

මේ දේ සිදු වෙලා තිබෙන්නේ මේ රටේ සෑම පළාතකටම සමසේ දළ ජාතික නිෂ්පාදිතයේ දායකත්වය ලබා දෙන්න පුළුවන් ශක්තිමත් පළාත් බවට පත් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මේ රජය දැනටමත් ග්‍රාමීය සංවර්ධනයට අත ගහලා තිබෙන නිසායි; මාර්ග පද්ධතිය දියුණු කර තිබෙන නිසායි. ඒක අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දන්නවා, පාරවල් කාපට් කළ නිසා බදුල්ලේ ඇති වෙලා තිබෙන සංවර්ධනය. ඕස්ෝන් වතුර සමාගමේ අයිතිකරු මාත් එක්ක කිව්වා, ඔහු කන්ටේනර් දෙකක ගෙන ගිය බඩු දැන් එක කන්ටේනරයක ගෙන යන නිසා එක ගමනාන්තයකින් ඔහුට රුපියල් 22,000ක ලාභයක් තිබෙන බව. ඔහු මා එක්ක පෞද්ගලිකව ඒ ගැන කථා කළා. ඒ නිසා මේ රටේ සංවර්ධනයට අවශ්‍ය මාර්ග පද්ධතිය සඳහා මේ රජය මහා දැවැන්ත ආයෝජනයක් කර තිබෙනවා. අපට මේ ණය නිකම් දෙන්නේ නැහැ. අප ණය ගෙවන බව දන්න නිසා තමයි අපට ණය දෙන්නේ. කාලයක් අපට උසුළු විසුළු කළා, ණය ගන්න බැහැ, ණය දෙන්නේ නැහැ, ණය හම්බ වෙන්නේ නැහැ කියලා. අපට පැනලා ණය දෙනවා. මේ ණය අර ගෙන, අද මේ රටේ ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කරන, නිෂ්පාදනය වැඩි කරන, ඒ එන ආර්ථික අභියෝගවලට මුහුණ දෙන්න මේ රටේ ජනතාව ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි කුරුඳු කර්මාන්තය සම්බන්ධයෙනුත් සඳහන් කරන්න ඕනෑ. කුරුඳු කර්මාන්තය සම්බන්ධයෙනුත් තේ කර්මාන්තය සම්බන්ධයෙනුත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේවායේ ප්‍රමිතිය ගැන අපට විවිධ කථා බහ ඇහෙනවා; අප දකිනවා. ඒ කුරුඳුවලට අවශ්‍ය මූලික ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම, තේවලට අවශ්‍ය ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම පිළිබඳවයි. තේවලට ලී කුඩු ඩයි කර, කලවම් කරලා යවා තිබෙනවා. කුරුඳුවලටත් එහෙමයි. කුරුඳුවල මැද පුරවන ඒවාට ලී කුඩු යොදලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයන්ගෙන් බේරා ගෙන අලුත් විධියට මේ කර්මාන්තය අප නවීකරණය කරන්න අවශ්‍ය වනවා.

දළ ජාතික නිෂ්පාදිතයේ සියයට හතරේ ඉලක්කමෙයි අප ඉන්නේ. තනි ඉලක්කමෙයි ඌව පළාත ඉන්නේ. ඒ වෙන මොනවාවත් නිසා නොවෙයි, අප කරන නිෂ්පාදනවලට අගය එකතු නොකරන නිසායි. මා ඉතාමත් ආඩම්බරයෙන් අපේ ආර්ථික සංවර්ධන ඇමතිතුමාව මතක් කරනවා. ආර්ථික සංවර්ධන ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නවා අමරපාල පෙරේරා කියන මහත්මයා laboratory එකක් හදලා තිබෙන බව. මා හිතන හැටියට රුපියල් මිලියන 40ක්, 50ක් වියදම් කරලා තිබෙනවා, scientistsලා දාගෙන මේ නිෂ්පාදනවලට අගය එකතු කරන්න. අපනයනය කරන ගම්මිරිස්, කුරුඳු වාගේ දේවල්වල අතුරු නිෂ්පාදන කරලා ඒවාට අගය එකතු කරන වැඩ පිළිවෙළක් තිබෙනවා. අප දන්නවා, ඌව පළාතේ හැම දාම -දවස ගණනේ- රබර් කිරි බවුසර් 4ක්, 5ක් කොටටාවට එන බව. නමුත් අපට අඩු ගණනේ glove එකක් හදන්නවත් කර්මාන්ත ශාලාවක් අපේ පළාතේ - බිබිලේ - ඇති කරලා නැහැ. ඒ නිසා අපේ අයට රැකියාවල් නැති වෙලා තිබෙනවා. ඒ වාගේම අපට ලොකු විශ්වවිද්‍යාලයක් තිබෙනවා. ඒ තමයි ඌව විශ්වවිද්‍යාලය. අපේ කර්මාන්ත පුරය පැත්තකට දාලා, කර්මාන්ත පුරයේ හිටපු කර්මාන්තකරුවන් වෙනුවට තමයි අප මේ විශ්වවිද්‍යාල භූමිය අපේ බදුල්ලේ කර්මාන්ත පුරයට දුන්නේ. අපේ විශ්වවිද්‍යාලය අගය එකතු කරන විශ්වවිද්‍යාලයක්. තවම ඒ අගය එකතු වෙනවාද කියන කාරණයත්, ප්‍රාන්ත විශ්වවිද්‍යාලයක් හැටියට ඒ සඳහා ඌව පළාතේ ඉන්න අයට ලබා දෙන දායකත්වය කොපමණද කියන කාරණයත් අපට මතු කරන්න සිද්ධ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද ඔබතුමාගේ පියා වන වි.ජ.මු. ලොකුබණ්ඩාර හිටපු කථානායකතුමා ඌව පළාත ගැන ඉතාමත්ම ලොකු හැඟීමකින්, භක්තියකින් කථා කරපු, වැඩ කරපු නායකයෙක්. මා තමුන්නාන්සේට ඒ කාරණයත් මතක් කරනවා. මේ විශ්වවිද්‍යාලයෙන් සැබෑ ප්‍රයෝජනය අප ගන්නවාද කියන එක අපට ප්‍රශ්නයක්.

කුරුඳුවල වාගේම තේවල තිබෙන විවිධ රසායනික ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් අරගෙන ඒවාට අගය එකතු කරලා, යම් නිෂ්පාදන ක්‍රියාවලියකට යන්න පුළුවන් නම් මා හිතනවා මීට වඩා විශාල ආදායමක් මේ සියලු දේවලින් අපට ලබා ගන්න පුළුවන්කමක් තිබෙනවාය කියලා. මා මේ කාරණයත් මතක් කරනවා. 2012 දී අප වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 31,049ක් වෙනවා. ඒ අතරම මෙට්‍රික් ටොන් 14,435ක් පමණ අප 2012 දී අපනයනය කරලා තිබෙනවා. 2020 වන විට අප අවම වශයෙන් හෙක්ටෙයාර 50,000ක භූමි ප්‍රමාණයක් ඉලක්ක කර ගෙන අප ගමන් කළ යුතුයි. ඒ වාගේම අපනයන පරිමාව ගත්තොත් මෙට්‍රික් ටොන් 30,000කටවත් අප ළඟා විය යුතුයි. විශේෂයෙන් අප දන්නවා, අක්කර දහයක කුරුඳු තැළුවොත් ඒ කුරුඳු තළන මනුස්සයාට අක්කර පහක ආදායමක් ලබා දෙන්න ඕනෑ බව. ඒ කියන්නේ ආදායමෙන් දෙකෙන් පංගුවක්. කුරුඳු තැළීම ඉතා හොඳ ස්වයං රැකියාවක්. මේ පිළිබඳ අවශ්‍ය පුහුණුව වාගේම ඒ සඳහා අවශ්‍ය වන කට්ටල් ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණයත් මතක් කරනවා. මේ විෂයය භාර ඇමතිවරයා වන රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමා මොනරාගල දිස්ත්‍රික්කයේ රබර් වගාව, කොකෝවා වගාව, කුරුඳු වගාව විධිමත් කරන්න සහ

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

කුළු බඩු උයන් - spice gardens - ඇති කරන්න මහා විශාල වූ කැප කිරීමක් කරනවා. මා එතුමාත් මේ අවස්ථාවේ මතක් කරනවා. අපට තිබෙන අභියෝගය තමයි නිෂ්පාදනය වැඩි කිරීම. නිෂ්පාදනය වැඩි කරන්න නම් අප ආණ්ඩු පක්ෂය, විපක්ෂය හැටියට බලන්නේ නැතිව සියලු දෙනාම එකතු වෙලා මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙනි යන්න කටයුතු කරන්න ඕනෑ. එසේ කටයුතු කරමුයි කියලා යෝජනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු ඇමතිතුමා. මී ළඟට, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

[අ.භා. 3.40]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුඳු වගාව සම්බන්ධයෙන් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නියෝගවලට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. මොකද කුරුඳු වගාව කියන්නේ අවුරුදු සිය ගණනක් අපේ රටට විශාල ආදායමක් ලබා දුන්නු වගාවක්. ඒ නිසා මේ නියෝගවලට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපනයන බලවත් කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අනුව 2003 සිට 2013 දක්වා වූ අවුරුදු 10 තුළ අපේ අපනයනවල සාමාන්‍ය ගණන - average එක- තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,516ටයි. The average for the 10 years from 2003 to 2013 was US Dollars 1,516 million. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රමාණය ගිය මාසයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 696ට අඩු වෙලා තිබෙනවා - approximately from US Dollars 1,500 million to US Dollars 696 million. ඒ කියන්නේ අපයන අංශයේ සියයට 50ක අඩු වීමක් - a 50 per cent drop in the exports. මේක ඉතාමත් බරපතළ තත්ත්වයක්. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා මෙතැන නොසිටීම ගැන මම කනගාටු වනවා. මොකද එතුමා කිව්වා, යුරෝපයේ වෙළඳ පොළ කඩා වැටිලා කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බංගලාදේශය ගත්තොත් 2009 දී යුරෝපීය වෙළෙඳ පොළෙන් -European market එකෙන්- ඒගොල්ලන්ගේ කොටස - share එක- තිබුණේ සියයට 6.2යි. The share in 2009 was 6.2 per cent. 2011 දී ඒගොල්ලන් සියයට 11ක් දක්වා ඒ ප්‍රමාණය වැඩි කර ගෙන තිබෙනවා. 2009 දී European market එකේ බංගලාදේශයේ කොටස තිබුණේ සියයට 6.2යි . 2011 දී ඒ ප්‍රමාණය වැඩි කර ගෙන තිබෙනවා, සියයට 11.2ට. ගරු සරත් අමුණුගම ඇමතිතුමා ඉදිරිපත් කෙරුවේ වැරදි කරුණුයි. මම හිතන්නේ ඒකයි එතුමා කථා කරලා ගියේ. සියයට 50කින් අපේ අපනයන ආදායම අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම බංගලාදේශය, පාකිස්තානය වැනි ලංකාව වටේ තිබෙන රටවල් යුරෝපීය රටවලට වැඩි වැඩියෙන් භාණ්ඩ අපනයනය කරනවා. උදාහරණයක් වශයෙන් 2014 වර්ෂයේදී ඉන්දියාව යුරෝපයත් එක්ක නිදහස් වෙළඳ ගිවිසුමක් - Free Trade Agreement - එකක් අත්සන් කරනවා. එතකොට ඒ අයට හම්බ වනවා GSP වාගේ විශේෂ වරප්‍රසාද. ඉන්දියාව ඒක ගත්තොත් අපේ අපනයන වටිනාකම මීටත් වඩා කඩා ගෙන වැටෙනවා. අද මේ සම්බන්ධව බරපතළ තත්ත්වයක් තිබෙන්නේ. මම දන්නේ නැහැ, ගරු සරත් අමුණුගම ඇමතිතුමා මේ ගැන දන්නවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කන්ද උඩ රට පළාත ගැන උනන්දු වන මන්ත්‍රීවරයෙක්. අපේ මුළු රටේම ඇඟලුම් කර්මාන්තශාලා 800ක් තිබුණා. නමුත් දැන් 400ටත් අඩු ගණනක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ වසා තිබෙන කර්මාන්තශාලා ගණන මම කියන්නම්. හසලක, මොරයාය ඇඟලුම් කර්මාන්තශාලාවේ 750ක් වැඩ කෙරුවා. දැන් ඒක වසා දමා තිබෙන්නේ. එතකොට 28 ඇළ "ලිහිණි" ඇඟලුම් කර්මාන්තශාලාව වසා දමලා. කිඹුලා ඇළ garment factory එක වසා දමලා. උඩුදුම්බර කර්මාන්තශාලාව වසා දමලා. පහතහේවාහැට, ග්‍රේ ලයන් ඇපරල් ඇඟලුම් කර්මාන්තශාලාව වසා දමලා. යටිනුවර, ඇලැක්සැන්ඩ්‍රා garment factory එක වසා දමලා. කුණ්ඩසාලේ, තැන්ඩම් ලංකා කර්මාන්තශාලාව වසා දමලා. මේක garment factory එකක් නොවෙයි, මෙතැන හැදුවේ computer chips. මේ කර්මාන්තශාලාවේ සේවකයෝ 2,500ක් වැඩ කෙරුවා. මේ කර්මාන්තශාලාව ගිය අවුරුද්දේ වසා දමලා. සී.එන්. ඇඟලුම් කර්මාන්තශාලාව වසා දමලා. තිබ්බටුව, කුරුණෑගල පාරේ හීනටිගල garment factory එක වසා දමලා. මාතලේ, කළුන්දෑවල දේවාලය ළඟ තිබෙන garment factory එක වසා දමලා. මේ වාගේ කර්මාන්තශාලා විස්සක් වසා දමා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මහනුවර දිස්ත්‍රික්කයේ විතරක්. මේ තුළින් රැකියා 15,000ක්, 20,000ක් පමණ නැති වෙලා තිබෙනවා. මහින්ද චින්තනයේත් කියා තිබුණා, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කර්මාන්තශාලාවක් විවෘත කරලා රැකියා 500ක් දෙනවා කියලා. ඇත්ත වශයෙන්ම රජය කොපමණ කිව්වත්; මේ වහපු කර්මාන්තශාලා වෙනුවෙන් එකම කර්මාන්තශාලාවක්වත් මහනුවර දිස්ත්‍රික්කයේ විවෘත කරලා නැහැ. ඒ නිසා රැකියා 15,000ක්, 20,000ක් විතර නැති වෙලා තිබෙනවා. මේ විධියට කර්මාන්තශාලා වසා ගෙන යන අවස්ථාවක මහනුවර දිස්ත්‍රික්කය තුළ දැන් මොකක්ද කරන්න යන්නේ? ගුවන් තොටු පොළක් - airport එකක් - හදන්න යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නම් ඉල්ලුවේ නැහැ, මහනුවර දිස්ත්‍රික්කයකට ගුවන් තොටු පොළක්. මම හිතන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ සිටින කිසිම කෙනෙකු එවැනි දෙයක් ඉල්ලුවේ නැහැ. ඇයි මේ ඉල්ලපු නැති දෙයක් දෙන්නේ? අපි එවැනි දෙයක් ඉල්ලුවේ නැහැ. අමුණුගම ඇමතිතුමා මේ ගරු සභාවෙන් ගිහිල්ලා නේ. මම මේ ගැන එතුමාගෙන් අහන්න තමයි හිටියේ. පසු ගිය සතියේ එතුමා මේ ගරු සභාවේ කිව්වා, අධිවේගී මාර්ගය නුවරට හදනවා කියා. ඒක හොඳයි. අධිවේගී මාර්ගයක් හදනවා නම් පැයෙන් නුවරට යන්න පුළුවන් නම් airport මොනවාටද? මෙතැන ප්‍රශ්නය ඒක නොවෙයි. මේ ගුවන් තොටුපොල හදන විට අලුත් ගෙවල් 500ක් විතර කැඩෙනවා. පසු ගිය සතියේ ඒ අය මාව හම්බ වෙන්න ආවා. ද පිනැන්ස්, සෙලින්කෝ වැනි ඉඩම් කොටස් කර අලෙවි කරන අය ගුරුදෙනිය, හාරගම අවට බොහොමයක් ගෙවල් හදලා තිබෙනවා. මේ ළඟදි මිනින්දෝරු මහත්වරු ගිහින් -"සඳැල්ල" කියන up-market නිවාස යෝජනා ක්‍රමයේ ගෙවල් 500ම ආවරණය වන විධියට මැන්නා, airport එකට ගන්න කියා. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. මම නම් දන්නේ නැහැ, අපේ කවුරු ගුවන් තොටුපොලක් ඉල්ලා තිබෙනවාද කියා. පළාත් සභා මැතිවරණය එන නිසා මධ්‍යම පළාතට යම්කිසි වැඩක් කරන්න ඕනෑ. මධ්‍යම පළාත සම්පූර්ණයෙන්ම අමතක කරලා වැඩ කර තිබෙනවා. දැන් මධ්‍යම පළාතට මොකක් හෝ වැඩක් කරන්න ඕනෑ; මොකක් හෝ show එකක් දමන්න ඕනෑ කියන අදහසින් තමයි මේ ගුවන් තොටුපොල කථාව නිර්මාණය වෙලා තිබෙන්නේ.

අපේ විජිත් විජයමුණි ද සොයිසා අමාත්‍යතුමා ආයෝජන ගැන කිව්වා. විශාල මුදලක් ආයෝජනය වෙනවාය කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය කරන වියදම් ආයෝජන නොවෙයි. මේවා ණයට අරගෙන කරන දේවල්. අපේ රටේ ජනතාව අභිංසකයි. ඒ අය දන්නේ නැහැ, ආයෝජන කියන්නේ මොනවාද; ණයට අරගෙන කරන ඒවා මොනවාද කියා. හම්බන්තොට වරාය ගත්තොත් මේවා ණයවලින් කරන දේවල්. මේවා ආයෝජන නොවෙයි. නොරොච්චෝලේ විදුලි බලාගාරයත් අපි ණයට අරගෙන කරන්නේ. නමුත් රටක් බලාපොරොත්තු වන්නේ ණය අරගෙන කරන වැඩ නොවෙයි. රටක් බලාපොරොත්තු වන්නේ ආයෝජකයෝ ඇවිත් ඒ ගොල්ලන්ගේ මුදලින් ඉඩම් අරගෙන ඒ ගොල්ලන්ගේ මුදල්වලින් කර්මාන්තශාලා හදලා නිෂ්පාදන කටයුතු කිරීමයි. අන්න ඒකයි ආයෝජනය කියන්නේ. උදාහරණයක් වශයෙන් බැරක් ඔබාමා බුරුමයට යන විට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකන් ආයෝජකයන් 100 දෙනෙක් අරගෙන ගියා. ඒ ගොල්ලෝ ඉඩම් තෝරා ගත්තා. ඒ ගොල්ලෝ ඒ ගොල්ලන්ගේ මුදල්වලින් ඉඩම් ගත්තා. කර්මාන්තශාලා ආරම්භ කරනවා; නිෂ්පාදනය කරනවා; අපනයනය කරනවා. ආණ්ඩුවට කිසිම බරක් නැහැ. ලංකාවේ ඒ වාගේ ආයෝජනයක් නැහැ. මේ ඔක්කොම ණයට අරගෙන කරන ඒවා. අපේ රට ණය උගුලක හිර කර තිබෙන්නේ. දැන් ආණ්ඩුවක් මෙහෙම ණය ගන්නා විට මොකක්ද කළ යුතු වන්නේ?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Please give me one more minute, Sir, I will conclude.

ඔබතුමා දන්නවා, අයිස්ලන්තය කියන්නේ යුරෝපා හවුලේ රටක් බව. ඉතාමත්ම නවීන නීති පද්ධතියක් තිබෙන රටක්. අයිස්ලන්තයේ මුදල් ඇමතිවරයාත් අගමැතිවරයාත් මේ වාගේ ණය උගුලකට අයිස්ලන්තය අරගෙන ගියා. කිසිම ගණනක් ගන්නේ නැතුව ණය උගුලකට අරගෙන ගියා. මොකක්ද වෙලා තිබෙන්නේ? ඔහු මැතිවරණයෙන් පැරදුණා. නීතිය යටතේ අද අයිස්ලන්ත අධිකරණයේ අගමැතිවරයට මුදල් ඇමතිවරයාට නඩු දමා තිබෙනවා, අයිස්ලන්තය හිතා මතා ණය උගුලකට අරගෙන ගියා කියා. මේක අලුත් නීතිමය සංකල්පයක්. යුරෝපා රටක නීතියේ උත්තරීතරභාවය තිබෙන රටක ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන රටක හිටපු අගමැතිවරයාට විරුද්ධව අද නීති මාර්ගයෙන් කටයුතු කරනවා, රට ණය උගුලකට අරගෙන ගිහින් තිබෙනවා කියා. දැන් අපේ රටත් තිබෙන්නේ ඒ විධියට. අපේ අවුරුද්දේ ආදායම මදි ණය වාරික සහ පොලිය ගෙවන්න. අපේ රට ණය උගුලකට ක්‍රම ක්‍රමයෙන් සමීප වෙනවා. අන්න එම නිසා රජය කටයුතු කරන විට විශේෂයෙන් අපනයන සියයට 50කින් බැහැලා. කවුද මේකට වගකියන්නේ? මේ කාරණා ගැන රජයේ අවධානය යොමු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා. ඔබතුමාට විනාඩි 11ක් පමණ තිබෙනවා.

[අ.භා. 3.50]

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් මාතෘකාවක් යටතේ මේ ගරු සභාවේ විවාදය පවත්වන්නේ. මට පළමුව කල්පනා වුණා, ගරු අගමැතිතුමාගේ කථාව දවස් කිහිපයක් ගුවන් විදුලියෙන් ගම්බද ජනතාවට ඇහෙන්න සැලැස්විය යුතු තරමේ වටිනා කථාවක් බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම ගරු කරනවා, අලුත් ඇමතිවරයෙක් වන ගරු විජිත් විජයමුණි ද සොයිසා මැතිතුමාට. එතුමා ඉතාම වේගයෙන් දියුණුවක් ප්‍රදර්ශනය කරන ගරු ඇමතිතුමෙක්. එතුමා ඌව පළාත පිළිබඳව, ඒ පළාතේ අමතක වෙච්ච ආර්ථික සංවර්ධනය පිළිබඳව බොහොම වැදගත් කථාවක් කළා. මම ඒවා ගැන නොවෙයි දැන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මම එක මාතෘකාවකට බහිනවා.

ලංකාව අවුරුදු 2,500කට පෙර සිට ප්‍රසිද්ධ වුණේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි, ලංකාවෙන් පිට රට යවන මැණික් ගල්, සාගරයේ මුතු ඇට සහ කුරුඳු නිසායි. කුරුඳු වර්ග ගණනාවක් ලෝකයේ තිබෙනවා. එම වර්ග ගණනාවෙන් ඉතාම විශිෂ්ට කුරුඳු තිබෙන්නේ ලංකාවේ පමණයි. එබැවින් පුරාණ කාලයේ ඉඳලාම ඉන්දියාව ලංකාවේ කුරුඳු හැඳින්වූයේ "සයිංහලේ" -සිංහල පැළැටිය- කියායි. මෙම කුරුඳු පොතු අහල් භාගයක කෑල්ලක් අරගෙන හපලා විනාඩියක් දිවේ තියාගෙන ඉන්න බැහැ. ඒ තරම් සැර ශක්තියක් නිකුත් කරනවා අහල් භාගයක කුරුඳු කෑල්ලකින්. අද ඊයේ නොවෙයි, පාරාවෝ රජ දරුවන් පිරමිඩ ගොඩ නහන කොට ලංකාවෙන් මේ කුරුඳු අරගෙන ගිහින් සෑම උදෑසනකම අහලක කුරුඳු පොතු කැබැල්ලක් සෑම සේවකයෙකුටම කන්න දෙනවා. ඒක හපලා වතුර බිව්වාට පස්සේ මුළු දවසම වැඩ කරන්න ඔහුට ශක්තියක් ලැබෙනවා. නමුත් මේ කුරුඳු පැළැටිය අමතක වෙලා ගියා. පෘතුගීසිකාරයා ලංකාවට ආවේ කුරුඳු සුවඳටයි කියලා කථාවක් තිබෙනවා. ඉංග්‍රීසිකාරයා ලංකාවට ඇවිල්ලා පැලපදියම් වන තුරු ලංකාවේ ප්‍රධානම අපනයන භෝගය වෙලා තිබුණේ කුරුඳු. කුරුඳු බද්දට කිව්වේ මහ බද්ද කියලායි. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වුණේ කුරුඳු බද්දයි. හලාවතටත් එහා ඉඳලා ගිරුවාපත්තුව දක්වාම මුළු මුහුදුබඩ ප්‍රදේශ වැහිලා තිබුණේ කුරුඳු වනාන්තරයකින්. විශේෂයෙන්ම ලන්දේසින් මේ කුරුඳු ඕනෑකමින්ම වැව්වා, සිංහල රජ්ජුරුවන්ගෙන් නිදහස් වෙන්න. මොකද, සිංහල රජ්ජුරුවන්ගෙන් හතර කෝරළයේ, තුන් කෝරළයේ වැව්වව කුරුඳු ගන්න ගියාම ප්‍රශ්න ඇති වෙච්ච නිසා. ඒ නිසා මේක හොඳ වැදගත් පැළැටියක්.

ලංකාවේ පාවිච්චි කරන කුළු බඩු වර්ග 42ක් තිබෙනවා. ගරු අගමැතිතුමාගේ කථාවේදීත් මේ ගැන කියැවුණා. ඉන්දියාවේ තිබෙනවා කුළු බඩු වර්ග 63ක්. ආහාර රසවත් කිරීම සඳහා මුළු ලෝකයේම කුළු බඩු වර්ග 110ක් දැනට සොයා ගෙන තිබෙනවා. වනාන්තරවලින් තවත් ඒවා සොයා ගෙන සංයෝග කර ගන්නවා. ආහාර රසවත් කිරීම සඳහා, ශක්තිය ලබා ගැනීම සඳහා, ගුණවත් බව සඳහා පාවිච්චි කරන කුළු බඩු අඩුවෙන් තක්සේරු කරන්න එපා. අපේ සොබා දහම තමයි අපේ පළමුවන මෑණියෝ. ඒ මෑණියන්ගේ ශක්තිය තමයි කුළු බඩු ඔස්සේ, පැළැටි ඔස්සේ, ආහාර ද්‍රව්‍ය ඔස්සේ සතුන්ට හා මිනිසාට ලබා දෙන්නේ.

ලංකාවේ තිබුණු පාරම්පරික භෝග වර්ග අද ඉතාම බෙදජනක තත්ත්වයකටයි වැටිලා තිබෙන්නේ. පළමුවැනි පහර වැදුණේ වී

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

පැළෑටියටයි. වී පැළෑටිය අමතක කරලා තේ පැළෑටිය, රබර් පැළෑටිය වගා කරලා ලංකාවේ ආර්ථිකය තනි ඇහෙන් බලන්න පටන් ගත්තා. ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා එන තුරු ලංකාවේ වී ගොවිතැන අභාවයට ගිහිල්ලා වඳ වෙන්න තව ටික කාලයයි තිබුණේ. ඇත්ත වශයෙන්ම සිංහල භාලේ බත් කන සෑම සිංහලයෙක්ම ගරු ඩී.එස්. සේනානායක මැතිතුමාට පින් දෙන්න ඕනෑ. එතුමා තමයි වී කුරුල්ලෙක් තරම් බත් මීටක් හදලා දීලා රජ රට විඤ්ඤ කරලා අලුත් ශිෂ්ඨාචාරයක් අපට ලබා දුන්නේ. අන්න ඒ වාගේ, අතුරුදන් වුණු පැළෑටිවලින් එකක් තමයි කුරුඳු පැළෑටිය. ඒක ඉතාම ඉහළ මට්ටමකට ගෙනෙන්න පුළුවන් වැදගත් පැළෑටියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා කළ කථාවට මා නැවත නැවතත් ගරු කරලායි මේ කථා කරන්නේ. ලංකාවේ පැළෑටි වර්ග විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මුළු ලෝකයේම පැළෑටි වර්ග 450,000ක් තිබෙනවාලු. ඒකෙන් වගා කර තිබෙන්නේ පැළෑටි 600ක් පමණයි. සතුන් වර්ග ලක්ෂ 47ක් ඉන්නවා. මිනිහා හීලෑ කර ගෙන ඉන්නේ සතුන් 55 දෙනෙකු පමණයි. මේවා කරලා මිනිහා මහා වැයමක් ගන්නවා අලුත් ශිෂ්ටාචාරයකට යන්න. නමුත් ඒකේ සීමාවක් ඇවිල්ලා තිබෙනවා. දැන් අපි ආපහු හැරිලා බලමු අපේ ලංකාවේ දියුණු කළ හැකි වී පැළේ, අපේ ලංකාවේ දියුණු කළ හැකි පොල් පැළේ දිහා. මා පොල් කර්මාන්තයට ගරු කරනවා. පසු ගිය අවුරුදු දෙක ඇතුළත යෝධ වැයමක් අරගෙන පොල් ගහ නැවත ශක්තිමත් කළ යුතුයි කියන හැඟීමක් ගම්වලට දී තිබෙනවා. ඒ ගැන බොහොම සන්තෝෂයි. ඒ වාගේම මා ගරු කරනවා පසු ගිය අවුරුදු 5ක පමණ කාලය තුළදී ලංකාවට අමතක වෙලා තිබුණු ගෙවත්ත පළමුවැනි වතාවට රජමල්වත්තක් බවට හරවලා තිබීම ගැන. ඒක අද ඊයේ ඇති වුණු වෙනසක් නොවෙයි. අවුරුදු හතක අටක ඉඳලා සිදු වුණු දෙයක්. මා දැන් ගම්වලට ගියාම වැඩියෙන් බලන්නේ කුඹුරු දිහා නොවෙයි. මා ගෙවත්තෙන් තමයි මනින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව මගේ ගෞරවය විඤ්ඤතව සහ ප්‍රසිද්ධියේම දිය යුතුයි පොළොන්නරුවේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට. එතුමා කෘෂිකර්ම අමාත්‍යතුමා හැටියට රාජකාරි භාර ගෙන ලංකාවේ ගෙවතු ප්‍රමාණය වැඩි කිරීමේ විප්ලවයක් ආරම්භ කළා. එතුමාගේ ඒ උත්සාහය ඉතිහාසයේ සටහන් විය යුතුයි. අද ඒක රට පුරා පැතිරිලා ගිහින්. නමුත් තමුන්නාන්සේලාට ඒ වාර්තා දෙන්නේ නැහැ. පිටකොටුවේ බඩු මිල සම්බන්ධ වාර්තා දෙනවා. බැංකුවල වාර්තා දෙනවා. මුදලේ අගය අඩු වීම ගැන වාර්තා දෙනවා. නමුත් කවුරුවත් මේ රටේ හේන් ගොවියාගේ නිෂ්පාදනය, ගමේ නිෂ්පාදනය ගැන වාර්තාවක් දෙන්නේ නැහැ. ඒවා ඔක්කෝම අහකට දාලා තිබෙන්නේ.

අද පළමුවැනි වතාවට මේ රටේ එළවලු වගාව පස් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. පලතුරු වගාව පස් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. පැණි කොමඩු දස දහස් ගණනක් ලොරි පිටින් ගෙනත් පාරවල්වල තියා ගෙන විකුණන්න පටන් අරන්. පිපිඤ්ඤා වර්ග තිබෙනවා, ඒවා ලංකාවෙන් පිට රට යවනවා. විශේෂයෙන් සතියකට ගොටු කොළ මිටි ලක්ෂයකට වඩා මැද පෙරදිගට පිටත් කර යවනවා. ලන්ඩන්, පැරිස්වලට මෙහෙන් යවලා ඒ මිනිසුන් අනුභව කරනවා අපේ ගොටු කොළ ආදී දේවල්. ඒවා කවුරුවත් කියන්නේ නැහැ. නමුත් අපි ඒවා ප්‍රසිද්ධ කළ යුතුයි. ඇහැට නොපෙනෙන මහා කෘෂි කාර්මික විප්ලවයක් ලංකාවේ සිදු වනවා ගම් මට්ටමින්. අපේ පරම්පරාගත දේවල් ඉදිරියට එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවාසනාවන්ත අනාවැකියකුත් කියනවා මේ අවස්ථාවේදී. ලංකාවේ බෙදවාචකය තමයි අපේ මුළුතැන් ගෙය -කුස්සිය- අභාවයට යෑම. අපේ කුස්සිය අභාවයට යන්නේ "takeaway" කියන පැකට් එක නිසා. චීනය, එංගලන්තයට ගිහින් පටන් ගත්තා, "takeaway" කියන පැකට් විකුණන්න. ඒ පැකට් එක ලංකාවට ආවාට පස්සේ අපේ ගෑනුන්ට උයන හැටි අමතක වෙලා. තුන පහේ අමතක වෙලා. අපේ ගෑනු දන්නේ නැහැ, ගුරුවරියෝ දන්නේ නැහැ තුන පහ කියන්නේ මොනවාද කියලා. තුනයි පහයි අටයි, ඒ අට මොනවාද කියලා දන්නේ නැති ගෑනියෙක් මහුල් පෝරුවට නග්ගන්න නරකයි, කස පහර ගහලා බස්සන්න ඕනෑ. දැන් "takeaway" නිසා කිසිම වැඩක් නැති ගැහැනියෙක් පහළ වෙලා තිබෙන්නේ. "Takeaway" කියන එකෙන් තමයි අපේ ජාතික ආහාර වේල විනාශ කර දමා තිබෙන්නේ. අපි ආපහු අපේ ආහාර වේල කරා, අපේ ගොවි පොළ කරා, අපේ ගෙවත්ත කරා, අපේ රසඥතාව කරා යා යුතුයි.

එහිදී මම කුරුඳු පැළේ අගේ කරලා කථා කරමින් නැවතත් මේ වන සම්පත දියුණු කරන මෙන් සියලු දෙනාටම කියනවා. ගරු අගමැතිතුමා එතුමාගේ කථාව කළ ආකාරය, එහි සඳහන් කළ මාතෘකා ගැන මගේ ප්‍රසාදය පළ කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 28ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ආනයන, අපනයන ක්ෂේත්‍රය ගැන සාකච්ඡාවට භාජනය වෙන මේ මොහොතේ මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. 2013 ආර්ථික වර්ධන වේගය සියයට 7.5ක් දක්වා යන්නට කටයුතු කරනවා කියලා මහ බැංකු වාර්තාව සඳහන් කරනවා. නමුත් මම විශ්වාස කරන්නේ එය සියයට 6ත්-6.5ත් අතර ප්‍රමාණයක් බවට පත් වෙනවාය කියන එකයි. මේකට හේතුව මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රය දිහා බැලුවාම හැම පැත්තකින්ම තිබෙන්නේ කඩා වැටීමක් බව අපට පෙනෙනවා. කාර්මික අංශය දිහා බැලුවොත් 2012 පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 10.8යි. නමුත් 2013 පළමු කාර්තුවේ මෙය 10.7 දක්වා අඩු වෙලා තිබෙනවා. ඊළඟට නිෂ්පාදන අංශය - manufacturing sector එක - ගනිමු. එහි 2012 වර්ෂයේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 6.7යි. 2013 වර්ෂයේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 6.4යි. ඇහලුම් අංශය ගත්තොත් 2012 වර්ෂයේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 7.4යි. 2013 පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 6.8යි. කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය - cottage industries - ගත්තොත් 2012 වර්ෂයේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 5.9යි. 2013 වර්ෂයේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 5.2යි. කාර්මික අංශය ගත්තත්, නිෂ්පාදන අංශය ගත්තත්, ඇහලුම් අංශය ගත්තත්, කුඩා කර්මාන්ත අංශය ගත්තත් මේ හැම අංශයකින්ම 2013 වර්ෂයේ පළමු කාර්තුවේදී 2012 වර්ෂයේ පළමු කාර්තුවට වැඩිය අඩු වර්ධන වේගයක් පෙන්නුම් කරනවා. මෙහෙම අඩු වර්ධන වේගයක් පවත්වා ගෙන සියයට 7.5ක ආර්ථික වර්ධන වේගය ලබා ගන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 පළමු මාස හතරේ නිෂ්පාදන අපනයනය - manufacturing exports - සියයට 8.4කින් පහළ බැහැලා තිබෙනවා. කෘෂි කාර්මික අංශය ගත්තොත් 2012

මුල් කාර්තුවේ වර්ධන වේගය සියයට 12යි. 2013 මුල් කාර්තුවේ වර්ධන වේගය සියයට 2යි. වී නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා කියලා අපි පිළිගන්නවා. ගිය වසරේ වී නිෂ්පාදනය සියයට 3.1කින් පහළ බැස්සා. මේ වසරේ එය සියයට 36.1කින් වැඩි වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. නමුත් තේ නිෂ්පාදනය ගන්න. 2012 වර්ෂයේ පළමු කාර්තුවේ සියයට 12.6ක වර්ධනයක් තිබෙනවා. 2013 මුල් මාස හතරේ තිබෙන්නේ සියයට 0.9ක වර්ධනයක් පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි සේවා අංශය දිහා බලමු. 2012 වර්ෂයේ පළමු කාර්තුවේ එහි තිබුණු සියයට 5.8ක වර්ධන වේගය 2013 වර්ෂයේ පළමු කාර්තුවේ සියයට 4.3 දක්වා අඩු වෙලා තිබෙනවා. ඊළඟට අපි බැංකු, රක්ෂණ හා දේපොළ වෙළෙඳාම sector එක - banking insurance and real estate sector එක- දිහා බලමු. 2012 වර්ෂයේ පළමු කාර්තුවේදී එහි සියයට 7.2ක වර්ධන වේගයක් තිබුණා. 2013 මුල් කාර්තුවේ සියයට 6.1ක වර්ධන වේගයකුයි තිබෙන්නේ. ඊළඟට ගුවන් සේවා, වරාය හා නැව් බඩු මෙහෙයුම් - aviation, ports and cargo handling - අංශය දිහා බලමු. 2012 වර්ෂයේ පළමු කාර්තුවේ තිබුණු සියයට 3.1ක වර්ධන වේගය 2013 වර්ෂයේ පළමු කාර්තුවේ දශම 5ක වර්ධන වේගයක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඉතින් මේ හැම ක්ෂේත්‍රයක් දිහා බැලුවාම -ආර්ථික ක්ෂේත්‍රයේ, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ, සේවා ක්ෂේත්‍රයේ ඒ වාගේම ඇහලුම් ක්ෂේත්‍රයේ, කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයේ, නිෂ්පාදන අංශයේ- හැම අංශයකම තිබෙන්නේ මහා බරපතළ කඩා වැටීමක් බව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි ආනයන, අපනයන ක්ෂේත්‍රයට යොමු වෙමු. අපේ රටේ තිබෙන අපනයන රටාව මොකක්ද? අපනයන ප්‍රවණතාව කුමක්ද? පසු ගිය අවුරුදු දෙකහමාර තුළ ඒ වාගේම 2013 මුල් මාස හතර තුළ ශීඝ්‍ර ලෙස අපනයන ආදායම පහළ වැටීමක් අපි දැක්කා. 2013 වර්ෂයේ මුල් මාස හතරේ අපනයන ආදායම සියයට 7.8කින් අඩු වුණා.

දිගින් දිගටම කාර්මික හා කෘෂි කර්මාන්ත අපනයන ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා. නිෂ්පාදන අපනයනයන් - manufacturing exports - දිහා බැලුවාම සියයට 8.4කින් පහත වැටිලා තිබෙනවා. කෘෂිකර්ම අපනයන ආදායම 2013 මුල් මාස හතරේ පහළ වැටිලා තිබෙනවා. අද වන විට ආනයනත් පහළ ගිහින් තිබෙන නිසා රටට සුභවාදී තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියලා සමහර අය අර්ථකථනය කරනවා. ආනයන පහළ වැටීම නිසා වෙළඳ හිඟයත් පහළ යන්න ඉඩ ප්‍රස්ථා තිබෙනවා කියලා අනාවැකි පළ වෙනවා. අපි එය පිළිගන්නවා. මුල් මාස හතර තුළ, ඇමෙරිකානු ඩොලර් බිලියන 3.47 සිට 2.96 දක්වා වෙළඳ හිඟයත් පහළ ගිහින් තිබෙනවා. වෙළඳ හිඟයත් සියයට 14.6කින් අඩු වෙලා තිබෙනවා. නමුත් කවුරු කොහොම කථා කළත්, 2011 ඇමෙරිකානු ඩොලර් බිලියන 9.7ක් වූ වෙළඳ හිඟය, 2012 ඇමෙරිකානු ඩොලර් බිලියන 9.3ක් වූ වෙළඳ හිඟය, 2013 වසරේත් අනිවාර්යයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 9 ඉක්මවන්න කටයුතු යෙදෙන බවට බොහෝ ආර්ථික විශ්ලේෂකයෝ අනාවැකි පළ කරලා තිබෙනවා. ඒ වාගේම, ආනයන වියදමත් 2013 මුල් මාස හතරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 764කින් -සියයට 11.7කින්-අඩු වෙලා තිබෙනවා. මේ නිසා වෙළඳ හිඟය ඇමෙරිකානු ඩොලර් මිලියන 500කින් අඩු වෙලා තිබෙනවා. මේවා හොඳ දේවල්. නමුත් අප්‍රේල් මාසය ගත්තාම, නැවත වරක් ආනයන වියදම සියයට 5.7කින් වැඩි වුණා. පාරිභෝගික භාණ්ඩ ආනයනය සියයට 12.7කින් වැඩි වුණා. අඩ නිමි භාණ්ඩ, අන්තර් භාණ්ඩ ආනයනය සියයට 5.5කින් වැඩි වෙලා තිබෙනවා. ආයෝජන භාණ්ඩ ආනයනයත් සියයට 1.2කින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අප්‍රේල් මාසයේ සිට නැවත වරක් ආනයන වියදම් වැඩි වීමේ ප්‍රවණතාව ඇති වීම අපේ රටට සුභවාදී වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි අපනයන ක්ෂේත්‍රය ගනිමු. දැන් පුදුම වැඩේ වෙලා තිබෙන්නේ, ආනයනය කිරීම පහළ යන අවස්ථාවේදී, අපේ රටේ වෙළඳ අතිරික්තයක් බිහි කරන්න පුළුවන් අවස්ථාවකදී අපනයන ක්ෂේත්‍රයත් පහළ යෑමයි. එය බරපතළ ප්‍රශ්නයක්. අපනයන ආදායම දිහා බලන්න. 2013 මුල් මාස හතරේ අපනයන ආදායම සියයට 7.8කින් අඩු වෙලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 3.17 සිට 3.06 දක්වා අඩු වෙලා තිබෙනවා. කාර්මික අපනයන ආදායම සියයට 7.8කින් පහත වැටිලා තිබෙනවා. මේවායේ ඵල විපාක මොනවාද? අපනයනය පහළ වැටීම නිසා රටේ ජාතික ආදායමට, රටේ ආර්ථික වර්ධනයට, ඒ වාගේම විරැකියා ප්‍රශ්නයට බරපතළ ඍණාත්මක බලපෑම් ඍජුවම එල්ල වනවා කියන එක මේ අවස්ථාවේ කිව යුතුයි. ඒ වාගේම 2013 අප්‍රේල් වන විට අපනයන ආදායමත් සියයට 6.8කින් අඩු වීම බරපතළ ප්‍රශ්නයක්. ප්‍රධානතම නිෂ්පාදන අපනයන භාණ්ඩය හැටියට අපට ඇහලුම් නිෂ්පාදන හඳුන්වන්න පුළුවන්. මුළු අපනයනවලින් තුනෙන් එකක්, ඇහලුම්. නමුත් මේ ඇහලුම් අංශයේත් සියයට 15ක පහත වැටීමක් සිදු වීම අපේ රටට ආර්ථිකමය වශයෙන් බරපතළ ඵල විපාක අත් විඳින්න සිදු වන කාරණාවක් බව මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන ක්ෂේත්‍රයේ කඩා වැටීමට වැදගත් වන හේතු, කරුණු කාරණා රැසක් තිබෙනවා. ඇත්තම කථා කරනවා නම් අපේ රටේ අපනයන ප්‍රවර්ධනය කිරීමේ පැහැදිලි ජාතික ප්‍රතිපත්තියක්, ජාතික ක්‍රමෝපායයක්, ජාතික සැලැස්මක් නැහැ. දැන් බලන්න, ආර්ථික වර්ධන වේගය ගැන අපි බොහොම උජාරුවට කථා කරනවා. හැබැයි මේක අරුම පුදුම ආර්ථික වර්ධන වේගයක්.

මේ ආර්ථික වර්ධන වේගය තුළ රටේ සියයට 20ක් වන පොහොසතුන්ට හම්බ වනවා, රටේ ජාතික ආදායමෙන් සියයට 53.4ක්; දුප්පත්ම සියයට 20ට හම්බ වනවා, ජාතික ආදායමෙන් සියයට 4ක් වැනි සොච්චමක්. අපේ රටේ මේ මහා ආශ්චර්යවත් වර්ධනය තුළින් ණය සේවාකරණ ගෙවීම්, රජයේ ආදායමින් සියයට 103ක් බවට පත්වෙලා තිබෙනවා. මොකක්ද, ඒකේ තේරුම? රජයට ලැබෙන ආදායම්වලින් සියයට 103ක්ම යන්නේ ණය ගෙවන්නයි, පොලිය ගෙවන්නයි. ඒක තමයි තේරුම. ඒ නිසා මේක අරුම පුදුම ආර්ථික වර්ධන වේගයක්. එපමණක් නොවෙයි, මේ ආර්ථික වර්ධනය නිසා අය වැය හිඟයකුත් ඇති වනවා; වෙළෙඳ හිඟයකුත් ඇති වනවා; ගෙවුම් ශේෂ හිඟයකුත් ඇති වනවා; ණය බරත් වැඩි වනවා. මේ රටේ ඒක පුද්ගල ණයබර සියයට 150කින් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඇත්තම කථා කරනවා නම් මෙය ආශ්චර්යවත් ආර්ථික වර්ධන වේගයක් බව මා සඳහන් කරන්නට කැමැතියි. නමුත් අපි චීනය ගත්තොත්, චීනයේ ආර්ථික වර්ධන වේගයත් සමඟ මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? චීනයේ විදේශ සංචිත වැඩි වනවා; අය වැය හිඟයක් නොවෙයි අය වැය අතිරික්තයක් ඇති වනවා; වෙළෙඳ හිඟයක් නොවෙයි වෙළෙඳ අතිරික්තයක් ඇති වනවා; ගෙවුම් ශේෂ හිඟයක් නොවෙයි ගෙවුම් ශේෂ අතිරික්තයක් ඇති වනවා; ණය බර අඩු වනවා. එහෙම නම් අපි යොමු වන්නට ඕනෑ මොන දිශාවටද? අපි යොමු වන්නට ඕනෑ, අපනයන මුල් කර ගත්, අපනයන කේන්ද්‍ර කර ගත් ආර්ථික වර්ධන රටාවකටයි. එයට ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ, "Export-led economic growth" කියලායි. හැබැයි, අපනයන කේන්ද්‍ර කර ගත් ආර්ථික වර්ධනයක් - Export-led economic growth - ක්‍රියාත්මක කරන්නට අපේ රටට හැකියාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මාධ්‍ය හරහා අපට අහන්නට ලැබෙනවා, පළාත් සභා "සුදු අලියෙක්"ය කියලා. හැබැයි, පළාත් සභාවලට වඩා ලොකු සුදු අලියෙක් ඉන්නවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ තමයි, අපනයන සංවර්ධන මණ්ඩලය - Export Development Board එක. Export Development Board එක අද ලංකාවේ ලොකුම සුදු අලියා බවට පත් වෙලා තිබෙනවා.

ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ කාලයේ අපනයන ප්‍රවර්ධන ගම්මාන - Export Promotion Villages - වැඩසටහන ක්‍රියාත්මක කළා. මොකක්ද, සන්ධාන ආණ්ඩුව යටතේ ඒකට වුණේ? ඇතුලත්මුදලි මැතිතුමාගේ අපනයන ප්‍රවර්ධන ගම්මාන වැඩසටහන සම්පූර්ණයෙන්ම නතර කර දැම්මා. දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇඟලුම් කර්මාන්තශාලා බිහි කිරීම සඳහා ඇඟලුම් කම්හල් 200 වැඩසටහන ක්‍රියාත්මක කළා. අද මොකක්ද, මේ රජය කරලා තිබෙන්නේ? අද මේ රජය පුහු වචනවලට, වේදිකාවලට, ප්‍රකාශනවලට, චින්තනවලට පොරොන්දු මාලාවකට සීමා වෙච්ච කිසිම ප්‍රතිඵලයක් නැති ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කරනවා.

අපි දන්නවා, අපේ රටේ විදේශ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. මහා දියාරු විදේශ ප්‍රතිපත්තියක් තමයි අද විදේශ අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන්නේ. විදේශ අමාත්‍යාංශයේ වගකීම තමයි, අපේ රටට අහිමි වුණු GSP Plus ප්‍රතිලාභය රට වෙනුවෙන් ලබා ගැනීම. නමුත් එය කරනවා වෙනුවට කිසිම ඵලක් නැති, කිසිම වැඩක් නැති තුන්වන ලෝකයේ රටවලට තොග පිටින් සචාරි ගිහින්, අපේ රටේ මහා ධනස්කන්ධය වෙනත් දුප්පත් රටවලට බෙදා දෙන යුගයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට අවශ්‍යයි, අපනයන විවිධාංගිකරණයට කේන්ද්‍ර වන අපනයන ප්‍රතිපත්තියක්; නව වෙළෙඳ පොළ ආක්‍රමණය කරන වෙළෙඳ ප්‍රතිපත්තියක්.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම - දිනවමු ශ්‍රී ලංකා" වැඩසටහනේ මහා ලොකුවට උජාරුවට සඳහන් කර තිබෙන කාරණා කිහිපයක් මා මෙම අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

> " .....නව කර්මාන්ත 300 ක් පිහිටුවන අතර එයින් රුපියල් ලක්ෂ 500 කට වැඩි ආයෝජන සඳහා වසර 5 ක බදු නිදහස් කාලයක් ලබා දෙන්නෙමි."
>
> " .... දේශීය අමු ද්‍රව්‍ය 75% කට වඩා යොදා ගන්නා කර්මාන්ත සඳහා ද වසර 5 ක බදු සහන කාලයක් ලබාදෙමි."

එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> " සෑම වසරකදීම නෝරාගනු ලැබූ සුමක ව්‍යාපෘති ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරග කළ හැකි මට්ටම දක්වා වර්ධනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය සඳහා රුපියල් කෝටි 50ක් වෙන් කරමි."

තවදුරටත් එහි මෙසේ සඳහන් කරනවා:

> " සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය ලබා ගෙන කෙරෙන නිෂ්පාදන දිරි ගැන්වීමට වසර 5 ක බදු සහන ලබා දෙමි."

එපමණක් නොවෙයි, 2005දී "මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ යටතේ එහෙම කියලා, ඒ එකක්වත් ක්‍රියාත්මක කරන්නේ නැතුව මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් මෙහෙම කියනවා:

> " සෑම වසරකදීම කුඩා ව්‍යාපාරිකයන් 5000 ක් මධ්‍ය පරිමාණ මට්ටමකට ද මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 200 ක් මහා පරිමාණ මට්ටමකට ද ගෙන යෑමේ ක්‍රියාවලියක් 2010 පටන් ක්‍රියාත්මක කරන්නෙමි.
>
> සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලට සහන පොළිය යටතේ රුපියල් ලක්ෂ 100 ක් දක්වා සහන ණය මුදලක් ලබා දෙමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා, මහින්ද චින්තන ඉදිරි දැක්ම කියන මේ පොරොන්දු මාලා අද සීමා වෙලා තිබෙන්නේ මේ කොළයට පමණයි. අද කථාව විතරයි, දේශනා පමණයි, ප්‍රවෘත්ති නිවේදන පමණයි තිබෙන්නේ.

මහ ලොකුවට, උජාරුවට කථා කරනවා දේශීය කර්මාන්ත ගැන. නමුත් අද අපේ රටේ අපනයන ක්ෂේත්‍රය මහා ගරා වැටීමකට ලක් වෙමින් තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවන්නේ රටේ ජනතාවගේ සුබ විහරණය උදෙසා. අපනයන ආනයන ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම රජයක වගකීමක්. අපේ රටට සම්පත් ලබා ගෙන, අපේ රට ලබා ගන්නා වූ සම්පත්වලින් රටේ ජනතාවට ප්‍රතිලාභ ලබා දෙන යුගයක් රටේ බිහි කරන්නටයි ආණ්ඩු ඇති කරන්නේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද අද අපේ රටට සිදු වෙලා තිබෙන විත්නැහිය? මහ ලොකුවට පම්පෝරි ගහන ආණ්ඩුවක් තිබෙනවා. නමුත් අඩුම ගණනේ අපේ රටේ අනාරක්ෂිත දුම්රිය මාර්ගවලට ගේට්ටු ටික සපයන්නට බැරි ආණ්ඩුවක් අපේ රටේ තිබෙන්නේ. 1989 දී මහා දුම්රිය අනතුරකින් බෙදවාචකයක් සිද්ධ වුණා, අහුන්ගල්ලේදී . ජීවිත 51කට වැඩි ප්‍රමාණයක් එයින් අහිමි වුණා. මොකක්ද, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කළේ? උණ බම්බු ගේට්ටු සංකල්පයක් ගෙනාවා. ඒ තුළින් රැකියා බිහි වුණා; ජනසවිලාභීන්ට රක්ෂා ලැබුණා; දුප්පතුන්ට තැන ලැබුණා. නමුත් මොකක්ද, සන්ධාන ආණ්ඩුවේ ආශ්චර්යයෙන් කළේ?

රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඒ උණ බම්බු ගේට්ටු ටිකත් ඉවත් කළා. උණ බම්බු ගේට්ටුකරුවන් අයින් කරලා දැම්මා. ආරක්ෂාව තිබුණු ඒ දුම්රිය හරස් මාර්ග අනාරක්ෂිත කළා; රටේ ජනතාව අනාරක්ෂිත කළා. ජාතියට ආලය කරන, දේශයට ආලය කරන මේ දේශ හිතෛෂී, ජාති හිතෛෂී ආශ්චර්යවත් ආණ්ඩුව එහෙමයි කටයුතු කළේ. දැන් අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ?

මේ ප්‍රශ්නය ගැන කථා කරන කොට ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ඇවිල්ලා Bell and Light ක්‍රමය ගැන කථා කරනවා. Top to bottom වැඩේ කරනවාලු. මේවා තමයි ඇමතිවරු කියන කථා. නමුත් මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට එක කාරණාවක් පෙන්වන්න කැමැතියි. ඒ තමයි මේ පාර්ලිමේන්තුව තුළ කරන බොරුව.

දැන් බලන්න, මේ ආශ්චර්යවත් ආණ්ඩුවේ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිතුමා කියන්නේ මොකක්ද කියලා. 2012 ජනවාරි 18 වන දා එතුමා මොකක්ද කියවන්නේ? එදින හැන්සාඩ් වාර්තාවෙන් මම මේ කියවන්නේ. එතුමා කියනවා, "මේ රටේ දුම්රිය හරස් මාර්ග 1083ක් තිබෙනවා" කියලා. ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයේදී තමයි එහෙම කියන්නේ. හැබැයි, 2012 සැප්තැම්බර් 19 වන දා අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් ඒ වාගේම සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළාම, ඒ නියෝජ්‍ය ඇමතිතුමාම කියනවා, මේ රටේ දුම්රිය හරස් මාර්ග 1175ක් තිබෙනවා කියලා. එදින හැන්සාඩ් වාර්තාව මම **සභාගත*** කරනවා.

මේක තමයි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කරන මහ බොරුව; මහ වංචාව; බොරු පම්පෝරිය.

එපමණක් නොවෙයි, ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කල් තැබීමේ යෝජනාවේදී ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, "මේ අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට ගේට්ටු සපයන්න ජනාධිපතිතුමා රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර

තිබෙනවා" කියලා. මිලියන 1,000ක්! ඒ නියෝජ්‍ය අමාත්‍යතුමාම 2012 සැප්තැම්බර් මාසයේ අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයට ඇවිල්ලා කියනවා, "අපේ ජනාධිපතිතුමා රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා" කියලා. එදින හැන්සාඩ් වාර්තාවේ තිබෙන්නේ. මේ තමයි බොරුව; පම්පෝරිය. දැන් මේ බොරුව ගහලා, මේ පම්පෝරිය ගහලා, ආශ්චර්යය ගැන කයිවාරු ගහලා අවසානයේදී, ජනාධිපතිතුමා ගත් නිගමනය මොකක්ද? ජනාධිපතිතුමා, ප්‍රවාහන ඇමතිතුමායි, ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමායි ගෙන්වලා කිව්වා, "මේක හරි යන්නේ නැහැ, අපි ආපහු යන්න ඕනෑ, රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ උණ බම්බු ගේට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න." කියලා.

එදා මොකක් ද කිව්වේ? ප්‍රේමදාස බම්බු ගහනවාය කිව්වා. දැන් ප්‍රේමදාසගේ බම්බු ප්‍රතිපත්තියම මේ ආණ්ඩුව වැළඳගෙන තිබෙනවා. ඒක තමයි කියන්නේ සත්‍යය කවදා හෝ ජය ගනීවි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ජනතාවට සහන දෙන යුගයක් ගැන කථා කරනකොට මා මේ කාරණයත් රජයෙන් අහන්නට කැමැතියි. දැන් ජලවිදුලි ඒකකයට වැය වන්නේ රුපියල් 3.50යි. ගල් අඟුරුවලින් නිෂ්පාදනය වන විදුලි ඒකකයකට රුපියල් 9.50ක් වැය වෙනවා. තාප විදුලි බලාගාරවලින් නිපදවන - තෙල් මාෆියාව නිපදවන- විදුලි ඒකකයකට රුපියල් 20ත්-රුපියල් 40ත් අතර මුදලක් වැය වෙනවා. විදුලිබල හා බලශක්ති ඇමතිතුමියන්, අමාත්‍යාංශයේ ලේකම් ෆර්ඩිනැන්ඩු මැතිතුමාත් මාර්තු මාසයේ කිව්වා, "තෙල් මාෆියාව නිසා; මේ තාප විදුලි බලාගාර නිසා; තෙල් බලාගාර නිසා විදුලිබල පද්ධතියට සියයට 65ක විශාල වියදමක් දරන්නට සිදු වෙනවා. විදුලිබල මණ්ඩලය පාඩුවටයි දුවන්නේ. එම නිසා අපට මේ විදුලිබිල ඉහළ නංවන්න ඕනෑ." කියලා. අද මොකක් ද සිදු වෙලා තිබෙන්නේ? 2013 වර්ෂයේ පළමු මාස 6 තුළ අධික වර්ෂාපතනයෙන් ජලාශ පිරී ඉතිරී ගොස් තිබෙන නිසා ජල විදුලිය නිපදවීම ඉහළ ගොස් තිබෙනවා. විදුලබල මණ්ඩලයට රුපියල් කෝටි 2,700ක ලාභයක් ලැබී තිබෙනවා. මාර්තු මාසයේ කිව්වා, "විදුලිබල මණ්ඩලයට පාඩුයි" කියා. 2013 වර්ෂයේ පළමු මාස හයේ ජලවිදුලිය උත්පාදනය සියයට 45 සිට සියයට 70 දක්වා වර්ධනය වෙලා තිබෙන නිසා; ජලවිදුලිය උත්පාදනය සියයට දෙසියකින් වර්ධනය වෙලා තිබෙන නිසා ලංකා විදුලබල මණ්ඩලය රුපියල් කෝටි 2,700ක් ලාභ ලබා තිබෙනවා. එහෙනම් අර ඒකක 1 සිට ඒකක 60 දක්වා විදුලිය පාවිච්චි කරන ලක්ෂ 24ක් වන පාරිභෝගික ජනතාවට - ලංකාවෙන් සියයට 48ක් වන ජනතාවට- ඒකක 60 සිට ඒකක 180 දක්වා විදුලිය පාවිච්චි කරන ලක්ෂ 25ක් වන පාරිභෝගික ජනතාවට - ලංකාවෙන් සියයට 49ක් වන ජනතාවට- මේ රුපියල් කෝටි 2,700 ලාභයේ වරප්‍රසාදය, ප්‍රතිලාභය ලබා නොදෙන්නේ ඇයි කියා මා මේ අවස්ථාවේදී අහන්නට කැමැතියි. විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය කියන්නේ එකක්, කරන්නේ තව එකක් කියන කාරණයත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි. වේදිකාවල සුන්දර දර්ශනයන්, සුන්දර සිහින මවා පාලා රටේ ජනතාව රවටනවා. නමුත් ක්‍රියාකාරී සැලසුම් දිහා බලනවිට මේ රජය ජනතාවට වැඩදායී, ඵලදායී වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර උණ බම්බු ගේට්ටු කථාව ගැන තවත් කාරණාවක් කියන්නට ඕනෑ. ගරු අමාත්‍යතුමායි, ගරු නියෝජ්‍ය ඇමතිතුමායි මේ උත්තරීතර සභාවට ඇවිත් කියනවා, ඒ දුම්රිය හරස් මාර්ග ගේට්ටුවක් නිෂ්පාදනය කර සවි කරන්න රුපියල් ලක්ෂ 65ක් විතර වැය වනවාලු. නමුත් අපේ ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ජීවත් වන මාතර දිස්ත්‍රික්කයේ, එතුමා ඡන්ද ලබන මාතර දිස්ත්‍රික්කයේ විමලසූරිය කියා වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ වෛද්‍යවරයා solar power එකෙන් ක්‍රියාත්මක කරන මේ ස්වයංක්‍රීය ගේට්ටු නිෂ්පාදනය කරනවා. වැය වන්නේ රුපියල් ලක්ෂ 10යි. හැබැයි කොමිස් මුදල් නැහැ. රුපියල් ලක්ෂ 65 ගේට්ටුවලට ඕනෑ තරම් ගසා කෑම් තිබෙනවා. කොමිස් කුට්ටි තිබෙනවා. රුපියල් ලක්ෂ 65 ගේට්ටුවට තමන්ගේ පංගුව තිබෙනවා. මේ වෛද්‍ය විමලසූරිය මැතිතුමා දේශීය නිර්මාණ කරුවෙක්. තමන්ගේම උත්සාහයෙන් -ස්වෝත්සාහයෙන් - ශක්තිමත් වැඩසටහනක් එතුමා නිර්මාණය කරනකොට දුම්රිය දෙපාර්තමේන්තුව අඩුම තරමින් එතුමාට සවන් දීමක්වත් කරන්නේ නැහැ.

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ සිටිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ බල ප්‍රදේශයේ, මාතර ප්‍රදේශයේ සිටින වෛද්‍ය විමලසූරිය මැතිතුමා රුපියල් හැටපන් ලක්ෂයේ ගේට්ටුව ලක්ෂ 10කට හදනවා නම්, අඩුම ගණනේ ඔබතුමාවත් එතුමාව මේ රටේ ජනාධිපතිතුමා ළඟට ගෙනගිහින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්නට කටයුතු කරන්නේ නැත්තේ ඇයි? ගරු ඇමතිතුමනි, ඔළුව වැනුවාට මදි. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මා දන්නවා, ඔබතුමා මා කියන දෙයට එකඟ වෙනවා කියලා. කරුණාකර හෙට දවසේම මේ සඳහා වෙලාවක් යොදා ගෙන, මේ රටට සම්පතක් වූ මේ වෛද්‍ය විමලසූරිය මැතිතුමාගේ නව නිර්මාණයට තැනක් ලබා දීලා අනාරක්ෂිත ගේට්ටු, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග නිසා දිනපතා ජීවිත අහිමි වන අපේ රටේ ජනතාවට යම් කිසි සුරක්ෂාවක්, ආරක්ෂිත භාවයක් ලබා දෙන්නය කියා මා මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජයේත්, රජයේ මැති ඇමතිවරුන්ගේත් බොරු පම්පෝරි ගැන පුංචි කථාවක් ඉදිරිපත් කරලා මගේ කථාව අවසන් කරනවා. රට වෙනුවෙන්, දැය වෙනුවෙන් මහා වංශෙන් කථා කරන පුද්ගලයෙක් ඉන්නවා. මහා වංශෙන් කථා කරන මේ පුද්ගලයා මොනවාද කියා තිබෙන්නේ? එතුමා එක තැනකදී කියනවා, "දහතුනට සංශෝධන නැති නම් උතුරේ ඡන්දයට අපේ සහාය නැහැ" කියලා. නැවත වරක් එතුමා කියනවා, "උතුරේ ඡන්දය තිබ්බොත් ඇමති ධුරයෙන් ඉවත් වෙනවා" කියලා. එතුමා කියපු මේ ඔක්කොම කථා පුවත් පත්වල පළ වෙලා තිබෙනවා. මැයි දින පෙළපාළියේ අවසානයේදී තිබුණු මහා රැළියේදී එතුමා කියපු කථාත් පුවත් පත්වල පළ වෙලා තිබෙනවා.

2013 මැයි 02 වැනි දින පළ වූ "ලංකාදීප" පුවත් පතේ එතුමා මෙසේ කියා තිබෙනවා:

"උතුරේ ඡන්දය සැප්තැම්බර්වල තිබ්බොත් වැඩේ ඉවරයි. මොන ඇමතිකම් දැරුවත් රට වෙනුවෙන් ඒ සියල්ල අතහැර යාමට අප සූදානම්"

කවුද මේ කියන්නේ? හැම වෙලාවේම මහා වංශෙන් කථා කරන විමල් වීරවංශ ඇමතිතුමායි. එතුමා මේ ආකාරයටම කියනවා උතුරේ ඡන්දය තිබ්බොත් ඇමති තනතුරෙන් අයින් වෙනවාය කියලා. [බාධා කිරීමක්] දැන් මට ඇහෙනවා සංශෝධනයක් ගැන කවුදෝ කෑ ගහනවා. ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි, කිසිම සංශෝධනයක් එන්නේ නැහැ. ඇත්තටම මේ ආණ්ඩුව කටවල් ගණනාවකින් කථා කරනවා; මුඛ පාවනය ක්‍රියාත්මක කරනවා. එක් එක් කණ්ඩායම් එක් එක් තැන්වලට දමලා ජන සමාජය රවටන්න හදනවා. බොරු කරලා, මුසාවෙන්, මුළාවෙන් මේ රටේ ජනතාව නැවත වරක් රවටන්න තමයි මේ ආණ්ඩුව කටයුතු කරන්නේ. මේ මහා වංශෙන් කථා කරපු විමල් වීරවංශ ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, එතුමා දැන් ඇමතිකමෙන් අස් වෙනවාද කියලා.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කිසිම සංශෝධනයක් මේ වන තෙක් ඇවිත් නැහැ. මම දන්නා විධියට සැප්තැම්බර් මාසයේ මේ පළාත් සභා ඡන්දය තියන්නේ කිසිම සංශෝධනයකින් තොරවයි.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.]*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඇත්ත කථා කරන්න ඕනෑ. පළාත් සභා ක්‍රමයේ දුර්වලකම් තිබෙනවා. මමත් ඒවා පිළිගන්නවා. ඒ වාගේම ඒ දුර්වලකම් ගැන කොන්ද කෙළින් තියාගෙන අප කථා කරනවා. අප කථා කරන දෙය ක්‍රියාත්මක කරනවා. අප මේ වාගේ බොරු කයිවාරු ගහන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධම්ම පදයේ හොඳ ගාථාවක් තිබෙනවා. ගරු පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්ස, මම මේ අවස්ථාවේදී එය සිහිපත් කරන්න කැමැතියි.

" අත්තානමෙව පඨමං - පතිරූපෙ නිවෙසයෙ,

අථඤ්ඤමනුසාස්‍යෙය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතො"

එහි තේරුම මෙසේයි:

" තමා ම පළමු කොට සුදුසු ගුණයෙහි පිහිටා ඊළඟට අනුන්ට ඒ ගැන අනුශාසනා කළ යුතු ය. එ සේ කරන පණ්ඩිතයා නො කෙලෙසෙයි."

අනුන්ට අනුශාසනා කරන්නට පෙර තමන් සුදුසු ගුණයෙහි පිහිටා සිට කටයුතු කළ යුතුයි. අනුන්ට ඇඟිල්ල දිගු කරන්නට පෙර තමන් හරි තැන -නිවැරැදි තැන- ඉඳගෙන කටයුතු කරන්නය කියා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා. ඒ උතුම් බුදු වදන් අනුගමනය කරමින්, මේ රජයෙනුත් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. තවදුරටත් මේ රටේ ජනතාව නිරන්තර රැවටිල්ලකට ලක් කරන්නේ නැතිව, මේ රටේ ජනතාවට කරන බොරුව -මුසාව- මුළාව නතර කරලා, රටේ ජනතාව ජීවත් කරවන්නට මේ රාජ්‍ය ශක්තිය, රාජ්‍ය බලය, රාජ්‍ය වරදාන, වරප්‍රසාද තමන්ගේ පෞද්ගලික සුඛ විහරණය උදෙසා නොව, රටේ සියලු දෙනාගේම සුබසාධනය වෙනුවෙන්, ඒ අයගේ සුබසිද්ධිය වෙනුවෙන්, ඒ අයගේ ජන ජීවිතයට සෙතක්, ශාන්තියක් ඉෂ්ට සිද්ධ කරන්නට, ජන ජීවිතය සුඛිත මුදිත කරන්නට කටයුතු කරන්නය කියා මේ රජයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

ඊට පෙර, මූලාසනය සඳහා ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* THE HON. (DR.) (MRS.) SUDHARSHINI FERNANDOPULLE *took the Chair.*

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තිබෙන්නේ විනාඩි අටයි කියලා කිව්වා නේද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්, ඔබතුමාට විනාඩි අටයි තිබෙන්නේ.

[අ.භා. 4.29]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
කථා කරන්න වෙලාවක් නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප කෘෂි ද්‍රව්‍ය නිෂ්පාදනය කරලා රටේ සංවර්ධනය වෙනුවෙන් ඒවා අපනයනය කරනවා. ඒ වාගේම කාර්මික අංශයෙනුත් යම් යම් ද්‍රව්‍ය අපනයනය කරනවා. මේවායේ අපනයනය වැඩි කිරීමට අපට අවශ්‍ය වෙනවා. ඒ වාගේම තිබෙන වෙළෙඳ පොළ රැක ගැනීමත් අවශ්‍ය වෙනවා. තිබෙන වෙළෙඳ පොළට නොයෙක් නොයෙක් අභියෝග එනවා. ඒවා ජය ගැනීමේ අරමුණක් හැටියට තමයි විශේෂයෙන් අද ඉදිරිපත් කර තිබෙන මේ නියෝග තුළින් කුරුඳු පිළිබඳවත් කරුණු ඉදිරිපත් කර තිබෙන්නේ.

සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කියපු ආකාරයට අපේ රටේ අතීතයේ ඉඳලාම බොහොම ප්‍රසිද්ධ වෙළෙඳාමක් පැවැති දේවල් තමයි මැණික්, ඇත් දත්, ඒ මහින් කරන නිෂ්පාදන වැනි දේවල්. ඊළඟට, අපේ කුළු බඩු වෙළෙඳාම මේ රටේ බොහොම ප්‍රසිද්ධ දෙයක් හැටියටයි කල්පනා කරන්නේ. ඒ වාගේම අදත් ඒ ද්‍රව්‍යයන් සම්බන්ධ කර්මාන්ත පවත්වාගෙන යනවා. මැණික් කර්මාන්තය පවත්වාගෙන යනවා. ඒ මාර්ගයෙන් විශාල ආදායමක් උපයා ගන්නවා. එය ක්‍රමානුකූලව කරගෙන යනවා.

විශේෂයෙන්ම වර්තමානයත් එක්ක බලනකොට අපේ රට විතරක් නොවෙයි, මුළු ලෝකයම ආර්ථික අර්බුදයක පැටලිලා තිබෙන වෙලාවක්. ඇමෙරිකාව ආර්ථික අර්බුදය නිසා වැටිලා, එහි අති විශාල බැංකු ප්‍රමාණයක් වැසී ගියා, සේවකයන් අස් කළා, රැකියාවන් අහිමි වෙලා ජනතාවට නොයෙකුත් අපහසුකම් ඇති වුණා. ඒ වාගේම යුරෝපයත් ඒ ආර්ථික අමාරුකම්වලට ගොදුරු වෙලා තිබෙනවා. අද පත්තරයක පළ වෙලා තිබෙනවා, -ඔබතුමන්ලා කවුරුත් දකින්න ඇති- ජර්මනියේ බොහොම ප්‍රසිද්ධ අපනයන කර්මාන්තයක් තමයි machine නිෂ්පාදනය; ඒ machine

නිෂ්පාදනය කර පිට රට යැවීමේ කර්මාන්තයක් අද පහළ බැස තිබෙනවා කියා. යුරෝපයේ නිෂ්පාදන කර්මාන්තයක් ඒ විධියට පහළ බැහැලා, ඒ රටවලත් ආර්ථික අර්බුදයක් පවතිනවා. මේ වෙළෙඳ පොළවලට භාණ්ඩ යැවීමා, ඒ රටේ පුද්ගලයන් ළඟ මිල මුදල් හොඳින් තිබෙනවා නම් තමයි ඒ භාණ්ඩ වැඩිපුර මිලදී ගන්නේ. ඒ කියන්නේ ලෝක ආර්ථිකය කඩා වැටුණු වෙළෙඳ පොළක් එක්ක තමයි අපට ගනුදෙනු කරන්නට සිදු වෙලා තිබෙන්නේ. එතකොට ඒ රටවල ආර්ථිකය පහළ බැස්සොත්, අපේ රටේ භාණ්ඩ මිලයට ගැනීම, ඒ සඳහා තිබෙන ඉල්ලුම වුණත් පහළ බහින්න පුළුවන්. තේ කිලෝ පහක් පාවිච්චි කළා නම්, ඒ ප්‍රමාණය තේ කිලෝ තුනකට විතර බහින්න පුළුවන්. ඒ වාගේ හුදෙකලා රටක් හැටියට අපට ආර්ථිකයක් පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ. සමස්ත ලෝකයම එකතු වෙලා තමයි මේ ගමන යන්නේ. ඒ නිසා මෙවැනි ආර්ථික අර්බුදයක් මැද්දේ අපි ගොඩනහාගෙන තිබෙන මේ රටේ ආර්ථික සංවර්ධන වේගය ප්‍රමාණවත්ය කියන්න පුළුවන්කම තිබෙනවා. අපි ඒක තවත් වැඩි කර ගන්න උත්සාහ කරන්නට ඕනෑ. අපි ඒකට ක්‍රමවේදයන් හදන්නට ඕනෑ.

ඒ අතර ජාත්‍යන්තර ආර්ථික පසුබිමක තමයි අපේ රට කටයුතු කරමින් තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ අපි ඒ උත්සාහය කළ යුතු වෙනවා. එවැනි තැනක තමයි අපි සිටින්නේ. එහෙම තිබෙද්දිත් මේ රටේ රැකී රක්ෂා හිඟය අඩු වෙලා තිබෙනවා මීසක් තව වැඩි වෙලා නැහැ. ඒ වාගේම දුප්පත්කමේ සියයට ගණන අඩු වෙලා මීසක් තව වැඩි වෙලා නැහැ. අපේ දුප්පත්කම අඩු කර ගන්න, සෞඛ්‍ය තත්ත්වය දියුණු කර ගන්න, ඒ වාගේම අපේ දියුණුව සඳහා නොයෙක් දේවල් අලුතෙන් ඇති කර ගන්නට අපට පුළුවන් වෙලා තිබෙනවා.

අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ණය ගැන කියන්නට යෙදුණා. ඒ කියන්නේ ණය ලබා ගෙන වරායවල් හදනවා නම්, ගුවන් තොටුපොළවල් හදනවා නම්, ඒ වාගේම විදුලි බලාගාර හදනවා නම්, ඒක සංවර්ධනයක් නොවෙයි කියනවා වාගේ තමයි එතුමා කථා කළේ. එහෙනම් ඒ මොකක්ද? ඒක සංවර්ධනයක් නොවෙයිද? ඒකෙන් අපට ආර්ථික දියුණුවට උපකාරයක් වෙනවා. නමුත් ඒක හදන ගමන්ම ආර්ථිකයේ කරපු වියදම් ඔක්කොම මාස හයෙන්, මාසයෙන් ලබා ගන්නට බැහැ. ඒ සඳහා කාලයක් ගත වෙනවා. නමුත් ඒක ආයෝජනයක්. සංවර්ධනයට අවශ්‍ය දෙයක්. අපේ රට විතරක් නොවෙයි ණය ලබා ගන්නේ. ලෝකයේ සෑම රටක්ම ණය ලබා ගන්නවා. මේ ණය ගැනීම තුළ තමයි ලෝක බැංකු ක්‍රමය, IMF ක්‍රමය ඇති වෙලා තිබෙන්නේ. ඒ වාගේම රට තුළ තිබෙන බැංකුවලින් ලබා ගන්නා ණයත් එක්ක තමයි සෑම ව්‍යාපාරිකයකුම වෙළෙඳ ගනු දෙනු කරන්නේ. අපි මේ කෑමට ණය ගත්තා නොවෙයි; ආප්ප කන්න ණය ගත්තා නොවෙයි; මිනිසුන්ට සහල් බෙදන්න ණය ගත්තා නොවෙයි. අපි සංවර්ධනය සඳහායි ණය ලබා ගෙන තිබෙන්නේ. ඒ නිසා අපේ රට මහා සංවර්ධනයක් කරා ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල ඉදිරියේ දී ලැබෙයි. ඒවායේ ප්‍රතිඵල ලබා ගෙන, මේ රටේ සංවර්ධනය ඉදිරියටම කරගෙන යන්න තමයි මේ කටයුතු කරගෙන යන්නේ. ඒක නිසා ණය ගැන කථා කරනවා නම්, අපට ණය ලබා දෙන එක ගැනත් එතුමන්ලා ඊර්ෂ්‍යයි.

අපි HSBC බැංකුවෙන් ණය ගන්න ගිය වෙලාවේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා HSBC බැංකුවට කිව්වා ණය දෙන්න එපා කියලා. "අපි ආවොත්; යූඑන්පී ආණ්ඩුව ආවොත් ණය ගෙවන්නේ නැහැ"යි කිව්වා. අන්න ඒ වාගේ කරන පක්ෂයක මන්ත්‍රීවරු තමයි මේවා පිළිබඳව අද මෙහෙම කථා කරන්නේ. ඒක හරි දර්ශනයක්ද? හරි ක්‍රමයක්ද? මේක කරන්නේ මහා ඊර්ෂ්‍යාවෙන්. අපේ ආණ්ඩුව ණය ගන්නේත් නැතිව, සංවර්ධන කටයුතු කරන්නේත් නැතිව තිබෙනවා නම් මේ රටේ ආර්ථික අර්බුදය වැඩි වෙනවා. එතකොට රැකී රක්ෂා හිඟය වැඩි වෙනවා. එතකොට ඒ ගොල්ලන්ට බලයට එන්න පාර කපා ගන්න මිනිසුන් අතර අර්බුද ඇති වෙනවා. එහෙම ප්‍රාර්ථනා කර ගෙන තමයි ඒ වාගේ කථා කියන්නේ. ද්වේෂ සහගත, ඊර්ෂ්‍යා සහගත දේවල් තමයි ඒ කථා මඟින් ප්‍රකාශ කරන්නේ. ඒ වාගේම GSP ගැන කථා කළා. GSP දෙන්න එපා කියලා එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ සඳහා ලියුම් පවා ලිව්වා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔය කියන්නේ අසත්‍යයක්; අසත්‍යයක්

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඔබතුමා කියන එක තමයි අසත්‍ය. මම කියන එක නොවෙයි. මම කියන එක විතරක් අසත්‍යයක් කියන්නේ කොහොමද? තමුන්නාන්සේගේ පැත්තෙන්ම තමයි අසත්‍යය හාර ගන්නේ. [බාධා කිරීමක්] ඔව්. ඔබතුමාත් පවයක් කියන්නේ. ලොක්කාගෙන් අහලා බලන්න. මහ එක්කෙනාගෙන් අහලා බලන්න. එහෙම අහලා බලලා කථා කරන්න. තමුන්නාන්සේලා තමයි GSP Plus දෙන්න එපා ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා පැහැදිලිවම ලියලා යැව්වේ. GSP Plus අයින් කරන්න කියලා තමයි එතුමා කථා කළේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ තමයි අසත්‍ය කියන්නේ. තමුන්නාන්සේ තමයි පවකාරයා. තමුන්නාන්සේ තමයි අමූලික පව ගහන්නේ. මහා කථිකයා වෙන්න, යූඑන්පී එකේ ඊළඟ ජනාධිපති වෙන්න හිතාගෙන වෙන්න ඇති මේවා කියා ගෙන යන්නේ. ඒ විධියට නිකම් මේවා ගැන කථා කරලා වැඩක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවුද කියන්න. නම කියන්න.

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
තමුන්නාන්සේගේ නම කවුද නොදන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කළොත් හොඳයි.

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ නිසා මම තමුන්නාන්සේලාට මතක් කරන්නේ කවුරුවත් මේ රට හදනවාට එක්සත් ජාතික පක්ෂය කැමැති නැහැයි කියන එකයි. අපේ අතිගරු ජනාධිපතිතුමා මේ රටේ මහා වෙනසක් කර ගෙන ඇවිල්ලා තිබෙනවා. ඒවා කර ගෙන යනවා. ඒවාට ඊර්ෂ්‍යාවෙන්, ද්වේෂයෙන් තමයි කථා කරන්නේ. ඒ විධියට තමයි කටයුතු කර ගෙන යන්නේ.

ඒ නිසා මම තමුන්නාන්සේට මතක් කරන්නේ ඉදිරියේදී මේ රට දියුණු කරන්න අවශ්‍ය පදනම් දමා තිබෙන බවයි. මහාමාර්ග

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ටික හදනවා. අධිවේගී මාර්ග හදනවා. ගුවන් තොටුපොළවල් හදනවා. ගුවන් තොටුපොළවල් හදන්න හොඳ නැහැයි කියනවා. මොකද, මේ අයට ගුවන් තොටුපොළක්වත් හදා ගන්න බැරි වුණා. ඒ නිසා මේ ගොල්ලන් එහෙම කල්පනා කරනවා. එදා තිබුණේ රත්මලාන ගුවන් තොටුපොළ. ඊළඟට හැදුවා කටුනායක ගුවන් තොටුපොළ. දැන් කටුනායක විතරක් නොවෙයි, මත්තල ගුවන් තොටුපොළත් හදලා. අනෙක් ප්‍රදේශවලත් ඒවා හැදීම සඳහා කටයුතු කරමින් සංවර්ධන වැඩ ඉදිරියට කර ගෙන යනවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් තමයි අපි ඇති කරන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඒ වාගේම අපි විදුලි බලාගාර හදනවා. මේ රටේ විදුලිය අවශ්‍යතාව අවුරුදුපතා වැඩි වෙනවා. ඒ මඟින් තමයි මේ රටේ සංවර්ධනයට පාර කපා ගන්න තිබෙන්නේ. ඒ අනුව සංවර්ධනයට අවශ්‍ය මූලික දේවල්; අත්‍යවශ්‍ය දේවල්; basic දේවල් කර ගෙන යන්න අවශ්‍ය පදනම දමලා තිබෙනවා. ඒ අනුව අපි වැඩ කටයුතු කර ගෙන යනවා. ඉදිරියේදී ඒවායේ ප්‍රතිඵල ලැබෙයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
හොඳයි, බොහොම ස්තුතියි.

[අ.භා. 4.40]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තෙන්ම ඉතාම සුවිශේෂ වූ වැදගත් පනතක් යටතේ නියෝග තමයි අද ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම රෙගුලාසි කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි කුරුඳු වගාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන නව සංශෝධනය. අපි සුළු අපනයනවලින් ආදායම් ලබා ගන්න කොට ඒ අපනයන්ගේ ප්‍රමිතිය හරියට ක්‍රියාත්මක කරන්නට ඕනෑ. මොකද, 1970 - 77 දක්වා කාලය තුළ ඉතාම හොඳින් මේ කටයුත්ත සිද්ධ වුණා. මම විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු හැටියට ඉන්න කාලයේ මගේ research එක; ව්‍යාපෘතිය කරන්න සිද්ධ වුණේ පොල් අපනයනය සම්බන්ධයි. එතකොට ඒ පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ තිබුණේත් මේ රෙගුලාසිම තමයි. ඒ කියන්නේ ඒ ආයතනයෙන් කොප්පරා අපනයන කළා නම් ඒ සියලු ප්‍රමිතීන් පොල් වගා කිරීමේ මණ්ඩලය හරහා තමයි ලබා ගන්න තිබුණේ.

එසේ ලබා ගැනීම තුළින් ප්‍රමිතියක් ඇති සුළු අපනයනයන් තමයි අප පිට රට යැවිවේ. ඒ නිසා අපට හොඳ තරගකාරිත්වයකට මුහුණ දෙන්න පුළුවන්කම ලැබුණා. හොඳ මිලක් අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. නමුත් අද ඒක වෙනස් පැත්තකට ගිහිල්ලා තිබෙනවා. එක කාරණයක් තමයි කුරුඳු වගාවට ආදේශකයක් අද බිහි වෙලා තිබීම. ඒ වාගේම ප්‍රමිතියෙන් තොර කුරුඳු අපනයනය තමයි මේ ආදේශකයන් බිහි වීමට සහ මිල පහළ යාමට හේතු වෙලා තිබෙන්නේ. ඇත්තෙන්ම පොදුවේ ගත්තාම සුළු අපනයන බෝග තුළින් අප යම් ආදායම් ප්‍රමාණයක් උපයලා තිබෙනවා. වගා කළ බිම් ප්‍රමාණය ගත්තොත් 2002 සහ 2011 සංසන්දනය කළාම හෙක්ටෙයාර 29,102ක ප්‍රමාණයක් අප මේ රටේ කුරුඳු වගා කරලා තිබෙනවා. ඒ වාගේම 2011 වසර වන විට කුරුඳු මෙට්‍රික් ටොන් 14,853ක් අප නිෂ්පාදනය කරලා තිබෙනවා. මා හිතන හැටියට මේ රටේ කුරුඳු නිෂ්පාදනය ඉතා ඉහළ තත්ත්වයක තිබෙනවා. ඒ වාගේම 2000 අවුරුද්දේ අප මෙට්‍රික් ටොන් 13,490ක් තමයි නිෂ්පාදනය කරලා තිබෙන්නේ. 2012 වන කොට මෙට්‍රික් ටොන් 17,165ක් දක්වා අපට නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. 2012 දී මෙට්‍රික් ටොන් 17,165ක් කුරුඳු නිෂ්පාදනය කරන කොට එයින් මෙට්‍රික් ටොන් 14,762ක් අපනයනය කර තිබෙනවා. ඒ නිසා මේ නියෝගය ඉතා වැදගත් වනවා. සුළු අපනයනයක් හැටියටත්, ආදායමක් ලබා දෙන අපනයන බෝගයක් හැටියටත් මේ කුරුඳු ප්‍රමිතියට අනුකූලව අපනයනයට නියෝග සැකසීම මා හිතන හැටියට ඉතාම වැදගත් වනවා. වටිනාකම ගත්තාම 2002 දී රුපියල් මිලියන 3,442ක ආදායමක් තමයි මේ රටට ලබා දුන්නේ. මේ වන විට කුරුඳුවල අපනයන වටිනාකම රුපියල් මිලියන 17,397ක් වෙලා තිබෙනවා. මේක ආර්ථික වශයෙන් ඉතා වැදගත් වනවා.

විශේෂයෙන් දකුණේ වැවෙන බෝගයක් හැටියටත්, දකුණේ සාමාන්‍ය ජනතාවට ආදායමක් එන බෝගයක් හැටියටත් මා හිතනවා තේ වාගේම කුරුඳු අපනයනය සම්බන්ධයෙනුත් ප්‍රමිතියක් ඇති කළ යුතුයි කියලා. ඒ සම්බන්ධයෙන් ගෙනෙන මෙම නියෝගය අප අගය කිරීමට ලක් කරන්න ඕනෑ. මේ තුළින් කුරුඳු ගොවියාට වැඩි ආදායමක් ලැබෙන්නත්, විදේශ වෙළෙඳ පොළේ අපේ කුරුඳුවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමටත් පුළුවන් වනවා. නැවත වතාවක් ආදේශනයන් බිහි නොවීමටත් මෙය හේතුවක් වේවි. මොකද, රබර් වෙනුවටත් කෘත්‍රිම රබර් ආවා. ඒ රබර් වෙළෙඳ පොළ යම් යම් ආකාරයෙන් පසු බෑමට ලක් වුණා. අද චීනය ගැන මේ අය කොච්චර කථා කළත් එදා චීන - ශ්‍රී ලංකා රබර් සහල් ගිවිසුම ගහලා තමයි අපට හාල් ටික ගෙන්වා ගන්න පුළුවන්කම ලැබුණේ. අද මේ ආදේශකයන් රටවල්වලට තරග කරන්න එනවා. නමුත් ඒ ආදේශකයන් කොච්චර ආවත් සැබෑ දේ, ස්වාභාවික දේ දීර්ඝ කාලීනව පවතිනවා. එයින් අනිවාර්යයෙන් පාරිභෝගිකයා ජය ගන්නවා. ඒ නිසා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම තුළින් කෘත්‍රිම ආදේශයකට දීර්ඝ කාලීනව අපට මුහුණ දෙන්න හැකියාව ලැබෙනවා. නමුත් මේ විධියට නියෝග පනවා අප ප්‍රමිතිය ආරක්ෂා කර ගත්තේ නැත්නම් ඉදිරියේදී අපට ඒ ආදේශකයත් සමඟ තරග කරන්න බැරි වෙනවා. ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, හොඳ වර්ගයේ කුරුඳු පොතු අහල් භාගයක කෑල්ලක් හපලා විනාඩියක් දිවේ තියාගෙන ඉන්න බැහැ කියලා. එම නිසා මේ ස්වාභාවික කුරුඳු නිෂ්පාදනයේ ප්‍රමිතිය නැති වෙලා ගියොත් මා හිතන්නේ අපට වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා අප මේ නියෝගය අගය කරන්න ඕනෑ.

රසායන ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් අද නියෝගයක් ගෙනැවිත් තිබෙනවා. මා හිතන්නේ මීට කලින් ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීම යටතේ ඒ මොන්ට්‍රියල් සන්ධාන නීතියට අනුකූලව මේ වන විට ශ්‍රී ලංකාව රසායන ද්‍රව්‍ය 54ක් ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවත්වලා තිබෙනවා. මේ නියෝග යටතේ මේ

රටේ ජනතාවට අහිතකර වන තවත් රසායන ද්‍රව්‍ය 96ක් ගෙන්වීම තහනම් කිරීමක් සිදු වනවා. ඒ නිසා මේ නියෝග පැනවීම ඉතාම වැදගත් වනවා. අද මේ සභාව තුළදී අප ඒක අගය කරනවා. එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය මේ රටේ ජනතාවට ඉතාම වටිනා, ඵලදායී, පරිසරයට බලපාන මෙවැනි නියෝග ගෙන ඒම ඉතාම වැදගත් වනවා. උදාහරණයක් ගත්තොත් කලින් ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ භාවිත කළ Chlorofluorocarbon - CFC - වායුව, ගිනි නිවන උපකරණවලට භාවිත කළ Floron කියන මේ රසායන ද්‍රව්‍ය ගෙන්වීම තහනම් කරලා තිබෙනවා. අනිකුත් රසායනික ද්‍රව්‍ය, විශේෂයෙන්ම ශීතකරණ, වායු සමීකරණ ක්ෂේත්‍රයේ භාවිත කරන Hydrochlorofluorocarbons - HCFCs - කියන රසායනික ද්‍රව්‍ය කාබන් ඉවත් කිරීම වාගේ දේවල් 2013 ජනවාරි 01 වැනිදා සිට ක්‍රියාත්මක කළා.

2030 වර්ෂය වන විට ඕසෝන් ස්තරයට බලපාන රසායන ද්‍රව්‍ය 96ක් ලංකාවට ගෙන්වීම නවත්වන්න කටයුතු කරලා තිබෙනවා. අපි ඒක අගය කරන්න ඕනෑ. ඒ වාගේම පරිසරයට බලපාන උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා සෙසු අපද්‍රව්‍ය දේශ සීමා හරහා ප්‍රවාහනය, අපහරණය කිරීම පාලනය කිරීමේ "බාසල් සම්මුතිය" තිබෙනවා. ඒ වාගේම දිගු කල් පවත්නා කාබනික දූෂණ පිළිබඳ "ස්ටොක්හෝම් සම්මුතිය" තිබෙනවා. මේවාට අනුව පරිසරයට හිතකර නොවන රසායනික ද්‍රව්‍ය 22ක් ගෙන්වීම නැවැත්වීමට අද මේ සභාව තුළ අපි අනුමත කරන නියෝග හරහා අවස්ථාව ලැබෙනවා. අපි ඒක අගය කරන්න ඕනෑ. මොකද හේතුව, අපේ ස්වභාවික පරිසරය රටේ අනාගතය භාර ගන්න සිටින දරුවන්ගෙන් අපි ණයට ගත් දෙයක්. ඒ නිසා අපි ඒක ආරක්ෂා කරලා දෙන්න ඕනෑ. එහෙම නම් ඒ පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පරිසරයට අහිතකර රසායනික ද්‍රව්‍ය 22ක් ගෙන ඒම පාලනය කරන්න මේ නියෝග තුළින් කටයුතු කිරීම අපි අගය කළ යුතු දෙයක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, බම්බු කථාවක් ගැන. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා බම්බු ගැහුවාට අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බම්බු ගහන්නේ නැහැ. මොකද හේතුව, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා රේල් ගේට්ටුවලට බම්බු දැම්මාට අපේ ජනාධිපතිතුමා ඒකට යම් කිසි ක්‍රමවේදයක් සකස් කළා. ඒ වාගේම ඒ ගේට්ටුවලට පාලකයන් හැටියට වගකීමක් දරන්න පුළුවන් කෙනෙක් පත් කරන්න කිව්වා. මොකද මේ ස්ථානවලට උණ බම්බුවක් ගහලා ගේට්ටුවක් දැම්මාට වැඩක් වෙන්නේ නැහැ. සමහර විට කාලයක් යනකොට එහි ප්‍රායෝගිකත්වයක් නැතිව යනවා. එහෙම නැතිව ඒක cancel කිරීම නොවෙයි කළ යුතු වන්නේ. එම ගේට්ටුව ළඟ ඒ පුද්ගලයා හිටියේ නැත්නම් පාලනයක් වන්නේ නැහැ. නමුත් අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒකට නියෝගයක් දීලා තිබෙනවා, මෙන්න මේ විධියට. ඒකට සිවිල් ආරක්ෂක බල කායේ නිලධාරියෙක් යොදවා වග කීමක් ඇතිව ඒ කටයුත්ත කරන්න කියලා එතුමා කිව්වා. ඒක වැදගත්. මොකද හේතුව, ජනතාවට යම් කිසි බලපෑමක් ඇති වන කොට සංවේදී රාජ්‍ය නායකයෙක් හැටියට එතුමා ඒකට ඇහුම් කන් දුන්නා. එදා හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේදී රේල් ගේට්ටුවලට උණ බම්බු දැම්මා. අපේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ රේල් ගේට්ටු හරහා උණ බම්බු නොවෙයි, ප්‍රයෝජනවත් වන ආකාරයට සහ ඉතා වැදගත් ආකාරයට යම් කිසි ගේට්ටුවක් හැදුණා. ඒ නිසා බම්බු ගහන්නේ නැතිව ජනතාවගේ ජීවිත ආරක්ෂා වන විධියේ වැඩ පිළිවෙලක් ඒ සඳහා ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා රුපියල අවප්‍රමාණය වීම ගැන කථා කළා. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 134ට ගියා කියලා එතුමා කිව්වා. 2012 අවුරුද්ද වෙන කොට ඩොලරයට සාපේක්ෂව ඉන්දියන් රුපියලේ අගයත් 55කට විතර තිබුණේ. ඒකත් අද 60 දක්වා වෙනස් වෙලා තිබෙනවා. මේ විධියට වෙනස් වුණේ ශ්‍රී ලංකා රුපියලේ අගය විතරක් නොවෙයි. මේ තත්ත්වය පාලනය කරන කොට එදා කිව්වා, ඩොලරයට සාපේක්ෂව රුපියල 140ට, 160ට යයි කියලා. ගෝලීය වශයෙන් තිබෙන යම් යම් ආර්ථික අවපාත අපේ රුපියලේ අගයට බලපානවා. ඒ වාගේම නියහයත් බලපානවා. මේ ක්‍රමවේදය තුළ රටට යම් යම් අර්බුදවලට මුහුණ දෙන්න වුණොත් ඒවාට මුහුණ දිය යුතු වනවා. නමුත් අද ඒ තුළින් අපට වෙනත් අභියෝග ජයග්‍රහණය කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

එදා රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා එක් එක් ප්‍රදේශවල garment factories ආරම්භ කළා. ඒ තුළින් වාසි මෙන්ම අවාසිත් වුණා. වතු ආර්ථිකය තිබුණු යටියන්තොට, රුවන්වැල්ල වැනි ප්‍රදේශවල මෙම කර්මාන්තශාලා ආරම්භ කිරීම නිසා තේ දළු කඩන්න, නැත්නම් තේ කර්මාන්තයට යොදන්න තිබුණු ශ්‍රමය ඇඟලුම් කර්මාන්තයට යොමු වීම තුළින් තේ කර්මාන්තය යම් කිසි පසු බෑමකට ලක් වෙලා තිබෙනවා. අලුතෙන් ආයෝජන ආරම්භ කරන කොට අපේ කර්මාන්ත ක්ෂේත්‍රයට එය කොයි ආකාරයෙන් බල පානවාද කියලා අපි බලන්න ඕනෑ. අපේ අපනයන වගාව ආරක්ෂා වන විධියට; ඒ සඳහා අවශ්‍ය ශ්‍රමය ඒකට යෙදවෙන ආකාරයට නව කර්මාන්ත ආරම්භ කරන්න ඕනෑ.

ප්‍රධාන වශයෙන් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අද ත්‍රස්තවාදය නැති කරලා තිබෙනවා. එදා හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහත්තයා garment factories 600ක් ආරම්භ කළා. නමුත් ඊට වැඩිය දෙයක් අද අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ වෙලා තිබෙනවා. ඒ තමයි, මේ රටට සාමය උදා වෙලා තිබීම. අපේ රටට සාමය උදා වීම තුළින් සිදු වූ ප්‍රධාන දේ මොකක්ද? එදා මේ රටට නොපැමිණි ආයෝජනයක් තමයි සංචාරක ව්‍යාපාරය කියන්නේ. 2008 දී අපේ රටට පැමිණි සංචාරකයින් ප්‍රමාණය 438,475යි. අද වෙන කොට ඒ ප්‍රමාණය දස ලක්ෂය ඉක්මවා තිබෙනවා. එහෙම නම් මේ ආදායම් මේ රටට එන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රටට සාමය උදා වුණු නිසායි. අද වෙන කොට දස ලක්ෂයක සංචාරකයින් ප්‍රමාණයක් අපේ රටට ඇවිල්ලා තිබෙනවා.

2005 වර්ෂයේ සිට පොහොර සහනාධාරය ලබා දීම තුළින් අද අපට වී වගාවෙන් ස්වයංපෝෂිත වන්න පුළුවන්කම ලැබී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හාල් ඇටයක්වත් අද අපි පිට රටින් ගෙන්වන්නේ නැහැ. වී වගාවෙන් අප ස්වයංපෝෂිත වුණේ නැත්නම් මොකද වෙන්නේ? හාල් පිට රටින් ගෙන්වන්න අපට මුදල් වියදම් කරන්න වෙනවා. අද ඒ මුදල අපි ඉතිරි කර ගෙන තිබෙනවා. අද අපි බඩ ඉරිභූ පිට රටින් ගෙන්වන්නේ නැහැ. අද අපි උළුදු පිට රටින් ගෙන්වන්නේ නැහැ. අද අපට ඒවා නිෂ්පාදනය කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මේ ක්‍රමවේදය අපි මේ රටේ ව්‍යාප්ත කළ යුතු වෙනවා. අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ එකම දෙයයි. 1977 දී මේ රට තුළ නිදහස් වෙළඳ ආර්ථික ක්‍රමය ඇති කිරීම මේ රටේ කෘෂි ආර්ථිකය කඩා වැටීමට හේතු වුණා. එයට ක්ෂණිකව ප්‍රතිකර්මයක් යොදන්න බැහැ. මේ පවතින ක්‍රමවේදය අනුව අපි කාර්මික අංශයට ඒ වාගේම සේවා අංශයට වැඩි වැදගත්කමක් දෙන්න ඕනෑ. දිවි නැඟුම ව්‍යාපාරය යටතේ භෝග වගාව සඳහා අද විශාල වශයෙන් පැළ ලබා දී ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න කටයුතු කරනවා. ඒ තුළින් අපනයනය වාගේම ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන්කම ලැබෙනවා ඇති.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ ඇට පැළ වන්නේ නැහැ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සජිත් මන්ත්‍රීතුමන්ලා කෑ ගැහුවාට, සමහර මන්ත්‍රීතුමන්ලා කෑ ගැහුවාට නිදහස ලබා ගෙන අද මේ රට සාමකාමීව ඉදිරියට යනවා. ඒක නවත්වන්න ඔබතුමන්ලාට බැහැ කියන එකයි මම කියන්නේ. වයඹ, උතුර, මධ්‍යම පළාත් සහ ඡන්දවලින් ප්‍රතිඵල නිකුත් කළාම මේ රටේ ආර්ථික කටයුතු සිද්ධ වන්නේ කොයි ආකාරයෙන්ද කියා තමුන්නාන්සේලාට බලා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග ගැන කථා කරන අවස්ථාවේදී, අපේ අපනයන ප්‍රතිපත්ති හා මූලධර්ම ගැනත් ඒවා අනුගමනය කිරීම නිසා රටට වෙලා තිබෙන හානිය ගැනත් කරුණු කිහිපයක් එකතු කරන්න මම කැමැතියි. දැනට ලැබී තිබෙන දත්ත අනුව 2013 මුල් භාගයේ අපේ අපනයන අඩු වෙලා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන් ලංකාව වාගේ දූපතක් අවුරුදු දහස් ගණනක් වෙනත් රටවල් එක්ක ගනුදෙනු කරලා මේ රටේ ජීවත් වෙන අයට යම් කිසි ජීවන රටාවක් ඇති වෙලා තියෙනවා. ඒ ජීවන රටාව පදනම් වෙලා තිබෙන්නේ මේ රටේ කෘෂිකර්මයත්, මේ රට තුළ නිෂ්පාදනය කරන ද්‍රව්‍යත්, පිට රටින් ගෙනෙන සේවාවනුත්, පිට රටින් ගෙනෙන භාණ්ඩත් අනුවයි. ඒ නිසා අපනයනය, ආනයනය මේ රටට අවශ්‍යයි. අපි විශාල ලෙස අපනයනය කරන්නේ යුරෝපයට සහ ඇමෙරිකාවට බව අපි දන්නවා. ඉන් පසුව තමයි අපි ආසියාවට සහ ලෝකයේ අනෙකුත් රටවලට අපනයනය කරන්නේ. අපි වැඩියෙන්ම ආනයනය කරන්නේ ඉන්දියාවෙන් සහ චීනයෙන්. නමුත් අවාසනාවකට අපිට ඒ රටවලට අපනයනය කරන්න පුළුවන්කමක් නැහැ. අපේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය හා සේවාවන් බොහොම සීමිතයි. ඉන්දියාවයි චීනයයි අපි එක්ක විශාල ගනුදෙනු තිබුණාට අපේ අපනයනයට ඒ රටවල් වෙළෙඳ පොළක් වෙලා නැහැ. මොකද, අපි නිෂ්පාදනය කරන දේවල් - අපනයනය කරන්න යන ද්‍රව්‍ය- ඒ රටවල නිෂ්පාදනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2007 ඉඳලා ලංකාවේ විශාලම වෙළෙඳ පොළ වුණේ යුරෝපය බව අප දන්නවා. අපේ මුළු අපනයනවල වටිනාකම 2011 දී ඇමෙරිකන් ඩොලර් බිලියන 5.4යි. ඒක 2012 දී 4.9ට අඩු වුණා. ඒ වාගේම 2011 දී යුරෝපයට පමණක් ලංකාවෙන් ගිය අපනයනය ඇමෙරිකන් ඩොලර් බිලියන 3.5යි. 2012 දී ඒ ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් බිලියන 3.2කට අඩු වුණා. අපේ අපනයනවලින් විශාල ප්‍රමාණයක් -සියයට 50කට අධික ප්‍රමාණයක්- යන්නේ යුරෝපයටයි. යුරෝපයට සහ ඇමෙරිකාවට යන අපනයන ප්‍රමාණය එකතු කළාම මුළු අපනයනවලින් සියයට 60ක් 70ක් පමණ වනවා. ඇඟලුම් කර්මාන්තය වාගේ කර්මාන්තයක් දෙස බලන විට සියයට 80ක් විතර යන්නේ මේ වෙළෙඳ පොළවල් දෙකටයි. 2007 ඉඳලා ශ්‍රී ලංකාවේ විශාලම වෙළෙඳ පොළ යුරෝපයයි.

යුරෝපයේ තිබෙන ආර්ථික අර්බුදය නිසා 2008 සිට 2012 දක්වා අපනයනය අඩු වුණා. නමුත් අනෙක් හැම අවුරුද්දකම වාගේ දිගින් දිගටම අපනයනය වැඩි වෙලා තිබෙනවා. යුරෝපයෙන් අපට විතරක් නොවෙයි රටවල් ගණනාවකටම GSP සහනාධාරයක් ලබා දෙන බව අපි දන්නවා. ඇමෙරිකාවෙනුත් GSP සහනාධාරයක් ලබා දෙනවා. රටවල් 129කින් භාණ්ඩ 4,800ක් ඇමෙරිකාවට අපනයනය කරනවා. ඒවා සඳහා GSP සහනාධාර ලැබෙනවා. ඒ වාගේම යුරෝපයෙනුත් GSP සහනාධාර ලැබෙනවා. එම සහනාධාර දෙන්නේ අඩු ආදායම් ලබන රටවල භාණ්ඩ යුරෝපීය රටවලට අපනයනය කිරීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2009 දී ලංකාවේ තිබුණු අර්බුදකාරී තත්ත්වය නිසා අපට ඒ GSP සහනාධාරය ලබා ගන්නට බැරි වුණු බව අපි දන්නවා. ඒ අවස්ථාවේදී අපට ඒක අහිමි වුණා. ඇත්තටම 2009 දී එහෙම වෙන්න හේතු තිබුණා. GSP සහනාධාර අපට ලබා ගන්නට බැරි වුණු හේතු තිබුණා. මොකද, ලංකාව අත්සන් කරලා තිබෙන ජාත්‍යන්තර ගිවිසුම් 27ක් විතර තිබෙනවා. එම GSP සහනාධාර ලබා ගන්නට නම් එම ජාත්‍යන්තර ගිවිසුම් මඟින් එකඟ වුණු දේවල් අනුව අපි ක්‍රියා කරන්නට ඕනෑ. මානව හිමිකම් ඒ ගිවිසුම්වල ප්‍රධාන කොටසක් වෙනවා. නමුත් 2009 තිබුණු අර්බුදය නිසා ලංකාවට ඒ එකඟතා සම්පූර්ණ කරන්න බැරි වුණා. එතකොට ඒකට හේතු තිබුණා. අපට GSP සහනය ලබා ගන්න නොහැකි වීමට හේතු තිබුණා. නමුත් අද යුද්ධය අවසන් වෙලා අවුරුදු 4කට වඩා වැඩියි. දැන් අපි ඉන්නේ අලුත් යුගයකයි. මේ අවුරුදු හතරේදී මොනවාද වුණේ? මේ කාලය තුළදී මේ රටේ කර්මාන්තශාලා 400ක් විතර වසා දමන්න සිදු වුණා. වසා දමන්න සිදු වූ එම කර්මාන්තශාලාවලින් වැඩි ප්‍රමාණයක් ඇඟලුම් කර්මාන්තශාලායි. ඒ වාගේම එම කර්මාන්තශාලාවල සේවකයන්ගේ රැකී රක්ෂා දසදහස් ගණනින් අහිමි වුණා. දැන් අපි දන්නවා, 2014 ජනවාරි මාසයේ ඉඳලා අලුතින් GSP, ඒ වාගේම GSP Plus සහනාධාරය ලබා ගන්න පුළුවන් කියලා යුරෝපා සංගමය ප්‍රකාශයක් කරලා තිබෙනවා කියලා. නැවතත් අපට එම GSP Plus සහනය ලබා ගෙන අපේ නිෂ්පාදකයින්ට එම සහනය ලබා දෙන්නටත්, අපේ අපනයනය වැඩි කරන්නටත්, අලුත් වෙළෙඳ පොළවල් ඇති කර ගන්නටත් ලංකාවට අවස්ථාවක් තිබෙනවා. මොකද, යුරෝපා සංගමයට අයත් රටවල් 27ක් තිබෙනවා. ඒ නිසා අලුත් වෙළෙඳ පොළවල් සොයලා අපට ඒ වෙළෙඳ පොළවල්වලට යන්න පුළුවන් වෙනවා. එතකොට ඒ රටවල අයට ලැබෙන භාණ්ඩ අඩු මිලට ලැබෙනවා; අපට වෙළෙඳ පොළක් ලැබෙනවා; අපට අලුත් රටවල්වලට යන්න පුළුවන් වෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ රටේ විශාල පරිමාණයේ නිෂ්පාදකයාට විතරක් නොව සාමාන්‍ය පරිමාණයේ නිෂ්පාදකයාටත් තරග කරලා තැනක් සොයා ගන්නට පුළුවන් වෙනවා. විශාල පරිමාණයේ නිෂ්පාදකයන්ට මේක ප්‍රශ්නයක් නොවෙයි. මොකද, මධ්‍යම පරිමාණයේ නිෂ්පාදකයා නැති වෙනවා නම්, මේ රටේ විශාල පරිමාණයේ නිෂ්පාදකයාට ඒකෙන් ප්‍රයෝජනයක් ලැබෙනවා. නමුත් අපි කල්පනා කරන්නට ඕනෑ විශාල පරිමාණයේ කර්මාන්ත ගැන සහ ඇඟලුම් කර්මාන්ත ගැන විතරක් නොවෙයි. මධ්‍යම පරිමාණයේ ඇඟලුම් කර්මාන්ත හුඟක් තිබෙනවා. ඒවා සඳහා මේ සහනාධාරය අවශ්‍යයි. දැන් අපට මේ සහනාධාරය ලැබුණේ නැත්නම් ඇත්තටම තව අවුරුදු 10කින් අපට ඒ වෙළෙඳ පොළවල් අහිමි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආර්ථිකය කියන එක හැම දාම ඉදිරියට යන දෙයක් බව අපි දන්නවා. අපි ඒ වෙළෙඳ පොළවල්වල සිටියේ නැත්නම් අප්‍රිකාවේ අලුතින් භාණ්ඩ නිෂ්පාදනය කරන රටවලුත්, ආසියාවේ මියන්මාරය, වියට්නාමය වාගේ රටවලුත් වැඩි වැඩියෙන් එම වෙළෙඳ පොළ අල්ලා ගන්නවා. එතකොට මේ රටට ඒකෙන් විශාල අලාභයක් සිදු වෙනවා.

දැන් GSP සහනය නොමැති වීමෙන් අපට අහිමි වන අලාභයේ ප්‍රමාණය මොකක්ද? අපට GSP සහනය නොමැති වීමෙන් අවුරුද්දකට අහිමි වන අලාභයේ ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් මිලියන 350ක් වෙනවා.

ඒ කියන්නේ, අවුරුදු 10ක කාලයක් තුළදී යූඑස් ඩොලර් බිලියන 5ක්, එහෙම නැත්නම් යූඑස් ඩොලර් මිලියන 5,000ක් අහිමි වනවා. ඒක විශාල මුදලක්. ඒ වෙළෙඳ පොළ අහිමි වෙලා අපට ඒ මුදල නැති වුණොත් මේ රටේ රැකී රක්ෂා නැතුව යනවා; සේවකයන්ගේ රැකී රක්ෂා නැතුව යනවා.

අපට පසු ගිය සතියේ වාර්තාවක් ලැබුණා, දැනට සවුදි අරාබියේ බලපත්‍ර නොමැතිව සේවය කරන ශ්‍රී ලාංකිකයන් 15,000ක් පමණ සිටින බවට. වීසා වලංගු කාලය ඉක්මවා ගිහින් තවමත් ඒ රටේ වැඩ කරන ශ්‍රී ලාංකිකයන් 15,000ක් විතර ඉන්නවා. දැන් එක්කෝ ඒ සේවකයන්ට ඒ රටින් පිට වෙන්න සිදු වනවා; නැත්නම් ඔවුන්ගේ බලපත්‍ර නැවත සකස් කර ගන්න වෙනවා. දැන් තිබෙන වාර්තා අනුව, 4,000ක විතර පිරිසක් සවුදි රජයෙන් ඉල්ලා තිබෙනවා, ඒගොල්ලන්ගේ බලපත්‍ර හදලා දීලා, ඒ රටේ දිගින් දිගටම සේවය කරන්න අවස්ථාව දෙන්න කියලා. නමුත් 11,000කට විතර නැවතත් මේ රටට එන්න වනවා සවුදි අරාබි රජය අදාළ නීතිය ක්‍රියාත්මක කරන නිසා. ඇත්තටම මේක විශාල ප්‍රශ්නයක් වනවා ඒ සේවකයන්ගේ පවුල්වලට. මොකද, ඒ අය ඇවිල්ලා මේ රටේ රැකී රක්ෂා සොයා ගන්න ඕනෑ නිසා. නමුත් ලංකාවේ පෞද්ගලික අංශය වර්ධනය වන්නේ නැත්නම්, රටේ කර්මාන්තශාලා වැහෙනවා මිස වැඩි වන්නේ නැත්නම්, සාධාරණ වැටුපකට රැකියාවක් සොයා ගන්න බැරි නම්, පිට රට සිට නැවත එන්න සිද්ධ වන ඒ අයගේ පවුල්වල සියලු දෙනාටම සිදු වන්නට යන්නේ "කබලෙන් ලිපට වැටෙනවා" වාගේ වැඩක්. ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපි කියන්නේ, ලාංකික සේවකයාට අපේ රටේ ප්‍රමුඛස්ථානය දිය යුතුයි කියන එකයි. මේ අවස්ථාවේදී රජය බලන්නට ඕනෑ, කොහොමද අපේ රැකියා වෙළෙඳ පොළ අපි ආරක්ෂා කර ගන්නේ කියලා. මේක බොහොම අවාසනාවන්ත සිදු වීමක්. නමුත් ඇයි යුද්ධය අවසන් වෙලා අවුරුදු හතරක් ගත වෙලාත් තවමත් අපට මේ ප්‍රශ්න නිරාකරණය කරන්න බැරි වෙලා තිබෙන්නේ කියලා අපට හිතා ගන්න බැහැ. ඒ නිසා මේ කාරණයේදී සඳහන් කරන්න ඕනෑ, ඇත්තටම ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අසාර්ථක වෙලා තිබෙනවා කියලා. රටක විදේශ ප්‍රතිපත්තියක් සාර්ථක වන්නට නම්, ඒ රට ජාත්‍යන්තරය තුළ බොහොම වැදගත්, පිළිගත් තැනකට එන්න ඕනෑ. ඒකෙන් තමයි රටක විදේශ ප්‍රතිපත්තිය සාර්ථකද, නැද්ද කියලා මනින්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා අවසන් කරන්නම්.

අපි විදේශ ප්‍රතිපත්තිය මනින්න ඕනෑ අපි අපනයනය කරන දේවල්වලට තිබෙන වෙළෙඳ පොළ වැඩි වනවාද නැද්ද කියන එකෙන්. අපට තිබෙන වෙළෙඳ පොළ ආරක්ෂා කරන්න පුළුවන්ද නැද්ද කියන එක අපි බලන්න ඕනෑ විදේශ ප්‍රතිපත්තිය තුළින්. විදේශ ප්‍රතිපත්තියක් තිබෙන්නේ ඒකටයි. යුද්ධය අවසන් වෙලා දැනට අවුරුදු හතරයි. නමුත් තවමත් අපට බැරි වෙලා තිබෙනවා, අපට වෙළෙඳ පොළක් තිබෙන රටවල් එක්ක, අප අපනයනය කරන රටවල් එක්ක තිබෙන සම්බන්ධතාව ගොඩනඟලා, අපේ වෙළෙඳ පොළ ආරක්ෂා කර ගනිමින් වෙළෙඳ පොළ වැඩි කර ගන්න කටයුතු කරන්න.

අද අපි අපනයනය ආනයනය ගැන කථා කරනවා. ඇත්තටම අද අපේ අපනයනය අඩු වෙමින් යනවා. GSP එක අපට නැවතත් ලැබුණේ නැත්නම් විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්නට වෙනවා. විශේෂයෙන්ම රැකියා අහිමිව මැද පෙරදිග ඉඳලා මේ රටට පැමිණෙන අයට රැකියා සොයා ගන්නට බැරි වනවා. ඒ වාගේම GCE (Ordinary Level) Exam එකෙන් පසු, මේ රටේ රැකියා වෙළෙඳ පොළට එන අයට, සරිලන පඩියකට රැකියාවක් සොයා ගන්නට බැරි වනවා. ස්තුතියි.

[අ.භා. 5.05]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන, ඒ වාගේම අපේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාගේ ආදරණීය බිරිඳ වූ ඔබතුමිය මූලාසනයේ ඉන්න අවස්ථාවේදී කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

මා විශේෂයෙන්ම සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ රේල් ගේට්ටු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඕනෑ.

එතුමාගේ පියා බම්බු ගේට්ටු දැම්මා, ඒක ඇත්තයි. නමුත් මම තමයි ඒ බම්බු ගේට්ටු සේවකයන් ස්ථිර කෙරුවේ. මම ප්‍රවාහන ඇමති වෙලා ඉන්දෙද්දී, වයස අවුරුදු 45ට අඩු ඒ සියලු දෙනාම ස්ථිර කරලා රජයේ සේවකයන් බවට පත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු කිහිප දෙනෙකු හිටියත් ඒ කටයුත්ත කළේ නැහැ. ඒ සත් කටයුත්ත අපේ ආණ්ඩුවක් යටතේ තමයි කළේ කියන එකත් මතක් කරන්න ඕනෑ.

ඊ ළඟට, ඒ ගරු මන්ත්‍රීතුමා කියපු නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය ගැනත් මම යමක් කියන්න ඕනෑ. පොදු රාජ්‍ය මණ්ඩලයීය රැස්වීම මේ රටේ තියනවා. කොච්චර බාධා කළත්, එපා කිව්වත් ඒ රැස්වීම අපේ රටේ තියනවා. ඒ අය මේ රටේදී රැස් වුණාම අපේ විදේශ ප්‍රතිපත්තියේ තිබෙන උත්තරීතරභාවය සටහන් වෙනවාය කියන එකත් මතක් කරන්න ඕනෑ.

අද මේ ගෙන එන නීති රීති 2013 අය වැය යෝජනාවලිය අනුව නිකුත් කරන ලද නියෝග 2012.11.28වැනි දින සහ 1783/18 දරන ගැසට් නිවේදනය මඟින් 3/2012 ආනයන බදු සම්බන්ධයෙන් වූ රේගු සංකේතාංක වර්ගීකරණයන් සංශෝධනය කර තිබෙනවා. මේ තුළින් පාරිසරික සුරක්ෂිතභාවය, මහ ජන සෞඛ්‍ය සහ ජාතික ආරක්ෂාව යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් කියන්න ඕනෑ, පාරිසරික සුරක්ෂිතභාවය ගැන. මොකක්ද මේ පාරිසරික සුරක්ෂිතභාවය කියන්නේ? අපේ ප්‍රදේශයේත් දැනට අවුරුදු

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

දෙකකට ඉස්සෙල්ලා පරණ computers විකුණන්න පටන් ගත්තා. රුපියල් 50,000 එකක් අට දාහයි, දහ දාහයි. ඇමෙරිකාවෙන් සහ නොයෙකුත් විදේශ රටවලට එපා වෙලා අයින් කරන දේවල් මෙහාට එවනවා. මේවායින් විශාල පරිසර හානියක් සිදු වෙනවා. සාමාන්‍යයෙන් hybrid වාහනයක බැටරි දෙකකින් අක්කර හයක්, හතක් විනාශ කරන්න පුළුවන් කියනවා. කොච්චර පාරිසරික හානියක්ද කියලා බලන්න. මෙවැනි කරුණු කාරණා අපි දැන ගෙන, මෙවැනි නියෝග ගෙනැල්ලා සුරක්ෂිතභාවයක් ඇති කරන්න යෑම ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

මම ධීවර ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. ඒ කාලයේ අපේ මාළු export කරන්න අවශ්‍ය නීති-රීති අපි මේ පාර්ලිමේන්තුවේදී සම්මත කෙරුවා. කාබනික අපද්‍රව්‍ය, ප්ලාස්ටික් හා නොයෙකුත් දේවල් ඇළ දොළට වැටිලා ඒ හරහා මුහුදට වැටෙනවා. මගේ විශ්වාසයේ හැටියට එකසිය හැටදෙපොළකින් ඇළවල් මුහුදට වැටෙනවා. ඒ අපද්‍රව්‍ය මුහුදට ගිහිල්ලා ජලය යට තැන්පත් වෙනවා. මාළු ඒ අපද්‍රව්‍ය කනවා. අපි ඒ මාළු කෑවාම අපටත් ප්‍රශ්න ඇති වෙනවා. මේ ගැන හුඟක් සැලකිලිමත් වුණා, යුරෝපය. එම නිසා අපි ඒ standards සහා සම්මත කරලා තැබුවාය කියන එක මතක් කරන්න ඕනෑ.

ඊ ළඟට, කුරුඳු. අපේ කුරුඳුවලට විකල්පයක් වශයෙන් කැෂියා කියන වර්ගය දැන් අප්‍රිකාවේ වවනවා. මගේ දැනීමේ හැටියට අපි රුපියල් මිලියන13,000ක් උපයනවා, කුරුඳු අපනයනයෙන්. ඒක පොඩි ගණනක් නොවෙයි. එවැනි ගණනක් උපයන්න නම් අපි අපනයනය කරන කුරුඳුවල ප්‍රමිතිය තිබෙන්න ඕනෑ. ප්‍රමිතිය නැති වුණොත් අපට කවදාවත් කුරුඳු export කරන්න බැහැ. දැන් ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, යුරෝපයට යවන බඩු භාණ්ඩ ගැන. මේ බඩු භාණ්ඩවල වටිනාකම තිබෙන්නේ quality එක අනුවයි. ඒවායේ export quality එක තිබෙන්න ඕනෑ. Export quality එක තිබෙනවා නම් විකුණන එකේ ප්‍රශ්නයක් නැහැ. අපේ කුරුඳු තමයි ලෝකයේ තිබෙන හොඳම කුරුඳු.

මම ළඟදී ගියා, නුවර ප්‍රදේශයට. නුවර බොක්කාවල ප්‍රදේශයේත් කුරුඳු වවලා තිබෙනවා. දකුණේ විතරක් නොවෙයි කුරුඳු වැවෙන්නේ. ජාඇලත් කුරුඳු වැවෙනවා. කටාන ආසනයේත් කුරුඳු වවලා තිබුණා. ඒ ප්‍රදේශවල කුරුඳු වැවෙනවා. මේවාට ලොකු ඉල්ලුමක් තිබෙනවා. අපේ කුරුඳුවලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ තත්ත්වය සුරක්ෂිත කරන්න නම් අපි කුරුඳුවල ප්‍රමිතිය ආරක්ෂා කරන්න ඕනෑ.

තේ නිෂ්පාදනය ගැන බලන්න. කසළ තේ පිට රටින් ගෙනැල්ලා, ඒවා අපේ තේ සමඟ මිශ්‍ර කරලා, අපේ තේ කියලා පිට රටට යවනවා. “Sri Lankan Tea”, “Sri Lankan Cinnamon” කියලා පිට රට යවනවා. අපත් හැදුවා “Sri Lankan Tuna” කියලා මාළු වර්ගයක්. අපි ඒ මාළු පිට රටට market කර ගත්තා. මේවා කරන්න නම් ඒවායේ ප්‍රමිතිය අනිවාර්යයෙන්ම ආරක්ෂා කරන්න ඕනෑ.

අද තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි පාරිසරික ප්‍රශ්න. මේ පාරිසරික ප්‍රශ්න කොහොමද ඇති වෙන්නේ කියන එක ගැන හැඟීමක් සහ ඒ පිළිබඳ අත් දැකීමක් අපටත් තිබෙනවා. දැනීමක් තිබෙන එක පැත්තකට දැමීමත් අත් දැකීමක් තිබෙනවා.

අපේ cold rooms එහෙම නැත්නම් freezersවලට ඉස්සර දැම්මේ ඇමෝනියා. තවමත් ධීවර අමාත්‍යාංශයේ ඇමෝනියා තිබෙනවා. මේ ඇමෝනියා අදට හරි යන්නේ නැහැ. ඊ ළඟට fume, gas පාවිච්චි කෙරුවා. ඒ ගෑස් එක උඩට ගියාම මාස ගණනක් වායුගෝලයේ තිබෙනවා. ඒවා වායුගෝලයට ගියාට පස්සේ කැඩිලා බිඳිලා, වායුගෝලය පිරිසිදු වෙන තත්ත්වයක් තිබුණොත් විතරයි අපේ රටට යහපතක් උදා කරන්න පුළුවන් වන්නේ. එහෙම නැත්නම් kidney රෝගය, අර රෝගය, මේ රෝගය කියලා රෝග රාශියක් අපට ඇති වෙනවා.

ගරු මන්ත්‍රීතුමා export ගැන කථා කෙරුවා. ඇත්ත තමයි. අපි පොහොර සහනාධාරය දීම නිසා සහල්වල අතිරික්ත නිෂ්පාදනයක් -විශාල අතිරික්ත නිෂ්පාදනයක්.- ඇති වෙලා තිබෙනවා. අතිරික්ත සහල් නිෂ්පාදනය තියා ගන්න බැහැ. එක්කෝ ගුල්ලෝ ගහනවා; නැත්නම් පරණ වෙනවා. වෙනත් රටවල් මොකක්ද කරන්නේ? ඒවායෙන් spirit හදනවා. අපේ ස්වාමීන් වහන්සේ මෙහි වැඩ ඉඳිද්දී මෙය කිව්වාට කමක් නැහැ. Spirit හදලා ඒවා තියා ගන්නවා; ගුදම්වල දාලා තියා ගන්නවා. අතිරික්ත නිෂ්පාදන එහෙම තියාගෙන තමයි ඒ අයගේ නිෂ්පාදන ක්‍රියාවලිය ආරක්ෂා කරන්නේ. අතිරික්ත නිෂ්පාදන ආරක්ෂා කිරීම ගැන අපි විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ. "වොඩ්කා" හදන්නේ අලවලින්. අල වැඩිපුරම නිෂ්පාදනය වුණාම විකුණන්න බැරි නිසා වීසි කරන්න බැහැ. ඒවායෙන් මධ්‍යසාරය හදනවා. ඒවා පාවිච්චියට ගන්නවා. ජපානයේ සුනාමියට මොනවා හසු වුණත් ඒ අයගේ "සකේ" export එක අඩු වුණේ නැහැ. එමඟින් විශාල මුදල් සම්භාරයක් හම්බ කර ගත්තා. මේ සම්බන්ධයෙන් ඕනෑ තරම් කරුණු කියන්න තිබෙනවා. සියයට 20ක් සැර ඇල්කොහොල් තමයි "සකේ" කියන්නේ.

අතිරික්ත සහල් නිෂ්පාදනය නිසි ප්‍රයෝජනයට ගැනීමෙන් සහල් වෙළඳ පොළ දැනට පවතින ඉල්ලුමට වඩා හොඳ මට්ටමට ගෙනෙන්න පුළුවන්. දැන් තිබෙන ප්‍රශ්නය තමයි සහල් කොහේද export කරන්නේ කියන එක. දැන් සහල්වල ලොකු අතිරික්තයක් තිබෙනවා. මොකද, සහල්නැලිය - Rice bowl එක - අපට ආවා. දැන් උතුරු නැහෙනහිර කුඹුරු විශාල ප්‍රමාණයක් වගා කරනවා. ගොවියා නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදෙද්දී ඔහුට තම නිෂ්පාදන පිරිවැය පියවා ගන්න බැරි වුණොත්, ඊට වඩා අඩු මිලකට තමන්ගේ භාණ්ඩ ටික market එකට විකුණන්න සිදු වුණොත් වන්නේ මොකක්ද? ඒ ගොවියා ගොවිතැනෙන් අයින් වන එකයි සිදු වන්නේ. ගොවියා ගොවිතැනින් අයින් වෙනවා කියන්නේ මොකක්ද? අන්න එතකොට අපේ ආර්ථිකය කඩා ගෙන වැටෙනවා. මෙතුමා කිව්වා වාගේ බඩ ඉරිඟු නිෂ්පාදනයෙන් අපි උඩට ගිහින් තිබෙනවා. හාල් නිෂ්පාදනයෙන් අපි උඩට ගිහින් තිබෙනවා. ඒ වාගේම, අපි කෘෂි නිෂ්පාදන අංශයේ නොයෙකුත් දේවලින් උඩට ගිහින් තිබෙනවා. කවුරු මොනවා කථා කළත්, අපේ රටේ තිබෙන භූගෝලීය හේතු මත සහ දේශ ගුණික තත්ත්වයේ හැටියට අපට කවදාවත් බඩගින්නේ මැරෙන්න සිදු වෙන්නේ නැහැ.

සමහර රටවල එහෙම නොවෙයි. ශීත ඍතුව පවතිනවා. අඩු තරමින් කුරුල්ලකුටවත් කන්න කෑම නැහැ. ඒ රටවල අනෙක් පැත්තේ තිබෙනවා කාන්තාර. ඒවායේ මොනවාද තිබෙන්නේ? කිසි දෙයක් නැහැ. කිසිම දෙයක් නැහැ. එම නිසා අපට තමයි ශක්තිය තිබෙන්නේ. GSP නැති වුණා කියලා තමුන්නාන්සේ බියක් පෙන්නුවා. එහි යම්කිසි ඇත්තක් තිබෙන්න පුළුවන්. නමුත් ඊට වඩා ලොකු ශක්තියක් මේ රටේ තිබෙනවා. දේව ශක්තියක් නිසා හෝ වේවා, එහෙම නැත්නම් වෙනත් හාස්කමක් නිසා හෝ වේවා, එහෙමත් නැත්නම් බෞද්ධ ධර්මය නිසා හෝ වේවා ඒ කුමකින් හෝ වේවා මේ රටේ ලොකු ශක්තියක් තිබෙනවා. ඒ ශක්තියට අලගු කියන්න කාටවත් බැහැ. මොකද, අපේ භූගෝලීය පිහිටීම, රටේ පවතින තත්ත්වය, ලංකාව වාගේ දහගුණයක් වන මුහුදු ආදිය ගැන කල්පනා කරද්දී ආර්ථිකයේ අනාගතය ගැන බයක් ඇති කර ගන්න සිදු වේවි කියන එක ගැන ඕනෑවට වඩා සැක සිතීම වැරැදියි. නමුත් ආර්ථිකය කළමනාකරණය කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ආනයනය වැඩි වෙලා කියලා. ඒක ඇත්තයි. මොනවායින්ද වැඩි වෙලා තිබෙන්නේ? වැඩි වූ ප්‍රමාණය සම්බන්ධ තොරතුරුත් මා ළඟ තිබෙනවා. වැඩි වෙලා තිබෙන්නේ, අප ගෙනෙන තෙල්වලිනුයි. වාහන වැඩි වුණා. ඒ නිසා තෙල් ආනයනයත් වැඩි වෙලා තිබෙනවා; සුවිශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අපේ ආනයනය වැඩි වීමට එක් හේතුවක් තමයි, අප ආනයනය කරන තෙල් ප්‍රමාණය. ඉස්සර තෙල් ප්‍රමාණය නොවෙයි දැන් ආනයනය කරන්නේ. සාපේක්ෂව බලද්දී දැන් අප ආනයනය කරන තෙල් ප්‍රමාණය ඉස්සරට වඩා ගොඩක් වැඩි වෙලා තිබෙනවා. මේ කරුණු කාරණා ගැන බලද්දී මට කියන්න ඕනෑ දේ තමයි ආර්ථිකය කළමනාකරණය කිරීමට කෘෂි ආර්ථිකය කියන පදනම අප තව තවත් ශක්තිමත් කරන්න ඕනෑ කියන එක. ඒ ශක්තිමත් බව ඇති කිරීමට අතිගරු ජනාධිපතිතුමා පොහොර සහනාධාරය දෙමින් ගත් පියවර අද සාර්ථක වෙලා තිබෙනවා. ඒ සාර්ථක වීම තුළ අපට පුළුවන් වෙනවා අපේ රටේ වැඩ කරගෙන යන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම, ශක්තිජනක පාන අරගෙන බලන්න. අපේ රටට ගෙනෙනවා energy drinks කියලා බොහොමයක්. දැන් මේවා පාලනය කරන්න සිදු වෙලා තිබෙනවා. අපට -මේ රටේ මිනිසුන්ට- energy drinks ඕනෑ නැහැ; energy drinks කියලා ලෝකයේ තිබෙන නොයෙකුත් දේවල් ගෙනැල්ලා, උත්තේජන දමලා, නොයෙකුත් වස කාරක දමලා, රස කාරක දමලා, අපේ මිනිසුන්ට ඒවා පුරුදු පුහුණු කරලා දැන් ඒවාට අපේ මිනිසුන් ඇබ්බැහි කරන්න වුවමනාවක් තිබෙනවා. ඉස්සර අපි කොයි කාලයේද පාන් කෑවේ? නමුත් පසු කාලයේදී, තිරිඟු අතිරික්ත නිෂ්පාදනය අපට දීපු නිසා මුළු වතුකරයම පාන් කන්න පටන් ගත්තා. පාන් කන්න පටන් ගත්තා විතරක් නොවෙයි. දැන් එහේ ඉන්න ළමයින්ගේ අඩු පෝෂණ තත්ත්වය ගැන කල්පනා කර බලන්න. සමාජ සේවා ඇමතිවරයා හැටියට මම වගකීමකින් යුතුව කියනවා පෝෂණ තත්ත්වය ගොඩක් අඩු වෙලා තිබෙන්නේ, විටමින් නැතිව නිකම්ම නිකම් පානුයි, හොදියි, වෙනත් නොයෙකුත් දේවලුයි ආහාරයට ගන්නා නිසායි කියලා. කුරුවිට තිබෙන නිවුඩු හාලේ බත් ආදිය නොකෑමෙන් ඇති වූ ප්‍රතිඵල නිසා අද ඒ අයට දුක් විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. මේවා තමයි ඇත්ත.

විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික් උපකරණ පරිසර හානියට බලපානවා. අද අපේ රටේ ජනගහනයටත් වඩා වැඩි ප්‍රමාණයක් handphones තිබෙනවා. අවසානයේ මේවා කොහේටද වීසි කරන්නේ? පොලිතින් කොහේටද වීසි කරන්නේ? ඉතින් මේවා තමයි තිබෙන ප්‍රශ්න. එම නිසා පරිසරය සුරක්ෂිත කරන්න මේ පනත යටතේ නියෝග තුළ තිබෙන වගන්ති ඉතාමත් ප්‍රයෝජනවත් කියලා මා කියා සිටිනවා.

අද ලෙඩ, කැඩිමියම් වාගේ අභිතකර රසායනික ද්‍රව්‍ය පරිසරයට එකතු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වකුගඩු රෝගය පැතිරිලා තිබෙනවාය කියලා මා කියන්න ඕනෑ. කොහොම වුණත් heavy metals දිරවන්නේ නැහැ. ඒවා මාළුවෙක් කෑවත්, සතෙක් කෑවත්, සූකරයෙක් කෑවත් උෂ්ට දිරවන්නේත් නැහැ. උන්ගේ මාළු, මස් අපි කෑවාම අපි සියලු දෙනාටම නොදන්නා ලෙඩ හැදෙනවා.

පේරාදෙනිය කුණු කන්ද ගැන බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඒ දවස්වල කථා කළා. එතුමා කරපු කථාව ඇත්තයි. ඒ කුණු කන්න දවසකට සත්තු විශාල ප්‍රමාණයක් එනවා. ඒ කුණු කාපු සතුන්ගේ මස් මිනිස්සු අනුභව කළාම ඒ අයටත් ඒ රෝග හැදෙන්න පුළුවන් කියන එක මා මෙම අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හොඳයි, බොහොම ස්තුතියි.

මෙම පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ගැන නැවත වරක් මා සඳහන් කරනවා. මෙම පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග ඉතාමත් හොඳයි. විශේෂයෙන්ම පාරිසරික සුරක්ෂිතභාවය, මහජන සෞඛ්‍යය, ජාතික ආරක්ෂාව යන අංශයන් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකාව විසින් අන්තර්ජාතික වශයෙන් බැඳී ඇති විවිධ ගිවිසුම්වලට අනුගත වීමට හැකි වන පරිදි ආනයන හා අපනයන පාලන අයිතමයන් නිර්ණය කර උපලේඛනගත කිරීමට කටයුතු කර තිබෙනවා. HS Code එක හරියාකාරව ක්‍රියාත්මක කෙරෙන්නේ නැහැ. ශ්‍රී ලංකාව ගෝලීය පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි සක්‍රීය ලෙස දායක වෙමින් අනිකුත් රාජ්‍ය සමඟ එක්සත්ව විවිධ බහුපාර්ශ්වික පාරිසරික එකඟතා රැසක් ඇති කිරීමට කටයුතු කර තිබෙනවා. දිගු කල් පවත්නා කාබනික දූෂක පිළිබඳව ස්ටොක්හෝම් සම්මුතිය වැනි සම්මුති තුනක් තිබෙනවා. අවසාන වශයෙන් මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

Rotterdam Convention එකට, Stockholm Convention එකට හා Basel Convention එකට අනුගත වෙමින් ක්‍රියා කිරීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඊළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක් තිබෙනවා.

[අ.භා. 5.18]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මා මෙම අවස්ථාව පාවිච්චි කරන්නේ, අපේ ෆිලික්ස් පෙරේරා ඇමතිතුමාගේත්, අපේ පැත්තෙන් හර්ෂ ද සිල්වා සහ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමන්ලාගේත් අදහස්වලට අවධානය යොමු කරලා, අපනයන ක්ෂේත්‍රය ගැන වචන ස්වල්පයක් කථා කරන්නයි. කුරුඳු සම්බන්ධයෙන් මෙම නියෝග ගෙනාවාට, ආර්ථිකය ගැන ඊට වඩා ගැඹුරින් කථා කිරීමට මා මෙම අවස්ථාව පාවිච්චි කරනවා.

ඊට පෙර ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු මෙම සභාවේ ප්‍රකාශ කරපු දෙයක් ගැන වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. ගරු ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ රටේ කවුරුත් බඩගින්නෙන් මැරෙන්නේ නැහැයි කියලා. ඒ අලුත් කථාන්දරය දැන් මව-මවා යනවා. එහෙම නම් ඇමතිතුමනි, අම්මලා කළු ගහට ළමයින් වීසි කරන එක, ළිඳට පනින එක, වස බොන එක -

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඒ බඩගින්න නිසාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බඩගින්න නිසා තමයි කියන්නේ.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ලෝකයේ මිලියන 200ක් විසාදියෙන් පෙළෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔහොම කියලා එකින් එක එකතු කර ගෙන උසාවි ළඟට යනවා. අනික් අය ගිහින් රෝහල්වලට භාර වෙනවා. ඔය නැහැයි කියන එකට වඩා රටේ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගුරුවරියක් ගහට පැන්නේ බඩගින්න නිසාද? නැහැ, විසාදියට.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පැන්නේ නැහැ. පනින්න කවුද කිව්වේ කියන එක වෙනම දෙයක්. මා හිතන විධියට ඇමතිතුමනි, - [බාධා කිරීමක්] අපනයනයි, පැනීමයි අතර ලොකු වෙනසක් තිබෙනවා. නමුත් අපනයනයි, බඩගින්නයි අතර නම් ලොකු සම්බන්ධකමක් තිබෙනවා. එම නිසා මා මෙම අවස්ථාව පාවිච්චි කළේ, ඒ ගැන සොයා බලා මේ තත්ත්වයේ තිබෙන්නේ මොකක්ද කියා කියන්නයි. අද සමස්ත ජනතාව අධික දුප්පත්කමින් පෙළෙනවා. එසේ නොවෙයි කියා ඇමතිවරු කියනවා නම් මා හිතන හැටියට එතුමන්ලා වෙන ලෝකයකයි ඉන්නේ. ඔබතුමන්ලා අවුරුදු 20ක් රට පාලනය කරලා, මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මා මුල ඉඳලාම කිව්වේ, ඔබතුමන්ලාට මේ රටේ ජාතික ආර්ථිකය දිනන්න පුළුවන් නම් සියලුම යුද්ධ දිනනවාය කියන එකයි. දැන් ඒ තත්ත්වයට තමයි ඇවිත් තිබෙන්නේ. අපේ ත්‍රිවිධ හමුදාවයි, ආණ්ඩුවයි ගත්ත උත්සාහය තුළින් ත්‍රස්තවාදය නැති කරලා අවුරුදු හතරක් ගත වුණා. ඒ අවුරුදු හතරේ ප්‍රතිලාභය කොහේද තිබෙන්නේ, ෆිලික්ස් පෙරේරා ඇමතිතුමනි? මා දන්නවා, ඔබතුමා -

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඔබතුමාගේ business successful නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම වෙන්නේ ආණ්ඩුවේ උදව්ව නිසා නොවෙයි; පෞද්ගලික දක්ෂතාවෙන්. ඊට වඩා සාර්ථකත්වයක් තිබෙනවා, ඔබතුමා අමාත්‍යාංශය භාර ගෙන අපට උදවු කළා නම්. ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා. මා එතුමාව අගය කරනවා. එතුමා දන්නා හඳුනන අය දමා ගෙන වැඩේ කර ගෙන යනවා. නමුත් ඊට වැඩිය කොච්චර ලොකු වෙනසක් කළ හැකිද? මීට වැඩිය උදවු කරන්න පුළුවන් ආණ්ඩු ස්වරූපයක් තිබුණා නම් ලෙහෙසියෙන් මේ ප්‍රශ්නය විසඳන්න තිබුණා. එක්සත් ජාතික පක්ෂය, බිස්නස්කාරයෝ හැම දෙනාම අද මේ ගැන කථා කරන්නේ ඇයි? "එක වැඩේකට මහින්ද රාජපක්ෂ අතිදක්ෂයි. වැඩේ කළා. දැන් කාලය අවසන්. දැන් අවශ්‍ය වන්නේ මොළෙන් ආර්ථිකය දියුණු කරන එක." අන්න එහෙම කියන තත්ත්වයකට අද ඇවිල්ලා තිබෙනවා. අද හැම දෙනාම එහෙම කථා කරන්න පටන් අරන් තිබෙනවා නේද?

ඔබතුමා කථා කරන කොට කොච්චර කැපවීමක් තිබෙනවාද? ඔබතුමන්ලාගේ business එකෙට රුපියල් මිලියන 5,600ක් ගෙවන්න තිබෙනවා නේද, යුද හමුදාවෙන්? දැන් ඔබතුමා නිශ්ශබ්දව සිටින්න. අපි කථා කරනවා. ඔබතුමා මට කිව්වේ නැහැ. ඉස්සෙල්ලා ඔබතුමා සමඟ මම පාර්ලිමේන්තුවේදී මේ ගැන කථා කළා. ඔබතුමා ඇහුවා, කොහෙන්ද විස්තර හම්බ වුණේ කියලා. ඔබතුමා මට දුන්නේ නැහැ නේ. ඉතින් එහෙම දෙන්නේ නැත්තේ ආණ්ඩුව බංකොලොත් නිසා නේ. නැත්නම් ඔබතුමාට රුපියල් මිලියන 5,600කට අධික ලාභයක් ලැබිලා තිබෙනවාද? ඒ වාගේම තමයි, Rodrigo & Sons (Pvt.) Limited ආයතනයටත්, රුපියල් මිලියන 8,900ක් ගෙවන්න තිබෙනවා. ඒ එක ව්‍යාපාරයකට. සමස්ත ත්‍රිවිධ හමුදාවෙන් රුපියල් මිලියන 15,800ක් ගෙවන්න තිබෙනවා. ඉතින් රුපියල් මිලියන 15,800ක ණය - debtors - කියා ගෙන මේ වාගේ කටයුතු කරන්න පුළුවන් නම් ලොකු business එකක් මේ කරන්නේ.

ඇමතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. අපි සියලු දෙනාම පිළිගනිමු. මේක අපේ රට; අපේ ජාතික ආර්ථිකය. ඔබතුමන්ලා එක පැත්තකින් ආණ්ඩුව ගෙනියනවා; අපි එක පැත්තකින් අදහස් දෙනවා. නමුත් මේ දෙගොල්ලම එක තැනකට ගෙනැල්ලා රටේ ජාතික ආර්ථිකය හදන්න අවස්ථාව දැන් ඇවිල්ලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ කියනවා, "පළමුව රට, දෙවනුව රට, තුන්වෙනුවත් රට" කියලා. ඒ වාගේ "පළමුවත් රටේ ආර්ථිකය, දෙවනුවත් රටේ ආර්ථිකය, තුන්වෙනුවත් රටේ ආර්ථිකය". ආර්ථිකය ආරක්ෂා කළොත් තමයි රටක් තිබෙන්නේ. අන්න ඒ වාගේ තත්ත්වයකට තමයි දැන් ඇවිල්ලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා බඩගින්න නොවෙයි, බඩගින්න ඇති කරන සාධක ටික නැති කරමු. ඒක තමයි විසඳන්නට තිබෙන ප්‍රශ්නය. දැනුවත්කමින් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. මේ, පෙනෙන්නේ නැතුව, බලන්නේ නැතුව, අහන්නේ නැතුව යන ගමනක් නිසා තමයි මේ තරම් අමාරු තත්ත්වයක් තිබෙන්නේ.

2002 රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තුළින් තමයි අපි යුරෝපා හවුලේ Labour GSP එක සොයන්න පටන් ගත්තේ. හොයාගෙන, ලබා ගෙන ඉදිරියට යන්න පුළුවන් වුණා. ඒ තුළින් ලැබුණු විශේෂ වරප්‍රසාදය නිසා තමයි අප රටේ අපනයන ශීඝ්‍රයෙන් යුරෝපයට යවන්න පුළුවන් වුණේ.

මම නැවත මතක් කරනවා, ඇඟලුම් කර්මාන්ත 684ක් තිබුණු ඒ අවස්ථාවේදී, ලක්ෂ 4 1/2ක සේවක පිරිසක් ඉන්න අවස්ථාවේදී Labour GSP එක නිසා තව වැඩි කර ගන්න පුළුවන් වුණා. නමුත් ඒක නැති වුණ අවස්ථාවේ සිට අද ඇඟලුම් කර්මාන්ත 189කට අඩු වෙලා තිබෙනවා; ඒ වාගේම සේවක පිරිස 1,98,000කට අඩු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ ආසනයේම තිබෙන කොම්පැනි කීයක් අද වහලා තිබෙනවාද? අපි

මෙය නැවත යථා තත්ත්වයට පත් කළේ නැත්නම් ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමනි, BOI එක තියා ගෙන වැඩක් නැහැ. ඔබතුමා මේක දැන ගන්න අවශ්‍යයි. කරුණාකරලා ආණ්ඩුවට කියන්න. වැරැද්දක් වුණා.

දැන් අපි කියන අවස්ථාවේදී, මේ රටේ මුදල් අමාත්‍යාංශයේ ආර්ථික සාතකයෙක් ඉන්නවා කියලා ඇමති මණ්ඩලය කියනවා වාගේ, මහ බැංකුවේ නිවාඩ් කබ්රාල් මැතිතුමාට අපි කිව්වා, "කරුණාකරලා මේ Labour GSP එක හාස්‍යයට ලක් කරන්න එපා. මේකේ වටිනාකමක් තිබෙනවා." කියලා. ඒ අවස්ථාවේදී කිව්වා, US Dollar බිලියන 1.3ක් තිබෙනවා කියලා. එතකොට හිනා වුණා. කිව්වා, " බිලියන 150ක් කියලා කියන්නේ අපට මොකක්ද?" කියලා. ගිය අවුරුද්දේ අපට බිලියන 500ක් විතර ඒ කියන්නේ කෝටි 50,000ක් විතර නැති වෙලා තිබෙනවා කියලා වාණිජ මණ්ඩලය කිව්වාට පසුව තමයි හැම දෙනාගේම ඇස් ඇරුණේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

ගරු මන්ත්‍රීතුමනි, ඇඟලුම් කර්මාන්ත වැටීමක් සිද්ධ වෙලා නැහැ. ආනයනයේ වෙනසක් ඇති වෙලාත් නැහැ. [බාධා කිරීමක්] ඒක වැරදි ආකල්පයක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැරදියි ඇමතිතුමා. ඒක වැරදියි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නිදහස් වෙළෙඳ කලාපවල රැකියා ඕනෑ තරම් තිබුණත් මිනිස්සු නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන එක-[බාධා කිරීමක්] නැහැ, වැරදි නොවෙයි. ඒක මම හරියට හරි ගස්සන්නම්.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නූල් මිල අඩු වෙලා තිබෙනවා. ආදායමේ අඩු වීමක් නැහැ. ගණන් හැදුවාම එන මුදල් ප්‍රමාණයෙන් රටට -[බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඒක කියනවා නේ. දැන් මම කියනවා, ඔබතුමා කියන දේ මූල්‍ය වශයෙන් හරි. නමුත් ප්‍රමාණාත්මක වශයෙන් සියයට 38ක් අඩු වෙලා තිබෙනවා. නොමඟ යවන ප්‍රකාශයක් නොවෙයි මම කරන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக්ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කැමැතියි, බාධා කරනවාට. මොකද, ඔබතුමා මේ සම්බන්ධයෙන් යම් ප්‍රයත්නයක් දරනවා, යම් දෙයක් කරන්න. අඩු ගණනේ BOI එකේ Chairmanව අලුතෙන් පත් කරලා යමක් කරන්න හදනවා. තවම හරියට කෙරෙන්නේ නැහැ. නමුත් මොනවා හෝ කරනවා. නමුත් මෙතැන තිබෙන්නේ ඒක නොවෙයි. ඇඟලුම් කර්මාන්ත 682ක් තිබුණු එක 199ට අඩු වෙලා තිබෙනවා. බ්‍රැන්ඩික්ස් එකේ එකතුවීමක් තිබෙනවා. ඒක හරි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ සිට බැලුවොත් එක percentage එකක් තිබෙනවා, ඇඟලුම් කර්මාන්තශාලා වැහෙන. නමුත් වැහෙනවා කියන්නේ, මාස් එක ගත්තත්, බ්‍රැන්ඩික්ස් එක ගත්තත්, මේවායේ පොඩි පොඩි සමාගම් අරගෙන එක සමාගමක් බවට පත් කරලා තිබෙනවා. ඒක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා, මාස් කියන්නේ, බ්‍රැන්ඩික්ස් කියන්නේ මැතකදී ඇති වුණු ඒවා. කෝ හෙන්ටලි ගාර්මන්ට්ස්? කෝ ක්‍රියේෂන්ස් ආයතනය? කේ හයිඛ්‍රමනිස්? කෝ ෆේවරිට්ස්? මේවා එදා සිට අවුරුදු තිස්පහක් මේ කර්මාන්තය කරපු ආයතන.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக්ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බ්‍රැන්ඩික්ස් කියන ඒවා තව සමාගම් එකතු කරලා-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. නැහැ. මම වග කීමකින් කියනවා. ක්‍රියේෂන්ස් කොම්පැනි එකේ ලින් ප්‍රනාන්දු මැරීමෙන් ඒ කොම්පැනිය නැතිව ගියා. හයිඛ්‍රමානිස් කොම්පැනිය තවම ටිකක් ඇදගෙන යනවා. කුමාර් මර්වන්ඩානිගේ ෆේවරිට්ස් ආයතනය ඇඟලුම් කර්මාන්තයෙන් සම්පූර්ණයෙන්ම අයින් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි හෙන්ටලි ගාමන්ට්ස් එකත්. ඒවා දැන් නැහැ. ඒවා තමයි 1975 වර්ෂයේ පටන් ගත්තේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக්ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමා, බංග්ලාදේශයේ තිබෙන තත්ත්වය දිහා බැලුවාම අපට විශාල අවස්ථාවක් තිබෙනවා, මේ ඇඟලුම් කර්මාන්තශාලා ආරක්ෂා කර ගන්න. අපට වෙලා තිබෙන්නේ මෙයයි. සේවකයෝ නැහැ. ඒ නිසා අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, මේ ව්‍යාපාරය පටන් ගන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක් ද සේවකයෝ නැහැයි කියන්නේ ගරු ඇමතිතුමා. ඔබතුමා කටුනායක වෙළඳ කලාපයේ -

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න ගරු මන්ත්‍රීතුමියගෙන් අහන්න. මොකුත් ඕනෑ නැහැ. කටුනායක කලාපයේ සෘජු පුරප්පාඩු 2800ක් තිබෙනවා. එකකටවත් සේවකයෝ නැහැ. ඇහලුම් කර්මාන්තයට එන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සෘජු පුරප්පාඩු 12,000ක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒ මුළු කලාපයේ ඔක්කෝම ගත්තාම.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. කටුනායක අවට ඔක්කොම -කටාන ඇතුළු ඒ ඔක්කෝම පැතිවල- පුරප්පාඩු 12,000යි. මම මේ 2000ක සේවක පිරිසක් යොදවා තිබෙන තැනක් ගැන කියන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම දන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා ඔබතුමාට උදවු කරන්නයි මේවා කියන්නේ. ඇයි එතැනට සේවකයෝ එන්නේ නැත්තේ? රුපියල් 17,000කට ජීවත් වන්නට බැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. ඩොලර්වලට මාරු කළොත් රුපියල් 17,000ක් කියන්නේ ඩොලර් 120යි. ඒ වාගේම බංග්ලාදේශයෙන් මෙහාට ගෙනැල්ලා අපනයනය කරන්නට පුළුවන් ඩොලර් 100ට. ඒක තමයි තිබෙන වෙනස. ඊට වඩා ඒ අයට වෙනින් දේවල් කර ගෙන ඉන්න පුළුවන් හැකියාවක් තිබෙන නිසා ඇහලුම් කර්මාන්තයට එන්නට වැඩි කැමැත්තක් නැහැ. ඒ විතරක් නොවෙයි ඇහලුම් කර්මාන්තය වැරදි-

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කොරියන් රැකියාවලට යනවා, ඉතාලි රැකියාවලට යනවා. ඒ වාගේ විදේශ රැකියවලට යනවා. මේ රැකියාවට එන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා ඉන්නේ ඉතාලි ආර්ථිකය හදන්න ද? ඔබතුමන්ලා ඉන්නේ කොරියාවේ ආර්ථිකය හදන්න ද? [බාධා කිරීමක්]නැහැ. නැහැ. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය වැරදියි. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය විය යුත්තේ රට හැදීමයි. ඔබතුමන්ලා අල්ලපු රට හදලා වැඩක් නැහැ නේ. අපේ රටේ කට්ටිය ඉන්නකොට ආර්ථිකය හදන්නේ නැතිව, මෙහෙ නැතිව පිට රට ගිහින් වැඩ කරන්නය කියා වැඩක් නැහැ. ඔබතුමන්ලා ජාතිකත්වය ගැනයි කථා කරන්නේ. එක පැත්තකින් කොරියාවට බනිනවා. අනෙක් පැත්තෙන් යුරෝපයට බනිනවා. බැනලා ඒ පැත්තට යනවා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒ මිනිස්සුන්ට අවස්ථාවක් තිබෙනවා, විදේශවල රැකියා කරන්න. නිකම් නොවෙයි මිනිස්සු යන්නේ. අධික වැටුපට යනවා. ඒක නවත්වන්න බැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට ඇහුණා, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් මේ ගැන කිව්වා. දැන් සවුදි වාගේ රටවල්වලින් පටන් ගන්නවා, වැරදි විදේශ ප්‍රතිපත්තිය නිසා ප්‍රශ්න ඇති වේවි. ඔබතුමා බලාපොරොත්තු වන අපනයන සංවර්ධනය හරියාකාරව ඇති කිරීමටයි මා මේ කාරුණිකව අදහස් කියන්නේ. මා හිතන විධියට විපක්ෂයක් වශයෙන් ඔබතුමාගේ ආයෝජන මණ්ඩලයට සමහරවිට ඔබතුමන්ලාගේ ඇමතිවරයෙකුට වඩා අප උදවු කර තිබෙනවා. ඒ නිසයි මා කියන්නේ. කරුණාකර හිතන්න මේ අපේ රට. ඔබතුමන්ලා තාවකාලිකව පරිපාලනය ගෙනයනවා. නමුත් ඉන්දියාවට මේක ගෙනියන්නේ නැතිව ගෙනාවේ කවුද? අපයි. බංග්ලාදේශයට ගෙන යන්නේ නැතිව ගෙනෙන්න උදව් කර තිබෙන්නේ කවුද? අපයි. කරුණාකර මේ රටේ තිබෙන අපනයන ප්‍රතිපත්තිය ගැන බලන්න. විදුලි බිල සියයට 30ක් වැඩි කරනකොට කොයි ලෝකයේ රටකටද අනෙක් රටවලට අපනයනය කරන්නට පුළුවන් වන්නේ? එම නිසා තමයි ඉන්දියාවේ රුපියල රුපියල් 53 සිට රුපියල් 60ට අවප්‍රමාණය කළේ.

පසු ගිය පෙබරවාරි මාසයේ ඩොලරය රුපියල් 112ටයි තිබුණේ. ඒක රුපියල් 127ට අවප්‍රමාණය වුණාම ඒ අවස්ථාවේදී රටට ඇතිවුණු ණය බරතාවය බිලියන 245ක්. ඒ කියන්නේ, කෝටි 24500ක් වැඩි වුණය කියා අප එදා කිව්වා. එහෙම කිව්ව අවස්ථාවේදී නිවාඩ කබ්‍රාල් මොනවා ද කිව්වේ? "විපක්ෂයෙන් භය කරන්න හදනවාය" කිව්වා. ඊට පස්සේ මහ බැංකු වාර්තාවේ පිටු අංක පණස් එකේද, පණස් දෙකේ ද කොහේද තිබෙනවා, රුපියල අවප්‍රමාණය වීම නිසා රටේ ණය බරතාවය බිලියන 255කින් වැඩි වුණාය කියා. ඒ කියන්නේ කෝටි 25,500ක් වැඩි වුණා. ගිය සුමානයේත් අවප්‍රමාණය වීම පටන් ගත්තා. රුපියල් 124ට තිබුණු ඩොලරය අද රුපියල් 133යි; නැත්නම් 134යි. අපේ රුපියල අවප්‍රමාණ වීම නිසා අපේ රටේ ණයබරතාවය වැඩි වෙනවා. ඔබතුමන්ලා හැම කොනකින්ම ණය ගන්නවා නේ. ඒ ණයබරතාවයෙන් සියයට 48ක් විදේශ ණය. රුපියල අව ප්‍රමාණය වීම නිසා- රුපියල් 124ට තිබුණු ඩොලරය රුපියල් 134 වීම නිසා- මේ විදේශ ණය බරතාවය තව කෝටි 25, 800කින් වැඩි වෙනවා. මේවා තමයි රටට දරා ගන්නට බැරි වන්නේ? මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ ඇයි? ඔබතුමන්ලා අපනයනය කරන්නේ නැතිව ආනයනය කරනවා. රුපියලේ අගය තිබුණා නම් ඉබේම අපනයනය කරන්නට පුළුවන් හැකියාව තිබෙනවා. ඒකම තමයි මට පෙර කථා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත්, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් කිව්වේ. එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය බොහොම සෘජුයි. මේ රටේ අපනයනය කරන්නට තිබෙන්නේ බොහොම සුළු දේවල්. හැබැයි හරි ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ. කෙලින් යන ගමනක වමට සිග්නල් දාලා, දකුණට හැරුණාම හරිද? කොයි ලෝකයේ ද මේ විධියට අපනයනය වැඩි කරන්නට පුළුවන් වන්නේ?

විදුලි බිල ඒකට හොඳ උදාහරණයක්. විදුලි බිල සියයට 35කින් වැඩි කිරීම ජනතාවට දරා ගන්න බැරි මට්ටමක්. රුපියල

අවප්‍රමාණය වීම නිසා ඒකේ සියයට දහයක පමණ පරතරයක් තිබෙනවා. නමුත් ඩොලරය රුපියල් 135ට අවප්‍රමාණය වුණාට, මේ රටට යම් ද්‍රව්‍ය ආනයනය කරලා ඒවායින් නිෂ්පාදන කරලා අපනයනය කිරීම තමයි ඇඟලුම් කර්මාන්තයේදී කෙරෙන්නේ. ඒ කියන්නේ සෘජු වශයෙන් වටිනාකම එකතු කිරීම - value addition එක - සියයට 25ක්, 30ක් පමණ වෙනවා. එතැනදී උද්ධමනය බලපානවා cost-push inflation එකක් තිබෙන නිසා. අන්න ඒ නිසා තමයි මේ රටේ අපනයනයේ ප්‍රශ්නයක් තිබෙන්නේ. නැත්නම් Brandix එක හයිද්‍රාබාද්වලට ගිහින් තම කර්මාන්තශාලා ආරම්භ කර තිබෙන්නේ ඇයි? MAS එක බංගලිදේශයේ ඇඟලුම් කර්මාන්තශාලා ආරම්භ කර තිබෙන්නේ ඇයි? SS International Company Limited එක ගිහින් බංගලිදේශයේ සහ-

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු මන්ත්‍රීතුමනි, ඒවායේ අඩු පඩියකට පටන් ගත්තා. දැන් බංගලිදේශයේත් සියයට 80කින් පඩි වැඩි කර තිබෙනවා. USAවල ඒ ඔක්කොම garments reject කර තිබෙනවා. ඔය ගිය අයට මෙහේ තිබෙන security එක නැති වෙලා තිබෙනවා අද බංගලිදේශයේ. ඔබතුමා ඒ කාරණයත් පිළිගන්න. අප නිවැරැදි දෙය කළා. අප සේවකයන්ට හරියට පඩි ගෙව්වා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම එය පිළිගන්නේ නැහැ. බිල්ඩින් එකක් කඩා වැටුණාය කියලා බංගලිදේශයේ ආර්ථිකය කඩා වැටිලා නැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ඔබතුමා දන්නවාද, බංගලිදේශයේ ඇඟලුම් ආනයනය USAවල නවතා තිබෙන බව?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ. USAවල කිසිම නැවතීමක් නැහැ. ඒක අසත්‍යයක් ගරු ඇමතිතුමනි. ඕවා තමන්ගේ licence එක ගන්න අපනයනකරුවන් ඇවිත් ඔබතුමාට කියන විනෝද කථා. මම වග කීමකින් කියනවා එවැනි දෙයක් නැති බව. ඕක කිව්වේ Nike. ඊට පසුව Adidasවලට ගියා. ඒක නැවතුණා. ඊට පසුව Victoria's Secretවලට ගියා. ඇවිත් බැලුවාට පසුව ඒ අය කිව්වා -

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

සිංගප්පූරුවේ garmentsවල අය කියා තිබෙනවා, garments අරින්න මෙහේ තිබෙන security එක නැති බව. ඒ අයට එතැන ඒ security එක නැති වෙලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම කියන්නේ නැහැ කියලා නොවෙයි. මෙතැන තිබෙනවා. අප ඒ තිබෙන අවස්ථාව නැති කරනවා. මේ Labour GSP ඕනෑද, නැද්ද? මේ රටේ සත පහක්වත් දෙන්නේ නැතිව ඔබතුමන්ලට සියයට 11ක් වරප්‍රසාද ලබා ගන්න පුළුවන් බදු විරාමයෙන්. ඒකෙන් අපට ලැබෙන වටිනාකම යූඑස් ඩොලර් බිලියන 1.4යි. ඒ කියන්නේ ශ්‍රී ලංකාවේ මුදලින් නම් බිලියන 175ක්. රුපියල් කෝටි 17,500යි. මේක ණයක් නොවෙයි. මේ මුදල ගෙවන්න ඕනෑ නැහැ.

ඔබතුමන්ලා එදා කිව්වා මානව අයිතිවාසිකම් ගැන යුරෝපය යම් විධියේ කොන්දේසි දමලා තිබෙනවාය කියලා. එහෙනම් ජිනීවා සිටින රවිනාථ ආරියසිංහ මැතිතුමා දැන් මේකට ඉල්ලීමක් කර තිබෙන්නේ ඇයි? දැන් කොන්දේසි නැද්ද? මේවා අමූලික බොරු. මේ විදේශ ප්‍රතිපත්තිය නිසා, ජී.එල්. පීරිස්ට අද කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන්න බැරි නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ජී.එල්. පීරිස් කියන්නේ නැතිව - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා කථා කරන්න ඕනෑ මම කථා කරන විධියට. එතුමාගේ ගරුත්වය පේන්නේ කටයුතු කිරීමෙන්. අප ගරුත්වය දෙනවා දෙන්න තිබෙන අයට. ඔබතුමන්ලා මෙතැන ඉඳගෙන, මේ පුත්තලමෙන් එන-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I rise to a point of Order.

ඔක්කොටම ඉස්සර වෙලා මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හදන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, there is a way, a custom and courtesy to address the other Members. මහින්ද රාජපක්ෂ නොවෙයි, President කියන්න ඕනෑ. Hon. (Prof.) G.L. Peiris කියන්න ඕනෑ. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉස්සර වෙලා ස්ථාවර නියෝග උගන්වන්න ඕනෑ. සූට් බූට් දාලා හිටියාට හරියට ගෞරවය දීලා කථා කරන්න දන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමාට මා කාරුණිකව කියන්නේ විපක්ෂයෙන් අප දෙන මේ අදහස්-

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Eran Wickramaratne.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
I take objection to the Hon. Member calling a distinguished lady, "Sir". A lady should be actually honoured and called properly.
Thank you.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
We know that these people who come from nowhere and as much as they get their priorities mixed up, they get their gender also mixed up. He is the one who said that Mahinda Rajapaksa was looking after Prabhakaran's wife. -[*Interruption*.] So, what more can we expect? I think we all know that he is the person who has attracted the entire attention of this House. We know that you are a lady.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You are the person who has violated the - [*Interruption*.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The louder he shouts, the less substance he has. So, all I have got to say is - [*Interruption*.] On this basis, what we have got to do is to ensure that we get our competitiveness.

බලන්න, අද පුවත් පතක මෙහෙම ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. අපේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා සහ ආර්ථික ඝාතකයෙක් වන නිවාඩ් කබ්‍රාල් මැතිතුමා Colombo Stock Exchange එකට ගොස් තිබෙනවා. එතකොට කොළඹ කොටස් වෙළෙඳ පොළේ 6,050ක්ව තිබුණු අගය එතුමන්ලා ගිහින් ආවාට පස්සේ 5,900ට අඩු වෙලා තිබෙනවා. ඔන්න බලන්න, මේ ඇමතිවරුන් කෙරෙහි ජනතාවගේ තිබෙන විශ්වාසය. මේ එසේ මෙසේ ඇමතිවරයෙක් නොවෙයි නේ. කොටස් වෙළෙඳ පොළට ගියා. හිතුවා, එතුමන්ලා ඒකට ගියාට පස්සේ මේ ගණන 6,000 පන්නලා 6,200ක් විතර වෙයි කියලා. ඔන්න කොටස් වෙළෙඳ පොළ කඩා වැටුණා.

ඊට පසුව, Colombo Stock Exchange crashes කියනවා.

The online edition of "Ceylon Today" of 9th July, 2013 states, I quote:

"Colombo Bourse slumps below 6,000"

මෙතැන තිබෙන්නේ, විශ්වාසය ගැන ප්‍රශ්නයක්. ඒ විතරක් නොවෙයි. 2013 ජූලි මස 09 වැනිදා "දිනමිණ" පත්‍රයේ අජිත් නිවාඩ් කබ්‍රාල් කළ ප්‍රකාශයක් මෙසේ පළ වෙලා තිබෙනවා,

" වසර 56ක් 4.5%ක් වූ අපේ ආර්ථික වර්ධනය ගිය වසර 7දී සියයට 7.5 දක්වා ඉහළ ගියා"

අවුරුදු හතක් වන තුරු මේ මහ බැංකුවේ දේශපාලනීකරණයක් තිබුණේ නැහැ. නමුත් මෙතුමා පත් වුණාට පසුව සිදු වුණු මේ දේශපාලනීකරණය නිසා තමයි මේ වාගේ විජ්ජාවක් තිබෙන්නේ. උද්ධමනය සියයට 15ක් තිබෙනවා නම්, පෙන්වනවා, සියයට 2යි, 3යි කියලා. මෙන්න මේ තුළින් ඇති වුණු ව්‍යාජ තත්ත්වය නිසා තමයි අද රටේ දළ දේශීය නිෂ්පාදනයත් එක්ක බලනකොට ආදායම සියයට 13.2ක් දක්වා අඩු වෙලා තිබෙන්නේ. එක පැත්තකින් පිම්බුවාම අනෙක් පැත්තෙන් අඩු වෙනවා. හැම පැත්තකටම, හැම මොහොතේම බොරු කරන්නට බැහැ.

ඉතින් මේ අවස්ථාව පාවිච්චි කරමින් අපි නැවත කියන්නේ, කරුණාකරලා මේ රටේ ජාතික ආර්ථිකයක් හදමු කියන එකයි. මේ රටේ ජාතික ආර්ථිකයක් නැති නිසා තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. මතක තබා ගන්න, මේ රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, මුදල් ඇමතිවරයා -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අන්න හරි. එහෙම කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා කිව්වා, මේ රටේ ආර්ථිකය කඩා වැටීමක් තිබෙනවා කියලා. මෙතුමාත් කියනවා, "හරි" යි කියලා. පුදුමයි, ඒ වාගේ දෙයක් පිළිගන්න එක. මහින්ද රාජපක්ෂ ජනාධිපති කියනවා, අද මේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා කියලා. විදුලි බිල සියයට 40කින් වැඩි කරන්නට ගියාම කිව්වේ, "අපි විදුලි බිල වැඩි කළේ නැත්නම් රටේ ආර්ථිකය කඩා වැටෙනවා" කියලායි. ඉතින් ඒක පිළිගත්තා. ඒක කළේ ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ඕනෑකමටයි. ඒගොල්ලන් කිව්වාම ණය දෙන්න බැහැ යි කියලා, ඔන්න ඔතැනින් තමයි වැඩේ පටන් ගත්තේ. ණය දෙන්න බැහැ යි කිව්වේ නැත්නම් ඔය ප්‍රශ්නය එන්නේ නැහැ. 2005 ඉඳලා විදුලි බිල වැඩි කරන්නේ නැහැයි කියලා කිව්වාට, දැන් ඒ ඔක්කොම බිල් ටික එකතු කරලා ජනතාවට ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඉතින් මේවා ගෙවන්න පටන් ගත්තාට පසුව අපේ අපනයනකරුවන්ට තරග කරන්න පුළුවන් වන්නේ කොහොමද?

බංගලිදේශය, ඉන්දියාව, පාකිස්තානය, ලාඕසය, වියට්නාමය, කාම්බෝජය, ඉන්දුනීසියාව, මියන්මාරය යන මේ රටවල් සියල්ලක්ම අපනයනකරුවන්. මා හිතන හැටියට දැන් ලංකාවට ලොකුම අභියෝගය තිබෙන්නේ, පාකිස්තානයේ නව අගමැති ලෙස නවාස් ශරීෆ් පත්වීමයි. ඒ කියන්නේ වාණිජ පැත්ත ගැන දන්නා අගමැතිවරයෙක් පත් වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මියන්මාරය කියන්නේ මානව හිමිකම් ප්‍රශ්න තිබුණු රටක්. දැන් ඒ රටේ ඒවා නැති කරගෙන බොහොම ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනවා. මේ රටවල් දෙක තමයි අපට තරගයක් ඇති කරන්නේ. ගරු ඇමතිතුමනි, අපනයනයන් ප්‍රවර්ධනය කරන ඇමතිවරයා වශයෙන් ඔබතුමා මේවා දැන ගන්නට අවශ්‍යයි. අපි මේවා කියන්නේ නිකම් නොවෙයි. ඔබතුමන්ලා ආර්ථිකය බිමට වට්ටලා දැමුවාට පසුව එය නැවත හදන්න වෙන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග 2001 දී කළේ ඒකයි. කඩා වැටුණාට පසුව අපි අවුරුදු දෙකකින් ඒක හදපු නිසා තමයි තවමත් ඒ තල්ලුවෙන් එය ඇදගෙන යන්නේ. ඇමතිතුමනි, මා ඉතාමත් ඕනෑකමින් කියන්නේ මේ අවස්ථාවේ අපේ රටේ වියදම අඩු කරලා, ආදායම වැඩි කරන්න පුළුවන් මාර්ග ඇති කළ යුතුයි කියන එකයි. ඔබතුමා කියන ආකාරයට වැඩ කරන සේවක පිරිස නැහැ නොවෙයි. ඔබතුමා කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු කොළඹ, මැද කොළඹ ප්‍රදේශයට එන්න. වැඩි දුර යන්න වුවමනා නැහැ. හැන්දෑවට බලන්න, කොයිතරම් තරුණ තරුණියන් රක්ෂාවල් කරන්නේ නැතිව ඉන්නවාද කියලා. ඒ අයගෙන් ඇහුවොත් කියන්නේ මොකක්ද? "අනේ සර්! රක්ෂාවක් කරලා වැඩක් නැහැ. මොකද, බස් එකේ යන්න මාසයකට රුපියල් දහදාහක් යනවා. ඊට පස්සේ කන්න බොන්න තවත් රුපියල් පහළොස් දාහක් යනවා. වැටුප රුපියල් දාහත්දාහයි, ඉතින්ගෙදර ඉන්න එක ඊට වඩා හොඳයි" කියන එකයි. ඔන්න ඔය අනුව තමයි විරැකියාවක් නැහැයි කියලා පෙන්වන්න හදන්නේ. හැබැයි ඇත්ත තත්ත්වය තමයි underemployment. හරි වැටුප් මට්ටමක් ගෙවන්න බැරි වීම. මට වැඩියෙන් හොඳට අපේ සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය ඒ ගැන දන්නවා ඇති. මොකද, එතුමියගේ ප්‍රදේශයෙන් තමයි වෙළෙඳ කලාපයේ රැකියා සඳහා වැඩි පිරිසක් එන්නේ. ඉතින් එතුමිය නොදන්නා දෙයක් අපි දන්නවාද? ඒ ප්‍රදේශවල ඕනෑ තරම් රැකියා ලබා දෙන්න පුළුවන්, වැටුප රුපියල් 25,000කට වඩා වැඩි කර දෙන්න පුළුවන් නම්.

මම නිදසුනක් හැටියට කියන්නම්, අපේ private security companiesවල වැඩ කරන අය ගැන. අපි එක් අවස්ථාවක -මට මතක විධියට මමත්, විමල් වීරවංශ ඇමතිතුමාත් සිටියා- පිට රට වැඩ කරන ලංකාවේ අය සමඟ කථා කළා. ලංකාවේ 3,000කට වැඩි පිරිසක් පිට රට වැඩ කරනවා. ඒ අයගේ වැටුප ලංකාවේ මුදලින් රුපියල් 31,000යි. මෙහි කොම්පැනියක වැඩ කරන අයගේ වැටුප රුපියල් 29,000යි. ඉතින් මෙහි රුපියල් 29,000ක වැටුපක් ලබා ගන්න පුළුවන් නම්, පිට රට ගිහිල්ලා රුපියල් 31,000කට වැඩ කරන්නේ මොකටද කියා අපි ඇහුවා. මොකක්ද ඒ අය දීපු උත්තරය? "එකම වෙනස තමයි ඇඟිලි ගසන්නේ නැතිව කන්න දීලා තිබෙනවා" කියන එක. එතැන රුපියල් භය හත්දහසක වෙනසක් තිබෙනවා. ඉතින් පවුල් ජීවිතයක් නැතිව, තමන්ගේ ළමයින් තනි කරලා යන්නේ ඔය වාගේ දේවල්වලටද? ඊට වඩා හොඳ නැද්ද මේ රටේම තමන්ගේ අනාගතය දියුණු කර ගන්න එක. එහෙම නැති නිසා තමයි ඔය ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඇමතිතුමනි, ඒ නිසා කරුණාකරලා ඔබතුමා කියන්න එපා, දැන් රැකියා සඳහා කොරියාවට යනවා, මැලේසියාවට යනවා කියලා. ඒ යන එක නවත්වන්න. මොකද, අපට මේ රට හදන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා නම් මොනවාද කරන්න පුළුවන් වෙන්නේ කියා සොයා බලන්න. අන්න ඒ මඟින් තමයි අපේ රට සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ.

අද සවස ඉදිරිපත් කරන්නට තිබෙන සභාව කල් තැබීමේ යෝජනාවේ තිබෙනවා, casino ගැන. එහිදී ඔබතුමාගෙන් හොඳ උත්තර ටිකක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. අපිත් ඒ ගැන හොඳ කරුණු ටිකක් දෙන්නම්. අද මේ රටේ අපනයනයන් නැති වෙලා තිබෙනකොට, ව්‍යාපාර නැති වෙලා තිබෙනකොට ඔබතුමන්ලා මේක වෙනස් කරලා තිබෙනවා. මේ රටේ වැඩියෙන්ම තිබෙන්නේ තැබෑරුම්. ඒවා තමයි ශීඝ්‍රයෙන් වර්ධනය වෙන්නේ. ඊට පසුව කැසිනෝ. [බාධා කිරීමක්] ඒ වාගේ ඒවා.

ඒ වාගේමයි, ගණිකා මඩම්. මේවායින් තමයි නිල නොවන මට්ටමට සල්ලි එකතු කරන්නේ. අද ආර්ථිකය දුවන්නේ ඒ වාගේ දේවල්වලින්. මේවාද අපේ රටට අවශ්‍ය වන්නේ? නැහැ. අපේ මහා නායක ස්වාමීන් වහන්සේලා මේවා කරන්න එපා කියනවා; අපේ අගරදගුරුතුමා එපා කියනවා. ඉතින් තවත් මොනවාද, මේ රටට අවශ්‍ය වන්නේ? තමුන්නාන්සේලා අපි එකතු වෙලා මේ රට හදමු. ඒක අමාරු නැහැ. මෙතැන තිබෙන්නේ ප්‍රතිපත්ති එකතු කරන්නයි. ඔබතුමන්ලාගේ අපනයන වර්ධන වේගය ලෙහෙසියෙන් දියුණු කරන්න පුළුවන්. ඔබතුමන්ලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන භීතිකාවක් ඇති කර තිබෙනවා. ඒ සඳහා දරන වෙහෙස මහන්සියෙන් සියයට 10ක් අපනයනය දියුණු කරන්න දැම්මා නම් ඊට ඉස්සරවෙලා මේ රට හදන්න පුළුවන්. එක පැත්තකින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්ථික ඝාතකයෙක් කියලා කියන්නේ කවුද? තමුන්නාන්සේලාගේම කැබිනට් මණ්ඩලයේ ඉන්න පුද්ගලයෙක්. අනෙක් පැත්තෙන් මේ රටේ ආර්ථිකය හදන්න බැහැයි කියන්නේ තමුන්නාන්සේලාගේම හිටපු විදුලිබල ඇමතියි. කැබිනට් මණ්ඩලයේ අය මේ වාගේ දේවල් කිව්වාම අපනයනකරුවන් මේ රටට ඇවිල්ලා බලනවා මේක මාර banana republic එකක් නේ, මේ රටේ ආයෝජනය කරලා වැඩක් තිබෙනවාද කියලා. අන්න ඒක තමයි අපි මේ අවස්ථාවේ ඉතා ඕනෑකමින් මතක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමයි යුරෝපා හවුලේ Labour GSP එකත්. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමා ආයෝජන ප්‍රවර්ධන ඇමති වශයෙන් කියන්න, Labour GSP එක ඕනෑද, එපාද කියලා. කිසිම කොන්දේසියක් නැහැ. Marks & Spencer එක ඇවිල්ලා ඇමති වශයෙන් ඉන්න ඔබතුමාගෙන් ඇහුවා, ඇයි, මේක ලබා ගන්න බැරි කියලා. ඊට පස්සේ Franceවල 3 Suisses කියන කොම්පැනිය මේ රටට ඇවිල්ලා අහනවා, ඇයි මේක ගේන්න බැරි කියලා. ජර්මනියේ Neckermann කොම්පැනිය ඇවිල්ලා ඔබතුමාගෙන් අහලා තිබෙනවා. දැන් ඕලන්දයෙන් G-Star ගෙන්වලා තිබෙනවා. මම හිතන හැටියට ඔබතුමාගේ වෙහෙස මහන්සියෙන් ඒක ලබා ගෙන තිබෙනවා. ඒ අය ඇවිල්ලා කියලා තිබෙන්නේ කරුණාකරලා Labour GSP එක ගේන්න, අපි සියයට 30ක් වැඩි කරන්නම්, බංගලිදේශය ඕනෑ නැහැ කියලායි. දැන් Labour GSP එක නැති වෙනවා විතරක් නොවෙයි, මේ ගෙන යන වැඩ පිළිවෙළ නිසා පකිස්ථානයටත්, බංගලිදේශයටත් ඇමෙරිකාවෙන් තවත් වරප්‍රසාද ලැබෙනවා. ලංකාවට ඒක නැහැ. ඒ නිසා භය වෙලා තමයි රවිනාත් ආරියසිංහ ගිහිල්ලා, කරුණාකරලා Labour GSP එක දෙන්න කියලා ඉල්ලා තිබෙන්නේ. ඒ ගොල්ලෝ අහලා තිබෙනවා, ඇයි ඔබතුමන්ලා නැති කර ගත්තේ කියලා. ඒ පටන් ගත්ත තැනින් පටන් ගන්න. එතකොට නැවත යන්න තිබෙන්නේ LLRC එකටයි. ඊට පස්සේ යන්න තිබෙන්නේ දහහත්වන සංශෝධනයටයි. ඊට පස්සේ යන්න තිබෙන්නේ මාධ්‍ය ප්‍රතිපත්තියටයි. අපි එදා කිව්වේත් ඒකමයි. ඔබතුමා මේවා ගැන සුද්දෝ කියන තෙක් ඉන්නවා. අපි කිව්වොත් ප්‍රශ්නය අමාරුයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, කරුණාකරලා රටේ-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. දැන් විනාඩි 24ක් ගියා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එච්චර ඉක්මනට වෙලාව ගියාද?

ගරු ඇමතිතුමනි, තවත් කරුණක් තිබෙනවා. මේ අවස්ථාවේ තිබෙන බදු ප්‍රතිපත්තිය -වැට එක- බලන්න. මේ රටේ අපනයනකරුවන්ට -තේවලට- වැට එක දමනවාද? මම මේ අවස්ථාව පාවිච්චි කරනවා-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ රටේ දුම්රිය වර්ජනය අසාධාරණයි කියලා ඇමතිතුමා කියනවා. 2013.07.09වන දින -අද දින- "දිවයින" පුවත් පතේ මෙහෙම තිබෙනවා:

"මඟීන්ට යන එන මං නෑ.
වර්ජන අතර සාකච්ඡා බැහැ."

ඇමතිතුමා එහෙම කියනවා. බැරි වෙලාවත් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවට මේක කිව්වොත් කොහොමද? "කරුණාකරලා තේරීම් කාරක සභාවට එන්න" කියලා ඔබතුමන්ලා අපට අඩ ගහනවා. "ඔබතුමන්ලා පළාත් සභා විසුරුවා හැරලා තිබෙනවා. තේරීම් කාරක සභා වැඩක් නැහැ" කියලා අපි කිව්වොත් කොහොමද? මේවා මොන කථාද? මේවා ආණ්ඩුවේම කථා. එකකට හොඳයි. අනෙක් එකට නරකයි. ඔබතුමන්ලා පළාත් සභා ගැන භීතිකා ඇති කරනවා; බිල්ලෝ මවනවා. ඉඩම් ප්‍රශ්නය, පොලිස් බලතල ප්‍රශ්නය ගැන කියනවා. මේවා අවුරුදු 26කින් පස්සේ නැඟිටලා කථා කරන ඒවායි. තේරීම් කාරක සභාව පත් කරලා, පළාත් සභා විසුරුවා හරින්නේ ඇයි? භයක් තිබෙනවා නම් තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා පළාත් සභා අහෝසි කරලා දමන්නකෝ. මොකක්ද තිබෙන භය? අපේ සහයෝගය අවශ්‍ය නැහැ. කිසිම ප්‍රශ්නයක් නැතිව ඔබතුමන්ලාට අහෝසි කර දමන්න පුළුවන් නේ. ඔබතුමන්ලා ඇමෙරිකාවට කෑ ගහනවා. යුරෝපයට මුකුළු කරනවා. ඉන්දියාවට තර්ජනය කරනවා. දැන් භය වෙන්න ඕනෑ නැහැ නේ. මේ වාගේ ප්‍රතිපත්ති නිසා තමයි රටේ ආයෝජන පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අද රටේ අල්ලස් චෝදනා විශාල ප්‍රමාණයක් තිබෙනවා. "පළාත් පාලන මන්ත්‍රීවරු 36ක් ගැන සෙවිල්ලෙන්" කියා එක පුවත් පතක සඳහන් වනවා. ගිය සතියේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති රුපියල් ලක්ෂ 15ක් අල්ලස් ගත්තාය කියා අත් අඩංගුවට ගත්තා. ඊට පස්සේ දොම්පේ ප්‍රාදේශීය සභා සභාපති කෙනෙක් අල්ලස් චෝදනා යටතේ අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මේවා නිසා තමයි මේ රටේ ආයෝජන කරන්න ඕනෑද, එපාද කියලා මිනිස්සු බලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තවත් කරුණක් තිබෙනවා. එය දැනට දවස් තුන හතරකට ඉස්සරවෙලා සිදු වුණ දෙයක්. නිහාල් පෙරේරා කියන්නේ බොහොම වැදගත් මනුස්සයෙක්. ඇත්ත වශයෙන් මම එතුමා ගැන දන්නවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද දින "Ceylon Today" පුවත් පතේ "Estate managers protest murder of colleague" යන සිරස් තලය යටතේ දැරණියගල state-owned estate එකක වුණ සිදුවීමක් තිබෙනවා. මේ එතුමාට මරණ තර්ජන තිබුණ හතරවැනි ගමනයි. අභිංසක දරුවෝ දෙදෙනෙක් ඉන්නවා. මම එතැනට ගියාම ඒ අය හඬාගෙන වැටුණා. මේ රටේ නීතියක් නැද්ද කියලා කරුණාකර කියන්න. DIGලා ගිහිල්ලා contract killings කරනවා. "අත්කොටා, අනිල් විජේසිංහ" කියලා කෙළින්ම නම් කළා. "පොලීසියෙන් අත් අඩංගුවට ගන්නේ නැහැ, මොකද, මහ ඇමති කෙනෙක්ගේ ගෝලයෙක්" කියලා කිව්වා. එහෙම හඬ හඬා කියන කොට මහින්ද සමරසිංහ ඇමතිතුමාත් එතැනට ගිහිල්ලා තිබුණා. එතුමා කියලා තිබුණා, "මට කරන්න පුළුවන් හැකියාව බොහොම සීමිතයි" කියලා. ඉතින් මේ වාගේ අවස්ථාවක තේ කර්මාන්තය තුළින් අපනයනය කරන්නේ කොහොමද?

අද superintendentලා එළියට යනවා. ඒ ගොල්ලන් වතුවල ඉන්නේ නැහැ. මොකද ඔවුන්ට තර්ජනය කරනවා. ඒ නිසා තමයි අපනයනය කඩා වැටෙන්නේ. අප රටේ ආනයනය සියයට 12කින් අඩු වන කොට අපනයනය සියයට 15කින් අඩු වෙනවා. ගෙවුම් ශේෂ පරතරය සියයට 15කින්, සියයට 20කින් වැඩි වෙනවා. මේ නිසා තමයි ගෙවුම් ශේෂ නිහය - balance of payment - වැඩි වෙලා තිබෙන්නේ. මේක නැති කරන්න ඇමතිතුමාට ලොකු කාර්ය භාරයක් තිබෙනවා. කරුණාකරලා එක්සත් ජාතික පක්ෂය කියන දේ ඔබතුමන්ලා වහ වශයෙන් ගන්න එපා. මොකද මෙතැන කියන දේ අපේ රටේ ජාතික ආර්ථිකයට බලපානවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ජාතික ආර්ථිකය හැම වෙලාවේම හදලා තිබෙන පක්ෂයක්. ඩී.එස්. සේනානායක මැතිතුමා අපේ රටට නිදහස ලබා ගත්ත දවසේ ඉඳලා ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන්ලා මේ රටේ ජාතික ආර්ථිකයට ඉමහත් සේවයක් සිදු කළා. රණසිංහ ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ලා ආර්ථිකය කඩා වැටෙන හැම අවස්ථාවේදීම පුනර්ජීවනයක් දීලා රට හැදුවා. ඒ අවස්ථාවලදී ආර්ථිකය හදලා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ නිසා කරුණාකරලා අත් වැල් බැඳ ගනිමු. බින් ක්ලින්ටන් බලයට එන කොට කිව්වේ, "It's the economy, stupid" කියලායි. ඒ කිව්ව වචනවලට වටිනාකමක් දුන්නා. දැන් තිබෙන්නේ ඒකමයි. මොකද ත්‍රස්තවාදය නැති වෙලා අවුරුදු හතර නම් ඒකේ ආර්ථික ප්‍රතිලාභය කොහේද ගිහිල්ලා තිබෙන්නේ? මේ රටේ ඒ අවස්ථාව පාවිච්චි කරන්න තිබෙන අයිතිය නැති කරන්න එපා. අන්තවාදී ගමනක් ගිහිල්ලා මේ රට හදන්න බැහැ. අපට අවශ්‍ය වන්නේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන ජාතීන් ඔක්කොටම එකට ජීවත් වන්න පුළුවන් වාතාවරණයක් ඇති කරන්නයි. ඒ තුළින් ඉදිරියට ගමන් කරන්න පුළුවන් වනවා. කාලය හරස් වන නිසා මා මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අපේ නියෝජ්‍ය කථානායකතුමා කියා තිබෙනවා, "Ageing politicos cannot fool new generation." කියලා. මා දන්නේ නැහැ ඒක කියලා තිබෙන්නේ ඇයි කියලා. මේක ජනාධිපතිට කියනවාද නැත්නම් කාට කියනවාද කියලා මා දන්නේ නැහැ. මා ඒ කාරණයත් මතක් කරමින් ජාතික ආර්ථිකය හදන්න කරුණාකර සියලු දෙනාම ඒක රාශි වන්න කියන කාරණයත් මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමීයට ස්තුතිය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, "ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON. (DR.) (MRS.) SUDHARSHINI FERNANDOPULLE *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 5.48]

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
බොහොම ස්තුතියි, මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි. අද දින ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග පිළිබඳව විවාද කරන අවස්ථාවයි මේ. විශේෂයෙන්ම එදා ඉඳලා අපේ රටේ නම ගිය භෝගයක් වන කුරුඳු වගාවට රජයක් හැටියට අප රජය විසින් ශක්තියක් ලබා දෙන්න ඉදිරිපත් කරන අලුත් නියෝග මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ගෙන එන අවස්ථාවේ කුරුඳු වගාව තිබෙන පළාතක් නියෝජනය කරන, කුරුඳු ගොවියන් සහ කුරුඳු නිෂ්පාදන කරන ජනතාව ජීවත් වන පළාතක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මේ උත්තරීතර සභාවේ මටත් වචන කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම සතුටට කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමා දන්නවා අපේ ලංකාව නම ගිය රටක්; ඉතාමත්ම අගය කරන මේ නිෂ්පාදනය තිබෙන රටක් බව. මොකද අපේ රටේ තිබෙන දේශගුණික තත්ත්වය අනුව කුරුඳු වගාවට ඉතාමත්ම හොඳ රටක් කියන එක මුළු ලෝකයම දන්නවා. විශේෂයෙන්ම යුරෝපීයයන් අප රටට ආවේ මේ spices මුල් කරගෙනයි. මොකද ලෝකයේ ආර්ථිකය ඒ යුගයේ මෙහෙය වන්නත් මේ කුළු බඩුවලට හැකියාවක් තිබුණා. අපට අදටත් ලෝකය ජයග්‍රහණය කරන්න පුළුවන් නිෂ්පාදනයක් තමයි මේ කුරුඳු නිෂ්පාදනය. අප මේ කරන ව්‍යායාමයට කිසිම විධියකින් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් විරුද්ධ වන එකක් නැහැ කියා මා හිතනවා. මොකද රට ගැන හිතන මන්ත්‍රීවරුත් මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්නවා. මේ වැඩ පිළිවෙළට ඉතාමත්ම පැහැදිලිව ඔවුන්ගේ සහයෝගයත් දක්වනවා කියන කාරණය ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සම්බන්ධව රජයේ මන්ත්‍රීවරයෙකු හැටියට මා ස්තුතිවන්ත වනවා. අද දින මේ විවාද කරන නියෝග පිළිබඳව කථා කරන කොට අපේ රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව, අපේ රජයේ ප්‍රතිපත්ති පිළිබඳව නොයෙකුත් ආකාරයේ අදහස් උදහස් විපක්ෂයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් වුණා.

එසේ ඉදිරිපත් වන අදහස් රැසකට අපේ රජයේ ගරු අමාත්‍යතුමන්ලා උත්තර ලබා දීලා තිබෙනවා. ගොඩක් වෙලාවට විපක්ෂයේ චෝදනාව තිබෙන්නේ "මහින්ද චින්තන" සහ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩ පිළිවෙළටයි. මේ නමටත් ගොඩක් අයගේ විරුද්ධතාවක් තිබෙනවා. "මහින්ද චින්තන" කිව්වාමත් කැමැති නැහැ. මේක අපේ චින්තනය. මේක දේශීය චින්තනයක් ඇතිව අප හිතන ක්‍රමය. මේ ක්‍රමය අලුත් දෙයක්. මේ රටේ ආණ්ඩු බිහි වුණා; ආණ්ඩු නැති වුණා. හැබැයි ඒ හැම ආණ්ඩුවක්ම මොකක්ද කළේ? මැතිවරණයෙන් මැතිවරණයට ප්‍රතිපත්ති ප්‍රකාශන නිකුත් කළා. මැතිවරණයෙන් මැතිවරණයට කොළ කැලි ගහලා බෙදපු එක තමයි කළේ. හැබැයි පළමුවැනි වතාවට අපේ නායකයා -අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා- ජනාධිපති ධුරයට තරග වදින අවස්ථාවේදී, "මම මහින්ද, මේ මගේ වැඩසටහන, මේ මගේ චින්තනය" කියලා "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. ඒ අනුව තමයි බලයට ආවේ. එතුමාගේ නායකත්වයෙන් "මහින්ද චින්තන" කියන ඒ වැඩ පිළිවෙළ යටතේ මේ රට අපි ඉස්සරහට ගෙනාවා. එතුමාගේ පළමුවන ධුර කාලය අවසන් වන කොට මහින්ද චින්තනයේ තිබුණු ප්‍රධානම කරුණ වන, "මේ රටට ගෞරවාන්විත සහ උත්තරීතර සාමයක් ලබා දීම" එතුමා ඉටු කළා. අපි දැන් දෙවෙනි යුගයට ඇවිල්ලා තිබෙන්නේ. මොකක්ද ඒ? ඒ තමයි "මහින්ද චින්තන ඉදිරි දැක්ම." ඒ යටතේ ආණ්ඩුවක් පළමුවැනි වතාවට ප්‍රතිපත්තියක් අනුව ඉස්සරහට යනවා. මහින්ද චින්තනය ගෙනැල්ලා, ඊළඟ ඡන්දය එනකොට ඒ මහින්ද චින්තනය අමතක කර දමලා ඉදිරියට යන වැඩ පිළිවෙළක් නොවෙයි මේක. අපි නියමිත වැඩසටහනක් අනුව මේ රට ඉස්සරහට ගෙන යනවා.

"මහින්ද චින්තන ඉදිරි දැක්මෙන්" එතුමා මොකක්ද කියන්නේ? මේ රට යුද්ධයක් තිබුණු රටක්; අවුරුදු 30ක් එක තැන පල් වුණු රටක්. තමුන්නාන්සේලා මහ ලොකුවට කථා කරන අනෙක් රටවල් යුද්ධයකින් පෙළුණේ නැහැ; එක තැනක හිර වෙලා තිබුණේ නැහැ. ඒ රටවල් ඉස්සරහට යද්දී අපි එක තැන හිටියේ. ඇයි ඒවා අමතක කරන්නේ? ඇයි ඒවා ගැන කථා කරන්නේ නැත්තේ? ඒවා ගැන කථා කරන්නේ නැතිව මේ විධියට වැඩ කරන්න පුළුවන්ද? බැහැ. අපි අවුරුදු 30ක් අපේ හිතෙන් අමතක කර දැම්මා. ඒ අවුරුදු 30ක අඳුරු කාලය අවසන් කළේ කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නිසා ඒ අවුරුදු 30 අපි අමතක කරන්න ඕනෑ කියලා කටයුතු කරන්න බැහැ. ඒ අඳුරු සෙවණැලිත් එක්ක තමයි අපි මේ රට ඉස්සරහට ගෙන යන්නේ.

[ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා]

අද අපි "මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියලා මොකක්ද ඉදිරිපත් කරලා තිබෙන්නේ? අපි මේ රට ඒ තිබුණු තැන සිට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යනවා කියලා ඒ තුළින් කියනවා. ඒ වැඩ පිළිවෙළේ තමයි අද අප ඉන්නේ. ඒ වැඩ පිළිවෙළ අනුව අපි මේ රට ගෙන යනවා. අවුරුදු 30ක් එක තැන පල් වුණු රටක් ඉස්සරහට ගෙන යනකොට, අවුරුදු 30ක් දේශීය ආර්ථිකය පිළිබඳව හිතපු නැති ආර්ථික වැඩසටහනක් තිබුණු රටක් වෙනස් කරලා,"දේශීය ගොවියා, දේශීය ව්‍යවසායකයා, දේශීය ව්‍යාපාරිකයා, දේශීය මනුස්සයා නහා සිටුවන්න ඕනෑය" කියන ඒ පදනමට නිලධාරියාගේ මනස, ව්‍යවසායකයාගේ මනස, ව්‍යාපාරිකයාගේ මනස, මේ රටේ සිටින ජනතාවගේ මනස අනෙක් පැත්තට හරවන්න ඕනෑ. "අපි ශ්‍රී ලාංකිකයෝ. අපට ශ්‍රී ලාංකික අනන්‍යතාවක් තිබෙනවා, අපට ශ්‍රී ලාංකික අභිමානයක් තිබෙනවා"ය කියන එක ඔවුන්ගේ ලේවලට බද්ධ කරනවා කියන එක දවසෙන්, දෙකෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. එය කෙනෙකුගේ මනසක් සම්පූර්ණයෙන් අනෙක් පැත්ත හරවනවා වාගේ වැඩක්. මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න තමයි අණපනත් ගෙනෙමින්, තවත් අවශ්‍ය වෙනස්කම් කරමින්, අධ්‍යාපනික මට්ටමත් වෙනස් කරමින් රජයක් හැටියට අපි වැඩ කරන්නේ.

කුරුඳු කර්මාන්තය පිළිබඳව මීට කලින් කවුරුවත් කථා කළේ නැහැ. හැබැයි අද කථා කරනවා. අද අපි ඒ සඳහා මේ විධියේ අණපනත් ගේනවා. ලංකාවේ කුරුඳු මෙතෙක් කල් පිට රටට ගියේ වෙවෙර්ණ නාමවලින්. මේ "ලාංකීය කුරුඳු" කියලා කුරුඳු ව්‍යාපාරය තුළින් ශ්‍රී ලාංකීය නාමය කවදාවත් අපි පිට රටවලට අරගෙන ගියේ නැහැ. හැබැයි අපේ ආණ්ඩුව "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ අනුව ගමන් කරන ආණ්ඩුවක් හැටියට මේ ගැන බැලුවා. වෙළඳ පොළේ අපේ කුරුඳු ව්‍යාපාරයට යම් යම් විධියේ ප්‍රශ්න ඇති වන කොට, "අපි කොහොමද මේකට මුහුණ දෙන්නේ, රජයක් හැටියට කුරුඳු ගොවියාට අපි දෙන්න ඕනෑ සහනය මොකක්ද, අපි දෙන්න ඕනෑ ශක්තිය මොකක්ද?" කියලා බැලුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුඳු කර්මාන්තය පිළිබඳව කථා කරනකොට, මගේ ආසනයේ නිකපොත ප්‍රදේශය, ඒ වාගේම සොරගුණේ ප්‍රදේශය ලෝකයේ තිබෙන හොඳම කුරුඳු නිෂ්පාදනය වන ප්‍රදේශ කියලා අද හඳුනා ගෙන තිබෙනවා.

එහෙම හඳුනා ගෙන තිබෙනවා වාගේම අපේ IFAD වැඩසටහන -වියළි කලාපීය ජීවනෝපාය වැඩසටහන- යටතේ කුරුඳු කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණය, පුහුණුව ලබා දීලා තිබෙනවා. වෙනදා වාගේ නිකම්ම කුරුඳු ටික තලලා, මීටි බැඳගෙන ලොරියේ දමාගෙන යනවාට වඩා, කුරුඳු තෙල් නිෂ්පාදනය කරන්නේ කොහොමද, කුරුඳුවලට value addition එකක් ලබා දෙන්නේ කොහොමද කියන එක ගැන අපි කල්පනා කර තිබෙනවා. කුරුඳුවල වටිනාකම වැඩි කරන්නේ කෙසේද කියලා හිතලා, ඒවාට වටිනාකමක් එකතු කරන වැඩසටහන්වල ආණ්ඩුවක් හැටියට අප නියැලී සිටිනවා.

අපට කරන්න තිබෙන දේ බොහෝයි. අපි කවදාවත් කියන්නේ නැහැ, සියලු දෙයම කරලා ඉවරයි කියලා. නැහැ, තව බොහෝ දේවල් කරන්න තිබෙනවා. එහෙම වුණත් ආණ්ඩුවක් වශයෙන් අප මේ දරන ව්‍යායාමය අගය කරන්න ඕනෑ. ශ්‍රී ලංකිකත්වය අගය කරන ආණ්ඩුවක් අද අපට තිබෙනවාය කියන එක ගැන අපි සතුටු වෙන්න ඕනෑ. කරන කියන හැම දෙයටම බක බක ගාන එක නොවෙයි විපක්ෂයක වගකීම. විපක්ෂය මේ කටයුතුවල ධනාත්මක පැත්ත බලන්න ඕනෑ; ඒවා දිහා ධනාත්මකව දකින්න පුළුවන් වෙන්න ඕනෑ. ඒක තමයි අපි විපක්ෂයකින් බලාපොරොත්තු වෙන්නේ. ආණ්ඩු පක්ෂය යම් වැඩ පිළිවෙළක නියැලෙනවාද, ඒ වැඩ පිළිවෙළට ධනාත්මක පැත්තෙන් යමක් එකතු කරන එක තමයි විපක්ෂයකින් අප බලාපොරොත්තු වෙන්නේ. අද අපෙන් අහනවා, මේ රජය මොනවාද කළේ කියලා. අපි යුද්ධය දිනලා නිකම් ඉන්නේ නැහැ. ආණ්ඩුවක් හැටියට අපි වගකීමෙන් වැඩ කරනවා.

විදේශ සමඟ අපට තිබෙන සම්බන්ධතා ගැන අද අහනවා. ඒ මිසක් පොදු රාජ්‍ය මණ්ඩලයීය නායක රැස්වීම ලංකාවේ පවත්වන එක පිළිබඳව කවුරුවත් කථා කරන්නේ නැහැ. පොදු රාජ්‍ය මණ්ඩලයීය නායක රැස්වීම ගැන කථා කරනවා වුණත්, එතැනදීත් අහන්නේ, ඒ සඳහා වාහන කීයක් ගෙනාවාද, හෝටල්වල කාමර කීයක් තිබෙනවාද ආදී දේවල්. ඇයි අපි හැංගෙන්නේ? ඇයි අපි business forum එක ගැන කථා නොකරන්නේ? ඇයි අපි youth forum එක ගැන කථා නොකරන්නේ? ලෝකයේ ඉන්න ඉහළ පෙළේ ව්‍යවසායකයන්, ආයෝජකයන් අද වනකොට අපේ රටට පැමිණෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
ඒ අවස්ථාව business networking කියා තමයි අප හඳුන්වන්නේ. ඒ තුළින් අපේ දේශීය ව්‍යාපාරිකයන්ට, දේශීය ව්‍යවසායකයන්ට අවස්ථාව ලැබෙනවා, ලෝකයේ ඉන්න ප්‍රබලම ආයෝජකයන් හා සහසම්බන්ධ වෙන්න. අපේ රජය එවැනි අවස්ථා ඇති කරලා තිබෙනවා. මහින්ද චින්තනය තුළින්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් තමයි එවැනි දේවල් කරලා තිබෙන්නේ. පොඩි උදාහරණයක් පමණයි මම ඒ කිව්වේ. රජයක් හැටියට අප යන ගමන් මාර්ගය තමයි, ඒ. අපි කියන පළියටම ඒ කටයුතු අගය කරන්න කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, රජයක් හැටියට අපට කරන්න පුළුවන් දේවල් අපි ඉතාම උනන්දුවෙන් හා අවබෝධයෙන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ලංකාවේ ණය බර ගැන හැම වෙලාවෙම මහ ලොකුවට තමුන්නාන්සේලා කථා කරනවා. හැබැයි තමුන්නාන්සේලා මතක තියා ගන්න ඕනෑ, අපි මේ ණය ගත්තේ පාන් කන්නවත්, පාන් කාපු බිල් ගෙවන්නවත් නොවෙයි කියන එක. ඔව්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ණය ගත්තා. ඒ ණය ගත්තේ ආයෝජනය සඳහා. ඒ ගත්තු සෑම රුපියලක්ම අපි මේ ලංකා මාතාව වෙනුවෙන් ආයෝජනය කරලා තිබෙනවා. අපේ දරුවන් අනාගතයේදී අපට පින් දෙයි මේ කරපු ආයෝජන ගැන. අපේ දරුවන් කවදා හරි අපට කියයි, "එදා අප්පච්චිලා හදාපු දේවල් අද අපි බුක්ති විඳිනවා" කියලා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව හැම විටම බලන්නේ අද කන එක ගැන විතරක් නොවෙයි. අනාගතය ගැන කල්පනා කරන ආණ්ඩුවක් මේක. අපට වගකීමක් තිබෙනවා, අපේ අනාගතය ගැන. ඒ වාගේම අපට වගකීමක් තිබෙනවා, අපේ රටේ දරුවන්ගේ අනාගතය පැහැපත් කිරීමට. තාත්තා කෙනෙකුට තේරෙන දෙය අනික් අයට තේරෙන්නේ නැහැ. ඒ ගැන අපි කනගාටු වෙනවා. හැබැයි, විපක්ෂයේ ඉන්න බුද්ධියක් තිබෙන මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලා සිටින්නේ මේ වැඩසටහනට සහයෝගය දෙන ලෙසයි. කවදා හරි දවසක අනාගතය අගය කරන පුද්ගලයකු හැටියට - විපක්ෂයේ හිටියත් කමක් නැහැ- කටයුතු කරන්න කියා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[6.01 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Mr. Presiding Member, before I commence my speech, please permit me to lodge our strongest protest in this House about the bomb blast at the sacred Mahabodhi Temple in Bodh Gaya in Bihar State.

Sir, His Excellency the President, while opening a mosque at Seenawatte, Dharga Town, last Sunday stated that his Government had always acted to ensure religious co-existence with firm determination and a clear commitment to national unity.

Today, we find that such co-existence is under attack even in a great country, the Bharath, where the Buddha was born. I place on record a vehement and an unequivocal condemnation of this dastardly act of bomb blast at this sacred place. I am happy, Sir, our respected, පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද නිමිපාණෝ මේ අවස්ථාවේ අප අසල සිටීම පිළිබඳව.

Sir, I should recall with gratitude that when the Bamiyan Buddha statues were destructed in Kabul, Afghanistan, it was our respected late Moulavi Alhaj Niyaz Mohamed Gafoori, the Founder of the Ihsaniya Arabic College and also the Islamic Religious Co-ordinator to His Excellency the President, who took large crowds on to the streets in Colombo protesting against that dastardly act, and he vouched the allegiance and co-operation of the Sri Lankan Muslim Community always in order to hold respect and sanctity of Buddhism and other religions.

In this regard, there had been a religious leaders' meeting in Colombo yesterday, attended by all religious leaders where a very timely statement has been made by Alhaj Moulavi Hassan Moulana, who is also a Religious Co-ordinator of His Excellency the President. The "Daily News" of 9th July, 2013 states, I quote:

> "On being pointed out that the Indian Police suspect that the attack was carried out by a banned terrorist outfit called Indian Mujahiddin, Moulavi Hassan said if it was carried out by any such outfit with an Islamic religious name, they should be punished at once, because Islam does not teach a doctrine of attacking other religions or places of worship.
>
> "Just because, they have a Muslim religious name and they may wear a head-cover (hijab), they are not to be considered Muslims if they commit acts of violence to harm other religions."

That is the position of Islam and the Muslims all over the world. Therefore, now it is a timely reminder for us that we must also guard ourselves further. The war is over; terrorism is over. But, terrorists are working behind the scene in order to destabilize the legally-elected Government. What Prabhakaran failed to achieve through his gun, some people together with the help of the NGOs, are trying to achieve through the pen. This is why we have to be very careful in dealing with NGOs and other anti-government movements in this country.

As pointed out by our young, up-and-coming Friend, the Hon. Udith Lokubandara, nobody seems to be speaking about the forthcoming CHOGM in this country. Why? They are shy of doing so. After many years, after 26 years, I think for the first time, the Commonwealth Heads of Governments are visiting this country. So, we all must be very happy. Then, what is happening today? We must be thankful to His Excellency the President Mahinda Rajapaksa. He has not only uplifted the economy tremendously to Himalayan heights in this country, which only the blind people refused to see but also raised the stature of the country in the international arena to sky high.

That is why, with all this manipulation and manoeuvres carried out unashamedly by certain sections who are in touch with the NGOs and the so-called superpowers, the world is convinced that this is a country where there is now economic stability and freedom.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුවත් පතක මෙන්න මේ විධියට සඳහන් වෙනවා.

"වසර 56ක් 4.5%ක් වූ අපේ ආර්ථික වර්ධනය ගිය වසර 7දී සියයට 7.5 දක්වා ඉහළ ගියා"

මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් මහත්මයා තමයි ඒ ප්‍රකාශය කරන්නේ.

He is speaking with all the statistics in his hand. Sir, that is why we call him an "economic wizard" or a *Visharadaya.* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනස් හය වසරක කාලයක් සියයට 4.5ක මට්ටමේ පැවැති ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය පසු ගිය වසර හතක කාලයේදී සියයට 7.5 දක්වා වර්ධනය කර ගැනීමට රජයට හැකිව තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා ප්‍රකාශ කරනවා. බොරුකාරයා, බොරුකාරයා කියලා මේ සභාවේදී කෑ ගැහුවාට, බලන්න කොයි තරම් හොඳට ආර්ථිකය නංවලා තිබෙනවාද කියලා. ඒකයි මේ අයට තිබෙන වේදනාව. හොඳින් වැඩ කරන, ආර්ථිකමය පැත්තෙන් රටට උපකාරී වන අයට "බොරුකාරයා" කියලා ද්වේෂ සහගතව කථා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Okay, Sir. අපි දන්නවා, අද මේ රටේ වැවෙන භෝග වර්ග සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. කුරුඳු, එනසාල්, ගොරකා, කරඳමුංගු, සියඹලා, புளியம்பழம், අබ, කොකෝවා, බුලත්, පුවක් සහ ගම්මිරිස් ආදී භෝග වර්ග මේ රටේ වැවෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, ඔබතුමාත් දන්නවා, කරන්දෙනිය ආසනය කුරුඳු වැවෙන ආසනයක් බව. එහි පමණක් නොවෙයි. ඉස්සර අපි ඉස්කෝලේ ළමයි වශයෙන් මහරගම ප්‍රදේශයේ ගතුරියා අරාබි විද්‍යාලයට අයත් භූමි භාගයේ දුව ඇවිදින විට එහි බොහෝ කුරුඳු කැලෑවල් තිබුණා. කොළඹ පෙදෙස ඉස්සර කුරුඳුවත්ත. දෙවටගහ පල්ලිය ගොඩ නැඟුණේ කුරුඳුවත්තේ සිද්ධියකින් පසුවයි; තෙල් වෙළෙඳාමේ යෙදුණු එක් සිංහල අම්මා කෙනෙකු සම්බන්ධිත කථාවක් ඇසුරෙන්. ඒක නිසා මේ ආර්ථිකය නංවාලීමට අපනයන භෝග වගාව වර්ධනය කිරීමේ මහා ව්‍යාපාරයක් රජය භාරගෙන තිබෙන බව මා ඉතාමත්ම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 ජූනි 5 දිනැති අංක 1813/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

විදේශිකයන් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන කැසිනෝ ව්‍යාපාර
இலங்கையில் வெளிநாட்டவர்கள் நடத்தும் கசினோ
RUNNING OF CASINOS IN SRI LANKA BY FOREIGNERS

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I move,

"The Government through the Minister of Investment Promotion mentioned in Parliament that James Packer will be given tax holidays and also a licence to operate a casino. With the emergence of James Packer to invest US$ 350 million to open a casino in Sri Lanka, many people have been querying the necessity and the ethicalness of such foreign owners running a casino in Sri Lanka.

Since then the Finance Minister and the Government Cabinet Spokesman mentioned that no new licences will be given but if an existing licensee is willing to transfer his licence, then nobody can prevent such a thing happening.

Curiously after my highlighting in the media, on the 28th of June, the Police raided the smallest casino operator and gave wide publicity, whilst another big player having two casinos running in the same premises paying only one levy has not got any raid on their casino premises.

The strange irony exists as to the statement that has been referred that 'you can transfer a licence' when in effect there is no casino licence that has been issued to anybody at any period from the inception of betting on horse-racing from 1930."

Therefore, will the Minister please advise regarding these? "

I was told to refrain from asking certain questions. But, during my speech I will refer to them.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා. මට වෙන් වෙලා තිබෙන කාලයත් මම එතුමාට ලබා දෙනවා එතුමාගේ යෝජනාවට අදාළ කථාව ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි.

මේ අවස්ථාවේ ඉතාම කාලෝචිත වශයෙන් මම මෙය මේ සභාවට ඉදිරිපත් කරනවා. කැසිනෝ, එහෙම නැත්නම් සූදු සම්බන්ධයෙන් තිබෙන පනත් සියල්ල මුල සිට අග වන තෙක් මම මේ සභාවට ඉදිරිපත් කරනවා.

ඉස්සෙල්ලාම මේක ගෙන ආවේ 1930 අගෝස්තු 01වැනිදා. Betting on Horse-Racing (Chapter 55) කියලා තමයි ඒක

ආවේ. ඊට පසුව 1961 දෙසැම්බර් 5වැනිදා Gaming (Amendment) Act, No. 48 of 1961 ගෙනාවා. Gaming (Amendment) Act, No. 26 of 1957 පනතට 1987 සංශෝධනයක් ගෙනාවා. ඒක 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ තමයි ගෙනාවේ. ඒක තමයි මේ වන තුරු පනතක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ.

1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට වෙනසක් කරන්න Betting and Gaming Levy (Amendment) Act, No. 7 of 2001 ගෙනාවා. ඊට පස්සේ මේක 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත වශයෙන් ගෙනාවා. 2006 මාර්තු 31, Betting and Gaming Levy (Amendment) Act, No.14 of 2006 ගෙනාවා. ඊට පසුව මේ පනත සංශෝධනය කරන්න සූදු (විශේෂ විධිවිධාන) පනත කියලා එකක් 2010 ඔක්තෝබර් 10 වන දා ගෙනාවා. මේ පනත නැවත සංශෝධනයට ලක් කරන්න amendments ගෙනාවා. I will make a clarification. It is Casino Business (Regulation) Act, No. 17 of 2010. ඊට පසුව 2013 අප්‍රේල් 24වැනිදා Betting and Gaming Levy (Amendment) Act, No. 19 of 2013 කියන ඒ සංශෝධනය ගෙනාවා. දැන් මේ පනත තමයි රටේ ක්‍රියාත්මක වන්නේ. මේ වන තුරු ඒකේ නෛතිකභාවයක් නැහැලු. මේකේ තිබෙන්නේ, ඇස් වහලා යම් විධියකින් කරන්න ඉඩ දෙනවා කියන එක මිසක් ඊට වැඩිය ඉදිරියට ගෙන යෑමක් නැහැ. මේ සම්බන්ධයෙන් නීතිමය පද්ධතිය අනුව, "*Ignorantia juris non excusat* - ignorance of the law is no excuse" කියන පදනම මුල් කොට ගෙන, -මා නීතිඥයෙක් නොවෙයි. Latin pronunciation වැරදුණොත් මා සමාව ඉල්ලනවා.- තිබෙන්නේ නීතිය හරියාකාරව ස්ථාපනය කරන්නේ නැතුව යම් විධියකින් ඇස් වහලා කරන දෙයක් තිබෙනවා නම් ඒක වැරදි ක්‍රියාවක් ලෙසයි. දැන් මේක පදනම් කර ගෙන තමයි මා පාර්ලිමේන්තුවේදී ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමාගෙන් එදා ප්‍රශ්නයක් ඇහුවේ. එදා බොහොම ඕනෑකමින් එතුමා ඒකට සම්පූර්ණ උත්තරයක් දුන්නා. එදා ඒ ප්‍රශ්නය අහන්න පසුබිමක් තිබුණා. එහි පසුබිම තමයි ජූලි මාසයේ 5වැනිදා පුවත් පතක හෙළිදරවු කළා, "කැසිනෝ සංකීර්ණයට වසර 12ක බදු සහන" කියලා. ඒ නිසා "Massive Casino Resort in Colombo" කියන එක ගැන හැම website එකකින්ම එන්න පටන් ගත්තා. ඊට පස්සේ ජූනි මාසයේ 8වැනිදා "Ceylon Today" පත්තරේ තිබෙනවා, "Govt. divided on Packer deal" කියලා.

It was stated that the Hon. Patali Champika Ranawaka opposes the casino project, while the Hon. Lakshman Yapa Abeywardena says that there will be no casinos.

මා මේ කියන්නේ ඒකේ පසුබිමයි. ඊට පස්සේ "Ceylon Today" පත්තරේ "Tax holiday for Packer" සිරස්තලය යටතේ ඒ සම්බන්ධව පළ වෙනවා. මා හිතන්නේ ඒ සම්බන්ධව වැඩියෙන්ම හෙළිදරවු වුණේ, ජූනි මාසයේ 9වැනිදා "The Sunday Leader" පත්තරෙන් කියලායි.

There is a list of concessions given. මෙහි සහනාධාර - concessions - යටතේ තිබෙනවා: Exemption of Corporate Income Tax; Exemption of Dividend Tax; Betting and Gaming Levy; Exemption of Customs Duty on Importation of Project-Related Items; Exemption of Value Added Tax; Exemption of Port and Airport Development Levy; Exemption of Construction Industry Guarantee Fund Levy; Exemption of Withholding Tax; Exemption of PAYE tax; Exemptions from Exchange Control Regulations.

දැන් මේ සහන ඔක්කෝම දීලා තිබෙන අවස්ථාවක "Packer's Bumper Package From Government." කියන සිරස්තලය යටතේ හුඟ දෙනා ප්‍රශ්න කරන්න පටන් ගත්තා. පුවත් පත් වාර්තා කළා, අපි ඉතාමත් ගරු කරන, අපේ බෞද්ධාගම ආරක්ෂා කරලා වැඩ කරන අපේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක හිමි ප්‍රකාශ කළ බව, "කැසිනෝ ගෙනාවොත් පාරට බහිනවා" කියලා. ඊට දවස් තුනකට පස්සේ අගරදගුරු තුමාත් කියනවා, "කැසිනෝ මේ රටට අවශ්‍යතාවක් නැත". Another headline states; "Government says 'no' to new Casino Licences" කියලා. ඊට පස්සේ දවසේ ඔබතුමා පාර්ලිමේන්තුවේදී අපට උත්තර දෙනවා, casino licence අලුතෙන් නිකුත් කරන්නේ නැහැ කියලා.

අප ළඟ තිබෙනවා තව වාර්තාවක්. ඔබතුමන්ලාගේ කැබිනට් ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා කියනවා, casino licence එකක් ඉදිරිපත් කරලා තිබෙනවා නම්, බැරි වෙලාවත් ඒක වෙනස් කළොත් තව තැනකට පාවිච්චි කරන්න අපට ඒක නවත්වන්න බැහැ කියලා.

මේකම මුදල් ඇමතිතුමාත් ප්‍රකාශ කළා. ඊට පස්සේ ජූනි මාසයේ 30වැනි දා සිරස්තලයක් තිබෙනවා, "Casino raided for evading tax" කියලා. බද්දක් ගෙවලා ඔය වාගේ පාවිච්චි කරන ආයතන හයක් තිබෙනවා. එක්කෙනෙකුට තුනක් අයිතිව තිබෙනවා. එක්කෙනෙකුට දෙකක් අයිතිව තිබෙනවා. එකකටයි ගෙවන්නේ. තව පොඩි එකක් තිබෙනවා. මේ ගෙවන පොඩිම එක ගැන ලොකු ප්‍රශ්නයක් ඇති කරලා පෙන්වන්න හදනවා, මේක raid කරලා තිබෙනවාය කියලා. මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් අහන්න තිබෙන්නේ, ආණ්ඩුවක් වශයෙන් ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් කොළඹ වහලා මේ රටට බොරුවක් කරන්නද හදන්නේ කියන එකයි. මේ රටේ කැසිනෝ තිබ්ලා තිබෙනවා. අශ්වයන්ට bet කරන එක, කැසිනෝ, Rudjino වාගේ එක එක නම්වලින් තිබෙනවා.

ඊට පස්සේ කැසිනෝ කියන නමත් ඇවිල්ලා යම් කාලාන්තරයක් පාවිච්චි කරලා තිබෙනවා. නමුත් සුවිශේෂ වෙනස තමයි මේ රටේ ඔබතුමන්ලා බලපත්‍රයක් නිකුත් කරපු එක කැසිනෝ ආයතනයක්වත් මේ මොහොත වන කොට නැති එක. එහෙම තිබෙනවා නම් ඔබතුමන්ලා කරුණාකර ඉදිරිපත් කරන්න, එය කාගේ නමටද තිබෙන්නේ, කවුද ඒකේ අයිතිකරු, ඒ වාගේම මොන පදනමකින්ද දුන්නේ, කවුද ඉදිරිපත් කරපු මුදල් ඇමති, කොයි දවසේද ඒක ඉදිරිපත් කළේ කියා. ඒ වාගේම ඒ බලපත්‍රය නිකුත් කරපු දවසේ සිට අද වෙන තුරු කොතරම් EPF සහ ETF ප්‍රමාණයක් ඒ වැඩ කරන අය වෙනුවෙන් ගෙවලා තිබෙනවාද, ඒකෙන් කොතරම් බදු ප්‍රමාණයක් ලබා ගෙන තිබෙනවාද, ඒ සම්බන්ධයෙන් කොයි ආකාරයටද කටයුතු කරලා තිබෙන්නේ කියාත් කියන්න. මේ නිකුත් කරපු බලපත්‍රය කවදාද නිකුත් කරලා තිබෙන්නේ කියන එක සම්බන්ධව කරුණාකරලා අපව දැනුවත් කරන්න. ඒක කළේ නැත්නම් ඔබතුමා ප්‍රෝඩාවක් තමයි කරන්නේ.

එක පැත්තකින් ඒක එහෙම වෙන කොට මැයි මාසයේ 8වැනි දා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පත්තරේට නිකුත් කරනවා, "බුකීකරුවන්, ඔට්ටු හෝ සූදු ව්‍යාපාරවල යෙදී සිටින තැනැත්තන් වෙත කෙරෙන දැන්වීමක්" කියන ශීර්ෂයෙන් යුතු දැන්වීමක්. ඔබතුමන්ලා කියලා තිබෙනවා, "31වැනි දාට ඉස්සෙල්ලා මේක license කරන්න ඉල්ලීමක් කරන්න" කියලා. ඒකෙන්ම ඔප්පු වෙනවා, මෙතෙක් දුරට කිසිම බලපත්‍රයක් - licence එකක්- දීලා නැහැය කියලා. එතැන වෙලා තිබෙන්නේ බදු වශයෙන් යම් විධියේ අය කිරීමක් කරලා තිබෙන එකයි. මෙතෙක් දුර ඒ අය කිරීම තමයි ඒ කැසිනෝ ආයතන හය සම්බන්ධව කරලා තිබෙන්නේ. ඊට පස්සේ නැවත 2013 ජූනි 28වැනි දා "ඩේලි මිරර්" පත්තරේ මෙහෙම notice එකක් තිබෙනවා.

[ගරු රවි කරුණානායක මහතා]

"Department of Inland Revenue - Betting and Gaming Levy".

It gives out the levy payable for the quarter as follows - 2013 ජූලි මාසයේ 1වැනි දා වෙන කොට - Agents - Rs. 500,000; Business with live telecast facilities - Rs. 75,000; Business without live telecast facilities - Rs. 6,250 and gaming - Rs. 25,000,000 million ගෙවන්න තිබෙනවා. ඔබතුමන්ලා මේ ඔක්කෝම කරලා තිබෙන්නේ සල්ලි එකතු කිරීමටයි.

මීට පෙර අවස්ථාවේදී මම කිව්වා වාගේ අද ආයෝජන නැති නිසා මේ ආණ්ඩුව කරන එක දෙයක් තමයි මේ වාගේ නෛතිකභාවයක් නැති ව්‍යාපාරවලට විවෘත කරන එක. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ කැබිනට් එක තුළත් යම් විධියක ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම ගරුතර මහනායක ස්වාමීන්වහන්සේලා මේකට සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරලා තිබෙනවා. අගරදගුරුතුමාත් ඒ වාගේම ප්‍රකාශ කරලා තිබෙනවා. ඔබතුමන්ලා කියනවා, අලුතෙන් licences නිකුත් කරන්නේ නැහැ කියලා. නිකුත් කරපු licence එක කවදාද නිකුත් කළේ කියන එක සම්බන්ධව කරුණාකර මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියන එක තමයි අපි මේ අවස්ථාවේදී කියන්නේ. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා එහෙම කරන ගමන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන- [බාධා කිරීමක්] Sir, I am referring to the Betting and Gaming Levy (Amendment) Act, No. 19 of 2013. එහි පළමුවැනි පරිච්ඡේදයේ මෙහෙම තිබෙනවා. I quote:

> "This Act may be cited as the Betting and Gaming Levy (Amendment) Act, No. 19 of 2013 and shall be deemed for all purposes to have come into operation on January 1, 2013."

ඒ කියන්නේ retrospective legislation - පස්සට ගිහිල්ලා මේක අනුමත කිරීමක්. මේක සාමාන්‍ය දෙයකදී කරන්නේ නැති දෙයක්. මේක පෙර සූදානමකින් ඒ සුද්දාට උදවු කරන්න හදන වැඩ පිළිවෙළක්. අපේ ලංකාවේ කැසිනෝ ව්‍යාපාරය මෙතෙක් දුර කරලා තිබෙනවා. ඇයි මේකේ ප්‍රශ්නයක් තිබෙනවාද? මම මේ සම්බන්ධයෙන් වෙනත් මතයක් දරන්නේ. අවශ්‍යතාවක් නැද්ද කියන එක නොවෙයි මම කියන්නේ. ආණ්ඩුවට අවශ්‍ය නම් සල්ලි එකතු කරන්න ඇයි ඔබතුමන්ලා මේක සුද්දන්ට විවෘත කරන්නේ? මේ තාක් කල් හැම සුද්දාටම බණින ආණ්ඩුව මේ සුද්දාට විතරක් ආදරය පෙන්වන්නේ ඇයි? පැල්පතේ ඉන්න අහිංසක මිනිහා භූමි තෙල්වලට බදු ගෙවන කොට, කිරි පැකට් එකට බදු ගෙවන කොට, සීනි ටිකට බදු ගෙවන කොට, ප්‍රවාහන සේවයට බදු ගෙවන කොට මේ සුද්දා වැට් එකෙනුත් අයින් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඒ අහිංසක මිනිසුන්ට ඒ වාගේ කරන කොට මේ සුද්දාට ඒ වරප්‍රසාද ලැබිලා තිබෙන්නේ කාත් එක්ක වැඩ කරන නිසාද? මේක හැම එක්කෙනාටම නොවෙයි නේ ලැබෙන්නේ.

ඇයි ලංකාවේ අයට මේ අවස්ථාව දෙන්නේ නැත්තේ? ජෝන් කීල්ස් එකටත් එය ගෙන එන්න හදනවා. මේක මිශ්‍ර සංකල්පයක්. කැසිනෝ ක්‍රීඩාව කරන්න යම්කිසි විධියේ තැනක් තිබෙන්න එපායැ. ඒක hotel එකක් නම්, ඒ hotel එකේ නම පාවිච්චි කරගෙන ඒ වහල යට වැරැදි වැඩ කෙරෙනවා නම් ඒ මුළු ක්ෂේත්‍රයම වැරැදි වෙනවා. You cannot legalize an illegal act. There is prostitution in this country. That is illegal. So, you cannot say that a tax should be imposed on prostitution. අන්න ඒ වාගේ දෙයක් තමයි මේක. "මතට නිත" තබනවාය කියන, ශ්‍රී ලංකා අනන්‍යතාව රකින්න ඕනෑය කියන, හැම දේටම ජාතිකත්වය - nationalism - බදා ගෙන පොරකන මේ ආණ්ඩුව මේවා ගෙන එන්නේ ඇයි? තමුන්නාන්සේලාට මේ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලා කියනවා නම්, "ඔව්, අපට සුද්දෙක් ගෙනෙන්න ඕනෑ. ගෙනෙන්න licence එකක් නැහැ. නැති නිසා මේ තත්ත්වය ඇති කර දෙනවා" කියලා, ඒක වෙනම දෙයක්. නමුත් බොරු කරලා හසු වුණාට පස්සේ කරුණාකර කියන්න එපා, licence එකක් නැහැ; මේක තිබුණාට කමක් නැහැ; මේක අවුරුදු ගණනාවක් තිබුණා; ජෝසිම් ආවා කියලා. ඒ වාගේ ඒවා වලංගු නැත. අප මෙය කියන්නේ සමස්ත ජනතාවටයි, මහා නායක ස්වාමීන් වහන්සේලාටයි, ඒ වාගේම අගරදගුරුතුමන්ලාටයි. ආණ්ඩුව ප්‍රකාශයක් කරනවා නම් මේවා ගෙනෙන්න ඕනෑ කියලා, ඒකට කමක් නැහැ. මේ අතරතුර Sri Lanka Tourism Development Authority එක ඊට වඩා වැඩි දෙයක් කියන්න පටන් ගෙන තිබෙනවා. ඒ තමයි, මේ විධියට කැසිනෝ ගෙනාවොත් ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 5,000කට, 6,000කට වැඩි වේවි කියන එක. කොයි ලෝකයේද තමන්ගේ රටේ ඒක පුද්ගල ආදායම කැසිනෝ මඟින් වැඩි කරනවා කියන කතන්දර විකුණන්නේ? මීට ඉස්සර වෙලා අපි බොහොම පොඩියට අපනයනය කරන කුරුඳු ගැන කථා කරමින් සිටියා. දැන් කැසිනෝ ගෙනෙනවාය කියනවා ඒක පුද්ගල ආදායම වැඩි කරන්න. කරුණාකර මේ වාගේ බංකොලොත් තත්ත්වයකට රට පත් කරන්න එපා. මේක එක කොනක තියලා, සද්ද නැතිව කරගෙන යනවා නම් ඒක වෙනම දෙයක්. නමුත් මෙය මේ වාගේ අවස්ථාවක පෙරට ගෙනැල්ලා මේ විධියට කටයුතු කිරීම තමයි කරන අපරාධය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් පොලීසිය නීතිය තමා අතට ගන්නවා. එක් පැත්තකින් DIG වාස් ගුණවර්ධන කුලියට මිනිසුන් මරන්න පටන් ගෙන තිබෙනවා; දැන් පුතා අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි මෙතැන ඉන්නවා තවත් DIGsලා. ඒ අය ගිහින් කැසිනෝ raid කරනවා. ඒ අය CMC එකට ගිහිල්ලා ඇඟිලි ගහනවා. ඒ වාගේ අය මේ 28වැනි දා ගිහිල්ලා ප්‍රශ්න ඇති කරලා තිබෙනවා. DIGලා ඉන්නේ නීතිය සහ සාමය රකින්න මිසක් raid කරන්නද? ඒ අයගේ කාර්යයක් වන්නේ කොහොමද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයිති කටයුත්තක්? ඒ අය ජේම්ස් පැකර්ලාට මෙහෙම කරාවිද? එහෙමත් නැත්නම් බොහොම ඉහළ බලතල තිබෙන අය ළඟට ගිහිල්ලා මෙහෙම ඇඟිලි ගසාවිද? නැහැ නේ. අහිංසක පොඩි කෙනෙකු අල්ලලා වැඩේ කරනවා. සද්ද කරන්න බැරි එකෙකු අල්ලලා පෙන්නන්න හදනවා, "මෙන්න අපි කැසිනෝ raid කරනවා" කියලා. ඒවා වසා දමන්න කෝ. බලපත්‍ර නැත්නම් කොහොමද ඒවා පවත්වා ගෙන යන්නේ? විපක්ෂයේ අපට කොපමණ හිරිහැර කරනවාද? මෙතැනදී හැම වෙලේම පනින, හැම වෙලේම කෑ ගහන අස්වර් මන්ත්‍රීතුමා කියනවා අපට යූඑස් ඩොලර් මිලියන ගණන් තිබෙනවාය කියා. අපි බය නැහැ. හිටපු විනිශ්චයකාරතුමෙක් මෙතැන ඉන්නවා; ඇමතිවරු ඉන්නවා. අපට හංගන්න දෙයක් නැහැ. අපි මේක ප්‍රසිද්ධ කරනවා. ඒ කොන්දක් නැති මන්ත්‍රීවරයා එළියට ඇවිල්ලා මේක කිව්වා නම් මට දඩ ගහන්න පුළුවන් එතුමාට. Parliament Privileges යටතේ හංගාගෙන ඉන්නවා. මේ රටට, බැංකුවට ආයෝජනය කරන්න විදේශිකයන් ගෙනෙන්න කියලා අප කිව්වාම, එහෙම ගෙනැල්ලා අප මේ රටේ විදේශ විනිමය අනුපාතය පිළිබඳ ප්‍රශ්නයක් ඇති කරාවි කියන මේ රටේ ආර්ථික ඝාතකයකු වන මහ බැංකුවේ අධිපති නිවාඩ් කබ්‍රාල්ලා මේ වාගේ සුද්දන්ට දක්වන ආදරය මොකක්ද? තමන්ගේ රටේ ඉන්න අයට වඩා සුද්දන් රටට ආදරේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා මේ රටේ පවත්වා ගෙන යනවාද නැද්ද කියන එක ආණ්ඩුවේ තීන්දුවක්. මේ අවස්ථාවේදී අපි කියනවා, කරුණාකර එය UNP එකේ ඇහට දමන්න එපා කියලා. අප මේ අවස්ථාවේ අහන්නේ, ඔබතුමන්ලා නැති බලපත්‍රයක් ඇති කරලා දෙන්නේ කොහොමද කියලායි. ඒවා කාටවත් නැහැ. බොහොම සුප්‍රසිද්ධ නම් පාවිච්චි කරනවා. "මෙන්න මෙතැන කැසිනෝ තිබෙනවා" කියනවා. ඒවා කරගෙන යන්න ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව. ඒක වෙනම දෙයක්. නමුත් බලපත්‍රය තිබුණාද නැද්ද කියන කාරණය කරුණාකර නිවැරැදිව

කියන්න. ඒ වාගේම තමයි "Rudjino". ඒ වාගේ පොඩි පොඩි ඒවා ගණනාවක් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් යම් පදනමක් ඇති කරන්න ඕනෑ. ඔබතුමන්ලා රුපියල් මිලියන 100ක් දමනවා නේ බද්ද වශයෙන්. Tables 75ක් තිබුණත්, table එකේ පස්දෙනකු සිටියත් එක බද්දක් තමයි තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම් විධියක සාධාරණයක් ඉෂ්ට කරන්න අවශ්‍යයි. ඒ අය යම් විධියකින් සූරා කන්න ආණ්ඩුව මෙවා කරනවා නම්, කොයි ආකාරයෙන්ද ඒක කරන්නේ කියලා කරුණාකර හෙළිදරවු කරන්න.

මීට ඉස්සර වෙලා, රටේ සංවර්ධනයක් ඇති කරන්න ඕනෑ කියලා කියමින්, රටේ එක කලාපයකට -මා හිතන විධියට කටාන ආසනයට- කැසිනෝ ඔක්කෝම ගෙන එන්න ඕනෑ කියලා කියමින් ලොකු ආයෝජන ප්‍රවර්ධනයක් ගැන කිව්වා. එයට මූලික වුණේ බැසිල් රාජපක්ෂ මැතිතුමා බව මට මතකයි. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමනි, එවිට ඔබතුමා නියෝජ්‍ය ඇමති වශයෙන් කටයුතු කළා. ඒ අවස්ථාවේදී කිව්වා මෙය එක් කලාපයකට ගෙන යනවා කියලා. එය මැලේසියාවේ, සිංගප්පූරුවේ තිබෙන ක්‍රමයක්. ඒ රටවල මේවා නැතුවා නොවෙයි. සිංගප්පූරුව මේ කාරණය ලොකු විවාදයකට ලක් කරලා, ඊට පස්සේ කිව්වා, "මේවා මේ රටට යම් විධියකින් ගෙනෙන්නත් අවශ්‍යයි" කියලා. බොහෝ සෙයින් ප්‍රශ්න කරලා තමයි ඒවා ඒ රටට ගෙනාවේ.

මේ වාගේ ගමනක් යනවාය කියා තමයි ලොකුවට ප්‍රකාශ කළේ. නමුත් මේ ඇමතිවරුන්ට වඩා විරෝධතාවන් අයිතිකරුවන්ට ඇති වුණා. ඉතින් එය කටාන ආසනයට ගෙන යන්නේ නැතුව ඩී.ආර්. විජයවර්ධන මාවතට ගෙනැවිත් තිබෙන නිසා දැන් මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මම හිතන හැටියට එතැන African Gaming Company එකක් තිබුණා. මට මතකයි, එදා South Africaවල තානාපතිතුමාත් ගෙන්වූවා. එහෙම ගෙන්වලා ලොකුවට ශබ්ද කළාට ඒ සියල්ලම නැති කළා. ඊට පස්සේ එක පාරටම ජේම්ස් පැකර් කොහෙන් හෝ ඇද ගෙන ඇවිත් මොකක්ද කරන්නේ? මේ ජේම්ස් පැකර් හොංකොං රටෙන් ණයක් ලබා ගෙන තිබෙනවාය කියන එක ඔබතුමන්ලා දන්නවාද? මා මෙම අවස්ථාවේදී ඒ සම්බන්ධයෙනුත් හෙළිදරවු කරන්නම්. එතුමා Crown Melbourne Limited එකට US Dollars 1.9 billion ණයක් තිබෙනවා. හොංකොං රටේ Melco Crown Entertainment Limited එක සියයට 33ක් අයිති කර ගන්නවා. ඒ කොම්පැනිය US Dollars billion 2.9ක ණයක් තිබෙනවා. ඉතින් ඒ අය මේ රටට එන්නේ සම්පතක් එක්ක නොවෙයි, මේ රටේ තිබෙන සල්ලි සූරා කන්නයි. මේ මොහොත වන කොට පැය 300ක් ඇතුළත අපේ රුපියල 124 ඉඳලා 137 දක්වා අවප්‍රමාණය වුණේ ඇයි? මේ රටට ආයෝජනය එනවා මදියි. මේ රටින් අපනයනය වනවා අඩුයි. එම නිසා අපට ගෙවුම් ශේෂ හිඟයක් තිබෙනවා. එතකොට රුපියලේ වටිනාකම අඩු වනවා. මේ වාගේ කැසිනෝකාරයෝ මේ රටට ඇවිත් බැරි වෙලාවත් මෙය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තොත්, අන්තිමට සිද්ධ වන්නේ අපේ රුපියල සම්පූර්ණයෙන්ම නැත්තටම නැති වන එකයි. මතකයි නේ, 1988, 1989 හා 1990 දී ආසියානු රටවල ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටුණු බව; ඉන්දුනීසියාවේ ආර්ථිකය කඩා වැටුණු බව. මැලේසියාව දණ ගස්වන්න පටන් ගත්තා. සිංගප්පූරුවේ පවා ප්‍රශ්නයක් ඇති වුණා. කවුරු මොනවා කිව්වත් අන්න ඒ වාගේ තත්ත්වයක් දැන් මේ රටේ සිද්ධ වෙමින් යනවා. එවැනි අවස්ථාවක අපේ capital market එක open කරන්නේ නැතිව කැසිනෝ ගෙනාවොත්? ඒක අරින්න ඕනෑ නැහැ, ඇරලා ඉවරයි. ඉන්දියාවේ අය මේ රටට ඇවිත් කැසිනෝ ගහලා යාවි. යනකොට සුද්දා කියාවි මෙන්න මේ තරම් සල්ලි ප්‍රමාණයක් ගෙනාවාය කියා. මෙහේ කළු සල්ලි සුදු කරලා යාවි. එතකොට අපේ රුපියලට මොනවාද වෙන්නේ? අපේ රටේ තිබෙන dollarsවලට මොනවාද වෙන්නේ? මෙහේ තිබෙන රුපියල් දිනුවාට පස්සේ ඉන්දියන්කාරයා රුපියල් අරගෙන යන්නේ නැහැ නේ. ඔහු අරගෙන යන්නේ dollars. එතකොට dollarsවලට මේ වාගේ තල්ලුවක් ඇති වුණොත් එතැනදි තමයි ප්‍රශ්න ඇති වන්නේ. කැසිනෝ එපාය කියන එක නොවෙයි අපි කියන්නේ. ඊට වඩා දුර ප්‍රමාණයක් බලා තමයි මේ ගැන කටයුතු කරන්න අවශ්‍ය වන්නේ. ලංකාවේ අයට කරන්න පුළුවන් දෙයකට සුද්දන් ගෙනෙන්න අවශ්‍ය වන්නේ ඇයි? ජාතිකත්වය ආරක්ෂා කරනවාය කියන ඔබතුමන්ලා, මතට හිත තබනවාය කියන ඔබතුමන්ලා, licence නැතිව licence තිබෙනවාය කියා පෙන්වන්න හදන්නේ මොන කුට ක්‍රියාවකටද කියන එක මා මෙම පාර්ලිමේන්තුවේදී ඔබතුමන්ලාගෙන් කරුණාවෙන් අහනවා.

තවත් කාරණයක් කියන්න තිබෙනවා. පොලීසිය දැන ගන්න අවශ්‍යයි, ඒ ගොල්ලන්ගේ කටයුත්ත මොකක්ද කියන එක. සාමය රකින්න හෝ මිනී මරුවකු අල්ලන්න හෝ දැරණියගල නිමල් පෙරේරා මැරුවාට පස්සේ ඝාතකයන් අල්ලන්න හෝ මිසක් වැරැදි කරන අයට අත් උදව්වක් දෙන්න නොවෙයි පොලීසිය තිබෙන්නේ. පොලීසිය තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ private security company එකක් වාගේ හැසිරෙන්න නොවෙයි. මෙය සමස්ත රටට යම්කිසි සේවයක් කරන්න තිබෙන ආයතනයක්. මේ සම්බන්ධයෙන් නීතිය හරිහැටි ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන එක මා මෙම අවස්ථාවේදී කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.මේ තුළින් රක්ෂා කියක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවාද? කැසිනෝ සඳහා තිබෙන licence එක වෙනත් කෙනකුට පැවරිය හැකි බව කියා තිබෙන්නේ එසේ මෙසේ පුද්ගලයෙක් නොවෙයි, රටේ මුදල් ඇමතිතුමායි. බැරි වෙලාවත් මෙම බලපත්‍රය වෙනත් කෙනෙකුට මාරු කළොත් අපි මොනවා කරන්නද? මේ වාගේ බලයලත් පුද්ගලයින් මෙවැනි ප්‍රකාශ කළේ කුමන බලපත්‍රයක්ද තිබෙන්නේ කියා දැන ගෙනද කියා මා අහනවා. සමහර විට මා වැරැදි වෙන්න පුළුවන්. හොරෙන් බලපත්‍ර issue කරලා තිබෙන්න පුළුවන්. එහෙම තිබෙනවා නම් බලපත්‍රයේ අයිතිකරු කවුද, කවදා සිටද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කොපමණ බදු ලැබුණාද කියා අහනවා. එහෙම නම් අපේ ලංකාවේ අයට බදු රහිතව බලපත්‍ර දෙන කොට සුද්දාටත් බදු රහිතව බලපත්‍ර දෙන්න හදන්නේ ඇයි? මෙන්න මෙය තමයි මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, මා හිතන හැටියට අපි ඔබතුමාව කොටු කරලා තිබෙන්නේ රටේ අභිවෘද්ධියටයි. අපේ රටට මේ වාගේ ආයෝජන ගෙනෙන්න ඕනෑ නැහැ. මේ වාගේ ආයෝජන ගෙනෙනවාට වඩා හොඳයි, මේ වාගේ බදු විරාම දීලා බංග්ලාදේශයෙන් ඇහලුම් කර්මාන්තයක් හෝ වියට්නාමයෙන් මාළු අල්ලන කොම්පැනියක් හෝ ගෙනාවා නම්. මේ රටේ රුපියල අවප්‍රමාණය වෙන්න සුද්දන් ගෙන්වා ගෙන නෛතිකභාවයක් ඇති කරන්න ඕනෑ නැහැ. ඊට වඩා හොඳයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා වාගේ ශ්‍රී ලංකා මහ බැංකුවට දීලා capital market එක open කරන එක. ඊට පසුව ඕනෑ දෙයක් වෙන්න දෙන්න. එතකොට කෙළින්ම රුපියල 137ට නොවෙයි, 150ට, 160ට විතර අවප්‍රමාණය වේවි.

මීට කලින් උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා කථා කළා. තරුණ මන්ත්‍රීවරයෙක් වන එතුමා තමන්ගේ පක්ෂය රැක ගෙන බොහොම ආවේගශීලිව කථා කළා. එම අවස්ථාවේදී එතුමා පෙන්වන්න හැදුවා, මේ ගෙනෙන හැම ශතයක්ම යොදවන්නේ මේ රටේ සංවර්ධනයටයි කියා.

රටේ සංවර්ධනයද, නැත්නම් යම් අයගේ පෞද්ගලික සංවර්ධනයද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

[ගරු රවි කරුණානායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න, කටුනායක අධිවේගී මාර්ගය ගැන. කිලෝමීටර් 24.5ක් වූ කටුනායක මාර්ගය හදන්න කොච්චර වියදමක් යනවාද කියලා 1999 දී ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා මට මතකයි. ඒ අවස්ථාවේදී රුපියල් කෝටි 690ක් - Rs. 6.9 billion - යනවා කියලා එතුමා පිළිතුරු දුන්නා. ඒ ප්‍රශ්නයම මම මීට මාස හයකට ඉස්සෙල්ලා නිර්මල කොතලාවල මහතාගෙන් ඇහුවාම කිව්වා, දැන් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න රුපියල් කෝටි 4,800ක් යනවා කියලා. අට ගුණයක වැඩි වීමක්! මේ රටේ සංවර්ධනයද? මේ ණය ගන්නේ අනෙක් අයගේ සාක්කු පුරවන්න. ඒ නිසා තමයි අද ණය බරතාව තිබෙන්නේ. අද සල්ලි හිර වෙලා තිබෙන්නේ මේ අය නිසායි. අද ඕනෑ තරම් සල්ලි තිබෙන්නේ කැබිනට් ඇමතිවරුන්ගේ, ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ, -සමහර විට ඒ අයටත් මුදල් අමාරුකම් ඇති වෙන්න පුළුවන්- යම් ඥාතිකමක් තිබෙනවා නම් ඒ නිලධාරීන්ගේ අතේ මිසක් සමස්ත ජනතාවගේ අතේ නොවෙයි. සමස්ත ජනතාවගේ අතට එන්නට කිසිසේත්ම ඒ රුපියල පහළට ගලාගෙන යන්නේ නැහැ.

රටේ ජාතික ආර්ථිකයක් හදන්න වගකීමක් තිබෙන, රටේ කඩා වැටුණු ආර්ථිකය හදන්න ඉතාමත් ඕනෑකමින් ඉන්න එක්සත් ජාතික පක්ෂය මේ අවස්ථාවේදී කියන්නේ, කරුණාකරලා ඔබතුමන්ලා රටට අවංකව උත්තර දෙන්න කියලායි. "ඔව්, අපට මේ අයව ගෙන්වන්න ඕනෑ, පැකර් කියන්නේ බොහොම හොඳ මනුස්සයෙක්. ඔහු මේක ගෙනේවි, අරක ගෙනේවි, මේක නැති කරාවි, "L" board දාලා අපටත් උගන්වාවි. ඒ නිසා බලපත්‍ර දෙනවා කියලා" කියන්න. එහෙම මිසක් කරුණාකරලා කොළේ වහලා බොරු කරන්න එපා කියන එක කියනවා.

ඇමතිතුමා රජයේ ඉන්න නිසා සමහර විට මට වඩා මේ ගැන දැනුවත් ඇති. එහෙම නම් මට ඒ තොරතුරු දෙන්න. එතකොට අපි රටට කියන්නම්. අපේ රටේ මහානායක ස්වාමීන් වහන්සේලාට සහ අග රදගුරුතුමාට ආණ්ඩුව පොරොන්දුවක් දීලා තිබෙනවා, දැන් මේ සඳහා licence දෙන්නේ නැහැයි කියලා. එහෙම නම් මොකක්ද කියන්නේ කියන එක කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ රටේ ආර්ථිකයට කොහොමද මේ සූදුව සහ කැසිනෝ උදව් වන්නේ කියන එකත් අපට පෙන්වන්න අවශ්‍යයි. මොකද, නැත්නම් මීට වඩා වැඩියෙන් කළු සල්ලි ගෙනෙන්න අවස්ථා තිබෙනවා. නමුත් ඒවා ගෙනෙන්නේ නැත්තේ ඒවා රටට අහිතකර නිසායි. මේ වාගේ දේවල් කරන්න රටක් ඕනෑ නැහැ. ඕනෑ තැනක මේ වාගේ දේවල් කරන්න පුළුවන්. මේකට නෛතිකභාවයක් දෙන්න යනවාද කියන එක ආයෝජන මණ්ඩලය සහ ආයෝජන භාර ඇමති වශයෙන් කරුණාකර අපට කියලා දෙන්න කියා මතක් කරනවා. සුද්දන්ට දෙන්නේ නැතුව රටේ ආයෝජකයන්ට සහ ශ්‍රී ලාංකිකයන්ට මේ වාගේ වරප්‍රසාද දීලා කටයුතු කරන්න ඔබතුමාට වගකීමක් තිබෙනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Minister of INVESTMENT PROMOTION)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මේ රට, පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට අවස්ථාවක් සලසා දීම පිළිබඳව මගේ හිතවත් රවි කරුණානායක මන්ත්‍රීතුමාට මම මගේ ස්තුතිය පිරිනමනවා.

පළමුවෙන්ම මා පැහැදිලි කිරීමක් කළ යුතුයි. ස්ථාවර නියෝග 23(2) යටතේ 2013.06.04වන දින මෙම ගරු සභාවේදී අනුර කුමාර දිසානායක මහතා විසින් නඟන ලද ප්‍රශ්නයකට මම උත්තර දුන්නා. එහිදී මා ඉතාමත් පැහැදිලිව සඳහන් කළා, අපි කැසිනෝ ව්‍යාපෘතියක් සඳහා බලපත්‍රයක් දීම හෝ එවැනි කටයුත්තක් කිරීම සම්බන්ධයෙන් කිසිම විධියකින් කටයුතු සිදු කරලා නැහැයි කියලා. එදා ඒ දැනුවත් කිරීමට වඩා ඉදිරියට ගිහිල්ලා, මම ඔබතුමාට අද ඉතාමත්ම පැහැදිලිව මේ ගැන සඳහන් කරන්නම්.

ඔබතුමා ජේම්ස් පැකර් දිහා බලලා මේක කැසිනෝ ව්‍යාපාරයක් කියන අදහස මේ රටට දෙන්න හදන්න එපා. ජේම්ස් පැකර්ද, එහෙමත් නැත්නම් ජෝන් කීල්ස්ද, එහෙමත් නැත්නම් අබාන්ස්ද , එහෙමත් නැත්නම් වෙනත් සමාගමක්ද, විදේශීය පුද්ගලයෙක්ද, කළුද, සුදුද කියන එක නොවෙයි මෙතැන ප්‍රශ්නය. අපි අනුමත කරලා තිබෙන්නේ මිශ්‍ර ව්‍යාපෘතියක්. ඒක ඉතාමත්ම පැහැදිලිව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, 'කැටික්' එක හෝටලයක් සඳහා ආයෝජනයක් ඉදිරිපත් කළ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවේ දී සඳහන් කළා, "කැටික් කියන්නේ ආයුධ ගෙන්වන සමාගමක්, ඒකට හෝටල් පිළිබඳ පළපුරුද්දක් නැහැ" යි කියලා. නමුත් මම පෙන්නුවා, කැටික් සමාගම ලෝකයේ හෝටල් පවත්වා ගෙන යන අංශ මොනවාද කියලා. ඒ වාගේ මෙතැනදී ආණ්ඩුව බැලුවේ නැහැ, ඕස්ට්‍රේලියාවේ ඉන්න -[බාධා කිරීමක්] නැහැ. නැහැ. මම කිව්වේ එදා කථා කළ එක. [බාධා කිරීමක්] ඒක වෙනම ප්‍රශ්නයක් නේ. ඒක මූල්‍යමය ප්‍රශ්නයක් නේ.

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

ඒක මූල්‍යමය ප්‍රශ්නයක් විතරක් නොවෙයි. ඒ ක්ෂේත්‍රයේ පොඩි කොටසක තිබුණු -[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)

(The Hon. Lakshman Yapa Abeywardena)

අපට එකඟතාවකට එන්න බැරි වුණු ප්‍රශ්නයක් මත මිසක් ඒ ගොල්ලන්ගේ ඕනෑම සමාගමකට තවත් දේවල් කරන්න, තවත් ආයෝජනයන්ට මුදල් දානවා නම් ඒ පිළිබඳව අවස්ථාවක් ලබා දීම කරන්නට පුළුවන්. එම නිසා මෙතැන පැහැදිලිව ආයෝජන මණ්ඩලය අනුමත කළේ මිශ්‍ර ව්‍යාපෘතියක්. ආයෝජන මණ්ඩලය ජේම්ස් පැකර් ගෙනැල්ලා කැසිනෝ ගහන්න ස්ථානයක් හදා දීලා නැහැ. ආයෝජන මණ්ඩලය මිශ්‍ර ව්‍යාපෘතිය තුළ අප රටට ලාභදායක ඇමෙරිකන් ඩොලර් මිලියන 350ක ආයෝජනයක් ගේනවා. මා හිතවත් මන්ත්‍රීතුමනි, අපේ ඒ ආයෝජන ගිවිසුම තුළ අප සෘජු රැකියා 2600ක් ඇති කිරීමට එකඟතාවකට එනවා. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරන්නට, ඕස්ට්‍රේලියානු හා සිංගප්පූරු ආයෝජකයන් ගෙන්වන්නට පුළුවන් ජාත්‍යන්තර සම්බන්ධීකරණය කරන කාමර 400කින් යුත් හෝටලයක් තමයි මේ මිශ්‍ර ව්‍යාපෘතිය තුළ තිබෙන්නේ. මේක තරු පන්තියේ හෝටලයක්. මේ හෝටලය තුළ retail shopping centre එකක් තිබෙනවා; entertainment facilities තිබෙනවා; fine dining facilities තිබෙනවා; meeting and convention hall එකක් තිබෙනවා. තවත් මිශ්‍ර ව්‍යාපෘති කිහිපයක් මේ ඇතුළට ඇවිත් තිබෙනවා. තව සතියක් යනකොට මේ කලාපය තුළම තව මිශ්‍ර ව්‍යාපෘතියක් අනුමත කරනවා. ඒ ව්‍යාපෘතියත් ඇමෙරිකන් ඩොලර් මිලියන 600කට වැඩියි. මේ ආණ්ඩුව හදන්නේ කැසිනෝ එකකට බලපත්‍රයක් දෙන්න කියන වැරදි මතයක් මේ රටේ ඇති කරන

නිසා තමයි අප මහා නායක හාමුදුරුවන්ට ගිහින් කිව්වේ. කැසිනෝ බලපත්‍රයක් දෙන්න සූදානම් නැහැ. කැසිනෝ බලපත්‍ර ලංකාවේ නැහැ. ඔබතුමා කිව්ව එක හරි. මේ නීතිය කඩලා කිසිම බලපත්‍රයක් නැතිව, 1980 දී කොළඹ නගර සභාව එක පුද්ගලයෙකුට කැසිනෝ ගහන්න දුන්නා. ඊට පස්සේ මේ කිසිම ආණ්ඩුවක් කැසිනෝ ගහන්න බලපත්‍ර දුන්නේ නැහැ. බදු ගෙවන ආයතන betting and gaming කියන එක තුළ තමයි, මේ කැසිනෝ දුවන්නේ. එතකොට මේ ආයතන තිබෙන තැන් බැලුවොත්, පන්සල් ඉස්සරහා තිබුණා. ඉස්කෝල ඉස්සරහා තිබුණා. එතකොට මේ රටේ කවුරුවත් කථා කළේ නැහැ. කවුරුවත් මේවා වහන්න ඕනෑය කියා කථා කළේ නැහැ. කවුරුවත් මේවා මේ තැන්වලින් අයින් කරන්න කථා කළේ නැහැ. ඇමෙරිකන් ඩොලර් මිලියන 350ක මිශ්‍ර ව්‍යාපෘතියක් ගේනකොට මේ ගැන මේ රටේ මතයක් ඇති කරන්න උත්සාහ කළා. මා මේ පාර්ලිමේන්තුවේදී ඉතාමත්ම පැහැදිලිව කියනවා, මේ කිසිම එකකට කැසිනෝ බලපත්‍රයක් නිකුත් කරන්න කිසිම සූදානමක් නැහැයි කියන එක. ඒක ඉතාමත්ම නිවැරදියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, කැසිනෝ එකකුත් තිබෙනවාය කියා. මේ කැසිනෝ එකක් පාවිච්චි කරන්න බලපත්‍රයක් කොහේද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බලපත්‍ර නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලපත්‍ර නැත්නම්, ඒවා ක්‍රියාත්මක කරන්න බැහැ නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු මන්ත්‍රීතුමනි, හෝටලයක් හැදුවාට පස්සේ ඒ ඇතුළේ තිබෙන restaurants කොහොමද? කාමර කොහොමද? ඒ ඇතුළේ තිබෙන dining rooms කොහොමද? ඒවා අපේ ප්‍රමිතියට තිබෙනවා නම්, අපේ සංචාරක ව්‍යාපාරය තුළින් අනුමත කරන දේවල් තිබෙනවා නම් ඊට එහා ඇතුළේ යම් වැරදි දෙයක් සිද්ධ කරනවා නම් ඒකට රටේ වෙනම නීතියක් තිබෙනවා. ඒකට රටේ වෙනම වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරපුවාවේ. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. ඒක ක්‍රියාත්මක කරනවාට අප විරුද්ධ නැහැ. නමුත් මෙතැන අප එහෙම කිසිම දෙයක් ඉදිරිපත් කරලාත් නැහැ; අනුමතියක් දීලාත් නැහැ. මෙම ව්‍යාපෘතිය ආයෝජන මණ්ඩලය මිශ්‍ර ව්‍යාපෘතියක් හැටියට 2008 වර්ෂයට ඉස්සෙල්ලා අනුමත කර තිබෙනවා. ව්‍යාපෘතියක් ගැන මේ පාර්ලිමේන්තුවේ කාටවත් ප්‍රශ්නයක් අහන්න බැහැ.

බදු කීයද කියලා අහන්න බැහැ. නමුත් අද ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මේ බදු ක්‍රමය ගැන අපෙන් අහන්න පුළුවන්; බද්දේ ප්‍රමාණය ගැන අහන්න පුළුවන්; බදු කාල සීමාව ගැන අහන්න පුළුවන්; බදු සහන දෙන්නේ කොයි තරම් කාලයකටද කියලා අහන්න පුළුවන්. 2008 වෙන තුරු මේ පාර්ලිමේන්තුවෙන් ඒ ගැන අහන්න අයිතියක් තිබුණේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත මේ පාර්ලිමේන්තුවේ අනුමත කළාට පස්සේ තමයි ඔබතුමන්ලාට ඒ තොරතුරු දැන ගන්න පුළුවන් වුණේ. මේ රටට ගෙනෙන ආයෝජනයේ ප්‍රමාණය, ඒ ආයෝජනය ගෙනෙන්නේ සුද්දෙක්ද, කල්ලෙක්ද, නැත්නම් වෙනත් කෙනෙක්ද කියලා මේ පාර්ලිමේන්තුව තුළ කථා කරන්න පුළුවන් නිදහසක් උදා වුණේ 2008 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් ඒ පනත් කෙටුම්පත සම්මත කළාට පසුවයි. අපි ඒක මතක තියාගන්න ඕනෑ. ඒ නිසා අද ඕනෑම මන්ත්‍රීවරයකුට ඒ ගැන අහන්න පුළුවන්.

තව සති දෙක තුනකින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගැසට් නිවේදනය නිකුත් කළාට පස්සේ මේ යෝජනා තුළ තිබෙන සියලුම දේවල් මා මේ පාර්ලිමේන්තුවට හෙළි කරනවා. ආයෝජනයට පැමිණි පුද්ගලයා කවුද, ඒ සඳහා දෙන බදු සහන කොපමණද, කාල සීමාව කොපමණද, ඒ කාල සීමාව අවසන් වුණාම අප දෙන සහනය මොකක්ද, ඒ නීතිය ඇතුළේ අපට ඕනෑ එකක් කරන්න, අලුතින් ඇති කරන්න, අලුතින් බද්දක් පනවන්න - impose කරන්න - අපට ඉඩක් තිබෙනවාද, නැද්ද කියන එක මම බය නැතිව මේ පාර්ලිමේන්තුවට හෙළි කරනවා. ඒ නිසා මම කියනවා මේ ගැන වෙන වැරැදි මතයක් ඇති කරන්න සූදානම් වෙන්න එපා කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, අප කියන්නේ බලපත්‍ර නැති-

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බලපත්‍ර නැත.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලපත්‍ර නැත. ඒවා නිකුත් කරන්නේත් නැත. එහෙම නේද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නිකුත් කරන්නේත් නැත.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙනම් කැසිනෝ ක්‍රීඩාව කරන්නත් බැහැ. ඒ පදනම තමයි තිබෙන්නේ, නේද ගරු ඇමතිතුමනි?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒ මොන එකක් කළත්, ඒක අපට අයිති නැත.

ඒක අපේ රාජකාරියක් නොවෙයි. ඔබතුමා එදාට අහන්න, "මේ වාගේ ව්‍යාපාරයක් කරනවා, කවුද ඒක නවත්වන්නේ?" කියලා. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. අපට තිබෙන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අය කරන බදු ගැනීම සහ සංචාරක ව්‍යාපාරය යටතේ තිබෙන අපේ ඉලක්ක සපුරා ගැනීමයි. එය තමයි, 2016 වන විට මිලියන 2.5ක සංචාරකයන් ප්‍රමාණයක් මේ රටට ගෙන්වා ගැනීම. එතකොට ඒ සංචාරකයන්ට ගැළපෙන ආකාරයට තරු පහේ හෝටල්, ඔවුන්ට අවශ්‍ය dining rooms, ඔවුන්ට අවශ්‍ය restaurants, ඔවුන්ට අවශ්‍ය entertainments ආදී සියල්ල තිබෙන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අයෝජනවලට අපත් සම්පූර්ණයෙන් උදව් කරනවා. නමුත් නැවත අපි අහන්නේ කැසිනෝ වාගේ නීත්‍යානුකූල නැති ඒවාට අවසර නැහැ නේද කියලායි. ඒවා මේ රටේ නීත්‍යානුකූල නැත.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැත. මෙහෙම නේ, ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ දැන් කැසිනෝ ක්‍රීඩාව කරනවා නේ. Betting and Gaming කියන එක යටතට කැසිනෝ වැටනවානේ. කැසිනෝ ගහන එක ඔබතුමාට ප්‍රශ්නයක් නම්, ඔබතුමා උසාවි යන්න. ඒ කාරණය මට අයිති දෙයක් නොවෙයි. මට අයිති ආයෝජනය මණ්ඩලයයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැබැයි, එතකොට ඔබතුමන්ලාගේ මුදල් ඇමතිතුමායි, කෙහෙළිය ඇමතිතුමායි කියනවා මේ බලපත්‍රය වෙනස් කරන්න පුළුවන් කියලා. ඒක අසත්‍යයක්ද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක එතුමන්ලාගෙන් අහන්න. මම කියන්නේ මගේ උත්තරය නේ. මම කියන්නේ වග කීමකින්. මම කියන්නේ ඒවා මට අයිති නැහැ කියලායි. මේ කිසි එකකට licence නැහැ. මේකේ තිබෙන්නේ බද්දක් අය කරන එක විතරයි. Betting and Gaming Act එක යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඒ අයගෙන් බද්දක් අය කරනවා. නමුත්, wine store එකක් එක තැනකින් තවත් තැනකට මාරු කරනවා නම්, රටේ නීතියට අනුව මාරු කරන්න පුළුවන්. එය නීති විරෝධීව කරනවා නම් ඒක නවත්වන්න උසාවි යන්න පුළුවන්. මේ betting and gaming ව්‍යාපාර වෙනත් තැනකට මාරු කරනවා, නම් එය නීති විරෝධීයි කියලා ඔබතුමන්ලා ඔප්පු කරනවා නම්-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මාරු කරන්න බැහැ. Licence එකක් නැහැ නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක ඔබතුමන්ලා බලා ගන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. "මාරු කරනවා නම්" කියන්න බැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මාරු කරනවා නම් එය අපට අයිති දෙයක් නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මාරු කරන්න බැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මාරු කරන්න බැරිද, පුළුවන්ද කියන එක මම දන්නෙත් නැහැ.ඒ ක්‍රීඩාව කරනවා නම්, විරුද්ධ පක්ෂය හැටියට ඔබතුමන්ලාට එය ප්‍රශ්නයක් නම්, එය නවත්වන්නත් වුවමනාවක් තිබෙනවා නම් ඔබතුමන්ලා උසාවි ගිහින් ඒක නවත්වන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප නොවෙයි, මහ ජනතාවයි උසාවි යන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එය වැරැදි නම් මහ ජනතාවට උසාවි යන්න පුළුවන්. ඒක වෙනම ක්‍රමයක්.

2013 පළමුවැනි මාසයේ 31වැනි දා සිට 2013 පස්වැනි මාසයේ 31වැනි දා දක්වා ලියා පදිංචිය අලුත් කරන්න කියලා මේ අයට කියා තිබෙනවා.ඔබතුමාට මතක ඇති, මේ පාර්ලිමේන්තුවේදී අපි ඒක කිව්වා. ඒ ලියා පදිංචිය අලුත් නොකළා නම් ඒ අයට මේ betting and gaming කරන්නත් බැහැ. ඒකත් නීතිගත කර තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක් හෝ නීතියක් නැති තැනක කොහොමද බද්දක් පනවන්නේ?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
සාමාන්‍යයෙන් සම්ප්‍රදායක් හැටියට මේ ව්‍යාපාර කරන අය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු ගෙවලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි හිතමු, අයිතිකරු උසාවියට ගෙන යනවා කියලා. විනිශ්චයකරු ඉන්නවා. අයිතිකරු උසාවියට ඉදිරිපත් කරලා පොලීසිය විනිශ්චයකරුට කියනවා, මේ පුද්ගලයා බදු ගෙවලා නැහැ කියලා. එතකොට අයිතිකරු කියයි, 'බද්දක් ගෙවන්න නීතියක් නැහැ" කියලා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔව්, ඒක නේ මම කිව්වේ. ඒක උසාවියෙන් බලාගනියි. ඒක අපට අයිති දෙයක් නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒක තමයි මම කියන්නේ. මේ රටේ නීතියක් නැති දෙයක් බවටයි මෙය පත් කරන්න හදන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම කිව්වා නේ ඒ ප්‍රශ්නය මට අයිති නැහැ කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන ඒ ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ ආයෝජනයට අවසර දෙනකොට, කැසිනෝ ආයතන පවත්වන්න බැහැ කියලාත් කොන්දේසියක් දමනවාද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි "කැසිනෝ" කියලා වචනයක් ඇතුළත් කරලා නැහැ. අපි මේකේ කොහේවත් "කැසිනෝ" කියන වචනය ඇතුළත් කරලා නැහැ නේ. අපි "entertainments" කියන වචනය ඇතුළත් කරලා තිබෙනවා; වෙනත් දේවල් ඇතුළත් කරලා තිබෙනවා. අපට තිබෙන්නේ මිශ්‍ර ව්‍යාපෘතියක් ගෙනාපුවාම ඒකෙන් බදු අය කර ගන්න එකනේ; එයින් ලැබෙන ආදායම ලබා ගන්නා එකනේ. ඒ තුළ නීත්‍යානුකූල හෝ එහෙම නොවන දේවල් කරනවාද නැද්ද කියන එක පිළිබඳව සොයා බලන්න රටේ නීතියක් තිබෙනවා. ඒ නීතියට ඔබතුමන්ලා යන්න. එතකොට ඒ ප්‍රශ්නය බේරුම් කර ගන්න පුළුවන්. ඒ නිසා අපි ඒ ප්‍රශ්නයට පටලවා ගන්න එපා. අපි රටට ආයෝජනයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ ආයෝජනය විධියට අපි ගෙනාවේ කැසිනෝ ව්‍යාපාරයක් නොවෙයි. අපි ගෙනාවේ මිශ්‍ර ව්‍යාපෘතියක්. ඒ මිශ්‍ර ව්‍යාපෘතිය තුළ සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය සියලු දේවල් තිබෙනවා. ඒ නිසා අපට ඒ ගැන ගැටලුවක් නැහැ. එහි නීත්‍යානුකූල නොවන දේවල් තිබෙනවා නම්, ඔබතුමන්ලා නීතියත් එක්ක කටයුතු කරගෙන යන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ වාගේ මිශ්‍ර හෝටලයක බැරි වෙලාවත් මහ පෝය දවසේ අරක්කු විකුණුවොත් ඒකත් -

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒකට රටේ නීතියක් තිබෙනවා නේ. ඒ නීතිය ක්‍රියාත්මක කරයි. දැන් පෝය දවස්වල අරක්කු විකුණන තැන් ඕනෑ තරම් වටලන්නේ. හෝටලයක් හැදුවාට පස්සේ ඒ කාමරවලට කවුද එන්නේ, යන්නේ කියන එක අපට හොයන්න බැහැ නේ. හෝටලය හැදුවාට පස්සේ ඒකට එක්ක යන්නේ කවුද, නීත්‍යානුකූල කෙනෙක් එක්ක එනවාද, එහෙම නැති කෙනෙක් එක්ක එනවාද කියලා ආයෝජන මණ්ඩලයට සොයන්න බැහැ. ඒ සඳහා වෙනත් ආයතන තිබෙනවා. ඉතින් ඒක ඒගොල්ලන් බලා ගනීවි. ඒ නිසා ප්‍රතිපත්තිමය වශයෙන් පැහැදිලිව මා එකක් කියන්න ඕනෑ. ක්‍රම ක්‍රමයෙන් මේ තිබෙන ව්‍යාපාර ඩී.ආර්. විජයවර්ධන මාවතට එන්න වෙනවා. අපි පැහැදිලිවම පසු ගිය අය වැයේ දී කිව්වා, පාසල් ඉදිරිපිට මේ betting and gaming centres පවත්වන්න බැහැ කියලා. දැනට ඒ සඳහා ස්ථානයක් දීලා තිබෙනවා. ඉදිරියේ දී ඒ ප්‍රදේශයේදී පමණක් ඒ කටයුතු කෙරෙන්නට ඕනෑ. ඒක වැරැදිද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නීතියක් නැති තැනක වල් නීතියක් ඇති කරන්න නේ හදන්නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, නීතියක් නැත්තේ නැහැ නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි, එහෙනම් ඔබතුමන්ලා මෙතැනට නීතියක් ගෙනෙන්නේ නැත්තේ? ඔබතුමා කිව්වා, ඉස්කෝල ඉදිරිපිට මේවා පවත්වන්න බැහැ කියලා.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි නීතියක් ගෙනැල්ලා තිබෙනවා නේ. 2013 අලුත් පනත ගෙනාවට පස්සේ, යම් ලියා පදිංචියක් තිබෙනවා නම්, ඒ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අවසරයක් ගන්න ඕනෑ. දැන් අපි ඒ අවසරය දෙන්නේ නැහැ. ඒ කියන්නේ මුදල් අමාත්‍යාංශයෙන් අවසරයක් ගන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවසර ගන්න ඕනෑ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
දැන් අවසර ගන්න ඕනෑ, අලුතෙන් දෙයක් පටන් ගන්නවා නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම කියන්නේ. ජේම්ස් පැකර් කියලා කෙනෙකුට licence එකක් නැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ජේම්ස් පැකර්ට licence එකක් අපි දීලා නැහැ නේ. අපි licence ගැන කථා කරන්නේ නැහැ නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කෙහෙලිය රඹුක්වැල්ල මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා, -

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම දන්නේ නැහැ. ඒක ගැන එතුමාගෙන් අහන්න කෝ. [බාධා කිරීමක්] අපි licence දෙන්නේ නැහැ නේ. [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රටේ තිබෙන මේ නීති පද්ධතිය තුළ බලපත්‍රයක් දීලා නැද්ද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, බලපත්‍ර දීලා නැහැ. බදු ගෙවීමේ සම්ප්‍රදායක් ඇවිල්ලා තිබෙනවා. ඒ බදු ගෙවීම තුළ තමයි මේ සෙල්ලම කරගෙන ගිහිල්ලා තිබෙන්නේ. ඒක වැරැදි නම්, ඔබතුමන්ලාට පුළුවන් ඔය කියන ඒවා උසාවියට කියන්න. දැන් මට අහන්න වෙනවා, හීනෙන් හරි යූඑන්පී ආණ්ඩුවක් ආවොත් මේ ඔක්කොම cancel කරනවාද? Betting centres, gaming centres, wine stores ඔක්කොම cancel කරනවාද කියලා ඔබතුමා නැඟිටලා කියන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එහෙම ආණ්ඩුවක් එන්නේ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම කියන්නේ හීනෙන් හරි ආවොත්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
දවල් හීන.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එහෙම ආණ්ඩුවක් ආවොත් මේ ඔක්කොම cancel කරනවාද? ඊළඟ ප්‍රශ්නය ඒක. එහෙම නම් කියන්න ඕනෑ, අපි ලංකාවේ තිබෙන wine stores ඔක්කොම වහනවා, ඔක්කොම betting and gaming centres වහනවා, අපි මේ එකක්වත් කරගෙන යන්න දෙන්නේ නැහැ කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, අපි කියන විධියටද දෙන්නේ? "මතට නිත" කියන ආණ්ඩුව- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඉතින් ඒක නේ අපි දීලා නැත්තේ. මේ ආණ්ඩුවෙන් දීලා නැහැ නේ. මට කියන්න, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ආවාට පස්සේ බලපත්‍ර දීලා තිබෙන wine stores මොනවද කියලා. Wine store එකකටවත් බලපත්‍ර දීලා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කෝට්ටේ ආසනයේ 40යි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, wine store එකකටවත් දීලා නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වයින් නැත්නම් බියර්වලට දෙයි.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
සංචාරක ව්‍යාපාරය තුළ කාමර 15ට වැඩි හෝටලයක් තිබෙනවා නම්, restaurant එකක් තිබෙනවා නම්, අන්න ඒවාට දීලා තිබෙනවා. එහෙම නැතිව wine stores වලට දීලා නැහැ. හොඳට මතක තියා ගන්න.

අපේ රට තුළ දේශපාලන ස්ථාවරභාවයක් තිබෙනවා; සාමය ස්ථාපිත කරලා තිබෙනවා. අපේ රටට ආයෝජන අවශ්‍යයි. මේ ආයෝජනවලට රටවල්වලට ආරාධනා කළ යුතුයි. ඒ නිසා ඒවා කළුද, සුදුද කියලා අපට ප්‍රශ්නයක් නැහැ. මම ඒකයි කිව්වේ. ලංකාවේ ව්‍යාපාරිකයකු වෙන්න පුළුවන්, අප්‍රිකාවේ ව්‍යාපාරිකයකු වෙන්න පුළුවන්, ජේම්ස් පැකර් වෙන්න පුළුවන්, වෙනත් කෙනකු වෙන්න පුළුවන්, මේ නීති රීතිවලට අනුව ආයෝජනයක් ගෙනෙනවා නම්, ඒ ආයෝජනයට ඉඩ දෙන එක වැරදිද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කිසි වරදක් නැහැ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා මට වැඩිය හොඳට ඒ ගැන දන්නවා. මේ ආයෝජන මේ රටට ඇද ගන්නේ කොහොමද කියලා ඔබතුමා දන්නවා. ඔබතුමා ඒක නොදැන නොවෙයි කථා කරන්නේ.

මේ පසු ගිය වකවානුව තුළ අපට තිබුණු චෝදනා මොනවාද? එකක්, " කෝ, සාමය ඇති වුණාද?" කියන එක. අනෙක, "සාමය ඇති වුණා නම් කොහෙද ආයෝජකයෝ එන්නේ?" කියන එක. ලබන සතියේ අත්සන් කරන එකත් මෙයත් එකතු වුණාම ඩොලර් බිලියනයක ආයෝජනයක් ඇවිල්ලා තිබෙනවා. එතකොට අපේ ඉලක්කය අනුව, මේ අවුරුද්දේ විතරක් ඩොලර් බිලියන දෙකක ආයෝජනයක් ගෙනෙන තැනට අපි කටයුතු කරගෙන යනවා. ජේම්ස් පැකර් එහෙම නැත්නම් ඕස්ට්‍රේලියාවේ තුන්වැනි සල්ලිකාරයා දීපු පණිවුඩය මොකක්ද? යුරෝපයේ රටවල්වලින් අපට ආයෝජන නැහැ කියන කොට ජේම්ස් පැකර් යුරෝපයට කියනවා,"ලංකාව ස්ථාවර දේශපාලන වාතාවරණයක් තිබෙන රටක්. ලංකාව සාමය තිබෙන රටක්. මම ගිහිල්ලා ලංකාවේ ආයෝජනයක් කරනවා" කියලා. ෂැංග්‍රි-ලා ආවාම, "Shangri-La in Sri Lanka" කියන කොට ඔබතුමන්ලාගේ කට්ටිය ඒ ඉඩම් ගැන කියලා කෑ ගැහුවා. ඒ අවස්ථාවේදී වෙනත් මතයක් මේ රටේ යන නිසා අනෙක් ඉඩමට ආපු පුද්ගලයා එක්ක තිබුණු ගිවිසුම අපට අවලංගු කරන්න සිද්ධ වුණා. ඒ ආයෝජනය අපට නැති වුණා. නමුත් ඊළඟට ඒ ඉඩම් අපි දුන්නා. ITC වෙන්න පුළුවන්; ෂැංග්‍රි-ලා එකට අමතරව, Sheraton වෙන්න පුළුවන්. දැන් අබාන්ස් එකෙනුත් එකක් කරනවා. හෙට අනිද්දා තවත් ලංකාවේ ව්‍යාපාරයක් කරනවා. පිටිනුත් තව කිහිපයක් ඇවිල්ලා තිබෙනවා. ඒ සියලු දේවල් ලංකාවේ ස්ථාවරභාවය පිළිබඳ සහතිකයක් දීලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ වර්තමානයේ ඉන්න තුන්වැනි ධනවතා හැටියට ජේම්ස් පැකර් මහත්මයාත් සහතිකයක් දෙනවා, භය නැතිව ලංකාවේ ආයෝජනයක් කරන්න පුළුවන් කියලා. ඒ ආයෝජනයට අපි පාර පෙන්වා තිබෙනවා. ඒක තමයි මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාට ආයෝජන ගෙන්වා ගන්න අවශ්‍ය නම් කොම්පැනි තිබෙනවා නේ. බින්ලාඩන් ඇවිල්ලා මේ රටේ ආයෝජනයක් කළාට හරි යන්නේ නැහැනේ.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බින්ලාඩන් කියන්නේ ත්‍රස්තවාදියෙක්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මේ කැසිනෝ කාරයෙක්.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
යූඑන්පී ආණ්ඩුවක් තිබුණා නම්, ඔබතුමා ජේම්ස් පැකර් ඒම නවත්වනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනිවාර්යයෙන්ම.

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා තමයි එහෙනම් ඉස්සෙල්ලාම ගිහිල්ලා ජේම්ස් පැකර්ට කථා කරන්නේ. මම ඒක හොඳට දන්නවා. මොකද, මේකේ වටිනාකම ඔබතුමා දන්නවා.

මේ සියලුම දේවල්වලින් අපි බලාපොරොත්තු වන්නේ සෘජු විදේශ ආයෝජන. හැම අතින්ම ස්ථාවර රටක් හැටියට ලංකාවට ඉදිරි කාලයේදී මේ ආයෝජන අවශ්‍යයි. මේ ආයෝජන නැතිව මේ රට ගෙන යන්න බැහැ. කාමර හතළිස්දහසක හෝටල් අපට අවශ්‍යයි.ඒ පහසුකම් ටික අවශ්‍යයි. හෙට අනිද්දා Commonwealth Heads of Government Meeting එක තිබෙන කොට ලෝකයේ විවිධ රටවල්වලින් විවිධ රාජ්‍ය නායකයන් එනවා. ඒ අය උතුරට නැහෙනහිරට යනවා. කොළඹ, ගාල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුනේම සම්මන්ත්‍රණ තිබෙනවා. රාජ්‍ය නායකයෝ මේ ස්ථාන තුනටම යනවා. එතකොට මේ රට අවශ්‍ය පහසුකම් දෙන්න පුළුවන් රටක් හැටියට ලෝකයට පේනවා.

මේ රටේ කුමන ස්ථානයකට ගියත් මේ රටේ සාමයක් තිබෙන බව පෙනෙනවා. අපට ඒ පණිවිඩය දෙන්න අවශ්‍යයි. ඒක තමයි, ආයෝජන ප්‍රකෘතිමත් කරන්න තිබෙන එකම දේ. ඒ නිසා මේ දෙස වෙනත් ඇහැකින් බලන්න එපා. බොහෝ දෙනා "මේ ආණ්ඩුවට ආයෝජන නැහැ. මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැහැ, කෝ ආයෝජන" කියමින් ලෝකයට මතයක් දෙන්න හැදුවා. Commonwealth Parliamentary Conference එකේත් එහෙම නේ. මීට මාස පහකට විතර කලින් කිව්වේ මොකක්ද? "කොයි නායකයාද එන්නේ" කියලා ඇහුවා. "තහංචි දමයි" කිව්වා. අර පැත්තෙන් නෝර්වේවලට ගිහිල්ලා කථා කළා. මේ පැත්තෙන් කථා කළා. ඒ ඔක්කොම නවතිව් කියලා හිතුවා. නමුත් එහෙම නැවතුණේ නැහැ. ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න අපට පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉදිරි කාලයේදීත් මේ වාගේ ආයෝජන ගෙන එනවා. හැබැයි, මම ඉතාමත්ම පැහැදිලිව කියනවා මිශ්‍ර ව්‍යාපෘති කියන්නේ ආයෝජනය ඇමෙරිකන් ඩොලර් මිලියන 200කට වැඩි නම්. ජේම්ස් පැකර්ද, වෙනත් කෙනෙක්ද, තවත් කෙනෙක්ද කියන එක නොවෙයි. ඒ ඔක්කොටම දෙන්නේ එකම පහසුකම්. ඒක ජේම්ස් පැකර්ට දෙන විශේෂ පහසුකමක් නොවෙයි. අපි බැලුවේ ඒ ආයෝජනයේ තිබෙන ස්වභාවයයි. ඒ ස්වභාවය අනුව දෙන බදු සහන තමයි මේ දීලා තිබෙන්නේ. එහෙම නැතිව ජේම්ස් පැකර්ට මෙච්චර බදු සහන දෙනවා කියලා කවුරුවත් බොරුවට පත්‍රවලට දමන්න එපා. ජේම්ස් පැකර්ගේ කාමර 400ත්, ෂැංග්‍රි-ලාවල කාමර 400ත්, Hyattවල එකත්, Sheraton එකේ එකත් යන්නේ එකම ව්‍යාපෘතියක් යටතේයි. ඒ නිසා ඒක දේශීය ව්‍යාපාරිකයාට නොදෙනවා කියලා කියන්න එපා. අබාන්ස් කියන්නේ දේශීය ව්‍යාපාරිකයෙක්. ආයෝජනය ඩොලර් මිලියන 200ට වැඩි නම් එයාටත් ඒ පහසුකම ලැබෙනවා. ඒකට අපි බැඳිලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ගෙන එන හැම දෙයක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි ලැහැස්තියි. තවත් අනුමත කළ තුනක් තිබෙනවා. අපි බ්‍රහස්පතින්දා එකක් අත්සන් කරනවා. ඒවාට අපි දෙන පහසුකම් සහ බදු සහන මොනවාද කියන ඒ සියල්ල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ නිසා කිසිම casino licence එකක් දෙන්න කටයුතු කර නැති බව ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ කරමින් මගේ පිළිතුරු කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.58ට, 2013 ජූලි 10 වන බදාදා අ. භා.1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.58 மணிக்கு பாராளுமன்றம், 2013 யூலை 10, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.58 p.m. until 1.00 p.m.on Wednesday, 10th July, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year.
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

218 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 218 - இல. 02
Volume 218 - No. 02

2013 ජූලි 10 වන බදාදා
2013 யூலை 10, புதன்கிழமை
Wednesday, 10th July, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදි

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් :
ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) – [ගරු ජානක බණ්ඩාර මහතා] - පළමුවන වර කියවන ලදි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය :
විගණකාධිපතිවරයාගේ වැටුප

කල්තැබීමේ යෝජනාව :
පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

உள்ளூரதிகார சபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
இர/குருவிட்ட மத்திய மகா வித்தியாலய பழைய மாணவர் கழகம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ஜானக பண்டார] - முதன்முறை மதிப்பிடப்பட்டது

அரசியலமைப்பின் கீழான தீர்மானம்:
கணக்காய்வாளர் தலைமை அதிபதியின் சம்பளம்

ஒத்திவைப்புப் பிரேரணை:
பொதுநலவாய அரச தலைவர்கள் மகாநாடு

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
R/Kuruwita Central College Past Pupils Association (Incorporation) – [The Hon. Janaka Bandara] – Read the First time

DETERMINATION UNDER THE CONSTITUTION:
Salary of Auditor-General

ADJOURNMENT MOTION:
Commonwealth Heads of Government Meeting

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 ජූලි 10 වන බදාදා
2013 யூலை 10, புதன்கிழமை
Wednesday, 10th July, 2013

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා]
මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

(i) 2011 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2012 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

(i) 2012 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2012 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(iii) 2012 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් 2008 සහ 2009 වර්ෂ සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය - පැමිණ නැත.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උලපනේ, මාවෙල පාර, අංක 107 දරන ස්ථානයෙහි පදිංචි කේ.පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.
ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) හබරාදුව, හරුමල්ගොඩ, සෙන්ට්‍රල් පාක්, අංක 35 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඊ. ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගාල්ල, හපුගල, ඉසුරු මාවත, අංක 112/27 'බී' දරන ස්ථානයෙහි පදිංචි එෆ්.වෙලේගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) උණවටුන, මැටරඹ, කොරටුවෙගෙදර පදිංචි එම්.ජී. සනත් චන්දන මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2 - 1895/'11 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව වයඹ පළාත් සභාවෙන් දක්වා තිබෙන කොරතුරු ප්‍රමාණවත් නොවන නිසා මම ගරු මන්ත්‍රීතුමාට වඩා විස්තරාත්මක වාර්තාවක් මාසයක කාලයක් තුළ ලබා දෙන්නට කල් ඉල්ලා සිටිනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පිළිතුරු ලබා දෙන්නේ කොහොමද, ඒ පළාත් සභාව විසුරුවලා නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පළාත් සභා මැතිවරණයට පෙර පිළිතුර ලබා දෙනවා. පළාත් සභා මැතිවරණයට පෙර අනිවාර්යයෙන්ම පිළිතුර ලබා දෙනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජනසෙවණ වැඩසටහන : මධ්‍යම පාන්තිකයන්ට තට්ටු නිවාස
ஜனசெவன நிகழ்ச்சித்திட்டம் : மத்திய வகுப்பினருக்கு மாடிவீடுகள்
JANASEVANA PROGRAMME: FLATS FOR MIDDLE-CLASS PEOPLE

2214/'12

3. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවණ වැඩසටහන යටතේ, මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබාදීම සඳහා තට්ටු නිවාස ඉදිකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබා දීම සඳහා තට්ටු නිවාස ඉදිකිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති එම තට්ටු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තට්ටු නිවාස ඉදිකර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නිර්මාණ, පොරියියල් සේවைகள், வீடமைப்பு, பொதுவசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) "மஹிந்த சிந்தனை- இலங்கையை வெற்றிபெறச் செய்வோம்" கொள்கைத் திட்டத்தின் ஜனசெவன நிகழ்ச்சித்திட்டத்தின் கீழ் மத்திய வகுப்பினருக்கு சலுகை விலையில் பெற்றுக்கொடுப்பதற்காக மாடி வீடுகள் நிர்மாணிக்கப்படுமென வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மத்திய வகுப்பினருக்குச் சலுகை விலையில் பெற்றுக்கொடுப்பதற்காக மாடி வீடுகளை நிர்மாணித்தல் ஆரம்பிக்கப்பட்ட வருடம் யாதென்பதையும்;

(ii) இற்றைவரை நிர்மாணப் பணிகள் பூர்த்தியாக்கப் பட்டுள்ள மேற்படி மாடி வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி மாடி வீடுகள் நிர்மாணிக்கப்பட்டுள்ள பிரதேசங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the Janasevana Programme of "Mahinda Chintana-Dinawamu Sri Lanka" manifesto that blocks of flats would be constructed to be given to middle-class people at concessionary prices?

(b) Will he inform this House -

(i) the year in which the construction of blocks of flats to be given to middle-class people at concessionary prices was commenced;

(ii) the number of such blocks of flats of which construction work has been completed by now;

(iii) the names of the areas in which those blocks of flats have been constructed?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) 2005

ආරම්භ කළ වර්ෂය	නිවාස ව්‍යාපෘතිය	නිවාස සංඛ්‍යාව
2004	ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය	400
2007	117 වත්ත ඇල්විටිගල නිවාස ක්‍රමය	08
2011	117 වත්ත ඇල්විටිගල නිවාස ක්‍රමය අදියර iv	04
2012	මොරටුව ලුනාව මහල් නිවාස ව්‍යාපෘතිය	356
2013	කොළඹ - කවිරත්න පෙදෙස නිවාස ව්‍යාපෘතිය	28

දේශීය ආයෝජකයින් ආරම්භ කළ ව්‍යාපෘති

ආරම්භ කළ වර්ෂය	නිවාස ව්‍යාපෘතිය	නිවාස සංඛ්‍යාව
2013.05.05	යක්කල සියනෑඋයන නිවාස ක්‍රමය	40
2013.06.22	පල්ලේකැලේ නිවාස ක්‍රමය	21

(ii) නිවාස 412යි.

නිවාස ව්‍යාපෘතිය	අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව
ජල්තර රාජ්‍ය සේවක නිවාස ව්‍යාපෘතිය	400
117 වත්ත ඇල්විටිගල නිවාස ක්‍රමය	08
117 වත්ත ඇල්විටිගල නිවාස ක්‍රමය අදියර iv	04
එකතුව	412

(iii)

නිවාස ව්‍යාපෘතිය	තට්ටු නිවාස ඉදි කර ඇති ප්‍රදේශ
ජල්තර රාජ්‍ය සේවක නිවාස ව්‍යාපෘතිය	හෝමාගම
117 වත්ත, ඇල්විටිගල නිවාස ක්‍රමය	නාරාහේන්පිට
මොරටුව, ලුනාව මහල් නිවාස යෝජනා ක්‍රමය	මොරටුව

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. 2005 දී "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්තියෙන් මධ්‍යම පාන්තිකයන්ට නිවාස පහසුකම් ලබා දෙනවාය කියන පොරොන්දුව ඉදිරිපත් කරලා දැනට වර්ෂ අටක් වෙනවා. නමුත් මධ්‍යම පාන්තිකයන් සඳහා නිවාස 412යි මේ අවුරුදු අටටම ඉදි කරලා තිබෙන්නේ. මේ පිළිබඳව ඔබතුමා සැහීමකට පත් වෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ නිවාස 412 ඉදි කිරීම හමාර කරලායි තිබෙන්නේ. තව නිවාස විශාල සංඛ්‍යාවක් ඉදි කරනවා. ඒ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඊට අතිරේකව විවිධ ණය ක්‍රම තුළින් මධ්‍යම පන්තියට නිවාස ඉදි කිරීම සඳහා පහසුකම් සලසා දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇමතිතුමනි ගණන් හදලා බැලුවොත් පෙනෙනවා, වසර අටක් තුළ මධ්‍යම පාන්තිකයන්ට හදලා තිබෙන්නේ නිවාස 412ක් බව. ඒ කියන්නේ අවුරුද්දකට හදලා තිබෙන්නේ නිවාස 51යි. ඔබතුමාටත් මේ ගැන හොඳ අත් දැකීමක් තිබෙනවා. රන්පොකුණගම, මත්තේගොඩ, රද්දොළුගම, ජයවඩනගම, වික්‍රමසිංහපුර ගැන ඔබතුමා දන්නවානේ. නිවාස ලක්ෂය, දස ලක්ෂය, පහළොස් ලක්ෂය යනාදී වැඩසටහන් තුළින් රණසිංහ ප්‍රේමදාස යුගයේ නිවාස හදපු ආකාරයයි, අද මහින්ද චින්තන යුගයේ වසරකට නිවාස 51ක් පමණක් මධ්‍යම පාන්තිකයන්ට හදන රටාව පිළිබඳවයි ඔබතුමා සැහීමකට පත් වෙනවාද? මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයම තමයි ආපසු අහන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දැනට ආරම්භ කරලා තිබෙන නිවාස ව්‍යාපෘතිවල හමාර කර තිබෙන නිවාස ගණන 412ක්. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඊට වඩා විශාල ප්‍රමාණයක් මම සඳහන් කළා, ණය ආදී විවිධ පහසුකම් ලබා දීමෙන් මධ්‍යම පාන්තිකයන්ට නිවාස ඉදි කර ගන්න අවස්ථාව අපි සලසා දීලා තිබෙන බව. ඔබතුමාට තව විස්තර ඕනෑ නම් තවත් ලේඛනයක් මට ඉදිරිපත් කරන්න පුළුවන්. විදේශීය ආයෝජකයන් සමඟ එක්ව හෝමාගම ඉදි කරන Mount Clifford Garden ව්‍යාපෘතියෙහි නිවාස 1,064ක වැඩ ආරම්භ කරලා තිබෙනවා. ගම්පහ, ලංකා ලෝහ ව්‍යාපෘතියෙහි නිවාස 864ක වැඩ ආරම්භ කරලා තිබෙනවා. මේ ආදී වශයෙන් නිවාස දහස් ගණනකින් යුක්ත නිවාස ව්‍යාපෘති දැනට අපි ආරම්භ කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පිළිගනියි, ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා නිවාස විශාල ප්‍රමාණයක් හැදුවත් ඒවා එක දවසෙන් හැදුවේ නැති බව. ඔබතුමන්ලාට මතකද? රුක්මල්ගම, වික්‍රමසිංහපුර -ජයවඩනගම- ඔය සියල්ල හැදුවේ එක දවසෙන් නොවෙයි. ඒ නිවාස හදන්න අවුරුදු ගණනාවක් ගත වුණා.

ජනසෙවණ වැඩසටහන යටතේ ඉදි කෙරෙන නිවාස ව්‍යාපෘතිවල වැඩ කටයුතු දැන් ආරම්භ කරලා තිබෙනවා. දැනට පවතින සැලැස්ම යටතේ කොළඹ නගරයේ නිවාස 65,000ක් හැදෙනවා. [බාධා කිරීමක්] එතුමාගේ කාලයේ හදපු වාර්තාව ක්‍රියාත්මක කරන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ වැඩසටහනෙන්. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒවා ක්‍රියාත්මක කළේ නැහැ.

කොළඹ නිවාස වතු 1475ක් තිබෙනවා. ඒ නිවාස වතු වෙනුවෙන් තට්ටු නිවාස කොළඹ නගරයේ ඉදි වෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරලායි තිබෙන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන් වන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, පළමු වන ප්‍රශ්නය තමයි මම ඇහුවේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඔක්කොම එක වතාවට හදන්න බැහැ කියලා. මම ඒක පිළිගන්නවා. නමුත් මම ඔබතුමාගෙන් ඇහුවේ වසර 8ක් ගැන. 2005 සිට 2013 දක්වා අවුරුදු 8ක්. ඔබතුමා කිව්වා, නිවාස එක්දහස් ගණනක් පෞද්ගලික ආයෝජකයන් සමඟ හදනවා කියලා. ඒ එක ගෙයක් විකිණෙන්නේ කීයටද? ලක්ෂ 100ට!

ගරු ඇමතිතුමනි, 2012 ඔක්තෝබර් 7 වන දා "සන්ඩේ ඔබ්සවර්" පත්තරේ - "ලේක් හවුස්" පත්තරේ- තිබෙනවා, කෙහෙල් කොළයක හැඩයට මගී ආවරණයක් හදන්නට නිවාස සංවර්ධන අධිකාරියෙන් රුපියල් ලක්ෂ 25ක් වෙන් කර තිබෙනවා කියලා. ඔබතුමා පාර්ලිමේන්තුවට යන එන විට ඒක දැකලා ඇති. ඇතුල්කෝට්ටේ හන්දියේ කෙහෙල් කොළයේ හැඩයට රුපියල් ලක්ෂ 25ක් වැය කරලා මගී ආවරණයක් හදලා තිබෙනවා. මේ මුදල් පොදු ජනතාවගේ හිසට සෙවණක් ලබා දෙන්නට, ගතට නිවනක් ලබා දෙන්නට, ඒ වාගේ ඵලදායී කාරණයකට ඇයි යොමු නොකරන්නේ? ප්‍රශ්නය තිබෙන්නේ ඒ මගී ආවරණයේ ඉන්න බැහැ, තෙමෙනවා. මේ බොරුවක් නොවෙයි, ඇත්ත කියන්නේ. මගේ ප්‍රශ්නය මේකයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අදාළ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ ප්‍රශ්නය මේකයි. ඇමතිතුමා මම ප්‍රශ්නය අහලා ඉවර නැහැ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා ප්‍රශ්න ඇසීමේදී පාර්ලිමේන්තුවේ කාලය කා දමන්නේ නැතුව ප්‍රශ්න අසන්න. කථා පවත්වන වෙලාවට කථා පවත්වන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා හෘදය සාක්ෂියට එකඟව උත්තරයක් දෙන්න. කෙහෙල් කොළේ හැඩයට මඟී ආවරණයක් ඉදි කිරීම සඳහා රුපියල් ලක්ෂ 25ක් වැය කරලා, මධ්‍යම පාන්තිකයින්ට අවුරුදු 8ක් මුළුල්ලේ වසරකට නිවාස 50ක් ඉදි කරපු වාර්තාව ගිනස් වාර්තාවක් වෙන්න පුළුවන් නේද? ලජ්ජා නැද්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කියන්නේ "මඟී ආවරණ නැති රටක්" ගැනයි. ඒ කියන්නේ ඒකටත් ඔබතුමා විරුද්ධයි. මඟී ආවරණ නැති රටක මඟියාට ඇති වන සෙතක් නැත. ඒ නිසා මඟී ආවරණත් ඕනෑ, නිවාසත් ඕනෑ, වාහන නවත්වන්න ඉඩකඩත් ඕනෑ. ඒවා සැලසුම් කරලා කරන්නේ. ඔබතුමා විවේචනාත්මකව කථා කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒවා තෙමෙන්නේ නැහැ, ඔබතුමා ගිහිල්ලා හිටගෙන ඉඳලා බලන්නකෝ. චිත්‍රපටයක නම් මම ඔබතුමා කියන දේ පිළිගන්නවා. මේක චිත්‍රපටයක් නොවෙයිනේ. එතැනට ගිහිල්ලා හිටගෙන ඉඳලා බලන්න. සූර්යාලෝකය නිසා මඟීන්ට මහ දවල් එතැන හිටගෙන ඉන්න බැහැ, මඟී ආවරණයක් නැත්නම්. ඔබතුමන්ලා කියන්නේ හැමදාම වහිනවා කියලාද? නැහැ. මේ රටේ වැඩි වෙලාවක් තිබෙන්නේ සූර්යාලෝකය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට අව්ව වෙලාවට එතැනට යන්නේ නැද්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අව්වටත් යනවා. වරුසාවෙන් නොතෙමී ඉන්නත් ආවරණය තිබෙනවා. ඔබතුමන්ලා කියවන්නේ කාටූන්. ඔබතුමන්ලා එතැනට ගිහිල්ලා හිටගෙන ඉඳලා බලන්න තෙමෙනවාද කියලා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4, ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න 4ක් ඇහුවා.

තංගල්ල නිවාඩු නිකේතනයකදී විදේශිකයෙකු ඝාතනය කිරීම : පියවර
தங்காலை விடுமுறை விடுதியில் வெளிநாட்டவர் படுகொலை: நடவடிக்கை
KILLING OF FOREIGNER AT HOLIDAY RESORT IN TANGALLE : ACTION TAKEN

2270/'12

4. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2011 වර්ෂයේ නත්තල් දින හෝ ඊට ආසන්න දිනක තංගල්ල ප්‍රදේශයේ නිවාඩු නිකේතනයක විදේශිකයෙකු ඝාතනය කිරීමක් සිදු වූයේද;

(ii) එසේ නම්, ඝාතනයට ලක්වූ පුද්ගලයාගේ නම සහ රට කවරේද;

(iii) එම ඝාතනයේ සැකකරුවන් හඳුනා ගෙන තිබේද;

(iv) ඔවුන් දරන තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ඝාතනය සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ඝාතනය හේතුවෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් මුහුණ දීමට සිදුවී ඇති තත්ත්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිසම අමාත්‍යාංශයේ ඇමතිතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සිදු වී ඇත.

(ii) බ්‍රිතාන්‍ය ජාතික කුරාම් ෂාමන් ෂේම්. වයස අවුරුදු 32යි.

(iii) හඳුනා ගෙන ඇත.

(iv) සැකකරුවන්ගේ නම්.

1. ඕඩ ආරච්චිගේ ලහිරු කැලුම්. "කැලුම්", නෝනගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

ගරු මන්ත්‍රීතුමනි, ලැයිස්තුවක් තිබෙනවා. එය කියවන්න ඕනෑද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, කී දෙනෙකු ඉන්නවාද? 25ක්, 30ක් නැහැනේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, ඒ තරම් නැහැ. කියවන්නද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් කියවන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

2. උඩුවන්ගේ සමන් දේශප්‍රිය. අංක 136/4, හිරිපිටිය, පන්නිපිටිය.

රැකියාව - නැත.

3. සම්පත් චන්ද්‍ර පුෂ්ප විදානපතිරණ. අශෝක සෙවන, විකාරන්දෙනිය.

රැකියාව - තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති.

4. වීරප්පුලිගේ ප්‍රනීත් චතුරංග. නන්ද සෙවන, නලගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

5. මොහොට්ටිගේ සරත්. අංක 201/ඒ, නෝනගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

6. එදිරිසූරිය පටබැඳිගේ නදීශාන්. නො. 03, නගර නිවාස, ඉඳිපොකුණගොඩ, තංගල්ල.

රැකියාව - නැත.

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) whether killing of a foreigner occurred in a holiday resort in Tangalle area on or around Christmas day of 2011;

(ii) if so, the name and the country of the person who was killed;

(iii) whether suspects of the aforesaid killing have been identified; and

(iv) the positions held by them?

(b) Will he inform this House -

(i) the action taken with regard to the aforesaid killing by now; and

(ii) the repercussions that Sri Lanka has had to face internationally as a result of the aforesaid killing?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සිදු වී ඇත.

(ii) බ්‍රිතාන්‍ය ජාතික කුරාම් ෂාමන් ෂේම්. වයස අවුරුදු 32යි.

(iii) හඳුනා ගෙන ඇත.

(iv) සැකකරුවන්ගේ නම්.

1. ඕඩ ආරච්චිගේ ලහිරු කැලුම්. "කැලුම්", නෝනගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

ගරු මන්ත්‍රීතුමනි, ලැයිස්තුවක් තිබෙනවා. එය කියවන්න ඕනෑද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, කී දෙනෙකු ඉන්නවාද? 25ක්, 30ක් නැහැනේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, ඒ තරම් නැහැ. කියවන්නද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් කියවන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

2. උඩුවන්ගේ සමන් දේශප්‍රිය. අංක 136/4, හිරිපිටිය, පන්නිපිටිය.

රැකියාව - නැත.

3. සම්පත් චන්ද්‍ර පුෂ්ප විදානපතිරණ. අශෝක සෙවන, විකාරන්දෙනිය.

රැකියාව - තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති.

4. වීරප්පුලිගේ ප්‍රනීත් චතුරංග. නන්ද සෙවන, නලගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

5. මොහොට්ටිගේ සරත්. අංක 201/ඒ, නෝනගම, විකාරන්දෙනිය.

රැකියාව - නැත.

6. එදිරිසූරිය පටබැඳිගේ නදීශාන්. නො. 03, නගර නිවාස, ඉඳිපොකුණගොඩ, තංගල්ල.

රැකියාව - නැත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

7. හේවාතොන්ඩිලගේ නුවන් චින්තක. අංක 96/සී, ඉඳිපොකුණගොඩ, තංගල්ල.

රැකියාව - නැත.

8. සරණච්චි පටබැඳිගේ ජානුක චතුරංග. නො. 36, මැදකැටිය පාර, තංගල්ල.

රැකියාව - නැත.

(ආ) (i) ඉහත සිද්ධියේ සැකකරුවන්ට විරුද්ධව තංගල්ල ම/ඵ නඩු අංක බී.ආර් 696/2011 යටතේ මූලික විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර ඒ අනුව නීතිපති උපදෙස් සඳහා නඩුව 2013.06.19 වන දින ගරු අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී ගරු නීතිපතිතුමාගේ උපදෙස් පරිදි මෙම නඩුව මින් ඉදිරියට තංගල්ල අධිකරණයේ නොකැඳවන ලෙසත් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 4507/1/2013 යටතේ 2013.06.28 වන දින කැඳවන ලෙසටත් උපදෙස් ලබා දෙන ලදී.

එදින නඩුව නැවත කැඳවූ අතර නැවත 2013.11.01වන දින කැඳවීමට උපදෙස් ලබා දෙන ලදී.

(ii) මෙම ආරවුල පෞද්ගලික හේතූන් මත ඇති වූවක් බැවින් ජාත්‍යන්තර වශයෙන් මෙතෙක් කිසිදු බලපෑමක් එල්ල වී නොමැත.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ඝාතන සිද්ධිය සම්බන්ධ නඩුව තංගල්ලේ ඉඳලා කොළඹට ගෙනාවේ ඇයි කියලා මම අහන්න කැමැතියි. මේ නඩුව තංගල්ලෙන් අහන්න තිබුණා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේක 2011දී වුණු සිද්ධියක් බව. මේ සිද්ධිය ලංකාවේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් විශාල බලපෑමක් කරනවා. අද වෙන කොට බ්‍රිතාන්‍යයේ තිබෙන පුවත් පත්වල විශාල වශයෙන් මෙය ප්‍රසිද්ධියට පත් වෙලා තිබෙනවා. මේ සිද්ධියට මුහුණ දුන් පුද්ගලයාගේ සහෝදරයාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ සිද්ධිය සම්බන්ධව අපත් එක්ක සාකච්ඡා කළා. මම අහන්න කැමැතියි, මේ නඩුව තංගල්ලේ ඉඳලා කොළඹට ගෙනාවේ ඇයි කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නීතිපතිතුමා විසින් ගෙන ඇති තීරණයක් පිළිබඳව විස්තර ඉදිරිපත් කිරීමට මම කටයුතු කරන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම කැමැතියි ඒක දැන ගන්න. මේ පාර්ලිමේන්තුවේදී මම මන්ත්‍රීවරයෙකු විධියට ප්‍රශ්නයක් ඇහුවාම ඒකට-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම නීතිඥවරයෙක් නොවෙයි. ඔබතුමා ගෞරවනීය නීතිඥවරයෙක්. නීති වෘත්තියට මම ගරු කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. ගරු ඇමතිතුමා අවසාන තීන්දුව දුන්නාට පස්සේ, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා මේක පෞද්ගලික කාරණයක් කියලා කිව්වාට ඇත්ත වශයෙන්ම මේක විශාල ප්‍රශ්නයක්. ඔවුන් ඒ සිද්ධිය හා සම්බන්ධ සැකකරුවන් බවට පත් වෙලා තිබෙනවා. දේශපාලන අධිකාරියේ පුද්ගලයෙකුත් මේ අතර සිටිනවා. අපි හිතමු කෝ, ඔවුන් වරදකරුවන් නොවෙයි කියලා. නමුත් සැකකරුවන් බවට පත් වෙලා තිබෙනවා. මේ සිද්ධිය ජාත්‍යන්තර වශයෙන් අද දැවැන්ත අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා.

ලංකාවට එන්න හදන විදේශිකයන්ට ඔවුන් නිකුත් කරලා තිබෙන නිවේදනය තමයි ලංකාව අනතුරුදායක රටක් කියන එක. ලංකාවට එන්න හදන අයට ඔවුන් එවැනි නිවේදනයක් කරලා තිබෙනවා. බ්‍රිතාන්‍යයෙන් ලංකාවට එන්න හදන අයට මේකෙන් බලපෑමක් වෙනවා. අපේ රටට පසු ගිය කාල වකවානුවේ විදේශිකයන් වශයෙන් අතිබහුතරයක් ආවේ බ්‍රිතාන්‍ය ජාතිකයනුයි. ඔවුන්ට මේක බලපානවා. ඒ නිසා මා කියන්නේ ජාත්‍යන්තර වශයෙන් අපට යම්කිසි විධියක කැලැලක් ඇති වෙලා තිබෙන මේ අවස්ථාවේ එය නිවැරැදි කර ගැනීම සඳහා ඉතාම ඉක්මනින් විභාග වන නඩුවක් විධියට මේ නඩුව අහලා අවසන් කරන්න කියලායි. අපි දුටුවා බොහොම පැහැදිලිව පත්තරවල පළ කරලා තිබෙනවා, ලංකාවේදී විදේශිකයන්ට එල්ල වන පහර දීම්, ඒ පහර දීම් සම්බන්ධයෙන් ඇති වන නීතිමය දුර්වලතා, නීතියේ ප්‍රමාද වීම් ආදිය ගැන. මේවා පිළිබඳව විශාල ප්‍රශ්න ගණනාවක් මා ඊයේ පෙරේදා කියවපු සහරා කිහිපයකම පළ වෙලා තිබුණා. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට තිබෙනවා විශාල බියක්. ඒ බිය නැති කිරීමේ ක්‍රමවේදය හදන එක ඔබතුමන්ලා අතේ තිබෙන කාර්යයක්. ඒ නිසා මා අහන්න කැමැතියි මේ සම්බන්ධව ආණ්ඩුව විධියට ගන්නා පියවර මොකක්ද කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය අධිකරණයේ පවතින කාරණයක්. නමුත් ආණ්ඩුව ඒ සම්බන්ධව ක්‍රියා කරලාත් තිබෙනවා. ඔබතුමන්ලා අර්ථ නිරූපණය කරන්න යන්නේ ආණ්ඩුව ඒ සම්බන්ධව ක්‍රියා කළේ නැහැ කියලායි. ආණ්ඩුව තරාතිරමක් නැතිව සැකකරුවන් අත් අඩංගුවට ගෙන අධිකරණයට පමුණුවා ඒ පිළිබඳ නීතිමය පියවර අරගෙන යනවා; නීතිමය පියවර අරගෙනත් තිබෙනවා. ඉක්මන් කරලා තීන්දුවක් දෙන්න නඩුව අහන්න කියලා දින නියම කරන්නේ ආණ්ඩුව නොවෙයි, අධිකරණයයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අරලියගහ මන්දිරයයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රවි කරුණානායක මන්ත්‍රීතුමා නොයෙක් ඒවා කියනවා. [බාධා කිරීමක්] එතුමාට අරලියගහ මන්දිරය එක්ක විශාල අමනාපයක් තිබෙනවා. වෙනදා නිතරම එතැන ඉඳලා දැන් එතැනට යන්න බැරි වීම හරි ප්‍රශ්නයක් වෙලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මෙය ලඝු නොවන නඩු විභාගයක් විධියට පවත්වා ගෙන ගිහින් ඉක්මනින් අවසන් කරන්න පුළුවන්. එය අධිකරණය විසින් තීරණය කරන කාරණයක් නොවෙයි. මා ඔබතුමාට කියන්නේ, ආණ්ඩුව විධියටයි. නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ දැන් ඔබතුමන්ලා යටතේයි. අතිගරු ජනාධිපතිතුමා යටතේ තමයි නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ. ඉතින් එතුමාට කියන්න පුළුවන්, මේ සම්බන්ධයෙන් ඉක්මන් කරලා කටයුතු කරන්න කියලා. මේ රටට යම්කිසි අපකීර්තියක් ඇති වෙලා තිබෙනවා නම්, කැලලක් ඇති වී තිබෙනවා නම්, නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැයි කියා ඔවුන් චෝදනා කරනවා නම් එයට අවශ්‍ය කරන විසඳුම් ලබා දෙන්න පැහැදිලි වුවමනාවක් තිබෙනවා නම් එසේ කරන්න පුළුවන්. ඒකයි මම මේ ප්‍රශ්නය ඇහුවේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, නීතිය ක්‍රියාත්මක වනවා. තරාතිරම බලන්නේ නැතිව නීතිය ක්‍රියාත්මක වනවා. මෙය ඉක්මන් කර ගැනීම සඳහා නීතිපතිතුමාට යළිත් යොමු කරන්න කියා ඔබතුමා කියනවා නම් අපි ඒ ආකාරයෙන් දැනුම් දීමක් කරන්නම්.

ජාත්‍යන්තර ක්‍රීඩා තරග : විකාශන අයිතිය
சர்வதேச விளையாட்டுப் போட்டிகள் : ஒளிபரப்பும் உரிமை
INTERNATIONAL SPORTS COMPETITIONS: TELECASTING RIGHTS

2537/'12

5. ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) (i) ජාත්‍යන්තර ක්‍රීඩා තරග විකාශය කිරීමේ අයිතිය රාජ්‍ය රූපවාහිනී නාලිකාවලට අමතරව පෞද්ගලික නාලිකාවලට ලබා දීමේ පදනම කවරේද;

(ii) පසු ගිය දා පැවති කොමන්වෙල්ත් බැන්ක් (Commonwealth Bank) කුසලාන ක්‍රිකට් තරගාවලිය ලංකාවේ විකාශය කළ රූපවාහිනී නාලිකාව කවරේද;

(iii) එම නාලිකාව ඒ සඳහා තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) ජාත්‍යන්තර ක්‍රීඩා තරග විකාශය කිරීමට සියලුම රූපවාහිනී නාලිකාවලට අවසර ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சர்வதேச விளையாட்டுப் போட்டிகளை ஒளி பரப்பும் உரிமையினை அரச தொலைக்காட்சி அலைவரிசைகளுக்கு மேலதிகமாக தனியார் தொலைக்காட்சி அலைவரிசைகளுக்கு வழங்குவதன் அடிப்படை யாது;

(ii) கடந்த தினம் இடம்பெற்ற கொமன் வெல்த் பாங்க் (Common Wealth Bank) கிண்ணத்துக்கான கிரிக்கெட் போட்டியை இலங்கையில் ஒளி பரப்பிய தொலைக்காட்சி அலைவரிசை யாது;

(iii) மேற்படி அலைவரிசையை அதற்கெனத் தெரிவு செய்ததன் அடிப்படை யாது;

(iv) சர்வதேச விளையாட்டுப் போட்டிகளை ஒளிபரப்புவதற்கு அனைத்து தொலைக்காட்சி அலைவரிசைகளுக்கும் அனுமதி வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he inform this House -

(i) the basis on which awarding the telecasting rights of international sports competitions to private channels in addition to the government television channels is done;

(ii) the television channel that telecast Commonwealth Bank Championship Cricket Tournament which was held recently;

(iii) the basis on which that channel was selected for that purpose; and

(iv) whether action will be taken to permit all the television channels to telecast international sports competitions?

(b) If not, why?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් "ශ්‍රී ලංකාවේ සහ විදේශයක පැවැත්වෙන ජාත්‍යන්තර ක්‍රිකට් තරගවල රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන අයිතීන්" යන මැයෙන් ඉදිරිපත් කර ඇති අංක 05/12/2011 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සහ අංක 11/1377/537/014 අමාත්‍ය මණ්ඩල තීරණය පරිදිය.

(ii) එය ශ්‍රී ලංකාවේ විකාශනය කරන ලද්දේ කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක් (CSN) ආයතනයයි.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමාට කෙටියෙන් පැහැදිලි කරනවා නම්, මුලින් රාජ්‍ය නාලිකාවලට තමයි මෙය ලබා දීලා තිබුණේ. ඊට පස්සේ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව ක්‍රීඩා නාලිකාවලටත් ලබා දෙන්න අවස්ථාවක් දුන්නා.

ඒ අනුව මේ තරගාවලි සඳහා bid කරන්න අවස්ථාවක් රාජ්‍ය නාලිකාවලට අමතරව ක්‍රීඩා නාලිකාවලටත් අපි ලබා දීලා තිබෙනවා. ඒ අනුව ඔබතුමා කියන මේ තරගාවලිය කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක් ආයතනයට තමයි bid කිරීමේ වැඩිම ලංසුව අනුව ලැබී තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
සියලුම නාලිකාවලට ලබා දුන්නාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, ගරු මන්ත්‍රීතුමා අපි එහෙම ලබා දුන්නේ නැහැ. අපි ක්‍රීඩා නාලිකාවලට සහ ජාතික නාලිකාවලට පමණයි ලබා දුන්නේ. දැනට සියලුම නාලිකාවලට ලබා දෙන්න තීරණයක් අරගෙන නැහැ.

(iii) අංක 05/12/2011 හා 2011.06.27 දින අමාත්‍ය මණ්ඩල සංදේශ තීරණය අනුව ක්‍රිකට් ආයතනය සමඟ එළඹුණු සාකච්ඡා සම්මුති අනුව රාජ්‍ය මාධ්‍ය ආයතන වෙත පිරිනැමීම සහ ක්‍රීඩාවන්ට පමණක් කැප වුණු ඕනෑම පෞද්ගලික රූපවාහිනී හෝ ගුවන්විදුලි නාලිකාවක් විකාශන අයිතිය පිරිනැමීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

(iv) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති අංක 11/1377/537/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශේෂයෙන්ම ක්‍රීඩාවට කැපවුණු ඕනෑම රූපවාහිනී හෝ ගුවන් විදුලි නාලිකාවකට සාකච්ඡා සම්මුති නියමයන් මත එවන් විකාශන අයිතීන් පිරිනැමීමේ සුදුසුකම් ලබනු ඇත.

(ආ) පැන නොනඟී.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. බොහොම ධෛර්ය සම්පන්නව පිළිතුරු ලබා දුන්නාට. මොකද, ටිකක් ධෛර්යය ඕනෑ, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. එම ක්‍රීඩා තරග මාලාවෙන් පසුව ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම සහභාගි වන, සහභාගි නොවන විවිධ ක්‍රීඩා තරග මාලාවන් ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පැවැත් වූවා. ඒ සියලු තරග මාලාවන් -මා දන්නා පරිදි මෑත කාලයේ විකාශනය වුණු සියලුම තරග- එම නාලිකාවට තමයි ලබා දී තිබෙන්නේ. එතකොට එම තරග මාලාවන් CSN නාලිකාවට පමණක්ම ලබා දීම සඳහා තෝරා ගන්නා ලද පදනම කුමක්ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, අපි තරගාවලියක විකාශන අයිතීන් දෙන්නේ යම් යම් කාල සීමාවලට. ඒ කියන්නේ අවුරුදු තුනකට වාගේ, ඒ ආකාරයෙන් තමයි දෙන්නේ. නමුත් මෑත කාලයේදී ප්‍රධාන පුවත්පත්වල සහ websites වල පළ කරලා කැඳවූවා. ඒ අනුව ඉල්ලුම් කරලා තිබුණු ආයතනවලින් වැඩිම ලංසුව ඇවිල්ලා තිබුණේ CSN නාලිකාවෙන්. ඒ අනුව තමයි ඉදිරි වසර තුන සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දී තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
කවදා වෙන තෙක්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මට හරියටම මතක නැහැ. මොකද, ඔබතුමා ඒ ගැන ප්‍රශ්නය අහලා තිබුණේ නැහැ. මම දන්නා තරමට ගරු මන්ත්‍රීතුමා, අවුරුදු දෙකකට හෝ තුනකට ලබා දීලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඉදිරියට තව තිබෙනවා?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
තව ඉදිරියට තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඊළඟට මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඔබතුමා දැන් කිව්ව, මේ කැබිනට් පත්‍රිකාව ගැන. ඒකත් ඉතින් ඔබතුමාම හැදුව එක නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මම නොවෙයි. මම එන්න කලින් -

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ජනමාධ්‍ය ඇමතිතුමා නේ? එහෙන්ද හැදුවේ ඒක?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, අපේ අමාත්‍යාංශයෙන් කියලා හිතමුකෝ. මොකක්ද ප්‍රශ්නය?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ කැබිනට් පත්‍රිකාව හදනකොට අපි ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ කාටද? රාජ්‍ය නාලිකාවල යන ප්‍රවෘත්ති, හරය පිළිබඳව අපට විවේචන තිබෙනවා වෙන්නට පුළුවන්. එය මහා භාණ්ඩාගාරයේ මුදල් අර ගනිමින් නඩත්තු වන රාජ්‍ය ආයතනයක්. විශේෂයෙන් ශ්‍රී ලංකා කණ්ඩායම සහභාගි වන ක්‍රිකට් තරගාවලියක් විකාශනය කරනවා කියන්නේ විශාල ලාභ ප්‍රමාණයක් අපේ රටේ රාජ්‍ය රූපවාහිනී නාලිකාවන්ට ලබා දෙන අවස්ථාවක්. අපේ රටේ විවිධ දේශපාලන වැඩසටහන් නොවුණත් වෙනත් වැඩසටහන්, හර පද්ධතීන් ගෙන යාමේදී විශේෂයෙන් ජාතික රූපවාහිනී නාලිකාව විශාල කාර්ය භාරයක් ඉටු කරනවා. ඒ කාර්ය භාරය සඳහා කරන පිරිවැය මෙවැනි ක්‍රියා මාර්ග හරහා ආවරණය කර ගත යුතු විධියට අප අවස්ථාව ලබා දිය යුතු වෙනවා. නමුත් දැන් සිදු වී තිබෙන දෙය මොකක්ද? කාලාන්තරයක් තිස්සේ ජාතික රූපවාහිනී නාලිකාව විශේෂයෙන්ම "Channel Eye" හරහා මේ ක්‍රිකට් තරගාවලි විකාශනය කළාට, "CSN" නාලිකාව දැමූ දවසේ සිට කැබිනට් පත්‍රිකාවත් වෙනස් වෙනවා ක්‍රීඩා තරග දෙන්නේ ක්‍රීඩා නාලිකාවලට කියා. ඊට පස්සේ ජාතික රූපවාහිනිය ඒකෙන් කැපෙනවා. නැවත "CSN" නාලිකාව තෝරා ගන්නවා. මේකයි ප්‍රශ්නය තිබෙන්නේ. ඔබතුමාට කියන්නට පුළුවන් වැඩි ගණන් අරහෙ මෙහෙ කියා. මේ ක්‍රියාවලිය තුළ බැලූ බැල්මට විශාල වුවමනාවක් ගැබ්ව තිබෙන බව පෙනෙනවා. තෝරා ගන්නා ලද යම් නාලිකාවකට පමණක්, විශේෂයෙන් "CSN" නාලිකාවට පමණක් මෙම ක්‍රීඩා තරග විකාශනය කිරීමේ අයිතිය ලබා දීමේ අරමුණක් මේ තුළ සැඟ වී තිබුණාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මම දන්නවා ඔබතුමා එන්නේ පොල් පැළය කන්නය කියා. ඔබතුමා බලාපොරොත්තු වන්නේ මොකටද කියන එක අපට හොඳට තේරෙනවා. ගරු මන්ත්‍රීතුමා, ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට පෞද්ගලිකව මා දරන මතය මේකයි. මා ඉන්නේ මේ තරගාවලි විකාශනය කිරීම ක්‍රීඩා නාලිකාවකට දෙන්න ඕනෑය කියන ස්ථාවරයේයි.

මම ඔබතුමාට එහෙම- [බාධා කිරීමක්] මට තත්පරයක් දෙන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
දැනට ක්‍රීඩා නාලිකා කීයක් තිබෙනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
දැනට ක්‍රීඩා නාලිකා තුනක් තිබෙනවා. "සිරස" ක්‍රීඩා නාලිකාව තිබෙනවා, "CSN" නාලිකාව තිබෙනවා, අපේ "Channel Eye" තිබෙනවා. මම ඉන්නේ ක්‍රීඩා තරගාවලි විකාශය කිරීම ක්‍රීඩා නාලිකාවලට දෙන්න ඕනෑ කියන ස්ථාවරයේයි. ඒකට හේතුව මේකයි, ගරු මන්ත්‍රීතුමනි. අපි ජාතික රූපවාහිනියට හෝ ස්වාධීන රූපවාහිනියට හෝ ස්වර්ණවාහිනියට හෝ "දෙරණට" දුන්නොත් අපේ නාලිකාවලින් මේ ක්‍රීඩා තරගාවලි අරගෙන ඔවුන් විශාල ප්‍රමාණයෙන් හම්බ කර ගන්නවා. හැබැයි, සාමාන්‍ය ගමේ ක්‍රීඩා තරගාවලියක්වත් live පෙන්වන්න මේ නාලිකාවලින් අධික ලෙස මිල අය කරනවා. නමුත් ක්‍රීඩා නාලිකාව එහෙම නැහැ. දැන් "CSN" නාලිකාව ගැන ඔබතුමාට කිව්වොත්, අපි ඒකට ජාතික ක්‍රීඩා තරගාවලියේ විකාශනය දුන්නා. අපිට දුන්නේ රුපියල් ලක්ෂ තුනකටයි. හැබැයි, අපි අනෙක් නාලිකාවලින් ගන්නේ රුපියල් ලක්ෂ දහතුනකටයි. ඒ විතරක් නොවෙයි. අපි මේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් හදන්න කටයුතු කරනවා; අපි මේ රටේ ක්‍රීඩා ආර්ථිකයක් හදන්න කටයුතු කරනවා; මේ රටේ හැම කෙනෙක්ම ක්‍රීඩකයෙක් කරන්න කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මේක කරන්න නම් අපි මේවා පෙන්වන්න ඕනෑ. මිනිස්සුන්ට ගමේ තරගාවලි පෙන්වන්න ඕනෑ. මේ සඳහා අපට තිබෙන එකම නාලිකාව ක්‍රීඩා නාලිකාව විතරයි. ක්‍රීඩා නාලිකාව නඩත්තු කරන්න ක්‍රමවේදයක් නැහැ. ඒ අයට තිබෙන එකම දෙය මෙය පමණයි. මම දකින්නේ මේ ක්‍රීඩා නාලිකාව හරහා මේ රටේ ක්‍රීඩාවට ලොකු සේවාවක් සිදු වන බවයි. ඒ නිසා ක්‍රීඩා නාලිකාවලට මේ ක්‍රීඩා තරගාවලි ලබා දීමේ වරදක් නැහැ. හැබැයි එහෙමයි කියලා පාඩුවට දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි වැඩිම ලන්සුවට දෙන්නත් ඕනෑ. ඒ වාගේම අපට පාඩුවක් වෙන්නත් බැහැ. ඒ සියල්ල සැලකිල්ලට අර ගෙන තමයි අපි මේ නාලිකාවට ලබා දී තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
විශේෂයෙන්ම දැන් ඔබතුමා-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
තුන්වැනි අතුරු ප්‍රශ්නයද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඔව්, තුන්වැනි අතුරු ප්‍රශ්නය. ඊට වඩා ප්‍රශ්න අහන්න ඕනෑත් නැහැයි කියලා මට හිතෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා පොලු තුනම ගලවා ගත්තා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
නැහැ, තවම නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
සාමාන්‍යයෙන් ඔබතුමන්ලාට ඒක දැනෙන්නේ නැහැ නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඔබතුමා පත් වී සිටින දුෂ්කරතාව, අසීරුතාව කෝටි එකෙන් වහ ගන්න බැහැ. සමහර දේවල් තිබෙනවා, කෝටි එකෙන් ආවරණය කර ගන්න පුළුවන්. හැබැයි, හැම දෙයක්ම කෝටි එකෙන් ආවරණය කර ගන්න බැහැ.

ඒ නිසා මම කියන්න හදන්නේ මේකයි ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] ඉන්න, මම අවසන් කරනවා. ඔබතුමා දැන් වෙන වෙන ඒවා කියන්න එපා. දැන් හොඳට හිටියා නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා මේ ගරු සභාවේදී නිශ්චිත ලෙස කිව්වා ජාතික රූපවාහිනියට -රූපවාහිනී සංස්ථාවට - අදාළ "Channel Eye" එකත්, "CSN" නාලිකාවත්, "සිරස" නාලිකාවට අදාළ ක්‍රීඩා නාලිකාවත් ක්‍රීඩා නාලිකා ලෙස පිළිගනු ලබන බව. මීට පෙර ක්‍රිකට් තරගාවලින් විකාශනය කිරීමේ අයිතිය ලබා ගැනීමේදී මේ ක්‍රීඩා නාලිකා තුනට නිශ්චිත ලෙස එම තරගාවලි සඳහා ඉල්ලුම් කිරීම වෙනුවෙන් දැනුම් දීමක් ලබා දී තිබුණාද, ඒ වාගේම එම නාලිකා තුනම ඒ ඒ අවස්ථාවලදී මේ විකාශන අයිතිය වෙනුවෙන් ඉල්ලීමක් කර තිබුණාද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඒ නාලිකා තුනට පමණක් නොවෙයි, ඒවාට අමතරව රාජ්‍ය නාලිකා හැටියට ස්වාධීන රූපවාහිනියටත්, රූපවාහිනී සංස්ථාවටත් විකාශන අයිතිය ඉල්ලීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව නාලිකා පහක් තිබෙනවා. නමුත් අප ඒ නාලිකාවලට ලියන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි. අප කරන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ විකාශන අයිතින් සඳහා ඉල්ලුම් කරන්න කියලා පුවත් පතේ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීමයි. ඒ අනුව ලංකාවේ ප්‍රධානම පුවත් පත් දෙකේත්, website එකේත් අප වෙළෙඳ දැන්වීමක් පළ කළා. ඒ පළ කරපු දැන්වීම අනුව තමයි-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නාලිකා කීයක් ආවාද ගරු ඇමතිතුමනි?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට දැන් ඒක හරියටම කියන්න අමාරුයි, ආපු නාලිකා ගණන කීයද කියලා. මොකද, ඔබතුමා ඒක අසා තිබුණේ නැහැ. මගේ මතකයේ හැටියට නාලිකා එකක් හෝ දෙකක් ඇවිත් තිබුණා. ඒත් මට හරියටම මතක නැහැ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට තවත් උදව්වක් හැටියට මා මේ කාරණය කියන්නම්. අවසානයේදී අප "CSN" නාලිකාව ලබා දීපු ලන්සුව වෙනම කමිටුවකට ඉදිරිපත් කරලා අධීක්ෂණය කළා. පසු ගිය අවුරුදු තුනේ අපට ලැබුණු මුදලත් සමඟ සංසන්දනය කිරීමේදී අපට හොඳ මිලක් ලැබී තිබුණා, ඒ නාලිකාවෙන්. ඒ නිසා අපේ තාක්ෂණ ඇගයීම් කමිටුව තීරණය කළා මේ ලන්සුවත් අපට හොඳයි කියලා. ඒ නිසා මා ඔබතුමාට වග කීමකින් කියනවා ක්‍රිකට් පාලක මණ්ඩලයට මේකෙන් පාඩුවක් නැති බව.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, මට පැහැදිලියි ගරු ඇමතිතුමනි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි.

නිල්වලා යෝජනා ක්‍රමයේ පළමු අදියර : සංවර්ධන ව්‍යාපෘති

நில்வள திட்டத்தின் முதற்கட்டம் : அபிவிருத்திப் பணிகள்

FIRST STAGE OF NILWALA SCHEME: DEVELOPMENT PROJECTS

2441/'12

8. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) නිල්වලා යෝජනා ක්‍රමයේ පළමු අදියරේ සැලසුම් කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති මේ වන විට අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, එම යෝජනා ක්‍රමයේ මුල් අදියර යටතේ සම්පූර්ණ නොකරන ලද සංවර්ධන කටයුතු කවරේද;

(iii) එම වැඩ කටයුතු අවසන් කිරීම සඳහා අරමුදල් මේ වන විට වෙන්කර තිබේද;

(iv) එසේ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නීර්ප්පාසන, නීර්වල ගුකාමෛත්තුව අමෛச්சரைக் கேட்ட வினா:

(அ) (i) நில்வள திட்டத்தின் முதற்கட்டத்திற்காக திட்டமிடப்பட்ட அனைத்து அபிவிருத்திக் கருத்திட்டங்களும் தற்போது முடிவடைந்துள்ளதா என்பதையும்;

(ii) இன்றேல், மேற்படி திட்டத்தின் முதற்கட்டத்தின் கீழ் பூர்த்தி செய்யப்படாத அபிவிருத்திப் பணிகள் யாவையென்பதையும்;

(iii) மேற்படி வேலைகளை முடிப்பதற்கான நிதி தற்போது ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறு ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்;

(v) மேற்படி அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப் படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House -

(i) whether all the development projects planned in the first stage of the Nilwala Scheme have been completed by now;

(ii) if not, the development activities that have not been completed under the first stage of the aforesaid scheme;

(iii) whether funds have been allocated to complete the aforesaid activities by now;

(iv) the amount of money so allocated; and

(v) the date on which the aforesaid development activities will be commenced?

(b) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ පළමු අදියරේ පමණක් නොව දෙවන අදියරේද සැලසුම් කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති මේ වනවිට අවසන් කර තිබේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ පළමුවැනි සහ දෙවැනි අදියරේ දී දෙණියාය එන්සල්වත්ත ප්‍රදේශයේ ගංවතුර ඇති වීමේ අවදානම දැනුම් දීමේ ක්‍රමවේදයක් සහිත සංඥා පද්ධතියක් - flood warning system එකක්- ඉදිකරන්නට යෙදුණා. භීෂණ යුගයේ ඒක විනාශයට පත් වුණා. නමුත් අද වනතුරු ඒක නැවත ඉදිවෙලා නැහැ. දැන් තාක්ෂණය බොහොම ඉදිරියට ගිහින් තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟෙන් අවුරුදු 10කට වතාවක් භයානක ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අවසාන ගංවතුර ඇති වුණේ 2003 අවුරුද්දේයි. මේ 2013 අවුරුද්දයි. දැන් ලැබෙන වර්ෂාපතනයත් එක්ක බලනකොට, මෙය නිල්වලා නිම්නය මීටියාවතේ සිටින මාතර ජනතාවට තර්ජිත වර්ෂයක්. ඒ නිසා මේ ගංවතුර පෙර හැඟවුම් පද්ධතිය -flood warning system එක- ප්‍රතිෂ්ඨාපනය කරන්න අමාත්‍යාංශය කටයුතු කරනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයේ එවැනි දෙයක් අන්තර්ගත වෙලා තිබුණේ නැහැ. එතුමා අහලා තිබුණේ, නිල්වලා යෝජනා ක්‍රමයේ පළමු අදියරේ සැලසුම් කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති මේ වන විට අවසන් කර තිබේද කියන එක පමණයි. මන්ත්‍රීතුමා ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් අහනවා නම්, ඒ පිළිබඳව මගේ නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගෙන, ඔබතුමා කියන කාරණය ඇත්තද කියලා සොයා බලා එයට පිළිතුරු සපයන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ආයෙත් ප්‍රශ්නයක් යොමු කරලා, එතුමාගෙන් පිළිතුරක් ලබා ගන්න මාස ගණනාවක් ගත වනවා. මට එහෙම අවශ්‍ය නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා ඊළඟ මාසයේ පවත්වන අපේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට පැමිණෙන්න. එතැනදී මම ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, නිල්වලා ගඟ යෝජනා ක්‍රමය යටතේ ඉදි වෙලා තිබෙන ඇතැම් ඇළ මාර්ගවල නැවත වතාවක් පස් පිරිලා ගොඩවීමේ අවදානමකට ලක් වෙලා තිබෙනවා. මම පළමුවෙනි අතුරු ප්‍රශ්නයේදී සඳහන් කළ විධියට, අතීතයේ ගංවතුර චක්‍රය දිහා බැලුවාම මෙම වර්ෂය යම් ගංවතුර අවදානමක් තිබෙන වර්ෂයක්. එම නිසා මේ අතුරු ඇළ මාර්ගවල පස් ඉවත් කරලා ගැඹුරු කිරීමේ වැඩ පිළිවෙළක් කෙරෙහි අමාත්‍යාංශය මේ අවුරුද්දේ අවධානය යොමු කරලා තිබෙනවාද? ඒ සඳහා මුදලක් වෙන් කරලා තිබෙනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගැඹුරු කිරීම පිළිබඳව තාක්ෂණික ප්‍රශ්න තිබෙනවාද කියා සොයා බැලිය යුතුයි. ඒ නිසා ඒ කාරණය පිළිබඳවත් ඔබතුමාට අපේ නිලධාරීන් සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අපේ මීළඟ උපදේශක කාරක සභාවේදී අවස්ථාව සලසා දෙන්නම්.

"ගම නැඟුම" වැඩසටහන : සංවර්ධන ව්‍යාපෘති

"கம நெகும" நிகழ்ச்சித் திட்டம் : அபிவிருத்திக் கருத்திட்டங்கள்

"GAMA NEGUMA" PROGRAMME: DEVELOPMENT PROJECTS

2576/'12

9. ගරු සජිත් ප්‍රේමදාස මහතා

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(අ) (i) ගම නැඟුම වැඩසටහන තුළින් මේ වන විට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘති තුළින් ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති සඳහා වැය කරන මුළු මුදල මිලියනවලින් කොපමණද;

(iv) මෙම වැඩසටහනේ සාර්ථකත්වය මැනීමට උපයෝගී කරගන්නා මිනුම් දණ්ඩ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පොරුළාදාර අපිවිරුත්ති අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) "கம நெகும" නිකළ්ච්චිත්තිට්ටත්තින් ඌටාග තර්පෝදු නටෛමුරෛප්පටුත්තප්පටුකින්ර අපිවිරුත්තික් කරුත්තිට්ටංකළ් යාවෛ;

(ii) මේර්පඩි කරුත්තිට්ටංකළිල් උළ්ළටංකුකින්ර කිරාම උත්තියෝකත්තර් පිරිවුකළින් එණ්ණික්කෛ යාදු;

(iii) මේර්පඩි කරුත්තිට්ටංකළුක්කු සෙලවිටප් පටුකින්ර මොත්තප් පණත්තොකෛ මිල්ලියන් කළිල් එව්වළවු;

(iv) මේර්පඩි නිකළ්ච්චිත්තිට්ටත්තින් වෙට්රියෛ අළවිටුවතර්කු පයන්පටුත්තප්පටුම් අළවුකෝළ් යාදු

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Economic Development:

(a) Will he inform this House -

(i) the names of the development projects which are implemented at present under the "Gama Neguma" programme;

(ii) the number of Grama Niladhari Divisions covered under the aforesaid projects;

(iii) the total amount of money spent on the aforesaid projects in millions; and

(iv) the criterion which is used to evaluate the success of the aforesaid programme?

(b) If not, why?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Susantha Punchinilame - Deputy Minister Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ගම නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්-

ගම ජාතික සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය බවට පත් කරමින් ශ්‍රී ලංකාවේ සියලුම ගම්මාන සමෘද්ධිමත් ගම්මාන ලෙස පුනර්ජීවනය කිරීමේ අරමුණින් ගම නැඟුම වැඩසටහන 2006 වර්ෂයේදී ආරම්භ කෙරිණි. දිළිඳුකම අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුව පදනම් කර ගනිමින් ගම්මාන 119ක් ආවරණය කරමින් ආරම්භ වූ මෙම වැඩසටහන, 2011 වන විට ග්‍රාම නිලධාරී වසම් 13,026ක් දක්වා ව්‍යාප්ත විය. 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ආංශික වශයෙන් ගම නැඟුම වැඩසටහන ක්‍රියාත්මක වූ ආකාරය ඇමුණුම් අංක 1හි දැක්වේ. ඇමුණුම් අංක 1හි දැක්වේ.

2012 වර්ෂයේදී නව ප්‍රවේශයට අනුව යමින් "එක ගමකට එක වැඩක්" යන සංකල්පය පෙරදැරි කර ගෙන ග්‍රාම නිලධාරී වසම් 13,098ක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක විය. එය ඇමුණුම් අංක 2 හි දැක්වේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

2013 වර්ෂයේදී ගම නැඟුම වැඩසටහන සඳහා රුපියල් මිලියන 11,000ක් වෙන් වූ අතර, මාර්ග ප්‍රතිසංස්කරණය, කුඩා පාලම් හා බෝක්කු ඉදි කිරීම, ළමා හා මාතෘ සායන වැඩි දියුණු කිරීම, පෙර පාසල් සංවර්ධනය කිරීම, වාරි මාර්ග ප්‍රතිසංස්කරණය, ක්‍රීඩා පිටි සංවර්ධනය, පානීය ජල ව්‍යාපෘති, පොහොර ගබඩා ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය යන සංරචක යටතේ මේ වන විට ව්‍යාපෘතීන් 13,098ක් ක්‍රියාත්මක වේ.

(ii) ගම නැඟුම ව්‍යාපෘති තුළින් ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව - 13,098කි.

(iii) මෙම ව්‍යාපෘති සඳහා වැය කරන මුළු මුදල රුපියල් මිලියන 11,000කි.

(iv) ගම නැඟුම වැඩසටහනේ සාර්ථකත්වය මැනීමට යොදා ගන්නා මිනුම් දඬු -

අංකය	ව්‍යාපෘතියේ නම	මිනුම් දඬු
1	මාර්ග, පාලම් හා බෝක්කු සංවර්ධනය	පැයක් තුළ මාර්ගයේ ගමන් ගන්නා මෝටර් රථ ප්‍රමාණයේ ඉහළ යාම. මෝටර් රථ නඩත්තු වියදම් අඩු වීම. ඉන්ධන සඳහා වන වියදම අඩු වීම. නිෂ්පාදන වෙළෙඳ පොළ වෙත රැගෙන යාම සඳහා ගත වන කාලය අඩු වීම. ප්‍රවාහනය සඳහා ගත වන කාලය අඩු වීම.
2	වාරිමාර්ග සංවර්ධනය	වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩි වීම. අස්වැන්න වැඩි වීම.
3	ප්‍රජා ජල සම්පාදනය	සුරක්ෂිත පානීය ජලය පරිභෝජන කරන පවුල් සංඛ්‍යාව ඉහළ යාම.
4	ග්‍රාමීය විදුලි බල පහසුකම් සංවර්ධනය	විදුලිය පරිභෝජන කරන පවුල් ප්‍රමාණයේ ඉහළ යාම. විදුලි උපකරණ භාවිතය වැඩි වීම.
5	මාතෘ හා ළමා සෞඛ්‍ය සායන පහසුකම් සංවර්ධනය	සායන සඳහා අඛණ්ඩව සහභාගී වන මවුවරුන් සංඛ්‍යාවේ ඉහළ යාම. ළදරු මරණ, ගර්භාෂ වීම් ප්‍රතිශතය අඩු වීම. සෞඛ්‍ය සම්පන්න දරුවන් සංඛ්‍යාව වැඩි වීම.
6	පෙර පාසල් පහසුකම් සංවර්ධනය	පෙර පාසල් සඳහා ඇතුළත් වන ළමුන් සංඛ්‍යාව ඉහළ යාම. පහසුකම් සහිත පෙර පාසල් සංඛ්‍යාවේ වැඩි වීම.
7	ක්‍රීඩා පිටි/උද්‍යාන පහසුකම් සංවර්ධනය	ක්‍රීඩාවට යොමු වන තරුණ පිරිසේ වැඩි වීම. සෞඛ්‍ය සම්පන්න තරුණ සංඛ්‍යාව ඉහළ යාම.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී දීපව්‍යාප්ත දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විස්තර ලබා ගත යුතු වනවා. ඊට කාලය, ධනය හා ශ්‍රමය විශාල වශයෙන් වැය වෙනවා. අප අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවලින් මෙම සියලු විස්තර ලබා ගත හැකි බව කරුණාවෙන් ඔබතුමාට දැනුම් දෙනවා.

**සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :
Annexes tabled:

ඇමුණුම 1

ගම් නැගුම් වැඩසටහන ආංශික ප්‍රගතිය 2006 - 2011

දිස්ත්‍රික්කය	මුළු		වී වගාවට		මුල බෝවීම		මිදීම		කපාදැ මිදීමේදී ය නැසීමේදී		කෙත් තෙතමනේ		කෙත් තෙතමනේ අතහැරීමේදී		වීජහානියක් සැලසීමකට		කඩිත් කාර්මිකයා		වෙනත්		එකතුව	
	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	මිදෙන ප්‍රමාණය (ය. මි.)
කොළඹ	3208	1171.8	123	36.37	433	130.84	14	6.41	100	86.95	306	132.96	268	8.85	22	5.98	26	11.72	91	16.05	0	0	4591	1607.97
ගම්පහ	8059	3542.3	111	78.58	717	252.74	16	3.24	0	0	972	172.56	263	15.13	66	25.56	49	9.17	35	62.33	10	7.98	10298	4169.6
කළුතර	4306	1792	92	83.42	307	79.15	110	45.43	30	10.88	356	37.44	430	7.68	16	3.6	1	0.28	62	28.79	0	0	5710	2088.71
රත්නපුර	4232	1772.8	121	35.77	813	303.68	12	10.31	157	55.24	417	55.87	472	8.4	16	3.09	450	46.22	267	51.88	2	0.6	6959	2343.89
කෑගල්ල	5126	1474.2	118	42.43	695	184.8	104	34.54	120	53.34	271	39.95	353	8.45	51	33.94	1676	36.09	241	44.74	0	0	8755	1952.45
කුරුණෑගල	5231	1643.2	380	216.45	812	316.34	2010	718.19	140	60.51	379	115.58	439	18.28	679	222.07	6451	115.3	980	19.6	65	39.99	17566	3485.54
පුත්තලම	2219	1043.6	259	173.47	468	124.97	874	328.93	118	63.03	313	88.18	210	11.87	22	8.77	713	46.72	514	110.32	47	23.59	5757	2023.46
මාතලේ	4658	2665.9	284	43.5	376	171.53	77	30.34	19	19.62	327	55.27	347	9.19	102	88.56	7	9.8	546	113.02	5	0.27	6748	3206.97
නුවර	4298	1931.8	229	84.56	599	177.43	155	56.91	4	43.03	799	66.18	250	8.76	76	77.23	79	8.66	460	20.68	15	2.32	6964	2477.52
අම්පාරෙ	2303	1509.9	262	83.93	794	438.7	37	24.73	85	47.25	1035	84.3	226	7.8	125	115.16	195	61.08	174	50.49	0	51.94	5236	2475.25
මහියංගණය	2074	953.48	242	67.97	303	169.06	272	244.2	4	12.77	543	97.36	182	4.94	22	45.18	233	24	597	78.63	6	9.73	4478	1707.32
බදුල්ල	3239	1503.4	157	72.24	274	94.65	22	63.62	97	33.84	297	25.7	267	4.43	338	97.78	596	78.85	5	2.21	3	1.77	5295	1978.46
මුළුතිව් දිස්ත්‍රික්කය	2620	1099.3	180	61.16	212	49.28	121	84.5	41	16.14	264	30.48	185	2.7	285	48.97	398	40.79	10	3.42	2	2.92	4318	1439.61
මඩකලපුව	4547	1502.1	190	39.54	805	223.36	35	12.6	118	85.36	473	115.11	459	16.82	154	364.52	14	101.95	190	66.25	8	3.34	6993	2530.93
ගාලල	2533	970.03	120	51.38	558	244.28	250	111.08	97	53.5	237	66.07	333	8.87	111	50.96	5	2.45	15	6.18	9	4.96	4268	1569.76
හම්බන්තොට	1858	1120.1	162	75.31	614	292.98	457	516.26	103	64.22	340	65.91	182	7.99	149	83.3	4	1.71	594	189.09	121	53.6	4584	2470.44
මාතර	946	561.25	115	48.39	111	69.58	113	35.5	50	50.95	209	81.1	86	4	75	67.84	19	10.61	99	36.86	2	0.63	1825	966.71
මොණරාගල	146	106.83	24	9.04	28	20.42	33	25.88	0	0	0	0	0	0	11	12.98	25	11.26	65	66.09	0	0	332	252.5
ඉහළ කොමලය	762	530.79	90	24.94	176	112.1	80	23.71	66	35.74	74	50.7	25	2.96	1	0.38	1521	78.93	229	95.87	3	2.65	3027	958.77
ගම්පහ දිස්ත්‍රික්කය	1148	870.2	58	21.53	56	45.63	31	13.89	44	28.43	196	19.82	112	5.94	0	0	386	94.56	451	122.2	0	0	2482	1222.2
ඒ.ජී.ඒ	1615	1191.6	105	38.05	81	70.74	31	13.35	25	47.2	79	41.46	34	4.94	30	10	789	131.22	106	37.72	15	5.86	2910	1592.14
යාපනය	37	14.08	107	42.89	39	58.86	32	12.69	0	0	0	0	0	0	1	2.38	424	360.04	38	9.33	0	0	678	500.27
කිලිනොච්චි	3	4.9	4	1.15	0	0	0	0	0	0	0	0	0	0	0	0	26	4.7	38	9.33	0	0	71	20.08
මුලතිව්	3	6	0	0	1	6.13	0	0	0	0	0	0	0	0	0	0	9	7.06	6	4	0	0	19	23.19
වව්නියාව	260	163.02	39	10.73	2	1.65	39	77.05	0	0	0	0	0	0	7	5.15	65	34.73	58	39.77	0	0	470	332.1
එකතුව	65431	29144	3572	1442.8	9274	3638.9	4925	2493.4	1418	868	7887	1442	5123	168	2359	1373.4	14161	1327.9	5871	1284.9	302	207.62	120334	43395.84

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

ඇමුණුම - 02

දිස්ත්‍රික්කය	මාර්ග පාලම් බෝක්කු	ජල සම්පාදන	සුළු වාරිමාර්ග	මාතෘ නිවාස	පෙර පාසල්	විදුලිය	ගොඩනැගිලි	ක්‍රීඩා පිටි/ උද්‍යාන	වියදම (රු.මි.)
කොළඹ	406	4	10	6	18	0	31	9	407.28
ගම්පහ	936	7	12	4	12	0	40	8	781.91
කළුතර	589	51	6	3	10	0	29	9	516.79
රත්නපුර	471	28	8	6	6	0	0	0	506.38
කෑගල්ල	502	26	5	3	4	0	12	5	406.64
කුරුණෑගල	755	83	192	31	21	126	52	5	1010.14
පුත්තලම	313	43	31	7	20	61	15	7	433.01
අනුරාධපුරය	310	30	66	8	66	16	86	18	474.97
පොළොන්නරුව	208	11	18	1	15	2	33	6	251.52
ගාල්ල	704	11	39	7	11	0	33	11	592.4
මාතර	472	5	29	4	7	0	30	5	423.57
හම්බන්තොට	360	20	103	4	34	0	23	10	444.57
මොණරාගල	248	5	14	8	23	4	10	3	269.86
බදුල්ල	489	19	8	4	15	0	13	3	485.06
නුවරඑළිය	340	40	4	8	18	1	17	7	344.15
මහනුවර	935	43	12	6	20	0	53	7	945.8
මාතලේ	445	11	21	0	0	1	43	0	501.32
ත්‍රිකුණාමලය	160	10	13	1	4	0	86	7	200.62
මඩකලපුව	270	3	3	6	13	3	29	16	338.91
අම්පාර	397	1	11	1	8	3	19	3	421.77
එකතුව	**9310**	**451**	**605**	**118**	**325**	**217**	**654**	**139**	**9757.00**

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වෙලාව ගත වෙලා තිබෙන නිසා කෙටියෙන් ඇසුවොත් හොඳයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් කළා, ගම් නැඟුම් වැඩසටහන යටතේ මේ රටේ ගම්මාන 14,000ක් ආවරණය වෙනවාය කියා. එහෙම නේද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ග්‍රාම නිලධාරී වසම් 13,098ක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2012 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මා සතුව තිබෙනවා. ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් ව්‍යාපෘති 14,000ක් ක්‍රියාත්මක කරනවාය කියා එහි සඳහන් වෙලා තිබෙනවා. නමුත් මම ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ කාරණය කියන්න කැමැතියි. මේ වැඩසටහනට කියන්නේ ගම නැඟුම කියායි.

දැන් ගම නැඟුම වැඩසටහන ක්‍රියාත්මක කරන කොට ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය දැන ගන්නට ඕනෑ, අපේ රටේ තිබෙන ගම්මාන ප්‍රමාණය කොපමණද කියලා. අපේ රටේ ගම්මාන නිස්පන්දහස් හාරසියහතළිහක් තිබෙනවා. නමුත් මේ කාර්ය සාධන වාර්තාවේ තිබෙන්නේත් මේක ක්‍රියාත්මක වෙන්නේ ගම්මාන දාහතරදහසකටයි කියලායි. එතකොට පළමුවන අතුරු ප්‍රශ්නය හැටියට මා තමුන්නාන්සේගෙන් අහන්න කැමැතියි, "ඉතිරි ගම්මාන විසිඑක්දහසට ගම නැඟුම වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ කවදාද?" කියලා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු මන්ත්‍රීතුමනි, එක් ග්‍රාම නිලධාරී වසමක ගම්මාන රාශියක් තිබෙනවා. ඔබතුමා කියන විධියට රට තුළම තිබෙන ගම්මාන ගණන නිස්පන්දහසක් හෝ නිස්අටදහසක් වෙන්න පුළුවන්. තව අලුතිනුත් ගම්මාන බිහි වෙනවා. මොකද, අවුරුදු 30ක යුද්ධය තිබුණු කාලයේ ත්‍රස්තවාදය නිසා ගම්මාන ගොඩක්

නැති වෙලා ගියා. දැන් තමයි නැවත පදිංචි කිරීම් යටතේ ජනතාව ඒ ගම්මානවල පදිංචි වෙලා ඉන්නේ. ගරු මන්ත්‍රීතුමනි, අපි දැනට ග්‍රාම නිලධාරි වසම් ගණන තමයි අරගෙන තිබෙන්නේ. ඔබතුමා කියන විධියට නොවෙයි. අපි බලාපොරොත්තු වනවා ක්‍රමානුකූලව ඒ ග්‍රාම නිලධාරි වසම් තුළ තිබෙන ගම්මානවලටත් මෙම ව්‍යාපෘති හඳුන්වා දෙන්න. එතැනදී සංඛ්‍යා ලේඛනවල ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයක් තිබෙනවා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මොකද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(මාණ්පුමිකු සුසන්ත පුංචිනිලමේ)
(The Hon. Susantha Punchinilame)
ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කියනවා ගම්මාන තිස්පන්දහස් හාරසිය හතළිහක් තිබෙනවා කියලා. ඔබතුමන්ලාගේ වැඩසටහනේ නමත් ගම නැහුම. එතකොට ඔබතුමන්ලාගේ කාර්ය සාධන වාර්තාවේ තිබෙනවා ගම්මාන දාහතරදහසක් ආවරණය වනවා කියලා. එක ග්‍රාම නිලධාරි වසමක කුඩා ගම්මාන රැසක් තිබෙනවා. එතකොට ගම නැහුම ග්‍රාම නිලධාරි වසමේ එක ගමකට මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වන කොට තවත් ගම් තුන හතරක් කොන් වෙනවා. ඒකයි මා මේ අවධාරණය කළේ. මගේ දෙවන අතුරු ප්‍රශ්නය-

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(මාණ්පුමිකු සුසන්ත පුංචිනිලමේ)
(The Hon. Susantha Punchinilame)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මගේ දෙවන අතුරු ප්‍රශ්නය. දෙවන අතුරු ප්‍රශ්නය අහනකම් ඉන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමාම කියනවා මේ 2012 කාර්ය සාධන වාර්තාව බලන්නය කියලා. මේ වාර්තාවේ තිබෙන ආකාරයට, ගම නැහුම සඳහා සියයට 75ක් අරමුදල් වෙන් වෙන්නේ ග්‍රාමීය මාර්ගවලටයි. එතකොට මග නැහුමෙන් කෙරෙන්නෙත් මාර්ග වැඩසටහන්. ගම නැහුමේ සියයට 75කින් වෙන්නෙත් මාර්ග වැඩසටහන්. ඒ මොකද? ඇත්තටම පංගුව, කොමිස් කුට්ටිය, කැල්ල බෙදා ගන්න පුළුවන් නිසා.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කරුණාකර අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්නේ නැතිව විවිධ දේවල් කථා කරනවා. ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායට පටහැනියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ ජාතික සම්පත්වලින් වැඩිම ප්‍රමාණයක් -කුට්ටි පිටින්- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කරනවා වෙනුවට, එහෙම නැත්නම් කොමිස් කුට්ටි කඩා ගන්න පුළුවන් බාල කොන්ක්‍රීට් වැඩසටහන්වලට වෙන් කරනවා වෙනුවට, ජීවනෝපාය සංවර්ධනයට, ජීවනෝපාය වැඩසටහන්වලට, ජනතාවගේ ජන ජීවිතය නංවාලන්නට වෙන් නොකරන්නේ ඇයි?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(මාණ්පුමිකු සුසන්ත පුංචිනිලමේ)
(The Hon. Susantha Punchinilame)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සභාව කල් තබන අවස්ථාවේදී අහන ප්‍රශ්නයක් හැටියට මේ ප්‍රශ්නය අහනවා නම් අපට ඉතාම පැහැදිලිව උත්තර දෙන්න පුළුවන්. ඔබතුමා දැන් අහලා තිබෙන ප්‍රශ්නවලට තමයි අපි උත්තර දුන්නේ. අපේ ඒ මාර්ග පද්ධති අවුරුදු තිහක් තිස්සේ හරි ගස්සලා තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා තමයි අපි එක එක කොටස්වලට බෙදාගෙන ඒ ඒ පාරවල් අවශ්‍ය විධියට හරි ගස්සන්නේ. අපි කුට්ටි හැටියට දමන්නේ ගල්. එහෙම නැතිව කොමිස් කුට්ටි කියලා ජාතියක් නැහැ. ඔබතුමන්ලා වෙන්න ඇති ඒ කාලයේ කොමිස් කුට්ටි ගහලා තිබෙන්නේ. නමුත් මේ කාලයේ එහෙම එකක් නැහැ. අප හොඳ ප්‍රමිතියෙන් යුතු කුට්ටි දමනවා ගල් වශයෙන්, ඒ ඒ පාරවල්වල හැටියට. ඒක වරදවා වටහාගෙනයි ඔබතුමා කථා කරන්නේ. ඇයි අපි පාරවල් වර්ගීකරණය කරගෙන ඒ ඒ ආයතන හරහා වැඩිදියුණු කරන්නේ කියන කාරණය පිළිබඳව ඔබතුමා නැවත ප්‍රශ්නයක් ඇහුවොත් අපට සවිස්තරාත්මකව පැහැදිලි උත්තරයක් දීමේ හැකියාව තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

නියෝජ්‍ය කථානායකතුමා
(පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ කාලය මේ කාලය ගැන කථා කරන්න එපා. ඔබතුමාත් අපිත් එක්ක කාලයක් හිටියානේ. ඒ නිසා මා මේ ප්‍රශ්නය අහන්නේ අවංකව. මා මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ගම නැහුම වැඩසටහන්වල යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛතා ලබා දෙන ක්‍රමවේදයේ බරපතළ ගැටලුවක් තිබෙනවා. ප්‍රදේශයේ ජනතාවගේ ඕනෑ එපාකම් අනුව නොවෙයි, මේ වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ. මේවා ක්‍රියාත්මක වෙන්නේ දේශපාලන අධිකාරියේ බලවතුන්ගේ ඕනෑ එපාකම් අනුව.

අපි උතුරු මැද පළාත ගනිමු. උතුරු මැද පළාත කේන්ද්‍ර කරගෙන වකුගඩු රෝගය වැලඳීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ගම නැහුම වැඩසටහනට වෙන් වන කෝටි ප්‍රකෝටි ගණනක අරමුදල් වකුගඩු රෝගයට හේතු සාධක වන පිරිසිදු පානීය ජලය නොමැතිකම වෙනුවෙන් වෙන් කරන්න පුළුවන්. නමුත් ඔබතුමන්ලා ගම නැහුම වැඩසටහනෙන් 2012 අවුරුද්දේ පානීය ජල වැඩසටහන්වලට වෙන් කරලා තිබෙන්නේ ඉතාම සොච්චම් මුදලක්. ඒ නිසා, මේ ප්‍රමුඛතා තීන්දු කිරීමේ ක්‍රමවේදය කවදාද ජනතාවගේ ඕනෑ එපාකම් දිහා බලලා ක්‍රියාත්මක කරන්නේ?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ ප්‍රශ්නය පටලවා ගෙන තමයි කථා කරන්නේ. ගම නැඟුම වැඩසටහන යටතේ පානීය ජලය හැම තැනටම දෙනවා කියන ආකල්පය වැරැදියි. ඒකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තිබෙනවා. ඒ අමාත්‍යාංශය යටතේ කරන ව්‍යාපෘති වෙනම තිබෙනවා. ඊට අමතරව තමයි අපි ව්‍යාපෘති හඳුනාගෙන, ඒ කුඩා ගම්වල තිබෙන පානීය ජල ප්‍රශ්නය විසඳන්නත්, වකුගඩු රෝගය නැති කරන්නත් ප්‍රතිපාදන ලබා දීලා තිබෙන්නේ. වකුගඩු රෝගය තිබෙන අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් පදවිය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් කන්තලේ, වාන් ඇළ, පදවි ශ්‍රී පුර, මුලතිව් දිස්ත්‍රික්කයට අයත් වැලිඔය ප්‍රදේශවලට පානීය ජලය ලබා දීමේ වැඩසටහනක් -ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතියක් - දැනටමත් අපි පටන් අරගෙන තිබෙනවා. අපි 2015 වසර අවසන් වෙන්න පෙර ඒ කටයුතු අවසන් කරන්න කටයුතු කරගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ වැඩේ පටලවා ගෙනයි අපෙන් ප්‍රශ්න අහන්නේ. "අපට පානීය ජල ව්‍යාපෘතියක් දෙන්න" කියලා ගම්මු ඉල්ලුවොත් "එක ගමකට එක වැඩක්" වැඩසටහන යටතේ අපි ඒක ලබා දෙනවා, ඒ මිනිසුන්ගේ වකුගඩු රෝගයෙන් මිදීමට දෙන අත් උදව්වක් වශයෙන්. එහෙම නැතිව අපේ අමාත්‍යාංශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් කරන්න යන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10-2858/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය : යාන්ත්‍රික දෝෂ

நுரைச்சோலை அனல் மின் உற்பத்தி நிலையம் : இயந்திரங்கள் செயலிழப்பு

NORACHCHOLAI COAL POWER PLANT : MECHANICAL DEFECTS

2871/'12

11. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ සවි කළ යන්ත්‍ර ආනයනය කළ රට කවරේද;

(ii) එම යන්ත්‍ර නිෂ්පාදනය කරන ලද සමාගම් කවරේද;

(iii) ඒවා නිෂ්පාදනය කර ඇති වර්ෂ කවරේද;

(iv) ඒ සඳහා ලබා දී ඇති වගකීමේ කාල සීමාව (Warranty Period) කවරේද;

(v) එම යන්ත්‍ර වෙනුවෙන් ලබා දී ඇති වගකීම් සහතික ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසු ගිය කාලයේදී නොරොච්චෝලේ විදුලි බලාගාරය අක්‍රිය වීමට හේතුව කවරේද;

(ii) එම බලාගාරයෙන් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන උපරිම විදුලිබල ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

(iii) එම උපරිම ශක්ති ප්‍රමාණය ජාතික විදුලිබල පද්ධතියට ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

මින්වලු, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) நுரைச்சோலை அனல் மின் உற்பத்தி நிலையத்தில் பொருத்தப்பட்டுள்ள இயந்திரங்கள்,

(i) இறக்குமதி செய்யப்பட்ட நாடுகள் யாவை என்பதையும்;

(ii) உற்பத்தி செய்யப்பட்ட நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) உற்பத்தி செய்யப்பட்ட ஆண்டுகள் யாவையென்பதையும்;

(iv) இவற்றுக்காக வழங்கப்பட்டுள்ள உத்தரவாத கால வரையறை (Warranty period) யாதென்பதையும்;

(v) மேற்படி இயந்திரங்களுக்காக வழங்கப்பட்டுள்ள உத்தரவாதச் சான்றிதழ்களை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த காலங்களில் நுரைச்சோலை அனல் மின் உற்பத்தி நிலையம் செயலிழந்தமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி மின் உற்பத்தி நிலையத்தின்மூலம் உற்பத்தி செய்வதற்கு எதிர்பார்க்கப்படும் உயர்ந்தபட்ச மின்சக்தியின் அளவு எத்தனை மெகாவோட்கள் என்பதையும்;

(iii) மேற்படி உயர்ந்தபட்ச மின்சக்தி தேசிய மின்சக்தி கட்டமைப்புக்கு வழங்கப்படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will she inform this House in regard to the machinery fixed at the Norachcholai coal power plant -

(i) the country from which they were imported;

(ii) the companies which manufactured them;

(iii) the years of manufacture;

(iv) the warranty period attached to them; and

(v) whether warranty papers pertaining to such machinery will be submitted?

(b) Will she state -

(i) the reason why the Norachcholai power plant went defunct recently;

(ii) the maximum amount of megawatt of electricity expected to be generated by this power plant; and

(iii) the date on which such maximum power will be added to the national grid?

(c) If not, why?

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මහජන චීන ජනරජය.

(ii) බොයිලේරුව, ටර්බයිනය, ජෙනරේටරය ආදී ප්‍රධාන යන්ත්‍ර චීනයේ හර්බින් සමූහ ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කර ඇත.

(iii) 2009 වර්ෂය.

(iv) වසර දෙකක කාලයක් දෝෂ වෙනුවෙන් වග කීමද, අමතර වසර තුනක කාලයක් මල කෑමෙන් ආරක්ෂාව වෙනුවෙන් වග කීමද ලබා දී ඇත.

(v) ලංකා විදුලිබල මණ්ඩලය සහ චීනයේ ජාතික යන්ත්‍රෝපකරණ ආනයන අපනයන සමාගම අතර අත්සන් කර ඇති ගිවිසුමෙහි මෙම වගකීම පිළිබඳව කරුණු ඇතුළත් කර ඇත.

(ආ) (i) 1. ගල් අඟුරු ඇඹරුම් යන්ත්‍රයේ ඇති වන වාෂ්පීකරණ ද්‍රව්‍යයන් නිසා සිදු වන ක්ෂණික ගිනි ගැනීම.

2. සිසිලන පද්ධතියේ අපද්‍රව්‍ය පෙරනයේ දෝෂයක් නිසා සිදු වූ බිඳ වැටීම.

3. වායු පංකා (air draft fan), බෙයාරිංහි දෝෂයක් නිසා සිදු වූ බිඳ වැටීම.

4. බොයිලේරු බෙරයෙහි පාලක දෝෂයක් නිසා සිදු වූ බිඳ වැටීම.

5. ජල සිසිලන තාප හුවමාරු යන්ත්‍රයේ දෝෂයක් නිසා සිදු වූ බිඳ වැටීම.

6. වේයන්ගොඩ කොටුගොඩ සම්ප්‍රේෂණ මාර්ගයේ ඇති වූ දෝෂයක් හේතුවෙන් විදුලි මාර්ගය විසන්ධි වීම නිසා එක වර බැර අඩු වීම නිසා බලාගාරය හදිසි නැවැත්වීම හේතු කොට ඇති වූ බෙයාරිං දෝෂයක් නිසා සිදු වූ බිඳ වැටීම.

7. හුමාලය කාන්දු වීමක් නිසා සිදු වූ බිඳ වැටීම.

8. නොරොච්චෝලේ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය හදිසියේ විසන්ධි වූ අවස්ථාවක යන්ත්‍ර නැවැත්වීම හා නැවත පණ ගැන්වීමට පෙර රැහැන් මාර්ගය පරීක්ෂා කිරීමෙන් අනතුරුව නැවත පණ ගැන්වීම.

9. පාලක විදුලි රිලේ උපකරණවල දෝෂ නිසා සිදු වූ බිඳ වැටීම.

(ii) දැනට ක්‍රියාත්මක බලාගාරයේ පළමු අදියර තුළින් ලබා දෙන මෙගාවොට ප්‍රමාණය මෙගාවොට 300කි. එම ප්‍රමාණය 2011 පෙබරවාරි මස සිට ලබා ගැනේ. දෙවන අදියරද අවසාන කිරීමෙන් පසුව උපරිම මෙගාවොට ප්‍රමාණය මෙගාවොට 900කි. මෙම බලාගාරයේ දෙවන පියවර යටතේ ඉතිරි යන්ත්‍ර සවි කිරීම 2014 අප්‍රේල් මස දී අවසාන කිරීමට සැලසුම් කර ඇත.

(iii) 2014 අප්‍රේල් මස.

(ඇ) පැන නොනඟී.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමියනි ඔබතුමියගේ පිළිතුරෙන් පැහැදිලිව පෙනෙනවා, මේ ගෙනැවිත් තිබෙන්නේ 2009 නිෂ්පාදනය කළ යන්ත්‍රසූත්‍ර බව. මේ සම්බන්ධ කාරණා ටික කිව්වාට ඔබතුමියට බොහොම ස්තුතියි. මේ යන්ත්‍රවල පාලක විදුලි රිලේ වැඩ කරන්නේ නැහැ; හුමාලය කාන්දු වෙනවා; වාෂ්පීකරණ ගිනි ගැනීම් ඇති වෙනවා; බොයිලේරුවෙහි දෝෂ තිබෙනවා; සිසිලන පද්ධතියේ දෝෂ තිබෙනවා. ඒවා එක්ක තමයි මේ යන්ත්‍ර සූත්‍රවල ප්‍රශ්නයක් තිබෙන්නේ. ඇත්තටම මේ යන්ත්‍ර සූත්‍ර 2009 දී ගෙනාපු ඒවා කියා ඔබතුමිය විශ්වාස කරනවාද? නැත්නම් ඊට කලින් ගෙනාපු ඒවා කියාද විශ්වාස කරන්නේ? මේ යන්ත්‍රසූත්‍රවලට අදාළ දෝෂ 10ක් විතර ඔබතුමිය දැන් කිව්වා. ඒ දෝෂ දහයම මේ ආයතනයේ වැඩවලට බලපානවා. පාවිච්චි කරපු යන්ත්‍ර ගෙනාපු නිසා තමයි මේ දෝෂ තිබෙන්නේ. අලුත් ඒවායේ ඔය වාගේ දෝෂ එන්න විධියක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා නේ. කාර් එකක එන්ජින් එකක වුණත් එකපාරට රිලේ එක වැඩ කරන්නේ නැතුව යන්නේ නැහැ. අලුත් බොයිලේරුවක් වැඩ කරන්නේ නැතුව යන්නේ නැහැ. වාෂ්පීකරණ ගිනි ගැනීම් සිදු වන්නේ නැහැ. මේ brand එකේ ප්‍රශ්නයකුත් තිබෙනවා. පාවිච්චි කරපු යන්ත්‍ර ගෙනාවාමත් සාමාන්‍යයෙන් ඔය වාගේ ප්‍රශ්න ඇති වෙනවා. පාවිච්චි කරන්නේ නැතිව බෙයාරින් යන්න විධියක් නැහැනේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමනි, යම්කිසි කාලයක් පාවිච්චි කරන විට කොයි යන්ත්‍රයේ වුණත් යම් යම් ප්‍රශ්න එනවා. ජල විදුලි බලාගාරයක වුණත්, තාප විදුලි බලාගාරයක වුණත් එහෙමයි. මෙහි නව වතාවක් බිඳ වැටීම් සිදු වෙලා තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විසිඑක් වතාවක් බිඳ වැටිලා තිබෙනවා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
සාමාන්‍යයෙන් මේවා යන්ත්‍රයක් පාවිච්චි කරන විට එන දෝෂ. ඒ නිසා ඔබතුමන්ලා විග්‍රහ කරන්න එපා, පාවිච්චි කරපු ඒවා ගෙනාවාය කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Brand new ඒවා ගෙනාවා නම් -

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඔබතුමාගේ ප්‍රශ්නය මට කියන්නකෝ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව පැහැදිලි කිරීමක් ඕනෑ නිසායි මම කියන්නේ.

පාවිච්චි නොකළ ඒවා නේ ගෙනැවිත් තිබෙන්නේ; brand new නේ. එහෙම ඒවා විසිඑක් වතාවක් කැඩෙන්න තරම් දෝෂ තිබුණේ කොහොමද කියලායි මම අහන්නේ. කාලයක් පාවිච්චි කළාට පස්සේ නම් එහෙම වෙනවා. හැබැයි, මේවා පාවිච්චි කර තිබෙන්නේ මාස කීයද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමනි, විසි එක් වතාවක් බිඳ වැටීමක් කියන්නේ සාමාන්‍යයෙන් trip switch එක off වෙනවා කියන එක වෙන්නත් පුළුවන්. සාමාන්‍යයෙන් ඒක අපේ ගෙදරක වුණත් currrent එකේ ඇති වන මොකක් හරි ප්‍රශ්නයකදී සිද්ධ වෙන දෙයක්. තමුන්නාන්සේලා මේවා උලුප්පා උලුප්පා, 'නොරොච්චෝලේ' 'නොරොච්චෝලේ' කියනවා.

ගරු මන්ත්‍රීතුමනි, 1982 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ත්‍රිකුණාමලයේ ගල් අඟුරු බලාගාරයක් හදන්න හැදුවා, කරන්න බැරි වුණා. 1992 දී ප්‍රේමදාස මහත්මයා දකුණේ හදන්න හැදුවා, කරන්න බැරි වුණා. ඊළඟට චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය 1999 දී හදන්න හැදුවා, කරන්න බැරි වුණා. ඉතින්, ආත්ම ධෛර්යයක් තිබෙන, මේ රටට ආදරය කරන, අඩු මිලට විදුලිය නිපදවන්න ඕනෑය කියා හිතූ කරපු රාජ්‍ය නායකයා දේශපාලන වාසි බලන්නේ නැතුව ගල් අඟුරු බලාගාරය හැදුවා. ඒ ගැන සතුටු වෙන්න. තමුන්නාන්සේලා පන්දම් අරගෙන ගිහිල්ලා පත්තු කර ගෙන උද්ඝෝෂණ කරන්නේ නැතුව ඒ ගැන සන්තෝෂ වෙන්න. තමුන්නාන්සේලා පන්දම් ඇල්ලුවේ එල්ටීටීඊ එකටනේ. එහෙම පන්දම් ඇල්ලිල්ල කරන්නේ නැතුව තමුන්නාන්සේලා නොරොච්චෝලේ බලාගාරය ළඟට ගිහිල්ලා ජාතියෙන් සමාව ඉල්ලන්න, "අනේ අපට සමා වෙන්න, අපට මේවා හදන්න බැරි වුණා, මහින්ද රාජපක්ෂ මැතිතුමාට ධෛර්යයක් තිබුණා මේක හදන්න" කියලා. ඒ විධියට ජාතියෙන් සමාව ඉල්ලන්න. නව සැරයක් බිඳ වැටීම කියන්නේ ලොකු බිඳ වැටීමක් නොවෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය. දැන් පන්දම වෙනස් කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඇහුවේ මේකයි. එතුමිය කිව්වා, "ඒකට ශක්තියක් තිබෙන නායකයෙක්" වාගේ කථා. ඒවා ඔක්කෝම හරි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ මම කියන්න. අපි වඳින්න ඕනෑ නැහැ. එහෙම එකක් මේ රටට ගෙනැල්ලා 21 වතාවක් කැඩුණාම, රටට විදුලි බලය දෙන්න බැරි නොරොච්චෝලේ තාප බලාගාරය ගෙනාපු ඔබතුමියලා අපට වඳින්න ඕනෑ; මේ රටේ ඉන්න ජනතාවට වඳින්න ඕනෑ. අපි වඳින්න ඕනෑ නැහැ. මොකටද අපි වඳින්නේ?

ගරු පවිත්‍රාදේවි වන්නිආර-ච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
එම බලාගාරයෙන් මෙගාවොට් 300ක විදුලි ධාරාවක් නිරන්තරයෙන් අපේ විදුලි පද්ධතියට එකතු වෙනවා. යම් කිසි බිඳ වැටීමක් වුණත්, පසුව ඒක හැදෙනවා. අවුරුදු ගණනක් වැඩ කරන කොට ඕනෑම machine එකක එහෙම දෙයක් සිද්ධ වෙන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු ඇමතිතුමියනි, 2012 වර්ෂයට එම බලාගාරයෙන් ගිගාවොට් පැය 1,800ක් බලාපොරොත්තු වුණා. ඇත්තටම ලැබුණේ ගිගාවොට් පැය 1,100යි. එතකොට මේ රටට ගිගාවොට් පැය 700ක් තාප බලාගාරවලින්, එහෙම නැත්නම් තෙල්වලින් වැඩ කරන ඩීසල් බලාගාරවලින් නිපදවන්න අපට සිද්ධ වුණා. එතකොට ඒ ගණන නිපදවන කොට, ඒ කියන්නේ ගිගාවොට් පැය 700ක් ලබා ගන්න කොට සාමාන්‍යයෙන් එක ඒකකයක් නිපදවීමට රුපියල් 20 ගණනේ ගණන් හදලා බැලුවොත් - සාමාන්‍යයෙන් තෙල්වලින් ඒකකයක් නිපදවන්න රුපියල් 30ක් විතර වැය වෙනවා. නමුත් රුපියල් 20ක් වැය වෙනවා කියලා හිතමු- පසු ගිය 2012 වසරේ විතරක් රුපියල් මිලියන 14,000ක් මේ රටට පාඩු වෙලා තිබෙනවා. හොඳ යන්ත්‍ර ගෙන්වන්නේ නැතුව මේ වාගේ කැඩෙන යන්ත්‍ර ගෙනැල්ලා 2012 දී මේ රටට වුණු රුපියල් මිලියන 14,000ක පාඩුවට කවුද වග කියන්නේ?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ඒ ගැන හරියට දන්නෙ නැතුවනේ කථා කරන්නේ. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් නිපදවන මුළු capacity එකම විදුලිබල පද්ධතියට හැම වෙලාවේම එකතු වන්නේ නැහැ. ඒ සම්පූර්ණ capacity එකම එහෙම එකතු කරන්නත් බැහැ. විදුලිය ලබා දීමේදී විදුලිබල පද්ධතියට නොරොච්චෝලේ බලාගාරයේ තිබෙන මෙගාවොට් 300ම දිගටම දෙන්නත් බැහැ. ඒකෙන් ගන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගන්නේ නැති ප්‍රමාණය ගැන තමුන්නාන්සේ කොහේවත් තිබෙන සංඛ්‍යා ලේඛන ටිකක් අරගෙන ඇවිල්ලායි ප්‍රශ්න කරන්නේ. තමුන්නාන්සේගේ ප්‍රශ්නයෙන් එහෙම එකක් අහලාත් නැහැ. ඒ එකතු කරන්නේ නැති ප්‍රමාණය රටට වුණු පාඩුවක් ලෙස ගණන් ගන්න බැහැ. ඔබතුමා හරියට දන්නෙ නැතුව කථා කරන්න එපා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තුන අවසානයි.

සවුදි අරාබියේ අතරමං වූ ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් : පියවර

சவூதி அரேபியாவில் அநாதரவாகியுள்ள இலங்கைப் பணிப்பெண்கள் : நடவடிக்கை

SRI LANKAN HOUSEMAIDS STRANDED IN SAUDI ARABIA : ACTION TAKEN

3435/'13

14.ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) සවුදි අරාබියේ රියාද්හි ගෘහ සේවිකාවක වශයෙන් සේවය කර මෙරටට පැමිණි කොම්පඤ්ඤවීදියේ අන්වර් ෂියානා මහත්මිය විසින් හෙළි කරන ලද තොරතුරු අනුව එරටේ සිර කර තබා ගෙන සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් 50ක් පමණ ගණිකා වෘත්තියෙහි යොදවමින් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ පිළිබඳව සෙවීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පිරිස මුදවා ගෙන වහාම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගෘහ සේවිකාවන් පිරිස අතරමං කිරීමට ක්‍රියා කළ විදේශ සේවා නියෝජිත ඒජන්සිකරුවන්ට හා එයට මැදිහත් වූ අනෙකුත් අයට එරෙහිව ගත් ක්‍රියා මාර්ග කවරේද;

(ii) එම කාන්තාවන්ගේ පවුල්වල ආරක්ෂාව, සුභසාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්ෂණිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) சவூதி அரேபியாவின் ரியாதில் வீட்டுப் பணிப் பெண்ணாகச் சேவையாற்றிவிட்டு இலங்கைக்கு வருகைதந்துள்ள கொம்பனித்தெருவைச் சேர்ந்த திருமதி அன்வர் சியானா வெளியிட்டுள்ள தகவல்களுக்கு அமைய அந்நாட்டில் சிறைவைக்கப் பட்டுள்ள இலங்கை வீட்டுப் பணிப்பெண்கள் சுமார் 50 பேர் விபசாரத் தொழிலில் ஈடுபடுத்தப்படுவதை அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், அது தொடர்பாக கண்டறிவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) இவர்களை விடுவித்து உடனடியாக இலங்கைக்கு அழைத்துவருவதற்கு மேற் கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி வீட்டுப் பணிப்பெண்களை அநாதரவான நிலையில் கைவிடுவதற்குச் செயற்பட்டுள்ள வெளிநாட்டு வேலைவாய்ப்பு முகவர்கள் மற்றும் அதற்குப் பங்களிப்புச் செய்துள்ள ஏனையோருக்கு எதிராக மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பெண்களது குடும்பங்களின் பாதுகாப்பு, நலன்புரி மற்றும் பொருளாதாரத்தை மேம்படுத்து வதற்கான நடைமுறைச்சாத்தியமான வேலைத் திட்டமொன்றை உடனடியாக அமுல்படுத்த நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Is he aware that around 50 Sri Lankan housemaids are imprisoned and being employed in prostitution in Saudi Arabia according to the information revealed by Ms. Anvar Shiyana of Slave Island, who worked as a housemaid in Riyadh in Saudi Arabia and has come back to the country?

(b) Will he inform this House -

(i) the steps that have been taken to look into it; and

(ii) the measures that have been taken to get them released and bring them back to Sri Lanka?

(c) Will he state -

(i) what action was taken against the foreign employment agents who have worked to leave the above group of housemaids stranded and against others who associated with it; and

[ගරු රන්ජන් රාමනායක මහතා]

(ii) whether a practical course of action will be adopted immediately in order to ensure security of the families of these women and to enhance their welfare and economy?

(d) If not, why?

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්. මෙවැනි සිද්ධියක් දේශීය මාධ්‍ය මඟින් වාර්තා කර ඇත.

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් මේ පිළිබඳ මාධ්‍ය හරහා දුන් තොරතුරු අනුව කොම්පඤ්ඤවීදියේ අන්වර් ෂියානා මහත්මිය කැඳවා ඇයගෙන් වැඩිදුර තොරතුරු ලබා ගන්නා ලදී.

(ii) ඒ අනුව සවුදි බලධාරීන්ගේ සහාය ලබා ගෙන එම ස්ථානය වැටලීමට කටයුතු කිරීම සඳහා රියාද්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව තානාපති කාර්යාල නිලධාරීන් අදාළ ප්‍රදේශයට ගොස් දින 03ක් (2013 මාර්තු 6,7 සහ 8) එහි නැවතී ශ්‍රී ලාංකික සේවිකාවකගේ (අන්වර් ශියානා මහත්මියගේ ඥාතියකු වන නූරා අශික් ජවූෆර් මිය) සහාය ලබා ගෙන එම ස්ථානය වටලා ඇත. ඔවුන් එම ස්ථානය වටලන විට කිසිම රැඳවියෙක් එහි සිට නැත.

(ඇ) (i) එවැනි ගෘහ සේවිකාවන් කණ්ඩායමක් එහි රැඳී නොසිටි තත්ත්වයක් තුළ මෙම ප්‍රශ්නය මඟින් අසනු ලබන ගැටලුවද පැන නොනඟී.

(ii) ගරු මන්ත්‍රීතුමා කියන ආකාරයේ වෘත්තියෙහි යෙදුණු කට්ටියක් ඒ ස්ථානයෙන් හසු වුණේ නැති වුවත් සාමාන්‍යයෙන් ගෘහ සේවිකාවන් විදේශගත වුණාට පසුව විදේශගත පවුල්හි ආරක්ෂාව, සුභසාධනය හා ආර්ථිකය නංවාලීම උදෙසා කාර්යාංශය මඟින් සේවක සුභසාධන අරමුදලක් පිහිටුවා ඇති අතර විවිධ අවස්ථාවන්හිදී එම අරමුදලින් විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත මෙන්ම ශ්‍රමිකයා වෙත ප්‍රතිදාන ලබා දෙනු ලබයි. විශේෂයෙන්ම ශ්‍රමිකයෙකු මරණයට පත් වුණොත් ලියා පදිංචි වූ කාලය තුළ නම් රුපියල් ලක්ෂ හතරක මුදලක් ලබා දෙනවා.

ලියා පදිංචි කාලය ඉක්මවලා නම් රුපියල් 150,000ක් දෙනවා. ලියා පදිංචි කාලය තුළ ශ්‍රමිකයා සම්පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වුණොත් රුපියල් ලක්ෂ දෙකක් දෙනවා. ලියා පදිංචි කාලය ඉක්මවලා නම් රුපියල් 150,000ක් දෙනවා. ශ්‍රමිකයා අසනීප තත්ත්වයක් මත පැමිණියොත් ආපසු එන්න වැය කළ ටිකට් පතේ මුදල හා වෛද්‍ය ආධාර ලබා දෙනවා. ශ්‍රමිකයා අසාධ්‍ය තත්ත්වයේ රෝගයකින් පැමිණියොත් රුපියල් 120,000ක් ලබා දෙනවා. ඊට අමතරව, එසේ අසනීප තත්ත්වයෙන් සහ ආබාධිත තත්ත්වයෙන් පැමිණෙන විගමණික ශ්‍රමිකයන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙන් ප්‍රතිකාර ලබා දෙන අතර එම වියදම් සම්පූර්ණයෙන් කාර්යාංශය දරනවා. එසේම ජාතික රෝහලේ ප්‍රතිකාර සඳහා යොමු වූ හා යොමු කළ රෝගීන්ගේ අවශ්‍යතා පිළිබඳව සම්පූර්ණයෙන් අපි සොයා බලා කටයුතු කරනවා. ඒ වාගේම පූර්ණ ආබාධිත රෝගීන් වෙනුවෙන් වටිනා නිවසක් කාර්යාංශය මඟින්ම හදලා දෙනවා. ඒ වාගේම ඔවුන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමට විවිධාකාරයෙන් කටයුතු කරනවා.

රාජ්‍ය බැංකු හා සම්බන්ධ විගමණික ශ්‍රමිකයන් සඳහා රුපියල් ලක්ෂ 5ක් දක්වා උපරිමයකට යටත්ව සහන පොලී යටතේ නිවාස ණය පහසුකම් ලබා දෙන අතර එම පොලියෙන් තුනෙන් දෙකක් කාර්යාංශය ගෙවනවා.

2013 වර්ෂයේ ඉඳලා සමෘද්ධි අධිකාරිය එක්ක සම්බන්ධ වෙලා අපි රුපියල් ලක්ෂ තුනක ණය මුදලක් ලබා දෙනවා. ඒ අය පිටත් වෙන්නට පෙර ඒ ණය මුදල සහන පොලියට ලබා දීලා මාස හයක් ඇතුළත සමෘද්ධි අධිකාරියත් එක්ක එකතු වෙලා ඒ ගෙවල් හැදීමේ ව්‍යාපාරය ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දු දරුවන් වෙනුවෙන් "රටවිරු දරු දිරි" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර ඒ අයගේ දරුවන් වාර්ෂිකව පහ වසර ශිෂ්‍යත්වය සමත් වුණොත් රුපියල් 15,000ක් බැගින්ද, අපොස සාමාන්‍ය පෙළ සමත් වුණොත් රුපියල් 20,000ක් බැගින් ද, අපොස උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් රුපියල් 30,000 බැගින් ද මූල්‍යාමය ශිෂ්‍යත්ව පිරිනමනු ලබනවා. එසේ 2012 වසරේදී පමණක් ශිෂ්‍යත්ව සඳහා ළමුන් 2,715ක් වෙනුවෙන් රුපියල් දස ලක්ෂ පනස්දෙකකට වැඩි මුදලක් ප්‍රදානය කරලා තිබෙනවා.

විගමණික ශ්‍රමිකයන්ගේ දු දරුවන්ගේ විෂය සමගාමී කුසලතා ඇගයීම් කරනු වස් නර්තන, රචනා, ගායනා, කථික හා චිත්‍ර තරග පවත්වනු ලබන අතර මෙයින් ජයග්‍රහණය කරනු ලබන දු දරුවන් සඳහා රුපියල් 50,000, රුපියල් 30,000 හා රුපියල් 20,000 පළමු, දෙවැනි, තෙවැනි ස්ථාන සඳහා ද, කුසලතා දක්වන දු දරුවන් සඳහා රුපියල් 10,000 බැගින් ද පිරිනමනු ලබනවා. ඊට අමතරව ශ්‍රී එෆ්එම් නාලිකාව සහ ස්වර්ණවාහිනී නාලිකාව යටතේ ඒ අයගේ කුසලතාවන් අපි ප්‍රචාරය කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, GCE (Ordinary Level), GCE (Advanced Level) විභාග සමත් වන දරුවන්ට විතරක් නොවෙයි, ඒ අයගේ දරුවන් වෙනත් තාක්ෂණික ආයතනයක යම් කිසි පාඨමාලාවක් හදාරන්න අපෙන් මුදල් ඉල්ලා හිටියොත් අපි ඒ සඳහාත් අවශ්‍ය කරන ශිෂ්‍යත්ව පිරිනැමීම ආරම්භ කරලා තිබෙනවා.

සියලුම ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් දැන් රටවිරු සංවිධාන හදලා ඒ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අලුතෙන් බඳවා ගත් උපාධිධාරීන් තුන් දෙනා බැගින් අනුයුක්ත කරලා ඒ අයට විශේෂ පුහුණුවක් ලබා දීලා දිස්ත්‍රික්ක මට්ටමින් මානසික සහ සාමාජික උපදෙස් අවශ්‍ය නම් ඒ සඳහාත් දැන් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම තානාපති කාර්යාලවලට පැමිණෙන ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ගැටලු නිරාකරණය කරන තෙක් ඔවුන් කාර්යාංශය විසින් නඩත්තු කරන අතර, තානාපති කාර්යාලයේ ආරක්ෂිත මධ්‍යස්ථානයේ -safe house එකේ - රඳවා ගන්නවා.

සාමාන්‍යයෙන් ලෝකය පුරා රටවල් ගණනාවකම -හැම රටෙම පාහේ- මේ වාගේ 1,000ක් 1,200ක් අතර පිරිසක් අපි බොහෝ විට රැක බලා ගන්නවා. ඒ වාගේම ඒ ආරක්ෂිත ස්ථානවල රඳවාගෙන ඉන්න අය සම්බන්ධයෙන් මතු වන ගැටලු විසඳීම, ඒ අයගේ කටයුතු සම්බන්ධීකරණය කිරීම වාගේ කාර්යයන් තානාපති කාර්යාලයේ විශේෂ නිලධාරීන් යොදවා ගෙන විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේත්, අපේ අමාත්‍යාංශය යටතේත්, කම්කරු අමාත්‍යාංශය යටතේත් සිදු කරනවා.

(ඈ) පැන නොනඟී.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාට යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමා සහ බැසිල් රාජපක්ෂ මැතිතුමා ගෙන යන නිවාස යෝජනා ක්‍රමයට ප්‍රථමයෙන්ම ප්‍රශංසා කරනවා. එය කාලෝචිත හොඳ පියවරක්. රට විරුවන්ට ගෙවල් ලබා දීම සම්බන්ධයෙන් කුහක දේශපාලනයෙන් තොරව මම සුභ පතනවා. "රට විරුවන්" කියන ඒ ශ්‍රමික කාන්තාවන්ට දැනට ගෙවල් කීයක් ලබා දීලා තිබෙනවාද ගරු ඇමතිතුමනි?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙවල් 800ක් සෑදීම ආරම්භ කරලා තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේ වන විට ගෙවල් කීයක් ලබා දීලා තිබෙනවාද?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අප මේ වැඩ පිළිවෙළ පටන් ගෙන මාස දෙකයි. දැනට ගෙවල් 800ක් හදන්න පටන් ගෙන තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ගරු ඇමතිතුමා මාධ්‍ය තුළින් ප්‍රචාරය කරලා තිබෙනවා -මාධ්‍යයෙන් වාර්තා වුණා- සවුදි අරාබියට ශ්‍රමික කාන්තාවන් යැවීම එතුමා හෙට සිට තහනම් කළොත්, එතුමා ලංකාවේ ජනප්‍රියම ඇමතිවරයා බවට පත් වේවි කියලා. එතුමා එවැනි ප්‍රකාශයක් කරලා තිබුණා. එයින් කියන්නේ, ෂරි-ආ නීතිය තක්කඩි විධියට යොදා ගන්නා මැදපෙරදිග සවුදි රටට ශ්‍රමික කාන්තාවන් යැවීමෙන් කරදරයක්, දුෂණයක්, අපරාධයක් වෙනවාය, බලහත්කාරයෙන් ගණිකා මඩම්වලට යොදවනවාය කියලා සමාජයේ ලොකු කථිකාවක් තිබෙන බව එතුමා සෘජුව හෝ වක්‍රාකාරව පිළිගන්නා බවයි. එතුමා කියනවා- [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. - [*Interruption.*]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඇමතිතුමා කියනවා, එය නැවැත්තුවොත් එතුමා ජනප්‍රියම ඇමතිවරයා වෙනවා කියලා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer. What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, the Shariah Law is God's law. It is Divine law. He cannot say, "*thakkadi"* law. He is insulting. You are a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා හැම දාම ඔය කාරණය කියනවා නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is anything against the Standing Order, that will be expunged from the Hansard.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බෙල්ල කපලා රිසානාව මැරුවා. කොහොමද තක්කඩි නොවන්නේ?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔබතුමාගේ බෙල්ල විතරක් නොවෙයි, වෙනත් දේවලුත් කැපෙයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමාගේ කපලා ඉවරයි නේ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුන් කරුණාකර පාර්ලිමේන්තුවේ ගැලරියේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද සිටිනා බව තේරුම් ගෙන කථා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමාම කියනවා, "සවුදි අරාබියට කාන්තාවන් යන එක නවත්වන්න ඕනෑ. එතකොට මම ජනප්‍රියම ඇමතිවරයා වේවි." කියලා.

[ගරු රන්ජන් රාමනායක මහතා]

ඉතින් මා අහන්නේ, සුඩානය, ඉතියෝපියාව වැනි දුප්පත් රටවල් පවා කම්කරු නීති නැති, ෂරි-ආ නීතිය තිබෙන සවුදි අරාබියට කාන්තාවන් යැවීම තහනම් කර තිබියදීත්, නේපාලනය, බංග්ලාදේශය, පාකිස්තානය, ඉන්දියාව වැනි රටවල් ද සවුදි අරාබියට කාන්තාවන් යැවීම නවත්වා තිබියදීත්, අපි විතරක් ලක්ෂ හයක ජනතාවගේ ජීවිත අඳුරේ දමා තිබෙනවා. එහි යවන කාන්තාවන් එක දිගට දූෂණය කරනවා, මරනවා, කපනවා, කොටනවා, ගණිකා මඩම්වලට යොදවනවා. ඒත් එතුමා කියනවා, ජනප්‍රිය ඇමතිවරයෙක් වෙන්නත් පුළුවන්ලු, සවුදි අරාබියට කාන්තාවන් යැවීම නවත්වන්නේත් නැහැයිලු. මා අහන්නේ, සවුදි අරාබියට කාන්තාවන් යැවීම නවත්වන්නේ කවදාද කියලායි.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අසා තිබෙන ප්‍රශ්නයට මෙම අතුරු ප්‍රශ්නය අදාළ නොවුණත් මා එයට පිළිතුරක් දෙන්නම්. පළමුවන කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂ නායකතුමාත් ඉදිරිපිටම තවත් රටක - සවුදි අරාබියේ- නීතියට නින්දිත ලෙස පරිභව කිරීම තුළින් එක්සත් ජාතික පක්ෂයේ මතය ප්‍රකාශ වුණා. මා හිතන හැටියට මැද පෙරදිග රටවල සහ මුස්ලිම් රටවල සියලු දෙනාම ඉතාම හොඳින් දැන ගනීවි, එක්සත් ජාතික පක්ෂය ඒ රටවල් ගැන බලන්නේ කොයි විධියටද කියලා. එක්සත් ජාතික පක්ෂයේ මතය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මගේ මතය.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය තුළ වුණත් එතුමා මේ රටේ අභිංසක කාන්තාවන් ගණිකාවන් බවට ප්‍රකාශ කර තිබෙනවා. එය සම්පූර්ණයෙන්ම අසත්‍යයි. මේ ප්‍රශ්නය තුළින් වුණත් එතුමා උත්සාහ කර තිබෙන්නේ අභිංසක අම්මලා, අභිංසක නංගිලා ගණිකාවන් හැටියට ප්‍රකාශ කරන්නයි. නමුත් එහෙම වෙලා නැහැ. අපි මේ පිළිබඳව වැටලීම් තුනක් කළා. [බාධා කිරීමක්] මා දැන් ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර දෙනවා. ඔබතුමා එය අහගෙන ඉන්නට ඕනෑ. එතුමා ප්‍රශ්නයක් එක්ක දීර්ඝ වැල්වටාරමක් කිව්වා. මා එය අහගෙන සිටියා නේ. ඉතින් ඒ ප්‍රශ්නයට උත්තර දෙන කොටවත් අහගෙන ඉන්න තරම් ඉවසීමක් නැත්නම් ඒකට මට කරන්න දෙයක් නැහැ. මා දැන් ප්‍රශ්නයට උත්තරය දෙනවා. ප්‍රශ්නය ඇහුවා නම් උත්තරය අහගන්නට තමන්ට හැදියාවක්, විනයක් තිබෙන්නට ඕනෑ. මෙය චිත්‍රපටයක් නොවෙයි; මෙය පාර්ලිමේන්තුව. මෙය බයස්කෝප් මඩුවක් නොවෙයි; මෙය පාර්ලිමේන්තුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභිංසක අම්මලා, අභිංසක නංගිලා, අපේ සහෝදර සහෝදරියන් සම්පූර්ණයෙන්ම ගණිකාවන් හැටියට ප්‍රකාශ කරලායි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ. අපි ඒ සම්බන්ධයෙන් වැටලීම් තුනක් කළා. මෙතුමා කියන එම කාන්තාව නම් කරපු සහායකයකුත් එක්ක ගිහින් සවුදි අරාබියේ වැටලීම් තුනක් කළා. එහෙම එකක් තිබුණේ නැහැ. තමන්ගේ පටු දේශපාලන වාසි තකා මේ රටේ ඉන්න අපේ අභිංසක අම්මලා, අක්කලා ගණිකාවන් හැටියට ප්‍රකාශ කරන මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒ අයගේ දුක් කඳුළු, ව්‍යාපාරයක් - business එකක්- කර ගෙන, ඒවා පෙන්වා ගෙන අරමුදල් හදලා මුදල් හම්බ කරන අය ඒවා කළාට කමක් නැහැ. හැබැයි මේ අභිංසක කාන්තාවන් ගණිකාවන් හැටියට ප්‍රකාශ කරන්න එපා. මේ අපේ අම්මලා, මේ අපේ අක්කලා ගණිකාවන් හැටියට ප්‍රකාශ කරන්න එපා. මොකක් හෝ ප්‍රශ්නයක් මතු වුණාම ඒ ප්‍රශ්නයට පිළිතුරු සොයනවා විනා තමන්ගේ බඩට වදින කොට, මේ අයගේ කඳුළු පෙන්වා සල්ලි හම්බ කර ගැනීමේ ව්‍යාපාරයට වදින කොට, මේ විධියට අභිංසක අය ගණිකාවන් හැටියට හංවඩු ගහන එක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍යවරයා හැටියටත්, අමාත්‍යාංශය හැටියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියටත් අපි කවුරුත් පිළිගන්නේ නැහැ.

ගෘහ සේවිකාවන් හැටියට පිට රට යැවීම තහනම් කිරීම නොවෙයි කළ යුතු වන්නේ. තහනම් කළොත් බොහොම බාල විධියට, බොහොම ලාභ විධියට, චිත්‍රපටයක රහපාන විධියට පැය විසිහතරෙන් මට ජනප්‍රිය වෙන්න පුළුවන්. හැබැයි රටකට ඇමතිවරයෙක් ඕනෑ, ඒ විධියට චිත්‍රපටයක රහ පානවා වාගේ බාල වැඩ කරන්නද? බයිස්කෝප් එකක පෙන්වනවා වාගේ පැය විසිහතරෙන් ප්‍රශ්න ඔක්කොම විසඳලා, චිත්‍රපටය ඉවර වුණාට පස්සේ ගෙදර ඇවිල්ලා ආයෙත් පාරක් ප්‍රශ්න කරේ බැඳ ගන්නද? නැහැ. රටකට ඇමතිවරයෙක් ඕනෑ, ගෘහ සේවිකාවනට තිබෙන්නා වූ ප්‍රශ්නවලට පිළිතුරු සොයන ගමන්, ගෘහ සේවිකාවන් හැටියට යන අය ගෘහ සේවිකාවන් - housemaids - හැටියට නොවෙයි, ඒ තත්ත්වයෙන් එහාට අරන් යන්නේ කොහොමද කියලා බලන්න. දැන් අපි ඒකට පිළියම් යොදලා තිබෙනවා. ඊළඟ මාසයේ පළමුවන දා ඉඳලා සවුදි අරාබියට housemaidලා යවන්නේ නැහැ. හැබැයි යන අය යන්නේ NVQ Level - 3 pass පාස් වෙලා නිසා ඒ අය යන්නේ House-Keeping Assistantලා හැටියටයි. ඒ අයගේ පිට රට යෑම තහනම් කරනවා වෙනුවට, ඒ අය යන එක නවත්වනවා වෙනුවට, ඒ අය ගෘහ සේවිකාවන් හැටියට නොවෙයි, නමුත් ඊට වඩා වැඩියෙන් පඩි ලබන, ඒ වාගේම ඒ රටේ සමාජ ආරක්ෂණ කටයුතුවලට මැදිහත් වෙන්න පුළුවන් ආකාරයේ NVQ Level - 3 මට්ටමේ පුහුණුවක් දීලා House-Keeping Assistantලා හැටියටයි යවන්නේ. අන්න එහෙමයි මේ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න ඕනෑ. එහෙම නැතුව මෙතුමා කියන ආකාරයට ඒ අයව ගණිකාවෝ විධියට හංවඩු ගහලා, ඒ අභිංසකයන්ගේ නමට, නම්බුවට, කීර්තියට හානියක් වන ආකාරයට කටයුතු කරමින් නොවෙයි මේ ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නට ඕනෑ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා වෙනම අර්ථ කථනයක් නිරූපණය කරන්න හැදුවා. මම ශ්‍රමික කාන්තාවන්ට කවදාවත් ගණිකාවන් කියලා කිව්වේ නැහැ. එතුමා තමයි ඒක වවා ගෙන කන්නේ.

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව. මේ වාර්තාවේ සඳහන් වනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, මෙන්න මෙහෙම:

"2.2.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණු වලින් බැහැර වූ වොලි බෝල් ක්‍රීඩාව වෙනුවෙන් රුපියල් 9,721,189ක් වියදම් කර ඒ තුල වොලිබෝල් සංගමය විසින් දැරිය යුතු රු.2,654,304 ක් ආයතනය විසින් දරා තිබුණි."

දැන් මොකක්ද මේකේ අරමුණ? එතුමා වොලිබෝල් සංගමයේ සභාපතිවරයා. අර අහිංසක ශ්‍රමික කාන්තාවන් මැරි මැරී වැඩ කරලා ගෙනාපු සල්ලි දමනවා, මේ වොලිබෝල් සංගමයට. ඒ සුළුපටු ගණනක් නොවෙයි. මේ විගණන වාර්තාව.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයට අදාළ නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
මගේ ප්‍රශ්නය අහලා ඉවර නැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයට අදාළ නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order. මගේ ප්‍රශ්නය අහලා ඉවර නැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
අහන ප්‍රශ්නය අදාළ නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
ඇත්ත කථා කරද්දී "අදාළ නැහැ" කියනවා. හොරකම් ගැන කියද්දි "අදාළ නැහැ"කියනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නයක් ඇසිය හැක්කේ, මූලික ප්‍රශ්නයෙන් හා එහි පිළිතුරෙන් පැන නැඟෙන කාරණාවක් සම්බන්ධව පමණයි. ඉතාම කෙටියෙන් අහන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
මේ ආපු අයට වන්දි ගෙවා නැහැ. මගේ ප්‍රශ්නය වන්දි ගෙවන්නේ නැතිව, ඒ මුදල් වෙන දේවල්වලට වියදම් කිරීමයි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් පිළිතුරු දෙන්න.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(මාණ්පුමිකු ඩිලාන් පෙරේරා)
(The Hon. Dilan Perera)
පිළිතුර ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කරන්නට දෙයක් නැහැ, ගරු මන්ත්‍රීතුමා මෙතැන කෑ ගහලා තමන්ගේ හැකියාව සහ නොහැකියාව පෙන්වීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නොවුණත් මම පිළිතුරු දෙන්නම්. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ගිය අයවැය විවාදයේදී මේ කාරණය පිළිබඳව මතු කරලා, ඒ පිළිබඳව අප පිළිතුරු දීලා තිබෙනවා. දැන් මේ වෙනකොට විගණකාධිපතිතුමා අපේ පිළිතුර හාර අරගෙන තිබෙනවා. "කොජ්" එකේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ පිළිතුර හාර අර ගෙන තිබෙනවා. ඒ පළමු වන කාරණය.

දෙවන කාරණය, මා ජාතික වොලිබෝල් සංගමයේ සභාපති වුණත්, නොවුණත් මා පිළිගන්නා කාරණයක් තමයි, ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පමණක් නොවෙයි. - විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වේවා, වරාය අධිකාරියේ වේවා, ගුවන් හමුදාවේ වේවා, ගුවන් තොටුපොළේ වේවා, විදුලිබල අමාත්‍යාංශයේ වේවා, ඒ හැම ක්‍රීඩකයෙකුටම උදවු කරන්නට ඕනෑය කියන කාරණය. ඒක භේදයක් නැහැ. ඒක මා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටියත් කරනවා. වරායේ හිටියත් කරනවා. මොකද, ක්‍රීඩාවෙන් මේ ජාතික මට්ටමට එන දරුවෝ එන්නේ ගමේ ඉඳලා. ඒ සමහර දරුවෝ "රට විරුවන්ගේ" දරුවෝ. හැබැයි. එක කාරණයක් කියන්න ඕනෑ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මා ඉන්න කාක් කල් එක එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඕනෑ විධියට අපේ අහිංසක කාන්තාවන් ගණිකාවන් කරන්නට ඉඩ දෙන්නේ නැහැ කියන කාරණය මා පැහැදිලිව කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15-3441/'13-(2), ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය නැවත වාරයක් අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය- ප්‍රශ්න අංක 1- 1850/'11-(3), ගරු රවි කරුණානායක මහතා

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න 6-3061/'12-(1),ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down

මැතිවරණ කොමිෂන් සභාව : සාමාජිකයන්
தேர்தல்கள் ஆணைக்குழு : அங்கத்தவர்கள்
ELECTIONS COMMISSION: MEMBERS

3065/'12

7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith P. Perera)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) ;

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කළ යුතු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සාමාජිකයන් සතු වගකීම් කවරේද;

(iii) එම සාමාජිකයන් පත්කිරීම පිළිබඳ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පවරා ඇති අය කවුරුන්ද;

(iv) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් මේ වන විට පත්කර තිබේද;

(v) නොඑසේ නම්, එම ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசியலமைப்பின் பிரகாரம் தேர்தல்கள் ஆணைக்குழுவுக்கு நியமிக்கப்படவேண்டிய அங்கத்தவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி அங்கத்தவர்களுக்குரிய கடமைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி அங்கத்தவர்களை நியமிக்கும் பொறுப்பு அரசியலமைப்பின் மூலம் யாருக்கு ஒப்படைக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) தேர்தல்கள் ஆணைக்குழுவின் அங்கத்தவர்கள் ஏற்கெனவே நியமிக்கப்பட்டுள்ளார்களா என்பதையும்;

(v) இன்றேல், இந்தச் சட்டப் பொறுப்புக்களைப் புறக்கணிப்பதற்கான காரணம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the number of members that should be appointed to the Elections Commission as per the Constitution;

(ii) the responsibilities of those members;

(iii) the person in authority who has been assigned with the responsibility of appointing those members by the Constitution;

(iv) whether members of the Elections Commission have been appointed by now; and

(v) if not, the reason for the negligence of this statutory responsibility?

(b) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නට පිළිතුර **සභාගත *** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 03යි.

(ii) "නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම" යන මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථයන් ඉෂ්ට වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ තත්කාලයේ බලපවත්නා අනෙකුත් නීතීන් මඟින් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති සියලු බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කරලීම සහතික කර ගැනීම.

(iii) පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇත.

(iv) නැත.

(v) ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීමක් සිදු වී නොමැත. රටේ මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල ව්‍යුහයන් වත්මන් අවශ්‍යතාවනට සරිලන කත්ත්වයකට පත් කරලීමේ අරමුණින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්හි බොහෝ අංශයන් ගැඹුරින් අධ්‍යයනය කරනු පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට රජය දීර්ඝ කාලයක් තිස්සේ මහත් ඕනෑකමින් සිටි බැව් ජනතාව මැනවින් දන්නා කරුණකි. අවාසනාවකට මෙන් බොහෝ අවස්ථාවන්හිදී මෙකී ආරම්භක කාර්යය කල් දැම්මට සිදු වූයේ කාරක සභාවේ කාර්යයන්ට සහභාගිවීමෙහිලා එකඟත්වයකට එළඹෙන්නට විපක්ෂයේ කණ්ඩායම් ගණාවක් ප්‍රමාද වීමේ හේතුවෙනි. මෙවන් තත්ත්වයක් යටතේ, කාරක සභාව කැඳවීමටත් එකඟතාවෙන් හඳුනාගනු ලබන ප්‍රමුඛතා පාදක කොටගෙන, ව්‍යුහගත හා කාල නිශ්චිත ආකාරයකින් කාරක සභාවේ කටයුතු කඩිනම් කිරීමටත් රජය දැන් තීරණය කර ඇත.

මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින්. දැනටමත් රැස්වීම් අරඹා ඇති පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ තීරණයන් ලැබෙනතෙක් පුළුල් පරාසයක කරුණු සම්බන්ධයෙන් වෙනස් කළ නොහැකි ආකාරයේ ක්‍රියාමාර්ග ගැනීම පසුවට කල් තැබීම සුපැහැදිලිව ම දූරදර්ශී වන්නකි. මැතිවරණ කොමිෂන් සභාවට අදාළ කරුණු මෙකී කාරක සභාවේ අවධානයට යොමුවනු ඇතැයි අපේක්ෂා කිරීම සාධාරණ වෙයි. එහි නිගමන රජයට දැනුම් දෙනු ලැබූ විට නිසි ක්‍රියාමාර්ගයක් ගැනීම සලකා බැලෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

මතුගම කුමාර වෙල්ගම මාවත: කැඩූ කඩ කාමර

මත්තුකම குமார வெல்கம மாவத்தை : உடைக்கப்பட்ட கடைகள்

MATHUGAMA KUMARA WELGAMA MAWATHA: DEMOLISHED MARKET STALLS

3164/'12

12.ගරු ජෝන් අමරතුංග මහතා (ගරු පාලිත තෙවරප්පෙරුම මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு பாலித தெவரப்பெரும சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Palitha Tewarapperuma)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) මතුගම සාන්ත මේරි මාවත ලෙසින් පෙරදී හැඳින්වූ වත්මන් කුමාර වෙල්ගම මාවතේ, 1991 දී තාවකාලිකව ඉදි කර පසුව 2005.03.30 දිනැති ප්‍රාදේශීය සභා අනුමතිය අනුව ස්ථිරව තනා විදුලි සැපයුම ද ලබා ගෙන තිබූ කඩ කාමර 70 ක් හදිසියේම කඩා ඉවත් කර ඇති බවත්;

(ii) එම නිසා පවුල් 70ක සාමාජිකයින් මේ වන විට අසරණව ඇති බවත්;

(iii) නව කඩ කාමර ලබා දීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් එක් කඩ හිමියෙකුගෙන් රු.100,000.00ක් බැගින් අත්තිකාරම් මුදල් ලබා ගෙන ඇති බවත්;

(iv) නව කඩ කාමර ඉදි කිරීමට ප්‍රාදේශීය සභාව සතු ඉඩමක පස් පරීක්ෂා කර ඇති නමුත් මෙතෙක් ඒවා ඉදි කර වෙළෙඳුන්ට ලබා නොදීම නිසා ඔවුන් විරෝධතා ක්‍රියා මාර්ගයන්ට යොමු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කඩ කාමර කඩා ඉවත් කිරීමට උපදෙස් දුන් අය කවුරුන්ද;

(ii) නව කඩ කාමර ලබා දීමට අයකළ අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iii) නව කඩ කාමර ඉදි නොකිරීමට හේතුව කවරේද;

(iv) කඩ කාමර අහිමි වූ වෙළෙඳුන්ට නව කඩ කාමර ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்துகம புனித மேரி வீதி என முன்பு அழைக்கப்பட்ட தற்போதைய குமார வெல்கம மாவத்தையில் 1991ஆம் ஆண்டு தற்காலிகமாக நிர்மாணிக்கப்பட்டு பின்னர் 2005.03.30ஆம் திகதி பிரதேச சபை அங்கீகாரத்தின்படி நிரந்தரமாக நிர்மாணிக்கப்பட்டு மின்சாரத் தையும் பெற்றிருந்த 70 கடைகள் திடீரென உடைத்து அகற்றப்பட்டுள்ளன என்பதையும்;

(ii) இதன் காரணமாக 70 குடும்பங்களைச் சேர்ந்த அங்கத்தவர்கள் தற்போது நிர்க்கதிக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்;

(iii) புதிய கடைகளைப் பெற்றுக் கொடுப்பதற்காக பிரதேச சபையானது ஒவ்வொரு கடை உரிமையாளர்களிடமிருந்து ரூபா 100,000.00 முற்பணத் தொகையைப் பெற்றுள்ள தென்பதையும்;

(iv) புதிய கடைகளை நிர்மாணிப்பதற்காக பிரதேச சபைக்குச் சொந்தமான காணியொன்றில் மண் பரிசோதனை நடைபெற்றுள்ளபோதிலும் இதுவரை இவை நிர்மாணிக்கப்பட்டு வியாபாரி களுக்கு வழங்கப்படாதமையினால் அவர்கள் எதிர்ப்பு நடவடிக்கைகளில் ஈடுபட்டுள்ளனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கடைகளை உடைத்து அகற்றுவதற்கு ஆலோசனை வழங்கியோர் யாவர் என்பதையும்;

(ii) புதிய கடைகளைப் பெற்றுக் கொடுப்பதற்காக அறவிடப்பட்ட முற்பணத் தொகை சம்பந்தமாக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை யென்பதையும்;

(iii) புதிய கடைகள் நிர்மாணிக்கப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

(iv) கடைகளை இழந்த வியாபாரிகளுக்கு புதிய கடைகள் வழங்கப்படும் திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that -

(i) 70 market stalls on the Kumara Welgama Mawatha earlier known as Mathugama St. Mary's Road, which were built temporarily in 1991 and made permanent building with electricity supply subsequently as per the Pradeshiya Sabha approval dated 30.03.2005, have been suddenly demolished;

(ii) members of 70 families have been rendered helpless as a result;

(iii) the Pradeshiya Sabha has charged an advance of Rs. 100,000/- from each shop owner in order to provide new market stalls; and

(iv) the soil of a land belonging to the Pradeshiya Sabha has been tested in order to build new market stalls but as they have not yet been built and handed over to the traders, they have resorted to various means of protest ?

(b) Will he state -

(i) the names of the persons who gave instructions to demolish the market stalls mentioned above;

(ii) the action taken with regard to the advance charged for providing new market stalls;

(iii) the reasons for not building new market stalls; and

(iv) the date on which new market stalls will be provided for those traders who lost market stalls ?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) නැත.

සභාව සමඟින් ඇති කර ගත් ගිවිසුම යටතේ ඉවත් කිරීමේ හැකියාව ඇත. අපහසුතාවක් ඇති වීම වළක්වා ගැනීම සඳහා මතුගම ශ්‍රවණාගාර භූමියේ වෙළෙඳසැල් පවත්වා ගෙන යාමට ඉඩ දී ඇත.

(iii) ඔව්.

(iv) නිවැරදිය. යම් ප්‍රමාදයක් පවත්නා බව සත්‍යයකි.

(ආ) (i) සී/ස මතුගම ශාන්ත මරියා මාවත වෙළෙඳ සංගමය හා මතුගම ප්‍රාදේශීය සභාව සමඟ ඇති කර ගත් ගිවිසුමකට අනුව කඩා ඉවත් කිරීමට සිදු වී ඇත.

(ii) එම මුදල් ප්‍රාදේශීය සභාවේ ගිණුමක තැන්පත් කර ඇත.

(iii) මීට අදාළව අධිකරණයේ නඩු විභාගයක් පවතින හෙයින්.

(iv) නඩු ක්‍රියා මාර්ග අවසන් වූ පසු ඉදිරි කටයුතු කරනු ඇත.

(ඇ) පැන නොනඟී.

අලව්ව, හුම්බුළුව - නැහෙනහිර පෞරාණික වැව: සංවර්ධනය
அளவ்வ, ஹும்புலுவ கிழக்கு புராதன குளம் : அபிவிருத்தி
ANCIENT TANK IN ALAWWA, HUMBULUWA-EAST : DEVELOPMENT

3406/'12

13.ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හුම්බුළුව නැහෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පෞරාණික වැවක් පිහිටා ඇති බවත්;

(ii) මේ වන විට එම වැවේ කොටසක් ගොඩ කර ඇති බවත්;

(iii) එම වැව සංවර්ධනය කිරීම තුළින් ගොවීන් විශාල සංඛ්‍යාවකට සෙත සැලසෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැව අයත් ඉඩම සතු වන්නේ කවුරුන්ටද;

(ii) අයිතිකරුවන් සිටී නම්, ඊට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தின் அளவ்வ பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்திற்குரிய ஹும்புலுவ கிழக்கு கிராம உத்தியோகத்தர் பிரிவில் புராதன குளமொன்று அமைந்துள்ளதென்பதையும்;

(ii) தற்போது மேற்படி குளத்தின் ஒரு பகுதி நிரப்பப்பட்டுள்ளது என்பதையும்;

(iii) மேற்படி குளத்தை அபிவிருத்தி செய்வது பெரும் எண்ணிக்கையான விவசாயிகளுக்கு நன்மைபயக்குமென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி குளம் அமைந்துள்ள காணி யாருக்கு உரித்தாயுள்ளது என்பதையும்;

(ii) உரிமையாளர்கள் இருப்பின், அதற்குரிய ஆவணங்களை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Is he aware that -

(i) there is an ancient tank in the Humbuluwa-East Grama Niladhari Division that belongs to the Alawwa Divisional Secretary's Division in the Kurunegala District;

(ii) a part of the tank has been reclaimed by now; and

(iii) a large number of farmers will be benefited by developing this tank?

(b) Will he inform this House -

(i) of the name of the person who owns this land in which the aforesaid tank is located; and

(ii) whether the relevant documents will be submitted if there are owners?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලවව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හුම්බුළුව නැඟෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පෞරාණික වැවක් පිහිටා තිබූ බවට සාධක ඇති අතර, එය රජයට අයත් බවට තහවුරු කිරීම සඳහා සාක්ෂි නොමැත.

(ii) වැවක් තිබූ බවට සාධක ඇති ප්‍රදේශයේ කුඹුරු යායක් අස්වද්දා ඇත.

(iii) එම කුඹුරු අස්වද්දා ඇති ගොවීන් හා ගොවි සංවිධාන වැවක් ඉදි කිරීම සඳහා ස්වකැමැත්ත ලබා දෙන්නේ නම් රජයට ඒ සඳහා මැදිහත් විය හැක.

(ආ) (i) 2000 වසරේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් කරන ලද මැනුම් කටයුතුවලදී මෙම වැව අයත් ඉඩමෙහි හිමිකම්ලාභීන් ලෙස හුම්බුළුව රජමහා විහාරයේ දායක සභාව ඇතුළු ගොවීන් 20 දෙනකුගේ නාම ලේඛනයක් දක්වා ඇත.

(ii) ඉහත ලේඛනයට අදාළව මෙම ඉඩම් කොටසේ හිමිකම්ලාභීන් ලෙස සඳහන් කර ඇති හිමිකරුවන්ගේ නාම ලේඛනය **ඇමුණුමෙහි*** සඳහන්ව ඇත.

(ඇ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Azwer, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I would refer to the Standing Order No. 31, especially 31(7) and 31(10). I want to raise the propriety of entertaining a Question of this nature to which a comprehensive answer has already been given by the Minister.

Standing Order No. 31(7) states, I quote:

"A question may not ask for an expression of opinion, or for the solution of an abstract legal question or of a hypothetical proposition."

Standing Order No. 31(10) states:

"A question making or implying a charge of a personal character shall be disallowed."

So, how can this Member purport to ask a question in this House from the Hon. Minister whether he knows that these women are being made use for prostitution, which cannot be entertained. Sir, this is not a good Parliamentary procedure that we are trying to follow. Not only that, this Member has a habit of insulting the Shariah Law, the Divine law, Allah's law. He is always abusing and insulting the great Kingdom of Saudi Arabia which has close friendly relationship with Sri Lanka.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, I will bring this to the notice of the Hon. Speaker for appropriate action. Thank you very much.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
உள்ளூரதிகார சபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) BILL

"(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ පළාත් පාලන ආයතනවල නගරාධිපති, නියෝජ්‍ය

නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.

2013 ජූලි 23 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතු යයි ද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.

උළුේ‍රාට්ඨි, මාකාණ සභෙකළ් අමෙච්චර් චාර්පිල් මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2013 யூலை 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Dinesh Gunawardena on behalf of the Minister of Local Government and Provincial Councils;
to be read a Second time upon 23rd July, 2013 and to be printed.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இர/குருவிட்ட மத்திய மகா வித்தியாலய பழைய மாணவர் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
R/KURUWITA CENTRAL COLLEGE PAST PUPILS ASSOCIATION (INCORPORATION) BILL

ගරු ජානක බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය"

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Education for report.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඊළඟට ගරු නිලංග සුමතිපාල මහතාගේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම - එතුමා පැමිණ නැත.

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය : විගණකාධිපතිවරයාගේ වැටුප
அரசியலமைப்பின்கீழான தீர்மானம் : கணக்காய்வாளர் தலைமை அதிபதியின் சம்பளம்
DETERMINATION UNDER THE CONSTITUTION: SALARY OF AUDITOR-GENERAL

[අ.භා. 2.15]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්.ඒ.එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු. 48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපති එච්.ඒ.එස්. සමරවීර මහතාට ගෙවිය යුතු වැටුප සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් නිරීක්ෂණ කැඳවන ලද අතර, ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ 5 වන වගන්තියෙහි විධිවිධානයන්ට අනුව SL- 4 - 2006 වැටුප් පරිමාණයේ දෙවන පියවර වන රුපියල් 48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම සුදුසු බව එම කොමිෂන් සභාව නිර්දේශ කර තිබෙනවා. එම තොරතුරු ඇතුළත්ව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ අතර, විගණකාධිපති එච්.ඒ.එස්. සමරවීර මහතා එම තනතුරට පත් කළ 2011.08.15 වන දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ දෙවන පියවර වන රුපියල් 48,940.00ක පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම සහ දෙවන කාරණය වන වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම, තුන්වන කාරණය වන ඉහත 1 සහ 2 සඳහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කිරීම පිණිස 2012.08.22වැනි දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය දෙන ලද බව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ අංක අමප/12/1010/501/025 හා 2012 අගෝස්තු මස 30වැනි දිනැති ලිපියෙන් දන්වා තිබෙනවා. ඒ අනුව තමයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවේ විගණකාධිපතිවරයා පිළිබඳව සඳහන් වෙනවා. එහි 153 (1) අනු ව්‍යවස්ථාව අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් විගණකාධිපතිවරයා පත් කරනු ලබනවා. ඒ වාගේම විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) අනු ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලුම දෙපාර්තමේන්තුවල ගිණුම්ද, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පළාත් පාලන ආයතන කාර්යාලවල සහ රාජ්‍ය සංස්ථා කාර්යාලවල ගිණුම්ද, යම් කිසි ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇති වෙළෙඳ ව්‍යාපාරවල හෝ වෙනත් ව්‍යාපාරවල ගිණුම්ද විගණනය කළ යුතු වෙනවා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේම විගණකාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන් පිළිබඳව සඳහන් කර තිබෙනවා. මේ නෛතික අවශ්‍යතාව ඉටු කිරීම සඳහා තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - Public Accounts Committee එක - ක්‍රියාත්මක වෙනවා. රජයේ දෙපාර්තමේන්තුවල, අමාත්‍යාංශවල සහ කොමිෂන් සභාවල ගිණුම් කටයුතු විගණනය කරලා, අදාළ කාර්ය පරිපාටිය අනුගමනය කරමින් ඒ විගණන වාර්තාව ඉදිරිපත් කළ පසුව Public Accounts Committee එකේ දී එම විගණන විමසුම් පිළිබඳව පරීක්ෂා කර බලා එම කාරක සභාවේ සභාපතිතුමා විසින් මෙම ගරු සභාවට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලබනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ - Committee on Public Enterprises - සභාපතිතුමාත්, එම කාරක සභාවේ සාමාජික සාමාජිකාවනුත් විසින් රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳව වාර්ෂිකව විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව, ඒ වාගේම සමහර රාජ්‍ය ව්‍යවසායන් විගණනය කිරීමෙන් පසුව ඒ පිළිබඳව මත ප්‍රකාශ කරමින් ඉදිරිපත් කරන ඒ වාර්තා පදනම් කරගෙන ඒ පිළිබඳව පරීක්ෂා කරනු ලබනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට අපේ ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා එම වාර්තාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා. මේ වර්ෂය තුළදී පරීක්ෂා කළ 252ක් පමණ වන රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ වාර්තාව සකස් කරලා එය සභාගත කිරීම සඳහා මේ වන විට කටයුතු සම්පාදනය කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාව යටතේයි විගණකාධිපතිවරයා පිළිබඳව සඳහන් වන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත් වැනි පරිච්ඡේදයේ රාජ්‍ය මූල්‍ය පිළිබඳව සඳහන් වනවා. 148 වන ව්‍යවස්ථාවෙන් එය ආරම්භ වනවා. ඒ අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳව වගකීමට පාර්ලිමේන්තුව බැඳී සිටිනවා. ඒ නිසා තමයි ස්ථාවර නියෝග යටතේ මේ කමිටු දෙක ක්‍රියාත්මක කරලා රාජ්‍ය ආයතනවල වගවීම් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් එහි තිබෙන්නා වූ දෝෂ, අඩු පාඩු සම්බන්ධයෙන් පරීක්ෂා කරලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සිදු වන්නේ. ඒ වාගේම අවශ්‍ය අවස්ථාවලදී මේ පිළිබඳව භාණ්ඩාගාරයේ අවධානය යොමු කිරීමත්, අවශ්‍ය නම් නීතිපතිතුමාට යොමු කිරීමත්, දූෂණ කටයුතුවලදී අල්ලස් දෙපාර්තමේන්තුවට යොමු කිරීමත් වැනි ක්‍රියා මාර්ගයන් ගනු ලබනවා. මෙම කොමිටි දෙකේම කාර්ය භාරයන් සාර්ථක කර ගැනීම සඳහා විගණකාධිපතිවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව සුවිශේෂ වූ කාර්ය භාරයක් ඉටු කරනවා.

පසු ගිය වසර කිහිපය තුළදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙත්, ඊට කලින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙත් සාමාජිකයකු හැටියට මා කටයුතු කර තිබෙනවා. ඒ නිසා අපි දන්නවා, විගණකාධිපතිවරයා කොයි තරම් වෙහෙසකර කටයුත්තක නියුක්ත වනවාද කියලා.

සමහර විට පාර්ලිමේන්තුව නොපැවැත්වෙන දිනවලදී පවා උදේ සවස අපි කමිටු විධියට රැස් වෙලා, අනු කමිටු විධියට රැස් වෙලා රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳවත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන සම්බන්ධයෙනුත් විගණන විමසුම්වලට අදාළව කටයුතු කිරීමත් සිදු කරනු ලබනවා. මේ තුළින් බලාපොරොත්තු වන්නේ රජයක් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරන අය වැය ලේඛනයේ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද -ව්‍යවසායන්වලට වෙන් කරන ලද- රාජ්‍ය මුදල් ඉහළ ප්‍රතිශතයකින් පොදු මහජන මුදල් හැටියට යෙදවුණාද කියා සොයා බැලීමයි. මේ මුදල් නිසියාකාරයකින් යෙදවුණාද, සැලසුම් සහගත වැඩ පිළිවෙළකට යෙදවුණාද, එහිදී පරිපාලන රෙගුලාසි හා මූල්‍ය රෙගුලාසි අනුව කටයුතු කළාද, ඒ වාගේම මහා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ අනුව සහ අනෙකුත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවලට අනුව යෙදවුණාද කියන කාරණය පරීක්ෂා කරනු ලබනවා. එය පාර්ලිමේන්තුවේ අපේ වගකීමයි. ඒ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය පසුබිම් සහාය ලබා දෙන්නේ විගණකාධිපතිතුමා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. ඕනෑම රාජ්‍ය ව්‍යවසායක හෝ රාජ්‍ය ආයතනයක යම් ආකාරයක මූල්‍ය අක්‍රමිකතාවක් සිදු වුණා නම් ඒ විෂයය භාර අමාත්‍යවරයාට කමිටුවක් පත් කරලා ඒ ගැන සොයන්න පුළුවන්. එහෙම නැත්නම් කෙළින්ම විගණකාධිපතිතුමාගේ අවධානය යොමු කරලා විශේෂ කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් හෝ වෙනම වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කරන්නට පුළුවන්. එම නිසා විගණකාධිපතිතුමාට පැවරී තිබෙන ඒ වගකීම ඉටු කිරීමේදී විගණකාධිපතිවරයාගේ වැටුප් තීරණය කිරීම පවා පාර්ලිමේන්තුවෙන් සිදු කළ යුතුයි කියන ව්‍යවස්ථාමය ප්‍රතිපාදනය ඇති කරලා තිබෙනවා.

ඒ නිසා මම මෙහිදී සඳහන් කරන්නට කැමැති කාරණයක් තිබෙනවා. අපි දන්නවා අද බහුල ලෙස සාකච්ඡා වන කාරණයක් තමයි රාජ්‍ය ව්‍යවසායන්වල, රාජ්‍ය ආයතනවල දූෂණ, වංචා පිළිබඳ කාරණය. ඒ ආයතන භාරව සිටින දේශපාලනඥයාට ප්‍රහාර එල්ල කිරීම සඳහා එය බොහෝ දුරට උපයෝගී කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වාර්තා අරගෙන බැලුවොත්, බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙපමණ ප්‍රමාණයක අලාභයක් සිදු වෙලා තිබෙනවා; ලංකා විදුලිබල මණ්ඩලයේ මෙතරම් ප්‍රමාණයක අලාභයක් සිදු වෙලා තිබෙනවා ආදී වශයෙන් සඳහන් වෙනවා. මේක රාජ්‍ය ප්‍රතිපත්තියත් සමඟ යම් ආකාරයක සම්බන්ධතාවක් තිබෙනවා. උදාහරණයක් හැටියට බනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් තෙල් ආනයනය කරනවා; බොර තෙල් ආනයනය කරනවා; පිරිපහදු කළ තෙල් ආනයනය කරනවා. බොර තෙල් ආනයනය කරලා කරන්නේ පිරිපහදුව මඟින් පිරිපහදු කරලා එයින් ඇති වන්නා වූ පිරිපහදු තෙල්, පෙට්‍රල්, ඩීසල්, ගුවන්යානා තෙල්, භූමිතෙල්, නැෆ්තා සහ ගෑස් සඳහා භාවිතා කිරීමයි. මම හිතන හැටියට දවසකට ගෑස් ටොන් 75ක් පමණ එනවා. ඒවා ලිට්‍රෝ සහ ලාෆ් කියන සමාගම් දෙකට දෙනවා. මේ ආදී වශයෙන් ව්‍යාපාරයක් කරනවා. Iranian Light crude oil වලින් නම්, පිරිපහදු කරලා ගන්න පුළුවන් වන්නේ සියයට 40යි. ඉතිරි සියයට 60 නිම් තෙල් හැටියට -පිරිපහදු කළ තෙල් හැටියට- විවෘත වෙළෙඳ පොළෙන් ටෙන්ඩර් පටිපාටිය අනුව ආනයනය කරන්නට බනිජ තෙල් සංස්ථාවට සිදු වෙනවා. උදාහරණයක් හැටියට පිරිපහදු කළ ඩීසල් ලීටරයක් ගෙනැත් වරායෙන් ගොඩ බානවා. අපි සියලුම මිල ගණනය කරලා ගත්තාම තෙල් ලීටරයක්

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

රුපියල් 110ක් වෙනවා කියලා හිතනවා නම්, එතැන සිට එකතු වන tax එක රුපියල් 25යි, ගුදම් ගාස්තු, වරාය ගාස්තු සියල්ලම එකතු වෙලා තමයි අවසාන වශයෙන් වෙළෙඳ පොළට එන විට එහි මිල තීරණය වන්නේ.

අද පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 157යි. ඒක විචලනය වනවා. අපි හිතමු ආනයනය කරන ඩීසල් ලීටර් එකක් ගොඩ බාන අවස්ථාවේ රුපියල් 110ක් නම් ඒකට tax එක එකතු වෙලා රුපියල් 121ක් වනවා. වියළි කාලගුණයක් ආවාම විදුලි බලාගාරවලට තෙල් නිකුත් කරන්නට සිදු වෙනවා. රුපියල් 121ක මිලකට තෙල් ලීටර් එකක් ගණනය කරලා විදුලිබල ක්ෂේත්‍රයට දුන්නොත්, අද ඩීසල් භාවිත කරලා ජනනය කරන විදුලි ඒකකයක පිරිවැය රුපියල් 40ක් වෙනවා නම්, ගණනය කරලා බැලුවාම ඩීසල්වලින් විදුලි ඒකකයක් ජනනය කිරීමේ පිරිවැය ඊට වඩා විශාල ප්‍රමාණයක් වෙනවා. අපි එම ගණන රුපියල් 120ක් කියලා ගත්තොත් සාමාන්‍යයෙන් ඩීසල් ලීටරයකට විදුලි ඒකක 4යි නිෂ්පාදනය කරන්නට පුළුවන්. එහෙම නම් එතැනදී විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ඉන්ධනවලට යන මිල රුපියල් 30ක් වෙනවා. එතකොට අනෙක් ගාස්තු සමඟ එකතු වුණාම රුපියල් 40 ඉක්මවා යනවා. හැබැයි දැන් රජයේ ප්‍රතිපත්තිය අනුව පළමුවන ඒකක 30 පාරිභෝගිකයන්ට විකුණන්නේ කීයටද? ඒකකයක් රුපියල් 3.60 බැගින්නුයි. විදුලි ඒකකයකට රුපියල් 40ක පිරිවැයක් යනවා. නමුත් පළමුවන ඒකක 30 පාරිභෝගිකයාට දෙන්නේ රුපියල් 3.60 බැගින්නුයි. දෙවන ඒකක 30 -60 දක්වා- විකුණන්නේ ඒකකයක් රුපියල් 5.40 බැගින්නුයි. තුන්වන මට්ටමට එනකොට -ඒකක 90 දක්වා- විකුණන්නේ ඒකකයක් රුපියල් 7.90 බැගින්නුයි. ජලයෙන් විදුලිය ජනනය කළා නම් ඒකකයක පිරිවැය රුපියල් 2.60යි. වියළි කාලගුණයක් යටතේ එහෙම කරන්න පුළුවන් වෙන්නේ සියයට 20ක් පමණයි. ඉතිරි සියයට 80ම එන්නේ ඉන්ධනවලිනුයි. එහෙම නම් ජලය, ගල් අඟුරු, තාප යන මේ සියල්ලම එකතු කරලා සාමාන්‍යය ගත්තොත් විදුලි ඒකකයක පිරිවැය රුපියල් 22ක් වෙනවා. රුපියල් 22ක නිෂ්පාදන පිරිවැයක් තිබෙද්දි පළමුවන ඒකක 30 දෙන්නේ ඒකකයක් රුපියල් 3.60 බැගින්නුයි. දෙවන ඒකක 30, ඒකකයක් රුපියල් 5.40ක් බැගින් සහ තුන්වන ඒකක 30 ඒකකයක් රුපියල් 7.90 බැගින්නුයි දෙන්නේ. ඉතින් ඕකට පන්දම් පත්තු කරගෙන ගිහින් වැඩක් නැහැ. ඒක තමයි යථාර්ථය. ඇයි එහෙම කරන්නේ? රජයේ ප්‍රතිපත්තිය අනුව විදුලි ඒකකයක පිරිවැය රුපියල් 22ක් වුණත් ඒක අඩුවට විකුණනවා. මෙතැනදී වන අලාභය කොහාටද යන්නේ? හවස 6.30 ඉඳලා රෑ 11.30 වනතෙක් - peak hoursවල - පරිභෝජනය සඳහා දවසකට විදුලිය මෙගා වොට් 2100 - 2400 අතර ඉල්ලුමක් තිබෙනවා. මේ මෙගා වොට් ගණන පරිවර්තනය කරලා, ඒකක පිරිවැය අනුව වෙන පාඩුව ගණනය කළාම පාඩුවේ ප්‍රමාණය බලා ගන්න පුළුවන්. තෙල් වුණත් එහෙමයි. ගෙනාව මිලටම නොවෙයි තෙල් විකුණුවේ. අඩුවෙන් විකුණුවා. එහෙම කළේ ඊළඟට ඒ මිල විචලනය වෙවිය -අඩු වේවිය- කියා අපි බලාපොරොත්තු වුණු නිසායි. නමුත් එහෙම වුණේ නැහැ. හැබැයි අවසාන වශයෙන් ඒකේ බර එන්නේ ආයතනයටයි. ආයතනයට එන බර අවසාන වශයෙන් භාණ්ඩාගාරයට යනවා. එම නිසා තෙල් සංස්ථාව, විදුලි බල මණ්ඩලය වැනි ආයතනවලට රජයේ ප්‍රතිපත්තිය අනුව සහනාධාරයක් දෙන්න තීන්දු කළාම ඒකත් අද වැරදියට පෙන්නුම් කරනවා, මේක වංචාවක්ය, දූෂණයක්ය, මේ පාඩුව වුණේ මෙහෙමයි කියා. නැහැ, පාඩුව වුණු විධිය ගණනය කර බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දවසකට furnace oil ටොන් 4000ක් විදුලි බල ක්ෂේත්‍රයට නිකුත් කරන්න ඕනෑ. ටොන් 4000ක් කියන්නේ ලීටර් මිලියන 4ක්. එක ලීටරයකින් සිදු වෙන පාඩුව රුපියල් 30ක් නම්, දවසකට ලීටර් මිලියන 4ක් නිකුත් කරනවා නම් දවසක පාඩුව රුපියල් මිලියන 120යි. ඒක තමයි තෙල් සංස්ථාව, විදුලි බල ක්ෂේත්‍රයට නිකුත් කරන furnace oilවලින් විතරක් වෙන පාඩුව. දවසකට සිදු වෙන පාඩුව රුපියල් මිලියන 120ක් නම් ඒක දවස් 365න් වැඩි කළාම අවුරුද්දකට සිදු වෙන පාඩුව කොච්චරද කියා දැන ගන්න පුළුවන්. හැබැයි ඒක දේශපාලනය පැත්තට අරගෙන කෑ ගහන්නේ වංචාව, දූෂණය කියායි. එක එක මට්ටම්වල tender proceduresවල යම් යම් ප්‍රශ්න මතු වුණොත් යම් යම් කටයුතු වෙන්න පුළුවන්. නමුත් මෙතරම් ප්‍රමාණයක අලාභයක් වුණේ සහනාධාර මිලකට විදුලි බල ක්ෂේත්‍රයට තෙල් ලබා දීමත්, පාරිභෝගිකයන්ට තෙල් ලබා දීමත් යන කරුණු දෙක නිසායි. හැම ලීටරයක්ම සත 10ක් වැඩි මිලකට විකුණුවා නම් කවදාවත් පාඩු වෙන්නේ නැහැ. ඒ නිසා ඒ කාරණයත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ විගණකාධිපතිවරයාගේ වැටුප් වැඩි කිරීම සඳහායි. එතුමන් සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනවා. ස්ථාවර නියෝග අනුව පිහිටුවා තිබෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - Public Accounts Committee එක- සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන මේ කමිටු දෙකේදී එතුමන්ලා ඒ කාර්ය භාරය ඉටු කරනවා. ඒ නිසා අද කාලයට ගැළපෙන ආකාරයට විගණකාධිපතිතුමාගේ වැටුප නිශ්චය කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අදාළ කාර්ය පටිපාටිය අනුගමනය කරමින් මේ යෝජනාව මේ ගරු සභාවේ අනුමත කිරීම ව්‍යවස්ථාමය කාර්ය භාරයක් වන නිසා මේ අවස්ථාවේදී මම මේ කරුණු ටික ඉදිරිපත් කරමින් මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 2.31]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම මා ඉතාමත් අගය කරනවා. එතුමා COPE එකේදීත් ඉතා ඕනෑකමින් කටයුතු කරන පුද්ගලයෙක්. ඇමතිකම කෙසේ හෝ වේවා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අපි නිර්දේශපාලනීකරණයක් තුළින් තමයි කටයුතු කරන්නේ. මේ අවස්ථාවේදී මා ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා තමයි අද විපක්ෂයෙන් පළමුවෙන්ම කථා කරන්න හිටියේ. නමුත් මට දිවංගත වී.ඒ. සුගතදාස මැතිතුමාගේ 40වන ගුණානුස්මරණ උත්සවයට සහභාගී වෙන්න යන්න තිබෙන නිසා ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මේ අවස්ථාවේදී වවන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මේ අවස්ථාවේදී, මම ඉස්සෙල්ලාම එච්.ඒ.එස්. සමරවීර මැතිතුමා ගැන වවන ස්වල්පයක් කථා කරනවා. එතුමා වරලත් ගණකාධිකාරීවරයෙක්. වරලත් ගණකාධිකාරීවරයකු හැටියට මම ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේදී කියා සිටින්නේ, මේ විධියට සොච්චමක් වැඩි නොකර, මීට වඩා වැඩි ප්‍රමාණයකින් එතුමාගේ වැටුප වැඩි කළ යුතුයි කියන එකයි. මේ ප්‍රමාණය මදි. මේ කරන්නේ අගෞරවයක්. වැටුපක් වැඩි කරනවා නම් අඩු ගණනේ ජීවත් වෙන්න පුළුවන් විධියකට වැඩි කරන්න ඕනෑ. එතුමාගේ කාර්ය මණ්ඩලයේ 1,800 දෙනෙක් ඉන්න ඕනෑකම තිබියදී දැනට ඉන්නේ 1,384 දෙනක් පමණයි. තව ඇබෑර්තු 500ක් තිබෙනවා.

වරලත් ගණකාධිකාරීවරයකු අද රුපියල් ලක්ෂ හය, හත, අට, නවය වශයෙන් වැටුප් ගන්නවා. එසේ තිබියදී මෙතුමාට රුපියල් හතළිස්අටදහස් නවසියයක වැටුපක් දෙනවාය කියන එකෙන් වැඩක් නැහැ.

ඔබතුමන්ලා ඉස්සෙල්ලාම මේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුවක් වශයෙන් කටයුතු කරන්න අවශ්‍යයි. ඒක තමයි කරන්න අවශ්‍ය වන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරු 65 දෙනකු ඉන්නවා. රජයේ සේවකයාට ජීවත් වෙන්න පුළුවන් වන විධියේ වැටුපක් දුන්නේ නැත්නම්, දූෂණය පටන් ගන්නේ එතැනින්.

ඇත්තටම එතුමා මේ තනතුරට පත් කිරීම ගැන මම සතුටු වන බව නැවතත් කියනවා. මුලදී ඒ පත්වීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. නමුත් පසුව හරි ගියා. මේ disclaimer reports, adverse impact reports බැලුවාම, වරලත් ගණකාධිකාරීවරයකු වශයෙන් කොන්දක් ඇතිව එතුමා ඒ reports ඉදිරිපත් කර තිබෙනවාය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හරහා රජයේ ව්‍යාපාර කරන ආයතන පරීක්ෂා කරමින් කරන සේවය වෙනුවෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අපේ ස්තුතිය පුද කරන්න කැමැතියි. නමුත් ඊටත් වඩා කාර්ය භාරයක් කරන්න ඕනෑ. සියයට 10ක, 15ක, 20ක විතර යම් විධියේ අක්‍රමිකතා සොයා ගෙන තිබෙනවා වාගේම, යම් යම් තැන්වල ඇති දූෂණ සෙවීමේදී ආණ්ඩුවේ ග්‍රහණයට හසු වෙලාද කියලා හිතෙනවා. යම් යම් තැන්වල යම් යම් කටයුතු සම්බන්ධයෙන් නිශ්ශබ්දව සිටින බවත් අපි මතක් කරන්න කැමැතියි. විගණකාධිපතිතුමා ගැන වචන ස්වල්පයක් කථා කළ නිසා, ආණ්ඩුවේ තිබෙන අක්‍රමිකතා සහ දූෂණ ගැන වචන ස්වල්පයක් මා කථා කරන්න කැමැතියි.

ත්‍රස්තවාදය තිබෙන අවස්ථාවේදී කිව්වා, "රටේ ආර්ථික යුද්ධය දිනුවොත් අපි සියලුම යුද්ධ දිනනවා" කියලා. ඒක තමයි අද තිබෙන ප්‍රශ්නය. ත්‍රස්තවාදී යුද්ධය ජයග්‍රහණය කළාට ආර්ථික යුද්ධය තවම ජයග්‍රහණය කරලා නැහැ. ප්‍රභාකරන්ට නැති කරන්න බැරි වුණු රටේ ආර්ථිකය මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවෙන් අවුරුදු හතරකින් නැති කර තිබෙනවාය කියන එක සාධක අනුව පෙනෙන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපතිතුමා ගැන කථා කරන මේ මොහොතේ මා කරුණු තුන හතරක් ගැන විශේෂයෙන් කියන්න කැමැතියි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටිනවා. මා අගය කරනවා, එතුමා දේශපාලන බේදයෙන් තොර නායකත්වයක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට දීම ගැන. සාමාන්‍යයෙන් මෙවැනි දේවල් කියන්නේ ඇත්ත වශයෙන්ම යමක් -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ වීය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER left the Chair, and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Chairman of Committees, you seem to have a knack for controlling the voices of this House because when the Deputy Speaker was in the Chair, there was a problem but no sooner you came, there is stony silence. So, it is nice to see that you are able to control matters.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ ආර්ථිකයට හරියාකාර නායකත්වයක් දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙන නිසායි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. අද රටේ නීතියක් නැහැ. අවනීතිය තමයි රජ වෙලා තිබෙන්නේ. අද පොලීසියේ DIGsලා කොන්ත්‍රාත් ක්‍රමයට මරන්න පටන් අරගෙන තිබෙනවා. මිනීමැරුම් කර තිබෙනවා. අද රටේ තත්ත්වය බලන්න. මේ නිසා තමයි රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. බලන්න, පුවත් පත්වල සඳහන් වන දේවල්. "වර්ජන අතර සාකච්ඡා බැහැ" කියලා කුමාර වෙල්ගම ඇමතිතුමා කියා තිබෙනවා. ඒ වාගේම, "දුම්රිය වර්ජනය අවසන් වෙද්දී බස් වර්ජනය ඇරඹේ" යනුවෙන් සඳහන් වනවා. තවත් සඳහන් වනවා, "වාස්ගේ - DIG ගේ- පුතා පොලීසියෙන් සොයයි" කියලා.

Then, there is another headline, “Cabinet Minister’s brother released due to pressure from above”. It refers to one of the Cabinet Ministers from Kandy. Then, the "Daily Mirror" of 9th July, 2013 states, "Kama Colombo" nightclub was illegal - Excise Department" If it is illegal, why is it permitted to stay?

Yesterday, the Hon. Lakshman Yapa Abeywardena, Minister of Investment Promotion informed this House that gambling is illegal and no licences are given for casinos. But, he has given approval for mixed development and if there are casinos and any other vices taking place, what can he do? "මතට තිතක්" කියමින්, බොරු කර කර, ලෝකයට එකක් කියලා ලංකාවට තවත් එකක් කියමින් අන්තවාදය වපුරාගෙන යන අවස්ථාවක් මේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම, අපේ විමල් වීරවංශ ඇමතිතුමා පළාත් සභාවලට සම්බන්ධ ඉඩම් සහ පොලිස් බලතල පිළිබඳ ප්‍රශ්න තිබෙනවාය කියනවා. චම්පික රණවක ඇමතිතුමාත් ඒක කියනවා. ඒ වාගේම, "උතුර මැද පළාත් සභා මන්ත්‍රීවරුන් රට සවාරියක" කියලා දවස් තුන හතරකට ඉස්සෙල්ලා පුවත් පත්වල පළ වුණා. නමුත් ඊට පස්සේ කියනවා, "උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ රට සවාරිය ජනාධිපති නවත්වයි" කියලා. ඒ පළාතේ මහ ඇමති කරන මේ වාගේ ක්‍රියාවක් නවත්වන්න ජනාධිපතිට පුළුවන් නම් ඇයි මේ ඇමතිවරු බොරුවට බයෙන් පළාත් සභා පිළිබඳ බිල්ලෙක් මවන්න හදන්නේ?

දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැති කිරීමේ ප්‍රතිවිපාක ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවශ්‍යයි. මූල්‍ය පාලනය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. විගණකාධිපති ස්වාධීනව පත් කරලා තිබුණා නම් මේ ප්‍රශ්න ඇති වන්නේ නැහැ. ඒ ස්වාධීනත්වය තමයි නැවත ඇති කරන්න අවශ්‍ය වන්නේ. ඒ නිසා ඉඩම් ප්‍රශ්න, පොලිස් බලතල වාගේ බිල්ලෝ මවන්නේ නැතිව නීතිය අනුව ක්‍රියා කරන්න.

[ගරු රවි කරුණානායක මහතා]

දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත ගෙනෙන්න ඕනෑය කියලා අපි ඔක්කොම කෑ ගැහුවා නම් මේ ප්‍රශ්න යම් විධියකට විසඳෙනවා. මා කියන්නේ නැහැ, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අංග සම්පූර්ණයි කියලා. නමුත් අඩු ගණනේ ඒ තුළින් මූල්‍ය විනයක් ඇති වෙයි; පොලීසිය ශිෂ්ට සම්පන්න විධියට කටයුතු කරන්න පටන් ගනියි; නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපති අතේ කියාගෙන වැඩ කරන එක නවතියි. රටේ කටයුතු මේ වාගේ වල්මත් වෙලා තිබෙන අවස්ථාවක, banana republic කියන title එකක් අපේ රටට ලැබිලා තිබෙනවා. සුද්දෝ රටට ආවොත් මරනවා; දූෂණය කරනවා. ඊට පස්සේ කියනවා, "නැහැ, එහෙම ප්‍රශ්න නැහැ" කියලා. ඒ වාගේ ප්‍රශ්න ඇති නොවන විධියට අපි වැඩ කටයුතු කරන්න අවශ්‍යයි.

බලන්න, අද රටේ තිබෙන සංවර්ධනය මොන වාගේ පහත් මට්ටමට වැටිලා තිබෙනවාද කියලා. ගිය සුමානේ පත්තරයක මෙහෙම තිබෙනවා:

"ආශ්චර්යමත් කොළඹ නගරයට අංග සම්පූර්ණ පොදු සනීපාරක්ෂක පද්ධති 7ක්"

ඒ කියන්නේ වැසිකිළි හතක් ආරම්භ කරනවා. මේක කරලා තිබෙන්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ශ්‍රීමතාණන්ගේ මහ පෙන්වීම යටතේ, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ මෙහෙය වීම අනුව. අපේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ඒක විවෘත කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සභායක.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සභායක. විළිලජ්ජාවක් නැද්ද සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. මේ ව්‍යාපෘතිය උදුරා ගන්නේ කොහෙන්ද? උදුරා ගත්තේ කොළඹ නගර සභාවෙන්. කොළඹ නගර සභාව පත් කරලා තිබෙන්නේ කවුද? ජනතාව; එක්සත් ජාතික පක්ෂය. අපේ නගරාධිපති ඒකට ඉඩ දීම සම්බන්ධයෙන් වාගේම ඒ ගැන වචනයක්වත් කථා කළේ නැති එක සම්බන්ධයෙන් මා සම්පූර්ණයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. නමුත් ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. නගර සභාවට අයිති වැසිකිළි හතක් බලහත්කාරයෙන් අරගෙන, ඊට පස්සේ රජයේ ජනාධිපති සහ ලේකම්ලා මඟින් ප්‍රතිසංස්කරණය කරලා විවෘත කරනවා. මේකද රටේ තිබෙන සංවර්ධනය? මෙන්න මේ වාගේ ප්‍රශ්න තිබෙන නිසා තමයි අද රටේ දූෂණය ඇති වෙලා තිබෙන්නේ.

දැන් බලන්න. විගණකාධිපතිගේ දෙපාර්තමේන්තුවෙන් බලන්නේ නැති දේවල් තිබෙනවා. Cost Benefit Analysis එක, එකක්. මේවා ඔක්කොම historical evidence, balance sheet එකේ තිබෙන ප්‍රශ්න. නමුත් ඇත්ත තත්ත්වය අනුව මේ රටේ Cost Benefit Analysis එකක් හරි, economic loss of a particular project එකක් ගැන හරි විගණකාධිපති දෙපාර්තමේන්තුව තවම සවිස්තරව බලලා නැහැ. මා මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා, රජය තුළින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට. මේ වාගේ economic impact එකක්- [බාධා කිරීමක්] අර ආර්ථික ඝාතකයෝ ඉන්නවාය කියන එක. ඒකේ කොටසක් තමයි මේක. ඒ කියන්නේ licence එකක් දෙන්නේ නැතිව තියා ගත්තොත් කෝටි ගණන් නැති වෙන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් විගණකාධිපතිට යමක් කරන්න බැහැ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා අපට ඒ ගැන ප්‍රශ්න කරන්න ඉඩ දීලා තිබෙනවා. දැන් මේ සභාවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඉන්න නිසා මා ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධයෙනුත් විමර්ශනයක් කරන්න පුළුවන් හැකියාව ඇති කරන්න කියලා.

මා උදාහරණයක් කියන්නම්. මේ රටේ satellite තිබෙනවා. මේ satellite එක රටට වාසියි. ආණ්ඩුවේ කවුරු හරි -ජනාධිපති හරි, අගමැති හරි, ඇමති මණ්ඩලයේ කවුරු හරි- මේකට licence එකක් දුන්නාම නිකම්ම ඒක ක්‍රියාත්මක කිරීම නේ තිබෙන්නේ. රටට රුපියල් කෝටි ගණනින් මුදල් නැති වන එකේ ප්‍රතිවිපාකය බලන්න අවශ්‍යයි. ඒ වාගේ ඒවා තමයි අපි සොයා බලන්න අවශ්‍ය වන්නේ. අඩ බෙර ගහලා ඉන්දියාවෙන් Krrish Towers ගෙනාවා. මැයි මාසයේ 30වැනිදාට ඉස්සෙල්ලා ගෙවන්න මුදලක් තිබුණා. නමුත් තවම ඒ මුදල ගෙවලා නැහැ. ඒ සම්බන්ධයෙන් රජයට කිව්වු, කොටස් වෙළඳ පොළේ ප්‍රශ්නයක් ඇති වුණු පුද්ගලයෙකුගේ සම්බන්ධකම තුළින් ඊට වැඩිය ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් විධියක වැඩ පිළිවෙළක් ඇති වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා සොයා බලනවාද, නැද්ද? විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන සොයා බලන්න අවශ්‍යයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා මෙතැන සිටින නිසා එතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මෙන්න මේවා ගැන තමයි අපි සොයා බලන්න අවශ්‍ය වන්නේ කියලා. මෙවැනි ක්‍රියා නිසා අපේ රටට යම් මුදල් ප්‍රමාණයක් අහිමි වනවා. ඒක තමයි මම කිව්වේ විගණකාධිපතිතුමාට රුපියල් ලක්ෂ හයක් නොවෙයි, ලක්ෂ දහයක් දුන්නත් ප්‍රශ්නයක් නැහැයි කියලා. මොකද ඒ දෙපාර්තමේන්තුව තුළින් රුපියල් කෝටි සියයක වියදමක් හරි, දූෂණයක් හරි නවත්වන්න පුළුවන් නිසා. ඒ දේවල් කරන්නේ විගණකාධිපතිතුමා පමණක්ය කියලා මම කියන්නේ නැහැ. එතුමා යටතේ සිටින වරලත් ගණකාධිකාරීවරුන්ටත් ඒ වාගේම market-oriented salary එකක් දෙන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා. මොකද එතැන බොහොම ඕනෑකමින් සහ මහන්සියෙන් ඔවුන් සෑම දෙනාම වැඩ කරනවා. මම විශේෂයෙන් ඒ ගැන කියන්නේ මේ රටේ බොහෝ දෙනෙක් කථා කරන්නේ නීතිඥයෝ ගැන නිසායි. අද ඔවුන් දේශපාලනයේ එක කොටසක් වෙලා. නීතිඥයෝ හිටියොත් ඔක්කොම හරි. අද රටේ ප්‍රශ්න රැසක් තිබෙන්නේ නීතිඥයෝ නිසායි. හැම දේකම ප්‍රශ්නයක් තිබෙනවා. උසාවි ගියාම එතැනින් හේතු සහගත උත්තරයක් ලැබෙනවා මිසක් ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. වරලත් ගණකාධිකාරීවරුන්ටත් නිසි තැන ලබා දෙන්න අවශ්‍යයි කියන පදනමෙන් තමයි මම මේ කරුණු සඳහන් කරන්නේ.

දැන් ආණ්ඩුව හැම කෙනාත් එක්කම සටන් කර කර යනවා. විපක්ෂයත් එක්ක පමණක් නොවෙයි. ඇමෙරිකාව එක්කත් ප්‍රශ්නයක්, යුරෝපීය හවුල එක්කත් ප්‍රශ්නයක්. ඒකෙන් Labour GSP එක නැති වුණා. දැන් IATA එක්කත් ප්‍රශ්නයක් ඇති කර ගෙන යනවා. මම හිතන්නේ මේ ගොල්ලන් ළිදේ සිටින ගෙම්බෝ වාගේයි. ලෝකයේ මොනවාද වෙන්නේ කියලා දන්නේ නැහැ. IATA එකේ තිබෙනවා, දවස් හතකින් ගෙවන්න තිබෙන දෙයක්. මේකේ Director-General නිමලසිරි මැතිතුමා කියනවා, "අපට කමක් නැහැ, දවස් හත ලෝකය පිළිගත්තා වුණාට ලංකාවේ දවස් 10ක් කරන්න ඕනෑ." කියලා. දැන් මොනවාද කරලා තිබෙන්නේ?

මේක ඉන්දියාව වාගේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි අහෝසි කරනවා, වෙනස් කරනවාමයි කියලා ලොකුවට සද්ද කරලා ඊට පස්සේ හෙමින් පොඩි බලු කුක්කෝ වාගේ ඇවිල්ලා ශිව් ශංකර් මෙනන් ඇවිල්ලා ගියා නේද, මොනවාද කිව්වා නේද කියනවා වාගේම IATA කියනවා, ලංකාවෙන් withdraw වනවා කියලා. එහෙම වුණාට පස්සේ මේ රටට මොනවාද වෙන්නේ? මේවා ගැන තමයි විගණකාධිපතිතුමා සොයා බලන්න අවශ්‍ය වන්නේ. මේ දේවල් රජයේ නිලධාරි හරියට ක්‍රියාත්මක කරන්නේ නැති වුණාම මේ රටට අත් වන ප්‍රතිවිපාකය මොකක්ද? IATA මේ රටෙන් withdraw වුණොත් මත්තලට fuel ටැංකියක් නැහැ කියලා තිබෙන ඒවාට අවසර දීලා තිබෙන්නේ කවුද? මේ නිමලසිරි මැතිතුමා. එතුමාම IATA එකට විරුද්ධව කටයුතු කරන්න ගියාම මේ ප්‍රශ්න ඇති වනවා. ඒ සම්බන්ධයෙන් බලන්න අවශ්‍යයි.

ඒ වාගේම තමයි "DailyFT" of 3rd July, 2013 පත්තරයේ තිබෙනවා, "fiscal fumble!" කියලා. ඒ කියන්නේ රටේ ආර්ථික තත්ත්වය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන්නේ මේ පත්තරයේ මේක හරියට වාර්තා කරලා තිබෙනවා. It states, I quote:

> "Govt. misses revenue target by Rs. 51.2 b or 14% up to April; expenditure overshot by Rs. 16 b or 2.5% Year on Year dip in revenue is 4% expenditure up by 7% "

So, the gap is 11 per cent. Now, this 11 per cent in reflection of the total GDP of the country, basically represents a huge figure. You all are not talking of rupees and cents. It is like the exchange rate depreciation.

අපි ගිය අවුරුද්දේ මතක් කළා, රුපියලේ අගය අවප්‍රමාණය වීම නිසා රටට රුපියල් බිලියන 285ක් නැත්නම් රුපියල් කෝටි 28,500ක අලාභයක් වුණා කියලා. ඒ කියන්නේ රුපියල අවප්‍රමාණය වීම නිසා. මේකට හේතුව කෑවාද, බීවාද, ජොලි කළාද කියන එක නොවෙයි. මේ, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 117 සිට 125ට අවප්‍රමාණය වීම නිසා ඇති වුණු ප්‍රශ්නයක්. දැන් එම අගය 125 සිට 134ට අවප්‍රමාණය වෙලා තිබෙනවා. ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්දේ මේ ණයබරතාව රුපියල් බිලියන 345ක් නැත්නම් රුපියල් කෝටි 34,500ක් වැඩි වනවා. මහ බැංකුවේත්, මුදල් අමාත්‍යාංශයේත් මේ වාගේ ප්‍රශ්න තිබෙන කොට කොහොමද මේ රටේ සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් වන්නේ? එතකොට විමල් වීරවංශ ඇමතිතුමා කියන, ආර්ථික ඝාතකයන් එක්කෙනෙක් නොවෙයි, දෙන්නෙක් මෙතැන සිටිනවා. ඒ නිසා යම් විධියකට එතුමා කියන දේ සියයට 50ක් ඇත්තයි කියන ප්‍රශ්නයත් ඇති වනවා. නමුත් ප්‍රශ්නය වන්නේ ආර්ථික ඝාතකයා සිටින එක නොවෙයි. එම ඝාතකයා කැබිනට් මණ්ඩලයේ සිටිනවා නම්, ඉවත් කරන්න ඕනෑ. මේ රටේ අග්‍ර විනිශ්චයකාරවරියව පැය 24න් ඉවත් කරන්න පුළුවන් හැකියාවක් තිබුණා නම් මේ ආර්ථික ඝාතකයා ජනාධිපති යටතේ සිටිනවා නම්, ඇයි ඉවත් කරන්න බැරි වන්නේ? නැහැ. ඒ දෙකම අවශ්‍ය සාධක. බොරුවට පුම්බනවා. ජනතාවට පෙන්වන්න හදනවා මේ රජයේ නිලධාරින් ප්‍රශ්න ඇති කරනවාය කියා. ආර්ථික ඝාතකයෝ නොවෙයි. රට ආරක්ෂා වන්නේ ආර්ථික ඝාතකයෝයි කියන පුද්ගලයෝ නිසයි. නමුත් මහ බැංකුවේ ආර්ථික ඝාතකයා ගැන වචනයක් කථා කරන්නේ නැහැ. ඒ ගොල්ලන්ට ඕනෑ දේ කියනවා. නමුත් හැන්ද තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් මත නිසා, ප්‍රශ්නය එතැනින් පටන් ගන්නා නිසා ඒක වෙනත් පැත්තකට ගෙන යන්න හදනවා.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට balance sheet එකේ තිබෙන items විතරක් නොවෙයි, ඒ balance sheet එකට එන්න තිබෙන items ගැන විශ්ලේෂණය කිරීමටත් අවශ්‍යතාවක් තිබෙනවා. "Treasury confident of containing fiscal deficit at 5.8 per cent by year end as announced in 2013 Budget" කියා කිව්වාට, පසු ගිය අවුරුද්දේ ඕක කියලා අන්තිමට සියයට 6.3 කියන එක 6.9ක් වුණා. ඒක ලොකු ප්‍රමාණයක්. මෙන්න මේවා සම්බන්ධයෙන් විපක්ෂයේ අපි කියපු දේවල් අද ස්ථිර වෙලා තිබෙනවා. ආණ්ඩුව වෙන්නේ නැහැයි කිව්වත්, ඒ වෙන්න තිබෙන දේවල් ගැන තමයි ඉදිරි දැක්මක් වශයෙන් අපි කියන්නේ.

විගණකාධිපතිවරයාගේ වැටුප ගැන විවාද කරන මේ මොහොතේ මේ සභාවේ සිටින්නේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු දෙදෙනෙක් විතරයි. ඇමතිවරු 65 දෙනෙක් සිටිය යුතු නමුත් ජ්‍යෙෂ්ඨ ඇමතිවරු දෙදෙනෙක් විතරයි මේ මොහොතේ මෙතැන ඉන්නේ. නියෝජ්‍ය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා මෙතැන නැහැ. මේ සභාව ගෙන යන්න ආණ්ඩුවේ quorum එකක් තිබෙනවාද? ඒක අපි ඇහුවොත් ප්‍රශ්නයක් මතු වන නිසා අපි අහන්නේ නැහැ. මේ වාගේ වැදගත් කාරණයක් ගැන කථා කරන විට මීට වඩා විධිමත්ව කටයුතු කළ යුතුයි. ආණ්ඩුවක් වශයෙන් ආර්ථිකය නැත්තටම නැති කර තිබෙන අවස්ථාවක ඒ වැරැද්ද නිවැරැදි කරන්න උදව් කරන්න අවශ්‍යයි. අන්න ඒක තමයි අවශ්‍ය වන්නේ.

ජාත්‍යන්තර මට්ටමින් " Moody's" කියන ආයතනය ඇවිත් ලංකාවේ තිබෙන rating එක අඩු කර තිබෙනවා. බැරි වෙලාවත් මෙහි වර්ධනයක් සිදු වුණා නම් ලොකුවට ශබ්ද කරන ආණ්ඩුව, මේක downgrade කළාම ඒ සම්බන්ධයෙන් කිසි වචනයක් කිව්වේ නැහැ. නමුත් ඇත්ත තත්ත්වය හෙළිදරවු වෙලා තිබෙනවා. ජනවාරි මාසයේ 01 වන දා සිට අප්‍රේල් මාසයේ 30 වන දා දක්වා විශ්ලේෂණය අනුව ඇති වෙලා තිබෙන කරුණු හෙළිදරවු කළාම පසු ගිය අවුරුද්දට වඩා ඉතාම දරුණු තත්ත්වයක් මේ අවස්ථාවේදී උද්ගත වෙලා තිබෙනවාය කියන එක තමයි මේ " Moody's" කියන ආයතනය කියන්නේ. මේක සතුටු වෙන්න දෙයක් නොවෙයි. වැරැද්දක් වුණ හැටියේම විපක්ෂයක් හැටියට පෙන්වන්න හදන්නේ මේක ඉස්මතු කර දක්වන්න නොවෙයි. නමුත් ආණ්ඩුව විසින් තමන්ලා දැනුවත්ව ප්‍රශ්න ඇති කරන විට අපි දේශප්‍රේමී ක්‍රියාවක් හැටියට මේක පෙන්වා දුන්නා. කරුණාකර, දැන්වත් ඇස් ඇරලා මේ ආර්ථික කාන්දුව, ප්‍රශ්නය නිවැරදි කිරීමේ මාර්ගයට යොමු වෙන්න කියන එක තමයි මම මේ මොහොතේ කියන්නේ.

IMF එකේ කෝෂි මතායි මේ ආණ්ඩුවට පුදුම විධියට කඩෙ යන පුද්ගලයෙක්. නමුත් ඒකෙන් ණය ගන්න බැරි වෙලා තිබෙනවා. ඒකෙන්, මේ ආණ්ඩුව ගැන හොඳ කියලා අන්තිමට ණය ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එතුමා කියනවා, "Sri Lanka's cost of living is on the up" කියා. අපේ මහ බැංකුවේ අධිපති නිර්දේශපාලනීකරණයක් ඇතුව කටයුතු කරන පුද්ගලයෙක්. එතුමා කටයුතු කරන්න ගිහින් ඇති වෙලා තිබෙන ප්‍රතිවිපාකයේ කොටසක් වශයෙන් දැන් උද්ධමනය වැඩි වෙනවා කියලා කිව්වාම ආණ්ඩුව මේ සම්බන්ධව කරන්න හදන ක්‍රියාව මොකක්ද?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you have only one minute left.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I was informed that the Hon. Dayasiri Jayasekara will not be speaking. He has been allotted 15 minutes. Out of that, I will take eight minutes and the balance will be given to the Hon. Eran Wickramaratne. පනස්හය වසරක කාලයක් සියයට 4.5ක මට්ටමේ පැවැති අපේ ආර්ථික වර්ධන වේගය පසු ගිය වසර හතක කාලයේදී සියයට 7.5ක් දක්වා වැඩි වෙලා තිබෙනවාලු. මේක අමූලික අසත්‍යයක්. නමුත් සංඛ්‍යා ලේඛන අනුව හරි. ඒක සැබෑවක්. මම පිළිගන්නවා. නමුත් පනස්හය වසරක කාලයක් සියයට 4.5ක් කිව්වාම ඒකේ සැබෑ වර්ධන වේගයක් තිබෙනවා. යම් විධියකට සංඛ්‍යා ලේඛන එක්ක ප්‍රශ්න කරන්න ගිහින්, අද ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිත ආදායම සියයට 13.2කට අඩු වෙලා තිබෙන්නේ මෙන්න මේ දළ දේශීය නිෂ්පාදනයත් එක්ක සෙල්ලම් කරන්න ගිහින් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය නිසයි.

මේ අවස්ථාවේදී මම ඉනොක් ආයතනය ගැන අහනවා. අපේ හිටපු බනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා යටතේ මේ ඉනොක් ආයතනය තිබුණා. ඉනොක් ආයතනය සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් ප්‍රශ්න තිබෙනවා. මේ ආයතනය බාල තෙල් රටට ගෙනෙනවා. මේ සම්බන්ධයෙන් ඒ අමාත්‍යතුමා මොනවාද කර තිබෙන්නේ? ඒ අමාත්‍යතුමා විතරක් නොවෙයි. වර්තමාන අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාත් මොනවාද කර තිබෙන්නේ? මෙවැනි ලොකු කොම්පැනි ග්‍රහණයට ලක් වුණු තත්ත්වයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. බාල තෙල් හත් අට වතාවක් ගෙනැවිත් තිබෙන බවක් පෙනුණාට මේ ආයතනය blacklist කරන්න ශක්තියක් නැති ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා.

ඇයි? කවුද මේක පස්සේ ඉන්නේ? වෙනත් අය රුපියල් 500ක්, 1,000ක්, 2,000ක් ගත්තාම අල්ලස් ගත්තාය කියා අල්ලනවා. මේ වාගේ දූෂණ සිද්ධ වෙලා තිබෙන කොට, මේ විධියට රුපියල් කෝටි ගණනක පාඩුවක්, ප්‍රශ්නයක් රටට ඇති වෙලා තිබෙන අවස්ථාවක ඇයි ENOC ආයතනය blacklist කරලා නැත්තේ? මෙන්න මේවා තමයි විගණකාධිපති ප්‍රශ්න කළ යුතු දේවල්.

Not only balance sheet items but off balance sheet items should also be verified, questioned and investigated. That is the role of an Auditor. As an Accountant, I would love to propose to the Chairman of the Committee on Public Enterprises - I know that you will be presenting the COPE Report within the next couple of days on behalf of us - as discussed, to meet the Hon. Speaker and ensure that the Standing Orders are amended to include this type of thing because it is not only the figures seen in a balance sheet, but also the off balance sheet figures, that will make or break an institution. That is what happened to the SriLankan Airlines. That is what happened to the CEB and it is the same thing that is happening to the Ceylon Petroleum Corporation. So, these are areas that need to be rectified.

බලන්න, SriLankan Airlines ආයතනය දිහා. කෝටි 2,980ක අලාභයක් මේ අවුරුද්දේ ලබන කොට, ගිය අවුරුද්දේ ඒ විධියටම කෝටි 2,700ක අලාභයක් තිබෙන කොට මොන විධියක ප්‍රකාශයක් කරලාද මම දන්නේ නැහැ අලුතින් අහස් යානා 15ක් අරන් ඒ සඳහා කෝටි 32,400ක් වියදම් කරන්න යනවාය කියනවා. අතේ ශත 5ක් නැහැ; clean suit empty pocket. මේ ගොල්ලෝ කෙළින්ම අලුත් airbus -අලුත් අහස් යානා- ඒ කියන්නේ, 330 - 500 airbus ගන්න යනවාලු. මේ ගොල්ලෝ අපව දැනුවත් කළා, කෙළින්ම airbus සමාගමත් එක්ක සම්බන්ධයක් තිබෙනවාය කියා. අපි ඒ website එක බැලුවා, කිසිම direct contact එකක් නැහැ. මොකද, direct contact එක සඳහන් වුණොත් ඒකේ දූෂණ හෙළිදරවු වෙනවා. මොකද, commission කියන ඒවා ගාවන්නවත් බැහැ. ඉතින් අපි අහනවා, කා තුළින්ද මේක යන්නේ කියලා. ඒවා ගත්තාට පස්සේ අපට කිව්වා, අලුත් aircraft එකක් සාමාන්‍යයෙන් US Dollars 130 million විතර වෙනවා කියලා. අපට තොරතුරු ලැබිලා තිබෙනවා, මේ වාගේ අවස්ථාවල ගනුදෙනු කළ හැකි කොම්පැනි තිබෙන බව. GE Engineering, එතකොට leasing company ඒ වාගේ ඒවාට දහස් ගණන් ගන්නේ. Aircraft ගන්න කොම්පැනිවලට ඊට වඩා ලොකු වරප්‍රසාද හා ප්‍රතිලාභ ලැබෙනවා. ඒ කොම්පැනි එක්ක සාකච්ඡා කරලා ඒවා ගත්තා නම් අපට හැකියාව තිබෙනවා wholesale discount එකෙන් කොටසක් අපට ලබා ගන්න. Direct discussions නැතුව මේවා තුළින් ගන්න කටයුතු කළා නම් මීට වැඩිය හුඟක් ලාභයට ලබා ගන්න පුළුවන්කම තිබුණා. මම ඕනෑකම නිසා මේ වාගේ කොම්පැනිවලට කථා කරලා තොරතුරු ලබා ගත්තා. US Dollars 130 millionට නැතුව 105ට, 110ට ගන්න පුළුවන් හැකියාව තිබෙනවා. දැන් මේවා තමයි විගණකාධිපති,-

Off balance sheet items should be verified, scrutinized and perused. These are matters on which corroborative evidence can be obtained. That is why I thought that it is my duty to state here today that they should not just be investigating and looking at the historical performance of an institution but also proactively look at what could happen and what did not happen through the process of management decision making. Management decision making is a very clear cut opportunity.

The Hon. Dilan Perera, Minister of Foreign Employment Promotion and Welfare, is a clear cut example. He works off the normal course of activity. I saw the debate he had in the morning. His amiable and generous disposition got somewhat perturbed because of the pressure exerted from the Opposition but he is one person who tries to, at least, be innovative and not stick to the rules because by sticking to the rules, you can sometimes be more corrupt than otherwise. So, I pay this tribute to him because of the experience I had. I addressed three or four matters and there were spontaneous responses. The efficacy and the economic viability in running the Ministry will be left to others to discuss but I thought a tribute needs to be paid where it is due.

Likewise, I urge the Hon. Ministers, instead of just raising your hands and being just by-standers in the Cabinet, to come out. As I said, we are the Government-in-waiting. What happened in 2001? You all had ruined the economy and gave us a negative growth economy. It was we, the United National Party, that was able to resurrect the economy and push it to some level and even today, dividends are obtained because of the push that you got at that particular moment. So, ensure that these

are checked because after all, it is the national economy that we are speaking of. This is not a blue colour economy or a green colour economy, it is the national economy that we are speaking of.

Purchasing an aircraft is one area that I urge you all to pay attention to because it is not fun to buy Rolls Royce engines from one area and buy airbuses from another area. Sometimes there is corruption when you do not go directly. But, when you go directly, if you do not go to the correct people, there will be more corruption. If you go to a company like GE Engineering, which basically deals with aircraft, or to the leasing company - I forget the name - they buy 10,000 to 20,000 and you can get a quicker delivery as well as a bigger discount than going direct to a particular institution.

ඊළඟට මිල්කෝ ආයතනය ගැන බලමු. "රජයේ ඇස් වසා මිල්කෝ වසා දැමීමේ කුමන්ත්‍රණයක්." ඒක විගණකාධිපති පෙන්වා දී තිබුණු එකක්. එම ආයතනයේ හොඳ සභාපතිවරයෙකු සිටින බව අපට පෙනුණා. නමුත් අද මිල්කෝ ආයතනය සම්පූර්ණයෙන්ම ගරා ගැනීමේ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එය යථා තත්ත්වයට ගෙනෙන්න පුළුවන් විධියට වැඩ කටයුතු කරන්න අවශ්‍යයි.

ඊළඟට අධිවේගී මාර්ග ගැන බලමු. අප මේ ගැන කථා කරන්න අවශ්‍ය වන්නේ විගණකාධිපතිගේ තොරතුරු තුළින් අපට හෙළිදරවු වුණ කරුණු නිසායි. අපේ දකුණු අධිවේගී මාර්ගය ඉදි කරන්න එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ කෝටි 5,800ක් අනුමත වුණා. හැබැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලන බලය ගත්තාට පස්සේ ඒ මුදල කෝටි 9,800ක් දක්වා වැඩි වුණා. සියයට සියයකින් එය වැඩි වුණේ ඇයි? නිශ්ශබ්දව තිබුණු කරුණක් විගණකාධිපති හෙළිදරව් කළාට ඊට වැඩිය ගැඹුරට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් සොයා බැලුවොත් මේ කටයුතු විධිමත් වනවා, රටටත් වාසිදායක තත්ත්වයක් ඇති වනවා කියලායි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

ඊළඟට කටුනායක අධිවේගී මාර්ගය ගැන බලමු. මට මතකයි 1999 වර්ෂයේදී ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමාගෙන් ඒ සම්බන්ධව ඇසූ අවස්ථාවේදී එතුමා කිව්වා, ඒ කිලෝ මීටර් 24 ඉදි කරන්න යන සම්පූර්ණ වියදම කෝටි 690ක් කියලා. දැනට මාස හයකට කලින් නිර්මල කොතලාවල මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී හෙළිදරවු කරනවා එම වියදම කෝටි 4,880ක් කියලා. අට ගුණයකින් වියදම වැඩි වන්න නම් දූෂණය කොතරම් ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවාද? ඒවා තමයි විගණකාධිපති සොයා බලලා කියන්න අවශ්‍ය. දැන් ඊට වැඩි දෙයක් සිදු වනවා. කොට්ටාවේ ඉඳන් කඩුවෙලට, කඩුවෙල ඉඳන් කඩවතට, කඩවත ඉඳන් කෙරවලපිටියට වශයෙන් අදියර තුනකින් කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය හදනවා. මේකේ වියදම හිතන්න බැරි ප්‍රමාණයක්. මෙම කොන්ත්‍රාත්තුව MCC කියන චීන කොම්පැනියකට දීලා තිබෙනවා. කොට්ටාවේ ඉඳන් කඩුවෙලට කිලෝ මීටර් 12ට වියදම දරලා තිබෙනවා කෝටි 2,800ක්. හිතන්න බැරි වියදමක්. කඩුවෙල ඉඳන් කඩවතට කිලෝ මීටර් 8.9යි. ඒකේ වියදම කෝටි 4,480යි. මේ පාරවල් රත්තරන්වලින් හදනවාද කියන ප්‍රශ්නය අද ඇති වෙලා තිබෙනවා. එතකොට කඩවත ඉඳන් කෙරවලපිටිය දක්වා කිලෝ මීටර් 8.5ට වියදම දරලා තිබෙනවා කෝටි 6,780ක්. අපි ආණ්ඩුවෙන් අහනවා, මේ කාගේ සල්ලිත් එක්කද සෙල්ලම් කරන්නේ කියලා?

ඊයේ මා අහ ගෙන හිටියා ලොකුබණ්ඩාර තරුණ මන්ත්‍රීවරයා ඉතාමත් ඕනෑකමින් තමන්ගේ ආණ්ඩුව ආරක්ෂා කරමින් කථා කරනවා. එතුමා කියනවා, මේ රටේ හැම තඹ ශතේම වියදම් කරන්නේ මේ රටට ආයෝජකයන් ගෙනෙන්න කියලා. මේ කරන්නේ රටේ ආයෝජනයටද නැත්නම් යම් අයගේ සාක්කු වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි අපි විගණකාධිපතිතුමා තුළින් අහන්නේ.

ඊළඟට, මහ බැංකුව ගැන බලමු. මීට අවුරුදු 9කට විතර කලින් මහ බැංකුව ගැන විමර්ශනය කරන අවස්ථාවේදී අජිත් නිවාඩ කබ්‍රාල් මැතිතුමාගෙන් අපි ඇහුවා, දැන් තිබෙන සියලුම මූල්‍ය ආයතන සම්බන්ධ අංග සම්පූර්ණ, සවිස්තර වාර්තා ලබා ගෙන තිබෙනවාද, කරුණාකරලා අපිව ඒ සම්බන්ධව දැනුවත් කරන්න කියලා. එතුමා කිව්වා, ඔව් කියලා. එහෙම නම් ප්‍රමුඛ බැංකුවේ කඩා වැටීම සිදු වන්න පුළුවන්ද? බැහැ. එහෙම තමයි ගෝල්ඩන් කී ආයතනය වැටුණේ. පසු ගිය සුමානේ "The Sunday Times" පත්තරේ "Business Times" අතිරේකයේ මෙසේ පළ වී තිබෙනවා: "Now People's Leasing to rescue crisis-hit CIFL".

CIFL මොකක්ද? Picture එක දැම්මා නම් ජනාධිපති, අගමැති, ඇමති ඔක්කෝම පාවිච්චි කරලා මහ ලොකුවට මාධ්‍යය තුළින්-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, please wind up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will take only one more minute, Sir.

අද මහ බැංකුවේ කටයුත්ත කරන්නේ නැති නිසා නැවත නැන්පත්කරුවන්ට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මහ බැංකුවේ අධිපති නිවාඩ කබ්‍රාල්ගේ ඕනෑකම නිසා ගෝල්ඩන් කී ආයතනයේ නැන්පත්කරුවන්ට ඔවුන්ගේ සල්ලි ගෙවන්නේ නැතුව ඒ සල්ලි ආණ්ඩුවේ ග්‍රහණයට ලක් කරලා, ඒ සල්ලි පාවිච්චි කරමින් තමාගේම හෙංචයියලා පත් කරලා අද දූෂණයකට ලක් කරලා තිබෙනවා. මේවා තමයි විගණකාධිපති බලන්න ඕනෑ කියන එක මා නැවත මතක් කරනවා.

මට ශුභ වාදී ලෙස කියන්න පුළුවන් එකම දේ තමයි, දැන් මේ වාගේ දේවල් කළා ඇති. අපේ රටේ ජාතික ආර්ථිකය ආරක්ෂා කරන්න තිබෙන අවස්ථාව මෙය වුණත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා, අපේ මහ ආණ්ඩුවේ විතරක් නොවෙයි පළාත් සභා තුළිනුත් විනයක් අනුව මේ රට ඉදිරියට ගෙන ගියේ නැත්නම් ආර්ථික අතින් කඩා වැටිලා තිබෙන රට තවත් ඉක්මනට කඩා වැටිලා රට ගොඩ ගන්නම බැරි තත්ත්වයකට පත් වනවා කියලා.

[අ.භා. 3.01]

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ව්‍යවස්ථානුකූලව පාර්ලිමේන්තුවට හිමි බලතල යටතේ ගරු විගණකාධිපතිතුමාගේ වැටුප නිර්ණය කිරීම පිළිබඳව යෝජනාව සාකච්ඡාවට ගන්න මේ වෙලාවේ මා හිතන්නේ අපි කාරණා කිපයක් සාකච්ඡාවට බඳුන් කළ යුතු බවයි.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

විගණකාධිපතිතුමා අපරිමිත සේවයක් කරනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් හැටියට පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අප සියලු දෙනාම දැනුවත් කරමින්, මේ රටේ රාජ්‍ය අංශයේත්, අර්ධ රාජ්‍ය අංශයේත් ගිණුම් කටයුතු සහ මුදල් කටයුතු පිළිබඳව ජනතාව වෙනුවෙන් අපේ අවධානය යොමු කරවනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සාමාජිකයෙකු හැටියටත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සාමාජිකයෙකු හැටියටත්, විගණකාධිපතිතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය මේ කරන්නා වූ මෙහෙය ඉතාම ඉහළින් අගය කරන සහ හැමදාමත් එය අගය කළ යුතු බව කියන කෙනෙක් මම.

රවි කරුණානායක මන්ත්‍රීතුමා ගණකාධිකාරිවරයෙක් සහ දේශපාලනඥයෙක් නිසාදෝ අවශ්‍ය විටෙකදී මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අරගෙන ආණ්ඩුවට පහර ගහන්නත්, අවශ්‍ය විටෙකදී ඒ සංඛ්‍යා ලේඛනම අරගෙන ඒ සංඛ්‍යා ලේඛන පිළිගන්න ඕනෑ නැහැ කියන තර්කය ගොඩ නඟන්නත් එතුමාට හොඳ හැකියාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් එතුමාට මනා දක්ෂකමක් තිබෙනවා. එතුමා ගණකාධිකාරිවරයෙක් නිසා balance sheet එක balance කර ගන්න දන්නවා. එතුමා කියපු කාරණාවලට මම සියයට සියයක් එකඟ නොවුණත්, පාර්ලිමේන්තුව තුළ ගමේ ප්‍රාදේශීය සභාවේ ප්‍රශ්න අහලා ලාභ ජනප්‍රියභාවයට පත් වෙන්න උත්සාහ කරන සමහර අයට වඩා පොදුවේ ජාතික වශයෙන් සමහර ප්‍රශ්න පිළිබඳව එතුමා වැරදි කරුණු මත වුණත් කථා කරන කෙනෙක් බව මා කියන්නට ඕනෑ. එතුමා ප්‍රාදේශීය සභාවේදී අහන්න ඕනෑ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේදී අහන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් මම එතුමාව අගය කරනවා. සමහර අය ජාතික මට්ටමේ නායකයන් වෙන්න හිතා ගෙන හිටියාට ගමේ ප්‍රාදේශීය සභාවේ ප්‍රශ්න තමයි අහන්නේ. ඒවා පාර්ලිමේන්තුවේ කථා කරන ඒවා නොවෙයි. ඒ පිළිබඳව එතුමාට මනා වැටහීමක් තිබෙනවා. පාට කණ්ණාඩිය ගලවලා අමාත්‍යාංශයක මහන්සි වෙලා වැඩ කරන අපි වාගේ ඇමතිවරුන් සම්බන්ධයෙන් යම් ආකාරයක ප්‍රසාදයක් පළ කිරීමට කටයුතු කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, කොච්චර හොඳ කළත් සමහර උදව්ය ඒක දිහා බලන්නේ වැරදි පාට කණ්ණාඩියක් දාලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තව කාරණාවක් මතු කරන්න කැමැතියි. රවි කරුණානායක මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව එතුමාගේ කථාවේ අවසානයේදී මතු කළා. විගණකාධිපතිතුමා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මේ සේවා කටයුතු කරන්නේ තවමත් මේ යල් පැන ගිය මුදල් රෙගුලාසි, ආයතන රෙගුලාසි මෙසය උඩ තියාගෙනයි. අපි දැන් අවුරුදු කීයක් මේ රෙගුලාසි මත කටයුතු කරනවාද? කෝප් කමිටුවේ වර්තමාන සභාපති ගරු ඩිව් ගුණසේකර මැතිතුමා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සභාපති ගරු සරත් අමුණුගම මැතිතුමා, මේ කමිටුවල හිටපු සභාපතිතුමන්ලා, මේ සියලු දෙනාම පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා හවුල් කරගෙන විගණකාධිපතිතුමාගේ ඒ සොයා ගැනීම මත අඩු වැඩි වශයෙන් විශාල මෙහෙයක් කළා. හැබැයි විගණකාධිපතිතුමාට මේ සියලු දේවල් කරන්න වෙලා තිබෙන්නේ යල් පැන ගිය මුදල් රෙගුලාසි, යල් පැන ගිය ආයතන රෙගුලාසි මූලික කරගෙනයි; පදනම් කරගෙනයි.

අද ලෝකය කොච්චර ඉස්සරහට ගමන් කරලා තිබෙනවාද? මේ මුදල් රෙගුලාසි, ආයතන රෙගුලාසි අවුරුදු 25ක් 30ක් පරණ ඒවායි. රටේ ආර්ථිකය පිළිබඳව මතය, ලෝකයේ ආර්ථිකය පිළිබඳව මතය වෙනස් වෙලා තිබෙන යුගයක තවදුරටත් මේ ආයතන රෙගුලාසි, මේ මුදල් රෙගුලාසි මතම විගණකාධිපතිතුමා කටයුතු කළ යුතුයි කියන තැනට අපි යනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකම මේ රටේ ආර්ථිකයට එක පැත්තකින් බාධාවක් වෙන්න පුළුවන්. විගණකාධිපතිතුමා පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාව, මේ යල් පැන ගිය මුදල් රෙගුලාසි සහ ආයතන රෙගුලාසි පිළිබඳව නැවත හිතා මතා අද යුගයට, අද ලෝකයට, අද රටට ගැළපෙන විධියට මේ රෙගුලාසි සංශෝධනය කර ගැනීමට මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සාකච්ඡාවකට මුල පුරන්න හොඳම අවස්ථාව කියලා මම හිතනවා.

ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා මගේ දේශපාලන ජීවිතයේම බොහොම ගරු කොට සලකන මගේ ගුරු පියෙක් වාගේ කෙනෙක්. එතුමාගේ කථා අහලා ඉගෙන ගන්න තිබෙන දේවල් බොහෝමයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මේ කාලය තුළදී එතුමා කරපු සේවය අරගෙන බැලුවාම අපට පෙනුණා, දැනට තිබෙන යල් පැන ගිය නීති මත ගෙනාපු කාරණා අරගෙන එතුමා මේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කවදාවත් සාකච්ඡාවට, පරීක්ෂණයට බඳුන් කරන්න බැරි වෙච්ච ආයතන ගණනාවක් ගෙනැල්ලා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව උප කමිටුවලට කඩලා ඉතාම හොඳින් ඒ කාරණා කටයුතු කරගෙන ගිය බව.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් හැටියට අපි දන්නවා, සමහර වෙලාවට සමහර රාජ්‍ය ආයතන ගැන අපට ඇත්තටම සතුටු වෙන්න පුළුවන් බව. විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධයෙන් අප රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු කරන කොට මම ඒ බව දුටුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල - ඔක්කෝම නොවෙයි. බොහෝ ඒවා- විගණකාධිපතිතුමාගේ විමර්ශනයට ලක් වෙලා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට ආවාම අපට ඔවුන්ගෙන් ප්‍රශ්න කරන්නට දේවල් පවා තිබුණේ නැහැ. ඒ මට්ටමට ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පත් වෙලා තිබෙනවා. ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරින් බලුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන කටයුතු ඉතාම හොඳ මට්ටමක තිබුණු බව මට පෙනුණා, ඒ ආයතනය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කරපු වෙලාවේ. මම ඒ ගැන බෙහෙවින් සතුටු වෙනවා. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විතරක් නොවෙයි, බොහෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල තත්ත්වය ඒකයි. මම දුටුවා කවදාවත් නැති විධියට, විගණකාධිපතිතුමාගේ විමසුම්වලට නිවැරැදිව පිළිතුරු දෙමින්, මුදල් සහ මූල්‍ය රෙගුලාසි නිවැරැදිව ආරක්ෂා කර ගනිමින් ඉතාම නිවැරැදිව ක්‍රියා කරපු ආකාරය. මා එසේ කීවේ මෙකයි. සාමාන්‍යයෙන් රාජ්‍ය අංශය, රාජ්‍ය පරිපාලනය පිළිබඳව දැඩි පහරක් සමාජයේ සමහර අංශවලින් එල්ල වන යුගයක රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු හැටියට මා දුටු දේ තමයි, බොහෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉතා නිවැරැදිව මුදල් රෙගුලාසි සහ ආයතන රෙගුලාසි ආරක්ෂා කර ගනිමින් මනා මූල්‍ය පාලනයකින් යුතුව කටයුතු කර ඇති බව. ඒ වග විගණකාධිපතිතුමාගේ වාර්තා දිහා බැලුවාම වුණත් අපට පෙනෙන්න තිබුණා. ඒ අනුව, රාජ්‍ය අංශයේත් යම් ප්‍රගතියක්, යම් මූල්‍ය විනයක් සහිතව කටයුතු කිරීමක් අපට දකින්න ලැබෙනවා. එය සමහර ආයතනවල අඩු වැඩි වශයෙනුයි දකින්න ලැබෙන්නේ. එය නිවැරැදිව ඉස්සරහට ගෙන යෑමට අප විගණකාධිපතිතුමාගේ හස්තය ශක්තිමත් කළ යුතු වන්නේ ඒ කාර්යය කිරීම සඳහා දැනට තිබෙන යල් පැන ගිය මූල්‍ය රෙගුලාසි සහ ආයතන රෙගුලාසි ඒ විධියටම තබා ගෙන නොවෙයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ සාකච්ඡාව ඒ සම්බන්ධයෙන් කථා කිරීම සඳහා යොදා ගැනීම වඩා

යෝග්‍ය වේවි කියලා මම හිතනවා. අපට යෝග්‍ය විධියට කාරණයක් අරගෙන විරුද්ධ පක්ෂයට පහර එල්ල කරනවාටත් වඩා, විරුද්ධ පක්ෂයට යෝග්‍ය විධියට කාරණයක් අරගෙන ආණ්ඩු පක්ෂයට පහර එල්ල කරනවාටත් වඩා විගණකාධිපතිතුමා මේ කර ගෙන යන්නා වූ මහා දුෂ්කර කාර්යය සඳහා කාලීන වශයෙන් අද යුගයට අවශ්‍ය වන පරිදි මුදල් රෙගුලාසි සහ ආයතන රෙගුලාසි සංශෝධනය කිරීම ගැන, රෙගුලාසි අලුතින් ගෙනෙන්න තිබෙනවා නම් ඒවා ගැන, අයින් කරන්න ඕනෑ ඒවා තිබෙනවා නම් ඒවා ගැන සාකච්ඡා කරනවා නම් හොඳයි. සමහර ඒවා අයින් කරන්නම ඕනෑ. ඒවා රටේ ආර්ථිකයට බාධාවක්. රටේ සමහර ක්‍රියාවන් සඳහා ඒවා විශාල බාධාවක් වෙලා තිබෙනවා. සමහර වෙලාවට, සමහර නිලධාරින්ට සමහර තීන්දු ගැනීමේදී ඒවා බාධාවක් වෙලා තිබෙනවා. ඒවා එදා යුගයට හොඳයි. අද යුගයට ඒවා ඔබින්නේ නැහැ. ඒ නිසා රටට ඔබින විධියට ඒ රෙගුලාසි සංශෝධනය කිරීම කියන කාරණය අප දෙගොල්ලන්ගේම සාකච්ඡාවට භාජනය වීමට අද හොඳම දිනයක් කියලායි මා හිතන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විගණකාධිපතිතුමාගේ කාර්යය පිළිබඳව පාර්ලිමේන්තුවේදී අප කථා කරන වෙලාවේ මා තවත් කාරණයක් මතු කරන්න ඕනෑ. මේ කාරක සභාවල කටයුතු කරන කොට අපේ මන්ත්‍රීවරුන් පුරුද්දක් හැටියට කරන්නේ මොකක්ද? මේ සම්බන්ධයෙන් මා විරුද්ධ පක්ෂයට ඇඟිල්ල දිගු කරන කොට මටත් ඇඟිලි තුනක් දිගු වෙනවා. මා විරුද්ධ පක්ෂයේ හිටපු කාලයේත් මේ වැඩේම කරන්න ඇති. විගණන විමසුම පාවිච්චි කරලා අදාළ අමාත්‍යාංශයට පහර ගහනවා. විගණන විමසුම අරගෙන පහර ගැසීම වැරදියි. විගණන විමසුමට උත්තරයක් දුන්නාට පස්සේ ඒ උත්තරය විගණකාධිපතිතුමා පිළිගත්තාද, නැද්ද කියන කාරණය මත තමයි ඒ විගණන විමසුම පිළිබඳව කථා කරන්න පුළුවන් වන්නේ. දැන් වෙන්නේ එහෙම නොවෙයි. දැන් වෙන්නේ, විගණන විමසුමේ තිබෙන කරුණු අරගෙන ඒවා වංචා, හොරකම් කියලා කියන එකයි. අද උදේ වරුවේත් එහෙම දෙයක් වුණා. එහෙම කරන්න හොඳ නැහැ. විගණකාධිපතිතුමා විමසුමක් කරනවා. ඒ විමසුමට පිළිතුරු දෙනවා අදාළ ආයතනය හෝ අමාත්‍යාංශය. එය විගණකාධිපතිතුමා පිළිගන්නවාද, රාජ්‍ය ආයතනයක් නම් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එය පිළිගන්නවාද, අර්ධ රාජ්‍ය ආයතනයක් නම් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එය පිළිගන්නවාද කියන කාරණය මත තමයි එය වංචාවක්ද දූෂණයක්ද කියලා හෙළිදරවු වන්නේ. දැන් සමහර අවස්ථාවල වෙන්නේ, විගණන විමසුම එහෙම පිටින් අරගෙන පුවත් පතක පළ කරන එකයි. එහෙම නැත්නම්, විගණන විමසුම අරගෙන ඇවිල්ලා, "මේක වංචාවක්" කියලා පෙන්වන එකයි. ඒක ඒ තරම් යෝග්‍ය ක්‍රමයක් නොවෙයි. එහෙම වුණාම සිද්ධ වන්නේ මොකක්ද? එහෙම වුණාම සිද්ධ වන්නේ විගණකාධිපතිතුමා සහ විගණකාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලය අධෛර්යයට පත් වන එකයි. ඒ අය ඒ ප්‍රශ්නය අහන්නේ ඒ අයට සොයා ගන්න බැරි වූ කාරණයක් පිළිබඳව උත්තරයක් බලාපොරොත්තුවෙන්. උත්තරයක් බලාපොරොත්තුවෙන් ප්‍රශ්නය අහන කොට උත්තරය දෙන්න පෙරම, එහෙම නැත්නම් උත්තරය හරිද, වැරදිද, සාධාරණද කියලා කියන්න පෙරම ඒ කාරණය වංචාවක්, සොරකමක් හැටියට අර්ථ දක්වන්න ගියොත් අප කරන්නේ විගණකාධිපතිතුමාට උදව්වූ කිරීමක් නොවෙයි; විගණකාධිපතිතුමාගේ කාර්ය භාරයට බලවත් බාධාවක් එල්ල කිරීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විගණකාධිපතිතුමා ගැන කථා කරන කොට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අපි කියනවා නේ එතුමාගේ කාර්ය භාරය හොඳයි කියලා; එතුමා කරන ඒ වැඩ කටයුත්ත අපි බොහොම අගය කරන්න ඕනෑය කියලා. එහෙම කියනවා නම් අපි පාට කණ්ණාඩි ගලවා තමයි කාරණා කටයුතු පිළිබඳව සාකච්ඡා කරන්නත් ඕනෑ.

රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිතුමා කටුනායක අධිවේගී මාර්ගය හදන්න 1999 දී ඇස්තමේන්තු කළ මුදල වාගේ අට ගුණයක මුදලක් 2013 දී වැය කරනවාය කියලා. ඉතින් දැන් අවුරුදු කීයක් ගත වෙලා තිබෙනවාද? 1999 සිට 2013 දක්වා අවුරුදු 14ක් ගත වෙලා තිබෙනවා. කටුනායක අධිවේගී මාර්ගය සඳහා 1999 දී ඇස්තමේන්තු කළ මුදලටම අවුරුදු 14කට පස්සේ 2013 දී කරන්න පුළුවන් කියන එක සම්බන්ධයෙන් විමසීමක් විගණකාධිපතිතුමාගෙන් අපට බලාපොරොත්තු වන්න පුළුවන්ද, එතුමාට කොපමණ බලතල දුන්නත්? බැහැ. 1999 දී ඇස්තමේන්තු කළ මුදල 2014වන කොට කාල වකවානු හැටියට ගත්තත් අනිවාර්යයෙන්ම වැඩි වන්නට ඕනෑ. එම නිසා 1999 දී ඇස්තමේන්තු කළ මුදල 2013 දී අට ගුණයකින් වැඩි වීම දූෂණය, වංචාව නිසා සිදු වුණාය කියා අර්ථ නිරූපණය කරන්න පුළුවන්ද? අවුරුදු 14කට -දවස් 365 ඒවා 14කට- පස්සේයි මෙම ඇස්තමේන්තුව අට ගුණයකින් වැඩි වෙලා තිබෙන්නේ කියන කාරණය සම්පූර්ණයෙන්ම අමතක කරලා තිබෙනවා. එහෙම කරන්න පුළුවන්ද? බැහැ. එහෙම කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි අවස්ථාවලදී අපි මේ ප්‍රශ්නය දිහා නිවැරැදිව බලා, යම් කිසි දූෂණයක්, වංචාවක් තිබෙනවා නම්, එම ඇස්තමේන්තුව තුළ යම් කිසි අධිතක්සේරුවක් තිබෙනවා නම් ඒ පිළිබඳව කථා කරන එක නිවැරැදියි. නමුත් 1999 සිට 2003 දක්වා අවුරුදු 14ක කාල සීමාව එහෙමපිටින්ම අමතක කරලා, 1999 දී ඇස්තමේන්තු කළ මුදල මෙපමණයි, 2013 දී එම මුදල අට ගුණයකින් වැඩි වුණේ දූෂණය, වංචාව නිසාය, එම මුදල සාක්කුවට ගියා වෙන්න පුළුවන් කියලා කියන එක වැරැදියි. හරියට අර අවුරුදු 14 එහෙමපිටින්ම ලොජ් වුණා වාගෙයි; එහෙමපිටින්ම වුත වුණා වාගෙයි; එහෙමපිටින්ම නැති වුණා වාගෙයි; එහෙමපිටින්ම අතුරුදහන් වුණා වාගෙයි. එහෙම වුණේ නැහැ. එම නිසා 1999 සිට 2013 දක්වා කාලය තුළදී එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට අපිත්, ඊට පෙර පොදුජන එක්සත් පෙරමුණ හැටියට අපිත්, ඒ අතර මැද අවුරුදු දෙකහමාරක කාලයක් එක්සත් ජාතික පක්ෂයත් මේ රට පාලනය කළා. එහෙම නම් 2001 දී, 2002 දී, 2003 දී, 2004 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මෙය තක්සේරු කළත් 1999 දී තක්සේකරු කළ ඒ මුදලට කරන්න බැහැ. මොකද, කාල වකවානුව අනුව මිල ගණන් වැඩි වනවා. ඒක තමයි සත්‍ය කථාන්දරය. අඩු තරමේ විගණකාධිපතිතුමාගේ වැටුප සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේදීවත් අපි උත්සාහ කරන්නට ඕනෑ, පාට කණ්ණාඩි ගලවා මේ දිහා නිවැරැදිව, මධ්‍යස්ථව බලන්න. මොකද, විගණකාධිපතිතුමා හැම තිස්සේම මේ දිහා බලන්නේ මධ්‍යස්ථවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට ආර්ථිකය පැත්තෙන් කථා කරනවා නම්, දැන් ආර්ථිකය කඩා වැටිලාය කියා විරුද්ධ පක්ෂයෙන් මහා ලොකු පම්පෝරියක් ගහන්න උත්සාහ කරනවා. හැබැයි පසු ගිය අවුරුදු හයේ, අවුරුදු හතේ ආර්ථික වර්ධන වේගයේ සාමාන්‍ය ගත්තොත් සියයට 7ක් පමණ වනවා. දැන් මා මෙහෙම කිව්වාම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, මට පසුව කථා කරන්න ලණිලහියේ සූදානම් වන ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් කියයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ සංඛ්‍යා ලේඛන පිළිගන්නේ කොහොමද කියලා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා ලංකාවට හඳුන්වා දෙන්නේ කවුද? ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා දේශපාලනීකරණය වෙලා තිබෙනවාය කියනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා මුලින්ම දේශපාලනයට එන්නේ අපේ පක්ෂයෙන් නොවෙයි. එතුමා කවදාවත් අපේ පක්ෂයෙන් ඡන්දය ඉල්ලුවේ නැහැ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ඉල්ලුවේ නැහැ. අජිත් නිවාඩ් කබ්‍රාල් මහත්මයා මුලින්ම ඡන්දය

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ඉල්ලුවේ එක්සත් ජාතික පක්ෂයෙන් බස්නාහිර පළාත් සභාවටයි. මා හිතන හැටියට එතකොට ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් අනිවාර්යයෙන්ම - sure එකට - එතුමාට මනාපයක් දෙන්න ඇති, දැන් නොකිව්වාට. රවි කරුණානායක මන්ත්‍රීතුමාත් එතුමාට මනාපයක් දෙන්නට ඇති. මොකද, නිවාඩ කබ්රාල් කියන චරිතයට ආර්ථිකය පිළිබඳව දැනුමක් තිබෙනවා; ගණකාධිකරණය පිළිබඳව දැනුමක් තිබෙනවා. එවැනි චරිතයක් පළාත් සභා මැතිවරණයට තරග කිරීම ම, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මනාපයක් දිය යුතු හේතුවක් වනවා. එහෙම කෙනෙක් ලෙහෙසියෙන් දේශපාලනයට එන්නේ නැහැ. එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනයට එනවා. එතකොට එතුමා හොඳයි. එතුමා tip-top; එතුමා තරම් කෙනෙක් නැහැ.

හැබැයි ඊට පස්සේ එතුමා දේශපාලනයෙන් ඉවත් වෙලා, පක්ෂ දේශපාලනයෙන් ඉවත් වෙලා, ඡන්ද දේශපාලනයෙන් ඉවත් වෙලා එතුමාගේ දැනුමෙන්, එතුමාට ලැබී තිබෙන අත් දැකීම් සම්භාරයෙන් මෙහෙයක් කරන්නට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයක් එක්ක කටයුතු කරනවා. ඒ හරහා එතුමා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් වනවා. එතකොට එක්සත් ජාතික පක්ෂයෙන් පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කිරීමේදී ඉතාම හොඳ නිවාඩ කබ්රාල් මහතා, එතුමාට තිබෙන දැනුම් සම්භාරයක් එක්ක අද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හැටියට කටයුතු කරන කොට කියනවා, එතුමා කියන්නේ වැරදි කථාන්දරයක්ය කියලා. හැබැයි නිවාඩ කබ්රාල් දිහා බලන්න ඕනෑ, නිවාඩ කබ්රාල් විධියට නොවෙයි. එතුමා දිහා බලන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා පක්ෂය දමලා ගිය කෙනකු හැටියට නොවෙයි. එතුමා දිහා බලන්නට ඕනෑ, නිවාඩ කබ්රාල් කියන චරිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිකමට සුදුසුද කියලායි. සුදුසුයි. අවශ්‍ය කරන සුදුසුකම් එතුමාට තිබුණාද? තිබුණා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයේ හිටපු සමහර අයත් එක්ක බලන කොට -ඒ හැම කෙනාටම සුදුසුකම් තිබුණා- මෙතුමාට ඒ අයටත් වඩා සුදුසුකම් තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කවුරු හෝ ඇඟිල්ල දික් කරලා එතුමාට කියනවා නම් එතුමා දේශපාලනය කරනවා කියලා, එතුමා කවදත් පක්ෂ දේශපාලනය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නොවෙයි. එතුමා පක්ෂ දේශපාලනයට ඡන්දය ඉල්ලුවා නම් හැම දාම ඉල්ලුවේ එක්සත් ජාතික පක්ෂයෙන්. එහෙම නම් අපට තමයි කියන්න පුළුවන් වන්නේ, එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනය කරපු පළාත් සභා මන්ත්‍රීවරයෙක් තමයි මහ බැංකුවේ අධිපති වුණේ කියලා. ඒ නිසා නිවාඩ කබ්රාල් කියන පුද්ගලයා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා ආණ්ඩුව පැත්තට පැමිණීම සම්බන්ධයෙන් මතු වෙලා තිබෙන පටු දේශපාලනය තුළ ඉඳ ගෙන මහ බැංකු වාර්තාවේ තිබෙන සියලු සංඛ්‍යා ලේඛන බොරුයි කියලා ඒවා පැත්තකට විසි කරලා දමන්න ඕනෑයි කියන කාරණය කියන්න බැහැ. එහෙම කියන කොට මොකද, අපි කරන්නේ? එහෙම කියන කොටම අපට අමතක වෙනවා, අපි මේ කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවට ගහන එකයි කියන එක. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ බැංකු වාර්තාවටවත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහ බැංකු වාර්තාවටවත් නොවෙයි, ශ්‍රී ලංකාව කියන ආපේ ආදරණීය මවු බිමේ මහ බැංකුවේ වාර්තාවටයි මේ ගහන්නේ. මම දැකලා තිබෙනවා, රූපවාහිනී විවාදවලදී අජිත් පී. පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඔය මහ බැංකු වාර්තාවම අරගෙන ඒකේ සංඛ්‍යා ලේඛන පාවිච්චි කරලා යම් යම් කාරණා මතු කරන අන්දම. මම දැකලා තිබෙනවා, ඒ වාර්තාවම අරගෙන ඉරාන් වික්‍රමරත්න ගරු මන්ත්‍රීතුමා යම් යම් කාරණා මතු කරන අන්දම. හැබැයි, ඒකේ තිබෙන පසු ගිය අවුරුදු හයේම ආර්ථික වර්ධන වේගය අරගෙන බලලා, සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය සියයට 7යි නම්, "සියයට 7යි කියන්නේ ලොකු ගණනක්, ඒ නිසා මේකට පහර ගහන්න ඕනෑ" කියලා ඒ කාරණාව පිළිගන්නේ නැහැ. ඒක පිළිගන්නේ නැහැ, හැබැයි ඊට පසුව ඊළඟ පිටුවේ තිබෙන කාරණාවක් පිළිගන්නවා. එහෙම තමාට වාසි ඒවා අරගෙන, අවාසි ඒවා ප්‍රතික්ෂේප කරලා, මහ බැංකු වාර්තාවක් පිළිගැනීමට හෝ පිළිනොගැනීමට බැහැ. මහ බැංකු වාර්තාව කියන්නේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව. ඒකට පහර ගහනවා කියන්නේ, ඒකේ තිබෙන සංඛ්‍යා ලේඛන පිළිගන්න බැහැයි කියලා කියන්නේ, අපේ මහ බැංකුවේ වාර්තාව පිළිගන්න බැහැයි කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා නේ එක්සත් ජාතික පක්ෂය කියන්නේ "the Government-in-waiting" කියලා. ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂය කියලා කියන්නේ, ඊළඟට ආණ්ඩුව ගන්න ඉන්න අය කියන එකයි. ඊළඟට ආණ්ඩුව ගන්න ඉන්න අය දැන් කියනවා නම් "මහ බැංකු වාර්තාව කුණු බක්කියට දමන්න ඕනෑ, පිළිගන්න බැහැ" යි කියලා ඒ කියන්නේ ඒ අය ආණ්ඩුව ගන්න සුදුසුයි කියන එකද? ඒ කියන්නේ ශ්‍රී ලංකාවේ මහ බැංකුව හොඳ නැහැ. එහි වාර්තාව කුණු බක්කියට දමන්න කියලායි කියන්නේ. හැබැයි එහෙම කියන්නේ එහි සමහර කාරණා පිළිගන්න ඕනෑයි කියලා කියන ගමන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අපි සාකච්ඡා කරන්නේ විගණකාධිපතිතුමාගේ වැටුප ගැනයි. එතුමාගේ වැටුප පිළිබඳව නිර්ණය කිරීමේ නීතිමය අයිතිය තිබෙන වෙලාවේ, ඒ කාරණය පිළිබඳ සාකච්ඡා කරන වෙලාවේ, පක්ෂ විපක්ෂ කණ්ණාඩි පැත්තකට දාලා කථා කරන්නට ඕනෑ. ඒකයි ඇත්ත කතන්දරය. ඒ නිසා මේ වේලාවේදී මම හිතන්නේ ආණ්ඩු පාර්ශ්වයේ මැති ඇමතිවරුන් වන අපිත්, විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාත් එකතු වෙලා කරන්නට ඕනෑ, දැනට විගණකාධිපතිතුමා අරන් යන්නා වූ මේ ව්‍යායාමය, කර ගෙන යන්නා වූ මේ ක්‍රියාදාමය තව දුරටත් ශක්තිමත් කරන්නේ කෙලෙසද, එතුමාට තවදුරටත් අවශ්‍ය කරන්නේ මොන බලතලද, එතුමාට සහ මේ රටේ සංවර්ධන ක්‍රියාදාමයට අද බාධා වෙලා තිබෙන්නේ යල් පැන ගිය මොන මුදල් රෙගුලාසිද කියා සොයා බලා අන්න ඒවා අයින් කිරීමයි. මොන ආයතනයේ රෙගුලාසි වුණත් ඒවා අයින් කරන්නට ඕනෑ. අයින් කරලා අලුත් රෙගුලාසි එකතු කරන්නත් වෙයි; සමහර ඒවා සංශෝධනය කරන්නත් වෙයි. අන්න ඒ පිළිබඳ කතිකාවකට තමයි අද යා යුතු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායකයන්ගේ සමුළුව මේ අවුරුද්දේ පවත්වනවා. මේ සමුළුව පවත්වන්නේ ලංකාවේ නේ. පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායකයෝ පනස් ගණනක් ඇවිල්ලා ලංකාවේ සමුළුව පවත්වනවා කියන කාරණය ලංකාවට හොඳයි. අනෙක් කාරණා සියල්ල පැත්තකට දමමු. ඒ කාරණය ලංකාවට හොඳයි. ඒක අගය කරනවාද? නැහැ. ඒක අගය කරන්නේ නැතුව අද කියන්නේ, පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායකයන්ගේ සමුළුව ලංකාවේ තියන්න එපා කියලායි. ලංකාවේ තියන්න එපා කියලා කවුද කියන්නේ? කැනඩාව කිව්වා. දැන් කැනඩාවෙන් නියෝජිතයෙක් එනවා. දැන් කැනඩාවටත් වඩා ඒක කියන්නේ ශ්‍රී ලංකාවේ විරුද්ධ පාර්ශ්වයේ සමහර අය. ඒ නිසා මතක තියා ගන්න ඕනෑ, රාජ්‍ය නායකයන් එන්නේ ලංකාවට; අපේ මවු බිමට කියන එක. සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, අපේ ආදරණීය මවු බිමටයි. අපේ ආදරණීය මවු බිමට ලෝකයේ රාජ්‍ය නායකයන් 54 දෙනෙක් ඇවිල්ලා රාජ්‍ය නායක සමුළුව තියනවා කියලා කියන එකම අපේ මවු බිමට ගෞරවයක් නේද? ඒක අගෞරවයක් නොවෙයි, ආඩම්බරයක් නේද? අභිමානයක් නේද? ඒ අවස්ථාවෙන් අපි ප්‍රයෝජන අරගෙන අපේ මවු බිම පිළිබඳව පැතිරිලා තිබෙන දුර්මත -වැරදි මත- නැති කරන්නත්, ඒ වාගේම

අපට අලුතෙන් සම්බන්ධ කර ගන්න ඕනෑ මිත්‍රයන් ඇති කර ගන්නත්, පළුදු වෙලා තිබෙන සමහර මිත්‍ර සම්බන්ධකම් නැවත ඇති කර ගන්නත්, මේ සියලු කාරණාවලට ඒ රාජ්‍ය නායක සමූළුව පාවිච්චි කිරීම නේද, පක්ෂ විපක්ෂ අප කළ යුතු වන්නේ? එහෙම නැතුව සමහර විදේශීය රටවල අයටත් වඩා වැඩිය ඒකට විරුද්ධ වෙලා රාජ්‍ය නායකයන් පනස් ගණනක් මේ රටට එන මේ සමූළුව මෙහේ තියන්න එපා කියලා උඩ බලාගෙන කෙළ ගහන එකද කරන්නට ඕනෑ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විගණකාධිපතිතුමා ඉතාම මහන්සියෙන්, ඉතාම අසීරුවෙන් යල් පැන ගිය විවිධ අණපනත් යටතේ කරන මේ කාර්ය භාරය පිළිබඳව අප එතුමාට ස්තුතිවන්ත වෙනවා. විගණකාධිපතිතුමා සෑම ප්‍රශ්නයක් දෙසම නිර්පාක්ෂිකව බලනවා වාගේම, මේ රටේ පවත්වන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමූළුව වේවා, විගණකාධිපතිතුමාගේ කාර්ය භාරය කිරීමට අවශ්‍ය කරන සංශෝධන කිරීමේදී වේවා, අපිත් නිර්පාක්ෂිකව රට ගැන සිතා "ඒ පිළිබඳව සලකා බලමුය" කියන යෝජනාව සාකච්ඡා කරමු. අද ඒ සඳහා හොඳ දිනයක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.22]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අද අප ඉදිරිපිට තිබෙන මෙම යෝජනාව, වත්මන් විගණකාධිපතිවරයා වන එච්.ඒ.එස්. සමරවීර මහතාගේ වැටුප වැඩි කිරීම පිළිබඳවයි. එතුමා ඒ තනතුරට පත් කළ 2011.08.15 වන දින සිට වැටුප් වැඩි කර නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මුලින්ම මේ කාරණය සඳහන් කරන්නට අවශ්‍යයි. මේ යෝජනාව අද මේ ගරු සභාවට ඉදිරිපත් කළේ ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා විසින්. අවසානයේ ඒ අමාත්‍යතුමා කථා කරනකොට සඳහන් කළා, මේ වාර්තා මඟින් -මා හිතන හැටියට COPE වාර්තාව ගැන තමයි එතුමා කථා කළේ - ඇමතිවරුන්ට පහර එල්ල කරනවා කියලා. ඇත්තටම ඒක අවාසනාවන්ත ප්‍රකාශයක්. මොකද, මා හිතන්නේ නැහැ COPE එකේ එක සාමාජිකයෙකුටවත් ඇමතිවරයකු එල්ල කරලා පහර ගහන්න අවශ්‍යතාවක් තිබෙනවා කියලා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වයේත්, විරුද්ධ පාර්ශ්වයේත් ගරු මන්ත්‍රීවරු තමයි ඒ කමිටුවේ ඉන්නේ. එතුමා කළ ඒ ප්‍රකාශය COPE එකේ සභාපතිතුමාටත්, ඒ සෑම සාමාජිකයකුටත් කරන අගෞරවයක් හැටියට තමයි මට නම් තේරුණේ. ඉතින්, මා ඒ නිසා එතුමා කියපු දේ මා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

ලෝකයේ අනෙක් රටවල තිබෙන ආකාරයටම COPE වැනි කාරක සභාවල සභාපතිත්වය දරන්න ඕනෑ, විපක්ෂයේ කෙනකුය කියන එක අප විශ්වාස කරන බව ගරු ඩිවි ගුණසේකර අමාත්‍යතුමාට මා නොයෙකුත් අවස්ථාවල සඳහන් කර තිබෙනවා. මේ ගරු පාර්ලිමේන්තුවේදීත් මා ඒ බව සඳහන් කර තිබෙනවා. අප එය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා කාරණයක්. කෙසේ වෙතත්, ඩිවි ගුණසේකර සභාපතිතුමා සාධාරණව COPE සභාව තුළ ක්‍රියා කරනවා. ඒ නිසා COPE එකටත් එහි සභාපතිතුමාටත් විරුද්ධව යම් කිසි දෙයක් ප්‍රකාශ කිරීම අප සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

අද මේ යෝජනාව ගෙන එන්නේ විගණකාධිපතිගේ පඩි වැඩි කිරීම පිළිබඳවයි. විගණකාධිපති තනතුර රාජ්‍ය සේවයේ තනතුරක් නොවෙයි, මේක ව්‍යවස්ථාදායක තනතුරක් කියන එක තමයි මුලින්ම සඳහන් කරන්න ඕනෑ. මේ යෝජනාව ඉදිරිපත් කරනකොට කිව්වා, මේ යෝජනාව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා, එයින් යෝජනාවක් කැබිනට් මණ්ඩලයට ගෙනැල්ලා, කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා කියලා. ඇත්තටම ඒක ව්‍යවස්ථාපිත ක්‍රමය නොවේ කියලා අප විශ්වාස කරනවා. ඒක මා සඳහන් කරන්නට ඕනෑ. විගණකාධිපති, අග්‍රවිනිශ්චයකාවරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා වැනි කිහිප දෙනෙකුගේ ඒ තනතුරු පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒවා ව්‍යවස්ථාදායක තනතුරු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ව්‍යවස්ථාදායක තනතුරුවල සිටින අයගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් යෝජනා කර අනුමත කරන්න ඕනෑ කියලා. ඒ නිසා මේ යෝජනාව පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරන එකක් විතරක් නොවෙයි. විගණකාධිපති තනතුර පිළිබඳව සඳහන් වෙන්නේ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ, මූල්‍ය පිළිබඳව තිබෙන කරුණු එක්ක.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා.

"රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේය."

පාර්ලිමේන්තුවට මේ බලය දීලා තිබෙන්නේ අය වැය අනුමත කරන්න විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවට මේ බලය දීලා තිබෙන්නේ අය වැය අනුමත කළාට පස්සේ, ඒවා ගැන සොයලා බලලා නිරීක්ෂණය කරලා, වැරදි දේවල් තිබෙනවා නම් ඒ ගැන රට දැනුවත් කරන්නත්, විධායකය දැනුවත් කරලා ඒ වැරදි නිවැරදි කරන්නත්.

මූල්‍ය කටයුතු ගැන කථා කරන කොට ඊට සම්බන්ධ වැදගත්ම ව්‍යවස්ථාදායක තනතුර වන්නේ විගණකාධිපති තනතුරයි. ඒ නිසා විගණකාධිපති පිළිතුරු දෙන්න ඕනෑ විධායකයට නොවෙයි, ව්‍යවස්ථාදායකයටයි. විගණකාධිපති පිළිතුරු දෙන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවටයි. විධායකයයි, ව්‍යවස්ථාදායකයයි, අධිකරණයයි වෙන වෙනම බලතල යටතේ එකක් අනෙකට ස්වායත්තව ක්‍රියා කරන්න ඕනෑ. ඒ කාරණය මේ ව්‍යවස්ථාවේ අඩංගු වෙලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 (1) අනු ව්‍යවස්ථාව යටතේ මෙසේ සඳහන් වෙනවා.

"මුදල් විෂය භාර අමාත්‍යවරයාට අවබෝධ වුවහොත් ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇතිව අවිනිශ්චිත අවස්ථා අරමුදලෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමෙන් ඒ වියදමට අවශ්‍ය මුදල සැපයීමට නියෝග කිරීමේ බලය මුදල් විෂය භාර ඇමතිවරයාට ඇත්තේ ය."

මෙතැන වැදගත් දේ මොකක්ද? මුදල් විෂය භාර ඇමතිවරයාට අවබෝධ වුවහොත්, ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇතිව ඒ කටයුත්ත කරන්න පුළුවන් කියන එකයි වැදගත් දේ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලියන කොට එහි නිර්මාතෘවරුන්, කර්තෘවරුන් මුදල් ඇමති ධුරය වෙනම හඳුනා ගත්තා; ජනාධිපති ධුරය වෙනම හඳුනා ගත්තා. අවාසනාවකට මේ රජයේ ජනාධිපතිතුමා විතරක් නොවෙයි, මීට ප්‍රථම හිටපු ජනාධිපතිවරුත් මේ තනතුරු දෙකම එක පුද්ගලයකු සතු කර තිබුණා. ඇත්තටම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කර්තෘවරු අදහස් කර තිබුණේ පුද්ගලයන් දෙදෙනකු වෙත මේ වගකීම පවරන්නයි. ඒ කර්තෘවරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ විධියට නිර්මාණය කළේ ඇයි? ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහෙම නිර්මාණය කළේ යහ පාලනය ගැන කල්පනා කරලායි. 148 වන ව්‍යවස්ථාව අනුව මූල්‍ය පිළිබඳ සම්පූර්ණ වගකීම දීලා තිබෙන්නේ ව්‍යවස්ථාදායකයටයි. ඒක ක්‍රියාත්මක කරන්නට නම් පාර්ලිමේන්තුවට වගකියන මුදල් ඇමතිවරයෙක් වෙනම ඉන්න ඕනෑ.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අපි අවුරුද්දකට දවස් සියයක් විතර මේ පාර්ලිමේන්තුවේදී මුණගැහෙනවා. මේ දවස් සියයෙන් වැඩි දවසක් අපි සාකච්ඡා කරන්නේ මුදල් පිළිබඳ ප්‍රශ්න; අය වැය පිළිබඳ ප්‍රශ්න; දූෂණය පිළිබඳ ප්‍රශ්න. ඒවා තමයි අපි සාකච්ඡා කරන්නේ. ඒක එක එක අංශ ගැන වෙන්න පුළුවන්. එක එක අමාත්‍යාංශ ගැන වෙන්න පුළුවන්. මූල්‍ය පිළිබඳව කාරණය තමයි ලෝකයේ ඕනෑම පාර්ලිමේන්තුවකට තිබෙන වැදගත්ම කාර්යය. නමුත් ඒක කරන්න නම් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘවරුන් හිතපු දේ අද මෙතැන සිදු වන්නේ නැහැ. අද අපි ඒ තත්ත්වයෙන් එහාට යන්න අවශ්‍යයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාවේ තමයි සඳහන් කරන්නේ විගණකාධිපතිවරයෙක් පත් කරන්න ඕනෑ කියලා. ඉන්පසුව 153(2) අනු ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා.

"විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කළ යුත්තේ ය."

අද රජය ඉදිරිපත් කළා විගණකාධිපතිතුමාගේ වැටුප රුපියල් 48,940.00ක් වෙන්න ඕනෑ කියලා. මට දැන ගන්න ඕනෑ, ඇත්තටම මේ වැටුප නිශ්චය කළේ කවුද කියන එකයි. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් කරනවා ඒක පාර්ලිමේන්තුවෙන් කළ යුතු ක්‍රියාවක් කියලා. "නිශ්චය කිරීම" සහ "අනුමත කිරීම" කියන වචන වෙනස් අර්ථ තිබෙන සිංහල වචන දෙකක්.

මේක අප නිශ්චය කරන්න ඕනෑ. පාර්ලිමේන්තු ක්‍රමයක් තියෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප දන්නවා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මකව තිබෙන විට එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබුණු බව. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ජනාධිපතිතුමාගේ, කථානායකතුමාගේ, අගමැතිතුමාගේ, විපක්ෂ නායකතුමාගේ, පාර්ලිමේන්තුවේ අනෙකුත් පක්ෂවල නියෝජිතයන් සිටියා. පාර්ලිමේන්තු ක්‍රමයක් තිබුණා. නමුත් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමෙන් ඒ ක්‍රමය අප අහෝසි කළා. ඒ ක්‍රමය අහෝසි කළත්, විපක්ෂය හැටියට අප එයට එකඟ නැහැ. ඒ ක්‍රමය අහෝසි කළත් එහි මූලික සිද්ධාන්තයක් තිබෙනවා. විගණකාධිපතිවරයාගේ වැටුප වුණත් නිශ්චය කරන්න ඕනෑ අපය කියන අදහස එම ව්‍යවස්ථාව තුළ තිබෙනවා. අප අද ඒක උල්ලංඝනය කරනවා. මේ යෝජනාව අප අද මෙහෙම ස්ථිර කළොත්, අප ඒක උල්ලංඝනය කිරීමක් කළා වෙනවා. මේ අවස්ථාවේදී බොහොම කනගාටුවෙන් මම ඒ කාරණය මතු කරන්න ඕනෑ.

1833 දී කෝල්බෘක් කොමිෂන් සභාව හරහා තමයි මේ පාර්ලිමේන්තු නියෝජිත ක්‍රමය -නියෝජිතයන්ට බලය දීමේ ක්‍රමය - අපේ රටට ආවේ. නමුත්1799 සිට අවුරුදු 214ක් තිස්සේ විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ රටේ පැවතිලා තිබෙනවා. ඒ නිසා මේ රටේ මූල්‍ය පිළිබඳවත්, මූල්‍ය පරිපාලනය පිළිබඳවත් මේ සභාවල හිටපු නියෝජිතවරු මුල් කාලයේ සිටම වග කීමක් අරගෙන තිබෙනවා. යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවා. නමුත් අද මොනවාද වෙන්නේ? විධායකයයි, ව්‍යවස්ථාදායකයයි අතර ඒ වෙන්ව වෙන්ව තිබෙන බලතල අප ක්‍රම ක්‍රමයෙන් හීන කරමින්, හීන කරමින් ක්‍රියා කරගෙන යනවා.

1921 වන විට මේ සභාව තීරණය කළා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවක් තියෙන්න ඕනෑය කියලා. 1921 සිට අද තිබෙන ක්‍රමයට වාගේම, මුලින් සාමාජිකයන් හතර දෙනෙක් එක්ක, පසුව සාමාජිකයක් දහ දෙනෙකු සමඟ, දැන් සාමාජිකයන් තිස්එක් දෙනෙකු සමඟ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඊට පසුව මේ කාර්ය භාරය බොහොම සංකීර්ණ වෙන කොට -ව්‍යාපාර ඇති වෙන කොට, ඒ කොම්පැනි නීතිය යටතේ තව තව සංවිධාන ඇති කරගෙන යන කොට- 1979 මාර්තු මාසයේ පාර්ලිමේන්තුව තීරණයක් ගත්තා, අපේ මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තව පුළුල් කරන්න. ඒ නිසා තවත් ස්ථාවර නියෝගයක් යටතේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවකුත් ඇති කළා. මේ කාරක සභා ඇති කළේ මුදල් පිළිබඳව අපට තිබෙන වගකීම ඉෂ්ට කරන්නයි. මේ වගකීම අප දරන්නේ කවුරු වෙනුවෙන්ද? මේ වගකීම අප දරන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්. අප මෙතැනට පැමිණිලා තිබෙන්නේ කෙටි කාලයකට පමණයි. අප මෙතැනට පැමිණ සිටින්නේ මේ රටේ ජනතාව කෙටි කාලයකට පමණක් අප කෙරෙහි යම් කිසි විශ්වාසයක් තබා තිබෙන නිසායි. ඔවුන් අපට ඒ වරම දෙනවා. ඔවුන්ට ඒ වරම නැවත අපෙන් ගන්න පුළුවන්. නමුත් අප මෙතැන සිටින කෙටි කාලයේදී හරියට ක්‍රියා කරන්න ඕනෑ.

අද අපේ විගණකාධිපතිතුමාට දෙන පඩිය රුපියල් 48,940යි. මම අහන්න කැමැතියි, බිලියන ගණන් පරිහරණය කරන මේ රටේ, විශාල පරිමාණයේ දූෂණ, වංචා තිබෙන මේ රටේ මේ වාගේ සොච්චම් පඩියක් දීලා මේ වැදගත් නිලධාරියාට අප ඇත්තටම කරන්නේ සාධාරණයක්ද කියලා. අද අප මෙතැන කථා කරන්නේ පුද්ගලයා ගැන නොවෙයි. ඒ පුද්ගලයා ගැන මම ඉක්මනට වචනයක් කියන්නම්. ඔහු ඇත්තටම සෑහෙන විධියට ඔහුගේ ක්‍රියාවලිය සිදු කරගෙන යනවා. ඒ දෙපාර්තමේන්තුවත් ඒ දේ කරගෙන යනවා. නමුත් අප මෙතැන පුද්ගලයා ගැන නොවෙයි කථා කරන්නේ. අප කථා කරන්නේ ඒ තනතුර ගැනයි. මෙවැනි යෝජනා පාර්ලිමේන්තුවට ගෙනාවාම අප ඇත්තටම ඒ නිල තලය හැල්ලුවට ලක් කරනවා. ඒ නිල තලයට මහජනයා තුළ තිබෙන ගෞරවය අපේ ක්‍රියාවලිය තුළින් අප අඩු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ කාරණයත් මේ ගරු සභාවට දන්වන්න මා කැමැතියි. අප එතුමාට වැටුප වශයෙන් රුපියල් 48,940ක් දුන්නාට, එතුමාට වඩා පඩි ලබන තුන් දෙනෙක් එම දෙපාර්තමේන්තුවේම සිටිනවා. එතුමාට වඩා පඩි ලබන තුන් දෙනෙක් දැනටමත් එම දෙපාර්තමේන්තුවේම සිටිනවා. [බාධා කිරීමක්] ඒ කොහොමද කියලා මගෙන් අහනවා. මම ඇත්තටම දන්නේ නැහැ. හැබැයි, මෙහෙම දෙයක් සිදු වෙලා තිබෙනවා කියලා මට හිතන්නට පුළුවන්. මේක ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ගෙන යනවා. මේක ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට අදාළ කරුණක් නොවෙයි. වැටුප් ගෙවන්නේ තනතුරටයි. ජනාධිපතිවරුන් කිහිප දෙනෙක් මේ රටේ කටයුතු කරලා තිබෙනවා. ඒ අය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියද, එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාද, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාද කියලා බලලා, එක එක්කෙනාගේ මුහුණ බලලා ඒ අයට වැටුප් ලබා දීලා නැහැ. ජනාධිපති කියන තනතුරටයි ඒ වැටුප තීරණය කරන්නේ. මේක ව්‍යවස්ථාදායක තනතුරක්. ඒ තනතුරට සරිලන වැටුප දෙන්න අවශ්‍යයි. මා නැවතත් කියනවා, අපි නම් සම්පූර්ණයෙන්ම විරුද්ධයි, මෙම යෝජනාවට. මොකද අපි දන්නවා, එම පුද්ගලයාට දැනටමත් අසාධාරණයක් සිදු වෙලා තිබෙන බව. 2011 දී තනතුර ලැබිලා, 2011 වර්ෂයේ ඉඳලා ඔහුගේ එම තනතුරට සරිලන වැටුප තවමත් ලැබිලා නැහැ. ඉතින් අපි ඒ ගැන කනගාටු වනවා. අපි ඒ ගැන කනගාටු වුණත්, අපට මෙම යෝජනාවට එකඟ වන්නට බැහැ. එක කාරණයක්, ඒ වැටුප මදි. දෙවැනි කාරණය, තනතුර ගැන හිතලා නැහැ. තුන්වැනි කාරණය, මෙය පාර්ලිමේන්තුවෙන් නිශ්චිත වන්නට අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා ගරු කථානායකතුමා මෙයට මැදිහත් වන්නට ඕනෑයි කියලා අපි ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමාට යම් කිසි වග කීමක් තිබෙනවා. ව්‍යවස්ථාදායක නිල තල පිළිබඳව එතුමාට වග කීමක් තිබෙනවා. මෙය විධායකයේ වගකීමක් නොවෙයි. ගරු කථානායකතුමා මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හෝ වෙනත් පාර්ලිමේන්තු ක්‍රමයක් හරහා මේ වැටුප නිශ්චය කරන්නට ඕනෑ. ඒ නිසා මා යෝජනා කරනවා, මෙය ව්‍යවස්ථානුකූල නැහැ කියලා. නීතිය අනුව බලපුවාමත් මේක සුදුසු නැහැ. ඒ වාගේම සාධාරණය පැත්තෙන් බැලුවත් මේක සුදුසු නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, මේක ප්‍රතික්ෂේප කරන්නටයි.

අපි දන්නවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව තුළින් විශාල සේවාවක් ඉටු වන බව. මේ රටේ ව්‍යාපාර ගණනාවක් තිබෙනවා. අද වුණත්, ව්‍යාපාර තිබෙන්නේ 250ක්ද, 300ක්ද, 350ක්ද කියලා අපි දන්නේ නැහැ. මොකද, අලුතෙන් රාජ්‍ය ව්‍යාපාර ඇති කරන්න අලුත් ක්‍රමයක් හදාගෙන තිබෙනවා. මොකක්ද අලුත් ක්‍රමය? කොම්පැනි නීතිය පාවිච්චි කරලා පොඩි මුදලක් යොදවලා කොම්පැනියකින් කොටස් අරගෙන අලුත් ක්‍රමයකට මේක රැගෙන යනවා. ඇත්තටම අපි මේක ගැන දන්නේ නැහැ. නමුත් අල්ලස, දූෂණය ක්‍රියාත්මක වන බව අපි දන්නවා.

අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේම හුඟාක් දූෂණ සිදු වෙමින් පවතින බව එතුමාත් දන්නවා. එතුමාත් ඒක පිළිගෙන තිබෙනවා. එතුමා වෑයම් කරනවා ඒවා නතර කරන්න. නමුත් දූෂණ සිදු වන්නේ එක එක මට්ටමෙන්. හැම තිස්සේම දේශපාලනඥයාගේ මට්ටමෙන්වත්, ඇමතිතුමාගේ මට්ටමෙන්වත් ඒක සිදු වන්නේ නැහැ. සමහර වෙලාවට ඒ මට්ටමෙනුත් සිදු වනවා වන්නට පුළුවන්. සමහර වෙලාවට නිලධාරී මට්ටමෙන් දූෂණ සිදු වනවා. ඉතින් මේ දූෂණ ගැන කථා කරද්දී ඊයේ පෙරේදාත් සිදු වුණු එක්තරා සිද්ධියක් ගැන අපි දන්නවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටින නිසායි මා ඒ ගැන සඳහන් කරන්නේ. යල් පැන ගිය බෙහෙත් ද්‍රව්‍ය මේ රටට ගෙන්වා තිබෙනවා කියලා පසු ගිය දින දෙක තුනේදීම මාධ්‍ය මඟින් අපට අහන්නට ලැබුණා. ඒකත් අර පරණ surgical gloves ගෙන්වීම සම්බන්ධ දූෂණ වාගේද දන්නේ නැහැ. එහෙම එකක් නොවෙන්නත් පුළුවන්. හැබැයි, අප තුළ අර අවිශ්වාසය ඇති වෙලා තිබෙන නිසා, මේ ඊයේ පෙරේදා දැක්ක දේවල් සම්බන්ධයෙනුත් කථා කරද්දී ඒ වාගේ දූෂණ සිදුවන්නට යනවාද කියන එක අපට අහන්නට සිදු වනවා. මේ දූෂණවල එක විශේෂත්වයක් තිබෙනවා. ඉස්සර සිදු වුණු දූෂණ ගැන අහපුවාම අපට දැන ගන්නට ලැබුණේ, සියයට 10ක, සියයට 20ක, සියයට 25ක කොමිස් අරගෙන කියලා යි. හැබැයි, අපි දන්නවා අර ශල්‍ය අත් වැසුම් පිළිබඳ දූෂණ ගැන කථා කරනකොට සියයට 20ක, සියයට 30ක දූෂණ නොවෙයි සිදු වෙලා තිබුණේ. සියයට 200ක, සියයට 300ක ප්‍රතිශතයක් තිබුණු දූෂණ තමයි ඒ අවස්ථාවේ දී සිදු වෙලා තිබුණේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි හුඟක් ක්ෂේත්‍රවල මෙවැනි තත්ත්වයක් තිබෙනවා. හුඟක් මාධ්‍යවල පළ වුණා බාල තෙල් ගෙනැල්ලා කියලා. අපි බලා ගෙන ඉන්නවා. මේ වාගේ දේවල් අපි කලින් කලට මතු කරනවා. COPE එකෙනුත් කථා කරලා තිබෙනවා, අපිත් මේවා ගැන ඉදිරිපත් කරනවා. නමුත් අපට රජයෙන් ප්‍රතිචාරයක් ලැබිලා නැහැ ඒවා ගැන. විශාල පරිමාණයේ දූෂණ වනවා. ඒ නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවත් ඒ තනතුරත් ඉතා වැදගත්. අපි COPE එකට ගියාම එම කාරක සභාවේ වැඩ පටන් ගන්නේ විගණකාධිපති වාර්තාව පදනම් කර ගෙනයි. එය පමණක් නොවෙයි අපට විස්තර ලබා ගැනීමට තිබෙන ක්‍රමය. නමුත් එය අපට විස්තර ලබා ගැනීමට තිබෙන ව්‍යවස්ථාදායක ක්‍රමය. අපි මේ තනතුරත්, මේ දෙපාර්තමේන්තුවත් අගය කරන නිසා අපි නැවතත් ඉල්ලා සිටිනවා එහි ස්වාධීනත්වය රකින්නට කියලා. අපි කථානායකතුමාගෙන් ඉල්ලනවා එහි ස්වාධීනත්වය රකින්න කියලා. අන්තිමට වෙන්නේ මොකක්ද? රුපියල් 50,000ක් 60,000ක් බෙරා ගන්න අපට බිලියන ගණන් වියදම් කරන්නට සිදු වෙනවා. අන්තිමට මේවා ගෙවන්න වෙන්නේ මේ රටේ අඩු ආදායම් ලාභීන්ට. ඒවා ගෙවන්න වෙන්නේ බදුවලින්. ඒ නිසා අපි විශේෂයෙන්ම නැවතත් මෙය සලකා බලා, නැවතත් පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 3.43]

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)

(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අප හමුවේ තිබෙන්නේ විගණකාධිපතිවරයාගේ වැටුප් පිළිබඳව අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනාවක්. මෙය විශාල විවාදයකට ලක් විය යුතු කාරණාවක් නොවෙයි. සාමාන්‍ය සම්ප්‍රදායයක් තිබෙනවා, ඒ නිලධාරීන්ගේ වැටුප් පාර්ලිමේන්තුවෙන් තීරණය කරන්න ඕනෑ කියලා. ඒ තනතුරට අනුයුක්ත කරන විට ඒ ගැන යෝජනාවක් සම්මත කරනවා. මෙහි විශේෂ කාරණා ගොඩක් තිබෙනවා. මම පිළිගන්නවා යළි සලකා බැලිය යුතු කාරණාවක් මෙතැන තිබෙනවා කියන එක. මේ යෝජනාව පාර්ලිමේන්තුවට ආවේ මීට අවුරුද්දකට විතර පෙර. ඒ අවස්ථාවේදී එය ඉදිරිපත් කරන්නට හදන විට ඇත්තටම මම එය සභානායකතුමාට කියලා නතර කළා. එහෙම කරලා මම උත්සාහයක් ගත්තා COPE එකේ සභාපතිවරයා විධියට යළිත් වරක් මේ කාරණාව මුදල් අමාත්‍යාංශයට, ජනාධිපති කාර්යාලයට සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යොමු කරලා මේ ගැන වෙනත් වැඩ පිළිවෙළක් සකස් කර ගන්න ඕනෑ කියලා. නමුත් ඒ විධියේ ක්‍රමවේදයක් ඇත්තේ නැහැ. මේ වැටුප සකස් කරලා තිබෙන්නේ එතුමා Auditor-General's Department එකේ දරන සේවාව පදනම් කර ගෙනයි. ඒ සේවාවේ වැටුප් වැඩි වන ආකාරයට තමයි මේ වැටුප නියම කරලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මමත් මුළුමනින්ම එකඟ වෙනවා අපේ ගරු වික්‍රමරත්න මන්ත්‍රීතුමා කියූ කාරණාවට. විගණකාධිපතිතුමා කියන්නේ ව්‍යවස්ථාවෙන් කළ පත්වීමක්, එහෙම නැත්නම් Constitutional appointment එකක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තීරණය කරන ලද තනතුරක්. ඒ තනතුරේ වැටුප තීරණය කළ යුත්තේ පාර්ලිමේන්තුව. නමුත් පාර්ලිමේන්තුවෙන් තීරණය කළ යුතුයි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණාට මෙතෙක් කවර දාකවත් පාර්ලිමේන්තුව තුළ එහෙම ක්‍රමවේදයක් සකස් වෙලා නැහැ. විය යුතු දෙය එය තමයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ වැටුප් තීරණය කරන්නෙත් ඒ විධියටයි. ඒවාත් Constitutional appointments. ඒ වාගේ තවත් නිලධාරීන් සිටිනවා. හැම දාම දිගින් දිගටම එම ක්‍රමවේදය වෙලා තිබෙනවා. පවතින ක්‍රමවේදය අනුව අමාත්‍ය මණ්ඩලයට යනවා, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයෙන් හෝ අනෙකුත් ලේකම්වරු මේ ගැන සාකච්ඡා කරලා නිලධාරී මට්ටමින් තමයි මෙය සකස් වෙමින් ඉස්සරහට එන්නේ. මෙය හිතකර හොඳ ක්‍රමයක් කියලා මම කල්පනා කරන්නේ නැහැ. මෙය අපි යළිත් සලකා බැලිය යුතුයි. නමුත් මෙය පවතින ක්‍රමවේදය යටතේ සම්මත කළ යුතුයි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස් වෙච්ච වෙලාවේ ඊයේත් අපි මේ කාරණාව ගැන සාකච්ඡා කළා. 23 වැනි දා

[ගරු ඩිව් ගුණසේකර මහතා]

වෙනකොට ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. අපේ නිර්දේශයන් යටතේ, විගණකාධිපතිතුමාගේ වැටුප් පිළිබඳ කාරණාව ගැන COPE **කමිටුව** විසින් යම් නිර්දේශයක් කරනවා, ඒ පිළිබඳව යම් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑය කියා. ඒ වාගේම මේ ප්‍රශ්නය ගැන ගරු කථානායකතුමා සමඟත් සාකච්ඡා කරන්න අප බලාපොරොත්තු වෙනවා. මේ සම්ප්‍රදාය වෙනස් කළ යුතුයි. මොකද, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කී ආකාරයට යටත් විජිත යුගයේ අපේ රටේ පළමුවෙන්ම පිහිටු වූ දෙපාර්තමේන්තුව තමයි Auditor-General's Department එක. 1799 දී තමයි එය පිහිටුවා තිබෙන්නේ. ඒ කියන්නේ, බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් අපේ රටට ඇවිල්ලා රට එක්සත් කරන්න ඉස්සෙල්ලා මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගෙන ඉන්න කාලයේදී පිහිටුවපු පළමු වන රජයේ දෙපාර්තමේන්තුව තමයි Auditor-General's Department එක. මූල්‍ය විනය, මූල්‍ය පාලනය පිළිබඳව එදා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව දැක්වූ වැදගත්කම ඒකෙන් පෙන්නුම් කරනවා. ඔවුන් මේ රටට එනකොටම Auditor-General's Department එකක් හදා ගෙන තමයි මෙහාට එන්නේ. මොකද, ඔවුන් එන්නේම වෙනත් රටකට ගිහින් සල්ලි වියදම් කරන්නයි. එදා පාර්ලිමේන්තුවක් නොතිබුණත් මුදල් වියදම් කරන ආකාරය පිළිබඳ කටයුතුවලදී විගණකාධිපති කෙනෙක් අවශ්‍යයි, දෙපාර්තමේන්තුවක් අවශ්‍යයි කියන එක ඔවුන් එදා තීන්දු කළා. මූල්‍ය පාලනය හා මූල්‍ය විනය පිළිබඳව තිබෙන මූලධර්මයන් මත පිහිටා තමයි එහෙම කටයුතු කර තිබෙන්නේ.

ඊට පසුව ක්‍රමානුකූලව තමයි පාර්ලිමේන්තුවට මූල්‍ය පිළිබඳව -මුදල් පිළිබඳව- බලය එන්නේ. 1921 දී තමයි ගිණුම් කාරක සභාවක් පිහිටුවන්නේ. එදා පාර්ලිමේන්තුවට සම්පූර්ණ බලතල තිබුණේ නැහැ. නමුත් ක්‍රමානුකූලව එය වැඩි වෙනවා. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ යම් බලතල තවත් වැඩි වෙනවා. 1947න් පසුව තමයි පාර්ලිමේන්තුවට මූල්‍ය පිළිබඳව බලය මුළුමනින්ම ලැබෙන්නේ. එසේ වුවත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුන් වතාවක් සකස් කර තිබෙනවා. විගණකාධිපතිතුමාගේ පත්වීම පාර්ලිමේන්තුවෙන් කරන පත්වීමක්ය, ව්‍යවස්ථාමය පත් වීමක්ය කියා තිබුණත් පාර්ලිමේන්තුව විසින් එතුමාගේ වැටුප නිශ්චය කළ යුතුයි කියා තිබුණත් තිබෙන ක්‍රමවේදය හා සම්ප්‍රදායයන් අනුව ඇත්ත වශයෙන්ම එතැනදි කරන්නේ නිලධාරි මට්ටමෙන් එය සකස් කරලා, ඇමති මණ්ඩලයට ඉදිරිපත් කළාම, එතැනින් මෙහාට එන එකයි. මෙතැනින් සම්මත වුණාම පාර්ලිමේන්තුව විසින් එය නිශ්චය කළාය කියා අපට අර්ථ කථනය කරන්න පුළුවන්. නමුත් පාර්ලිමේන්තුවේ එවැනි ක්‍රමවේදයක් නැහැ කියා ඒ ගරු මන්ත්‍රීතුමා කියපු දෙය මම පිළිගන්නවා.

Constitutional appointments කියන මේ පත්වීම්, ටිකයි තිබෙන්නේ. ඒවායේ වැටුප තීරණය කිරීමේ කාර්යභාරය අමාත්‍යාංශයක නිලධාරියෙකුට පවරන එක සදාචාරාත්මක නැහැ. ඒක උත්තරීතර තනතුරක්. ඒ නිසා තමයි ඒක ව්‍යවස්ථාවට අන්තර්ගත කර තිබෙන්නේ. ඇයි මේ මූල්‍ය බලය පාර්ලිමේන්තුවට දී තිබෙන්නේ? මූල්‍ය පිළිබඳව වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ජනතාවට වග කියන්නේ පාර්ලිමේන්තුවයි. ජනාධිපතිතුමා වග කියන්නේ නැහැ, ජනතාවට. මූල්‍ය පැත්තෙන් වග කියන්නේ පාර්ලිමේන්තුවයි. පෞද්ගලිකව එකද ඇමතිවරයෙක් හෝ මූල්‍ය පිළිබඳව ජනතාවට වග කියන්නේ නැහැ. මූල්‍ය පිළිබඳව සමස්තයක් වශයෙන් ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් කියන ඔක්කොම එකතු වුණාම තමයි සමස්තයක් වශයෙන් වග කිව යුත්තේ හැම සතයක්ම වියදම් කිරීම පිළිබඳව. ඒ වාගේම බදු වශයෙන් ජනතාවගෙන් ගන්නා හැම සතයක්ම පිළිබඳවත් වගකිව යුතු වෙනවා. එහෙම තමයි මූල්‍ය විනය පිළිබඳව බැලිය යුත්තේ. නමුත් ප්‍රායෝගිකව ක්‍රියා කිරීමේදී සමහර විට මේවා ලිහිල් වෙලා ගිහින් මුල් මූල ධර්මයන් අනුව කටයුතු කිරීමේ තත්ත්වයෙන් ඉවත් වන අවස්ථාවනුත් තිබෙනවා. ඒ නිසා මෙතැනදී අසාධාරණයක් වෙනවාය කියා මම පිළිගන්නවා. ඒ අනුව මා ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකට විරුද්ධ නොවන ලෙසටයි. විගණකාධිපතිතුමා 2011 ඉඳලා පඩි වැඩිවීමක් නැතිව ඉන්නවා. අවුරුදු දෙකක් විතර ගිහින් තිබෙනවා. ඒක නිසා අපි මේ යෝජනාව සම්මත කරමු. අපි 23 වැනිදාට ඉදිරිපත් කරන වාර්තාවේ නිර්දේශ ගෙනෙනවා. කැබිනට් ඇමතිවරු ගණනාවක් ඔබතුමාගේ කථාව අහලා මගෙන් ඒ ගැන විමසුවා. මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා මේ ගැන පුදුමයට පත් වෙලා. ඇත්ත වශයෙන්ම එතුමා විසින් විමර්ශනය කරන සියලුම ආයතනවල ප්‍රධානීන් එතුමාට වඩා පඩියක් ගන්නවා. එතුමාගේ ආයතනයෙන් එතුමා හතර වැනියා. අපි 23 වැනිදා දෙන්නේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අයිති ආයතන 247ක් පිළිබඳව වාර්තාවක්. මේ 247ම ගත්තත් එහි හැම ප්‍රධානියකුම Auditor-Generalට වඩා ඉහළ පඩියක් ගන්නවා. මේකෙදී පැරණි සම්ප්‍රදායන් නැති කරලා පාර්ලිමේන්තුවට තිබෙන බලය පාවිච්චි කිරීමට අපි ක්‍රමවේදයක් හදා ගන්න ඕනෑ.

ඊයේ පත්තරේ තිබුණා, එක්තරා ආයතනයක සභාපතිගේ පඩිය රුපියල් ලක්ෂ 6යි කියලා. මා දන්නේ නැහැ, ඇත්තක්ද කියලා. බලන්න, ඒ Board එකට බලය තිබෙනවා, ලක්ෂ හයක් දක්වා වැඩි කරන්න. නමුත් පාර්ලිමේන්තුවේ අපට බලයක් නැහැ, විගණකාධිපතිතුමාගේ පඩිය තීරණය කරන්න, ක්‍රමවේදයක් නැතිකම නිසා. මෙතැන ක්‍රමවේදය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඒ තිබෙන විෂමතාව අපි වෙනස් කළ යුතුයි. 23 වැනිදා අප විසින් ඉදිරිපත් කරන වාර්තාවේ මේ කාරණාව සම්බන්ධයෙන් නිර්දේශයක් ගෙනෙන්න බලාපොරොත්තු වනවා. එතකොට ඒක විධායකයට ගියාට පසු විධායකය විසින් එය සැලකිල්ලට ගන්න ඕනෑ. කිසි ලෙසකින් මෙය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් තීරණය කළ යුත්තක් නොවෙයි. ඒ අය දන්නවාද මොකක්වත් මෙතැන කෙරෙන දේවල් ගැන? Auditor-General කරන වැඩ ප්‍රමාණය එතුමන්ලා දන්නවාද? 1799 Auditor-General's Department එක පිහිටවපු කාලයේ වාගේ නොවෙයි, අද රටේ ආයතන විශාල ගණනක් තිබෙනවා. රජයේ සියලුම දෙපාර්තමේන්තු විගණනය කරන්න ඕනෑ; සියලුම අමාත්‍යාංශ විගණනය කරන්න ඕනෑ. අනෙක් අතට බැලුවාම ආයතන 247ක් තිබෙනවා. සමහර ඒවා තිබෙනවා, Limited Liability Companies කියලා, රජයේ ප්‍රාග්ධනය යොදවන ආයතන. විගණකාධිපතිතුමාට බලයක් නැහැ ඒවා හොයන්න. අපි දැන් ඒ සඳහා බලය ඉල්ලන්න, Standing Orders වෙනස් කරන්න recommendation එකක් කරනවා. අපට ඒවා ගැනත් හොයන්න ඕනෑ. ඒවා විමර්ශනය කරන්නේ private auditorsලා; Auditor-General නොවෙයි. Private auditorsලා ඒවා හෙව්වත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පත් වන නිලධාරියාට රාජ්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කරන හැම ආයතනයකටම ගිහිල්ලා ඒ කටයුතු හරියට කෙරෙනවාද කියලා සොයා බැලීමේ බලතල අවශ්‍ය වනවා. ඉතින් එය පාර්ලිමේන්තුව විසින්මයි තීරණය කළ යුත්තේ. එය අමාරු කටයුත්තක් නොවෙයි. අපේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවක් තිබෙනවා. ඒකෙන් නිර්දේශ කරලා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ දෙපැත්තම එකඟ වෙලා කටයුතු කරනවා නම් ඒක නීතියක් බවට පත් වෙනවා. අපට තිබෙන බලතල ගන්න අපට පුළුවන්. කවුරුවත් දෙන්න ඕනෑ නැහැ. මේ පාර්ලිමේන්තුවට පුළුවන් ඒක කරන්න. අද ආයතන විශාල ගණනක් රාජ්‍ය අංශයේ ව්‍යාප්ත වෙලා තිබෙනවා. අද කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරනවා. මේ හැම එකක්ම හොයා

බලන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව. විගණකාධිපතිතුමා යටතේ deputiesලා ඉන්නවා. ඒ වාගේම මේ දෙපාර්තමේන්තුව තවත් ශක්තිමත් කරන්න ඕනෑ.

මේ පාර්ලිමේන්තුවට ආවාම හැමදාම අල්ලස් ගැන, දූෂණ ගැන කථා කෙරෙනවා. මේවා අවම කරන්න කළ යුතු එක දෙයක් තමයි විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම. අද ඉස්සර වාගේ නොවෙයි. අපේ තිබෙන accounting systems පැරණි ඒවා. ජාත්‍යන්තර ප්‍රමිතිය තිබෙන accounting systems එකකට යන්න ඕනෑ. විශේෂයෙන්ම CEB එක, Ceylon Petroleum Corporation, SriLankan Airlines වාගේ ඒවාට පැරණි ගිණුම් ක්‍රම නොවෙයි අලුත් ගිණුම් ක්‍රම ඇතුළත් කරන්න ඕනෑ. Cost accounting system එකකට යන්න ඕනෑ. නැත්නම් CEB එක වාගේ ආයතනයක කොතැන leaks තිබෙනවාද කියලා හොයන්න අමාරුයි. එක පැත්තකින් electricity generate කරනවා; ඊළඟට transmit කරනවා; ඊළඟට distribute කරනවා. කොයි point එකකදී අලාභ වනවාද කියලා දන්නේ නැහැ. Cost accounting system එකක් නැත්නම් ඒ අලාභය හොයන්න බැහැ. අපි ඇමතිවරයාට බැණලාත් වැඩක් නැහැ; අනෙක් අයට බැණලාත් වැඩක් නැහැ; ඒ system එක ඇති කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පැරණි මූල්‍ය ගිණුම් විමර්ශනය කිරීමට වඩා ඒ පැත්තෙන් අපි අඩියක් ඉස්සරහට ගිහින් තිබෙනවා. අද කාර්ය සාධනය - performance - බලන්න ඕනෑ. මුදල් වැය කිරීම පමණක් නොවෙයි, product එක පැත්තත් බලන්න ඕනෑ; ඒ වැඩේ හරියට කෙරුණාද කියලා බලන්න ඕනෑ. Auditor-General's Department ඉතිහාසයේ පළමුවැනි වතාවට performance auditing එක ආරම්භ කරලා තිබෙනවා. අපි කෝප් එකේදී සාකච්ඡා කරලා විගණකාධිපතිතුමාට කිව්වා, performance auditing එක ආරම්භ කරන්න කියලා. දැනටම එය ආරම්භ කර තිබෙනවා.

අපි ඒ වාර්තා ගෙනෙනවා. Ceylon Petroleum Corporation එකට contaminated oil ගෙනාපු වෙලාවේ ඒවා පත්තරේ වැටුණු ගමන්ම, COPE එකේ සභාපති විධියට ඉතිහාසයේ පළමුවැනි වතාවට මා Auditor-Generalට පාර්ලිමේන්තුවෙන් order එකක් දුන්නා, ගිහින් පරීක්ෂා කරන්නය කියලා. ඒ වාර්තාව ඊයේ කථානායකතුමාට බාර දුන්නා. ඒක ඉතිහාසයේ පළමුවැනි වතාවට අප කරපු දෙයක්. අපේ දෙපැත්තේ මන්ත්‍රීවරු ගිහින් ආයතන දෙකක් පරීක්ෂා කළ අවස්ථා තිබෙනවා. ජයවර්ධනපුර ඉස්පිරිතාලයට ගියා. හැබැයි මා මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාට telephone එකෙන් කිව්වා, මම යනවාය කියලා. එතුමා හරි කැමැත්තෙන් කිව්වා, මට මේක හරි ගස්සා ගන්න බැරිව ඉන්නේ කියලා. ඒ වාර්තාව සකස් කිරීමේදී අප ඉදිරිපත් කරපු නිර්දේශ ඔක්කොම ඇමතිතුමා පිළිගත්තා. අප එතැනට ගිහිල්ලා දොස්තරවරු, nursesලා ඔක්කොම ගෙනැල්ලා එතුමන්ලාගේ ප්‍රශ්න මොනවාද කියලා පැය ගණනක් ඔවුන් සමඟ කථා කළා. එතැන තිබෙන අඩු පාඩුකම් අප දැක්කා. දෙපැත්තේම මන්ත්‍රීවරු එතැන හිටියා. ඒ වාගේම අප අඩියක් ඉස්සරහට ගිහින් අද කාර්ය සාධනය - performance - පැත්තත් බලනවා. එහෙම විශාල වැඩ කොටසක් බාරව ඉන්න ප්‍රධාන නිලධාරියකුගේ වැටුප රුපියල් 45,000යි.

ඇත්ත වශයෙන්ම, එතුමා යටතේ තිබෙන එතුමා විමර්ශනය කරන හැම ආයතනයකම ප්‍රධානීන් එතුමාට වඩා වැඩි පඩියක් ගන්නවා. මේ තත්ත්වය බරපතළයි. අපේ නිලධාරි පැළැන්තියක් ඉන්නවා. නමුත් මේවා යෝජනා කරන්නේත් නැහැ. මේවා අප නොවෙයි කරන්න ඕනෑ. සමහර විට ඔවුන්ට පෙනෙන්න ඕනෑ, මේවා යෝජනා කරන්න. National Salaries and Cadres Commission එකට අවබෝධයක් තිබෙන්න ඕනෑ, මෙතැන අසාධාරණයක් වෙනවාය කියලා තේරුම් ගන්න. කරුණු නොදන්නවා නම් ඒ ගැන පාර්ලිමේන්තුවෙන් අහන්න තිබුණා. අපෙන් ඇහුවා නම් අප කියනවා. මා හිතන්නේ 2011 ඉඳලා මේ ප්‍රශ්නය තිබුණා. මා එතුමාටත් කථා කළා. අපි මේක සම්මත කරමු. 23 වැනිදා ඉදිරිපත් කරන වාර්තාවෙන් නිර්දේශ කළාට පස්සේ අප බලාපොරොත්තු වනවා, කථානායකතුමාත් එක්ක මේ ගැන සාකච්ඡා කරන්න. මෙය Auditor-Generalගේ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. Constitutional appointments තිබෙන, ඒ කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පත්වීම් කරන සියලුම තනතුරු පිළිබඳව මා හිතන්නේ හරි තක්සේරුවක් කරලා ඒ පිළිබඳව ක්‍රමවේදයක් හදන්න ඕනෑ, පාර්ලිමේන්තුව තුළින් ඒවායේ පඩි වැඩි කරන්න පුළුවන් වන විධියට. පාර්ලිමේන්තුවට ඒ බලය ගන්න ඕනෑ. ඊට පස්සේ සල්ලි pass කරන එක කැබිනට් එකට දාලා, මුදල් ඇමතිවරයා මඟින් අනුමත කර ගන්න පුළුවන්. ඒක දෙවැනි කාරණාවක්. මෙම තීරණය ගැනීමේ සාම්ප්‍රදාය, ක්‍රමවේදය අලුතින් සකස් කරන්න ඕනෑ. මා ඊට වඩා මේ ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

23 වැනිදා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළාම අපම යෝජනා කරනවා, මාසයක් ඇතුළතදී විවාදයක් පවත්වන්න ඕනෑය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊ ළඟ අවුරුද්දේ මාස තුනෙන් තුනට පාර්ලිමේන්තුවට වාර්තාවක් ගෙනෙන්න අප බලාපොරොත්තු වනවා. අවුරුද්දක් යන තුරු අප ඉන්නේ නැහැ. මාස තුනක් යන කොට වාර්තාව ඉදිරිපත් කරනවා. ඒ පිළිබඳව debate එකක් දෙනවා. ඊ ළඟ මාස තුන ගියාම ඊ ළඟ කටයුතු ටික කරනවා. එතකොට අවුරුද්ද අවසාන වන කොට ආයතන ටික ඔක්කොම පිළිබඳව සොයා බලා අවසානයි. අවසානයේදී හොඳ විවාදයක් කරන්න පුළුවන්, ප්‍රතිපත්ති පිළිබඳව වාගේම අනික් කාරණා ඔක්කොම එක් කරලා. නිරන්තරයෙන්ම ජනමාධ්‍යයට ඒ පිළිබඳව ඇහැ ගහගෙන ඉන්න පුළුවන්. අපේ මැති ඇමතිවරුන් තමන්ගේ ආයතනවල තත්ත්වය දැන ගන්නවා, මාස තුනෙන් තුනට වාර්තා එන නිසා. පාර්ලිමේන්තුවේ මාස තුනෙන් තුනට විවාද වනවා, ඒ ආයතන පිළිබඳව. ඒ නිසා මෙයින් යම් බලපෑමක් ඇති වෙනවා.

මා සන්තෝෂයෙන් මේ කාරණය පිළිබඳව කියන්නේ. අප 2012 - 2013ට ආයතන 247ක් පරීක්ෂාවට ලක් කර තිබෙනවා. මේක තමයි පාර්ලිමේන්තු ඉතිහාසයේ 1921න් පස්සේ සියලුම ආයතන පරීක්ෂා කරපු එකම අවස්ථාව. ගිය අවුරුද්දේ අපට පරීක්ෂාවට ලක් කරන්න පුළුවන් වුණේ ආයතන 229යි. අඩුවෙන් තමයි පරීක්ෂා කරන්න පුළුවන් වුණේ. මොකද ඉතුරු කොටස ඊට ඉස්සෙල්ලා කොමිටියෙන් පරීක්ෂා කරලා තිබුණු නිසා අප කළේ නැහැ. මේක තමයි දවස් 365ක් තුළ ආයතන 247ක් පරීක්ෂාවට ලක් කළ එකම අවස්ථාව. තමුන්නාන්සේලා පුදුම වෙලා අසාවි, අපි වෙන වැඩක් කළේ නැද්ද කියලා. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරු, ඇමතිවරු විශාල ගණනාවක් පාර්ලිමේන්තුව රැස් නොවන දවස්වලත් උදේ ඉඳලා රෑ වන තුරු වැඩ කළා. එය විශාල වැඩ කොටසක්. මා හිතන හැටියට අපේ කාර්ය මණ්ඩලයේ ඉන්නේ 11 දෙනායි. අපේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත් කියන මේ කාරක සභා දෙකේම වැඩ කරන්නේ ඒ නිලධාරින්. ඔවුන්ට අසීමිත වැඩ කොටසක් තිබෙනවා. දැන් ඉස්සර වාගේ නොවෙයි. COPE එකට ඇවිල්ලා මේක කරන්න ඕනෑය කියලා අප තීරණයක් දුන්නාට පස්සේ ඒ කටයුතු කරනවාද නැද්ද කියලා පසු විපරම් කරනවා; ලියුමක් යවනවා.

ආපසු ගෙන්වනවා; පිටුපසින් යනවා. ඉස්සර අපි තීරණ දුන්නාට පස්සේ ඊළඟ අවුරුද්දක් ගියාට පස්සේ තමයි බලන්නේ. දැන් follow-up action අපි ආරම්භ කරලා තිබෙනවා. පළමුවැනි

[ගරු ඩිව් ගුණසේකර මහතා]

වතාවට Commission to Investigate Allegations of Bribery or Corruption වෙත යැවූ ඒවායේ සියලුම වාර්තා අපි ගෙන්වා ගත්තා. මම ප්‍රකාශයක් කළාට පස්සේ Commission to Investigate Allegations of Bribery or Corruption පසු ගිය දවස්වල පත්තරයේ පළ කරලා තිබුණා, "අපව කැඳවන්න පාර්ලිමේන්තුවට බලයක් නැහැ" කියලා. මම කිව්වා, "කොමසාරිස්වරයා කැඳවන්න මට බැහැ, මම Director General කැඳවනවා" කියලා. දැන් වාර්තා ඔක්කොම එව්වා. මම ඒවා ඉදිරිපත් කරන්නම්. ඒවා සම්බන්ධව පරීක්ෂණ කරනවාද, නැද්ද කියන එක වෙනම කාරණාවක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් අවුරුදු ගණනාවක් තිස්සේ කියනවා, අපි Commission to Investigate Allegations of Bribery or Corruption වෙත පැමිණිලි කරනවා, කෝ කාට කියන්නද කියලා. දැන් ඒ වාර්තා එනවා. අපි ඒ තත්ත්වය ඇති කරලා තිබෙනවා. CID එකට යැවූ වාර්තා අපි ගෙන්වා ගන්නවා. සමහර දේවල් ගැන මෙතැන යම් දූෂණයක් ඇති වෙලා කියලා අපට පෙනෙන්න තිබෙනවා නම්, Auditor-Generalට පරීක්ෂා කරන්න බැරි, ඊට වඩා ගැඹුරට යන දෙයක් නම් අපි ඒක CID එකට යවා තිබෙනවා. ඒ වාගේ පියවර ගණනාවක් අපි අරගෙන තිබෙනවා. අද ගම්වල මිනිස්සුත් දන්නවා, COPE එක කියන්නේ මොකක්ද කියලා. ඉස්සර දන්නේ නැහැ. දැන් හැමෝම දන්නවා. ජනමාධ්‍ය උදේ ඉඳලා හැන්දෑ වෙනකම් මේ ගැන අහනවා. FM නාලිකා 50ක් විතර තිබෙනවා. ඒ ඔක්කෝම මොනවා හරි තොරතුරක් ඉල්ලා හැම දාම මට telephone කරනවා. ඒ වාගේ අවදියෙන් සිටින තත්ත්වයක් අප ඇති කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි බලපෑම තමුන්නාන්සේලාට 23වැනි දා බලා ගන්න පුළුවන්. මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ සවිස්තර වාර්තාවක් අපි මේ වතාවේ ඉදිරිපත් කරනවා. ලාභ ලබන ආයතන, අලාභ ලබන ආයතන, ලාභ වැඩි වුණු ආයතන, අලාභ වැඩි වුණු ආයතන ගැන අපි classification එකක් කළා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අයත් ආයතන 247 පිළිබඳවම වාර්තාවක් අපි සකස් කරලා තිබෙනවා. ඒ නිසා මා විපක්ෂයෙන් ඉල්ලා සිටින්නේ, විගණකාධිපතිතුමාගේ වැටුප සම්බන්ධ තීරණය අපි අනුමත කරමු කියලායි. ඒ ප්‍රශ්නය සමරවීර මහත්තයාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ තනතුරේ ප්‍රශ්නයක්. Constitutional appointment එකක් වූ ඒ තනතුරේ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමා එක්කත් කථා කරලා විගණකාධිපතිතුමාගේ වැටුප සම්බන්ධ ප්‍රශ්නයට අලුත් ක්‍රමවේදයක් හදලා මේ විෂමතාව නිවැරදි කරලා මේ තනතුර අපි පූජනීය තත්ත්වයට ගේන්න ඕනෑ. මුළු රාජ්‍ය තන්ත්‍රයේම මූල්‍ය පාලනය කරන පුද්ගලයාගේ වැටුප මේ තරම් අඩු නම් මම හිතන්නේ ඒක හරිම අසාධාරණයක් කියලායි. මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන්න කියලා විශේෂයෙන්ම මහා භාණ්ඩාගාරයෙනුත්, ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත් මා ඉල්ලා සිටිනවා. වැටුප් කොමිෂන් සභාව එක්ක මේ ගැන කථා කරලා වැඩක් නැහැ. ඒගොල්ලන්ට මේක යන්න අවශ්‍ය නැහැ. පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා සමඟ සාකච්ඡා කරලා මේ පිළිබඳව අලුත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sunil Handunnetti. Before that, will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී "ගරු ආර්. යෝගරාජන් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

[අ.භා. 4.05]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විගණකාධිපතිතුමාගේ වැටුප පිළිබඳව නීත්‍යානුකූල තත්ත්වයක් ඇති කිරීම පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී රටේ මූල්‍ය විගණනය, මූල්‍ය පාලනය පිළිබඳව වැදගත් කරුණු ගණනාවක් අවධාරණය කෙරුණා. විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හැටියට ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා ඉතා පැහැදිලිව රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන වගකීම පාර්ලිමේන්තුව හමුවේ අවධාරණය කළා. එතුමා ඉතා නිවැරදි ආකාරයට කිව්වා, ඒ පිළිබඳව වගකීම තිබෙන්නේ ජනාධිපතිතුමාට නොවෙයි, විධායකයට නොවෙයි, මේ පාර්ලිමේන්තුවට -අපට- කියලා. දැන් අපට තිබෙන ගැටලුව තමයි පාර්ලිමේන්තුව සතු මූල්‍ය පාලනයේ වගකීම ක්‍රියාත්මක වන්නේ කොහොමද, ඒක ජනතාවට යන්නේ කොහොමද කියන එක. තමන්ගේ බදු මුදල්වලට මොකද වන්නේ, තමන් රජයට ගෙවන දේට මොකද වන්නේ, රජය තමන්ගෙන් අය කරන දේ කොහොමද වියදම් කරන්නේ කියන එක පිළිබඳව හොයා බලන්න ජනතාව අපව පත් කර ගෙන තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සිටින අප 225 දෙනාගේ කාර්ය භාරය ඒකයි. නමුත් අපි පෞද්ගලිකව ගිහිල්ලා ඒක සොයා බලන්නේ නැහැ. රජයේ ආයතනවලට ගිහිල්ලා කඩා පැනලා දැන් මේකේ සල්ලි කොපමණ අරගෙන තිබෙනවාද, කොපමණ වියදම් කරලා තිබෙනවාද කියලා හොයන්න එහෙම පෞද්ගලික යාන්ත්‍රණයක් අපට නැහැ.

එහෙම නැත්නම් කැබිනට් මණ්ඩලය දෙන අනුමතිය පිළිබඳවත්, ඒ තීන්දු තීරණ නැවත පසු විපරම් කරන්නත් මේ පාර්ලිමේන්තුවේ අපි යන්නේ නැහැ. මෙන්න මේ ක්‍රියාවලිය පසුවිපරම් කරන, මේ ක්‍රියාවලිය සොයා බලන, ඒ වගවීම පිළිබඳව පාර්ලිමේන්තුව සතු කාර්ය භාරය ක්‍රියාත්මක කරන පුද්ගලයා තමයි විගණකාධිපතිතුමා. විගණකාධිපතිතුමාගේ ක්‍රියාවලිය ඇතුළත තමයි අපි තේරුම් ගන්නේ අහවල් අහවල් රාජ්‍ය ආයතන අද විනාශයට ගමන් කරමින් සිටිනවා; නැත්නම් හොඳ මට්ටමින් ක්‍රියාත්මක වෙනවා; නැත්නම් ජනතාවට යහපත් ආකාරයට කටයුතු කරනවාය කියා. දැන් තිබෙන ගැටලුව තමයි මේ විගණකාධිපතිතුමාගේ කාර්ය භාරය එක පැත්තකින් ප්‍රායෝගිකවම සීමා කර තිබීම. එහි එක ලක්ෂණයක් තමයි, එහි

එක අවස්ථාවක් තමයි විගණකාධිපතිතුමා විසින් අධීක්ෂණය කරන ආයතනවල ප්‍රධානීන්ගේ වැටුපටත් වඩා විගණකාධිපතිවරයාගේ වැටුප අඩු වීම. ආයෝජන මණ්ඩලයේ සභාපතිතුමාගේ වැටුප ගත්තොත් මාසයකට රුපියල් ලක්ෂ 6යි. ශ්‍රීලංකන් ගුවන් සේවයේ සභාපතිතුමා රුපියල් 2,50,000ක දීමනාවක් ලබනවා. සමහර ආයතනවල ප්‍රධානීන් රුපියල් ලක්ෂ දෙකහමාරක දීමනාවක් ලබනවා. ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා මාසයකට රුපියල් ලක්ෂ 6ක් ලබනවා. ආයෝජන මණ්ඩලය ගැන වග විභාග කරන විගණකාධිපතිවරයා මාසයකට ලබන්නේ රුපියල් 48,940යි. ප්‍රශ්නය තිබෙන්නේ වැටුප විතරක් නොවෙයි. මේ කාර්ය භාරය, විගණකාධිපති දෙපාර්තමේන්තුවට හඳුන සීමාව, රාජ්‍ය මූල්‍ය පිළිබඳව සම්පූර්ණ වගකීම විගණකාධිපතිවරයා සතුය කිව්වාට, එය ව්‍යවස්ථානුකූල ධුරයක් වුණාට, එය ව්‍යවස්ථානුකූල ස්වාධීන ධුරයක් වුණාට, ප්‍රායෝගික යථාර්ථයට ගියාට පසු අත් බැඳපු කකුල් බැඳපු කට වහපු නිලයක් බවට එය පත් වෙනවා. ඒ නිසා පසු ගිය මූල්‍ය වාර්තා අධීක්ෂණය කිරීමට පමණක් විගණකාධිපතිවරයාගේ ක්‍රියා මාර්ග අද සීමා වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ 2009, 2010, 2011 සහ 2012 විගණකාධිපති වාර්තායි. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා ලබන 23වන දා ඉදිරිපත් කරන්නේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 2011 වාර්තාවයි. එතකොට 2012, 2013 දැන් ක්‍රියාවලියක් සිද්ධ වෙමින් යනවා. බඩු මිල වැඩි වන්නේ, බදු ගහන්නේ, රාජ්‍ය ආයතන පාඩු ලබනවාය කියන්නේ, පාඩු ලබනවාය කියා බදු ගහන්නේ 2013ටයි. හැබැයි,විගණකාධිපතිතුමා පරීක්ෂා කරන්නේ 2009, 2010. ඒ කියන්නේ අවුරුදු පහකට එහා ඒවායි. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ එයින් ඇති වැඩය මොකක්ද කියන එකයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අපි ප්‍රායෝගිකව අත් විඳින යථාර්ථය මේකයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවට අද පරීක්ෂාවට ලක් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ ආපස්සට ගිහිල්ලායි. ඇත්තටම තිබෙන ප්‍රශ්නය මේකයි. වුණු දේ කියන්න විගණකාධිපතිතුමාට පුළුවන්. හැබැයි, දැන් සිද්ධ වන දේ වළක්වන්න විගණකාධිපතිතුමාට බැහැ. මේ මොහොත වන විට අද රටේ සිදු වන මහා පරිමාණ මූල්‍ය හානි, රාජ්‍ය දේපොළවල සිදු වන අයථා ගනු දෙනු, එදිනෙදා පුවත් පත්වල වාර්තා පළ කෙරෙන මහා පරිමාණ මූල්‍ය වංචා නතර කරන්න එතුමාට බැහැ. එතුමාට ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් ගතහොත් අද උදේ පාර්ලිමේන්තුවේදී විදුලිබල හා බලශක්ති අමාත්‍යාතුමිය කිව්වා, නොරොච්චෝලේ තාප බලාගාරයේ සිදු වුණු දේ. නොරොච්චෝලේ තාප බලාගාරයේ තිබෙන වැරැදි 21ක් එතුමිය මේ ගරු සභාවට කිව්වා. හැබැයි, ඒ වැරැදි 21 සිදු වෙමින් යද්දි -ඒ 21 සිදු වන විට- එතැන වන මූල්‍ය හානියට -මූල්‍ය පාඩුවට- වගඋත්තරකාරයෙක් හොයන්න විගණකාධිපතිතුමාට බලයක් නැහැ. රජය ණය ගන්නවා. රජය ණය ගිවිසුම්වලට එළඹෙනවා. ඒ ණය ගිවිසුම් මත ණය අරගෙන මහා පරිමාණ ව්‍යාපෘතිවලට මුල් ගල් තියනවා. සමහර මුල් ගල් පැළ වෙනවා. සමහර මුල් ගල් උඩ ඇවිත්, අතු පැළ වෙලා, අතු ලියලා ඒවායේ මහා පරිමාණ දූෂණ සිද්ධ වෙනවා. අවසානයේ ඒ පිළිබඳව වග කියන්න විගණකාධිපතිවරයාට බැහැ. දැන් නොරොච්චෝලේ තාප බලාගාරය පිළිබඳව, ගුවන් යානා එන්නේ නැති මත්තල ගුවන් තොටුපොළ පිළිබඳව, නැව් එන්නේ නැති හම්බන්තොට වරාය පිළිබඳව එහෙම නැත්නම් ක්‍රිකට් ගහන්නේ නැති සූරියවැව ක්‍රීඩාංගණය පිළිබඳව විගණකාධිපතිවරයාට කියන්න පුළුවන් මොනවාද? ඒ පිළිබඳ හරි පරීක්ෂාවක් කරන්න විගණකාධිපතිතුමාට බලයක් තිබෙනවාද? අඩු තරමේ ඒ ක්‍රියාවලිය යන විට "මේක ආර්ථික ඵලදායක් නැති ව්‍යාපෘතියක්; මේ ව්‍යාපෘතිය දැන් නතර කරන්න ඕනෑ; මේ ව්‍යාපෘතියට වඩා වෙන විකල්ප ක්‍රියාවලියකට යන්න ඕනෑ" කියා යෝජනාවක් කරන්න විගණකාධිපතිවරයාට බැහැ.

ඒ නිසා එතැන ගැටලුවක් තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව ව්‍යවස්ථානුකූල, ස්වාධීන ආයතනයක්ය කිව්වාට, පාර්ලිමේන්තුවේ අපට රාජ්‍ය මූල්‍ය පාලන බලය තිබෙනවාය කිව්වාට, අපි වෙනුවෙන් ඒ මූල්‍ය පාලන බලය පවරා ගෙන තිබෙන්නේ විගණකාධිපතිවරයාය කියලා අපි සතුටු වුණාට, විගණකාධිපතිවරයාටවත්, පාර්ලිමේන්තුවේ අපටවත් මේ මොහොතේ ක්‍රියාත්මක වන මහා දැවැන්ත මූල්‍ය වංචා පිළිබඳව පරීක්ෂා කරන්න බැහැ. ඒක තමයි තිබෙන ගැටලුව. ඒක නිසා පාර්ලිමේන්තුවේ අපිත්, විගණකාධිපතිවරයාත් අතීතයට අදාළ වුණු ආයතන. රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව අපේ කාර්යභාරය බැලුවොත්, අපි "කෞතුක වස්තු" බවට පත් කරලායි තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ අපි එවැනි තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලේක්හවුස් ආයතනය ඉදිරි පිට රජයේ දේපොළක් -රජයේ ඉඩමක්- කැසිනෝ රජෙකුට ලබා දෙනවා; කැසිනෝ ආයතනයක් ආරම්භ කරන්න හදනවා. ඒ රාජ්‍ය දේපොළ රටට හානිකර ක්‍රියාදාමයකට යෙදවෙන කොට මොකක්ද විගණකාධිපතිවරයාට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය? මොකක්ද මේ පාර්ලිමේන්තුවේ අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය? අපට මොකුත් කරන්න බැහැ. ඒ පිළිබඳ ගිවිසුම් අත්සන් කරන්නේ අපි නොවෙයි. "රජ්‍ය මූල්‍ය පාලන බලය පාර්ලිමේන්තුව සතුය, එය ක්‍රියාත්මක කරන බලධාරියා විගණකාධිපතිවරයාය" කියලා අපට පම්පෝරි ගහන්න පුළුවන්. හැබැයි, විගණකාධිපතිවරයාටවත් මොකුත් කරන්න බැහැ, ඒ ගැන; අපටත් මොකුත් කරන්න බැහැ, ඒ ගැන. ඒක නිසා රාජ්‍ය මූල්‍ය පාලනයේදී විගණකාධිපතිවරයා සහ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනා "කෞතුක වස්තු" බවට පත් වෙනවා. මේ කටයුතුවලදී සර්ව බලධාරී බවට පත් වෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන් එළියේ ඉන්න අදිසි බලවේග. එක වෙලාවකට එතැනදී සර්ව බලධාරී බවට පත් වෙන්නේ විධායක ජනාධිපති ධුරය. තීන්දු තීරණ ගන්න කැබිනට් මණ්ඩලයවත් සමහර වෙලාවට මේ පිළිබඳව දන්නේ නැහැ. කැබිනට් මණ්ඩලයත් ඉක්මවා ගිහින් ගිවිසුම් අත්සන් කෙරෙනවා. ඒවා පිළිබඳවයි ගැටලුව තිබෙන්නේ. ඇත්තටම අද ආර්ථිකයේ, රාජ්‍ය මූල්‍යයේ බහුතර පංගුවක් -වැඩි පංගුවක්- ආර්ථික ඵලදායක් නැති ව්‍යාපෘතිවලට යෙදවෙනවා. ඒවා විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයකින්, මෙහෙයවීමකින්, පරීක්ෂාවකින් පිට සිදු වන දේවල්. ඒ නිසා අද විගණකාධිපති දෙපාර්තමේන්තුව, විගණකාධිපතිතුමා පරණ ගිණුම් වාර්තා පරීක්ෂා කරන ආයතනයක් සහ පුද්ගලයකු බවට පත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ ලාභ අලාභ ගිණුම හරිද, බදු ගෙවිවාද නැද්ද, මූල්‍ය ප්‍රමිතීන්ට අනුව ගිණුම් හදලා තිබෙනවාද නැද්ද, හර බැර හරියට කරලා තිබෙනවාද නැද්ද කියලා හොයන තැනක් බවට විගණකාධිපති දෙපාර්තමේන්තුව පත් කරලා තිබෙනවා. හර බැර හරියට කරලා තිබෙනවා නම් ඒ ඇති. එතකොට එතැනින් එහාට මොකක්ද කරන්නේ?

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට එන සමහර ආයතනවලට මාර්ග සැලැස්මක් නැහැ. ඒ ආයතනවලට තමන් යන ගමනක් පිළිබඳ දැක්මක් නැහැ; සංයුක්ත සැලැස්මක් නැහැ. සංයුක්ත සැලැස්මක් තිබෙනවාද කියලා ඇහුවාම මොනවා හරි කොළ ටිකක් ඉදිරිපත් කරනවා. ක්‍රියාකාරී සැලැස්මක් - Action Plan එකක්- නැහැ. සංයුක්ත සැලැස්මක් නැති, ක්‍රියාකාරී සැලැස්මක් නැති, ලක්ෂ ගණන් වැටුප් ගන්න, දීමනා ගන්න රාජ්‍ය ආයතන තිබෙනවා. කියන්න කනගාටුයි, අපේ රටේ එවැනි විශ්වවිද්‍යාලත් තිබෙනවා. අපි දැක්කා, රටට බුද්ධිය එකතු කරන, රටට උගතුන් බිහි කරන සමහර විශ්වවිද්‍යාලවලට සංයුක්ත

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

සැලැස්මක් නැහැ. ඒ අවුරුදු 5දී, 10දී කොයි වාගේ කෙනෙක්ද විශ්වවිද්‍යාලයෙන් එළියට ගන්නේ, මේ ආයතනවල කටයුතු පළල් වෙන්නේ කොහොමද, උගතුන්, බුද්ධිමතුන් බිහි කරන්නේ කොහොමද කියලා දැක්මක්, සැලැස්මක් අඩු තරමින් ඒ විශ්වවිද්‍යාලවලටවත් නැහැ. නමුත් ඒ පිළිබඳව පරීක්ෂා කරන්න, ඒ පිළිබඳව මැදිහත් වෙන්න සිටින විගණකාධිපතිවරයාගේ බලතල සීමාකාරීයි.

මෙතැන ගැටලු දෙකක් තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවට වෙච්ච දේ කියන්න පුළුවන්. නමුත් වෙන දේ හොයන්නත් බැහැ; වෙන්න තිබෙන දේට මැදිහත් වෙන්නත් බැහැ. විගණකාධිපතිවරයාට වෙච්ච දේ කියන්න පුළුවන්. ඒක කියන්නේත් බොහොම සීමිත සම්පත්වලින්, සීමිත කොටසක් අරගෙන. මෝරු අත හැරලා හාල් මැස්සෙක් දෙන්නෙක් අල්ලා ගන්නවා. මහ දැල අත හැරලා පුංචි දැලෙන් කෙනකු අල්ලා ගන්නවා. "කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලනවා වාගේ" කලාතුරකින් තමයි දෙයක් දකින්නේ. ඒක දැකලා "මේක තමයි සමස්තය" කියනවා. ඇත්ත ඒකයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ සිද්ධ වුණු දූෂණ, වංචා තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතන පිටින් කාබාසිනියා වෙලා තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය බිලියන අනූ ගණනකින් බංකොලොත් වන තැනට ගෙනිච්චා. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව බංකොලොත් වන තැනට ගෙනිච්චා. හෙජීන් ගනුදෙනුව සිද්ධ වුණා; බාල තෙල් ගෙනාවා. ඒ නිසා රටේ ජනතාව මත දැවැන්ත බදු බරක් පැටවිලා තිබෙනවා. හැබැයි, ඒ ක්‍රියාවලිය සිද් වන කොට "මෙන්න මේ ක්‍රියාවලිය නතර කරන්න ඕනෑය" කියා විගණකාධිපතිවරයාට මැදිහත් වෙන්න බැහැ. විගණකාධිපතිවරයා මැදිහත් වෙන්නේත් නැහැ. එහෙම මැදිහත් වෙන්න ක්‍රමයකුත් නැහැ.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ලලිත් අඹන්වල මහත්මයා අපට මතකයි. එතුමා ඒ විධියට මැදිහත් වෙන්න ගිය මනුස්සයෙක්. අන්තිමට එතුමාට ඇසිඩ් ගැහුවා. එතුමාගේ ජීවිතය යාන්තම් බේරුණේ. තව පොඩ්ඩෙන් එතුමාගේ ජීවිතයත් නැති වෙනවා. එහෙම මැදිහත් වෙන්න යන අයට සිද්ධ වෙන්නේ ඒකයි. රටේ තිබෙනවා ඊට වඩා එහා ගිය දැවැන්ත මර්දන යාන්ත්‍රණයක්. ලලිත් අඹන්වල මහත්මයා පෞද්ගලික ආයතනවල දූෂණ හොයන්න ගියේ නැහැ. එතුමා දූෂණ හොයන්න ගියේ එම ක්‍රියාවලිය සිදු වෙමින් තිබුණු තැනකට. එතකොට දූෂණය තිබෙන තැනක ඒ දූෂණය හොයන්න ගියොත්, ඒ සිද්ධ වන දේට මැදිහත් වුණොත් අවසානයේ සිද්ධ වෙන්නේ ජීවිත හානිය.

ඉතින්, ජීවිත තර්ජනයකට ලක් වනවාට වැඩිය හොඳයි රජයේ සේවකයකු හැටියට pension එක අරගෙන ගෙදර යන එක. එහෙම නැත්නම් සිද්ධ වෙන්නේ ලියුම් කියුම් බලලා අතීතයේ සිදු වුණු මොනවා හෝ දෙයක්, අතීතයට බලපාන දෙයක්, අතීතයේ මිය ගිය කෙනෙකුගේ වැරැද්දක් හොයා ගන්න එක. ඇත්තටම අපි හොයන හුහක් දේවල් එහෙමනේ. දැන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට එන බොහෝ ආයතනවල සභාපතිවරු කියන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලය කියන්නේ, "අපි නොවෙයි මේවා කළේ. පරණ කට්ටිය." කියලා. ඒ කට්ටිය හොයන්න යන්න ඕනෑ කනත්තට; සුසාන භූමිවලට. මොකද, පරණ ඒවා තමයි කියන්නේ. ඔවුන් හැම තිස්සේම කියන්නේ, "අපි අලුතෙන් පත් වෙලා ආවේ. අපි මේ මොකුත් දන්නේ නැහැ. අපේ අධ්‍යක්ෂ මණ්ඩලය අලුත්. අපි හොඳ දෙයක් කරන්නම්. අපි අලුත් දෙයක් කරන්නම්. අපි දැන් සෙන්ට් ගා ගෙන ඉන්නේ. අපි බොහොම පුසුඹ ගහන කට්ටිය." කියලා. හුහක් අය කියන්නේ එහෙමයි. හැබැයි විගණකාධිපතිවරයාට තිබෙන්න ඕනෑ බලයක්, විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබෙන්න ඕනෑ බලයක්, "ඔයා අලුත්ද පරණද කියලා වැඩක් නැහැ, ඒ වරද සිදු වෙලා අවුරුදු පහද, දහයද කියන එක වැඩක් නැහැ, සිදු වුණු දෙයට නිලධාරින් වග කියන්න ඕනෑ, අද ඉන්න පුද්ගලයා ඒ වරදට වග කියන්න ඕනෑ, මේ ධුරයයි එයට වග කියන්න ඕනෑ" කියන්න. අදාළ නිලධාරින් කැඳවලා ප්‍රශ්න කරන්න බලයක් තිබෙන්න ඕනෑ. නමුත් අද එහෙම බලයක් නැහැ.

ඊයේ පෙරේදා මෙයට ආසන්න සිදුවීමක් වාර්තා වුණා සළුසල ආයතනයෙන්. සළුසල ආයතනයේ අතීතයේ සිදු වූ ප්‍රශ්නයකට දැන් අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු ඔක්කෝම අය කැඳෙව්වා උසාවියට. ඒ අය වරදකරුවන් බවට පත් වුණා. පස්සේ කොහොම හරි ඒක බේර ගත්තා. නමුත් ඒ විධියට විභාග කිරීම තමයි හරි දේ. ඉතිහාසයේ සිදු වූ දේවල්වලට පවා අපි කවුරුත් වග කියන්න ඕනෑ. නමුත් එහෙම වග කීමක්, වග වීමක් අද නැහැ. දැන් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය ඒකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විගණකාධිපතිවරයාගේ බලතල යටතේ මොනවා සඳහන් වුණත්, වග වීමක් - accountability - නැහැ. ඒක නිසා ඇත්තටම විගණකාධිපතිතුමාගේ දෙපාර්තමේන්තුවේ නිලධාරි මණ්ඩලයට අද සීමාවක් හදලා තිබෙනවා, පොතේ තිබෙන පරණ දේවල් විතරක් වාර්තා කරන්න කියලා. නමුත් ඉන් එහාට ගිහින් අද සිද්ධ වන දේවල්වලට, මේ දැන් සිද්ධ වෙමින් තිබෙන දේවල්වලට මැදිහත් වන්න අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සම්පත් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳ අවදානම ගන්න හැකියාවක් නැහැ. ඇත්තටම අවදානමක් තිබෙනවා. ඒ අවදානම ජීවිත අවදානමක් එක්ක බැඳුණු එකක්. ඒ අවදානම බලපාන අයට අවදානම් දීමනාවක් තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් මොන යම් හෝ සහනයක් තිබෙන්න ඕනෑ; ආරක්ෂාවක් තිබෙන්න ඕනෑ. නමුත් එහෙම ආරක්ෂාවක් නැහැ. මේ දෙපාර්තමේන්තුවට සම්පත් නැහැ: සේවකයන්ට දිරි දීමනාවක් නැහැ. විගණකාධිපතිවරයාගේ තත්ත්වය ඒක නම්, හිතන්න විගණන නිලධාරින්ගේ තත්ත්වය මොකක්ද කියලා. අනෙකුත් සාමාන්‍ය නිලධාරින්ගේ තත්ත්වය මොකක්ද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

විගණකාධිපතිවරයාට එතුමා පරීක්ෂා කරන ආයතනවල ප්‍රධානියකු ලබන වැටුපෙන් හයෙන් පංගුවක්, පහෙන් පංගුවක් නම් ලැබෙන්නේ, අනෙක් අයගේ තත්ත්වය මොකක්ද? අපට කියන්න පුළුවන්ද රජයේ වෙනත් ආයතනයක ලිපිකාර රස්සාවක ක්‍රියාවලියෙන් රාජ්‍ය මූල්‍ය පාලනය කරන්න පුළුවන් කියලා? මොකද, ඒ කවුරුවත් රාජ්‍ය මූල්‍ය පාලනය කරන්නේ නැහැ. රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ පාලනය සිද්ධ වෙන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය ශක්තිමත් වුණොත් පමණයි. ඒ පාලන කටයුතු වාර්තා කරන්න, පරීක්ෂා කරන්න, වග වන්න, ඒ වගවීම පිළිබඳ ප්‍රකාශන නිකුත් කරන්න තිබෙන යාන්ත්‍රණය ශක්තිමත් නම්, ඇත්තටම රාජ්‍ය ආයතනවල පාලනය ඉබේම සිද්ධ වනවා. නමුත් අද එහෙම දෙයක් සිද්ධ වන්නේ

නැහැ. අද යම් ආයතනයක් පරීක්ෂා කරන්න audit එකෙන් එනවා කිව්වාට පස්සේ, audit එකට දෙන්න විතරක් වෙනම පොත් ටිකක් හදනවා. Audit එකෙන් එන කොට පෙන්වන්න පොත් ටිකක් හදලා තිබෙනවා. Audit එකේ මහත්තුරු කියලා වෙනම කාමරයක් දීලා, කන්න බොන්න දීලා, ඒ වෙලාවට සැලකිල්ලක් කරලා, ඒ පොත් ටික පෙන්වලා යවනවා. ඒ පෙන්වන වාර්තා ටික අනුව තමයි ඒ කට්ටිය වාර්තා හදන්නේ. ඒ කට්ටියට තිබෙනවා වාර්තා හදන වෙනම ක්‍රමයක්. ඒ ක්‍රමයට හදලා අපට වාර්තාවක් දෙනවා. අපි ඒ වාර්තාව බලලා තව වාර්තාවක් හදනවා. ඒ වාර්තා තමයි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව; රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව. මා කියන්නේ ඉන් එහාට ගිහිල්ලා මේ හැම තැනටම ස්වායත්තවයක් හදන්න ඕනෑ කියන එකයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා කියපු දේ ඉතා නිවැරදියි. පක්ෂ භේදයෙන් තොරව ඒ ස්වායත්තවය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට තිබෙන්න ඕනෑ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙනුවෙන් අදාළ ගිණුම් පරීක්ෂාව කරන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව. ඒ නිසා ඔවුන්ට ඒ පිළිබඳව බලයක් තිබෙන්න ඕනෑ. නමුත් එහෙම බලයක් නැහැ. මා ප්‍රධාන වශයෙන්ම අවධාරණය කරන්නේ ඒකයි. සිදු වුණු දේත් ඕනෑ, සිද්ධ වන දේත් ඕනෑ. හැබැයි, ඒ සිදු වන දේ නතර කරන්න ඕනෑ. සිදු වන්න තිබෙන දේ වළක්වන්න ඕනෑ. සිදු වන්න තිබෙන හානිය වළක්වන්න ඕනෑ. ඒ පිළිබඳව යම් හෝ මැදිහත්වීමක් කරන්න විගණකාධිපතිවරයාට බලයක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම ආර්ථික ඵලදායිතාවක් ඇති කිරීමට නම් ආර්ථික ඵලදායිතාවක් තිබෙන මූල්‍ය පාලනයක් රටට අවශ්‍ය වනවා.

රටේ මූල්‍ය විනය හදන්න පුළුවන් වන්නේ එහෙමයි. අපට පෙනෙනවා, දේශපාලන ප්‍රතිරූප හදා ගැනීමේ, දේශපාලන ප්‍රතිරූප ගොඩ නඟා ගැනීමේ රාජ්‍ය මූල්‍ය යෙදවීමකුයි දැන් තිබෙන්නේ කියා. රාජ්‍ය මූල්‍ය අද යොදවන්නේ සමබරතාවකින් නොවෙයි. රටේ ආර්ථිකයෙන් උතුරු පළාතට, නැඟෙනහිර පළාතට අද මොකුත් ලැබෙන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙද්දී රටේ ආර්ථිකයේ විශාල පංගුවක් වෙනත් පැත්තකට යොදවනවා, තමන්ගේ දේශපාලන ප්‍රතිරූප හදා ගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒකේ කොච්චර ඵලදායිතාවක් තිබෙනවාද? අද අපි අහන්නේ ඒකයි.

මම කියන මේ කාරණය පරීක්ෂා කරලා බලන්න. ඊයේ, පෙරේදා කොළඹ වරායට ආපු නැවක තිබ්බිච්ච කාර් ටිකක් ගෙනිහිල්ලා බානවා, හම්බන්තොට වරායේ. ඊට පස්සේ ඒ බාපු කාර් ටික ගොඩබිමින් කොළඹට ගෙනෙනවා. ඒ නැව කොළඹ වරායට ආපහු එනවා, ඒකේ තිබුණු තව බඩු ටිකක් බාන්න. එතකොට අවසාන ප්‍රතිඵලය මොකක්ද වෙලා තිබෙන්නේ? කොළඹටම බාන්න තිබුණු කාර් ටික ගෙනිච්චා හම්බන්තොටට. එතකොට වාර්තාවේ සඳහන් වෙනවා, හම්බන්තොටට අලුත් නැවක් ආවා කියලා. අලුතෙන් නැවක් ඇවිල්ලා නැහැ. කොළඹ වරායට බාන්න තිබුණු බඩු ටික තමයි හම්බන්තොට වරායේ බෑවේ. වෙනස වුණේ ගොඩබිමින් ඒ කාර් ටික ගෙනාපු එක විතරයි. ගොඩබිමින් කාර් ටික ගෙනාවා. නැවත අර නැව හම්බන්තොටින් කොළඹට ඇවිල්ලා ඉතුරු බඩු ටික බානවා. මොකක්ද ආර්ථික ඵලදායිතාව? මොකක්ද රටට සිදු වන යහපත? රටට යහපතක් සිදු වෙන්න නම් හම්බන්තොට වරායට අලුතෙන් නැවක් එන්න ඕනෑ.

කොළඹ වරායට ආපු නැවේ බඩු දෙකට බෙදලා හම්බන්තොට ටිකක් බාලා ඉතුරු බඩු ටික බාන්න ආපසු කොළඹට ආවාට වැඩක් වෙන්නේ නැහැ. ඒකෙන් සිදු වෙන්නේ ආර්ථික හානියක්. එතකොට වෙන්නේ අර හම්බන්තොටින් ගෙනෙන කාර් එකේ මිල වැඩි වන එකයි. මේක වටයක් යනවා නේ. පරංගියා කෝට්ටේ ගියා වාගේයි. "පරංගියා කෝට්ටේ ගියා වාගේ" තමයි දැන් හම්බන්තොට වරායට නැව් යන්නේ. වටේ ගහන්නේ. කොළඹ වරායට එන නැව තමයි හම්බන්තොටට යන්නේ. හරි විකාරයක් නේ, මේක. ආර්ථික ඵලදායිතාවක් නැති ව්‍යාපෘතියක් ගැන විගණකාධිපතිවරයා චාර්තා කරනවාද? එහෙම චාර්තා කරන්න බලයක් තිබෙනවාද? නැහැ, එහෙම බලයක් නැහැ. එතුමාට පුළුවන් ලාභාලාභ ගිණුම ගැන යන්තම් මොනවා හරි කියන්න විතරයි. ඇඟ බේරා ගන්නා විගණකාධිපති දෙපාර්තමේන්තුවකින් වැඩක් නැහැ. එවැනි බලයකින් වැඩක් නැහැ. එවැනි බලයකින් රටේ මූල්‍ය පාලනයක් හදන්න බැහැ. ඒ නිසා අපි ඔබතුමන්ලාට අවධාරණය කරන්නේ මෙයයි.

විගණකාධිපතිතුමාගේ වැටුප විතරක් නොවෙයි, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කොන්දත් හදන්න ඕනෑ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ බලය ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ කාර්ය භාරය ශක්තිමත් වෙන ප්‍රමාණයට විතරයි මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවේ අපට වග කියන්න පුළුවන්කම තිබෙන්නේ. අපේ වග වීමත් තිබෙන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් වන ප්‍රමාණයට පමණයි කියන කරුණය අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.26]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)

(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විගණකාධිපතිතුමාගේ වැටුප වැඩි කිරීම නැත්නම් වැටුප තීරණය කිරීම සම්බන්ධව පැවැත්වෙන මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුට පළ කරනවා. ඒ අතරම, අපේ ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමාටත් ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාටත් පැහැදිලිව පිළිගන්න සිදු වෙලා තිබෙනවා, මේ වැටුප ලබා දෙන්නේ යම් අසාධාරණයක් සිදු වෙලා තිබෙන නිසා බව. මොකද ඒ ආයතනයේ ප්‍රධානියා හැටියට විගණකාධිපතිතුමා යටතේ සිටින නිලධාරීන් එතුමා වඩා වැඩි වැටුපක් ලබන තත්ත්වයකුයි තිබෙන්නේ. එතකොට ඒ නිලධාරියාගේ රාජකාරියේ අභිමානය සම්බන්ධව සියලු දෙනාටම ගැටලුවක් තිබෙනවා.

විශේෂයෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හැටියට අපේ ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා 23වැනි දාට මෙම කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරනවා. එතුමා ඒ කාරක සභාවේ සාමාජිකයන් සමඟ සාකච්ඡා කරලා ඒ වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා එහිදී ඇතිවන සමහර විෂමතාවන් ඒ වාගේම නිර්දේශයන් ගැන සලකා බලා අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. මෙම කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට මම සතුටු වෙනවා, ගරු ඩිව් ගුණසේකර මැතිතුමාගේ සභාපතිත්වයෙන් පත් කරන ලද ඒ කමිටුව වසර ගණනාවකට පසු උප කමිටු තුනක් පත් කරලා කටයුතු කිරීම ගැන. ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාගේ සභාපතිත්වයෙන්, ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් සහ හිටපු අමාත්‍ය ගරු කරු ජයසූරිය මැතිතුමාගේ සභාපතිත්වයෙන් එම උප කමිටු තුන පැවැත්වෙනවා. ඒ වාගේම ප්‍රධාන කමිටුව හැටියටත් රජයේ ආයතන සියල්ල කැඳවලා තිබෙනවා. ඒ වාගේම ඒ ආයතනවල නිලධාරීන්, අමාත්‍යාංශවල ලේකම්වරු වරින් වර කැඳවලා මේ විමර්ශන කටයුතු කරගෙන ගියා.

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

අප විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කැඳවනවාය කියන කොට අද හුඟක් නිලධාරීන් වෙනදාට වඩා බයයි. මෙම කාරක සභාවට එන්න ඉස්සර වෙලා අදාළ අමාත්‍යාංශවල ලේකම්තුමා ඇතුළු නිලධාරීන්, එහෙම නැත්නම් අදාළ ආයතනවල අධ්‍යක්ෂවරුන් රැස් වෙලා මෙම කාරක සභාවේදී මතු විය හැකි ප්‍රශ්නවලට පිළිතුරු දීම සම්බන්ධයෙන් සූදානම් වන තත්ත්වයක් අද පෙනෙන්නට තිබෙනවා. වර්තමාන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් කටයුතු කරන ආකාරය සම්බන්ධව නිලධාරීන්ට පොඩි චකිතයක් තිබෙනවා. ඒ වාගේම, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා සියලු ලේකම්තුමන්ලාට පළමු වතාවට දන්වා යවා තිබෙනවා, මෙම කාරක සභාව ඉදිරිපත් කරන නිර්දේශ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න කියලා. එසේ දන්වා යවන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිවරයා කියන්නේ, ස්වාධීන පුද්ගලයෙක්. ඒ තනතුර කිසිම අමාත්‍යාංශයකට වග කියන්නේ නැහැ. එතුමා වග කියන්නේ පාර්ලිමේන්තුවටයි. එතුමා යවන විගණන විමසුම්වලට පිළිතුරු ගෙන්වා ගෙන ඒවා සම්බන්ධයෙන් එතුමා සෑහීමකට පත් වන්නේ නැති අවස්ථාවලදී විගණන වාර්තා හැටියට යවන්න එතුමා කටයුතු කරනවා. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඇතුළු අපේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා කියපු ආකාරයට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විගණකාධිපතිතුමාගේ වැටුප් නිර්දේශ කළත් එය කැබිනට් එකට ගිහිල්ලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා අනුමත කර ගන්න ඕනෑ. එම නිසා පාර්ලිමේන්තුවට වග කියන කෙනකු හැටියට විගණකාධිපතිතුමා කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගරු සභාපතිතුමා එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. ඒ අනුව එය නිවැරැදි කිරීමේ වැඩ සටහන කෙරෙහි අතිගරු ජනාධිපතිතුමාගේත් අවධානය යොමු වෙවි කියන එක මා මතක් කරන්න කැමැතියි. විගණකාධිපතිතුමාට බලපෑම් කරන්න කිසිම කෙනකුට බැහැ. එතුමාගේ ස්වාධීන තීරණය, ස්වාධීන මතය තමයි එතුමා ඉදිරිපත් කරන්නේ. කිසිම තැනකදී ඒවාට බලපෑම් ඇති වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විගණන නිලධාරීන්ට විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්නත් සිදු වෙනවා. මට මතකයි, පසු ගිය කාලයේ අපේ විගණන අධිකාරිවරයකුට ඇසිඩ් ගැහුවා. ඒ වාගේ තත්ත්වයනුත් පැවැති අවස්ථා තිබුණා. අපට ඒවාත් අමතක කරන්න බැහැ. එවැනි තත්ත්වයන් තිබුණත් අවශ්‍ය රාජකාරි හරියාකාරව ඉටු කරමින් එතුමන්ලා කටයුතු කරනවා. ඒ වාගේම, විගණකාධිපතිතුමාගේ වැටුප නිශ්චය කරන්න මේ ගරු සභාවට ඉදිරිපත් වුණාම එය අනුමත නොකරපු අවස්ථාත් ඉතිහාසයේ තිබුණු බව අප සඳහන් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ උත්තරීතර වගකීම වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව සුවිශාල කාර්ය භාරයක් ඉෂ්ට කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කර්තෘවරුන් බලාපොරොත්තු වූ කාරණාවක් සම්බන්ධව. එතුමා සඳහන් කරන්න ගියේ මේ අතිගරු ජනාධිපතිතුමා යටතේ හෝ, එහෙම නැත්නම් ඕනෑම ජනාධිපතිතුවරයෙකු, ජනාධිපතිවරියක යටතේ හෝ මුදල් අමාත්‍යාංශය තබා ගැනීම සම්බන්ධවයි. එතුමා කියන කාරණාවට මට එකඟ වෙන්න බැහැ. එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන් කරන්න තිබුණා මුදල් අමාත්‍යාංශය ජනාධිපතිතුමා යටතේ තියා ගන්නේ නැතිව අනිවාර්යයෙන් වෙනම තියා ගන්න ඕනෑ කියලා. එම නිසා එතුමා වක්‍රාකාරව සඳහන් කරපු කාරණය සමඟ එකඟ වීමට මට හැකියාවක් නැහැ. මා එය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම සමහර ආයතනවල පාඩුව දූෂණයක් හැටියට උලුප්පා දක්වනවා. නමුත් ඒ අලාභය දූෂණයක් නිසාම සිදු වෙන්න බැහැ. උදාහරණයක් විධියට අපි ලංකා විදුලිබල මණ්ඩලය ගනිමු. ලංකා විදුලිබල මණ්ඩලයේ දූෂණ තිබෙන්න පුළුවන්. හැබැයි සියයට 100ක් දූෂණම නොවෙයි. දූෂණ නැහැයි කියලාත් මා කියන්නේ නැහැ. හැබැයි සියයට 100ක්ම දූෂණමයි කියා සඳහන් කරන්න පුළුවන්ද?

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දූෂණ තිබෙන්න පුළුවන්. එහි දූෂණ නැහැයි කියලා මා කියන්නේ නැහැ. නමුත් ඇත්ත වශයෙන්ම සියයට 100ක්ම දූෂණයක්ද කියන එක ගැනත් අපි කල්පනා කර බලන්න ඕනෑ. උදාහරණයක් හැටියට දැන් බලන්න, දැව් තෙල් ලීටරයක නිෂ්පාදන වියදම රුපියල් 95යි. දිනකට දැව් තෙල් ලීටර් මිලියන 4ක් රුපියල් 35ක පාඩුවට දෙනවා. ඒ සඳහා දිනක පාඩුව පමණක් රුපියල් මිලියන 120ක් වනවා. අවුරුද්දකට දින 365යි කියන එක අපි පැත්තකින් තබමු. අවුරුද්දකට දින 300යි කියා ගත්තොත් අවුරුද්දකට දැව් තෙල්වලින් ලබන පාඩුව විතරක් රුපියල් මිලියන 36,000ක් වනවා. සමහර විට ජනතාවට සහන සැලසීම සඳහා අඩු මුදලට විදුලිය සපයන්න රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තොත් ඒ වාගේ පාඩුවලට මුහුණ දෙන්න අපට සිද්ධ වනවා. විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යතුමා හැටියට අපේ හිතවත් කරු ජයසූරිය මැතිතුමා දන්නවා, මෙවැනි කටයුතු කරන්න රජයක් හැටියට සමහර තීන්දු ගන්න සිද්ධ වනවාය කියලා.

ඒ විතරක් නොවෙයි. අනික් පැත්තෙන් අපි ඩීසල් සඳහා සහනය දෙනවා. සමහර අවස්ථාවලදී සාමාන්‍යයෙන් ඩීසල් ලීටරයක් රුපියල් 12ක් වැනි මුදලක පාඩුවකට විකුණනවා. අපි දිනකට ඩීසල් ටොන් 4,000ක් නිකුත් කරනවා. ටොන් 1ක් කියන්නේ ලීටර් ලක්ෂයක්. ඒ වාගේ 4,000ක ගුණයක් දවසකට නිකුත් කරනවා. ඩීසල් සඳහා සහනය දීමෙන් දවසකට රුපියල් මිලියන 48ක පාඩුවක් සිදුවනවා. මෙම මුදල දවස් 365න් වැඩි කළාම අවුරුද්දකට රුපියල් මිලියන 14,400ක පාඩුවක් සිද්ධ වනවා. මා මේ කිව්වේ සරල උදාහරණයක්. දැන් මේ සංඛ්‍යා දෙක විතරක් එකතු කළොත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වන පාඩුව රුපියල් මිලියන 50,000ක් පමණ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඒකයි කිව්වේ, දුප්පත් ජනතාව වෙනුවෙන් සහන සලසන්න රජයක් හැටියට අපට සමහර තීරණ ගන්න සිද්ධ වනවාය කියලා. ඩීසල් සඳහා දෙන සහනය ඇත අනුරාධපුරයේ, මොනරාගල, පොලොන්නරුවේ වී වගා කිරීම සඳහා ට්‍රැක්ටරය පාවිච්චි කරන ගොවියාටත් ලැබෙනවා. ඩීසල්වලින් ධාවනය කරන සුඛෝපභෝගී ජීප් රථයේ ගමන් කරන තානාපති කාර්යාලයේ සේවය කරන පිට රටින් ආපු සුදු මහත්තයාටත් ඒ සහනය ලැබෙනවා. රුපියල් කෝටි ගණන් හම්බ කරන ධනපතියාටත් ඒ සහනය ලැබෙනවා. අහිංසක මිනිසාට ලැබිය යුතු සහනය, ඒ සහනය නොලැබිය යුතු අයටත් දෙනවා. සමහර වෙලාවට එවැනි තීන්දු ගන්නවා. එවැනි තීන්දු ගන්න හේතු වෙලා තිබෙන්නේ විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාවගේ පැත්තෙන් කල්පනා කරලා කටයුතු කරන්න ඕනෑ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ආයතන සම්බන්ධයෙන් බැලූ බැල්මට මෙපමණ පාඩුයි -රුපියල් මිලියන 55,000ක් අලාභයි, රුපියල් මිලියන 60,000ක් අලාභයි- කියලා, එයට හේතුව දූෂණයයි කියලා රජයට ඇඟිල්ල දික් කරන්න

විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, විපක්ෂයේ දේශපාලනඥයෝ උත්සාහ කරනවා; ලෑස්ති වනවා. මා ඒකයි කිව්වේ, සමහර ආයතනවල යම් යම් දූෂණ තිබිය හැකියි කියලා. මා කියන්නේ නැහැ, සියයට 100ක් නිවැරැදියි කියලා. නමුත් ජනතාවට සහන දීම සඳහා රජය ගන්නා යම්කිසි ප්‍රතිපත්තිමය තීන්දු අනුවත් මේ පාඩු ලබන තත්ත්වයන්ට අපට මුහුණ දෙන්න සිද්ධ වනවා. අපි විදුලිය සඳහා සහනය දෙනවා. තවදුරටත් සහනය දෙනවා. අපි ජනතාව වෙනුවෙන් කල්පනා කරලා ඒ සහනය දීම සඳහා අවශ්‍ය පියවර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි කල්පනා කරන්න ඕනෑ, මේ අලාභය දූෂණයක් හැටියටම සඳහන් කරන්නේ නැතුව, ප්‍රතිපත්තිමය තීරණ අනුව ගන්නා කාරණා සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න. උදාහරණයක් හැටියට මම ගන්නවා, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන. ගරු කරු ජයසූරිය මැතිතුමා දන්නවා, පොල් වගා කිරීමේ මණ්ඩලය ගැන. හැබැයි අපි ඒවා ක්‍රමවත් කළා. මට මතකයි, මම පොල් වගා කිරීමේ මණ්ඩලය භාර ගන්න අවස්ථාව වන විට රුපියල් මිලියන 64ක් ලාභ ලබපු ආයතනය, එක් අවුරුද්දක් ඇතුළත රුපියල් මිලියන 119ට වැඩි කළා. දෙගුණයක් ලාභ ලැබුවා. කුරුණෑගල වැවිලි සමාගම භාර ගන්න කොට රුපියල් මිලියන 154යි, ලාභය. ඊළඟ අවුරුද්ද වන කොට රුපියල් මිලියන 225කට වැඩි කරන්න හැකියාව ලැබුණා. බොහෝ වේලාවට ඒ සඳහා හැම පැත්තෙන්ම කරන හොඳ අධීක්ෂණයක් තිබෙන්නට ඕනෑ; නිවැරදිව සොයලා බලන්න ඕනෑ. සමහර වෙලාවට අධීක්ෂණය වැඩි කරන කොට, හොරකම් කරන මිනිහාගේ බෙල්ලෙන් අල්ලා එළියට දමන කොට, නැත්නම් ඒ හොරකම්වලට එක පැත්තකින් බාධා ඇති කරන කොට, සමහර විට ඇඟිලි ගහනවා. හැබැයි සමහර තැන්වලට නිදහසේ කටයුතු කර ගෙන යන්න ඉඩ දුන්නාම කිසිම ප්‍රශ්නයක් නැහැ, කටයුතු කරනවා. හැබැයි ඇඟිල්ල දික් වෙන්නේ මේ ආයතන පාලනය කරන සභාපතිවරුන්ට නැත්නම් අධ්‍යක්ෂවරුන්ට. ඒ අයගේ කටයුතුවලට දේශපාලනඥයෝ ඇඟිලි ගහන්නේ නැහැ. හැබැයි අර කිව්ව ආකාරයටම කටයුතු කරන කොට බොහෝ වෙලාවට කියන්නේ මේවාට ඇමතිවරයා වග කියන්න ඕනෑ; එහෙම නැත්නම් ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා. ඒ නිසා අපි සියලු දෙනාටම සාමූහික වගකීමක් තිබෙනවා.

විගණකාධිපතිවරයාගේ වැටුප සම්බන්ධව මේ අවස්ථාවේදී ප්‍රශ්න තිබෙනවා නම්, මේක වැරැද්දක් කියලා කාටත් පෙනෙනවා නම්, ව්‍යවස්ථාවේ සඳහන් දේ හරියට නිශ්චය කරලා නැත්නම් අපට පුළුවන්, අපි සියලු දෙනාම එකතු වෙලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය කළ යුතු තැන් රාශියක් තිබෙනවා කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා සම්බන්ධයෙන් කථා කරන කොට අපට පෙනෙනවා, සමහර කාරණා සංශෝධනය කළ යුතු බව. උදාහරණයක් හැටියට අපේ-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, තව විනාඩියක් තිබෙනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන් විනාඩි 05ක් ලබා ගන්නවා.

අපි හිතමු, පළාත් සභා සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙනෙනවා කියලා. මේ යෝජනාව විමධ්‍යගත කාරණාවක් සම්බන්ධයෙනුයි කියලා හිතමු. විමධ්‍යගත විෂයයක් සම්බන්ධව යෝජනාවක් ගෙනැත් මුදල් වෙන් කරන්න කටයුතු කරන අවස්ථාවේදී, ඒක පළාත් සභාව යටතට පත් වුණු විෂයයක් නම් සමහර විට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියන්න පුළුවන්, "මේක පළාත් සභාව යටතට අයත් විෂයයක්, මේකට කටයුතු කරන්න පාර්ලිමේන්තුවට බැහැ" කියලා. මම මේ කියන්නේ සරල උදාහරණයක්. එහෙම වෙලාවට පළාත් සභාවල එකඟතාව ගන්න ඕනෑ. මේ එකඟතාව ගන්න කොට එක පළාත් සභාවක් හෝ ඒකට එකඟතාව දෙන්න බැහැයි කිව්වොත් අපි මධ්‍යම රජය හැටියට ඒ ඉදිරිපත් කරන යෝජනාව ඒ පළාත් සභාවේ ක්‍රියාත්මක කරන්නේ නැහැ. සමහර විට එයින් ඒකීය රජයක් තුළ එක පළාත් සභාවක් දන්නෙම නැතුව වෙන් වෙනවා. ඒ පළාත් සභාව ඒ කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා රජයක් හැටියට අපට දැන් අවශ්‍ය වෙලා තිබෙනවා, එක්සත් ජාතික පක්ෂය හෝ විපක්ෂය හෝ ආණ්ඩු පක්ෂය හෝ මේ සියලු දෙනාම එකතු වෙලා පළාත් සභා බහුතරයක එකඟතාවකින් ගන්නා යෝජනා ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න. අද රටේ අවධානයත් ඒ කෙරෙහි යොමු වෙලා තිබෙනවා.

පළාත් සභා ක්‍රියාත්මක කරන කොට අපිට, නැත්නම් අතිගරු ජනාධිපතිතුමාට තීරණය කරන්න පුළුවන්, පළාත් සභා දෙකක් තාවකාලිකව ඒකාබද්ධ කරන්න. එදා එසේ ඒකාබද්ධ කර තිබුණේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ වකවානුවේ. පසුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා, එසේ එක් කළ පළාත් සභා දෙකක් වෙන් කරන්න. වර්තමාන ජනාධිපතිතුමා ඉන්නා තෙක් නැවත ඒක එකතු කරන්නේ නැහැයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. එතුමා මේ රට බෙරා ගත්ත, මේ රට එක් සේසත් කරපු නායකයා. අපි හිතමු, තව අවුරුදු පනහකින් හෝ තව අවුරුදු සියයකින් හෝ පත් වන ජනාධිපතිවරයෙක් කල්පනා කළාය කියලා, පළාත් සභා දෙකක් ඒකාබද්ධ කරන්න, එවිට නැවතත් අර්බුදයකට යනවා.

එම නිසා පළාත් සභා ඒකාබද්ධ කිරීමට නොහැකි වන පරිදි, තාවකාලිකව හෝ ඒකාබද්ධ කිරීමට නොහැකි වන පරිදි කටයුතු කිරීමට රටේ අවධානය අද යොමු වී තිබෙනවා. අද මේ රට කථා කරන්නේ මොනවා ද? මේවා සම්බන්ධව සාකච්ඡා කරනකොට, අද රටේ අවශ්‍යතාව සම්බන්ධයෙන් කථා කරනකොට පිට රටවලට වඩා අපේම රටේ සමහර පිරිස් විවේචනාත්මකව බලන අවස්ථා තිබෙනවා. විගණනය සම්බන්ධයෙනුත් අපේ අවධානය විශේෂයෙන් යොමු කරන්නට ඕනෑ. මේ ගැන ජනතාව දැනුවත් කර, ජනතාවගේ අවධානය යොමු කර කටයුතු කරන්නට ඕනෑ.

අද අපි මේ සාකච්ඡා කරන කාරණය වර්තමානයේ විගණකාධිපතිතුමා හැටියට කටයුතු කරන සමරවීර මහත්මයාට පමණක් පොදු වූ කාරණාවක් නොවෙයි. මීට පෙර මේ වාගේ අවස්ථා කිහිපයක් මතු වී තිබෙනවා. විගණකාධිපතිගේ වැටුප වැඩි කරන්නට පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුව එවැනි යෝජනා අනුමත නොකළ අවස්ථා උදාහරණ වශයෙන් තිබෙනවා. ඉතිහාසයෙන් උදාහරණ තිබෙනවා. අද මේ ඉදිරිපත් වුණ කාරණාව සම්බන්ධව විපක්ෂය විරුද්ධ වේය කියා මා විශ්වාස කරන්නේ නැහැ. ආණ්ඩු පක්ෂය විරුද්ධ වන්නේ නැහැ. නමුත් එහෙම විරුද්ධ වෙච්ච අවස්ථා තිබෙනවා. අප කොයි තරම් කථා කළත් එවැනි කාරණාත් ඉතිහාසයේ දකින්නට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ සමහර ආයතන විගණනය කරනකොට ඒ ගැන විශාල භයක් තිබෙනවා. ඒ වාගේම සමහර ආයතනවල අය විගණන කරන තැන්වලට බලපෑම් කර, ඒවාට බාධා කරන අවස්ථාත් නැතිවා නොවෙයි. එම නිසා ඒ විගණන ආයතන තවදුරටත් ශක්තිමත් කරන්නටත්,

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

ඒවාට බාධා වන තැන් වළක්වාලීමට කටයුතු කරන්නටත් මේ ගරු සභාවේ, ඒ වාගේම අපේ රටේ අවධානය තවදුරටත් යොමු කරන්නට අවශ්‍යයි කියන එක මා මතක් කරන්නට කැමැතියි.

විගණකාධිපතිතුමාගේ පැත්තෙන් මේ ගැනත් අවධානය යොමු කරන්නට ඕනෑ. විශේෂයෙන් එතුමා වග කියන්නේ පාර්ලිමේන්තුවටයි. සමහර ආයතනවලින් අපට වාර්තා වෙලා තිබෙනවා, ඒ ආයතන පරීක්ෂා කරන්න පත් කළ විගණකවරුන් ඉල්ලන නොයෙක් ඉල්ලීම්, නොයෙක් පහසුකම් දුන්නේ නැත්නම් හිරිහැර කරන තත්ත්වයන් තිබෙනවාය කියා. සමහර විට වාහනයක් ඕනෑ වුණාම වාහනය දුන්නේ නැත්නම්, ඒ ආයතනයෙන් ඔහුට ගන්නට තිබෙන මොනවා හරි දෙයක් තිබෙනවා නම් ඒක දුන්නේ නැත්නම් ඒ ආයතනයෙන් පළිගැනීමේ චේතනාවෙන් කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ කියමනක් තිබෙනවා, "වැද්දාට ගොරක දඩමස් කරන්නට පුළුවන්" කියා. තමන්ට පහසුකම් සැලසුවේ නැති වුණාම, තමන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කළේ නැති වුණාම පළිගැනීමේ ස්වරූපයෙන් කටයුතු කරන අවස්ථා තිබෙනවා. ඊට වඩා යමක් අප විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් බලාපොරොත්තු වන බවත් විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විගණකාධිපතිතුමා පුද්ගලයා හැටියට කවුරු වුණත් එතුමාගේ පහසුකම්, එතුමා කරන ඒ කාර්ය භාරයේ වගකීම, ඒ වාගේම එතුමාගේ නිල ගරුත්වය සම්බන්ධව මුළු රටේම අවධානය යොමු වන්නට ඕනෑ. එතුමා යටතේ ඉන්න නිලධාරීන් එතුමාට වඩා වැටුප් ගන්නවා නම්, එවැනි විෂමතාවයන් ඇති නොවෙන්නට ක්‍රමවේද සැලැස්විය යුතුයි. එවැනි විෂමතාවක් තිබෙන විට ඒ ආයතනයේ කටයුතු කිරීමේදී එතුමාට ලොකු අපහසුතාවක් ඇති වෙනවා; මානසික පීඩාවක් ඇති වෙනවා. එම නිසා අප සියලු දෙනාගේ අවධානය ඒ කාරණය කෙරෙහි යොමු කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඕනෑම රාජ්‍ය ආයතනයකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ඇතුළු වීමේ බලය, ඒවායේ ගිණුම් ලේඛන පරීක්ෂා කිරීමේ බලය සහ ඒවා පවරා ගැනීමේ බලය ව්‍යවස්ථාවෙන්ම විගණකාධිපතිතුමාට, එතුමාගේ නියෝජිතයන් වන කාර්ය මණ්ඩලයට පවරා තිබෙන්නේ ලොකු විශ්වාසයකිනුයි. එම නිසා මා කිවූ සමහර කාරණා ගැන සියලු දෙනාම එක මතයක ඉඳලා ස්වාධීන පිරිසක් හැටියට කටයුතු කළ යුතු බවට දෙපාර්තමේන්තුවේ සමස්ත නිලධාරීන්ගේම අවධානය යොමු කරවන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අපි ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මේ වැඩ කටයුතු ආරම්භ කළාට පසුව අතපසු වී තිබුණු වාර්ෂික වාර්තා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. සමහර ආයතන 2004 වර්ෂයේ ඉඳලා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුට ඉදිරිපත් කර තිබුණේ නැහැ; අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණේ නැහැ. දැන් ඒවා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වී තිබෙනවා. මේ වන විට සමහර ආයතන 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාත් ඉදිරිපත් කරමින් ඉන්නවා. ඉදිරි මාස කිහිපය තුළ ආයතන විශාල ප්‍රමාණයක වාර්ෂික වාර්තා මේ ගරු සභාවට ඉදිරිපත් කරාවිය කියා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ඉදිරිපත් කරන්නට සිටින නිසා මම මීට වඩා කාලය ගන්නේ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තූතිය පළ කරමින්, ආණ්ඩු පක්ෂයත් විපක්ෂයත් අපි සියලු දෙනාම එකතු වෙලා මේ තනතුරේ පමණක් නොවෙයි, ඕනෑම තනතුරක තිබෙන විෂමතාවන් පිළිබඳව කල්පනා කරලා යම් යම් ආකාරයට ඒවා ඉවත් කරන්නට මැදිහත් වෙමුය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[4.49 p.m.]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

Mr. Presiding Member, a lot has been said about the salary scale applicable to the Auditor-General and also the good work done by the Auditor-General's Department. I, for one, coming from the private sector, always believe that the Auditor-General is grossly underpaid. The salary that we are talking about is actually, in American terms, "peanuts" because a position of this nature deserves a much higher salary.

The Hon. DEW Gunasekara, as the Chairman of the COPE, explained in detail the enormous amount of work that is done by the Auditor-General and his team and the Hon. Eran Wickramaratne also expressed his views on the principal involved. Therefore, we do not intend to object to the salary increase proposed. That, I would like to tell the House because we have a responsibility especially to defend and protect the Office of the Auditor -General.

Talking about the history, I think public accountability dates back to King Mahinda in the 10th Century AD, a long time ago. The Auditor-General's Department itself has a 214 year-old history. During this period, we must say, they have done exemplary work, carried out their duties to the best of their ability and history says that the work they have done, dating back to the colonial days, had received wide acceptance and was to the satisfaction of everybody.

Sir, of course, we have to strengthen this position because I always believe that in this country, financial discipline is not there: we do not believe in forward planning, financial prudence and much about internal auditing. So, there have been occasions where public money had been wasted without any plan, approval or any valid reason. Therefore, the role of the Auditor-General is very important here.

Looking back, I must say that during the last couple of years, we have been able to, through the COPE, work very closely with the Auditor-General and they have been bold enough to come out with and highlight facts and to follow through. But, let me ask whether we have the required number of competent people in the Auditor-General's Department. Are they well-resourced and well equipped? They must be trained; they must adopt the best tools and techniques and must be compensated well. As I have said before, to get the best talent available, they must have an attractive remuneration package and must

be exposed to the other countries' best-in-class practices. Do they have all the modern techniques and tools, equipment and methodologies? These are the areas on which the attention of the Auditor-General should be focused and we, in turn, must support him to make his Department a very viable and strong body.

Sir, I remember that as far back as the early '70s, we had a Corporations Division under the Treasury and that monitored the performance of public corporations and statutory boards. That Division survived many regimes. Its first Director, if I remember right, was no less than Mr. P.M.W. Wijesuriya, who was later to become the country's most revered Auditor-General**.** During the regime of President Ranasinghe Premadasa, the Corporations Division was renamed as the "Department of Public Enterprises". I think the then Director General was an exceptionally capable lady, a professional and chartered accountant, whom I had the distinct privilege of working with. As a Member of the Presidential Commission on Privatization and also as a Member of the Public Investment Management Board, I was able to work very closely with that Department.

They did an exemplary job. That Department made sure that every government institution, State-owned enterprise or statutory board was externally audited and on time. The performance of these entities was monitored. The reports of that Department were actually feeders for the COPE and it was extremely helpful. I am not sure whether that exists today.

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
It exists.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Very good!

In the discharge of my duties with the COPE, Sir, I also have come across the Auditor-General and his staff on many occasions and I found them energetic, committed and brave. They also highlight very serious breaches of financial indiscipline. I am sorry to say that Reports of the Auditor-General are not taken very seriously, as I said before, by some quarters. This is very unfortunate because the Auditor-General is the watchdog of public finance. It is the people's money that we have to take care of. So, he is really the watchdog of public funds. We have seen gross abuse of funds by some government departments and sometimes, by provincial councils and even local government institutions. I also remember instances where these were highlighted by the Auditor-General in his Report but no proper action had been taken. I think one of the Hon. Members of Parliament said that these accounts sometimes drag for five to ten years. It is true. They raise a query but no action is taken.

Therefore, it is time that we take some very serious steps to correct this anomaly. I think it is a very serious crime that no action is taken on the Reports submitted by the Auditor-General. It is here that we advocate strict Government surveillance.

Today, Sir, there is a very serious waste of public funds. The media highlighted several instances of extravagant spending of public funds by powerful people. In the name of development, we indulge in various projects, wasting enormous amounts of money without a feasibility study or a project report. This is something very unfortunate happening in Sri Lanka. Huge amounts, billions of rupees, have been spent and we have come across instances where no proper study or feasibility study has been done.

In my view, Sir, it is very important that we make the respective Ministry Secretaries accountable. I know, by law, they are accountable but it has to be followed strictly. There are several Ministries and institutions coming under various Ministries which have fallen behind in replying to audit queries or correcting the misdeeds. Therefore, even the Minister should give the required strength to the respective Secretaries of Ministries.

In the modern world, Sir, financial reporting can be done pretty fast. I recall that in 2003, the then UNF Government appointed a Cabinet Subcommittee. It comprised of the then Finance Minister, Hon. K.N. Choksy, the then Trade Minister, Hon.Ravi Karunanayake and it was chaired by me. We came across some State accounts which were over 10 years old. So, at that time, we realized that there was no point in bringing these accounts before Parliament. Therefore, the Subcommittee sat and with the help of the then Auditor-General, it was able to clear most of the outstanding accounts. By the end of that year or within a period of about 18 months, it was possible for us to get 90 per cent of the accounts cleared and then we found that most of the accounts were coming before Parliament within six to nine months. So, that was quite creditable and even now, I must say that quite a large number of Government institutions submit their accounts to Parliament within that period. I mentioned this to the Chairman of the COPE, that we should make it mandatory. I do not think any institution should take more than nine months to submit the accounts.

Also, those who violate financial discipline must be held responsible. I must cite just one instance where a State media institution had an outstanding amount running into several millions of rupees for services

[ගරු කරු ජයසූරිය මහතා]

extended for political purposes. This was highlighted in the media and had been taken up at the COPE for the last several years, but nothing happened.

These are the type of incorrect financial procedures followed or the authority that has been used by certain people for political purpose and we certainly must put an end to this.

With regard to appointment of right people to most of the Government institutions, I must say here that, in principle, we always believe that COPE should be chaired by a Member of the Opposition. But, I must also say that this argument is not valid for the Hon. DEW Gunasekara. Although he is a Member of the Government, he has discharged his duties extremely well. We are very happy to work with him and it was probably a historical process that most of the institutions have gone through without favour. In this process, we have come across very good and profitable Government institutions which are professionally-run and professionally-maintained. They are run by good, competent management teams, management boards and chairmen. Also, we have come across some institutions run by political appointees who are not worthy of appointment. Hon Presiding Member, even today when we make appointments to the Diplomatic Service, there is a system of screening. There have been one or two occasions where we had to decline the appointments of some of the people who came before the Committee on High Posts. Therefore, even the Chairman felt that we must look into the possibility of introducing some sort of screening of the top appointees to large public corporations to see that, at least financially they have done no wrong. So, these are little thoughts that came to our minds.

Sir, I also feel that with the development of accounting and auditing in the world, the time has come for us to invite the International Organization of Supreme Audit Institutions - INTOSAI - to further strengthen to evaluate the Auditor-General's Department, to determine how well-equipped with people, tools and techniques we are and how effective the Office of the Auditor-General is amidst various attempts to obstruct good work.

This is said in good faith because I have seen the vast developments made in India. I would like to cite a comment made by Mr. Vinod Rai, former Controller and Auditor-General of India about INTOSAI. He said this in this very month, July, in the International Journal of Government Auditing. As some of us believe in good governance, transparency and accountability, we try to keep abreast of these developments.

Mr. Vinod Rai states, I quote:

"I recently completed my term as Controller and Auditor-General of India.

Building on the foundation laid in Lima and its reiteration and consolidation in Mexico, INTOSAI has emerged as a champion of the independence of supreme audit institutions. Today, it is recognized as the leading standard-setting body in the field of public audit. Examples of INTOSAI's growing stature and confidence include formulating auditing standards and guidance on best practices for good governance; building a partnership with multilateral international donors and national development agencies to promote capacity building in supreme audit institutions in need of such efforts; and having the United Nations adopt a General Assembly Resolution acknowledging the main principles of the Lima and Mexico Declarations and recognizing the role of supreme audit institutions in promoting the efficiency, transparency and accountability of public administration.

These developments also underscore the fact that INTOSAI is a catalyst in a paradigm shift in the way public audit is perceived today and its relevance to modern societies is demonstrated. In a few months, INTOSAI will be adopting a standard that asserts the values and benefits of supreme audit institutions.

Roles that required auditors to express an opinion about whether financial statements were free from material misstatements. While this will continue to be a key role for all auditors, the increasing complexity in governance today and the demand for greater accountability place an onerous responsibility on auditors. Our minds are occupied as never before with questions about whether we have obligations beyond those achieved by traditional audits, whether governance is actually improving the lives of our citizens and whether public policy and programs are responsive to the needs of those for whom such programs are intended."

Sir, I believe that we can take a lesson from these wonderful words of Vinod Rai, former Controller and Auditor-General of India, from the land of the Mahatma, our friend and neighbour.

In conclusion, let me once again pay tribute to the Auditor-General and the Auditor-General's Department. There is a tremendous responsibility lying ahead of them. There are quite a large number of public bodies that run at a loss. These are the areas that need to be looked at because these are people's money. We have to look into them in detail and find out why these are going wrong. I have seen a few instances of obstructing but it is our duty to support this institution.

Once again, in conclusion, let me say, as I said before, we are not objecting to the salary increase; it should be done. It is only a matter of principle that was highlighted and I wish the Department well.

Thank you very much.

[අ.භා. 5.05]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. විගණකාධිපතිතුමාගෙන් මේ රට අපේක්ෂා කරන, ඒ භාරදූර වග කීමක් සහිත කර්තව්‍ය සහ ඒ වෙනුවෙන් අප දක්වන සහයෝගය

ගැන කරු ජයසූරිය මන්ත්‍රීතුමා කථා කළා. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, ලෝකය පිළිගත් ක්‍රමවේදවලට අනුව අපගේ විගණන කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයකට යෑම පිළිබඳව එතුමාගේ කථාවේ අවසාන භාගයේ දී සඳහන් කළා. මා ඒ ගැන සන්තෝෂ වනවා. මේ වනකොටත් විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය සම්බන්ධව ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධතා ඇති කරගෙන ක්‍රියාත්මක වන තත්ත්වයක් තිබෙනවා. මා හිතන විධියට විගණකාධිපතිතුමාට තිබෙන විශේෂ කාර්ය භාරයක් තමයි, සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද වැය ශීර්ෂ පදනම් කරගෙන, ඒවාට අදාළ විගණන කටයුතු නිවැරදි ලෙස වාර්තා කර කරුණු ඉදිරිපත් කිරීම. ඒ නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙනුවෙන් කරන ගෙවීම්, එම නිලධාරීන්ට ලබා දෙන පහසුකම් සහ සහයෝගය හැම අතින්ම මීට වඩා වැඩිදියුණු වුණොත් හොඳයි. මෙහි පරිගණක පද්ධතිය මීට වඩා වැඩි දියුණු කරලා, අනෙකුත් ජාල සමඟ සම්බන්ධ කිරීමට කටයුතු කරනවා නම් හොඳයි. මොකද, ගොඩක් වෙලාවට අපට audit reports ලැබෙන්නේ හුඟක් කල් ගිහිල්ලා. ඒකට හේතුව තමයි, බොහෝ අමාත්‍යාංශවල කාර්ය භාරය තවමත් සිදු කෙරෙන්නේ අතින්. ඒ කියන්නේ manually. එතකොට කරුණු සම්පිණ්ඩනය කරලා, වාර්තාවක් හදලා එවන්න කල් ගත වනවා. සාමාන්‍යයෙන් ජූනි මාසයේ 30 වැනි දාට කලින් අය වැය වාර්තාව සකස් කර අවසන් කළ යුතු වෙනවා. සැප්තැම්බර් මාසය වනවිට විගණන වාර්තාව සකස් කර අවසන් කළ යුතු වනවා. මේ වාර්තා සකස් කිරීමේ ප්‍රමාදය නිසා බොහෝ විට මේ වාර්තා උපදේශක කාරක සභාවලට ලැබෙන්නේ, පාර්ලිමේන්තුවේ සභාගත කරන්නේ අවුරුදු 2ක්, 3ක් හෝ සමහර අවස්ථාවල අවුරුදු 5ක් විතර ප්‍රමාදයක් ඇතිව බව අපි දකිනවා. මේ හේතු නිසා විගණකාධිපතිතුමාගේ කර්තව්‍ය සංකීර්ණ වෙනවා. ඒ නිසා එතුමාට යම් කිසි දිරි දීමනාවක් ලබා දිය යුතු වනවා.

අපි Sri Lanka Customs ගැන කථා කරනවා නම්, Sri Lanka Customs මඟින් හොර බඩු අත් අඩංගුවට ගත්තොත් ඒ නිලධාරීන්ට ඒ සඳහා විශේෂ දීමනාවක් ගෙවනවා. ළඟදී, පොලිස්පතිතුමාත් සාක්ෂිකරුවකුට එවැනි දිරි දීමනාවක් ලබා දුන් අවස්ථාවක් ගැන සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. ඒ හොරු අල්ලන්න, ඒ වැරැදි වැඩ කරන අය සොයා ගන්න, ඒ පිළිබඳව හොඳ සාක්ෂි ලබා දුන් අයකුට දිරි දීමනාවක් ලබා දීලා තිබුණා.

විශාල වග කීමක් ඇති ආයතනයක් හැටියට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට සාමාන්‍ය මාසික වැටුපක් සහ සාමාන්‍ය පහසුකම් පමණයි ලැබෙන්නේ. ජාත්‍යන්තර සහ මේ රටේ වෙනත් ආයතන සමඟ සංසන්දනය කළාම, ගණකාධිකරණය පිළිබඳව පුළුල් දැනුමක් ඇති, accountantලා වැනි හුඟක් සුදුසුකම් තිබෙන අය මේ දෙපාර්තමේන්තුවේ කටයුතු කරනවා. ලෝකයේ වෙනත් රටවල නම් එවැනි අයට අද ලොකු දීමනා ලැබෙනවා. ලංකාවේත් පෞද්ගලික අංශයේ සේවය කරන එවැනි අයට විශාල දීමනා ගෙවනවා. එම නිසා මේ දෙපාර්තමේන්තුවේ සේවය කරන අයටත් ලබා දෙන පහසුකම් වැඩි කළොත් හොඳයි කියලා මම හිතනවා. නමුත් අපේ රටේ තිබෙන වැටුප් මට්ටම, එහෙම නැත්නම් ආදායම්වල තත්ත්වය මත එක අංශයකට විතරක් එවැනි දීමනා වැඩි කිරීමක් කරන්න අපට අපහසුයි. නමුත් අපේ රේගුවේ නිලධාරීන්ට සාමාන්‍ය වැටුප් ගෙවන එකට අමතරව විශේෂ දීමනා ලබා දෙන වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. එය විශේෂ අවස්ථාවක් හැටියට මා දකිනවා. නීත්‍යානුකූල නොවන, නොයෙකුත් වැරැදි වැඩ කරන අය වැටලීම් සඳහා කටයුතු කරන ඒ සේවක පිරිස උනන්දු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමටත් විශේෂ දීමනාවක් ලබා දෙමින් ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා.

විගණකාධිපති දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන Act එක වරින් වර මේ පාර්ලිමේන්තුවෙන් වෙනස් කර තිබෙනවා. Public corporations විගණනය කිරීම කලින් මේ දෙපාර්තමේන්තුව යටතට පැවරී තිබුණේ නැහැ. 1971 කාල වකවානුවේ එම කාර්යය මෙම දෙපාර්තමේන්තුව යටතට පැවරී තිබුණේ නැහැ. පසුව එයත් මෙම ආයතනයට පැවරුවා. 1987 දී ගෙන ආ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව provincial councils, municipal councils, urban councils හා ප්‍රාදේශීය සභාවල audits විගණකාධිපති දෙපාර්තමේන්තුවට භාර දීලා තිබෙනවා. Agrarian Development Act, No. 46 of 2000 අනුව Agrarian Development Councils ද තමන්ගේ ගිණුම් මෙම දෙපාර්තමේන්තුවට භාර දීලා තිබෙනවා. මට මතකයි, 1993 දී සියලුම ක්‍රීඩා සංගම්වල විගණනයත් මෙම දෙපාර්තමේන්තුවට භාර දුන් බව. මෙවැනි වගකීම් භාර දීමට සාපේක්ෂව අප විගණකාධිපති දෙපාර්තමේන්තුව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා පුහුණුවක්, යටිතල පහසුකම් සහ අනිකුත් සහයෝගයන් ඔවුන්ට ලබා දිය යුතුය කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාම, ඒ ගැන මේ උත්තරීතර සභාවේදී මැති ඇමතිවරුන් සැම දෙනාගේම අදහස් විමසලා, තර්ක විතර්ක ඉදිරිපත් කරලා ඒ අය වැය ලේඛනය සම්මත කර ගන්නවා. ඒ සම්මත කරන ලද මුදල්වලින් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරලා ඊළඟ වසරේදීත් ඒවා ඉදිරියට අරගෙන යනවා. මේ ක්‍රමවේදයත් එක්ක බැලුවාම අපට පේනවා පාර්ලිමේන්තුවේ මූල්‍ය කටයුතු අධීක්ෂණය කරන නිලධාරියෙක් හැටියටත්, අපට උපදෙස් දෙන, අපට ඒ ගැන හරි වාර්තාවක් ලබා දෙන ආයතනයක් හැටියටත් විගණකාධිපතිතුමා ඇතුළු එම දෙපාර්තමේන්තුව කරන මේ කාර්ය භාරය අතිශය වැදගත් බව.

දියුණු රටවල් දිහා බැලුවාම අපට පේනවා ඒ රටවල මේ කර්තව්‍ය බොහොම පුළුල් විධියට ක්‍රියාත්මක වන බව. ඒ රටවල සජීවීව -online- මාස් පතා සෙසු ආයතන හා දෙපාර්තමේන්තුවල ගිණුම් දත්ත සම්පූර්ණ පරිගණක පද්ධතියක් යටතේ ක්‍රියාත්මක වෙනවා. ඒවා audit කරන software එකෙන් ඒ ඒ අංශවලට මුදල් වෙන් කිරීම් - allocations - හදලා තිබෙනවා. ඒවා ශ්‍රේණිගත කරලා -ලෙජර් ක්‍රමයකට- අනුමත වෙනවා. ඒ මුදල් ඒ කාල සීමාවේදී පාවිච්චි කරන්න ඕනෑ. ඊට පසුව ඒවා නැවත මධ්‍යම ගිණුමකට බැර වෙනවා. ඒ ක්‍රමවේදය සම්පූර්ණයෙන් පරිගණක පද්ධතියක සටහන් වෙලා තිබෙනවා. එතකොට මාසයෙන් මාසයට, නැත්නම් මාස තුනෙන් තුනට ඒ ගැන විග්‍රහයක් කර බලන්න හරි පහසුයි. ඒ මුදල් හරියට පරිහරණය වෙනවාද, කුමන කාලයක් ඇතුළතද ඒ මුදල් වියදම් කර තිබෙන්නේ කියලා හරි පහසුවෙන් බලා ගන්න පුළුවන්. එහෙම නැති වුණාම, එය දැන ගන්නත් ඒවායේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ඒ අමාත්‍යාංශවලට ලබා දෙන මුදල් නිසියාකාරව පරිහරණය කෙරුණේ නැත්නම් බලාපොරොත්තු වන වේගයට සංවර්ධනය සිදු නොවන බව, නැත්නම් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක ගැන අවබෝධයක් එමඟින් අදාළ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ සෙසු නිලධාරීන්ට දැන ගන්න ලැබෙනවා. අන්න ඒ විධියට, ඊළඟ යුගයට ගැළපෙන පරිදි විගණකාධිපති දෙපාර්තමේන්තුව නවීකරණය කරලා, විගණකාධිපතිතුමාගේ කාර්ය භාරය තවත් පුළුල් කරලා, ඒ අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය වැඩි කරලා, දත්ත ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරිගණක පහසුකම් ලබා දුන්නොත් අපටත් ඉක්මනටම හොඳ ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම මෙම කටයුතුවල කාර්යක්ෂමතාවත් වැඩි දියුණු කරන්න ඕනෑ. අප දන්නවා පුළුල් වැඩ කොටසක් කෙරෙන අමාත්‍යාංශ රාශියක් තිබෙන බව. ඒවායේත් පොඩි අතපසුවීමක්

[ගරු තිලංග සුමතිපාල මහතා]

වුණොත්, රුපියල් ලක්ෂ දෙකක, තුනක, පහක වාගේ පොඩි ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක විශාල දෙයක් හැටියට උලුප්පා දක්වන්න පුළුවන්. එසේ වන්නේ ඇයි? ඒ අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු ගැන පුළුල් අවබෝධයක් ක්ෂණිකව ලබා දීමේ හැකියාවක් ඇති පරිගණක පද්ධතියක් -තොරතුරු ලබා ගැනීමේ හැකියාවක්- අපට නැති නිසායි. දියුණු රටවල් භාවිත කරන ඒ ක්‍රමය ඇති කළොත් මේ අතිනුත් අපට විශාල වාසියක් සිද්ධ වෙනවා.

විගණකාධිපතිතුමා වෙනුවෙන් වෙන් කරන ලද පහසුකම් හා මුදල් අතිශය වැදගත් වනවා. ඒ වාගේම එම දෙපාර්තමේන්තුව සහ අනිකුත් අමාත්‍යාංශවල සම්බන්ධීකරණයත් අතිශය වැදගත් වනවා. මේ සම්බන්ධතාව තුළින් අපගේ වැඩ කටයුතුවල කාර්යක්ෂමතාව ඇති කර ගැනීමට හැකි වෙනවා වාගේම, අමාත්‍යාංශ හා සෙසු දෙපාර්තමේන්තුවලට සම්බන්ධව තිබෙන සියලුම අංගවල ක්‍රමවේද, ඒ වැඩ පිළිබඳව අධීක්ෂණය කිරීමේ හැකියාවත් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, internationally accepted standard එකකට අපේ විගණන ක්‍රමවේදය සකස් කර ගැනීම තුළින් අපට ලොකු ගෞරවයක් සහ විශ්වාසයකුත් ඇති වෙනවා. අප ගොඩක් දුරට ඒ පිළිබඳව කථා කරනවා. ඒ වෙනුවෙන් මහන්සි වෙනවා; ඒ වෙනුවෙන් විශාල වශයෙන් ක්‍රියාත්මක වෙනවා. මේ පද්ධතියත් අප ජාත්‍යන්තර තලයේ තත්ත්වයට යොමු කර ගත්තොත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවට මීට වඩා විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් වෙනවා. ඒ වාගේම ඒ අයගේ ශ්‍රම දායකත්වය මීට වඩා වැඩියෙන් ලබා ගෙන, ඔවුන් තුළ ඇති අවබෝධය, දැනුම තුළින් තවත් උපදෙස් අරගෙන සෙසු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කර්තව්‍ය මීට වඩා හොඳට කරගෙන යන්න හැකියාව ලැබෙනවා.

මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වන අතර, මෙම කර්තව්‍ය ඉතාම කාලෝචිත බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.15]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ රටේ රාජ්‍ය සේවය තුළ තිබෙන සැබෑ ස්වරූපය, එක අතකින් මේ රටේ රාජ්‍ය සේවකයන් මුහුණ දීලා තිබෙන අසරණකම පෙන්නුම් කරන අවස්ථාවක් තමයි අද මේ පැවැත් වෙන විවාදය. මේ රටේ ප්‍රධානතම රජයේ නිලධාරියෙක්; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පත් කරන අති ගෞරවනීය, ස්වාධීන නිලධාරියෙක්; රාජ්‍ය ආයතන අති විශාල ප්‍රමාණයක් සම්බන්ධව සුපරීක්ෂාවෙන් සිටීම පිණිස පත් කරන නිලධාරියෙක් තමයි විගණකාධිපතිතුමා. එතුමාගේ වැටුප රුපියල් 48,940යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේ මාධ්‍ය ආවරණය කරන මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ වැටුප ගැන මාධ්‍යවලින් කියන්න එපාය කියලා. මේ රටේ විගණකාධිපතිට වැටුප හැටියට හම්බ වෙන්නේ රුපියල් 48,940ක් නම්, රාජ්‍ය සේවයට බැඳෙන්නට අපේක්ෂා කරන, තමන්ගේ දක්ෂකම්, තමන්ගේ කැපවීම් රාජ්‍ය සේවය වෙනුවෙන් යොදවන්න බලාපොරොත්තු වන අය මේ ගැන දැන ගත්තාම රාජ්‍ය සේවය තුළ තමන්ට අනාගතයක් නොමැති බවත්, තමන්ගේ දක්ෂතා ඇගැයීමට ලක් නොවන බවත් සනාථ කරන්නට මේ වැටුප ගැන කියනවා නිසැකයි. එපමණක් නොවෙයි. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වැටුපට වඩා වැඩියෙන් වැටුප් ලබන රජයේ සේවකයෝ තුන් දෙනෙකු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙක හරි පුදුම දෙයක්. යම් රාජ්‍ය දෙපාර්තමේන්තුවක දෙපාර්තමේන්තු ප්‍රධානියාට වඩා වැඩියෙන් වැටුප් ගන්න තුන් දෙනෙකු සිටිනවා නම් ඒ දෙපාර්තමේන්තුවේ පාලනය සහ අධිකාරිය පිළිබඳව නිසැකවම ප්‍රශ්න මතු වෙනවා. මොකද, සේවයේ ජ්‍යෙෂ්ඨත්වය සහ අධිකාරි බලය මත වැටුප් සහ වරප්‍රසාද වැඩි වන ක්‍රමයක් තිබිය යුතුයි, පෞද්ගලික අංශයේ වුණත්, රාජ්‍ය අංශයේ වුණත්. ඒ බව ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කියන විට ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා පිළිගන්නවා.

මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමාත් මේ මොහොතේ මෙම ගරු සභාවේ ඉන්නවා. මේ ප්‍රශ්නය විසඳා ගන්න වසරකටත් වැඩිය උත්සාහ කළාය, ඒ උත්සාහය අසාර්ථක වුණාය, කෙසේ නමුත් විගණකාධිපතිතුමාට මේ වැටුප පිළිබඳ ප්‍රශ්නය මේ මට්ටමින් හෝ විසඳා දිය යුතු නිසා මේ යෝජනාවට විරුද්ධ වන්නට එපාය කියලා ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් අපෙන් ඉල්ලනවා. අපි, -විපක්ෂයෙන්- විරුද්ධ වුණත් නැතත් මේ යෝජනාව සම්මත කර ගන්නට පුළුවන්. අපි විරුද්ධව ඡන්දය දෙන්නෙත් නැහැ. එහෙත් රජයේ විගණකාධිපතිවරයාට, -රටේ ඉන්න ප්‍රධානතම, ජ්‍යෙෂ්ඨතම රජයේ නිලධාරියෙකුට- දෙන්නේ රුපියල් 48,940ක පඩියක්. ලජ්ජයි. ඒක වැරදියි. ඒක නුසුදුසුයි. එහෙම කරන්න එපා. රජයේ සේවකයින්ට මීට වඩා ගෞරවණීය විධියට සලකන්නය කියා එක්සත් ජාතික පක්ෂය හැටියට අපට කියන්නට සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් අතට මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම කරන පත්වීම් ගණනාවක් තිබෙනවා. අග්‍රවිනිශ්චයකාරතුමා ප්‍රමුඛ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්, සභාපති විනිශ්චයකාරතුමා ප්‍රමුඛ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්, නීතිපතිවරයා, විගණකාධිපතිවරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. ඒ වාගේම ස්වාධීන කොමිෂන් සභාවලට කරන පත් කිරීම්, ඒවායේ සභාපතිවරු සහ සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ම කරන පත් කිරීම්. මේ තනතුරුවල ස්වාධීනත්වය ආරක්ෂා කරන්නට, මේ තනතුරුවල ගෞරවය ආරක්ෂා කරන්න, මේ තනතුරුවල තිබෙන අධිකාරී බලය ආරක්ෂා කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ස්වාධීනත්වය පිළිබඳ කරුණ ගැන හිතලා ඔවුන්ගේ වැටුප අඩු කළ නොහැකි බවත්, පාර්ලිමේන්තුව විසින් වැඩි කළ හැකි බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම දක්වා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ පැවැත්වෙන මේ විවාදයේ දී කියැවෙන කරුණ තමයි රුපියල් 48,940.00ක සංඛ්‍යාව හැදුවේ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින්ය කියන එක. එතකොට මේ පාර්ලිමේන්තුව මොකටද? පාර්ලිමේන්තුව විසින් වැටුප් වැඩි කළ හැකියි, අඩු කළ නොහැකියි කියන විශේෂ ප්‍රතිපත්තිය මොකටද? කියන්න තිබුණා නේ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් තමයි මේ වැටුප් නිර්ණය කරන්නේ කියලා. එහෙම තීරණය කරලා පාර්ලිමේන්තුවට එවනවා, රබර් සීල් එකක් වගේ සීල් එක ගහලා දෙන්න කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමා දීර්ඝ කාලයක් මේ ගරු සභාවේ තනතුරු දරලා තිබෙනවා. ඔබතුමාට විශාල අත් දැකීම් තිබෙනවා. පාර්ලිමේන්තුව විසින් වැටුප වැඩි කළ හැකියි, අඩු කළ නොහැකියි කියන එකේ ගෞරවයක්

තිබෙනවා; වටිනාකමක් තිබෙනවා. ඒක ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට තීරණය කරන්න ඉඩ දීලා අපට ඒ සංඛ්‍යාව අනුමත කරන්න එවනවා නම් එහි ලොකු පරස්පරයක් තිබෙනවා.

මේ තනතුර ගැන පමණක් නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පත් කරන සියලුම තනතුරු ගැන මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා අපට හිතන්න කාලය ඇවිල්ලා තිබෙනවා, මේ තනතුරු සඳහා පත් කරන ක්‍රමවේදය, ඉවත් කරන ක්‍රමවේදය සහ වැටුප් වැඩි කරනවා නම් ඒ වැඩි කිරීමේ ක්‍රමවේදය පිළිබඳව. ඒ සඳහා පාර්ලිමේන්තුව ඇතුළේ, පාර්ලිමේන්තුව විසින්, පාර්ලිමේන්තුව තුළ යම් ක්‍රියාදාමයක් නිර්මාණය කර ගත යුතුයි. එක අතකින් එයින් ව්‍යවස්ථාදායකයේ බලය ආරක්ෂා වෙනවා, ශක්තිමත් වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කර තිබෙන ඒ තනතුරුවල ගෞරවය සහ ස්වාධීනත්වය පිළිබඳව තිබෙන ඒ ප්‍රතිපාදන තහවුරු වෙනවා.

දැන් මේ කාරණය ගැන ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් අතර යම් මූලධර්ම එකඟතාවක් තිබෙනවා. ඒ නිසා අද මේ යෝජනාවට විපක්ෂය විරුද්ධ වන්නේ නැහැ. මොකද, විගණකාධිපතිතුමාට මොනවා හරි වැටුපක් ලැබීම තහවුරු කරන්නය කියන මේ ආයාචනය නිසා. හැබැයි, මේ තරම් අවම වැටුපක් ලබා දීමත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට දෙපාර්තමේන්තුවේ පහළ සේවකයන්ට වඩා අඩු වැටුපක් නිර්දේශ කිරීමත් එක අතකින් තුනෙන් දෙකක් බලය තිබෙනවාය කියලා කයිවාරු ගහන මේ ආණ්ඩුවේ තිබෙන ඇත්ත දුර්වලකම පෙන්නුම් කරන අවස්ථාවක්.

අනෙකුත් ඕනෑම දෙයකට හදිසි පනත් කෙටුම්පත් ගෙනල්ලා හදිසියේම අදාළ දේවල් වෙනස් කර ගන්න පුළුවන්, බලය තහවුරු කර ගන්න. හැබැයි රටේ ඉන්න ප්‍රධානතම රජයේ සේවකයෙකුගේ වැටුප පිළිබඳ අර්බුදයක් මතු වෙලා තිබෙනකොට, ප්‍රධානතම රජයේ සේවකයන්ගේ වැටුප් තලයන්හි අවුලක් තිබෙන බව බැලුබැල්මට මතුපිටින්ම පෙනෙනකොට තුනෙන් දෙකේ බලය නැහැ. එතකොට තුනෙන් දෙකේ බලය පාවිච්චි කරන්නේ නැහැ. එතකොට ඔය කියන විධායක බලය පාවිච්චි කරන්නේ නැහැ. ඒක ලජ්ජයි. හොඳටම ලජ්ජයි. මෙහෙම ආණ්ඩුවක් මොකටද? මෙහෙම ආණ්ඩුවකින් රජයේ සේවකයන්ට ලැබෙන පිළිසරණ මොකක්ද කියා අහන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද උදේ ප්‍රශ්න අහන අවස්ථාවේදී මම මේ පාර්ලිමේන්තුවට ප්‍රශ්නයක් යොමු කර තිබුණා. රාජ්‍ය සේවය පිළිබඳව, ඒ වාගේම යහ පාලනය පිළිබඳ කාරණයට සෘජුවම අදාළ නිසා එම ප්‍රශ්නය හා ලබා දුන් පිළිතුර තුළින් මතු වුණු කරුණු ගැන මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්න මා කැමැතියි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් තුන් දෙනෙක් පත් කරන්න අවශ්‍යයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සාමාජිකයන් 5 දෙනෙක් පත් කළ යුතුව තිබුණා. 5 දෙනෙක් වැඩියි, පරිපාලනයට අපහසුයි කියා තර්කයක් ගොඩ නැඟුණා. ඒ අනුව දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ගණන 3 දෙනෙක් බවට පත් කළා. ඒ විතරක් නොවෙයි, මැතිවරණ කොමිෂන් සභාවට තමයි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීමේ වගකීම භාර දී තිබෙන්නේ.

අද මැතිවරණ කොමසාරිස්වරයා කියා තාවකාලිකව ධුර දරන ආකාරයකට මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරන තුරු වගකීම ඉටු කළ හැකිය කියා කිව්වත්, ඇත්තෙන්ම මේ රටේ මැතිවරණ මෙහෙයවීම සඳහා වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් -මැතිවරණ කොමිෂන් සභාව කියා ආයතනයක්- පිහිටුවා තිබෙනවා. ඒ ආයතනය සඳහා සාමාජිකයන් පත් කිරීමේ වගකීම පැවරී තිබෙන්නේ ජනාධිපතිවරයාටයි. විධායකයේ ප්‍රධානියා විධියට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් කොන්දේසි විරහිතව තමන්ට ඕනෑ කෙනෙක් ඒ තනතුරුවලට පත් කරන්න ජනාධිපතිතුමාට බලය දී තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. පාර්ලිමේන්තුවේදී මම අහපු ප්‍රශ්නයේ එක කොටසකින් මා අසා තිබුණා, "මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් මේ වන විට පත් කර තිබේද?" කියා. උත්තරය "නැත" යන්නයි. ඊළඟට මම ප්‍රශ්නයක් අසා තිබෙනවා, "මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් නොකිරීම මඟින් ව්‍යවස්ථාපිත යුතුකම ඉටු කිරීම පැහැර හැර තිබේද?" කියා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කියනවා නම් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරන්න ඕනෑ ජනාධිපතිතුමාය කියා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා අවුරුදු දෙකකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා නම්, එවැනි අවස්ථාවක මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් නොකරන්නේ ඇයි? මැතිවරණ ස්වාධීනත්වය ගැන වැඩි වැඩියෙන් ප්‍රශ්න මතු වන මොහොතක, උතුරේ පළාත් සභා ඡන්දය පැවැත්වීමේ ප්‍රශ්නය ගැන වැඩි වැඩියෙන් කථා කරන මොහොතක, අලුත් පළාත් සභා මැතිවරණ ප්‍රකාශයට පත් වෙලා තිබෙන මොහොතක මේ රට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක නිරත වෙනවා නම්, මේ රටේ විධායකයේ ප්‍රධානියා සහ පාලක පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අවංක විශ්වාසයක් තිබෙනවා නම්, එතුමන්ලාම ගෙන ආ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුවවත් සාමාජිකයන් පත් කරලා නැහැ, මැතිවරණ කොමිෂන් සභාවට. මම මේ ප්‍රශ්නය ඇහුවාම ජනාධිපතිතුමා වෙනුවට අග්‍රාමාත්‍යතුමා ඒකට පිළිතුරු දුන්නා. මම අහපු ප්‍රශ්නයට ජනාධිපතිතුමා වෙනුවට අග්‍රාමාත්‍යතුමා දෙන පිළිතුර මොකක්ද? ඒ පිළිතුර තමයි "අලුතින් පත් කර තිබෙන තේරීම් කාරක සභාවෙන් යම් යෝජනාවක් එන තුරු මැතිවරණ කොමිෂන් සභාව පත් කිරීම නුසුදුසු බව හැඟේ." යන්නයි. තේරීම් කාරක සභා පත් කරන්න පුළුවන්. ඒ තේරීම් කාරක සභාව පත් කරලා විසඳුම් ලබා ගන්න පුළුවන්. ඒක වෙනම ක්‍රියා දාමයක්. නමුත් රටේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන එක, තිබෙන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන එක විධායකයේ වගකීමක්, ව්‍යවස්ථාදායකයේ වගකීමක්. "අනාගතයේ වෙනත් යෝජනා ඒමට ඉඩ ඇත. එතෙක් පත් කිරීමට මම කැමති නැත. එහෙම පත් කිරීම නුසුදුසුයි" කියා තර්ක කරන එකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව චේතනාන්විතව උල්ලංඝනය කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම හැන්සාඩ් කාර්යාලයෙන් එම පිළිතුර ගෙනැල්ලා දෙපාරක්, තුන්පාරක් කියවලා බැලුවා මේ තේරීම් කාරක සභාවට ලබා දීලා තිබෙන, තේරීම් කාරක සභාවෙන් අපේක්ෂා කරන විෂය ක්ෂේත්‍රය කුමක්ද කියලා. දැන් මේ කියන තේරීම් කාරක සභාවේ විෂය ක්ෂේත්‍රය තුළ කිසිම ලෙසකින් මැතිවරණ කොමිෂන් සභාවේ සුදුසු නුසුදුසු බව, එහි සාමාජිකයන් පත් කිරීමේ ක්‍රියාදාමය හෝ පොදුවේ කොමිෂන් සභා සඳහා සාමාජිකයන් පත් කිරීමේ ක්‍රියාදාමය, එම කොමිෂන් සභාවල සුදුසු නුසුදුසු බව ඇත්තේ නැහැ. ඒ කිසිවක් ගැන මේ අලුතින් පත් කර තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ වූ තේරීම් කාරක සභාවේ ඇත්තේ නැහැ. එහෙම නම් ගරු අගමැතිතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරු දීම මඟින් මේ සභාව නොමඟ යවා තිබෙනවා. රටට බලපාන වැදගත්ම ප්‍රශ්නයක් ගැන එනම්, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් නොකිරීමට හේතුව වශයෙන් දක්වා තිබෙන්නේ සම්පූර්ණ වැරදි, අසත්‍ය කාරණාවක්. ඒක ලජ්ජාවට කරුණක්.

රටේ රාජ්‍ය සේවය සහ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපි වැඩි වැඩියෙන් කල්පනා කරන්න ඕනෑ කාලයක් මේ. යුද්ධය තත්ත්වය

[ගරු තිලංග සුමතිපාල මහතා]

අවසන් වුණාට රටේ සැබෑ සාමයක් ඇති කරන්නත්, ප්‍රජාතන්ත්‍රවාදය හරහා රටේ සංවර්ධනයක් ඇති කරන්නත්, රට නවීන ජාතියක් ලෙස එක්සත් ජාතියක් ලෙස ඉදිරියට යන්නටත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ආරක්ෂා කළ යුතුයි. ඒ නිසා පත් කිරීමේ ක්‍රමය දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් වෙනසකට පත් කිරීමෙන් පසුව වුවත් ජනාධිපතිවරයාට සියයට සියයක් තමන්ගේ අභිමතය පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කරන්න හැකියාව තිබුණා. අඩුම තරමින් එලෙසවත් පත් කළ යුතුයි. ඇයි එහෙම කරන්න බැරි? ඇයි, මැතිවරණ කොමිෂන් සභාව ගැන සැකයක් ඇති කර ගන්නේ? ඇයි, මැතිවරණ කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කරන්නේ නැත්තේ? දැන් වර්තමාන මැතිවරණ කොමසාරිස්තුමාට කියන්න පුළුවන්, "ඇයි මට බැරි, මට තනියම වුණත් මේ කාර්යය කරන්න පුළුවන්, මොකටද ඔය කොමිෂන් සභා, මට පුළුවන් මේ වැඩේ කරන්න" කියලා. එතුමාට විහිළුවෙන් එහෙම කියන්න පුළුවන්. හැබැයි මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ සභාපතිවරයකු සහ සාමාජිකයන් දෙදෙනකු ඉන්න සම්පූර්ණ සාමාජිකයන් ගණන තුනක් වෙච්ච මැතිවරණ කොමිෂන් සභාවක් ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අද දවස මේ මැතිවරණ කොමිෂන් සභාව පත් නොකිරීම පිළිබඳ රජයේ ස්ථාවරය වැරදි සහගත විහිළු ස්ථාවරයක්. මේ වැරදි ස්ථාවරය ගැන සනාථ කිරීම, ඒ වැරදි ස්ථාවරය ඉදිරිපත් කිරීම ගැන මගේ බලවත් කනගාටුව පළ කරනවා. මා දීර්ඝව කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. විගණකාධිපති ධුරය ඉතා වටිනා ධුරයක්. අද තිබෙන දුෂ්කරතාවන් යටතේ ඔවුන් ඉතා අසීරුවෙන් මේ කටයුතු කරනවා. නමුත් විගණකාධිපති දෙපාර්තමේන්තුව වඩා ශක්තිමත් ආයතනයක් කිරීම සඳහා මා එක් වැදගත් යෝජනාවක් කිරීමට කැමැතියි.

අද තිබෙන දෙපාර්තමේන්තු ව්‍යූහය තුළ මේ කියන ප්‍රශ්න මතු වනවා නියතයි. ඒවා වෙනත් ආයතන සමඟ සංසන්දනය කරන්නට ඕනෑ. වෙන වෙන දෙපාර්තමේන්තු සමඟ සංසන්දනය කරන්නට ඕනෑ. දැන් එවැනි තත්ත්වයන් තුළ, විගණකාධිපති දෙපාර්තමේන්තුවට යම් අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. අද නීතිපති දෙපාර්තමේන්තුව ගත්තොත් නීතිපති දෙපාර්තමේන්තුවට සාපේක්ෂව වැඩි වැටුප් ලැබෙනවා. මා දන්නේ නැහැ කොහොමද ඒවා කෙරුණේ කියලා. එහෙම දෙන එක හොඳයි. විනිශ්චයකාරවරුන්ට සාපේක්ෂව වැඩි වැටුප් ලැබෙනවා. මා එපා කියන්නේ නැහැ. ඒක හොඳයි. හැබැයි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ඉන්න ඉතාම වැදගත්, බරපතළ සේවයක් කරන ඒ සියලුම නිලධාරීන්ගේ වැටුප් සාපේක්ෂව වැඩි විය යුතුයි, ඔවුන්ගේ රාජකාරී ස්වාධීනව කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දෙපාර්තමේන්තු ආකෘතිය තුළ ඔවුන්ට ඒ වැඩි වැටුප් ලබා දෙන්න බැරි නම්, එහෙම හිතනවා නම් ස්වාධීනත්වය ආරක්ෂා කරන්නත් ඒ නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා කරන්නත් හොඳම දේ තමයි ස්වාධීන විගණන කොමිෂන් සභාවක් පිහිටුවීම. එලෙස ස්වාධීන විගණන කොමිෂන් සභාවක් පිහිටු වූවොත් ආයතනික ස්වාධීනතාව හරහා සැබෑ ලෙස සියලුම ආයතනවල විගණන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට ඔවුන්ට අවකාශ ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් එක් කරුණක් ගැන අවධානය යොමු කරන්නට ඕනෑ. අපේ රටේ රජයේ දෙපාර්තමේන්තුවලට සම්බන්ධ, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වාර්තා පිළිබඳව කටයුතු කරන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි. ඒ වාගේම රජයට අයිති ව්‍යවස්ථාපිත මණ්ඩල ගැන සොයා බලන්නේ "කෝප්" එකයි. COPE එකේ ප්‍රධානියා වන ඩිව් ගුණසේකර මැතිතුමා ආණ්ඩුවේ ඇමති කෙනෙකු වෙලාත් එතුමාගේ කටයුතු ස්වාධීනව කරපු එක ගැන ස්තුතිය හැම තැනින්ම ආවා. හැබැයි මමත් සාමාජිකයෙකු වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගැන, එහි සභාපතිවරයා ගැන එලෙස ප්‍රකාශ කළ නොහැකි බව වාර්තා වීම සඳහා සඳහන් කර තැබීමට කැමැතියි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තමන් වෙත පැවරී ඇති ඒ සීමිත බලය පවා නිසි ලෙස ක්‍රියාත්මක නොකරන, නිර්මාණශීලී යමක් නොකරන තැනක්. ඩිව් ගුණසේකර ඇමතිතුමා ගැන සඳහන් කරන කොට එතුමාගේ නිර්මාණශීලීකම ගැන, කාර්යක්ෂමභාවය ගැන, සියලුම ආයතන ඉක්මනින් විමර්ශනය කිරීම සඳහා එතුමා ගත් උපාය මාර්ග ගැන මේ සභාවේ සඳහන් වුණා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අදාළ ආයතනවල කටයුතු ඉක්මනින් විසඳීම සඳහා වූ ගත් උපාය මාර්ග මොනවාද? විශේෂයෙන්ම ස්වාධීනත්වය පිළිබඳව තිබෙන ප්‍රශ්න විසඳීමට ගත් ක්‍රියාමාර්ග මොනවාද? මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. අපේ රටේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගැන අප විදෙස් නියෝජිතයන් සමඟ සාකච්ඡා කරනකොට අපට කියන්න කාරණයක් තිබෙනවා. ඒ තමයි අපේ රටේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ආණ්ඩුවේ ඇමතිවරයෙක් බව. මෙහෙම කියපු ගමන්ම ලෝකයේ පිළිගත් සම්ප්‍රදාය කඩ කරපු පසුගාමී රාජ්‍යයක් ලෙස අප විහිළුවට ලක් වෙනවා. ඒ අය පුදුමයට පත් වෙනවා.

සාමාන්‍යයෙන් රාජ්‍ය ආයතනවල ගිණුම් විමර්ශනය කිරීමේ වගකීම පැවරුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවල මුලසුන දරන්නේ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. රජයේ ඇමතිවරයෙකුට තමන්ගේ අමාත්‍යාංශයේ, තමන් යටතේ තිබෙන දෙපාර්තමේන්තුවල, තමන්ගේ හිතවත් සමාන අමාත්‍යවරුන් යටතේ තිබෙන දෙපාර්තමේන්තුවල අඩු පාඩු කියන්නට බැහැ නොවෙයි, එය අසීරුයි. ඒක ඩිව් ගුණසේකර ඇමතිතුමා කරනවා. ඒ, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු නොවන නිසාය කියලායි මට හිතෙන්නේ; එතුමාට තිබෙන ඒ වාමාංශික දේශපාලනික පුහුණුව නිසාය කියලායි මට හිතෙන්නේ; එතුමාගේ හදවත තුළ තිබෙන යම් ආකාරයක අංවකභාවයක් නිසාය කියලායි මට හිතෙන්නේ. හැබැයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තත්ත්වය මේක නොවෙයි කියලා අප දන්නවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට වැඩි ඡන්දයෙන් වර්තමාන සභාපතිවරයා පත් කර ගත්තා. වැඩි ඡන්දය ආණ්ඩුවට තිබෙන නිසා ඔය ඕනෑ කම්ටුවක සභාපතිවරයා පත් කර ගන්න පුළුවන්. හැබැයි තමන් යටතේ තිබෙන අමාත්‍යාංශයේ ගිණුම් සාකච්ඡා කරන වෙලාවේත් "මම සභාපති, මම මෙතැන ඉන්නවා, මගේ නිලධාරීන් මම ආරක්ෂා කරනවා" කියලා ප්‍රකාශ කළේ, කටයුතු කළේ ඒ සභාපතිවරයාම තමයි. ඒ නිසා මා නැවතත් කියනවා, රාජ්‍ය පාලනය පිළිබඳ, යහ පාලනය පිළිබඳ මූලධර්ම භාවිතය ගැන මේ රටේ ආණ්ඩුව තුළ සිටින අතිබහුතරයක් අමාත්‍යවරුන්ගේ -විධායකයේ ඉඳලා පහළට- තිබෙන විශ්වාසය අවමයි කියලා. ඒ නිසා තමයි විගණකාධිපතිවරයාව අද මේ විධියට හැල්ලු වෙන්නේ. රටේ ඉන්න ප්‍රධානම ව්‍යවස්ථාපිත ධුරයක් දරන නිලධාරියාව අද හැල්ලු වෙන්නේ ඒ නිසායි. මේ කනගාටුදායක තත්ත්වය හැකි ඉක්මනින්ම අවසන් කිරීමට අවස්ථාව ලැබෙවා, මේ රටේ පුරවැසියන්ගේ සැබෑ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්නට හැකි අලුත් ව්‍යවස්ථාවක් රටට උදා වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නතර වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.36]

ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් වැදගත් කටයුත්තකට අප සම්බන්ධ වනවා. ඒ තමයි විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි කිරීම පිළිබඳ කාරණය. මේ සම්බන්ධව දීර්ඝ විවාදයක් පැවැත්වුණා. එහිදී මා හිතන්නේ ඒකමතිකව සියලුම දෙනා පිළිගත්තා විගණකාධිපතිතුමාගේ වැටුප මේ තිබෙන මට්ටමට වඩා ඉහළ මට්ටමක තිබිය යුතුයි කියලා. විවිධ තර්ක ඉදිරිපත් කළා, එතුමාගේ වැටුප් වැඩි කිරීම මෙතැනට ගෙනෙන්න ඕනෑ නැහැ, මේක හැල්ලු වෙනවා, වෙන තැන්වලින් කළ යුතුයි කියලා. නමුත් විගණකාධිපතිවරයා ස්වාධීනව කටයුතු කරන්න ඕනෑ නිලධාරියෙක්. කිසිම අමාත්‍යාංශයකට එතුමා අයිති නැහැ. එතුමා අයින් කරන්නත් බැහැ, සාමාන්‍ය නිලධාරියකු අයින් කරන ආකාරයට. ඒකටත් විශේෂ ක්‍රමවේදයක් තිබෙනවා. එතුමාට ස්වාධීනව කටයුතු කරන්න තිබෙන අයිතිය නිසාම මූල්‍ය පාලනයේ වගකීම සම්පූර්ණයෙන් දරන පාර්ලිමේන්තුව මඟින් තමයි එතුමාගේ වැටුප් වැඩි කිරීම සිදු කරන්නේ. එතුමාගේ වැටුප සම්බන්ධයෙන් යම් විෂමතාවක් සිදු වෙලා තිබෙනවා. ඒක අප පිළිගත යුතුයි. මේ පිළිබඳව අප අවධානය යොමු කර තිබෙනවා. විගණකාධිපතිතුමාගේ පරීක්ෂාවට ලක් වන ආයතනවල ප්‍රධානීන්ගේ වැටුප එතුමාගේ වැටුපට වඩා බෙහෙවින් වැඩියි.

විගණකාධිපතිවරයාගේ වැටුප රුපියල් 45,000යි. අපි දන්නවා, සමහර සංස්ථාවල සභාපතිවරු රුපියල් ලක්ෂ 5, 6 දක්වා වැටුප් වැඩි කර ගෙන තිබෙනවා කියලා. ඒ වාගේම අමාත්‍යාංශවල සමහර නිලධාරීන්ගේ වැටුපත් රුපියල් ලක්ෂ ගණනින් තිබෙනවා. මේ නිසා මේ තත්ත්වයේ යම් වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව තිබෙනවා කියන එක අපි වටහා ගෙන තිබෙනවා.

රජයක් විධියට පැහැදිලිවම අපි සඳහන් කරන්න කැමැතියි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විගණකාධිපතිතුමාගේ වාර්තා පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා කරන බව. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා සභාපතිත්වය දැරූ කාල පරාසය තුළ එය සාකච්ඡාවට පමණක් සීමා නොවී ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් බවට පත් කර ගන්න පුළුවන්කම ලැබුණා. මම අවස්ථා ගණනාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝජනය කළා. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමා සභාපතිත්වය දරන මේ කාරක සභාව තුළ ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ ගරු මන්ත්‍රීන් සියලුම දෙනාත් සාක්ෂි දරනවා, කිසිම බලපෑමකින් තොරව එතුමා ඉතාමත් ස්වාධීනව කටයුතු කරයි කියන එක පිළිබඳව. අද එය ඒ හැම කෙනෙකුගේම විශ්වාසය බවටත් පත් වෙලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය කාලය තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගත් තීන්දු සහ දුන් උපදෙස් නිසා අඩුම ගණනේ රුපියල් බිලියනයකින්වත් මේ රටේ මුදල් ඉතිරියක් සිද්ධ වුණා කියලා මම විශ්වාස කරනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දුන් තීන්දු ක්‍රියාත්මක කිරීම තුළින් ලාභ ලබන ආයතන ලාභය වැඩි කර ගත්තා, සමහර වෙලාවට පාඩු ලබන ආයතනවල පාඩුව අඩු වුණා. පාඩු ලබන තවත් ආයතන ලාභ ලබන ආයතන බවට පත් කර ගන්නත් පසු ගිය කාලය තුළ හැකියාව ලැබුණා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට පැමිණි සමහර ආයතනවල සභාපතිවරුන් අපට ස්තුති කරලා තිබෙනවා. ඒ අයට සමහර වෙලාවට අපි දොස් කියනවා. නමුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නිසාවෙන් ඒගොල්ලන්ගේ ආයතන ලාභදායී මට්ටමට පවත්වා ගෙන යන්න පුළුවන්කම ලැබුණා කියන ප්‍රශංසාව අපට හිමි කරපු අවස්ථා ගණනාවක් තිබෙනවා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නිසා ආයතන බොහොමයක් හැඩ ගස්වා ගන්න පුළුවන්කම ලැබුණා කියලා අමාත්‍යාංශ ලේකම්වරු පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. අපි මුල් කාලයේ සාකච්ඡා කරන කොට අවුරුදු පහක, හයක වාර්ෂික වාර්තා ලැබුණේ නැති ආයතන ගණනාවක් තිබුණා. දැන් ඒවා සම්පූර්ණයෙන් වෙනස් වෙලා. ආසන්නම වර්ෂය දක්වා වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන තත්ත්වයක් අපට දැන් දකින්න ලැබෙනවා. ඒ වාගේම වෙනදා නොතිබුණු විධිමත් බවක් ගිණුම්වල දැන් ඇති වෙලා තිබෙනවා. නමුත් තවත් ඉස්සරහට යන්න තිබෙන බවත් අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් මෙතෙක් සිදු වුණේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රැස් වෙනවා; තීන්දු ගන්නවා; පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරනවා; වැඩිම වුණොත් විවාදයක් කරනවා; එපමණයි. එතැනින් පස්සේ ක්‍රියාත්මක වීමක් තිබුණේ නැහැ. නමුත් මේ වතාවේ අපට ආඩම්බර වන්න පුළුවන්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගත් තීන්දු අතිගරු ජනාධිපතිතුමා වෙත දැනුම් දීමෙන් අනතුරුව එතුමා කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගත් තීන්දු ක්‍රියාත්මක කරන්න ප්‍රමුඛත්වය දෙන්න කියලා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන්ට දැනුම් දීම ගැන. චෝදනා එල්ල වුණු නිලධාරීන්ට එරෙහිව කටයුතු කරන හැටියටත්, ඒ වාගේම අඩු පාඩු මහ හරවා ගන්නා හැටියටත් එතුමා පැහැදිලි උපදෙසක් ලබා දුන්නා කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම එතුමාත් තමන්ගේ අමාත්‍යාංශ යටතේ තිබෙන ආයතනවල සිටි සමහර නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීම සඳහා ඒ අපි දීපු නියෝග ක්‍රියාත්මක කළා. එතුමා සමහර සභාපතිවරු ඉවත් කළා. "මහ නැඟුම" ව්‍යාපෘතියේ සිටි සභාපතිවරයාගේ කටයුතු පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අවධානයට ලක් වුණා. අවසාන වශයෙන් අප ලබා දුන් නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා ඒ පුද්ගලයාව ඉවත් කළා. ඒ පුද්ගලයා වෙන කිසිම ආයතනයකටවත් නැවත පත් කළේ නැහැ. එම සභාපතිවරයා සමඟ තිබෙන දේශපාලන සම්බන්ධකමවත්, හිතවත්කමවත්, වෙන කිසිම දෙයක්වත් සැලකිල්ලට ගන්නේ නැතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ඒ දුන් තීරණය ක්‍රියාත්මක කරලා එම සභාපතිවරයාව ඉවත් කරන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළා. තවත් ආයතන ගණනාවක් සහ අමාත්‍යාංශ ගණනාවක් සම්බන්ධයෙන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුණාය කියන එකත් අපි ආඩම්බරයෙන් සඳහන් කරන්න ඕනෑ. මෙතෙක් කලක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය සාකච්ඡාවකට, විවාදයකට පමණක් සීමා වෙලායි තිබුණේ. පසු ගිය කාලය තුළ මෙම කාරක සභාව නොයෙකුත් ආයතන සම්බන්ධව ගත් තීන්දු ක්‍රියාත්මක කරන්න පුළුවන් මට්ටමේ කාරක සභාවක් බවට පත් වුණාය කියන එකත් අපි ආඩම්බරයෙන් සඳහන් කරන්න කැමැතියි.

අද මෙම විවාදයට සහභාගි වූ සමහර ගරු මන්ත්‍රීවරු මේ විවාදය වෙන පැත්තකට ගෙන යන්න උත්සාහ දැරුවා. මේ විවාදයට අදාළ නැති කාරණා කිව්වා. ඒ වාගේම අසත්‍යය බොහොමයක් ප්‍රකාශ කළා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා සඳහන් කළා, හම්බන්තොට වරායට එන නැව් හම්බන්තොට ඇවිත් වාහන ගොඩ බානවා; ආපසු කොළඹට ඇවිත් ඉතිරි බඩු ගොඩ බානවාය කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ කොළඹ වරායේ තිබුණු තදබදය ගැන අපි හැමෝම දන්නවා. නැවක් ආවොත් බඩු බාන්න turn එක එන තුරු සති දෙකක් තුනක් ඉන්න ඕනෑ; වරායෙන් පිටත නැංගුරම් දමා ගෙන ඉන්න වෙලා තිබුණා. නමුත් අද ඒ තත්ත්වය නැති වෙලා තිබෙනවා. නිදහස් වරායක් විධියට ඒ ගොල්ලන් ඉතාමත් කැමැත්තෙන් හම්බන්තොට වරායට යනවා. ඒ විතරක් නොවෙයි. කලින් ලංකාවට ආවේ නැති නැව් හම්බන්තොට වරාය නිසා දැන්

[ගරු මහින්ද අමරවීර මහතා]

අලුතෙන්ම එන්න පටන් ගෙන තිබෙනවා. නැව් සමාගම්වලට බදු නිදහස ආදී යම් යම් සහන ලබා දීලා තිබෙනවා. ඒ නිසාවෙන් ඒ නැව් සමාගම්වලට ආකර්ෂණීය වරායක් බවට අද හම්බන්තොට වරාය පත් වෙලා තිබෙනවා. ඒ නැව් සමාගම් බොහොම සතුටෙන් තමයි හම්බන්තොට වරායට නැව් ගෙන යන්නේ කියන එකත් අපි මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් විධියට ගත්තාම අපට තිබෙන ප්‍රධාන අභියෝගය තමයි මේ රට දියුණු රටක් බවට පත් කිරීම. යුද්ධය අවසාන කිරීමෙන් අපට තිබුණු ප්‍රධාන අභියෝගය අපි ජය ගත්තා. දැන් තිබෙන්නේ මේ රට දියුණු කිරීමේ අභියෝගයයි. ඒකට කොච්චර අභියෝග තිබෙනවාද කියා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක් විධියට මම දන්නවා. අපේ රටේ ආයතන ගණනාවක් පාඩුවට යනවා. අපි ක්‍රම ගණනාවකින් සහනාධාර දෙනවා. අප සහනාධාර කොච්චර දෙනවාද කියා කල්පනා කළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහනාධාර දීමටම වෙනම නිලධාරි කණ්ඩායමක් පත් කරලා පඩි ගෙවන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. අපි පොහොර සහනාධාරයක් දෙනවා. ඒක ගොවියාට දෙන්න ඕනෑ. රජ කාලයෙන් පසු, පරාක්‍රම යුගයෙන් පසු අද පළමුවන වතාවට අපේ රට සහලින් ස්වයංපෝෂිත වෙලා අතිරික්ත සහල් ප්‍රමාණයක් අපේ රට තුළ ඇති වෙලා තිබෙනවා. ගොවියාට දෙන සහනය ඒ වාගේම ගොවියා උනන්දු කරවීම මත තමයි ඒ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. දැන් අපේ රටේ වී නිෂ්පාදනය වැඩි වෙලා පිට රටවලට සහල් යවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ සහනාධාර ලබා දෙන්න අපේ නිලධාරීන් විශාල වෙහෙස මහන්සියක් දරන බව අපි දන්නවා. ඒ වාගේම සමෘද්ධි සහනාධාරය අපි ලබා දෙනවා. ඒකට නිලධාරීන් කණ්ඩායමක් සිටිනවා. ඊට අමතරව මේ රජය ධීවරයන්ට ඉන්ධන සහනාධාරයක් ලබා දෙනවා. ඒ වාගේම පාසල් දරුවන්ට නිල ඇඳුම් ලබා දීම, පාසල් දරුවන්ට දිවා ආහාර වේල් ලබා දීම, කිරි වීදුරුවක් ලබා දීම, ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීම ආදී විධියට ගත්තාම සහනාධාර රාශියක් අපේ රජය ලබා දෙනවා. ඒවා ලබා දෙන්නම නිලධාරීන් විශාල පිරිසකට මහන්සි වෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා සහනාධාර ලබා දීමේ ක්‍රමය විධිමත් කරන්න, පහසු කරන්න දැන් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. මේ එකක්වත් අඩු කරන්න කප්පාදු කරන්න රජයේ අදහසක් නැහැ. මේවා මීට වඩා විධිමත් විධියට ජනතාවට ලබා දෙන වැඩ පිළිවෙළක් කෙරෙහි දැන් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට සහනාධාර වෙනුවෙන් කාඩ් පතක් ජනතාව වෙත ලබා දීම කෙරෙහි දැන් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ කාඩ් එක දීලා සහනාධාර ලබා ගන්න පුළුවන් ආකාරයේ පහසුවක් ලැබෙන විධියේ වැඩ පිළිවෙළකට රජය යන්න සූදානම් වෙනවාය කියන එකත් මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රාජ්‍ය ආයතන ගණනාවක් පාඩුවට දුවනවා. ඒ සමහර ආයතන සේවාවන් උදෙසා අනිවාර්යයෙන් පවත්වාගෙන යන්න අපිට සිද්ධ වෙලා තිබෙනවා. පසු ගිය දා දුම්රිය වැඩ වර්ජනයක් තිබුණා. දුම්රිය වැඩ වර්ජනයෙන් ලක්ෂ 40ක ලාභයක් ලැබුණා කියා සඳහන් වුණා. අපි අහලා තිබෙන්නේ වැඩ වර්ජනයක් පැවැතියාම ඒ ආයතනය පාඩු වෙනවාය කියායි. දුම්රිය වැඩ වර්ජනයෙන් ලාභ ලබන්න හේතුව මොකක්ද? දුම්රිය දුවන්නේ නැති වෙන්න නැති වෙන්න ලාභ ලබන මට්ටමක් තිබෙන්නේ; දුවන්න දුවන්න පාඩු ලබන මට්ටමක් තිබෙන්නේ. නමුත් අපිට ඒක වළක්වන්න පුළුවන්කමක් නැහැ. දුම්රිය සේවාව වෙනුවෙන් අති විශාල මුදලක් රජය පාඩු දරනවා; වාර්ෂිකව වියදම් කරනවා. ඒ වාගේම ලංගම නඩත්තු කරන්න, අපේ බස් ටික නඩත්තු කරන්න, බස් සේවාව ලබා දෙන්න විශාල මුදලක් අපේ රජය වැය කරනවා. ඒ වෙනුවෙන් විශාල වැයක් දරන්න වෙනවාය කියන එක අපි දන්නවා. ඒක පාඩුවට දුවන්නේ. ඒ වාගේම ඛනිජ තෙල් ලබා දීම සඳහා විශාල සහනාධාරයක් ලබා දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක රජයට විශාල බරක් විධියට තිබෙනවා. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු ලබන මට්ටමට ඇවිත් තිබෙන එක හේතුවක් බවට ඒක පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විදුලි බලය ලබා දෙන්න මෙතෙක් කලක් විශාල සහනාධාරයක් ලබා දුන්නා. දැන් එහි යම් ප්‍රමාණයක අඩු කිරීමක් කර තිබෙනවා. එය රටට දරා ගන්න බැරි තත්ත්වයක තිබෙනවාය කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් ආයතන ගණනාවක් තිබෙනවා. පාඩු දරාගෙන හෝ ජනතාවට සහන ලබා දීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම ඒවා නඩත්තු කළ යුතු වෙනවා. ඒ වාගේම සමහර ආයතන වසා දැමිය යුතුයි කියලා දැන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවධානයට යොමු වෙලා තිබෙනවා. ඒ නිසා එම නිර්දේශය ලබා දෙන්න අපි තීන්දු කරලා තිබෙනවා. එම ආයතන පවත්වාගෙන යෑමෙන් රටටවත්, ජනතාවටවත්, රජයටවත් කිසිම වාසියක් අත් වෙලා නැහැ. ඒවා බරක් විතරයි. එම නිසා එවැනි ආයතන ගණනාවක් වසා දමන නිර්දේශ ඉදිරි කාලය තුළදී රජයට ලබා දෙන්න පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විධියට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ තවත් ආයතන ගණනාවක් ඒකාබද්ධ කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, පොහොර ගෙන්වන ආයතන ගණනාවක් තිබෙනවා. ඒවා ඒකාබද්ධ කිරීමේ හැකියාව තිබෙනවා. ඒ තුළ සමහර කුඩා කුඩා සමාගම් තිබෙනවා. අපට ඒවා ඒකාබද්ධ කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේ ක්‍රමවේද පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මේ වන විට සාකච්ඡා කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිතුමා ඉතාමත් ස්වාධීනව කටයුතු කරනවා. එතුමා වග කියන්නේ මේ පාර්ලිමේන්තුවට විතරයි. ඔහුගේ බලතල තවත් වැඩි කළ යුතුයි. ඒ පිළිබඳව කිසිම තර්කයක් නැහැ. හදිසි අවස්ථාවක කිසිම දැනුම් දීමකින් තොරව ආයතනයකට ඇතුළු වෙලා පරීක්ෂා කිරීමේ හැකියාව, බලතල ඔහු සතුව තිබුණත් එය ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව තිබෙනවා. සමහර වෙලාවට දැන් විගණකාධිපතිතුමාගේ නිලධාරියකුට ආයතනයකට යන්න ඕනෑ වුණාම එම ආයතනයෙන් වාහනයක් ගෙන්වා ගෙන තමයි ගිහිල්ලා පරීක්ෂණ කරන්නේ. එවැන්නකට ඉඩ තියන්නේ නැතුව, ඉදිරියේදී හදිසි කඩා පැනීම්වලට අවශ්‍ය බලතල සහ අවශ්‍ය පහසුකම් ලබා දීම කෙරෙහි අපේ අවධානය යොමු වෙලා තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - COPE එක - විධියට අපි එවන් අවස්ථා ගණනාවකට සම්බන්ධ වුණා. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා සෝදිසි කිරීම් කළා. අපි ඒවා හදිසි පරීක්ෂාවන්ට ලක් කළා. එසේ පරීක්ෂාවන්ට ලක් කිරීමේ ප්‍රතිඵල අද අපට දකින්නට ලැබෙනවා. එවැනි ආයතන බොහොමයක් අද ඒවායේ තිබුණු අඩු පාඩු සම්පූර්ණ කර ගෙන නිවැරදි මාවතකට ඇවිල්ලා තිබෙනවාය කියන එක අපට ආඩම්බරයෙන් සඳහන් කරන්න පුළුවන්. ඒ සඳහා රටේ රාජ්‍ය නායකයා විධියට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අපට නිරන්තරයෙන් සහයෝගය ලබා දෙනවා. ඒ කටයුතුවලට එතුමා කිසිම වෙලාවක අපට විරුද්ධ

වෙලා නැහැ. එම ආයතන පිළිබඳව සොයා බලන්න එපා කියලා නැහැ. එම ආයතන පිළිබඳව අධීක්ෂණය කරන්න එපා කියලා නැහැ. අපි එතුමාගේ අමාත්‍යාංශයට අයත් ආයතනවල නිලධාරීන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ගෙන්වනවා. ඒ වාගේම අනෙක් අමාත්‍යාංශවල නිලධාරීන් ගෙන්වනවා. එසේ ගෙන්වලා අපි ඒ අයගෙන් ප්‍රශ්න කරනවා විතරක් නොවෙයි, අපි ඒ අයට යෝජනා ලබා දීලා ඒවා ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳවත් පසු විපරම් කිරීමක් සිදු කරනවාය කියන එකත් සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විධියට මීට පසුව අපේ බලාපොරොත්තුව තමයි මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට වාර්තාවක් දෙන්නත්, ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන්නත් අවශ්‍ය පියවර ගැනීම. ඊයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි සභාපතිතුමාගේ -ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාගේ- නායකත්වය යටතේ එම තීරණය ගත් බවත් මා ඉතාමත් සතුටින් සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වැඩි යමක් කථා කරන්න මම කාලය ගන්නේ නැහැ. අපි ඉතාමත් පැහැදිලිව සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. විගණකාධිපතිතුමාගේ වැටුප් වැඩි වීම පිළිබඳව කවුරුත් විරුද්ධ වෙන්නේ නැහැ කියා මම හිතනවා. ඒක කළ යුතුයි වාගේම, විගණකාධිපතිතුමාගේ බලතල වැඩි කිරීමත් සිදු කළ යුතුයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මෙතෙක් ආ ගමන ගැන බලන කොට එන්න එන්නම එහි තත්ත්වය වර්ධනය කර ගත්තා වාගේම ඉදිරියේදීත් එය තවත් වර්ධනය කර ගෙන රාජ්‍ය ආයතන ටික, සංස්ථා ටික ලාභ ලබන මට්ටමකට ගෙන ඒම දක්වා කටයුතු කරන්න පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අපි පසු පසින් ඉඳගෙන ඒ වෙනුවෙන් මග පෙන්වීම් කරන බවත් සඳහන් කරනවා.

මෙම විවාදයේදී බොහෝ මන්ත්‍රීවරු ඉතාමත් හොඳ අදහස් දැක්වූවා. කිහිප දෙනෙක් විතරක් පෞද්ගලික පහර ගැසීම්වලට, ඒ වාගේම රජය විවේචනය කරන්නට මෙම විවාදයට අදාළ නැති කාරණ ගෙනාවත්, සමස්තයක් විධියට ගත්තාම හොඳ විවාදයක් ගෙන යන්න කටයුතු කළ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට රජය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු නිමල් සිරිපාල ත සිල්වා)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රදු.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)

The Adjournment Motion to be moved by the Hon. Alhaj A.H.M. Azwer. Before that, will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (පේරාසිරියර්) ජී.එල්. පීරිස් - වෙළිනාට්ට ලුවල්කළ් අමෛච්චර්)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

I propose that the Hon. Janaka Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරගු, මාණ්පුමිකු ආර්. යෝකරාජන් අවර්කළ් *අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු* ජානක පණ්ඩාර *අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.*

Whereupon THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව
பொதுநலவாய அரச தலைவர்கள் மகாநாடு
COMMONWEALTH HEADS OF GOVERNMENT MEETING

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර්)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Presiding Member, I move,

"The 58th Session of the Commonwealth Parliamentary Association was held very successfully in Sri Lanka under the guidance of the Hon. Speaker.

Preparations are being made to hold the Commonwealth Heads of Government Meeting in Sri Lanka this year. It is of utmost importance that the general public is made aware of the significance of holding an international conference of this nature in the country. Therefore, it is moved in this august House that, programmes for making the public aware of the 23rd Commonwealth Heads of Government Meeting be implemented at national level."

I **table*** the Sinhala and Tamil versions of the Motion to be included in the Hansard. Before I commence, the Hon. (Ven.) Ellawala Medhananda Thero would second the Motion and after that I would carry on.

සභාමේසය මත තබන ලද යෝජනාවේ සිංහල හා දෙමළ පරිවර්තන:
**சபாபீடத்தில் வைக்கப்பட்ட பிரேரணையின் சிங்கள மற்றும் தமிழ் மொழிபெயர்ப்புகள்:*

**Sinhala and Tamil versions of Motion tabled:*

"2012 වර්ෂයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ 58 වන සැසිවාරය ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේදී ඉතා සාර්ථකව පැවැත්විය.

මෙම වසරේ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට කටයුතු කරමින් පවතී. මෙවැනි ජාත්‍යන්තර සමුළුවක් රට

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

තුළ පැවැත්වීමේ වැදගත්කම පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම ඉතා වැදගත් වේ. එබැවින් 23 වන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සම්බන්ධයෙන් ජාතික මට්ටමින් මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

"2012ஆம் ஆண்டில் பொதுநலவாய நாடுகளின் பாராளு மன்றச் சங்கத்தின் 58வது கூட்டத்தொடர் கௌரவ சபாநாயகர் அவர்களின் தலைமையில் இலங்கையில் மிகவும் வெற்றிகரமாக நடைபெற்றது.

இவ்வாண்டில் பொதுநலவாய நாடுகளின் அரச தலைவர் களின் மாநாட்டை இலங்கையில் நடத்துவதற்கான ஏற்பாடுகள் நடைபெறுகின்றன. இத்தகைய சர்வதேச மாநாடொன்று நாட்டினுள் நடைபெறுவதன் முக்கியத்துவம் பற்றி மக்களை விழிப்புணர்வூட்டல் மிக முக்கியமாகும். ஆகையால் 23வது பொதுநலவாய நாடுகளின் அரச தலைவர்களின் மாநாடு தொடர்பாகத் தேசிய மட்டத்தில் பொதுமக்களை விழிப்புணர் வூட்டுவதற்கான வேலைத்திட்டமொன்றை நடைமுறைப் படுத்துதல் பொருத்தமாகுமென இச்சபைக்குப் பிரேரிக் கின்றேன். "

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Presiding Member, Sri Lanka, which was called earlier "Seylan", "Serendib" and "Taprobane" has a long, colourful and unenviable relationship with foreign states from time immemorial. This land, "The Pearl of the Indian Ocean", has attracted the Arabs even before the advent of the Holy Prophet in Arabia. The world famous Globe-Trotter, Ibn Battuta of Morocco landed on this island of serenity and put little Sri Lanka - or Ceylon at that time - on the world map. Then, Sir, a great seafarer, Fa-Hien Bhikku from China also made a great impact on the island in the global scene. The Siamese Bhikku brought *Upasampada* from Thailand and so is our intimate relationship with Burma throughout the ages.

After such an intimate and long relationship with the countries the world over, preparations are now being made to hold the Commonwealth Heads of Government Meeting - CHOGM - in November, 2013 in Sri Lanka. Sir, Heads of Governments of 52 member countries have been invited for this Conference. The theme of the CHOGM, "Growth with equity: inclusive development" has been proposed by His Excellency President Mahinda Rajapaksa. On the margins of the CHOGM, the Commonwealth Business Forum, the Commonwealth Youth Forum and the Commonwealth People's Forum will also take place. The Commonwealth Business Council - CBC - envisages that there will be approximately 1,000 participants from which about 500 would be from abroad. Non-Commonwealth countries have also been invited to participate in this event. About 80 projects in Sri Lanka have been detailed to be promoted among the participants. So, Sir, the CBC envisages that generation of investment business of about US Dollars two billion to Sri Lanka. These are the benefits that are going to accrue to our island as a result of holding the Commonwealth Heads of Government Meeting.

Now, Sir, it is significant to note what our Excellency the President has promised in "Mahinda Chintana" at the last General Election.

I quote from the subheading, "A Non-aligned foreign policy" on pages 56 and 57 of "Mahinda Chintana - Vision for the Future: A new Sri Lanka - A Brighter Future",

"I will continue Sri Lanka's non-aligned foreign policy. During the last four years we witnessed the benefits of maintaining friendly relations with India, Japan, China, Pakistan and other Asian countries. I am committed to continue these friendly relations in the political, economic, defence, trade and cultural arena.

I will maintain the dignity of my country in foreign relations and will initiate a new programme to forge relations with countries."

This is what His Excellency Mahinda Rajapaksa promised to the nation at the last General Election. Today we see the fruition of its full results. Although there have been various vicious attempts made by certain quarters - NGOs, the diaspora and even local conspirators - to dissuade Commonwealth countries from attending the CHOGM, nothing worked as they dreamt; everything is going very smooth.

The Commonwealth is a voluntary association of 54 countries that supports each other and works together towards shared goals in democracy and development. The Commonwealth is a home to two billion citizens of all faiths and ethnicities and includes some of the world's largest, smallest, richest and poorest countries. Over half of its citizens are 25 or under. This is the most significant factor to note.

Now, when you hold this Conference here, these Heads of Nations will represent two billion citizens of the world. The Association has roots as far back as the 1870s. It was reconstituted in 1949 when the Commonwealth Prime Ministers met and adopted the London Declaration where it was agreed that all member countries would be freely and equally associated. The Commonwealth believes in the best democracies achieved through partnership of government business and civil society. When we are holding this in our soil, it is a very opportune moment for us to showcase the post-conflict developments in Sri Lanka and the opportunity available for economic co-operation.

God has given this opportunity for us! The values are protected at Government level by the Commonwealth Ministerial Action Group.

So, my endeavour today, through this Motion, is to make an appeal to the Government to make our people understand and realize the value of such a massive Heads of Governments converging here because it is such a gigantic task to achieve by a small country like ours. I believe this will be the most significant event after the Non-Aligned Summit which took place in 1976 at the newly-built Bandaranaike Memorial International Conference Hall under the Chairmanship of the late Hon. (Mrs.) Sirimavo Bandaranaike. This certainly will help our nation to leap forward. We have to admit that all the countries are convinced that there is peace in this country and this country has a future. We can impart the rich qualities of our histroy, culture and heritage to the West, the East and to the Middle-East countries. That is why I say that no power will be able to dissuade those countries from attening this Commonwealth Moot. All those will be simply futile attempts.

Sir, I would now like to quote St. 60 of "Everlasting Mercy" by Masefield, this important axiom:

"States are not made, nor patched; they grow,
Grow slow through centuries of pain,
And grow correctly in the main,
But only grow by certain laws
Of certain bits in certain jaws."

Then, look at what is stated in Section 6 of "Annals" - Book iii by Tacitus on Commonwealth. I quote:

"Chiefs are mortal, the commonwealth is eternal."

Then, again, Edmund Burke in his speech in the House of Commons on 11th February, 1780 beautifully portrays the beauty of the Commonwealth. He said, I quote:

"Individuals pass like shadows; but the commonwealth is fixed and eternal."

So, we are going to have eternal peace and prosperity in this country after holding the CHOGM.

I am very much confident that our amiable, genius, genial, great Professor, the Hon. G.L. Peiris, who is heading the foreign sector of our country as the Minister of External Affairs has taken all the initiatives and he has left no stone unturned, to make this momentous event a success that is so well deserved.

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව මෙරට පැවැත්වීමෙන් අපට වන වාසිය මොකක්ද? [බාධා කිරීමක්] ගරු වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේත් ඒක කියලා දෙන්න ඕනෑ, plantation sector එකේ ඉන්න අයට. ඒ ගැන අපේ ජනතාවට නිවැරදිව පැහැදිලි කර දෙන්න ඕනෑ. එදා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය නොබැඳි ජාතීන්ගේ සමුළුව පවත්වන අවස්ථාවේදී ඒකට "කාපිරි සමුළුව" කියලා අවලාද නැඟුවා. ඒ විධියට තමයි අපේ සමහර මිනිසුන් තවම හැසිරෙන්නේ.

Some people who are born in this country, breathe the air of this country, and drink the water of this country, go abroad and say, "Do not come to Sri Lanka, do not give aid and assistance to Sri Lanka". Certain other devious methods they adopt unashamedly. His Excellency the President himself has said, "Of course, we are getting loans. They are well spent for development projects. Which is the country that do not get loans?" Even America is supposed to be borrowing loans from China now. The impression that has been created in China about Sri Lanka is amazing.

Recently, I had the good fortune of going to China with His Excellency the President on his official visit. The Minister of External Affairs and others were in this entourage. The Chinese are very convinced about Sri Lanka. A record number of bilateral relationship and "Leader to Leader" agreements were signed on that occasion. Not only that, they are very convinced about the progress and development that has been made after 30 years of prolonged war, which the world has not seen in recent history. The country is progressing tremendously. So, they are willing to help. හොඳට වැඩ කරනවා නම්, ලාභ ලබන්න පුළුවන් ව්‍යාපාරයක් කරන්නට පුළුවන් නම් කවුරුත් උදව් කරනවා; ණය දෙනවා. අන්න ඒකයි අපට ලැබෙන වාසිය. I have the "Mahinda Chintana" here with me. The Chinese Government is so convinced that they have translated the "Mahinda Chintana" fully into the Chinese language.

Sir, I must relate this story to you:

The Hon. (Prof.) G.L. Peiris, Minister of External Affairs held a press conference after signing the agreements between our Leader and the Chinese Leader, Xi Jinping. At that conference, a young talented Chinese female journalist asked, "What is 'Mahinda Chintana'?" They know English very well. They have mastered the language. They are masters at everything. At that time, the Hon. Minister told Ambassador Ranjit Uyangoda to please make available to them the Chinese translation of the "Mahinda Chintana". The "Mahinda Chintana" has been translated into the Chinese language by Professor Ma Zhongwen of Jinan University in Guangzhou. Sir, this is an amazing story of modern Sri Lanka. Where on this earth has a policy statement of a leader or a political party been translated into another language and published as a book in this country? Later, Ambassador Ranjit Uyangoda told me that copies of the "Mahinda Chintana" have been distributed to them and they are doing an in-depth study about the significance of the "Mahinda Chintana."

They want to study how this revolution - a miracle - has taken place in Sri Lanka. Therefore, we all are very

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

happy that the Heads of Government from Commonwealth nations are coming to Sri Lanka. Not only that, Sir, as the Head of the host country, His Excellency President Mahinda Rajapaksa will be entitled to be the Chairman of the Commonwealth for the next two years. This will grant him an unparallel opportunity to be a leader on the world stage. He will be the leader of the 54 Commonwealth nations for the next two years. Feel jealous, if you like.

තමුන්නාන්සෙලා උදේ ඉඳන් හැන්දෑව වෙන කල් ක්‍රෝධය වපුරනවා; ඊර්ෂ්‍යාව වපුරනවා. කාර් ගෙනෙනවාය කියලා කිව්වා. ලොකු, ලොකු කාර් ගෙනෙනවාය කියලා කිව්වා. ඒ කාර් එක කොච්චිකඩේ ඉඳන් කොටහේන දක්වා දිගයි කියලා කිව්වා. දැන් ඒ කාර් ගැන කථා කරන්නේ නැහැ. දැන් කාපිරි කෙනෙකුගේ නමක් හෝ සුද්දෙකුගේ නමක් හෝ කියා නටන්න පටන් ගනීවි, සමහර විට.

So, Sir, the Heads of Government will participate in conferences and visit various parts of the country. The main meetings will be held in Colombo, Kandy and Hambantota - the new "land" of Sri Lanka. Our economic revival will be showcased to the world through Hambantota, for sure.

There was a recommendation made on Cricket. I would also agree with it. The Commonwealth has a wealth of cricketers. It is the Queen's country, the Great Britain, that introduced Cricket to the world sports. England, New Zealand, Australia, Zimbabwe, India, Pakistan and Bangladesh all play serious Cricket. They can play a match - Sri Lanka Vs. the rest of the Commonwealth countries. We welcome such a move. We understand that such a move is being very seriously worked out.

ගරු අර්ල් ගුණසේකර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர -பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Earl Gunasekara - Deputy Minister of Plantation Industries)
A business forum will also be there.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Yes, a business forum will also be there. Now, you can see we are inviting foreign investors to our country. They would be going to Jaffna through the A9 road or they would fly. What would they see? They would see a completely different land of revival and survival. Last time when a Commonwealth Parliamentary Delegation came here, I had the opportunity of accompanying them to Jaffna through the A9 road. I took the microphone in that luxury coach on the way and gave a full description of the landscape before and after the war. The Hon. Abdulla Shahid, the Speaker of the People's Majlis of Republic of Maldives and some delegates who came from Canada told me "We want to come here with our families to see Jaffna and enjoy our holiday next time".

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
Including the "Mahinda Chintana".

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Yes, I explained to them that all these great strides made in the field of development in the North has taken place after the implementation of the "Mahinda Chintana". Then, of course, they said, "We want to come here with our families to see Jaffna and enjoy a holiday". They were convinced to that extent.

I was talking about cricket. His Excellency the President is very eager to recruit talented cricketers from Jaffna to the National Team. Three lads have already been selected from Jaffna and are being coached in Colombo. A coaching camp was held in Colombo with the great speedsters Chaminda Vass and Ravindra Pushpakumara.

This is the new world we see! As I told you the other day, people who cannot see the good side of life are really blind, not the people who are blind at their birth. So, we see the road is open for us. We see a great future for us and I want the Hon. Minister to exercise some more powers and also to put more pressure. I am very much convinced and I know the talented, able and amiable staff that the Secretary to the Ministry of External Affairs, Mr. Karunatilaka Amunugama has. I have accompanied them on several visits with our President to other countries. They are very clever; they can match - may I say - any able bureaucrats or foreign service staff in any other country. You could see that they are perhaps unmatched and they are the wealth of the Ministry of External Affairs. So, we are going to have a wealth of expertise, knowledge and development.

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)
ඇත්ත තත්ත්වය බලා ගන්න පුළුවන්.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඇත්ත තත්ත්වය කියන්න ඕනෑ, ඔබතුමා කියනවා වාගේ. අනාගතයේදී අපට ලැබෙන ලාභ ප්‍රයෝජනය මොකක්ද කියන එක එතුමන්ලාට බලා ගන්න පුළුවන්. බලා ගත්තාට පස්සේ ඒ අයම නැවත නැවතත් එන්න පුළුවන්.

Therefore, Sir, as I said earlier, it is a golden opportunity that we have. Colombo will be the centre, the Capital hosting the CHOGM. After it was held in Perth, Australia, we are going to have it here now. Therefore, Sir, I only appeal to the good senses of the Hon. Members of the Opposition, including the Leader of the Opposition, the Hon. Ranil Wickremasinghe, do not attempt to defile our culture, our status as a nation and our good name; do not spread scurrilous literature abroad.

Today, what happened when the Hon. Ranjan Ramanayake spoke? He condemned the Shariah law. It is practised in Saudi Arabia. You know, Sir, the seriousness of that statement. He should be declared an apostate. I asked the Hon. Leader of the Opposition at that time, "What do you say? Is this your party policy?" Nobody can challenge the Quranic laws, the Divine law. You can speak about or criticize Buddhist history or other history but you can never challenge or find fault with *Pirith* or *Dhammapada*. So, the Quran, in its pristine form is unchallenged in the world.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please, try to wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Okay. Therefore, Sir, I would ask them to refrain from such dubious attempts. In the name of Allah, I would say we are on the correct path and this country would be further blessed after holding the CHOGM. We hail the leadership of His Excellency President Mahinda Rajapaksa to whom Ban Ki-moon, the Secretary-General of the United Nations said - when we had a meeting with him outside the UN General Assembly - "You are a great leader that we find in Asia. I would ask you take the leadership of Asia". So, that is our proud President!

Thank you, Sir.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you very much. The next speaker is the Hon. Sri Ranga.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த ஒத்திவைப்புப் பிரேரணையில் உரையாற்றுவதில் உண்மையில் நான் மகிழ்ச்சியடைகின்றேன். இறுதி நேரத்தில் எனக்கு இந்தச் சந்தர்ப்பம் வழங்கப்பட்டிருந்தாலும் சில விடயங்களை இங்கு கூறலாமென நினைக்கின்றேன். ஆரம்ப காலகட்டத்திலே உலக நாடுகள் வேறு நாடுகளுக்கிடையிலான தொடர்புகளை பண்டமாற்று ரீதியிலே ஏற்படுத்தியிருந்தன. அதன் பின்பு கம்யூனிஸ நாடுகள் 'கம்யூனிஸம்' எனவும், சோசலிச நாடுகள் 'சோசலிஸம்' எனவும், முதலாளித்துவ - capitalist - நாடுகள் 'முதலாளித்துவம்' எனவும் பொருளாதாரத் தொடர்புகளை தங்கள் நாடுகளுக்கிடையிலே முன்னெடுத்து வந்தன. அதற்குப் பின்பு திறந்த பொருளாதாரம், மூடிய பொருளாதாரம் அல்லது கலப்புப் பொருளாதாரம் என்ற வகையிலே தொடர்புகளை ஏற்படுத்திவந்தன. ஈற்றிலே ஐக்கிய அமெரிக்கா versus ரஷ்யா என்ற வகையிலே சர்வதேச நாடுகளின் தொடர்புகள் மாறின. இந்தியா, கியூபா, வட கொரியா போன்ற நாடுகள் ரஷ்யா சார்பு நாடுகளாகவும் இலங்கை போன்ற நாடுகள் அமெரிக்கா சார்பு நாடுகளாகவும் செயற்பட்ட காலகட்டத்தில் 1977ஆம் ஆண்டு இலங்கையில் திறந்த பொருளாதாரக் கொள்கை நடைமுறைப் படுத்தப்பட்டது. அன்றிலிருந்து சர்வதேச ரீதியாக எமது நாடு பொருளாதாரத்தில் முன்னேறிவந்தது. துரதிஷ்டவசமாக அன்றிருந்த தூரநோக்கற்ற தலைவர்களின் சில நடவடிக்கைகளால் இந்த நாட்டில் இனங்களிடையே பல்வேறு வேற்றுமைகள் ஏற்பட்டதுடன், அவை இனப்படுகொலைக்கும் இனச்சுத்திகரிப்புக்கும் வழிசமைத்தன.

இன்று சிலர் 'சர்வதேச சூழ்ச்சி' பற்றிக் கூறுகின்றார்கள். சர்வதேசம் இந்த ஆட்சியைக் கவிழ்க்க முற்படுவதாகப் பறைசாற்றுகிறார்கள். சர்வதேச நாடுகள் எமது நாட்டின்மீது தங்களுடைய ஆதிக்கத்தைச் செலுத்துகின்ற நிலைமையை ஏற்படுத்தியவர்கள் யார்? நிச்சயமாக இனவாதம் பேசுபவர்கள்தான் இந்த நாட்டிலே சர்வதேசத் தலையீட்டுக்கு வித்திட்டவர்கள். இந்த உலக நாடுகள் கடந்த மார்ச் மாதம் ஜெனீவாவிலுள்ள ஐக்கிய நாடுகள் சபையின் மனித உரிமைகள் பேரவையிலே இலங்கை பற்றிய பிரேரணையை எடுத்துக்கொண்டமை அரசுக்குக் கசப்பான விடயம். அதேநேரம் எதிர்வரும் நவம்பர் மாதம் பொதுநலவாய நாடுகளின் அரச தலைவர்களின் மாநாட்டை இலங்கையில் நடத்தவிருப்பது அரசுக்கு ஓர் இனிப்பான விடயம். இதிலிருந்து ஒரு விடயத்தை இந்த அரசாங்கம் புரிந்துகொள்ள வேண்டும். சர்வதேசம் என்பது தொட்டிலையும் ஆட்டிப் பிள்ளையையும் கிள்ளுபவர்கள் என்பதைப் புரிந்துகொள்ள வேண்டும். நீங்கள் கூறுகின்ற 'சர்வதேச சூழ்ச்சி' என்பது இங்கு இடம்பெறாமல் இருக்கவேண்டுமென்றால், இங்கிருக்கின்ற மக்கள் நிரந்தரமான ஓர் அரசியல் தீர்வு பெற்று நிம்மதியாக வாழ்கின்றபொழுதுதான் அது சாத்தியமாகும். 1947ஆம் ஆண்டு இந்தியா சுதந்திரமடைந்தபோது பாகிஸ்தானை ஜின்னா கேட்டதுபோல், இந்த நாட்டில் ஜே.ஆர். ஜயவர்தன அவர்கள், Sinhala Only Actஐப் பற்றி 1944இல் தீவிர பிரச்சாரத்தில் ஈடுபட்டபொழுது சேர். பொன். இராமநாதன், சேர். பொன். அருணாசலம் போன்றவர்கள் ஒரு தனி நாட்டைக் கேட்கவில்லை. 1948ஆம் ஆண்டுக்கு முன்னர் இந்த நாட்டிலுள்ள தமிழர்கள், முஸ்லிம்கள், சிங்களவர்கள் அனைவரும் ஒற்றுமையாக இணைந்து செயற்பட்டார்கள். இலங்கை சுதந்திரம் அடையும்வரை தமிழ்த் தலைமைகள் சிங்களத் தலைமைகளுடன் ஒன்றாகத்தான் இருந்தனர். இந்த நாட்டில் அனைவரும் ஒற்றுமையாக இருக்கவேண்டும் - வாழவேண்டும் என்பதற்காக அவர்கள் அனைவரும் இணைந்து செயற்பட்டார்கள். அதன் பின்பு என்ன நடந்தது? சுதந்திரம் அடைந்த பின்பு இந்த நாட்டில் நடைபெற்ற விடயங்கள் என்ன? 'ஸ்ரீ' பிரச்சினை கொண்டுவரப்பட்டது; 'சிங்களம் மட்டும் சட்டம்' கொண்டுவரப்பட்டது. தமிழ்பேசும் மக்களின் குடிப்பரம்பலை மாற்றியமைக்கும்வகையில் சிங்களக் குடியேற்றங்கள் மேற்கொள்ளப்பட்டன. இப்படியான பல நடவடிக்கைகளினால்தான் எமது நாட்டின்மீது சர்வதேச நாடுகள் ஆதிக்கத்தைச் செலுத்தக்கூடிய நிலைமை ஏற்பட்டது. எனவே, இதற்கு யார் காரணம்?

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

இந்தச் சபையில் கௌரவ அமைச்சர் ஜீ.எல். பீரிஸ் அவர்கள் இருக்கின்றபொழுது சில விடயங்களைப் பேசலாமென்று எண்ணுகின்றேன். நான் கொழும்புப் பல்கலைக்கழகத்தில் படித்த காலப்பகுதியில் ஜீ.எல். பீரிஸ் அவர்கள் அங்கு துணைவேந்தராக இருந்தார். எமது பல்கலைக்கழகத்தில் துணைவேந்தராக இருந்தவர் அமைச்சராக வந்தபொழுது, நான் ஒரு பல்கலைக்கழக மாணவன் என்ற ரீதியில் அன்று சந்தோசமடைந்தேன். அப்பொழுது அவர் Ethnic Affairs and National Integration என்ற அமைச்சைத்தான் பொறுப்பேற்றார். அவருடைய Deputy Minister - பிரதி அமைச்சராக கௌரவ டிலான் பெரேரா அவர்கள் இருந்தார். கௌரவ அமைச்சரவர்களே, அன்று நீங்கள் இந்த நாட்டிலுள்ள சமூகங்களை இணைப்பதற்குப் பாரிய முயற்சிகளை மேற்கொண்டீர்கள்; பாரிய பணிகளை ஆற்றினீர்கள். ஆனால், இன்று நீங்கள் வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருக்கின்றபொழுது, சமூகங்கள் வெவ்வேறாகப் பிரிக்கப்பட்டு, சமூகங்களிடையே குரோதங்கள் வளர்க்கப் படுகின்றன. இவை என்ன காரணத்துக்காகச் செய்யப்படுகின்றன? சில கட்சிகள் தாங்கள் இழந்த செல்வாக்கை மீண்டும் பெறுவதற்காக - கட்டியெழுப்பு வதற்காக - அல்லது தங்களால் நடத்த முடியாத அமைச்சுக்களில் தாம் இழந்த செல்வாக்கை மீண்டும் கட்டியெழுப்புவதற்காகத்தான் இவ்வாறு செய்கின்றார்கள். சர்வதேசம் எமது நாட்டின்மீது அழுத்தங்களைப் பிரயோகிக்கின்றது என்று நீங்கள் கூறுகின்றீர்கள். சர்வதேசம் பொதுநலவாயம் என்று கூறி உங்களுக்கு வலது கையால் இனிப்பைத் தருகின்றது. மார்ச் மாதத்தில் மனித உரிமை மீறல்கள் என்று இடது கையால் கசப்பைத் தருகின்றது. எனவே, நீங்கள் சர்வதேசத்தின் இந்தப் பின்னலிலிருந்து - அழுத்தங்களிலிருந்து விடுபடவேண்டுமாயின், இனப் பிரச்சினைக்கு ஒரு சிறந்த தீர்வுத் திட்டத்தை முன்வைக்க வேண்டும். அப்பொழுதுதான் சர்வதேசத்தின் சூழ்ச்சியிலிருந்து நாட்டைக் காப்பாற்ற முடியும்.

கௌரவ அமைச்சர் அவர்களே, அன்று உங்களுடைய செயலாளராக இருந்த திரு. ஷிரால் லக்திலக்க என்பவர் தற்பொழுது மாகாண சபை உறுப்பினராக இருக்கின்றார். அதேபோல, அன்று உங்களுடைய இன்னொரு செயலாளராக இருந்த தயாசிறி ஜயசேகர அவர்கள் இன்று பாராளுமன்ற உறுப்பினராக இருக்கின்றார். காலஞ்சென்ற நீலன் திருச்செல்வம், கௌரவ சம்பந்தன் போன்றவர்கள் முன்னாள் ஜனாதிபதி சந்திரிகா அம்மையார் அவர்களுடைய ஆட்சிக்காலத்தில் உங்களுடைய நெருங்கிய நண்பர்களாக இருந்தார்கள். அன்று நீங்கள் இந்த நாட்டிலே ஓர் அரசியல் தீர்வை முன்வைத்து, சர்வதேசத்தின் தலையீடுகள் இல்லாமல் நாட்டுக்குள்ளேயே ஒரு தீர்வைக் காண்பதற்காக பல முன்னணி நடவடிக்கைகளை எடுத்தீர்கள். ஆனால், இன்று எந்தவிதமான நடவடிக்கையும் இல்லாமல் சமூகங்கள் பிரிந்துபோகின்ற நிலைமை காணப்படுகின்றது. நீங்கள் இலங்கையின் இனப்பிரச்சினை வரலாற்றுடன் பாரிய தொடர்பைக் கொண்டவர். அதாவது 1994ஆம் ஆண்டிலிருந்து இன்றுவரை இனப்பிரச்சினைக்கான பேச்சுவார்த்தைகளில் நேரடியாகச் சம்பந்தப்பட்டவர் என்றவகையில் இதற்கான ஒரு தீர்வைக் காண்பதில் உங்களுக்குப் பாரிய பங்கு இருக்கின்றது.

இதைவிட, தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்தவுடன் விடுதலைப் புலிகளுடன் இடம்பெற்ற பேச்சுவார்த்தையின் போது உங்களை அரசின் சார்பில் பிரதிநிதியாக அனுப்பவேண்டாமென்று இருவர் மூலமாகக் கோரிக்கை விடுக்கப்பட்டது. இதனை நான் இந்தச் சபையிலே கூறியாகவேண்டும்; இது ***ஹன்சாட்*** அறிக்கையில் பதியப்படவேண்டும். விடுதலைப் புலிகளின் பேச்சாளரான தத்துவாசிரியர் கலாநிதி அன்ரன் பாலசிங்கம் அவர்கள் அப்பேச்சுவார்த்தைக்கு வருகின்றபடியால், ஜீ.எல். பீரிஸ் அவர்களை அனுப்பாதீர்கள் என்று அவ்வியக்கத்தின் அரசியல் பொறுப்பாளர் சு.ப. தமிழ்ச்செல்வன் ஜனாதிபதியிடம் ஊடகவியலாளர் திரு. வித்தியாதரன் ஊடாகக் கோரிக்கை விடுத்திருந்தார். அதேபோல ஜே.வி.பீ.யைச் சேர்ந்த விமல் வீரசவன்ச அவர்களும் ஜனாதிபதியிடம் உங்களை அப்பேச்சுவார்த்தைக்கு அனுப்பவேண்டாமென்று கோரிக்கை விடுத்திருந்தார். அதனடிப்படையில் அப்பேச்சுவார்த்தைக்கு உங்களை அனுப்பவில்லை. நீங்கள் அன்று தமிழ்த் தலைமைகளுடன் அப்படியான நெருங்கிய தொடர்பினை வைத்திருந்தீர்கள். இன்று இலங்கையின் உள்நாட்டு விவகாரங்களில் சர்வதேச நாடுகள் சும்மா தலையீடு செய்யப்போவதில்லை என்பதும் மாறாக, அவர்கள் தங்களுடைய நலன்கள் சார்ந்த விடயங்களுக்காகத்தான் நமது நாட்டை நிச்சயமாகப் பயன்படுத்துவார்கள் என்பதும் உங்களுக்குத் தெரியும்.

முன்னர் சர்வதேச கம்யூனிஸ நாடுகளுக்கிடையில் தொடர்புகள் இருந்துவந்தன. பிறகு capitalist economy - மூடிய பொருளாதாரம் என்ற அடிப்படையில் அது மாற்றமடைந்தது. ஆனால், இன்று எந்தெந்த நாட்டில் தங்களுக்கு எவ்வளவு சந்தைப்படுத்தல் வாய்ப்புக்கள் இருக்கின்றன என்பதைத்தான் பார்க்கின்றன. ஏன், இந்தியா மற்றும் சீனாவைப் பற்றி நாங்கள் பேசுகிறோம். இன்று இரண்டு பில்லியனுக்கு மேற்பட்ட சனத்தொகையை இந்தியாவும் சீனாவும் கொண்டிருக்கின்றன. அதாவது இன்று உலக சனத்தொகை கிட்டத்தட்ட 7.7 பில்லியனாக இருக்கின்றபொழுது, அதிலே 2 பில்லியனுக்கு மேற்பட்ட சனத்தொகையை இந்தியாவும் சீனாவும் கொண்டிருக்கின்றன. இதனால்தான் இன்று நாங்கள் எல்லோரும் இந்தியாவும் சீனாவும் சர்வதேச வல்லரசு நாடுகளின் பட்டியலில் இருக்கின்றன என்று சொல்கின்றோம். எனவே, இன்று நாடுகளுக்கிடையிலான தொடர்புகள் அந்தந்த நாட்டிலுள்ள சந்தைப்படுத்தலின் அடிப்படையிலேயே மேற்கொள்ளப் படுகின்றன. தங்களுடைய பொருட்களை வாங்குவதற்கான consumer - நுகர்வோர் எந்த நாட்டில் இருக்கின்றார்கள் என்பதை வைத்துத்தான் இன்று சர்வதேசத் தொடர்புகள் வியாபித்திருக்கின்றன. இன்று அமெரிக்காவின் GDP, US Dollars 19 trillion ஆகவும் சீனாவின் GDP, US Dollars 4 trillion ஆகவும் இந்தியாவின் GDP, US Dollars 3 trillion ஆகவும் இருக்கின்றது. ஆகவே, இன்று இந்த மூன்று நாடுகளையும் பற்றியே பேசப்படுகின்றது. இன்று ஜப்பான், அமெரிக்காவின் Treasury இலே 6.8 வீதத்தை வைத்திருக்கிறது. ஆனால், சீனா 6.5 வீதத்தை வைத்திருக்கின்றது.

இனிவருகின்ற காலத்தில் இந்த நாட்டிலுள்ள சமூகங்கள் நிம்மதியாக வாழ வேண்டும்; வெளிநாடுகளின் தலையீடு இருக்கக்கூடாது. அரசு கூறுவதுபோல் இந்த நாட்டில் வெளிநாடுகளின் சூழ்ச்சி இருக்கக்கூடாது அல்லது வெளிநாடுகள் இந்த நாட்டின் வளங்களைச் சுரண்டக்கூடாது என்றால், தமிழ் பேசும் மக்களும் சிங்கள மக்களும் இந்த நாட்டில் ஒற்றுமையாக வாழ வேண்டும். அவ்வாறு இருப்பதாயின், நிச்சயமாக தமிழ் பேசும் மக்களின் பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும்.

பேச்சுவார்த்தையின் ஆரம்ப காலகட்டத்திலே அமைச்சர் ஜீ.எல். பீரிஸ் அவர்களுடன் நெருங்கிய தொடர்பை

වෛත්තිරුන්ත කාරණත්තුක්කාක කෙළරව සම්පන්තන්, නීලන් තිරුච්සෙල්වම් පෝන්රවර්කළුක්කු සන්තිරිකා අම්මෙයාරාල් කුණ්ඩු තුළෙක්කාත වාකනංකළ් මුතලිය high command පාතුකාප්පු කොටුක්කප්පට්ටතු. අතර්කුක් කාරණම්, අන්ත නේරත්තිල් විටුතලෛප් පුලිකළ් අවර්කළෛත් තාක්කිවිටුවාර්කළ් එන්පතනාල්තාන්. මුන්නර් අමෙච්චර් අවර්කළින් සෙයලාළරාක ඉරුන්ත තයාසිරි ජයසේකර අවර්කළ් අන්රු ඔරු නාළ් එන්නුටන් lobby ඉල් පේසික්කොණ්ටිරුන්තපෝතු ඔරු විටයත්තෛක් කූරිනාර්. අතාවතු "ඉන්රු සම්පන්තන් ඔරු පක්කත්තිලුම් අමෙච්චර් ජී.එල්. පීරිස් අවර්කළ් ඉන්නොරු පක්කත්තිලුම් ඉරුක්කින්රාර්කළ්. අන්ත නේරම් නාන් ඉතනෛක් කනවිලුම් එතිර්පාර්ක්කවිල්ලෛ" එන්රාර්.

ඉන්ත ඉනප්පිරච්සිනෛ මුටිවුක්කු වරුකින්රපොළුතු ඉන්ත නාට්ටුක්කු එතිරාකච් චර්වතේස නාටුකළ් සූළ්ච්චි සෙය්ය මුටියාමල් ඉරුක්කුම්. නාංකළ් ඔව්වොරුවරුම් ඔව්වොරු තික්කාකච් සෙන්රු ඉන්ත නාට්ටින් නලන්කළෛප් පර්රිප් පේසික්කොණ්ටු එමතු එතිර්කාලච් සන්තතික්කු ඉන්ත නාට්ටෛ උරියමුරෛයිල් විට්ටුච් සෙල්ලප්පෝකින්රෝමා අල්ලතු නටප්පතෛච් චොල්ලාමල්, පොය්යින් මායෛයිල් වාළ්න්තු, ඉනවාතක් කරුත්තුක්කළෛප් පේසි, වෙළිනාට්ටුච් චක්තිකළ් ඉන්ත නාට්ටිල් ඌටුරුවුවතර්කු වාය්ප්පළිත්තු, තමිළ් චමූකත්තෛයුම් සිංකළ චමූකත්තෛයුම් පිරික්කප් පෝකින්රෝමා එන්පතර්කු අප්පාල්, ඉන්ත නාට්ටිල් නිලවුම් පිරච්සිනෛක්කු ඔරු තීර්වෛක් කොටුත්තු තමිළර්කළුම් සිංකළවර්කළුම් මුස්ලිම්කළුම් සුයනිර්ණය උරිමෛයුටන් වාළක්කූටිය නිලෛමෛයෛ ඒර්පටුත්ත වේණ්ටුම්; තමිළර්කළ් තංකළෛත් තාංකළේ ආළක්කූටිය ආට්චියිනෛ අරසු උරුති චෙය්ය වේණ්ටුම් එන්රු කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 6.28]

ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)

(මාණ්පුමිකු (පේරාසිරියර්) ජී.එල්. පීරිස් - වෙළිනාට්ටලුවල්කළ් අමෙච්චර්)

(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වර්ෂයේ නොවැම්බර් මාසයේ පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ සමුළුව අපේ රටේ පැවැත්වීම ලංකා ඉතිහාසයේ ඉතාම වැදගත් සිද්ධියක්; මෙය අපේ රටට අතිවිශාල කීර්තියක්, ගෞරවයක් ගෙන දෙන අවස්ථාවක්. අවුරුදු 24කට පසු පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකයන් ආසියානු රටක රැස් වන ප්‍රථම අවස්ථාව මෙයයි. වර්තමානයේ පොදු රාජ්‍ය මණ්ඩලය රටවල් 53කින් සමන්විත වනවා. ඒ රටවල නායකයන්, විදේශ අමාත්‍යවරුන් සාකච්ඡා පැවැත්වීම සඳහා අපේ රටට පැමිණෙනවා. 1976 ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය සමයේ පැවැත්වුණු නොබැඳි සමුළුවෙන් පසුව අපේ රටේ පැවැත්වෙන විශාලතම ජාත්‍යන්තර සමුළුව මෙයයි. නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට අයත් වන්නේ අද්විතීය ගෞරවයක්. ඒ ගෞරවය තමයි, අවුරුදු දෙකක කාලයක් තුළ පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකත්වය අපේ රටට ලැබීම. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ නායකත්වය හොබවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ අප සලකා බැලිය යුත්තේ, මේ අවස්ථාවෙන් අපේ රටට ලැබෙන ප්‍රායෝගික වාසි කවරේද කියන එකයි. මා හිතන හැටියට මේ පිළිබඳව අපි ජනතාවට කරුණු අනාවරණය කළ යුතුයි. මේ පිළිබඳව යම්කිසි ජන මතයක් අපේ රට තුළ නිර්මාණය විය යුතුයි. ප්‍රථම කොටම මෙයින් අපට ලැබෙන ප්‍රයෝජනය තමයි, තුස්තවාදය විනාශ කර දැමීමෙන් පසු අපේ රට ලබා ගත් ප්‍රගතිය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට මෙය ඉතාම යෝග්‍ය අවස්ථාවක් වීම. අපි සියලු දෙනා දන්නවා ශ්‍රී ලංකාවට විරුද්ධව ඉතාම සැලසුම් සහගත, ද්වේෂ සහගත වැඩ පිළිවෙළක් යම් යම් කොටස් විසින් දියත් කර තිබෙන බව. ඒ විවේචනවලට, ඒ මිථ්‍යාවන්ට දෙන්න පුළුවන් ඉතාම ප්‍රබල පිළිතුර මෙයයි. අපි ආරාධනා කරනවා ලෝක නායකයන්ට, අපේ රටට පැමිණ යථාර්ථය අවබෝධ කර ගන්න කියලා; තමන්ගේ ඇසින්ම දැකලා මේ තත්ත්වයන් ගැන සොයා බලන්න කියලා; කට කථාවලට රැවටෙන්නේ නැතිව නියම තත්ත්වය වටහා ගෙන නිගමනවලට පැමිණෙන්න කියලා. මේ විධියේ අවස්ථා අතීතයේ උදා වූ සෑම විටම ඒ තුළින් අපේ රටට විශාල සෙතක් සැලසුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයට පැහැදිලිම නිදර්ශනය තමයි මාස කිහිපයකට පෙර මේ රටේ පැවැත්වුණු පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සම්මේලනය. මා හිතන්නේ, ඔබතුමාත් ඒකට සහභාගි වුණා. ඒ අවස්ථාවේදී අපේ රටට පැමිණි සමහර නායකයන් තීරණය කළා උතුරු ප්‍රදේශයට ගිහින් ඒ පළාතේ තත්ත්වය සොයා බැලීමට. කොළඹට ආවාට පස්සේ ඒ කීප දෙනෙක් මට කථා කළා ඒ අයගේ අත් දැකීම් පිළිබඳව සාකච්ඡා කරන්න.

ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තුවේ සියලුම පාර්ශ්වකරුවන්ගේ පූර්ණ සහයෝගය ලබා ගෙන, උපරිම මට්ටමෙන් ඒ උත්සවය සංවිධානය කළා. කොළඹට පැමිණි සියලුම රටවල්වල නියෝජිතයන් කිව්වේ, "අපි අහපු දේවල් අනුව අපි බලාපොරොත්තු වුණේ මීට වඩා හාත් පසින් වෙනස් දෙයක්. ඒත් අපි ගියාම නියම තත්ත්වය දැක්කා" කියායි. ඒ කියන්නේ ඒ ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ආර්ථික තත්ත්වය, ඒ ජනතාවගේ ආදායම් මාර්ග, ආර්ථිකයේ ඇති වෙලා තිබෙන පුනර්ජීවනය ඒ අය දැක්කා. ඒ සමහර අය මීට අවුරුදු 10කට, 15කට ඉස්සෙල්ලා අපේ රටට පැමිණි පුද්ගලයෝයි. එතකොට අපේ රටේ පෙර පැවැති තත්ත්වය සහ වර්තමානයේ පවතින තත්ත්වය සංසන්දනය කිරීමට ඒගොල්ලන්ට අවකාශ ලැබුණා. එය අහසයි පොළොවයි වාගෙයි. පෙර පැවැතුණේ අන්ධකාරයෙන් වැසී ගිය යුගයක්. අද ජීවත් වනවා, හෙට ජීවතුන් අතර සිටීද, නැද්ද කියන එක පිළිබඳ සැකයක් ඒ යුගයේ ඒ ජනතාවගේ සිත් සතන් තුළ තිබුණා. ඒ අයට ජීවත් වීමට මාර්ග තිබුණේ නැහැ. භයෙන් ජීවත් වුණේ. අද ඒ වාතාවරණය සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා. අද සම්පූර්ණ විපර්යාසයකට ගොදුරු වෙලා තිබෙනවා. අද විශ්වාසයක් ඇතිව ජීවත් වීමට, අනාගතය පිළිබඳව බලාපොරොත්තු ඇති කර ගැනීමට පුළුවන් විධියේ පරිසරයක් ඒ ප්‍රදේශයේ ඇති වෙලා තිබෙනවා. යුධ්වර කර්මාන්තය, කෘෂි කර්මය දියුණු වෙලා තිබෙනවා. යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් අපේ රටේ ඉතිහාසයේ කිසිම යුගයක නොතිබුණු අන්දමේ අවධානයක් යොමු වී තිබෙන බව අද ඒ පළාත්වල ඇස් පනා පිට පෙනෙනවා. ඒ සියල්ලම ඔවුන් දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැනඩාවේ කැල්ගරි ප්‍රදේශයෙන් පැමිණි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මට කිව්වා, "මේ කෙටි කාලයක් තුළ ඇති වෙලා තිබෙන ප්‍රගතිය ගැන අපි මවිතයට පත් වනවා" කියලා. ඒ කියන්නේ, 2009 මැයි මාසයේ ඒ යුද්මය ක්‍රියාදාමය අවසන් වූ වෙලාවේ ශ්‍රී ලංකාව මුහුණ දුන් අභියෝගවල පරිමාණය, උග්‍රභාවය සැලකිල්ලට භාජනය කරන විට මේ ප්‍රගතිය ඉතාමත් ප්‍රශංසනීයයි කියලා ඒ අය සඳහන් කළා. දැන් මේක තමයි මා දකින හැටියට අපේ රටට ලැබෙන ප්‍රධාන ප්‍රයෝජනය. ඒ කියන්නේ, වෙන අය කියන දේවල් අනුව තමන්ගේ නිගමනවලට පැමිණීමට වඩා පෞද්ගලිකවම -තමන්ම- ගිහිල්ලා බලා ගෙන තමන්ගේ අත් දැකීම් ලෝකයට පහදා දීමට ඒ අයට අවස්ථාව ලැබෙනවා. මේ නොවැම්බර් මාසයේ අපේ රටේ

[ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා]

පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව නිසා ඒ අවස්ථාව උදා වෙනවා. ඒක පළමුවැන්නයි. අපි ඒක කිසිසේත් අවතක්සේරු කරන්න හොඳ නැහැ. අද අපේ රටට විරුද්ධව විශාල සංග්‍රාමයක් ගෙන යනවා. ඒකට "සංග්‍රාමය" කියන වචනය පාවිච්චි කිරීම වරදක් නොවෙයි. ඒක තුවක්කු, බෝම්බ පාවිච්චි කරලා කරගෙන යන යුද්ධයක් නොවෙයි. ඒක ආර්ථික යුද්ධයක්. අපේ රට කොන් කිරීමට, මේ රටට එන ආයෝජන නැවැත්වීමට, සංචාරක කර්මාන්තය අඩාළ කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳාමට පහරක් එල්ල කිරීමට ගෙන යන මේ ව්‍යාපාරයට ඉතාමත් හොඳ පිළිතුර මෙය බව අපි පැකිළීමකින් තොරව සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මෙහි ආර්ථික පැත්තකුත් තිබෙනවා. ඒ කියන්නේ අපේ ගරු අස්වර් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි විවිධ සිද්ධි මාලාවකින් සමන්විත වැඩ පිළිවෙළක් තමයි නොවැම්බර් මාසයේ අපේ රටේ පැවැත්වෙන්නේ. ප්‍රධාන සිද්ධිය වන්නේ රාජ්‍ය නායකයන්ගේ සමුළුවයි. ඊට සමාන්තරව ව්‍යාපාරික ප්‍රජාවගේ සමුළුවක් - a business forum - තිබෙනවා. ලෝකයේ ඉහළම ගණයේ ව්‍යාපාරිකයන් ඒකට පැමිණෙනවා. ඒ ව්‍යාපාරික සමුළුව පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවලට පමණක් සීමා නොකිරීමට අපි තීරණය කරලා තිබෙනවා. ගරු අස්වර් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මීට ඉස්සෙල්ලා මේ පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ සමුළුව පැවැත්වුණේ 2011 ඔක්තෝබර් මාසයේ බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේයි. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත්, විදේශ කටයුතු ඇමති හැටියට මාත් ඒ සමුළුවට සහභාගි වුණා. ඒ අවස්ථාවේදී ඕස්ට්‍රේලියානු රජය තීරණය කළා, ව්‍යාපාරික වැඩ මුළුවට පොදු රාජ්‍ය මණ්ඩලයෙන් පිටස්තර රටවල ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන්ට ඇරයුම් කිරීමට. අපිත් ඒ අනුව රටවල් රාශියකට ආරාධනා කරලා තිබෙනවා. පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවූවත් ශ්‍රී ලංකාව සමඟ සමීප වෙළෙඳ හා ව්‍යාපාරික සම්බන්ධතා පවත්වාගෙන යන රටවල නියෝජිතයන්ට අපි ආරාධනා කරලා තිබෙනවා. උදාහරණ වශයෙන් චීනය, රුසියාව, ජපානය, කොරියාව, මැද පෙරදිග, තායිලන්තය කියන මේ සියලුම රටවලට මෙහි පැමිණෙන්න කියලා අපි ආරාධනා කරලා තිබෙනවා. අපට ලැබිලා තිබෙන ප්‍රතිචාර ඉතාමත් හොඳයි. මොකද මේ පිළිබඳව ශුභවාදී මතයක් ලෝකයේ ව්‍යාපාරික ප්‍රජාව තුළ තිබෙන බව අපට පෙනෙනවා.

ඒ සඳහා අපි ඉතාම විධිමත් ලෙස හා ක්‍රමානුකූල ලෙස සූදානම් වනවා. අපේ ප්‍රධාන සැලැස්ම මේකයි. ඊට සම්බන්ධ රජයේ සියලුම ආයතන -ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, සංචාරක සංවර්ධන අධිකාරිය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය- එකතු වෙලා සැලසුම් රාශියක්, -project proposals- හදා තිබෙනවා. මෙන්න මේ මේ ක්ෂේත්‍රවල ආයෝජන කාලෝචිතයි, යෝග්‍යයි කියලා. ඒකෙන් අපි බලාපොරොත්තු වන්නේ, එම රටවල සමාගම් එම යෝජනා අධ්‍යයනය කරලා, ඒ ගොල්ලන්ට සුදුසු ව්‍යාපාර සඳහා ඉදිරිපත් වීමයි. දැනටම රාජ්‍ය නායකයන් කිහිප දෙනෙක් පවා උනන්දුවක්, උද්‍යෝගයක් දක්වා තිබෙනවා, එම ව්‍යාපාරික වැඩ මුළුවට සම්බන්ධ වීමට. එයින් අපි අදහස් කරනවා, අපේ රටට විශාල ප්‍රමාණයක් විදේශ විනිමය ගලා එයි කියලා. අද නොයෙක් නොයෙක් තැන්වල විවේචන තිබෙනවා, මෙය මුදල් නාස්ති කිරීමක් කියලා. එය එසේ නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙය ආයෝජනයක්. 2009 වර්ෂයේ මෙම ව්‍යාපාරික වැඩ මුළුව පැවැත්වූවා, කැරිබියන් ප්‍රදේශයේ Trinidad and Tobago කියන රටේ. ඒ අයටත් විශාල මුදල් සම්භාරයක් ඒ තුළින් ලැබුණා. ඕස්ට්‍රේලියාවටත් ඒ විධියටම ඒ තුළින් මහා පරිමාණයේ ප්‍රතිලාභ අත් පත් කර ගැනීමට අවස්ථාව සැලසුණා.

අපේ රටට තිබෙනවා, නොයෙක් නොයෙක් ස්වාභාවික වාසි. එකක් තමයි, අපේ රටේ භූගෝලීය පිහිටීම. අනික් එක තමයි, අපේ මානව සම්පත්වල ගුණාත්මකභාවය. පසු ගිය දශක තුන තුළ අපට මේ සියල්ලෙන්ම උපරිම ප්‍රයෝජන ගන්න බැරි වුණා, ත්‍රස්තවාදය නිසා. දැන් ත්‍රස්තවාදය ඉතිහාසයට සීමා කිරීමට අපට පුළුවන් වීම නිසා, මේ සියලුම ස්වභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අවස්ථාව එළඹී තිබෙනවා. ඒ නිසා තමයි මේ රාජ්‍ය නායක සමුළුව හා ව්‍යාපාරික වැඩ මුළුව මේ අවස්ථාවේදී බෙහෙවින් කාලෝචිත වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වනවා, ආර්ථික කේන්ද්‍රස්ථානයක් හැටියට ශ්‍රී ලංකාව දියුණු කිරීමටත්, ඒ සම්බන්ධයෙන් ලෝකයාගේ අවධානය යොමු කිරීමටත්. එයට ඉංග්‍රීසියෙන් කියන්නේ hub concept කියලායි. විවිධ දෘෂ්ටි කෝණවලින් බලන කොට aviation hub, shipping hub, knowledge hub, technology hub යන මේ සියල්ලක්ම සඳහා අපේ රට බෙහෙවින් යෝග්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු ලෝකයේම අවධානය අපේ රට කෙරෙහි යොමු වෙලා තිබෙන අවස්ථාවකදී යෙවන පිරිසගේ ශුභ සිද්ධිය සඳහා අපි වැඩ මුළුවක් හම්බන්තොට පවත්වනවා. ඒ වාගේම මහජන සමුළුවක් - people's forum - හික්කඩුවේ පවත්වනවා. එතකොට අපේ රටට පැමිණෙන රාජ්‍ය නායකයන්ට අවස්ථාව ලැබෙනවා, කොළඹට පමණක් නොවෙයි, අපේ රටේ සියලුම ප්‍රදේශවලට ගිහින් අපි ලබා ගත් ප්‍රගතිය සියැසින්ම බලා ගැනීමට.

ඒ හැර අපි බලාපොරොත්තු වනවා, අපේ රටට ලැබෙන ප්‍රයෝජන වඩා වැඩි කර ගැනීම සඳහා නුදුරු අනාගතයේදී පැවැත්වෙන වෙනත් යම් යම් වැඩ පිළිවෙළවලට සම්බන්ධ කරලා මෙම අවස්ථාව සංවිධානය කිරීමට. උදාහරණයක් වශයෙන් 2014 දී -එන අවුරුද්දේ- අපේ රට තුළ පැවැත්වෙනවා, ජාත්‍යන්තර යෙවන සමුළුවක් - International Youth Conference. හම්බන්තොට කෙරෙන ඒ සාකච්ඡාව හා ඒ තුළින් ඉස්මතු වන නිගමන ඍජු ලෙස බලපානවා, 2014 පැවැත්වෙන එම සාකච්ඡාවට.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ලෝකයේ විවිධ ප්‍රදේශවල විශාල උනන්දුවක් හා උද්‍යෝගයක් තිබෙනවා, මුහුදු කොල්ලකරුවන් හා මහා සමුද්‍රයේ නිශ්චලභාවය සම්බන්ධයෙන්. එයට හේතුව ජාත්‍යන්තර වෙළෙඳාමට ඒවා කෙළින්ම බලපාන නිසායි. අපේ රටේ නාවික හමුදාව මේ සම්බන්ධයෙන් අද්විතීය මෙහෙවරක් ඉෂ්ට කරනවා.

විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව ඒ සම්බන්ධයෙන් ප්‍රශංසා මුඛයෙන් කථා කරලා තිබෙනවා. ඕස්ට්‍රේලියානු නායකත්වය කියලා තිබෙනවා, කිසිම සැකයකින් තොරව ඒ අය මේ උත්සවයට සහභාගි වනවා කියලා. ලෝකයේ විවිධ නායකයන් අපට එහෙම දන්වලා තිබෙනවා. මේ සම්බන්ධ ඒකාබද්ධ වැඩ පිළිවෙළක් අපි දියත් කරලා තිබෙනවා, ඕස්ට්‍රේලියාව සමඟ. එම නිසා අපේ අත් දැකීම්වල සම්පූර්ණ ප්‍රයෝජනය ලෝකයට ලබා දීමට මෙය කදිම අවස්ථාවක් වනවා. මේ විධියේ අවස්ථාවක් අපට 1976 සිට අද දක්වා ලැබිලා නැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අදහස වන්නේ සියලු දෙනාගේම ශ්‍රමය, ශක්තිය, උද්‍යෝගය ගොනු කරලා රටට උපරිම වාසිය ලැබෙන විධියට මේ කටයුතු සංවිධානය කර ගැනීමටයි.

ඊයේ සන්ධ්‍යාවේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි සාකච්ඡාවක් පැවැත්වූවා. එහි අරමුණ වුණේ, ලංකාව තුළ මේ සම්බන්ධ සම්පූර්ණ තොරතුරු අපේ ජනතාවට ලබා දීමටත්, ඒ සියලු දෙනාගේම දායකත්වය උපරිම මට්ටමින්

ලබා ගැනීමටත් පුළුවන් වන පරිදි අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම අදාළ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හා අධිකාරිවල නිලධාරීන් ගෙන්වලා ඒ අය දැනුවත් කිරීමේ ඉතාම ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් ඇති කර ගැනීමයි. ඒ වැඩ පිළිවෙළ අපි ඊයේ දියත් කළා.

15. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு ரவி கருணாநாயக்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 240 යටතේ වෙනත් විවිධ ශීර්ෂයන් හට සිදු කර ඇති වෙනස්කම් කවරේද;

(ii) 2012 වර්ෂය තුළදී ශීර්ෂ අංක 240 හරහා සිදු කර ඇති යළි වෙන් කිරීම්වල මුළු අගය කවරේද;

(iii) මුදල් අමාත්‍යාංශ වැය විෂය සහ එහි වෙනසද දක්වමින් එවන් යළි වෙන් කිරීම් සිදු කර ඇති ප්‍රධාන ශීර්ෂයන් 15 කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උචිත නොවන මූල්‍ය වෙන් කිරීම් මගින් මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතු පිරිහීමට ලක්විය හැකි බැවින්, අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී මෙම කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීමට නොහැකිවීමට හේතුව කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නිදි, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வரவுசெலவுத் திட்ட திணைக்களத்தின் 240ஆம் செலவுத் தலைப்பின் கீழ், வேறு பல செலவுத் தலைப்புகளில் ஏற்படுத்தப்பட்ட மாற் றங்களையும்;

(ii) 2012ஆம் ஆண்டில் 240ஆம் செலவுத் தலைப் பினூடாக மேற்கொள்ளப்பட்ட மீளொதுக் கத்தின் மொத்தப் பெறுமதியையும்;

(iii) அமைச்சுக்கான ஆரம்ப ஒதுக்கீட்டையும் வேறு பாட்டையும் குறிப்பிட்டு அத்தகைய மீளொதுக் கங்கள் மேற்கொள்ளப்பட்ட 15 பிரதான செலவுத் தலைப்புக்களையும்

அவர் கூறுவாரா?

(ஆ) பொருத்தமற்ற நிதி ஒதுக்கங்கள், நிதி அமைச்சின் நிதி முகாமைத்துவத்தின் தரத்தைக் குன்றியுரச் செய்வதால் இது வரவுசெலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டபோது ஏன் திட்டமிடப்பட்டிருக்கவில்லை எனவும் அவர் கூறுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the changes made under Head 240 of Department of National Budget to various other Heads;

(ii) the total value of the reallocation made through Head 240 during the year 2012; and

(iii) the main 15 Heads to which such reallocations were made indicating the original ministry vote and the difference?

(b) Will he also state as to why it was not possible to plan out at the time the Budget was being presented since inappropriate financial allocations may lead to an erosion of financial management in the Finance Ministry?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභගත* කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 240 යටතේ විවිධ ශීර්ෂයන් හට 2012 සිදුකර ඇති වෙනස්කම් 2012 මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ පිටු අංක 123 සිට 132 දක්වා විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

(ii) 2012 වර්ෂය තුළ ශීර්ෂ අංක 240 යටතේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. මිලියන 38,706 ක් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. මිලියන 32,750 ක් වශයෙන් වෙන්කර දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 71,456 කි.

(iii) ප්‍රධාන වැය ශීර්ෂ 15 පහත පරිදි වේ. විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.

අනු අංකය	වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය
01	103	රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
02	102	මුදල් හා ක්‍රමසම්පාදන
03	121	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
04	130	පළාත් පාලන හා පළාත් සභා
05	111	සෞඛ්‍ය
06	117	වරාය හා මහා මාර්ග

07	114	ප්‍රවාහන
08	179	ගොවිජන සේවා හා වනජීවී
09	105	ආර්ථික සංවර්ධන
10	176	සිවිල් ගුවන් සේවා
11	166	ජලසම්පාදන හා ජලාපවහන
12	126	අධ්‍යාපන
13	1-22	විශේෂ වියදම් ඒකක
14	112	විදේශ කටයුතු
15	152	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ

(ආ) මේ සඳහා පදනම් කරගනු ලබන නිර්ණායකයන් ද පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති අයවැය ඇස්තමේන්තුවල, අයවැය ඇස්තමේන්තු පිළිබඳ පැහැදිලි කිරීමේ සටහනේ, 2.1 ලෙස සඳහන් කර ඇත. එසේම, විසර්ජන පනතේ 6 (1) වගන්තිය පරිදි මෙම වෙන්කිරීම් සිදුකර මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

* ඇමුණුම:
* *இணைப்பு:*
* *Annex:*

Main 15 Heads which supplementary allocations were made in 2012

Rs.Million

Serial No.	Head No.	Ministry	Estimate 2012		Supplementary Allocation from Head 240		Revised Estimate	
			Recurrent	Capital	Recurrent	Capital	Recurrent	Capital
1	103	Ministry of Defence and Urban Development	215,427	15,816	6,596	6,447	222,023	22,263
2	102	Ministry of Finance and Planning	11,132	9,624	4,449	5,505	15,581	15,129
3	121	Ministry of Public Administration and Home Affairs	135,954	2,000	4,944	876	140,898	2,876
4	130	Ministry of Local Government and Provincial Councils	95,059	34,714	1,149	4,330	96,208	39,044
5	111	Ministry of Health	55,000	19,500	4,258	121	59,258	19,621
6	117	Ministry of Ports & Highways	200	144,367	0	3,396	200	147,763
7	114	Ministry of Transport	13,540	40,000	2,734	385	16,274	40,385
8	179	Ministry of Agrarian Services & Wildlife	37,541	1,437	2,779	275	40,320	1,712
9	105	Ministry of Economic Development	18,547	86,024	2,798	140	21,345	86,164
10	176	Ministry of Civil Aviation	87	12,007	0	2,822	87	14,829
11	166	Ministry of Water Supply and Drainage	156	33,000	16	2,480	172	35,480
12	126	Ministry of Education	27,250	6,016	1,790	551	29,040	6,567
13	1-22	Special Spending Units	7,464	4,300	1,694	529	9,158	4,829
14	112	Ministry of External Affairs	5,700	940	1,630	264	7,330	1,204
15	152	Ministry of Irrigation and Water Resources Management	3,335	32,500	75	1,000	3,410	33,500

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විසින් ලබා දී ඇති ප්‍රකාශය පමණක් කියවන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 5ට මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ වන විට ලංගම ඩිපෝ 73ක සේවකයින් 25,000කට මාස දෙකක පඩි ගෙවලා නැහැ. මෙතැන ගරු ඇමතිතුමාත් සිටිනවා. ගරු ඇමතිතුමා, කරුණාකර, ඔබතුමා මේ ප්‍රශ්නයෙන් මහ හැර යන්නේ නැතුව කටයුතු කරන්න. ඩිපෝ 73ක සේවකයින් 25,000කට මාස දෙකක පඩි ගෙවලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමා ගිහින් -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙය ඊට අවස්ථාවක් නොවෙයි. ඔබතුමාගේ ප්‍රශ්නය අවශ්‍ය වෙලාවට අහන්න. මේ පාර්ලිමේන්තුවේ කාලය කා දමන්න එපා. ඔබතුමාගේ ප්‍රශ්නයට විනාඩි 20ක් ගියා. ගරු අනුර දිසානායක මහතා. [බාධා කිරීමක්] ඔබතුමාට පුහුණු පාඨමාලාවක් තියන්න වෙනවා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 4/2013 දරන චක්‍රලේඛය
கல்வி அமைச்சின் 4/2013ஆம் இலக்கச் சுற்றறிக்கை
CIRCULAR NO. 4/2013 OF EDUCATION MINISTRY

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

අ.පොෂ. සාමාන්‍ය පෙළ විභාගය උසස් ලෙස සමත්ව අ.පොෂ.උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් ඇති නමුත් ජාතික පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වීම නිසා පාසල් දරුවන් විශාල පිරිසකට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මම මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

දිවයිනේ සියලුම පාසල්වල සමාන පහසුකම් නොමැති බැවින් ඊට පිළියම් ලෙස 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින්ම සමත් වන සිසුන්ට ලබා ගත් ලකුණු අනුව උසස් පාසලකට ඇතුළත් වීමට අවස්ථාව ලබා දීම මෙතෙක් අනුගමනය කළ වැඩ පිළිවෙළයි. එසේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වී උසස් පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වූ දරුවන්ගේ දෙවැනි කඩුල්ල වන්නේ අ.පොෂ. සාමාන්‍ය පෙළ භාගයයි. අ.පොෂ. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉහළින්ම සමත් වන දරුවන්ට ලබා ගත් සාමාර්ථයන්ට අනුව සුදුසු උසස් පාසලකට ඇතුළත් වීමට වරම් ලැබී තිබුණා. මෙම ක්‍රමවේදය තුළින් දිවයිනේ ඉතා දුෂ්කර පාසල්වල සිටින දක්ෂ දරු දැරියන් විශාල ප්‍රමාණයකට නගරයේ පහසුකම් සහිත උසස් පාසල්වලට ඇතුළත් වී අ.පොෂ.උසස් පෙළ විභාගය හොඳින් සමත් වී සරසවි ප්‍රවේශය ලබා ගැනීමට වාර්ෂිකව අවස්ථාව ලැබී තිබුණා.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2013.04.06 දාතමින් සහ අංක 4/2013 දරන චක්‍රලේඛය අනුව, කෙතරම් ඉහළින් අ.පොෂ.සාමාන්‍ය පෙළ විභාගය සමත් වුවද, තමන් ඉගෙන ගන්නා පාසලේ අදාළ උසස් පෙළ විෂයයන් සඳහා පහසුකම් පවතින්නේ නම් එම පාසලෙන් ඉවත් වීමට දක්ෂ සිසු දරු දැරියන්ට තහනම් කෙරුණා. අදාළ විෂයයන්ට ගුරුවරුන් හිහ වුවද විද්‍යාගාර ආදී අනෙකුත් පහසුකම් අවම වුවද එම දරුවන් එම පාසලේම රැඳී සිටිය යුතු වුණා.

අදාළ විෂයයන් ඉගැන්වුවද, දිවයිනේ සියලු පාසල්වල සමාන පහසුකම් නොමැති බව අද ඕනෑම අයෙකු පිළිගන්නා සත්‍යයක්. එසේ සමාන පහසුකම් තිබේ නම් අනේක දුක් විඳ තම දරුවන් නගරයේ උසස් පාසල්වලට ඇතුළත් කිරීමට දෙමාපියන් පෙළඹෙන්නේ නැහැ. නගරයේ ඇතැම් පාසල්වල පිහිණුම් තටාක පවතිද්දී අවම පහසුකමක් හෝ වැසිකිළි, ජලය, විදුලිය වැනි පහසුකම් හෝ නොමැති පාසල් අපේ රටේ පවතිනවා. මෙවැනි තත්ත්වයක් තුළ සියලුම පාසල්වලට සමාන පහසුකම් සැපයීමට අසමත් වන ආණ්ඩුව මෙවැනි චක්‍රලේඛ නිකුත් කර දක්ෂ සිසු සිසුවියන්ට උසස් පාසල්වලට ඇතුළත් වීමට ඇති ඉඩකඩ ඇහිරීම ඉතාම අමානුෂික පියවරක්. අධ්‍යාපනයට වෙන් කරන ලද මුදල් දිනෙන් දින කප්පාදු කරන තත්ත්වයක් යටතේ දිවයිනේ සියලුම පාසල්වල තත්ත්වය සමාන කරනවා යැයි පැවසීමද, කඩිනමින් පාසල්වලට අවශ්‍ය වන පහසුකම් සලසනවා යැයි කියන බලධාරීන්ගේ ප්‍රකාශද විහිළුවක් වී තිබෙනවා.

මේ පිළිබඳව අවංක වුවමනාවක් තිබුණේ නම් පළමුව කළ යුතුව තිබුණේ පාසල්වල තත්ත්වය උසස් කිරීමයි. එසේ වූයේ නම් චක්‍රලේඛ නිකුත් කර සිසුන්ව බලෙන් එම පාසල්වලම නතර කර ගැනීමට අවශ්‍ය වන්නේ නැහැ. සෑම සිසුවෙක්ම සිසුවියක්ම කැමැති වන්නේ, තමන් මෙතෙක් ඉගෙනුම ලැබූ පාසලේම උසස් පෙළ හැදෑරීමටයි. අලුත් පාසලකට ගිය විට අලුත් පරිසරයක් යටතේ මුල් කාලයේ ඇති වන මානසික පසුබෑම ඔවුන් හොඳින් දන්නවා. එහෙත් ඒ සියල්ල දරා ගෙන වෙනත් පාසැලකට ඇතුළත් වීමට ඔවුන් උත්සාහ කරන්නේ හොඳ විද්‍යාගාර පහසුකම් සහිතව වඩා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමටයි.

කවර හේතු ඉදිරිපත් කළද එකී චක්‍රලේඛය මඟින් සියලුම උසස් පෙළ සිසු සිසුවියන්ට බලවත් අසාධාරණයක් විශාල ලෙස සිදු වුණා. ඊට අමතරව පහත අක්‍රමිකතාවන්ටද මෙම චක්‍රලේඛය මඟ පෑදීය. එනම් මෙම චක්‍රලේඛය පෞද්ගලික හා ජාත්‍යන්තර පාසැල් සඳහා බල නොපෑමයි. ඒවාට අදාළ වන්නේ නැහැ. මෙමඟින් ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසල් සඳහා විශේෂ

වරප්‍රසාදයක් ලැබී තිබෙනවා. මේ තත්ත්වය තුළ ඉදිරියේදී දෙමව්පියන් අ.පොෘ.ස. සාමාන්‍ය පෙළ සඳහා තම දරුවන් පෞද්ගලික පාසල්වලට ඇතුළත් කිරීමට වැඩි නැඹුරුතාවක් දක්වන්න ඉඩ තිබෙනවා. එය දිරිගන්වනු ඇත්තේ ඇති හැකි පවුල්වල දරුවන් පෞද්ගලික පාසල්වලට ඇතුළත් කරවීමටයි. එවිට එම පාසැල්වල අ.පොෘ.ස. සාමාන්‍ය පෙළ පන්ති සිසුන්ගෙන් පිරෙන අතර රජයේ පාසල් සිසුන් නොමැතිකමින් අපහසුතාවටද පත් විය හැකියි.

මෙම චක්‍රලේඛය ගෙන ආ පිළිවෙළෙහිද පැවතියේ අතිශය දෝෂ සහගත තත්ත්වයකි. 2012 අ.පොෘ.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වූයේ 2013 අප්‍රේල් 04 වැනිදායි. සමහර උසස් පාසල් එදිනම අන්තර්ජාලය මඟින් අයදුම්පත් කැඳවා අප්‍රේල් 22 නව පාසල් වාරය ආරම්භ වන විට සිසුන් තෝරා ගෙන අවසන් කර තිබුණා. ඒ කටයුත්ත අවසන් කරමින් තිබුණා. අප්‍රේල් 29 මෙම චක්‍රලේඛය නිකුත් වන විට එම පාසල් පළාත් සභා පාසල්වලින් සිසුන් ඇතුළත් කර ගෙන අවසාන වී තිබුණා. තවත් පාසල්වලට සිසුන් තෝරා ගත් බව දන්වා ඔවුන්ට ලිපිද නිකුත් කර තිබුණා. එම සිසුන් තමන් මෙතෙක් ඉගෙන ගත් පාසල්වලින් අස්වී නව පාසල්වලට ඇතුළත්වීමට යන විට මෙම චක්‍රලේඛය නිකුත්වී තිබූ බැවින් එම සිසුන් පාසලට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කෙරුණා. මෙතෙක් ඉගෙන ගත් පාසලත්, ඇතුළත්වීමට බලාපොරොත්තු වූ නව පාසලත් යන දෙකම අහිමි වීමෙන් දරුවන් සහ ඔවුන්ගේ දෙමාපියන් දැඩි අපහසුතාවට පත් වුණා.

කෙසේ වුවද මෙම ගැටලුව දැඩි උත්සාහයකින් පසු මෑතකදී විසඳා ගනු ලැබුවා. මෙම කරුණුවලින් පෙන්වා දෙන්නේ, මෙම චක්‍රලේඛය මඟින් දිවයිනේ සියලුම පාසල්වල උසස් පෙළ පන්තිවල අධ්‍යාපන කටයුතු අවුල් කර ඇති බවයි. කෙසේ නමුත් අධ්‍යාපන ඇමතිවරයා පවසන්නේ, ගම්බද පාසල්වල උසස් පෙළ පන්ති ආරක්ෂා කිරීම සඳහා මෙම චක්‍රලේඛය ගෙන ආ බවයි. පාසැලේ සිටින දක්ෂ දරුවන් පාසැලේම රැඳී සිටීමෙන් උසස් පෙළ පන්ති සාර්ථකව පවත්වා ගත හැකි බවයි. නමුත් නව සංශෝධනය මඟින් අමාත්‍යවරයාගේ තීරණය වැරදි බව පෙන්නුම් කර තිබෙනවා. එතුමා විසින්ම මෙම චක්‍රලේඛයට නැවත සංශෝධන ඇති කොට තිබෙනවා.

අධ්‍යාපන ඇමතිවරයාගේ මෙම අසාධාරණ, අදූරදර්ශී චක්‍රලේඛයට එරෙහිව දෙමව්පියෝ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට මීට විරෝධතා දක්වමින් සිටියා. එහි බලපෑම මත ඉහත 4/2013 චක්‍රලේඛය සඳහා 27/2013 චක්‍රලේඛය මඟින් පසු ගිය ජූනි 28වැනි දා යම් සංශෝධන ගෙන එනු ලැබ තිබුණද ගැටලුව මුළුමනින්ම අවසන් වී නැහැ.

ප්‍රධානම ගැටලුව වී තිබෙන්නේ, නව සංශෝධන අනුව අ.පොෘ.ස සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් වූ දරු දැරියන්ට ජාතික පාසල්වලට ඇතුළත්වීමේ අවස්ථාව ලැබෙන විට එම පාසල්වල අ.පොෘ.ස. උසස් පෙළ පන්තිවල ඉඩකඩ නොමැති වීමයි. දැන් ඒවායේ ඉඩකඩ නැහැ. තමුන්නාන්සේ චක්‍රලේඛය සංශෝධනය කරන කොට ළමයින් අරගෙන ඉවරයි. අත්තනෝමතික පූර්ව චක්‍රලේඛය සංශෝධනය විය හැකි බවට උපකල්පනය කළ ඇතැම් පාසලක් ඒ මත පැමිණෙන සිසුන් වෙනුවෙන් ඉඩකඩ වෙන්කර ගෙන සිටියද බොහෝ පාසල් ප්‍රමාණයක් එසේ ඉඩකඩ වෙන් කරගෙන සිටියේ නැහැ. විශේෂයෙන්ම කොළඹ ආශ්‍රිත බාලිකා විද්‍යාලවල ඒ ඉඩකඩ වෙන් කරගෙන තිබුණේ නැහැ. එම නිසා අ.පොෘ.ස. සාමාන්‍ය පෙළ උසස් ලෙස සමත් සිසු සිසුවියන් රැසකට පහසුකම් සහිත පාසලකට ඇතුළත් වීම සඳහා ලැබිය යුතු වූ අවස්ථාව අහිමි වී ගොස් තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අමාත්‍යවරයා විසින් මෙම සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. 2013/4 චක්‍රලේඛය හදිසියේ නිකුත් කරන ලද්දේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කුමන විශේෂඥයින්ගේ, කුමන නිර්දේශ අනුවද?

02. එම චක්‍රලේඛය මඟින් පෞද්ගලික පාසල් පවත්වාගෙන යන ඇතැමුන්ට විශේෂ වාසි සැලසීමට අදහස් කෙරුණාද? මා දන්නේ නැහැ, එහෙම දෙයක් කරන්න ඔබතුමාට අපේක්ෂාවක් තිබුණාද කියලා.

03. එම චක්‍රලේඛයේ සංශෝධන ප්‍රමාදවීම නිසා උසස් ලෙස අ.පොෘ.ස සාමාන්‍ය පෙළ සමත් සිසු සිසුවියන්ට නව පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

04. එම අසාධාරණයට ලක් වූ සිසු සිසුවියන්ට ලබා දෙනු ලබන සහනය කුමක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු අනුර දිසානායක ශූරීන් ඉතා වැදගත් කරුණක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කළා.

මෙතෙක් කල් පාසල්වල පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳව ප්‍රශ්න තිබුණු රටේ ඉතාම පටු පෞද්ගලික න්‍යාය පත්‍ර තිබෙන යම් යම් අය උසස් පෙළට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳවත් දේශපාලන හා රාජ්‍ය මැදිහත් වීම් ඇති කරන්න උත්සාහ දැරීම ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මා මේ ගරු සභාවේදී විශේෂයෙන් අපේ මාධ්‍ය හිතවතුන්ගේ දැන ගැනීම සඳහා, උසස් පෙළට දරුවන් ඇතුළත් කර ගැනීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සඳහන් සියලු නිල චක්‍රලේඛන ඔබතුමාගේ අනුමැතිය ඇතිව හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ, අධ්‍යයනය කරන කෙනකුට ඉතාම නිවැරැදිව තමා කියන කරුණ පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරන්න ඉඩකඩ ලබා දීම සඳහායි. 1975 දී ගරු ආචාර්ය බදිඋද්දීන් මහමූද් මැතිතුමා අධ්‍යාපන අමාත්‍ය ධුරය දරද්දී, ආචාර්ය ප්‍රේමදාස උඩගම ලේකම්වරයාගේ අත්සනින් ජා.උ.අ.ස. පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛනය; 1977 දී දිවංගත ගරු නිශ්ශංක විජයරත්න අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, ඩී.එම්.පී.බී. දිසානායක ලේකම්වරයාගේ අත්සනින්, ජා.උ.අ.ස. පන්තියට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛනය; 1995 දී ගරු ආචාර්ය රිචර්ඩ් පතිරණ අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, එම්.ඩී.ඩී. පීරිස් ලේකම්තුමාගේ අත්සනින් නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 1999 දී ගරු ආචාර්ය රිචර්ඩ් පතිරණ අධ්‍යාපන ඇමතිතුමාගේ අවධියේදී, ඒ. ඇන්ඩඍ ද සිල්වා ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කොට තිබෙන චක්‍රලේඛනය; 2001 දී ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන ඇමතිවරයාගේ යුගයේදී, වෛද්‍ය ටාරා ද මැල් මැනිනියගේ අත්සනින් නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 2003 දී එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ගරු ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු අධ්‍යාපන ඇමතිවරයාගේ අවධියේදී, වී.කේ. නානායක්කාර ලේකම්තුමා නිකුත් කොට ඇති චක්‍රලේඛනය; 2006 දී ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන ඇමතිතුමාගේ යුගයේදී, ආරියරත්න හේවගේ ලේකම්වරයාගේ අත්සනින් නිකුත් කොට තිබෙන චක්‍රලේඛනය ඇතුළුව උසස් පෙළ පන්තියට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ සියලු චක්‍රලේඛන **සභාගත*** කරන අතර, රටටත්, රටේ ජනතාවටත්, මාධ්‍ය ආයතනවලටත් අවබෝධ කර ගැනීම සඳහා මේ පැහැදිලි කිරීමේ කොටසක් වශයෙන් හැන්සාඩ්

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

වාර්තාවේ මුද්‍රණය කරන ලෙසට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] ඉන්න පොඩ්ඩක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු චක්‍රලේඛවල ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා, ජාතික පාසලක සිටින දරුවකුට, තම පාසලේ අදාළ විෂය ධාරාව නැත්නම්, අදාළ මාධ්‍යය නැත්නම් හැර කිසිම වෙලාවක වෙනත් ජාතික පාසලකට උසස් පෙළ හැදෑරීම සඳහා ඇතුළු වන්න බැහැයි කියලා. එය විපක්ෂ නායකතුමා අධ්‍යාපන අමාත්‍යතුමා වශයෙන් සිටියදීත් එලෙසයි; ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමා සිටියදීත් එලෙසයි; නිශ්ශංක විජයරත්න මැතිතුමා සිටියදීත් එලෙසයි. අනික් යුගවලදී තිබුණු තත්ත්වයත් ඒකයි. ඒ යුග ගණනාව තුළත් අධ්‍යාපනයේ අසමානතා, සම්පත් බෙදී යාමේ විෂමතා යන සියල්ල තිබුණා. පසු ගිය කාලය තුළ අපේ ඇති හැකි අය විසින් අලුත් මානසික තත්ත්වයන් නිර්මාණය කර ගත්තා. අනගාරික ධර්මපාලතුමා තමන්ගේ පෞද්ගලික දේපොළ යොදා හදා තිබෙන, විශිෂ්ට ප්‍රතිඵල ලත් වියතුන් රාශියක් මේ සමාජයට දායාද කළ, සියලුම විද්‍යාගාර පහසුකම් සහිත පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ඉගෙන ගෙන "A" සාමාර්ථ 8ක්, "A" සාමාර්ථ 9ක් තිබෙනවාය කියලා කොළඹ පාසලකට එන්න ඕනෑය කියනවා. මේ රටේ විවිධ ක්ෂේත්‍රවලට ඉහළම පුද්ගලයනුත්, වෛද්‍ය විශේෂඥයන් වැනි අයත් බිහි කළ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉගෙන ගෙන එවැනි සාමාර්ථ ලබා ගත් අයත් කොළඹ පාසලකට එන්න ඕනෑය කියනවා. දුර දක්නා, තුන් කල් දක්නා අධ්‍යාපනඥයෝ, ජාති හිතෛෂියෝ, දරුවන්ට ආදරය කරන මිනිස්සු, එකම 1 AB පාසලක්වත් නැති ප්‍රදේශවල ගම්බද පාසල්වල ඉගෙන ගන්නා අන්ත අසරණ දරුවන්ට නේවාසිකාගාර හදලා මේ පාසල් නිර්මාණය කළේ ඇයි? ආනන්ද විද්‍යාලයේ නේවාසිකාගාරය, රාජකීය විද්‍යාලයේ නේවාසිකාගාරය හැදුවේ ඇයි? නාලන්දා විද්‍යාලයේ නිටපු විදුහල්පති මහාචාර්ය ගුණපාල මලලසේකර මැතිතුමන්ලා, මෙත්තානන්ද මැතිතුමන්ලා යටතේ විවිධ ප්‍රදේශවල නේවාසිකාගාර හැදුවේ ඇයි? එකම 1 AB පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා, මේ රටේ. එකම 1 AB පාසලක්වත් නැහැයි කියන්නේ, ඒ පාසල්වල විද්‍යා අංශයක් නැහැ; විද්‍යාගාර නැහැ; විද්‍යා ගුරුවරු නැහැ. එවැනි පාසල්වල දරුවන් "A" සාමාර්ථ 8ක් හෝ 9ක් ගත්තාම කැපකරු පියවරුන්, කැපකරු මව්වරුන් ලෙස ඒ දරුවන්ගේ භාරකාරත්වය භාර ගන්නා මානව හිතවාදී මිනිස්සු මේ රටේ ඉන්නවා. උදාහරණයක් ලෙස කිව්වොත් විශිෂ්ට ලෙස සමත් වුණු නිවුන් දරුවන්ගේ අම්මා, තාත්තා දෙදෙනාම අහිමි වුණාම ටොයොටා ලංකා සමාගමේ ගණකාධිකාරිතුමා කිව්වා, ආනන්ද විද්‍යාලයේ නේවාසිකාගාරයේ දරුවන් දෙදෙනා නතර කරන්න, සියලුම වියදම් දරනවාය කියලා. හැබැයි ඒ ඔහුගේ ළමයි නොවෙයි; මේ රටේ අසරණ ළමයි.

අපි එහෙම කරන්න ඉඩ දුන්නා. මොකද, මේ දරුවන්ව මෙහෙම භාර ගන්න අය ඉන්නවා නම්, තමාගේ ඥාති මිත්‍රාදීන් උදව් කරනවා නම් බදුල්ල, බණ්ඩාරවෙල, මොනරාගල වැනි ප්‍රදේශවල දරුවන්ට පහසුකම් තිබෙන අපේ පාසලක -රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය, නාලන්ද විද්‍යාලය, විශාඛා විද්‍යාලය, දේවි බාලිකා විද්‍යාලය වාගේ එකක- අපි ඉඩ දෙන්නේ නැත්නම්, වරප්‍රසාද ලත් අපි දන්නා හඳුනන හිතවතුන්ට පමණක් මේ පාසල් ටික බෙදා ගන්න යනවා නම් - [බාධා කිරීමක්] මම නිකුත් කරලා තිබෙන චක්‍රලේඛය මම ඔබතුමාට කියවනවා. ඊට කලින් මම කියවනවා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොයි චක්‍රලේඛයද ගරු ඇමතිතුමනි?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2013 පළමුවන චක්‍රලේඛය. [බාධා කිරීමක්] ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඇමතිවරයා ප්‍රකාශය කරලා ඉවර වෙන තෙක් ඉන්න.

චක්‍රලේඛ අංක 2013/4 හි 03 (අ) වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

"(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂය ධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ හොත් එය අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.) "

එතකොට ඒ පාසලේ ඉන්න සියලුම ශිෂ්‍යයන්ට උසස් පෙළ කරන්නට සුදුසුකම් තිබෙනවා නම් පළමුවන අවස්ථාව ඒ දරුවන්ට දෙන්න ඕනෑ. එහි (ආ) වගන්තිය යටතේ මෙලෙස සඳහන් වනවා:

"(ආ) එකම 1 AB (උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ්‍ය) පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි පාසල්වලින් අතිවිශිෂ්ඨ ලෙස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලබා ඇති ග්‍රාමීය පාසල්වල සිසුන්"

මම මේකේ ශුද්ධ සිංහලෙන් කියලා තිබෙනවා 1 AB පාසල් එකක්වත් නැති ප්‍රදේශ ගැන. මහියංගනයේ, ආඳාඋල්පතේ එහෙම තිබුණේ නැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමා දන්නවා. මොනරාගල, ඇතිමලේ එහෙම තිබුණේ නැහැ. මේ වාගේ පළාත්වල දරුවන් අතිවිශිෂ්ට ලෙස සමත් වෙලා තිබෙනවා නම්, තම පාසලේ දරුවෝ ටික ගත්තාට පසුව ඒ අයට ඊළඟ අවස්ථාව දෙන්න කියලා (ආ) වගන්තිය යටතේ කියා තිබෙනවා.

ඊළඟට (ඇ) වගන්තිය යටතේ මෙහෙම කියනවා:

"(ඇ) ඉහත (අ) හා (ආ) යන වගන්තිවලට අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම් පාසල පිහිටි දිස්ත්‍රික්කයේ 1 AB නොවන පාසල්වලින් විශිෂ්ඨ ලෙස සමත් වූ සිසුන්"

දැන් කොළඹ දිස්ත්‍රික්කය ඇතුළෙත් මේ 1 AB පාසලක් නොමැතිව පළාත් සභා පාසල්වල "A" සාමාර්ථ 9ක් ලබා ගෙන විශිෂ්ට ලෙස සමත් වන සිසුන් ඉන්නවා. තුන්වෙනුව ඒ අයට ඒ අවස්ථාව දෙන්න.

පළමුව තමන්ගේ පාසලේ අයට අවස්ථාව දෙන්න. ඊට පසුව ඇත ගම්වල අභිංසකම දරුවන්ට ඉඩ දෙන්න. ඊට පස්සේ තම පාසල පිහිටි දිස්ත්‍රික්කය තුළ විද්‍යාගාර පහසුකම් එහෙම නැති පාසල්වල ළමයින්ට ඉඩ දෙන්න. මේ කරුණු ටික තමයි මම නිකුත් කළ චක්‍රලේඛයේ අඩංගුව තිබුණේ.

මේ උද්ඝෝෂණ කිසි දෙයක් අපි සතයකට ගණන් ගන්නේ නැහැ. මොකද, හේතුව? තමන්ගේ පෞද්ගලික පටු අරමුණු සඳහා මේ උද්ඝෝෂණ මෙහෙයවන්නේ කවුද? මම, මේ රටේ ගමේ පාසලේ නිදහස් අධ්‍යාපනය ලබා ගත්ත දරුවෙක් ලෙස මේ වරප්‍රසාද ලත් අයට ඕනෑ විධියට පාසල් අධ්‍යාපනය නටවන්න දෙන්නේ නැහැ. හඬක් නඟන්න බැරි ලක්ෂ ගණන් ළමයි වෙනුවෙන් තමයි මේ අවස්ථාව අපි හදලා දීලා තිබෙන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි ගරු ඇමතිතුමා. දැන් ගරු මහින්ද යාපා අබේවර්ධන අමාත්‍යතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

පොඩ්ඩක් ඉන්න නියෝජ්‍ය කථානායකතුමනි. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, මේක ඉතා අමානුෂික ක්‍රියාවක් කියලා. ගමේ ළමයින්ට මේ වරප්‍රසාදය ලබා දෙන ක්‍රියාව ඉතාම අමානුෂික නම් මම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් ඒ අමානුෂික ක්‍රියාව දිගටම කරනවාය කියන එක මම මේ සභාවේදී සඳහන් කරන්නට කැමැතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හරි, බොහොම ස්තුතියි. ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා.


ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

ඉවර නැහැ. පොඩ්ඩක් ඉන්න. අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා, ජාත්‍යන්තර පාසල්වලට විශේෂ අනුග්‍රහයක් දුන්නා කියලා. මේ බලන්න, ආරියරත්න හේවගේ ලේකම්තුමාගේ කාලයේ ජාත්‍යන්තර පාසල් ගැන මොකක්ද කියලා තිබෙන්නේ කියලා. මේ බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

"අ.පො.ස.(සා.පෙ.) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති විදේශගතව සිට පැමිණෙන අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාත්‍යන්තර පාසල්වල හා පෞද්ගලික පාසල්වල සිසුන් ඇතුළු කර ගත යුතුයි" කියලා තියෙන එක මම අයින් කළා. අයින් කළාම කියනවා, මම ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වලට විශේෂ වරප්‍රසාද දුන්නා කියලා.

මම දන්නවා, අනුර දිසානායක මන්ත්‍රීතුමා ගමේ ළමයින්ට ආදරෙයි කියලා. හැබැයි, සල්ලි තිබෙන අය අටවලා ඉංග්‍රීසි පත්තරයේ පළමුවන පිටුවේ පිකටින් එක දමපුවාම ඉංග්‍රීසි පත්තරයට පිකටින් එක යන්න හදන අය පැත්තේ ඔබතුමා හිට ගන්න එපා. පැරණි කාලයේ හිට ගත්තා වාගේ ගමේම ළමයින්ගේ පැත්තේ හිට ගන්නය කියන ටික කියමින් මගේ කථාව අවසන් කරනවා.

***සභාමේසය මත තබන ලද වක්‍රලේඛන:**
சபாபீடத்தில் வைக்கப்பட்ட சுற்றறிநிருபங்கள்:
Circulars tabled:



අමු. අං. 32/75
1975. 07. 31

III වැනි කොටස

මහා විද්‍යාලයවල 10 වැනි ශ්‍රේණියට ශිෂ්‍යයන් ඇතුළු කිරීම—

(1) ජා.උ.අ.ස. (10, 11) පන්තිවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ කාර්යයේදී 1962 වර්ෂයේ අංක 9 දරණ චක්‍රලේඛයේ 16 වැනි වගන්තියේ සඳහන් ප්‍රමුඛත්වයන් පිළිපැදිය යුතුයි. එම ප්‍රමුඛත්වය මෙසේයි :—


(අ) පළමුව, කිසිම විශේෂයක් නො කොට එම පාසලේම සියලුම ශිෂ්‍යයෝ.

(ආ) දෙවනුව, ජා.උ.අ.ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට අඩු සියලුම ශිෂ්‍යයෝ.

(ඉ) තෙවනුව, ජා.උ.අ.ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට වැඩි සියලුම ශිෂ්‍යයෝ.

(ඊ) සිව්වනුව, ශාස්ත්‍රීය සුදුසුකම් ඇත්නම් මැයි මස 1 දිනට වයස අවුරුදු දහ අටට අඩු අනිකුත් සියලුම ශිෂ්‍යයෝ.

ආචාර්ය ප්‍රේමදාස විඛගෙ
ලේකම්.
ගරු බඳුදුදීන් මහමූද් මැතිතුමා
අධ්‍යාපන අමාත්‍යතුමා.



අමු. අං. 144/77
1977. 10. 04

III වැනි කොටස

මහා විද්‍යාලවල 10 වැනි ශ්‍රේණියට ශිෂ්‍යයින් ඇතුළු කිරීම්.

(i) ජා. උ. අ. ස.. (10, 11) පන්තියට ශිෂ්‍යයින් ඇතුලත් කිරීමේ කාර්යයෙ මගේ අංක පා. ස. 6/285 සහ 1976. 03. 04 දිනැති චක්‍රලේඛ ලිපියේ සඳහ ප්‍රමුඛත්වයන් පහත සංශෝධනය කර ඇති පරිදි තරයේ පිළිපැදිය යුතුය.

එම ප්‍රමුඛත්වයන් මෙසේයි :—

(අ) පළමුව කිසිම විශේෂයක් නොකොට එම පාසලේම සියලුම ශිෂ්‍යයි

(ආ) අමාත්‍යාංශය ප්‍රා. අධ්‍යා. අ./ප්‍ර. අධ්‍යා. නි. විසින් යොමු කරන ලබ ජා. උ. අ. ස. සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යත්වධාරීන්.

(ඉ) ජා. උ. අ. ස. (10, 11) පන්ති නොමැති පහසුකම් අනින් දුෂ්කර ඝනයේ සැලකෙන පාසල්වල මැයි මස 1 දිනට වයස අවුරුදු 17 අඩු ශිෂ්‍යයි (පාසල්වල දුෂ්කරතාවය පිළිබඳ ප්‍රා. අ. අ./ප්‍ර. අ. නි. ගෙන් උපදෙ ලබාගත යුතුය.)


(ඊ) ජා. උ. අ. ස. (10, 11) පන්ති නොමැති අනිකුත් පාසල්වල ජා. පො. අ. විභාගයේ දී ලබා ඇති ශ්‍රේණි අනුව වැඩි සැලකිල්ලක් දක්වමින්, මැ මස 1 දිනට වයස අවුරුදු 17 ට වැඩි සියලුම ශිෂ්‍යයින්.

(උ) ශාස්ත්‍රීය සුදුසුකම් ඇත්නම්, ජා. පො. අ. ස. විභාගයේ දී ලබා ඇති ශ්‍රේ අනුව මැයි මස 01 දිනට වයස අවුරුදු 17 ට අඩු අනිකුත් සියලුම ශිෂ්‍යයි

10 වන ශ්‍රේණියේ එක් විෂයධාරාවක් සඳහා ඉහත සඳහන් පදනම මත ඇතුල් වීමෙන් පසුව, ඇතුලත්වීමට නොහැකි වූ විෂයධාරාවක් හැදාරීමට ඉඩ නොදිය යුතු

ඩී. කේ. ජී. බී. විජානායක.
ලේකම්.

ගරු නිශ්ශංක නිම්බෙරත්න මැතිතුමා
අධ්‍යාපන අමාත්‍යතුමා.



අමු. අං. 1995/09
1995. 05. 15

11

(උ) ඉහත දක්වා ඇති සුදුසුකම් නියමකර ඇත්තේ අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පීඨයන්ට ඇතුළුවීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සළකා බලා සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

18. අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව:-

අ.පෝ.ස. (උ.පෙ.) පන්තිවල සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත දැක්වෙන අයුරුවේ.

(අ) එම පාසලේ ඉගෙනුම් ලබන සිසුන්,

(ආ) අ. පෝ. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාළ විෂය ධාරාව නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්,

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත්වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්,

(ඈ) ඉහත (ආ) හා (ඇ) යටතේ අ. පෝ. ස. (උ. පෙ.) පන්තියට ඇතුළුවීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ලේඛනගතකොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත ලකුණු දීමේ ක්‍රමයක් යටතේ තෝරා ගැනීම කළ යුතුය. ලකුණු දීමේ ක්‍රමය අ. පෝ. ස. (සා. පෙ.) ප්‍රතිඵල හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ගත යුතුය.

(ඉ) අ. පෝ. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියළුම සිසුන්ට අ. පෝ. ස. (උ. පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළුවීමට ඉඩ සලසාදීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

19. අ. පො. ස. (උ. පෙ.) පන්තිවල අධ්‍යයනය කළ හැකි කාලසීමාව :-

(අ) අ. පො. ස. (උ. පෙ.) පාඨමාලාව 12 වන වසර සහ 13 වසර යනුවෙන් දෑඅවුරුදු කාලසීමාවකට සාමාන්‍යයෙන් සීමාවේ.

(ආ) ශිෂ්‍යයෙකු 12 වන වසර සම්පූර්ණ කළවිට 13 වසරට උසස් කළ යුතුවේ.

(ඇ) දහතුන්වන වසරේ සෑම ශිෂ්‍යයෙකුම එම වසර අවසානයේදී නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් අ. පො. ස. (උ. පෙ.) විභාගයට ඉදිරිපත් කළ යුතුය.

(ඈ) ශිෂ්‍යයෙකු තමා විශ්ව විද්‍යාලයේදී හැදෑරීමට බලාපොරොත්තුවන පාඨමාලාව සඳහා තෝරා නොගතහොත් දහතුන්වන වසරේ පාඨමාලාව නැවත එක්වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකිය.

20. පොදු කරුණු :

(අ) පිළිගත හැකි හේතුවක් නොමැතිව ජාතික පාසලකින්, ජාතික පාසලකට ළමුන් ඇතුළත් නොකළ යුතුය. එවැනි අවස්ථාවල මෙම අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය.

ගරු අධ්‍යාපන අමාත්‍ය

ඇමති . ඩී . ඩී . පීරිස්

ලේඛනේ

ගරු අධ්‍යාපන අමාත්‍ය

අධ්‍යාපන අමාත්‍ය

අමා. අං. 1999/14

1999. 05. 20

(ඇ) විද්‍යා අංශය :

නියමිත සම්මාන තුනෙන් එකක් විද්‍යාවට හෝ ගණිතයට හෝ විය යුතු ය. තවද විද්‍යාව හා ගණිතය විෂයයන් දෙකෙන්ම සමත් වී තිබිය යුතු ය.

(i) භෞතික විද්‍යා විෂය ධාරාව හැදෑරීම සඳහා ගණිතය II විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ඊට අමතරව විද්‍යාව I හෝ විද්‍යාව II හෝ විෂයය සමත් විය යුතු ය.

(ii) ජෛවීය විද්‍යා විෂය ධාරාව හැදෑරීම සඳහා විද්‍යාව II විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ඊට අමතරව ගණිතය I හෝ ගණිතය II හෝ විෂයය සමත් විය යුතු ය.

(ඉ) දොළොස්වැනි ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසුව තමන් තෝරාගත් විෂය ධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයකුට එම වර්ෂය තුළ දී අවශ්‍ය සුදුසුකම් තිබේ නම් එසේ කිරීමට ඉඩ දිය හැකිය. එසේ ඉඩ දෙනු ලබන්නේ අ. පො. ස. (උ. පෙ.) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් පමණක් ය යන කොන්දේසිය මතය. අනතුරුව පැවැත්වූ අ. පො. ස. (සා. පෙ.) විභාගයක ප්‍රතිඵල මත විෂය ධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඊ) ඉහත දක්වා ඇති සුදුසුකම් නියම කර ඇත්තේ අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පීඨයන්ට ඇතුළු වීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සලකා බලා සිය ශිෂ්‍යන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

18.0 අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව :

18.1 අ. පො. ස. (උ. පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්;

(ආ) අ. පො. ස. (උ. පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්;

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්.

16

ගරු ආචාර්ය රිවාණි නානායක්කාර මැතිනුමා

අධ්‍යාපන අමාත්‍ය

ලේඛනේ

ණ්. ඇන්ඩ්‍රෑ ද සිල්වා

අමා. අං. 2001/15

2001. 05. 29

18.0 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

18.1 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්

(ආ) අ.පො.ස (උ.පෙ) පන්ති නොමැති පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්

(ඈ) අ.පො.ස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි වයස අවු. 18 ට අඩු විද්‍යගතව සිට පැමිණෙන සිසුන් (සහතික වල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි.)

පොදු කරුණු

20.0 (අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. මේ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රශ්නයක් ශිෂ්‍යාවකට හෝ ශිෂ්‍යයෙකුට හෝ අභාරණයක් වන්නේ යැයි අදාළ අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

(ආ) විද්‍යගත ව සිට පැමිණෙන ළමයකු ඒ රටේ අධ්‍යාපනය ලැබූ පාසලට හෝ ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ පන්ති ශ්‍රේණි

වෛද්‍ය චාරා ද මැල්

ලේඛනේ .

ගරු ණ්. ණී. නුහිල් ප්‍රේමචන්ද්‍රන් මැතිනුමා

අධ්‍යාපන අමාත්‍ය .

අති. අං. 2003/23
2003.05.23

18.0 අ.පොස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

18.1 අ.පොස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් (වලංගුවෙයේ 17 වගන්තිය පරිදි සුදුසුකම් සපුරා ඇති සිසුන්)

(ආ) අ.පොස (උ.පෙ) පන්ති නොමැති පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 180 අඩු වෙනත් සිසුන්

(ඈ) අ.පොස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විද්‍යාගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි.)

20.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. තවද එකම නගරයක පිහිටන ජාතික පාසලකින් තවත් ජාතික පාසලකට (අ.පොස (උ.පෙ) විෂය ධාරාව නොමැතිවීම නිසා වෙනත් පාසලකට යාම හැර) කිසිසේත් ම යාමට අවසරයක් නොමැත. මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යෙයකුට හෝ ශිෂ්‍යාවකට හෝ අකාර්‍යාණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

ඒ. කේ. නානායක්කාර
ලේකම්
ගරු ආණ්ඩුකාර්‍ය කරුණානේන හොණ්ඩාවන්නු මැතිනුමා
අමාත්‍යාංශ අමාත්‍ය.

අති. අං. 2006/20
2006.05.23

19.0 අ.පොස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

19.1 අ.පොස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් (වලංගුවෙයේ 18.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂයධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා තිබේ නම් ඔවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්‍යයෙන් ම ලබාදිය යුතු ය.)

(ආ) අ.පොස (උ.පෙ) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති රජයේ පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 180 අඩු වෙනත් සිසුන්

(ඈ) පිළිගත හැකි කාර්‍යාරණ හේතු ඉදිරිපත් කරන විෂයධාරා තිබෙන රජයේ පාසල්වල සිසුන්

(ඉ) අ.පොස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විද්‍යාගත. ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි.) අ.පොස. (උ.පෙ) පංති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාතිකපෙත්තර පාසල්, ප්‍රාදේශීය පාසල් සිසුන්.

ආණ්ඩුකාර්‍ය හෝමයේ
ලේකම්.
ගරු ඒ. ඒ. සුනිල් ලේමල්සන්ත. මැතිනුමා
අමාත්‍යාංශ අමාත්‍ය.

23.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. (5 ශ්‍රේණි ශිෂ්‍යෙත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යෙයකුට හෝ ශිෂ්‍යාවකට හෝ අකාර්‍යාණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

අති. අං. 2008/17
2008.04.30

4.0 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

4.1 අ.පොස. (උ.පෙ) (12 ශ්‍රේණි) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) එම පාසලේ අපේක්ෂයෙන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (වලංගුවෙයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා හෙන බවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්‍යයෙන් ම ලබාදිය යුතු ය).

(ආ) අ.පොස. (උ.පෙ.) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂයධාරා නොමැති රජයේ පාසල්වල සිසුන් (ජාතික පාසලකට සිසුන් ඇතුළත් කිරීමේ දී එම පාසල අයත් කලාපය හුදු උසස් පෙළ පන්ති නොමැති හෝ අදාළ විෂය ධාරාව හෝ ශිෂ්‍යෙත්වය ඉල්ලුම් කරන විෂය සංයෝජනය හෝ නොමැති ජාතික පාසල් නොවන පාසල්වලින් අතුවුම් කරන සිසුන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය).

(ඇ) පිළිගත හැකි කාර්‍යාරණ හේතු ඉදිරිපත් කරන විෂය ධාරා තිබෙන වෙනත් රජයේ පාසල්වල සිසුන්

(ඈ) අ.පොස. (සා.පෙ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනවලට අනුකූල වන පරිදි) විද්‍යාගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි).

(ඉ) අ.පොස.(උ.පෙ.) පන්ති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික පාසල්වල සිසුන්. (අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් ඉල්ලුම් කළ යුතු ය.)

9.0 පොදු කරුණු

9.1 අ.පොස.(උසස් පෙළ) පන්තියකට ඇතුළත්වූ ශිෂ්‍යෙයක්/ශිෂ්‍යාවක් පිළිගත හැකි කාර්‍යාරණ හේතු ඉදිරිපත් කරන්නේ නම් පමණක් එම පාසලකින් තවත් පාසලකට ඇතුළත් වීමට අනුමැතිය ලබා දිය හැකි ය. එහෙත් දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයක පාසලකට ඇතුළත් වීමට බලාපොරොත්තු වන්නේ නම් සාධාරණ පදනම් මත බලා. අනුමැතිය ලබා දිය යුතුය. මෙහි දී ඇතුළත්වීමට බලාපොරොත්තු වන පාසලෙහි විද්‍යාගතියේ තිරාදර්‍ශය මත ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ- ගේ ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය දෙමව්පියන් විසින් ලබා ගත යුතුය.

ජේ. ජේ. ජේ. ඒ. බණ්ඩාර.
ලේකම්
ගරු ඒ. ඒ. සුනිල් ලේමල්සන්ත. මැතිනුමා
අමාත්‍යාංශ අමාත්‍ය

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

අමු. අං. 1986/2
1986.01.02

4.2.5 සිංහල, දෙමළ, ඉංග්‍රීසි හෝ බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, ක්‍රිස්තු ධර්මය (රෝ.ක.) ක්‍රිස්තු ධර්මය (රෝ. ක. නොවන) යන කවර හෝ විෂයයක් ඉහත සඳහන් විෂය ධාරාවන් යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයෙකු අ. පො. ස. (සා.පෙ.) විභාග යේදී එම විෂයයෙන් සම්මාන සමාර්ථයක් ලබා තිබිය යුතුය.

4.2.6 විද්‍යා විෂයධාරාව : නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් විද්‍යාවට හෝ ගණිතයට හෝ විය යුතුය. තවද, විද්‍යාව හා ගණිතය යන විෂයයන් දෙකෙන්ම සමත්වී තිබිය යුතුය.

4.2.7 දෙළොස්වන වසරට ඇතුලත්වීමෙන් පසුව නමක් තෝරාගත් විෂයධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයෙකුට එම වර්ෂය තුලදී අවශ්‍ය සුදුසුකම් ලබා නිසෙනම්, එසේ කිරීමට ඉඩදිය හැකිය. මෙසේ ඉඩ දෙනු ලබන්නේ අ.පො.ස. (උ.පෙ.) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයෙකුට ලබන කාල සීමාව වර්ෂ තුනක් පමණක්ය යන සොත්දේසිය වීනය. අනතුරුව පැවැත්වූ අ.පො.ස. (සා.පෙ.) විභාගයක ප්‍රතිඵල මත විෂයධාරාව වෙනස් කිරීමට ඉඩ ලැදුවු නොලැබේ.

4.2.8. ඉහත දක්වා ඇති සුදුසුකම් නියමකර ඇත්තේ අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට ඇතුලත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යයන පිරියන්ට ඇතුළුවීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සලකා බලා සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

4.3 අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට යිසුන් ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය

4.3.1. අ. පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරාගැනීමේ ප්‍රමුඛතාවය පහත දැක්වෙන අයුරු වේ:—

(අ) එම පාසලේ ඉගෙනුම් ලබන සිසුන්;

(ආ) අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාල විෂයධාරාව නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්;

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස පළමුවැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්.

4.3.2 ඉහත 4.3.1 (ආ) හා (ඇ) යටතේ අ.පො.ස. (උ.පෙ.) පන්තියට ඇතුළුවීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ලේඛණගත කොට ප්‍රා. අ. අ. විසින් අනුමත ලකුණු දීමේ ක්‍රමයක් යටතේ තෝරා ගැනීම කළයුතුය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල හා විෂයානු බද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ගත යුතුය.

4.3.3 අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියළුම සිසුන්ට අ.පො.ස. (උ. පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළුවීමට සලසාදීම ප්‍රා. අ. අ. ගේ. වගකීම වේ.

4.4 අ.පො.ස. (උ.පෙ.) පන්තිවල අධ්‍යයනය කළ හැකි කාල සීමාව

4.4.1 අ. පො.ස. (උ.පෙ.) පාඨමාලාව 12 වන වසර 13 වන වසර යනුවෙන් දෑවුරුදු කාලසීමාවකට සාමාන්‍යයෙන් සීමා වේ.

4.4.2 ශිෂ්‍යයෙකු 12 වන වසර සම්පූර්ණ කළවිට 13 වන වසරට උසස් කළ යුතුවේ.

4.4.3 දහතුන්වන වසරේ සෑම ශිෂ්‍යයෙකුම එම වසර අවසානයේදී අ.පො.ස. (උ.පෙ.) විභාගයට ඉදිරිපත් කළ යුතුය.

ර්. ණිල්. විජේමාන්න
ලේකම්
ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා அமைச்சர் Minister 2784832 2784807 2785617
ලේකම් செயலாளர் Secretary 2784811
කාර්යාල அலுவலகம் Office 2785141-50 Fax: 2784846
ඊමේල්/மின்னஞ்சல்-மெயில்: E-mail : isurupaya@moe.gov.lk
ඔබේ අංකය உமது இல. Your No.
අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர. கோட்டை.
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
මගේ අංකය எமது இல: My No. ED/01/12/02/06/01
දිනය திகதி Date 2012.05.03

චක්‍රලේඛ අංක 2012/14

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස හාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත.

අ.පො.ස. (උසස් පෙළ) පන්ති වලට සිසුන් ඇතුලත් කිරීම.

අ.පො.ස. (උසස් පෙළ) පංතිවලට සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛයට හා 2008.12.31 දිනැති අංක 2008 /17(1) හා 2009.06.02 දිනැති අංක 2008/17(II) මගින් නිකුත් කරන ලද සංශෝධනයන්ට අමතර වශයෙන් පහත සඳහන් සංශෝධන ද ඇතුලත් කරමි.

02. අංක 2008/17 චක්‍රලේඛයේ 4.0 හි 12 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

4.0 12 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ ප්‍රමුඛතාවය

4.1 අ.පො.ස (උසස් පෙළ) (12 ශ්‍රේණි) පන්තිවලට සිසුන් ඇතුලත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත දැක්වෙන පරිදි විය යුතුය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂයධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන මවුන් එම විෂයධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කලහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතුය.)

(ආ) අ.පො.ස. (උසස් පෙළ) පන්ති නොමැති රජයේ පාසල්වල හෝ අදාල විෂයධාරාව නොමැති රජයේ පාසල්වල හෝ අදාල මාධ්‍ය නොමැති රජයේ පාසල්වල සිසුන්

(ඇ) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනවලට අනුකූල වන පරිදි) විදේශගතව සිට පැමිණෙන සිසුන් (සහතික වල සමාන්තරතාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය)

(ඈ) අ.පො.ස. (උසස් පෙළ) පන්ති නොමැති හෝ අදාල විෂයධාරා නොමැති ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික පාසල්වල සිසුන් (අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉල්ලුම් කළ යුතුය.)

(ඉ) ඉගෙනුම් ලබන පාසලේ ඉල්ලුම් කරන විෂය ධාරාව හා මාධ්‍ය පවත්නා අවස්ථාවක වෙනත් පාසලක එම විෂය ධාරාවට හෝ මාධ්‍යය සඳහා සිසුවකු ඉල්ලුම් කරන්නේ නම් එම සිසුන් ඇතුලත් නොකළ යුතුය. එහෙත් තම පාසල්වල තව දුරටත් පුරප්පාඩු පවතින්නේ නම් දුෂ්කර ප්‍රදේශ වලින් අයදුම් කරන විශේෂ දක්ෂතා ඇති සිසුන් හා ස්ථාන මාරුවීම් ලැබ ජදිංවිය වෙනස් කරන රජයේ නිලධරයන්ගේ දරුවන් ඇතුලත් කර ගත හැකිය.


එසේම 4.2. 4.3. 4.4 හා 4.5 නොවෙනස්ව පවතින අතර 4.5 ට පහතින් සඳහන් සැ.යු. යනුවෙන් සඳහන් ඡේදය ඉවත් කරනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද සංශෝධනයන්ට අනුව අංක 2008/17 චක්‍රලේඛය මින් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු අතර එම චක්‍රලේඛයේ හා පළමු ඡේදයේ සඳහන් සංශෝධනයන්හි අඩංගු අනෙකුත් කරුණු සියල්ල එසෙසම බලපැවැත්වෙන බව අවධාරණය කරමි. තව ද මෙම චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන විදුහල්පතිවරුන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එච්. එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:
1.ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2.ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3.විභාග කොමසාරිස් ජනරාල්
4.අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5.විගණකාධිපති
6.අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
7.අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්
8.රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන්

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍ය



දුරකථන/தொலைபேசி இல/Telephone Nos.

අමාත්‍යතුමා அமைச்சர் Minister 2784832 Fax: 2784825

ලේකම් செயலாளர் Secretary 2784812

කාර්යාල அலுவலகம் Office 2785141-50 Fax: 2784846

ඊ-මේල්/E-mail: isurupaya@moe.gov.lk

ඔබේ අංකය உமது இல. Your No. .....

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල
இசுருபாய
பத்தரமுல்ல
"Isurupaya"
Battaramulla

මගේ අංකය எமது இல. My No. ED/01/12/02/06/0

දිනය திகதி Date 2013.04.24

චක්‍ර ලේඛ අංක 2013/4

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ පාසල් වල හා අනුමත පෞද්ගලික පාසල් වල ප්‍රධානීන් වෙත.

අ.පො.ස.(උසස් පෙළ) පන්ති වලට සිසුන් ඇතුළත් කිරීම

01. අ.පො.ස.(උසස් පෙළ) පංතිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති, 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛය හා එයට අදාළව නිකුත් කර ඇති 2008.12.31 දිනැති අංක 2008/17 (1) හා 2009.06.02 දිනැති අංක 2008/17 (11) දරණ සංශෝධනයන්ට අමතරව 2012.05.03 දිනැති 2012/14 දරණ චක්‍රලේඛයෙ හි 4.0 වගන්තියේ 12 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාවය සඳහන් 4.1 උපවගන්තිවල (ආ), (ඇ), (ඈ) හා (ඉ) යන උපවගන්ති පහත සඳහන් අයුරින් සංශෝධනය කරමි.

02. ඒ අනුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති වලට සිසුන් ඇතුළත් කිරීම පහත පරිදි සිදු කළ යුතුය.

03. 2012/14 චක්‍රලේඛයේ 4.0 වගන්තියට අනුව 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත පරිදි විය යුතුය.

(අ) එම පාසලේ අපේක්ෂකයන් ලෙස විභාගයට පෙනී සිටි සිසුන් (චක්‍රලේඛයේ 2.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂය ධාරාවට නිබිය යුතු අවම සුදුසුකම් සපුරා ගෙන ඔවුන් එම විෂය ධාරාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.)

(ආ) එකම 1 AB (උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ්‍ය) පාසලක් හෝ නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පිහිටි පාසල් වලින් අතිවිශිෂ්ඨ ලෙස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලබා ඇති ග්‍රාමීය පාසල් වල සිසුන්

(ඇ) (අ) හා (ආ) යන වගන්ති වලට අනුව සිසුන් ඇතුළත් කිරීමෙන් පසු නවදුරටත් පුරප්පාඩු පවතී නම් පාසල පිහිටි දිස්ත්‍රික්කයේ 1 AB නොවන පාසල් වලින් විශිෂ්ඨ ලෙස සමත් වූ සිසුන්

(ඉ) මෙම අනුපිළිවෙලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු උසස් පෙළ සියළු විෂය ධාරා යටතේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හා උසස් පෙළ ගුරුභවතුන් පංති වලට අනුයුක්ත කිරීම පිළිබඳ පූර්ණ වාර්තාවක් විදුහල්පතිගේ අත්සනින් අගෝස්තු 31 වන දිනට ප්‍රථම පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන ලේකම් වෙත ද/ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂක වෙත ද වාර්තා කළ යුතුය.

04. ඒ අනුව උසස් පෙළ පංතිවලට සිසුන් ඇතුළත් කිරීමට අදාළව නිකුත් කර ඇති 2008/17, 2008/17(1) හා 2008/17(11) හා 2012/14 යන චක්‍රලේඛයන් හි අන් උපදෙස් නොවෙනස්ව ඵලෙසින්ම පවතින බව වැඩි දුරටත් දන්වමි. මෙම චක්‍රලේඛ විධි විධාන උල්ලංඝනය කරනු ලබන විදුහල්පතිවරුන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අගමාත්‍ය.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා.

පොහොර හිඟය හේතුවෙන් ගොවීන් මුහුණදෙන දුෂ්කරතා : කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රකාශය

உரம் பற்றாக்குறையினால் விவசாயிகள் எதிர்நோக்கும் கஷ்டங்கள் : கமத்தொழில் அமைச்சரினது கூற்று

DIFFICULTIES FACED BY FARMERS DUE TO FERTILIZER SHORTAGE : STATEMENT BY MINISTER OF AGRICULTURE

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා 2013.07.09වන දින පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නයට මා පිළිතුර දෙනවා.

එතුමා අසා තිබුණු පළමුවන ප්‍රශ්නය මෙයයි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය සැලැස්ම සංශෝධනය කිරීමට තීරණය කරන ලද්දේ කවර විද්‍යාත්මක නිර්ණායක උපයෝගී කර ගනිමින්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනතේ 3වන වගන්තියට අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයාට තාක්ෂණික වශයෙන් උපදෙස් ලබා දීමට පොහොර උපදේශන කමිටුව පිහිටුවා ඇති අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ වී සම්බන්ධ විශේෂඥයින් විසින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල පාදක කර ගනිමින් පොහොර උපදේශන කමිටුව විසින් වී සඳහා පොහොර නිර්දේශය සංශෝධනය කරන ලදී. මෙතෙක් භාවිතා කළ පොහොර නිර්දේශය 2005 වර්ෂයේ සකසන ලද අතර, ඊට ප්‍රධානම සාධකය ලෙස සලකන ලද්දේ ශ්‍රී ලංකාව සහල්වලින් ස්වංපෝෂිත කිරීම සහ උපරිම අස්වැන්න ලබා ගැනීමය. එහෙත් නව නිර්දේශය සඳහා පාදක කර ගනු ලැබුවේ ගොවියාගේ ලාභාංශය අඩු නොකර, පාරිසරික හා සෞඛ්‍ය හිතකර ලෙස උපරිම අස්වැන්න ලබා ගැනීමය. ලංකාවේ ඇති රජරට වකුගඩු රෝගය හා අනෙකුත් රෝගාබාධවලට කෘෂි රසායනික ද බලපාන බවට සැක සහිත බවට ලෝක සෞඛ්‍ය සංවිධානය අදහස් දක්වා ඇත. නව නිර්දේශය රසායනික පොහොරවල කාර්ක්ෂමතාවය ඉහළ නංවා ගැනීම සඳහා අවධානය යොමු කර ඇති බැවින් යොදන පොහොර ප්‍රමාණවල වෙනසක් සිදු වී ඇතත්, අස්වැන්න අඩු නොවන බවට පර්යේෂණාත්මක දත්ත මගින් ඔප්පු කර ඇත. මෙම නිගමනය සඳහා දිවයින පුරා පවත්වන පර්යේෂණවල දත්ත පාදක කර ගන්නා ලදී. මේ සඳහා පත්‍ර වර්ණ දර්ශකය ද , ඒකාබද්ධ පෝෂණ මාධ්‍යය ද, කාබනික පොහොර භාවිතය ද, උනන්දු කරවීමේ තාක්ෂණය ද ඇතුළත් කර ඇත. එසේම නව පොහොර අවශ්‍යතාවය පවතින පොහොර තොග ප්‍රමාණයන් ද සැලකිල්ලට ගනිමින් පොහොර ආනයනික සැලැස්ම සංශෝධනය කරන ලදී.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

එතුමාගේ දෙවන ප්‍රශ්නය මෙයයි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය කප්පාදු කිරීමට නිර්දේශ කිරීමේදී සලකා බලා ඇති නිර්ණායකයන් කවරේ ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පොහොර ආනයනය කප්පාදු කිරීමක් සිදු කර නොමැත.

එතුමාගේ 3වන ප්‍රශ්නය මෙයයි. පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදු කළ යුතු වූ ණයවර ලිපි විවෘත කිරීම ජූනි මාසය දක්වා කල්යාමට හේතු කවරේද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. රාජ්‍ය පොහොර සමාගම සතු ප්‍රමාණවත් පොහොර තොග පැවතීම මත පොහොර ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම ජූනි මස දී සිදු කරන ලදි. තවද, නියමිත කාලයට පෙර පොහොර තොග ආනයනය කිරීම තුළින් රටේ විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයක් අනවශ්‍ය ලෙස අහුරා තැබීමට සිදු වෙයි.

එතුමාගේ 4වන ප්‍රශ්නය මෙයයි. 2013 වර්ෂය සඳහා ක්වෝටාවලට නියමිත පොහොර ලංකාවට ආනයනය සහතික කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. දැනටමත් 2013 ඉදිරි පොහොර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා පෞද්ගලික සමාගම්වලට අවශ්‍ය ක්වෝටා ලබා දීම සිදු කර ඇත. ක්වෝටා ප්‍රමාණයන් දීමට අවශ්‍ය වන්නේ, දේශීය අවශ්‍යතාවය නිර්ණය කර ගැනීම -වැවිලි සහ අනෙකුත් භෝග සඳහා- සහ නිසි පාලනයක් සිදු කර ගැනීම යන කරුණු සඳහා ය. දැනට ලබා දුන් ක්වෝටා ප්‍රමාණය තීරණය කරන ලද්දේ ඉහත කරුණු හා එම ආයතනය විසින් 2012 වර්ෂයේ ආනයනය කරන ලද පොහොර ප්‍රමාණයන් ද සැලකිල්ලට ගනිමිනි. කෙසේ නමුත් අදාළ පෞද්ගලික සමාගම්වලට ආනයනික සැලැස්ම ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව පොහොර ආනයනය සිදුවේ ද යන්න සනාථ කර ගැනීම සඳහා ප්‍රගති සමාලෝචන සෑම කාර්තුවකදීම සිදු කිරීමට කටයුතු යොදා ඇත. දෙවන කාර්තුවේ රැස්වීම ජූලි 15වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර ඒ අනුව පොහොර නියමිත පරිදි ආනයනය සහතික වීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරනු ඇත. ඒ අනුව වර්ෂයට අදාළ පොහොර ප්‍රමාණය නියමිත කාල සීමාවන්වලදී ආනයනය කිරීම සහතික කෙරේ.

එතුමාගේ 5 වන ප්‍රශ්නය මෙයයි. ලෝක වෙළඳ පොළේ පොහොර මිල ගණන් වෙනස් වීමට අනුව සමාගම් වෙත සහනාධාර ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සැකසිය නොහැක්කේ මන්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. භාණ්ඩාගාරයේ ප්‍රධානත්වයෙන් අදාළ සියලු පාර්ශ්ව නියෝජනය වන පරිදි පෞද්ගලික අංශයේ පොහොර ආනයනය කරන සමාගම්වල පොහොර ආනයනය සහ බෙදා හැරීමේ වියදම ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මෙම කමිටුව මඟින් පොහොර ආනයනය කරනු ලබන විදේශ විනිමය ප්‍රමාණය මෙන්ම දේශීය වියදම් ප්‍රමාණය ද තීරණය කරනු ලබයි. අදාළ ආනයනික වියදම තීරණය කිරීමේදී ඔවුන් විසින් දරන ලද ආනයනය කිරීමේදී වැය වූ මුදල ද ලෝක වෙළඳපොළේ පොහොර මිල ගණන් උච්චාවචනයන් හා රාජ්‍ය පොහොර සමාගම් ආනයනය සඳහා වැය වන මිල ගණන් ද සැලකිල්ලට ගනු ලබයි.

එතුමාගේ 6වන ප්‍රශ්නය මෙයයි. පොහොර හිඟය සහ එම ප්‍රමාදය හේතුවෙන් ගොවීන්ගේ අස්වැන්නට ඇති වන අහිතකර බලපෑමට වගකීම භාර ගන්නේ කවුරුන් විසින් ද ? අස්වනු හානි වී ඇත්නම් ගොවීන්ට හානිපූර්ණ වන්දි ප්‍රදානයක් සිදු වනු ඇත්ද?

එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. අස්වැන්නේ කිසිම අඩු වීමක් හෝ ප්‍රමාදයක් හෝ සිදු වන්නේ නැති බවට සහතික වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

වරප්‍රසාද : "ලංකාදීප" සහ "අද" යන පුවත් පත්හි සහ "ඔත්තුකරු" වෙබ් අඩවියේ පළ වූ වාර්තා

சிறப்புரிமை : 'லங்காதீப' மற்றும் 'அத' பத்திரிகைகள் மற்றும் 'ஒத்துகரு' இணையத் தளத்தில் வெளியான அறிக்கைகள்

PRIVILEGE: REPORTS IN "LANKADEEPA" AND "ADA" NEWSPAPERS AND "OTHTHUKARU" WEBSITE

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මස 09වන දින සහ 10වන දින "ලංකාදීප" සහ "අද" කියන පුවත් පත් දෙකේත් ඒ වාගේම "ඔත්තුකරු" නම් වෙබ් අඩවියේත් සඳහන් වුණු ප්‍රවෘත්තියක් පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ අමාත්‍යවරයෙකුගේ සහෝදරයෙක් පොලිසියේ අණ නොතකා රිය ධාවනය කළාය කියාත්, ඉහළ බලපෑමකින් ඔහුව නිදහස් කළාය කියාත් මේ පුවත් පත් දෙකේ සඳහන් කර තිබුණා. ඒකට මගේ නම සඳහන් කර තිබුණා. මේ පිළිබඳව "අද"පත්තරයේ ප්‍රධාන කර්තෘ චම්න්ද කියා මහත්මයෙක් මට දුරකථනයෙන් කථා කර කිව්වා, ගම්පහ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් දෙන ලද දුරකථන ඇමතුමක් පදනම් කර ගෙන තමයි මෙසේ සඳහන් කළේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ සහෝදරයා ඉන්නේ විදේශ ගත වෙලායි. ඒ නිසා මෙය සම්පූර්ණ අසත්‍ය තොරතුරක්. පළමුවන කාරණය, පොලිස් නිලධාරියෙකුට මාධ්‍යයකට එවැනි ප්‍රකාශයක් කරන්නට බැහැ.

දෙවැනි කාරණය මෙයයි. මෑත කාලයේදී මාධ්‍ය විසින් සංවිධානාත්මකව රජයේ අමාත්‍යවරුන්ට විරුද්ධව යම් යම් ප්‍රචාර කළ ආකාරය අප දැක්කා. මේවා අභූත චෝදනායි. ඔවුන් පොඩි සිද්ධියක් මුල් කරගෙන එය මහා ලොකුවට පෙන්වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රවෘත්තිය වැරැදියි කියලා මම "අද" පුවත් පතේ කර්තෘවරයාට කියද්දිත් ඔහු මෙය පළ කර තිබුණා. ඒ නිසා මෙය සම්පූර්ණ වැරැදි දෙයක්. මගේ සහෝදරයෙක් ලංකාවේත් නැහැ. එවැනි සිද්ධියක් වෙලාත් නැහැ.

පසු ගිය කාලයේ දිගින් දිගටම මේ විධියට සුළු සිද්ධීන් මුල් කරගෙන අමාත්‍යවරුන්ට චෝදනා එල්ල කරමින්, මහා ලොකුවට ඒවා මාධ්‍යවලින් හුවා දක්වපු ආකාරය අප දැක්කා. එපමණක් නොවෙයි, මාධ්‍ය විසින් අසත්‍ය ප්‍රවෘත්ති හදලා රජය අපහසුතාවට පත් කරන්න කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පිළිබඳව පොලිස්පතිතුමාට පැමිණිල්ලක් කළා. ඒ වාගේම මාධ්‍යයත් මේ පිළිබඳව දැනුවත් කරන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කොට වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කිරීමට කටයුතු කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය කුමක්ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා එතුමා පිළිබඳව මාධ්‍යයක පළ වූ ප්‍රවෘත්තියක් ගැන තමයි මේ කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහනවා. අප කවුරු හෝ කෙනෙක් පිළිබඳව, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වේවා විපක්ෂයේ වේවා යම් මන්ත්‍රීවරයකු හෝ ඇමතිවරයකු පිළිබඳව කවර හෝ මාධ්‍යයක යමක් කියනවා නම් ඒ පිළිබඳ අපට පාර්ලිමේන්තුවේ මතු කළ හැකිද? එසේ නම් ගරු ඇමතිතුමනි-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එය point of Order එකක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන කොට පාර්ලිමේන්තුවට ඒ සම්බන්ධ නීති උපදෙස් නොයෙක් ආකාරයෙන් ලැබෙනවා. එහෙම නම් නීති උපදෙස් ලැබිලා නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. තුනෙන් දෙකේ බලය තිබෙනවා කියලා, අපට ඕනෑ දෙයක් සම්මත කර ගන්න පුළුවන් කියලා, හදිසියේ පනත් කෙටුම්පතක් ගෙනාවා. එහෙම කරන්න පුළුවන්. ඒක නීතියක් බවටත් පත් වෙනවා. නමුත් ක්‍රියාත්මක කරන්න බැරි තැන්වලදී ඒක හිර වෙනවා. ඒ සම්බන්ධයෙන් එක උදාහරණයක් තමයි මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොට්ඨාස බෙදීම පිළිබඳව - delimitation පිළිබඳව - වචන ස්වල්පයක් කථා කරන්නම්, මේ ප්‍රධාන කරුණට පස්සේ. මේ නීතියේ තිබෙන ප්‍රශ්නය පිළිබඳව කථා කළාට පස්සේ මම ඒ ගැන කථා කරන්නම්. ඔබතුමන්ලා යෝජනාවක් ගෙනාවා. අද රටේ ඇති වෙලා තිබෙන ජන වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ගෙනෙන්න විශේෂ කාරක සභාවක් පත් කරන්නයි ඒ යෝජනාව ගෙනාවේ. ඒකට සියලුම දේශපාලන පක්ෂවල සභාගිත්වය අවශ්‍යයි කියලා කිව්වා. අපි එක්සත් ජාතික පක්ෂය හැටියට මේ පිළිබඳව බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරනවා. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න අවස්ථා කිහිපයකදී එක එක කොමිෂන් පත් කරලා තිබෙනවා. රජය හැටියට එක එක ප්‍රතිඥා දීලා තිබෙනවා. අද මේවා ඔක්කෝම බැහැර කරලා වෙනත් කතන්දරයකට ගිහිල්ලායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ස්වෛරී රාජ්‍යයක්. තීන්දු තීරණ ගැනීමේදී ඒ අනුව කටයුතු කරන්න අපට බලය තිබෙනවා. ඒක ඇත්ත. ඒ වාගේම ජාත්‍යන්තරය එක්ක කටයුතු කිරීමේදී අපට ලොකු බැඳීමක් තිබෙනවා. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ.

ඒ බැඳීම අනුව, මේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා ගත යුතු පියවර ගන්නට ඉතිහාසයේ ඉඳලා රජයන් හුඟක් අවස්ථාවල ලෑස්ති වෙලා යම් යම් ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. යුද්ධයෙන් පස්සේ අද අප අලුත් තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. අද අප අතේ තිබෙනවා ප්‍රධාන කරුණු කීපයක්. ඒ ප්‍රධාන කරුණු කීපය තමයි, මේ ප්‍රශ්නය විසඳන්න දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව යම් යම් කරුණු සාකච්ඡා කරලා -ජාත්‍යන්තර වශයෙන්- එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමා සමඟ අපේ ජනාධිපතිතුමා අත්සන් කරපු අවබෝධතා ගිවිසුම; ඒ වාගේම, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ඇති කර තිබෙන පළාත් සභා ක්‍රමය ඉදිරියට ගෙන යන්නට, ඒ කියන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තවත් බලතල ලබා දෙන්නට අපේ ජනාධිපතිතුමා ඉන්දියානු අගමැතිතුමා සමඟ වූ එකඟතාව; ඒ වාගේම, තිස්ස විතාරණ කමිටුව බොහෝ කාලයක් සාකච්ඡා කරලා සියලු දෙනාගේ එකඟතාවෙන් ගත් තීන්දුව සහ අප ජාත්‍යන්තරයට වෙච්ච පොරොන්දුව අනුව පත් කරන ලද LLRC එකේ වාර්තාවෙන් මේ ප්‍රශ්නය පිළිබඳව අපට දීලා තිබෙන නිර්දේශ. මේ සියල්ලම අහකට දමලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන්, බලය බෙදීම සම්බන්ධයෙන් අද හිතුවක්කාර ගමනක් යන්න ආණ්ඩුව ලෑස්ති වෙලා තිබෙනවා. ඒ අතර තමයි විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාව ගෙනාවේ. මේ යෝජනාවේ බොහොම පැහැදිලිව තිබෙනවා මේ සඳහා 31දෙනකුගෙන් යුතු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. මේ යෝජනාවට අත්සන් කරලා තිබෙනවා රවුෆ් හකීම් මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, වාසුදේව නානායක්කාර මැතිතුමා වාගේ විශාල පිරිසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරක සභාවට දැන් පත් කරලා තිබෙනවා මන්ත්‍රීවරුන් පිරිසක්. ගරු කථානායකතුමා මන්ත්‍රීවරුන් 19දෙනකු විතරයි ඒ කමිටුවට නම් කළේ. මේක රජයෙන් අහලා කළාද, එහෙම නැත්නම් ගරු කථානායකතුමාගේ වුවමනාවට කළාද, එහෙමත් නැත්නම් සාකච්ඡාවකින් වූ එකඟතාවකින් කළාද කියලා මම දන්නේ නැහැ. කොහොම වුණත්, 19දෙනායි ඉන්නේ මේ කාරක සභාවේ. මේ කාරක සභාව දැන් වැඩ කටයුතු කරනවා. මේ විධියේ කාරක සභාවක් පත් කරන කොට, ඒ කාරක සභාවට විපක්ෂයේ නියෝජිතයන් නම් කරන්නේ නැත්නම් මොකක්ද කරන්න ඕනෑ? මා දන්නා පිළිවෙළට ආණ්ඩු පක්ෂයට පුළුවන් පත් කරන්න, දැන් පත් කරලා තිබෙනවා වාගේ. ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් මූලික වෙලා කටයුතු කරන, මේ යෝජනාවට අත්සන් කරපු ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කථානායකතුමා නම් කරපු මේ 19දෙනා අතර නැහැ. ඉතින්, කොහොමද ප්‍රශ්නය විසඳන්නේ? මේක නීතිය පිළිබඳ ප්‍රශ්නයක් හැටියට දකිනවා කියලා මා කියන්න හේතුව මේකයි. මේ යෝජනාවේ තිබෙන්නේ 31දෙනකු පත් කරන්න කියලායි. දැන් පත් කරලා තිබෙන්නේ 19දෙනායි. දැන් ඒ 19දෙනා රැස් වෙනවා. මම ඔබතුමාගෙන් අහනවා, කොහොමද එහෙම වෙන්නේ කියලා ගරු ඇමතිතුමනි. පාර්ලිමේන්තුවේ යෝජනාව වෙලා තිබෙන්නේ 31දෙනකු පත් කරන්න කියලායි. නමුත් ගරු කථානායකතුමා පත් කරලා තිබෙන්නේ 19දෙනායි. ඉතිරි පිරිස නම් කරන කල් ඉන්න පුළුවන්. ඒකට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුවේ ඉන්නවා නම් මේ සඳහා මැදිහත් වෙලා සාකච්ඡා කරන්න කැමැති අය, ඒ අයගෙන් පත් කරන්නත් පුළුවන්. මගේ තර්කය වන්නේ, පාර්ලිමේන්තුවේ යෝජනාව වුණේ 31දෙනකු පත් කරන්න වුණත් 19දෙනකු පමණක් පත් කර තිබීම ගැනයි. දැන් ඒ විශේෂ කාරක සභාව රැස් වෙනවා. දැනට එක වරක් රැස් වුණා. කොහොමද එහෙම රැස් වෙන්නේ? මම මේ සඳහා තමුන්නාන්සේගෙන් පිළිතුරක්

බලාපොරොත්තු වනවා, ගරු ඇමතිතුමනි. දැන් නොවෙයි, තමුන්නාන්සේගේ කථාවේදී.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේදී නීති විරෝධී විධියට, නීතිය නොදන්නාකමට වැඩ කටයුතු කළා. පළමුවැනි කාරණය ඒකයි.

දෙවන කාරණය වශයෙන් මා කියන්නේ මේකයි. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කිරීමේදී ඒ සඳහා 31දෙනකු පත් කරන්න කියා ගෙනාපු යෝජනාව පැත්තකට දමලා, 19දෙනකු පත් කර තිබෙන එකයි. මෙම ප්‍රශ්නයට සම්බන්ධ, ඒක විසඳන්න ඕනෑය කියා කැමැත්තක් තිබෙන ආණ්ඩුවේ ප්‍රධාන අය -විශේෂයෙන් දෙදෙනකු- ඒකෙන් අයින් කරලා තිබෙනවා. රවුෆ් හකීම් ඇමතිතුමාත්, ඒ වාගේම පක්ෂ සියල්ලම එක්ක මේ ප්‍රශ්නය පිළිබඳව පුළුල් සාකච්ඡාවක් මෙහෙයවූ කමිටුවක සභාපතිවරයා හැටියට කටයුතු කරපු තිස්ස විතාරණ ඇමතිතුමාත් මෙම විශේෂ කාරක සභාවට පත් කරලා නැහැ. එහෙම නම් මා කියනවා, මෙයත් නීතියට පිටස්තරව, තුනෙන් දෙකක බලයක් තිබෙනවාය කියලා, වැඩි බලයක් තිබෙනවාය කියලා නිතුවක්කාර ලෙස මෙම පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු මෙහෙයවන කොමිටියක් කියලා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඇයි යූඑන්පී එක -

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ ප්‍රශ්නය ඒක නොවෙයි නේ. ඒකට මා වෙනම උත්තර දෙන්නම්. මගේ ප්‍රශ්නය තේරුම් ගන්න. 31දෙනකු පත් කරන්න ඕනෑ එකට 19දෙනකු පත් කරලා, ඉතිහාසයේ සිට මෙම ප්‍රශ්නයට මැදි වෙලා හිටපු ආණ්ඩුවේ රවුෆ් හකීම් ඇමතිතුමාත්, තිස්ස විතාරණ ඇමතිතුමාත් ඇයි පත් නොකළේ? මගේ ප්‍රශ්නය ඒකයි. යූඑන්පී එක ගැන වෙනම කථා කරමු. [බාධා කිරීමක්] කරුණාකරලා තමුන්නාන්සේ ඔහොම ඉඳ ගෙන කථා කරන්නත් එපා; හිට ගෙන කථා කරන්නත් එපා. හොඳට ඇහුම් කන් දෙන්න. මා මතු කරන්නේ නීති ප්‍රශ්නයක්. [බාධා කිරීමක්] එය කාගෙන්වත් අහන දෙයක් නොවෙයි. මා අහන්නේ පාර්ලිමේන්තුවෙන්.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක අවශ්‍ය නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා අහන්නේ පාර්ලිමේන්තුවෙන්. මා අහනවා, හෙට ඉඳලා මේ විශේෂ කාරක සභාවට රැස් වෙන්න පුළුවන්ද? මේ විශේෂ කාරක සභාවට රැස් වෙන්න බැහැ. එහෙම නම් මේ විශේෂ කාරක සභාව රැස් වීමත් නීතියට පටහැනිව කෙරෙන වැඩක් හැටියටයි මා දකින්නේ.

ඊළඟ කාරණාව කොටියාස බෙදීම පිළිබඳවයි. මා ඒ ගැන විශේෂයෙන් මතක් කරනවා. රවුෆ් හකීම් ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් මතක් කළා. කොටියාස බෙදීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් අහන්න පුළුවන් නේ. අපි බලාපොරොත්තු වුණු විධියට නොවෙයි ඒ වැඩේ කෙරිලා තිබෙන්නේ. අපි එකඟතාවක් ඇති කර ගත්තා, බොහොම සාධාරණ විධියට මේ දේ කරන්න. අද ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු මා එක්ක කියලා තිබෙනවා, කොටියාස බෙදීම කරලා තිබෙන්නේ නිවැරැදි ක්‍රමයට නොවෙයි කියලා. එක් එක් කෙනාට තමන්ගේ පුද්ගලයන් පත් කර ගන්න පුළුවන් ආකාරයට කිසිම පදනමක් නැතුවයි මේ කොටියාස බෙදීම කරලා තිබෙන්නේ. ජා-ඇලත් එක කොටියාසයක් තිබෙනවා. ඒ ගැන මා තමුන්නාන්සේට කියන්නම්.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තවම finalize කරලා නැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හදන්න ඕනෑ නිසායි මේ කියන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කියන්න යන දේ මා දන්නවා. දෙසැම්බර් මාසය දක්වා කල් දමා තිබෙනවා; අපට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් - [බාධා කිරීමක්]

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මඩ ගහන්න බැහැ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මඩ ගැහුවේ නැහැ නේ.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
විශේෂයෙන් කොමිටි පත් කර තිබෙනවා. ඒ එක් එක් මන්ත්‍රීවරුන්ගේ -

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවයි මෙතුමා ගන්නේ. [බාධා කිරීමක්] මා දන්නවා. කරුණාකරලා මගේ වෙලාව ගන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව ගන්න එපා කියන්න. මට disturb කරන්නත් එපා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, එතුමාගේ කථාවේදී එතුමා පැහැදිලි කරයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වැදගත් කරුණක් කියන කොට, තමුන්නාන්සේලා කෑ ගහලා ඒක යටපත් කරන්න එපා. [බාධා කිරීමක්] ඒක හරි නේ. අපි එකඟ වුණා නේ. [බාධා කිරීමක්] දැන් මා කථා කරනවා. ගරු ඇමතිතුමාට වෙලාව තිබෙනවා, මේවාට උත්තර දෙන්න. කරුණු පැහැදිලි කර දෙන්න ඔබතුමාට වෙලාව දෙන්න මගේ කැමැත්ත ඕනෑ. ගරු ඇමතිතුමනි, මගේ කැමැත්ත නැතුව පැහැදිලි කරන්න බැහැ. ඒ පැහැදිලි කිරීම කරන්න ඔබතුමාට වෙලාවක් තිබෙනවා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

මා පැහැදිලි කළේ මෙයයි. තමන්ගේ මිනිසුන් පත් කරන්න පුළුවන් විධියට ඉතාම වැරැදි පිළිවෙළට රජයේ මන්ත්‍රීවරු, සංවිධායකවරු ලැයිස්තුව හදලා දුන්නා, මෙහෙමයි කරන්න ඕනෑ කියලා. අන්න ඒ විධියේ වැඩක් සිද්ධ වෙලා තමයි ජාතික කමිටුවට ගිහින් තිබෙන්නේ. අපි ඒකයි ගරු ඇමතිතුමා දැනුවත් කරන්නේ. අපි දන්නවා, රජයම මැදිහත් වෙලා ඒ ගැටලුව විසඳන්න තවත් කල් දුන්නා කියලා. ඒ ගැන අපි ස්තුතිවන්ත වනවා. ඇමතිතුමනි, මෙය නිවැරැදියි කියන්න එපා. අපි අහන්නේ, ඒවා නිවැරැදි කර ගන්නේ කොහොමද කියලායි. දැන් යම්කිසි තීරණයක් අරගෙන තිබෙනවා නම්, ඒ තීරණය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අප දැනුවත් කරන්න, මෙන්න මේකයි කොටියාස බෙදීමේ ක්‍රමය කියලා. මේ රටේ ජනතාව කවුරුත් දන්නේ නැහැ, කොහොම කොටියාස බෙදනවාද කියලා. ඇමතිතුමාට ඒ නිර්දේශය ලැබුණාම එය හරි හෝ වැරැදි හෝ වේවා ජනාධිපතිතුමාට යවනවා. ඊට පස්සේ එතුමාටත් මේ සම්බන්ධයෙන් සොයන්න ක්‍රමයක් නැහැ. ඊට පස්සේ ගැසට් කරනවා. මෙහෙම තමයි කොටියාස බෙදීමේ නීතිය අනුව කොටියාස පිහිටු වන්නේ.

මා ඔබතුමාට යෝජනා කරන්නේ, මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියායි. "මෙන්න මෙහෙමයි අප කරන්න යන්නේ." කියා දැනුවත් කරන්න. "ප්‍රාදේශීය ලේකම් කොටියාස මට්ටමින්, පළාත් පලන ආයතන මට්ටමින් මේ ජාතික කමිටුවට ලැබී තිබෙන තොරතුරු අනුව, අප නිර්දේශ කර තිබෙන්නේ මේ ආකාරයටයි, මේකට විරුද්ධත්වයක් තිබෙනවා නම්, ඒක ඉදිරිපත් කරන්න." කියා ජනතාව දැනුවත් කරන්න. මේක අපට දෙන දෙයක් නොවෙයි. මේක මහජනයාට දෙන දෙයක්. මේක කරලා ඉවර වුණායින් පස්සේ තමයි, ඒක නිවැරදි කරන්න ආපසු පාර්ලිමේන්තුවට ගේන්න වෙන්නේ. මා කියන්නේ, ඊට ඉස්සෙල්ලා අපට මේක නිවැරදි කරන්න පුළුවන්ය කියායි. දැනට හදලා තිබෙන ලැයිස්තු ටික තීරණ ටික අනුව, මෙන්න මෙහෙමයි කොටියාස ටික බෙදෙන්නේ, මෙන්න මෙහෙමයි බහු ආසන හැදෙන්නේ කියා පෙන්නුවාම ජනතාව දැනුවත් වෙනවා. ජනතාව ඒ ගැන කථා කරාවි. [බාධා කිරීමක්] ඒක වැරදි නම් පස්සේ කියන්න. ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] මම මෙය කියන්නේ, මඩ ගහන්නට නොවෙයි. මෙය මා දන්නා දෙයක්.

ජා ඇල මැතිවරණ කොටියාසයයි, නාගොඩ මැතිවරණ කොටියාසයයි බහු කොටියාසයක් කරලා. කිසිම පදනමක් නැහැ. ප්‍රධාන පාර දෙපැත්තේ තිබෙන කොටියාස දෙකක් අර ගෙන එකට ඇදලා බහු කොටියාසයක් කරලා. මම මේ කියන්නේ දන්නා දෙයක්. ඔබතුමා මේ ගැන සොයා බලන්න. [බාධා කිරීමක්] මොකක්ද අප මේ කථා කරන්නේ? මගේ මතය තමයි මා කියන්නේ. ඒක වැරදියි කියලා තමුන්නාන්සේ කියනවා නම්, ඒක තමුන්නාන්සේගේ වැඩක්. [බාධා කිරීමක්] මට තේරෙනවා නේ. මා කියන්නේ, ඒ අරගෙන තිබෙන තීරණ ටික ගැසට් කරන්නට පෙර මහජනතාව දැනුවත් කරන ක්‍රමවේදයක් හදන්න කියලායි. ඔබතුමා පිළිගත්තා නේ. [බාධා කිරීමක්] "බලමු" නොවෙයි කරමු. දැන් එකඟතාවක් තිබෙනවා නේ. මේ අනුව බලන විට අපට කොටියාස බෙදීම පිළිබඳව නිවැරදි වැඩ පිළිවෙළකට යන්නට පුළුවන්.

විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු අනෙක් කාරණය තමයි ජන පදනම. සමහර කොටියාසවල තිබෙන්නේ ජන්ද 2,000 යි. සමහර කොටියාසවල තිබෙන්නේ ජන්ද 5,000 යි. කොහොමත් එහෙම වෙන්න බැහැ, භූමියේ වෙනස්කම් ගත්තත්. ළඟ තිබෙන කොටියාසයේ ජන්ද 2,000කට කැඩෙනවා. ඊළඟට අල්ලපු කොටියාසයේ ජන්ද 5,000කට කැඩෙනවා. මේ විධියට වැරදි ක්‍රියා කලාප කිහිපයක් ඇති කරලා, මේවා මතු වෙනකොට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලියුම් එවා තිබෙනවා ඇවිල්ලා මේ ගැන බලන්න කියා. අපට එහෙම ලියුම් එව්වෙත් නැහැ, අපි බලන්න ගියේත් නැහැ. කරුණාකර, දැනට සකස් කර තිබෙන වැඩ පිළිවෙළ ගැන අපව දැනුවත් කරන්නය කියා මේ ඉන්න මන්ත්‍රීවරුන්ට කියන්න. "අප ගත්ත පදනම මෙන්න මේකයි, ඒ පදනම උඩ මේ කොටියාසවල තිබෙන විශාලත්වය අප සොයා බැලුවා. ජාතීන් අනුව ලැබෙන්නට තිබෙන අයිතිවාසිකම් පිළිබඳව අප සොයා බැලුවා. ආගම් අනුව සොයා බැලුවා." කියා ඒ පිළිබඳව පැහැදිලි කරන්න.

උදාහරණයකට කිව්වොත්, අපේ ගම් හැදිලා තිබෙන ක්‍රමය බලමු. පන්සලක් තිබෙනවා නම් ඒ පන්සල අවට එක ජන කොටියාසක් තමයි ජීවත් වෙන්නේ. ඒ බෞද්ධ ජනතාවයි. මීගමුවේ බැලුවොත් ගරු හකීම් ඇමතිතුමා කිව්වා වාගේ, මුස්ලිම් පල්ලිය වටා ප්‍රදේශයේ තමයි මුස්ලිම් ජනතාව ජීවත් වෙන්නේ. ඒ වාගේම කතෝලික අයටත්, ක්‍රිස්තියානි අයටත් පල්ලියක් තිබෙනවා. ඒ පල්ලිය අවට තමයි ඒ ජනතාව ජීවත් වන්නේ. ඒ පරීක්ෂණය කළාම, මේ කාරණය මා තමුන්නාන්සේට සනාථ කරන්නම්. පල්ලියට තිබෙන ගම් දෙකක් දෙපැත්තට බෙදලා. එකක් ඇඳලා බෞද්ධ පළාතට; පන්සලට. අනෙක් එක තවත් තැනකට ඇඳලා. පල්ලියත් බෙදෙනවා. පන්සලත් බෙදෙනවා. මේ කාරණා සියල්ලම අද සිද්ධ වෙලායි තිබෙන්නේ. එම නිසා මා මේ කාරණය ගැන ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේක අපට විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ටත් තිබෙන ප්‍රශ්නයක්. ඒ අයත් අප එක්ක කිව්වා,"අපට කථා කරන්නට විධියක් නැහැ. තමුන්නාන්සේලාවත් මේ ගැන කථා කරන්න" කියා. එම නිසායි මා මේ කාරණා ගැන සඳහන් කළේ.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මේ කොටියාස බෙදන කොට ඒ ඒ මන්ත්‍රීවරුන්ට රාජකාරිය කරන ක්‍රම පිළිබඳව මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් හදලා දෙන්න; බලයක් දෙන්න. ඒ අය හැම තිස්සේම කියන දෙයක් තමයි, අප අත් දැකපු දෙයක් තමයි, පළාත් පාලන ආයතනවලට ඔප්පු, මුද්දර ගාස්තු, දඩ මුදල් ආදිය ලැබෙන කොට, ඒවා පළාත් සභාව තියා ගන්නවාය කියන එක. නමුත් ඒවායේ අයිතිය තිබෙන්නේ පළාත් පාලන ආයතනයටයි. නමුත් ඒවාට දෙන්නේ නැහැ. මේ ප්‍රශ්නය හරියට තිබෙනවා.

අද නිතුවක්කාර ආකාරයට ගෙවල් හදනවා. සැලැස්මක් අනුමත කරන්නේ නැහැ. මේ වාගේ වෙලාවකදී ක්‍රියා කරන ආකාරයක් අපට පේන්නේ නැහැ. ඉදිරියේදී එක තැනක පාරේ පළල අඩි 20ක් වෙයි, තව තැනක අඩි 10ක් වෙයි කියලා. අනාගතයේ එහෙම වෙයි කියලා අපට හිතෙනවා. මේ අත්දැකපු දේවල් අප මේ කියන්නේ. වාහන මෙපමණ සංඛ්‍යාවක් මේ පාරේ යයි, විදුලි බලය එයි, අප ජලය දෙන්න ඕනෑ, කානු දමන්න ඕනෑ, ඒ නිසා මෙන්න මේ පළලත් තිබෙන්න ඕනෑය කියා කියනවා. මේවා නීතියෙන් කියා තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වන්නේ නැහැ. මම කියන්නේ නැහැ කොයි දේශපාලන පක්ෂයද කියලා. ඉස්සර එහෙත් වුණා. දැන් මෙහෙත් වෙනවා. මෙයින් සිදු වන්නේ සැලසුම් සහගත නොවන අව්ධිමත් පාලනයක් මේ කොටියාස තුළ ඇති වීමයි. ඊට පසුව සැලසුම් හදන්න යන කොට ගෙවල් කඩන්න වෙනවා. විශාල වශයෙන් වන්දි ගෙවන්න වෙනවා.

අනික් කාරණය මෙයයි. සමහර පළාත් පාලන ආයතන නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ සම්බන්ධීකරණයක් කළා. එහෙම සම්බන්ධීකරණය කළාම විවිධ කටයුතුවලදී බදු ගෙවන්නන්ට නාගරික සංවර්ධන අධිකාරියට විශාල මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඒ කෙරෙහි මා තමුන්නාන්සේගේ විශේෂ අවධානය යොමු කරවනවා. මෙය මැතිවරණ -ඡන්ද විමසීම්- හා සම්බන්ධ පනත් කෙටුම්පතක් වුණත්, මේ ක්‍රියාකාරීත්වය පිළිබඳව වෙනම කථාවක් ඇති කරන්න වෙනවා. එසේ කරලා මීට වඩා බලතල එම ආයතනවලට දෙන්න.

මම උදාහරණයක් කියන්නම්. බොහෝ දුරට රජයේ මුදල් වෙන් කරන කොට ඒ මුදල් නියමාකාරයෙන් දෙන්න ඕනෑ ඒ පළාත් පාලන ආයතනයටයි. මොකද, ඒ පාර කැඩුණොත් නඩත්තු කරන්නේ ඒ පළාත් පාලන ආයතනයයි. දැන් ඒක තමයි වෙනස් වෙලා තිබෙන්නේ. අපේ මහ ආණ්ඩුව, පළාත් සභාව හිතුවක්කාර විධියට ගිහින් ප්‍රාදේශීය සභාවට, නගර සභාවට අයිති ප්‍රදේශයක පාරක් හදනවා. ඇමතිවරයෙක් යනවා නම් ඒ පාර හදනවා. අර අභිංසක මන්ත්‍රීවරු දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පැත්තෙ මන්ත්‍රීවරු දන්නෙත් නැහැ. කවුද මේවා නඩත්තු කරන්නේ? නඩත්තු කරන්න කෙනෙක් නැහැ. පාර හැදුවා, ගියා. ඒ නඩත්තු කරන කොටත් ඒ වියදම් කරන මුදලින් සියයට 50ක්වත් එතැනට වියදම් වන්නේ නැහැ. දැන් ඒ පාරවල් යන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා පළාත් පාලන ආයතනවල බලය ස්ථාවර කරන්න. ඒක වැදගත්.

ඉස්සර මෙන්න මේ විධියේ ක්‍රමයක් තිබුණා. මමත් පළාත් පාලන ආයතනවල වැඩ කර තිබෙන නිසා මේ ගැන දන්නවා. ඒ කාලයේ ලියා පදිංචි නැති පාරකට අපට වැඩ කරන්න බැහැ. එය සංවර්ධනය කරන්නත් බැහැ. පාර දෙපස පදිංචි වෙලා ඉන්න අයගෙන් අවසර ගන්න ඕනෑ. ඊට පසුව එය කරන්න ඕනෑ. ඒක තමයි පොදු පාරක් වන්නේ. දැන් ඒ කිසි දෙයක් නැහැ. එක්කෙනෙකුගේ ගෙදරට පාරක් තිබෙනවා. ඔන්න ගිහින් ඒ පාරට කාර දමනවා; කොන්ක්‍රීට් කරනවා. මේ විධියේ විධිමත් නොවන සංවර්ධනයක් මේ පළාත් පාලන ආයතන හරහා සිදු වෙනවා නම් ඒක මේ රටට හොඳ දෙයක් නොවෙයි. එය ක්ෂණිකව කවුරු හරි සතුටු කරන්න පුළුවන් ක්‍රමයක් විතරයි. ඒ නිසා මේ පනත් ගැන කථා කරන කොට විශේෂයෙන්ම මේ කිව්ව කරුණුවලට මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු ඇමතිතුමනි, ජන වාර්ගික ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න දැන් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වන විශේෂ කාරක සභාව ගැනත් මා යමක් කිව යුතුයි. එම යෝජනාවේ තිබෙන්නේ එම විශේෂ කාරක සභාවට සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන්න කියලායි. නමුත් දැන් එම කාරක සභාවේ සාමාජිකයන් තිස්එක්දෙනෙකු නැහැ. දැන් එම කාරක සභාවේ ඉන්නේ සාමාජිකයන් දහනවදෙනායි. ඒකට කමක් නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි.

එතකොට සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන තුරු මේ කාරක සභාව ක්‍රියාත්මක වෙන්න බැහැ. [බාධා කිරීමක්] ඒක නොවෙයි. ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්නවා නේ. ඒ අය පත් කරන්නකෝ, අපෙන් අහන්නේ නැතිව. රවුල් හකීම්, මහාචාර්ය තිස්ස විතාරණ වැනි ඇමතිවරු ඉන්නවා නේ. තව කොච්චර අය ඉන්නවාද? පත් කරන්නකෝ. අප එපා කිව්වාද? එතකොට නේ ආණ්ඩුව ඇතුළේ එකඟතාවත් ඇති වන්නේ? ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් නැතිව අපට කියනවා. මේක වැරැදියි. මම මේ කියන්නේ නීතියේ පැත්ත ගැනයි. සාමාජිකයන් තිස්එක්දෙනෙකු පත් කරන්න කියලා ගෙනාපු යෝජනාව සම්මත වෙලා ඒ අනුව ගරු කථානායකතුමා පත් කර තිබෙන්නේ සාමාජිකයන් දහනවදෙනෙක් විතරයි. ඒ දහනවදෙනා තමයි මේ කාරක සභාව ආරම්භ කරලා වැඩ කටයුතු කරගෙන යන්නේ. මම කියන්නේ මේක වැරැදියි කියලායි.

ඉතිරි අයවත් පත් කරන්න. 31 දෙනාවම පත් කරන්න. අපි ඉදිරිපත් වන්නේ නැත්නම්, පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරුන් ඉන්නවා නේ. තමුන්නාන්සේලාගේ පැත්තේ මේ ප්‍රශ්නයට මැදිවුණු මන්ත්‍රීවරුන් ඉන්නවා නේ. ඒ අයව පත් කරන්න. ඒ අයව පත් කරලා නීත්‍යානුකූල විධියට මේක කරන්න. මේ විශේෂ කාරක සභාවට සහභාගි වන්න නම් මෙන්න මේ කාරණා ඉෂ්ට කළ යුතුයි කියලා අපි රජයට දැනුම් දීලා තිබෙනවා. අපේ නායකතුමා විසින් ජනාධිපතිතුමාට දැනුම් දීලා තිබෙනවා, මෙන්න මේ කාරණා ඉෂ්ට කරනවා නම් අපි මෙම විශේෂ කාරක සභාවට සහභාගි වනවා කියලා. එය ලිඛිතව දැනුම් දුන්නා. නමුත් අද වන තුරු ජනාධිපතිතුමා එයට පිළිතුරක් එවලා නැහැ. පිළිතුරක් එවනවා නම්, අපි මේ විශේෂ කාරක සභාවට සහභාගි වනවාද, නැද්ද කියන එක ගැන අපිට තීරණයක් ගන්න පුළුවන්. ඒ යවපු ලිපියට පිළිතුරක් එවන්නේ නැත්නම්, අපි ස්ථිර වශයෙන්ම එයට සහභාගි වන්නේ නැහැ. ඒක බොහොම පැහැදිලියි. ඒ නිසා අපි ගැන බලාපොරොත්තුවක් තබන්නට එපා. අලුත් ව්‍යවස්ථාවක් පිළිබඳව යෝජනාවක් අපි ඉදිරිපත් කරනවා. අන්න ඒක සාකච්ඡා කරලා අපි එකඟතාවකට එමු. එතැන තිබෙනවා, මේ ප්‍රශ්නයට විසඳුමක්. මීට වඩා මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබතුමාට ස්තුතියි.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaulla)
Question and Answer දෙකම එතුමා කළා. පළාත් පාලන ආයතනයට බලයක් නැහැ, පළාත් සභාවට බලයක් තිබෙනවා, පළාත් සභාවෙන් ගිහිල්ලා ඒ පළාතේ මන්ත්‍රීවරුන් දන්නේත් නැතිව පාරවල් හදනවා කියලා කිව්වා. හරි. පළාත් පාලන ආයතන ශක්තිමත් කරනවා නම්, දැන් අපි ඒ සඳහා අනුමැතිය ගන්නට ඕනෑ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාවෙනුයි. අපේ අතිගරු ජනාධිපතිතුමා දැන් කියන්නේ ඒකයි. මේ පළාත් පාලන ආයතන ශක්තිමත් කරනවා නම්, අපි ඒ සඳහා පළාත් සභාවෙන්ම අනුමැතිය ඉල්ලන්නට ඕනෑ. පළාත් සභාව ඒ අනුමැතිය දෙයිද? තමන්ගේ බලය නැති කර ගන්න ඒගොල්ලන් කැමැති වෙයිද? [බාධා කිරීමක්] ඒ වාගේම මුද්දර ගාස්තු ගැන සඳහන් කරන්නේ මොකක්ද? මුද්දර ගාස්තු අයිති වන්නේ පළාත් සභාවට කියලා ඔබතුමන්ලා තමයි කියලා තිබුණේ. එදා Indo-Sri Lanka Peace Accord එක අත්සන් කරලා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙල්ලා, එක්සත් ජාතික පක්ෂයෙන් තමයි ඒ බලය පළාත් සභාවට දුන්නේ. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ඒක වෙනස් කරනවා නම් පළාත් සභාවෙන් අනුමැතිය දෙන්න ඕනෑ නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේ දී තවදුරටත් පැහැදිලි කරන්න. මීළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

[අ.භා. 3.45]

ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! කරුණාකර මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මොහාන් ප්‍රියදර්ශනද සිල්වා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SHANTHA BANDARA *left the Chair, and* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *took the Chair.*

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුවිශේෂ සාකච්ඡාවක් සිදු වන මේ අවස්ථාවේ දී පළමුවෙන්ම ජෝශප් මයිකල් පෙරේරා, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා - [බාධා කිරීමක්] ආ, සමාවෙන්න. දැන් ඒ තනතුර ඔබතුමාගෙන් මාරු වෙලානේ. ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කියපු කාරණා කිහිපයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. එතුමා කියපු එක කරුණක් තමයි, මේ මන්ත්‍රීවරුන් පත් කිරීම සඳහා වන කොටියාස ක්‍රමය ප්‍රායෝගික නැති විධියට සකස් කරලා ඉවරයි; අවසානයි කියලා. එතුමන්ලා ඒ පිළිබඳව අදහස් දරනවා කියලා කිව්වා. නමුත් මා පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි, ඒ පිළිබඳව මේ වනවිට සාකච්ඡා සිදු වෙමින් පවතින බව. ඒ පිළිබඳව අදහස් දැක්වීමේ හැකියාව එතුමන්ලාටත් තිබෙනවා. ඒ වාගේම එතුමන්ලාගේ පක්ෂයේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ටත් ඒ පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. ඊට පසුව තමයි අවසාන තීන්දුව ගනු ලබන්නේ. හැබැයි ඒකෙදී පල්ලියට එක කොටසයි, පන්සලට එක කොටසයි, කියලා එහෙම වෙන් කරන්නට අවශ්‍ය වන්නේ නැහැ. ඒක වෙන් කරන ක්‍රමවේදයක් තිබෙනවා. බොහෝවිට ජන වාර්ගික පදනම පිළිබඳව සැලකිලිමත් වෙනවා. ඒ වාගේම ජනගහනය, ප්‍රදේශයේ පිහිටීම ගැන තමයි ප්‍රධාන වශයෙන්ම සැලකිලිමත් වන්නේ. ඒ නිසා අවසාන තීන්දුවක් ගෙන නැහැ. හොඳම දේ තමයි ඔබතුමන්ලාගේ තිබෙන යෝජනාවලිය අනුව ඒ සංශෝධන ඉදිරිපත් කරන්න. අදහස් ඉදිරිපත් කළාම හොඳ දෙයක් සිදු වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පළමුවෙන්ම කියන්න කැමැතියි, එය ඉතිහාසගත පනතක් බව. මනාප ඡන්ද ක්‍රමය, ඒ වාගේම එයින් ඇති වුණු ගැටුම් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනතුරුවයි එම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. රටේ ජන මතයක් ඇති වෙලා තිබුණා; ඡන්ද දායකයන්ගේ මතයක් නිර්මාණය වෙලා තිබුණා, මේ පළාත් පාලන ඡන්ද ක්‍රමය විතරක් නොවෙයි, සියලුම මැතිවරණ ක්‍රම සංශෝධනය කරන්නට ඕනෑ යි කියලා. ඒ අනුව ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් එයට පත් කළා. මටත් එහි සාමාජිකයකු වශයෙන් සම්බන්ධ වන්නට අවකාශ ලැබුණා.

මෙහි බොහෝ මන්ත්‍රීවරු සම්බන්ධ වුණා. එතැනදී ගත්ත තීන්දු අනුව එක ස්ථානයක මේක පටන් ගත්තා. පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය තමයි පළමුව ආරම්භ කළේ. ඒක අද සාර්ථක විධියට ඉස්සරහට යනවා. පොඩි පොඩි අඩු පාඩු ඇති වෙන්න පුළුවන්. මේක සියයට 100ක් සාර්ථක කර ගන්න ටිකක් අමාරු වෙනවා. මොකද, අලුත්ම ක්‍රමයක් තමයි මෙතැනින් හඳුන්වා දීම සිද්ධ වන්නේ. හැබැයි ඒක එක්ක හොඳ දෙයක් වෙනවා. මන්ත්‍රීවරයාට කොට්ඨාසයක් තිබෙනවා, කොට්ඨාසයකට නිශ්චිත වූ මන්ත්‍රීවරයෙක් ඉන්නවා.

අද පළාත් පාලන ආයතනවල විතරක් නොවෙයි, මුළු පාර්ලිමේන්තුවේම වේවා, පළාත් සභාවල වේවා, ඡන්දය දෙන්න ගියාම ජනතාවට විශාල ගැටලුවලට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. සමහර වෙලාවට තමාගේ ඡන්දය තම පක්ෂයේ කෙනෙකුට පාවිච්චි කළත්, තමා එම පක්ෂයේ ක්‍රියාකාරී දේශපාලනයේ යෙදුණත්, එම පක්ෂයේම තවත් කෙනෙකුගෙන් අවශ්‍ය සහයෝගය නොලැබෙන්නට ඕනෑ තරම් අවකාශ තිබෙනවා. ඒ වාගේම විවිධ ගැටුම් පවා නිර්මාණය වී තිබෙනවා. ඒ වාගේම සමහර ගම්වලට සංවර්ධන වැඩ බෙදී යාමේ අඩු පාඩු පවා මේ තුළ ඇති වෙලා තිබෙන බව ඉතාමත්ම පැහැදිලියි.

මේ කරුණු වටහා ගෙන අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම රජයක් විධියට අපත් තීන්දු කළා, පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න. ඒ අනුව ආරම්භයක් විධියට තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ. මේක ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක්.

ප්‍රායෝගිකව විවිධ අත් දැකීම් අපට තිබෙනවා. දැන් පවතින සමහර පළාත් පාලන ආයතන බැලුවොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -ඒ ආයතනයේ පාලනය ආණ්ඩු පක්ෂයේද විරුද්ධ පාර්ශ්වයේද කියන එක නොවෙයි- ඒවා නිකම් පෞද්ගලික කොම්පැනි වාගේ වෙලා තිබෙනවා. හැබැයි එක් කාරණයක් කිය යුතුව තිබෙනවා. පෞද්ගලික කොම්පැනියක් නම් අධ්‍යක්ෂ මණ්ඩලයත් එක්ක නේ තීන්දු ගන්නේ. එහෙම නොවෙයි, සභාපතිවරයා විතරක් තීන්දු ගන්නා බොහෝ කොම්පැනිවල තත්ත්වයට මේ ආයතන පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉතාමත් ඉක්මනින් ඉදිරිපත් වීම ගැන අපි සතුටු වෙනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක ජනතාවට වැඩි සේවාවක් සිදු වෙයි කියලා අපි හිතනවා.

සමහර වෙලාවට අපට ආරංචි ලැබෙනවා; අපට තොරතුරු ලැබෙනවා, අල්ලස්වලට සම්බන්ධ වුණු පළාත් පාලන ආයතන ප්‍රධානීන්, ඒ වාගේම ජනතාවට අවභිර කරන ප්‍රධානීන් පිළිබඳව පවා. ඒවා එච්චර හොඳ තත්ත්ව නොවෙයි. මේ තත්ත්ව දැන් වහාම වෙනස් වෙන්න ඕනෑ. නව ඡන්ද ක්‍රමයත් එක්ක එන කොට අඩුම ගණනේ කණ්ඩායමක් එකතු වෙලා වැඩ කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. එතකොට සභාපතිවරයාට විතරක් හිතුමතේට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. ඔහුට මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අවශ්‍ය වෙනවා. අවම වශයෙන් තමන්ගේ පක්ෂයේවත්, තමන්ගේ කණ්ඩායමේවත් සහයෝගය ඇතිව තමයි පළාත් පාලන ආයතන පවත්වා ගෙන යන්න පුළුවන් වන්නේ කියන එක පිළිබඳව අපි ඉතාමත් පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි.

ගරු ජෝශප් මයිකල් මන්ත්‍රීතුමා බොහෝ කාරණා කියලා එක් ප්‍රධාන කාරණයක් ගැනත් කිව්වා. ඒ තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව. ඒ සම්බන්ධයෙන් මේ දිනවල පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් රැස් වෙනවා. ඒ පිළිබඳව විවිධ මත එතුමා ඉදිරිපත් කරන්නට වුණා. ඒ කාරක සභාව වලංගු නැති බව කියන්න ගත්තා, ඒ කාරක සභාවට සාමාජිකයෝ 31 දෙනෙක් ඉන්න ඕනෑ, පත් වෙලා ඉන්නේ 19 දෙනායි කියලා. මේ 31දෙනාගෙන් 19 දෙනෙක් පත් වෙලා නම් කවුද ඉතුරු සාමාජිකයෝ? ඉතුරු සාමාජිකයන් විධියට නම් කරන්න ඉන්නේ

වෙන කවුරුවත් නොවෙයි, ඒකේ යුතුකම පැහැර හැර තිබෙන්නේ කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ටිඑන්ඒ එක ඇතුළු ඒ කණ්ඩායමට තමයි ඒ කොටස වෙන් වෙලා තිබෙන්නේ. ඒ අයගේ යුතුකම තමයි ඒකට ඇතුළු වීම. ඒ ගොල්ලෝ ආවේ නැහැයි කියලා මේ කාරක සභාව නීති විරෝධී කාරක සභාවක් බවට පත් කරන්න පුළුවන්කමක් නැහැ.

දැන් එතුමා ගෙනෙන තර්කය තමයි, මේ කාරක සභාවේ සාමාජිකයෝ 31 දෙනෙක් නැහැ, 19 දෙනායි ඉන්නේ, ඒ නිසා මේ කාරක සභාව නීත්‍යානුකූල නැහැයි කියන එක. ඒක පදනම් විරහිත ප්‍රකාශයක් කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

කමිටුවට සාමාජිකයෝ පත් කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයට අනුව කථානායකතුමා ආණ්ඩුව නියෝජනය කරන්නත්, පක්ෂ ගණනාවක් නියෝජනය කරන්නත් පිරිසක් නම් කරලා තිබෙනවා. සාමාජිකයෝ ගණනකට අවස්ථාව ඉතිරි කරලා තිබෙනවා, ඒ අයට ඇවිල්ලා එහි සාමාජිකත්වය අරගෙන කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා.

මේ වාගේ ජාතික ප්‍රශ්නයකදී මහ හැරලා යන එක නොවෙයි කාර්ය භාරය වෙන්නේ. මේ වාගේ ජාතික ප්‍රශ්නයකදී රට විතරක් නොවෙයි, ලෝකයම බලාගෙන ඉන්න කාරණයක් පිළිබඳව සාකච්ඡා වෙන කොට, විශේෂ කාරක සභාවක් පාර්ලිමේන්තුවේ තිබෙන කොට විරුද්ධ පක්ෂයේ යුතුකම තමයි සියලුම දෙනා ඇවිල්ලා එතැනට සම්බන්ධ වීම. ඒ කටයුතු පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැත්නම් නැඟිටලා යන එක වෙනම දෙයක්. නමුත් මේ කාරක සභාවට එන්නත් ඉස්සෙල්ලාම කියනවා,"අපි සම්බන්ධ වෙන්නේ නැහැ"යි කියලා. එන්න ඉස්සෙල්ලා කියනවා. ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න ගමන් කියනවා, මේ පාර්ලිමේන්තු කටයුත්ත පිළිබඳව විශ්වාසයක් නැහැයි කියලා. ඒක බරපතළ කාරණයක්. පාර්ලිමේන්තුවේ මේ කමිටුවට සම්බන්ධ වෙන්න බැරි නම් මම හිතන හැටියට පාර්ලිමේන්තුවට එන එකේ තේරුමකුත් නැහැ. එතැනට ඇවිල්ලා තමන්ගේ පක්ෂයේ අදහස, තමන්ගේ ජන කොට්ඨාසයේ අදහස ප්‍රකාශ කරන්නට ඕනෑ. ප්‍රකාශ කරලා ඒකේ වැරැද්දක් තිබෙනවා නම්, අඩු පාඩුවක් තිබෙනවා නම් ඒක වෙනම කථා කරන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ තේරීම් කාරක සභාවට සහභාගි නොවන සියලු පක්ෂවලට කවදා හෝ දවසක ඉතිහාසයේ වුණු මේ වැරැද්ද පිළිබඳව ජනතාවගෙන් සමාව ගන්නට වෙයි. මම එය පැහැදිලිව කියනවා. ඒ නිසා හැම කෙනෙකුගේම යුතුකම තමයි මේ වෙලාවේ මේ කාරක සභාවට ඇවිල්ලා අදහස් ඉදිරිපත් කිරීම; යෝජනා ඉදිරිපත් කිරීම. ඉන් පසුව තමයි තීන්දු ගන්නේ. ඒ යෝජනා පිළිගන්නේ නැත්නම්, එහෙම නැත්නම් ඒ මතය අහන්නේ නැත්නම් නැඟිටලා ගියත් කමක් නැහැ කියලා මම හිතනවා. එන්නේම නැතිව මේක පැත්තකට දාලා සිටීම තමන් නියෝජනය කරන ජන කොට්ඨාසවලට සහ තමන්ට ඡන්දය දුන්නු ජනතාවට කරන ද්‍රෝහීකමක් විධියට තමයි මම නම් පැහැදිලිව දකින්නේ. රටක් විධියට ගත්තොත් මේක අපට ලැබෙන හොඳම අවස්ථාව මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න. මේ ප්‍රශ්නය පිළිබඳව අපි කොපමණ මාධ්‍ය හමු පැවැත්වූවත් වැඩක් නැහැ. සමහර කණ්ඩායම් මේවා කථා කරන්නේ මාධ්‍යයට විතරයි; ප්‍රවෘත්ති සාකච්ඡාවලදී විතරයි. නමුත් මේ ගැන කථා කරන්නට හොඳම තැන තමයි මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාව. එතැනට ඇවිල්ලායි කථා කරන්නට ඕනෑ. එතැනින් සාධාරණයක් ඉෂ්ට නොවෙනවා නම් එළියට ගිහින් කථා කළාට කමක් නැහැ. එහෙම නැතිව දේශපාලන සන්දර්ශන පැවැත්වීමේ ප්‍රතිඵලයක් නැහැයි කියන එක මම එතුමා සඳහන් කළ කාරණයට එකතු කරන්නට කැමැතියි.

මේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡා වන මොහොතක්. මේ පනත තුළින්, විශේෂයෙන් මේ ඡන්ද ක්‍රමය තුළින් මේ රටේ ජනතාවට විශාල සෙතක් සැලසෙයි කියන විශ්වාසය තබමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ කාලයක් තිබෙනවාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලබා දීලා තිබෙනවා.

[අ.භා. 3.55]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම ස්තුතියි මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් මෙම පනත් කෙටුම්පත ගැන කථා කරන්නට කලින් ගරු මහින්ද අමරවීර ඇමතිතුමා කථාව අවසන් කළ තැනින් කථාව පටන් ගන්න එක හොඳයි. එතුමා අර්ථ කථනය කරන්නට උත්සාහ කරන්නේ මේ විශේෂ කාරක සභාව ජාතික වශයෙන් අභිශයින් වැදගත් ස්ථානයකයි තිබෙන්නේ, ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහභාගි නොවීම අනාගතයේ ජාතියෙන් සමාව ගැනීම දක්වා වූ ගමනකට ඉඩ කඩ හැදෙයි කියලායි. නමුත් එහෙම නොවෙයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව වර්තමාන ආණ්ඩුව -රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව- සාකච්ඡා වට කීයක් පැවැත්වූවාද? සර්ව පාක්ෂික සාකච්ඡා තිබුණා; සර්ව පාක්ෂික නියෝජිත සාකච්ඡා තිබුණා. මට මතකයි, තිස්ස විතාරණ අමාත්‍යතුමා සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපතිවරයා හැටියට ප්‍රකාශ කළා ටයිප් කළ පිටු 11,000ක වාර්තාවක් සකස් කළා කියලා. මහින්ද අමරවීර ඇමතිතුමාත් හිටියා, මමත් මුල් කාලයේ ඒකට සහභාගි වුණා. සර්ව පාක්ෂික සාකච්ඡා පැවැත්වූවා; සර්ව පාක්ෂික නියෝජිත සාකච්ඡා පැවැත්වූවා; ඉන් පසුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසම තිබුණා. ඒ කොමිසමටත් අගතියට පත් වුණු විවිධ පාර්ශ්වයන් කරුණු ඉදිරිපත් කළා. ඒ කොමිසමත් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉන් අනතුරුව ආණ්ඩුව සහ TNA එක අතර ද්විපාර්ශ්වික සාකච්ඡා පැවතුණා. මම හිතන්නේ සාකච්ඡා වට ගණනාවක් පැවැත්වුණා. TNA එකේ මන්ත්‍රීවරුන් පවසන පරිදි අවසානයේ එය ආණ්ඩුව දින නියමයකින් තොරව ඔහේ අත් හැරලා දාපු සාකච්ඡාවක් බවට පත් වුණා. ඒ අනුව තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය පිළිබඳව ඇති තරමට විවිධ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. තවදුරටත් සාකච්ඡා කරනවා කියන්නේ මේ ප්‍රශ්නයෙන් මඟ හැර යන්න, සැබෑ ප්‍රශ්නයට පිළිතුරු සොයනවා වෙනුවට කල් මරන්න සහ සැබෑ ප්‍රශ්නය යට ගැසීම සඳහා දරන ප්‍රයත්නයක්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ප්‍රයත්නයකට හවුල් වෙන්න අපි සූදානම් නැහැ. ඒක පළමුවෙනි කරුණ.

දෙවෙනි කරුණ තමයි, මේ ප්‍රශ්නය ගැන ආණ්ඩුවේ පාර්ශ්වයන් අතර යම් එකඟතාවකට එන එක. දැන් ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුව ඇතුළේ. කැබිනට් මණ්ඩලය ඇතුළේ ගහ මරා ගන්න ගියා කියලා තමයි මාධ්‍ය වාර්තා කරලා තිබුණේ. එය ලංකා ඉතිහාසයේ පැවතුණු උණුසුම්ම කැබිනට් මණ්ඩල සාකච්ඡාව කියලා තිබෙනවා. අරයාගේ කොලර් එකෙන් ඇල්ලුවා කියනවා, මෙයාගේ කනට ගැහුවා කියනවා. මම දන්නේ නැහැ. මාධ්‍යවල තිබෙන දේවල්. [බාධා කිරීමක්] හරි, මම තිබෙන දේ නේ කියන්නේ. එතකොට දැන් ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද? ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුව ඇතුළේ. එහෙම නම් පළමු කොටම ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් ඇති කර ගෙන විශේෂ කාරක

[ගරු අනුර දිසානායක මහතා]

සභාවට එන්න. ආණ්ඩුවේ තිබෙන අර්බුදය පාර්ලිමේන්තුවට ගේන්න එපා. මේ කරන්න හදන්නේ මොකක්ද? කැබිනට් මණ්ඩලය ඇතුළේ එකඟතාවකට එන්න බැරිව, ආණ්ඩුවට පක්ෂ හැටියට එකඟතාවකට එන්න බැරිව ඒක පාර්ලිමේන්තුවට ගෙනැවිත් අතහරිනවා.

ආණ්ඩුව ඇතුළේ තිබෙන අර්බුදය පාර්ලිමේන්තුවට ගෙනෙන එකට සම්මාදම් වෙන්න අපි සූදානම් නැහැ. ඒක තමයි දෙවන කාරණය. [බාධා කිරීමක්] ඒක ඔබතුමාගේ අදහස නේ. මා කීවාට පසුව ඔබතුමා පිළිතුරු දෙන්න.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaulla)

ඒක ආණ්ඩුව පිට දමන්න එපා. එකම පක්ෂයේ - [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

හරි, හරි. ආණ්ඩුව කියන්නේ මෙතැන ඉන්න කට්ටියට නේ. කැබිනට් මණ්ඩලය කියන්නේ ආණ්ඩුව. ඒ නිසා ආණ්ඩුව තුළ එකඟතාවක් තිබෙන්න ඕනෑ. විවිධ වලිග කොට, කන් අල්ලා ගෙන හදපු ආණ්ඩුවක් තිබෙනවා. ඒ ආණ්ඩුව තුළ එකඟතාවක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුව ඇතුළේ එකඟතාවක් ඇති කර ගෙන අපට කියන්න, මේක තමයි කරන්නේ කියලා. ඒක සාකච්ඡා කරන්න අපි ලෑස්තියි. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න. බාධා කරන්න එපා.

තුන්වන කාරණය මේකයි. විශේෂ කාරක සභාව පිළිබඳව තමුන්නාන්සේලාට තිබෙන අත් දැකීම මොකක්ද? තමුන්නාන්සේලාගේ භාවිතය මොකක්ද? ශිරාන් බණ්ඩාරනායක මැතිතුමිය වෙනුවෙනුත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ විශේෂ කාරක සභාවේ නියෝජිතයන් හැටියට අපි සහභාගි වුණා. ඒ විශේෂ කාරක සභාවේ සභාපති වශයෙන් හිටියේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඒකත් විශේෂ කාරක සභාවක්. ඒ විශේෂ කාරක සභාවේ හැසිරීමෙන් පෙන්නුම් කළේ කුමක්ද? විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න ඉඩ නොදී, ඒ අදහස් කිසිසේත් සැලකිල්ලට ලක් නොකොට, දවල් 12.00ට නඩුව අහන්න පටන් අරගෙන, රෑ 12.00 වෙනකම් නඩුව අහලා, රෑ 2.00ට වාර්තා හදලා, පසුවදා උදේ 10.00ට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. විශේෂ කාරක සභාවක් තුළින් තමුන්නාන්සේලා දී තිබෙන්නේ සාධාරණ අත් දැකීමක් නොවෙයි. විශේෂ කාරක සභාවක අත් දැකීම හැටියට තමුන්නාන්සේලා ඔප්පු කර තිබෙන්නේ අනික් පාර්ශ්වයන්ට ඉඩකඩ දෙන, සාකච්ඡාවට විවෘත කරන සාකච්ඡා මෙසයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ විශේෂ කාරක සභාව මොකක්ද? අනිකාගේ මත යටපත් කරන, අනිකාගේ මතවලට ඉඩ නොදෙන, තමුන්නාන්සේලා තීරණය කර තිබෙන මතය හිතුවක්කාර ලෙස, තක්කඩි ලෙස ඉටු කර ගැනීම සඳහා වන වුවමනාවක්. ඒ වුවමනාවට හවුල් වෙන්න අපි ලෑස්ති නැහැ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, හැම පක්ෂවලම අදහස් ගැනීම පිළිබඳව, විවෘත මනසකින් රටේ ජාතික ප්‍රශ්නයක් පිළිබඳව හැම කෙනෙකුගේම අදහස්වලට ඇහුම් කන් දීම සඳහා වූ මහා ඉහළ ගුණාංගයකින් යුතු තේරීම් කාරක සභාවක් නොවෙයි මේ. ඉතාමත්ම පහත් තත්ත්වයකට ඇද දමා තිබෙන විශේෂ කාරක සභාවකට සහභාගි වෙන්න අපි සූදානම් නැහැ. එම නිසා සමාව ගන්නට සිදු වන්නේ කාටද කියන එක අනාගතය තීරණය කරාවි.

ඊළඟට, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දක්වන්නට කැමැතියි. මෙම පනත් කෙටුම්පත සකස් කිරීමේදී අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීම ගැන ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා. සාමාන්‍යයෙන් එක පනතක් වෙනස් කොට අනික් පනත දක්වා යනකොට කලින් පනත විසින් ඇති කර තිබෙන ආයතනවලට අනික් පනතින් බලපෑම් ඇති වෙනවා. ඒ නිසා ඇත්තෙන්ම ඒ පනතට අන්තර්කාලීන විධිවිධාන ඇතුළත් විය යුතුව තිබුණා. තිබෙන පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක ඊට ඇතුළත් විය යුතුයි. මා දන්නේ නැහැ, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඇයි ඒ ගැන උපදෙස් නොදුන්නේ කියලා. මා දන්නේ නැහැ, ඇමතිතුමාට ඇයි ඒ සිතිවිල්ල ආවේ නැත්තේ කියලා. මොකද, කලින් තිබුණු පනතින් ස්ථාපිත කරන ලද පළාත් පාලන ආයතනයක් තිබෙනවා. ඒකේ මන්ත්‍රී ධුර තිබෙනවා. නව පනතක් නීතිය බවට පත් වෙනවා. එතකොට කලින් පනතින් නව පනත දක්වා එන්න අන්තර් කාලයක් අවශ්‍යයි. ඒ නිසා ඒ අන්තර්කාලීන යෝජනාවලියක් ඒ පනතට ඇතුළත් කළ යුතුව තිබුණා. නමුත් තමුන්නාන්සේලාට තිබුණේ වෙනත් වුවමනාවක්. ලොකු කලබලයක් තිබුණා; කඩිමුඩියක් තිබුණා. ඒ කඩිමුඩිය නිසා මේ සංශෝධනය අමතක කළා. පූර්වයේ තිබුණු පනත් ගැන කල්පනා කර බැලුවා නම් ඕනෑම කෙනෙකුට තේරෙනවා අන්තර්කාලීන විධිවිධාන ඒ පනත් කෙටුම්පතට එන්න ඕනෑය කියලා. ඒ අමතක වෙච්ච සංශෝධනය අද හරි ඔබතුමා මේ පාර්ලිමේන්තුවට ගෙනාපු එක ගැන අපි සන්තෝෂ වෙනවා. මේක එදා ඉදිරිපත් කළ යුතුව තිබුණු සංශෝධනයක්. හැබැයි වැදගත් දෙය ඒක නොවෙයි, ගරු ඇමතිතුමනි. මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේදී මේ පාර්ලිමේන්තුව තුළ තමුන්නාන්සේ එකඟ වෙච්ච සංශෝධන ගණනාවක් තිබුණා. ඒක තමයි වැදගත් විය යුත්තේ. සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කර ගන්න තිබෙනවාය, සීමා නිර්ණය කිරීමේ කාර්යයක් තිබෙනවාය, ඒ නිසා මේක සම්මත කර ගන්න උදවු වෙන්නය කියා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටියා. අපි විටින් විට ප්‍රශ්න ඇහුවා. ඔබතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා මේ පනතට ඇතුළත් කළ යුතු තවත් සංශෝධන තිබෙනවාය; ඉතා ඉක්මනින් ඒවා ගෙනෙනවාය කියා. තමුන්නාන්සේ ඒවා ගෙනාවාද? කවදාද ඒවා ඉදිරිපත් කරන්නේ කියා මා තමුන්නාන්සේගෙන් අහනවා.

විශේෂයෙන්ම මෙහිදී සමානුපාතික නියෝජනය වැඩි කළ යුතුයි කියන එක ගැන සාකච්ඡා වුණා. ඒ සාකච්ඡාවට සහභාගි වුණු අපේ පක්ෂයේ විජිත හේරත් මන්ත්‍රීතුමා විසින් ඒ පිළිබඳ ලිඛිත සංශෝධන ඉදිරිපත් කර තිබුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු ලබා දීමේදී කිව්වේ ඒ සංශෝධන කඩිනමින් ගෙනෙනවාය කියායි. නමුත් මේ වනකොට සැලකිය යුතු කාලයක් ගත වෙලා තිබෙනවා. තවම ඒ සංශෝධන ගෙනල්ලා නැහැ. තමුන්නාන්සේලා මේ පනතට ඉක්මනින් ඇතුළත් කළ යුතු සංශෝධන පසෙකට දමා තිබෙනවා.

තවත් වැදගත් කාරණයක් එතැන මතු වුණා, පළාත් පාලන මන්ත්‍රීවරයකුට අපේක්ෂකත්වය සඳහා රුපියල් 5000ක් ඇප බැඳිය යුතුයි කියා. මේ හදා තිබෙන නව ක්‍රමය අනුව ආසන්න වශයෙන් පළාත් පාලන අපේක්ෂකයන් 5000ක්වත් එන එක වළක්වන්න බැහැ. එතකොට 5000X5000. ඒ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් දේශපාලන ව්‍යාපාරයකට ඇප තැන්පත් කිරීමට විතරක් රුපියල් මිලියන 25ක් -රුපියල් ලක්ෂ 250ක්- අවශ්‍ය වෙනවා.

ලක්ෂ 250ක් තමන්ගේ අපේක්ෂකත්වය වෙනුවෙන් තැන්පත් කරන්න පුළුවන් වන්නේ කවර දේශපාලන පක්ෂයකටද? කුඩු ව්‍යාපාරවල යෙදෙන, ගණිකා මඩම් පවත්වා ගෙන යන, පාතාලය හරහා කප්පම් ගන්න, රටේ ඉඩම් විකුණා කොමිස් ගන්න, ඒ කොමිස්වලින් තමන්ගේ දේශපාලනය ශක්තිමත් කර ගෙන තිබෙන දේශපාලන ව්‍යාපාරවලට පුළුවන් වේවි, යම් මැතිවරණයක් වෙනුවෙන් ලක්ෂ 250ක් ඇප ලෙස තැන්පත් කරන්න. අපට බැහැ ඒක කරන්න. ඒ නිසා කළ යුතු සංශෝධන ඒවායි.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ගරු මන්ත්‍රීතුමනි, අපේක්ෂකවරයකුට ඡන්දය ඉල්ලන්න පුළුවන් නම් එයාට රුපියල් 5,000 ගෙවන්න -[බාධා කිරීමක්] නැහැ. ඒ තර්කය වැරදියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේක්ෂකවරයා තමයි ඡන්දය ඉල්ලන්නේ. හැබැයි පක්ෂයක් ලෙස හිතන්න. පක්ෂයක් ලෙස කල්පනා කර බැලුවොත්, ලක්ෂ 250ක් එක පක්ෂයකට ඇප මුදල් තැන්පත් කරන්න සිද්ධ වෙනවා. ඒක සාධාරණ තත්ත්වයක් නොවෙයි. ඒක කරන්න පුළුවන්කම තිබෙන්නේ -[බාධා කිරීමක්]

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ පිළිතුරු කථාවේදී කියන්න. මට බාධා කරන්න එපා. ඒ නිසා කරන්න ඕනෑ මේ සංශෝධනය ගෙනෙන එකයි.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
අද අදාළ වෙන්නේ-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද අදාළ දේ තමයි මේ කථා කරන්නේ. තමුන්නාන්සේ කළ යුතු සංශෝධන ගැනයි මේ කියන්නේ. මේවා පිළිබඳව තමයි පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කළේ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ අපි දිගින් දිගටම බලාගෙන හිටියා; දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ අදහස් ඉදිරිපත් කරමින්ද අපි මේ ගැන කියා සිටියා. මේ සංශෝධන ගෙනෙන්නේ කවදාද කියා කරුණාකර කියන්න. සංශෝධන තබා ඔබතුමා පාර්ලිමේන්තුවේදී දකින්නේත් බොහොම කලාතුරකිනුයි. ඉතින් අඩුම තරමින් මේක ගැන අහන්නත් විධියක් නැහැ. ඔබතුමා බොහොම කාලයකින් හෝ අද දකින්න ලැබුණු එකත් සතුටක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් මට විටින් විට කියනවා, "පළාත් පාලන හා පළාත් සභා ඇමතිවරයකු ඉන්නවා, කොහෙද කියලා හොයා ගන්න බැහැ, පළාත් පාලන ආයතනවල ප්‍රශ්න තිබෙනවා" කියලා. ඒ නිසා අද ඔබතුමාව දකින්න හෝ ලැබුණු එක ගැන සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළ යුතුව තිබුණේ මොකක්ද? මේ පනත්වලට සංශෝධන ගෙන ආ යුතුව තිබුණා. ඒක තමයි එදා මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේදී පාර්ලිමේන්තුව ආපු එකඟතාව. පාර්ලිමේන්තුවෙන් පිටතත් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයාත්, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යවරයාත්, අපත් අතර සාකච්ඡාවේදීත් එකඟ වුණා ඉක්මනින් මේවා ගෙනෙනවා කියලා. නමුත් සැලකිය යුතු කාලයක් පමා කර තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාට කියන්නේ, ඉතා ඉක්මනින් ඒ සංශෝධන මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කරුණ තමයි සීමා නිර්ණය හරහා මතු වී තිබෙන ගැටලු. ගරු හකීම් අමාත්‍යතුමාත් විශේෂයෙන් ඒ පැත්ත ඉලක්ක කරලා ද දන්නේ නැහැ, මේ සීමා නිර්ණය පිළිබඳව ඇති වී තිබෙන ගැටලුව ගැන විශේෂ අවධානයක් යොමු කළා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
අද හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, අඩු තරමින් ආණ්ඩුවේ ඉඳගෙන ආණ්ඩුව ගැන එහෙම කිව්ව එක හොඳයි. ගොඩාක් නරක දේවල් කරන අතරේ එක හොඳක් හෝ කළොත් ඒක කියන්න එපායැ. ඒ ගුණවත්භාවය තිබෙන්න ඕනෑනේ. ඉතින් ගරු හකීම් අමාත්‍යවරයාත් පෙන්වා දුන්නේ මොකක්ද? මේ සීමා නිර්ණ කොමිෂන් සභාව හරහා සීමා බෙදීම් අතරේ අද සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක රටක්. මේ රටේ අපි සීමා නිර්ණ ගැන සැලකිල්ලට ලක් කරන කොට සැලකිල්ලට භාජනය කළ යුතු කරුණු ගණනාවක් තිබෙනවා. එක පැත්තකින් අපේ රට සිංහල, දෙමළ, මුස්ලිම් කියලා ප්‍රධාන ජාතිකත්වයන් තුනක් ජීවත් වන රටක්. ආවේ කොහෙන්ද, ආවේ කවදා ද, ඒවා අදාළ නැහැ. අද මේ රටේ ඉපදෙන, මේ රටේ ආර්ථිකයට හවුල් වෙන, මේ රටට පොහොර වෙන ප්‍රධාන ජන කොට්ඨාස තුනක් ඉන්නවා සිංහල, දෙමළ, මුස්ලිම් කියලා. එතකොට ඒ අය රටේ විවිධ ස්ථානවල විසිරිලා ජීවත් වෙනවා. ඒකයි අපේ රටේ තිබෙන වැදගත්කම. එක් එක් ප්‍රදේශවලට සීමා වෙලා නොවෙයි, රට පුරා විසිරිලා ජීවත් වෙනවා. එතකොට සීමා නිර්ණ සකස් කිරීමේදී ඒ ඒ ජන ප්‍රජාවන්ගේ නියෝජනයන් ඇති විය හැක්කේ කෙසේද කියන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ, සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒ වාගේම අපේ සංවර්ධනයේ විවිධත්වයන් තිබෙනවා. අපේ රට ග්‍රාමීය වශයෙන් අතිශය විශාල සංවර්ධන පරතරයක් තිබෙන රටක්. නගරය සහ ගම අතර විශාල පරතරයක් තිබෙනවා. ඒ නිසා ඒ ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කොට ගෙන වේගවත් ලෙස සංවර්ධනය කරගත යුතු ප්‍රදේශ ගැන ඉලක්කයක් සැලකිය යුතු වෙනවා. ඒ වාගේම එම ප්‍රදේශවල සිටින ජනතාව, ජන සංයුතිය, භූමිය යන මේවා පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුයි. මේ පළාත් පාලන ආයතනවල අදාළ භූමිය, කේවල කොට්ඨාසය තීරණය කිරීමේදීඑහෙම විද්‍යාත්මක ක්‍රමවේදයක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද සිද්ධ වෙමින් තිබෙන්නේ මේකේ ඉතා හොඳ තත්ත්වයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, කැමැති නම් අපටත් ඇවිල්ලා අදහස් කියන්නය කියලා ඔබතුමා කිව්වා. අපි අදහස් කියනවානේ. ඒවා අදහස් විතරයි. මේ මොහොතේදී සැබවින්ම මේවා යම් දේශපාලන අධිකාරියක ආධිපත්‍යයට යටත් වෙලා තිබෙනවා. දේශපාලන අධිකාරිත්වය විසින් තමයි අද මේ සීමා නිර්ණ කරන්න හදන්නේ. ප්‍රාදේශීය සභාවේ ඉන්න සභාපතිවරයා කල්පනා කරනවා තමන්ගේ සභාපති පුටුව ආරක්ෂා කර ගන්න තමන් කොහොමද සීමාව හදා ගන්නේ කියලා. ඒ නිසා තමන්ගේ ඥාති ගණය, තමන්ගේ කුල ගණය, තමන්ගේ ජාතිකත්වයේ ගණය, තමන්ගේ වෙන වෙන සම්බන්ධකම් තිබෙන ගණය එක තැනකට කොටු වෙන පරිදි සීමාවක් නිර්ණය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඒකක මුළු පහේ තරු වාගෙයි. එක තැනකට යනවා කුලය හොයා ගෙන. තවත් තැනකට යනවා ජාතිකත්වය හොයා ගෙන. තව තැනකට යනවා ඥාතිකම හොයා ගෙන. තව තැනකට යනවා පරම්පරාව හොයා ගෙන. මෙන්න මේ විධියට මුළු පහේ තරු වාගෙයි මේ කොට්ඨාස හදලා තිබෙන්නේ. ඒක තමයි කරලා තිබෙන්නේ.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නැහැ, නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා නැහැ කිව්වාට වැඩක් නැහැනේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු බලය හොබවන පක්ෂය තමන්ගේ දේශපාලන ව්‍යාපෘතියක කොටසක් බවට මේ සීමා නිර්ණය පත් කර ගෙන තිබෙනවා. ඒක ඔබතුමා තේරුම් ගන්න. ඔබතුමා අක්කරපත්තුව ගැන විතරක් හිතන්න එපා; රට ගැන හිතන්න. ඔබතුමාට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය දීලා තිබෙන්නේ අක්කරපත්තුවේ සීමා නිර්ණය කරන්න නොවෙයි. අක්කරපත්තුව ගැන විතරක් හිතමින් සීමා නිර්ණය කරන්න එපා. රට ගැන හිතලා කරන්න. අපි දන්නවා, අපේ රටේ සම්ප්‍රදායික ලෙස එක්සත් ජාතික පක්ෂයේ වැඩි ජන සනත්වයක් සිටින ගම් තිබෙන බව; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් එහෙම තිබෙනවා; අපේ පක්ෂයේත් එහෙම තිබෙනවා. තමුන්නාන්සේලා කරන දේ තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩි සනත්වයක් තිබෙන භූමිය ඒ විධියටම ආරක්ෂා වෙන පරිදි අනෙක් පක්ෂවලට වැඩි සනත්වයක් තිබෙනවා යැයි කියා මතයක් තිබෙන ගම් තුනට හතරට කඩනවා; කැලිවලට කඩ කඩා අමුණනවා. මේ දිය කර හැරීම කරන්නේ. මේක තමයි කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා නැහැ කිව්වාට වැඩක් නැහැ. මේක කරනවා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
කවදාවත් හොඳ දේවල් කියන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේක කරනවා. හොඳ දේවල් කියන්න ඔබතුමා ඉන්නවා නේ.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හැම දාම ගහන්නේ මඩ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳ දේවල් කියන්න ඔබතුමා ඉන්නවා. හොඳ දේවල් මම කියන්න ඕනෑ නැහැ. මම කියන්න ඕනෑ වැරැදි දේවල්. [බාධා කිරීමක්]හොඳ දේවල් කියන්න ඔබතුමා සිටිනවා නේ. බාධා කරන්න එපා, ගරු ඇමතිතුමා. හොඳ මනුෂ්‍යයෙක්. මට බාධා කරනවා නේ. කල්පනා කර බලන්න. නැවත ජාතිකත්වයන් අතර ගම් ඇතුළත යම් ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වීමේ අනතුරක් තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා තමයි කිව්වේ මේ දෙක එකතු කරන්න හොඳ නැහැ කියා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. ඒවා හොඳයි නේ. ඒ විතරක්ද? මෙතුමා තවත් දේවල් අපිත් එක්ක කියලා තිබෙනවා. ඒවා මේ ගරු සභාවේ කියන එක හොඳ නැති නිසා මම කියන්න යන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමනි, මේ සීමා නිර්ණය ඔබතුමා සැලකිල්ලට ලක් කරන්න. ඔබතුමා නැහැ කියන මතයේම ඉන්න එපා. දැන් භූමියේ සිද්ධ වෙමින් තිබෙන දේ ගම්වල සිද්ධ වෙමින් තිබෙන දේ ඔබතුමා තිබෙනවාද නැද්ද කියා පරීක්ෂා කරන්න. ඔච්චරයි තිබෙන්නේ. කෑ ගහන්න ඕනෑ නැහැ. ඔබතුමා ඇමතිවරයෙක් නේ. සාමාන්‍ය අමාත්‍යවරයෙක් නොවෙයි නේ. පළාත් පාලන ඇමතිවරයා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතට තවත් සංශෝධනයක් ගෙනෙන්න යෝජනා කරනවා. ඒ සංශෝධනය ගෙනෙන්න කියලා කියන්නේ ඇත්තෙන්ම පළාත් පාලන මට්ටමින් එන දේශපාලන අධිකාරිත්වයේ හැසිරීම් ගැනයි. සෘජුවම මේ පනතට සම්බන්ධ නොවුණත් මේවා ග්‍රාමීය රාජ්‍යයන් වාගෙයි. මේක ග්‍රාමීය රාජ්‍යයක්. ඒ රාජ්‍යයේ ඔටුන්න සභාපතිවරයා පළඳාගෙන සිටිනවා. ඒ අස්සේ ඒකේ කටු ඔටුන්න දමා ගත් අයත් සිටිනවා. හැබැයි, පළාත් පාලන ආයතනවල යුව රජවරු කියලාත් සිටිනවා. ඒ නිසා මුළු ගමේම සියලු ක්‍රියාකාරකම් මෙම දේශපාලන ආධිපත්‍යයට යටත් කර තිබෙනවා. මේක ඉතා නරක දෙයක්. ගමේ නිදහස්භාවය, ගමේ ස්වාධීනත්වය, ගමේ කෙනෙකුට ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාත්මක වෙන්න තිබෙන අයිතිය, යම් දේශපාලන පක්ෂයකට රැස්වීමකට සම්බන්ධ වෙන්න තිබෙන අයිතිය, මේ ඔක්කොම බලහත්කාරී ව්‍යුහයක් ලෙසට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් මේවායෙන් කෙරෙන හොඳ කාර්යයන් තිබෙන අතර දේශපාලනික වශයෙන් ගත්තොත් ග්‍රාමීය වශයෙන් තමන්ගේ ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා මේ ආයතනවල නියෝජිතයින් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. ඒක නිසා පළාත් පාලන ආයතන බිහි කිරීමේදී තිබුණු අරමුණුයි සැබැවින්ම දැන් එහි සිටින සභිකයන්ගේ ක්‍රියාකාරිත්වයයි අතර විශාල පරස්පරතාවයක් මතු වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, මේකට මොකක්ද කරන්නේ කියා. ඔබතුමා උදාහරණයක් හැටියට පසු ගිය කාලයේ ප්‍රදේශීය දේශපාලනඥයන් සම්බන්ධයෙන් තිබෙන වාර්තාව අරගෙන බලන්න. ඒ වාර්තාව දැන් මා ළඟ තිබෙනවා. කවුද? එල්.එච්. ධර්මසිරි, ප්‍රාදේශීය සභා මන්ත්‍රී. මොකක්ද තිබෙන්නේ? ස්ත්‍රී දූෂණයක් සහ නයනා නිල්මිණි හා ඇයගේ දියණිය ඝාතනය කිරීම සම්බන්ධයෙන් මිනීමැරුම් චෝදනා. 2012 මාර්තු. මැතිවරණ කොට්ඨාසය නිවිතිගල, රත්නපුර. දැන් මෙහෙම සිදුවීම්වලට ඔවුන් සම්බන්ධ වෙලා තිබෙනවා. මේ, පාර්ලිමේන්තුවේ Research Unit එකෙන් මා ලබා ගත් තොරතුරුයි. ඒ වාගේම ඔබ දකින්න ඇති, ස්ටැන්ලි තිලරත්න සම්බන්ධ කාරණය. ස්ටැන්ලි තිලකරත්න කියලා කියන්නේ අරනායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයායි. තුන් දෙනෙකුට පහර දෙන්නත් ඒ වාගේම power plant එකක් damage කරන්නත් ඔහු සම්බන්ධ වෙලා තිබෙනවා. මේ අරනායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයායි. ඊළඟට එම්.ඒ. චන්ද්‍රසිරි, උප සභාපති, ඇඹිලිපිටිය. එයා ප්‍රසිද්ධියේ බීමත්ව හැසිරිලා මිනිසුන්ට හිංසා වන විධියට කටයුතු කර තිබෙනවා. ඊළඟට මධ්‍යම පළාතේ සාලිය දිසානායක. එයා නම් ටිකක් උඩ කෙනෙක් නේ. අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මල්ලි. එයා පළාත් සභාවේ. ඒක ඕනෑ නැහැ.

ඊළඟට සම්පත් චන්ද්‍ර පුෂ්ප විදානපතිරණ. ඔහු තංගල්ල ප්‍රාදේශීය සභාවේ Chairman. ගරු අතාවුල්ලා ඇමතිතුමනි, සම්පත් ගැන ඔබතුමා දන්නවා ඇතිනේ. දැන් ඔහු ලොකු ආන්දෝලනයකට තුඩු දීලා තිබෙනවා. එංගලන්ත පුරවැසියකු ඝාතනය කිරීම පිළිබඳව ඔහුට විරුද්ධව නඩුවක් පැවරිලා තිබෙනවා.

ඊළඟට ජයන්ත සුරවීර. කරන්දෙනිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී. අම්මා කෙනෙකු දූෂණය කිරීම පිළිබඳ චෝදනාවක් ඔහුටත් තිබෙනවා. ඊළඟට සුරවීර ලියනගේ සුනිල්. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති. එතුමාටත් තිබෙනවා කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ චෝදනා. ඊට පස්සේ කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු ඝාතනය කිරීම පිළිබඳ චෝදනාවක් එතුමාට තිබෙනවා. ඔහු තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම රුක්මන් කොළඹගේ. ඔහු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. ඔහුට තිබෙනවා, කාන්තාවකට තර්ජනය කිරීම සහ හිරිහැර කිරීම පිළිබඳ චෝදනා. තමුන්නාන්සේලා ප්‍රාදේශීය සභා හරහා මේ ක්‍රියාත්මක කරන්නේ, "එක ගමකට එක වැඩක්" කියන වැඩසටහන කියලායි මට හිතෙන්නේ. මේ ඒ ව්‍යාපෘතිද කියලා මට සැකයක් තිබෙනවා. එක ගමකට එක වැඩක් කියන්නේ, එක්කෝ එක ගමක මන්ත්‍රීවරයකු විසින් ස්ත්‍රියක් දූෂණය කරනවා; නැත්නම් මිනිහෙක් මරණවා. ඒකද ඒ ව්‍යාපෘතිය? අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා එක ගමකට එක වැඩක් නොවෙයි, එක ගමකට වැඩ 100ක් කරනවා කියලයි මට හිතෙන්නේ. ඒක සාධාරණ නැහැ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා කලබල වෙන්න එපා. අක්කරපත්තුවේ ඒ.එල්.එම්. අතාවුල්ලා කියලා නමක් මේ ලැයිස්තුවේ නැහැ. ඒ නිසා කලබල වෙන්න එපා. [බාධා කිරීමක්] ඒක හොඳයි. ඒ නම මේ ලැයිස්තුවේ සඳහන් වෙලා නැහැ. නමුත් ඔබතුමා කලබල වන විධිය දැක්කාම හරියට හොයලා බලන්න ඕනෑ.

ඊට පස්සේ එම්.කේ. අමිල. ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සභාපති. අපි දැක්කා පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට පහර දීලා අත් අඩංගුවට ගන්නවා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔබතුමාගේ යෝජනාව කියන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ යෝජනාව මෙකයි. [බාධා කිරීමක්] නැහැ, මේවා හරිම වැදගත්. ඔබතුමා කලබල වෙනවානේ. මේ ලැයිස්තුවේ දහවැනියාගේ නම කියන කොට මෙතුමා කල්පනා කරනවා, තමන් ඉන්නේ එකොළොස්වැනියාටද කියලා. කලබල වෙන්න එපා, එකොළොස්වැනියාත් ඔබතුමා නොවෙයි. [බාධා කිරීමක්] ඊට පස්සේ, අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔබතුමාගේ යෝජනාව කියන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
යෝජනාව කියන්නම්. පොඩ්ඩක් ඉන්නකෝ. අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මිනිස්සු දෙදෙනෙක් ඝාතනය කළා. ඒ වාගේම කරු වීරරත්න. ඔහු රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. හිංසා කිරීම පිළිබඳව ඔහුටත් චෝදනා ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේ ලැයිස්තුව හැන්සාඩ්ගත කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

මගේ යෝජනාව මෙකයි. දැන් මේ සඳහා නීතියක් සම්පාදනය කරන්න බැරිද? තමුන්නාන්සේ යටතේ තිබෙන පළාත් පාලන ආයතනවල අරමුණ මොකක්ද? අරමුණ වෙන්නේ ස්ත්‍රීන් දූෂණය කිරීම හෝ මිනී මැරීම හෝ පොලිසියට ගැසීම හෝ කොටන් කැපීම හෝ නිදන් හැරීම හෝ නොවෙයිනේ. ඔබතුමා මේ පනතින් ඒ බලතල දීලා නැහැනේ. හැබැයි, දැන් සිද්ධ වෙලා තිබෙන්නේ, මේ පනතින් ලබා නොදී තිබෙන බලතල ඒ මන්ත්‍රීවරු ක්‍රියාත්මක කරන එක. අපි කරන යෝජනාවක් තමයි මේ බලතල මේ පනතට ඇතුළු කරන්න කියන එක. එතකොට කියන්න පුළුවන්, "ඒවා නීත්‍යානුකූලයි" කියලා. එතකොට ගරු ඇමතිතුමනි, පළාත් පාලන පනත අනුවම ඉඩ දීලා තිබෙනවා නිදන් කඩන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා ස්ත්‍රීන් දූෂණය කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කොටන් කපන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කාන්තාවන් ඝාතනය කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කුඩු business කරන්න; පනත අනුවම ඉඩ දීලා තිබෙනවා කප්පම් ගන්න. එහෙම නැත්නම් වලල්ලාවිට ප්‍රාදේශීය සභා සභාපතිවරයා අත් අඩංගුවට පත් වෙන්නේ නැහැනේ. ඒ නිසා ඔබතුමා පනතට සංශෝධනයක් ගෙනෙන්න, මේවා තමයි පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය කියලා. ඔන්න එක යෝජනාවක්. [බාධා කිරීමක්] ඔබතුමා අහපු යෝජනා ගැන මම කියන්නේ. ඔබතුමා විශේෂ කාරක සභාවක් පත් කරලා හෝ කමක් නැහැ,- [බාධා කිරීමක්] ඔබතුමා අහපු නිසා මම එක යෝජනාවක් කළේ. ඔබතුමා දැන් අහනවානේ යෝජනා මොනවාද කියලා. දැන් තිබෙන ප්‍රශ්නය මෙකයි. දැනට තිබෙන පළාත් පාලන පනතේ අරමුණු තිබෙනවානේ. දැන් තමුන්නාන්සේ මේ සංශෝධන ගෙනෙන්නේ මොකටද? පළාත් පාලන ආයතන පිහිටුවන්න, ඒ පිහිටුවන ආයතන අරමුණු අනුව මෙහෙයවන්න. නමුත් දැන් ඒ අරමුණු නොවෙයි, වෙනත් අරමුණු තමයි ක්‍රියාත්මක වෙන්නේ. එක්කෝ දැන් පනතට සංශෝධනයක් ගෙනෙන්න ඕනෑ, අරමුණ තමයි, "එක ගමකට එක වැඩක්" කියලා. හැබැයි සමහර අය වැඩ දෙක තුනක් කරලා තිබෙනවා. හැබැයි, ප්‍රවේශමෙන්. එක්කෝ ඒ සංශෝධන ගෙනෙන්න ඕනෑ. එහෙම නැත්නම් කරන්න ඕනෑ මොකක්ද? පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් මෙවැනි ක්‍රියාමාර්ගවල නිරත වූ වහාම ඔහුගේ මන්ත්‍රීධුරය අහෝසි වීමට අදාළ වන පරිදි සංශෝධන ගෙනෙන්න ඕනෑ. ඔන්න කරනවා නම් වැඩේ. නමුත් ඔබතුමා ඒක කරන්නේ නැහැ.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඒක කරන්න පුළුවන්. හැබැයි, ඒවා පළාත් සභාවෙන් අනුමත කරන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමා කියනවා ඒ සංශෝධනය ගෙනෙනවා කියලා. බොහොම හොඳයි, ස්තුතියි. ගරු අකාවුල්ලා ඇමතිතුමා කියනවා, ඒ පනතට සංශෝධන ගෙනෙනවා, හැබැයි පළාත් සභාවලින් අනුමත වෙන්න ඕනෑලු. දැන් මෙතුමා බයයි. මොකද, පළාත් සභාවල ඉන්නේත් ඒ ජාතියේ අයියලානේ. ඒත්, අනුමත කරයි.

ගරු ඇමතිතුමනි, පොඩි කාරණයක් කියන්නද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අද කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරු කැඳවා තිබුණා, මේ කොට්ඨාස නිර්ණය පිළිබඳ ඔවුන්ගේ අදහස් දක්වන්න කියලා. එහෙම අදහස් දක්වන්නය කියලා ඔවුන් කැඳෙව්වාට, දැනට තිබෙන යෝජනාව ගැන ඔවුන්ව දැනුවත් කිරීමක් කර නැහැ කියලායි කොළඹ මහ නගර සභාවේ සන්තියාගු මන්ත්‍රීතුමා සඳහන් කළේ. අපට සියල්ලම ගැන කථා කරන්න බැහැ නේ. මේ යෝජනාව පිළිබඳ පදනම අපට දැනුම් දුන්නා නම්, ඒ පදනම මත ඉඳගෙන එහි හොඳ - නරක ගැන අපට කථා කරන්න පුළුවන්. ඒ වාගේම බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මගේ පක්ෂයේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මන්ත්‍රීවරුන්ට දැනුම් දීමක් කර තිබෙනවා, ඉදිරි දිනකදී මැතිවරණ කොමසාරිස්තුමාව මුණ ගැහෙන්නය කියලා. ඔවුන් දන්නේ නැහැ, නිලධාරීන් විසින් දැනට කර තිබෙන පදනම් යෝජනාව ගැන . ඒක අපට කිව්වොත් අපට අදහස් දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ගරු අමාත්‍යතුමාට අවස්ථාව දෙන්න. කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මේ සම්බන්ධව කථා කරන්න තව ගොඩක් කරුණු තිබෙනවා. මේක විතරක් නොවෙයි. ඉදිරියට තව කථා කරන්න වෙනවා. අනික් කාරණය මේකයි. ඒ පනත් කෙටුම්පත සම්මත කරපු දවසේ මම පිළිගත්තා, අප මේ delimitation එක ඉවර වුණාට පස්සේ එහි තිබෙන අඩුපාඩු ටික සකස් කරනවාය කියලා. ඒක අප පිළිගත්තා. අප එය කිව්වා. පනතක් සංශෝධනය කරලා, මේ ක්‍රමය හදන කොට එක පාරටම ඒක හරියට කරන්න බැරි වෙයි. බලන්න, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තිබුණු Parliamentary system එක වෙනස් කරලා ඒ Constitution එක amend කර ගත්තා. හැබැයි අදත් දවසින් දවස ඒ පනත අප සංශෝධනය කරනවා නේ. දවසින් දවස හැම ආයතනයක්ම ඒ පනත වෙනස් කරනවා. පළාත් පාලන ආයතනය ඒ පනත වෙනස් කරනවා. Constitution එක වෙනස් කරනවා. දහඅට වෙනස් කරනවා. දහතුන වෙනස් කරනවා. දහහත වෙනස් කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දහතුන?

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
දහතුනත් වෙනස් කළා. වෙනස් කරනවා නේ. හැම වෙලාවේම වෙනස් කරනවා. ඒ කියන්නේ, මොකක්ද හේතුව? ඒකට හොඳ advice එකක් තිබුණේ නැහැයි කියා අපට කියන්නට පුළුවන් ද? කියන්නට බැහැ නේ. දැන් අර ගරු මන්ත්‍රීතුමා කියනවා, "බලන්න ඒක ඔයගොල්ලො හරියට කරලා නැහැ නේ. නැත්නම් මේ ප්‍රශ්නය එන්නේ නැහැ නේ. නැත්නම් මේ amendment එක ගේන්න ඕනෑ නැහැ නේ." කියා. ඒක වැරදියි. අපට මාස හයක් ඇතුළත මේක කරන්නට පුළුවන්කමක් තිබුණා නම්, මේ amendment අපට ඕනෑ නැහැ. Interpretation Ordinance එකට අනුව අපට පත් කරන්නට පුළුවන්. දැනුත් පුළුවන්. හැබැයි මැතිවරණ කොමසාරිස්තුමා ඉල්ලුව නිසා තමයි අප මේක කරන්නේ. එම නිසා පුළුවන් තරම් අපේ අමාත්‍යාංශයයි, Attorney-General's Department එකයි එකතුවෙලා මේ පනත් කෙටුම්පත හරිගස්සා තිබෙනවා. නමුත් ඒවා බලන්නේ නැහැ. ඒවා හරියි කියා කියන්නේ නැහැ. "හොඳයි "කියා කියන්නේ නැහැ, කවදාවත්. Opposition එක කවදාවත් "හොඳයි" කියා කියන්නේ නැහැ. "නරකයි" කියන එක තමයි කියන්නේ.

තමුන්නාන්සේලා අදහස් ඉදිරිපත් කිරීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේ මට්ටමට කථා කරාවිය කියා මා නම් බලාපොරොත්තු වුණේ නැහැ. [බාධා කිරීම්] නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා නළවන්න ද?

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නළවන්නට ඕනෑ නැහැ. මන්ත්‍රීවරුන්ගේ, සභාපතිවරුන්ගේ ප්‍රශ්න තමුන්නාන්සේලාගේ කාලයේ තිබිලා නැද්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ.

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
UNP ආණ්ඩුව කාලයේ එහෙම තිබිලා නැද්ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔය තරම් නැහැ.

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඇමතිවරු , මන්ත්‍රීවරු එහෙම කරලා නැද්ද? කොච්චර දූෂණ තිබුණා ද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ.

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
එහෙම නැහැයි කියලා කියන්න එපා. ඒවා අපට කරන්නට බැහැ නේ. ඒකට වෙනම ආයතනයක් තිබෙනවා. මන්ත්‍රීවරු වේවා, පළාත් සභා මන්ත්‍රීවරු වේවා, CJ වේවා දඩුවම් දෙන්න ක්‍රමයක් තිබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
The responsibility must be taken by the Government.

ගරු ඒ.එල්.එම්. අකාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
හරි. Government එක වුණත් කෙලින්ම, නිකම් ම කරන්නේ නැහැනේ. ඒකට ක්‍රමයක් තිබෙනවා නේ. ඔබතුමා පොඩි ළමයෙක් වාගේ කථා කරන එක මට පිළිගන්නට බැහැ. අනෙක් අය කථා කළා නම් ඒක පිළිගන්නට පුළුවන්. අර JVP මන්ත්‍රීතුමා හැම දාම කථා කරනවා විතරයිනේ. ඔබතුමා senior politician කෙනෙක්. You have a responsibility.[බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාට බාධා කරන්න එපා. කාලවේලාව පිළිබඳ ගැටලුවක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
අපිත් අපේ රටට ආදරෙයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙදතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු ඇමතිතුමා කථා කරන්න. කාලවේලාව සම්බන්ධ ගැටලුවක් තිබෙනවා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)
හොඳ අදහස් ඉදිරිපත් කළ මන්ත්‍රීතුමන්ලාට අප ස්තුතිවන්ත වෙනවා. හැබැයි අප මේ delimitation එක ඉවර කරලා පළාත් පාලන ආයතනවලට නව ඡන්ද පවත්වා, මේවා වෙනස් කරනකොට මොකක් ද අප කරලා තිබෙන්නේ කියා මේ රටට පැහැදිලි වෙයි. මොකක් ද අප කළ වෙනස කියා රට දැන ගනීවි. ඒ වෙනතුරු තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. තව මාස හයයි තිබෙන්නේ මේක ඉවර කරන්න.. [බාධා කිරීම්]

නාන් තමිළිලේ සිල විටයංකළෛච් සොල්ල වේණ්ටුම්. ඉච්සපෙයිලේ වටක්කු, කිළක්කු මාකාණංකළ් තොටර්පාන පිරච්සිනෛ පට්රිප් පේසප්පට්ටතු. කුරිප්පාක මාණ්පුමිකු යෝකරාජන් අවර්කළ් ඉතෛප්පට්රිප් පුරින්තුකොළ්ළ වේණ්ටුම්. වටක්කු මාකාණම්, කිළක්කු මාකාණම් එන්පන ඉරණ්ටු වෙව්වේරු මාකාණංකළ්. ඉව්විරු මාකාණංකළෛයුම් ඉණෛප්පතානතු, නාටු ඒට්රුක්කොණ්ටු ඔරු පේච්සු වාර්ත්තෛමූලම් සෙය්තිරුක්ක වේණ්ටිය විටයම්. ආනාල්, ඉලංකෛ - ඉන්තිය ඔප්පන්දත්තින් පිරකාරම්, කිළක්කු මාකාණත් තිලුළ්ළ තමිළ් මක්කළුටනෝ, මුස්ලිම් මක්කළුටනෝ එව්විතත්තිලුම් ආලෝසික්කප්පටාමල් කපටත්තනමාක කිළක්කු මාකාණම් වට මාකාණත්තුටන් ඉණෛක්කප්පට්ටතු. අව්වාරු ඉණෛත්ත කාලත්තිල් වටක්කු, කිළක්කු මාකාණත්තිල් වාළ්න්ත මුස්ලිම් මක්කළුටෙය පිරතිනිතිකළ් ඉල්ලාමලේයේ වටක්කු, කිළක්කු මාකාණ සපෙ කූටියතු. අංකු 17 මුස්ලිම් අංකත්තවර්කළ් ඉරුන්තාර්කළ්. අන්තප් 17 මුස්ලිම් අංකත්තවර්කළුටෙය පිරසන්නම් ඉල්ලාමලේයේ අම්මාකාණ සපෙයෛක් කූට්ටක්කූටියතාක ඉරුන්තතු. ඉතනාල්, අවර්කළුටෙය අරසියල් පලම් පාතික්කප්පට්ටිරුන්තතු. ඉන්තච් සූළ්නිලෛයිලේ තමිළර් විටුතලෛක් කූට්ටණියින් පෙරුම්පෙරුන්ත තලෛවර්කළ් එල්ලෝරුම් "නාංකළ් පිරික්කාමල් චේර්න්තිරුප්පතර්කු වළිවකෛකළෛච් චෙය්වෝම්" එන එමතු තලෛවර් මාණ්පුමිකු අෂ්රෆ් අවර්කළිටම් කේට්ටුක්කොණ්ටතර්කිණංක අවර්, "නිපන්තනෛකළුටන් ඉණෛවතර්කුප් පේසුවෝම්" එන්රු චොන්නාර්. අව්වාරු අන්තක් කාලත්තිල් නිපන්තනෛකළ් තොටර්පාක පල පේච්සුවාර්ත්තෛ නටෛපෙට්රපොළුතිලුම් ඔරුපොළුතුම් තමිළර් විටුතලෛක් කූට්ටණියිනරෝ, පුලිකළෝ එන්ත නිපන්තනෛයෛයුම් ඒට්රුක්කොළ්ළවිල්ලෛ. මාට්රාක, පේච්සු වාර්ත්තෛ මේසෛක්කුප් පෝකුම්පොළුතු "පෝරාටාත මුස්ලිම් මක්කළුක්කු එන්න පේච්සු වේණ්ටික්කිටක්කිරතු" එන්රු කූරිය වසනංකළෛත්තාන් කේට්ටක්කූටියතාක ඉරුන්තතු.

ඉවෛ ඔරුපුරමිරුක්ක, තලෛවර් අෂ්රෆ් අවර්කළ් කටෛසියාක පාරාළුමන්රත්තිල් ආට්රිය උරෛ අටංකිය *හන්සාට්* එන්නිටම් ඉරුක්කිරතු. අවර් තනතු උරෛයිලේ "වට කිළක්කු තමිළ් පේසුම් මානිලම් එන්රු ඉණෛන්තිරුප්පතර්කාන ඕර් ඔළුංකු සම්පන්තමාක පේසුකින්ර කටෛසික් කුරල් ඉන්ත අෂ්රෆ්පිනුටෙයතාකත්තාන් ඉරුක්කුම්. ඉන්ත නිපන්තනෛකළ් තොටර්පාක, මුස්ලිම් මක්කළුටෙය පිරච්සිනෛකළුක්කු නීංකළ් කාතු කොටුක්කවිල්ලෛයෙන්රාල්, එන්නුටෙය සමූකම් වටක්කු, කිළක්කෛප් පිරික්කක් කෝරුම්" එනක් කුරිප්පිට්ටිරුක්කිරාර්. අතන් පින්නර් අවර් මරණිත්තුවිට්ටාර්. අතන් පිරකාරම් කිළක්කිලිරුන්තු එළුන්ත කුරලාක මුතලාවතාක නාන්තාන් වටක්කු, කිළක්කෛප් පිරික්කක් කෝරිනේන් එන නිනෛක්කිරේන්. ඒනෙනිල් අතෛත් තවිර වේරු වළියිල්ලෛ. කිළක්කිල් වාළ්කින්ර තමිළ් මක්කළුම් මුස්ලිම් මක්කළුම් ඔරු තාය් වයිර්රුප් පිළ්ළෛකළ්. ඔරු කාලත්තිලුම් කිළක්කු මාකාණත්තිල් වාළ්න්ත තමිළර්කළ් වට මාකාණත්තිල් වාළ්න්ත තමිළර්කළෛ ඒර්රුක්කොළ්ළවිල්ලෛ. අන්රෛය කාලත්තිලේ කිළක්කු මාකාණත්තිල් වාළ්න්ත තමිළර්කළ් මට්ටක්කළප්පිලේ "යාළ් ඔට්ටික් කළකම්" එන්රු ඔරු කළකත්තෛ ස්තාපිත් තිරුන්තාර්කළ්. ඒතෝ ඔරු කාරණත්තුක්කාක කිළක්කු මාකාණත් තිලුළ්ළ තමිළර්කළ් වට මාකාණත්තිලුළ්ළ තමිළර්කළින් පිටික්කුළ් මාට්ටි, පාතික්කප්පට්ටු අන්තප් පිටියිලිරුන්තු මීළ මුටියාත නිලෛ ඒර්පට්ටතු එංකළුක්කු ඥාපකමිරුක්කිරතු.

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(මාණ්පුමිකු ජෙ. ශ්‍රී තංකා)
(The Hon. J. Sri Ranga)
අදු ඔරු පිරච්සිනෛයල්ල.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙදතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
Hon. Minister, please wind up now.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)
Please give me one more minute.

ඉලංකෛයෛප් පොරුත්තවරෛයිල් ඉරණ්ටු තමිළ් පේසුම් මානිලම් ඉරුප්පතෛයිට්ටු නාම් ඒන් කවලෛප්පට වේණ්ටුම්? තමිළ් පේසුම් මානිලංකළ් ඉරණ්ටු ඉරුක්කට්ටුම්! වටක්කු මාකාණත්තිල් තමිළර් ඔරුවර් මුතලමෛච්චරාක ඉරුක්කට්ටුම්; කිළක්කු මාකාණත්තිලේ තමිළරෝ, මුස්ලිමෝ, චිංකළවරෝ මුතලමෛච්චරාක ඉරුක්කට්ටුම්. "ඉනංකළුක්කිටෛයිල් අතිකාරප් පකිර්වු" එන්පතෛ නාංකළ් "මානිලංකළුක්කිටෛයිල් අතිකාරප් පකිර්වු" එන මාට්රුවෝම්. කිළක්කු මාකාණත්තිලුළ්ළ අනෛත්තු මක්කළුක්කුම් නාංකළ් අතිකාරප් පකිර්වෛක් කොටුප්පෝම්. කිළක්කු මාකාණත්තිලුළ්ළ තමිළර්කළ්, මුස්ලිම්කළ්, චිංකළවර්කළ් අනෛවරුක්කුම් අතිකාරම් කිටෛක්කට්ටුම්. අතුපෝල වට මානිලත්තුක්කුම් අන්ත අතිකාරංකළ් කිටෛක්කට්ටුම්. අප්පටි අතිකාරප් පකිර්වෛ මේර්කොළ්වතන්මූලම්තාන් ඉන්තච් චිරිය නාට්ටිලේ චිංකළ, තමිළ්, මුස්ලිම් ඉනප්පාකුපාටුකළ් ඉල්ලාමල් එම්මාල් වාළ මුටියුම්. ඉන්ත නාටු අව්වාරු කූරුපෝටප්පට්ටාල්, අංකු තොටර්ච්චියාක මක්කළ් වාළ්වතර්කුරිය ආරෝක්කියමාන සූළ්නිලෛ ඉරුක්කාතු එන්පතෛ එමතු නීණ්ටකාල අනුපවත්තින් පිරකාරම් අරින්තුකොණ්ටෝම්. ඉන්රෛක්කුක්කූටප් පාරුංකළ්! අණ්මෛයිල් නියමික්කප්පට්ට පාරාළුමන්රත් තෙරිවුක්කුළුවුක්කු එතිර්ක්කට්චිකළ් චාර්පාක අංකත්තවර්කළෛ නියමිප්පතු චම්පන්තමාකප් පේසිනාර්කළ්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙදතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
Hon. Minister, please wind up.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මට විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ප්‍රශ්න විසඳන්න ඕනෑ කියන මතය එක්සත් ජාතික පක්ෂයට කවදාවත් නැහැ. අනිවාර්යයෙන්ම මම කියනවා, කවදාවත් ඒ ගොල්ලෝ එය කරන්නේ නැහැ කියා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ මොකක්ද?

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
දැන් බලන්න, Parliamentary Select Committee එක පත් කරලා තිබෙනවා නම්, තමුන්නාන්සේලාට පක්ෂයක් තිබෙනවා නම්, තමුන්නාන්සේලාගේ නියෝජිතයෝ ඇවිල්ලා එහි වාඩි වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා රවුල් හකීම් ගැනයි, අනෙක් අය ගැනයි කථා කරන්න ඕනෑ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට බාධා කරන්න එපා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
රවුල් හකීම් ගැනයි අනෙක් අය ගැනයි කථා කරන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමාට බාධා කරන්න එපා.

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
තමුන්නාන්සේලා හිතන්න ඕනෑ. කවදාවත් තමුන්නාන්සේලා හිතලා නැහැ. ඒ වාගේම තමයි එදා ප්‍රභාකරන්ව ගෙන්වලා ගිවිසුම් අත්සන් කළේ ප්‍රශ්න විසඳන්නටද? නැහැ, එහෙම නොවෙයි. කන්න; නැත්නම් කන ගොනාට දෙන්න. කන්නෙත් නැහැ, කන ගොනාට දෙන්නෙත් නැහැ. ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

ඛිනා විදුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පඩි, සට්ටමූලම් ඉරණ්ටාම් මුරෙයාක මදිප්පිටප්පට්ටතු.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]

තීර්මානික්කප්පට්ටතු.
"සට්ටමූලම් මුළුප් පාරාළුමන්රක් කුළුවුක්කුච් චාට්ටප් පඩුමාක" [மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

කුළුවිල් ආරායප්පට්ටතු.
[තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.]
Considered in Committee.
[MR. PRESIDING MEMBER in the Chair.]

1 සිට 3 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ආම් වාසකත්තිලිරුන්තු 3ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (වලංගු කිරීම.)
வாசகம் 4.- (செல்லுபடியாக்குதல்.)
CLAUSE 4. - (*Validation*)

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"In page 1, leave out all words in line 26 and insert:

'of this Act in terms of the provisions of the Local Authorities Elections Ordinance (Chapter 262) which were in operation on the date immediately preceding the date of coming into operation of the Local Authorities Elections (Amendment) Act, No. 22 of 2012 shall be deemed to have been validly filled.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

4වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 සහ 6 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
5ආම්, 6ආම් වාසකංකළ් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 5 and 6 ordered to stand part of the Bill.

දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
විරිවුප් පෙයර් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Long Title ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධනය සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendment.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන්, දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

අ.පො.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණ වේදය විෂය ධාරාව
க.பொ.த (உயர்தர) தொழில்நுட்பப் பாடவிதானம்
TECHNOLOGY STREAM FOR G.C.E. (A/L)

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)

(The Hon. Eric Prasanna Weerawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"සෑම වර්ෂයකම අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට උසස් පෙළ හැදෑරීමට ප්‍රමාණවත් ප්‍රතිඵල නොලැබූ විශාල පිරිසක්ද, අ.පො.ස. (උ.පෙළ) තරගකාරී විභාගයට පෙනී සිට සරසවි වරම් නොලබන විශාල පිරිසක්ද, සමාජයට එකතු වේ. එසේම කලා විෂය ධාරාව යටතේ උපාධිය ලබන බොහෝ තරුණයින්ට රැකියා සොයා ගැනීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට ද සිදුව ඇත.

මේ තත්ත්වය මැඩලීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ යෙදෙන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය එක්ව පාසල් සඳහා තාක්ෂණික විෂය ධාරාවක් හඳුන්වා දීම නියමිතව ඇති බව දැනගන්නට ඇත. එවැනි නව විෂය නිර්දේශයක් හඳුන්වා දෙන්නේ නම් එම කාල වකවානුව කුමක්ද යන්න මෙම ගරු සභාව දැනුවත් කරන ලෙසත්, එසේ නොමැති නම්, ඒ වෙනුවට ඉහත අමාත්‍යාංශ එකතු වී විකල්ප වැඩසටහනක් හඳුන්වා දිය යුතු බවත් මම මේ ගරු සභාවට යෝජනා කරමි. "

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, යුද්ධයෙන් තොර මේ රටේ ජනතාව මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ අනුමත කරමින් ශක්තිමත් පාර්ලිමේන්තුවක් 2010 මැතිවරණයෙන් පස්සේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ බිහි කළා. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, යුද්ධයෙන් තොර රටක පාර්ලිමේන්තුවේ 161 දෙනෙකුගේ ශක්තිමත් ස්ථාවරභාවයක් එක්ක, මැතිවරණයට විතරක් සීමා කරන්නේ නැතුව අපි හැමදාම කියවන, හැම අමාත්‍යාංශයක්ම ඒ අනුව කටයුතු කරන මහින්ද චින්තන ඉදිරි දැක්ම කියන ඒ වැඩ පිළිවෙළ ඔස්සේ ශක්තිමත් ආර්ථිකයක් කරා, ආසියාවේ ආශ්චර්යය කරා යන මොහොතකයි අපි සියලු දෙනාම සිටින්නේ.

අනාගතයේදී මේ නිදහස්, සාමකාමී රටේ ආර්ථිකයට ගැළපෙන ශක්තිමත් ශ්‍රම බලකායක් බිහි කිරීම හැමෝම ඉදිරියේ තිබෙන අභියෝගයක්. ඒ ශ්‍රම බලකාය බිහි කිරීම පිළිබඳව 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩ පිළිවෙළ තුළත් නොයෙක් තැන්වල සඳහන් වුණා.

මේ වැඩ පිළිවෙළ සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉතාමත්ම වැදගත් වෙනවා. පසු ගිය කාලයේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සහ යෙදෙන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තුළ -අධ්‍යාපනයට සම්බන්ධ අමාත්‍යාංශ තුළ- විශේෂ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වන බව අපිට දකින්නට ලැබුණා. පසු ගිය කාලයේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කාරක සභාව මාස ගණනාවක් තිස්සේ රැස් වෙලා මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගෙන, මහාචාර්යවරු ආචාර්යවරු විදුහල්පතිවරු ඇතුළු රටේ විද්වතුන් කැඳවලා ඔවුන්ගේ අදහස් ලබා ගෙන සුවිශේෂී වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම ඒ වැඩ පිළිවෙළ පොතකට විතරක් සීමා වෙන්නේ නැතිව 2012 ජනවාරි 01 වැනි දා සිට ක්‍රියාත්මක වුණු බව අපට දකින්නට ලැබෙනවා. පාසල් 350කට අධික ප්‍රමාණයක ප්‍රාථමික අංශය ඉවත් වෙලා නව වැඩ පිළිවෙළ පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම උසස් පෙළ දරුවන්ට ඉගැන්වීම සඳහා අලුත් ගුරුවරුන් බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 409ක් අද ලංකාව පුරා ඉදි වෙනවාය කියන එක. මහනුවර දිස්ත්‍රික්කයේ මගේ ආසනය තුළ පාසල් 3ක දැනටමත් ඒ තාක්ෂණික විද්‍යාගාර හදලා ඉවරයි. මේ වාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඒ කථා කළ කරුණු, ඉදිරිපත් කළ කරුණු එකින් එක, එකින් එක යථාර්ථයක් බවට පත් වන බව අපට දකින්නට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ වෙලාවේ ශ්‍රම බලකාය ගැන සඳහන් කරන්නට ඕනෑ. ලංකාවේ බොහෝ ආයතන -රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන- රැකියා සඳහා කැඳවීම් කරනවා. රැකියා සඳහා තරුණ තරුණියන් අවශ්‍යයි කියලා කියනවා. ඒ වාගේම ලෝක රැකියා වෙළෙඳ පොළ තුළත් විශාල ක්ෂේත්‍රයක රැකියා සඳහා තරුණයින්ට අවස්ථාව තිබෙනවා. අනෙක් පැත්තෙන් ගත්තාම උසස් පෙළ, සාමාන්‍ය පෙළ කරලා රැකියා විරහිත යම් තරුණ පිරිසකුත් රට තුළ සිටිනවා. මේ දෙක ගළපන්නේ කොහොමද කියන අභියෝගයත් අනිවාර්යයෙන්ම රට හමුවේ තිබෙනවා. තාක්ෂණික විෂය ධාරාවක් හඳුන්වලා දීලා, පළමුව පාසල් 200ක පමණක් එය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබෙන බව අපට අහන්නට ලැබුණා. අපි බලාපොරොත්තු වනවා මේ තුළින් ඉදිරියේදී රැකියා ඉල්ලුම සහ රැකියා නැතිකම අතර සම්බන්ධීකරණයක් ඇති වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසු ගිය දවස්වල පත්තරවල දකින්නට ලැබුණා ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා සමඟ ගිවිසුමක්

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

අත්සන් කරනවා කියලා university colleges 9ක් ලංකාව තුළ ඇති කරන්නට. නමුත් ගරු ඇමතිතුමනි, දැනටත් ලංකාවේ තිබෙන විශ්වවිද්‍යාල පද්ධතිය තුළින්, උසස් අධ්‍යාපන පද්ධතිය තුළින් එළියට එන බොහෝ තරුණ තරුණියන්ට -විශේෂයෙන් කලා මාධ්‍ය හදාරා ඇති අයට- රැකියා නොමැතිකමේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. අපි දැන ගන්නට කැමැතියි, ඔබතුමා බිහි කරන්නට යන විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් අප හමුවේ තිබෙන අභියෝගවලට උත්තර දෙන්නේ කොහොමද කියලා. ඒ වාගේම ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, මේ වැඩ පිළිවෙළ අදාළ වන්නේ පාසල් 200කට පමණක්ද? පාසල් 1,000 වැඩ පිළිවෙළ තුළ ඉතිරි පාසල්වලට මේ වැඩ පිළිවෙළ හඳුන්වා දෙන්නේ නැද්ද? අපේ හාරිස්පත්තුව ආසනයේ 150,000ක් පමණ ජනතාව සිටිනවා. නමුත් එක පාසලකට පමණයි මේ තාක්ෂණික විෂය ධාරාව හඳුන්වලා දීලා තිබෙන්නේ. අනෙක් පාසලුත් මේකට ඇතුළත් කර ගන්න කියලා අපි යෝජනා කරනවා. එහෙම කරනවා නම් කොයි කාලයේ වාගේද වෙන්නේ කියන කාරණයත් අපි දැන ගන්නට කැමැතියි.

හෙද වෘත්තිය - nursing - සඳහා ලංකාවේ රාජ්‍ය සෞඛ්‍ය සේවයේත්, පෞද්ගලික සෞඛ්‍ය සේවයේත්, ඒ වාගේම විදේශ රැකියා වෙළෙඳ පොළේත් විශාල ඉල්ලුමක් තිබෙනවා.

එවැනි වැඩ පිළිවෙළක් තුළින් අපේ රටේ තරුණ තරුණියන්ට අවස්ථාවක් ලැබෙනවාද කියන කාරණය දැන ගන්න කැමැතියි. ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමනි, විශේෂයෙන් මෙහිදී සඳහන් කරන්න ඕනෑ, බොහෝ අය රක්ෂාවලට ගිහින් තිබෙන්නේ රක්ෂාවක් කරන්න ඕනෑ නිසා මිසක් ඒ රක්ෂාවට තිබෙන කැමැත්ත නිසා නොවෙයි කියන එක. උදාහරණයක් විධියට විශ්වවිද්‍යාලවලට තේරුණේ නැති අය විද්‍යා පීඨවලට යනවා. ඒ අය විශ්වවිද්‍යාලයට යන්න බැරි වුණු නිසා විද්‍යා පීඨවලට යනවා මිසක් උගන්වන්න තිබෙන ආශාව නිසා ඒ අය ඒ වෘත්තිය තෝරා ගත්තාය කියා අපට පෙනෙන්නේ නැහැ. මේක බොහෝ ක්ෂේත්‍රවල තිබෙන ගැටලුවක්. Nursing ගැන බැලුවත් එහෙමයි. වෛද්‍ය විද්‍යාලයට ගිහින් ඩොක්ටර් කෙනෙක් වෙන්න බැරි වුණාම තමයි ඒ වෘත්තිය තෝරා ගන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාගේ මේ වැඩ පිළිවෙළතුළින් තරුණයෙකුට, තරුණියකට එහෙම නැත්නම් ශිෂ්‍යාවකට, ශිෂ්‍යාවකට තමන් කැමැති ක්ෂේත්‍රය මුල පටන්ම හදුනා ගෙන ඒ ඔස්සේ ඉදිරියට ගිය හැකි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එකත් දැන ගන්න කැමැතියි. O/L, A/L සමත් වෙච්ච අයට තමයි තමුන්නාන්සේලා මේ තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දෙන්නේ. නමුත් O/L විභාගය fail වෙන විශාල පිරිසක් මේ රටේ සිටිනවා. ඒ අයගේ අනාගතය සම්බන්ධයෙන් මොන වාගේ වැඩ පිළිවෙළක්ද තිබෙන්නේ කියන එකත් මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. ඒ වාගේම, චීනය වැනි රටක 9 වසරෙන් පසුව තමන් academic field එකෙන් ඉදිරියට යනවාද, එහෙම නැත්නම් වෘත්තිය පුහුණු ක්ෂේත්‍රය තුළින් ඉදිරියට යනවාද කියන එක ගැන තීරණය කරන්න ශිෂ්‍යයින්ට අවස්ථාව තිබෙනවා. අපේ රටටත් එවැනි වැඩ පිළිවෙළක් ඉතාමත් යෝග්‍යයි කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මොකද, අපේ රටේ විශාල පිරිසක් O/L අසමත් වන නිසා 9 වසරේදීම තමන් කැමැති ක්ෂේත්‍රයකින් ඉදිරියට යන්න අවස්ථාවක් ලැබෙනවා නම් ඒකත් ඉතාමත් යෝග්‍යයි කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් වූ කාලෝචිත යෝජනාවක් හැටියට ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ඉතා ඕනෑකමින් ස්ථිර කරනවා.

රටක දියුණුවට බලපාන සාධකවලින් ප්‍රධානම සාධකය තමයි අධ්‍යාපනය. අධ්‍යාපනය සම්බන්ධයෙන් කවුරු මොනවා කිව්වත් නිදහස් අධ්‍යාපනය අපේ රට තුළ ස්ථාපිත වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඇප කැප වුණු විවිධ දේශපාලන පක්ෂවල නායකයින් ඉන්නවා. නිදහස් අධ්‍යාපනය අබණ්ඩව ඉදිරියට ගෙන යන්න ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා කරපු ඒ උදාර මෙහෙවර, නිදහස් අධ්‍යාපනය ලබපු අය හැටියට අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය පියවරෙන් පියවර ඉදිරියට ගලා ගෙන ආවත් ඒ අධ්‍යාපනය කාලීනව වෙනස් වෙන්න ඕනෑය කියා හෝ එහෙම නැත්නම් එහි ප්‍රතිසංස්කරණ සිදු විය යුතුය කියා හෝ මේ රටේ හිටපු නායකයින්, පාලකයින් අවධානය යොමු කළේ නැහැ. එහෙම අවධානය යොමු කළත් එවැනි වෙනස්කම් කරන්න බැරි ආකාරයේ විධිවාකාර බලවේගයනුත් ක්‍රියාත්මක වුණා. ඒ නිසාම කුමන හෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයකට යනකොට හුහාක් වෙලාවට කියපු සරල සහ සංවේදී දෙය වුණේ නිදහස් අධ්‍යාපනයට අත තියන්න යනවාය කියන එකයි. නිදහස් අධ්‍යාපනය කඩාප්පල් කරන්න යනවාය කියා සියලුම හොඳ දේවල් වසා දමා සමහර අවස්ථාවලදී දේශපාලනමය වශයෙන් යම් අය වාසි ලබා ගත් බව අපි දැක්කා. නමුත් අතිගරු ජනාධිපතිතුමා නිස් අවුරුදු යුද්ධයෙන් මේ රට නිදහස් කර ගෙන, මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු කර, පංච මහා බල කේන්ද්‍රස්ථානයක් බවට මේ රට පත් කරන විට දැනුම එක් කේන්ද්‍රස්ථානයක් විය යුතුය කියන සංකල්පයේ ඉඳගෙන මේ රටේ වැදගත්ම ක්ෂේත්‍රය වන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනසක් ඇති කරන්න විෂය භාර ඇමතිතුමන්ලාට අවශ්‍ය උපදේශකත්වය ලබා දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යන මේ සියල්ලම ඒකාබද්ධ වෙලා ඉතාම හොඳ ආදර්ශයක් ලබා දෙමින් අද නව ප්‍රවේශයකට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මීට අවුරුදු 30කට ඉස්සරින් විය යුතුව තිබුණු දෙයක්. මේ රටේ තරුණ අසහනයට පිළියමක් වශයෙන් මීට අවුරුදු 30කට කලින්වත් මේ වාගේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා නම් අතීතයේ මේ රටේ ඇති වුණු තරුණ ව්‍යසන, ලේ වැගිරීම් වැනි ඒ අමිහිරි අත් දැකීම් පිළිබඳව කවදාවත් අපට කථා කරන්න සිදු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හාරලක්ෂ හැටදහසක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් උසස් පෙළ විභාගයට වාඩි වුණාම ඒ අතරින් විසිතුන්දහසකුයි විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගන්නේ. ඒ වාගේම කලා විෂය ධාරාව හදාරන දෙලක්ෂ තිස්පන්දහසක් දරුවන් අතරින් අටදහසයි විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වෙන්නේ. ඒ වාගේම ඉතාම සීමිත කොටසක් එනම්, එක්ලක්ෂ විසිදෙදහසක් වැනි ප්‍රමාණයක් වාණිජ විෂය ධාරාවත්, එක්ලක්ෂ තුන්දහසක් වැනි ප්‍රමාණයක් විද්‍යා විෂය ධාරාවත් හදාරන කොට විශාල පිරිසක් ආපසු හැරෙනවා. ඒ අය මහජන දිනයේදී අපි හමු වෙන්න එනවා. ඒ හැම කෙනාටම හොඳ අධ්‍යාපන සුදුසුකම් තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රවේශයට Z-score එක දශමයයි, දෙකයි අඩු වෙලා තිබෙන්නේ. හැබැයි යන්න මාවතක් නැහැ. යමක් කරන්න ඔවුන්ට නිපුණතාවක් නැහැ. ඒ නිසා මේ රටේ පාසල් දෙසිය තිස්දෙකක තාක්ෂණ විද්‍යාල ආරම්භ කරන මේ වැඩ පිළිවෙළ මේ රටේ ආර්ථිකමය වශයෙනුත්,සමාජමය වශයෙනුත්, දේශපාලනික වශයෙනුත් විශාල හැරවුම් ලක්ෂ්‍යයක් හැටියටයි අපි දකින්නේ. ඒ නිසා අපේ අතිගරු ජනාධිපතිතුමාටත්, මෙයට නායකත්වය දෙන ගරු අධ්‍යාපන ඇමතිතුමා, ගරු යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා සහ මේ සම්බන්ධව කටයුතු කරන අනෙකුත් මහජන නියෝජිතයන් ඇතුළු සියලු දෙනාටම අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට අපි පසු ගිය කාලයේ දිගටම සම්බන්ධ වුණා. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ නිලධාරීන් විශාල කැප කිරීමක් කරමින්, විවිධ අයගේ අදහස්, යෝජනා ගනිමින් ක්‍රියා කළා. නව අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරන වෙලාවේ මේ ක්ෂේත්‍රය කෙරෙහියි මහජන නියෝජිතයින් වැඩි දෙනකුගේ අවධානය යොමු වුණේ. එනම්, තාක්ෂණ දැනුම අපේ දරුවන්ට ලබා දීම සම්බන්ධයෙනුයි. ඒ නිසා අධ්‍යාපන පනත එහෙම නැත්නම් ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්නත් පෙර, මහජන නියෝජිතයන් බහුතරයකගේ ඉල්ලීම සහ අවධානය යොමු වුණු, මේ වැඩ පිළිවෙළේ ප්‍රථම පියවරේදී තාක්ෂණ පාසල් 232ක් ආරම්භ කරන්න ගත්තු පියවර මේ රටේ අධ්‍යාපනයේ නොමැකෙන සලකුණ හැටියට නැත්නම් තීන්දුව හැටියට සනිටුහන් වෙනවායි කියන එක මතක් කරමින්, ඒ වෙනුවෙන් නායකත්වය දෙන අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජයට, අධ්‍යාපනයට ආදරය කරන හැම කෙනාගේම ගෞරවය ස්තුතිය නැවත වාරයක් පළ කරමින් මා නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කල් තැබීමේ විවාදය අවස්ථාවේ මෙම යෝජනාව ගෙනාව අපේ ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන් මේ රටට අවශ්‍ය, ඒ වාගේම රටේ අනාගත සංවර්ධනය තීරණය කරන්න ගත්තා වූ ප්‍රගතිශීලී ක්‍රියා මාර්ගය පිළිබඳවත් අපි ඇත්ත වශයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒකේ කිසිම තර්කයක් නැහැ. මොකද, ජපානය වාගේ රටවල් 1868 දී මේජි ප්‍රතිසංස්කරණ ආරම්භ කරලා 1912 වන තුරු ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙලා ඒවා තවත් දියුණු වුණා. මා දන්නා විධියට ජපානයේ මේ වන විට කාර්මික විශ්වවිද්‍යාල නැත්නම් තාක්ෂණික විද්‍යාල 63කට වැඩි ප්‍රමාණයක් පවත්වා ගෙන යනවා. ඒ තුළින් ජපානය වාගේ රටවල් ඉදිරියට ආපු පිම්ම එහෙම නැත්නම් ජපානය කාර්මික අංශයෙන් කොතරම් දියුණු වුණාද කියන එක අපි සැලකිල්ලට ගන්න ඕනෑ. දැන් ඒක චීනයට turn වුණත් එහෙම නැත්නම් චීනය ඒක අත්පත් කර ගනිමින් ගියත් තවමත් ජපානයේ නිෂ්පාදන උසස් තත්ත්වයේ ඒවා - quality ඒවා - බව පිළිගන්නවා. ජපානයේ වාහන ගත්තත් එහෙමයි. ඒ නිෂ්පාදනවල "Made in Japan" කියලා සඳහන් කර තිබෙනවා නම් ලෝකයේ හැමෝම අතර තවමත් ලොකු විශ්වාසයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් පහු වෙලා හෝ ලංකාවේ මේ තාක්ෂණික විෂයයන් හඳුන්වා දීමට ගත්ත ක්‍රියාමාර්ගය පිළිබඳව විපක්ෂය විධියට අපි සතුටු වෙනවා. හැබැයි සමීක්ෂණ කරලා, පර්යේෂණ කරලා මීට වැඩිය හොඳට මේවා කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. නැත්නම් අපි මේක කරන්නන් වාලේ කළා වෙනවා. මා දන්නා විධියට මේ කටයුත්ත කිරීම සඳහා කාර්මික විද්‍යාලවල - Technical Collegesවල- ගුරුවරු 300ක් තමයි දැන් අධ්‍යාපන අමාත්‍යාංශයට අරගෙන තිබෙන්නේ.

එතකොට ඒ කාර්මික විද්‍යාල ටික පවත්වාගෙන යන්නේ කොහොමද කියන ප්‍රශ්නය එනවා. ඒ වාගේම මේ ගුරුවරු 300 ගත්තාම -ඒක කරන්න ඕනෑ- කඩිනමින් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. තාක්ෂණික විෂයය ඇතුළත් කරනවාත් සමඟම, විද්‍යාලවලින් මේ කාර්ය භාරය ආරම්භ කරනවාත් සමඟම ආපහු මේ විෂයය උපාධිය දක්වා - විශ්වවිද්‍යාල දක්වා- ගෙන යන්නේ කොහොමද, මේ සඳහා අවශ්‍ය කථිකාචාර්යවරු, මේ සඳහා අවශ්‍ය නිපුණයන් හොයා ගන්නේ කොහොමද, රටට අවශ්‍ය ප්‍රමාණය කොපමණද යනාදී කාරණා කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතුයි කියා මම විශ්වාස කරනවා. එතකොට තමයි තාක්ෂණික විෂය හදාරන ශිෂ්‍යයා පරිපූර්ණ වෙලා විශ්වවිද්‍යාලයෙන් උපාධියක් අරගෙන එතැනින් එහාට යන්නේ. ජර්මානු තාක්ෂණික ආයතනය වාගේ ආයතන ලෝකයේ ඕනෑම රටක් පිළිගන්නවා. එවැනි තත්ත්වයට මේ විද්‍යාල ගෙනෙන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් මම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. එතුමාගේ සම්මුඛ සාකච්ඡාවක් ITN එකේ නැත්නම් රූපවාහිනියේ ප්‍රචාරය වෙනවා මා දුටුවා. ඒ වැඩසටහනට දෙමවුපියෝ දුරකථනයෙන් සම්බන්ධ වෙලා ප්‍රශ්න ඇහුවාම එතුමා ප්‍රකාශ කළා, තාක්ෂණික විෂයයන් හැදෑරූ ලක්ෂයක් දරු දැරියෝ ඉදිරි කාලය තුළදී ඉතා ඉක්මනින් බිහි කරනවාය කියා. මට මතක විධියට එක දෙමවුපියෙක් ඇහුවා, මේ ගොල්ලන්ට රැකියා අවස්ථා ඇති කරන්නේ කොහොමද කියා. එතුමා ඊට දුන්න පිළිතුරේදී කිව්වා, Mattala Airport එක ආරම්භ කරද්දි ගුවන් යානය අරගෙන ආවේ කාන්තාවක්. ඒ වාගේම හම්බන්තොට වරායේ රැකියා බිහි වෙනවා ආදී වශයෙන්. නමුත් මම නම් එයින් කොහොමටවත් සෑහීමට පත් වන්නේ නැහැ. මොකද, මත්තල වෙන්න පුළුවන්; කොළඹ වරාය වෙන්න පුළුවන්; හම්බන්තොට වරාය වෙන්න පුළුවන්; මෙවැනි ස්ථානවල දැනටත් ඒ තනතුරු පුරවා ඉවරයි. නමුත් තාක්ෂණික ශිල්පීය දැනුම තිබෙන පුද්ගලයින් ලක්ෂයක් බිහි කරන්න ඉන්නවා නම් ඒ ලක්ෂයට කොතරම් ප්‍රමාණයක් විදේශ රැකියා ඉලක්ක කරනවාද, කොතරම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ රැකියා දෙන්න අපේක්ෂා කරනවාද, ඒකේ වැඩ පිළිවෙළ මොකක්ද, රැකියා බිහි කිරීමේ වැඩ පිළිවෙළ මොකක්ද යනාදී කාරණා රජයක් විධියට ආර්ථිකය සංවර්ධනය කර පුළුල්ව සැලසුම් කළ යුතුයි කියා මම විශ්වාස කරනවා. එහෙම නැතුව අපි එක තැනකින් අල්ලා ඉවර වෙලා එතැන ඒ කාර්ය භාරය කරද්දි ඉගෙන ගන්නා ළමයි ඊට පසු විශ්වවිද්‍යාලවල හිර වෙනවා. ඊට පසු එළියට ගියාම ආපසු හිර වෙනවා. මේ වැඩසටහන කොච්චර promote කළත් මේ වැඩසටහන කොච්චර රටට ගෙනෙන්න හැදුවත් අවසානයේ හිරවීම නම් කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක වතාවක් 6 වසරේ ඉඳලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්න පටන් ගත්තා මට මතකයි. ඒ කාලයේ ඇමතිතුමා නොවෙයි හිටියේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය දීලා ඉවර වෙලා O/Lවලින් පසු A/L කරන්න මේ පාසල්වල ගුරුවරු මේ වන විට පුහුණු -train - කරනවාද කියා අපි දිගින් දිගටම ඇහුවා. අධ්‍යාපන අමාත්‍යාංශයට හරි වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. O/L කර ඒ ළමයි නන්නත්තාර වුණා. A/L විෂයන් හදාරන්න විද්‍යා අංශය ආදී එක එක අංශවලින් අවශ්‍ය දැනුම තිබෙන ගුරුවරු නැහැ කියා අපිටත් ඇවිත් කිව්වා. අන්තිමට ඒ ළමයින්ගෙන් ඇති හැකි අය ජාත්‍යන්තර පාසල්වලට ගියා. අනෙක් අය නැවත සිංහලෙන් කරන්න ගිහින් පටලැවිල්ලක් කර ගත්තා. ඒ නිසා මෙහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරද්දි අවුරුදු 5, 10, 15, 20, 30, 40 ආදී වශයෙන් සැලැස්මක් ඕනෑ; ඉදිරි දැක්මක් ඕනෑ. නැත්නම් එච්චර දමනවා මෙච්චර දමනවා කියා කියන්නේ නැතුව පුළුල් වශයෙන් පියවරෙන් පියවර පර්යේෂණ කරන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා. අපේ විශ්වවිද්‍යාලවලට වර්ෂයකට 23,000ක් විතර ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඇතුළත් වෙනවා. එයින් සියයට 51ක් විතර ගන්නේ කලා අංශයෙන්. ඉතුරු සියයට 49 ගන්නේ විද්‍යා, වාණිජ, ගණිත අංශවලින්.

දැන් මම දන්නා විධියට මේ රටේ තිබෙන තත්ත්වය අනුව විද්‍යා අංශයට අදාළවත් රැකියා නැහැ. එහෙම නැත්නම් විද්‍යාව හැදෑරූ අයටත් රුපියල් 10,000ක වැටුපක් ලැබෙන පත්වීම්වලට

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ගුරුවරුන් වශයෙන් යන්න සිද්ධ වෙලා තිබෙනවා. සියයට 51ක් කලා උපාධිධාරින් වශයෙන් බිහි වෙලා ඒ සියයට 51 එළියට ගියාම ඔවුන් මොකක්ද කරන්නේ? දැන් බලන්න, දෙයියනේ මේ වැය කරන්නේ රජයේ මුදල්නේ. කලා උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, වාණිජ උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, විද්‍යා උපාධිධාරියෙක් වෙන්න පුළුවන්, රජයක් වශයෙන් ඕනෑම රජයකට ඒ එක් අයෙක් වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරන්න සිද්ධ වෙනවා. පුස්තකාල පහසුකම් වෙනුවෙන්, එතකොට ශිෂ්‍යාධාර වෙනුවෙන්, ඒ වාගේම hostelsවලට, ඒ සියල්ලම ගත්තාම රුපියල් ලක්ෂ 10ක්, ලක්ෂ 15ක්, ලක්ෂ 20ක් එක් අයෙකු වෙනුවෙන් වෙන් කරන්න සිද්ධ වෙනවා. වෛද්‍ය සිසුවෙකුට නම් රුපියල් ලක්ෂ 25ක්, ලක්ෂ 30ක් වාගේ විවිධ ගණන්වලින් වෙන් කරන්න වෙනවා. හැබැයි අ.පො.ස.(උ.පෙළ)ට ඉස්සෙල්ලා භූගෝල විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන්, ආර්ථික විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන්, සමාජ විද්‍යා අංශයෙන් වෙන්න පුළුවන් මේ රටට අවශ්‍ය ප්‍රමාණය කොච්චරද කියලා අපි බලන්න ඕනෑ. ආර්ථික විද්‍යාඥයෝ කොච්චර ඕනෑද, Central Bank එකට කොච්චර ඕනෑද, පාසල්වල උගන්වන්න කොච්චර ඕනෑද, වෙනත් ආයතනවලට කොච්චර ඕනෑද, භූගෝල විද්‍යාඥයෝ කොච්චර ඕනෑද කියා බලන්න ඕනෑ. අපට තවම එවැනි තක්සේරුවක් නැහැ. ඊට පස්සේ මොකද වෙන්නේ? උපාධිය හදාරලා එළියට ගියාම කිසිසේත්ම හැදෑරුවේ නැති විෂයයක් තමයි ඔහුට රැකියාව වශයෙන් කරන්න වෙන්නේ. එක්කෝ පාසල්වලට ගිහින් උගන්වනවා. එහෙම නැත්නම් උපාධිය අරගෙන ගිහින් ගමේ කඩයක් දමා ගන්නවා. එහෙමත් නැත්නම් lathe machine එකක් ගන්නවා. උපාධියට අදාළ output එකක් නැහැ.

සිය දහස් ගණනක් දෙනා තමන් ඉගෙන ගත් විෂයයට, හැදෑරූ උපාධියට හාත් පසින්ම වෙනස් වූ දෙයක් තමයි ගම්වලට ගිහින් කරන්නේ. විශ්වවිද්‍යාලයට තෝරා ගන්න ඉස්සෙල්ලා මුලදීම අපට ඒ පිළිබඳව නිවැරදි තක්සේරුවකට එන්න පුළුවන් නම් හොඳයි. ඒ වාගේම "කලා විෂයයෙන් තේරුණාම රජයෙන් මෙච්චර වියදමක් -ලක්ෂ 15ක් වෙන්න පුළුවන්, ලක්ෂ 20ක් වෙන්න පුළුවන්- දරනවා" කියලා නිවැරදි තක්සේරුවකට එන්න පුළුවන් නම් හොඳයි. විශ්වවිද්‍යාලයට තේරුණත්, "මේ විෂයයෙන් උපාධිය හදාරලා ඒ මාර්ගයෙන් ඉදිරියට යන්න ඕනෑ" කියලා ඒ ශිෂ්‍යයා හිතනවා නම් අපි ඒ ශිෂ්‍යයාට ඒ අවස්ථාව දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඉන්දියාවට යන්න, වෙන රටකට යන්න, පරිගණක විද්‍යාව ඉගෙන ගන්න බැංගලෝර්වලට යන්න ඒ ශිෂ්‍යයා කැමති නම්, voucher system එකකට හෝ මොකක් හරි ක්‍රමවේදයකට ඒ මුදල් ටික දුන්නොත් ඔහුට ගිහින් ඉගෙන ගෙන එන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමත් නැත්නම් ඇත්තටම ඒ සල්ලි ටික දීලා business එකක් හරි පටන් ගන්න පුළුවන්. එතකොට රජයෙන් වියදම් කරන මුදල්වලට වටිනාකමක් ලැබෙනවා. එතකොට ඒ මුදල් රජයෙන් දුන්නත් කිසිම තේරුමක් නැති මුදලක් බවට පත් වෙන්නේ නැහැ. අන්න ඒ වාගේ මීට වඩා දීර්ඝ කාලීනව, මීට වඩා ගැඹුරින් හිතලා මේ පිළිබඳ දත්ත සකසන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්නකෝ අපේ තිබෙන යල් පැන ගිය අධ්‍යාපන පද්ධතියේ තිබෙන පාඨමාලා පිළිබඳව. පාසල්වල ගත්තත්, විශ්වවිද්‍යාලවල ගත්තත් එහෙමයි. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න කොට මට මතකයි ඒ lecturersලාගේ -කථිකාචාර්යවරුන්ගේ- notes දිය වෙලා තිබුණා. දශක ගණනක් තිස්සේ එක්කෙනාගෙන් එක්කෙනාට එකම note එක - ඒ ටිකම - උගන්වනවා. ඒවා යාවත්කාලීන වෙන්නේ නැහැ. ගොඩක් විෂයයන් පිළිබඳව එහෙමයි. ඒ නිසා ඒ දේවල් කෙරෙහිත් අවධානය යොමු කරන්නය කියලා අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හොඳ කාර්ය භාරයක් කරන්න පුළුවන් ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් බොහොම නිර්මාණශීලීව බලන නිසා මේ බිහි කරන්න හදන තාක්ෂණික විෂය ධාරාවන් ඇති කිරීම පහසු වෙයි. මේ කටයුත්ත කරන්න අධ්‍යාපන ඇමතිතුමාටත් වුවමනාවක් තිබෙනවා. තමුන්නාන්සේලා ඔක්කෝම එකතු වෙලා මේ කාර්යය මීට වැඩිය යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් විධියට කටයුතු කළොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මොකද, මම දැක්කා කවුරු හෝ කෙනෙක් කියනවා "අපට දැන් වාහන නිෂ්පාදනයත් පටන් ගන්න පුළුවන්" කියලා. මේ වාගේ කථාත් සමහර ඇමතිවරු කියනවා. මේවා විහිළුනේ. අපේ රටේ වාහනවලට තිබෙන market එක මොකක්ද? අපේ රටේ තිබෙන්නේ පුංචි market එකක්. වාහන නිෂ්පාදන තාක්ෂණය පුහුණු කරලා මේ වෙළෙඳ පොළට වාහන නිෂ්පාදනය කරලා කාට විකුණන්න පුළුවන් වෙයිද කියලා මම දන්නේ නැහැ. ඉන්දියාවයි, චීනයයි ඊට වඩා අඩු මුදලකට - අඩු පිරිවැයකට- වාහන නිෂ්පාදනය කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මෙහේ නිෂ්පාදනය කරන්න පුළුවන් නම් ආනයනය කරන ඒවා නවත්වන්න පුළුවන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මෙහේ කරන්න පුළුවන් කියලාද ඔබතුමා හිතන්නේ? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිතන්නේ මෙහේ වාහන කර්මාන්තශාලාවක් දාලා අපට අපනයනය කරන්න පුළුවන් කියලාද? [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තමුන්නාන්සේ හැමදාම පිට රටට සල්ලි යවන්නද කැමැති?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු අස්වර් මන්ත්‍රීතුමාට ඒ පිළිබඳව දැනුමක් නොතිබීම පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, අපේ රටේ වාහන කර්මාන්තශාලාවක් හදලා මේ වාගේ පොඩි වෙළෙඳ පොළක් වෙනුවෙන් ඒක පවත්වාගෙන යන්න පුළුවන් වෙයිද කියලා මම නම් දන්නේ නැහැ. ඊට වැඩිය ඉන්දියාව, චීනය වාගේ රටවල් එක්ක තරගයක් දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඔන්න ඔය වාගේ දේශපාලනඥයෝ ඔය වාගේ අදහස් දැක්වූවාම තමයි මේ රටේ සංවර්ධනයට බාධා ඇති වෙන්නේ. මොකද, හැම එකක් දිහාම බලන්නේ දේශපාලන කෝණයකින්. මට තේරෙන විධියට මම පැහැදිලිව කිව්වේ, මේ රට සංවර්ධනය කරා ළඟා කර ගන්න නම් අපි මීට වැඩිය ගැඹුරින් මේ ප්‍රශ්න ගැන සෙවිය යුතුයි කියන එකයි.

මොකද, රැකියා බිහි කිරීමේ වැඩ පිළිවෙළක් අපට නැහැ. අද අපේ රටේ ප්‍රධානම ආදායම් මාර්ගය වෙලා තිබෙන්නේ ගම්වල ඉන්න අහිංසක කාන්තාවන් මැද පෙරදිග ගිහින් දුක් විඳලා හම්බ කරන මුදල. ඒ මුදල්වලින් තමයි සමහර වෙලාවට මේ සෙල්ලම් දමන්නේ. එහෙම නැත්නම් වෙනත් විදේශීය රටවලට ගිහින් සීතලේ ගැහි ගැහී දුක් විඳලා තමයි අපේ අය මේ මුදල් උපයන්නේ. අපි යුරෝපයේ රටවලට ගියාම දැකලා තිබෙනවා ඒ වැඩ කරන අය සීතලේ වෙව්ලන හැටි. ඒ රටවලදී කරන්නේ

අමාරුම රස්සා. එහෙම වැඩ කරලා ටික කාලයක් ගියාම එක එක ලෙඩ හැදෙනවා. වැඩි කල් ජීවත් වන්නත් බැහැ. මේ රටේදී කරන්නේ නැති රස්සා ඒ රටවල්වලදී කරලා තමයි Euroවලින්, Dollarsවලින් ආදී එක එක විදේශ මුදල්වලින් මේ රටට ආදායම් අරගෙන එන්නේ. අපි ජාතියක් විධියට ඉස්සරහට යනවා නම්, දියුණු වනවා නම් ඉතාම සැලසුම් සහගතව ගමන් කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. මා මේ ඔවුන්ගේ සේවය අගයමින් කථා කරන්නේ. අපි ඒවා විවේචනය කරනවා නොවෙයි. අපි ඔවුන්ගේ සේවය බොහොම අගය කරන අතර ඒ අය ගැන තව ටිකක් හිතන්න කියලායි කියන්නේ.

තව කරුණක් තිබෙනවා ගරු ඇමතිතුමනි. අපේ මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාත් දැන් ගරු සභාවේ ඉන්නවා. මේ ප්‍රශ්නය එතුමාගේ පාසල්වල නැහැ. දැන් බලන්න, හතු පිපෙන්නා වාගේ ජාත්‍යන්තර පාසල් බිහි වනවා; පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති වනවා. හැබැයි, අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට තවමත් බැරි වුණා ඒවාට බලපත්‍රයක් දෙන තත්ත්වයක් ඇති කරන්න. සමහර පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වූවාට එහි ගුණාත්මකභාවය ඉතාම අඩුයි. Ordinary Level විභාගයවත් සමත් නැති ගුරුවරු ඒවායේ ඉන්නවා. ඉංග්‍රීසි පොඩ්ඩක් දැන ගත්තාම ඒ අයට දෙනවා උගන්වන්න. මා මීට පෙරත් කියා තිබෙනවා මේ කාරණය. මාත් එක්ක ඉගෙන ගත්ත සහෝදරියක් හිටියා. ඇයට උපාධියක් තිබෙනවා, ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ඇය එක්තරා ජාත්‍යන්තර පාසලකට උගන්වන්න ගියා. ඒ පාසලේ නම කියන්න හොඳ නැහැ. ගරු ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ජාත්‍යන්තර පාසලක නොවෙයි. උගන්වන්න ගියාම කිව්වාලු, විද්‍යාව උගන්වන්න කියලා. ඇය කිව්වාලු, "මම කළේ විද්‍යාව නොවෙයි. මම English Literature කළේ. මට විද්‍යාව උගන්වන්න දැනුමක් නැහැ" කියලා. එතකොට කිව්වාලු, "පොත තිබෙනවා, ඒ අනුව උගන්වන්න" කියලා. මේක සත්‍ය කථාවක්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඒ නිසා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සියලුම ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කරන්න. ඔබතුමාට ඒ ගැන ලොකු වග කීමක් තිබෙනවා. ඒ ගැන සොයන්න Committee එකක් පත් කරන්න. ඒ පාසල්වල ඉන්න ගුරුවරු කවුද, ඒ ගුරුවරුන්ගේ සුදුසුකම් මොනවාද, ඒ පාසල්වල උගන්වන විෂය ධාරා මොනවාද, ඒ පාසල්වල විෂය ධාරාවට අපේ ආගම, අපේ සාදාචාරාත්මක කරුණුවලට අදාළ පාඩම් ඇතුළු කරලා තිබෙනවාද කියලා අධීක්ෂණය කරන්න. ඒ සියල්ලම ගැන හිතලා ඒවා පිළිබඳව අධීක්ෂණයක් කරන්න ඒ ජාත්‍යන්තර පාසල්වල ප්‍රශ්න තිබෙන නිසායි මම මෙහෙම කියන්නේ.

මට ගොඩක් දේවල් කියන්න තිබුණත් වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මා අධ්‍යාපන ඇමතිතුමාට නැවත මේ කාරණය කියනවා. වයඹ පළාත් සභා මැතිවරණයත් එනවා. වයඹ පළාත් සභාවේ සිටින අධ්‍යාපන ඇමතිවරයාත්, මහ ඇමතිවරයාත් දෙදෙනාම එක්කෙනෙක්. අද ඒ පාසල් පද්ධතිය ඉතාම නරක විධියට විනාශ කරලායි තිබෙන්නේ. කොටින්ම කියනවා නම්, පත්වීම් දෙන්නේ විවිධ වර්ගයේ අල්ලස් අරගෙන. මාරු වීම් දෙන්නේ, විදුහල්පතිනියන් පත් කරන්නේ විවිධ මාර්ගවලින්. වෙන පළාත් සභාවල සිදු නොවන මට්ටමින් මහ ඇමතිවරයා ඇතුළු අදාළ පුද්ගලයන් ඒ වයඹ පළාත් සභාවේ පාසල් පද්ධතිය විනාශ කරමින් යනවා.

ඒ විතරක් නොවෙයි. අපි පසු ගිය කාලයේ තවත් සිදු වීමක් දැක්කා. අපි වෙනදා කියන්නේ, මුළු ජාතියම ගුරුවරුන්ට දණ නමස්කාර කරනවා කියලායි. දැන් අට පාස් නැති දේශපාලනඥයන් ඉදිරියේ දණ නමස්කාර කරන්න වෙලා තිබෙන්නේ ගුරුවරුන්ටයි. අද ඒ තැනට පිරිහිලා. ඒ පිරිහීම පිළිබඳව ගැඹුරට හිතලා ඒ සම්බන්ධයෙන් තීරණ ගන්න කියලා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගීළඟට ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bismillahir Rahmanir Raheem.

Hon. Presiding Member, two Ministers who have geared themselves to mobilize the students and youths of this country to create a new world order for them, are brought into focus today by this Adjournment Motion by my young Friend, the Hon. Eric Prasanna Weerawardhana.

Sir, a large group of individuals who are unable to obtain the opportunity to enter the university after sitting for the competitive GCE (Advanced Level) Examination join the society every year. When we travel in the European countries and even the United States, we find there is nothing called "People who are sent out of the schools". They are sometimes termed as "dropouts", and various institutions are opened for them in order to advance their different aptitude and engage them in various vocations. Most of the youths who have read for their degrees under the Art stream have to face difficulties when finding employments. What the Hon. Weerawardhana proposes is exactly what the advanced countries are doing. We are trying to create such a society in this country. A stream of technical subjects is due to be introduced to schools by the Ministry of Higher Education, the Ministry of Education and the Ministry of Youth Affairs and Skills Development in order to control the situation.

Therefore, it is moved in this august Assembly that people must be made known of the facts and the inherent value of this new revolutionary change in education in this country.

His Excellency the President quite rightly said the other day, "දක්ෂ ශිෂ්‍යයන්, අදක්ෂ ශිෂ්‍යයන් කියලා මේ රටේ කවුරුවත් නැහැ." The concept that there are clever students and non-clever or weak students cannot be accepted in this country. His Excellency the President has quite rightly emphasized this. In his "Mahinda Chintana" - this is the Magna Carta of this Government - mention has been made on every field of activity in detail what the Government proposes to do, what the real intention of

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

"Mahinda Chintana" is.

Page 68 of the "Mahinda Chintana" states, I quote:

"Priority for Youth

In recent history we have witnessed several incidents of the violent destruction of our energetic youth. This is the reason why I decided to allocate more space for young people in the Mahinda Chintana."

Also, on page 75 of the "Mahinda Chintana" it states, I quote:

"University education for knowledge

....I believe it is necessary to create a new educational framework that will provide liberal thinking, broad dialogue and opportunities for entertainment instead of the present system that confines the undergraduate to lectures, assignments and examinations."

There are three Ministers, the Hon. Bandula Gunawardane, the Hon. Dullas Alahapperuma and the Hon. S.B. Dissanayake, to carry forward these laudable intentions of His Excellency the President. They are all working ceaselessly day and night adding much weight and importance to the Mahinda Rajapaksa regime. They are the Ministers who could be marketed to other parts of the country saying, "Look! Because of these Ministers the youth of this country, the school-going population of this country and generally the educational setup are made very vibrant and strong.

Sir, look at the Minister of Youth Affairs. What a novel scheme he has introduced! For instance, take the Youth Parliament. Take note of it, which we could not find in so many other parts of the world. There are 332 Members in that Parliament. "Catch them young", as it is called. They are given training in good governance, in administration, in public speaking which would serve them as a ladder to come into the mainstream of politics through this main Legislature later.

In that Youth Parliament, there are 332 Members. In the Senate, there are 50 Members and all communities are represented. Earlier in the First Youth Parliament, there was a Deputy Prime Minister. She was from Thunukkai in the North. She was made Deputy Prime Minister of that Youth Parliament. Who was she? She was the sister of a very strong LTTE cadre. She reformed herself. Today, in the present Youth Parliament, the Deputy Prime Minister is a Tamil. There are two Muslim Ministers. I think, this must be told to India, to Jayalalithaa Jayaram and to M. Karunanidhi as well.

See what happened this afternoon at Temple trees. More than 15,000 people including LTTE cadres who have been rehabilitated are being looked after by the Ministry of Rehabilitation and Prison Reforms. The Hon. Chandrasiri Gajadeera, Minister of Rehabilitation and Prison Reforms introduced that scheme. The President gave compensation to LTTE cadres who have lost their limbs; lost their lives; lost their belongings and everything. Where is LTTE women's political wing leader, Thamilini today? She is now a reformed, civilized lady, in the civilized Sri Lankan society. Who made this transformation? Is it not our President His Excellency Mahinda Rajapaksa under the "Mahinda Chintana?" Like her, there are thousands of people who have been transformed today. I spoke to Mr. Shathish Kumar, Senior Consultant of the Ministry of Rehabilitation and Prison Reforms, a clever officer that he is, gave me detailed information. Now, this is the way that this Government is moving forward, Sir.

A news item appeared in the "Daily News" of 21st June, 2013 states, I quote:

"A technology stream was introduced to the Advanced Level curriculum by the President. The President added aesthetic subjects and other subjects as well, play a pivotal role in moulding young minds."

This is what the three Ministers are proposing to do and are trying to achieve for the good of the future generation of our country.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Okay, Sir. It further states, I quote:

"Each year, around 350,000 students sit the Advanced Level examination and out of them 25,000 qualify to enter universities. Around 300,000 youths, who sit the examination following the four streams enter ……."

I wish all three Ministers good luck and Godspeed so that we will have a peaceful Sri Lanka with flowering youthfulness all around us.

Thank you.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ගරු ඇමතිතුමාටත් ස්තුතිවන්ත වනවා, මේ රටේ අධ්‍යාපනය කඩා වැටිලා තිබෙනවාය කියලා දැනගෙන, ඊට පිළිතුරක් දෙන්න ඕනෑ කියා හිතලා තාක්ෂණවේදය විෂයය ධාරාව පාසල් අධ්‍යාපන පද්ධතියට එකතු කිරීමට කටයුතු කිරීම පිළිබඳව.

අනිවාර්යයෙන්ම, අධ්‍යාපන ක්‍රමය මේ තිබෙන විධියට කරගෙන ගියොත්, අපට මේක කරන්න වෙන්නේ නැහැයි කියලා පැහැදිලිව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන පහසුකම් එක්ක මේ කාර්යය කරන්න බැහැ. වර්තමානය දිහා බැලුවාම පෙනෙනවා, දැනට Advanced Level අධ්‍යාපනය පාසල්වල අසාර්ථක වෙලා තිබෙන බව. ගරු ඇමතිතුමන්ලා, විවිධ දේශපාලනඥයෝ සඳහන් කරනවා, පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය, Advanced Level විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය, Ordinary Level විභාගයෙන් මෙපමණ සිසුන් සංඛ්‍යාවක් pass වෙලා තිබෙනවාය කියලා. නමුත් මොවුන් මේ විභාග pass වෙලා තිබෙන්නේ ඉස්කෝලේ ගිහිල්ලාද, නැත්නම් tuition පන්ති ගිහිල්ලාද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. අප මොන දේ කළත් මේ තිබෙන පහසුකම් යටතේ අධ්‍යාපනය නංවන්න බැහැ. මේ තිබෙන පාසල් පද්ධතිය යටතේ නිදහස් අධ්‍යාපනයක් ජනතාවට දීලා නැහැ. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බිහි වන්නේ උගත් මිනිස්සු නොව, දැනුම තිබෙන මිනිස්සුය කියලා අප දන්නවා. උගත් මිනිහෙකු බිහි වෙන්න නම්, දැනුම, කුසලතා, ආකල්ප කියන මේ කාරණා තුනම එකතු වෙන්න ඕනෑ. නමුත් මේ පාසල් හිඟය තුළ හයේ පන්තියේ අධ්‍යාපනය කරන්න ඉස්කෝල නැහැ. ඒ නිසා ශිෂ්‍යත්වය pass වෙන්නම ඕනෑ වෙලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි ශ්‍රේණියේ ඉඳලාම අම්මලා වූටි දුවලා, පුතාලා tuition පන්ති ඇදගෙන යන කාලයක් උදා වෙලා තිබෙනවා. එයින් විභාග pass කිරීම මිසක් උගත් පුද්ගලයෙකු බිහි වෙන්න තිබෙන ඉඩකඩ, අවස්ථා අඩු වෙලා යනවා. ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමා ඒ ගැන ප්‍රශ්න කළා. දැනටත් ඒ සඳහා ළමයින් බඳවාගෙන අවසානයි. මේ මාසයේ 15 වැනිදා වන කොට මේ තාක්ෂණ විෂයය පාසල්වල උගන්වන්න පටන් ගනීවි. සමහර විට ඇමතිවරු එයි; මල් මාලා දමයි; නටයි; බෙර ගහයි; පත්තරවල යයි; TVවල යයි, අලුත් දෙයක් පටන් ගත්තා කියලා. මේ අලුත් දේ පටන් ගන්න සද්ද දාලා කෑ ගැහුවත් තව වන තුරු මේ සඳහා පුහුණු ගුරුවරු බඳවාගෙන නැහැ. නමුත් කියනවා, විශ්වවිද්‍යාලයෙන් තාක්ෂණ විෂයය සඳහා පුහුණු ගුරුවරු ගන්නවාය කියලා. එහෙම නැත්නම් කියනවා, Technical Collegeවලින් ගන්නවා කියලා.

අප දන්නවා, ඒ Technical Collegeවලත්, විශ්වවිද්‍යාලවලත් මේ තාක්ෂණ විෂයය උගන්වන ආචාර්යවරුන් -lecturers- හිඟ බව. ඒ විතරක් නොවෙයි, ඒ අය පඩි මදියි කියලා එක පැත්තකින් කෑ ගහන කොට මේ දෙන දීමනාව තුළ ඒ ගොල්ලන් උගන්වන්න ගම්වලට එයිද? ආණ්ඩුව ඇයි මෙහෙම සැලසුම් නැතිව මේ විෂයය ධාරාව උගන්වන්න පටන් ගන්නේ? අනිවාර්යයෙන්ම මේක කෙරෙන්න ඕනෑ දෙයක්. මේක අප හෙළා දකින්නේ නැහැ. මොකද තාක්ෂණ විෂයය ධාරාව අධ්‍යාපනයට එකතු කරපු එක ලොකු දෙයක්. නමුත් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ආණ්ඩුව මේ කටයුත්ත පටන් ගන්නේ යම් ක්‍රමවේදයක් ඇතිවද, එහෙම නැත්නම් කරන්නන් වාලේ මේ කටයුත්ත කරනවාද කියන කාරණය. නුදුරු අනාගතයේදී මේ විෂයය පාසල්වල උගන්වන්න පටන් ගන්නවා නම් මේ දරුවන්ට ඇවිල්ලා අධ්‍යාපන කටයුතු කරන්න තාක්ෂණ විද්‍යාගාර පාසල්වල තිබෙන්න ඕනෑ. මේවා හදලා අවසානද? අඩු ගණනේ මේවාට සැලැස්මවල් තිබෙනවාද? සැලැස්මවල් තිබිලා බැහැ. තාක්ෂණ විෂයය ධාරාව පාසල්වල උගන්වන්න පටන් ගන්නවා නම් දැන් ඒ තාක්ෂණ විද්‍යාගාර පාසල් තුළ හැදිලා තිබෙන්න ඕනෑ. රජය ගුරුවරු බඳවාගෙන තිබෙන්න ඕනෑ. පුහුණු ගුරුවරු ඇති කරලා තිබෙන්න ඕනෑ. නමුත් එහෙම පිළිගත හැකි සැලැස්මක් ඉදිරිපත් වෙලා නැහැ. අනිවාර්යයෙන්ම තාක්ෂණ විෂයය ධාරාව පාසල් පද්ධතියට එකතු කරන එක හොඳයි. නමුත් මේ ආණ්ඩුව කරන්න ගිය දේවල් ඔක්කොම මහ දී ඇන ගත්තා. GCE (A/L) විභාගය කරන්න ගියාම ප්‍රශ්න පත්‍ර පිට වුණා. GCE (O/L) විභාගයේ ප්‍රශ්න පත්‍ර පිට වුණා. පහේ ශිෂ්‍යත්වය විභාගය කර ගන්නත් බැරි වුණා; ප්‍රශ්න පත්‍ර පිට වුණා. අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දරුවන් අතරමං නොකර මේ තාක්ෂණ විෂයය ධාරාව නිවැරැදිව ඉදිරියට පවත්වාගෙන යන්න පුළුවන්ද? ඒක මේ ආණ්ඩුව කරන වැඩ පිළිවෙළ දිහා බැලුවාම පෙනෙනවා.

අප දන්නවා, "ඉසුරු පාසල්" කියලා පාසල් පද්ධතියක් පටන් ගත්ත බව. නමුත් ඒ ඉසුරු පාසල් සාර්ථකද? ඉසුරු පාසල් දැන් සපිරි පාසල් දාහට එකතු වෙලා. Advanced Level පන්තියේදී Physics විෂයය උගන්වපු මගේ ගුරුතුමා -මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා- මේ සපිරි පාසල් ටික ශක්තිමත් කරන්න කියලා අපේ පක්ෂයෙන් මාරු වෙලා ආණ්ඩුව පැත්තට ගියා. නමුත් එතුමාත් හෘදය සාක්ෂියට එකඟව හිතනවා ඇති, අද එතුමාගේ කාර්ය භාරය හරියට ඉෂ්ට කරන්න පුළුවන් වුණාද කියලා. එතුමා ලොකු බලාපොරොත්තුවකින් තමයි අපේ පක්ෂයේ ඉඳලා ආණ්ඩුව පැත්තට ගියේ. ඒ ගියේ සපිරි පාසල් ටික ශක්තිමත් කරන්නයි. නමුත් ඒ වැඩේ කරන්න පුළුවන් වුණාද? අද අප දකිනවා, IT ගුරුවරුවත් මේ සපිරි පාසල් දාහට සොයා ගන්න විධියක් නැතිව ඉන්නවා. ගුරුවරු බඳවා ගෙන නැහැ. IT ගුරුවරු ටික සපිරි පාසල්වලට හොයා ගන්න බැරිව තිබියදී මේ තාක්ෂණ විෂයය උගන්වන්න ගුරුවරුන් විශ්වවිද්‍යාලවලින් ඒවිද? IT කරපු අය ලංකාවේ ඕනෑ තරම් හිටියත් මේ ගෙවන පඩියට එන්න කැමැත්තක් දක්වන අය අඩුයි.

සමහර ඉස්කෝල තිබෙනවා, IT ගුරුවරයෙක්, ඉංග්‍රීසි ගුරුවරයෙක් හොයා ගන්න නැහැ. සපිරි පාසල්වල ගොඩනැඟිලි හදාගෙන යන එකත් යන්නේ ඉබි ගමනින්. කිව්ව වෙගයෙන් ඒවා ඉදි වෙන්නේ නැහැ. කිව්වේ, "චීනයෙන් ආධාර හම්බ වෙනවා, නැත්නම් තව කොහෙන් හරි ආධාර හම්බ වෙනවා, ඒ ආධාරවලින් මේ තෝරා ගත්තු පාසල්වල භෞතික පද්ධතිය දියුණු කරනවා, ඒ වාගේම මානව සම්පත දියුණු කරනවා" කියලායි. නමුත් ඒක සාර්ථකභාවයට පත් වෙලා තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ. බොහොම ඉබි ගමනින් යන ගමනකුයි පෙනෙන්නේ. ඒක තමයි අපට සැකයක් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. "දිවි නැගුම" වැඩසටහන පටන් ගත්තා. ඇට බෙදන්න පටන් ගත්තා. ඒ ඇට පැළ වෙන්නේ නැහැ. පොහොර සහනාධාරය දෙන්න පටන් ගත්තා. අද බෙහෙතකටවත් පොහොර ටිකක් හොයා ගන්න බැරි තත්ත්වයට රට පත් වෙලා. ගුවන් තොටුපොළවල් හදන්න පටන් ගත්තා. වරායවල් හදන්න පටන් ගත්තා. නමුත් මේවායින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවක් පෙනෙන්නේ නැහැ. රටේ සල්ලි නාස්ති වුණු එක විතරයි වුණේ.

2013 ජූලි මාසයේ තාක්ෂණ විෂය ධාරාව පාසල්වල පටන් ගන්නවා. 2016 වෙන කොට විශ්වවිද්‍යාලවල හරි, කාර්මික විද්‍යාලවල හරි මේ දරුවන්ට ඒ තාක්ෂණය විෂය වැඩි දුර ඉගෙන ගන්න අවශ්‍ය පහසුකම් හරිගස්සලා තිබෙන්න ඕනෑ . 2020 වෙන කොට මේ අය තාක්ෂණික අධ්‍යාපනයක් ලබාගෙන උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ අරගෙන සමාජගත වෙනවා. මේ අයට සුදුසු වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, මේ රජය ගෙන යන්නේ "එදා වේල ටුවර්ස්" වැඩ පිළිවෙළක් කියලා. ඒ වෙලාවට තමයි පිළිතුරු හොයන්නේ. ඉතින් ඒක මේකට හරි යන්නේ නැහැ. "එදා වේල ටුවර්ස්" යන ආණ්ඩුවක් වුණත් අද මේ තිබෙන ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ. මේ විෂය උගන්වන්න පුහුණු ගුරුවරු අධ්‍යාපන අමාත්‍යාංශය සතුව ඉන්නවාද? අදාළ තාක්ෂණ විෂය පටන් ගන්න කොට ඒ අයට අදාළ පරීක්ෂණ කරන්න අදාළ පාසල් පද්ධතිය තුළ විද්‍යාගාර හදලා තිබෙනවාද? "එදා වේල ටුවර්ස්" යන ආණ්ඩුවක් වුණත් අඩු ගණනේ ඔය ටිකවත් සම්පූර්ණ කරන්න ඕනෑ. අපට සමහර අයගේ කථාවලින් ඇහුණා, මේකෙන් ලෝකයේ රැකියා වෙළෙඳ පොළට තරුණයන් බිහි වෙනවා, ලෝකයේ රැකියා වෙළෙඳ පොළට යන්න පුළුවන් පුද්ගලයන් බිහි වෙනවා කියලා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරයාට ගුරු වෘත්තිය සඳහා විදේශ රැකියා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ ලංකාවේ සල්ලිවලින් රුපියල් ලක්ෂ 8ක් ගෙවන රක්ෂා තිබෙනවා. නමුත් අපේ ගුරුවරයා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන ගුරුවරයකු කරන්නට තවම රජය සමත් වෙලා නැහැ. ගුරු විද්‍යාල තිබුණාට, විද්‍යා පීඨ තිබුණාට එහෙම නැත්නම් ජාතික අධ්‍යාපන ආයතන තිබුණාට මේවායින් ජාත්‍යන්තර ප්‍රමිතියේ ඉන්න පුද්ගලයෙකු - ගුරුවරයෙකු- පුහුණු කරන්නට රජය සමත් වෙලා නැහැ. ඒ නිසා අපේ අධ්‍යාපනය ජාත්‍යන්තර ප්‍රමිති මට්ටමට ගිහිල්ලා නැහැ.

විදේශ රැකියාවලට අපේ ශ්‍රමිකයන් යවන්න එහෙම නැත්නම් අපේ උගත් පිරිස විදේශ රැකියාවලට යවන්න මේ තාක්ෂණික විෂයම පටන් ගන්න ඕනෑ නැහැ. ජාත්‍යන්තර මට්ටමට ගැළපෙන්න හෙදිය හරියට පුහුණු කරන්න පහසුකම් තිබුණා නම්, හරියට පුහුණු කළා නම්, ජාත්‍යන්තර මට්ටමට ගැළපෙන්න පාසලේ ගුරුවරයා පුහුණු කළා නම් අපට විදේශ රැකියාව කියන එක ලොකු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ අවස්ථා තිබෙනවා. නමුත් මේකෙන් ඒකට උත්තර හොයන්න හම්බ වෙන්නේ නැහැ. අපි දන්නවා, මේක කොහොමත් කරන්න ලෙහෙසි නැහැය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තවත් සැකයක් තිබෙනවා. නූගත් දේශපාලනඥයා උගත් ගුරුවරයා දණ ගස්වද්දී මෙවැනි සමාජ පෙරළියක් අධ්‍යාපනය තුළින් කරන්න පුළුවන් දේශපාලන වාතාවරණයක් මේ රටේ තිබෙනවාද කියලා විශේෂයෙන්ම හිතන්න වෙලා තිබෙනවා. මේවා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා හිතන්න වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට තේරෙනවා, අධ්‍යාපනය කඩාගෙන වැටිලා තිබෙන බව. ඒක රජය දන්නවා. මේ සඳහා යම් වැඩ පිළිවෙළක් කරන්න ඕනෑය කියලා රජය පිළිඅරගෙන තිබෙනවා. ආණ්ඩුව දන්නවා, රටේ නිදහස් අධ්‍යාපනය දැන් අවුල් ජාලාවක් වෙලා තිබෙනවා කියලා. හැබැයි ඒකෙන් ආණ්ඩුව ලිස්සන්න හදනවා. ඒකට ප්ලාස්ටර් අලවන්න හදනවා. එහෙම කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

අධ්‍යාපනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාවක් 2010 දී පත් කළා. මේ නිදහස් අධ්‍යාපනය රැකගෙන, අධ්‍යාපනය නිවැරැදි කරන්න ඕනෑය කියන අදහස තුළ ඉඳලා තමයි 2010 වර්ෂයේදී පාර්ලිමේන්තු විශේෂ උපදේශක කාරක සභාව පත් කළේ. නමුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය කරන්න යෝජනා ලබා ගෙන කෙටුම්පත් හදලා ඉවරයි. අඩු ගණනේ මේවා පාර්ලිමේන්තුවටවත් ගෙනෙන්න බැරි තත්ත්වයක් තවම උදා වෙලා තිබෙනවා. තවම මේවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සාකච්ඡා කරන්න පටන් අරගෙන නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තාක්ෂණික විෂය නැවත පටන් අරගෙන තිබෙන එක හොඳ වැඩක්. ඒකේ වචන දෙකක් නැහැ. තාක්ෂණ විද්‍යාව පාසල් අධ්‍යාපනයේ පටන් අරගෙන ඒක ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. මොකද අපට ඕනෑ වෙන්නේ එහෙම සමාජයක් නිසා. විභාග pass කරපු සමාජයක් විතරක් අපට ඕනෑ නැහැ. අපට ඕනෑ උගත් මිනිස්සු. අපට නවලෝක මුදලාලි වාගේ මිනිස්සු හැදුණොත් ඇති. විභාග pass කරපු වෛද්‍යවරුන්ට ලංකාවේ පළමුවැනි පෞද්ගලික ඉස්පිරිතාලය හදන්න බැරි වුණා. නමුත් නවලෝක මුදලාලි වෛද්‍ය විද්‍යා විභාගය pass නොකළත් ඉස්පිරිතාලයක් නිර්මාණය කළා. අන්න ඒ වාගේ පුද්ගලයෝ අපට ඕනෑ.

මේ තාක්ෂණ විෂය හැදෑරීමට අවශ්‍ය වාතාවරණය නිර්මාණය නොකර, අවශ්‍ය ගුරුවරු පුහුණු නොකර, අවශ්‍ය තාක්ෂණික විද්‍යාගාර හදන්නේ නැතුව මේක පටන් ගත්තාට වැඩක් නැහැ. එහෙම නොකළොත් අන්තිමට සිදු වන්නේ මේ තාක්ෂණික පාඨ මාලාවත් tuition පන්තිවලට භාර දෙන්නයි. එහෙම වුණොත් tuition පන්තිවලින් ළමයි හදන ව්‍යාපාරයක් තමයි නිර්මාණය වෙන්නේ. තවම අධ්‍යාපන අමාත්‍යාංශය මේ සඳහා සියයට සියයක් ලැස්ති වෙලා නැහැ. ගරු අධ්‍යාපන ඇමතිවරයා උගත් ඇමතිවරයෙක්. එතුමාට වැඩ කරන්න පුළුවන්. එතුමාට මේ සම්බන්ධයෙන් ඕනෑකම ඇති. මේ වැඩ කරන්න නම්, අය වැයෙන් සියයට භයක මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්න අවශ්‍ය බවයි උගතුන් ප්‍රකාශ කළේ. නැතිව මේ කියන දේවල් කරන්න බැහැ. අය වැයෙන් සියයට භයක මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්නේ නැතිව තාක්ෂණය හදන්න බැහැ; ගුරුවරු පුහුණු කරන්න බැහැ. ගරු ඇමතිවරු කොපමණ දැහලුවත් එහෙම කරන්නේ නැතිව මේවා ක්‍රියාත්මක කරන්න බැහැ. මේ තත්ත්වය යටතේ ඒ දේවල් ක්‍රියාත්මක කළොත් එය අසාර්ථක වනවා.

ඒ නිසා මම විශේෂයෙන්ම අවධාරණය කරනවා, මේ ළමයි ටික අරගෙන ගිහිල්ලා අතර මං කරන්න එපා; මේ අභිංසක ළමයින්ගේ බලාපොරොත්තු අතර මං කරන්න එපා; මේ අභිංසක දෙමව්පියන්ගේ බලාපොරොත්තු අතර මං කරන්න එපා; මේවා පටන් අරගෙන tuition පන්තිවලට භාර දෙන්න එපා කියලා. මොකද අද දෙමව්පියන්ට වැඩිම මුදලක් වියදම් වන්නේ දරුවන්ට උගන්වන්නටයි. Tuition පන්තිවලට මුදල් දෙන්න ඕනෑ; වැන්දවලට මුදල් දෙන්න ඕනෑ. මේ වැඩ පිළිවෙළ තුළිනුත් එහෙම වෙන්න ඉඩ තියන්න එපාය කියලා ඉල්ලමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් ඓතිහාසික හැරවුම් ලකුණ පිළිබඳව මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීම පිළිබඳවත්; ඒ හරහා මේ සම්බන්ධයෙන් රටේ ජනතාවට යම් ප්‍රමාණයකින් හෝ කරුණු ඉදිරිපත් කරන්න අපට අවස්ථාව සලසා දීම පිළිබඳවත් අපේ තරුණ, ජව සම්පන්න මන්ත්‍රීතුමෙකු වන එරික් ප්‍රසන්න වීරවර්ධන මැතිතුමාට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම විවේචනාත්මක වූ නමුත් ධනාත්මකව මේ විවාදයට සම්බන්ධ වෙලා තමන්ගේ විවාදය ආයෝජනයක් විධියට පාවිච්චි කරන්න උත්සාහ ගැනීම පිළිබඳව විපක්ෂය වෙනුවෙන් මේ විවාදයේ ආරම්භක කථිකයා විධියට ඉදිරිපත් වුණු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාටත් මගේ ස්තුතිය ලෝභ නැතිව ප්‍රදානය කරන්න ඕනෑ. මොකද දේශපාලන ගොහොරුවල ලැගලා ජාතික ප්‍රශ්න දිහා බලන්න උත්සාහ ගන්න අවස්ථා සමහර වෙලාවට අපි දකිනවා. ඒ වාගේම අපට ඒ සම්බන්ධයෙන් අත් දැකීම් ද තිබෙනවා. එතැනින් මිදීම පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සමහර කාරණා පිළිබඳව සිතා බැලුවාම, බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත්, අප සියලු දෙනා අතිනුත් යම් කිසි අඩු පාඩුවක් වුණාද කියලා මම කනගාටු වුණා. මොකද මේ වැඩ පිළිවෙළ පිළිබඳව; මෙහි තිබෙන සැලසුම් සහගතභාවය පිළිබඳව; අනාගත ඉලක්ක පිළිබඳව මීට කලින් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලා දැනුවත් කිරීමට අපට අවස්ථාවක් නොලැබුණු නිසා. නමුත් එතුමා මතු කරපු සමහර කාරණා මම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. මෙය සැලසුම් සහගතයි. මෙහි වැඩ පිළිවෙළක් තිබෙනවා. මෙහි විධිමත්භාවයක් තිබෙනවා. මෙය ඉලක්ක හඹා ගෙන යනවා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා හොඳ ගුරුවරයෙක්. ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා කියන්නේ ඔබතුමා කිව්ව විධියට ඔබතුමාගේ වාගේම භෞතික විද්‍යාව පිළිබඳ මගේත් ගුරුවරයා. ඒ නිසා ඒ දෙපළ කථා කරන කාල සීමාව තුළ මේ ගැන යම් දැනුවත් කිරීමක් කරන්න උත්සාහ ගනීවි කියලා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ විනාඩි 15 ඇතුළේ ඒ කොටස් ස්පර්ශ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන විෂය භාර ඇමතිවරයා විධියට මම අතිගරු ජනාධිපතිතුමාට මේ රාජ්‍යයේ දරුවන් වෙනුවෙන් කෘතවේදීත්වය ප්‍රකාශ කරන්න මේ අවස්ථාව පාවිච්චි කරන්න කැමැතියි. ඇයි මම එහෙම කියන්නේ? මම එතුමා සභාපතිත්වය දරන පක්ෂයේ භාණ්ඩාගාරික නිසාවෙන් හෝ එතුමාගේ කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක් නිසාවෙන් හෝ නොව, පියෙක් විධියට එතුමා තමයි මේ තාක්ෂණ විෂය ධාරාව ශ්‍රී ලාංකීය අධ්‍යාපන සැලැස්මට ඇතුළට ගෙනෙන්න කියන තෙරපීම කළේ; බල කිරීම කළේ. 1994 කාලයේ පැවැති ආණ්ඩුවේ කම්කරු හා වෘත්තීය පුහුණු ඇමතිවරයා විධියට පළමුවැනි වතාවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත ඉදිරිපත් කරලා නගර කේන්ද්‍රීයව තිබුණු කාර්මික අධ්‍යාපනය ගමට ගෙන යන්න වෘත්තීය පුහුණු අධිකාරිය ආරම්භ කිරීම පමණක් නොවෙයි, මේ රටේ වෘත්තීය අධ්‍යාපනයේ තීරණාත්මක ලක්ෂ්‍යයන් කීපයක්ම නිර්මාණය කළේ එතුමායි. ජාතික වෘත්තීය සුදුසුකම - NVQ - සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - UNIVOTEC - කියන මේ සියල්ලම නිර්මාණය වුණේ එතුමාගේ නායකත්වයෙනුයි.

තාක්ෂණ විෂයය ධාරාව මේ රටේ ජාතියේ දරුවන්ට තිළිණ කරන්න අතිගරු ජනාධිපතිතුමා ගනු ලැබූ තීන්දුව අනුව තමයි ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා, ඒ අමාත්‍යාංශය, නිලධාරීන්, මේ රටේ බුද්ධිමතුන්, විශ්වවිද්‍යාල ප්‍රජාව, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා, අපේ අමාත්‍යාංශය ඒ කටයුත්ත වෙනුවෙන් ඒක රාශි වුණේ. අපි විශේෂයෙන් කෘතවේදීව කියන්න ඕනෑ ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ගැන. අපේ අමාත්‍යාංශ දෙකේ අධීක්ෂණ මන්ත්‍රීවරයා විධියට එතුමා තිරයෙන් පිටු පස දැවැන්ත කාර්ය භාරයක් කළා. රටේ ජනතාව ඒක දැන ගන්න ඕනෑ. ඉහත කී සියලු දෙනාට අපි ජාතියක් විධියට කෘතවේදී වන්නට ඕනෑ, මේ තීරණාත්මක හැරවුම වෙනුවෙන් කරනු ලැබූ කැපකිරීම් සහ දායකත්වය සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙය හඳුන්වන්නේ ඉතිහාසයේ වරදක් නිවැරදි කිරීමක් විධියටයි. ඒ වැරැද්ද ඓතිහාසික වැරැද්දක්. මේ රටේ කාර්මික අධ්‍යාපනය, මේ රටේ වෘත්තීය අධ්‍යාපනය ආරම්භ වන්නේ 1893 දීයි ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි. ඒ, මරදාන කාර්මික විද්‍යාලයෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ රජ දරුවන්ගේ කාලයේ ඉඳලාම මේ රටේ, ශ්‍රී ලාංකීය සංස්කෘතිය ඇතුළේ සැලසුම්සහගත අධ්‍යාපනය තුළ නිපුණතා සංවර්ධනය තිබුණා. සැලසුම්සහගත අධ්‍යාපන ක්‍රමය ඇතුළේ වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය මේ රටට දායක වන්නේ සුදු අධිරාජ්‍යවාදීන් අතින් 1893 දීයි. හැබැයි අවාසනාවට ඒ වෘත්තීය අධ්‍යාපනය පාසල් පද්ධතියට, ද්විතීයික අධ්‍යාපනයට සම්බන්ධ කරන්න 1893 ඉඳලා අවුරුදු 120ක් අපට බලා ඉන්න සිද්ධ වුණා. අපට අවුරුදු 120ක් බලා ඉන්න සිද්ධ වුණා ගරු මන්ත්‍රීතුමනි. මීට ඉස්සර වෙලා ආණ්ඩු ඒ සඳහා උත්සාහ ගත්තා; නොයෙක් යෝජනා කළා; සැලසුම් සකස් කළා; ඒවා ක්‍රියාත්මක කළා. නමුත් ඒ ඉලක්කයට යන්න, ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප පාසල් ගිය කාලයේ පැවැති තත්ත්වය මොකක්ද? මම ගරු පුෂ්පකුමාර ඇමතිතුමාගෙන් ඒ ගැන ඇහුවාම, එතුමාත් කිව්වා, "මමත් වඩු වැඩ කළා" කියලා. ඒ කාලයේ ප්‍රාග් වෘත්තීය විෂයයන් ආවා. අපි ලෝහ වැඩ, වඩු වැඩ, කෘෂිකර්මය ඇතුළු තාක්ෂණික විෂයයන් හැදෑරුවා. නමුත් එය විධිමත් විෂයය ධාරාවක් විධියට උසස් පෙළට එකතු කරලා උසස් පෙළ පාසල් පද්ධතිය සහ වෘත්තීය අධ්‍යාපනය අතර පාලම නිර්මාණය කරන්න ඉතිහාසයේ හිටපු හැම නායකයකුම, හැම ආණ්ඩුවක්ම, හැම අධ්‍යාපන ඇමතිවරයකුම අසමතුන් වූ බව මේ සභාවට වාර්තා කළ යුතුව තිබෙනවා. ඒ, කාටවත් ඇඟිල්ල දිගු කරන්න නොවෙයි. ඉතිහාසයේ ඒ අසමතුන්ගේ ගොඩේ අපිත් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඓතිහාසික අවස්ථාවක්. මේ දිහා දේශපාලන මල පුඩුවේ හිර වෙලා බලන්න හොඳ නැහැ ගරු මන්ත්‍රීතුමනි. කාගේ අතින් වුණත්, කවුරුන් මේකට නායකත්වය දුන්නත් කමක් නැහැ. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට ජාතියේ ගෞරවය හිමි වෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. නමුත්, අපි මෙතෙක් ගත්ත උත්සාහය මොකක්ද? මොකක්ද, අධ්‍යාපනය කියලා මේ රටේ අප කල්පනා කළේ? මොනවාද, අධ්‍යාපන ක්‍රමය ගැන තිබුණු සංකල්ප? අම්මා තාත්තා අධ්‍යාපන ක්‍රමය ගැන කොහොමද හිතුවේ? ගුරුවරයා කොහොමද අධ්‍යාපන ක්‍රමය ගැන හිතුවේ? දේශපාලකයන් වන අපි කොහොමද ඒ ගැන හිතුවේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්මා තාත්තා හිතුවා, වේවැලෙන් තළලා හරි කමක් නැහැ කොල්ලා කෙල්ල අරගෙන ගිහිල්ලා ඉස්කෝලේ වැටෙන් ඇතුළට දාලා ආවොත් ප්‍රශ්නය ඉවරයි කියලා. ඒක තමයි අම්මා තාත්තා හිතපු විධිය. ගුරුවරයා කොහොමද හිතුවේ? ගුරුවරයා හිතුවා, තනි රුල් ටික පිරෙන්න වචන ලිව්වොත්, කොටු රුල් ටික පිරෙන්න ඉලක්කම් ලිව්වොත් ප්‍රශ්නය ඉවරයි කියලා. දේශපාලකයන් වන අපි හිතුවා, ඡන්දය කාලයේ පස්සෙන් ආපු, "පෝස්ටර්" අලවපු, "බැනර්" දාපු, "කැන්වසින්" ගිය කොල්ලන් කෙල්ලන් ටික දෙනාට රස්සාවල් ටිකක් දුන්නොත් ප්‍රශ්නය ඉවරයි කියලා. අකමැත්තෙන් වුණත් කියන්න ඕනෑ, මේ රටේ අධ්‍යාපනය දිහා දෙමව්පියන්, ගුරුවරුන්, දේශපාලකයන් ඉතිහාසයේ බැලුවේ එහෙමයි කියලා. තරුණයන් අතරේ එයට විරෝධය මතු වෙන කොට අපි හෞතිස්ම කළා වචනයක්, 'තරුණ අසහනය' කියලා. මේ රටේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන ඇමතිවරයා විධියට මම මෙය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. ශ්‍රී ලාංකීය තරුණයා අසහනකාරයෙක් කියලා මම පිළිගන්නේ නැහැ. ශ්‍රී ලාංකීය තරුණයා අසහනකාරයෙක් නොවෙයි. තරුණ අසහනය සම්බන්ධයෙන් කියලා කොමිෂන් සභා දෙකක් ඉතිහාසයේ පත් කෙරුණා.

ඒ නිර්දේශ අරගෙන බලන්න. මොකක්ද තිබුණු ප්‍රශ්නය? හඳුනා ගන්න බැරි වුණු ප්‍රශ්නය මොකක්ද? තිබුණේ තරුණ අසහනයද, තරුණ විරැකියාවද? මොකක්ද ප්‍රශ්නය? අසහනයෙන් පෙළෙනවාය කියන ඕනෑම කෙනකුට රැකියාවක් දීලා බලන්න, ඒ මොහොතේ ඉඳලා අසහනය තිබෙනවාද කියලා. නැහැ. අපි ගල් අව්වුවේ හරි හතරැස්, අවිද්‍යාත්මක, අතාර්කික වචනයක් හදා ගත්තා "තරුණ අසහනය" කියලා. තරුණ අසහනයක් නොවෙයි තිබුණේ. මොන ආණ්ඩුව යටතේ වුණත් ඒවාට ටයර්වලින් උත්තර දෙන්න, ඊයම් බරුවලින් උත්තර දෙන්න ඇතැම් විට අපි උත්සාහ ගත්තා. රටක් විධියට බැලුවොත් ඒක අපේ උත්සාහයක්.

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ප්‍රශ්නය තිබුණේ විරැකියාවේ; තරුණ විරැකියාවේ. ඒක තමයි ජනාධිපතිතුමා තේරුම් ගත්තේ.

අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා ජපානයේ උදාහරණයක් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ ජපානය නැඟිටිටේ කාර්මික අධ්‍යාපනයෙන්; තරුණයන්ගේ උරහිස් මතින්. කාර්මික විප්ලවයෙන් පස්සේ යුරෝපය නැඟිටිටේ තරුණයින්ගේ උරහිස් මතින්. සිවිල් යුද්ධයෙන් පස්සේ ඇමෙරිකාව නැඟිටිටේ තරුණයන්ගේ උරහිස් මතින්; කාර්මික අධ්‍යාපනයෙන්; තාක්ෂණයේ දියුණුව හරහා. ඒක තමයි අද අපේ රටේ රාජ්‍ය නායකයා මේ රටේ -ජාතියේ- දරුවන්ට ලබා දෙන්න උත්සාහ ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ දිහා පාට කණ්ණාඩි දමා ගෙන බලන්න එපාය කියා මා ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. පටන් ගන්න අවස්ථාවේ අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඒකයි අපි මැතිවරණ කොටඨාසයකින් එක පාසලක් බැගින් තෝරා ගෙන පාසල් 230කින් පමණ අඩු ප්‍රමාණයකින් මේක ආරම්භ කරන්නේ. දේශපාලන ඉලක්කයක් තිබුණා නම්, පාසල් දහසකින්, දෙදහසකින්, සියලුම මහා විද්‍යාලවලින් මේක ආරම්භ කරන්න තිබුණා. එවැනි ප්‍රාථමික දේශපාලන න්‍යාය පත්‍රයක් අතට අරගෙන නොවෙයි මේ වැඩ පිළිවෙළට ආණ්ඩුව එකතු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට තුළ තිබෙන රැකියා අවස්ථා ගැන විතරක් නොවෙයි, මා කියන්නේ. ඩිලාන් පෙරේරා ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ තොරතුරු වාර්තා අරගෙන බලන්න. 2010 වර්ෂයේදී 2,60,000ක් පුහුණු ශ්‍රමිකයන්ට - skilled labourersලාට- රැකියා අවස්ථාවන් මේ රටට ආවා. නමුත් ඒ සඳහා රට තුළ සිටියේ කී දෙනාද? 61,000යි. සේවකයන් 2,60,000ක් ඉල්ලුවා. නමුත් අපට 1,99,000ක් යවන්න බැරි වුණා. අපේ විදේශ ශ්‍රම බල කාය ලක්ෂ 18යි; 1.8 million. ඒ ලක්ෂ 18 ඇතුළේ බහුතරය ඉන්නේ නුපුහුණු ශ්‍රමිකයෝ. සියයට 70ක පමණ ප්‍රමාණයෙන් සියයට 44ක් ගෘහ සේවිකාවෝ; නුපුහුණු ශ්‍රමය. දේශීය වෙළෙඳ පොළ විතරක් නොවෙයි, අපට ජාත්‍යන්තර වෙළෙඳ පොළත් තිබෙනවා. එම නිසා මේ රටේ අනාගතය වෙනුවෙන් කරනු ලබන ආයෝජනයක් විධියට සැලසුමක් ඇතුවයි අපි මේ තාක්ෂණ විෂය ධාරාව පාසල් පද්ධතියට එකතු කර තිබෙන්නේ. ඒ වෙනුවෙන් ලැබෙන සාධාරණ විවේචනත් එක්ක ගනුදෙනු කරන්න අපි කැමැතියි. එම අඩු පාඩු හදා ගන්න අපි සූදානම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මේ සභාව හරහා අපි රටට කියන්නට ඕනෑ, -මා මුලිනුත් සඳහන් කරපු විධියටම- පාසල් පද්ධතිය හා වෘත්තීය අධ්‍යාපනය අතර සම්බන්ධතාව ගොඩ නැඟීම සඳහා වූ ඒ පෙකණි වැල, ඒ පාලම ඉදි කිරීම සඳහා වූ කටයුත්ත දිහා කරුණාකරලා ප්‍රාථමික තර්කවලින්, දේශපාලන තර්කවලින් තොරව, එහෙම නැත්නම් පළාත් සභාව ගැන හෝ වෙනත් තර්කයක් ගැන හෝ හරස් කර ගන්නේ නැතුව බලන්න කියලා. තමුන්නාන්සේලා විපක්ෂය විධියට හෝ වෙනත් පක්ෂ විධියට හෝ බෙදෙන්නේ නැතුව මෙයට ඒ සම්මාදම දෙන්න. අපි ජාතියක් විධියට ලෝක දේශපාලන සිතියමේ අපේ අනන්‍යතාව සොයා ගෙන යන ගමනකයි ඉන්නේ; අපි ලකුණු සොයා ගෙන යන ගමනකයි ඉන්නේ.

ඒ ලකුණට යන්න පුළුවන් දොරක් තිබෙනවා. ඒ දොර තමයි වෘත්තීය අධ්‍යාපනය සංඛ්‍යාත්මකව ඉහළ ගෙනියන එක. මට පෙර කථා කළ මන්ත්‍රීවරුන් සියලු දෙනාම මේ ගැන කිව්වා. තුන් ලක්ෂ හතළිස් දෙදාහක් දරුවන් අවුරුද්දකට පාසල් පද්ධතියට ඇතුළු වෙනවා. එයින් විසිතුන් දාහක් හෝ විසිපන් දාහක් රටේ සරසවි පද්ධතියට යනවා. තව නව දාහක් විදේශ සරසවිවලට ඇතුළු වෙනවා. ගිය අවුරුද්දේ එක් ලක්ෂ විසිහය දාහක් වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය ලැබුවා. හැබැයි විසඳුමක් නැති එක් ලක්ෂ පණස්දාහක් ඉතිරි වෙනවා. ඒ අය වෙනුවෙනුයි මේ ව්‍යායාමය. ගරු ජනාධිපතිතුමා මේ තාක්ෂණ විෂය ධාරාව එළිදක්වන දවසේ කිව්වා, "මේ රටේ දක්ෂ දරුවෝ, අදක්ෂ දරුවෝ කියා දෙපැත්තක් නැහැ"කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පිළිගන්නවා ඇති, මේ රටේ මෙතෙක් වෘත්තීය අධ්‍යාපනය, කාර්මික අධ්‍යාපනය ලබා දුන්නේ පාසල් හැර යන දරුවන්ට, විභාගය අසමත් වන දරුවන්ට කියන එක. "F" තුනේ දරුවන්ට කථා කළා, Technical College එක. පාසල් හැර යන දරුවා ඉලක්ක කර ගෙන වෘත්තීය අධ්‍යාපනය නිර්මාණය කළා. ඒකම තමයි වැරැද්ද. ඒකයි අප කිව්වේ, අද, පාසල් පද්ධතිය ඇතුළේ ඒ අධ්‍යාපන ක්‍රම සැලසුම්සහගතව නිර්මාණය වන අවස්ථාව කියා. මේ පිළිබඳව බුද්ධිමත්ව අනාගතවාදී සංවාදයකට යන්නටයි අවශ්‍ය වෙන්නේ. අපේ අමාත්‍යාංශය විශ්වාස කරන විධියට මේ වෙනුවෙන් ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක -ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ඒ මැදිහත්වීම කරමින්- එසේම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක මේ විෂය ධාරාවට ඇතුළු වන කිසිම දරුවෙකුට අසාධාරණයක්, අගතියක් නොවෙන්න ඔවුන්ගේ අනාගතය සාර්ථක කරන්නට පුළුවන් වන විධියට ඒ පසුබිම හදා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - නවයක් මේ අවුරුද්දේ අප ආරම්භ කරනවා. ඒ university colleges නවයට එන දරුවෝ එන්නේ මේ තාක්ෂණ විෂය ධාරාව හරහායි. ඉංජිනේරු තාක්ෂණය වේවා, ජෛව පද්ධති තාක්ෂණය වේවා, තාක්ෂණය සඳහා විද්‍යාව වේවා මේ කුමන හෝ විෂයක් ජූලි මාසයේ 15වෙනි දායින් පස්සේ තමන්ගේ පන්ති කාමරය ඇතුළේ දරුවන් ඉගෙන ගන්නවා. ඒ ඉගෙන ගන්නා දරුවන්ගෙන් එක් දහසක් 2016 වර්ෂයේ විශ්වවිද්‍යාලයට යනකොට, හය දහසකට විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - වෙත එන්න පුළුවන්කම ලැබෙය කියා අප බලාපොරොත්තු වෙනවා. සමහරු NVQ සුදුසුකම් මට්ටම් හරහා එනැනට ඒවි. ඒ වාගේම Z-score එක හරහාත් 2016 වර්ෂයේ දී university collegesවලට එන ළමයින්ගේ සංඛ්‍යාව පන්දහසකට අධික වෙය කියා අප විශ්වාස කරනවා. ඒ හැම දරුවෙක්ම B.Tec උපාධියේ පළමුවන අවුරුදු දෙක university college එකේදී සම්පූර්ණ කරාවි. මේ අනුව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අනාගතය වෙනුවෙන් ඉතාම නිවැරදි, ඉතාම දියුණු විද්‍යාත්මක ආයෝජනයක් අධ්‍යාපනයට සිද්ධ වෙලා තිබෙනවාය කියා මේ අවස්ථාවේදී අප විශ්වාස කරනවා. ඔබතුමා මට නියෝග කරන්න මොහොතකට පෙර මා මගේ කථාව අවසාන කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මගේ කථාව අවසාන කරන්නට මොහොතකට පෙර නැවත ඉල්ලන්නේ මෙයයි. මෙවැනි ජාතික ප්‍රතිපත්ති මීට පෙර මේ සභාව හමුවට ඇවිත් තිබෙනවා; නිල්පාටින් වාගේම කොළපාටින් මේ ගරු සභාවට ඇවිත් තිබෙනවා. හැබැයි, අප ප්‍රාථමිකව ඒවා දිහා බලා, දේශපාලන න්‍යාය පත්‍රය ඉස්සරහින් තියාගෙන ඒවා දිහා බලා, අප නූගතුන් විධියට හැසිරිලා, අප මන්ද බුද්ධිකයන් විධියට හැසිරිලා ඒ ජාතික ප්‍රතිපත්ති ජාතික දේශපාලන වේදිකාවෙන් එළියට ඇද දමා තිබෙනවා. මේ ඉතිහාසයේ ඇත්ත කථාව නීරස වුණත් ගරු සභෝදර මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙන්ම නැවත මා ඉල්ලන්නේ මෙන්න මේ කාරණයයි. මේ දෙස අන්ධානුකරණ දේශපාලනය තුළ ඉඳගෙන බලන්න එපා. ප්‍රාථමික දේශපාලනය තුළ ඉඳගෙන මේ දෙස බලන්න එපා. සභෝදරාත්මකව විවේචන කරන්න. හැබැයි ජාතියේ දරුවන් වෙනුවෙන් අනාගතවාදීව, බුද්ධිවාදීව මේ විෂය ධාරාව යථාර්ථයක් කර ගන්නට තමුන්නාන්සේලාගේ

මැදිහත් වීම සිද්ධ කර, ඒ හරහා මේ රටේ අනාගතය වෙනුවෙන් ඒ කැප කිරීම කරන්නය කියන ඉල්ලීම කරමින් ඔබතුමාට විශේෂයෙන් ස්තුති කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්ධකාරය පවතිනකොට වැදගත් දේවලුත් යටපත් වෙනවා. වැදගත් දේවලටත් වැරදි අර්ථ නිරූපණ ලැබෙනවා. හොඳම හොඳ දෙය දෙසත් සැක සංකාසහිතව බලන්නට සිද්ධ වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා සඳහන් කළ පරිදිම මේ නොම්මර එකේ වැඩේ -තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම කියන ඉතාම ඉස්තරම් වැඩේ- පිළිබඳව විපක්ෂයේ අප තුළ යම් යම් සැක සංකා මතු වන්නේ ඔබතුමන්ලා අපත්, රටත් අන්ධකාරයේ තබා ඇති නිසායි. මෙම අලුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අලුතින් යෙදිය යුතු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද, ඒ ප්‍රාග්ධනය සොයා ගන්නේ කෙසේද කියලා මේ රජය, විෂය භාර අමාත්‍යවරු පැහැදිලි කරනවා නම් අපට ඒ ගැන එකඟ වන්නට පුළුවන්. නමුත් අද වන තුරු -ඔබතුමාගේ කථාවේම සඳහන් කළ පරිදි- මේ ගෞරවනීය පාර්ලිමේන්තුව ඒ ආයෝජනය ගැන දැනුවත් කර නැහැ. මොකද මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය යුද්ධයෙන් පස්සේ දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. 2012 දී ඒ ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 1.8ක් පමණයි. 2013 වසරේ ඇස්තමේන්තු අනුව එය සියයට 1.6ක් බවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ සියයට 1.8ක් ආයෝජනය කරලා, මේ අවුරුද්දේ සියයට 1.6ක් ආයෝජනය කරලා මෙවැනි දැවැන්ත වැඩ පිළිවෙළකට අවශ්‍ය කරන මූල්‍ය සම්පත් හොයා ගන්නේ කොහෙන්ද කියන සැකය අපට ඇති වෙනවා. එතකොට තමයි අප කියන්නේ මේ වැඩ පිළිවෙළ ප්‍රමාණවත් ලෙස සූදානම් නොවූ වැඩ පිළිවෙළක්දෝ යැයි අපට සිතෙනවා කියලා. අවසානයේ මේ ගරු සභාව අමතන ගරු ඇමතිවරයා කවුරුන් හෝ වේවා ඒ වැය වන අතිරේක මුදල් ප්‍රමාණය කොපමණද, ඒවා සොයා ගන්නේ කෙසේද කියන කාරණය ගැනත් අපව දැනුවත් කළොත් මේ වටිනා වැඩ පිළිවෙළ ගැන අපේ සිත තවත් සතුටු වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපොස උසස් පෙළ විභාගයට ගණිත විෂයයන් හැදෑරූ, විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා විෂයන් හැදෑරූ කෙනෙක් හැටියට මේ වැඩ පිළිවෙළ ගැන මගේ ලොකු සතුටක් තිබෙනවා. කර්මාන්ත සහ ඒ කර්මාන්ත හරහා ගොඩනැහෙන අනිකුත් සේවා සැපයීම් මත රටට වැඩිපුර ලැබෙන ලාභය තමයි අනික් රටවලට සාපේක්ෂව ඒ රට දියුණු වීම කියලා කියන්නේ. ජපානයේ කර්මාන්ත දියුණු වෙලා, ඒ නිෂ්පාදනවල අතිරික්තය ලෝකයේ වෙනත් රටවලට විකුණලා ලබා ගන්නා ලාභය තමයි ජපානයේ පොහොසත් වීම කියලා කියන්නේ. දකුණු කොරියාව 1948 දී අපේ රටටත් වඩා පහළ තත්ත්වයක තිබිලා අද දකුණු කොරියාව ලෝකයේ පොහොසත්ම රාජ්‍යයක් වන්නේ දකුණු කොරියාවේ නිෂ්පාදන එම රටටම නිෂ්පාදනය කරලා, ඒ නිෂ්පාදන හරහා ලැබෙන අතිරික්ත ධනය රට තුළ ඉතිරි වෙන කොටයි. මලයාසියාව ගැනත්, වේගයෙන් දියුණු වන ඉන්දියාව ගැනත් දියුණු වූ අනික් ඕනෑම ජාතියක් ගැනත් මේ තර්කය පොදුයි. ඒ නිසා අපේ රට ලෝකයේ දියුණුව කරා ගෙන යන්න නම් එක අතකින් කර්මාන්ත, තවත් අතකින් කෘෂි කර්මාන්තය හා සම්බන්ධ කර්මාන්ත, ඒ වාගේම ඒ හා සම්බන්ධ අනිකුත් සේවා දියුණු තලයකට යා යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අද කරන්නේ අපේ නුපුහුණු ශ්‍රමිකයන් අතිවිශාල ප්‍රමාණයක් මැද පෙරදිග රටවලට දුක් විඳින්නට යවන එකයි. අපේ නුපුහුණු ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් ඉතාලියට, ජපානයට හොර රහසේ යවන එකයි. ඒ අයගෙන් වසරකට ලැබෙන ඩොලර් බිලියන 7ක විතර මහා ධනස්කන්ධය මත තමයි අද අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ. මොකද අපේ රටේ ඇහලුම් කර්මාන්තය හැර වෙනත් කිසිදු නිෂ්පාදනයක් සැලකිය යුතු තරම් රටේ ආර්ථික වර්ධනයට දායකත්වය දක්වන්නේ නැහැ. ඊට අමතරව සම්ප්‍රදායික බෝග වන තේ, රබර්වලින් අපට ආදායමක් ලැබෙනවා. පොල්වලින් අප ජාත්‍යන්තරව ආදායමක් උපයන්නේ නැහැ. තේ, රබර් සහ ඊට අමතරව කුරුඳු සහ වෙනත් සුළු අපනයන බෝග මඟින් අප කෘෂි කර්මාන්තය හරහා ආදායම උපයනවා. නමුත් දැන් අප පිළිගත යුතුයි, එය සුදුසු නැහැ, අපේ රට තුළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන පුහුණු ශ්‍රමිකයන් ඒ විවිධ ක්ෂේත්‍ර -ඉංජිනේරු ක්ෂේත්‍රය, ජීව විද්‍යාත්මක කර්මාන්ත ක්ෂේත්‍රය- සඳහා බිහි කර ගත යුතුයි කියන කාරණය. ඒ නිසා මේ පියවර ඉතා හොඳයි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගුරුවරයෙක්. මම හිතන හැටියට මේ ගරු සභාවේදී අද දින මේ විවාදයට සහභාගි වුණු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කීප දෙනෙකුම ඔබතුමාගෙන් ඉගෙන ගත් අය. ඒ අතර ඉංජිනේරුවකු වන ගම්පහ දිස්ත්‍රික්කයේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත්, ආණ්ඩු පක්ෂයේ ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මන්ත්‍රීතුමාත් සිටිනවා. ඒ වාගේම ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කිව්වා, එතුමාත් ඔබතුමාගෙන් ඉගෙන ගෙන තිබෙනවා කියලා. මමත් ඔබතුමාගෙන් භෞතික විද්‍යාව විෂය ඉගෙන ගෙන තිබෙනවා. මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගුරුවරයකු නිසා දන්නවා ඇති, අධ්‍යාපනයට අවශ්‍ය කරන සාධක ගණනාවක් තිබෙන බව. පළමු වැනි සාධකය හැටියට, ඒ විෂය තෝරා ගැනීම පිළිබඳව යම් ආකාරයක විශ්වාසයක් සමාජය තුළ ඇති කළ යුතුයි. ඒ වාගේම ඒ විෂය තෝරා ගන්නා දරුවා පාසලට ගියාම, ඒ විෂය ගැන හොඳින් දන්නා පුහුණු ගුරුවරුන්ගේ සහායත් ඒ දරුවාට පාසල තුළදී අවශ්‍යයි. විශේෂයෙන් තාක්ෂණවේදය විෂය නිසා ඒ සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් පවා අවශ්‍ය වෙනවා. ඒ සඳහාත් පහසුකම් සූදානම්ව තිබෙන්න ඕනෑ.

මා පානදුරේ නගර ශාලාව ඉදිරිපිට තිබුණු බැනරයක් දැක්කා. ඒ බැනරයේ තිබුණේ, "පානදුර ශාන්ත ජෝන් විද්‍යාලයේ තාක්ෂණවේදය විෂය ඉගැන්වීම මේ වසරේ ආරම්භ වන බැවින් ඒ සඳහා අයදුම් කළ හැකියි" කියන එකයි. බැලූ බැල්මටම මා ඒ ගැන සතුටු වුණත්, දෙවනුව මා කල්පනා කළා, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සහ ගොඩනැගිලි තිබෙනවාද කියලා. පළමු වතාවට, දෙවැනි වතාවට මේ විෂය ඉගෙන ගන්න ඉදිරිපත් වන දරුවන්ට විඳින්නට සිදු වන අවදානම කුමක්ද කියන එක මා කල්පනා කළා. මෙය, දෙමවුපියන්ට තමන්ගේ දරුවන්ගේ ජීවිතයේ තීරණාත්මක මොහොතක්. උසස් පෙළ පන්තියට මේ විෂය ධාරාවෙන් ඇතුළත් වෙන්න කියලා ඒ දරුවන්ට ආරාධනා කරනකොට, අවශ්‍ය පහසුකම් සනාථ කරලා ඒ අවශ්‍ය ආත්ම විශ්වාසය ඇති කරලා නොතිබුණොත් - දෙමවුපියන් ඒ තීරණය ගන්නේ නැහැ - ඒ දරුවන් අසරණ වෙනවා.

ඉංග්‍රීසි භාෂාවෙන් පහළ ශ්‍රේණිවල සිට ඉහළ ශ්‍රේණි දක්වාම ඉගැන්වීම ඉතා වැදගත් යෝජනාවක් වුණත්, ඇතැම් ප්‍රධාන පෙළේ පාසල්වල පවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම පිළිබඳ වූ ව්‍යාපෘතිය අසමත් වෙලා තිබෙනවා. ඇතැම් පාසල්වල එය හොඳින් ක්‍රියාත්මක කරනවා. නමුත් ඇතැම් ප්‍රධාන පෙළේ පාසල් පවා එයින් අසමත් වෙලා තිබෙනවා. ඒ අසමත් වුණු කාරණා ගැනත්, ඒ අත්හදා බැලීමට ලක් වෙච්ච දරුවන්ට මුහුණ දෙන්න

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සිද්ධ වුණු කාරණා ගැනත් අපට හොඳ අවබෝධයක් තිබෙනවා. ගරු මොහාන් ලාල් ග්‍රේරු අධීක්ෂණ මන්ත්‍රීතුමනි, මේ වැඩ පිළිවෙළ සත්‍ය ලෙසම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නම් සමාජය තුළ විශ්වාසයක් ඇති කළ යුතුයි, "ඒ සඳහා සූදානම්" කියලා. ඒ සූදානම පිළිබඳ පණිවුඩය ඉක්මනින්ම සමාජ ගත කළ යුතුයි. දරුවකු පන්තියට එන පළමුවැනි දවසේම, දෙවැනි දවසේම ඒ හැඟීම එම දරුවාට දිය යුතුයි. එසේ නොමැතිව මුල් අවස්ථාවේ දී යම් පසුබෑමක් ඇති වුණොත්, අවිශ්වාසයක් ඇති වුණොත් අනිවාර්යෙන්ම දිගින් දිගටම ඒ තත්ත්වය බලපාන්නට ඉඩ තිබෙනවා.

උසස් පෙළ විභාගයෙන් පසුව විශ්වවිද්‍යාලවලට ඉංජිනේරු විද්‍යාව හැදෑරීම සඳහා හෝ වෙනත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා නොතේරෙන හෝ නොයන සිසුන් වෙනුවෙන්, NVQ කියන සුදුසුකම්වල එක එක මට්ටම් හරහා ඒ වෘත්තීයමය අධ්‍යාපනයට යොමු කිරීම ඉතාම හොඳයි කියලා මා අගය කරනවා. මොකද, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව කෙනෙකු විශ්වවිද්‍යාලයට තෝරා ගන්න පුළුවන්. එහෙම නොවෙයි නම්, තමන්ට නිශ්චිත තීරණාත්මක සුදුසුකම් ලැබෙන, ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් ලබා ගැනීමේ ක්‍රියාවලියක පළමුවැනි, දෙවැනි පියවර අපි දැන් උසස් පෙළ පන්තියේ දීම සම්පූර්ණ කළාය කියන ඒ විශ්වාසය මත ඒ සිසුන්ට ඉදිරියට යන්නට පුළුවන්. ඒ නිසා හොඳ දේ හොඳයි. හොඳටම හොඳයි. හැබැයි, මෙය අධ්‍යාපන ක්ෂේත්‍රය නිසා, ඒ මූලික විශ්වාසය ඇති වන ආකාරයට අපත්, සමාජයත් දැනුවත් කළ යුතුයි.

ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. නමුත් මා එතුමාට පිළිතුරු දිය යුතුව තිබෙනවා. එතුමා මේ අවස්ථාවේ පාර්ලිමේන්තුව තුළ සිටිනවා ඇති කියලා මා හිතනවා. එතුමා කිව්වා, 1988, 1989, 1990 කාලයේ තරුණ අසහනය ඇති වුණේ, රක්ෂාවක් නොමැතිවීමේ ප්‍රශ්නය නිසාය කියලා. රක්ෂාවක් දුන්නා නම් මොන අසහනයක්වත් නැහැ කියලා එතුමා මේ ප්‍රශ්නය ලඝු කළා. ඒ කාලයේ එතුමාගේ දේශපාලන ක්‍රියාකාරකම් ගැනත් මට මතකය තිබෙනවා; අවබෝධය තිබෙනවා. අප මැරිලා ඉපදුනු අය නොවයි. අප ජීවිතයේ බොහෝ අත්දැකීම් ලබපු අය. ඒ නිසා ඒ කාලයේ එතුමාගේ දේශපාලන ක්‍රියාකාරකම් ගැනත් අපට මතකයි. එතුමාටත් අප මතක ඇති. මූලාසනයේ සිටින ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමනි, අපට ඔබතුමාත් මතකයි. ඔබතුමාටත් අප මතක ඇති.

මේ ජීවිතයේ විවිධ අත් දැකීම් හරහා අප විවිධ තැන්වල සිටිනවා. හැබැයි, ඉතිහාසයේ සැබෑවට වුණ දේ අමතක කළොත් අපට කිසිම විසඳුමක් ලබා ගැනීමට හැකි වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 88-89 කාලයේ රැකියා ප්‍රශ්නයක් තිබුණා. සාධාරණ රැකියා අවස්ථා නොමැතිවීමේ ගැඹුරු ප්‍රශ්නයක් තිබුණා. එවකට මම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. ඒ හැඟීම, විප්ලවීය අදහස්වලට යොමු කරන්නත්, ඒ හරහා මහත් විනාශයක් කරා ජනතාව පොළඹවන්නත් ජනතා විමුක්ති පෙරමුණට අවස්ථාව ලබලා දුන්නා. ජනතා විමුක්ති පෙරමුණ රටේ කාටවත් විමුක්තිය උදා කළේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ට වශී වුණ දරුවන්ගේ විනාශය කරා ඔවුන් අරගෙන ගියා. නමුත් එහෙම කරන්නට පදනම් වෙච්ච සමාජ තත්ත්ව තුළ රැකියා කියන ප්‍රශ්නය එක ප්‍රශ්නයක් පමණයි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වූ හැඟීම, තනි පක්ෂ පාලනයක් පිළිබඳව වූ හැඟීම, තමන්ට තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව අයිතියක් නැතිකම පිළිබඳව වූ හැඟීම, සීමිත පිරිසක් -ධනවත් පිරිසක්, බලවත් පිරිසක්- සමාජයේ තිබුණු වරප්‍රසාද ඔවුන් වටා ගොනු කර ගැනීම පිළිබඳව වූ හැඟීම ඒ කාලය වන කොට වර්ධනය වෙලා තිබුණා. අදත් ඒ ප්‍රශ්නය එලෙසම තිබෙනවා. ඒක එදාට සියයට 100ක් සමානයි කියලා කියන්න අවශ්‍යතාවක් නැහැ. එය වෙනස්; නමුත් තිබෙනවා. ඒ නිසා මේ රටේ තරුණයන් තුළ තවමත් අසහනය තිබෙනවා. ඒ අසහනය නැති කිරීමට ගත යුතු පියවර අතර එක පියවරක් පමණයි, මෙම තාක්ෂණවේදය පිළිබඳ විෂයය හඳුන්වා දීම.

අනෙක් පියවර වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම රටේ සැබෑවට ස්ථාපනය කිරීමයි. නිදහස් අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වුණු ඒ මූලධර්ම නවීන කාලයට ගැළපෙන ආකාරයට සකස් කළ යුතුයි. මේ සමාජයේ සැබෑ පංගුකාරයන් වන අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන ව්‍යවස්ථාවෙන්ම සනාථ කරලා තිබෙන ආකාරයට, මේ රටේ ජනතාවගේ විධායක බලය, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය, ජනතාවගේ අධිකරණ බලයයි මේ තිබෙන්නේ. මේ රටේ පාලකයන් කටයුතු කරන්නේ ජනතාව වෙනුවෙන්ය, ඒ ජනතාවගේ ආණ්ඩුවක් මේ රටේ තිබෙනවා යැයි කියන හැඟීම ඇති කළොත් විතරයි, මේ රටේ බාල, තරුණ, මහලු හැමෝගේම අසහනය නැති කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අධ්‍යාපනය සම්බන්ධයෙන් අලුත් පියවරක් ගන්න මේ මොහොතේ විශ්වාසය පිළිබඳව ඇති ප්‍රශ්නය බරපතළයි. -මා මේ කාරණය කියන්නේ මෙයට බාධා කිරීමේ අරමුණකින් නොවෙයි- ඒ විශ්වාසය ඇති කරන්නට අවශ්‍ය කරන පැහැදිලි කිරීම් සහ පහසුකම් ලබා දෙනු ඇතැයි කියන විශ්වාසයෙන් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කිසිම රජයකට විසඳන්න බැරි අභියෝග ගණනාවකට අධ්‍යාපනය මුහුණ දීලා තිබුණා. එයින් ඉතාම වැදගත් කාරණය වුණේ, අද කිව්වා වාගේ ටියුෂන් යන්න දරුවන් යොමු කරවපු, කටපාඩම් කරන විභාග මුල් කර ගත් අධ්‍යාපන ක්‍රමයයි. අපි දැනුමට විතරයි තැන දුන්නේ; කෙරුමට තැන දුන්නේ නැහැ. කරන්නෝ නොමැතිවීම නිසා දැනුවත්කමින් හිස් උදුම්මා ගත් උගත්තු ශීත කාමරවල කොළ අත්සන් කිරීමේ ක්‍රියාවලියේ පමණක් නිරත වෙද්දී අපේ රටේ කර්මාන්ත ඇති කිරීමට තිබෙන, අපේ රටේ අලුත් දේවල් හදන්න තිබෙන ඉඩකඩ ඇහිරිලා ගියා. ඒ පසුබිම ඇතුළේ අතිගරු ජනාධිපතිතුමා හිතුවා මේ දේශපාලන තීන්දුව ගත යුතුයි කියලා. අපේ රටේ දරුවෝ -අනාගත පරපුර- දැනුමෙන් සන්නද්ධ වනවා වාගේම කෙරුමෙන්, නිපුණතාවෙන් සන්නද්ධ කිරීම සඳහා එතුමා මේ තීරණය ගත්තා. අපි කොහොමද, මේ සඳහා වැඩ කෙරුවේ, සැලසුම් කෙරුවේ? අද මේ වන කොටත් මේ විෂය මාලාව ඇතුළේ තනි විෂයයන් විධියට මේ තාක්ෂණවේදය තිබුණා. හැබැයි ඒවා ඇඳලා තිබුණේ ඉතාම අසාර්ථක විධියට කලා විෂය ධාරාවට. අපි අලුත් විෂය ධාරා දෙකක් හැදුවා. මෘදු තාක්ෂණය කියලා අපි විෂය ධාරාවක් හැදුවා. ඒ මෘදු තාක්ෂණ විෂයයන් එකතු කර ගෙන ජෛව පද්ධති තාක්ෂණය - Biosystems Technology - කියලා විෂයයක් හැදුවා. ජෛව පද්ධති තාක්ෂණය ඇතුළේ තිබෙනවා, කෘෂි තාක්ෂණය, පසු අස්වනු තාක්ෂණය, ගොවි පොළ තාක්ෂණය, ධීවර සම්පත් පිළිබඳ තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය. මේ ජෛව සම්පත් හා ජෛව පද්ධති ආශ්‍රිතව පරිසර හිතකාමීව, සමාජයේ උන්නතිය සඳහා හා ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා වුවමනා කර්මාන්ත ඇති කිරීමට වුවමනා මූලික දැනුම දෙන නොගැඹුරු, එහෙත් පුළුල් අත් දැකීම් සම්භාරයක් නිපුණතාව සමඟ දරුවාට ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති වන විධියට ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ විෂය නිර්දේශය අපි නිර්මාණය කෙරුවා.

අනෙක් පැත්තෙන් තාක්ෂණයේ අනෙක් පැත්ත. ඒ තමයි කාර්මික පැත්ත, ඉංජිනේරු පැත්ත. සිවිල් ඉංජිනේරු එහෙම නැත්නම් ඉදි කිරීම් පැත්ත. අනෙක් පැත්තෙන් යාන්ත්‍රික කටයුතු පිළිබඳ ඉංජිනේරු පැත්ත.

අනෙක් පැත්තෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ තාක්ෂණය කියන අංශ එකතු කරලා නොගැඹුරු එහෙත් පුළුල් දැනුමක් ලබා දෙන විධියට දෘඩ තාක්ෂණය මුල් කර ගෙන අපි ඉංජිනේරු තාක්ෂණය කියන විෂය නිර්මාණය කළා. ඊට අමතරව අපි මේ වෙනස්කම් ඇති කරන විට දරුවන්ගේ අනාගතය මොන විධියට වෙන්න ඕනෑද කියලා බැලුවා; මොන මාර්ගයේද දරුවන්ට යන්න පුළුවන් වෙන්නේ කියලා බැලුවා. අපි දන්නවා විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළේ මේ දක්වා තිබුණේ විද්‍යාව විතරයි කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විද්‍යාව කියන්නේ මූල ධර්මය. ඒ මූල ධර්මය යොදවා ගෙන හදපු මයික්‍රෝෆෝනය -යකඩ කට-මෙතැන තිබෙනවා. මේක තුළ ක්‍රියාත්මක වන විද්‍යාත්මක මූල ධර්මයට අපි කියනවා, විද්‍යුත් චුම්බක ප්‍රේරණය කියලා. එය සොයා ගත්තේ මයිකල් ෆැරඩේ. ඒ විද්‍යුත් චුම්බක මූල ධර්මය යොදලා සිය දහස් ගණනක් උපකරණ නිපදවලා තිබෙනවා. විද්‍යාවේ එක මූල ධර්මයයි, නමුත් හදලා තිබෙන උපකරණ බොහොමයි. අන්න තාක්ෂණය. මේ මයික්‍රෝෆෝනය කියන්නෙත් තාක්ෂණය. අර cellular phone එකෙත් මේ මූලධර්මය තිබෙනවා. එතැනත් ඒ තාක්ෂණය. පත්‍යාවර්තධාරා ජනකයේත්, ඒ කියන්නේ generator එකේත්, අපට විදුලිය සපයන උපකරණයේත් මේ මූල ධර්මය තිබෙනවා. මේ විවිධ උපකරණ තමයි තාක්ෂණය කියන්නේ. මේ තාක්ෂණය තමයි මුළු ලෝකය පුරා පැතිරී තිබෙන සියලු නිෂ්පාදන කර්මාන්ත ඇතුළේ හරය වෙලා තිබෙන්නේ. අපි මොකද කළේ? අපේ විශ්වවිද්‍යාල එකකවත් තාක්ෂණය පිළිබඳ පීඨයක් නැහැ. එකකවත් තාක්ෂණ දෙපාර්තමේන්තුවක් නැහැ. විද්‍යාපීඨ විතරයි තිබෙන්නේ. මූල ධර්මය විතරයි උගන්වන්නේ. දැනුම විතරයි දෙන්නේ. කෙරුමෝ හදන්න අපේ පසුබෑමක් ඇති වෙලා තිබුණා. කරන්නෝ හදන්න, ඒ විද්‍යාව යොදලා ලෝකයට ඕනෑ වන, මිනිසුන්ගේ ජීවන මට්ටම ඉහළට ගෙන යන්න පුළුවන් වන බඩු භාණ්ඩ ආදිය හදන, ආර්ථිකයට උදව් කරන පරපුරක් හදා ගන්න අපට බැරි වුණා. අපි මේ සියලු ආයතන සමඟ කථා කළා. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ කථා කළා. මගෙන් ඇහුවා අනෙක් පැත්තට ගිහිල්ලා සන්තෝෂ වෙන්න පුළුවන් දෙයක් කර ගන්න පුළුවන් වුණාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා අධ්‍යාපන අමාත්‍යාංශයේ විතරක් නොවෙයි යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේත් අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් විධියට කාර්ය භාරයක් පවරලා මාව ඇතුළු කළේ මේ දෙක සම්බන්ධ කරලා මෙතෙක් කල් අධ්‍යාපන ක්‍රමය ඇතුළේ අපට හදා ගන්නට බැරි වුණු නිපුණතා සංවර්ධනය, කෙරුම හදා ගන්නයි.

21 වන ශත වර්ෂයේ අධ්‍යාපනය පිළිබඳව Jacques Delorsගේ පොතේ තිබෙනවා දැන ගන්න ඉගෙන ගන්න, ඒ වුණාට මදි, කරන්නත් ඉගෙන ගන්න ඕනෑ කියලා. "Learning to know, learning to do, learning to live together and learning to be" කියන්නේ අධ්‍යාපනයේ කුලුනු හතර. මෙහි ඉතා වැදගත් කුලුනක් වන කරන්න පුළුවන් විය යුතු වීම, -කිරීම පිණිස- අධ්‍යාපන පද්ධතිය ඇතුළට ගෙන යන්න හඳුන්වලා දෙන්න, වැඩ කිරීමේ වැදගත්කම දරුවන්ට කියලා දෙන්න, දහඩියේ සුවඳ හඳුනන, මහ පොළොවේ පය ගහලා වැඩ කරන්න පුළුවන් අලුත් දේවල් හිතන්න පුළුවන්, අලුත් දේවල් කරන්න පුළුවන්, නව නිර්මාණ තනන්නට පුළුවන් ජාතියක් හදන්න එතුමා පියවර ගත්තා. ඒ සඳහා පෙරමුණේ ගමන්කරුවෙක් විධියට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ අභියෝගය බාර ගත්තා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා මේ අභියෝගය බාර ගත්තා. අපි මේක ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා ළඟට ගිහ ගියා. එතුමා කිව්වා අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති විශ්වවිද්‍යාල 17ම තාක්ෂණ පීඨ ඇති කරනවා කියලා මූල ධර්මයක් විධියට පිළිගත්තා. B.Tech උපාධි ඇති කරනවා, තාක්ෂණයෙන් තොර විද්‍යාවකින් එලක් නැහැ. එහෙම නම් අපි තාක්ෂණ පීඨ ඇති කරනවා. එහෙම නැත්නම් අඩුම ගණනේ විද්‍යා හා තාක්ෂණ පීඨ - Science and Technology Faculties - අපේ විශ්වවිද්‍යාල ඇතුළේ හදනවා කියලා. මේ විධියට අපි විශ්වවිද්‍යාල ඇතුළට තාක්ෂණය ගෙන ගියා.

2016 වන විට අනිවාර්යයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා මේ කර්තව්‍යය සම්පූර්ණ කිරීමට. ඒ සඳහා දැනටමත් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සියලු වැඩ කටයුතු කරලා ඉවරයි. තට්ටු 8ක මහල් ගොඩනැඟිල්ලක් හදලා තාක්ෂණ විෂයයට උපාධි අපේක්ෂකයින් 450ක් ඇතුළත් කර ගැනීම සඳහා වැඩ කටයුතු දැනටම සැලසුම් කරලා ඒ සඳහා වුවමනා කරන යෝජනා බාර දීලා ඉවරයි. මේ විශ්වවිද්‍යාල දහහත්මම මෙය කෙරෙනවා. එතකොට මේ දරුවන්ට ඒ පැත්තෙන් යන්න පාර තිබෙනවා. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කිව්වා ඇත්තටම විශ්වවිද්‍යාල විද්‍යායතන - university colleges - 25ක් මේ රටේ හැදෙනවා කියලා. මේ අවුරුද්දේ 09ක් හැදෙනවා. ඉතිරි ටික ලබන අවුරුද්දේ හැදෙනවා.

දරුවන් 7,500ක් ඒවාට ඇතුළත් කර ගන්න පුළුවන්. එක පැත්තකින් NVQ හතරෙන් එන දරුවන්, තව පැත්තකින් තාක්ෂණවේදය හදාරා, මේ පාඨමාලාව හදාරා සමත් වන දරුවන් කියන ඒ හැමෝම අන්තිමට යන්නේ වසර හතරක පාඨමාලාවකින් කාර්මික පුහුණුව සහිතව industry එකේ හොඳ පුහුණුවක් -හොඳ training එකක්- එක්කයි. ඒ අයට තාක්ෂණවේදී උපාධිය තිබෙන**වා;** B.Tech උපාධිය තිබෙන**වා.** එතකොට තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති මේක ඉතා හොඳට සැලසුම් කරපු විෂය මාලාවක්ය කියන එක. ඒ වාගේම, මේකට සල්ලි තිබෙනවාද, මේකට කොයි තරම් මුදලක් අයින් කරලා තිබෙනවාද කියා තමුන්නාන්සේලා ඇහුවා. මේ වැඩසටහන ගැන දැනුම් දීපු ගමන් ආසියානු සංවර්ධන බැංකුවේ නිලධාරින් ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට මොකද කිව්වේ? "මේක පටන් ගන්න තිබුණේ අද නොවෙයි, මීට අවුරුදු 20කට ඉස්සෙල්ලා. අපි මේකට ආයෝජනය කරන්න කැමැතියි. අපි මේකට උදව් කරන්න කැමැතියි" කියා ඒ අය කිව්වා. පළමුවන අවුරුදු කිහිපය ඇතුළත ඩොලර් මිලියන 200ක ආධාර මුදලක් අපට ලැබී තිබෙනවා. ඒ ඩොලර් මිලියන 200න් මුලින්ම පටන් ගන්න පාසල් 233ට - වැඩිම වුණොත් මේ ප්‍රමාණය 250ක් වේවි - ඩොලර් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් ආයෝජනය කරන්න අපට පුළුවන්. මේ වනකොටත් ඒවාට වුවමනා විද්‍යාගාර නිර්මාණය කරලා ඉවරයි. ඒවායේ සටහන් ඇඳලා ඉවරයි. ගෙනෙන්න ඕනෑ උපකරණවල specifications හරිගස්සා ඉවරයි. අගෝස්තු මාසයේ අපි මේවා හදන්න පටන් ගන්නවා. මාස 6ක් ඇතුළත අපි මේවායේ වැඩ අවසන් කරන්න බලාපොරොත්තු වනවා. වැඩිම වුණොත් මාස 8ක් ගත වේවි. මේ දරුවන්ට වැඩ කරන්න, පුහුණු වෙන්න අවශ්‍ය පරීක්ෂණාගාර, වැඩ පොළවල් අපි මේ භූමිය මත හදනවා කියන එක මා භය නැතුව, විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ මෙවැනි පාසල් 400ක් තිබෙනවා. එයින් පාසල් 250යි අපි තෝරා ගන්නේ. කාර්මික විද්‍යාල හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පුහුණු මධ්‍යස්ථාන 400ක් තිබෙනවා. ළඟම තිබෙන පුහුණු මධ්‍යස්ථානයට අපි මේ දරුවන් ගෙන යනවා. ඒ අයට ප්‍රවාහන පහසුකම් සපයන්න අපි බලාපොරොත්තු වනවා. සතියකට එක දවසක් ඒ තැන්වල මෘදු තාක්ෂණය හා දෘඪ තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට අපි මේ අය යොමු කරනවා. ඇයි, මේ අයට tuitionවලින් ගොඩ එන්න බැරි වන්නේ? ඉංජිනේරු තාක්ෂණය, පෛව පද්ධති තාක්ෂණය යන මේ මූලික විෂයයන් දෙක සඳහා සිද්ධාන්තවලට ලැබෙන්නේ ලකුණු 75යි. ඉහළ ලකුණු අරගෙන මේ විවෘත වෙලා තිබෙන අංශවලට දරුවා ඉදිරිපත් වන්න නම්, තරග කරන්න නම් අර ලකුණු 25 ඉතා වැදගත් වනවා. ඒ ලකුණු 25 ලැබෙන්නේ ප්‍රායෝගික වැඩවලටයි. සන්තත ඇගැයීම් ක්‍රමයක් හරහා අන්තිමේදී විභාග දෙපාර්තමේන්තුව කරන සුවිශේෂ ඇගැයීමකින්, සම්පිණ්ඩිත ඇගැයීමකින් ලකුණු 25ක් ලැබෙනවා. ප්‍රායෝගික වැඩවලටයි දරුවන්ට ඒ ලකුණු හම්බ වෙන්නේ. එතකොට tuition පන්තියට ගිහිල්ලා කට පාඩම් කරපු යුගයට අද මේකෙන් අභියෝගයක්

[ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා]

එල්ල වෙනවා. එහෙම නම් මේක tuition පන්තියෙන් කර ගන්න පුළුවන් වැඩක් නොවෙයි. දැනුම තිබෙන අය හදන්න පුළුවන් වුණාට, කට පාඩම් කරන්න පුළුවන් අය හදන්න පුළුවන් වුණාට, පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයට දෙක වසරේ ඉඳලා tuition දීලා ළමයාගේ මොළය අකුළා දමපු සමාජයක් තුළ අලුතින් හිතන්න පුළුවන්, ප්‍රායෝගික වශයෙන් අලුතින් වැඩ කරන්න පුළුවන් මිනිසුන් හදා ගන්න පුළුවන් විධියට හරියටම යොමු වුණු පාඨමාලාවක් අපි පටන් ගෙන තිබෙනවා. ඒ නිසා tuition පැත්තෙන් ගිහින් දරුවන්ට මේකෙන් ගොඩ එන්න ලැබෙන්නේ නැහැ. මේක ඉතා නිවැරැදිව සැලසුම් කරලා, නිවැරැදි අනාගතයක් කරා මේ දරුවන් ගෙන යන්න පුළුවන් වන විධියට ලොකු විශ්වාසයකින් යුක්තව පටන් ගත්තු වැඩක්. ගුරුවරුන් පුහුණු කළාද කියා තමුන්නාන්සේලා ඇහුවා. මේ වනකොට අපි 320ක් පුහුණු කරලා ඉවරයි. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් කළ ඒ හැම පුහුණු පාඨමාලාවකටම ගිහින් මමත් පැයක් කථා කළා. ඒ අය මේ අංශයේ විශේෂඥයෝ. ඒ අය තමයි මුලින් යන්නේ.

ඊට අමතරව මා කිව්වා, මේ විධියට නැතුව 2005 ඉඳලා තාක්ෂණ විෂයයන් කලා විෂයයන්වලට එල්ලලා තිබුණාය කියා. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. හැබැයි ඒවාට උගන්වපු ගුරුවරුන් 1,000කට කිට්ටු ප්‍රමාණයක් මේ පද්ධතිය තුළ අද නිකරුණේ ඉන්නවා. අපි ඒ අය ගෙන්වලා ඒ අයව පුහුණු කරන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි, කෘෂිකර්මය පිළිබඳ උපාධි තිබෙන අය, ජීව විද්‍යාව පිළිබඳ උපාධි තිබෙන අය මේ කාර්යය ඉතා උනන්දුවෙන් භාර ගත්තා. අපි එවැනි අය 350ක් ගෙන්නුවා. අද පාසල්වලින් එවැනි ගුරුවරු ඇවිල්ලා ඉල්ලනවා, මේ පාඨමාලාව අපට දෙන්නය; මේ පුහුණු වීම් හරහා අපට මේක කරන්න දෙන්නය; මේක තමයි අපි අධ්‍යාපනයෙන් බලාපොරොත්තු වුණු දේ කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
එම නිසා අපි දැඩි ලෙස විශ්වාස කරනවා, ඉතා හොඳින්, කැප වීමෙන් වැඩ කරන්න පුළුවන් ගුරුවරුන් සමූහයක් මේ සඳහා අපට නිර්මාණය කර ගන්න පුළුවන්ය කියා. ඒ පුහුණු වීම් දැන් ආරම්භ කරලා තිබෙනවා. මේ වනකොට විෂය නිර්දේශ හදලා ඉවරයි. ඒ විෂය නිර්දේශ මෙතැන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ගුරු අත් පොත්වල මූලික කොටස් හදා දැනටමත් පාසල්වලට බෙදා දීලා ඉවරයි. පිටුපසින් ඉඳ ගෙන අපි මේ සියලු කටයුතු නියාමනය කරනවා; අධීක්ෂණය කරනවා. විපක්ෂය වෙනුවෙන් කථා කරපු සියලු මන්ත්‍රීවරුන්ට අපි ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

එතුමන්ලා ඉතාම ධනාත්මකව කථා කෙරුවා. යම් විවේචන තිබුණත් ඒවා සාධාරණයි කියලා මා හිතනවා. ඒවා අපේ ඇස් අවදි කරන, අපේ ධෛර්ය ඉස්මතු කරන, අප විසින් කළ ඉටු යුතු මේ ජාතික ක්‍රියාවලියේ වගකීම පිළිබඳව අපට තව තවත් පාඩම් කියා දෙනවා ඇති. ඒ නිසා මා ඔවුන්ට ඉතා ගෞරවයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ කලා විෂය හදාරන උසස් පෙළ දරුවන් ප්‍රමාණය සියයට 52යි. අනෙක් අතට විශ්වවිද්‍යාලවල සිටින ප්‍රමාණය සියයට 36ක්. විශ්වවිද්‍යාලවල ඉන්න විසිතුන්දහසක් දරුවන්ගෙන් අටදහසකට ආසන්න ප්‍රමාණයක් හදාරන්නේ කලා උපාධිය. කලා විෂයන් හොඳයි; කලා ක්ෂේත්‍රය හොඳයි. හැබැයි එයින් බිහි වන මෙච්චර උපාධිධාරීන් සංඛ්‍යාවක් අපේ රටට අවශ්‍ය නැහැ. ඉල්ලුමක් නැහැ; ඔවුන් රැකියාගත කරන්න බැහැ. ඒ නිසා මේ සමස්ත ක්‍රියාවලියේදී මේ විෂය මාලාවට දරුවන්ට අවතීර්ණ වෙන්න හොඳ ප්‍රවර්ධනයක් ඕනෑ. දරුවන් මේක දැන ගන්න ඕනෑ. ඒ නිසා අපි විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, තමුන්ගේ ගම් නියම්ගම්වල, තමුන්ගේ පළාත්වල, තමුන්ගේ කොට්ඨාසයේ දරුවන් මේ ගැන දැනුවත් කරන්නය කියලා. අද මේකට අපි තෝරා ගන්නේ ගණිතය පිළිබඳ විශේෂඥයෝම නොවෙයි. මේකට අපි තෝරා ගන්නේ විද්‍යාව පිළිබඳ විශේෂඥයෝම නොවෙයි. ගණිතයෙන් අවම සුදුසුකම තිබෙන, එහෙම නැත්නම් ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්, විද්‍යාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතිව සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා තිබුණොත් මේ විෂය මාලාව හදාරන්න පුළුවන්. මොකද, උසස් පෙළදී ඔවුන් ගණිතයෙන් හා විද්‍යාවෙන් තවදුරටත් පෝෂණය කරන නිසා ඔවුන්ට ඒ අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ඉතා නිවැරදිව සැලසුම් කර, දුරදක්නා නුවණින් යුක්තව ස්ථාපනය කරන ලද ඉතා ස්ථාවර පාඨමාලාවක් වෙන බව සඳහන් කරමින් මේ සඳහා උර දුන් අපේ ප්‍රධාන අමාත්‍යවරු තිදෙනා ඇතුළු ඒ දුක් විඳපු සියලු දෙනාට මේ අවස්ථාවේදී මගේ ගෞරවය හා ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ජීවිත කාලය තුළ මා වැඩියෙන්ම සතුටු වන දවස වෙන්නේ ලබන සඳුදා දින. එනම්, 15වැනිදා. මොකද, මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට දරුවන්ට නිපුණතාව ලබා දෙන තාක්ෂණික විෂය ධාරාව ජාතික පාසල් පද්ධතියට හඳුන්වා දීලා ඉගැන්වීමේ ක්‍රියාවලිය ආරම්භ වන දිනය එය වන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනයේ නිර්ව්‍යාජ දරුවකු ලෙසත්, මේ රටේ අධ්‍යාපනය ලබන උසස් පෙළ අවධියේ තුන්ලක්ෂයකට ආසන්න දරුවන් ප්‍රමාණයකට වඩා හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා උගුරට ලේ රස දැනෙනතුරුත්, මෙස් බැනියමට දාඩිය උරනතුරුත් පංචස්කන්ධයෙන් මහන්සි වුණ කෙනකු ලෙසත් නිදහස් අධ්‍යාපනයේ ණයෙන් කොටසක් මේ රටේ උප නූපන් පරම්පරාවලට ගෙවන්න පුළුවන්කම මේ පිංකම තුළින් මට ලැබෙනවා කියා මා හෘදයාංගමව විශ්වාස කරනවා. ඒ අවස්ථාව මටවත්, මේ සඳහා ඉතාම විශාල දායකත්වයක් සැපයූ අපේ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාටවත්, අපේ ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාටවත්, මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාටවත්

ලැබෙන්නේ නැහැ, අපේ රටේ රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නොවුණා නම්. මගේ පෞද්ගලික, අවංක විශ්වාසයේ හැටියට අපි කාටවත් සසර වසනා තාක් කල් අධ්‍යාපනයේ මෙවැනි වෙනසක් කරන්න හම්බ වෙන්නේ නැහැ, රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවුණා නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස් අධ්‍යාපනය මේ රටට හඳුන්වා දුන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී සඳහන් කළා, නිදහස් අධ්‍යාපන පනත මහින් අධ්‍යාපනය දුප්පතුන්ගේ නිත්‍ය උරුමයක් බවට පත් කරනවා කියලා. ඒ අවස්ථාවේදී කන්නන්ගර චින්තනයේ කිසි විටෙක තිබුණේ නැහැ, විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයකින් සහතික පතක් දීලා දරුවකු සමාජගත කරන්න.

එතුමා මධ්‍ය විද්‍යාල 54ක් පිහිටෙව්වා. එස්.බී. දිසානායක ඇමතිතුමා බිහි වුණ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලය, පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිතුමිය බිහි වුණ ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලය, විමල් වීරවංශ ඇමතිතුමා බිහි කරපු තිස්ස මධ්‍ය මහා විද්‍යාලය, ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා බිහි කරපු හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය, චම්පික රණවක ඇමතිතුමා බිහි කරපු හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය යනාදී වශයෙන් මට ලැයිස්තුවක් කියන්න පුළුවන්. මෙවැනි දරු පරපුරක් මධ්‍ය විද්‍යාලවලින් බිහි කළා. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ තමයි මා අධ්‍යාපනය ලැබුවේ. එතුමා අපේක්ෂා කළේ ගුණ, නැණ, බල, සුව සපිරි විශ්වයටම සම්පතක් විය හැකි දරුවන් බිහි කිරීම සඳහා වැඩ ලෝකයට සරිලන නිපුණතාව සහිත දරුවෙකු සමාජගත කරන්නයි. පැරණි මධ්‍ය විද්‍යාල ගැන දන්න සියලු දෙනා දන්නවා, කන්නන්ගර චින්තනය තිබුණු පාසල් තුළ විද්‍යා, වාණිජ, කලා අංශ එක්ක වඩු වැඩ, මැටි වැඩ, ලෝහ වැඩ, යකඩ වැඩ, මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව, ඉලෙක්ට්‍රෝනික් වැඩ, විදුලි වැඩ කියන මේ සියල්ල තිබුණු බව. එපමණක් නොව, ඒ සඳහා අවශ්‍ය ගුරුවරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් බඳවා ගනු ලැබුවා. නමුත් අවාසනාවකට නිදහස් අධ්‍යාපනයේ මූලික චින්තනය මේ බ්‍රිතාන්‍ය අනුකරණවාදී මානසිකත්වයෙන් යුතු අය විසින් මරා දැම්මා. එය නැවත වතාවක් නිදහසින් පස්සේ පණ ගැන්වීම සඳහා උත්සාහයක් දැරුවා. 1970 ගණන්වලදී ආචාර්ය අල්හාජ් බදිඋද්දීන් මහ්මුද් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් සිටියදී HNCE කියන විභාග ක්‍රමය යටතේ ප්‍රාග් වෘත්තීය අධ්‍යාපනය රටේ ක්‍රියාත්මක වුණා. කන්නන්ගර චින්තනය යළි උපද්දවීම සඳහා යම් කිසි උත්සාහයක් දරනු ලැබුවා. නමුත් 1977 දී විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය අතිගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් රටට හඳුන්වා දෙන අවස්ථාවේදී දේශපාලන තීන්දුවක් ගත්තා, මේ තිබුණ සම්පූර්ණ විභාග ක්‍රමය වෙනස් කරලා නැවත වතාවක් London GCE (O/L), London GCE (A/L)වලට සමාන්තරව අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග දෙක නැවත ඇති කරන්න ඕනෑය කියලා. එය සම්පූර්ණ දේශපාලන තීන්දුවක්. මේ තීන්දුවෙන් පසුව අප බලාපොරොත්තු වුණේ කුමන හෝ ආකාරයකින් දරුවා විභාගවලින් සමත් කරවීම පමණයි. ඒ නිසා සමස්ත ලංකාවේ දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ ජීවිත, ආකල්ප, සිතුම් පැතුම්, ජන වහර, ධර්මතා සියල්ල විභාග තුනකට සීමා වුණා. සමහර දෙමව්පියන්ට පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග ත්‍රිවිධ රත්නය වාගේ. තුන්තරා බෝධිය වාගේ පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ)විභාග. ත්‍රෛලෝක්‍යොකතිලක වාගේ වුණා පෙළක් අයට, පහේ ශිෂ්‍යත්වය, අපොස (සා.පෙ) හා අපොස (උ.පෙ) විභාග.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 17ක් එක්සත් ජාතික පක්ෂය විසින් විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියා මාර්ග අනුගමනය කළත්, 1995 වන විට අපොස (සා.පෙ) විභාගයට වාඩි වුණු දරුවන්ගෙන් සියයට 15.9 අපොස (සා.පෙ) විභාගය සමත් වුණේ. විභාග දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව සියලුම අවුරුදුවල සියයට 20ක්වත් අපොස (සා.පෙ) විභාගය සමත් වෙන්නේ නැහැ. දරුවෝ සියයක් අපොස (සා.පෙ) විභාගයට ගිහිල්ලා, 15 දෙනෙකු, 16 දෙනෙකු, 20 දෙනෙකු විභාගය සමත් වුණත්, සියයට 80කට අපොස සාමාන්‍ය පෙළවත් නැති, යන එන මං නැති, කිසිදු නිපුණතාවක් නැති දරුවෝ පිරිසක් වශයෙන් සමාජගත වනවා. ඔවුන් ජීවිතය අපේක්ෂා කරන හදු යෞවනයේ පොපියන චමත්කාරය සහිත අවුරුදු 15,18, 20ක් වැයසැති දරුවෝ. ඔවුන්ට ඔවුන්ගේ කියන ජීවිතයක් ගොඩ නහා ගන්න ඕනෑ. රක්ෂාවක්; ජීවනෝපායක් හොයා ගන්න ඕනෑ. විවාහයක් වෙන්න ඕනෑ. කුටුම්භයක් ඇති වෙන්න ඕනෑ. ජීවිතය හොයා ගෙන ඔවුන් ගියා. ඔවුන්ට ජීවිතය මුණ ගැහුණේ නැහැ. මේ පිළිබඳ විශාල සමාජ කතිකාවතක් අප කුඩා කාලයේ ඉඳලා ඇති වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මතකයි, මා පුංචිම අවධියේ චිත්‍රපටයක් බැලුවා. ඒ මා චිත්‍රපට නිෂ්පාදකයෙක් වෙන්න කලින්. මගේ මතකයේ හැටියට ඒ චිත්‍රපටයේ නම "වල්මත් වූවෝ".

මගේ මතකය නිවැරැදි නම් ඒ චිත්‍රපටියෙන් කිව්වේ මෙවැනි කථාවක්. ඇත ගම්මානවල දෙමව්පියෝ දහසකුත් එකක් බලාපොරොත්තු යටතේ තමන්ගේ ඉඩම් උකස් කරලා දරුවෝ විශ්වවිද්‍යාලයට යවනවා. මේ කථාවේ තරුණයෝ තුන් දෙනෙක් කලා උපාධිය ලබා ගෙන විශ්වවිද්‍යාලයෙන් පිට වුණා. සිරිල් චිත්‍රමගේ කියන ප්‍රතිභා පූර්ණ නළුවා තමයි එම චිත්‍රපටියේ ප්‍රධාන චරිතය සඳහා රංගනය ඉදිරිපත් කළේ. තාත්තා උකස් කරපු ගේ දොර සින්න වන්නය යන අවස්ථාවේදී රක්ෂාවකුත් නැතිව අනෙක් බලාපොරොත්තු සියල්ලම සුන් කර ගෙන මේ තමුන්ට උගන්වන්න උකස් කරපු නිවස තිබෙන ඉඩමේ ඔප්පුව බේරා ගැනීම සඳහා උකස්හිමියා වන මුදලාලි ළඟට ඔහු ගියා. ඒ අවස්ථාවේදී ඇති වූ අරගළයකදී පිහි ඇනුමක් වෙලා එකී ඔප්පු හිමියා මිය යාමේ බෙදවාචකය තමයි එම චිත්‍රපටියෙන් කිව්වේ.

ඒ කාලයේ ඇති වුණේ වල්මත් වන අධ්‍යාපනයක්. ඒ වල්මත් වූ අධ්‍යාපනය තුළින් අපි කැමැති වුණත්, අකමැති වුණත් මේ රටේ ඉතිහාසය ලියලා තිබෙන්නේ ලේ වලින්. පුරා දශක තුනක් යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, සංස්කෘතික අපගමනය, සදාචාරාත්මක පිරිහීම, මනුස්සකමේ දරුණු නාය යාම, දුක වේදනාව, මර ළතෝනිය කියන ඒ සියල්ල අප විඳ්දා. එයට වග උත්තරකරුවෙකු බවට පත් වුණා අධ්‍යාපනය. අද වන විට එදා වාගේ අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වන්නේ සියයට 15ක්, 16ක් නොවෙයි. අපි ඇති කරනු ලැබුවා වූ අධ්‍යාපනයේ ගුණාත්මක වෙනස්කම් රාශිය නිසා විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය වුණත් මේ වන විට සාමාන්‍ය පෙළ විභාගයෙන් සියයට 65ක් සමත් වනවා. සියයට 65ක් අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වන කොට 118,000ක් ගණිතය අසමත් වනවා. 85,000ක් විද්‍යාව අසමත් වනවා. විෂයයන් නවයම අසමත් 11,100ක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ අපේ රටේ උසස් පෙළට තේරී සිටින දරුවෝ ටිකෙනුත් ගිය වර්ෂයේදී විද්‍යා අංශයෙන් උසස් පෙළ අධ්‍යාපනය ලැබුවේ දරුවෝ 103,000යි. මේ රටේ Point Pedro සිට දෙවුන්දර තුඩුවට යනකම් වෛද්‍යවරුන්, ඉන්ජිනේරුවන්, විද්‍යාඥයින්, ගණිතඥයින්, නව නිපැයුම්කරුවන්, පර්යේෂකයින්, විද්‍යාත්මක චින්තනයක් ඇති අය බිහි වීම සඳහා අධ්‍යාපනය ලැබුවේ 103,000යි. ජීවනෝපාය වශයෙන් වාණිජ අංශයේ, සේවා අංශයේ රැකියා අවස්ථා බහුලව තිබෙනවා. බැංකු, රක්ෂණ, ප්‍රවාහන, ගබඩාකරණය, සන්නිවේදනය, සංචාරක, අළෙවිකරණය, කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලැබුවේ 122,000යි. ගිය අවුරුද්දේත් අපොස උසස් පෙළ විභාගයට කලා අංශයෙන් 235,000ක් පෙනී සිටියා. මේ 235,000ක් වන මනුෂ්‍ය ජීවිත ප්‍රමාණය ගැන මේ පාර්ලිමේන්තුව ප්‍රශ්න කළේ නැහැ. සියයට 6ක් සියයට 10ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා කියන කිසි කෙනෙක් මේ මුදල වෙන් කරන්නේ කුමන මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා ද කියලා ප්‍රශ්න කළේ නැහැ.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ 235,000ක දරුවන්ගෙන් කලා උපාධිය හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයට යන්නේ 8,000යි. අපි ඒ 8,000 ප්‍රමාණය 10,000 දක්වා වැඩි කළත් සෑම වර්ෂයකදීම 225,000ක් කලා අංශයෙන් ඉගෙනුම ලබා සමාජගත වනවා. ඒ දරුවෝ ඉගෙන ගෙන තිබෙන විෂයයන් මොනවාද? පෙරදිග සංගීතය, සිංහල භාෂාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, ඉතිහාසය. සියලු සම්පත් දීලා අවුරුදු දෙකක් මේ දරුවෝ ඉගෙන ගන්නේ මේ ටිකයි. අවුරුදු දෙකක් ඉතිහාසය ඉගෙන ගෙන ඊට පස්සේ කලා උපාධිය ගන්න විශ්වවිද්‍යාලයට යන්නේ නැහැ. මොකක්ද රක්ෂාව? පෙරදිග සංගීතය ඉගෙන ගෙන විශ්වවිද්‍යාලයට ගියේ නැහැ. මොකක්ද රක්ෂාව? දේශපාලන විද්‍යාවත් එහෙමයි. අඩු තරමෙන් දේශපාලන විද්‍යාව ප්‍රගුණ කරපු කී දෙනෙක් මේ උත්තරීතර සභාවේ සාමාජිකයෝ ලෙස ඉන්නවාද? එහෙමත් නැහැ. ඒ විෂයයන් වැදගත්. යම් කිසි පිරිසක් ඒ විෂයයන් අත්‍යවශ්‍යයෙන් හැදෑරිය යුතු වනවා. නමුත් එදා වල්මත්වූවන්ට වාගේම; කලා උපාධිය ලබා ගත් 8,000ක පිරිස උපාධි සහතිකය අරගෙන බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලාවෙන් එළියට එනකොට ඉස්සරහා ගේට්ටුව ළඟ වෙනම සංවිධානාත්මක දේශපාලන පිරිසක් ඉන්නවා, රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමයේ පෝරමය අතට දෙන්න.

එදා ඉඳන් දියවු දියවු රක්ෂා දියවු! කඩවු කඩවු දේපළ කඩවු! මරවු මරවු මිනිස්සු මරවු! කියන එකෙන් තමයි අපේ රටේ අපේක්ෂා භංග වෙච්ච, ජීවිතය නැති වෙච්ච, අධ්‍යාපනයෙන් ජීවිතය නුදුන්නු පරම්පරාව ඉතිහාසයේ සනිටුහන් කරලා තිබෙන්නේ. ඒක ජපානයට වුණේ නැහැ. ඒක චීනයට වුණේ නැහැ. ඒක දකුණු කොරියාවට වුණේ නැහැ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ තත්ත්වය නිවැරදිව හඳුනා ගත්තා. දේශපාලනඥයකු ලෙස එතුමා මේ ප්‍රායෝගික අත් දැකීම ලැබුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයන් වූ අපි කාගේත් හෘදය සාක්ෂිය ඒක දන්නවා. ඉරිදා සෙනසුරාදා දවස්වලට අම්මලා දරුවෝ අරගෙන අප හමු වන්නට එන්නේ මොනවා කියලාද? පසු ගිය සුමානයේ මගේ ළඟට ආවා පෙරදිග සංගීතය "ඒ" සාමාර්ථය ලබා ගත් දරුවෙක්. විභාගයකට මහන්සි වෙලා දරුවකුට "ඒ" සාමාර්ථයට වඩා ඉහළ සාමාර්ථයක් ගන්න බැහැ. ඒ දරුවාට සිංහල භාෂාවට "ඒ" සාමාර්ථයක් තිබෙනවා. විභාගයකට මහන්සි වෙලා දරුවකුට ඊට වඩා සාමාර්ථයක් ගන්න බැහැ. ඊළඟට ඉතිහාසයට "ඒ" සාමාර්ථයක්. "ඒ" සාමාර්ථ තුනයි. ඉල්ලා සිටියේ පාසල් කම්කරු රක්ෂාවක් දෙන්න කියා. වෙන රක්ෂාවක් ඉල්ලුවේ නැහැ. මම මොනරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේට විද්‍යාලයට ගියා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය විවෘත කරන්න. එහිදී දැරියක් මට ලිපියක් ඉදිරිපත් කළා. සුමේධා ජයසේන ඇමතිතුමිය සාක්ෂි දරයි, මම ඒ ලිපිය සභාවට කියෙව්වා. ඒ ලිපිය දුන්නු තරුණිය එතැන හිටියා. මේ ලිපියේ තිබුණු හැටියට ඒ තරුණිය පෙරදිග සංගීතයට "ඒ" සාමාර්ථයක්, සිංහල භාෂාවට "ඒ" සාමාර්ථයක්, භූගෝල විද්‍යාවට "සී" සාමාර්ථයක් ලබා ගෙන තිබෙනවා. Z-score ලකුණු ගණන තිබුණා. සමස්ත ලංකා නර්තන තරගාවලියෙන් පළමුවැනියා වෙලා තිබෙනවා. දහම් පාසල් තරගවලින් පළමුවැනියා වෙලා තිබෙනවා. එම ලිපියේ සඳහන් කර තිබුණේ ඇයට කුමන හෝ රැකියාවක් දෙන්න කියලායි. ඒ තරුණිය ඇතිමලේ. මේ රටේ ලක්ෂ ගණන් දරුවන්ගේ ජීවිතය පිළිබඳ කථාවයි මේ කිව්වේ. පළමුවන ශ්‍රේණියේ සිට ඉගෙන ගෙන පහේ ශිෂ්‍යත්වය කරලා අපොස සාමාන්‍ය පෙළ කරලා අපොස උසස් පෙළ කරලා, හැම අවුරුද්දේම 225,000 බැගින් පසු ගිය අවුරුදු 20ට වල්මත් වූ, අතරමං වූ, ජීවිතය නොදුන්නු අධ්‍යාපනය මහින් ලක්ෂ 25ක් මනුෂ්‍ය ජීවිත එළියට දමා තිබෙනවා. මේ සඳහා යම් කිසි වෙනසක් ඇති කරන්න ප්‍රබුද්ධ සංවාදයක් මේ රටේ ඇති වුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා අපිට කථා කරලා කිව්වා, නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස මේ රටේ දරු පරම්පරාව වෙනුවෙන් ඔවුන්ට ජීවිතය දෙන, නිපුණතාවය දෙන අධ්‍යාපනයක් ලබා දෙන්න කියා. ඒක මුළු ලෝකයම පිළිගන්නා සත්‍යයක්.

2012 ගෝලීය නියාමන වාර්තාවේ - EFA Global Monitoring Report -2012 එකේ - නිර්දේශ මම ඔබතුමාට කියවන්න කැමැතියි. එහි මෙන්න මේ විධියට සඳහන් වෙනවා:

> "සියලුම යෞවන යෞවනියන්ට සිය දියුණුව සලසා ගැනීම උදෙසා කුසලතාවල අවශ්‍යතාව මෙම **සියල්ලන්ට අධ්‍යාපනය ගෝලීය නියාමන වාර්තාවෙහි** දස වන මුද්‍රණයෙන් පෙන්වා දෙයි. වාර්තාව හෙළි කරන අන්දමට, තමන්ට අවශ්‍ය කුසලතා නොමැතිව පාසලින් බැහැර වන මිලියන 200 පමණ තරුණ පරපුරක් ලොව පුරා විසිර සිටිති. නාගරික දිළිඳු ප්‍රජාවන්හි හෝ දුර බැහැර ග්‍රාමීය ප්‍රජාවන්හි ජීවත්වන සහ විශේෂයෙන් තරුණ කතුන් බොහෝ දෙනා රැකියා විරහිතව හෝ අඩු වැටුපට වැඩ කරමින් ගත කරති. සිය විභවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මොවුනට දෙවන අවස්ථාවක් දීම අවශ්‍යය.
>
> විශ්වාසයෙන් යුතුව වැඩ ලෝකය වෙත පිය නැගීමට හැකියාව මහින් තරුණ පිරිසට වඩාත් හොඳ ජීවන තත්ත්වයක් රජය විසින් ලබා දිය හැකි ආකාරය **යෞවන පිරිස සහ කුසලතා අධ්‍යාපනය වැඩට යෙදවීම** කෘතියෙන් පෙන්වා දෙයි. අලුතින් සම්පත් රැස් කිරීම සහ ඒවා වඩාත් කාර්යක්ෂම ලෙස යොදා ගත හැකි ආකාරය පිළිබඳව රජයන්, ආධාර ආයතනවල සහ පුද්ගලික අංශයෙහි භූමිකාව හුවා දක්වමින් සියල්ලන්ට අධ්‍යාපනය ලබා දීමේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මූල්‍ය ආධාරවල වර්තමාන තත්ත්වය එම කෘතිය තුළ හඳුනාගෙන ඇත.
>
> රටවල් සහ පාලිත ප්‍රදේශයන් 200කට වඩා සියල්ලන්ට අධ්‍යාපනය ලබාදීමේ ඉලක්ක භය ළඟා වන අයුරු මෙම වාර්තාවෙන් නියාමනය වන්නේය. 2015 වන විට එම ඉලක්කයන් වෙත අවසාන වශයෙන් ළඟාවීමට ලඟි ලඟියේ කටයුතු කිරීමත් නොවුණහොත් ප්‍රගතිය නැවතීමට ඉඩ තිබෙන බව එය පෙන්වා දෙයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙවර ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ නිපුණතා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳ ඉතා පැහැදිලි විශේෂ සටහනක් ඇතුළත් වී තිබෙනවා. එම විශේෂ සටහන හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමේ සියලු භිය සැක අහිමි වන, මේ වැඩ පිළිවෙළ පිළිබඳ විස්තරාත්මක හා සංක්ෂිප්ත විස්තරයක් සඳහන් වන සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම ප්‍රකාශිත අධ්‍යාපන අමාත්‍යාංශයේ "අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම" නමැති කෘතියත් එහි තිබෙන ජාතික වැදගත්කම සලකා හැන්සාඩ් වාර්තාවේ කොටසක් ලෙස මුද්‍රණය කිරීම පිණිස මම **සභාගත*** කරනවා.

අතිගරු ජනාධිපතිතුමා නිදහස් අධ්‍යාපනයේ දරුවෝ ලෙස අපට මේ වගකීම භාර දුන්නාට පස්සේ ජාතික අධ්‍යාපන කොමිසම, ජාතික අධ්‍යාපන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය තීන්දුවකට ඇවිල්ලා, ලිඛිත ගිවිසුම් අත්සන් කරලා තමයි අපි මේ තාක්ෂණික විෂය ධාරාවේ විෂයයන් හඳුනා ගත්තේ. එහිදී අපි මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුත් කණ්ඩායම රැස් වෙලා ප්‍රථමයෙන්ම වැඩ ලෝකයට මේ විෂය තුළ වඩාම ඵලදායී තාක්ෂණවේදී දරුවෙක් නිර්මාණය කරන්න

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

අවශ්‍ය වන විෂයයන් තුනක් අලුතින් හඳුන්වලා දුන්නා. ඉංජිනේරු තාක්ෂණයට, සිවිල් ඉංජිනේරු -ඉදි කිරීම් අංශය හා සම්බන්ධිත- යාන්ත්‍රික ඉංජිනේරු -ලොරි, බස්, කාර්, වෙනත් යන්ත්‍ර සූත්‍ර උපකරණ පිළිබඳව- පිළිබඳ පුහුණුව අයත් වනවා. ඊට පස්සේ විදුලි ඉංජිනේරු. මේක ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ විෂයයක්. එහෙම නැත්නම් ජෛව පද්ධති තාක්ෂණය. කෘෂි කර්මය, පසු අස්වනු තාක්ෂණය, ගොවිපළ කළමනාකරණය, ආහාර තාක්ෂණය, කෘෂි නිෂ්පාදනවල අගය ඉහළ නැංවීම- පිළිබඳ විෂයයක්. ඊළඟට තාක්ෂණය සඳහා විද්‍යාව - Science for Technology - ඉතිරි විෂයය වෙන්නේ කලා හෝ වාණිජ අංශවල තිබෙන විෂයයක්. ගෘහ ආර්ථික විද්‍යාව වෙන්න පුළුවන්, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, මාධ්‍ය අධ්‍යයනය, ගණකාධිකරණය, චිත්‍ර කර්මය වෙන්න පුළුවන්, එවැනි විෂයයක් තෝරා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ගුරුවරුන්ගේ හිඟය පිළිබඳව කථා කළා. තුන්වැනි විෂයය සඳහා කිසිම ගුරුවරයෙකුගේ හිඟයක් නැහැ. දැනට කලා හා වාණිජ අංශවල ඉගෙනුම ලබන උපාධිධාරී ගුරුවරුන්ට එම විෂයය උගන්වන්න පුළුවන්. දෙවැනි විෂයය සඳහා ගුරුවරුන්ගේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මක් නිසාද යත්, විද්‍යා උපාධිධාරීන්ට විද්‍යාව විෂයය සඳහා තාක්ෂණය විෂය නිර්දේශයේ තිබෙන මූලධර්ම ටික උගන්වන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය සියලුම හිඟ ගුරුවරු බඳවා ගැනීම සඳහා 6වැනි දා 22,000ක් උපාධිධාරීන් සහභාගී වුණු විභාගය පවත්වලා තිබෙනවා. මේ නිවාඩු මාසය අවසන් වෙන්න කලින් අ.පොෂ.ස. (උ.පෙළ) පන්තිවල වාණිජ, විද්‍යා, තාක්ෂණික අංශයේ ගුරු හිඟය පියවන්න අවශ්‍ය කටයුතු යොදලා තිබෙනවා. අපි ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා කැබිනට් අනුමැතිය ඇතිව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පුහුණුව ලත් උපදේශකවරුන්ට මසකට රුපියල් 10,000ක ගමන් වියදමක් යටතේ ඔවුන්ගේ සේවය ලබා ගන්න පුහුණු කිරීමේ කටයුතු කරලා ඒ අය ලබා දීලා තිබෙනවා. එතකොට අස් වීමේ සහතිකය දීලා එළියට දාන දරුවෝ වෙනුවට ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ විෂය ඉගෙන ගන්නා සියලුම දරුවන්ට මෙම විභාගය සමත් වුණත්, නූනත් නිපුණතා සහතිකයක් ලැබෙන NVQ 3 ලැබෙනවා. ඒ නිසා ප්‍රථම වතාවට අපේ රටේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා සහතිකයක් පාසල් දරුවන්ට පාසල් කාලය අවසානයේ ලබා දීමේ ඓතිහාසික වැදගත් කාර්ය භාරය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ඉෂ්ට කරලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම පාඨමාලාව ඉතාම සාර්ථක ලෙස නිම කරන දරුවන්ට විශ්වවිද්‍යාලය තුළ දැනට පවතින වෘත්තීය අංශයේ පාඨමාලා 40ක තිබෙන උපාධිය ලබා ගැනීම සඳහා අවස්ථාව තිබෙනවා. ඊට අතිරේකව අද ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ලිඛිතව අපට පොරොන්දු වෙලා තිබෙනවා, 2016 වෙන කොට ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ විද්‍යා අංශය, - Science Faculty එක- විද්‍යා හා තාක්ෂණික අංශය - Science and Technology Faculty - බවට පරිවර්තනය කරන බව. අපේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පමණක් අලුතින්ම තාක්ෂණ පීඨයක් පටන් ගන්නවා. ඒ තාක්ෂණ පීඨයට පමණක් B.Tech - Bachelor of Technology - උපාධිය සඳහා 450ක් බඳවා ගන්නවා.

2016 දී මේ පාඨමාලාව හදාරන්න දළ වශයෙන් දරුවන් 2,000කට පමණ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළු වීමේ අවස්ථාව තිබෙනවා. ඊට පස්සේ විශ්වවිද්‍යාල විද්‍යාතනවල තව දරුවන් 7,500කට අවස්ථාව තිබෙනවා. German Technical Training Institute, UNIVOTEC ආදී වෙනත් උසස් තාක්ෂණික ආයතනවලට ඇතුළු වීමේ අවස්ථාව තිබෙනවා. මීට වඩා ජීවිතය පිළිබඳ අවස්ථාවන් තිබෙන විෂය ධාරාවක්ද අපි මේ දරුවන්ට ලබා දෙන්නේ කියන ප්‍රශ්නයයි ඔබ විසින් ප්‍රශ්න කළ යුතුව තිබුණේ. අධ්‍යාපනයට කරන වියදම වැඩි කරලා, කිසිම ඵලදායී නිෂ්පාදනයකට එකතු වන්නේ නැති, නිකම්ම නිකම් දරුවෝ බිහි කරනවා වෙනුවට හිතනවාට වඩා වැඩිපුර යමක් හිතන්න පුළුවන්, පෙනෙනවාට වඩා වැඩිපුර යමක් දකින්නට පුළුවන්, ඇසෙනවාට වඩා වැඩිපුර යමක් අහලා මේ ලෝකයට අලුත් අගයක් එකතු කරන්නට පුළුවන් මානව ප්‍රාග්ධනයක් බවට මේ දරුවෝ පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාව කිසිම ගෘහ සේවිකාවක් පිට රටට යවන්නේ නැහැ. ඇයි? ඔවුන්ට පුහුණු ශ්‍රමය තිබෙනවා. අද මේ පුහුණු ශ්‍රමය පිළිබඳව ඩලස් අලහප්පෙරුම ගරු ඇමතිතුමා සඳහන් කළ පරිදි, විශ්වය තුළ තිබෙන ඉල්ලුම සම්පූර්ණ කරන්නේ නැතුව ඉන්න අවධියක මේ තාක්ෂණික විෂය ධාරාව හදාරන සියලු දරුවන්ට අනාගතය හා ජීවිතය පිළිබඳව සහතිකයක් ලැබෙනවා. මෙපමණ කල් ලංකාවේ අධ්‍යාපනයෙන් දුන්නේ, සහතික තුනක්. නමුත් මේ තාක්ෂණවේදී විෂය ධාරාව මඟින් අපි දරුවන්ට ජීවිතය දෙනවා. ඒ නිසා දේශපාලන වශයෙන් කිසිම වාසියක් හෝ ප්‍රයෝජනයකට වඩා උපනූපන් පරම්පරාවල අනාගතය නිවැරදිව පෙළ ගස්වන්න අධ්‍යාපනයේ ඇති කළ දැවැන්තම හැරවුම ලෙසයි තාක්ෂණ විෂය ධාරාව මේ 15වැනි දා අපි ඉගැන්වීමට පටන් ගන්නේ කියන එක මා මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විනාඩි දෙකකින් අවසන් කරනවා.

හිරෝෂිමාවට බෝම්බ දාලා ජපානය විනාශ වුණු අවස්ථාවෙන් පසුව, අපිට නිදහස ලැබෙන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපානයේ ඒකපුද්ගල ආදායම අපට වඩා ඩොලර් 2කිනුයි වැඩිය තිබුණේ. ජපානය අධ්‍යාපන ක්‍රමය වෙනස් කළා. ඔවුන් පාඩම් තුනක් කියලා දුන්නා.

පළමුවන එක, උපන්න මිනිසෙකු ලෙස තමන් සියලුම මිනිසුන්ට ගරු කරන්න කියන එකයි. මිනිසුන්ට ආදරය කරන්න. පාසල් දරුවාට කියා දුන් පාඩම ඒකයි. අදත් ඕනෑම ජපන් ජාතිකයකු මිනිසෙකු දැක්කාම නැමිලා bow කරනවා. ඒ පළමුවැනි පාඩමයි. දෙවැනි පාඩම, සතා සිවුපාවා ඇතුළු පරිසරයට ආදරය කරන්න කියන එකයි. හරිත නගරයක් ඇති කරන්න. ඔවුන් ගස් සිටෙව්වා මිසක් ගස් කැපුවේ නැහැ. ඒ දරුවෝ සතා සිවුපාවාට හා ගහ කොළට ආදරය කළා. තුන්වන පාඩම පාසල් ශිෂ්‍යයන් පාසල තුළත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය තුළත්, ගොවීන් ගොවි පොළ තුළත්, කම්කරුවන් කම්හල තුළත් වැඩි වැඩියෙන් වැඩ කරන්නය කියන එකයි. ඒ පාඩම් තුන ඔවුන්ට කියා දුන්නා. මේ පාඩම් තුනෙන් ජපානය ආසියාවේ ආශ්චර්යය බවට පත් වෙලා ලෝකයේ මහා කාර්මික බලවතෙකු බවට පත් වුණා. චීනය, කොරියාව, තායිලන්තය හා සිංගප්පූරුව යන ඒ අවට සියලු රාජ්‍යයන්ට වුණෙත් එයයි. අපි පස්සට ගියා නම් ගියේ නිපුණතා රහිත අධ්‍යාපන ක්‍රමයක් දරුවන්ට ලබා දීමෙනුයි. ඒ නිසා මහින්ද චින්තන ඉදිරි දැක්මට පින් සිද්ධ වන්න අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ සඳහා උර දුන්නු, වචනයෙන් හෝ සහය දුන්න ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලු දෙනාම, සියලුම මිනිසුන්, දරුවන්ට ආදරය කරන අය කළේ මේ ලෝ වශයෙන් කීර්තියක්; පර ලෝ වශයෙන් පින්කමක්. ඒ පින්කම තුළින් මේ රටේ අනාගතයේ උපදින දරුවෝ විශ්වයට සම්පතක් වන, තමන් හැදූ වැඩූ දෙමව්පියන්ට ගෞරවයක් හා අභිමානයක් වන, රටටම වාසනාවක් වන මානව ප්‍රාග්ධනයක් බවට පත් කර ගන්න අපි එකතු වෙලා වැඩ කරමු කියන ප්‍රාර්ථනයෙන්, සැමට සුබ අනාගතයක් වේවා කියලා මගේ වචන කීපය අවසන් කරනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තබන ලද ලියවිලි:**
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :
Documents tabled:

Selected Schools for New Technological A/L Stream

Province	Selected Schools				
	National	Provincial	Sinhala	Tamil	Total
1.Western	24	26	49	01	50
2.Central	21	14	25	10	35
3.Southern	26	09	33	02	35
4.Nothern	06	12	01	17	18
5.Eastern	09	11	05	15	20
6.North Western	15	09	21	03	24
7.North Central	05	15	20	00	20
8.Uva	17	04	18	03	21
9.Sabaragamuwa	15	04	18	01	19
Total	**138**	**104**	**190**	**52**	**242**

Selected National Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Students	Medium
00023	KOTAHENA CENTRAL COLLEGE	MAHA VIDYALA MAHAWATHA,COLO	1.Western	Colombo	Colombo Central	771	Sin
00051	GOTHAMI B.V.	TEMPLE RD.,COL-10	1.Western	Colombo	Borella	3,144	Sin
00066	DEVI B.V.	SRI JAYAWARDANAPURA MW.,COL-	1.Western	Colombo	Colombo East	2,797	Sin
00078	LUMBINI V.	HAVELOCK TOWN,COL-05.	1.Western	Colombo	Colombo West	2,783	Sin
00131	KUDABUTHGAMUWA SRI RAJASINGHE V.	KUDABUTHGAMUWA, MULLERIYAW	1.Western	Colombo	Kolonnawa	1,098	Sin
00248	SRI SUBHUTHI M.M.V.	BATTARAMULLA	1.Western	Colombo	Kaduwela	1,250	Sin
00250	BOMIRIYA M.M.V.	KADUWELA	1.Western	Colombo	Kaduwela	3,201	Sin
00283	SEETAWKA M.M.V.	AVISSAWELLA	1.Western	Colombo	Awissawella	2,543	Sin
00316	RAJASINGHE CENTRAL COLLEGE	HANWELLA	1.Western	Colombo	Awissawella	2,658	Sin
00418	PILIYANDALA M.M.V.	PILIYANDALA	1.Western	Colombo	Kesbewa	3,376	Sin
00457	MAHINDA RAJAPAKSHA COLLEGE	PITIPANA, HOMAGAMA	1.Western	Colombo	Homagama	1,538	Sin
01028	D.S.SENANAYAKA	MIRIGAMA	1.Western	Gampaha	Mirigama	1,781	Sin
01083	BANDARANAYAKA M.M.V	VEYANGODA	1.Western	Gampaha	Mirigama	3,088	Sin
01136	BANDARANAYAKA COLLEGE	GAMPAHA	1.Western	Gampaha	Gampaha	4,510	Sin
01137	RATHNAWALI BALIKA V.	COLOMBO ROAD, GAMPAHA	1.Western	Gampaha	Gampaha	3,764	Sin
01228	SIYANE NATIONAL SCHOOL	PALUGAMA,DOMPE	1.Western	Gampaha	Dompe	537	Sin
01336	AL MUBARAK M.M.V.	MALWANA	1.Western	Gampaha	Biyagama	1,693	Tam
01379	SRI PANGNANDA NATIONAL SSHOOL	RADDOLUWA, KOTUGODA.	1.Western	Gampaha	Katana	2,014	Sin
01502	SENERATH PARANAVITHANA NATIONAL M.V	UDUGAMPOLA	1.Western	Gampaha	Minuwangoda	1,294	Sin
02003	ST JOHN'S M.V.	PANADURA	1.Western	Kalutara	Panadura	2,131	Sin
02083	TAXILA M. M. V.	AGURUWATHOTA ROAD , HORANA	1.Western	Kalutara	Horana	4,315	Sin
02133	BULATHSINGHALA M.M.V.	BULATHSINGHALA	1.Western	Kalutara	Bulathsinhala	2,709	Sin
02181	ANANDA SASTRALAYA	MATUGAMA	1.Western	Kalutara	Matugama	3,042	Sin
02282	BERUWALA D.S. SENANAYAKE M.M.V	BEUAWALA	1.Western	Kalutara	Beruwala	736	Sin
03011	K/HATARALIYADDA CENTRAL COLLEGE	HATARALIYADDA.	2.Central	Kandy	Galagedara	1,047	Sin
03048	ALAWATHUGODA C C	ALAWATHUGODA	2.Central	Kandy	Harispattuwa	775	Sin
03075	NUGAWELA CENTRAL COLLEGE	NUGAWELA CENTRAL COLLEGE NU	2.Central	Kandy	Harispattuwa	2,261	Sin
03169	RANASINGHE PREMADASA N.S	HASALAKA	2.Central	Kandy	Teldeniya	866	Sin
03184	K/TELDENIYA NATIONAL SCHOOL	TELDENIYA	2.Central	Kandy	Teldeniya	1,622	Sin
03263	MADINA MUS.C.C	MADAWALA BAZAAR	2.Central	Kandy	Pathadumbara	1,848	Tam
03382	PUSHPADANA GIRLS' COLLEGE	KANDY	2.Central	Kandy	Kandy	2,530	Sin
03406	SWARNAJOTHI NATIONAL SCHOOL	KIRIBATHKUMBURA	2.Central	Kandy	Yatinuwara	1,017	Sin
03441	D.B.WIJETHUNGA NATIONAL SCHOOL	DASKARA MURUTHAGAHAMULA	2.Central	Kandy	Udunuwara	688	Sin
03488	WICKRAMABAHU NATIONAL SCHOOL	GAMPOLA	2.Central	Kandy	Gampola	1,226	Sin
03553	ANURUDDHA KUMARA NATIONAL SCHOOL	NAWALAPITIYA	2.Central	Kandy	Nawalapitiya	856	Sin

Selected National Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Students	Medium
03617	HINDU NATIONAL COLLEGE	NUWARAELIYA ROAD,PUSSELLAWA	2.Central	Kandy	Gampola	989	Tam
03648	AL-MANAR CENTRAL COLLEGE	HANDESSA	2.Central	Kandy	Udunuwara	976	Tam
04003	RANGIRI DAMBULLA CENTRAL COLLEGE	DMBULLA	2.Central	Matale	Dambulla	2,544	Sin
04093	SRINAGA N.S.	NAULA	2.Central	Matale	Laggala	1,486	Sin
04175	ST THOMAS COLLEGE	MATALE	2.Central	Matale	Matale	2,453	Sin
04263	AJMEER NATIONAL SCHOOL	ELKADUWA ROAD UKUWELA	2.Central	Matale	Rattota	842	Tam
05001	GAMINI N.S	NUWARAELIYA	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	1,433	Sin
05071	CP/KOT/GAMINI DISSANAYAKE NATIONAL S	NEW TOWN, KOTHMALE	2.Central	Nuwara Eliya	Kotmale	1,152	Sin
05111	SRI SUMANGALA.N.S.	NILDANDAHINNA	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	1,190	Sin
05428	PORAMADULLA N S	PORAMADULLA, RIKILLAGASKADA	2.Central	Nuwara Eliya	Hanguranketa	3,083	Sin
06068	KARANDINIYA M.M.V.	KARANDENIYA	3.Southern	Galle	Karandeniya	3,088	Sin
06141	ANANDA M.M.V	ELPITIYA	3.Southern	Galle	Bentara-Elpitiy	2,754	Sin
06180	G/NELWA NATIONAL SCHOOL	NELUWA GALLE	3.Southern	Galle	Hiniduma	2,307	Sin
06218	G/NAGODA ROYAL COLLEGE	NAGODA,GALLE	3.Southern	Galle	Hiniduma	1,258	Sin
06317	SRI SUMANGALA M.V.	NALAGASDENIYA, HIKKADUWA	3.Southern	Galle	Rathgama	1,091	Sin
06318	DEVAPATHIRAJA COLLEGE.	RATHGAMA.	3.Southern	Galle	Rathgama	2,158	Sin
06457	KATHALUWA CENTRAL COLLEGE	KATHALUWA,AHANGAMA	3.Southern	Galle	Habaraduwa	555	Sin
06459	BATEMULLA NATIONAL SCHOOL	IMADUWA GALLE	3.Southern	Galle	Habaraduwa	1,870	Sin
06497	MALHARUSSULHIYA NATIONAL SCHOOL	H.K.EDMOND MAWATHA,GALLE	3.Southern	Galle	Galle	872	Sin
07017	KEERTHI ABEWICKRAMA NATIONAL SCHOO	DENIYAYA ROAD,MORAWAKA	3.Southern	Matara	Deniyaya	1,685	Sin
07146	NARANDENIYA M.M.V.	NATIONAL SCHOOL,KAMBURUPITIY	3.Southern	Matara	Kamburupitiya	1,964	Sin
07225	DEIYANDARA NATIONAL COLLEGE	DEIYANDARA.	3.Southern	Matara	Hakmana	1,796	Sin
07258	SIDDHARTHA COLLEGE	WELIGAMA	3.Southern	Matara	Weligama	2,077	Sin
07283	ARAFA CENTRAL COLLEGE	WELIGAMA	3.Southern	Matara	Weligama	1,110	Tam
07309	MATARA CENTRAL COLLEGE	RAHULA ROAD,MATARA	3.Southern	Matara	Matara	3,672	Sin
07406	RASSANDENIYA M.R. N.S.	MATARA	3.Southern	Matara	Matara	240	Sin
08001	H/WALASMULLA NATIONAL SCHOOL	WALASMULLA	3.Southern	Hambantota	Mulkirigala	3,210	Sin
08038	RAJAPAKSHA CENTRAL COLLEGE	WEERAKATIYA	3.Southern	Hambantota	Mulkirigala	4,182	Sin
08073	H/TANGALLE BOYS NATIONAL SCHOOL	TANGALLE	3.Southern	Hambantota	Tangalla	1,079	Sin
08074	H/TANGALLE BALIKA VIDYALAYA	TANGALLE	3.Southern	Hambantota	Tangalla	2,720	Sin
08144	H/GETAMANNA VIJAYA NATIONAL SCHOOL	GETAMANNA,BELIATTA	3.Southern	Hambantota	Beliatta	468	Sin
08229	H/DEBARAWEWA M.M.V	DEBARAWEWA,TISSAMAHARAMA.	3.Southern	Hambantota	Tissamaharamaya	2,607	Sin
08275	THERAPUTTHA N. V	WADURUPPA ROAD, AMBALANTOTA	3.Southern	Hambantota	Tangalla	2,204	Sin
08276	ST.MARY'S COLLEGE	HAMBANTOTA	3.Southern	Hambantota	Tissamaharamaya	1,239	Sin
08280	ZAHIRA N.S.	HAMBANTOTA	3.Southern	Hambantota	Tissamaharamaya	616	Tam

Selected National Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Students	Medium
08339	RUHUNU VIJAYABA NATIONAL SCHOOL	SITINAMALUWA, BELIATTA	3.Southern	Hambantota	Beliatta	3,680	Sin
09166	MANIPAY HINDU COLLEGE	MANIPAY	4.Nothern	Jaffna	Vaddukkodai	968	Tam
09269	J/NELLIADY MADHYA MAHA VIDYALAYAM	KARAVEDDY	4.Nothern	Jaffna	Uduppiddy	1,194	Tam
09353	CHAVAKACHCHERI HINDU COLLEGE	KANDY ROAD SANKATHTHANAI CHA	4.Nothern	Jaffna	Chavakachcheri	2,266	Tam
09416	JAFFNA HINDU COLLEGE	JAFFNA HINDU COLLEGE, JAFFNA	4.Nothern	Jaffna	Nallur	2,375	Tam
09465	J/VEMBADY GIRLS' HIGH SCHOOL	1ST CROSS STREET JAFFNA	4.Nothern	Jaffna	Jaffna	2,140	Tam
13111	MADUKANDA NATIONAL SCHOOL	MADUKANDA VAVUNIYA	4.Nothern	Vavuniya	Vavuniya	417	Sin
14018	BT/BC/ODDAMAVADY CENTRAL COLLEGE(N	ODDAMAVADY	5.Eastern	Batticaloa	Kalkudah	1,752	Tam
14022	BT/BC/VALAICHENAI ANNOOR MAHA VIDYAL	VALAICHENI	5.Eastern	Batticaloa	Kalkudah	1,049	Tam
14145	BT/BC/KATTANKUDY CENTRAL COLLEGE	322,BEACH ROAD,NEW KATTANKUD	5.Eastern	Batticaloa	Batticaloa	2,482	Tam
15161	KM/ST/SAMMANTHURAI.M.M.M.VID(NATIONA	KM/ST/SAMMANTHURAI.M.M.VID(N.S	5.Eastern	Ampara	Samanturai	2,823	Tam
15200	ZAHIRA COLLEGE (N/S)	ZAHIRA COLLEGE ROAD,AAINTHAM	5.Eastern	Ampara	Kalmunai	2,549	Tam
15231	AKKARAIPATTU MUSLIM CENTRAL COLLEGI	AKKARAIPATTU	5.Eastern	Ampara	Samanturai	1,437	Tam
15248	ADDALAICHNAI MMV	MAIN STREET ADDALAICHENAI	5.Eastern	Ampara	Pothuvil	2,354	Tam
15290	SRI RAMAKRISHNA COLLEGE	NATIONAL SCHOOL AKKARAIPATTU	5.Eastern	Ampara	Pothuvil	1,290	Tam
16175	T/MU/MUTUR CENTRAL COLLEGE	KNOX ROAD MUTUR	5.Eastern	Trincomalee	Mutur	1,079	Tam
17001	PARACKAMABAHU NATIONAL SCHOOL	POLGAHAWELA	6.North Western	Kurunegala	Polgahawela	1,837	Sin
17234	S.B.HERATH M.M.V.	GANEWATHTHA,NIKADALUPOTHA.	6.North Western	Kurunegala	Hiriyala	1,299	Sin
17265	MAYURAPADA M.M.V.	NARAMMALA	6.North Western	Kurunegala	Dambadeniya	3,192	Sin
17464	J.R.JAYAWARDANA.M.M.V	DUMMALASURIYA	6.North Western	Kurunegala	Bingiriya	390	Sin
17489	KULIYAPITIYA CENTRAL COLLAGE	KULIYAPITIYA	6.North Western	Kurunegala	Kuliyapitiya	3,525	Sin
17522	SANDALANKAWA M.M.V.	SANDALANKAWA	6.North Western	Kurunegala	Katugampola	1,627	Sin
17613	S.W.R.D.BANDARANAYAKE M.M.V.	HETTIPOLA	6.North Western	Kurunegala	Panduwasnuwara	2,014	Sin
17663	KEKUNAGOLLA MUS.M.M.V.	KEKUNAGOLLA	6.North Western	Kurunegala	Kuliyapitiya	2,101	Tam
17708	MAHAWA VIJAYABA N.S.	MAHAWA.	6.North Western	Kurunegala	Yapahuwa	2,848	Sin
17767	PERAKUMPURA.N.S.	TRACK3,SOLEPURA.	6.North Western	Kurunegala	Galgamuwa	555	Sin
17838	MAHASEN NATIONAL SCHOOL	NIKAWERATIYA	6.North Western	Kurunegala	Nikaweratiya	2,626	Sin
17867	SRI PARACKRAMA NATIONAL SCHOOL	KOBEIGANE	6.North Western	Kurunegala	Nikaweratiya	1,314	Sin
18073	ZAHIRA NATIONAL SCHOOL	PUTTALAM	6.North Western	Puttalam	Puttalam	1,573	Tam
18199	ANANDA NATIONAL SCHOOL	COLOMBO ROAD,CHILAW	6.North Western	Puttalam	Chilaw	3,619	Sin
18218	SENANAYAKE NATIONAL SCHOOL	MADAMPE	6.North Western	Puttalam	Chilaw	1,922	Sin
19001	MAITHIPALA SENANAYAKE M.M.V.	MEDAWACHCHIYA	7.North Central	Anuradhapura	Medawachchiya	2,940	Sin
20001	MINNERIYA N.S.	HINGURAKGODA	7.North Central	Polonnaruwa	Minneriya	1,315	Sin
20002	ANANDA BALIKA N.S	HINGURAKGODA	7.North Central	Polonnaruwa	Minneriya	1,924	Sin
20035	MEDIRIGIRIYA N.S.	MEDIRIGIRIYA	7.North Central	Polonnaruwa	Medirigiriya	2,656	Sin

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

Selected National Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Students	Medium
20069	ROYAL CENTRAL COLLEGE	POLONNARUWA	7.North Central	Polonnaruwa	Minneriya	3,148	Sin
21026	MAHIYANGANA NATIONAL SCHOOOL	MAHIYANGANAYA	8.Uva	Badulla	Mahiyangana	3,409	Sin
21071	KANDEGEDARA M.M.V	KANDEGEDARA-HALIELA	8.Uva	Badulla	Wiyaluwa	553	Sin
21105	MEEGAHAKIULA NATIONAL SCHOOL	MEEGAHAKIULA	8.Uva	Badulla	Wiyaluwa	554	Sin
21125	PASSARA M.M.V.	PASSARA	8.Uva	Badulla	Passara	1,328	Sin
21173	BADULLA M.M.V	BADULLA	8.Uva	Badulla	Badulla	3,796	Sin
21234	VISHAKA BALIKA M.M.V	BANDARAWELA	8.Uva	Badulla	Bandarawela	1,593	Sin
21276	SRI JANANANDA NATIONAL SCHOOL	KADURUGAMUWA,DIYATHALAWA	8.Uva	Badulla	Haputale	560	Sin
21277	WALHAPUTHENNA M.M.V	WALHAPUTHENNA,HALDUMMULLA	8.Uva	Badulla	Haputale	708	Sin
21311	WELIMADA M.M.V.	WELIMADA	8.Uva	Badulla	Welimada	1,992	Sin
21464	SARASWATHY CENTRAL COLLEGE	MAHIYANGANA ROAD BADULLA	8.Uva	Badulla	Badulla	802	Tam
21511	PASSARA TAMIL M.V.	PASSARA	8.Uva	Badulla	Passara	1,256	Tam
22001	MO/WELLASSA N.S.	HEWELWELA-BIBILE	8.Uva	Monaragala	Bibile	1,283	Sin
22005	MO/MEDAGAMA N.S.	MEDAGAMA-BIBILE.	8.Uva	Monaragala	Bibile	1,254	Sin
22069	MAHANAMA M.M.V.	MONARAGALA	8.Uva	Monaragala	Monaragala	1,836	Sin
22111	NISHSHNAKA M.M.V.	BADLKUMBURA	8.Uva	Monaragala	Monaragala	2,077	Sin
22146	MO/MALWATTAWALA M.M.V.	WELLAWAYA	8.Uva	Monaragala	Wellawaya	1,603	Sin
22149	MO/DUTUGEMUNU M.M.V.	BUTTALA	8.Uva	Monaragala	Wellawaya	1,887	Sin
23001	EHELIYAGODA M.M,V	EHELIYAGODA	9.Sabaragamuwa	Ratnapura	Eheliyagoda	3,025	Sin
23061	SUMANA BALIKA VIDYALAYA	RATHNAPURA	9.Sabaragamuwa	Ratnapura	Rathnapura	3,501	Sin
23092	SIVALI CENTRAL COLLAGE	HIDELLANA,RATHNAPURA	9.Sabaragamuwa	Ratnapura	Rathnapura	3,080	Sin
23123	GANKANDA CENTRAL COLLEGE	PELMADULLA	9.Sabaragamuwa	Ratnapura	Pelmadulla	2,197	Sin
23209	BALANGODA ANANDA MAITHRIYA M.M.V.	BALANGODA.	9.Sabaragamuwa	Ratnapura	Balangoda	2,803	Sin
23247	RAHULA M.M.V.	GODAKAWELA	9.Sabaragamuwa	Ratnapura	Rakwana	1,726	Sin
23319	KARAVITA CENTRAL COLLEGE	KARAWITA UDA KARAWITA	9.Sabaragamuwa	Ratnapura	Kalawana	1,440	Sin
23400	KALAWANA NATIONAL SCHOOOL	KALAWANA	9.Sabaragamuwa	Ratnapura	Kalawana	2,106	Sin
23431	KOLONNA M.M.V	KOLONNA	9.Sabaragamuwa	Ratnapura	Kolonnawa	785	Sin
24042	DR.N.M.PERERA M.M.V.	YATIYANTOTA	9.Sabaragamuwa	Kegalle	Yatiyantota	1,345	Sin
24066	DEHIOWITA NATIONAL SCHOOL	DEHIOWITA	9.Sabaragamuwa	Kegalle	Ruwanwella	1,176	Sin
24112	SIRISAMAN M.M.V.	JINADASA MAWATHA DERANIYAGAL	9.Sabaragamuwa	Kegalle	Deraniyagala	1,424	Sin
24158	PINDENIYA VIDYACKKRAWARTHI M.M.V	PINDENIYA ATALA	9.Sabaragamuwa	Kegalle	Galigamuwa	947	Sin
24321	PINNAWALA M.M.V	RABUKKANA	9.Sabaragamuwa	Kegalle	Rambukkana	2,882	Sin
24381	RIVISANDA M.M.V	USSAPITIYA	9.Sabaragamuwa	Kegalle	Aranayaka	2,470	Sin

Selected Provincial Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Student	Medium
00002	MODARA ANANDA M.M.V.	MODARA,COL-15.	1.Western	Colombo	Colombo North	1,004	Sin
00093	S.DE.S.JAYASINGHE M.M.V.	KARAGAMPITIYA, DEHIWELA	1.Western	Colombo	Dehiwala	1,150	Sin
00113	KOTHALAWALAPURA M.V.	RATMALANA	1.Western	Colombo	Rathmalana	367	Sin
00158	HEWAVITHARANA M.V.	RAJAGIRIYA RD., RAJAGIRIYA.	1.Western	Colombo	Kotte	1,090	Sin
00170	SRI SUNANDOPANNADA NAVODYA M.V.	EGODAUYANA,MORATUWA	1.Western	Colombo	Moratuwa	432	Sin
00317	SIRIPIYARATHANA CENTRAL COLLEGE	PADUKKA	1.Western	Colombo	Awissawella	2,879	Sin
00319	BOPE RAJASINGHE M.V.	BOPE, PADUKKA	1.Western	Colombo	Awissawella	657	Sin
00349	HOMAGAMA CENTRAL COLLEGE	COURTS ROAD, HOMAGAMA.	1.Western	Colombo	Homagama	2,375	Sin
00351	WETHARA MAHA VIDYALAYA	POLGASOVITA	1.Western	Colombo	Homagama	392	Sin
00398	MAHARAGAMA M.M.V.	GAMMANA RD., MAHARAGAMA.	1.Western	Colombo	Maharagama	1,080	Sin
00404	MAHAMAYA B.V.	PEPILIYANA RD., NUGEGODA.	1.Western	Colombo	Maharagama	1,357	Sin
00419	DHARMARAJA MAHA VIDYALAYA	MAMPE, PILIYANDALA	1.Western	Colombo	Kesbewa	1,038	Sin
01086	URAPOLA M.M.V.	URAPOLA	1.Western	Gampaha	Attanagalla	1,550	Sin
01188	KIRILLAWALA M.M.V	KIRILLAWALA , KADAWATHA	1.Western	Gampaha	Mahara	2,905	Sin
01189	BUTHPITIYA M.V.	BUTHPITIYA	1.Western	Gampaha	Mahara	305	Sin
01226	KIRINDIWELA M.M.V.	KIRINDIWELA	1.Western	Gampaha	Dompe	2,137	Sin
01293	BIYAGAMA M.M.V.	BIYAGAMA	1.Western	Gampaha	Biyagama	1,068	Sin
01303	SRI SUMANGALA M.V	ERIYAWETIYA , KELANIYA	1.Western	Gampaha	Kelaniya	953	Sin
01424	SRI GNANODAYA M.M.V	DIVULAPITIYA	1.Western	Gampaha	Divulapitiya	1,481	Sin
01544	BATUWATTA M.V.	RAGAMA	1.Western	Gampaha	Ja-Ela	964	Sin
02041	WEVITA MAITHREE M.V,	WEVITA BANDARAGAMA	1.Western	Kalutara	Bandaragama	1,369	Sin
02087	PALANNORUWA M.M.V.	GONAPOLA JUNCTION	1.Western	Kalutara	Horana	1,490	Sin
02140	REMUNA M.V.	ANGURUWATOTA	1.Western	Kalutara	Bulathsinhala	265	Sin
02250	KATUKURUNDA DHARMAPALA M.V.	KATUKURUNDA, KALUTARA	1.Western	Kalutara	Kalutara	931	Sin
02320	MIHINDU M.M.V.	AGALAWATTA	1.Western	Kalutara	Agalawatta	1,543	Sin
02358	COLVIN R DE SILVA M.V.	ITTAPANA	1.Western	Kalutara	Agalawatta	813	Sin
03214	A.RATHNAYAKE M.M.V.	WALALA, MENIKHINNA	2.Central	Kandy	Kundasale	1,673	Sin
03313	HEWAHETA C C	THALATHUOYA	2.Central	Kandy	Hewaheta	1,334	Sin
03354	BERREWAERTS COLLEGE	AMPITIYA	2.Central	Kandy	Kandy	1,540	Sin
03385	PERADENIYA CENTRAL COLLEGE	PERADENIYA	2.Central	Kandy	Kandy	1,053	Sin
03494	NILLAMBE MAHA VIDYALAYA	NILLAMBE	2.Central	Kandy	Gampola	684	Sin
03613	KATHIRESAN CENTRAL COLLEGE	KOTMALE ROAD,NAWALAPITIYA	2.Central	Kandy	Nawalapitiya	1,166	Tam
04062	GALEWELA C.C.	GALEWELA	2.Central	Matale	Dambulla	1,784	Sin

Selected Provincial Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Student	Medium
04119	NAMINIOYA CENTRAL COLLEGE	WILGAMUWA, MATALE.	2.Central	Matale	Laggala	977	Sin
05002	SUMANA C C	TALAWAKELLE	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	612	Sin
05171	HOLBROOK.T.M.V	AGRAPATANA	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	1,244	Tam
05255	CP/HZ/NORWOOD T.M.V	NORWOOD	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	1,082	Tam
05313	RAGALA TAMIL MAHA VIDYALAYA	HALGRANOYA	2.Central	Nuwara Eliya	Walapane	1,138	Tam
05378	HOLY TRINITY CENTRAL COLLEGE	NUWARAELIYA	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	1,844	Tam
05533	CAMBRIDGE COLLEGE	KOTAGALA	2.Central	Nuwara Eliya	N'eli-Maskeli	643	Tam
06002	SIDDHARTHA M.M.V	BALAPITIYA	3.Southern	Galle	Balapitiya	464	Sin
06034	BATAPOLA M.M.V	BATAPOLA	3.Southern	Galle	Ambalangoda	1,609	Sin
06262	SHANTHA ANTHONY'S(NAVODYA)M.V	BADDEGAMA	3.Southern	Galle	Baddegama	1,084	Sin
06396	KALAHE SRI SUMANGALODAYA MAHA VIDYALA	KALAHE WANCHAWALA	3.Southern	Galle	Akmeemana	1,307	Sin
06399	RICHARD PATHIRANA COLLAGE	ULUVITIKE,GALLE	3.Southern	Galle	Galle	711	Sin
07051	BERALAPANARHARA M.V.	BERALAPANATHARA	3.Southern	Matara	Deniyaya	912	Sin
07113	MALIDUWA M.V.	A	3.Southern	Matara	Akuressa	203	Sin
07193	METHODIST M.M.V	METHODIST M.M.V HAKMANA	3.Southern	Matara	Hakmana	1,083	Sin
07373	RADAMPOLA SRI SUMANGALA M.M.V	RADAMPOLA URUGAMUWA	3.Southern	Matara	Dewinuwara	483	Sin
09029	J/VELANAI CENTRAL COLLEGE	VELANAI WEST VELANAI	4.Nothern	Jaffna	Kayts	770	Tam
09065	VADDU HINDU COLLEGE	SITHANKERNI	4.Nothern	Jaffna	Vaddukkodai	933	Tam
09216	J/VAYAVILAN MADHYA MAHA VIDYALAYAM	VAYAVILAN	4.Nothern	Jaffna	Kankasanturai	1,029	Tam
09223	J/SRI SOMAS KANDA COLLEGE	PUTTUR	4.Nothern	Jaffna	Kopay	1,114	Tam
09333	METHODIST GIRLS HIGH SCHOOL	POINT PEDRO	4.Nothern	Jaffna	Point-Pedro	1,162	Tam
10001	KN KILINOCHCHI CENRAL COLLEGE	A9.ROAD, ANANTHAPURAM WEST, KILINOCHCHI	4.Nothern	Kilinochchi	Kilinochchi	1,162	Tam
10002	KILINOCHCHI HINDU COLLEGE	JEJANTHINAGAR KILINOCHCHI	4.Nothern	Kilinochchi	Kilinochchi	1,007	Tam
11024	ERUKKALAMPIDDY MUSLIM MADHYA MAHA VID	ERUKKALAMPIDDY, MANNAR.	4.Nothern	Mannar	Mannar	437	Tam
11034	MURUNKAN MV	NANATTAN	4.Nothern	Mannar	Mannar		Tam
12046	ODDUSUDDAN MAHAVIDYALAYAM	VITHTHIYAPURAM ODDUSUDDAN	4.Nothern	Mulaitivu	Mulathivu	493	Tam
13072	V/CHEDDIKULAM MAHA VIDYAYAM	CHEDDIKULAM.	4.Nothern	Vavuniya	Vavuniya	804	Tam
13081	VAVUNIYA AL-IQBAL VIDYALAYAM	SOODUWENTHAPULAVU VAVUNIYA	4.Nothern	Vavuniya	Vavuniya	595	Tam
14036	BT/KK/KIRAN MAHA VIDYALAYAM	KIRAN	5.Eastern	Batticaloa	Kalkudah	921	Tam
14045	BT/KK/VANTHARUMOOLAI MATHIYA MAHA VIDY	SITTANDY-1	5.Eastern	Batticaloa	Kalkudah	2,171	Tam
14106	BT/HINDU COLLEGE	BT/HINDU COLLEGE, BATTICALOA	5.Eastern	Batticaloa	Batticaloa	1,007	Tam
14180	BT/PD/KALUTHAVALAI MAHA VIDYALAYAM	KALUTHAVALAI	5.Eastern	Batticaloa	Paddirippu	930	Tam

Selected Provincial Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Student	Medium
14225	BT/PALUGAMAM KANDUMANY MAHA VIDYALAY	THIRUPALUGAMAM	5.Eastern	Batticaloa	Paddirippu	808	Tam
15079	POLWATHTHA M.V.	POLWAGA JANAPADAYA, AMPARA	5.Eastern	Ampara	Ampara	1,065	Sin
15120	MEDAGAMA M.V.	"C"	5.Eastern	Ampara	Ampara	929	Sin
16062	ABAYAPURA M.V.	ABAYAPURA, TRINCOMALEE.	5.Eastern	Trincomalee	Trincomalee	592	Sin
16082	VIPULANANDA COLLEGE.	KANDY ROAD,TRINCOMALEE.	5.Eastern	Trincomalee	Trincomalee	1,025	Tam
16119	AGBOPURA MAHA VIDYALAYA	AGBOPURA KANTHALE	5.Eastern	Trincomalee	Seruwila	411	Sin
16124	KANTALE CENTRAL COLLEGE	KANTALE	5.Eastern	Trincomalee	Seruwila	1,016	Sin
17055	SIR JOHN KOTHALAWALA M.M.V.	DODAMGASLANDA	6.North Western	Kurunegala	Dodangaslanda	1,491	Sin
17100	POTHUBOWA M,V.	MAWATHAGAMA	6.North Western	Kurunegala	Mawatagama	792	Sin
17169	SANGABODHI M.M.V.	AWLEGAMA	6.North Western	Kurunegala	Wariyapola	1,562	Sin
17298	UDABADALAWA SUDARSHNA M.V.	MASPOTHA	6.North Western	Kurunegala	Kurunegala	1,211	Sin
17333	HIZBULLAH CENTRAL COLLEGE	UDAYR LANE,THLIYAGIONNA ,KURUNEGALA	6.North Western	Kurunegala	Kurunegala	1,390	Tam
17710	BALALLA U.B.WANNINAYAKA.M.V.	BALALLA.	6.North Western	Kurunegala	Yapahuwa	1,447	Sin
18001	ANAMADUWA M.M.V.	ANAMADUWA	6.North Western	Puttalam	Anamaduwa	2,003	Sin
18271	WEKADA M.V.	YOGIYANA	6.North Western	Puttalam	Wennappuwa	1,132	Sin
18311	ST.SEBASTIANS CENTRAL COLLEGE	KATUNERIYA	6.North Western	Puttalam	Nattandiya	1,869	Sin
19045	KEBITHIGOLLEWA M.M.V.	KEBITHIGOLLEWA	7.North Central	Anuradhapura	Medawachchiya	1,676	Sin
19097	SAMPATH NUWARA V.	ETHAWETUNUWEWA	7.North Central	Anuradhapura	Medawachchiya	380	Sin
19104	RUWANWELI M.M.V.	HOROWPOTHANA	7.North Central	Anuradhapura	Horowpathana	1,581	Sin
19182	WALISINGHA HARISHCHANDRA M.V.	ANURADHAPURA	7.North Central	Anuradhapura	Anuradhapura-E	3,933	Sin
19281	VIDDYADARSHA MAHA VIDYALAYA	NOCHCHIYAGAMA	7.North Central	Anuradhapura	Anuradhapura-W	2,083	Sin
19286	THAMBUTHTHEGAMA.M.M.V.	THANBUTHTHEGAMA	7.North Central	Anuradhapura	Horowpathana	2,626	Sin
19297	THALAWA M.V.	THALAWA	7.North Central	Anuradhapura	Kalawewa	1,978	Sin
19336	GALNEWA.M.M.V.	GALNEWA	7.North Central	Anuradhapura	Kalawewa	1,941	Sin
19362	GANTHIRIYAGAMA MAHINDA M.V	IPALOGAMA	7.North Central	Anuradhapura	Mihintale	1,645	Sin
19414	MIHINTHALE M.V.	MIHINTHALE	7.North Central	Anuradhapura	Mihintale	1,194	Sin
19442	SRI REWATHA NAWODYA PASALA	MADATUGAMA	7.North Central	Anuradhapura	Kekirawa	722	Sin
20072	PALUGASDAMANA M.V.	PALUGASDAMANA,POLONNARUWA	7.North Central	Polonnaruwa	Polonnaruwa	661	Sin
20103	VILAYAYA M.M.V	ARALAGANVILA	7.North Central	Polonnaruwa	Polonnaruwa	1,931	Sin
20176	BAKAMUNA MAHASEN M.M.V.	BAKAMUNA	7.North Central	Polonnaruwa	Minneriya	1,216	Sin
20219	WELIKANDA M.V	WELIKANDA	7.North Central	Polonnaruwa	Polonnaruwa	853	Sin
21194	MALITHTHA MAHA VIDUHALA	MALITHTHA,PATTIYAGEDARA	8.Uva	Badulla	Hali-Ela	762	Sin

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

Selected Provincial Schools for New Technological A/L stream

CensusNo	Name	Address	Province	District	Electorate	Student	Medium
21254	DHARMAPALA M.V	BANDARAWELA	8.Uva	Badulla	Bandarawela	2,832	Sin
21377	JANADIPATHIV	AMBAGAHSDOWA,WELIMADA	8.Uva	Badulla	Uva-Paranagama	2,227	Sin
21408	HAPUTALE TAMIL MAHA VIDYALAYA	HAPUTALE	8.Uva	Badulla	Haputale	1,115	Tam
24401	NAGARAGIRI M.V	HEMMATHAGAMA	9.Sabaragamuwa	Kegalle	Mawanella	1,614	Sin
24409	AL-AZAR MU.M.V.	HIJRAMAGA,HEMMATHAGAMA	9.Sabaragamuwa	Kegalle	Mawanella	1,422	Tam
24493	SWARNAJAYANTHI M V	KUMARATHUNGA MUNIDASA MAWATHA KEGALLE	9.Sabaragamuwa	Kegalle	Kegalle	1,892	Sin
24579	DARMASIRI SENANAYAKA M V	THULHIRIYA	9.Sabaragamuwa	Kegalle	Dedigama	628	Sin

*සභාමේසය මත තබන ලද ලේඛනය :
சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :
Statement tabled:*

ශ්‍රම ඵලදායිතාව

ශ්‍රම ඵලදායිතාව 2012 වසරේ දී අඛණ්ඩව ඉහළ ගියේය. එක් ශ්‍රමිකයකු සඳහා වන දළ දේශීය නිෂ්පාදිතය (2002 වසරේ ස්ථාවර මිල ගණන් මත පදනම් වූ) මගින් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව සමස්තයක් ලෙස, 2012 වසරේ දී රුපියල් 374,900 දක්වා සියයට 7 කින්

4.15 සංඛ්‍යා සටහන ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව

විස්තරය	2011	2012 (අ)
ස්ථාවර (2002) මිල අනුව දළදේ.නි. (රු. මිලියන)	2,863,715	3,047,277
කෘෂිකර්මාන්ත	320,178	338,625
කර්මාන්ත	838,932	925,335
සේවා	1,704,605	1,783,318
ශ්‍රම ඵලදායිතාව සේවා නියුක්ත එක් පුද්ගලයකු සඳහා රු. '000 (ආ)	349.4	374.9
කෘෂිකර්මාන්ත	118.2	134.4
කර්මාන්ත	424.3	436.7
සේවා	485.4	511.0

(අ) තාවකාලික
(ආ) සියලුම දිස්ත්‍රික්ක සාරාංශය වන පරිදි දත්ත ඇතුළත් වේ.

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 8 **නිරසාර සංවර්ධනයක් සඳහා අවශ්‍ය නිපුණතා සහ උසස් තත්ත්වයේ මානව ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 100ක් කරා ගෙන යමින්, 2016 ට පෙර ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 4000ක මට්ටමේ ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීමටත් එමගින් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට රට පරිවර්තනය කිරීමත් පිණිස රජය විසින් ආර්ථික කටයුතුවල ප්‍රධාන අංග ලෙස කේන්ද්‍රස්ථාන පහක් හඳුනාගෙන ඇත. එනම් නාවික, ගුවන් සේවා, වාණිජ, බලශක්තිය සහ දැනුම් සමාජ සංචාරක කර්මාන්තයයි.

ප්‍රචලිත මැදි ආදායම් වර්ධන උගුලට (Middle Income Growth Trap) හසුවීම වලක්වාලමින්, නිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ දී සම්පූර්ණ කළ යුතු ප්‍රධාන අවශ්‍යතාවයන් කිහිපයක් පවතී. මේවාට අයත් වන්නේ, ආර්ථිකයේ අසමතුලිතතාවයන් අඩු කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම, ඉහළ ආයෝජන මට්ටමක් ළඟාකර ගැනීම, ඵලදායීතාවය වැඩි කිරීම, නිපුණතාව වර්ධනය කිරීම සහ මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම යනාදියයි.

ඉහළ ආදායම් මට්ටමක් කරා ගමන් කිරීමේ දී, නිපුණතාවන් සහ මානව ප්‍රාග්ධනය වැදගත් වන්නේ කුමක් නිසාද යන්නට හේතු කිහිපයක් ආනුභවික අධ්‍යනයන් සහ ආර්ථික සාහිත්‍ය කුළින් හඳුනා ගත හැකිය.

(අ) ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථිකය මන්දගාමී බවට පත්වීම (Slowdown) සහ මැදි ආදායම් උගුලට හසුවීමට ඇති ඉඩකඩ අඩුකරයි: නිරසාර සංවර්ධනයේ දී ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ආර්ථික වර්ධනයේ මන්දගාමී බව සහ "මැදි ආදායම් උගුල" වලක්වන ප්‍රධාන සාධක අතරින් එකක් බව හඳුනාගෙන තිබේ. අඩුම තරමින් ජනගහනයෙන් ද්විතියික මට්ටමේ අධ්‍යාපනයක් (ද්විතියික, විශ්වවිද්‍යාල සහ ඊට ඉහළ) ලබාගෙන ඇති ප්‍රතිශතය වැඩි කිරීම, අනෙකුත් තත්ත්වයන් සමාන වන්නේ යැයි උපකල්පනය කළහොත්, ආර්ථික වර්ධනයේ වේගය අඩුවීමට ඇති සම්භාවිතාව අඩු කරන බව සොයාගෙන ඇත (Eichengreen, Park and Shin, 2013)[1]. නමුත් සාමාන්‍ය පොදු අධ්‍යාපනයට එවැනි බලපෑමක් ඇති කිරීමට හැකි බව සොයාගෙන නැත, මෙම අධ්‍යනයට අනුව, ආර්ථික මන්දගාමීබව මග හැරීම සඳහා "අඩු තත්ත්වයේ" මානව ප්‍රාග්ධනයට වඩා ද්විතියික හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මානව ප්‍රාග්ධනය වඩා වැදගත් බව පෙනී යයි. වටිනාකම් දාමයේ පහළ අගය එකතු කළ කර්මාන්තයන්ගේ සිට ඉහළ වටිනාකම් එකතු කරන කර්මාන්ත කරා ගමන් කිරීමට, අවශ්‍ය වන්නේ නිපුණතා සහිත සේවකයන් කියා අපට සිතාගත හැකිය. ඉහළ තත්ත්වයෙන් යුතු මානව ප්‍රාග්ධනය, ව්‍යාපාර සේවා වැනි නවීන ඉහළ අගය එකතු කිරීමේ කටයුතු සඳහා විශේෂයෙන් වැදගත් වේ. තවද, මැදි ආදායම් තත්ත්වයේ සිට ඉහළ ආදායම් තත්ත්වයක් දක්වා කොරියාවේ සාර්ථක සංක්‍රාන්තිය, එහි ද්විතීක අධ්‍යාපනයේ වේගවත් ප්‍රසාරණය තුළින් පැහැදිලි වන අතර, මැලේසියාව හා තායිලන්තය මැදි ආදායම් උගුලට හසුවී ඇති ආර්ථික බවට පත්වීම එම රටවල උසස් මානව ප්‍රාග්ධනයේ හිඟය තුළින් පැහැදිලි වන බව මෙම අධ්‍යනය මගින් තවදුරටත් පෙන්වා දේ.

(ආ) ඉහළ නිපුණතාවන් නවීන සේවා අංශයේ ප්‍රසාරණයට පහසුකම් සපයයි: ලෝක මට්ටමින් ගතහොත් අධ්‍යාපනය හා සේවා සංවර්ධනය අතර ධන සම්බන්ධතාවයක් පවතී (ADB, 2012)[2]. වඩා උගත් ජනගහනයක් සහිත ආසියානු රටවල්වල විශාල සේවා අංශයක් ඇතිවීමට නැඹුරුතාවක් තිබෙන අතර, රටක ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළ යන විට, රටේ සේවා අංශය ද ඒ සමගම ප්‍රසාරණය වීමේ නැඹුරුතාවක් තිබෙන බව මෙම වාර්තාව කියා සිටියි. ව්‍යාපාර සේවා සංවර්ධනයට මානව ප්‍රාග්ධනය තීරණාත්මක වන බව සහ ව්‍යාපාර සේවාවලදී ඇමෙරිකාවේ හා අනෙකුත් දියුණු ආර්ථිකවල සාපේක්ෂ වාසිය විස්තර කිරීමට එම රටවල තිබෙන නිපුණතා සහිත සේවක බහුලත්වය සහාය වන බව මෙම වාර්තාව විස්තර කරයි. එසේම, සංවර්ධනය වන ආසියාවේ අඩු අධ්‍යාපන මට්ටම්, කලාපයේ සාපේක්ෂ අවාසිය පැහැදිලි කිරීමට උපකාරී වේ. සාම්ප්‍රදායික සේවාවන්ගේ සිට නවීන සේවාවන් දක්වා වූ ආසියාවේ ගමන් වේගය අඩු කිරීමට ආසියානු රටවල පවතින නිපුණතාවන්ගේ හිඟකම බලපාන බව වාර්තාව පෙන්වා දෙයි.

(ඇ) නිපුණතාවත්, ආර්ථික කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි කරයි: නිපුණතාවන්ගේ හිඟය විවිධාකාරයෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම් කරයි. ඒවා

[1] Barry Eichengreen, Donghyun Park, and Kwanho Shin. 2013, Growth Slowdowns Redux: New Evidence on the Middle-Income Trap, Working Paper No. 18673, National Bureau of Economic Research.

[2] ආසියානු සංවර්ධන බැංකුව. Asian Development Outlook 2012 Update: Services and Asia's Future Growth.

4 මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

***සභාමේසය මත තබන ලද පොත :**
சபாபீடத்தில் வைக்கப்பட்ட புத்தகம்:
Book tabled:

අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම

අධ්‍යාපන අමාත්‍යාංශය
2013



අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

තාක්ෂණවේදය විෂය ධාරාව සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වාදීමේ අවස්ථාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටට පත්වෙමි.

පංච මහා ක්ෂේත්‍රයන් ඇසුරින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා ගොඩනැඟීමට මහින්ද චින්තන ඉදිරි දැක්ම පියවර කිහිපයක් තබා තිබේ. එහිදී නාවික, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුම ජය ගැනීම ඉලක්කගත ය. ඒ සඳහා වන මානව සම්පත ගොඩනැඟීම අපට ඇති දුවැන්ත අභියෝගයකි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම එකී අභියෝගය ජය ගැනීම වෙනුවෙන් ගනු ලබන තවත් වටිනා පියවරක් බව මම විශ්වාස කරමි.

විද්‍යා, තාක්ෂණ හා ප්‍රායෝගික අත්දැකීම් භාවිත ඉගෙනුම් ක්‍රමයෙහි වූ හිඩැස රටේ අධ්‍යාපනයේ දී දුවැන්ත පසුබෑමක් විය. තරුණ තරුණියන්ගේ රැකියා වෙළෙඳපොළ සේ ම රටේ සංවර්ධන ක්‍රියාදාමයට ද එය මහත් බාධාවක් විය. දැනුම ක්ෂේත්‍රීය අධ්‍යාපනයට පරිබාහිරව රටට වඩාත් උචිත අධ්‍යාපන ක්‍රමයක් ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යයට මහින්ද චින්තනය පියවර තැබුවේ ඒ නිසා ය. ඒ අනුව රටේ තාක්ෂණ සංවර්ධනය පෙරට ගැනීමට තාක්ෂණික නිපුණතා සහ අත්දැකීම් සහිත මානව සම්පත අනාගතයේ අප සතු වෙයි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම ඒ අධ්‍යාපන විප්ලවයේ වැදගත් හැරවුම් ලක්ෂයක් ලෙස මම දකිමි.

නව විෂය ධාරාවක් ලෙස තාක්ෂණ විෂය ධාරාව තෝරා ගන්නා සිසු දරු දරියන් ප්‍රායෝගික දැනුම ද සමඟ පෙරට යනු දකීම අපගේ අපේක්ෂාව ය. සඳහා ඔබ සැමට මාගේ සුභ පැතුම් පිරිනමමි.

මහින්ද රාජපක්ෂ
2013 ජූනි මස 17 වෙනි දින

"ඉහළ ප්‍රමිතියකින් යුත් නිපුණතා සංවර්ධනය, පර්යේෂණ, හා තාක්ෂණ විප්ලවයකට අධ්‍යාපනය සිසුයෙන් යොමු කරවමින් අධ්‍යාපනය හා දැනුම රටට උචිත ලෙස ප්‍රතිනිර්මාණය කරමි. ශ්‍රී ලංකාව ලෝකයේ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට නැවත පත් කරමි"
(මහින්ද චින්තන - පිටු අංක 16)

"மகத்துவமிக்க திட்டமான திறன்கள் அபிவிருத்தி ஆராய்ச்சி மற்றும் தொழில்நுட்ப புரட்சிக்காக கல்வி துறையை உள்வாங்குவதன் மூலம், நாட்டிற்கு ஏற்றவகையில் கல்வியையும் அறிவையும் மீளமைப்பேன். உலகத்தில் அறிவு மிக்கமையமாக இலங்கையை மீண்டும் மாற்றுவேன்"

(மஹிந்த சிந்தனை பக்க இலக்கம் 16)



හැඳින්වීම

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කරලීමේ දුවැන්ත ක්‍රියාදාමයට පිවිස සිටින මේ අවස්ථාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම අධ්‍යාපනයේ සුවිශේෂී සන්ධිස්ථානයකි. පසුගිය දශකය තුළ තාක්ෂණික හා සේවා අංශයේ වර්ධනය සහ නාවික, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම ක්ෂේත්‍රීය මානව සම්පත් සංවර්ධනය සඳහා වූ රජයේ සංවර්ධන සැලසුම් තාක්ෂණය කෙරෙහි දිගානුගත වී ඇත.

සාමාන්‍ය අධ්‍යාපනයේ දී තාක්ෂණික අංශයෙහි මූලික කාර්යභාරය වනුයේ ද්‍රව්‍ය, මෙවලම් හා තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ ගවේෂණ මඟින් සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය, බෙදාහැරීම් හා කළමනාකරණය මෙන් ම ප්‍රායෝගික අත්දැකීම් තුළින් ඉගෙනුම් ක්‍රියාවලිය පෝෂණය කිරීම හා වැඩ ලෝකය සහ තාක්ෂණික ලෝකය හඳුන්වා දීම මඟින් අධ්‍යාපනයේ නිමි වළලු පුළුල් කිරීම බව යුනෙස්කෝව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් නිර්දේශ කර ඇත.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) මට්ටමේ දී තාක්ෂණ විෂය කාණ්ඩය මඟින් සියලුම සිසුන්ට වැඩ ලෝකය හා තාක්ෂණික ලෝකය පිළිබඳ මූලික හඳුන්වාදීමක් ඉදිරිපත් කර ඇති නමුත් තවදුරටත් තාක්ෂණවේදය හෝ එම අංශයෙන් තෘතීයික අධ්‍යාපනය හෝ හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන්ට එය ප්‍රමාණවත් නොවේ.

දැනට අ.පො.ස. උසස් පෙළ හදාරණ සිසුන්ගෙන් 22% ක් විද්‍යා හා ගණිත අංශය ද 27% ක් වාණිජ අංශයද 51% ක් කලා අංශය ද තෝරා ගනිති. කලා අංශයෙන් අ.පො.ස. උසස් පෙළ සමත් විශ්ව විද්‍යාල ප්‍රවේශය නොලැබූ විශාල තරුණ පිරිසක් රැකියා වියුක්තියෙන් පෙළෙති. වර්තමානයේ ග්‍රාම වෙළඳපොලෙහි ඉහළ ඉල්ලුමක් පවතින නිපුණතාවලින් යුත් පිරිස් අඩුවීම නිසා කලා උපාධිධාරීන් අතර ද රැකියා වියුක්තිය දක්නට ලැබේ. මෙය රටේ ආර්ථික සංවර්ධනයට ද බලපාන ප්‍රධාන ගැටලුවකි. තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම මඟින් විශ්ව විද්‍යාලයේ දී හෝ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ දී තෘතීයික මට්ටමේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පරිපෝෂණ විවර කරමින් සිසුනට මාර්ගෝපදේශය ලබාදීම අපේක්ෂා කෙරේ. 2016 වර්ෂයේදී අ.පො.ස

උසස් පෙළ හදාරණ සිසුන්ගෙන් විද්‍යා, ගණිත හා තාක්ෂණවේදය විෂය ධාරා තෝරාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 40% දක්වා වැඩි කිරීම තුළින් කලා විෂය ධාරාව තෝරාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 25% දක්වා අඩුකිරීමට බලාපොරොත්තු වේ.

අ.පොෂ. (උසස් පෙළ) සඳහා යෝජිත තාක්ෂණවේදය විෂය ධාරාව අලුතින් ම හඳුන්වා දෙනු ලබන වෙනම විෂය ධාරාවක් වන අතර එය තාක්ෂණික හා වැඩ ලෝකයට අදාළ සහාය විෂයවලින් සමන්විත වේ. මෙම විෂය ධාරාව පුළුල් තාක්ෂණික ක්ෂේත්‍ර දෙකක් යටතේ හඳුන්වා දෙනු ලබන අතර සිසුනට "ඉංජිනේරු තාක්ෂණවේදය" හා "ජෛව පද්ධති තාක්ෂණවේදය" යන විෂය දෙකෙන් එකක් තෝරා ගත හැකිවේ. එසේම මෙම විෂය ධාරාවේ දෙවන විෂයය වන "තාක්ෂණය සඳහා විද්‍යාව" මගින් සිසුන් තෝරා ගත් තාක්ෂණික විෂයය සඳහා අවශ්‍ය වන ගණිතය, විද්‍යාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලධර්ම හැදෑරීමට අවස්ථාව සැලසේ.

තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් සංයෝජනයේ තෙවන විෂයය, අ.පොෂ. (උසස් පෙළ) සඳහා දැනට පවත්නා විෂය දහයක් අතුරින් එක් විෂයයක් වේ.
මේ අනුව විෂය අන්තර්ගතය පහත සඳහන් වේ.

01. ජෛව පද්ධති තාක්ෂණවේදය හෝ ඉංජිනේරු තාක්ෂණවේදය
(Biosystems Technology or Engineering Technology)

✶ ජෛව පද්ධති තාක්ෂණය විෂයය, පරිසර ඉංජිනේරු විද්‍යාව, ජීව ක්‍රියාවලි, ඉංජිනේරු විද්‍යාව, ජීව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හා ස්වභාවික සම්පත් තාක්ෂණයට සම්බන්ධ විෂය සංකලනයකි. එම නිසා මෙම විෂයය ජෛව පද්ධති සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමේ ඉංජිනේරුමය විෂයයකි.

මෙම විෂයමාලාව ගොඩනැගීමෙදී ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා විවිධාංගීකරණය වූ ස්වභාවික සම්පත් පිළිබඳව නිපුණතා හා මූලික අංග ඇතුළත් කර ඇත. මෙමගින් අධ්‍යාපනය ලබන සිසුන්ගට අ.පොෂ. (උ.පෙළ) මට්ටමේ දී ම රටෙහි දියුණුව පිණිස සම්පත් භාවිතය පිළිබඳව නිපුණතාව ලැබෙනු ඇත.

✶ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය, ඉදිකිරීම් තාක්ෂණය, මෝටර් යාන්ත්‍ර විද්‍යාව, විදුලි තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හා පාරිසරික ගැටලු යන තාක්ෂණවේදවල සංකලනයකි. ඉංජිනේරු තාක්ෂණවේදය යනු තාක්ෂණික පද්ධතිවල ගැටලු නිරාකරණය කිරීම සඳහා ඉංජිනේරුමය දැනුම ලබා දෙන විෂයයකි.

අ.පොෂ. (උ.පෙළ) සඳහා සංවර්ධනය කරන ලද මෙම විෂය මාලාව, ඉංජිනේරු තාක්ෂණයේ මූලිකාංග පිළිබඳ දැනුම හා වෘත්තීය කුසලතා සිසුනට ලබා දෙනු පිණිස සකසා ඇත. එමගින් රටේ සංවර්ධනය සඳහා සම්පත් භාවිතය පිළිබඳව උසස් පෙළ මට්ටමේදී සිසුන් තුළ වෘත්තීය හැකියා වර්ධනයට දායකත්වය ලබාදෙනු ඇත. සිසුන් විසින් ඉංජිනේරු තාක්ෂණවේදයට සම්බන්ධ දැනුම භාවිත කිරීම, කැපවීම හා යොමුවීම බලාපොරොත්තු වේ.

02. තාක්ෂණවේදය සඳහා විද්‍යාව
(Science for Technology)

තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයයෙහි අන්තර්ගතය, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයන්ට ගැළපෙන සේ විද්‍යාව, ගණිතය හා තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවල විෂය සංකලනයකින් සකස් කර ඇත. මෙම විෂය අන්තර්ගතය මගින් ලැබෙන දැනුමින් තාක්ෂණික පද්ධතියක ගැටලු විසඳීමට අවශ්‍ය විද්‍යාත්මක, ගණිතමය හා තොරතුරු තාක්ෂණික පසුබිම සැපයේ.

03. පහත දක්වෙන තෙවන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක්
(One subject from ten optional subjects)


- ආර්ථික විද්‍යාව
- භූගෝල විද්‍යාව
- ගෘහ ආර්ථික විද්‍යාව
- ඉංග්‍රීසි
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- චිත්‍ර කලාව
- ව්‍යාපාර අධ්‍යයනය
- කෘෂි විද්‍යාව
- ගිණුම්කරණය


අරමුණු :

මෙම විෂය ධාරාව හැදෑරීමෙන්,

- එදිනෙදා ජීවිතයට ප්‍රයෝජනවත් වන තාක්ෂණික කුසලතා සිසුනට ලබා දීම
- තාත්ත්වික ලෝකයේ ගැටලුවලට තාක්ෂණික විසඳුම් සෙවීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම
- ශ්‍රම වෙළඳපලට ගැළපෙන කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීම
- ජාතික වෘත්තීය සුදුසුකම් රාමුවට අනුව වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් යොමු කිරීම

යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.





7

අ.පොෂ. උසස් පෙළ සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව ස්ථාපනය කිරීම

(ආචාර්ය පී.ඒ. පියසිරි, උපකුලපති, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)

ශ්‍රී ලංකාව පසුගිය විසර 5ක කාලය පුරා 6%කට වැඩි සමස්ත ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති අතර 2009 සිවිල් යුද්ධය අවසන් වීමෙන් අනතුරුව 2010 සහ 2011 වර්ෂවල වර්ධන අනුපාතය 8% ඉක්මවිය. 2009 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් 2000 ඉක්මවන ඒක පුද්ගල ආදායමක් සාක්ෂාත් කර ගනිමින් ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන රටක් බවට පත් වූ අතර එම ප්‍රමාණය 2016 දී ඇමරිකානු ඩොලර් 4000ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුළු දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික අංශයේ ප්‍රතිශතාත්මක දායකත්වය 2000 වර්ෂයේදී පැවති 27.3% සිට 2010 වන විට 29.4%ක් දක්වා වැඩි වී ඇත.

වැඩිම වර්ධනයක් දළ දේශීය නිෂ්පාදිතයෙහි පෙන්නුම් කරනුයේ සේවා අංශයෙහි වන අතර එය 2000 දී 52.8%ක පැවති අගය 2010 වන විට 57.8% ක ප්‍රමාණයක් දක්වා වූ ප්‍රතිශතාත්මක වැඩි වීමකි. එසේම, කාර්මික හා සේවා අංශවල රැකියා ප්‍රතිශතය 2000 සහ 2010 වර්ෂවලදී වෙන වෙනම ගත් කල පිළිවෙළින් 23.6% සහ 40.3% සිට 24.6% සහ 43.1% දක්වා වැඩි වී ඇත. පසුගිය දශකය පුරා කර්මාන්ත සහ සේවා අංශවල සිදු වූ වර්ධනය සහ ශ්‍රී ලංකාව නාවික, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කරලීමේ රජයේ සංවර්ධන සැලසුම් සඳහා තාක්ෂණික මුහුණුවරකින් යුතු මානව සම්පත් සංවර්ධනය සිදු කිරීම අවශ්‍ය වේ.

"ද්‍රව්‍ය, මෙවලම්, තාක්ෂණය සහ නිෂ්පාදනය, බෙදාහැරීම් හා සමස්තයක් ලෙස කළමනාකරණ ක්‍රියාවලිය, වැඩ ලෝකයට සහ තාක්ෂණික ලෝකයට හඳුන්වා දීමක් ලෙස කටයුතු කිරීම මගින් අධ්‍යාපන සීමා අතික්‍රමණය කිරීම පිණිස සහ ප්‍රායෝගික අත්දැකීම් හරහා ඉගෙනීම් ක්‍රියාවලිය පෝෂණය කිරීම පිණිස" සාමාන්‍ය අධ්‍යාපනය තුළ තාක්ෂණික අධ්‍යාපනය ස්ථාපිත කිරීමේ කාර්යය හඳුනාගැනීම යුනෙස්කෝ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධාන නිර්දේශ (2002) මගින් සිදු කර ඇත.

ඉහළ ද්විතියික අධ්‍යාපනයෙහි තාක්ෂණික විෂයමාලා හඳුන්වා දෙමින් මෙය බොහෝ රටවල පෙන්වා දී ඇති අතර ආසියානු කලාපයේ සංවර්ධනය වෙමින් පවතින්නා රටක් වන මලයාසියාවේ අත්දැකීම අවධානයට ලක් කිරීම වටී. ශ්‍රී ලංකාවෙහි අ.පොෙ.ස. සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයෙහි වෘත්තීය විෂය ගොන්නක් මඟින් වැඩ ලෝකයට සහ තාක්ෂණික ලෝකයට ප්‍රවේශයක් සියලුම සිසුන්ට ලබා දෙන නමුත් තෘතීයික අධ්‍යාපනයට හෝ යෝග්‍ය වෘත්තීයක් සොයා ගැනීමට හෝ වැඩිදුර තාක්ෂණික අධ්‍යාපනයක් සඳහා වන මාර්ගයකට හෝ පිපිසීමට අපේක්ෂා කරන්නවුන් සඳහා වන යෝග්‍ය මාර්ග නොපවතී. අ.පොෙ.ස. උසස් පෙළ විෂය ධාරාවන් ලෙස කලා, වාණිජ, විද්‍යාව සහ ගණිතය යන විෂය ධාරා පවතින අතර ශිෂ්‍යයන්ගෙන් බහුතරය කලා විෂය ධාරාව තෝරා ගනිති. මෙම විෂය ධාරා හතර අතරින් එකක් හදාරා, අ.පොෙ.ස. උසස් පෙළ විභාගය සමඟ විශ්ව විද්‍යාලවලට ප්‍රවේශවන ප්‍රමාණය ඇමුණුම් 1ඒ සහ ඇමුණුම් 1බී හි දක්වා ඇත. මෙමඟින් බහුතරයක් සිසුන් කලා විෂය ධාරාවෙන් උපාධි හැදෑරීමට විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන බව පෙනී යයි. වර්තමානයේ දී අ.පොෙ.ස. උසස් පෙළ සඳහා සිවිල් තාක්ෂණය, යාන්ත්‍රික තාක්ෂණය, විද්‍යුත් තාක්ෂණය, කෘෂි තාක්ෂණය, ජෛව සම්පත් තාක්ෂණය සහ ආහාර විද්‍යාව හා තාක්ෂණය යන තාක්ෂණික විෂය හය, කලා විෂය ධාරාවෙන් ලබා දී ඇති අතර සිසුන්ට එක් තාක්ෂණික විෂයයක් ද වෙනත් කලා විෂය දෙකක් ද තෝරාගත හැකි ය.

පසුගිය වසර පහ පුරාවට අ.පොෙ.ස. උසස් පෙළ විභාගය සඳහා එක් එක් තාක්ෂණික විෂයයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව ඇමුණුම 2හි දක්වා ඇත. මෙමඟින්, කලා විෂය ධාරාවෙන් ලබා දී ඇති තාක්ෂණික විෂයයක් තෝරාගත් සිසුන් සංඛ්‍යාව ඉතාම අඩු ප්‍රමාණයක් බව පෙනෙන අතර එයට හේතුව විශයෙන් ගුරුවරුන් සහ පහසුකම් නොමැති වීම මෙන් ම විශ්වවිද්‍යාල මට්ටමෙහි දී තාක්ෂණික අධ්‍යාපනය අඛණ්ඩව ලබා ගැනීම සඳහා ස්ථාපිත පාඨමාලා නොමැති වීම පෙන්වා දිය හැකිය. තම උදෙග්‍යාය නිසාම තාක්ෂණික විෂය තෝරාගන්නා ශිෂ්‍යයන්ට අන් විකල්පයක් නොමැති ව කලා උපාධිය ලැබීමට සිදු වේ. ග්‍රාම වෙළඳපොල සිසින් ඉල්ලා සිටිනු ලබන ශක්‍යතාව නොමැති වීම හේතුවෙන් කලා උපාධිධාරීන් අතර රැකියා විරැකියාව පැවතීම රජයේ ප්‍රධාන විශයෙන් සැලකිල්ලට භාජනය වූ කරුණක් මෙන් ම සංවර්ධනයට ද බාධාවකි. රජය විසින් කලා විෂය ධාරාවෙන් රජය විසින් කලා විෂය ධාරාවෙන් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කිරීමට ද අනෙකුත් විෂය ධාරාවලින් අධ්‍යාපනය ලබන සංඛ්‍යාව ඉහළ නංවා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීමට ද සැලසුම් කෙරේ. තාක්ෂණවේදය විෂය ධාරාව මඟින් තෘතීයික අධ්‍යාපන මට්ටම සඳහා විශ්වවිද්‍යාලවල පාඨමාලා ලබා දීම හෝ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයෙහි අවස්ථා ලබාදීම හෝ මඟින් සිසුනට සිය පළමු රැකියාව සඳහා අවශ්‍ය උපදේශනය ලබාදීම සිදු කෙරේ.



අ.පොෙ.ස. (උසස් පෙළ) සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා මාධ්‍යය සඳහා ලබා දුන් සම්මුඛ සාකච්ඡාවෙහි සාරාංශය

ත්‍රිතානය යටත් විජිත යුගයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ විශේෂයෙන් සලකා බැලිය යුතු අවස්ථා තුනක් විමර්ශනයට ලක් කළ හැකි වේ. පහත දැක්වෙන එම අවස්ථා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍ය ලෙස සැලකිය හැකිය.

I. ශ්‍රී ලංකාවේ එතෙක් පැවති සාම්ප්‍රදායික අධ්‍යාපන පද්ධතිය, ත්‍රිතානය සම්ප්‍රදායට අනුව හා යටත් විජිත යුගයේ අවශ්‍යතාවලට අනුකූල ව බටහිර ආකෘතියේ අධ්‍යාපන පද්ධතියක් බවට පත් කරනු ලැබිය. සලකනු ලබන කාල වකවානුව තුළ සිදු කරන ලද ප්‍රථම හැරවුම වන මෙම පරිවර්තනය කෙරෙහි දක්වන ලද දේශීය ප්‍රතිචාරය වූයේ, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, කර්නල් හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා වැනි විශිෂ්ට අධ්‍යාපනඥයින් විසින් අභිමහත් බහුතරයක් වන දේශයේ නියම උරුමකරුවන්ගේ අධ්‍යාපනය සහනික කරනු වස් බෞද්ධ පාසල් පද්ධතියක් නිර්මාණය කරනු ලැබීමයි.

II. දෙවන හැරවුම වූයේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගනිමින් අධ්‍යාපනය නොමිලේ ලබා ගත හැකි මධ්‍ය විද්‍යාල පනස් හතරක් නිර්මාණය කිරීමෙන් ඇරඹි අදටත් පවත්වා ගෙන යනු ලබන නිදහස් අධ්‍යාපන ව්‍යාපාරයයි.

III. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ යුගයේ පෞද්ගලික පාසල් රජයට පවරා ගනිමින්, ඇති හැකි අයට විශේෂ

යෝජිත තාක්ෂණවේදය විෂය ධාරාව යනු පැහැදිලිවම උසස් පෙළ දෙනට පවතින විෂය ධාරාවලට අලුතින් එක්වන වෙනස් ධාරාවක් බව හඳුනාගත යුතු වේ. මන්ද යත් අවශ්‍ය සහාය විෂයයන් සමඟ පුළුල් තාක්ෂණික පරාසයයක ඉගෙනීම එම විෂය ධාරාවට ඇතුළත් කිරීමය. අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව සහ ජාතික අධ්‍යාපන ආයතනය යන ස්ථානවල පැවති සාකච්ඡාවලින් සිසුන්ට එක් විෂයයක් තෝරාගත හැකි වන පරිදි නාමිකව "ඉංජිනේරු තාක්ෂණය" සහ "ජෛව-පද්ධති තාක්ෂණය" යන පුළුල් තාක්ෂණික විෂය පථ දෙක හඳුනා ගැනීමට හැකිවිය. තෝරාගත් තාක්ෂණික විෂයය ඉගෙනීම සඳහා සෘජුවම සහාය දිය හැකි විද්‍යාව, ගණිතය සහ තොරතුරු තාක්ෂණය යන විෂයවල අවශ්‍ය මූලික දැනුම ලබාදෙන "තාක්ෂණයවේදය සඳහා විද්‍යාව" යනු විෂය සංයුක්තියෙහි ඇති දෙවන විෂයයයි. සංයුක්තියෙහි ඇති තෙවන විෂයය වන්නේ දැනටමත් අ.පොෙ.ස. උසස් පෙළ විෂය ධාරාවෙහි අඩංගු විෂය ගොන්නෙන් තෝරා ගනු ලබන එක් විෂයයකි.

බාධාවන් ඇති වෙලා ජීවිත දහස් ගණනක් නැති වෙලා තිබෙනවා. ධීවර ජනතාවට විතරක් නොවෙයි, ඇත්තටම අනාගතයේදී ගොඩබිම ජීවත් වන ජනතාවටත් ගංවතුර උවදුරු හා වෙනත් කාරණාවලදී ඔවුන්ගේ ආරක්ෂාව සඳහා සහ අනාගත ක්‍රියාමාර්ග සඳහා මෙවැනි දියුණු තාක්ෂණික තත්ත්වයන් භාවිත කරන්න ක්‍රියා කළ යුතුම වෙනවා. මොකද, ස්වාභාවික ව්‍යසනයන් එන්න එන්න වැඩි වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම යෝජනා කරන්නේ නැවත ආපදාවක් එනකම් බලා ඉන්නේ නැතිව මේ දෙපාර්තමේන්තුව වැඩිදියුණු කරන්න ක්ෂණික පියවර ගත යුතුයි කියලායි. නැවත ආපදාවක් ආවාම තමයි අපි ආයෙත් කථා කරන්නේ මේක කරන්න ඕනෑ, ඒක කරන්න ඕනෑ කියලා. ඒ නිසා මේ දෙපාර්තමේන්තුවයි, ඊට අදාළ ආයතනයි නවීකරණය කරන්න අවශ්‍ය පියවර ගැනීම කළ යුතුයි. ඒ වාගේම අපි අනෙක් පැත්තට කියනවා, මේ ගැන ක්‍රියා කරන්න ඕනෑ විධියට අදාළ පුද්ගලයින් දැනුවත් කරලා, ඔවුන්ට පුහුණුව ලබා දිය යුතුයි කියලා. ස්වාභාවික විපත් ඇති වන අවස්ථාවලදී ලෝකයේ වෙනත් රටවල ගන්නා ක්‍රියාමාර්ග ගැනීමට අපේ නිලධාරීන් දැනුවත් කිරීමට, පුහුණු කිරීමට වගකීමකින් යුතුව පියවර ගත යුතුව තිබෙනවා.

අපි කියන අනෙක් කාරණය මෙයයි. අපේ අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය තවමත් දුර්වලයි. ස්වාභාවික විපත් විතරක් නොවෙයි, සුනාමි ව්‍යසනයෙන් පසුව මුළු ලෝකයම අනතුරු හැඟවීම් සඳහා විශේෂ වැඩ පිළිවෙළවල් යොදා ගෙන තිබෙනවා. විශේෂයෙන් අපට බලපාන පැසිපික් ආපදා මධ්‍යස්ථානය හරහා ලබා දෙන තොරතුරු විමර්ශනය කරන්නවත් උනන්දුවක් තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ.

ඒ නිසා අපි කියන්නේ, මෙවැනි අවස්ථාවලදී එකිනෙකාට - එහාට මෙහාට- චෝදනා කර කර ඉන්නේ නැතිව ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලායි. දැන් ඉතින් ඒක සිද්ධ වෙලා ඉවරයි. අනාගතය වෙනුවෙන් මේ සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයකට අවතීර්ණ විය යුතුයි කියන කාරණය පෙන්වා දෙමින් මේ සභාවේ අවධානය සඳහා මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

[අ.භා. 2.45]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනවල ඇති වුණු ආපදා තත්ත්වයත් සමඟ සිද්ධ වුණු මහා ව්‍යසනය පිළිබඳව ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් මේ විවාදයට සහභාගි වෙන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පසු ගිය දිනවල ඇති වුණු කුණාටුව නිසා ජීවිත 51කට වැඩි ප්‍රමාණයක් අහිමි වුණා වාගේම අතුරුදහන් වීම් ගණනාවකුත් සිද්ධ වුණා. අහිංසක පවුල්වලට නිවසේ ගෘහ මූලිකයින් අහිමි වුණා. සමහර තැන්වල ගෙදරට ප්‍රධාන ආදායම ලබා දෙන පුද්ගලයා ජීවිතක්ෂයට පත් වීම නිසා ඒ පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගයත් නැති වුණා. අද වන විට විපතට පත් වුණු ධීවර පවුල් - [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. GAYANTHA KARUNATILEKA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට විපතට පත් වුණු ධීවර පවුල් විශාල ප්‍රමාණයක්, ධීවර යාත්‍රා ආම්පන්න රැසක් අහිමි වුණු බහුතර ජනතාවක් කර කියා ගන්න දෙයක් නොමැතිව අන්දමන්ද වෙලා ළැතැවෙනවා. ඒ අයගේ ජන ජීවිත සහමුලින්ම නන්නත්තාර වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පිළිගන්නට ඕනෑ, සුළි සුළං, කුණාටු හෝ වෙනත් කාලගුණික දේශගුණික තත්ත්වයන් පිළිබඳව ආණ්ඩුවලට, විපක්ෂවලට දොස් පවරන්න බැහැ කියන එක. ඒවා ස්වභාවික ව්‍යසනයන්. එනමුත් අවදානම් තත්ත්වයන් පිළිබඳව ජනතාව නිසි ලෙස දැනුවත් කර, ජනතාවගේ ආරක්ෂාව සැපයීමේ ප්‍රධාන වගකීම රජය සතු වෙනවා.

විශේෂයෙන්ම මේ ව්‍යසනය තුළ, මේ විනාශය තුළ ජනතාව දැනුවත් නොකිරීමේ පූර්ණ වගකීම චර්තමාන රජය භාර ගත යුතුයි. ඒ වාගේම මේ ජීවිත රැසක් අහිමි වුණු මහා ව්‍යසනයකින් පසුවත් අපට දකින්නට ලැබෙන්නේ මොකක්ද? වග කිව යුතු මැතිඇමතිතුමන්ලා කුඩා දරුවන් හැසිරෙන ආකාරයට මහා විහිළුකාර ද්විත්ව රංගනයක් ක්‍රියාත්මක කරලා මුළු රටේම පුරවැසියන්ට ඒ විහිළුකාරී ද්විත්ව රංගනය නැරඹීමේ අවස්ථාව ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මහා ව්‍යසනයෙන් පසුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත්, ආපදා කළමනාකරණ ඇමතිතුමාත් මොනවාද කියන්නේ? එක් කෙනකු කියනවා, මේ ගැන දැනුම් දුන්නා කියලා. අනෙක් එක්කෙනා කියනවා, දැනුම් දුන්නේ පරක්කු වෙලායි කියලා. තවත් අවස්ථාවක එක් කෙනෙක් කියනවා, හවස 4.00ට කිව්වා කියලා. එහෙම කිව්වාම තවත් පුද්ගලයෙක් කියනවා, දැනුම් දුන්නේ ඊළඟ දවසේ උදේ පාන්දරයි කියලා. ඉතින් මේ ද්විත්ව රංගනය, අනුන්ට බෝලය පාස් කරන රංගනය, තවත් කෙනකු මත වගකීම පැටවීමේ විහිළු සහගත නාට්‍ය ජනතාවට නරඹන්න අවස්ථාව ලබා දුන්නා. "මම නොවෙයි, ඒක කරන්න ඕනෑ එයා", "මේක කරන්න ඕනෑ මෙයා", "මම නොවෙයි, මේකට වග කියන්නේ, අපෝ! මට වගකීම භාර ගන්න බැහැ" යනාදී දේවල් කියමින් සත්‍ය වශයෙන්ම ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ රජයේ ඇමතිවරුන් රඟ දැක්වූ, නවතම රූකඩ සංදර්ශනය නරඹන්නට මුළු රටටම අවස්ථාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේක නිකම් ඉදිරිපත් කරන ප්‍රකාශයක් නොවෙයි. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් කුමාර ගුණරත්න මැතිතුමා සඳහන් කර තිබෙනවා, ඔය කියන fax එක ඒ වෙලාවේ ලැබී නැති බව ඔප්පු වුණා කියලා. එතකොට ගරු අමරවීර ඇමතිතුමා කියා තිබෙනවා, ධීවර අමාත්‍යාංශයට ඒ නිවේදනය වෙලාවට යවා තිබෙනවා කියලා. ආපසු සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, ඒ අමාත්‍යාංශය මේ වරද භාර ගත යුතුයි කියලා. එතකොට අමරවීර ඇමතිතුමා කියා තිබෙනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වගකීම නිසි ලෙස ඉටු කර තිබෙනවා කියලා. ආපසු සරත් කුමාර ගුණරත්න

මැතිතුමා කියා තිබෙනවා, දෙයක් වුණාට පස්සේ මෙහෙම දෙයක් වුණා කියන්න කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවක් අවශ්‍ය නැහැ කියලා. අමරවීර මැතිතුමා කියනවා, "මේ fax එක යවලා තිබෙන්නේ වෙනදා යවන නොම්මරවලටමයි. මම කියනවා, විශේෂ කමිටුවක් දමා CID එකටත් කියලා මේ ගැන සොයන්න" කියා. එතැනින් නතර වන්නේ නැහැ. ආපහු සරත් ගුණරත්න මැතිතුමා කියනවා, "කාලගුණ නිවේදන ජනමාධ්‍යයට දැනුම් දීම මගේ කාර්යයක් නොවෙයි" කියා. පෙරළා අපේ අමරවීර මැතිතුමා කියනවා, "කමිටුව, අපදා කළමනාකරණ අමාත්‍යාංශය වරදකරු කළොත් ඇමතිකමෙන් ඉල්ලා අස් වෙනවා" කියා. මෙන්න මේක තමයි මම සඳහන් කළ ද්විත්ව රුකඩ සංදර්ශනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මොකක්ද ඇත්ත කථාව? ඇත්ත කථාව මෙන්න මේකයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අසරණයි. කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුවේ බරපතළ භෞතික මානව සම්පත් ඌනතාවක් තිබෙනවා. ඒ ඌනතාවෙන් පෙළෙනවා. නියමාකාරව කාලගුණය පිළිබඳව අනාවැකි පළ කිරීම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දුෂ්කර කාර්යයක්. බොරුවට නිලධාරීන්ට බැණලා වැඩක් නැහැ. ප්‍රමාණවත් සම්පත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයටවත් නැහැ. අමාත්‍යාංශයට ක්‍රියාත්මක වන්න ඉඩක් නැහැ. ප්‍රතිපාදන නැහැ. සම්පත් නැහැ. ඇමතිතුමනි, අඩුම තරමේ පසු ගිය ගංවතුරෙන් විපතට පත් වුණු ජනතාවට තවම නිවාස ආධාර ටික දෙන්න බැරි ආශ්චර්යවත් යුගයකයි අපි ජීවත් වන්නේ. ආපදා කළමනාකරණ ඇමතිතුමා අසරණයි. පසු ගිය දවසක මම ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමට සහභාගි වුණු අවස්ථාවේ රජයේ මන්ත්‍රීවරු මැසිවිලි නැඟුවේ, "ගංවතුර ඇවිත් දැන් වසර ගණනාවක් වෙනවා. ඇයි, මේ විපතට පත් වුණු ජනතාවට නිවාස ආධාර ටික නොලැබෙන්නේ" කියායි. ඇත්ත වශයෙන්ම අපට දැන ගන්න ලැබුණා -[බාධා කිරීමක්]ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වැදගත් ඉදිරිපත් කිරීමක් කරන්නේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Chairman of Committees, I have to bring to your kind notice the validity and the operation of the Standing Orders of Parliament, which should be strictly adhered to by the House. Sir, Standing Order No. 10 is about the Quorum, which states, I quote:

> "The quorum of Parliament required by Article 73 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka is twenty members including the person presiding. If at any time the attention of Mr. Speaker or other person presiding is directed to the fact that a quorum is not present he shall order the division bells to be rung and if at the expiration of five minutes a quorum be not present he shall adjourn Parliament without question put."

So, Sir, I raise, according to the Standing Orders, that there is no Quorum, which I am entitled to. Therefore, Sir, I am once again raising it when you are in the Chair, that you have to call for the Quorum and if the Quorum is formed, then you can continue with the Debate. If not, Standing Order No. 11 states, I quote:

> ".....If a quorum be not then present Parliament shall adjourn as provided in the preceding Order but if a quorum be proved to be present Parliament shall forthwith resolve itself into Committee."

So, Sir, according to that, you have to call for the Quorum.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Lakshman Kiriella.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, when you raise the question of Quorum, nobody can argue about it.

ගරු කිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
නැහැ, නැහැ, ඒ ගැන නොවෙයි. This is a very important Debate.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Nobody can debate that, Sir.

ගරු කිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
Debate කිරීමක් නොවෙයි අසත්‍ය ප්‍රකාශ කරන විට කියන්න ඕනෑ. ඔබතුමා දැන් කිව්වා නේ. දැන් කී වතාවක් කිව්වාද වාඩි වෙන්න. තින්දුවක් දෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lakshman Kiriella, what do you want to say?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි Parliamentary Business Committee එකේදී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කරන කොට සාමාන්‍යයෙන් Adjournment Motions සම්බන්ධයෙන් Quorum එකක් ඉල්ලන්නේ නැහැ කියලා ඇති කර ගත් එකඟතාවක් තිබෙනවා. මේක රටට බලපාන ප්‍රශ්නයක්නේ. [බාධා කිරීමක්]

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මෙතුමා කියන්නේ? මන්ත්‍රීතුමා භයද? [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
භයද?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
According to the Standing Orders - [*Interruption.*]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We have to follow the Standing Orders.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, but sometimes, - [*Interruption.*] For example, during the Budget Debate -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, you cannot allow this. I have already raised my objection - [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Will you shut up,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You shut up.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මොකක්ද මේ කියන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You sit down. - [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I am only asking you -

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I have to act according to the Standing Orders.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Chairman of Committees, kindly listen to me. පොඩ්ඩක් මම කියන දේ අහන්න. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Right, I am calling for the Quorum.

පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

පසුව ගණපූරණයක් නොතිබුණෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් 10 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 03.02ට, 2013 ජූලි මස 23වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.

பின்னர் கூட்ட நடப்பெண் சேராததனால் குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் நிலைக் கட்டளை இல. 10இன்படி வினாவின்றிப் பாராளுமன்றத்தை ஒத்திவைத்தார்கள்.

இதன்படி, பி.ப. 3.02 க்கு, பாராளுமன்றம் 2013 யூலை 23, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Later, a Quorum not being present, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament, without Question put, under Standing Order No. 10.*

Adjourned accordingly at 3.02 p.m. until 1.00 p.m. on Tuesday, 23rd July, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year.
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

218 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 218 - இல. 5
Volume 218 - No. 5

2013 ජූලි 23 වන අඟහරුවාදා
2013 யூலை 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd July, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
"ඒ" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්

විගණකාධිපතිවරයාගේ වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් :
සෙයිඩ් අබ්දුර් රහ්මාන් ජිෆ්රි මව්ලානා අනුස්මරණ අරමුදල (සංස්ථාගත කිරීමේ) – [ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා] - පළමුවන වර කියවන ලදි

අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු හුනෙයිස් ෆාරූක් මහතා] - පළමුවන වර කියවන ලදි

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදි

කල්තැබීමේ යෝජනාව:
ගම්පහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය පුළුල් කිරීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
நிலைக்குழு 'ஏ' : மேலதிக உறுப்பினர்கள்
நிலைக்குழு 'பி' : மேலதிக உறுப்பினர்கள்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
ஸெய்யித் அப்துர் ரஹ்மான் ஜிப்ரி மௌலானா ஞாபகார்த்த அறக்கட்டளை (கூட்டிணைத்தல்) - [மாண்புமிகு அல்ஹாஜ் ஏ.ஏச்.எம். அஸ்வர்] - முதன்முறை மதிப்பிடப்பட்டது

அல்ஹசன் மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ஹுனைஸ் பாரூக்] - முதன்முறை மதிப்பிடப்பட்டது

இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
கம்பஹா தேசிய போக்குவரத்து மருத்துவ நிறுவனத்தை விஸ்தரித்தல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Standing Committee "A": Additional Members
Standing Committee "B": Additional Members

AUDITOR-GENERAL'S REPORT

REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:
Seyd Abdurahiman Jiffri Mowlana Memorial Trust (Incorporation) – [The Hon. Alhaj A.H.M. Azwer] – Read the First time

Alhasan Foundation (Incorporation) – [The Hon. Hunais Farook] - Read the First time

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:
Second Reading – Debate Adjourned

ADJOURNMENT MOTION:
Expansion of Gampaha National Transport Medical Institute

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 ජූලි 23 වන අඟහරුවාදා
2013 யூலை 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd July, 2013

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

"ඒ" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
நிலையியற் குழு "ஏ" : மேலதிக உறுப்பினர்கள்
STANDING COMMITTEE "A": ADDITIONAL MEMBERS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා, 139වැනි ස්ථාවර නියෝගය යටතේ මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, එම පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "ඒ" ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි. එම නාම ලේඛනය මම **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல் :*
** List of names tabled:*

ගරු ටී. බී. ඒකනායක මහතා
ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා
ගරු විජය දහනායක මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු කරු ජයසූරිය මහතා
ගරු පොන්. සෙල්වරාසා මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු අජිත් කුමාර මහතා
ගරු දිළුම් අමුණුගම මහතා
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

මාණ්පුමිකු ඊ.පි. ඒක්කනායක්ක
මාණ්පුමිකු (කලානිති) ජගත් පාලසූරිය
මාණ්පුමිකු විජය තහනායක්ක
මාණ්පුමිකු කාමිනි ජයවික්කිරම පෙරේරා
මාණ්පුමිකු කරු ජයසූරිය
මාණ්පුමිකු පොන්. සෙල්වරාසා
මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක
මාණ්පුමිකු (තිරුමති) සන්තිරාණි පණ්ඩාර ජයසිංහ්ක
මාණ්පුමිකු අජිත් කුමාර
මාණ්පුමිකු තිලුම් අමුණුකම
මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා
මාණ්පුමිකු එස්.සී. මුත්තුකුමාරන
මාණ්පුමිකු එරික් පිරසන්න වීරවර්තන
මාණ්පුමිකු සි. සිරිදරන්
මාණ්පුමිකු (තිරුමති) මාලනී පොන්සේක්කා

Hon. T.B. Ekanayake
Hon. (Dr.) Jagath Balasuriya
Hon. Wijaya Dahanayake
Hon. Gamini Jayawickrama Perera
Hon. Karu Jayasuriya
Hon. Pon. Selvarasa
Hon. Gayantha Karunatileka
Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe
Hon. Ajith Kumara
Hon. Dilum Amunugama
Hon. Lakshman Wasantha Perera
Hon. S.C. Mutukumarana
Hon. Eric Prasanna Weerawardhana
Hon. S. Shritharan
Hon. (Mrs.) Malani Fonseka

II

"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්
நிலையியற் குழு "பி" : மேலதிக உறுப்பினர்கள்
STANDING COMMITTEE "B" : ADDITIONAL MEMBERS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා, 139වැනි ස්ථාවර නියෝගය යටතේ මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, එම පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි. එම නාම ලේඛනය මම **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද නාම ලේඛනය:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல் :*
** List of names tabled:*

ගරු දුමින්ද දිසානායක මහතා
ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
ගරු පී. හැරිසන් මහතා

[ගරු කථානායකතුමා]

ගරු අර්ජුන රණතුංග මහතා
ගරු එස්. විනෝ මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු පී. අරියනේත්‍රන් මහතා
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

மாண்புமிகு துமிந்த திசாநாயக்க
மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா
மாண்புமிகு பீ. ஹரிசன்
மாண்புமிகு அர்ஜுன ரணதுங்க
மாண்புமிகு எஸ். வினோ
மாண்புமிகு (திருமதி) தலதா அதுகோரல
மாண்புமிகு அகில விராஜ் காரியவசம்
மாண்புமிகு பா. அரியநேத்திரன்
மாண்புமிகு மொஹான் லால் கிரேரு
மாண்புமிகு (டாக்டர்) ரமேஷ் பதிரண
மாண்புமிகு ஹரின் பர்னாந்து
மாண்புமிகு (டாக்டர்) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே
மாண்புமிகு சாந்த பண்டார
மாண்புமிகு உதித் லொக்குபண்டார
மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க

Hon. Duminda Dissanayake
Hon. Gamini Wijith Wijayamuni De Zoysa
Hon. P. Harrison
Hon. Arjuna Ranatunga
Hon. S. Vino
Hon. (Mrs.) Thalatha Atukorale
Hon. Akila Viraj Kariyawasam
Hon. P. Ariyanethran
Hon. Mohan Lal Grero
Hon. (Dr.) Ramesh Pathirana
Hon. Harin Fernando
Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle
Hon. Shantha Bandara
Hon. Udith Lokubandara
Hon. Neranjan Wickramasinghe

III

"බී" ස්ථාවර කාරක සභාව : අතිරේක සාමාජිකයන්

நிலையியற் குழு "பி" : மேலதிக உறுப்பினர்கள்

STANDING COMMITTEE "B" : ADDITIONAL MEMBERS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

"ශ්‍රී ලංකා පරිගණක සංගමය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවේ සභාපති වශයෙන් නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපති ගරු චන්දිම වීරක්කොඩි මහතා, 139වැනි ස්ථාවර නියෝගය යටතේ මවිසින් පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

තවද, එම පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස "බී" ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි. එම නාම ලේඛනය මම **සභාගත*** කරමි.

සභාමේසය මත තබන ලද නාම ලේඛනය:
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல் :*
** List of names tabled:*

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
ගරු අර්ල් ගුණසේකර මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ආර්. යෝගරාජන් මහතා
ගරු ඒ. විනායගමූර්ති මහතා
ගරු සනත් ජයසූරිය මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු රුවන් රණතුංග මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු ඊ. සරවනපවන් මහතා

மாண்புமிகு ரெஜினோல்ட் குரே
மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க
மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார
மாண்புமிகு ஏர்ல் குணசேக்கர
மாண்புமிகு இந்திக்க பண்டாரநாயக்க
மாண்புமிகு விஜித ஹேரத்
மாண்புமிகு ஆர். யோகராஜன்
மாண்புமிகு அ. விநாயகமூர்த்தி
மாண்புமிகு சனத் ஜயசூரிய
மாண்புமிகு மனுஷ நாணாயக்கார
மாண்புமிகு புத்திக பதிரண
மாண்புமிகு அஜித் பீ. பெரேரா
மாண்புமிகு ருவன் ரணதுங்க
மாண்புமிகு இரான் விக்கிரமரத்ன
மாண்புமிகு ஈ. சரவணபவன்

Hon. Reginold Cooray
Hon. Patali Champika Ranawaka
Hon. A.P. Jagath Pushpakumara
Hon. Earl Gunasekara
Hon. Indika Bandaranayake
Hon. Vijitha Herath
Hon. R. Yogarajan
Hon. A. Vinayagamoorthy
Hon. Sanath Jayasuriya
Hon. Manusha Nanayakkara
Hon. Buddhika Pathirana
Hon. Ajith P. Perera
Hon. Ruwan Ranatunga
Hon. Eran Wickramaratne
Hon. E. Saravanapavan

විගණකාධිපතිවරයාගේ වාර්තාව

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

AUDITOR-GENERAL'S REPORT

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ I සහ II වැනි කොටස් සහ 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ II වැනි කොටස මම ඉදිරිපත් කරමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

(i) 2011 වර්ෂය සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2012 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2010 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010 සහ 2011 වර්ෂ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තා.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මීළඟට, 7වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසි වාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු ඩිව් ගුණසේකර මහතා විසින් පිළිගැන්වීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අප කමිටුව මුලින්ම වැඩ ආරම්භ කළේ 2010 ජූලි 08වැනි දිනයි. පළමු වසර, එනම් 2010-2011 කාල පරිච්ඡේදය තුළදී විමර්ශනයට ලක් කරනු ලැබූ රාජ්‍ය ආයතන සංඛ්‍යාව 229කි. මෙවර, එනම් 2012-2013 කාල පරිච්ඡේදය තුළදී අප කමිටුව රාජ්‍ය ආයතන 244ක් විමර්ශනයට ලක් කළා. ඉන් ආයතන 32ක් පිළිබඳව අතුරු වාර්තාවක් මා විසින් 2012 ඔක්තෝබර් 25වන දින මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබුවා. අද ඉදිරිපත් කරනු ලබන වාර්තාව ඉතිරි ආයතන 212 පිළිබඳවයි.

ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාදායකයේ ඉතිහාසයේ පළමු වරට පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටුවකට පවරනු ලැබූ සියලු ආයතන විමර්ශනයට ලක් කිරීමට හැකි වීම මෙතෙක් ලබා නොගත් ජයග්‍රහණයක්. එය ඔබතුමාගේ නායකත්වය යටතේ සිදු කිරීමට ලැබීම ගැන අප ඉමහත් සේ සතුටු වෙනවා.

පළමුවෙන්ම මෙම කාර්යය ඉටු කරලීමට මට සහාය දුන් අනු කමිටුවල සභාපතිවරුන් වන ගරු සුසිල් ප්‍රේමජයන්ත, ගරු ලසන්ත අලගියවන්න සහ ගරු කරු ජයසූරිය යන මැති ඇමතිතුමන්ලාගේ දැඩි කැපවීම මා ඉහළින්ම අගය කරනවා. එමෙන්ම කමිටුවේ සියලුම සාමාජික මන්ත්‍රීතුමන්ලාට මීට සහයෝගය ලබා දීම සහ ක්‍රියාකාරී ලෙස සහභාගී වීම ගැන මගේ ගෞරවය පිරිනමනවා.

ගරු කථානායකතුමනි, මෙතරම් විශාල ආයතන සංඛ්‍යාවක් විමර්ශනය කිරීම, සාක්ෂි සටහන් කිරීම, සාක්ෂි විග්‍රහ කිරීම එමෙන්ම පිටු 320ක වාර්තාවක් සකස් කිරීම එතරම් පහසු හා සරල කාර්යයක් නොවෙයි. මාස 15ක් තුළ දී ඇතැම් විට

[ගරු ඩිව් ගුණසේකර මහතා]

පාර්ලිමේන්තුව රැස් නොවන දිනවලදී පවා රැස් වෙමින් උදේ සිට රෑ බෝ වන තෙක් අතිරේක වියදමක් නොදරා මෙම කටයුතුවල යෙදුණු කමිටු ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මා බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මෙම කාර්යයේදී අප කමිටුවට ප්‍රබලව සහාය දුන් විගණකාධිපතිතුමා, නියෝජ්‍ය විගණකාධිපතිවරුන් ඇතුළු එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත්, මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් පැමිණි පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ සහ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ද අපේ ස්තුතිය හිමි වෙනවා.

මේ වාර්තාව තුළින් අපේ සොයා ගැනීම්, නිරීක්ෂණ හා නිර්දේශ පොදු වශයෙන් මෙන්ම නිශ්චිතව අප ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව විස්තරාත්මක කරුණු ඉදිරිපත් කිරීමට මේ අවස්ථාවේ මා අදහස් කරන්නේ නැහැ. අප විශ්වාස කරනවා, මේ වාර්තාව විධායකයේ අවධානයට යොමු වනු ඇතැයි කියා. වාර්තාව පිළිබඳව විවාදය පැවැත්වෙන අවස්ථාවේදී කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වනවා. ගරු මන්ත්‍රීතුමන්ලාට පහසු වන පරිදි අප මෙවර වාර්තාව තුළින් රාජ්‍ය වාණිජ ආයතනවල ලාභ ලබන, ලාභ වැඩි කර ගෙන ඇති, ලාභ අඩු වී ඇති, අලාභ ලබන, දිගටම අලාභ ලබන, අලාභ අඩු වී ඇති, අලාභ ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් වී ඇති වශයෙන් වර්ගීකරණයක් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, 2009 සහ 2010 වර්ෂ සඳහා මේ වන තෙක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නැති ආයතන හඳුනා ගෙන ඒ විස්තර ඔබතුමා වෙත අප ඉදිරිපත් කර තිබෙනවා. 2009 වර්ෂයේදී මෙම ආයතනවලින් සියයට 81ක් තමයි වාර්ෂික වාර්තා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ තත්ත්වය 2010 වර්ෂයට සියයට 70ක්; 2011 වර්ෂයට සියයට 25ක්. නමුත් මින් පෙර වර්ෂවලට සාපේක්ෂව බැලුවොත් සමහර ආයතන වර්ෂ 10ක් ගත වන තෙක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. දැන් ඒ තත්ත්වය වඩාත් සතුටුදායක තත්ත්වයක තිබෙන බව වාර්තා කරන්නට ඕනෑ.

එමෙන්ම ලාභ අලාභ ගණන් නොබලන හා වාණිජ නොවන රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒවා නියාමක, සංවර්ධන, ප්‍රවර්ධන, අධ්‍යාපනික, පර්යේෂණ ආයතන, මණ්ඩල, කොමිෂන් සභා, අධිකාරි වශයෙන් විවිධ වූ රාජ්‍ය ආයතනයි. ඒවායේ තත්ත්වය වෙන් වෙන් වශයෙන් පෙන්වා තිබෙනවා. විගණකාධිපතිවරයා විසින් ඇතැම් ආයතනවල ගිණුම් අසතුටුදායක බවත්, තවත් ආයතනවල ගිණුම් ප්‍රතික්ෂේප කරන බවත් වාර්තා කිරීමට අපට සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නා පරිදි මෙම ගරු සභාව තුළ නිරන්තරවම COPE වාර්තාවල අන්තර්ගත කරුණු පිළිබඳව පසුවිපරම් කර බැලීම ගැන ප්‍රශ්නය මතු කොට තිබෙනවා. ඒ පිළිබඳ වගකීම් පළමු වරට අප මතම පවරා ගනිමින් ක්‍රියා කිරීමට පසු ගිය වසර තුළ අප කටයුතු කළා. මා විසින් ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබූ පළමු වාර්තාව ඉතිහාසයේ පළමුවරට අප අමාත්‍ය මණ්ඩලයට යොමු කරනු ලැබුවා. ඒ අනුව අපේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබ, ගරු අමාත්‍යවරුන්ට ඒ පිළිබඳව අධීක්ෂණය කිරීමේ වගකීම ද පවරනු ලැබුවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රජයේ ප්‍රධාන ගිණුම් නිලධාරින් වන්නේ අමාත්‍යාංශ ලේකම්වරුන් ය. ඔවුන් ව්‍යවස්ථාදායක සභ විධායකය සම්බන්ධීකරණය කරන පුරුකයි. අප ඔවුන් සමඟ කමිටු වාර්තා පිළිබඳව ගැඹුරින් සහ දීර්ඝ ලෙස සාකච්ඡා කළා. එසේම කොළඹ සහ පළාත් මට්ටමේ සියලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් කැඳවා සම්මන්ත්‍රණ මාර්ගයෙන් මූල්‍ය පාලනය පිළිබඳව දැනුවත් කිරීම් සිදු කළා. මෙහිදී මාධ්‍ය ක්ෂේත්‍රය විසින් සිදු කළ දායකත්වය අප ඉහළින් අගය කරනවා. සෑම පුවත් පතකම COPE වාර්තාව පිළිබඳව කතුවැකි පළ වුණා. ඔවුන්ගේ සංවර්ධනාත්මක විවේචන මූල්‍ය විනයට මහත් සේ බලපා තිබෙනවා. සමස්ත රාජ්‍ය සේවය තුළම මූල්‍ය පාලනය සහ මූල්‍ය විනය පිළිබඳව අවබෝධයක්, අවදි කිරීමක් ඇති කිරීමට මෙයින් හැකි වුණා.

අද, "COPE" කියන වචනය නිරතුරුවම කථා බහට ලක් වෙන යෙදුමක් බවට පත්වී තිබෙනවා. මේ සියලු පියවර රාජ්‍ය සේවයට යම් බලපෑමක් එල්ල කර තිබෙන බව කිව යුතුයි.

ආයතනවලට ගොස් පරීක්ෂා කරලීම ද අප ආරම්භ කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත අප කමිටුව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි සම්බන්ධයෙන් තත්ත්ව වාර්තාවක් දැන් අපට ලැබී තිබෙනවා. සාක්ෂි සහ කරුණු ප්‍රමාණවත් නොවීම නිසා පැමිණිලි 13න් 10ක් අහෝසි කරනු ලැබ තිබෙනවා. ඉතිරි 3 අධිකරණයට යොමු කර තිබෙනවා. එමෙන්ම තවත් කරුණු අධිකරණයට යොමු කිරීම සඳහා තවදුරටත් ගැඹුරින් විමර්ශනය කරනු ලබනවා.

ආනයනය කරනු ලැබූ කළවම් කරන ලද බනිජ තෙල් සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කිරීමට අප කමිටුව විගණකාධිපතිතුමා වෙත බලය පැවරුවා. දැන් එම වාර්තාව ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කර තිබෙනවා. මුද්‍රණය වූ පසු එම වාර්තාව ඔබතුමන්ලාට ලැබෙනවා ඇති.

ගරු කථානායකතුමනි, අප කමිටුව 2010 ජූනි 08වැනි දා වැඩ ආරම්භ කිරීමෙන් පසු ගතවූ වසර තුන තුළ අවසන් වාර්තා දෙකක් සහ අතුරු වාර්තාවක් ඉදිරිපත් කොට තිබෙනවා. ඒවායේ සාධනීය ප්‍රතිඵල රාජ්‍ය ආයතන දැන් පෙන්වන වාර්තාවලින් දැක ගත හැකියි. සියලු රාජ්‍ය වාණිජ ආයතන පාඩු ලබන ඒවා බවට සමාජය තුළ මතයක් ගොඩ නැඟී තිබෙනවා. එය පවතින යථාර්ථයෙන් තොරයි. ලාභ අලාභ ගණන් බලන රාජ්‍ය වාණිජ ආයතන 72ක් අතරින් 2011 වසරේදී ඇත්ත වශයෙන් පාඩු ලැබූ ආයතන සංඛ්‍යාව 16ක් පමණයි. දිගින් දිගටම පාඩු ලබා ඇති සංඛ්‍යාව 14කි. එක් වර්ෂයක් තුළ ලබන මුළු අලාභයෙන් සියයට 98ක් ම වාගේ අදාළ වන්නේ ආයතන 4කටයි. ඒවා, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව, "එයාර්ලංකා" සහ "මිහින් එයාර්" ආයතනයි. මෙසේ අලාභ ලැබීමට හේතුවූ සාධක බොහෝයි; විවිධයි. ඉදිරි විමර්ශනවලදී අප වැඩි හා දැඩි අවධානය යොමු කරන්නේ අලාභ ලබන ආයතන සම්බන්ධයෙන් බව මා මේ ගරු සභාවට දන්වා සිටීමට කැමැතියි.

මූල්‍ය පාලනය සහ මූල්‍ය විනය ඇති කිරීම අපේ කමිටුවට පමණක් කළ හැකි දෙයක් නොවේ. අප අධීක්ෂණ කමිටුවක් පමණයි. අප කටයුතු කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාමුව තුළ සිටිමින්. අප ක්‍රියා කරන්නේ විගණකාධිපතිතුමා හරහායි. පොලීසියෙන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් හෝ අධිකරණයෙන් අපේක්ෂා කරන දේ අප කමිටුවෙන් අපේක්ෂා කළ යුතු නැත. අප ක්‍රියා කරන්නේ ව්‍යවස්ථාදායකය වෙනුවෙන් පමණයි. මා මෙහිදී යළිත් අවධාරණයෙන් කිව යුතු දෙයක් නම්, මූල්‍ය පාලනය පිළිබඳ ජනතාව වෙත ඇති වගකීම පැවරී තිබෙන්නේ මෙම ව්‍යවස්ථාදායකයට බවයි. එම වගකීම අප සාමූහිකව දැරිය යුතුය. අප ඉදිරියේදී -ලබන සැප්තැම්බර් මාසයේ සිට- මාස තුනෙන් තුනට -ත්‍රෛමාසිකව- කමිටු වාර්තා ඔබතුමා වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා. ඔබතුමන්ලාට වැඩි-වැඩියෙන් විවාද කිරීමට අවස්ථාවක් ඒ මඟින් සැලසෙනවා ඇති. මෙම වාර්තාව භාෂා තුනෙන්ම මුද්‍රණය කොට බෙදා හැරීමට ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. ස්තුතියි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

පළමුවෙන්ම ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් සම්බන්ධ කර ගෙන දීර්ඝ කාලයක් මෙම සමීක්ෂණ කටයුතු කර, වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධව. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මෙම වාර්තාව මුද්‍රණය කර ලැබෙන කල් අපට ඒ වාර්තාව සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවේ විවාද කිරීමට නොහැකි වීමයි. මෙම වාර්තාව මුද්‍රණය කරන්න ගියාම තව මාස දෙකක්, මාස තුනක් ගත වනවා. මෙම වාර්තාව cyclostyle කරලා හෝ photocopy කරලා හෝ අපේ මන්ත්‍රීවරුන් අතට ඉක්මනින් දුන්නොත් අපට ඊළඟ සැසි වාරයේදී හෝ ඊට පසු සැසි වාරයේදී හෝ මේ වාර්තාව සම්බන්ධයෙන් විවාද කරන්න පුළුවන්. එහෙම නොවුණොත් මාස 15ක් තිස්සේ මෙතුමා මහන්සි වෙලා කරපු දේ හරියට අශ්වයා පැන ගියාට පස්සේ ඉස්තාලය වැහුවා වාගෙ වෙනවා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

මේ වාර්තාව වාගේ එකක් නම් වහාම බෙදන්න පුළුවන්. මේක මුද්‍රණය කර නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

පිටපත් ටිකක් හදලා දෙන්න.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

පුළුවන්. පුළුවන්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Cyclostyle කරලා දෙන්න. නැත්නම් තමුන්නාන්සේගේ මහන්සියේ ප්‍රතිඵලයක් නැහැ. මාස පහළොවක් තිස්සේ මේ කටයුත්ත කරලා තිබෙනවා. දැන් මා අහගෙනයි කියනවා, මීට පස්සේ මාස තුනෙන් තුනට අතුරු වාර්තාවක් දෙනවාය කියා. ඒක බොහොම හොඳයි. එහෙම කළේ නැත්නම් මොකද වෙන්නේ? මේ වැරදි කරපු මිනිස්සු පැනලා ගියාට පස්සේ අප මෙතැන කෑ ගහලා වැඩක් නැහැ. එම නිසා ගරු කථානායකතුමනි, මේ පිළිබඳව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මොන ක්‍රමයකින් හෝ මොන තාක්ෂණය හෝ යොදවා හැකි ඉක්මනින් මේ වාර්තාව සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්නට සලස්වන්න. ඊළඟ අය වැයට ඉස්සෙල්ලා මේ වාර්තාව විවාදයට ගන්න ඕනෑ. [බාධා කිරීමක්] මේ වාර්තාව හංගන්න හදන්න එපා, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ කාරණයට අපේ අවධානය යොමු කළා. අප ඒ ගැන කටයුතු කරනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය "යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

1. පෝද්දල, හවිපෙගෙ වත්තෙහි පදිංචි කේ.යූ.ජී.බුද්ධික ප්‍රියන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; හා

2. බද්දේගම, ඉඳිගස්කැටිය, ඉසුරුපුර අංක 39 දරන ස්ථානයෙහි පදිංචි රෝහිත මද්දගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය - පැමිණ නැත.
ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)

ගරු කථානායකතුමනි, මාතර, රත්මලේ, "ඉඳුනිල්" නිවසෙහි පදිංචි කේ.එම්.අයි. ශිරෝමිණී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා - පැමිණ නැත.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නිල්වලා ගඟ ව්‍යාපාරයේ කිරල කැලේ ප්‍රදේශය : ලවණ ජලය කාන්දුවීම
நில்வள கங்கை திட்டத்தின்கீழான கிரளகலே பிரதேசம் : உவர் நீர்க் கசிவு
KIRALA KALEY AREA UNDER NILWALA GANGA SCHEME : SEEPAGE OF BRACKISH WATER

2443/'12

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) නිල්වලා ගඟ ව්‍යාපාරයේ පළමු අදියරට ඇතුළත් වූ කිරල කැලේ ප්‍රදේශයේ තෙත් බිම් හෙක්ටයාර් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ පිටාර ගැලීම වැළැක්වීම සඳහා කිරල කැලේ හා අවට ප්‍රදේශවල වැසි ජලය නිරන්තරයෙන් පොම්ප කිරීමක් සිදුවන බවත්;

(ii) එකී තත්ත්වය නිසා එම ප්‍රදේශවල භූගත ජල ප්‍රමාණය අඩුවී පසට ලවණ ජලය කාන්දුවීමක් සිදුවන බවත්;

(iii) එමඟින් ඇතිවන පරිසර තත්ත්වය හේතුවෙන් කිරල කැලේ තෙත් බිම ආශ්‍රිත කුඹුරු පුරන්වී එම ගොවි ජනතාවගේ ජීවන මාර්ග අවහිරවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(iii) හි සඳහන් ගැටලුකාරී තත්ත්වය වෙනස් කර ගැනීම සඳහා කද්දුව ජල පොම්පාගාරයට පහළින් අමුණක් තනා කිරල කැලේ ප්‍රදේශයට ජලය සැපයීමේ සැලසුමක් පවතින්නේ දැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

නීර්ප්පාසන, නීර්වළ මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) நில்வள கங்கை திட்டத்தின் முதலாம் கட்டத்திற் குட்பட்ட கிரளகலே பிரதேசத்தின் ஈரநிலப் பிரதேசத் தில் எத்தனை ஹெக்டயர் காணி உள்ளதென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) நில்வள கங்கை பெருக்கெடுப்பதை தடுப்பதற்கு கிரளகலே மற்றும் அதனை அண்டிய பிரதேசத் தில் எப்போதும் மழை நீர் இறைக்கப்பட்டு வருகின்றதென்பதையும்;

(ii) இந் நிலைமையின் காரணமாக இப்பிரதேசங் களில் நிலக்கீழ் நீர் குறைவடைந்து மண்படை களுக்குள்ளே உவர் நீர்க் கசிவு ஏற்படுகின்றது என்பதையும்;

(iii) இதனால் ஏற்படுகின்ற சுற்றாடல் நிலைமை களின் காரணமாக கிரளகலேயின் ஈரநிலம் சார்ந்த வயல்கள் செய்கைபண்ணப்படாது விவசாயிகளின் வாழ்வாதாரம் பாதிக்கப் பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(இ) மேற்படி (ஆ) (iii) இல் குறிப்பிடப்பட்டுள்ள சிக்கலான நிலையை மாற்றியமைப்பதற்காக கத்தூவ நீர் பம்பி நிலையத்திற்கு கீழே அணைக்கட்டொன்றை அமைத்து கிரளகலே பிரதேசத்திற்கு நீர் வழங்குவதற் கான திட்டமேதும் உள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he state the number of hectares of wetland in the Kirala Kaley area which came under phase one of the Nilwala Ganga Scheme?

(b) Is he aware that -

(i) rainwater is constantly pumped out from Kirala Kaley and surrounding areas in order to prevent the river Nilwala from overflowing;

(ii) as a result of the aforesaid situation, the water table in the aforesaid areas goes down and brackish water seeps into the soil; and

(iii) paddy fields surrounding Kirala Kaley have gone fallow and livelihoods of those farmers have been hindered due to the consequent environmental condition?

(c) Will he inform this House whether there is a plan to provide water to Kirala Kaley area by building an anicut below the Kadduwa Pump House in order to remedy the problematic situation mentioned in (b) (iii) above?

(d) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) නිල්වලා ගඟ ව්‍යාපාරයේ පළමු අදියරට ඇතුළත් කිරල කැලේ තෙත් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1983කි.

(ආ) (i) නිල්වලා ගඟ පිටාර ගැලීම වැළැක්වීම සඳහා නිරන්තරයෙන් පොම්ප කිරීමක් සිදු නොවේ. යල හා මහ කන්න දෙකේදී බිත්තර වී පැළවීම, පොහොර ගැසීම, අස්වනු නෙළීම යන සාධකවලට ගොවීන්ගේ ඉල්ලීම මත පොම්ප කරනු ලැබේ. තවද ජල ගැල්මකදී ජනතාව බෙරා ගැනීම හා අනිකුත් යටිතල පහසුකම් පවත්වා ගැනීම සඳහා පොම්ප කරනු ලැබේ.

(ii) පොම්ප කිරීමේ හේතුවෙන් ලවණ ඇතුල් වීම පිළිබඳව මෙතෙක් වාර්තා වී නැති අතර, නිල්වලා ගඟේ ජල ප්‍රමාණයන් අඩු වීම නිසා ගඟ දිගේ ඉහළට ලවණ ඇතුල් වන බවට වාර්තා වී ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සැලසුමක් පවතින අතර, මේ සඳහා ජලය නිහ කාල සීමාවේ ගඟෙහි ජල මට්ටම පවත්වා ගත යුතු වන බැවින් ඒ සඳහා දිගිලි ඔය සෑදීමටත්, කිරල කැලයට ජලය ගැනීම සඳහා කද්දුව ප්‍රදේශයෙන් ජලය ඇතුල් කිරීමටත් යෝජනා වී ඇත.

(iii) පොම්ප කිරීම හේතුවෙන් කිරල කැලේ තෙත් බිම් ආශ්‍රිත කුඹුරු පුරන් වී එම ගොවි ජනතාවගේ ජීවන මාර්ග අවහිර වීමක් පිළිබඳව වාර්තා වී නොමැත. එහෙත් පහත් බිම් වගා කිරීම සඳහා අවශ්‍ය ජලය ඉවත් කර දීම පොම්පාගාරය මඟින් සිදු කරයි.

(ඇ) කද්දුව පොම්පාගාරයට පහළින් ගඟ හරහා අමුණක් තනා ජලය සැපයීමට කලින් යෝජනා වී තිබුණි.

එහෙත් කිරල කැලේ ප්‍රදේශයට ජල අවශ්‍යතාව ඇති වන්නේ ගඟෙහිද ජල ප්‍රවාහය අඩු, පායන කාලවලදී ය. එසේ ජලය හැරවීමෙන් ගඟෙහි මෝයකට සිට ඉහළට කිලෝමීටර් 14ක් පමණ දිගක් කරදියට බිලිවන බැවින් එම කිලෝමීටර් 14 දෙපස පවතින කිරල කැලේ හා කඩවැද්දුව ව්‍යාපාරවල ලවණතාවයට අභිතකර ලෙස බලපෑ හැකි වන අතර, ගඟ පහළ තිබෙන ආරවල්ද එම බලපෑමට යට විය හැකිය. එහෙත් මෝයකටට තරමක් ආසන්නයේ සෑදීමට නියමිතව ඇති ලවණ බාධකය ඉදිකිරීමෙන් අනතුරුව කද්දුව ආසන්නයෙන් ගඟෙහි ලවණ මිශ්‍ර නොවූ ජලය ලබා ගැනීමේ සැලසුමක් පවතී.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් කරන්නට යෙදුණා, කිරල කැලේ ප්‍රදේශයට අයත් හෙක්ටයාර් 1983කට අදාළ ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන්ම ලවණ ඇති වන්නේ ගඟට ඉහළින් මුහුදේ සිට පැමිණෙන කරදිය නිසාය කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

බොහොම කෙටියෙන් අහන්නේ, ගරු කථානායකතුමනි. ගොවි ප්‍රදේශයකට අදාළ ප්‍රශ්නයක් අහන්නේ.

ප්‍රදේශයේ ගොවි ජනතාව දිගින් දිගටම සඳහන් කරන්නේ මෙම ප්‍රදේශය අවුරුදු දහස් ගණනකට කලින් පැවැති මුහුදු කළපුවක් වීම නිසා කේශාකර්ෂණය හරහා පොළොවේ යට තිබෙන ලවණ ඉහළට එනවාය කියන එකයි. ඒ ගැන මෙතෙක් වාර්තා වෙලා නැති නිසාත්, ගොවි ජනතාව මෙහෙම කියන නිසාත්, ඔබතුමාගේ නිලධාරි මණ්ඩලය මේ ප්‍රදේශයට යවලා, ගොවි සංවිධානත් එක්ක සාකච්ඡා කිරීමටත්, මේ ගොවීන්ගේ හඬට කන් දෙමින් ඒ ගැන පරීක්ෂණයක් කිරීම සඳහාත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නට පුළුවන්ද කියලා මා අහන්න කැමැතියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

එවැනි දෙයක් අවශ්‍ය වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. එම ගඟේ ජලය බැසයාම පිළිබඳව දීර්ඝ කාලීන දත්ත හා වාර්තාවන් අප සතුව තිබෙනවා. විශාල ජල කඳක් එනකොට, එහි ලවණ තිබෙනවා නම් ඒවා පහළට ගලාගෙන ගිහින් ඉවර වෙනවා. නමුත් නැවත ලවණ එන්නේ මුහුදේ ඉඳන්. ඒ නිසා ඒ පිළිබඳව මම විශ්වාසය තබන්නේ මගේ තාක්ෂණික නිලධාරින් ලබා දී තිබෙන වාර්තා ගැන. ඒ නිසා මම හිතන්නේ නැහැ, එවැනි දෙයක් කිරීමට අවශ්‍ය වෙයි කියලා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. තාක්ෂණික නිලධාරින්ගේ වාර්තා මතම පදනම් වෙද්දී සාම්ප්‍රදායික ගොවි ජනතාවගේ දැනුම අවතක්සේරු කරන්න අපිට බැහැ. මොකද, සමහර තාක්ෂණික නිලධාරින් නොදන්නා දේ සම්ප්‍රදායික ගොවි ජනතාව දන්නවායි කියන දේ ඔබතුමා දන්නවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඇයි ඇමතිතුමාගේ හිත නැවෙන්නේ නැත්තේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

සිත නැවෙන්නේ නැත්තේ ඔවැනි ඉල්ලීමක් ගොවි සංවිධානවලින් කරලා නැති නිසායි. නමුත් අපට ඉතාම පැහැදිලිව පෙනෙනවා ගරු කථානායකතුමනි, එවැනි තත්ත්වයක් එතැන නැහැ කියලා. ඒ නිසා මේ ගැන කාලය නාස්ති කිරීමෙන් වැඩක් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්නය අහන කොට මන්ත්‍රීතුමා, ඇමතිතුමා දුන් පිළිතුර නැවත කියන්න එපා. ප්‍රශ්නය කෙටියෙන් අහන්න, අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය. මෙම ප්‍රදේශයේ කුඹුරු හෙක්ටයාර් 1983න් සැලකිය යුතු ප්‍රමාණයක් වගා කරන්නට බැහැ. මොකද, මේ කරදිය පිළිබඳ ප්‍රශ්නය නිසා; මේ ලවණ පිළිබඳ ප්‍රශ්නය නිසා. ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධව මේ ප්‍රදේශයේ වගා කරන්නට පුළුවන් වී වර්ග හඳුන්වා දීමට යද්දී දිගින් දිගටම ඇති වන ප්‍රශ්නය තමයි වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ඒකට ලැබෙන සහයෝගය මදියි කියන එක. මොකක්ද, මේ සම්බන්ධයෙන්අමාත්‍යාංශයට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මොකක්ද මදියි කියලා කියන්නේ? මොනවාද ඉල්ලලා තිබෙන්නේ, මොනවාද අපි දීලා නැත්තේ කියලා ඔබතුමා කරුණාකරලා කියන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඉල්ලුම අනුව සැපයුම ඔබතුමා කියන විධියට කළා නම් මෙච්චර හෙක්ටයාර් ගණනක් පුරන් වෙලා තිබෙන්නේ ඇයි?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අපට කරන්න පුළුවන්, තාක්ෂණික තොරතුරු ලබා දීම පමණයි. කෘෂි කර්මාන්තය පිළිබඳව ඒ තීරණ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලබා ගන්න ඕනෑ. අපෙන් ඉල්ලා තිබෙන සියලු තොරතුරු අපි ලබා දීලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මමත් කෘෂිකර්ම ඇමැති හැටියට ඉන්න විට එහි අක්කර 1,250ක් වගා කළා. ඒ නිසා බැරිකමක් නැහැ.

ප්‍රශ්න අංක 2 - 2584/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා යුද හමුදාව : මස් සැපයුම්කරුවන්
இலங்கை இராணுவம் மாமிச வகை வழங்குநர்
SRI LANKA ARMY : SUPPLIERS OF MEAT

2875/'12

3. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවේ ආහාර සඳහා මස් වර්ග ලබා දුන් සැපයුම්කරුවන්ගේ නම් කවරේද;

(ii) යුද හමුදාව සඳහා මස් සැපයුම්කරුවන් තෝරා ගන්නා ආකාරය කවරේද;

(iii) එම කාලය තුළ එක් එක් මස් වර්ගය සඳහා වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ සඳහා තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) ඉහත සඳහන් මස් වර්ගවල එක් කිලෝවක් සඳහා වාර්ෂිකව ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් මස් වර්ගයේ වාර්ෂික අවශ්‍යතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2005ஆம் ஆண்டு முதல் இன்று வரை இலங்கை இராணுவப் படையினரின் உணவுக் காக மாமிச வகைகளை வழங்கிய வழங்குநர் களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) இராணுவப் படைக்கான மாமிசம் வழங்குநர்கள் தெரிவுசெய்யப்படும் விதம் யாது என்பதையும்;

(iii) மேற்படி பகுதியினுள் ஒவ்வொரு மாமிச வகைக் காகவும் வருடாந்தம் செலுத்தப்பட்ட மொத்தப் பணத்தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) இதற்காக மேலும் செலுத்தப்பட வேண்டியுள்ள பணத்தொகை யாதென்பதையும்;

(v) மேற்குறிப்பிடப்பட்ட மாமிச வகைகளில் ஒரு கிலோவுக்காக வருடாந்தம் செலுத்தப்பட்ட பணத் தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(vi) மேற்குறிப்பிடப்பட்ட ஒவ்வொரு மாமிச வகை யினதும் வருடாந்த தேவைப்பாடு வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -
(i) the names of the suppliers that supplied meat for the consumption of Sri Lanka Army from the year 2005 up to now;
(ii) the procedure followed in the selection of meat suppliers for Sri Lanka Army;
(iii) total amount of money that was paid for each variety of meat annually;
(iv) the amount of money to be paid for that;
(v) separately, the amount of money paid, for a kilo of the aforesaid varieties of meat annually; and
(vi) separately, the annual requirement of the each variety of meat?

(b) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සී/ස වික්‍රමරත්නස් (පුද්) සමාගම
කරුණාරත්න ට්‍රේඩර්ස් (පුද්) සමාගම
එස්.එම්.ඒ. අසීස් සහ සහෝදරයෝ (පුද්) සමාගම
ඒ.එස්.ආර්. (පුද්) සමාගම
එච්.ටී. ජිනදාස (පුද්) සමාගම
සී/ස ෆිලික්ස් පෙරේරා (පුද්) සමාගම
මදාර් කන්ස්ට්‍රක්ෂන්ස්
අසීස් පුත්‍රයෝ (පුද්) සමාගම

රොහාන් රොඩ්රිගෝ (පුද්) සමාගම
රොඩේෂා එන්ටර්ප්‍රයිසස්
චන්ද්‍රපාල කන්ස්ට්‍රක්ෂන්
එස්.එස්.ඥාණම් සහ සමාගම
සී. ලොබ්ස්ටර් එන්ටර්ප්‍රයිසස්
සුනිල් ට්‍රේඩර්ස්
එච්.ජී.පී.එම්. (පුද්) සමාගම

(ii) යුද හමුදාව වෙතට සියලු මස් වර්ග සැපයීම රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව සිදු කරනු ලබයි.

(iii) ඇමුණුම I හි දක්වා ඇත.

(iv) ආසන්න වශයෙන් රුපියල් මිලියන 60කි.

(v) ඇමුණුම IIහි දක්වා ඇත.

(vi) ඇමුණුම III හි දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

ප්‍රශ්න අංක (අ) (iii) ඇමුණුම - I

වර්ෂය	වාර්ෂිකව ගෙවූ මුදල (රු.)				
	ශුෂ්ක කුකුල් මස්	කෂ්ය එළුමස්	කර ගව මස්	ගව පිණුදු	එකතුව
2005	543,012,955.23	8,752,844.00	1,338,168.00	408,240.00	553,512,207.23
2006	625,643,048.65	8,468,264.00	2,487,372.00	683,670.00	637,282,354.65
2007	503,520,990.55	6,686,751.80	1,226,671.19	169,533.00	511,603,946.54
2008	885,986,656.61	12,336,735.70	10,316,542.50	8,511,065.00	917,150,999.81
2009	1,230,540,368.32	53,704,138.00	6,541,561.60	1,413,600.00	1,292,199,667.92
2010	2,254,320,381.39	39,584,630.00	14,823,824.00	932,400.00	2,309,661,235.39
2011	1,260,119,581.25	155,213,595.02	4,143,425.00	594,900.00	1,420,076,501.27
2012	1,518,818,477.21	608,200,783.61	6,147,710.00	79,640.00	2,133,246,615.82
	8,821,962,459.20	**892,947,747.13**	**47,030,274.29**	**12,793,048.00**	**9,774,733,528.60**

කෙටි යෙදුම් :
ශුෂ්ක - ශුද්ධ කළ
කෂ්ය - කුටු සහිත
කර - කුටු රහිත

ප්‍රශ්න අංක (අ) (v) ඇමුණුම II

මස් වර්ගය	මස් කිලෝවක් සඳහා වාර්ෂිකව ගෙවූ මුදල (රු.)							
	2005	2006	2007	2008	2009	2010	2011	2012
ශුෂ්ක කුකුල් මස්	190.77	192.02	236.10	294.38	323.91	339.84	345.28	358.99
කෂ්ය එළුමස්	429.33	469.00	550.50	641.63	755.20	786.00	803.05	867.63
FRAUD AT KALUBOWITIYANA C.T.C. TEA FACTORY : FORMAL INQUIRY

2710/'12

13. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවට අයත් සී.ටී.සී. තේ කම්හලෙන් 2012.01.26 දින තේ පිරවූ බෑග් 240ක් කොළඹට ප්‍රවාහනය කිරීම සඳහා අංක SP KL-5432 දරන ලොරි රථයට පටවා ඇති බවත්;

(ii) එම තේ බෑග් ප්‍රමාණය පැටවූ බවට කම්හලේ අධිකාරි සහ ලොරි රියදුරු විසින් තේ නිකුත් කරන ලද පොතෙහි අත්සන් තබා ඇති බවත්;

(iii) එම තේ බෑග් 240න් තේ මිල දී ගන්නා ස්ථානයට අළෙවි කර ඇත්තේ බෑග් 200ක් පමණක් බවත්;

(iv) කම්හල් ලේඛනවල 240ක් ලෙස සටහන්ව තිබූ තේ බෑග් සංඛ්‍යාව පසුව 200ක් ලෙස වෙනස් කර ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) කළුබෝවිටියාන සී.ටී.සී. තේ කම්හලේ සිදු වී ඇති ඉහත සඳහන් වංචාව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் வரையறுக்கப்பட்ட களுபோவிட்டியான தேயிலைத் தொழிற்சாலைக் குரிய சீ.ரீ.சீ. தேயிலைத் தொழிற்சாலை யிலிருந்து 2012.01.26ஆந் திகதி தேயிலை நிரப்பிய 240 பைகள் கொழும்புக்கு ஏற்றிச் செல்வதற்காக SP KL-5432ஆம் இலக்க லொறியில் ஏற்றப்பட்டுள்ளதென்பதையும்;

(ii) அந்தத் தேயிலைப் பைகள் ஏற்றப்பட்டதாக தொழிற்சாலையின் அத்தியட்சகர் மற்றும் லொறிச் சாரதி தேயிலை விநியோக ஏட்டில் கையொப்பம் இட்டுள்ளார்கள் என்பதையும்;

(iii) இந்த 240 தேயிலைப் பைகளில் 200 தேயிலைப் பைகள் மாத்திரமே கொள்வனவுசெய்யும் இடத்திற்கு விற்பனை செய்யப்பட்டுள்ளன தென்பதையும்;

(iv) தொழிற்சாலை ஆவணங்களில் 240 எனக் குறிப்பிடப்பட்டிருந்த தேயிலைப் பைகளின் எண்ணிக்கை பின்னர் 200 ஆக மாற்றப் பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) களுபோவிட்டியன சீ.ரீ.சீ. தேயிலைத் தொழிற்சாலையில் இடம்பெற்றுள்ள மேற்கூறிய மோசடி தொடர்பாக முறையான விசாரணை நடத்த நடவடிக்கை எடுப்பாரா என்பதையும் ;

(ii) அவ்வாறெனின் அத்திகதி யாது என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that -

(i) on 26.01.2012, 240 bags filled with tea from C.T.C. Tea Factory belonging to Kalubowitiyana Tea Factory Limited of the Matara District, were loaded to the lorry bearing No. SP KL-5432, to be transported to Colombo;

(ii) the superintendent of the factory and the lorry driver have signed in the book recording the issue of tea to confirm the loading of the aforesaid number of bags of tea;

(iii) only 200 bags of tea have been sold to the purchasing place out of the aforesaid 240 bags of tea; and

(iv) the number of bags of tea recorded as 240 in the documents of the factory have been changed later as 200?

(b) Will he inform this House -

(i) whether action will be taken to hold a formal inquiry in relation to the aforesaid fraud committed at Kalubowitiyana C.T.C. Tea Factory; and

(ii) if so, when?

(c) If not, why?

ගරු අර්ල් ගුණසේකර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர -பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Earl Gunasekara - Deputy Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අංක SP KL-5432 දරන ලොරි රථය මඟින් 2012.01.26 දින තේ පිරවූ බෑග් 200ක් කොළඹට ප්‍රවාහනය කර ඇත.

(ii) තේ බෑග් 200ක් පැටවූ බවට කම්හලේ අධිකාරි සහ ලොරි රියැදුරු විසින් තේ නිකුත් කරන ලද පොතෙහි අත්සන් තබා ඇත.

(iii) වාර්තා වී ඇති පරිදි තේ බෑග් 200ක් මිල දී ගන්නා ස්ථානයට භාර දී ඇත.

(iv) කම්හල් මුර පොතෙහි එදිනට අදාළ දත්ත වෙනස් කර ඇත.

(ආ) (i) මේ පිළිබඳව සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් වෙන වෙනම පරීක්ෂණ පවත්වා ඇත. කර්මාන්තශාලාවේ තොග සම්බන්ධ ලේඛන පරීක්ෂා කරන ලද අතර, එවැනි වංචාවක් සිදුව ඇති බවට කරුණු තහවුරු වී නොමැත.

(ii) සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම පරීක්ෂණ ආරම්භ කළ දිනය - 2012.03.27

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පරීක්ෂණ ආරම්භ කළ දිනය - 2012.12.12

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරෙන් කියැවුණා ඒ ලේඛන වෙනස් කරලා කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පිළිතුර ආපසු කියන්න යන්න එපා. අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මා දැන් අහන්නේ මේකයි. තේ ප්‍රවාහනය කරපු ලොරියේ රියැදුරු ලියුමක් දෙනවා තේ පෙට්ටි 240ක් ප්‍රවාහනය කළා කියලා. මට ඒක පෙන්වන්න පුළුවන්. ඒ වාගේම, තේ පෙට්ටි 240ක් ප්‍රවාහනය කරපු බවට මුල් පොතේ සඳහන් කරපු ලියැවිල්ලේ, -වෙනස් කළ බව ඔබතුමා ම කියන ලියැවිල්ලේ - ඡායා පිටපත් තිබෙනවා. මෙහිදී පැහැදිලිවම තේ පෙට්ටි 240ක් එළියට ගිහින් තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අදාළ තැනට ගිහිල්ලා තිබෙන්නේ තේ පෙට්ටි 200යි. තේ පෙට්ටි 40ක් නැති වෙලා තිබෙනවා. රියැදුරු ඒ ගැන ලිඛිතව ප්‍රකාශයක් දීලා තිබෙනවා. මේ ගැන මොකක්ද ඔබතුමා කියන්නේ?

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ගරු කථානායකතුමනි, මේ සිද්ධියට අවුරුදු එකහමාරකට පස්සේ තමයි මේ ප්‍රශ්නය අහන්නේ. ඒ වෙලාවේ එතුමා දුරකථනයෙන්වත් කිව්වා නම් අපට ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න තිබුණා. නමුත් එවෙලේම -මාර්තු මාසයේ- අදාළ කර්මාන්තශාලාවේ අධිකාරිවරයා පරීක්ෂණයක් පවත්වා තිබෙනවා. මුරකරුගේ පොතේ පමණයි සටහන් වෙනස් වෙලා තිබෙන්නේ. මුරකරුත් ඒ ලොරි රියැදුරුත් පමණයි එහෙම කියන්නේ. නමුත් තේ පොතේ - Tea Book එකෙ- තමයි නිවැරැදි තොරතුරු තිබෙන්නේ. ඒකෙන් තමයි නිවැරැදි තොරතුරු ගන්නේ. අපි පරීක්ෂණ පවත්වා තිබෙනවා. තේ stock අරගෙන තිබෙනවා. දලු ලැබුණු ප්‍රමාණයට සරිලන තේ ප්‍රමාණයත් තිබෙනවා. ඒ නිසා ඒ කර්මාන්තශාලාවේ එහෙම කිසිම අක්‍රමිකතාවක් වූ බවක් ඒ පරීක්ෂණවලින් පෙනෙන්නේ නැහැ.

අමාත්‍යාංශයෙන් වෙනම පරීක්ෂණ කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කිසිම තහවුරු වීමක් නැහැ. මෙය පෞද්ගලික හේතුවක් මත මුරකරු විසින් ඒ දත්ත සටහන් වෙනස් කරලා කරන ලද දෙයක් හැටියට තමයි අපට අනාවරණය වෙලා තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේ කියන විධියට පෞද්ගලික කෝන්තරයක් මත මුරකරු මෙම කටයුත්ත කළාය කියලායි කියන්නේ. එහෙම කළා නම්, පෞද්ගලික කෝන්තරයක් මත එවැනි ලේඛන සකස් කිරීම පිළිබඳව මේ වන කොට ගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ඒ පිළිබඳව අපි අමාත්‍යාංශයෙන් ගත් තීරණය විනය පරීක්ෂණ කමිටුවට යොමු කර තිබෙනවා. ඒ සඳහා ඒ ගොල්ලන්ව නැවත වරක් කැඳවන්න ලබන මාසයේ පමණ දින දීලා තිබෙනවා. ඊට පස්සේ ගනු ලබන තීරණය ඔබතුමාට දන්වන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කළේ අවුරුදු එකහමාරක් ගත වීමෙන් පසුව කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් මා බැලුවා. මා මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුවට භාර දීලා තිබෙන්නේ 2012 අප්‍රේල් මාසයේ දිනයකදීයි. ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් තිබෙන නිසා ප්‍රමාදයක් වෙන්න ඇති. විනය පරීක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අවුරුදු එකහමාරක් ගත වෙලා තිබෙන්නේ ඇයි?

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

රාජ්‍ය ලේඛන සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි තිබෙනවා. අපට ඕනෑ විධියට පෞද්ගලික අංශයේ කරනවා වාගේ පසුව දා උදේ වන කොට තීරණයක් අරගෙන සේවකයන් ඉවත් කරන්න බැහැ. සියලු දෙනාම කැඳවා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගත් හැටියේම ඔබතුමාට දන්වන්නම්.

සිවිල් ආරක්ෂක භටයින්: වැටුප් හා දීමනා
சிவில் பாதுகாப்பு படையினர் : சம்பளம் மற்றும் கொடுப்பனவுகள்
CIVIL SECURITY PERSONNEL : SALARIES AND ALLOWANCES

2876/'12

14. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු භටයින්හට ලබා දෙන වැටුප් සහ දීමනා කවරේද;

(ii) ඔවුන්ගේ වැටුපෙන් මාසිකව සිදු කරන අය කිරීම් කවරේද;

(iii) එම අය කිරීම් අරමුදලක් වෙත බැර කරන්නේද;

(iv) එසේ නම්, එකී අරමුදල ගිණුම්ගත කර ඇති ආයතනය කවරේද;

(v) එවැනි අය කිරීම් සිදු කිරීමට හේතු කවරේද;

(vi) ආපසු ඔවුන් වෙත ලබා දෙන අය කිරීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(අ) (i) සිවිල් ආරක්ෂක භටයින්ගේ වැටුප් නියමිත දිනයේ දී ගෙවා තිබේද;

(ii) එසේ නොමැති නම්, ඔවුන්ට ගෙවීමට ඇති හිඟ මුදල කොපමණද;

(iii) එම හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිවිල් ආරක්ෂක භටයින් යොදා ගනිමින් වර්තමානයේ සිදු කරන ක්‍රියාකාරකම් කවරේද;

(ii) වගා කටයුතු සහ අනෙකුත් කර්මාන්ත සඳහා ඔවුන් යොදා ගෙන තිබේද;

(iii) ඒ සඳහා ඔවුන්ට ලබා දෙන පහසුකම් කවරේද;

(iv) එම ක්‍රියාකාරකම් තුළින් වාර්ෂිකව ඔවුන් උපයා දෙන මුදල කොපමණද;

(v) එම මුදල් යොදා ගන්නා කටයුතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා) [Prof. G. L. Peiris (Minister of Buddha Sasana and Religious Affairs)]

(අ) (i) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන භටයින්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(ii) ඔවුන්ගේ වැටුප්වලින් මාසිකව අය කරගනු ලබන මුදල්;

(iii) ඒ සඳහා ඔවුන්ට ලබා දෙන පහසුකම් කවරේද;

(iv) එම ක්‍රියාකාරකම් තුළින් වාර්ෂිකව ඔවුන් උපයා දෙන මුදල කොපමණද;

(v) එම මුදල් යොදා ගන්නා කටයුතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා) [Prof. G. L. Peiris (Minister of Buddha Sasana and Religious Affairs)]

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) சிவில் பாதுகாப்பு திணைக்களத்தில் கடமையில் ஈடுபட்டுள்ள படையினருக்கு வழங்கப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவை என்பதையும்;

(ii) இவர்களது சம்பளத்திலிருந்து மாதாந்தம் அறவிடப்படும் அறவீடுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி அறவீடுகள் நிதியமொன்றில் வைப்பிலிடப்படுகின்றனவா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி நிதியம் எந்த நிறுவனத்தின் கணக்குகளில் இடப்பட்டுள்ளன என்பதையும்;

(v) இவ்வாறான அறவீடுகளை மேற்கொள்வதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vi) அவர்களுக்கு மீளச் செலுத்தப்படும் அறவீடுகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிவில் பாதுகாப்பு படையினரின் சம்பளம் உரிய திகதியில் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) இல்லையெனில், அவர்களுக்கு செலுத்தப்பட வேண்டிய நிலுவைப் பணத்தொகை யாது என்பதையும்;

(iii) மேற்படி நிலுவைச் சம்பளம் வழங்கப்படும் திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சிவில் பாதுகாப்பு படையினரை ஈடுபடுத்தி தற்போது மேற்கொள்ளப்படும் செயற்பாடுகள் யாவை என்பதையும்;

(ii) பயிர்ச் செய்கை மற்றும் ஏனைய கைத் தொழில்களில் நடவடிக்கைகளில் அவர்கள் ஈடுபடுத்தப்பட்டுள்ளனரா என்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைக்காக அவர்களுக்கு வழங்கப்படும் வசதிகள் யாவை என்பதையும்;

(iv) மேற்குறிப்பிடப்பட்ட நடவடிக்கைகளினூடாக அவர்கள் வருடாந்தம் ஈட்டிக் கொடுக்கும் பணத்தொகை யாது என்பதையும்;

(v) மேற்படி பணத்தொகை எந்த நடவடிக்கைகளுக்காகப் பயன்படுத்தப்படுகின்றன என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) the salaries and allowances paid to soldiers who serve in the Department of Civil Security;

(ii) the recoveries made out of their salaries monthly;

(iii) whether the aforesaid recoveries are deposited in a fund;

(iv) if so, of the institution in which the aforesaid fund is maintaining its accounts;

(v) the reasons to make such recoveries; and

(vi) the recoveries that will be refunded to them?

(b) Will he state -

(i) whether the salaries of the civil security personnel have been paid on the date due;

(ii) if not, the amount of arrears to be paid for them; and

(iii) the date on which the aforesaid arrears will be paid?

(c) Will he also inform this House -

(i) the activities that are carried out by using the personnel of the civil security force at present;

(ii) whether they have been assigned for cultivation works and other industries;

(iii) the facilities that have been provided for them to that effect;

(iv) the amount of money that they generate through the aforesaid activities, annually; and

(v) the affairs for which the aforesaid monies are made use of?

(d) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සිවිල් ආරක්ෂක බල කායේ සාමාජිකයන්හට සේවයට පැමිණීම මත රජයේ අනුමත දෛනික දීමනාව, ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනාව ගෙවනු ලබයි.

(ii) 1. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

2. යහසාධක අරමුදල

3. සුවසවිය අරමුදල

4. භටයන්ගේ ඉල්ලීම මත සිදු කරනු ලබන්නා වූ බැංකු ණය, නිවාස ණය, ජීවිත රක්ෂණ ආදී විවිධ කේවල අවකරණයන්

(iii) ඔව්.

(iv) ඉහත (ii)හි සඳහන් අවකරණයන් ප්‍රේෂණය කළ යුතු ආයතන සහ අරමුදල් බැංකු ගිණුම් වෙත

(v) 1. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - අනිවාර්යය අය කිරීමකි.

2. යහසාධක / සුවසවිය අරමුදල් - අනෙකුත් සන්නද්ධ හමුදා, පොලිස් සහ සිවිල් රාජ්‍ය නිලධාරීන්ට මෙන් මේ වන තුරු විශ්‍රාම වැටුප් හිමිකම, ශුභ සාධන හා රක්ෂණ ක්‍රම නොමැති හෙයින්, එම භටයන්ගේ ශුභ සාධනය, අභිවෘද්ධිය හා ආරක්ෂණය තහවුරු කිරීම සඳහා.

(vi) ඉහත (ii)හි සඳහන් අවකරණයන් ත්‍රිත්වය (රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, යහසාධක අරමුදල, සුවසවිය අරමුදල) නියමිත අවස්ථාවන්හිදී පොලිස හා ව්‍යවස්ථාගත ප්‍රතිලාභයන් සමඟින් නැවත ලබා දෙනු ලබයි.

(ආ) (i) ඔව්.

(ii) නිහ වැටුප් ගෙවීමට නැත.

(iii) අදාළ නැත.

(ඇ) (i) රටේ ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට උරදෙමින් ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සිදු කිරීම;

අතිගරු ජනාධිපතිතුමන් හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් පැවරෙන විශේෂ ව්‍යාපෘති සිදු කිරීම;

කොළඹ/ගම්පහ වැනි රජයේ නගර සංවර්ධන ව්‍යාපෘතිවලට දායක වීම;

පූජා භූමි ප්‍රතිසංස්කරණය/සංවර්ධනය/නඩත්තුව හා ආරක්ෂාව;

රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වෙත ආරක්ෂාව සැපයීම;

අලිවැට ඉදිකිරීම හා නඩත්තුව;

වනාන්තර හා වනජීවී ආරක්ෂාව;

පුද්ගලික ආරක්ෂක භටයන් පුහුණු කිරීම;

රජයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමග ඒකාබද්ධව විවිධ සේවා සැපයීම;

ඩෙංගු මර්දන/ආපදා කළමනාකරණ වැනි කාලීන හා හදිසි රාජකාරීන් ඉටු කිරීම;

ශ්‍රී ලංකා පොලීසිය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක රාජකාරීන් ඉටු කිරීම;

පෙර පාසල් හා ස්වේච්ඡා පාසල් ගුරුවරු ලබා දෙමින් ප්‍රාදේශීය අධ්‍යාපනය නහා සිටුවීමට මහඟු පිටිවහලක් ලබා දීම;

විවිධ සමාජ සත්කාරමය ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.

(ii) ඔව්.

(iii) අනුමත වැටුප්, දීමනා සහ අවශ්‍ය සියලුම උපකරණ.

(iv) ආසන්න වශයෙන් රුපියල් මිලියන 1322 කි.

(v) භාණ්ඩාගාර තැන්පත් ගිණුමට බැරකොට, අදාළ අනුමැතීන් මත ව්‍යාපෘති පවත්වාගෙන යාමට සහ සංවර්ධනයටත් ඒ සඳහා දෙපාර්තමේන්තු වැය පියවා ගැනීමටත් වන ප්‍රතිපාදන අවශ්‍යතා සපුරා ගැනීමට.

(ඇ) අදාළ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම මේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2006 සැප්තැම්බර් 13 වන දා ශ්‍රී ලංකා ජනරජයේ අංක 1462/20 දරන ගැසට් පත්‍රයෙන් ගැසට් කරලා වෙනම ආරක්ෂක දෙපාර්තමේන්තුවක් විධියට ජනරාල් සරත් වීරසේකර මැතිතුමා යටතේ පවත්වා ගෙන ගියා. මේ බල කායේ 38,000ක පමණ පිරිසක් සිටිනවා. මේ අයගේ සේවය ස්ථීර කිරීම සම්බන්ධව පසු ගිය කාල වකවානුවේ දිගින් දිගටම පොරොන්දු ගණනාවක් දීලා තිබුණා. ගරු ඇමතිතුමනි, එම නිසා මේ අයගේ සේවය ස්ථීර කර, යම් කිසි විධියකට මේ අයට ස්ථීරව තමන්ගේ රැකියාව කරන්නට අවශ්‍ය වාතාවරණය සකස් කරන්නේ කවදාද කියා මා ඔබතුමාගෙන් අහන්නට කැමතියි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඇත්තටම ඔබතුමාගේ මූලික ප්‍රශ්නයේ ඔය කියන ප්‍රශ්නය සඳහන් වෙලා තිබුණේ නැහැ. එම නිසා එම දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරන්නේ නැතිව මට ඒ පිළිබඳව උත්තරයක් දෙන්නට පුළුවන්කමක් නැහැ. නමුත් ඔබතුමා අපේ ඊළඟ කාරක සභාවට ආවොත්, මේ පිළිබඳව එම කාරක සභාවේදී උත්තරයක් ලබා දීමට මා කටයුතු කරනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අනික් කාරණය මෙයයි. මේ සිවිල් ආරක්ෂක භටයන්ගේ වැටුපෙන් සුබසාධනයට ඒ කාලයේ -ආරම්භයේදී- ගත්තේ රුපියල් 5යි. මේ වන විට ඒ සඳහා රුපියල් 300ක් ගන්නවා. ඊළඟට සුව සවියට රුපියල් 300ක් ගන්නවා. අර්ථ සාධක අරමුදලට රුපියල් 1,200ක් ගන්නවා. 38,000ක ගෙන් ලිපි ගොනුවලට රුපියල් 10ක් අය කරනවා. ගරු ඇමතිතුමනි, මේ මුදල් බැංකුගත කර තිබෙනවාය කියලා ඔබතුමා කිව්වාට, මම ඇහුවේ ඒ මුදල් නිශ්චිත වශයෙන් තිබෙන්නේ කුමන බැංකුවලද කියලායි. මේ සම්බන්ධව සිවිල් ආරක්ෂක බල කායේ ඉන්න නිලධාරීන් විශාල පිරිසක් අපෙන් ප්‍රශ්න කරනවා, "කරුණාකරලා මේක අහන්න, අපෙන් කපා ගන්නා මුදල් ටික කොහේද තිබෙන්නේ" කියලා. ඒ මුදල් තැන්පත් කර ඇති ස්ථානයක් නැති තත්ත්වයක් තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මෙන්න මේ බැංකුවල මේ මුදල් බැංකුගත කර තිබෙනවාය කියලා ඒ සඳහා නිශ්චිත වශයෙන් අපට පිළිතුරක් දෙන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔව්. ඔබතුමා අහපු ප්‍රශ්නයට දීපු පිළිතුරේ අඩු පාඩුවක් තිබෙනවා. ඔබතුමා මේ ප්‍රශ්නයේ (අ) (iv) කොටසින් අසා තිබෙන්නේ, "එසේ නම්, එකී අරමුදල ගිණුම්ගත කර ඇති ආයතනය කවරේද?" කියලායි. ඒකට පිළිතුර වශයෙන් දීලා තිබෙන්නේ, "ඉහත (ii)හි සඳහන් අවකරණයන් ප්‍රේෂණය කළ යුතු ආයතන සහ අරමුදල් බැංකු ගිණුම් වෙත" කියලායි. බැංකු ගිණුම් විස්තර දීලා නැහැ. එම කාරණයත් මා ඔවුන්ගේ අවධානයට යොමු කරවන්නම්. අපට ලැබී තිබෙන්නේ ඔබතුමාගේ ප්‍රශ්නයට පූර්ණ පිළිතුරක් නොවන බව මා පිළිගන්නවා. ඒ පිළිබඳව අවධානය යොමු කරවලා ඉදිරියේදී ඔබතුමාට ඒ විස්තර ලබා දීමට මා කටයුතු කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සිවිල් ආරක්ෂක භටයින් විවිධ වගා කටයුතු කරන්න අනුයුක්ත කර තිබෙනවා. මේ සමහර ප්‍රදේශවල යම් යම් ගැටලු තිබෙනවා. මම උදාහරණයක් කියන්නම්. සේරුවිල, කන්තලේ, ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශවල ගොවිතැන් කටයුතුවල යෙදිලා ඉන්න අය මාස තුනකට වරක් වී ගෝනි 15ක්, නැත්නම් කිලෝග්‍රෑම් 65ක් අදාළ ඉහළ නිලධාරීන්ට දෙන්න ඕනෑ. ඒක තමයි ඒ අයගේ ක්‍රමවේදය. ඒ අයට හම්බ කර ගන්නත් පුළුවන්, හැබැයි වී ගෝනි 15ක් ඉහළ නිලධාරීන්ට දෙන්න ඕනෑ. ඒක මේ අයට දීලා තිබෙන ක්‍රමවේදයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ, ප්‍රවේණිය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ අයට වගා කරන්න බැරි වුණොත් රුපියල් 200ක් දෙන්න ඕනෑ. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ වාගේම මේ අයගේ දෛනික දීමනාව රුපියල් 405යි. අපට ප්‍රශ්නයක් නැහැ, මේකේ ඔබතුමන්ලාගේ ව්‍යවස්ථාව අනුව එහෙම ඒ අය පාවිච්චි කරන්න පුළුවන්. නමුත් මා කියන්නේ වගා කිරීමේ කටයුතුවලට මේ අය සම්බන්ධ කර ගන්න අතරේ, ඔවුන්ට යම් කිසි විධියක ස්ථාවර වැටුපක් දීලා, ඔවුන් ස්ථීර සේවයකට යෙදෙව්වා නම් මා හිතන්නේ මේ කාර්ය භාරය වඩාත් හොඳට කරන්න පුළුවන් වෙයි. එතකොට වගා කිරීමේ වැඩ පිළිවෙළක් යටතේ ආණ්ඩුවට යම් කිසි ප්‍රයෝජනයකුත් ලැබෙනවා. මම ඒක නැහැයි කියන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මම නැවතත් ඔබතුමාගෙන් අහන්නේ මේ අයගේ සේවය ස්ථීර කිරීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික අවසන් කරන්නේ කවදාද කියලායි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ස්ථීර කිරීම පිළිබඳව අපට උත්තර දෙන්න පුළුවන්. නමුත් ඔබතුමා කියනවා නම්, ඉහළ නිලධාරීන් මේ විධියට අල්ලස් ගන්නවා කියලා, වී ගෝනි 15ක් -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අල්ලස් නොවෙයි. ඒ අය වවලා දෙන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අය අස්වද්දන්නට ඕනෑ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ගරු කථානායකතුමනි. අස්වද්දලා එයින් වී ගෝනි 15ක් ඉහළ නිලධාරීන්ට දෙන්නට ඕනෑ. ගෝනි 15ක් තිබුණේ නැත්නම්

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකට අපේ පැතිවල කියන්නේ ප්‍රවේණිය කියලා යි. ඒ ප්‍රවේණිය අයිකිකාරයාට දෙන්න ඕනෑ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

අපට නම් එහෙම පැමිණිල්ලක් ලැබුණේ නැහැ. ඔවුන් ඉතාම සතුටින් වගා කටයුතු කරගෙන යන බව තමයි අපට වාර්තා වෙලා තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. තොරතුරු තිබෙනවා නම් ඒවා දෙන්න. ඇමතිතුමා එතකොට සොයා බලයි නේ.

විදේශ ණය සහ ප්‍රදාන : විස්තර
வெளிநாட்டுக் கடன்கள் மற்றும் மானியங்கள்: விபரம்
FOREIGN LOANS AND GRANTS : DETAILS
2891/'12

15. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රටට ලැබෙන සියලු විදේශ ණය සහ ප්‍රදාන සඳහා වගකීම දරන්නේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ 3 තුළදී ඉහත කී දෙපාර්තමේන්තුව හරහා රටට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එක් එක් රට විසින් පසුගිය වර්ෂ 5 සඳහා ලබාදීමට පොරොන්දු වූ මුදල සහ ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (ii) අනුව ලැබුණු මුදල් උපයෝගිතා අනුපාතය, වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ විදේශ රටවලින් සහ බහු පාර්ශ්වීය නියෝජිත ආයතන විසින් ලබා දුන් මුළු මුදල් ප්‍රමාණයෙන්,

(i) ප්‍රයෝජනයට නොගත් මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) එකී මුදල් ප්‍රමාණය ප්‍රයෝජනයට නොගැනීමේ හේතු කවරේද;

යන්නත් වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டுக்கு கிடைக்கின்ற சகல வெளிநாட்டுக் கடன்கள் மற்றும் மானியங்களை பெற்றுக் கொள்வதற்கு அமைச்சின் வெளிநாட்டு வளங்கள் திணைக்களம் பொறுப்பாக உள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், கடந்த 3 வருடங்களின் போது மேற்படி திணைக்களத்தின் ஊடாக நாட்டினால் பெற்றுக்கொள்ளப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) கடந்த 5 வருடங்களில் வாக்களிக்கப்பட்டதும் பெற்றுக்கொள்ளப்பட்டதுமான பணத்தொகை நாடுகளின் அடிப்படையில் தனித்தனியாக எவ்வளவு என்பதையும்;

(iv) மேலே (ii) இன் பிரகாரம் பெற்றுக் கொள்ளப் பட்ட பணத்தின் பயன்பாட்டு வீதத்தை ஆண்டு அடிப்படையில் எவ்வளவு என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) கடந்த 10 வருடங்களாக, வெளிநாடுகளிலிருந்து அல்லது பல்தரப்பு முகவர்களிடம் இருந்து பெற்றுக் கொள்ளப்பட்ட மொத்தப் பணத்தொகை தொடர்பாக, ஆண்டு அடிப்படையில்,

(i) பயன்படுத்தப்படாத தொகை எவ்வளவு என்ப தையும்;

(ii) குறிப்பிட்ட பணத்தை பயன்படுத்த முடியாமைக் கான காரணங்கள் என்ன என்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister Finance and Planning:

(a) Will he state -

(i) whether the Department of External Resources of the Ministry is responsible for receiving all foreign loans and grants to the country;

(ii) if so, the amount of monies received by the country through the aforesaid Department during the last three years;

(iii) the amount of money pledged and received for the last five years on per country basis separately; and

(iv) the rate of utilization of money received as per (ii) on per year basis?

(b) Will he also state pertaining to the total amount of money received from the foreign countries or multilateral agents for last 10 years on per year basis -

(i) the amounts that were not utilised; and

(ii) the reasons for not being able to utilise the said money?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රජය හා රාජ්‍ය ආයතන වෙනුවෙන් විදේශ ණය හා ප්‍රදාන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරේ.

(ii) එම තොරතුරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2010, 2011 සහ 2012 වාර්ෂික වාර්තාවන්ගේ පිළිවෙළින් 251, 169, 207, පිටුවලින් පෙන්වා දී ඇත. එහි එකතුව මා සඳහන් කරන්නම්. එම විස්තර ඇතුළත් පත්‍රිකා ඇමුණුම 1 සහ 2 වශයෙන් **සභාගත*** කරමි.

වර්ෂය	2010	2011	2012
එකතුව	2,121	1,901	1,986

(iii) එක් එක් රට විසින් පසුගිය වර්ෂ 5 සඳහා ලබා දීමට පොරොන්දු වූ මුදල ඇමුණුම 1හිද, ලබා දුන් මුදල ඇමුණුම 2හිද දැක්වේ.

(iv) එක් එක් වර්ෂයට අදාළ උපයෝගිතා අනුපාතය වාර්ෂික වාර්තාවේ දක්වා ඇති පරිදි මෙසේය.

වර්ෂය	2010	2011	2012
උපයෝගිතා අනුපාතය (සියයට)	25.70	21.84	22.28

(ආ) (i) නැත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

2008 - 2012 වර්ෂ තුළ රජය ඇති කර ගත් විදේශ එකඟතා (පොරොන්දු වූ මුදල්) ඇමුණුම 1

එ.ඒ. ඩොලර් මිලියන

සංවර්ධන පාර්ශ්වකරු	2008	2009	2010	2011	2012
ද්විපාර්ශ්වික	1,717.8	1,487.7	2,468.0	1,500.5	2,585.5
ප්‍රංශය	78.8	-	16.3	45.3	28.3
ඉන්දියාව	209.2	20.1	483.8	36.8	700.3
ජපානය	368.1	19.5	438.9	523.0	515.38 *
කුවේටය	-	34.1	-	10.8	-
නෙදර්ලන්තය	99.7	37.0	0.1	12.9	102.5
නෝර්වේ	1.2	-	-	-	-
කොරියාව	62.9	69.1	40.2	-	19.8
චීනය	-	1,206.7	828.1	784.7	1,056.19 *
ජර්මනිය	-	2.8	1.6	-	39.7
ස්විට්සර්ලන්තය	-	1.3	-	-	-
සෞදි අරාබිය	23.0	-	46.1	-	59.9
ඇමරිකා එක්සත් ජනපදය	16.9	7.5	44.1	14.7	5.1
ඔස්ට්‍රියාව	43.3	-	45.3	-	-
ඔස්ට්‍රේලියාව	-	-	105.2	-	-
ස්පාඤ්ඤය	-	-	-	-	14.1
ස්වීඩනය	-	19.6	-	54.2	-
ඉරානය	450.0	-	83.4	-	-
මැලේසියාව	-	-	-	4.0	-
බෙල්ජියම	-	-	-	14.0	-
පාකිස්ථානය	-	-	-	0.1	-
රුසියාව	-	-	300.0	-	-

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

එක්සත් ජනපදය	209.4	-	35.0	-	44.1
ඩෙන්මාර්කය	155.2	-	-	-	-
හංගේරියාව	-	70.2	-	-	-
බහුපාර්ශ්වීය	499.4	725.2	791.8	623.0	566.0
ආසියානු සංවර්ධන බැංකුව	90.1	423.7	372.2	373.8	99.7
ආහාර හා කෘෂිකර්ම සංවිධානය	9.3	14.8	7.6	14.5	4.7
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල	20.7	7.9	24.2	-	22.0
ලෝක බැංකුව	277.1	116.0	357.9	159.1	335.3
ඔපෙක් අරමුදල	-	-	24.0	-	40.0
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	2.3	25.9	3.7	1.3	10.2
සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්	-	2.0	2.2	0.8	0.1
එක්සත් ජාතීන්ගේ ජනාගහන අරමුදල	18.0	-	-	-	-
එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල	41.0	-	-	16.0	26.0
එක්සත් ජාතීන්ගේ කාර්මික සංවිධානය	-	-	-	8.8	-
ලෝක ආහාර සංවිධානය	41.0	134.9	-	48.6	28.0
එකතුව	2,217.2	2,212.9	3,259.8	2,123.5	3,151.5

රාජ්‍ය බැඳුම්කරයන් යටතේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා ගුවන් සේවයට හා ගුවන් සේවා ආයතනය ලබාගත් ණය ඇතුළුව

ඇමුණුම 2

2008 සිට 2012 දක්වා රජයට ලබාදුන් මුදල්

.ඩො. මිලියන

සංවර්ධන පාර්ශ්වකරු	2008	2009	2010	2011	2012
ද්විපාර්ශ්වීය	675.2	983.6	1,554.1	1,287.8	1,408.4
ඉංග්‍රීසිය	27.9	19.7	67.3	35.9	34.0
ඉන්දියාව	0.5	47.4	27.9	208.0	234.1
ජපානය	295.8	310.9	332.9	380.4	395.9
කුවේටය	9.7	8.7	5.2	5.5	2.2
නෙදර්ලන්තය	18.3	62.7	58.9	24.4	32.1
නෝර්වේ		0.2	-	-	-
කොරියාව	17.0	21.4	37.8	35.8	42.7
චීනය	61.4	297.9	844.7	438.2	478.0
ජර්මනිය	37.5	8.1	9.6	5.2	2.5
ස්විස්ටර්ලන්තය	0.5		1.5	-	-
සෞදි අරාබිය	6.6	12.4	1.3	0.8	0.4
ඇමරිකා එක්සත් ජනපදය	30.6	7.3	9.8	18.3	27.9
ඔස්ට්‍රියාව	31.0	16.2	16.7	17.4	21.5
ඔස්ට්‍රේලියාව	9.0		16.1	36.9	23.6
ස්පාඤ්ඤය	20.2	11.3	0.3	-	4.0
ස්වීඩනය	6.5	22.4	29.5	15.9	36.6
ඉරානය			-	17.7	48.4
මැලේසියාව	0.9		-	-	4.0
බෙල්ජියම	0.6		-	-	5.5
එක්සත් රාජධානිය	49.7	96.8	54.4	6.7	0.5
ඩෙන්මාර්කය	51.8	40.5	40.2	40.7	14.5
බහුපාර්ශ්වීය	594.7	652.6	566.9	613.6	577.6
ආසියානු සංවර්ධන බැංකුව	291.2	286.0	342.6	290.6	302.0
ලෝක බැංකුව	144.8	201.8	156.0	216.9	172.6
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල	5.4	13.4	9.5	17.5	14.4
යුරෝපීය ආයෝජන බැංකුව	28.8	21.2	6.7	-	32.0
ඔපෙක් අරමුදල	1.2	0.4	0.5	3.1	5.4
යුරෝපා සංගමය	24.0	32.6	12.6	1.7	-
නෝර්ඩික් සංවර්ධන අරමුදල	0.7	0.4	-	-	-
ආහාර හා කෘෂිකර්ම සංවිධානය	1.1	2.2	13.5	15.4	4.1
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	6.5	4.8	9.0	6.7	3.6
සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්			-	-	0.4
එක්සත් ජාතීන්ගේ ජනාගහන අරමුදල	0.9	1.6	0.5	2.1	6.4
එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල	21.5	11.7	7.0	23.5	26.8
ලෝක ආහාර සංවිධානය	68.8	76.6	9.0	36.1	9.9
එකතුව	1,269.9	1,636.1	2,121.0	1,901.4	1,986.0

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඇමුණුම් සභාගත කළ නිසා මුදල් අමාත්‍යාංශයට අදාළව මා අතුරු ප්‍රශ්නයක් අහන්නම්. ඔබතුමා ලබා දුන් තොරතුරු අනුව විදේශ සහ දේශීය ණය තුළින් සම්පූර්ණ ණයබරතාව රුපියල් කෝටි 6,77,000කට වැඩි වෙලා තිබෙනවා. මේ කථා කරන මොහොත වනකොටත් තමන් ලබන ආදායම මදි වෙලා තිබෙනවා, අවුරුද්දක පොලිය සහ ප්‍රාග් ධන ප්‍රමාණය ගෙවන්න.

දවසින් දවස තවත් ණය ගන්නවා. අපි ණය උගුලකට වැටෙන්නේ නැති වන විධියට කොහොමද, මේ ආර්ථිකය හොබවන්න පුළුවන් වන්නේ කියන එක ගැන ඔබතුමා අපව දැනුවත් කරනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුගම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔබතුමාට මම කෙටියෙන් උත්තර දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, රටක් සංවර්ධනය කිරීම ගැන විවිධ දර්ශන තිබෙන්න පුළුවන්. එකක් තමයි, තමුන්නාන්සේලාගේ පරණ, ඩී.එස්. සේනානායක මහත්තයාගේ දර්ශනය, 'හෙමින් හෙමින් දර්ශනය'. කිසිම දෙයක් නොකර ඉන්න ඕනෑ. ලැබුණු ආදායමෙන් යම්තම් ගැට ගහගෙන ඉන්න ඕනෑ. ඒක තමයි පරණ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය. හෙමින් හෙමින් ප්‍රතිපත්තිය - *festina lente*. දෙවන ක්‍රමය තමයි, දේශීය ඉතිරි කිරීම්වලින් ඒ සංශෝධන සඳහා, වැඩ සඳහා මුදල් යොමු කිරීම. ඔබතුමා පෙන්වා දුන්න හැටියට මෑත යුගයේ, මුළු ලංකාවේම අපේ දේශීය ඉතිරි කිරීම්වලින් ශීඝ්‍ර සංවර්ධනයට වැය කරන්න බැහැ. ඒවා සාමාන්‍යයෙන් පුනරාවර්තන වියදම්වලට - recurrent expenditure - විතරයි සීමා වෙන්නේ ගරු කථානායකතුමනි. එහෙම නම් සංවර්ධනයට මුදල් වැය කරන අපේ ප්‍රතිපත්තිය 'හෙමින් හෙමින් ප්‍රතිපත්තිය' නොවෙයි. අපේ ප්‍රතිපත්තිය 'ඉක්මනින් ඉක්මනින් ප්‍රතිපත්තිය'. ඒක කරන්න අපට අවශ්‍ය වනවා, විදේශ ණය මුදල් ගන්න. විදේශ ණය මුදල් සංඛ්‍යාව ඔය විධියට කිව්වාට එක දවසකින් ගෙවන ඒවා නොවෙයි. ඔබතුමා හොඳට දන්නවා, සමහර ඒවා තිබෙනවා, කෙටි කාලීන ණය; සමහර ඒවා තිබෙනවා, මධ්‍ය කාලීන ණය; සමහර ඒවා තිබෙනවා, දීර්ඝ කාලීන ණය. ඒවා උපරිම ලෙස උපයෝගී කර ගෙන ඒ වැඩ කටයුතු කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. අපි පෙන්වා දීලා තිබෙනවා, අපේ දළ දේශීය නිෂ්පාදනයේ - GDP එකේ- අනුපාතය බැහැලා තිබෙන බව. එක කාලයක සියයට 120ක අනුපාතයකට තිබුණු එක දැන් සියයට 80කට බැහැලා. අපේ ප්‍රතිපත්තිය තමයි එය සියයට 70කට බස්සවන එක. ඒක ස්වාභාවිකයි. රටේ ධනය වැඩි වන කොට ඒ අනුපාතය බහිනවා. රුපියල් 1,000ක් හම්බ වුණු මිනිහා රුපියල් 100ක් වැය කරලා ඉන්නවා නම් ඒ මිනිහාට 10,000ක් හම්බ වෙන කොට ඒ අනුපාතය බහිනවා. අපට ඕනෑ වෙලා තිබෙන්නේ රට දියුණු කරන්න. රට දියුණු කළාම, දේශීය ධනය වැඩි වුණාම ඒක කරන්න පුළුවන් එකම විධිය ඒ ණය අරගෙන යටිතල පහසුකම් ලබා දීම. එහෙම කෙරුවාට පස්සේ අපි හිතනවා, අපේ ණය අපට manage කරන්න පුළුවන් කියලා. මේකයි ඔබතුමාට දෙන්න තිබෙන පිළිතුර. ඔබතුමා මේ ප්‍රශ්නය නහපු නිසා මට උත්තරයක් ලබා දෙන්න අවස්ථාව සැලසීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ඇමතිතුමනි, හයියෙන් හයියෙන්, හිමින් හිමින් යන ආර්ථිකයට ඔබතුමා උත්තරයක් දුන්නා. දැන් මේ අවස්ථාවේදී ඇමතිතුමනි, ඔබතුමන්ලා සියයට 7ක සියයට 8ක පොලියකට

ණය අරන් සියයට 1ක සියයට 2ක ලාභයක් ලබා ගන්න පුළුවන් ව්‍යාපෘතිවලට වියදම් කරනවා. ඒකෙන්ම ප්‍රශ්නයක් ඇති වනවා. රුපියල 124.75 සිට 133.20 ට බාල්දු වීමෙන් මේ රටේ ණයබරතාව මේ සුමාන දෙක තුළ රුපියල් කෝටි 8,900කින් වැඩි වෙලා තිබෙනවා. මේවා දරා ගන්න බැරි වියදම්. ඔබතුමන්ලා සංවර්ධනය කියලා, රුපියල් 100ක් වියදම් කරන්නට තිබෙන දෙයට රුපියල් 1,000ක් වියදම් කරලා ඇති වන ණයබරතාව තුළින් රටට වෙන සෙත මොකක්ද කියන එක මම අහනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒකටත් මම ඔබතුමාට උත්තර දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා, මට වඩා හොඳට ඔබතුමා දන්නවා මේ සියලුම ණය සියයට 7 පොලියට ගත්ත ඒවා නොවන බව. විවිධ ණය තිබෙනවා; ප්‍රදානයන් තිබෙනවා. ඒවායේ අනුපාතය ගැන අපට කථා කරන්නට පුළුවන්. පොලී නැති ණය දෙනවා. අපි බොහෝ විටම යන්නේ mixed credit විධියට. එක එක විධියට සම්බන්ධ කරලා පුළුවන් තරම් අඩු පොලියකට තමයි අපි ඒ ණය ලබා ගන්නේ. නිදසුනක් වශයෙන් මට ඔබතුමාට කියන්නට පුළුවන් පෞද්ගලිකව අපි ඒවාට සම්බන්ධ වන නිසා. ඔබතුමා දන්නවා Bank of Austria එකේ පොලී අනුපාතය වැඩි බව. නමුත් අපි සාකච්ඡා කරලා තිබෙනවා OPEC Fund for International Development එකත් සමඟ. ඔබතුමා දන්නවා වියානා නගරයේම තමයි ඒකත් තිබෙන්නේ. අපි ඉස්සෙල්ලාම Bank of Austria එකට ගිහින් කථා කරනවා. ඉන් පසුව OPEC Fund for International Development එකට කථා කරනවා. එහෙම කරලා ඒ දෙක එකතු කරලා ඉතාම සාධාරණ අනුපාතයකට අපට ඒක ගේන්න පුළුවන්. අපි ඒවාගේ විවිධ උපක්‍රම යොදනවා. දැන් අලුත්ම ක්‍රමය ගැන මම ඔබතුමාට කියන්නට කැමැතියි වාගේම ගරු සභාවටත් දන්වන්නට කැමැතියි. අපි දැන් බලාපොරොත්තු වනවා BOT - Build-Operate-Transfer - ක්‍රමයට යන්නට ගරු කථානායකතුමනි. කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ මුල් අදියර සඳහා අපි චීන සමාගමක් සමඟ ගිවිසුම් ගහලා තිබෙනවා. ඒක BOT - Build-Operate-Transfer - ; සල්ලි ඔක්කොම යොදන්නේ ඒගොල්ල. ඒ අය ඒ වෙනුවෙන් අවුරුදු 15ක් toll fee එක ගන්නවා. අපි කළ පරීක්ෂණ අනුව පේනවා ඒ අයට ඒ ගණන ලබා ගන්න පුළුවන් කියලා. අවුරුදු 15කට පසුව එය රජයට පවරනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - சீனிக் கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Sugar Industry Development)

For new sugar industries as well.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔව්, new sugar industries. අපි අනාගතයේදීත් මේවාට විවිධ උපක්‍රම යොදා ගන්නවා. නමුත් එකක් කියන්නට ඕනෑ. මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, ලෝකයේ ණය ගෙවීම පිළිබඳව අපිට හොඳ සටහනක් තිබෙනවා; හොඳ වාර්තාවක් තිබෙනවා කියලා. කවුරුත් කියන්නේ නැහැ, We are not a HIPC country, as you know. හුඟාක් රටවල් තිබෙනවා, "Highly Indebted Poor Countries" කියලා. Club of Rome සමහර රටවලට ණය සහන පවා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් අද අපේ රට මධ්‍යම ගණයේ ආර්ථිකයක්. අපට වැඩියෙන් ණය ගන්නත් පුළුවන්, ණය ගෙවන්නත් පුළුවන්. මම ඔබතුමන්ලාට මතක් කරන්නට කැමැතියි, ඔබතුමන්ලා හුඟාක් කල් විරුද්ධ පක්ෂයේ ඉන්න විට මේවා අමතක වෙනවා. මොකද, ප්‍රායෝගික දැනුමක් නැති නිසා. නමුත් අපි ණය ගන්න සෑම ව්‍යාපෘතියක් ගැනම ඒ ණය දෙන බැංකුව විශාල පර්යේෂණයක් කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා හම්බන්තොට ගැන, කී සැරයක් ඒ අය පර්යේෂණ කළාද කියලා. ඒ harbour එක ගැන කිම්දුම්කරුවන් පවා යවා බැලුවා. නොයෙක් විධියේ පර්යේෂණ කරලා තමයි ඒ බැංකුව කියන්නේ අපට මේ ණය දෙනවාය කියලා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. ඒකෙන් ලැබෙන ආදායම සහ වියදම සම්බන්ධයෙන් පර්යේෂණයක් කළායින් පසුව තමයි Export-Import Bank of China කියන ආයතනය සල්ලි මුදා හරින්නේ. ඒ නිසා සරලව බලනකොට ඒකෙදි අපට ණය වුණාද නැද්ද කියන එක විසඳන්න බැහැ. අපි යම්කිසි සැලැස්මක් අනුව කටයුතු කරනවාය කියන එක මම ගරු මන්ත්‍රීතුමාට දන්වන්නට කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා අපි මධ්‍යම ගණයේ ආර්ථිකයකට වැටී තිබෙනවාය කියා. වෙන විධියකට කිව්වොත් ඒක හරියට "Clean suit, empty pockets" වාගෙයි. ඒ ගණයට වැටෙන්නේ නැතිව හිටියා නම් අපට සියයට 1/2 පොලියට ණය ගන්න තිබුණා. ඔබතුමා කිව්වා දළ දේශීය නිෂ්පාදනය අනුව අපේ ණයබරතාවය අඩු වෙලා තිබෙනවාය කියා. ඒ වාගේම අපේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 16.8ක මට්ටමේ තිබුණු එක අද වනකොට සියයට 13.1ක් දක්වා අඩු වෙලා තිබෙනවාය කිව්වා. ඒකෙන් ඊට වැඩිය ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ණය ලබා ගැනීම තුළින් රටේ ණයබරතාව පිළිබඳ ප්‍රශ්නයක් ඇති වන්නේ. මේක රටේ ආර්ථිකයට බලපාන කාරණයක්; රටේ ආදායම අඩු වීමක්. මේ සම්බන්ධයෙන් අපට පෙනෙන්නේ අකාර්යක්ෂමතාවය සහ දූෂණය නිසා මෙවැනි තත්ත්වයක් ඇති වුණු බවයි. ගරු ඇමතිතුමනි, මේ මොහොතේදී මා ඔබතුමා දැනුවත් කරනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමා දන්නවාද නැද්ද කියා මම දන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඉක්මනින් ප්‍රශ්නය අහන්න. වෙලාව පහු වෙලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හොඳමයි, ගරු කථානායකතුමනි. ජාතික ඉතිරි කිරීමේ බැංකුව කොටස් මිලදී ගැනීමක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. ඒකෙදි හේමා මාදිවෙල කියන අධ්‍යක්ෂවරයා - director - අයින් වුණා. දැන් එතුමා ආයෙත් අරගෙන තිබෙනවා. ඒකෙදි ප්‍රශ්නයට මුහුණ දී තිබෙන්නේ ප්‍රසන්න කාරියවසම් විතරයි. ඒ වාගේම මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් කිව්වා, Securities and Exchange Commission එකේ සභාපති සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවාය කියා. ඒ සම්බන්ධයෙන් අපි ප්‍රශ්නයක් මතු කළා මෙවැනි අන්දමේ දූෂණයක් වෙලා තිබෙනවාය; ආර්ථික මාෆියාවක් ගෙන යනවාය කියා. එතකොට එක පාරටම UDA එකෙන් අයින් වුණාම, ඒ වාගේම Krrish Towers එකට ගෙවන්න තිබෙන කාල සීමාව දීර්ඝ කළාම, වෙලා තිබෙන දෙය අනුව ඒ ප්‍රශ්නය තහවුරු වෙනවා. දූෂණයෙන් මතු වෙන ඒ ප්‍රශ්න නැති කළොත් අපේ ණයබරතාවය තව අඩු වේවි. කොහොමද ඔබතුමා මේ සම්බන්ධයෙන් සටනක යෙදෙන්නේ, ගරු ඇමතිතුමනි?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔබතුමාත් මේ ගැන හොඳින් දන්නා කෙනෙක් නිසා මම ඒ සම්බන්ධයෙන් හොඳ උත්තරයක් දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, රටකට ආයෝජකයින් ගෙනෙනවාය කියන එක ලෙහෙසි වැඩක් නොවෙයි. ඔබතුමා දන්නවා ඇති නේ. නිකම්ම පත්තරේ දැන්වීම් පළ කළාට ආයෝජකයන් එන්නේ නැහැ. අපි ගොඩාක් මැදිහත් වෙන්න ඕනෑ. අපි මෙතැනදී දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ ගැන ඉස්සෙල්ලාම මොකද කිව්වේ? පළමු වැනි කථාවේදීම කිව්වා,"Let the robber barons come" කියා. ඒ කියන්නේ, හොරු ඔක්කොමන්ලාට ලංකාවට එන්නය කියා ආරාධනා කළේ නැද්ද? ඊට පසු මොකද කළේ? එතුමාගේ ලේලියට - daughter-in-lawට - කොන්ත්‍රාත් ටික ඔක්කොම දුන්නා. Mitsui Construction Company එකට දීලා මේ පාර්ලිමේන්තුව හැදුවා. පාරවල් හැදුවා. ඔක්කොම කළේ එතුමාගේ ලේලිය මැදිහත් වෙලායි. එහෙම මැදිහත් කර ගෙන තමයි ණය මුදල් ගත්තේ. සිංගප්පූරුවේ ලී ක්වාන් යූ අගමැතිතුමාත් ඒ ඒ ආයෝජකයන් හමු වෙන්නට ඇමතිවරුන් යැව්වා. මෙතැනදී මම දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ගැන ආඩම්බරයෙන් කියන්න කැමැතියි. එතුමාගේ කාලයේ පාස්කරලිංගම් මහත්මයා සිංගප්පූරුවට යැව්වා, ආයෝජකයන් සමඟ කථා කරන්නය; නොමිලේ ටිකට් දීලා ඒ අයව ලංකාවට කැඳවාගෙන එන්නය කියලා. එහෙම තමයි ආයෝජන කටයුතු කරන්නේ. එහෙම නැතිව බොරු කථා කියා හරියන්නේ නැහැ. ආයෝජනය කරන්න විවිධ උපක්‍රම යොදා ගන්න ඕනෑ. මම මේ සභාවට ඒ ගැන ඇත්ත කියන්න ඕනෑ. මේ ගොල්ලන් මේ සභාවට ඇවිල්ලා උපාසකයෝ වාගේ කථා කරනවා. කරන්න පුළුවන් දහඉරා වැඩ ඔක්කොම කරලා අහු වුණායින් පස්සෙදි උපාසකයෝ වාගේ කථා කරනවා. ඒ නිසා ඒවා බොරු වැඩය කියන එක අපි කියන්න ඕනෑ. ඒ නිසා ඒ ගැන නිකම් කාලය නාස්ති කරන්න හොඳ නැහැ. ඒවා හොඳයි රූපවාහිනියට.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

නැහැ, නැහැ. මම කියන්නේ ආයෝජනය සඳහා අපි ඒ විධියට කටයුතු කරන්න ඕනෑය කියන එකයි.

ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් : පත්වීම්
ஆயுர்வேத மருத்துவ பட்டதாரிகள் : நியமனங்கள்
AYURVEDIC MEDICAL GRADUATES: APPOINTMENTS

3597/'13

7. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Gamini Jayawickrama Perera)

දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රැකියා විරහිත ආයුර්වේද උපාධිධාරීන් සියලුම දෙනාට රැකියා ලබා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

(ii) අවසන් වරට ආයුර්වේද උපාධිධාරීන්ට රජයේ පත්වීම් ලබා දුන් වර්ෂය කවරේද;

(iii) එම අවස්ථාවේදී පත්වීම් ලබා දුන් ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියකු බිහි කිරීම සඳහා රජය වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් වසා ඇති බෙහෙත් ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම බෙහෙත් ශාලා සඳහා ආයුර්වේද වෛද්‍යවරු අනුයුක්ත කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுதேச மருத்துவத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தொழிலற்ற ஆயுர்வேத பட்டதாரிகள் அனைவருக்கும் தொழில் வழங்குவதற்கான வேலைத் திட்டமொன்றை நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) இறுதியாக ஆயுர்வேத பட்டதாரிகளுக்கு அரச நியமனங்கள் வழங்கப்பட்ட வருடம் யாதென் பதையும்;

(iii) அச்சந்தர்ப்பத்தில் நியமனங்கள் வழங்கப்பட்ட ஆயுர்வேத மருத்துவ பட்டதாரிகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஆயுர்வேத மருத்துவ பட்டதாரியொருவரை உருவாக்குவதற்காக அரசாங்கம் செலவிடும் பணத்தொகை எவ்வளவென்பதையும்;

(ii) ஆயுர்வேத மருத்துவர்களது பற்றாக்குறையின் காரணமாக மூடப்பட்டுள்ள மருந்தகங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி மருந்தகங்களுக்கு ஆயுர்வேத மருத்துவர்களை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Indigenous Medicine:

(a) Will he state -

(i) whether steps have been taken to implement a programme to provide employment to all the unemployed Ayurvedic graduates;

(ii) the year in which the appointments were given to the Ayurvedic graduates in the Government sector for the last time; and

(iii) the number of Ayurvedic graduates who were given appointments on that occasion?

(b) Will he inform this House -

(i) of the amount of money spent by the Government for an Ayurvedic medical graduate;

(ii) of the number of dispensaries that are closed down due to the lack of Ayurvedic doctors; and

(iii) whether steps have been taken to assign Ayurvedic doctors to those dispensaries?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. රැකියා විරහිත සියලු ආයුර්වේද උපාධිධාරීන් හට රැකියා ලබා දීම සඳහා දැනට කටයුතු කරගෙන යන අතර, මේ වන විටද රැකියා විරහිත පිරිසත් නවක ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට පියවර ගෙන ඇත.

(ii) 2012 වර්ෂය

(iii) 264කි.

(ආ) (i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා ගත් තොරතුරු අනුව ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියකු බිහි කිරීම සඳහා වසර පහක කාලයක් තුළ වැය වන පුනරාවර්තන වියදම රු.1597980කි.

(ii) ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිඟය හේතුවෙන් කිසිම ආයුර්වේද බෙහෙත් ශාලාවක් වසා ඇති බවට වාර්තා වී නැත.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

I
සෙයියිද් අබ්දූර් රහ්මාන් ජිෆ්රි මවිලානා අනුස්මරණ අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஸெய்யித் அப்துர் ரஹ்மான் ஜிப்ரி மௌலானா ஞாபகார்த்த அறக்கட்டளை (கூட்டிணைத்தல்) சட்டமூலம்
SEYD ABDURAHIMAN JIFFRI MOWLANA MEMORIAL TRUST (INCORPORATION) BILL

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"සෙයියිද් අබ්දූර් රහ්මාන් ජිෆ්රි මවිලානා අනුස්මරණ අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.

II
අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
அல்ஹசன் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
ALHASAN FOUNDATION (INCORPORATION) BILL

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the Alhasan Foundation."

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற் காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා වැදගත් කාරණාවක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. 2005 දී ඉදිරිපත් කර තිබෙන ස්වාභාවික ව්‍යසන පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තාව අද වන විට වසර 08ක් පරණයි. නමුත් මේ මොහොත වන තෙක් මෙහි සිංහල සහ දෙමළ පරිවර්තන සකස් වෙලා නැහැ. මේ රටේ නිස්දහසකට වැඩි ප්‍රමාණයකගේ ජීවිත අහිමි වුණු සුනාමි විපත පිළිබඳ වාර්තාවේ පිටු 359යි තිබෙන්නේ. හැබැයි ගරු කථානායකතුමනි, -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා කියන කරුණ පිළිබඳව මා සොයා බලා කටයුතු කරන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තව පොඩි කාරණාවක් කියන්න තිබෙනවා. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමියට විරුද්ධව ගිය වසරේ ගෙනාපු පිටු 1575ක වාර්තාව පැය 48කින් භාෂා තුනෙන්ම පරිවර්තනය වුණා. නමුත් මේ වාර්තාවේ තිබෙන්නේ පිටු 359යි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒක ගැනත් හොයා බලන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා, ජීවිත නිස්දහසත්, හතළිස්දහසත් අතර-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඔබතුමාට අවශ්‍ය දේ කිව්වානේ. ඒ ඇති නේ. මම ඒ කාරණාව ගැන සොයා බලන්නම්. [බාධා කිරීමක්] ඒ ගැන සොයා බලන්නම් කියා මම කිව්වා. ඊට වඩා එහාට යන්න වැඩක් නැහැ.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்
SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.16]

ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාතුමිය වෙනුවෙන් "පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත ඉවත් කිරීමෙන් පසුව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අපි මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තා. ඒ වන විට 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත පාර්ලිමේන්තුවේ සම්මත වී තිබුණත් එම කොමිසමට ලබා දිය යුතු බලතල ඒ ආකාරයට ලබා දෙන්නට අපි කටයුතු කර තිබුණේ නැහැ. ඒ නිසා විදුලි නිෂ්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම් කටයුතු සම්බන්ධයෙන් කාර්යක්ෂම, හොඳ සේවාවක් ලබා දීමට විදුලිබල මණ්ඩලයට තිබුණු බාධක රාශියක් ඉවත් කර ගන්නට මේ සංශෝධනවලින් හැකි වන බව මා කියන්නට කැමැතියි.

2009 අංක 20 දරන පනතේ 2වන වගන්තිය මේ අනුව සංශෝධනය වනවා. විශේෂයෙන්ම, මීට පෙර තිබුණු පනත් යටතේ විදුලි මාර්ග ඉදි කිරීම්වලදී සිදු වන දේපොළ හානි, පවරා ගැනීම් පිළිබඳව වන්දි හා වෙනත් සහන ලබා ගැනීම සම්බන්ධයෙන් දිසාපතිවරයාට අභියාචනයක් ඉදිරිපත් කරන්නට ඕනෑම පුරවැසියකුට හැකියාව තිබුණා. නමුත් මෙවැනි ඉල්ලීම් පිළිබඳව සොයා බැලීම සඳහා උපයෝගිතා කොමිසමට බලය පැවරීමෙන් පසුව සෑහෙන ප්‍රමාද සිදු වෙන්නට පටන් ගත්තා. මොකද, කොමිසමට පවරපු වගකීම තවත් කෙනකුට භාර දීලා තිබුණේ නැහැ.

කෙළින්ම කොමිසමේ නියෝජිතයන් මේ පිළිබඳව සොයා බලන විට, රට හැම තැනම විදුලිබලය බෙදා හැරීමේ කටයුතු සිදු වන විට සෑහෙන ප්‍රමාද දෝෂයක් ඇති වන්නට පටන් ගත් නිසා මේ පනත් සංශෝධනය මඟින් ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රජයේ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට ඒ බලතල පවරන්න කටයුතු කර තිබෙනවා.

පෞද්ගලික අංශයේ විදුලිය ජනනය කිරීම පිළිබඳව තිබෙන 9 වන වගන්තිය සංශෝධනය වනවා. පළමු වරට 1990 ඉඳලා තමයි විදුලිය ජනනය කිරීම සඳහා පෞද්ගලික අංශයට බලතල පවරන්න යෙදුණේ. ඒ අවස්ථාවේදී ව්‍යාපාරයක් වශයෙන් සමාගම් ගණනාවක් ඉදිරිපත් වුණා. ඒ සමාගම් සියල්ලම පෞද්ගලික සමාගම් හැටියට තමයි ඉදිරිපත් වුණේ. සියයට 100ක් අයිතිය තිබුණේ ඒ සමාගම්වලටයි. මීට පසු විදුලි ජනනය කිරීම සඳහා ඇති කරන සමාගම්වල අයිතිය සියයට 51ක් රජයට ලබා දිය යුතුයි කියා තමයි මේ පනතින් ගෙනහැර දක්වන්නේ. ඊට අමතරව දැනට විදුලිය ජනනය කරන සමාගම් මේ කොන්දේසියෙන් නිදහස් වන බවත් මම සඳහන් කරන්න ඕනෑ.

මීළඟට විදුලිය බෙදා හැරීමේ බලපත්‍ර ලබා ගත හැක්කේ විදුලිබල මණ්ඩලයට, පළාත් පාලන ආයතනයකට, ඒ වාගේම

දැනට ලෙකෝ සමාගමට. මින් පසු විදුලි බලය බෙදා හැරීමේ අයිතිය යම්කිසි සමාගමක් ඉල්ලා සිටියොත් එයින් සියයට 50කට වැඩි අයිතියක් රජය සතු විය යුතුයි කියා ඒ පනත් සංශෝධනයේ සඳහන් වෙලා තිබෙනවා. ප්‍රජා මූල විදුලි උත්පාදන ඒකක තිබෙනවා. ඒ කියන්නේ යම් යම් ප්‍රදේශවල කුඩා ජල විදුලි බලාගාර තිබෙනවා. ඉන්ධනවලින් -ඩීසල්වලින්- ක්‍රියාත්මක වන කුඩා විදුලි උත්පාදන යන්ත්‍ර සවි කර ඇත පිටිසර ගම්මානවලට විදුලිය ලබා දීම සඳහා කටයුතු කරන අවස්ථාවල් තිබෙනවා. ඒ වාගේ දෙයක් ඇති කරන අවස්ථාවක වාණිජ නොවන පදනමක් මත ඒ ගමේ උදවිය එකතු වෙලා වියදම පාරිභෝගිකයින්ගෙන් එකතු කරලා පවත්වා ගෙන යෑමක් පමණයි සිදු වන්නේ. ඒ අය මෙතෙක් කලක් බලපත්‍රයක් ලබා ගත යුතුව තිබුණා. නමුත් මේ පනත් සංශෝධනයෙන් එවැනි ආයතන බලපත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කරනවා. මොකද ඒ අය ලාභ ලබන ආයතනයක් හැටියට කටයුතු නොකරන නිසායි.

ගරු කථානායකතුමනි, මී ළඟට 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ සභාධිපත්‍ය දේපළවලට විදුලිය ලබා දීම පිළිබඳව සඳහන් වෙනවා. විශේෂයෙන්ම තට්ටු ගොඩනැඟිලිවල නිවාස ඒකක සිය ගණනක් තිබෙන අවස්ථාවන් අප දකිනවා. මේවාට විදුලි බලය සැපයීම අද ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඒ ඒ ඒකකවලට වෙන වෙනමයි කරන්නේ. මේක ලංකා විදුලිබල මණ්ඩලයටත් විශාල ප්‍රශ්නයක්. තට්ටු තිහ හතළිහක් තිබෙන, නිවාස ඒකක තුන් හාරසියයක් තිබෙන ගොඩනැඟිල්ලක නම් ඒ ගොඩනැඟිල්ල තුළ තිබෙන මනු තුන් හාරසියයක් මාස් පතා කියවන්නට වනවා. ඒකට විශාල වියදමක් යනවා. ඒ වාගේම මේ හේතුව නිසා වෙන වෙනම බිල් පත් යැවීමක් කරන්නට සිදු වෙනවා. සමහර අවස්ථාවලදී සභාධිපත්‍යය අයිතිකරුවන් කළමනාකරණ සමාගමට යම් කිසි ප්‍රශ්නයක් වෙලා තිබෙනවාය කියා මා හිතනවා. විදුලි බිල නොගෙවා හිටියොත් ලංකා විදුලි බල මණ්ඩලයට විදුලිය විසන්ධි කරන්නට පුළුවන්. වතුර බිල නොගෙවා හිටියත් වතුර විසන්ධි කරන්න පුළුවන්. නමුත් මේ අය අයින් කර ගන්නට බැරි අවස්ථාවන් වන කොට, සභාධිපත්‍ය සමාගමට ඒ විදුලිය බෙදා හැරීමේ බලතල දුන්නොත් ඒ මුදල් නොගෙවා ඉන්න අයට විරුද්ධව කටයුතු කරන්නට පහසු වනවා. විදුලි සම්බන්ධතා සඳහා විදුලිය බෙදා හැරීමේ අවසරයක් ඒ සභාධිපත්‍ය සමාගමට ලබා දීමට මේ පනත් කෙටුම්පතට ඉදිරිපත් කෙරෙන සංශෝධනවලින් ඉඩ කඩ ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මීළඟට විදුලි සම්බන්ධතා සඳහා ණය පහසුකම් ලබා ගැනීම පිළිබඳව සඳහන් වෙනවා. බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල ළඟම තිබෙන කණුවේ ඉඳලා ගෙදරට විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා දැනට රුපියල් තිස්දාහක් පමණ වියදම් වෙනවා. ඒ වාගේ විශාල මුදලක් ගෙවා ගැනීමට බැරි බොහෝ දෙනා අප දකිනවා. නොයෙකුත් ආකාරයෙන් ණය ලබාගෙන, බොහෝ කලක සිට බොහොම ආශාවෙන් තමන්ගේ ගමට විදුලිය ලබා ගත්තත් ඊට පසුව තමන්ගේ ගෙදරට විදුලිය ලබා ගන්නට බැරි අවස්ථාවන් අප දකිනවා. මෙන්න මේ වාගේ අවස්ථාවන්වලදී විදුලිය ලබා ගැනීම සඳහා අය කරන මුදල මාසිකව අය කර ගැනීමට විදුලි බලය බෙදා හරින බලය ලත් ආයතනයට බල කිරීමක් තමයි මේ පනත් කෙටුම්පත මඟින් ගෙනෙන ලද සංශෝධනවලින් සිදු වෙන්නේ.

එම මුදල විදුලි බිලත් සමඟ කොටස් වශයෙන් අය කර ගැනීමට හැකි වන නිසා විශේෂයෙන්ම විදුලිය ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින ගම් ප්‍රදේශවල ජනතාවට එය විශාල පහසුවක් වනවා.

ගරු කථානායකතුමනි, බෙදා හැරීමේ බලපත්‍රලාභියා හා පාරිභෝගිකයා අතර සහ තවත් පාරිභෝගිකයන් අතර ඇති වන යම් යම් ආරවුල් නිරවුල් කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම මෙතෙක් කල් මැදිහත් වුණේ නැහැ. ඒ වෙනුවෙන් මැදිහත් වීමට එම කොමිසමට බලතල ලැබුණත් දුර ප්‍රදේශවල ආරවුලක් සිදු වන අවස්ථාවලදී ඒ සඳහා කොළඹ සිට තමන්ගේ නියෝජිතයා යවා ඒ ප්‍රශ්නය විසඳීමට ඉක්මනින් කටයුතු කරන්නට හැකි නොවන නිසා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට ඒ ප්‍රදේශයෙන් සමථ මණ්ඩලයක් පත් කරලා, ඒ කටයුත්ත භාර දීමට ප්‍රධාන ප්‍රඥප්තියේ 39වන වගන්තිය මේ අවස්ථාවේදී සංශෝධනය වනවා.

ගරු කථානායකතුමනි, විදුලිය සොරා ගැනීම් සහ විදුලි මීටරය අනවසරයෙන් වෙනස් කිරීම ඇප ලබා නොදෙන වරදක් හැටියට ඉවත් කරන ලද පැරණි පනතේ සඳහන්ව තිබුණා. ඊට පසුව 2009 ප්‍රඥප්තියෙන් එය ඉවත් කර තිබුණත් මේ ගෙනෙන සංශෝධනයෙන් නැවත ඒ දඬුවම් ඒ ආකාරයෙන් ලබා දීමට බලතල පැවරී ඇති බව පැහැදිලිව පෙනෙනවා. පෙර තිබුණු ආකාරයට විදුලිය සොරා ගැනීම සහ විදුලි මීටරය අනවසරයෙන් වෙනස් කිරීම ඇප ලබා නොදෙන වරදක් බවට පත් කිරීම තමයි මේ අවස්ථාවේදී සිදු වන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟ සංශෝධනය බෙදා හැරීමේ බලපත්‍රලාභියෙකු විදුලි මාර්ගයක් ඉදි කිරීමට යෙදෙන අවස්ථාවක මාර්ග අවසරය ලබා ගැනීම පිළිබඳවයි. විශේෂයෙන්ම ගම් ප්‍රදේශවල ගහ කොළ වවා ගෙන ඉන්න අයගේ ඉඩම් හරහා විදුලි මාර්ගයක් ඉදි කිරීමට කටයුතු කරන අවස්ථාවලදී මේ ප්‍රශ්නය පැන නඟිනවා. තමන්ට විදුලිය සපයා ගැනීමට අමතරව වෙනත් පිරිසකට විදුලිය සැපයීම හෝ වෙනත් ප්‍රදේශයකට විදුලිය සැපයීම සඳහා ඉඩමක් උඩින් අධි වෝල්ටීයතාවෙන් යුතු විදුලි මාර්ගයක් දිවෙන අවස්ථාවකදී ගම්වල විරෝධයක් ඇති වනවා අපි දකිනවා. එවැනි අවස්ථාවලදී ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම මැදිහත් විය යුතුයි කියන එක තමයි මේ සංශෝධනයේ තිබෙන්නේ. මීට පෙර අමාත්‍යාවරයා නිර්දේශ කළේ ඉඩම් අත්පත් කර ගැනීම වාගේ දේවල් කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම පරීක්ෂණයක් කරලා ඊට නිර්දේශ ඉදිරිපත් කිරීමයි. විශේෂයෙන්ම ප්‍රධාන පනතේ පළමුවන උපලේඛනයේ යෝජනා කළේ එයයි. අද ඉදිරිපත් කරන සංශෝධනය අනුව එවැනි අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂණයක් කළ යුතුයි. ඒක ඉතාම වැදගත් කාරණයක් නිසා එම මාර්ග අවසරය ලබා ගත්තොත්, සමහර විට ඉඩම් පවරා ගැනීම සිදු කරන්නට වනවා. මේ අවස්ථාවලදී ඇමතිවරයා විසින් ඒ අවශ්‍ය ඉඩම් පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතුයි කියන එකයි මෙම සංශෝධනයෙන් පැහැදිලි වන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟට ප්‍රධාන පනතේ දෙවන උපලේඛනයේ සඳහන් වනවා, විදුලි මීටරයක් පරීක්ෂා කිරීමට ඇති අවසරය. නිවසකට ඕනෑම වෙලාවක ඇතුළු වෙලා විදුලි මීටරයක් පරීක්ෂා කරන්න පුළුවන් අවසරය මෙතෙක් කල් තිබුණා. ඒක ඒ තරම් සුදුසු නැති බව පැහැදිලි වුණු නිසා තමයි ඒ වෙලාව උදේ 8 සිට සවස 6 දක්වා කළ යුතුයි කියා යෝජනා කරලා තිබෙන්නේ. ඒ වාගේම නොයෙකුත් අය මේ වාගේ පරීක්ෂණ සඳහා නිවාසවලට ගිය අවස්ථාවල අර්බුදකාරී තත්ත්ව ඇති වෙලා තිබෙනවා. ඉතාම වැදගත් සංශෝධනයක් තමයි මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මෙන්න මේවා තමයි සංශෝධන අතින් ඉතාම වැදගත් ඒවා කියලා අපට කියන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම මෙම සංශෝධන සියල්ලම මීට පෙර කළ යුතුව තිබුණා. ගරු ඇමතිතුමිය ඒ පිළිබඳව සොයා බලා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට ඒ බලය පවරලා, ඒ කොමිසම තුළින් ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්නට පියවර ගැනීම පිළිබඳව මේ අවස්ථාවේ අපගේ ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

සියයට 51ක බලය රාජ්‍ය අංශයට තිබෙනවා කියලා ගරු අමාත්‍යතුමා කිව්වා. එතකොට, මෙගාවොට් 25ට වැඩිය විදුලිය නිෂ්පාදනය කරන විදුලි බලාගාරයක් පෞද්ගලික අංශයෙන් කරද්දී එහෙම වෙනවා කියලා මේ පනතේ කොහේද තිබෙන්නේ ගරු ඇමතිතුමනි? [බාධා කිරීමක්]

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
ගරු ඇමතිතුමියගේ කථාවේදී ඒකට උත්තර දෙයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
සියයට 51ක කොටස් රජයට තිබෙන්න ඕනෑය කියලා ඇමතිතුමාගේ කථාවේදී කිව්වා. ඒක පනතේ සඳහන් වෙලා නැහැ. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව ඇමතිතුමිය පැහැදිලි කරයි.

මීළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය වටිනවා. ඒකට උත්තරයක් ලබා ගත්තොත් හොඳයි නේද? එහෙම නැත්නම් අපි නොමඟ යන,- [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමියගේ පිළිතුරු කථාවේදී ඒකට පිළිතුරක් ලබා දෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩු පක්ෂයෙන් කියපු දෙයක් පිළිබඳව තමයි අපි උත්තර දෙන්න ඕනෑ. ඒක වැරැදියිනේ. එතකොට අපි වැරැදි මාර්ගයේ යනවානේ ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්] කියන්න, ඒක සඳහන් වෙන්නේ මොන පිටුවේද කියලා. මොකද, ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්නේ කිව්වේ. [බාධා කිරීමක්] ඒක වැරැදි ප්‍රකාශයක්ද? ගරු කථානායකතුමා මූලාසනයේ ඉන්නවා. ඒ කියපු දේවල්වලට විපක්ෂය වශයෙන් අපිත් උත්තර දෙන්න ඕනෑ. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ වැදගත් කරුණක්. නිකම් කථා කිරීම නොවෙයිනේ අවශ්‍ය වන්නේ. බුද්ධිමත්ව කථා කිරීම තමයි අපට අවශ්‍ය වන්නේ.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපට හොඳ උත්තරයක් ඕනෑ. මොකද, මේක විවාදයක්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කථා කිරීමම නොවෙයි අප කළ යුතු වන්නේ. ඔය විධියට කථා කරලා දැන් රට වැටිලා තිබෙන තැන දන්නවානේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා කිව්වා, අලුතින් පටන් ගන්නා සමාගම්වල කොටස්වලින් සියයට 51ක් හෝ වැඩි ප්‍රමාණයක් රජය තියා ගන්නවා කියලා. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඇහුවේ, පනතේ මොන වගන්තියේද ඒක තිබෙන්නේ කියලා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
"කිසියම් ප්‍රතිශතයක් රජය තබා ගත යුතුයි" කියලා මේ පනතේ සඳහන් වෙනවා මිස, සියයට ගණනක් සඳහන් කරලා නැහැ. එහෙම දෙයක් කිව්වාට, පනතේ සඳහන් වෙන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම සියයට ගණනක් ගැන පනත් කෙටුම්පතේ සඳහන් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවාද? ඒ සියයට ගණන අමාත්‍ය මණ්ඩලයට සාකච්ඡා කරලා තීරණයක් ගන්න පුළුවන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, සියයට 51ක් රජයට තියා ගන්න

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමිය පසුව ඒකට පිළිතුරක් දෙයි. දැන් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලන්නේ ඒ කාරණය ඉතාම වැදගත් නිසා පිළිතුරක් ලබා දෙන ලෙසයි. ඇයි දන්නවාද ගරු කථානායකතුමනි? ඒක පෞද්ගලීකරණයේ පෙර නිමිත්තක් වෙන්න පුළුවන්. මොකද, සියයට 51 වෙනුවට සියයට 49 වුණා නම් පෞද්ගලීකරණය තමයි එතැන තිබෙන්නේ. මේ විවාදය පටන් ගන්න ඉස්සෙල්ලා මේ පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා අපට දැන ගන්න අවශ්‍යයි. මොකද, සමහර ඇමතිවරු නින්දෙන් ඇවිදිනවා, යම් අයට මතක නැහැ කියනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අනවශ්‍ය කථා නැතුව තමන්ගේ ප්‍රශ්නය කථා කරන්න. [බාධා කිරීමක්] හරි, ඉතින් අමාත්‍ය මණ්ඩලයට ඕනෑ වෙලාවට ඒ තීරණය ගනීවි. ඒ ඇමතිතුමා කිව්වා, ගරු ඇමතිතුමිය පිළිතුරු දෙනවා කියලා. ඒ ඇති.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මයික් එක ලබා දුන්නොත් මගේ ප්‍රශ්නය හරියට කියන්න පුළුවන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රශ්නය ඇහුවා නේ. ගරු ඇමතිතුමිය පිළිතුරු දෙනවා කිව්වා. පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් ගරු ඇමතිතුමිය පිළිතුරු දෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා විශ්වාස කරලා මගේ කථාව ආරම්භ කරන්නම්. එතුමා කියපු දේ ඇත්තටම ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒක සටහන් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව කියන්නේ එකක්; කරන්නේ තවත් එකක්. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට වෙන් කර තිබෙන කාලයෙන් දැන් විනාඩි දෙකක් ගියා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, උත්තර දෙන්න මේ ආණ්ඩුවට විනාඩි දෙකක් ගියා. [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාගෙන් හරි කාලය ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාගේ කාලයෙන් තමයි ඒකත් ගිහිල්ලා තිබෙන්නේ.

[අ.භා. 2.31]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකත් අපෙන්ද ගන්නේ? ගරු කථානායකතුමනි, බලන්නකෝ කොච්චර අසාධාරණයක්ද කියලා.

ගරු කථානායකතුමනි, මට කථාව ආරම්භ කරන්න තිබෙන්නේ ඒ ප්‍රශ්නයට පිළිතුර නොදැනුවත්වයි. ආණ්ඩුව අඳුරේ අත පත ගගා යනවා වාගේ විපක්ෂයත් ඒ මාර්ගයේ ගෙන යන්න හදනවා. ඒක තරයේ ප්‍රතික්ෂේප කරලා තමයි මා කථාව පටන් ගන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී අපට කියන්න තිබෙන්නේ විදුලි බලය අත්‍යවශ්‍ය යටිතල පහසුකමක් බවයි. ඒ වටිනාකම දැන ගෙන, ජල විදුලිය පාවිච්චි කරලා අඩු මිලට විදුලිය උත්පාදනය කරන්න පුළුවන් නිසා තමයි එදා එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල, මාදුරුඔය, කුකුළේ ගඟ වැනි ව්‍යාපෘති ආරම්භ කළේ. විදුලිබල මණ්ඩලය මේ මොහොතේ දවසක අවශ්‍යතාව හැටියට මෙගාවොට්ස් 1400ක් උත්පාදනය කරනවා. ජල විදුලිය වැඩියෙන් නිෂ්පාදනය කරන්නට හැකි මේ අවස්ථාවේ දී අපි ආණ්ඩුවෙන් ඉස්සරවෙලාම ඉල්ලන්නේ පසු ගිය මාස දෙකක සිට අධික වර්ෂාපතනයක් ලැබෙන නිසා අසාධාරණ ලෙස වැඩි කර තිබෙන විදුලි මිල කරුණාකර අඩු කරන්න කියන එකයි. අපේ ගරු විපක්ෂ නායකතුමා ඊයේත් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. සාමාන්‍යයෙන් ජල විදුලි බලය - hydropower - මාස හතක විතර කාලයක් පාවිච්චි කරනවා. ඊට පස්සේ ඉතිරි අඩුව උත්පාදනය කරන්න තමයි අපි තාප බලය පාවිච්චි කරන්නේ. මේ තුළින් විදුලි බිලේ අසාධාරණ මට්ටමක් ඇති නොවන විධියට වැඩ කටයුතු කරන්නේ නැහැ. මේක ලෝක වෙළෙඳ පොළේ මිල වැඩි වන විට වැඩි කරලා, අඩු වන විට අඩු නොකරන ආණ්ඩුවක්. මේ අවස්ථාවේ ඕනෑ තරම් ජල විදුලිය උත්පාදනය කරන්න හැකියාව තිබෙද්දී, එහෙම කරන්නේ නැතිව තෙල් සහ අනෙකුත් දේවල් පාවිච්චි කරලා විදුලිය උත්පාදනය කරනවා. විදුලි බිල දැකලා මිනිස්සු අමාරුවේ වැටිලා ඉන්න අවස්ථාවක මම ගරු ඇමතිතුමියගෙන් අහන්නේ මේ ආණ්ඩුව විදුලි බිල අඩු කරන්නේ නැද්ද කියන එකයි. ඒක මුලින්ම කියන්න ඕනෑ. මේ විධියට සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි?

එක්සත් ජාතික පක්ෂ රජය කළ සේවය මම මේ අවස්ථාවේ මතක් කරන්න අවශ්‍යයි. 1985 සිට විදුලිබල මණ්ඩලය ලැබූ ලාභයත් අද ලබන අලාභයත් පෙන්වා දුන්නොත්, ඒ දෙක අතර ඇති වෙනසින් පෙනෙනවා, විදුලිබල මණ්ඩලයේ කාර්යක්ෂමතාව, එහි තිබෙන දූෂණ සහ රට ගැන හැඟීමක් නැතිව පාලනය කරන බව.

ගරු කථානායකතුමනි, 1985 දී රුපියල් මිලියන 1301ක් තිබුණ ලාභය 1986 දී රුපියල් මිලියන 1285ක් වුණා. 1987 දී ලාභය රුපියල් මිලියන 1254යි. 1988 දී රුපියල් මිලියන 1135යි. 1989 දී රුපියල් මිලියන 907යි. 1990 දී රුපියල් මිලියන 1653යි. 1991 දී ලාභය රුපියල් මිලියන 344යි. 1992 දී ලාභය රුපියල් මිලියන 275යි. 1993 දී ලාභය රුපියල් මිලියන 1264යි. 1994 දී රුපියල් මිලියන 3809යි. 1995 දී රුපියල් මිලියන 4997යි. ගරු කථානායකතුමනි, 1996 වර්ෂයේ ලාභය රුපියල් මිලියන 95ට අඩු වුණා. 1997 දී අලාභය රුපියල් මිලියන 1990යි. 1998 දී අලාභය රුපියල් මිලියන 2152යි. 1999 දී රුපියල් මිලියන 4234යි. 2000 දී රුපියල් මිලියන 6723යි. 2001 දී රුපියල් මිලියන 9236යි. 2002 දී ඒ ආණ්ඩුව වෙනස් වුණා. ඊට පස්සේ අලාභය රුපියල් මිලියන 7426ක් වුණා. 2003 දී රුපියල් මිලියන 3750 දක්වා තවත් අඩු වෙනවා. 2004 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැරදුනා. ඒ අවුරුද්දේ අලාභය රුපියල් මිලියන 15706යි. ඊට පස්සේ 2005 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 6852යි. 2006 දී රුපියල් මිලියන 6124යි.

2007 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 14,812යි. 2008 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 33,860යි. 2009 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 49,800යි. 2010 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 53,500යි. 2011 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 95,200යි. ඒ කියන්නේ අලාභය රුපියල් කෝටි 9,520යි. 2012 වර්ෂයේ අලාභය රුපියල් මිලියන 89,100යි. ඒ කියන්නේ අලාභය රුපියල් කෝටි 8,910යි. ගරු කථානායකතුමනි, මේ සංඛ්‍යා ලේඛන බැලුවාම පෙනෙනවා, එක්සත් ජාතික පක්ෂ

[ගරු රවි කරුණානායක මහතා]

ආණ්ඩුව කාලයේ විදුලිබල මණ්ඩලයේ ලාභය අධික මට්ටමක තිබුණත්, ඊට පසුව ඒ තත්ත්වය හාත්පසින් වෙනස් වෙලා ඒ ලාභය අලාභයක් බවට පරිවර්තනය වෙලා ඒ බර අද අහිංසක ජනතාවගේ කර පිට තබා තිබෙනවාය කියන එක. ගරු කථානායකතුමනි, ඒ පසු බිම පාවිච්චි කර ගෙන තමයි මම අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ. ඒ නිසා අපි ගරු පී. දයාරත්න ඇමතිතුමාගෙන් අහනවා, මොන විධියටද මේ ආයතනය ගෙන යන්න හදන්නේ කියලා. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් මේ දේවල් ගේන්න හදන කොට විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණයට යොමු කරන්න හදනවාය කියලා ලොකු ශබ්දයක් කළා. එතුමාත් අපේ කැබිනට් මණ්ඩලයේ සිටියා. මේ අවස්ථාවේදී ඒක හුදකලාව කිව්වාම මෙපමණ ප්‍රතිශතයක් පෞද්ගලික අංශයට දෙන්න යනවාය කියලා, ඒ ප්‍රමාණය සියයට එකක්ද, දෙකක්ද, දහයද, විස්සක්ද, පනස්එකක්ද කියලා අපට දැන ගන්නට අවශ්‍යයි.

අපි 2001 දී පාලන බලය ලබා ගත්තා. අප පාලන බලය ලබා ගන්නා අවස්ථාවේදී පැය අටක් ලයිට් නැතිව තිබුණා. ඒ තත්ත්වය යථා තත්ත්වයට පත් කරලා මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය යටිතල පහසුකම් දවස් සියයකින් ලබා දෙන්න අපට හැකියාව ලැබුණා. අපි නිකරුණේ කථා කරන පක්ෂයක් නොවෙයි. විපක්ෂයක් වශයෙන් නිකරුණේ කථා කරලා, තිබෙන ප්‍රශ්න යම් විධියකින් ආණ්ඩුවට පෙන්වීම නොවෙයි අපට කරන්න තිබෙන්නේ. ඒ ප්‍රශ්නවලට අදාළව තර්කානුකූලව අදහස් ඉදිරිපත් කරලා අපි මේක වැඩිදියුණු කරන්නේ කොහොමද, ඔබතුමන්ලාගේ කඩා වැටෙන ආණ්ඩුව හෙට අපි හදන්නේ කොහොමද කියන්න පුළුවන් අවස්ථා තමයි අපි පෙන්වන්න හදන්නේ. ඒ නිසා තමයි ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි ඇමතිතුමියගෙන් අපි ඉල්ලුවේ මේ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන්න කියලා. ඔබතුමන්ලා කොයි තරම් අපගේ චරිත ඝාතනය කළාද, මේ ආයතනය පෞද්ගලීකරණයට යොමු කරනවා කියලා. දැන් පෙනෙනවා, ඒ ආයතන ආරක්ෂා කළේ අපියි කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව මේ රටේ හැම බිම් අහලක්ම විකුණන්න හදන ආණ්ඩුවක්. පොඩි ඉඩම් කෑල්ලක් තිබුණොත් එතැන කුලියට සිටින ඒ අහිංසක මිනිසුන්ව එළියට විසි කරලා ඒ ඉඩම සුද්දන්ට විකුණන තත්ත්වයක් මේ ආණ්ඩුව ඇති කරලා තිබෙනවා.

අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතෙන් ගෙන එන සංශෝධන මඟින් විදුලිබලය උත්පාදනය කිරීමක් කරන්න හැකි වනවාද කියන කරුණ ප්‍රශ්නාර්ථයක් වශයෙන් මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී එතුමා එයට උත්තර දේවි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නියෝජ්‍ය ඇමති කියනවා, ජ්‍යෙෂ්ඨ ඇමති කියනවා. ඔබතුමිය තමයි මේ පාර්ලිමේන්තුවේ කිව්වේ මාර්තුවල විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියලා. නමුත් සුමාන දෙකක් යන්න ඉස්සෙල්ලා කිව්වා, "ඔව්, අපි වැඩි කරනවා" කියලා.

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

මම කිව්වේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමිය කිව්වේ නැහැ, එහෙනම් ඔබතුමියගේ කට කියලා ඇති. හැන්සාඩ් වාර්තා තුළින් ඒක ඔප්පු කරන්න පුළුවන්. මේ කියන අවස්ථාව වන විට කී දෙනෙක් ලයිට් බිල සම්බන්ධයෙන් ප්‍රශ්න කරලා තිබෙනවාද? අඩු ගණනේ සියයක්, දෙසීයක් මේ ලයිට් බිල දැකලා මැරිලා ඇති.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා දැන් ඡන්දයකටත් යනවා. මැතිවරණ කොමසාරිස්වරයාත් කියනවා, මේ පවත්වන්න යන පළාත් සභා තුනේ මැතිවරණය නිසා වියදම රුපියල් මිලියන 150කින් වැඩි වනවා කියලා. ඒක එසේ මෙසේ වැඩි වීමක් නොවෙයි, රුපියල් මිලියන 150ක්. අපි නොවෙයි කියන්නේ ඔබතුමන්ලාගේ මැතිවරණ කොමසාරිස්. මෙය අනවශ්‍ය ඡන්දයක්. යම් යම් අය කියනවා, බලතල ඕනෑ නැහැයි කියලා. දැන් ඉන්දියාවට භය වෙලා ඕනෑ නැහැයි කියනවා. ඔබතුමන්ලා පෙන්වූවා, මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳ නැහැ, වෙනස් කරනවා කියලා. හැබැයි මැතිවරණය පවත්වනවා. හොඳ නැත්නම් මොකටද මැතිවරණය පවත්වන්නේ? ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා නේ එය වෙනස් කරන්න. ඒ ගැන අපි අභියෝග කරනවා. එහෙම නැත්නම් දැන් ඉන්දියාවට භයේ ඒ තත්ත්වය යටපත් කර ගෙන ඉන්නවාද කියලා මම අහනවා.

අපි පෙන්වා දීලා තිබෙනවා, මේ ආණ්ඩුව විදුලිය ගාස්තුව වැඩි කරලා තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිකුත් කරලා තිබෙන නිවේදනයක් තුළින් මම දැනුවත් කරනවා, මේ වැඩිවීම බොහොම අසාධාරණයි කියලා. රජය තමයි විදුලිය වැඩියෙන්ම පරිභෝජනය කරන්නේ. මේ ආයතනවල තිබෙන අලසකම සහ අකාර්යක්ෂමතාව නිසා විශාල නාස්තියක් -wastage එකක්- සිදු වනවා. දැන් රජයේ ආයතනයකින් එක ඒකකයකට අය කරන්නේ රුපියල් 14.65යි. රටේ ආර්ථිකයට සියයට 75කින් පමණ දායකත්වය ලබා දෙන පෞද්ගලික අංශයෙන් එක unit එකකට රුපියල් 42ක් අය කරනවා. අනෙක් පැත්තෙන් industrial sector එකට එක ඒකකයකට රුපියල් 24ක් අය කරනවා. ඒකට සියයට 25ක ඉන්ධන ගැළපුම් ගාස්තුවකුත් - fuel adjustment charge - එකතු කරනවා. රජයේ ආයතනවලින් ඒකකයකට රුපියල් 14ක් අය කරනවා. රටේ ආර්ථිකයට සියයට 75කින් දායක වන පෞද්ගලික අංශයෙන් ඒකකයකට රුපියල් 24ක් අය කරනවා, ඒකට සියයට 25කුත් එකතු කළාම රුපියල් 40ක් විතර වනවා. එහෙමනම් මේ රටේ තරගකාරී තත්ත්වයක් ඇති කරන්න පුළුවන් වන්නේ කොහොමද?

තමුන්නාන්සේලා "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දුන්නු පොරොන්දුව මොකක්ද? කථානායකතුමාටත් මතක ඇති නේ. ඒකේ කියනවා, "අපි විදුලි බිල වැඩි කරන්නේ නැහැ, අපි වතුර බිල වැඩි කරන්නේ නැහැ" කියලා. නමුත් අද ඒ සම්පූර්ණ බර ජනතාව පිට පටවලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා, "අපි ඔයගොල්ලන්ට ණය දෙන්නේ නැහැ, ණය ඕනෑ නම් කරුණාකර විදුලිබල මණ්ඩලයේ තිබෙන අලාභය නැති කරන්න, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තිබෙන අලාභය නැති කරන්න" කියලා. 2013 පෙබරවාරි මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කළ ඒ අභියෝගයට භය වෙලා මාර්තු මාසයේ විදුලිය ගාස්තු වැඩි කරන්න පටන් ගත්තා. [බාධා කිරීමක්] නැහැ නොවෙයි, ඒක ඇත්තටම වෙලා තිබෙනවා.

ඊයේ විපක්ෂ නායකතුමාත් මේ කාරණය මතක් කළා. අද අධික වර්ෂාපතනයක් තිබෙනවා. ජලාශවල ජල මට්ටම අධික ලෙස ඉහළ ගොස් තිබෙනවා. ජල විදුලිය නිෂ්පාදනය කිරීමට හැකියාවක් තිබෙන නිසා විදුලිය ගාස්තු අඩු කරයි කියලා අද පාරිභෝගිකයන් බලාගෙන ඉන්නවා. කරුණාකර මේ විදුලිය ගාස්තු අඩු කරන්න. ඇයි, fuel adjustment charge එක සියයට 25ක් දමන්නේ? මේ ආණ්ඩුව මුහුණ බලාගෙන pickpocket ගහන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා. සම්පූර්ණයෙන්ම කළු කඩ ව්‍යාපාරයක් ගෙන යන තත්ත්වයට තමයි අද විදුලිබල මණ්ඩලය පත් වෙලා තිබෙන්නේ.

බලන්න, විදුලිය පරිභෝජනය ගැන. විදුලිය ඒකක 0 සිට ඒකක 30 දක්වා එක ඒකකයක් සඳහා අය කරන්නේ රුපියල් තුනයි කියලා පෙන්වනවා. ඒකක 31 සිට ඒකක 60 දක්වා එක ඒකකයක් සඳහා අය කරන්නේ රුපියල් 4.70යි. Unit 90ට තිබුණු එක unit 60 දක්වා අඩු කළා. ඒකක 61 සිට ඒකක 90 දක්වා එක ඒකකයක් සඳහා අය කරන්නේ රුපියල් 12යි. ඒකක 91 සිට ඒකක 120 දක්වා එක ඒකකයක් සඳහා අය කරන්නේ රුපියල් 26.50යි. [බාධා කිරීමක්] තවම හොයන්න බැරි වෙලා තිබෙනවා නේද? එහේ මෙහේ දුවනවා. පෙනෙනවා නේ, ගරු කථානායකතුමනි. කොළේ වහලා වැඩේ දෙන්න හැදුවා. අපේ luck එකට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඒක දැක්කා.

ගරු කථානායකතුමනි, ඒකක 121 සිට ඒකක 180 දක්වා එක ඒකකයක් සඳහා අය කරන්නේ රුපියල් 30.50යි. ඒකක 180ට වැඩි සෑම ඒකකයක් සඳහාම අය කරන්නේ රුපියල් 42යි. මේකට ගැළපුම් ගාස්තුවත් - fuel adjustment charge - එකතු කරනවා. ගරු කථානායකතුමනි, සියයට 25ක් මේකට එකතු කරනවාය කියලා කියන්නේ රුපියල් 10ක් මේකට එකතු වෙනවා කියන එකයි. එතකොට රුපියල් 52ක් වෙනවා. අපට කොයි ආකාරයෙන්ද විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වන්නේ?

ගරු කථානායකතුමනි, අද රට පුරාම තිබෙන දේ තමයි දූෂණය. දූෂණය හැම කොනකම ඇති වෙලා ඒක එකතු වෙලා අර ඉංග්‍රීසියෙන් කියන snowball වෙලා ඒක ලොකු බෝලයක් බවට පත් වෙලා තිබෙනවා. අද ඒක දරා ගන්න බැරි තත්ත්වයක තිබෙන නිසා තමයි විදුලිබල මණ්ඩලයට මෙතරම් ණය බරතාවක් තිබෙන්නේ. විදුලිබල මණ්ඩලයේ ශේෂ පත්‍රය බැලුවොත් ඒ ආයතනය කඩා වැටිලායි තිබෙන්නේ කියලා පෙනෙනවා. ඒක බංකොලොත් වෙලා වහලා දමන තත්ත්වයකුයි ඇති වෙලා තිබෙන්නේ. ඒකේ තිබෙන ප්‍රශ්නය එතැනින් නවතින්නේ නැහැ. මේ ආයතනයට දීපු ණය නිසා මහජන බැංකුවේත්, ලංකා බැංකුවේත් ශේෂ පත්‍රයට යම් විධියක ප්‍රශ්නයක් ඇති වෙලා ඒවායේත් ණය බරතාවක් ඇති වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් පෞද්ගලික අංශයේ ප්‍රශ්නයක් තිබුණොත් දවස් හැටකට පස්සේ ඒක CRIB එකට එවනවා වාගේ ආණ්ඩුවේ ආයතන නිසා එවන්න බැහැ. නමුත් Basle Bank Theory එක අනුව ණය ගෙව්වේ නැත්නම් මාස තුනකට පස්සේ ඒ ආයතනයේ ණය බොල් ණය වශයෙන් කපා හරිනවා. එහෙම කපා හැරියොත් ලංකා බැංකුවත්, මහජන බැංකුවත් කඩා වැටෙනවා.

විශේෂ පළපුරුද්දක් ඇතිව, විශේෂ දැනුවත්කමක් ඇතිව මේ ආයතනවල කටයුතු ඉදිරියට කරගෙන යන්න අවශ්‍යයි. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අපි මේ ආයතනය යම් විධියකින් විමර්ශනයකට - investigation එකකට- ලක් කළා. ඒ අවස්ථාවේදී අපට පෙනුණා, අවුරුදු දෙකකට පෙර මේ ආයතනයේ වරලත් ගණකාධිකාරිවරුන් දෙදෙනයි හිටියේ කියලා. මේ ආයතනය සාමාන්‍යයෙන් රුපියල් කෝටි 22,800ක් විතර ආදායමක් උපයන ආයතනයක්. ඒ ආයතනයේ වරලත් ගණකාධිකාරිවරුන් දෙදෙනායි සිටියේ කියලා කිව්වාම ඒකෙන් පෙනෙනවා, මොන වාගේ අකාර්යක්ෂමතාවක් තිබුණු ආයතනයක්ද කියලා; කිසිම දර්ශනයක් නැතුව ගමන් කරපු ආයතනයක්ද කියලා. ඉතින් ඒ ආයතනය මේ වාගේ අලාභයක් ලබන එක අහන්නත් දෙයක්ද? මේ ආණ්ඩුවේ තිබෙන අදක්ෂතාව නිසා අභිංසක පාරිභෝගිකයන් ලක්ෂ 50කගෙන් ඒවා අය කර ගන්න මේ විධියට නිකරුණේ විදුලිය ගාස්තු වැඩි කරන්න පුළුවන්ද? ගරු කථානායකතුමනි, මොහොතකට පෙර මේ සභාවේ විදුලිබල හා බලශක්ති ඇමතිතුමිය හිටියා. නමුත් දැන් එතුමිය ගිහිල්ලා.

ෂැන්ග්‍රි-ලා හෝටලය මෙහාට ගෙනෙන්න ඕනෑය කියලා, විදුලිබල මණ්ඩලයට කිව්වා රුපියල් මිලියන 30ක් වියදම් කරලා එතැන ලයිට් ටික හදන්න කියලා. රුපියල් මිලියන 30ක් වියදම් කරන්න අවශ්‍යද මේ පෞද්ගලික කොම්පැනියකට? ආණ්ඩුව එක පැත්තකින් ගෙනෙන්න කියලා කියනවා. අනෙක් පැත්තෙන් පගා ගන්නවා කියලා කියනවා. ඒ වාගේ විදුලි බලයත් ඒ ගොල්ලන්ගේ දොරකඩටම ගිහිල්ලා දෙන්න ඕනෑය කියලා මේ ෂැන්ග්‍රි-ලා ආයතනයත් එක්ක ගිවිසුම් ගහලා තිබෙනවා. ඒ වාගේම තමයි night race. කවුරුත් දන්නවා නේ, ඒක විහිළුවක් බවට පත් වෙලා තිබෙනවාය කියලා. කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ. කථා කරන්න භයයි. නමුත් රුපියල් කෝටි 23ක් ඒ දවස් දෙකට නාස්ති කරලා තිබෙනවා. මේවා තමයි අනවශ්‍ය දේවල්.

අපේ ගරු කථානායකතුමා, තමාගේම ප්‍රායෝගික දැනුවත්කම තුළින් යම් යම් තැන්වල කියලා තිබෙනවා, මේ වාගේ මුදල් නාස්ති සිද්ධ වුණාම රටක් හරියට ගෙන යන්න බැහැ කියලා. මම ඒ කථාව අගය කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ආදර්ශය දුන්නා වරාය අමාත්‍යාංශය හොඹවපු අවස්ථාවේදී; ඒ වාගේම තමයි ගුවන් සේවා අමාත්‍යාංශය හොඹවපු අවස්ථාවේදී. ඔබතුමා වර්තමානයේදීත් අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ වාගේ අනවශ්‍ය වියදම් නිසා ආණ්ඩුවට අනවශ්‍ය බරක් දරන්න සිදු වෙලා තිබෙනවා කියලා. ආණ්ඩුව බර ඇද්දාට කමක් නැහැ. නමුත් ඒවායේ - night races, hedging සූදුව වාගේ ඒවායේ- බර ජනතාව මතට දමන්න පටන් ගත්තාට පස්සේ තමයි අපි මෙතැනදී ඒ දේවල් ප්‍රතික්ෂේප කරන්නේ. විමල් වීරවංශ ඇමතිතුමා කිව්වා, "ආර්ථික ඝාතකයෙක් ඉන්නවා" කියලා. ඒ බවට යම් යම් සාධක තිබෙනවා. Standard Chartered Bank එකට කෝටි 7,000ක් විතර ගෙවලා තිබෙනවා. ඒ කෝටි 7,000 ගෙවන්නේ ඇයි? Hedging සූදුව ඇති කරපු නිවාඩ් කබ්‍රාල්ලා නිසායි ඒ. අද ඔහේ නිකම් සුදනකු වාගේ පැත්තකට වෙලා ඉන්නවා. නමුත්, හෙජින් සූදුව කවුද ගෙනාවේ කැබිනට් එකට? නිවාඩ් කබ්‍රාල් තමයි ඒක ගෙනැල්ලා කිව්වේ, ඒක බොහොම හොඳයි කියලා. අප්පුඩි ගහලා පිළිගත්තා. ඉස්සෙල්ලාම මිලියන 100ක චෙක් එකක් ආවාම ෆවුසි ඇමතිතුමාට භයියෙන් අප්පුඩි ගැහුවා. ඊට පස්සේ නිවාඩ් කබ්‍රාල් ආරක්ෂා කරන්න ෆවුසි ඇමතිතුමා අස් කළා. නමුත් ඊට පස්සේ මොකද වුණේ? ගිය සුමානයේ Standard Chartered Bank එකට කෝටි 7,000ක් ගෙවා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කවුද වග කියන්න ඕනෑ? ඒක ගෙවන්නේ නිවාඩ් කබ්‍රාල් නොවෙයි. ඒක ගෙවන්නේ අභිංසක පාරිභෝගිකයාත්, ඔබත්, මමත් තමයි. ආණ්ඩුව කියපු අසත්‍යය නිසා වූ අපරාධ බලන්න. පඩි වැඩි කරනවා කිව්වා. ඒ පඩි වැඩි කිරීමත් කළේ නැතිව මේ විධියට කටයුතු කරනවා. මුළු ආණ්ඩුවම අද නින්දෙන් ඇවිදිනවා කියන එක තමයි පෙනෙන්න තිබෙන්නේ. ආණ්ඩුව කියන දේ ආණ්ඩුවට මතක නැහැ. ආණ්ඩුවේ සමහර මන්ත්‍රීවරුන්ගේ හැසිරීම් නිසා අපි කියනවා, ආණ්ඩුව නින්දෙන් ඇවිදිනවා; දවල් කාලයේ නින්දෙන් ඇවිදිනවා කියලා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් කියනවා, ඔහු එක්නැලිගොඩ දැක්කා කියලා. දැක්කා නම් ඉතින්, අඩු ගණනේ ගිහින් සොයා බලා ගෙනැවිත් දෙන්න කෝ, නිකම්ම කියන්නේ නැතිව. ඒ වාගේ එකක් මනුෂ්‍යත්වයේ නාමයෙන් කියන්න පුළුවන්ද? ලජ්ජාසහගත කථා. ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරු අපේ ගුරුවරුන්ව දණ ගස්වනවා. මේ වාගේ තමයි අද මුළු රටම. ලංකා විදුලිබල මණ්ඩලයත් දණ ගස්වලායි

[ගරු රවි කරුණානායක මහතා]

තිබෙන්නේ. මේ රටේ විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 16ක් යද්දී average selling price එක රුපියල් 23ක් වෙලා තිබෙන කොට තවමත් අලාභයට යන්නේ මොකද?

මට මතකයි පවිත්‍රා මැතිනිය කිව්වා, විදුලි බිල සියයට 50කින් වැඩි කළාට, තවමත් අපේ අලාභය සියයට 53ක් තිබෙනවා කියලා. එහෙම නම් ගරු ඇමතිතුමිය, ඔබතුමිය කියන විධියට, විදුලි බිල තවත් සියයට 50කින් වැඩි කරන්න අවශ්‍යයි. කොහේ වැඩි කරන්නද? ඒ මොකටද? එහි තිබෙන අල්ලස, දූෂණය, වංචාව වෙනුවෙන්ද? දැන් ඔය දෙපළ කථා කරන්නේ, සියයට 51ක් දීලා එය පුද්ගලීකරණය කරන්නද? මෙන්න මේ ප්‍රශ්න නිසා තමයි එක්සත් ජාතික පක්ෂය වශයෙන් අප මේවා අහන්නේ. අපි පෙන්වා දුන්නා මේ රටේ ආදායම් උපයාගෙන, නිෂ්පාදනය කරගෙන කටයුතු කරන්නේ කොහොමද කියලා. මෙන්න මේ වාගේ තමයි ආදර්ශවත් නායකත්වයක් කටයුතු කරන්න ඕනෑ කියලා අපි රටට පෙන්වා දී තිබෙනවා. අපි කියනවා, ඔය ප්‍රශ්නය විසඳෙන කල් කරුණාකර දැන් ලැබෙන වර්ෂාපතනය පාවිච්චි කරලා විදුලි බලය නිෂ්පාදනය සියයට 45කින් වැඩි කරන්න කියලා. ඔබතුමන්ලා රහපෑවා නේ. විදුලි බිල සියයට සියකින් වැඩි කළා. ජනාධිපති ගෙනැල්ලා සියයට 10ක් අඩු කළා. අප්පුඩි ගැහුවා. ඊට පස්සේ හිතුවා බිල වැඩි වුණේ නැහැ කියලා. අන්තිමට ජනතාව ඇත්ත තත්ත්වය දුටුවාම දැන ගත්තා එක්සත් ජාතික පක්ෂය සහ පොදු විපක්ෂය කියපු දේ ඇත්තයි කියන එක. ඉතින්, මේ අවස්ථාවේදී අප කාරුණිකව ඔබ සියලු දෙනාට කියන්නේ, කරුණාකර මේ පම්පෝරි නවත්වන්න කියලායි.

ගරු කථානායකතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලයේ රැස්වීම මෙහේ තිබෙනවා නොවැම්බර් මාසයේ. අපි බොහොම සතුටුයි ඒ ගැන. බොහොම ආඩම්බර වෙනවා. නමුත් අපි අපට කරන්න පුළුවන් දේවල් කරන්න ඕනෑ. ඒකට යන වියදම කීයද? ගරු කථානායකතුමා නම් කැබිනට් මණ්ඩලයට යන්නේ නැති නිසා එතුමා මේ ගැන දන්නේ නැහැ. නමුත් 67දෙනෙක් එයට සහභාගි වෙනවා. පොදු රාජ්‍ය මණ්ඩලයේ සමුළුවට යන වියදම රුපියල් කෝටි 2,200යි කියලා එහිදී කියා තිබෙනවා. එතකොට කියා තිබෙන්නේ, "අපි මේක පස්සට දමමු. මේක කථා කරන්න පටන් ගත්තොත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා." කියලායි. සරත් අමුණුගම ඇමතිතුමා ඒ ගැන දන්නවා ඇති. මේ වියදම දරන්නේ කොහෙන්ද? ආණ්ඩුවට සල්ලි නැති වුණාම ලයිට් බිල හරහා ජනතාවගෙන් සල්ලි ගන්නවා. නමුත්, පොදු රාජ්‍ය මණ්ඩලයේ කාර්වලට රුපියල් කෝටි 500ක් ගෙවනවා; වියදම වෙනුවෙන් රුපියල් කෝටි 2,200ක් ගෙවනවා. ඒවා කාගෙන් අරගෙනද දෙන්නේ? ෂැංග්‍රි-ලා එකට රුපියල් මිලියන 20ක් දෙනවා. Night raceවලට රුපියල් කෝටි 23ක් දෙනවා. මේ ඔක්කෝම බර අදින්න වෙන්නේ ලංකා විදුලිබල මණ්ඩලය පිටින්. එහි 11,800දෙනෙක් ඉන්නවා. තවම ඒ අයගේ පඩි වැඩි කළේ නැහැ. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. විදුලි බිල විතරයි වැඩි කළේ. පොරොන්දුවක් දුන්නා. ඒකත් ඉතින් මතක නැහැ කියනවා දැන්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම තවත් මිනිත්තු දෙකතුනක් ගන්නම්. මොකද, කථාව පටන්ගත්තු තැන ප්‍රශ්නයක් වුණා නේ. ඒ මිනිත්තු දෙක තුනත් මට ලබා දුන්නොත් ලොකු දෙයක්. මේ අවස්ථාවේ අප කාරුණිකව කියන්නේ මේකයි. එක්සත් ජාතික පක්ෂයේ අප නැඟිටලා නිකරුණේ බණින එක නොවෙයි මේ කරන්නේ. ඔබතුමන්ලා කිසි ඉදිරි දැක්මක් නැතිව යන ගමන නිසා රටට, ජනතාවට ලැබෙන ප්‍රතිවිපාකය තමයි අප පෙන්වා දී තිබෙන්නේ.

ඉතින් ඔබතුමන්ලා පම්පෝරිය ගහනවා, අරකද, මේකද කියලා. ඉදිරියේදී මැතිවරණ දෙකක් එනවා. මේ මැතිවරණ තුළින් ඔබතුමන්ලාගේ අර "දැයට කිරුළ" වැඩසටහනේ වාගේ ලයිට් කණු එහේ මෙහේ ගෙන ගිහින් විහිළු කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. කරුණාකරලා ලයිට් බිල අඩු කරලා පෙන්වන්න, කළුකඩ ව්‍යාපාරයක් ලෙස නොවෙයි මෙම ආයතනය කටයුතු කරන්නේ කියන එක.

ඒ විතරක් නොවෙයි. මා හිතන හැටියට මෙම ආයතනයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අමාත්‍යාංශයේ දැනට සිටින ලේකම් අපේ ෆර්ඩිනැන්ඩු මැතිතුමා බොහොම හොඳ මනුෂ්‍යයෙක්. Thursday, 11th July "The Island" පත්‍රය මා ළඟ තිබෙනවා. එම පත්‍රයේ මෙසේ සඳහන් වනවා:

"Ranawaka suffering from amnesia, says Power Ministry Secy."

ඒ කියන්නේ හිටපු ඇමතිතුමා ගැන එම අමාත්‍යාංශයේ දැනට සිටින ලේකම් කියනවා, ඇමතිතුමාට මතක නැහැයි කියලා. කිසිසේත්ම මිල වැඩි කරන්න අවසර දුන්නේ නැහැයි කියලා ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා මේ සභාවේදී කිව්වා මට මතකයි. නමුත් දැනට සිටින ඇමතිනිය මෙම අමාත්‍යාංශය භාර ගත් හැටියේම කිව්වේ, "හිටපු ඇමතිතුමා වැඩි කළ එක තමයි මා මේ ක්‍රියාත්මක කරන්නේ" කියලායි. දෙදෙනාට දෙදෙනා බැන්නා මිසක් ඒ කරුණු දෙක ගැන විවාදය තවම එළියට ආවේ නැහැ. ජනතාවට තිබෙන්නේ බිල ගෙවන එක විතරයි. අපි මේවා පෙන්නුවාම අපි දේශ ද්‍රෝහියෝ. අසත්‍ය ප්‍රකාශ කර-කර, ජනාධිපති, අරක, මේක කිය-කියා පන්දම් අල්ලා ගෙන ඉන්න. නමුත් අහිංසක ජනතාවට තමයි මේ මුදල් ගෙවන්න වෙලා තිබෙන්නේ. ඒක දැන ගන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමාත් දන්නවා නේ, විදුලි බිල සාධාරණ නැහැයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විදුලිය නිවන්න හදන්නේ. දැන් වෙලාව 2.52යි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම කරන්න එපා. මා දන්නවා, ගරු කථානායකතුමා එහෙම කරන්නේ නැහැයි කියලා. මට පුළුවන්, ඔබතුමාගේ හදවතට කථා කරලා තව විනාඩි දෙකක්, විනාඩි තුනක් ගන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට වැඩියෙන් මිනිත්තු දෙකක් දුන්නා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා මේ විධියට කථා කරන්නේ ඔබතුමාගේ විදුලි බිලත් අඩු කරන්නයි. මෙම අවස්ථාවේදී මා නැවත කියනවා, අධික වර්ෂාපතනයක් තිබෙන මේ අවස්ථාවේදී ඉස්සෙල්ලාම fuel adjustment charge එක ඉවත් කරන්න, අපව තරගකාරී තත්ත්වයට ගෙන යන්න කියලා. අද අපේ ආයෝජකයන්ට තරග කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා තමයි අද ගෙවුම් ශේෂයේ හිඟයක් ඇති වෙලා තිබෙන්නේ. අපේ අපනයනය සියයට 10කින් වැටෙන කොට, ආනයනය සියයට 15කින් වැඩි වන කොට ඒ පරතරය අඩු කරන්න පුළුවන් වන්නේ තරගකාරී තත්ත්වයකින් අපනයනය කරන්න පුළුවන් වුණොත් තමයි. මේ යටිතල පහසුකම්වල විදුලි බිල සියයට 25ක්, සියයට 26ක් විතර වන කොට එය අඩු කරන්න පුළුවන් නම් රටේ ලාභයක් ඇති කරන්න හැකියාව තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එම නිසා දූෂණය නැති කරලා, විනිවිදභාවයකින්, ඉදිරි දැක්මක් සහිතව, එක්සත් ජාතික පක්ෂය ගෙන ගිය වැඩ පිළිවෙළ රටේ ඇති කරන්න කියන එක මේ ආණ්ඩුවට මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟට ගරු ප්‍රේමලාල් ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 2.57]

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරන අවස්ථාවේදී, රටේ විදුලි පාරිභෝගිකයාගේ, ඒ වාගේම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවන් සඳහා ගන්නා වූ වැදගත් සංශෝධනයක් කරන අවස්ථාවේදී, කිලිනොච්චියට යන කොට මැදවච්චියට යන බවත්, ඒ වාගේම අලිමංකඩට යන කොට පාමංකඩට යන බවත් කිව්ව අපේ නිතවත් රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කළ දේවල් රජයට මඩ ගැසීමක් හැටියට තමයි මා දැක්කේ. අද මෙම පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරනවා නම් ඇත්තෙන්ම පනත් කෙටුම්පත ගැන කථා කරන්න ඕනෑ.

අද අපේ රජයේ අතිගරු ජනාධිපතිතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අවශ්‍යතාව වන, මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව වන විදුලි බලය සියයට 100ක් ලබා දීමේ වැඩසටහන සඳහා ක්‍රියාත්මක වෙලා ඒ සඳහා අවශ්‍ය කරන විදුලිය උත්පාදනය කරන මොහොතේ, විවිධ සංශෝධන ඉදිරිපත් කරන මොහොතේ අවශ්‍ය නැති වෙනත් දේවල් කථා කිරීම පිළිබඳව මා කනගාටු වනවා. ඒ වාගේම රජය හැටියට අපි දන්නවා, මේ රටේ අනාගතය වෙනුවෙන් අද මේ රජය විශාල වැඩ කොටසක් ඉටු කර ගෙන යනවාය කියලා. මේවා දකින කොට ඇහේ කටු අනිනවා වාගේ ඉන්න බැරි තරම් දැඩි අපහසුතාවට මේ අය පත් වෙලා, අද මෙම ගරු සභාවට ඇවිල්ලා වෙනත් දේවල් කියවනවා.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාට මා ස්තුතිවන්ත වනවා, මේ රටේ විදුලිය නැතුව හිටපු ජනතාවට සියයට 100ක් විදුලිය ලබා දීමට අද මේ ගන්නා ක්‍රියා මාර්ගය ගැන. මා හිතන හැටියට 2009 දීත් පනත සංශෝධනය කරන්න එතුමා කටයුතු කළා. ඒ වාගේ යම් යම් සංශෝධන තමයි අද සිදු කරන්නේත්. මෙහිදී මා මෙම කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. 2002 දී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් බලයට පත් වුණා. ඒ වෙලාවේ එම සංශෝධනය ගැසට් නිවේදනය නිකුත් කිරීම දක්වා යන්න අවස්ථාවක් ලැබුණා නම් මේ වන කොට අපට ලංකා විදුලිබල මණ්ඩලය නැහැ, ලංකා විදුලිබල මණ්ඩලය අපට අහිමි වෙලා. ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරලා, එය කැලි හයකට, හතකට කඩලා, පෞද්ගලික අංශයට විකුණා දමන යුගයක් තමයි එවකට තිබුණේ.

හැබැයි ඒ අවුරුදු දෙක ගිහිල්ලා 2004 වර්ෂයේදී නැවත වතාවක් ඒ ආණ්ඩුව පරාජයට පත් වෙච්ච නිසා තමයි අද මේ විදුලිබල මණ්ඩලය තිබෙන්නේ කියන එකත් මා එක්සත් ජාතික පක්ෂයට මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා විශේෂයෙන් මතක් කළ යුතු කාරණාවක් තිබෙනවා. 1950 අංක 19 දරන ආඥාපනත අනුව මුලින්ම විදුලිබල මණ්ඩලය ඇති කළා. ඒ වාගේම 2009 අංක 20 දරන පනතෙන් විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න හදපු එක නවත්වා, ඊට පසුව වැදගත් තීන්දු වගයක් අර ගෙන තිබෙනවා. 1969 අංක 17 දරන ආඥාපනත අනුව තමයි ලංකා විදුලිබල මණ්ඩලය මේ දක්වා පවත්වා ගෙන යන්නේ.

මහජන උපයෝගිතා කොමිසමට තිබුණු බලය රජයේ නියෝජිතවරයෙකුට පැවරීම සඳහා අප මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා. මෙතැනදී මා මේ කාරණය විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. අපේ ප්‍රදේශවල පමණක් නොවෙයි, මුළු රටේම ජනතාවට විදුලිය අවශ්‍යයි. පාසල් දරුවන්ට අධ්‍යාපන කටයුතු කර ගෙන යෑමට විදුලිය අවශ්‍යයි. හැබැයි මේ විදුලි බලය ලබා දීම සඳහා සමහර ඉඩම්වලින් විදුලි රැහන් යනකොට ඒ අයගෙන් විරෝධතා මතු වෙනවා. ඒ විරෝධතාවලට පිළිතුරු සපයන්න මහජන උපයෝගිතා කොමිසමට මාස ගණන් කල් යනවා. මොකද, ඒ අය ඉන්නේ කොළඹ. ප්‍රාදේශීය ලේකම්වරයෙකුට හෝ ඒ ප්‍රදේශයේ රජයේ නිලධාරියෙකුට බලය පැවරීම තුළ ක්ෂණිකව ඒ ප්‍රශ්නවලට තීන්දු ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා. පසු ගිය කාලයේ නිවසකට විදුලිය ලබා දෙනකොට පමණක් නොවෙයි, මිලියන පහළොව, විස්ස වියදම් කර ගම්මාන මට්ටමින් විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට මේ වාර්තා එන තුරු මාස ගණන් බලා ගෙන ඉන්න සිද්ධ වී තිබෙනවා. එම නිසා ප්‍රාදේශීය ලේකම්වරයා හෝ එවැනි කෙනෙකුට ඒ බලය තිබුණා නම් ක්ෂණිකව ජනතාවට ඒ විදුලි බලය ලබා දෙන්නට පුළුවන්කම තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, දිර්ඝ කාලයක් තිස්සේ විදුලි බලය ලබා ගන්නට බලාපොරොත්තුවෙන් සිටින ජනතාවට, විදුලි බලය ලබා ගන්නට නොහැකිව අපහසුවට පත් වී සිටින ජනතාවට ක්ෂණිකව විදුලි බලය ලබා ගන්නට මේ තුළින් අවස්ථාව උදා වෙනවා.

ගරු කථානායකතුමනි, මා මතක් කළ යුතු ඊළඟ කාරණය මෙයයි. පසු ගිය වසර දෙකක පමණ කාලය තුළ අනවසරයෙන් විදුලිය ලබා ගන්නා අයගෙන්, ඒ වාගේම විදුලිය අයථා ලෙස පරිහරණය කරන අයගෙන් අප විශාල වශයෙන් දඩ මුදල් අය කර ගත්තා. ඒ තුළින් විදුලිබල මණ්ඩලයට මිලියන ගණනක් උපයා ගන්නට පුළුවන්කම ලැබුණා. මීට පෙර පැවැති ක්‍රමය අනුව

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

විදුලිය පිළිබඳ පරීක්ෂණවලට නිලධාරීන්ට යන්නට සිදු වුණේ තමුන් පැමිණෙන බව දින තුනකට කලින් දැනුම් දීමෙන් පසුවයි. ඒක හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ වැඩක්. කෙනෙක් හොරට විදුලිය ලබා ගෙන තිබුණා නම් ඒ දින තුන ඇතුළත ඒ තත්ත්වය වෙනස් කර, විදුලිය පාවිච්චිය යථා තත්ත්වයට පත් කර අර හොරකමෙන් මිදෙන්නට පුළුවන්කම ලැබෙනවා. නමුත් මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන තුළ ක්ෂණිකව ගිහින් ඒ අය අත් අඩංගුවට අර ගෙන නීතිමය කටයුතු කරන්නට පුළුවන්කම තිබෙනවා. එයින් විශාල ආදායමක් විදුලිබල මණ්ඩලයට ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම සැපයුම් ගාස්තු ගැන මා මතක් කරන්නට ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. නිවසකට විදුලිය ලබා ගන්නා විට විදුලිබල මණ්ඩලය යම් කිසි මුදලක් අය කරනවා. රුපියල් දහසය දාහක් වන්නට පුළුවන්. වඩා දුර ප්‍රමාණයක් යනවා නම් මීටර් ප්‍රමාණය අනුව ඒ ගණන වෙනස් වෙන්නට පුළුවන්. විදුලි බලය ලබා දෙනකොට දිළිඳු පවුල් සඳහා යම් වැඩ පිළිවෙළක් පසු ගිය කාලයේ තිබුණේ නැහැ. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අර අඩු පාඩුව, මේ අඩු පාඩුව ගැන කිව්වා. දුප්පත් ජනතාව ගැන යම් තීන්දුවක් ගන්න ඒ කාලයේ එතුමන්ලාට අවස්ථාව තිබුණා. අපේ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ගිය අවුරුද්දේ සමෘද්ධි අධිකාරිය හරහා ණය මුදලක් ලබා දෙන්නට තීන්දු කළා. විදුලිය ලබා ගන්නට නොහැකිව සිටි දිළිඳු පවුල් විශාල සංඛ්‍යාවකට "විදුලි අත්වැල" වැඩසටහන තුළින් මේ වන විට විදුලිය ලබා ගන්නට හැකියාව ලැබී තිබෙනවා. මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් එය නීතිගත කෙරෙනවාය කියා මා හිතනවා. අපේ මහජන දිනය දවසට සමහර අය, පාසල් දරුවෝ කාර්යාලයට ඇවිත් කියනවා, "අපට විදුලිය ගන්න මුදල් නැහැ, ඒ නිසා අපට අධ්‍යාපන කටයුතු කර ගන්නට පුළුවන්කමක් නැහැ, කෙසේ හෝ විදුලිය ගන්න ඕනෑ" කියා. එහෙම කිව්වාම, අපේ අතින් සල්ලි දීලා සමහර වෙලාවට විදුලිය ලබා දීමට කටයුතු කරනවා.

දැනට සති දෙකකට කලිනුත් එවැනි දෙයක් සිද්ධ වුණා. විදුලි බලය ලබා දීමේදී අද නොයෙකුත් අපහසුතාවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අද අප ඉදිරිපත් කර ඇති මේ සංශෝධන තුළින් ඒ අයට විශාල සහනයක් සැලසෙනවා. [බාධා කිරීමක්] ඔව්, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා දැන් කිව්ව කාරණය නිසායි මම මේ ගැන කියන්නේ. බොහෝ අය ඇවිල්ලා ළමයින්ට පාඩම් කරන්න ඕනෑය කියලා ලයිට් දෙන්න කියලා ඉල්ලනවා. Henamulla Camp එකේ ඉඩම්වල ගෙවල් 238ක් තිබෙනවා. දැන් මාස හතරක් වෙනවා. තවම ඒ නිවාසවලට ලයිට් දීලා නැහැ. ඔබතුමන්ලා ලයිට්, චතුර තිබෙන තැනක හිටපු ඒ අයව එතැන කුණු ගොඩ උඩට ගෙනැත් දමලා දැන් මාස හතරක් වෙනවා. Henamulla Camp එකේ තවම ලයිට් නැහැ. ඉතින් ඔබතුමන්ලා ඔය තරම් කියනවා නම්-

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
කිසිම ගැටලුවකින් තොරව අප ඒ අයට විදුලිය ලබා දෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් මාස හතරක් වෙනවා නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ගරු විදුලිබල ඇමතිතුමියට හෝ අපට ඒ පිළිබඳව කිසිම දැනුවත් කිරීමක් කර නැහැ. ඒ පිළිබඳව අප දැනුවත් කිරීම දේශපාලනඥයන් වන ඔබතුමන්ලාගේ යුතුකමක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප දැනුවත් කළා. ෆවුසි ඇමතිතුමාත් ගියා. අප ඔක්කොම පෙන්වා දීලා තිබෙනවා.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
හරි, ඔබතුමා ඒ තොරතුරු සියල්ලම ලබා දෙන්න. ඔබතුමාගේ නම පවතීවි. අප විදුලිය ලබා දෙන්නම් නේද ඇමතිතුමියනි? කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද අප ඔබතුමාට සිහිපත් කරනවා, කරුණාකර ඔබතුමන්ලාගේ ක්ෂණික හැකියාව තුළින් හෙට අනිද්දා වන විට ඒ අයට විදුලිය ලබා දෙන්න කියලා.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
හරි, විදුලිබල ඇමතිතුමියත් ඉන්නවා. මමත් ඉන්නවා. ක්ෂණිකව විදුලිය ලබා දෙන්නම්. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය ගන්න එපා. මම අපේ ගරු ඇමතිතුමියත් සමඟ කථා කරලා ඒ අයට ක්ෂණිකව විදුලිය ලබා දීමට කටයුතු කරන්නම්. තවත් තැන් තිබෙනවා නම් එම ස්ථාන පිළිබඳවත් අපේ අමාත්‍යාංශයට දැනුම් දෙන්න. ඇමතිතුමියටත් මටත් ඒ හැකියාව තිබෙනවා. කිසිම ගැටලුවක් ඇති වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය විදුලි බලාගාර ගැනත් මා යමක් කියන්න ඕනෑ. අප දන්නවා ගම්වල ට්‍රාන්ස්ෆෝමර් එකක් ගෙන යන්න බැරි තැන්වල ප්‍රජා සමිති මඟින් කුඩා මට්ටමේ විදුලි බලාගාර ඉදි කරන බව. ඒ මෙගාවොට් 10ට අඩු -කිලෝවොට් 500, කිලෝවොට් 1,000, මෙගාවොට් 1- බලාගාරයි. ඒවා ආරම්භ කිරීමේදී ඒ බලපත්‍රය ලබා ගන්න ඔවුන්ට යම් ගාස්තුවක් ගෙවන්න සිද්ධ වෙනවා. ඔවුන් ඒකෙන් නිදහස් කරන්නට අද මෙම සංශෝධන මඟින් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මෙගාවොට් 10ට අඩු ග්‍රාමීය විදුලි ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් පටිපාටියක් යටතේ තමයි අප පසු ගිය කාලයේ කටයුතු කළේ. ඒකත් සම්මත මිලකට ලබා දෙන්න කටයුතු කරන්න අප බලාපොරොත්තු වෙනවා. මොකද ජාතික විදුලිබල පද්ධතිය මඟින් විදුලිය ලබා දෙන්න ගියාම අපට ඉන්ධන සඳහා විශාල වශයෙන් මුදල් වැය කරන්න සිද්ධ වුණා. ඒ නිසා තමයි පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි යොමු වෙන්න සිද්ධ වුණේ.

නොරොච්චෝලේ, ඉහළ කොත්මලේ වැනි විදුලි බලාගාර ඉදි කරන්න පුළුවන් වුණු නිසා -අතිගරු ජනාධිපතිතුමා සෘජුවම තීන්දුවක් ගත්ත නිසා- තමයි අද ඒ විදුලි බලාගාර තුළින් අප විදුලිය මෙගාවොට් විශාල ප්‍රමාණයක් ලබා ගන්නේ. අද අප නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් විදුලිය මෙගාවොට් 300ක් ලබා ගන්නවා. එම බලාගාරයෙන් තවත් විදුලිය මෙගාවොට් 300ක් ලබා ගැනීමේ වැඩ කටයුතු ළඟදී අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉහළ කොත්මලේ බලාගාරයෙන් විදුලිය මෙගාවොට් 150ක් ලබා ගැනීමේ වැඩ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. තවත් කුඩා විදුලි බලාගාර අප ආරම්භ කරනවා. මෑතකදී ගරු ඇමතිතුමිය ඇතුළු අප කණ්ඩායම ගිහින් බ්‍රෝඩ්ලන්ඩ්ස් කුඩා ජල විදුලි බලාගාරයේ වැඩ කටයුතු ආරම්භ කළා. මෙවැනි කාර්යයන් රාශියක් අප කර තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඒ නිසා අද ගැන එදා තක්ත්වයෙන් හිතන්න හොඳ නැහැ. එදා ඔබතුමන්ලා මහවැලිය තුළින් වික්ටෝරියා වැනි ජලාශ ආරම්භ කර නිසා අද ඒ තුළින් විදුලිය උත්පාදනය කරනවා තමයි. නමුත් එවකට සිටි ජනගහනයට වඩා විශාල ජනගහනයක්, වැඩි විදුලි පාරිභෝගික පිරිසක් අද මේ රටේ ඉන්නවා. ඒ අය වෙනුවෙන් විදුලිය ලබා දෙන්න තමයි අද අප මේ විදුලිබල පනත් සංශෝධනය කරන්න අවශ්‍ය කටයුතු මේ වන විට කරගෙන යන්නේ.

තවත් වැදගත් කාරණයක් කිව යුතුව තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ සැලසුම් අංශයේ ඉංජිනේරුවන් හරහා අඩුම පිරිවැයට දීර්ඝකාලීන උත්පාදන පුළුල් කිරීමට සැලසුම් නීතිගත කරන්න අද මේ පනත් කෙටුම්පත තුළින් කටයුතු කර තිබෙනවා. ඇත්තටම මින් පසුව විදුලි ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමේ කාර්යය එක එක සමාගම්වලට දෙන්න අවශ්‍ය වන්නේ නැහැ. විධිමත් විධියට, අපේ විදුලි ඉංජිනේරු මහත්වරු සකස් කරන සැලසුමට අනුව තමයි අප ඉදිරි කාලයේදී විදුලි බලාගාර ඉදි කරන්න බලාපොරොත්තු වන්නේ. එතකොට විධිමත් නොවන විදුලි උත්පාදන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන අයට අවස්ථාව ලබා දෙන්නේ නැහැ කියන කාරණය පැහැදිලිවම මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

අද ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් වැදගත් කාරණා ගණනාවක් ඉෂ්ට කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. මෙයින් සුවිශේෂම කාරණය තමයි ග්‍රාමීය මට්ටමේ ජනතාවට අවශ්‍ය කරන විදුලි බලය ක්ෂණිකව ලබා ගැනීමේ වැඩ පිළිවෙළ. අනික් කාරණය, ණය පහසුකම් ලබා දීලා වසර පහක් තුළ ඒ මුදල විදුලි බිලට එකතු කර ගෙවීමට අවස්ථාව ලබා දීම. ඒ වාගේම පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිපදවීම සඳහා වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කරන්නත් අප බලාපොරොත්තු වෙනවා.

කලින් කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමකු ඇහුවා, සියයට 51ක් දීලා පෞද්ගලීකරණය කරන්න හදනවාද කියලා. මෙන්න මේ කාරණය මා පැහැදිලිව මතක් කරන්න ඕනෑ. මෙගාවොට් 25ට වැඩි විදුලි බලාගාර ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ රජය සම්බන්ධ වෙලායි. ඒක මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි තීන්දු කරන්නේ, මෙපමණ ප්‍රමාණයක් අපට -රජයට- ලබා දිය යුතුයි කියලා. එවැනි ප්‍රමාණයක් ලබා දෙන කොන්දේසිය තුළ තමයි අප ඒ බලාගාර ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නේ.

එහෙම නැතිව එක එක්කෙනාට අවශ්‍ය ප්‍රමාණයට, අවශ්‍ය විධියට කරන්න දෙන්නේ නැහැ. මේක විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය. නින්දෙන් ඇවිදිනවා, හීනෙන් ඇවිදිනවා කියලා රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා. එතුමන්ලාගේ කාලයේ තමයි ක්‍රියාත්මක වෙමින් තිබුණු සතොස වෙළෙඳ සැල් බින්දුවටම වැටුණේ. [බාධා කිරීමක්] ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, අද තිබෙන සතොස වෙළෙඳ සැල් දිහා බලන්න. අද "ලක් සතොස" කියලා නව නමකින් හැම ප්‍රදේශයකම වෙළෙඳ සැල් ක්‍රියාත්මක වනවා. අද අපේ ගම්වල මිනිස්සු අඩු මුදලට ඒවායින් භාණ්ඩ මිලදී ගන්නවා. ඔබතුමා වවන 10ක් කථා කළා නම්, එයින් වවන නවයක්ම කථා කළේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ගැන නොවෙයි. අනෙක් එක, තනිකරම රජයට මඩ ගැසීමක් කළේ; අසත්‍ය ප්‍රකාශ කළේ. ඒ නිසා අපිත් මේ රජය වෙනුවෙන්, රජය ගෙන යන වැඩ පිළිවෙළ ගැන වචනයකින්, දෙකකින් හරි පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. ඒ නිසා අද දින ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් ඉදිරි කාලය තුළදී අප බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්නට අපට පුළුවන්කම ලැබෙයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කලින් කිව්ව ආකාරයට අපේ ජනගහනය එන්න එන්නම වැඩි වීමත් සමඟම අපේ විදුලිය පාරිභෝගික සංඛ්‍යාවත් වැඩි වෙමින් තිබෙනවා. පසු ගිය කාලයේ අයථා ලෙස විදුලිය ලබා ගැනීම් නිසා අපට කෝටි ගණනක් පාඩු විඳින්නට සිදු වුණා. ඔබතුමන්ලා කියනවා, වීදි ලාම්පු දවල් නිස්සෙත් දැල්වෙනවා කියලා. පසු ගිය කාලයේ සිදුවුණු සිදුවීමක් මම කියන්නම්. ඒ සම්බන්ධයෙන් අපි පොලිසියේ පැමිණිල්ලක් කරන්නටත් කටයුතු කළා. පසු ගිය ඡන්ද කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා අපේක්ෂකයකු පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු මඟින් පාර දිගේම වීදි ලාම්පු දමාගෙන ගියා. මේ ගැන පොලිසියට පැමිණිලි කරන්න කියලා මම ඒ අවස්ථාවේ අපේ විදුලි අධිකාරිතුමාට හෝ විදුලි ඉංජිනේරු මහත්මයාට කිව්වා. මා හිතන විධියට එම පුද්ගලයාව අත් අඩංගුවට ගන්න යන අවස්ථාවේ දී කොහොම හරි මහඟරලා ගිහින් තිබුණා. ඒ විධියට අපේ ඇඟේම වරද ගහන්න බලාපොරොත්තුවෙන් ඉන්න එපා. ඔබතුමන්ලාගේ කාලයේ යම් යම් වැරදි කරන්න බලාපොරොත්තු වුණා. මේවා පෞද්ගලීකරණය කරන්න හිතාගෙන සිටියා. නමුත් ඒවා කරන්න බැරි වුණා. ඒවා කරන්න බැරි වුණු හිතේ අමාරුවට අද ඔබතුමන්ලා විවිධ දේවල් කියනවා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයත්, විදුලිබල මණ්ඩලයත් එකතු වෙලා අද මේ රටේ අවශ්‍යතාවට අනුව විදුලිය ලබා දෙනවා වාගේම, පුනර්ජනනීය විදුලි උත්පාදන ක්‍රමවේදත් සොයා ගන්නට උත්සාහ කරමින් සිටිනවා. එම ක්‍රමවේද ක්‍රියාත්මක කරන්නට අපි බලාපොරොත්තු වන අතර, තමුන්නාන්සේලා ඒ සඳහා අපට සහයෝගය ලබා දෙන්නට ක්‍රියා කරනවා මිසක්, මේවාට අකුල් හෙළන එක, නැත්නම් බාධාවන් එල්ල කරන එක නොවෙයි කළ යුත්තේ කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා කාලය ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ ගරු අමාත්‍යතුමියත් සමඟ සම්බන්ධ වෙලා ඉදිරි කාලය තුළදී අපට රට පුරාම විදුලිය ලබා දෙන්නට පුළුවන් වෙයි කියලා මම හිතනවා. තව සියයට 5ක පමණ ප්‍රමාණයක් තමයි විදුලිය ලබා දෙන්නට ඉතිරි වෙලා තිබෙන්නේ. එම සියයට 5ක ප්‍රමාණයටත් විදුලිය ලබා දීලා, මේ රටේ ජනතාවගේ විදුලි අවශ්‍යතාව සියයට 100කින් ඉෂ්ට කරමින් අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය යථාර්ථයක්

[ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා]

බවට පත් කරන්නට අපි ඉතාමත්ම ඕනෑකමින් කටයුතු කරනවා. තමුන්නාන්සේලා අපේ රජයට විරුද්ධව, එහෙම නැත්නම් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට විරුද්ධව පහර ගසන්න, ගසන්න එයින් අපි මුවහත් වෙලා ඒ තුළින් ජනතාව වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම සහනය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙනුත්, විදුලිබල මණ්ඩලය තුළිනුත් ලබා දෙනවාය කියන එකත් මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්න කැමැතියි, අද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය තුළත් ඒ වාගේම විදුලිබල මණ්ඩලය තුළත් දක්ෂ නිලධාරීන් පිරිසක් සිටින බව. ඒ අය විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. Grade N5, N6 කියන පුහුණු කාර්මිකයාගේ සිට නුපුහුණු කාර්මිකයා දක්වා අද විශාල කාර්ය භාරයක් ඒ අය විසින් ඉෂ්ට කරනවා. ඒ නිසා ඒ අයට අගෞරවයක් වන විධියට කථා කරන්නට එපාය කියන ඉල්ලීමත් කරනවා. මොකද, සමහර අවස්ථාවල විදුලිබල මණ්ඩලයේ විදුලිය ඇණ හිටි අවස්ථාවලදී ඒකටත් ආණ්ඩුවට දොස් කියනවා. Breakdown එකක් ඇති වුණොත්, සමහර අවස්ථාවලදී එය යථා තත්ත්වයට පත් කරන්නට යම් කාලයක් ගත වනවා. එතකොටත් කියන්නේ "ආණ්ඩුවෙන් විදුලිය කපනවා" කියලායි. බැරි වෙලා හරි ගහක් කඩා වැටිලා විදුලිය ඇණ හිටියොත්, ඒකටත් කියන්නේ ආණ්ඩුවෙන් විදුලිය කපනවා කියලායි. ඉතින් ඒ වාගේ බොරු ප්‍රචාර මඟින් අද මේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්නට උත්සාහ කරනවා. තව ටිකක් කල් යනකොට තමුන්නාන්සේලාගේ විපක්ෂයේ ඔය පුටුවල දැන් සිටින ගණන තවත් අඩු නොවෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Ravi Karunanayake, what is the point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Hon. P. Dayaratna mentioned a figure, which was highlighted by the Hon. Ajith Mannapperuma. That was not clear. The Hon. Minister said she would get the Hon. Deputy Minister to clarify it. So, why was it not clarified?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, we are talking of substance. She mentioned that it will be revealed through the Hon. Deputy Minister but it was not revealed. The senior Minister started the Debate by mentioning that 51 per cent will be held back -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, that is not a point of Order. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, no. They are misleading Parliament. The Hon. Speaker, who was there -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Minister would reply. He himself had already said that.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Both the Hon. Minister and the Hon. Deputy Minister are present in Parliament. They will answer.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
This is not the Question time. This is a Debate.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, it is irrelevant to us whether they are - [*Interruption.*]

[අ.භා. 3.15]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තිබෙන්නේ ඉතාම සුළු වේලාවයි. මේ රජයට මම මතු කරන්න බලාපොරොත්තු වන්නේ එක ප්‍රශ්නයයි. විදුලි බිල වැඩි කිරීමේ සීමාවන් දිහා බැලුවාම අපට පෙනෙනවා, රුපියල් 217.50ක්ව තිබුණු ගාස්තුව රුපියල් 481.50ක් වුණා; රුපියල් 546ට තිබුණු ගාස්තුව රුපියල් 852ක් වුණා; රුපියල් 728.40ට තිබුණු ගාස්තුව රුපියල් 1,161ක් වුණා; රුපියල් 1,835ට තිබුණු ගාස්තුව රුපියල් 2,835ක් වුණා කියලා. මේ විධියට unit 1-30 දක්වාත්, units 31-60 දක්වාත්, units 61-90 දක්වාත් ආදී විධියට ගාස්තු වැඩි වූ අන්දම ගැන විස්තරයක් මා ළඟ තිබෙනවා. මම එය හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

මට තිබෙන ප්‍රශ්නය මේකයි. මේකට ප්‍රධාන හේතුවක් හැටියට රජය ප්‍රකාශ කළේ වෙන කිසි දෙයක් නොවෙයි, "අද අපට විදුලි බලය ලබා දෙන්න අවශ්‍ය වන ඒ බලාගාර ක්‍රියාත්මක කරන්න බැහැ. ඒ, අවශ්‍ය ප්‍රමාණයට වැසි ජලය නොමැතිකමයි" කියලායි. ඒ එක තර්කයක්.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

දෙවෙනි තර්කය වුණේ, ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවා; ඒ මිලට තමයි විදුලිබල මණ්ඩලය ඉන්ධන ගන්නේ; ඒ නිසා ඒ බරත් මේ විදුලි බිල වැඩි කිරීමේ තවත් හේතුවක් වුණාය කියන එකයි. විදුලිබල මණ්ඩලයේ සමස්ත පාඩුවම පෙන්නුම් කරන්නේ ප්‍රධාන වශයෙන් මේ කාරණා දෙක තුළයි කියන හැඟීම අපට ලබා දීලා තිබෙනවා. ඇමතිතුමිය එදා ඉදිරිපත් කළ කථාවේ ප්‍රධාන වශයෙන් මේ කාරණා තිබෙනවා. "විදුලි බලය නිපදවීමට තාප විදුලි බලාගාර පාවිච්චි කරන්න වෙනවා. ඒ වාගේම විදුලි බලය නිෂ්පාදනය කරන්න පාවිච්චි කරන ඉන්ධනවල මිල වැඩි වෙලා තිබෙනවා" කියලා එය විදුලි බිල වැඩි කිරීමට ප්‍රධාන හේතුවක් හැටියට එතුමිය පෙන්වලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි ඉල්ලීමක් කරනවා. දැන් හොඳට වැහැලා, විදුලි බලය නිෂ්පාදනය කරන්න පාවිච්චි කරන සියලුම reservoirs ටික දැන් පිරිලා ඉතිරිලා ගිහිල්ලා තිබෙනවා. මේක දැන් හැම දාම ලොකු show එකක් විධියට පෙන්වනවා. අපේ දයාරත්න ගරු ඇමතිතුමාත් ඒ බව දන්නවා. මහවැලිය තමයි පෙන්වන්නේ; වික්ටෝරියා එක තමයි පෙන්වන්නේ. ඒ අනුව අපට පැහැදිලි වන්නේ අර තාප විදුලි බලාගාර පාවිච්චි කරන්නට තිබෙන ඒ ඉඩකඩ වෙනස් වෙලා අද ජල විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා කියන එකයි. එසේ නිෂ්පාදනය කරන්න වෙන කොට එහි මිලත් අඩුයි. මම හිතන හැටියට සියයට 60ට වඩා අපි ලබා ගන්නේ ජල විදුලියයි. තාප බලාගාරවලින් ඒ දෙන නිෂ්පාදනය දැන් අඩු වෙලා තිබෙනවා. දැන් මම අහන්නේ එහෙම තිබෙනවා නම් විදුලි බිල අඩු කරලා ඉන්ධන ගැළපුම් ගාස්තුව අයින් කරන්න බැරි ඇයි කියන එකයි. මේ කාරණය සාධාරණ ඉල්ලීමක්. මේ කාරණය හැම දෙනෙකුටම වැටහෙන ඉල්ලීමක්. මම දැන් මතක් කරන්නේ මේ කාරණය විතරයි. දැන් හොඳට වහිනවා. ජලාශ සියල්ලක්ම පිරිලා; උතුරලා යනවා. අනෙක් පැත්තෙන් දැන් තෙල් මිල අඩු වෙලා තිබෙනවා. තෙල් මිල අඩු වුණාම අපි තෙල් ගන්නේ අඩු මිලකටයි.

එහෙම නම් විදුලි බිල වැඩි කරන්නට තමුන්නාන්සේලා ඉදිරිපත් කළ කාරණා දෙකම අද අහෝසි වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලන්නේ දැන්වත් අර ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්න කියලායි. මේ කාරණය වැදගත්. අපි දැන් අහන්නේ, ඉන්ධන ගැළපුම් ගාස්තුවවත් ඉවත් කරනවා කියලා ඇමතිතුමිය ප්‍රකාශයක් කරනවාද කියලායි. මේ කාරණය තමයි වැදගත් දේ වෙන්නේ. එහෙම කරන්න බැරි නම්, ඇයි බැරි කියලා අපට කියන්න. පාඩු තිබෙනවා. නොයෙක් දූෂණ නිසා පාඩු තිබෙනවා. ඒ, වහින්නේ නැති නිසා නොවෙයි; තෙල් මිල වැඩි නිසා නොවෙයි. ඒ දූෂණවලට වග කියන්න මේ රටේ ජනතාවට වුවමනාවක් නැහැ.

ගරු පී. දයාරත්න මහතා
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)
වහින කාලයට -[බාධා කිරීමක්]

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක දැන් තියා ගෙන ඉන්නවා නේ. ඉන්න, මම කියන්නම්, දැන් මේ යන්නේ ඒක පිරිමහන්නද? තමුන්නාන්සේ බොහොම හොඳට කල්පනා කරලා තර්කය ගෙනාවත්, මේ වැඩි කළේ ඇයි කියලා ඇමතිතුමිය එදා කළ කථාව මා ළඟ දැන් තිබෙනවා. මේ හැන්සාඩ් වාර්තාවේ එය සඳහන්ව තිබෙනවා. ඔබතුමාත් මෙය පිළිගන්නවා. ඒ හැන්සාඩ් වාර්තාව අතේ තියාගෙනයි මම කථා කරන්නේ.

ඒ නිසා ඒ කාරණා දෙක උඩ ඉන්ධන ගැළපුම් ගාස්තුව ඇති කළා. තමුන්නාන්සේලා ඉන්ධන ගැළපුම් ගාස්තුව දැම්මේ තෙල් මිල වැඩි වුණ නිසාවත්, වතුර නැති නිසා විදුලිබලාගාර ක්‍රියාත්මක කරන්න බැරි වීම නිසාවත් නොවයි. නමුත් තමුන්නාන්සේලා ඒක නේ දැන් කියන්නේ. මම කියන්නේ ඒක නොවෙයි. දැන් තෙල් මිල අඩු වුණ නිසා සහ ජලය ඇති නිසා ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්න. අද සිද්ධ වෙන පාඩුව ගැන අපට වෙනම කථා කරන්න පුළුවන්. කොච්චර පාඩුද, හොරකම් කරපුවා, කොමිස් ගහපුවා කොහොමද ජනතාවගෙන් අය කරන්නේ කියන එක වෙනම කථා කරමු. COPE වාර්තාව ආවාම ඒ සියල්ලම කථා කරමු. ප්‍රශ්නයක් නැහැ. මගේ ප්‍රශ්නය මේකයි. ඉන්ධන මිල වැඩි නිසා සහ ජලාශ පිරෙන්නේ නැති නිසා ජල විදුලිය නිෂ්පාදනය කරන්න බැරි වුණ නිසා එකතු කළ, -දැන් ඒ කරුණු දෙකම නැති නිසා- ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්නේ නැත්තේ ඇයි? ඒ සහනය මේ රටේ ජනතාවට දෙන්න තමුන්නාන්සේලාට බැරි ඇයි?

විශේෂයෙන්ම මේ හේතුව නිසා නිවාසවල කටයුතුවලට අමතරව කුඩා කර්මාන්ත අඩාළ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා මහජනතාව අමාරුවෙන් හෝ මේ මිල වැඩිවීම විඳ දරා ගන්නේ කොහොමද කියලා. විදුලිය පාවිච්චි කරමින් ඉගෙන ගත්ත ළමයා දැන් ඒ වෙලාවේ ඉගෙන ගන්නේ නැහැ. වැඩට යන විට electric cooker එක පාවිච්චි කළ අයට ඒක පාවිච්චි කරන්න බැහැ; iron එක පාවිච්චි කරන්න බැහැ. මේ ගැන කල්පනා කරලා බලන්න. ඒ නිවාස පැත්තෙන් තිබෙන ප්‍රශ්නය. මේ මිල වැඩි වීම සෑම වැඩ කරන ජන කොටසකටම තදබල ලෙස බලපා තිබෙනවා. ජනතාව ජීවත් වෙන්න බැහැ කියලා වැඩි පඩි ඉල්ලා සිටිනවා. ඒ නිසා විදුලිය නිසා ජනතාවට ඇති වුණු පාඩුව රජයට දැන් ඉවත් කරන්න පුළුවන්. ඒ බර ජනතාව පිට පටවන්න එපා. ඒ වාගේම අපි මතක් කරනවා ඒ නිසා කර්මාන්ත අතිවිශාල ප්‍රමාණයක් දැන් වැඩ කරන්න බැරි තත්ත්වයට ඇවිත් තිබෙනවා කියලා. සේවකයන්ට පඩි ගෙවන්න බැරි තත්ත්වයට, දීමනා දෙන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. දැන් ඒ කර්මාන්ත වහ ගෙන යනවා. මේ විධියට තමයි අද මේ රටේ කර්මාන්ත ගැන අපට කථා කරන්න තිබෙන්නේ.

එක්සත් ජාතික පක්ෂ කාලයේ ඇති වුණු පුංචි පුංචි කර්මාන්ත ගැන තමුන්නාන්සේලා දන්නවා. මහවැලි මහා ව්‍යාපෘතියත් සමඟ පොඩි පොඩි කර්මාන්ත ඇති වුණා. ඒ කර්මාන්ත ඉදිරියට ගෙන යන්නට මහවැලිය නිෂ්පාදනය කරන ජල විදුලිය ඉතා අඩු මුදලකට ඒ අයට දුන්නාම, ඒක සහනයක් වුණා. අද ගෙදරක මහන මැෂින් හතරක් පහක් තියා ගෙන පොඩි කර්මාන්තයක් කරනවා නම්, දැන් ඒවාත් කරන්නට බැහැ. ඒවාටත් දැන් මේ විදුලි මිල වැඩිවීම අලුත් බිලක් ඇවිත් තිබෙනවා.

ඊට අමතරව ඇහලුම් කර්මාන්තශාලා තිබෙනවා. මුළු රට පුරාම ඇහලුම් කර්මාන්තශාලා පන්සියයක්, දහසක් වැඩ කරනවා. ඒ සේවකයන්ට දෙන දීමනා මදි. ඒ විතරක් නොවෙයි දැන් ඒ සේවකයන්ගේ පඩිය දෙන්නත් බැහැ. ඇයි ඒ? විශාල මුදලක් මේ ඉන්ධන ගැළපුම් ගාස්තුව නිසා ඒ කර්මාන්තවලට වැය වෙනවා. ඒ නිසා කම්කරුවන්ට සහනයක් දෙන වැඩ පිළිවෙළකට අපට යන්න බැරිද? කරුණාකරලා මේවාට උත්තර දෙන්න.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි දන්නවා අද නොයෙකුත් සේවා සඳහා රජයට දරන්න වෙලා තිබෙන බර ගැන. ඒ, ආරෝග්‍යශාලා, පාසල් වැනි. පසු ගිය දිනක දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කිව්වා ජල බිල වැඩි කළේ නැහැ කියලා. නමුත් දැන් වැඩි වෙලා. ඒ ගැන වැඩි ශබ්දයක් කරන්න මිනිසුන්ට කල්පනා වුණේ නැහැ. මොකද, විදුලි බිලත් එක්ක, බඩු මිලත් එක්ක, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක ඒ ප්‍රශ්න

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ඔක්කොම වහලා තිබෙන්නේ. දැන් ජල බිලත් වැඩි වෙලා. ඒකත් වැඩි කරන්න වෙනවා නේ. මොකද, ජලය බෙදා හරින ඒවැඩ පිළිවෙළ සඳහා මැෂින් ක්‍රියාත්මක කරන විට විදුලි බිලට බලපානවා. ඒ අනුව ජල බිලත් වැඩි වෙලා. දැන් තත්ත්වය අනුව ඒකත් අඩු කරන්න පුළුවන්. මම ඉදිරිපත් කරන්නේ මේ කාරණා විතරයි. මේ රටේ ජනතාව ලක්ෂ ගණනක් අද බලා ගෙන ඉන්නවා, තමුන්නාන්සේලා කියන්නේ ඇත්තද; ඒවා සාධාරණයද කියලා.

ගරු දයාරත්න ඇමතිතුමනි, ඔබතුමා හොඳට ඇහුම් කන් දෙන ඇමතිවරයෙක් නිසා මම ඔබතුමාටයි කථා කරන්න කැමැති. කොපමණ මුදල් ප්‍රමාණයක් මීහින් ලංකා එකටයි, එයාර් ලංකා එකටයි පාඩුව පිරිමහන්නට අපි දෙනවාද? කොපමණ ප්‍රමාණයක් දෙනවාද? ඒවාට රුපියල් බිලියන ගණනක් දෙනවා. ඒ දෙන්නේ කොහොමද? ඒ දෙන්නේ ජනතාවගෙන් මේ විධියට සල්ලි අරගෙන.විදුලිබල මණ්ඩලයේ පාඩුව පියවන්න විතරක් නොවෙයි, මේ පාඩු ලබන ආයතන ගෙන යන්නත් ජනතාවගෙන් සල්ලි ගන්නවා.

පත්තරවල පළ වෙලා තිබෙනවා අපි දැක්කා, රජයේ වතුවල EPF, ETF ගෙවා ගන්නත් බැහැ කියලා. ඒ ගැන කැබිනට් එකට වාර්තා වුණාද නැද්ද කියන්න අපි දන්නේ නැහැ. දැන් රජයේ වතුවල තිබෙන ගස් ඔක්කොම කපලා විකුණලා EPF, ETF ගෙවන්න කටයුතු කරනවා. මෙන්න අද රජයේ ආයතන පවත්වාගෙන යන්න වෙලා තිබෙන හැටි. මහා ලොකු සංවර්ධනයක් ගැන කථා කළත් ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි ඒ. මා ඒ ගැන එතැනින් එහාට කථා කරන්නේ නැහැ.

මට මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. ඒකයි මා බලාපොරොත්තු වෙන්නේ. මට අවංක උත්තරයක් ඕනෑ. ඉන්ධන ගැළපුම් ගාස්තුව විදුලි බිලෙන් ඉවත් කරනවාද, එය ඉවත් කරන්නේ කවදාද? [බාධා කිරීමක්] ඔව්, දැන් වහිනවා නේ. ඒ වාගේම තෙල් මිලත් අඩු වෙලා තිබෙනවානේ. ඒ කාරණා දෙකම ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්න පුළුවන් කාරණා. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Shantha Bandara to take the Chair?

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

I propose that the Hon. Shantha Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHANTHA BANDARA *took the Chair.*

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බොහොම සුළු වෙලාවයි ලැබී තිබෙන්නේ. මම දිගින් දිගට රජය විවේචනය කරන්නවත්, වෙනත් කතන්දර කියන්නවත් යන්නේ නැහැ. අපට විස්තර ගොඩක් කියන්න තිබෙනවා. මම ඒ හැම දෙයකින්ම තෝරා ගෙන කථා කළේ එක දෙයක් පමණයි. මා කථා කළේ ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්න පුළුවන්ද, බැරිද කියන එකයි. ඒ මිසක් වෙන ඒවා නොවෙයි. පාඩුව වහගන්න ඉන්ධන ගැළපුම් ගාස්තුව අය කළේ නැහැ නේ. වහින්නේ නැති නිසා විදුලිය නිපදවන්න තෙල් පාවිච්චි කළා; තාප බලාගාර පාවිච්චි කළා. ඒ නිසා මිල ගණන් වැඩි වුණා. ඒක අපි පිළිගන්නවා. පිළිගන්න වෙනවා නේ. හොරකම්, දූෂණ, වංචා කියන ඒ ඔක්කොම කොටස් මම අයින් කළා. මම ඒවා ගැන කථා කරන්නේ නැහැ. නමුත් දැන් වහින්න එක ගැන මොකද කියන්නේ? තෙල් මිල අඩු වුණ එක ගැන මොකද කියන්නේ? එම නිසා මම ගරු ඇමතිතුමියට කියන්නේ, එළියට ඇවිල්ලා කථා කරන්න බැරි ජනතාවට, උද්ඝෝෂණය කරන්න බැරි ජනතාවට - [බාධා කිරීමක්]

පාසල් යන ළමයි පාන්දර 5.00 වන තුරු පාඩම් කරනවා. ඒ ළමයින්ට අවශ්‍ය වැඩසටහන් අද TV එකේ යනවා. GCE (Ordinary Level) විභාගය කරන ළමයින්ගේ වැඩසටහන් උදේ හතරට පටන් ගන්නේ. [බාධා කිරීමක්] ඒක හොඳයි. නමුත් බලන්න බැහැ නේ. ලයිට් බිල වැඩි වෙනවා නේ. ඒකයි මම මේ කියන්නේ. එක්තරා කාලයක JVP එකෙන් කිව්වා, විදුලිය පාවිච්චි කිරීම සම්පූර්ණයෙන්ම නතර කරන්න කියලා. එතකොට TV බලන්නත් බැහැ. [බාධා කිරීමක්] අද කියනවා, අඩුවෙන් පාවිච්චි කරන්න කියලා. මම මේ ගැන කිව්වේ දන්නා නිසා; ළමයින් ගැන කල්පනා කරලා. උදේ පාන්දර 4.00 ඉඳලා TV channels වල GCE (Ordinary Level) විභාගය කරන ළමයින්ගේ පාඩම් ප්‍රචාරය වෙනවා. නමුත් දැන් ඒවා බලන්න බැහැ නේ. ඇයි මොකද? ඒ සඳහා ගෙවන්න මේ පවුල්වලට වැඩි මුදලක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව සාධාරණ ආණ්ඩුවක් කියලා කියනවා නම් මේකට විසඳුමක් දෙන්න බැරි ඇයි?

විදුලිබල මණ්ඩලයේ පාඩුව ගැන මම මේ අවස්ථාවේදී කථා කරන්නේ නැහැ. ඒක වෙනම කථා කරමු. විදුලි බලය පාවිච්චි කරන ජනතාවගෙන් පාඩුව සඳහා මිලක් ඉල්ලනවා නම් ඒ ගැන වෙනම කථා කරමු. වෙනත් හේතු උඩ නිෂ්පාදන මිල වැඩි වෙනවා නම් අපි ඒ ගැනත් කථා කරමු. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන අපට කථා කරන්න පුළුවන්. නමුත් මේ කාරණයේදී අපට කථා කරන්න බැරි ඉන්ධන ගැළපුම් ගාස්තුව ගැනයි. ගරු ඇමතිතුමියගේ කථාවේදී පැහැදිලිවම ඒ ගැන කිව්වා. ඒ කාරණා ඔක්කොම මම ලකුණු කර ගත්තා. ඒකට ඔබතුමියට උත්තරයක් දෙන්න පුළුවන්. ඔබතුමිය කියා තිබුණා, "වහිනවා නම් අපි මේ ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරනවා" කියලා. දැන් මේ වනකොට වහිනවා විතරක් නොවෙයි, වැහැලා ජලාශ පිරී ඉතිරී ගිහින් තිබෙනවා. ඇමතිතුමියගේ මුහුණත් ලස්සන වෙලා. පිරී ඉතිරී ගිහිල්ලා. [බාධා කිරීමක්] ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, ඉන්ධන ගැළපුම් ගාස්තුව අඩු කරන්න බැරිද, ඉවත් කරන්න බැරිද කියලා අද මේ විවාදයේදී මේ රටට කියන්න කියන එකයි. ඔබ හැම දෙනාටම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද වගුව :**
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:
Chart tabled:

Classification of Electricity users:

Unit Range	No. of Subscribers / Families	Tariff change	
		Previous	New
1-30	11,01,125	217.50	481.50
31-60	13,18,755	546	852
61-90	12,99,301	728.40	1,161
91-120	6,69,026	1,835	2,835
121-180	5,29,923	3,851.40	5,355
181-210	40,000	5,363.40	7,595
211-240	60,000	9,899.40	13,755

(Source: Hon. Pavithradevi W., Hansard 23. July 2013)

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

මේ සභාවේ ගණ පූරණයක් නැහැ කියලා එදා ගරු අස්වර් මන්ත්‍රීතුමා ශබ්ද කළා. මේ කාරණය අපි මතු කරන්න පෙර, කරුණාකර මන්ත්‍රීතුමන්ලා ගෙන්වා ගන්න කියලා අපි කියනවා. අපි, ඒ ගොල්ලන් වාගේ පළා යන්නේ නැහැ. අපි අවස්ථාවක් දෙනවා. ඒ නිසා ඒ කාරණය මතු කරන්න කලින් ගණ පූරණයට අවශ්‍ය මන්ත්‍රීවරුන් ගෙන්වා ගන්න කියලා අපි කියනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මී ළඟට ගරු අතාවුද සෙනෙවිරත්න මහතා.

[අ.භා. 3.30]

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මා විදුලිබල හා බලශක්ති අමාත්‍ය ධුරයට අලුතින් පත් වුණු ගරු ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා කැඳවා, පොල්පිටිය ජල විදුලි බලාගාරය ඉදි කරන්න මුල් ගල් තියලා වැඩ කටයුතු ආරම්භ කිරීම ගැන. ඒ වාගේම දැන් ඇති වෙලා තිබෙන තත්ත්වයට එතුමියට ඇඟිල්ල දිගු කර වැඩක් නැහැ. එතුමිය ඊයේ පෙරේදායි මේ විෂය භාර ගත්තේ. අතීතයේ ඉඳලාම කර තිබෙන පවු නිසයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අද ඊයේ කරපු පාපයක් නිසා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ මිත්‍ර ගරු දයාරත්න මැතිතුමාගෙන් -එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලයි මේ පැත්තට ආවේ- මම 1998 ප්‍රශ්නයක් ඇහුවා. මම කිව්වා, "අවුරුදු දෙසියයක් තුළ මේ රටට සපයා තිබෙන්නේ විදුලි අවශ්‍යතාවෙන් සියයට 38යි, ඒ අනුව අවුරුදු සියයක් තුළ සපයා තිබෙන විදුලිය ප්‍රමාණය සියයට 19යි" කියලා. එවිට එතුමා මට උත්තර දෙමින් කිව්වා, "සියයට 38ක් නොවෙයි, සියයට 40යි" කියලා. ඉතින් මම ඒක පිළිගත්තා. නමුත් ඒ සියයට 40ක ප්‍රමාණය 1994 ඉඳලා මේ දක්වා කාලය තුළ අපි සියයට 95 දක්වා වැඩි කර තිබෙනවා. ඒක මේ රටේ සිදු වී තිබෙන විශාල සංවර්ධනයක්. සෝවියට් දේශය ගොඩ නැඟූ ලෙනින් සහෝදරයා ප්‍රකාශ කර තිබෙනවා, රට සංවර්ධනය කරන්න නම් කාරණා දෙකක් ඉටු කළ යුතුයි කියා. එකක් තමයි සංවර්ධන සැලැස්මක් අවශ්‍ය වීම. ඒ කියන්නේ, සැලසුම්ගත සංවර්ධනයක්. ඊළඟට මුළු රටටම විදුලිය දෙන්න ඕනෑයි කියන එක. ඒ කාලයේ ලෙනින් සහෝදරයා රුසියාව ඇතුළු මුළු සෝවියට් දේශයටම විදුලිය සැපයුවා. දැන් මේ කාලය තුළ අපට පමණක් විදුලිය සපයන්න බැහැ. අපි අය වැය ලේඛනයෙන් සල්ලි වියදම් කර, නොයෙක් රටවල්වලින් ආධාර ලබාගෙන, ඒ වාගේම ණය ලබාගෙන විදුලිය පැත්තෙන් මේ රටේ සංවර්ධනයේ මහා පිම්මක්, විප්ලවයක් කර තිබෙනවා. අපේ ඉලක්කය වන්නේ ඉදිරි කාලය තුළ දිවි නැඟුම වැඩ පිළිවෙළ යටතේ ලංකාවේ සෑම ගෙදරකටම විදුලිය සපයන්නයි. සියයට සියයක්ම විදුලිය සපයනවා. ඒ අරමුණින් තමයි වැඩ කරගෙන යන්නේ. ලබන අවුරුද්ද අවසාන වෙන්න ඉස්සෙල්ලා මේ රටේ ජනතාවට සියයට සියයක් විදුලිය සපයා දෙන්න අපේ රජය කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අලුතින් ගෙවල් හැදෙනවා; අලුතින් ජනපද හැදෙනවා; අලුතින් ව්‍යාපාර පටන් ගන්නවා. අපේ රටේ නගරයක වුණත් ඉස්සර වාගේ නොවෙයි, දැන් හදන්නේ තට්ටු ගෙවල්. තට්ටු 7,8,10,15,20,30 ගොඩනැඟිලි හදන්නේ. ඒ නිසා එක ගෙයකට විදුලිය සපයනවා වාගේ නොවෙයි ගොඩනැඟිල්ලකට විදුලිය සැපයීම. එය විශාල විදුලිය සැපයීමක්. ඒ වාගේම ඉස්සර අපි වැඩිපුර විදුලිය පාවිච්චි කළේ නැහැ. Fans එහෙම වැඩිපුර පාවිච්චි කළේ නැහැ. නමුත් දැන් fans නොවෙයි, වායු සමීකරණයත් - AC - ඕනෑ කර තිබෙනවා. ඒ විධියට විදුලිය දීපු ගෙවල්වලටම වැඩි වැඩියෙන් විදුලිය භාවිතය ඕනෑ කර තිබෙනවා. ඒ වාගේම refrigerators භාවිත කරනවා. තමන් උයාපු දේවල් ටික, අනෙක් ආහාර පාන ශීතකරණවල දාලා පාවිච්චි කරනවා. විදුලිය තිබෙන හැම ගෙදරකම මේ පහසුකම් අතින් තවතවත් ඉදිරියටම යනවා මිසක පස්සට යන්නේ නැහැ. ඒක නරකක් නොවෙයි. ඒක මේ සමාජයේ ඉදිරි ගමන. මේ රට දියුණු වෙන්න, දියුණු වෙන්න, ආර්ථිකය දියුණු වෙන්න, දියුණු වෙන්න, පවුල්වල ආදායම දියුණු වෙන්න, දියුණු වෙන්න විදුලිය මේ විධියට පාවිච්චි කරනවා. අපට උවමනා කරන්නේත් විදුලිය එක්ක ඒ පහසුකම් සියල්ලමත් ජනතාවට ලබා දෙන්නයි. ගෙදරක ආර්ථිකය දියුණු නැත්නම් ශීතකරණ ගන්නේ නැහැ. ඒ වාගේම fans සවි කර ගන්නේ නැහැ; AC කරන්නේ නැහැ; TV ගන්නේ නැහැ. නමුත් ඒවා වැඩි වැඩියෙන් භාවිත කරන්නේ මේ රටේ ආර්ථිකය දියුණු වෙලා තිබෙන නිසායි. ඒ වාගේම සමාජ තත්ත්වය දියුණු වෙලා තිබෙන නිසායි.

සියයට 35කට තිබුණු දුප්පත්කම පසු ගිය කාලයේ සියයට 15ට අඩු වුණා. ඒ දුප්පත්කම දැන් සියයට 7ට අඩු කර තිබෙනවා. ඒ අනුව ජනතාව අපෙන් වැඩි වැඩියෙන් මේ පහසුකම් ඉල්ලනවා. ඒ සඳහා විදුලිය වැඩි වැඩියෙන් සැපයිය යුතුයි; වැඩි වැඩියෙන් ලබා දිය යුතුයි. මේ ලබපු අත් දැකීම් අනුව ඒ අඩු පාඩුකම් සකසා ගන්න පසු ගිය කාලයේ කටයුතු කර තිබීම ඉතා වැදගත් හැටියට අපි කල්පනා කරනවා. ඒ නිසා මෙම ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට ඔබතුමන්ලා කාගෙත් සහයෝගය ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ මේ රටේ විදුලිය නිෂ්පාදනය වෙගයෙන් වැඩි දියුණු කර මේ රටේ සෑම නිවසකටම විදුලිය සැපයීම තමයි අපේ අරමුණ වෙලා තිබෙන්නේ; අපේ සටන් පාඨය -අපේ slogan එක- වෙලා තිබෙන්නේ; අපේ ජාතික පාඨය වෙලා තිබෙන්නේ. අන්න ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ තත්ත්වය උදා කර දෙන්න තමයි අප බලාපොරොත්තු වන්නේ. පසු ගිය කාලයේ විදුලි බලාගාර රාශියක් ආරම්භ කළේත් ඒ නිසායි. විදුලි බලාගාර වැඩි හරියක් ඇති කළේත්, අක්‍රීයව තිබුණු ඒවා සකස් කළේත්

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ඒ නිසායි. අපි ඒවා හරි ගස්සා ගෙන ඉදිරියට යමින්සිටිනවා. [බාධා කිරීමක්] ඔව්. අපිට ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට ඇමතිතුමිය නැවත ඒ ගැන කල්පනා කර බැලිය යුතු වෙනවා. ඒ මොකක්ද? තාප බලාගාර. පෞද්ගලික අංශයෙන් හදලා තිබෙන තාප බලාගාර ආරම්භ කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේයි. අපේ කරු ජයසූරිය ඇමතිතුමා තමයි එයින් දෙකක් අනුමත කළේ. ඒක අනෙක් අයටත් ඉදිරියට ගෙන යන්න සිදු වෙලා තිබෙනවා. විදුලිය ගාස්තුව අඩු කර ගන්න ඒ අය සමඟ නැවත සාකච්ඡා - renegotiate- කළ යුතුයි. කවුරු කවුරු මේවායේ සිටිනවාද කියා මා දන්නේ නැහැ. නමුත් මේ තත්ත්වය නැති කිරීම වඩා යෝග්‍යයි කියා මා කල්පනා කරනවා. මෙතුමන්ලාත් කිව්වා, අපේ ජෝශප් මයිකල් මැතිතුමාත් කියන්න යෙදුණා, දැන් වහිනවා කියලා; සොරොව්වලින් වතුර යවනවා කියලා. නමුත් වහින විටම විදුලිය ගාස්තු අඩු කරන්න පුළුවන්කමක් නැහැ. වහිනවාය කියලා, සම්මත කරපු මේ වැඩ පිළිවෙළ වෙනස් කරන්න පුළුවන්කමක් තිබෙනවාද? යූඑන්පී එක බලයේ හිටියා නම් එහෙම කරනවාද? යූඑන්පී ආණ්ඩුව එක අවස්ථාවකදී නොවෙයි කිහිප අවස්ථාවකදීම විදුලි ගාස්තු සියයට 100කින්ම වැඩි කළා. මෙතුමා කියන්නේ වැහැලා වතුර ගලා ගෙන යන්න ඉස්සර විදුලිය ගාස්තු අඩු කරන්න කියලායි. අවුරුද්ද අන්තිමේ ගණන් බලලා තමයි ඒක කරන්න ඕනෑ. එහෙම නැතුව අද කරන්න පුළුවන්කමක් නැහැ. ඊළඟ අවුරුද්දේ විදුලිය නිෂ්පාදනය කොහොම වෙයිද කියා දන්නේ නැහැ. ජල විදුලිය ලබා දෙන්න අපහසු කාල තිබුණා. ඒ ප්‍රදේශවලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොතිබීම නිසා විදුලි බලය සපයන්න අපහසුකම් ඇති වුණා. අද වහින්න පුළුවන්. අද ජලය තිබෙන්න පුළුවන්. නමුත් තව මාස කිහිපයකින් විදුලිය නිෂ්පාදනය කරන්න තරම් ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් නොතිබෙන්න පුළුවන්. ඒ අනුව කල්පනා කර කටයුතු කළයුතුයි. මෙතුමන්ලා කල්පනා කරන්නේ මේ ආර්ථිකය දිහා බලලා මේ ආයතන ගෙන යාම දිහා බලලා ඡන්දය ලබා ගන්න, මිනිස්සු රවටන්න, දේශපාලන කථා කරන්නයි.

සියයට 60 දක්වා විදුලිය ගාස්තු වැඩි කර නැහැ. පවුල් සියයට 50කට විතර විදුලිය ගාස්තුව වැඩි වෙලා නැහැ. ඒ මොකද, ඒකක 60 දක්වා විදුලිය ගාස්තු වැඩි කර නැහැ. එහෙම වැඩි නොකළ නිසා සියයට 50කට විතර ඒ සහනය ලැබිලා තිබෙනවා. රුපියල් බිලියන 23ක් සහන හැටියට දීලා තිබෙනවා. රුපියල් කෝටි 100 ඒවා 23ක් සහන හැටියට දීලා තිබෙනවා. ඒ වාගේම ව්‍යාපාරිකයන්ටත් දීලා තිබෙන ප්‍රමාණය මදි බව හැබෑව. ඒත් ඒ අයට රුපියල් බිලියන 25ක සහන දීලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් කෝටි 100 ඒවා 25ක් දීලා තිබෙනවා. මේ ගැන අපි කල්පනා කළ යුතුයි. ඒ අයගේ නිෂ්පාදනයන්ට වැඩි වැඩියෙන් මුදල් යොදවන්න සිදු වුණාම නිෂ්පාදන වියදම වැඩි වනවා. එතකොට වෙළෙඳ පොළේ තරග කිරීමේ ප්‍රශ්නයක් එන බව අපි දන්නවා. ඒ අය ගැනත් සලකා සහන දීලා තිබෙනවා. ව්‍යාපාරිකයන්ට, industrial sector එකට රුපියල් බිලියන 25ක සහනයක් දීලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය ජනතාවට රුපියල් බිලියන 23ක සහනයක් දීලා තිබෙනවා.

මේ විධියට දුප්පතාගේ පැත්ත බලා, සංවර්ධනය පැත්තත් බලා මේ ආණ්ඩුව ක්‍රියා කර ගෙන යනවාය කියන කාරණය අප කියන්න ඕනෑ. නමුත් එතුමන්ලා ඒවා කියන්නේ නැහැ. දැන් වහිනවා. වැහැලා ඇළ ගලන කොට, ගඟ ගලන කොට විදුලි බිල අඩු කරන්න කියලා තමයි එතුමන්ලා ඉල්ලන්නේ. ඒක මොන තර්කයක්ද කියා මා දන්නේ නැහැ. ඒවා ඡන්ද වෙලාවට රටට කියන්න හදා ගන්න සටන් පාඨ හැටියට තමයි මට කල්පනා කරන්න වෙලා තිබෙන්නේ. මේ රටට විදුලිය සැපයීම සංවර්ධනය කරලා, ගෙදරින් ගෙදරට ඒ පහසුකම් සපයා දීලා, ළමයින්ට තවත් පාඩම් කරන්න පහසුකම් වැඩි කරලා දෙන්න තමයි අප කල්පනා කරන්නේ. "දැයට කිරුළ" ප්‍රදර්ශනය අපේ දිස්ත්‍රික්කයේත් පැවැත්වීමට නියමිතව තිබෙනවා. දැන් අප සෑම ගෙදරකටම ප්‍රධාන වශයෙන් විදුලිය සැපයීම අවසාන කරලා තිබෙන්නේ. විදුලි කණු දෙක, තුන, හතර දෙන්න තිබෙන තැන් තමයි කීපයක් ඉතිරිව තිබෙන්නේ. ඒ ස්ථානවලටත් මේ පහසුකම් ලබා දෙන්න "දැයට කිරුළ" ප්‍රදර්ශනය යටතේ ඒ දිස්ත්‍රික්කවලට සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒ විධියට මුළු රටටම මෙය ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ තමයි කරගෙන යන්නේ. මේක තමයි වැඩ පිළිවෙළ; මේක තමයි සංවර්ධනය. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාවගේ සහයෝගය, තමුන්නාන්සේලාගේ සහයෝගය ලැබිය යුතුව තිබෙනවා. මේ, මහා වෙනසක් ඇති කරන්න අවශ්‍ය වේලාවක්.

2002 දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිතුමා වශයෙන් බලයට පැමිණිලා Electricity Reform Bill එකක් -පනත් කෙටුම්පතක්- ගෙනාවා. එතුමා මේ විදුලි බල අංශය කොටස් හතකට කඩලා -කැලිවලට කඩලා, sectors හතකට කඩලා- විකුණන්න, public companies බවට පත් කරන්න, share market එකෙන් පෞද්ගලික අංශයට ගන්න කටයුතු යෙදුවා. එතකොට රාජ්‍ය ආයතන ඇති වෙන්නේ නැහැ. රාජ්‍ය ආයතන නැති වෙනවා. මෙන්න මේ තත්ත්වයට පත් කරලා තමයි එතුමා කටයුතු කරන්න ලෑස්ති වුණේ. නමුත් අපේ ආණ්ඩුව ආපු නිසා ආපසු ඒවා වෙනස් කළා. කොම්පැනි හතක් කරන එක නැතිව ගියා. යූඑන්පී ආණ්ඩුව පරාජය වුණු නිසා කොම්පැනි හත නැති වුණා. අපේ විදුලිබල මණ්ඩලය රැකුණා. ඒ අනුව අද රාජ්‍ය ආයතනය හැටියට මේ වැඩ ටික කරගෙන යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ reformsවලින් 2002 යූඑන්පී ආණ්ඩුව බලාපොරොත්තු වුණේ ඒකයි. තමුන්නාන්සේලා කවුරුත් මතක් කළා, සල්ලි වියදම් කරනවා කියලා. මොනවාටද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව පවත්වන්න සල්ලි වියදම් කරනවා, ඒ සල්ලි මේකට දාන්න බැරි ඇයි කියා අහනවා. අපේ රටට ප්‍රසිද්ධියක් ලැබුණා, ක්‍රිකට් ගහලා. ක්‍රිකට් තරගවලින් අප ලෝක ශූරයින් වෙලා ලොකු නම්බුවක්, ප්‍රසිද්ධියක් ලබා ගත්තා. ඒ වාගේම ත්‍රස්තවාදය ජයග්‍රහණය කළ නිසා අපේ රටට ලොකු ප්‍රසිද්ධියක් ලැබුණා. මුළු ලෝකයම කථා කළා, ත්‍රස්තවාදය පරාජය කිරීම පිළිබඳව. ත්‍රස්තවාදය පරාජය කළ රටක් හැටියටත් දැන් අපට ප්‍රසිද්ධිය ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සිරිමාවෝ මැතිනියගේ කාලයේ Non-Aligned Movement Summit එක තිබුණා. රටවල් 76ක රාජ්‍ය නායකයින් මේ රටට ආවා. ළඟදී පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල රාජ්‍ය නායකයින් 50ක් පමණ මේ රටට එනවා. ඒ තොරතුරු වාර්තා කරන්න දහස් ගණනක් මාධ්‍යවේදීන් අපේ රටට එනවා. ඒවා ලෝකයට ප්‍රසිද්ධ වීම නිසා ලංකාවට සංචාරකයින් පැමිණීම, ව්‍යාපාරිකයින් පැමිණීම, ආයෝජකයින් පැමිණීම සිදු වෙනවා. එයින් අපේ රටට ප්‍රසිද්ධියක්, කීර්තියක් ලබා ගන්න පුළුවන් වනවා. ඒ තත්ත්වය ලබා දෙන්න, අපේ ව්‍යාපාර දියුණු කරන්න නම් අප ඒවා ප්‍රචාරය කරන්න ඕනෑ. නොයෙක් රටවල TVවල, radioවල අපත් ප්‍රචාරයන් කරනවා, අපේ සංචාරක ව්‍යාපාරය ගැන. මේ තත්ත්වය තුළින් ප්‍රචාරයක් ඉබේ ලැබෙනවා. මේ තුළ ඇති කරන වියදම අපට ආයෝජනයක්. එයින් මේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න, මේ රට ආර්ථික වශයෙන් දියුණු කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒක අපට ලැබෙන ශක්තියක්. ඒ වැඩ පිළිවෙළ

ක්‍රියාත්මක කිරීම තුළින් අපට ශක්තිය ලැබෙනවා. ඒ ශක්තිය තමයි අපට ලැබෙන්නේ. දේශපාලනීකරණය මිසක් ඊට එහා දෙයක් තමුන්නාන්සේලා මේ පිළිබඳව කල්පනා කරන්නේ නැහැ.

මා මීට වැඩිය කථා කරන්නේ නැහැ, කාලය අවසාන නිසා. මේ රට මහා ඉදිරි පිම්මක් පැනලා තිබෙනවා. එය සංවර්ධනය කරන්න අපට දැන් ඕනෑ කරලා තිබෙනවා. මේ රටේ සාමය, සමගිය ඇති කරගෙන යන්න ඕනෑ කරලා තිබෙනවා. සාමයයි, සමගියයි, සංවර්ධනයයි එකට යන්න ඕනෑ කරලා තිබෙනවා. සමහර ආයතන, සමහර අය, සමහර කණ්ඩායම් ජාති භේද, ආගම් භේද හඳලා, ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට එකතු වෙලා මේ රටේ අර්බුද ඇති කරන්න උත්සාහ කරනවා. එයින් අපේ රට බේරා ගෙන මේ රට සංවර්ධනය කරන්න දරන උත්සාහයට මේ රටේ සියලු දෙනාගේම සහයෝගය ලබා දිය යුතුයි. ඒකට අවශ්‍ය කාලය මෙයයි කියලා මතක් කරමින් මගේ කථාව මින් අවසාන කරනවා.

[පි.ප. 3.45]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු එම්.එල්.ඒ.එම්. හිස්පුල්ලාහ් - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Economic Development)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைමைதාතුමා, இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான இந்த விவாதத்திலே கலந்துகொள்வதையிட்டு நான் மிக மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, எமது பிராந்திய நாடுகளுக்குள்ளேயே மின்வெட்டு இல்லாத ஒரு நாட்டில் பெருமையோடு நாம் வாழ்ந்துகொண்டிருக்கின்றோம். அதாவது, அருகிலிருக்கின்ற இந்தியா, நேபாளம், பூட்டான் போன்ற எந்த நாடுகளிலும் இல்லாத அளவுக்கு இருபத்துநான்கு மணி நேரமும் மின்சாரத்தை வழங்குகின்ற ஒரு நாடாக எமது நாடு இருப்பதையிட்டு நாம் எல்லோரும் பெருமைப்பட வேண்டும். சில நாடுகளில் பதினெட்டு மணித்தியால மின்வெட்டு அமுலில் இருக்கின்ற சூழ்நிலையிலே நமது நாட்டிலே இருபத்துநான்கு மணி நேரமும் சீரான முறையிலே மின்சாரம் விநியோகிக்கப்பட்டு வருகின்றது. யுத்தத்திற்குப் பின்னர் வடக்கு, கிழக்கு மாகாணங்களின் பெரும்பாலான பிரதேசங்களுக்கும் இன்று மின் விநியோகம் சீராக நடைபெற்று வருகின்றது; மின்சாரம் இல்லாமலிருந்த நூற்றுக்கணக்கான கிராமங்களுக்கு மின்சாரம் வழங்கப்பட்டிருக்கின்றது. இலங்கையிலே மின்சாரம் அறிமுகப்படுத்தப்பட்டு 200 வருடங்களுக்கு மேலாகியும் மின்சாரத்தைப் பெற்றிராத வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள பல கிராமங்களுக்கு இன்று மின் விநியோகிக்கப்பட்டிருக்கின்றது. அதற்காக அதியுத்தம ஜனாதிபதி அவர்களுக்கும் மின் வலுவுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களுக்கும் மின்சார சபையினருக்கும் எங்களுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கின்றோம். 30 வருடகாலம் இலங்கையில் இடம்பெற்ற யுத்தத்திற்குப் பின்னர் ஆசியாவின் ஆச்சரியமிக்க ஒரு நாடாக இலங்கையைக் கட்டியெழுப்புகின்ற மாபெரும் பணியிலே அதியுத்தம ஜனாதிபதி அவர்களின் தலைமையில் நாங்கள் பயணித்துக் கொண்டிருக்கின்றோம். இதற்கு இலங்கை மின்சார சபையும் அதிக பங்களிப்பை வழங்கிக்கொண்டிருக்கின்றது.

கௌரவ தலைමைதාතුමා, அவ்வாறு இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு முனைகின்றபோது இனவாதத்தையும் மதவாதத்தையும் கிளப்பி, இனங்களுக்கிடையிலும் மதங்களுக்கிடையிலும் பிரச்சினைகளை உண்டுபண்ணி, மீண்டும் இந்த நாட்டிலே ஓர் இரத்தக்களரியை ஏற்படுத்துவதற்கும் இந்த நாட்டுக்கு அபகீர்த்தியை உண்டாக்குவதற்கும் சில தீய சக்திகள் முயன்றுகொண்டிருக்கின்றன. அந்தச் சூழ்நிலையிலிருந்து இந்த நாட்டை நாங்கள் காப்பாற்றியாக வேண்டும். கடந்த பல மாதங்களாக இந்த நாட்டிலே முஸ்லிம்களுக்கெதிராக, இஸ்லாம் மதத்துக்கெதிராகச் சில தீய சக்திகள் எடுத்துவரும் நடவடிக்கைகள் முஸ்லிம் மக்கள் மத்தியிலே அச்சத்தையும் கவலையையும் ஏற்படுத்தியிருக்கின்றன. ஆகவே, இந்த நாட்டை நாங்கள் கட்டியெழுப்ப வேண்டுமாக இருந்தால், இந்த நாடு வளர்ச்சியடைந்த நாடாக மாற வேண்டுமென்றால், 30 வருடங்களாக இழந்திருந்த அந்த ஒற்றுமையை மீண்டும் கட்டிக்காக்க வேண்டும்; இந்த நாட்டிலே எல்லா இனங்களும் ஒற்றுமையாக வாழ்கின்ற ஒரு சூழ்நிலை உருவாக்கப்பட வேண்டும். சிறுபான்மை மக்களது உரிமைகள் மற்றும் அவர்களது மத ஸ்தலங்களைப் பாதுகாக்கின்ற முழுப்பொறுப்பும் அரசாங்கத்துக்கும் பெரும்பான்மை மக்களுக்கும் இருக்கின்றது. அந்த வகையிலே இந்த அரசாங்கம் அவற்றை உரிய முறையிலே செய்ய வேண்டும்.

கடந்த பல மாதங்களாக முஸ்லிம்களுக்கு எதிரான பல்வேறுபட்ட சம்பவங்கள் இடம்பெற்றுக்கொண்டிருக் கின்றன. முஸ்லிம் சமூகத்துக்கெதிராக கடும்போக்குள்ள இனவாத அமைப்புக்கள் மேற்கொண்டுவரும் அச்சுறுத்தல்கள் தொடர்நிகழ்வாக இடம்பெற்றுக் கொண்டிருப்பதனை கடந்த 10 நாட்களுக்குள் நடைபெற்ற சம்பவங்கள் உணர்த்துவதாக உள்ளன. கிராண்ட்பாஸ் பள்ளிவாசல் பிரச்சினை, மஹியங்கனை ஜும்ஆ பள்ளிவாசல் தாக்குதல், தெமட்டகொடையில் மாடு அறுக்கும் மடுவத்துக்குள் இறைச்சி ஏற்றும் லொறி எரிக்கப்பட்டமை போன்ற சம்பவங்கள் மற்றும் மாவனல்லை பகுதியிலுள்ள தெவனகல பிரதேச முஸ்லிம்களை வெளியேற்றக் கோரும் கூட்டம் என்பன கடந்த 10 நாட்களுக்குள் நடந்த முக்கிய சம்பவங்களாகும். தாக்குதலுக்குள்ளான மஹியங்கனை ஜும்ஆ பள்ளிவாசல் இன்று மூடப்பட்டிருக்கின்றது. மாகாண சபை அமைச்சர் ஒருவர் நேரடியாகச் சென்று அந்தப் பள்ளிவாசலை மூடுமாறு உத்தரவிடுகின்ற அளவுக்கு நிலைமைகள் உருவாகியிருப்பதைக் கண்டு முஸ்லிம் சமூகம் மிகவும் மனவேதனையடைந்திருக்கின்றது.

கௌரவ தலைමைதාතුමා, இத்தகைய செயல்களும் நிகழ்வுகளும் முஸ்லிம் மக்கள் மத்தியில் மட்டுமன்றி முஸ்லிம் அல்லாதோர் மத்தியிலும் மிகுந்த வெறுப்பை ஏற்படுத்தியுள்ளன. இவை மிகவும் கீழ்த்தரமான செயல்களாகும். மஹியங்கனை பள்ளிவாசல் தாக்கப்பட்டபொழுது பள்ளிவாசல் அமைந்துள்ள வீதியில் மாத்திரம் சிறிதுநேரம் மின்சார விநியோகம் துண்டிக்கப்பட்டு, பின்னர் சீர்செய்யப்பட்டது. இதனை ஒரு திட்டமிடப்பட்ட செயலாகவே கருத வேண்டியுள்ளது. எது எவ்வாறிருப்பினும் கடந்த இருபது வருட காலமாக ஐவேளைத் தொழுகைக்கும் ஜும்ஆ தொழுகைக்கும் பயன்படுத்தப்பட்டுவந்த அந்தப் பள்ளிவாசல் இந்தப் புனிதமான நோன்பு மாதத்திலே ஜும்ஆ தொழுகை நடத்தப்படாமல் இழுத்து மூடப்பட்டிருப்பது இலங்கையில் வாழ்கின்ற முஸ்லிம்களை மாத்திரமன்றி, முழு உலகிலும் வாழ்கின்ற அனைத்து முஸ்லிம்களுடைய மனங்களையும் மிகவும் புண்படுத்தியிருக்கின்றது. இத்தகைய விடயங்கள் எந்தவிதமான பிரச்சினைகளுக்கும் உட்படுத்தப் படாமல் சமாதானமாக, மிகவும் அமைதியான முறையிலே தீர்க்கப்பட வேண்டும். எவ்விதமான பிரச்சினைகளுக்கும் உட்படுத்தப்படாமல், இந்த நாட்டிலுள்ள இனங்கள் மீண்டும்

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

සීර්කුලෙන්තුවිඩාමල් ඉන්නප් පිරච්සිනෙක්කුත් තීර්වු කාණප්පට්ටු ඔත්රුමෙයුඩන් වාළවේණ්ඩුමෙන නාංකළ් ආසෙප්පඩුකින්රෝම්. එනවේ, අරසාංකම් ඉන්ත විඩයංකළිල් කවනම් සෙලුත්ත වේණ්ඩුම්.

ඉන්ත නාට්ටිලුළ්ළ අනෙවරුම් ඔත්රුමෙයුඩන් වාළවේණ්ඩුම් එනවුම් ඉන්ත නාඩු කට්ටියෙළුප්පප්පඩ වේණ්ඩුම් එනවුම් ආසෙප්පඩුපවර්කළ් නාංකළ්. ඉන්ත නාඩු යුත්තත්තිල් සික්කුණ්ඩපොළුදු, නාඩු පිරින්තුවිඩක්කූඩාදු, එන්රුම් ඔරේ නාඩාක ඉරුක්ක වේණ්ඩුම් එන්ර එණ්ණත්තුඩන් ආයිරක්කණක්කාන මුස්ලිම්කළ් උයිරෛත් තුච්චමෙන මතිත්තු තමදු උයිර්කළෙයුම් උඩෙමෛකළෛයුම් ඉළන්තු, ඉන්ත අරසාංකත්තුඩනුම් අරස පඩෛකළුඩනුම් චේර්න්තු ඉන්ත නාට්ටෛප් පාතුකාත්තාර්කළ්. ආනාල්, කඩන්ත පල නාට්කළාක ඉඩම්පෙට්ර පල්වේරුපට්ඩ සම්පවංකළ් තොඩර්පිල් ඉදුවරෛ එවරුම් කෛදු සෙය්යප්පඩවිල්ලෛ. ඉන්තත් තාක්කුදලිල් සම්පන්දප්පට්ටවර්කළ් මර්රුම් සම්පන්දප්පට්ඩ වාකනංකළ් තොඩර්පාක පාතුකාප්පුප් පිරිවිනරුක්කුත් තෙරින්දිරුන්දුම් ඉන්රු වරෛයිල් පාතුකාප්පුත් තරප්පිනර් සම්පන්දප්පට්ටවර්කළෛක් කෛදුසෙය්යාමලුම් සට්ඩ නඩවඩික්කෛ එදනෛයුම් මේර්කොළ්ළාමලුම් ඉරුප්පදු එංකළුක්කු මිකුන්ත මනවේදනෛයෛත් තරුකිරදු. ඉදනෛයිට්ටු මුස්ලිම් සමූකම් මිකවුම් මනවේදනෛ යඩෛන්දිරුක්කිරදු.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්ත නාට්ටෛ මුන්නේර්රමඩෛන්ත, වළර්ච්චියඩෛන්ත නාඩාකක් කට්ටියෙළුප්පි අපිවිරුත්ති සෙය්යවේණ්ඩුමායින්, නාම් එල්ලෝරුම් ඔත්රුමෛප්පඩ වේණ්ඩුම්. ඔත්රුමෛප්පට්ඩ ඔරු සමූකත්තින්මූලමාක මට්ටුමේ ඉන්ත නාට්ටෛක් කට්ටියෙළුප්ප මුඩියුම්. ආකවේ, ඉන්ත නාට්ටෛ මුන්නේර්රුවතර්කාකච් චකල ඉනංකළුම් ඔත්රුමෛයාක වාළවේණ්ඩුම්. ඉදු තොඩර්පාක අරසාංකම් විරෛවිලේ නඩවඩික්කෛ එඩුක්ක වේණ්ඩුම්. පාතුකාප්පුත් තරප්පිනරාල් එංකළුක්කුප් පල උරුතිමොළිකළ් වළංකප්පඩුකින්රන. ආනාල්, අන්ත උරුතිමොළිකළ් එදුවුම් ඉදුවරෛයිල් නිරෛවේර්රප්පට්ටදාක ඉල්ලෛ. ඉත්තකෛය නිලෛමෛ තොඩර්න්තුම් නීඩිත්තුක්කොණ්ඩිරුක්ක මුඩියාදු. ඉදු තොඩර්පාක අරසාංකම් උඩනඩියාකච් චට්ඩ නඩවඩික්කෛ එඩුක්ක වේණ්ඩුම්; සම්පන්දප්පට්ටවර්කළ් කෛදු සෙය්යප්පඩ වේණ්ඩුම්.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්ත නාට්ටිලේ මීණ්ඩුම් ඉනංකළුක්කිටෛයිලුම් මතංකළුක් කිටෛයිලුම් කලවරම් ඒර්පට්ටුවිඩක්කූඩාදෙන්ර කාරණත්තුක්කාක අකිල ඉලංකෛ ජම් ඉය්යත්තුල් උලමාවුම් මුස්ලිම් අමෛච්චර්කළුම් අරසියල් තලෛමෛකළුම් කල්විමාන්කළුම් ඉණෛන්දු මිකවුම් කවනමාක එමදු මුස්ලිම් සමූකත්තිනරෛ අමෛදිප්පඩුත්දි වළිනඩත්දික්කොණ්ඩිරුක් කින්රාර්කළ්. ඉන්ත නාට්ටිලුළ්ළ අනෛත්දු මක්කළුක්කුම් ඔරේ චට්ටම් අමුල්පඩුත්තප්පඩ වේණ්ඩුම්. මුස්ලිම් ඔරුවනුක්කු ඉන්ත නාට්ටිලේ පල්ළිවාසල් අමෛත්තුත් තොළුවතර්කාන පූරණ උරිමෛ ඉරුක්කින්රදු. අතනෛත් තඩුක්කින්ර අදිකාරම් එවරුක්කුම් කිටෛයාදු. කඩන්ත ඉරුපත්තිරණ්ඩු වරුඩංකළාකත් තොළුකෛ නඩත්තප්පට්ටුවන්ත මහියංකනෛ පල්ළිවාසලෛ එන්දවිත කාරණමුම් ඉන්රි මාකාණ අමෛච්චර් ඔරුවර් නේරඩියාකච් චෙන්රු ඉළුත්තු මූඩුම්පඩි චොන්නතනාල් අදු මූඩප්පට්ටිරුක්කින්රදු. ඉන්රු නාට්ටිලුළ්ළ ඉත්තකෛය චූළ්නිලෛයෛප් පුරින්තුකොණ්ඩු පාතුකාප්පුත් තරප්පිනර් උඩනඩියාක නඩවඩික්කෛ මේර්කොළ්ළ වේණ්ඩුම්. චකල සමූකත්තවරුම් අවර්කළුඩෛය සමූක, අරසියල්, මත උරිමෛකළෛප් පේණිප්පාතුකාප්පතර්කාන නඩවඩික්කෛකළ් එඩුක්කප්පඩ වේණ්ඩුම්. අරසාංකමුම් පාතුකාප්පුත් තරප්පිනරුම් තොඩර්න්තුම් කණ්මූඩිත්තනමාක ඉදේ නිලෛමෛයෛක් කඩෛප්පිඩික්කාමල් උඩනඩියාකච් චම්පන්දප්පට්ටවර්කළුක්කු එදිරාකච් චට්ඩ නඩවඩික්කෛකළෛ එඩුත්තු, නාට්ටිලේ චට්ඩත්තෛයුම් අමෛදියෛයුම් නිලෛනාට්ටි චකල සමූකංකළුම් ඔත්රුමෛයුඩන් නිම්මදියාක වාළ්වතර්කුරිය චූළ්නිලෛයෛ උරුවාක්ක වේණ්ඩුම්. කඩන්ත 30 ආණ්ඩුකළුක්කුප් පින්නර් ආයිරක්කණක්කාන පාතුකාප්පුප් පඩෛයිනර් ඉරත්තම් චින්දි, උයිර්ප්පලි කොඩුත්තුප් පෙර්රෙඩුත්ත චුතන්දිරත්තෛප් පේණිප් පාතුකාප්පතර්කු එල්ලෝරුම් මුන්වර වේණ්ඩුමෙන්රු කේට්ටු, විඩෛපෙරුකින්රේන්. නන්රි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
මීළහට ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 3.55]

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතට පෙරාතුව, 2009 තවත් සංශෝධන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. මට මතකයි ඒ අවස්ථාවේදී එවකට හිටපු විදුලිබල ඇමතිවරයා ඉතා පැහැදිලිව කිව්වා, මේ පනත තුළින් ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ගිණුම zero කරන්න පුළුවන් කියලා. මීට වසර හතරකට පෙරාතුව, ඒ කියන්නේ 2009 දී ඒ පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ එවකට හිටපු විදුලිබල ඇමතිවරයා මහා සද්දෙට කිව්වා ණය ගිණුම zero කරන්න පුළුවන් කියලා. නමුත් අවුරුදු හතරකට පස්සේ ප්‍රායෝගිකව ඔප්පු වෙලා තිබෙනවා; වර්තමාන ඇමතිවරුන්ගේ ප්‍රකාශවලින් ඉතා පැහැදිලිව ඔප්පු වනවා ණය ගිණුම zero වෙලා නැහැ; ඒ වෙනුවට දැවැන්ත පාඩුවක් ලබන ආයතනයක් බවට ලංකා විදුලිබල මණ්ඩලය පත් වෙලා තිබෙනවා කියලා.

ඇත්තටම මේ වන කොට රටේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ විදුලි බිල පිළිබඳ ප්‍රශ්නයයි. විදුලි බිල වැඩි කරන්නේ නැහැ, ඒ වෙනුවට විදුලි බිල අඩු කරනවා, මුළු රටේම ජනතාවට විදුලිය සපයනවා කියපු ආණ්ඩුව එක පැත්තකින් විදුලි බිල වැඩි කළා. අනෙක් පැත්තෙන් අද මේ පනත් කෙටුම්පත හරහා නීතිය තවත් තද කිරීමක් කරනවා. ඒ තමයි මාසික වාරිකය ගෙවීම පැහැර හරින අයගේ විදුලිය විසන්ධි කිරීමට අවශ්‍ය කරන නෛතික කටයුතුවලට බලය ලබා ගැනීම. දැනටමත් ඒ හැකියාව තිබෙනවා තමයි. නමුත් ඊට වඩා බලගතු වගන්ති එකතු කර තිබෙනවා. මේ වැඩි වුණු විදුලි බිල යම් කිසි ආකාරයකින් ගෙවා ගන්න බැරි වුණොත් ඒ කාල සීමාව ඉක්මවපු ගමන් -මාසය අවසන් වුණු ගමන්- විදුලිය විසන්ධි කරන්න බලය පවරා ගන්නවා. විදුලි බිල වැඩි කළාට අමතරව, වැඩි කරපු ගණන අය කර ගැනීම සඳහාත් දැඩි නීති ක්‍රියාත්මක කරනවා. නියමිත කාල සීමාව තුළ නොගෙවුවොත්, ඒකට යම් ප්‍රමාදයක් ඇති වුණොත් ඒ ප්‍රමාදය නිසා එක පැත්තකින් විදුලියත් විසන්ධි කරනවා. අනෙක් පැත්තෙන් නැවත විදුලිය ලබා දීමේ ගාස්තුවත් අය කරනවා. ඒවා තමයි මේ සංශෝධන පනත් කෙටුම්පතේ වගන්ති විධියට තිබෙන්නේ. මේ මොකක්ද කරන්නේ?

විදුලිබල නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා ගහපු දඩ මුදල්වලින් ලොකු ආදායමක් උපයනවා කියලා. ආදායම වැඩි වුණු ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යා ලේඛනත් එතුමා ඉදිරිපත් කළා. දැන් එතුමන්ලා මණ්ඩලයේ පාඩුව පියවන්න හදන්නේ මේ ජාතියේ ඒවායෙන්. පාඩුවට බලපෑ ඇත්ත හේතුව හඳුනා ගෙන ඒවාට උත්තර සපයනවා වෙනුවට විදුලි බිල වැඩි කර ජනතාව මත ඒ බර පටවලා, අනෙක් පැත්තෙන් විදුලි බිල ගෙවා ගන්න බැරි වුණොත් වහාම ක්‍රියාත්මක වන පරිදි විදුලිය විසන්ධි කරලා, ඒ විසන්ධි කිරීම නැවත ලබා දීම සඳහා අමතර ගාස්තුවකුත් අය කරලා, දැන් ඒකෙන් ආදායම් උපයන්නයි හදන්නේ. මේවා පැලැස්තර විසඳුම්. ඇත්තටම ගත්තොත් මේ නිසා රටේ ජනතාව තවත් හානිදායක තත්ත්වයට පත්වීම විතරයි සිදු වන්නේ. ඇත්තටම මේ පනත් කෙටුම්පත ගෙන එන්න කලින් 2009 දී ගෙනාපු පනතේ වගන්තිවල ඉතා පැහැදිලිව ඇතුළත් වුණා, මෙය පෞද්ගලීකරණ දිශාවට ගමන් කිරීම.

දැන් කොයි තරම් පුරාජේරු ගැහුවත්, කයිවාරු ගැහුවත් ඇත්ත කථාව ඒකයි. එතැනට තමයි මේ ටික ටික, ටික ටික යන්නේ. 2009 පනත ගෙන ආ වෙලාවේදී ඉතා පැහැදිලිව අපි එයට විරුද්ධ වුණා. වෘත්තීය සමිති, ඒ වාගේම විදුලි පාරිභෝගිකයෝ මහා දැවැන්ත උද්ඝෝෂණ කළා. ඒ උද්ඝෝෂණවලට පොලීසිය කඳුළු ගෑස් ගැහුවා; බැටන් පොලු ප්‍රහාර එල්ල කළා. ඒ විධියට බැටන් පොලු ප්‍රහාර දීලා, කඳුළු ගෑස් ගහලා එම උද්ඝෝෂණ මර්දනය කරලා බලහත්කාරයෙන් ඒක යටපත් කළා. පසුව පාර්ලිමේන්තුවේ බලය පාවිච්චි කරලා ඒක සම්මත කළා. හැබැයි, සම්මත කරලා මොකක්ද ලබා ගත් ජයග්‍රහණය? මේ රටේ ජනතාවට ජයග්‍රහණයක් ලබා දුන්නාද? අඩුම ගණනේ ජනතාවට ජයග්‍රහණය කෙසේ වෙතත්, විදුලිබල මණ්ඩලයට ජයග්‍රහණයක් ගෙනාවාද? විදුලිබල මණ්ඩලය එවකට තිබුණු පාඩු ලබන තත්ත්වයෙන්, බංකොලොත් තත්ත්වයෙන් මුදා ගන්න පුළුවන් වුණාද? එහෙම කර ගන්න බැරි වුණා. නොරොච්චෝලේ බලාගාරය, කොත්මලේ බලාගාරය කියලා සන්දර්ශන පවත්වනවා. උමඟ ඇතුළට ගිහිල්ලා තමයි ඒ කාලයේ විදුලිබල හා බලශක්ති ඇමතිවරයා කිව්වේ, "දැන් බලන්න, රටටම විදුලිය සපයන්න පුළුවන්, විදුලිය ගාස්තු අඩු කරනවා" කියා.

ඊයේ පෙරේදා මම දැක්කා අලුත් විදුලිබල හා බලශක්ති ඇමතිවරිය හැටන් ප්‍රදේශයේ තිබෙන බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරයට මුල් ගලක් තබනවා. මධ්‍යම පළාත් සභා ඡන්දය පැවැත්වීමට කටයුතු කර තිබෙන වෙලාවේ බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරයට මුල් ගලක් තැබුවා. එතුමියට මතකද කියා මා දන්නේ නැහැ, මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා ඔය බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරය සඳහාම මීට කලින් හිටපු විදුලිබල හා බලශක්ති ඇමති පාඨලී චම්පික රණවක මැතිතුමාත් මුල් ගලක් තැබුවා. ඒ, 2010 ප්‍රාදේශීය සභා ඡන්දය කාලයේ. 2010 ප්‍රාදේශීය සභා ඡන්දය කාලයේ ඔය බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරයට මේ ආණ්ඩුවේම එවකට හිටපු විදුලිබල හා බලශක්ති ඇමතිවරයා මුල් ගලක් තැබුවා. කිසිදු හිරිකිතයක්, ලජ්ජාවක් නැතුව දෙවැනි වතාවට බැසිල් රාජපක්ෂ ඇමතිවරයාත් එක්ක ගිහිල්ලා එතැනම මුල්ගලක් තැබුවා. මේ වාගේ විහිළුවලින් මේ රටේ ජනතාවගේ විදුලි බිල අඩු කරන්නත් බැහැ, මේ රටේ බලශක්ති උත්පාදනය වර්ධනය කරන්නත් බැහැ. ඇත්තටම ආණ්ඩුවේ ඒ සියල්ල අසාර්ථකයි කියන එක අද ඔප්පු වෙලා තිබෙනවා.

මේ පනත් කෙටුම්පත අරගෙන බැලුවොත්, එහි තුන්වැනි පිටුවේ මෙතුමන්ලා ඉතා පැහැදිලිව වාක්‍ය සංශෝධනය කරලා තිබෙනවා. "ආණ්ඩුව විසින් සියයට පනහට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන" යන වාක්‍ය ඉවත් කරලා "ආණ්ඩුව විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් සියයට පනහට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන" කියලා මේකට අලුත් වාක්‍යයක් එකතු කර තිබෙනවා. මේක තමයි පියවරෙන් පියවර පෞද්ගලීකරණය දිසාවට ගමන් කිරීමට පාවිච්චි කරන උපක්‍රමය. ආණ්ඩුවට සියයට 51ක් තිබෙනවා කියලා කිව්වාට, එහෙම එකක් මේකේ කොහේවත් සඳහන් වෙලා නැහැ. ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමාට උත්තර දෙන්න බැරි වුණේ ඒකයි. විදුලිබල හා බලශක්ති ඇමතිවරිය පස්සේ උත්තර දෙන්නම් කියලා සද්ද නැතුව හිටියා. අඩුම ගණනේ නියෝජ්‍ය ඇමතිවරයා හෝ උත්තරයක් දෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. නියෝජ්‍ය ඇමතිවරයාටත් උත්තරයක් නැහැ. එහෙම එකක් මේ පනත් කෙටුම්පතේ කොතැනකවත් නැහැ. "සියයට 50ට වැඩි" කියලා තිබෙනවා. හැබැයි, ඒක සම්පූර්ණ රාජ්‍ය සතුයි කියලා නැහැ. ක්‍රමානුකූලව පෞද්ගලීකරණය දිසාවට ගමන් කිරීමක් තමයි මේකෙන් පෙනෙන්නට තිබෙන්නේ. මේක වචනයෙන් කරන මහා වෙනස්කමක්.

ඇත්තටම බැලුවොත්, 2009 පනතින් ඒ පෞද්ගලීකරණ දිසාව පටන් ගත්තා. 2009 දී නොවෙයි, ඉතිහාසයට ගියොත් 2005 දීත් මේ ආණ්ඩුවේ එවකට හිටපු මුදල් ඇමතිවරු, විදුලිබල හා බලශක්ති ඇමතිවරු මෙය පෞද්ගලීකරණය කරන්න උත්සාහ කළා. අද මෙහෙම කථා කළාට, මේ කැබිනට් මණ්ඩලයේම ඉන්න ඇමතිවරු එදා ඒකට පක්ෂවයි කථා කළේ. ඒක තමයි ඇත්ත ඉතිහාසය. ඒවා වෙනස් කරන්න පුළුවන් වුණේ එක පැත්තකින් මේ රටේ ජනතාවගේ බලයෙන් සහ අනෙක් පැත්තෙන් වෘත්තීය සමිතිවල මැදිහත් වීමෙන්. ඒවාත් එක්ක තමයි අද විදුලිබල මණ්ඩලය මේ තත්ත්වයෙන් හෝ පවත්වා ගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ තත්ත්වයෙන් පවත්වා ගෙන යාමේදී ආණ්ඩුව ප්‍රතිපත්ති සකස් කරන්න ඕනෑ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියත් එක්ක එකට සම්බන්ධ කරලායි.

විදුලි බිල වැඩි වෙන්න බලපෑ ප්‍රධාන සාධකයක් තමයි පසු ගිය දවස්වල මේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේ මුදල් ඇමතිවරයා විසින් ගත් වැරදි තීරණය. මොකක්ද ඒ තීරණය? රුපියල අවප්‍රමාණය කිරීමේ තීන්දුව; ඩොලරයට සාපේක්ෂව රුපියල බාල්දු කිරීම. ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි මත ගත්ත තීන්දුවක්. 2009 ජූලි මාසයේ 16 වැනිදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අත්සන් කළ ගිවිසුමෙන් ඉතා පැහැදිලිව ඔවුන් උපදෙස් දුන්නා අපේ රටේ බදු ක්‍රමය වෙනස් කරන්න; බදු පරාසය වැඩි කරන්න; බදු පරාසය වැඩි කරලා බදු ක්‍රමය සරල කරන්න කියලා. ඒ අනුව බදු කොමිසමක් පත් කරලා ඒ දේ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව තමයි රුපියල බාල්දු කරන්න කියලා උපදෙස් දීම. ඒ රුපියල බාල්දු කිරීමේ යෝජනාවට අනුව තමයි මුදල් ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පළමුවැනි වතාවට අය වැය කථාවේදී කිව්වේ සියයට 3කින් රුපියල අවප්‍රමාණ කරනවා කියලා. ඊළඟ වතාවේ අජිත් නිවාඩ් කබ්‍රාල්ලා, ජයසුන්දර මහත්තයලා ඔක්කොම එකතු වෙලා රුපියල සම්පූර්ණයෙන්ම පාවෙන්න හැරියා. රුපියල බාල්දු කළා. රුපියල බාල්දු කරන වෙලාවේ කිව්වේ අපේ අපනයන ආදායම වැඩි කරන්න පුළුවන් කියලායි. නමුත් අපනයන ආදායම වැඩි වුණේ නැහැ. පසු ගිය අවුරුදුදේ - 2012- අපනයන ආදායම සියයට 10.7කින් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මොකක්ද වුණේ? අපි ආනයනය කරන තෙල්වලට - ඉන්ධනවලට- ගෙවිය යුතු රුපියල් වටිනාකම වැඩි වුණා. ඇත්තටම ගත්තොත් අපි ආනයනය කරන තෙල්වලට ගෙවිය යුතු වියදම වැඩි වුණා. අන්න ඒක තමයි විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න යන නිෂ්පාදන පිරිවැය වැඩි වෙන්න බලපෑ ප්‍රධාන හේතුව වුණේ. නිෂ්පාදන පිරිවැය වැඩි වුණාම දැන් ඒක එකින් එකට විදුලි බිල වැඩි වෙන්න බලපා තිබෙනවා. ඒක ආර්ථික ප්‍රතිපත්තියත් එක්ක සම්බන්ධයි. මූල්‍ය ප්‍රතිපත්තියත් එක්ක සම්බන්ධයි. විදුලිබල ඇමතිවරයා හෝ ඇමතිවරියට මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කරන්න බැහැ. මූල්‍ය ප්‍රතිපත්තිය සකස් කරන්නේ මුදල් ඇමතිවරයායි. ඒ නිසා අද රටේ විදුලිය ගාස්තු වැඩි වීමට ප්‍රධාන වශයෙන් වග කියන්න ඕනෑ මුදල් අමාත්‍යාංශය භාර මුදල් ඇමතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි.

[ගරු විජිත හේරත් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ ආණ්ඩුව අවුරුදු ගණනාවක් තිස්සේ ගිවිසුම් ගහලා පෞද්ගලික අංශයේ ජාවාරම්කාරයන්ට එහෙම නැත්නම් මාෆියාවට ඉඩ ප්‍රස්ථා දීලා තිබෙනවා. අද විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයා කියනවා පෞද්ගලික අංශය සමඟ ඇති කර ගත් ගිවිසුම් සංශෝධනය නොකිරීම නිසා විදුලිබල මණ්ඩලයට රුපියල් කෝටි 1200ක පාඩුවක් දරන්න සිදු වෙලා තිබෙනවා කියලා. අමාත්‍යාංශයට කරන්න දෙයක් නැහැලු. ඒක විදුලිබල මණ්ඩලයට අයිති වැඩක්ලු. හැබැයි, පසු ගිය දවස්වල විදුලිය ගාස්තු වැඩි කරන කොට නම්, විදුලිබල අමාත්‍යාංශයේ කට්ටිය, මණ්ඩලයේ කට්ටිය, කොමිසමේ කට්ටිය ඔක්කොම එකතු වෙලා තමයි ජාතික රූපවාහිනියේ, ITN එකේ ඒක සාධාරණීකරණය කළේ; හරියි කිව්වේ. දැන් මේක විතරක් මණ්ඩලයට පටවනවා. දැන් විදුලිබල මණ්ඩලයේ සභාපති අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙක්. විදුලිබල මණ්ඩලය පිළිබඳව තීන්දු තීරණ ගන්නේත් මේ ආණ්ඩුව; කැබිනට්ටුව. එහෙම නම් මේ පෞද්ගලික අංශයේ මාෆියාව එතැනින් අයින් කරන්න කැබිනට් මණ්ඩලය මෙතරම් කාලයක් පරක්කු කරන්නේ ඇයි? ඒක තමයි රහස. හිටපු ඇමතිවරුන්ගේ සහ වර්තමාන බොහෝ ඇමතිවරුන්ගේ ආදායම් පිටිපස්සේ ඔය මාෆියාව ඉන්නවා. ඒක තමයි ඇත්ත. මේ කොන්දේසි යටතේ ඔය මාෆියාවත් එක්ක ගිවිසුම් ගැහුවේ කවුද? ඒ මණ්ඩලයේ ඇමතිවරුන්, නිලධාරීන් සහ කැබිනට් මණ්ඩලයෙන් තමයි ඒවා අනුමත කළේ. ඒ ගිවිසුම් විමර්ශනය කරන්න, වැරදි නම් ඒවා වෙනස් කරන්න මේ කැබිනට් මණ්ඩලයට පුළුවන්; ආණ්ඩුවට පුළුවන්. නමුත් අද වන තෙක් ඒක කරන්නේ නැහැ. ඒවා කල් දම දමා යනවා. ඒවා කළොත් ඒවායේ අවාසිය, ඒවායේ commission නැති වන්නේ මේ දේශපාලනඥයන්ටයි. ඒක තමයි ඇත්ත හේතුව. ඒ නිසා විදුලිය ගාස්තු වැඩි කරන්න බලපෑ දෙවැනි කාරණාව වුණු මේ මාෆියාව අහෝසි කරන්නේ නැත්තේ ඇයි? ඒ මාෆියාව වෙනස් කරලා අලුත් ගිවිසුම්වලට යන්නේ නැත්තේ ඇයි? ඒක ප්‍රමාද කරන්නේ ඇයි? ඒක ප්‍රමාද කිරීම තුළ තමයි අර commission ප්‍රමාණය වැඩි වන්නේ; ආදායම් වැඩි වන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට බල කරන්නේ, මේ ගත්ත වැරදි මූල්‍ය ප්‍රතිපත්තිය -රුපියල බාල්දු කිරීම- වහාම අහෝසි කරන්න; වෙනස් කරන්න කියලායි. ඒ එකක්.

දෙවනුව, පෞද්ගලික අංශයේ මාෆියාවත් එක්ක ගහලා තිබෙන ගිවිසුම් වහාම -කඩිනමින්- සංශෝධනය කරන්න ඕනෑ. ඒක ප්‍රමාද කරන එක මේ රටේ ජනතාවට පිළිගන්න පුළුවන් කාරණාවක් නොවෙයි. තුන්වැනි එක තමයි විදුලිබල අමාත්‍යාංශයේ කෝටි ප්‍රකෝටි ගණන්වලින් සිදු වන දූෂණ, වංචා සහ අක්‍රමිකතා. ඒවා දැන් කෝප් වාර්තාවලින් හෙළිදරවු වන දේවල්. හැබැයි, හෙළිදරවු වුණාට ඒවාට ගන්නා ක්‍රියා මාර්ග නැහැ. ඒවා නතර වන්නේ නැහැ. ඉතින් විදුලිබල මණ්ඩලය හැම දාම පාඩුයි. රුපියල් කෝටි ගණනක් පාඩුයි. ඒ පාඩුව ජනතාව මත පටවන එකද ආණ්ඩුවේ උත්තරය? එහෙම නම් ආණ්ඩුවක් මොකටද? යම් කිසි මණ්ඩලයක්, විදුලිබල මණ්ඩලය හෝ බනිජ තෙල් නීතිගත සංස්ථාව පාඩු වන විට ඒ පාඩුව ජනතාව මත පටවනවා නම්, මිල වැඩි කරනවා නම් ඒකට ආණ්ඩුවක් මොකටද? ආණ්ඩුවක් තිබෙන්නේ යම් කිසි ආයතනයක් පාඩු ලබනවා නම්, ඒ පාඩුව නැති කරලා ඒ ආයතනය ලාභදායී තත්ත්වයට පත් කිරීම සඳහා සැලසුම් හදන්නයි; ප්‍රතිපත්ති හදන්නයි; ඒවා ක්‍රියාත්මක කරවන්නයි.

ඒක අද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් හෝ ආණ්ඩුවෙන් කෙරෙන්නේ නැහැ. ඒ නිසා තමයි අද මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් තිබුණු පනතේ තව වගන්තියක් දැන් මේ පනත් කෙටුම්පතෙන් සංශෝධනය වනවා. ඒක තමයි අක්‍රමවත් ලෙස විදුලිය පාවිච්චි කරනවා නම්, නැත්නම් අක්‍රමවත් ලෙස විදුලිය යොදා ගන්නවා නම්, එය පරීක්ෂා කිරීම සඳහා දින තුනකට -පැය 72කට- කලින් දැනුම් දීලා ඒ නිවසට ප්‍රවේශ වීම පිළිබඳව තිබුණු වගන්තිය. ඒක වෙනස් කිරීම හොඳයි. නැත්නම් ඒ පරීක්ෂාවෙන් වැඩක් නැහැ නේ. දවස් තුනකට කලින් දැනුම් දීලා ගියාම හොරෙන් ලයිට් ගන්න කෙනා ඒක වෙනස් කර ගන්නවා නේ. ඒ නිසා ඒ වගන්තිය සංශෝධනය කිරීම හොඳයි. හැබැයි දැන් තිබෙන අලුත් ක්‍රමය මොකක්ද? ඕනෑම වෙලාවක ගිහිල්ලා පරීක්ෂා කරන්න පුළුවන්. හැබැයි පරීක්ෂා කරන්න පුළුවන් කිව්වාම ඔන්න ඔතැන තමයි දැන් ප්‍රශ්නය තිබෙන්නේ. අද මේ රටේ සිටින හොරු, කොල්ලකාරයෝ සහ කප්පම් ගැනීම් එක්ක විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ගේ අනන්‍යතාව සහතික කරන ක්‍රමය මොකක්ද? විදුලිබල මණ්ඩලයේ ලාංඡනය අද ඒ වාහනවල සටහන් කරන්නේ නැහැ. අද පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවන් කාඩ්බෝඩ් කැල්ලක "CEB" කියලා සටහන් කර ගෙන යනවා. හැබැයි විදුලිබල මණ්ඩලයේ වාහනයේ ඒ ලාංඡනය නැහැ. ඒ යන නිලධාරීන්ගේ අනන්‍යතාව හඳුනා ගන්නේ කොහොමද? ඒ නිලධාරීන් ගෙදරට පැනලා එක පාරට ගේ ඇතුළේ, කුස්සියේ, හැම තැනම රිංගා ඒ ගේ පරීක්ෂා කරන්න ගියාම වෙන්න පුළුවන් අලකලංචි මේ රටේ ජනතාවට හිතා ගන්න පුළුවන්. ඒකට ක්‍රමවේදයක් මේ පනත් කෙටුම්පතෙන් හදන්න බැහැ තමයි. හැබැයි ඒකට ක්‍රමවේදයක් ආණ්ඩුව පැත්තෙන් - අමාත්‍යාංශයෙන්- යෝජනා වෙන්න ඕනෑ. එහෙම ක්‍රමයක් දැනට නැහැ. දැනට නැති තත්ත්වය තුළ වෙන්න පුළුවන් බරපතළ සිදුවීම් දැන් තියා අප තේරුම් ගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙන් කර ගන්න බැරි වුණු යම් කිසි තාක්ෂණික දෝෂයන් නැවත සකස් කර ගැනීමක් පමණයි අද මේ කරන්නේ. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ හරය වුණේ විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණයේ දිශාවට ගමන් කිරීම සඳහා වගන්ති සම්මත කර ගැනීමයි. එයට අදාළ කරන තවත් වචන, වගන්ති, පේළි එකතු කර ගැනීමක් මේ අලුත් සංශෝධනය තුළ ඇතුළත් වෙලා තිබෙනවා. හැබැයි විදුලිබල මණ්ඩලය ලාභදායී තත්ත්වයකට, එහෙම නැත්නම් රටේ ජනතාවගේ විදුලි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමේ දිශාවට ගමන් කිරීම සඳහා වුණු සංශෝධනයක් විධියට මේක හඳුනා ගන්න බැහැයි කියලා කියමින් මා නවතිනවා. බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තූතියි, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.11]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතේ හොඳ පැත්ත කියවෙනවා ටිකක් අඩුයි. සාමාන්‍ය මනුස්සයෙකුගේ නිවසකට අලුතෙන් විදුලි දිගුවක් අදින කොට යම් කිසි කෙනෙක් තරහට හෝ කිව්වොත් මේ ඉඩම හරහා අදින්න එපා, එහෙම නැත්නම් අහිංසක මනුස්සයෙක් ගෙදරට විදුලිය ගන්න කොට ඔහුත් එක්ක තිබෙන පෞද්ගලික තරහට විදුලිය ගැනීම සම්බන්ධයෙන් විරුද්ධතාවක් ප්‍රකාශයට පත් කළොත් මෙතෙක් කල් නීතිය තිබුණේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මඟින් ඒ ගැන නිරාකරණයක් කර ගන්නයි. මේ පනත් කෙටුම්පත යටතේ කෙරෙන මේ අලුත් සංශෝධනයෙන් නැවත වරක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ බලය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒක බොහොම හොඳ කටයුත්තක්. විදුලිය

ගන්න ගිය අයට මේ වාගේ ලෙහෙසියෙන් කර ගන්න තිබෙන කටයුතු කලින් නීතිය යටතේ කර ගැනීම බොහොම අමාරු තත්ත්වයකට පත් වෙලා තිබුණු බව අපි දැක්කා. අප කාගේ හරි ගෙදරකට විදුලිය ගන්න තිබුණොත් ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ලේකම්වරිය විදුලි අධිකාරිවරයා සමඟ ගිහිල්ලා පරීක්ෂා කර බලා මෙතැනින් විදුලිය දෙන්න සුදුසුද, නැද්ද කියලා ඒ අයට තීන්දුවක් දෙන්න පුළුවන් මේ සංශෝධනයෙන්. ඒ තීන්දුව දුන්නාම ඒ අයට විදුලිය ගන්න පුළුවන්කමක් ලැබෙනවා. ඒ නිසා අභිංසක කෙනෙකු ඉස්සෙල්ලා තිබුණු ක්‍රමයට විදුලිය ලබා ගන්න ගියොත් ඒ කටයුත්ත කර ගන්න බොහොම අමාරුයි. මේ සංශෝධනය තුළින් මේ කටයුත්ත බොහොම ලෙහෙසියෙන් කර ගන්න පුළුවන්කමක් තිබෙනවා.

මීට ඉස්සෙල්ලා අපි ට්‍රාන්ස්ෆෝමරයක් සවි කරලා ගමකට විදුලිය දෙන්න හදන කොට මේ ට්‍රාන්ස්ෆෝමරය දක්වා අධි බලැති විදුලි රැහැන් එන එකට විරෝධතාව ප්‍රකාශයට පත් කිරීම නිසා මාස ගණනක් ඒ කටයුත්ත කර ගන්න බැරිව ඇදී ඇදී තිබුණා. මම එය අත් විඳලා තිබෙනවා. ඒ, මේ කටයුත්ත කෙරෙන්න ඉස්සෙල්ලා. මේ සංශෝධනය මඟින් ප්‍රාදේශීය ලේකම්තුමා ලබා දෙන තීන්දුවත් එක්ක අපට විදුලිය ලබා ගන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ පනතේ තිබුණු කාරණාත් එක්ක විදුලිය ලබා දෙන්න බොහොම අමාරු වුණා. සමහර ගම්වල අය කැමති නැහැ, තව කෙනෙක් විදුලිය ලබා ගන්නවාට. එතකොට ඒ ව්‍යාපෘතිය නවතිනවා. මේ පනතෙන් ඒ තත්ත්වය වෙනස් කරලා තිබෙනවා. මේ පනත තුළින් මේ රටේ ජනතාවට හොඳ කටයුතු රාශියක් කෙරෙනවා. අපි පසු ගිය දවස්වල ඇමතිතුමියත්, නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක ගිහිල්ලා අපේ ප්‍රදේශවලට විදුලිය ලබා දුන්නා. විදුලිය දෙන්න, දෙන්න පාඩු ලබන ආයතනය තවත් පාඩු ලබනවා.

අපේ ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව සියලු දෙනාටම විදුලිය ලබා දෙන්නයි. -සැමට විදුලිය - සැමට විදුලිය ලබා දෙන කොට සැම දාම විදුලිය තිබෙන්න තමයි දෙන්නේ. ඉස්සර විදුලිය දෙනවා. ඒ දුන්නත් දවස් කිහිපයක් යන කොට රටේම විදුලිය නැති වෙනවා. ඒ තත්ත්වය නැති කරන්න අපි බලාගාර කිහිපයක් අලුතෙන් හැදුවා. නොරොච්චෝලේ බලාගාරය, කෙරවලපිටිය බලාගාරය වාගේ ගල් අඟුරු බලාගාර ඇති කළා. ඒ වාගේම දැන් සුළං මඟින් විදුලිය නිෂ්පාදනය කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මේ සියල්ලෙන්ම බලාපොරොත්තු වෙන්නේ අඩු වියදමකින් විදුලිය නිෂ්පාදනය කරන්නයි. අපේ ආණ්ඩුව කොහොමත්ම කැමති නැහැ, විදුලි බිල වැඩි කරන්න. හැබැයි, විදුලි බිල වැඩි කළාට පස්සේ අපි දැක්කා, ගොඩක් දෙනෙක් අරපිරිමැස්මෙන් විදුලිය පරිභරණය කරන හැටි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ගෙදර ළඟ සිටින මගේ ඥාතිවරයකුගේ විදුලි බිල මට පෙන්වූවා. මැයි මාසයේ ඔහුගේ බිල තිබුණා, රුපියල් 3,182ක්. ඔහුට ඒකක 185ක් ගිහින් තිබුණා. හය වැනි මාසයේ -ජූනි මාසයේ- ඔහුගේ බිල රුපියල් 318යි; ඒකක 51යි. මම ඇහුවා, මොකක්ද හේතුව කියලා. අවශ්‍ය නැති කටයුතුවලින් ඇත් වුණා කිව්වා. මම කිව්වා, මොකක් හරි වැරැදීමක් වෙලා වෙන්න ඇති, ඊ ළඟ බිල බලන්න කියලා. ඊ ළඟ බිල ඇවිල්ලා තිබෙනවා, දැනට දවස් දෙකකට ඉස්සෙල්ලා. ඒකට ඇවිල්ලා තිබෙන්නේ රුපියල් 340යි; ඒකක 55යි. අරපිරිමැස්මෙන් විදුලිය පරිභෝජනය කළොත් ඉතුරුවක් කර ගන්න පුළුවන්. විදුලි බිල අඩුවට තියෙන්න තියෙන්න පරිභෝජනය වැඩියි. මගේ ගෙදරට රුපියල් හාර දහස් ගණනක් ආපු විදුලි බිල මේ මාසයේ රුපියල් 915යි. මගේ බිලත් අඩු වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි අරපිරිමැස්මෙන් කටයුතු කරපු එක.

විදුලි බිල සම්බන්ධයෙන් ඇමතිවරු ගැන ගොඩක් දේවල් කියලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගේ වටේට සවි කරලා තිබෙන විදුලියටත් ආණ්ඩුවෙන් සල්ලි ගෙවනවා. හැබැයි, ඒක කවුරුවත් කියන්නේ නැහැ. ඒකට පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයෙන් මුදල් ගෙවනවා. අපේ ආරක්ෂාව සඳහා විදුලි ලාම්පු හතරක් සවි කරලා තිබෙනවා. ඒකේ වියදම රජයෙන් ගෙවනවා. හැබැයි ඇමතිවරු ගැන විතරක් පත්තරේ පළ වෙලා තිබෙනවා. නමුත් මන්ත්‍රීවරුන්ටත් එහෙම වරප්‍රසාදයක් හිමි වෙලා තිබෙනවා. මගේ ගෙදර වටේත් එහෙම සවි කරලා තිබෙනවා. ඒක කවුරුවත් කියන්නේ නැහැ. මම දන්නේ නැහැ, අනෙක් අයගේ ගෙවල්වල විදුලි ලාම්පු සවි කරලා නැද්ද කියලා. එහෙම සවි කරලා තිබෙනවා. ඕනෑ නැත්නම් සවි නොකර නිකම් ඉන්නත් පුළුවන්. ගොඩක් වෙලාවට ඇමතිවරුන් සම්බන්ධ මොකක් හරි එකක් තිබුණොත් ඒක කියනවා. නමුත් ඒ පහසුකම මන්ත්‍රීවරුන්ට තිබුණත් කියන්නේ නැහැ. ඒ නිසා කාටහරි යමක් හම්බ වෙනවා නම් ඒක කියන්න ඕනෑ. මගේ ගෙදර සවි කරපු ඒ විදුලි ලාම්පුවලට යන විදුලි බිල මම ගෙවන්නේ නැහැ. ඒක රජයෙන් ගෙවනවා.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතට හොඳ සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, දින තුනකට කලින්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

ගරු නියෝජ්‍ය කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ශාන්ත බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு சாந்த பண்டார அவர்கள் *அக்கிராசனத்திலிருந்து அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SHANTHA BANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් නැඟුවා, මේ සංශෝධන ගෙන එන්නට ප්‍රථම කවුරු හරි කෙනෙක් හොරෙන් විදුලිය ගන්නවා නම් ඒ ගැන බලන්න දින තුනකට කලින් යන්න ඕනෑ, දැන් මේ සංශෝධනය අනුව එහෙම ඕනෑ නැහැ, ඕනෑ වෙලාවක ගිහින් බලන්න පුළුවන් කියලා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඒකට වෙලාවක් දීලා තිබෙනවා. එහෙම යන්න පුළුවන් උදේ අටත් ඒ වාගේම හවස හයත් අතර පමණයි.

ඒ වෙලා ගිහිල්ලා ඒ වැඩේ කරන්න බැහැ. උදේ 8.00ත් හවස 6.00ත් අතර තමයි යන්න අවසර දීලා තිබෙන්නේ. අපි ගරු ඇමතිතුමියගෙන් ඉල්ලනවා, එහෙම යන අයට තමන්ගේ හැඳුනුම් පත හෝ ලංකා විදුලිබල මණ්ඩලයෙන් නිකුත් කරපු හැඳුනුම් පත හෝ සමඟ යන්න කියන්න කියලා. එහෙම නැති වුණොත් ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියපු දේ වෙන්න පුළුවන්. කෙසේ වෙතත්, රාත්‍රී කාලයේ යන්නේ නැහැ. යා යුතු වෙලාව මෙහි සඳහන්ව තිබෙනවා. මේ සංශෝධන මඟින් වැඩි වශයෙන් බලාපොරොත්තු වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ජනතාවට වැඩි සේවයක් ලබා දෙන්නයි.

[ගරු ජානක වක්කුඹුර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දවස්වල වැස්සයි, හුළඟයි තිබුණා. ඒවා නිසාත් ලංකා විදුලිබල මණ්ඩලයට ගොඩක් පාඩු වුණා. වැහැලා ජලාශවල වතුර පිරුණා වාගේම ගස් කොළන් කඩා වැටිලා, විදුලිය විසන්ධි වෙලා විදුලිබල පද්ධතිය යථා තත්ත්වයට පත් කරන්න ලංකා විදුලිබල මණ්ඩලයට ලොකු මුදලක් වැය කරන්න සිදු වුණා. වැහි ඇල්ලක් හරි, සුළඟක් හරි ආවොත්, ඒකෙනුත් ලංකා විදුලිබල මණ්ඩලයට පාඩුවක් වෙනවා. එක පැත්තකින් ලාභ ලබනවා වාගේම, තව පැත්තකින් පාඩුවක් වෙනවා. හැබැයි පාඩු වන ආයතනයක් යම් වෙලාවක ලාභයක් ලබන කොට ඒ ලාභයත් ආපසු දෙන්න ගියොත්, හැම දාම ඒ ආයතනයට පාඩුවටමයි දුවන්න වෙන්නේ. අපි හිතනවා ඉදිරියේදී ගල් අඟුරු බලාගාරවලින්, ඒ වාගේම සුළං බලාගාරවලින් අලුතින් විදුලිය නිෂ්පාදනය කරන කොට ජනතාවට මීට වඩා සහනයක් ලබා දෙන්න පුළුවන්කමක් ලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන කොට, "සැමට විදුලිය" වැඩසටහන යටතේ මේ රටේ සියයට 90කට විතර විදුලිය ලබා දීලා තිබෙනවා. මේ වන කොට බොහෝ මැතිවරණ කොට්ඨාසවල විදුලිය සැපයුම සියයට සියය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කරන කටයුත්ත කරගෙන යනවා. විදුලිබල පහසුකම නැති අයට විදුලිය ලබා දුන්නේ නැත්නම් ඒ පසුකම නැතිවත් ඒ අය විදුලිබල මණ්ඩලයේ පාඩුවේ කොටස්කරුවන් වෙනවා. මීට ඉස්සර වෙලා මේ රටේ සියයට 60කට විතර විදුලිය සපයා තියෙද්දී, විදුලිය පහසුකම නැති කෙනාත් ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුවේ කොටස්කරුවෙක් වෙලා තිබෙනවා. ඒ අයටත් විදුලිය දීලා තමයි ඒ අය මේ පාඩුවේ කොටස්කරුවන් කර ගන්න ඕනෑ. කොහේවත් හඳුනා ගෙන නැහැ, "මෙයාට විදුලිය පහසුකම නැහැ. විදුලිය පහසුකම නැති කෙනාගෙන් මේ පාඩුව පියවා ගන්නේ නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීටර් 50ක් දක්වා රැහැන් සම්බන්ධතාව නොමිලේ ලබා දීලා එක කණුවක් දාලා තමන්ගේ ගෙදරට විදුලිය ගන්න පුළුවන් මට්ටමට විදුලිය ලබා ගැනීමේ කටයුත්ත අද ලේසි කර දීලා තිබෙනවා. ඒ වාගේම සමෘද්ධිලාභී අයට සමෘද්ධිය හරහා විදුලිය ලබා දෙන්නත්, ඒ සඳහා වැය වූ මුදල විදුලිය බිල සමඟ අය කර ගන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ලොකු පිරිවැයක් දරන්නේ නැතිව සමෘද්ධිලාභීන්ට විදුලිය ලබා ගන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා. රටට අත්‍යවශ්‍ය දෙයක් තමයි විදුලිය. මෙහිදී මීටත් වඩා හොඳට කටයුතු කරන්න-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
The Hon. Ravi Karunanayake is taking photographs inside the House. What is the conspiracy he is hatching? Sir, confiscate that camera.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, please do not take photographs inside the Chamber.

ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යන්න ගරු ඇමතිතුමියටත්, රජයටත් ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 4.22]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී, මෙම සංශෝධන පිළිබඳව කරුණු කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. එක කාරණයක් තමයි, ලංකා විදුලිබල මණ්ඩලයෙන් නිවෙස්වලට ගිහිල්ලා මීටරය කියැවීම පිළිබඳව ගෙනෙන සංශෝධනය. ඒ සංශෝධනයට අපි එකඟයි. එය බොහොම හොඳයි කියන්න ඕනෑ. ඒ සඳහන් කාල සීමාව තුළ ඒ කාර්යය ඉටු කරන එක හොඳයි. මොකද, එසේ නොවීම නිසා නිවාසවල නොයෙකුත් ප්‍රශ්න, අර්බුද ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාරණයක් තමයි, විදුලිය නිෂ්පාදනය කරන ආයතනවල, ව්‍යාපාරවල අයිතිය පිළිබඳ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය ගැන අපට තවම පැහැදිලි පිළිතුරක් ලැබිලා නැහැ.

ඇමතිතුමිය කථා කරන වෙලාවේ ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරයි කියලා මා හිතනවා. මේ රජය ඒ ව්‍යාපාරවල අයිතියක් ලබා ගන්නවා නම්, යම් කොටස් ප්‍රමාණයක් ගන්නවා නම් ඒ කොටස් ප්‍රමාණය කොපමණද කියලා පැහැදිලි පිළිතුරක් තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් සිද්ධ වන්නේ එක් එක් කෙනාගේ මුහුණ බලා කොටස් දෙනවාය කියන හැඟීමක් සමහර අය තුළ ඇති වන එකයි. ඒක හොඳ නැහැ. එම නිසා ඒ පිළිබඳ පිළිතුරක් මා බලාපොරොත්තු වනවා.

මෙම සංශෝධන ඉදිරිපත් කළත්, මා හිතන හැටියට අද මේ රටේ ජනතාවට තිබෙන විශාලම ප්‍රශ්නය විදුලි බිලයි; විදුලියට ගෙවන ගාස්තුවයි. විදුලි බිල වැඩි කරන්න පෙරත්, විදුලි බිල වැඩි කළාට පසුවත් නිකුත් කරන ලද විදුලි බිල් පත් කිහිපයක් මා සෝදිසි කර බැලුවා. ඒකක ගණන අනුව ගාස්තුව වෙනස් වනවා. නමුත් සමහර නිවාසවල විදුලිය ගාස්තුව සියයට 26කින්, සියයට 27කින් ඉහළ ගිහින් තිබෙනවා. මා තවදුරටත් තවත් සමහර නිවාසවල මාර්තු මාසයේ සිට මැයි මාසය දක්වා විදුලිය බිල් පත් සෝදිසි කර බැලුවා, එම ගාස්තු ප්‍රමාණය සසඳන්න ඕනෑ නිසා. එම බිල් පත් අතර, ගාස්තුව සියයට 56.32කින් වැඩි වුණු අවස්ථාවනුත් තිබෙනවා. මේ තුළින් මා කියන්න යන්නේ, සමහර අයට රුපියල් 1,000කින්, සමහර අයට රුපියල් 2,000කින්, රුපියල් 3,000කින් විදුලි බිල වැඩි වෙලා තිබෙන බවයි. රුපියල් 15,000ක වැටුපක් ලබන කෙනකුට රුපියල් 3,000කින් විදුලි බිල වැඩි වුණාය කියන්නේ, එම විදුලි බිල ගෙවන්න ඔහුගේ අදායමෙන් වැඩිපුර සියයට 30ක් යනවාය කියන එකයි. ඉතින් ඒකයි මේ රටේ තිබෙන විශාලම ප්‍රශ්නය.

මේ රටේ ගල් අඟුරු බලාගාර ගොඩ නඟපු දවසකට විදුලි බිල පහළට එයි කියන පොරොන්දුව, බලාපොරොත්තුව අවුරුදු 10කට වැඩි කාලයක සිටම ජනතාව කෙරෙහි ඇති කළා. අපට කිව්වා, ගල් අඟුරු බලාගාර ඇති කළාම විදුලිය ඒකකයක් රුපියල් 3.50ට ලබා ගන්න පුළුවන්ය කියලා. නමුත් අපි දන්නවා, ඇත්තටම ඒක සිදු වුණේ නැහැයි කියලා. මොකද, අපි දන්නවා, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ආරම්භ කරන කොට එහි නිෂ්පාදනය කරන විදුලිය ඒකකයක මිල රුපියල් 13ත් ඉක්මවා ගියාය කියලා. විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න අපි හිතනවාට වඩා විශාල මුදලක් වැය වනවා. අපි දන්නවා, ගල් අඟුරු භාවිතය පරිසර දූෂණයට බලපානවාය කියලා. ඒ වාගේම ජලාශ අවට ගල් අඟුරු භාවිත වනවා නම් -නොරොච්චෝලේ වාගේ ප්‍රදේශවලත්, අනික් ප්‍රදේශවලත් මේක වන්න පුළුවන්.- ඒ ජලයේ උෂ්ණත්වය ඉහළ යනවා. එතකොට එහි සිටින ජල ජීවීන් විනාශ වනවා. ගල් අඟුරු භාවිතය නිසා පරිසර දූෂණය ඇති වනවා; ජලාශවල ප්‍රශ්න ඇති වනවා; ඒ අවට ජීවත් වන මිනිසුන්ට අහිතකර සෞඛ්‍ය තත්ත්වයන්, රෝග තත්ත්වයන් ඇති වනවා. මෙවැනි තත්ත්වයක් ලංකාවේ ඇති වෙලා තිබෙනවාය කියා මා කියන්නේ නැහැ. මොකද, අපේ විදුලි බලාගාරය මෑතකදී ඇති කරපු එකක් නිසා.

Utilities Commission" because this Commission made a tariff revision. It called for public representations over 100 or 200 people's representations and in April this year, made a recommendation against all public opinions, against all representations. But, on the 1st of May since His Excellency the President went back on that and gave what is called a promise, a "May Day promise", the Public Utilities Commission or rather the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Utilities Commission of Sri Lanka" has now changed its tune. After having not listened to the representations from experts, from the members of the public - [*Interruption.]*

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Today, we are discussing the Sri Lanka Electricity (Amendment) Bill.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am discussing the conduct of the Public Utilities Commission of Sri Lanka, not the conduct of the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

I am saying the Public Utilities Commission of Sri Lanka is not doing its job listening to the public, but it is listening to the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

So, I am not discussing the conduct of the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

I am discussing the conduct of that Commission in wrongly following the dictates of the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

It should not be doing that. [*Interruption.*] - That is why it is now called the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Utilities Commission of Sri Lanka".

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He being a lawyer must know that he cannot make an innuendo on the conduct of the President. That must be expunged.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Now, what has happened as a result is that the Public Utilities Commission has also become like that Select Committee -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Madam, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක? [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හරි ලජ්ජයි. මේ ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අයියෝ! මෙතුමාව defend කරනවා නේ.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Select Committee that has been appointed is also not a Parliamentary Select Committee but a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Select Committee" - [*Interruption.*] Therefore, Madam, I say the same lack of confidence that the PUCSL and the - [*Interruption*.]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වාඩි වෙන්න, වාඩි වෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අසත්‍ය කියන්න එපා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එම ප්‍රකාශය තුළ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට පටහැනි යම් දෙයක් තිබෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනවා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I will conclude now. ස්ථාවර නියෝගවලට පටහැනි කිසිම දෙයක් නැහැ. මම කියන්නේ PUCSL ගැන විතරයි. ගරු ජනාධිපතිතුමා ගැන මම කිසිවක් කිව්වේ නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නැහැ, කිව්වා. [*Interruption.*] You are a lawyer.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I was only discussing the conduct of the PUCSL, not

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Hon. Azwer, you sit down. You cannot understand this. So, you sit down.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You cannot take us for a ride.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I was saying that even what is called the Parliamentary Select Committee, the PSC, does not stand for Parliamentary Select Committee, it stands for

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Select Committee." Now, Madam, there is a serious lack of confidence in these institutions of the Executive, of the Commissioner of Elections**,** of the PUCSL, of the Ceylon Electricity Board, of -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Madam, I rise to a point of Order.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
What is your point of Order? All these tariff revisions that we are discussing today have brought the confidence of the public -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Madam, the PSC was appointed or the names to the PSC were duly announced by the Hon. Speaker of this House. So, it is a Parliamentary Select Committee, not a Presidential Committee. He does not know the difference being a lawyer. What type of lawyer is he if he does not know the difference between a Parliamentary Select Committee and a Presidential Committee? This is the Parliamentary Select Committee appointed by the Hon. Speaker. He is almost bringing an indictment on the Hon. Speaker also. That must be expunged. Ask him to withdraw that. [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එම ප්‍රකාශය තුළත් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට පටහැනි දෙයක් තිබෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරනවා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
ස්ථාවර නියෝගවලට පටහැනි කිසිම දෙයක් නැහැ.

All that I am saying is, the Parliamentary Select Committee that was appointed is known as the

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

Select Committee". That is all I am saying. It cannot denigrate that; it can only lift its image. [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
Do not get his advice.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Hon. Chief Government Whip - [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, බාධා නොකර ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Hon. Chief Government Whip, without sitting on the front row, is sitting next to the Hon. Azwer and winding him up. That is the cause for all this interruption. If the Hon. Chief Government Whip sat in the front row, none of these disturbances would occur. It is only because he is sitting next to the Hon. Azwer and giving - [*Interruption.*] Ah! There is another honourable - [*Interruption.*] No, no. He is very quiet. The Hon. Chief Government Whip must take his due place in the front row without sitting with troublemakers at the back. [*Interruption*.]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කිරීමට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මෙතුමාට ලබා දී තිබුණු කාලය ඉවරයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Okay. Madam Presiding Member, I was saying that the tariff revision on electricity went through such a process that the confidence of the public in how this processes are done have suffered a great setback and even the promise made on the 1st of May, has been greatly misunderstood by the Ceylon Electricity Board. They have not adhered to the promise that was given to the people. In any case, whatever concession that is said to be given for those who consume less than 60 units or less is immaterial because if there is a refrigerator in a house, it will definitely exceed 61 units. If you exceed 61 units, that relief is not available. According to a survey done in 2011, 56 per cent of the households in Sri Lanka have refrigerators.

So, Madam Presiding Member, the whole manner in which the electricity tariff revision was approached can be compared to what I spoke of for most part of my speech - the Government's attempted reconciliation. All the wrong directions in which they have gone is emblematic of how they have handled the electricity tariff revision. That is why when the Sri Lanka Electricity (Amendment) Bill is being considered today, the 23rd of July, 2013, 30 years after the Black July - 1983, I thought it is appropriate to draw a parallel between the two and place that before the House.

Thank you very much.

[අ.භා. 5.43]

ගරු ෆිලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. එතුමා කථා කළේ political powers ගැනයි. කියන්න කනගාටුයි, සමහර විට එතුමාට current එක වැදිලාද දන්නේ නැහැ ඒ විධියට කථා කළේ. ඒක මට හිතා ගන්නත් බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කෙසේ වෙතත් මම මේ සංශෝධන පනත් කෙටුම්පත ගැන කියන්න ඕනෑ. මේ ගැන කථා කළොත්, මේක කාලීන අවශ්‍යතාවක් විධියට තමයි අපි දකින්නේ. ඒ කාලයේ අපේ රටේ තිබුණු තත්ත්වය මට මතකයි. ඒ කාලයේ මා විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය ඇමතිවරයා වශයෙනුත් කටයුතු කළා. 2005 දී රජය උත්පාදනය කළේ විදුලිය ගිගාවොට් 5,337යි. ලොකු ගණනක් නොවෙයි. පෞද්ගලික අංශය ගිගාවොට් 3,423ක් උත්පාදනය කළා. ඊළඟට 2005 දී රජය සහ පෞද්ගලික අංශය එකතු වෙලා ගිගාවොට් 8,700 ගණනක් නිෂ්පාදනය කළා. එපමණයි නිෂ්පාදනය කළේ. නමුත් අපට මතක් වෙනවා, ඒ කාලයේ -1984 කාලයේ- ගෘහස්ත විදුලි අවශ්‍යතාවෙන් සියයට 40ක්, 45ක් විතර තමයි සපයන්න පුළුවන් වුණේ. අද එය සියයට 95ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. පොඩි ගණනක් නොවෙයි. ඉතින්, මේ රජයේ ප්‍රතිපත්තිය කුමක්ද කියලා ඒකෙන් අපට පෙනෙනවා. මේ රජයේ ප්‍රතිපත්තිය තමයි "හැමටම විදුලිය" කියන එක. "සමාජවාදය" කියන එකට වෙනත් වචනයක් විධියට ලෙනින් පාවිච්චි කළේ "විදුලිය ලබා දීම" කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදුලිය ලබා දීම තුළ අද ඇති වෙලා තිබෙන වෙනස සහ විදුලිය පාවිච්චි කරන ප්‍රමාණය දෙස බැලුවොත් නොපෙනෙන පැතිත් ගොඩක් තිබෙනවා. විදුලිය පාවිච්චි වෙන්නේ කොහොමද කියලා මම බැලුවා. ලංකාවේ ජනගහනය කෝටි 2යි. මේ වෙන කොට පාවිච්චි කරන ජංගම දුරකථන ගණනත් කෝටි 2 ඉක්මවා ගිහින් තිබෙනවා. දවසකට ජංගම දුරකථන කෝටි දෙකක් recharge කරන්න ඕනෑ. Packages නම් ඕනෑ තරම් තිබෙනවා. මල් package කියනවා, low-package කියනවා, double-package කියනවා, couple package කියනවා. සහන ගොඩක් ගැන කියනවා. නමුත් ඒ සහන දෙන්නත් ඒවා recharge කරන්න ඕනෑ. අද මෙන්න මෙවැනි තත්ත්වයකට මේ රට පත් වෙලා තිබෙනවා. මේ රටේ තිබෙන විවෘත ආර්ථිකයත් එක්ක, තමුන්නාන්සේලා හදපු විවෘත ආර්ථිකයත් එක්ක අද මේ රටේ ජනතාව විදුලි බලයෙන් ක්‍රියා කරන භාණ්ඩ විශාල වශයෙන් පරිභෝජනය කරනවා. ඒකට උදාහරණ මොනවාද? ගුවන් විදුලි යන්ත්‍රවලින් සියයට 84ක් බස්නාහිර පළාතේ තිබෙනවා. ඌව පළාතේ තිබෙන්නේ සියයට 7.6යි. රූපවාහිනී යන්ත්‍රවලින් සියයට 85ක් බස්නාහිර පළාතේ - අපි ඉන්න පළාතේ- තිබෙනවා. ශීතකරණවලින් සියයට 53ක් බස්නාහිර පළාතේ තිබෙනවා. ඌව පළාතේ තිබෙන්නේ සියයට 11යි. මහණ මැෂින්වලින් සියයට 5.8ක් බස්නාහිර පළාතේ තිබෙනවා. ඌව පළාතේ තිබෙන්නේ සියයට 2.8යි. රෙදි සෝදන යන්ත්‍රවලින් සියයට 17ක් බස්නාහිර පළාතේ තිබෙනවා. ඌව පළාත අරගෙන බැලුවොත් සියයට 2යි තිබෙන්නේ. නොදියුණුම පළාත ඌව පළාත කියා තමයි බොහෝ දෙනෙක් කිව්වේ. මේවා ගැන කල්පනා කරලා බලන්න. තමන්ගේ ආර්ථික තත්ත්වය මොකක් වුණත් ඉතා පහසුවෙන් වැඩ කර ගන්න හැම කෙනෙක්ම විදුලි උපකරණ භාවිත කරනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. නමුත් මේකට විකල්ප බල ශක්තියක් අවශ්‍යයි.

ඒ කාලයේ අපි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදද්දී පරිසර දූෂණය වෙනවාය කියා කතෝලික සභාවත් විරුද්ධ වුණා; තවත් බොහෝ අය විරුද්ධ වුණා. නමුත් අද නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදා මේ වනකොට විශාල විදුලි බලය ප්‍රමාණයක් උත්පාදනය කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. ජල විදුලියෙන් අපට ලැබෙන්නේ මෙගාවොට 1350යි. අපි පටන් ගත් කොත්මලේ බලාගාරයෙන් මෙගාවොට 150ක් අලුතින් නිෂ්පාදනය කරනවා. නොරොච්චෝලෙන් මෙගාවොට 350ක් නිෂ්පාදනය කරනවා. කෙරවලපිටිය බලාගාරයෙන් මෙගාවොට 270ක් නිෂ්පාදනය කරනවා. කෙරවලපිටිය බලාගාරය සඳහා අපි හොඳ oil එකක් පාවිච්චි කළා. ඒ නිසා වියදම වැඩි වුණා. මොකද, පරිසරයට උචිත වන විධියට පාවිච්චි කරන්නය කියා පරිසර සංවිධානවලින් කිව්වා. මා විදුලි බල නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියදී දකුණේ සුළං විදුලි බලාගාර කිහිපයක් ආරම්භ කරන්නට කටයුතු කළා මට මතකයි. එතැනදීත් පරිසර සංවිධාන ඊට විරුද්ධ වුණා. කුරුල්ලෝ මැරෙනවාය කියා ඒ අය ඊට විරුද්ධ

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

වුණා. පරිසරයත් ආරක්ෂා කර ගෙන ජනතාවට පහසු මිලට විදුලිය ලබා දෙන්නට අද අපට සිදු වෙලා තිබෙනවා. විදුලි බලය සඳහා වන වියදමෙන් සියයට 80ක්ම වියදම් වෙන්නේ තෙල් සඳහා වන නිසා මේ කටයුත්ත කළ යුත්තේ කොහොමද කියන එක කල්පනා කරන්න වෙනවා. ඇත්ත වශයෙන්ම ඒ සඳහා විකල්ප බල ශක්ති උපයෝගී කර ගන්නට වෙනවා. විකල්ප බල ශක්ති උපයෝගී කර ගැනීම ගැන හොල්සිම් එක අපට උදාහරණයට ගන්න පුළුවන්. ඉස්සර හොල්සිම් එකේ සිමෙන්ති නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා oil එකක් පාවිච්චි කළා. පසු කාලයකදී ත්‍රිකුණාමලය පැත්තෙන් ගල් අඟුරු ගෙනැල්ලා, ඒ ගල් අඟුරු භාවිතයෙන් සිමෙන්ති නිෂ්පාදනය කිරීම නිසා ඒ අය රුපියල් මිලියන 400ක් ඉතුරු කර ගත්තා. දැන් ඒ ගොල්ලෝ මොනවාද කරන්නේ? සිමෙන්ති නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා කාර්මික අපද්‍රව්‍ය පාවිච්චි කරලා ඒ සඳහා යන වියදමෙන් තවත් රුපියල් බිලියනයක් අඩු කර ගෙන තිබෙනවා. ඒවා උදාහරණයට ගන්නය කියා මම කියන්න කැමැතියි. එවැනි කරුණු කාරණා ගැන තමයි අපි කථා කළ යුත්තේ. ඒ මිසක් නිකම් බොරුවට ආණ්ඩුවට බැණලා අනම් මනම් කියලා හරියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉදිරිපත් කරන පනත් කෙටුම් පත්වේ තිබෙන්නේ විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයුම භාවිත කිරීම විධිමත් කිරීම යනාදී කාරණායි. ඒ වාගේම මෙපමණ කාලයක් පෞද්ගලික විදුලි බලාගාර සඳහා licence එකක් තිබුණේ නැහැ. නමුත් මේ පනත් කෙටුම්පත මඟින් ඒ licence එක දීමට කටයුතු කර තිබෙනවා. ඊ ළඟට එක තැනක ඉඳලා තව තැනකට ලොකු line එකකින් විදුලිය ගෙන යනකොට එතැනදී වාෂ්ප වෙලා යන විදුලි බල ප්‍රමාණයත් - transmission loss එකත්- විදුලි බල මණ්ඩලය අඩු කර ගෙන තිබෙනවා. ඒ ප්‍රමාණය තවත් අඩු කර ගන්න පුළුවන්. LECO එක කරන්නේ විදුලි බලය තොග ගණනේ අර ගෙන එතැන ඉඳලා නගරාසන්න ස්ථානවලට විදුලි බලය බෙදා හරින එකයි. නගරාසන්න ප්‍රදේශවල එක ගෙයක් තව ගෙයකට ඉතා ළං වෙන්න තමයි පිහිටා තිබෙන්නේ. එතකොට ඒ ගොල්ලන්ගේ waste එක, transmission loss එක අඩු කර ගන්න පුළුවන් වෙනවා. නමුත් මුළු රටටම විදුලිය දීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා සමහර විට කිලෝ මීටර් 15, 20 තරම් ඈතට ගිහින් ගම්වලට විදුලි බලය ලබා දෙන්න දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා. එතකොට waste එක ගොඩක් වැඩියි. ඉතින් මේක කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක කල්පනා කරන්න ඕනෑ.

සැමටම විදුලිය දෙද්දී අපට ඉන්ධනවලට සියයට 80ක් වැය වනවා නම්, ඒ ඉන්ධන අපේ රටේ නිෂ්පාදනය වෙන්නේ නැත්නම්, වෙනත් විකල්ප බලශක්ති ක්‍රම අපට උපයෝගී කර ගන්න වෙනවා. තමුන්නාන්සේලා කොච්චර තර්ක කළත්, කොච්චර දොස් කිව්වත් යථාර්ථය ඒකයි කියන එක මතක් කරන්න ඕනෑ. ඒ යථාර්ථයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඉස්සර යාපනයේ විදුලිය ලබා ගත්තේ generatorsවලින්. දැන් රැහැන් මඟින් විදුලි බලය දෙන්න ලෑස්ති කර තිබෙනවා. ඒ වාගේම ජලයත් ලබා දෙනවා. මට මතකයි, ඒ කාලයේ මන්නාරම පාරේ විදුලි කණු දාපුවම විරෝධය පළ කෙරුවා. කණු ටික හිටුවා ගන්න හම්බ වුණේ නැහැ. මඩු පල්ලියට, මන්නාරමට, තලෙයි මන්නාරමට විදුලිය සපයන්න ගියාම ලොකු බාධාවක් තිබුණා ත්‍රස්තවාදීන්ගෙන්. Electricity Board එකේ අය භයෙන්, භයෙන් ජීවිත පරවුවට තියලා තමයි කණු ටික හිටෙව්වේ. අද මොනවාද ඒ ගැන කියන්නේ? අද කියන්න දෙයක් නැහැ. ඒ නිසා බොරුවට ත්‍රස්තවාදය ගැන කථා කරන්න එපා. ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව මේ රටට කර තිබෙන වැඩ ටික හරියට තක්සේරු කළොත්, නැවත වරක් ත්‍රස්තවාදය ඕනෑද කියන කාරණය සුමන්තිරන් මන්ත්‍රීතුමාට සිතන්න පුළුවන්. "කොහේටද අපි යන්නේ?" කියලා කල්පනා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ ඡන්දය තිබෙන නිසා එතුමා දැන් දේශපාලන කථාවක් කළා, අන්තර්ජාලයට යන්න. ඒක තමයි පරමාර්ථය.

අද විදුලිබල අමාත්‍යාංශය ගැන කථා කරද්දී, විදුලි බලය ගැන කථා කරද්දී, එතුමා කථා කළේ වෙනත් බලයක් ගැන. දේශපාලන බලය ගැනයි එතුමා කථා කළේ. ඒක කොහොමද මේකට සම්බන්ධ වන්නේ? ඒකෙන්ම තේරෙනවා, ඒ අය වක්‍රව මොන තරම් නම් මේ ජාතිවාදී ප්‍රශ්නයට උඩ ගෙඩි දෙනවාද කියලා. අපි ඒවා ගැන කල්පනා කරන්න ඕනෑ.

විශේෂයෙන්ම විදුලි බලය ග්‍රාමීය ප්‍රදේශවලට ගෙන යෑමේදී අපට ලොකු පාඩුවක් සිදු වෙනවා. දැන් LECO එක තිස්තුන්දහසේ line එකෙන් විදුලිය ගෙනැල්ලා, එකොළොස්දහසේ line එකට අඩු කරලා, ඒකෙන් තමයි වොට් දෙසියනිහ දෙන්නේ. එතකොට පාඩුව අඩුයි; transmission loss එක අඩුයි. Transmission loss එක අඩු කරන්න සිංගප්පූරුව භාවිත කර තිබෙන ක්‍රමය තමයි underground cableවලින් විදුලිය ලබා දීම. ඒකට විශාල මුදලක් අවශ්‍ය වෙනවා. ඉතින් මේවාට ආයෝජනය කරන්නත් ඕනෑ; ජනතාවට විදුලිය දෙන්නත් ඕනෑ; විදුලි බලාගාර ක්‍රියාත්මක කරන්නත් ඕනෑ. විදුලි බලාගාර ක්‍රියාත්මක කරලා සමහර විට ඒකෙන් පාඩුවක් වුණත්, මුළු රට පුරාම කර්මාන්ත ඇති වෙනවා. දැන් තමුන්නාන්සේලා කියනවා, ඇඟලුම් කම්හල් ඇති කරන්න කියලා. මොනවායින්ද ඒවා වැඩ කරන්නේ? හාල් මෝල් දමන්න කියනවා. මොනවායින්ද ඒවා වැඩ කරන්නේ? නමුත් දැන් විකල්ප බලශක්තිය ඒ සඳහා පාවිච්චි කරනවා. අද ලංකාවේ තිබෙන ලොකුම හාල් මෝල් දෙකක් වීවල තිබෙන නිවුඩුවලින් විදුලි බලය උත්පාදනය කර ගෙන යනවා. ඉතින් මේවාට ආණ්ඩුව උදව් කරන්න ඕනෑ; ශක්තිය දෙන්න ඕනෑ; සහන දෙන්න ඕනෑ. සමහර farmsවලත් ඒ දේ කරන්න පුළුවන්. නමුත් ඒ අය තවමත් ලේසියට මේ current එක භාවිත කරනවා. නමුත් පුළුවන් වෙන්න ඕනෑ, biogas හදලා තමුන්ගේම විදුලිය නිෂ්පාදනය කරගෙන විදුලි බිල අඩු කර ගන්න.

අද උදේ ජනාධිපතිතුමාගේ අතින් විවෘත වුණා, බියගම ප්‍රදේශයේ ලොකු ජල යෝජනා ක්‍රමයක්. මම ඒ අයගෙන් ඇහුවා, current බිල වැඩි වුණාට පස්සේ මොකක්ද ඔයගොල්ලන්ගේ තත්ත්වය කියලා. "අපි ඒක කර ගත්තා" කිව්වා. මම engineerගෙන් ඇහුවා, ඒ කොහොමද කියලා. එතුමා කිව්වා, "මම peak hour එකේදී power එක නතර කළා" කියලා. ඒකෙන් ලක්ෂ තුනක් ඉතිරි කර ගෙන තිබෙනවා. හෙට ගිහිල්ලා අහලා බලන්න, peak hour එකේදී power එක නතර කරලා එතුමා ලක්ෂ තුනක් ඉතිරි කරගෙන තිබෙනවා.

ඉතින් නිරපරාදේ අපේ අලුත් ඇමතිතුමියට දොස් කියලා වැඩක් නැහැ. එතුමිය දක්ෂ ඇමතිවරියක්. හරි විධියට නම් මේවා මේ විධියටයි වෙන්න ඕනෑ. ඒ මොකක්ද? විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයත්, Ceylon Petroleum Corporation එකත් එකතු වෙලා කමිටුවක් හදා ගෙන කටයුතු කරන්න ඕනෑ. විදුලිබල මණ්ඩලය සියයට 80ක් ඉන්ධන ගන්න ඕනෑ Ceylon Petroleum Corporation එකෙන්. විදුලිබල මණ්ඩලයේ වියදම තිබෙන්නේ සියයට 20යි. ඉතින් මේ සියයට 80යි, සියයට 20යි ගළපා ගන්න නම් මේ දෙගොල්ල එකතු වෙන්න ඕනෑ. දෙගොල්ලන්ම එකතු වෙලා කටයුතු කරන්න ඕනෑය කියන එකයි මගේ පෞද්ගලික අදහස. ඉස්සර මේ ආයතන දෙකම තිබුණේ එක අමාත්‍යාංශයක් යටතේ. දැන් අමාත්‍යාංශ දෙකක් නිසා එකතු වෙලා කටයුතු කළොත් අපට තව ටිකක් ඉදිරියට යන්න පුළුවන් වෙනවා.

ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන විදුලි බලාගාරයේ සල්ෆර් වැඩියි. ඒක ලොකුම ප්‍රශ්නයක්. ඒ සල්ෆර් ප්‍රමාණය අඩු කර ගත්තා නම් වියදම තවත් අඩු කර ගන්න පුළුවන්. මගේ දැනීම හැටියට තෙල් එක්ක සසඳා බලද්දී විදුලි ඒකකයක් සඳහා ගල් අඟුරුවල cost එක රුපියල් 8ක් විතර වෙනවා. ඒක නිවැරදිද කියන්න මම

දන්නේ නැහැ. විදුලි ඒකකයක් නිපදවීම සඳහා ඉන්ධන වෙනුවෙන් රුපියල් 20ක් වැය වෙනවා. රුපියල් 20ක් වැය කරලා නිපදවන විදුලිය unit එකක් රුපියල් 4.30ට තමයි අපි නිකුත් කරන්නේ. නමුත් cost එක රුපියල් 20ක් වෙනවා. මේ cost එක වැඩි වෙන මූලික හේතුව සලකා බලන්න කියලා අපි විදුලිබල මණ්ඩලයට කියනවා. ඒ තමයි, පෞද්ගලික අංශය එක්ක ඇති කර ගත්ත agreements. ඒවා නැවත වරක් විශ්ලේෂණය කර බලන්න. විශ්ලේෂණය කර බලලා, නැවත වරක් කථා කරලා කටයුතු කරන්න. විදුලිය නිපදවීම සඳහා heavy oil පාවිච්චි කරනවා වාගේම, ඉන්ධනවලින් ඉතුරු වන - මට ඒ නම හරියටම මතක නැහැ.- දේවල් භාවිත කළොත් වියදම අඩුයි. නමුත් අපට එහෙම කරන්න පුළුවන් එක තැනයි තවම තිබෙන්නේ. අපේ Ceylon Petroleum Corporation එකට පිරිපහදුවක් තිබෙනවා. Ceylon Petroleum Corporation එකේ පිරිපහදුවේ ඉතුරු වන අතුරු ඵල බොහොම සුළු ප්‍රමාණයයි තිබෙන්නේ. සියයට 40ක් විතර Iranian Light Crude කියන එක තමයි එතැන පිරිපහදු කරන්නේ. නමුත් මුළු ප්‍රමාණයම crude oil ගෙනැවිත් පිරිපහදු කරන්න පුළුවන් වුණොත්, එයින් ඉතුරු වන waste එක භාවිත කරලා විදුලිය නිපදවීමේ cost එක තව ටිකක් අඩු කර ගන්න පුළුවන්. ඒ නිසා cost-cutting system එකක් තමයි අවශ්‍ය වන්නේ. එහෙම ක්‍රමයක් නැතිව ඇමතිවරුන්ටත් ජනතාවටත් රජයටත් කරන්න දෙයක් නැහැ. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යන්න ඉහළ යන්න, ඒ බර අපි දරා ගන්න ඕනෑ. ඒ බර කාටද පටවන්නේ? මොකක්ද කරන්න ඕනෑ? රජය කොහොමද ඒක භාර ගන්න ඕනෑ? ඉතින්, මේ සඳහා විකල්ප බලශක්ති පාවිච්චි කරන්න වෙනවා. සමහර රටවල මුහුදු රැල්ලෙන් විදුලි බලය ජනනය කරනවා. රුසියාව ඉතාම සාර්ථකව ඒක කර ගෙන යනවා. ඒ වාගේම පරමාණු බලයෙන් විදුලිය ජනනය කරනවා. පරමාණු බලයෙන් ජනනය කරද්දී, ලංකාව දූපතක් නිසා අපට පොඩි අනතුරක් තිබෙනවා. නමුත් රුසියාව වාගේ රටවල ඒක ඉතාම ලස්සනට කර ගෙන යනවා. සමහර රටවල් තමුන්ගේ විදුලිය තනිකරම නිෂ්පාදනය කරන්නේ ගල් අඟුරුවලින්. ලෝකයේ පරමාණු බලව ළඟට තිබෙන විකල්පය තමයි ගල් අඟුරු. ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කිරීම. තෙල් වාගේ නොවෙයි, එහි එක්තරා ඒකාකාර මිලක් තිබෙනවා. නමුත් දැන් දිගින් දිගටම ගල් අඟුරු බලාගාර හැදෙන නිසා ඒ මිලත් උච්චාවචනය වන තත්ත්වයකුත් තිබෙන බව අපි සඳහන් කරන්න ඕනෑ. මේ කරුණු කාරණා තමයි මට කියන්න තිබෙන්නේ.

ඇමතිතුමියට අපි සුබ පතනවා. මෙතුමිය යමක් කරන්න පුළුවන් කෙනෙක්. මෙතුමිය සමෘද්ධි ඇමතිතුමිය හැටියට සිටියදී ඉතාම හොඳට වැඩ කළා. මේ අවස්ථාවේදී හිටපු විදුලිබල ඇමතිතුමාත් මතක් කරන්න ඕනෑ. හිටපු ඇමතිතුමාත් යම්කිසි සේවාවක් කර තිබෙනවා. මේ අයට වැඩ කරන්න පුළුවන්. ඒ ගොල්ලන්ට දොස් කියලා වැඩක් නැහැ. නමුත් මේ තියෙන තත්ත්වය අපි තේරුම් ගන්න ඕනෑ. සියයට 80ක් තෙල්වලට වියදම් වෙනවා නම්, ඔබතුමියට මොනවාද කරන්න පුළුවන්? රජයට මොනවාද කරන්න පුළුවන්? ඒ ප්‍රශ්නය අපි කවුරුත් මතක් කර ගන්න ඕනෑ. අපේ විදුලිබල මණ්ඩලයට furnace oil වලින් දුවන එක විදුලි බලාගාරයක්වත් නැහැ. Heavy oil, furnace oil, waste oil වාගේම කාර්මික අප ද්‍රව්‍ය මේ සඳහා භාවිත කරන්න පුළුවන් නම් එහෙම කරන්න. හොල්සිම් සිමෙන්ති ෆැක්ටරියට පුළුවන් වුණා තමන්ගේ නිෂ්පාදන පිරිවැය මිලියනයක් අඩු කර ගන්න. ඉස්සර ඒ අය තෙල්වලින් විදුලිය හැදුවා. ඊළඟට ගල් අඟුරුවලින් හැදුවා. දැන් ඒ අය දවසකට ටොන් 600ක කාර්මික අප ද්‍රව්‍ය පුච්චනවා. ඒකෙන් විදුලිය නිපදවනවා මෙකට Blue Sky Project කියලාත් කියනවා. නමුත් ඒක මට හරියටම මතක නැහැ. පරිසර හිතකාමී වැඩ පිළිවෙළක් එතැන කරනවා, ගරු ඇමතිතුමියනි. මම ඔබතුමියගෙනුත්, විදුලිබල මණ්ඩලයෙනුත් ඉල්ලා සිටිනවා, ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කර ගත්තේ කොහොමද කියලා පුත්තලම් දිස්ත්‍රික්කයේ එතැනට ගිහින් පරීක්ෂා කර බලන්න කියලා.

ඒගොල්ලෝ නැව්වලින් ගෙනෙන්නේ නැහැ. ත්‍රිකුණාමලයට ගල් අඟුරු ටික ගෙනැල්ලා ටිපර්වලින් ඇදලා තමයි නිෂ්පාදන වියදම අඩු කර ගෙන තිබෙන්නේ. ගරු ඇමතිතුමියනි, ඔබතුමියට පුළුවන් වෙයි, මේවා කළමනාකරණය කරලා වැඩ ටික කරගෙන යන්න. කෙරවලපිටියෙන් අප මෙගාවොට් 270ක විදුලි බලයක් නිපදවනවා. බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරයක් ඉදි කරන්න ඒ දවස්වල යෝජනා කර තිබුණා. ඒ ජල විදුලි බලාගාරය ඉදි කිරීමේ වැඩ කටයුතු පටන් ගත්තාට අප ඔබතුමියට ස්තුතිවන්ත වන්න ඕනෑ. ඒකෙන් මෙගාවොට් 35ක විදුලි බලයක් නිෂ්පාදනය කර ගන්න පුළුවන් වෙයි. සාම්පූර්වලින් මෙගාවොට් 500ක විදුලි බලයක් නිෂ්පාදනය කර ගන්න පුළුවන් වෙනවා. නොරොච්චෝලේ දෙවැනි අදියරත් දැන් පටන් ගන්න ලෑස්ති කරලා තිබෙනවා. මෙගාවොට් 600ක විදුලි බලයක් එතැනදී නිෂ්පාදනය කර ගන්න පුළුවන්. අප සිටි කාලයේ නම් ඉල්ලුම තිබුණේ සියයට 10යි. දැන් මේ අවුරුද්දට වඩා ලබන අවුරුද්දට සියයට 6ක ඉල්ලුමක් තිබෙනවා. ඉල්ලුම වැඩි වෙනවා. ඉල්ලුම වැඩි වන විධියට විදුලි බලය සපයන දකුණු ආසියාවේ තිබෙන එකම රට ලංකාවයි. අනෙක් කිසිදු රටක හැම දාම දිගටම විදුලිය ලබා දෙන්නේ නැහැ. විදුලිය කපා දමනවා. නමුත් දිගින් දිගටම විදුලිය ලබා දීමට අපේ රටේ ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙනවා. හැම අවුරුද්දකම විශාල ප්‍රමාණයක් අපට විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මෙදා පාර අප කරන වැඩේ තමයි පෞද්ගලික අංශයටත් නැවත වරක් බලපත්‍ර දෙද්දී කොන්දේසි ටිකක් දැමීම. ඒ දවස්වල හදිසියට ගිවිසුම් අත්සන් කර ගත්තා. යුද්ධය තිබුණා. යුද්ධයේදී රට අඳුරේ තියන්න බැහැ. යුද්ධ කාලයක් අපට තිබුණා. අප දොස් කියන්නේ නැහැ, ඒ කාලයේ සිදු වුණු දේවල්වලට. ඒ කාලයේ විදුලිය කැපුවාම මිනිසුන් තැන් තැන්වලට රැස්වෙලා හැන්දෑවේ 6.00ට, 6.30ට විතර රැස්වීම් තියන්න පටන් ගත්තා. ඇයි? විදුලිය නැහැනේ. එක ගෙදරකට රැස්වෙලා එතැනදී ඕපාදූපා කථා කරනවා. එවැනි තත්ත්වයක් මේ රටේ තිබුණා. නමුත් දැන් ඒ තත්ත්වය නැති කර තිබෙනවා. දැන් හැම කෙනකුටම විදුලිය ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ ගැන නැවත වරක් සිතන්න කියලා අප කියන්න ඕනෑ. දැනට සියයට 94කට විදුලිය තිබෙනවා. පැය 24 පුරාම විදුලිය ලබා දෙනවා. විදුලිබල මණ්ඩලය යමක් කළාම ලාභය ලැබෙන්නේ විදුලිබල මණ්ඩලයට. නමුත් පෞද්ගලික අංශයේ companies පටන් ගත්තාම ඒගොල්ලෝ විදුලිය නිකම් දෙන්නේ නැහැනේ. ඒ ගොල්ලෝ ලාභයකුත් කියාගෙන නේ දෙන්නේ. අපත් කල්පනා කරන්න ඕනෑ, මේ ලාභය ලබා ගන්න -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, විනාඩි 20ක කාලයක් අවසාන වෙලා තිබෙනවා. දැන් කථාව අවසාන කළා නම් හොඳයි.

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

එක පාර current එක වැදුණා වාගේයි. [බාධා කිරීමක්] අලි වැට වාගේ. අලියා මැරෙන්නේ නැහැනේ. තමුන්නාන්සේලාටත් current එක වදිනවානේ. එක පාර current එක වදිනවා. නමුත් කෑ ගහගෙන දුවනවා. වැටෙන්නේ නැහැ. මැරෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒක තමයි, ඒක තමයි. [බාධා කිරීමක්] අලියා පනින්නේ මෙහෙමයි. අලියා පනිනවා නම් පනින්නේ කම්බි වැටට කොටයක් දාලා. තමුන්නාන්සේ කොට දාන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ එනවා නම් අපි භාර ගන්නවා. කෙළින්ම භාර ගන්නවා. [බාධා කිරීමක්] දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සුන්දර මනුස්සයෙක් නේ. එනවා නම් කොපමණ හොඳයිද? මේ පැත්තට එනවා නම් අපත් එක්ක සිංදුවක් කියා ගෙන හෝ ඉන්න තිබුණා. තමුන්නාන්සේලාගේ පැත්තේ ඉඳන් එතුමාට කියන්න වෙන්න

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

ශෝක ගීත. අපේ පැත්තට ආවොත් සිංදුවක්, බයිලාවක් කියලා සන්තෝෂයෙන් ඉන්න පුළුවන්.

මා මීට පෙර කිව්ව Blue Sky Project එක තමයි හොල්සිම් ආයතනයේ දැනට කර ගෙන යන්නේ. හොල්සිම් ආයතනය උදාහරණයට අරගෙන අපට බිලියනයක් ඉතුරු කර ගන්න පුළුවන් වුණොත් අපටත් ඒ model එක ගන්න පුළුවන් වෙයි කියලා කියන්න ඕනෑ.

මා මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා නැවත කියන්නේ, අපි විදුලි භාණ්ඩ වැඩියෙන් පාවිච්චි කරන නිසා තමයි මේ ගැටලුව. අපේ රටේ බිලියන දෙකක් telephones පාවිච්චි කරනවා. ඉස්සර SMS එකක් ගැහුවේ ඇහෙන්. දැන් ගහන්නේ කොහෙන්ද? Mobile phonesවලින්. Mobile phonesවලින් ගහනවා විතරක් නොවෙයි. Reload දාන්නත් සිදු වනවා. Reload දාලා පුළුවන් තරම් low-cost package එකේ කථා කළාට පස්සේ අන්තිමේදී සිදු වනවා බැටරිය charge කරන්න. එතකොට charge වන්නෙ කවුද? අපේ රටේ ජනතාව. "දේසේ හැටියට වාසේ" කිව්වා වාගේ ඒවා මතක තබා ගන්න ඕනෑ. අද රටේ තිබෙන ප්‍රශ්නත් එක්ක පැය විසිහතරේම විදුලිය දෙනවා නම්, රටේ සියයට 94කටම විදුලිය ලබා දීලා තිබෙනවා නම් ඒවා ගැනත් හිතලා විවේචනයන් කරන්නය කියමින්, අපේ ගරු ඇමතිතුමියටත් සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[6.05 p.m.]

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

Madam Presiding Member, I am glad to speak after the Hon. Minister, who said "සැමට විදුලිය". We know that you have given electricity to all but today all cannot afford to use electricity. This is the sad state that you have put this country into. The electricity to the plantation workers started coming in after 1996 when the former President created the Ministry of Livestock Development and Estate Infrastructure and provided funds for providing electricity to the plantations. Also, the Ministry of Irrigation and Power then had rural electrification projects through which plantations were also served. There was the Ministry of Livestock Development and Estate Infrastructure to provide for the needs of the people in the plantations. Today, we have got rid of that Ministry and there is no project under the Ministry of Power and Energy to provide electricity to estates. You still talk about "සැමට විදුලිය" - "Electricity for All" but extension of electricity supply to the plantations has come to a standstill and provision of electricity to the people in plantations has stopped.

In 1996, the electricity penetration to the plantation people was as low as 20 per cent but by the year 2005, it had increased to 72 per cent. It was your Government, I acknowledge that. During that period, vast expanses of plantation areas were provided electricity but today, you seem to be neglecting this group of people by keeping them out of this electricity boom that you are trying to create. Why is this discrimination? Is it because six of the Parliamentarians from the plantation areas are with you and they do not ask you to provide better services to the people in the plantations or is it because you feel that these people do not need or deserve any development? You are all aware that the plantation people have contributed to the economy of this country for over six generations, for 180 years and still they live in line rooms.

The Ministry of Livestock Development and Estate Infrastructure was created for providing them a better lifestyle, a lifestyle where they were brought out of the line rooms and provided with proper housing. Between 1995 and 2005, 23,000 houses have been built in 10 years at the rate of 2,300 houses per year. But, during the period of the current President, His Excellency Mahinda Rajapaksa, under the "Mahinda Chintana" you have built only 4,200 for seven years. Why is this Government so discriminatory towards these people? Those six Members of Parliament from the upcountry are with you. Is it because they neglect their people; they are interested only in the perks that they get and not speaking to you about the needs of their people? I understand that the only Cabinet Minister who is representing the plantation sector rarely comes to Cabinet; he had not been sighted in the Cabinet room for the last three months and so, maybe his neglect is the cause for what is happening to these people.

It is unfortunate that the people's representatives who are in your Government, whom people believed joined this Government to get them their needs and their services, have neglected the people. However, all the Parliamentarians from the plantation areas who are with the Government, go out into the public, to the media and say that they are hanging on to this Government to provide services to their people. But today, we do not see any of the services reaching our people. Is it the policy of your Government or your President or is it the principle of "Mahinda Chintana" to discriminate against the people who have contributed so much to the economy of this country?

As I said earlier, 72 per cent of our people do have access to electricity but are they able to enjoy the benefits of electricity? The cost of electricity for those who consume over 61 units is so high that our people cannot afford it. Anyone who consumes 61 units has to pay over Rs. 1,200.

The total income of a plantation worker is in the region of Rs.12,000. To spend 10 per cent of their income for electricity is so difficult. They live in very difficult circumstances because of the cold weather in the plantation areas. They used a small immersion heater to heat the water for bathing or for their daily ablutions. But

today, because electricity charges have gone up, they cannot afford to use electric heaters and they have to give up using hot water. They have to go in search of firewood which is not available. The boilers in the tea factories are today converted from oil to firewood because of the cost. So, the management does not allow the worker to pick firewood within the estate. Therefore, they do not have firewood. Electricity is too expensive and they find it so difficult to use hot water, which is so essential because of the cold weather. But, what are you doing? Are you giving them any special treatment? Are you giving them any subsidies? You are only increasing rates. So, although they have an electricity supply, they are unable to utilize electricity.

Our Member, the Hon. (Dr.) Harsha de Silva once said that they are poor in the use of power because they cannot afford it. In all other countries, they measure economic development and wellbeing of people based on the power they use. Sri Lanka being the most expensive country for use of power, people have had to give up the use of power as time went on. People use more power when there is development. But, in our country, though you say there is development, the people have to reduce their consumption of power because they cannot afford to use electric power. It is a shame that you do not bother to look at the needs of the plantation people from whose area most of the power in this country is generated. They have a right to use power. For several years, power lines had been running over their heads but they did not have power in their homes. But today, though they have power in their homes, they cannot afford to use that power.

You have also put a stop to extension of any more power lines within the plantations and these people are now in a very sad state where they cannot have access to power anymore because you do not have any special schemes to provide power as the Ministry of Nation Building and Estate Infrastructure has not been voted any funds as there is no such Ministry.

Your Ministry has no special projects for the plantation people. Then, you have a scheme; one of your Members who spoke a few minutes ago talked about the provision of electricity and the payments for service connection to be provided through the Sumurdhi scheme or a Samurdhi Bank. They give a loan and that money will have to be paid back through the electricity bill over a period of time. It is so difficult for the plantation people to access this because they are not Samurdhi recipients. You have shut them out from receiving Samurdhi benefits. At the same time, they are poor; they are unable to afford; they have to be certified as low-income families for accessing the Samurdhi loan. But, the Ceylon Electricity Board offices are generally shunning this responsibility.

I had an issue in the Ragala region where seven poor families wanted to get electricity through the Samurdhi loan scheme. But, the CEB office initially refused. Then, I had to speak to the DGM and get him to speak to the regional office or the area office to give them the forms in the first place. When they went up, the authorities said, "You are not Samurdhi recipients". Then, I had to speak again to the then Secretary and get the Electricity Board to instruct the Samurdhi Bank to give them a loan form.

After they got the loan form, again hurdles were put in their way. So, why is this discrimination against the people in the plantation sector?

Last week, I went to Deltota where some poor families live. They have saved money; they have wired their homes but they are unable to get electricity connection on the concessionary scheme that is available to the adjoining village but not available to their estate. When I spoke to the Area Engineer and the Commercial Manager in that area office, they were not aware of this scheme. Why has it not been extended to the plantation people? Why this discrimination? I call upon the Hon. Minister to request the CEB to give proper instructions so that even the plantation people could access the Samurdhi loan scheme to get their electricity connection.

We speak so much about power and providing the people with power to use in other activities. The people in the plantation sector are poor because the salary they are paid for their employment in plantations is very low. The World Bank has done a study and said that only those who are involved in some sort of self-employment in addition to working in the plantations are above the poverty line. But to do that, they need electric power, so that they can engage in some sort of small industry or domestic manufacturing exercise like making some clothing in their homes. But, for all this, they need power, which is not available to them.

The education of the children in the plantation sector, who have no access to electricity, is also being affected. They, being a group of people who need some sort of affirmative action, are left without any assistance. The assistance could have come if there was a Ministry of Estate Infrastructure which the President thought was not necessary or thought that these people do not deserve and abolished that Ministry. The progressive policies of your own previous government under the then President, (Mrs.) Chandrika Bandaranaike Kumaratunga have been reversed by the present President. However, the Representatives of our people still hang on to your Government, which is a shame.

Thank you.

[අ.භා. 6.20]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට සංශෝධන කිහිපයක් ගෙන ඒම ගැන ඇත්තටම අපි සතුටු වෙන්න ඕනෑ. ඒවා ඉතා වැදගත් සංශෝධනයන් හැටියට අප දකිනවා.

ජනතාව 2005 වසරේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ නායකයා හැටියට පත් කළාට පසුව එතුමාගේ නායකත්වය යටතේ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ගෙන ඒම නිසා විදුලිබල මණ්ඩලය බේරා ගත්තා. එක්සත් ජාතික පක්ෂ රජය විදුලිබල මණ්ඩලය අහෝසි කරන්නට පනතක් ගෙනැවිත් තිබුණා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි අද අපට විදුලිබල මණ්ඩලය ගැන කථා කරන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ. ප්‍රථමයෙන්ම අපි ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. එදා අපේ ගරු කරු ජයසූරිය - අපේ කරුවල ජයසූරිය- මන්ත්‍රීතුමා විදුලිබල ඇමතිතුමා හැටියට ඉන්න කාලයේ විදුලිබල ප්‍රතිසංස්කරණ පනතක් මේ රටට ගෙනාවා. 1950 අංක 19 දරන විදුලිබල පනත, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත කියන පනත් දෙකම අහෝසි කර දමලා විදුලිබල මණ්ඩලය කැලි හතකට කඩන්න හැදුවා. විදුලිය ජනනය කිරීම, සම්ප්‍රේෂණය - බෙදා හැරීම - කැලි තුනකට කඩන්න, අනෙකුත් කටයුතු තවත් කැලි තුනකට කඩන්න පනතක් ගෙනාවා. ඒක පාර්ලිමේන්තුවේ අනුමත කළත්, ගැසට් කර ගන්න ලැබුණේ නැහැ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පැහැදිලිව කියා තිබෙන දෙයක් තමයි රජයේ දේවල් විකුණන්නේ නැහැයි කියන එක. ඒ අනුව 2009 පනත තුළින් ඒ චින්තනය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළා. ඒ තුළින් අද අපට ලංකා විදුලිබල මණ්ඩලය ගැන කථා කරන්න පුළුවන්කම ලැබී තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. ඒ ගැන අතිගරු ජනාධිපතිතුමාටත්, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයටත් අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගෙනැවිත් තිබෙන සංශෝධන ඉතාම වැදගත්. 1950 අංක 19 දරන මුල්ම පනත යටතේ සම්ප්‍රේෂණය හෝ බෙදා හැරීම පිළිබඳව යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණාම එය නිරාකරණය කළේ එදා හිටපු රජයේ ඒජන්තතුමා. ඒක පසු ගිය කාලයේත් තිබුණා. යම් විරෝධතාවක් ගැන පරීක්ෂණය කරන්නට මැදිහත් වුණේ ප්‍රාදේශීය ලේකම්තුමායි. ඒ ක්‍රමය වෙනස් කරලා ඒ බලය මහජන උපයෝගිතා කොමිෂන් සභාවට දුන්නා. ඒ නිසා ඒ පරීක්ෂණ, ඉල්ලීම් පෝලිම් ගැහිලා විදුලිය ලබා ගන්න බැරි තත්ත්වයට පත් වුණා. අද ඉදිරිපත් කර තිබෙන මේ පනතේ දෙවැනි වගන්තිය අනුව අද ඒක වෙනස් කරලා -සංශෝධනය කරලා- ඒ පරීක්ෂණ පැවැත්වීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරයාට පවරා තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමාට නැවත බලය ලබා දීම තුළින් විදුලි බලය ලබා ගැනීමේදී ඇති වන විරෝධතා, ආරවුල් නිරාකරණය කරලා ඉක්මනින් විදුලිය ලබා ගන්නට පුළුවන් වෙනවා.

ඊළඟ සංශෝධනය තමයි ඉතාම වැදගත් වන්නේ. අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමා කිව්වා සමෘද්ධිලාභීන්ය කියලා වතු කම්කරුවන්ට මේ සහන දෙන්නේ නැහැයි කියලා. ඒ සම්බන්ධයෙන් ඉතාම හොඳ සංශෝධනයක් තිබෙනවා. තමන්ගේ නිවසට විදුලිය ලබා ගැනීමේදී ඒ සඳහා වැය වන මුදල ණයක් හැටියට අරගෙන තමන්ගේ විදුලි බිලෙන් මාසික වාරික හැටියට ගෙවන්න පුළුවන්කම ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, වතු කම්කරුවන්ටය කියලා වෙනසක් නැහැ. මම ඔබතුමාට මේ සංශෝධනය පැහැදිලිව පෙන්වන්නම්. මා එය කියවන්නම්. එහි පැහැදිලිව තිබෙනවා- [බාධා කිරීමක්] එහෙම කියන්න එපා. ඒ නිසා තමයි මේ සංශෝධනය ගෙනාවේ. ඒ නිලධාරීන් දැනුවත් කරන්න තමයි මේක ගෙනාවේ.

මෙම පනත් කෙටුම්පතේ 11. (2) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "(1අ) ..... බලපත්‍රලාභියා විසින් පනවන ලද ගාස්තු සහ වෙනත් යම් අයකිරීම් සමඟ සාධාරණ මාසික වාරිකවලින් ඒ වියදම් අයකර ගැනීමේ පදනම මත අදාළ පරිශ්‍රයට විදුලිබල සම්බන්ධතාවය සහ විදුලිබල සැපයුම ලබා දෙන ලෙසට ඒ තැනැත්තා විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකිය."

එතකොට සමෘද්ධිලාභීන්, වතු කම්කරුවන් කියලා වෙනසක් නැහැ. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සියලු දෙනාම මේ රටේ පුරවැසියන් හැටියට තමයි සලකන්නේ. තමුන්නාන්සේලා ජන වර්ග විධියට හිතන්න එපා. අපේ ජනාධිපතිතුමාවත්, අපවත් එහෙම හිතන්නේ නැහැ. වතු කම්කරුවන් කියන්නේ මේ රටට විශාල ආදායමක් ජනනය කර දෙන ජනතාවක්. අපි ඒ අයගේ පඩි වැඩි කළා. ඒ අයගේ ලයින් කාමර හොඳ තත්ත්වයට පත් කළා. වතු නිවාසලාභීන්ට ඒ ඉඩම්වල අයිතිය ලබා දුන්නා. සුද්දන්ගේ කාලයේ තිබුණු ලයින් කාමර වෙනුවට හොඳ ගෙවල් හදලා දුන්නා. ඒ වාගේ වැඩ කටයුතු අපි කර තිබෙනවා. අපි භූමිතෙල් ලාම්පුව වෙනුවට විදුලිය ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේම කිව්වා මේ වන විට ඉතා හොඳින් විදුලිය සැපයීම කර තිබෙනවාය කියලා. ඒ ගැන අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ප්‍රජාව සම්බන්ධ කර ගෙන ගම්වල හදන පුංචි විදුලි බලාගාර අපේ ප්‍රදේශවල තිබෙනවා. ඒවා තිබෙන්නේ රජයට විදුලිය විකුණන්න නොවෙයි. ප්‍රදේශයේ ජනතාවට පරිහරණය කරන්න ඔවුන් කුඩා විදුලි බලාගාරයක් හැදුවාම ඒකට බලපත්‍රයක් ගන්න ගාස්තු හැටියට විශාල මුදලක් ගෙවන්න වුණා. අපේ ඇමතිතුමියට ස්තුතිවන්ත වන්න ඕනෑ, අද ගෙනෙන සංශෝධන යටතේ ඒ බලපත්‍ර ගාස්තුව අහෝසි කර දමා තිබෙන එක ගැන. ඒ අනුව යම් කිසි ජන කණ්ඩායමකට තමන්ගේ ප්‍රදේශයේ කුඩා ජල විදුලි බලාගාරයක් ඉදි කර ගැනීමට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ සංශෝධනය ඉතාම වැදගත් වනවා.

එදා පැවැති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි ලංකා විදුලිබල මණ්ඩලය විකුණන්න කටයුතු කළේ. මා ළඟ තිබෙනවා පරණ පත්තරයක්. එහි පැහැදිලිව තිබෙනවා, "විදුලිබල මණ්ඩලය විකුණන්නේ නැතැයි කිව්වත් ටෙලිකොම් එකට කළ වැඩේම කරනවා - ලංකා විදුලිබලය සුරැකීමේ සංවිධානයේ කැඳවුම්කරු" කියලා. මේවා කියන්නේ යූඑන්පී ආණ්ඩුවක් තිබුණු කාලයේ. මේ දේවල් එදා ඒ විධියට සිද්ධ වුණා. නමුත් අද මේ රජය ජනතාවට විශාල සහනයක් ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විදුලි බිල වැඩි කිරීමක් ගැන කතා කෙරුණා. අද ගෙනෙන මේ සංශෝධන යටතේ ප්‍රථම විදුලි ඒකක 30ට කිසිදු වැඩි කිරීමක් කරලා නැහැ. විදුලි ඒකක 30ක් පාවිච්චි කරන මිලියන 1.2ක් වූ පාරිභෝගික ජනතාව වෙනුවෙන් අපේ රජය රුපියල් මිලියන 4,266ක සහනාධාරයක් ගෙවනවා. පොහොර සහනාධාරය ලබා දෙනවා වාගේම, ළමුන්ගේ පොත් ටික ගන්න, නිල ඇඳුම් ගන්න ගෙවනවා වාගේම ප්‍රථම විදුලි ඒකක 30 පරිභෝජනය කරන ජනතාව වෙනුවෙන් අපේ රජය රුපියල් මිලියන 4,266ක සහනාධාරයක් ලබා දෙනවා. ඊට අමතරව ඒකක 30 සිට 60 දක්වාත් කිසිදු වැඩි වීමක් කර නැහැ. ඒ

ඒකක ප්‍රමාණය පරිභෝජනය කරන පවුල් සංඛ්‍යාව මිලියන 1.3ක් ඉන්නවා. ඒ අය වෙනුවෙන් රුපියල් මිලියන 13,545ක් රජය දරනවා. මේවා සහනාධාර නොවෙයිද? මේවා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රජය ජනතාව වෙනුවෙන් ලබා දෙන සහන. ඒ වාගේම ඒකක 61 සිට 90 දක්වා විදුලිය පරිභෝජනය කරන පවුල් සංඛ්‍යාව මිලියන 1.3ක්. අපේ රජය ඒ අය වෙනුවෙන් රුපියල් මිලියන 12,479ක මුදලක් වැය කරනවා. විදුලි ඒකක 91 සිට 120 දක්වා පරිභෝජනය කරන පවුල් සංඛ්‍යාව ලක්ෂ 6ක් පමණ ඉන්නවා. ඒ අය වෙනුවෙනුත් රජය දළ වශයෙන් රුපියල් මිලියන 136ක සහනාධාරයක් දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොකද මා මෙහෙම කියන්නේ? අද "ලංකාදීප" පත්තරේ මුල් පිටුවේ පළ වී තිබෙනවා, "විදුලි ගිවිසුමට කඹ ඇදිල්ලෙන් වසරකට කෝටි 1200ක පාඩුවක්" කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ ගසා කෑම් නිසා සිදු වන පාඩුව පාරිභෝගිකයා මත පටවනවා කියන එක තමයි අද විපක්ෂයෙන් හැම වෙලාවේම කියන්නේ. එහෙම දෙයක් නැහැ.

විදුලිබල මණ්ඩලයේ මුළු වියදම සියයට 21ක් පමණ වනවා. වැටුප්වලට රුපියල් බිලියන 10ක් වැය වනවා. උපකරණවලට රුපියල් බිලියන 8ක් පමණ වැය වනවා. බැංකු පොලී ආදී අනෙකුත් වියදම් සඳහා රුපියල් බිලියන 3ක් වශයෙන් සියයට 21ක ප්‍රමාණයක් තමයි විදුලිබල මණ්ඩලය තමන්ගේ වියදමට ගන්නේ. විපක්ෂය මේ රටේ ජනතාවට පෙන්වන්න හදන්නේ ඒක නොවෙයි. මේවා සහනාධාර නොවෙයි කියනවා. මේ මිනිස්සු හොරකම් කරනවා; විදුලිබල මණ්ඩලය ගසා කනවා; ඒ නිසා පාරිභෝගිකයා උඩට ඒක පටවන්න යනවා කියලා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් ඇත්ත තත්ත්වය එහෙම නොවෙයි. මම ඇත්ත තත්ත්වය කියන්නම්. ඒකක 90 දක්වා පාවිච්චි කරන ගෘහස්ථ පාරිභෝගිකයින් වෙනුවෙන් රජය විසින් දරනු ලබන වියදම රුපියල් මිලියන 30,428යි. කිසිම පූජනීය ස්ථානයක විදුලි බිල මේ රජය වැඩි කළේ නැහැ. ඒ අනුව රජය වසරකට පූජනීය ස්ථාන සඳහා දරන වියදම රුපියල් මිලියන 1,229යි. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න හෝටල් කර්මාන්තය සඳහා රජය දරන වියදම රුපියල් මිලියන 923යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ හදවත කුඩා කර්මාන්ත නොහොත් සාමාන්‍ය කර්මාන්තයි. අපි කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ. ඒ සඳහා අපි රුපියල් මිලියන 25,982ක් වියදම් කරනවා. ඒ අනුව රජය වියදම් කරන මුළු ගණන රුපියල් මිලියන 58,561ක්. විදුලිය පරිභෝජනය කරන මේ රටේ අභිංසක ජනතාව වෙනුවෙන්; ඒ වාගේම විදුලිය ලබා ගන්නා හෝටල් අංශය සහ කර්මාන්තවල නියැලෙන අය වෙනුවෙන් තමයි රජය මේ වියදම දරන්නේ. නමුත් ලාභය අපට ගෙවන්නේ නැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(තලෛමෙතාඞ්ගුම උறුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් තිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(තලෛමෙතාඞ්ගුම උறුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට හෙට දිනයේ ඉතිරි කාලය ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(මාණ්පුමිකු ලලිත් තිසානායක්ක)
(The Hon. Lalith Dissanayake)
එසේ නම් මගේ කථාව අදට මම අවසාන කරනවා.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.
එකැන් සිට විවාදය 2013 ජූලි මස 24 වන බදාදා පවත්වනු ලැබේ.

අප්පොழුදු පි. ප. 6.30 මණියාකිවිඩවේ අලුවල්කළ් ඉඩෙනිරුත්තප්පට්ටු, විවාදම් ඔත්තිවෛක්කප්පට්ටදු.
විවාදම් 2013 යූලෛ 24, පුදන්කිழමෛ මීළත් තොඩංගුම්.

It being 6.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.
Debate to be resumed on Wednesday, 24th July, 2013.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) පවිත්‍රාතේවි වන්නිආරච්චි)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එடුත්තියම්පප්පෙற්ற්‍රදු.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(තලෛමෙතාඞ්ගුම උறුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) පවිත්‍රාතේවි වන්නිආරච්චි)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විடුක්කප්පට්ටු ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார *அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

ගම්පහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය පුළුල් කිරීම

கம்பஹா தேசிய போக்குவரத்து மருத்துவ நிறுவனத்தை விஸ்தரித்தல்

EXPANSION OF GAMPAHA NATIONAL TRANSPORT MEDICAL INSTITUTE

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ රෙගුලාසිවලට අනුව අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජන විය යුතු වේ.

මේ සමඟ වෛද්‍ය මධ්‍යස්ථාන ගණනාවකට අදාළ වෛද්‍ය සහතික නිකුත් කිරීමේ බලය ලබා දී තිබුණද, ගම්පහ දිස්ත්‍රික්කය තුළ අද වන විට මෙම සහතික නිකුත් කරන්නේ ප්‍රමාණවත් ඉඩකඩ නොමැති ආයතනයකි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් සහතික ලබා ගැනීම බොහෝ සෙයින් ප්‍රමාද වන අතර, එමඟින් ජනතාවට මහත් දුෂ්කරතාවකට හා අපහසුතාවකට මුහුණ දීමට සිදුව ඇත.

මෙම තත්ත්වය කෙතරම් තදබල එකක් ද යත් ඉහත වෛද්‍ය මධ්‍යස්ථානයෙන් සේවය ලබා ගැනීමට පැමිණෙන පිරිසගෙන් සැදුණු දිගු පෝලිම ප්‍රධාන මාර්ගය ඔස්සේ හා ඉන් ඔබ්බටද විහිදෙන අතර, එහි සේවා ලබා ගැනීමට රැඳී සිටින අයට සහ මාර්ගය භාවිත කරන්නා වූ අනෙකුත් අය හට ද අපහසුතාවට ලක් වීමට සිදුව ඇත.

ගම්පහ දිස්ත්‍රික්කයේ අවම වශයෙන් ප්‍රධාන නගර සීමාව තුළ මෙම වෛද්‍ය පරීක්ෂණය ලබා ගැනීමට පැමිණෙන පිරිසට රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ ඇති ගොඩනැඟිල්ලක් සහිත ප්‍රමාණවත් වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගත හැකි පරිදි වෛද්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කර හෝ මෙම ගැටලුවට විසඳුමක් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ කරුණ ගම්පහට අදාළව කියලා කිව්වත්, කොළඹ හැරුණාම හැම දිස්ත්‍රික්කයේම තත්ත්වය මේකයි. මෙම ස්ථානයට වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබා ගන්න පැමිණෙන පුද්ගලයන් පැය ගණනක් තිස්සේ පාර දිගේ පෝලිමේ සිටින ආකාරය අපි දකිනවා. එසේ රැඳී සිටීමෙන් ඒ අයගේ ගරුත්වයට හානි වනවා. රුපියල් 750ක් වාගේ ගණනක් ගෙවා වෛද්‍ය පරීක්ෂණයට ලක් වන්නටයි මේ අය පැමිණෙන්නේ. නමුත් අලුතෙන් රියදුරු බලපත්‍ර ගන්න එන අයත් මේ පෝලිමේ ඉන්නවා. ඒ වාගේම පැහැදිලි නැති රියදුරු බලපත්‍ර අලුත් කර ගන්න යන අයත් ඉන්නවා. ඇත්තටම රියදුරු බලපත්‍ර අපැහැදිලි වන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේම වරදකින්. ඒ සඳහා බාල අමුද්‍රව්‍ය යොදා ගන්නා නිසායි ඒ තත්ත්වය ඇති වන්නේ. ඒ වාගේම රියදුරු බලපත්‍ර නැති වුණු අයත් මේ පෝලිමේ ඉන්නවා. කල් ඉකුත් වුණු රියදුරු බලපත්‍ර හිමි අයත් ඉන්නවා. පෞද්ගලික බස් රථවල කොන්දොස්තර බලපත්‍රය ලබා ගන්න යන අයත් ඉන්නවා. ඒ වාගේම ඒ පෝලිමේ ලංකාවේ රියදුරු උපදේශකවරු ඉන්නවා. ඒ ගොල්ලන්ගේ ඒ බලපත්‍රය අවුරුදු දෙකෙන්, දෙකට අලුත් කරන්න ඕනෑ. ඒ වාගේම ඒ පෝලිමේ පෞද්ගලික බස් රථයකට මාර්ග බලපත්‍රයක් ගන්න යන පුද්ගලයෝ ඉන්නවා. මෙතැනදීත්, "කොළඹට කිරි, ගමට කැකිරි" කියන සංකල්පය තමයි අපි දකින්නේ. වෛද්‍ය සහතික ගන්න සකස් කළ ඒ වාගේ වෛද්‍ය මධ්‍යස්ථානයක් නුගේගොඩක් තිබෙනවා. වෛද්‍ය සහතික ගන්න දවසකට 500ක්, 600ක් වාගේ ප්‍රමාණයක් එතැනට එනවා. හැබැයි ඒ ආයතනයේ සේවකයන් 150ක්, 200ක් විතර ඉන්නවා. නමුත් ගම්පහ වාගේ පිට පළාත්වලට එහෙම සේවකයෝ පුරවලා නැහැ. උදාහරණයක් විධියට ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, වෛද්‍ය සහතික ගන්න දවසකට 250ත්, 300ත් අතර ප්‍රමාණයක් එනවා. නමුත් සේවකයෝ ඉන්නේ 12යි. අනෙක් දිස්ත්‍රික්කවල තත්ත්වයත් ඒකයි. එක සේවකයෙක් අඩු වුණොත් ඒකේ ඉන්න ප්‍රධාන නිලධාරියා ගිහිල්ලා ඒ සේවය කරනවා. නමුත් දෙන්නෙක්, තුන්දෙනෙක් අඩු වුණොත් එදාට වෛද්‍ය සහතිකය ගන්න ගිය අයට දෙයියන්ගේම පිහිට තමයි වෙන්නේ. මොකද ඒ වැඩේට වෙන අය දාන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට උපාධිධාරින් ගෙනැල්ලා පුරවලා තිබෙනවා. ඒ අයට නිසි සැලකීමක් කරන්නේ නැහැ. උපාධිධාරින් විධියට සලකන්නේ නැහැ. සමහර වේලාවට ඒ ගොල්ලන්ට ඉන්න මේසයක් නැහැ; පුටුවක් නැහැ. සමහර විට ගස් යටයි ඉන්නේ. මේ වෛද්‍ය මධ්‍යස්ථානත් ක්‍රියාකාරී වෙන්න සේවක නිහයක් ඇති නොවන ආකාරයට ඒ වාගේ අය ගෙනැල්ලා හරි මේ ජනතාව විඳින දුක නැත්නම් විඳින කරදරය නැති කරන්න බැරි ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර මේ වෛද්‍ය සහතිකය ගන්න ඕනෑකම තිබුණේ බර වාහන licence එක ගන්න අයට විතරයි. නමුත් දැන් ඒක වෙනස් වෙලා තිබෙනවා. වෛද්‍ය සහතිකය ගන්න අර මම කලින් කිව්ව සියලු දෙනාම ඒ පෝලිම්වලට එකතු වෙනවා. ඔවුන් මේ මධ්‍යස්ථාන කරා එන්න ඕනෑ. ඉස්සර බර වාහන බලපත්‍රයට විතරක් වෛද්‍ය සහතිකය ගන්න ඕනෑ වුණත් ඒ කාලයේ දිවයින පුරා ඕනෑම තැනකින් එය ගන්න පුළුවන්කම තිබුණා. MBBS ලියා පදිංචි වෛද්‍යවරුන්ට මේ සහතිකය නිකුත් කිරීමේ හැකියාව තිබුණා. ඒ නිසා රියදුරු බලපත්‍රයක් ගන්න යන අයට එහෙම කරදරයක් වෙලා තිබුණේ නැහැ. නමුත් වර්තමානය වන විට හැම දිස්ත්‍රික්කයකටම එක තැනක් විතරයි මේ සඳහා තිබෙන්නේ. කොළඹ දිස්ත්‍රික්කය ඇරුණාම හැම දිස්ත්‍රික්කයකටම එක තැනක් විතරයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රියදුරු බලපත්‍ර ගන්න යන අයට, රියදුරු බලපත්‍රය අලුත් කර ගන්න යන අයට, පෞද්ගලික බස් රථ ලියා පදිංචි කරන්න යන අයට දිස්ත්‍රික්කයේ එක තැනක් විතරක් හරි ගස්සලා තිබෙනවා. ඒ නිසා තමයි අපි දැකපු ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ. ඇත්තටම ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, හම්බන්තොට දිස්ත්‍රික්කයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. ප්‍රවාහන පහසුකම් නැති ප්‍රදේශවල අය පාන්දර තුනට විතර ගෙදරින් ඇවිල්ලා මේ පෝලිමට එක්කාසු වෙනවා. විශේෂයෙන්ම රජයේ සේවකයන්, ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන් නිවාඩු ගන්න බැරි නිසා උදෙන්ම එනවා. මොකද මේ මධ්‍යස්ථාන සෙනසුරාදාට ඇරලා නැහැ. අඩු ගණනේ සෙනසුරාදා වරුවක්වත් ඇරලා නැහැ. මේ අයට නිවාඩු දාන්න බැරි නිසා පාන්දර ඇවිල්ලා හයේ විතර ඉඳන් පෝලිමට එකතු වෙලා ඉන්නවා අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ කටයුතු මීට වඩා ක්‍රමවත් කරන්න පුළුවන් නම් හොඳයි. සමහර විට ඇමතිතුමා කියයි, "මේ වෛද්‍ය සහතිකය ඉස්සර MBBS වෛද්‍යවරු දෙනකොට අක්‍රමිකතා වුණා, රිය අනතුරු වැඩියි, ඒ නිසා මේ ආයතනය අමාත්‍යාංශය අතට ගත්තා" කියලා. නමුත් මම කියනවා, එහෙම කියලා බැහැ කියා. ලංකාව හතර වටේම දුවන බස් ටික පාලනය කර ගන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ.

එහෙම නම් ඇයි මේ වෛද්‍ය සහතිකය දෙන එක පාලනය කර ගන්න බැරි? ඒක එක ආයතනයක් යටතට ගත්තේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමානය වනකොට CTB එකේ සේවකයන් පිළිගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙන ආකාරය අපට පෙනෙනවා. ණයක් ගන්න බැහැ. බැංකුවකින් පිළිගැනීමක් නැහැ. CTB එකේ වැඩ කරන සේවකයෙකුට වෙන කෙනෙකුට ණයක් ගන්න ඇපකාරයෙක් වශයෙන් අත්සන් කරන්න බැහැ. පිළිගැනීමක් නැහැ. මොකද ඒ ගොල්ලන්ට පඩි හරියට ගෙවන්නේ නැහැ. ඒ වාගේ අකාර්යක්ෂමතාවක් තිබෙන නිසාද මේ කටයුත්තත් පාලනය කර ගන්න බැරි කියලා මම අහනවා. එක වහලක් යටට මුළු දිස්ත්‍රික්කයේම ජනතාව ගෙන්වලා වෛද්‍ය සහතික දෙන්න පටන් ගත්තේ ඒ නිසාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා.

මේ කරගෙන යන වැඩ පිළිවෙළ තුළ ඒ වාගේ තත්ත්වයක් අපි දකිනවා. ශ්‍රී ලංගමයේ සිදු වන දූෂණය, අකාර්යක්ෂමතාව වාගේ හේතු නිසා එය පාඩු ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙන නිසා ඒ පාඩුව පියවා ගන්නද මුළු දිස්ත්‍රික්කයේම සිටින, රියැදුරු බලපත්‍ර සඳහා වෛද්‍ය වාර්තා ගන්නා අය එක වහලක් යටට ගෙනැල්ලා, අවශ්‍ය පහසුකම් දෙන්නේ නැතිව, රුපියල් 750 ගණනේ අය කරලා, පෝලිම්වල තියලා වැඩ කටයුතු කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථානය දිහා බැලුවොත්, එතැනට දවසකට 250ක් 300ක් පමණ පිරිසක් වෛද්‍ය වාර්තා ගන්න යනවා. ඒ අය පැය දෙකක් තුනක් පෝලිමේ ඉන්නවා. ගොඩක් ඉන්නේ කාන්තාවන්. ස්කූටි බයිසිකලයට licence එක ගන්න වුණත් වෛද්‍ය වාර්තාව ගන්න ඕනෑ. ඒ අයත් පෝලිමේ ඉඳලායි ඒ වැඩේ කරගන්න ඕනෑ. ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ආයතනය ගෙන බැලුවත්, මාසයකට රුපියල් ලක්ෂ 40ක විතර ආදායමක් ලබනවා. ගම්පහ මධ්‍යස්ථානය තිබෙන ගොඩනැඟිල්ල අපි දැක්කා. චූටි ගොඩනැඟිල්ලක් තමයි, හුංඩුවක් වාගේ එකක් තමයි අරගෙන තිබෙන්නේ. ඒ ගොඩනැඟිල්ලේ තිබෙන්නේ වර්ග අඩි 1,500යි. ආණ්ඩු පක්ෂයේ ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ ගොඩනැඟිල්ලක් ඒ සඳහා ගත්තේ ඔහු සතුටු කරන්නද කියා පොඩි ප්‍රශ්නයක් අපට තිබෙනවා. ඒ අය සතුටු කරන්න ගිහිල්ලා ජනතාව අමාරුවේ දමා තිබෙනවා කියලා අපට තේරෙනවා. ඒ නිසා විශේෂයෙන් මේ කාරණය කෙරේ ඔබතුමාගේ අවධානය යොමු කරවනවා ගරු ඇමතිතුමනි. වර්ග අඩි 4,000ක විතර ගොඩනැඟිල්ලක් ඕනෑ එකේ කාර්යාලයක් නොවන, වර්ග අඩි 1,500ක් විතර වන, කලින් තිබුණු කඩ කාමරයක් අරගෙන, සේවකයන් 12දෙනකු දාගෙන කොහොමද මේ කටයුත්ත කරන්නේ? එක දොස්තර කෙනකු විතරයි cadre එකේ ඉන්නේ. මෙවැනි පිරිසකගෙන් කොහොමද ඒ වැඩේ කරන්නේ? නමුත් ඒ මධ්‍යස්ථානයෙන් දවසකට රුපියල් ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක ආදායමක් උපයනවා. දවසකට 200දෙනෙක්, 300දෙනෙක් විතර එතැනට යනවා වෛද්‍ය වාර්තා ගන්න. ඒ වැඩේට අදාළ තත්ත්වයන් ගැන සිතලා නොවෙයි කටයුතු කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ගොඩනැඟිල්ල දිහා බැලුවාම, එතැනට යන 200ක් 300ක් පමණ දෙනාටත්, ඒ වාගේම එහි සේවකයන් 12දෙනාටත්, වෛද්‍යවරුන්ටත් යන්න තිබෙන්නේ එක වැසිකිළියයි. ගම්පහ මධ්‍යස්ථානයේ තත්ත්වයයි මා මේ කියන්නේ. කොළඹ ඇරෙන්න අනෙක් දිස්ත්‍රික්කවල මධ්‍යස්ථාන සම්බන්ධයෙනුත් මේ තත්ත්වයම උදා වෙලා තිබෙනවා. ගම්පහ තිබෙන මධ්‍යස්ථානය දිහා බැලුවොත්, වෛද්‍ය වාර්තා ගන්න පෝලිම පාර දිගේ යනවා. අනෙක් පැත්තෙන්, toilet පෝලිමත් යනවා building එක ඇතුළේ. මොකද, toilet එකයි තිබෙන්නේ ඒ හැම කෙනාටම යන්න. වෛද්‍යවරයාට යන්න තිබෙන්නේත් ඒකමයි. වෛද්‍ය වාර්තා ගන්න දවසකට එතැනට යන 200ක් 300ක් පමණ දෙනාටත් යන්න තිබෙන්නේ ඒ toilet එකමයි. එහි වැඩ කරන සේවකයන් 12දෙනාට යන්න තිබෙන්නේත් ඒ toilet එකමයි. ඒ නිසා ඒ toilet එකටත් පෝලිම. ඒ වටේ ගෙවල්වලින්, කඩවලින් අපි විස්තර ඇහුවා. පිරිමි අය නම් ඒ කඩවල මුදලාලිලාගෙන් බැණුම් අහගෙන හරි, රැවුම් ගෙරවුම් මැද්දේ හරි ඒ අයගේ toiletsවලට ගිහිල්ලා අදාළ වැඩේ කර ගන්නවා. නමුත් අපි දැක්කා එහිදී කාන්තාවන් අසරණ වෙලා ඉන්නවා. අනෙක් අතට, එහි වාහන park එකක් නැහැ. මොකද, පොඩි කඩයක් තමයි ඒ මධ්‍යස්ථානය විධියට අරගෙන තිබෙන්නේ. වාහන නවත්වන්න තැනක් නැහැ. ඔක්කෝම වාහන ඒ මධ්‍යස්ථානය පැත්තේ නවත්වලා; මොටෝ බයිසිකල් නවත්වලා. එතැන වාහන තදබදයක් තිබෙනවා. ඒ ගමේ ඉන්න මිනිහෙකුට, ඒ ප්‍රදේශයේ ඉන්න අයට වාහනයකින් පාරේ යන්න විධියක් නැහැ. ඒ වාගේ දැඩි අපහසුතාවකට ඒ පුද්ගලයන් පත් කරලා තිබෙනවා, හරියට තේරුම් අරගෙන ඒ වැඩේ නොකිරීම නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැඩසටහන නරකයි කියලා මම කියන්නේ නැහැ. ශ්‍රී ලංගමය පාඩු ලබන බව අපි දන්නවා. බස් ටික දුවවලා විතරක් ලාභ ගන්න බැහැ. ඒ සේවකයන්ට නියමිත කාලයට පඩි ටික ගෙවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ අය පිළිගැනීමක් නැති සේවකයන් බවට පත් වෙලා තිබෙනවා. සීටීබී එක ගොඩ නහන්න බස් දුවලා විතරක් හරි යන්නේ නැහැ, ගමේ ඉන්න අය licence එකට අදාළ වෛද්‍ය වාර්තාව ගන්න ආවාම ඒ අයගෙන් හරි රුපියල් 750 ගණනේ එකතු කරලා CTB එක ශක්තිමත් කරනවා කියන සංකල්පය තුළ මේ කටයුත්ත කරනවාද කියා මට තේරෙන්නේ නැහැ. ඒ කොහොම වුණත් උදේට ගම්පහ මධ්‍යස්ථානය දිහා බැලුවාම, ඒ ගොඩනැඟිල්ලේ ඉඳලාත් මීටර් 200ක් විතර දුරට පෝලිම තිබෙන බව පෙනෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන මධ්‍යස්ථානය දිහා බැලුවොත් -කොළඹ හැර අනෙක් දිස්ත්‍රික්කවල මධ්‍යස්ථානවල වාගේම- දවසකට රුපියල් ලක්ෂ දෙකකට ආසන්න ආදායමක් තිබෙනවා. නමුත් පොඩි ගොඩනැඟිල්ලක් තමයි ගම්පහ මධ්‍යස්ථානය සඳහා තෝරා ගෙන තිබෙන්නේ. එහි අවශ්‍ය පහසුකම් නැහැ. එතැනට යන 200දෙනාට, 300දෙනාට medical certificates දෙන්න අවශ්‍ය සේවකයන්වත් ප්‍රමාණවත්ව සපයන්නේ නැහැ. එක් පැත්තකින්, ගොඩනැඟිල්ල පොඩියි. අනෙක් පැත්තෙන්, සේවකයන් සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ. අනෙක් අතට, මේ වැඩේ හරියට කරන්න දොස්තරලා නැහැ. අන්න ඒ වාගේ දැඩි අපහසුතාවන්ට මුහුණ පාන තත්ත්වයකට ඒ ජනතාව පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා යන්නේ නැහැ ගොඩනැඟිල්ලක් තෝරන්න. අමාත්‍යාංශයේ නිලධාරීන් කීප දෙනෙක් තමයි යන්නේ ගොඩනැඟිල්ලක් තෝරන්න. මේ කියන ගම්පහ ගොඩනැඟිල්ල තෝරන කොට ඒ අය දැන ගෙන සිටියේ නැද්ද licence එක සඳහා අවශ්‍ය වෛද්‍ය වාර්තාව - medical certificate එක- ගන්න මේ ප්‍රදේශයේ කී දෙනෙකු දවසකට ඒවිද කියලා? ඒවා ගැන හිතලා නොවෙයිද ගොඩනැඟිලි තෝරන්නේ? ගිය අවුරුද්දේ කීදෙනෙක් ආවාද, මේ අවුරුද්දේ කීදෙනෙක් එයිද, එහෙම නම් එම සංඛ්‍යාවට ගැළපෙන විධියට තැනක් සොයන්න ඕනෑ; සේවකයන් ඉන්න ඕනෑ; වෛද්‍යවරු ඉන්න ඕනෑ කියලා අදහසක් නැතුවද මේ ගොඩනැඟිල්ල තේරුවේ? එහෙම නැත්නම් "අන්න අරයා අපේ හිතවතා, එයා අපේ මන්ත්‍රීවරයා, එයාගේ ගොඩනැඟිල්ල ගන්න" කියන දේශපාලන බලපෑම්වලට යට වෙලාද නිලධාරීන් මෙම ගොඩනැඟිලි තෝරන්නේ කියලා විශේෂයෙන්ම මා අහනවා.

වර්තමානයේ මෙතැන cadre එක හැටියට ඉන්නේ එක දොස්තරවරයායි. නමුත් එහි කාර්ය භාර නිලධාරීවරයාට -ප්‍රධාන

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

නිලධාරිවරයාට- බලය තිබෙනවා, කොන්ත්‍රාත් පදනම මත දොස්තරවරයකු බඳවා ගන්න. දොස්තරවරුන්ට ගෙවීම් කිරීමේදී ඒ අයට බලය තිබෙන්නේ රුපියල් 400ක් ගෙවන්නයි. අද රුපියල් 400කට දොස්තරලා එන්නේ නැහැ. මැහුම් පාඨමාලාවක් කරන ගුරුවරයක්වත් රුපියල් 400කට උගන්වන්නේ නැහැ. ඒ වාගේ තත්ත්වයක් අද රටේ උදා වෙලා තිබියදී රුපියල් 400ට දොස්තරලා කොහෙන්ද සොයන්නේ? මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර මෙම රුපියල් 400 මුදල අඩු ගණනේ රුපියල් 650ක්වත් කරන්න කියා ඉල්ලා සිටිනවා. මෙම ආයතනය අමාත්‍යාංශය යටතට අරගෙන ආදායම උපයන තවත් මාර්ගයක් කර ගත්තාට කමක් නැහැ. ඒකට අපි විරුද්ධ නැහැ.

අපි දන්නවා, ලංගම දියුණු කරන්න ඕනෑය කියලා. රෑට පාරේ බස් එකක් යන්නේ නැහැ. අඩු ගණනේ රෑට බස් ධාවනය කරන්නවත් ලංගමයක් අපට තිබෙන්න ඕනෑ. මොකද, රෑට private buses ධාවනය කරන්නේ නැහැ. ඒ නිසා ලංගම අපට අවශ්‍යයි. නමුත් මේ කටයුත්ත මීට වඩා ක්‍රමවත්ව, මීට වඩා හිතා බලා කරන්න. මොකද, මෙයින් හොඳ ආදායමක් ලැබෙනවා. මා කිව්වා වාගේ දවසකට රුපියල් 1,75,000ක, රුපියල් ලක්ෂ දෙකක ආදායමක් මේ ආයතනය ලබනවා. ඒ නිසා මෙය ජනතාව අපහසුතාවට පත් කරන මධ්‍යස්ථානයක් කරන්න එපා. නමුත් අද මෙම ආයතනය ඒකාධිකාරයක්. කෙනකුට licence එකක් ගැනීමට අවශ්‍ය වන වෛද්‍ය වාර්තාව ලබා ගන්න දිස්ත්‍රික්කයේ වෙනත් ස්ථානයක් නැහැ. බලෙන් කියා තිබෙනවා, "මෙන්න මෙතැනින් වෛද්‍ය වාර්තාව ගන්න ඕනෑ, වෙනත් තැනක් නැහැ"යි කියලා. ඒ සම්බන්ධයෙන් තරගකාරිත්වයක් නැහැ. එහෙම නම් මෙම ආයතනය හොඳ වුණත්, නරක වුණත් මිනිස්සු එතැනට යා යුතුයි. කොපමණ වැදගත් පුද්ගලයකු වුණත් දුවිලි කා ගෙන දිගටම පෝලිමේ ඉන්න ඕනෑ. එහෙම නැතුව වෙනත් විකල්පයක් නැහැ. ශ්‍රී ලංගම විඳින පාඩුව, ප්‍රවාහන අමාත්‍යාංශය විඳින පාඩුව මේ අහිංසක මිනිසුන්ගේ කර මත පටවන්න එපා. පොඩි motorcycle එකට, පොඩි scooter එකට licence එක ගන්න යන කාන්තාවන්ගේ කර පිටින් ශ්‍රී ලංගම දියුණු කරන්න යන්නේ නැතුව, ඒ අයටත් පහසුකම් සලසා, ඒ අයටත් වැදගත් විධියට, තමන්ගේ අභිමානය රැක ගෙන වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබා ගන්න පුළුවන් විධියට මෙම ආයතනය සකස් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම එයට අවශ්‍ය තරම් ඉඩකඩ තිබෙන්න ඕනෑ. අවශ්‍ය තරම් ඉඩකඩ තිබෙන ගොඩනැඟිල්ලක් අරගෙන ඒ කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. උදාහරණයක් වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මෙම ගොඩනැඟිල්ල ගැන පමණක් කිව්වාට අනික් දිස්ත්‍රික්කවල තත්ත්වයත් එසේමයි. ඒවායේ ගිහින් බැලුවොත් කෑම කන්න තැනක් නැහැ. දොස්තරවරයා එළියට යනතුරු සේවකයන් බලාගෙන ඉන්නවා, එතැනට රිංගලා කෑම කන්න. අන්න ඒ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. එතැන දොස්තරවරුන් හතරදෙනකු, පස්දෙනකු තබා ගන්න විධියක් නැහැ, ඉඩකඩ නැති නිසා. මෙම ගොඩනැඟිල්ල තෝරන කොට මේ කරුණු ගැන හිතලා නැහැ. මා දන්නවා, මෙම ගොඩනැඟිල්ල වෙනුවෙන් දැනට අවුරුද්දකට මුදල් ගෙවලාත් ඉවරයි කියලා. නමුත් එතැනට එන සෙනඟ දිහා බැලුවාම මෙම ගොඩනැඟිල්ල තුළ අවුරුද්දක් කටයුතු කර ගෙන යන්නේ කොහොමද කියලා ප්‍රශ්නයක් මතු වනවා.

ඒ විතරක් නොවෙයි. අඩු ගණනේ දොස්තර මහත්මයා ළඟට යන අයගේ පෝලිමක්වත් හදන්න ඕනෑ. ඒ කියන්නේ ඉක්මනින් වෛද්‍ය පරීක්ෂණ වාර්තා ගන්න දහදෙනකුටවත් ඉන්න පෝලිමක් හදන්න ඕනෑ. 10දෙනකුගෙන් යුක්ත පෝලිමකට ඉන්නවත් ඉඩක් නැති තැනක් තමයි තෝරා තිබෙන්නේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ මෙම ආයතනයෙන් සිද්ධ වන ක්‍රියාදාමය දිහා බැලුවාම, වර්ග අඩි 1,500ක, වර්ග අඩි 2,000ක ප්‍රමාණයේ ගොඩනැඟිල්ලක් නොව වර්ග අඩි 4,000කින් යුක්ත ගොඩනැඟිල්ලක්වත් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි සාමාන්‍ය procedure එක මෙයයි. වෛද්‍ය පරීක්ෂණයට භාජන වන අය පාන්දර 6.00ට විතර පෝලිමට එනවා. අපි දැකලා තිබෙනවා, පාන්දර 6.00ට විතර පෝලිමට ඇවිල්ලා ඉන්නවා. සමහර විට ඔහු රජයේ සේවකයෙක් වෙන්න ඇති. එහෙම නැත්නම් ඔහු පෞද්ගලික අංශයේ වැදගත් නිලධාරි මහත්මයෙක් වෙන්න ඇති. නිවාඩු ලබා ගැනීමට තිබෙන නොහැකියාව නිසාම half-day නිවාඩුවක් ගෙන සවස් වරුවේ වැඩ කරන්න හිතා ගෙන ඔහු පාන්දර 6.00ට පෝලිමට එනවා. සමහර විට ඔහු ගෙදරින් එන්නේ පාන්දර 3.00ට විතර වෙන්න ඇති. මොකද, දිස්ත්‍රික්කයේ එහා කෙළවරේ සිට වුණත්, බස් ධාවනය වන්නේ නැති වෙලාවක වුණත් කෙසේ හෝ මෙම වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබා ගන්න මෙම ආයතනයට එන්න ඕනෑ වෙලා තිබෙනවා.

මේ ආයතනය 8.00ට විතර විවෘත කරනවා. ඊට පස්සේ සල්ලි ගෙවන්න පෝලිමේ යනවා. සල්ලි ගෙවලා අවසන් වුණාට පස්සේ පෝලිමේ ගිහින් photos ගන්නවා. ඊට පස්සේ නැවත පෝලිමේ එනවා, register වන තැනට. ඊට පස්සේ forms පුරවන තැනට යනවා. එතැන form එක පුරවලාම දෙනවා. ඒක හොඳයි; පහසුයි. ඊට පස්සේ ලේ පරීක්ෂා කරන තැනට යනවා. ලේ පරීක්ෂා කර ඒ වාර්තා ගත්තාට පස්සේ බර, උස මනින තැනට පෝලිමේ යන්න තිබෙනවා. ඊට පස්සේ වෛද්‍ය නිලධාරි ඉන්න තැනට පෝලිමේ යන්න ඕනෑ. මෙන්න මේ වාගේ විශාල procedure එකක් මෙම ආයතනයේ තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. කෙනෙක්, පැහැදිලි නැති රියැදුරු බලපත්‍රයක් අරගෙන ආවොත්, එහෙම නැත්නම් රියැදුරු බලපත්‍රය නැති වුණාය කියලා ආවොත් මේ පෝලිමේ ආවාට පස්සේ කව්ළේරියට ගිහින් form එකක් පුරවා ගෙන එන්න ඕනෑ, ඔහුගේ රියැදුරු බලපත්‍රයේ විස්තර සඳහන් කරලා. මෙම ආයතනය තිබෙන ස්ථානයේ සිට මීටර් 700ක් විතර දුරින් තමයි කව්ළේරිය තිබෙන්නේ. කව්ළේරියට ගිහින් ඒ විස්තර ගෙනෙන්න ඕනෑ. ඒ එක්කම අවුරුදු 10ක් විතර කල් පැනපු licence තිබෙන අයත් ඉන්නවා. තවත් සමහර අයට X-rays ගන්න ඕනෑ වෙනවා. ඔහු town එකට ගිහින්, රෝහලක් ළඟට ගිහින් X-ray machine එකක් තිබෙන තැනකට ගිහින් X-ray එක අරගෙන නැවත මෙම මධ්‍යස්ථානයට දුව ගෙන එන්න ඕනෑ.

අන්න ඒ වාගේ තත්ත්වයක් උදා වෙලා තිබෙද්දී, සේවකයන් දොළොස් දෙනෙක් වාගේ අඩු පිරිසක් දමාගෙන කොහොමද මේ කටයුතු කරන්නේ? සේවකයන් බඳවා ගැනීම සඳහා අපහසුතා ඇති. ඒත් අඩු ගණනේ උපාධිධාරීන් ටික දෙනෙක් හෝ මේ කටයුතු සඳහා යොදවන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහින් බැලුවොත් ඇතුළේ ඉඩ නැතිව ගස් යට ඉන්නවා උපාධිධාරීන්. ඒ අයට හෝ මේ රාජකාරිය පවරනවා නම් ඒ අයටත් යහපතක් වෙනවා.

අද ඒ උපාධිධාරීන් ආත්ම විශ්වාසයකින්, ආත්ම ශක්තියකින් වැඩක් කරන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා නැහැ. අද ඒ උපාධිධාරීන් මැසිවිලි නඟනවා, "අපට හරියට වැඩක් කරන්න බැහැ. උපාධිධාරීන් හැටියට අප ගණන් ගන්නේ නැහැ" කියලා. ඒ වාගේ තත්ත්වයකට මේ උපාධිධාරීන් පත් කරන්නේ නැතිව, මේ වාගේ තැන්වලට ඒ අය යොමු කරන්න පුළුවන් නම්, ජනතාවගේ ප්‍රශ්නවලට උත්තර සපයන්න පුළුවන් වෙනවා. දෙළොස් දෙනෙකුගෙන් කොහොම ද මේ ස්ථානයේ වැඩ කටයුතු කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාසයකට ලක්ෂ 40කට ආසන්න මුදලක් උපයන ආයතනයක් මේක. මේ ආයතනය එක්කෝ කච්චේරියක තිබෙන්න ඕනෑ. එතකොට මේ ප්‍රශ්න හුඟක් දුරට අඩු වෙනවා. කච්චේරියක මෙම ආයතනය ස්ථාපනය කරන්න පුළුවන්කම තිබෙනවා නම් බොහොම හොඳයි. නැත්නම් ඊට සරිලන, ඉඩ තිබෙන තැනක ස්ථාපනය කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාගේ අවධානයට මා මේ කරුණු යොමු කරනවා. මේ ස්ථානයට අඩුම තරමින් X-ray machine එකක් සවි කර ගන්නට පුළුවන් නම් මේ ප්‍රශ්න ටිකක් හරි විසඳා ගන්න පුළුවන්. මේවා කරන්න බැරිකමක් නැහැ. පුද්ගලයන්ගෙන් මුදලක් අය කර ගන්නා නිසා ඒ අය අපහසුතාවට පත් නොකර වැඩ කටයුතු කරන්න අප සිතට ගන්න ඕනෑ.

එපමණක් නොවෙයි. මෙවැනි කටයුතු සඳහා ස්ථාන තෝරන්න නිලධාරීන් යවන විට, ඒ ස්ථානයෙන් සැපයෙන සේවාව ගැන හොඳට හිතා බලන්න පුළුවන් නිලධාරීන් යවලා සුදුසු ගොඩනැඟිල්ලක් තෝරා ගන්න කියලා ඒ නිලධාරීන්ට කියන්න ඕනෑ. ඒ අයට දේශපාලන බලපෑම් කරන්න හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේරහැර කාර්යාලයට licence එකක් ගන්න ගියොත් බොරු නිලධාරීන් ඉන්න බව අප දකිනවා. Brokersලා වාගේ නිලධාරීන් ඉන්නවා. නිලධාරීන්ගේ වෙස් ගත් brokersලා පණුහක් විතර ඉන්නවා. ඒ අය සුදු ෂර්ට් සහ කළුපාට කලිසම් ඇඳගෙන ඉන්නවා. නිලධාරියෙකු වාගේ රතුපාට හෝ නිල්පාට බෙල්ට් එකක් බෙල්ල වටේ දමා ගෙන ඉන්නවා, identity card එකක් එල්ලාගෙන ඉන්නවා වාගේ පෙනෙන්න. බැලුවාම එතැන තිබෙන්නේ ජංගම දුරකථනයක්. මේ වාගේ වෙස් වලාගත් පිරිස් මිනිසුන් අතරමං කරන හැටි අප දකිනවා. මේ නිසා මේ කටයුතු තුළ විවිධ අක්‍රමිකතා සිදු වෙනවා. අලුතින් licence එකක් ගන්න එන කෙනෙක් මේවා දන්නේ නැහැ. ඒ අය නිලධාරීන් කියලා ඒ මිනිසුන්ට රැවටෙනවා. මේ ගොල්ලෝ හොඳ රියැදුරු පුහුණුවක් නැතත් licence එක අර ගෙන දෙනවා. ඒ විධියේ විවිධ අක්‍රමිකතා මෙතැන සිදු වෙනවා. ඒ හරහා මුදල් ගසා කනවා. ඒ විධියට ගියොත් මේ ආයතනයටත් වෙන්නේ ඒ ටිකම යි. පෝලිම්වල ඉන්නකොට, රස්තියාදු වෙන්න සිද්ධ වෙන කොට, පහසුකම් නැති තැනක් නිර්මාණය වුණාම, වේරහැර ආයතනයේ වාගේ මේ ආයතනය වටාත් brokersලා බිහි වෙයි. එම නිසා එම තත්ත්වය නවත්වන්න මෙන්ම, ජනතාවට ගෞරවාන්විත සේවාවක් සලසන්න මීට වඩා සිතා බලා කටයුතු කරන්න කියලා විශේෂයෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. Licence එකක් ගැනීමේදී වෛද්‍ය සහතික ගන්න දිස්ත්‍රික්කයට තිබෙන එකම තැන මෙතැන. ඒකට කමක් නැහැ. පරිපාලන දිස්ත්‍රික්කයේ මූලික නගරයට ඒ අවස්ථාව දුන්නාය කියා හිතමු. ඒ නිසා මා ඒ ගැන විවේචනය කරන්න යන්නේ නැහැ. නමුත් මේ දිස්ත්‍රික්කයට තිබෙන මේ එකම තැනට, අනිවාර්යයෙන්ම පැමිණිය යුතු එකම තැනට සුදුසු පරිදි සේවය සැලසීමට හැකි කාර්ය මණ්ඩලයක් පත් කරන්න ඕනෑ. සුළු අධ්‍යයනයක් කරලා මේ කාර්ය මණ්ඩලයේ පිරිස වැඩි කරන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් බැලුවොත් අඩු ගණනේ මෙවැනි ගොඩනැගිල්ලක් ප්‍රමිතියක් අනුව ගොඩ නහා තිබෙන්න ඕනෑ. මා ගම්පහ නගරයේ නගරාධිපති වශයෙන් වැඩ කටයුතු කළා. මා දන්නවා, නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව ගොඩනැගිල්ලක් නිර්මාණය වන්න ඕනෑ බව. ගොඩනැගිල්ලකින් කෙරෙන කාර්ය භාරය අහලා, එම ගොනැගිල්ලේ මිනිසුන් කී දෙනෙක් ඉන්නවා ද, ඒ ගොඩනැඟිල්ලට toilets කීයක් ඕනෑ ද, වාහන නවත්වන්න ඉඩ ඕනෑද කියා අප සොයා බලනවා. ගොඩනැඟිලි සෑදීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතියක් තිබෙනවා. ඒ නිසා මා විශේෂයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා, ආයතනයක් සඳහා ගොඩනැඟිල්ලක් තෝරන කොට නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතියට අදාළව ගොඩනැඟිල්ල තිබෙනවා ද කියා සොයා බලන්න කියලා. කඩයක් පවත්වා ගෙන ගිය තැනක් කාර්යාලයක් කරද්දී, නැත්නම් කඩයක් පවත්වා ගෙන ගිය තැනක් චිත්‍රපට hall එකක් කරද්දී අනුගමනය කළ යුතු විවිධ ප්‍රමිති තිබෙනවා. මෙතැන පිහිටුවන්නේ රජයේ කාර්යාලයක් කියලා හිතාගෙන අත්තනෝමතිකව කටයුතු කරන්නේ නැතිව ඒ ප්‍රමිතීන්ට යටත් ව කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ ආයතනයේ වැඩ කටයුතු නවත්වන්න කියනවා නොවෙයි. ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර, ජනතාව වෙනුවෙන් නිවැරදිව ක්‍රියාත්මක වන ආයතනයක් බවට මෙය පත් කරන්න කියා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ අභිමානය රැකගෙන රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වෛද්‍ය වාර්තාවක් ගන්න පුළුවන් ස්ථානයක් නිර්මාණය කරන්නට කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක් තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

තම ප්‍රදේශයේ සිටින සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා දැවෙන ප්‍රශ්න දෙස සංවේදීව බලන මන්ත්‍රීවරයෙක් විධියට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය කෙරෙහි දැඩි අවධානයක් යොමු කර තිබෙනවා. එතුමා මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන බව පවසමින්, එය ස්ථිර කළ හැකි දැයි මගෙන් ඇසූ විට මෙම ප්‍රශ්නය පිළිබඳව ගරු ඇමතිතුමා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේත්, අනිකුත් ස්ථානවලත් තිබෙන තත්ත්වය පිළිබඳව මම වැඩිදුර සොයා බැලුවා. ඒ අනුව මට පෙනී ගියා මෙවැනි සෑම වෛද්‍ය මධ්‍යස්ථානයකම වාගේ දැඩි තදබදයක් පවතින බව. මෙම කටයුත්ත අනිවාර්යයෙන්, කෙසේ හෝ කරගත යුතු දෙයක් නිසා බොහෝ දෙනා ඒ සේවාව ලබා ගැනීමේදී සිදු වන අපහසුකම් ගැන නොසිතා කටයුතු කරන බවත් මට පෙනී ගියා. ඒ නිසා මෙය ඉතා ඉතා බරපතළ කාරණයක්; වැදගත් කාරණයක්.

සියලුම තරාතිරම්වල ජනතාව වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා මේ ස්ථානයට පැමිණෙනවා. මෙතැනදී දුප්පත් පොහොසත් භේදයක් බලන්නේ නැහැ. මේ ස්ථානවලින් රජයට විශාල ආදායමකුත් ලැබෙනවා. ඒ නිසා රජයට මෙම ස්ථානවල නඩත්තුව සඳහා සහ ඒ ඉදිකිරීම් සඳහා ආයෝජනයක් කරන්න නොහැකිකමක් නැහැ. ඒ නිසා මෙම වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා නවීන පහසුකම් ලබා දීලා, ඒවාට ගැළපෙන විධියේ ගොඩනැඟිලි ඉදි කරලා, ඒවාට අවශ්‍ය වැසිකිළි පහසුකම් සහ ජනතාවට තමන්ගේ වාරය එනතුරු වාඩිවී සිටීමට අවශ්‍ය කරන පහසුකම් සකස් කර දීලා, වෛද්‍යවරු සංඛ්‍යාවත්, අනිකුත් කාර්ය මණ්ඩලවල සේවක සංඛ්‍යාවත් වැඩි කරලා, වඩාත් හොඳ ගුණාත්මකභාවයකින් යුතුව ඉක්මන් සේවයක් ලබා දීමට උත්සාහ කරාවි කියලා මා විශ්වාස කරනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අපේ ගරු ප්‍රවාහන අමාත්‍යතුමා සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න දෙස සංවේදීව බලන අමාත්‍යවරයෙක්. එතුමාට මේ කාරණාවල තිබෙන ප්‍රායෝගික පැත්ත ගැන බොහොම හොඳ අවබෝධයක් තිබෙනවා. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා විසින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තමන්ගේ පළමුවෙනි සභාව කල් තැබීමේ යෝජනාවේදීම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ එතුමාට තමන්ගේ දිස්ත්‍රික්කය සම්බන්ධව තිබෙන විශේෂ අත්දැකීම නිසා බව අපට තේරුම් යනවා. ඒ වාගේම එතුමාගේ කථාවේදී ඉදිරිපත් කළ තොරතුරුවල විස්තරාත්මකභාවය අනුවත් අපට තේරුම් යනවා එතුමා මේ ප්‍රශ්නය පිළිබඳ නිසි අවබෝධයෙන්, දැනුමෙන් යුතුව මේ කටයුත්ත කරන බව.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව තිබෙන අනිකුත් වෛද්‍ය මධ්‍යස්ථාන ගැනත් සොයා බලලා ක්ෂණිකව යම් යම් විසඳුම් ලබා දීමටත්, දිගුකාලීනව නවීන පහසුකම් සහිත ගොඩනැඟිලි ඉදි කර හෝ ඒවා කුලියට ලබා ගෙන ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමටත් කටයුතු කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හුඟක් කැමැතියි, හුඟක් සන්තෝෂ වෙනවා මගේ අඩු පාඩුකම් පෙන්වා දීම ගැන. මේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ලංගම - CTB එක- ගැන කථා කළා. මා හිතන හැටියට එතුමා ලංගමයට වුණු දේ ගැන හරියට දන්නේ නැතිව ඇති. මොකද ලංගමය මේ තත්ත්වයට වැටුණේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේයි. ලංගමය ඉතාම හොඳ තත්ත්වයේ තිබුණු ආයතනයක්. එම්.එච්. මොහොමඩ් මහත්තයාගේ කාලයේ, විජයපාල මෙන්ඩිස් මහත්මයාගේ කාලයේ, ඒ වාගේම 2001 දී එක්සත් ජාතික පක්ෂය නැවත බලයට පත් වුණු කාලයේදී ලංගමය ගැන සැලකිලිමත් වන්නේ නැතිව එය පහළම මට්ටමට දමලා පෞද්ගලික අංශයට විකුණන්න ගියාය කියන කාරණය මා හිතන හැටියට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා දන්නේ නැතිව ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ බස් වෙන්දේසි කළ යුගයක් තිබුණා. ඔවුන් හොඳ බස් වෙන්දේසි කළා. ඒ කාලයේ බස් එක තල්ලු කරගෙන ගේට්ටුවෙන් එළියට ගෙනැත් ඊට පසුව බැටරිය දාලා start කරලා අරගෙන ගියා. මේ රටේ ජනතාව ඒක දන්නවා. 2001දී රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ මේ බස් කොම්පැනි විකුණන්න පත්තරේ දැන්වීම් දැම්මා. ඒ කාලයේ ලංගමයක් තිබුණේ නැහැ. ලංගමය අන්තිම පහළම මට්ටමට වැටිලායි තිබුණේ. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ තමයි ලංගමයට නිසි තැන ලැබුණේ.

ලංගම සේවකයන්ට පඩි ගෙවීමේදී පොඩි පොඩි අමාරුකම් තිබෙනවා. ඒවා නැත්තේ නැහැ. මම ඒක පිළිගන්නවා. අපේ ප්‍රධාන කාර්යාලයෙන් දැන් ලංගමයේ වැඩ කරන හැම සේවකයෙකුගේම account එකට රුපියල් 11,250ක් දමනවා.

"ලංගම" කියන්නේ පිනට බස් දුවන ආයතනයක් නොවෙයි නේ. "ලංගම" කියන්නේ මුදල් හම්බ කරන ආයතනයක්. මෙහි දවසක ආදායම රුපියල් මිලියන 55ක් විතර වෙනවා. මේ ආයතනයෙන් ටයර් ටික ඩිපෝවලට අපි නොමිලේ ලබා දෙනවා. බැටරි ටික නොමිලේ ලබා දෙනවා. සමහර වෙලාවට motor spare parts ටිකත් නොමිලේ ලබා දෙනවා. මෙහි සිටින සේවකයින් සහ නිලධාරීන්ට තිබෙන්නේ මුදල් හම්බ කරලා අර ඉතිරි වැටුප් භාගය ගෙවලා, ඉන්ධන ටික ගහගෙන දුවන එක විතරයි. අපේ ඩිපෝ 100න් ඩිපෝ 40ක් විතර දැන් මේ කාර්යය කරනවා. මොකද, උදේ පාන්දර 4.30ට DS මහත්මයා ඩිපෝ එකට එනවා. ලොරි ප්‍රවාහන ව්‍යාපාරික පවුලකින් එන කෙනෙකු හැටියට මා දන්නවා, මගේ පියා සහ එම ප්‍රවාහන ව්‍යාපාර කරපු අනෙකුත් අය පාන්දරින් ගිහිල්ලා තමන්ගේ ලොරි ටික - fleet එක- එළියට දමනවා. ඒ වාගේ කැපවීමකින් වැඩ කළොත් ලංගම සේවකයන්ට වැටුප් ගෙවන්න පුළුවන් කියලා මා හිතනවා. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙනුත් මුදලක් ලබා දෙනවා. අනෙක් කාරණය, මේක සේවාවක්. "ලංගම" කියන්නේ මුදල් හම්බ කරන ආයතනයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා, ලංගමයෙන් තමයි රෑට බස් එකක් දුවන්නෙත්. අනෙක් කාරණය, මේ සිටින සෑම මන්ත්‍රීවරයෙක්ම වාගේ, රටේ ජනාධිපතිතුමා පවා ඉස්කෝලේ ගියේ ලංගම බස් රථයෙන්. ලංගම බස් රථයෙන් තමයි මේ අපි ඔක්කොම ඉස්කෝලෙ ගියේ. මේ බස් රථ ඇණිය, නැත්නම් ලංගමය මේ වාගේ පහත්ම මට්ටමකට ඇද දැම්මේ අපේ ආණ්ඩුව කාලයේ නොවෙයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේයි කියන කාරණය මා මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මතක් කර දිය යුතුයි.

රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා වෛද්‍ය වාර්තා ලබා දෙන වෛද්‍ය මධ්‍යස්ථාන ගැන සඳහන් කළා. මා ඒ කාරණය පිළිගන්නවා. මම හරි නම් "හරි" කියලා කියන, වැරැදි නම් "වැරැදියි" කියලා කියන මිනිහෙක්. මා ළඟ වචන දෙකක් නැහැ. ගන්නවා කිව්වොත් ගන්නවා, දෙනවා කිව්වොත් දෙනවා. ඒක මේ රටේ ජනතාව හැම කෙනෙක්ම දන්නවා. මේ කියපු කතන්දරය බැලුවොත් ඇත්තටම මෙහි ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට හේතුවත් මා කියන්නම්. මේ වෛද්‍ය මධ්‍යස්ථානවලින් බොහෝ වෙලාවට කළේ මොකක්ද? මේ වෛද්‍ය මධ්‍යස්ථානවල වෛද්‍යවරුන් 1061ක් ලියා පදිංචි වෙලා සිටියා. මා එහි breakdown එක තමුන්නාන්සේලාට දෙන්නම්. එයින් 898 දෙනෙක් MBBS doctorsලා. 163 දෙනෙක් RMO වෛද්‍යවරුන් හැටියට හිටපු අය. මුළු වෛද්‍ය සංඛ්‍යාව 1061ක් සිටියා. මොකක්ද මේ අය කළේ? මේ අය රුපියල් 100ක් අය කරගෙන ෆෝම් ටික දුන්නා. රුපියල් 100ක් අය කරගෙන මේ ෆෝම් එක අත්සන් කරලා දෙන්නේ කාටද? ලර්නර්ස්කාරයාට. ලර්නර්ස්කාරයාට මේ ෆෝම් එක දෙනවා, ඔහුට වෛද්‍ය පරීක්ෂණය පවත්වන්න කියලා. මෙකයි ඇත්ත. සහතික ඇත්ත මෙකයි. හරි නම් මේ පරීක්ෂණය පවත්වන්නට ඕනෑ, මෙන්න මේ විධියටයි. මේ පරීක්ෂණයේ දී උස බලන්නට ඕනෑ, බර බලන්නට ඕනෑ. රුධිර සීනි ප්‍රමාණය පරීක්ෂා කරන්නට ඕනෑ. Blood group එක බලන්නට ඕනෑ. ඇස් පෙනීම සහ රුධිර පීඩනය - blood pressure - බලන්නට ඕනෑ. ඊට අමතරව දොස්තර මහත්මයා තවත් ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනවා. ඒ කියන්නේ කකුල් හොඳට වැඩ කරනවාද, අත් හොඳට වැඩ කරනවාද බලනවා. බයිපාස් සැත්කමක් එහෙම කරලා තිබෙනවාද කියලා ෂර්ට් එක ගලවලා පපුව බලනවා.

Learners ආයතනවල අය මොකක්ද කළේ? මේ එකක්වත් බැලුවේ නැහැ. ඒගොල්ලන් වාහනයක් ඇතුළේ ඉඳගෙන අර දොස්තර මහත්මයා අත්සන් කරපු, රුපියල් 100ක් දීලා ලබා ගත් ෆෝම් එක තමන්ට හිතෙන විධියට පුරවලා දෙනවා. ඒකෙ blood group එකත් තමන්ට හිතෙන එකක් ලියන්නේ. රියදුරු බලපත්‍රය ලබා ගැනීමට අදාළ පුද්ගලයා ඊළඟ සැරේ වෛද්‍ය මධ්‍යස්ථානයට ආපුවාම, එතකොට බලද්දී තිබෙන්නේ වෙනත් blood group එකක්. රියදුරු බලපත්‍රය ලබා ගන්නා කෙනාගේ blood group එක බැලුවේ නැහැ, උස බැලුවේ නැහැ, ඒවා ඔක්කොම Learners ආයතනයේ අය තමන්ට හිතෙන විධියට සඳහන් කළා. ඇස් පෙනීම බැලුවේ නැහැ; රුධිර පීඩනය බැලුවේ නැහැ; මේ එකක්වත් බැලුවේ නැහැ. රුධිරයේ සීනි මට්ටම ආදී මේ ඔක්කොම රියදුරු බලපත්‍රයක් ලබා දෙනකොට බැලිය යුතු දේවල්. නමුත් ඒ එකක්වත් බැලුවේ නැහැ. ඒවා කිසිවක් බලන්නේ නැතිව නිකම්ම රුපියල් 1,200ත් 1500ක් අතර මුදලක් අය කළා. නමුත් අය කළ යුතු නියමිත මුදල රුපියල් 750යි. රුපියල් 750ක් අය කළ යුතු එකට රුපියල් 1200ත්, 1500ත් අතර

මුදලක් අය කළා. මා හිතන්නේ ගරු මන්ත්‍රීතුමා ඒක ගැන කිව්වේ නැහැ. මෙහි තිබෙන වැරැදි ගැන විතරක් පුන පුනා, පුන පුනා එකම දේ කියාගෙන ගියා හැරෙන්නට මේ සම්බන්ධව කථා කළේ නැහැ. මේ මිනිසුන්ට සිදු වුණු අසාධාරණය ගැන කථා කළේ නැහැ.

ලයිට් බිල වැඩි කළාය කියලා මෙතුමන්ලා පහන් පත්තු කරගෙන ගියා. ඒ වාගේ නොයෙකුත් විකාර කළා. නමුත් මේ මිනිසුන්ට සිදු වුණු අසාධාරණය ගැන කවුරුවත් කථා කළේ නැහැ. මම ඒක දැක්කා. මට ඇවිල්ලා කිව්වාට පසුව මා ඒ ගැන සොයා බැලුවා. මම කිව්වා, මීට පසුව පෞද්ගලික වෛද්‍යවරුන්ට මේ ෆෝම් නිකුත් කරන්නේ නැහැයි කියලා. [බාධා කිරීමක්] පනතේම තිබෙනවා, ඇමතිවරයාට බලය තිබෙනවා කියලා. මේක දෙන්නත් පුළුවන්, නොදෙන්නත් පුළුවන්. මේක නොදුන්නාම මේ සල්ලි එන්නේ ආණ්ඩුවට.

දැන් මේ කථා කරන ගම්පහ branch එකේ, 2011 අප්‍රේල් මාසයේ light vehiclesවලට ලයිසන් ගන්න දවසකට ආවේ එක් කෙනායි; මැයි මාසයේ එක් කෙනායි; ජූනි මාසයේ දෙන්නායි; නැවත 2012 අප්‍රේල් මාසයේ දෙන්නායි; 2012 මැයි මාසයේ තුන් දෙනායි; ඊට පස්සේ 2013 -මේ අවුරුද්දේ- ජූනි මාසයේ තුන් දෙනායි. ගරු මන්ත්‍රීතුමනි, මේකට හරියන ගොඩනැඟිල්ලක් තමයි ගත්තේ. මේ ගොඩනැඟිල්ල ගැන ඔබතුමා එහෙම කිව්වාට, මෙන්න මේකට හරියන්නයි ගත්තේ. දවසකට දෙන්නායි, තුන් දෙනායි ලයිසන් ගන්න හිටියේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු ඇමතිතුමා,-

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමා, ඔබතුමාට මම කරදර කළේ නැහැ නේ. මම කාටවත් කරදර කරන්නේ නැතුව මගේ වැඩය කර ගෙන යන මිනිහෙක්. ඔබතුමාට ඕනෑ නම් එළියේදී කියන්නම්, කොහොමද මම ඒ වැඩේ කර ගෙන යන්නේ කියලා. මම ඔබතුමාට කරදර කළේ නැහැ. මම සියල්ලක්ම අහගෙන සිටියා.

Heavy vehicle licences සමහ මේ සියල්ලම ගත්තත්, 2011 අප්‍රේල් මාසයේ average per day 41යි; මැයි මාසයේ 54යි; ජූනි මාසයේ 62යි; 2012 අප්‍රේල් මාසයේ 30යි; මැයි මාසයේ 37යි; ජූනි මාසයේ 27යි.

මම මේ නීතිය පැනෙව්වාට පසුව, -ඒ කියන්නේ මේ හැම එකක්ම රජයට එන්න ඕනෑ, මේක හරියාකාරව බලන්න ඕනෑ කියලා මේ විධියට තීරණයක් ගත්තාට පසුව- මේ සංඛ්‍යාව වැඩි වුණා. 2013 අප්‍රේල් මාසයේ ලයිසන් ගන්න දවසකට 86 දෙනෙක් ආවා; මැයි මාසයේ 132 දෙනෙක් ආවා; ජූනි මාසයේ 149 දෙනෙක් ආවා. ඒ ගම්පහ.

ඒ විතරක් නොවෙයි, අද වන කොට දවසකට සාමාන්‍යයෙන් 225කට ආසන්න සංඛ්‍යාවක් ලයිසන් ගන්න එනවා. ඒක මම පිළිගන්නවා. හොඳ ආදායමකුත් රජය ලබනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංගමය නොවෙයි මේ ආදායම ලබන්නේ. මේක ලංගමත් එක්ක කිසි සම්බන්ධයක් නැහැ. මේ මන්ත්‍රීතුමා පොට වරද්දාගෙන. ලංගමයට මේ සල්ලි යන්නේ නැහැ. මේකේ සල්ලි යන්නේ මහා භාණ්ඩාගාරයට. ලංගමයට සත පහක්වත් ලැබෙන්නේ නැහැ.

අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමාගේ වැරදි මතය මම නිවැරදි කරන්නේ. අලුත් මන්ත්‍රීවරයකු හැටියට ඔබතුමාට මම ශුභ පතනවා. මොකද, අපිත් මුල් කාලයේ ආවාම ඔහොම තමයි. දන්නේ නැති දේවල් කියෙව්වා. නමුත් දැන් පරිණතභාවයට ඇවිල්ලා. දැන් ඉතින් සාමාන්‍යයෙන් දෙයියන්ගේ පිහිටෙන් හැම දෙයක් ගැනම කථා කරන්න පුළුවන්.

මම ඔබතුමාට කියන්නම්. දැන් අපට ආදායම ලැබෙනවා. මුළු ආදායම - total - මේ අවුරුද්දේ ජූනි මාසය වන කොට අපට ලැබිලා තිබෙනවා, රුපියල් 24,677,632.49ක්. මැයි මාසයේ ආදායම රුපියල් 20,801,994.00ක් ලැබිලා තිබෙනවා. මේ විධියට අද ආදායම වැඩි වෙලා තිබෙනවා. ජනවාරි මාසයේ ආදායම තිබුණේ රුපියල් ලක්ෂ 122යි. පෙබරවාරි මාසයේ ආදායම තිබුණේ රුපියල් ලක්ෂ 120යි. මේ වාගේ ආදායම එන්න එන්නම වැඩි වුණත් මේ ආදායම වැඩි වුණේ රජයට මිසක් කුමාර වෙල්ගමගේ සාක්කුවට නොවෙයි; නැත්නම් වෙනත් කෙනෙකුගේ සාක්කුවකටත් නොවෙයි. මේ ආදායම -රුපියල් 750- යන්නේ රජයට. අඩු පාඩුකම් තිබෙනවා. මේ අඩු පාඩුකම් අනුව දැන් අපි ඒකට පිළියමක් යොදලා තිබෙනවා.

කළුතර මගේ දිස්ත්‍රික්කය ගත්තොත්, මේ ආයතනය තිබෙන්නේ කළුතර කච්චේරියේ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා දන්නවා. කළුතර කච්චේරියේ තිබෙන්නේ, වෙන කොහේවත් නොවෙයි. එහාට එන සංඛ්‍යාවට ඒ ස්ථානය සරිලනවා. මොකද, ඒකේ බිම හොඳයි. වේරහැර හොඳයි. වේරහැර අපට දැන් කිසි ප්‍රශ්නයක් නැහැ, අපට කර ගෙන යන්න පුළුවන්. නුගේගොඩ වෛද්‍ය මධ්‍යස්ථානයේ අපට කිසිම ගැටලුවක් නැහැ. හවස තුන හමාර වන කොට සියල්ලම clear කරලා ඉවරයි. මොකද, ආපු ගමන් ගන්න බැහැ නේ. ආවාට පස්සේ සීනි බලන්න ඕනෑ, pressure බලන්න ඕනෑ, blood group බලන්න ඕනෑ, උස බලන්න ඕනෑ, අත පය වැඩ කරනවාද කියලා බලන්න ඕනෑ. මේක මේ එක පාරටම කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

වැරදි විධියට ලයිසන් එකක් දුන්නොත් මොකක්ද වෙන්නේ? ඒකෙන් දුක් විඳින්නේ මමද, තමුන්නාන්සේලාද? නැහැ නේ. පාරේ යන අහිංසක මහජනතාව. ලයිසන් එකකට වෛද්‍ය සහතිකයක් වැරදි විධියට දුන්නොත් ඒකෙන් වන්දි ගෙවන්නේ මේ රටේ මහජනතාව. ඔබතුමා මේවා බලන්නේ නැතිව, සමහර දොස්තර මහත්වරුන්ට කඩේ යන්න කියනවා නම් ඒකත් කරන්න. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ආපු කාලයට ඒක කරන්න. මම කාටවත් කඩේ යන්න නොවෙයි ඉන්නේ. මම ඉන්නේ මේ රටේ මහ ජනතාවට යම් කිසි සේවාවක් කරන්න. ලංගම බස් එක ගත්තත්, කෝච්චිය ගත්තත් විශාල සෙනඟක් ගමන් කරනවා. අද කෝච්චියේ විශාල සෙනඟක් ගමන් කරනවා. අද කෝච්චිය හොඳයි. ලංගමයේ තිබෙන්නේ සියයට 60කට වැඩිය, -සියයට 70ක් පමණ- අවුරුදු 15කට 20කට වඩා පරණ බස්. මගේ model එකේ බස්. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා new model, මම old model. මගෙයි තමුන්නාන්සේගේයි ක්‍රියාකාරීත්වය එකද? නැහැ නේ. තමුන්නාන්සේට හොඳට දුවන්න පුළුවන්. තමුන්නාන්සේට හොඳට එල්ලෙන්න පුළුවන්; පදින්න පුළුවන්. මේ ඔක්කොම කරන්න පුළුවන්. [බාධා කිරීමක්] මට ඉතින් ඒක කරන්න බැහැ නේ. මටයි ගරු අස්වර් මහත්මයාටයි කරන්නත් පුළුවන්. අපි එහෙම පෙන්වනවා, කරන්න පුළුවන් කියලා. අපි සමහර අවස්ථාවලදී පෙන්වලාත් තිබෙනවා. ඒ ක්‍රියාකාරීත්වය වෙනස්. ඒ පරණ ලංගම බස් එක කොහොමද ගොඩ ගන්නේ? බැහැ. අපි ඒ නිසා තමයි දැන් අලුත් බස් ගෙන්වන්නට යන්නේ. දැන් සාකච්ඡා කර ගෙන යනවා බස් 2,000ක් මේ රටට ගෙන්වන්නට. 2006න් පසුව මේ රටට අලුත් ලංගම බස් එකක් ගෙනැල්ලා නැහැ නේ. අපි lease කරලා බස් වගයක් ගත්තා. ඒ නිසා අපි දැන් අලුත් බස් ගේන්නට බලනවා. ඒ නිසා ලංගමය පාඩුවට දුවනවා. ඒක ඇත්ත.

[ගරු කුමාර වෙල්ගම මහතා]

සේවකයින්ට පඩි ගෙවන්නට අමාරුයි. නමුත් අපි පඩි ගෙවා ගෙන යනවා. ඒ වාගේ දුෂ්කරතා මැද්දේ වුණත් අපි ලංගමය විකුණන්නේ නැතිව කර ගෙන යනවා. ඒකයි මේකේ වැදගත්කම. එක්සත් ජාතික පක්ෂය කාලයේ ලංගමය විකුණන්නට හැදුවා. පත්තරේ දැම්මා. පත්තරේ දැම්මාම මේකට ලොකු කොම්පැනි bid කළා. එදා වික්කා නම් අද මහ ජනතාවට මොකද වෙන්නේ? එහෙම නම් අද අපට පුළුවන්ද වැඩි ගාස්තු අය කරන එක නවත්වන්නට? බැහැ. එදා ඒක වික්කා නම් බැහැ. එදා, -මම දැන් නම් කියන්නේ නැහැ- ඒ ඇමතිවරුන්ගේ කාලයේ බස් එක තල්ලු කර ගෙන එළියට ඇවිල්ලා start කර ගෙන නොගියා නම්, එදා ඒ බස් එක දුවනවා නේ. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඒ නිසා හරිහැටි කරුණු අවබෝධ කර ගෙන ඉදිරිපත් කරන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් මේකට විකල්පයක් දෙනවා. අපේ ගරු මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි මේකට විකල්පයක් දෙනවා. මම තොරතුරු අරගෙන ආවා. ගම්පහ ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් වෛද්‍යවරුන් වැඩි කරනවා. දැන් මේ මගේ අතේ තිබෙන්නේ එදා දීපු පරණ form එක. මේකත් පෙන්වන්නට ඕනෑ. මේක නොමිලයේ දුන්නේ. මා අතේ තව එකක් තිබෙනවා, ඒක තමයි දැන් දෙන අලුත් form එක. මේකේ අලුත් features ඔක්කොම තිබෙනවා. දැන් දෙන අලුත් form එක මේකයි. මේක computerize කරන්න පුළුවන්. ඒ හැම දෙයක්ම කරන්න පුළුවන්. ඒ වාගේම අපි මිනිසුන්ට ඉඳ ගැනීමේ පහසුකම් වැඩි කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපි ඉතාම ඉක්මනින් මිනිසුන්ට ඒ පහසුකම් සියල්ලක්ම ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. මොකද, අපි පිළිගන්නවා මේකේ වැරැද්දක් සිදු වෙලා තිබෙනවා කියන එක. ඒක "නැහැ" කියලා අපි කියන්නේ නැහැ. මට හදිසියට මේ තොරතුරු ටික සොයා ගන්නට ටිකක් අමාරුයි. ඒ සඳහා දෙන්න ඕනෑ පිළියම මොකක්ද කියන එක සම්බන්ධව ලේඛන ගෙනැත් තිබෙනවා. මට දැන් ඒ ලේඛනය සොයා ගන්න බැහැ, මට සමාවන්න.

එක මධ්‍යස්ථානයක එක වෛද්‍යවරයෙක් නොවෙයි ඉන්නේ. ඒක අමූලික අසත්‍යයක්. වෛද්‍යවරුන් දෙදෙනෙකු ඉන්නවා. නමුත් අපි දැන් තව එක් වෛද්‍යවරයෙකු වැඩි කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් 225 දෙනෙකුට වෛද්‍යවරුන් 4 දෙනෙකු සිටියාම හොඳටම ඇති. ගම්පහ මහ ඉස්පිරිතාලෙන් ඒ අයගේ කෑම කන වෙලාවේදී නිදහස් කරනවා එක දොස්තර මහත්මයෙක්ව. ගාස්තුව රුපියල් 400ද, රුපියල් 600ද කියන්න මම දන්නේ නැහැ. නමුත් අපි ඒ එක් අයෙකුව නිදහස් කරනවා. එවිට වෛද්‍යවරු 4 දෙනෙක් සිටිනවා. සාමාන්‍යයෙන් එක වෛද්‍යවරයෙකුට පනස් දෙනෙකුව ලෙහෙසියෙන් බලන්නට පුළුවන්. [බාධා කිරීමක්] පනස් දෙනෙක්. මම දන්නවා නේ. ඔබතුමා නොවෙයි නේ ප්‍රවාහන ඇමති. මම නේ ප්‍රවාහන ඇමති. ඔබතුමා එන්නකෝ මම පෙන්වන්නම්. පනස් දෙනෙක් බලන්න පුළුවන්. මම මේ කියන්නේ වගකීමක් ඇතිවයි. පනස් දෙනෙකුව බලන්න පුළුවන්. ඒක එච්චර අමාරු කාර්යයක් නොවෙයි. පණස් දෙනෙක් බලන්න පුළුවන්. වෛද්‍යවරුන් හතර දෙනෙක් සිටියාම හොඳටම ඇති. දැන් අපට වෛද්‍යවරුන් තුන් දෙනෙක් ඉන්නවා. මේ කියපු විධියට පෝලිමක් තිබුණු එක ඇත්තයි. සහතික ඇත්තයි. මම ඒක පිළිගන්නවා. දැන් අපි ඒකට ඉස්සරහට කෑල්ලක් අරගෙන පුටු දමලා ලස්සණට හදනවා, එන මහජනතාවට ඉඳගන්න. ඒ එක්කම මේක රජයේ ආයතනයකට ගෙනියන්න පුළුවන්ද කියන එකත් අපි බලනවා. පුළුවන් වුණොත් කව්චේරියට මම මේක ගෙනියනවා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. අපට ඉඩකඩ අවශ්‍යයි. ඒ ගරු මන්ත්‍රීතුමා කියපු එක සහතික ඇත්තයි. එතුමා ඒක දකින්න ඇති. ඒක ඇත්තයි. ඒක එහෙම නොවෙයි කියා මම කියන්නේ නැහැ. ඒ වාගේම අපි දැන් staff එකත් වැඩි කරනවා. උපාධිධාරීන් බඳවා ගන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒකේ ප්‍රධානියා හැටියට පත් කරන්න යන්නේත් උපාධිධාරියෙක්. ගරු මන්ත්‍රීතුමනි, මට තව මාසයක් කල් දෙන්න. එහෙම නැත්නම් සුමාන තුනක් කල් දෙන්න. වැරැද්දක් නොවෙන විධියට ඔබතුමාට මම ඒක හදා දෙන්නම්.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ සංකල්පය හරි. නමුත් වෛද්‍යවරුන්ට ගෙවන ගෙවන වැඩි කිරීමේ වැඩ පිළිවෙළකුත් හදා ගන්න ඕනෑ. දෙවන එක තමයි එකැන ඉඳ ගන්න තිබෙන ඉඩ ප්‍රමාණයේ 30කට වැඩිය ඉඳ ගන්න බැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ වාගේ සුළු ප්‍රශ්න තිබෙනවා. මොකද, එක් කෙනෙක් දෙන්නෙක් ආපු තැනකට එක පාරටම මෙවැනි සංඛ්‍යාවක් ආවාම ඒක ලොකු ප්‍රශ්නයක් නේ. එතකොට මම මේකෙන් කරලා තිබෙන්නේ හොඳක්. දැන් මේකෙන් රජයට විශාල ආදායමක් ලැබෙනවා. තිබුණු depositsවලින් තමයි මෙච්චර කල් පඩි ගෙවා ගෙන ආවේ. දැන් එහෙම නොවෙයි. දැන් bank account එකේ රුපියල් කෝටි 25ක් තිබෙනවා. ඒ ආයතනයේ depositsවල රුපියල් කෝටි 25ක් තැන්පත් කර තිබෙනවා. අවසානයේදී භාණ්ඩාගාරය තමයි මේ මුදල් ගන්නේ. මොකද, මේක භාණ්ඩාගාරයට අයිති ආයතනයක් නේ. මම ඒ ටික හරිගස්සලා දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය මතක් කර දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. නමුත් අනික් තැන්වල මේ විධියේ තදබදයක් නැහැ. හැබැයි මේ කාර්යාල පහසුකම් නැති තැන් තිබෙනවා. අපි ඒ තැන් පෞද්ගලික අංශයේ දොස්තර මහත්වරුන්ට දෙනවා. පුත්තලමේ අපේ කාර්යාලයක් නැහැ. ඒ නිසා පුත්තලමෙන් තැනක් සොයා ගන්න අපි උත්සාහ කරනවා. පොළොන්නරුවේ නැහැ; මුලතිව්වල නැහැ; මාතලේ නැහැ; කෑගල්ලේ නැහැ; නුවරඑළියේ නැහැ. සාමාන්‍යයෙන් දැනට දොස්තර මහත්වරුන් 127ක් ලියා පදිංචි වෙලා ඉන්නවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(මාණ්පුමිකු அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

පුත්තලමෙන් තැනක් සොයා දෙන්න පුළුවන්.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

තැනක් සොයා දුන්නොත් අපට පුත්තලමේ කාර්යාලයක් ආරම්භ කරන්න පුළුවන්. මේ 127ටම අපි අර forms නිකුත් කරනවා. අධීක්ෂණය යටතේ අපි බලනවා, ප්‍රමිතියකට අනුව හරියාකාරව මේවා ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියා. මේ වෛද්‍ය ආයතනය බොහොම හොඳ ආයතනයක්. රජයට විශාල මුදලක් උපයා දෙන්න මේ ආයතනයට පුළුවන්. ඒ වාගේම එහි සේවය ලබා ගන්නට එන මහජනතාවට අවශ්‍ය සැලකිල්ල දැක්විය යුතුයි කියන එක මම පිළිගන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි ගොඩාක්ම මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඉතා ඉක්මනින් මම එය නිවැරදි කරන බව ප්‍රකාශ කරනවා. ඒ වාගේම මේ වෛද්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් කරන මේ වැඩ පිළිවෙළට විපක්ෂයේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්නය කියා ඉල්ලා සිටිනවා.

ඊ ළඟට, ලංගමයේ සේවකයන් නොමඟ යවන්න එපාය කියා මම ඔබතුමන්ලාට කියනවා. සේවකයෙක් ගහක් උඩට නැග්ගාම

ඔබතුමන්ලා ගිහින් හාල් මිටියක් බානවා. ඒකේ ඇත්ත නැත්ත බලන්නේ නැහැ. මේවා දේශපාලන වාසි ගන්න කරන දේවල්. රට ගැන නොවෙයි හිතන්නේ. දේශපාලන වාසි ගන්න තමයි බලන්නේ. CTB එකෙන් පඩි භාගයක් ගෙවන නිසා උනන්දු වෙලා වැඩ කරන්න කියලායි කියන්න ඕනෑ. "ටයර් ටික හම්බ වෙන්නේ නිකම් නේද, බැටරි ටික හම්බ වෙන්නේ නිකම් නේද, repairs වලට යන වියදමින් භාගයක් විතර head office එකෙන් ගෙවනවා නේද; එහෙම නම් තමුන්නාන්සේලාට ඩීසල්වල වියදම ගෙවා ගෙන, ඉතිරි පඩි භාගය ගෙවා ගෙන යන්න බැරි ඇයි" කියන එකයි අහන්න ඕනෑ. ඒ මිසක් ඒ අයට උඩ ගෙඩි දෙන්න එපා. මට සහයෝගය දෙන්න. මගේ සේවය මේ හැම කෙනෙකුටම අවශ්‍ය වන නිසා, මම කෙළින් කථා කරන මිනිහෙක් නිසා මේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම මට සහයෝගය දෙන බව මම දන්නවා. සියලු දෙනාටම බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.18ට, 2013 ජූලි 24 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 7.18 மணிக்கு பாராளுமன்றம், 2013 யூலை 24, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.18 p.m. until 1.00 p.m. on Wednesday, 24th July, 2013.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

218 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 218 - இல. 6
Volume 218 - No. 6

2013 ජූලි 24 වන බදාදා
2013 யூலை 24, புதன்கிழமை
Wednesday, 24th July, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් :
කුල්ලියියතුල් ඉමාම් ෂාෆිඊ අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) – [ගරු එම්.එස්. තව්ෆික් මහතා] - පළමුවන වර කියවන ලදි
මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) – [ගරු එම්.එස්. තව්ෆික් මහතා] - පළමුවන වර කියවන ලදි

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි

ගරු දයාසිරි ජයසේකර මහතාගේ විශේෂ ප්‍රකාශය

කල්තැබීමේ යෝජනාව:
කාසි සංසරණය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
குல்லிய்யத்துல் இமாம் சாபிஈ அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம்.எஸ். தௌபீக்] - முதன்முறை மதிப்பிடப்பட்டது
மூதூர் நத்வதுல் உலமா அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம்.எஸ். தௌபீக்] - முதன்முறை மதிப்பிடப்பட்டது

இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

மாண்புமிகு தயாசிறி ஜயசேகரவினது விசேட கூற்று

ஒத்திவைப்புப் பிரேரணை:
நாணயக்குற்றிகளின் புழக்கம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:
Kulliyyathul Imaam Shafiee Arabic College (Incorporation) – [The Hon. M.S. Thowfeek] – Read the First time
Naduathul Ulama Arabic College, Mutur (Incorporation) – [The Hon. M.S. Thowfeek] – Read the First time

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:
Read a Second and the Third Time, and passed as amended

SPECIAL STATEMENT BY HON. DAYASIRI JAYASEKARA

ADJOURNMENT MOTION:
Circulation of Coins

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 ජූලි 24 වන බදාදා
2013 யூலை 24, புதன்கிழமை
Wednesday, 24th July, 2013

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාව අනුව, 2013 ජූලි මස 12වන දින මවිසින් පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

උපදේශක කාරක සභා වාර්තා
ஆலோசனைக் குழு அறிக்கைகள்
CONSULTATIVE COMMITTEE REPORTS

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2010 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2010/2011 වර්ෂය සඳහා නෝත්සී සමාගමේ වාර්ෂික ගිණුම් සහ විගණන වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු රෝහණ දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. W.B. Ekanayake - Deputy Minister of Irrigation and Water Resources Management)
ගරු කථානායකතුමනි, අනුරාධපුරය, තුන්වෙනි පියවර, අංක 2245/ඒ2 දරන ස්ථානයෙහි පදිංචි අයි.එම්. ගාමිණී චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වීරකුමාර දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, කැලණිය, පොල්හේන, තෙවැනි පටුමග, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සිරිල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.

ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා - පැමිණ නැත.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය - පැමිණ නැත.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා - පැමිණ නැත.

ගරු හුනෙයිස් ෆාරූක් මහතා- පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1 - 2459/'12- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2 -2586/'12- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඕලුමඩු ගම්මානයේ නැවත පදිංචි කරවූ පවුල් : පහසුකම්
ஒலுமடு கிராம மீள்குடியேற்றக் குடும்பங்கள் : வசதிகள்
FAMILIES RESETTLED IN OLUMADU: FACILITIES

3257/'12

7. ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අවතැන් කඳවුරුවල සිටි ජනතාව මුලතිව් දිස්ත්‍රික්කයේ, ඕලුමඩු ගම්මානයේ නැවත පදිංචි කරවන ලද දිනය කවරේද;

(ii) එම ගම්මානයේ පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව සහ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) නැවත පදිංචි කරවූවන් සඳහා නිවාස ඉදිකර ගැනීමට ලබාදී ඇති ද්‍රව්‍යමය හා මූල්‍යමය ආධාර කවරේද;

(iv) මෙම ගම්මානයට ලබාදී ඇති අනෙකුත් පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඕලුමඩු ගම්මානයේ සිටින,

(i) සිංහල, දෙමළ සහ මුස්ලිම් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) වැන්දඹු කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් පාදයක් අහිමි පිරිමි සංඛ්‍යාව කොපමණද;

(iv) මව සහ පියා අහිමි දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இடம்பெயர் முகாம்களில் இருந்தவர்கள் முல்லைத்தீவு மாவட்டத்தின் ஒலுமடு கிராமத்தில் மீள்குடியேற்றப்பட்ட திகதி யாது;

(ii) மேற்படி கிராமத்தில் குடியேற்றப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை மற்றும் உள்ள வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) மீளக் குடியமர்த்தப்பட்டவர்களுக்காக வீடுகளை அமைத்துக்கொள்ள வழங்கப்பட்டுள்ள பொருள் ரீதியிலான மற்றும் நிதி ரீதியிலான உதவிகள் யாவை;

(iv) இக்கிராமத்துக்கு வழங்கப்பட்டுள்ள ஏனைய வசதிகள் யாவை

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) ஒலுமடு கிராமத்தில் உள்ள,

(i) சிங்கள, தமிழ் மற்றும் முஸ்லிம் குடும்பங்களின் எண்ணிக்கை;

(ii) விதவைப் பெண்களின் எண்ணிக்கை;

(iii) ஒரு பாதத்தை இழந்த ஆண்களின் எண்ணிக்கை;

(iv) தாய் மற்றும் தந்தையை இழந்த பிள்ளைகளின் எண்ணிக்கை

எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement:

(a) Will he inform this House -

(i) the date on which the displaced people who were in displaced camps were resettled in the village of Olumadu in the Mullaitivu District;

(ii) the number of families resettled in that village and the number of houses available therein;

(iii) the material and financial assistance provided to the resettled people for the construction of houses; and

(iv) the other facilities provided to this village?

(b) Will he state in relation to the village of Olumadu -

(i) the number of Sinhala, Tamil and Muslim families;

(ii) the number of widows;

(iii) the number of males who lost one leg; and

(iv) the number of children who lost both parents?

(c) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) එම ජනතාව 2008 සැප්තැම්බර් මාසයේදී අවතැන් වීමෙන් අනතුරුව වවුනියාව මැණික් ෆාම් සහන ගම්මානයේ සහ නැදෑ හිත මිතුරන්ගේ නිවෙස්වල සිට 2010 වර්ෂයේ ජූනි මස 09 දින නැවත පදිංචි කරන ලදී.

(ii) නැවත පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව

නැවත පදිංචි කරන ලද	**පවුල් සංඛ්‍යාව**	**සාමාජික සංඛ්‍යාව**
කඳවුරුවල සිට	119	420
නෑදෑ හිත මිතුරන්ගේ නිවාසවල සිට	50	158
මුළු සංඛ්‍යාව	**169**	**578**

මෙම ගම්මානයේ මේ වන විට ඇති නිවාස සංඛ්‍යාව

නිවාස පිළිබඳ විස්තරය	**පවුල් සංඛ්‍යාව**
නව නිවාස	46
අලුත්වැඩියා කරන ලද නිවාස	01
සම්පූර්ණයෙන් හානියට පත් නිවාස	08
තාවකාලික නිවාස	114
මුළු සංඛ්‍යාව	169

(iii)

සහනාධාරය	නැවත පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව
මුදල් සහනාධාරය රු. 550,000 (ඉන්දියානු නිවාස ආධාර)	46
මුදල් සහනාධාරය රු. 250,000 (UN HABITAT ආයතනයෙන් - නිවාස ආධාර)	01
සෙවිලි තහඩු 12 බැගින්	141

(iv)

සහනාධාරය	පවුල් සංඛ්‍යාව
මුදල් සහනාධාරය රු. 5,000.00	169
මුදල් සහනාධාරය රු. 20,000.00	142
ආහාර නොවන ද්‍රව්‍ය කට්ටල	169
තාවකාලික නිවාස	114
ජීවනෝපාය සහනාධාර	121

(ආ) (i)

ජන වර්ගය	පවුල් සංඛ්‍යාව
සිංහල	-
දෙමළ	169
මුස්ලිම්	-
මුළු ගණන	**169**

(ii) වැන්දඹු කාන්තාවන් තිස් දෙනෙකු වෙසෙති.

(iii) එක් පාදයක් අහිමි පිරිමි දෙදෙනෙකු සිටියි.

(iv) දරුවන් තුන්දෙනෙකු දෙමාපියන් අහිමිව සිටියි.

(ඇ) පැන නොනඟී

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ඔව්. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පිළිතුරේ සඳහන් වුණා, වැන්දඹු කාන්තාවන් තිස් දෙනකු ඉන්නවා කියලා. ඒ පවුල් 169න් ගෘහ මූලිකත්වය දරන කාන්තාවන් සංඛ්‍යාව ගැන ගරු ඇමතිතුමා දැනුවත් වෙලා තිබෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ. එහෙම දැනුවත් වීමක් හෝ විස්තර දැනුම් දීමක් නැහැ. ඔබතුමියට -

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, වැන්දඹුභාවයට පත් වුණු කාන්තාවන් තිහක් වුණත්, ගෘහ මූලිකත්වය දරන කාන්තාවන්ගේ ප්‍රමාණය මීට වැඩියි. ඒ එක්කම ගරු ඇමතිතුමා කිව්වා නැවත පදිංචි කරවීමේදී රුපියල් 5000 ගණනේ දීලා තිබෙනවා කියලා. ඒ වාගේම වියළි ආහාර ද්‍රව්‍ය දුන්නා කිව්වා. ගරු ඇමතිතුමනි ඒවා දුන්නේ කොපමණ කාලයකටද ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඒ තොරතුරු විස්තරාත්මකව ඔබතුමියට ලබා දෙන්න කටයුතු කළ හැකියි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මා දැනුවත් වෙලා තිබෙන ආකාරයට ඒවා දුන්නේ මාස හයකට පමණයි. නමුත් අද වන තෙක්ම වැන්දඹුභාවයට පත් වෙලා ගෘහ මූලිකත්වය දරන කාන්තාවන්ට ජීවනෝපාය මාර්ගයක් නැහැ. මේ හේතුව නිසා ඒ කාන්තාවන් අසීරු තත්ත්වයකට පත් වෙලා සිටිනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමා දැනුවත් වෙලා තිබෙනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ පවුල්වලට ජීවනෝපාය මාර්ග ඇති කර ගැනීමට හැකි තත්ත්වයක් තිබෙනවා. ඒ ගම්මානවල විවිධ ව්‍යාපෘතිවල සේවය කිරීමෙන්, පුහුණු වැඩ කටයුතු කිරීමෙන් ආදායම් ලබන්නට වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
නමුත් මේ වන විටත් කිසිම ජීවනෝපාය මාර්ගයක් නොමැතිව ඉතාම අසීරු තත්ත්වයට පත් වුණු ගෘහ මූලිකත්වය දරන කාන්තාවන් මේ ගම්මානයේ ඉන්නවා කියලා ඔබතුමා දන්නවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ ගම්මානයේ පමණක් නොවෙයි, කොටි සංවිධානය විසින් අනතුරට පත් කරන ලද උතුරු පළාතේ කාන්තාවන් වෙනුවෙන් රජය ඉදිරිපත් වෙලා සහන ලබා දීමේ කටයුතු ඇති කර ගෙන යනවා. ඔබතුමියත් ඒක පිළිගැනීම හොඳයි. ඒ අයට ඒ තැන්වලට යන්න බිම් බෝම්බ ගලවන්න සිද්ධ වුණා. බිම් බෝම්බ ඉවත් කරලා ඒ අයට නේවාසික වීමට හැකි තත්ත්වය උදා කිරීමෙන් පසුව, ගොවිතැන්බත් කටයුතුවලට අද අවතීර්ණ වෙලා තිබෙනවා. එහි ගොස් ඕනෑම කෙනකුට ඒවා බලන්න පුළුවන්. ඒ අනුව රජය ඒ පියවර ගනිමින්, කාල සටහනකට අනුව මේ අයගේ ජීවිත යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යෑමට කටයුතු කරනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝසී සේනානායක්ක)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මේ අය ලියා පදිංචි කළේ 2010 ජූනි මාසයේ 09 වෙනි දා කියලා කිව්වා. මේ 2013 ජූලි මාසය. මේ වෙන කොටත් ජීවනෝපාය මාර්ගයක් නැතිව අසීරු තත්ත්වයකට පත් වුණු කාන්තාවන් මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම තමන්ගේ නිවාස හරියට තනා ගැනීමට අවශ්‍ය කරන පහසුකම්වත් ඔවුන්ට ලැබිලා නැහැ. ඔබතුමා පැහැදිලිවම කිව්වා, බොහෝ නිවාස ඉදි කිරීමට පෞද්ගලික අංශයෙන්, රාජ්‍ය නොවන අංශවලින් උපකාර කළා කියලා. මේ කාන්තාවන්ගේ ජීවනෝපාය මාර්ග ගොඩ නහා ගැනීමට රජය මේ වෙන කොට මොන වාගේ ක්‍රියාදාමයක්ද අරගෙන තිබෙන්නේ? ඔබතුමා කිව්වාට මෙහෙම කර ගෙන යනවා කියලා, 2010 වසරේ ලියා පදිංචි කරපු අය අදටත් කිසි දෙයක් නැතිව ඉතාම අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වය ඔබතුමා දන්නවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමිය අහන්නේ හතරවැනි අතුරු ප්‍රශ්නය. එහෙත් එතුමිය නිසා මා ඒ ප්‍රශ්නයටත් උත්තරය දෙනවා, ගරු කථානායකතුමනි. [බාධා කිරීම] මා ඊට වඩා දෙයක් දැනට කියන්නේ නැහැ. පසු වෙන කොට දැන ගත හැකියි.

ඔබතුමිය කියන කාරණාවට පසු බිමක් තිබෙනවා. අපි මේ අය දිගටම ජීවත් කරවීමට සහ ඒ අයගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඒ අයට පුහුණු වැඩසටහන් ලබා දීම හා ආදායම් ලබා ගැනීමට හැකි කටයුතු දිගටම කර ගෙන යනවා. තම ප්‍රදේශවල පදිංචි වීමට කලින් බිම් බෝම්බ ඉවත් කරන්න ඕනෑ බව ගරු මන්ත්‍රීතුමියත් දන්නා වූ සත්‍යයක්. ඒ බිම් බෝම්බ සවි කරපු අයට -කොටින්ට- ඒවා සවි කරන්න එපා කියලා ඔබතුමියලා කලින් කිව්වා නම් මීට වඩා සේවයක් වනවා. අපි ඒ බිම් බෝම්බ ඉවත් කරමින්, ගෙවල් හදමින්, යළි පදිංචි කරමින් ඒ අය ජීවනෝපාය මාර්ගයට යොමු කරමින් පවතිනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 - 3681/'13 - (1), ගරු නිමල් විජේසිංහ මහතා.

ගරු නිමල් විජේසිංහ මහතා
(මාණ්පුමිකු නිමල් විජේසිංහ)
(The Hon. Nimal Wijesinghe)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ඒ.පී. ජගත් පුෂ්පකුමාර - තෙංකු අපිවිරුත්ති, මක්කළ් තෝට්ට අපිවිරුත්ති අමෛච්චර්)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටතු.
Question ordered to stand down.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 - 3870/'13 - (1), ගරු ශෙහාන් සේමසිංහ මහතා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු චෙහාන් චේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(මාණ්පුමිකු ඒ.පී. ජගත් පුෂ්පකුමාර)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෛ මත්තොරු තිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළෛයිටප්පට්ටතු.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 - 2587/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් : මානව හිමිකම් කොමිසමට කළ පැමිණිලි

புகையிரதத் திணைக்கள பாதுகாப்பு உத்தியோகத்தர்கள்: மனித உரிமைகள் ஆணைக்குழுவில் முறைப்பாடு

SECURITY OFFICERS OF DEPARTMENT OF RAILWAYS : COMPLAINTS TO HUMAN RIGHTS COMMISSION

2712/'12

13. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර, වේරගම්පිට, තොටු පොළ පාර, රත්ගම්වත්තේ පදිංචි පී. ජී. එස්. කේ. වික්‍රමනායක මහතා ඇතුළු දුම්රිය දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙකු අංක HRC / 6061, 6081, 6083, 6099, 6163, 6214, 6306 සහ 06B යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළ බවත්;

(ii) ඔවුන්ට සහන සැලසෙන නිර්දේශයක් මානව හිමිකම් කොමිසම විසින් 2007.07.16 දින ලබා දුන් බවත්,

(iii) එම නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මානව හිමිකම් කොමිසම ලබාදෙන ලද එම නිර්දේශයන් මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම නිර්දේශ ක්‍රියාත්මක කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை, வேரகம்பிட்டிய, தொட்டுபொல வீதி, ரத்கம்வத்தையில் வசிக்கும் திரு. பி. ஜீ. எஸ். கே. விக்கிரமநாயக்க உட்பட புகையிரதத் திணைக்களத்தின் 16 பாதுகாப்பு உத்தியோகத்தர்கள் HRC/6061, 6081, 6083, 6099, 6163, 6214, 6306 மற்றும் 06Bஆம் இலக்கங்களின் கீழ் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவில் முறைப்பாடு செய்துள்ளார்கள் என்பதையும்;

(ii) இவர்களுக்கு நிவாரணம் வழங்கும் சிபாரிசு ஒன்றை மனித உரிமைகள் ஆணைக்குழு 2007/07/16ஆம் திகதி வழங்கியுள்ளது என்பதையும்;

(iii) மேற்படி சிபாரிசு இதுவரை நடைமுறைப்படுத் தப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மனித உரிமைகள் ஆணைக்குழுவினால் வழங்கப்பட்ட சிபாரிசுகள் இதுவரை நடை முறைப்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) குறித்த சிபாரிசுகள் நடைமுறைப்படுத்தப்படு மெனின் அத் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that -

(i) 16 security officers of the Department of Railways including Mr. P. G. S. K. Wickramanayaka residing at Rathgam watta, Thotupola Road, Weragampita, Matara lodged complaints with the Sri Lanka Human Rights Commission under number HRC/6061, 6081, 6083, 6099, 6163, 6214, 6306, and 06B ;

(ii) a recommendation, granting them relief was given by the Human Rights Commission on 16/07/2007; and

(iii) that recommendation has so far not been implemented?

(b) Will he inform this House -

(i) the reasons for not implementing that recommendation given by the Human Rights Commission; and

(ii) if that recommendation is to be implemented, the date on which it will be done?

(c) If not, why?

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) පී.ජී.එස්.කේ. වික්‍රමනායක මහතා ඇතුළු දුම්රිය දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙකු මානව හිමිකම් කොමිසමට නව උසස්වීම් සම්බන්ධව පැමිණිලි ඉහත දක්වා ඇති අංකවලින් ගොනු කර තිබුණි.

[ගරු කුමාර වෙල්ගම මහතා]

(ii) මානව හිමිකම් කොමිෂන් සභාව පහත දැක්වෙන නිර්දේශ 02 ලබා දී තිබුණි.

i. පැමිණිලිකරුවන් සුදුසුකම් ලබන උසස්වීම් සඳහා විධිමත් කාර්ය පටිපාටියක් අනුගමනය කර, විනිවිද පෙනෙන ක්‍රමවේදයන් තුළින් උසස්වීම් ලබා දී, පෙරදාතම කිරීමට සුදුසු පරිදි පියවර ගත යුතුය.

ii. මෙහි පිටපතක් සුදුසු පියවර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ඇත.

(iii) ඉහත ii හි පළමු නිර්දේශය අනුව අදාළ උසස්වීම් විභාග පවත්වා සුදුසුකම් සපුරන ලද නිලධාරීන් පරීක්ෂක තනතුරට හා සහකාර ආරක්ෂක අධිකාරි තනතුරට උසස් කරන ලදී. ඒ අනුව පළමු නිර්දේශය ක්‍රියාත්මක කර ඇත.

(ආ) (i) කෙසේ වෙතත් මීට පෙර කිහිප අවස්ථාවකදීම දේශපාලන කම්ටු තීරණ මත, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මත හා මානව හිමිකම් කොමිෂන් සභා තීරණ මත ආරක්ෂක නිලධාරි හා සහකාර ආරක්ෂක අධිකාරි තනතුරු පුරප්පාඩු පිළිබඳව නොසලකා අධිසේවක පදනම මත උසස්වීම් ලබා දී ඇත.

එබැවින් මානව හිමිකම් කොමිෂන් සභාව ලබා දී ඇති නිර්දේශ අනුව කටයුතු කර උසස්වීම් ලබා දී තිබියදීත් අවශ්‍ය සුදුසුකම් සපුරා නොගත් ඉහත කී නිලධාරීන්ගේ - නියමිත සුදුසුකම් නැති නිලධාරීන්ගේ- විමසීම හේතුවෙන් මේ පිළිබඳව තවදුරටත් ලබා දිය හැකි යම් සහනයක් තිබේද යන්න පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් උපදෙස් පතා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අහලා තිබෙනවා.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ සම්බන්ධව තවදුරටත් ලබා දිය යුතු යම් සහනයක් ඇති බව දන්වා සිටියහොත් මෙම නිලධාරීන්ට එම දැනුම් දීම් පරිදි තවදුරටත් සහනය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමාගේ පිළිතුරේදී කියැවුණා තවදුරටත් ලබා දිය යුතු යම් සහනයක් ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැන්වුවහොත් තමයි මෙක කරන්නේ කියා. එය කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවෙන් තමයි කියැවුණේ.

ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, 2000.03.22, 2005.04.11 සහ 2006.09.11 කියන අවස්ථා තුනේදීම දුම්රිය ආරක්ෂක සේවයේ සැරයන්, උප පරීක්ෂක, පරීක්ෂක, සහකාර අධිකාරි යන තනතුරු සඳහා විභාග, සම්මුඛ පරීක්ෂණ කිසිවක් පවත්වන්නේ නැතුව, පුරප්පාඩු නොතිබුණත් අධි සේවක පදනමින් පත්වීම් 164ක් දුන්නා නම්, මෙතැනදීත් එය කරන්න බැරි ඇයි කියලා. මොකද, එම අවස්ථාවේදී උසස් වීම් ලබා දීලා තමයි ආයතන අධ්‍යක්ෂට හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඒ සම්බන්ධයෙන් දැන්වූයේ. ඉතින් ඒක මෙතැනට අදාළ නොවන්නේ ඇයි?

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)

ඒක මා හරියටම දන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මට බොරුවට උත්තර දෙන්න බැහැ. මා හරියට බලලා ඔබතුමාට ඒකට උත්තරයක් දෙන්නම්. දැන් කියන්න බැහැ. මොකද, මට එක වරටම කියන්න බැහැ නේ, ඔබතුමා මගෙන් මෙහෙම අහන කොට. එහෙම දීලා තිබෙනවා නම් මා ඒ ගැන සැලකිල්ලක් දක්වන්නම්. නමුත් දැන් කියන හැටියට නීත්‍යානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දෙන තීන්දුව මත අපි ඒ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා පළමුවන අතුරු ප්‍රශ්නයට දුන්නු සාධනීය පිළිතුර මත මා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි, මේ ගැන පරීක්ෂා කරලා ඊළඟ උපදේශක කාරක සභාවේදී මේ ගැන පුළුල් සාකච්ඡාවක් කරලා මේ අයට සහන දීම පිළිබඳව සලකා බලන්න කැමැතිද කියලා.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)

මේ ගැන පරීක්ෂා කරලා මා ඔබතුමාට මේ සම්බන්ධව දැනුම් දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

බොහොම ස්තුතියි.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් : විස්තර

நிதி, திட்டமிடல் அமைச்சின் பிரதான அதிகாரிகள் : விபரம்

KEY OFFICIALS OF MINISTRY OF FINANCE AND PLANNING : DETAILS

2893/'12

15. ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් කවුරුන්ද;

(ii) ඉහත සඳහන් නිලධාරීන්ගේ නම්, නිපුණතා, සුදුසුකම් සහ වයස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි සංවිධාන සැලැස්ම කවරේද;

(iv) අමාත්‍යාංශයෙහි උසස්වීම් ප්‍රදානය කරනු ලබන ආකාරය කවරේද;

(v) දේශපාලනීකරණයට අවනත නොවීම හේතුවෙන් අසාධාරණයට ලක්වූ යම් නිලධාරීන් සිටීද;

(vi) එසේ නම්, එම අසාධාරණයෙහි ස්වභාවය කවරේද;

(vii) අගතියට පත් පාර්ශ්වයට ලබා ගත හැකි සහනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிதி, திட்டமிடல் அமைச்சின் பிரதான அதிகாரிகள் யார் என்பதையும்;

(ii) மேற்குறிப்பிடப்பட்ட அதிகாரிகளின் பெயர்கள், ஆற்றல்கள், தகைமைகள் மற்றும் வயது ஆகியன வெவ்வேறாக யாது என்பதையும்;

(iii) அமைச்சின் ஒழுங்கமைப்பு அட்டவணையினை யாது என்பதையும்;

(iv) அமைச்சில் பதவியுயர்வுகள் எவ்வாறு வழங்கப் பட்டு வருகின்றன என்பதையும்;

(v) அரசியல் மயப்படுத்தலின் அழுத்தங்களுக்கு வளைந்து கொடுக்காத காரணத்தினால் எவ ரேனும் அதிகாரிகளைப் பாதிக்கும் வகையில் நீதி முறைச் சீர்குலைவு இடம்பெற்றுள்ளதா என்பதையும்;

(vi) அவ்வாறாயின், அந்த அநீதியின் தன்மை யினையும்;

(vii) பாதிக்கப்பட்ட தரப்பினருக்கு வழங்கப்பட்ட நிவாரணம் யாது என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the key officials of the Ministry of Finance and Planning;

(ii) the names, competencies, qualifications and age of the aforesaid officials, separately;

(iii) the organizational chart of the Ministry;

(iv) as to how the promotions are being granted in the Ministry;

(v) whether there are miscarriages of justice affecting any officials for not having given in to politicization;

(vi) if so, the nature of such injustice; and

(vii) the recourse for the affected party?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) භාණ්ඩාගාර ලේකම් 01
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් 03
අධ්‍යක්ෂ ජනරාල් 18
කොමසාරිස් ජනරාල් 02
පාලක ජනරාල් (ආනයන අපනයන) 01
ප්‍රධාන තක්සේරුකරු 01

(ii) ඇමුණුම 1 මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම 2 මඟින් දක්වා ඇත.

(iv) භාණ්ඩාගාරයේ ලේකම් පත් කරනු ලබන්නේ අතිගරු ජනාධිපතිතුමන් විසිනි.

එම තනතුර සඳහා රටේ ආර්ථිකය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ විදේශ සබඳතා පිළිබඳ විශේෂ දැනුමක් හා පරිචයක් සතු ඉතාම සුදුසු ම පුද්ගලයා පත් කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් කටයුතු කර තිබේ. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරු හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කරනු ලබන්නේ කැබිනට් මණ්ඩලය මඟිනි.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள்:

Annexes tabled:


ඇමුණුම 01

නම	තනතුර	සුදුසුකම්	නිපුනතා	වයස අවුරුදු
ආචාර්ය පී බී ජයසුන්දර මහතා	භාණ්ඩාගාර ලේකම්	Ph.D (Economics)	ජාත්‍යන්තරව පිළිගත් ආර්ථික විද්‍යාඥයකි.	62 මාස11
ආචාර්ය බී.එම්.එස් බටගොඩ මහතා	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්	* *Ph.D. in Environmental Science * MSc in Natural Resources Management * BA Honours(in Geography) * Attorney –at -Law	පරිසර ආර්ථික විද්‍යාව පිළිබඳව හා රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ නිපුනතාවය.	53
එස්.ආර්.ආටිගල මහතා	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්	*M Sc in Economic *B Sc	ආර්ථික විද්‍යාව පිළිබඳ නිපුනතාවය.	52
පුෂ්පා වෙල්ලප්පිලි මෙනවිය	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්	BSc(Hon) ; LL. B, LL. M Post Graduate Diploma in Urban Development Diploma in Marketting Management Certificate in Public Administration	මානව සම්පත් කළමනාකරණය , රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ නිපුනතාවය.	57
එච්.ජී.සුමනසිංහ	අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)	*Master of Public Policy *B.Com	මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ නිපුනතාවය.	50

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

		*Certificate in Public Administration * Certificate for Participated in a Workshop on Public Relations * Certificate in Proper Performance through Self Awareness *Diploma in English for Professionals		
මාලනී ගමගේ මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	*Master's Degree in Development Studies * Post Graduate Diploma in Economic Development * Bachelor of Arts Degree(Hons)	ජාතික ක්‍රමසම්පාදනය පිළිබඳ නිපුනතාවය.	59
අජන්ත කුමාරසිරි මහතා	අධ්‍යක්ෂ ජනරාල් - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	*Degree in Development Studies *B A (Development Studies)	විදේශ සම්පත්, විදේශ ණය, විදේශ ගිවිසුම් (ද්විපාර්ශවික/ බහුපාර්ශවික) පිළිබඳ නිපුනතාවය.	59
ජී.ඩී.සී ඒකනායක මෙනවිය	අධ්‍යක්ෂ ජනරාල්- ජාතික අයවැය දෙපාර්තමේන්තුව	*B Sc (Special) *Post Graduate Diploma in Business Administration	ජාතික අයවැය පිළිබඳ නිපුනතාවය.	55
		*Post Graduate Diploma in Development Administration *Post Graduate Diploma (International Relationship)) * Post Graduate Diploma (Economic Development)		
අනුලා හරස්ගම මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් -රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	Master of Commerce Majoring in Finance Post Graduate Diploma in Management Bachelor of Arts Completed Licentiate Examination	රාජ්‍ය ව්‍යාපාර නියාමනය හා මෙහෙයවීම පිළිබඳ නිපුනතාවය.	54
එන්.ගොඩකන්ද මිය	අධ්‍යක්ෂ ජනරාල්- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	*Master Degree- Public Policy & Management * Post Graduate Diploma in Local Government Administration *Bachelor of Arts -Econ(Sp)	සියලු රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යා කළමනාකරණය පිළිබඳ නිපුනතාවය.	54
කේ.එම්.එම්.සිරිවර්ධන මයා	අධ්‍යක්ෂ ජනරාල්- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	*ශාස්ත්‍රවිදී උපාධිය (ආර්ථික විද්‍යාව) *පශ්චාත් උපාධි ඩිප්ලෝමාව(ආර්ථික	ආර්ථික විද්‍යාව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සැකසීම් පිළිබඳ	49
		සංවර්ධනය) *ශාස්ත්‍රපති උපාධිය(ආර්ථික විද්‍යාව)	නිපුනතාවය	
පී.ඒ ඛයස් මහතා	අධ්‍යක්ෂ ජනරාල් -තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව	*B. Sc (Hons) Post Graduate Diploma in Buisness Computing M B A e-governence	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තොරතුරු කළමනාකරණය පිළිබඳ නිපුනතාවය.	59
ඩී.එස් ජයවීර මහතා	අධ්‍යක්ෂ ජනරාල්- සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව	*M.Sc(Town & Country) *M.Sc(Computer Science) *B.Dev.(Statics)- Special *Senior Cource in Urban Transport Planning *Special Program for Regional & Urban *Planning Studdies *Diploma in Computer Systems & Design	ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව (සංවර්ධන මූල්‍ය) පිළිබඳ නිපුනතාවය	60
පී අල්ගම මහතා	අධ්‍යක්ෂ ජනරාල් -රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව	*Master of Business Administration(MBA) *Bachilorof Commerce (B.Com-Special)	රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ නිපුනතාවය.	53
එච්.එම්.එන්.එස් ගුණවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් - නීති කටයුතු දෙපාර්තමේන්තුව	LL. B, LL. M	රාජ්‍ය අංශයේ නීති කටයුතු පිළිබඳ නිපුනතාවය	53

එම්.එස්.ඩී රණසිරි මහතා	අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	*Degree in B Com	ජාතික ආයවැය කළමනාකරණය යටතේ භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ නිපුනතාවය	55
එන්.ජී.දයාරත්න මයා	අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	B Sc (Public Finance & Taxation Post graduate Diploma in Education Management	රාජය ගිණුම් කළමනාකරණය පිළිබඳ නිපුනතාවය	59
එස්.ඒ.සී.කුලතිලක මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව	*B.Com (Commerce) *Diploma – Financial Management	ගණකාධිකරණය හා විගණන කටයුතු පිළිබඳ නිපුනතාවය.	50
මල්ලිකා සමරසේකර මහත්මිය	කොමසාරිස් ජනරාල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	* B Sc. Mgt. *Law Degree * Master of Public Management	දේශීය ආදායම් රැස්කිරීමේ කටයුතු පිළිබඳ නිපුනතාවය	59
ජගත් පී විජේවීර මහතා	අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව	Master of Economics Master of International Relationship Diploma in Conflict Resolution Diploma in World Affairs and Diplomacy Diploma in World Affairs and Diplomacy		53



ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, වැටි වංචාව සිදු වුණේ තමාගේ කාලයේ නොවෙයි, මේ වාගේ දෙයක් ඇති වුණාය කියා දන්නේ නැහැ කියා මුදල් අමාත්‍යාංශයේ දැනට සිටින ලේකම් කියා තිබෙනවා කියලා අද පත්තරයේ තිබෙනවා මා දැක්කා. දැන් මෑතක සිට බෝවෙන රෝගයක් වාගේ "මතක නැහැ, නින්දෙන් ඇවිදිනවා" වාගේ කථා එන වෙලාවක මා කාරුණිකව ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. ඔබතුමාගේ මුදල් අමාත්‍යාංශයේ 2004 කාලයේ මේක ඇති වෙලා, මෙහෙම තමා නොදන්නවා කියන එක උසාවියට ප්‍රකාශ කිරීම, උසාවියට කරන අගෞරවයක් නොවේ ද? නැත්නම් තමා දරන වැදගත් අමාත්‍යාංශයේ ලේකම් ධුරය භාෂ්‍යයට ලක් කරනවා නොවේ ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සම්පූර්ණයෙන්ම වැරදියි. මොකද? ඒ අදාළ කරුණු සිද්ධ වුණේ මාත්, එතුමාත් එන්න ඉස්සර. මා මුදල් ඇමති වුණා. එතුමා භාණ්ඩාගාරයේ ලේකම් වුණා. ඒවා ඊට ඉස්සර වෙච්ච සිද්ධීන්. ඊට පස්සේ අප ඒක අල්ලා ගත්තේ මා හිතන විධියට 2005 වර්ෂයේයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ. 2003 වර්ෂයේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒක තමයි පිළිතුර. ඒ නිසා ඒකට අදාළ නැහැ. භාණ්ඩාගාරයේ ලේකම්තුමා කියන දෙය සියයට සියයක් හරි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට නැවත මතක් කරනවා මේ වංචාව සිදු වුණේ 2000 වර්ෂයේ බව. ඒ ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ එතුමා සිටින අවස්ථාවේදීයි. ඊට පසුව විගණකාධිපති තුළින් 2003, 2004 කාලයේ මේක හෙළිදරවු වුණා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව පෙරළුණාට පසුව 2003දී -අපේ ආණ්ඩුව කාලයේ- විගණකාධිපතිවරයාට විවෘත වුණු එක හෙළිදරවු වීමක් වුණේ. මේ වංචාව උසාවියට දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මෑතකදී තවත් රුපියල් කෝටි 400ක වංචාවක් වුණා. ඒකත් මෙතුමාගේ කාලාන්තරයේ සිදු වුණේ. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය අහන්න කෝ. ඔබතුමා උත්තර දෙන කොට මම අහගෙන හිටියා. දැන් මම නේ ප්‍රශ්නය අහන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තමුන්නාන්සේට ප්‍රශ්නය විතරයි අහන්න පුළුවන්. කෙටියෙන් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමා කියන පරිදි මම කෙටියෙන් ඒ ප්‍රශ්නය අහන්නේ. මොකද, මාතෘකාවෙන් පැනලා යනවා නේ. මම කාරුණිකවයි කියන්නේ. මේ විධියට උසාවියට අපහාස කරන කොට, තමන් කාර්යයක් කරලා ඒක නැහැය කියලා කිව්වාම කොහොමද මේක ඉදිරියට ගමන් කරන්නේ? මොකද මට මතකයි, මෙතුමාට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියා තිබෙනවා තනතුරක් දරන්න එපාය කියලා. ඒකත් නැද්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මම එක දෙයක් කියන්න ඕනෑ. මේ ගරු සභාවේ පිළිතුරු දෙන්න බැරි නිලධාරීන් ගැන විවිධ චෝදනා කිරීම ඉතාම අශෝභන ක්‍රියාවක්. ඒ වාගේම අප මතක තියා ගන්න ඕනෑ ඉහළ තනතුරු දරන නිලධාරීන් ගැන ප්‍රශ්න අහන්න තිබෙනවා නම්, වාද විවාද කරන්න තිබෙනවා නම් අපේ නීති-රීති යටතේ ඒ සඳහා නොයෙක් විධියේ ප්‍රතිපාදන තිබෙන බව. එහෙම නැත්නම් උපදේශක කාරක සභාවට ඇවිත් ඒ ප්‍රශ්නය නහන්න පුළුවන්. එක එක්කෙනා කියන විධියටම මෙතැනටත් ඇවිල්ලා ඒවා ඇද බාන එක ඉතාම නරක සම්ප්‍රදායයක්. ඒක හොඳ සම්ප්‍රදායක් නොවෙයි. යම් කිසි ඉහළ නිලධාරියෙකුට විරුද්ධව, යම් කිසි ඇමතිවරයකුට විරුද්ධව කරුණු ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන තිබෙනවා. තමුන්නාන්සේලා ඒක කරන්නේ නැතිව මේ ප්‍රශ්න අසන අවස්ථාවේ දී ඒවා ඇද ගැනීම ගරු කථානායකතුමාටත් කරන අගෞරවයක් හැටියට මා සලකනවා. අන්න ඒකයි උත්තරය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා බොහොම වැදගත් පිළිතුරක් දුන්නා. තමන්ගේම කැබිනට් මණ්ඩලයේ 65දෙනෙකුගෙන් එක්කෙනෙකු වන විමල් වීරවංශ ඇමතිතුමා කිව්වා, "පී.බී. ජයසුන්දර කියන්නේ ආර්ථික ඝාතකයෙක්" කියලා. මම නොවෙයි කියන්නේ. විමල් වීරවංශ කිව්වේ. තමන්ගේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක්. [බාධා කිරීමක්] ඉතින් ඔබතුමා මෙහෙම කථා කරනකොට, එතුමා කියපු එකේ සත්‍යතාවක් තිබෙනවාය කියන එකයි පෙනෙන්නේ. ඒක අපි කිව්වාම නරකයි. තමන්ගේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් කියපුවාම - [බාධා කිරීමක්] විමල් වීරවංශ ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

What is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කිසියම් චෝදනාවක් කළා. එය ඉල්ලා

අස් කර ගන්න කියලා එතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය නොවෙයි. Point of Order එකට උත්තරයයි මේ. ඇත්ත වශයෙන්ම මට පෙනෙනවා, - [බාධා කිරීම්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
එම ඇමතිතුමාගේ නම සඳහන් කරන්නට එපා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, විමල් වීරවංශ ඇමතිතුමා කියන කාරණයේ සත්‍යතාවක් තිබෙනවා. [බාධා කිරීම්] ඒක වැරැදි නැහැ. එතුමා කියපු එක වැරැදියි කියලා මම කිව්වාට, මම දැන් කියනවා මම එහෙම කියපු එක වැරැදියි කියලා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
විමල් වීරවංශ ඇමතිතුමා මොකක්ද කිව්වේ?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ රජය ඇතුළේ ආර්ථික ඝාතකයෙක් -නිලධාරියෙක්- ඉන්නවා කියලා මම කිව්වාය කියලා මෙතුමා කියනවා. ඒක පිළිගන්නවාද කියලා මෙතුමා සරත් අමුණුගම ඇමතිතුමාගෙන් අහනවා. අපේ ගමේ ගොඩේ කථාවක් තිබෙනවා, "දන්නා තරම තමයි" කියලා. දන්නා තරම තමයි කියන එකෙන් මම අදහස් කරන්නේ මේකයි. රවි කරුණානායක මන්ත්‍රීතුමාත් දැන ගන්න ඕනෑ, මම කියපු දෙයක් ගැන මගෙන් අහන්න. ඒ වාගේම රවි කරුණානායක මන්ත්‍රීතුමා දැන ගන්න ඕනෑ, මුදල් විෂය භාර නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඒ ගැන ඇහුවාට ඒකට පිළිතුරක් ලැබෙන්නෙත් නැහැ කියලා. ඒක තේරෙන්නේ නැහැ, එතුමාට. ඒ තමයි එතුමා දන්නා තරම. ඒ වාගේම එතුමා දන්නෙත් නැහැ, ආර්ථික ඝාතකයෙක් ඉන්නවාද කියලා. ඒක නේ අපෙන් අහන්නේ. ඒක තේරුම් ගන්නවත් -

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඒ පිළිතුර ප්‍රමාණවත්. කරුණාකරලා ඒ ඇමතිතුමාගේ ප්‍රශ්න ඒ ඇමතිතුමාගෙන් අහන්න. මේ ඇමතිතුමා දන්නේ නැහැ ඒක.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
Point of Order නොවෙයි, තමුන්නාන්සේගේ තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
I rise to a point of Order. ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. මම කොළඹ හිටියාට මමත් ගමේ ගොඩේ කියන දේ පිළිගන්නවා. මොකද, ඔබතුමා කිව්ව දේ අනුව මම වැරදියි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
දෙවන වටය.

2012 කාල්ටන් රග්බි තරඟාවලිය : විස්තර
கால்டன் றக்பி சுற்றுப்போட்டி—2012 : விபரம்
CARLTON RUGBY TOURNAMENT 2012 : DETAILS

2877/'12

3. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)
(මාණ්පුමිකු ජෝන් අමරතුංග - මාණ්පුමිකු දයාසිරි ජයසේකර සාර්පාක)
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2012 කාල්ටන් රග්බි තරඟාවලිය පැවැත් වූ දිනයන් කවරේද;

(ii) එය පැවති ක්‍රීඩාංගන කවරේද;

(iii) ඒ සඳහා ඉදිරිපත් වූ ක්‍රීඩා කණ්ඩායම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත රග්බි තරඟාවලිය සඳහා සහභාගි වූ විදේශීය ක්‍රීඩකයින් කවුරුන්ද;

(ii) එම එක් එක් ක්‍රීඩකයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඊට සහභාගි වූ දේශීය ක්‍රීඩකයින් කවුරුන්ද;

(iv) එම එක් එක් ක්‍රීඩකයාට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාල්ටන් රග්බි තරඟාවලියේ සංවිධායකයින් කවුරුන්ද;

(ii) එම තරඟාවලියේ දේශීය හා විදේශීය අනුග්‍රාහකයින් කවුරුන්ද;

(iii) එම එක් එක් අනුග්‍රාහකයින් ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී තරග විකාශනය කරන ලද රූපවාහිනී නාලිකාව කවරේද;

(v) එම තරඟාවලිය ප්‍රචාරය සඳහා ගිය වියදම කොපමණද;

(vi) ප්‍රචාරක අනුග්‍රාහකත්වය දැරූ ආයතන කවරේද;

(vii) ඒ සඳහා එම ආයතන ලබා දුන් මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ජෝන් අමරතුංග මහතා]

විළයාට්ටුත්තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) 2012 කාල්ටන් රක්බි සුර්රුප්පෝට්ටි,

(i) නටෙපෙර්ර තිකතිකළ් යාවෙයෙන්පතෙයුම්;

(ii) නටෙපෙර්ර මෙතානඞ්කළ් යාවෙයෙන්පතෙයුම්;

(iii) සුර්රුප්පෝට්ටියිල් පඞ්කුපර්රිය විළයාට්ටු අණිකළ් යාවෙ එන්පතෙයුම්

අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) මේර්පටි සුර්රුප්පෝට්ටියිල් පඞ්කුපර්රිය වෙළිනාට්ටු වීරර්කළ් යාවරෙන්පතෙයුම්;

(ii) මේර්පටි ඔව්වොරු විළයාට්ටු වීරුක්කුම් සෙලුත්තප්පට්ට පණත්තොකෙ තනිත්තනියේ එව්වළවෙන්පතෙයුම්;

(iii) ඉතිල් පඞ්කුපර්රිය උළ්ළූර් විළයාට්ටු වීරර්කළ් යාවරෙන්පතෙයුම්;

(iv) මේර්පටි ඔව්වොරු විළයාට්ටු වීරුක්කුම් සෙලුත්තප්පට්ට පණත්තොකෙ තනිත්තනියේ එව්වළවෙන්පතෙයුම්

අවර් ඉච්චපෙයිල් කුරිප්පිටුවාරා?

(ඉ) (i) කාල්ටන් රක්බි සුර්රුප්පෝට්ටියින් ඒර්පාට්ටාළර් යාවරෙන්පතෙයුම්;

(ii) මේර්පටි සුර්රුප්පෝට්ටියින් උළ්නාට්ටු මර්රුම් වෙළිනාට්ටු අනුචරණෙයාළර්කළ් යාවරෙන් පතෙයුම්;

(iii) මේර්පටි ඔව්වොරු අනුචරණෙයාළරුම් වළඞ්කිය පණත්තොකෙ තනිත්තනියේ එව්වළ වෙන්පතෙයුම්;

(iv) මේර්පටි සුර්රුප්පෝට්ටියෙ ඔළිපරප්පිය තොලෙක්කාට්චි අලෙවරිචෙ යාතෙන්පතෙ යුම්;

(v) මේර්පටි සුර්රුප්පෝට්ටියින් ඔළිපරප්පුක්කාන චෙලවිනම් යාතෙන්පතෙයුම්;

(vi) ඔළිපරප්පිර්කාන අනුචරණෙ වළඞ්කිය නිරුවනඞ්කළ් යාවෙයෙන්පතෙයුම්;

(vii) ඉතර්කාක මේර්පටි නිරුවනඞ්කළ් වළඞ්කිය පණත්තොකෙ එව්වළවෙන්පතෙයුම්

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Sports:

(a) Will he state in relation to the Carlton Rugby Tournament 2012

(i) the dates on which it was held;

(ii) the stadiums where it was held; and

(iii) the Rugby teams that participated in it?

(b) Will he inform this House of -

(i) the foreign players who participated in the above Rugby tournament;

(ii) the money paid to each of the aforesaid players separately;

(iii) the local players that participated in it; and

(iv) the money paid to each of the aforesaid players separately?

(c) Will he also inform this House -

(i) of the organizers of the Carlton Rugby Tournament;

(ii) of the local and foreign sponsors of the aforesaid tournament;

(iii) separately, of the money provided by each of the aforesaid sponsors;

(iv) of the television channel that telecast the aforesaid events;

(v) of the advertising cost of the aforesaid tournament;

(vi) of the institutions that provided sponsorship for publicity; and


(vii) of the money provided by the aforesaid institutions for that purpose?

(d) If not, why?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*


(අ) (i) 2012 කාල්ටන් රග්බි තරඟාවලියේ පළමු වටය 2012 මැයි 26 සහ 27 දිනයන්හි දී ද දෙවැනි තරඟ වටය 2012 ජූනි 2 සහ 3 යන දිනයන්හිදී ද පවත්වන ලදී.

(ii) එහි පළමු වටය මහනුවර බෝගම්බර ක්‍රීඩාංගණයේදී ද දෙවෙනි වටය කොළඹ "පොලිස්පාක්" හිදී ද පවත්වන ලදී.

(iii) මීට අමුණා ඇති 'A' ලේඛනය අනුව කණ්ඩායම් දහයක් (Franchise owned teams) සහභාගි විය.

(ආ) (i) කරුණාකර මීට අමුණා ඇති 'B' ලේඛනය බලන්න.

(ii) කරුණාකර මීට අමුණා ඇති 'B' ලේඛනය බලන්න.

(iii) කරුණාකර මීට අමුණා ඇති 'C' ලේඛනය බලන්න.

(iv) කරුණාකර මීට අමුණා ඇති 'C' ලේඛනය බලන්න.

(ඇ) (i) එය සංවිධානය කරන ලද්දේ සී/ස කාල්ටන් ස්පෝට්ස් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ආයතනය විසිනි.

(ii) කරුණාකර මීට අමුණා ඇති 'D' ලේඛනය බලන්න

(iii) අදාළ පිළිතුර වාචිකව ලබා දෙනු ඇත.

(iv) කාල්ටන් ස්පෝට්ස් නෙට්වර්ක් ආයතනයයි.

(v) තරඟාවලිය ප්‍රචාරය සඳහා වූ පිරිවැය දරන ලද්දේ කාල්ටන් ස්පෝට්ස් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) සමාගමයි. අදාළ පිළිතුර වාචිකව ඉදිරිපත් කරනු ඇත.

(vi) ප්‍රචාරක අනුග්‍රාහකත්වය සී/ස කාල්ටන් ස්පෝට්ස් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ආයතනය විසින් සලසන ලදී.

(vii) මුදල් ලබා දීම කාල්ටන් ස්පෝට්ස් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ආයතනය විසින් සිදු කරන ලදී. අදාළ පිළිතුර වාචිකව ඉදිරිපත් කරනු ඇත.

(ඇ) පැන නොනඟී.

"A"

Franchisee Owners:

1.	North Western Blacks	-Asian Finance Plc., T. K. S. Securities Plc., T. K. S. Finance Plc.,
2.	Jaffna Challengers	- Environmental Resources Investments Plc.
3.	Eastern Eagles	- Nation Lanka Finance Plc.
4.	Northern Gladiators	- Gargills Ceylon Plc.
5.	Central Kings	-Access Group of Companies
6.	Southern Sharks	- E-Wis Group of Companies
7.	Sabaragamuwa Stallions	- Vallible Finance Plc., Pan Asia Bank, Hayleys Plc. Rocell Bath ware Ltd., & Ascot Holdings Plc.,
8.	North Central Typhoons	- Avant Guard Security Services (Pvt) Ltd.,
9.	Uva Vipers	- Rank Group of Companies
10.	Western Warriors	- ORIX Group of Companies, Taprobane Holdings Plc., Entrust Limited & Asia Broadcasting Corporation (Pvt.) Ltd.,

"B"

CARLTON SUPER SEVEN'S - 2012

Eastern Eagles - Foreign National Players/Coach

		Name	Country	Amount USD
1	Player	Chris Brightwell	England	$7,398.00
2	Player	Simon Hunt	England	$7,398.00
3	Player	Sam Edgerly	England	$7,398.00
4	Player	Tom Losefo	New Zealand	$7,398.00
5	Coach	Russell Earnshaw	England	$7,398.00
		Total Amount		**$36,990.00**

Southern Sharks - Foreign National Players/Coach

Name	Country	Amount USD
Ed Cocker (Captain)	New Zealand	$ 7,398.00
Pio Tuwai - Fiji	Fiji	$ 7,398.00
Malakkai Fekitoa	New Zealand	$ 7,398.00
Nalu Tuigamala	New Zealand	$ 7,398.00
Chris Roche	Australiya	$ 7,398.00
Total Amount		**$ 36,990.00**

Northern Gladiators Foreign National Players/Coach

		Name	Country	Amount USD
1	Player	M.J.Mentz	South Africa	$7,398.00
2	Player	Ranfred Dasal	South Africa	$7,398.00
3	Player	Slaimankhel Sabir	New Zealand	$7,398.00
4	Player	Deon Helberg	South Africa	$7,398.00
5	Coach	Neil Powell	South Africa	$7,398.00
		Total Amount		**$36,990.00**

North Western Blacks - Foreign National Player/Coach

Name	Country	Amount USD
Frank Halai	New Zealand	$ 7,398.00
Shane Christie	New Zealand	$ 7,398.00
Joe Webber	New Zealand	$ 7,398.00
Warwick Lahmert	New Zealand	$ 7,398.00
Chris Neill	New Zealand	$ 7,398.00
Total Amount		**$ 36,990.00**

North Central Typhoons - Foreign national Players/Coach

		Name	Country	Amount USD
1	Player	Shalom Suniula	U S A	7,398.00
2	Player	Samu Saqiwa	Fiji	7,398.00
3	Player	Metuisela Talebula	Fiji	7,398.00
4	Player	Timoci Vakadranu	Fiji	7,398.00
5	Coach	Clark Laidlaw	New Zealand	7,398.00
		Total Amount		**36,990.00**

Jaffna Challengers Foreign Players/Coach

Name	Country	Amount USD
Osea Kolinsau	Fiji	7,398.00
Setefano Cakaunivalu	Fiji	7,398.00
Nasoni Roko	Fiji	7,398.00
Taniela Rawaqa	Fiji	7,398.00
Mike Friday	England	7,398.00
Total Amount		**36,990.00**

Central Kings Foregin national Player/ Coach

		Name	Country	Amount USD
1	Player	Zar Lawrence	New Zealand	$7,398.00
2	Player	Dan Norton	England	$7,398.00
3	Player	Matt Turner	England	$7,398.00
4	Player	Zac Test	U S A	$7,398.00
5	Coach	Geoff Alley	New Zealand	$7,398.00
		Total Amount		**36,990.00**

Uva Vipers Foreign National Player/Coach

Name	Country	Amount USD
Tomasi Cama	New Zealand	$7,398.00
Tim Mikkelson	New Zealand	$7,398.00
Charles Piutau	New Zealand	$7,398.00
D.J.Forbes	New Zealand	$7,398.00
Peter Woods	New Zealand	$7,398.00
Total Amount		**$36,990.00**

Western Warriors Foreign National Player/Coach

		Name	Country	Amount USD
1	Player	Lote Raikabula	New Zealand	7,398.00
2	Player	Rupeni Levase	Western Samoa	7,398.00
3	Player	Waisake Naholo	New Zealand	7,398.00
4	Player	Mark Atkins	New Zealand	7,398.00
5	Coach	Blair Mills	New Zealand	7,398.00
		Total Amount		**36,990.00**

Sabaragamuwa Stallions Foreign national Player/Coach

Name	Country	Amount USD
Jack Wilson -	New Zealand	$7,398.00
Bryce Heem	New Zealand	$7,398.00
Mark Jackman	New Zealand	$7,398.00
Johnathan Malo	New Zealand	$7,398.00
Charles Baxter	New Zealand	$7,398.00
Total Amount		**$36,990.00**

$ 369,900.00

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

"C"

CARLTON SUPER 7'S - 2012

NAMES OF THE LOCAL PLAYERS PARTICIPATED AND THE MONEY PAID TO THEM

		Eastern Eagles - Local Players		
		Name	Amount Per Day	Total Amount
1	Player	Sandun Herath	81,400	1,302,400
2	Player	A Wilwara	81,400	1,302,400
3	Player	Samantha Lakshan	26,000	416,000
4	Player	Thusitha Samarathilake	15,000	240,000
5	Player	Niroshan Fernando	20,000	320,000
6	Player	Chamara Vithanage	15,000	240,000
7	Player	Sudrshana Muthuthanthri	74,000	1,184,000
8	Player	Amjad Buksh	11,000	176,000
9	Manage	Rajeew Perera		100,000
10	Asst Coach	Mothilal Jayathilake		100,000
		Total Amount		**5,380,800**

Southern Sharks - Local Players		
Name	Amount Per Day	Total Amount
D Chathuranga	47,300	756,800
Sooriyabandara	47,300	756,800
Dushantha Lewke	37,000	592,000
Shanka Kumara	8,000	128,000
Mekalanka Perera	5,000	80,000
Shabeer Mohamed	5,000	80,000
Kosala Tisera	9,000	144,000
Ashean Karathelis	43,000	688,000
Mahesh Kumara		100,000
Asanga Rodiro		100,000
Total Amount		**3,425,600**

		Nothern Gladiators - Local Players		
		Name	Amount Per Day	Total Amount
1	Player	Dinesh Kumar	56,100	897,600
2	Player	Lakala Pertera	56,100	897,600
3	Player	Shane Aravinda Disanayake	40,000	640,000
4	Player	Gayan Rathnage	41,000	656,000
5	Player	Shahikala Udayakumara	7,000	112,000
6	Player	Mithun Haugodage	51,000	816,000
7	Player	Mohamad Rizwan	5,000	80,000
8	Player	Pethum Chathuranga	5,000	80,000
9	Manage	Senaka Amarasinghe		100,000
10	Asst Coach	M J M Mustak		100,000
		Total Amount		**4,379,200**

North Western Blacks - Local Players		
Name	Amount Per Day	Total Amount
R. Hettiarachchi	64,900	1,038,400
Chanaka Chandimal	64,900	1,038,400
Dilip Selvam	59,000	944,000
Pardeep Kurukulasuriya	25,000	400,000
Prasad Devendra	5,000	80,000
Remageeth Peris	7,000	112,000
Puem Jayasinghe	30,000	480,000
Sayaru Anthony	5,000	80,000
Dilroy Fernando		100,000
Sudath Sampath		100,000
Total Amount		**4,372,800**

		Western Warriors - Local Players		
1	Player	Dilan Soyza	48,400	774,400
2	Player	Viswamithra	48,400	774,400
3	Player	Shenal Dias	40,000	640,000
4	Player	Sasanka Ariyaratne	10,000	160,000
5	Player	Rajitha Abeykoon	5,000	80,000
6	Player	Kanchana Ramanayake	15,000	240,000
7	Player	Madushan Iddmalgoda	5,000	80,000
8	Player	Jeevan Amaradasa	5,000	80,000
9	Manage	S.W Chang		100,000
10	Asst Coach	Inthi Markir		100,000
		Total Amount		**3,028,800**

Sabaragamuwa Stalliions - Local Players		
S Handapangoda	71,500	1,144,000
C Senaviratne	71,500	1,144,000
Ahdrew Benson	20,000	320,000
Sajith Saranga	65,000	1,040,000
Udaya Hettiarachchi	15,000	240,000
Gayan Udara Liyanege	5,000	80,000
Heshan Gunaratne	31,000	496,000
Dinesh Liyanege	5,000	80,000
Waruna De Silva		100,000
Anwer Jayah		100,000
Total Amount		**4,744,000**

		North Central Typhoons - Local Players		
		Name	Amount Per Day	Total Amount
1	Player	Sajith Sihaid	44,000	704,000
2	Player	S Pushpakumara	26,000	416,000
3	Player	Ruchira Ratnage	6,000	96,000
4	Player	Gayan Ratnayake	38,000	608,000
5	Player	Mushin Faleel	40,000	640,000
6	Player	Randima Mahawaththa	28,000	448,000
7	Player	Ashan Gallage	38,000	608,000
8	Player	Chamara Dabare	5,000	80,000
9	Manage	Nilame Samarakoon		100,000
10	Asst Coach	Chaminda Yapa		100,000
		Total Amount		**3,800,000**

Jaffna Challengers - Local Players		
Name	Amount Per Day	Total Amount
Yoshitha	36,300	580,800
E. Weerakkody	5,000	80,000
Niranjan Wicramratne	33,000	528,000
Rehan Weerakoon	27,000	432,000
Thilan Madhushanka	25,000	400,000
Dilip Methruwan	16,000	256,000
Tuan Shamkock Arbber	5,000	80,000
M R C Silva	5,000	80,000
Anuradha Fonseka		100,000
Nilufer Ibrahim		100,000
Total Amount		**2,636,800**

		Central Kings - Local Players			Uva Vipers - Local Players		
		Name	Amount Per Day	Total Amount	Name	Amount Per Day	Total Amount
1	Player	M. Sheriff	60,500	968,000	R. Mubarak	45,000	720,000
2	Player	Chula Susantha	60,500	968,000	Lasintha De Costa	45,000	720,000
3	Player	N Karunanayake	40,000	640,000	Ashan De Costa	32,000	512,000
4	Player	Pubudu Kodagoda	55,000	880,000	Lee Keegel	31,000	496,000
5	Player	Rajitha Sansoni	25,000	400,000	Ranjan Senaviratne	12,000	192,000
6	Player	Nigel Ratwatte	35,000	560,000	Chilanka Sudharaka	27,000	432,000
7	Player	Dilshan Kelaniyagoda	20,000	320,000	Mohamed Sashan	31,000	496,000
8	Player	Malitha Jayaruwan	6,000	96,000	Nayakaratne M Duminda	22,000	352,000
9	Manage	Felix Wijesinghe		100,000	Rohan Chinthaka		100,000
10	Asst Coach	Sheik Hussain		100,000	Sanath Martis		100,000
		Total Amount		5,032,000	Total Amount		4,120,000

Total	40,920,000

"D"

Local Sponsors:

1. Sri lanka Insurance Corp. Ltd.
2. Sri Lanka Telecom.
3. Mobitel.
4. Keells.
5. KIK Cola.
6. Elephant House.
7. Samsung.
8. Flemingo duty free.
9. MAS Holdings.
10. Huawei.

රජයේ වියදම් සීමා : නිරීක්ෂණය

அரசாங்கத்தின் செலவின எல்லைகள்: அவதானிப்பு

EXPENDITURE LIMITS OF GOVERNMENT: OBSERVATION

2892/'12

4. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රජයේ වියදම, විනිවිදභාවය මත පදනම්ව අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය හෝ පාලනය කරනු ලබන්නේ කවර ආකාරයටද;

(ii) අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථාවල වියදම් සීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමිති නියම කිරීම සහ යාවත්කාලීන කිරීම භාරව සිටින්නේ කවුරුන්ද;

(ii) ඉහත කී ප්‍රමිති අවසන් වරට යාවත්කාලීන කරන ලද දිනය සහ නැවත යාවත්කාලීන කරනු ලබන දිනය කවරේද;

(iii) කැබිනට් අමාත්‍යවරයෙකුට, අමාත්‍යාංශයකට, දෙපාර්තමේන්තුවකට සහ සංස්ථාවකට අනුමත කළ හැකි ටෙන්ඩර් සීමාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ටෙන්ඩර් සම්බන්ධයෙන් පැන නැගිය හැකි යම් දූෂණයක් පිළිබඳව වගකීම දැරිය යුතු පුද්ගලයා හෝ ආයතනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தின் செலவினமானது வெளிப்படைத் தன்மையின் அடிப்படையில் எவ்வாறு அமைச்சினால் அவதானிக்கப்படுகின்றது அல்லது கட்டுப்படுத்தப்படுகின்றது என்பதையும்;

(ii) அமைச்சுகள், அரசாங்கத் திணைக்களங்கள் மற்றும் கூட்டுத்தாபனங்களின் செலவின எல்லைகள் வெவ்வேறாக யாது என்பதையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) கேள்விப் பத்திரங்கள் மற்றும் நடைமுறைகளின் நியமங்களை நிர்ணயிப்பதற்கும் இற்றைப் படுத்துவதற்கும் பொறுப்பாக இருக்கும் நபரையும்;

(ii) மேற்குறிப்பிடப்பட்ட நியமங்கள் கடைசியாக எப்போது இற்றைப்படுத்தப்பட்டன என்பதையும் அவை மீண்டும் எப்போது இற்றைப்படுத்தப் படும் என்பதையும்;

(iii) அமைச்சரவை அமைச்சரினாலும் அமைச்சு, திணைக்களம் மற்றும் கூட்டுத்தாபனம் ஆகிய வற்றினாலும் அங்கீகரிக்கப்படக்கூடிய கேள்விப் பத்திர எல்லைகளை வெவ்வேறாகவும்;

(iv) கேள்விப் பத்திரங்கள் தொடர்பில் ஏற்படக்கூடிய ஏதாவது ஊழல்களுக்குப் பொறுப்புக் கூற வேண்டிய நபர் யார் அல்லது அமைப்பு யாது என்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல் ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) as to how the Government expenditure is kept under observation or controlled by the Ministry on the basis of transparency; and

(ii) the expenditure limits of the Ministries, Government Departments and Corporations separately?

(b) Will he also state -

(i) the person who is in charge of setting and updating the standards of tenders and procedures;

(ii) as to when the aforesaid standards were last updated and it will be updated again;

(iii) the tender limits that can be approved by a Cabinet Minister, a Ministry, a Department and a Corporation separately; and

(iv) the person or entity that should hold the responsibility for any corruption that could be occurred in relation to the tenders?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම මේ ගරු සභාවේ සිටින නිසා පිළිතුර ලබා දෙන්න කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ප්‍රශ්නය අහන මුල් අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ සිටියේ නැහැ. ඒ නිසා මම පිළිතුර දෙන්න බැඳිලා නැහැ. නමුත් ගරු කථානායකතුමා කියනවා නම් මම උත්තර දෙන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාමාන්‍යයෙන් දෙවෙනි වටයේදී පිළිතුරු සභාගත කිරීම තමයි සිද්ධ වන්නේ. නමුත් ගරු ඇමතිතුමා උත්තර දෙන්න සූදානම් නිසා පිළිතුර ලබා දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රහපෑම්වලට ඉස්සෙල්ලා ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න. රහපෑම් තිබෙයි තව පොඩ්ඩකින්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාගේ තීරණය මොකක්ද ගරු කථානායකතුමනි?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාට උත්තරයක් ලබා දෙන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, ඔබතුමාට අවනත වෙලා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට උත්තරය ලබා දෙනවා.

(අ) (i) වාර්ෂික අයවැය ඇස්තමේන්තු හරහා රජයේ විවිධ කාර්යයන් වෙනුවෙන් වියදම් දැරීම සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන සීමාවන් යටතේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. මෙලෙස වෙන් කරනු ලබන ප්‍රතිපාදන විනිවිද භාවයකින් යුතුව නිසි පරිදි වියදම් කිරීම සහතික කිරීම සඳහා මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා විවිධ චක්‍රලේඛ මඟින් ද වියදම් පිළිබඳ සීමාවන් සහ මාර්ගෝපදේශයන් දක්වා ඇත.

එසේම, අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් කර ඇති ආකාරය පිළිබඳ මාසික වාර්තා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තා භාණ්ඩාගාරය විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තා සමඟ සසඳා බැලීමත් ඒ මත පදනම්ව ඉදිරි අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන හා අරමුදල් නිදහස් කිරීමත් සිදු කරයි. සියලු අමාත්‍යාංශ තුළ අභ්‍යන්තර විගණන ඒකකයන් ස්ථාපිත කර ඇති අතර, එමඟින් ද එම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල වියදම් පිළිබඳව නිරන්තර විගණනයන් සිදු කෙරේ.

ඊට අමතරව, සියලුම රාජ්‍ය ආයතනවල වියදම් හා ගිණුම් වාර්ෂිකව විගණකාධිපතිගේ පූර්ණ අධීක්ෂණයට ලක් වන අතර, එම වියදම් මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අදාළ අනෙකුත් චක්‍රලේඛයන්හි දැක්වෙන නියමයන්ට අනුකූලද යන වග විගණකාධිපති විසින් විමර්ශනයට ලක් කෙරේ.

මේ සම්බන්ධයෙන් විගණකාධිපති විසින් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව හරහා පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි. තවද, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතට අනුව, අදාළ වර්ෂයේ ජූනි 30ට පෙර සහ නොවැම්බර් මාසයේ අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී රාජ්‍ය වියදම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරනු ලබයි. රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය පිළිබඳ වාර්තාද නිශ්චිත දිනවලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර

පාර්ලිමේන්තු අනුමැතිය ලද පසු ඒවායේ මුද්‍රිත වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි.

(ii) අමාත්‍යාංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂික අය වැය ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ හරහා වියදම් සීමා පනවනු ලබයි. 2013 වර්ෂය සඳහා සම්මත කරන ලද අය වැය ඇස්තමේන්තු අනුව වැය ශීර්ෂ 202ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. විශේෂ වියදම් ඒකක 22ක්, අමාත්‍යාංශ 54ක් හා දෙපාර්තමේන්තු 126ක් ඊට අයත් වේ. 2013 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද එම සවිස්තරාත්මක වියදම් ඇස්තමේන්තු ඇතුළත් මුද්‍රිත ඇස්තමේන්තු මා **සභාගත*** කරනවා.

සංස්ථා සම්බන්ධයෙන් අදාළ ආයතනයටම විශේෂිත වූ මුදල් හා කාර්ය පටිපාටි සංග්‍රහ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කර ගෙන නොමැති නම් එම ආයතන සඳහාද රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සඳහා අදාළ වන මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අනිකුත් චක්‍රලේඛ අදාළ වේ.

ගරු මන්ත්‍රීතුමනි, බොහෝ අවස්ථාවල අභවල් චක්‍රලේඛය, අභවල් පරිපාලන නීති, මුදල් සංග්‍රහයේ අභවල් නීති ඒ අයට බලපානවා කියලා ඒ සංස්ථාවේම අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වෙලා තීරණය කරනවා.

(ආ) (i) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හා ක්‍රියාවලිය පිළිබඳව විධිවිධාන සැලසීම්, සමාලෝචනය හා යාවත්කාලීන කිරීම පිළිබඳ වගකීම දරයි.

(ii) 2006 වර්ෂයේදී ප්‍රකාශිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය අවශ්‍යතාව අනුව වරින් වර චක්‍රලේඛ හා අතිරේක මඟින් යාවත්කාලීන කෙරේ. 2006 වසරේ සිට මේ දක්වා ප්‍රසම්පාදනය හා සම්බන්ධ අතිරේකයන් 27ක් සහ චක්‍රලේඛ 9ක් නිකුත් කර ඇති අතර, අවසන් වරට යාවත්කාලීන කර ඇත්තේ 2013.01.02 දිනය. මෙම චක්‍රලේඛ සහ අතිරේකයන්ද ඇතුළත් කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සංශෝධනය කර නිකුත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

(iii) එක් එක් ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාව හා එම කමිටු නිර්දේශ අනුමත කිරීමේ බලධාරින් පිළිබඳ විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත**** කරමි.

(iv) ප්‍රසම්පාදන ක්‍රියාවන්හි වගකීම අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පැවරේ.

(ආ) පැන නොනඟී.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

*****සභාමේසය මත තබන ලද ඇමුණුම:***

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :

Annex tabled:

ඇමුණුම

අ) වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් එක් එක් ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාව

බල අධිකාරය	ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු	විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 1500 වැඩි	රුපියල් මිලියන 500 ට වැඩි
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 150 දක්වා	රුපියල් මිලියන 500 දක්වා
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව / ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 50 දක්වා	රුපියල් මිලියන 150 දක්වා
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 5 දක්වා	රුපියල් මිලියන 5 දක්වා

කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රසම්පාදන කමිටු විසින් කර ඇති නිර්දේශ සඳහා පහත සඳහන් අධිකාරිත්ගේ අනුමැතිය ලබාගත යුතුය.

ප්‍රසම්පාදන කමිටුව	අනුමැතිය ලබාගත යුතු අධිකාරිය
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව	අමාත්‍ය මණ්ඩලය
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව	
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව	
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව	දෙපාර්තමේන්තු ප්‍රධානියා

(ආ) උපදේශකවරුන් තෝරාගැනීම සහ සේවයේ යෙදවීම සඳහා උපදේශක කමිටුවල අධිකාරී සීමාවන්

උපදේශකවරුන් තෝරාගැනීමේ ක්‍රියාපටිපාටිය	බල අධිකාරය	ජාතික වශයෙන් ප්‍රසිද්ධ කිරීම	අන්තර්ජාතික සහ ජාතික වශයෙන් ප්‍රසිද්ධ කිරීම
ගුණාත්මක භාවය හා පිරිවැය මත පදනම්ව තෝරාගැනීම (QCBS) / ගුණාත්මක භාවය මත පදනම්ව තෝරාගැනීම (QBS) / ස්ථාවර අයවැයක් යටතේ තෝරාගැනීම (FBS) / අවම පිරිවැයක් යටතේ තෝරාගැනීම (LCS)	අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි	රුපියල් මිලියන 200 හෝ ඊට වැඩි
	අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 100 ට අඩු	රුපියල් මිලියන 200 ට අඩු
	දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව / ව්‍යාපෘති උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 20 ට අඩු	රුපියල් මිලියන 50 ට අඩු
උපදේශකවරයාගේ සුදුසුකම් මත පදනම්ව තෝරාගැනීම (CQS) / තනි ප්‍රභව තෝරාගැනීම (SSS)	අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 25 හෝ ඊට වැඩි	රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි
	අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 25 ට අඩු	රුපියල් මිලියන 100 ට අඩු
	දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව / ව්‍යාපෘති උපදේශක ප්‍රසම්පාදන කමිටුව	රුපියල් මිලියන 5 ට අඩු	රුපියල් මිලියන 20 ට අඩු
	ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පත්කළ කමිටුවක් මඟින් කරන ලද නිර්දේශයක් මත)	රුපියල් 500,000 ට අඩු	රුපියල් මිලියන 5 ට අඩු
	ගණන්දීමේ නිලධාරී / ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පත්කළ කමිටුවක් මඟින් කරන ලද නිර්දේශයක් මත හෝ බලය පැවරීමක් මත)	රුපියල් 250,000 ට අඩු	රුපියල් මිලියන 3 ට අඩු

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ Chief Accounting Officerගේ නම මොකක්ද කියා කරුණාකර දැනුවත් කරන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
භාණ්ඩාගාරයේ ලේකම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
පී.බී. ජයසුන්දර මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පී.බී. ජයසුන්දර මැතිතුමා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් ප්‍රශ්න කීයක්ද? දැන් ප්‍රශ්න තුනක්-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. ඒක එක ප්‍රශ්නයක්. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. නම අහන එකත් ප්‍රශ්නයක් නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ නිසා තව එක ප්‍රශ්නයටයි ඉඩ තිබෙන්නේ. මේක උසාවියක් නොවෙයි නේ, ගරු කථානායකතුමනි. මෙතැන හරස් ප්‍රශ්න අහන්න බැහැ නේ. එහෙම නම් මටත් හරස් ප්‍රශ්න අහන්න පුළුවන්නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අහන්නයි ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නයි කෙටියෙන් පුරුදු වුණොත් හොඳයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තව එක ප්‍රශ්නයටයි මම උත්තර දෙන්නේ. ඕනෑ දෙයක් අහන්න. එක ප්‍රශ්නයටයි උත්තර දෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ ගරුත්වයත් ආරක්ෂා කරන මෙතැනට අප පත් වෙලා තිබෙන්නේ මේ වාගේ මොන්ටිසෝරි ප්‍රශ්න අහන්න නොවෙයි. අපි මෙතැන ඉන්නේ ඔබතුමාගේ පිහිට තුළිනුයි. ඒ නිසා වැදගත් ප්‍රශ්න අහන්න ඕනෑ. මම ඇහුවේ නම මොකක්ද කියායි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නමට පිළිතුරු දුන්නා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම "භාණ්ඩාගාරයේ ලේකම්" කියන එක නොවෙයි නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, බොහොම කලාතුරකින් මෙතුමා ස්වයං විවේචනයක් කර ගන්නේ. බොහොම සන්තෝෂයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. මගේ දෙවන අතුරු ප්‍රශ්නය වන්නේ -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කථානායකතුමා කිව්වේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම තව එක ප්‍රශ්නයටයි උත්තර දෙන්නේ. භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ නම මොකක්ද කියන එකත් ප්‍රශ්නයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක ප්‍රශ්නයක් තමයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැනේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඇහුවේ නම මොකක්ද කියායි. ඒකට උත්තර දුන්නේ "භාණ්ඩාගාරයේ ලේකම්" කියායි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතකොට ප්‍රශ්න දෙකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතකොට අපට තේරෙන්නේ නැහැ, එතුමා උත්තර දෙන්නේ මොනවාද කියා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතකොට ප්‍රශ්න දෙකයි නේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නම ඇහුවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නම ඇහුවේ. ඒ පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ප්‍රශ්න සීයක් ඇහුවත් මම එකකට විතරයි උත්තර දෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකර ඒකට Ruling එකක් දෙන්න.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. ඇමතිතුමාට ඕනෑ ආකාරයට උත්තර දෙන්න පුළුවන්. ප්‍රශ්නය අහන්න කෝ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දෙවන අතුරු ප්‍රශ්නයයි අහන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊළඟට ඒකත් ප්‍රශ්නයක් වෙනවා. හොඳයි. දැන් අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය. [බාධා කිරීමක්] මූලාසනයේ ඉන්නේ කථානායකතුමා නේ. ඇමතිතුමා නොවෙයි. ඒ නිසා එතුමා කියන පරිදි මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් තමයි මුදල් අමාත්‍යාංශයේ අය වැය සකස් කරන්නේ. එතුමා මුදල් අමාත්‍යාංශය තුළින් වැය ශීර්ෂ, ආදායම් ශීර්ෂ ඇතුළත් කර සකස් කරන අය වැය තමයි නොවැම්බර් මාසයේ මේ සභාවට ඉදිරිපත් කරන්නේ. පසු ගිය අවුරුද්දේ අය වැය හිඟය කෝටි 45,800යි. හැබැයි, අපිට මෙහාට ඒ අය වැය හිඟයෙන් සියයට 28ක Supplementary Estimates එවනවා. Budget Head 243 යටතේ එහෙම වෙන් කරනවා නම් මේකේ ප්‍රශ්නයක් තිබෙනවා කියා ඔබතුමා පිළිගන්නවාද? එහෙම වෙනවා නම් කරුණාකර කියන්න, කොහොමද -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ. දැන් එතැන ප්‍රශ්න දෙකයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මම උත්තරයක් දෙන්නම්. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මම උත්තරයක් දෙන්නම්. මේකෙන් පැහැදිලිව පෙනෙනවා, අපේ හිතවත් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා public finance කියන්නේ මොනවාද කියලා දන්නේ නැහැ කියන එක. [බාධා කිරීමක්] දන්නේ නැහැ. දන්නවා නම් ඔහොම කථා කරන්නේ නැහැනේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඔව්. අපි මොනවත් නොදන්නා-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක තමයි. ඔය ආයෙම කරන්නේ ස්වයං විවේචනයක්. [බාධා කිරීමක්] මා කියන දේ අහ ගන්න. කරුණාකර, අපි කියන දේත් අහ ගන්නකෝ. අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ ඔබතුමා කියන විධියට භාණ්ඩාගාරයේ ලේකම්තුමා නොවෙයි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමායි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට ඇහෙන්නේ නැද්ද? මම ඒක තමයි කිව්වේ. එතුමා හදන එක මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා -[බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. [බාධා කිරීමක්]ඒක සම්පූර්ණයෙන් වැරදියි. බොහෝ අවස්ථාවලදී භාණ්ඩාගාරයෙන් එන ඒ සංඛ්‍යා ලේඛන මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමා වෙනස් කරනවා. ඒ කථාව වෙනස් කරනවා. ඔබතුමාම දන්නවා මේ ගරු සභාවට ඇවිල්ලා

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ගරු ජනාධිපතිතුමා එතුමාගේ අදහසුත් ප්‍රකාශ කරන බව. සමහර විට ඒවා ඒ සටහනෙත් නැහැ. ඒ නිසා අය වැය පිළිබඳ වගකීම නිලධාරියකුට දෙනවායි කියලා අපට පිළිගන්න බැහැ; මේ පාර්ලිමේන්තුවට පිළිගන්න බැහැ. ඒක මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ වගකීමයි. ඊළඟට දෙවැනි කරුණ. [බාධා කිරීමක්] තව කියන්න තිබෙනවා. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉන්න අවස්ථාවේ -[බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවුරු හරි කියන ලද දෙයක් ගැන ආපසු කියන්න එපා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප්‍රේල් මාසයේ 28වැනි දා එතුමා එහෙම කියලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා "නැහැ" කියලා කියනවා. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතුමා දැන් මෙතැන ඉන්නවා නේ. ඒක -[බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමාගේ කථාව මෙතුමා දන්නේ නැහැ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා දැන් තව අතුරු ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නයට උත්තර දුන්නාම අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නයට මම උත්තර දෙන්නම්. අපේ රටේ විතරක් නොවෙයි මුළු ලෝකයේම රටවල මේ තත්ත්වය තිබෙනවා. අය වැය ලේඛනයක් හැදුවාට පස්සේ විවිධ ප්‍රස්තුත හේතූන් මත මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාට මේ ගරු සභාවට ඇවිල්ලා ප්‍රතිපාදන ගන්න සිද්ධ වෙනවා, Supplementary Estimate එකක් හැටියට ඉදිරිපත් කරලා මේ ගරු සභාවේ අනුමැතිය ඇතිව. එන අවුරුද්දේ දෙසැම්බර් මාසය වන තුරු ප්‍රමාණවත් වන විධියට මුදල් වෙන් කරන්න මේ ලෝකයේ කිසිම රටක මුදල් ඇමතිවරයකුට හෝ කාටවත් බැහැ. ඒක කවදාවත් වෙන්නේ නැති වැඩක්. ඒක තේරුම් නොගැනීම තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉඳලා මොළය කුරුවල් වුණු නිසා ඇති වුණු දෙයක්. ප්‍රායෝගික දැනුම තිබෙන ඕනෑම කෙනකුට මේක තේරෙනවා.

උදාහරණයක් විධියට සුනාමියක් ආවාම අපට කියන්න පුළුවන්ද, "කිසි දෙයක් දෙන්නේ නැහැ, මේක budget එකේ නැහැ" කියලා. ඉතින් අපි මේ ගරු සභාවේ ප්‍රශ්න අහන කොටත් එක්තරා වගකීමෙන් අහන්න ඕනෑ නේ. අන්න ඒකයි මගේ අවසාන උත්තරය. මීට වඩා මම උත්තර දෙන්නේ නැහැ. මොකද, දැන් අතුරු ප්‍රශ්න තුනකට වැඩි ප්‍රමාණයකට මා උත්තර දී තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් මේ ප්‍රශ්නයට පමණක් විනාඩි 13ක් අරගෙන තිබෙනවා. මෙහෙම මේ ගරු සභාව මෙහෙය වන්න බැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද ප්‍රශ්න තුනක් අහන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන අහනවාද, දෙක අහනවාද, එක අහනවාද කියන එක මගේ වැඩක්. මා කිව්වේ ප්‍රශ්නයකට මෙහෙම මෙතරම් කාලයක් ඉඩ දෙන්න බැහැ කියලායි.

දකුණු පළාත් සභාවේ ප්‍රඥප්ති : විස්තර
தென் மாகாண சபையின் நியதிச் சட்டங்கள் : விபரம்
STATUTES OF SOUTHERN PROVINCIAL COUNCIL: DETAILS

3071/'12

5. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) දකුණු පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) දකුණු පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ Iවැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ IIIවැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தென் மாகாண சபையைத் தாபித்து அதன் நடவடிக்கைகள் ஆரம்பித்து வைக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) தென் மாகாண சபையினால் இதுவரை நிறைவேற்றப்பட்டுள்ள நியதிச்சட்டங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நியதிச்சட்டத்தினதும் பெயர், இலக்கம் மற்றும் நிறைவேற்றப்பட்ட திகதி வெவ்வேறாக யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி மாகாண சபையினால் நிறைவேற்றப்பட்ட,

(i) அரசியலமைப்பின் ஒன்பதாம் அட்டவணையின் Iஆம் நிரலின் (மாகாண சபை நிரலின்) விடயங்களுக்குரிய நியதிச் சட்டங்கள்;

(ii) அரசியலமைப்பின் ஒன்பதாம் அட்டவணையின் IIIஆம் நிரலின் (ஒருங்கியை நிரலின்) விடயங் களுக்குரிய நியதிச்சட்டங்கள்

யாவையென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he state -

(i) the date on which the Southern Provincial Council was established and commenced its functions;

(ii) the number of Statutes adopted by the Southern Provincial Council by now; and

(iii) separately, the title, number and the date of adoption of each of the aforesaid Statutes?

(b) Will he inform this House -

(i) the Statutes relevant to the subjects in List I of the Ninth Schedule of the Constitution (Provincial Councils List); and

(ii) the Statutes relevant to the subjects in List III of the Ninth Schedule of the Constitution (Concurrent List);

(iii) which have been adopted by the aforesaid Provincial Council?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1988.07.21

(ii) 39

(iii) ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 01)

(ආ) (i) ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 02)

(ii) රුහුණු සංචාරක ප්‍රඥප්තිය

(ඇ) අදාළ නොවේ.
ඇමුණුම් **සභාගත*** කරමි.

සභාමේසය මත තබන ලද ඇමුණුම්:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:
Annexes tabled:

ඇමුණුම් අංක 01

දකුණු පළාත් සභාව

1989 වර්ෂයේ සිට අනුමත ප්‍රඥප්ති ලැයිස්තුව

අනු අංක	ප්‍රඥප්තියේ නම	ප්‍රඥප්තියේ අංකය	සම්මත කල දිනය	වෙනස් සංශෝධන
01.	දුගී දුප්පත්කම දුරලීමේ ප්‍රඥප්තිය	1989 අංක 02	1989.10.23	2001 අංක 1 සංශෝධන
02.	වැටුප් හා දීමනා (දකුණු පළාත් සභාවේ සභාපති / නියෝජ්‍ය සභාපති)	1989අංක 03	1989.11.21	
03.	භදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය	1989 අංක04	1989.11.15	
04.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයනට වැටුප් හා දීමනා	1989 අංක06	1989.12.28	1999 අංක01 අංශෝධන 2001 අංක 03 සංශෝධන
05.	දකුණු පළාත් සභාවේ ක්‍රීඩා ප්‍රඥප්තිය	1990අංක 01	1990.03.27	
06.	පළාත් පාලන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය	1990අංක 02	1990.04.17	
07.	දකුණු පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තිය	1990අංක 03	1990.11.29	
08.	පළාත් පාලන අධීක්ෂන ප්‍රඥප්තිය	1990අංක04	1990.12.03	
09.	පළාත් පාලන කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය	1990අංක06	1990.12.30	
10.	මුදල් සංශෝධන ප්‍රඥප්තිය	1990අංක 07	1990.12.30	
11.	ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය	1991අංක 01	1991.06.03	
12.	පරිවාස හා ළමාරක්ෂක සේවා ප්‍රඥප්තිය	1991අංක 02	අනුමත වී නැත	
13.	මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය	1992අංක02	1992.04.23	
14.	පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය	1992අංක04	1992.12.31	
15.	මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය	1994අංක02		
16.	මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය	1994අංක03		
17.	මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය	1994අංක 04	1994.12.02	
18.	අධිකරණ දඩ පැනවීමේ ප්‍රඥප්තිය	1994අංක 05		
19.	දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය	1995අංක01	1995.05.30	අංක 947 1996.10.25 ගැසට් පත්‍රය
20.	දකුණු පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය	1996අංක 02	1996.10.07	

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

21.	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය	1996අංක 02	1996.12.23	අංක 1163 2000.12.15 ගැසට් පත්‍රය
22.	දකුණු පළාත් සවුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය	1998අංක 01	1998.12.17	
23.	දකුණු පළාත් සභාවේ රුහුණු සංචාරක ප්‍රඥප්තිය	2000අංක01	2000.08.22	
24.	දකුණු පළාත් සභා සභාපති /නියෝජ්‍ය සභාපති වැටුප් (සංශෝධන) ප්‍රඥප්තිය	2001අංක 01	2001.03.21	
25.	ආගමික සංස්කෘතික හා කලා (සංශෝධිත) ප්‍රඥප්තිය	2001අංක02	201.07.28	
26.	දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික වැටුප් (සංශෝධන) ප්‍රඥප්තිය	2001 අංක03	2001.07.28	
27.	දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය	2002අංක 01	2002.09.03	
28.	සමාජ සේවා ප්‍රඥප්තිය	2002අංක 02	2002.06.28	
29.	දකුණු පළාත් පුස්තකාල සේවා ප්‍රඥප්තිය	2006අංක01	2007.01.12	අංක1497/30 2007.05.18 ගැසට් පත්‍රය
30.	දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය	2007අංක01	2007.10.17	
31.	දකුණු පළාත් විකල්ප බල ශක්ති පිළිබඳ ප්‍රඥප්තිය	2007අංක02	2007.10.22	අංක 1532 2008.01.11 ගැසට් පත්‍රය
32.	2007 අංක 04 දරණ ආඛාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය	2007අංක 04	2007.03.28	
33.	මුදල් (පරිපූරක විධිවිධාන) සංශෝධන ප්‍රඥප්තිය	2007අංක05	2008.12.20	
34.	දකුණු පළාත් පෙර පාසල් ප්‍රඥප්තිය	2008අංක02	2008.07.31	අංක 1567 2008.09.12 ගැසට් පත්‍රය
35.	දකුණු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය	2008අංක03	2008.06.02	
36.	දකුණු පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය	2008අංක05	2009.05.28	
37.	දකුණු පළාත් අනත් හා අත්හල ළමා නිවාස පිළිබඳ ප්‍රඥප්තිය	2008අංක01	2009.08.08	
38.	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය	2009අංක 01	2009.08.03	අංක 1567 2008.09.25 ගැසට් පත්‍රය
39.	දකුණු පළාත් ආයුර්වේද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය	2012අංක 02	2012.04.18	

ඇමුණුම් අංක 02

දකුණු පළාත් සභාව

1989 වර්ෂයේ සිට අනුමත ප්‍රඥප්ති ලැයිස්තුව

අනු අංක	ප්‍රඥප්තියේ නම	ප්‍රඥප්තියේ අංකය	සම්මත කල දිනය	වෙනත් සංශෝධන
01.	දුගී දුප්පත්කම දුරලීමේ ප්‍රඥප්තිය	1989 අංක 02	1989.10.23	2001 අංක 1 සංශෝධන
02.	වැටුප් හා දීමනා (දකුණු පළාත් සභාවේ සභාපති / නියෝජ්‍ය සභාපති)	1989අංක 03	1989.11.21	
03.	හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය	1989 අංක04	1989.11.15	
04.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයනට වැටුප් හා දීමනා	1989 අංක06	1989.12.28	1999 අංක01 අංශෝධන 2001 අංක 03 සංශෝධන
05.	දකුණු පළාත් සභාවේ ක්‍රීඩා ප්‍රඥප්තිය	1990අංක 01	1990.03.27	
06.	පළාත් පාලන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය	1990අංක 02	1990.04.17	
07.	දකුණු පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තිය	1990අංක 03	1990.11.29	
08.	පළාත් පාලන අධීක්ෂන ප්‍රඥප්තිය	1990අංක04	1990.12.03	
09.	පළාත් පාලන කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය	1990අංක06	1990.12.30	
10.	මුදල් සංශෝධන ප්‍රඥප්තිය	1990අංක 07	1990.12.30	
11.	ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය	1991අංක 01	1991.06.03	
12.	පරිවාස හා ළමාරක්ෂක සේවා ප්‍රඥප්තිය	1991අංක 02	අනුමත වී නැත	
13.	මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය	1992අංක02	1992.04.23	
14.	පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය	1992අංක04	1992.12.31	
15.	මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය	1994අංක02		
16.	මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය	1994අංක03		
17.	මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය	1994අංක 04	1994.12.02	
18.	අධිකරණ දඩ පැනවීමේ ප්‍රඥප්තිය	1994අංක 05		
19.	දකුණු පළාත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය	1995අංක01	1995.05.30	අංක 947 1996.10.25 ගැසට් පත්‍රය
20.	දකුණු පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය	1996අංක 02	1996.10.07	
21.	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය	1996අංක 02	1996.12.23	අංක 1163 2000.12.15 ගැසට් පත්‍රය

23.	දකුණු පළාත් සභා සභාපති /නියෝජ්‍ය සභාපති වැටුප් (සංශෝධන) ප්‍රඥප්තිය	2001අංක 01	2001.03.21	
24.	ආගමික සංස්කෘතික හා කලා (සංශෝධිත) ප්‍රඥප්තිය	2001අංක02	201.07.28	
25.	දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික වැටුප් (සංශෝධන) ප්‍රඥප්තිය	2001 අංක03	2001.07.28	
26.	දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය	2002අංක 01	2002.09.03	
27.	සමාජ සේවා ප්‍රඥප්තිය	2002අංක 02	2002.06.28	
28.	දකුණු පළාත් පුස්තකාල සේවා ප්‍රඥප්තිය	2006අංක01	2007.01.12	අංක1497/30 2007.05.18 ගැසට් පත්‍රය
29.	දකුණු පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය	2007අංක01	2007.10.17	
30.	දකුණු පළාත් විකල්ප බල ශක්ති පිළිබඳ ප්‍රඥප්තිය	2007අංක02	2007.10.22	අංක 1532 2008.01.11 ගැසට් පත්‍රය
31.	2007 අංක 04 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය	2007අංක 04	2007.03.28	
32.	මුදල් (පරිපූරක විධිවිධාන) සංශෝධන ප්‍රඥප්තිය	2007අංක05	2008.12.20	
33.	දකුණු පළාත් පෙර පාසල් ප්‍රඥප්තිය	2008අංක02	2008.07.31	අංක 1567 2008.09.12 ගැසට් පත්‍රය
34.	දකුණු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය	2008අංක03	2008.06.02	
35.	දකුණු පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය	2008අංක05	2009.05.28	
36.	දකුණු පළාත් අනත් හා අත්හල ළමා නිවාස පිළිබඳ ප්‍රඥප්තිය	2008අංක01	2009.08.08	
37.	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය	2009අංක 01	2009.08.03	අංක 1567 2008.09.25 ගැසට් පත්‍රය
38.	දකුණු පළාත් ආයුර්වේද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය	2012අංක 02	2012.04.18	

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා විෂයය භාර ඇමතිවරයා නොවුණත් මේ විෂයය ගැන බොහොම හොඳින් දන්නා නිසා ඔබතුමාට මේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. [බාධා කිරීම්] මේ බාධා කරන්නේ ඔබතුමාටයි. පළාත් සභා ක්‍රමය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබිලා තිබෙන බලය පළාත් සභාව විසින් අත්පත් කර ගෙන, ප්‍රඥප්ති හදලා ඒවා ක්‍රියාත්මක කර ගන්නේ නැති බව ඔබතුමා දුන් පිළිතුර අනුව පෙනෙනවා. පළාත් සභා ක්‍රමය මේ විධියට අසාර්ථක වෙලා තිබෙනවාය කියලා සංඛ්‍යා ලේඛන මත පෙනෙන කොට මේ බලය විමධ්‍යගත කිරීම පිළිබඳව තිබෙන විකල්පය මොකක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විකල්පයයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මා ඉතුරු අතුරු ප්‍රශ්න දෙක අහන්නේ නැහැ. එතුමා බොහොම දුෂ්කරතාවක ඉන්නේ. ඒ නිසා මා ඉතුරු අතුරු ප්‍රශ්න දෙක අහන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අවුරුදු 26ක් මේ පළාත් සභා ක්‍රමය මේ විධියට තිබිලා -[බාධා කිරීමක්] මා දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment and Renewable Energy)

අදාළ නැහැ. සභාගත කරන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

මා පිළිතුරු දෙන්නම්. තමුන්නාන්සේ අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අවුරුදු 26ක් මේ පළාත් සභා ක්‍රමය මේ විධියට තිබුණා. එයින් අවුරුදු පහක් විතර තමයි එක්සත් ජාතික පක්ෂ පාලනය තිබුණේ.

[ගරු රවි කරුණානායක මහතා]

ඉතුරු කාලාන්තරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩු තුළින් පාලනය කර තිබෙනවා.

දැන් එක පාරටම පළාත් සභා ක්‍රමය නරක් වෙලා තිබෙනවා. ඉඩම් බලතල, පොලිස් බලතල නිසා ඔබතුමන්ලාට දැන් පළාත් සභා නරක් වෙලා තිබෙනවා නම්, එක්සත් ජාතික පක්ෂයට බණින්නේ නැතුව, ඔබතුමන්ලාට තිබෙන තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා ඒවා සංශෝධනය කරලා ඇයි ඡන්දයට යන්නේ නැත්තේ? ඔබතුමන්ලාට පළාත් සභා හොඳත් නැහැ; නමුත් ඒ ඡන්දය පවත්වන්නත් ඕනෑ. අවුරුදු 19ක් ඔබතුමන්ලා තමයි ඒවා පාලනය කරලා තිබෙන්නේත්. එහෙම නම් අපිට කියන්න මොකක්ද පළාත් සභාවල තිබෙන අහිතකර තත්ත්වය කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඒක මෙතුමන්ලාට හොඳාකාරවම තේරෙයි ලබන පළමු වැනිදා නාම යෝජනා භාර දීලා, මැතිවරණය අවසන් වෙලා ඡන්ද ගණන් කරන කොට. එක්සත් ජාතික පක්ෂයට නැවත උදා වන්නේ පරාජයයි. වෙන කිසිම දෙයක් වෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්ඩලික රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඡන්දය අවසන් වන තෙක් ඉන්න අවශ්‍ය නැහැ. අපි පරාජය වෙනවාය කියලා මෙතැනට ඇවිල්ලා ලොකුවට පම්පෝරි ගහන මේ ආණ්ඩුව-

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
කථා පවත්වන්නේ නැතුව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්ඩලික රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
ලැබෙන උත්තර අනුව අපත් ඒවාට උත්තර දෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

නාම යෝජනා භාර දීලා ඡන්දය අවසන් වන්න ඉස්සර වෙලා තමුන්නාන්සේලා ඒ ගැන කියන්න. අද බිල්ලෙක් මවලා තිබෙනවා පළාත් සභා නරකයි කියලා. ඒ බිල්ලා මවලා ලෝකයට පෙන්වන්න ඉස්සර වෙලා, ඇයි තමුන්නාන්සේලාගේ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා, පළාත් සභා අහෝසි කරලා ඡන්දයකට යන්නේ නැත්තේ? ඔබතුමන්ලා ඒක දැන දැන-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ඒ වෙනුවෙන් පත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමාට ගෞරවයක් වශයෙන් කරුණාකර තමුන්නාන්සේලා ඒ කමිටුවට එන්න. එතකොට දැන ගන්න පුළුවන් මොකක්ද කළ හැක්කේ කියලා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 - 3196/'12 - (3), ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්ඩලික රන්ජන් රාමනායක)
(The Hon. Ranjan Ramanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(මාණ්ඩලික ඩිලාන් පෙරේරා - වෙළිනාට්ටු වේලෙවාය්ප්පු ඌක්කුවිප්පු, නලනෝම්පුකෙ අමෛච්චර්)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා. මුලින් ප්‍රශ්නය ඉදිරිපත් කරන වෙලාවේ ඔබතුමා සිටියේ නැහැනේ. [බාධා කිරීම්]

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දේශගුණික තත්ත්වයන්ට ගැළපෙන පොල් ප්‍රභේද : අත්හදා බැලීම්
காலநிலைக்கேற்ற தெங்கு இனங்கள் : பரீட்சிப்புகள்
SURVIVAL OF COCONUT VARIETIES UNDER WEATHER CONDITIONS : EXPERIMENTS

3678/'13

8. ගරු වික්ටර් ඇන්ටනි මහතා
(මාණ්ඩලික වික්ටර් අන්තනී)
(The Hon.Victor Antony)
පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ විටින් විට ඇතිවන විවිධ දේශගුණික තත්ත්වයන්ට සහ දැඩි නියහයට ඔරොත්තු දීමට හැකි පොල් ප්‍රභේද හඳුනා ගෙන තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් සිදු කළ අත්හදා බැලීම්වල සාර්ථක අසාර්ථකභාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

තෙංකු අපිවිරුත්ති, මක්කළ් තෝට්ට අපිවිරුත්ති අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் காலத்திற்குக் காலம் ஏற்படும் கடும் வரட்சி போன்ற சீரற்ற காலநிலை நிலைமைகள் உள்ளடங்கலாக பல்வேறு காலநிலை நிலைமைகளுக்கு ஈடுகொடுக்கக் கூடிய தெங்கு இனங்கள் இனங்காணப் பட்டுள்ளதா என்பதையும்;

(ii) அது தொடர்பாக மேற்கொள்ளப்பட்ட பரீட்சார்த்த நடவடிக்கைகளின் சாதக, பாதக நிலைமைகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he inform this House -

(i) whether varieties of coconut that can survive in different weather conditions in Sri Lanka, including unfavourable weather conditions like intermittent severe droughts, have been identified; and

(ii) of the success or failure of the experiments carried out in that regard?

(b) If not, why?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) දැනට වගාකරුවන්ට නිර්දේශ කර ඇති CRIC60, CRISL 98 හා උසස් මව් ශාක පැළ විවිධ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පොල් වර්ග වන අතර, ඒවා ලංකාවේ පොල් වගා කරන ඕනෑම ප්‍රදේශයක සිටුවීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

කෙසේ වුවද 2012 වර්ෂයේ වියළි කලාපයේ පැවතුන ආකාරයේ දීර්ඝ කාලීන නියහයට ඔරොත්තු දෙන ආකාරයේ පොල් වර්ග නිෂ්පාදනය කිරීම සිදු කිරීම අපහසු අතර, එවැනි වූ දැඩි නියහයකදී දැනට නිර්දේශ කර ඇති පොල් වර්ග පොල් පර්යේෂණ ආයතනයේ තෙතමන සංරක්ෂණ කටයුතු සමඟ ඒකාබද්ධව සිදු කිරීමෙන් එවැනි වූ දැඩි නියහයකට මුහුණ දිය හැකි ආකාරයට පොල් වගාව සිදු කළ හැක.

දැනට නිර්දේශිත දෙමුහුම් පොල් වර්ග හිතකර තත්ත්ව යටතේ අධික අස්වැන්නක් ලබා දෙන අතර මෙම දෙමුහුම් වර්ග අහිතකර තත්ත්ව යටතේද ප්‍රශස්ත අස්වැන්නක් ලබා දෙන අකාරයට වැඩිදියුණු කළ හැකිද යන නිරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර ඒවා ක්ෂේත්‍රයේ පරීක්ෂා කිරීමේ කටයුතුද සිදු කරමින් පවතී.

(ආ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව: මෙහෙයුම් කටයුතු

அரச ஈட்டு, முதலீட்டு வங்கி: தொழிற்பாடுகள்
STATE MORTGAGE AND INVESTMENT BANK : OPERATIONAL ACTIVITIES

3771/'13

10. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු විජිත බේරුගොඩ මහතා වෙනුවට)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு விஜித பேருகொட சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Vijitha Berugoda)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) ජාතික ආර්ථිකයට ලබා දුන් දායකත්වය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නව ප්‍රවණතා සහ සංවර්ධන කටයුතු ඉලක්ක කර ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන් කවරේද;

(iii) බැංකුව තම ශාඛා ජාලයේ සිදු කළ ව්‍යාප්තිය කවරේද;

(iv) උතුරු නැඟෙනහිර සංවර්ධන කටයුතුවලට දැක්වූ දායකත්වය කවරේද;

(v) ආසන්න සමාජ වගකීම සම්බන්ධයෙන් ඉටු කරන ලද ක්‍රියාකාරකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේනිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அரச ஈட்டு, முதலீட்டு வங்கி 2005ஆம் ஆண்டு தொடக்கம் இன்று வரையான காலப் பகுதியில்,

(i) தேசிய பொருளாதாரத்திற்கு வழங்கியுள்ள பங்களிப்பு ஆண்டுவாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) புதிய போக்குகள் மற்றும் அபிவிருத்தி நடவடிக்கைகளை இலக்கு வைத்து நடைமுறைப்படுத்திய விசேட நிகழ்ச்சித் திட்டங்கள் யாவை என்பதையும்;

(iii) வங்கிக் கிளை வலையமைப்பில் மேற் கொண்டுள்ள விரிவாக்கல் யாதென்பதையும்;

(iv) வடக்கு, கிழக்கு அபிவிருத்தி நடடிக்கைகளில் செலுத்திய பங்களிப்பு யாதென்பதையும்;

(v) நெருக்கமான சமூகக் கடப்பாடுகள் தொடர்பில் நிறைவேற்றிய செயற்பாடுகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform this House, in relation to the period from the year 2005 to date -

(i) separately and on annual basis, the contributions made to the national economy;

(ii) special programmes implemented which aimed at new trends and development activities;

(iii) the expansion done in its branch network;

(iv) contribution made to the development activities in the North and East areas; and

(v) activities carried out in relation to the immediate social responsibility;

by the State Mortgage and Investment Bank?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

		2013 ජූනි 30 දක්වා	2012	2011	2010	2009	2008	2007	2006	2005
1.	මුදු හරින ලද මුළු ණය ප්‍රමාණය (රුපියල් මිලියන)	2,044	4,116	3,009	1,760	1,285	3,175	2,513	2,121	1,556
2	ණය සංඛ්‍යාව	5,475	8,881	9,099	6,291	5,538	10,804	9,679	9,823	9,281
3.	නැන්පතු සඳහා ගෙවන ලද මුළු පොළී ප්‍රමාණය (රු. මිලියන)	1,181	1,711	1,214	1,368	1,939	1,636	1,002	608	468
4.	ගෙවන ලද මුළු වැට බදු ප්‍රමාණය (රු. මිලියන)	48.2	92.7	146.55	231.87	98.32	76.09	53	136	90.67
5.	ගෙවන ලද මුළු අදායම් බදු ප්‍රමාණය (රු. මිලියන)	60.15	130.74	176.11	178.74	46.44	11	41	105	102
6.	ගෙවන ලද ලාභාංශ හෝ ලාභාංශ බදු ප්‍රමාණය (රු. මිලියන)	26.62	79.88	176.56	179.89	51.12	10.85	21	97.49	95.64
7.	ගෙවන ලද සේවක වැටුප් හා දීමනා ප්‍රමාණය (රු. මිලියන)	216	433	381	349	354	303	276	267	186
8.	සේවක සංඛ්‍යාව	312	323	302	308	320	328	345	349	304
9.	රජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවීම (රු. මිලියන)	-	25	-	-	50	-	25	25	126

(ii) 2013ජූනි දක්වා

- දහම් පාසල් දරුවන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කිරීම සඳහා, දහම් පාසල් සංවර්ධනය මූලික කරගත් ළමා ඉතිරි කිරීම් වැඩසටහනක් ආරම්භ කිරීම.
- සුළු පරිමාණ ව්‍යාපාර/ස්වයං රැකියා නගා සිටුවීම අරමුණු කරගත් ඉතිරි කිරීමේ හා සුළු ණය පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීම.
- මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ සමාජයේ අඩු අදයම් ලාභී පුරවැසියන්ට නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් නිවාස සහ පොදු පහසුකම් කටයුතු අමාත්‍යාංශය සමග එක්ව සහන පොළියට ණය ලබාදීම සඳහා ජන සෙවන උපහාර වැඩසටහනට දායක වීම,
- ණය වාරික ගෙවීම් සහ අනෙකුත් ප්‍රේෂණයන් කාර්යක්ෂම කිරීම සඳහා අන්තර් බැංකු පියවීම් ජාලයට (SLIPS) සම්බන්ධ වීම

2012

- මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ සමාජයේ අඩු අදයම් ලාභී පුරවැසියන්ට නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් නිවාස සහ පොදු පහසුකම් කටයුතු අමාත්‍යාංශය සමග එක්ව සහන පොළියට ණය ලබාදීම සඳහා ජන සෙවන උපහාර වැඩසටහනට දායක වීම,
- අඩු ආදයම්ලාභීන්ට නිවාස සිහිනය සැබෑ කිරීම සඳහා දේපල ඇපයට නොතබා පුද්ගල ඇප මත ණය ලබා දීම.
- අඩු ආදයම් ලාභීන්ට නිවාස සිහින සැබෑ කිරීම සඳහා ලිහිල් ප්‍රතිපත්ති මත ණය ලබා දීම.
- රජයේ සේවකයින්ගේ නිවාස අවශ්‍යතාවය සපුරා ලීම සඳහා සහන පොළියට ණය ලබා දීම.

2011

- ළමා ඉතුරුම් ප්‍රවර්ධනය සඳහා ආකර්ෂණීය තෑග්ග සහ වැඩි පොළියක් සහිතව "Challenger" ළමා ගිණුම් ආරම්භ කරන ලදී.
- ණය විවිධාංගීකරණය යටතේ නව ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දෙන ලදී. එනම්,

  වයඹ දිරිය,දිරිය,සිරිනිකා,Auto Chance, Professional loans, Ekamuthuwa, රාජ්‍ය සේවක ණය,

  - **වයඹ දිරිය**
    වයඹ පාලාතේ පදිංචි කරුවන් සඳහා වූ නිවාස ණය ක්‍රමය.
  - **දිරිය**
    කෘෂිකර්ම, සංචාරක, මැණික් කර්මාන්ත වල නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම, කර්මාන්ත ශාලා ඉදිකිරීම සහ කාරක ප්‍රාග්ණ අවශ්‍යතා සඳහා ණය ලබා දීම.
  - **සිරිනිකා**
    ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විදේශගත ශ්‍රමිකයන් සඳහා වූ නිවාස ණය ක්‍රමය.
  - **ඔටෝ චාන්ස්**
    සංචාරක, ගමනාගමන සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වාහන මිලදී ගැනීමට ඉක්මන් සහ පහසු අඩු පොළී ණය යෝජනා ක්‍රමය.
  - **Professional Loan**
    වෘත්තිකයන් සඳහා වූ සහනදායී පොළියට නිවාස ණය යෝජනා ක්‍රමය.
  - **රාජ්‍ය සේවක ණය**
    රාජ්‍යසේවකයන්සඳහාවූණයයෝජනාක්‍රමය.
  - **එකමුතුව**
    පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අය සඳහා වූ සහනදායී පොළියක් සහිත විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමය.

2008

- ණය අනුමත කිරීමේ සිට නිදහස් කිරීම සඳහා වූ කාලය අවම කිරීම සඳහා උකස් බැඳුම්කර ලියපදිංචි කිරීමට පෙර ණය නිදහස් කිරීමේ පහසුකම් සහිත ප්‍රමුඛතා ණය ක්‍රමය හඳුන්වා දෙන ලදී.
- දුරේක්ෂා
  ආකර්ෂණීය පොළියක් සහිත දිගුකාලීන ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

2006

- මුතුසිතා
  ආකර්ෂණීය තෑග්ග සහ ඉහළ පොළී අනුපාතයක් සහිත ළමා ඉතුරුම් තැන්පත් ගිණුම

(iii) 2013 ජූනි දක්වා

2013 වර්ෂය තුලදී අම්පාර, අනුරාධපුර, බණ්ඩාරවෙල, මොණරාගල, මාතලේ, තුවරඑළිය, රත්නපුර වවුනියාව සහ කුරුණෑගල යන නගර වල ශාඛාවන් විවෘත කිරීමට කටයුතු කිරීම.

2012 වවුනියාව නගරයේ සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

2010 යාපනය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වල ව්‍යාප්ති කාර්යාල ආරම්භ කිරීම.

2008 අම්බලන්ගොට නගරයේ ව්‍යාප්ති කාර්යාලය ආරම්භ කිරීම.

2007 හලාවත, මාතර, කිරිබත්ගොඩ, බත්තරමුල්ල, කැගල්ල, හොරණ.

(iv)

- යාපනය හා මඩකලපුව නගර වල ශාඛා පිහිටුවීම.
- වවුනියාවේ සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමග උතුරු සහ නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් විනාශ වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා සහනදායී පොළියට ණය මුදල් ලබාදීම.
- අම්පාර නගරයේ ශාඛාවක් විවෘත කිරීමට පියවර ගැනීම.

(v)

2013

- ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනයට සඳහා ඉදිකෙරෙන අහිමංසල සඳහා මූල්‍ය දායකත්වය සැපයීම.
- දයට කිරුළ ජාතික සංවර්ධන හා ප්‍රදර්ශන වැඩ සටහන යටතේඅම්පාර හාඩ්ඩස් නාක්ෂණ විද්‍යායතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දායක වීම.

- රාජගිරිය වික්ටෝරියා නිවසයේ අබාධිත නේවාසිකයන්ට දිනක අහාර වේල පරිත්‍යාග කිරීම සහ ධර්ම දේශනයක් පැවැත්වීම.

2012 – 2012

- දයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව අනුරාධපුර ඔයාමඩු ගොවිපල වැඩි දියුණුකිරීමටමූල්‍යමයදායකත්වයලබාදීම.

2011


- ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.
- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගංවතුරින් අනාථවූවන් හට අහාර, නාවකාලික නවාතැන්, බෙහෙත් ද්‍රව්‍ය සහ අදුම් ලබාදීම සඳහා මූල්‍යාධාර සැපයීම.
- රණවිරුවන් ඇතුළුආබාධිත පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට දෛනික අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීම.
- අධ්‍යාපන ක්‍රීඩා, පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන් හි නියුතු පාසල් දරුවන් සහ උපාධි අපේක්ෂකයින්ට අධාර දීම.
- ජනාධිපති කාර්යාලය මගින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා දින සැමරුමට මූල්‍ය දායකත්වය සැපයීම.

2010

- මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල් කුඹුර රෝහලේ ඉදිකිරීමේ කටයුතු සඳහා වියදම් දැරීම.
- මාතර දිස්ත්‍රිකයේ අකුරැස්ස ප්‍රදේශයේ අබාධිත යුධ හමුදු නිලධාරියකු සඳහා නිවසක් ඉදිකර දීම.
- ලේ දන්දීමේ ව්‍යාපාර කිහිපයක් සංවිධානය කිරීම.
- බැංකුවේ සේවකයන් හා ගණුදෙනුකරුවන් සඳහා තොම්බේ පිරිසිදු පානීය ජලය ලබාදීම.
- කළුතර බන්ධනාගාරයේ මව්වරුන් හා ළමයින් සඳහා වූ උද්‍යානයේ වැඩිදියුණු කිරීම සඳහා මුදල් යෙදවීම.
- ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය විසින් සංවිධානය කරන ලද 67 වන උපසම්පදා පුණ්‍යකර්මය සඳහා මුදල් පරිත්‍යාගයක්සිදු කිරීම.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩු ආදයම් ලාභී පවුල් වලට අයත් දරුවන් වෙත අභ්‍යාස පොත් බෙදා දීම.

2009

- මහරගම පිළිකා රෝහලට වෛද්‍ය උපකරණ සහ මුදල් පරිත්‍යාග කිරීම.
- ලේ දන්දීමේ ව්‍යාපාර කිහිපයක් සංවිධානය කිරීම.
- කොග්ගල වෙරළ උද්‍යානය පරිසර හිතකාමී ලෙස නඩත්තු කිරීම සඳහා සැලසුම් කිරීම.



- කැගල්ල දිස්ත්‍රික්කයේ අඩු ආදායම් ලාභී පවුල් වල්ට අයත් දරුවන් වෙත අභ්‍යාස පොත් බෙදා දීම.
- දරුවන් අතර ඉකිරිකිරීමේ පුරුද්ද ඇතිකිරීම සඳහා කැගල්ල දිස්ත්‍රික්කයේ අඩු ආදායම් ලාභී පවුල් වල දරුවන් සඳහා ඉකිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීමට දායක වීම.

2008

- දුර බැහැර ප්‍රදේශවල පාසල් කිහිපයක අ.පො.ස (සා/පෙ), අ.පො.ස (උ/පෙ) ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.
- ක්‍රියාත්විතයේ යෙදී සිටින්නන්ගේ දරුවන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම.(පාසල් පොත්, පානීය ජලය ආදී)
- සෑම පුර පුන් පොහෝ දිනකම ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශනය වන "සවනක් රැස්" සජීව රූපවාහිනී වැඩසටහන පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වීම.
- ප්‍රධාන කාර්යාලයට සම්පතව පිහිටි පොල්වත්ත ධර්ම කීර්තිරාම විහාරයේ අළුත් වැඩියා කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම.
- ලේ දන්දීමේ ව්‍යාපාර කිහිපයක් සංවිධානය කිරීම.
- අනුරාධපුර, කලුතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ ඉකිරි කිරීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම සඳහා ඉකිරි කිරීමේ ගිණුම් ආරම්භ කිරීමට දායක වීම.
- අනුරාධපුර දිස්ත්‍රිකයේ මන්කඩවල පුරාණ රජමහා විහාරයේ වහලයක් සැකසීමට ඇස්බැස්ටස් ශීට්ස් ලබා දීම, එම දහම් පාසලේ දරුවන්ට අහාර වේලක් ලබාදීම සහ අභ්‍යාස පොත් ලබාදීම.
- පිරිසිඳු කල පානීය ජලය ගණුදෙනු කරුවන් සඳහා ලබා දීමට කටයුතු කිරීම.

2007

- 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින ගම්පහ, කුරුණෑගල, ගාල්ල, මාතර සහ නිස්සංකාරාම දී දිස්ත්‍රික්කයේ ළමුන් සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කිරීම.
- අනුරාධපුර ඇඟැටුවැව විද්‍යාලය සඳහා අභ්‍යාස පොත්, පාසැල් බෑග්, සපත්තු ලිපිදුව්‍ය පරිත්‍යාග කිරීම.
- රණවිරු අධිකාරියේ නිර්දේශයන් මත රණවිරුවන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම.
- ලේ දන්දීමේ ව්‍යාපාර කිහිපයක් සංවිධානය කිරීම.
- බුස්ස ශ්‍රී ලංකා ශුධ හමුදු සුහුණු පාසැලට ඉහුම් පිහුම් උපකරණ පරිත්‍යාග කිරීම.
- කොග්ගල වෙරළ උද්‍යානය පරිසර හිතකාරීම ලෙස නඩත්තු කිරීම සඳහා සැලසුම් කිරීම.
- පිළිකා සංගමයට බෙහෙත් ද්‍රව්‍ය ප්‍රදානය කිරීම.

2006

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇඟැටුවැව විද්‍යාලයට පොත් පාසල් උපකරණ වාර්ෂිකව පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකිරීම.
- සෑම පුර පුන් පොහෝ දිනකම "සවනක් රැස් " සජීවරූපවාහිනී වැඩසටහන පැවැත්වීම සඳහා අනුග්‍රහය දක්වීම.
- ලේ දන්දීමේ කඳවුරක් සහ වෙසක් සිල් වැඩසටහනක් පැවැත්වීම.
- රණ විරුසේවා අධිකාරියේ නිර්දේශ සහිතව ශුධ හමුදු ක්‍රියාත්විතයේ රාජකාරී කරන අයගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- ගණකාධිකරණ ශිල්පීන්ගේ ආයතනය සහ කාර්මික විද්‍යාලය සමග ඒකාබද්ධව අනාගත වෘත්තීකයන් පුහුණු කිරීමේ වැඩසටහනට දායකත්වය.

2005

- කොළඹ සහ ගාල්ල දිස්ත්‍රික්ක වල සුනාමියෙන් අවතැන් වූ දරුවන් සඳහා ළමා ඉතුරුම් ගිණුම් ආරම්භ කිරීම.
- සුනාමියෙන් අවතැන් වූවන් සඳහා ණය සහන ලබා දීම.
- ලේ දන්දීමේ කඳවුරු පැවත්වීම.
- ඒ ඒ ටී හා නයිටා ආයතනය හා කාර්මික විද්‍යාලය සමග සම්බන්ධ වී අනාගත වෘත්තීකයන් පුහුණු කිරීමට දායක වීම.
- සෑම පොහෝ දිනකම ස්වාධීන රූපවාහිනී සේවයේ පැවසී"සවනක් රැස්" සජීව වැඩසටහන් සඳහා අනුග්‍රහය දක්වීම.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇඟැටුවැව මහා විද්‍යාලයේ සිසු දරු දරියන් සඳහා පාසැල් පොත් හා ලිපිදුව්‍ය බෙදා දීම.
- රණ විරු සේවා අධිකාරියේ නිර්දේශ මත ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටී හමුදු නිලධාරීන්ගේ පවුල් වල දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා අරමුදලක් පිහිටුවීම.

(ආ) පැන නොතැඟී

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This Answer is also placed in the Library.]

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ප්‍රශ්න අංක 14 - 2878/'12 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්

தனி உறுப்பினர் சட்டமூலங்கள்

PRIVATE MEMBERS' BILLS

කුල්ලිය්‍යතුල් ඉමාම් ෂාෆිඊ අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

குல்லிய்யத்துல் இமாம் சாபிஈ அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) சட்டமூலம்

KULLIYYATHUL IMAAM SHAFIEE ARABIC COLLEGE (INCORPORATION) BILL

ගරු එම්.එස්. තව්ෆික් මහතා

(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)

(The Hon. M.S. Thowfeek)

Sir, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Kulliyyathul Imaam Shafiee Arabic College".

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා

(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)

(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.

Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5)இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

මුතූර් නද්වතුල් උලමා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

மூதூர் நத்வதுல் உலமா அரபுக் கல்லூரி (கூட்டிணைத்தல்) சட்டமூலம்

NADUATHUL ULAMA ARABIC COLLEGE, MUTUR (INCORPORATION) BILL

ගරු එම්.එස්. තව්ෆික් මහතා

(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)

(The Hon. M.S. Thowfeek)

Sir, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Naduathul Ulama Arabic College, Mutur."

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and religious Affairs for report.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்
SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.
ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 23]
'පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු පී. දයාරත්න මහතා]
ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඔත්තිවෛක්කප්පට්ට විවාදම් මීළත් තොඩංකුදර්කාන කට්ටළෛ වාසික්කප්පට්ටදු.
சம்பந்தப்பட்ட வினா - [யூலை 23]
"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு பீ. தயாரத்ன]
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [23rd July]
"That the Bill be now read a Second time".- [The Hon. P. Dayaratna]
Question again proposed.

[අ.භා. 1.46]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, ඊයේ නැවැත්වූ මගේ කථාවේ ඉතිරි කොටස කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එදා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ පුවත් පතක පළ වී තිබුණ කාරණයක් මා කියනවා. "විදුලිබල මණ්ඩලය විකුණන්නේ නැතැයි කීවත් එයටත් ටෙලිකොම් එකට කළ වැඩේම කරලා"

මේ කියන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබෙන කාලයේ ලංකා විදුලිබල සුරැකීමේ සංවිධානයයි.

ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන් ඉල්ලීම් 12ක් ඉදිරිපත් කර තිබෙනවා. 12 වැනි යෝජනාව විධියට කියලා තිබෙන්නේ "විදුලිබලය රටේ සංවර්ධනය සඳහා සහ මහජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය සේවාවක් හෙයින් විදුලිබල ජනනය සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම මහජනතාව වෙනුවෙන් රජයේ පාලනය යටතේ වූ රාජ්‍ය සතු ඒකීය ආයතනයක් වශයෙන් පැවතිය යුතුය" කියලායි.

මහජනයාට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් හැටියට එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඒ කටයුත්ත කළේ නැහැ. මේ කරු ජයසූරිය මන්ත්‍රීතුමා එදා විදුලිබල ඇමතිතුමා හැටියට මොකක්ද කළේ? මේ විදුලිබල සුරැකීමේ සංවිධනයේ 12 වැනි ඉල්ලීමට මොකක්ද කළේ? 1950 අංක 19 දරන විදුලිබල පනතත්, 1969 අංක 17 දරන විදුලිබල මණ්ඩල පනතත් යන දෙකම අහෝසි කරලා, විදුලි ජනනයට එක ආයතනයක්, සම්ප්‍රේෂණයට තව ආයතනයක්, බෙදා හැරීමට ආයතන තුනක්, අනෙකුත් කටයුතුවලට තවත් ආයතන තුනක් හදලා විදුලිබල මණ්ඩලය අහවර කර දමන්නයි එදා කටයුතු කළේ. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මහින්ද චින්තනය යටතේ 2005 දී බලයට ඇවිල්ලා මේ රටේ කිසිම රාජ්‍ය ආයතනයක් විකුණන්නේ නැහැයි කියන ප්‍රතිපත්තිය අනුව 2009 අංක 20 දරන විදුලිබල පනත ගෙනැල්ලා නැවත විදුලිබල මණ්ඩලය සුරැකීමට කටයුතු කළා. එහෙම නම් එදා පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ජනතාවට ඇහුම්කන් දෙන ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා තමයි ජනතාව ඒ ආණ්ඩුව අයින් කරලා දැම්මේ. අද ඒ අය විදුලිය ගැන කථා කරනවා.

ගරු කථානායකතුමනි, තව එක දෙයක් කියන්න තිබෙනවා. අපේ ගරු රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා මහනුවරදී කියා තිබෙනවා, "අසීමිත හා අසාධාරණ ලෙස විදුලි බිල වැඩි කර කොල්ල කෑ මුදල ඉදිරි එජාප ආණ්ඩුවක් යටතේ ජනතාවට යළි දෙනවා" කියලා. ගරු විපක්ෂ නායකතුමනි අපි කියනවා, අපි මුදල් කොල්ලකාලා නැහැ කියලා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව විදුලිය වෙනුවෙන් මේ රටේ ජනතාවගෙන් මුදල් කොල්ල කාලා නැහැ.

ඒකක 90 දක්වා පාවිච්චි කරන ගෘහස්ථ පාරිභෝගිකයන් වෙනුවෙන් රජය විසින් දරනු ලබන වියදම රුපියල් මිලියන 30,428යි. පූජනීය ස්ථානවලට රජය දරන වියදම රුපියල් මිලියන 1,229යි. හෝටල්වලට රජය දරන වියදම රුපියල් මිලියන 923යි. හෝටලයෙන් නැවත අපි ඒ මුදල් අය කරන්නේ නැහැ. ඒ මුදල් ජනාධිපතිතුමා ගන්නේ නැහැ. කර්මාන්ත ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් මිලියන 25,982ක් අපි වියදම් කරනවා. මේ රජය ජනතාව වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට සහන වශයෙන් වියදම් කරන මුළු මුදල රුපියල් මිලියන 58,561ක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ඇවිල්ලා ජනතාවට ලබා දෙන මේ සහනාධාරද කොල්ල කන්න යන්නේ? ගරු කථානායකතුමනි, මේ විධියට ජනතාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා අපි පැහැදිලිව කියනවා. අලි වැටක් ගැහුවත් ඔය පැත්තෙන් මේ පැත්තට එන "සින්දු කියන අලි" නවත්වන්න තමුන්නාන්සේට බැහැ.

අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමන්ලා පන්දම් අරගෙන යනවා. මොකක්ද වුණේ? සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පියා, නිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ -1987 දී- ගෘහස්ථ විදුලි බිල සියයට 45කින් වැඩි කළා. එතුමාගේ කාලයේදීම 1990 දී ගෘහස්ථ හා කර්මාන්ත කියන අංශ දෙකේම විදුලි බිල සියයට 23කින් වැඩි කළා. අද තමුන්නාන්සේලා ඉටි පන්දම් පත්තු කර ගෙන කෑ ගහනවා, ජනතාව වෙනුවෙන් කථා කරනවා කියලා.

1981, 1983, 1984, 1987, 1992 සහ 1994 කාලවලදී තමුන්නාන්සේලා විදුලිය කප්පාදු කරලා රට අඳුරේ තැබුවා. ඒක නැහැ කියලා කියන්න බැහැ. ආසියානු කලාපය ගත්තාම අද

ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය වාගේ රටවල් විදුලිය කප්පාදු කරනවා. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ අපේ පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය විදුලිබල හා බලශක්ති ඇමතිතුමිය හැටියට පැය 24ම අපට විදුලිය ලබා දෙනවා කියන එක අද අපි පැහැදිලිව කියනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමාගේ කථාවකදී කියනවා, "මේ ආණ්ඩුව යටතේ කෙරෙන බොරු වියදම් සහ දූෂණවලට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් යටතේ කිසි ඉඩක් නැහැ." කියලා. එතුමා තව දුරටත් කියනවා, "මා අගමැති හැටියට නොරොච්චෝලේ තාප විදුලි බලාගාර ව්‍යාපෘතිය නතර කළත්, මේ ආණ්ඩුව ඒක ආරම්භ කළා." කියලා.

ඒක ආරම්භ කරපු එක හොඳයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒක නැවැත්වුවත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒක ආරම්භ කෙරුවා. ඒක කැඩෙනවා කිව්වා. කෝ කැඩුණාද? ඊළඟට කිව්වා, ඒ බලාගාරය චීනයට විකුණන්න යනවා කියලා. තමුන්නාන්සේලා මේ විධියට නොයෙක් අසත්‍ය දේවල් කිව්වා. ඒ කාලයේ කරු ජයසූරිය මැතිතුමාට "කරුවල ජයසූරිය" කියලා නමකුත් හැදුණා.

ගරු කථානායකතුමනි, අද විදුලිබල මණ්ඩලය ඉතා සාර්ථකව අපි කර ගෙන යනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා. ඒ වාගේම අලි වැටක් දමන්න කියලා රනිල් වික්‍රමසිංහ මහත්තයාට කියනවා. මොකද තව ටිකකින් ඔය අලි වැට කඩා ගෙන අපේ පැත්තට අලි එනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මා වෙනුවෙන් කථා කරාවි.

[අ.භා. 1.51]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විදුලිබල ක්ෂේත්‍රය ගැන සාකච්ඡා වන මේ මොහොතේ මම බලාපොරොත්තු වෙනවා, විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රශ්න ගණනාවක් පිළිබඳව කරුණු කාරණා ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට ඉදිරිපත් කළා, 2013 ඇස්තමේන්තුවක්. මුල් මාස පහේ ජල විදුලි ඒකක ප්‍රමාණය ගිගාවොට් පැය 1,880ක් නිපදවනවාය කියලා තමයි විදුලිබල මණ්ඩලය කිව්වේ. නමුත් ඇත්ත වශයෙන්ම විදුලි ඒකක ගිගාවොට් පැය 2,728ක් නිපදවන්නට විදුලි බල ක්ෂේත්‍රය සමත් වුණා. ඒ කියන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ තක්සේරුවට වැඩිය වැඩිපුර ජල ඒකක ගිගාවොට් පැය 848ක් නිපදවන්නට විදුලිබල ක්ෂේත්‍රය සමත් වුණා. ඒ කියන්නේ සියයට 45ක වැඩි වීමක්. මේ නිසාම විදුලිබල මණ්ඩලය මේ වන විට රුපියල් කෝටි 2,700ක ලාභයක් ලබා තිබෙනවා. දැන් මේ විදුලි ගාස්තු ඉහළ දැමුවේ විදුලිබල මණ්ඩලය තක්සේරු කළ මුළු වියදම පියවා ගැනීමටයි. විදුලි බිල වැඩි කරන්නට පදනම වුණේ විදුලිබල මණ්ඩලය පාඩු ලබනවා, ඒ නිසා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම හරහා ඒ විදුලි ජනන ඇස්තමේන්තු කේන්ද්‍ර කරගෙන විදුලි ඒකකයක මිල වැඩි කරන්න කියන එකයි. මම වගකීමෙන් කියනවා, විදුලිබල මණ්ඩලය බොරු ඇස්තමේන්තු ඉදිරිපත් කරලා තමයි මේ විදුලි බිල වැඩි කිරීම ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ජල විදුලි ජනනය දිහා බලන කොට ජනවාරි, පෙබරවාරි මාසයේ ගිගාවොට් පැය 515ක් නිෂ්පාදනය කරනවාය කියපු විදුලිබල මණ්ඩලය ඇත්තටම ගිගාවොට් 911ක් නිෂ්පාදනය කරලා. වැඩි පුර ගිගාවොට් පැය 400ක් පමණ නිෂ්පාදනය කරලා. එහෙම නම් මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි, මේ මහා වැසි තත්ත්වයත් සමඟ ජලාශ පිරී ඉතිරී යන මොහොතක, මේ වාගේ වාසි සහගත තත්ත්වයක් උදා වුණු මොහොතක, විදුලිබල මණ්ඩලයේ ලාභය රුපියල් කෝටි 2,700ක් වන මොහොතක ඇයි මේ ලබා ගත්තු ලාභයේ ඒ වරප්‍රසාදය ජනතාවට ලබා නොදෙන්නේ කියලා. විශේෂයෙන්ම වාර්තා අනුව 2010 මැයි මාසයේ සියයට 60ක විදුලිය නිපදවීම ජල විදුලියෙන් සිදු වුණා.

දැන් 2013 ජල විදුලිය හරහා ඊටත් වඩා විදුලිය උත්පාදනය වෙනවා. විදුලිය උත්පාදනය සියයට 45 ඉඳලා සියයට 75 දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අද ප්‍රධාන ජලාශ වාන් දමන තත්ත්වයකට ඇවිල්ලායි තිබෙන්නේ. ජූනි මාසයේ 19වැනි දා වන කොට කාසල්රී ජලාශය සියයට සියයම පිරිලා. මාවුස්සාකැලේ ජලාශයේ ජල මට්ටම, සියයට 99.9යි; කොත්මලේ, සියයට සියයයි; වික්ටෝරියා, සියයට 99.3යි; රන්දෙනිගල, සියයට 94.2යි; සමනළවැව, සියයට 65යි. එහෙම නම් ජල විදුලිය උත්පාදනය හරහා ලබපු රුපියල් කෝටි 2,700ක ලාභය ඇයි මේ රටේ ජනතාවට ලබා නොදෙන්නේ කියන ප්‍රශ්නය මම අහනවා. ඒකක 1 සිට 60 දක්වා පාවිච්චි කරන පාරිභෝගිකයෝ ලක්ෂ 24ක් සිටිනවා. ඒ, අපේ රටේ මුළු විදුලිය පාරිභෝගිකයන්ගෙන් සියයට 48ක්. ඒකක 60 ඉඳලා 180 දක්වා පාවිච්චි කරන තවත් ලක්ෂ 25ක් ඉන්නවා. ඒ, අපේ රටේ විදුලිය පාරිභෝගිකයන්ගෙන් සියයට 49ක්. ඒ අයගේ විදුලිය බිල වැඩි කිරීම නතර කළේ නැහැ. මා මේ රජයෙන් අහන්න කැමැතියි, කොටි ත්‍රස්තවාදය තුරන් කළා කියන මේ රජය ඇයි අද විදුලි බෙදුම්වාදයක් ක්‍රියාත්මක කරන්නේ කියලා. මේ රටේ සියයට 48කට පමණක් විදුලිය බිල වැඩි කරන එක නතර කරලා සියයට 49කට දරා ගන්න බැරි විදුලිය බිලක් ලබා දීලා තිබෙන්නේ ඇයි කියන ප්‍රශ්නය මා අහන්න කැමැතියි. ඒ නිසා මම විශේෂයෙන්ම ඇමතිතුමියගෙන් ඉල්ලීමක් කරනවා, පසු ගිය මාස හයේ ජල විදුලිය උත්පාදනය නිසා රට ලබපු; ලංකා විදුලිබල මණ්ඩලය ලබපු රුපියල් කෝටි 2,700ක ලාභය, ඒ සහනය, ඒ වරප්‍රසාදය ඒකක 60 සිට 180 දක්වා පාවිච්චි කරන පාරිභෝගිකයන්ට විදුලිය බිල අඩු කිරීමක් තුළින් කරුණාකර ලබා දෙන්න කියලා. ඒ වාගේම, මම ඇමතිතුමියට කියනවා 2013 දී ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 40ක හෙවත් මිලියන 40,000ක - කෝටි 4,000ක- අපේක්ෂිත ලාභයක් ලබන බව. එහෙම නම්, ලංකා විදුලිබල මණ්ඩලය ලබන මේ රුපියල් කෝටි 4,000 ලාභය තමන්ගේ පුද්ගලික සුඛ විහරණය උදෙසා විය හියදම් කරනවා වෙනුවට, තමන්ගේ අධිපෝෂණය උදෙසා විය හියදම් කරනවා වෙනුවට මේ රටේ දුක් විඳින විදුලිය පාරිභෝගිකයන්ගේ විදුලිය බිල අඩු කරන්න යොමු කරන්න කියලා මම ගරු ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, අද මේ රජය කරන්නේ පොදු ජනතාවගේ කර මත, හිස මත අසීමිත බරක්, ජනතාවට දරාගත නොහැකි බරක් පැටවීමයි.

බලන්න, ගරු කථානායකතුමනි. ඒකකයකට අය කරන ගාස්තුව ඉහළ නංවා, ඊට අමතරව රුපියල් 315ක ස්ථාවර ගාස්තුවක් අය කරනවා. ඊටත් අමතරව, සියයට 15ක ඉන්ධන ගැළපුම් ගාස්තුවකුත් අය කරනවා. ඒ වාගේම පරිභෝජනය කරන ලද සමස්ත විදුලි ඒකක ප්‍රමාණය 90ට වැඩි වන කොට සියයට 12ක වැට් බද්දකුත් ගහනවා. මේක තමයි රජයේ දූෂිත විදුලි මිල සූත්‍රය. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මෙපමණ වහිනවා නම්, මෙපමණ ජලාශ වාන් දමනවා නම්, ලංකා විදුලිබල මණ්ඩලයේ ලාභය රුපියල් කෝටි 2,700ක් නම් ඉන්ධන ගැළපුම් ගාස්තුවක් අය කරන්නේ ඇයි කියලා. අපට මේක මහා ලොකු ප්‍රහේළිකාවක්. මේක ඉන්ධන ගැළපුම් ගාස්තුවක් ද, එහෙම

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නැත්නම් දූෂණය නඩත්තු කිරීමේ ගාස්තුවක්ද කියන එක මා මෙම අවස්ථාවේදී අහන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, තවත් හාස්‍යජනක කාරණාවක් තිබෙනවා. ජලාශ පිරී ඉතිරී යන මොහොතක, ජල විදුලි ජනනය වැඩි කරන්න පුළුවන් මොහොතක, නඩත්තු කටයුතු සඳහා අද සමහර ජල විදුලි බලාගාරවල ජල විදුලි ජනනය අත් හිටුවා තිබෙනවා. බලන්න, ගරු කථානායකතුමනි. වික්ටෝරියා විදුලි බලාගාරයේ විදුලිජනක යන්ත්‍රවලින් එකක් අලුත්වැඩියාවට කියලා නතර කරලා තිබෙනවා. ඒකෙන් රටට අහිමි වනවා, මෙගාවොට් 70ක්. මෙම ප්‍රමාණය ඉන්ධන බලාගාරවලින් ලබා ගන්නට දින පතාම තවත් රුපියල් මිලියන 40ක් වැය කරන්නට සිද්ධ වනවා.

එපමණක් නොවෙයි. වැස්ස වහින කාලයට කුකුලේගහ turbine යන්ත්‍රවලට වතුර පිරිලා අස්වාභාවික විධියට අක්‍රිය වනවා. අස්වාභාවික විධියට මේ දෝෂ ඇති වනවාය කියන එක ලංකා විදුලිබල මණ්ඩලයත් පිළිගෙන තිබෙනවා. මේ නිසා දිනකට මෙගාවොට් 75ක් අහිමි වනවා. මෙම ප්‍රමාණයත් ඉන්ධනවලින් නිපදවන්න යන කොට තවත් රුපියල් මිලියන 40ක දෛනික පාඩුවක් රටට සිදු වනවා. මා අහන්න කැමැතියි, ජලාශ පිරී ඉතිරී යන මොහොතක, ජල විදුලි ජනනය වර්ධනය කරන්න පුළුවන් මොහොතක -

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු පිරේමලාල් ජූයසේකර - මින්වලු, ෙඑරිසක්ති පිරති අමෙච්සර්)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ අනවශ්‍ය points of Orderවලට ඔබතුමාගේ අවධානය යොමු කරන්න එපාය කියා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ගරු ප්‍රේමලාල් ජයසේකර විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(මාණ්පුමිකු පිරේමලාල් ජූයසේකර)
(The Hon. Premalal Jayasekara)
ගරු කථානායකතුමනි, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේ ගරු සභාව නොමඟ යවනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ඒක point of Order එකක් නොවෙයි, ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඔබතුමා මේ ගරු සභාව නොමඟ යවනවාලු. ඒ නොමඟ යවන කාරණය මොකක්ද?

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(මාණ්පුමිකු පිරේමලාල් ජූයසේකර)
(The Hon. Premalal Jayasekara)
කුකුලේගහ එවැනි සිද්ධියක් සිදු වෙලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ඒක point of Order එකක් නොවෙයි කියලා.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
(මාණ්පුමිකු පිරේමලාල් ජූයසේකර)
(The Hon. Premalal Jayasekara)
කුකුලේගහ එවැනි සිද්ධියක් සිදු වෙලා නැහැ. මෙම ගරු සභාවේ සිටින මන්ත්‍රීතුමන්ලා නොමඟ යවන්න එපා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාව නොමඟ යවන්නේ නැතුව කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කුකුලේගහ turbines හිතාමතාම නතර කරලා, වික්ටෝරියා විදුලි බලාගාරයේ විදුලිජනක යන්ත්‍ර හිතාමතාම නතර කරලා, දිනකට නිෂ්පාදනය කළ හැකි මෙගාවොට් 150ක පාඩුව වන රුපියල් මිලියන 80ක් මේ රටට අහිමි කරලා මේ ආණ්ඩුව කරන්නේ ඩීසල් බලාගාර මාෆියාවට ඒ නිහ විදුලිය ලබා ගැනීමේ වරප්‍රසාදය ලබා දීම නොවෙයිද කියන එක මා අහන්න කැමැතියි.

සංඛ්‍යා ලේඛනවලින් සනාථ වෙලා තිබෙනවා, මේ පසු ගිය මාස දෙකේ මහා වැස්ස නිසා තාප බලාගාරවලින් සමස්ත විදුලි ජනනය ක්‍රියාත්මක වුණේ සියයට 6යි කියා. හැබැයි වික්ටෝරියා කුකුළේ ගහ turbines නතර කිරීම නිසා තාප විදුලි බලාගාර පාවිච්චිය සියයට 10කින් වැඩි වෙලා තිබෙනවාය කියන එක අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමතියි, 2007 මහ බැංකු වාර්තාවේ 69 වන පිටුවට. [බාධා කිරීම්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
කථා කරන මන්ත්‍රීතුමාගේ කථාවට සවන් දෙන්න. අනෙක් මන්ත්‍රීතුමන්ලාට කතා කරන්නට ඕනෑ නම්, කරුණාකර මේ ගරු සභාවෙන් පිටවෙලා කතා කර ගෙන මෙහාට එන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, බලන්න 2007 මහ බැංකු වාර්තාව. එම වාර්තාවේ 69 වන පිටුව මොකක් ද කියන්නේ? 2007 මහ බැංකු වාර්තාවේ 69 වන පිටුවේ මෙහෙම කියනවා:

" විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම්වල ඌනතා නිසා කොටස් හිමිකම ප්‍රාග්ධන පිරිවැයෙන් සියයට 30ක් පමණ වන විදුලි බලය සපයන පෞද්ගලික අංශයේ ආයතන, ඉහත වාසි අත් විඳින අතර සාමාන්‍ය ජනතාවට අවසානයේ ලං. වී. ම.යේ අධික පාඩුවල, බර දැරීමට සිදුවේ"

මහ බැංකු වාර්තාව ඒ කියන්නේ. මහ බැංකුව වාර්තාව තවදුරටත් මෙසේ කියනවා:

"ඒ අනුව විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම්වල පවත්නා අවාසිදායක කොන්දේසි නිවැරදි කිරීම තුළින්, ලං.වි.මි.ට දළ වශයෙන් රුපියල් බිලියන 6ක් වාර්ෂිකව ඉතිරි කර ගත හැක."

මා නොවෙයි කියන්නේ, 2007 මහ බැංකු වාර්තාව.

එපමණක් නොවෙයි, තව දුරටත් මහ බැංකු වාර්තාව කියනවා මෙන්න මෙහෙම:

"විදුලිබලය සපයන පුද්ගලික අංශයේ ආයතන සමඟ පවතින විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වල බරපතළ වැරදි හේතුවෙන් ලං.වි.මි. ට අධික පාඩු විඳීමට සිදු වී ඇති අතර, එය විදුලි බිල දැඩි ලෙස ඉහළ යාමට ද හේතු වී ඇත."

ගරු කථානායකතුමනි, 2007 මහ බැංකු වාර්තාව කියනවා, විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම් ටික සංශෝධනය කරන්නටය කියා. මහ බැංකු වාර්තාව එහෙම කියනකොට පි.බී. ජයසුන්දර මැතිතුමා කියනවා, මේවා සංශෝධනය නොකළොත් වාර්ෂිකව රුපියල් කෝටි 1200ක පාඩුවක් අපේ රටට සිදු වෙනවා කියා. නමුත් විදුලි බලය මිල දී ගැනීමේ ගිවිසුම්වලට - power purchase agreementsවලට- අද මොකක් ද සිදු වී තිබෙන්නේ? අද ස්වාධීන බලශක්ති නිපදවන්නන් - independent power producers- සමඟ අඩුම ගණනේ සාකච්ඡාවක් කර මේ ගිවිසුම් සංශෝධනය කරන්නට විදුලිබල මණ්ඩලයවත්, අමාත්‍යාංශයවත් කටයුතු කර නැහැ.

එසේ කළා නම් වාර්ෂිකව අපේ රටට රුපියල් කෝටි 1,200ක් ඉතුරු කර ගන්නට තිබුණා. ගරු කථානායකතුමනි, වාර්ෂිකව රුපියල් කෝටි 1,200ක් ඉතුරු කළා නම් 2007 සිට 2013 වන තුරු ගණන් බැලුවොත්, ඒ අවුරුදු පහට අපට රුපියල් කෝටි 5,000ක් ඉතුරු කර ගන්න පුළුවන්කම තිබුණා. හැබැයි මොකක්ද විදුලිබල මණ්ඩලය කරන්නේ? විදුලිබල මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට බෝලය pass කරනවා. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ආපහු විදුලිබල මණ්ඩලයට බෝලය pass කර කර අර විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් - power purchasing agreements - සංශෝධනය කරන්නේ නැතිව, අවුරුදු පහක් හෙමින් හෙමින් ඉබි ගමනින් මේ යන්නේ මොකද? අර පෞද්ගලික විදුලිබල ඩීසල් මාෆියාව සුරකින්නට නොවේද කියන එක මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, බලන්න, තෙල් විදුලි බලාගාර සැපයුම්කරුවන් හත් දෙනකුගෙන් නියාමන කොමිසමේ බලපත්‍ර තිබෙන්නේ දෙදෙනෙකුට විතරයි. ඒ පෞද්ගලික තාප විදුලි බලාගාර සැපයුම්කරුවන්ගෙන් දෙගොල්ලකටයි බලපත්‍ර තිබෙන්නේ. පස් දෙනෙකුට බලපත්‍ර නැහැ. නමුත් විදුලිබල මණ්ඩලය මොකක්ද කියන්නේ? විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කරන්නේ මොකක්ද? Ace Power Generation Matara Limited, ඒ වාගේම හොරණ, ලක්දනවි සමාගමේ බලපත්‍ර අහෝසි වී තිබියදී පැරණි ගිවිසුම් අනුව මෙම සැපයුම්කරුවන්ගෙන් ඉතාම දූෂිත විධියට විදුලි බලය මිලදී ගන්නට විදුලිබල මණ්ඩලය කටයුතු කර තිබෙනවා. නියාමන කොමිසමේ නිර්දේශ නොතකා, නියාමන කොමිසමේ කොස්තා මැතිතුමාගේ ඒ යෝජනා නොතකා, ගිවිසුම් කඩලා, බලපත්‍ර නැතිව, අධික මිලට මේ පෞද්ගලික තෙල් බලාගාර හිමියන්ගෙන් විදුලිය මිලට අරගෙන මේ රටේ මහා ධනස්කන්ධය, රටේ ජනතාවගේ සල්ලි, ඔබගේ, අපේ සල්ලි මේ විධියට නාස්ති කිරීම තුළින් රටට සිදු වන විපත්තිය දෙස දැන්වත් ඇස් ඇර බලන්න, ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියලා විදුලිබල මණ්ඩලයෙනුත්, විදුලිබල හා බලශක්ති ඇමතිතුමියගෙනුත් මා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, අපට මතකයි පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමිය මේ උත්තරීතර සභාවේදී ප්‍රකාශ කළා නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි නොකිරීම පිළිබඳව විපක්ෂය ජනතාවගෙන් සමාව ගන්න ඕනෑය කියලා. ඒ වාගේම එතුමිය ප්‍රකාශ කළා, නොරොච්චෝලේ බලාගාරය ඉදි කිරීම පිළිබඳව වර්තමාන රජයට ප්‍රශංසාව ලැබිය යුතුය කියලා. ගරු කථානායකතුමනි, මේ නොරොච්චෝලේ ලක්විජය බලාගාරය අද දූෂිත චීන කරච්චලයක් බවට පත් වෙලා තිබෙනවා. චීනයේ එක්සිම් බැංකුවෙන් කෝටි 17,500ක් ණයට අරගෙන ඒ බලාගාරය ඉදි කළාට පොරොන්දු වූ දිනයටවත් එය විවෘත වුණේ නැහැ. මාස දෙකකට පස්සේයි එය විවෘත වුණේ.

මෙගාවොට් 300ක් සපයනවාය කිව්වාට මෙගාවොට් 285යි සපයා තිබෙන්නේ. තවත් කෝටි 65ක අතිරේක වියදමකින් හදපු ගල් අඟුරු ජැටියට දෙවැනි පියවරේ, තුන්වැනි පියවරේ ගල් අඟුරු ටික බාන්නට හැකියාවක් නැහැ. විශේෂයෙන්ම බාල භාණ්ඩ උපයෝගී කර ගෙනයි මේ නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි කර තිබෙන්නේ. බලන්න, විදුලිබල මණ්ඩලයේ හිටපු සභාපතිතුමා වන මහාචාර්ය විමලධර්ම අබේවික්‍රම මැතිතුමා BBC එකට ප්‍රකාශයක් කර තිබෙනවා. චීන සමාගමක් මඟින් චීනයේ තිබුණු බාල බඩු ටික, බාල උපකරණ මෙහෙට ගෙන්වලා තමයි නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි කර තිබෙන්නේ. මේ විදුලි බලාගාරයේ නල පද්ධති හිටි ගමන් පුපුරා යනවා, වෑල්වලින් හුමාලය කාන්දු වනවා. ඒ වාගේම විදුලි උත්පාදන යන්ත්‍රය -

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, point of Order එකක් ඉදිරිපත් කරනවා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමා නොරොච්චෝලේ විදුලි බලාගාරයක් ඉදි කිරීම ගැන කථා කරනවා. ජපානයෙන් ලැබෙන්න ගිය විදුලි බලාගාරයේ කටයුතු නවතා දැමුවේ එතුමාගේ නායකතුමායි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ තමයි ජපානයෙන් ලැබෙන්න ගිය විදුලි බලාගාරයේ කටයුතු නවතා දැමුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම points of Order ඉදිරිපත් කරනකොට ඔබතුමා අනුගමනය කරන රීතිම, ආණ්ඩු පක්ෂය පැත්තටත් අනුගමනය කරන්න කියලා මා බොහොම බැගෑපත්ව ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ නොරොච්චෝලේ බලාගාරය අරුම පුදුම විදුලි බලාගාරයක්. විශේෂයෙන්ම මෙහි විදුලි උත්පාදන යන්ත්‍ර රත් වනකොට සෙන්ටිග්‍රේඩ් 500 ඉක්මවා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රත්වෙනවා. ඊට පසුව මේවා සිසිල් වෙනකන් දින 22ක් බලාගෙන ඉන්නට ඕනෑ. මේ වාගේ ආශ්චර්යවත් බලාගාරයක් තමයි මේ රජය රටට දායාද කර තිබෙන්නේ. එපමණක් නොවෙයි, මේ නොරොච්චෝලේ විදුලි බලාගාරයට වැඩි මිලට දූෂිත විධියට ගල් අඟුරු ලබා ගැනීම තුළින් රටට කෝටි 200ක් පාඩු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ලංකා කෝල් කියන සමාගම මේ රටට රුපියල් කෝටි 470ක් පාඩු කරමින් දෙවැනි ගල් අඟුරු තොගය සැපයීමත් අර වැඩි මිලට ගල් අඟුරු සපයන ආයතනයටම ලබා දී තිබීම ඉතාමත්ම නින්දිත කර්තව්‍යයක්. ඉතින් මේ හොර වැඩ අස්සේ විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමා කියනවා, විදුලිය ගාස්තු ඉහළ දැම්මාට මණ්ඩලයට රුපියල් කෝටි 2600ක් පාඩුයි කියලා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ ඇසූ ප්‍රශ්නයකට උත්තර දෙමින් පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියම කිව්වා, මේ නොරොච්චෝලේ විදුලි බලාගාරයේ අඩු පාඩුකම් රැසක් තිබෙනවා කියලා.

එක්සිම් බැංකුවෙන් කෝටි 17,500ක් ගිනි පොලියට අරගෙන ඉතාමත්ම බාල මාදිළියේ නොරොච්චෝලේ විදුලි බලාගාරයක් හදලා රටට දායාද කරපු එකට මේ ආශ්චර්යවත් ආණ්ඩුවට අපේ සහයෝගය ලබා දෙන එක නොවෙයි, මුළු රටෙන්ම, මුළු ජාතියෙන්ම සමාව ගන්නට මේ රජයට සිදු වනවායි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය ගැන සාකච්ඡා වන මේ මොහොතේ, මම මගේ කථාව අවසන් කරන්නේ ජයතිස්ස ද කොස්තා මැතිතුමා මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය ගැන කරපු ප්‍රකාශයක් තුළින්. මොකක්ද, එතුමා කියන්නේ? "විදුලිබල මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 18,000යි. එයින් 800ක් ඉංජිනේරුවෝ. එයින් බහුතරය වැරදි කරන්නේ නැහැ, ඉන්නවා නම් ඉන්නේ අතළොස්සක්. වැරදි අක්‍රමිකතා දිගින් දිගටම තිබිලා තිබෙනවා." කවුද මේ කියන්නේ? ජයතිස්ස ද කොස්තා මැතිතුමා. එතුමා කියනවා, "ගිණුම් නැහැ, අපි ඉල්ලුවා. දුන්නේ නැහැ. අපේ ඉල්ලීමට මිලියන 50ක් පමණ වැය කරලා මෘදුකාංග ගෙනැත් තිබෙනවා. නමුත් පාරදෘශ්‍යභාවය නැහැ. දූෂිත ක්‍රියාවන් ක්‍රියාත්මක වෙන්නේ" කියලා. මම නොවෙයි මේ කියන්නේ, ජයතිස්ස ද කොස්තා මැතිතුමා. විශේෂයන්ම මහජන උපයෝගිතා කොමිසමේ සභාපති-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න ගරු කථානායකතුමනි.

මේ සභාපති ජයතිස්ස ද කොස්තා මැතිතුමාම කියනවා, "විදුලිබල මණ්ඩලය දූෂිතයි, විදුලිබල අමාත්‍යාංශය දූෂිතයි" කියලා. මේ වාගේ තත්ත්වයක් තුළ කොහොමද, මේ රටේ ලක්ෂ 50ක් වූ විදුලි පාරිභෝගිකයන්ට සාධාරණත්වයක් ඉෂ්ට වන්නේ කියන එක මම අහන්න කැමැතියි. ඒ නිසා විදුලිබල හා බලශක්ති ඇමතිවරියගෙන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා. මේ මහ වැසි නිසා විදුලිබල මණ්ඩලයට රුපියල් කෝටි 2,700ක් ලාභ ලබා තිබෙනවා. කරුණාකරලා ඒකක 60-180 දක්වා වූ පාරිභෝගිකයන්ට වැඩි කළ විදුලි බිල - ඒ ඒකක ප්‍රමාණය පාවිච්චි කරන පාරිභෝගිකයන් මේ රටේ සියයට 49ක් ඒ කියන්නේ විසිපන් ලක්ෂයක් ඉන්නවා.- මේ පාරිභෝගිකයන්ගේ කර පිට, හිස මත, බර පටවන්නේ නැතුව තමුන්නාන්සේලාගේ කට වචනයට පමණක් සීමා වෙලා තිබෙන ශුභ සාධනයේ ආශ්චර්යය රටේ ජනතාවගේ ඇහට පතට, බඩට, කටට, හදවතට දැනීමට ක්‍රියාත්මක කරන්න. දෙයියන්ගේ නාමයෙන් කරුණාකර විදුලි බිල අඩු කරන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

විශේෂ ප්‍රකාශයක් කිරීමට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉල්ලා සිටිනවා. මම එම අවස්ථාව ලබා දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතාගේ විශේෂ ප්‍රකාශය
மாண்புமிகு தயாசிறி ஜயசேகரவினது விசேட கூற்று
SPECIAL STATEMENT BY HON. DAYASIRI JAYASEKARA

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අද දවසේ මේ පාර්ලිමේන්තුවේ විවාදයක් යන අවස්ථාවේදී මට මෙම විශේෂ ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

1959 දී හොරණ, ශ්‍රීපාලි විද්‍යාලයේ දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා කරන ලද කථාවක උපුටනයකින් මම මගේ කථාව පටන් ගන්නවා.

"මිනිසුන් දැඩි සේ එල්බ ගෙන සිටිය යුතු නිදහසක් ඇත. ඒ, මිනිසා සතු සිතිමේ නිදහසයි. එකී නිදහස නැතිව යාම සකල මානව වර්ගයාටම ඛේදජනක කාලයක් උදා කරනු ඇත."

අද මට මේ ප්‍රකාශය කරන්නට සිදු වෙලා තිබෙන්නේ සිතීමේ නිදහස සම්බන්ධයෙන් අපට අපේ පක්ෂය ඇතුළේ ඇති කරලා තිබෙන භයංකාර තත්ත්වයක් සමහයි. සිතීමේ නිදහස වෙනුවට අන්ධානුකරණයේ ඇදහීමක් තමයි අපට ලැබිලා තිබෙන්නේ. ඒක ඊයේ දිනය දක්වාම සිදු වුණා. අන්ධානුකරණයේ ජීවත් වනවාට වඩා එතැනින් ඉවත් වීම ගැන මම අද සන්තෝෂ වෙනවා.

අපේ පක්ෂයේ නායකතුමා කොන්සර්වටිව්වාදියෙක්. එතුමා එකී දෘෂ්ටිවාදය නියෝජනය කරනු ලබන්නේ ලෝක ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සංගමයේ දකුණු ආසියාතික කලාපයේ නියෝජ්‍ය සභාපතිවරයා විධියටයි.

බ්‍රිතාන්‍යයේ ශ්‍රේෂ්ඨ අගමැතිවරයකු වූ බෙන්ජමින් ඩිස්රායිලී මහතා අනුගමනය කරමින් තමයි අපේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා සකස් කළේ. ඒ ශ්‍රේෂ්ඨ අගමැති බෙන්ජමින් ඩිස්රායිලී මහතා, ඔහු දකින කොන්සර්වටිව්වාදය මේ විධියට විග්‍රහ කරනවා:

"Conservatism discards Prescription, shrinks from Principle, disavows Progress; having rejected all respect for antiquity, it offers no redress for the present, and makes no preparation for the future."

එහි සිංහල අනුවාදය මෙයයි.

"කොන්සර්වටිව්වාදය පර්යාලෝකය හෙවත් දැක්ම කුණු බක්කියට දමති. ප්‍රතිපත්ති හමුවේදී හැකිළෙති. ප්‍රගතිය විශ්වාස නොකරති. අතීතය වෙත පවතින ගෞරවය ප්‍රතික්ෂේප කරති. එය වර්තමානයට විසඳුම් නොසොයනවා මෙන්ම අනාගතය සඳහා ද කිසිදු සූදානමක් ඇති කර නොගනී."

අපේ එක්සත් ජාතික පක්ෂයේ අනාගතය ගැන මැනවින් සිතා බලපුවාම මේ ගර්භාවට, කොන් කිරීමට, පළි ගැනීමට ලක් වුණු මන්ත්‍රීවරයෙක් විධියට මම දකිනවා, බෙන්ජමින් ඩිස්රායිලීගේ මේ වදන්වල නියම අර්ථය වර්තමාන පක්ෂ නායකත්වය විසින් අපට ලබා දීලා තිබෙනවා කියලා.

ඒ තත්ත්වයට එරෙහිව ක්‍රියා කරන්නට යන හැම කෙනකුම ගිලටීනයට අහු වෙනවා. මේ ආණ්ඩුවේ සිටින මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් ඒ ගිලටීනයට අහු වෙලා, එතැනින් ඉවත් වුණු අය විධියට ඉතිහාසයට එක් වෙලා තිබෙනවා.

1994 දී අපේ නායකතුමා පක්ෂ නායකත්වයට පත් වුණායින් පසුව 1995 දී කතරගම තිබුණු පක්ෂ සම්මේලනයේදී එතුමා යෝජනාවක් ගෙනාවා. 8(1) හැටියට ගෙන ආ ඒ යෝජනාව තමයි පක්ෂ නායකත්වයේ පුරප්පාඩුවක් ඇති වන තුරු පක්ෂ නායකත්වය වෙනස් කළ නොහැකියි කියන එක. ඒකෙන් අදහස් වන්නේ මොකක්ද? එක්කෝ පක්ෂ නායකයා මැරෙන්න ඕනෑ; එහෙම නැත්නම් ඉල්ලා අස් වෙන්න ඕනෑ. එතුමා අරගෙන ගිය ඒ ක්‍රමවේදය තමයි අපේ පක්ෂයේ ඉදිරි ගමනට දැවැන්ත බාධාවක් බවට පත් වෙලා තිබුණේ. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් අපි විශාල පිරිසක් -පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්- එකතු වෙලා ඒක වෙනස් කරන්න ලොකු සටනක් කළා. අපෙන් ඉවත් වී ගිය මන්ත්‍රීවරුන් විශාල පිරිසක් ඒ සටන කරලා බැරි තැන තමයි මෙතැනින් එළියට ගියේ. ඒ කාල වකාවනු තුළ අපි අරගෙන ගිය සටනේ ප්‍රතිඵලයක් හැටියට, සම්මේලනයක් පවත්වලා අපි අලුත් ව්‍යවස්ථාවක් හැදුවා. ඒකෙන් 8(1) වගන්තිය අයින් කළා. ඒ කියන්නේ නායකත්වයේ පුරප්පාඩුවක් ඇති වන තුරු, නායකත්වයේ වෙනසක් ඇති නොවනවාය කියන ප්‍රකාශනය අපි ඉවත් කළා. මේ රටේ එක්සත් ජාතික පක්ෂයේ සියලු දෙනා අත් උස්සලා, අත්වැල් බැඳගෙන ඔක්කොම කිව්වා, "අපි මේක එක හඬින් අනුමත කරනවා" කියා. මාස කිහිපයකට පසුව මේකට ඡන්ද විමසීමක් තිබුණා. එක දවසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට 23 දෙනෙක් පත් කළා. ඔවුන් කිසිම දෙයක් දැන ගෙන සිටියේ නැහැ. පක්ෂයේ ඉතිහාසය, එහෙම නැත්නම් පක්ෂය අභ්‍යන්තරයේ, කෘත්‍යාධිකාරී මණ්ඩලය ඇතුළේ වෙන්නේ මොනවාද කියන මේවා ගැන කිසි දැනුමක් තිබුණේ නැති 23 දෙනෙක් පත් කළා. ඒක හරියට මරණාධාර සමිතියට අලුතින් සාමාජිකයන් බඳවා ගන්නවා වාගේ වැඩක්. එහෙම බඳවා ගෙන ඡන්දය පැවැත්වුවා. නායකතුමා ජයග්‍රහණය කළා, අපි පරාජය වුණා. සජිත් ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළා. ඒක එහෙම පිටින්ම පැහැදිලිවම මේ පක්ෂයේ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ගතිගුණ උල්ලංඝනය කරපු වැඩ පිළිවෙළක්. පත්‍රිකා 92ක් හදලා ඒ 92 අංක කරලා ඒ අංකය දමපු පුද්ගලයාගේ නම හොයා ගන්න පුළුවන් විධියට තමයි ඡන්දය පාවිච්චි කිරීමේ වැඩ පිළිවෙළ සකස් කළේ. මා දන්නා එක මන්ත්‍රීවරයෙක් ඒ අංකය කටු ගාලා තමයි ඔහුගේ ඡන්දය පාවිච්චි කළේ.

ඒ තරම් භයානක තත්ත්වයක් තමයි තිබුණේ. ඔහු ඡන්දය පාවිච්චි කරන්න භය වුණා. මොකද, ඒ පත්‍රිකා 92ම අරගෙන ගිහින් බලන්න පුළුවන් කාටද ඡන්දය දීලා තිබෙන්නේ කියලා. ඡන්දය දීලා තිබෙන්නේ දයාසිරි ජයසේකරට නම්, ඡන්දය දීලා තිබෙන්නේ සජිත් ප්‍රේමදාසට නම් පහුවදා උදේට ඔහු ගිලටීනයට අහු වෙනවා. ඒකයි මම කිව්වේ. මේ දේ තමයි පසු ගිය කාලයේම අපට සිද්ධ වුණේ.

සිරිකොතට පහර දීමේ සිද්ධියක් ඇති වුණා. අපේ මහ ගෙදර වාගේ තිබෙන සිරිකොතට පහර දීම අපි හෙළා දකිනවා. එදත් අපි කිව්වේ ඒකයි. ඒක අපි සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා විතරක් නොවෙයි, ඒකට සම්බන්ධ වෙලා වැඩ කරපු අයට යම් කිසි දඬුවමක් දෙනවා නම් ඒ දඬුවම දෙන්න ඕනෑය කියන තැන තමයි අපි එදාත් සිටියේ, අදත් ඉන්නේ. නමුත් මේ සිද්ධිය අවසානයට මොකක්ද වුණේ? පක්ෂ ව්‍යවස්ථාවට සංශෝධන ගෙනැල්ලා, ශ්‍රීනාත් පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා තව දුරටත් පක්ෂ නායකත්වය අවුරුදු 6කට දීර්ඝ කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කළා. ඊට පසුව තිබුණු පක්ෂ සම්මේලනයට CCTV cameras ගෙනැල්ලා, වට කර ගෙන හිරකාරයින්ගෙන් ඡන්දය ගන්නවා වාගේ තමයි, අත් ඔසවන්න කියලා තමයි ඒ යෝජනාවට ඡන්දය ගත්තේ. අන්න ඒකයි අද මේ පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදයට අත් වෙලා තිබෙන ඉරණම. සමහර අය ඒවාට විරුද්ධ නොවී සද්ද නැතුව නිකම් ඉන්න කොට අපට කොන්දක් තිබුණා එදා නැඟිටලා කථා කරලා ඒකට විරුද්ධව අත ඔසවන්න. ඒකට විරුද්ධ නොවී ඉන්න අපේ හෘදය සාක්ෂිය අපට ඉඩ දුන්නේ නැහැ. අවුරුදු 6කට නායකත්ව කාලය දිගු කර ගත්තා. දැන් 2014 ඡන්දයක් දිනන්න කථා කරනවා. 2014 ජනාධිපතිවරණයක් තිබ්ලා ඒ ඡන්දයෙන් පැරදුණත් 2018 වන තුරු මේ නායකත්වය තව දුරටත් මේ පක්ෂයේ ඉතුරු වෙනවා. අත් පුඩි ගහන්න ඒක මේ ආණ්ඩුවට හොඳ කාරණයක් බවට පත් වෙයි. 2022 දී බලය ලබා ගැනීමේ හීනය තමයි දැන් ඉතිරි වෙලා තිබෙන්නේ. තව අවුරුදු 10ක් මේ රටේ එක්සත් ජාතික පාක්ෂිකයෝ මැරී මැරී ගුටි කකා ඔවුන්ගේ සියලු දේවල් කැප කරලා තිබෙනවා. 2022 දී බලය ලබා ගැනීමේ හීනයක තමයි අද ඔවුන් ජීවත් වෙන්නේ.

මේ කාරණයේදී අපේ පක්ෂයේ විශාල පිරිසක් දඬුවමට ලක් වුණා. කරු ජයසූරිය මැතිතුමා 1995 සිට මේ පක්ෂයේ නියෝජ්‍ය නායකයා විධියට සිටි කෙනෙක්. එතුමාගේ කණෙන් අල්ලලා කෘත්‍යාධිකාරී මණ්ඩලයෙනුත් එළියට දැම්මා. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ නියෝජ්‍ය නායකකම ඔහුගෙන් ඉවත් කළා. එතුමාත් කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඉවත් කළා. නමුත් පසුව එතුමාව කෘත්‍යාධිකාරී මණ්ඩලයට අරගත්තා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් ඉවත් කරලා තිබුණා, පසුව ඔහුවත් ආපසු ගත්තා. තලතා අතුකෝරල මැතිනිය ලක් වනිතා පෙරමුණේ සභාපතිනිය විධියට සිටියා. එතුමිය ඒ සභාපති ධුරයෙන් ඉවත් කරලා කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකත්වයත් නැති කළා. පසුව නැවතත් එම තනතුරු ලබා දුන්නා. රෝසි සේනානායක මැතිනිය කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඉවත් කළා. මේ වන තුරුත් එතුමියව කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් කරලා නැහැ. බුද්ධික පතිරණ මැතිතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඉවත් කළා. ඔහු තමයි මාතර දිස්ත්‍රික්කයෙන් පළමුවැනි තැනට මනාප ගත් පුද්ගලයා.

සාමාන්‍යයෙන් කෘත්‍යාධිකාරී මණ්ඩලයට අපි ගෙන්වන්නේ ඒ විධියටයි. එතැනින් ඔහුව අයින් කළා. ඒ වාගේම සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ පක්ෂය වෙනුවෙන් කථා කරන්න පුළුවන් දක්ෂ මන්ත්‍රීවරයෙක්. අපි හෙට මෙතැනින් ගියත් ඒක කියන්න ඕනෑ. එතුමාගේ ආසනය දෙකට කඩලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට කැල්ලක් දුන්නා. අද වන තුරු අවුරුදු ගණනක් තිස්සේ අපේ පක්ෂය වෙනුවෙන් පුවත් පත් සාකච්ඡාවකට එතුමාව කැඳවා නැහැ. මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ වාගේම දුනේෂ් ගන්කන්ද මන්ත්‍රීතුමා කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් අයින් කෙරුවා. පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ ආසනය එතුමාට අහෝසි කෙරුවා. පසුව කථා කරලා නැවත ඒක එතුමාට ලබා දුන්නා. ඒ වාගේම අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉතාම දක්ෂ විධියට වැඩ කළ මන්ත්‍රීවරයෙක්; මිනිස්සුත් එක්ක හිටපු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ ආසනය එතුමාට අහිමි කෙරුවා. ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා අපේ පක්ෂයේ මුස්ලිම් ජන පදනම ආරක්ෂා කරපු නායකයා විතරක් නොවෙයි, සිංහල ජන පදනමක් තිබුණු නායකයා. එතුමාගේ කෘත්‍යාධිකාරී

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මණ්ඩල සාමාජිකත්වය අහෝසි කෙරුවා. රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමා අපේ පක්ෂය වෙනුවෙන් දැවැන්ත මෙහෙවරක් කරපු මාතලේ දිස්ත්‍රික්කයේ නායකයා. එතුමාගේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකත්වය අහෝසි කෙරුවා. ඒ වාගේම චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකත්වය අහෝසි කෙරුවා.

පළාත් සභා මන්ත්‍රීවරු ගැන කියනවා නම් පළාත් සභා මන්ත්‍රී ශිරාල් ලක්තිලක මැතිතුමාගේ කෝටිටේ ආසනය ඔහුගෙන් අයින් කෙරුවා. නීතිඥ මෛත්‍රී ගුණරත්න මැතිතුමාගේ ආසනය එතුමාට අහෝසි කෙරුවා. පළාත් සභා මන්ත්‍රී ජෝර්ජ් පෙරේරා මැතිතුමා මහර ආසනයෙන් අයින් කෙරුවා. පළාත් සභා මන්ත්‍රී නීතිඥ ශිරන්ත අමරසේකර මැතිතුමාගේ ආසනය එතුමාට අහිමි කෙරුවා. රෝස් ප්‍රනාන්දු මැතිනිය කටාන -[බාධා කිරීම්] කලබල වෙන්න එපා. රෝස් ප්‍රනාන්දු මැතිනිය කටාන ආසනයෙන් අයින් කෙරුවා.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, නැහැ. කටාන ආසනයේ මම.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, ඔව්. මම දන්නවා. මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ. කරුණාකර නිශ්ශබ්දව ඉන්න. [බාධා කිරීම්] බන්දුලාල් බන්ඩාරිගොඩ මැතිතුමා එතුමාගේ ආසනයෙන් අයින් කෙරුවා. ඩොනල්ඩ් මැතිතුමා මින්නේරිය ආසනයෙන් අයින් කෙරුවා. ආනන්ද ලැනරෝල් මැතිතුමා බද්දේගම ආසනයේ සංවිධායකකමින් අයින් කෙරුවා. රවි ජයවර්ධන මැතිතුමාව හොරණ ආසනයෙන් අයින් කෙරුවා. ලාල් පෙරේරා මැතිතුමා අපේ ජාතික සේවක සංගමයේ හිටපු මාධ්‍ය ප්‍රකාශක. එතුමාවත් ඉවත් කෙරුවා. ප්‍රාදේශීය සභාවල විපක්ෂ නායකවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 250කට අධික සංඛ්‍යාවකට විරුද්ධව චෝදනා පත් යවලා ඔවුන්ට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වුවා. මේක හරියට ජෝශප් ස්ටාර්ලින් එදා කොමියුනිස්ට් පක්ෂයේ මහා ශුද්ධ කිරීම - purge - හා සමානයි. පක්ෂයක් ශුද්ධ කිරීමේ වැඩ පිළිවෙළ, පක්ෂයේ මිනිස්සු එළවන වැඩ පිළිවෙළ, ජනමතයක් තිබෙන, මිනිස්සුන්ට හදවතින් ආදරය කරන මිනිස්සු එළවන වැඩ පිළිවෙළ තමයි පසු ගිය කාල වකවානුවේ ක්‍රියාත්මක වුණේ. අද වන කොට රංගෙ බණ්ඩාර මැතිතුමාගේ තත්ත්වය මොකක්ද? 2000 වසරේ අපේ පක්ෂයේ කටයුතු කර ගෙන යන්න අමාරු අවස්ථාවේ එතුමා තමන්ගේ නිලතලවලින් ඉල්ලා අස් වෙලා ගිහිල්ලා පක්ෂය වෙනුවෙන් ගුටි කාගෙන, ගහගෙන කටයුතු කළා. එතුමාට විරුද්ධව තවමත් නඩු තිබෙනවා. එහෙම තිබියදීත් එතුමාගේ ආසනය අහිමි කෙරුවා. එතුමා තවමත් මේ පක්ෂයේ රැඳිලා ඉන්නවා. ඉතිහාසයේ මේ නායකතුමා යටතේ ඉන්න බැරි වුණු විශාල පිරිසක් මේ පක්ෂය අතහැර දමා ගියා. සරත් අමුණුගම මැතිතුමා මේ පක්ෂයට තිබුණු සම්පතක්. එතුමා 1998 වූලා බණ්ඩාරනායක ඇතුළු තවත් පස් දෙනකු එක්ක පක්ෂයෙන් අයින් වෙලා ගියා. ඊළඟට, රෝහිත බෝගොල්ලාගම මැතිතුමා, කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමා, මහින්ද සමරසිංහ මැතිතුමා මේ නායකතුමා ළඟ ඉතාම ළඟින් වැඩ කරපු අය. [බාධා කිරීම්] හිනා වෙන්න එපා. හෙට අනිද්දාට අනෙක් අයටත් ඔය ටික වේවි. ඔය ළඟින් ඉඳගෙන කෑ ගහපු අය තමයි ඉස්සෙල්ලාම යන්නේ. මතක තියා ගන්න. [බාධා කිරීම්] දැන් එක එක කොන්ත්‍රාත් භාර ගන්න ලැහැස්ති වෙන්න එපා.

කරු ජයසූරිය මැතිතුමා ඇතුළු 17 දෙනෙක්, යුද්ධයේදී ඇති වුණු වාතාවරණයත් එක්ක ආණ්ඩු පක්ෂයට ගියා. 2008 දී අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට ඉගැන්නුවා යුද්ධය පරදින්නේ කොහොමද කියන එක. ජොන්ස්ටන් ඇමතිතුමා සාක්ෂි දරනවා ඇති; අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා සාක්ෂි දරනවා ඇති. අපි නැඟිටලා විරුද්ධ වුණා මේවාට. මතක තියා ගන්න. [බාධා කිරීම්] එදා හිටියේ නැති අය කථා කරන්න එපා. එදා අපි විරුද්ධ වුණා. හමුදාවේ කර්නල්ලා ගෙනැල්ලා එදා අපට ඉගැන්නුවා යුද්ධයෙන් පරදින්නේ කොහොමද කියලා.

"මෝසම් වැස්ස නිසා, එන මෝටාර් නැත්නම් එන යුද බඳල් යන්න බැරුව හිර වෙනවා. එරෙනවා. එරුණායින් පසු යුද්ධයෙන් අපි පරදිනවා. යුද්ධය පැරදුණාම අනික් පැත්තෙන් ආර්ථිකය කඩා වැටෙනවා. එතකොට ආණ්ඩුව ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇවිත් තිබෙනවා" කියා අපට ඉගැන්නුවා. මේ රටට ආදරය කරන මිනිස්සු විධියට අපි එදා නැඟිටලා ඒකට විරුද්ධ වුණා. ඒවා තමයි -යුද්ධයෙන් පරදින හැටි- යූඑන්පී මන්ත්‍රී කණ්ඩායමට ඉගැන්වූවේ. ඒක මතක තියා ගන්න. පසු ගිය සතියේත් ගාමිණී ලොකුගේ මැතිතුමා මාත් සමඟ කිව්වා, එදා ඒ වෙලාවේ අපි හරි තීන්දුවක් ගත්තා නම්, යුද්ධයට සහයෝගය දීලා වෙන විධියකට අපි වැඩ පිළිවෙළක් සකස් කර ආණ්ඩුව වටටන වැඩ පිළිවෙළක් ගෙන ගියා නම්, අදත් මේ විපක්ෂයේ අපි ඔක්කොම කට්ටිය සිටිනවා කියා. ඒවා තමයි තිබුණු ප්‍රශ්න. අපි ඒවා ඔක්කොම හිතින් දරා ගෙන පක්ෂය ඇතුළේ හිටියා. මතක තියා ගන්න.

එදා 1989 දී මහින්ද රාජපක්ෂ මහත්මයා ප්‍රමුඛ අට දෙනෙක් හිටිය විපක්ෂය මොනවාද කළේ? එහෙම අට දෙනාට බැහැපු වෙලාවේ එතැනින් පසු -[බාධා කිරීමක්] ඔව්. 1989න් පස්සේ. ඔක්කොටම ගණන් වරදිනවා. ඒ අය මොකක්ද කළේ? ඒ අය පාර්ලිමේන්තුවෙන් ඉන් පිටතත් විශාල වැඩ කොටසක් කර ගෙන ගියා. එදා පාද යාත්‍රා කරලා, ජන ඡෝෂා කරලා, ශබ්ද ඡෝෂා කරලා 1993 දකුණේ මැතිවරණයේදී අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට දිවුරුම් දෙන්න බැරි වන විට, තිබුණු යකඩ ගේට්ටු ගලවා දමා ඉබ්බෝ ගලවා දමා බාකීර් මාකාර් මැතිතුමා කැඳවා ගෙන ගිහින් ඒ දිවුරුම් දීම කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාට හයියක් තිබුණා. අද අපි අරගෙන ගියොත් දිවුරුම් දෙනවා තියා අපව පැත්ත පළාතකට ගන්න එකක් නැහැ. අප බේරා ගන්න කවුරුවත් නැහැ. ගැහුවොත් ගුටි කාලා නිකම් ඉන්න වෙලා තිබෙන්නේ. මේ තත්ත්වයට අපි පත් වුණා.

අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අද අපි උද්ඝෝෂණය කරනවා. උද්ඝෝෂණයේදී නායකයෝ එනවා. ඇවිත් කථා කරලා ගියාට පස්සේ අපේ සිටින මිනිසුන්ට කඳුළු ගෑස් ගහනවා. එදා ජීවන බරට විරුද්ධව අපි කළ උද්ඝෝෂණයෙන් පාලිත තෙවරප්පෙරුම මැතිතුමා තනියම සටනට මුහුණ දුන්නා. නායකයෝ ඔක්කොම ගිහිල්ලා. කථා කරලා ගියාම ඒක හරියට සෙට් කරලා ගැහුවා වාගේ වැඩක්. අනෙක් ඔක්කෝම මිනිසුන්ට කඳුළු ගෑස් ගැහුවා. ඒකයි සිද්ධ වුණේ. අද වන විට අපත් එක්ක හිටපු මිනිසුන් බේරා ගත්තාද? එස්.බී. දිසානායක මැතිතුමා අපේ පක්ෂය වෙනුවෙන් හිරබත් කන වෙලාවේ හඟුරන්කෙත ඉඳලා පාද යාත්‍රාවක් පටන් ගත්තා. ඒ පාද යාත්‍රාව ආරම්භ කරලා කිලෝ මීටරයක් යන්න හම්බ වුණේ නැහැ නායකයෝ ටික ඔක්කෝම ගියා. කොළඹට එන තුරු පාද යාත්‍රාව තනියම අරගෙන එන්න අපට සිද්ධ වුණා. එදා සෙනහ හිටියේ නැහැ. ඒත් සෙනහ එකතු කර ගෙන කොළඹට එන්න අපට සිද්ධ වුණා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ නුවර ඉඳලා කොළඹට පෙළපාළියක් එන විට දෙතුන් දාහක් එකතු කර ගන්න බැරි පක්ෂයක්ද? නැහැ. ඒකට සහයෝගය දෙන්නේ නැහැ. තමන් වෙනුවෙන් හිරේ ගිය මිනිසුන් බේරා ගන්න බැරි නායකයෝ සාමාන්‍ය මිනිසුන්ගේ හදවතේ දැනෙන රාවය ගැන කල්පනා කරන්නේ කොහොමද? එහෙම හදවතක් නැති මිනිස්සු අනාගතයේ අපේ අහිංසක යූඑන්පීකාරයෝ වෙනුවෙන් තමන්ගේ හඬ අවදි කරන්නේ කොහොමද? මම අහන්නේ ඒකයි.

අද සරත් ෆොන්සේකා මැතිතුමාගේ තත්ත්වය කොහොමද? සරත් ෆොන්සේකා මැතිතුමා අවුරුදු දෙකහමාරක් පාර්ලිමේන්තුවේ ඉඳලා කුදලාගෙන ගිහින් හිරේ දැම්මාට පස්සේ එක්සත් ජාතික පක්ෂය විධියට අපි මොනවාද කළේ? 2010 නායකයෙක් නැතුව අපට පිටින් නායකයෝ ආදේශ කරන්න සිද්ධ වුණා; ආනයනය කරන්න සිද්ධ වුණා. එහෙම කළ නායකයා අපට බේරා ගන්න බැරි වුණා. ඒ වෙනුවෙන් අපි කළ උද්ඝෝෂණ අරගෙන ගිහින් අතරමඟදි නතර කරන එක, වැඩි කාලයක් සරත් ෆොන්සේකා මහත්මයා හිරේ තියන එක, එස්.බී. දිසානායක වැඩි කාලයක් හිරේ තැබුවාම තමයි අපට මේක කර ගෙන යන්න පුළුවන් කියා හිතන එක තමයි ඇති වුණ ආස්වාදය. මිනිස්සු හිරේ දමා මිනිසුන්ගේ හදවත් ඔක්කොම හිර කරලා මිනිස්සු හඬන කොට ඒකෙන් බලය ලබා ගන්න පුළුවන් කියන මන්ද මානසිකත්වයක් තමයි මේ අයට තිබුණේ.

පසු ගිය කාලයේ අපි මොකක්ද කළේ? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවාම අපි එළියට ගිහින් උපවාසයක් කරලා මේ ආණ්ඩුවට විරුද්ධව අපි වැඩ කටයුතු කරමු කියා තීරණය කර අපේ පළමු වන වැඩ පිළිවෙළ පටන් ගත්තා. මෙතැන තිබෙන පොඩි hut එකක අපි උපවාසය පටන් ගත්තා. පසු දා උදේ පුළුවන් තරම් ඇතුළට සෙනඟ ගෙන්වා මේක දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාරයක් බවට පත් කරමු කියා අපි කල්පනා කළා. එහෙම කරන්න හම්බ වුණේ නැහැ. "සිරිකොත" ඇතුළෙන් එළියට යන විට පාර වහලා. අනෙක් පැත්තේ පාරෙන් යන්න බැහැ, වෙන පාරකින් යමු කියා නතර කරන්න හැදුවා. කවුරුවත් එන්නේ නැහැ. නමුත් කරන්න දෙයක් නැතිකමට අපි ගිහිල්ලා සටන් කරලා barricades කඩාගෙන බිඳගෙන ආපසු එළියට ආවා.

ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍රවිනිශ්චයකාර තනතුරින් අයින් කළා. කවුරු වුණත් එතුමිය මේ රටේ අග්‍රවිනිශ්චයකාරතුමිය. එය වැරැදි අයින් කිරීමක්. ඒක මා අදත් කියනවා. [බාධා කිරීම්] මතක තියා ගන්න ඒ ක්‍රමවේදය වැරැදියි. මම ඒ කථාව ඕනෑ තැනක කියනවා. මට ඒක ප්‍රශ්නයක් නොවෙයි. නමුත් මතක තියා ගන්න, ඒ අවස්ථාවේ විපක්ෂයක් විධියට අපි හරියට වැඩ කටයුතු කළා නම් මේ විධියට ආණ්ඩුවකට සෙල්ලම් කරන්න බැහැ. ඒ අවස්ථාව අපි අත් හැරියා. ඒක අත් හැරලා මොකක්ද කළේ? ඊ ළඟට එන අග්‍රවිනිශ්චයකාරවරයා ලවා පක්ෂය හැර ගිය මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධුර අහෝසි කර ගන්න පුළුවන් කියලා හිතුවා. ඒකයි කල්පනා කළේ. "බය වෙන්න එපා. ඊ ළඟට එන්නේ ටොප් බඩුවක්, එතුමා ලවා ඒක කර ගන්න පුළුවන්" කියලා හිතුවා. එතුමා දාගෙන අපේ මන්ත්‍රීවරු අට දෙනකු අයින් කර ගන්න පුළුවන් කියලා හිතුවා. එහෙමයි plan එක තිබුණේ. නමුත් අද මොකද වෙලා තිබෙන්නේ? අද ඒ ගොල්ලෝ තවම ඉන්නවා. මෙන්න අද ඇති කරලා තිබෙන තත්ත්වය.

විදුලි බිල වැඩි කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ආවා. ඒ අවස්ථාවේ මේ ආණ්ඩුව වටින්න පුළුවන් තැනකට ගෙනෙන්න උද්ඝෝෂණ ව්‍යාපාර ඇතුළු කරන්න පුළුවන් හැම වැඩ පිළිවෙළක්ම කරන්න තිබුණා. දෙදාහක පමණ පිරිසක් එකතු කරලා රාත්‍රියේ හුළු එළි පත්තු කරගෙන මා පළමුවැනි සටන් ක්‍රියා මාර්ගය පඩුවස්නුවර ආසනයෙන් පටන් ගත්තා. නමුත් ඒ සටන් ක්‍රියා මාර්ගය ඉදිරියට ගෙන ගියේ නැහැ.

අපේ ජාතික වෘත්තීය සමිති අද කඩා වැටිලායි තිබෙන්නේ. එදා අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ සාමාජිකයන් 95,000ක් විතර හිටියා. 1994 වර්ෂය වන කොට අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ 72,000ක් විතර සාමාජිකයන් හිටියා. නමුත් අද සාමාජිකයන් 9,000ට පහත වැටිලා තිබෙන්නේ. අද අපේ වෘත්තීය සමිති නැහැ. එදා විශාලම වෘත්තීය සමිති ව්‍යාපාරය තිබුණු පක්ෂය තමයි අපේ පක්ෂය. නමුත් විදුලිබල අර්බුදය වෙනුවෙන් කරපු වැඩ වර්ජනය අපට කරන්න බැරි වුණා. අපි ඒක බාර දුන්නා, ඒකාබද්ධ වෘත්තීය සටන් ක්‍රියා මාර්ගවලට යන වෙනත් දේශපාලන පක්ෂවල නායකයන්ගේ අතට. අද අපි නිකම් ඇවිදින ඇට සැකිලි වාගේයි. වෘත්තීය සමිති ව්‍යාපාරය කඩා වටිලා තිබෙන්නේ; ඉවරයි.

එක පැත්තකින් පක්ෂ සාමාජිකයන් ඉවත් වෙනවා. තව පැත්තකින් ඡන්ද ප්‍රතිශතය හැළෙනවා. තවත් පැත්තකින් වෘත්තීය සමිති කඩාගෙන වැටෙනවා. ගම් මට්ටමේ නායකයන් මලානික වෙලා නැවත නොනැඟිටෙන තැනකට පත් වෙලා තිබෙන්නේ. මේ නිසා තමයි අපි ව්‍යාපාර ගණනාවක් හැදුවේ. නිදහස් ජනතා ව්‍යාපාර අපට වුවමනා වුණා. එදා 2004 මේ ආණ්ඩුව ගෙනාවා වාගේ වැඩ පිළිවෙළක් අපට වුවමනා වෙලා තිබුණා. වෙනත් බලවේග එකට එකතු කර ගෙන, රට වටේ එක්සත් ජාතික පක්ෂ වැඩ පිළිවෙළ වෙනම යන ගමන්, ආණ්ඩු විරෝධයත් ඇති කරලා, ඒ සියල්ල යම් කිසි තැනකින් එකතු කර ගෙන දැවැන්ත ආණ්ඩු විරෝධයක් හරහා ආණ්ඩුවක් ගන්න අපට වුවමනා වෙලා තිබුණා. අප ඒ වැඩ පිළිවෙළ අරගෙන යන කොට පක්ෂ නායකත්වයෙන් ආවේ "ඒවා නතර කරන්න" කියලායි.

අපි එදා නිදහස් ජනතා ව්‍යාපාරය එස්.බී. දිසානායක මැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා පටන් ගත්තා. ඒ පළමු වැනි රැස්වීමට පහර දුන්නා. ඊ ළඟට අපි "නිදහසේ විලාපය" නමින් උද්ඝෝෂණයක් සරත් ෆොන්සේකා මැතිතුමා වෙනුවෙන් පටන් ගත්තා; ඒකට පහර දුන්නා. මගේ වාහනය, රවි කරුණානායක මැතිතුමාගේ වාහනය, රෝසි සේනානායක මැතිනියගේ වාහනය එදා කුඩු කරලා දැම්මා. නමුත් අපට පිහිට වෙන්න කවුරුවත් හිටියේ නැහැ. ඒ ව්‍යාපාර ඔක්කොම අත් හැරලා දැම්මා.

ඊළඟට, සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය. ඇත්තටම ඒකෙන් කළේ ව්‍යවස්ථාව පිළිබඳව කථා කරන්න අවශ්‍ය වාතාවරණය සකස් කිරීමයි. අද ඒකට මොකක්ද කරලා තිබෙන්නේ? ඒ ඇවිළෙන ගිනි ගොඩට කාඩ්බෝඩ් එකක් දැම්මා වාගේ "ව්‍යවස්ථාවක්" ගෙනැල්ලා දැම්මා. දැන් ඒ ව්‍යවස්ථාව ගැන තමයි කථා කරන්නේ. හිතන්නේ ව්‍යවස්ථාවෙන් රට පෙරළන්න පුළුවන් කියලා. 50 දෙනකු, 60 දෙනකු එකතු කර ගෙන කරන Voice Cut දේශපාලනයක් දැන් තිබෙන්නේ; වෙන එකක් නොවෙයි. ජනතා ව්‍යාපාරවලින් ඇත් වෙච්ච Voice Cut දේශපාලනයේ පෙර ගමන්කරු බවට පත් වෙලා තිබෙනවා. Mike එකක් හම්බ වුණාම ආණ්ඩුව කුඩු වෙන්න බණින්න පුළුවන්. හැබැයි ඉස්සරහා සෙනඟ නැහැ, හූ කියන්න, කෑ ගහන්න, කථා කරන්න. එතැනින් වියුක්ත වෙච්ච වාතාවරණයක් තිබෙන්නේ. මෙහෙම විපක්ෂයක් නිසා තමයි ඒකාධිපතිවාදය ඇවිස්සෙන්නේ; ඒකාධිපතිවාදය නැඟිටින්නේ. මෙහෙම විපක්ෂයක් තියෙන කොට මිනිසුන් බණින්නේ ආණ්ඩුවට නොවෙයි. මිනිසුන් අද බණින්නේ විපක්ෂයට. මොකක්ද විපක්ෂය කරන්නේ, තමුන්නාන්සේලා මොනවාද කරන්නේ, කරුණාකර මේ ආණ්ඩුවට විරුද්ධව පාරට බහින්න ලෑස්ති වෙන්න කියලායි මිනිස්සු බණින්නේ. [බාධා කිරීම්] තව කරන්න. බය වෙන්න එපා. ඕනෑ එකක් කර ගන්න.

දැන් පළාත් සභා මැතිවරණ ඇවිල්ලා තිබෙනවා. මේ පළාත් සභා පරදින එක අහන්න දෙයක් නොවෙයි. ඊළඟ පළාත් සභා මැතිවරණ සියල්ලම පරදිනවා, විපක්ෂය මේ විධියට කටයුතු කර ගෙන ගියාම. ඒක මතක තියා ගන්න. මේ පළාත් සභා මැතිවරණයේදී අපි වයඹ පළාත ඉතාම ඉහළ ප්‍රතිශතයකින් දිනලා පෙන්වනවා. එතැනින් පස්සේ තියන සියලු පළාත් සභා මැතිවරණ අපි ජයග්‍රහණය කරනවා. ඒක මතක තියා ගන්න. එතැනින් නතර වෙන්නේ නැහැ. ඊළඟට තිබෙනවා, ජනාධිපතිවරණය. [බාධා කිරීම්] මතක තියා ගන්න, ජයග්‍රහණය කරන්නේ අපි. ආණ්ඩුව තමයි ජයග්‍රහණය කරන්නේ. [බාධා කිරීම්] ආස්වාදයට ඔබතුමන්ලා ඒක කියන්න. මා අද මෙතැනින් එළියට ගියාට පස්සේ ඒ ජයග්‍රහණය අරගෙන දෙන්නේ ආණ්ඩුවට. ඒක මතක තියා ගන්න. අපි මීට පස්සේ විපක්ෂයට දිනන්න ඉඩ තියන්නේ නැහැ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

අපි 1989 ඉඳලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළා. සාලින්ද දිසානායක ඇමතිතුමාට මතක ඇති 1989 දී එක්සත් සමාජවාදී පක්ෂය වෙනුවෙන් මා කථා කළ පළමු වැනි රැස්වීම. මා 2000 දීයි එක්සත් ජාතික පක්ෂයට එකතු වුණේ. 2001 දී මා ඡන්දය ඉල්ලුවා; පරාදයි. එක්සත් ජාතික පක්ෂය කටුගම්පොළ ආසනයෙන් ඡන්දය ඉල්ලන්න හතර දෙනකු දැම්මා. එක ආසනයක් ඇතුළේ පාර්ලිමේන්තුවට එන්න ඡන්දය ඉල්ලුවා හතර දෙනෙක්. දිනවන්න නොවෙයි, පරද්දන්නයි එහෙම දැම්මේ. නමුත් මා 2004 දී පාර්ලිමේන්තුවට ආවා.

ඊළඟට, මා කිව්වා, පක්ෂයේ ශිෂ්‍ය ව්‍යාපාරය දියුණු කරලා කටයුතු කරමු කියලා. ශිෂ්‍ය නායකයකු විධියට හා විශ්වවිද්‍යාලය ඇතුළේ සටන් කරපු කෙනකු විධියට මා ඒ සඳහා වැඩ පිළිවෙළක් හැදුවා. වැඩ පිළිවෙළක් හදලා ඒ file එක අරගෙන එන කොට මට කිව්වා, "ඒ වැඩ කටයුතු මෙයාට දෙන්න සිද්ධ වනවා. ඒක නිසා ඔයාට දෙන්න බැහැ " කියලා. මා ඒ මන්ත්‍රීවරයාගේ නම කියන්නේ නැහැ. මා file එක අරගෙන ආපහු හැරිලා ආවා. ඊළඟට මට භාර දුන්නා three-wheelers ගැන කටයුතු කරන්න. මා ලංකාවේ three-wheelers වල වැඩ කරන අය එකතු කරලා පළමු වැනි උද්ඝෝෂණ ව්‍යාපාරය පැවැත්වූවා, ලිප්ටන් වටරවුමේ. ඒ, three-wheelers වල වැඩ කරන අයගේ පළමු වැනි උද්ඝෝෂණය. ඒ විධියට අපි වැඩ කරලා පෙන්නුවා.

ඊළඟට, 2010 දී භාර දුන්නා කලාකරුවෝ එකතු කරන්න. ඒ වෙන කොට සියලු කලාකරුවෝ ගිහින් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සභායට. කවුරුවත් නැහැ අපට එකතු කර ගන්න. අපිට කිව්වේ, "ඌම් පවං කලාකාරයෝ විතරයි දැන් එක්සත් ජාතික පක්ෂයට ඉතුරු වෙලා ඉන්නේ" කියලා. අපට එහෙමයි කිව්වේ. නමුත් 1,200කට වැඩි පිරිසක් එකතු කරලා එදා අපේ වැඩ පිළිවෙළ කරන්න හැකියාව ලැබුණා.

2004 ඉඳලා තිබුණු හැම උද්ඝෝෂණයකටම මේ පාර්ලිමේන්තුවට ගෙනාපු සටන් පාඨ මගේ අතින් ලියලා තිබෙනවා. ඒ සටන් පාඨ අපේ අත්වලින් ලියැවිලා, මෙතැනට ගෙනැත් උස්සා ගෙන ඉඳලා තිබෙනවා. සමහර අය උස්සා ගෙන ඉන්නවා. සමහර අය උස්සා ගෙන ඉන්නේ නැහැ. අපට වුවමනාව තිබෙනවා උස්සා ගෙන ඉන්න. හැබැයි ඉදිරි පෙළ කිහිප දෙනකුට වුවමනා වෙලා තිබුණා, ඒවා උස්සන්නේ නැතිව ඔහේ තියා ගෙන ඉන්න. ඒවා උස්සන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒක තමයි තිබෙන තත්ත්වය.

එදා විදුලි බිල වැඩි කිරීමට කටයුතු කරපු වෙලාවේ මමයි අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමායි කථා කරලා, කෑ ගහලා කිව්වා, "අපි අද පාර්ලිමේන්තුව තුළ මොකක් හෝ කරමු" කියලා. එහෙම කිව්වේ නැත්නම් එදාත් කිසිම උද්ඝෝෂණයක් නැහැ. ඒක නිකම්ම කෙරෙනවා. ඒවා සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න කවුරුවත් නැහැ. මටත්, බුද්ධිකටත් මේ පළිගැනීම් දිගින් දිගටම එන්නේ එකම කාරණයක් මත, එකම එක කාරණයක් මත.

2010 දී පැවැති ඡන්දයේදී ලංකාවේ දෙ වැනි වැඩිම මනාප ගණන මා ලබා ගත්තා. නායකතුමා ලක්ෂය පන්නලා ඡන්ද ගන්න කොට, ලක්ෂය පන්නලා ඡන්ද ගත්ත එකම එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා තමයි දයාසිරි ජයසේකර. නමුත් මම කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නැහැ. හැබැයි ප්‍රාදේශීය සභා ඡන්දයකදී ඡන්ද 1,070ක් ගත්ත කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුත් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඉන්නවා. ඒකයි තිබෙන ලජ්ජාව.

පසු ගිය මැතිවරණවලදී, පළාත් සභා මැතිවරණවලදී අපට පක්ෂ රැළි තහනම් කලාප බවට පත් වෙලා තිබුණා. සමහර රැස්වීම්වලට නායකතුමා එන කොට මා රැස්වීමේ කථා කරමින් සිටි අවස්ථාවලදි මට වේදිකාවෙන් බැහැලා යන්න කියා තිබෙනවා. එක රැස්වීමකදී අපේ තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය මට කිව්වා, "මල්ලි කරුණාකරලා වේදිකාවෙන් බැහැලා මෙතැනින් යන්න" කියලා. මා ඇහුවා, "ඇයි අක්කා මට යන්න කියන්නේ" කියලා. එතුමිය කිව්වා, "නායකතුමා ඔයා ඉන්න නිසා මෙතැනට එන්න කැමැති නැහැ. ඔයා ඉන්න නිසා එතුමා එන්න බැහැයි කියනවා. ඔයා ගියාට පස්සේ තමයි එතුමා එන්නේ" කියලා. මා එළියට එනතෙක් එතුමාගේ වාහන පෙළ තිබුණා ඇඹිලිපිටිය නගරයේ පාරේ දකුණු පැත්තේ නවතා ගෙන. මා මේ පක්ෂය වෙනුවෙන් උදේ ඉඳන් රෑ වන තෙක් කෑ ගහනවා. මේ පක්ෂය වෙනුවෙන් උදේ ඉඳන් රෑ වන තෙක් කථා කරනවා. හැබැයි, මා රැස්වීමේ ඉන්න තෙක් ඇතුළට එන්න බැරි තත්ත්වයක් එතුමාට තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදයේ පියා විධියට අපි සලකන ෆැන්සිස් වෝල්ටර්ගේ මේ ප්‍රකාශය මා කියවන්න කැමැතියි.

"මා ඔබ දරන මතයට ඉදුරාම විරුද්ධ වෙමි. නමුත් එකී මතය දැරීමට ඔබට ඇති අයිතිය දිවි හිමියෙන් සුරකින්නෙමි."

ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් ගල විසම්මුතියට ඇති අයිතිය බව එතුමා ප්‍රකාශ කළා. ආණ්ඩුවේ ඒකාධිපතිවාදය විවේචනය කරන, පවුල් පාලනය විවේචනය කරන, සුපිරිසිදු ප්‍රජාතන්ත්‍රවාදයකට ව්‍යවස්ථා හදන ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී නායකයා පක්ෂයේ විසම්මුතියට ඉඩක් දෙන්නේ නැති නායකයකු බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මොනවාද කථා කරන්නේ? ඒකාධිපති ආණ්ඩුවකට එරෙහිව වැඩ කරන කොට අප තුළ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්න ඕනෑ. අප තුළ ප්‍රජාතන්ත්‍රවාදයක් නැතුව අපි කොහොමද ආණ්ඩුවට ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩුවක් කියන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒකාධිපතියා ළඟට යන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකාධිපතිත්වයක් ගෙනෙන්න අත ඔසවපු අය කථා කරන්න එපා. අවුරුදු හයේ යෝජනාව ගෙනාපු කෙනා තමයි ලජ්ජා නැතුව හිනා වෙවී කථා කරන්නේ. ලජ්ජා නැතිව තව කථා කරනවා. එතකොට පක්ෂ නායකත්වයේ ප්‍රජාතන්ත්‍රවාදය නැති වීමේ කිඹුල් කඳුළු පිළිබඳව සිහිපත් වන්නේ සාධාරණ රීතින් තුළ පවතින එක ආජ්ඤයකි. මම කියන්න කැමැතියි, "සාධාරණය පතන්නා පිරිසිදු දැත් ඇතිව සාධාරණය ඉල්ලා සිටිය යුතු ය; he who comes into equity must come with clean hands" කියලා. [බාධා කිරීම්] මම ඒ කිව්වේ නායකතුමා ගැනයි. [බාධා කිරීම්] ඔබතුමන්ලා ඉතින් හැම දාම කරන්නේ තප්පුලන එක නේ. ඒක කර ගෙන යන්න. තව හරියයි. තව කර ගෙන යන්න. ඕකෙන්ම තේරෙනවා යන පිරිස තව වැඩි වෙනවා කියලා. තවත් ඒක කරන්න. දිගටම කර ගෙන යන්න.

පසු ගිය කාලය පුරාම අපි කළේ පක්ෂයේ විනය ගැන කල්පනා කරමින් සිටි එක විතරයි. මිනිස්සු ඔක්කොටම යන්න හැරියා. එහි ප්‍රතිඵලයක් හැටියට පසු ගිය කාලයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිශතය සියයට 59.26 සිට සියයට 27.29 දක්වා පහත වැටුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සන්ධානයේ ඡන්ද ප්‍රතිශතය සියයට 35.86 සිට 70.13 දක්වා වැඩි කර ගත්තා. එක්සත් ජාතික පක්ෂය දශක දෙකක් තුළ ජනගහනයේ වර්ධනය සහ විපක්ෂයේ සිටීමේ වාසිය නොතකා

ඡන්ද ප්‍රමාණය 346,978 සිට 270,347 දක්වා පහතට වැටී තිබෙනවා. මේ නිසා තමයි අද පක්ෂය ගොඩ නඟන්න බැරි තැනට පත් වෙලා තිබෙන්නේ. 2009 වර්ෂයේ ආණ්ඩුවේ ඡන්ද පදනමෙහි සහ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනමෙහි වෙනස 398,396යි. මේක නැවතත් ගොඩ ගන්න; ඡන්ද 398,396 නැවත එකතු කරන්න පක්ෂය ඇතුළේ දැවැන්ත විප්ලවයක් සිද්ධ වෙන්න ඕනෑ. ජාතික තලයේ ඡන්ද පදනම සෝදාපාළුවට ලක්වීම මීටත් වැඩියි. මේ කඩා වැටීම පිළිබඳව කථා කිරීම, විකල්පය පිළිබඳව හෙළි කිරීම පළි ගැනීමට, දේශපාලනමය වශයෙන් ඝාතනය කිරීමට හේතුවක් වෙලා තිබෙනවා. අනාගත මැතිවරණයකදී නාම යෝජනා අහිමි වන තැනකට අපි අභ්‍යන්තරය තුළ කළ විවේචන අද ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

1951 ජූලි 12 වැනි දා, බණ්ඩාරනායක මහත්මයා වසර හතරක් තමන් දැරූ තනතුරුවලින් සෞඛ්‍ය හා පළාත් පාලන අමාත්‍ය ධුරයෙන් සහ සභානායක ධුරයෙන්- ඉල්ලා අස් වුණා. 1946 දී එක්සත් ජාතික පක්ෂය පිහිටු වන අවස්ථාවේදී සිංහල මහ සභාවට එක්වීමෙන් අපේක්ෂා කළ පළමු වැනි අරමුණ වුණේ සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ දේශීය ආණ්ඩුවක් හදන එකයි. ඊළඟට එතුමා බලාපොරොත්තු වූ මහජන සංවර්ධනයේ පරමාර්ථ ඉටු නොවීම තුළ ඒ සඳහා එක්සත් ජාතික පක්ෂය තුළ ඉඩ ප්‍රස්ථා නැති බව දැන ගෙන එතුමා එතැනින් ඉවත් වුණා.

එලෙස අනුගමනය කරමින් එතුමාගේ අඩි පාරේ මමත් ගමන් කරනවා. ඒ අඩි පාරේ ගමන් කරමින් එක්සත් ජාතික පක්ෂය අත්හැර දමා මමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට; මගේ නිජබිරි ගෙයට නැවතත් ගමන් කරනවාය කියලා මේ අවස්ථාවේ මා හඳවතින්ම ප්‍රකාශ කරන්න කැමැතියි. වීර කැප්පෙටිපොළ මහ දිසාවේ ඉංග්‍රීසීන් වෙනුවෙන් සිංහල හමුදාවන්ට එරෙහිව වෙල්ලස්ස කැරැල්ල පාගා දමන්නට ගොස්, ඉංග්‍රීසීන් විසින් ලබා දුන් ආයුධ නැවතත් ඉංග්‍රීසීන් වෙත භාර දීලා සිංහල හමුදාවන් එක්ක එකට එකතු වෙලා සටන් කළා වාගේ සටනක ආරම්භය තමයි මේ පටන් ගන්නේ කියලා මම කියන්න කැමැතියි. [බාධා කිරීම්]

අහිංසක එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දය භාවිත කරලා ඕනෑ නම් මටත් තිබුණා, අද මේ පාර්ලිමේන්තුවේ කථාවක් කරලා එහා පැත්තට ගිහිල්ලා ඇමතිකමක් අර ගෙන ඇමති පුටුවක වාඩි වෙන්න. ප්‍රජාතන්ත්‍රවාදයේ යහගුණය මගේ හදවතේ තිබෙනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ අපේ ආදරණීය මිනිස්සු; ලංකාව ඇතුළේ ඉන්න හදවතක් තිබෙන එක්සත් ජාතික පාක්ෂිකයෝ සියලු දෙනා අද අපට ආදරයෙන් කියන්නේ, "ඔබතුමා යන්න එපා, අපට ඔබතුමා විතරයි දැන් ඉන්නේ. ඔබතුමාත් ගියාට පස්සේ අඩුම තරමින් අපි වෙනුවෙන් කථා කරන්නවත් ඉන්නේ කවුද" කියන එකයි. [බාධා කිරීම්] ඒ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දවලින් ඇවිල්ලා, මට මගේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ මුහුණේ දැලි ගාන්න බැරි නිසා; මගේ ආදරණීය ජනතාවගේ ජනමතය නැවතත් උරගා බලන්න වුවමනාවක් තිබෙන නිසා අද මම පාර්ලිමේන්තු මන්ත්‍රීකමින් ඉල්ලා අස් වෙලා වයඹ පළාත් සභාවට තරග කරනවා. එහෙම නැත්නම් මටත් ඒ පැත්තට ගිහිල්ලා ඉඳගෙන ඉන්න තිබුණා. මම ඒක කරන්නේ නැහැ. මොකද, මට ඡන්දය දුන්න එක්සත් ජාතික පාක්ෂිකයෝ මට ආදරය කළා. ඒ නිසා තමයි සීසර්ට අයිති දේ සීසර්ටම දෙනවා වාගේ මම ලබා ගත් 132,000ක ඡන්ද සංඛ්‍යාව අපේ නායකතුමාගේ කකුල් දෙක ළඟ තියලා එතුමාට කැමැති කෙනෙක් පත් කර ගන්න ඉඩ දීලා මම මේ පක්ෂයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වෙලා වයඹ පළාත් සභාවට තරග කරන්න තීරණයක් ගත්තේ.

ඒ නිසා මම විශ්වාස කරනවා, මේ රටේ සිටින එක්සත් ජාතික පාක්ෂිකයිනුත්, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයිනුත් මම ගත් තීරණය ඓතිහාසික, එමෙන්ම ඔවුනට වැදගත් වන තීන්දුවක් බවට පත් කරාවි කියා. ඒ ජන මතය නැවත උරගා බලා ජන මතයක් තුළින් නැවත පාර්ලිමේන්තුවට එන්න මගේ බලාපොරොත්තුව තියා ගෙන ඒ හිඩැස ඉතිරි කරමින් තමයි මම අද පාර්ලිමේන්තුවෙන් සමු ගන්නේ. මේ කාරණයේදී අහිංසක එක්සත් ජාතික පාක්ෂිකයෝ ඉතාම දරුණු කඩා වැටීමකට ලක් වෙලා තිබෙන බවත් මම කියන්න කැමැතියි.

ඒ නිසාම බණ්ඩාරනායක මැතිතුමා ගොඩ නඟපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් නව දැක්මක් හා ජවයක් ලබා දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙත මා අද නැවත එක් වෙලා මගේ ජනතාවට සේවය කරන ක්‍රියාකාරකම ඉස්සරහට කර ගෙන යන්න බලාපොරොත්තු වනවා.

මේ පක්ෂය එක් අයෙකුගේ පෞද්ගලික බූදලයක් නොවෙයි. ඒක ජනතාවගේ බූදලයක්. ඒ නිසා අපිට වුවමනා වෙලා තිබෙනවා,- [බාධා කිරීමක්]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(*மாண்புமிகு ஹரின் பர்னாந்து*)
(The Hon. Harin Fernando)
කාගේද? රාජපක්ෂලාගේද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඊට කලින්, කරුණාකර හරින් ප්‍රනාන්දු මහත්තයා උපැස් යුවළ ගලවලා කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා බලන්න, මේ කාගේ බූදලයක්ද කියලා. එතකොට තේරේවි.

1951 සැප්තැම්බර් 2වෙනි දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමාරම්භක රැස්වීම පවත්වමින් බණ්ඩාරනායක ශ්‍රීමතාණන්, "ඉන්දියාව, පාකිස්තානය, බුරුමය, ඉන්දුනීසියාව, අයර්ලන්තය නිදහස ලබා ගත්තේ නිශ්චිත ප්‍රතිපත්ති හා පදනම් මත පිහිටා ක්‍රියා කළ මහජන ව්‍යාපාරයක් තුළිනි. නමුත් අපගේ නිදහස් ව්‍යාපාරය එසේ නොවූයේය. එය මුදුනින් පටන් ගෙන බොහෝ දුරට මහ ජනතාවගෙන් වියෝ වූයේය. ඒ නිසාම ඇතැමුන් තුළ ඇති කරන ලද මානසිකත්වය වූයේ, අපේ නිදහස ජනතාව විසින්, ජනතාව වෙනුවෙන් දිනා ගත් දෙයක් නොව, පුද්ගල කණ්ඩායමක් විසින් උපයා ගත් දෙයක් බවයි. ඒ නිසාම එකී පුද්ගල කණ්ඩායම් රටේ උරුමය හා නිදහස ඔවුන්ගේ පෞද්ගලික දේපළක් ලෙස සලකන්නට පුරුදු පුහුණු කොට ගෙන සිටින්නාක් මෙන්ම එකී උරුමයන්හි ප්‍රතිලාභ තමනට පමණක් හිමි විය යුතු යයි විශ්වාසයක්ද පවතී." යනුවෙන් පවසා තිබෙනවා.

අද එක්සත් ජාතික පක්ෂයේ බෙදජනක තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ මෙකී චින්තනය නිසායි. රාජපක්ෂ පවුලේ ආදීනවයන් ගැන කථා කරන ගමන් එක්සත් ජාතික පක්ෂ නායකත්වය කටයුතු කරමින් සිටින්නේ තම පරම්පරාවේ උරුමය දේශපාලනය තුළ පවත්වා ගෙන යෑම සඳහායි. නමුත් රාජපක්ෂවරුන්ට ජනතාවගේ ආශීර්වාදය හා වරම නොඅඩුව ලැබෙන කල, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය දිනෙන් දිනම සමාජයෙන් හා ජනතාවගෙන් වියෝ වන තත්ත්වයක එක්සත් ජාතික පක්ෂ මහජන නියෝජිතයන් ලෙස අපට කළ හැකි කාර්ය භාරය අද වන විට ශූන්‍ය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ කාරණාත් එක්ක මම මෙතැනදී කියන්න කැමැතියි, මේ අර්බුදය ගැන. පසු ගිය කාලයේ විනය පරීක්ෂණය පවත්වා මාස අටක් ගත වුණත්, එම විනය පරීක්ෂණය අවසන් කළේ නැහැ. ඡන්දයක් ළං වෙලා තමයි මේ විනය පරීක්ෂණය අවසන් කරන්න අවශ්‍ය කටයුතු ටික කළේ. ඒකත් කළේ බුද්ධික

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පතිරණ මන්ත්‍රීතුමාගේ විනය පරීක්ෂණය මංගල සමරවීර මන්ත්‍රීතුමා මාර්ගයෙන් යෝජනා කරන විධියටයි, මගේ විනය පරීක්ෂණය අහෝසි කිරීම අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමාගේ නම දමා යෝජනා කරන විධියටයි. කෘත්‍යාධිකාරී මණ්ඩලයට එහෙම කරන්න වුවමනාවක් නැහැ. ඒ, අපි තවත් වැට්ටවීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටිකයි කළේ.

මෙහිදී විශේෂයෙන් මම ස්තුතිවන්ත වනවා, අපේ රවි කරුණානායක මැතිතුමාට. එතුමා ගැන අපේ යම් කිසි පරස්පර මත ගණනාවක් තිබුණා. නමුත් එක තැනකදී එතුමා තීරණයක් ගත්තා, මේ පක්ෂය එකට එකතු කර ගෙන යන්න ඕනෑය කියලා. ඒ අනුව තමයි එතුමා අපත් එක්ක කථා කළේ. එතුමා අශෝක් අබේසිංහ මැතිතුමා එක්කත් කථා කළා. පාලිත රංගේ බණ්ඩාර මැතිතුමා එක්කත් කථා කළා. මම දන්නවා, අනෙක් මන්ත්‍රීවරු සියලු දෙනා එක්කත් කථා කරමින් මේ පක්ෂය නැවත ගොඩ ගන්න ඕනෑය කියන තැනක ඉඳගෙන තමයි එතුමා වැඩ කළේ. මගේ හදවතින්ම මම රවි කරුණානායක මැතිතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ වාගේම මා වෙනුවෙන් වචනයක් හරි කථා කරලා මා ගැන විශ්වාසයක් තැබූ හරින් ප්‍රනාන්දු මැතිතුමාටත්, අජිත් පී. පෙරේරා මැතිතුමාටත් මගේ හදවතින් මම ස්තුතිවන්ත වනවා. මේ කථාව කිරීමේදී මට බාධා කරපු අපේ ආදරණීය මන්ත්‍රීවරුන්ටත් මගේ හදවතින්ම මම ස්තුතිවන්ත වනවා. මට එහෙම බාධා කරන්න එතුමන්ලාට අයිතියක් තිබෙනවා. ඒ වාගේම මගේ කථාවට සානුකම්පිතව සවන් දුන් සියලු දෙනාටත් මගේ හදවතින්ම මා ස්තුතිවන්ත වනවා.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයක් යටතේ ඉදිරි අවුරුදු 10ක කාලයක් ඇතුළත නැවත මේ රට එක් සේසත් කරන්න අපි කටයුතු කරනවාය කියන කාරණයත් තමුන්නාන්සේලා සියලු දෙනාටම මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට මා ඔබතුමාටත් ස්තුතිවන්ත වනවා. බොහොම ස්තුතියි.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම මගේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කළ ප්‍රකාශ ප්‍රතික්ෂේප කරනවා. අද මේ විවාදයේ කාලය පළමුවෙන්ම රජයෙන් අඩු විය යුතුයි. [බාධා කිරීම්] එතුමා කථා කෙරුවේ රජය වෙනුවෙන්. [බාධා කිරීම්] විශේෂ ප්‍රකාශයක්. [බාධා කිරීම්]

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ කථාවට පිළිතුරු දෙන්න ඊළඟට කථා කරන්න අවස්ථාව විපක්ෂයට දෙන්න කියලා. ඔබතුමා කිව්වා විදුලි බලය ගැන කථා කෙරුවොත් ඒ අවස්ථාව දෙනවා කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)
අපි මෙතෙක් නිශ්ශබ්දව සිටියා. කිසිම ප්‍රශ්නයක් ඇති කෙරුවේ නැහැ. පිළිතුරු දීම හා අද විෂය පිළිබඳව කථා කරන්න අපේ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකුට අවස්ථාව දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
හොඳයි. කමක් නැහැ. සාධාරණ ඉල්ලීමක්.

ඊළඟට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
මොකක්ද point of Order එක?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ කාරුණික අවධානයට මේ කාරණය යොමු කරවනවා. කිසියම් මන්ත්‍රීතුමෙක් කරන ලද කථාවකින් යම් මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් වුණා නම් ඒ පිළිබඳව ප්‍රතික්‍රියා දැක්වීමේ අයිතිය ඒ නම සඳහන් වුණු මන්ත්‍රීතුමාට තිබෙනවා. දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ කථාවේ විවේචනයට ලක් වුණේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමායි. ඒකට- [බාධා කිරීම්] නැහැ, නැහැ. ඒකට- [බාධා කිරීම්] ඉන්න, ඉන්න. මම කියලා ඉවර නැහැ. මම කියලා ඉවර නැහැ. [බාධා කිරීම්] මම කියලා ඉවර නැහැ, පොඩ්ඩක් ඉන්න.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
තමුන්නාන්සේට අවශ්‍ය නම් විපක්ෂ නායකතුමා පිළිතුරු දෙනවා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මගේත්, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේත් දෙන්නාගේම නම් සඳහන් කළා. දැන් ඔබතුමා හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ නම කිව්වා. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. මම අපේ විවාද කාලය අරගෙන පිළිතුරු දෙන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංශ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Point of Order එකක් නැහැ. ගරු විමල් වීරවංශ ඇමතිතුමනි, එතැන point of Order එකක් නැහැ. මම දැන් හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දීලයි තිබෙන්නේ.

[අ.භා. 2.52]

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මෙම පාර්ලිමේන්තුවේ මා ආදරය කරපු, මම පළමු වැනි වතාවට පාර්ලිමේන්තුවට සහභාගි වෙද්දී ආදර්ශයක් හැටියට බලාපොරොත්තුවෙන් හිටපු චරිතයක් වන දයාසිරි ජයසේකර මැතිතුමාගේ මෙවැනි දේශපාලන ජවනිකාවක අවසන් ගමන් යන මේ අවමංගල්‍යයේ ස්තුති කථාව කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. [බාධා කිරීම්] දයාසිරි ජයසේකර මැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් හැදිලා එක්සත් ජාතික පක්ෂයට කැත විධියට බණින කොට අපි සංවරව අහගෙන හිටියා. මේ ඔබතුමන්ලාට බණින දෙයක් නොවෙයි. කරුණාකර ගරුත්වය ඇති කර ගෙන අපි ගෞරවාන්විතව හිටපු විධියට ඔබතුමන්ලාත් ඉන්නවා නම් බොහොමත්ම මැනවි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, කථාවක් තිබෙනවා ලෝකයේ නොවෙනස්වෙන එකම දේ තමයි වෙනස්වීම කියලා. දැන් බලන්න, දයාසිරි ජයසේකර මැතිතුමා අද කරපු ප්‍රකාශයෙන් එක දිගට, එක දිගට ආරම්භයේ ඉඳන්ම ප්‍රකාශ කළේ මේ පක්ෂය කරපු වැරැදි ගැන විතරයි. ගරු කථානායකතුමනි, අද අර ගෙන බලන්න දයාසිරි ජයසේකර මැතිතුමාගේ දේශපාලන ගමන ගැන. දයාසිරි ජයසේකර මැතිතුමාට එතුමාගේ දේශපාලන ගමන අමතක වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇහුම් කන් දෙන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
දයාසිරි ජයසේකර මැතිතුමාට එතුමාගේ දේශපාලන ගමනම අමතක වෙලා තිබෙනවා. එතුමා ඉස්සේලාම දේශපාලනයට ආවේ 1997 වර්ෂයේයි. එතුමා ප්‍රදේශීය සභාවට ඉල්ලලා ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩිම මනාප අරගෙනත් එතුමාට සභාපති ධුරය හම්බ වුණේ නැහැ. යම් හෙයකින් මෙතුමා වයඹ පළාත් සභාවට ගිහිල්ලා වයඹ පළාත් සභාවෙත් වැඩිම ඡන්ද ගත්තත් ඒකේ මහ ඇමතිකම මෙතුමාට දෙන්න හැකියාවක් නැහැ. එතුමා එකට එන්නේත් නැහැ. මොකද ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා ජීවිතේට ඒක වෙන්න දෙන්නේ නැති නිසා. ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මැතිතුමා 2001 පළමුවැනි වරට පාර්ලිමේන්තු මැතිවරණයට ඉල්ලා ලබා ගත්තේ අවසාන ස්ථානයයි.

2001 පාර්ලිමේන්තු මැතිවරණයේදී එතුමා අන්ත පරාදයි; අන්තිමයායි. 2004 දී යූඑන්පී එකෙන් දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට හත්දෙනකු එන කොට එතුමා බොහොම අමාරුවෙන් පස්වෙනියා විධියට එල්ලී ගෙන ආවා. 2010 දී සින්දු කියලා -ගීත කියලා- මිනිසුන් පිනවලා එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ආශීර්වාදයෙන් එතුමා පළමු වැනියාට ආවා. අද එතුමාට අතිවිශාල ප්‍රශ්න රාශියක් තිබෙනවා නම් එතුමා මොකක්ද කරන්න තිබුණේ? එතුමාට ඒ කථාව ලියා දීපු අයත් මෙතැන ඉන්නවා. ඒ කථාව ලියා දීපු අය එතුමාට දාපු කථා සියල්ල අපි දන්නවා. ඒ අය බොහොම සතුටින් ඇති. මොකද, දේශපාලනික වශයෙන් එක්සත් ජාතික පක්ෂය විනාශ කිරීම තමයි එතුමාගේ අරමුණ වුණේ. අද මෙතැනදී එතුමා කරපු කථාවේ එකම වචනයකින්වත් එක්සත් ජාතික පක්ෂයෙන් ලද අත් දැකීම්වලට ස්තුතිවන්ත වුණේ නැහැ. අද දයාසිරි ජයසේකර කෙනකු ඇති වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය නිසායි. දයාසිරි ජයසේකර මැතිතුමාට අනෙක් පැත්තට යන්න හම්බ වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය නිසා ලැබුණු ප්‍රසාදය නිසායි.

ගරු කථානායකතුමනි, යම්කිසි කෙනකුට පක්ෂයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අභ්‍යන්තරයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්, අසාධාරණයක් වෙනවා නම් කරන්න ඕනෑ දේශපාලනයෙන් සමු ගැනීම මිස අනෙක් පැත්තට පැනීම නොවෙයි. දයාසිරි ජයසේකර මැතිතුමා කළේ, පළාත් සභා මැතිවරණයක් ආසන්නයේ තිබෙන කොට ඒ පළාත් සභා මැතිවරණය විනාශ කරවලා, යූඑන්පී එකට ගහලා අනෙක් පැත්තට බල්ටියක් ගහපු එකයි. අපි හිතනවා කෝටි 25ක් 30ක්වත් අරගෙන තමයි ඔය බල්ටිය ගහන්න ඇත්තේ කියලා. දයාසිරි ජයසේකර මැතිතුමාට මම ආදරෙයි. මා එතුමාට ආදරේ වාගේම එතුමා පෞද්ගලිකව සල්ලිවලට ආදරෙයි කියලාත් අපි දන්නවා. අපරාදේ කියන්න බැහැ, මේක දයාසිරි ජයසේකර මැතිතුමාගේ අවාසනාව. එතුමාගේ අවාසනාවක මහත තමයි අප මේ දවස්වල දකින්නේ. එතුමා දැනටම ගමේ පෝස්ටර් ගහලා. එතුමා පනින්න හිටියේ අද ඊයේ නොවෙයි. ගරු කථානායකතුමනි, අපි විශාල උත්සාහයක් දැරුවා එතුමාට කරුණු තේරුම් කරලා දෙන්න.

ගරු කථානායකතුමනි, එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා ගැන කථා කරනවා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කථා කරනවා. එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා -ජනාධිපතිතුමා- ආදර්ශයට ගන්නවා නම් එතුමාට ගන්න තිබුණු එකම ආදර්ශය තමයි ඉවසීම. එහෙම නම් දයාසිරි ජයසේකර මැතිතුමාටත් කරන්න තිබුණේ ඉවසන එකයි. පක්ෂයට මඩ ගහලා පක්ෂයෙන් පනින එක නොවෙයි කරන්න තිබුණේ. අද වයඹ පෝස්ටර් ගහලා තිබෙනවා, "වයඹට සිරි - දයාසිරි" කියලා. අපි අහනවා, 'අම්මට සිරි, දයාසිරි! උඹ මොකක්ද මේ කර ගත්තේ?' කියලා. මේ අද කර ගත්තේ දයාසිරිගේ විනාශයයි. දයාසිරි දේශපාලනයේ අනාථයි. දයාසිරිගේ දේශපාලනයේ මළගමයි මේ. මම ඉල්ලීමක් කරනවා, ඔය යන ගමන් පාර්ලිමේන්තුව ඉස්සරහට ගිහිල්ලා හොඳට අත ගාලා වැඳලා යන්න කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ආයෙත් පාර්ලිමේන්තුවට එන්න එතුමාට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒක කවදාවත් -මේ කපේදි- වෙන්නේ නැහැ. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා කවදාවත් ඒක වෙන්න දෙන්නේත් නැහැ. ඒ නිසා මෙතැනදී අපි පැහැදිලිව දන්නවා එතුමාගේ දේශපාලන දිවියට අද ඉඳන් 'සරණං ගච්ඡාමි' ම තමයි කියන එක.

ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මැතිතුමා අසත්‍ය ප්‍රකාශ රාශියක් කළා. 2004 මැතිවරණයෙන් පසුව පක්ෂයේ සම්ප්‍රදාය අනුව තිබුණේ පක්ෂයේ දෙ වැනියාට මනාප ගන්න කෙනාට පක්ෂයේ ලේකම් ධුරය දීමයි. පක්ෂයේ සභාපති ධුරය පළමු වැනියාට මනාප ගන්නා කෙනාටයි දෙන්නේ. දෙ වැනියාට තමයි පක්ෂයේ ලේකම් ධුරය දෙන්නේ. නමුත්, 2004 දී දිස්ත්‍රික්කයෙන් පස් වැනියා විධියට මනාප අරගෙන තිබෙන කොටත් එදා දයාසිරි ජයසේකර නැහලා එන චරිතයක් වූ නිසා දයාසිරි ජයසේකරට දුන්නා, දිස්ත්‍රික් සභාවේ ලේකම්කම. එතුමාව කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් කළා. ඒ විතරක් නොවෙයි. එතුමාට හැම නිල තලයක්ම දීලා එතුමා ඉදිරියට ගන්න අතිවිශාල උත්සාහයක් ගත්තා. හැබැයි එතුමාට තිබෙනවා පුදුම බල ලෝභිකමක්; බල කෑදරකමක්. එතුමා දක්ෂයි. එතුමාට කට තිබෙනවා. එතුමාට හැකියාව තිබෙනවා. නමුත් එතුමා ඉතාම ඉක්මනට ඒකෙන් අන්ධ වෙනවා. අද එතුමාට තිබෙන්නේ ඉක්මන්කමයි. ඉක්මන කොටයි කියලා අපි සියලු දෙනා දැක

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

තිබෙනවා. එතුමා බොහෝ ඉක්මන් වුණා. තනතුරු, යානාන්තර, නිල තල, වරප්‍රසාද, වරදාන දෙසට එතුමා හැම දාම බොහෝ ඉක්මනින් යන්න ගත්තා. ඒ සැර වැඩිකම නිසා තමයි අද මෙහෙම කළේ. පක්ෂයේ අභ්‍යන්තරයේ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. දයාසිරි ජයසේකර මැතිතුමා පක්ෂයේ ජාතික සංවිධායක ධුරය ඉල්ලද්දී මම එතුමාටයි ඡන්දය දුන්නේ. මම එතුමාගේ නියෝජිතයා හැටියටයි ඒ ඡන්ද කටයුත්තේදී පත් වුණේ. නායකත්වයට විරුද්ධව ඡන්දය දුන්නා නම් හෝ පක්ෂයත් එක්ක ඉන්න පුද්ගලයකු හැටියට පක්ෂයට ආදරය කරන්න, ගරු කරන්න අපි දැන ගන්න ඕනෑ. අංක එක පක්ෂයයි. අද යන්න ඕනෑ වුණා නම් දයාසිරි ජයසේකරට තිබුණා නම්බු පිටින් කට වහගෙන ගෙදර යන්න. "මට අසාධාරණයක් වුණා. මම ඉල්ලා අස් වෙනවා." කියලා ගියා නම් අපි මීට වඩා දයාසිරි ජයසේකරට ගරු කරනවා. දයාසිරි ජයසේකර අද කථා කළේ මාධ්‍යයටයි. දයාසිරි ජයසේකර කථා කළේ එක්සත් ජාතික පාක්ෂිකයන්ටයි. යූඑන්පී එක වටිටලා, යූඑන්පී එක විනාශ කරලා, ගත්තු මුදලට යම්කිසි return එකක් දෙන්න ඕනෑ නිසා තමයි දයාසිරි ජයසේකර මැතිතුමා අද මේ පාර්ලිමේන්තුවේදී ඒ කථාව කළේ. ඒකයි අපට තිබෙන කනගාටුව. අපි එකට එක පිහානේ කාලා තිබෙනවා. නමුත් එතුමා මේ කළේ අශීලාචාර, ඉතාම අශික්ෂිත වැඩක්. නිවට දේශපාලන ප්‍රතිරූපයක් තමයි එතුමා අද ගොඩ නැඟුවේ. එම නිසා මම හිතනවා දිවිඇධම්ම වේදනීය කර්මය කියන එක අනිවාර්යයෙන් පඬිසන් දෙනවා කියලා ගරු කථානායකතුමනි. හිතා බලන්න, පාර්ලිමේන්තුවේ එතුමාගේ අවසාන කථාව ගැන ගරු කථානායකතුමනි. ඒ කථාව කරපු දයාසිරි ජයසේකර මැතිතුමා 2013 මැයි 09 වැනි දා විදුලි බලය ගැනම කථා කරපු වෙලාවකදී ප්‍රකාශයක් කළා.

එදා ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මෙහෙම කියනවා:

"විජිත් විජයමුණි ද සොයිසා ඇමතිතුමා අහනවා, ඔබතුමා අපේ පැත්තට ආවාම විදුලිබල ඇමතිකම දුන්නොත් ඔබතුමා කරනවාද කියලා"

මේ වැඩ් ඇතක නොවෙයි, මැයි මාසයේ 09වන දා. එවිට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මොනවාද කිව්වේ? එතුමා මෙහෙම කියනවා:

"ඕකට මුක්කු ගහන්න මම එන්නේ නැහැ. මතක තියා ගන්න."

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මැයි 09වන දා එහෙම කියනවා. "ඕක කැඳ හැළියක්" කියලා එතුමා කියනවා. ඒ කැඳ හැළිය එතුමාට දැන් සව් කැඳ හැළියක් බවට පත් වුණේ කොහොමද කියන එක පිළිබඳව අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. හැන්සාඩ් වාර්තාවේ තවත් තැනකදී එතුමා මේ ආණ්ඩුව විවේචනය කරනවා. කවුරු ගැනද එතුමා කියන්නේ? මැයි දිනයේ මැයි පෙළපාළියට මේ රටේ දහස් ගණනක් කම්කරු ජනතාව කැඳවා, ජනාධිපතිතුමා දුන්නු පොරොන්දුව අමු-අමුවේ බොරුවක් බවට ඔප්පු කරලා තිබෙනවා කියලා එතුමා කියනවා. මේ මහින්ද රාජපක්ෂ බොරුකාරයෙක් කියලා කිව්ව, මේ පාර්ලිමේන්තුවේ ඉන්න දයාසිරි ජයසේකර මැතිතුමාට මාසයකින් පස්සේ කෝටි 25ට ඒක අමතක වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, පළමු වන වරට පාර්ලිමේන්තුවට ආපු අපට පාර්ලිමේන්තුව අප්‍රිය වෙනවා. අද ඇත්ත වශයෙන්ම දේශපාලනය අප්‍රිය වුණා. මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ බොහොමයක් මන්ත්‍රීවරු කථා කළා, "මචං මොකක්ද මේ වෙන්න යන්නේ? මොකක්ද බං මේ දේශපාලනය? අපටත් අප්‍රියයි. මේ දේශපාලනය මෙතරම් නිරීකිතයි කියලා අපේ ගැනුන්ටත් කියලා අපි ආවේ" කියලා. දැන් ටික වෙලාවට ඉස්සෙල්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු එහෙම කිව්වා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අද අපි සාකච්ඡා කරන්නේ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මේ වචන ස්වල්පයක් කියලා අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙය තේරුම් ගන්න. මේ සියලු දෙනාම අද කනස්සල්ලෙන් ඉන්නවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේදී අපි ආදර්ශයක් හැටියට ගත්ත දයාසිරි ජයසේකර අද අපව විනාශ කළා. ආණ්ඩුවේ මුදල්වලට ඒ විධියට දේශපාලනය විකුණනවා නම් මේ දේශපාලනයේ ඇති වටිනාකම මොකක්ද? ඇත්ත වශයෙන්ම එය පෞද්ගලිකව දුක් විය යුතු කරුණක්. ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දිගින් දිගටම, දිගින් දිගටම, දිගින් දිගටම, දිගින් දිගටම පහර ගැහුවේ යූඑන්පියටයි. එතුමා නැත්නම් යූඑන්පියක් නැහැ කියලායි එතුමා කිව්වේ. මා එක කාරණයක් කියනවා. දයාසිරි ජයසේකර නොවෙයි, මම නොවෙයි, සුජීව සේනසිංහ නොවෙයි, අජිත් පී. පෙරේරා නොවෙයි, රවි කරුණානායක නොවෙයි, අපි කවුරු නැති වුණත් එක්සත් ජාතික පක්ෂය කවදාවත් වටිටන්න බැහැ. එක්සත් ජාතික පක්ෂය කියන්නේ මේ රටේ අතිවිශාලම - දැවැන්තම- තනි පක්ෂයයි. අද දයාසිරි කාට කථා කළත්, මොන සන්දර්ශන දමලා ගියත් දයාසිරිව පිළිකුල් කරනවා මිසක් දයාසිරිගේ පස්සේ යන්න තරම් ජනතාව මෝඩ නැති බව මා මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, මේ වෙලාවේ සමහර ඇමතිවරු සතුටු වනවා. සමහර ඇමතිවරුන්ගේ මුහුණු පොඩි වෙලා. සමහර ඇමතිවරුන්ගේ මුහුණු අව්චාරු වෙලා. සමහර ඇමතිවරු ඔළුවට අත ගහගෙන ඉන්නවා, මොකක්ද මේ වෙන්නේ කියලා. "අපි අවුරුදු ගණනක් සිටියා. පනින එකාට මහ ඇමති. පනින එකාට ඇමති. පනින එකාට නියෝජ්‍ය ඇමති. අපි හැම දාම කඩේ ගියා, අපට මුකුත් නැහැ"යි කියනවා. [බාධා කිරීම්] අර පෙනෙනවා නේ, රට ඉදිකාරයා. රට ඉදිකාරයෙක් වාගේ පැත්තකට වෙලා කෑ ගහමින් ඉන්නවා. ජීවිතේට ඇමතිකමක් හම්බ වෙන්නේත් නැහැ. පිටි පස්සේ ඉන්න තරුණ මන්ත්‍රීවරුන්ට මොකක්ද යන කල? දැන් ඔය කියන විධියට අනික් කට්ටියත් පැන්නොත්, පනින පනින පාරට මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න පාරම්පරික පාක්ෂිකයන්ට මොකක්ද වෙන්නේ? මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය මොකක්ද? [බාධා කිරීම්] ඔය පිටි පස්සේ ඉඳ ගෙන කථා කරන පුද්ගලයා ගැන මා කථා කරනවා නම් ඒ පුද්ගලයාට ප්‍රතිපත්තියක් කියන එකක් ගැවිලාවත් නැහැ. ආත්මයක්වත් නැති පුද්ගලයෙක්. කිසිම චාරයක් නැති, කිසිම සංවරයක් නැති, කිසිම ප්‍රතිපත්තියක් නැති, ඒ පැත්තටත්, මේ පැත්තටත් පනින රිළවෙක්. ඒ කියන්නේ කාටද කියලා මා කියන්නේ නැහැ. මේ වාගේ රිළවි ඉන්න දේශපාලනය -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
නම කිව්වේ නැහැ. [බාධා කිරීම්] කවුද රිළවා?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් තිබෙනවා. [බාධා කිරීම්] ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ පැත්තටත්, මේ පැත්තටත් පනින කරු ජයසූරිය මැතිතුමාට රිළවා කියා කියන්න එපාය කියලා මා කියනවා. කරු ජයසූරිය මන්ත්‍රීතුමා ගැනයි ඔය කියන්නේ. එතුමා තමයි එහාටයි මෙහාටයි පනින්නේ. අනේ, එහෙම අවමන් කරන්න එපා! එතුමා නියෝජ්‍ය නායකතුමා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පැත්තට, මේ පැත්තට පැන්නා කිව්වාට නමක් කිව්වේ නැහැ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මගේ කථාව අවසන් කරන්න පෙර මා මේ කාරණයත් ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, බලන්න නියම වැඩේ තමයි මේ. දයාසිරි ජයසේකර මැතිතුමන්ලා කලිසම් ඇඳ ගෙනද, රෙදි ඇඳ ගෙනද, එහෙම නැත්නම් රෙද්ද ඇඳලා යට ඇඳුමක් අඳින්නේ නැතිවද දන්නේ නැහැ මෙහෙම කිව්වේ. දයාසිරි ජයසේකර මැතිතුමා පත්තරවලට කියා තිබෙනවා, "කිසිම දිනක එජාපය අතහැර යන්නේ නැහැ. දහඅට අවුරුද්දක් තිස්සේ දුක් විඳින පාක්ෂිකයන්ගේ අපේක්ෂාව මා අනිවාර්යයෙන්ම ඉටු කරනවා" කියලා.

ඒ විතරක් නොවෙයි. වැඩිය ඕනෑ නැහැ, ඊයේ දවල් එකහමාරට "දිවයින" පත්තරයට දයාසිරි කියා තිබෙනවා, "මා කිසි විටෙකත් එජාපයෙන් යන්නේ නැහැ" කියා. ඊයේ දවල් 1.30ට දයාසිරි කිව්වේ ඒ ටිකයි. මේ වාගේ ප්‍රතිපත්තියක් නැති දේශපාලනයක් කරන උන්දැලා වයඹ පළාත් සභා මැතිවරණයේදී මහ ඇමති විධියට ඉල්ලනවා නම්, වයඹ පළාතේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ට මා කියනවා, "ඔබතුමන්ලාට බුද්ධං සරණං ගච්ඡාමි තමයි" කියලා. මොක ද, එතුමා මේ වාගේ පාවා දෙන, මේ වාගේ වචන වෙනස් කරන කෙනෙක් නිසා. මෙතුමා ක්‍රිස්තියානි ආගමටත් බැන්නා ක්‍රිස්තියානි ආගම ඇතුළේ ඉඳගෙන. එතුමා කරන විජ්ජාවලට අප හුහක් කලබල වෙනවා; කනගාටු වෙනවා. එතුමා ක්‍රිස්තියානුවන්ට බැන්නා. එතුමා ක්‍රිස්තියානි කියලා පාර්ලිමේන්තුවට දීලා තිබුණු ඒවාත් වෙනස් කළා, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා. අප එතුමාගේ ඉතිහාසය හොඳට දන්නවා. එතුමා මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කිරීම ගැන මා කනගාටු වෙනවා. මා ආදරය කළ කෙනෙක් එතුමා. අද Library එකේදි එතුමා මාව බදා ගෙන ඇඬුවා. මාත් ඇඬුවා යන්න එපාය කියා. ඇත්ත වශයෙන්ම ඇඬුවා. අඩලා කිව්වා, යන්න එපා, ඔබතුමාට මේකේ අනාගතයක් තිබෙනවාය කියා. මම කිව්වා, "ඔබතුමා පනින්න එපා. මහින්ද රාජපක්ෂ මැතිතුමා උදාහරණයකට ගන්න. ගහන්න, ගහන්න ඉන්න. ඉන්න කෙනාට අවසානයේ වෙලාව ලැබෙනවා" කියා. නමුත් එතුමාට අනතුරුව ලැබෙන වාසි ප්‍රයෝජන ඊට වඩා ලොකු වුණා. අප අද කියනවා, එතුමා පාවා දුන්නේ කාවවත් නොවෙයි, එතුමා පාවා දුන්නේ එතුමාගේම සම්පූර්ණ ශරීර සෞඛ්‍යය සහ එතුමාගේ ආත්මයයි කියලා. අප ඒ ගැන කනගාටු වෙනවා. දයාසිරි ජයසේකර කියන ඒ ප්‍රසිද්ධ චරිතය ගැන මා කියන්නට කැමැති නැහැ.ජ්‍යොතිෂවේදියෙකුත් කිව්වා, මේ දයාසිරි ජයසේකරට දේශපාලන අනාගතයක් නැහැ කියා. එතුමාට අප කිව්වා, ඔය වැඩේ කරන්න එපාය කියා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
න්‍යාය පත්‍රයේ විෂයට තැන දෙන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
හොඳයි, ගරු කථානායකතුමනි. එතුමා විදුලි බලය ගැනත් කිව්වා. එතුමා විදුලි බලය ගැන කියපු ඒවා තමයි හැන්සාඩ් වාර්තාවෙන් මම කියෙව්වේ.

ගරු කථානායකතුමනි, අවාසන වශයෙන් මා ඉල්ලීමක් කරනවා. මෙවන් විපත්වලට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයෝ ඉඩ දෙන්න එපා. මේ අය ඇවිල්ලා පනින රිළව්. මේ පනින රිළව්, පැනලා ටික කාලයක් ගිහිල්ලා කොකා පෙන්නලා නැවත වරක් මේ පැත්තටම එනවා. දයාසිරි ආණ්ඩුවට මඩ ගැහුවේ කොහොමද? අර ගලේ විවාදයේදී මාත් එක්ක ගිහිල්ලා මොනවා ද කිව්වේ නැත්තේ ආණ්ඩුවට? ඒ ගල ගැන, ආණ්ඩුවේ හොරකම් ගැන, ආණ්ඩුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැරකම් ගැන, ආණ්ඩුවේ තිබෙන වංචා දූෂණ ගැන කථා කළ ප්‍රතිපත්තියක් නැති දයාසිරි අද යට ඇඳුමත් නැතිව ඔය පැත්තට යාම ගැන මම හුහක් කනගාටුවට පත් වෙනවා. මොකද, මා වැඩියෙන්ම ආදරය කළ, පාර්ලිමේන්තු කණ්ඩායමේ වැඩියෙන්ම මාත් එක්ක කිට්ටුවෙන් හිටපු, මා වැඩියෙන්ම ආදර්ශයට ගත් මන්ත්‍රීවරයා තමයි දයාසිරි ජයසේකර මැතිතුමා. හැබැයි, අදින් පස්සේ දයාසිරි ජයසේකර මැතිතුමා මගේ කුණු බක්කියේ ය කියන එකත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා මට මේ කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය කුඩු කරමින්, පක්ෂයේ නායකවරයෙකුට පෞද්ගලිකව විටින් විට එකින් එක පහර ගැහුවා. අප අහලා තිබෙනවා ගෙදර ප්‍රශ්න ගෙදරදී කථා කරන්නට ඕනෑය කියන එක. අද දයාසිරි ජයසේකර මැතිතුමා කථා කළේ කාට ද? අපේ පක්ෂය තුළ ප්‍රශ්න තිබුණා නම්, එතුමාට ඉල්ලා අස් වෙන්න ඕනෑකමක් තිබුණා නම් පාර්ලිමේන්තුව එල්ල කර මේ ප්‍රකාශය කරන්න ඕනෑ නැහැ. එතුමාට අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් අවස්ථාවක් ඉල්ලා ගෙන නම්බුකාර විධියට, "මම මේ පක්ෂයෙන් ඉල්ලා අස් වෙනවා, මට අසාධාරණයක් වුණා" කියලා යන්න තිබුණා. එතුමා මන්ත්‍රීවරුන් ටික ඔක්කොම කැඳවලා පාර්ලිමේන්තුවට ඇවිත් වේදිකාවක් හදලා, රූපවාහිනියට පෙනෙන්න යූඑන්පී එකේ වැරදි කියලා, ජනතාව විකල් කරන්න කටයුතු කළා. එතුමා ඊට පස්සේ කියනවා, "යූඑන්පී කාරයෝ ආදරේ මට" කියලා. එතුමා බලන්නේ අර සිංදු කියලා මිනිස්සු රවටා ගත්තා වාගේ ඡඳයේදීත් මිනිස්සු රවට්ටා ගන්නටයි. ඒකටයි කටයුතු කළේ. එතුමා භයයි. දෙගිඩියාවෙන් ඉන්නේ ජොනීගේ පුතාට පරදීද කියලා. අති විශාල දෙගිඩියාවකින් ඉන්නේ. අද එතුමා දෙළොවක් අතර රත් වෙලා ඉන්නේ.අපට විශ්වාසයක් තිබෙනවා, අපට හිතෙනවා,

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

දේශපාලනයේ ඒ වාගේ අවාසනාවන්ත තීන්දු ගත්තාම දිවියඩම්ම වේදනීය කර්ම වශයෙන් අනිවාර්යයෙන්ම පඩිසන් දෙනවාය කියා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අටට වැටිලත් අද තුනෙන් දෙකක බලයක් අර ගෙන තිබෙනවා. එම නිසා එක්සත් ජාතික පක්ෂයට මොන මඩක් ගැහුවත්, එක්සත් ජාතික පක්ෂයෙන් මොන ශක්‍රයා ගියත්, එක්සත් ජාතික පක්ෂය වැටෙන්නේ නැහැ. ලංකාව වටේ කොළ පාටට ආදරය කරන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් එක්සත් ජාතික පක්ෂයට ඉන්නවා. අපේ නායකත්වයත්, අපේ තරුණයෝත් ඇතුළු අපේ සියලුම කණ්ඩායම් එකතු වෙලා එක්සත් ජාතික පක්ෂය අනිවාර්යයෙන් ජයග්‍රහණය කරවනවා. මොන ශක්‍රයා මොන තීන්දුවක් ගත්තත් අපේ පාක්ෂිකයෝ එක්සත් ජාතික පක්ෂයත් එක්ක ඉන්න බව මතක් කරනවා. අවසාන වශයෙන්, දයාසිරි ජයසේකර මහතාගේ අවසාන ගමනේ ස්තුති කථාව කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන ගරු ජෝන් අමරතුංග මැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 3.12]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය බරපතළ සෝදා පාළුවකට ලක් වෙලා තිබෙන වෙලාවක, -[බාධා කිරීමක්] තලතා අතුකෝරල මන්ත්‍රීතුමියනි, මම කාටවත් බාධා කළේ නැහැ. ඔබතුමිය එක්සත් ජාතික පක්ෂයට ආදරය කරන මන්ත්‍රීවරියක් නම් ඔබතුමියගේ පපුවට අත තියලා හෘදය සාක්ෂියෙන් මඳක් විමසන්න හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ කථාව අනුමත කරනවාද කියලා. [බාධා කිරීමක්] අපි දෙන්නා වෙන වෙලාවක අත තියා ගනිමු.

ගරු කථානායකතුමනි, හරින් ප්‍රනාන්දු කියන්නේ මම බොහොම ගරු කළ මන්ත්‍රීවරයෙක්. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මේ වාගේ තත්ත්වයකට පත් වෙයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, අද දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයාගේ කථාවට උත්තර දෙන්න ඕනෑ හරි නම් අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමායි. එහෙම නැත්නම් මේ කථාවට අද උත්තර දෙන්න ඕනෑ මංගල සමරවීර මන්ත්‍රීතුමායි. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, අද ඔබතුමාට එක්සත් ජාතික පක්ෂයේ නායකයා දුන්නේ -[බාධා කිරීමක්] ඇයි ඔබතුමා සභා ගැබෙන් පිටව යන්න හදන්නේ? ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, සමාවෙලා වැදගත් විධියට පොඩ්ඩක් ඉඳගන්න. [බාධා කිරීමක්] කරුණාකර ඔබතුමා වැදගත් විධියට ඉඳගන්න. ඔබතුමා වීරයෙක් වාගේ ඒ විධියට ගැහුවා නම් වීරයෙක් වාගේම ඉඳගන්න. අන්න එහෙම ඉඳගන්න.

එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මැරුණු, කෑ ගහපු, ලේ හලපු, පාරවල් ගණුනේ ගිය, ගුටි කාපු දයාසිරි ජයසේකර පක්ෂයෙන් එළවපු වෙලාවක, පක්ෂයෙන් පිට පිට ගහලා එතුමා ගිය වෙලාවක, වයඹ පළාතේ, කුරුණෑගලින් වැඩිපුරම ඡන්ද අරගෙන එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මැරුණු දයාසිරි ජයසේකර පක්ෂයෙන් එළවපු වෙලාවකයි ඔබතුමා ඒ විධියට කථා කළේ. තමුන්නාන්සේලාගේම පක්ෂයේ ප්‍රාදේශීය සභාවක් දිනා ගන්න බැරි, මිනිස්සු දහ දෙනෙක් කොළඹට ගේන්න බැරි කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට පක්ෂය සලකන කොට, කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් එළවලා, පළාත් සභා මන්ත්‍රීලා එළවලා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීලා එළවලා, යූඑන්පීකාරයෝ පාරට බැහැලා අනාථ වෙන කොට, රංගෙ බණ්ඩාරලා, කළුතර ඉන්න මන්ත්‍රීතුමන්ලා, පාලිත තෙවරප්පෙරුමලා වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ මිනිස්සු කථා කරන්නේ නැති වෙන කොට තමුන්නාන්සේ අද කරපු කථාව හරිම කනගාටුදායකයි මගේ මිත්‍ර හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] මම ඔබතුමාට බාධා කළේ නැහැ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැනට දවස් හතරකට කලින් මමත් එක්ක රූපවාහිනියේ විවාදයකට ගියා. ඒක මතකද? ඔබතුමා මට කිව්වා, "මගේ මිත්‍ර මන්ත්‍රීතුමා, මට මහියංගනය ආසනයට යන්න වෙලා" කියලා. ඔබතුමා එහෙම කිව්වා නේද? ඔබතුමා කිව්වා මහියංගනය ආසනයේ සංවිධායකකම විපක්ෂ නායකතුමා මට ගන්න කිව්වාය කියලා. අන්න, දැන් සතුටින් යනවා. ලොකුම සතුටුකාරයා යනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමනි, මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කිව්වා මට මහියංගනය ආසනය භාර ගන්න වෙනවාය කියලා. නමුත් ඔබතුමා මේ කාරණය දන්නේ නැහැ. ඔබතුමාගේ ආසනයට -බදුල්ලට- කවුද එන්නේ? දයා ගමගේ. මට අනෝමා ගමගේ මහත්මිය කිව්වා දයා ගමගේ බදුල්ල ආසනයේ සංවිධායකකම භාර ගන්නවාය කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නිකම් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

පොඩ්ඩක් ඉන්න. රවි කරුණානායක මන්ත්‍රීතුමනි, මම බාධා කළේ නැහැ. මමත් අහගෙන හිටියා. ඔබතුමා -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මට ඔබතුමා කියන්න, දයාසිරි ජයසේකර පක්ෂයෙන් ගිය එක හරිද කියලා. [බාධා කිරීමක්] හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දැන් පැයකට කලින් දයාසිරි බදාගෙන මොකද කිව්වේ? මහින්දව අනුගමනය කරන්න කිව්වා. දයාසිරි අනුගමනය කළේ මහින්ද තමයි. තමුන්නාන්සේ දයාසිරි බදාගෙන අඬලා කිව්වා මහින්දව අනුගමනය කරන්න කියලා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, පක්ෂය වෙනුවෙන් තමුන්නාන්සේ කිව්වා ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ මුහුණු එල්ලුනාය කියලා. තමුන්නාන්සේ එහෙම කියන කොට මම රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලාගෙන හිටියා; තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලාගෙන හිටියා; සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලාගෙන හිටියා; රෝසි සේනානායක මන්ත්‍රීතුමියගේ මුහුණ දිහා බලාගෙන හිටියා; සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගේ මුහුණ දිහා බලාගෙන හිටියා. එක්සත් ජාතික පක්ෂයේ මේ වාගේ නරිප්පඩ දේශපාලනය කරන මන්ත්‍රීවරු ඉන්නවාද කියන වේදනාව ඒ අයගේ මුහුණුවල තිබුණු ආකාරය මා දැක්කා. තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය ඒ වෙලාවේ පපුව අල්ලාගෙන හිටියේ; රෝසි සේනානායක මන්ත්‍රීතුමියත් පපුව අල්ලාගෙන හිටියේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ සංශෝධන පනත් කෙටුම්පතේ ඔය කිසිවක් මට පෙනෙන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, දැන් විදුලිබල පනත හොඳයි. මේ වෙන පනතක්.

අවසාන වශයෙන් මා මෙම කාරණයත් කිව යුතුයි. රවි කරුණානායක මන්ත්‍රීතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පක්ෂයෙන් යාමට වග කිව යුතු අනික් තැනැත්තා තමයි සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා. එතුමා ගිය මේ ගමනට සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාත් යම් පාර්ශ්වකාරයෙක්. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි දයාසිරි ජයසේකරලාට යන්න පාර හැදුවේ. තමුන්නාන්සේ නිසා අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු එකසිය විසිගණනක් එළියේ; පළාත් සභා මන්ත්‍රීවරු ගණනාවක් එළියේ. අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණනාවකගේ කටවල් වහලා තිබෙනවා. අද සමහරුන්ගේ නාම යෝජනා නැති කරලා තිබෙනවා. කරු ජයසූරිය වාගේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයෝ අනාථ කරලා තමුන්නාන්සේ අද බොහොම සතුටින් කෘත්‍යාධිකාරී මණ්ඩලයට ගිහින් ඉන්නවා. අද තමුන්නාන්සේට ඉස්සරහා පුටුවක් හම්බ වෙලා තිබෙනවා. නියෝජ්‍ය නායකකම නැති වුණාට, තමුන්නාන්සේ තමුන්නාන්සේගේ ගමන තනියම යන්න හදනවා. අද තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ සටන පාවා දුන්නා. අද තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් දර ඇදපු, කර ඇදපු දයාසිරිලා ඇතුළු සියලු දෙනා පාවා දුන්නා.

ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා පමණක් නොවෙයි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට අද එක්සත් ජාතික පක්ෂයෙන් යන්නට හේතු වුණු පළමු වැනි පාර්ශ්වකරුවෙක් හැටියට තමුන්නාන්සේත් වග කියන්නට ඕනෑ යි කියන එක තමුන්නාන්සේ මතක තබා ගන්නට ඕනෑ. ඔබතුමා තමයි එම සටනට නායකත්වය දුන්නේ. ඔබතුමා තමයි එම මන්ත්‍රීවරුන්ට නායකත්වය දුන්නේ. ඒ නායකත්වය දීලා, සියලු දෙනාවම අනාථ කරලා, තමුන්නාන්සේ අද ඔය පැත්තේ පළමු පෙළේ පුටුවක ඉන්නවා. තමුන්නාන්සේට ගහන කොට රවි කරුණානායක මන්ත්‍රීතුමා යන ගමනත් නවත්වලා බොහොම සතුටින් මෙසයට හේත්තුවෙලා නැවතිලා සිටිනවා. මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

දේශපාලකයන් එක්කද තමුන්නාන්සේලා කටයුතු කරන්නේ සජිත් මන්ත්‍රීතුමනි? රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ සභාවෙන් පිටව යන්න ලැහැස්තිවෙලා පඩියත් නැහලා සිටින කොට, "සජිත්" කියන නම ඇහිලා, නැවතිලා මෙසයකටත් හේත්තු වෙලා පුදුම සතුටකින් බලාගෙන සිටියා, "සජිත්ට මහින්දානන්ද ගහනවා, ඊළඟ නියෝජ්‍ය නායකකම මට ලැබෙයි" කියලා හිතාගෙන. මගේ මිත්‍ර රවි කරුණානායක මන්ත්‍රීතුමනි, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේලාට කියනවා, ඔය කඩේ යන එක රුවන් විජේවර්ධනලාට යන්න කියන්න; ඔය කඩේ යන එක අකිල විරාජ් කාරියවසම්ලාට යන්න කියන්න කියලා. තමුන්නාන්සේලා තරුණ දේශපාලනඥයන් බිලි බාන්නට ඉඩ දෙන්න එපා.

ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ මම බලාගෙන සිටියා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇවිල්ලා ඉඳගත්තා. ඉඳගෙන පොතක් අතට ගත්තා. බලනකොට මොකක්ද? පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පොත. මම හිතුවා, නායකතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

තමයි හදන්නේ කියලා. ස්ථාවර නියෝග පොත පෙරළා බැලුවා. පැය කාලක් විතර ස්ථාවර නියෝග පොත පෙරළා බැලුවා. අපි හිතුවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට විරුද්ධව point of Order එකක් ගෙනෙන්න හදනවා කියලා. අන්තිමට මොකද වුණේ? අනේ! අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

නැහිට්ටා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මෙච්චර වෙලාවක් කථා කළාට පසුව එක්සත් ජාතික පක්ෂයෙන් එතුමා නැහිටලා කිව්වේ මොකක්ද? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ලබා ගත් වෙලාව එතුමන්ලාගේ පැත්තට ලබා දෙන්න කිව්වා. දෙවි හාමුදුරුවනේ! එක්සත් ජාතික පක්ෂයට මොකක්ද වුණේ?

හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, මේ රටේ මහවැලිය හැදුවේ තමුන්නාන්සේලාගේ පක්ෂය. මේ රටේ මහා ජලාශ හැදුවේ තමුන්නාන්සේලාගේ පක්ෂය. ඔබතුමන්ලාගේ පක්ෂය මහා ලොකු පක්ෂයක්. ගාමිණී දිසානායක මැතිතුමන්ලා මේ පක්ෂය හදපු නායකයෝ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා බදුල්ලේ ගස් ගණනේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

කරනකොට බදුල්ලේ යූඑන්පී එක ඇද්දේ ලක්ෂ්මන් සෙනෙවිරත්නලායි. අද තමුන්නාන්සේට කථාවක් කරන්න දුන්නාට, තමුන්නාන්සේ බදුල්ලේ කෑ ගහලා, කෑ ගහලා, මොකද වුණේ? තමුන්නාන්සේව කනෙන් ඇදලා මහියංගනයට දමලා, අද දයා ගමගේව බදුල්ලට ගෙනැල්ලා බදුල්ලේ යූඑන්පී නායකත්වය දීලා, අද තමුනාන්සේව එළියට දමන්න හදනවා මගේ මිත්‍ර හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි. ඔබතුමා කිව්වා, දයාසිරි ජයසේකර සල්ලිවලට ආණ්ඩු පක්ෂය පැත්තට ගියා කියලා. තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියට අනුව කල්පනා කරලා බලන්න, සල්ලිවලට කැමැති දයාසිරි ජයසේකරද, හරින් ප්‍රනාන්දුද කියලා. ඒක මේ රටේ ජනතාව දන්නවා. මා ඔබතුමාට ඉතාම ගෞරවයෙන් කියන්න කැමැතියි, මන්ත්‍රීවරයෙකුට එහෙම පහර ගහන්න එපා; කරුණාකරලා මන්ත්‍රීවරයෙකුට එහෙම පෞද්ගලිකව පහර ගහන්න එපා කියලා. ඔබතුමා දන්නේ නැත්නම් අහගන්න. ඔබතුමාගේ පක්ෂය වෙනුවෙන්, යූඑන්පීකාරයන් වෙනුවෙන් කථා කරපු මනුෂ්‍යයෙකුට තමුන්නාන්සේ පහර ගහලා තමුන්නාන්සේ ලබන සතියේ බදුල්ලේ යනකොට -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [மாண்புமிகு சந்திம வீரக்கொடி] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව කරනකොට රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ මුහුණේ තිබෙන හිනාව බලන්න. "අපට යූඑන්පී එකේ ඉඳගෙන කරන්න බැරි බලවේගය අද මහින්දානන්ද ආණ්ඩුවේ ඉඳගෙන ක්‍රියාත්මක කරනවා" කියලා එතුමා හිතනවා ඇති. බලන්න, තෙවරප්පෙරුම මන්ත්‍රීතුමනි, එදා තමුන්නාන්සේලාගේ පක්ෂය වෙනුවෙන් උද්ඝෝෂණය කරපු තමුන්නාන්සේ වෙනුවෙන් අද තමුන්නාන්සේගේ එක නඩුවකට එක්සත් ජාතික පක්ෂයෙන් සත පහක්වත් ගෙවනවාද? අද තමුන්නාන්සේ උසාවියට යනකොට එක යූඑන්පී මන්ත්‍රීවරයෙක් එනවාද? එදා ඩිලාන් පෙරේරාව ඔබතුමන්ලා උසාවි දමලා, ඩිලාන් උසාවි යනකොට පාර්ලිමේන්තුවේ අපි 20 දෙනෙක් ඩිලාන් එක්ක උසාවි ගියා. තමුන්නාන්සේලා ජනක බණ්ඩාර තෙන්නකෝන්ව උසාවි දමනකොට මහින්දානන්දලා, මේ අමරවීරලා, පුෂ්පකුමාරලා අපි 20 දෙනෙක් එතුමා එක්ක උසාවි ගියා. තෙවරප්පෙරුම මන්ත්‍රීතුමනි, රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා යූඑන්පී ආණ්ඩුව හදලා, ඔබතුමන්ලාට නඩු වැටිලා, ඔබතුමන්ලා තිබෙන දේපොළ විකුණලා නඩු කියනකොට අද එක්සත් ජාතික පක්ෂයේ මේ පළමු වැනි පේළියේ ඉඳගෙන කථා කරන ඔය පිංපොංලා කවුරුවත් තමුන්නාන්සේලා වෙනුවෙන් එනවාද කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා.

බලන්න, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිති ව්‍යාපාරය හදන්න කියලා දයාසිරි ජයසේකර ඉල්ලුවා. එහි 72,000ක් වුණු යූඑන්පී එකේ සාමාජිකත්වය අද 7,000කට වැටිලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ වෘත්තීය සමිති ව්‍යාපාරය හදන්න භාර දුන්නේ කාටද? ජෝන් අමරතුංග මහත්මයාට භාර දුන්නා, වෘත්තීය සමිතිය හදන්න. දෙවි හාමුදුරුවනේ! දැන් එතුමාට වයස අවුරුදු 82යි. [බාධා කිරීමක්] අවුරුදු 82ක් වයස ජෝන් අමරතුංග මහත්මයෝ, තමුන්නාන්සේ වෘත්තීය සමිති හදන්න කලින් කරුණාකරලා ගිහිල්ලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා මා තමුන්නාන්සේට කියනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවසාන වශයෙන් මා කියා සිටින්නේ, දයාසිරි කියන්නේ මහත්මා දේශපාලනය කළ මිනිහෙක් කියන එකයි.

දයාසිරි මන්ත්‍රීතුමාට තිබුණා, මේ පැත්තට ඇවිල්ලා කැබිනට් ඇමතිකමක් අරගෙන මේ පළමුවන පේළියේ ඉන්න. දයාසිරි මන්ත්‍රීතුමාට තිබුණා, කැබිනට් ඇමතිකමක් අරගෙන පළමු වන පේළියට එන්න. නමුත් මොකක්ද, දයාසිරි මන්ත්‍රීතුමා කළේ? දයාසිරි මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවෙන් අයින් වෙලා පළාත් සභාවට තරග කරන්න යනවා. ඡන්දය ඉල්ලලා, පළාත් සභාව දිනලා ඊට පසුව පාර්ලිමේන්තුවට එනවා. අන්න, නියම අවංක දේශපාලනඥයකුගේ වැඩ පිළිවෙළ.

මම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට කියනවා, තමුන්නාන්සේ මොන දේ කළත්, තමුන්නාන්සේ මේ විධියට කඩේ ගියත්, එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්තයා කවදා හරි තමුන්නාන්සේටත් දෙන්නේ මේ ටික තමයි කියලා. තමුන්නාන්සේට පුළුවන් නම්, අකිලට විරුද්ධව හෙට ලොබියේදී වචනයක් කථා කරන්න. තමුන්නාන්සේ අකිලට විරුද්ධව ලොබියේදී වචනයක් කථා කළොත්, ඊට පහුව දා තමුන්නාන්සේගේ කනෙන් ඇදලා බදුල්ලෙන් අයින් කරනවා. එහෙම නොවුණොත් මේවා කියන මම මහින්දානන්ද අලුත්ගමගේ නොවෙයි කියන එකත් මතක් කරනවා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ මේ තරුණයන්ට, සුදු කොල්ලන්ට, මේ අව්වාහක මිනිසුන්ට කරන මේ විශේෂ සැලකිලි නවත්වලා, අවුරුදු ගණනක් හිරේ හිටිය, අවුරුදු ගණනක් දුක් විඳින යූඑන්පීකාරයන් වෙනුවෙන් ආණ්ඩුවක් හදන්න තමුන්නාන්සේලා පෙරමුණ ගන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.23]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අපේ මිත්‍රයා, කලා ක්ෂේත්‍රයේ මගේ මිත්‍රයා, ඒ වාගේම "Mega Star". මේ සියලුම titles තිබෙන මගේ මිත්‍රයාගේ අලුත්ම පිම්ම, එතුමාගේ අලුත්ම තීරණය ගැන කථා කරන්නට කාලය දීම ගැන මුලින්ම ස්තුතිවන්ත වනවා. [බාධා කිරීම්] විදුලි බලය ගැන කථා කරන්න ඇවිල්ලා දැන් කවුරුත් කථා කළේ ඒ පිම්ම ගැන නේ. එතුමාත් කථා කළේ ඒ ගැන නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විදුලි බලය ගැන නොවෙයි, බලය ගැන.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
විදුලියේ බලය, බලය සොයා යෑම. මම කථා කරන්නේ බලය ගැන; අපේ ගරු මන්ත්‍රීතුමාගේ බලය සොයා යෑම ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි සියලු දෙනා ඒ කථා අහගෙන සිටි නිසා මගේ කථාවත් සාවධානව අහගෙන ඉඳියි කියලා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මේ මිත්‍රයා සෑහෙන කාලයකට ඉස්සර වෙලා මට හම්බ වුණේ කලා ක්ෂේත්‍රයේදී. එතුමා ගීත ගායනා කළා; නාට්‍ය රඟ පෑවා. එතුමා හොඳ නළුවෙක්; හොඳ ගායකයෙක්; හොඳ නිරූපණ ශිල්පියෙක්; හොඳ නර්තන ශිල්පියෙක්. නමුත් අද එතුමා කළ රංගනය දිහා බැලුවාම, මේ පාර්ලිමේන්තුවේ එතුමා එක්ක හැරෙන්නවත් පුළුවන් කවුරුත් නැහැ. මොකද, එතුමා අද ඒ තරම්ම හොඳ රංගනයක් කළා, පසු ගිය කාලයේම කළ රංගනයත් එක්ක සසඳා බැලීමේදී.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මිත්‍රයා පළමුවෙන්ම කථාව පටන් ගත්තේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාගේ නාමය උදාහරණයකට අරගෙන. අපි කවුරුත් ගරු කරනවා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයාට. එතුමා කවදාවත් සල්ලිවලට එහාට පැන්නාද, මෙහාට පැන්නාද? තනතුරුවලට පැන්නාද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය පිහිටුවා ගෙන, තමුන්ම පක්ෂයක් හදා ගෙන- අනුන්ගේ පක්ෂයක ඡන්දවලින් නොවෙයි - නායකත්වයට ආපු පුද්ගලයෙක්. අපේ දයාසිරි ජයසේකර මහත්මයා, අනේ! එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහත්මයාගේ නමත් විකුණුවා. කැප්පෙටිපොළ කියන රණ විරුවාගේ නාමයත් විකුණා ගෙන, ඒ වීර චරිත ආදේශ කර ගන්න හදනවා, තමුන්ගේ චරිතයට.

වයඹ ජනතාව ඇතුළු ලංකාවේ ජනතාව තේරුම් ගනීවි, තක්සේරුවක් වටිනාකමක් දෙයි, කැප්පෙටිපොළ කවුද, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක කවුද, දයාසිරි ජයසේකර කියන්නේ කවුද කියලා.

මගේ මිත්‍රයාට අපහාස කරන්න මම මේ කථාව පටන් ගත්තා නොවෙයි. මේ මිත්‍රයා අතිදක්ෂයෙක්; හොඳ ගායකයෙක්; හොඳ නළුවෙක්; හොඳ නර්තන ශිල්පියෙක්. ඒ ගැන විවාදයක් නැහැ. ඒ ගැන ඊර්ෂ්‍යාවක්, ක්‍රෝධයක්, වෛරයක් අපේ හිතේ නැහැ. නමුත් විජය කුමාරණතුංග මහත්මයා මතක් කරනවා නම්, එතුමාත් හොඳ ගායකයෙක්; හොඳ නළුවෙක්; හොඳ දේශපාලනඥයෙක්. ඒ වාගේම හොඳ පපුවක් තිබුණු, රත්තරන් හිතක් තිබුණු මානව හිතවාදියෙක්.දේශපාලනඥයකුට හොඳ දේශපාලන කථා කරන්න පුළුවන්; හොඳ විවාදවලට සම්බන්ධ වෙන්න පුළුවන්. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳ හිතක්, රත්තරන් පපුවක් ජානානාකුලව - genetically - උපතින්ම ගෙනෙන්න ඕනෑ. හැල ගෙම්බෝ සල්ලිවලට, තනතුරුවලට එහාට මෙහාට පනිනවා. විජය කුමාරණතුංගගේ ගීත ගායනා කරන, "සිංදු කියන අලියාට" ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. අද මේ අලියා හැසිරුණේ කොහොමද? එතුමා පසු ගිය ටිකේ කරපු කථා ඇහුවා නම්, අද මේ කථාව කළේ කටින්ද, වෙනයම් ස්ථානයකින්ද කියලා හිතන්න පුළුවන්ද?

මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා දන්නවා, දයාසිරි මන්ත්‍රීතුමා මීට දවස් ගණනකට ඉස්සෙල්ලා වරායේ ගලක් ගැන කියපු හැටි. ගලක් තිබෙනවා කියලා පොළොවේ අත ගහලා දිවුරුවා. දැන් එතුමාට කියන්න වෙලා තිබෙනවා, අද හවස තුනහමාර වන විට එතුමාට කියන්න වෙලා තිබෙනවා, "ගලක් නැහැ" කියලා. ඒ වාගේම එතුමාට කියන්න වෙනවා මත්තල ගුවන් තොටුපොළට අලි එන්නේ නැහැ කියලා; මත්තලට එන flightsවල කුරුල්ලන් වදින්නේ නැහැ කියලා.

කෙසේ වෙතත්, තමුන්නාන්සේලාට මම ගරු කරනවා. තමුන්නාන්සේලා එක ප්‍රතිපත්තියක සිටියා; තමුන්ගේ පක්ෂයේ සිටියා. කවදාවත් වෙන පක්ෂයකට ගිහිල්ලා තමුන් හිටපු, තමුන් ඡන්ද ගත්ත පක්ෂයට බැන්නේ නැහැ. අද අපේ පක්ෂයේ තිබුණ ලොකුම අසූචි ගොඩවල් අපි තමුන්නාන්සේලාගේ පක්ෂයට දෙනවා.

නමුත් තමුන්නාන්සේලාට මරණ තර්ජන තිබෙනවා. අපේ පක්ෂයේ හිටිය නරකම සටන්කරුවෝ, නරකම දැන් තමුන්නාන්සේලාගේ පක්ෂයට ඇවිල්ලා තමුන්නාන්සේලාගේ උප සභාපතිලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අද තමුන්නාන්සේලාගේ නායකතුමා ඒකට විරුද්ධවත් කථා කරන්නේ නැහැ. අද ගන්නේ යූඑන්පී එකෙන් ආපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

පැත්ත කියලා මම මේ අවස්ථාවේදී කියනවා. අන්න ඒක තමයි අද තත්ත්වය.

අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මහ ඇමති අපේක්ෂකයෙක් නැති වුණු කාලයක්. අපි තමයි ඒකත් දෙන්නේ. අනේ, එහේ ඉන්න නාවින්න මහත්මයා බලාපොරොත්තුවෙන් ඉන්නවා එතුමාට මහ ඇමති අපේක්ෂකකම දෙයි කියලා. නමුත් ගරු ජනාධිපතිතුමාට, මේ අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ළඟ වැඳ වැටිලා කොළේක අත්සන් කරලා දෙන්න වෙනවා, "වයඹ මහ ඇමති අපේක්ෂක - දයාසිරි ජයසේකර" කියලා. ඒ තත්ත්වයට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය නොවෙයි. අද ඒ දුක්ඛිත තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. මහ ඇමති අපේක්ෂකයකු සොයා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා, මහ ඇමති අපේක්ෂකයකු යූඑන්පී එකෙන් ආනයනය කරනවා. යූඑන්පී එකෙන් ආනයනය කරපු මහ ඇමති අපේක්ෂක කෙනකු භාවිත කරන්න අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිද්ධ වෙලා තිබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දේශපාලන බංකොලොත්භාවය.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මේකයි තත්ත්වය. මේ කාලය පුරාම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කළ රංගනය, කථිකාව මොකක්ද? "කියන කථාවලට" ඇවිල්ලා, "රතු ඉරට" ඇවිල්ලා, වාද විවාදවලට ඇවිල්ලා කිව්ව කථා මතකද? ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා සියලු දෙනාම පට්ට ගැහුවා; තමුන්නාන්සේලාගේ රෙදි ගැලෙව්වා. තමුන්නාන්සේලා නිරුවතින් පාරේ ඇවිද්දපු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එක්ක අද තමුන්නාන්සේලාට වාඩි වෙලා ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. කාටද ලජ්ජාව? තමුන්නාන්සේලාට හොරා කිව්වා; තක්කඩියා කිව්වා; කුපාඩියා කිව්වා; මීනී මරුවා කිව්වා; වරායේ ගලක් තිබෙනවා කිව්වා; මත්තල ගුවන් තොටුපොළට අලි එනවා කිව්වා; ගුවන් යානාවල කුරුල්ලෝ වදිනවා කිව්වා. මේ සේරම දේවල් මොහොතකින් අමතක කරලා එතුමාට දැන් වෙන පැත්තකට යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක හරි පුදුම රංගනයක්. ඒකයි මම කියන්නේ. කලාකරුවෙකුට ජීවිතයේ දෙවියන් දෙන ත්‍යාගයක් තමයි රංගනය සහ ගායනය කියන කුසලතාවන් - talents. මේ කුසලතාවලින් ඔහු මුළු ජනතාවම රවටලා, තමුන්ට SMS එවූ, කලාව නිසා තමුන්ට ආදරය කළ, ගායනය නිසා තමුන්ට ආදරය කළ සියලුම ජනතාව එක මොහොතින් රවටලා, U-Turn එකක් අරගෙන දැන් කියනවා, මම අවුරුදු ගණනාවක් "කියන කථා", "රතු ඉර", "වාද පිටිය" හරහා කිව්ව කථා සේරම අසත්‍ය කියලා; මේ දූෂණය කරන, මේ හොරකම් කරන, මේ ඒකාධිපති ආණ්ඩුවේ සේරම අද ඉඳන්

[ගරු රන්ජන් රාමනායක මහතා]

හොඳයි කියලා. අද එතුමා රහපාන අලුත්ම නාට්‍යයේ නම, "හොරු සමඟ හෙලුවෙන්." අපේ හොඳ නාට්‍යවේදියෙක් "හොරු සමඟ හෙලුවෙන්" කියලා නාට්‍යයක් හදලා තිබෙනවා. හොරු සමඟ හෙලුවෙන් කියන්නේ, හොරු ගොඩකට එකතු වෙලා එයාත් හොරකම් කිරීමේ නිරත වෙන එකට. අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තීරණයක් ගත්තා "හොරු සමඟ හෙලුවෙන්" කියන ඒ නාට්‍යයේ ප්‍රධාන චරිතය කරන්න. ඒක තමයි අද තත්ත්වය.

දයාසිරි ජයසේකර කියන මගේ මිත්‍රයා ගැන මට විශාල දුකක් තිබෙනවා. එතුමා අනුරාධපුරයේ තිබුණු එක්තරා meeting එකකදී අඬ අඬා කිව්වා, "දිවි ඇති තෙක් මේ පක්ෂය දාලා යන්නේ නැහැ. මගේ ජීවිතය මේ පක්ෂය" කියලා. හරින් මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඊයේ "දිවයින" පත්තරයෙනුත් කිව්වා, "දිවි ඇති තෙක් දාලා යන්නේ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මොකක්ද වලංගු කථාව? ඊයේ දවස් දොළහට කිව්ව කථාවද, අද දවස් දෙකට කිව්ව කථාවද?

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)
මොකක්ද ඒ වළලූ කථාව?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
වළලූ නොවෙයි, වලංගු. වලංගු. ඇමතිතුමිය විදුලි බලය පොඩ්ඩක් off වෙලා වාගේ, ඇහෙන්නේ නැහැ. නොලොව්වෝලේ විදුලි ප්‍රශ්නයක්. දැන් ඔබතුමියට පසු ගිය කාලයේ කොපමණ දේවල් කිව්වාද? නොරොව්වෝලේ බලාගාරය 21 වතාවක් කැඩුණා කිව්වා. ඔබතුමියගේ bearing ගිහින් කිව්වා. ඔබතුමියගේ මැෂින් පරණයි කිව්වා. දැන් අද ඉඳන් එතුමාට කියන්න වෙනවා, ඔබතුමියගේ bearing හොඳයි, ඔබතුමියගේ මැෂින් එක හොඳයි, ඔබතුමියගේ මැෂින් එකේ bearing ගිහින් නැහැ, 21 වතාවක් කැඩුණේත් නැහැ කියලා. ඔබතුමියගේ මැෂින් එක brand new කියලා අද ඉඳන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කියන්න වෙනවා.

හැබැයි ඒ වාගේම ඊට පසුව වෙනත් තීරණයක් අරගෙන වෙනත් පක්ෂයකට පැන්නොත් ආයෙත් සියලු දෙනාටම පහර ගහනවා. මම තමුන්නාන්සේලාට ගරු කරනවා. තමුන්නාන්සේලා කවදාවත් පැන්නේ නැහැ. දේශපාලන රිළවු වුණේ නැහැ. දේශපාලන ගෙම්බෝ වුණේ නැහැ. තමුන්නාන්සේලා කුමන හෝ මතයක් දැරුවා නම්, තමුන්නාන්සේලාට ජන්දය දුන් ජනතාවට ගරු කරලා තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයා එක්ක ඒ පක්ෂයේ ඉන්නවා. නමුත් මේ රංගන ශිල්පියා, මේ ගායකයා, මේ "Mega Star", පැය විසි හතරක් ඇතුළත ඊයේ කියපු දෙය වෙනස් කරලා U-Turn එකක් අරගෙන එහාට පැන්නා. ඒක තමයි තත්ත්වය. කලාකාරයෙක් වුණාම රහ පාන්න ඕනෑ කැමරාවක් ඉදිරියේදී පමණයි. ඔහු "action" කියද්දී රහ පාන්න ඕනෑ, "cut" කියද්දී නවත්වන්න ඕනෑ. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අමුණුගම ඇමතිතුමනි, මේ ගායකයා, මේ "Mega Star" අර පහු ගිය කාලයේදී වාද විවාදවලදී කියපු සියලුම දේවල් අවලංගු කරලා දැන් අලුත් කථාවක් කියනවා, මේ ඒකාධිපති පක්ෂයට යනවාය කියා. ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, එතුමා තරම් මේ රජයට, මේ ජනාධිපතිතුමාට, තමුන්නාන්සේලාට පහර ගහපු කෙනෙක් මේ පක්ෂයේම නැහැ කියා මේ පාර්ලිමේන්තුව දන්නවා. එතුමා තරම් තමුන්නාන්සේලාට අපහාස කරපු කථිකයෙක් මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ කියා තමුන්නාන්සේලාගේ හදවත දන්නවා. නමුත් හෙට ඉඳලා අර ගලත් නැහැ; අලිත් නැහැ; කුරුල්ලොත් නැහැ; බෙයාරිනුත් නැහැ; මැෂිනුත් හොඳයි; නොරොව්වෝලෙ කැඩෙන්නෙත් නැහැ. තමන් කියපු ඒ සියලු දේවල් ගලේ පහරපු බළලා වාගේ එතුමාට අද වහන්න වෙලා තිබෙනවා. නමුත් ඒ ගලේ තිබෙන අසූචි ගොඩ එතුමාට වහන්න බැහැ. ගඳ එහෙමමයි. ඒ නිසා තමුන්නාන්සේලා ඒ අසූචි ගොඩ ගත්තා වාගේම ඒ ගඳත් අපෙන් ගන්නය කියා මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,විජය කුමාරතුංග කලාකරුවා සාහසිකයකු අතින් වෙඩි කාලා මැරුණත් අදත් ඔහුගේ නම පවතිනවා. එතුමා කවදාවත් තමන්ට ජන්දය දුන්නු, තමන්ට මනාප දුන්නු, තමන්ගේ චිත්‍රපට බලපු, තමන්ගේ ගායනය appreciate කරපු , තමන්ට ප්‍රශංසා කරපු තමන්ගේ රසික ජනතාව පාවා දුන්නේ නැහැ. නමුත් මේ පුද්ගලයා ලක්ෂ ගණනක් SMS මනාප සහ ජන්ද අරගෙන වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවගේ සිහින, ඒ අයගේ අපේක්ෂාවන් මොහොතකින් පාවා දුන්නා. [බාධා කිරීමක්] SMS ගැහුවේ "Mega Star" උළෙලට. එතුමාට ඒකෙදි වැඩි SMS ප්‍රමාණයක් ලැබුණේ කලාකරුවෙක් හැටියටයි. ඒකයි මම ඒ ගැන කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය යටතේ ඉදිරියේදී එතුමාට රහ පාන්න වෙන්නේ මම අර කියපු "හොරු සමඟ හෙලුවෙන්" කියන නාට්‍යයේ පමණයි. අපේ පක්ෂයේ හිටපු නරකම, දරුණුම, ත්‍රස්තවාදයට උර දුන් බොහෝ දෙනා අපි ඒ පක්ෂයට යවා තිබෙනවා. එතුමා අපේ පක්ෂයේ නායකතුමාට දෝෂාරෝපණයක් කළා, නායකතුමාගේ දුර්වලකම හින්දාය යන්නේ කියලා. නමුත් තමුන්නාන්සේලා පොඩ්ඩක් හිතන්න, ඒ ගිය හැට ගණනෙන් කී දෙනකුට cheque cases තිබෙනවාද, කී දෙනකුට rape cases තිබෙනවාද, කී දෙනකුට නඩු තිබෙනවාද, කී දෙනකුට murder cases තිබෙනවාද කියලා. [බාධා කිරීමක්] ඉතින් අද ජනතාවත් දන්නවා, අපේ පැත්තේ ඉඳලා ප්‍රශ්නයක් විසඳා ගන්න ඕනෑ නම්, නඩු නැති කර ගන්න ඕනෑ නම් අනික් පැත්තට යන්න ඕනෑය කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්නේ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ දේශපාලන රිළවුන්ගේ, මේ දේශපාලන ගෙම්බන්ගේ පැනිලි අපි වහාම නැවැත්විය යුතුයි කියන එකයි. සියලුම පක්ෂ තීරණයක් අරගෙන

මේ විනය - discipline එක- පක්ෂ තුළ ඇති කළ යුතුයි. අපි යම්කිසි පක්ෂයකින් ඡන්දය ඉල්ලා, ඒ ඡන්ද දායකයින්ගෙන් ඡන්ද අරගෙන පාර්ලිමේන්තුවට එන්නේ ඒ ජනතාව වෙනුවෙන් පෙනී හිටින්නයි. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂයේ රෙදි සෝදන ඩෝබිලා පිරිලා ඉන්නවා. දැන් අපි අලුතෙන් නොම්මර එකේ රෙදි සෝදන්නෙක් -නොම්මර එකේ ඩෝබි කෙනෙක්- තමුන්නාන්සේලාට එව්වා. ඒ නිසා තමුන්නාන්සේලාගේ රෙදි සෝදන කට්ටියට, කඩේ යන කට්ටියට ලොකු තර්ජනයක් වෙනවා.

රෙදි සෝදන අයට ඒක ඉතාම ලොකු තර්ජනයක්. මොකද, අපි එවපු පුද්ගලයා දක්ෂ කථිකයෙක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ගරු ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා.

[අ.භා. 3.37]

ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජන් රාමනායක මැතිතුමාගෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවාද, කනගාටු වෙනවාද කියන ප්‍රශ්නයත් එක්ක තමයි මම කථාව ආරම්භ කරන්නේ. කෙසේ වෙතත් ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ මුළු කථාවම අහගෙන ඉන්න කොට මට හිතෙන්නේ ඒක බොරු කොණ්ඩයක් දමා ගත්, වයෝ වෘද්ධ - වයස්ගත- වැන්දඹුවකුගේ ප්‍රේම කථාවක් වාගේ කියලායි.

ඊළඟට එතුමා කිව්වා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැල ගෙම්බෙක් වාගේ එහා පැත්තට පැන්නා කියලා. එහෙම කිව්වේ මංගල සමරවීම මන්ත්‍රීතුමායි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමායි දිහා බලාගෙනයි. දේශපාලන පක්ෂවලින් එහාට පනින හැල ගෙම්බෝ කියලා කිව්වේ මංගල සමරවීර මන්ත්‍රීතුමායි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමායි දිහා බලාගෙනයි. එතකොට හැල ගෙම්බා කියලා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කිව්වාද, අර පැනලා දුවන මංගල සමරවීර මන්ත්‍රීතුමාට කිව්වාද, ඉස්සරහ පුටුවේ ඉඳගෙන ඉන්න මගේ මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට කිව්වාද කියලා මම දන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ දෙන්නාටම.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
කෙසේ වෙතත් මම මේක දන්නවා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට නියම හැල ගෙම්බා බලන්න තිබුණා කණ්ණාඩියක් ඉස්සරහට ගියා නම්. මොකද, එතුමාත් විජය කුමාරතුංග මැතිතුමාගේ අඩි පාරේ යමින් ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් පෙළපාළි ගිහිල්ලා, ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා එතැනින් හැල ගෙම්බෙක් වාගේ යූඑන්පී එකෙන් කටානට පැනලා, ඊටත් වඩා ලොකු හැල ගෙම්බෙක් වාගේ කටානෙන් රත්නපුරයට පැනලා දැන් රත්නපුරේ මිනිස්සුන්ට හොයා ගන්න බැරුවයි ඉන්නේ. ඒ නිසා නියම දේශපාලන හැල ගෙම්බාව බලා ගන්න ඕනෑ නම් රන්ජන් රාමනායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා යන්න ඕනෑ කණ්ණාඩියක් ඉස්සරහටයි. එතකොට හැල ගෙම්බා හැටියක් ගහගෙන ඉන්නවා පෙනෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලිම කතන්දරය මේකයි; අද එක්සත් ජාතික පක්ෂයට ගිය කල මේකයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවට අද එක්සත් ජාතික පක්ෂයෙන් අලුතින් ගොඩ නහන කෙනා කවුද? රන්ජන් රාමනායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙනුයි මෙය අහන්නේ. ඔබතුමාට අනාගතයේදී නායකත්වය ගන්න තිබෙන පක්ෂය තමයි මේ එක්සත් ජාතික පක්ෂය. ඔබතුමා පසුවට තට්ටු කරලා අහන්න, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ තැන ගන්නට එක්සත් ජාතික පක්ෂයේ ඉන්න සුදුස්සා රන්ජන් රාමනායකද කියලා. ඒක මට කියන්න. එතුමා උත්තර දෙන්නේ නැහැ. ඇයි? එතුමාට උත්තර දෙන්න බැහැ. එතුමාගේ හිත දන්නවා, දයාසිරි ජයසේකර කොයි තරම් වටිනවාද, අද එතුමා වෙනුවට යූඑන්පී එකෙන් පුම්බන්න හදන රන්ජන් රාමනායකට වඩා කියලා. එතුමා දන්නවා.

දෙයියනේ! ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා වගේ හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අද නියම බයිට් එකටයි අහු වුණේ. රුවන් විජයවර්ධන මහත්මයා දුන්නා ලණුව.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අකිල ඒ කථාව ස්ථිර කළා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ හොඳම යාළුවා රුවන් විජයවර්ධන මන්ත්‍රීතුමායි. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා දන්නවා, තමන්ගේ දේශපාලන අනාගතය හොඳ නැහැ, ඒ නිසා රුවන් අල්ලා ගත්තොත් වැඩේ හරි කියලා. රුවන් දන්නවා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා හරහා ඕනෑම ජරා වැඩක් කර ගන්න පුළුවන් කියලා. ඒ නිසා රුවන් හරින්ට ලණුව දෙනවා. හරින් ප්‍රනාන්දුත් ඒ තරම්ම මෝඩයෙක් නෙමෙයි. එතුමාත් කපටියා, රුවනුත් කපටියා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, හැබැයි තමුන්නාන්සේ අද අහු වුණා. අද කථා කරන්න අවස්ථාව දෙන්න තිබුණේ අකිල විරාජ් මන්ත්‍රීතුමාට. එහෙම නැත්නම් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට. ඒ ගොල්ලෝ තමයි අද විපක්ෂ නායකතුමාගේ ළඟම හිතවත්තු. අද සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාටත් challenge කරන්නේ අජිත් පී. පෙරේරා නේ. සජිත් ප්‍රේමදාස කියන්නේ ආර්. ප්‍රේමදාස මහත්මයාගේ පුතා. ආර්. ප්‍රේමදාස මහත්මයාගේ පුතාට පක්ෂය ඇතුළේ ගේම දෙන්නේ අජිත් පී. පෙරේරා. ඔහුත් පෙරේරා, මාත් පෙරේරා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිලාන් පෙරේරා නම් විරුද්ධ පැත්තේ ඉඳගෙන හරි සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට පොඩ්ඩක් අභියෝග කළාට කමක් නැහැ.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

මොකද, එතුමාගේ තාත්තාටත් මම අභියෝග කරලා තිබුණු හින්දා. මේ පෙරේරා මොකෙක්ද, එතුමාට challenge කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාටයි මෙය කියන්නේ. ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේක මතක තියා ගන්න. ඔබතුමා බදුල්ල දිස්ත්‍රික්කයට ආවේ හිටපු අමාත්‍ය ගරු වින්සන් ඩයස් මැතිතුමාගේ ආදරණීය දෝණියන්දෑ විවාහ කර ගෙනයි. ඔබතුමා බදුල්ලට ආවාට පස්සේ බදුල්ල නගරය තුළ එක්සත් ජාතික පක්ෂයට නව ජවයක් දුන්නා. ඒක මම පිළිගන්නවා. ඔබතුමායි මමයි පසු ගිය ජනාධිපතිවරණය කාලයේ පොලීසිය ඇතුළේ අතින් පයින් ගහගත්තා.

ඒ ගැන ප්‍රශ්නයක් නැහැ; දේශපාලනයේදී එහෙම දේවල් වෙනවා. ගුටි කෑවේ කවුද, ගැහුවේ කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. කෙසේ වෙතත්, එහෙම දේවල් වෙනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දේශපාලනයේ අනාගතයක් තිබෙනවා. හැබැයි තමුන්නාන්සේ අද තමුන්නාන්සේගේ ඒ දේශපාලන අනාගතය අනා ගන්න පටන් ගත්තා.

ගරු මඟින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අන්න ඒකයි, අපට දුක.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට රන්ජන් රාමනායක වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඕනෑ දෙයක් කියාපුවාවේ.

ගරු මඟින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගණන් ගන්නේවත් නැහැ.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
රන්ජන් රාමනායක වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාව විවේචනය කරන්න, කරන්න දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මනාප වැඩි වෙනවා; ඡන්ද වැඩි වෙනවා. Mega Star එකේදීත් වුණේ ඒකනේ. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාත් හිටියා Mega Star තරගයට. නමුත් ඡන්ද, මනාප අඩු වෙන කොට එතුමා gigolo කෙනකු නිසා, gigolo කෙනකුට තිබෙන වාසිය ප්‍රයෝජනයට අරගෙන තරගයෙන් ඉල්ලා අස් වුණා.

ගරු මඟින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "gigolo" කියන වචනයේ සිංහල තේරුම මොකක්ද කියලා අහන්න.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒක පසුව දැනුම් දෙනු ලැබේ. [බාධා කිරීමක්]

ගරු මඟින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, නැහැ. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාට කියන්නය කියන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මගේ නම සඳහන් කරමින් කිහිප වතාවක්ම gigolo කථාවක් කිව්වා. "Gigolo" කියලා කියන්නේ හැඩි දැඩි පිරිමියෙකුට. නමුත් එතුමාට දියවැඩියාව. ගැහැනු එතුමාව දාලා යනවා. [බාධා කිරීම්]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "gigolo" කියන වචනය සම්බන්ධයෙන් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා දුන්නු නිර්වචනය හරි හෝ වැරදි වේවා, එය හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා "gigolo" කියන වචනයට දුන්නු නිර්වචනය හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න එපා. කරුණාකර, ඒක ඒ විධියටම කියන්න. මොකද හේතුව?[බාධා කිරීම්]

ගරු මඟින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

භාෂා පරිවර්තකගෙන් එහි සිංහල තේරුම අහන්න කියන්න. [බාධා කිරීම්]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒක තමයි මම කිව්වේ. [බාධා කිරීම්] තව ඇතට යන්න ඕනෑ නැහැ. රංජන් රාමනායක මන්ත්‍රීතුමා "gigolo" කියන වචනයට දුන්නු නිර්වචනය හරහාම ජේනවා නේද, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් අද යූඑන්පියෙන් කවුද ඉස්සරහට ගෙනෙන්නේ කියලා. "Gigolo" කියන්නේ හොඳ සම්මානනීය තනතුරක් කියලා හිතන කෙනෙක් මේ. එතුමා හිතන්නේ "gigolo" කියන්නේ හරි ෂෝක් මිනිහෙක් කියලායි. ඒකනේ මේ කියන්නේ. "Gigolo" කියන්නේ නියම බඩුවක් කියලයි එතුමා හිතන්නේ. එතකොට "gigolo" කියන්නේ නියම බඩුවක් කියලා හිතන මිනිහෙක් තමයි ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ගහන්න ඉස්සරහට ගෙනෙන්නේ. එක්කෝ රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඔළුවේ අමාරුවක්. එහෙම නැත්නම් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඉංග්‍රීසි ශබ්ද කෝෂය අලුතින් හදනවා. එතුමා හෙට කියාවි, "prostitute" කියන්නේ පියයුරු ලොකුවට තිබෙන උස, මහත ගැනියෙකුටයි කියලා. [බාධා කිරීමක්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
"Prostitute" කියන්නේ "කනකා".

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
කනකා ද ඔළුව කා ද කියන එක නොවෙයි ප්‍රශ්නය. [බාධා කිරීමක්]ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "prostitute" කියන

වචනයේ තේරුම මොකක්ද කියලා ඇහුවොත්, "gigolo" කියන එකත් එක්ක සංසන්දනය කරලා එතුමා කියාවි, "prostitute" කියන්නේ හොඳට පියයුරු තිබෙන උස, මහත ගැනියෙකුටයි කියලා. ඒ නිසා තමන් නොදන්නා දේ ප්‍රදර්ශනය කිරීම තරම් ලොකු පාප කර්මයක් ලෝකයේ කොහේවත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ගැන මා කථා කළා ඇති. මොකද, දැන් එතුමා ලොකු විහිළුවක් වෙලායි තිබෙන්නේ. හැබැයි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කොතැනටද ආවේ? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අද කියාපු සමහර කාරණා එක්ක මා එකඟ වෙන්නේ නැහැ. එදා කියාපු ඒවා එක්ක එකඟ වෙන්නේත් නැහැ. හැබැයි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ මහගෙදර වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එතුමා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලා වැඩියෙන්ම මනාප ගත්ත කෙනා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමායි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි ඡන්දය ඉල්ලුවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ ලේකම් තනතුරට. ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මා මේ කියන්නේ. ඒ නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අලුත් තැනක් නොවෙයි. එතුමා අද කියාපු සමහර කාරණාවලට මා එකඟ වෙන්නේ නැහැ. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලයේ කියාපු සමහර ඒවා එක්කත් මා එකඟ වෙන්නේ නැහැ.

ඒක වෙනම කතන්දරයක්. හැබැයි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ආවේ තමාගේ දේශපාලන මහ ගෙදරට. එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අලුත් තැනක් නොවෙයි. ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයාට එක්සත් ජාතික පක්ෂය තමයි හොඳ තැන; සුදුසු තැන. එතුමාට පහසුයි. එතුමාගේ සමාජ පැලැන්තියට පුරුදුයි. මංගල සමරවීර මහත්මයාට එතැන තමයි හිමි තැන. එස්.බී. දිසානායක ඇමතිතුමාට හිමි තැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. යූඑන්පී එකේ එස්.බී. දිසානායක මැතිතුමන්ලා දයාසිරිලා හිටියේ අනුන්ගේ සළු පිළි ඇහේ දමාගෙන. හදවත එතැන නැහැ. රවි කරුණානායක මන්ත්‍රීතුමාට සුදුසු තැන එක්සත් ජාතික පක්ෂය. එතුමා අපේ මේ පැත්තේ සිටියේ හරි අමාරුවෙන්. එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය හුරු නැහැ. එතුමාට හුරු තැන එක්සත් ජාතික පක්ෂය. ඒක තමයි ඇත්ත කතන්දරය. අද දයාසිරි ජයසේකර මැතිතුමා කෝප වුණේ නැහැ නේ. එතුමා දන්නවා, අදින් පසු හරින් ප්‍රනාන්දු මැතිතුමා එතුමාට කුණු වෙන්න ගහනවා කියා. නමුත් කථාව අවසන් කරන විට හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට ස්තුති කළා. පක්ෂය ඇතුළත සිටියදී ඔබතුමායි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි අතර තිබුණු අරගලය අපි දන්නවා. නමුත් එතුමා කුහක වුණේ නැහැ.

මම කැමැතියි, රවි කරුණානායක මන්ත්‍රීතුමාට මේ කාරණය කියන්න. ඔබතුමාට විරුද්ධව සජිත් ප්‍රේමදාස මහත්මයා එක්ක ඉන්න කාලයේ පත්තරවලින් නොයෙක් විධියේ පහර ගැසීම් කළා. නමුත් එතුමා කුහක වුණේ නැහැ. හැබැයි, අද රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඔය කිව්ව ඒවා කවුරුත් ගණන් ගන්නේ නැහැ. හැබැයි, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගෙන් මේ වාගේ වැඩක් බලාපොරොත්තු වුණේ නැහැ. එතුමාගේ දේශපාලන කුහකත්වයක් තිබුණේ නැහැ. අජිත් පෙරේරා මන්ත්‍රීතුමා තමයි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ තනතුර ගන්න ඉන්නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තමයි එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය සංවිධායක ධුරයේ හිටියේ. අජිත් පෙරේරා මන්ත්‍රීතුමා යට ගේමක් ගහලා පන්දම් අල්ලා ඒක ගන්නවා. හැබැයි, එතුමා කුහක වුණේ නැහැ, අජිත් පෙරේරා මන්ත්‍රීතුමාට පහර ගහන්න. එතුමා ස්තුති කළා. ඒ නිසා පැහැදිලිව පෙනෙනවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතය තුළ තිබෙන ගුණාංග. එතුමා කිව්වා, මම එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලා පාර්ලිමේන්තුවට ආවා. මම දැන් ඉල්ලා අස් වෙලා පළාත් සභාවට ගිහින් ඡන්දය ඉල්ලා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් අහනවා, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ආවොත් උඹලා මාව තවමත් තෝරනවාද. මේ මගේ පරණ මහ ගෙදර" කියා. ජනතාවගේ මතය සමඟ තමයි එතුමා පළාත් සභාවට යන්නේ. ඒ නිසා කරුණාකර, තමන්ගේ හඳවතට තට්ටු කර අහන්න, "මොන දේශපාලන මතයේ හිටියත් දයාසිරි ජයසේකර විරුද්ධ පාර්ශ්වයේ හිටියත් ආණ්ඩු පාර්ශ්වයේ හිටියත් අපි පිළිගන්න දෙයක් නැද්ද? දයාසිරි ජයසේකර කියන්නේ මේ රටේ දේශපාලනයේ ඉන්න ඕනෑ කෙනෙක්ද? නොසිටිය යුතු කෙනෙක්ද?" කියා. දේශපාලන මතය පිළිගන්න එකක් නැහැ. දේශපාලන වශයෙන් මතවාදයට විරුද්ධයි. හැබැයි, දයාසිරි ජයසේකර කියන්නේ ලංකා දේශපාලනයේ යූඑන්පී හෝ ශ්‍රී ලංකා හෝ ජේවීපී හෝ සිටිය යුතු කෙනෙක්ද නැද්ද? රන්ජන් රාමනායක වාගේ කෙනෙක් හැර අනෙක් අයගෙන් උත්තරය හම්බ වන්නේ "ඔව්, ඔව්, ඔව්" කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇත්තට මුහුණ දෙමු. අපිටත් වේදනා තමයි. ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයාලා එදා යන විට අපිට කොච්චර වේදනාවක් ඇති වුණාද? තද වෙනවා. දෙන්න ඕනෑ කියා හිතනවා. ඒ වේදනාව සාධාරණයි. ඒ වේදනාවත් සමඟ මේ මනුෂ්‍යා දේශපාලනයේ ඉන්න ඕනෑ චරිතයක් නේද කියන කාරණය අපි දේශපාලන බුද්ධිමතුන් හැටියට හිතන්න ඕනෑ. එහෙම හිතලා තමයි ඒ මනුෂයා විවේචනය කරන්න ඕනෑ. දයාසිරි ජයසේකර මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකයා විවේචනය කිරීම පිළිබඳව දේශපාලන විවේචන එල්ල කරන්න පුළුවන්. නමුත් ඉන් පරිබාහිරව ගිහින් මුදල් අරගෙන මේ වැඩේ කළා කියන කාරණය එන්නේ මොන පදනමකින්ද?

දැන් කියනවා, "ස්ත්‍රී දූෂකයෝ, හොරු" කියා. ස්ත්‍රී දූෂකයෝ කියලා කියන්නේ ස්ත්‍රී දූෂණය ගැන නඩු තිබෙන කෙනෙක්. මාර වැඩක් නේ. නැත්නම් ස්ත්‍රී දූෂණයක් හොඳයි. බලන්න මේ මානසිකත්වය. ඉතින්, gigolo නොකියා මොකක්ද කියන්නේ? ස්ත්‍රී දූෂණය හොඳයි කියායි එතුමා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඒම ගැන මගේ තිබෙන්නේ විශාල වූ ප්‍රීතියක්. එක්සත් ජාතික පක්ෂයෙන් සමහර උදවිය එන වෙලාවේ මම ඒකට විරෝධය පා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් ඉල්ලා අස් වූ මිනිහෙක්. මගේ දේශපාලන ජීවිතයේ මගේ ඇමතිකමට වඩා ලොකුයි මගේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ධුරය. හැබැයි, එක්සත් ජාතික පක්ෂයෙන් සමහර අය එන විට ඒ වටිනා කියන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ධුරයෙන් මා ඉල්ලා අස් වුණා. මම එහෙමයි කළේ. දයාසිරි ජයසේකර මැතිතුමා එන එක ගැන මට ප්‍රීතියි. මා එතුමා පිළිගන්නවා. ඇයි? එතුමා එන්නේ මහ ගෙදරට. එතුමා එන්නේ එතුමා ඉන්න ඕනෑ තැනට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ එතුමාට දේශපාලනය කරන්න අලුතෙන් සළු පිළි ඇඳගෙන මනස හදා ගන්න ඕනෑ නැහැ. එතුමා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ඇඟ ඇතුළත තිබෙන කෙනෙක්. ලිබරල්වාදී දේශපාලනය එතුමාගේ ඇඟට දමා ගන්න සිදු වුණා. ඒ නිසා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මම සුබ පතනවා විතරක් නොවෙයි. මා ඉතා අවංකවම කියනවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ශක්තියක් බව.

ඒ වාගේම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ පක්ෂයට ආගමනයත් එක්ක කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයට වන සෝදා පාළුව මේ පාර වයඹ පළාත් සභා මැතිවරණයේදී බලන්න පුළුවන්. තමුන්නාන්සේලාට මේ වෙලාවට පොඩි මෝඩ වූන් එකක් ගන්න, විනාඩි දෙකක වූන් එකක් ගන්න "බලමු" කියලා කියන්න පුළුවන්. විනාඩි දෙකක වූන් එකක් ගන්න, "මම දයාසිරි කුණු බක්කියට දානවා" කියලා හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට කියන්න පුළුවන්. හැබැයි අවසානයේ කුණු බක්කියට ඔබතුමාවයි, මාවයි දාන්න තීන්දු කරන්නේ අප

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

දෙදෙනා නොවෙයි, ජනතාව. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව නොවෙයි, ඊට අල්ලපු මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව සහ මුළු මධ්‍යම පළාතේ ජනතාව. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ මේ ආගමනයත් එක්ක වැඩියෙන්ම පහර වැදෙන්නේ කාටද? එක්සත් ජාතික පක්ෂයේ ඡන්දවලට. මේක අහන්න, තමන්ගේ පපුවෙන්. නිකම් බොරුවට උඩ පනින්න එපා. මේ වෙලාවේ රුවන් විජයවර්ධන මන්ත්‍රීතුමා යම් යම් දේවල් කිව්වාම ඔබතුමා නැඟිටලා කෑ ගහනවා. මොකද, ඔබතුමාට ඔබතුමාගේ අනාගතය විසඳා ගන්න තිබෙන නිසා; දයා ගමගේත් එක්ක තිබෙන ගෝරිය බේරා ගන්න තිබෙන නිසා. හැබැයි එහෙම කෑ ගැහුවාට ඔබතුමා පක්ෂය ඇතුළේ ඉතුරු වෙයි. මේ කාරණය මතක තියා ගන්න. අවසානයේ තීන්දුව ගන්නේ කවුද? ඔබතුමා මේ weekend එකේ බදුල්ලට යනවා. බදුල්ලේ එක්සත් ජාතික පාක්ෂිකයෝ ඔබතුමා හම්බ වෙන්න එනවා. ඇවිල්ලා ඔබතුමාට කියන්නේ, දයාසිරි කුණු බක්කියට දමන්න කියලා නොවෙයි. ඔබතුමාගෙන් අහන්නේ "කවදාද අපේ පක්ෂය හදා ගන්නේ?" කියලායි. ඒක තමයි අහන්නේ. ඔබතුමා නැති වෙලාවේ ඔබතුමාගේ ගෙදර මේ පොසොන් පෝය දවසේ තිබුණු සව් දන්සැලට මා ගියා. එතුමායි, මමයි එක ළඟ ඉන්නේ. අපේ ගෙදර ගිය අවුරුද්දේ තිබුණු නූඩ්ල්ස් දන්සැලට එතුමා ආවා. මා ගියා, එතුමාගේ ගෙදර තිබුණු සව් දන්සැලට. එහි හිටියේ ඔක්කොම එක්සත් ජාතික පක්ෂයේ අය. එතුමන්ලා මා ගියාම පුදුම වුණා. මෙතුමා හිටියේත් නැහැ. ඇයි මෙහේ ආවේ කියලා ඒ අය මගෙන් ඇහුවා. මා කීවා, "දන්සැලට සව් කන්න ආවා" කියලා. මා සව් කෑවා. ඔබතුමා සවිම තෝරා ගත්ත එක හොඳයි. මොකද එක්සත් ජාතික පක්ෂයට මේ කාලයේ සව් තමයි ඕනෑ. ඔබතුමා දන්සැලට තෝරා ගත්තේ හොඳම වර්ගය. එක්සත් ජාතික පක්ෂයට හැම දාම දර දිය ඇදපු අර පුවක්ගොඩමුල්ලේ ලලිතක්කා එහි සිටියා. ඇයගේ ස්වාමිපුරුෂයා වන විල්සන් අයියා තමයි අවුරුදු 35ක් මගේ තාත්තාගේ කාර් එක එලෙව්වේ. විල්සන් අයියා සම සමාජ පක්ෂයේ. ලලිතක්කා යූඑන්පී එකේ. ඒ හිටපු විනාඩි 15 ඇතුළත මම ඇහුවා, "ලලිතක්කා, කවදාද මැරිච්ච විල්සන් අයියා ගිය අඩි පාරේ එන්නේ" කියලා. "අනේ ඇමතිතුමා, එන්න හිතුණු වාර ගණන අනන්තයි. හැබැයි ඩී.එස්. සේනානායක මහත්මයාලා මතක් වෙන කොට එන්න හිතෙන්නේ නැහැ. ඩඩ්ලි මහත්මයාලා මතක් වෙන කොට එන්න හිතෙන්නේ නැහැ. විපක්ෂ නායකතුමාගේ නම් කනට ගහලා එන්න හිතෙනවා" කියලා කිව්වා. ඔබතුමාගේ ගෙදර තිබුණු සව් දන්සලේ සව් කන ගමන් කිව්වේ. මේ පක්ෂය වෙනුවෙන් දර දිය ඇද්ද මහත්තයා සම සමාජකාරයා වුණත් ලලිතක්කා කවදාවත් පක්ෂය දාලා ගියේ නැහැ. එයාගේ මස්සිනා වන බණ්ඩාර නමැත්තා මට හම්බ වුණා, මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකතුමාගේ තාත්තාගේ මළ ගෙදරදී. රාත්‍රී 2.00ට පමණ ඇති, මා එහි යන කොට. බදුල්ල HQI මහත්තයාගේත් තාත්තා.

බණ්ඩාර කියන්නේ හැම ඡන්දයකදීම ඔබතුමාට දර දිය අදින, බර අදින කෙනෙක්. ටිකක් වැඩි පුර බොනවා, එච්චරයි තිබෙන වරද. ඔබතුමා ඒක දන්නවා. ඔහු කිව්වේත් ඒ කථාවමයි. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙතැන නැඟිටලා දයාසිරිට බණියි. එහෙත් ගමේ ගියාම එක්සත් ජාතික පාක්ෂිකයෝ තමුන්නාන්සේගෙන් අහන්නේ දයාසිරිට බැන්න එක ගැන නොවෙයි. දයාසිරි වාගේ හොඳ මිනිස්සු පක්ෂයෙන් යන එක නවත්වන්නේ කවදාද, එක්සත් ජාතික පක්ෂය තුළ වෙනසකට මුල පුරන්නේ කවදාද කියලා තමයි ඔබතුමාගෙන් අහන්නේ. ඔබතුමා අද රුවන් විජයවර්ධනගේ ලණුව කාලා කෑ ගහලා යාවි. හැබැයි බදුල්ලට ගියාම ඔබතුමාගෙන් අහන්නේ ඔය ලණුව කාපු එක ගැන නොවෙයි. වෙන වෙන අය කථා කරපු ඒවා කවුරුවත් අහන්නේ නැහැ. ඒවා අහන්න එතුමන්ලා ගමේ යන්නේත් නැහැනේ. ඒ නිසා එතුමන්ලාගෙන් ඔය ප්‍රශ්නය කවුරුවත් අහන්නේ නැහැ. ඔබතුමාගෙන් ඔය ප්‍රශ්නය අහනවා, ඔබතුමා ගමේ යන මන්ත්‍රීවරයෙකු හැටියට.

අද එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ගැන කියනවා. ඒ සමහර අයට අමතකයි, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ආවේත් යූඑන්පී එකේ ඉඳලා කියලා. ඒ ගැන බෙරිහන් දෙනවා. හැබැයි දන්නේ නැහැ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා මෙහාට ආවේ යූඑන්පී එකේ ඉඳලා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පක්ෂ මාරුව කියන එක පිළිබඳව විවිධ අයගේ විවිධ මත තිබෙනවා. සමහර අය පක්ෂ මාරු කරනවා. සමහර අය පක්ෂ මාරු කරනවා. සමහර අය පක්ෂ මාරු කරන්නේ නැහැ. සමහර අය පක්ෂ මාරු කරන්නේ නැතිව ඒ පක්ෂය හැටියට සන්ධානගත වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ අපට සන්ධානගත වුණා. අනුර දිසානායකලා, හඳුන්නෙත්තිලා, විමල් වීරවංශලා එකට සන්ධානය වෙනුවෙන් පෙළපාළි ගියා. සන්ධානය වෙනුවෙන් රෝහිතලා පෙළපාළි ගියා. සන්ධානගත පෙළපාළිවල ජාතික ලැයිස්තුවෙන් දාපු නරුමයෝත් එනවාය කියලා පක්ෂයේ නායිකාව වරක් මට මධ්‍යම කාරක සභාවේදී කිව්වා. හැබැයි අප පෙළපාළි ගියා.

අපි එහෙම එකට පෙළපාළි ගියාට සුනාමී සහන මණ්ඩල යෝජනාව ගෙනාපු වෙලාවේ අපි දෙගොල්ලෝ දෙපැත්තේ ඉඳගෙන වාද කර ගත්තා. නැවත වෙන ප්‍රශ්නයක් එන කොට අපි එකතු වනවා. දේශපාලන වශයෙන් අපේ මත ගැටෙන කොට වෙනස් වනවා. ඒ වාගේ සමහර අය පක්ෂය දාලා යනවා. සමහර අය සන්ධානගත වනවා. ඒවා මේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම දේශපාලනයේ වන දේවල්.

සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා මේ රටේ ජනාධිපති කාලයේ ඇතුලත්මුදලි මහත්මයා, ගාමිණී දිසානායක මහත්මයා, මේ රවි කරුණානායක මහත්මයා ඇතුළු අය එතුමාට විරුද්ධව දෝෂාභියෝග යෝජනාවක් ගෙනැල්ලා, රාජාලියා නමින් වෙනම පක්ෂයක් හදා ගෙන ඒ පක්ෂයෙන් අයින් වෙලා ගියා. ගියා විතරක්ද, මොනවාද නොකිව්වේ? ප්‍රේමදාස මහත්මයාට දොස් කිව්වා; ප්‍රේමදාස මහත්මයාගේ නෝනගේ මල්ලිට අයිති shed එකක් ගැන කිව්වා; හොරකම් ගැන කිව්වා; වංචා ගැන කිව්වා; ජංගි මහනවයි කිව්වා. මොනවාද නොකිව්වේ? අපි නොවෙයි කිව්වේ. එක්සත් ජාතික පක්ෂයෙන් කඩා ගෙන ගිය කට්ටිය කිව්වේ. ඔවුන් මොනවාද නොකිව්වේ? දැන් ඔය එකට ඉඳ ගෙන ඉන්නේ. එදා කුණු අද කුණු නොවෙයිද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනයේදී එහෙම වෙනස්කම් වනවා.

මේ අපේ පැත්තේ ඉන්නේ සද්ධන්ත කුලයේ ඇත්තු නේ. මගෙ අප්පොච්චියේ පී. දයාරත්න කියන්නේ අම්පාරේ හිටපු සද්ධන්ත කුලයේ ඇතෙක්නේ. මගේ අප්පා, අර මහියංගනයේ සද්ධන්ත කුලයේ ඇතා. අර ඊට එහා පැත්තේ ඉන්න ගාමිණී දිසානායක මැතිතුමාගේ පුතා. දැන් මේ මහා සද්ධන්ත කුලයේ ඇත්තු එක්ක බලන කොට මේ රාමනායකලා ඒ ඇත්තුන්ගේ වලිගයේ ඉන්න මැක්කාගෙ බෙට්ටක් තරම්වත් වටින්නේ නැහැනේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇත්තු දළ පිටින් එනවා. ඒ එන කොට අපේ පරණ මහ ගෙදර හිටපු දයාසිරි ජයසේකර මහත්මයා එන එක අරුමයක්ද? පී. දයාරත්න මහත්මයා එන කොට, ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්මයා එන කොට, ගාමිණී දිසානායක මහත්මයාගේ ආදරණීය පුත්‍ර රත්නය වන නවීන් දිසානායක මහත්මයා එන කොට, කරු ජයසූරිය මහත්මයා -එතුමා ඇවිල්ලානේ ආපහු ගියේ- ඇවිල්ලා යන කොට අපේම පක්ෂයේ මහ ගෙදර හිටපු, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලලා නොමේරා එකට මනාප හම්බ වෙලත් ප්‍රාදේශීය සභාවේ සභාපතිකම නුදුන් වෙලාවෙත් පක්ෂය දාලා නොගිය දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එන එක අරුමයක් නොවෙයි. හැබැයි එක වෙනසක් තිබෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මේ නොසැලකිල්ල පක්ෂයෙන් එන්නේ ඇයි කියන එක පිළිබඳව තමුන්නාන්සේලා හිතලා බලන්න. එය පොදු කාරණයක් නොවෙයිනේ. දේශපාලන කාරණාවලට අපි පක්ෂය තුළ හැප්පෙනවා. අපි අවංකව කියමු. දැන් අපේ සන්ධානය ඇතුළේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන විවිධ මත

තිබෙනවා. මම ඉන්න මතයේ නොවෙයි විමල් වීරවංශ ඇමතිතුමා ඉන්නේ. ඒ වාගේ මත තිබෙනවා. හැබැයි ඒවා දේශපාලන කාරණා. නමුත් දයාසිරිට, බුද්ධිකට මේ ප්‍රශ්නය ඇති වන්නේ දේශපාලන කාරණා නිසාද? නැහැ. සයනය පිළිබඳ ප්‍රශ්නයක් නිසා. සයනය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. යහන පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. යහනේ නිදා ගන්නේ කවුද, යහනේ නිදා නොගන්නේ කවුද කියන ප්‍රශ්නයක් තිබෙන්නේ. දේශපාලන පක්ෂයක තනතුරු වෙන් කරන්න පුළුවන්ද, තීන්දු කරන්න පුළුවන්ද යහන පිළිබඳ කාරණය මුල් කර ගෙන? බැහැ. එහෙම දිගින් දිගටම යන කොට පක්ෂය වෙනුවෙන් කොච්චර දර දිය ඇද්දත් ඒ මනුස්සයා වැටෙන එක අහන්න දෙයක්ද? කලකිරෙන එක අහන්න දෙයක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන මතවාද අනුව වෙන් වන්න පුළුවන්. ඒවා ප්‍රශ්න නොවෙයි.

දැන් බලන්න ජනතා විමුක්ති පෙරමුණ. ඒ පක්ෂය ඇතුළේ දේශපාලන මත කොච්චර ගැටෙනවාද? ගැටි ගැටී, රණ්ඩු වෙවී ඒගොල්ලෝ තවම ඉන්නවා. පක්ෂය කැලි කැලිවලට කැඩුණත් ඒගොල්ලෝ තවම ඉන්නවා. හැබැයි ඒ පක්ෂය තුළ කවදාවත් යහනේ ප්‍රශ්නයක් මත වාද කර ගන්නේ නැහැ. මා ඒක දන්නවා. එහෙම කර ගන්නත් එපා. මා දන්නේ නැහැ මේ අලුත් එක්සත් ජාතික පක්ෂයත් එක්ක ජනතා විමුක්ති පෙරමුණේ යහන්ගත වීම එක්ක මොන මොන විධියට ඒ උදවිය වෙනස් වේවිද කියලා. හැබැයි ජනතා විමුක්ති පෙරමුණේ බදුල්ල දිස්ත්‍රික්කයේ තිඹිරිගෙය මගේම කාමරයේ හදපු මගේ තාත්තා සහ ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණ හිතපු දේවල් නිසාවත් මේ දේශපාලනයේ යහන්ගත වීම අර මට්ටමට ගෙන යන්න එපා. තවම අරගෙන ගිහින් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පැමිණීම පිළිබඳව අපි සියලු දෙනාම සතුටුයි. ඒකට අපි කිසිම කෙනෙකුගේ කිසිම භේදයක් හෝ ප්‍රශ්නයක් නැහැ. විපක්ෂයෙන් කියන්න හැදුවා, ඒ කාරණය නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන්ට මොකද වෙන්නේ කියලා. ජ්‍යෙෂ්ඨයෝ තමයි එකතු වෙලා තීන්දු කළේ එතුමාව ගන්න. කනිෂ්ඨයෝ නොවෙයි. ජ්‍යෙෂ්ඨයෝ තමයි එකතු වෙලා තීන්දු කළේ එතුමාව ගන්න ඕනෑ කියලා. වෙන කවුරුවත් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයෙන් අපේ පක්ෂයට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එන කොට තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් ඊළඟට එන්නේ කවුද කියන එක පිළිබඳව අවධානයෙන් ඉන්න. එදාට එයා වෙනුවෙන් කථා කරන්නේ කවුද දන්නේ නැහැ. හැබැයි, මම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට කියනවා, මම ඔබතුමාගේ හිත දන්නවාය කියලා. සමහර වෙලාවට කියනවා, "අනේ! මටත් දයාසිරිත් එක්ක යන්න තිබුණා නේද" කියලා. හැබැයි, මේ ඡන්ද ක්‍රමය ඇතුළේ එක්සත් ජාතික පක්ෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් තනිවම ඉන්න නිසා ඒක ඔබතුමාට ලැබුණ ස්වීප් එකක්. ඒ ස්වීප් එක නිසා නොවන්නට ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්මයාටත් කලින් ඔබතුමා මෙහාට ඇවිල්ලා ඉවරයි. මම තමුන්නාන්සේලා සියලු දෙනාටම කියනවා මොන පක්ෂයේ වුණත් දයාසිරි ජයසේකර වාගේ චරිත දේශපාලනයේ ඉන්න ඕනෑ චරිත කියලා. ඒ අයගේ තිබෙන දේශපාලන ප්‍රතිපත්ති මත තමන් එකඟ නොවන තැන් පිළිබඳව ඒ අයත් එක්ක වාද කර ගනිමු. හැබැයි, පෞද්ගලිකව මඩ ගහන්න එපා. මොන පක්ෂයෙන් ආවත් එතුමා දේශපාලනයේ ඉන්න ඕනෑ චරිතයක්. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(*பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Deputy Speaker)

මීළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා. ඊට පෙර කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතාගේ නම යෝජනා කරන්න.

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේ ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *took the Chair.*

[අ.භා. 4.03]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපේ විවාදය විදුලිබල පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වුවත් බොහෝ කථා බහ දයාසිරි සංශෝධනය මට්ටමට පත් වෙලා තිබෙනවා. මේ විවාදය තුළදී ඇත්තටම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විශේෂ ප්‍රකාශයක් කරමින් විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය පිළිබඳව, එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තරයේ තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය පිළිබඳව කිව්වා. එක්සත් ජාතික පක්ෂය ඒකාධිපති නායකත්වයක් සහිත, ඒකාධිපති පක්ෂයක්ය කියන එක කිව්වා. හැබැයි, ඒ කථාව ඇතුළේදීම එතුමා මේ ආණ්ඩුවත්, මහින්ද රාජපක්ෂ පාලනයත් ඒ තරමටම පළවා හැරිය යුතු ඒකාධිපති ආණ්ඩුවක් බව කිව්වා. ඉතින් එතුමා මේ කියන්නේ මොකක්ද කියලා ඇත්තටම අපට තේරෙන්නේ නැහැ. එතුමා එක්සත් ජාතික පක්ෂය ඒකාධිපතියි කියන ගමන්ම ආණ්ඩුවත් ඒකාධිපතියි කියලා කියනවා. ඒ කියන දේ අපට තේරෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒ පිළිබඳව කථා කරන්නේ නැතිව මේ විවාද කරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. ගරු විදුලිබල ඇමතිතුමියත් බලාපොරොත්තු වෙනවා දෙපැත්තේම තිබෙන ඒකාධිපතිත්වය ගැන කථාවට විතරක් යන්න. විදුලිබල පනත ගැන කථා නොකර ඉන්නවා නම් එතුමියත් කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේත් විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලය පිළිබඳව සඳහන් වුණා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් වුණු, එහිදී විවේචනයට ලක් වුණු, පැහැදිලි කිරීම්වලට ලක් වුණු වඩාත්ම අලාභදායක, නාස්තිකාරම, දූෂිතම ආයතන පහ ඇතුළේ විදුලිබල මණ්ඩලය ඉන්නවා. විදුලිබල අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධානම ආයතනය හැටියට අපි දකින්නේ විදුලිබල මණ්ඩලයයි. අද මේ විවාදයට ලක් වන්නේත් ඒ විදුලිබල මණ්ඩලයට අදාළ පනතක් යටතේ සංශෝධන පිළිබඳවයි. ඒ නිසා දයාසිරි සංශෝධනයට වඩා විදුලිබල සංශෝධනය පිළිබඳව වගකීම් සහගත විධියට ගරු ඇමතිතුමියගේ අවධානය යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා.

අද රටේ බදු ගෙවන ජනතාවට තිබෙන ලොකුම ප්‍රශ්නයක් තමයි විදුලිබල මණ්ඩලය තමන්ගේ බදු මුදලට සාධාරණත්වය ඉෂ්ට කරනවාද කියන එක. විශේෂයෙන්ම අද මේ සංශෝධනයට ලක් වන විදුලිබල ව්‍යාපෘති පිළිබඳව, විදුලි ජනනය පිළිබඳව, විදුලි

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ජනනය කරන ලියා පදිංචි නොවුණ ආයතන - නීත්‍යානුකූල නොවන ආකාරයට ක්‍රියාත්මක වුණු ආයතන- නීතිගත කිරීම පිළිබඳව 2009 පනත සංශෝධනය වන අවස්ථාවේදීත් අපි අදහස් දක්වා තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. ඔබතුමියලා මේ සංශෝධන ගෙනැල්ලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යටතේත්, විදුලිබල පනතිනුත් විදුලිය ජනනය කරන විදුලි බලාගාර, විදුලිය සපයන ආයතන නීත්‍යානුකූල කරන ක්‍රියාවලියකට යන කොට ඒවා ඊට කලින් බලපත්‍ර ගත්තේ කොයි ආකාරයෙන්ද, ඒ බලපත්‍ර ගත් හැම ආයතනයක්ම නීත්‍යානුකූල රාමුව ඇතුළට ගන්න සුදුසු ද නැද්ද, ඒවායේ තිබෙන සුදුසුභාවය, නිලභාවය පිළිබඳවත් නැවත පරීක්ෂාවක් කළ යුතුයි නේද? මොකද, එවැනි පරීක්ෂාවකින් තොරව දැනට තිබෙන සියලුම ආයතන ටික, විදුලිය සපයන සියලුම බලාගාර ටික මේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න කොට එතැන ගැටලු ඇති වන්න පුළුවන් බව මම අවධාරණය කරනවා. ඒ එකක්.

ගරු ඇමතිතුමියනි, විදුලිබල මණ්ඩලය පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවධානයට ලක් වෙද්දී ප්‍රධාන වශයෙන්ම අවධානයට ලක් වුණේ විදුලිබල මණ්ඩලයේම හිටපු නිලධාරින් සම්බන්ධවයි. ඒ අය අතර ඔබතුමියත් පිළිගන්නා ආකාරයට මාෆියාවක් විධියට ක්‍රියාත්මක වුණු අය ඉන්නවා. ප්‍රධාන වශයෙන්ම විදුලිබල මණ්ඩලයම විනාශ කරන තත්ත්වයට පත් වුණේ ඒ නිලධාරි යාන්ත්‍රණය ඇතුළේ තිබුණු මාෆියාවට එරෙහි වන්න විදුලිබල ඇමතිවරයෙකුට බැරි වුණු නිසායි. ඒ මාෆියාව විසින් ක්‍රියාත්මක කර ගත් බලාගාර තිබෙනවා. ඒ තුළින් විදුලිබල මණ්ඩලයේම අයිතිය විකෘති කරලා තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ අයිතිය කොතරම් දුරට විකෘති කර තිබෙනවාද කිව්වොත් මේ පාර්ලිමේන්තුවට වග නොකියන ආයතන විදුලිබල මණ්ඩලය යටතේ තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම විදුලිය ජනනය කරන, විදුලිය සපයන ආයතනයක්. හැබැයි එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම පාර්ලිමේන්තුවට කැඳවන්න බැහැ. එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ගේන්න බැහැ. ඇයි ඒ? ගරු ඇමතිතුමියනි, විදුලිබල මණ්ඩලයේම අයිතිය නම් තිබෙන්නේ, විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයම නම් ඉන්නේ, විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධනය යටතේ නම් ඒ විදුලිය ජනනය කරන සමාගම පිහිටුවන්නේ, නමුත් ඒ සමාගම පාර්ලිමේන්තුවට කැඳවන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් උදාහරණයකට LECO ආයතනය ගන්න. LECO ආයතනය විදුලි බිල් පරීක්ෂා කරනවා. ග්‍රාමීය මට්ටමෙන් විදුලිය සැපයීම කුඩාවට කරන හැම තැනම කරන්නේ LECO ආයතනයයි. හැබැයි විදුලිබල මණ්ඩලය පාර්ලිමේන්තුවට කැඳවුවාට අපට LECO ආයතනය පාර්ලිමේන්තුවට කැඳවන්න බැහැ. අද නීත්‍යානුකූල කරන බලාගාර ක්‍රියාවලිය තුළ බලපත්‍රලාභීන් වාගේම මේ පෞද්ගලික සපයන්නනුත් සිටින්න පුළුවන්. හැබැයි විදුලිබල මණ්ඩලයේම අයිතිය වෙනත් නම්වලින් හදා ගත් සමාගම් තිබෙනවා. ඒවා පාර්ලිමේන්තුව යටතට වග කියන ආයතන බවට පත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ විදුලිබල මණ්ඩලය තව දුරටත් පාඩු ලබන දූෂිත ආයතන ලැයිස්තුවේ අංක එකට තිබෙන එක විතරයි. ඔබතුමියට ලබන අවුරුද්දේත් ඔය ඇමතිකම තිබුණොත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව කියවද්දි ඒ record එක නම් හම්බ වනවා. මොකක්ද? ඔබතුමිය යටතේ තිබෙන මේ ආයතනය පාඩු ලබන ආයතන ලැයිස්තුවේ අංක එකට පත් වනවා. මගේ අවබෝධයේ හැටියට රුපියල් බිලියන 94ක් පමණ පාඩු ලබන ආයතනයක් බවට විදුලිබල මණ්ඩලය පත් වෙලා තිබෙනවා.

ඊළඟට මම ඔබතුමියගේ අවධානය තව වැදගත් කාරණයකට යොමු කරනවා. ඒක තමයි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය පිළිබඳ ප්‍රශ්නය. මම මේ මතු කරන්නේ වෙනත් කාරණාවක්. ලංකා ගල් අඟුරු සමාගම ගල් අඟුරු මිලදී ගැනීම සඳහා 2009 වසරේ ජූලි මාසයේදී ක්‍රියාත්මක වනවා. විශේෂයෙන් 2010 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත වුණු මෙගාවොට් 300ක බලාගාරය වෙනුවෙන් අවුරුද්දකට ටොන් 650,000ක් ගණනේ අවුරුදු තුනකට ගල් අඟුරු මිලදී ගන්න ගල් අඟුරු සපයන්නන්ගෙන් ටෙන්ඩර් කැඳවුවා. මේ ප්‍රශ්නය ඔබතුමිය දන්නවා. 2010 වසරේ පෙබරවාරි තුන්වැනි දා කැබිනට් පත්‍රිකාවක් මඟින් තමයි මේ යෝජනාව ඉදිරිපත් වුණේ. ඒ යෝජනාවේ තිබුණේ ගල් අඟුරු සැපයීමේ ටෙන්ඩර් එක හොල්සිම් ට්‍රේඩින් කියන සමාගමට දෙන්නයි. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ ඒ ටෙන්ඩර් එක අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කරලා අභියාචනා මණ්ඩලයේ නිගමනය බවට පත් වුණේ අඩුම ලන්සුව දීලා තිබෙන නොබෙල් රිසෝසස් (පුද්ගලික) සමාගමට ඒ ටෙන්ඩරය ලබා දීමයි. ඒකේ මිල ගණන් ටික මා ළඟ තිබෙනවා. ඕනෑ නම් ඒ මිල ගණන් ටික සභාගත කරන්නම්. හොල්සිම් සමාගමට ගල් අඟුරු ටොන් එකකට ඇමෙරිකානු ඩොලර් 87.99යි. ඔය ආදී වශයෙන් සංඛ්‍යා දත්ත මා ළඟ තිබෙනවා. අවසානයේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ක්‍රියාවලිය අනුව ඒ ටෙන්ඩර් මණ්ඩලයම, අභියාචනා මණ්ඩලයම පිළිගන්නවා, අභියාචනා මණ්ඩලයේ ගණනය කිරීම් වැරැදියි කියලා. ඒ වැරැද්ද වන්නේ ප්‍රවාහන වියදම් දෙවරක් ගණනය කිරීම නිසායි. ඒ ක්‍රියාවලිය තුළදී ඒ ටෙන්ඩරය ලැබෙන්න ඕනෑ ආයතනයට නොවෙයි දැන් ටෙන්ඩරය ලැබිලා තිබෙන්නේ. ඒකට හේතුව තමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා තමන්ට මේ ටෙන්ඩරය දෙන්න ඕනෑ ආයතනයට ටෙන්ඩරය ලැබෙන තුරු මෙහි මිල ගණන් සංශෝධනය කරමින් මිල ගණන් කේවල් කිරීම. මිල ගණන් කේවල් කරන්නේ ටෙන්ඩර් ක්‍රියාවලියටත්, කැබිනට් මණ්ඩලයටත්, අභියාචනා මණ්ඩලයටත් සම්පූර්ණ පටහැනිවයි. ඒ කේවල් කිරීම කොපමණද කිව්වොත් අවසානයේදී එතුමා එක කොම්පැනියක් දිහා බලාගෙන යනවා. ඒ කොම්පැනියට ගැළපෙන විධියට මිල සංශෝධනය කරන කොට එතැන නොහිටපු වෙන කොම්පැනියකුත් උඩට එනවා.

උදාහරණයක් විධියට කිව්වොත්, නොබෙල් රිසෝසස් (පුද්ගලික) සමාගමට දෙන්න ඕනෑ විධියට මිල ගණන් කේවල් කළොත්, Coal of Africa කියන සමාගමත් උඩට එනවා. ඒ කියන්නේ, මේ ලැයිස්තුවේ නොහිටපු සමාගමකුත් උඩට ඇවිල්ලා තමයි අවසානයේදී ගනුදෙනුව සිද්ධ වන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන වෙන කථා නේ අද කථා කළේ. ඒවා නිසා මේ වැදගත් කථා යට යනවා.

ඊ ළඟ ප්‍රශ්නය මේකයි. මේ ටෙන්ඩර් ක්‍රියාවලියේදී සමාගම් 10ක් ටෙන්ඩර් ඉල්ලුම් කරනවා. ඒකෙන් සමාගම් හයක් සුදුසුකම් ලබනවා. තාක්ෂණික ඇගැයීම් කමිටුවයි, කැබිනට් මණ්ඩලයයි ඒක තීරණය කරනවා. නමුත් මූල්‍ය යෝජනා ඉදිරිපත් කළාට පස්සේ උදා වුණේ වෙන තත්ත්වයක්. ඒක තමයි, ඉල්ලපු ගණනට වඩා -ඉදිරිපත් කරපු ගණනටත් වඩා- වැඩි ගණනක් ඒ අය මුදල් හැටියට බලාපොරොත්තු වුණ එක. ඒ අනුව ටොන් එකකට ඇමෙරිකන් ඩොලර් 126ක් බලාපොරොත්තු වෙනවා. ටොන්

එකකට ඇමෙරිකන් ඩොලර් 87ක් ඉල්ලපු කට්ටියත් ඉන්නවා. ටොන් එකකට ඇමෙරිකන් ඩොලර් 87ක් ඉල්ලපු කට්ටිය සිටියදී, ටොන් එකකට ඇමෙරිකන් ඩොලර් 126ක් ඉල්ලා තිබෙනවා, මූල්‍ය යෝජනාවේ! පුදුමය ඒක විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි අදියරේදී ගල් අහුරු සපයන්නේ ටොන් එකක් ඇමෙරිකන් ඩොලර් 144 ගණනේ. ඒ කියන්නේ කේවල් කිරීමෙන් පස්සේ අවසානයේදී ටෙන්ඩරය දීලා තිබෙන්නේ ටොන් එකක් ඩොලර් 89ට. ඊටත් වඩා අඩු මිල ගණන් දීපු අය ඉන්නවා. නමුත් විදුලිබල මණ්ඩලය මිලදී ගන්නේ ටොන් එකක් ඇමෙරිකන් ඩොලර් 144 ගණනේ. කල්පනා කරලා බලන්න මොන තරම් පාඩුවක්ද කියලා. මේ නිසා වෙන පාඩුව කාගෙන්ද දැන් අය කරන්නේ? ටෙන්ඩරයේ විවෘත කරන්නේ ගල් අහුරු ටොන් එකක් ඇමෙරිකන් ඩොරල් 88කට, 89කට ගන්න. ඇමෙරිකන් ඩොලර් 89ට දෙන ටොන් එකක් මිලදී ගන්නේ ඇමෙරිකන් ඩොලර් 144ට. මේ කැබිනට් පත්‍රිකාව ගැන ඇමතිතුමිය දන්නවා. ඔබතුමිය කියෙව්වා නම් මේක දකිනවා. අපට තිබෙන ප්‍රශ්නය මේවා පෙනෙන්නේ නැත්තේ ඇයි කියන එක. ලේකම්තුමන්ලා දෙන එකම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාම, අවසානයේ සිද්ධ වෙන පාඩුව ගෙවන්න වෙන්නේ මේ රටේ ජනතාවට. ඒ නිසා මේ ඉන්නේ නියම ආර්ථික ඝාතකයෝ තමයි. මේ අයගේ ආර්ථික ඝාතනය නිසා ඝාතනය වෙන්නේ බදු ගෙවන අහිංසක ජනතාව.

ඇමතිතුමිය පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවා, බිල ගෙව්වේ නැත්නම්, දින තුනක් ඇතුළත දැනුම් නොදී ලයිට් කපන්න. ඇත්තටම ඒ විදුලිය කපන්නේ විදුලි බිල ගෙවා ගන්න බැරි ජනතාවගේ. ඔබතුමන්ලා විදුලි බිල වැඩි කළා. ඒක නිසා ගෙවා ගන්න බැරි වෙනවා. ගෙවා ගන්න බැරි වෙන ඒ ජනතාවගේ විදුලිය නොදන්වා කපන්න අද සංශෝධන ගෙනෙනවා. හැබැයි, ඒ විදුලිබල මණ්ඩලයම ඩොලර් බිලියන ගණනක් රජයට පාඩු කරන ටෙන්ඩර් දානවා, ගල් අහුරු මිලදී ගන්න. නමුත් ඒ අමාත්‍යාංශ ලේකම්ලාට කිසිම කැපිල්ලක් නැහැ. ඒ අමාත්‍යාංශ ලේකම්ලා අදත් තවම හොඳට ඉන්නවා. තමන්ගේ කොම්පැනියට ටෙන්ඩරය ලැබෙන කල් මිල කේවල් කරනවා. ඇමතිතුමිය ගණන් හදලා බලන්න, මේ ගනුදෙනුව නිසා විතරක් ආණ්ඩුවට වෙච්ච පාඩුව රුපියල් බිලියන තුනක්. මේ ගනුදෙනුව නිසා විතරක් සිදු වෙච්ච පාඩුව බිලියන තුනකට වඩා වැඩියි. එතකොට මේ රටේ ජනතාව මොකද කරන්න ඕනෑ? ජනතාව ඔබතුමියන්ලාගේ මේ නාස්තිකාර වියදම් සහ දූෂණවලට ගෙවන්නත් ඕනෑ; ලයිට් කැපුවාට පස්සේ ඒකට ගෙවන්නත් ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නා විධියට කඩුවෙල ආසනයේ 38 පොළකම ලයිට් කැපුවා, මේ විධියට ඇවිල්ලා. ලයිට් බිල ගෙවා ගන්න බැරි නිසා 38 පොළකම ලයිට් කැපුවා. නැවත ඒ සම්බන්ධතාව ගත්තේ 12 දෙනයි. අනෙක් අයට ගන්න සල්ලි නැහැ. ඒ නිසා අද මිනිස්සු කළුවරේ ඉන්නවා. අද මිනිස්සු කළුවරේ ඉන්නවා, තමුන්නාන්සේලාගේ මේ නාස්තිකාර දූෂණ, අක්‍රමිකතා නිසා. ලංකාවේ විදුලිබල මණ්ඩල පහක් නැහැ. ලංකාවේ විදුලිබල මණ්ඩල තිබෙන්නේ එකයි. ඒකේ ඇමතිතුමිය ඔබතුමිය.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම අවසන් කරනවා. මම ඉල්ලීමක් කරනවා, පුත්තලමට මේ ගල් අහුරු මිලදී ගැනීම පිළිබඳව -මේ ටෙන්ඩරය පිළිබඳව- ඔබතුමිය මේ පාර්ලිමේන්තුවට විශේෂ ප්‍රකාශයක් කරන්න කියලා. අඩු තරමේ ඔබතුමියට ඒකෙන් සාධාරණයක් වෙයි. මේවාට ඔබතුමියගේ සම්බන්ධයක් නැහැ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඒ කාලයේ කියන්න තිබුණා නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කොයි කාලයේද?

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඔය ටෙන්ඩරය දාන වේලාවේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන කථා කරන්න තිබුණා නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ ටෙන්ඩරයේ අවසාන විවෘත කිරීම කරලා තිබෙන්නේ 2013 මැයි මාසයේ. මම කියන්නම්. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් කැබිනට් මණ්ඩලයට ඒ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කළේ 2013 මැයි මාසයේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඔය කියන ජාතියේ කැබිනට් පත්‍රිකාවක් නම් 2013 මැයි මාසයේ ඉදිරිපත් කළේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමිය දන්නේ නැහැයි කියන එක හරි ලේසියෙන් කියයි.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඔබතුමාට වැරදිලා. 2013 මැයි මාසයේ ඔය කියන ජාතියේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ නැහැ. එහෙම නම් මා ඉදිරිපත් කරන්න එපායැ. ඔබතුමාට වැරදිලා. පළමුවන කාරණය, 2013 ඔය කියන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා නෝවල් කියන සමාගමකට ගල් අහුරු ගෙන්වන්න දීලා නැහැ. මා ඇමති වෙලා ඉන්න කාලයේ කැබිනට් තීන්දුවකින් ගල් අහුරු ගෙන්වන්න කාටවත් ටෙන්ඩරයක් භාර දීලා නැහැ. ඔබතුමා කියන්නේ වැරැදි ප්‍රකාශයක්. ඔබතුමාට දීලා තිබෙන්නේ අසත්‍ය තොරතුරු. ඔය කියන කාරණාවල තිබෙන්නේ අසත්‍ය තොරතුරු.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳමයි. මේ ගනුදෙනුව පිළිබඳව මගේ අසත්‍ය තොරතුරු ඔබතුමිය නිවැරැදි කරන්න. පුත්තලම නොරොච්චෝලේ බලාගාරයට ගල් අහුරු මිල දී ගැනීමේ ගනුදෙනුවට මොන කොම්පැනිද ඉදිරිපත් වුණේ, මොන කොම්පැනියද අඩුම මිල දුන්නේ, මොන කොම්පැනියද තේරා ගත්තේ කියලා මෙම පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ඔබතුමා අසත්‍ය නේ කියන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමියට ඇත්ත කියන්න කියලායි මා කියන්නේ. මා කියන්නේ අසත්‍ය. ඔබතුමිය ඇත්ත කියන්න.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මේ අවුරුද්දේ මැයි මාසයේ ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවකින් කිසිම වෙලාවක ගල් අහුරු ගෙන්වන ටෙන්ඩරයක් කාටවත් දීලා නැහැ. ඉතින් ඔය නැති එකක් ගැන නේ ඔබතුමා කථා කරන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ විස්තර කියන්න කියලායි ඔබතුමියට කියන්නේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
කොළ ටිකක් අරගෙන ඇවිල්ලා බොරුවට නිකම් කථා කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමියගේ සම්බන්ධයක් නැහැ කියලා නේ කියන්නේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
කිසිම සත්‍ය තොරතුරක් නැහැ නේ. අසත්‍ය නේ කියන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේකට ඔබතුමියගේ සම්බන්ධයක් නැත්නම් ඔබතුමිය මේ සම්බන්ධයෙන් ඇත්ත කථාව කියන්න. එතකොට මගේ අසත්‍ය ප්‍රකාශය මා ඉල්ලා අස් කර ගන්නම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පෞද්ගලිකව මෙතුමිය වග කියන්න ඕනෑ නැති දෙයක් වෙන්න පුළුවන්. නමුත් මේවා මෙම ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්ටත් වඩා, මේ ආණ්ඩුව වහගෙන කන නිලධාරී මාෆියාවේ ඉන්න ප්‍රධාන අයගෙන් සිද්ධ වන දේවල්. නමුත් මෙම හානිවලට ඔබතුමියත් වග කියන්න ඕනෑ; මේ ආණ්ඩුවත් වග කියන්න ඕනෑ. පුළුවන් නම් මේකේ ඇත්ත, නැත්ත මේ පාර්ලිමේන්තුවට හෙළි කරන්න. ඒ සඳහා විශේෂයෙන්ම නොරොච්චෝලේ බලාගාරයට ගල් අහුරු මිල දී ගැනීම පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා නැවත වතාවක් ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.19]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Minister of Ports and Highways)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ ආරම්භ වුණු ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත අද දෙවන දවසේත් විවාදයට ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස මෙම පාර්ලිමේන්තුවේ ඓතිහාසික දවසක් බවට පත් වුණා. අද දවස මෙම පාර්ලිමේන්තුවේ ඓතිහාසික දවසක් බවට පත් වුණේ, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය කරන අතර තුර එක්සත් ජාතික පක්ෂයට දරුණු ලෙස විදුලි සැර වැදුණු නිසායි. පක්ෂයේ නායකතුමා -විපක්ෂ නායකතුමා- ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයන්ට, ඒ වාගේම පක්ෂ සාමාජිකයන්ට වැදුණේ, මා හිතන හැටියට 33,000 ධාරිතාවේ විදුලි සැරයි. සාමාන්‍යයෙන් වොට් 120, 240 නොවෙයි, high tension 33,000ක ධාරිතාවකින් යුත් විදුලි සැර වැදුණා කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෙඩා රෝහලටවත් ගෙන යන්න ඉතුරු වන්නේ නැහැ. සාමාන්‍යයෙන් ගෙදරක තිබෙන single phase විදුලි සැරක් වැදුණොත් බේරා ගන්න පුළුවන්. ළඟ තිබෙන පොල්ලකින් හෝ ගහලා බේරා ගන්න පුළුවන්කමක් තිබෙනවා. එවැනි සිදු වීමක් මීට පැය එකහමාරකට, පැය දෙකකට ඉස්සෙල්ලා මෙම පාර්ලිමේන්තුවේ සිද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මැතිතුමා අද එතුමාගේ මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වුණා. එතුමා මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වෙලා මෙම උත්තරීතර පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශය තුළින් එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා පක්ෂය ඇතුළේ ගෙන ගිය ක්‍රියාවලිය පිළිබඳව අපට අහන්න ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ක්‍රියාවලිය තුළින් අපට දැක ගන්න, අහගන්න ලැබුණේ මොනවාද?

පසු ගිය දවස්වල විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන, මේ රටේ යහ පාලනය ගැන කථා කරනවා අප අහගෙන හිටියා. පාර්ලිමේන්තුව නියෝජනය කරන ඒ පක්ෂයේ නොයෙකුත් මත දරන මන්ත්‍රීවරු මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙලා, මේ රට දවල්ටත් කළුවරේ තියනවාය කියා ජාත්‍යන්තරයට ගිහින් ප්‍රකාශ ඉදිරිපත් කරනවා අප බලාගෙන හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තමයි බළලා මල්ලෙන් එළියට පැන්නේ. එක්සත් ජාතික පක්ෂයේ ඒකාධිපති වියරුව, ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ මේ රටට වුණු හානි කර සිදුවීම් ඇතුළු සියලු දේවල් මේ උත්තරීතර සභාව තුළදී අද අපට අහන්නට ලැබුණා. 2008 දී රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා තමන්ගේ කණ්ඩායම එකතු කරලා, යුද්ධය පරදින විධිය ඒ අයට පෙන්වූවාය කියලා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේදී කියනවා අප අහගෙන සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රකාශයත් එක්ක විපක්ෂයේ කාර්ය භාරයේ බැරෑරුම්කම මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන් පිට, රටේ ජනතාවට ඇහෙනකොට, මේ රටේ

එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීපු අය මොනවාද කල්පනා කරන්නේ? අප ජාති ද්‍රෝහීන්ටයි ඡන්දය දීලා තිබෙන්නේ; අප ජාතිය විනාශ කරන අයටයි ඡන්දය දීලා තිබෙන්නේ; අප අපේම වීරෝදාර රණවිරුවාව මරණ මංචකයට ගෙනයන අයටයි අප ඡන්දය දීලා තිබෙන්නේ කියා හෙට වෙන කොට ගම්වල එක්සත් ජාතික පාක්ෂිකයෝ කෑ ගහලා කියාවි. ඒ පාක්ෂිකයෝ කෑ ගහලා කියන එක ආණ්ඩුව පැත්තේ ඉඳගෙන අප කිව්වා නම්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු ඒ කණ්ඩායම 2008 දී යුද්ධය පරදින විධිය- සැලසුම - හැදුවේ මේ විධියටයි කියා, ඒක ජනතාව විශ්වාස කරන එකක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙන්න, මේ මුළු රටටම ඇහෙන්න ඒක කියන කොට, එවැනි දෙයක් මේ එක්සත් ජාතික පක්ෂය ඇතුළේ ක්‍රියාත්මක වුණාය කියන එක මුළු රටම දැන ගන්නවා. ඒක සිද්ධ වෙලා තිබෙනවා.

"දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා" කියන්නේ, එක්සත් ජාතික පක්ෂයට ආදරය කළ, ප්‍රබල, පක්ෂය වෙනුවෙන් කකුල් දෙකම එක තැන තියාගෙන හිටපු, පක්ෂයේ සිටියදී ආණ්ඩුව දැඩි ලෙස විවේචනය කළ, එක්සත් ජාතික පක්ෂයට අවශ්‍ය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. අප ඒක කියනවා. අප අතර ප්‍රශ්න තිබුණා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් එක්ක දැඩි ලෙස විවාදයට එක් වුණු ඇමතිවරයෙක් හැටියට මා කියනවා, අපට ප්‍රශ්න තිබුණාය කියන එක. හැබැයි මා එතුමාට ගරු කරනවා. ඔහු ඉන්න තැන කකුල් දෙක හරියට තියාගෙන සිටියා. ඔහු එක්සත් ජාතික පක්ෂයේ ඉන්නකොට තමන්ගේ පක්ෂයට ආදරය කළා. තමන්ගේ පක්ෂය රකින්න, ඒ පක්ෂය ඇතුළේ තිබෙන ක්‍රමවේදයන් පාවිච්චි කරමින් ඉදිරියට යන්න හැදුවා. නමුත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඒකට ඉඩක් ලැබුණේ නැහැ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අද තමා සිටි එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා අස් වෙලා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සමඟ, එක්සත් ජනතා නිදහස් සන්ධානය සමඟ, ඔහු හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ නැවත අත්වැල් බැඳගෙන තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒ ප්‍රකාශය කරනකොට එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු එතුමාගේ කථාවට බාධා කළා මා බලාගෙන සිටියා.

මේ බාධාව තුළ මම මෙන්න මෙහෙම දෙයක් දකිනවා. එක්සත් ජාතික පක්ෂයි කියන්නේ ඉතිහාසයේ සිටි ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන වැනි ප්‍රබල නායකයන් හදපු ප්‍රබල පක්ෂයක්. මේ පක්ෂය දැඩි ලෙස පොළොවට බද්ධ වුණු බුරුත, නැදුන්, මාර වැනි මහා පතාක ගස් තිබෙන, රටේ පොළොවට දැඩි ලෙස ආකර්ෂණය වුණු මහා ඝන වනාන්තරයක් හා සමානයි. එවැනි පක්ෂයක් තමයි ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක වැනි අය එක්සත් ජාතික පක්ෂය කියලා නිර්මාණය කර තිබුණේ. වර්තමාන විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ පක්ෂයේ මහා පොළොවට බද්ධ වෙලා තිබුණු අර මහා ප්‍රබල ගස් ටික ටික කපන්න ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා ඒ වනාන්තරයේ තිබුණු මහා මාර ගස් කැපුවා; මහා පලු ගස් කැපුවා; කළුවර ගස් කැපුවා. එහෙම කපලා කපලා මේ වනාන්තරය ටික ටික විනාශ කර දැම්මා. එතුමා එහෙම කපලා අයින් කරපු ගස් තමයි අද ආණ්ඩුව පැත්තට ඇවිත් තමන්ගේ දේශපාලන දර්ශනය අරගෙන යන්නේ.

දැන් මේ කැලෑව කපන කොට, මේ මහා වීර, පලු, නැදුන්, කළුවර ගස් නැති වෙන කොට මේ වනාන්තරයට නැවත වගාවක් දමන්න ඕනෑ. විපක්ෂ නායකතුමා නැවත මේකට වගාවක් දමනවා; මේ වනාන්තරයේ නැවත ගස් වර්ගයක් හිටවනවා. ඒ හිටවපු ගස් වර්ගය මොකක්ද? අර තිබුණු මාර ගස් වෙනුවට, පොළොවට බද්ධ වෙලා තිබුණු විශාල ගස් වෙනුවට දැන් එතුමා ලන්සි පැපොල් වවනවා. අර මහා කැලෑවක -ඝන වනාන්තරයක- තිබුණු ඒ ගස් ටික අයින් කර දමලා දැන් එතුමා ලන්සි පැපොල් වවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලන්සි පැපොල් ගස්වල කවදාවත් ගෙඩි හැදෙන්නේ නැහැ. ලන්සි පැපොල් ගහ ලොකුයි; පෙනුම රතුයි. නමුත් ගෙඩි නැහැ. අන්න එවැනි ලන්සි පැපොල් වගාවක් තමයි එතුමා දමලා තිබෙන්නේ. එතුමාගේ අත් දෙකෙන්ම හිටවලා, පොහොර දමලා, වතුර දමලා හදපු ඒ ලන්සි පැපොල් ගස් හා සමාන මන්ත්‍රීවරු තමයි අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන කොට, එතුමාට විරෝධය පෑවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විතරයි මෙතැන කථා කළේ. නමුත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරපු හඬ ඇතුළේ තවත් මන්ත්‍රීවරු ගණනාවකගේ හඬ තිබුණු බව මේ උත්තරීතර පාර්ලිමේන්තුවට, අපට දැන ගන්න ලැබුණා කියන කාරණයත් අප කියන්න ඕනෑ. ඔවුන් කථා කරන්න බයයි. කථා කළොත් ඔවුන්ට හිමි වන්නේ විනය පරීක්ෂණයයි. කථා කළොත් ඔවුන්ගේ ආසන සංවිධායකකම බිල්ලට දෙන්න වෙනවා. කථා කළොත් කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් එළියට බහින්න වෙනවා. කථා කළොත් ඔවුන්ට එක්සත් ජාතික පක්ෂයෙන් නැවත ඔවුන්ගේ දේශපාලන අනාගතය අහිමි කර ගන්න වෙනවා. කථා නොකර ඉන්න අය හොඳයි. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමන්ලා වාගේ ඕනෑ වෙලාවක බුදියාගෙන ඉන්න ගන්න අයට කිසිම ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. එතුමා මෙහෙත් බුදි; ගෙදරත් බුදි; පක්ෂයේත් බුදි. එවැනි අයට ඕනෑ වෙලාවක මේ පක්ෂය හොඳයි. ලන්සි පැපොල් ගස් හැදෙන කොට, ඒ ගස් අස්සේ මේ වාගේ චරිතත් තිබෙන්න ඕනෑ. ඇතුළේ බෙන තිබෙන, එවැනි ගසුත් එකක් දෙකක් හරි පක්ෂය ඇතුළේ තවම ඉතිරිව තිබෙනවා.

අද මේ පක්ෂය ඒ අවසන් ගමන් යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒ තත්ත්වය අද උදා වෙලා තිබෙනවා. අද රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා මහා ලොකුවට කථා කළා. මම නම කියලාම සඳහන් කරන්නම්. ඒ වාගේම හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අද කථා කළා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පක්ෂයෙන් ගියාට පසුව අද ඔහුගේ ඉතිහාසය ගැන මතක් කරලා එතුමන්ලා කථා කරනවා. අපි ඒ මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමැතියි, තමුන්නාන්සේලාටත් තව නොබෝ දවසකින් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගත්තු ක්‍රියා මාර්ගයම ගන්න සිදු වෙනවා කියලා. ඒ, තරුණ ජීවිත නිසා. තරුණයන් වශයෙන් දේශපාලන අනාගතයකට උරුමකම් කියනවා නම්, දේශපාලනයේ දී තමන් බලාපොරොත්තු වන්නේ ජනතා සේවයක් කරන්න නම්, මේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගත් ක්‍රියා මාර්ගයම ඔවුන්ටත් අනුගමනය කරන්නට සිදු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නොවෙයි නම්, කවුරුන් හෝ එම පක්ෂය තුළම රැඳී සිටිනවා නම්, ඒක ඔහුගේ පෞද්ගලික මතවාදයක් අනුව වන්නට පුළුවන්. සමහර වෙලාවට තමන්ගේ නායකතුමාත් එක්ක ගනු දෙනුවල රැඳී සිටිනවා වන්නට පුළුවන්. තමන්ගේ නායකයාත් එක්ක විශ්වසනීය ලෙස රැඳී සිටිනවා වන්නට පුළුවන්. හැබැයි, දේශපාලනික වශයෙන් ජනතා සේවයක් කරන්නට බැරි වෙයි, නායකයාට සේවයක් කරන්නට පුළුවන් වෙයි. ඒක තමයි අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගෙන් අපට අහන්නට ලැබුණු ඒ හඬ තුළින් ක්‍රියාත්මක වුණේ කියන එක මතක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අද මේ ක්‍රියාවලිය සිදුවීමත් එක්කම අපි ඉදිරි පළාත් සභා මැතිවරණ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

තුනකට මුහුණ දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වයඹ පළාත් සභා මැතිවරණයට මුහුණ දෙනවා, ඒ වාගේම මධ්‍යම පළාත් සභා මැතිවරණයට අපි මුහුණ දෙනවා, උතුරු පළාත් සභා මැතිවරණයට අපි මුහුණ දෙනවා. ඒ පළාත් සභා මැතිවරණවලට අද මේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාගේ නායකත්වය තුළ එම කණ්ඩායමත් මුහුණ දෙනවා. අද මේ පාර්ලිමේන්තු විවාදයේ දී අපි අභියෝගයක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම අභියෝග තමයි, දැනට මධ්‍යම පළාත් සභාවේ, වයඹ පළාත් සභාවේ, තමන්ගේ සිටින මන්ත්‍රී සංඛ්‍යාවවත් බේරා ගන්න එක්සත් ජාතික පක්ෂයට පුළුවන්කමක් තිබේද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වයඹ සහ මධ්‍යම පළාත් සභාවේ සිටින එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් හරියටම තවත් සියයට 40ක් අපි අඩු කරලා, එක්සත් ජනතා නිදහස් සන්ධානය අති විශිෂ්ට ජයග්‍රහණයක් මේ පළාත් සභාව තුළ ලබනවාය කියලා අපි කියනවා. ඒක නවත්වන්නට කිසි කෙනෙකුට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා අවසාන වශයෙන් මේ කාරණය ගැනත් මතක් කරන්නට ඕනෑ. මේ එක්සත් ජාතික පක්ෂයේ කඩා වැටීමට හේතු සාධක අද අපට අහන්නට ලැබුණා. ඒ වාගේම මේ රටේ විපක්ෂයකුත් තිබිය යුතුයි. කොන්ද පණ තිබෙන විපක්ෂයක් තිබිය යුතුයි. ඒ විපක්ෂය අද එහෙමපිටින්ම කැලිවලට කැඩිලා විනාශ වෙලා ගිහිල්ලා තිබෙනවා. මා මේ ළඟදී හොඳ කථාවක් ඇහුවා. මම ඒක කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක තාත්තා කෙනෙක් පොඩි දරුවෙකුව අරගෙන පාරේ යනකොට ඒ තාත්තා දැක්කා ලු, එක තැනක රැස්වීමක් පැවැත්වෙනවා. මේ තාත්තා දැක්කා ලු, කොළ පාට කොඩි දමලා, ඒ ස්ථානයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් රැස්වීමක් පවත්වනවා. අර පොඩි පුතා ඇහුවා ලු, "තාත්තේ අර මොකක්ද තිබෙන්නේ?" කියලා. තාත්තා කිව්වා ලු, "අනේ! පුතේ, මගේ පුතා මේක අහපු එකට මට හරිම සතුටුයි. මගේ පුතාගේ වයස දැන් අවුරුදු 10යි. බලාගන්න පුතේ, මේ තමයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙක්." කියලා "මේක දැන්ම බලාගන්න පුතේ, තව අවුරුදු 10ක් යනකොට මේ පක්ෂය වඳවෙලා ගිය පක්ෂයක් වෙනවා. ඊට පසුව මේක කෞතුකාගාරයේවත් දකින්න ලැබෙන්නේ නැහැ. අන්න ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු දකින්නට ඕනෑ නම්, එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන කෙනෙක් දකින්නට ඕනෑ නම් දැන්ම බලාගන්න පුතේ, ආයෙත් ජීවිතයට බලාගන්න ලැබෙන්නේ නැහැ, උපරිම කාලය අවුරුදු 10යි" කියලා කිව්වා ලු. එක්සත් ජාතික පක්ෂයට ඒ ඉරණම අත් වෙනවා. ඒ ඉරණම අත්වන බවට අද දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පළමු වැනි සංඥාව දුන්නා. ඒ ඉරණම අත්වනකොට "නායකයා හොඳයි, ඔබ නිසා මල් පිපෙනවා, ඔබ නිසා පක්ෂයට ලොකු ගෞරවයක් තිබෙනවා" කියමින් මෙතැන ඉඳගෙන තප්පුලන අයටත් කවදා හරි දවසක අපිට කථා කරලා, රටම ආදරය කරන අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක එකතු වන්නට සිදු වනවාය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 4.36]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් විදුලි ක්ෂේත්‍රයේ ඇති යම් යම් අඩු පාඩුකම් ශක්තිමත් කිරීමට පියවර ගැනීම ගැන මම ස්තුතිවන්ත වනවා. 2002 දී ඉදිරිපත් කළ පනතක් අවුරුදු දහයකට පසුව, අද - 2013 දී -විදුලිබල ක්ෂේත්‍රයේ ඇති විවිධ වෙනස්කම් හේතුවෙන්, කාලානුරූපව වෙනස් කිරීමට අවශ්‍ය බවටත් මම පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලය, හිරු එළිය වගේම ජන ජීවිතයට විදුලි බලයත් ඉතාම අවශ්‍ය දෙයක්. ඒ නිසා ලෝකයේ සෑම රටකම විදුලි බලය සම්බන්ධයෙන් විශාල ඕනෑකමක්, උනන්දුවක් තිබෙනවා. විශේෂයෙන්ම දියුණු රටවල සෑම කෙනෙකුටම - සියයට 99කට සියයට 100කට- වාගේ විදුලිය ලැබෙනවා.

මේ ළඟදී විදුලි මිලේ වැඩි වීමක් සිදු වුණා. අනෙක් රටවල් සමඟ සංසන්දනය කරන කොට අපේ රටේ තමයි විදුලි ගාස්තු හුඟක්ම ඉහළ මට්ටමක තිබෙන්නේ. මේ සඳහා වන හේතු සාධක අපි සොයා ගත යුතුයි. මේ විදුලිබල මණ්ඩල පාලනය කිරීමේදී ලෝකයේ පවතින නවීන ක්‍රමවේද උපයෝගි කර ගැනීම සාමාන්‍ය සිරිතක්. මේ අනුව මට මතකයි, 2002 දී අපට සිදු වුණා, 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත ඉදිරිපත් කරන්න. මේ පනත ගැන කථා කරන කොට අපේ ලලිත් දිසානායක මැතිතුමාත් සඳහන් කළා, මේක මේ යූඑන්පී ආණ්ඩුවෙන් ගෙනා පනතක් කියලා. මම මෙතැනදී යම් කිසි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මේ පනත අපි ගෙනාපු එක ඇත්ත. නමුත් මේ පනත එහෙම පිටින්ම යෝජනා කළේ, අනුමත කළේ එදා තිබුණු පොදුජන පෙරමුණු රජයයි. නමුත් විවිධ හේතූන් නිසා මේ පනත ඉදිරිපත් කිරීම ප්‍රමාද වුණා. අපට මේ පනත ගෙනෙන්නට සිදු වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා එක්සත් ජාතික පෙරමුණු රජය භාර ගත්තේ පැය අටක විදුලි කප්පාදුවත් සමඟ වීම නිසයි. ඒ තත්ත්වය තුළ අපට කඩිනම් පියවර ගැනීමට සිදු වුණා, විදුලි බලය සැපයීම ඉක්මන් කිරීමට. ඒ නිසා මේ පනත ඉදිරිපත් කිරීමේදී අපට විශාල සහයෝගයක් ලැබුණා, ආසියානු සංවර්ධන බැංකුවෙනුත්, ජෙබික් ආයතනයෙනුත්. එම ආයතන දෙක එකතු වෙලා ඩොලර් මිලියන 120ක් ඉතාමත්ම සහනදායී කොන්දේසි පිට -මට මතක විධියට අවුරුදු 40කින් ගෙවන ආකාරයට- එදා විදුලිබල මණ්ඩලයට ලබා දීමට ඒ අය පොරොන්දු වුණා. මොකද, ඒ අයට දැනුණා, අප දරන අවංක උත්සාහය. ඒ නිසා තමයි අපි 2002 දී මේ පනත තුළින් අපි යෝජනා කළේ, ලෝකයේ අනෙක් දියුණු රටවල් කරන ආකාරයට, යුරෝපයේ සෑම රටක්ම කරන ආකාරයට, ප්‍රතිසංවිධානය -මේකට කියන්නේ unbundling කියලා.- කරන්න. එසේ unbundling කර ක්‍රියාත්මක වන්නේ අපි අනුගමනය කරන්නට බලාපොරොත්තු වුණු ක්‍රමවේදයමයි. වෙන එකක් තියා කොමියුනිස්ට් චීන රජයේත් මේ විධියට තමයි විදුලි බලය නිෂ්පාදනය කරන්නේ.

ඒ අවස්ථාවේදී මේ පනත තුළින් අපි යෝජනා කළා, විදුලි බලය බෙදා හැරීම තුන් ආකාරයකින් ප්‍රතිසංවිධානය කිරීමට. පළමුවෙන්ම ජනනය -generation- එක් ආයතනයක් වශයෙනුත්, සම්ප්‍රේෂණය -transmission- තවත් ආයතනයක් වශයෙනුත්, බෙදා හැරීම -distribution- තව ආයතනයක් වශයෙනුත් ආයතන තුනකට බෙදලා, සමාගම් පහක් ඒ තුළින් අපි ඇති කළා. ඒ සෑම ආයතනයක්ම ලාභ උපදවන ආයතන - profit centres -වශයෙන් තමයි අපි එදා යෝජනා කළේ.

ඉතිහාසය දෙස ආපසු හැරිලා බලන කොට මට මතකයි, ඒ පනත් කෙටුම්පත මුලින්ම ඉදිරිපත් කළ අවස්ථාවේදී විවිධ චෝදනා ආ බව. සමහරු කිව්වා, එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශයට වෙළෙඳාම් කරන්න කරන උත්සාහයක් කියලා. තදබල විරෝධතා ආවා. එදා අදාළ අමාත්‍යවරයා වශයෙන් මට මතකයි, ඒ අවස්ථාවේදී විපක්ෂයෙන් ඉදිරිපත් කළ බොහෝ යෝජනා. මට මේ අවස්ථාවේදී මතක් වෙනවා, අපේ දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා වාගේ අය විවිධ වටිනා යෝජනා ඉදිරිපත් කළ බව. ඒ සියලු දේම අපි ඇතුළත් කළා.

ඒ වාගේම මම සඳහන් කරන්නට ඕනෑ, පෞද්ගලීකරණ බිය ඒ දවස්වල බොහෝ දෙනෙකුට තිබුණු බව. වෙන එකක් තියා එක්සත් ජාතික පෙරමුණු රජය සීගිරි කන්දත් විකුණන්න හදනවා

කියලා චෝදනා කළා. කිසිම අවස්ථාවක එක්සත් ජාතික පක්ෂ රජයට විදුලිබල මණ්ඩලය විකිණීමේ අදහසක් තිබුණේ නැහැ.

ඒ නිසා අපට පුළුවන් වුණා, එදා තිබුණු වෘත්තීය සමිති බොහොමයකට කරුණු පැහැදිලි කරලා දෙන්න. ඒ අය ඒක පිළිගත්තා; ඒ විශ්වාසය ඇති වුණා. ඒ වාගේම අපට ලැබුණු ඒ ආධාර තුළ අපට පුළුවන් වුණා, එදා විදුලිබල මණ්ඩලයේ තිබුණු අඩු පාඩු දිහා බලලා ඒක දියුණු කරන්න. මට මතකයි, පැය 8ක විදුලි කප්පාදුව තිබුණු අවස්ථාවේ මෙගාවොට් 150ක් ජනනය කරන GT7 කියන යන්ත්‍රය අක්‍රිය වෙලා තිබුණා. අපි විශේෂ නියෝජිතයෝ ඉතාලියට යවලා වහාම ඒක ක්‍රියාත්මක කරන්න කටයුතු කළා.

ඒ වාගේම එදා අවශ්‍ය ජනන යන්ත්‍ර ගන්න බැරිව කුකුලේ ගහ ව්‍යාපෘතියේ වැඩ එහෙම පිටින්ම නැවතිලා තිබුණා. අපට ඒ අවස්ථාවේදී පුළුවන් වුණා ඉතාමත් ඉක්මනින් ඒ යන්ත්‍ර ඔස්ට්‍රියාවෙන් ලබා ගන්න. ඒ වාගේම එදා අවශ්‍ය මුදල් ලබා ගන්න බැරි වූ නිසා ඉහළ කොත්මලේ ව්‍යාපෘතිය නැවතිලා තිබුණා. අපට පුළුවන් වුණා ජපන් රජයෙන් ඉතාමත්ම සහන කොන්දේසි මත ඒ මුදල් ලබා ගන්න. අපි ඒ වැඩ කටයුතු ආරම්භ කළා. මොකද, වැරදි මතයක් තිබෙනවා මේක අපි ආරම්භ කළේ නැහැ කියලා. ඒ අවස්ථාවේ අපට විවිධ බාධක ඇති වුණා. අපේ හවුල් ආණ්ඩුවේ සිටි එක් අමාත්‍යවරයෙක් ඒකට විරුද්ධ වුණා. නමුත් අපි ඒ වැඩ කටයුතු හෙමින් හෙමින් නොකඩවා කර ගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මට මතකයි, අපි පෞද්ගලික අංශයෙන් විදුලිය ගන්න විට යම් කිසි විනිවිද භාවයක් ඇති කළ බව. කිසිම විධියකට ඇඟිලි ගැසීමක් සිදු කළේ නැහැ. ඒ වාගේම විශේෂ කමිටුවක් මඟින් භාණ්ඩාගාරය හරහා තමයි අපි ඒ විදුලිය ලබා ගත්තේ. ඒ වාගේම නොරොච්චෝලේ විදුලි බලාගාරය සම්බන්ධයෙන් එදා විවිධ මත තිබුණා. අපට පුළුවන් වුණා නොරොච්චෝලේ තිබුණු ප්‍රශ්න තේරුම් ගන්න. ඒ අනුව අපි ත්‍රිකුණාමලය සහ හම්බන්තොට ප්‍රදේශ ගැනත් බැලුවා. ත්‍රිකුණාමලයත්, හම්බන්තොටත් විදුලි බලාගාර හදන්න අපි සොයා බලායි තිබුණේ. ඒ වාගේම මට මතකයි, ඒ අවස්ථාවේදී ඒ සඳහා අවශ්‍ය මුදල් JEBIC සහ ආසියානු සංවර්ධන මණ්ඩලයෙන් අපට ලබා ගන්න පුළුවන් වුණු බව.

මේ අවස්ථාවේදී අපි සඳහන් කරන්නේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම කාලෝචිත බවයි. ඒ ගැන අපේ කිසිම විවේචනයක් නැහැ. කාලානුරූපව මේවා වෙනස් වන්න ඕනෑ. විදුලි ක්ෂේත්‍රයේ කළමනාකාරිත්වය වෙනස් වන විට, ක්‍රමවේදය වෙනස් වන විට ඒ අනුව ඒ කටයුතුත් වෙනස් විය යුතුයි. එසේ කියන ගමන්ම අපි සඳහන් කරනවා, විදුලිබල මණ්ඩලයේ කළමනාකරණයේදී යම් කිසි විනිවිද භාවයක් ඇති විය යුතුයි කියලා. විනිවිද භාවය ගැන කථා කරන විට මම සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අපට මතකයි, එදා හිටපු අමාත්‍යවරයාත් මේ සම්බන්ධයෙන් විශාල ලෙස ඒ විනිවිද භාවය අපට පෙන්වූ බව. ඒ වාගේම 2013 ජල විදුලි ජනනය සම්බන්ධයෙන් ලැබූ ලාභයත් විදුලි මිල වැඩි කිරීමෙන් ලැබූ ලාභයත් ප්‍රයෝජනයට ගෙන විදුලි මිල අඩු කරන්න පුළුවන් කියලා අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා සඳහන් කරනවා මම අහ ගෙන හිටියා. ඒ නිසා මම නැවතත් ඒ කරුණු කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කොත්මලේ සහ වික්ටෝරියා බලාගාර නඩත්තු කිරීම සඳහා වසා දැමීම තුළ යම් කිසි පාඩුවක් සිදු වුණා කියලා අපි දන්නවා. මොකද, චතුර පිටාර ගලන අවස්ථාවේදී වසා දැමීම සුදුසු ක්‍රියාවක් විධියට අපි දකින්නේ නැහැ. ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරයට ගල් අඟුරු ලබා ගැනීමේදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව යනවා කියලා පුවත්පත්වල වාර්තා වෙලා තිබුණා අපි දැක්කා. ඒ කරුණු ගැන අපි දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. යම් කිසි විධියකින් විනිවිද භාවයක් තිබෙනවා නම්, අපි විශ්වාස කරනවා ඒක මේ විදුලි බල ක්ෂේත්‍රයට විශාල පිටුවහලක් වෙනවා කියලා. ඒ නිසා අපි බලාපොරොත්තු වන්නේත්, එදා අපේ රජය බලාපොරොත්තු වුණේත් මේ රටේ ජනතාවට අවුරුදු 6ක කාලයක් තුළ විදුලි බලය ලබා දෙන්නයි. දැනට ඉහළ විදුලි බිලක් අය කිරීම සම්බන්ධයෙන් අපිත් කම්පා වෙනවා. මේ සම්බන්ධයෙන් අපි ආපසු හැරිලා බලලා, යම් කිසි විධියකින් ජනතාවට සහනයක් දෙන්න ක්‍රියා කරන්න පුළුවන් නම් ඒක ඉතාමත්ම වටිනා දෙයක් වශයෙන් මම දකිනවා. තවත් කථා කිරීමට ඇතත්, මගේ කථාව සීමා කරනවා. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 4.46]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය, ශ්‍රී ලංකා විදුලිබල පනතට කරනු ලබන සංශෝධන පිළිබඳ සාකච්ඡා කරන වෙලාව. අද අප බලාපොරොත්තු වුණේ මේ පනත සංශෝධනය කිරීම ගැන කථා කරන්නයි. නමුත් අද දවල් පාර්ලිමේන්තුවේ සිද්ධ වූ විශේෂ කාරණයක් නිසා වැඩි දෙනකුගේ අවධානයත්, ඒ වාගේම ප්‍රමුඛතාවත් ඒ කාරණයට දෙන්න යෙදුණා. කෙසේ නමුත් ආපසු මාතෘකාවට ඇවිත් අදට නියමිත, ශ්‍රී ලංකා විදුලිබල පනතට ගෙනෙන සංශෝධන සම්බන්ධව අදහස් කීපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

අපේ කරු ජයසූරිය හිටපු ඇමතිතුමා කිව්වා වාගේ, ශ්‍රී ලංකා විදුලිබල පනත ගැන 2002 දී තමයි පළමුවෙන් සාකච්ඡා වුණේ. ඒ කාලයේ ලොකු මතයක් තිබුණා ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කිරීම සඳහා සකස් වූ වැඩ පිළිවෙළක් තමයි මේ පනත හරහා ක්‍රියාත්මක වන්නේ කියලා. මෙය අවුරුදු හතක් පමණ නොයෙක් වාද විවාදවලට භාජනය වුණා. මා විදුලිබල හා බලශක්ති ඇමතිවරයාව සිටි කාලයේ නොයෙක් විධියේ සාකච්ඡා කරලා අපට පුළුවන්කම ලැබුණා 2009 දී මෙය සම්මත කරන්න; එය මේ රටේ නීතියක් බවට පත් කරන්න. මම සන්තෝෂ වෙනවා ඒ වෙලාවේ කරු ජයසූරිය මහත්මයාත් අපේ ආණ්ඩුවේ ඇමතිවරයකු වශයෙන් ඒ අනුකමිටුවකට පත් වීම ගැන. මෙහි තිබෙන යම් යම් අඩු පාඩු ගැන සමීක්ෂණයක් කරලා, විශේෂ වාර්තාවක් ඉදිරිපත් කරලා ඒ ආණ්ඩුවේ සියලු කොටස්කාර පක්ෂවල සහයෝගය ලබා ගෙන ඒ කටයුත්ත කරන්න අපට පුළුවන්කම ලැබුණා. එතැනදී සමහර පක්ෂ කරපු යෝජනාත් මේ පනතේ විධිවිධාන වශයෙන් ඇතුළත් කළා. ඒ යෝජනා අද මේ පනතේ විධිවිධාන වශයෙන් ක්‍රියාත්මක වන විට යම් යම් අඩු පාඩු තිබෙන බව අපට පෙනෙනවා. ඒ අඩු පාඩු සකස් කරන්න, ඒ වාගේම ඒ පනත පසු ගිය අවුරුදු කීපය තුළ ක්‍රියාත්මක කිරීමේදී අප දැකපු පසු බෑම් නිවැරැදි කරන්න තමයි මේ සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ. මෙතෙක් අප මුහුණ දීපු ගැටලුවක්, දුර්වලතාවක් තමයි, ගමේ ගොඩේ විදුලි ව්‍යාපෘතියක් කරන කොට, විදුලි රැහැනක් අදින කොට ඇති වන ආරාවුල් -විදුලි කණු සිටුවීමේදී, ගස් කොළන් කැපීමේදී ඇති වන ආරාවුල්- විසඳීම සඳහා පසු ගිය විදුලිබල මණ්ඩල පනතේ තිබුණු විධිවිධාන අහිමි වීම. ඒ විධිවිධාන ඉවත් වෙලා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ සම්බන්ධයෙන් තිබුණු බලතල අහිමි වීම නිසා ඒ ප්‍රශ්න ඉක්මනින්, කාර්යක්ෂමව විසඳීමට තිබුණු ඉඩකඩ අහිමි වෙලා තිබුණා. නමුත් අද නැවත වරක් මේ සංශෝධනවලින් ඒවා ස්ථාපිත කරන්න කටයුතු යෙදිලා තිබෙනවා. ඒක ඉතාම හොඳයි. ඒ වාගේම, මේ පනත මඟින් වඩා කාර්යක්ෂමතාවක් ඇති කරන්න, පසු බෑමට ලක් වෙලා තිබුණු යම් යම් ක්ෂේත්‍ර ඒ පසු බෑම්වලින් මුදා ගන්න මේ සංශෝධන සමත් වේවි කියලා මම බලාපොරොත්තු වෙනවා.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවල් මේ විවාදයේදී කථා කරපු සජිත් ප්‍රේමදාස මහත්මයා බරපතළ චෝදනාවක් කළා, අද ලංකා විදුලිබල මණ්ඩලයට විශාල ආදායමක් ලැබෙනවා, මේ ආදායම ලැබෙද්දී විදුලිය බිල සම්බන්ධයෙන් ජනතාවට තවත් බර පටවලා තිබෙනවා, ඒ බරින් ජනතාව නිදහස් කරන්න ලංකා විදුලිබල මණ්ඩලයට පුළුවන් කියලා. පසු ගිය මාස තුනහතරේදී ලැබුණු වර්ෂාව නිසා ජලය උපයෝගි කරගෙන විදුලිය නිපදවන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒක ආශීර්වාදයක්. එය මේ වර විතරක් නොවෙයි, 2010 දීත්, 2011 දීත් සිද්ධ වුණා. 2010 දීත්, 2011 දීත් අඛණ්ඩව වර්ෂාව ලැබීම නිසා ජලය උපයෝගි කරගෙන විශාල වශයෙන් විදුලිය නිපදවලා අපේම සමහර අය කියන්න පටන් ගත්තා, "අපි දැන් ලංකා විදුලිබල මණ්ඩලය ලාභදායක තත්ත්වයට පත් කළා" කියලා. ඒ විතරක් නොවෙයි. "ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ගෙවන්න මීට පස්සේ අපට භාණ්ඩාගාරයේ සල්ලි ඕනෑ නැහැ, අප ලබන ආදායම මීට පස්සේ සෑහෙනවා, අපට පුළුවන්කම ලැබුණා ලංකා විදුලිබල මණ්ඩලය ලාභදායක ආයතනයක් බවට පරිවර්තනය කරන්න" කියලා යම් යම් අය ප්‍රකාශ කළා. නමුත් මා කියන්න ඕනෑ 2012 වෙන කොට රට පුරාම විශාල නියඟයක් ඇති වෙලා 2010, 2011 වාන් දැමූ තත්ත්වයට පත් වූ ජලාශ හිඳුණාම ඊට පස්සේ ඉන්ධන පාවිච්චි කරලා විදුලිය නිපදවන්න අපට සිද්ධ වූ බව. ඒ ඉන්ධනවල මිල වැඩි වීම නිසා කිසිම දවසක මුහුණ නොපාපු විධියේ විශාල ණය බරකට ලංකා විදුලිබල මණ්ඩලය පත් වුණා. ඒ නිසා තාවකාලිකව ලැබෙන මේ වර්ෂාව හේතුවෙන් අපේ විදුලිබල මණ්ඩලය දැනට ලබන ආදායම හැම දාම ලැබේවි කියලා අපට හිතන්න බැහැ. හැම දාම මේ වර්ෂාව මේ විධියට පවතින්නේ නැහැ. අපේ රටේ, අපේ අත් දැකීම්වලින් අපි දන්නවා, ඒ වාගේම පසු ගිය සිදුවීම්වලින් අපි දන්නවා කාලයක් වහිනවා, කාලයක් පායනවා කියලා. සමහර විට, පායන කාලය වැඩියි.

2010 දී වැස්සා. 2011 මුල් කාලයේදී වැස්සා. 2011 මැද භාගයේ ඉඳලා 2012 අග වනතෙක්ම විශාල වශයෙන් නියඟ කාලයක් තිබුණා. ඒ නිසා කෙටි කාලීනව තීන්දු අරගෙන කටයුතු කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එය මම පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, විරුද්ධ පක්ෂය හැම දාම කියන කථාවක් තමයි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය බාල මැෂින් ගෙනැල්ලා, අසතුටුදායක විධියට සකස් කළ බලාගාරයක්ය කියන එක. මම දන්නේ නැහැ, එහෙම කියන්න හේතුව මොකක්ද කියලා. මට හිතෙන විධියට නම් මෙතැනදී එක්සත් ජාතික පක්ෂය කියන ඒ කථාව උඩඟු නරියාගේ කථාවට තමයි සමාන කරන්න පුළුවන් වෙන්නේ. මොකද, ඒ ගොල්ලන් 1982 ඉඳලා මේ බලාගාරය ක්‍රියාත්මක කරන්න හදලා ඒ ගොල්ලන්ට ඒක කරන්න බැරි වුණා; අසාර්ථක වුණා. කරු ජයසූරිය මහත්මයා පෞද්ගලිකවම මට ඒක කිව්වා. එතුමා ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ ඒක ගොඩ නහා ක්‍රියාත්මක කරන්න කටයුතු කරද්දී පක්ෂය තුළින්ම බාධක ආවාය කියා එතුමා කිව්වා. පක්ෂයේම සමහර අය ඒ කාරණයේදී එතුමාගේ කකුලෙන් ඇද්දාය කිව්වා. එතුමා ඒක හදන එක ගැන යම් යම් අය ඊර්ෂ්‍යා කළාය, ඒ නිසා ඒක හදන්න දුන්නේ නැහැ කියා එතුමා කිව්වා. අපි ඒ බලාගාරය හදනකොට එතුමාට කනගාටුවක් දැනෙන්න ඇති, "මා කළ යුතුව තිබුණු දෙය අද මේ ආණ්ඩුවෙන් කරනවා" කියා. ඒ වාගේ තත්ත්වයක් තමයි තිබුණේ. අද අපි මේ බලාගාරය හදලා ප්‍රතිඵල ලබනකොට මේ සංකල්පයට පහර ගහන්න ඒ ගොල්ලන් හැමදාම යම් යම් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම යෝජනා කරන්න.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී "ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயானி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. MOHAN PRIYADARSHANA DE SILVA *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා කථා කරමින් සිටියේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සම්බන්ධයෙන් සහ පදනම් විරහිතව විරුද්ධ පක්ෂය එයට චෝදනා කිරීම ගැනයි. ඇත්ත වශයෙන්ම මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සෑදීම සඳහා එතුමා කිව්ව විධියට විශාල ණයක් ගත්තේ නැහැ. පළමුවෙන්ම අපි ඇමෙරිකන් ඩොලර් මිලියන 300ක් සියයට 2 පොලියට ගත්තා. ඊට පසුව ඇමෙරිකන් ඩොලර් මිලියන 155 ක් LIBOR සහ සියයට 1 පොලියට ණයට ගත්තා. ඒ මුදල් පමණයි අපි පාවිච්චි කළේ. ඒ මිසක් ඔය කියන විධියේ විශාල මුදලක් පාවිච්චි කළේ නැහැ. ඒ වාගේම ඒ වෙලාවේ හැටියට ඒ පොලිය ඉතාමත් සාධාරණ පොලියක්. මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හැදීම සම්බන්ධයෙන් ඉදිරිපත් වුණේ රටවල් දෙකක් පමණයි. ඒ කියන්නේ, ඉන්දියාවේ NTPC සමාගමත්, චීන ආණ්ඩුවත් පමණයි. යම් යම් හේතූන් නිසා මෙහිදී අපි චීන ආණ්ඩුව තෝරා ගත්තා. චීන ආණ්ඩුව තෝරා ගැනීමෙන් පසු Exim බැංකුව හරහා තමයි චීන ආණ්ඩුවෙන් දෙන මුදල් ආධාර අපට ලැබුණේ. චීනයේ CMEC සමාගම ඒ ව්‍යාපෘතිය භාර අරගෙන ක්‍රියාත්මක කළා. එසේ ක්‍රියාත්මක කිරීමේදී ඒ අය අපේ රටට එවන ලද සෑම යන්ත්‍රයක්ම අපේ රටේ විදුලි ඉංජිනේරුවන් ගිහින් පරීක්ෂා කරලා අනුමත කළායින් පසුව තමයි එව්වේ. එහෙම නැතිව අපේ ඇස් වහලා, අපේ ඇස්වලට වැලි ගහලා, අපි රවට්ටලා ඒ කටයුතු කළේ නැහැ. අපේ විදුලි ඉංජිනේරුවන් ගිහින් ඒවා බැලුවා. ඒ වාගේම ඒ අයට උපදෙස් දෙන්න electrowatt නමැති ස්විට්සර්ලන්තයේ විදුලි සමාගමක් කටයුතු කළා. ඒ අය තමයි අපේ consultancy කටයුතු කළේ. They were the consultants; ඒ ගොල්ලන් තමයි අපට උපදෙස් දුන්නේ. ඒ අය මේ ව්‍යාපෘතිය ආරම්භයේ ඉඳලා අවසාන වනතෙක්ම උපදෙස් දීමේ කටයුත්ත කළා. ඒ අයගේ උපදෙස් අනුව තමයි මේ කටයුතු කළේ. යම් කිසි විධියකින් එහි ස්විචයක් මාරු කරන්න නැවැත්වුවත්, නොරොච්චෝලේ මහ විශාල කාර්මික කඩා වැටීමක් සිද්ධ වෙලා තිබෙනවාය කියා ප්‍රකාශ කරලා, පුවත් පත්වල පළ කරලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරලා පහර ගැහීම අද ප්‍රතිපත්තියක් කර ගෙන තිබෙනවා.

ඊයේ පෙරේදා විදුලි බල ඇමතිතුමිය පාර්ලිමේන්තුවේදී කිව්වා 9 වතාවක් මේ බලාගාරය යම් යම් ආබාධවලට පත් වුණාය කියා. අවුරුදු දෙකක් තුළදී 9 වතාවක් කියන්නේ විශාල වාර ගණනක් නොවෙයි. අපේ රටේ යම් යම් විදුලි ව්‍යාපෘති තිබෙනවා. සමනල වැව බලාගාරය හැම අවුරුද්දකදීම දෙතුන් වතාවක් කැඩෙනවා. කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය විවෘත කරලා අවුරුද්දක් යන තෙක් වැඩ ආරම්භ කරන්න බැරි වුණා. විවෘත කරලා අවුරුද්දකට පසුවයි වැඩ ආරම්භ කළේ. මොකද,

හරියාකාරව ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් තිබුණා. වරින් වර කැඩෙන එවැනි තවත් ව්‍යාපෘති තිබෙනවා. එවැනි සමහර ඒවා දැන් අත්හැර දමා තිබෙනවා. නමුත් පසු ගිය මාස 4, 5දී නොරොච්චෝලේ බලාගාරයේ කිසිදු ආපදාවක් ඇති වුණේ නැහැ; කිසිම කඩා වැටීමක් ඇති වුණේ නැහැ. අද මේ රටට විදුලිය ලබා දීමේදී විශාල සහනයක් වෙලා තිබෙන්නේ නොරොච්චෝලේ ව්‍යාපෘතියයි. අද ඒ ව්‍යාපෘතියෙන් දවසකට මෙගාවොට් 280ක විතර විදුලි බලයක් අපේ විදුලි පද්ධතියට සපයනවා. නොරොච්චෝලේ බලාගාරය නොතිබුණා නම් අද අපට දවසකට පැය 3, 4ක් විදුලිය කපන්න වෙනවා. ඒ නිසා ඊර්ෂ්‍යාවෙන්, කුහකකමෙන් කරන මේ චෝදනා වැරදියි. ඒ නිසා මේ චෝදනාවලට මම පිළිතුරු දෙන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කරලා තිබෙනවා, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉතාමත්ම දූෂිත ආකාරයට ගල් අඟුරු ගෙන ඒම සඳහා වන ටෙන්ඩරය සම්බන්ධව, එහෙම නැත්නම් ඒවායේ මිල සම්බන්ධව ඇඟිලි ගැහුවාය කියා. එම ප්‍රකාශය පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, මෙතැනට ඇවිල්ලා පිළිතුරු දෙන්න බැරි පුද්ගලයෙකුට ඒ වාගේ බරපතළ විධියේ චෝදනාවක් කිරීම ගැන මම කනගාටු වෙනවා. ඒ ලේකම්වරයා ගැන මම හොඳින් දන්නවා. ඔහු මා සමඟ අවුරුදු හතරහමාරක් වැඩ කළා. එම අවුරුදු හතරහමාර තුළ මම මැන ගත් දෙයක් තමයි මේ රටේ සිටින ඉතාමත්ම දක්ෂ ලේකම්වරයෙක් තමයි එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩු කියන එක. එම්.එම්.සී. ෆර්ඩිනැන්ඩු කියන්නේ ඉතාමත් මහන්සි වෙලා වැඩ කරන, සමහර විට රාත්‍රී 1, 2 වන තෙක් මහන්සි වෙලා නිදි වරාගෙන වැඩ කරන, ඒ වාගේම උදේ පාන්දර කාර්යාලයට ඇවිල්ලා තමන්ගේ කටයුතු ආරම්භ කරන, ඒ වාගේම ඕනෑම අවස්ථාවක රාජකාරී කටයුතු වෙනුවෙන් කැප වන නිලධාරියෙක්. ඒ වාගේ ලේකම්වරයෙක් නිසා තමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මේ තත්ත්වයෙන් හරි ගෙනයන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියන එක මා මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මේ වාගේ ස්ථානයකට ඇවිල්ලා ඒ විධියේ චෝදනා කිරීම ඉතාම වැරදියි. මොකද, මෙතැනට ඇවිල්ලා පිළිතුරු දෙන්න ඒ නිලධාරියාට පුළුවන්කමක් නැහැ. ඔහුට පිළිතුරු දෙන්න බැරි ස්ථානයකට ඇවිල්ලා මන්ත්‍රීවරයෙක් විසින් මේ විධියට ප්‍රකාශ කිරීම වැරදියි. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඒ ප්‍රකාශය පිළිබඳව මගේ අකමැත්ත, ඒ වාගේම මගේ අප්‍රසාදය පළ කරමින් මගේ වචන කිහිපය මා අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි.

මීළඟට ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.58]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අද දවසේ සම්මත වීමට නියමිත සංශෝධනවලින් විදුලිබල පද්ධතියට, ඒ වාගේම රටේ සිටින ජනතාවට ලොකු හානියක් වන බව මට පෙනෙනවා. ඒ වාගේම මේ වාගේ හානියක් වන පනත් කෙටුම්පතක් සම්මත කරන වෙලාවේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සම්බන්ධ කරලා අපට විදුලිය වද්දන්න හැදුවා. එහෙම කරලා ඒ පනත් කෙටුම්පත සම්මත කර ගන්න හදනවා. නමුත් එක්සත් ජාතික පක්ෂය කියන්නේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන ප්‍රෞඪ පක්ෂයක්. ඒකට විදුලි බලය වද්දලාවත්, මෙගාවොට් 3,000ක් නොවෙයි ඊට වැඩි ප්‍රමාණයක විදුලියක් වැද්දුවත් වටිටන්න බැහැයි කියන එක විශේෂයෙන්ම මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. මෙම පනත් කෙටුම්පතේ මේ විධියට සඳහන් වෙනවා:

> ".....මෙ.වො. 25 ඉක්මවා සහ අභිබවා ශ්‍රී ලංකාව තුළ විදුලිය උත්පාදනය කිරීම පිණිස පිරියතක් ක්‍රියාත්මක කරන, මෙම පනත බලාත්මක වන දිනයට පෙරාතුව ම ...."

එදිනට පෙර තිබෙන විදුලි බලාගාර නීතිගත වෙනවා. හැබැයි, විදුලි බලය මිලට ගැනීමේ ගිවිසුම බල පවත්නා කාල සීමාව තුළ දී පමණක් එය ක්‍රියාත්මක විය යුතුයි කියාත් සඳහන් වෙනවා. ඒ කියන්නේ ගිවිසුම්ගත කාලය තුළ පමණයි. නමුත් මම විශේෂයෙන් මේ කාරණයට අවධානය යොමු කරවනවා. පෞද්ගලික විදුලි බලාගාර හිමි සමාගම් අවුරුදු 10ක්, 15ක්, 20ක් වාගේ කාලයකට ගිවිසුම් අත්සන් කරලා ඒ අය රටේ ජනතාවට, එහෙම නැත්නම් විදුලිබල මණ්ඩලයට බොහොම අධික මිලකට විදුලිය විකුණනවා. ඒ අවුරුදු 10ක කාලය තුළ, අවුරුදු 15ක කාලය තුළ, එහෙම නැත්නම් එම ගිවිසුම්ගත කාලය තුළ, ආයෝජනය කරන ලද මුදල හම්බ කරලා ඉවරයි. ඒ නිසා ඊළඟට ඒ බලාගාරවලට මොකද කරන්නේ? මේ පනත් කෙටුම්පතේ මෙහෙම සඳහන් වනවා:

> "*.... ඒ උපවගන්තියේ සඳහන් කරන ලද විදුලි බලය මිලට ගැනීමේ ගිවිසුම බලපවත්නා කාලසීමාව තුළ දී පමණක් ක්‍රියාත්මක විය යුතු ය.*"

ඊට පස්සේ ඒවා පංචිකාවත්තට විකුණනවාද? එහෙම නැත්නම් මොකක්ද මේ විදුලි බලාගාරවලට කරන්නේ? මොකද, අපේ ජනතාව විදුලිය සඳහා අධික මිලක් ගෙවිවේ එම බලාගාරවලට සල්ලි ගෙවන නිසායි. එම නිසා ඒ පිළිබඳව දැන ගන්න රටට, ජනතාවට අයිතියක් තිබෙනවා කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරනවා. ඒක මේ පනත් කෙටුම්පතින් ප්‍රකාශ නොකර ගොළු වත රකිනවා. ඒ නිසා ඒ ගැනත් ප්‍රකාශ කරන්න කියලා විශේෂයෙන්ම මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඊයේ ගරු පී. දයාරත්න ඇමැතිතුමා කථා කරද්දී මම ප්‍රශ්නයක් නැඟුවා. මේ සම්බන්ධව කථා කරද්දී එතුමා ප්‍රකාශ කළා මේ පනත් කෙටුම්පතට අනුව යම් කෙනෙක් පෞද්ගලික විදුලි බලාගාරයක් අරඹන්නේ නම් සියයට 51ක අයිතියක් රජයට දිය යුතුයි කියලා. අපි ඇහුවා ඒක මේ පනත් කෙටුම්පතේ කොහේද සඳහන් වෙලා තිබෙන්නේ කියලා. නමුත් ඒක මේ පනත් කෙටුම්පතේ කිසිම තැනක සඳහන් වෙලා නැහැ. නමුත් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ මෙහෙම සඳහන් වෙනවා:

> "2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකහත්වය ඇතිව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි කොටස් ප්‍රමාණයක් දරනු ලබන, රජය, රාජ්‍ය සංස්ථාවක්, රජය විසින් කොටස්වලින් සියයට පනහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන සමාගමක් හෝ එවැනි සමාගමක පාලින සමාගමක්"

කොටසක් රුපියල් 10ක් වෙන්න පුළුවන්. අන්න එවැනි සමාගමක් රුපියල් 10ක් ගෙවලා එක කොටසක් ලබා ගත්තොත්, විදුලි බලාගාරයක් හදලා විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ අයිතිය ඒ අයට තිබෙනවා කියලා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ පැහැදිලි කරලා තිබෙනවා.

දැන් කට කතා පැතිර යනවා, නොරොච්චෝලේ විදුලි බලාගාරය ආපසු චීන ජාතිකයන්ටම විකුණන්න යනවා කියලා. එහෙම නම් ඒක විකුණලා එහි කොටස් රජයට එහෙම නැත්නම් රාජ්‍ය සංස්ථාවකට තබා ගන්න පුළුවන්. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතින් කියන විධියට විෂය භාර අමාත්‍යවරයාගේ එකහත්වය ඇතිව, භාණ්ඩාගාර ලේකම්වරයා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

විසින් තීරණය කරනු ලැබිය හැකි කොටස් ප්‍රමාණයක -එක කොටසක් රුපියල් 10ක් වෙන්න පුළුවන්- අයිතිය දීලා මේ විදුලි බලාගාරයෙන් රුපියල් 20 ගණනේ විදුලි ඒකකයක් විකුණන්න ගිවිසුම් අත්සන් කරන්න පෙළඹෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මා විශේෂයෙන් කියනවා, මේ සඳහා යම් clause එකක් තිබෙන්න ඕනෑ; යම් නීතියක් තිබෙන්න ඕනෑ කියලා. ඒ අනුව, මෙගාවොට් 25ට වඩා විදුලිය නිපදවන, දැනට ක්‍රියාත්මක වන විදුලි බලාගාරවලට අදාළ කාලයෙන් පස්සේ මොකක්ද කරන්නේ කියලා විශේෂයෙන් සඳහන් කරන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මෙම පනත් කෙටුම්පතේ 8වන පිටුවේ මෙසේ සඳහන් වනවා :

"...අයකිරීම් සමඟ සාධාරණ මාසික වාරිකවලින් ඒ වියදම අයකර ගැනීමේ පදනම මත අදාළ පරිශ්‍රයට විදුලිබල සම්බන්ධතාවය සහ විදුලිබල සැපයුම ලබා දෙන ලෙසට ඒ නැනැත්තා විසින් බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකි ය."

ඒ කියන්නේ, කිසියම් කෙනෙකු විදුලිය ලබා ගැනීමේදී අවශ්‍ය මුදල එකවර ගෙවන්න බැහැ කියනවා නම්, සාධාරණ වාරිකවලින් ගෙවන්න පුළුවන් කියන එකයි. අද ආණ්ඩුවේ දේශපාලනඥයන්ගේ හිතවතුන්, ආණ්ඩුවේ දේශපාලනඥයන් උතුරු නැඟෙනහිර හෝටල් හදන බව අපි දන්නවා. මේවාට විදුලිය ගන්න කෝටි ගණනක් වැය වන්න පුළුවන්. මේ වගන්තිය අනුව, "මට මාසයකට ගෙවන්න පුළුවන් මෙච්චරයි" කියලා, අවුරුදු 99ක් දක්වා ගෙවන්න අවස්ථාව දෙන්න කියලා දැන් ඒ අයට ඉල්ලන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ මුදල් ගෙවන්න අවුරුදු 50ක, 75ක කාලයක් ඉල්ලන්න පුළුවන්. ඒ නිසා මෙතැනට ඇතුළත් වෙන්න ඕනෑ නිශ්චිත කාල සීමාවක්. තලගොයා කබරගොයා කරනවා වාගේ වැඩක් තමයි අපට මේකෙන් පෙනෙන්නේ. විදුලි බලය ගන්න කොට එකවර මුදල් ගෙවන්න බැරි කෙනකුට සාධාරණ සමාන කොටස් වාරිකවලින් ගෙවන්න පුළුවන් කිව්වාට, නිශ්චිත කාලයක් සඳහන් කරලා නැහැ. එක්කෝ "අවුරුද්දක කාලයක් තුළ" කියලාවත් සඳහන් වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා පොලියක් අය කරන බවක් සඳහන් වන්නේත් නැහැ. ඒ නිසා, "මහ බැංකුව නියම කරන පොලියක් සමඟ" කියලාවත් සඳහන් වෙන්න ඕනෑ. නමුත් ඒ වාගේ කිසිම නිර්ණායකයක් නැතිව මෙම පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා, "විදුලි බලය ගන්න යන කෙනකුට ඒ මුළු මුදල ගෙවන්න බැරි නම් සාධාරණ වාරිකවලින් ගෙවන්න පුළුවන්" කියලා. ඒත් ඒ සඳහා නිශ්චිත කාලයක් සඳහන් කරලා නැහැ. ඒ නිසා මේ සංශෝධනවලින් කෙරෙන්නේ දුප්පත් මිනිහෙකුට උදව් කිරීමක් නොවෙයි. එහෙම කරනවා නම්, "අවුරුද්දක කාලයක්" කියන එකවත් ඇතුළත් කරන්න තිබුණා. දුප්පත් මනුෂ්‍යයෙක් ගෙයකට විදුලිය ගන්න කොට මහ ලොකු ගණනක් වැය වන්නේ නැහැ. නමුත් හෝටලයකට විදුලි බලය ගන්න ලක්ෂ 50ක්, 60ක් වැය වනවා. එහෙම නම් ඒකට වැය වන්නේ, අභිංසක ජනතාවගේ සල්ලි; ජනතාව අමාරුවෙන් electricity bills ගෙවාපු සල්ලි; විදුලිබල මණ්ඩලයේ තිබෙන සල්ලි; මහා භාණ්ඩාගාරයේ තිබෙන සල්ලි. ඒ මුදල මාස්පතා පොඩි පොඩි වාරිකවලින් ගෙවන්න අවුරුදු 50ක් වුණත් ගන්න පුළුවන් අවකාශ ඒ අයට මෙයින් සැලසෙනවා. මේක, ආණ්ඩුවේ හිතවතුන්ට තමුන්ගේ ව්‍යාපාරික ආයතනවලට විදුලිය ගන්න අවස්ථාව ලබා දීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පනත් කෙටුම්පතෙහි තව වරදක් පෙනෙනවා. මෙහි 13වන පිටුවේ සඳහන් වනවා, "අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති විදේශීය ස්වෛරී රාජ්‍යයකින් ශ්‍රී ලංකා රජයට ලැබුණු යෝජනාවක් ටෙන්ඩර්වලින් තොරව ක්‍රියාත්මක කළ හැකියි" කියලා. නමුත් එවැනි යෝජනාවක් ටෙන්ඩර්වලින් තොරව ක්‍රියාත්මක වෙන්න බැහැ. යෝජනාවක් කිව්වාම ඒක ණයක් වෙන්න පුළුවන්. මේ රටට ආධාරයක් වශයෙන් අවසාන වශයෙන් ලැබිලා තිබෙන්නේ වික්ටෝරියා ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතිය විතරයි. එතකොට එවැනි ඉදි කිරීම්වලට ටෙන්ඩර් කැඳවන්න ඕනෑ නැහැ. නමුත් මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ යෝජනාවක් සම්බන්ධවයි. අපට අත් දැකීම් තිබෙනවා, මේ වාගේ යෝජනා සම්බන්ධයෙන්. නොරොච්චෝලේ විදුලි බලාගාර ව්‍යාපෘතියේත් අඩු පාඩු තිබෙනවා කියලා දැන් හැම කෙනාම කථා කරනවා. මාත් පෞද්ගලිකව හිතනවා, නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදි කරපු එක හොඳයි කියලා. මොකද, එයින් රුපියල් 8කට වාගේ මුදලකට විදුලිය ඒකකයක් නිපදවන්න පුළුවන් නිසා. අද ජල විදුලියට පසු අඩු වියදමකින් විදුලිය නිපදවන්න පුළුවන් ගල් අඟුරුවලින් තමයි. නමුත් මෙතැනදී "ස්වෛරී රාජ්‍යයකින් ශ්‍රී ලංකා රජයට ලැබුණු යෝජනාවක්" කිව්වාම චීන ජාතික කොන්ත්‍රාත්කරුවකුට පුළුවන්, ලංකාව සම්බන්ධයෙන් චීන ආණ්ඩුවට යෝජනාවක් කරන්න, "අපි මේකට එක්සිම් බැංකුවෙන් ණය දෙනවා, මේ machines ටික ලංකාවට ගන්න කියන්න" කියලා. එතකොට මේ පනත් කෙටුම්පතේ මේ වගන්තිය අනුව, ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න tenders නැතිව හැකියාව තිබෙනවා. චීන රජය එහෙම ඉල්ලීමක් අපෙන් කරනවා නම්, ඒ අයගෙන්ම ඒ උපකරණ ගන්න ඕනෑ නම්, චීන ජාතිකයන් අතර හෝ කමක් නැහැ ටෙන්ඩර් කිරීමක් කරන්න ඕනෑ.

නොරොච්චෝලේ විදුලි බලාගාරය හදපු එක හොඳයි. ඒක කාලීන අවශ්‍යතාවක්. අපි ඒකට එකඟයි. නමුත් ඒකේ තිබෙන අඩු පාඩුවලින් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ. ඒකේ තිබෙන machines කැඩෙනවා. දැනට විසි වතාවක් විතර කැඩිලා තිබෙනවා. නොරොච්චෝලේ විදුලි බලාගාරය ඇතුළට ගිහින් බැලුවොත් පෙනෙනවා, එතැන තිබෙන tap එක පවා මළකඩ කාලා. ඇයි ඒ? ප්‍රමිතියක් සහිත ඒවා අරගෙන නැහැ. ප්‍රමිතියක් නැති වන්න හේතුව තමයි, ටෙන්ඩර් කිරීමක් නැති එක; තරගකාරිත්වයක් නැති එක. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය පරීක්ෂා කිරීමක් නැහැ. ඒ වාගේම අපි දරන මිලට වඩා machines -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 2ක් දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාගේ වෙලාවෙන්ද අඩු කරන්නේ? [බාධා කිරීමක්] එහෙම නම් විපක්ෂයේ වේලාවෙන් අඩු කරන්න වෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නොරොච්චෝලේ විදුලි බලාගාරයේ කටයුතු ටෙන්ඩර් නැතුව තමයි කළේ. දවසකට මෙගාවොට් 300ක් නිපදවනවා කියලා තමයි මේ නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවේ. නමුත් මේ බලාගාරයෙන් දවසකට ලැබෙන්නේ මෙගාවොට් 285යි. ඒ නිසා නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් දවසකට රුපියල් ලක්ෂ 20ක් අපට පාඩු වෙනවා. මේ අත්දැකීම් අපි ලබා ගන්න ඕනෑ. ඒ නිසා අපි මේ ව්‍යාපෘති කරන කොට ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්න ඕනෑ. මේවා චීන රජයෙන් දෙන ආධාර නොවෙයි; නිකම් දෙන ඒවා නොවෙයි. ණය හැටියටයි මේවා දෙන්නේ. රුපියල් කෝටි 50ක machines ගන්න ගිහින් -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට වෙලාව දුන්නා කිව්වා නේද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා වැඩියෙන් කාලය අරගෙන තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව වැඩියෙන් දුන්නා කිව්වා නේද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනෙක් මන්ත්‍රීවරු වෙලාව දෙන්න එකඟ නැහැ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මේ පනත් කෙටුම්පතේ තිබෙන බොහෝ දේවල් රටට අහිතකර වෙලා, රට අගාධයට ගිහිල්ලා, මිනිසුන්ගේ මුදල් හූරා කන අවස්ථා ඇති වෙනවා. එයට විරෝධය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු විනායගමූර්ති මුරලිදරන් නියෝජ්‍ය අමාත්‍යතුමා.

[பி.ப. 5.08]

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා (නැවත පදිංචිකිරීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் - மீள்குடியேற்ற பிரதி அமைச்சர்)
(The Hon. Vinayagamoorthi Muralidaran - Deputy Minister of Resettlement)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் தொடர்பாக இன்று நடைபெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்புக் கிடைத்தமைக்காக நான் மகிழ்ச்சியடைகிறேன். காலத்தின் தேவைக்கேற்ப இச்சட்டத்தில் திருத்தங்களைக் கொண்டுவந்தமைக்காக நான் முதலில் வலு, சக்தி அமைச்சர் மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி அவர்களுக்கு நன்றி கூறவேண்டும். மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள், அரசியலை நன்கு அறிந்த, அனுபவம் வாய்ந்த ஒருவரை இவ்வமைச்சுக்கு அமைச்சராக நியமித்திருக்கின்றார். கடந்த முப்பது வருடங்களாக எங்களுடைய நாடு யுத்த மேகத்தினால் சூழப்பட்டு இருண்டு கிடந்தது. அக்காலம் இருண்டதொரு காலமாக இருந்தது. எங்களுடைய நாடு யுத்தத்தினால் மாத்திரம் இருண்டு கிடக்கவில்லை. மாறாக, மின்சார விளக்குகள் இல்லாமல்கூட பல பிரதேசங்கள் இருண்டு கிடந்தன. அந்தக் கொடிய யுத்தமானது எங்களுடைய மேதகு ஜனாதிபதி அவர்களால் முடிவுக்குக் கொண்டுவரப்பட்டதற்குப் பிற்பாடு, இன்று அந்த யுத்த மேகம் அகற்றப்பட்டிருக்கின்றது; மக்கள் சந்தோஷமாக வாழ ஆரம்பித்திருக்கின்றார்கள். அதுமாத்திரமல்ல, இருண்டு கிடந்த பல பிரதேசங்களும் இன்று ஒளிரத்தொடங்கியுள்ளன. இலங்கையிலே பல பாகங்களில் பொதுவாக கிராமப் புறங்களிலும் நகர்ப்புற எல்லைகளிலுமுள்ள பல பிரதேசங்கள் கடந்த முப்பது வருடங்களாக மின்சாரமற்ற நிலையில்தான் இருந்தன. எனினும், குறுகியதொரு காலப்பகுதிக்குள் அதாவது 2009 - 2013ஆம் ஆண்டு காலப்பகுதியில் பெரும்பாலான பிரதேசங்கள் மின்சார ஒளியைப் பெற்றவையாக மாறியிருக்கின்றன.

குறிப்பாக வடக்கு, கிழக்கை எடுத்துக்கொண்டால், யுத்தம் நடந்த காலப்பகுதியில் அங்கு கிட்டத்தட்ட 18-20 வீதமான மின்சாரத் தேவைதான் பூர்த்தியாக்கப்பட்டிருந்தது. ஆனால், இன்று கிழக்கு மாகாணத்திலுள்ள ஒவ்வொரு மாவட்டமும் - அதாவது அம்பாறை, திருகோணமலை, மட்டக்களப்பு மாவட்டங்கள் - கிட்டத்தட்ட 80 சதவீதமான மின்சாரத் தேவையைப் பூர்த்தி செய்திருக்கின்றன. அவ்வாறே இன்று வட மாகாணமும் மாறியிருக்கின்றது. இதனை நான் புள்ளிவிபரத்துடன் கூறலாம் என நினைக்கின்றேன். 2009 - 2013ஆம் ஆண்டு காலப்பகுதியில் அம்பாறை மாவட்டத்துக்கு மின்சாரத்தை விநியோகிப்பதற்கு கிட்டத்தட்ட 1360.55 மில்லியன் ரூபாய் செலவிடப்பட்டிருக்கின்றது. இதன்மூலம் அங்குள்ள 14,607 குடும்பங்கள் நன்மைபெறுகின்றன. இம்மாவட்டத்தில் 80 வீதமான மின்சாரத் தேவை பூர்த்தியாக்கப்பட்டிருக்கின்றது. இதேபோன்று மட்டக்களப்பு மாவட்டத்துக்கு 1327.55 மில்லியன் ரூபாய் செலவிடப் பட்டிருக்கின்றது. இதன்மூலம் கிட்டத்தட்ட 15,336 குடும்பங்கள் நன்மை பெறுகின்றன. இம்மாவட்டத்தில் 80 வீதமான மின்சாரத் தேவை பூர்த்தியாக்கப்பட்டிருக்கின்றது. திருகோணமலை மாவட்டத்துக்கு 772.31 மில்லியன் ரூபாய் செலவிடப்பட்டிருக்கின்றது. இதன்மூலம் 8,051 குடும்பங்கள் நன்மைபெறுகின்றன. இம்மாவட்டத்தில் 85 வீதத்துக்கும் அதிகமான மின்சாரத் தேவை பூர்த்தி செய்யப்பட்டிருக்கின்றது. மொத்தமாக கிழக்கு மாகாணத்துக்கு 3,460.41 மில்லியன் ரூபாய் செலவிடப்பட்டிருக்கின்றது. இது ஒப்பீட்டளவில் பெருந்தொகை நிதியாகும். இந்த வகையில் இம்மாகாணத்தில் கிட்டத்தட்ட 81.55 வீதமான மின்சாரத்தேவை பூர்த்தியாக்கப்பட்டிருக்கின்றது.

இதேபோன்று வட மாகாணத்தில், வவுனியா மாவட்டத்துக்கு 1,086 மில்லியன் ரூபாய் செலவிடப் பட்டிருக்கின்றது. இதன்மூலம் 11,725 குடும்பங்கள் நன்மை பெறுகின்றன. இம்மாவட்டத்தின் 82 வீதமான மின்சாரத் தேவை பூர்த்தி செய்யப்பட்டிருக்கின்றது. அவ்வாறே முல்லைத்தீவு மாவட்டத்துக்கு 790 மில்லியன் ரூபாய் செலவிடப்பட்டிருக்கின்றது. இதன்மூலம் 9,130 குடும்பங்கள் நன்மைபெறுகின்றன; மாவட்டத்தின் 30 வீதமான மின்சாரத் தேவை பூர்த்தியடைந்திருக்கின்றது. இது தொடர்பான வேலைகள் தற்பொழுது அங்கு நடைபெற்றுவருவதை அனைவரும் கண்கூடாகப் பார்க்கலாம். இதேபோன்று கிளிநொச்சி மாவட்டத்துக்கு 971 மில்லியன் ரூபாயும், மன்னார் மாவட்டத்துக்கு 522 மில்லியன் ரூபாயும் யாழ். மாவட்டத்துக்கு 674 மில்லியன் ரூபாயும் செலவிடப் பட்டிருக்கின்றது. இதன்மூலம் இந்த மாகாணத்தின் 81 சத வீதமான மின்சாரத்தேவை பூர்த்தி செய்யப்பட்டிருக்கின்றது. ஆகவே, இது மிகவும் பாரிய ஓர் அபிவிருத்தியாகும்.

[ගරු විනායගමූර්ති මුරලීදරන් මහතා]

මින්සාරම් එන්බදු අපිවිරුත්තියින් මුදුකෙලුම්පාක ඉරුක්කින්රදු. මේදකු ජනාදිපදි අවර්කළින් පණිප්පින් පේරිල් මින්සාරම් වළංකප්පට්ටිරුප්පදන්මූලම් අංගිරුක්කින්ර මක්කළ් සිරන්ද පලනෛප් පෙට්රු වරුකින්රාර්කළ් එන්රුදාන් කූර වේණ්ඩුම්. පොදුවාක වඩක්කු, කිළක්කිලේ පල කිරාමංකළිල් ඉරුක්කින්ර මක්කළ් දාංකළ් පිරන්ද වළර්න්ද කාලත්දිල් දර්පොළුදුදාන් මින්නොළියෛප් පාර්ත්දිරුක්කින්රාර්කළ්. ඉන්රු අවර්කළ් ඉන්ද මින්සාරක් කට්ටණත්දෛප් පර්රි අලට්ටික්කොළ්වදිල්ලෛ. ඒනෙන්රාල් අවර්කළ් දර්පොළුදුදාන් මින්සාරත්දෛප් පයන්පඩුත්දත් දොඩංකි අදන් පලනෛ නන්කු අනුපවිත්දු වරුවදනාල් ඉන්රු අරසුක්කු නන්රියුඩෛය මක්කළාක මාර්රමඩෛන්දිරුක්කින්රාර්කළ්. අදේනේරම් වඩ මාකාණත්දුක්කු මින්සාරම් වළංකුවදර්කෙන ඉදුවරෛයිල් මොත්දමාක 14.22 පිල්ලියන් රූපාය් නිදි ඔදුක්කීදු සෙය්යප්පට්ටිරුක්කින්රදු. 2016ආම් ආණ්ඩු වරෛක්කුම් ඉන්ද නිදියෛච් සෙලවු සෙය්යත් දිට්ඩමිඩප්පට්ටිරුක්කින්රදු.

ඉන්රු උණ්මෛයිලේ මින්සාරම් ඉරණ්ඩු විදමාකප් පෙරප්පඩුකින්රදු. ඔන්රු ඉයර්කෛයෛප් පයන්පඩුත්දුවදන්මූලම් පෙරප්පඩුකින්රදු. අදුත්දු අනල් මින් නිලෛයංකළ්මූලම් අල්ලදු සෙයර්කෛ වළංකළෛක් කොණ්ඩු පෙරප්පඩුකින්රදු. උණ්මෛයිලේ ඉයර්කෛයාන කාලනිලෛ සිරප්පාක ඉරුක්කින්රපොළුදු නීරින්මූලම් පෙරප්පඩුකින්ර මින්සාරත්දෛ මක්කළුක්කු වළංකි, සිරන්ද මුරෛයිලේ මින්සාරත් දේවෛ පූර්ත්දි සෙය්යප්පඩුකින්රදු. අදේනේරම් නීර්ප් පර්රාක්කුරෛ වරුකින්රපෝදුම් අනල් මින් නිලෛයංකළෛප් පයන්පඩුත්දි මින්සාරත්දෛ වළංකුවදර්කාන දර්කාලික ඒර්පාඩුකළෛක්කූඩ ඉන්රු ඉන්ද අරසාංකම් සෙය්දු වෛත්දිරුක්කිරදු. අදනාල් ඉන්රු නාට්ඩින් මින්සාරත් දේවෛ එන්බදු සිරන්ද මුරෛයිලේ පූර්ත්දි සෙය්යප්පට්ටු වරුකින්රදු එන්රුදාන් නාන් කූරුවේන්. අදර්කාක ඉන්ද අරසාංකත්දින් මුයර්සියෛ නාංකළ් පාරාට්ට වේණ්ඩුම්.

ඉන්රු ඉංකිරුක්කින්ර පල අරසියල්වාදිකළ් ඉරෝප්පිය නාඩුකළුක්කුච් සෙන්රු වරුවදුණ්ඩු. උණ්මෛයිලේ ඉන්ද මින්සාරක් කට්ටණත්දෛප් පොරුත්දවරෛයිල් අවර්කළුක්කු ඔරු විඩයම් දෙළිවාක විළංකුම්. අදාවදු, වළර්ච්චියඩෛන්ද නාඩුකළිල් ඉරුක්කින්ර මින්සාරක් කට්ටණත්දුඩන් අල්ලදු පල ඉරෝප්පිය නාඩුකළිල් ඉරුක්කින්ර මින්සාරක් කට්ටණත්දුඩන් ඔප්පිඩුකින්රපෝදු, එංකළ් නාට්ටිලේ එත්දනෛයෝ මඩංකු කුරෛන්ද වීදම්දාන් අදවිඩප්පඩුවදු දෙරියවරුම්. එමදු අයල්නාඩුකළුඩන් ඔප්පිට්ඩුප් පාර්ත්දාල්කූඩ එංකළුඩෛය මින්සාරක් කට්ටණම් මිකවුම් කුරෛන්ද අළවිලේයේ ඉරුප්පදෛක් කාණලාම්. ආකවේ, නාංකළ් මින්සාරක් කට්ටණත්දෛප් පර්රික් කූඩුදලාකප් පේසුවදෛවිඩ මින්සාරත්දෛ එව්වාරු සික්කනමාන මුරෛයිල් පයන්පඩුත්දුවදු එන්පදෛප් පර්රිත්දාන් පේස වේණ්ඩුම්. මින්සාරම් සික්කනමාන මුරෛයිල් පයන්පඩුත්දප්පඩුමාක ඉරුන්දාල් ඔරු වරිය කුඩුම්බම්කූඩ සිරන්ද මුරෛයිල් මින්සාරත්දෛ උපයෝකික්කින්ර කුඩුම්බමාක මාර්රමඩෛයලාම්. ආකවේ, අදු සම්බන්දමාක මක්කළ් දෙළිවුපඩුත්දප්පඩ වේණ්ඩුම් එන්රු නාන් වළු, සක්දි අමෛච්චරිඩම් කේට්ඩුක්කොළ්කින්රේන්. අදුපෝල්, ඉදු සම්බන්දමාක අනෛත්දු අරසියල්වාදිකළුම් මක්කළුක්කුත් දෙළිවුපඩුත්දුකින්රපොළුදු උණ්මෛයිලේ ඔරු සිරන්ද පලනෛ මක්කළුක්කුප් පෙට්රුක් කොඩුක්කලාම් එන්රු නාන් කරුදුකින්රේන්.

ඉන්රු මට්ඩක්කළප්පු මාවට්ඩත්දෛප් පිරදිනිදිත්දුවප්පඩුත්දුකින්ර පොරුප්පුවාය්න්ද ඔර් අරසියල්වාදි එන්ර වකෛයිල්, නාන් ඔරු විඩයත්දෛක් කූර විරුම්පුකින්රේන්. අදාවදු, දර්පොළුදු නාංකළ් මට්ඩක්කළප්පු මාවට්ඩත්දිලේ පෙරුන්දොකෛයාන නිදියෛච් සෙලවළිත්දු කිට්ඩත්දට්ඩ 80 සදවීදමාන මින්සාරත් දේවෛයෛප් පූර්ත්දියාක්කියිරුක්කින්රෝම්. අංගු පල පිරදේසංකළිල් මින්සාර ඉණෛප්පුක්කළ් වළංකප්පට්ටිරුක්කින්රන. මේලුම් පල ඉඩංකළිල් මින්සාර ඉණෛප්පුක්කළ් වළංකප්පඩවිරුක්කින්රන. ආකවේ, ඉදනූඩාක ඉන්නුම් ඔරු වරුඩත්දුක්කුළ් කිට්ඩත්දට්ඩ 100 වීදමාන මින්සාරත් දේවෛයෛ නාංකළ් පූර්ත්දියාක්කුවෝම් එන්පදෛ ඉව්විඩත්දිල් නාන් ආණිත්දරමාකක් කූරික්කොළ්කින්රේන්.

ඉන්රු ඉන්ද නාඩු මින්සාරත්දුරෛයිල් මාත්දිරමල්ල කට්ටුමානත්දුරෛ, නීර් වළංකල් දුරෛ, විවසාය්ත් දුරෛ එන්රු පල දුරෛකළිලුම් පෙරිදුම් අපිවිරුත්දියඩෛන්දු වරුකින්රදු එන්රාල්, අදර්කුක් කාරණමාක ඉරුක්කින්ර මේදකු ජනාදිපදි අවර්කළෛ උණ්මෛයිල් නාංකළ් මදික්ක වේණ්ඩුම්, පාරාට්ට වේණ්ඩුම්. අදු මාත්දිරමල්ල, වළු, සක්දි අමෛච්චින් මුන්නාළ් අමෛච්චර්කළාක ඉරුන්ද මාණ්පුමිකු ජෝන් සෙනවිරත්න, මාණ්පුමිකු සම්පික්ක රණවක්ක මර්රුම් ඉන්නාළ් අමෛච්චර් මාණ්පුමිකු පවිත්රාදේවි වන්නිආරච්චි පෝන්රවර්කළෛයුම් නාංකළ් පාරාට්ට වේණ්ඩුම්. ඒනෙන්රාල්, ඉන්රු වඩක්කු, කිළක්කිල් පෙරුන්දොකෛයාන පිරදේසංකළ් වළු, සක්දි අමෛච්චින් නිදි ඔදුක්කීදුකළෛප් පෙට්රුත්දාන් මුන්නේරික් කොණ්ඩිරුක්කින්රන. ඉන්රු කිළිනොච්චි නකරම් මින්නොළියිලේ මිදක්කින්ර ඔරු නකරමාක මාර්රමඩෛන්දිරුක්කින්රදු. අදේපෝන්රු මුල්ලෛත්දීවු මර්රුම් යාළ්ප්පාණ මාවට්ඩ මක්කළුම් නීණ්ඩ කාලත්දින් පිර්පාඩු ඉප්පොළුදු ඔර් ඔළිමයමාන එදිර්කාලත්දෛ එදිර්පාර්ත්දු වාළ්න්දුකොණ්ඩිරුප්පදෛක් කණ්කූඩාකක් කාණ මුඩිකින්රදු. ඉන්රු අංගු පෝය් වරුකින්රවර්කළ් ඉදර්කුච් චාට්චියාක ඉරුප්පාර්කළ් එන්පදෛ නාංකළ් අඩිත්දුක් කූරුකින්රෝම්. දර්පොළුදු අන්ද මක්කළ් මින්සක්දියින්මූලම් මිකච් සිරන්ද පයනෛ අනුපවික්කත් දොඩංකියිරුක්කින්රාර්කළ්. අන්දළවුක්කු එංකළුඩෛය අරසාංකත්දින් ඉන්දච් සේවෛ, අංගුළ්ළ මක්කළෛච් සෙන්රඩෛකින්රදු එන්පදෛ ඉව්විඩත්දිල් කූරික්කොණ්ඩු, එනදු උරෛයෛ මුඩිත්දුක්කොළ්කින්රේන්. නන්රි, වණක්කම්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මීළහට ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම ගැන මා ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා. විදුලි බලය කියන්නේ අපේ රටටත්, ලෝකයේ අනිකුත් රටවලටත් ඉතාම අත්‍යවශ්‍ය දෙයක්.

විශේෂයෙන්ම රටක් සංවර්ධනය වන කොට, ජන ජීවිතය ඉස්සරහට යන කොට, සාධාරණ විදුලිය ගාස්තුවක් අය කිරීමත්, ජනතාවට අඛණ්ඩව විදුලිය සැපයීමත් රජයේ වග කීමක් වෙනවා. නමුත් අද වන කොට මේ රජය යටතේ විදුලිය ගාස්තුව ඉතාම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබෙනවා. විදුලිබල මණ්ඩලයට විවිධ වංචා, දූෂණ සම්බන්ධයෙන් විශාල චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා. අප ඒවා හදා ගන්නේ කොහොමද, රටේ ජනතාවට, අපේ කර්මාන්තකරුවන්ට, ව්‍යාපාරවලට සාධාරණ ලෙස විදුලිය ලබා දෙන්නේ කොහොමද කියන ඉතාම වැදගත් වූ විවාදයක් අද මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අවස්ථාවේ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයාගේ ප්‍රකාශයෙන් ඒක පොඩ්ඩක් යටපත් වෙන්න ගියා. නමුත් ආපසු අප විවාදයට ඇවිල්ලා තිබෙනවා. කවුරු එහාට - මෙහාට ගියත් ඇත්තටම අපේ රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳෙන්නේ නැහැ. අද සිද්ධ වුණේ මේ දෙස බලාගෙන ඉන්න ජනතාවට දේශපාලනය එපා වුණු එකයි. ඊයේ රජයට බැණලා, අද ඒ පැත්තට ගිහිල්ලා රජය හොඳයි කියනවා. මා හිතන හැටියට ඒක ජනතාව විශ්වාස කරන්නේ නැහැ. ඒ වාගේ දේශපාලනයක් කරලා මේ රට ඉස්සරහට ගෙනි යන්න ක්‍රමවේදයක් නැහැ.

විදුලි බලය ගැන කථා කරන කොට විශේෂයෙන්ම පුත්තලම් දිස්ත්‍රික්කයේ නොරොච්චෝලේ විදුලි බලාගාරය ගැන අපට කථා කරන්න වෙනවා. අද නොරොච්චෝලේ විදුලි බලාගාරය අපේ රටට විශාල බරක් වෙලා තිබෙනවා. නොරොච්චෝලේ විදුලි බලාගාරය මේ වන විට 24 වතාවක් කැඩිලා තිබෙනවා. ඒකේ ප්‍රමිතිය ගැන බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒක ඉස්සරහට ගෙනිහිල්ලා මේ රටේ විදුලිබල ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද කියලා අපට අහන්න සිද්ධ වනවා. මොකද, නොරොච්චෝලේ විදුලි බලාගාරයේ තව අදියර දෙක, තුනක් තිබෙනවා. ඒ අදියරවලිනුත් මේ වාගේ පීඩනයක් අපේ විදුලි බල පද්ධතියට වැටුණොත් එයින් මොනවාද වෙන්නේ කියලාත් අපට අහන්න සිද්ධ වනවා. ඒ වාගේම පෞද්ගලික තාප විදුලි බලාගාර සමඟ ඇති කර ගත්ත ගිවිසුම් අපේ රටටත්, විදුලිබල මණ්ඩලයටත් අහිතකර ලෙස බලපා තිබෙනවා.

ඊයේ -2013.07.23 දින- "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ ප්‍රවෘත්තියක් පළ කර තිබුණා, "විදුලි ගිවිසුමට කඹ ඇදිල්ලෙන් වසරකට කෝටි 1200ක පාඩුවක්" කියලා. ඒකේ කියලා තිබුණා, පෞද්ගලික විදුලි ජනන සමාගම් සමඟ ක්‍රියාත්මක කරන ගිවිසුම් සංශෝධනය කරන්න කියලා, විදුලිබල මණ්ඩලයට දැනට වසර හයකට පෙර දැනුම් දී තිබුණත් ඒක තවම කරලා නැහැ කියලා. මේවායේ වංචා හා දූෂණ තිබෙනවාද, මේවායේ කොමිස් ගැහිලි තිබෙනවාද කියන බරපතළ ප්‍රශ්න අපට මහජනතාවගෙනුත් ලැබෙනවා. මොකද, මේ සියලුම පාඩු අද දරා ගන්න සිදු වෙලා තිබෙන්නේ මහ ජනතාවටයි. අද වන කොට ලෝකයේ වැඩිම විදුලිය ගාස්තුව අපේ මහ ජනතාවටත්, අපේ ව්‍යාපාරිකයින්ටත් දරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ වෙලාවේ මෙතරම් වර්ෂාවක් ලැබිලා අපේ ජලාශ වාන් දමන තත්ත්වයට පත් වුණත් මේ රජයට කිසිම වුවමනාවක් නැහැ, ජනතාවට සහනයක් දෙන්න. වුවමනාව තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේ පාඩුව පියවා ගන්න විතරයි. අද විදුලිය ගාස්තුව වැඩි කරලා තිබෙනවා. රුපියල් 10 සිට රුපියල් 42 දක්වා විදුලි ඒකකයක් සඳහා වෙන් වෙන් වශයෙන් ගෙවන්න අද ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා.

ඒ කාලයේ ඉන්ධන ගැළපුම් ගාස්තුවක් එකතු කළා. ඒක සාධාරණීකරණය කළා, රටේ නියහයක් තිබෙනවා; අපේ ජලාශවල වතුර නැහැ; ඒ නිසා අපට මේක කරන්න සිද්ධ වනවා කියලා. නමුත් අද මොනවාද වෙලා තිබෙන්නේ? අද කොච්චර වැස්සත් ජල විදුලිය නිෂ්පාදනය නොකිරීමේ කුමන්ත්‍රණයක් තිබෙනවාද කියලා ගරු ඇමතිතුමියගෙන් අපට අහන්න සිද්ධ වනවා. මොකද, අද ජලාශවල වතුර තිබෙද්දීත් අපි දන්නවා සමහර turbines අක්‍රිය කර තිබෙන බව. විශේෂයෙන්ම වික්ටෝරියා, කුකුළේගඟ සහ නව ලක්ෂපාන යන ජලාශවල turbines අද අක්‍රිය කරලා පෞද්ගලික සමාගම්වලින් වැඩි මුදලට විදුලිය ගන්නට අපේ ලංකා විදුලිබල මණ්ඩලයට සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා දවසකට පාඩුව මිලියන 110ක් පමණ වෙලා තිබෙනවා. ඒ පාඩුව දමන්නේ මහ ජනතාව මතට. අද වන කොට ලංකා විදුලිබල මණ්ඩලයේ වියදමින් සියයට 50ක් ගෙවන්නේ පෞද්ගලික තාප විදුලි බලාගාරවලට. ඒක අපි අඩු කරන්න ඉදිරියේදී ක්‍රමවේදයක් හදා ගන්න ඕනෑ. එහෙම අඩු කළේ නැත්නම් ඒ තුළින් අපේ ආර්ථිකයට විශාල බලපෑමක් සිද්ධ වනවා. අපට අනෙක් රටවල් එක්ක තරග කරන්නට බැරි වනවා. අපේ නිෂ්පාදන වියදම වැඩි වනවා. අපේ ජනතාවගේ ජීවන බර එන්න එන්නම වැඩි වනවා. මා හිතන හැටියට ඒවා සැලකිල්ලට ගෙන අපි පෞද්ගලික තාප විදුලි බලාගාර හිමිකරුවන්ද රකින්නේ, නැත්නම් ජනතාවද රකින්නේ කියලා මේ වෙලාවේ තීන්දුවක් ගන්න ඕනෑ. නැත්නම් නිලධාරීන්ට හා සේවකයන්ට ඕනෑ ඕනෑ විධියට ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළේ ක්‍රියා කරන්න ඉඩ දෙනවාද කියලා අපට අහන්න සිද්ධ වනවා.

එදා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය පුත්තලම් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ ජනතාවට විශාල පීඩනයක් කරලා තමයි හැදුවේ. ඒ ප්‍රදේශයෙන් ධීවර ජනතාව අයින් කරලා, ඒ ප්‍රදේශයේ ජීවත් වුණු මුස්ලිම් ජනතාවගේ ඉඩම් අරගෙන ඒක හැදුවේ. අපි ඒ වෙලාවේ ඒකට විරුද්ධ වුණා. නමුත් ඒ බලාගාරය හදලා හරියට ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ අවස්ථාවේදී රජයට තිබුණා.

එදා චීනයේ එක්සිම් බැංකුවෙන් රුපියල් කෝටි 17,500ක් අරගෙන නොරොච්චෝලේ බලාගාරය හදන්න සැලසුම් කළා. පළමු වැනි අදියරට රුපියල් කෝටි 3,900ක් ඇස්තමේන්තු කළත්, රුපියල් කෝටි 5,915ක් ඒකට වියදම් කර තිබෙනවා. ඒ බලාගාරයෙන් මෙගාවොට් 300ක විදුලියක් විදුලි බල පද්ධතියට ලබා දෙනවා කිව්වත් -අපේ හිටපු ගරු ඇමතිතුමාත් කිව්වා, මෙගාවොට් 300ක විදුලියක් දෙනවා කියලා.- අපිට ඒකෙන් මෙගාවොට් 300ක විදුලියක් ලැබෙන්නේ නැහැ. ඒකෙන් ලැබෙන්නේ මෙගාවොට් 285යි. නොරොච්චෝලේ බලාගාරය බරපතළ ලෙස බිඳ වැටුණු අවස්ථාවේ ඒ බිඳ වැටීමට ක්‍රියා කරපු කිසිවෙකුට මා හිතන්නේ මේ වන තෙක් මොන යම් හෝ දඬුවමක් දීලා නැහැ. අද වන කොට ඒක 24 වතාවක් කැඩී තිබෙනවාය කියා තමයි අපට වාර්තා වන්නේ. එදා මණ්ඩලයේ හිටපු සභාපතිතුමා BBC ලෝක සේවයට කිව්වා, බාල තත්ත්වයේ උපාංග ඒකට සවි කරලා තිබෙනවා කියලා. නමුත් අපේ හිටපු ගරු අමාත්‍යතුමා ඒවා සියල්ලම ප්‍රතික්ෂේප කළා. මේවා කියන්නේ අපි නොවෙයි. මේ සියලුම තොරතුරු අපට ලැබෙන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්ජිනේරු මහතුන් පුවත් පත්වලට කරලා තිබෙන ප්‍රකාශ මඟින්. විශේෂයෙන්ම විදුලි මාෆියාවක් මේ රට තුළ ක්‍රියාත්මක වනවාය කියපු එක ගැන පරීක්ෂණයක් කරලා, ඒ හස්තය අපේ විදුලි බල ක්ෂේත්‍රයෙන් අයින් කරන්න කටයුතු කරන්නට රජයට වග කීමක් තිබෙනවාය කියා මා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් මා නැවතත් මතක් කරනවා, අපේ රටේ සංවර්ධනයත්, ඒ වාගේම මහ ජනතාවත් ගැන හිතලා, කාගෙන්වත් සිදු වන වැරදි නිසා ඇති වන පාඩු පියවා ගන්න කටයුතු කරන්නේ නැතුව, හොඳ සැලසුම් ඉදිරියට ගෙනියලා සාධාරණ මිලකට, අඛණ්ඩව විදුලිය සැපයුමක් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඒ "කෝප්" වාර්තාවේ සඳහන් කර තිබෙන විධියට විදුලිබල මණ්ඩලයේ යම් යම් අක්‍රමිකතා වෙලා තිබෙනවා නම් ඒවාත් විභාග කර අවශ්‍ය පුද්ගලයන්ට දඬුවම් දීලා මේක නිසි මහට ගෙනෙන්න කියා ඉල්ලන අතර සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.28]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක් වෙන්න ලැබීම ගැන ප්‍රථමයෙන්ම මම සන්තෝෂ වෙනවා. 2009 අංක 20 දරන පනතේ වගන්ති කිහිපයක් අපගේ පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිනියගේ මේ යුගයේ සංශෝධනය කරන්න පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කිරීම ගැන; ඒ අවශ්‍යතාව ගැන අපි දැඩි ලෙස සන්තෝෂ වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ගරු කරු ජයසූරිය මැතිතුමා තමයි බොහොම සාධාරණව මේ ගැන බැලුවේ. මේ අමාත්‍යාංශයේ සිටි ඇමතිවරයකු හැටියට එතුමා දැන ගෙන සිටියා, විදුලිබල ක්ෂේත්‍ර පරිපාලනයේ තිබෙන අමාරුකම. ඒ නිසා කිසිම කුහකත්වයක් නැතුව එතුමා මේ විවාදයට සහයෝගය දක්වනවා. ඒක කාලෝචිතයි කීම මා ඇගයීමට ලක් කරනවා. මේ විවාදයේ අරමුණ දේශපාලන කර්තව්‍යයන් සඳහා පණිවුඩයක් ලබා ගන්න පාවිච්චි කරනවා නම් ඒක සුදුසු නැහැ කියන එක තමයි එතුමාගේ පණිවුඩයෙන් විදහා දැක්වුවේ.

අපි මෙහිදී දකින විශේෂම කාරණාව මේකයි. මේ පළාත්වල විදුලිය ලබා දුන් කෙනකුට ප්‍රශ්නයක් ඇති වුණාම ඒ අවශ්‍ය කටයුතු සඳහා ක්‍රියාත්මක වෙන්න අපේ ග්‍රාමීය මට්ටමේ ප්‍රාදේශීය ලේකම්තුමාට හෝ දිසාපතිතුමාට මීට කලින් අවස්ථාවක් තිබුණේ නැහැ.

එම නිසා විදුලිබල මණ්ඩලය මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගෙන මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ එකඟතාවත් සමඟ මෙම ක්‍රියාදාමයට පිවිස තිබෙනවා. නැත්නම් මේ කර්තව්‍යයට සෑහෙන කාලයක් යනවා.

විදුලිය සැපයීම සම්බන්ධයෙන් විපක්ෂයේ දිගටම තිබුණු ස්ථාවරය තමයි ගල් අඟුරු බලාගාර - coal power - ක්‍රියාත්මක කිරීමේ අඩු පාඩුවක් තිබෙනවාය කියන එක. මේ සම්බන්ධයෙන් දෙන විකල්පය මොකක්ද කියන්න විපක්ෂය දිගටම අපොහොසත් වෙනවා. ගල් අඟුරු බලාගාර එපා, ගල් අඟුරු හොඳ නැහැ, තාප බලාගාර හොඳ නැහැ, සුළං බලය - wind mills - පාවිච්චි කරන්න එපා කියලා විපක්ෂයෙන් කියන්නේ නැහැ. ඔවුන් විකල්පයක් යෝජනා කරන්නේ නැහැ. එකම දෙයයි කියන්නේ. මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමාත් කිව්වේ නොරොච්චෝලේ ගැනම තමයි. දවස් දෙකේම විපක්ෂයේ කථාවලට මූලික කථාව වුණේ නොරොච්චෝලේයි. නමුත් ගල් අඟුරුවලින් අපට අවශ්‍ය වන විදුලිය උත්පාදනය කිරීමට නොරොච්චෝලේ බලාගාරය පමණක් මදි. අපි දැන් සම්පූර් ගැනත් කල්පනා කරනවා. ඇයි ඒ? අනෙක් විකල්ප බලශක්ති ක්‍රම කොපමණ යෝජනා කළත් ලංකාවට සුදුසුම ක්‍රමය ඒක නිසා තමයි අපි මේ කර්තව්‍යයේ නියැලෙන්නේ.

විදුලිය සැපයීම සම්බන්ධව පෞද්ගලික අංශයත් සමඟ එකතු වෙලා වැඩ කරන්න කියන ගිවිසුමට එළඹෙන්නේ 1993 දීයි. 1993 දී ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන ඒක රජය අනුමත කළා. ඒ, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමාගේ යුගයේදීයි. ඒ අයගේ එකඟතාවක් මත විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක වුණා. ඊට පස්සේ වරින් වර පෞද්ගලික ගිවිසුම්වලට එළඹුණා.

විශේෂයෙන්ම 1994 සිට බැලුවොත් ඒ අවුරුදු 19න් අවුරුදු 16කට වැඩි කාලයක් අපි හිටියේ යුද්දයක් එක්කයි. ඒ නිසා අපට ගල් අඟුරු බලාගාර හෝ පෞද්ගලික අංශයට යොමු නොවී රජයේ මුදල්වලින් පමණක් විදුලිය උත්පාදනය කර ගැනීමට; විදුලිය ජනනය කර ගැනීමට හැකියාවක් තිබුණේ නැහැ. අපට සිද්ධ වුණා පෞද්ගලික අංශයට ආරාධනා කරලා ඒ අයගේ ආයෝජනත් සමඟ විදුලිය ජනනය කිරීම සඳහා ඒකාබද්ධ වැඩ සටහනකට යන්න. නමුත් විදුලිය සම්ප්‍රේෂණය - transmit - එහෙම නැත්නම් බෙදා හැරීම විදුලිබල මණ්ඩලයෙන් පරිබාහිරව කෙරුණු දෙයක් නොවෙයි. ලෝකයේ බොරතෙල් මිල බැලුවාම අපේ රටේ තිබුණු තත්ත්වයත් එක්ක අපි හොඳ පාලනයක් කළා කියලා මම හිතනවා. අද අපට මැසිවිල්ලක් තිබෙනවා විදුලි බිල වැඩියි කියලා. ඒක විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා. නමුත් ඒ හා සාපේක්ෂව විදුලිබල මණ්ඩලයේ තිබෙන මිලටත් විදුලිය සැපයීමට විශාල ඉල්ලුමක් තිබෙනවා. දැන් සැපයීම නවත්වන්නත් බැහැ. සැපයීම වැඩි කරන්නත් සිද්ධ වෙනවා. ඒක වැඩි කරන්න නම් ආයෝජනය කරන්න ඕනෑ. ආයෝජනය කරන්න මුදල් අවශ්‍යයි. ඒ නිසා අනාගතය ගැන කල්පනා කරලා ගරු ඇමතිතුමිය ඉතාමත් බුද්ධිමත්ව, සැලසුම් සහගතව මේ කටයුතු පරිපාලනය කරනවා. මේ අවස්ථාවේ අපි බොහොම සන්තෝෂයෙන් කියන්න ඕනෑ වර්තමාන අමාත්‍යාතුමිය; ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිනිය බොහෝම කල්පනාවෙන් අපේ මහ ජනතාව ගැන හිතලා, විදුලිබල මණ්ඩලය ගැන හිතලා, මහජන උපයෝගිතා කොමිසමෙන් උපදෙසුත් ලබා ගෙන, ඒ ඒ අයගේ කර්මාන්තශාලාවලට අවශ්‍ය නිෂ්පාදන ධාරිතාව ගැනත් හිතලා පොදු ජාතික වැඩසටහනක් එක්ක ක්‍රියාත්මක වනවාය කියන එක. මෙහිදී අතිශය වැදගත් වන්නේ මිල පාලනය කිරීමයි. මිල පාලනය කරන ගමන්ම අනාගත අවශ්‍යතාව සඳහා ආයෝජනය කරන්නත් ඕනෑ. මේ සඳහා රජයේ මුදල් ආයෝජනය කරන්න බැරි වුණු නිසා මෙතෙක් කල් කළ දේ තමයි පෞද්ගලික අංශයත් එක්ක ගිවිසුම් ඇති කර ගෙන ඒ අයටත් විදුලිය උත්පාදනය කරන්න අවසරයක් දෙන එක. ක්‍රමක්‍රමයෙන් ඒ ප්‍රතිශතය වැඩි වුණා. විදුලිබල මණ්ඩලයත් නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගෙන යනවා. යුද්ධය අවසන් වීමෙන් පසු පසු ගිය අවුරුදු තුන තුළ විදුලිය ඉල්ලුම වැඩි වෙලා තිබෙනවා.

2013 වසරේ සිට ඉදිරි වසර හතරක් පහක් දිහා බැලුවොත් වසරකට සියයට 3ක, 7ක වාගේ ප්‍රමාණයකින් විදුලිබල ඉල්ලුම වැඩි වන්න පුළුවන්. නමුත් සියයට 30ක් වාගේ ප්‍රමාණයකින් ඊළඟ අවුරුදු හතේදී විදුලි බල ඉල්ලුම වැඩි වන බවක් දකින්න තිබෙනවා නම්, ඒ ඉල්ලුම සපුරන්න රජයේ මුදල්ම ආයෝජනය කරලා විදුලි බලය උත්පාදනය කරන්න ගියොත් හැම වසරකම අපට මේ සඳහා පමණක් රුපියල් කෝටි ගණනක මුදලක් වෙන් කරන්න සිද්ධ වනවා. පෞද්ගලික අංශයේ දායකත්වය අඩු කරලා රජයෙන් පමණක් මේ විදුලි බල අවශ්‍යතාව සපුරන්න නම් ආයෝජන නවත්වන්න ඕනෑ.

මෙහිදී අපට තේරුම් කර ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. සංවර්ධනය වනවා නම්, සංවර්ධනයේ අවශ්‍යතාවට විදුලිය ලබා දෙනවා නම්, ඊට සාපේක්ෂව වර්තමානයේ තිබෙන සැපයුම කඩාකප්පල් කරන්නේ නැතිව අපි මේ ගමන යන්න ඕනෑ. කිසිම දවසක කිසිම මොහොතක විදුලිය ඇණ හිටීමක් කරන්නේ නැති ආසියානු කලාපයේම තිබෙන එකම රට අපේ රටයි. දැනුවත් කිරීමක් කරලා එක එක පළාත්වල යම් යම් repairs, maintenance සඳහා විදුලිය අත් හිටුවීම් සිදු කරනවා. ජාතිකමය වශයෙන් uninterrupted power supply කියන එකේ ගෞරවය අපට තිබෙනවා. විශේෂයෙන්ම ඒක ආයෝජකයාගේ පැත්තෙන් බැලුවොත් හරිම වැදගත් දෙයක්. රටකට ආයෝජකයින් එනකොට ඒ රටේ තිබෙන දේශපාලන ස්ථාවරභාවය හා යටිතල පහසුකම් ගැන බලනවා. යටිතල පහසුකම්වල අංක එක තමයි විදුලිය සම්පූර්ණයෙන් සැපයුම. ඊළඟට බලනවා, අපේ පළාත්වල තිබෙන වාහන පහසුකම්, ගුවන් තොටුපොළ සහ වරාය ගැන. මෙවැනි අත්‍යවශ්‍ය කාරණා පදනම් කර ගෙන තමයි අපේ රටට එන්න ආයෝජකයින් තීන්දු ගන්නේ.

ඊට සමගාමීව විදේශිකයින් ලංකාවට එන එක ගැන අපි කථා කරනවා නම්, ඒ තුළින් අපේ හෝටල් කර්මාන්තය වැඩිදියුණු වනවා. හෝටල් කර්මාන්තයේ අවශ්‍යතා රාශියක් තිබෙනවා. එහිදී විදුලිබල මණ්ඩලයෙන් කෙරෙන සේවාව අතිශය වැදගත් වනවා. ඒ නිසා මෙම වැඩසටහන බොහොම සැලසුම්සහගතව ක්‍රියාත්මක කළ යුතුයි.

අපි දන්නවා, අද ලංකාව පුරා දිස්ත්‍රික්ක හතරක සියයට 100ක්ම විදුලිබල අවශ්‍යතාව සපුරන්න පුළුවන් වී තිබෙන බව. සියයට 95ට වඩා වැඩි දිස්ත්‍රික්ක තුනක් තිබෙනවා. එහෙම බැලුවාම සියයට 80ට වඩා අඩුවෙන් විදුලිය සපයා ඇති දිස්ත්‍රික්ක කිහිපයක් පමණයි තිබෙන්නේ. එය සපුරාලීමට කටයුතු කරන ගමන් සංවර්ධනයේ අවශ්‍යතාව සහ ඉල්ලුමට සාපේක්ෂව විදුලිය සැපයීමට මේ ක්‍රියාත්මක කර ගෙන යන වැඩසටහන අතිශය සාර්ථකයි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මම තව එක දෙයක් කියන්න ඕනෑ. අඩුම මිලකට, සාධාරණ මිලකට විදුලිය ලබා දීමේ ක්‍රමයක් -අපේ රජයෙන් නොවෙයි- විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු මහත්වරු සලැසුම් කරලා තිබෙනවා. ඒ ඉංජිනේරු මහත්වරුන්ගේ සැලැස්මේ කොටසක් තමයි මේකත්. එය අපි ඇගැයීමට ලක් කරන්න ඕනෑ. මොකද ඒ විෂයය ගැන අවබෝධයක් ඇති පුද්ගලයන්ගෙන් සමන්විත විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කරන ලද, ඊට පස්සේ මහජන උපයෝගිතා කොමිසම විසින් අනුමත කරන ලද වැඩසටහනක් අනුව තමයි මෙය ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා මම හිතනවා, මෙය පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය බොහෝම කල්පනාවෙන් ක්‍රියාත්මක කර ගෙන යන වැඩසටහනක් කියලා. මේ සඳහා එතුමියට අපි සහයෝගය දක්වනවා. එතුමියගේ වැඩ අපි ඇගැයීමට ලක් කරනවා වාගේම, මේ කාලෝචිත සංශෝධන ඉදිරිපත් කිරීමත් ඇගැයීමට ලක් කරමින් මගේ කථාව මම මෙයින් නවත්වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාවට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)
I propose that the Hon. Janaka Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මොහොතක් අවසර දෙන්න. මගේ කථාවේදී ගරු ඇමතිතුමිය කිව්වා, පුත්තලම coal power එකට ගල් අහුරු මිලදී ගැනීමට අදාළව 2013 අවුරුද්දේ කැබිනට් පත්‍රිකාවක් දමා නැහැ කියලා. මම ඒ කැබිනට් පත්‍රිකාව දැන් ඉදිරිපත් කරනවා. 2013 මැයි 03 වැනිදා එතුමියමයි අත්සන් කරලා තිබෙන්නේ.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
නොරොච්චෝලේ සම්බන්ධව ඔබතුමා ඔය කථා කරන නෝබල් සමාගමට ටෙන්ඩර් එකක් ලබා දීම සම්බන්ධයෙන් මම කැබිනට් පත්‍රිකාවක් අත්සන් කරලා නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ කැබිනට් පත්‍රිකාවේ නෝබල් සමාගම ගැන තිබෙනවා.

ගරු පවිත්‍රාදේවි වන්නිආර-ච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
නෝබල් සමාගම ගැන තිබෙන එක හරි. ඔබතුමා මේ කියන්නේ 2009 එකක් ගැන නේ. මම අත්සන් කරලා ටෙන්ඩර් ප්‍රදානයක් කරලා නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට මේ සම්බන්ධයෙන් විවාදයක් ඕනෑ නැහැ. ඔබතුමිය කිව්වේ ඔබතුමිය සම්බන්ධම නැහැ කියලා. ඔබතුමියට අදාළ නැහැ කියලා. මේ කැබිනට් පත්‍රිකාව පොඩ්ඩක් බලන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්, ගරු අස්වර් මන්ත්‍රීතුමා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් නැඟිටලා මොකක්වත් table කරන්න කියලා ගේන්න බැහැ. කථාවේදී ඕනෑ නම් ඒක කරන්න තිබුණා. මේක සම්ප්‍රදායට විරුද්ධයි. ඒ ඉල්ලපු එක expunge කරන්න. ඒක කරන්න බැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එවැනි දෙයක් කරන්න ස්ථාවර නියෝග යටතේ ප්‍රතිපාදන නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

[අ.භා. 5.39]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත්, වර්තමාන විදුලි බිල ගැනත් කථා කරද්දී මට මතක් වෙනවා, මේ ආණ්ඩුව අසාධාරණ විධියට විදුලි බිල වැඩි කළ වෙලාවේ එක්තරා තාප්පයක ලියලා තිබුණු කවි පද දෙකක්.

"තෙල් මිල, විදුලි බිල වැඩි වී කුස ගින්නේ

ජනතා පැතුම් උදුරා ගෙන මර නින්දේ"

ඒ විධියට එහි සඳහන්ව තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අප්‍රේල් මාසයේදී - සිංහල අවුරුද්ද මාසයේදී සෞභාග්‍යවත් මාසයේදී- තමයි විදුලි බිල වැඩි කිරීමේ අභාග්‍ය සම්පන්න තීන්දු, තීරණවලට මෙතුමන්ලා එළැඹුණේ. ඒ වේලාවේ විදුලිබල ඇමතිතුමිය කිව්වා, විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියලා. මහජන උපයෝගීතා කොමිසම කිව්වා, එහෙම ඉල්ලීමක් කරලාත් නැහැ, අවශ්‍යතාවකුත් නැහැ කියලා. හැබැයි අපි ජනතාවට කිව්වා, "අවුරුද්දත් කිට්ටු කිට්ටු, විදුලි බිලට තට්ටු තට්ටු" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව මොකක්ද කළේ කියන එකත් ඒ වාගේම අපට මතකයි. හරියට අර "නිසේ අමාරුවට කොටිටේ මාරු කළා වාගේ" විදුලිබල හා බලශක්ති විෂයය පිළිබඳව ප්‍රායෝගික හා න්‍යායික දැනුමක් තිබුණු ඇමතිවරයා ඉවත් කරලා මේ ආණ්ඩුවේ ඉන්න ඉතාම දක්ෂ, පළපුරුදු, උගත් ඒ වාගේම දිස්ත්‍රික්කයේ බොහොම ඉහළ ප්‍රතිශතයකින් දිනන අපේ පවිත්‍රාදේවි අමාත්‍යාතුමියට මේ අමාත්‍යාංශය භාර දුන්නා. ඒ දෙන කොටම අපි දැන ගත්තා, අලුත් ඇමති මුහුණක් දාලා ආණ්ඩුව මේ විදුලි බිලට තට්ටු කරන්න තමයි ලැහැස්ති වෙන්නේ කියලා.

මේ අලුත් ඇමතිතුමිය යටතේ ඉතිහාසයේ පෙර නොවූ විරූ විදුලි බිලක් ගෙනාවා. ඒක මේ ලෝකයේ කවර රටකවත් ගෙනාපු ජාතියේ විදුලි බිලක් නොවෙයි. ජනතාවට අසූහාර දාහෙන් කරන්ට එක වද්දන විදුලි බිලක් තමයි තමුන්නාන්සේලා ගෙනාවේ. "මේ සන්ධාන ආණ්ඩුවේ සියලුම පව්, දූෂණ, අක්‍රමිකතා සියල්ලම ජනතාවගේ කරමත පටවපු විදුලි බිලක් තමයි ගෙනැල්ලා තිබෙන්නේ" කියලා විද්වතුන් පවා මේ වැඩි වීම ගැන අර්ථ දැක්වුවා. මේ විදුලි බිල නිසා ජනතා උද්ඝෝෂණ මතු වුණා. විදුලි බිල දැක්කාම බිල ගෙවන්න ගිය සමහර විදුලි පාරිභෝගිකයන්ට හෘදයාබාධ හැදිලා මැරුණා. එහෙම විදුලි බිලක් තමයි තමුන්නාන්සේලා ගෙනාවේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ විදුලිබල මණ්ඩලයේ සිදු වුණු සියලුම දූෂණ, අක්‍රමිකතාවල බර විදුලි බිල මහින් ජනතාව පිට පටවලා තිබෙනවා. අපි දන්නවා, අද වෙද්දී ලෝකයේ කොහේවත් රටක විදුලි ඒකකයකට ගෙවන්නේ නැති තරම් ජනතාවට දරා ගන්න බැරි විදුලි බිලක් අපට ගෙවන්න වෙලා තිබෙනවා කියලා. රුපියල් 53.49ක් වාගේ අසීමිත මිලක් අද අපට විදුලි ඒකකයකට ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේ වාර්තා තියලා අපේ රට ආශ්චර්යවත් රටක් බවට තමුන්නාන්සේලා පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට එරෙහිව ජනතා විරෝධතා දිගින් දිගටම එල්ල වෙද්දී, ජනතා විරෝධතා පළ කරලා මිනිස්සු වීදි බහිද්දී, රට පුරා පන්දම් පාලි යද්දී, තැනින් තැන කළු කොඩි එසවෙද්දී ආණ්ඩුව මැයි පළමු වැනි දා නැවතත් "චෙතිය" වර්ගයේ අසත්‍යයක් කියලා ප්‍රතිශත ගණන් විජ්ජාවක් පෙන්වලා සුපුරුදු විධියට ජනතාව ඇන්දවීමට කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැයි පළමුවැනි දා එහෙම කිව්වාට මිනිස්සු කියනවා, මනු කියවන්නා ගෙදරට ඇවිල්ලා ගිනි ගණනින් ලයිට් බිල අතට දීලා යන හැටි ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් දරා ගන්න බැරි ආර්ථික අමාරුකම් මැද්දේ මේ විදුලි බිල ගෙවද්දී ආණ්ඩුවේ සමහර ඇමතිවරු ලයිට් බිලට රුපියල් ලක්ෂයකට වැඩිය ජනතා මුදල්වලින් ගෙවන හැටි වාර්තා වුණා. මම දැක්කා, ආණ්ඩුවට කඩෙ යන ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිවරයාගේ 2013 ජනවාරි මාසයේ බිල රුපියල් 61,000යි, ගෙවන්නේ මහ ජන මුදලින් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති විෂයට අදාළව වැඩිම වැඩ කොටසක් ඉටු කළේ, වැඩිම ජලාශ ප්‍රමාණයක් ඉදි කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් කියන එක අපි අභිමානයෙන් කියනවා.

බලශක්ති උත්පාදනයට ලාභදායිම, ඒ වාගේම පරිසර දූෂණය අවම ජල විදුලි බලාගාර නිර්මාණය කිරීමේ පුරෝගාමී මෙහෙවර ඉටු කළේ වෙනත් කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඒවා කළේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු සමයන්හිදීයි. වික්ටෝරියා, කොත්මලේ, රන්ටැඹේ, කාසල්රී වැනි ජලාශ හදලා, ඒ වාගේම පළමුවැනි ජල විදුලි බලාගාරය වන ලක්ෂපාන වැනි බලාගාර හදලා අපේ රට නව මහකට යොමු කරනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු විසින් කියන එක මම ඔබතුමාට මතක් කරනවා. ඒ වාගේ ජල විදුලි බලාගාර හදද්දී අද වාගේ ගිනි පොළී ණය අරගෙන නැහැ. විදේශ ආධාර, ප්‍රදාන හැටියට අරගෙනයි අපි හුඟක් ඒවා හැදුවේ. මහා බ්‍රිතාන්‍යයෙන්, ජර්මනියෙන්, ස්වීඩනයෙන් අපේ ආණ්ඩුවට එදා ආධාර ගලා ගෙන ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොත්මලේ ජලාශය හැදුවේ ගිනි පොළී ණය අරගෙන නොවෙයි. ඒක තනිකරම ස්වීඩන් රටෙන් අපට ලැබුණු ආධාරයක්. වික්ටෝරියා ජලාශය තනිකරම බ්‍රිතාන්‍යයෙන් ලැබුණු තෑග්ගක්. ඒ නිසා තමයි මාග්‍රට් තැචර් අගමැතිනිය ඇවිල්ලා ඒක විවෘත කළේ. රන්ටැඹේ ජලාශය හැදුවේ තනිකරම ජර්මනියෙන් ලැබුණු ආධාරවලින්. මේවාට ශත පහක්වත් අද වාගේ ගෙවන්න වුණේ නැහැ. මේ රටේ ඉදි කළ ජල විදුලි බලාගාර 15න් දෙකක් හැරුණු කොට ඉතිරි 13ම හැදුවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් කියන එක අප මතක් කරන්න කැමැතියි. මේක තමයි මේ ආණ්ඩු දෙකේ තිබෙන වෙනස. ඒ සියලු විදුලි බලාගාර අද රටට අමිල මෙහෙවරක් ඉටු කරනවා. ආසියාවේ ආශ්චර්යය කෙසේ වෙතත්, දූෂණයේ ආශ්චර්යය බවට අපේ රට පත් කළ මේ ආණ්ඩුවේ විදුලි බලාගාර හරියට නිකම්, පය බරවායට පිටි කර බෙහෙත් බැන්දා වාගෙයි.

අද බලන්න, නොරොච්චෝලේ බලාගාරය දිහා. නොරොච්චෝලේ බලාගාරයයි, සන්ධාන ආණ්ඩුවයි දෙකම එක වාගේ කියලායි මා නම් දකින්නේ. සද්දේ විතරයි; වැඩ නැහැ. සතියක් වැඩ කළොත් මාසයක් වැඩ නැහැ; කොට උඩ. චීනයෙන් ගෙන්වන ලද යල් පැන්න කොමිස් ව්‍යාපෘතිවල පව්, ගිනි පොළී ණය බර අභිංසක ජනතාව පිට පටවලා ඉවරයි. ඒ නොරොච්චෝලේ බලාගාරයට රුපියල් කෝටි 17,500ක් වැය කළා ලු. චීනයේ එක්සිම් බැංකුවෙන් තමයි ණය ගත්තේ. වැඩිම ටෙන්ඩර් එක ඉදිරිපත් කළ සමාගමට තමයි ඒ ටෙන්ඩර් එක දුන්නේ. ඒ නිසා රජයට වූ පාඩුව විතරක්, රුපියල් කෝටි 200කට වැඩියි. ඒ බලාගාරය අවුරුද්දේ දින කීයක් වැඩද, දින කීයක් ලෙඩද කියලා ඇහුවොත් අපට දෙලෝ රත් වෙනවා ඇමතිතුමියනි. ඒ බලාගාරයේ පළමුවැනි අදියර හදන්න

ඇස්තමේන්තු මුදල රුපියල් කෝටි 3,900යි. අන්තිමට වැඩේ ඉවර වෙන කොට රුපියල් කෝටි 5,900ත් පැන්නා. මේ ආණ්ඩුවේ බාල වැඩ නිසා තවත් අමතර කෝටි 2,00කුත් මේකට යොදවන්න සිද්ධ වුණා. නොරොච්චෝලේ බලාගාරය මේ වික කාලයට විතරක් 24 වතාවක් අක්‍රිය වුණා. එය එක දිගට දින හතක් අක්‍රිය වුණාම රුපියල් මිලියන 210කට වැඩි පාඩුවක් සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි කියනවා 'යුගදනවි' කියලා ලස්සණ වචන දාලා හදපු බලාගාරය ගැනත් කියන්න කියලා. වැඩ කරන අහිංසක ජනතාවගේ සේවක අර්ථසාධක අරමුදල දාලා තමයි ඒවා හැදුවේ. මඟුල් බෙර ගහලා එය විවෘත කරද්දී, මෙයින් විදුලි ඒකක 100ක් නිෂ්පාදනය කරන කොට තවත් අමතර ඒකක 100ක් ඉබේටම නොමිලේ නිෂ්පාදනය වෙනවා කියලා පම්පෝරි ගැහුවා. ඒ මොන කතන්දර කිව්වත් අද අන්තිමට ඒ දූෂිත ගනුදෙනුවල බරත් විදුලිය බිල මඟින් ජනතාවට අසාධාරණ විධියට පටවලා තිබෙනවා කියලා අප කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට අපේ රටේ ජල විදුලි බලාගාර ආශ්‍රිත ප්‍රදේශවලට, ජල පෝෂක ප්‍රදේශවලට අනෝරා වැසි ලැබෙන කාලයක් උදා වෙලා තිබෙනවා. ජලාශ සියල්ල සියයට සියයක් පිරිලා ඉතිරිලා ගිහින් තිබෙනවා; වාන් දමලා තිබෙනවා. ඇමතිතුමියගෙන් මම අහනවා, "කෝ, ඒවායේ ප්‍රතිලාභ ජනතාවට දුන්නාද?" කියලා. අවාසනාවට මේ ආණ්ඩුවෙන් ජනතාවට ලැබෙන්නේ ප්‍රතිලාභ වෙනුවට ප්‍රතිප්‍රහාරයි කියන එක තමයි අපට කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ජලය පිරුණු සමහර ජලාශ හිස් කරලා නඩත්තු කරන්න පටන් ගෙන තිබෙනවා. මේවා ඔක්කෝම අද සැකසහිත දේවල් ලෙස රටේ ජනතාව දකිනවා. කොත්මලේ ජලාශය මීට මාස එකහමාරකට කලින් හිස් කරලා ශුද්ධ කරනවා කිව්වා.

වහින කාලයටම තමයි මේවා කරන්නේ. එම නිසා රටේ ජනතාව මේ ගැන බලන්නේ වපර ඇහෙන්. මේවා මේ විධියට සිදු කරලා, ජල විදුලිය ප්‍රයෝජනයට නොගෙන පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් ගිනි ගණුනට තාප විදුලිය ගන්න එක ගැන අද රටේ ජනතාවට ලොකු කුතුහලයක් තිබෙනවා. ඒ හේතුව නිසා දිනකට සිදු වන පාඩුව රුපියල් මිලියන 110ක්, විතර වනවා. මේ සියලුම පව් බුලත් කොළයට කතිරය ගහපු අයටයි, බුලත් කොළයට කතිරය නොගහපු අයටයි කියලා භේදයක් නැතුව තමුන්නාන්සේලා විසින් අද අපේ රටේ අහිංසක ජනතාව මත පටවා තිබෙන බව අපි දකිනවා.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර ගැළපුම් ගාස්තු, මේ ගැළපුම් ගාස්තු කියලා විදුලි බිලෙන් ජනතාව ගසා කන හැටි අපට පෙනෙනවා. මෙපමණ ජලාශ පිරී ඉතිරී ගිහින් තිබියදී තමුන්නාන්සේලාට තවම බැරි වුණා, සියයට පහළොවේ ඉන්ධන ගැළපුම් ගාස්තුව ඉවත් කර ජනතාවට සහනයක් දෙන්න. ආණ්ඩුව කලින් නම් කිව්වේ, "මේ ඉන්ධන ගැළපුම් ගාස්තුව අපි දමන්නේ නියහය නිසා. වැස්ස ප්‍රමාණවත් විධියට ලැබුණු ගමන් ඉන්ධන ගැළපුම් ගාස්තුව ඉවත් කරනවා" කියලායි. අද ඒ ඉන්ධන ගැළපුම් ගාස්තුව ඉවත් කරන්නේ නැතුව ආණ්ඩුව මුනිවත රකින එක ගැන අපි කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකා විදුලිබල මණ්ඩලය ජනතා මුදල් කාබාසිනියා කරන බහිරවයකු බවට පත් වෙලා තිබෙනවා. COPE වාර්තාව ඒ සම්බන්ධයෙන් හොඳට සාක්ෂි දරනවා. මහජන මුදල් ගිල දැමීම ගැන කප් ගහපු ආයතනයක් බවට අද වන කොට ලංකා විදුලිබල මණ්ඩලය පත් වෙලා ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට මෙම ආයතනය සම්පූර්ණයෙන්ම නිලධාරි මාෆියාවට යටත් වෙලා. ජල විදුලි බලයේ අතිරික්තයක් තිබියදීත් හිතාමතාම බලාගාර අක්‍රිය කරලා පෞද්ගලික සමාගම්වලින් ගිනි ගණුනට විදුලිය මිලට ගන්න එක අද අපේ රටේ ප්‍රසිද්ධ රහසක් බවට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවේදී යැයි කෑ මොර දුන් ආණ්ඩුවක්, මේ වැරදි නතර කරලා ජනතාවට සංවේදී වන්න තරම් සංවේදීකමක් තිබුණු බවක් අපට මේ කොයිම අවස්ථාවකදීවත් දකින්න නොලැබුණු එක ගැනයි අපට තිබෙන කනගාටුව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. මා කනගාටු වනවා, අපට මේවා ගැන අහන්න ඇමතිතුමිය මේ සභාවේ නොසිටීම ගැන. ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරික්ත සේවකයන් ඉන්නවාය කියනවා. මෙපමණ අතිරික්ත සේවකයන් ඉන්නවාය කියන ලංකා විදුලිබල මණ්ඩලය, සමහර ප්‍රදේශවල විදුලිය විසන්ධි කිරීම් පවා කොන්ත්‍රාත් දීලා පිට උදවිය දමලා තමයි කරන්නේ. පොඩ්ඩ වැරදුණ ගමන් අර පිස්සා පොල්ල ගත්තා වාගේ උන්නැහේලා ගිහිල්ලා විදුලිය කපන හැටි හැම පළාතකින්ම අපට වාර්තා වනවා. යූඑන්පී ආණ්ඩුව කාලයේ විශාල වශයෙන් ලාභ ලබන ආයතනයක් බවට ලංකා විදුලිබල මණ්ඩලය පත් වෙලා තිබුණා. අද මේ ආණ්ඩුව යටතේ මෙම තත්ත්වය උදා වුණේ වෙන මොකක්වත් නිසා නොවෙයි, දූෂණයයි, වංචාවයි, අකාර්යක්ෂමතාවයි, වැරදි කළමනාකරණයයි නිසාය කියන එක අපි කියන්න ඕනෑ.

අවසාන වශයෙන්, මහජන උපයෝගිතා කොමිසම කියන්නේ මොකක්ද කියන එක ගැන මා කියන්න කැමැතියි. මෙම කොමිසම, මහ ජනතාවට උපයෝගි නොවී, රජයට උපයෝගි වුණු, විදුලි බිල වැඩි කිරීමට රජයට කඩේ ගිය, ජනතා අදහස් තඹ දොයිතුවකට මායිම් කරන්නේ නැතුව මිල වැඩි කිරීමට කටයුතු කරපු කොමිසමක් කියන එක අද ජනතාව අතරට ගිහින් ඉවරයි. ජලාශවල ජලය පිරී තිබියදී, ඒවා හිස් කරලා නඩත්තු කටයුතු කරන්න තරම් මන්ද බුද්ධික තත්ත්වයට පත් වීම ගැන අපි කනගාටු වනවා. අපි ඇමතිතුමියට කියනවා, නව ඇමතිවරිය හැටියට මේ සම්බන්ධයෙන් කල්පනා කර ඉක්මන් තීන්දුවක් දෙන්න කියලා.

අන්තිම තත්පරයේ එතුමියගෙන් අහන්න කාරණා දෙකක්, තුනක් විතරක් තබා ගෙන සිටියත් එතුමිය මේ සභාවේ නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයයි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි පාඩු ලබද්දී, ඒවා ලාභ ලබන රාජ්‍ය ආයතන බවට පත් කරන්න අපට පුළුවන් වුණා. 2002 යූඑන්පී ආණ්ඩුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන්ටයි, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ටයි ඉතිහාසයේ වැඩිම ප්‍රතිශතයකින් - සියයට 42කින්- වැටුප් වැඩි කළා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඇස්තමේන්තු මුදලට වඩා රුපියල් බිලියන ගණුනක ලාභයක් ලබද්දී, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ සියයට 8 හිහ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වැටුප දෙන්නට ක්‍රියා කරනවාද කියන එක එතුමියගේ පිළිතුරු කථාවේදී දැන ගන්න කැමැතියි කියන එක ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 5.51]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පැවැත්වෙන මෙම විවාදයේදී "බලය"පිළිබඳ කොටස ගැන පමණක් මට තිබෙන මේ කෙටි කාලය තුළ කථා කරන්න බලාපොරොත්තු වෙනවා. පක්ෂය අතහැර යන්නේ නැතැයි ඊයේ සපථ කළ, එක්සත් ජාතික පක්ෂය දිනවන්නට ජීවිත පරිත්‍යාගයෙන් සටන් කරනවාය කියලා ඊයේ අප සමඟ කියපු, අපේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ධනය, බලය සහ වරප්‍රසාද වෙනුවෙන් අපේ ආදරණීය පක්ෂය පාවා දීපු දවසේ, ඒ කනගාටුවත් එක්ක දීර්ඝව කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

අද දින කළ ඒ පාවා දීම නරඹන්නට මේ පාර්ලිමේන්තුවේ ගැලරියට පැමිණ, අපේ මිත්‍ර නීතිඥ ශිරාල් ලක්තිලක මැතිතුමා සහ නීතිඥ මෛත්‍රී ගුණරත්න මැතිතුමා ඒ ගැන සතුටින් ප්‍රතිචාර දක්වමින් මේ ගරු සභාවේ ගැලරිය තුළ කටයුතු කළ ආකාරය දෙ ඇසින් දුටු කෙනකු හැටියට මා කියන්නට කැමතියි, පසු ගිය කාලය පුරා එක්සත් ජාතික පක්ෂයේ අඩු පාඩු පෙන්වා දෙන බව කියමින්, නායකත්වයේ අඩු පාඩු පෙන්වා දෙන බව කියමින් මේ පිරිස කර ඇත්තේ මහත් වූ රැවටීමක් බව. අද මට ඒ බව සපථ වෙනවා; තේරුම් යනවා. අපේ මිත්‍ර දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මා රැවටුවා; මගේ පක්ෂය රැවටුවා; මගේ රට රැවටුවා. අද දවස මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත්, එක්සත් ජාතික පක්ෂයටත්, පෞද්ගලිකව දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතයටත් කනගාටුදායක දවසක් බව කියමින් මා නතර වෙනවා.

[අ.භා. 5.57]

ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வலு, சக்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ විදුලි ක්ෂේත්‍රයට අවශ්‍ය ඉතාම වැදගත් නීතිමය සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරන්නට ලැබීම ගැන මා පළමුවෙන්ම බොහොම සන්තෝෂ වෙනවා. විශේෂයෙන් මේ මොහොත, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය පෙරදැරි කර ගෙන ලබන වසර වන විට සියලු ලක්වාසීන්ට ම - මේ රටේ ජනතාවගෙන් සියයට සියයකට ම- විදුලිය ලබා දීලා ඉවර කරන්න කටයුතු කරන මොහොතක්. ඒ වාගේම විදුලි ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම කියන මේ කාර්යයන් ඉටු කිරීම ඉතා කාර්යක්ෂමව, රටට හිතකර විධියට, රටේ සියලුම ජනතාවට විදුලිය ලබා දීමේ අරමුණ මුල් කර ගෙන කටයුතු කරන වකවානුවක්. මේ රටේ ශීඝ්‍ර සංවර්ධනයක් සිද්ධ වෙන මේ මොහොතේ, මේ රට විශාල ආර්ථික දියුණුවකට ගෙන යන මේ මොහොතේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් පටන් ගැනීමට අප කටයුතු කර තිබෙනවා. සංවර්ධනය ශක්තිමත් කරන්න මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන විදුලි ඉල්ලුමට සරිලන විදුලිය සැපයීමේදී අපට ශක්තිමත් නීති රාමුවක් අවශ්‍යයි. නීති රාමුවක් වාගේම ක්‍රියාත්මක වැඩ පිළිවෙළකුත් අපට අවශයයි. ව්‍යාපෘති ගැන කථා කරන විට මේ සභාවේ නොයෙකුත් කතන්දර කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සවස 6.20 පමණ වන විට මගේ කථාව නතර කරන්නට ඕනෑ නිසා මා දීර්ඝව ඒ ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

මට කියන්න තිබෙන්නේ 1982 සිට මේ රටේ විදුලි ජනන සැලැස්මේ ගල් අඟුරු බලාගාර සැදීමේ සංකල්පය තිබුණු බවයි. මොකද ඒ වන විට ජලය පාවිච්චි කරලා හැදිය හැකි විශාල බලාගාර ටික හදලා අවසන් වෙලා තිබුණා. ඉන් පසු රටේ අවශ්‍යතාවට ගල් අඟුරු බලාගාර හදන්න ඒ හිටපු කිසිම දේශපාලන නායකයකුට ධෛර්යයක් තිබුණේ නැහැ. ඒ නිසා අප ඒ ගැන පුදුම වන්නේ නැහැ. රටේ NGOs විරුද්ධ වෙන කොට, පරිසරවේදීන් කියන අය විරුද්ධ වෙන කොට, ප්‍රභාකරන් ඉස්සරහා දණ ගහපු, ප්‍රභාකරන්ට පන්දම් අල්ලපු එක්සත් ජාතික පක්ෂයේ නායකයන්ට මේවා හදන්න ධෛර්යයක් නොතිබීම ගැන අප වැඩිය කලබල වන්නෙත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1982 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ත්‍රිකුණාමලයේ ගල් අඟුරු බලාගාරය හදලා 1989 දී එය අවසන් කරන්නත් සැලසුම් කළා. හැබැයි එය හැදුවේ නැහැ. ලත් කැනම ඒවා ලොප් වුණා. රණසිංහ ප්‍රේමදාස මහත්මයා 1992 දී දකුණේ එවැනි බලාගාරයක් හදන්න සියලු කටයුතු කළා. හැබැයි NGOs විරුද්ධ වෙන කොට, දේශපාලන වාසි බලාගෙන එතුමාත් ඒ කටයුතු නැවැත්තුවා. 1999 දී චන්ද්‍රිකා මැතිනිය පවා නොරොච්චෝලේ බලාගාරය හදන්න කටයුතු කරන කොට යම් යම් ආගම් විරෝධීන් සහ විවිධ බලපෑම් ආපු නිසා ඒ ධෛර්යය නැතිව එතුමියත් ඒක නැවැත්තුවා. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය කියන වැඩ පිළිවෙළේ තිබෙන ප්‍රබලත්වය නිසා මේ ධෛර්යවන්ත නායකයා බලයට පත් වුණාට පස්සේ, 2006 දී නොරොච්චෝලේ බලාගාරයේ වැඩ කටයුතු පටන් ගත්තා.

කරු ජයසූරිය මැතිතුමා ඉහළ කොත්මලේ බලාගාරය ගැන කිව්වා. නමුත් ඒ ඇමතිවරුම කැබිනට් මණ්ඩලයේ තියාගෙන, ඒවා පටන් ගන්න ඒ නායකත්වය, ඒ ධෛර්යය තිබුණේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පමණයි. ඒ නිසා කමයි අපට අද විදුලිබල අර්බුදයට යම් මට්ටමකට විසඳුම් සොයා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපට මතකයි, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සාමය තිබුණෙත් නැති බව. 1982න් පස්සේ බලාගාර හැදුවෙත් නැහැ. විදුලිය තිබුණෙත් නැහැ. එක්දහස්නවසියඅසූ ගණන්වල මේ රට කළුවරේ තිබුණේ නැද්ද? 1989, 1991, 1992 සහ 1993 කාලවල මේ රට පැය ගණන් කළුවරේ තිබුණේ නැද්ද? කරු ජයසූරිය මැතිතුමා 2002 දී විදුලිබල ඇමති වුණාම එතුමාට නමක් පට බැඳුණේ නැද්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ විදුලි ජනන සැලැස්මේ තිබෙන බ්‍රෝඩ්ලන්ඩ් බලාගාරය බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. JANAKA BANDARA *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප උමා ඔය බලාගාරයේ වැඩ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් බ්‍රෝඩ්ලන්ඩ් බලාගාරයේ වැඩ කටයුතු මේ මාසයේ ආරම්භ කළා. ඒ වාගේම ඉතා අඩු වියදමින් විදුලිය ජනනය කිරීම සඳහා සකස් කළ නොරොච්චෝලේ බලාගාරයේ දෙවැනි අදියරේ කටයුතු දැන් අවසන් වෙමින් පවතිනවා. මේ රජයට තිබෙන සැලැස්ම අනුව අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අපට උපදෙස් ලබා දී තිබෙනවා, මහ පෙන්වලා තිබෙනවා පෞද්ගලික ඉන්ධන බලාගාරවලට යන්න එපාය කියලා. ඒ සංවර්ධන ක්‍රියා දාමයේදී රජයක් විධියට තීන්දු ගන්න කොට, එතුමා ඉතා නිවැරැදිව තීන්දු, තීරණ අරගෙන තිබෙනවා. අඩු වියදමකින් විදුලිය නිපදවන නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ දෙවැනි අදියරේ වැඩ කටයුතු අවසන් කරලා මේ අවුරුද්දේ අප එය ජාතියට දායාද කරනවා. එයින් තවත් විදුලිය මෙගාවොට් 300ක් ලබන අවුරුද්දේ මේ රටට ලබා දෙනවා. අප ඒ කටයුතු කරගෙන යන කොට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඇවිත්, උත්තර දෙන්න බැරි මගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නම සඳහන් කරමින් ඉතාම සාවද්‍ය චෝදනාවක් ඉදිරිපත් කළා. ඒ ගැන මා ඉතාම කනගාටු වෙනවා. මම කිව්වත්, නොකිව්වත් කවුරුත් අවිවාදයෙන් යුතුව පිළිගන්නවා ෆර්ඩිනැන්ඩු මැතිතුමා කියන්නේ මේ රටේ ඉන්න ඉතාම දක්ෂ පරිපාලන නිලධාරියෙක් බව. එතුමා තමන්ගේ සියලු කැප කිරීම් කරලා විදුලිබල ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම එතුමා ඉතාම අවංකව, මේ හැම කටයුත්තකටම අවශ්‍ය නීත්‍යානුකූල පියවර අරගෙන තිබෙනවා.

එතුමා මට චෝදනා කළා, 2009 වර්ෂයේ ලබා දීපු ටෙන්ඩර් එකක් ගැන. මේ අවුරුද්දේ මැයි මාසයේ ටෙන්ඩර් එකක් දැම්මා කිව්වා, නෝබල් සමාගමට දෙන්න. එහෙම එකක් සිදු වුණේ නැහැ. එතුමා බාගෙට දැනගෙනයි කථා කළේ. මම ඒකයි කිව්වේ, "බොරු කියන්න එපා" කියලා. නෝබල් සමාගමට ගල් අඟුරු ටෙන්ඩර් එක ලබා දුන්නේ 2009 අවුරුද්දේයි. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණ හා මූල්‍ය කොන්දේසිවලට අදාළව අඩුම ලන්සුව ඉදිරිපත් කරපු නෝබල් සමාගමට ඒක ලබා දීලා තිබෙන්නේ රටේ නීතියට අනුවයි. ඒ වාගේම ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියත් ලැබී තිබෙනවා. තමුන්නාන්සේලාට නොයෙකුත් කථා කියන්නට පුළුවන්. ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමාගේ කාලයේ ඒ ගල් අඟුරු බලාගාරය පටන්ගත්තා. ඒ අවශ්‍ය ටෙන්ඩර් ලබා දුන්නා. ඒවා ඉතාම නීත්‍යානුකූලයි. මේ ගරු සභාවට ඇවිල්ලා උත්තර දෙන්නට බැරි නිලධාරියෙකු ගැනයි එතුමා කථා කළේ. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එවැනි දේශපාලන සංස්කෘතියක් මේ සභා ගර්භය තුළ නිර්මාණය කිරීම ගැන මා ඉතාම කනගාටු වනවා. මොකද, එතුමන්ලාටත් අවශ්‍යයි, රජය යන මේ ගමනට බාධා පමුණුවන්නට. මේ රටේ අවංක, දක්ෂ නිලධාරීන්, කාර්යක්ෂම නිලධාරීන්, රට ඉදිරියට ගෙන යන්නට කැපවීමෙන් කටයුතු කරනවා. අමතක කරන්න එපා, රජයක් කියන්නේ ඇමතිවරුන් විතරක් නොවන බව. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය විතරක් නොවෙයි, රටේ සිටින නිලධාරිනුත් එයට විශාල දායකත්වයක් ලබා දෙනවා. එම නිලධාරීන්ගේ දායකත්වය අනුව තමයි අමාත්‍යාංශ සහ අනෙකුත් සියල්ල එකට කැටි වෙලා යන්නේ. ඇමතිවරයෙකුට තනියෙන් අමාත්‍යාංශයක් ගෙන යන්නට බැහැ. මම මේ වෙලාවේ මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා කරන ඒ සේවය ඉතා ඉහළින් අගය කරන අතර, එතුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන් කරන කැපවීම ගැන මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ ගරු සභාපති ඩබ්ලිව්.බී. ගනේගල මැතිතුමා, ඒ වාගේම සාමාන්‍යාධිකාරී එන්.කේ. මොහිඩීන් මැතිතුමා ඇතුළු ඉතාම දක්ෂ, ඉතාම කාර්යක්ෂම, ඉතාම කැපවීමකින් වැඩ කරන එම නිලධාරීන්ට මගේ ස්තුතිය පුද කරනවා.

මම මේ කියාගෙන ආවේ, විදුලි ජනනය ගැනයි. අපි මේ විදුලි ජනන සැලැස්ම හදාගෙන යනවා. මෙගාවොට් 500ක සාම්පූර් බලාගාරයේ වැඩ පටන් ගැනීම සඳහා ඉන්දියානු ආණ්ඩුවත් එක්ක ගිවිසුම් අත්සන් කරන්නට මේ අවස්ථාවේ දී අමාත්‍යාංශය විධියට අපි ලඟි ලඟියේ කටයුතු කරගෙන යනවා. මේ රටට අවශ්‍ය විදුලිය ඉතාම අඩු මුදලකට ජනතාවට ලබා දීම සඳහා විදුලි බලාගාර ඇතිකර විදුලිය ජනනය කිරීම සඳහා අපි වැඩ පිළිවෙළ සකස් කරගෙන යනවා. මේ කටයුතු කරගෙන යනකොට අපට පෙනී ගිය දෙයක් තමයි, ඒ සඳහා තිබෙන අණපනත්වල නීතිමය රාමුවේ යම් කිසි පරතරයක් - gap එකක් - තිබෙන බව. මේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යන්න, ඵලදායීව කරගෙන යන්න, ඒ තිබෙන නීතිමය රාමුවේ යම් යම් ප්‍රශ්න තිබෙනවා. අපි ඒ ප්‍රශ්න දැකපු නිසා තමයි විදුලිබල පනතට අද මේ සංශෝධන ගෙනෙන්නේ. මේවා එකින් එක අරගෙන බැලුවොත් මේ පනතේ සංශෝධනවල තිබෙනවා, මීන් පසුව මේ රටේ විදුලි ජනන පද්ධතියට හිතෙන හිතෙන විධියට, හිතෙන හිතෙන ආකාරයට නොයෙකුත් වැඩි මිල ගණන්වලට, ආයෝජන ගෙනෙන්න බැහැ කියලා. තවදුරටත් මේ සංශෝධනවල තිබෙනවා, විදුලිබල මණ්ඩලය විසින් සකස් කරනු ලබන Least Cost Long Term Generation Expansion Plan එක මහජන උපයෝගීතා කොමිසමෙන් අනුමත වුණාට පසුව ඒ අනුව තමයි මේ රටට ගෙනෙන්නේ LNGද, මේ රටට ගෙනෙන්නේ ගල් අඟුරුද, මේ රටට ගෙනෙන්නේ තාප බලාගාරද, මොන ආකාරයේ රටට හිතකර බලාගාරද මේ රටට ගෙනෙන්නේ කියන එක තීරණය කරන්නේ. ඒ සියලු කරුණුත් සමඟ මේ රටට අවශ්‍ය වන පුනර්ජනනීය බල ශක්ති ප්‍රමාණය ඉතාම අඩු වියදමකින් මේ රටේ ජනනය කිරීම සඳහා විදුලිබල මණ්ඩලය අවුරුදු 10කට හදන ඒ ජනන සැලැස්ම මහජන උපයෝගීතා කොමිසමෙන් අනුමත කිරීමෙන් එම සැලැස්ම මේ සංශෝධනය තුළ නීතිගත වනවා. ඊට පසුව අර වැඩි ගණනට, මේ වැඩි ගණනට කියලා ඕනෑ ඕනෑ විධියට කතන්දර කියන්න පුළුවන්කමක් නැහැ.

මේවායේ අපි දැක්ක අඩු පාඩු කිහිපයක් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, පුනර්ජනනීය බල ශක්තිය මෙගාවොට් 10ක් දක්වා අපි අද ලබා දීලා තිබෙනවා. පුනර්ජනනීය බල ශක්ති ව්‍යාපෘති අද රටේ ක්‍රියාත්මක වනවා. මේවා ටෙන්ඩර් කැඳවීමකින් තොරවයි හැදෙන්නේ. සූර්ය බලාගාර වන්නට පුළුවන්, එහෙමත් නැත්නම් සුළං බලයෙන් ක්‍රියාත්මක වන බලාගාර වන්නට පුළුවන්. එහෙම නැත්නම් ජල විදුලි බලාගාර වන්නට පුළුවන්.

මෙතෙක් මේ රටේ නීතියක් තිබුණේ නැහැ; නීතිමය රාමුව තුළට ඇතුළු කරලා තිබුණේ නැහැ, මේ ආයතනවලින් විදුලිය මිලදී ගැනීම කොහොමද නීත්‍යානුකූල වෙන්නේ කියලා. මහජන උපයෝගිතා කොමිසම හා විදුලිබල මණ්ඩලය එක්ව නියම කරන මිල ගණන්වලට ආයතනවලින් විදුලිය මිලදී ගත්තත් ඒවායේ නීතිමය තත්ත්වය ශක්තිමත් කරලා තිබුණේ නැහැ. ඒ නිසා අද ඒ නීතිමය සංශෝධන අපි ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මේ

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

සභාව සතුටු වෙන්න ඕනෑ, අද විදුලිය ඉල්ලන අයට සියයට 100ක්ම විදුලිය ලබා දෙන කොට. මගේ දිස්ත්‍රික්කයේ මගේ හිතමිත්‍ර වාසුදේව නානායක්කාර ඇමතිතුමා වාගේ අයත්, අපේ මේ මැතිතුමන්ලාත් මේ ගැන වඩාත් සතුටු වෙයි. මේ රටේ මිනිසුන්ට විදුලිය ලබා ගැනීමට connection charge එක නැත්නම් සම්බන්ධතාව ලබා ගැනීමට ඉස්සර රුපියල් ලක්ෂ ගණන් වැය වුණා; අද අපි ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා, ගේ ඉස්සරහ හිටවන කණුව දක්වාම විදුලිබල මණ්ඩලයෙන් ඒ වියදම දැරිය යුතුයි කියලා. එතකොට රුපියල් ලක්ෂ ගණන් ඒ අයට වැය වෙන්නේ නැහැ. ඊට පස්සේත් ලබා දෙන සම්බන්ධතාව වෙනුවෙන් අය කරන රුපියල් 30,000ක මුදල තමන්ගේ විදුලි බිලෙන් වාර්ෂිකව අවුරුදු පහකින් අය කර ගැනීමටත් සංශෝධන අපි මේ පනතට ඇතුළත් කරලා තිබෙනවා.

ග්‍රාමීය ජල විදුලි යෝජනා ක්‍රම තිබෙනවා. ආර්ථික වාසි ලබා ගන්නේ නැති, තමන්ගේ ප්‍රදේශයට විදුලිය ලබා ගන්න පුළුවන්, අහිංසක මිනිසුන්ට විදුලිය ලබා ගැනීම සඳහා ගම්වැසියන් විසින් ක්‍රියාත්මක කරන කුඩා ජල විදුලි බලාගාර තිබෙනවා. මේ අයට විදුලි උත්පාදනයට, සම්ප්‍රේෂණයට බලපත්‍ර ලබා ගන්න ගියොත් විශාල මුදලක් වැය වනවා. ඒවා නීතිගත කරලා, මේ බලපත්‍ර ලබා ගැනීම සහ ඊට අදාළ ඉතිරි කටයුතු කිරීමෙන් නිදහස් කිරීමට මේ පනතට සංශෝධන අපි ගෙනැත් තිබෙනවා, පසු ගිය පනත්වල තිබුණු අඩුපාඩු දැකලා.

ප්‍රාදේශීය ලේකම්වරුන්ට විදුලි විරෝධතා සඳහා තීන්දු ගැනීමේ බලය මේ සංශෝධනවලින් අපි ගෙනැත් තිබෙනවා. රටක් විධියට අපි තේරුම් ගන්නට ඕනෑ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, මේ ආණ්ඩුව අද ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද කියලා. මේ රටේ සමස්ත ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් සිද්ධ වෙන කොට විදුලිබල ක්ෂේත්‍රයේ අපි යන්නේ සංයුක්ත සැලැස්මකට. තමුන්නාන්සේලාට කට තිබෙනවාට මේ සභාවේ ඕනෑ දෙයක් කියන්න පුළුවන්. විදුලිබල මණ්ඩලයේ යම්කිසි දුෂණයක් තිබෙනවා නම් ඇයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරන්න බැරි? ඇයි, යන්න බැරි පොලීසියට? ඇයි, මෙන්න මෙතැන මේ දූෂණය සිද්ධ වෙනවායි කියලා අපට පෙත්සමකින් හෝ ලිඛිතව දැනුම් දෙන්න බැරි? මම කිසි වෙලාවක භිය වෙන්නේ නැහැ; කිසි වෙලාවක පැකිළෙන්නේ නැහැ, ඒවාට පරීක්ෂණ කරන්න. නිකම් කට තිබෙනවාට කියලා හරි යන්නේ නැහැ. නීත්‍යානුකූලව, ඉතාම නිවැරදිව, ඉතාම පාරදෘශ්‍යව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ කටයුතු ක්‍රියාත්මක කරනවායි කියන එකට මේ අවස්ථාවේදී මෙම ගරු සභාවට මම ප්‍රතිඥා දෙනවා.

මම දීර්ඝව කථා කරන්න ගියොත් කථා කළ හැකි කාරණා බොහොමයක් තිබෙනවා. විශේෂයෙන්ම LTL සමාගම ගැන කිව්වා. හැම දාම මේ ගැන කියන කොට මේකට දිගටම උත්තර නොදී හිටියොත් එහෙම හිතනවා, අපි මේ හැම දෙයක්ම අනුමත කරනවායි කියලා. විදුලිබල මණ්ඩලයට LTL සමාගමේ කොටස් තිබෙන්නේ 63යි. රුපියල් මිලියන 97ක් විදුලිබල මණ්ඩලය LTL සමාගමට ආයෝජනය කරලා තිබෙනවා. හැබැයි ඒ සමාගම ලාභය වශයෙන් රුපියල් මිලියන 2,858ක් විදුලිබල මණ්ඩලයට ගෙවලා තිබෙනවා. මේ ගැන තමුන්නාන්සේලා කථා කරන්නේ නැහැ.

දීර්ඝව කථා කළ යුතු යැයි මා විශ්වාස කරන්නේ නැහැ. විශේෂයෙන්ම නැවත වතාවක් මම මතක් කරන්නට ඕනෑ, බලශක්ති අර්බුදය මුළු ලෝකයම කථා කරන මාතෘකාවක් බව. ඉන්ධන පිරිමැස්ම, බලශක්ති අර්බුදය වැනි මේ මාතෘකාවලට අද ලොකු සමාජ, දේශපාලනමය වටිනාකමක් ලැබිලා තිබෙනවා. ඒ නිසා මේවාට ආර්ථිකමය වටිනාකමකුත් ලැබිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, බලශක්ති අර්බුදය අද මුළු ලෝකයම අර්බුදයක් ලෙස සලකනවා.

මේකට විසඳුම් සෙවීම මේ පාර්ලිමේන්තුවේ සිටින අපි 225 දෙනාගේම වගකීමක් කියලා මම හිතනවා. ඒකට දේශපාලනය ගාවා ගෙන තමුන්නාන්සේලා පසු ගිය දවස්වල strike එකක් කළා. සාර්ථක වුණාද? මේ රටේ ජනතාව ඒ වැඩ වර්ජනයට සම්බන්ධ වුණාද? නැහැ. මොකද, මේ රටේ මිනිසුන් මෝඩ නැහැ. මේ රටේ මිනිසුන් දන්නවා මේ රටේ තිබෙන අර්බුදය කුමක්ද, ඒකට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ස්ථිරසාර, දීර්ඝ කාලීන විසඳුම් ගේනවා කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දාපු පැලැස්තර විසඳුම් නොවෙයි දෙන්නේ. ස්ථිරසාර වැඩ පිළිවෙළක් මෙතැන තිබෙනවා කියන එක මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා තමුන්නාන්සේලාට බැරි වුණා මේ රටේ වැඩ කරන ජනතාව පාරට බස්සවා ගන්න. තමුන්නාන්සේලා කියන විධියට, මම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැඩ භාර ගන්නා විට විදුලිබල මණ්ඩලය බිලියන 362ක් මේ අවුරුද්දේ නොයෙකුත් ආයතනවලට දෙන්න තිබෙනවා. මාස 2ක් වැස්සා කියලා, අවුරුද්දේ ලාභ පාඩු බලන්න පුළුවන්ද? ඒක කොයි රටේ කෙරෙන කටයුත්තක්ද? මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයට අද විදුලිබල මණ්ඩලයෙන් රුපියල් බිලියන 25ක සහනාධාරයක් දෙනවා. මේ රටේ ජනගහනයෙන් සියයට 50කට විදුලි බිල වැඩි වුණේම නැහැ. ඒ පිරිස වෙනුවෙන් රජයේ විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 23ක් පාඩු විඳිනවා. ඒ කථාන්තර ගැන තමුන්නාන්සේලා කථා කරන්නේ නැහැ. මාස 2ක් වහින කොට තමුන්නාන්සේලා කියනවා විදුලි බිල අඩු කරන්න කියලා. ඕනෑම වර්ෂයක ආදායම් වියදම් බැලෙන්නේ අවුරුද්දේ අග. ඒ අනුව රජය තීන්දුවක් ගනීවි. මේ රජය කැමැතියි, මේ රටේ ජනතාවට දිය හැකි සියලු සහන ලබා දෙන්න. එහෙම කරන්න තමයි අපි මේ සියලු සහනාධාර ලබා දී ගෙන යන්නේ. නමුත් රටේ ඇති වෙලා තිබෙන ඒ තත්ත්වයන් තේරුම් ගන්නට විපක්ෂයේ මන්ත්‍රීවරුන් බුද්ධිමත් වෙයි කියලා මම විශ්වාස කරනවා.

මම දීර්ඝව කථා කරන්නේ නැහැ. කෙසේ නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළ ඉතාම සංයුක්ත වැඩ පිළිවෙළක්. අඩුම වියදමින් විදුලිය ජනතාය කිරීම සඳහා ඉතා විශාල ව්‍යාපෘති ගණනාවක් අපි පටන් අරගෙන ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ වාගේම ඒ හරහා මේ රටේ ජනතාවට ලබා දිය හැකි සහන ලබා දෙන්නට ඉදිරියේදී අපි කටයුතු කරනවා කියන කාරණයත් සඳහන් කරනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි නැවත වතාවක් කියනවා, තමුන්නාන්සේලාට ගල් අඟුරු බලාගාරය හදන්නට බැරි වුණාට, - 1982, 1992 ඒවා හදන එක කල් දැම්මාට- තමුන්නාන්සේලා පන්දම් අල්ලා ගෙන නොරොච්චෝලේ බලාගාරය ළඟට ගිහින්, එහෙම නැත්නම් ඉහළ කොත්මලේ බලාගාරය ගාවට ගිහින්, බ්‍රෝඩ්ලන්ඩ් ගාවට ගිහින්, උමා ඔය ගාවට ගිහින් ඔය පන්දම් ටික අරගෙන ජාතියෙන් සමාව ඉල්ලන්න. අපට මේවා කරන්න බැරි වුණ නිසා තමයි මේ රටට වැඩි මිලට විදුලිය ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා ජනතාවගෙන් සමාව ඉල්ලා සිටින්න. ඒ හැරෙන්නට වැඩ කරන්නට බැරි වුණු තමුන්නාන්සේලාට වෙනත් උත්තරයක් නැහැ. මේ රජය ඉතාම ස්ථිරසාර වැඩ පිළිවෙළක් යටතේ අඩු මිලට ජනතාවට විදුලිය ලබා දෙන්න කටයුතු කරගෙන යනවා. එහි යම් කිසි නීතිමය අඩු පාඩු තිබෙනවා නම් ඒ සංශෝධන නීතිගත කරමින් මේ රජය ඉදිරියට යනවා කියන කාරණය ප්‍රකාශ කරමින්, මේ සඳහා ඔබ සියලු දෙනාම ලබා දුන් සහයෝගයට ස්තුති කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විවුක්කප්පට්ටු, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." **[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]**

තීරණය කරන ලදී.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." [The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

කුලුවිල් ආරාය්පට්ටු.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY SPEAKER *in the Chair.]*

1 සිට 2 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம், 2 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 and 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)

வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 2அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்.)

CLAUSE 3.- (*Insertion of new section 2A in the principal enactment.*)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

1 වන පිටුවේ, (1) "21 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
'2අ (1) (අ) කොමිෂන් සභාව විසින් මේ පනත මගින්' "

(2) "25 වන සහ 26 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
'යම් නිලධරයකුට කොමිෂන් සභාව විසින්'

(3) "29 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
'(ආ) කොමිෂන් සභාව විසින් මේ පනතේ 1 වන උපලේඛනයේ අයිතම 3, 4, 5 හා 6 මගින් ඒ වෙත පවරන ලද බලතල කිසිවක් යම් ප්‍රාදේශීය ලේකම්වරයකු වෙත පවරනු ලැබිය හැකි ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

3වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 9ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 5.- (*Amendment of section 9 of the principal enactment.*)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

2 වන පිටුවේ, 31 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.
" 'මෙ.වො.25 ඉක්මවා සහ අඟ්බවා' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

5වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
6ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 6 to 12 ordered to stand part of the Bill.

13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 43ஆம் பிரிவை மாற்றீடு செய்தல்.)

CLAUSE 13. - (*Replacement of section 43 of the principal enactment*.)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "12 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'සඳහා (1) වන උප වගන්තිය යටතේ' "

(2) "11 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'(4) (2) වන උපවගන්තිය යටතේ' "

(3) "25 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'එසේ වුවද, මේ වගන්තියේ (6) වන' "

(4) "14 වන පිටුවේ, 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
'පරාමිතීන්ට අනුකූලව (4) වන' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

[ගරු පවිත්‍රාදේවි වන්නිආර-විවි මහත්මිය]

13වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 13, as amended, ordered to stand part of the Bill.

14 සහ 15 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

14ஆம், 15ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 14 and 15 ordered to stand part of the Bill.

16 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 16.- (முதன்மைச் சட்டவாக்கத்தின் 61ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 16. - (*Amendment of section 61 of the principal enactment.*)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 22 සිට 25 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කළ යුතුය"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 16, as amended, ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කිරීම.)

வாசகம் 17.- (முதன்மைச் சட்டவாக்கத்திற்கான 1ஆம் அட்டவணையைத் திருத்துதல்.)

CLAUSE 17. - (*Amendment of Schedule I of the principal enactment.*)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"22 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පත්‍රයක් ඉදිරිපත් කර සති භයක් ඇතුළත, ප්‍රාදේශීය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය සංශෝධනය කිරීම.)

வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்திற்கான IIஆம் அட்டவணையைத் திருத்துதல்.)

CLAUSE 18. - (*Amendment of Schedule II of the principal enactment.*)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "23 වන පිටුවේ, 3 සිට 19 දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

(අ) එම උපලේඛණයේ 1 වන අයිතමයේ (5) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන්:

'(5) ගාස්තු ක්‍රම පාරිභෝගිකයකු විසින් -

(අ) යම් පරිශ්‍රයකට සපයන ලද විදුලි බලය වෙනුවෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියකුට අය විය යුතු සියලු ගාස්තු හෝ සැපයුමේ කාර්ය සඳහා වූ යම් විදුලි මීටරයක්, විදුලි මාර්ගයක් හෝ විදුලි පිරියතක් සැපයීමේ වියදම් නියමිත කාලසීමාව තුළදී නෙගෙවුවහොත්;

(ආ) බලපත්‍රලාභියා විසින් වෙනත් යම් පාරිභෝගිකයෙකුට දී ඇති සැපයුමට අනිසි ලෙස හෝ අනුචිත ලෙස මැදිහත් වන යම් මෙවලමක් භාවිත කිරීම නවත්වන ලෙස නියම කරමින් බලපත්‍රලාභියාගෙන් ලත් දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්; හෝ

(ඇ) පනතේ 27 වන වගන්තියේ (1ආ) උපවගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමක් යටතේ නියමිත කාලසීමාවක් සඳහා අය විය යුතු මාසික වාරික හෝ පාරිභෝගිකයා විසින් බෙදා හැරීමේ බලපත්‍රලාභියාට ගෙවීමට පොරොන්දු වී ඇති වෙනත් යම් ගාස්තු ගෙවීම පැහැර හැරියහොත්,' "

(2) "28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යන වචන දක්වා ඉවත් කර" II වන උපලේඛනයේ 8(1) (අ) අයිතමයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නියෝග මගින් නියම කරන ලද පරිදි බෙදාහැරීම් බලපත්‍රලාභියා' ";

(3) "33 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බලපත්‍රලාභියා විසින් පෙ.ව. 8 සිට ප.ව. 5 දක්වා විදුලි' ";

(4) "24 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සඳහා හෝ පෙ.ව. 8 සිට ප.ව. 5 දක්වා' "; සහ

(5) "20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සඳහා හෝ පෙ.ව. 8 සිට ප.ව.5 දක්වා පරිශ්‍රයට' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තඞ්කළ් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 18, as amended, ordered to stand part of the Bill.

19 සිට 21 දක්වා වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19ஆம் வாசகத்திலிருந்து 21ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 19 to 21, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේදී යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ජානක වක්කුඹුර මහතා.

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

ස්ථාවර නියෝග අනුව ගණපූරණය කියා සංකල්පයක් තිබෙනවා. ඒ පිළිබඳව මේ අවස්ථාවේ ප්‍රශ්නයක් නැඟිය හැකි වුවත්, මා එම ප්‍රශ්නය නඟන්නේ නැති බව ඔබතුමාගේ අවධානයට ලක් කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

Adjournment Motion එක අවස්ථාවේ ගණපූරණයක් අවශ්‍ය නැහැ නේද?

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

නැහැ, නැහැ. ඒ සම්ප්‍රදාය කඩ කළා. ඒක අපට මතක තිබෙන බවයි මම කියන්නේ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිතව තිබෙන කාලය ගත වෙනවා. ඒ නිසා කථා කරන්න.

කාසි සංසරණය
நாணயக்குற்றிகளின் புழக்கம்
CIRCULATION OF COINS

ගරු ජානක වක්කුඹුර මහතා

(மாண்புமிகு ஜானக வக்கும்புர)

(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් නෝට්ටු හා කාසි මුද්‍රණය කිරීම සඳහා විශාල පිරිවැයක් දරනු ලබයි. මින් කාසි අච්චු ගැසීම සඳහාද විශාල පිරිවැයක් දරනු ලබයි. නමුත් වෙළෙඳ පොළට නිකුත් කරනු ලබන කාසි ප්‍රමාණයට සාපේක්ෂව වෙළෙඳ පොළ සංසරණය වන කාසි ප්‍රමාණයේ අඩුවක් දක්නට ලැබේ. මීට විවිධ මහජන ක්‍රියාකාරකම් බලපා ඇත.

[ගරු ජානක වක්කුඹුර මහතා]

මෙසේ වෙළෙඳ පොළ සංසරණයට නිකුත් කර ඇති කාසි ප්‍රමාණවත් තරම් නොතිබීම හේතුවෙන් ගනුදෙනු කිරීමේදී විවිධ අපහසුතා ඇති වේ. එබැවින්, විවිධ ආයතන හා මහ ජනතාව එකතු කර තබා ඇති කාසි නැවත සංසරණය සඳහා ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වී නව වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මා මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම යෝජනාව ගෙන ආවේ අද වෙළෙඳ පොළේ කාසි අඩුකම ජනතාවට අපහසුතාවක් දැනෙන දෙයක් වෙලා තිබෙන නිසයි. මම ගොඩක් වෙලාවට දැකලා තිබෙනවා, රුපියල් 20ක් ලබා දී රුපියල් 18ක් වටිනා යමක් මිලදී ගත්තොත් ඉතිරි රුපියල් දෙක ආපසු දෙන්නේ නැහැ. ඒ වෙනුවට ටොෆියක් හෝ වෙනත් දෙයක් දෙනවා. එතකොට පාරිභෝගිකයාට අවශ්‍ය දේ නොවෙයි ලැබෙන්නේ. බස්වලදීත් ඔය විධියට සිද්ධ වෙනවා කියා පත්තරවලත් පළ වුණා.

ඒ වාගේම දැන් වෙළෙඳ පොළේ තිබෙන භාණ්ඩවලත් ඉස්සර වගේ රුපියල් 13, 14 වාගේ මිල ගණන් සඳහන් කරලා නැහැ. රුපියල් 10, 20, 30 වාගේ මිල ගණන් තමයි දැන් සඳහන් කරන්නේ. ඒකට හේතුව තමයි කාසිවල හිඟකම. මහ බැංකුව විසින් කාසි අච්චු ගහලා තිබුණත් ගොඩක් වෙලාවට එම කාසි යම් ආයතනවල හෝ එහෙම නැත්නම් කැටවල හෝ තිබෙනවා. ගොඩක් වෙලාවට පිං කැටවලට දමන කාසි ඉක්මනින් නැවත වරක් වෙළෙඳ පොළට එන්නේ නැති බව අපි දන්නවා. ඒ නිසා මා යෝජනා කරන්නේ යම් වැඩ පිළිවෙළක් හදලා ඒ කාසි ඉක්මනින් නැවත වරක් වෙළෙඳ පොළට ගේන්න කියන එකයි. එහෙම කළොත් ජනතාවට වන අපහසුතා මහ හරවන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ එක්කම අපි දන්නවා, පුංචි දරුවෝ කාසි එකතු කරනවා කියලා. ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, කාසි එකතු කිරීම සඳහා සිරස මාධ්‍ය හරහා අලුත් වැඩසටහනකුත් විකාශය වෙනවා මම දැක්කා. ඒ වාගේම පුංචි දරුවෝ එකතු කරන සල්ලි බැංකු හරහා අපට එකතු කර ගන්න පුළුවන්. බැංකුවට ලබා දෙන කාසිවලට තෑග්ගක් දෙනවා කිව්වොත් පුංචි දරුවෝ එකතු කරපු කාසි නැවත වරක් බැංකු හරහා වෙළෙඳ පොළට ලැබෙයි. මොකද, ගොඩාක් වෙලාවට ඒ කාසි එකතු කරන්නේ පුංචි දරුවෝ. ඒ වාගේම කාසි එකතු වන ආගමික ආයතන ගණනාවක් තිබෙනවා. අපිත් යන එන ගමන් ඒවාට කාසි දමා යනවා. ඉක්මනින්ම එම කාසි ආපසු ගන්න වැඩ පිළිවෙළක් හදා ගත්තොත් දැන් තිබෙන ගැටලුව නිරාකරණය කරන්න පුළුවන් වෙයි.

ගරු සරත් අමුණුගම ඇමතිතුමාත් දන්නවා ඇති කාසියක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය වැඩියි කියා. අපේ රට තුළ හැංගිලා තිබෙන කාසි ටික එළියට ගන්න වැඩ පිළිවෙළක් හැදුවොත් මහ බැංකුවට වැය වන ඒ මුදල ඉතිරි වනවා. ඒක නිසා මම මේ ගරු සභාවෙන් සහ ගරු සරත් අමුණුගම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, කාසි හිඟකම නිසා ජනතාවට ඇති වන අපහසුතාව මහ හරවන්න මහ බැංකුව මැදිහත් වෙලා හැංගිලා තිබෙන කාසි එළියට ගන්න නව වැඩ පිළිවෙළක් හදන්න කියායි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා.

විශේෂයෙන්ම වර්තමානයේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක් විධියටයි මා දකින්නේ. අද කාසියක මූල්‍යමය වටිනාකමට වඩා ද්‍රව්‍යමය වටිනාකම වැඩි වීම මත එක පැත්තකින් මේ කාසි වෙළෙඳ පොළ ගනුදෙනුවලට යොදා ගැනීම අඩු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මේවා භාණ්ඩ විධියට රැස් කිරීමටත් ජනතාව පුරුදු වෙලා තිබෙනවා. සමහර වෙලාවට මේවායේ තිබෙන ලෝහමය වටිනාකම් ප්‍රයෝජනයට ගන්නවා. උදාහරණයක් විධියට සමාජයේ සමහරු රුපියල් පහේ කාසිය පාවිච්චි කරලා ආභරණ හදා ගන්නවා. රන් භාණ්ඩවලට ආදේශිත භාණ්ඩ තනා ගන්න පාවිච්චි කරනවා. කෙසේ නමුත්, වෙළෙඳ පොළ මුදල් ගනුදෙනු තුළ මේ ඉතා කුඩා මුදල් ඒකක -කාසි- පාවිච්චිය අපට අවශ්‍ය වනවා. විශේෂයෙන්ම මේ කාසි නිෂ්පාදනය කරන්නට යන වියදම ඉතා අධිකයි. මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් එක් තැනක එකතු නොවන විධියේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා. උදාහරණයක් විධියට ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කිව්වා වාගේ කාලයක් තිස්සේ කැට තුළ කාසි එකතු කරන අවස්ථා තිබෙනවා. එහෙම නැත්නම් අපි පන්සල් ඇතුළු ආගමික ස්ථානවලට ගිහිල්ලා පිං කැටවලට කාසි දමනවා. ඉතින් මේවා එක තැනක ගබඩා වීමක් තමයි එයින් සිද්ධ වන්නේ. ඒ නිසා නැවත නැවත මුදල් නිෂ්පාදනය කර වෙළෙඳ පොළට සැපයීමට රටකට සිද්ධ වනවා. එයින් විශාල පාඩුවක් වනවා. මේ පාඩුව නැති කරලා මේ මුදල් සංසරණයේ යොදවන්න වැඩ පිළිවෙළක් සකස් විය යුතුයි. මේ සඳහා කළමනාකරණ වැඩ පිළිවෙළකට යා යුතුයි කියන එකයි මගේ අදහස. ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් බව නැවත වරක් සඳහන් කරමින් මා නිහඬ වනවා, ස්තුතියි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Mr. Presiding Member, I think it was the Hon. (Dr.) N.M. Perera, when he was Minister of Finance, who took out all the black money with a vision in sight. At that time, a large number of currency notes and coins were brought back to the Central Bank and deposited.

Now, particularly the collection of coins - as mentioned by my good Friend, the Hon. Janaka Wakkumbura - is a matter of concern to the nation as a whole. When you go to Hospital Street in Fort, you can find coins, as my Colleague, the Hon. (Mrs.) Sriyani Wijewickrama said, not only in tills in temples, mosques and kovils, but also being taken from people, paying a lesser value of the coins and certain decorations being made out of those. Like the sale of stamps, they sell those to foreigners. So, now there is a drain of coins out of the country. I can remember, Sir, in those days, Europeans and Australians who came in large ships and yachts, getting off from the old Harbour jetty and going toYork Street to purchase not only stamps but even currencies. As a result of the shortage, coins have been issued for circulation in the market and the Central Bank spends large sums of money, more than the value of the currencies, for printing banknotes and minting of coins. So, this is the pivotal issue my good Friend, the Hon. Janaka Wakkumbura, has been raising in this House.

In the Annual Report, 2012 of the Ministry of Finance and Planning, there is Chapter 2.7 titled "Capital Flows", which states, I quote:

"The volatility in capital flows to emerging market and developing economies is a major concern as their macroeconomic management

has become more challenging with an indication of vulnerabilities in external financial position. As given in World Economic Situation and Prospects 2013 by the United Nations, this volatility is fuelled by the fragility in financial markets and quantitative easing policies of advanced economies."

That is one aspect of this issue.

"The April, 2013 issue of World Economic Outlook of IMF indicates a 70.7 per cent drop in net private financial flows (which includes direct investment, portfolio investment and other long and short-term investment flows) to emerging markets in 2012 mainly due to changing nature of risk perceptions."

The Minister, Hon. (Dr.) Sarath Amunugama, works around-the-clock, not only in this country, but also visits major financial centres in New York, Geneva, Washington and other places. Also, I must place on record the great services rendered by the Governor of the Central Bank, Mr. Ajith Nivard Cabraal, in order to build up a strong economy.

Although the Opposition always throws mud at him, - the Minister, Hon. (Dr.) Sarath Amunugama contradicted this morning - it is very unfair. Why they choose to do that was proved beyond doubt with the resignation of the Hon. Dayasiri Jayasekara from Parliament and also from the United National Party today.

He made a revelation today, Sir, and that must go on record. That is, the Leader of the UNP - his Leader, he said - the Hon. Ranil Wickremasinghe, at one point, got them round and taught how not to win the war. යුද්ධයෙන් පරාජය වන්නේ කොහොමද කියන එක ගැන එතුමා පාඨමාලාවක් පවත්වා තිබෙනවා. This is a very dangerous issue. We have had in history, traitors in this country. But, I cannot find a more treacherous act than that in the history and nobody contradicted our good Friend, the Hon. Dayasiri Jayasekara. Sir, sometimes, these things are just allowed to go by. During Question Time, one Member of Parliament, the Hon. Ravi Karunanayake, did not ask Supplementary Questions according to the Standing Orders based on the Answer given. When asking questions, he goes all round the world making speeches. In fact, every time he speaks to the TV, it is not about the economy, not to the people, not to bring any salvation to the people or to reduce their burden. No, he speaks to the TV.

Therefore, Sir, what the Hon. Dayasiri Jayasekara said should not be allowed to go unchecked. I even go to the extent of proposing to the House that a Select Committee be appointed to find out the veracity, the truth, of what he said today. That is about summoning generals, lieutenants, commanders and personnel of the Army, the Navy and the Air Force. At that time, they had been given lessons on how we could get ourselves defeated in the war and why the forces cannot win the war.

Sir, I think these things have got to be revealed much more. Otherwise, we are lurking in danger. This conspiracy that has been hatched from the time this Government came into power under His Excellency Mahinda Rajapaksa is going beyond a certain limit when we, as national-minded people, have taken Oaths in Parliament to protect the sovereignty, the territorial integrity and the independence of the nation. But, to give lessons as to how not to win a war is a most treacherous act than those done by the traitors in the history of Sri Lanka. Therefore, while commending the Adjournment Motion, I would earnestly request that a Select Committee be appointed by the Government in order to find out the truth**.**

Thank you very much.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම යෝජනාව ගෙනාව ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාටත්, එය ස්ථීර කළ ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියටත් පළමුවෙන්ම මා ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ විෂය ගැන කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ හිතවත් ගරු අස්වර් මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ යෝජනාවලින් ඔබතුමන්ලා විශාල සේවයක් කරනවා කියලා මා හිතනවා. මොකද, දේශපාලන වැඩ කටයුතු කරන ගමන්, වෙනත් සාමාජීය වැඩ කටයුතු කරන ගමන් අපේ පවතින නීති-රීති, පවතින වැඩ කටයුතු දියුණු කිරීමේ අරමුණින් ඔබතුමන්ලා මේ කරන යෝජනා ඉතාමත් වටිනවා කියා මා ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මේ ප්‍රශ්නය ගැන මම මහ බැංකුවත් එක්ක සාකච්ඡා කළා. මොකද, එහි යම් කිසි තාක්ෂණික පැත්තකුත් තිබෙනවා. මා ඒ අයට කිව්වා, මේ විෂයය ගැන මට සටහනක් දෙන්නය කියලා. ඔබතුමන්ලාත් ඉතාම කාරුණිකව යම් යම් ක්‍රියා මාර්ග පිළිබඳ යෝජනා ඉදිරිපත් කළා. ඉතින් ඔබතුමන්ලාට ස්තුතිවන්ත වන අතරේ, ඒවා ගැනත්, මෙහි යථා තත්ත්වය, අනාගත සැලැස්ම සම්බන්ධයෙනුත් වවන ස්වල්පයක් මට කථා කරන්න පුළුවන්.

1. 2013.07.23 දිනට සංසරණයේ පැවැති මුළු කාසි සංඛ්‍යාව බිලියන 4.3ක් වන අතර මෙම කාසි තොගයේ මුළු වටිනාකම රුපියල් බිලියන 7.2ක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව නව කාසි මිලියන 125ක් පමණ සංසරණය සඳහා බැංකු වෙත නිකුත් කරනු ලබන අතර එම කාසි ටංකන සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 800 -1000 පමණ පිරිවැයක් දරනු ලබයි. ඉහත දත්ත අනුව, දළ වශයෙන් සංසරණයේ පවතින කාසි ප්‍රමාණය එක් පුද්ගලයෙකු සතුව කාසි 200ක පමණ ප්‍රමාණයකි. එවැනි දළ සංඛ්‍යාවක් හැම එක්කෙනාගේම අතේ තිබෙනවාය කියන්නේ නැහැ. නමුත් ඒ තරම් මුදලක් සංසරණය විය යුතුයි.
2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු විසින් ඉල්ලා සිටින පරිදි කාසි සංසරණයට නිකුත් කොට තිබුණද, මහජනතාව නිසි පරිදි නිරන්තරයෙක් කාසි පරිහරණයට යොදා නොගැනීම හේතුවෙන් නිසි පරිදි සංසරණය සඳහා එක් නොවී කාලයක් පුරා කාසි තැන තැන රැස්ව පැවතීම නිසා කාසි හිඟයක් පැවතිය හැකිය.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ගරු මන්ත්‍රීතුමා කියන එක හරියට හරි. බැංකු හරහා කාසි කොපමණ වෙළෙඳ පොළට දැම්මත් ඒවා කොහේ හරි හිර වෙනවා. ගරු මන්ත්‍රීතුමාත්, ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියත් ඒක ඉතාම පැහැදිලිව කිව්වා. ඇත්ත වශයෙන් සංසරණය සඳහා එම කාසි එන්නේ නැහැ. එක එක තැන්වල ඒවා හිර වෙලා තිබෙනවා. ඒක ශ්‍රී ලංකා මහ බැංකුවත් පිළිගන්නවා.

3. මේ පිළිබඳව මහජනතාව දැනුම්වත් කර තැන තැන රැස්ව ඇති කාසි නැවත සංසරණයට යෙදවීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර කාසි එකතු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. 2007 වසරේදී දිවයිනේ දිස්ත්‍රික් 22ක් ආවරණය වන පරිදි පාසල් මූලික කර ගනිමින් කාසි එකතු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී.

4. කාසි එකතු කිරීමේ නවමු අදියර 2012 වසරේ දෙසැම්බර් මස සිට ක්‍රියාවට නංවනු ලැබූ අතර, පාසල් සහ හඳුනාගත් පූජනීය ස්ථාන කේන්ද්‍ර කර ගනිමින් එක් රැස්වී ඇති කාසි එකතු කිරීමේ වැඩසටහන දැනට දීප ව්‍යාප්තව සිදු කරමින් පවතී. ඒ අනුව 2012 දෙසැම්බර් සිට මේ දක්වා අවස්ථා 78කදී පූජනීය ස්ථාන 18ක් හා පාසල් 32ක් ආවරණ කරමින් සංසරණය නොවී පැවති කාසි සැලකිය යුතු ප්‍රමාණයක් එකතු කර නැවත සංසරණය සඳහා නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබී ඇත.

5. ප්‍රථම වරට ප්‍රමුඛතම මාධ්‍ය ආයතනයක් සම්බන්ධ කර ගනිමින් පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් හරහා ජනතාව දැනුවත් කරමින් මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2013.07.23 දින ජා ඇලදී කාසි එකතු කිරීමේ දැවැන්ත වැඩ සටහනක් දියත් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා හොඳ අවස්ථාවක තමයි මේ ප්‍රශ්නය නැඟුවේ.

ඉදිරි දින 25 පුරා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 6ක් ආවරණය වන පරිදි ගමන් මාර්ග 3ක් ඔස්සේ ගම් නගර 225ක් මූලික කරගෙන මේ කටයුත්ත සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

- වන්දනාකරුවන් විසින් පරිත්‍යාග කරන ලද ශ්‍රී ලංකා කාසි විශාල ප්‍රමාණයක් ඉන්දියාවේ බුද්ධගයාවේ එක් රැස් වී පවතින අතර, එම කාසි තොගය නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා 2013 අප්‍රේල් මස 23 සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බුද්ධගයාවේ අදාළ පාර්ශ්ව සමග සාකච්ඡා කොට ඒ සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී. ඒ අනුව 2013.07.12 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් දෙදෙනෙකු බුද්ධගයාවට ගොස් අදාළ පාර්ශ්ව හමුවී මූලික එකඟතාවක් ඇති කරගෙන ඇත. මෙහි ටොන් 10ක පමණ කාසි පවතින බවට වාර්තා වී ඇත.
- බැංකු රාශියක් විසින් විශාල වශයෙන් කාසි එකතු වන පූජනීය ස්ථාන රාශියකින් කාසි අඛණ්ඩව එකතු කිරීම දැනට කාලයක සිට කරගෙන යනු ලැබේ.
- දීප ව්‍යාප්ත කාසි එකතු කිරීමේ වැඩසටහනට සමගාමීව කාසි පරිහරණයේ නිවැරැදි පුරුදු හා එහි ප්‍රතිඵල පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම සඳහා අඛණ්ඩව දේශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙන්ම, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රචාරණ කටයුතු ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

මේ තොරතුරු තමයි මහ බැංකුවෙන් මට ලැබුණේ. ඒ වැඩ කටයුතු ප්‍රශංසනීය වන අතර, ඔබතුමන්ලා අද සඳහන් කරපු තොරතුරුවලින් මේ කටයුත්ත අප තවත් වර්ධනය කරන්න ඕනෑ බව මට හිතෙනවා. මෙහි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ- [බාධා කිරීමක්] ඔව්, කියන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

රූපවාහිනියේ ප්‍රවෘත්තිවලට කිව්වා, ඔබතුමා කියන ආකාරයට ටොන් 10ක පමණ කාසි එහේ තිබෙනවා කියලා. ඒවා ගෙන්වා ගන්න මාර්ගයක් තිබෙනවාද? එම කාසි ඒ ගොල්ලන්ට ප්‍රයෝජනවත් නැහැලු. දඹදිව වන්දනා ගමන් යන අපේ අය දමපු ටොන් ගණන් කාසි එහි තිබෙනවා. ඒවා කොහේ හරි වළලා දමයි. ඒ නිසා කෙසේ හෝ ඒවා ගෙන්වා ගන්න මොකක් හරි උත්සාහයක් දැරුවොත් හොඳයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අපි නිලධාරීන් එහේ යවලා, ඒගොල්ලන් එක්ක සාකච්ඡා කරලා ඒ වැඩ ටික කරන්න බලාපොරොත්තු වනවා. මෙහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි එක එක තැන්වල මෙවා රැස් වීම. එහෙම රැස් වුණාම ඒවා සංසරණයට මුදා හරින්නේ නැහැ. ඒ නිසා අප අනාගතයේ මීටත් වඩා ඒ ගැන යුහුසුලුව කටයුතු කරනවා. මේ ප්‍රශ්නය ඔබතුමන්ලා නැඟීම ගැන බොහොම ස්තුතිවන්ත වනවා. මහ බැංකුවත් මේ ගැන ඔබතුමන්ලාට ස්තුතිවන්ත වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.50ට, 2013 ජූලි මස 25 වන බ්‍රහස්පතින්දා අ.භා.1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 6.50 மணிக்கு பாராளுமன்றம், 2013 யூலை 25, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 6.50 p.m. until 1.00 p.m. on Thursday, 25th July, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

218 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 218 - இல. 7
Volume 218 - No. 7

2013 ජූලි 25 වන බ්‍රහස්පතින්දා
2013 யூலை 25, வியாழக்கிழமை
Thursday, 25th July, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
ඉල්ලා අස් කර ගන්නා ලදි

දේශීය ආදායම් පනත :
යෝජනාව

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත :
නියමය

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත:
නියෝගය

සුරාබදු ආඥාපනත:
නියමය

කල්තැබීමේ යෝජනාව:
ආනයනික ආහාර ද්‍රව්‍යවල සුරක්ෂිතභාවය

பிரதான உள்ளடக்கம்

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அரச ஊழியர் அபிவிருத்தி நிதிக் கூட்டுத்தாபனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது

உண்ணாட்டு இறைவரிச் சட்டம் :
தீர்மானம்

விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்:
கட்டளை

முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம்:
கட்டளை

மதுவரிக் கட்டளைச் சட்டம்:
கட்டளை

ஒத்திவைப்புப் பிரேரணை:
இறக்குமதியாகும் உணவுப் பொருட்களின் பாதுகாப்பு

PRINCIPAL CONTENTS

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ORAL ANSWERS TO QUESTIONS

THE STATE EMPLOYEES' DEVELOPMENT FINANCE CORPORATION (INCORPORATION) BILL:
Withdrawn

INLAND REVENUE ACT:
Resolution

SPECIAL COMMODITY LEVY ACT:
Order

STAMP DUTY (SPECIAL PROVISIONS) ACT:
Order

EXCISE ORDINANCE:
Order

ADJOURNMENT MOTION:
Safety of Imported Food Items

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 ජූලි 25 වන බ්‍රහස්පතින්දා
2013 யூலை 25, வியாழக்கிழமை
Thursday, 25th July, 2013

අ. භ. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
පාරාළුමන්ත්‍රම් பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] *தலைமை வகித்தார்கள்.*
The Parliament met at 1.00 p.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2013 ජූලි මස 25 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2011 වර්ෂය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

2012 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

2010 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

2012 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා නැවත පදිංචි කරවීමේ අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව නැවත පදිංචි කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මීළඟට කාරක සභා වාර්තා පිළිගැන්වීම - හත්වැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා විසින් පිළිගැන්වීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, හත්වැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරනවා.

එම කාරක සභාවේ යම් යම් නිරීක්ෂණ ගැන මේ අවස්ථාවේ මම වචන ස්වල්පයක් කථා කරන්නට කැමැතියි. මේ සඳහා අපට සම්පූර්ණ සහයෝගය දීම සහ මේ වැඩ කටයුතු සාර්ථකව කිරීමට සහාය දීම ගැන විගණකාධිපතිතුමාට සහ එතුමාගේ කාර්ය මණ්ඩලයටත්, මේ විෂයයට සම්බන්ධ වුණු පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

2010 මැයි මස 20වැනි දින හත්වන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය සඳහා තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව 2010 ජූනි මස 08වන දින ප්‍රථම වරට රැස්වීමෙන් අනතුරුව නිතිපතා රැස් වී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 125 ප්‍රකාරව රජයේ ආයතනවල ගිණුම් විභාග කරන ලදී.

මෙම වාර්තාවෙන් 2010 ජූනි මස 08වැනි දින සිට 2011 දෙසැම්බර් මස 31වැනි දින දක්වා වූ කාල සීමාව තුළ 2005 සිට 2009 දක්වා පළ වූ විගණකාධිපතිවරයාගේ වාර්තාවන්හි දැක්වුණු විගණන ඡේද මත පදනම්ව විමර්ශනය කරන ලද අමාත්‍යාංශ 20ක් ඇතුළු රජය ආයතන 69ක් ආවරණය කර ඇත. එමෙන්ම 2009 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් වූ අතිරික්තයන්, සීමා ඉක්මවීම්, අවසර නොලත් කාරක පාඩු මෙන්ම එම ආයතනවල වත්මන් කාර්ය සාධනය පිළිබඳව ද මෙම කාරක සභාව විභාග කර ඇත.

වාර්තාවේ පරිශිෂ්ට අංක 01 යටතේ කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවකට පොදු වූ කරුණු සාමාන්‍ය නිරීක්ෂණ ලෙස ඉදිරිපත් කර ඇත. එකී සෑම නිරීක්ෂණයක් සමඟම එම කරුණට අදාළව කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සඳහන් කොට ඇත.

පරිශිෂ්ට අංක 2 යටතේ එක් එක් රජයේ ආයතන සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද ඌනතාවන්, අඩු පාඩු සහ වැරදි ක්‍රියාකාරකම් ගෙන හැර දක්වා ඇත.

නිරීක්ෂණයන් මඟින් හඳුනා ගත් අඩු පාඩු රජයේ ආයතනයන්හි සපලදායී ක්‍රියාකාරිත්වය මත අහිතකර බල පෑමක් ඇති කරන බැවින් අදාළ පාර්ශ්වයන් කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ අනුගමනය කර තම ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගනු ඇතැයි යන දැඩි විශ්වාසය මත මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

ගරු කථානායකතුමනි, මම තව කරුණු එකක්, දෙකක් පමණක් මතක් කරන්න කැමැතියි. අපට පෙනුණු එක් කරුණක් තමයි බොහෝ විට අපේ රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ විගණකාධිපතිතුමා සහ එතුමාගේ නිලධාරීන් අතර මීට වඩා හොඳ සම්බන්ධතාවක් තිබෙන්න ඕනෑය කියන එක. බොහෝ විට ඒ අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව තුළ විගණනය ගැන හොඳ විමර්ශනයක් කරන්නේ අපේ කාරක සභාවෙන් කැඳවීමක් ලැබුණාට පස්සේයි.

මේක හොඳ තත්ත්වයක් නොවෙයි. ගරු කථානායකතුමනි, විගණකාධිපතිතුමා කරුණු ඉදිරිපත් කරපුවාම, ඒ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අවස්ථාවක් සැලසෙනවා, සංවාදයක් ඇති කරන්න. ඒ මතු කරපු කරුණු අනුව ලේකම්තුමාත් -ප්‍රධාන මූල්‍ය නිලධාරියා- විගණකාධිපතිතුමාත් අතර මූලික සංවාදයක් ඇති වෙන්න ඕනෑ. ඒ ඉදිරිපත් කරපු කරුණුවලට ලේකම්තුමාට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ඒ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා සෑහීමකට පත් වෙනවා නම් ඒක ඒ වාර්තාවට ඇතුළත් වෙන්නේ නැහැ. දැන් අපට පෙනෙන්නේ, ඒ සංවාදය ඇති නොවීමෙන් සුළු සුළු දේවල් පවා විගණකාධිපතිතුමාගේ වාර්තාවල නිතරම සටහන් වෙන ආකාරයයි. ඒ නිසා අපේ කාලයෙන් ගොඩක් ඒ කරුණු සොයා බැලීම සඳහා මිඩංගු වෙනවා.

ඒ නිසා මගේ පළමුවැනි නිර්දේශය තමයි, ඒ අමාත්‍යාංශවල ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මුල් අවස්ථාවලදී -මේ කරුණු පෙන්වලා දුන්නු අවස්ථාවලදී- තවත් විධියකින් කියනවා නම් යම් කරුණක් විගණකාධිපතිතුමාගේ වාර්තාවට ඇතුළු වෙන්න ඉස්සෙල්ලා ඒ සංවාදය ඇති කරන්න කියන එකයි. ඒ වෙලාවේදී විගණකාධිපතිතුමා සෑහීමකට පත් වෙනවා නම් ඒ කරුණ එතුමාගේ වාර්තාවට ඇතුළත් වෙන්නේ නැහැ. ඒ වාගේම අපි විභාග කරන්න අවශ්‍ය වෙන්නේත් නැහැ. ඒ හන්දා ඒක කරන එක ඉතාම අවශ්‍යයි. අපේ හිතවත් ඩිව් ගුණසේකර මැතිතුමාත්, මාත් සියලුම ලේකම්වරුන් ගෙන්වුවා. ගෙන්වලා මීට වඩා හොඳ සම්බන්ධයක් තිබෙන්න ඕනෑ කියන කාරණාව අපි එතුමන්ලාට අවධාරණය කළා. එහෙම වුණාම තමයි, අපට රටේ හොඳ පාලන තත්ත්වයක් ඇති කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම පාර්ලිමේන්තුවටත් වඩාත් හොඳට වග කියන්න අපට පුළුවන් වෙන්නේ.

දෙවැනි කාරණාව මෙයයි. ගරු කථානායකතුමනි අපට පෙනුණා, හුඟක් අවස්ථාවලදී ඒ ලැබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම පාවිච්චි කරන්නේ නැති බව.

බොහෝ අවස්ථාවලදී විවේචන එල්ල වෙනවා, මේ මුදල් මදි, සියයට හයක් දෙන්න ඕනෑ, මෙච්චර දෙන්න ඕනෑ, අච්චර දෙන්න ඕනෑ කියලා. එහෙම කිව්වාට, ඒ ඒ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල ගිණුම් කටයුතු දිහා බලන කොට ඇත්ත වශයෙන් අපට පෙනෙනවා වර්ෂය අවසානයේදී මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි වෙනවා කියලා; ඒවා ආපසු භාණ්ඩාගාරයට යනවා කියලා. එය පාලනය - governance - අතින් එච්චර හොඳ දෙයක් නොවෙයි. මේ ගරු සභාව ඉතාම කල්පනාකාරීව ඒ ඒ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදල් ලබා දුන්නාට පස්සේ, එහෙම සිදු වන එක හොඳ දෙයක් නොවෙයි. එහි තවත් පැත්තක් තිබෙනවා. වෙනත් කෙනකුට නොදී තමයි අප ඒ මුදල් ඒ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට ලබා දෙන්නේ. ඒ නිසා එම අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල යුතුකමක් තිබෙනවා, හුඟක් දුරට සාකච්ඡා කරලා, සංවාද කරලා, ගණන් හිලව් බලලා ඒ මුදල් නියම සැලැස්මක් අනුව හරි විධියට යොදා ගැනීමට. මාස 12 තුළ අප කොහොමද මේ මුදල් වැය කරන්නේ කියන එක සම්බන්ධයෙන් හොඳ දැනුමක් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව ආවාට ගියාට කටයුතු කිරීම හොඳ නැහැ. මේ පාර්ලිමේන්තුව ලබා දෙන ප්‍රතිපාදන පරිපාලනමය වශයෙන් හරියට කළමනාකරණය කළේ නැත්නම් ඒ ආයතනවලට සිදු වන්නේ පාඩුවක්. ඒ විතරක් නොවෙයි. එය, මුදල් ලබා ගන්න ඕනෑකම තිබුණු අනෙක් දෙපාර්තමේන්තුවලටත් පාඩුවක්. ඒ ඔක්කෝටමත් වඩා, නිසි සැලසුම් සකස් නොකිරීම තුළින් රටට සිදු වන්නේත් පාඩුවක්. ඒ හන්දා මම හිතනවා, මේ ලැබෙන ප්‍රතිපාදන හරි විධියට පාවිච්චි කිරීම ඉතාම අවශ්‍යයි කියලා.

ගරු කථානායකතුමනි, අප තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපේ දැනට තිබෙන්නේ performance audit කියන එකයි. ඒ ඒ ආයතනය යම් යම් වැඩ කළාට පස්සේ අපි අඩු පාඩු පෙන්වා දෙනවා; කරුණු සොයා බලනවා. අපි කරුණු සොයා බලන කොට ඒ වැඩේ සිද්ධ වෙලා ඉවරයි.

අපේ සොයා බැලීමේදී, එක්කෝ හොර වැඩක් කරපු කෙනෙක් අල්ලා ගන්න පුළුවන්. එහෙම නැත්නම් අනාගතයේදී රිංගා යන්න පුළුවන් හිල - loophole එක- වහලා දමන්න පුළුවන්. නමුත් ඒ වන කොට එම සිද්ධිය සිදු වෙලා ඉවරයි. බොහෝ විට අවුරුදු දෙකක්, අවුරුදු තුනක් ගත වෙලා; එහෙම නැත්නම් එම රජයේ නිලධාරීන් වෙනත් තැන්වලට මාරු වෙලා. එම නිසා මා හිතන හැටියට අපට අවශ්‍ය වනවා, ගරු අමාත්‍ය මණ්ඩලය සමඟත් සාකච්ඡා කරලා, මොන මොන හේතු නිසාද මෙහෙම සිද්ධ වුණේ කියලා performance audit එකක්, එහෙම නැත්නම් post-mortem එකක් කරන්න. එතකොට ලෙඩා මැරිලා. ඒ නිසා ඒක එතරම් වැදගත් නැහැ. නමුත් අනාගත සැලසුම් සකස් කිරීමට ඒක අවශ්‍යයි. ඒක ක්‍රියාත්මක වන ගමන්ම running audit එකක් කරන්න අපට සැලසුම් හදන්න වනවා. අනාගතයේදී ඒ විධියට කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන්, අපේ විගණකාධිපතිතුමාටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත්, අපේ කාර්ය මණ්ඩලයටත්, ඒ වාගේම ඉතාම හොඳට වැඩ කරන අපේ ලේකම්කරුවන්ට සහ ඒ අයගේ නිලධාරි මණ්ඩලයටත් නැවත වරක් මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු යැයි" යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය - පැමිණ නැත.
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - පැමිණ නැත.
ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, මම මාලබේ, තලංගම උතුර, මිල්ලගහවත්ත පාර, අංක 767/4/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ.ඩී.ඒ. වසන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petition ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

විදේශ ආධාර : විස්තර
வெளிநாட்டு உதவித் தொகைகள்: விபரம்
FOREIGN AID : DETAILS

2588/'12

1. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට,

(i) වාර්ෂිකව ලැබුණු විදේශ ආධාර ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වැඩිම ද්විපාර්ශ්වික ආධාර ලබා දෙන ප්‍රධාන රටවල් දහය (10) කවරේද;

(iii) ද්විපාර්ශ්වික ආධාර ලබා දුන් ඉහත එක් එක් රට ලබා දී ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බහුපාර්ශ්වික ආධාර ලබා දුන් රටවල් සහ ජාත්‍යන්තර ආයතන කවරේද;

(v) බහුපාර්ශ්වික ආධාර වැඩියෙන්ම ලබා දී ඇති රටවල් හෝ ආයතන 10 ලබා දී ඇති ආධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවට විදේශ ආධාර ලබා ගැනීම සඳහා අනුගමනය කරන්නා වූ උපාය මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005ஆம் ஆண்டு முதல் 2011ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியினுள் இலங்கைக்கு,

(i) வருடாந்தம் கிடைக்கப்பெற்ற வெளிநாட்டு உதவித்தொகைகள் வெவ்வேறாக யாது;

(ii) ஆகக் கூடுதலான இருதரப்பு உதவிகளை வழங்கும் பிரதானமான (10) பத்து நாடுகளும் யாவை;

(iii) இருதரப்பு உதவிகளை வழங்கியுள்ள மேற்குறிப் பிடப்பட்ட ஒவ்வொரு நாடும் வழங்கிய பணத்தொகை வெவ்வேறாக யாது;

(iv) பல்தரப்பு உதவிகளை வழங்கிய நாடுகள் மற்றும் சர்வதேச நிறுவனங்கள் யாவை;

(v) ஆகக்கூடுதலான பல்தரப்பு உதவிகளை வழங்கி யுள்ள 10 நாடுகளும் அல்லது நிறுவனங்களும் வழங்கியுள்ள உதவிகளின் பெறுமதி வெவ்வேறாக யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இலங்கைக்கு வெளிநாட்டு உதவிகளை பெற்றுக் கொள்வதில் பின்பற்றப்படுகின்ற உபாய வழி முறைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state for the period from the year 2005 to 2011-

(i) separately, the amounts of foreign aid received annually;

(ii) the 10 major countries that provide the highest amount of bilateral aid;

(iii) separately, the amounts of money provided by each of the aforesaid countries that provided bilateral aid;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(iv) the countries and international institutions that provided multilateral aid;

(v) separately, the value of the aid provided by the 10 countries or institutions which have provided the highest amount of multilateral aid?

(b) Will he inform this House the strategies that are adopted to obtain foreign aid to Sri Lanka?

(c) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වර්ෂ 2005 සිට වර්ෂ 2011දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ ආධාර ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් ඇමුණුම 1 හි දක්වා ඇත.

(ii) මෙම කාල සීමාව තුළ වැඩිම ද්විපාර්ශ්වික ආධාර ලබා දෙන ලද ප්‍රධාන රටවල් 10 පහත දක්වා ඇත.

1. චීනය
2. ජපානය
3. ඉන්දියාව
4. එක්සත් රාජධානිය
5. ජර්මනිය
6. ඩෙන්මාර්කය
7. කොරියාව
8. නෙදර්ලන්තය
9. ප්‍රංශය
10. ස්විඩනය.

(iii) ඇමුණුම 1 හි දක්වා ඇත. ඇමුණුම 1 **සභාගත*** කරමි.

(iv) මෙම කාල සීමාව තුළ බහුපාර්ශ්වික ආධාර ලබා දුන් ජාත්‍යන්තර ආයතන පහත දක්වා ඇත.

01. ආසියානු සංවර්ධන බැංකුව
02. ලෝක බැංකුව
03. ආහාර හා කෘෂිකර්ම සංවිධානය
04. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික අරමුදල
05. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
06. ලෝක ආහාර වැඩසටහන
07. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
08. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්
09. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල
10. යුරෝපීය ආයෝජන බැංකුව
11. යුරෝපා සංගමය
12. නෝර්ඩික් සංවර්ධන අරමුදල
13. ඔපෙක් අරමුදල

(v) මෙම කාල සීමාව තුළ බහුපාර්ශ්වික ආධාර වැඩියෙන්ම ලබා දී ඇති ආයතන 10 පහත දක්වා ඇති අතර, ලබාදී ඇති ආධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් ඇමුණුම 1හි දක්වා ඇත.

01. ආසියානු සංවර්ධන බැංකුව
02. ලෝක බැංකුව
03. ලෝක ආහාර වැඩසටහන
04. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
05. යුරෝපීය ආයෝජන බැංකුව
06. යුරෝපා සංගමය
07. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල
08. ආහාර හා කෘෂිකර්ම සංවිධානය
09. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
10. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල.

(ආ) ශ්‍රී ලංකාවට විදේශාධාර ලබා ගැනීම සඳහා අනුගමනය කරන්නා වූ උපාය මාර්ග, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ වාර්තාවන් මඟින් ප්‍රකාශ කර ඇති අතර, උපාය මාර්ග පිළිබඳ පහත දැක්වෙන උපුටනයන් පිළිවෙළින් ඇමුණු 2, 3 සහ 4හි දක්වා ඇත.

- ඇමුණුම 2 - "ණය ගැනීමේ උපාය මාර්ග" යනුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද "සංවර්ධනයෙහිලා ගෝලීය සහයෝගිතාවය - 2011" පිටුව 16 සිට 18
- ඇමුණුම 3 - "රජයේ ණය කළමනාකරණ උපාය මාර්ග"/ "ණය ගැනීමේ වැඩසටහන 2011" යනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තාව 2011, පිටු 154 හා 155
- ඇමුණුම 4 - "The Medium Term Debt Management Strategy 2013 - 2017 and Issues And Challenges" යනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද "Public Debt Management in Sri Lanka - Performance in 2012 and Strategies for 2013 and Beyond" වාර්තාවේ 31 සිට 34 දක්වා පිටු.

ඇමුණුම් 2, 3 සහ 4 **සභාගත**** කරමි.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :

Annex tabled:

ඇමුණුම 1

වර්ෂ 2005 -2012 කාල සීමාව තුළ ශ්‍රී ලංකා රජයට ලැබුණු විදේශ ආධාර ප්‍රමාණය

රුපියල් මිලියන

වර්ෂය / රට/ ආයතනය	2005	2006	2007	2008	2009	2010	2011	2012	එකතුව (2005 -2012)	සාමාන්‍යය (2005 - 2012)
ද්විපාර්ශ්වික										
චීනය	1,124.3	1,240.4	20,588.7	6,738.2	34,126.9	95,803.2	48,348.3	110,849.9	318,819.9	39,852.5
ජපානය	24,197.8	31,621.9	25,692.5	32,129.8	35,655.3	38,016.4	42,244.1	49,881.5	279,439.4	34,929.9
ඉන්දියාව	755.9	2,258.7	1,619.5	58.0	5,415.6	3,127.0	22,952.3	38,250.0	74,437.1	9,304.6
එක්සත් රාජධානිය	749.9	875.0	328.3	22,492.5	11,261.3	8,784.7	741.3	62.0	45,294.9	5,661.9
ජර්මනිය	6,538.0	11,279.4	8,787.5	4,126.9	939.6	1,087.9	583.1	324.8	33,667.1	4,208.4
ඩෙන්මාර්කය	913.7	2,463.9	3,639.6	5,597.0	4,664.0	4,548.6	3,332.7	1,867.1	27,026.5	3,378.3
නෝරියාව	1,927.0	2,078.5	4,308.7	1,863.0	2,452.1	4,256.2	3,980.5	6,085.4	26,951.3	3,368.9
නෙදර්ලන්තය	1,702.8	365.8	2,155.2	1,991.8	7,454.2	4,187.9	2,727.1	4,176.7	24,761.5	3,095.2
ප්‍රංශය	29.4	224.7	1,362.8	3,054.6	2,260.4	7,579.4	3,977.7	4,352.9	22,842.0	2,855.3
ස්විඩනය	1,062.1	1,252.4	3,750.1	705.0	2,614.3	3,339.4	2,922.0	4,634.8	20,280.1	2,535.0
ඇමරිකා එක්සත් ජනපදය	1,706.5	3,001.9	3,574.0	3,304.8	834.4	1,408.7	2,024.2	3,617.0	19,471.4	2,433.9
ඔස්ට්‍රියාව	1,317.3	675.2	1,151.6	3,364.1	1,851.4	1,920.2	1,940.6	2,803.0	15,023.5	1,877.9
ඔස්ට්‍රේලියාව	1,322.3	554.7	-	-	-	1,788.9	4,110.0	3,199.0	10,974.9	1,371.9
සංගප්පූරුව	-	10,762.5	-	-	-	-	-	-	10,762.5	1,345.3
ඉරාණය	-	-	-	-	-	-	1,949.9	6,219.3	8,169.2	1,021.1
ස්පාඤ්ඤය	-	492.2	1,469.2	2,175.0	1,310.6	31.0	-	517.6	5,995.6	749.4
කුවේටය	494.2	394.6	508.1	1,046.3	1,001.1	704.3	670.5	284.7	5,103.7	638.0
පාකිස්ථානය	-	3,509.5	1,214.7	-	-	-	-	-	4,724.2	590.5
ෆින්ලන්තය	-	2,879.4	640.1	-	-	-	-	-	3,519.5	439.9
සෞදි රාජ්‍යය	32.9	390.3	558.4	713.3	1,421.4	142.3	85.0	55.4	3,398.9	424.9
ස්විට්සර්ලන්තය	727.8	557.0	211.5	57.1	-	171.3	-	-	1,724.6	215.6
බෙල්ජියම	-	-	380.4	61.4	-	-	-	711.7	1,153.4	144.2
නෝර්වේ	360.9	304.9	56.6	4.9	19.5	-	-	-	746.8	93.4
මැලේසියාව	-	-	121.6	98.0	-	-	-	455.6	675.2	84.4
චෙනිසියුලාව	632.3	-	-	-	-	-	-	-	632.3	79.0
කැනඩාව	-	32.5	-	-	-	-	-	-	32.5	4.1
බහුපාර්ශ්වීය										
ආසියානු සංවර්ධන බැංකුව	22,039.0	21,207.1	19,215.4	31,584.4	32,874.7	38,636.1	32,330.1	39,029.6	236,916.5	29,614.6
ලෝක බැංකුව	15,882.4	17,379.1	13,513.4	15,700.4	23,156.2	17,434.1	24,015.4	22,054.3	149,135.1	18,641.9
ලෝක ආහාර වැඩසටහන	5,699.0	836.2	1,300.0	7,377.0	8,761.2	1,117.0	4,419.7	1,984.0	31,494.0	3,936.7

වර්ෂය / රට/ ආයතනය	2005	2006	2007	2008	2009	2010	2011	2012	එකතුව (2005 -2012)	සාමාන්‍යය (2005 - 2012)
එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල	5,872.1	5,903.7	845.2	2,313.2	1,336.4	776.5	2,605.7	3,497.3	23,150.0	2,893.8
යුරෝපා ආයෝජන බැංකුව	1,817.0	3,433.1	4,741.8	3,120.8	2,440.1	741.4	-	3,994.7	20,288.9	2,536.1
යුරෝපා සංගමය	-	539.6	1,233.9	2,620.0	3,764.7	1,416.1	183.7	-	9,758.0	1,219.8
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල	157.2	381.3	514.4	585.2	1,547.0	1,160.1	1,942.4	2,071.0	8,358.7	1,044.8
ආහාර හා කෘෂිකර්ම සංවිධානය	991.7	1,538.6	448.2	118.1	254.4	1,509.4	1,730.9	529.5	7,120.8	890.1
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	1,720.6	117.0	652.0	708.1	557.2	801.1	689.0	458.9	5,704.0	713.0
එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල	621.0	743.7	244.7	102.2	189.1	51.4	234.9	816.4	3,003.4	375.4
ඕපෙක් අරමුදල	399.1	625.1	360.7	130.4	40.9	58.1	332.4	661.3	2,608.0	326.0
නෝඩික් සංවර්ධන අරමුදල	417.9	638.0	461.9	80.4	41.1	-	-	-	1,639.3	204.9
සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය	-	-	-	-	-	224.5	68.4	42.2	335.1	41.9
එකතුව	101,212.1	130,557.7	125,650.6	154,021.7	188,245.1	240,823.1	211,141.8	313,487.5	1,465,139.7	183,142.5

**** පුස්තකාලයේ තබා ඇත.***

*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** *Placed in the Library.*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මීට මාස තුනකට පෙර ඇමෙරිකාවේ විදේශ ලේකම් ජෝන් කෙරී විසින් එතුමාගේ විදේශ ආධාර අය වැය යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී අපේ රටට ලබා දෙන විදේශ ආධාරවලින් සියයට 20ක් කප්පාදු කරන්නට සෙනෙට් සභාවටයි, House of Representatives එකටයි යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ ආයතනය තුළ තිබෙන මහ බැංකුව තුළින් Majority Group කියන ආයතනයට මාසයකට රුපියල් ලක්ෂ 63ක් ගෙවනවා. Thompson Advisory Group කියන ආයතනයට මාසයකට රුපියල් ලක්ෂ 83ක් ගෙවනවා. මේ ආයතන දෙකම විශේෂයෙන්ම ගත්තොත් පෙළඹවීමේ සංවිධාන. එනම්, lobbying groups. Thompson Advisory Group ආයතනයට මාසයකට රුපියල් ලක්ෂ 83ක් ගෙවනවා. මේ ආයතන දෙකටම ගෙවන්නේ ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ගොඩනඟන්නටයි. ඉතින් මේ වාගේ විශාල ධනස්කන්ධයක් විදේශීය ආයතන දෙකකට - Majority Group එකටයි, Thompson Advisory Group එකටයි - මාස්පතා ගෙවනකොට, අපේ රටට ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලබා දෙන ආධාර කප්පාදු වන්නේ කොහොමද, මේ අයට ගෙවන මුදලට මේ අය අපේ රට වෙනුවෙන් ඒ යුතුකම ඉෂ්ට කරනවාද කියලා මා ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමැතියි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය අහපු එක ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මොකද, ඒ තත්ත්වය ගැන මුළු රටටම පැහැදිලි කිරීම අත්‍යවශ්‍යයි. ඔබතුමාත් දන්නවා ඇති, ඇමෙරිකන් ආර්ථිකය අර්බුදයකට ලක්වෙලා තිබෙන බව. එම නිසා ඇමෙරිකන් රජය විවිධ ක්‍රියා මාර්ගයන් ගන්නවා.

තමුන්නාන්සේලා දන්නවා, fiscal cliff ගැන. ඒ කියන්නේ පරණ විධියටම වැඩ කර ගෙන ගියොත් ආර්ථිකය නැති හංග වන තත්ත්වයකට පත් වෙන්න ඉස්සෙල්ලා ඇමෙරිකන් ආණ්ඩුව කරන කණ්ඩායමයි, විරුද්ධ පක්ෂයයි -අපේ වාගේ නොවෙයි, ඒ ගොල්ලෝ බොහොම සහයෝගයෙන් වැඩ කරනවා.- සාකච්ඡා කරලා පොදු නිගමනවලට එළඹුණා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ ගැන හොඳට දන්නවා. ඔබාමා ජනාධිපතිතුමා කිව්වා, "අපි යම් යම් ඉතිරිකිරීම් මේ විධියට කරනවා" කියලා. අර ගොල්ලොත් කිව්වා, මේ බදු වැඩි කිරීම සමනය කරනවා කියලා. මේ මුළු ලෝකයටම බලපාන සමස්ත තීන්දුවක් ඇමෙරිකන් රජය ගත්තා. ඒ කියන්නේ බොහෝ ආයතනවලට ඊට ඉස්සෙල්ලා අවුරුද්දේ තිබුණ ප්‍රතිපාදන අඩු කළා. ඒකට across-the-board කියලා තමයි මම කියන්නේ. මේ, ඇමෙරිකාව ලංකාවට විතරක් දුන්න පොඩි තරවටුවක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. ඒ ගොල්ලෝ ප්‍රතිපත්තිමය වශයෙන් across-the-board ලෝකයේ හැම රටටම දෙන ආධාර ප්‍රමාණයේ අඩුවීමක් කළා.

ඇත්ත වශයෙන්ම ඔබතුමා ඇහුව ප්‍රශ්නයට අදාළ කරුණ ගැන අපි එක විධියකින් සතුටු වෙන්න ඕනෑ. මොකද, අපේ රටේ තමයි අවම විධියට මූල්‍යාධාර කපලා තිබෙන්නේ. වෙන රටවල ඊට වැඩිය ගොඩක් කපලා තිබෙනවා. ඒ නිසා මේක ලංකාවට, නැත්නම් අපේ මූල්‍ය කළමනාකරණයට විරුද්ධව ගත්ත තීරණයක් නොවෙයි, ඒ ගොල්ලන්ගේ අභ්‍යන්තර තීරණයක්. නිදසුනක් වශයෙන් පැහැදිලි කිරීමක් කරන්න අපට පුළුවන්. සමහර විට අපේ භාණ්ඩාගාරයත් කියනවා, සියලුම ප්‍රතිපාදනවලින් සියයට 10ක් අඩු කරනවා කියලා, රටේ ආර්ථික තත්ත්වය මත. සියයට 10ක් වැඩි කරනවා කියලා නම් මම අහලා නැහැ. නමුත් හදිසියේ, අවස්ථා අනුව, හැම ප්‍රතිපාදනයෙන්ම කොටසක් අඩු වෙනවා. ඒක සාමාන්‍ය මූල්‍ය කළමනාකරණයේ ලකුණක්.

ඒ නිසා මම ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. මට පෙන්වන්න ඕනෑ වුණේ, ලංකාවට විරුද්ධව කළ දෙයක් ලෙස මේක අර්ථකථනයක් කිරීමට කොහෙත්ම බැරි බවයි.

අද ඇමෙරිකාවේත් ලොකු සංවාදයක් තිබෙනවා ඇයි මේ මේ රටවලින් මේ විධියට කැපුවේ, වෙනත් රටවලින් කැපුවේ නැත්තේ කියලා. නමුත් fiscal cliff එකෙන් බේරෙන්න ඇමෙරිකාවේ ඔබාමා ජනාධිපතිතුමා ඒගොල්ලන්ගේ විරුද්ධ Republican පාක්ෂිකයන් සමඟ එකඟ වුණු සම්මුතියේ ප්‍රතිඵලයක් තමයි මේක. දැන් ඔබතුමන්ලාගේ නායකතුමාත් Republican පාක්ෂිකයින් සමඟ ගිවිසුම් ගහලා තිබෙනවා නේ. ඒ නිසා එතුමාගෙනුත් අහලා බලන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සෑහීමකට පත් වෙනවාද මගේ අර්ථ කථනය පිළිබඳව?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම සෑහීමකට පත් වන්නේ නැහැ. මොකද, මම අහපු ප්‍රශ්නයට නොවෙයි උත්තරය දුන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඇයි නැත්තේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, මම ඇහුවේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. දකුණු ආසියාවෙන්ම වැඩියෙන්ම ආධාර කපලා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි සත්‍ය තත්ත්වය. මම ඒකයි ඔබතුමාට ඉදිරිපත් කළේ. කමක් නැහැ. මම ගරු උගත් ඇමතිතුමාගෙන් ඇහුවේ මුළු ලෝකයටම එක විධියට ආධාර කපපු කථාව ගැන නොවෙයි. මහ බැංකුව මාස්පතා Majority Group කියන ආයතනයට හැටතුන් ලක්ෂයක් ගෙවනවා. Thompson Advisory Group කියන ආයතනයට මාසයකට අසූතුන් ලක්ෂයක් ගෙවනවා. මේ ආයතන දෙකම පෙලඹවීමේ සමාගම්. ඒ කියන්නේ lobbying firms. මෙපමණ මුදලක් වැය කරන්නේ ආධාර කපා ගන්න නොවෙයි නේ. මම ඔබතුමාගෙන් ඇහුවේ මෙපමණ මුදලක් ගෙවලත්, මෙපමණ ප්‍රතිපාදනයක් වියදම් කරලාත් ඇමෙරිකා එක්සත් ජනපදය අපේ රටට ලබා දෙන ආධාර සියයට 20කින් කපනවා කියන්නේ-

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ලැබුණු ප්‍රතිලාභය මොකක්ද කියලා අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
-මේ ගෙවන මුදල අපතේ යෑමක් නොවෙයිද කියායි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, ඔබතුමා ඇමෙරිකාවේ ඉගෙන ගත්ත මන්ත්‍රීවරයෙක් නේ. ඔබතුමා දන්නවා ඇමෙරිකන් ක්‍රමය තුළ lobbying groups තිබෙන බව.

තුවක්කු විකුණන මිනිසුන්ගේ lobbying firms තිබෙනවා. නිතරම ඒ කට්ටිය ඇවිල්ලා lobby කරනවා. වාසනාවකට ලංකාවේ ඒවා කරන්නේ නොනිල වශයෙනුයි. නිල වශයෙන් කරන්නේ නැහැ. නමුත් ඒ හඬ ගෙනියන්න වෘත්තීයමය කොටස් ඉන්නවා. කර්මාන්ත සඳහා විතරක් නොවෙයි, රටවලටත් මේ lobbying groups පාවිච්චි කරන්න සිද්ධ වෙනවා. එහෙම නැතිව අපට බැහැ, ඇමෙරිකාවේ ඉන්න ඔක්කොම මන්ත්‍රීවරුන්ට කථා කරන්න. අපට බැහැ, ඔක්කොම බලධරයින්ට කථා කරන්න. යථා තත්ත්වය ඒකයි. යථාර්ථයට මුහුණ දෙන්න අපට සිද්ධ වෙනවා. එහෙම තමයි ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධතා ඇති වෙන්නේ. ඒ නිසා විශේෂයෙන් යුද්ධයෙන් ගොඩ ආපු රටක් හැටියට අපට නිකම් ඉන්න බැහැ. ඩයස්පෝරාව දිනපතා විශාල මුදල් ප්‍රමාණයක් lobbying firmsවලට ගෙවනවා. තානාපති කාර්යාලවලට විතරක් භාර දීලා මේක කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ බව හොඳින් දන්නවා. මේ සමහර අනික් මන්ත්‍රීවරුන්ට වඩා සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඒ බව දන්නවා, එතුමා අවුරුදු තුන, හතරක් ඇමෙරිකාවේ හිටපු නිසා. [බාධා කිරීමක්] අවුරුදු තුනක් නොවෙයි හතරක් හිටියාය කියා ඒකත් දැන් හදන්න යන්න එපා.

ගරු මන්ත්‍රීතුමනි, ඒ ක්‍රමයට අනුගත වෙන්නේ නැතිව අපටත් දැන් කරන්න දෙයක් නැහැ, විශේෂයෙන් අපට මුහුණ දෙන්න වෙලා තිබෙන අභියෝග ගැන බලනකොට. අද නිරන්තරයෙන් අපට විරුද්ධව, අපේ රටට විරුද්ධව, රජයට විරුද්ධව, අපේ ජනාධිපතිතුමාට විරුද්ධව ඒ ගොල්ලන් ප්‍රචාරයක් ගෙන යනවා. ඒක ලොකු සංවිධානයක්. මාස් පතා මිනිස්සුන්ගෙන් සල්ලි එකතු කරලා ඒවාට වියදම් කරනවා. ඒ නිසා අපට නිකම් ඉන්න බැහැ. අපි අවංකවම කියන්න ඕනෑ, අපටත් එවැනි කණ්ඩායම් ඉන්න ඕනෑ; ඒවාට වියදම් කරන්න ඕනෑය කියන එක. ඒක තමයි හැටි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නයට පමණක් විනාඩි 13ක් අරගෙන තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන් වැනි අතුරු ප්‍රශ්නය නොවෙයි, මම දෙවැනි ප්‍රශ්නයට යනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අද ඇවිල්ලා ඉන්න සංඛ්‍යාවත් අඩුයි. මට තුන්වැනි අතුරු ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, එතුමා ඒ ප්‍රශ්න අහනවා නම් අපට වාසියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාසිය අරන් දෙන්න වාගේ හදන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, අපේ රටේ අපනයනවලින් සියයට 21ක්ම යන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයටයි. නමුත් ඔබතුමාගේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් iPad පාවිච්චි කරමින්, පවුලේ සාමාජිකයෝ ඩිස්නිලන්තයට යවලා, Gmail පාවිච්චි කරන්න එපා; Google පාවිච්චි කරන්න එපා; McDonald's එකෙන් කන්න එපා; Kentucky Fried Chicken කන්න එපා යනාදී වශයෙන් ඇමෙරිකානු භාණ්ඩ වර්ජනය කිරීමේ ප්‍රයත්නයක නිරත වන කොට ඒකෙන් වක්‍රව සංඥාවක් යවන්නේ නැද්ද ඇමෙරිකා එක්සත් ජනපදයට අපේ රටට ලබා දෙන සහන, ආධාර කප්පාදු කරන්න කියලා?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, පිළිතුර මෙකයි. අපේ රජය ලෝකයේ තිබෙන සියලුම රටවල් එක්ක මිත්‍රයි. ඇමෙරිකාව අපේ මිත්‍ර රටක්. කොයි විධියකින්වත් ඇමෙරිකානු රජයට විරුද්ධව අපේ රජය ක්‍රියා කරලාවත්, කථා කරලාවත් නැහැ. ඒ වාගේම අනෙක් රටවලටත් අපි විරුද්ධ වෙන්නේ නැහැ. අපි ඉතාම හොඳ නොබැඳුණු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන රටක්. ඔබතුමා උපකල්පනය කරනවා නම් ඇමෙරිකාව අපට වද දෙන්න ලැහැස්තියි, අපට නොයෙක් විධියේ කරදර කරනවා කියලා, ඔබතුමාගේ තිබෙන ඒ දැනුම අපට නැහැ. අපි බලන්නේ හැම දෙනාත් එක්කම හොඳින් ඉන්න. අපේ හොඳ තානාපතිවරයෙක් ඇමෙරිකාවේ ඉන්නවා. අපි සාකච්ඡා කරනවා. මම අවුරුද්දකට දෙවරක් යනවා; ඇමෙරිකානු රජයේ භාණ්ඩාගාරයත් එක්ක අපි කථා කරනවා. අපේ රජය කිසි විටෙක ඇමෙරිකාව හතුරෙක් හැටියට සලකලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇහුවේ විමල් වීරවංශ ඇමතිතුමාගේ ක්‍රියා කලාපය ගැනයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, හරි වැඩක් වෙනවා. එක්සත් ජාතික පක්ෂය හැම දාම මගෙන් අහනවා විමල් වීරවංශ මහත්මයාගේ අදහස් ගැන.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා එතුමාගේ ක්‍රියාකලාපය ප්‍රතික්ෂේප කරන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේලාගේ පක්ෂයේ වාගේ කිට්ටු සම්බන්ධතා නැහැ, අපේ.

වාර්ෂික රාජ්‍ය ආදායම : විස්තර
அரசாங்கத்தின் வருடாந்த வருமானம்:விபரம்
ANNUAL GOVERNMENT REVENUE: DETAILS

2894/'12

2. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 1950, 1960, 1970, 1980, 1990, 2000, 2005, 2006, 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 යන මූල්‍ය වර්ෂයන් අවසානයේදී,

(i) වාර්ෂික රාජ්‍ය ආදායම කොපමණද;

(ii) වාර්ෂික රාජ්‍ය ආදායම සහ වියදම අතර සංසන්දනාත්මක වෙනස කවරේද;

(iii) දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(iv) (අ)(ii) හි සඳහන් කරන ලද වෙනස අදාළ වර්ෂයෙහි දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

(vi) ඒක පුද්ගල ණය ප්‍රමාණයෙහි සංසන්දනය රුපියල්වලින් සහ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්වලින් කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1950, 1960, 1970, 1980, 1990, 2000, 2005, 2006, 2007, 2008, 2009, 2010, 2011 மற்றும் 2012 ஆகிய நிதியாண்டுகளின் முடிவின் போதுள்ளவாறு,

(i) அரசாங்கத்தின் வருடாந்த வருமானம்;

(ii) அரசாங்கத்தின் வருடாந்த வருமானத்திற்கும் செலவிற்கும் இடையிலான ஒப்பீட்டு ரீதியிலான வித்தியாசம்;

(iii) மொத்த உள்நாட்டு உற்பத்தி (GDP);

(iv) (அ) (ii) இல் குறிப்பிடப்பட்டுள்ள வித்தியாசத்தினை, அந்த வருடத்தின் மொத்த உள்நாட்டு உற்பத்தியின் சதவீதமாகவும்;

(v) ஆளொருவருக்கான கடன்;

(vi) ஆளொருவருக்கான கடன் ஒப்பீட்டை ரூபாவிலும் ஐக்கிய அமெரிக்க டொலரிலும்

அவர் வெவ்வேறாகக் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state as at the end of the financial years, separately, for the years 1950, 1960, 1970, 1980, 1990, 2000, 2005, 2006, 2007, 2008, 2009, 2010, 2011 and 2012-

(i) the annual Government revenue;

(ii) the comparative difference in annual Government revenue and expenditure;

(iii) the Gross Domestic Product (GDP);

(iv) the difference referred to in (a) (ii) as a percentage of GDP in the relevant year;

(v) the per capita debt; and

(vi) the comparison of per capita debt in Rupees and USD?

(b) If not, why?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

පහත වගුවේ 01 තීරුවේ දක්වා ඇත.

	(i)	(ii)	(iii)	(iv)	(v)	(vi)
වසර	රජයේ ආදායම (ප්‍රදාන ඇතුළුත්ව) (රු. මිලියන)	සමස්ත හිඟය (රු. මිලියන)	දළ දේශීය නිෂ්පාදිතය (රු.මිලියන)	සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි % ප්‍රතිශතයක් ලෙස	ඒක පුද්ගල ණය ප්‍රමාණය (රු)	ඒක පුද්ගල ණය ප්‍රමාණය (ඇ.ඩො)
1950	623	-163	N.A	-4.1	87	18
1960	1,413	-408	6,711	-6.1	231	49
1970	2,799	-873	13,664	-6.4	694	117
1980	15,642	-12,746	66,527	-19.2	3,482	193
1990	74,662	-25,152	321,784	-7.8	18,265	454
2000	216,427	-119,396	1,257,636	-9.5	63,800	797
2001	239,796	-146,722	1,407,398	-10.4	77,358	830
2002	268,967	-134,023	1,581,885	-8.5	88,280	913
2003	284,421	-133,252	1,822,468	-7.3	97,212	1,005
2004	320,154	-156,753	2,090,841	-7.5	110,086	1,052
2005	412,387	-172,396	2,452,782	-7.0	113,131	1,108

	(i)	(ii)	(iii)	(iv)	(v)	(vi)
වසර	රජයේ ආදායම (ප්‍රදාන ඇතුළුත්ව) (රු. මිලියන)	සමස්ත හිඟය (රු. මිලියන)	දළ දේශීය නිෂ්පාදිතය (රු.මිලියන)	සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි % ප්‍රතිශතයක් ලෙස	ඒක පුද්ගල ණය ප්‍රමාණය (රු)	ඒක පුද්ගල ණය ප්‍රමාණය (ඇ.ඩො)
2006	507,901	-205,745	2,938,680	-7.0	130,056	1,207
2007	595,559	-246,045	3,578,688	-6.9	151,788	1396
2008	686,482	-309,644	4,410,682	-7.0	177,522	1,569
2009	725,566	-476,361	4,835,293	-9.9	203,493	1,779
2010	834,188	-446,017	5,604,104	-8.0	222,256	2,003
2011	949,917	-450,180	6,544,009	-6.9	245,980	2,160
2012	1,003,915	-488,967	7,582,376	-6.4	295,165	2,321

(අ) (i)
(ii) ඉහත වගුවේ (ii) තීරුවේ දක්වා ඇත.
(iii) ඉහත වගුවේ (iii) තීරුවේ දක්වා ඇත.
(iv) ඉහත වගුවේ (iv) තීරුවේ දක්වා ඇත.
(v) ඉහත වගුවේ (v) තීරුවේ දක්වා ඇත.
(vi) ඉහත වගුවේ (vi) තීරුවේ දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන සටහන මා කියවන්නම්. අනෙක් විස්තර ඔබතුමාට බලා ගන්න පුළුවන්.

The Government debt at the end of 2012 totalled to Rs. 6,000.1 billion. This consisted of Rs. 3,232.8 billion of domestic debt and Rs. 2,767.2 billion of foreign debt. The total debt accounted for 79.1 per cent of GDP in 2012 in comparison to 78.5 per cent recorded in 2011 and the highest ratio of 105.6 per cent which was recorded in 2002. Accordingly, even though the debt has increased in absolute value, as a percentage of GDP it has gradually decreased over the period from 105.6 per cent in 2002 to 79.1 per cent in 2012.

Sri Lanka's per capita income has increased to US Dollars 2,923 in 2012. During the last eight years, the per capita GDP has more than doubled in comparison to the period of 15 years that took us to reach the US Dollars 1,000 mark in 2004. This reflects that the country has reached a faster phase of growth during this period.

The Government has been able to manage an average budget deficit of 7 per cent of GDP during the period of the last eight years in comparison to 19.2 per cent of higher deficit in 1980 and 10.4 per cent in 2001. The targetted deficit in 2013, which is 5.8 per cent of GDP, in the context of the last three years' achievement in reducing the deficit, reflects the Government commitment in strengthening fiscal consolidation towards lowering the deficit to below 5.0 per cent of GDP by 2015.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, thank you but even though you tabled the answer, I would like to ask more generalized questions as you have the ability to answer. Hon. Minister, you are taking pride in saying that the debt to GDP has reduced drastically but the more alarming factor is that revenue to GDP had reduced even more drastically. It is from 16.9 to 13.1 per cent. That impact is far greater than the debt to GDP. Now, what I would like to reflect on the GDP, which I am sure you would also agree, is that the increase in the GDP on one side, artificially maybe, has created this distortion. Hon. Minister, can you give a reason as to why your revenue has dropped against GDP?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, අපේ ඒ revenue කියන කොටස පහත බැහැලා තිබෙනවාය කියලා අප පිළිගන්නවා. ඇත්ත වශයෙන් මේ සංවර්ධන වැඩවලට අපේ රටේ GDP එක වැඩි කර ගැනීම සඳහාත්, අපේ ව්‍යදම් වැඩි කර ගැනීම සඳහාත් මීට වඩා අපේ ආදායම් වැඩි කර ගැනීම අත්‍යවශ්‍යයි. මෙතැන හේතු දෙකක් තිබෙනවා. අප කවුරුත් පිළිගන්නා එක හේතුවක් තමයි අපේ tax compliance කියන එක. ඔබතුමන්ලාගේ රජය තිබුණු කාලයේත්, අපටත් මේ විශාල ප්‍රශ්නයක් එක්ක ගැටෙන්න සිද්ධ වනවා. රටේ ආදායම විශාල ප්‍රමාණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අපේ භාණ්ඩාගාරයට නැත්නම් රජයට ව්‍යදම් කිරීම සඳහා ගලාගෙන එන ප්‍රමාණය ඉන් කොටසක්. ඒක ගැඹුරටම අධ්‍යයනය කරලා හුඟක් විසඳුම් අප දී තිබෙනවා. එක කාලයක ආදායම් බදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය සේවක සංඛ්‍යාව නැහැ කියලා අප විශාල සංඛ්‍යාවක් බදවා ගත්තා. ඒ වාගේම හොඳ ගොඩනැඟිලි, නව උපකරණ ඔක්කොම අප ලබා දී තිබෙනවා. ඒ

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වාගේම ඊටත් වඩා ඔබතුමා පිළිගන්නා දෙයක් තිබෙනවා. මා හිතන හැටියට එය ඔබතුමන්ලාත් කැමැති දෙයක් වෙන්න ඕනෑ. අපේ බදු ව්‍යුහය තුළත් හුඟක් පහසුකම් අප ලබා දී තිබෙනවා.

ඇත්ත වශයෙන්ම බදු න්‍යාය යටතේ ඒ බදු ක්‍රමය සරල කරන්න, සරල කරන්න ඒ පුද්ගලයාට නැත්නම් කොම්පැනියට ගෙවන්න තිබෙන බදු ප්‍රමාණය සාධාරණ හැටියට පෙනෙන්න, පෙනෙන්න තමයි ඒගොල්ලෝ බදු ගෙවන්නේ. මොකද, අපේ රටේ තවම තිබෙන්නේ අපේ income එක අපිම declare කරන්න ඕනෑ ක්‍රමයක්. තමන්ම තමයි ඒ income එක හොයා ගන්නේ. ඒ නිසා අපි ප්‍රතිපත්තියක් හැටියට පුළුවන් තරම් මේ බදු ක්‍රමය සරල කරනවා. Compliance වැඩි කරනවා. මා ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. Tax compliance must increase.

ගරු කථානායකතුමනි, දෙවැනි ක්‍රමය තමයි අපේ tax ප්‍රතිපත්තිය. මොකක්ද අපේ බදු ප්‍රතිපත්තිය? මේ අවස්ථාවේදී අපේ බදු ප්‍රතිපත්තිය තමයි, සහන බදු ක්‍රමයක් තුළින් ඒ මුදල් රටට ලබා ගැනීම. සමහර විට කළු සල්ලි වෙන්න පුළුවන්. වෙන වෙන විධියෙන් උපයා ගත් මුදල් වෙන්න පුළුවන්. තමුන්නාන්සේලාත් ඒ සඳහා එක එක උපක්‍රම කළා. තමුන්නාන්සේලා විතරක් නොවෙයි. එන්.එම්. පෙරේරා මහත්මයාත් ඒක කළා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාත් ඒක කළා. අපි ඒක නවත්වලා නැවත ගෙනාවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මා ඒකට විරුද්ධ වනවා නොවෙයිනේ. මා කියන්නේ, those are mechanisms to get that money. බොහෝ විට අපි එක එක්කෙනාට බැණ ගන්නවා. ඇයි මෙහෙම කළේ කියලා, ඔබතුමන්ලා අපිට බණිනවා; අපි ඔබතුමන්ලාට බණිනවා. නමුත් ඇත්ත තත්ත්වය නම් අපි ඒ මුල් ප්‍රශ්නයට තමයි මේ අද මුහුණ දෙන්නේ. ඒ නිසා අපේ බදු collection එක දියුණු කරන්න දැන් අපි බලාපොරොත්තු වනවා. බදු මුදල් අඩු වීම ගැන මා අපේ බදු නිලධාරීන් එක්ක සාකච්ඡා කළාම ඔවුන් දැක්වූ එක හේතුවක් තමයි, අපිට එක එක කොටස්වලට සහන දෙන්න සිද්ධ වෙලා තිබීම. ආයෝජන කරන කොටස්වලට වෙන්න පුළුවන්. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රයට, ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයට සහන දෙන්න සිද්ධ වනවා. ඔබතුමා දන්නවා අපි අද හුඟක් සහන දීලා තිබෙන බව. අපි නොයෙක් විධියේ සහන දීලා තිබෙනවා. සහනාධාරක්‍රම තුළින් සහන ලබා දීලා තිබෙනවා. ඒ නිසා මා කොහෙත්ම කියන්නේ නැහැ අපි ගන්න ආදායම ඇතියි කියලා. ඒක වැඩිදියුණු කරන්න ඕනෑ. ඒ මාර්ගයේ අපි යනවා කියලා ඔබතුමාට මා මතක් කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දුන් පිළිතුර මා අගය කරනවා. ගරු ඇමතිතුමනි, අපි කියනදේත්, ඔබතුමන්ලා කියනදේත් අතර පරස්පරයක් නැහැ. දැන් මෙතැන තිබෙන්නේ tax compliance. ඒක ඇත්තයි. මා හිතන්නේ ඒක broadbase කරලා පුළුවන් තරම් tax එක අඩු කරලා-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Incentives දීලා ගන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Incentives දීලා ඒක වැඩි කරන එක තමයි කළ යුත්තේ. A higher tax compliance is better than trying to impose one hundred different taxes. අපි ඒක පිළිගන්නවා. නමුත් මා ඇහුවේ, දළ දේශීය නිෂ්පාදිතය හා ආදායම අතර ඇති පරතරයයි. ඔබතුන්ලාගේ ඇස්තමේන්තුව අනුව සියයට 98ක් ලබා තිබෙනවා. ඒ කියන්නේ, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා ගන්න පුළුවන් උපරිම - maximum - ආදායම ලබා ගන්නවා. ඒකේ පරස්පරයක් නැහැ. දැන් ජනතාවට ගෙවන්න පුළුවන් උපරිමයට ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා දන්නවා ඇතිනේ. මා අහන්න ඕනෑ නැහැ. ආණ්ඩුවේ නිසා කියන්නේ නැතුව ඉන්න වෙයි. නමුත් මා කියන්නේ -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඇත්ත කියන්න මම පුළුවන් තරම් මහන්සි ගන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක පැත්තකින් ඔබතුමන්ලා මහලොකුවට පම්පෝරි ගහනවා, ඒක අඩු වෙනවා කියලා. මේක ඊට වඩා භයානක දෙයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අවස්ථාව තිබෙන්නේ කථා පවත්වන්න නොවෙයි. ප්‍රශ්න අහන්නයි, පිළිතුරු දෙන්නයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මම ඒකට පිළිතුරු දෙන්නම්. මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ලෙඩේ සොයා ගත්ත එක ගැන අපි බොහොම සතුටු වෙනවා. අපේ බදු ආදායම වැඩි කර ගැනීමට අපි නොයෙක් පියවරවල් ගන්නවා; පුළුවන් තරම් මහන්සි ගන්නවා. සමහර විට ඊළඟ අය වැයෙන් ඒවා තවත් පැහැදිලි කරන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. සාතකයෝ ගැන නොවෙයි. ඊයේ ඔබතුමා මට කිව්වා පී.බී. ජයසුන්දර මැතිතුමා හිටියේ නැහැයි කියලා. මාර්තු 18වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 2862හි රංජිත් සියඹලාපිටිය මැතිතුමා -එවකට හිටපු නියෝජ්‍ය මුදල් ඇමති- කියනවා පී.බී. ජයසුන්දර හිටියා කියලා. මම මේ හැන්සාඩ් වාර්තාව තියා ගෙනයි කථා කරන්නේ. සාමාන්‍යයෙන් මුදල් ප්‍රශ්න සම්බන්ධයෙන් මම බොහොම ඕනෑකමින්, පරෙස්සමින් කථා කරන්නේ. මොකද, අපට -

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහන්න ඕනෑකම තිබෙන්නේ මොකක්ද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමාට මම උත්තරයක් දෙන්නම්. මට හංගන්න දෙයක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
උත්තරයක් දෙන්න. මේ හැන්සාඩ් වාර්තාව -[බාධා කිරීමක්] මිස්ටර් විරසිංහ අත්සන් කර දී තිබෙන ලියුම දීලා තිබෙන්නේ 2005 ජූනි මාසයේ 23වැනි දා. ඒ කාලයේ පී.බී. ජයසුන්දර හිටියා කියලා කියනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ. ඔබතුමාට මම නියම තත්ත්වය පැහැදිලි කරන්නම්. මොකද, නැත්නම් මේක නරක හීනයක් වාගේ හැමදාම ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒ වෙලාවේ මුදල් ඇමති වෙලා හිටියේ මම.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කනගාටුයි. මම මේක කියන්නේ බොහොම වග කීමෙන්. මොකද, නිහාල් ශ්‍රී අමරසේකර මැතිතුමා මේ රටට ඉමහත් සේවයක් කළ කෙනෙක්.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් ඔබතුමා කිව්වා නේ. දැන් මම කියන දේත් අහගන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒකත් පදනම් කර ගෙන තමයි මම කියන්නේ. එතුමා මේ සම්බන්ධයෙන් නීතිය ඉදිරියට ගිහිල්ලා තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. මම ඒක පැහැදිලි කරන්නම්. ඒ වෙලාවේ රංජිත් සියඹලාපිටිය මැතිතුමා මගේ නියෝජ්‍ය ඇමතිතුමා. මම ඇමතිතුමා. ඊට ඉස්සර තිබුණ සිද්ධීන් ගැන ඒ කාලයේ පුවත්පත්වලින් -අපි මාධ්‍යයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ- මාධ්‍යයෙන් කථා කළා, ඊට ඉස්සරවෙලා තිබුණ racket එකක් ගැන. ඒ එදා තිබුණ racket එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඊට ඉස්සරවෙලා තිබුණ, දීර්ඝ කාලයක් කෙරීගෙන ආපු racket එකක් ගැන ඒ අවස්ථාවේදී තමයි මාධ්‍ය හරහා හෙළිදරවු වුණේ. ඒ අවස්ථාවේදී මමත් ලියුමක් ලිව්වා, මගේ නියෝජ්‍ය ඇමතිතුමාත් ලිව්වා, "මේක පත්තරවල වැටෙනවා, ඒ නිසා ඒ ගැන පරීක්ෂා කරන්න" කියලා. මේ සිද්ධීන් ඇති වුණේ මේ කියන කාලයේ නොවෙයි, ඊට ඉස්සර කාලයේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
1999.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
අන්න ඒකයි ඒ narrative එක. ඒක ඔබතුමා දන්නවා. හොඳට තේරෙනවා. ඒ වෙලාවේ අපි තමයි ඒ ගැන බලන්න පරීක්ෂණයක් පටන් ගන්න කියලා වීරසිංහ මහත්තයාව පත් කළේ. ඒකයි ඉතිහාසය. ඒ නිසා මේකේ වැරදි සොයා ගන්න අපට ඔය කරුණු උදව් වෙන්නේ නැහැ.

ඒ පරීක්ෂණයෙන් බලන්න ඕනෑ. මට තව කියන්න පුළුවන්. ඒවා මේ වෙලාවේ කියන්න මම කැමැති නැහැ. මේකට අහු වුණු මිනිස්සු කාගේ කාගේ supportersලාද කියලා කියන්න මට වුවමනාවක් නැහැ. ඒක කරපු අය ඔබතුමාත් හොඳට දන්නවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔව්. හොඳට දන්නවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
එතකොට ඇත්ත වශයෙන්ම කිසි වැරැද්දක් වෙලා නැහැ. ඒ වෙලාවේ මමත් සිටියා. සියඹලාපිටිය මහත්තයාත් හිටියා. ජයසුන්දර මහත්තයාත් සිටියා. අපි තුන් දෙනා මේ පරීක්ෂණය ආරම්භ කළා. ඒ සිද්ධීන් ඇති වුණේ ඊට හුඟක් කලින්. That is the narration of it. බොහොම ස්තුතියි.

වලස්මුල්ල රෝහල : සම්පත් හිඟය
வலஸ்முல்ல மருத்துவமனை : வளப் பற்றாக்குறை
WALASMULLA HOSPITAL: SHORTAGE OF RESOURCES

2920/'12

3. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි වලස්මුල්ල රෝහල අවට ගම්මාන රාශියක රෝගී ජනතාවට සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබූ රෝහලක් බවත්;

(ii) මේ වන විට එම රෝහලෙහි වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයක් පවතින බවත්;

(iii) රෝහලෙහි ලේ බැංකුවේ කටයුතු සහ මෘත ශරීරාගාරයේ මීනී කැපීමේ කටයුතු සිදු නොවන බවත්;

(iv) එම රෝහලෙහි කිසිදු වාට්ටුවකට නේවාසික රෝගීන් ඇතුළත් කර නොගන්නා බවත්;

(v) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වලස්මුල්ල නගරයෙන් ඉවත් කිරීමට සැලසුම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වලස්මුල්ල රෝහලෙහි පවතින මානව හා භෞතික සම්පත් හිඟය කඩිනමින් මග හැරවීමට කටයුතු කරන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் அமைந்துள்ள வலஸ்முல்ல மருத்துவமனையானது, சுற்றுக் கிராமங்கள் பலவற்றிலுள்ள நோயாளர்களுக்கு சுகாதார சேவைகளை வழங்கி வந்த மருத்துவமனை என்பதையும்;

(ii) இன்றளவில் குறித்த மருத்துவமனையில் மருத்துவர்களுக்கான பாரிய பற்றாக்குறை நிலவுகிறது என்பதையும்;

(iii) மருத்துவமனையில் இரத்த வங்கியின் நடவடிக்கைகள் பிரேத அறையில் பிரேதப் பரிசோதனை நடவடிக்கைகள் நடைபெறுவதில்லை என்பதையும்;

(iv) மேற்படி மருத்துவமனையின் எந்தவொரு வாட்டிலும் தங்கியிருந்து சிகிச்சை பெறுவதற்காக நோயாளிகள் அனுமதிக்கப்படுவதில்லை என்பதையும்;

(v) சுகாதார மருத்துவ உத்தியோகத்தர் அலுவலகத்தை வலஸ்முல்ல நகரத்திலிருந்து அகற்ற திட்டமிடப்பட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) வலஸ்முல்ல மருத்துவமனையில் நிலவும் மனித மற்றும் பௌதீக வளப் பற்றாக்குறையை நிவர்த்தி செய்ய துரிதமாக நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the Walasmulla Hospital situated in Hambantota District is a hospital that had provided health services to the patients living in several surrounding villages;

(ii) a severe shortage of doctors exist in the aforesaid hospital by now;

(iii) the functions of the blood bank of the hospital and cutting open of the corpses at the mortuary are not carried out;

(iv) residential patients are not admitted to any of the wards of the aforesaid hospital; and

(v) it has been planned to shift the Office of the Medical Officer of Health from Walasmulla Town?

(b) Will he inform this House whether prompt action will be taken to rectify the shortage of human and physical resources that exist in Walasmulla Hospital?

(c) If not, why?

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)

(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) වෛද්‍යවරු හිඟය මහ හැරවීම සඳහා මේ වන විට කටයුතු කෙරෙමින් පවතී.

මොකද වෛද්‍යවරු විසිතුනක් අවශ්‍යයි. දැනට අටක් ඉන්නවා. අපි හෙට අනිද්දාට දෙන පත්වීම්වලින් ඒ නව වෛද්‍යවරුන් යම් ප්‍රමාණයක් මේ රෝහල සඳහා යොමු කරන්න බලාපොරොත්තු වනවා.

(iii) මෙම රෝහලේ ලේ බැංකුවේ හා මෘත ශරීරාගාරයේ කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලැබේ.

(iv) රෝහලට සාමාන්‍ය පරිදි රෝගීන් ඇතුළත් කිරීම සිදු වෙමින් පවතී.

(v) එවැනි සැලසුමක් නොමැත.

(ආ) මෙම රෝහලේ භෞතික හා මානව සම්පත් හිඟය මහ හැරවීම සඳහා මේ වන විට කටයුතු කෙරෙමින් පවතී.

(ඇ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමනි, දිසා රෝහලක් හැටියට තිබුණු මෙම රෝහල මූලික රෝහලක් බවට පත් කළා. දැනට මෙම රෝහලේ විශේෂඥ වෛද්‍යවරු දෙන්නෙක් ඉන්නවා. ගිය සඳුදා ළමා රෝග සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍යවරයෙකුත් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම කායික රෝග වෛද්‍යවරයෙකුත් ඉන්නවා. මේ රෝහල උසස් කිරීම නිසා විශේෂඥ වෛද්‍ය සේවාව ගමට ඇවිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රෝහල් මේ ආකාරයෙන් පරිවර්තනය කෙරෙන කොට යම් යම් අඩු පාඩුකම් තිබෙනවා. මොකද තවම මේ රෝහලේ පරිවර්තන අවස්ථාව. නමුත් ඒ සේවාවන් සැපයීමට තමයි මේ රෝහල උසස් කරලා තිබෙන්නේ. දැනට විශේෂඥ වෛද්‍යවරු දෙපළක් ඇවිල්ලා ඉන්නවා. හෙට අනිද්දා ලැබෙන නව පත්වීම්වලින් යම් ප්‍රමාණයක් මේ රෝහලට යොමු කරන්න අපි කටයුතු කරනවා. මූලික රෝහලක් බවට පත් වුණාම වෛද්‍යවරු විසිතුනක් ඕනෑ වනවා. දැනට අටයි ඉන්නේ. ඒ නිසා තව වෛද්‍යවරු ප්‍රමාණයක් අපි මේ රෝහලට ලබා දෙන්න ඕනෑ.

ලේ බැංකුව සඳහා වෛද්‍යවරු පුහුණු කරලා, ඒ පුහුණු කළ වෛද්‍යවරු ලබා දෙන්න ඕනෑ. ඒ සඳහාත් දැන් කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය උපකරණ ඔක්කොම ලබා දීලා තිබෙනවා.

මේ රෝහලේ ශල්‍යාගාරය ගැන මම DMO මහත්තයාත් එක්ක කථා කළා. ප්‍රදේශයේ දානපතියෙක් ඒ සඳහා අවශ්‍ය සම්පූර්ණ මුදල ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. දැන් ඒ සැලසුම් සකස් කර ගෙන යනවා. පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා තෙමහල් පරිපාලන ගොඩනැඟිල්ලේ පළමුවැනි පියවර සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න දැනට ඇස්තමේන්තු සකස් කරලා තිබෙනවා.

ඊට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා පවත්වපු සාකච්ඡාවේ ප්‍රතිඵලයක් හැටියට සියලුම ගොඩනැඟිලි

අලුත්වැඩියා කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් දැනට ඇස්තමේන්තු සකස් කරලා තිබෙනවා. ඒ සඳහා අපි ප්‍රතිපාදන ලබා දෙනවා. ඊට අමතරව අභ්‍යන්තර මාර්ග පද්ධතිය ලක්ෂ 15ක් වැය කර ඉදි කරලා තිබෙනවා. "ෂෝක් මහත්මයා" කියන ප්‍රදේශයේ දානපතියෙක් තමයි ඒ ප්‍රතිපාදන ලබා දීලා තිබෙන්නේ. දැනට මෙම රෝහල ඵලදායිතාව සඳහා පෙළ ගැහෙනවා. ඒකත් රෝහලකට අවශ්‍ය දෙයක්.

ගිය අවුරුද්දේ -2012 වර්ෂයේ- අභ්‍යන්තර රෝගීන් විශාල සංඛ්‍යාවකට - 9,879 දෙනෙකුට- ප්‍රතිකාර කරලා තිබෙනවා. 2013 පළමුවැනි කාර්තුව වන විට 2,576 දෙනෙකුට ප්‍රතිකාර කරලා තිබෙනවා. ඒ නිසා මේ රෝහල මූලික රෝහලක් බවට පරිවර්තනය කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, ඒ ප්‍රදේශයේ විශාල රෝගීන් සංඛ්‍යාවකට මේ තුළින් සේවාවක් වෙනවා. ඒ සේවා සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ රෝහල මූලික රෝහලක් කරලා අවුරුදු ගණනාවක් වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඔබතුමා නිවැරැදිවම කිව්වා. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලාත් දැනට මාස 10ක් වෙනවා. දැන් එතුමාම කියනවා, 23 දෙනෙකු සිටිය යුතු වෛද්‍යවරුන්ගෙන් දැනට ඉන්නේ අට දෙනයි කියලා. ගරු කථානායකතුමනි, එතකොට අවශ්‍ය වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් එකයි ඉන්නේ. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලාත් මාස 10ක් වෙනවා. ඒ නිසා ඉතා පැහැදිලියි, පසු ගිය මාස 10ක කාලය තුළදීත් ඉන්න ඕනෑ වෛද්‍යවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකයි ඉන්නේ කියන එක. මේ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ක්ෂණිකව වැඩි කරන්න ක්‍රියාදාමයක් තිබෙනවාද, ඊ ළඟ සීමාවාසික පුහුණුවෙන් එන පිරිසට අමතරව?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සීමාවාසික වෛද්‍යවරුන්ගෙන් තමයි ලබා දෙන්න වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. එහෙම නැතුව අපට වෛද්‍යවරු වෙනත් ස්ථානවලින් ගන්න බැහැ. ඒ සිටින ප්‍රමාණය කළමනාකරණය කර ගන්න ඕනෑ. පසු ගිය කාලයේ තමුන්නාන්සේලාගේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයෙක් හිටියා. තමුන්නාන්සේ දන්නවා ඇති, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා හැටියට හිටපු කාලයේ තිබුණු තත්ත්වය කොහොමද කියන එක. අපි තමයි මේ රෝහල මේ තත්ත්වයට පත් කරලා දියුණු කරන්න යන්නේ. දියුණු කරන්න යන කොට බැණුම් අහන්න වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. වැඩ කරන කොට නේ බැණුම් අහන්න වෙන්නේ. එල ඇති රුකට තමයි ගල් ගහන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

එක්ස්-රේ යන්ත්‍ර ක්‍රියා කරවන්නන් නොමැති වීමත්, ලේ බැංකුවට අවශ්‍ය පුහුණු පිරිස නොමැතිවීමත් කියන ප්‍රශ්න දෙකට මොකක්ද තිබෙන විසඳුම?

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
දැනට ලේ බැංකුවට අවශ්‍ය උපකරණ සහ ස්ථානය තිබෙනවා. දැන් ඒ සඳහා පුහුණු කිරීමක් කරනවා. පුහුණු වෛද්‍යවරු තමයි ඒ සඳහා යොදවන්න ඕනෑ. ඒක කරන්නේ ජාතික මට්ටමෙන්. ඒ පුහුණු වෛද්‍යවරු ලබා දෙන්න අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ගිහිල්ලා සාකච්ඡා කර තිබෙනවා. ඒ වෛද්‍යවරුත් අපි ඉක්මනට ලබා දෙනවා. ගරු කථානායකතුමනි, දිසා රෝහලක් මූලික රෝහලක් බවට පරිවර්තනය වෙනවා.

දැන් ඒ සේවා සහිතව ඒ රෝහල දියුණු කරන්න කටයුතු කර තිබෙනවා. මාත් පළාත් සභාවේ හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයෙක්. මූලික කාලයේ අවශ්‍ය සියල්ල කරන්න හරි අමාරුයි. මොකද, මේ රටේ තිබෙන සම්පත් ප්‍රමාණය අඩුයි. නමුත් මේ ආකාරයෙන් යන කොට අවශ්‍ය ප්‍රතිඵලය ලැබෙනවා. දැන් මේ රෝහල දියුණු තත්ත්වයට පත් වෙලා. ඒ සඳහා දානපතියෝත් උදව් කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ පළාතේ ඉන්න දාන පතියෙක් කියලා තිබෙනවා, කීයක් ගියත් කමක් නැහැ, ඒ රෝහලේ ශල්‍යාගාරය වෙනුවෙන් අවශ්‍ය සම්පූර්ණ මුදල දෙන්න කැමැතියි කියලා. දැන් ඒ ඇස්තමේන්තු සකස් කරලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. අභ්‍යන්තර මාර්ග පද්ධතිය වෙනුවෙන් ලක්ෂ 15ක් වැය කරලා තිබෙනවා "ෂෝක් මහත්මයා" කියන දාන පතියා. බලන්න කොච්චර හොඳද කියලා. ඒ රෝහල දියුණු කරන්න බොහොම ඕනෑකමක් තිබෙනවා ඒ ප්‍රදේශයේ ජනතාවට. ඒ කියන්නේ, ඒ රෝහලේ කටයුතු හොඳින් සිදු වනවා කියන එකයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට ගත්ත කාලය වැඩියි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය.

දැන් ඒ රෝහල මූලික රෝහලක් බවට පත් වෙලා තිබෙනවා කියන එක ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. ගරු කථානායකතුමාම කියනවා ඒ රෝහල මූලික රෝහලක් බවට පත් වෙලා දීර්ඝ කාලයක් ගත වෙලා තිබෙනවා කියලා. මූලික රෝහලක් බවට පත් වෙලා දීර්ඝ කාලයක් ගත වෙලා තිබියදීත් අවශ්‍ය සම්පත් ටික ලබා දෙන්න තිබෙන ප්‍රමාදය මොකක්ද? ඒ වාගේම මා දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් අහපු එක්ස්රේ යන්ත්‍ර ක්‍රියාකරුවන් පිළිබඳව ඇමතිතුමා පිළිතුරක් දුන්නේ නැහැ. ඒ ප්‍රශ්න දෙකටම මට පිළිතුරු දෙන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
එක්ස්රේ යන්ත්‍රයක් දෙනවා නම් ඊට අදාළ නිලධාරියෙකු දෙන්නත් ඕනෑ. ඒක තමයි මා කිව්වේ, ඒ පරිවර්තනය සිදු වෙන කොට ටික ටික අවශ්‍ය සම්පත් ලබා දෙනවා කියලා. එක පාරට සියල්ල ලබා දෙන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
යන්ත්‍ර තිබෙනවා. අවශ්‍ය පුද්ගලයන් නැති එක ගැනයි මා අහන්නේ.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සේවා ලබා දීලා දැනට එම රෝහල දියුණු කරගෙන යනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වළස්මුල්ල රෝහල පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න.

හෝමාගම, පාදුක්ක සහ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස : ග්‍රාම නිලධාරි

ஹோமாகம, பாதுக்க மற்றும் ஹங்வெல்ல பிரதேச செயலாளர் பிரிவுகள்: கிராம உத்தியோகத்தர்கள்
HOMAGAMA, PADUKKA AND HANWELLA DIVISIONAL SECRETARIES' DIVISIONS : GRAMA NILADARIS

3266/'12

5. ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) හෝමාගම, පාදුක්ක සහ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සමහර ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාම නිලධාරීන් සේවයේ යොදවා නොමැති වීම නිසා ඒ ඒ ප්‍රදේශයන්හි ගම්වාසීහු දැඩි දුෂ්කරතාවකට පත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,

(i) දැනට සේවය කරනු ලබන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஹோமாகம, பாதுக்க மற்றும் ஹங்வெல்ல பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள ஒரு சில கிராம உத்தியோகத்தர் பிரிவுகளில் கிராம உத்தியோகத்தர்கள் சேவையில் ஈடுபடுத்தப்படாத காரணத்தினால் அப் பிரதேசங்களின் மக்கள் பாரிய சிரமங்களுக்கு உள்ளாகியுள்ளனர் என்பதை அவர் அறிவாரா?

(ஆ) மேலே குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும்,

(i) தற்போது சேவையாற்றும் கிராம உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) வெற்றிடங்கள் நிலவும் கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) குறித்த கிராம உத்தியோகத்தர் பிரிவுகளின் பெயர்கள் யாவை என்பதையும்

வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Is he aware that the villagers of certain areas in the Homagama, Padukka and Hanwella Divisional Secretaries' Divisions have been severely inconvenienced due to non deployment of Grama Niladaris in certain Grama Niladhari Divisions of the said Divisional Secretaries' Divisions?

(b) Will he inform this House, separately -

(i) the number of Grama Niladaris serving at present;

(ii) the number of GN Divisions with vacancies for Grama Niladaris;

(iii) the names of the aforesaid GN Divisions;

in each of the above-mentioned Divisional Secretaries' Divisions?

(c) If not, why?

ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) දිවයින පුරා ග්‍රාම නිලධාරි පුරප්පාඩු පවතින වසම් සඳහා වැඩ බැලීමට ග්‍රාම නිලධාරීන් පත් කර ඇති අතර, මේ වන විටත් 2012.10.05 දිනැති ගැසට් නිවේදනය අනුව ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා අයදුම් පත් කැඳවා 2013.05.04 දින විවෘත තරග විභාගයක් පවත්වා ඇත. එම තරග විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලද පසු සුදුසුකම් ලබන අපේක්ෂකයන් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට කටයුතු කෙරේ.

(ආ) (i)

	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	දැනට සේවය කරනු ලබන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව
1	හෝමාගම	68
2	පාදුක්ක	33
3	හංවැල්ල	52
එකතුව		153

(ii)

	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	2013.05.04 දිනට පුරප්පාඩු
1	හෝමාගම	13
2	පාදුක්ක	13
3	හංවැල්ල	16
එකතුව		42

(iii)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ග්‍රාම නිලධාරී වසමේ අංකය	ග්‍රාම නිලධාරී වසමේ නම
1	හෝමාගම	451	හේන්පිට
		447/බී	පානළුව
		447/සී	ගැහැණුවල
		450/ඒ	වල්පිට
		482/ඩී	නාවලමුල්ල
		484/සී	දොළහේන
		486/බී	හෝමාගම බටහිර
		587/බී	මත්තේගොඩ මධ්‍යම
		591/සී	කිතුලහේන
		591/ඒ	කුඩමාදුව
		595	හෙරලියාවල
		602/සී	කහතුඩුව නැඟෙනහිර
		603/සී	මුණමලේ යකහළුව
2	පාදුක්ක	452	ගලගෙදර නැඟෙනහිර
		453/ඒ	වේවැල්පනාව
		454/බී	හල්පේ
		457	වග නැඟෙනහිර
		457/බී	වග උතුර
		458	උඩගම
		458/ඒ	තුම්මෝදර
		458/සී	දඹෝර
		459/ඒ	පහළ බෝපේ
		460/බී	ගනේගොඩ
		461/සී	පහළ පාදුක්ක
		462/ඒ	පොරෙගෙදර
		463/ඒ	මාලුලාව දකුණ
3	හංවැල්ල	427/බී	පහළ කොස්ගම බටහිර
		429/බී	මානකඩ
		430	කඩුගොඩ උතුර
		431/සී	පුවක්පිටිය දකුණ

		432/ඒ	කුඩගම
		432/ඊ	ආරාධනා කන්ද
		432/එච්	වෙරළුපිටිය
		432/ජී	අග්‍රා පෙදෙස
		437	මාවල්ගම
		439	දිද්දෙනිය උතුර
		440/ඒ	ඉැන්ඩිගම්පල
		442/ඒ	පඤ්ඤාගල
		442/සී	ඉලුක්ඕවිට
		442/ඩී	ළඟිරුගම
		443/ඒ	පහන්ගම
		444/ඊ	කුඩාකන්ද

(ඇ) අදාළ නොවේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු ආකාරයට මේ වන කොට තරග විභාගයක් පවත්වා පුරප්පාඩු පුරවන්න ලෑස්ති කරලා තිබෙනවා. ඇමතිතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා රොහාන් වෙත්තසිංහ, එතුමාද දන්නේ නැහැ තවමත් ලේකම්තුමා වශයෙන් සිටින්නේ.-

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
නැහැ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගිය වසරේ මාර්තු මාසයේ 17වන දා එතුමා "Ceylon Today" පුවත් පතට කියා තිබුණා, ඒ වසර -2012 වසර- අවසන් වන කොට තරග විභාගයක් පවත්වා මෙම පුරප්පාඩු 4,000 පුරවා අවසන් කරනවා කියලා. නමුත් මේ වන කොට ඔබතුමා කියන -

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය සඳහන් කළ නම තිබෙන ලේකම්වරයකු පසු ගිය අවුරුදු දෙක, තුන තුළ අපේ අමාත්‍යාංශයේ සිටියේ නැහැ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා එසේ කියා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ලේකම්වරයාගේ නම වැඩක් නැහැ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ලේකම්වරයාගේ නම කෙසේ වෙතත් මා අහන ප්‍රශ්නය මෙයයි. ගිය වසර අවසන් වන කොට එම පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනවාය කියන මතය තුළ -

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
අපි විභාගයක් පවත්වා තිබෙනවා.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
තරග විභාගයක් පවත්වනවාය කිව්වා. ඒ වාගේම සමෘද්ධි නිලධාරීන් මෙම පුරප්පාඩුවලට පත් කරන්න යන බවත්, ඒ තරග විභාගය සම්බන්ධයෙනුත් පොඩි ප්‍රශ්නයක් තිබෙන බවත් එතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. මේ වන කොට එම ප්‍රශ්නය නිරාකරණය නොකිරීම නිසාත්, පුරප්පාඩු 4,000ක් තිබෙන නිසාත් ඒ ප්‍රදේශයේ ජනතාව ඉතාම අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මෙම පුරප්පාඩු සම්පූර්ණ කරන්නේ කවදාද ?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමියනි, ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීමට 2012.10.05 දිනැති ගැසට් පත්‍රයෙන් අයදුම් පත් කැඳවා තිබෙනවා. 2013.05.04 වන දින විවෘත තරග විභාගයක් පවත්වා තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල එන්නයි තිබෙන්නේ. ඒ පුරප්පාඩු 4,000 සඳහා ඉතා ඉක්මනින් බඳවා ගැනීම් කටයුතු කරනවා. ඔබතුමිය කියපු විධියට සමෘද්ධි නිලධාරීන් ඒ තනතුරුවලට පත් කරන්න සූදානම් කරලා නැහැ. තරග විභාගයේ ප්‍රතිඵල අනුව තමයි සුදුසු අය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගන්නේ.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පුරප්පාඩු 4,000ක් තිබෙනවා. එම තරග විභාගයට පෙනී සිටි සංඛ්‍යාව කීයද කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
එම සංඛ්‍යාව නම් මට ඉදිරිපත් කරන්න අපහසුයි, ගරු කථානායකතුමනි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මෙම පුරප්පාඩු 4,000ම සම්පූර්ණ කරන්නද මේ කටයුතු කරන්නේ?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
සම්පූර්ණ කරන්න පුළුවන්.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා විභාගයට පෙනී සිටි සංඛ්‍යාව දන්නේ නැත්නම් කොහොමද කියන්නේ මේ පුරප්පාඩු සම්පූර්ණ කරන්න පුළුවන් කියලා?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තරග විභාගයක් නිසා විභාගයට ඉල්ලුම් කරපු සංඛ්‍යාව කියන්න.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
විභාගයට ඉල්ලුම් කරපු සංඛ්‍යාව තමයි මා ඉල්ලන්නේ, ගරු කථානායකතුමනි.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, විශාල පිරිසක් ඉල්ලුම් කරලා තිබෙනවා. ඒ පිරිසෙන් ඒ අවශ්‍ය ප්‍රමාණය බඳවා ගන්න පුළුවන්.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මා සඳහන් කළ ප්‍රදේශවල ග්‍රාම නිලධාරී වසම් දෙකක, තුනක එකම නිලධාරියකු රාජකාරී ආවරණය කරන හේතුව නිසාම ජනතාව අසීරු තත්ත්වයකට පත් වෙලා සිටිනවා. එම නිසා එදිනෙදා වැඩ කටයුතු කර ගන්න බැරි තත්ත්වයට එම ජනතාව පත් වෙලා තිබෙනවා.

ඔබතුමා ම කිව්වා, මේ ආසන තුනේ පමණක් පුරප්පාඩු 43ක් මේ වන විට තිබෙනවාය කියා. මේ තරම් පුරප්පාඩු තියාගෙන මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නේ කොහොමද කියන එකයි මගේ දෙවන අතුරු ප්‍රශ්නය. ඒකයි මා ඇහුවේ -

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, ඉතා ඉක්මනින්, මේ බඳවා ගැනීම්වලට අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඉදිරි මාස දෙක ඇතුළත මේ සියල්ලම අවසන් කර, ඒ නිලධාරීන් ඒ ස්ථානවලට යොදවන්නට පුළුවන්කම තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ කාරණය දැන ගන්නට කැමැතියි. විශේෂයෙන් අද තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විස්තර කියන්නේ නැතිව ප්‍රශ්නය අහන්න.

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මේ අතුරු ප්‍රශ්නයට ඒක අදාළයි ගරු කථානායකතුමනි. විශේෂයෙන් "ගමේ පොත" කියා මෘදුකාංගයක් මේ වෙනකොට නිර්මාණය වෙලා තිබෙනවා. මේ "ගමේ පොත" කියන මෘදුකාංගය - software එක- භාවිත කරන්න මේ ග්‍රාම නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබෙනවා ද? ඒ සඳහා අවශ්‍ය කරන පුහුණුව ලබා දී තිබෙනවා ද? අද ග්‍රාම නිලධාරියෙක් වසම් දෙක තුනක වැඩ කටයුතු කරනවා. එහිදී ඔවුන්ට ඇති වන අසීරුතාව මේ තුළින් අවම කර ගන්නට පුළුවන්වෙයි කියා මා හිතනවා. මේ පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැනුවත් වෙලා තිබෙනවාද?

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු කථානායකතුමනි, සියලුම ග්‍රාම නිලධාරීන්ගේ සේවා පහසුව සඳහා අවශ්‍ය උපකරණ සහ කාර්යාල උපකරණ සියල්ලම ලබා දෙන්නට -

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මේ තාක්ෂණය ගැන -මේ " ගමේ පොත" කියන මෘදුකාංගය ගැන- ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැනුවත් වෙලා තිබෙනවා ද?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමිය අප සාකච්ඡා කර ඉතා ඉක්මනින් laptops ලබා දීමට අවශ්‍ය කටයුතු මේ වෙනකොට කර ගෙන යනවා. ඒ තුළින් ග්‍රාම නිලධාරීන්ට ඒ සේවය පහසුවෙන් කරන්නට පුළුවන්කම ඇතිවේය කියා අප බලාපොරොත්තු වෙනවා. තවද, අප "සේවා පියස" කාර්යාල ඉදි කරලා කාර්යාලීය උපකරණ ලබා දෙනවා. ඒ සියල්ලම ක්‍රියාත්මක වෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7- 3773/'13-(1), ගරු විජිත බේරුගොඩ මහතා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය : වැඩසටහන්

கரையோர வள முகாமைத்துவக் கருத்திட்டம்: நிகழ்ச்சித்திட்டங்கள்

COASTAL RESOURCES MANAGEMENT PROJECT : PROGRAMMES

3871/'13

8. ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ,

(i) වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ඉටු කරන ලද වැඩසටහන් කවරේද;

(ii) ඩී කොම් ආයතනයේ ක්‍රියාකාරීත්වය කවරේද;

(iii) ලංකා ධීවර සංස්ථාව මගින් ඉටු කරන ලද මහජන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ආයතන තුනෙහි අනාගත සංවර්ධන සැලසුම් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005ஆம் ஆண்டு முதல் இன்று வரையான காலப் பகுதியினுள்,

(i) கரையோர வள முகாமைத்துவக் கருத்திட்டத்தினால் நிறைவேற்றப்பட்டுள்ள நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) `டீ கொம்' நிறுவனத்தின் செயற்பாடு யாது என்பதையும்;

(iii) இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனத்தினால் ஆற்றப்பட்ட மக்கள் சேவைகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி மூன்று நிறுவனங்களினதும் எதிர்கால அபிவிருத்தித் திட்டங்கள் யாவை என்பதை தனித்தனியே அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House in relation to the period from the year 2005 up to date -

(i) the programmes implemented by the Coastal Resources Management Project;

(ii) the functions of the institution known as "D Com"; and

(iii) the public services delivered by the Ceylon Fisheries Corporation?

(b) Will he state separately the future development plans of the above three institutions?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම ව්‍යාපෘතිය මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නොවේ.

(ii) මෙම ආයතනය මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නොවේ.

මෙම ප්‍රශ්නයේ (අ) (iii) කොටසෙන් අසා ඇති ලංකා ධීවර සංස්ථාව මගින් ඉටු කරන ලද මහජන සේවාවන් කවරේ ද යන්නට පිටු තුනක පමණ පිළිතුරක් තිබෙනවා. එම නිසා මා මෙම පිළිතුරෙහි ඉතිරි කොටස **සභාගත*** කරනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(iii) ලංකා ධීවර සංස්ථාව -

(i) 2005 වර්ෂය -

මාළු මිල ස්ථායිකරණය මඟින් පාරිභෝගිකයාද, ධීවරයාද ආරක්ෂා කිරීම.

ධීවර කාර්මිකයාගේ මත්ස්‍ය නිෂ්පාදනයට නිසි මිලක් ලබාදෙමින් අතරමැදි පෞද්ගලික මාළු වෙළෙන්දන්ගේ ග්‍රහණයෙන් පාරිභෝගික ජනතාව රැක ගනිමින් සංස්ථා සහ නියෝජිත මත්ස්‍ය අළෙවිහල් මඟින් පාරිභෝගික ජනතාවට මත්ස්‍ය අළෙවිය සිදුකිරීම.

(ii) 2006 වර්ෂය - එම

(iii) 2007 වර්ෂය - එම

(iv) 2008 වර්ෂය - එම

(v) 2009 වර්ෂය - එම

(vi) 2010 වර්ෂය -

සහන මිලට, නියම ප්‍රමිතියෙන් යුත් මාළු අළෙවිය සඳහා අළෙවි සැල් 22ක් ස්ථාපනය කිරීම.

මේ අනුව, සංස්ථාව සහ අළෙවි නියෝජිතයින් මාර්ගයෙන් ව්‍යාපාර කටයුතු කළ අළෙවිහල් 51ක් සංස්ථා අළෙවි ජාලයට එකතු කිරීම මඟින් අළෙවිහල් ගණන 73ක් බවට පත් කිරීම.

(vii) 2011 වර්ෂය -

නව අළෙවිහල් 32ක් ඉදිකර මුළු අළෙවිහල් ගණන 105ක් බවට පත් කිරීම.

කල්පිටිය අර්ධද්වීපයේ පුංචි බත්තලංගුන්ඩුව ධීවර දූපත වෙත 150 KVA විදුලි උත්පාදක යන්ත්‍රයක් ලබාදෙමින් එතෙක් අඳුපාඩුවක් ව තිබූ විදුලිය අවශ්‍යතා ඉටු කිරීම.

වඩා විධිමත් නොග හා සිල්ලර අළෙවි කටයුතු යදහා පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සම්බන්ධීකරණ කටයුතු ආරම්භ කිරීම.

(viii) 2012 වර්ෂය -

නව මත්ස්‍ය අළෙවිහල් 17ක් එකතු කිරීම තුළින් 122ක් වූ සංස්ථා අළෙවිහල් ජාලය හරහා මහජනතාවට සහන සැලසීම.

බද්ධ ව්‍යාපාරයක් වශයෙන් ගාල්ල ප්‍රදේශයේ ටින් මාළු කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම.

ත්‍රිකුණාමලය නොග මත්ස්‍ය වෙළඳාම්පොළ සම්පූර්ණයෙන්ම නවීකරණය කිරීමෙන් අනතුරුව වෙළඳපොළ කටයුතු ආරම්භ කිරීම.

කළමැටිය, නුවරඑළිය සහ මින්නේරිය නිවාඩු නිකේතන අලුත්වැඩියාව හා නේවාසික පරිහරණයට ලබාදීම.

(ix) 2013 වර්ෂය -

නව මත්ස්‍ය අළෙවිහල් 05ක් අලුතින් එකතු කිරීම තුළින් අළෙවිහල් ගණන 127ක් බවට පත් කිරීම.

රාජ්‍ය නොරතුරු කේන්ද්‍රය හරහා දුරකථන අංක 1919 ඇමතීමෙන් දෛනිකව මාළු මිල ගණන් දැනගැනීම සඳහා අවස්ථාව සලසා දීම. (කෙටි පණිවුඩ සහ වෙබ් අඩවිය හරහා ද මිල ගණන් පිරික්සුම් කළ හැක)

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදවිය, ශ්‍රී පුර, සිංහපුර ඉදි කරන ලද නව නිවාඩු නිකේතනය සංස්ථාව වෙත භාරගෙන පහසු මිල ගණන් යටතේ මහජනතාව වෙත පහසුකම් සැලසීම.

ලංකා ධීවර සංස්ථාව දේශීය වශයෙන් උම්බලකඩ නිෂ්පාදනය ආරම්භ කිරීම - මෝදර

ලංකා ධීවර සංස්ථාව කරවල නිෂ්පාදනය ආරම්භ කිරීම - මෝදර, යාපනය, ජේසාලේ සහ පේදුරුතුඩුව.

(ආ) වෙරළ සම්පත් කලමනාකරණ ව්‍යාපෘතිය - පැන නොනඟී.

ඩී කොම් ව්‍යාපෘතිය - පැන නොනඟී.

ලංකා ධීවර සංස්ථාව

(i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආමදුව සංක්‍රමණික ධීවර නොටුපළ සඳහා විශාල අඳුපාඩුවක්ව තිබූ බිඳකන් පහනක් සූර්යකාප බලය ප්‍රයෝජනයට ගෙන ආමදුව ධීවර ප්‍රජාව වෙත සහන සැලසීම.

(ii) ලංකා ධීවර සංස්ථාව සතුව දැනට ඇති 127 ක් වූ මත්ස්‍ය අළෙවිහල් ජාලය 2013 – 2014 වර්ෂ තුළදී 250ක් දක්වා වර්ධනය කරගැනීම සහ ලංකා සතොස අළෙවිසැල් 223 ක් සහ කෝප්සිටි අළෙවිසැල් හරහා දිවයින පුරා මහජනතාව වෙතුවෙන් සහන මිලට නියම බරට අලුත් මාළු සපයමින් සහන සැලසීම.

(iii) දිවයින පුරා වෙරළ තීරය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ආවරණය වන පරිදි මාළු මිලදී ගැනීමේ මධ්‍යස්ථාන අලුතින් ආරම්භ කිරීම.

2010 – 2013 යුනි දක්වා කාලය තුළ පහත සඳහන් ප්‍රදේශයන්හි මසුන් මිලදී ගැනීමේ නව මධ්‍යස්ථාන ආරම්භ කර ඇත.

1. අම්බලන්ගොඩ
2. කුඩාවැල්ල
3. ජේසාලේ
4. පේදුරු තුඩුව
5. චාලඑවෙනය

2013 – 2014 වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රදේශ තුළ මසුන් මිලදී ගැනීමේ නව මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

1. නිරිනද
2. දික්ඔවිට
3. පානදුර
4. ගිනිකඩුව
5. ඔලුවිල්
6. නිල්වැල්ල

2013 වර්ෂය තු දී පහත සඳහන් ප්‍රදේශවල මිරිදිය මසුන් මිලදී ගැනීමේ නව මධ්‍යස්ථාන ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

1. අනුරාධපුරය
2. කුරුණෑගල

ඉහත පරිදි කටයුතු කිරීම තුළින් සමෘද්ධීධීවර ප්‍රජාවට සහ පාරිභෝගික ජනතාවට සහන සැලසීම ලංකා ධීවර සංස්ථාවේ අරමුණ වේ.

(ඇ) පැන නොනඟී.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
බොහොම ස්තුතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා නම් වැඩ කරන ඇමතිවරයෙක්. රටේ තිබෙන කාලගුණ තත්ත්වය දැන ගන්න යම් ක්‍රමයක් තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද? මොකද පසු ගිය දා ඇති වුණු කාලගුණික වෙනස්වීම් ධීවරයන්ට දැන ගන්නට බැරි වීමෙන් ඉතාම කනගාටුදායක තත්ත්වයක් ඇති වුණා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒකෙදි ඇත්තටම අපි ජීවිත අහිමි වුණු-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දන්නවා, ඔබතුමන්ලා පුළුවන් තරම් වැඩ කර තිබෙන බව. මේ විස්තර දැන ගන්නේ නැතිව අපට ඉදිරියට යන්න පුළුවන් වන්නේ කොහොමද? මේ දිනවල අහිතකර කාලගුණ තත්ත්වයක් තිබෙන නිසා මාළු මිල වැඩි වෙලා තිබෙනවා. අප ඉදිරියට කටයුතු කරගෙන යන්නේ කොහොමද? මා දන්නවා, ඔබතුමා මහන්සි වෙලා වැඩ කරන්න හදනවා කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තාක්ෂණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක, පුද්ගලයන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒ ආයතනයේ තිබෙන අඩු පාඩුවක්. නමුත් අපේ යාත්‍රා සුපරීක්ෂාකරණ පද්ධතිය - Vessel Monitoring System කියන එක- දැන් Cabinet-Appointed Negotiating Committee එකේත් අවසාන අදියරේයි තිබෙන්නේ. එය අවසන් වුණාට පසුව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය

අරගෙන මේ වසර අවසාන වෙන්නට පෙර එය ක්‍රියාත්මක කරනවා. ඒකේ තිබෙනවා නියම satellite මාර්ගයෙන් ගන්න weather forecast එක. ඒ කියන්නේ අනාගත කාලගුණ තත්ත්වය. එමඟින් පැය 24කට ඉස්සර වෙලා ඒ නියමිත කාලගුණය සියලුම ධීවරයන්ට දන්වන්න අපට පුළුවන්. බහුදින යාත්‍රාවල transponder එකටම අපට ඒ විස්තර ලබා දෙන්න පුළුවන්. එක්දින යාත්‍රාවලට අපේ මධ්‍යස්ථාන හරහා ඒ තොරතුරු ලබා දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඉන්දියාවේ සහ මාලදිවයිනේ ධීවරයන් අපේ ලංකාවේ මුහුදුකරය - territorial waters - ආක්‍රමණය කරනවා. මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් අපට පේනවා, දෙපැත්තෙන්ම උසාවියට ඉදිරිපත් කරනවා, අත් අඩංගුවට ගන්නවාය කියන ප්‍රශ්නය තිබෙන බව. මීට වඩා මිත්‍රශීලීව -ඉන්දියාවටත් මාලදිවයිනටත් ප්‍රශ්නයක් නොවන විධියකට- අපට මේ කටයුතු කරන්න බැරිද? ඒ වාගේම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ලස්සනට බෙදලා තිබෙන එකේ පොලීසිය අතර ප්‍රශ්න තිබෙනවාද, නැද්ද කියන එකට ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මොකක්ද ඔබතුමා ඇහුවේ? දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා බොහොම හොඳ ස්ථාවරයක් අරගෙන මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරනවා. බලය විමධ්‍යගත කිරීම තුළ පොලීසිය අතර ප්‍රශ්නයක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒක ධීවර ප්‍රශ්නයක් නොවෙයි. දේශපාලන ප්‍රශ්නයක් නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා දන්නවා, ඔබතුමා බොහොම නිර්භීතව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කර තිබෙන බව.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

සෘජුව කථා කරනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔව්. ඔබතුමා සෘජුව කථා කරනවා. අප එය අගය කරනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පොලීසිය පිළිබඳව මම අද උදේ රූපවාහිනිය සහ ගුවන් විදුලිය හරහා පැය දෙකක් කථා කළා. එහිදී සියලුම තත්ත්වයන් දැන්වූවා. මේ ධීවරයන්ගේ ප්‍රශ්නය ගැන මම ඔබතුමාට කියන්නම්.

අපේ ධීවරයන් ඉතා සුළු ප්‍රමාණයයි ඉන්දියානු මුහුදු කලාපය පැත්තට යන්නේ. ඒකත් තනි තනිව ගිහින් අහු වෙන ඒවා විතරයි. ඒ අයගේ අය එන්නේ සිය ගණනින්; දහස් ගණනින්. ඒ නිසා පසු ගිය කාලයේ අප දිගටම ඔවුන් සමඟ සාකච්ඡා කළා. රජයන් රජයන් අතර අප සම්බන්ධ වෙලා කථා කළා. ඒ මොන තත්ත්වය යටතේ කටයුතු කළත්, මෙහි කිසිම අඩුවක් තිබුණේ නැහැ. ඒ අනුව පසු ගිය කාලයේ අපේ රජයත් තීන්දු කළා අපේ අයට කරනවා වාගේම ඒ අයත් අත් අඩංගුවට අරගෙන බන්ධනාගාරගත කරලා නඩු අහන්න. ඒකත් එක්ක දැන් ඒ ධීවරයන්ගේ පැමිණීම ඉතාම අවම තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. දැනට සියයට 80ක් විතර එහෙම එන්නේ නැහැ. හිටපු ගමන් හොරෙන් එන කෙනෙක් විතරයි. වෙනදා වාගේ කණ්ඩායම් පිටින් එන්නේ නැහැ.

මාලදිවයිනෙන් කවුරුවත් පැමිණෙන්නේ නැහැ. වෙනත් කිසිම රටකින් අපට ප්‍රශ්නයක් නැහැ. මේක ධීවර සංවිධාන සහ රට අතර ප්‍රශ්නයක් විධියට විසඳන්නට විධියක් නැහැ. මොකද, ඒගොල්ලන් ඉල්ලීම කරන්නේ අවුරුද්දකට දවස් 70ක් ඒ ගොල්ලන්ට ලබා දෙන්න, අපට දවස් 70ක් එහෙන් ලබා දෙනවා කියලා යි. ඒකෙන් කවදාවත් විසඳුමක් ලැබෙන්නේ නැහැ. දවස් 70ක් ඒ අයට දුන්නොත්, ඒ අය දහස් ගණනින් ඇවිල්ලා මෙහි නවාතැන් ආදිය පාවිච්චි කරනවා. අනෙක් කාරණය, ඒ අයගේ පැත්තට දවස් 70ක් දෙන එකෙන් උතුරේ ධීවරයන්ට කිසිම වටිනාකමක් ලැබෙන්නේ නැහැ. මොකද, කෙලවල්ලන් අල්ලා ගැනීම සඳහා යන්නේ දකුණේ ධීවරයනුයි. ඉතින් එහෙම දකුණේ ධීවරයන් වෙනුවෙන් එවැනි තීරණයක් ගැනීමෙන් උතුරේ ධීවරයන්ට ඉතාමත්ම අසාධාරණයක් සිදු වනවා. ඒ නිසා උතුරේ ධීවර සංවිධාන එකක්වත් ඒකට එකඟ නැහැ. ඒ නිසා මමත් සමඟ සම්බන්ධ වෙලා මේ සංවිධාන දෙකම - දකුණු ඉන්දීය ධීවර සංවිධානයත්, උතුරේ ධීවර සංවිධානයත් - සාකච්ඡා පැවැත්වුවා. නමුත් ඒ එකකටවත් ඔවුන් එකඟ වුණේ නැහැ. මමත් ප්‍රතිපත්තියක් වශයෙන් ඒකට එකඟ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 9, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා. මා අතුරු ප්‍රශ්න දෙකයි ඇහුවේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම නම් මම අනෙක් මන්ත්‍රීතුමන්ලාට ප්‍රශ්න අහන්න දෙන්නේ නැහැ, මම හරියටම 2.00ට ප්‍රධාන කටයුතු ආරම්භ කරනවා. හොඳයි, ඔබතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න ඇසීම පටන් ගත්තේ පස්වරු 1.15ටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මම දන්නේ නැහැ, න්‍යාය පත්‍රය බලන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පස්වරු 2.00ට ප්‍රධාන කටයුතු ආරම්භ වෙනවා. ප්‍රශ්න ඇසීමට දීපු කාලය අවසන්.

ප්‍රශ්න අංක 9 -2589/'12 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10 -2895/'12 - (1), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 -2921/'12 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 -3775/'13 - (1), ගරු විජිත බේරුගොඩ මහතා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 4 -3072/'12 - (2), ගරු අජිත් පී. පෙරේරා මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -3683/'13 - (1), ගරු නිමල් විජේසිංහ මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, ගරු නිමල් විජේසිංහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සී/ස හලාවත වැවිලි සමාගම : ආදායම සහ ලාභය/ අලාභය

வ/ப சிலாபம் பெருந்தோட்டக் கம்பனி : வருமானம் மற்றும் இலாபநட்டம்

CHILAW PLANTATIONS COMPANY LIMITED : INCOME AND PROFIT/ LOSS

3684/'13

12. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු නිමල් විජේසිංහ මහතා වෙනුවට)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு நிமல் விஜேசிங்க சார்பாக)
(The Hon. A.H.M. Azwer on behalf of the Hon. Nimal Wijesinghe)

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සී/ස හලාවත වැවිලි සමාගම යටතේ පාලනය වන වතු කවරේද;

(ii) එම එක් එක් වත්තේ භූමි ප්‍රමාණය සහ කරනු ලබන ප්‍රධාන වගාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ එක් එක් වත්තෙන් ලැබූ ආදායම සහ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) வ/ப சிலாபம் பெருந்தோட்டக் கம்பனியின் கீழ் நிர்வகிக்கப்படும் தோட்டங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு தோட்டத்தினதும் காணி யின் பரப்பளவு மற்றும் மேற்கொள்ளப்படும் முக்கிய பயிர்ச் செய்கைகள் தனித்தனியே யாவை என்பதையும்;

(iii) கடந்த 10 வருடங்களுக்குள் ஒவ்வொரு தோட் டத்திலிருந்தும் கிடைத்த வருமானம் மற்றும் இலாபம் அல்லது நட்டம் தனித்தனியே எவ்வளவென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he inform this House -

(i) the estates managed under Chilaw Plantations Company Limited;

(ii) the extent of land of each estate and the main crops cultivated in them separately;

(iii) the income derived from each estate along with the profit generated or the loss incurred by each estate during the last 10 years?

(b) If not, why?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

- බිංගිරිය
- හලාවත
- දිවුලපිටිය
- මාදම්පේ
- නිකවැරටිය
- පලුගස්වැව
- පුත්තලම
- මංගලඑළිය

(ii)

වත්තේ නම	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
බිංගිරිය	1,109.7 (එක්දහස් එකසිය නවයයි දශම හත)
හලාවත	782.6 (හත්සිය අසූ දෙක දශම හය)
දිවුලපිටිය	510.6 (පන්සිය දහයයි දශම හය)
මාදම්පේ	656.9 (හයසිය පනස් හයයි දශම නවයයි)
නිකවැරටිය	401.4 (හාරසිය එකයි දශම හතර)
පලුගස්වැව	670.2 (හයසිය හැත්තෑවයි දශම දෙක)
පුත්තලම	926.2 (නවසිය විසි හයයි දශම දෙක)
මංගලඑළිය	816.6 (අටසිය දහසයයි දශම හය)

<u>ප්‍රධාන වගාවන්</u>

- පොල්
- කජු
- ගම්මිරිස්
- රබ්බටන්
- ඩ්‍රැගන් ෆෘට්
- කුරුඳු
- තේක්ක
- කහ
- මඤ්ඤොක්කා
- සැන්ඩ්‍රියානා

(iii)

[ගරු ඒ.ඒ. ජගත් පුෂ්පකුමාර මහතා]

2002		
වත්තේ නම	ආදායම (රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	18.77 දහඅටයි දශම හතයි හත	8.08 අටයි දශම බින්දුවයි අට
පලුගස්වැව	43.29 හතළිස්තුනයි දශම දෙකයි නවයයි	24.43 විසිහතරයි දශම හතරයි තුනයි
කලාප අංක 01 (පුත්තලම)	20.54 විස්සයි දශම පහයි හතර	5 පහයි
බිංගිරිය	32.6 (තිස්දෙකයි දශම හය)	17.25 දාහතයි දශම දෙකයි පහ
නිකවැරටිය	17.1 දාහතයි දශම එකයි	8.58 අටයි දශම පහයි අට
කලාප අංක 02 (මංගළඑළිය)	48.34 හතළිස් අටයි දශම තුනයි හතර	25.13 විසිපහයි දශම එකයි තුන
දිවුලපිටිය	-	-
මාදම්පේ	-	-

2003		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	20.45 විස්සයි දශම හතරයි පහ	7.5 හතයි දශම පහ
පලුගස්වැව	35.49 තිස්පහයි දශම හතරයි නවය	16.24 දහසයයි දශම දෙකයි හතර
කලාප අංක 01 (පුත්තලම)	18.55 දහඅටයි දශම පහයි පහ	1.32 එකයි දශම තුනයි දෙක
බිංගිරිය	28.85 විසිඅටයි දශම අටයි පහ	13.13 දහතුනයි දශම එකයි තුන
නිකවැරටිය	14.46 දාහතරයි දශම හතරයි හය	5.16 පහයි දශම එකයි හය
කලාප අංක 02 (මංගළඑළිය)	45.34 හතළිස් පහයි දශම තුනයි හතර	20.74 විස්සයි දශම හතයි හතර
දිවුලපිටිය	-	-
මාදම්පේ	-	-

2004		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	23.71 විසිතුනයි දශම හතයි එක	11.28 එකොළහයි දශම දෙකයි අට
පලුගස්වැව	46 හතළිස් හය	25.5 විසිපහයි දශම පහ
කලාප අංක 01 (පුත්තලම)	27.41 විසි හතයි දශම හතරයි එක	7.8 හතයි දශම අට
බිංගිරිය	30.2 තිහයි දශම දෙක	14.88 දාහතරයි දශම අටයි අටයි
නිකවැරටිය	15.87 පහළොවයි දශම අටයි හත	6.82 හයයි දශම අටයි දෙක
කලාප අංක 02 (මංගළඑළිය)	52.23 පනස්දෙකයි දශම දෙකයි තුන	27.9 විසිහතයි දශම නවය
දිවුලපිටිය	-	-
මාදම්පේ	-	-

2005		
වත්තේ නම	ආදායම (රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	20.99 විස්සයි දශම නවයයි නවය	5.6 පහයි දශම හය
පලුගස්වැව	43.64 හතළිස් තුනයි දශම හයයි හතර	18.43 දහඅටයි දශම හතරයි තුන
කලාප අංක 01 (පුත්තලම)	22.56 විසිදෙකයි දශම පහයි හය	1.57 එකයි දශම පහයි හත
බිංගිරිය	26.36 විසිහයයි දශම තුනයි හය	9.41 නවයයි දශම හතරයි එක
නිකවැරටිය	15.26 පහළොවයි දශම දෙකයි හය	5.20 පහයි දශම දෙකයි
කලාප අංක 02 (මංගළඑළිය)	46.16 හතළිස් හයයි දශම එකයි හය	19.35 දහනවයයි දශම තුනයි පහ
දිවුලපිටිය	-	-
මාදම්පේ	-	-

2006		
වත්තේ නම	ආදායම (රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	24.15 විසිහතරයි දශම එකයි පහ	6.61 හයයි දශම හයයි එක
පලුගස්වැව	42.48 හතළිස් දෙකයි දශම හතරයි අට	17.84 දාහතයි දශම අටයි හතර
පුත්තලම	8.16 අටයි දශම එකයි හය	අලාභය (3.47) තුනයි දශම හතරයි හත
මංගළඑළිය	10.35 දහයයි දශම තුනයි පහ	අලාභය (1.03) එකයි දශම බින්දුවයි තුන
බිංගිරිය	27.33 විසිහතයි දශම තුනයි තුන	7.57 හතයි දශම පහයි හත
නිකවැරටිය	13.03 දහතුනයි දශම බින්දුවයි තුන	2.23 දෙකයි දශම දෙකයි තුන
දිවුලපිටිය	26.99 විසිහයයි දශම නවයයි නවය	11.85 එකොළහයි දශම අටයි පහ
මාදම්පේ	26.07 විසිහයයි දශම බින්දුවයි හත	9.45 නවයයි දශම හතරයි පහ

2007		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	38.98 තිස්අටයි දශම නවයයි අට	18.40 දහඅටයි දශම හතර
පලුගස්වැව	77.53 හැත්තෑහතයි දශම පහයි තුන	38.67 තිස්අටයි දශම හයයි හත
පුත්තලම	24.15 (විසිහතරයි දශම එකයි පහ	7.76 හතයි දශම හතයි හය
මංගළඑළිය	21.17 විසිඑකයි දශම එකයි හත	5.67 පහයි දශම හයයි හත
බිංගිරිය	41.57 හතළිස් එකයි දශම පහයි හත	14.46 දාහතරයි දශම හතරයි හය
නිකවැරටිය	22.52 විසිදෙකයි දශම පහයි දෙක	8.34 අටයි දශම තුනයි හතර
දිවුලපිටිය	37.29 තිස්හතයි දශම දෙකයි නවය	16.61 දහසයයි දශම හයයි එක
මාදම්පේ	41.69 හතළිස්එකයි දශම හයයි නවය	18.34 දහඅටයි දශම තුනයි හතරයි

2008		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	44.95 හතළිස් හතරැදශම් නවයයි පහ	22.6 විසිදෙකයි දශම් හය
පලුගස්වැව	70.91 හැත්තෑවයි දශම් නවයයි එක	31.39 තිස් එකයි දශම් තුනයි නවයයි
පුත්තලම	35.57 තිස්පහයි දශම් පහයි හත	16.67 දහසයයි දශම් හයයි හත
මංගළඑළිය	20.73 විස්සයි දශම් හතයිතුන	4.6 හතරයි දශම් හය
බිංගිරිය	44.48 හතළිස් හතරයි දශම් හතරයි අට	20 විස්සයි
නිකවැරටිය	20.35 විස්සයි දශම් තුනයි පහ	5.72 පහයි දශම් හතයි දෙක
දිවුලපිටිය	39.16 තිස්නවයයි දශම් එකයි හය	15.6 පහළොවයි දශම්හය
මාදම්පේ	50.34 පනහයි දශම් තුනයි හතර	26.56 විසිහයයි දශම් පහයි හය

2009		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	45.1 හතළිස් පහයි දශම් එකයි	21.9 විසිඑකයි දශම් නවය
පලුගස්වැව	86.11 අසුහයයි දශම් එකයි එක	48.83 (හතළිස් අටයි දශම් අටයි තුන)
පුත්තලම	19.72 දහනවයයි දශම් හතයි දෙක	1.4 එකයි දශම් හතර
මංගළඑළිය	28.36 විසිඅටයි දශම් තුනයි හය	10.21 දහයයි දශම් දෙකයි එක
බිංගිරිය	42.5 හතළිස්දෙකයි දශම් පහ	11.35 එකොළහයි දශම් තුනයි පහ
නිකවැරටිය	25.62 විසිපහයි දශම් හයයි දෙක	8.94 අටයි දශම් නවයයි හතර
දිවුලපිටිය	41.62 හතළිස් එකයි දශම් හයයි දෙක	17.32 දාහතයි දශම් තුනයි දෙක
මාදම්පේ	48.95 හතළිස්අටයි දශම් නවයයි පහ	20.62 විස්සයි දශම් හයයි දෙක

2010		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	55.20 පනස් පහයි දශම් දෙකයි	25.41 විසිපහයි දශම් හතරයි එක
පලුගස්වැව	127.3 එකසිය විසි හතයි දශම් තුන	70.9 හැත්තෑවයි දශම් නවය
පුත්තලම	32.09 තිස්දෙකයි දශම් බින්දුවයි නවය	7.7 හතයි දශම් හත
මංගළඑළිය	26.2 විසි හයයි දශම් දෙක	2.87 දෙකයි දශම් අටයි හත
බිංගිරිය	65.05 හැටපහයි දශම් බින්දුවයි පහ	31.82 තිස්එකයි දශම් අටයි දෙක
නිකවැරටිය	37.61 තිස්හතයි දශම් හයයි එක	14.58 දාහතරයි දශම් පහයි අට
දිවුලපිටිය	56.28 පනස් හයයි දශම් දෙකයි අට	28.68 විසිඅටයි දශම් හයයි අට
මාදම්පේ	65.65 හැට පහයි දශම් හයයි පහ	32.92 තිස්දෙකයි දශම් නවයයි දෙක

2011		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	47.38 හතලිස් හතයි දශම තුනයි අට	23.11 විසිතුනයි දශම එකයි එක
පලුගස්වැව	108.73 එකසිය අටයි දශම හතයි තුන	59.02 පනස් නවයයි දශම බින්දුවයි දෙක
පුත්තලම	17.64 දාහතයි දශම හයයි හතර	1.25 එකයි දශම දෙකයි පහ
මංගළඑළිය	14.33 දාහතරයි දශම තුනයි තුන	අලාභය (2.3) දෙකයි දශම තුන
කිංගිරිය	61 හැටඑක	33.17 තිස්තුනයි දශම එකයි හත
නිකවැරටිය	35.30 තිස්පහයි දශම තුන	18.23 දහඅටයි දශම දෙකයි තුන
දිවුලපිටිය	56.27 පනස් හයයි දශම දෙකයි හත	34.48 තිස්හතරයි දශම හතරයි අට
මාදම්පේ	58.19 පනස්අටයි දශම එකයි නවය	28.42 විසිඅටයි දශම හතරයි දෙක

2012		
වත්තේ නම	ආදායම(රු.මිලියන)	ලාභය/අලාභය (රු.මිලියන)
හලාවත	35.1 තිස්පහයි දශම එක	10.83 දහයයි දශම අටයි තුන
පලුගස්වැව	90.4 අනූවයි දශම හතර	44.12 හතළිස් හතරයි දශම එකයි දෙක
තම්බපණ්ණි කලාපය (පුත්තලම ,මංගළඑළිය)	50.45 පනහයි දශම හතරයි පහ	14.83 දාහතරයි දශම අටයි තුන
කිංගිරිය	60.44 හැටයි දශම හතරයි හතර	33.34 තිස්තුනයි දශම තුනයි හතර
නිකවැරටිය	30 තිහ	12.57 දොළහයි දශම පහයි හත
දිවුලපිටිය	55.75 පනස්පහයි දශම හතයි පහ	28.84 විසිඅටයි දශම අටයි හතර
මාදම්පේ	53.37 පනස් තුනයි දශම තුනයි හත	24.92 විසිහතරයි දශම නවයයි දෙක

(ආ) ඉහත පිළිතුර අනුව පැන නොනගී.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, අපේ සම්ප්‍රදාය තිබෙන්නේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ප්‍රශ්න 15ක් ඇතුළත් කිරීමට. අද න්‍යාය පත්‍රයේ තිබෙන්නේ ප්‍රශ්න 13යි. මම දැන ගන්න කැමැතියි, කුමන හේතුවක් මත ප්‍රශ්න 13කට සීමා කළාද කියලායි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒක මටත් ප්‍රශ්නයක්. මන්ත්‍රීවරයෙක් එතුමාගේ ප්‍රශ්න ඉල්ලා අස් කරගෙන තිබෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ මන්ත්‍රීවරයා තවම පාර්ලිමේන්තුවෙන් අස් වෙලා නැහැ නේ. ඉල්ලා අස් වීමේ ලිපියක් දීලා නැහැ. මම දන්නේ නැහැ ඇයි කියලා. මේක අපට ප්‍රහේලිකාවක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඉල්ලා අස් වෙන්නම ඕනෑ නැහැ. තමුන්නාන්සේටත් ප්‍රශ්නයක් අහලා ඉල්ලා අස්කර ගන්න පුළුවන්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ඊයේ එතුමා ප්‍රකාශයක් කළා, එතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වෙලා පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා යනවා කියලා. මේක මොකක්ද කියන එක අපට පොඩි ප්‍රහේලිකාවක්. අපි දැන ගන්න කැමැතියි,- [බාධා කිරීමක්]

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රහේලිකාවක් ඇති වෙන්නේ නැහැ. හෙට සිට ප්‍රශ්න 15ම න්‍යාය පත්‍රයේ පළ වෙනවා. ඒ වාගේම ප්‍රශ්න සියල්ලම -[බාධා කිරීමක්] එතුමා ඊයේ හැන්දෑවේ දන්වලා තිබෙනවා. එතකොට මේ න්‍යාය පත්‍රය මුද්‍රණය කරලා නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ මන්ත්‍රීවරයාට සැකයක් තිබෙනවාද දන්නේ නැහැ, එතුමාට මහ ඇමතිකමට අපේක්ෂකත්වය නොලැබෙයි කියලා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒක අහන්න ඕනෑ ඒ පැත්තෙන්, මගෙන් නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අපට කියන්න පුළුවන්ද, කවදාද මේක ඉල්ලා අස් කර ගත්තේ කියලා. මොකද, සාමාන්‍යයෙන් අපි ප්‍රශ්නයක් ඉල්ලා අස් කර ගන්න හැදුවොත් අපට කියනවා, සුමානයක් කල් ඕනෑ කියලා. මොකද, print කරන්න මෙහෙම schedule කරලා තිබෙනවා කියලා. මේ ප්‍රශ්න අවශ්‍ය නැහැයි කියලා කවදාද කිව්වේ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

සමහර ඒවාට එහෙම කාලයක් වැඩක් නැහැ. ප්‍රශ්නයක් ඉල්ලා අස් කර ගන්න නම් ඕනෑ වෙලාවක පුළුවන්, ඇතුළු කර ගන්න තමයි අමාරු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, විපක්ෂයට එක විධියක්, ආණ්ඩු පක්ෂයට තවත් විධියක්. මේක හරි වැඩක් නේ ගරු කථානායකතුමනි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බලන්න, ඔබතුමාත් අද හවසට දෙන්න, ප්‍රශ්නයක් ඉල්ලා අස් කර ගන්නවා කියලා. මම හෙට ඒ සියලු කටයුතු -[බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ වාගේ අවස්ථාවක් එන්නේ නැහැ. මොකද, අපට ඒ වාගේ අවස්ථාවක් එන්නේ එක්සත් ජාතික පක්ෂයේ අපි ආණ්ඩුව ගත්තාට පස්සේ. අපි මෙතැන අහන්නේ මේ ප්‍රශ්න කොයි වෙලාවේද ඉල්ලා අස් කර ගත්තේ කියන එකයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කාලයක් තිබුණානේ, ඊයේ හවස 3.00 සිට.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ මේකට ඉස්සර තමයි වෙලා තිබෙන්නේ. ආ! එහෙම නම් ඒක හරි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සවස 3.00 සිටම කාලය තිබුණා.

දැන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ පුස්තකාලයට අනුබද්ධව පිහිටුවා තිබෙන Research Division එකෙන් මන්ත්‍රීවරුන්ට අවශ්‍ය විවිධ තොරතුරු ලබා ගැනීම සඳහා විශාල දායකත්වයක් සපයනවා. ජනාධිපති ලේකම් කාර්යාලයට යවන ලිපිවලට පිළිතුරු ලබා දෙනවා. එතුමන්ලා ලබා දෙන තොරතුරු අපට ලබා දෙනවා. නමුත් මම පසු ගිය මැයි මාසයේ පොලිස්පතිතුමාගෙන් ලබා ගත යුතු තොරතුරු වගයක් ඉදිරිපත් කළා. පර්යේෂණ ඒකකයෙන් ජූනි මාසයේ 18 වෙනි දා පොලිස්පතිතුමාට දන්වා තිබෙනවා ඒ සඳහා තොරතුරු ලබා දෙන්න කියලා. නමුත් ලබා දීලා නැහැ. මාසයකට පසුව නැවත මතක් කිරීමක් කරලා තිබෙනවා මේ තොරතුරු ලබා දෙන්න කියලා. නමුත් ගරු කථානායකතුමනි, පොලිස්පතිතුමාගේ කාර්ය මණ්ඩලය විසින් මුළුමනින්ම පාර්ලිමේන්තුවට මෙම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කොට තිබෙනවා. එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යම් තොරතුරු ලබා ගැනීම සඳහා කෙරෙන බාධාවක් ලෙස තමයි පවතින්නේ. එම නිසා ගරු කථානායකතුමාගේ අවධානයට මෙම කරුණ යොමු කරන්නට කැමැතියි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය ගැන මම සොයා බලා, අවශ්‍ය කටයුතු කරන්නම්.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
அரச ஊழியர் அபிவிருத்தி நிதிக் கூட்டுத்தாபனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
THE STATE EMPLOYEES' DEVELOPMENT FINANCE CORPORATION (INCORPORATION) BILL

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)
ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ අංක 18 යටතේ සඳහන් රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත මා ඉල්ලා අස් කර ගැනීමට අවසර පතමි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාවේ එකඟත්වය?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

අවසර දෙන ලදුව පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.
சட்டமூலம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
Bill, by leave, withdrawn.

දේශීය ආදායම් පනත : යෝජනාව
உண்ணாட்டு இறைவரிச் சட்டம் : தீர்மானம்
INLAND REVENUE ACT : RESOLUTION

[අ.භා. 2.05]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 2013.06.18 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර 2013 ජනවාරි මස 22 වැනි දින ඇති කර ගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ ඇති අංක 1, 2, 3, 4 සහ 5 විෂයයන් අද අපි සාකච්ඡාවට ගැනීමට බලාපොරොත්තු

වනවා. ඒවා නම් වශයෙන් සඳහන් කරනවා නම්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ යෝජනාව, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් දෙකක්, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය සහ (52 වන අධිකාරය වන) සුරාබදු ආඥාපනත යටතේ අංක 957 දරන සුරාබදු නිවේදනය. මේ කාරණා තමයි අද අපි සාකච්ඡා කරන්නේ.

ඒවා ඔක්කොම එකට අරගෙන විස්තර කරන්නම්. අපේ මූල්‍ය පරිපාලනය කර ගෙන යන අවස්ථාවල දී ඒ ඒ ප්‍රස්තුත සම්බන්ධයෙන් තීරණ ගන්න සිද්ධ වෙනවා. බොහෝ අවස්ථාවලදී ඒ තීරණ කිසියම් කාල සීමාවක් තුළ මේ ගරු සභාවේ අනුමතිය සඳහා අපි ඉදිරිපත් කරනවා. ඒ අනුව තමයි මේ විවිධ නියමයන්, විවිධ පනත්වල යම් යම් කොටස් සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන්නේ. මම ඒවා එකින් එක විස්තර කරන්නම් ගරු කථානායකතුමනි.

පළමුවැනි කාරණය තමයි, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම. දැනට පවතින ගිවිසුමට සංශෝධනයක් ලෙස ද්විත්ව බදුකරණය වැළැක්වීම හා බදු නොගෙවා මහහැරීම වැළැක්වීම සඳහා සවිස්තරාත්මක කෙටුම්පත් ගිවිසුමක් 2012 පෙබරවාරි මස 23 වැනි දින නිලධාරී මට්ටමෙන් කොළඹදී අත්සන් කරන ලදි. එය 2012 ජූනි මස 11 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, 2013 ජනවාරි 22 වැනි දින ඉන්දියාවේ නවදිල්ලි නගරයේදී රාජ්‍ය මට්ටමෙන් විධිමත් ලෙස අත්සන් කරන ලදි. මේ විධියට දේශයන් අතර ද්විපාර්ශ්වික බදු ගිවිසුම් - බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්- 38ක් දැනට තිබෙනවා. ඒ එක්කම තමයි අපට ඉන්දියාව සමඟ ඇති කර ගත් ගිවිසුම ගැන සලකා බලන්න වෙන්නේ. එහි පළමුවන අරමුණ තමයි එක රටකින් තවත් රටකට ප්‍රාග්ධනය, තාක්ෂණය හා පිරිස් ගලනය උනන්දු කරවීම මඟින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම. දෙවන කරුණ තමයි, එකම ආදායම සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම පිණිස ආනුෂංගිකව පවත්නා බාධක ඉවත් කිරීම. විදේශික ආයෝජකයින් සාමාන්‍යයෙන් තමන්ගේ මව් රටෙදී මෙන්ම තමන් ආයෝජනය කරන රටේදීද බද්දට යටත් වේ. බදු ගෙවන්නෙක් එකම ආදායම වෙනුවෙන්, එකම කාල සීමාවක් සඳහා දෙවරක් බදු ගෙවීම අවශ්‍ය නොවේය යන්න ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුමෙන් තහවුරු කරන දෙයක්. ජාත්‍යන්තර ගමනාගමන කටයුතු, නෞකා මෙහෙයුම් ආදී දේවල් මත ලැබෙන ප්‍රභව මූල ධර්මය තවදුරටත් ක්‍රියාත්මක කරන අතර අය කරන බද්ද සියයට පනහකින් අඩු කර තිබෙනවා, මේ ගිවිසුම යටතේ.

මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම නිසා ආදායමට ඇති වන පාඩුව එතරම් විශාල නොවේ. එහෙත් ශ්‍රී ලංකාවේ ආයෝජන කිරීම දිරි ගැන්වීම සඳහා සහ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර වෙළෙඳ හා ආර්ථික සබඳතා පුළුල් කිරීම සඳහා ඇතුළත් කරනු ලැබ ඇති විධිවිධානවලින් අත් වන මූල්‍ය ප්‍රතිලාභ ඉහත සඳහන් කළ ආදායමේ ක්ෂණිකව ඇති වන පහළ වැටීමට වඩා වැඩි බව අපේක්ෂා කළ හැකිය. එසේම මෙවැනි ගිවිසුම් දෙරට අතර හොඳ හිත, මිත්‍රත්වය හා සමීප සහයෝගිතාව ගොඩ නැඟීමටද බෙහෙවින් ඉවහල් වනු ඇත. ඒ, එකක්.

විශේෂයෙන් මා සඳහන් කරන්නට ඕනෑ, අද ලෝකයේ හැම තැනම වාගේ ද්විත්ව බදුකරණයෙන් මුදා හැරීමේ ගිවිසුම් තිබෙනවා, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සාකච්ඡා කරලා. ඒක අද ලෝකයම පිළිගත් න්‍යායක්. පුරවැසියන් දෙරටකට අයිති වුවත්, මේ ගිවිසුම යටතේ එක රටකින් පමණක් ඒ අය එකතු කරන බදු මුදල්වලට කිසියම් සහනයක් සැලසෙනවා, විශේෂයෙන්ම ආයෝජනය දිරි ගැන්වීම සඳහා. ඒ නිසා විශේෂයෙන් අපි ඉන්දියාවත් එක්ක එවැනි ගිවිසුමක් ඇති කර ගැනීම ඉතාම අවශ්‍යයි. මොකද, අපේ රටේ ආයෝජන දිහා බැලුවාම සැලකිය යුතු ආයෝජනයක් ලැබෙන්නේ ඉන්දියාවෙන් කියලා බලාපොරොත්තු වෙන්න පුළුවන්. විශේෂයෙන් ලංකාවේ ආයෝජනය කරන පෞද්ගලික අංශයේ අය අතරින් බැලුවොත් ඉන්දියාව ඉතාම ප්‍රබල තැනක ඉන්නවා. ඒ නිසා මේකෙන් මේ රටට -අපට- ලැබෙන ආයෝජන ප්‍රමාණය ශීඝ්‍ර විධියට වැඩි වෙනවා. ඒකට පසුතලයක් හැටියට තමයි අපි මේ සහන ලබා දෙන්නේ. ඒ තමයි ද්විත්ව ගෙවීම් නොකර එක රටකදී විතරක් බදු ගෙවන ප්‍රතිපත්තියට යෑම.

ඊළඟට අපි ගැසට් නිවේදන කිහිපයක්ම ඉදිරිපත් කරනවා. ඒවා සඳහා දැන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න ඕනෑ. මොකද, කීන්දුවක් ගත්තාට පස්සේ නියමිත කාල පරිච්ඡේදය තුළ අපට ඒ සඳහා මෙම ගරු සභාවේ අනුමැතිය ලබා ගන්න සිද්ධ වෙනවා. ඒවා අතරින් එකක් තමයි, 2012.12.08 දිනැති අංක 1787/41 දරන ගැසට් නිවේදනය. 2012 යල කන්නයේදී දේශීය ලොකු ලූනු, රතු ලූනු හා අර්තාපල් අස්වැන්න වෙළෙඳපොළට ලැබී අවසන් වෙමින් පැවතීමත් සමඟ එකී ද්‍රව්‍යාන්හි මිළ ඉහළයාම සැලකිල්ලට ගෙන, ආනයනික ලොකු ලූනු, රතු ලූනු හා අර්තාපල් සඳහා වූ බද්ද අඩු කිරීම මෙම ගැසට් නිවේදනය මඟින් සිදු කළා. අපේ දේශීය stock එක අවසන් වීගෙන එන කොට ඇති වන සාමාන්‍ය පිළිවෙත අනුව මිල ගොඩක් ඉහළ නඟිනවා.

ඒ වෙලාවට පාරිභෝගිකයා ගැන කල්පනා කරලා රජයට මැදිහත් වෙන්න වෙනවා. ඒ අනුව, ආනයනික ලොකු ලූනු කිලෝ ග්‍රෑමයකට රුපියල් 50ක්ව පැවැති බද්ද රුපියල් 15 දක්වාත්, අර්තාපල් කිලෝ ග්‍රෑමයකට රුපියල් 50ක් වූ බද්ද රුපියල් 15 දක්වාත්, රතු ලූනු සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 25ක්ව පැවැති බද්ද රුපියල් 15 දක්වාත් අඩු කිරීම මෙම ගැසට් නිවේදනය මඟින් සිදු කරනවා.

හැම විටම රජයට නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම පිනවන ක්‍රියා මාර්ගවලට යන්න වෙනවා. බොහෝ විට නිෂ්පාදකයාට හොඳ මිලක් ලබා දෙන්න ඕනෑ. ඒ මිල ලබා දුන්නේ නැත්නම් ඒ අයට ඒ නිෂ්පාදන ක්‍රියාදාමයෙන් ඈත් වෙන්න සිද්ධ වෙනවා. අනෙක් අතට පාරිභෝගිකයාටත් සරිලන විධියට අපට ඒ මිල සකස් කරන්න සිද්ධ වෙනවා. නිරන්තරයෙන්ම අපට ඒ තිබෙන අණ පනත් යටතේ සාධාරණ මිලකට පාරිභෝගිකයාටත් ඒ භාණ්ඩ ලබා දෙන්න සිද්ධ වෙනවා. ඒ වාගේම අල, ලූනු, අර්තාපල් වැනි දේවල්වල season එක ඉවර වුණාට පස්සේ මිල වැඩි වන විට අපට ඒ බදු සකස් කරලා පාරිභෝගිකයාට සහනයක් දෙන්න සිද්ධ වෙනවා. නමුත් නැවත වරක් ඒ දේශීය වෙළෙඳ පොළ වර්ධනය වන කොට, දේශීය නිෂ්පාදනය වර්ධනය වන කොට සෙස් බද්ද වැඩි කරලා අපට පිට රටින් එන භාණ්ඩ සීමා කරන්න පුළුවන්.

ඊළඟට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක වීමේදී අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් අපේක්ෂිත අස්වනු අඩු වීම මත එළවලු ඇතුළු අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවක් මතු වූ බැවින් හා පැවති උත්සව සමයද සැලකිල්ලට ගෙන පාරිභෝගික ජනතාවට අත්‍යවශ්‍ය ආහාර වෙනුවෙන් සහන සැලසීම සඳහා පවත්නා බදු අනුප්‍රමාණ එලෙසම පවත්වා ගනිමින් මෙම ගැසට් නිවේදනය ක්‍රියාත්මක කරනු ලැබුවා.

එයට අමතරව දේශීය පොල්තෙල් නිෂ්පාදකයින්ව ආරක්ෂා කර ගැනීමේ අරමුණින් අඩු බද්දක් යටතේ මෙරටට ගෙන්වා පොල්තෙල් සඳහා කලවම් කිරීමට යොදා ගන්නා palm ගෙඩි, මද හෝ බාබසු තෙල් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට ඇතුළත් කර ඉහළ බදු අනුප්‍රමාණයන් පැනවීමද මෙම ගැසට් නිවේදනය මඟින් සිදු වුණා. විශේෂයෙන් ඔබතුමන්ලා දන්නවා අපේ රටේ පොල්තෙල් සහ palm oil කියන ඒ ද්‍රව්‍ය දෙක අතර එක්තරා සමතුලිතතාවක් තිබෙන්න ඕනෑ බව. එක පැත්තකින් අපි පොල් නිෂ්පාදකයින් රැක ගන්න ඕනෑ. අඩු බද්දකට palm oil ගලාගෙන ආවොත් වෙන්නේ අපේ නිෂ්පාදකයාට විශාල පහරක් වදින එකයි. අනෙක් අතට ඒ පොල්තෙල් නිෂ්පාදනය කරන අයත් ඉල්ලා සිටිනවා, මේ රටින් අවශ්‍ය ප්‍රමාණය ගන්න බැරි වුණොත් පිට

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

රටින් යම් කිසි ප්‍රමාණයක් ලබා දීලා ඒක මිශ්‍ර කරන්න ඉඩ දෙන්න කියලා. ඉතින් ඒ උච්චාවචනය වන තත්ත්වයට සරිලන විධියට කටයුතු කර එය ස්ථාවර කර ගැනීමයි අපි සෙස් බදු පැනවීමෙන් බලාපොරොත්තු වන්නේ.

ඊළඟට, මුද්දර ගාස්තු සම්බන්ධයෙන් තව නියෝගයක් අපි අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. පසු ගිය අය වැයෙන් අපි මුද්දර ගාස්තු රුපියල් 250 දක්වා වැඩි කළා. අය වැය විවාදයේදීත් විරුද්ධ පක්ෂයේ ප්‍රධාන මාතෘකාවක් වුණා, මේ අය කිරීම වැඩියි කියන එක.

ඒ වාගේම වෘත්තීය කණ්ඩායම්, නීතිඥ කණ්ඩායම්, රෙජිස්ට්‍රාර්වරු ඒ මුදල අධිකයි කියා රජයට කරුණු කියා සිටියා. ඒ නිසා පොදුවේ අපි ඒක රුපියල් 50 දක්වා අඩු කර තිබෙනවා. ඒ අඩු කිරීමට සමගාමීව ගැසට් නිවේදනයකින් ඒක නීත්‍යානුකූල කරන්න ඕනෑ. ඒකයි එතැන කර තිබෙන්නේ.

අවසාන එක හැටියට තිබෙන්නේ ඊතයිල් මද්‍යසාර පිළිබඳ ප්‍රශ්නයයි. ඊතයිල් මද්‍යසාරය එක අවස්ථාවකදී තහනම් කරන්න කටයුතු කළා. රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මඟින් යොදා ගනු ලබන ස්ප්‍රිතු දේශීයව සැපයීමේදී ලීටර් 500 දක්වාත්, ආනයනය කිරීමේදී ලීටර් 100 දක්වාත්, අවසන් නිපැයුම සුරා බද්ද ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන ස්ප්‍රිතු දේශීයව සැපයීමේදී ලීටර් 500 දක්වාත් සුරා බද්දෙන් නිදහස් බව මෙම ගැසට් නිවේදනයෙහි සඳහන් වනවා.

ඇත්ත වශයෙන් මේ සියලු අණපනත්වල හරය නැත්තම් සම්පිණ්ඩනය තමයි අපේ රටට බලපාන ඒ ආර්ථික වාතාවරණය වෙනස් වන විට, උච්චාවචනය වන විට ඒ හා සමාන නෛතික බලතල ලබා ගෙන ගැසට් නිවේදන මඟින් ඒවා පාලනය කිරීම. ඒ සඳහා අපේ ගරු සභාවේ අනුමතිය ලබා දෙන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

කථානායකතුමා
(සභානායකර් අවර්කළ්)
(Mr. Speaker)
ඊළඟට (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඊට පෙර ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු කිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු තිස්සෙ කරල්ලියත්ත - සිරුවර් අපිවිරුත්ති, මහළිර් අලුවල්කළ් අමైච්චර්)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
මේ අවස්ථාවේදී "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකలవే, මාණ්පුමිකු උදිත් ලොක්කුපණ්ඩාර අවර්කළ් තలైමై වකිත්තార්කළ්.

Whereupon MR. SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

[අ.භා. 2.18]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන දේශීය ආදායම් පනත යටතේ යෝජනාව, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය සහ සුරාබදු ආඥාපනත යටතේ නියමය සම්බන්ධව ගරු ඇමතිතුමා අපට දැන්වූවා. ඒ පිළිබඳව අපේ අදහස් කිහිපයක් මේ ගරු සභාවේදී ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමා කිව්වා, ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර තිබෙන සම්බන්ධතාව ගොඩ නැඟීම සඳහා අවශ්‍ය කරන නීතිමය පසුබිම සකස් කරන්න තමයි මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ කියා. ඇත්ත වශයෙන්ම එතුමායි මමයි හොඳටම දන්නවා, Comprehensive Economic Partnership Agreement කියන එක. ඒ කියන්නේ භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් පුළුල් ගිවිසුමක් ඉන්දියාවත් සමඟ අත්සන් කරන්න සියලු කටයුතු සම්පාදනය කර තිබුණු අවස්ථාවක ගරු ජනාධිපතිතුමා එය අත්සන් කරන්න ඔන්න මෙන්න තිබියදී සමහර පුද්ගලයන්ගේ පෞද්ගලික ඕනෑ එපාකම් මත එය අත්සන් කිරීම නතර කළා. එහෙම නතර කර නැවත සාකච්ඡාවට භාජනය කරන්න ඕනෑ කියා කිව්වා. මට මතකයි සමහරු කිව්වා, මේ ගිවිසුම අත්සන් කළොත් බාබර්වරු පවා ඉන්දියාවෙන් එයි කියා. ඉන්දියාවේ මහ ලොකු සංඛ්‍යාවක් රක්ෂා නැතුව සිටිනවා. රක්ෂා නැතුව සිටින අය මෙහෙ එයි කිව්වා. නමුත් මම කලිනුත් දවසක් මෙතැන කියා තිබෙනවා ඉන්දියාවේ බාබර්වරු මෙහෙ එනවාට වඩා Ramani Salon එක, Nayana Salon එක වාගේ salons තිබෙන උදවිය ඉන්දියාවේ ගිහින් බාබර් සාප්පු දමා තිබෙනවාය කියා. ඒ නිසා ඒ තර්කය කිසිසේත්ම අදාළ තර්කයක් නොවෙයි. ඔවුන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ බදු වැඩි කර කාර්යක්ෂමතාවකින් තොර ඔවුන්ගේ නිෂ්පාදන සාමාන්‍ය පාරිභෝජකයාට වැඩි ගණනකට විකුණන්නයි. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිවරයා ඊයේ පෙරේදා පත්තරයකට කියලා තිබුණා, -ඒක ප්‍රධාන පත්තරවල මුල පිටුවේ සඳහන් වෙලා තිබුණා- දැන් CEPA එක අවශ්‍යතාවක් නැහැ කියා. එතුමා කියනවා, "There is no need for CEPA between Sri Lanka and India as both countries have moved along" කියලා.

ඒ කියන්නේ CEPA එක අවශ්‍යයි කියා කියද්දි, ගරු ඇමතිතුමා ඒ සඳහා මෙතැනට නීති සංශෝධන ඉදිරිපත් කරද්දි, රටවල් දෙක අතර සම්බන්ධතාවය ගොඩ නඟන්න ඕනෑ කියා කියද්දි, දේශපාලන වශයෙන් නොයෙකුත් ප්‍රශ්න පැන නැඟෙද්දි එක පැත්තකින් කියනවා අපට ඉන්දියාව අවශ්‍යයි, ඉන්දියාවත් එක්ක ආර්ථික සම්බන්ධතාවක් ගොඩ නඟන්න ඕනෑ කියා. අනික් පැත්තෙන්, "ඉන්දියාවත් එක්ක කිසිම සම්බන්ධයක් ගොඩ නැඟීම නොකළ යුතුයි, ඉන්දියාව අපේ සතුරෙක්" කියන දෙබිඩි පිළිවෙතක් තමයි මේ ආණ්ඩුව ඇත්ත වශයෙන්ම ඉස්සරහට අරගෙන යන්නේ. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මොනවා කිව්වත් රාජපක්ෂවරුන් කියන දේ තමයි මා හිතන හැටියට සිද්ධ වන්නේ. එතැනදී මේ ගෙනෙන නියමයන්වල ඇති ප්‍රයෝජනය මොකක්ද කියන කාරණය පිළිබඳව අපට ප්‍රශ්න කරන්න සිද්ධ වනවා. මෙතැනදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, පාරිභෝගිකයා ගැනත් බලන්න ඕනෑ, නිෂ්පාදනය කරන පුද්ගලයා ගැනත් බලන්න ඕනෑය කියලා. රතු ලූනු ගැනයි, අර්තාපල් ගැනයි මෙතුමා කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2004 ඉඳලා -අවුරුදු අටක විතර- හැම දාම Dambulla market එකේ රතු ලූනුවලයි, අර්තාපල්වලයි තිබුණු මිල පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් මා ළඟ තිබෙනවා. එතුමා කියන්න උත්සාහ කළා, මේ නියමයෙන් අර්තාපල්වලයි, බොම්බයි ලූනුවලයි බද්ද රුපියල් 50 ඉඳලා රුපියල් 15ට අඩු කළාය කියලා. එහෙම නේද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒ කාලයේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. ඒ කාලයේ. ඒ කාලයේ කියන්නේ, මේ බද්ද අඩු කරලා තිබෙන්නේ 2013 පෙබරවාරි මාසයේ 08වැනි දායි. ඊට පස්සේ එතුමා කිව්වා, "නැහැ, නැහැ, නැවතත් සමහර වෙලාවට වැඩි කරන්න සිද්ධ වනවා"ය කියලා. එතුමාට අමතක වුණාද දන්නේ නැහැ, 2013 මැයි මාසයේ 21වැනි දා නැවතත් මේ බද්ද රුපියල් 15 ඉඳලා රුපියල් 25ට වැඩි කර තිබෙන බව. මා මෙතැනදී සඳහන් කරන්න ඕනෑ, මුං ඇටවලට රුපියල් 100යි, කව්පිවලට රුපියල් 100යි, මෑවලට රුපියල් 20යි වශයෙන් ගිය මාසයේ නැවතත් මේ බද්ද වැඩි කර තිබෙන බව.

ගරු ඇමතිතුමනි, මයිසූර් පරිප්පු සඳහා රුපියල් දෙකේ තිබුණු බද්ද දැන් ටික දවසකට කලින් රුපියල් 22 දක්වා වැඩි කර තිබෙනවා. මා දන්නේ නැති නිසායි මේ ප්‍රශ්නය අහන්නේ. මේ රටේ මයිසූර් පරිප්පු වගා කරන ගොවි මහත්වරුන් ඉන්නවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමා, අප හඳන්නේ විකල්ප දේවල්; මුං ඇට වැනි දේවල්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මට තේරෙනවා. ඔබතුමා කියන එක හරි. මා අහන්නේ මේකයි. මයිසූර් පරිප්පු වවන ගොවි මහත්වරු මට හමු වෙලා නැහැ. නමුත් මයිසූර් පරිප්පු කන පාරිභෝගිකයෝ ඉන්නවා. අපේ රටේ සාමාන්‍යයෙන් කොතරම් විකල්ප තිබුණත් මිනිසුන් පරිප්පු කනවා. ඒවාට වෙනත් විකල්ප තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමායි, මායි දෙදෙනාම market එකට ගියාම පරිප්පු ගන්නවා. මොකද ඔබතුමායි, මායි දෙදෙනාම කාලයෙන් කාලයට පරිප්පු කනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් දෙකට තිබුණු පරිප්පු බද්ද රුපියල් 22ට වැඩි කරලා තිබෙනවා. ඒකෙන් පහර ගහන්නේ කොයි පාරිභෝගිකයාටද? ඒකෙන් අත හිත දෙන්නේ කොයි පරිප්පු වෙළෙන්දාටද? පරිප්පු ලංකාවේ වගා කරන්නේ නැහැ. එතකොට පාරිභෝගිකයාට පරිප්පු ටිකක් පොල් සම්බෝල ටිකකුත් එක්ක ආහාර වේලට එකතු කර ගන්න බැහැ. කොයි විධියකටවත් පොල් සම්බෝලයට උම්බලකඩ නම් එකතු කර ගන්න බැහැ. මොකද, උම්බලකඩවල බදු මෙතුමන්ලා වැඩි කරලා තිබෙනවා-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කරවල, උම්බලකඩ, ජාඩි ඔක්කෝම ලංකාවේ හදනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
උම්බලකඩවලට බද්ද රුපියල් 275යි. උම්බලකඩවලට රුපියල් 275ක බද්දක් පැනෙව්වාම මිනිසුන්ට පොල් සම්බෝලයට උම්බලකඩ දාන්න බැහැ. අපේ ගෙවල්වල දැන් කෑම හදන්නේ උම්බලකඩ නැතුවයි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙම කරන්නේ නැතුව අපේ ධීවරයන්ට ඒ ආරක්ෂණය - protection එක- දෙන්නේ කොහොමද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙතැන වෙලා තිබෙන්නේ, ආණ්ඩුවට මුදල් අවශ්‍ය නිසා බදු පැනවීමයි. ඔබතුමාම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට උත්තර දෙමින් කිව්වා, "ඔව්. අපේ ආදායම අඩු වෙලා" කියලා. දැන් ආදායම අඩු වෙලා නම් ඒ ආදායම වැඩි කර ගන්න බදු ගහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැන් 2013 වර්ෂයේ පළමු වැනි මාස 4ට ඇස්තමේන්තු කළ බදු තිබෙනවා නේ. ඒ ඇස්තමේන්තු කළ බදුවලට සාපේක්ෂව ලැබුණු බදු ප්‍රමාණයත් ඔබතුමා මීට සති දෙකකට කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා නේ. ඒ බදු කොටස්වලින් බොහොමයක් අඩු වෙලා තිබෙනවා. ඇස්තමේන්තුවට වඩා සියයට 20ක්, සියයට 30ක් වාගේ අඩු වෙලා තිබෙනවා. නමුත් අඩුවෙන්ම බදු අඩු වෙලා තිබෙන්නේ මොනවාවලද? සියයට එකකින් පමණ -අඩුවෙන්ම- බදු අඩු වෙලා තිබෙන්නේ, ආහාර ද්‍රව්‍යවලට ගහන බදුවලයි. අපි දන්නවා මේ රටේ ආහාර ද්‍රව්‍යවලට ගහන බද්ද තුළින් තමයි වැඩිපුරම බදු ප්‍රතිශතයක් එකතු කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ කියලා. බදු නොගෙවන අය මහ ගොඩක් ඉන්නවා. නමුත් අහිංසක මිනිසුන්ගේ පරිප්පු ටිකට, ලූනු ගෙඩියට බදු ගහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හොඳටම දන්නවා පසු ගිය අවුරුද්දේ මුල් මාස හතරට සාපේක්ෂව මේ අවුරුද්දේ මුල් මාස හතර ගත්තාම වැඩිපුරම බදු වැඩි වුණේ මොනවාටද කියලා. සියයට 39කින් වැඩි වුණේ මොන බද්දද? ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳටම දන්නවා සියයට 39කින් වැඩි වුණේ ආහාර ද්‍රව්‍යවලට ගහන බද්ද කියලා. ආහාර ද්‍රව්‍යවලට ගහන බද්ද තමයි වැඩිපුරම වැඩි වුණේ. ඒක තමයි මේ දවස්වල-

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපි මේ ගෙනෙන නියමයන් යටතේ බදු අඩු කරනවා. ඔබතුමා විස්තර බලන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අඩු කළේ පෙබරවාරි මාසයේයි. දැන් ජූලි මාසය. පෙබරවාරි මාසයේ අඩු කළාට දැන් නැවත වැඩි කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට අභියෝග - challenge - කරනවා, පුළුවන් නම් ඔබතුමා ඊළඟ කථිකයාට කියන්න ඇත්ත වශයෙන්ම බදු අඩු වෙලාද, වැඩි වෙලාද කියා කියන ලෙස. පසු ගිය මාසයේ ගැසට් එකක් මඟින් ඒවා වැඩි කළා. අඩු කළ ඒවා ගැන කථා කරලා වැඩක් නැහැ. යථාර්ථය තමයි අඩු කළ ඒවා ඊටත් වඩා වැඩි කරලා තිබීම.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අනෙක් කාරණය තමයි සැමන්වල ආනයන බද්දත් රුපියල් සියයකින් වැඩි කරලා තිබෙනවා කියන එක. මේ දවස්වල ජනලේඛන හා සංඛ්‍යා ලේඛන

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දෙපාර්තමේන්තුවෙන් මිනිසුන්ගේ බත් පතේ ප්‍රමාණය ගැන කරුණු ඉදිරිපත් කරනවා. මේක ඔබතුමාම ඕනෑ නම් ගිහිල්ලා බලන්න. ඔබතුමාට ලැබිලා ඇති. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේයි ඒ දෙපාර්තමේන්තුව තිබෙන්නේ. අද මිනිසුන් බත් කන ප්‍රමාණයත් අඩු වෙලා තිබෙනවා; පිටිවලින් හදන ආහාර වන පාන් සහ රොටි කන ප්‍රමාණයත් අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා කිව්වා, "මිනිසුන්ගේ බත් පරිභෝජනය වැඩි කරන්න ඕනෑ නිසා තමයි අපි පිටිවල බද්ද ඉහළ දමන්නේ" කියලා. පිටිවල බද්ද ඉහළ දැමූ නිසා දැන් මිනිසුන් පිටි ආහාර කන්නෙත් නැහැ. මුදල් මදි නිසා බත් කන්නෙත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. මා අසත්‍යයක් කියනවා නම් ඒක අසත්‍යයයි කියලා ඔප්පු කරන ලෙස ඊළඟ කථිකයාට කියන්න ඔබතුමාට පුළුවන්. අසත්‍යය නොවෙයි. පසු ගිය සතියේ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර තිබෙන දත්තවලට අනුවයි මා මේ කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි ඊතයිල් මධ්‍යසාර ගැන මේ ගරු සභාවේ කථා කළා. ඒවා ඖෂධ හදන්න ඕනෑය කිව්වා. නමුත් පත්තර බලන මිනිසුන්, TV බලන මිනිසුන් හැමෝම දැක්කා, ඒ ඊතයිල් මධ්‍යසාර ගෙනාවේ ඖෂධ හදන්න නොවෙයි කියලා. මතකයි නේ containersවල ඇවිල්ලා තිබුණා. ඒ containers විවෘත කරන්න දෙන්නේ නැතුව, ඒකට ලොකු teledrama එකක් කළා. පස්සේ පොලීසියෙන් පැනලා, ඒවා විවෘත කළා. ඒවායේ මොනවාද තිබුණේ? ඊතයිල් මධ්‍යසාර. අරක්කු හදන්න තමයි ඊතයිල් මධ්‍යසාරය ගෙනැල්ලා තිබුණේ. ඒවා මිනිසුන්ට වස විෂ කියලා label එකක් අලවලා තිබුණා. මා දන්නේ නැහැ, සමහර දේශපාලනඥයෝත් ඒකට සම්බන්ධයි කියලා කථාවක් තිබෙනවා.

ඒවා රටපුරා විකුණනවා. ඒක ඔවුන්ට මුදල් උපයන්න තිබෙන ක්‍රමවේදයක් හැර වෙන මොකක්ද කියලා මට ඔබතුමාගෙන් ප්‍රශ්න කරන්න සිද්ධ වෙනවා.

මෙහිදී මම ඉතාම වැදගත් දෙයක් කථා කරන්න ඕනෑ. අපි මේ කථා කරන්නේ බදු පිළිබඳවයි. එක සංශෝධනයකින් බදු ගහනවා. තව සංශෝධනයකින් රටවල් දෙකක් අතර බදු ගහන්නේ නැති වන විධියට නීතිය වෙනස් කරනවා.

2013.07.23 වැනි අඟහරුවාදා "ලංකාදීප" පත්‍රයේ මේ විධියට සඳහන්ව තිබෙනවා.

"මරදානේ මහා ඉඩමක් පෞද්. සමාගමක් ගිලී"

මම මේ ලිපිය **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

කොළඹ 10, මරදාන ප්‍රදේශයේ පිහිටි අක්කර 29ක පමණ විශාලත්වයෙන් යුත් ඉඩමක් ඩුබායි හා චීන සමාගම්වල සහයෝගය ඇතිව ආරම්භ කරන ලද වෙලීනා එන්.ඊ.බී. ලංකා පෞද්ගලික සමාගමට දෙන්න කියලා කැබිනට් පත්‍රිකාවක් දමලා තිබෙනවා. පොඩි ප්‍රමාණයක් නොවෙයි, අක්කර 29ක්! පර්චස් 29ක් නොවෙයි, මරදානේ අක්කර 29ක්. මම මේ ගැන පොඩ්ඩක් සොයලා බැලුවා. සොයලා බලන කොට මට ලැබුණා, 13/0949/561/011 Cabinet Memorandum එක.

එහි මෙසේ කියනවා:

"Proposal has been submitted by the BOI by Chelina NEB Lanka (Pvt.) Limited…"

අක්කර 29කුත් රූඩ් 2ක් විශාල, දැනට දුම්රිය දෙපාර්තමේන්තුවට බදු දී තිබෙන ඉඩමක් ඔවුන්ගෙන් නැවත පවරා ගෙන ආයෝජන මණ්ඩලයට පවරා දීලා, ආයෝජන මණ්ඩලයෙන් වෙලීනා එන්. ඊ. බී. කියන පෞද්ගලික සමාගමට ලබා දෙන්න කියනවා. මේකේ මෙහෙම කියා තිබෙනවා:

"Sri Lanka Railways has given their written confirmation to hold the said land up to November 2013".

ඒ කියන්නේ, වෙලීනා සමාගම ඔවුන්ගේ ව්‍යාපෘතිය පටන් ගන්නා තෙක්, ඒ අක්කර 29 වෙලීනාට පමණක් දෙන්න - exclusively - තියා ගෙන ඉන්නවා කියලා දුම්රිය දෙපාර්තමේන්තුව වගකීමෙන් යුතුව ලියුමක් ලියලා -ලිඛිතව- දීලා තිබෙනවා ලු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රශ්න අහනවා. මාස ගණනාවකට කලින් ඉදිරිපත් කළ ප්‍රශ්නයක් 2013 අප්‍රේල් 23 වැනිදා මම ඇහුවා. එම ප්‍රශ්නය එදින හැන්සාර් වාර්තාවේ තීරු අංක 1777හි මෙසේ සඳහන් වෙනවා:

"(අ) 1994 වර්ෂයේදී ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලද මරදාන ට්‍රිපොලි වෙළෙඳ සංකීර්ණය නමින් ස්ථානයක් පවතින බවත්;"

ට්‍රිපොලි වෙළෙඳ සංකීර්ණය තිබෙන්නේ ඔය කියන අක්කර 29ක් විශාල ඉඩමේ. මම ගිහිල්ලා බැලුවා. ඒ පින්තූර පවා මා ළඟ තිබෙනවා. ඒ ප්‍රශ්නයේ (අ) (i)කොටසින් මම මෙහෙම ඇහුවා.

"ඉහත සඳහන් වෙළෙඳ මධ්‍යස්ථානයේ වත්මන් භාරකරුවන් කවුරුන්ද?

මේ ප්‍රශ්නයට පිළිතුර එදින හැන්සාඩ් වාර්තාවේ අංක 1779 සහ 1780 තීරුවල සඳහන් වෙනවා.

මේ ඉඩමේ අයිතිකාරයා දුම්රිය දෙපාර්තමේන්තුව කියලා මේ පාර්ලිමේන්තුවේදී කියනවා.

ඊළඟට, අ (ii) කොටසින් මම මෙහෙම අසා තිබෙනවා:

"අධි ආරක්ෂිත කලාප පවා විවෘත කර ඇති සමයක එම වෙළෙඳ මධ්‍යස්ථානයට ඇතුළු වන මාර්ග වසා තැබීමට හේතු කවරේද?"

ට්‍රිපොලි කියලා market එකක් තිබුණා. ඒ market එක ලංකාව වටේම ඉන්න ගොවි මහත්වරුන්ට -වෙළෙඳ මහත්වරුන්ට- ඇවිල්ලා ඔවුන්ගේ භාණ්ඩ විකුණා ගන්න, කෘෂි භෝග විකුණා ගන්න, ඒවා පිට රටවලට යවන්න ඉඩ හදලා තිබුණු තැනක්. මේ අක්කර 29 ඉඩමේ තමයි ඒක තිබුණේ.

ඒ ප්‍රශ්නයට උත්තරය හැටියට මෙහෙම සඳහන් වෙනවා. මේක හොඳට අහගන්න.

"යුද්ධ හමුදා කඳවුරක් තුළ තිබිය යුතු ආරක්ෂිතභාවය හා රහස්‍යභාවය හේතුවෙන් කඳවුර මධ්‍යයේ පිහිටි මෙම ගොඩනැඟිල්ලට සිවිල් පුද්ගලයන් හට ඇතුළු වීම සඳහා ඉඩ සලසා දීමට හැකියාවක් නොමැත."

***** *පුස්තකාලයේ තබා ඇත.***

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

ඒකෙන් කියන්නේ, "මේ අභිංසක මිනිස්සුන්ට මෙතැන වෙළෙඳාම් කරන්න බැහැ; මේක යුද්ධ හමුදා කඳවුරක්. සිවිල් වැසියන්ට එන්න බැහැ" කියන එකයි. ඒ විධියට උත්තරය දෙනවා.

ඊළඟට, ආ (iii) කොටසින් මම අහන ප්‍රශ්නය මේකයි: මේක තමයි වැදගත්ම දේ.

" එහි හිමිකරුවන්ට ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට එම මධ්‍යස්ථානය ලබා දෙන්නේද?"

ට්‍රිපොලි වෙළෙඳ සංකීර්ණය තිබෙන්නේ ඒ අක්කර 29 ඇතුළේ තිබෙන බිල්ඩිමේ. ඒ ප්‍රශ්නයට දෙන උත්තරය මේකයි:

" ට්‍රිපොලි වෙළෙඳ සංකීර්ණය තුළ පිහිටි යුද හමුදාවට අයත් කාර්යාල ස්ථානගත කිරීමට අවශ්‍ය ඉඩම් හා ගොඩනැඟිලි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒවා යුද්ධ හමුදාව වෙත ලබා ගත් පසු ට්‍රිපොලි යුද්ධ හමුදා කඳවුර සංකීර්ණය සම්පූර්ණයෙන්ම නිදහස් කිරීමට කටයුතු යොදා ඇත."

ඒ කියන්නේ, මේ අක්කර 29 තුළ තිබෙන ට්‍රිපොලි එකේ ඇති ව්‍යාපාරිකයන්ගේ ඉඩම්, ඔවුන්ගේ ආයතන, ඔවුන්ගේ ව්‍යාපාර ස්ථානය ලබා දෙනවා කියන එක.

මා ළඟ තිබෙනවා, Ministry of Defence එකෙන් එවපු ලියුම්. ඒවායේ තිබෙන කරුණු මම කියවන්නම්. 2012 නොවැම්බර් මාසයේ 19වැනි දා යුද හමුදාපතිට මේ ලියුම ලියන්නේ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන්. ලේකම් වෙනුවට අත්සන් කරලා තිබෙන්නේ අතිරේක ලේකම්, ජේ.ඒ. රංජිත් මහත්මයා.

එහි මෙසේ සඳහන් වනවා:

" ගබඩාව තුළ පිහිටි ගොඩනැඟිලි යුද හමුදාව විසින් දැනටමත් පරිහරණය නොකරන්නේ නම්, අදාළ දේපළ හිමිකරුවන් වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලෙස...."

හිමිකරුවන් කියන්නේ මෙතැන ඉන්න අභිංසක වෙළෙන්දෝ; එදා දිස්ත්‍රික්ක 21කින් එතැනට කෘෂි භෝග ගෙනාපු පුද්ගලයෝ. ඒ ස්ථාන නැවත ඔවුන්ට ලබා දෙන්න කියලා යුද හමුදාපතිතුමාට නියෝගයක් නිකුත් කරනවා, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට අතිරේක ලේකම්.

ඔය අතරතුර, ට්‍රිපොලි ආයතනයේ පුද්ගලයන්ට යුද හමුදාවෙන් ලියුමක් 2012 ඔක්තෝබර් 25 වෙනි දා එවනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, මේක අහගන්න ඔබතුමා මේවා දැන ගන්න ඕනෑ.

" මෙම ගොඩනැඟිලි සංකීර්ණය නිදහස් කර දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් "ට්‍රිපොලි" යුද හමුදා කඳවුරේ ස්ථානගතව සිටින මූලස්ථාන/ඒකක සමඟ සම්බන්ධතාවෙන් දීර්ඝ ලෙස කරුණු සොයා බලන ලදී.

එහිදී පහත සඳහන් හේතු මත විෂයගත ගොඩනැඟිල්ල වෙත සිවිල් පුද්ගලයින් හට ඇතුළු වීම සඳහා ඉඩ ප්‍රස්තාව සලසා දිය නොහැකි බවට කරුණු අනාවරණය විය.

අ. සිවිල් පුද්ගලයින් කඳවුරු මධ්‍යයේ පිහිටි විෂයගත ගොඩනැඟිල්ල වෙත යාම/ඊම් සිදු කිරීමේදී කඳවුරේ ආරක්ෂාවට බල පෑමක් ඇති වීම."

ඊට පස්සේ කියනවා, "විශාල වටිනාකමකින් යුත් යුධෝපකරණ භාණ්ඩ මෙහි තිබෙනවා. ආහාර ද්‍රව්‍යවල ආරක්ෂාව අවශ්‍යයි." කියලා.

ඊළඟට ප්‍රධාන වශයෙන් කියනවා, මෙන්න මෙහෙම:

" කොළඹ නගරයේ ආරක්ෂාව සපයන හට පිරිස් කේන්ද්‍රීතව මෙම ගබඩා සංකීර්ණයේ ස්ථානගතව සිටීම."

ඒ නිසා කිසි විධියකටවත් මේ "ට්‍රිපොලි" එකේ ඉඩම ඒ හිමිකාරයන්ට දෙන්න බැහැ කියලා 2012 ඔක්තෝබර් මාසයේ 25වැනි දා ලියුමක් යවන්නේ army එකේ ඊ. පී. ද ඉසෙඩ් අබේසේකර, මේජර් ජෙනරාල්; යුද හමුදාපති වෙනුවට.

මම ඒ ලිපි **සභාගත*** කරනවා. මොකක්ද එහෙනම් මෙතැන සිද්ධ වන්නේ?

මා ළඟ තිබෙනවා, මේ Chelina NEB Lanka (Pvt.) Limited කියන ආයතනයෙන් ඉදිරිපත් කරලා තිබෙන proposal එක. මේකේ නව වැනි පිටුවේ තිබෙනවා, chart එකක්. එහි තිබෙනවා, "Progress to date" කියලා. මම මේ ලේඛනයත් **සභාගත*** කරනවා.

මේකේ තිබෙනවා, land survey, BOI accreditation, Draft Project pre-feasibility and exclusive status for CNEB. එහෙමනම් මේකේ අයිතිය තිබෙන්නේ exclusively "ට්‍රිපොලි" එකේ කට්ටියට නොවෙයි, Chelina NEB Lanka (Pvt.) Limited කියන ආයතනයට පමණයි. ඒ අයිතිය දීලා තිබෙන්නේ කවදාද? 2012 ජනවාරි මාසයේ. එක්කෝ මේ මිනිස්සු කියන්නේ අසත්‍යයක්. එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නයට උත්තර දීපු ඇමතිවරයා කිව්වේ අසත්‍යයක්. එහෙමත් නැත්නම් ආරක්ෂක අමාත්‍යාංශය කියන්නේ අසත්‍යයක්. මේ කරුණු තුනම ඇත්ත වෙන්න බැහැ. මේ කරුණු තුනෙන් එකයි ඇත්ත.

ඊට පස්සේ 2012 මාර්තු මාසයේ මෙසේ කියනවා:

Preliminary Project Report for submission to BOI and MOT.

ඊට පස්සේ 2012 අප්‍රේල් මාසයේත් කියනවා. එහෙම දිගින් දිගටම 2012 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් වන තුරු හැම මාසයේම මේ අසරණ මිනිසුන්ට කිව්වා, "ඔහේලාට මේක දෙන්න බැහැ, ඔහේලා සිවිල් පුද්ගලයෝ, මේක army camp එකක්, ඔහේලා මේකට ඇවිල්ලා ආරක්ෂාවට කරදර ඇති කරන නිසා army camp එකට ඇතුළු වෙන්න ඉඩ දෙන්න බැහැ" කියලා.

එහෙම නම් කවුද මේ වෙලීනා? කවුද වෙලීනා? කවුද වෙලීනා? මේකේ තිබෙනවා, ඔක්තෝබර් 2012, "Meeting with Secretary to the Ministry of Transport" කියලා. කවුද ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා? බෙලාජියෝ, එම්ජීඑම්, බැලිස් කියන කැසිනෝ ආයතනවල සභාපති ධම්මික පෙරේරා මැතිතුමා තමයි මේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා. දැන් එතුමාත් එක්ක හම්බ වෙලා කථා කළා කියලා කියනවා. දැන් බලන්න, ඊළඟට මොකද වෙන්නේ කියා. පෙනෙනවා නේද, මෙතැන වෙලා තිබෙන දේ? පෙනෙනවා නේද? ඊට පස්සේ තිබෙනවා, "...the commitment given by BOI in principle based on the above undertaking of the CGR" කියලා. එහෙම නම් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මොන අමාත්‍යාංශය යටතටද එන්නේ? ඒක

කථාව අවසානයේ පළ කර ඇත.

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

එන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ. එහෙම නේද? ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලිඛිතව දන්වලා තිබෙනවා, මේ වෙලීනා කියන එකට මේ ඉඩම දෙනවා කියලා. ඒ undertaking එක යටතේ තමයි මේ සියලු දේ වෙන්නේ. මේකේ තිබෙනවා," ...based on the presentation made by the principal investor to the Secretary, Ministry of Defence and Urban Development, Secretary of Ministry of Transport, Chairman of the UDA and other authorities, they have granted preliminary approval for the design" කියලා.

ඔවුන්ට අනුමැතිය ලබා දීලා තිබෙනවා, ඒ මූලික වැඩ කටයුතු කරන්න. දැන් ඔන්න එනවා, හොඳ කථාවක්: "The project will be implemented by the principal investor in two phases". මේ principal investor කියලා කියන්නේ Chelina NEB Lanka (Pvt.) Limited කියන ආයතනයයි. මෙන්න මේක හොඳටම අහ ගත්තා නම් හොඳයි. අපේ සුජීව සේනසිංහ මගේ කල්‍යාණ මිත්‍ර මන්ත්‍රීතුමාගේ නඩුවක් සම්බන්ධයෙන් පත්තරේ තිබුණා. එතුමාට විරුද්ධව නඩුවක් දාලා එතුමා ඒ නඩුව දිනලා තිබුණා. ඊ ළඟට Phase I. මේ අක්කර 29 infrastructure facilities මොනවාද? "...development of base infrastructure facilities such as..... in the project land within internal roads". ලොකු ඉඩමක් තිබුණාම ඒක ඇතුළේ පොඩි පාරවල් ටිකක් දාන්න ඕනෑ. තාර ටිකක් දාලා, කානු ටිකක් කපන්න ඕනෑ. The next is, Provision of Power Requirements. ලයිට් ගන්න කම්බි අදින්න ඕනෑ. ඊ ළඟට, Sewerage and Stormwater Management. අපද්‍රව්‍ය සහ වැහි වතුර බහින්න කානු කපන්න ඕනෑ. කානු කපන්න approve කරලා තිබෙන cost එක කීයද? ඇමෙරිකන් ඩොලර් මිලියන 350යි. රුපියල් බිලියන 47යි. රුපියල් කෝටි 4,700යි. මේක කොහොමද වෙන්නේ? කොළඹ තිබෙන අක්කර 29ක මේ ඉඩම පුරවන්න ඕනෑ ඉඩමක් නොවෙයි; flat land එකක්. පුරවන්න ඕනෑ නැහැ. මොකුත් කරන්න ඕනෑ නැහැ. මරදානේ තිබෙන මේ ඉඩමට මොකුත් කරන්න ඕනෑ නැහැ. ශුද්ධ කළා. පාරවල් ටිකක් දැම්මා. තාර දැම්මා. කානු කැපුවා. රුපියල් කෝටි 4,700යි. මේක වෙන්න බැහැ. මේකේ මොකක් හරි ලොකු හොරයක් තිබෙනවා. මොකක්ද මෙතැන වෙන්නේ?

ඊ ළඟට කියනවා, "Phase II". මම එතැනට එන්නම්. මම ඒක පැහැදිලි කරලා දෙන්නම්. " ".....construction of high-end commercial towers, residential towers, convention facilities, hotels, operational support services et cetera". ඒකට cost එක ඩොලර් මිලියන 1,000යි. ඒ කියන්නේ කානු කපන්න ඩොලර් මිලියන 350යි. මේ තට්ටු නිවාස, හෝටල් සංකීර්ණ මේ ඔක්කෝම හදන්න ඩොලර් මිලියන දාහයි. එහෙම නම් මේකේ රහස මොකක්ද? "...in order to implement this project, the principal investor, Chelina NEB Lanka (Pvt.) Limited, is now required to acquire the land on 99-year lease for it to make its initial payment for the land upfront by way of Foreign Direct Investment".

මේකේ කියනවා, මේක අනුනව අවුරුද්දට බදු දෙනවා කියලා. ඇත්තටම අනුනව අවුරුද්දට බදු දෙන එකයි, විකුණන එකයි අතර ලොකු වෙනසක් නැහැ. මම කියන්නම් මොකද කියලා. මේකේ මෙන්න මෙහෙම දෙයක් කියනවා. මේක අනුමැතිය ඉල්ලලා කැබිනට් එකට දාලයි තිබෙන්නේ. According to this, the principal investor is required to include freehold transfer facility of condominium units in fourth floor and above to a third party.

දැන් මෙතැන කියනවා, අපි ආණ්ඩුවෙන් අනුනව අවුරුද්දට බදු ගන්නවා, අරගෙන අපි තුන්වැනි පාර්ශ්වයකට විකුණන කොට ඔවුන්ට සින්නක්කර ඔප්පුවකට විකුණන්න ඉඩ දෙන්න කියලා. ඒක කොහොමද එහෙම කරන්නේ? විදේශිකයන්ට සින්නක්කර ඔප්පුවකට විකුණන්න හදනවා.

ඒක අවශ්‍ය වන්නේ ඇයි කියලා ඊට පස්සේ කියනවා. ඒක අවශ්‍ය වන්නේ, "...because it is much beneficial to the company for the smooth operation of the project". ඒ කියන්නේ, Chelina NEB Lanka (Pvt.) Limited කියන ආයතනයේ ප්‍රගතිය සඳහා, ඔවුන්ට ලාභ ලබා ගැනීම සඳහා මෙන්න මේ විධියට 99 අවුරුදු බද්දට ගන්නා ඉඩමේ හදන නිවාස සින්නක්කරයට විකුණන්න කැබිනට් අනුමැතිය දෙන්න කියන එකයි. ඊට පස්සේ මෙන්න මෙහෙම කියනවා:

> "....the difference attributable to the value of such condominium units being transformed from a leasehold basis to a freehold basis. That revenue collected shall be remitted to the Consolidated Fund".

ඒ කියන්නේ මොකක්ද? සින්නක්කර ඔප්පුවට විකුණන එක සහ 99 අවුරුද්දේ බද්ද අතර මීලේ වෙනසක් තිබෙනවා නම් ඒ වෙනස භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දමන්න කියනවා. ඉතින් මොකක්ද මේ කියන්නේ? මේ ආණ්ඩුවේ මහින්ද චින්තනයේ මොකක්ද කිව්වේ? එක ඉඩම් අහලක් විකුණන්න දෙන්නේ නැහැ කිව්වා; සුද්දන්ට විකුණන්න දෙන්නේ නැහැ කිව්වා; සියයට සියයක් බදු දමනවා කිව්වා. නමුත් මොකක්ද මේ කරන්නේ? එක ශත පහක්වත් එන බද්දක් ගැන මෙහි කථා කරනවාද? එක ශත පහක බද්දක් ගහන්න ඕනෑ කියලා කියනවාද? දැන් පරිප්පු කිලෝ එකේ බද්ද රුපියල් 2 ඉඳලා රුපියල් 22 දක්වා වැඩි කළා. ලූනුවල බද්ද වැඩි කළා. අර්තාපල්වල බද්ද වැඩි කළා. සැමන් ටින් එකේ බද්ද වැඩි කළා. Reload එකට බද්ද වැඩි කළා. මෙහි කියනවා ශත පහක්වත් බදු ගහන්න ඕනෑ නැහැ කියලා. අපේ ජාතික සම්පත් වන පිටකොටුවේ, මරදානේ, ගෝල්ෆේස් එකේ තිබෙන ඉඩම් සුද්දන්ට විකුණන්න කියනවා ශත පහකවත් බදු නැතිව. දුප්පත් මිනිහෙකු ඉඩමක් පිරෙව්වොත් අල්ලාගෙන ගිහින් දමනවා කුඩුවේ. දවසක් පෙන්නුවා ටීවී එකේ -"සිරස" රූපවාහිනියේද කොහේදෝ- සොල්දාදුවකුගේ නෝනා කෙනකුට වෙච්ච සිද්ධියක්. ඒ සොල්දාදුවා වැඩ කරන්නේ කොළඹ. ඒ සොල්දාදුවාගේ බිරිඳ පොඩි නිවාසයක් ඉදි කර ගෙන තිබෙනවා. එය ඉඩම පුරවලා කරපු අනවසර ඉදි කිරීමක් කියලා ඒ නෝනා මහත්මයාවයි, වයස අවුරුදු හතරේ පහේ ළමයි දෙන්නායි අරගෙන ගිහිල්ලා පැය 12ක් කුඩුවේ දමලා. ඊට පස්සේ ප්‍රතිභා මහානාම හේවා මහත්මයා ටීවී එකට කිව්වා, නීතියට අනුව මෙහෙම කරන්න බැහැ, අම්මා කෙනෙකු වරදක් කළා නම් දරුවන් දෙදෙනා කුඩුවේ දමන්න බැහැ කියලා. එහෙම කරන ආණ්ඩුව, එහෙම කරන ඔය පොලීසිය, එහෙම කරන ආරක්ෂක අමාත්‍යාංශය සුද්දන්ට දෙනවා ශත පහක්වත් ගන්නේ නැතිව කොළඹ මධ්‍යයේ අක්කර 29ක්. මෙහි කියනවා, මේ ඉඩම සාධාරණ මිලකට දෙන්න කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் [மாண்புமிகு சந்திம வீரக்கொடி] அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER (THE HON. CHANDIMA WEERAKKODY) *took the Chair.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආයතනයට මේ ඉඩම ලබා දෙන්න නම් මේ ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවෙන් BOI එකට පවරා ගන්න ඕනෑ. හරි නේ ගරු ඇමතිතුමනි? ඒ පවරා ගැනීම තමයි නැවත පවරා දෙන්නේ Chelina NEB Lanka (Pvt.) Limited එකට. මෙහි මෙන්න මෙසේත් කියනවා:

"To authorize the Commissioner General of Lands to transfer an extent of 29 acres and 2 roods to the Board of Investment of Sri Lanka as an outright grant without any cost".

ඒ කියන්නේ, කිසිම ගෙවීමකින් තොරව මේක transfer කරන්න කියලායි. ඊට පස්සේ මෙහෙමත් කියනවා:

"To authorize the Commissioner General of Lands to include the following conditions in the said free grant of land to the BOI".

හරි නේද? මේ ඉඩම BOI එකට නිකම් දෙන කොට කොන්දේසි වගයක් දමන්න කියනවා. කොන්දේසි දමනවා නේ. හරි, අපි කියනවා, හොඳයි කියලා. කොන්දේසි දමලා තමයි දෙන්නේ. මොනවාද කොන්දේසි?

මෙම කොන්දේසිවල තිබෙන්නේ මෙහෙමයි: "To authorize the BOI to lease the land to Chelina NEB Lanka (Pvt.) Limited on a 99-year lease".

කීය ගණනේද මේ ඉඩම විකුණන්නේ? කීයටද මේ ඉඩම විකුණන්න බලාපොරොත්තු වන්නේ? "BOI shall lease out such land to principal investor, Chelina NEB Lanka (Pvt.) Limited, on a 99-year lease based on the valuation by the Government Chief Valuer". ඒ කියන්නේ ප්‍රධාන තක්සේරුකරුගේ මිලට අනුව මේ ඉඩම පවරන්න පුළුවන් කියනවා.

දැන් අපි කල්පනා කර බලමු, Krrish Group එක ගැන. මේ දවස්වල ඒ ගැන හැම දෙනාම කථා කරනවා නේ. Krrish Group එකට දීලා තිබෙන්නේ, අක්කර 4ක් ඩොලර් මිලියන 50කටයි. එතකොට අක්කර 29ක් -නිකම් ගණන් හැදුවොත්, හයෙන් වැඩි කළොත්- ඩොලර් මිලියන 350ක්, ඩොලර් මිලියන 360ක් විතර වෙනවා. ඒ අවට තිබෙන ඉඩම් එක්ක බැලුවාම ඩොලර් මිලියන 360ක් තමයි මෙම ඉඩමේ සාධාරණ වටිනාකම වෙන්න ඕනෑ. එතකොට මෙතැන කියන ඩොලර් මිලියන 360ත්, කාණු කපන්නයි, තාර දමන්නයි කියන ඩොලර් මිලියන 350ත් අතර බොහොම ලොකු සම්බන්ධයක් තිබෙනවා. එතකොට මේ කියන්නේ, ඩොලර් මිලියන 360කට පාරේ තාර දමලා, කාණු කපලා ඒක ආණ්ඩුවට දෙනවා කියන එකයි.

දැන් බලන්න. මෙහි තව කාරණයක් තිබෙනවා. මා කලින් ඉදිරිපත් කළ ඔවුන්ගේ financial proposal එකේ 8වන පිටුවේ මෙන්න මෙහෙම තිබෙනවා. "Transport Towers" එහි පින්තූරයක් මා ළඟ තිබෙනවා. මේ ප්‍රවාහන කුලුනු හදන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවට -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only two more minutes left.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට නියමිත වෙලාවෙන් විනාඩි 5ක් මට දෙනවා.

මෙහි මෙසේ සඳහන් වනවා:

"CNEB will provide the MoT with a modern Grade-A office facility (Transport Towers) as consideration for a 99-year lease for the site".

මෙහි එය කෙළින්ම ඉදිරිපත් කරනවා. ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමනි, එයට ගෙවන්නේ නැහැ. මෙය barter ක්‍රමයක්. ශතයක්වත් ගෙවන්නේ නැහැ. ඒ වෙනුවට ප්‍රවාහන අමාත්‍යාංශයට building එකක් දෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයට මොනවාටද buildings ගරු ඇමතිතුමනි? ඔය තිබෙන buildings හොඳටම ඇති. ගිය අවුරුද්දේ ප්‍රවාහන අමාත්‍යාංශයේ පාඩුව රුපියල් කෝටි 380යි. රුපියල් කෝටි 4,700ක් වටිනා මෙම ඉඩම එක තඹ දොයිතුවක්වත්, එක ඩොරලයක්වත්, එක පවුමක්වත්, එක යුවාන් එකක්වත්, එක යෙන් එකක්වත් බදු ගහන්නේ නැතුව රුපියල් කෝටි 4700 වෙනුවට මේ ගොල්ලෝ කියන පරිදි ඩොලර් මිලියන 350කට හුවමාරු කර ගන්න හදනවා.

ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා පොහොර සහනාධාරයට කොපමණද දුන්නේ ගරු ඇමතිතුමනි? මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවට අනුව 2013 ජනවාරි සිට අප්‍රේල් දක්වා පොහොර සහනාධාරය සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් කෝටි 640යි; පාසල් පොත්, නිල ඇඳුම් සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් කෝටි 123යි. නමුත් ඉඩමේ බදු නිදහස රුපියල් කෝටි 4,700යි. කවුද මෙතරම් වාසනාවන්ත ආයෝජකයෝ? ඔවුන් කවුද කියලා මා කියන්නම්. අපි ඒ ගැන සොයා බැලුවා. Chelina NEB Lanka (Pvt.) Limited. මෙහි තිබෙනවා, ඔවුන්ගේ Chelina Capital Corporation කියන මවු සමාගමේ Corporate Profile එක. මා මෙය **සභාගත*** කරනවා.

මෙහි මෙහෙම තිබෙනවා - Strategic Advantages of Chelina Capital Corporation.මොකක්ද කියන්නේ? "Our professional team is well capable of successfully securing government

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

stand-alone projects..."මෙන්න පළමු වන දේ. ඒ ගොල්ලන්ගේ strategic advantage එක මොකක්ද? ඒ ගොල්ලන්ගේ strategic advantage එක තමයි, ආණ්ඩුවේ projects ඔවුන්ට ගන්න පුළුවන්ය කියන එක. ඒක කෙළින්ම කළු, සුදුවලින් ලියා තිබෙනවා.

ඊළඟට ඔවුන් කියනවා, අපේ clientsලා කවුද කියලා. What is our track record? අපේ ගමන් මඟ කුමක්ද?

මෙන්න අහගන්න ගරු ඇමතිතුමනි. මෙතැන කියනවා, මෙන්න මෙහෙම:

> "We have been successful in winning many mega projects for our clients ..." It further states that "Most of our achievements remain undisclosed due to sensitivity of shared interest by parties involved".

මොකක් ද කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මෙතැන කියනවා, "අපේ ප්‍රධානම හැකියාව තමයි, රජයේ කොන්ත්‍රාත්තු ලබා ගැනීමට පුළුවන් වීම" කියා. ඔවුන් ඒවා මොනවා ද කියා කියන්නේ නැහැ. මොකද? ඒවා රහස්‍යගත නිසා. මිනිසුන්ගේ සල්ලි තව කාට හෝ කොන්ත්‍රාත්තුවලට දෙනවා නම්, ඒවා කොහොම ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රහස්‍යගත වෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායතතුමනි, මා දැන් ප්‍රශ්න තුනක් ඉදිරිපත් කරනවා, වරාය අමාත්‍යතුමාට, මහාමාර්ග අමාත්‍යතුමාට සහ මුදල් ඇමතිතුමාට. 2009 ජනවාරි 1 වනදා සිට Chelina Capital Corporation හෝ ඊට අනුබද්ධ ආයතන සමඟ කළ ගනුදෙනු මොනවා ද කියන්න. ඔවුන්ට ගෙවූ මුළු මුදල් ප්‍රමාණය කොපමණ ද? ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර මොනවා ද? මේවා අපට අහන්නට සිද්ධ වෙනවා. මෙන්න බලන්න.

With absolute arrogance they say that their strategic advantage is to win government projects but they will not disclose information because of the secrecy and sensitivity of those projects. කාගේ රහස් ද මේ රකින්නේ? කාව ද sensitize කරන්න හදන්නේ?

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප සොයා බැලුවා, Chelina NEB Lanka (Pvt.) Limited කියන්නේ කවු ද කියා. මා නම් කියන්න කැමැති වන්නේ නැහැ. නමුත් අබේසිංහ කියා පුද්ගලයෙක් ඉන්නවා. ඒ අබේසිංහ කියන පුද්ගලයා Sri Lankan කෙනෙක්. ජමීල් යූසුෆ් කියන්නේ අරාබි ජාතිකයෙක්. එඩ්වඩ් බුල්ජන්ස් කියා තව Sri Lankan කෙනෙක් ඉන්නවා. සාමාන්‍ය ජනතාවට දෙන්නට බැහැයි කියපු, army එක ඉන්න නිසා ට්‍රිපොලි එකේ වෙළෙන්දන්ව පන්නපු තැන -මේ අක්කර 29- දෙන්න යනවා මේ චෙලිනා කියන ආයතනයට. අවම වශයෙන් රුපියල් කෝටි 4700ක් ගන්න ඕනෑ ඉඩමට, සියයට සියයේ බද්ද ගැහුවාම තවත් කෝටි 4700ක් බදු හැටියට ගන්න ඕනෑ. ඊට පස්සේ මොවුන් ඉදිරිපත් කරනවා, ඇමෙරිකන් ඩොලර් බිලියන 1.3ක්. [බාධා කිරීමක්] රුපියල් බිලියන 140ක්. රුපියල් කෝටි 17,000කට වැඩි ආයෝජනයක් කරන්න ඉල්ලන්නේ. දැන් අප බැලුවා, විශාල කොම්පැනියක් වෙන්නට ඇති කියා. කවුද මේ? මුළු shares ප්‍රමාණය කීය ද? shares තුනයි. Per share රුපියල් 10 යි. Total stated capital එක රුපියල් 30යි. හත් දෙයියනේ! රුපියල් තිහේ total stated capital එක තියෙන ආයතනයක් ඔවුන්ගේ strategic advantage එක තුළින් රුපියල් කෝටි දහ දහස් ගණනක ආණ්ඩුවේ project එකක් ගන්න උත්සාහ කරනවා. අබේසිංහ කියන පුද්ගලයා හදිසියේම ගිය මාසයේ මේකෙන් ඉල්ලා අස්වෙලා, ඒ වෙනුවට එදා ම තව කෙනෙක් පත් කරලා. ඇයි මේ ඉල්ලා අස්වීම? කවුද මේ පුද්ගලයා? කවුද මේ අබේසිංහ? මේවා ගැන අවධානය යොමු කරන්නට සිද්ධ වෙන්නේ, මේ අක්කර 29 නිසා පමණක් නොවෙයි. ජනතාවට තමයි මේ බදු ගහන්නේ. ජනතාවට තමයි ජීවත් වෙන්න බැරි. ජනතාවට තමයි මේ දුක දෙන්නේ. ඊයේ දයාසිරි පනිනවාය කියා එහෙන් ලොකු show එකක් කළා. වෙන මොකක් හෝ එකක් කියා ලොකු show එකක් කරනවා. Rugger matches ගහනවා. Cricket matches ගහනවා. මිනිසුන්ට ඒවා බලන්නට දෙනවා. මිනිස්සුන් බිල්ලෝ වාගේ, ගෙම්බෝ වාගේ, ඉබ්බෝ වාගේ ඕවා බල බලා ඉන්නවා. ඒ අතරතුර මුළු රටම දූෂණය කරනවා. මුළු රටෙම සල්ලි හොරා කනවා. ඒක තමයි වෙන්නේ. This is a "Smoke and Mirrors" show. You say, "No, everything is okay".

CHOGM එක එනවා, අරක එනවා, ඔක්කොම හරි කියලා ඒ කළුවරේ ගිහින් මොකද කරන්නේ? කළුවරේ ගිහින් මිනිසුන්ගේ දේවල් හොරා කනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වඩා මේ පිළිබඳව කථා කරන්න දෙයක් ඉතුරු වෙලා නැහැ කියලා මා කල්පනා කරනවා. ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමනි, මා විශ්වාස කරනවා ඔබතුමා මේ බදු පිළිබඳව කථා කරද්දි මේවා ගැන හොඳට හොයා බලාවි කියලා. because this is an unsolicited proposal. This proposal did not come through a tender process. When you are giving an unsolicited proposal, how can you give 29 acres of land to a company that has a stated capital of Rs. 30? It just does not make sense.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
These are all *gonibilla* companies.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Yes, therefore there must be an invisible hand.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Exactly.


ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
So, I ask this House, particularly the Hon. Minister, to look into this.

ගරු ඇමතිතුමනි, එක දෙයක් කරන්න. මේවාට බදු පනවන්න. මේවාට බදු පනවලා අද ඔය වැඩි කරපු අල බද්ද අඩු කරන්න; අද වැඩි කරපු පරිප්පු බද්ද අඩු කරන්න; අද වැඩි කරපු බොම්බයි ලූනු බද්ද අඩු කරන්න; අද වැඩි කරපු සැමන් බද්ද අඩු කරන්න. ඒවා අඩු කරලා මේ අයට බදු පනවන්න. බොහොම ස්තුතියි.

සභාමේසය මත තබන ලද ලේඛන:

சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:

Documents tabled:



අවධානය: හට නීවාස සම්පාදන අධ්‍යක්ෂ

යුද්ධ හමුදාපති,

මරදාන ට්‍රිපොලි වෙළඳ සංකීර්ණයේ පවත්වාගෙන යන යුද හමුදා කඳවුර සම්බන්ධව

උක්ත කරුණ සම්බන්ධ මේ සමග යාකර ඇති එල්.එම්.ඩී. ලලිත් සාගර මහතා ඇතුලු ගොඩනැගිලි හිමිකරුවන් විසින් මා අමතන ලද 2012.10.23 සහ 2012.10.26 දිනැති ලිඛියන් හි පායාස්ථ පිටපත් සකෙරෙහි අවධානය යොමු කරවමි.

02) මරදාන ට්‍රිපෝලි ගඩඩාව තුළ පිහිටි ගොඩනැගිලි යුද හමුදාව විසින් දැනටමත් සුවිශාරණය කොකරන්නේ නම්, අදාල දේපල හිමිකරුවන් වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලෙස නම්නහොත්, ඉදිරියටත් කඳවුර පවත්වාගෙන යාමට අදහස් කරන්නේ නම් උක්ත දේපල වෙනුවෙන් කුලී මුදල් කොපමණ කිරුළුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බව දන්වමි.

අස්/ගේ. ඒ. ඒ. රංජිත්
(ජේ. ඒ. රංජිත්)
අතිරේක ලේකම
(පාර්ලිමේන්තු හා සිවිල් කටයුතු)
රාජ්‍ය ආරක්ෂක හා නාගරික
සංවර්ධන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

සිටපත :- 1) එල්.එම්.ඩී. ලලිත් සාගර මහතා - දැ. ගැ. ස
විල්සන් මාකටින් පුද්ගලික සමාගම
අංක. 25
පැලවත්ත පාර
නුගේගොඩ .

සිමාන්විතයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ
இலங்கைத் தரைப்படைத் தலைமையகம், த.பெ. 553, கொழும்பு
SRI LANKA ARMY HEADQUARTERS, P. O. BOX 553, COLOMBO

හනිස/ඉඩම්/02/1286/2012(33) ටෙලි : 011-2302566, 011-2388760
ෆැක්ස් : 011-2388760

එල්.එම්.ඩී. ලලිත් සාගර මහතා,
සභාපති,
ට්‍රිපොලි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය
නො. 23,
පැලවත්ත පාර,
නුගේගොඩ

2012 ඔක්තෝබර් 29

මරදාන ට්‍රිපොලි වෙළඳ සංකීර්ණය වෙත ඇතුල්වීම/නිදහස් කිරීම.

1. මරදාන ට්‍රිපොලි යුද්ධ හමුදා කඳවුර මධ්‍යයේ පිහිටි ට්‍රිපොලි වෙළඳ සංකීර්ණය පිහිටි ගොඩනැගිලිද ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය බැවින් එම ගොඩනැගිලි සංකීර්ණය වෙත ඇතුල්වීම සඳහා කටයුතු සලසා දෙන ලෙස ඔබ මණ්ඩලය වෙතින් ලිපි තිහිපයක් මඟින් ගරු ආරක්ෂක ලේකම් තුමා හා යුද්ධ හමුදාධිපති වෙත කරුණු ඉදිරිපත් කර ඇත.

2. මෙම ගොඩනැගිලි සංකීර්ණය නිදහස් කර දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ට්‍රිපොලි යුද්ධ හමුදා කඳවුරේ ස්ථානගතව සිටින මූලස්ථාන/ඒකක සමග සම්බන්ධතාවයෙන් දීර්ඝ ලෙස කරුණු සොයා බලන ලදි.

3. එහිදී පහත සඳහන් හේතු මත විෂයගත ගොඩනැගිලිද වෙත සිවිල් පුද්ගලයින් හට ඇතුල්වීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දිය නොහැකි බවට කරුණු අනාවරණය විය.

අ. සිවිල් පුද්ගලයින් කඳවුරු මධ්‍යයේ පිහිටි විෂයගත ගොඩනැගිලිද වෙත යාම්/ඒම සිදු කිරීමේදී කඳවුරේ ආරක්ෂාවට බලපෑමක් ඇති වීම.

ආ. කඳවුරෙහි ඉතා විශාල වවිනාකමකින් යුත් සුඩෝපකරණ හාණ්ඩ ගබඩා කර ඇති බැවින් එම හාණ්ඩයන්හි ආරක්ෂාවට තර්ජනයක් ඇති වීම.

ඇ. යුද්ධ හමුදාවට ඇවැසි නොග සලාක නිකුත් කිරීමේ කටයුතුද මෙම කඳවුරු භූමිය තුළ පිහිටි ගබඩා ගොඩනැගිලි තුළ සිදුවන බැවින් එම ආහාර ද්‍රව්‍යයන්හි ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීමට සිදුවිම.

ඇ. ප්‍රවාහන අවශ්‍යතාවයන් සපයනු ලබන ඒකකයද මෙම කඳවුරු භූමිය තුළ ස්ථානගතව ඇති බැවින් වාහන/අමතර කොටස්හි ආරක්ෂාව පිළිබඳ සැලකිල්ලක් දැක්වීමට සිදුවිම.

ඈ. කොළඹ නගරයේ ආරක්ෂාව සපයන හඳ පිරිස් සේන්දුිතව මෙම ගබඩා සංකීර්ණයේ ස්ථානගතව සිටීම.


ඉ. සිවිල් පුද්ගලයින් කඳවුරු භූමිය තුළට ඇතුල්වීමේදී දැඩි සෝදිසියකට ලක් කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බැවින් එහිදී සිවිල් පුද්ගලයින් හට දැඩි අසිරුතාවයකට පත් වීමට සිදුවිම.

සිමාන්විතයි

4. කරුණු එසේ හෙයින් ඔබ වෙළඳ සංගමය විසින් කර ඇති ඉල්ලීම පරිදි මරදාන ට්‍රිපොලි ගබඩා සංකීර්ණය මධ්‍යයේ පිහිටි වෙළඳ සංගම් ගොඩනැගිලිද වෙත ඇතුල්වීම/නිදහස් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීමට නොහැකිව ඇති බව කාරුණිකව දන්වමි.

ඒපි ද ඇල්විස් අබේසේකර යුඑස්පි
මේජර් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති වෙනුවට

Progress to date



[මෙම ලේඛන පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்த ஆவணங்கள் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This Documents are also placed in the Library.]

[අ.භා. 3.00]

ගරු අකාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர்)

(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර ඇති යෝජනා හා නියමයන් ගැන කථා කරමින් මුදල් අමාත්‍යාංශය හා අනිකුත් අමාත්‍යාංශ ගැන යම් යම් අදහස් ඉදිරිපත් කරන්න යෙදුණා. අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මහජනයාට අපහාස වන විධියට කථා කළා. මිනිස්සු ඉබ්බෝ වාගේ බලා ඉන්නවාය, ගෙම්බෝ වාගේ බලා ඉන්නවාය කියලා එතුමා කිව්වා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ඒවාත් නොකියා කථා කරන්න තිබුණා නේ. මිනිස්සු මොළයක් නැති, උගත්කමක් දැනුමක් නැති ඉබ්බෝ ගෙම්බෝ වාගේ බලා ගෙන ඉන්නවා කියලා ඒ ආචාර්යතුමා කිව්වා. ආචාර්යතුමා මේ රටේ ජනතාව ගැන නිතන්නේ ඒ ආකාරයට වාගෙයි මට පේන්නේ. මම නම් කියන්නේ එතුමා ජනතාවට නින්දාවක් කළා කියලායි. අපේ ඡන්ද දායකයන්ට එතුමා අපහාසයක් කළේ. එතුමාට තිබෙන්නේ ඒ කියපු කථාව ඉල්ලා අස් කර ගන්නයි. ඒ කථාව ඉල්ලා අස් කර ගන්න ආචාර්යතුමනි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ගෙම්බෝ, ඉබ්බෝ කියලා ජනතාවට අපහාස කරලා මේ කරන නාට්‍යය මොකක්ද? මොකක්ද මේ ජවනිකාව?

ඊයේ ඔබතුමන්ලා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගැනත් ඒ විධියට කිව්වා. මහ එක්කෙනාගේ හැසිරීමේ ඉඳලාම ඔය වාගේ තමයි ජනතාවට කථා කරන්නේ. ඒක නිසා තමයි දයාසිරි

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ජයසේකර මන්ත්‍රීතුමා කිව්වේ තව දහ අවුරුද්දකටවත්, පේන තෙක් මානයේවත් එක්සත් ජාතික පක්ෂයට හරි මඟක් නැහැ කියලා. අන්න ඒ මඟ නැති කර ගන්න ජනතාවට අපහාස කරන්න. ගෙම්බෝ කියන්න, ඉබ්බෝ කියන්න, හරක් කියන්න. තමන්ගේ ඡන්ද දායකයන්ටත් එක්කයි එහෙම කියන්නේ. යූඑන්පී එකේ ඡන්ද දායකයන්ටත් එක්කයි ඔය කියන්නේ. තමන්ගේ ඡන්ද දායකයන්ට ඔය විධියට නින්දා කරන්න එපා. ආචාර්ය තනතුරක් දරා ගෙන එවැනි නින්දා සහගත වචන කථා කරන්න හොඳද? ඡන්ද දායකයා මොන තීරණයක් දුන්නත් ඒ තීරණය හරි කියලා හිස නමලා පිළි අරගෙන මේ රටේ වගකීම, පාලනය භාර ගන්නවා මිසක් මෙහෙම කථා කිරීමේ ක්‍රමයක් නැහැ. ඔබතුමා කිසිම හරයක් නැතිව, ගැඹුරක් නැතිව මේ රටේ ජනතාව අඳුරන්නේ නැති කෙනෙකු වාගේ කථා කළා. ඒ නිසා මේ කරපු නින්දාවට ජනතාවගෙන් සමාව ගන්න, ඒ වචන ඉල්ලා අස් කර ගන්න කියලායි මම අවසාන වශයෙන් කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ඒ කථාව ඉල්ලා අස් කර ගන්නවා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
බොහොම හොඳයි. ඒක හොඳ ශීලාචාරකමක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමනි, මම ඒ වෙලාවේ ජනතාව හැල්ලු කරන්න හිතලා ගෙම්බෝ, ඉබ්බෝ කියලා කිව්වේ නැහැ.

එහෙම අදහස් වුණා නම්, මා එය ඉල්ලා අස් කර ගන්නවා. මම එහෙම ජනතාවට අපහාස කරන ජාතියේ මන්ත්‍රීවරයෙක් නොවෙයි. මම කිව්වේ, ජනතාවට ආණ්ඩුව සලකන්නේ ජනතාව ගෙම්බෝ, ඉබ්බෝ වාගේ හිතාගෙනයි කියන එකයි. බොහොම ස්තුතියි.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
නැහැ, නැහැ, එහෙම නොවෙයි කිව්වේ. ඕනෑ නම් තැටිගත කරපු එක අරගෙන බලන්න. ඇතුළට ගිහිල්ලා ටේප් කරපු එක ඉල්ලා ගෙන බලන්න. [බාධා කිරීමක්] සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ඒ මන්ත්‍රීතුමාව රැක ගන්නට කථා කරනවා. [බාධා කිරීමක්] ඒක වෙනම එකක්. ටේප් කරපු එක අරගෙන බලන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඒක වෙනම එකක්. ජනතාව සොරකම් කළා නොවෙයි නේ. ජනතාව සොරකම් කරලා නැහැ නේ. ඒ සොරකම් කරන අයට පහර ගහන එක වෙනම දෙයක්. ජනතාව ගෙම්බෝ, ඉබ්බෝ වාගේ බලා ඉන්නවා කියලායි කිව්වේ. [බාධා කිරීම්] මේවා කියද්දී මෙතුමන්ලා මේ එක එක නාට්‍ය රඟපානවා. නමුත් එතුමා එහෙම තමයි කිව්වේ. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මෙතැන නාට්‍ය රඟපෑවාට එතුමා අවසානයේ ඒක තේරුම් අරගෙන එය ඉල්ලා අස් කර ගත්තා. [බාධා කිරීම්] තමුන්නාන්සේ ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් එතුමාව රකින්න කථා කරනවා. ආචාර්යතුමා ඒක තේරුම් අරගෙන ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා තවත් ඒකේ පැටලිලා යන්නේ නැතිව වාඩි වෙන්න. ඒ ගොන් වැඩේ තවත් එල්ලිලා යන්නේ නැතිව වාඩි වෙන්න. ඒක තේරුම් ගන්න. මේ වාගේ වැරැද්දක් වුණාම ඒක පෙන්වා දෙන්න අපට යුතුකමක් තිබෙනවා. ආචාර්යතුමා ඒ කරපු කාර්ය බොහොම හොඳයි. [බාධා කිරීමක්] මෙතුමා ආචාර්ය නොවෙයි නේ. මෙතුමා මොන ආචාර්යද? මෙතුමා අනාචාර්ය. දැන් නැඟිටලා කථා කරන්නේ අනාචාර්ය. බලන්න, මේ අනාචාර්ය කථා කරනවා. ආචාර්යතුමා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තා. ඒ වෙනුවට දැන් අනාචාර්ය නැඟිටලා කථා කරනවා. මොකක්ද මේ කථාවේ තේරුම?

මොන ආණ්ඩුවක් ආවත් බදු පනවනවා, බදු අඩු කරනවා, බදු අස් කර ගන්නවා. එහෙම තමයි ආණ්ඩු කටයුතු කරන්නේ. ඒ ඒ යුගයන්වල තිබෙන තත්ත්වයන් අනුව, ඒ අවශ්‍යතාවන් අනුව එම කටයුතු සිදු කරනවා. අද මෙතුමා මුදල් නියෝජ්‍ය ඇමතිතුමා හැටියට කරුණු ඉදිරිපත් කළේ, කලින් කලට ඇති වන ඒ තත්ත්වයන් අනුවයි. සමහර ඒවාට බදු වැඩි කරන්නට සිදු වනවා. අපේ රටේ අර්තාපල් අස්වැන්න වැඩි වන කාලයට පිට රටින් ගෙන්වන අර්තාපල්වලට බදු වැඩි කරනවා. අපේ රටේ ගොවීන් රකින්නයි, එවැනි වැඩ පිළිවෙළවල් සකස් කරන්නේ. ඒ අනුව තමයි කටයුතු කරන්නේ. ඒක නිසා බදු පැනවීම, බදු අඩු කිරීම, බදු ඉවත් කිරීම ඉතිහාසයේ සෑමදාම සෑම ආණ්ඩුවක් විසින්ම සිදු කරලා තිබෙනවා. ඒක ගැන දෝෂයක් කියන්න බැහැ. ඒවා සිද්ධ වනවා. එහෙම වෙන්න පුළුවන්. එහෙම විය යුතුයි.

තමුන්නාන්සේලා පසු ගිය කාලයේ ආණ්ඩුවෙන් ඇහුවා, කෝ ආයෝජන කියලා. කවුද ආයෝජනයන් කරන්න එන්නේ, කරන ආයෝජන මොනවාද කියලා ඇහුවා. දැන් ආයෝජන නැහැ, ආණ්ඩුවේ ප්‍රතිපත්තියට විරුද්ධයි, රුපියල බහිනවා, ඩොලර් එක නඟිනවා වාගේ දේවල් කිය කියා සිටියා. දැන් ආයෝජකයන් එනකොට - [බාධා කිරීමක්] සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ වෙලාවේ දී ඒ ගැන කථා කරන්න. අපි තමුන්නාන්සේලාගේ වැඩ ගැන කථා කළේ නැහැ. මේ මෑත යුගයේ තරම් ආයෝජනයන් මේ රටේ මීට පෙර ඇති වෙලා නැහැ. මේ රට හදන්න අපට වැඩි වැඩියෙන් ආයෝජනයන් ඕනෑ. වාමාංශිකයන් හැටියට අපි ඉස්සර කල්පනා කළේ චීනය ගත්තත් අනෙක් රටවල් ගත්තත් විදේශිකයන්ට ආයෝජනයන් කරන්නට ඉඩ දීම සුදුසු නැහැ කියායි. ඉස්සර අපි එහෙමයි කල්පනා කළේ. ඒ අනුව විදේශිකයන් මෙහි ආයෝජනය කරලා තිබුණු ඒවාත් අපි නැවත ලබා ගත්තා. චීනයත් දැන් විදේශීය ආයෝජනයන්ට දොර විවෘත කරලා තිබෙනවා. ඒ වාගේම ලෝකයේ සෑම රටකම තිබෙන -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Sujeewa Senasinghe?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ රටට ආපු ආයෝජන දෙකක් ගැන කියන්න පුළුවන්ද කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු ඇමතිතුමා කථා කරන්න.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
තමුන්නාන්සේ point of Order කිය කියා මොකක්ද ඉදිරිපත් කරන්න හදන්නේ? යන්න කෝ, හැන්දෑවට අර Galle Face එකට. හැන්දෑවට ගිහින් Galle Face එක දිහා බලා ගෙන ඉන්නකෝ. Galle Face එකේ තට්ටු කීයක හෝටලයක් හදනවාද? ඒක ආයෝජනයක් නොවෙයිද? මෙහේ ඇවිත් හෝටල් හදන්න ඊට වැඩිය ලොකු කොම්පැනියක් ලෝකයේ තිබෙනවාද? මේ ආණ්ඩුව කරන වැඩ නවත්වන්න, දුර්වල කරන්න, ආයෝජකයන් අතර, විදේශිකයන් අතර වැරදි ප්‍රචාරයන් ගෙනියන්න තමුන්නාන්සේලා ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් කරන ව්‍යාපාරයක් තමයි මේ කර ගෙන යන්නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හෝටලය හදන කොම්පැනිය මොකක්ද?

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
තමුන්නාන්සේට උත්තර දෙන්න මම බැඳිලා නැහැ. මම කථා කරන්නේ මූලාසනයටයි. තමුන්නාන්සේ වාඩි වෙලා නිකම් ඉන්නවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හොටෙල් එකේ නම කියන්න. මොකක්ද දන්නේ නැහැ. ඒ ගැන දන්නේ නැති කට්ටිය ඉන්නවා. හෝටලයේ නම මොකක්ද?

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මන්ත්‍රීතුමා ගිහින් හුළං වදින්නත් එක්ක Galle Face එකේ ඉඳගෙන ඉන්නකෝ. ඉඳගෙන ඉඳලා බලන්නකෝ. අර හදා ගෙන හදාගෙන යන්නේ. ඒ හෝටලය ගොඩනඟලා ඉවර කරන කාලයත් ඒකේ දාලා තිබෙනවා. බලා ගෙන ඉන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මෙලෝ දෙයක් තේරෙන්නේ නැහැ. තල් ගස් ටික නම් ගැලෙව්වා.

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ආයෝජන දෙකක් කියන්න කියලා නේ කිව්වේ. ඔන්න එකක් කිව්වා. තවත් කියවා ගන්න ඕනෑද? ආයෝජන නැද්ද, මේ රටේ? ඒ නිසා තව තවත් වැඩි වැඩියෙන් ආයෝජන ලංකාවට ගෙන්වා ගන්න තමයි අපේ වුවමනාව; අපේ අරමුණ. මේ රටේ සංවර්ධනය වැඩි වෙලා, නිෂ්පාදනය වැඩි වෙලා, රැකී රක්ෂා වැඩි වෙලා, මේ රටේ දුප්පත්කම අඩු කර ගන්න තිබෙන එක මාර්ගයක් තමයි විදේශීය ආයෝජන. ඒ අය අපි කැඳවා ගන්න ඕනෑ. ආයෝජන කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද හෝටල් ක්ෂේත්‍රය විවෘත කරලා තිබෙනවා. හෝටල් හදන්න ප්‍රදේශ වෙන් කරලා දීලා තිබෙනවා. ඒ ප්‍රදේශවල හෝටල් හැදී ගෙන එනවා. සංචාරකයන් වැඩි වෙනවා. ඒ එක අංශයක්.

තවත් අංශයක් තමයි ව්‍යාපාර පටන් ගැනීම සඳහා, කර්මාන්ත පටන් ගැනීම සඳහා ඒ ඒ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය විධියට ඒ කටයුතු සකස් කර ගන්න පහසුකම් සැලසීම. ඒ ව්‍යාපාරිකයන් ආකර්ෂණය කර ගන්න ඒ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. ඒ සඳහා වූ වැඩ පිළිවෙළවල් සකස් කරලා, ඒ අය කැඳවලා, ඒ අයට භාර දුන්නාම, ඒ අය නිෂ්පාදනය වැඩි කරන්න, වැඩි කරන්න; ඒ ගොල්ලන් දියුණු වෙන්න, දියුණු වෙන්න ඒ ගොල්ලන්ගෙන් බදු ගැනීම, බදු වැඩි කර ගැනීම වැනි ඒ කටයුතු වැඩි වැඩියෙන් ක්‍රියාත්මක වන කොට අපට අවස්ථාව ලැබෙනවා, අපගේ ආර්ථිකය දියුණු කර ගන්න. එහෙම වූ වැඩ පිළිවෙළක් තමයි අපි ක්‍රියාත්මක කරන්න යන්නේ.

තමුන්නාන්සේලා කියන්නේ අපි ණය ගන්නවා වැඩියි කියලායි. තමුන්නාන්සේලා දන්නවා, World Bank එක අපි දැන් ගෙනියන වැඩ පිළිවෙළට ස්තුති කරනවා; අපේ සංවර්ධනයට ස්තුති කරනවා කියලා. අපේ සංවර්ධනයේ වේගය ගැන ඔවුන් සතුටට පත් වෙලා ඉන්නවා. ඒවා ගැන සතුටට පත් වෙලා ඒ අය කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයේ කොම්පැනිය තමයි මේකට විරුද්ධව කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක සංවර්ධනයට ණය අවශ්‍යයි. ණය නැතුව සංවර්ධනය වුණු රටක් නැහැ; සංවර්ධනය කරන රටක් නැහැ. ඇමෙරිකාව මේ කාලයේ කොච්චර ණය ගන්නවාද? ණය අවශ්‍යයි. ණය ලබා ගන්න ඕනෑ. එසේ ණය ලබා ගෙන තමයි සංවර්ධනය කරන්නේ. අපේ රටේ සෑම අංශයකම ඒ සංවර්ධනය ව්‍යාප්ත කර ගෙන යනවා. අලුතෙන් රේල් පාරවල් හදනවා, ගුවන් තොටු පොළවල් හදනවා, වරායවල් හදනවා, විදුලි බලාගාර හදනවා. ණය අරගෙන හෝ කොහොම හෝ මේවා හදමින් මේ රට සංවර්ධනය කරා යමින් සිටිනවා. ඒ මඟින් තමයි මේ රට සංවර්ධනය කරා ගෙනියන්න තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ, තමුන්නාන්සේලා වාගේ කෑ ගහපු කෙනෙක් තමයි, ඔය වාගේම ආණ්ඩුවට බැණපු කෙනෙක් තමයි, තමුන්නාන්සේලා වාගේ නින්දා කරපු කෙනෙක් තමයි, උඩ පැනපු කෙනෙක් තමයි ඊයේ ආණ්ඩුවට ආවේ. තවත් එන්න අය ඉන්නවා.

ජේවීපී එක මොනවාද කියන්නේ? ජේවීපී එකේ කැල්ලක් මෙහේ; කැල්ලක් කැඩිලා. ජේවීපී එකට ඡන්දයෙන් බලයට එන්න බැහැ, අපි වෙනම අරගලයක් කරනවා කියලා කැල්ලක් කැඩිලා එහෙන් ගමනක් යනවා. පෙරටුගාමී සමාජවාදී අරටුවද, පෙරමුණද කියලා එකක් එහෙන් යනවා. මෙහෙන් පරණ ජේවීපී එක කර ගහගෙන යනවා. ජේවීපී එකේ හිටපු අය කී දෙනෙක් මෙහාට ඇවිල්ලා අද සංස්ථාවල සභාපතිවරුන් වෙලා ඉන්නවාද? තනතුරු ලබා ගෙන ඉන්නවාද? අධ්‍යක්ෂවරු වෙලා ඉන්නවාද? ඇයි? ඒ කියන්නේ ඒ පක්ෂයේත් ගමනක් නැහැ; අනාගතයක් පෙනෙන්නේ නැහැ; අනාගතයක් දකින්න නැහැ.

එක්සත් ජාතික පක්ෂයට -[බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂයට මොකක්ද තිබෙන තත්ත්වය? එක්සත් ජාතික පක්ෂයටත් කාලයක් අනාගතයක් ජේන්නේ නැහැ. අද මේ රටේ ජනතාවට ඡන්දය දෙන්න තිබෙන පක්ෂය මොකක්ද? මොන පක්ෂයටද ඡන්දය දෙන්න පුළුවන්? එක්සත් ජාතික පක්ෂයටද? එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නේ මොකටද? ආණ්ඩුවක් හදන්නද? එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් හදන්න පුළුවන්ද?

[ගරු අනාවුද සෙනෙවිරත්න මහතා]

ජේවීපී එකට ඡන්දය දීලා ආණ්ඩුවක් හදන්න පුළුවන්ද? සරත් ෆොන්සේකාට ඡන්දය දීලා ආණ්ඩුවක් හදන්න පුළුවන්ද? ඒ අයට බලයට එන්න පුළුවන්ද? රට සංවර්ධනය කරන්න පුළුවන්ද? මොකක්ද ඒ අයට තිබෙන සැලැස්ම?

යූඑන්පී එකේ රනිල් වික්‍රමසිංහ මහත්මයා අවුරුදු දෙකක් විතර අගමැති ධුරයේ හිටියා. එතුමා මොකක්ද කළේ? එතුමාගේ කාලයේ රාජ්‍ය සේවය කප්පාදු කරන්න, රාජ්‍ය සේවකයින් පත් කරන එක නතර කරන්න ලැහැස්ති කළා. 900,000ක්ව සිටිය රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව 600,000 දක්වා අඩු කරන්නට තීන්දු කරලා තිබුණා. අපි එය 1,400,000ක්, 1,500,000ක් දක්වා වැඩි කරලා රාජ්‍ය සේවය ශක්තිමත් කළා. අපි 42,000ක් උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගත්තා. උපාධිධාරීන් සියලුම දෙනාට රක්ෂාවල් දීලා අප මේ රට ඉදිරියට ගෙන යනවා. අපි දුප්පත්කම සියයට 7 දක්වා අඩු කරලා තිබෙනවා. උද්ධමනය අඩු කරලා තිබෙනවා. ඒ අනුව මේ විධියට රටේ සංවර්ධනය කර ගෙන යනවා. ඒ අනුව තමයි මේ රට ගොඩ නහන්නට තිබෙන්නේ. මේ රට ගොඩ නහන්නට වෙනත් පිළිවෙළක් නැහැ. තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති ධුරයේ සිටි කාලයේ එක කම්කරුවෙක්, එක driver කෙනෙක්, එක සේවකයෙක් රාජ්‍ය සේවයට බඳවා ගත්තේ නැහැ. එක් කෙනෙකුවත් බඳවා ගත්තේ නැහැ.

ඊළඟට එතුමා මොකක්ද කළේ? එතුමාගේ ආර්ථික න්‍යාය මොකක්ද? එතුමා ගොඩ නැඟුව ආර්ථික න්‍යාය මොකක්ද? මොකක්ද කළේ? කළ දෙයක් තිබෙනවාද? කළ දෙයක් සම්බන්ධයෙන් එක වාර්තාවක් ඉදිරිපත් කරන්නට පුළුවන්ද? හැදූ එක ස්ථානයක් කියන්නට පුළුවන්ද? [බාධා කිරීමක්] හැදූ එක ගොඩනැඟිල්ලක් පෙන්වන්නට පුළුවන්ද? හැදූ එක පාරක් පෙන්වන්නට පුළුවන්ද? හැදූ එක පාලමක් පෙන්වන්නට පුළුවන්ද? මොකක්ද පෙන්වන්නට පුළුවන්? රනිල් වික්‍රමසිංහ මහත්මයා 2002 - 2004 දක්වා අගමැති ධුරයේ ඉඳලා ගොඩ නහපු එක පාලමක් කියන්න බලන්න; එක පාරක් කියන්න බලන්න; එක ගුවන් තොටුපොළක් කියන්න. මොනවාද කරලා තිබෙන්නේ? කළ දෙයක් කියන්න බලන්න. කියන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්] ඔව්, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් දයාසිරි වාගේ තමයි. හෙට අනිද්දා වන විට මේ පැත්තේ ඉඳීවි. තමුන්නාන්සේත් මෙහාට එන්න. [බාධා කිරීමක්] යන එන මහක් නැහැ. යන එන මහක් නැහැ. [බාධා කිරීමක්] ඔව්, ඔයිට වඩා පූර්වානම් කියාපු කට්ටිය, අපට කුණුහරුපයෙන් බැණපු කට්ටිය දැන් මේ පැත්තේ ඉන්නේ. දැන් මේ පැත්තේ මුල් පුටුවල ඉන්නේ එතුමන්ලායි. එතුමන්ලා තමයි දැන් තමුන්නාන්සේලාට උත්තර දෙන්නේ. උත්තර දෙන්න අපි ඕනෑ නැහැ. යූඑන්පී අය දාලාම තමයි ආපසු තමුන්නාන්සේලාට උත්තර දෙන්නේ. එතුමන්ලා තමයි තමුන්නාන්සේලාට හොක්කට අනින්නට කථා කරන්නේ. යූඑන්පී ලොක්කෝ තමයි මෙහේ ඉඳලා තමුන්නාන්සේලාට උත්තර දෙන්නේ. [බාධා කිරීමක්] අපට ඕනෑ නැහැ, අපට ඕනෑ නැහැ. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එහෙම තමයි. ඔබතුමාටත් ඕනෑ දේවල් ඒ විධියට කියා ගන්න පුළුවන්. යූඑන්පී එක මොන ගමනක්ද යන්නේ? මොකක්ද යන්න පුළුවන් ගමන? ගමනක් නැහැ. පයින් ගමනකුත් නැහැ. කරපු දෙයකුත් නැහැ. මේ රටේ කරපු සංවර්ධනයකුත් නැහැ. කවුරුවත් තමුන්නාන්සේලාට රට බාර දෙන්නට ලැහැස්ති නැහැ; ඡන්දය දෙන්න ලැහැස්ති නැහැ. දීලා වැඩක් නැහැ. ඡන්දය අහකට යන, ඡන්දය අපතේ යන, ඡන්දය විනාශ වන වැඩක් මේ කර ගෙන යන්නේ. ඒක නිසා තමුන්නාන්සේලා -[බාධා කිරීමක්] ඉතින් පරිප්පු ඉල්ලා ගෙන කන්න කෝ. ඉල්ලා ගෙනම කන්න කෝ පරිප්පු. උදේටත් කන්න, දවල්ටත් කන්න, රෑටත් කන්න. කන්න, තමුන්නාන්සේලා පරිප්පු කන්න. පරිප්පු තිබෙනවා. පරිප්පු නැත්තේ නැහැ. පරිප්පු ලැබිලා තිබෙනවා. කඩවල පරිප්පු තිබෙනවා. ඕනෑ නම් උයලාත් දෙන්නම්. හෝටල්වලට ගිහිල්ලාත් කන්න. ඒ විධියට හදලා කන්න. පරිප්පුම කන්න. පරිප්පුම කන්න. පරිප්පු කාලා තමයි දැන් ඇති වෙලා තිබෙන්නේ. ජේවීපී එකට යන එන මහක් නැහැ. විප්ලවයකුත් නැහැ; ඡන්දයකුත් නැහැ. විප්ලවයක් නැහැ; ඡන්දෙත් නැහැ; ගමනත් නැහැ. ඒ නිසා මේ අය කොහාටද යන්නේ? යන ගමනක් නැහැ.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ මේ රට ඓතිහාසික වශයෙන් මහා සංවර්ධන වැඩ පිළිවෙළවල් -දැවැන්ත සංවර්ධන වැඩ පිළිවෙළවල්- සහිතව අලුත් වාර්තා සහිත අලුත් යුගයකට ගෙන යන්න යන වෙලාවයි මේ. මේ රට සංවර්ධනය කරා ගෙන යන වෙලාව මේ. මේ රට ඓශ්වර්යවත් රටක් බවට පත් කරන්නට ගෙන යන වෙලාවේ තමුන්නාන්සේලාත් උදවු කරන්න; දුර්වලකම් පෙන්වලා දෙන්න. ඒ දුර්වලකම් පුළුවන් තරම් හදාගෙන රට හදන්න අපි කැප වෙමු. ඒ සඳහා තමයි තමුන්නාන්සේලාට කටයුතු කරන්නට තිබෙන්නේ. එහෙම නැතිව තමුන්නාන්සේලා මේ සභාවට ඇවිල්ලා කෑ කෝ ගහලා, අපට බැණලා වැඩක් නැහැ. බැණ්නාට මේ රට හැදෙන්නේ නැහැ. තර්ක විතර්ක ඉදිරිපත් කළාට මේ රට හැදෙන්නේ නැහැ. ප්‍රායෝගික වශයෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යන්න තමුන්නාන්සේලාගේ සහයෝගය අපට අවශ්‍ය වෙනවා.

ඒක නිසා තමයි සෑම කෙනෙක්ම අප සමඟ එකතු වෙලා තිබෙන්නේ. දැන් අපේ ආණ්ඩුව ජාතික ආණ්ඩුවක්. දැන් අපේ ආණ්ඩුවේ මුස්ලිම් කොංග්‍රසය ඉන්නවා; වතුකරයේ තොණ්ඩමන් ඇමතිතුමාගේ පක්ෂය ඉන්නවා. සියලු දෙනාම ඉන්නවා. ඒ ඔක්කොම එකතු වෙලා ඉන්නේ මේ ආණ්ඩුව යන ගමන නිවැරදි නිසායි. පොඩි පොඩි අඩු පාඩුකම් තිබෙනවා.

පහු ගිය කාලයේත් මේ රටේ එක එක ප්‍රශ්න තිබුණා. මේ රටේ ආගම් බේද ඇති කරලා, රණ්ඩු ඇති කරලා ප්‍රශ්න ඇති කරන්න හදනවා. අපි ඒවාට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අපට මේ රටේ සංවර්ධනය ඉදිරියට ගෙන යන්න සමගිය සමාදානය අවශ්‍යයි. ඒ තත්ත්වය ආරක්ෂා කර ගෙන යන්න නම් සියලු දෙනාම ඉදිරිපත් වෙන්න ඕනෑ; කටයුතු කරන්න ඕනෑ. ජාති බේද අවුස්සලා, ලබන මැතිවරණයේදී හාමුදුරුවන් එක්කෙනෙක් දෙන්නෙක් ඉදිරිපත් කරලා ආසනයක් දෙකක් දිනා ගන්න පුළුවන්ද කියලා බලන මිනිස්සුත් ඉන්නවා. නමුත් දේශපාලනය කියන්නේ ඒක නොවෙයි. එදා සිදුහත් කුමාරයාට ඕනෑ නම් තිබුණා, කිඹුල්වත් නුවර තමන්ගේ පියතුමාගේ රාජ්‍යය භාර ගන්න. නමුත් එහෙම කළේ නැහැ. රජ්ජුරුවන්ගේ වංශය ඒක, මගේ වංශය මේකයි කියලා පිඬු සිඟා වළඳා උන් වහන්සේ ඒ කටයුතු කරගෙන ගියා. දැන් මේ අයට ඕනෑ කරනවා මන්ත්‍රීකම්; තව තව දේවල් ඕනෑ කරනවා. ඒක බුද්ධාගම නොවෙයි; ඒක බෞද්ධ දර්ශනය නොවෙයි. ජාතිවාදය ඇති කරලා ඡන්දයේදී ඒක මතු කරලා ගන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ජාතිවාදය ඇති කරන අයට උදවු කරන විදේශීය බලවේග තිබෙනවා. NGOකාරයන් උදවු කරනවා. එහෙම උදවු කරලා, තවත් රණ්ඩු ඇති කරලා, ඒ අය මඟින් ආණ්ඩු විරෝධී ගමන් මහට, රටට හතුරුකම් කරන අයට උදව් වෙන්න, ඩයස්පෝරාවට උදව් වෙන්න, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ඉන්න අපට විරුද්ධ නිලධාරීන්ගේ වුවමනාවන් ඉෂ්ට කරන්න, අපේ රට විනාශ කරන්න, රටට හතුරුකම් කරන්න, ඒ වාගේ යම් බලවේග හදන්න උත්සාහ කරනවා. ඒවාට රැවටෙන්නේ නැතිව අපේ රට බේරා ගෙන මේ රජය ඉදිරියට යන මේ ගමනට උදව් වෙන්න ඕනෑ.

සමහර අය කිව්වා, පළාත් සභා අහෝසි කරන්න ඕනෑ, පළාත් සභාවලින් වැඩක් නැහැ කියලා. ජනාධිපතිතුමා කිව්වේ පළාත් සභා ඡන්දය තියනවා කියලායි. දැන් පළාත් සභා මැතිවරණයට නාම යෝජනා කැඳවා තිබෙනවා. මේ රටට ඕනෑ දේ කරන්න ජනාධිපතිතුමා අවශ්‍ය කටයුතු කර ගෙන යනවා. ඒ අනුව මේ රට හදන්න, මේ රට දියුණු කරන්න, මේ රටේ සියලු ජාතීන් රකින්න, මේ රට ඉදිරියට ගෙන යන්න අපේ ජනාධිපතිතුමා තමයි මේ යුගයේ මේ රටේ ඉන්න නායකයා. ඒ පෞරුෂත්වය, ඒ නායකත්වය මඟින් රට ආර්ථික පැත්තෙන් වාගේම සෑම පැත්තකින්ම දියුණු කර තිබෙනවා. සමස්තයක් හැටියට ඒ වැඩපිළිවෙළ කර ගෙන යනවා. නමුත් යම් පිරිහීමක් තිබෙනවා. අවුරුදු 40ක්, 50ක් යුද හමුදාවේ, පොලිසියේ නීති-රීති ඇතිව ක්‍රියා කරපු යුද තත්ත්වයක් තිබුණු රටක් මේක. ඒ තත්ත්වය තුළ නරක පුරුදු ඇති වෙච්ච අය ඉන්නවා. ඒ වාගේම මේ විවෘත ආර්ථිකය තුළ ඉක්මනින් භාණ්ඩ ගන්න, ද්‍රව්‍ය ගන්න, බඩු මුට්ටු ගන්න, ඉක්මනින් පොහොසත් වෙන්න, "New Rich" class එකක් හදන්න තමයි හැමෝම උත්සාහ කරන්නේ. ඒක නිලධාරීන් අතරත් ඒ පිරිහීම තිබෙනවා. දේශපාලකයන් අතරත් ඒ පිරිහීම තිබෙනවා. නඩුකාරයන් අතරත් ඒ පිරිහීම තිබෙනවා. නීතිඥයින් අතරත් ඒ පිරිහීම තිබෙනවා. පූජකවරුන් අතරත් ඒ පිරිහීම තිබෙනවා. මේ විධියට සමස්ත පිරිහීමක් මේ රටේ තිබෙනවා. ඒ නිසා ඒ තත්ත්වය නිවැරදි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම සියලු දේශපාලන පක්ෂ මේ රට හදන්න එකතු වෙන්න ඕනෑ. ඒක තමයි නායකයන්ගේ වගකීම. ඒකට අවශ්‍ය සමාජ කතිකාවතක්, සමාජ දර්ශනයක්, සමාජ විශ්‍රහයක් ඉදිරිපත් කරලා මේ රට හදන වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. ඒක අවශ්‍යයි. ඒ සඳහා ඉදිරිපත් වෙලා වැඩ කිරීම ඉතාම වැදගත් හැටියට මා සලකනවා. සමාජය නරක පැත්තට ගන්න එක බොහොම ලෙහෙසියි; දූෂණයට ගන්න එක බොහොම ලෙහෙසියි; ඒ දුබලකම් ඇති වන තැනට පත් වන එක ලෙහෙසියි. ඒක නිසා තමයි නොයෙක් වැරදි ක්‍රියාවලින් සල්ලි හොයන, සල්ලි කරා හඹා යන සමාජයක් විවෘත ආර්ථිකයත් එක්ක මේ රටේ ඇති වෙලා තිබෙන්නේ. බහු භාණ්ඩ යුගයත් එක්ක ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. මේ වැරදි හදා ගෙන යන්න ඕනෑ. ඒ සඳහා දැවැන්ත නැගිටීමක්, ව්‍යාපාරයක් අවශ්‍ය වෙනවා. යහපත් සමාජයක්, සංවර සමාජයක් හදා ගන්න ඒක අවශ්‍ය වෙනවා. එවැනි සමාජ ක්‍රමයක් ඇති කර ගන්න අප උත්සාහ කළ යුතුව තිබෙනවා. ඒ ගමන යන්න අපි සියලු දෙනාම එකතු වෙමු කියා ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.24]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව නැවතත් ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩ ගණනාවකට බදු පනවන යෝජනාව අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. අද ආණ්ඩුවේ එකම පැවැත්ම වී තිබෙන්නේ බදු, දඩ සහ ණය මත. බදු, දඩ සහ ණය හරහා උපයා ගන්නා මේ මුදල් තමයි මේ ආණ්ඩුව ඉතාම වැරැදිසහගත ලෙස, ඉතාම දූෂිත ලෙස අද යොදවමින් තිබෙන්නේ. ඒ මුදල් ජනතාවගේ වුවමනාව වෙනුවෙන් නොවෙයි යොදවන්නේ. මා ගරු සරත් අමුණුගම ඇමතිතුමාගෙන් අහනවා, එක සතියක් තුළ තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන කැබිනට් පත්‍රිකා හරහා මොන තරම් මුදල් ප්‍රමාණයක් දූෂිත කරන්න බලාපොරොත්තු වෙලා තිබෙනවාද කියලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණ පිළිබඳව පසුව කථා කරන්න බලාපොරොත්තු වෙමින් මම පළමුවෙන්ම මෙම කරුණ ඉදිරිපත් කරනවා.

මේ රටේ "මාතා" කියලා චිත්‍රපටයක් හැදුවා. "මාතා" කියන ඒ චිත්‍රපටය රට පුරා සිනමාහල්වල පෙන්නුවා. පෙන්නුවාට පස්සේ, ඒක තව දුරටත් දුවන්න බැරිව, සිනමාහල්වලට ලාභ උපයා ගන්න බැරිව අකුළා ගත්තා. ඒක අකුළා ගත්තාට පස්සේ තමුන්නාන්සේලා අද මොකක්ද කරන්න හදන්නේ? ඒ දුවන්නේ නැති, අකුළා ගත්ත චිත්‍රපටය තමුන්නාන්සේලා සල්ලි දීලා ගන්න හදනවා. දැන් මම මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහනවා, ඒ චිත්‍රපටය මිලදී ගන්න තමුන්නාන්සේලා රජයේ සල්ලි වෙන් කරනවාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, තව දුරටත් ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැ. මොකද, ඇත්ත වශයෙන්ම ඒ චිත්‍රපටය නොගන්න රජය තීරණය කළා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
නොගන්න තීරණය කළාද?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්. ඒ නිසා ඒ ගැන කලබල වෙන්න එපා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

දැන් බලන්නකෝ. මේ කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙලා තිබෙනවා ඒ චිත්‍රපටයේ වියදම රුපියල් මිලියන එකසිය,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ගරු ඇමතිතුමා වාඩි වෙන්න කෝ. ඇයි කලබල වෙන්නේ? ආචාර්ය මර්වින් සිල්වා මැතිතුමා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ තිබෙනවා, "මාතා" චිත්‍රපටයේ වියදම රුපියල් මිලියන 139යි, චිත්‍රපටයෙන් ලද ආදායම රුපියල් මිලියන 17යි කියලා. රට පුරා සිනමාහල්වල ඒක පෙන්නුවා. සතිය දෙක යන කොට cinema hallsවලින් ඒක ඉවත් කළා. ඒක දුවන්න බැරි චිත්‍රපටයක්. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදනවා, රුපියල් මිලියන 122ක් පාඩු ලැබූ චිත්‍රපටය රුපියල් මිලියන 87.5ක් දීලා මිලදී ගන්න. [බාධා කිරීමක්] ගන්නේ නැත්නම් හොඳයි. දැන් මේ ආණ්ඩුව තිබෙන්නේ බංකොලොත් වුණ චිත්‍රපට දුවවන්නද? මහ ජනයාට බදු ගහලා එකතු කර ගන්න සල්ලිවලින් බංකොලොත් වෙච්ච චිත්‍රපට ගන්න හදනවා.

ඒ චිත්‍රපටය ගන්න කියලා ලියුම් එවන්නේ කවුද? තමුන්නාන්සේලාගේ වේදිකාවල හිටපු සංවේදී කලාකාරයෝ. එක්කෙනෙක් තමයි මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස. ඉස්සර කැලණිය විශ්වවිද්‍යාලයේදී එතුමාට කිව්වේ "කරවල පියා" කියලා. එතුමා අත්සන් කරලා ලියුමක් එවලා තිබෙනවා, "මේ චිත්‍රපටය හොඳයි, ගත්තාට කමක් නැහැ" කියලා. ඊළඟට කවුද? කලාකීර්ති එඩ්වින් ආරියදාස. එතුමා තමයි අර ප්‍රසිද්ධ හොරෙක් එක්ක එකට ඡායාරූප ගහගෙන business කරපු පුද්ගලයා. ඊළඟට කවුද? ප්‍රවීණ රංගන ශිල්පී ශ්‍රියන්ත මෙන්ඩිස්. ඒ ගොල්ලෝ දැන් කොහේද ඉන්නේ? ඊළඟට කවුද? ප්‍රවීණ චිත්‍රපට හා ටෙලි අධ්‍යක්ෂ ජයන්ත චන්ද්‍රසිරි. ඊළඟට කවුද? ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක. ඒ ගොල්ලෝ දැන් කොහේද ඉන්නේ? ඒ ගොල්ලෝ

[ගරු අනුර දිසානායක මහතා]

මේ ආණ්ඩුවට කියනවා, "මේක හොඳ චිත්‍රපටයක්, රට ගැන තිබෙන චිත්‍රපටයක්, ඒක ආණ්ඩුව ගන්න" කියලා. දැන් මේ ආණ්ඩුව තිබෙන්නේ බංකොලොත් වෙච්ච චිත්‍රපට දුවවන්නද? අපි ඒකයි තමුන්නාන්සේලාගෙන් අහන්නේ.

එතැනින් නතර වෙන්නේ නැහැ. ඊළඟට තමුන්නාන්සේලා මංගල්‍යයක් නටන්න හදනවා. ඒක තමයි, 2013 නොවැම්බර් මාසයේ 15 සිට 17 දක්වා පැවැත්වෙන පොදුරාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව. මේක මහා පරණ, බංකොලොත් වුණ, රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ලෝකයේ කිසිදු පිළිගැනීමක් නැති, ලෝකයේ සිද්ධ වන කිසිදු කාර්යයකට මැදිහත් වෙන්නේ නැති, බංකොලොත් වුණ සුදු අධිරාජ්‍යයාගේ මන දොළ පිනවීම සඳහා අටවලා තිබෙන බංකොලොත් ආයතනයක්. ඒ සංගමය මොකක්ද ලෝකයට කරලා තිබෙන්නේ? ලෝක ආර්ථිකය පිළිබඳව මොකක්ද පොදු රාජ්‍ය මණ්ඩලයීය සංගමයේ තිබෙන මැදිහත් වීම? ලෝක සාමය පිළිබඳව මොකක්ද පොදු රාජ්‍ය මණ්ඩලයීය සංගමයේ තිබෙන මැදිහත් වීම? ලෝක ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මොකක්ද පොදු රාජ්‍ය මණ්ඩලයීය සංගමයේ තිබෙන මැදිහත් වීම? ඒක නිකම් සුදු රැජිනගේ මන දොළ සපුරා ගැනීම සඳහා අටවා ගත් ආයතනයක්; සමුළුවක්. දැන් ඒ සමුළුව ලංකාවේ පවත්වන්න හදනවා. ඒ සඳහා කොච්චර වියදම් කරනවාද? ජී.එල්. පීරිස් අමාත්‍යවරයා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා මහ ජනයාගේ මුදල්වලින් කෝටි ප්‍රකෝටි ගණන් වෙන් කර ගත්තා. අද තමුන්නාන්සේලා පරිප්පු කිලෝ එකට බද්දක් ගහනවා, සැමන් ටින් එකට බද්දක් ගහනවා. බදු වශයෙන් එකතු කර ගන්නා මේ මුදල්වලින් මොකක්ද කරන්නේ? රාජ්‍ය නායකයන්ගේ සමුළු තියන්න, සභාපති පුටුවල වාඩි වෙන්න කෝටි ප්‍රකෝටි ගණන් වෙන් කරනවා. එයින් එක කොටසක් විතරක් මම කියන්නම්. මෙන්න, කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව. මොකක්ද එතුමා කියන්නේ? "මාධ්‍ය හා ප්‍රචාරණය සඳහා වන අනු කමිටුවේ කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම." ඒ කියන්නේ මාධ්‍ය වැඩේ සඳහා. පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවේ මාධ්‍ය වැඩේ සඳහා කීයක් වෙන් කරනවාද? වෙබ් අඩවි සඳහා රුපියල් මිලියන 15යි, මාධ්‍ය මධ්‍යස්ථාන සඳහා රුපියල් මිලියන 800යි, ප්‍රචාරක කටයුතු සඳහා රුපියල් මිලියන 160යි. මුළු වියදම රුපියල් මිලියන 975යි. නමුත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයටම වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 20යි.

ගොවි ජනතාවගේ විශ්‍රාම වැටුප ගෙවන්න වැය වන්නේ රුපියල් මිලියන 120යි. ගොවි ජනතාවගේ විශ්‍රාම වැටුප කපනවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට වෙන් කරනවා රුපියල් මිලියන 20ක්. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ ප්‍රචාරක වියදම්වලට විතරක් මෙච්චර ලොකු මුදලක් වැය කරනවා. මතක තබා ගන්න, ඔය ගෙනෙන BMW car, Mercedes-Benz carවලට නොවෙයි, ප්‍රචාරක වියදම්වලට. කාගේ සල්ලිද මේ? [බාධා කිරීමක්] කරන්න ඕනෑද? කරන්න ඕනෑ තමයි. එතකොටනේ, ජනමාධ්‍ය ඇමතිවරයාට එතැන කරලා ගහ ගන්න පුළුවන් වන්නේ; ඉදි කිරීම් ඇමතිවරයාට එතැන කරලා ගහ ගන්න පුළුවන් වන්නේ. ඒ නිසා ඒවා කරන්න ඕනෑ තමයි. කොච්චර මුදලක්ද මේ? රුපියල් මිලියන 975යි. අපි අහනවා, හෙට සිට වැඩි වන පරිප්පු කිලෝ එකට ගහපු බද්ද, හෙට සිට වැඩි වන සැමන් ටින් එකට ගහපු බද්ද එකතු කරලා මොකක්ද මේ කරලා තිබෙන්නේ කියලා. පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවේ මාධ්‍ය රැස්වීමට විතරක්, මාධ්‍ය ප්‍රචාරක වැඩ කටයුතුවලට විතරක් වියදම රුපියල් මිලියන 975යි. අපි අහනවා, මොකක්ද එච්චර මුදලකින් කරන්න තිබෙන්නේ කියලා. පත්තරවලට ads ටිකක් දමන්නයි, රූපවාහිනී දැන්වීමක් හදන්නයි -[බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes, what is your point of Order?

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Speaker, we are a member of the Commonwealth Parliamentary Association. Therefore, the Hon. Member cannot make a scathing attack on the Queen and the Commonwealth Parliamentary Association. Non-Aligned Summit එකටත් මේකයි කිව්වේ. - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! That is not a point of Order. - [*Interruption.*]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
One of the core values of the Commonwealth is freedom of expression.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කියන්නේ මොකක්ද? [බාධා කිරීම්] මේක මේ රැජිනට- [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකර, ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිරුවාපත්තුවේ ඉපදුණු, කුරහන් තලප කන, කුරහන් සාටකය දමාගෙන ඉන්න, ගැමී සුවඳ තිබෙන, වෙල් නියරේ ඇවිදින, වක්කඩෙන් අත හෝදපු මේ නායකයාගේ සුදු රැජිනට දැන් ආවඩන්නේ. වෙන කවුද? එහෙමනේ මේ කියන්නේ. දැන් ලොකු වෙලා තිබෙන්නේ සුදු රැජිනද? අපි අහන්නේ ඒකයි. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 975යි. මේ රටේ මහජනයාගේ මුදල්. [බාධා කිරීමක්] උත්සවයට

නොවෙයි, එහි ප්‍රචාරක වැඩකටයුතුවලට. පත්තරවල දැන්වීම් ටිකටයි, රූපවාහිනී දැන්වීමටයි රුපියල් මිලියන 975ක්. තමුන්නාන්සේලා මහජනයාගේ සල්ලි මේ විධියට නාස්ති කරනවාද? ඒ එකක්.

ඊළඟ ප්‍රධාන කරුණ තමයි- [බාධා කිරීමක්] අනේ! ගිහිල්ලා අර සුදු බෙබිට වැඳලා එන්නකෝ. තුන් වෙනි රාජ කුමාරයාත් ඉපදිලා නේද? මෙතැන කෑ ගහ ගහ ඉන්නේ නැතිව ගිහිල්ලා ඒ කිරි සප්පයාටත් වැඳලා එන්නකෝ. එච්චරයි තිබෙන්නේ. අර තුන් වෙනි- [බාධා කිරීමක්]

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
සාමාන්‍යයෙන් ළමයින් වඩා ගන්න එක- [බාධා කිරීමක්] අර අලුත ඉපදුණු- [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන් වෙනි රාජ කුමාරයාගේ nappy එක ඉවත් කිරීම සඳහා සේවකයකු හොයනවාලු. මම හිතනවා, එතුමාට ඒ කාර්ය මණ්ඩලයට බැඳෙන එක හොඳයි කියලා, වළං හෝදනවාට වඩා ඒකත් ටිකක් හොඳයි කියලා. රාජ කුමාරයාගේ nappy එක නේ. [බාධා කිරීමක්] ඉතින් මම මේ කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ- [බාධා කිරීමක්] කලබල වෙන්නේ නැතිව වාඩි වෙන්නකෝ. මොකක්ද මේ? හරි කරදරයක්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, කරුණාකර, බාධා කරන්න එපා. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඊළඟට මේ සතියේම ඉදිරිපත් කරපු ඊළඟ කැබිනට් පත්‍රිකාව මොකක්ද? ගරු හර්ෂ මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව පැහැදිලි කළා. මරදානේ එල්ෆින්ස්ටන් රඟහලේ සිට ටෙක්නිකල් හන්දිය දක්වා ප්‍රදේශයේ තිබෙන මේ කියන ඉඩම මා හිතන්නේ කොළඹ නගරයේ ඉතිරි වී තිබෙන ඉතාමත් වටිනාම ඉඩම. ඉඩමේ ප්‍රමාණය අක්කර 29යි, රූඩ් දෙකයි. දැන් තමුන්නාන්සේලා මේ අක්කර 29යි, රූඩ් දෙකක ඉඩම 99 අවුරුද්දකට සමාගමකට බදු දෙන්න යනවා. මේ 2013 වර්ෂය. 99 අවුරුද්දක් කියන්නේ 2112 දී තමයි මේ බදු කාලය ඉවර වෙන්නේ. එතකොට මේකට අත්සන් කරපු අයත් නැහැ, මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කරපු අයත් නැහැ. 99 අවුරුදු බද්ද කියලා කියන්නේ, තමුන්නාන්සේලාගේ හොරකම වසා ගැනීම සඳහා අලවා තිබෙන සළුවක් මිසක ඇත්ත කථාවක් නොවෙයි. දැන් මේ අක්කර 29යි, රූඩ් දෙකේ ඉඩම කොළඹ නගරයේ තිබෙන ඉතාමත් වටිනා ඉඩම. දැන් තමුන්නාන්සේලා කරමින් තිබෙන්නේ මොකක්ද? රටේ වැදගත්ම වෙළෙඳ මධ්‍යස්ථානවල තිබෙන ඉඩම් ටික තමුන්නාන්සේලාගේ හිතවත් ගෝල බාලයන්ට විකුණන්නයි හදන්නේ. ජනාධිපතිතුමා මහනුවර ගිය වෙලාවේ කිව්වා, බෝගම්බර හිර ගෙදර එතැන තිබෙන එක හොඳ නැහැ, ඒක වෙන කොතැනට හෝ ගෙන යන්න ඕනෑය කියලා. මොකද, එතැන තමයි නුවර හොඳම ඉඩම් ටික තිබෙන්නේ. ඊළඟට දැන් සැලසුමක් තිබෙනවා, වැලිකඩ හිර ගෙදර එතැන තිබෙන එක හොඳ නැහැ, ඒකත් වැල්ලවාය පැත්තට අරගෙන යන්න ඕනෑය කියලා. මොකද, එතැනත් තිබෙනවා හොඳ ඉඩම් ටිකක්.

හමුදා කඳවුරු එතැන තිබෙන එක හොඳ නැහැ, ඒකත් වෙන පැත්තකට ගෙන යන්න ඕනෑ කියලා. එතැනත් තිබෙනවා, හොඳ ඉඩම් ටිකක්. දැන් තමුන්නාන්සේලා මොකක්ද මේ කරන්නේ? රටේ ඉතාමත් වටිනා, මිල කළ නොහැකි තරමේ, රටේ හදවත බඳු කොළඹ නගරයේ තිබෙන ප්‍රධාන ඉඩම් තමන්ගේ ගෝලබාලයින්ට දෙන්න සැලසුම් කර තිබෙනවා. දැන් අක්කර 29 රූඩ් 2ක ඉඩම තමුන්නාන්සේලා දෙන්න හදන්නේ කාටද? Chelina NEB Lanka (Pvt.) Limited කියන සමාගමට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමාගම මේකේ පළමු වන පියවරට ඩොලර් මිලියන 350කුත් දෙවන පියවර වෙනුවෙන් ඩොලර් මිලියන 1,000කුත් වැය කරනවාය කියා මේ කැබිනට් පත්‍රිකාවේ තිබෙනවා. ගරු හර්ෂ මන්ත්‍රීතුමාත් කරුණු ඉදිරිපත් කළා. මේ සමාගමේ ප්‍රධාන කොටස්කරුවන් තුන් දෙනයි ඉන්නේ. ඒ ප්‍රධාන කොටස් කරුවන් තුන් දෙනාටම තියෙන්නේ එක කොටස ගණනේ. රුපියල් 10 කොටස් තුනයි. ඒ කියන්නේ රුපියල් 30යි. රුපියල් 30ක් තිබෙන සමාගමක් තමයි ඩොලර් මිලියන 1350ක ව්‍යාපෘතියකට අත ගහන්න යන්නේ. රුපියල් 30ක් තිබෙන සමාගමක් ඩොලර් මිලියන 1350ක ව්‍යාපෘතියක් කරන්නේ කොහොමද? කරුණාකර, මට කියන්න. රුපියල් 30ක් කියා ගෙන බුලත්විට කඩයක් කරන්න පුළුවන්ද? සුරුට්ටු කඩයක් කරන්න පුළුවන්ද? තමුන්නාන්සේලාගෙන් අහන්නේ එච්චරයි. සුරුට්ටු කඩයක් කරන්න බැරි, බුලත්විට කඩයක් කරන්න බැරි රුපියල් 30ක් විතරක් තැන්පතුවක තිබෙන රුපියල් 10 කොටස් තුනක් විතරක් හිමි කොටස්කරුවෝ තුන් දෙනෙක් විතරක් සිටින මේ සමාගමට මේ ඉඩම ඩොලර් මිලියන 1350ක ආයෝජනයක් වෙනුවෙන් දෙනවා. පිළිගන්නවාද? රාජිත සේනාරත්න ඇමතිතුමා මේ කැබිනට් පත්‍රිකාවට අත ඉස්සුවාද කියා මම දන්නේ නැහැ. කවුද මේකේ ඉන්නේ? Chelina NEB Lanka (Pvt.) Limited එකේ මීට මාසයකට කලින් අයින් වූ -

ගරු සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු සුජීව සේනසිංහ)
(The Hon. Sujeewa Senasinghe)
කෙලීනාද? වෙලීනාද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
වෙලීනා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කෙළියා නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, කෙළියා නොවෙයි. කෙළියා තමයි. ඉඩමට කෙළියා. හැබැයි, සමාගම වෙලීනා. මේ සමාගමේ කළින්ම හිටියේ ලෝලිත අබේසිංහ. ලෝලිත අබේසිංහ තමයි මාසයකට කලින් මේකේ Director Board එකෙන් අයින් වන්නේ. මොකද, එතුමා ඉඳගෙන මේක දෙන්න බැහැ. දුන්නොත් වැඩය අහු වෙනවා. කවුද, ලෝලිත අබේසිංහ කියන්නේ? පුළුවන් නම් ඇමතිවරු නැඟිටලා කියන්න. ලෝලිත අබේසිංහ කියන්නේ කවුද? Chelina NEB Lanka (Pvt.) Limited එකේ ප්‍රධාන කොටස්කරුවකු වන ලෝලිත අබේසිංහ කවුද? ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත්ගේ ඥාතියා. වෙන කවුද? වෙන කාටද මේ ඉඩම දෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට පුළුවන්ද අඩුම තරමේ කොළඹ නගරයෙන් පර්චස් එකක් ගන්න? ඇමතිවරයෙකුට පුළුවන්ද පර්චස් 10ක් ගන්න? එහෙම කාටවත් ගන්න බැහැ. හැබැයි, අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මේ සමාගම ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත්ගේ ඥාතියෙකුට දෙන්න හදන්නේ. එතුමා මාසයකට කලින් Director Board එකෙන් අයින් වෙනවා. අයින් වන්නේ ඇයි? එතුමා සිටියදී දුන්නොත් වැඩය අහු වෙනවා. මේ කොළේ වහලා ගහන්නේ කාටද? මේ කොටස් රුපියල් 30ක් තිබෙන සමාගමකට ඩොලර් මිලියන 1350ක ආයෝජනයක් ගෙනෙන්න. මේක පාර්ලිමේන්තුවට විශ්වාස කරන්න පුළුවන්ද? කැබිනට් මණ්ඩලයේ තමුන්නාන්සේලා විශ්වාස කරනවාද? තමුන්නාන්සේලාට කට අරින්න බැහැ. පුළුවන් නම් කියන්න රාජිත ඇමතිතුමනි, මේ කැබිනට් පත්‍රිකාවට එකඟ නැහැ කියා. කැබිනට් මණ්ඩලයේ ඔබතුමාට කියන්න බැහැ. ඇයි? ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ඔබතුමාට වඩා බලවත්. ඇමතිවරයන්ට වඩා බලවත් ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී. මේ වන විට එතුමාට කරන්න බැරි දෙයක් නැහැ. එතුමා රජයේ සංස්ථා කීයක සිටිනවාද? මම දන්නේ නැහැ එතුමා විෂ්ණු දෙවියෝද කියා, ඇඟ හැම තැනම අත පය ගොඩක් තිබෙන. එහෙමද කියා හිතෙන තරම්. මුහුණු සයයි අත් දොළසයි මොණරා පිට වාහනේ. ඒ වාගේද කියා හිතෙනවා. එතුමා මහජන බැංකුවේ සභාපති. රක්ෂණ සංස්ථාවටත් සම්බන්ධයි. ඇපලෝ රෝහලටත් සම්බන්ධයි. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී. [බාධා කිරීමක්] නුවරඑළියේ ඉන්නවා. ලංකාවේ ප්‍රධාන - [බාධා කිරීමක්] මේ ඔක්කොම එක ප්‍රධානියෙකුට කරන්න පුළුවන්ද? මේ ප්‍රධානියා හරහා තමයි එන්නේ. ඒ බව අද කවුරුත් දන්නවා. එතුමා වෙන කවුරුත් නොවෙයි. ජනාධිපතිවරයාගේ භාණ්ඩාගාරික කියන්න. ඒ ගොල්ලන්ගේ මුදල් තිබෙන්නේ ඒ ගොල්ලන් ළඟ. ඒ ගොල්ලෝ හරහා තමයි මේවා යොදවන්නේ. මේක මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. කෝටි ප්‍රකෝටි ගණන් හොරකම් කරන - [බාධා කිරීමක්] ඒක මෙහෙ.

මම මර්වින් සිල්වා ඇමතිතුමා සමඟ එකඟයි. එතුමා සමඟ එකඟ වන්නේ එතුමා එතුමාගේ චිත්‍රය මැනවින් පෙන්වනවා. පෙන්වමින් එතුමා වැඩය දෙනවා. එතකොට සාධාරණයි නේ. [බාධා කිරීමක්] ඒක සාධාරණයි. එතුමාගේ ප්‍රකාශනයත් හරි. එතුමා කියන ප්‍රකාශත් හොඳයි. ඒක අගයන්න පුළුවන්. මොකද, එක අමාත්‍යවරයෙක්. එතුමාගේ සැබෑ පින්තූරයයි එතුමාගේ වැඩයි අතර සමානකමක් තිබෙනවා. හැබැයි, වර්තමාන ආණ්ඩුව එහෙම නොවෙයි නේ. වර්තමාන ආණ්ඩුවේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හදා ගෙන තිබෙන චිත්‍රය මොකක්ද? බුදු රැස් විහිදෙන, පෝයට සිල් ගන්න- [බාධා කිරීමක්] හදා ගෙන තිබෙන්නේ එහෙමයි. ලොකු චිත්‍රයක් හදා ගෙන මේ පෙන්නුම් කර තිබෙන්නේ මහා බෝධිසත්ව ගුණාංගවලින් පිරුණු නායකයෙක් කියා. හැබැයි, කරන්නේ මොනවාද? ඒකයි දැන ගන්න තිබෙන්නේ. එක මාධ්‍යයකටවත් විරුද්ධව ලියන්න බැහැ.

එක මාධ්‍යයක් විරුද්ධව ලිව්වොත් මොකද වෙන්නේ? දකුණු අතින් ලියන මාධ්‍යවේදියාට පුරුදු වෙන්න වෙනවා, වම් අතිනුත් ලියන්න. දකුණු අතින් ලියන මාධ්‍යවේදියා විරුද්ධව ඒ ගැන ලිව්වොත් වම් අතිනුත් ලියන්න පුහුණුව අර ගත්තොත් විතරයි ආපසු ඔහුට ලියන්න පුළුවන්කම ලැබෙන්නේ. මොකද ලිව්වොත් අත නැහැ; ලිව්වොත් බෙල්ල නැහැ; ලිව්වොත් මාධ්‍ය ආයතන නැහැ. මාධ්‍යවලින් පුම්බන ලද, මාධ්‍යවලින් රැකවරණය අරගෙන තිබෙන, මාධ්‍යවලින් ප්‍රබන්ධයක් ලෙස ගොඩ නඟලා තිබෙන, මාධ්‍යය පමණක් තමන්ගේ බලයේ ප්‍රධාන මෙවලම බවට පත් කරගෙන තිබෙන නායකයෙකු රට මෙහෙය වනවා. මේකයි ඇත්ත කථාව. එහෙම වෙස් මුහුණු දා ගත්තු, බොරු හදා ගත්තු, ආවරණය දා ගත්තු නායකයෙකු රට මෙහෙයුවොත් මොකද කරන්නේ? රටේ සියලු සම්පත්, වටිනාම දේපළ ඔහේ යන්න දෙනවා. ඊට පස්සේ ඇවිල්ලා දේශ ප්‍රේමීත්වය පිළිබඳව, රටේ මහා ආශ්චර්යයන් පිළිබඳව, මහා වාග් ප්‍රලාප ඉදිරිපත් කරන්න පටන් අරගෙන තිබෙනවා. මේක සාධාරණද? ඒකයි මා කියන්නේ, මර්වින් සිල්වා ඇමතිතුමායි, ඔහුගේ ක්‍රියාවයි අතර සමානකමක් තිබෙනවා කියලා. ඒකට ගරු කරන්න ඕනෑ. ඔහුගේ පෙනුමයි, ඔහුගේ ක්‍රියාකාරිත්වයයි සමාන වන එක හොඳයි. හැබැයි ඔහුගේ ක්‍රියාකාරිත්වය සහ ඔහු හදාගෙන තිබෙන චිත්‍රය සියයට සියයක් පරස්පරයි. ඒක මට වඩා හොඳට දන්නවා, කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු. කැබිනට් මණ්ඩලයේ කොහොමද කථා කරන්නේ, ඇමතිවරුන්ට කොහොමද අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නේ, කොහොමද හරිහමන් සංවාදයක් කරන්නේ, සංවාදයක අදහස් ඉදිරිපත් කරන්නේ කොහොමද, සාකච්ඡාවක් කරන්න පුළුවන්ද, විනාඩි 5ක් යන්න කලින් මැඩලින් ගහන්නේ නැද්ද කියන කාරණා පිළිබඳව කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු අපට වඩා හොඳට දන්නවා. මොකක්ද මේ තිබෙන්නේ? මේක නේ ඇත්ත කථාව.

දැන් අප අහන්නේ එක දෙයයි. මේවා ජනයාගේ ඉඩම්. බලයට පත් වන කොට මොකක්ද කිව්වේ? අයිතිකරුවා නොවෙයි, භාරකරුවා කිව්වා. දැන් භාරකරුවාට දීලා තිබෙනවාද, තමන්ගේ කාර්ය මණ්ඩලයේ ප්‍රධානියාගේ ඥාතීන්ට කොළඹ නගරයේ ඉඩම් විකුණන්න? ඔහු භාරකරුවාද? මේ අක්කර 29 රූඩ් 2, රුපියල් 30ක් සහිත සමාගමකට විකුණන්නේ. ඒවා කථා කරන කොට අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමා වෙන වෙන ඒවා කියනවා. ඒවා වැඩක් නැහැනේ. ඇත්ත ප්‍රශ්නය කියන්න. ඒ විතරක් නොවෙයි, කියන්නේ අනුනව අවුරුද්දකට බදු දෙනවාය කියලායි. හැබැයි ඊට පස්සේ මොකද කරන්නේ? තුන් වැනි පාර්ශ්වයකට විකිණිය හැක කියලා කියනවා. දැන් ආණ්ඩුව විකුණන්නේ නැතිව ආණ්ඩුව වෙන පාර්ශ්වයකට දීලා තුන් වැනි පාර්ශ්වයක් හරහා ඒ ඉඩම් විකුණනවා. ඒ පාර්ශ්වය මොකද කරන්නේ? ඒකේ මිල ගණන් අපට තීරණය කරන්න බැහැ. [බාධා කිරීමක්] ආණ්ඩුවේ ඉඩම් ටික තමන්ගේ හිතවතාට දෙනවා. ඊට පස්සේ තුන් වැනි පාර්ශ්වකරුවාත් අතර ගනුදෙනුව කෙරෙන්නේ ඒගොල්ලෝ. ඔහු තමයි තුන්වැනි පාර්ශ්වකරුවාට මිල කියන්නේ. ඔහුට කියන්න පුළුවන් "මා පාඩුවට වික්කා, මා රුපියලක් ලාභ කියාගෙන වික්කා, මා රුපියල් දෙකක ලාභ කියා ගත්තා" කියලා. එහෙම කියන්න පුළුවන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මේ රටේ ඉඩම් තුන් වැනි පාර්ශ්වයට විකුණන්නත්, කොමිස් ගහන්නත්, කෝටි ප්‍රකෝටි ගණන් වංචා කරන්නත්, මේ දේපළ පාවිච්චි කරමින් තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මා කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප ඊයේ දැක්කා, අර වඩු කාර්මිකයින්ගේ උද්ඝෝෂණයට ගිහිල්ලා ජීවන් කුමාරණතුංග අමාත්‍යවරයාට බෝතල් ප්‍රහාරයක් එල්ල වුණා. ෆිලික්ස් පෙරේරා ඇමතිතුමාත් ඒ වාගේ අකරතැබ්බයකට මුහුණ දීලා තිබෙනවා. මේ පෙන්නුම් කරමින් තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි, මහජනයාට එල්ල වී තිබෙන පීඩනයේ තරමයි. ඒ නිසා මේ හොරකම් වහන්න ඕනෑ. මේවා තමුන්නාන්සේලා ආරක්ෂා කරන්න ඕනෑ. මේවා එළිදරවු වුණොත් තව තවත් පාරට බහින්න බැරි තත්ත්වයක් තමයි තමුන්නාන්සේලාට උදා වෙන්නේ කියලා ප්‍රකාශ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි. ගරු තිලංග සුමතිපාල මහතා. Order, please! Will an Hon. Member propose the Hon. Udith Lokubandara to take the Chair?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 3.43]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මෙම විවාදයට සම්බන්ධ වී වචනයක් ප්‍රකාශ කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වනවා. මට කලින් විපක්ෂයේ අනුර දිසානායක මන්ත්‍රීතුමාත්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ගනුදෙනුවක් ගැන බොහොම දැඩි ප්‍රහාරයක් එල්ල කළා. ඒක අද දවසේ විවාදයට කිසිම සම්බන්ධයක් නැති දෝ කියලායි මා කල්පනා කළේ. ඒ සම්බන්ධයෙන් කථා කරන්න වෙනම විවාදයක් ඉල්ලන්න.

අද මේ විවාදය පිළිබඳව පැන නැඟෙන අතිශය වැදගත් දේ තමයි අපේ මුද්දර ගාස්තු රුපියල් 250 සිට රුපියල් 50 දක්වා අඩු කිරීම. ඒ ගැන අප සන්තෝෂ වනවා. මොකද ගිය අය වැයේදී විශාල වශයෙන් අප මේ මුද්දර ගාස්තු වැඩි කළා. නමුත් ජනතාවගෙන් ඉල්ලීමක් තිබුණා, එය වැඩියි කියලා. නැවත එය සංශෝධනය කිරීම ගැන හුහක් සන්තෝෂයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද විෂයයන් 5ක් ඉදිරිපත් කර තිබුණත් විශේෂයෙන්ම එක කරුණක් සම්බන්ධව මා වැඩි පුරම අවධානය යොමු කරන්න කැමැතියි. ඒ තමයි දේශීය ආදායම් පනත යටතේ යෝජනාව. 2013.06.18 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර 2013 ජනවාරි මස 22 වැනි දින ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව, එහෙම නැත්නම් double taxation කියන එක සම්බන්ධයෙන් අරගෙන ඇති ප්‍රතිචාරය පිළිබඳව. මොකද, යම් ආයෝජකයෙකුට හෝ ආයතනයකට -අපි වුණත් වෙන රටක ආයෝජනය කරනවා නම් හෝ වෙන රටක කෙනෙකු ලංකාවේ ආයෝජනය කරනවා නම්.- රටවල් දෙකටම ආදායම් බදු ගෙවීමට සිද්ධ වුණොත් ඒ ආයතනයට හා ඒ පුද්ගලයාගේ ආදායමට විශාල ප්‍රශ්නයක් ඇති වනවා. දැනට රටවල් 34ක විතර මෙවැනි ක්‍රියාදාමයක් සිද්ධ වනවා. ඒ නිසා මා හිතනවා ඒක අතිශය වැදගත් කාරණයක් කියලා. එකම පුද්ගලයකුගෙන් රටවල් දෙකකින් බදු අය කර ගැනීම නීති ප්‍රකාරව ගත්තොත් එකම වරදක් සඳහා කෙනෙකුට දෙවතාවක් උසාවි දෙකකින් දඩුවමක් දෙනවා වාගේ වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියනවා අපේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව වෙනස් මහකට යා යුතුමයි කියලා. මා එසේ කියන්නේ, අපේ ආයතනවලින් අය කරන බදු ප්‍රතිශතය - Corporate Tax - සියයට 35ක් බවට පත් වෙලා තිබෙනවා. නමුත් සියයට 35ට තිබුණු ප්‍රතිශතය සියයට 25 දක්වා අඩු කරලා තිබෙනවා. යමෙක් පෞද්ගලිකව බදු ගෙවනවා නම් එයත් පසු ගිය වසරේ සිට අඩු කරලා තිබෙනවා. නමුත් අපේ රටේ තත්ත්වය අනුව පෞද්ගලික ආදායම ඉහළම තලයේ, එහෙම නැත්නම් මිලියන 5කට, එහෙම නැත්නම් මිලියන 10කට වඩා වැඩි වන හැම අවස්ථාවකදීම පෞද්ගලික බදු ප්‍රතිශතය ක්‍රමක්‍රමයෙන් වැඩි විය යුතුයි. වර්තමානයේ අපේ රටේ පෞද්ගලික බදු සහ ආයතනවලින් අය කරන බදු -Corporate Tax- යන දෙකම සම වශයෙන් තමයි ගෙවන්න සිද්ධ වන්නේ. මෙහිදී පෞද්ගලිකව ආදායම් උපයන කෙනෙකු ආයතනයක ආදායම වැඩි වුණත් ආයතනය ගෙවිය යුතු බදු ප්‍රමාණය වැඩි නම් ඔහු උනන්දු වන්නේ නැහැ ආයතනයකට මුදල් යොමු කරන්න. නමුත් අපිට පුළුවන් නම් ක්‍රමක්‍රමයෙන් ක්‍රමක්‍රමයෙන් අපේ ආයතනවල බදු - Corporate Tax - ප්‍රතිශතය අඩු කරලා එය සියයට 20ට ගෙනි යන්න එය ඉතා හොඳයි.

ඒ වාගේම මා හිතනවා පෞද්ගලික ආදායම් බදු සියයට 35, 40 දක්වා වැඩි වුණත් කමක් නැහැ කියලා ඉහළ ආදායම් ලබා ගන්නා අයට. එසේ නොවුණාම වන්නේ, තමන්ගේ ආදායම් මට්ටම් පෞද්ගලිකව වැඩි කර ගෙන, වැඩි කර ගෙන යනවා. හැබැයි රට තුළ බදු අය කර ගැනීම් තුළින් බදු බෙදා හැරීමක් සිදු වන්නේ නැහැ. අපට බදුවලින් ලැබෙන ආදායම් ජනතාව අතර බෙදා හැරීමක් සිදු කරන්න බැරි වනවා. ඒක නිසා සම බදු ප්‍රතිශතයක් ඇති කිරීමෙන් අපි ජනතාව උනන්දු කරන්නේ නැහැ ආයෝජනයට. උදාහරණයක් ගත්තොත් පෞද්ගලික ආදායම රුපියල් ලක්ෂ 5ක් තිබෙන කෙනෙකු දැන් රුපියල් ලක්ෂ 2ක බද්දක් ගෙවනවා නම්, ඔහුට ලක්ෂ 3ක් වාගේ ප්‍රමාණයක් බදු ගෙවන්න සිද්ධ වුණොත් ඔහු හිතනවා ඒ මුදල ආයතනයකට හෝ කොටස් වෙළෙඳ පොළට හෝ එහෙම නැත්නම් ව්‍යාපාරයකට ආයෝජනය කරන්න. එසේ ආයෝජනය කරන්න උනන්දු කිරීමෙන් රට තුළ නිෂ්පාදන ධාරිතාව පුළුල් වනවා. දළ දේශීය නිෂ්පාදනය වැඩි වනවා. එහිදී සේවා අවස්ථා වැඩි වනවා. සේවාවන්වලින් භාණ්ඩ නිෂ්පාදනය වැඩි වනවා. ඒ නිසා දළ දේශීය ආදායම වැඩි කර ගන්න නම්, නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගන්න නම් බදු ප්‍රතිපත්තියේ වෙනසක් විය යුතුයි කියා මා දැඩි ලෙස සිතනවා. මොකද, හේතුව? අද පැහැදිලිව පෙනෙනවා ධනය

[ගරු තිලංග සුමතිපාල මහතා]

වැඩිපුර උපයන්න පුළුවන් අයගේ බදු ප්‍රතිශතය අඩු කිරීමෙන් කිසි සේත්ම අපි බලාපොරොත්තු වන ආදායම් සමසේ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට යන්න අමාරු බව.

විශේෂයෙන්ම යුද්ධයෙන් පස්සේ අපට ආයෝජන අවස්ථා රාශියක් ඇති වෙලා තිබෙනවා. අපේ ව්‍යාපාරික අවස්ථා වැඩි වෙලා තිබෙනවා. හැබැයි රට තුළ ධනය වැඩිපුර උපයන අයට ඒ මුදල් ආයෝජනය කිරීමට, ආයතන හරහා ආයෝජනය කිරීමෙන් නිෂ්පාදන ධාරිතාව, සේවා ධාරිතාව වැඩි වීමට උනන්දු නොකර ඒ අයගේ ආදායම් ඒ අයම පෞද්ගලිකව භුක්ති විඳලා, ඒවා තමන් අතරම බෙදා හැරීමේ ක්‍රමවේදයකට යෑමෙන් අපට රට තුළ මුදල් බෙදා හැරීමක් සිදු වනවා කියා සිතන්න අමාරුයි. ඒ නිසා මා මේ කාරණය ගැන අපේ මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

පසු ගිය අය වැයේදී ඒ බදු වර්ග දෙක සම ප්‍රමාණයකින් තමයි අඩු කළේ. අපි ලෝකයේ අනෙක් රටවල්වල බදු ප්‍රතිශතයන් ගනිමු. අද ලෝකයේ දියුණු වුණු රටක් වන කැනඩාව ගත්තොත් එහි Corporate Tax එක සියයට 15යි. පෞද්ගලික tax එක සියයට 29යි. ඕස්ට්‍රේලියාව ගත්තොත් පෞද්ගලික tax එක සියයට 45ක් වෙනවා. දියුණු වුණු රටවල් බැලුවොත් ජර්මනියේ Corporate Tax එක සියයට 29යි, පොද්ගලික tax එක සියයට 45යි. හැම තිස්සේම රටක පෞද්ගලික බදු ප්‍රමාණය ආයතන බදුවලට වඩා සියයට 15ක් 20ක් වැඩියි. මේ ගැන උනන්දු කළ යුතුමයි. විපක්ෂය මතු කරන නොයෙකුත් දේවල් හොඳ විවේචන ලෙස ගන්නවා මිසක්, ඒවා පැහැර හරින්න නරකයි. මොකද, යම් යම් නිලධාරීන් මැදිහත් වෙලා සොරකම් කරනවා නම්, මොනවා හරි ක්‍රමයකට නොමඟ යවනවා නම්, ඒ ගැන සොයලා බලලා ඒ තොරතුරු සත්‍ය නම් විමසිල්ලෙන් සිටීම වරදක් නැහැ. හැබැයි අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කළේ "බදු", "දඩ" සහ "ණය" යන වචන ගැනයි. බදු ගහන්නේ නැති, ණය ගන්නේ නැති, දඩ ගහන්නේ නැති කිසිම රටක් ලෝකයේ තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. බදු ගන්නේ නැති, ණය ගන්නේ නැති, දඩ ගසන්නේ නැති කිසිම රටක් ලෝකයේ නැහැ. උදාහරණයක් හැටියට එවැනි රටක් තිබෙනවා නම් අපට සොයා බලන්න පුළුවන් ඒ රටේ ආර්ථික තත්ත්වය පවත්වා ගෙන යන්නේ කොහොමද කියලා. එහෙම කරන්න බැහැ. එතුමා ණය මුදල් ලබා ගැනීම ගැන කාරණා කිහිපයක් කිව්වා. එකක් තමයි අපට ණය ගන්න බැහැයි කියන එක. ණය දෙන්නේ නැහැයි කිව්වා. අපට ණය ගෙවන්න බැහැයි කිව්වා. අපේ රටට ණයක් දෙන්න ඉස්සර වෙලා යම් යම් දේවල්; indicators සොයා බලනවා. ඒ කියන්නේ ඊළඟ අවුරුදු පහ, දහය, විස්ස තුළ ප්‍රතිපත්ති ගැන සොයා බලනවා. ස්ථාවරභාවය පිළිබඳව සොයා බලනවා. ඒ සම්බන්ධයෙන් අපට තිබෙන එක වාසියක් තමයි දේශපාලන ස්ථාවරභාවය; Political stability එක. ඊළඟ එක ආර්ථික ප්‍රතිපත්තියේ ස්ථාවරභාවය. ඒ වාගේම අපි යන ගමන් මාර්ගයේ ප්‍රාග්ධනය වැය කරන්නේ මොන වාගේ ව්‍යාපෘති සඳහාද කියන එකත් බලනවා. මම හිතන විධියට ණය ගැනීමේ දී අපට ඒ සඳහා අවශ්‍ය පසුබිම හැදිලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සියලුම දත්තයන් - නිර්ණායකයන් - අනුගමනය කර තිබෙනවා. ඒ නිසා ණය ගැනීම පහසු නැහැ, එහෙම ණයක් දෙන්නේ නැහැයි කිව්වාට ණය ගැනීමට අවශ්‍ය පසුබිම, ක්‍රමවේදය, ඒ ගමන් මාර්ගය බොහොම පැහැදිලි ස්ථාවරයක තිබෙනවා.

දඩ මුදල් ගැන කිව්වොත් ආවාට ගියාට දඩ ගසන්න බැහැ. දඩ අය කිරීමේදී යම්කිසි නීති-රීති පද්ධතියක් නැත්නම් ක්‍රමවේදයක් අනුගමනය කරන්න ඕනෑ. ඒ තුළින් ආදායමක් ලබා ගන්නා ගමන් ජනතාව තුළ යම්කිසි විනයක් ඇති කරන්න පුළුවන්. එය රට යන ගමන පිළිබඳ යම්කිසි ප්‍රතිපත්ති මාලාවක්, ගමන් මාර්ගයක් සඳහා යොමු කිරීමක්. ඒ නිසා එහි වරදක් නැහැ. මම හිතනවා මිනිස්සු කරන වැරදි සාපේක්ෂව බැලුවාම අපේ පොලීසිවලට මීට වඩා විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් කියලා. සමහර වෙලාවට ඒ ආදායම් ලබා ගැනීමේ අවස්ථා පැහැර හරිනවා. ඒ සඳහා ක්‍රමවේද, නවීන උපක්‍රම තිබෙනවා. මොකද, ලංකාවේ පාරවල වාහන තදබදය ගැන කියනවා. වාහනවල වැරදි කියනවා. No-Parking ගැන කියනවා. තවත් නොයෙක් දේවල් ගැන කියනවා. ලෝකයේ සාමාන්‍යයෙන් දියුණු රටවල් සහ විශාල වශයෙන් දියුණු වුණ රටවල් එක්ක බැලුවොත් යම්කිසි මුදලක් වැය කරලා තාක්ෂණය දියුණු කළොත්, vehicle monitoring system එකක් ඇති කිරීම තුළින් වාහන තදබදය නැති කරලා, වැරදි කරන අයට දඩ ගහලා ආදායම් වැඩි කර ගන්න අපට පුළුවන්. වාහනවල වැරදි සම්බන්ධයෙන් සොයන්නට උපක්‍රමශීලීව ඒ ක්‍රම යොමු කළා නම් ආදායම් ලබා ගන්න පුළුවන්. එතුමා මෙතැනදී මොනවා කිව්වා වුණත් දඩ ගැන අපේ අදහස ඒකයි.

එතුමා බදු ගැනත් කථා කළා. බදු ප්‍රතිපත්තිය ගැනත් මීට වඩා වෙනස් ආකාරයෙන් සිතන්න ඕනෑ. විපක්ෂයේ තමුන්නාන්සේලා පැහැදිලිව දැන ගන්න ඕනෑ අපි කර ගෙන යන වැඩසටහන මොකක්ද කියලා. අපේ රට කෘෂිකර්මය සඳහා විශාල වශයෙන් ආයෝජනය කළ රටක්. කෘෂිකර්මය සඳහා කළ ආයෝජනයේ ප්‍රතිඵලයක් හැටියට මේ වාගේ යුගයක ආර්ථිකයේ ලොකුම ගැටලුව අපට දරා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඕනෑම රටක් රඳා පවතින්නේ දේශීය වශයෙන් කෘෂි ආර්ථිකය මතයි. අපි ඒකට පැහැදිලි වැඩසටහනක් ඇති කර තිබෙනවා. පසුගිය අවුරුදු හයක් ගත්තොත්, හතරක් ගත්තොත්, දෙකක් ගත්තොත් අපට ඒ ගැන වරදක් කියන්න බැහැ.

මෙහිදී Non-Aligned Movement එක ගැන යම්කිසි අදහසක් ඉදිරිපත් කෙරුණා. මට මතකයි, අපි පොඩි කාලයේ Non-Aligned Movement එකේ Conference එකක් ලංකාවේ තිබුණා. ඒ 1976 අගෝස්තු මාසයේ 16වැනි දා සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ කාලයේ. ඒ සමුළුවෙන් පස්සේ මේ රටට ලැබුණු වාසිය ගැන අපට අවබෝධයක් තිබෙනවා. මේකෙදි අනවශ්‍ය වියදම් තිබෙනවා නම්, නාස්තිකාර වැඩ කෙරෙනවා නම්, ඒවා ගැන දැනුවත් කිරීම ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ Commonwealth එක -පොදු රාජ්‍ය මණ්ඩලයීය ජන නායකයින්ගේ හමුව- අපි මේ රටේ අනාගතය සඳහා වාසියකට හරවා ගන්න ඕනෑ. මොකද මේ හා සමගාමීව ජනතාව, ඒ වාගේම ආයෝජකයින්, ව්‍යාපාරික ප්‍රජාව විශාල වශයෙන් සම්බන්ධ වනවා. ඒක නැහැ කියන්න බැහැ. Commonwealth Business Forum එකක් තිබෙනවා. ඒ වාගේම Commonwealth Youth Forum එකක් හැදිලා තිබෙනවා. Commonwealth Heads of Government කියලා තිබෙනවා. ඒ වාගේම මේ න්‍යාය පත්‍රයේදී සාකච්ඡා කරන ගොඩක් කරුණු ඊළඟට ඉදිරිපත් වනවා, තමුන්නාන්සේලා කියන එක්සත් ජාතීන්ගේ සංවිධානයට. අද UN එකේ ප්‍රබලයින් හැටියට ගත්තොත්, UN Security Council එකේ ප්‍රබලයින් හැටියට බහුතරයක් රටවල් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් එහෙම නැත්නම් මේ Commonwealth countries. යුද්ධයෙන් පස්සේ ගෙවී ගිහිල්ලා තිබෙන්නේ අවුරුදු හතරයි. පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල සාමාජිකයන්ගෙන් සමන්විත මේ වැඩසටහන 2009න් පස්සේ අපට ලැබෙන්නේ පළමුවැනි වතාවටයි. ලෝකය ඉදිරියේ අපේ රට ගැන; රට අභ්‍යන්තරයේ තිබෙන දක්ෂතා සහ අපට තිබෙන නගර අලංකරණය පිළිබිඹු කරන්න මෙය හොඳ අවස්ථාවක්. එහෙම නැත්නම් ඒ දේවල් showcase කරන්න රටට තිබෙන අවස්ථාවක් මෙය. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත යුතුයි. ඔබතුමන්ලාට මේ ගැන විවේචන තිබෙනවා; නාස්තිය ගැන විවේචන තිබෙනවා. නාස්තිය ගැන විවේචන කරන එක ප්‍රශ්නයක්

නැහැ. ඒ ගැන රජය දැනුවත් කරන්න තමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවුලක් නැහැ. නමුත් පොදු රාජ්‍ය මණ්ඩලයීය සමුළුව අපේ රටේ පැවැත්වීමෙන් අපේ රටට හිමි වන වාසිය සුළු කොට හිතන්න එපා. මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගත යුතුයි කියලා අප විශ්වාස කරනවා. මේ අවස්ථාව බොහොම කාලයකින් උදා වන්නේ. හැබැයි මේ අවස්ථාවේදී රට තුළට එන ජාත්‍යන්තර ප්‍රජාව තුළ තිබෙන අදහස හුහක් වෙනස්. මේ රටට නොපැමිණි; එන්න හේතුවක් නැති විශාල පිරිසක් මේ නොවැම්බර් මාසයේ ලංකාවට එනවා. ලංකාව ගැන ඒ අයගේ ඔළුවේ; ඒ අයගේ මනසේ තිබෙන චිත්‍රය අපට ඉස්සර "බැග්ඩෑඩ්" වාගේයි, අපට ඉස්සර "ඉරාකය" වාගේයි. ඒ නිසා මෙවර මේ සමුළුව අප රටේ පැවැත්වීම ඒ පින්තූරය වෙනස් කිරීමට තිබෙන මහඟු අවස්ථාවක් කියමින් මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා පොදු රාජ්‍ය මණ්ඩලයීය සමුළුව ගැන සඳහන් කළා. මම ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, ඒ සමුළුව ලංකාවේ පවත්වන්න එක්සත් ජාතික පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයේ නායකයාත් මුල ඉඳලාම සහයෝගය දීලා තිබෙනවා කියලා. ඒ නිසා ඒ ගැන කිසිම වැරැදි අදහසක් ප්‍රකාශ නොකළ යුතුයි කියා මා හිතනවා. මම එය නිවැරැදි කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මාතෘකාවට එන්න ප්‍රථමයෙන් ඊයේ වුණු සිදුවීම ගැන අදත් කථා කරපු නිසා මමත් ඒ ගැන වචනයක් එකතු කරන්න බලාපොරොත්තු වනවා. දේශපාලනඥයන් හුහක් වෙලාවට ජනතාව යොමු කරන්නේ ඔවුන් දෙසටමයි. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට ඇත්තටම අපට තිබෙන්නේ රටේ පොදු ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරලා ඒවාට විසඳුම් සොයන්නයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඊයේ මේ පැත්තේ ඉඳලා ඔය පැත්තට ගියා. පක්ෂය මාරු කළා. මම දන්නවා, මේ රජයට ඇමතිවරු සොයා ගන්න අපහසුතාවක් තිබෙනවා කියලා. ඒ නිසා කලින් කලට විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු බිලී බා ගෙන, ඒ අයට ඇමති ධුර දීලා මේ රටේ ඇමති මණ්ඩලය ඒ විධියට සමන්විත කර ගෙන ඔවුන් ක්‍රියා කර ගෙන යනවා. නමුත් මම කවදාවත් හිතුවේ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාක්ෂිකයන් අතරින් මහ ඇමති කෙනෙක්වත් තෝරා ගන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැරිව යයි කියලා.

ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න මානව සම්පත ගැන ඉබේටම ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රජය සන්ධාන රජයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මහඇමති අපේක්ෂකයෙක් හොයා ගන්න බැරි වුණා නම් සන්ධානයේ අනෙක් පක්ෂවලින්වත් -සන්ධානයේ තවත් පක්ෂ කිහිපයක් තිබෙනවා- කෙනෙක් තෝරා ගන්න තිබුණා. එහෙමත් තෝරා ගන්න බැරි නම් මාධ්‍ය දැනුවත් කරලා, පත්තරවල දාලා කෙනෙකු තෝරා ගන්න තිබුණා. මේ රටේ හුහක් විද්වතුන් ඉන්නවා. වෘත්තියවේදීන් ඉන්නවා. ඒ අවස්ථාව දුන්නා නම් එයින් කෙනෙක් හරි ඔය අභියෝගය භාරගෙන ක්‍රියා කරන්න ලැහැස්ති වෙලා එනවා ඇති.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)
ඔබතුමා මට අවසර දෙනවාද, ඒකට පිළිතුරක් දෙන්න?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
නැහැ. මට බොහොම කෙටි කාලයයි තිබෙන්නේ. ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කියන්න පුළුවන්. මම අහඹරුවාදා විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමා සමඟ ගුවන් විදුලි වැඩසටහනක ඉන්න කොට අපට කිහිප දෙනෙක් දුරකථනයෙන් කථා කළා. එක පුද්ගලයෙකු කථා කරලා කිව්වා, මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවුරුදු 42ක සාමාජිකයෙක්; නිලතල දරලා, දර දිය ඇදලා ක්‍රියා කරපු කෙනෙක් කියලා. එහෙම සඳහන් කරලා කිව්වා, මේ වාගේ එක්සත් ජාතික පක්ෂයෙන් එන එන අයට තැන දෙන නිසා මට විශාල කනගාටුවක් ඇති වෙනවා කියලා. ඊළඟට මගෙන් කෙළින්ම ප්‍රශ්නයක් ඇහුවා, දයාසිරි ජයසේකර කියන ඔය මන්ත්‍රීතුමා ඒ පැත්තට යන එක ඇත්තද කියලා. පක්ෂයකට දීර්ඝ කාලීනව, විශ්වාසයෙන් වැඩ කරන පුද්ගලයන්ට, පක්ෂයට ළැදියාවක් තිබෙන, ඒ ගුණාංග තිබෙන අයට අද දේශපාලනයේ තැනක් නැහැය කියලා කනගාටුවෙන් හරි කියන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒ නිසා දේශපාලන පක්ෂ මාරු කිරීම රටේ ජනතාව පිළිකුල් කරන දෙයක් කියලා මම විශ්වාස කරනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මංගල සමරවීර මන්ත්‍රීතුමාත් පක්ෂ මාරු කෙරුවා නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
රටට සේවය කරනවා; අපේ පක්ෂ තුළ අසාධාරණ සිදු වෙනවා; මේ වාගේ දේවල් හුහක් අය කියා ගෙන, කියා ගෙන යනවා. මමත් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් අවුරුදු තුනක් වෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම පැන්නා නොවෙයි, මාව පැන්නුවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මංගල සමරවීර මන්ත්‍රීතුමා හිටපු ජ්‍යෙෂ්ඨ ඇමති කෙනෙක්. දැන් ඔහු සඳහන් කළා, ඔහු පැන්නේ නැහැ, පැන්නුවා කියලා. [බාධා කිරීම්] මේ එක එක දේවල් කිව්වාට මමත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු තුනක් වෙනවා. මේක සම්පූර්ණයෙන් මට වැටහෙන්නේ නැහැය කියලා ඔබ හිතන්නට පුළුවන්. නමුත් ටිකක් මෝරලා වෙන්න ඇති; හාගෙට දැන් තැම්බිලා වෙන්න ඇති.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ජනතාව රවටටන්න කාටවත් බැහැ. පක්ෂ මාරු කිරීම, පිල් මාරු කිරීම පක්ෂයෙන් පනින කෙනාගේ වාසියට මිසක නැත්නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාසියට මිසක ඒ පක්ෂයේ වාසියට නොවෙයි කියලා සඳහන් කරන්නට ඕනෑ. ඒ නිසා රට පිළිකුල් කරන දේශපාලන සංස්කෘතියක් තමයි මේ රටේ අද ඇති වෙලා තිබෙන්නේ. දැන් මම අද විවාදයට නියමිත මාතෘකාවට එන්න අවශ්‍යයි. එක එක බදුවල ප්‍රතිශතය වෙන් කිරීම ගැන මේ සභාවේ සාකච්ඡාවක් ඇති වුණා. මම සරත් අමුණුගම නියෝජ්‍ය මුදල් ඇමතිතුමා කිව්ව සමහර දේවල් එක්ක එකඟ වෙන්නේ නැහැ. මොකද බොහොම ළඟින් බැලුවොත් මේ බදුවල යම් කිසි වැඩිවීම් තිබෙන නිසා.

ලූනු, අර්තාපල්, පරිප්පු, සීනි, සහල් කියන මිනිසුන් ප්‍රධාන වශයෙන් පාරිභෝජනය කරන දේවල් ගත්තාම ඒවායේ මිල සතොස හරහා පහළ මට්ටමක තියන්න වෑයමක් තිබෙනවා. මම උදාහරණ කිහිපයක් අරගෙන කථා කරන්න ඕනෑ. උදාහරණයක් හැටියට බැලුවොත් හාල්වල මිල 2006, 2007 අතරේ සියයට 65ත්, 70ත් අතර වැඩිවීමක් තිබෙනවා.

අවුරුද්දකට අදාළව බැලුවොත් සියයට 15ක විතර වැඩි වීමක් තිබෙනවා. කුකුළු මස්වල මිල බැලුවොත්, සියයට 86ක වැඩි වීමක් තිබෙනවා. ඒ කියන්නේ, කුකුළු මස්වල මිලේ සියයට 20ක විතර වැඩි වීමක් වාර්ෂිකව තිබෙනවා. බල මාළු අරගෙන බැලුවොත්, සියයට 30ක විතර වෙනස් වීමක් තිබෙනවා. කරවල අරගෙන බැලුවොත්, කරවල මිල වැඩි වීම සියයට 188යි. අවුරුද්දක කාලයක් තුළ බැලුවොත් සියයට 40ක විතර මිල වැඩි වීමක් තිබෙනවා. ලූනුවල මිල වැඩි වීම සියයට 167යි. අවුරුද්දකට අදාළව බැලුවාම සියයට 40යි. එළවලුවල පමණයි සියයට 10-20 අතරේ වන අඩු ප්‍රතිශතයකින් මිල වැඩි වෙලා තිබෙන්නේ. ඒ හැරෙන්න අනෙක් සෑම ආහාර ද්‍රව්‍යයකම මිල වැඩි ප්‍රතිශතයකින් වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උද්ධමනය අඩුයි කියලා කලින් කලට මහ බැංකුවේ වාර්තාවෙන් අපට කියනවා. මහ බැංකුවේ වාර්තාව පිළියෙල කරන කොට උද්ධමනයට අදාළව ආහාර පිළිබඳ මිල පිළිබඳ දත්ත ගන්නේ සතොස ආයතනයෙන්. සතොස ආයතනය මොකක්ද කරන්නේ? සමහර වෙලාවට සතොස ගිහින් වෙළඳ පොළෙන් වැඩි මිලට භාණ්ඩ අරගෙන අඩු මිලට විකුණනවා. අප අමතක නොකළ යුතු දෙයක් තිබෙනවා. ආහාර ද්‍රව්‍ය විකිණීමට සතොස වෙළඳ සැල් 268ක් විතර තිබෙනවා. නමුත් මේ රටේ පාරිභෝගිකයා -මේ රටේ ජනතාව- මේ බඩු භාණ්ඩ ගන්නේ සාමාන්‍යයෙන් පෙට්ටි කඩයකින්, පවුලක් නිවාසයක කරන කඩයකින්. එතැන තිබෙන මිලයි, සතොස මිලයි අතර වෙනසක් තිබෙනවා. නමුත් සතොසට තිබෙන්නේ වෙළඳ පොළ ප්‍රමාණයෙන්ම සියයට 10යි. සියයට 90කට වඩා මේ බඩු භාණ්ඩ ගන්නේ පොඩි පොඩි කඩ සාප්පුවලින්. ඒ අය එළවලු, මස් මාළු, හාල් ආදී සියල්ල ගන්නේ ඔය පොඩි පොඩි කඩවලින්. මොනවාද මේ දත්තවලින් කරන්නේ? මේ අඩු මිල දත්ත පෙන්නලා උද්ධමනය අඩුයි කියලා පෙන්නනවා. ඇත්තටම උද්ධමනය ඊට වඩා හුඟක් වැඩියි. උද්ධමනය වැඩි වීමෙන් පහර වදින්නේ සාමාන්‍ය ජනතාවටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා රජය බදු ගන්න ඕනෑ කියලා. රජයට බදු අවශ්‍යයි. නමුත් කොහොමද මේ බදු ගන්නේ? එක්කෝ සෘජුව බදු ගන්න පුළුවන්; එහෙම නැත්නම් වක්‍රව ගන්න පුළුවන්. නමුත් මේ රටේ බදු වැඩි වැඩියෙන් ගන්නේ වක්‍රවයි. භාණ්ඩ හරහා තමයි වැඩියෙන්ම බදු ගන්නේ. භාණ්ඩ හරහා බදු ගත්තාම එය සෑම කෙනකුටම එක හා සමානව ක්‍රියාත්මක වෙනවා. නමුත් ආදායම අඩු පුද්ගලයාට එහි අවාසිය තිබෙනවා; ආදායම වැඩි පුද්ගලයාට එහි වාසිය තිබෙනවා. ආදායම අනුව සෘජුව බද්දක් ගත්තොත්, වැඩියෙන් හම්බ කරන පුද්ගලයා වැඩියෙන් බදු ගෙවන්න ඕනෑ. නමුත් මේ රටේ සෘජු බදු සියයට 20ට වඩා අඩුයි; වක්‍ර බදු සියයට 80ට වඩා වැඩියි. ඉතින්, බදු ඉහළට යන කොට, උද්ධමනය ඉහළට යන කොට විශේෂයෙන් අඩු ආදායම්ලාභීන්ට තමයි එය විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. පරිප්පු ගත්තොත්, පරිප්පු කිලෝවකට රුපියල් දෙකක්ව තිබුණු බද්ද රුපියල් 22ක් කළා කියලා අද දවල් සඳහන් කළා. උම්බලකඩ ගත්තාම, කිලෝ එකකට රුපියල් 275ක බද්දක් ගහලා තිබෙනවා. අද දවල් කිව්වා වාගේ පරිප්පු කන්නත් බැහැ. අපට උම්බලකඩ දාලා සම්බෝලයත් කන්න බැරි තත්ත්වයක් තමයි දැන් උදා වෙලා තිබෙන්නේ. ටින් මාළු අර ගෙන බලන්න. ටින් මාළු හැම පවුලක්ම වාගේ හැම සතියකම ගන්නා දෙයක් වෙලා තිබෙනවා. ඒ සෑමන් ටින් එකේ බද්ද ඇත්තටම වැඩි කළා. මේ තිබෙන්නේ 2012 මැයි 23 දිනැති අංක 1757/23 දරන ගැසට් පත්‍රයයි. එය 2012 නොවැම්බර් 08 දිනැති අංක 1783/17 දරන ගැසට් පත්‍රයත් එක්ක සසඳලා බැලුවොත්, ඒ මාස හය තුළදී ටින් මාළුවලට අදාළ බද්ද රුපියල් 85 ඉඳලා රුපියල් 100ට වැඩි කරලා තිබෙන බව පෙනෙනවා. ඒ බදු ප්‍රමාණය සියයට 17කින් විතර වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම සෑමන්, හෙරින් ආදි සෑම මාළු වර්ගයකම බද්ද වැඩි කරලා තිබෙනවා. තොග මිල -wholesale price එක- ගත්තොත් ග්‍රෑම් 425ක සෑමන් ටින් එක රුපියල් 160ත් 180ත් අතර වෙනවා. නමුත් අපි කඩේට ගිහින් ඒක ගන්නකොට සමහර විට රුපියල් 230ක් පමණ ගෙවන්නට වනවා.

ඒ විතරක් නොවෙයි. මේ ඊයේ පෙරේදා නැවතත් -

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔබතුමා පැහැදිලි කර දෙන්න, අපේ රටේ යම්කිසි භාණ්ඩයක් නිෂ්පාදනය කරනවා නම්, පිට රටත් ඒ භාණ්ඩය නිෂ්පාදනය කරනවා නම්, අපේ ගොවියාට, ධීවරයාට යම්කිසි වාසියක් සලසන්න ඒ භාණ්ඩයට සෙස් බද්දක් පැනවීමේ වැරැද්ද මොකක්ද කියලා. හැම වෙලාවේම තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ඒක තමයි. පිටින් ගෙනැවිත් කන එක. මේවා ඔක්කොම විකුණා ගෙන කන එක. අපි ඒකට එකඟ වන්නේ නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ප්‍රශ්නය ඇසුවාට බොහොම ස්තුතියි. ඒ ප්‍රශ්නයට මා දැන් පිළිතුරු දෙන්නම්. ඔව්, බදු අය කරන්න ඕනෑ. ගොවියා ආරක්ෂා කරන්න ඕනෑ. පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ දෙකම කරන්න අවශ්‍යයි. [බාධා කිරීමක්] අපි මෙතැන කථා කරන්නේ ගොවියා ආරක්ෂා කරන්නේ කොහොමද, පාරිභෝගිකයා ආරක්ෂා කරන්නේ කොහොමද කියලායි. ඔබතුමා ගොවියාගේ ආරක්ෂාව ගැන කථා කරන්න ඕනෑ නැහැ. දැන් මට පොහොර සහනාධාරය ගැනත් කථා කරන්නට වෙනවා. නමුත් ඒකට වෙලාව නැහැ. ඒ සම්බන්ධ තොරතුරු මාධ්‍යවලින් දකින්න ඇති. ඒ නිසා රජය ගොවියා ආරක්ෂා කරන්නේ කොහොමද කියලා මා දැන් කථා කරන්න යන්නේ නැහැ. ගොවියාගේ විශ්‍රාම වැටුපත් ඒ විධියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීමිත කාලයක් තිබෙන නිසා අපි පාරිභෝගිකයා ගැන මොහොතක් කථා කරමු. අද පාරිභෝගිකයාට වැඩි මිලක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඊයේ, පෙරේදා ඔබතුමා කිව්වා, මිල අඩු වෙලා කියලා. නමුත් ලූනුවලට පනවන බද්ද නැවතත් වැඩි කළා. ඒ බද්ද රුපියල් 15, 20, 30 කරලා තිබෙනවා. මේක අමතක කරන්න එපා. ඒක ඒ තිබුණු ප්‍රමාණයටම පවත්වා ගෙන යන්න තිබුණා. මෙයට

මොහොතක් ඇහුම් කන් දෙන්න ඇමතිතුමනි. මාසයක කාලයක් තුළදී, ලූනු ටොන් එකක මිල ඩොලර් 200, ඩොලර් 220 සිට ඩොලර් 500 දක්වා ඉහළ ගියා. ඩොලර් 500 දක්වා ඉහළ ගියාම ලැබෙන බදු ප්‍රමාණය ඉබේටම වැඩි වනවා. නමුත් ඔබතුමා කරන්නේ මොනවාද? ඔබතුමා කරන්නේ ඒ වාසියත් බද්ද හරහා ගන්න එකයි. ඒ විතරක් නොවෙයි. බද්දේ ප්‍රතිශතයත් වැඩි කරලා එක වරක් නොවෙයි, දෙවරක් පාරිභෝගිකයාට බදු ගහනවා. ඒක තමයි ඔබතුමා කරලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මට විනාඩියක් දෙන්න. මා ඒ ගැන කියන්නම්. ප්‍රතිශතය නොවෙයි ප්‍රතිඵලය බලන්න. අපි වැඩි කල් යන්න ඉස්සෙල්ලා ලූනුවලින්, හාල්වලින්, අර්තාපල්වලින් මේ රට ස්වයංපෝෂිත කරනවා. ඒකයි අපේ අරමුණ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඔය ස්වයංපෝෂිත කථාව අපි දිගින් දිගටම අහලා තිබෙනවා. ඇයි ඔබතුමා එහෙම නම්, - [බාධා කිරීමක්]

පාරිභෝගිකයාට විතරක් නොවෙයි. සතොසට තිබෙන්නේ කඩ 268යි. නමුත් මේ රටේ පෙට්ටි කඩ, පොඩි කඩ දසදහස් ගණනින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සමුපකාර කඩ 8,000ක් විතර තිබෙනවා. ඒවා ආරක්ෂා කරන්නේ කවුද? [බාධා කිරීමක්] ඕනෑම පොඩි කඩයක සිටින අම්මා කෙනෙක් හෝ තාත්තා කෙනෙක් කියයි, මේ රජයේ ප්‍රතිපත්තිය නිසා මේ කටයුතු කොපමණ අමාරුවෙන්ද කර ගෙන යන්නේ කියලා. මේ භාණ්ඩවලින් සියයට 10ක් පමණයි රජයට විකුණන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අනික් ඒවා විකුණන්නේ පොඩි මිනිසුන්ගේ කඩ හරහායි. ඒ පොඩි මිනිසුන්ගේ ආර්ථිකය තමයි තමුන්නාන්සේලා ගසා ගෙන යන්නේ.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

සම්පූර්ණයෙන් වැරැදියි. [බාධා කිරීමක්] UNP එකට - [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

UNP එක ගැන මට කියන්න අවශ්‍ය නැහැ. මොකද, මා ඉඳලා තිබෙන්නේ UNP එකේ විතරමයි. මා පක්ෂ දෙකක ඉඳලා නැහැ. ඉතින් මා UNP එකේ ප්‍රතිපත්තිය දන්නවා; මා ඒක අඳුනනවා. සමහර විට UNP එක ගැන මට වඩා ඔබතුමා දන්නවා වෙන්න පුළුවන්. ඔබතුමා මේ පැත්තෙත් සිටියා නේ. එහෙම වෙන්න පුළුවන්. ඒ ගැන මා තර්ක කරන්න යන්නේ නැහැ. හැබැයි මා කියන්න හදන්නේ, පාරිභෝගිකයාට පනවා තිබෙන බදු නිසා මිල වැඩි වීම ගැනයි. ආහාරවල උද්ධමනය සාමාන්‍ය උද්ධමනයට වඩා ශීඝ්‍ර ලෙස වැඩි වෙලා තිබෙනවා. ආහාරවල මිල ඉහළට, ඉහළට යමින් තිබෙනවා.

එපමණක් නොවෙයි, ඇමතිතුමනි. දැන් මේ ඔක්කොම එන්නේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතටයි. ඒක තමයි මා කිව්වේ, පොඩි මිනිසා ආරක්ෂා වන විධියට පොඩි කඩකාරයා ආරක්ෂා වන විධියට, SMEs ආරක්ෂා වන විධියට කටයුතු කරනවා කිව්වාට ඒ ගොල්ලන්ට කිසිම සහනයක් නැහැ කියලා.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව ජූලි මාසයේ 23වන දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අවම වශයෙන් මේ කාරක සභාවට එන සමාගම් තුනක් තිබෙනවා. එකක් රාජ්‍ය තොග වෙළෙඳ සමාගම. මේ සමාගම 2010 සිට ක්‍රියාත්මක වෙලා නැහැ. මේ සමාගම ක්‍රියාත්මක නොවුණත් සේවකයන්ට පඩි ගෙවා ගෙන යනවා. අවුරුදු තුනකුත් ගිහිල්ලා තවමත් පඩි ගෙවනවා. ඇයි මෙහෙම සිදු වෙන්නේ? මේ සමාගම වහන්න කියලා මුදල් අමාත්‍යාංශයෙන් ම නිර්දේශයක් දීලා තිබෙනවා. ඒකවත් නොසලකා, දැනට අවුරුදු තුනක් ගිහිල්ලාත් දිගින් දිගටම මේ සමාගම පවත්වාගෙන යනවා.

මේ වාර්තාවේ 86 වන පිටුවේ සතොස ගැනත් යමක් සඳහන් කරනවා. It states that the financial management system is inadequate. ඒ කියන්නේ මූල්‍ය පරිපාලනයට ක්‍රමවේදයක් නැහැ කියන එකයි. මේ සමාගමේ මූල්‍ය පරිපාලනයට ක්‍රමවේදයක් නැහැ. ඊළඟට මේ වාර්තාවේ 147 වන පිටුවේ CWE එක ගැන සඳහන් කරනවා. ඒක ඉතාම වැදගත්. මා එය කියවන්න ඕනෑ. මේ වාර්තාවෙන්ම කියවන්නට ඕනෑ. ඒ වාර්තාවේ මෙහෙම කියනවා:

> "It was noted that the evidence relating to the balances of accounts of Rs. 5,482,050,935/- had not been submitted for audit."

Then, under Comments and Decisions of the COPE it states, I quote:

> "It was stated that they were confronted with the problem of unavailability of necessary documents ....."

There were no documents to provide to the Audit.

මේ වාර්තාවෙන් කියන්නේ, සතොසේ රුපියල් බිලියන 5.4ක් නැත්නම් රුපියල් මිලියන 5400ක මුදලක් ගැන විගණකාධිපතිට විගණනය කරන්නට බැරි වෙලා තිබෙන බවයි. ඒවා පිළිබඳව විස්තරවත් CWE එකේ නැහැ. අපේ පාරිභෝගික මිල දර්ශකය ඉහළට යන්නේ ලෝක වෙළෙඳපොළ නිසාවත්, ගොවියා නිසාවත් නොවෙයි, මේවා නිසා. අපි ගොවියාට සාධාරණ මිලක් දෙන්න ඕනෑ. ලෝක වෙළෙඳ පොළේ කටයුතු ඔබටත් මටත් තීරණය කරන්න බැහැ. නමුත් අපට තීරණය කරන්නට පුළුවන් දේවල් තිබෙනවා. ඒ තීරණය කරන්නට පුළුවන් දේවල්වලින් එකක් තමයි මේ ආයතන කළමනාකරණය කිරීම. බිලියන 5.4ක් විගණනයට ලක් කර නැහැ කියලා මේ වාර්තාවේ කියනවා. ගරු ඇමතිතුමනි, බිලියන 5.4ක් කියන්නේ විශාල මුදලක්. ඒක විගණනයට භාජන කර නැහැ. මේ බිලියන 5.4 ට මොනවා ද වෙලා තිබෙන්නේ කියලා අහන්න ඕනෑ. මේ වාගේ දූෂණය නිසා තමයි මේ රටේ උද්ධමනයයි, බඩු මිලයි ඉහළට යන්නේ. [බාධා කිරීමක්] මේවා හැම තිස්සේම වහගන්න කථා කරන්න එපා. මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවක්. මගේ වාර්තාවක් නොවෙයි. මේ කාරක සභාවේ සාමාජිකයන් 31 දෙනෙක් ඉන්නවා. මේ කාරක සභාවේ සභාපති රජයේ ඇමති කෙනෙක්; ජ්‍යෙෂ්ඨ ඇමති කෙනෙක්. එම නිසා මේ කරුණු අහගෙන ඉඳලා, මේ කරුණු පිළිගෙන, මේ වාර්තාවේ තිබෙන දේවල්වලට හරි පිළිතුරක් දෙන්න ගරු ඇමතිතුමනි. මා ඒක ගැන විතරයි මේ වාර්තාවෙන් කථා කරන්න යන්නේ. ඒක ගැන විතරක් කථා කරන්නේ මේ අමාත්‍යාංශයට අදාළ නිසා පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කරුණු රාශියක්ම කථා කරන්න තිබෙනවා. අද අප දූෂණය වංචාව ගැන කථා කළා. දූෂණය වංචාව ගැන කථා කළාම බොහෝ වෙලාවට කියනවා, "ඒක මාතෘකාවට අදාළ නැහැ" කියලා. නමුත් ඒක මාතෘකාවට

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අදාළයි. මොකද, දූෂණය තිබෙනවා නම්, වංචා කරනවා නම්, පගා ගහනවා නම්, අල්ලස් ගන්නවා නම්, ඒවා අවසානයේ බඩු මිලට එකතු වෙනවා. ඒ වියදම කවුරු හෝ පියවන්න ඕනෑ.

Krrish Group එකේ ආයෝජනය ගැන මේ සභයේ ම පත්තරවල වාර්තා තිබුණු බව අප දන්නවා. මේ ගැන අප මුල ඉඳලාම කථා කරලා කිව්වා. අයෝජනයක් රටට එන කොට, කවුද අයෝජකයා, ආයෝජකයාගේ වත්කම් බැරකම් මොනවා ද, මේ රටේ කරන්න යන ආයෝජනය පිළිබඳව ඒ ආයෝජකයාට අත් දැකීමක් තිබෙනවා ද, නැද්ද කියා සොයා බලන්න ඕනෑ. Krrish Group එක ගැන මුල ඉඳලා අපට තිබුණු ප්‍රශ්නය තමයි, ඔවුන් මේ රටේ කරන්න යන ආයෝජනය පිළිබඳව අත් දැකීමක් නැහැ කියන එක.

ඒක තමයි අපට Krrish Group එක ගැන මුලින්ම තිබුණු ප්‍රශ්නය. අන්තිමට ඒ අක්කර හතර බිලියන පහකට ආසන්න මුදලකට Krrish Group එකට දුන්නා. ඒක දුන්නාට පස්සේ කලින් කලට අප ඇහුවා ඒ මුදල් ලැබිලා තිබෙනවාද කියලා. කොටසක් ලැබුණා, ලැබුණේ නැහැ, කාල වේලාව ඉක්මවා ගියා, අප කාල වේලාව දික් කළා කිය කියා ඔහොම කොටසින් කොටස ආවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හොඳයි. මම ඉක්මනටම කියන්නම්.

අන්තිමට මට දැන ගන්න ඕනෑ මෙකයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන කොට පුළුවන් නම් මේවාටත් පිළිතුරු දෙන්න. තවමත් ඒ සල්ලිවලින් මිලියන 700ක් ලැබිලා නැහැ. ඒක ජූලි මාසයේ 15වැනි දා ලැබෙන්න තිබුණා. අපට දැන ගන්න ඕනෑ ඇත්තටම ඒක ලැබුණාද කියලායි. නමුත් ඊට වැඩිය විශාල ප්‍රශ්නයක් තිබෙනවා. රුපියල් මිලියන 400ක් පගාවක් හැටියට දුන්නා කියලා චෝදනා තිබෙනවා. ඒක දුන්නේ ජොෂ්ඨ නිලධාරියෙකුට කියලා කියනවා. ඒ ජොෂ්ඨ නිලධාරියා කියනවා ඒක දේශපාලනඥයන්ට දුන්නා කියලා. අපට දැන ගන්න ඕනෑ මේ ජොෂ්ඨ නිලධාරියා කවුද, මේ දේශපාලනඥයන් කවුද කියලායි. මේවා මේ රටේ ජනතාවගේ මුදල්.

අද මේ රටේ විශාල ඉඩම් කොල්ලයක් සිදු වෙනවා. එය සිදු වන්නේ උතුරු, නැඟෙනහිර පළාත්වල පමණක් නොවෙයි. එය කොළඹ සිදු වෙනවා. පිටකොටුවේ, කොටුවේ, කොම්පඤ්ඤ වීදියේ, කොල්ලුපිටියේ ඒ ඉඩම් කොල්ලය සිදු වෙගෙන යනවා. අද ඉඩම් කොල්ලය සිදු වන්නේ විදේශිකයන් ගෙනැල්ලායි. ලංකාවේ අයටවත් නොවෙයි ඒ ඉඩම් දෙන්නේ. විදේශිකයන් ගෙනැල්ලා මේ front companies හදලා තමයි මේ ඉඩම් කොල්ලය සිදු වන්නේ. මේ කොම්පැනිවලට මූල්‍යවත් නැහැ. අද අපට අලුත් දෙයක් අහන්න ලැබුණා, වෙලීනා කියන සමාගම ගැන. මොකක්ද මේ සමාගම? රුපියල් 30ක වටිනාකමක් තිබෙන සමාගමකට ඩොලර් මිලියන 350ක ක්‍රියාවලියක් කරන්න පුළුවන්ද? මේ වෙලීනා කියන සමාගමත්-

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අවසන් කරන්නම්.

අප මුල ඉඳලාම කියනවා මේ වෙලීනා කියන සමාගමත් Krrish Group එක වාගේම හොරකමක් කියලා. ප්‍රවේශම් වෙන්න. මේක පිටිපස්සේ ඉන්න මිනිස්සු කවුද කියලා මේ ගරු සභාවට දන්වන්නැයි කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 4.21]

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම කනගාටු වෙනවා අපේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා බොහොම ආවේගයෙන්, ඊර්ෂ්‍යාවෙන් කථා කිරීම ගැන. මෙතුමන්ලා ආයෝජන එනවාටත් කැමැතියි. ඒවා නැති වෙනවාටත් කැමැතියි. ආයෝජකයෙක් එන කොට එක්කෝ සූදුකාරයෙක් කියලා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආයෝජන මණ්ඩලයක් තිබෙනවා. ඉතින් ආයෝජකයෝ එනවා. ඒ එන අය ව්‍යාපාරයක් වෙන්න ඕනෑ, එක්කෝ සමාගමක් වෙන්න ඕනෑ. සමාගමක් හැටියට ආවාම ඒකේ ඉතිහාසය හොයන්න, කොන්දේසි දමන්න අවශ්‍ය නැහැ. ගිවිසුමක් තිබෙනවා. ගිවිසුම් ඇති කරගෙන ඒ ආයෝජනය රටට ගේනවා. කොන්දේසි දමලා ඒ අය ආපසු ගියාම මෙතුමන්ලා අනික් පැත්තට තමයි කෑ ගහන්නේ, අන්න ආයෝජනය කරන්න ආවා, ගියාය කියලා. ඒ නිසා ඔබතුමන්ලා ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් කථා කරන්න එපා. රටක සංවර්ධනයක් වෙන කොට ඒ සංවර්ධනයට අප පුළුවන් තරම් ප්‍රවේශයන් ඇති කරන්න ඕනෑ.

ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මාතෘකාවට අදාළව කථා නොකළාට, ඉතා හොඳ යෝජනාවක්, නියෝගයක් සහ නියමයන් තුනක් අද **අප** මේ ඉදිරිපත් කර තිබෙනවා. මේවා ඉතාමත් වැදගත් වෙනවා. මෙහි ප්‍රධානම කාරණය තමයි, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම. අපට අපේ අපනයන ආදායම වැඩි කර ගැනීමට අවශ්‍යයි. කවුරු ආණ්ඩු කළත්, ගෙවුම් ශේෂ හිඟයන් අඩු කර ගන්නට, එක පැත්තකින් අප අපනයනය කරන භාණ්ඩ ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ. ආනයනයට අප ආදේශනයන් ඇති කරන්න ඕනෑ. අප ආනයනය කරන සීනි ටික වෙන්න පුළුවන්, බෙහෙත් ටික වෙන්න පුළුවන්, ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය බොත්තම වෙන්න පුළුවන් අප ඒවා මේ රටේම නිෂ්පාදනය කර ගන්නට ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ශ්‍රී ලංකා ඉන්දියා ද්විත්ව බදුකරණ ගිවිසුම විතරක් නොවෙයි, මේ රටේ මෙවැනි ගිවිසුම් 32ක් පමණ තිබෙනවා. මෙවැනි ද්විත්ව බදුකරණ ගිවිසුමක් හරහා සිදු වන්නේ ඒ රටවල් දෙකේම ඉන්න ආයෝජකයන් ද්විත්ව බදුකරණයට අසුවීම වැළැක්වීමයි. ඊළඟ වාසිය මෙයයි. මේ ගිවිසුමට අදාළ රටවලට අපනයනයේදී සහන ලබා දීමයි. ඒ නිසා මේ ගිවිසුම වැදගත් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගිවිසුම අත්සන් කළේ 2013 ජනවාරි 22වැනි දායි. දැන් එය ක්‍රියාත්මක වෙනවා.

දළ වශයෙන් අපේ අපනයන ගත්තොත්, මේ ගිවිසුම යටතේ භාණ්ඩ වර්ග 431ක් අපට බදු සහන යටතේ යවන්න බැහැ. ඒ සහනය අපට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ලංකාවට අප භාණ්ඩ ආනයනය කරන විටත් භාණ්ඩ වර්ග 1,280කට අප තහනමක් පනවා තිබෙනවා. මොකද, කෙනෙක් කියන්නට පුළුවන් ඉන්දියාව ලොකු රටක්, ඒ රට ලොකු නිසා ඉන්දියාවේ ව්‍යාපාරිකයෝ වැඩියි, ඒ නිසා මේ ගිවිසුම හරහා අපට අවාසියක් සිදු වනවා කියලා. නැහැ, ඒකෙන් එහෙම අවාසියක් සිදු වන්නේ නැහැ. මොකද හේතුව, අපි අපනයන වෙළෙඳ පොළ කරා යනවා නම්, අපි මෙවැනි ගිවිසුම් ඇති කරගත යුතුයි. අපනයන වෙළෙඳ පොළ තිබෙන ඉන්දියාව වාගේ රටවල ජනගහනය වැඩියි; ආයෝජකයන් වැඩියි. එතකොට ඒ ආයෝජකයන් අපේ රටට ගෙන්වා ගන්න, ඔවුන්ට සහනයක් ලබා දෙන්න, අපි කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම මේ හරහා අපේ නිෂ්පාදනයන් ඉන්දියාවට යවන්නත් අපි කටයුතු කරන්නට ඕනෑ. එහෙම නම් අපි භාණ්ඩ වර්ග 1280කට බදු සහන දෙන්නේ නැතිකොට, ඉන්දියාව භාණ්ඩ වර්ග 431කටයි, බදු සහනය ලබා දෙන්නේ නැත්තේ. එතකොට අපිට එතැනිනුත් වාසියක් තිබෙනවා. මේ ගිවිසුම හරහා තේ මෙට්‍රික් ටොන් 15,000ක් ඉන්දියාවට යවන්න අපිට බදු සහනයක් තිබෙනවා. එතකොට මේ රටේ තේ නිෂ්පාදකයාට මෙට්‍රික් ටොන් 15,000ක් දක්වා බද්දක් රහිතව ඉන්දියාවට තේ යවන්න පුළුවන්කම ලැබෙනවා. එතකොට එහි ප්‍රයෝජනය ලබන්නේ, - [බාධා කිරීමක්] ඒක වෙනයි. නමුත් අපේ තේ මෙට්‍රික් ටොන් 15,000ක් ඉන්දියාවට - අසල්වැසි වෙළෙඳ පොළට - බද්දක් නොමැතිව යවන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ඇඟලුම් කර්මාන්තය ගත්තාම, ඇඟලුම් මිලියන 8ක් බදු සහන යටතේ අපට ඉන්දියාවට යවන්න පුළුවන්. එතකොට ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම යටතේ තමයි මේ ප්‍රතිලාභය අපේ රටට ලැබෙන්නේ. එතකොට ඇඟලුම් මිලියන අටක් බදු රහිතව ඉන්දියාවට යවන්න, අපි අත්සන් කරපු මේ ශ්‍රී ලංකා ඉන්දියා ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම යටතේ බදු සහනයක් ලැබෙනවා. බටහිර රටවල් ඒ දීලා තිබෙන සහන ඉවත් කරනකොට, එහෙම නම් අපට විකල්පයක් තිබෙන්නට ඕනෑ. අපට විකල්පයක් අසල්වැසි -

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ ජංගම දුරකථනය සභා ගර්භය තුළ පාවිච්චි කරන්න එපා. ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා උපදෙස් දීලා තිබෙනවා. ඔබතුමා එළියට ගිහිල්ලා කථා කරන්න. බොහොම ස්තුතියි.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දුන් ඒ නියෝගය මා අගය කරනවා. මොකද, මා නියෝජ්‍ය කාරක සභාපති ධුරයේ සිටිනකොට මේ ගරු සභාව තුළට කිසිම ජංගම දුරකථනයක් ගෙනෙන්නට දුන්නේ නැහැ. එක් මන්ත්‍රීවරයෙකුගේ දුරකථනයක් එළියට ගෙන යන්නත් මා නියෝග කළා. මොකද, අපි මේ සභාවේ ගෞරවය ආරක්ෂා කළ යුතුයි. Standing Orderවල සඳහන් වෙලා තිබෙනවා, මේ ගරු සභාව තුළ පුවත්පත් බලන්නට බැහැ, සභාවට පිටුපා කථා කරන්නට බැහැ කියලා. මොකද ගරු මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ කථා කරනකොට, තවත් මන්ත්‍රීවරයෙක් දුරකථනයෙන් කථා කර කර සිටිනවා නම් ඒක අශෝබනයි. අපි හොඳ ආදර්ශයක් දිය යුතු තැනක් තමයි මේ ගරු සභාව. ගරු මන්ත්‍රීවරයෙක් සභාවේ කථා කරනකොට, තවත් මන්ත්‍රීවරයෙක් සභාවට පිටුපා කථා කරමින් සිටිනවා නම්; මන්ත්‍රීවරුන් දෙදෙනා බැගින් කැරැලි ගැසී කථා කරමින් සිටිනවා නම් ඒක අභෝභනයි. මොකද, මේ ගරු සභාව තමයි උත්තරීතර ආයතනය. මේ ගරු සභාවට එනකොට දුරකථනය switch off කර ගෙන එන්නට ඕනෑ. මෙතැනට ඇවිල්ලත් දුරකථනයෙන් හැලි කථා කරන්න ඕනෑ නැහැ නේ. [බාධා කිරීමක්] මම මේ කියන්නේ ඇත්තයි. මේක දැන් සම්ප්‍රදායක් විධියට කෙරෙනවා මා දකිනවා. පසු ගිය කාලයේ අපි කාටවත් සභාව තුළ ජංගම දුරකථන පාවිච්චි කරන්නට ඉඩ දුන්නේත් නැහැ; මේ ගරු සභාව තුළට රැගෙන එන්න අවසර දුන්නේත් නැහැ. මේ කාලයේ වැටුප්, තීරු බදු රහිත වාහන, මේ සියල්ලම ලැබෙනකොට අපි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ ගරු සභාව තුළ අපේ වගකීම් ඉටු කළ යුතුයි. අපි මහජන ඡන්දයෙන් පත්වෙලා මේ සභාවට එන්නේ ඒ යුතුකම්, වගකීම් ඉටු කරන්නයි. ඒ නිසා අපේ වගකීම් අපි ගෞරවයෙන් ඉටු කළ යුතුයි. ඒ නිසා එවැනි නියෝගයක් දීම ගැන ඔබතුමාට මා ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ පියා හිටපු කථානායකවරයෙක්. ඒ ආදර්ශය නිසා වන්නට ඇති ඔබතුමා නියමාකාරයෙන් ඒ නියෝගය ලබා දුන්නේ. [බාධා කිරීමක්] ඒක ගැන එච්චරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශ්‍රී ලංකා ඉන්දියා ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම හරහා එම බදු සහනය අපට ලැබෙනවා. ඒ අනුව මේ ගිවිසුමේ ප්‍රතිලාභ අපට ලබා ගන්නට පුළුවන්. ඒ අනුව කිසිම බද්දක් ගෙවන්නේ නැතිව ඉන්දියාවට ඕනෑ තරම් පලතුරු යවන්න අපට පුළුවන්කම ලැබෙනවා. බලන්න, කොච්චර සහනයක් මේ ගිවිසුම හරහා අපේ රටට ලැබිලා තිබෙනවාද කියලා. නමුත් අපි එයින් ප්‍රයෝජනය ගන්නේ නැහැ. අපි ඒවා යවන්න නිෂ්පාදකයන් උනන්දු කරවන්නට ඕනෑ. අනෙක් පැත්තෙන් ගත්තාම, අපි ඉන්දියාවට අපනයනය කරන ප්‍රමාණයේ වටිනාකම ඇමෙරිකන් ඩොලර් මිලියන 567ක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙනෙක් මේ ගිවිසුම දිහා වැරැදි විධියට බලන්නට පුළුවන්. අපි ඇමෙරිකන් ඩොලර් මිලියන 567ක් වන භාණ්ඩ ඉන්දියාවට අපනයනය කරනකොට එයින් සියයට 80ක්ම මේ ගිවිසුමේ ප්‍රතිලාභ, නැත්නම් අර තීරු බදු රහිත සහනය අපට ලැබෙනවා. ඉන්දියාව, ඒගොල්ලන්ගේ මුළු අපනයන වටිනාකම වන US Dollars 3500ක භාණ්ඩ අපේ රටට එවනකොට සියයට 80ක්ම ඔවුන් ගිවිසුමේ වාසිය ලබා ගන්නේ නැහැ. ගිවිසුමේ වාසිය නොගෙන, ගිවිසුමට වලංගු නොවන භාණ්ඩ තමයි අපට එවලා තිබෙන්නේ. එතකොට කෙනෙක් වැරැදි ආකල්පයක් දෙන්නට පුළුවන්, මෙවැනි ගිවිසුම්වලට එළඹීම තුළින් අපට හානියක් සිදුවනවා කියලා. නැහැ, එවැනි හානියක් මේ ගිවිසුම තුළින් සිදු වෙලා නැහැ. ඔවුන් ඇමෙරිකන් ඩොලර් 3500ක් වටිනා භාණ්ඩ අපේ රටට එවනකොට ඔවුන් සියයට 80ක සහනය ලබා ගන්නේ නැහැ. නමුත් අපි සියයට 80ක සහනය ලබාගෙන තමයි ඉන්දියාවට ඒ භාණ්ඩ ටික අපනයනය කර තිබෙන්නේ.

ඒ නිසා මේ ගිවිසුම තුළින් සැබෑ වාසියක් මේ රට ඇතුළට එනවා. රජය ඉන්දියාව සමඟ ඇති කර ගත්ත මේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම යටතේ මේ රටට, මේ රටේ කුඩා පරිමාණ නිෂ්පාදකයන්ට, අපනයන නිෂ්පාදකයන්ට, ඒ ව්‍යාපාරවලට විශාල සහනයක් ලැබෙයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නව තත්ත්වයට යන්න ඕනෑ. බෙහෙත් ද්‍රව්‍ය අපි ආනයනය කරනවා. බොහොමයක් අපි ආනයනය කරන්නේ ඉන්දියාවෙන්. ඒ සඳහා රුපියල් මිලියන 1,000කට ආසන්න මුදලක් අපට වැය කරන්නට වෙනවා. සාමාන්‍යයෙන් දළ වශයෙන් අපි රුපියල් මිලියන 400ක් 700ක් විතර ඒ සඳහා වියදම් කරනවා. ඒ බෙහෙත් ද්‍රව්‍ය ටික මේ රටේ නිෂ්පාදනය කරන්න අපට ඒ ආයෝජකයන් මේ රටට කැඳවන්න පුළුවන් නම් ඒ ආනයනය සඳහා අපි කරන වියදම අඩු කර ගන්න පුළුවන්. ගෙවුම් ශේෂය අඩු කර ගන්න ඒක අපට බලපෑමක් වෙනවා.

[ගරු ලලිත් දිසානායක මහතා]

සීනි ආනයනය කරන්න දළ වශයෙන් රුපියල් මිලියන 200ක් විතර ඉන්දියාවට වැය කරන්න අපට සිදු වෙලා තිබෙනවා. මේ රටේ සීනි නිෂ්පාදනය කරන්න මෑතකදී ඉන්දියාවේ රේණුකා සීනි සමාගම සමඟ අපි ගිවිසුම් ඇති කර ගෙන තිබෙනවා. එතකොට අර ගිවිසුම හරහා ලැබෙන සහන ලබා දීලා අපේ වියදම් අඩු කර ගැනීමට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා අපි අද සාකච්ඡා කරන මේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම ඇති කිරීම ගැන අපි රජයට ස්තුතිවන්ත වනවා. ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කරලා ඒ තුළින් අපි ඒ ප්‍රයෝජනය ගන්නට ඕනෑ.

බදු ගැන කථා කරන විට, විශේෂයෙන්ම 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත ඉතාම වැදගත් වනවා. බද්ද ගැන කථා කරන විට බොහෝ අය හිතන්නේ අපේ රජය නඩත්තු වෙන්න බදු අය කරනවා කියලා. නැහැ. අද ඉදිරිපත් කරන බද්දේ විශේෂ කරුණු තිබෙනවා. මොකද, අපේ ගොවියා ලොකු ලූනු නිෂ්පාදනය කරනවා. දේශීය ලොකු ලූනු නිෂ්පාදනය වෙළෙඳ පොළට එන කොට අපි අනිවාර්යයෙන්ම කරන දෙයක් තමයි ආනයන බද්ද වැඩි කරන එක. එසේ කිලෝ එකකට රුපියල් 50ක් වුණ බද්ද අද රුපියල් 15ට අඩු කරලා තිබෙනවා. එහෙම අඩු කරන්නේ දේශීය වෙළෙඳ පොළට අවශ්‍ය සැපයුම් අපි දේශීය වෙළෙන්දාගෙන් අරගෙන ඉවරයි. නමුත් ලූනුවල මිල ඉහළ යෑමක් සිදු වෙනවා. එතකොට පාරිභෝගිකයා ආරක්ෂා කරන්න කිලෝ එකකට රුපියල් 50ක් ගහපු බද්ද අපි රුපියල් 15කට අඩු කරලා තිබෙනවා. ලොකු ලූනු ගොවියා ආරක්ෂා කරන්න අපි රුපියල් 50ක බද්දක් ගහලා, නිෂ්පාදනය වෙළෙඳ පොළට එන කොට අපි ගොවියාට ඒ සහනය එසේ ලබා දෙන අතරම, ගොවියාගේ නිෂ්පාදනය වෙළෙඳ පොළට ගත්තාට පස්සේ ලූනු හිඟයක් ඇති වන කොට, මිල ඉහළ යන කොට ඒ ආනයන බද්ද රුපියල් 15 දක්වා අඩු කරලා වෙළෙඳ පොළේ ලූනු හිඟයක් ඇති වෙන්න ඉඩ දෙන්නේ නැතුව එය සමනය කරනවා. ඒ වාසිය අපි ලබාදෙන්නේ පාරිභෝගිකයාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ භාණ්ඩ 31ක් හරහා මේ සහන ලබා දීලා තිබෙනවා. හාල්මැස්සන් වෙන්න පුළුවන්, පරිප්පු වෙන්න පුළුවන්, වෙනත් දෙයක් වෙන්න පුළුවන්, සහනය ලබා දීම සඳහා රජය මේ ක්‍රියා මාර්ගය ගැනීම ඉතා වැදගත් වනවා. මොකද, හේතුව? අපි පාරිභෝගිකයාගේ පැත්ත බලන්න ඕනෑ. රජයක් හැටියට එය ඉතාම වැදගත් වනවා.

ග්‍රාමීය ණය යෝජනා ක්‍රම ගැන බැලුවොත් අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ, කෘෂි සහ පශු සම්පත් සංවර්ධන අංශයේ ණය යෝජනා ක්‍රමය දෙස. පසු ගිය අවුරුද්දේ ගොවීන් 13,282 දෙනෙකුට ලබා දී තිබෙන මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 1,573ක්. ප්‍රතිශතයක් හැටියට ගත්තාම එය සියයට 65.9ක්. ණය ලබා දී තිබෙන පෞද්ගලික අංශයේ ආයෝජකයන් සංඛ්‍යාව 911ක්. ඔවුනට රුපියල් මිලියන 813ක් ලබා දී තිබෙනවා. ණය ලබා දී තිබෙන මුළු සංඛ්‍යාව ගත්තාම 14,193යි, මුළු ණය ප්‍රමාණය ගත්තාම රුපියල් මිලියන 2,386ක්. කෘෂි හා පශු සම්පත් සංවර්ධනය සඳහා ඒ ණය යෝජනා ක්‍රමය යටතේ මේ ණය ලබා දී තිබෙනවා.

ලොකු අයට විතරක් නොවෙයි, ග්‍රාමීය අංශයටත් ණය සහන ලබා දීලා තිබෙනවා. 2012 අවුරුද්දේ භෝග අනුව ණය ලබා දීලා තිබෙනවා. ඒ කියන්නේ මිරිස්, බඩ ඉරිඟු, ලූනු, අර්තාපල්, එළවලු වාගේ දේවලට ලබා දී තිබෙන සංඛ්‍යාව ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1,12,413ක්. ණය ප්‍රමාණය රුපියල් මිලියන 9,359ක්. ඒ යටතේ අක්කර 3,55,752.9ක් වගා කර තිබෙනවා.

මේ රජය සුළු ගොවීන් ආරක්ෂා කරන්න මේ සහනයන් ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේ රජය ගමේ ගොවියා, ගමේ ආයෝජකයා, සුළු කර්මාන්තකරුවා ගැන තමයි බලන්නේ. ඒ නිසා තමයි එක්සත් ජාතික පක්ෂය කොයි තරම් කෑ ගැහුවත් ඊයේ වන කොට ආණ්ඩුව ගිලෙන නැවක් නොවෙයි, තව ඉදිරියට යන නැවක් පෙන්නුම් කළේ.

ගිලෙන නැව තමයි එක්සත් ජාතික පක්ෂය. දක්ෂ මන්ත්‍රීවරුන් අද අපේ පැත්තට එන්නේ. අපට එන්නේ ගරු දයාසිරි මන්ත්‍රීතුමා වාගේ අය. ඒ අය අපට එකතු වෙන්නේ මේ රජය යම් කිසි ගමනක් යන නිසා. අපි පසු ගිය පළාත් සභා මැතිවරණත් ජයග්‍රහණය කළා. මෙවරත් වයඹ පළාත් සභාව, උතුරු පළාත් සභාව සහ අනෙක් පැත්තෙන් මධ්‍යම පළාත් සභාව අපි නියත වශයෙන් ජයග්‍රහණය කරනවා. එහි පළමුවෙනි වෙඩි මුරය තමයි ඊයේ පාර්ලිමේන්තුවේ තිබුණේ. මම හිතන හැටියට ඒක මේ රටේ ජනතාව තේරුම් ගත්තා.

අපි එක දෙයක් කියන්නට ඕනෑ. අපි "Thirteen Plus", "Thirteen Minus" ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "Plus", "Minus" මොනවා වුණත් අපි පැහැදිලිව කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අවුරුදු 33කට පෙර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා මේ රටට පළාත් සභා ක්‍රමය ගෙනාවා. නමුත් ඒ ගෙනාව පළාත් සභා ක්‍රමය සැබෑ ලෙසම මේ පොළෝ තලය තුළ ක්‍රියාත්මක වන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවක් යටතේයි. අද උතුරේ එල්ටීටීඊ අධිකරණ නැහැ; අද උතුරේ වෙනම නියෝග නැහැ. අද අපි උතුරට පළාත් සභා මැතිවරණයක් දීලා තිබෙනවා. ඒ නිසා අපි ඒක මුල් තැනට කථා කරමු. "Plus" , "Minus" ගැන කථා කරලා මේකේ credit එක; මේකේ සම්මානය ආණ්ඩුවට, ජනාධිපතිතුමාට දෙන්නේ නැතිව ඒක වෙනත් පැත්තකට හරවන කුමන්ත්‍රණ තිබෙනවා. ඒවාට රැවටෙන්න එපා. අපි උතුරේ ජනතාවටත් කියන්නේ, ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදයෙන් තමුන්ව බේරා ගත්ත අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට සහෝදය දෙන්න කියලා. එදා උතුරේ ජනතාව මරද්දී, තමන්ගේ සහෝදර මන්ත්‍රීවරුන්ව මරද්දී, තමන්ගේ දරුවෝ මරද්දී, බලහත්කාරයෙන් තමන්ගේ දරුවෝ යුද්ධයට ගනිද්දී නිහඬව සිටිය TNA එකට උතුරේ ජනතාව ඡන්දය දෙන්නේ නැහැ කියන එක අපි පැහැදිලිව කියනවා. උතුරේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ජනතාවක් හැටියට ඒ ප්‍රතිඵලයත් එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දෙයි කියා අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වෙලාවක් තිබෙනවාද?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම බදු ව්‍යුහය, ද්විත්ව බදු සහන වාගේම සමස්ත ආර්ථිකය පිළිබඳව සාකච්ඡා වන මේ මොහොතේ අදහස් කිහිපයක් එකතු කරන්නට ලැබීම ගැන මමත් සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජෝන් ජාක් රූසෝ කියන දාර්ශනිකයා ඉදිරිපත් කරලා තිබෙනවා "Social Contract" කියන න්‍යාය. ඒ න්‍යායේ සඳහන් වෙලා තිබෙන්නේ සමාජ ගිවිසුමක් පිළිබඳව. අපි හැමෝම දන්නවා රටක ජනතාවත් පාලකයිනුත් අතර සමාජ ගිවිසුමක් තිබෙන බව. විශේෂයෙන්ම ඒක ඉංග්‍රීසි භාෂාවෙක් කියනවා නම්, "The social contract exists between the rulers and the rule" පාලිතයන් සහ පාලකයෝ අතර තිබෙන සමාජ ගිවිසුමට තමයි "social contract" එක කියන්නේ.

අද රට දිහා බැලුවාම, 2005 දිත් 2010 දිත් වර්තමාන රජය මේ රටේ ජනතාවත් සමඟ ගිවිසුම්ගත වුණු සමාජ ගිවිසුමට මොකක්ද අද සිදු වෙලා තිබෙන්නේ? ඇත්ත වශයෙන්ම ඒ සමාජ ගිවිසුම කීතු කීතුවලට ඉරා දමලා, කුණු බක්කියට වීසි කළ යුගයකයි අද අපි මේ විවාදයට සහභාගී වී සිටින්නේ. ඇයි මම එහෙම කියන්නේ? දැන් බදු ගැන කථා කරනවා; ද්විත්ව බදු අහෝසි කිරීම ගැන කථා කරනවා. බදුවලින් රජයට ආදායමක් ලැබෙනවා. ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි මේ ගහන බදුවලින් රජයට ආදායමක් ලැබෙනවා නම් ඇයි වසර දෙකහමාරක් මුළුල්ලේ ගොවි විශ්‍රාම වැටුප ලබා නොදෙන්නේ? රුපියල් 1,000 - 4,166ත් අතර බොහොම සුළු මුදලක් තමයි මේ ගොවි විශ්‍රාම වැටුප යටතේ ලබා දෙන්න තිබෙන්නේ. බදු ගහනවා නම්, බදු එකතු කරනවා නම්, බදු ආදායමක් ලබනවා නම් අහිංසක ගොවි පරපුරට, රටට බත සපයන රෙද්ද බැනියම, සරම ෂර්ට් එක අඳින ගොවි ජනතාවට එක්සත් ජාතික පක්ෂ රජයක් තුළින් ලබා දුන් ගොවි විශ්‍රාම වැටුප ලබා නොදෙන්නේ ඇයි කියන එක මටත් ලොකු ප්‍රහේලිකාවක්. මහා ආශ්චර්යවත් රජයක් ලු. ජනතාවගේ සිතුම් පැතුම් හඳුනනවා ලු. නමුත් ගොවි ශ්‍රාම වැටුප වසර දෙකහමාරක් මුළුල්ලේ අක්‍රියයි. කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ පෝලිම් ගණන් මැති ඇමතිවරුන් ඇවිල්ලා කියනවා, "අද දෙනවා ගොවි විශ්‍රාම වැටුප, හෙට දෙනවා ගොවි විශ්‍රාම වැටුප" කියලා. ගොවි විශ්‍රාම වැටුපට අද බාලගිරි දෝෂය වැලඳිලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බදු ගැන සාකච්ඡා වෙන මේ මොහොතේ, බදුවලින් රජයට ආදායමක් ලැබෙන මේ මොහොතේ රුපියල් 350 පොහොර සහනාධාරයට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද කියා මම අහන්න කැමැතියි. අද රුපියල් 350ට පොහොර නැහැ. රුපියල් 1200ටවත් පොහොර නැහැ. අද අපේ රටේ පොහොර හිඟයක් තිබෙනවා. උතුරු අප්‍රිකාවෙන් සහ තවත් විවිධ රටවලින් අපේ රටට බාල පොහොර ගෙන්වලා, ප්‍රමිතියක් නැති පොහොර ගෙන්වලා කැඩිමියම් ආසනික් අඩංගු පොහොර ගෙන්වලා පොහොර සහනාධාරයේ නාමයෙන් රටේ වකුගඩු වසංගතය ව්‍යාප්ත කරන්නට මේ රජය කටයුතු කර තිබෙනවාය කියන එක මම මතක් කරනවා. එහෙම නම් දෙවතාවක්ම මේ සමාජ ගිවිසුම - Social Contract එක - මේ රජය සම්පූර්ණයෙන්ම කඩ කර තිබෙනවා. පොහොර සහනාධාරය ගැන කථා කරනකොට විශේෂයෙන්ම අප මතක් කර දෙන්න ඕනෑ, ඉහළ ප්‍රමිතියෙන් යුක්ත වූ පොහොර ගෙන්වනවා නම් ඇත්ත වශයෙන්ම රටේ ගොවි ජනතාවට ඒක ලොකු සහනයක්ය කියන එක. වස විස අඩංගු පොහොර නොවෙයි, ඉහළ ගුණාත්මක බවකින් යුක්ත වූ පොහොර ටික ලබා දෙන්නට මේ ආශ්චර්යවත් ආණ්ඩුව පැකිළෙන්නේ ඇයි කියන එක ලොකු ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බදු ගහනවාය කියන එක ගැන කථා කරනකොට බදුවලින් එකතු වන මුදල්වලින් මේ රටේ වී ගොවියාට තිරසාර සහතික මිලක් ලබා නොදෙන්නේ ඇයි කියා අපි අහනවා. අපේ ගරු නන්දිමිත්‍ර ඒකනායක නියෝජ්‍ය ඇමතිතුමා මම මේ කියන කාරණාව අහගෙන ඉන්නවා. මහ ලොකුවට පුරසාරම් දොඩවනවා රුපියල් 32ක, රුපියල් 35ක මිලක් නාඩු, සම්බා කියන වී වර්ගවලට ලබා දෙනවාය කියා. ඔබතුමා දන්නවා ඇති, පහුගිය කන්නයේ වී ටික විකිණුනේ කිලෝව රුපියල් 18ට, රුපියල් 20ට, රුපියල් 22කටය කියන එක. ඒකයි සත්‍ය කථාව. මහ ලොකුවට මේ රටේ මහජනතාව මත බදු බර පටවා, රාජ්‍ය ආදායම ලබා ගෙන අපේ රටේ සමස්ත වී අස්වැන්නෙන් මිල දී ගන්නේ සියයට 4ක, 5ක සොච්චම් ප්‍රමාණයක්ය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද චින්තනය තුළින් 2005 දී මේ රටේ ජනතාව සමඟ ගහපු ඒ සමාජ ගිවිසුමේ පොරොන්දුවක් තිබුණා, හැම වසරකදීම හැම ගමකටම ගෙවල් 25 ගණනේ හදනවාය කියා. මේ වනකොට කොච්චර ගෙවල් හදා තිබෙනවාද කියා පහු ගිය දවසක මම ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ප්‍රශ්න කළා. මහින්ද චින්තනය තුළින් රටේ ජනතාව සමඟ ගහපු ගිවිසුමට අනුව අවුරුදු පහකදී මේ වනකොට ගෙවල් හතළිස් දෙලක්ෂ පනස් දාහක් හැදිලා තිබෙන්න ඕනෑ. 2013 ගැන මම කථා කරන්නේ නැහැ. 2005 - 2010 අතර කාලය ගැනයි මම කථා කරන්නේ. ඒ කාලය ඇතුළත ගෙවල් හතළිස් දෙලක්ෂ පනස් දාහක් හැදිලා තිබෙන්න ඕනෑ. නමුත් කියන්නත් ලැජ්ජයි, විමල් වීරවංශ ගරු ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ඇවිත් කියනවා, අනේ දෙවියනේ! ගෙවල් ලක්ෂ දෙකයි හදා තිබෙන්නේ කියා. අන්න එතැනදී සමාජ ගිවිසුම සම්පූර්ණයෙන්ම කඩ කරලා තිබෙනවා. විමල් වීරවංශ ඇමතිතුමා මේ උත්තරීතර සභාවට ප්‍රකාශ කළා, රණසිංහ ප්‍රේමදාස උළුවස්සක් හදනකොටත්, උළු තියනකොටත්, දොරක් දමනකොටත් ගෙයක් හැදුවාය කියනවාය කියා. 1996 දී පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව හැබිටාට සම්මේලනයට යනකොට රටේ නිවාස වැඩසටහන ගැන වාර්තාවක් හදා තිබෙනවා. පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව හැබිටාට සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාවේ කියා තිබෙන්නේ මොකක්ද? නිවාස ලක්ෂය, දස ලක්ෂය, පහළොස් ලක්ෂය යන වැඩසටහන් අතරින් නිවාස විසිහය ලක්ෂයේ වැඩසටහන තරම් ශ්‍රී ලංකා ඉතිහාසයේ උත්තරීතර නිවාස වැඩසටහනක් කිසිම මොහොතක, කිසිම අවස්ථාවක ක්‍රියාත්මක වුණේ නැහැ කියා එවකට නිවාස අමාත්‍යවරයා වශයෙන් සිටි නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සඳහන් කර තිබෙනවා. එම වාර්තාව මම **සභාගත*** කරනවා. එහෙම නම් අර හදනවාය කියපු ගෙවල් ටිකත් පැහැදිලිවම අපේ රටට අහිමි වෙලා සිටින මොහොතකයි අපි සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම අදූරදර්ශී, ඇහ පුරාම මොළය තිබෙන මිනිසුන්ගේ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා අපේ රටට GSP සහනය අහිමි වෙලා තිබෙනවා. GSP Plus සහනය අහිමි වීම තුළින් අපේ රටේ සිය ගණනක් කර්මාන්තශාලා සම්පූර්ණයෙන්ම වැසී ගිහින් තිබෙනවා. දසදහස් ගණනක් විරැකියා පෝලිමට එකතු වෙලා තිබෙනවා. එදා දේශීය විදේශීය ආයෝජකයින්ට රතු පලසක් දමලා ඇහලුම් කම්හල් දෙසීයේ වැඩසටහන ආරම්භ කළා. නගරයට සීමා වෙලා තිබුණු සංවර්ධනය ගමට ගෙන යන ඇහලුම් කම්හල් දෙසීයේ එම වැඩසටහන හරහා රටේ ජනතාවට කොයි තරම් ශක්තියක් සහනයක් ලැබුණාද කියන එක අපට මතක් වෙනවා. නමුත් එදා කර්මාන්තශාලා බිහි වුණු යුගය අවසන් කරමින් අද තරගයට, පෝලිමට කර්මාන්තශාලා වැසී යනවා. GSP Plus සහනය අහිමි වුණු අපේ රටේ කර්මාන්තශාලා ඉන්දියාව, බංගලාදේශය, වියට්නාමය සහ Cambodia වැනි රටවලට පිටත් කර යවන ඉතාමත්ම නින්දිත යුගයක අද අපි ජීවත් වනවාය කියන එක කනගාටුවෙන් හෝ මතක් කරන්නට ඕනෑ.

***** පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මහ ලොකුවට ජනතාවත් සමඟ ඇති කර ගත් ඒ සමාජ ගිවිසුමේ තිබෙනවා, දැනුමේ කේන්ද්‍රස්ථානය ගොඩ නඟනවාය කියා. දැන් කොහොමද මේ වර්තමාන රජය දැනුමේ කේන්ද්‍රස්ථානය අපේ රටේ ගොඩ නඟමින් යන්නේ? මම කියන්නම්. අපේ රටේ පාසල් දූ දරුවන් හතළිස්තුන් ලක්ෂයකගෙන් සියයට 27කට දිවා ආහාරය දෙනවා. සියයට 73කට දිවා ආහාරය කප්පාදු කරනවා. අපේ රටේ පාසල්වලින් විදුලිය නැති පාසල් සියයට 18ක් තිබෙනවා; ජලය නැති පාසල් සියයට 15ක් තිබෙනවා; වැසිකිළි නැති පාසල් සියයට 11ක් තිබෙනවා; පුස්තකාල නැති පාසල් සියයට 66ක් තිබෙනවා; පරිගණක විද්‍යාගාර නැති පාසල් සියයට 67ක් තිබෙනවා. ඒ වාගේම සමස්ත පාසල් 9,731 තුළ සාමාන්‍ය පෙළ විද්‍යාගාර නැති පාසල් සියයට 72ක් තිබෙනවා; උසස් පෙළ විද්‍යාගාර නැති පාසල් සියයට 92ක් තිබෙනවා; ක්‍රීඩාංගන නැති පාසල් සියයට 36ක් තිබෙනවා. ආශ්චර්යයේ ප්‍රතිලාභය ජනතාවට, මේ රටේ අධ්‍යාපන පද්ධතියට ලබා දෙන්නේ මෙහෙමද කියන එක මම අහන්නට කැමැතියි.

ඒ විතරක් නොවෙයි. මා ළඟ තිබෙන සංඛ්‍යා ලේඛන අනුව මේ වන විට ගුරුවරුන් 8,534 දෙනෙකුගේ හිඟයක් තිබෙනවා. බස්නාහිර පළාතේ 1,723යි, මධ්‍යම පළාතේ 1,338යි, උතුරු මැද පළාතේ 1,374යි, වයඹ පළාතේ 580යි, ඌව පළාතේ 699යි, සබරගමුව පළාතේ 620යි, දකුණු පළාතේ 653යි, උතුරු පළාතේ 1,455යි. මේ යනාදී වශයෙන් ගුරු හිඟය තිබෙනවා. ඒ වාගේම 2012 වසර වන විට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බස්නාහිර පළාතේ රුපියල් මිලියන 104ක හිඟ වැටුප් ගෙවීමට තිබෙනවා. මධ්‍යම පළාතේ රුපියල් මිලියන 117ක්, උතුරු මැද පළාතේ රුපියල් මිලියන 55ක්, වයඹ පළාතේ රුපියල් මිලියන 90ක්, ඌව පළාතේ රුපියල් මිලියන 12ක්, දකුණු පළාතේ රුපියල් මිලියන 61ක්, උතුරු පළාතේ රුපියල් මිලියන 147ක් සහ නැගෙනහිර පළාතේ රුපියල් මිලියන 62ක් වශයෙන් හිඟ වැටුප් ගෙවීමට තිබෙනවා. මේ ගහන බවුවලින් මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආශ්චර්යය උදා කරන්නේ මෙහෙමද කියන එක වර්තමාන පාලකයින්ගෙන් - වර්තමාන රජයෙන්- මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද රට දිහා බලන කොට පෙනෙනවා සමාජ සමානාත්මතාව ස්ථාපනය වෙනවා වෙනුවට සමාජ අසමානාත්මතාව ව්‍යාප්ත වෙලා තිබෙනවා කියලා. මේ වන විට social equity වෙනුවට social inequality ප්‍රවර්ධනය වෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරත් අමුණුගම මැතිතුමාගෙන් නොයෙකුත් අවස්ථාවලදී අපට අහන්නට ලැබෙනවා ඒක පුද්ගල ආදායම එන්න එන්න වැඩි වෙනවාය කියා. දැන් බලන්න, 2009 දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2,057යි, 2010 දී ඇමෙරිකානු ඩොලර් 2,400යි, 2011දී ඇමෙරිකානු ඩොලර් 2,836යි, 2012 දී ඇමෙරිකානු ඩොලර් 2,923යි. 2016 දී කොහොම හරි ඒක ඇමෙරිකානු ඩොලර් 4,000ක් කර ගන්නවාලු. නමුත් මේ සංඛ්‍යා ලේඛන තුළ සැඟවුණු සත්‍යය මොකක්ද? සැඟවුණු සත්‍යය මෙකයි. පොහොසත්ම සියයට 20 මේ රටේ ජාතික ආදායමෙන් සියයට 54.1ක් බුක්ති විඳිනවා; දුප්පත්ම සියයට 20 බුක්ති විඳින්නේ රටේ ජාතික ආදායමෙන් සියයට 4.5ක් වැනි ඉතාමත්ම සුළු ප්‍රමාණයක්. ගරු සරත් අමුණුගම ඇමතිතුමනි, මේ වාගේ තත්ත්වයක් තුළ නැති බැරි සහ ඇති හැකි පරතරය එන්න එන්නම වර්ධනය වන යුගයක මේ සමාජ අසමානාත්මතාව, මේ බලවත් වරද නිවැරදි කරන්නට රජය ගන්නා පියවර මොකක්ද කියන එක මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටේ පාලකයින්, ඔබතුමන්ලා රටේ ජනතාව විපතට පත් වෙන මොහොතක රටේ ජනතාවට සලකන ආකාරය තුළින්, අපට පැහැදිලි නිගමනයකට එන්න පුළුවන්, මේ රටේ ජනතාවට කොයි තරම් ආදරය කරනවාද කියලා. පසු ගිය කාල වකවානුව තුළ සුළි කුණාටුවක් ඇවිල්ලා යීවරයින් 51දෙනකුගේ ජීවිත අහිමි වුණා. ඒ ගෘහ මූලික පවුල් ඒකකවලට ප්‍රධාන ආදායම් උපයන්නා අහිමි වුණා. හැබැයි, අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ බරපතළ ඌනතාවන් තිබෙනවා; ප්‍රමාණවත් පිරිස් නැහැ; විද්‍යාඥ සේවයේ පුරප්පාඩු 22ක් තිබෙනවා; කළමනාකරණ සහකාරවරුන් 15 දෙනකුගේ පුරප්පාඩු තිබෙනවා; නවීන ඒකාබද්ධ කාලගුණ අනාවැකි පද්ධති නැහැ; Doppler radar system එක තිබෙන්නේ ගොංගල පමණයි; රිවස්ටන් ප්‍රදේශයේ එය තවමත් ස්ථාපනය කර නැහැ. මේ වාගේ බරපතළ අඩු පාඩුකම් රැසක් තිබෙනවා. හැබැයි, රුපියල් මිලියන 1,100කින් -කෝටි 110කින්- මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්. නමුත් තවමත් මුදල් අමාත්‍යාංශය මේ සඳහා මුදල් වෙන් කර නැහැ. හැබැයි, මේ රටේ රුපියල් කෝටි 2,000ක් පාඩු ලබන ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනයට කෝටි 3,150ක් වැය කරලා නවීන අහස් යාත්‍රා -ගුවන් යාත්‍රා- 10ක් ඇණවුම් කරන්නට මහා භාණ්ඩාගාරයටත්, මුදල් අමාත්‍යාංශයටත් සල්ලි තිබෙනවා. නමුත් අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැඩි දියුණු කරන්නට, සවිබල ගන්වන්නට කෝටි 110ක් වෙන් කරන්න සල්ලි නැහැ. මේක තමයි රටේ ජනතාවත් සමඟ එළැඹී තිබෙන මහා සමාජ ගිවිසුම.

ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක උත්සවය සම්බන්ධව මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ ගැන බොහෝ දෙනා කථා කළා. ඇත්ත වශයෙන්ම රටට ආදරය කරන දේශපාලනඥයින් හැටියට, පොදු රාජ්‍ය මණ්ඩලීය නායක හමු හෝ වෙනත් රාජ්‍ය තාන්ත්‍රික ජාත්‍යන්තර හමු අපේ රටේ ක්‍රියාත්මක කරනවාට අපි කිසි සේත්ම විරුද්ධ වන්නේ නැහැ. අපි දේශපාලන කුහකයෝ නොවෙයි. පිට රටියන් අපේ රටට ආවාම අපි රට විවේචනය කරලා රට පාවා දෙන්න යන්නේ නැහැ. හැබැයි, වාහන ගෙන්වන්න කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වැය කරන්නට යනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දින තුනක් හතරක් පමණක් පවත්වන මේ සමුළුවට ප්‍රවාහන පහසුකම් ලබා දෙන්නට මේ රටේ පොහොසතුන්ට අයිති අධි සුඛෝපභෝගී වාහන දින පහකට ස්වේච්ඡාවෙන් ලබා දෙන්නය කිව්වොත් අර වියදම් කරන මහා මුදලින් කොටසක් ඉතිරි වෙනවා නේද කියන එක මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඒ ඉතිරි වන මුදලින් පොහොර සහනාධාරය දෙන්න පුළුවන් නේද? ගුණාත්මක පොහොර ගෙන්වන්න පුළුවන් නේද? ඒ වාගේම ගොවි විශ්‍රාම වැටුප ලබා දෙන්න පුළුවන් නේද? මේ රටේ පාසල් යන සමස්ත දූ දරුවන්ට දිවා ආහාරය දෙන්න පුළුවන් නේද? පාසල් දරුවන්ගේ දිවා ආහාරය සියයට 27කට පමණක් ලබා දීලා සියයට 73කට කප්පාදු කරලා තිබෙනවා. ලජ්ජයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. දින තුන හතරක් පමණක් පවත්වන මේ රාජ්‍ය තාන්ත්‍රික මහා මඟුලට මේ තරම් කෝටි ගණන් සල්ලි වෙන් කරලා කටයුතු කරන්නේ ඇයි? මේ රට පෝෂණය කරන, මේ රටට ශක්තිය ලබා දෙන පුංචි මනුෂ්‍යයාට ශක්තිය ලබා දෙන්නට මහා භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් නොකරන්නේ ඇයි කියන එක මා මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுணுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ආචාර්ය සරත් අමුණුගම නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා විනාඩි -[බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මොකක්ද point of Order එක? [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මගේ වෙලාව ගන්න එපා.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
එහෙනම් උත්තරයක් ඕනෑ නැද්ද? [බාධා කිරීම්] ඔබතුමා දැන් විනාඩි 10ක් විතර "ඇයි, ඇයි, ඇයි" කියලා ඇහුවා. මාව ආමන්ත්‍රණය කළා. බොහොම සන්තෝෂයි. මා කියන්න කැමැතියි, අපි මේ වාහන ගන්නේ දැනටමත් ඒ අමාත්‍යාංශවලට වෙන් කරපු ප්‍රතිපාදනවලින් බව. අලුත් මුදල්වලින් නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පැහැදිලිව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට ඕනෑ -[බාධා කිරීමක්] එතුමාට mike එක දීලා තිබෙන්නේ මොකද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් නැහැ. මොනවා හෝ පගාවක් දෙනවාද mike එක දාන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
නැහැ, නැහැ-[බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
එහෙනම් මොකද mike එක දමන්නේ? මොකක් හෝ රාජ්‍ය තාන්ත්‍රික පගාවක් දෙනවාද? [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, point of Order එක කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
නැහැ. Point of Order එකක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට බාධා කරන්න එපා. දෙපැත්තටම එක හා සමානව සලකන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, point of Order එක කියන්න.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
Sir, I am raising a point of Order. - [*Interruption.*]

ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර - තේසිය මොළිකළ්, සමූක ඔරුමෙප්පාට්ටු අමෙච්චර්)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
Sir, you must allow the point of Order to be raised.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
Hon. Minister, please raise your point of Order.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(මාණ්පුමිකු කලානිති සරත් අමුණුකම)
(The Hon. (Dr.) Sarath Amunugama)
මේ ගරු සභාවේ යම් කිසි මන්ත්‍රීවරයකුට ආමන්ත්‍රණය කරලා ප්‍රශ්නයක් ඇහුවාම එතුමාට අයිතියක් තිබෙනවා; සම්ප්‍රදායයක් තිබෙනවා; ඒකට ඉඩ දෙන්න ඕනෑ. ඒක තමයි -[බාධා කිරීමක්] නැහැ. අපිට පිළිගන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ යම් කිසි සම්ප්‍රදායක් තිබෙනවා. මොකද, -[බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරන්න. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා -[බාධා කිරීමක්] මන්ත්‍රීතුමා ඔබතුමාට ඉඩ දෙන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Presiding Member)
ඇමතිතුමාට උත්තර දෙන්නට සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වෙලාව දෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මගේ කාලය කන්නේ නැතුව මට කථා කරන්න ඉඩ ලබා දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මගේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියා. [බාධා කිරීමක්] වර්තමාන රජය දෙස බැලුවාම ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, ක්‍රියාත්මක වන්නේ දිව දෙකේ රාජ්‍ය පාලනයක්. දිව දෙකේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේ. මේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රජය වෙනමම විදේශීය සංවිධාන දෙකකට -ආයතන දෙකකට- මුදල් ගෙවනවා. Majority Group එකට මාසයකට ලක්ෂ 63කුත් Thompson Advisory Group එකට මාසයකට ලක්ෂ 83කුත් හැම මාසයකම මහ බැංකුවෙන් ගෙවනවා. මොනවාටද? අපේ රටට වැඩි වැඩියෙන් ඇමෙරිකාවෙන් ආධාර ලබා ගන්න. අපේ රටට වැඩි වැඩියෙන් සහන ලබා ගන්න. අපේ රටට ඇමෙරිකාවෙන් වැඩි වැඩියෙන් ආයෝජන ශක්තිය ලබා ගන්න. මාසයකට Majority Group එකට ලක්ෂ 63ක් ගෙවනවා. Thompson Advisory Group එකට ලක්ෂ 83ක් ගෙවනවා. එක පැත්තකින් මහ බැංකුව එහෙම රංගනයක් ක්‍රියාත්මක කරන විට තවත් පැත්තකින් රජයේම පාර්ශ්වයක් වන විමල් වීරවංශ මැතිතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා, Google වර්ජනය කරන්න; Gmail වර්ජනය කරන්න; Kentucky Fried Chicken වර්ජනය කරන්න; McDonald's වර්ජනය කරන්නය කියා. රජය එක පැත්තකින් ඇමෙරිකානු ආයතන දෙකකට මුදල් ගෙවනවා; මේ රටට ආයෝජනය ගෙන එන්න; මේ රටට ආධාර ලබා ගන්න; මේ රටට ශක්තිය ලබා ගන්න. මේ දිව දෙකේ ජවනිකාව, දිව දෙකේ රාජ්‍ය තාන්ත්‍රික මහා රංගනය තුළ විමල් වීරවංශ ඇමතිතුමා කියනවා, Google පාවිච්චි කරන්න බැහැ; Gmail පාවිච්චි කරන්න බැහැ; McDonald's එකෙන් කන්න බැහැ; Kentucky Fried Chicken කන්න බැහැ කියා. මොන විහිළුවක්ද? මොකක්ද මේ දිව දෙකේ රංගනය? මොකක්ද මේ දිව දෙකේ දේශපාලනය?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම මම ඔබතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරවනවා. මා හිතවත් උගත් ගරු සරත්අමුණුගම ඇමතිතුමනි, මේ රටේ අපනයනවලින් සියයට 21.7ක් යන්නේ කොහාටද කියා ඔබතුමා දන්නවා. ඇමෙරිකා එක්සත් ජනපදයටයි. ඔබතුමා මට කියන්න, Google වර්ජනය කරන්න; Gmail වර්ජනය කරන්න කිව්වාම අපේ අපනයන විවිධාංගිකරණය වෙනවාද; අපට අලුත් අපනයන වෙළෙඳ පොළවල් ලැබෙනවාද කියා. මොකක්ද මේ විහිළුව? මේක හරියට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සංදර්ශනය වාගෙයි. වාසුදේව ඇමතිතුමා කියනවා, දහතුන තියා ගන්න; දහතුන plus කරන්න කියා. වීරවංශ මැතිතුමා කියනවා, දහතුන minus කරන්න කියා. මේක ද්විත්ව රංගනයක් නොවෙයි; කකුල් දහයේ රංගනයක්. ඒ නිසා ගරු ඇමතිතුමනි, මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ දිව දෙකේ රංගනය නතර කරන්න කියා. මේ රටේ පේසන්ම සියයට 20ට ජාතික ආදායමෙන් සියයට 54.1ක් ලැබෙනවා. දුප්පත්ම සියයට 20ට ලැබෙන්නේ සියයට 4.5යි. හැබැයි, ගරු ඇමතිතුමනි, දන්නවාද මේ රාජ්‍ය රංගනයේ මහිමය? අපි තාක්ෂණ විද්‍යාලයක් හදන්න උගන්ඩාවට ඩොලර් මිලියන 1.5ක් දෙනවා. ඩොලර් මිලියන 1.5ක් උගන්ඩාවට දෙන්න පුළුවන්. අපේ රටේ ගොවි ජනතාවට ගොවි විශ්‍රාම වැටුප දෙන්න බැහැ; ධීවරයින්ට ඉන්ධන සහනාධාරය දෙන්න බැහැ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ රටේ ගෙවල් හතළිස් දෙලක්ෂය හදන්න බැහැ. හැබැයි, උගන්ඩාවට දෙන්න පුළුවන් මිත්‍රත්ව තාක්ෂණ විද්‍යාලයක් හදන්න කෝටි 19.5ක්. ඒ විතරක් නොවෙයි, බටහිර උගන්ඩාවේ පානීය ජල ප්‍රශ්නය විසඳන්නට රුපියල් කෝටි 1,950ක් දෙන්න සල්ලි තිබෙනවා. හැබැයි, මේ රටේ සියලුම පාසල් දූ දරුවන්ට දිවා ආහාරය දෙන්න බැහැ; දෙවැනි නිල ඇඳුම් කට්ටලයක් දෙන්න බැහැ; සපත්තු කුට්ටමක් දෙන්න බැහැ. ඒවා දෙන්න බැහැ. හැබැයි, උගන්ඩාවට දෙන්න පුළුවන්. මොකක්ද මේ රංගනය? මොකක්ද මේ විහිළුව? මේ රජය ඉන්නේ උගන්ඩාවේ ජනතාවගේ පිහිටෙන්ද, එහෙම නැත්නම් ලංකාවාසී ජනතාවගේ පිහිටෙන්ද කියන කාරණය මා අහන්න කැමැතියි. මා දැන් මගේ කථාව අවසාන කරන්න බලාපොරොත්තු වනවා. [බාධා කිරීමක්] මගේ කථාව අවසාන කරන්න අවස්ථාව දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්න මට අවස්ථාව ලබා දෙන්න. ඊයේ දවසේ විදුලි බල ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන මොහොතේ අප දැක්කා, මේ රටේ බදු ගෙවන්නන්ගේ සල්ලිවලින් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවේ පැවැති ඒ රහ දැක්ම. ඊයේ විදුලි බලය ගැන කථා කළේ නැහැ; විදුලි පාරිභෝගිකයාට දෙන සහන ගැන කථා කළේ නැහැ. වෙනත් බහුබූත තමයි කථා කළේ. පාර්ලිමේන්තුවක් රැස් වෙන්නේ මේකටද? මේ රටේ බදු ගෙවන ජනතාවගේ සල්ලිවලින් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුව ඊයේ දවසේ වල්පල් කථා කරන්න කටයුතු කළ ආකාරය මා දැක්කා. වල්පල් තමයි ඊයේ කථා කළේ. මේ උත්තරීතර සභාව තිබෙන්නේ යුක්තිගරුකව රටට නීති සම්පාදනය කරලා රටේ ජනතාව ජීවත් කරවන්නයි.

මා ධම්මපදයේ ගාථාවකින් මගේ කථාව අවසාන කරනවා.

" සහස්සමපි චෙ වාචා - අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති"

ලොව්තුරා බුදු රජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, නිසරු පද දහසකට වැඩිය කෙලෙස් දුරලන එක පදයකින් රටටත්, ජනතාවටත් සෙතක් සැලසෙනවා කියලා. ඒ බුදු වදනින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[5.01 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Presiding Member, before I discuss the subject that is before the House, I think it is a duty cast on me, not only as a Member of the Government but also as a Sri Lankan to meet certain unfounded charges made by both the JVP, who were earlier *Gathakayas* in this country, the Hon. Anura Dissanayake, and also my good Friend - I call him a "baby" because I carried him as a baby. It is a far cry from a man who wanted to build up -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

මා අස්වර් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නාමල් රාජපක්ෂ මැතිතුමාට නිගරු කරන්න එපා කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Point of Order එක කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි කිව්වේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Point of Order එකක් නැහැ. ගරු අස්වර් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු මන්ත්‍රීතුමා, එතුමා ශ්‍රේෂ්ඨ නායකයෙකුගේ ශ්‍රේෂ්ඨ පුතෙක්. නමුත් තමන්ගේ පියාගේ ශ්‍රේෂ්ඨත්වය රැක ගන්නට දන්නේ නැති පුතකු පිළිබඳව කථා කරලා වැඩක් නැහැ. තමුන්නාන්සේ මට එදාත් බබා; අදත් බබා. තවම වැඩිලා නැහැ; mature වෙලා නැහැ. දැන් මොකක්ද කියන්නේ? පොදුරාජ්‍ය මණ්ඩල සම්මේලනයෙන් කිසිම වැඩක් නැහැලු. සුදු රැජිනගේ මොකක්ද වහ ගන්න මේ සම්මේලනය පවත්වනවාලු. ඒක එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියද, policy statement එකද කියලා මා අහන්න සතුටුයි. මා සජිත්ට -පුංචි බබාට- කියන්නට ඕනෑ, එතුමාගේ පියා -ආර්. ප්‍රේමදාස මැතිතුමා- Commonwealth Heads of Government Meeting එක ඒ දවස්වල එංගලන්තයේ තියන කොට මෙහේ ඉඳලා ඇලෝසියස් මුදලාලිවත් එක්කගෙන ගිහිල්ලා Commonwealth නායකවරුන්ට තොරණ හදලා පෙන්නුව බව. තොරණ හදලා පෙන්නුවා. අපේ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුවා, "These are our assets" කියලා. එවැනි නායකවරුන්ගේ -

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order. This Hon. Member is misleading the House. What the Hon. Sajith Premadasa said was that he has nothing against the Commonwealth Heads of Government Meeting. He only criticized the way it is to be conducted.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මා එතුමා පිළිබඳවත් කනගාටු වනවා. ඊයේ දයාසිරි මන්ත්‍රීතුමාට එපා වෙලා, එපා වෙලා, එපා වෙලා මෙහාට පැන්නා. සිරිකොතෙන් පොඩි වන තුරු ගහලා, ගහලා කවදා හරි එතුමාත් ඉක්මනට මේ පැත්තට එන බවත්, ඒ වෙලාවට "ආවඩා" කියා තමුන්නාන්සේ වඩා ගන්නත් මා කැමැතියි කියලා කියනවා.

සජිත් ප්‍රේමදාස මහත්මයාට හුහක් දේවල් ඉගෙන ඕනෑ. He brings statistic from all over. His job during the Question Time is to bring in statistic. He never recognizes or honours the Standing Orders followed in the House. When three Supplementary Questions could be asked from the Answer given, he goes around and asks the same thing.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
There is no point of Order, Sir. I have not spoken anything against the Standing Orders.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, according to the Standing Orders, the speakers have to have capabilities in proper pronunciation. It is "statistics". Please ask him to pronounce it well.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I taught him අ, ආ, I taught him A, B, C, D before he went to London and took a certificate from a pavement tutory. Sir, he took a certificate from a pavement tutory; I feel very sorry for him. What a character he has turned out to be! That is far, far away from the image His Excellency R. Premadasa wanted to build up.

Sir, with regard to the CHOGM, Mr. Raj Pal Abeynayake, the Editor of the "Daily News" has a premonition. He has written a timely, appropriate editorial on the 22nd of July, 2013. Perhaps, he knows that the Hon. Sajith Premadasa and the Hon. Anura Dissanayake would be castigating the CHOGM. Now, look at this. I quote:

> " The Powerful CHOGM Message"
>
> " The Cassandras are at it again, and their droning on is worse than a lethal U.S government unmanned aircraft assault……..People are free to fantasize about such positions in a free country such as ours..."

You can speak freely because there is freedom in this country. - [*Interruption*.] You do not know Sinhala. How can you teach me English? You had better pronounce Sinhala words correctly.
I further quote:

> " …..but one needs to wonder about the productivity of such fantasies in the long term. People should indeed be more worried about their long term prospects and without a doubt these will be served by the Commonwealth Heads of Government meeting. All countries which have had events such as CHOGM on their calendar during a phase of growth and development have benefited enormously from the visibility that these events afforded such countries - Malaysia and Singapore being the two prime examples."

Sir, the reality is powerful. He is not ready to listen. He cannot understand English. He is running away; he cannot understand what is there in the "Daily News".

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order please! Will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

I propose that the Hon.(Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේ ඔබතුමිය මූලාසනයට පැමිණීම අප සතුටින් පිළිගන්නවා.
I again quote:

> " This reality is powerful - and a few chatterers on the sidelines will merely represent the pathetic state of denial of the chattering classes,
>
> and that's what mainly underlies the recent spate of predictions by the Cassandras to the effect that the next months are 'make or break', or that there is irredeemable division within the government. All this provides a sort of a comic backdrop to a happy upbeat scenario. It's as if the clowns are doing their bit before a very riveting show begins."

They have turned into clowns. I am not worried about the Hon. Anura Dissanayake. But, there is a new clown.

කැරලා වාගේ කොච්චර කෑ ගැහුවාත් සජිත් ප්‍රේමදාස මැතිතුමාට සිරිකොතේ තැනක් ලැබෙන්නේ නැහැ. කෝට්ටේ මඩ වගුරේ තමයි ඔබතුමා ඔබන්නේ. එතකොට, සමහර විට තමුන්නාන්සේ ආරක්ෂා කරන්න අපි එන්නත් පුළුවන්. අන්න ඒක හිතා ගන්න. [බාධා කිරීම්] ඔය කෑ ගහන හුඟ දෙනෙක් මේ පැත්තටයි එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා යෝජනා කරන්නේ මොනවාද? මෙන්න බලන්න.

"භාණ්ඩ 31ක් සඳහා ගැසට් නිවේදන 4ක් යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක වූ අතර ඒවායේ වලංගු කාලය අවසන් වීමට නියමිත වූ බැවින්, ඒ සඳහා නව ගැසට් නිවේදනයක් නිකුත් කිරීම අදාළ පනත ප්‍රකාරව සිදු කළ යුතු විය. මෙම කාලයේ ඇති වූ අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් අපේක්ෂිත අස්වනු අඩු වීම මත එළවලු ඇතුළු අත්‍යවශ්‍ය ආහාර මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවක් මතු වූ බැවින් හා පැවති උත්සව සමයද සැලකිල්ලට ගෙන, පාරිභෝගික ජනතාවට අත්‍යවශ්‍ය ආහාර සඳහා සලසන සහනයන් එලෙසම පවත්වා ගැනීමේ අරමුණෙන්ද, පවත්නා බදු අනුප්‍රමාණ එලෙසම පවත්වා ගනිමින් මෙම ගැසට් නිවේදනය ක්‍රියාත්මක කරන ලදී. එයට අමතරව, දේශීය පොල් තෙල් නිෂ්පාදකයින් ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන්, අඩු බද්දක් යටතේ මෙරටට ගෙන්වා පොල් තෙල් සඳහා කලවම් කිරීමට යොදා ගන්නා පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට ඇතුළත් කර ඉහළ බදු අනුප්‍රමාණයක් පැනවීමද මෙම ගැසට් නිවේදනය මඟින් සිදු විය."

පතෝලයක් උස්සන් ගියාට අද පතෝලයත් නැහැ. පතෝලය ඔසවා ගෙන ගිය මිනිහාත් නැහැ. පතෝලයට කර ගහපු කෙනාත් නැහැ. කැඩී බිඳී ගිහිල්ලා. අපි ඊයේ දැක්කානේ, මෙතැන මොකක්ද වුණේ කියන එක. අද කවුරුවත් නැහැ.

මාතර දිස්ත්‍රික්කයෙන් ප්‍රථම තැනට ආවා බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. කෝ, එතුමාට තැනක් නැහැ. අද වන කොට එක්සත් ජාතික පක්ෂයේ නායකයන් 68 දෙනෙකු පමණ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට එකතු වෙලා තිබෙනවාය කියන එක මා තමුන්නාන්සේට මතක් කරනවා මේ ගරු සභාවේදී. මෙන්න, එක්සත් ජාතික පක්ෂය හැල්ලුවට පත් වෙලා තිබෙන්නේ; නාය යනවා. ලජ්ජයි, පිරිහෙනවා. ඒ නිසා තමුන්නාන්සේ ඔය කටුස්සන්ගෙන් පරිස්සම් වන්න. කවුද කියන්නේ? ගෙම්බෝ කිව්වා. කවුද එහෙම කියන්නේ? හර්ෂ ද සිල්වා. එයාට ආචාර්ය පට්ටමක් දුන්නේ කවුද?

මේ බලන්න Ministry of Finance and Planning එකේ 2012 වර්ෂයේ Annual Report එක. මේ හොඳට වැඩ කරන අය. ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා. ඒ වාගේම තමයි Central Bank එකේ අජිත් නිවාඩ කබ්‌රාල් මැතිතුමා. ඒ අය ගැන මොකක්ද මේගොල්ලන්ට තිබෙන කැක්කුම? [බාධා කිරීම්] අන්න හරි. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කටට දැන් සීනි ටිකක් දමන්න ඕනෑ. ඒගොල්ලන් මහාචාර්ය මහාචාර්යවරු. මොකද, රට නංවන්න, රට සංවර්ධනය කරන්න, මේ රජයේ ප්‍රතිපත්ති පෙරට ගෙන යෑම සඳහා රෑ දවල් දෙකේ වෙහෙස මහන්සි වෙලා වැඩ කරන අය. තමුන්නාන්සේ වාගේ වතුර බීබී කැලේ දුවන අය නොවෙයි. ඒගොල්ලන් වැඩ කරනවාය කියන එක මා තමුන්නාන්සේට අවධාරණය කරනවා. ඔබතුමා තවත් වතුර බෝතලයක් බොන්න. බී බී ඉන්න. එපමණයි මේ ගරු සභාවේ කරන්න දන්නේ. මෙවැනි අයට මොකක්ද මේ ලංකාවේ තිබෙන්නා වූ අනාගතය? මේ CHOGM එක මේ රටේ පවත්වන්නට එපා කියන මූලික කරුණ මොකක්ද?

What is the reason behind this? It is a conspiracy, an international conspiracy, and the local conspirators have joined hands with them. The other day, the Hon. Mangala Samaraweera said that Callum Macrae of Channel 4 will not sleep until we solve the human rights problem. What is the human rights problem that they are speaking of? They must look at their figures in the mirrors. Then, they would see what is in the West. Day in and day out, the Palestinian people are suffering. We know about the torture camps that are conducted in certain Western countries. They are the people who are violating the human rights day and night. You had better turn to them.

Now, what is happening? The conspiracy is this. After CHOGM takes place in this country, our President elected by a majority of nearly 20 lakhs of votes will be the Leader of the Commonwealth for the next two years.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි, හොඳයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කියනවා, හොඳයි කියලා. ඒකත් හොඳයි. ඒකත් හොඳ කථාවක්. ඒකයි කැසිල්ල. ඒකයි ඊර්ෂ්‍යාව.

ඒක නවත්වන්න හදනවා. ගිහිල්ලා කියලා තිබෙනවා, මානව අයිතිවාසිකම් ගැන. මොන මානව අයිතිවාසිකමක්ද තිබෙන්නේ? සියලුම මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන රජයක් මේක. උදාහරණයක් හැටියට කියන්නම්. අද උතුරු කොළඹ ඉඳලා දකුණට යන්න; වැල්ලවත්තට යන්න. මට්ටක්කුලියේ ඉඳලා, කොච්චිකඩේ ඉඳලා වැල්ලවත්තට යන්න. අපේ සුහද මිතුරන්; ද්‍රවිඩ ජාතිකයන් මොන තරම් අලංකාර විධියට බිස්නස් කරනවාද; සල්ලි හම්බ කරනවාද කියලා බලන්න. ඊයේ පෙරේදා-

The Vel cart and procession went through the streets without any problem and in the absence of His Excellency the President, Madam Shiranthi Rajapaksa received the Vel cart at his official residence, "Temple Trees". Now, we proceed further away to the Colombo Tamil Sangam in Wellawatte.

See how the Tamil Language is being fostered and developed. Everyday, they hold seminars at Tamil Sangam. The Indian lecturers are coming, lecturing and launching Tamil books here. At the Ramakrishna Mission, there is also the “Kamban Vila” festival held annually. There is no problem whatsoever. Our ladies -

தமிழ்ப் பெண்கள் பூவும் பொட்டும் வைத்து அழகாக உடையணிந்து வீதியிலே செல்கின்ற காட்சியை நாங்கள் இந்த மஹிந்த ராஜபக்ஷ ஆட்சியில்தான் கண்டுகளிக்கக்கூடியதாக இருக்கின்றது. உங்களால் பார்க்க முடியாவிட்டால் கண்களைப் பொத்திக்கொள்ளுங்கள். அழகான பெண்மணிகள்! அன்று அவ்வாறு அவர்களால் போக முடியவில்லை - நடமாட முடியவில்லை; பயத்தால் - பீதியால் அவர்கள் நடுநடுங்கினார்கள். அப்படியான நிலைமையை இல்லாமல் செய்தது யார்? அதனை நாங்கள் முதலில் அறிய வேண்டும்.

இன்று இன்னொரு நாடகம் அரங்கேற்றப்பட்டிருக்கின்றது. அதுதான் வடக்கு மாகாணத்துக்கான தேர்தல்! நாங்கள் பொருளாதாரத் துறையிலே வடக்கையும் அபிவிருத்தி செய்துகொண்டுதான் இருக்கின்றோம். இன்று நான் யாழ்ப்பாண அரசாங்க அதிபர் சுந்தரம் அருமைநாயகம் அவர்களோடு தொலைபேசியில் தொடர்புகொண்டு சில விடயங்களைக் கேட்டறிந்தேன். யாழ்ப்பாணத்தை அபிவிருத்தி செய்ய மாத்திரம் 68,683.20 மில்லியன் ரூபாயை அரசாங்கம் செலவு செய்திருக்கின்றது. அதேபோல், கிளிநொச்சி மாவட்டத்தை அபிவிருத்தி செய்வதற்காக 28,775 மில்லியன் ரூபாய் செலவழிக்கப்பட்டிருக்கின்றது; தொடர்ந்தும் செலவழிக்கப் பட்டு வருகின்றது. A sum of Rs. 216 billion has already been spent by the Government to develop the North. That is how this Government functions.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මට තව මිනිත්තු දෙකක් දෙන්න. තව එක කාරණයක් කියන්න තිබෙනවා. Now, see what the "Virakesari" of 22nd July, 2013 states, I quote:

"சர்வதேசத்தின் நிலைப்பாட்டை அறிந்தே முதலமைச்சர் வேட்பாளர் தெரிவு" - சம்பந்தன்

So, in the North, there is dictatorship. Yesterday, on a TV show, the veteran politician, Hon. V. Anandasangaree said that there is dictatorship in the TNA and he said the Hon. R. Sampanthan is a dictator.

"சர்வதேசத்தின் நிலைப்பாட்டை அறிந்தே தமிழ்த் தேசியக் கூட்டமைப்பின் வட மாகாண சபை முதலமைச்சர் வேட்பாளர் தெரிவு இடம்பெற்றது."

என மேலும் அப்பத்திரிகை குறிப்பிடுகிறது. இந்த நாட்டு மக்களைப் பற்றியோ, வடபகுதியில் இருக்கின்ற தமிழ் மக்களைப் பற்றியோ சிந்திக்காமல், சர்வதேசத்தைத் திருப்திப்படுத்துவதற்காகவே கூட்டமைப்பினர் விக்கினேஸ்வரன் அவர்களைத் தெரிவுசெய்திருக்கின்றார்கள்.

"முதலமைச்சர் வேட்பாளராகக் களத்தில் குதிக்க நான் தயார் - மாவை எம்.பி. தெரிவிப்பு"

என்றும் 'வீரகேசரி' கூறுகிறது. ஐயோ! விக்கினேஸ்வரன் ஐயாவைத் தெரிவுசெய்த நாளிலிருந்து நாங்கள் எந்தநாளும் கண்டு பழகிய அந்த முகம் - மாவை சேனாதிராஜா ஐயா - இந்தச் சபைக்கு வருவதில்லை. எனவே, இப்படியான விடயங்களில் அவர்கள் என்ன செய்கின்றார்கள்?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Madam Presiding Member, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විග්නේශ්වරන් මැතිතුමා ගැන මොකුත් කියන්න එපාය කියන්න. මොකද, අපේ ඇමතිවරයෙකුට එතුමාගේ ඥාති සම්බන්ධකමක් තිබෙනවා. ඒක නිසා විග්නේශ්වරන් මැතිතුමා ගැන සඳහන් කරමින් කථා කිරීම ඉතාමත් අසාධාරණයි. ආණ්ඩුවේ ඇමතිවරයෙකුට එතුමාගේ ඉතාමත්ම ළඟ ඥාති සම්බන්ධතාවක් තිබෙනවා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ කථාවේ ස්ථාවර නියෝගවලට පටහැනි යමක් තිබෙනවා නම් එය ඉවත් කරන ලෙසට මා නියෝග කරනවා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තියා ගෙන එක්සත් ජාතික පක්ෂය හදන්නේ කොහොමද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ "සුඩර් ඔළි" පුවත් පතේ හොඳ හොඳ දේවල් තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Madam Presiding Member, I rise to a point of Order.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Point of Order ගෙදර ගිහිල්ලා අහන්න. දැන් ගෙදර කවුරුවත් නැහැ නේ. එයා ගෙදර ඉන්නේ නැහැ නේ. එයා ඉන්නේ වෙන ගෙදරක.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගැන පොඩ්ඩක් නියෝජ්‍ය මහ ලේකම්තුමාගෙන් අහන්න. තවත් මන්ත්‍රීවරයකුට intentions impute කරන්න බැහැ. ඒ ගැන ඔබතුමිය Ruling එකක් දෙන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔළමොට්ටළ කියන්නේ මොකක්ද? ඒ සිංහල වචනය-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම කථා කරන්න බැහැ. සම්පූර්ණයෙන්ම ස්ථාවර නියෝගවලට පටහැනියි. [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ සිංහල වචනය-

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තමන්ගේ නම වෙනත් කෙනකුට කියන්න බැහැ. තමන්ගේ නම තමන්ට විතරයි කියා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ ප්‍රකාශය ඉවත් කරන්න නියෝග කරනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
නැහැ, නැහැ. මම ඔළ මොට්ට කිව්වේ- [බාධා කිරීමක්] ඒ සිංහල වචනයවත් තේරෙන්නේ නැහැ. බුද්ධියෙන් තොරව කථා කරන මිනිස්සුන්ට තමයි ඔළ මොට්ට කියන්නේ.

මේ "සුඩර් ඔළි" පුවත් පතේ කියනවා, මාවෙ සේනාධිරාජාව පිළිගන්න- [බාධා කිරීමක්]

"வடக்குத் தமிழ் மக்களின் எதிர்காலம் கேள்விக்குறி"

"மாவையைச் சந்தித்து வவுனியா தமிழ்ச் சமூகம் கடும் அதிருப்தி"

இப்படி 'சுடர் ஒளி' பத்திரிகையிலே நல்ல செய்திகளை ஒவ்வொன்றாக வெளியிட்டு வருகின்றார்கள்.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අපහාස කර ගැනීමෙන් වළකින්න කියලා මා නියෝග කරනවා. එකිනෙකාට අපහාස කර ගන්න එපා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අවර්කලුන්ක්කු එතිර්කාලම් ඉල්ලෙ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
இறுதியாக ஒரு விடயத்தை நான் சொல்ல விரும்புகின்றேன். அதாவது, யாழ்ப்பாண மக்களுக்கு அபிவிருத்தி தேவை; அவர்களுக்கு நல்ல ஓர் எதிர்காலம் தேவை; அவர்களுடைய பிள்ளைகள் படிக்க வேண்டும்; அவர்கள் நல்ல வாழ்வு வாழ வேண்டும். அந்த அடிப்படையில் அவர்கள் எல்லோரும் அரசாங்கத்துக்கு ஆதரவளிப்பதற்கு முன்வந்திருக்கின்றார்கள் என்ற நல்ல செய்தியை உங்களுக்குச் சொல்வதுடன், வடக்கிலும் அரசாங்கம் வெற்றிபெறுமென்று கூறி, நான் விடை பெறுகின்றேன். மிகவும் நன்றி.

සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, තේරුණාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Madam Presiding Member, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ස්ථාවර නියෝගවලට අනුකූලව කුලියට කහින්න තහනම්. කුලියට කහින්න බැහැ. ඒක පොඩ්ඩක් පැහැදිලි කර දෙන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

මීළඟට ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.20]

ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බදු ක්‍රමය ගැන කථා කරන මේ අවස්ථාවේ දී ද්විත්ව බදු ක්‍රමය ගැන වචන ස්වල්පයක් කථා

කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. ආයෝජනය තමයි රටක සංවර්ධනය සඳහා බලපාන ප්‍රධානතම සාධකය. මොකද, ආයෝජනය රටේ සංවර්ධනයට ඍජුවම බලපාන නිසා. රටේ සංවර්ධනයට ආයෝජනය බලපාන නිසා, ආයෝජකයන්ට තමන්ගේ රටේ වාගේම, වෙනත් රටක ආයෝජනය කරනවා නම් ඒ ආයෝජනය කරන රටේ බදු ක්‍රමයට යටත් වෙන්න සිදු වුණොත් ඒක ඉතාම අසාධාරණයි. ඒ අසාධාරණත්වය නිසාම තමයි ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ඔවුන් අධෛර්යට පත් වන්නේ. ඒ නිසා තමයි ද්විත්ව බදු ක්‍රමය අහෝසි කරන්නට මේ තීරණය අර ගෙන තිබෙන්නේ.

රටක් සංවර්ධනය වන්නට නම් ආයෝජන කරන්නට ඕනෑ. එහෙම ආයෝජන කරන්නට නම් රටේ සාමය ස්ථාපිත වෙලා තිබෙන්න ඕනෑ. එහෙම නම් අපි අතීතයට යන්න අවශ්‍යයි. මොකද, ඒකත් මේ ආයෝජනය සහ සංවර්ධනයට ඍජුව සහ වක්‍රව බලපාන සාධකයක් නිසා.

අද එක්සත් ජාතික පක්ෂයේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, සමාජ ගිවිසුම කීතු කීතු වෙලා තිබෙනවාය කියලා. මම හිතන්නේ නැහැ, මොන වාගේ තත්ත්වයක් යටතේ ඒ වාගේ ප්‍රකාශයක් කරනවාද කියලා. එක්සත් ජාතික පක්ෂයේ පමණක් නොවෙයි, සමාජයේ සිටින සියලුම පුරවැසියන්ට ජීවත් වීමේ නිදහස ලබා දී තිබෙන්නේ අපේ රජය විසින්; අපේ අතිගරු ජනාධිපතිතුමා විසින්. මම හිතන හැටියට, ඒකම ඇති. සමාජ ගිවිසුම වසර ගණනාවකට ස්ථාපිත කළාය කියලා කියන්න පුළුවන් හොඳම සාධකයක් තමයි ඒක. යුද්ධය පැවතුණු අවුරුදු තිහක, තිස්පහක කාලය තුළ දී විවිධ ආණ්ඩු තිබුණා. ඒ වාගේම විවිධ රාජ්‍ය නායකයෝ, සේනාධිනායකයෝ යුද්ධය ගැන දැක්වූ ආකල්ප ගැන මට ඉතා හොඳ දැනුමක්, අවබෝධයක් තිබෙනවා.

මොකද, යුද්ධය ආරම්භ කරන කොටත්, යුද්ධය අවසාන වෙන කොටත් අවුරුදු 39ක් තිස්සේ මම හමුදාවේ සාමාජිකයෙකු වෙලා හිටපු නිසා. ඒ විවිධ අවස්ථාවල අපේ ගම්මානවල වැසියන් කපා කොටා කීතු කීතු කරලා ඝාතනය කරන කොට ඒ ඒ රාජ්‍ය නායකයින් දැක්වූ ආකල්ප මා ඉතාම හොඳින් දන්නවා. ඒ වාගේම වර්තමාන රාජ්‍ය නායකයාගේ හදවතේ තිබුණු ගැස්ම සහ ඇති වූ වේදනාව ගැනත් මා ඉතාම හොඳින් දන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, GSP Plus අපට නැති වුණා කියලා. අපට GSP Plus නැති වුණේ ඇයි? ඇත්ත වශයෙන්ම GSP Plus අපට නැති වෙන්න එක හේතුවක් වුණා, බටහිර රටවල් කියන දේ අහන්නේ නැතිව අපේ අතිගරු ජනාධිපතිතුමා සහ ආරක්ෂක ලේකම්තුමා මේ යුද්ධය දිගටම කර ගෙන ගිහිල්ලා ප්‍රභාකරන් විනාශ කිරීම. 1987 වර්ෂයේ සිදු කළ වඩමාරච්චි මෙහෙයුමේදී ඉන්දියාවේ බල පෑමට යටත් වෙලා එදා හිටපු රාජ්‍ය නායකයන් නිවට වෙලා, බෙල ඕන වෙලා, බියගුලු වෙලා මේ යුද්ධය නැවැත්වූයේ කොහොමද කියලා අපි දන්නවා. ඇත්ත වශයෙන්ම අපට එදා තමයි ප්‍රභාකරන් විනාශ කරන්න තිබුණේ. එදා එහෙම වුණා නම්, අපට පසුව නැති වුණු දහස් ගණන් ජීවිත ආරක්ෂා කර ගන්න තිබුණා. ඒ වාගේම හිටපු ජනාධිපති ප්‍රේමදාස මහතාගේ කාලයේදී ඉන්දියාවේ හමුදාව මෙහේ සිටින කොට කොටින්ට ආයුධ දීලා ඉන්දියන් හමුදාව යැව්වා. එදා ඉන්දියන් හමුදාව තුළින් අපි කොටි විනාශ කළා නම්, එදා තමයි එල්ටීටීඊ ත්‍රස්තවාදය විනාශ කරන්න අපට තිබුණු දෙවැනි අවස්ථාව. මේ වාගේ දේවල් කළ එක්සත් ජාතික පක්ෂයට අද සමාජ ගිවිසුම කඩ කළාය කියලා කියන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී කියා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදීන් විනාශ කරලා යුද්ධය සම්පූර්ණයෙන්ම නැති කරලා අද අපේ රට සංවර්ධනය කරා එළඹෙන යුගයකට පැමිණ තිබෙනවා. ඒ නිසා තමයි අතිගරු ජනාධිපතිතුමා ඊයේ පෙරේදා ප්‍රකාශයක් කළේ, "තව දුරටත් අපි කම්මැළි ජාතියක් නොවෙයි, මුළු රටම අද වැඩ බිමක්."ය කියලා. අප ලබා ගත් මේ ඓතිහාසික යුද ජයග්‍රහණයෙන් පස්සේ මේ වෙන කොට අපි වසර හතරක් පසු කරලා තිබෙනවා. ඒ වසර හතර තුළදී මොන තරම් ශීඝ්‍රයෙන් අපේ රටේ යටිතල පහසුකම් වර්ධනය වුණාද කියලා ඕනෑම කෙනෙක් දන්නවා. අද වෙන කොට අපේ රටේ ප්‍රදේශ රැසකට විදුලි බලය ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ සිටින සියයට අසූපහක ජනතාවට අද විදුලි බලය ලැබී තිබෙන බව ඔබතුමියත් දන්නවා. ඒ වාගේම තමයි අද පාරවල් හැදිලා තිබෙනවා. අද අම්පාරේ සිට මහඔයට යන්න ගත වන්නේ විනාඩි 45යි. මහඔය සිට අරලගංවිල පාරේ පොළොන්නරුවට විනාඩි 45යි. එදා ඒ ගමනට පැය හතරක්, පහක් ගත වුණත්, අද පැය එක හමාරකින් අම්පාරේ සිට පොළොන්නරුවට යන්න පුළුවන්. මේ විධියට විශාල වශයෙන් පාරවල් සංවර්ධනය වුණා. ඒ වාගේම බෝක්කු හැදුණා. ගුවන් පාලම් හැදුණා. වරායවල් හැදුණා. ගුවන් තොටුපොළ හැදුණා. යුද්ධය නිමා කරලා ජීවත් වීමේ නිදහස රටට අරගෙන දුන්නාට පස්සේ මේ විධියට ශීඝ්‍රයෙන් යටිතල පහසුකම් සංවර්ධනය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමයි මුදා ගත් ප්‍රදේශ සම්පූර්ණයෙන්ම සරු සාර වුණා. ඒ වාගේම රඹකැන් ඔය, උමා ඔය වාගේ විශාල වාරි කර්මාන්ත යෝජනා ක්‍රම තුළින් වියළි බිම්, හරිත බිම් බවට පත් කළා. මෙවා තමයි යටිතල පහසුකම්. ඒ නිසා කවුරු මොනවා කිව්වත් අද මුළු රටම දන්නවා, අපි සහල්වලින් සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිතයි, උළුවලින් සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිතයි, ඒ වාගේම බඩ ඉරිඟුවලින් සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිතයි කියලා.

අද තොරතුරු තාක්ෂණය අපේ රටේ සියයට තිස්පහක් පුරා පැතිරී තිබෙනවා. ඒක සියයට හැත්තෑපහ දක්වා ඉදිරි වසර කිහිපය තුළදී නංවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමයි තාක්ෂණ විෂය නිර්දේශ සංකල්පය තුළින් අපි අධ්‍යාපනයේ විප්ලවයක් ඇති කරන්න බලාපොරොත්තු වනවා. ඉදිරියේදී සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සමත් වෙලා එළියට යන සිසුන් නන්නත්තාර වන්නේ නැහැ. ඔවුන්ට අනිවාර්යයෙන්ම රැකියාවක බලාපොරොත්තු තබා ගන්න පුළුවන්. මේ විධියට රටේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට හයක් යටිතල පහසුකම් සඳහා රජය ආයෝජනය කරන කොට පෞද්ගලික සහ දේශීය, විදේශීය ආයෝජකයින් විසින් අනෙක් දේවල්වලට සියයට විසිහතරක් ආයෝජනය කළ යුතුයි. මේක තමයි සාමාන්‍යයෙන් පිළිගත් ආර්ථික න්‍යාය. උදාහරණයක් විධියට රුපියල් මිලියන හයකින් අපි පාරක් හදනවා නම්, ඒ පාර දෙපැත්තේ පුද්ගලයෝ සහ දේශීය, විදේශීය ආයෝජනය රුපියල් මිලියන විසිහතරක වටිනාකමකින් තිබෙන්න ඕනෑ. ඒ සඳහා ඒ පාර දෙපැත්තේ අපට නිවාස හදන්න පුළුවන්, එහෙම නැත්නම් වෙළඳ සැල් විවෘත කරන්න පුළුවන්.

එහෙම නැත්නම් නම් කර්මාන්තශාලා දාන්න පුළුවන්. මේක තමයි පිළිගත් ආර්ථික න්‍යාය. මේ අතින් ගියොත් තමයි රටකට දියුණු වෙන්න පුළුවන්. එහෙම නම් රටට ආයෝජනය දැන් එන්න පටන් අරගෙන තිබෙනවා. අපි දන්නවා, පිට රටින් අපි හම්බ කරන මුදල්වලට වඩා අපි පිට රටට යවන මුදල් නැත්නම් ආනයනය සඳහා කරන මුදල් ඉතාම වැඩියි කියලා. ආනයන වියදම්වලින් සියයට 25ක් යන්නේ බනිජ තෙල් ආනයනය සඳහායි. අපි බනිජ තෙල් නිෂ්පාදනය කරන්නේ නැති නිසා ඒ වියදම අපි අනිවාර්යයෙන්ම කළ යුතුයි. නමුත් අපට නිෂ්පාදනය කරන්න පුළුවන් දේවල් තිබෙනවා. අපට සිමෙන්ති නිෂ්පාදනය කරන්න පුළුවන්. අපට යකඩ, වානේ නිෂ්පාදනය කරන්න

[ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා]

පුළුවන්. අපට කිරි නිෂ්පාදනය කරන්න පුළුවන්. අපට සීනි නිෂ්පාදනය කරන්න පුළුවන්. මේවා නිෂ්පාදනය කරන්න රජයකට පමණක් බැහැ. විදේශ ආයෝජකයන් පැමිණිය යුතුයි. ඒ කර්මාන්තශාලා ඇති විය යුතුයි. ඒ විදේශ ආයෝජකයන් මෙහාට ගෙන්වන්න තිබෙන, ඔවුන් දිරිමත් කරන්න තිබෙන එක සංකල්පයක් තමයි ද්විත්ව බදු ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීම. ඇත්ත වශයෙන්ම ඒක තමයි අද මෙතැනදී කරන්නේ. ඒ ද්විත්ව බදු ක්‍රමය අහෝසි කරමින්, ඒ ආයෝජකයන් උනන්දු කළාට පස්සේ අපට රැකී රක්ෂා බොහෝ සංඛ්‍යාවක් එනවා. ඒ වාගේම නිදාවට පත් වෙලා තිබෙන සම්පත් බොහොමයක්ම අපට උද්දීපනය කරලා මතු කර ගන්න - surface කර ගන්න - පුළුවන්. ඇත්ත වශයෙන්ම ඒ තුළින් තමයි රටක් සංවර්ධනය වෙන්නේ.

අපේ රට, රටවල් 40ක් සමඟ මේ ද්විත්ව බදු අහෝසි කිරීමේ ගිවිසුම අත්සන් කරලා තිබෙනවා. ඉන්දියාව, චීනය, බෙල්ජියම, බංගලාදේශය, කැනඩාව වාගේ රටවල් සමඟ ඒ ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේ රටවල ආයෝජකයෝ මේ රටේ ආයෝජනය කළාම ඒ ද්විත්ව බදු ක්‍රමයෙන් නිදහස් වෙනවා. උදාහරණයක් වශයෙන් කැනඩාවේ ඉන්න පුරවැසියෙක් මේ රටේ ආයෝජනය කරලා මේ රටෙන් යම් කිසි ආදායමක් ගත්තොත් ලංකාවේ නීතිය අනුව ඔහු බදු ක්‍රමයකට යටත් වෙනවා. නමුත් ඒ පුද්ගලයා නැවත කැනඩාවට ගියොත් ලංකාවේ උපයාගත් ආදායමට අනුව ඔහුට ඒ රටේ බදු ක්‍රමයටත් යටත් වෙන්න සිදු වෙනවා. මේ ක්‍රමය සම්පූර්ණයෙන් අසාධාරණ නිසා තමයි මේ ද්විත්ව බදු ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කරලා එක රටක පමණක් නැත්නම් ආයෝජනය කරන රටේ පමණක් බදු නීතියට යටත් වෙන ක්‍රමයක් හදලා තිබෙන්නේ. ඒකේ පොලිය සහ අනෙකුත් තිබෙන සවිස්තරාත්මක දේවල් ඒ රටවල් දෙක අතර සාකච්ඡා කරලා යම් කිසි නිගමනයකට පැමිණෙනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයෙනුත් කිව්වා, පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව සඳහා යන වියදම් ගැන. පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව කිසිම ඵලක් නැහැ, ලෝකයේ සාමය ගැන, ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන, ලෝකයේ විවිධ ප්‍රශ්න ගැන කිසිම විසඳුමක් දෙන්නේ නැති මේ වාගේ සමුළුවක් අපේ රටේ පවත්වන්න මෙතරම් විශාල මුදලක් වැය කරන්නේ ඇයි කියලා ඒ ගොල්ලන් ඇහුවා. නමුත් ඒකෙන් වක්‍රව සහ සෘජුව එන ප්‍රතිඵල ගැන අවබෝධයක් නැති එක ගැන ඇත්ත වශයෙන්ම මට කනගාටුයි. ඒක කනගාටුවෙන් කියන්න ඕනෑ.

අපි දන්නවා, මේ රටේ හමුදාව කොහොමද යුද්ධ කළේ කියලා. එදා නන්දිකඩාල් කලපුවේ අගල් කපලා ප්‍රභාකරන් ද්‍රවිඩ ජනතාව 200ක් පමණ වට කරගෙන ඉඳලා ඒ අගල්වල බෝම්බ අතුරලා දුරස්ථ පාලකවලින් ඒවා සම්පූර්ණයෙන් පුපුරවන කොට අපේ සොල්දාදුවන්ට තිබුණා, ඉතාම ලෙහෙසියෙන් කාලතුවක්කු ප්‍රහාර එල්ල කරලා ප්‍රභාකරනුයි, අර දෙමළ ජනතාව 200යි මරලා යුද්ධය නවත්වන්න. නමුත් අපේ සොල්දාදුවන් එහෙම කළේ නැහැ. ඒ ද්‍රවිඩ ජනතාවගේ ජීවිත බේරා ගන්න ඒ අගල් උඩින් 300ක් ගියා. ඒ ගිය අයගෙන් 220 ගණනකගේම එක්කෝ කකුල් දෙකම අහිමි වුණා; එක්කෝ එක කකුලක් අහිමි වුණා. නැත්නම් සමහර අය ජීවිතක්ෂයට පත් වුණා. අන්න එහෙම තමයි අපි මානව හිමිකම් ආරක්ෂා කළේ.

මම අවුරුදු 28ක් නාවික හමුදාවේ ඉඳන් මුහුදේ සටන් කරලා තිබෙනවා. අපි මුහුදේ සටන් කරන කොට කොටි බෝට්ටුවක් විනාශ වුණාම ත්‍රස්තවාදියෝ තුන්, හතර දෙනෙකු මුහුදේ වැටිලා දහලන කොට අපි ඔවුන්ට වෙඩි තියලා මරන්නේ නැහැ. ඔවුන් ලණුවක් දාලා බෝට්ටුවට අරගෙන අත පය ගැට ගහලා කන්න බොන්න දීලා අපි ඔවුන්ව හමුදාවට භාර දෙනවා. නමුත් මම ගිහිල්ලා තිබෙනවා, ත්‍රස්තවාදීන් විසින් අත් අඩංගුවට ගත්තු අපේ සොල්දාදුවන් ගෙනෙන්න. මම මොනවාද දැක්කේ? ඔවුන්ගේ ඇස් උගුල්ලලා, කන් ගලවලා, දත් උගුල්ලලා, රහසහ කපලා; මේ වාගේ දරුණු වද දීලා මැරිච්ච මළ මිනී තමයි අපි ගේන්නේ. අපි මානව හිමිකම් රැකුවේ එහෙමයි. කොටි මානව හිමිකම් රැකුවේ එහෙමයි. ඒ වුණාට මානව හිමිකම් කැඩුවයි කියලා අද අපට විරුද්ධව තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී මේ වාගේ අභූත චෝදනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේ රටවල් මෙහාට ආවාට පස්සේ කොහොමද අපි ද්‍රවිඩ ජනතාවට සලකන්නේ, අර අස්වර් මැතිතුමා කිව්වා වාගේ නැහෙනහිර සහ උතුරේ ජනතාවට මොන වාගේ සංවර්ධනයක් කරලා තිබෙනවාද කියලා ඔවුන්ට තමන්ගේ ඇස් දෙකෙන්ම බලා ගන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ දිහා බලලා ඔවුන් පුදුමයට පත් වේවි. උතුරු පළාතේ ද්‍රවිඩ ජනතාව ගැන කිව්වොත්, ද්‍රවිඩ ජනතාව සියයට 52ක් අද ජීවත් වන්නේ සිංහල ජනතාව සමඟයි. මෙන්න මේවා ගැන ඉතාම හොඳ අවබෝධයක් ඔවුන්ට ලැබේවි. ඒ වාගේම තමයි රටේ තිබෙන යටිතල පහසුකම් ගැන ඔවුන් ඉතාම හොඳ අවබෝධයක් ලබා ගත්තොත් ඇත්ත වශයෙන් ඔවුනුත් ආයෝජනය සඳහා සම්පූර්ණයෙන් දිරිමත් වේවි. ඒ නිසා තමයි මා හිතන්නේ පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව මේ රටේ පැවැත්වීමේ දැඩි අවශ්‍යතාවක් තිබෙනවා කියලා. පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව අපේ රටේ පැවැත්විය යුතුමයි. මා නැවත වරක් එසේ කියා සිටින්නේ අපේ රට ගැන තිබෙන ඒ වැරැදි අවබෝධය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ සම්පූර්ණයෙන් නිරවුල් කරලා හොඳ ප්‍රතිරූපයක් ඇති කරන්න අපට පුළුවන් නිසායි. ඒ කාරණය කියමින්, මට ලබා දීපු කාලය අවසාන නිසා මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි කීයක් තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[අ.භා. 5.33]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද බදු සම්බන්ධ යෝජනා ගැන කථා කරන්න නියමිතව තිබුණත් සරත් වීරසේකර මන්ත්‍රීතුමා විශේෂයෙන් යුද්ධය සම්බන්ධයෙන් අදහස්

ප්‍රකාශ කළා. කිසි පැකිළීමක් නැතිව එතුමාත් එක්ක අපි එකඟ වෙනවා. යුද්ධය සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාව අනුගමනය කරපු ක්‍රියා මාර්ග පිළිබඳව, යුද්ධය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය අනුගමනය කරපු ක්‍රියා දාමය පිළිබඳව අපේ එකඟතාව පළ කරනවා. එය අපේ පැසසුමට ලක් වෙනවා. ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා කිව්වා, මානව හිමිකම් ආරක්ෂා කරමින් ඒ කාර්ය භාරය ඉටු කළා කියලා. ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් වෙලා ගත වූ අවුරුදු හතරක කාලය තුළ ඔබතුමන්ලා විදේශ කටයුතු සම්බන්ධයෙන් නිවැරැදිව ක්‍රියා කළා නම්, ඒ පණිවුඩය නිවැරැදිව පිට රටවලට අරගෙන ගියා නම්, ඒ කාරණය පහදා දෙන්න පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන්ගේ සමුළුවක් අවශ්‍ය නැහැ කියලායි මා හිතන්නේ. එදා මෙහේ සිද්ධ වුණු දේවල් මට මතකයි. එදා බැන් කී මූන් මහත්මයා මෙහේට ගෙන්නුවා; එතුමාට නොයෙකුත් පොරොන්දු දුන්නා. නමුත් ඒ පොරොන්දු කඩ කළා. එහෙම කරන ගමන්ම ජනාධිපතිතුමා හරියට කැබිනට් මණ්ඩලය හැසිරවුයේ නැහැ. එක ඇමතිවරයෙක් එක දෙයක් කිව්වා. තව ඇමතිවරයෙක් තව දෙයක් කිව්වා. ඒ ආකාරයට කටයුතු නොකර අපේ රටේ සිංහල ජනතාවගේ, ඒ වාගේම දෙමළ, මුස්ලිම් ජනතාවගේ ආවේග එක්ක සෙල්ලම් නොකර, ඡන්ද බලාපොරොත්තුවෙන් දේශපාලනය නොකර, ගත වූ අවුරුදු හතර තුළ විදේශ රටවලට ඒ කාරණය නිවැරැදිව කියලා දෙන්න ඔබතුමන්ලාට හැකියාව ලැබුණා නම්, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වන පුද්ගලයන් -ඒ නියෝජිතයන්- ඒ කාරණය නිවැරැදිව ජාත්‍යන්තරයට කියලා දුන්නා නම් ඔබතුමා කියපු ආකාරයට මීට වඩා ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳා ගන්න අපට හැකියාව තිබුණා ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමනි. එහෙම කටයුතු කළා නම් පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුවකට මේ වාගේ වියදමක් කරලා, රටේ දුප්පත් ජනතාවගේ මුදල් විනාශ කරලා එවැනි කාර්ය භාරයක් කිරීම සඳහා ඒ කාරණය ඉතිරි වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විශේෂයෙන් දේශීය ආදායම් පනත යටතේ යෝජනාව, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්, මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය, සුරාබදු ආඥාපනත යටතේ නියමය ගැන කථා වෙනවා. සවිස්තරාත්මකව මේ එක එකක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මා අද විපක්ෂයේ අන්තිම කථිකයායි. විශාල පිරිසක් අද ඒවා සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඇත්තටම සන්තෝෂ වෙනවා ගරු සරත් අමුණුගම ඇමතිතුමා දැන් මෙතැන සිටියා නම්. එතුමා මගේ ගම වන මහනුවර ප්‍රදේශයේ කෙනෙක්, ඒ වාගේම මගේ පාසලේ ඉගෙන ගත්ත කෙනෙක්. එතුමා මෙපමණ වෙලාවක් තනිවම මේ සභා ගර්භයේ රැඳී සිටියා. ආණ්ඩුව වෙනුවෙන් මේ යෝජනා ඉදිරිපත් කරලා ආර්ථිකය සම්බන්ධයෙන් එතුමා අදහස් ප්‍රකාශ කළා. එතුමා දැන් මෙහි සිටියා නම් එතුමා එක්ක අදහස් හුවමාරු කර ගනිමින් මට මීට වඩා සාර්ථක කථාවක් කරන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ආර්ථිකය සම්බන්ධයෙන්, අනෙකුත් සියලු කාරණා සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරමින් කථාවක් කළා. එහිදී එතුමා එකින් එක කරුණු පහදා දුන්නා. මේ ආණ්ඩුව නිදහස ලබා ගත්තාට පස්සේ අප බලාපොරොත්තු වූ සංවර්ධනය, ජනතාව බලාපොරොත්තු වූ වර්ධනය, ආසියාවේ සුර පුරය මේ රටේ ඇති වුණාද නැද්ද යන්න සම්බන්ධයෙන් එතුමා අදහස් දැක්වුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සරත් අමුණුගම මැතිතුමා වෙළඳ භාණ්ඩ ගැන, ඒ වාගේම සාමාන්‍යයෙන් වෙළඳ පොළේ තිබෙන භාණ්ඩ ගැන කථා කළා. විශේෂයෙන් එතුමා කිව්වා, ලංකාවේ වෙළඳුන් ශක්තිමත් කරන්න ඕනෑ, වෙළඳුන්ට හොඳ ආදායමක් ලබා දෙන්න ඕනෑ, හොඳ මිලක් ලබා දෙන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු ජානක බණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහක්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON.(MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair and* THE HON. JANAKA BANDARA *took the Chair.*

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සරත් අමුණුගම ඇමතිතුමා වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. අද අප සියලු දෙනා දන්නා දෙයක් තමයි මේ රටේ ජනතාව ජීවත් වන්නේ අමාරුවෙන්ය කියන එක. හතර දෙනකු ඉන්න පවුලකට රුපියල් 7,500කින් ජීවත් වෙන්න පුළුවන් කියලා ආණ්ඩුවේ ඇමතිවරයෙක් කිව්වා. හැබැයි සංඛ්‍යා ලේඛන අනුව බැලුවොත් අද හතර දෙනකු ඉන්න පවුලකට ජීවත් වෙන්න මාසයකට රුපියල් 45,000ක් වාගේ ප්‍රමාණයක් අවශ්‍යයි.

එහෙම නම් සාමාන්‍ය පවුලක ආදායම රුපියල් 40,000ක්, රුපියල් 42,000ක් වාගේ ප්‍රමාණයක් බවට පත් විය යුතුයි. ඔබතුමන්ලා කියන ආකාරයෙන් ඒක පුද්ගල ආදායම වැඩි වුණා. හැබැයි වියදම ඊට වඩා වැඩි වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ මුක්ත ආදායම සහ මුක්ත වියදම හරියාකාරව ගණනය කළොත් ආදායමට වඩා භාණ්ඩ වියදම වැඩි වෙලා තිබෙනවා. මේ වනකොට ජීවත් වීමේ ඉතාමත් අමාරු අවස්ථාවක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. ජීවත් වන්නේ හොඳින්ද, නැද්ද කියා මෙම පාර්ලිමේන්තුවේ සේවය කරන කාර්ය මණ්ඩලයෙන් ඇහුවොත් එතුමන්ලා අපට හොඳ උත්තරයක් දෙයි. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි අද මසකට සියලුම දීමනා එකතු කරලා රුපියල් ලක්ෂයක විතර වැටුපක් ලබා ගන්නවා. හැබැයි අද අපටත් ජීවත් වන්න අමාරු තත්ත්වයක් තිබෙනවා.

[ගරු සුජීව සේනසිංහ මහතා]

හොරකම් කරන්නේ නැත්නම්, සමහර ඇමතිවරුන් වාගේ -මා ඒ ගැන ඉදිරියේදී සඳහන් කරන්නම්- ක්‍රිෂ්, ටාටා ආයතනවලින් අරගෙන හොරා කන මුදලත් එක්ක තමන්ගේ ආදායම වැඩි කර ගන්නේ නැත්නම් ජීවත් වීමේ අපහසුතාවක් අද මුළු රටේම ජනතාවට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරත් අමුණුගම මැතිතුමා කිව්වා වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ සුර පුරයක් මවලා නැහැ. යුද්ධය අවසන් කළ බව ඇත්ත. යුද්ධය අවසන් කිරීම සඳහා ඒ ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවට, මහින්ද රාජපක්ෂ මැතිතුමාට, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට, ඒ වාගේම සරත් ෆොන්සේකා මැතිතුමාට, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට යන සියලු දෙනාටම අපේ ප්‍රශංසාව මෙම අවස්ථාවේදී පිරිනමනවා.

ඒ විතරක් නොවෙයි. මේ සියලු දෙනාටම වැඩියෙන් විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවට අපේ ප්‍රශංසාව හිමි විය යුතුයි. මේ රටේ යුද්ධය කරන්න මේ පස්දෙනාට වඩා දායක වුණේ ත්‍රිවිධ හමුදාවයි. ඒ පවුල්වල තමන්ගේ දරුවා, තමන්ගේ දියණිය, තමන්ගේ නැඟණිය ජීවිත පූජා කළා. මා හිතන හැටියට ජීවිත 25,000ක් නැති වුණා; පරම්පරා ගණනක් අනාථ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි මේ පිරිසට ආණ්ඩුව සලකන ආකාරය බැලුවොත් ඉතාමත් අප්‍රසන්නයි. අපි ගිය වතාවේ ප්‍රශ්නයක් ඇහුවා, ත්‍රිවිධ හමුදාවට ගෙවල් කීයක් දුන්නාද කියලා. මේ රටේ ත්‍රිවිධ හමුදාවේ 25,000ක් මිය ගිහින් තිබෙනවා; අත් පා නැති වුණු අය 29,000ක් වැනි ප්‍රමාණයක් ඉන්නවා.

මා ස්තුතිවන්ත වනවා, මෙම අවස්ථාවේදී සරත් අමුණුගම මැතිතුමා මෙම ගරු සභාවට පැමිණීම සම්බන්ධයෙන්. මා හිතන හැටියට අද දින සභාවේ කටයුතු ආරම්භයේ සිටම මෙතුමා සභාවේ රැඳී සිටියා. එතුමාට මා ස්තුතිවන්ත වනවා. එතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. හැබැයි එතුමා ඒ කිසි දෙයක් නොසලකා ආරම්භයේ සිටම එතුමාගේ කථාවෙන් පස්සේ කළ සියලුම කථාවලට ඇහුම් කන් දෙමින් මෙම ගරු සභාවේ රැඳී සිටියා. ඒ සම්බන්ධයෙන් එතුමාට මගේ විශේෂ ස්තුතිය පිරිනමනවා. එතුමා මගේ දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රිකයේ කෙනෙක්, ඒ වාගේම මගේ පාසලේ ආදි ශිෂ්‍යයෙක්. එතුමා එතුමාගේ කාර්ය භාරය ඉටු කරනවා. ඒ ගැන මටත් සන්තෝෂයි.

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ඔබතුමා වෙළෙඳුන් ශක්තිමත් කළ යුතු ආකාරය ගැන කථා කළා. ඇමතිතුමනි, තේ ගැන කළ කථාව මා අහගෙන සිටියා. හැබැයි අවසාන අවුරුද්ද වන කොට අපේ තේ නිෂ්පාදනය සියයට 4කින් පහත වැටිලා තිබෙනවා. ඒ වාගේම අනිකුත් භෝග නිෂ්පාදනය පහත වැටිලා තිබෙනෙවා. ගිය වර අය වැයේදී කථා කළ බඩ ඉරිභූ විතරයි මේ රටේ ස්වයංපෝෂණය වෙලා තිබෙන්නේ. අනිකුත් සියලුම වෙළෙඳාම් ගැන මා එකින් එකට ඔබතුමාට පෙන්වන්නම්. මා ගිය වර අය වැය විවාදයේදී ඒ සම්බන්ධයෙන් පෙන්නුම් කළා. විශේෂයෙන්ම දළ ජාතික නිෂ්පාදනයත් එක්ක බැලුවාම අපේ සියලුම භෝග නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමනි, විශේෂ ප්‍රශ්නයක් තිබෙනවා. අපේ භාණ්ඩ වැඩි වන්නේ නැහැ. රටේ වගා කරන එළවලු වැඩි වන්නේ නැහැ. පිට රටින් ගෙනෙන අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් වැඩි වනවා. ඒ වැඩි වීම නිසා අපේ රටට ආදායමක් ලැබෙන්නේ නැහැ ඇමතිතුමනි. ආදායම යන්නේ පිට රටටයි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමා කිව්වා, පරිප්පු, ලූනු, ටින් මාළු ගැන. ඇමතිතුමනි, මා හිතන හැටියට සම්බෝල සහ පරිප්පු තමයි අපේ රටේ සාමාන්‍ය ආහාරය. සම්බෝල සහ පරිප්පුත් එක්ක රට පාන් කනවා නම් ඒකට අමාරුවෙන් බිත්තර භාගයක් එකතු කර ගන්නවා. එහෙම නැත්නම් එයට වෙන යම් දෙයක් එකතු කර ගන්නවා. හැබැයි සම්බෝල සහ පරිප්පු කන්නවත් බැරි තත්ත්වයක් අද රටේ ඇති වෙලා තිබෙනවා. රටේ ධනවත් පිරිසට මේක දැනෙන්නේ නැහැ, ඇමතිතුමනි. මේක දැනෙන්නේ දුප්පත් ජනතාවටයි. විශේෂයෙන්ම ජනගහනයෙන් සියයට 70කට, සියයට 80කට පමණ පිරිසකට මෙය බලපානවා. ඔබතුමන්ලා බලාපොරොත්තු වුණු ආර්ථික සංවර්ධනය රටේ ජනතාවට ලැබිලා නැහැ. ආදායම වැඩි වුණා කියා ඔබතුමා කියන එක මා පිළිගන්නවා. අදායමට සාපේක්ෂව වියදම වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් අපි කලින් බලාපොරොත්තු වුණු ආසියාවේ සුර පුර අපේ දුප්පත් ජනතාවට ලැබිලා නැහැ. ඔබතුමා අදහස් කරන ආකාරයට කොළඹ යම්කිසි ප්‍රදේශයකට ආසියාවේ සුර පුර ලැබෙන්න පුළුවන්. හැබැයි එයින් ලාභය ලබා තිබෙන්නේ ඇමතිතුමනි, ආණ්ඩුවේ ඉහළම තැනට සම්බන්ධ ඥාති හිත මිත්‍රාදීන් හැරෙන්න මේ රටේ සාමාන්‍ය ජනතාව නොවෙයි. ඉදිරියේදී මා ඒ සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව සඳහන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියා ගැන අපේ ඇමතිතුමා කථා කළා. ගොවියාට කරලා තිබෙන්නේ මොනවාද? අද ගොවියාට පොහොර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. රුපියල් 300ට නොවෙයි, රුපියල් 400ට නොවෙයි, රුපියල් 500ට නොවෙයි, රුපියල් 1,200ටවත්, රුපියල් 1,300ටවත් පොහොර ලබා ගන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ගොවි විශ්‍රාම වැටුප ගැන බලමු. ඔබතුමා දන්නවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන අපට මාසයක වැටුප ලැබුණේ නැත්නම් ජීවත් වන්න කොපමණ අමාරුද කියලා; වැටුපෙන් සියයට 30ක් කැපුවොත් ජීවත් වන්න කොපමණ අමාරුද කියලා. ඒ වාගේම පාර්ලිමේන්තු සේවකයකුට තමන්ගේ වැටුපෙන් සියයට 20ක්, සියයට 30ක් කැපුවොත්, යම්කිසි දීමනාවක් දෙන්නේ නැත්නම් ජීවත් වන්න කොපමණ අමාරුද? මොකද අන්තිම අමාරුවෙන් අපි ජීවත් වන්නේ. මාසය අවසන් වන කොට අපේ අන්තිම ශතයත් ඉවරයි. එතකොට මිලියනයක් පමණ පිරිසකට ගොවි විශ්‍රාම වැටුප දෙන්න බැරිකමක් අද ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

රටේ ජනතාව ගැන, ගොවි ජනතාව ගැන කථා කරනවා. හැබැයි එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කළාට, එතුමා සේවය කරන්නේ මේ රටේ ධනවතුන් කිහිප දෙනෙකුට පමණයි. ඒ තමන්ගේ සහෝදරයන්ට, තමන්ගේ පවුලට, තමන්ගේ පවුලට සම්බන්ධ පිරිසටයි. ඒ හැර, යුද්ධය ඉවර වුණාට පස්සේ දුප්පත් ජනතාවට එතුමා කරන සේවයක් නැහැ.

ගරු ඇමතිතුමනි, මේ රටේ ආයෝජන සම්බන්ධව ඔබතුමා සඳහන් කළා. රටට ආයෝජන අවශ්‍යයි, රටට මුදල් එන්න අවශ්‍යයි කියා අප පිළිගන්නවා ගරු ඇමතිතුමනි. දැන් මොකක්ද වෙන්නේ? චීනයෙන් විශේෂ නියෝජිත පිරිසක් ඇවිත් ඉන්නවා. මා දැන් එතැනට ගියා. ඒ නියෝජිත පිරිස කථා කරනවා මා විනාඩි දහයක් පහළොවක් අහගෙන හිටියා. මගේ කථාව කරන්න තිබුණ නිසා මා පල්ලෙහාට ආවා. මොනවාද එතුමන්ලා සඳහන් කරන්නේ? ගරු ඇමතිතුමනි, එතුමන්ලා මේ රට තමන්ගේ කුණු බක්කියක් ලෙස පාවිච්චි කරනවා. චීනයෙන් ආ ඒ නියෝජිතවරිය කියනවා, "ලංකාව basket එකක් වාගේ සකසලා, ඒ basket එකට ඒ අය පුළුවන්, පුළුවන් දේවල් ලබා දෙනවාය" කියා. චීනයෙන් ලංකාවට බාස්කට් එකක් ඇර හම්බු වුණු දෙයක් නැහැ. ගරු ඇමතිතුමනි, පොලිය සියයට 7.2යි; සියයට 6.8යි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ හිටියා. ඔබතුමා දන්නවා, මහවැලිය කරනකොට අපට අවුරුදු දහයක grace period එකක් හම්බු වුණා; අපට හම්බු වුණු ණය පොලී අනුපාතය සියයට 1.5යි; සියයට1.6යි කියා. ඒ වාගේම මේ රටට සියයට 50ක මුදලක් ලැබුණේ ආධාර වශයෙනුයි. ණය වශයෙන් නොවෙයි. පොලියට නොවෙයි. අපට ණය ලබා දුන් එංගලන්තය, ස්විට්සර්ලන්තය, නෝර්වේ වාගේ රටවල් ඒ ආධාර දීලා ඒ රටවල ශ්‍රම බලකාය මෙහාට ගෙනාවේ නැහැ. අද මොකක්ද වෙන්නේ? චීනයේ විශාල පිරිසක් අද අපේ රටට ගෙන්වනවා. අද, මේ රට චීනයේ කොළණියක් බවට පත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා හොඳට මතක තියාගන්න, අනාගතයේදී මේ රට ගැලවෙන්නට බැරි උගුලකට අහු වෙන බව.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ගුණ වර්ණනා කරන ගමන්ම මා විශේෂයෙන් කාරණයක් කියන්නට ඕනෑ. මා කථා කරන අතරතුරක විමල් වීරවංශ අමාත්‍යතුමා මට බාධා කරමින් කිව්වා, ක්‍රිෂ් ආයතනයෙන් මම මිලියන 10ක -ඩොලර් මිලියන දහයක් ද, රුපියල් මිලියන දහයක් ද කියා කිව්වේ නැහැ- පගාවක් ඉල්ලුවාය කියා. මා ඒකට උත්තර දෙන්න ගියේ නැහැ. මොකද, මා උත්තර දෙන්නට ගියේ නැත්තේ? සමහර කට්ටිය මගෙන් ඇහුවා, "ඇයි උත්තර දුන්නේ නැත්තේ?" කියා. මගෙන් ඇහුවා "ඔබතුමා ඉල්ලුවා ද නැද්ද?" කියා. මා දන්නේ නැති එකකට මා මොකටද උත්තර දෙන්නේ? මා ක්‍රිෂ් ආයතනය ගැන අහලාත් නැහැ. මෙතැන හතර පස් දෙනෙක්ම කිව්වා "ඔබතුමා ගත්තාද නැද්ද කියා කියන්න" කියා. මොකක්ද මේ කියන්නේ කියා මා සොයා බැලුවා. ක්‍රිෂ් ආයතනයත් එක්ක මගේ සම්බන්ධයක් තිබුණේත් නැහැ. ඔබතුමා සඳහන් කළ ආකාරයට අක්කර 4ක් ක්‍රිෂ් ආයතනයට, අක්කර 29 ක් වෙලීනා ආයතනයට, තව අක්කර 12ක් ෂැන්ග්‍රිලා සහ ෂෙරටන් කියන ආයතනවලට දුන්නා. මේවායින් ලැබුණු මුදල්වලට මොකද වෙන්නේ? ඔබතුමන්ලා සඳහන් කරන ආකාරයට යුද්ධය අවසන් වුණාට පස්සේ හදා තිබෙන්නේ ගෙවල් 350යි. අවුරුදු හතරක් යනකොට අඩුම ගණනේ ත්‍රිවිධ හමුදාවට ගෙවල් දහ දාහක් හදා දෙන්නට පුළුවන් වුණා නම්, අඩුම ගණනේ ගෙවල් තිස් දාහක් හදා දෙන්නට පුළුවන් වුණා නම්! ගරු අමාත්‍යතුමනි, යුද්ධයෙන් අනාථ වුණු පවුල් 29,000ක් ඉන්නවා. මිය ගිය අය 25,000යි. අද වෙන තුරු මේ පවුල්වල අයට හරි හමන් නිවසක් හදා දෙන්නට ඔබතුමන්ලාට හැකියාව නොමැති වී තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා සඳහන් කරන ආකාරයට ආයෝජන අවශ්‍යයි. ලෝකෙන් වහගෙන අපේ රට ඇතුළේ තියාගෙන මේ දේවල් දියුණු කරන්නට පුළුවන්ය කියා අප කියන්නේ නැහැ. අප එහෙම කියන්නේ නැහැ. අප ඒ සම්බන්ධයෙන් ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. විශේෂයෙන් ඔබතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ලැබූ පන්නරයත් එක්ක මේ රට හොඳ තැනකට අරගෙන ගිහින් තිබෙනවා. අප පිළිගන්නවා. නමුත් අප ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නේ මේ හොරකම නවත්වන්න කටයුතු කරාවිය කියන එකයි.

ගරු ඇමතිතුමනි, අද "Lanka-e-News" එක මේ page එක block කරලා තිබෙනවා. එහි මේ කාරණය සඳහන් වුණා. පිරිසකට උත්තර දෙන්නට බැරි නිසා මා නම් ගම් සඳහන් කරන්නට යන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "Securities and Exchange Commission Chairman's life under threat" කියා තමයි Lanka-e-News එකේ සඳහන් වෙන්නේ. නාලක ගොඩහේවා කියන පුද්ගලයාට මිලියන 400ක මුදලක් ලබා දුන් බවට ක්‍රිෂ් ආයතනය සඳහන් කරනවා. එහි තවත් විශේෂ නම් දෙකක් සඳහන් වෙනවා. රජයේ ඉතාම බලසම්පන්න දෙදෙනෙකුගේ නම් දෙකක් මෙහි සඳහන් වෙනවා. මේ නම් එකිනෙක ගැන මා කථා කරන්නට යන්නේ නැහැ. විශේෂයෙන්ම තරුණ මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් වෙනවා. ස්ථාවර නියෝග අනුව ඒ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කිරීමට මා මැළි වෙනවා. හැබැයි අනිවාර්යයෙන්ම ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, මා කොම්පඤ්ඤවීදියේ නිවාස අහිමි වුණු ජනතාවගේ නඩුව කරනවා. මම නඩුවේ පගා ඉල්ලනවාය කියා මට විරුද්ධව පැමිණිල්ලක් දැම්මා. අද වෙන තුරු ඒ නඩුව ඉදිරියට කර ගෙන යන්නට විධියක් නැහැ. මාව අත් අඩංගුවට ගන්නය කියා විශේෂ බල කායක් යෙදුවා. සාමාන්‍ය පොලිසියේ පැමිණිල්ල කළේ. ඒත් සාමාන්‍ය පොලිසියේ පැමිණිල්ල CD එකට යැව්වා. එහිදී "පුළුවන් නම් විභාග කරන්න, පුළුවන් නම් මාව ගෙන්වන්න" කියා මා කිව්වා. මාව ගෙන්වූයේ නැහැ. එහි "බාන්" කියන පුද්ගලයෙකුගේ නමක් සඳහන් කළා. ඔහු මගේ වෙන නඩුවක client කෙනෙක්. ඒ පුද්ගලයාට මා කථා කර ඇහුවා, "මොකක් ද මේ කියන කථාව" කියා. මේ, සුජීව සේනසිංහ මැතිතුමාගේ දේශපාලන ජීවිතය නැති කරන්නට, එතුමාගේ අනාගතය නැති කරන්නට ආණ්ඩුවෙන් කරන කුමන්ත්‍රණයක්ය කියා එතුමා එංගලන්තයෙන් affidavit එකක් මට අත්සන් කර එව්වා. "ඩොලර් මිලියන දෙකක් දෙන්නම්. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා සල්ලි ඉල්ලුවාය කියා මොකක් හෝ සඳහනක් කරන්න" කියා එතුමාට කිව්වාලු. අද වෙනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩුව කර ගෙන යන්න බැහැ. පැමිණිල්ල කර ගෙන යන්නට විධියක් නැහැ. එහෙමයි අපට සලකන්නේ. සාමාන්‍ය ජනතාව වෙනුවෙන් -පවුල් 600ක් වෙනුවෙන්- අප මේ කථා කරන්නේ. අක්කර හතක් -මේ රටේ ප්‍රධාන භූමි භාගයක්- ටාටා ආයතනයට දෙන්න යනවා.

මේ ඉඩමේ පර්චස් එකක් රුපියල් මිලියන පහමාරක් වටිනවා. නමුත් සත පහක්වත් ගෙවන්නේ නැතිව ඒ ඉඩම්වලින් ඒ ජනතාව ඉවත් කර තිබෙනවා. මේවා ඔවුන්ට අයිති ඉඩම්. ඔවුන් ඒ ඉඩම්වල බලෙන් පදිංචි වෙලා සිටි අය නොවෙයි. තමන්ට අයිති ඒ ඉඩම්වලින් ජනතාව බලෙන් ඉවත් කරනවා. මේක ඔවුන්ගේ මානව අයිතිවාසිකම් කඩ කිරීමක්. ඔවුන්ට ඒ ඉඩමෙන් අයිතිව තිබෙන්නේ පර්චස් දෙකක් වෙන්න පුළුවන්; පර්චස් තුනක් වෙන්න පුළුවන්. නමුත් එතුමන්ලාගේ කැමැත්ත අනුව එතැනින් ඉවත් කරලා ඒ ස්ථානයේ යම් වැඩ පිළිවෙළක් කරනවා නම් අපේ අකමැත්තක් නැහැ. අප එයට සහාය පළ කරනවා. ඔබතුමන්ලා මේ ගැන හරිහමන් අදහසක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව විශේෂයෙන්ම මම ගරු කථානායකතුමාට කිව්වා. එතුමා කිව්වා, "අඩුම ගණනේ අයිති වන්න ඕනෑ නැහැ, යම් පුද්ගලයෙකුට එතැන වර්ග අඩි 1,000ක භූමි ප්‍රමාණයක් තිබෙනවා නම් ඒ පුද්ගලයාට අඩුම ගණනේ වර්ග අඩි 2,000ක් දෙන්න එතැනින් ඉවත් වෙන්න" කියලා. ඒක දෙන්නේ තට්ටු 10ක් උඩින්; එක්කෝ තට්ටු 15ක් උඩින්. ඒ පවුලක වයසක අම්මා, තාත්තා කෙනෙක් ඉන්නවා නම් ඒ අයට ඒ තරම් උඩට නඟින්නත් බැහැ. ඔවුන් පහළට බැස්සොත් බැස්සාමයි; උඩට නැග්ගොත් නැග්ගාමයි. ගරු ඇමතිතුමනි, මේ කරුණු ඔබතුමන්ලාගේ අවධානයට ගන්න. මේවා තනිකර හොරකම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තැරැව්කරුවාට ඩොලර් මිලියන 20ක් හම්බ වෙනවා කියා ඒ ෂමිරාස් කියන පුද්ගලයා කිව්වාලු. මට විරුද්ධව තමයි පළමුවෙන්ම ඔහු පැමිණිල්ල දැම්මේ මම මරණ තර්ජනයක් කළා කියලා. අන්තිමට මරණ තර්ජනය පගා තර්ජනයක් වුණා. ඒ පගා තර්ජනයටත් සාක්ෂි නැහැ. අද ඒ නඩුව කරගෙන යන්න විධියක් නැහැ. මට මතකයි, මේ ගරු සභාවේදී විමල් වීරවංශ ඇමතිතුමා කිව්වා මට විරුද්ධව තිබෙන ඒ

[ගරු සුජීව සේනසිංහ මහතා]

කරුණු -මම පගා ඉල්ලා තිබෙනවා කියලා - ඔප්පු කරනවා කියලා. හැබැයි අද වෙන තුරු ඒවා ඔප්පු කර ගන්න විධියක් නැතිව ගිහින් තිබෙනවා. නමුත් බල කිරීම් කරලා අපේ මන්ත්‍රීවරු ඩැහැ ගන්න බලනවා. බලපෑම් කරලා අපේ මන්ත්‍රීවරු ගන්න බලනවා. අපට තරවටු කරලා, තර්ජනය කරලා අපට හිරබත් කන්න සූදානම් කරලා අපව ගන්න බලනවා. නමුත් අප කියනවා, අප දේශපාලනයට ආවේ ජනතාවට පරිත්‍යාගශීලීව බව. මම අනික් මන්ත්‍රීවරු ගැන කථා කරන්න යන්නේ නැහැ. අප දේශපාලනයට ආවේ යම් කිසි අරමුණක්, ප්‍රතිපත්තියක් ඇතිවයි. නැත්නම් දේශපාලනයෙන් ආවඩා ගන්න, දේශපාලනයෙන් බෙන්ස් කාර් එකක් ගන්න, දේශපාලනයෙන් නිවසක් ගන්න නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කොළඹ හත ප්‍රදේශයෙන් නිවසක් ගත්තා. මම දැක්කා "සන්ඩේ ඔබ්සර්වර්" පුවත් පතේ සඳහන් කර තිබෙනවා, මම ඒ නිවස ගත්තේ ඒ නිවසේ අයිතිකාරයා බය කරලාය කියලා. මම ඒ නිවසට රුපියල් මිලියන 43ක් ගෙව්වා. ඒ මගේ හැකියාවෙන්, මගේ දෙමව්පියන්ගේ හැකියාවෙන් හම්බ කරපු සල්ලිවලින්. ඒ හොරකම් කරපු සල්ලි නොවෙයි. මගේ පරම්පරා හතරක් නීතිඥවරු. මම නිවෙස ගත්තේ එහෙමයි. නමුත් තුන්වැනි පාරත් පත්තරෙන් මට මඩ ගහලා තිබෙනවා, මම ඒ ගෙදර ගත්තේ ඒ ගෙදර ඉන්න කට්ටිය බය කරලා, අඩුවට කියලා. මම නඩුවක් දමනවා. පත්තරෙන් මට මඩ ගහන එක මම නවත්තනවා. ඔබතුමන්ලා මේවා විමර්ශනය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ක්‍රිෂ් ආයතනය සම්බන්ධයෙන් තරුණ මන්ත්‍රීවරයකුගේ නම තිබෙනවා, එතුමාට රුපියල් මිලියන 200ක් ගෙව්වාය කියලා. එතුමා ආණ්ඩුවේ ප්‍රබල පවුලකට සම්බන්ධ මන්ත්‍රීවරයෙක්. තවත් කරුණු මෙහි සඳහන් කර තිබෙනවා. මේ නාලක ගොඩහේවා කියන පුද්ගලයාගෙන් අප ප්‍රශ්න කළා. කොම්පැනි 40කට, 50කට වැඩි ප්‍රමාණයක් එතුමාත් එක්ක සම්බන්ධයි. එතුමා තමයි අද Securities and Exchange Commission එකේ Chairman. There is a conflict of interest. කොහොමද පත් කරන්නේ? කොහොමද stock exchange එක රටේ පවත්වාගෙන යන්නේ? එය පවත්වාගෙන යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එංගලන්තයේ වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුවේ පැවැති සති දෙකක වැඩ මුළුවකට මම සහභාගී වුණා. තමන්ගේ ඥාතියෙක්, තමන්ගේ යාළුවෙක්, යම් කිසි ආයතනයකට සම්බන්ධකම් තිබෙන පුද්ගලයෙක් මේ වාගේ තනතුරුවලට පත් කරන්න පුළුවන්ද කියලා එතුමන්ලාගෙන් මම ඇහුවා. එංගලන්තයේ පුද්ගලයන් නොවෙයි ගරු ඇමතිතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, දුප්පත් රටවල අය ඒ සමුළුවේ හිටියා. සියලු දෙනාම කිව්වේ කොයි තරම් සුදුසුකම් තිබුණත්, තමන්ගේ පවුලේ උදවිය, තමන්ගේ සහෝදරයන්, තමන්ගේ ඥාතීන්, තමන්ගේ හිතමිත්‍රාදීන් පත් කරන්න බැහැ කියලායි. එතුමන්ලා කිව්වා එතකොට there would be a conflict of interest, ඒ වාගේම ඒ ස්ථානයේ හොරකම් කියන දේ පටන් ගන්නවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිෂ් ආයතනයේ ගනුදෙනු සම්බන්ධයෙන් අප සොයා බැලුවා. ක්‍රිෂ් ආයතනය මිලියන 400ක් ගෙව්වා කියනවා. ඔබතුමන්ලා පී. බී. ජයසුන්දර මහත්මයා පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ. ක්‍රිෂ් ආයතනය සඳහන් කරනවා මුල් ගෙවීමක් වශයෙන් මිලියන 400ක් එතුමන්ලා ගෙව්වා කියලා. නමුත් මෙහි මුළු ගණන රුපියල් බිලියන 5,000ක් වාගේ ප්‍රමාණයක්. යම් කිසි වෙළඳාමක් කරනවා නම් මේ ප්‍රමාණය අද රටට හිමි විය යුතුව තිබෙනවා. හැබැයි මේවාට ටෙන්ඩර් නැහැ. ඒක තමයි ගරු ඇමතිතුමනි අපේ ප්‍රශ්නය. ඔබතුමන්ලා විවෘතව ක්‍රියා කරනවා නම් අපට මේවා ඉදිරිපත් කරන්න ඕනෑ. මේවා අපේ රටේ ජනතාවට අයිති ඉඩම්. කොළඹ අක්කර 4යි, අරෙහෙන් 29යි, මෙහෙන් 7යි. දැන් එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දිගු කරනවා. ඔබතුමාට මම ඉතා කරුණාවෙන් මේවා කියන්නේ. ඔබතුමා මේවා පරීක්ෂා කර බලන්න. ටාටා ආයතනයට දීපු ඉඩම ගැන බලන්න. ඒ ආයතනයට තමන්ගේ ඒ apartments සින්නක්කර ලෙස විකුණන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හොඳයි.

ඒ ප්‍රමාණය පමණක් නොවෙයි, ටාටා ආයතනයට ඒ මුළු අක්කර හතේම තිබෙන buildings ටික සින්නක්කර ක්‍රමයට පිට රට ඕනෑම පුද්ගලයෙකුට විකුණන්න පුළුවන්. ඒ වාගේම තමයි මේ කාරණයත්. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් සඳහන් කළා මේ වෙලීනා කියන ආයතනයට දීපු අක්කර 29 ගැන. ඒකට දීපු ඒවාත් විකුණන්න පුළුවන්. අවුරුදු 99යි බද්ද. නමුත් ඒ ඉඩම් සින්නක්කර ලෙස විකුණන්න පුළුවන්. මේකේ සිදු වන්නේ විශාල හොරකමක් ගරු ඇමතිතුමනි. අප නොවෙයි, ඔබතුමා නොවෙයි, ඊට වඩා විශාල බලයක් තිබෙන හස්තයන් මේක වටේ කැරකෙනවා ගරු ඇමතිතුමනි.

මේ රට වෙනුවෙන් ඒ යුද්ධය අවසන් කළේ, විශේෂයෙන්ම ගම්වල සිටින දූ දරුවන්, නැහනියන්, සහෝදරයන්. ඔවුන්ගේ ලේවලින්, ඔවුන්ගේ රිරි මාංසවලින් තමයි අපි යුද්ධය ජයග්‍රහණය කළේ. මේ රට හිමි වන්නට ඕනෑ, මහින්ද රාජපක්ෂ මහත්මයාටවත්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාටවත්, සරත් ෆොන්සේකා මහත්මයාටවත්, ඔබතුමාටවත්, මටවත් නොවෙයි. අපි ඉන්නේ අපේ ජනතාව බලා ගන්නයි. මේ රටේ සියලු සාරය හිමි විය යුත්තේ මේ රටේ දුප්පත් ජනතාවටයි. හැබැයි, අපට තිබෙන දුක, ඔබතුමන්ලා සඳහන් කළ සුරපුරය, ඔබතුමන්ලා සඳහන් කළ ආසියාවේ ආශ්චර්ය - ආසියාවේ විස්මය - මේ රටේ සිටින පොහොසත්, බලවත් කිහිප දෙනෙකුට පමණක් උරුම වෙලා තිබෙන එකයි ගරු ඇමතිතුමනි. රටේ දුප්පත් ජනතාව තවමත් දුක් විඳිනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාගේ අවධානයට යොමු කිරීම සඳහා විශේෂයෙන්ම නම් කිහිපයක් මා සඳහන් කරන්නට කැමැතියි. අන්තර් ජාලයේ Lanka-e-News එකේ මේ පිටුව අද block කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තර් ජාලයෙන් උපුටා ගත් එම ප්‍රවෘත්තිය මා මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මෙහි විශේෂයෙන්ම නම් සඳහන් කර තිබෙන ධම්මික පෙරේරා, නිමල් පෙරේරා සහ දිලිත් ජයවීර යන පිරිස අපේ කොටස් වෙළෙඳ පොළත් එක්ක සම්බන්ධකම් තිබෙන පිරිසක්. මේ මිල ගණන් එහා මෙහා කිරීම ගැන මම හැම වෙලාවේම ප්‍රශ්න කළා. මෙතුමන්ලා ඒ සම්බන්ධයෙන් විශේෂ කාර්ය භාරයක් සිදු කරනවා. එහෙම නම් ඔබතුමන්ලා තරාතිරම නොබලා මේ වැරදි වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන්න. කාටද මේවා අයිති වෙලා තිබෙන්නේ, කවුද මේවාට සම්බන්ධකම් තිබෙන්නේ කියලා සොයා බලන්න. මේ රුපියල් මිලියන 400 සම්බන්ධව ඔබතුමන්ලා පරීක්ෂණයක් කරන්න. අපට බොරු අවලාද නඟලා, අප පොලීසියට ගෙන්වලා, CID එකට ගෙන්වලා අපට කරදර කරන්න පුළුවන් නම්, ඔබතුමන්ලා මේ රුපියල් මිලියන 400 සම්බන්ධයෙනුත් පරීක්ෂණයක් කරන්න. පී. බී. ජයසුන්දර මහත්මයා පාර්ලිමේන්තුවට ගෙන්වලා අහන්න, මේ රුපියල් මිලියන 400 හම්බ වුණාද, නැද්ද කියලා. මේ රුපියල් මිලියන 400 දුන්නේ කාටද කියලා අහන්න. පළමුවෙන් රුපියල් මිලියන 200ක් දුන්නේ කාටද? ඉතිරි රුපියල් මිලියන 200 දුන්නේ කාටද? පළමුවැනි ගෙවීමක් ලෙස ආණ්ඩුවට මේ මුදල ලැබුණාද කියලා ඔබතුමන්ලා බලන්න. අනිවාර්යෙන්ම ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කරන්න. නැත්නම් මේ රටට පොදු රාජ්‍ය මණ්ඩලය නොවෙයි, කවුරු ආවත් මේ රට පහළටම ගිහිල්ලා විනාශ වන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.54]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු සරත් අමුණුගම ඇමතිතුමා විසින් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර ඇති කර ගත් ගිවිසුම අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද දේශීය ආදායම් පනත යටතේ යෝජනාව පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේ දී මෙම කාරණය මා පළමුවෙන්ම සඳහන් කළ යුතුයි. මේ ඉදිරිපත් කරන ලද යෝජනාව අද දවසේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉතාම වැදගත් ආකාරයෙන් බලපාන වැදගත් යෝජනාවක් කියන එක මුලින්ම සඳහන් කරන්න ඕනෑ.

දේශීය ආර්ථිකය ශක්තිමත් කරමින්, දේශීය ගොවියා සහ ව්‍යවසායකයා ශක්තිමත් කිරීම සඳහා මහින්ද චින්තන වැඩ පිළිවෙළ අනුව රට ගොඩනැඟීමට අවශ්‍යම කරන තීරණ කිහිපයක් මේ තුළින් ක්‍රියාත්මක කෙරෙනවා. මෙහි සඳහන් වන ආකාරයට එක් අවස්ථාවක විශේෂ භාණ්ඩ සඳහා බදු අඩු කිරීමට යෝජනා කර තිබෙනවා, විශේෂයෙන්ම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා. ඒ නිෂ්පාදනවල අඩුවීමක් සිදුවන අවස්ථාවල දී වෙළෙඳ පොළ තුළ මිල ගණන් සමතුලිතව පවත්වා ගැනීම පිණිස එම ද්‍රව්‍ය සඳහා අය කරන බද්ද අඩු කරන්නට යෝජනා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර හොඳ හිත, මිත්‍රත්වය, සහයෝගිතාව, ආරක්ෂා වන ආකාරයට මේ නව යෝජනා සකස් කර තිබෙනවා. දේශපාලනය පිළිබඳව මූලික අවබෝධයක් හෝ තිබෙන කෙනෙක් මෙය අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු කරුණක් හැටියට පිළිගන්නවා ඇති කියලා මා විශ්වාස කරනවා.

මෙවැනි වැදගත් කීන්දු තීරණ කිහිපයක් රටේ ප්‍රධාන ආයතනය වන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සාකච්ඡාවට ගැනෙන මේ අවස්ථාවේ දී විරුද්ධ පක්ෂය නියෝජනය කරමින් ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ අදහස් දැක්වුවා. එතුමන්ලාගේ අදහස් දැක්වීම අද දින ඉදිරිපත් කරන ලද මේ නියෝගයට කොතරම් දුරට අදාළ වනවාද කියන එක පිළිබඳව නම් අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එතුමන්ලා කථා කළේ මොනවාද කියලා එතුමන්ලාම දන්නේ නැහැ. මම හිතන විධියට අහගෙන හිටපු අය එය දන්නේත් නැහැ.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කථා කරපු ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා විවිධ කරුණු පිළිබඳව කථා කළා. එතුමාගේ කථාවේ එක් අවස්ථාවක දී සඳහන් වුණා, "ඊයේ දවසේ , මේ සභාවේ කථා කළේ වැඩකට නැති වල්පල්" කියලා. ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා වුණු ඊයේ දවසේ මේ ගරු සභාවේ කථා කළේ වැඩකට නැති වල්පල් කියලා එතුමා කිව්වා. ඊයේ මේ ගරු සභාව තුළ සිදු වුණු තවත් සිද්ධියක් අපි දැක්කා. ඊයේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විපක්ෂ නායකතුමා මේ සභාවේ සිටියදී ඉතාම බරපතළ ප්‍රකාශයක් මේ ගරු සභාව තුළ කළා.

ඒ කරපු ප්‍රකාශය, වල්පල් හැල්ලක් විධියට සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා අර්ථ නිරූපණය කළා. ඒක එතුමාට වැදගත් නැතිව ඇති. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස ගරු මන්ත්‍රීතුමාගේ මේ අදහස් දැක්වීම සහ එතුමාගේ ක්‍රියා කලාපය පිළිබඳව, දේශපාලනය පිළිබඳව උනන්දුවක් දක්වන උදවිය හැටියට අපට බරපතළ සැකයක් තිබෙනවා. මොකද, කාලාන්තරයක් තිස්සේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වලි කනවා, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට එන්න. නායකයා වීම සඳහා රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාට එරෙහිව විවිධ ක්‍රියා මාර්ග අරගෙන, පක්ෂය තුළ විවිධ කල්ලි කණ්ඩායම් හදා ගෙන, ඉතාම ක්‍රමානුකූල ගමනකට එතුමා සැරසිලා සිටිනවා. එසේ සැරසුණු ගමනේ එක සන්ධිස්ථානයක් හැටියට අපි දක්වනවා,

එවකට එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකයා හැටියට හිටපු කරු ජයසූරිය මැතිතුමාත් එක්ක සම්බන්ධ වෙලා, "රනිල් විරෝධී පිල" කියලා කණ්ඩායමක් හදා ගෙන මහලොකු කැරැල්ලක් ගැහුව අවස්ථාව. රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා හැරුණුකොට, එක්සත් ජාතික පක්ෂයේ දෙවැනියා හැටියට හිටියේ කරු ජයසූරිය මැතිතුමා. නමුත් කරු ජයසූරිය මහත්මයා එක්ක වෙනම කණ්ඩායමක් හදා ගෙන, කරු ජයසූරිය මහත්මයා එක්ක බොහෝ දුර ගිහිල්ලා, අවසානයේ කරු ජයසූරිය මහත්මයා තනි කළා; කරු ජයසූරිය මහත්මයා අතරමං වුණා. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂය තුළ කරු ජයසූරිය භූමිකාව ඉවර වුණා.

ඊට පස්සේ එකතු කළා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇතුළු තව කණ්ඩායමකට. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් එක්ක කැරලිකාර කණ්ඩායමක් හදලා, රහපාලා අවසානයේ දයාසිරි ජයසේකර ආණ්ඩුවට යන්න මෙතැන ඉඳන් කථාව පවත්වනකොට සද්ද නැතුව, බකම් නිලාගෙන, බිම් බලා ගෙන හිටියා. ඒ විධියට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ එක්සත් ජාතික පක්ෂය තුළ භූමිකාවත් ඊයෙන් අවසන් වුණා. දැන් තව කණ්ඩායමක් එකතු කරගෙන, තවත් කැරලිකාර මන්ත්‍රීවරුන් හදා ගෙන නායකතුමාට විරුද්ධව කැරැල්ලක් මෙහෙයවන ආකාරය පෙන්වනවා. එක්සත් ජාතික පක්ෂයේ නායකයකු වෙන්න උත්සාහ කරන හැම කෙනාම දං ගෙඩියට දක්කලා, ඉතා පහසු කෙටි ක්‍රමයකින් සජිත් ප්‍රේමදාස මහත්තයා එක්සත් ජාතික පක්ෂයේ බලය පැහැර ගන්න හදන බල අරගලය හැර වෙන දෙයක් අපට එතුමාගෙන් පෙනෙන්නේ නැහැ. මේක තමයි සජිත් ප්‍රේමදාස මහත්තයා නායකත්වයට එන්න කරන අරගලය; ඒ වැඩ පිළිවෙළ. බිහි වෙන හැම නායකයෙක්ම දං ගෙඩියට දක්කලා, තල්ලු කරලා දාලා, ඉතා කෙටි ක්‍රමයකින් එතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකයා වෙන්න හදනවා. නමුත් මෙතැනට ඇවිල්ලා කථා කරනවා, "ඊයේ දවසේ මේ සභාව තුළ වැඩකට නැති මහා වල්පල් ගොඩක් කථා කළා" කියලා. වල්පල් ටික ඔක්කොම

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

අනලා, මැල්ලුම හදලා දීලා දයාසිරි ජයසේකර මහත්මයා ආණ්ඩුවට තල්ලු වෙන කොට එතුමා නිකම්ම බලාගෙන සිටියා. මේකයි, එක්සත් ජාතික පක්ෂය අද ලබලා තිබෙන දුර්භාග්‍යය, අභාග්‍යය සම්පන්න කාල පරිච්ඡේදය. එහෙම කෙනෙක් තමයි අද මෙතැන ඉඳ ගෙන කියන්නේ, "පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනය වැඩකට ඇති දෙයක් නොවෙයි, ඇයි මේකට මේ තරම් කාර් ගෙන්වන්නේ, ඇයි මේකට මේ තරම් වියදම් කරන්නේ?" කියලා. ඒ ගැන එතුමා මහා විශාල ඝෝෂාවක් නඟනවා. හැබැයි අපට මතකයි, එතුමාගේ පියා මේ රටේ ජනාධිපතිවරයා හැටියට සිටියදී, සාර්ක් සම්මේලනය-දකුණු ආසියානු සහයෝගිතා සංවිධානයේ සම්මේලනය - ලංකාවේ තියන්න ගිහිල්ලා, ඉන්දියාව ඇතුළු රටවල් ආවේ නැති බව. ඒ වෙලාවේ පාකිස්තානය විතරක් මෙහාට ආවා. එදා දකුණු ආසියානු රටවල් ටික කොළඹට රැස් කර ගන්න බැරි වුණු පාලන වකවානුවක් මේ රට තුළ තිබුණා.

ඒ විතරක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අනෙක් මන්ත්‍රීවරු අද දිගින් දිගටම කියනවා, මේ පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනයට ඇයි මේ තරම් වියදම් කරන්නේ, මේක අනවශ්‍ය දෙයක් කියලා. හැබැයි අපට මතක් වෙනවා, 2005, 2006, 2007 වාගේ අවුරුදුවල එක්සත් ජාතික පක්ෂය දිගින් දිගටම කිව්වේ, "ලංකාව හුදකලා වුණු රාජ්‍යයක්, ලෝකයෙන් කොන් වුණු රාජ්‍යයක්, ලෝකයෙන් ඈත් වුණු රටක්, ලෝකයේ කිසිම රටක් එක්ක ජාත්‍යන්තර සම්බන්ධතා නැති, ලෝකය පිළිගන්නේ නැති අසාර්ථක රාජ්‍යයක් බවට ලංකාව පත් වෙලා තිබෙනවා" කියලායි. අපට උදවු කරන්නේ ලෝකයේ තිබෙන හිඟන රටවල් කියලා එක වතාවක් කිව්වා. ලෝකයේ ඉන්න හිඟන්නු ටික තමයි ලංකාවට උදවු කරන්නේ, ඉතියෝපියාව, සුඩානය, බුරුමය කියන මේ රටවල් හැර ලෝකයේ පිළිගත්, වැදගත් රටවල් අපට උදවු කරන්නේ නැහැයි කිව්වා. අද මහා බ්‍රිතාන්‍යය ඇතුළු පොදු රාජ්‍ය මණ්ඩලීය සියලු රටවල් ඒකමතිකව ලංකාවට එන්න තීන්දු කරලා තිබෙන වෙලාවක, පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනය සාර්ථක කරන්න සියලු කටයුතු සූදානම් කරන වෙලාවක දැන් අහනවා, "ඇයි, මේ තරම් මේකට වියදම් කරන්නේ, ඒකෙන් ගොවි විශ්‍රාම වැටුප ගෙව්වොත් හොඳ නැද්ද, ඒකෙන් බදු අඩු කළොත් හොඳ නැද්ද?" කියලා. හැබැයි, අපි මතක් කරන්න ඕනෑ, අපි රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට වැඩ කටයුතු කර ගෙන යෑමේදී, රාජ්‍යයක් ලෝකයට ගෙන යෑමේදී, ජාත්‍යන්තර සම්බන්ධතා ඇති ලෝකය පිළිගත් රටක් හැටියට පත් කිරීමේදී, පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් හැටියට, එහි සාමාජිකයකු හැටියට මේ අවස්ථාව ආසියාවටම ලැබුණු මහාවිශාල ගෞරවයක් සේ සලකනවා මිස, ඒකට අපහාස කිරීම, අවමාන කිරීම රාජ්‍ය බලය කීප වතාවක් හොබවපු එක්සත් ජාතික පක්ෂයට නොගැළපෙන දෙයක් කියන එක.

ඒ එක්කම අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මේ රට තුළ දැවැන්ත ප්‍රතිරූපයක් නිර්මාණය වෙලා ඒක ජාත්‍යන්තරයට ගෙන යන වෙලාවේදී, ජාත්‍යන්තරය පිළිගත්ත ලෝකයේ සාර්ථක රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාවේ නම ප්‍රතිෂ්ඨාපනය වෙලා තිබෙන වෙලාවක ඒක දරා ගන්නට බැරිව, විවිධාකාර මතවාද ඉදිරිපත් කරමින්, විවිධාකාර අපහාසවලට මේ රට ලක් කිරීම එක්සත් ජාතික පක්ෂය වැටිලා තිබෙන බංකොලොත් බව ප්‍රදර්ශනය කිරීමක් හැටියට අපි නැවත නැවතත් ප්‍රකාශ කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි හඳන ගෙවල් ගැන කිව්වා. "අපි වෙනුවෙන් අපි" ව්‍යාපෘතිය යටතේ කොච්චර ගෙවල් හැදුවාද කියලා අහනවා. ප්‍රේමදාස යුගයේ තමයි මේ රටේ ගෙවල් හැදුවේ, මේ මහින්ද රාජපක්ෂ යුගයේ ගෙවල් හදන්නේ නැත කියලා හදපු ගෙවල් ගැන වාර්තාවක් කිව්වා. නමුත් අපි දන්නේ නැහැ මේ වාර්තාවල්කොහෙන් ගත්තාද, කොහොම සොයා ගත්තාද කියලා. නමුත් අපට මතකයි, එදා අපි පාසල් ශිෂ්‍යයෝ හැටියට සිටි ප්‍රේමදාස යුගයේදී උදා ගම්, නඟින ගම්, බඟින ගම්, පෙරේත ගම්, කුම්භාණ්ඩ ගම් වාගේ නම් තිය තියා, ගම්මාන හද හදා ගියා කියලා කිව්වාට රටේ නිවාස ප්‍රශ්නය එක තැන පල් වුණු වකවානුවක් තිබුණා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඇවිල්ලා ගණන් අහනවා. ගෙවල් 350යි හදලා තිබෙන්නේ කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපි මතක් කරන්නට ඕනෑ අපි නියෝජනය කරන පළාත්වල, අපේ මැතිවරණ කොට්ඨාසයේ රුපියල් ලක්ෂ 20ක වටිනාකමක් තිබෙන නිවාස ගණනාවක් "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතිය යටතේ හදලා විවෘත කළ බව. ඒවා විවෘත කරන්නට අපි ගියා. හමුදාවේ සෙබළුන්ට ඒවා හදලා දීලා ඒවා විවෘත කරන අවස්ථාවලට අපි ගියා. ගෙවල් ගැන සංඛ්‍යා ලේඛන අහන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්නට ඕනෑ ඇත එපිට ගම්මානවලට ගිහින් බලන්න කියලා. එතුමන්ලාට කියන්න නැතිව ඇති මේවා විවෘත කරන්න එන්න කියලා; මේවා බලන්න එන්න කියලා. නමුත් අපි ගියා. හමුදා සෙබළුන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 20කට වැඩි වටිනාකමක් තිබෙන ගෙවල් ගණනාවක් ආණ්ඩුවේ මුදල්වලින් හදලා දුන්නා. "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතිය යටතේ ගෙවල් හදනවා. "සසුනින් සෙවන" ව්‍යාපෘතිය යටතේ ගරු විමල් වීරවංශ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයෙන් හැම ගමකම පන්සල සම්බන්ධ කරගෙන, දායක සභාව සම්බන්ධ කරගෙන දැන් හැම වසමක් ගානේම ගෙවල් හදාගෙන යනවා. සමෘද්ධි වැඩ පිළිවෙළ යටතේ "දිරිය පියස" නිවාස යෝජනා ක්‍රමය යටතේ හැම වසමකටම සල්ලි දීලා, නිවාස නැති අයට ගෙවල් හදා ගෙන යනවා. මේවා ගැන දන්නේ නැතිව, රජයේ වැඩ පිළිවෙළට අනුගත වන්නේ නැතිව, ඒවා ගැන අහන්නේ නැතිව, ඒවා දැකලා නැතිව, "ගෙවල් හැදුවේ නැහැ. අපේ කාලයේ විතරයි ගෙවල් හැදුවේ." කියලා කියන උදවියට අපි පිළිතුරක් හැටියට කියන්නට ඕනෑ, ගම්මානවලට ගිහින් බැලුවොත් මේ නිවාස ව්‍යාපෘතිය යටතේ රජය කොයි තරම් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියන එක දැක ගන්නට පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වී මිලදී ගැනීම ගැනත් කථා කළා. අපි නියෝජනය කරන්නේ මහවැලි කලාපයයි. අපි මහවැලි කලාපය තුළ ජීවත් වන ගොවියෝයි. නමුත් අපි මතක් කරන්නට ඕනෑ, ලෝකයේ කිසිම රටක නීතියක් නැහැ, නිෂ්පාදනය කරන ඔක්කොම වී ටික ආණ්ඩුව මිලදී ගන්න ඕනෑය කියලා. එහෙම නීතියකුත් නැහැ, ආණ්ඩුවකට එහෙම කරන්නත් බැහැ. නමුත් අපි ගොවියාට ස්ථීර මිලක් ලබා දෙමින්, තරගකාරීත්වයක් තුළ සතොසෙන් වී මිලදී ගන්නවා; වී අළෙවි මණ්ඩලයෙන් වී මිලදී ගන්නවා. තරගකාරීත්වය තුළ වී මිලදී ගැනීම සඳහා රජය වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අද හාල් කිලෝවක් රුපියල් 45යි කියලා කවුරුත් කියන්නේ නැහැ. නමුත් වී විකුණා ගන්න බැහැයි කියනවා. මේවා කියන්නට දෙයක් නැති වන විට තම තමන් විසින් නිර්මාණය කර ගත්ත ප්‍රලාපයන් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා ප්‍රකාශ කරන්නට ඕනෑ, අද දින ගරු සරත් අමුණුගම ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ බදු පිළිබඳ නියමයන් තුළ සරල බදු ක්‍රමයක් රටට හඳුන්වා දීමේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිය වඩාත් නිවැරදිව ක්‍රියාත්මක කරමින් මේ රටේ ජනතාවට වඩාත් සහන සලසන වැඩ පිළිවෙළක් අන්තර්ගත වෙලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 6.06]

ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කරන ලද, බදු සම්බන්ධ නියමයන් සහ යෝජනා පිළිබඳ විවාදයට සම්බන්ධවීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම පළාත් සභාව කියන ආයතනය යැපෙන්නේ මහ ආණ්ඩුවෙන්. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ. එහි අදායම රුපියල් බිලියන 49.2යි. වියදම රුපියල් බිලියන 150.5යි. මධ්‍යම රජයෙන් වාර්ෂිකව රුපියල් බිලියන 112ක් පළාත් සභාවට දෙනවා. අනෙක් ප්‍රධාන කාරණය මෙයයි. මම මේ කියන්නේ ප්‍රායෝගික අත් දැකීමයි. "A" සහ "B" පාරවල් අයිති වන්නේ මහ ආණ්ඩුවටයි. "C" සහ "D" පාරවල් අයිති වන්නේ පළාත් සභාවලටයි. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේත් පළාත් සභාවට අයිති පාරවල් ටික හදන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙනුයි. මේවා විගණනය කරලා හරියට වැඩ කරන්නට ඕනෑ කියන මතයේ තමයි මම ඉන්නේ.

ඊළඟට, අද දින ඉදිරිපත් කර තිබෙන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය තුළින් මුද්දර ආදායම, දිවුරුම් පෙත්සම් සඳහා අය කරනු ලබන මුද්දර ගාස්තුව සම්පූර්ණයෙන්ම පළාත් සභාවට ලැබෙනවා. රක්ෂණ ඔප්පුවක් ලිවීමේදී රුපියල් 250ක ගාස්තුවක් අය කරන්නට ඉස්සර තීරණයක් තිබුණා. දැන් ඒක රුපියල් 50 දක්වා අඩු කරලා තිබෙනවා. ඒ ගාස්තුව වැඩියි කියා කථාවක් තිබුණා. දැන් ඒක අඩු කරලා තිබෙනවා. මත්පැන් බල පත්‍ර සඳහා අය කරපු රුපියල් 10,000ක ගාස්තුව දැන් රුපියල් 20,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. මත් පැන් වෙළඳාම සඳහා ගාස්තුව ඉස්සර තිබුණේ රුපියල් 1000යි. දැන් 2000ක් කරලා තිබෙනවා. එවැනි වැඩි කිරීමකුත් තිබෙනවා. සම්පූර්ණ ආදායම ලැබෙන්නේ ඒ ගොල්ලන්ටයි. 2010 වර්ෂයේදී ඉපයූ බදු මුදල රුපියල් මිලියන 4501යි; 2011දී රුපියල් මිලියන 8968යි. ඒ අනුව ඒ ආදායම වැඩි වෙලා තිබෙනවා. 2012දී රුපියල් මිලියන 7530යි; 2013දී රුපියල් මිලියන 3051ක් මේ දක්වා -ජූනි 30 වැනි දා දක්වා- එකතු වෙලා තිබෙනවා. මුද්දර ආදායම, බදු ආදායම පහළ බස්සපු එක පොඩ්ඩක් ඉහළ යනකොට මූල්‍ය විනය ආරක්ෂා කර ගැනීම සඳහා අපට යම්කිසි ක්‍රමවේද හදන්න සිද්ධ වෙලා තිබෙනවා. COPE එක තිබෙනවා. ඒ නිසා මෙකට වෙන ක්‍රමයක් හදන්න ඕනෑ. මොකද, ඒ අය හුඟාක් වෙලාවට Nescafe machines දෙමින් කටයුතු කරනවා. ඒ නිසා මේ මුදල් හරි හැටි පරිහරණය කරනවාද කියන එක අපි බලන්න ඕනෑ. මොකද, මේ රටේ ජනතාව වක්‍ර බදු ගෙවා තමයි අපේ රටේ ආර්ථිකයට උදව් වෙන්නේ. සෘජු බදු ගෙවන අය හුඟාක් අඩුයි. ව්‍යාපාරිකයෝ තමන්ගේ ආදායම පෙන්වන ගමන් වියදමත් ඒකට හේත්තු කරනවා. ඒ මැද්දට තමයි බදු ටික ගෙවන්නේ. ආදායම එක පැත්තකින් තිබෙනවා. වියදමත් ඒ ගණනට ළං කරලා පොඩි ගණනකට බදු ගෙවනවා. බදු වෙනුවෙන් ස්වතක්සේරුවක් කරන්න තමයි අපට පුළුවන් වෙන්නේ. අප විසින්ම අප තක්සේරු කරලා බදු ගෙවන system එකක් තමයි ලංකාවේ තිබෙන්නේ. ඒ නිසා ඒ ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ.

ඊළඟට, අපේ රටේ අර්තාපල් නිෂ්පාදනය ගැන කථා කරනකොට මේ රටේ නිෂ්පාදනය කරනවා වාගේම පිටරටිනුත් විශාල ප්‍රමාණයක් ගෙන්වනවා. මේ ගැන පරීක්ෂණයක් කරන්න මා එක වතාවක් බංග්ලා දේශයට ගියා. ගරු කථානායකතුමාත් ගියා. ඒ ගොල්ලන්ගේ අල නිෂ්පාදනය වැඩි වෙන්නේ කොහොමද කියා අපි බැලුවා. ඒ රටේ කඳු අඩුයි. බංග්ලා දේශයේ ගංගාවල්වලින් එන රොන් මඩ විශාල ප්‍රමාණයෙන් කුඹුරුවල තැන්පත් වෙනවා. ඒ නිසා ඒ රටේ අල නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. 1: 100ක්, 1:150ක් ආදී වශයෙන් ඒ රටේ අල නිෂ්පාදනය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. නමුත් අපේ රටේ කඳු බෑවුම්වල තමයි අල වගා කරන්නේ. එතකොට මූල ගමන් කරන්නේ බොහොම පොඩි දුරක් විතරයි. එහෙම වුණාම පොහොර ටික බාදනය වෙලා ගිහින් නිෂ්පාදනය අඩු වෙනවා. මගේ දැනීමේ හැටියට නම් අපට අල මෙට්‍රික් ටොන් ලක්ෂයක් අවශ්‍ය වෙනවා. නමුත් අපේ රටේ නිෂ්පාදනය කරන්නේ ඒකෙන් සියයට 50යි. අවුරුද්දකට අර්තාපල් මෙට්‍රික් ටොන් 180,000ක් අවශ්‍යයි. කලින් මා කිව්වේ ලූනු ගැනයි. ඒකෙන් සියයට 40ක් විතරයි අපි නිෂ්පාදනය කරන්නේ. ඒ නිසා නිෂ්පාදනය තිබෙන අවස්ථාවේදී ගොවියා ආරක්ෂා කිරීම සඳහා විටින් විට බදු වැඩි කරන ගමන්, නිෂ්පාදනය අඩු වන වෙලාවේදී බදු අඩු කිරීම රජයේ ප්‍රතිපත්තියක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රතිපත්ති ටික හොඳයි. ඒවා අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඊළඟට අපි දන්නවා සීනි, මිරිස්, ලොකු ලූනු ආදියත් ආනයනය කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ආනයනය නොකර මෙහිම ඒවා වගා කළොත් හොඳයි.

ඊළඟට, අපේ පොහොර සහනාධාරය ගැනත් කියන්න ඕනෑ. පොහොර සහනාධාරය තුළින් නිෂ්පාදනය වැඩි වෙනවා වාගේම ආසනික්, heavy metals වැඩි වීම නිසා අද වකුගඩු රෝගීන් විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. දැමිය යුතු පොහොර ප්‍රතිශතය කුමක්ද කියා හරියට තක්සේරු කරන්නේ නැතිව අනවශ්‍ය විධියට පොහොර යෙදීම නිසා ඒවා භූගත ජලයට මිශ්‍ර වෙලා, භූමියට මිශ්‍ර වීම නිසා පස විනාශ වෙලා තිබෙනවාය කියන එක තමයි අද විද්වතුන්ගේ මතය වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ සඳහා විද්‍යාත්මක ක්‍රමවේද පාවිච්චි කළොත් භාණ්ඩාගාරයේ ශක්තිය වැඩි කර ගන්න පුළුවන් වෙනවා. මෙතුමන්ලා එක එක චෝදනා ගෙනෙනවා. චීනය ගැනත් කථා කළා. චීනය ගැන කථා කරනකොට යමක් කියන්න ඕනෑ. අපි රාජ්‍ය ප්‍රතිපත්තියක් හදන්නේ රාජ්‍ය උපාය මාර්ග අනුවයි.

ඒ කියන්නේ යම් කිසි රාජ්‍යයක් එක්ක ගනුදෙනු කරන්නේ නිකම් නොවෙයි. එසේ ගනුදෙනු කිරීමේදී කොහොමද ඒ ගනුදෙනු සිද්ධ කරන්නේ කියලා අපි බලනවා. එහිදී අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මොකද, අපේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කර ගෙන බටහිර රටවලින් එන බලපෑම්වලට ඔරොත්තු දෙන්න අපි ශක්තිමත් යාළුවෙක් එක්ක ඉන්න ඕනෑ. එතකොට ඒ යාළුවා අපව ආරක්ෂා කර ගන්නවා. එහෙම නැතුව වෙළෙඳාමේ තිබෙන අතිරික්තයේ ප්‍රතිශතය සහ ආනයනය අපනයනය අතර තිබෙන පරතරය විධියට නොවෙයි. අපට හොඳ යාළුවෙක් ඉන්න ඕනෑ. අපි දන්නවා අපට හොඳ යාළුවෙක් ඉන්නවා. ඒ තමයි අල්ලපු රට, ඉන්දියාව.

ඊළඟට මෙතුමන්ලා කිව්වා, චීනයට හැම දේම දෙනවා, චීනය සේරම කරනවා, චීනය අපිව නාස්ති කරලා දානවා කියලා. නමුත් එක පැත්තකින් අපි කියනවා, රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලදී උපාය මාර්ගික සහයෝගීතාව කියන්නේ ඉතාම ඉහළ මට්ටමක තියා ගන්න ඕනෑ දෙයක් බව. ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහයෝගය පමණක් නොවෙයි, ආරක්ෂාව පිළිබඳවත් එම සහයෝගීතාව වැදගත්. කවුද අපට යුද්ධයේදී ආරක්ෂාවට හිටියේ? අපි දන්නවා, එක වෙලාවකදී ඉන්දියාව අපට පරිප්පුත් දාලා එහේදී ත්‍රස්තවාදීන්ට පුහුණුවකුත් දුන්න බව. ඉන්දීය මධ්‍යම ආණ්ඩුව පැත්තකට දාන්නකෝ. තමිල්නාඩුවේ එවැනි සිද්ධීන් ඇති වුණා. නමුත් අපට ආරක්ෂාවට හිටියේ කවුද? අපට ආයුධ දුන්නේ කවුද? අපව ආරක්ෂා කළේ කවුද? ඒ ආරක්ෂාව නොතිබුණා නම් මේ රට අද ත්‍රස්තවාදීන්ගේ නිජ බිමක් වෙන්න තිබුණා නේද? මේවා ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා විදේශ ප්‍රතිපත්තිවල balance එකක් තිබෙන්නට ඕනෑ. ජනාධිපතිතුමා ඒ balance එක හොඳින් පවත්වාගෙන යනවා කියන එක තමයි අපි විශ්වාස කරන්නේ.

[ගරු ෆිලික්ස් පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසු ගිය කාලයේ අපට විරුද්ධව බටහිර රටවල් වැඩ කර ගෙන යද්දී අප්‍රිකානු රටවල් රාශියක් අපට උදව්වු වුණා. කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා, නයිජීරියාවට හෝ ඝානාවට අපේ රටෙන් මොනවාද දුන්නා කියලා. නමුත් අපි එවැනි සම්බන්ධතා පවත්වා ගන්න ඕනෑ. අපි ගෙදරකට යද්දීත් තෑග්ගක් අරගෙන යන්න ඕනෑ. ජනාධිපතිතුමා ජාත්‍යන්තර වශයෙන් රට රටවලට ගිහිල්ලා සම්බන්ධතා ජාලය ගොඩ නඟා ගත්තා. එහි අවසන් ප්‍රතිඵලය වෙන්නේ කුමක්ද? අපේ ආරක්ෂාව පිළිබඳව අපට බයක් නැතුව, සැකක් නැතුව ඉන්න පුළුවන් වෙලා තිබෙනවා. නැත්නම් අපට හදවත් ගැහි ගැහී තමයි ඉන්න සිද්ධ වෙන්නේ. අපව තනි වෙයිද, අපව තනි කරයිද, අපට යාළුවෙක් නැද්ද -මිත්‍රයෙක් නැද්ද- කියන මතයේ අපට ඉන්න සිද්ධ වෙනවාය කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

ඊළඟට මම අපේ එතනෝල් නිෂ්පාදනය ගැනත් යමක් කියන්න ඕනෑ. 2012 වර්ෂයේදී එතනෝල් ලීටර් මිලියන 2ක් ආනයනය කරලා තිබෙනවා. 2013 මුල් භාගයේදී එතනෝල් ආනයන කිරීම තහනම් කළා. එහි අරමුණ වුණේ ලංකාවේ එතනෝල් නිෂ්පාදනය වර්ධනය කර ගැනීම කියායි කිව්වේ. නමුත් එතනෝල් භාවිතා කර කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන වන ඇල්කොහොල් සහ රසායනිකව කරනු ලබන ප්ලාස්ටික් කර්මාන්තයටත් ඒවා අවශ්‍ය වෙනවා.

අපේ රටේ සහල් අතිරික්තයක් තිබෙනවා. එම අතිරික්තයට අපි කුමක්ද කරන්න ඕනෑ? මගේ සුළු දැනීම අනුව මට කියන්න පුළුවන් ඕනෑම ධාන්‍යයක් ටික කාලයක් යද්දී ගුල්ලෝ ගහනවා, එක්කෝ පරණ වෙනවා, එහෙම නැත්නම් ඒ ධාන්‍යයේ තිබෙන ගුණාත්මකභාවය අඩු වෙනවා. ගුණාත්මකභාවය අඩු වෙද්දී ඒවා භාවිතයට, නැත්නම් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයක් දිනෙන් දින -දවසින් දවස- වර්ධනය වෙනවා. ගුණාත්මකභාවය වැඩි වෙන්නේ නැහැ, නුසුදුසු තත්ත්වය වර්ධනය වෙනවා. නමුත් අරක්කු නම් පරණ වෙන්න, පරණ වෙන්න ගණන් වැඩි වෙනවා; විස්කි නම් පරණ වෙන්න, පරණ වෙන්න ගණන් වැඩි වෙනවා. සාමාන්‍යයෙන් ධාන්‍ය වර්ග වගේ දේවල් කළමනාකරණය කරන්න නම් අතුරු නිෂ්පාදන රාශියක් කරන්න ඕනෑ. ඒ නිසා අපි ඒකට පොඩි ප්‍රමුඛත්වයක් දෙන්න ඕනෑ. අපේ රටේ සහල් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. එම විශාල ප්‍රමාණය මේ ආර්ථිකයට ප්‍රශ්නයක් වෙලා ගොවියෝ ඒකෙන් ඉවත් වුණොත් අපට තවත් අර්බුද රැසකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒවා ගැනත් අපි කල්පනා කරන්නට ඕනෑ.

ඊළඟට සුරාබදු ආඥාපනත ගැනත් කියන්න ඕනෑ. රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මඟින් යොදා ගනු ලබන (ඊතයිල් මද්‍යසාර) ස්ප්‍රිතු දේශීයව සැපයීමේදී ලීටර් 500 දක්වා ද ආනයනය කිරීමේ දී ලීටර් 100 දක්වා ද, බදුවලින් නිදහස් කරනවා. සද්භාවයෙන් කරන කරුණු කාරණා සඳහා ලීටර් 100 දක්වා බදුවලින් නිදහස් කරලා, අවසන් නිපැයුම සුරා බද්ද ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මද්‍යසාර) ස්ප්‍රිතු දේශීය සැපයීමේදී ලීටර් 500 දක්වා ද සුරාබද්දෙන් නිදහස් කරන අතර, ආනයන බද්ද රුපියල් 75ක් පමණක් පනවනවා. ඔක තමයි අලුත් සංශෝධනය. මත්පැන් සඳහා නිෂ්පාදනය කරන (ඊතයිල් මද්‍යසාර) ස්ප්‍රිතු සඳහා සෑම ලීටරයකටම රුපියල් 100ක් ගෙවන්න ඕනෑ, ආනයනය සඳහා රුපියල් 200ක බද්දක් ගෙවන්න ඕනෑ.

අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රිතු ඒ කියන්නේ කාර්මික ස්ප්‍රිතු, දුර්වල ස්ප්‍රිතු සඳහා සෑම ලීටරයකටම දේශීය සැපයුමට රුපියල් 150ක්ද, ආනයනය සඳහා රුපියල් 800ක්ද වශයෙන් බදු ගෙවන්න ඕනෑ. මේ ප්‍රතිපත්තිය හොඳයි. දැන් අපි රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල්, රජයේ දෙපාර්තමේන්තු සඳහා මේවා ආනයනයේදී ලීටර් 100ක් දක්වා බදු නැහැ. ලීටර් 500 දක්වා ඒවාට බොහොම සුළු බද්දක් තමයි අය කරන්නේ. ඉතින් මේ තත්ත්වය අපි ඉස්සරහට ගෙනෙන්න ඕනෑය කියන එක මතක් කරන්න ඕනෑ.

ඊළඟට බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙනුත් විශේෂයෙන් මතක් කළ යුතු කාරණාවක් තිබෙනවා. මා හැම දාමත් මේ මතයේ ඉන්නවා. මොකද, එක පුද්ගලයකු licences 15, 20, 50, 60 අරගෙන තිබෙනවා, විවිධ නම්වලින්. නමුත් අපි කීයද අය කරන්නේ? රුපියල් 20,000යි. නමුත් ඒවා විකුණන්නේ කීයටද? ලක්ෂ 200ට, 300ට අත යටින් විකුණනවා. මේ ජීවන වියදමේ බර අඩු කරන්න යෝජනාවක් වශයෙන් මා කියනවා, මේවා රජයට ගන්න ඕනෑය කියලා. මේවා අවුරුදු ගණනක් පරම්පරාවලට ලබා දෙන්නේ නැතිව ඩෙන්ඩර් කැඳවා දෙන්න ඕනෑ. ටෙන්ඩර් කරපුවාම යම් කිසි ආර්ථික වාසියක් ලැබුණොත් ජනතාවගේ යහපත වෙනුවෙන් අපට එය යොදවන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් සිංගප්පූරුවේ මත්පැන් බලපත්‍රයක් වලංගු වන්නේ අවුරුදු දෙකකටයි. අලුත් කිරීමට ලැබෙන්නේ සති දෙකයි. ඒ දියුණු රටක්. ඉන්දියාවේ නම් යම් කෙනකු මත්පැන් පානය කරනවා නම් ඒකටත් licence එකක් ගන්න ඕනෑ. දිනකට රුපියල් 5ක් ගෙවන්න ඕනෑ. ඊළඟට ප්‍රවාහනයටත් බදු ගන්නවා. දිනකට රුපියල් 5යි. මත් පැන් පානය කරන්න වර්ෂයකටම licence එක ගත්තොත් රුපියල් 100ක් ඉන්දියාව අය කරනවා. ඒවාත් වක්‍ර බදු.

ඉතින් අද මේ නියමය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ නිලධාරි මහත්වරුන්ට මා කියනවා, මේ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්නය කියලා. එතුමන්ලා අපේ ආර්ථිකයට අත්වැලක් දෙන නිලධාරින්. බොහොම හොඳ නිලධාරින්. ඒ අය තමන්ගේ රාජකාරිය හොඳට ඉෂ්ට කරනවා. නමුත් මේවා ගැනත් අවධානය යොමු කර කටයුතු කරන්න ඕනෑ. එහෙම කටයුතු කළොත් දුප්පතාට තිබෙන ජීවන බර අපට හුඟාක් දුරට අඩු කරන්න පුළුවන්. 2013.04.03 දින, අංක 1804/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ, සුරාබදු ආඥා පනත යටතේ, අංක 957 දරන සුරාබදු නිවේදනය තුළින් මේ කරුණු කාරණා ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ෆිලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මත් ද්‍රව්‍යවලිනුත් ලොකු හානියක් සිදු වෙනවා. ලොකුම ප්‍රශ්නය ගංජා ප්‍රශ්නය. 2010දී ගංජා කිලෝ එක්ලක්ෂ දාහතරදහස් තුන්සියඅනූවක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. 2009ත් එක්ක සැසඳීමේදී 2010දී ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වූවන්ගේ සංඛ්‍යාව සියයට 52කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. දැන් බලන්න, කේරලින් තමයි ගංජා ගෙනෙන්නේ. කේරලින් ගංජා ගෙනෙනවා වාගේම සිගරට් ආනයනයත් කරනවා. අපි දන්නවා සිගරට් හොඳ නැහැ, ඒවා භාවිතය තුළින් මිනිස්සුන්ට නොයෙකුත් ලෙඩ රෝග හැදෙනවා, ලක්ෂ ගණන් මිය යනවා කියා. නමුත් සිගරට් තුළින් ආර්ථිකය මිය යන ක්‍රමයකුත් තිබෙනවා. ඒ, අද විදේශ රටවලින් ගෙනෙන "Gold Seal" කියන සිගරට් එක තුළිනුයි. එහි cost එක රුපියල් 2යි. විකුණන්නේ රුපියල් 8ට. හැබැයි, වෙළෙන්දාට රුපියල් 6ක් දෙනවා. සමහර විට රුපියල් 12ට විකුණනවා; රුපියල් 4ටත් විකුණනවා. වැඩි මුදල සේරම

යන්නේ වෙළෙන්දාට. ශත පහක්වත් tax ගෙවන්නේ නැහැ. විශාල වශයෙන් ඒ සිගරට් ආනයනය කරනවා. ඒ නිසා නීතිය සංශෝධනය කරලා මේ අයට උපරිම දඬුවම දෙන්න ඕනෑ. සිර දඬුවම්, බරපතළ වැඩ ඇතිව සිර දඬුවම් දෙන්න ඕනෑ. මොකද, මේ සිගරට් ආනයනය තුළින් එක පැත්තකින් ජීවිත හානියට පත් කරනවා. අනෙක් අතින් ඒ අය ආර්ථිකයට ලොකු පහරක් ගහනවා. ඒ නිසා විශේෂයෙන් ඒ ගැන මතක් කරන්න ඕනෑ.

ඊළඟට 2011 දිවයින පුරා කරපු වැටලීම්වලින් ගංජා කිලෝ දෙලක්ෂ තුන්දහස් පන්සියයක් අත් අඩංගුවට පත් වෙලා තිබෙනවා. 2009ත් එක්ක සැසඳීමේදී 2010 දී ගංජා සම්බන්ධයෙන් අත් අඩංගුවට පත් වූ සංඛ්‍යාව සියයට 58කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා.

දැන් ලංකාවේ ගංජා බොන්න බැහැලු. ඒකත් කේරළයෙන් තමයි ගෙනෙන්න වෙලා තිබෙන්නේ. මුහුදු මාර්ගයෙන් තමයි සියලු දේවල් සිදු වන්නේ. මුහුදු මාර්ගයෙන් අපේ රටෙන් බර ගණනක් ඕස්ට්‍රේලියාවට යනවා. ඕස්ට්‍රේලියාවට ගිහින් බෝට්ටු 500ක් අපට අහිමි වුණා. ඕස්ට්‍රේලියාවට මිනිස්සු යනවා විතරක් නොවෙයි, බෝට්ටුවත් එහෙ දමා එනවා. මෙහෙම ගියොත් දෙවන පරම්පරාවේ ධීවර කර්මාන්තය කරන්න කවුරුත් නැති වෙනවා. ඔබතුමන්ලා මේවා ගැන හොඳට බලන්න. ගරු සරත් අමුණුගම ඇමතිතුමාට ආර්ථික කටයුතු පිළිබඳව හොඳ දැනුමක් තිබෙනවා. ඒ නිසා මේවා ගැන බලා අවශ්‍ය නීතිමය කටයුතු කරන්නය කියා මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම නැති වුණොත් අපේ අතිගරු ජනාධිපතිතුමාත් ඒ වාගේම ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාත් කොච්චර උත්සාහ කළත් ප්‍රතිඵලයක් ගන්න බැරි වෙනවා. පිටතින් හිල් තිබෙන භාජනයකට කොච්චර වතුර දැම්මත් පිරෙන්නේ නැහැ වාගේ, යටින් පොඩ්ඩ පොඩ්ඩ leak වන නිසා හරියට පුරවා ගන්න බැරි තත්ත්වයකට පත් වෙනවා වාගේ ඒ උත්සාහය අපතේ යනවා.

දැන් අපේ රටේ විස්කි බොන උදවිය වැඩි වෙලා. 2006 දී විස්කි ලීටර් 240,008ක් පානය කර තිබෙනවා. 2010 දී ලීටර් 5422යි. 2011 වන විට ලීටර් 744,585ක් විස්කි පානය කර තිබෙනවා. ඇමෙරිකාව හාල්වලිනුත් විස්කි හදනවා. අපේ සහල් අතිරික්තයෙන් මොනවා හෝ කර ගත්තොත් අපේ ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් කියන එක මතක් කරමින් මගේ වවන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

I

විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත: නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 08 දිනැති අංක 1787/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

II

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2013 පෙබරවාරි 08 දිනැති අංක 1796/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.12 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත: නියෝගය
முத்திரைத் தீர்வை (விசேட ஏற்பாடுகள்) சட்டம் : கட்டளை
STAMP DUTY (SPECIAL PROVISIONS) ACT: ORDER

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2013 මැයි 10 දිනැති අංක 1809/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

සුරාබදු ආඥාපනත: නියමය
மதுவரிக் கட்டளைச் சட்டம் : கட்டளை
EXCISE ORDINANCE: ORDER

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.07.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ආනයනික ආහාර ද්‍රව්‍යවල සුරක්ෂිතභාවය
இறக்குமதியாகும் உணவுப்பொருட்களின் பாதுகாப்பு
SAFETY OF IMPORTED FOOD ITEMS

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ඛ්‍යසීලයෙන් ආනයනය කළ සුදු සීනිවල මිනිස් සිරුරට හානි සිදු කළ හැකි විෂ සහිත ලෝහයක් වන 'කැඩ්මියම්' අඩංගු වී ඇති බව ගන්නෝරුව කෘෂි පර්යේෂණ ආයතනය විසින් සිදු කරන ලද පරීක්ෂණවලින් හෙළි කර ගෙන ඇත.

මෙම හෙළිදරව්වට අනුව පෙනී යන්නේ මෙරටට මෙවැනි ආහාර ද්‍රව්‍ය තත්ත්ව පරීක්ෂණයකින් තොරව ගෙන්වීමට ඇති හැකියාව මෙන්ම මිනිස් සිරුරට අහිතකර ආහාර ද්‍රව්‍ය නිදහසේ වෙළෙඳාම් කිරීමට ඇති හැකියාවය.

මෙම තත්ත්වය හේතුකොට රටේ සියලු ජනතාව වකුගඩු රෝග, පිළිකා සහ දියවැඩියා වැනි රෝග වැළඳීමේ අවදානමක සිටින බව පෙන්වා දිය හැක.

එබැවින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ආනයනික ආහාර ද්‍රව්‍ය දැඩි පරීක්ෂාවට ලක් කිරීම සහ වෙළෙඳ පොළෙහි විකිණීමට ඇති ආහාර ද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිත බවට සහතික කර ඒවා පාරිභෝගිකයාට මිලදී ගැනීමට පෙර හඳුනා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් කඩිනමින් සකසා ජන ජීවිතය සුරක්ෂිත කිරීමට කටයුතු යොදන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයනික සුදු සීනිවල "කැඩ්මියම්" වැනි මිනිස් සිරුරට අහිතකර ලෝහ තිබෙන බව ගන්නෝරුව කෘෂි පර්යේෂණ ආයතනය පසු ගිය දවස්වල හෙළි කර ගෙන තිබුණා. ඒ සම්බන්ධ මතු වන බරපතළ කාරණය තමයි අපේ රටේ ජනතාව තවදුරටත් වකුගඩු රෝග, පිළිකා සහ දියවැඩියා වැනි රෝගවලට ගොදුරු වීමේ බරපතළ අවදානමක් දකින්න ලැබීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ විෂ රසායනික ද්‍රව්‍ය, වල් නාශක, කෘමි නාශක, රසායනික පොහොර, ආසනික් වාගේම ඉතා විෂ රසායනික ද්‍රව්‍ය හේතුවෙන් අපේ රටේ දහස් ගණනක් ජනතාව ඒවාට ගොදුරු වෙලා සමහරු මිය ගියා. සෑහෙන පිරිසක් රෝගීන් බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අංශයේ ඉතා හොඳ දර්ශකයක සිටි අපේ රට පසු ගිය දශක දෙක තුළ බරපතළ අන්දමට මේ වාගේ මාරාන්තික රෝග ව්‍යාප්ත වීම නිසා සෞඛ්‍යමය වශයෙනුත් විශාල වශයෙන් පල්ලම් බැස තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන සභාවේ අවධානයට යොමු කරන්න කල් තැබීමේ විවාදයක් ගත්තේ අපේ රටේ ජනතාව සීනි පරිභෝජනය ගැන විශාල උනන්දුවක් දක්වන නිසායි.

කහට කෝප්පයට, plain tea එකට, කිරි වීදුරුවට වාගේම නොයෙකුත් ආහාරවලට සීනි භාවිත කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට තුළ පාරිභෝගික අවශ්‍යතාවට ප්‍රමාණවත් තරම් සීනි නිෂ්පාදනය වීමක් ගැන අපට පෙනෙන්න නැහැ. හිඟුරාන ගැන, කන්තලේ ගැන නොයෙක් දේවල් කිව්වත් ඒක ඒ තරම් ප්‍රමාණවත් නැහැ. සීනිවලට අපේ රටේ වෙනම ඇමතිවරයෙකුත් ඉන්නවා. මා හිතන හැටියට තවමත් රටේ සීනි අවශ්‍යතාවෙන් සියයට 90ක් විතර පිට රටින් තමයි ආනයනය කරන්නේ. විශේෂයෙන්ම බ්‍රසීලය වාගේ රටවලින් ගෙන්වනවා. නමුත් මේ ගෙනෙන ආනයනික ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රමාණවත් සොයා බැලීම් සිදු වනවාද කියන කාරණය අද ප්‍රශ්නයක්. සුදු සීනි ගැන කථා කරන්නට පෙර මේ සභාවේදී මීට පෙර ආනයනික කිරි පිටි සම්බන්ධයෙනුත් සාකච්ඡා කළා. ඇතැම් රටවලින් ආනයනය කරන කිරි පිටිවල ප්‍රමිතිය ගැන, ඒවායේ තිබෙන රසායනික දේවල් ගැන කථා බහ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීනි වේවා, කිරි පිටි වේවා, අනිකුත් ඕනෑම ආහාරයක සිරුරට අහිතකර රසායනික ද්‍රව්‍ය තිබෙනවා නම්, එම ආහාර පරිභෝජනය කිරීමෙන් අපේ ජනතාව රෝගීන් වනවා නම් ඒක ඉතාම බරපතළ කාරණයක්. මේ කාරණා ගැන විශේෂ, කඩිනම් අවධානය යොමු විය යුතුයි. ඒ සඳහා ක්ෂණික පියවර ගන්නට ඕනෑ. "අස්වයා පැන ගියාට පසුව ඉස්තාලය වැසීම" වාගේ ආණ්ඩුවේ බොහෝ දේවලට ගන්න කීන්දු මේකට අරගෙන හරි යන්නේ නැහැ. පසු ගිය කාලයේ ආසනික් ගැන කථා කළා. කෘෂි කර්මාන්තයට යොදා ගන්නා වල් නාශක, කෘමි නාශක, රසායනික පොහොර ගැන කථා කළා. මේ නිසා ඇතැම් විෂ රසායනික ද්‍රව්‍ය තහනම් කළා කියලාත් කිව්වා. නමුත් ඒ තහනම් කරපු ඇතැම් විෂ රසායනික ද්‍රව්‍ය තවමත් වෙළෙඳ පොළේ විකුණන්න තිබෙන බවටත් මත පළ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙද්දී රටේ බරපතළ අර්බුදයක් බවට පත්ව තිබෙන වකුගඩු, පිළිකා, දියවැඩියා වැනි රෝගවලට බලපාන මේ කාරණා ගැන වග කිව යුතු අංශ සහ අමාත්‍යාංශවල කිසිම ඒකාබද්ධතාවක් දකින්නට නැති වීම ලොකුම දුර්වලතාවක් හා බේදවාචකයක්. කෘෂිකර්ම අමාත්‍යාංශය එකක් කියනවා; සෞඛ්‍ය අමාත්‍යාංශය තව එකක් කියනවා; පාරිභෝගික සුඛසාධන අමාත්‍යාංශය තවත් කාරණයක් කියනවා. හරියට කාලගුණ ප්‍රශ්නය ආපු වෙලාවේ ධීවර අමාත්‍යාංශයයි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයයි කතන්දර කිය කියා හිටියා වාගේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාවගේ ජන ජීවිතය සම්බන්ධයෙන් තිබෙන මෙවැනි බරපතළ කාරණා ගැන මීට වඩා විශේෂ අවධානයකින් කටයුතු කිරීමේ අවශ්‍යතාව ඇත්ත වශයෙන්ම තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ මධ්‍යම ඇමෙරිකානු රටවල විෂ රසායනික හේතුවෙන් ජනතාව රෝගී වෙලා බරපතළ සෞඛ්‍ය අර්බුද මතු වුණාම ඒ රටවල් ඒකාබද්ධ වෙලා මාස හයක් වාගේ කෙටි කාලයකින් ඒ සෞඛ්‍ය ගැටලුවලින් ඒ ජනතාව මුදවා ගන්න කටයුතු කරපු හැටි අප ආදර්ශයට ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අවාසනාවකට තවම අපේ රටේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යාංශ දෙක, තුනට එකට එකතු වෙලා නිසි ක්‍රමවේදයක්, වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න බැරි වෙලා තිබෙනවා.

ආනයනික සුදු සීනි සම්බන්ධයෙන් මතු වන මේ තත්ත්වය සමගම අනිකුත් ආනයනික ආහාරවල ගුණාත්මකභාවය තව දුරටත් පරීක්ෂා කිරීමට පියවර ගැනීමත් අත්‍යවශ්‍ය කාරණයක් හැටියට අප දකිනවා. අප දන්නවා, මේ රටට හොර පාරෙන් ඕනෑම දහ ජරාවක් ගෙනැත් කිසිම කරදරයක් නැතිව විකිණීමට තවමත් ඉඩකඩ තිබෙන බව. සමහර වෙලාවට හොඳ එළවලු ටිකක්, හොඳ පලතුරු ටිකක් බයක් සැකක් නැතිව අනුභව කරන්න බැරි තත්ත්වයක් තමයි අද අපේ රටේ තිබෙන්නේ. අහන්න, දකින්න තිබෙන තොරතුරුවලින් ඒක හොඳට පෙනෙනවා. පසු ගිය කාලයේ අපේ රටේ ව්‍යාප්ත වෙලා තිබුණු වකුගඩු රෝගය මැඩලීමට ලෝක සෞඛ්‍ය සංවිධානය යම් යම් නිර්දේශ සැපයුවා.

ඒවා ක්‍රියාත්මක වුණේ බොහොම මන්දගාමී ස්වභාවයකින්. ඒ වාගේම තමයි ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ගැන අවුරුදු ගණනාවක් තිස්සේ කිව්වා. ඔන්න ගෙනෙනවා, මෙන්න ගෙනෙනවා, සතියෙන් ගෙනෙනවා, සති දෙකෙන් ගෙනෙනවා කියලා මේ මැති ඇමතිවරුන්ගේ කටින් පිට වුණා. නමුත් ඒ ප්‍රතිපත්තිය ගෙනෙන්න තවම බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම රටට හිතවත් විද්වතුන්, යම් යම් විෂයයන් ගැන විශේෂඥයන් හැටියට ඉන්න උදව්විය, දැනුමක් තිබෙන අය මත පළ කළාම ඒවාට දක්වන සැලකිල්ල බොහොම මදි බව අපට පෙනෙන්න තිබෙනවා. මේ කාරණා ගැන තමුන්නාන්සේලා අර කඩින් කඩ පවත්වන මැතිවරණවලට දක්වන උනන්දුවවත් නැති වීම ගැන අප කනගාටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ගෙන්වන ආහාර ඇතුළු අනෙකුත් ආනයනික භාණ්ඩ වරාය පරිශ්‍රය තුළදීම විධිමත් පරීක්ෂණ ක්‍රමවේදයකට යටත් කළ යුතුයි කියා මා කල්පනා කරනවා. එහෙම කරනවා නම් මේ වාගේ සිද්ධීන් බොහෝ දුරට අපට මහ හරවා ගන්න පුළුවන්කම ලැබෙයි. ඒ වාගේම ප්‍රමිති ආයතන, විද්‍යාත්මක පර්යේෂණ සිදු කරන ආයතන වැනි තැන් තව තවත් උසස් මට්ටමකට පත් කරන්න අපි කටයුතු කළ යුතුව තිබෙනවා. මේ රටේ ජනතා මුදල් නොයෙකුත් දේවල්වලට නාස්ති කරනවා. හැබැයි ඒ වාගේ තැන් ගැන අපි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒවාට අවශ්‍ය නවීන තාක්ෂණය ලබා දීම අවශ්‍යයි. ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික භාණ්ඩ පිළිබඳව පරීක්ෂා කරන්න අපට තිබෙන දියුණු විද්‍යාත්මක පහසුකම් ප්‍රමාණවත්ද කියන එක ගැන හිතන්න වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ විට අපට මෙවැනි ගැටලු ඇති වුණාම සමහර දේවල් ගැන පරීක්ෂා කරන්න විශාල මුදලක් වැය කර විදේශ රටවලට යවන්නත් සිදු වුණු අවස්ථා අප දැක තිබෙනවා. ඒ නිසා මෙවැනි කාරණා කෙරෙහි අවධානය යොමු නොකිරීමේ විපාකවලට අද අපි මුහුණ දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බාල ඉන්ධන ගෙන්වා බෙදා හැරිය හැටි අපි දැක්කා. ඒක එක අවස්ථාවක නොවෙයි, අවස්ථා කීපයකදී සිද්ධ වුණා. වර්තමාන රජය යටතේ සමහර දේවල් - බාල බඩු ගෙනෙන එක, බාල දේවල් ගෙන්වා පාරිභෝගිකයා අතට දෙන එක, ගනුදෙනු සිද්ධ වන එක- නිකම් විලාසිතාවක් බවට පත්වෙලා තිබෙනවා. බාල ඉන්ධන ගෙනැල්ලා මොකක්ද වුණේ? ඒවායින් පරිසරය දූෂණය වනවා. ඒ වාගේම ඊයම් ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්න ඇති වුණා. ප්‍රමිතිය ගැන ප්‍රශ්න මතු වුණා. විශේෂයෙන්ම අපි දන්නවා වාහන දුම ජනතාවට ඒ තරම් හිතකර නැහැ කියලා. ඒ බාල ඉන්ධනවලින් පිට වන දුම විශේෂයෙන්ම ගැබිනි මාතාවන්ට, කාන්තාවන්ට බොහොම අහිතකරයි කියා අප අසා තිබෙනවා. මේවා පිළිබඳව රටක් හැටියට අපි කල්පනා කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රජරට ප්‍රදේශයේ අනුරාධපුර, පොළොන්නරුව ඇතුළු පළාත් ගණනාවක වකුගඩු රෝගීන්ගේ, පිළිකා රෝගීන්ගේ, ඒ වාගේම දියවැඩියා රෝගීන්ගේ සංඛ්‍යාව එන්න එන්නම වර්ධනයක් තමයි අපට දකින්න තිබෙන්නේ. අවුරුදු කීපයකට ඉස්සෙල්ලා ඒ රෝගීන්ගේ සංඛ්‍යා ලේඛන බලලා වර්තමානයත් එක්ක සංසන්දනය කරන කොට ඉතාම භයානක තත්ත්වයකට අද අපි ඇද වැටෙමින් තිබෙනවා. වකුගඩු රෝගීන්ගේ සංඛ්‍යාව දිහා සහ මිය ගිය සහ රෝගී වුණු පිරිස් ගැන කල්පනා කරන කොට ත්‍රස්තවාදයටත් වඩා භයානක තැනකට දැන් අප ගමන් කරමින් සිටිනවා. පසු ගිය කාල සීමාව තුළ 22,000කට වැඩිය මිය ගිහින් තිබෙනවා. 15,000ක් විතර රෝගී තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි පිළිකා රෝගීන්. අද ඔබතුමන්ලා අපි කවුරුත් දේශපාලනඥයෝ හැටියට අපේ ගම්වල තිබෙන මළ ගෙවල්වලට ගියාම මිය ගියේ කොහොමද කියලා අහන කොට, නිකම් උණක් හෙම්බිරිසාවක් ගණනට මිනිසුන් කියනවා පිළිකා රෝගයෙන් මිය ගිය බව. අප මේවා පිළිබඳව දැඩි ලෙස කල්පනා කළ යුතු තැනකට දැන් ඇවිල්ලා තිබෙනවා. මේවා දේශපාලන වශයෙන් එහාට මෙහාට කථා කර ගන්නා මාතෘකාවලට වඩා, අපි රටක් හැටියට රටේ ජනතාවගේ ජන ජීවිතය වෙනුවෙන් ක්ෂණික තීන්දු තීරණවලට යා යුතු තැනකට ඇවිත් තිබෙනවා. ඒ වාගේම තමයි දියවැඩියා රෝගීන්ගේ ව්‍යාප්තිය. අපි මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉල්ලන්න විශේෂයෙන්ම බලාපොරොත්තු වුණේ සුදු සීනි, පරිජපු, ඇපල්, කිරි පිටි ඇතුළු ආනයනය කරන ද්‍රව්‍ය, විශේෂයෙන්ම පරිභෝජනයට ගන්න ආහාර වාගේ දේවල් විශේෂ පරීක්ෂාවකට ලක් කර ජනතාව අතරට යැවීමේ ක්‍රමවේදයක් අවශ්‍ය නිසායි.

වෙළෙඳ පොළේ තිබෙන ආහාර ද්‍රව්‍යයත්, ප්‍රමිතියෙන් යුතුද , ජනතාවගේ ශරීර සෞඛ්‍යයට ගැළපෙනවාද කියන එක නිරන්තරයෙන්ම පරීක්ෂාවකට යොමු කළ යුතුය කියලා අපි කියන්න කැමැතියි. ඒ නිසා ආනයනය කරන දේවල් හරි, දේශීයව නිෂ්පාදනය කරන දේවල් හරි, කොයි විධියෙන් හරි පාරිභෝගිකයා අතට යන හැම දෙයක්ම පරිභෝජනයට සුදුසුද, ජනතාවගේ ශරීර සෞඛ්‍යයට ගැළපෙනවාද කියන එක ගැන අවධානය යොමු කරලා, පරීක්ෂාවට ලක් කරලා බයක් සැකක් නැතිව මේ රටේ ජනතාවට ඒවා පරිභෝජනය කරන්න පුළුවන් වාතාවරණයක් ඇති කිරීම සඳහා වහාම -කඩිනම්- පියවර ගන්න කියන එක තමයි මේ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අපි බලාපොරොත්තු වන්නේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මේවා පුවත් පත්වල පවා දැඩි ලෙස පළ වුණා. "රටින් ගේන සුදු සීනිවල සිරුරට අහිතකර විෂ. වකුගඩු රෝගී මූත්‍රා පරීක්ෂාවකදී හෙළිවෙයි" කියලා පත්තරවල ගියා. ආනයනික සුදු සීනිවල අහිතකර ලෝහ තිබෙන බව පළ වුණා. මේ හැම එකකින්ම විවිධ විධියට කියැවුණේ මෙවැනි දේවල් නිසා අද අපේ රටේ පාරිභෝගිකයාට භයානක තත්ත්වයක් උදා වෙලා තිබෙන බවයි.

මම මීට වඩා කාලය ගන්නේ නැහැ. ගණපූරණය ගැන කථා කරන ආණ්ඩුවක් පසු ගිය දවස්වල අපි දැක්කා. ගණපූරණය කෙසේ වෙතත්, ඇමතිවරු හිස් වෙලා හිටියත් වෙළෙඳ ඇමතිතුමා වගකීමක් තිබෙන ඇමතිවරයෙක්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
අපි දෙදෙනාම ඉන්නවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම දන්නවා ඊයේ ඉඳලා පක්ෂය ඇතුළේ කුරුණෑගල මැතිවරණ තරගය වැඩි වුණා කියලා. එවැනි වෙලාවක එතුමා ඒ සියල්ලම පසෙක දමලා අද මේ කල් තැබීමේ විවාදයට සහභාගිවීම ගැන මගේ විශේෂ ස්තුතිය එතුමාට පුද කරනවා. කෝකටත් තෙලය වාගේ හැමදාම සෞඛ්‍ය ගැන කථා කරන කොට සම්පූර්ණ බර කරට ගන්නා නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමාත් අද මෙතැනට පැමිණීම ගැන අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා වග කිව යුතු පුද්ගලයන්. දක්ෂ ඇමතිවරයෙක් වන අපේ වෙළෙඳ ඇමතිතුමා මම හැම දාම අගය කරනවා. එතුමා තමන්ගේ දක්ෂතාව අනුව මේ ප්‍රශ්නයටත් මොකක් හරි උත්තරයක් අපට ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. දැන් යෝජනාව ස්ථිර කිරීම ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා විසින් කරනවා ඇති. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. යෝජනාව ස්ථිර කිරීම ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, ඒ යෝජනාව සම්බන්ධයෙන් මම අදහස් ප්‍රකාශ කරනවා. මොකද, මේ ප්‍රශ්නය රටට වාගේම මා නියෝජනය කරන අපේ ගම්පහ දිස්ත්‍රික්කයටත් මේ දවස්වල බොහෝ දුරට බලපාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ නැවුන්ගමුවේ තිබෙන විනිග්‍රෝස් ආයතනය හේලීස් ආයතනයට අයිති එකක්. වතුරවලට ඇසිඩ් මිශ්‍ර වෙලා කියලා ඒ අවට ප්‍රදේශවාසීන් සියලු දෙනාම දැන් බය වෙලා සිටිනවා. මේ ගැන පරීක්ෂා කරන්න තැනක් තවම හරියට ගැලපිලා නැහැ. භූගත ජලයේ ඇසිඩ් තිබෙනවා, භූගත ජලයේ pH අගය 4ට වඩා අඩු වෙලා තිබෙනවා කියලා කියනවා. ඒ අයට වතුර බොන්න විධියක් නැහැ. National Water Supply and Drainage Board එක කියනවා මේ වතුර අහිතකරයි, බොන්න එපා, විවිධ රෝග හැදෙන්න පුළුවන්, පිළිකා හැදෙන්න පුළුවන් කියලා.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක කියන එක හොඳයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම කථා කළාට පස්සේ ඔබතුමා කථා කරන්න.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ග්ලවුස් නිෂ්පාදන ආයතනයක් නිසා මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවාය කියලා අද "හිරු" නාළිකාවෙන් කිව්වා. මේ සම්බන්ධයෙන් කටයුතු කරන අපේ වෛද්‍ය අමුණුගම මහත්මයා මේ අවස්ථාවේ නිලධාරී මැදිරියේ ඉන්නවා. මේ news එක අහපු ගමන්ම මම මේ සම්බන්ධයෙන් ලියුමක් ගහන්නත් හින්දු කළා. වහාම මේ ගැන කටයුතු කරන්න කියලා මම එතුමාටත් උපදෙස් දෙන්නම්. ඒ වතුරවල pH අගය අඩුයි කියලා "හිරු" නාළිකාවේ "රතු මිනිත්තුව" කියන වැඩසටහනින් ප්‍රචාරය වුණා. මම ඒකට ඇහුම්කන් දුන්නා. මම ඒ වෙලාවේම විස්තර ටික ලියා ගත්තා. වෛද්‍ය අමුණුගම මහත්මයාත් මේ අවස්ථාවේ ඉන්නවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හෙඳයි, බොහොම ස්තුතියි. භූගත ජලයේ ඇසිඩ් තිබෙන නිසා දැන් National Water Supply and Drainage Board එකෙන් කියනවා, pH අගය 4ට වඩා අඩු වෙලා තිබෙන නිසා මේ වතුර බොන්න කිසිසේත් සුදුසු නැහැයි කියලා. මේ හේතුව නිසා ඌරුවල, නැවුන්ගමුව, රතුපස්වල, හිරිපිටිය, කහටාන, කිරිකිත්ත වාගේ ප්‍රදේශවල මිනිස්සු බය වෙලා දැන් වතුර බොන්නේ නැතිව ඉන්න එකේ ප්‍රවණතාවක් තිබෙනවා. ඒ පැත්තෙන් යන මිනිස්සු කොච්චර වතුර තිබහක් හැදුනත් දැන් ඒ වතුර බොන්නේ නැහැ. එවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශවල මිනිස්සුන්ගේ ජීවිත ගැන විශ්වාසයක් නැති දරුවන්ගේ ජීවිත ගැන විශ්වාසයක් නැති තත්ත්වයකට ඒ ගම්මාන සියල්ලම -ලොකු ප්‍රදේශයක්- පත් වෙලා තිබෙනවා. මේ වෙන කොට National Water Supply and Drainage Board එකෙන්- ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන්- බවුසර් දෙකකින් ඒ ප්‍රදේශයට වතුර අදිනවා. ප්‍රාදේශීය සභාවෙන් බවුසර් දෙකකින් වතුර අදිනවා. National Water Supply and Drainage Board එකෙන් ගෙනැල්ලා මේ ගම්මාන තුළ දැනට ලීටර් 500 ටැංකි 100ක් සවි කර තිබෙනවා. ලීටර් 1000 ටැංකි 25ක් විතර තිබෙනවා. මේ වාගේ වැඩ කොටසක් කර ගෙන යනවා.

විශේෂයෙන්ම මේකේ අයිතිකාරයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එක්ක බොහොම සම්බන්ධ කෙනෙක් නිසා-

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙනවාද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ කථාව අවසාන වුණාට පස්සේ කථා කරන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තව වේලාව තිබෙන නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමාට අවස්ථාව ලබා දෙන්නද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මගේ කථාව අවසාන වුණාට පස්සේ එතුමාට අවස්ථාව ලබා දෙන්න.

හේලීස් ආයතනයේ අයිතිකාරයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එක්ක බොහොම සම්බන්ධ නිසා ජනතාවට විශ්වාසයක් නැහැ, හරි උත්තරයක් ලැබෙයි කියලා. ජනතාව සී සී කඩ දුවනවා. ජනතාව රජය විශ්වාස කරලා රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් මේ දේවල් පරීක්ෂා කරන්න බැහැයි කියනවා. දැනට සුමාන තුන, හතරක සිට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ බැර ලෝහ පරීක්ෂා කරන machines කැඩිලා. [බාධා කිරීමක්]

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම වග කීමෙන් කියන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට කථා කරන්න දෙන්න.

මේ machinesවලට යොදන "ආගන්" කියන වායුව ඉවර වෙලා. ඒ වායුව ගෙනැල්ලා නැහැ. ඒ නිසා බැර ලෝහ පරීක්ෂා කරන්න බැහැ. මේ බැර ලෝහ පරීක්ෂා කරන්න පුළුවන්ද කියලා මම අදත් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ගිහිල්ලා බැලුවා. "ආගන්" වායුව අවසන් වීම නිසා සුමාන තුනක පමණ කාලයක සිට බැර ලෝහ පරීක්ෂා කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් රටේ තාක්ෂණය දියුණු වනවා කියනවා. අනෙක් හැම දේමත් දියුණු වනවා කියනවා. රට computer යුගයට යනවා කියනවා. නමුත් අනෙක් පැත්තෙන් මිනිසාගේ ආයුෂ එන්න එන්නම අඩු වනවා. එදා මිනිසකුගේ ආයුෂ අවුරුදු 120ක්. අද එම ආයුෂ අවුරුදු 100ට, 90ට පහළ බැහැලා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේම දැන් අපි මළ ගෙදරකට ගියාම පෙනෙනවා, මැරුණු කෙනාගේ වයස අවුරුදු 70ක්, 80ක් බව. අවුරුදු 80 ඉක්ම වූ කෙනෙකුගේ මළ ගෙයක් අහන්න ලැබෙන්නේත් බොහොම අඩුවෙන්. නමුත් තාක්ෂණය දියුණුයි. මේකට හේතුව, අපේ රටේ වග කිව යුත්තන් ශීඝ්‍රයෙන් වෙනස් වන පරිසරය දිහා බලන්නේ නැතිකමයි.

පසු ගිය දවස්වල ජනමාධ්‍යයෙන් හෙළි වුණා, සීනිවල විෂ ද්‍රව්‍ය, හාල්වල විෂ ද්‍රව්‍ය, කිරි පිටිවල විෂ ද්‍රව්‍ය, කෘෂි රසායන ද්‍රව්‍යවල විෂ ද්‍රව්‍ය තිබෙනවා කියලා. එක එක වෙලාවට එක එක දේ ගැන හෙළිදරවු වනවා. අපි පරිභෝජන කරන එළවලු විෂයි. මේ වාගේ දේවල් සිද්ධ වුණා. මේවා පරීක්ෂා කරන්න බැහැ. ඒ වාගේම බාල බෙහෙත් ආවා; සේලයින් බෝතල්වල වීදුරු කැටු තිබෙනවා. මේවා පරීක්ෂාවට ලක් වෙන්නේ නැහැ. ඒ වාගේම බාල පෙට්‍රල් ආවා. ඒ නිසා වාහන මහ නැවතුණා. ඒ වාගේම බාල සිමෙන්ති ගෙනාවා. ඒ නිසා buildings කඩා ගෙන වැටෙනවා. ඒ සිමෙන්තිවලින් හදපු buildingsවල ඉන්න මිනිස්සු භයයි. මොකද buildings හැදුවාට පස්සේයි බාල සිමෙන්ති කියලා මාධ්‍යයෙන් හෙළිදරවු කරන්නේ. මේවායේ තත්ත්වය පරීක්ෂා කිරීම අපේ රටේ අද අත්තිම පහළට දමා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ආනයනික දේවල් සම්බන්ධයෙනුත් අපි විශේෂයෙන් අවධානය යොමු කරනවා. මේවා එන්නේ රේගුව හරහා. විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය ආනයනය කරනවා නම්, අනිවාර්යයෙන්ම පරීක්ෂණයකට භාජන වන්න ඕනෑය කියලා නීතියක් හදන්න ඕනෑ. හැම ආහාර ද්‍රව්‍යයක්ම පරීක්ෂණයට භාජන කරන්නේ නැතිව ගෙනෙන්න බැහැ කියලා නීතියක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද මේ දේවල් ගැන පරීක්ෂා කරන්න තිබෙන ස්ථාන දිහා බැලුවොත් ප්‍රධාන වශයෙන් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව තිබෙනවා. නමුත් අද එතැනින් බැර ලෝහ test කරන්න විධියක් නැහැ. "ආගන්" වායුව නැති නිසා ඒ ස්ථානයේ තිබෙන machines ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ආයතනය කලින් තිබුණු ස්ථානයෙන් දැන් වෙනත් ස්ථානයකට මාරු කරලා. අලුත්වැඩියා කිරීම්, ඒ machines සවි කිරීම නිසාත් ඒ කටයුතු අඩාළ තත්ත්වයට පත් වෙලා.

මේවා පරීක්ෂා කරන්න අපට කළුතර, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කොළඹ නාගරික රස පරීක්ෂණාගාරය අපට තිබෙනවා. හැබැයි, ඒ ස්ථානවල බැර ලෝහ පරීක්ෂා කරන්නේ නැහැ. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විතරයි සියයට සියයක් රජයට අයිති ආයතනයක් වශයෙන් ඒ පරීක්ෂාව කරන්න තිබෙන්නේ. ඊළඟට කුරුණෑගල, ප්‍රාදේශීය රස පරීක්ෂණාගාරය තිබෙනවා. ඊළඟට අනුරාධපුර ආහාර රසායනාගාරය තිබෙනවා. නුවරත් ආයතනයක් තිබෙනවා. ඒ වාගේම semi-government ආයතනයකුත් තිබෙනවා ITI - Industrial Technology Institute එක කියලා. ඒ වාගේම විදේශීය රටක් එක්ක සම්බන්ධයක් තිබෙන ආයතනයක් තිබෙනවා, SGS Lanka (Pvt.) Limited කියලා. මේ වාගේ ආයතන තමයි අපට තිබෙන්නේ.

අද කියනවා, දැනුම තිබෙන මිනිසුන්ගෙන් ලෝකයේ භයවැනියට, හත්වැනියට සිටින්නේ අපේ රට කියලා. නමුත් මේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

රටේ මේ වාගේ දේවල් පරීක්ෂා කර ගැනීමේ හරි විධියක් අපට නැහැ. ඒ සඳහා අවශ්‍ය පහසුකම් නැහැ. මේ වාගේ රටක ඒ විධියේ පරීක්ෂණයක් කරන්න මේ ආයතන හත අට පමණයි තිබෙන්නේ.

අඩුම ගණනේ අපි ආහාර ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ආහාර ආනයනය කරන කොට ඒකට නීති සැකසෙන්න ඕනෑ. ආහාර ගැන පරීක්ෂණ පවත්වන්නේ නැතිව ආනයනය කිරීම නවත්වන්න ඕනෑ. විෂ ද්‍රව්‍ය තිබෙනවාද, බැර ලෝහ තිබෙනවාද කියන මේ සාමාන්‍ය දේවල් ටිකවත් බලන්න ඕනෑ. පසු ගිය දවස්වල කිරි පිටිවල ප්‍රශ්න ආවා. සාමාන්‍ය විෂ ද්‍රව්‍ය පරීක්ෂා කරන්නවත් අවශ්‍ය පහසුකම් අපේ වරායවල ඇති කරන්න ඕනෑ. අපි කියනවා, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශාඛාවක් වරාය තුළ විවෘත කරන්න කියලා. නැත්නම් ITI එකේ ශාඛාවක් වරාය තුළ විවෘත කරන්න කියලා. මේ සඳහා මුදල් ගෙවන එක ප්‍රශ්නයක් නැහැ. ආනයනය කරන පුද්ගලයා ඒ සඳහා මුදල් ගෙවා අදාළ වාර්තාව ගනීවි. ඔහු අදාළ ගාස්තු ගෙවයි. කොළඹ වරායේ මෙවැනි ප්‍රශ්නයක් නැහැ. මොකද කොළඹ මෙවැනි ආයතන ඕනෑ තරම් තිබෙන නිසා.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව තිබෙනවා; ITI ආයතනය තිබෙනවා. නමුත් හම්බන්තොට වරායට එන ආහාර පරීක්ෂා කරන්න කොහේද තැනක් තිබෙන්නේ? ඒ ගොල්ලන් එන්න ඕනෑ කළුතරට. හම්බන්තොට වරායේ කන්ටේනර් එක බාලා, කළුතරට ඇවිල්ලා පරීක්ෂා කරගෙන ආපහු යන්න ඕනෑ. නමුත් වරායක් හදන කොට මේ වාගේ විශේෂ ස්ථාන-

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

අපේ හිතවත් නවක මන්ත්‍රීතුමා නිසා මේ ගැන කියන්න ඕනෑ. එතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගැන කිව්වා. ස්ථාවර නියෝග අනුව එහෙම කියන්න බැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මිත්‍රයෙක්, හිතවතෙක් නිසා මේ පිළිබඳව අපට වැඩි විස්තර....." ආදී

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

සම්බන්ධ කරලා එතුමා කථා කළා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

පැවැත්ම, හැසිරීම පිළිබඳව ප්‍රකාශ කරන්න බැහැ. එවන් ප්‍රකාශයක් අන්තර්ගත වෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මිත්‍රයකු නිසා භයක් තිබෙනවා කියලායි මම පැහැදිලි කළේ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔව්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මිත්‍රයෙක් නිසා යම් කාරණයක් සිදු වෙලා කියනවා නම් ඒක එතුමන්ගේ හැසිරීම, පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක්. එවැනි ප්‍රකාශ කරන්න බැහැ. එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි.

හම්බන්තොට වාගේ වරායක් හදද්දී ඒ ගෙන්වන බඩු පරීක්ෂා කරන්නත් අවශ්‍ය ආයතන හදන්න ඕනෑ. රටට ආහාර ද්‍රව්‍ය එන්නේ මේ වාගේ තැන් දෙක, තුනකින් විතරයි. මේ ප්‍රශ්න ගොඩක් ඇති වෙන්නේ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් තමයි. කිරි පිටි වෙන්න පුළුවන්, හාල් වෙන්න පුළුවන්, සීනි වෙන්න පුළුවන්, ඒ වාගේ ආනයනය කරන දේවල්වල තමයි මේ ප්‍රශ්න තිබෙන්නේ. එහෙම නම් අවම වශයෙන් මේ ප්‍රධාන විෂ ද්‍රව්‍ය, ඒ කියන්නේ බැර ලෝහ වෙන්න පුළුවන්, වෙන බැක්ටීරියා වෙන්න පුළුවන්, ඒවා පරීක්ෂා කරන ආයතනයක් වරායක් තුළ තිබෙන්න ඕනෑ. ඒ ආයතනය වරායෙන්ම පාලනය කරන්න ඕනෑ කියලා අපි කියන්නේ නැහැ. ඒක වෙනත් ආයතනයක, රස පරීක්ෂක ආයතනය වාගේ එකක ශාඛාවක් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර කර්මාන්තශාලා ගම්මාන ඇතුළේ තිබෙනවා. මේවායේ කරන්නේ ආනයනය කරන ලද බඩුවල කල් ඉකුත්වීමේ දිනය - expiry date එක- සහිත ලේබල් ගලවලා, කල් ඉකුත්වීමේ දිනය සහිත අලුත් ලේබල් ගහන එකයි. ඉතින් ඒ භාණ්ඩය මිලදී ගෙන බැලුවාම කල් ඉකුත්වීමේ දිනය හරි. මොකද, අලුත් කල් ඉකුත් වීමේ දිනය සහිත අලුත් ලේබල් එකක් අලවලා තිබෙන නිසා. කුණු වෙච්ච, අයින් කරපු බඩු ගෙනැල්ලා ඒවායේ ලේබල් ගලවලා අලුත් ලේබල් ටිකක් ගහනවා. එතකොට ඒ මිනිස්සු කොච්චර ලාභයක් උපයනවාද? බොහොම ලාභ ලබනවා. නමුත් මිනිස්සු වස කනවා. අන්න ඒ වාගේ දේවල් වටලන්න යම් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

හේලීස් එකේ ප්‍රශ්නය නැත්නම් මේ නැදුන්ගමුව ෆැක්ටරියේ ප්‍රශ්නය පිළිබඳව අපි කථා කරලා, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ඒවා පරීක්ෂා කරන්න ඕනෑය කිව්වාම, සඳුදා සහ අඟහරුවාදා විතරයි බඩු භාර ගන්නේ ඒ දෙපාර්තමේන්තුවෙන් කිව්වා. මම ඒ නිලධාරින්ට බනින්නේ

නැහැ. මුළු ලංකාවේම රස පරීක්ෂක කටයුතු කරන්න තිබෙන ආයතනය ඒක. එතකොට සතියේ දින හතේම ගෙනෙන බඩු පරීක්ෂා කරන්න ඒ ගොල්ලන්ට පහසුකම් නැහැ.

මේ වාගේ කාලයක ආනයනික බඩු විවිධ විධියට වෙනස් වෙනවා. ඒ නිසා හැම තැනම, අඩු ගණනේ දිස්ත්‍රික් මට්ටමින් බැරි නම් පළාත් මට්ටමින්වත් මේ වාගේ ද්‍රව්‍ය පරීක්ෂා කරන්න පුළුවන් ස්ථාන හරිගස්සන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කරන්න ඕනෑ. අපේ රටේ සමහර ඒවාට නීති නැහැ. උදාහරණයක් විධියට අජිනමොටෝ ගන්න. අජිනමොටෝ කියන්නේ වෙළෙඳ නාමයක්. ඒකේ විද්‍යාත්මක නාමය තමයි මොනොසෝඩියම් ග්ලූටමේට්. මේවා ශරීරයට අහිතකරයි. නමුත් මේවා ශරීරයට අහිතකරයි කියලා වටලන්න පුළුවන් නීතියක් කොහේවත් නැහැ. නමුත් internet එකට ගිහිල්ලා බැලුවොත් පෙනෙනවා, මොනොසෝඩියම් ග්ලූටමේට් ශරීරයට අහිතකරයි කියලා. ඒවායින් හන්දි රෝග ඇති වෙන්න පුළුවන්, ආමාශ ප්‍රශ්න ඇති වෙන්න පුළුවන් කියනවා. Internet එකේ විවිධ දේවල් ගැන විස්තර තිබෙනවා. නමුත් අපේ රටේ මේ අහිතකර ද්‍රව්‍ය වටලන්න, නැති කරන්න නීති නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මම විශේෂයෙන්ම මේ සභාවේ අවධානය යොමු කරවනවා, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ යෝජනාවේ සඳහන් පරිදි මේ ආනයනය කරන දේවල්වල මේ විෂ ද්‍රව්‍ය තිබෙනවා වාගේම, ඒවා පරීක්ෂා කරන තැන් ශක්තිමත් කරන්න ඕනෑ කියලා. අපේ රටේ දැනුම තිබෙන මිනිස්සු ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය machines ගෙනැත් දීලා ඒ කටයුතු පහසුවෙන් කර ගන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් හදන්න ඕනෑය කියන එක විශේෂයෙන්ම කියනවා. අපි මේ රටේ මීට වැඩිය සල්ලි නාස්ති කරනවා. වරාය හදනවා; ඒකේ මතුවන ගල් කඩනවා. ඒවාට සල්ලි වියදම් කරනවා. නමුත් විෂ දේවල් රටට ආනයනය වෙන එක නවත්වන්න පරීක්ෂණාගාරයක් අපට හදා ගන්න බැහැ. අපි ඒවා ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. නමුත් අපි ඒ ගැන අවධානය යොමු කරන්නේ නැහැ. අපි ගැලරිය සන්තෝෂ කරන්න තමයි, ගැලරියේ අවධානය ගන්න තමයි අපේ අවධානය යොමු කරන්නේ. නමුත් මනුෂ්‍ය ජීවිතය ශක්තිමත් කිරීම සඳහා, මනුෂ්‍ය ජීවිත නිරෝගීමත් කිරීම සඳහා, ආනයනය කරන බඩුවල තත්ත්වය පරීක්ෂා කරන්න අපි අවධානය යොමු කරලා නැහැ.

එක කාලයක ප්‍රශ්නයක් ආවා, කිරි පිටිවල මෙලමයින් තිබෙනවා කියලා. එතකොට ඇත්තටම අපි ඒ ගැන දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා, ඒවා පරීක්ෂා කළේ නැහැ කියලා දොස් කියන්න අපට බැහැ. මෙලමයින් කියන දෙයක් කිරි පිටිවල තිබෙනවා කියලා අපි දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා ඒවා පරීක්ෂා කරන්න අපට විධියක් තිබුණේ නැහැ.

ඒ වාගේම කිරි පිටිවල DCD තිබෙනවා කියලා ඊයේ, පෙරේදා ඉඳන් කියන්න පටන් ගත්තා. දැන් ඒවා පරීක්ෂා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අහිතකර ද්‍රව්‍ය හඳුනා ගන්න නම් සම්බන්ධතා ගොඩ නඟා ගන්න ඕනෑ. වෙන රටවල් මේ අහිතකර ද්‍රව්‍ය කලින් හඳුනා ගන්නවා. ඒ නිසා ඒ රටවල් එක්ක තිබෙන අපේ සම්බන්ධතාව ගොඩ නඟන්න ඕනෑ.

අලුත් අලුත් දේවල් සොයා ගත්තාම, අලුත් අලුත් රෝග තිබෙනවා කියලා තොරතුරු internet එකට ආවාම ඒවා අපේ රටේ අදාළ ආයතන වෙත බෙදා හැරීමේ - distribute කිරීමේ- ක්‍රමයක් තිබෙන්න ඕනෑ. බැර ලෝහ වාගේ දේවල් සම්ප්‍රදායානුකූලව test කරන්න අපට පුළුවන් වුණාට එක එක කාලයට වෙනත් නම්වලින් එක එක දේවල් එනවා. උදාහරණයක් තමයි කිරි පිටිවල DCD තිබෙනවා කියන කාරණය. DCD කියන්නේ හරකුන් ආහාරයට ගන්නා තණ කොළවලට ගහපු බෙහෙත් වර්ගයක්. ඒ හරකුන් කියන්නේ කිරි ගන්නා හරකුන්. ඒ හරකුන්ගේ මූත්‍ර ගංගාවලට එකතු වෙලා ජලය අපිරිසිදු වෙලා බැක්ටීරියා හැදෙනවාය, ඒ ජලය හරකුන් ආහාරයට ගන්නා තණ කොළ සමඟ මිශ්‍ර වෙනවාය කියා හිතලායි DCD තණ කොළවලට ගැහුවේ. සද්භාවයෙන් තමයි DCD ගහන වැඩේ කරලා තිබෙන්නේ. එහි තිබෙන අහිතකර තත්ත්වය ගැන ඒ ගොල්ලෝ දන්නේත් නැහැ. නමුත් අන්තිමේදී ඒ හරකුන්ගෙන් ගන්නා කිරිවලින් හදන කිරි පිටිවල DCD කියන විෂ ද්‍රව්‍ය තිබෙනවා කියලා කිව්වා. ඉතින් මේවා ගැන අපි දන්නේ නැහැ. එහෙම නම් තොරතුරු සපයන මධ්‍යස්ථානයක් -වෙනම ආයතනයක්- අපේ රටට තිබෙන්න ඕනෑ. ඒ ආයතනය වෙනත් රටවල් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ. වෙනත් රටවල් එක්ක සම්බන්ධ වෙනවාය කිව්වාට, කථා කරන්න යන්න ඕනෑ නැහැ. අද අන්තර්ජාලයට - internet එකට- ඔය තොරතුරු ඔක්කෝම එනවා. අන්තර්ජාලයෙන් ඒ තොරතුරු අරගෙන බෙදා හරින්න පුළුවන්. අන්තර්ජාලය ගැන දන්නා හොඳ expertලා, IT Technicianලා අපේ රටේ ඉන්නවා. නමුත් අපි ඒ අය තොරතුරු තාක්ෂණය දෙසට, තොරතුරු රට තුළට ගලා එන ක්‍රමයක් දෙසට යොමු කරලා නැහැ. ඒ අය ඒ ක්ෂේත්‍රයේ උසස් නිර්මාණ කරලා වෙනත් රටවලට විකුණනවා; programmes හදලා විකුණනවා. ඒ අය එවැනි දේවල් කරනවා. ඒ වාගේම, විශේෂයෙන් තොරතුරු ලබා ගැනීමේ තාක්ෂණයක් අපේ රටේ තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වැදගත් දෙයක් මේ යෝජනාව තුළ සඳහන් කළා. එතුමා ප්‍රකාශ කළා මේ වාගේ ප්‍රශ්නයකදී කෘෂිකර්ම, වරාය, සෞඛ්‍ය, ධීවර, පරිසර වාගේ අමාත්‍යාංශ ඒකාබද්ධ වෙන්න ඕනෑ කියලා. ඒ අය ඒ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ. ධීවරයන් වෙනුවෙන් ධීවර අමාත්‍යාංශය ඒ සඳහා එක්කාසු වෙන්න ඕනෑ; ඒ වාගේම පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වරාය අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය -දැන් බාල බෙහෙත් එනවා- එක්කාසු වන්න ඕනෑ. මේ ඔක්කෝම එකතු වෙලා මේ පරීක්ෂණවලට සද්භාවයෙන් යොමු වන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි කථා කරමු අපේ රටේ තිබෙන ආහාර ද්‍රව්‍ය ගැන. ගරු ඇමතිතුමනි, අපි පොඩි කාලයේ මෙහෙම සින්දුවකුත් කිව්වා:

" ඇල්සේෂන් බල්ලා
බනිස් ගෙඩිය ගිල්ලා
ඒකෙ හිටපු ගුල්ලා
ඒකට කෙළ ගිල්ලා"

එහෙම සින්දුවක් අපි පොඩි කාලයේ කිව්වා. ඒ කියන්නේ ඒ කාලයේ පිටිවල ගුල්ලෝ; බනිස් ගෙඩියේ, පාන් ගෙඩියේ ගුල්ලෝ. අද පිටිවල ගුල්ලෝ නැහැ. මොකද, ඒ පිටිවලටත් chemicals ගහනවා. පිටිවල දැන් ගුල්ලෝ නැහැ. අද හැදෙන

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කංකුං කොළ ටිකක් ගත්තොත්, ඒවා කෑමියෝ කාලා නැහැ. තක්කාලි ගත්තොත් බලන්න ලස්සනයි. බල්බ් වාගෙයි තක්කාලි. මොකද, නරක් වූ එකක්වත් නැහැ. මෙන්න මේ වාගේ දේවලුත් තිබෙනවා. නගරාධිපතිවරයකු වශයෙන් වැඩ කරපු කාලයේ මම දැක තිබෙනවා, වෙනත් රටවල මේ තත්ත්වය නැති කරන්න කටයුතු කර තිබෙන ආකාරය. ඒ රටවල farmer's market තිබෙනවා. ඒ කියන්නේ ගොවියාගේ වෙළඳ පොළක්. අපේ රටේ හැම තැනම තිබෙනවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යාල. ඒ වාගේම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කාර්යාල තිබෙනවා. ඒවා අනුග්‍රහයෙන් අපට බැරිද, කෘෂි රසායන ගහපු නැති ආහාර ද්‍රව්‍ය සතියකට සැරයක් විකුණන පොළක් හදන්න? දැන් මිනිස්සු market එකේ තිබෙන එළවලුවලට වඩා ගමේ තිබෙන එළවලු වැඩි මිලකට ගන්නවා. ගොවියා වගා කරලා ගෙනාවා නම් ඒවා ගන්නවා. ඒකටත් පරීක්ෂණ ක්‍රමයක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක් දෙන්න. ඉස්සර ගමේ පොළ තිබුණේ ගමේ මිනිසුන්ට තමා වගා කරන දේවල් ගෙනැල්ලා විකුණන්නයි. අද ගමේ පොළ ගමට නැති වෙලා. වෙළඳ ව්‍යාපාරිකයෝ කොටසක් පොළෙන් පොළට සඳුදා, අඟහරුවාදා, බදාදා වගේ දවස්වල යනවා. නමුත් දැන් ඒ ක්‍රමය නැති වෙලා. මා කියන්නේ අන්න ඒ වාගේ දේවල් පිහිටුවීම තුළින් අපට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙනවා කියලායි. බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේ යෝජනාව ටිකක් කල් ගිහිල්ලායි ගෙනැල්ලා තිබෙන්නේ කියලායි මා හිතන්නේ. අපි දන්නවා මෑත යුගයේ DCD කිරි පිටිවල තිබෙනවා කියලා ප්‍රචාරයක් ගිය බව. එහෙම ප්‍රචාරයක් ගියාම ආහාර පනතට අනුව සාමාන්‍යයෙන් ඒවා සම්බන්ධව කටයුතු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයයි. ඒ වාගේම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අයිති අමාත්‍යාංශයේ විෂයය භාර ඇමතිවරයා හැටියට මම ඒ වෙලාවේම ඒ සම්බන්ධයෙන් සොයා බලන්න සාමිපල් යැව්වා සිංගප්පූරුවට. වඩා හොඳටයි එහෙම කළේ. දෙවතාවක්ම යැව්වා. කලබල කරන්නේ නැතිව යැව්වා. හේතුව, ආහාර සම්බන්ධව තීන්දු තීරණ අරගෙන යම් යම් ප්‍රකාශ කරන එක අප හරි පරෙස්සමෙන් කරන්න ඕනෑ දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කලබල වෙලා ඒවා කරන්න බැහැ. දේශපාලන තීන්දු එහේ මෙහේ ගන්න පුළුවන් කලබල වෙලා. ඔය වාගේ ප්‍රකාශ කරන්න පුළුවන් කලබල වෙලා. හැබැයි ආහාර සම්බන්ධව තීන්දු තීරණ ගනිද්දී අපි හරි පරෙස්සම් වන්න ඕනෑ. මොකද, අපි සියලු දෙනා ආහාර අනුභව කරනවා. අපට තොරතුරු ආවා ඒවායේ DCD කොහෙත්ම නැහැ කියලා. අදටත් මම ඒවා මාධ්‍යයට දීලා නැහැ. පළමුවැනි වටයේ ආවා 'තිබෙනවා' කියලා. ඇත්ත වශයෙන් එහෙම තිබිලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, internet එකට ගියාම තොරතුරු බලා ගන්න පුළුවන් කියලා. ඔව්, internet ගියාම බලා ගන්න පුළුවන් ඒ රටවලත් උද්ඝෝෂණය කරලා තිබෙන බව. ඒක කවුරුත් දන්නා දෙයක්. හැබැයි අද වන කොට DCD නැහැ කියන එක සම්පූර්ණයෙන් තහවුරු වෙලා තිබෙනවා.

ඊළඟට සීනි සම්බන්ධ කාරණය ගැන බලමු. සුදු සීනි සම්බන්ධයෙන් ගන්නෝරුවේ කෘෂි පර්යේෂණ ආයතනය කළ පරීක්ෂණයක් ගැන පත්‍රයේ තිබෙනවා මා දැක්කා. ඒක තමයි ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේ අල්ලා ගෙන තිබෙන්නේ, සුදු සීනිවල කැඩ්මියම් තිබෙනවාය කියලා. හැබැයි මේකේ බලධාරියා සෞඛ්‍ය අමාත්‍යාංශයයි. මා හිතන හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශය tests ගණනාවක් කරලා, පරීක්ෂණ ගණනාවක් කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා තිබෙනවා. එම නිසා අපි ඒ සම්බන්ධයෙන් කලබල වෙන්න හොඳ නැහැ.

ආහාරවලට දේශපාලනය ඇදලා ගන්න හොඳ නැහැ. දැන් අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා මෙම සභාවෙන් ගියා. එතුමා බොහොම අහිංසක පුද්ගලයෙක්. මා එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලයේ එතුමා නගරාධිපතිතුමා හැටියටයි සිටියේ. එතුමා කථා කර ගෙන ගියේ මෙය නගර සභාව කියා හිතා ගෙනයි. මෙය උත්තරීතර පාර්ලිමේන්තුවයි. එතුමා හිතා ගෙන ඉන්නේ මුත්‍රා සාම්පල් test කරන්න හන්දි ගණනේ රසායනාගාර තිබෙනවා වාගේ සුදු සීනි සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න හන්දි ගණනේ රසායනාගාර දමනවාය කියලායි. එහෙම බැහැ. මේ ITI ආයතනය තිබෙනවා. එම ආයතනයෙන් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයක් එම පරීක්ෂණ කටයුතු කර ගන්නේ. මා එතුමාගෙන් අහන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ඒවා දැම්මේ නැත්තේ ඇයි කියලා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සීනි ආවේ බ්‍රසීලයෙන් නොවෙයිද, ඉන්දියාවෙන් නොවෙයිද, තායිලන්තයෙන් නොවෙයිද? එහෙම නැතුව හඳෙන් ගෙනාවාද, වෙන කොහෙන් හෝ ගෙනාවාද? නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒක එතුමාගෙන් අහන්න ඕනෑ. ඒ කාලයේ එතුමා සිටියේ නැහැ නේ.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ නේ. එතුමාත් හිටියා. එතුමාත් දැන් ඉතින් රනිල් වික්‍රමසිංහ මහත්මයාට පින් දෙන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ අය ඔක්කොම පක්ෂය අත් හැර යද්දී එතුමන්ලාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබෙනවා. හැබැයි මේවා ගැන මීට වඩා බලන්න. හැම දෙයටම දේශපාලනය ඇද ගන්න එපා. කැඩ්මියම් ගැන කථා කරන්න ගිහින් අන්තිමට එතුමා නතර වුණේ හම්බන්තොට වරායෙන්. එතුමා කියනවා හම්බන්තොට වරායෙන් ආහාර ද්‍රව්‍ය ගණනාවක් එනවාය කියලා. හැබැයි සමහර මන්ත්‍රීවරු කියන්නේ හම්බන්තොට වරායට එක නැවක්වත් එන්නේ නැහැ; එක නැවයි ආවේ කියලායි. මඩවලින් නැවිලා ඉන්නේ. මඩ ගහන්න ගිහිල්ලා මුළු පක්ෂයම දිය වෙලා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දක්ෂයා. එතුමා ආණ්ඩු පක්ෂයට ආවේ නැති වුණාට, එතුමා ඇත්තටම හරියන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටයි.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එතුමා එයි, එයි. කවදා හෝ එනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
එතුමා එක්සත් ජාතික පක්ෂයේ අතිදක්ෂයෙක්; මනුෂ්‍යාකම තිබෙන හොඳ පුද්ගලයෙක්. එතුමා සුදුසු නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එතුමා සුදුසු මෙහා පැත්තයි. එතුමා වෙලාවට තීන්දුව ගනියි. හැබැයි අපේ අජිත් මාන්නප්පෙරුම නවක මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, මීට වඩා හොඳින් සොයා බලා කථා කරන්න කියලා.

දැන් යුද්ධය අවසන් වෙලායි තිබෙන්නේ. ඒ කාලයේ මේවා ගැන කථා කරනවා තියා මේවා ගැන ලියන්නවත් පුද්ගලයෝ සිටියේ නැහැ. යුද්ධය නිසා ඊට වඩා මහා බරපතළ ප්‍රශ්නයකට රට මුහුණ දීලා තිබුණා. දැන් යුද්ධය ජයග්‍රහණය කරලා තිබෙනවා. දැන් කථා කරන්න තිබෙන මාතෘකාව තමයි වකුගඩු ප්‍රශ්නය. ඔබතුමාත් වකුගඩු ප්‍රශ්නය ගැන කථා කරන එක මීට වඩා හොඳයි. කැබිනට් මණ්ඩලයේදී විනාඩි 45ක් පමණ අපිත් ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා සමඟ කථා කරනවා. අපි වග කිව යුතු රජයක් හැටියට ප්‍රශ්නවලින් පැනලා යන්නේ නැහැ. ප්‍රශ්න මොනවාද එන්නේ, අභියෝග මොනවාද එන්නේ, අපි ඒවා ගැන හොඳට සාකච්ඡා කරලා සැලසුම්සහගතව ඒවාට මුහුණ දෙන බව පැහැදිලිව කියන්න කැමැතියි.

ආහාර පාන ගෙන්වන කොට යම් යම් ප්‍රමිතීන් - standards - තිබෙනවා. ටින් මාළුවලට ප්‍රමිතීන් තිබෙනවා. කිරි පිටිවලට ප්‍රමිතීන් තිබෙනවා. එතුමා හිතන විධියට රේගුවේ රසායනාගාරයේ දමා ගෙන පරීක්ෂා කරලා එළියට දමන්නේ නැහැ. සෑමන් ගෙන්වන්න සමාගමකට අවසර දුන්නොත්, ඉස්සෙල්ලාම ඒකේ ප්‍රමිතිය බලා එය අනුමත කරනවා. ඊට පස්සේ සෑමන් ගෙන්වන්න අවසර දෙනවා. එහෙම ගෙන්වන කොට හැම කන්ටේනරයෙන්ම check කර බලනවා. හොඳ නැති container load එකක් ආවොත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට දන්වා වහාම ඒවා අත් අඩංගුවට ගෙන සීල් කරනවා. එහෙම නැත්නම් ආපසු යවන්න කියනවා. ඒ රටෙනුත් වාර්තාවක් දෙනවා. එහෙමයි කටයුතු කරන්නේ.

අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, ඉස්සර පිටිවල ගුල්ලෝ සිටියා, දැන් පිටිවල ගුල්ලෝ නැහැයි කියලා. දැන් එතුමාට අවුරුදු 50ක් ආපස්සට ගිහින් ගුල්ලන් එක්ක පිටි කන්න ඕනෑද? පොඩ්ඩක් කල්පනා කර බලන්න. මේ ලෝකය දියුණු වෙලායි තිබෙන්නේ. පාරිභෝගික ජනතාව ගන්න බලන්නේ ප්‍රමිතියට අනුකූල භාණ්ඩයි. ජනතාව දන්නවා, ප්‍රමිතියට අනුකූල නැති භාණ්ඩ හා ප්‍රමිතියට අනුකූල භාණ්ඩ මොනවාද කියලා.

ඒ විතරක් නොවෙයි. එතුමා ඒ අස්සේ කිව්වා, බාල සිමෙන්ති ගෙනාවාය කියලා. බාල සිමෙන්තිවලින් හදලා කොයි ගොඩනැඟිල්ලද කඩා ගෙන වැටුණේ? බාල සිමෙන්තිවලින් හදලා කඩා වැටුණු ගොඩනැඟිල්ලක් පෙන්වන්න. [බාධා කිරීමක්] කොහේද? යන්න දෙයක් නැහැ. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන කොට මීට වඩා පොඩ්ඩක් ඔළුව පාවිච්චි කරලා කථා කරන්න. උස තිබුණාට හරියන්නේ නැහැ, මොළෙත් පොඩ්ඩක් පාවිච්චි කරන්න. ඒක තමයි එක්සත් ජාතික පක්ෂයට වුණේ. බාල සිමෙන්ති නිසා එහෙම සිද්ධ වෙලා නැහැ. ඒවාට නිසි තීන්දු, තීරණ අපි ගත්තා. එක් එක් මාෆියාවලට ඔළුව නවන්න සූදානම් ආණ්ඩුවක් නොවෙයි, අපේ ආණ්ඩුව.

නොයෙක් මාෆියාවල් තිබෙනවා. වෙළඳ පොළේත් තිබෙනවා. ඒවා අප හරියට හසුරුවා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය ඒවා හසුරුවන්නට හිතුවේවත් නැහැ. මාත් ඒ ආණ්ඩුවේ කැබිනට් ඇමති කෙනෙක් හැටියට හිටියා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දන්නවා. අවුරුදු දෙකෙන් ගෙදර යන්නට සිදු වුණා. එම නිසා පොඩ්ඩක් කල්පනා කර බලන්න. හොඳ දෙයට හොඳයි කියන්න. නරක දෙයට නරකයි කියන්න. හැබැයි ආහාරපාන ගැන අරගෙන ඒවායින් දේශපාලනය කරන්නට හදන්න එපා. අපත් මේ ආහාරපාන පරිභෝජනය කරනවා. අපත් මේවා පරිභෝජනය කරන අය හැටියට මේවාට අනුමතිය දෙන්න, ඔබතුමන්ලා හිතනවා ද මේ ආණ්ඩුව ඒ තරම් මෝඩ තකතීරු ආණ්ඩුවක් ය කියා? එහෙම දෙන්නේ නැහැ. මා වෙළඳ ඇමති හැටියට ඉතාමත් වගකීමෙන් කටයුතු කර තිබෙන්නේ. නුසුදුසු දේවල් ආවාම අප ඒවාට විරුද්ධව කටයුතු කරනවා.

ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට හැම අවුරුද්දේම සීමාසහිත සේවක පිරිසකින් -එකසිය ගණනකින්- වැටලීම් හතළිස් දාහක් කරනවා. ලංකාවේ නඩු භාර දාහයි වැඩිම වශයෙන් තිබුණේ. අප කාගිල්ස් එකත් අල්ලනවා. ගමේ ඉන්න කඩ මහත්මයාවත් බලනවා. අප සතොසත් අල්ලනවා. අප සමුපකාරයත් අල්ලනවා. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සතොසටත් මම ගිහින් නඩු දාලා තිබෙනවා. මොකද, ප්‍රමිතිය ගැන හරි වගකීමකිනුයි අප කටයුතු කරන්නේ. අප එහෙම විනාශයක් කරා ගෙන යන්නට ඉඩ දෙන්නේ නැහැ. මා ඒක ඉතාමත් වගකීමෙන් කියන්නට කැමැතියි.

සීනි සම්බන්ධව, කිරිපිටි සම්බන්ධව අප ඉතාමත් වග කීමෙන් කියනවා. අද වැඩ බලන සෞඛ්‍ය ඇමති හැටියට සිටින ගරු ලලිත් දිසානායක ඇමතිතුමා දක්ෂ ඇමතිවරයෙක්. මේ සම්බන්ධව එතුමා කියාවි. සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අපේ අමාත්‍යාංශයත් ඒ වාගේම පාරිභෝගික අධිකාරියත් ඒකාබද්ධව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. අප කිසිසේත් නුසුදුසු දෙයට ඇතුළු වන්නට ඉඩ දෙන්නේ නැහැ. වැටලීම් කරන්නට තිබෙන හැම තැනකම අප වැටලීම් කරනවා. හැම ගබඩාවක්ම මාසයකට සැරයක් අප වැටලීම් කරනවා. වැටලීම් කර සොයා බලනවා. එම නිසා තමයි ඉතිහාසයේ පළමු වන වතාවට කුණු අල අහුවෙන්නේ. කුණු අල ගෙනාවේ මේ කාලයේ විතරක් නොවෙයි. ආණ්ඩුවෙන් අල ගේන්නේ නැහැ. බී ලූනු ගේන්නේ නැහැ. ඒවා ගේන්නේ පෞද්ගලික අංශයෙන්. යූඇන්පී කාලයේ ගෙනාවේත් පෞද්ගලික අංශයෙන්. ඒ කාලයේත් ගෙනාවා. ගෙනාවාට ඇල්ලුවේ නැහැ. දැන් අපි අල්ලනවා. අල්ලලා වැරදිවලට උපරිම වශයෙන් දඬුවම් කරනවා. වැරදි කරන පුද්ගලයන්ට විරුද්ධව කටයුතු කරලා, දඩ වශයෙන් බිලියන සියයක් රජය උපයාගෙන තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා විපක්ෂය වෙනුවෙන් මේවාගේ දේවලුත් ගෙනෙන්නට ඕනෑ. හැබැයි ටිකක් මීට වඩා සොයා බලා ගේන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
රට වෙනුවෙන්.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
රට වෙනුවෙන් පෙනී සිටින්නේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා තමයි. ඒ වෙනුවෙන් ඔබතුමන්ලාට හිතන්නටවත් බැහැ. රට වෙනුවෙන් කියලා කිව්වොත්, රටේ ජනතාව දන්නවා රට වෙනුවෙන් ඉන්න නායකයා මහින්ද රාජපක්ෂ

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

ජනාධිපතිතුමාය කියා. වෙන කවුරුත් නොවෙයි. ඒ සටන් පාඨය තමුන්නාන්සේලා ගන්න හිතන්නටවත් එපා. රට කඩන තැන, රට බෙදන තැන, කොටින්ට රටෙන් භාගයක් දෙන තැන තමයි එක්සත් ජාතික පක්ෂය හිටියේ. රට වෙනුවෙන්ය කිව්වොත් එන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඇයි දයාසිරි ජයසේකර -[බාධා කිරීම්]

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

දයාසිරි ඉතින් අපේ මිත්‍රයානේ. දයාසිරි ආවාම අපි ඉතාම ආදරයෙන් පිළිගත්තා. ඔබතුමා ආවත් අප ඉතාමත් ආදරයෙන් පිළිගන්නවා. ඔබතුමන්ලා වාගේ දක්ෂ අය ඉන්න ඕනෑ ආණ්ඩුවේ. [බාධා කිරීම්] මා හිටපු පක්ෂය; ඒක වෙනම දෙයක්. හැබැයි, හෙන ගැහිලා, මකබෑවිලා, විනාශවෙලා ගිහිල්ලා. ඔබතුමන්ලාගේ තරුණ කාලය. ඔබතුමන්ලා දක්ෂයෝ. ඔබතුමන්ලා වාගේ අය ආණ්ඩුවේ තනතුරු ගත්තා නම් විශාල වැඩ කොටසක් කරාවි. [බාධා කිරීම්] ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා දක්ෂයෙක් වෙන්න තව හුගක් කල් යාවි. එතුමා තවම training period එකේ. ඔහේ පුරුදු වෙනවා. පුරුදු වෙලා ඇවිත් ආණ්ඩුවට උදව් කරනවා. හේතුව, මොකද, පේනතෙක් මානයක බලයක් නැති බව දන්නවා. අවුරුදු විස්සක් ද, තිහක් ද, පරම්පරා ගණනකට බලය ලබා ගන්න බවක් පේන්නේ නැහැ. අප දන්නවා නේ. විනාශ වෙලා; දිය වෙලා. වයඹ පළාත් සභාවේ ප්‍රතිඵලය ආවාම බලන්න. ගිය සති දෙකට විතරක් එක්සත් ජාතික පක්ෂයෙන් පහළොස් දාහකට වඩා පිරිසක් අපේ පක්ෂයට අර ගෙන තිබෙනවා. පසු ගිය මහ මැතිවරණයේත්, ජනාධිපතිවරණයේත් මට කිසි කෙනෙක් හම්බ වෙන්න වෙලාවක් ලැබුණේ නැහැ. ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් මම ජනාධිපතිතුමාත් එක්ක රට වටේ ගියේ. මගේ දිස්ත්‍රික්කයේ දවස් දහයයි ඉන්න හම්බ වුණේ.

මා ගන්න මන්ත්‍රී සංඛ්‍යාවයි, සාමාජික සංඛ්‍යාවයි තමුන්නාන්සේලාට තව සති කිහිපයකින් පෙන්වන්නම්. මාධ්‍ය ඔක්කොම සංඛ්‍යා ලේඛන අර ගෙන තිබෙන්නේ. ඔය ඔක්කොම එනවා. ඔවුන් දන්නවා, මොනවා කළත්, ප්‍රතිපත්තිය හැටියට යූඑන්පීයේ හිටියත් මේ රටට ජනාධිපතිතුමා වැඩ කරන බව. මේ වාගේ වැඩ කළ නායකයෙක් ලංකා ඉතිහාසයේම බිහි වෙලා නැහැ. යුද්ධය අවසන් කළා. "ආර්ථිකය හදන්නට බැහැ"යි කියා තමුන්නාන්සේලා කිව්වා. තමුන්නාන්සේලා මොනවා කිව්වත් අද රටේ ආර්ථිකය හදනවා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා, ඔබතුමන්ලා හම්බන්තොට වරාය ගැන කථා කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැම්මා, එය හදනවාය කියා. නමුත් හැදුවේ නැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැම්මා, ඒක හදනවාය කියා. හැදුවා. ගුවන් තොටුපළක් මොනරාගලට දෙනවාය එක්සත් ජාතික පක්ෂය කිව්වා. ජනාධිපතිතුමා හම්බන්තොට ඒක හැදුවා. හදලා විවෘත කළා. රටේ මිනිස්සු - ජනතාවක් හැටියට සතුටු වන්නට ඕනෑ.

ගෙවෙන හැම තත්පරයකදීම ශ්‍රී ලංකාවේ යෝධ සංවර්ධනයක් සිදු වෙනවා. කාටවත් ඒක නැහැ කියන්න බැහැ. ඒ නිසා ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමාට සීනි ගැනවත්, ගුල්ලෝ ගැනවත් කථා කරලා කවදාවත් ආණ්ඩු බලය ගන්න හම්බ වන්නේ නැහැ. ඔබතුමා රටට ආදරය කරන්න. රටේ ක්‍රියාත්මක වෙන වැඩසටහන් ගැන හොඳ කථා කරන්න. නරකක් වෙනවා නම් ඒක පෙන්වලා දෙන්න. ඒකයි මා කියන්නේ.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. අප ඉන්න තාක් කල් විෂ තිබෙන ආහාර කිසි සේත්ම ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ට දෙන්නේ නැහැ. මේ රටේ පාරිභෝගිකයන් වෙනුවෙන් අප ඒක අකුරටම ක්‍රියාත්මක කරනවා. අප සියලු දෙනාම මේ රටේ පාරිභෝගිකයෝ. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වේවා, අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා වේවා, මේ ගරු සභාවේ ඉන්න අපේ ගරු ඇමතිතුමා වේවා, අපේ අස්වර් මන්ත්‍රීතුමා වේවා -ඒ හැම දෙනාම- පාරිභෝගිකයෝ. ඒ නිසා අපේ පාරිභෝගිකයන්ට විෂ ආහාර කවන්න අප සූදානම් නැහැ. යුගයෙන් යුගයට ලෝකයේ එන අභියෝග, ආහාර සම්බන්ධව ශ්‍රී ලංකාවේ අපට එන අභියෝගවලට හරි විධියට මුහුණ දීලා, මේ ප්‍රශ්නවලට විසඳුම් ගේනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි. එහෙම නැතිව, ඔබතුමන්ලා අපට මඩ ගැහුවා, එක අමාත්‍යාංශයක් මෙහෙම කියනවා, මෙහෙම කියනවා, තීන්දු තීරණ ගන්නේ නැහැ කියලා හිතන, එහෙම කඩා වැටුණු ආණ්ඩුවක් නොවෙයි අපි. අපේ ආණ්ඩුව බොහොම බලසම්පන්න ආණ්ඩුවක්. අප නිවැරැදි තීන්දු, තීරණ ගන්නවා. ඒ නිවැරැදි තීන්දු, තීරණ අරගෙන අප රට මෙහෙය වනවාය කියන එක මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට පිළිතුරු කථාව. ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා මා හිතන හැටියට මේ සඳහා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නා. කෙසේ වෙතත්, අද අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති සභාව කල් තැබීමේ යෝජනාවෙන් කියන්නේ සීනිවල කැඩ්මියම් නැමැති රසායන ද්‍රව්‍යයක් අඩංගු වෙලා තිබෙන බව වාර්තා වෙලා තිබෙනවා කියලායි.

සීනි කියන්නේ මේ රටට වැදගත් ද්‍රව්‍යයක්. උදේට තේ එක බොන්න, දවල්ට, හවසට -ඒ ඕනෑම වෙලාවක - තේ එක බොන්න ශ්‍රී ලාංකික ජනතාව වශයෙන් අප වැඩියෙන්ම පාවිච්චි කරන්නේ සීනි තමයි. නමුත් සෞඛ්‍ය පැත්තෙන් නම් අප එච්චර කියන්නේ නැහැ සීනි පාවිච්චි කරන්න කියලා. මොකද, අද මේ රටේ බෝ නොවන රෝග සම්බන්ධ අභියෝගයකට අප මුහුණ දී සිටින නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට ආහාර වර්ග ගෙන ඒමේදී ඒ පිළිබඳ අපේ ජාතික ප්‍රතිපත්තියක්, ක්‍රමවේදයක් තිබෙනවා. මා හිතන හැටියට මේ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළම ඒ ගැන ඒ තරම් අවබෝධයකින් නොවෙයි කථා කළේ. අපේ වෙළඳ ඇමතිතුමාත් කිව්වා, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට සීනි මනින්න අපට තැන තැන රසායනාගාර දමන්න බැරි බව. මේවා කරන ආයතන තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට විශේෂයෙන්ම මේ රටට ගෙන්වන ආහාර ද්‍රව්‍යවල වර්ග දෙකක් තිබෙනවා. විශේෂයෙන්ම ළදරු කිරි පිටි වාගේ දේවල්

දැඩි අවධානයට ලක් වෙන ආහාර ද්‍රව්‍ය. තව කොටසක් තිබෙනවා දැඩි අවධානයට ලක් නොවන. නමුත් ඒ හැම ආහාර ද්‍රව්‍යයක්ම පරීක්ෂා කරන්න ඕනෑ. ආහාර ද්‍රව්‍යයක් වශයෙන් ලංකාවේ වරායට එන සෑම සීනි කන්ටේනරයක්ම අප පරීක්ෂාවට ලක් කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරීක්ෂාවෙන් තොරව, වාර්තාවකින් තොරව ඒවා එළියට එන්නේ නැහැ. ITI එක මඟින් පරීක්ෂාවට ලක් කරලා, ඒ සියලු කටයුතු නිම වූවාට පසුව තමයි පරිභෝගිකයාට ඒවා නිදහස් කරන්න ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ මාධ්‍යයට විශාල නිදහසක් තිබෙනවා. මම අහනවා, අඩුම තරමින් අද මේ රටේ සැමන් ටින් එකක්වත් විෂ වෙලා ළමයෙක් රෝහලකට ඇතුළු කළා කියලාවත් වාර්තා වෙලා තිබෙනවාද කියලා. නැහැ නේ. මොකද එහෙම වුණා නම් මාධ්‍යවල ඒක ලොකුවට පළ කරයි. එහෙම දෙයක් නැහැ. අද ආහාර ද්‍රව්‍ය විශාල වශයෙන් ගෙන්වනවා. ඒ ගෙන්වන ආහාර සම්බන්ධයෙන් අපට වග කීමක් තිබෙනවා. මෙතුමා නඩු දමලා බිලියන 1,00කට ආසන්න ප්‍රමාණයක් ආදායම ගත්තා කියලා කියනවා. අපේ සෞඛ්‍ය සේවාවේත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු සීමිත ප්‍රමාණයක් තමයි ඉන්නේ. ඔවුනුත් මේ ආහාර ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධව විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා මේ රටේ ජනතාවට යම් කිසි වග කීමකින් තමයි ඒ කටයුත්ත අප ඉටු කරන්නේ.

පසු ගිය කාලයේ කිරි පිටි සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා කිරි පිටි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වලා අප වාර්තා 128ක් ලබා ගෙන තිබෙනවා. මොකද, පසු ගිය දවස්වල වාර්තා වෙලා තිබුණා මේ කිරි පිටිවල සෞඛ්‍යයට අහිතකර DCD කියන ද්‍රව්‍යය අඩංගු වෙනවාය කියලා. ඒ samples යවලා අප වාර්තා ලබාගෙන තිබෙනවා. ඒ ලබා ගත් වාර්තා එකසිය විසිඅටෙම කිරි පිටිවල DCD ඇති බවට වාර්තා වෙලා නැහැ. මෙම පරීක්ෂණය කර තිබෙන්නේ තායිලන්තයේ SGS Laboratory එකෙන්. ඒ නිසා අපට පැහැදිලිව කියන්න පුළුවන් කිරි පිටි සම්බන්ධයෙන් යම්කිසි මතයක් තිබුණා නම් ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක් බව. මේ කිරි පිටි පරිභෝජනය සඳහා නිකුත් කරන කොට, අනිවාර්යයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අප ඒ වාර්තාව නිකුත් කර තිබෙනවා. මේ ප්‍රශ්නය ඇති වුණු නිසාම අප තායිලන්තයේ ඒ රසායනාගාරයට කිරි පිටි samples යවලා වාර්තා 128ක් ලබා ගත්තා. ඒ වාර්තා එකසිය විසිඅටෙම කියා තිබෙනවා එවැනි තත්ත්වයක් නැහැ, ඒ කිරි පිටි පිරිසිදුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ තත්ත්වයන් පිළිබඳව අපි පුන පුනා කියන්නට දහලන්නේ නැහැ. එහෙම කියන්නට අවශ්‍යතාවකුත් නැහැ. අපට තේ කෝප්පය තුළ කුණාටුවක් ඇති කරන්නට අවශ්‍යතාවක් නැහැ. අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හැටියට අපි මාධ්‍යයට යම් දෙයක් කිව්වොත්, සමහර වෙලාවට ඒකෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වන්නට පුළුවන්. මේ රටේ කුරුළු උණ රෝගය පැතිර යනවා කියලා සෞඛ්‍ය ඇමතිතුමා මාධ්‍යයට කිව්වොත් ඒකෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වන්නට පුළුවන්. ඒක internet එකෙත් පළ වෙනවා. සංචාරකයෝ අපේ රටට එන්න ඉස්සර වෙලා මේ රටේ පැතිරෙමින් තිබෙන රෝග මොනවාද කියා බලනවා. ඩෙංගු රෝගය, ඒ වාගේ තවත් රෝග පැතිරෙමින් තිබෙනවාද කියලා බලනවා. ඊයේ පෙරේදා අපෙන් වාර්තාවක් ඉල්ලා තිබුණා, ඩෙංගු රෝගයෙන් මැරෙන සංඛ්‍යාව කියන්න කියලා. අපි කිව්වා, ඒක කියන්න අවශ්‍යතාවක් නැහැ කියලා. මොකද, මැරෙන සංඛ්‍යාව කිව්වා කියලා ඒකෙන් රටට සුගතියක් සිදු වන්නේ නැහැ නේ. නමුත් internet එක හරහා ඒක බලන සංචාරකයා ඊළඟට මොකද කරන්නේ? මේ රටේ මෙච්චර දෙනෙකුට ඩෙංගු රෝගය තිබෙනවා, මේ රටට යන්න ඕනෑ නැහැ කියලා හිතනවා. මොකද, සංචාරකයන් කැමැති වෙන්නේ නැහැ නේ එහෙම රෝග පැතිර යද්දී මේ රටට එන්න. [බාධා කිරීමක්] ඒක තමයි එයින් අපි බලාපොරොත්තු වුණේ. ඉතින් අපි ජනතාවට මේ දේවල් ප්‍රකාශ කිරීමේ දී එහි යම් කිසි වග කීමක් තිබෙන්නට ඕනෑ.

මේ ආනයනික සීනිවල ගුණාත්මකභාවය සම්බන්ධයෙනුත් අපි එහෙමයි කටයුතු කරන්නේ. ඒවායේ samples ලබා ගැනීම අනිවාර්යෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා සිදු වනවා. එසේ ලබා ගෙන පරීක්ෂණ කරලා වාර්තා ලැබෙන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිම තොරතුරක් පිට කරන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒ තොරතුරු පිට කරන්නේ මේ සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීමෙන් පසුවයි. මේ සඳහා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය යන මේ සියල්ලටම වග කීමක් තිබෙනවා. ඒ අයගේ වාර්තා ලැබුණාට පසුව තමයි මේ සම්බන්ධයෙන් තොරතුරු පිටතට හෙළි කරන්නේ. ඒ විතරක් නොවෙයි. මේ වාර්තා කැඳවනකොට අපි ඒ රටේ නිෂ්පාදන වාර්තාවත් කැඳවනවා. බෙහෙත් ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් දැන් අපි වාර්තාවන් කැඳවනවා. සමහර විට යම් බෙහෙතක් බාල තත්ත්වයෙන් තිබෙන්නට පුළුවන්. නමුත් ඒක මේ රටේ නිෂ්පාදනය කරපු එකක් නොවෙයි, ඒක පිට රටින් ගෙන්වන බෙහෙතක් වන්නට පුළුවන්. එතකොට අපි ඒ රටේ අදාළ සමාගමට විරුද්ධවයි කථා කරන්නට ඕනෑ. නමුත් අද ඇඟිල්ල දිගු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයටයි. ඒ ගෙන්වන බෙහෙත නිෂ්පාදනය කරන්නෙත් අපි නොවෙයි. එය ලබා දෙන්නෙත් නොමිලේයි. නමුත් ඒ ගෙන්වන බෙහෙත යම් කිසි බාල තත්ත්වයේ එකක් වුණොත් ඇඟිල්ල දිගු කරන්නේ ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයටයි. නමුත් ඒක ගැන කියන්න ඕනෑ ඒ බෙහෙත නිෂ්පාදනය කරපු කොම්පැනියටයි. ඇයි අපට බාල බෙහෙත් දෙන්නේ කියලා ඒ කොම්පැනියෙනුයි අහන්න ඕනෑ. නමුත් විපක්ෂයේ තමුන්නාන්සේලා ඇඟිල්ල දිගු කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයටයි. ඒකෙන් ප්‍රතිඵලයක් එන්නේ නැහැ. අපට එහෙම බාල බෙහෙත් ගෙන්වීමේ අවශ්‍යතාවක් නැහැ. එහෙම බාල බෙහෙත් ගෙන්වා ජනතාවට දෙන්න අපේ රජයට අවශ්‍යතාවක් නැහැ.

මේ රටේ ජනතාව අප කෙරෙහි ලොකු විශ්වාසයක් තබා තිබෙනවා. ඒ නිසා තමයි මේ රටේ ජනතාව මෙච්චර දීර්ඝ කාලයක් තිස්සේ අපට මේ රටේ බලය ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි තමුන්නාන්සේලාගේ පක්ෂයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීවරුන් අපේ පක්ෂයට එකතු වන්නේ. මේ අවස්ථාවේ ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා අපේ පැත්තේ සිටිනවා. ආණ්ඩු පක්ෂය පැත්තේ දැන් ඡන්දයක් පැවැත්වුවොත්, වැඩිපුරම මේ පැත්තේ සිටින්නේ එදා එක්සත් ජාතික පක්ෂයේ - අද එක්සත් ජාතික පක්ෂයේ කියලා මම කියන්නේ නැහැ- හිටපු කට්ටියයි. මම කැමැති නැහැ, අද මෙතුමන්ලාට පරණ යුද්ධේ කට්ටිය කියලා කියන්න. මොකද, මෙතුමන්ලා දැන් අපේ පක්ෂයේ ඉන්නේ. ඒ නිකම් නොවෙයි. යුතුකම්, වග කීම් ඉටු කරලා, විභාගයෙනුත් සමත් වෙලා ඇවිල්ලා තිබෙන්නේ. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා කුරුණෑගලින් අංක එකට තේරිලා ඇවිල්ලා තිබෙන්නේ. අස්වර් මන්ත්‍රීතුමාත් තවම අපේ පැත්තේ ඉන්නවා. එදා එතුමා එහා පැත්තේ ඉඳගෙන අපිට කෑ ගහපු මන්ත්‍රීවරයෙක්. ඉතින් අද අපි මේ ගැන සතුටු වනවා. ඒක තමයි අපේ දක්ෂකම; අපේ නායකතුමාගේ දක්ෂකම. මොකද, මේ රටේ වැඩ කරන්නට පුළුවන් මහජන නියෝජිතයන් එකතු කර ගෙන එතුමා ඒ කටයුතු කරනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඉතින් තමුන්නාන්සේත් මේ පැත්තට එන්න. අපි කැමැතියි ඔය තරුණකම, තරුණ ජවය, අපේ පක්ෂයට එකතු කර ගන්න. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ තරුණ ජවයෙන් තමුන්නාන්සේලා අහෝසි කරපු සතොස ආයතනය අද නැවත

[ගරු ලලිත් දිසානායක මහතා]

ඇති කරලා තිබෙනවා. අද කුරුණෑගල දිස්ත්‍රික්කය විතරක් නොවෙයි, මුළු ලංකාව පුරාම සතොස වෙළෙඳ සැල් ආරම්භ කර තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා විසින් එතුමාට භාර වූන් සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ යුතුකම්, වග කීම් සියල්ල එතුමා හොඳින් ඉටු කරනවා. අවංකව කටයුතු කරන ඕනෑම කෙනෙක් සම්බන්ධයෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා කවදාවත් අහක බලලා නැහැ. ඒ සියලු දෙනාටම එතුමා හොඳින් සලකා තිබෙනවා. ඊයේ අපේ පක්ෂයට ආපු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත් එහෙමයි. එතුමාටත් හොඳින් සලකනවා. මොකද, එතුමා දන්නවා වැඩ කරන්න පුළුවන් මිනිස්සු මේ ආණ්ඩුවට ගත්තොත් තමයි, රටට වැඩක් කරන්න පුළුවන් වෙන්නේ කියලා. එතුමා ඒ දේ දකිනවා. ඒ නිසා වයඹ ඡන්ද ප්‍රතිඵලයත් ඕකමයි.

ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය හැටියට තමුන්නාන්සේත් මොනවා හරි යෝජනාවක් ගෙනෙන්න ඕනෑ නේ. ආනයනික සීනි සම්බන්ධයෙන්, කිරි පිටි සම්බන්ධයෙන් හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් එහෙම ගැටලුවක් නැහැ. අපි මේ රටේ ජනතාවට විෂ ආහාර වර්ග කවන්නේ නැහැ. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හොඳ නිලධාරි මණ්ඩලයක් සිටිනවා. මේ රටේ ජනතාවට ඉතාම ඉහළ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් අපේ අමාත්‍යාංශය මඟින් සපයනවා. අපේ අමාත්‍යාංශයේ සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ දැනුම හරහා අපට තව වග කීමක් ඉටු කරන්නට තිබෙනවා. රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අමතරව තමයි මේ වෙළෙඳ අමාත්‍යාංශයේ වග කීමත් තමුන්නාන්සේලා අපට භාර දීලා තිබෙන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරන්නට ඕනෑ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධවයි. නමුත් අපි මේ වග කීමත් භාරගෙන කටයුතු කරන්නේ, එය අපේ වග කීමක් ලෙස සලකලායි. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට අපි ඒ වග කීමත් ඉටු කරනවා. හැබැයි, මේ එක එක මත අරගෙන, ඒවා තහවුරු කරන්නේ නැතිව අපි ඒ ගැන කථා කරන්නට හොඳ නැහැ. වකුගඩු රෝගියකු පරීක්ෂා කරලා, සීනිවල කැඩිමියම් තිබුණු නිසා එහෙම වුණා කියලා කියන්න බැහැ. ඒ සම්බන්ධයෙන් අදාළ පර්යේෂණායතනවල වාර්තා දෙන්නට ඕනෑ. එහෙම නැතිව වකුගඩු රෝගියකුගේ මූත්‍රා පරීක්ෂා කරලා සීනිවල කැඩිමියම් තිබෙනවා කියලා කියන්න බැහැ. ලෝකයේ වකුගඩු රෝගය හැදෙන්න හේතු තවම සොයා ගෙන නැහැ. මේ වකුගඩු රෝග සම්බන්ධයෙන් විවිධ මත තිබෙනවා. නමුත් මේ සියල්ල එකට කැටි කරලා අපට ආණ්ඩුවකට ඇහිල්ල දිගු කරන්න බැහැ.

අද ලෝකයේ විවිධ රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරනවා. විවිධ රසායනික පොහොර පාවිච්චි කරනවා. රසායනික පොහොර භාවිතය නිසා මේ ප්‍රශ්නය ඇති වෙනවා කියලා කිව්වා. අපි වකුගඩු රෝග සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කළා. කෘෂිකර්ම අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය යන මේ සියල්ල එකතු වෙලා කෘෂි නාශක ද්‍රව්‍ය තුනක් අපි තහනම් කළා.

වාර්තාව අනුව අපි ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු කරනවා. ඒ වාගේම දැඩි ක්‍රියාකාරී වැඩසටහනක් අපි අරගෙන ගියා, වකුගඩු රෝගීන් සම්බන්ධයෙන්. අපි මේ ප්‍රශ්නය ගැන දැන ගෙන සිටියා. අපි 2000 දී තමයි මහනුවර ප්‍රධාන වකුගඩු රෝග මධ්‍යස්ථානය ආරම්භ කළේ. මීට කලින් අපි මේ සම්බන්ධව වැඩ කරලා තිබෙනවා. ඊයේ පෙරේදා නොවෙයි අපි මේ ගැන අවධානය යොමු කළේ. මේ ගැන අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූලික වග කීමක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි පැහැදිලිව කියන්නට ඕනෑ, සීනි සම්බන්ධයෙන් අපි මේ වන විට ITI ආයතනයෙන් වාර්තා 49ක් ලබා ගෙන තිබෙන බව. ඒකෙන් ප්‍රතිඵල 24ක් ලැබී තිබෙනවා. යවා ඇති මුළු sample ගණන 73යි. බ්‍රසීලයෙන් ආනයනය කර තිබෙන සීනිවලින් sample 21ක් අපි දැනට පරීක්ෂණයට යවලා තිබෙනවා. මෙයින් එක් පරීක්ෂණ වාර්තාවක් අපට දැනට ලැබිලාත් තිබෙනවා. බැර ලෝහ අඩංගුයි කියලා කිසිම සටහනක් ඒවායේ නැහැ. ඉන්දියාව, පාකිස්තානය, කොරියාව, තායිලන්තය කියන රටවලින් අපි සීනි ආනයනය කරනවා. ඒ සම්බන්ධයෙන් අපි වාර්තා ගෙන්වලා තිබෙනවා. ඒ වාර්තාවල මේ සීනිවල බැර ලෝහ තිබෙනවායි කියලා අපට කිසි තැනක වාර්තා වෙලා නැහැ.

අපේ පාරිභෝගිකයන්ට යම් කිසි ආහාර ද්‍රව්‍යයක් නිකුත් කිරීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ වාගේම සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයෙන් අපි යම් වගකීමකින් කටයුතු කරනවා. එහෙම විෂ ද්‍රව්‍ය අඩංගු දේවල් නිකුත් කර තිබෙනවායි කියලා යම් මතයක්, එහෙමත් නැත්නම් පුවත් පත්වල සඳහනක් ඉදිරිපත් වෙලා නැහැ, තවම. ඒ වගකීම අපට තිබෙනවා. එහෙම තිබුණා නම් මාධ්‍ය හරහා මීට වැඩිය මෙය ප්‍රචාරය වෙන්න ඕනෑ.

අල්ලපු වැටේ ඉන්දියාවේ, ළමයි විසි ගණනක් ඊයේ පෙරේදා මැරුණා, ආහාර විෂ වෙලා. නමුත් එහෙම තත්ත්වයක් මේ රටේ ඇති වෙලා නැහැ. මොකද, අපි මේ සඳහා යම් කිසි ක්‍රමවේදයක් අනුගමනය කරනවා. හැබැයි අපි මේ කරන කටයුත්ත ගැන බොහෝ අය දන්නේ නැහැ. හම්බන්තොට වරායෙන්, වෙනත් වරායකින් ගෙන්වූවා කියලා එහෙම දෙයක් නැහැ. කොයි වරායෙන් ආවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ අදාළ නිලධාරීන් ගිහිල්ලා sample අරගෙන පරීක්ෂා කරනවා. වරාය හම්බන්තොටද, වරාය ඔලුවිල්ද, චීන වරායද කියලා ප්‍රශ්නයක් නැහැ.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හීනෙනුත් වරාය.

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔව්, හීනෙනුත් වරාය.

අපි ඒ අදාළ sample අරගෙන පරීක්ෂා කරනවා. ඒ container එක මෙහාට එන්න ඉස්සර වෙලා sample අරගෙන කටයුතු කරන්න නිලධාරීන් ඉන්නවා. ඒ නිසා එතැනට යන්න ඕනෑ නැහැ. මේ සඳහා ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුව තමයි අපි කටයුතු කරන්නේ. හම්බන්තොට වරායෙන් ගෙනා එකේ sample පරීක්ෂා කරන්නේ නැතුව ඒ භාණ්ඩ අපි නිකුත් කරන්නේ නැහැ; ඒ container එක කොළඹට ගෙනෙන්නේ නැහැ. ඒකට අදාළව අපේ යන්ත්‍රණයක් තිබෙනවා. අදාළ නිලධාරීන් ගිහිල්ලා sample අරගෙන පරීක්ෂා කරලා තමයි ඒවා නිකුත් කරන්නේ.

ඊළඟට, මේ මාතෘකාවට අදාළ නැතත්, මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, ගම්පහ ප්‍රදේශයේ තිබුණු ආයෝජන මණ්ඩලයේ - BOI එකේ - project එකක ප්‍රශ්නයක් ගැන. පළමුව කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ආයතනයකට චෝදනාවක් ආවත් එක වරම එය අවලංගු කරන්න අපට බලය නැති බව. ගිවිසුමක් තිබෙනවා, ඒ අනුව අපි අදාළ තැනට දැනුම් දෙන්න ඕනෑ. අපේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) අමුණුගම මහතා මේ අවස්ථාවේ සභා ගර්භයට යාබද නිලධාරීන්ගේ මැදිරියේ ඉන්නවා. මම එතුමාගෙන් තොරතුරු ගත්තා.

අද දවල් "හිරු" නාලිකාවෙන් ප්‍රචාරය වුණු "රතු මිනිත්තුව" වැඩසටහනින් මේ පණිවුඩය යන කොට මම ඇහුම්කන් දුන්නා. මම ඒ වෙලාවේම සටහන් කර ගෙන ඒ සම්බන්ධයෙන් අමුණුගම මහත්තයාට දැනුම් දීමට කටයුතු කළා. පළාත් සභාවේ සෞඛ්‍ය ඇමතිතුමාට, ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාට - MOH - ඒ වාගේම නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂතුමාට මේ කරුණු ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ තත්ත්වය මට දැනුම් දෙන්න කලින් අපේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය බලධාරින් ඒකට කටයුතු කරලා තිබෙනවා. ඒක BOI එකට වාර්තා කරලා තිබෙනවා; ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) අමුණුගම මහත්තයාට වාර්තා කරලා තිබෙනවා. අපි අදාළ තැන්වලට තොරතුරු යවලා තිබෙනවා. ඒ වාර්තා අනුව ඒ පළාතේ ජලයේ විෂ ද්‍රව්‍ය තිබෙනවා නම් මේ ආයතනය වහන්න හෝ ඒ අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව මේ ගැන ජනාධිපතිතුමාට චෝදනා කරලා, තවත් කෙනකුගේ හිතවතෙක් කියලා බොරුවට මත ගෙනැත් වැඩක් නැහැ. රජය හැටියට අවශ්‍ය තොරතුරු වාර්තා කරලා තිබෙනවා. BOI එක මේ තොරතුරු ගෙන්වා ගෙන, ඒක පරීක්ෂා කරලා බලලා, අදාළ ආයතනයට ඒ බව දැනුම් දීලා අවවාද - warn - කරලා, එහෙම නම් ඒ ආයතනය වහන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව හිතුමතේට ඒ ආයතන වහන්න ගියොත් ආයෝජකයෝ එන්නෙත් නැති වෙයි; තව මිනිස්සු එන්නෙත් නැති වෙයි; මේවා අකුළාගෙන යයි. ඒ නිසා රජයක් හැටියට අපි කටයුතු කරන කොට වග කීමෙන් ඒ තොරතුරු ගෙන්වා ගෙනයි කටයුතු කරන්න ඕනෑ.

සීනි ගැන කෙසේ වෙතත්, තේ කෝප්පයේ කුණාටුවක් ගැන කියන්න හෝ මෙහෙම දෙයක් තිබෙනවා කියලා කියන්න හෝ කවුරු හරි ඉන්න ඕනෑ නේ. මොකද, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ඊයේ අපේ පැත්තට ආපු වෙලාවේ කවුරු හෝ මොනවා හෝ දෙයක් කියන්න එපා යැ. අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මහජන නියෝජිතයෙකු හැටියට එතුමාගේ යම්කිසි යුතුකමක් වග කීමක් ඉටු කරන්නට කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා ගෙනා යෝජනාව නිසා ජනතාවට මේ කාරණාව ගැන යථා තත්ත්වය අවබෝධ කර ගන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. නමුත් මම කනගාටු වනවා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තු ගැලරියේ කිසිම මාධ්‍යවේදියකු නොසිටීම ගැන. හිටියා නම් හොඳයි. මොකද, මේ කරුණු මේ පාර්ලිමේන්තුව තුළත්, මේ සභා ගර්භය තුළත් සාකච්ඡා කිරීම පමණක් වැඩක් නැහැ. මේ කරුණු මාධ්‍ය හරහා ජනතාවට යන්න ඕනෑ. අපේ යුතුකම, වග කීම අප ඉටු කරනවා. ජනමාධ්‍යවේදීන් ගැලරියේ සිටියා නම් ඔබතුමාටත් හොඳයි; අපටත් හොඳයි; ආණ්ඩුවටත් හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විවාදයකින් තොරව එකඟ විය.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.25ට, 2013 ජූලි මස 26වන සිකුරාදා අ.භා.1.30 වන තෙක් කල් තියේය.

அதன்படி பி.ப. 7.25 மணிக்கு பாராளுமன்றம், 2013 யூலை 26, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.25 p.m. until 1.30 p.m. on Friday, 26th July, 2013.

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year .
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

218 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 218 - இல. 08
Volume 218 - No. 08

2013 ජූලි 26වන සිකුරාදා
2013 யூலை 26, வெள்ளிக்கிழமை
Friday, 26th July, 2013



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ශෝක ප්‍රකාශය :

ගරු එම්. මහරූෆ් මහතා

ගරු කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මහතා

මෙඩිසිනා ඕල්ටනේටීවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:

දෙවන වර කියවා" ඒ "ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

කල්තැබීමේ යෝජනාව:

පැරණි ජංගම දුරකථන අපහරණය

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு எம். மஹ்றூப்
மாண்புமிகு கே.வை.எம். விஜேரத்ன பண்டா

மெடிசினா ஓல்டனேடிவா நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்கு சாட்டப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
பாவனைக்குதவாத செல்லிடத் தொலைபேசிகளை அழித்தல்

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. M. Mahroof
Hon. K.Y.M. Wijeratna Banda

INSTITUTE OF MEDICINA ALTERNATIVA (INCORPORATION) BILL:
Read a Second time, and allocated to Standing Committee "A"

ADJOURNMENT MOTION:
Disposal of Used Mobile Phones

WRITTEN ANSWERS TO QUESTIONS

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2013 ජූලි 26වන සිකුරාදා
2013 யூலை 26, வெள்ளிக்கிழமை
Friday, 26th July, 2013

අ. භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.

பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

The Parliament met at 1.30 p.m., MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XIවැනි කොටස, තුන්වැනි කාණ්ඩයේ IVවැනි කොටස, පස්වැනි කාණ්ඩයේ IXවැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ XXIIIවැනි කොටස; 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ VIIIවැනි කොටස; සහ 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ IIIවැනි කොටස මම ඉදිරිපත් කරමි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 සහ 2011 වර්ෂ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2012 වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික පාලන වාර්තාව.- [ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු මහින්ද අමරවීර මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජයරත්න හේරත් මහතා - පැමිණ නැත.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දහතුන මම පිළිගන්වමි.

1. පොල්ගහවෙල, කොළඹ පාර, ඉහළ ගෙදරවත්තෙහි පදිංචි ආර්. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;
2. පේරාදෙනිය, පහළ ඊරියගම, අංක 172 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඩී. නිමලසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;
3. රක්වාන, ගංගොඩ පාර, ඔරෙන්ජ් ෆීල්ඩ්හි පදිංචි ජයවර්ධන මැදවත්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;
4. ඇල්ල, කුඹල්වෙල, අංක 233 දරන ස්ථානයෙහි පදිංචි වයි.එම්. සුනිල් ධනරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;
5. අම්පිටිය, උඩුවෙල පාර, අංක 273/4 දරන ස්ථානයෙහි පදිංචි දයාරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;
6. මහියංගනය, අරාවත්ත, වෙලම්පැලේ කණිෂ්ඨ විද්‍යාලයේ ඒ.එම්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;
7. කහවත්ත, යායින්න, "සියත්" නිවසෙහි පදිංචි එල්.එච්. රෙජිනල්ඩ් මහතාගෙන් ලැබුණු පෙත්සම;

[ගරු තිස්ස අත්තනායක මහතා]

8. බලංගොඩ, මොරහැල, උඩවෙල පදිංචි එන්.පී. උඩවත්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

9. නාමිණිඔය-විල්ගමුව, හැරමිටිගාල, 53 ඇල, අංක 2126 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්. ඩිංගිරි බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

10. පල්ලෙබැද්ද, කොස්වැටිය, විමලාරාමයෙහි වැඩ වසන පූජ්‍ය මහගම සුමණ හිමිගෙන් ලැබුණු පෙත්සම;

11. හඳපාන්ගොඩ, හොරණ පාර යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ.ඩී. ලිලිතා සුරවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

12. දොඩන්ගොඩ, නාගොඩ, සමඟි මාවත යන ලිපිනයෙහි පදිංචි එම්.ඒ.ජේ. ප්‍රේමලාල් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

13. මහියංගනය, පූජා නගරය, අංක 59/100 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

සමර්ප්පිකප්පට්ට මනුක්කළෙප් පොදුමනුක් කුළුවුක්කුච් චාට්ටක් කට්ටළෙයිටප්පට්ටදු.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

"එක ගමකට එක වැඩක්" ව්‍යාපෘතිය : විස්තර
"ஒரு கிராமத்துக்கு ஒரு வேலை" கருத்திட்டம் : விபரம்
"ONE WORK FOR ONE VILLAGE" PROGRAMME : DETAILS

2590/'12

1. ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "එක ගමකට එක වැඩක්" යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන එක ගමක් වෙනුවෙන් වැය කරන මුළු මුදල කොපමණද;

(iv) දීප ව්‍යාප්තව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් උක්ත ව්‍යාපෘතියේ නිශ්චිත ඉලක්කයන් ළඟා කර ගැනීම වෙනුවෙන්ම යොමු කිරීම සඳහා සැකසූ සැලැස්ම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අපක්ෂපාතීව කටයුතු කිරීමට ගන්නා වූ පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "ஒரு கிராமத்துக்கு ஒரு வேலை" எனும் கருத்திட்டத்தை அமுலாக்குவதன் நோக்கம் யாவையென்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தில் உள்ளடக்கப்படுகின்ற கிராமங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) இக்கருத்திட்டம் அமுலாக்கப்படுகின்ற ஒரு கிராமத்திற்காக செலவிடப்படுகின்ற மொத்தச் செலவு யாதென்பதையும்;

(iv) நாடளாவிய ரீதியில் மேற்படி கருத்திட்டத்தை அமுலாக்குவதற்காக செலவிடப்படுகின்ற மொத்தப் பணத்தொகை யாதென்பதையும்;

(v) அப்பணத்தை மேற்படி கருத்திட்டத்தின் திட்டவட்டமான இலக்குகளை அடைவதற்காகவே ஆற்றுப்படுத்துவதற்காக வகுக்கப் பட்டுள்ள திட்டம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி நிகழ்ச்சித் திட்டத்தை அமுலாக்கும் போது பக்கச்சார்பின்றி செயலாற்ற மேற்கொள்ளப்போகும் நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state -

(i) the objectives of the implementation of the project named "One Work for One Village" (*Eka Gamakata Eka Wedak*);

(ii) the number of villages covered by the aforesaid project;

(iii) the total amount of money spent per village where this project is being implemented;

(iv) the total amount of money spent for the islandwide implementation of the above project; and

(v) the plan devised to utilize the aforesaid amount of money exclusively for the attainment of the specific objectives of the aforesaid project?

(b) Will he inform this House of the steps that will be taken to act impartially in implementing the above programme?

(c) If not, why?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් අයුරින්ම සෞන්දර්යයෙන්, ශ්‍රී විභූතියෙන් හා සෙනෙහසින් සපිරුණු පරමාදර්ශී ගමක් පිළිබඳ සිහිනය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ගතානුගතික මධ්‍යගත සංවර්ධන සංකල්පයෙන් ඔබ්බට ගොස් ජාතික මට්ටමේ සංවර්ධනයේ ඵල පහළ ස්තරය සඳහා කාන්දුවන ආකාරයට ජාතික සංවර්ධනයේ ක්ෂුද්‍ර මධ්‍යස්ථානය ලෙස ගම පාදක කරගත් මධ්‍යගත සංවර්ධන වැඩසටහනක් ලෙස ගම නැගුම වැඩසටහන මූලික වශයෙන් දායක වේ.

ගම ජාතික සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය බවට පත් කරමින් ශ්‍රී ලංකාවේ සියලුම ගම්මාන සමෘද්ධිමත් ගම්මාන ලෙස පුනර්ජීවනය කිරීමේ අරමුණින් ගම නැගුම වැඩසටහන 2006 වර්ෂයේදී ආරම්භ කෙරිණි.

එම වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ග්‍රාමීය මාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම, විදුලිය නොමැති සෑම ගමකටම විදුලිය ලබා දීම, ප්‍රජා ජල පහසුකම් සංවර්ධනය, කෙත් බිම් සඳහා වාරි ජලය සැපයීම, මාතෘ හා ළමා සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන ඉදි කිරීම, සිඟිති උයන මැදි කොටගත් පෙර පාසල් ඉදි කිරීම, වී ගබඩා හා පොහොර ගබඩා පහසුකම් සැපයීම සහ ක්‍රීඩා හා උද්‍යාන පහසුකම් වැඩිදියුණු කිරීම වැනි සංවර්ධන කාර්යයන් සිදු කරනු ලැබේ.

(ii) ග්‍රාම නිලධාරි වසම් 13,098ක ක්‍රියාත්මක වේ. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කවල විදේශ ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක වන බැවින් එම ග්‍රාම නිලධාරි වසම් සඳහා "එක් ගමකට එක් වැඩක්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේ.

(iii) රුපියල් මිලියන 01කි.

(iv) රුපියල් මිලියන 9,757කි.

(v) ග්‍රාමීය ජන සභාව විසින් තෝරා ගන්නා ලද යෝජනාවලින් සැදුම්ලත් ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතියෙන් ක්‍රියාත්මක කිරීම.

අනුමත ව්‍යාපෘතිය ගමේ අදාළ ප්‍රජා සංවිධානයක් විසින් ක්‍රියාත්මක කිරීම.

සුළු වාරිමාර්ග ව්‍යාපෘතියක් නම් එම වසමේ ගොවි සංවිධානය විසින් ක්‍රියාත්මක කළ යුතු වේ.

(ආ) ගමේ ජන සභාවේ වැඩි කැමැත්ත මත ව්‍යාපෘතිය තෝරා ගත යුතු වීම.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ලබා දුන් පිළිතුර පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ රජය "එක ගමකට එක වැඩක්, ගම නැඟුම, මහ නැඟුම, දිවි නැඟුම" යනාදී නම් වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඔබතුමා පිළිතුරේ සඳහන් කළා, "එක ගමකට එක වැඩක්" වැඩසටහනට රුපියල් මිලියන 9,757ක් වෙන් කර තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් රටේ පොහොර සහනාධාරය කපලා. ධීවරයන්ට ඉන්ධන සහනාධාරය දෙන්නේ නැහැ. ගොවි විශ්‍රාම වැටුප කපලා. පාසල් දූ දරුවන්ගෙන් සියයට 27කටයි දිවා ආහාරය ලබා දෙන්නේ. "එක ගමකට එක වැඩක්" කියන වැඩසටහන යටතේ ඔබතුමන්ලා ගොවි විශ්‍රාම වැටුප ලබා දෙන්නේ නැත්තේ ඇයි, ධීවරයන්ට ඉන්ධන සහනාධාරය ලබා දෙන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සමිපත් ටික එක එක ව්‍යාපෘතිවල නම් යටතේ හංගනවා වෙනුවට, කපපු ගොවි විශ්‍රාම වැටුප ලබා දෙන්න යොදා නොගන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

එතුමා ප්‍රශ්නය ඇහුවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට මම උත්තර දුන්නා. ඒ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න. ගොවි විශ්‍රාම වැටුප, ධීවර විශ්‍රාම වැටුප ගැන වෙනම ප්‍රශ්න අහන්න. ඒවා වෙනම විෂයයන්. ඒවා මේකට පටලවා ගන්න එපා. ප්‍රශ්නය පටලවා ගෙන තමුන්නාන්සේ රූපවාහිනියට කථා කරන්නට ගියාට, ඒක හරියන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒක තමයි. ගැලරියේ ඉන්න ළමයින්ට ඇත්ත කියන්න ඕනෑ නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

උත්තර දෙන්න බැරි නම්, "බැහැ" කියන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

මොනවාටද උත්තර දෙන්නේ? තමුන්නාන්සේ නිවැරදිව ප්‍රශ්නය අහන්න. ගොවි විශ්‍රාම වැටුප ගැන වෙනම අහන්න. ධීවර විශ්‍රාම වැටුප ගැන වෙනම අහන්න. තමුන්නාන්සේ ඇහුවේ "එක ගමකට එක වැඩක්" ගැන නේ. ඉතින් ඒ ගැන අහන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීතුමා ඇහුවේ "එක ගමකට එක වැඩක්" ගැන. "එක ගමකට එක වැඩක්" සහ ගොවි විශ්‍රාම වැටුප අතර සම්බන්ධයක් නැහැ. ඒකයි ගොවි විශ්‍රාම වැටුපයි අතර සම්බන්ධයක් නැහැ. ඒ අනුව මන්ත්‍රීතුමාට ඒ අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග ගැන ඉතාම පැහැදිලි වැටහීමක් තිබෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ස්ථාවර නියෝග ප්‍රකාරව, අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් ප්‍රශ්නයට ලබා දෙන පිළිතුර අනුව පැන නඟින කාරණයක් සම්බන්ධවයි. ඒ අනුව කරුණාකර ඊට අදාළව දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා මටත් පොඩ්ඩක් සවන් දෙන්න කියා. මම ප්‍රශ්නය අහලා තිබෙන්නේ "එක ගමකට එක වැඩක්" ගැන.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම කීන්දුවක් දීලා ඉවරයි. ස්ථාවර නියෝග ප්‍රකාරව ඔබතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"එක ගමකට එක වැඩක්" කියන්නේ, ගමේ ජීවත් වන ජනතාවට වැඩක් කිරීම. එහෙම නම්, "එක ගමකට එක වැඩක්" යටතේ, ඒ මුදල් ප්‍රතිපාදනවලින්, ගමේ ජීවත් වන ජනතාවගෙන් කපපු ගොවි විශ්‍රාම වැටුප, පොහොර සහනාධාරය, ධීවරයන්ගේ ඉන්ධන සහනාධාරය ලබා නොදෙන්නේ ඇයි?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ ජාතික අය වැය ඉදිරිපත් කරන වෙලාවේදී කථා කරන්න ඕනෑ දෙයක් මේ කථා කරන්නේ. අය වැය ගැන සාකච්ඡා කරන වෙලාවක නම් මේ වාගේ ප්‍රශ්න ඉදිරිපත් කළාට කමක් නැහැ. එක ගමකට එක වැඩක් වැඩසටහන ගැන අහලා ධීවර ප්‍රශ්නයි, ගොවි විශ්‍රාම වැටුපයි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න. මේ කියන ඒවායින් වැඩක් තිබෙනවාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
වැඩක් තිබෙනවා. ඒ විධියට ප්‍රශ්න අහන්න. තමුන්නාන්සේ ඇහුවේ වෙන එකක් නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වැඩක් තිබෙනවා නම් උත්තර දෙන්න. අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
තමුන්නාන්සේ අහන්නේ වෙන දෙයක්.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන් වැනි අතුරු ප්‍රශ්නය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අහපු ප්‍රශ්නයට කරුණාකර උත්තර දෙන්න කියන්න. මා ඇහුවේ එක ගමකට එක වැඩක්-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දුන්නාද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට මා උත්තර දීලා ඉවරයි. වෙනත් ප්‍රශ්න මෙතුමා දැන් අහන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා තුන් වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, එක ගමකට එක වැඩක් කරනවා කියලා. එහෙම නේද?

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ඔව්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එක ගමකට එක වැඩක් කරනවා කියලා ඔබතුමන්ලා ප්‍රකාශ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එක ගමකට එක වැඩක් ක්‍රියාත්මක කරන කොට, තීන්දු තීරණ ගැනීමේ සභාවක් තිබෙනවාය කියලා ඔබතුමා ප්‍රකාශ කළා. එහෙම නේද? විශේෂයෙන් මේ සභාවල ප්‍රධාන කාර්ය භාරයක් ඉෂ්ට කරනවා, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු. ඔබතුමා ඒක පිළිගන්නවා නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බලන්න ප්‍රාදේශීය සභාවල සභාපතිවරු "එක ගමකට එක වැඩක්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්ය භාරයේ නිරත වෙලා සිටින කොට, දැන් යටියන්තොට ප්‍රාදේශීය සභා සභාපති පගා ගහලා; වලල්ලාවිට සභාපතිත් පගා ගහලා; මාවනැල්ලේ ප්‍රාදේශීය සභා සභාපති මිනී මරලා. ඉතින් මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි-

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීතුමා- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුව විහිළුවක් බවට පරිවර්තනය කර ගන්නේ නැතුව ස්ථාවර නියෝග ප්‍රකාරව අතුරු ප්‍රශ්න අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට කථා කරන්න වෙන් කරන අවස්ථාව යොදා ගන්න කථා පවත්වන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා අතුරු ප්‍රශ්නය අහලා ඉවරත් නැහැ. මොකද කලබල වන්නේ? ඇයි ඔව්වර කලබල වන්නේ? ගැලරියේ දූ දරුවෝ බලා ගෙන ඉන්නවා. මේ පාසල් දූ දරුවෝ බලා ගෙන ඉන්නවා. මට අතුරු ප්‍රශ්නය අහන්න දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දූ දරුවන් නොවෙයි සියලු දෙනාම සමව්වලයට ලක් කරයි ඔබතුමා මේ ආකාරයට හැසිරුණොත්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මාව කවුරුත් සමව්වලයට ලක් කරන්නේ නැහැ. අපක්ෂපාතීව තීන්දු දෙන්න. එතකොට තමයි හරි යන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග තිබෙනවා. කරුණාකර ඒවාට ගැළපෙන ආකාරයෙන් ඉතාම කෙටියෙන් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමා හරහා මගේ මේ අතුරු ප්‍රශ්නය ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා පැහැදිලි කරලා දුන්නා "එක ගමකට එක වැඩක්" වැඩසටහනේ ප්‍රධාන කාර්ය භාරයක් ඉෂ්ට කරන බව ප්‍රාදේශීය සභා සභාපති. මා ප්‍රශ්නයට අදාළවයි අතුරු ප්‍රශ්නය අහන්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අදාළ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. අදාළයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න බැහැ. ඔබතුමා එක ප්‍රශ්නයකට විනාඩි 15ක් ගත්තා. ප්‍රශ්න 15ටම තිබෙන්නේ පැයයි.

ප්‍රශ්න අංක 2, ගරු රවි කරුණානායක මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් බොහොම ගෞරවාන්විතව ඉල්ලීමක් කරනවා, මට මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න කියලා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I have given you four chances. You are only making speeches; you are not raising relevant Questions. You have already asked four Questions.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, I have asked only two Questions.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2- ගරු රවි කරුණානායක මහතා

ලංකා පොලිස් සේවය : කොස්තාපල්වරුන්
இலங்கைப் பொலிஸ் சேவை : கான்ஸ்டபிள்கள்
SRI LANKA POLICE SERVICE : CONSTABLES

2898/'12

2. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2012 ජූලි 01 දින වනවිට,

(i) මෙරට පිහිටි පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) ශ්‍රී ලංකා පොලිසියේ සිටින පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් සේවය තුළ සිටින නියෝජ්‍ය පොලිස්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොලිස් කොස්තාපල්වරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2003, 2006 සහ 2009 වර්ෂවල ජූලි මස 01 දින වනවිට,

(i) ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ පොලිස් කොස්තාපල්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලීසියෙහි නියෝජ්‍ය පොලිස්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොලිස් කොස්තාපල්වරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරිතම අමෙච්චරුම් පෙළත්ත සාසන, මත අලුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) 2012 යූලෙ 01ආම් තිකතියිලුළ්ළවාරාක,

(i) නාට්ටිලුළ්ළ පොලිස් නිලෙයඞ්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(ii) ඉලඞ්කෙප් පොලිසිල් කටමෙයාට්රුම් පොලිස් කාන්ස්ටබිල්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(iii) පොලිස් සේවෙයියිලුළ්ළ පිරතිප් පොලිස් මාඅතිපර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙ යුම්;

(iv) පොලිස් කාන්ස්ටබිල් ඔරුවරින් සරාසරි මාතාන්තච් චම්පළම් එව්වළවෙන්පතෙයුම්

අවර් කූරුවාරා?

(ආ) 2003, 2006 මට්රුම් 2009ආම් ආණ්ටුකළින් යූලෙ 01ආම් තිකතියිලුළ්ළවාරාක,

(i) ඉලඞ්කෙප් පොලිසිල් කටමෙයාට්රිය පොලිස් කාන්ස්ටබිල්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(ii) ඉලඞ්කෙප් පොලිසිලිරුන්ත පිරතිප් පොලිස් මාඅතිපර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(iii) පොලිස් කාන්ස්ටබිල් ඔරුවරින් සරාසරි මාතාන්තච් චම්පළම් එව්වළවෙන්පතෙයුම්

අවර් කූරුවාරා?

(ඉ) ඉන්රෙල් ඒන්?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state as at 01st July, 2012 -

(i) the number of police stations in the country ;

(ii) the number of Police Constables in the Sri Lanka Police;

(iii) the number of Deputy Inspectors-General in the Police Service; and

the average monthly salary of a Police Constable?

(b) Will he also state separately, as at 01st July in the years of 2003, 2006 and 2009 -

(i) the number of Police Constables who served in the Sri Lanka Police;

(ii) the number of Deputy Inspectors-General in the Sri Lanka Police; and

(iii) the average monthly salary of a Police Constable?

(c) If not why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 430කි. (හාරසිය තිහකි.)

(ii) 47289කි. (විශේෂ කාර්ය බලකාය සමඟ) (හතලිස් හත්දහස් දෙසිය අසූනවයකි.)

(iii) 34කි. (තිස්හතරකි.)

(iv) මාසික මූලික වැටුප රුපියල් 14280කි. (රුපියල් දහහතරදහස් දෙසිය අසූවකි.)

(ආ) (i) 2003.07.01 දිනට (විශේෂ කාර්ය බලකාය සමඟ)- 21957කි. (විසිඑක්දහස් නවසිය පනස්හතකි)

2006.07.01 වන දිනට (විශේෂ කාර්ය බලකාය සමඟ)- 17932 කි. (දහහත්දහස් නවසිය තිස්දෙකකි.)

2009.07.01 වන දිනට (විශේෂ කාර්ය බලකාය සමඟ) - 49040කි. (හතලිස්නවදහස් හතලිහකි)

(ii) 2003.07.01 දිනට 36කි.

2006.07.01 දිනට 25කි.

2009.07.01 දිනට 35කි.

(iii) 2003.07.01 දිනට මූලික වැටුප රුපියල් 4540/-කි. (රුපියල් හාරදහස් පන්සියහතළිහකි.)

2006.07.01 වන දිනට මූලික වැටුප රුපියල් 12130/-කි.(රුපියල් දොළොස්දහස් එකසියතිහකි.)

2009.07.01 වන දිනට මූලික වැටුප රුපියල් 14280කි. (රුපියල් දහහතරදහස් දෙසිය අසූවකි)

(ඇ) පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation led by the Hon. (Ms.) Eleanor Laing from CPA, UK Branch, now present in the Speaker's Gallery.

පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, while acknowledging their presence in this House, I would like to ask the Hon. Minister whether he accepts the fact that the basic salary of a Police Constable is half the per capita income of the country.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
How can you compare the per capita income with the salary?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am talking of the per capita income, ඒක පුද්ගල ආදායම. The per capita income of this country which you all are boasting of is US Dollars 2,900 which represents Rs. 28,000 monthly. So, what you are telling is that a person who contributes to keep peace in this country is earning half the per capita income of this country.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
What was the salary paid by the UNP Government? What was the per capita income at that time? How much was a Police Constable paid at that time? Can you give me answers to those questions? - [*Interruption*.] Hon. Deputy Speaker, that is not a rational question.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Please do not convert this to a debate. This is time for Questions and Answers.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, you do not need to lose your disposition on a matter that you have got stumped. You yourself answered -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Minister, will you please answer?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, it is not a rational Question because these salaries have been fixed by the National Salaries and Cadre Commission, taking into consideration the salary levels of others in the public sector.

That is the salary which has been fixed. If you say that that salary is not enough, that is your view. But, this is the salary that the Government has given the Police Constables.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The second Supplementary Question, please.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙ වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ඒ අතුරු ප්‍රශ්නය සිංහල භාෂාවෙන් අහන්නම්, විදේශීය දූත කණ්ඩායමක් ඇවිල්ලා ඉන්න නිසා. පොලීසියේ අය මේ වාගේ අඩු වැටුපක් ලබන නිසාද, ඩීඅයිජීලා වාගේ අය කුලී පදනමට මිනී මරන්නේ? ඩීඅයිජී වාස් ගුණවර්ධනගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගොල්ලන් කියලාත් තිබෙනවා, කුලියට මරලා තිබෙනවා කියලා. ඒ අයට සල්ලි ලැබෙන්නේ නැති නිසා ද එහෙම වෙන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් පුද්ගලයෙකුට විරුද්ධව චෝදනාවක් තිබෙන්න පුළුවන්. අපි ඒ අය ආරක්ෂා කරන්න යන්නේ නැහැ. නමුත් ඒ චූදිතයා වරදකරු වන තෙක් ඔහු නිර්දෝෂය කියන න්‍යාය තමයි අපේ ලංකාවේ පවතින්නේ. ඒ නිසා අපට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක තුන.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලස්සනට දන්නවා, වංගුව දාලා කියන්න. හොඳයි එහෙම කිව්ව එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. උතුරු පළාත් සභා මැතිවරණයත් එක්ක පොලිස් බලතල සම්බන්ධයෙන් ලොකු ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා. මම දන්නවා, ඔබේ මතය එකක් වන්න පුළුවන්. ආණ්ඩුවේ මතය වෙනත් එකක් වෙන්න පුළුවන්. මම කථා කරන මේ මොහොත වන විට උතුරු පළාත් සභා මැතිවරණය පවත්වන්න කටයුතු යොදලා තිබෙනවා.

The elections to the Northern Provincial Council has been gazetted now. There is a big issue on police powers. So, I am asking you, as the Hon. Leader of the House, there is a lot of aberration on the "white van" syndrome, where police powers have been -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, he is making a statement.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, please raise the Supplementary Question. This is not the time for a debate or a speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am trying to do it according to the British system, Sir. In the British system, we are able to show -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You know that we have got only one hour for 15 Questions. Now, the two of you have taken almost half-an -hour. Please shorten your Supplementary Questions.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
We are trying to keep the vibrancy of Parliament.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You are well aware of the Standing Orders of this House. Please strictly adhere to those and raise your Supplementary Questions.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, we want to keep a sense of vibrancy in Parliament. Then, I am sure even the British will be very proud that we, Sri Lankans as well, are doing what they are doing in the UK. So, Hon. Leader of the House, please tell us whether the fact that the Independent Police Commission has been submerged owing to the Eighteenth Amendment overriding the Seventeenth Amendment, has led to the erosion of the independence of the Police? Now, this "white van" syndrome that has taken place -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
How many questions have been asked? If you want to know about the Police Commission -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, please raise your Supplementary Question.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I will come from the main road to the byroad. My Question is, please tell us: is there any harm owing to the devolution of powers through this particular basis, and is the independence of the Police Commission being put to test owing to the fact that there is this devolution of power that has been given to the provinces?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
This Question does not arise from the Question which has been asked. But, anyway I will answer. With regard to the question of devolution, there is a Committee appointed by Parliament and we have asked everybody to come there and air their views and reach a consensus. So, it will be decided in that Committee what the consensus is.

ධීවර සංස්ථාව : ලාභ/පාඩු
கடற்றொழில் கூட்டுத்தாபனம் : இலாப நட்டம்
FISHERIES CORPORATION : PROFIT/LOSS

2923/'12

3. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්තමාන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා එම අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාව වන විට ධීවර සංස්ථාව ලාභ ලැබුවේද; නැතහොත්, පාඩු ලැබුවේද;

(ii) එම අවස්ථාවේදී ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(iii) 2012.12.31 දිනට ධීවර සංස්ථාව ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට ධීවර සංස්ථාවේ සේවය කරන තාවකාලික, අනියම් සහ ස්ථිර සේවකයින් හා නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 වර්ෂයේ සිට මේ දක්වා විවෘත කරන ලද නව ධීවර වෙළඳ සල් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වෙළඳ සල් සඳහා පසු ගිය වර්ෂ 3ක කාල සීමාව තුළ ගෙවන ලද මුළු කුලී මුදල කොපමණද;

(iv) එම ධීවර වෙළඳ සල්වල සේවය කරනු ලබන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වන විට ධීවර සංස්ථාව සතුව පවතින වත්කම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர் மேற்படி அமைச்சை பொறுப்பேற்ற போது கடற்றொழில் கூட்டுத் தாபனம் இலாபம் ஈட்டியதா அல்லது நட்டத்தில் இயங்கியதா என்பதையும்;

(ii) அச்சந்தர்ப்பத்தில் பெறப்பட்ட இலாபம் அல்லது நட்டம் எவ்வளவென்பதையும்;

(iii) 2012.12.31ஆம் திகதியளவில் கடற்றொழில் கூட்டுத்தபானம் ஈட்டிய இலாபம் அல்லது நட்டம் எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் கடற்றொழில் கூட்டுத்தாபனத்தில் சேவையாற்றும் தற்காலிக, அமைய மற்றும் நிரந்தர ஊழியர்கள் மற்றும் உத்தியோகத்தர் களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) 2009ஆம் ஆண்டிலிருந்து இன்றுவரை திறந்து வைக்கப்பட்ட புதிய மீன் விற்பனை நிலையங் களின் எண்ணிக்கை வருடாந்தம் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி விற்பனை நிலையங்களுக்காக கடந்த 3 வருட காலப்பகுதியில் செலுத்தப்பட்ட மொத்த வாடகைத் தொகை எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி மீன் விற்பனை நிலையங்களில் சேவை யாற்றுகின்ற பணியாளர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) இன்றளவில் கடற்றொழில் கூட்டுத்தாபனத்துக் குச் சொந்தமான சொத்துக்கள் யாவை என்பதை யும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) whether the Fisheries Corporation was making profits or making losses at the time that the incumbent Minister of Fisheries and Aquatic Resources Development took over the Ministry;

(ii) the amount of loss incurred or profit earned at that time; and

(iii) the amount of loss incurred or profit earned by the Fisheries Corporation as at 31.12.2012?

(b) Will he also inform this House -

(i) separately, the number of temporary, casual and permanent staff and officials who serve in the Fisheries Corporation by now;

(ii) separately, the number of new fish stalls that were opened in each year from the year 2009 to date;

(iii) the total amount of rent paid for aforesaid stalls for the past three years;

(iv) the number of staff who work in the aforesaid fish stalls; and

(v) the assets that belong to the Fisheries Corporation at present?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) අලාභ (පාඩු) ලබන තත්ත්වයේ පැවතුණි.

(ii) අලාභය (පාඩුව) රුපියල් 103,889,475 (රුපියල් මිලියන 103)

(iii) 2012.12.31 දිනෙන් අවසන් වර්ෂයේ වාර්තා වී ඇති අලාභය රුපියල් 41,763,563 (රුපියල් මිලියන 41) අපි රුපියල් මිලියන 62කින් පාඩුව අඩු කර ගෙන තිබෙනවා.

(ආ) (i)

	ස්ථිර	විධායක පුහුණු	කොන්ත්‍රාත්	අනියම්
විධායක නිලධාරීන්	71	01	07	-
අනෙකුත් කාර්යමණ්ඩලය	536	-	674	01
මුළු කාර්ය මණ්ඩලය	607	01	681	01 = 1290

(ii) ස්ථාපිත කරන ලද නව අළෙවි සල් සංඛ්‍යාව:

2009	-	-
2010	-	22
2011	-	32
2012	-	17
2013	-	03
එකතුව	-	74

(iii) පසු ගිය වර්ෂ 03හි ගෙවා ඇති කුලී මුදල:

2010	-	1,076,050.00
2011	-	7,315,449.60
2012	-	12,032,914.60

(iv) එම අළෙවි සල් වෙත ස්ථිර හා කොන්ත්‍රාත් පදනමට අයත් සේවකයින් සංඛ්‍යාව 162ක් අනුයුක්ත කොට ඇත.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(v) ලංකා ධීවර සංස්ථාව සතුව පවත්නා වත්කම් පහත ලැයිස්තුවේ දැක්වෙන අතර, එහි අගය 2012.12.31 දිනට රුපියල් 497,258,613.57

වත්කම්

ඉඩම්

බද්දට ගත් ගොඩනැඟිලි

ගොඩනැඟිලි සහ වෙනත්

බෝට්ටු

මෝටර් රථ

ගෘහ භාණ්ඩ

කාර්යාලීය උපකරණ

අධි ශීතකරණ

අනෙකුත් උපකරණ

වෙනත් ස්ථාවර වත්කම්

පරිගණක

පාපැදි

ශීතාගාර හා කල්බදු දුන් ශීතාගාර

අයිස් යන්ත්‍රාගාර

තරාදි

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මා බලාපොරොත්තු වුණු ආකාරයේ අංග සම්පූර්ණ පිළිතුරක් දීම ගැන ගරු ඇමතිතුමට මා ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එයින් මට පැන නැඟෙන පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පෙන්වා දුන් ආකාරයට, ඔබතුමා මෙය භාර ගන්නකොට මිලියන 103ක් වශයෙන් වූ අලාභය මේ වන විට මිලියන 41ක් දක්වා අඩු වී තිබෙනවා. ධීවර සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කර ගන්න මේ වර්ෂය තුළ හැකි වෙයි කියා ඔබතුමා අපේක්ෂා කරනවාද, නැත්නම් ඒ සඳහා තවත් යම් කාලයක් ගත වේ ද කියා මා දැන ගන්නට කැමතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ලබන අවුරුද්දේ මැද භාගය වන විට ධීවර අමාත්‍යාංශය ලාභදායී තත්ත්වයකට පත් කර ගන්නවා. ගරු මන්ත්‍රීතුමා, අපට මේක ලාභ ලබන තත්ත්වයට පත් කර ගන්න තිබුණා. අපේ වෙළඳ සැල් දිගටම විවෘත කළා. අප මේ වන විට වෙළඳ සැල් 128ක් නඩත්තු කරනවා. පළමු වන කාරණය, ඒවාට අවශ්‍ය කාර්ය මණ්ඩලය සපයන්න ඕනෑ කියන එකයි. ඒ වාගේම ඒවාට අවශ්‍ය මාළු විශාල ප්‍රමාණයක් තොග වශයෙන් ගන්නවා. දෙවන කාරණය සතොස 225කට ශීතකරණ මාළු නිකුත් කරනවා කියන එකයි. ඒ සියලු වියදම් දරලා තමයි මේ අලාභය මිලියන 63කින් අඩු කර ගන්නට අපට හැකියාව ලැබුණේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, බොහෝ විට සෘජුවම පාරිභෝගිකයාටත්, සතොස වාගේ අතරමැදි වෙළඳසැල් ඉලක්ක කර ගෙනත් තමයි ධීවර සංස්ථාව දේශීය මාළු විකිණීම කරන්නේ. නමුත් අප දන්නවා අද ජපානය වැනි රටවලින් අපේ සමහර මාළුවලට දැඩි ඉල්ලුමක් තිබෙන බව. ඒ දැවැන්ත ලාභය -ඒ විදේශ මුදල්- අපේ දේශීය ආර්ථිකයට එකතු කර ගැනීම සම්බන්ධව ධීවර සංස්ථාව සතුව තිබෙන උපාය මාර්ගය මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඒක විශාල පරිශ්‍රමයක් දැරිය යුතු කටයුත්තක්. මොකද පිට රටට මාළු යවනවා නම් අප වෙනමම processing factories හදන්න ඕනෑ. ඒ සඳහා රුපියල් මිලියන සිය ගණනක් වියදම් කරන්න ඕනෑ. එවැනි මුදලක් වියදම් කරලා අපට මාළු අපනයනය කරන්න බැහැ. නමුත් මේ දවස්වල මම සාකච්ඡා කර ගෙන යනවා ජපානයට වෙනත් මාළු වර්ග -ඒ කියන්නේ process කරපු ඒවා නොවෙයි, කෙළින්ම sashimiවලට යවන මාළු - ධීවර සංස්ථාව හරහා යැවීමට හැකිද කියලා. සිංගප්පූරුවේදීත් මම ශ්‍රී ලාංකීය ආනයනකරුවන් සමඟ කථා කළා. ලංකාවෙන් මාළු ගන්න කොට පෞද්ගලික අංශයෙන් වාගේම ධීවර සංස්ථාවෙනුත් ටිකින් ටික ගන්න කියන ඉල්ලීම එහිදී මම කළා. ඒ පිළිබඳව සාකච්ඡා කෙරෙනවා. නමුත් ඒක ලොකු වැඩ පිළිවෙළක්. මොකද අප විශේෂයෙන්ම ලාභය පමණක් නොවෙයි සේවය බලන්න ඕනෑ. ඔබතුමාට මා කියන්න ඕනෑ මේ වැඩ පිළිවෙළ යටතේ ධීවර සංස්ථාවත්, භාණ්ඩාගාරයත් 2011 වසරේ සිට දෛනිකව මාළු මිල අධීක්ෂණය කරන බව. ජීවන වියදම් කමිටුව අභිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව හැම මාසයකම රැස් වෙනවා. 2011 සිට 2013 වසරේ මේ වන තුරු මාළු මිලේ වෙනසක් වෙලා නැහැ. හැම දාම graph එක තිබෙන්නේ හරස් අතටයි. එහෙම කර ගන්න අපට පුළුවන් වෙන්නේ කොහොමද? මේ වැඩ පිළිවෙළ තිබෙන ප්‍රධාන නගර මොනවාද, ඒ හැම එකකම මාළු මිල ධීවර සංස්ථාවත් එක්ක සමගාමීව යන්න වෙනවා. නැත්නම් අනික් අයගේ මාළු විකිණෙන්නේ නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න කැමැතියි. අපට පෙනෙනවා ඊයේත්, අදත්, ඒ වාගේම හෙට සහ අනිද්දා කියන දවස්වලත් කාලගුණ තත්ත්වයේ බරපතළ වෙනසක් තිබෙන බව.

මේ තත්ත්වය තුළ පසුගිය දවස්වල සිදු වුණු ආකාරයේ බේදවාචකයක් ධීවරයන්ට නැවතත් සිදු නොවන්නට මේ මොහොත වනකොට අමාත්‍යාංශය ගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා මා දැන ගන්නට කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

දැන් තිබෙන ප්‍රශ්නය මෙකයි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි. මෙයට එක පාරටම කෙටි කලකින් විසඳුමක් යොදන්න බැහැ. අපේ vessel monitoring system එක ආපු දවසට මේ තත්ත්වය සැහෙන ප්‍රමාණයකින් අපට වෙනස් කර ගන්නට පුළුවන්. එම පද්ධතිය මේ අවුරුද්ද අවසන් වන්නට පෙර ආරම්භ කරන්නට අපි

බලාපොරොත්තු වෙනවා. ඒකත් එක්ක satellite එකෙන් ලැබෙන කාලගුණ වාර්තාව - weather forecast එක - පැය 24කට කලින් අපට ලැබෙනවා. දැන් තිබෙන ක්‍රමයට අනුව කාලගුණ දෙපාර්තමේන්තුවෙන් අපට කාලගුණ වාර්තාව ලබා දෙනකොට අපේ ධීවරයෝ පිටත් වෙලා ගිහින් ඉවරයි. එතකොට ධීවරයන්ට ඒ ගැන දැනුම් දීමේ හැකියාවක් අපට නැහැ. නමුත් VMS එක යටතේ සෑම බහුදින යාත්‍රාවකම transponder එකක් තිබෙනවා. අනෙකුත් යාත්‍රාවලට අපේ centres මඟින් පණිවුඩ ලබා දෙන්නට පුළුවන්. එහිදී කාලගුණයේ නරක තත්ත්වයක් තිබෙනවා නම් - සුළි සුළඟක්, කුණාටුවක්, සුනාමි තත්ත්වයක්, භූ චලන වාගේ දෙයක් - ඒ ගැන ඔවුන්ට දැනුම් දෙන්නට අපට හැකියාව තිබෙනවා. ඒ හැරෙන්නට අපි ලබන ජනවාරි මාසයේ පළමු වැනි දා ඉඳලා ආරක්ෂක කබායත්, රක්ෂණයත් ධීවරයන්ට අනිවාර්ය කරනවා.

බස්නාහිර පළාත් සභාවේ ප්‍රඥප්ති: විස්තර
மேல் மாகாண சபையின் நியதிச் சட்டங்கள் : விபரம்
STATUTES OF WESTERN PROVINCIAL COUNCIL: DETAILS

3073/'12

5. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බස්නාහිර පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) බස්නාහිර පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මඟින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மேல் மாகாணசபை தாபிக்கப்பட்டு அதன் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்ப தையும்;

(ii) மேல் மாகாணசபையினால் இதுவரை நிறை வேற்றப்பட்டுள்ள நியதிச்சட்டங்களின் எண்ணிக் கையையும்;

(iii) மேற்படி ஒவ்வொரு நியதிச்சட்டத்தினதும் பெயர், இலக்கம் மற்றும் நிறைவேற்றப்பட்ட திகதி வெவ்வேறாக யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி மாகாண சபையினால் நிறைவேற்றப்பட்ட,

(i) அரசியலமைப்பின் ஒன்பதாவது அட்டவணை யின் I வது நிரலின் (மாகாணசபை நிரலின்) விடயங்களுக்குரிய நியதிச் சட்டங்கள் யாவையென்ப தையும்;

(ii) அரசியலமைப்பின் ஒன்பதாவது அட்டவணை யின் III வது நிரலின் (ஒருங்கியை நிரலின்) விடயங்களுக்குரிய நியதிச் சட்டங்கள் யாவை யென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he state -

(i) the date on which the Western Provincial Council was established and commenced its functions;

(ii) the number of Statutes that have been adopted by the Western Provincial Council by now; and

(iii) separately, the title, number and the date of adoption of each of the aforesaid Statutes?

(b) Will he inform this House -

(i) of the Statutes relevant to the subjects in List I of the Ninth Schedule of the Constitution (Provincial Council List); and

(ii) of the Statutes relevant to the subjects in List III of the Ninth Schedule of the Constitution (Concurrent List);

(iii) which have been adopted by the aforesaid Provincial Council?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1988.06.22

(ii) 165කි.

(iii) ඇමුණුම් අංක 01හි දක්වා ඇත.

(ආ) (i) 61 කි. ඇමුණුම් අංක 02හි දක්වා ඇත.

(ii) 2 කි. ඇමුණුම් අංක 03හි දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:

Annexes tabled:

ඇමුණුම් අංක 01

අනු අංකය	ප්‍රඥප්තිය	සභා සම්මත කල දිනය
01.	1988 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	1988.12.05
02.	1989 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය	1989.01.18
03.	1989 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1989.06.05
04.	1989 අංක 04 දරන පළාත් ඖද මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය.	1989.09.27
05.	1989 අංක 05 දරන හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය	1989.10.11
06.	1989 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය.	1989.12.18
07.	1989 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	1990.01.17
08.	1990 අංක 01දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය.	1990.01.17
09.	1990 අංක 02 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය.	1990.03.13
10.	1990අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය.	1990.08.27
11.	1990 අංක 04 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය.	1990.08.14
12.	1990 අංක 05 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය.	1990.10.31
13.	1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය.	1990.10.09
14.	1990 අංක 07 දරන පළාත් පාලන බල මණ්ඩල (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය.	1990.10.31
15.	1990 අංක 08 දරන විසර්ජන ප්‍රඥප්තිය	1990.11.07
16.	1990 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය	1990.12.11
17.	1991 අංක 01 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය.	1991.04.04
18.	1991අංක 02 දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1991.01.30
19.	1991 අංක 03 දරන පළාත් පාලන ආයතනික නිවාස ප්‍රඥප්තිය.	1991.04.04
20.	1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධික්ෂණ කිරීමේ බලතල පවරාදීම ප්‍රඥප්තිය.	1991.05.29
21.	1991 අංක 05 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	1991.08.13
22.	1991 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	1991.10.04
23.	1991 අංක 07 දරන මෝටර් ප්‍රවාහන ප්‍රඥප්තිය.	1991.11.12
24.	1991 අංක 09 දරන විසර්ජන ප්‍රඥප්තිය	1991.12.10
25.	1992 අංක 01 දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1992.03.24
26.	1992 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	1992.10.11
27.	1992 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1992.11.24
28..	1992 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	1992.11.24
29.	1992 අංක 05 දරන මුද්දර ගාස්තු පැනවීම සඳහා වූ ප්‍රඥප්තිය.	1992.11.24
30.	1992 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	1992.12.08
31.	1993 අංක 01 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය.	1993.03.11
32.	1993 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	1993.10.15
33..	1993 අංක 03 දරන මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1993.11.25
34.	1993 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	1993.12.09
35.	1994 අංක 01 දරන සමුපකාර සේවා කොමිෂන් සභා ප්‍රඥප්තිය.	1994.03.29
36.	1994 අංක 02 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය.	1994.04.07
37.	1994 අංක 03 දරන සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය	1994.04.07
38.	1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය.	1994.09.08
39.	1994 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	1994.09.11
40.	1994 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	1994.11.26
41.	1994 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	1994.12.19
42.	1995 අංක 02 දරන පළාත් ඖද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය	1995.06.07
43.	1995 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1995.06.07
44.	1995 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	1995.10.14
45.	1995 අංක 05 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	1995.11.09
46.	1995 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	1995.11.09
47.	1995 අංක 07 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1995.11.09
48.	1996 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	1996.05.23
49.	1996 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	1996.10.15
50.	1996අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1996.11.07
51.	1997 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	1997.04.08
52.	1997 අංක 02 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	1997.04.08
53.	1997 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1997.09.25
54.	1997 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	1997.11.22
55.	1997 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	1997.12.11
56.	1998 අංක 01 දරන ක්‍රීඩා (සංශෝධන) ප්‍රඥප්තිය.	1998.01.06
57.	1998 අංක 02 දරන පුස්තකාල ප්‍රඥප්තිය.	1998.02.17
58.	1998 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තිය.	1998.03.03
59.	1998 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	1998.03.17
60.	1998 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය.	1998.03.17
61.	1998 අංක 06 දරන මෝටර් වාහන (සංශෝධන) ප්‍රඥප්තිය.	1998.04.21
62.	1999 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.06.18
63.	1999 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.06.18
64.	1999.අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.06.18
65.	1999අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.07.20
66.	1999 අංක 05 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	1999.07.20
67.	1999අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.10.15
68.	1999 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.11.09
69.	1999 අංක 08 දරන විසර්ජන ප්‍රඥප්තිය	1999.12.07
70.	1999 අංක 09 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරී ප්‍රඥප්තිය.	2000.01.04
71.	2000 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.03.21
72.	2000 අංක 02 දරන බස්නාහිර පළාතේ පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය	2000.05.23
73.	2000 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.09.05
74.	2000 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.09.19
75.	2000 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.11.30
76.	2000 අංක 06 දරන තොරතුරු තාක්ෂණ ප්‍රඥප්තිය.	2000.12.05
77.	2000 අංක 07 දරන පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය	2000.12.05
78.	2000 අංක 08 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය.	2000.07.18
79.	2000 අංක 09 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2000.12.29
80.	2000 අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.12.29
81.	2000 අංක 11 දරන විසර්ජන ප්‍රඥප්තිය	2000.12.29
82.	2001 අංක 01 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2001.01.23
83.	2001 අංක 02 දරන මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ (සංශෝධන) ප්‍රඥප්තිය.	2001.01.23
84..	2001 අංක 03 දරන බඩු උගස් ගන්නන්ගේ ප්‍රඥප්තිය.	2001.02.06
85.	2001 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2001.05.28
86.	2001 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2001.10.18
87.	2001 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	2001.12.18
88.	2001 අංක07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2001.12.18
89.	2002 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2002.04.23
90.	2002 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	2002.06.04
91.	2002 අංක 03දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2002.09.03
92.	2002 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2002.09.03
93.	2002 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2002.10.18
94..	2002 අංක 06 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන ශ්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තිය.	200.12.03
95.	2002 අංක 07දරන බස්නාහිර පළාතේ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය.	2002.12.17
96.	2002 අංක 08 දරන විසර්ජන ප්‍රඥප්තිය	2002.12.17
97.	2003 අංක 01 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරී (සංශෝධන) ප්‍රඥප්තිය.	2003.02.18
98.	2003 අංක 02 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධන) ප්‍රඥප්තිය	2003.02.18
99.	2003 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	2003.06.03
100.	2003 අංක 04 දරන බස්නාහිර පළාතේ පෙර පාසල් ප්‍රඥප්තිය.	2003.07.08
101.	**2003 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය**	2003.09.23
102.	**2003 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය**	2003.11.17
103.	2003අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2003.11.24
104.	2004 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.02.03
105.	2004 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.09.15
106.	2004 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.10.12
107.	2004 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.11.09
108.	2004 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.11.23
109.	2004 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	2004.12.07
110.	2005 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2005.02.22
111.	2005 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	2005.06.07
112.	2005 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	2005.08.09
113.	2005 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2005.11.25
114.	2005 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2005.12.06
115.	2006 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2006.05.09
116.	2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2006.07.04
117.	2006 අංක 03 දරන බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා ප්‍රඥප්තිය.	2006.08.22
118.	2006 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2006.09.05
119.	2006 අංක 05 දරන බඩු උගස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය.	2006.09.19
120.	2006 අංක06 දරන විසර්ජන ප්‍රඥප්තිය	2006.10.16
121.	2006 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2006.11.07
122.	2006 අංක 08 දරන විසර්ජන ප්‍රඥප්තිය	2006.12.19
123..	2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරී ප්‍රඥප්තිය.	2007.01.23
124.	2007 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	2007.04.03
125.	2007අංක 03 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	2007.06.05

126.	2007 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2007.08.21
127.	2007 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2007.10.22
128.	2007 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය	2007.12.04
129.	2007 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2007.12.18
130.	2008 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය.	2008.01.23
131.	2008 අංක 02 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2008.03.04
132.	2008 අංක 03 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2008.05.06
133.	2005 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2008.08.26
134.	2008 අංක 05 දරන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යධාර සැපයීම සඳහා වූ ප්‍රඥප්තිය	2008.09.23
135.	2008 අංක 06 දරන විකල්ප විදුලිබල ප්‍රඥප්තිය.	2008.10.21
136.	2008 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2008.11.11
137.	2009 අංක 01 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරි(සංශෝධන) ප්‍රඥප්තිය.	2009.01.20
138.	2009 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2009.01.20
139.	2009 අංක 03 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2009.06.23
140.	2009 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය	2009.11.10
141.	2009 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2009.12.22
142.	2009 අංක 06 දරන විසර්ජන(සංශෝධන) ප්‍රඥප්තිය	2009.12.22
143.	2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තිය.	2010.02.09
144.	2010 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2010.02.09
145.	2010 අංක 03 දරන ගම්පහ ජනාධිපති ශිල්ප කලා ශාලිකාව සහ සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රීඩාංගණය පාලන අධිකාරි ප්‍රඥප්තිය.	2010.02.23
146.	2010 අංක 04 දරන බස්නාහිර පළාතේ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය.	2010.03.09
147.	2010 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය	2010.04.20
148.	2010 අංක 06 දරන බස්නාහිර පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය.	2010.06.08
149.	2010 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තිය	2010.10.12
150.	2010 අංක 08 දරන විසර්ජන ප්‍රඥප්තිය	2010.11.09
151.	2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය.	2010.11.09
152.	2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශිය සභා සභිකවරුන් වෙත රාජකාරී නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම සඳහාවන ප්‍රඥප්තිය.	2010.11.23
153.	2011 අංක 01 දරන විසර්ජන ප්‍රඥප්තිය	2011.02.22
154.	2011 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය	2011.07.19
155.	2011 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය	2011.10.10
156.	2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය.	2011.10.10
157.	2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා සහ සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය.	2011.10.10
158.	2011 අංක 06දරන විසර්ජන ප්‍රඥප්තිය	2011.12.09
159.	2012 අංක 01 දරන බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරි ප්‍රඥප්තිය	2012.02.06
160.	2012 අංක 02දරන බස්නාහිර පළාතේ බනිජ බදු ප්‍රඥප්තිය.	2012.03.06
161.	2012 අංක 03 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මහජනසෙවක පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය.	2012.03.20
162.	2012 අංක 04 දරන බස්නාහිර පළාතේ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය.	2012.08.07
163.	2012 අංක 05දරන විසර්ජන ප්‍රඥප්තිය	2012.08.21
164.	2012 අංක 06දරන විසර්ජන ප්‍රඥප්තිය	2012.12.10
165.	2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්ති ය.	2013.01.22හා 2013.02.05

ඇමුණුම් අංක 02

අනු අංකය	ප්‍රඥප්තිය	සභා සම්මත කල දිනය
01.	1989 අංක 04 දරන පළාත් බද මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය.	1989.09.27
02.	1989 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය.	1989.12.18
03.	1990 අංක 01දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය.	1990.01.17
04.	1990අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය	1990.08.27
05.	1990 අංක 04 දරන ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය.	1990.08.14
06.	1990 අංක 05 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය.	1990.10.31
07.	1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය.	1990.10.09
08.	1990 අංක 07 දරන පළාත් පාලන බල මණ්ඩල (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය.	1990.10.31
09.	1991 අංක 01 දරන පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය.	1991.04.04
10.	1991අංක 02 දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1991.01.30
11.	1991 අංක 03 දරන පළාත් පාලන ආයතනික නිවාස ප්‍රඥප්තිය.	1991.04.04
12.	1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණ කිරීමේ බලතල පවරාදීම ප්‍රඥප්තිය.	1991.05.29
13.	1991 අංක 05 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	1991.08.13
14.	1991 අංක 07 දරන මෝටර් ප්‍රවාහන ප්‍රඥප්තිය.	1991.11.12
15.	1992 අංක 01දරන මාර්ගස්ථ මඟින් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1992.03.24
16.	1992 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	1992.11.24
17.	1992 අංක 05 දරන මුද්දර ගාස්තු පැනවීම සඳහා වූ ප්‍රඥප්තිය.	1992.11.24
18.	1993 අංක 01 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය.	1993.03.11
19.	1993 අංක 03 දරන මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1993.11.25
20.	1994 අංක 01 දරන සමුපකාර සේවා කොමිෂන් සභා ප්‍රඥප්තිය.	1994.03.29
21.	1994 අංක 02 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය.	1994.04.07
22.	1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීම් සඳහා වූ ප්‍රඥප්තිය.	1994.09.08
23.	1995 අංක 02 දරන පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය	1995.06.07
24.	1995 අංක 07 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	1995.11.09
25.	1998 අංක 01 දරන ක්‍රීඩා (සංශෝධන) ප්‍රඥප්තිය.	1998.01.06
26.	1998 අංක 02 දරන පුස්තකාල ප්‍රඥප්තිය.	1998.02.17
27.	1998 අංක 03 දරන සමුපකාර ප්‍රඥප්තිය	1998.03.03
28.	1998 අංක 05 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය	1998.03.17
29.	1998 අංක 06 දරන මෝටර් වාහන (සංශෝධන) ප්‍රඥප්තිය.	1998.04.21
30.	1999 අංක 09 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරි ප්‍රඥප්තිය.	2000.01.04
31.	2000 අංක 06 දරන කොරතුරු තාක්ෂණ ප්‍රඥප්තිය.	2000.12.05
32.	2000 අංක 08 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය.	2000.07.18
33.	2001 අංක 02 දරන මුද්දර ගාස්තු පැවරීම් සඳහා වූ (සංශෝධන) ප්‍රඥප්තිය.	2001.01.23
34.	2001 අංක 03 දරන බඩු උගස් ගන්නන්ගේ ප්‍රඥප්තිය.	2001.02.06
35.	2002 අංක 06 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මඟී ප්‍රවාහන ශ්‍රීරෝද රථ සේවා ප්‍රඥප්තිය.	2002.12.03
36.	2002 අංක 07දරන බස්නාහිර පළාතේ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය.	2002.12.17
37.	2003 අංක 01 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරි (සංශෝධන) ප්‍රඥප්තිය.	2003.02.18
38.	2003 අංක 04 දරන බස්නාහිර පළාතේ පෙර පාසල් ප්‍රඥප්තිය.	2003.07.08
39.	2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2006.07.04
40.	2006 අංක 03 දරන බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා ප්‍රඥප්තිය.	2006.08.22
41.	2006 අංක 05 දරන බඩු උගස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය.	2006.09.19
42.	2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමණාකරන අධිකාරි ප්‍රඥප්තිය.	2007.01.23
43.	2007අංක 03 දරන මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය.	2007.06.05
44.	2008 අංක 02 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය.	2008.01.23
45.	2008 අංක 05 දරන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත මූල්‍යධාර සැපයීම සඳහා වූ ප්‍රඥප්තිය	2008.09.23
46.	2008 අංක 06 දරන විකල්ප විදුලිබල ප්‍රඥප්තිය	2008.10.21
47.	2009 අංක 01 දරන දුව්‍ය කළමණාකරන අධිකාරි ප්‍රඥප්තිය.	2009.01.20
48.	2009 අංක 02දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2009.01.20
49.	2010 අංක 01 දරන බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පාලන අධිකාරි ප්‍රඥප්තිය.	2010.02.09
50.	2010 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.	2010.02.09
51.	2010 අංක 03 දරන ගම්පහ ජනාධිපති ශිල්ප කලා ශාලිකාව සහ සිරිමාවෝ බණ්ඩාරනායක ක්‍රීඩාංගනය පාලන අධිකාරි ප්‍රඥප්තිය.	2010.02.23
52.	2010 අංක 04 දරන බස්නාහිර පළාතේ මුද්දර ගාස්තු පැවරීම සඳහා වූ ප්‍රඥප්තිය.	2010.03.09
53.	2010 අංක 06 දරන බස්නාහිර පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය.	2010.06.08
54.	2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය.	2010.11.09
55.	2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශිය සභා සභිකවරුන් වෙත රාජකාරී නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම සඳහාවන ප්‍රඥප්තිය.	2010.11.23
56.	2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය.	2011.10.10
57.	2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා සහ සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය.	2011.10.10
58.	2012 අංක 02දරන බස්නාහිර පළාතේ බනිජ බදු ප්‍රඥප්තිය.	2012.03.06
59.	2012 අංක 03 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මහජනසෙවක පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය.	2012.03.20
60.	2012 අංක 04 දරන බස්නාහිර පළාතේ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය.	2012.08.07
61.	2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තිය.	2013.01.22 සහ 2013.02.05

ඇමුණුම් අංක 03

අනු අංකය	ප්‍රඥප්තිය	සභා සම්මත කල දිනය
01.	1994 අංක 03 දරන සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය	1994.04.07
02.	2012 අංක 01 දරන බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරි ප්‍රඥප්තිය	2012.02.06

[මෙම ඇමුණුම් පුස්තකාලයේ ද තබා ඇත.]

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This Annex is also placed in the Library.]

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මම අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා ක්‍රමයේ තිබෙන සාර්ථකත්වය, අසාර්ථකත්වය පිළිබඳව අපි මේ දිනවල ගැඹුරු ලෙස සාකච්ඡා කරනවා. නමුත් මේ ලැයිස්තු අනුව පෙනෙනවා, වසර 20කට අධික කාලයක් ගත වෙලාත් රටේ වැඩිම සම්පත් තිබෙන පළාත් සභාව වන බස්නාහිර පළාත් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමන්ට පවරා තිබෙන විෂයයන්වලට අදාළව ප්‍රඥප්ති සකස් කර ගැනීම ඉතාම සුළු වශයෙනුයි සිද්ධ කරලා තිබෙන්නේ කියලා. ඒ, වසරකට දෙකක් තුනක් පමණයි. මේ පළාත් සභාවල කාර්යක්ෂමතාව වැඩි කර ගන්න මේ රජයෙන් කරලා තිබෙන දේ මොනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කිව්ව දෙයට මම එකඟ වෙන්නේ නැහැ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මෙතැන තිබෙන ඇමුණුම් අංක1හි ප්‍රඥප්ති 165ක් දක්වා තිබෙනවා. ඇමුණුම් අංක 2 හි ප්‍රඥප්ති 61ක් දක්වා තිබෙනවා. ඇමුණුම් අංක 3හි ප්‍රඥප්ති 2ක් දක්වා තිබෙනවා. ඉතින් බලන්න, ප්‍රඥප්ති දෙසිය ගණනක් විතර සම්මත කර ගෙන තිබෙනවා. ඒ අනුව ඉතාම කාර්යක්ෂම විධියට තමන්ගේ විෂය පථය ගැන ඔවුන් වැඩ කරලා තිබෙන බවයි මගේ හැඟීම.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔය ලැයිස්තුව බැලුවොත් ඔබතුමාට පෙනෙයි, වැඩිපුර ප්‍රමාණයක් තිබෙන්නේ මුද්දර ගාස්තු සම්බන්ධව සංශෝධන බව. විශාල ප්‍රමාණයක් තිබෙන්නේ ඒවා. උදාහරණයක් විධියට ගොවිජන සේවා විෂයය සම්බන්ධව බස්නාහිර පළාත් සභාවෙන් ප්‍රඥප්ති හදලා නැහැ. ඉඩම් පිළිබඳ ප්‍රඥප්තිය හැදුවා, අසම්පූර්ණයි, ඒක අතහැරියා. ඒ වාගේ ප්‍රධාන විෂයයන් පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ ප්‍රඥප්ති සකස් කරලා නැහැ. මුද්දර ගාස්තු පිළිබඳව තිබෙන මුල් ප්‍රඥප්තියත් සංශෝධනත් පමණයි තිබෙන්නේ. ඒ නිසා හරයාත්මක විෂයයන් පිළිබඳව බස්නාහිර පළාත් සභාවවත් - ඉතුරු පළාත් සභාවල කොහොමත් නැහැ- ප්‍රඥප්ති සකස් කර නැහැ. ඔබතුමා ඒ කාරණය පිළිගන්නවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන පරීක්ෂා කර බැලීමේදී එතුමා කියන කාරණයෙහි යම් සත්‍යතාවක් තිබෙන බව පෙනෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ, ඒක ඔබතුමන්ලාගේ පක්ෂයේ දුර්වලතාවක්ය කියායි. මොකද, බස්නාහිර පළාත් සභාව තුළදී තමයි ඒ ගැන ප්‍රශ්න කරලා හඬ නඟන්න ඕනෑ. පාර්ලිමේන්තුව තුළදී ඒ ගැන හඬ නැඟුවාම අපට කරන්න පුළුවන් වෙන්නේ ඒක පළාත් සභාවට දැනුම් දීම පමණයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I stood up to ask the third Supplementary Question. Hon. Minister, we are made to understand that there are certain amendments to be brought to the Provincial Council system and the Eastern Provincial Council, which has not been supportive of certain ideas, is going to be dissolved, brought under the Governor's control and through that, you are trying to get consent for the amendments to the Thirteenth Amendment. - [*Interruption.*] Is it correct that the Eastern Provincial Council is going to be dissolved in the next couple of days owing to the fact that you are unable to extract support from it?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව ගරු රවි කරුණානායක මැතිතුමාට තිබෙන දැනුම පිළිබඳව මම කනගාටු වෙනවා. Provincial Council එක dissolve කරන්න එහෙම පුළුවන්කමක් නැහැ. Provincial Council එකක් විසුරුවා හරින්න නම් බහුතර කැමැත්ත අනුව ප්‍රධාන අමාත්‍යාරවයා විසින් ආණ්ඩුකාරවරයාට එවැනි දැනුම් දීමක් කරන්න ඕනෑ. අපට එවැනි කිසිම දැනුම් දීමක් කරලා නැහැ.

බන්ධනාගාරය තුළ සිදුවන අයථා සිදුවීම් : පියවර
சிறைச்சாலையினுள் இடம்பெறும் முறைகேடுகள் : நடவடிக்கை
IRREGULARITIES WITHIN PRISONS: MEASURES TAKEN

3256/'12

6. ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බන්ධනාගාර රැඳවියන් බැලීමට එන පුද්ගලයන් සහ බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාරයට ඇතුල්වීමේදී පරීක්ෂාවට ලක්වන්නේද;

(ii) එසේ නම්, බන්ධනාගාර තුළට මත්ද්‍රව්‍ය සහ ජංගම දුරකථන රැගෙන එන අය කවුරුන්ද;

(iii) බන්ධනාගාර ඇතුළත සිදුවන අයථා සිදුවීම්වලට බන්ධනාගාර නිලධාරීන්ගෙන් සහයෝගය ලැබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැලිකඩ බන්ධනාගාරය තුළ ඉඩ පහසුකම් ලබා දිය හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට එම බන්ධනාගාරය තුළ රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පුනර්වාෂ්වලිප්පු, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிறைக் கைதிகளைப் பார்ப்பதற்காக வரும் நபர்கள் மற்றும் சிறைச்சாலை உத்தியோகத் தர்கள் சிறைச்சாலையினுள் பிரவேசிக்கும்போது சோதனைக்கு உட்படுத்தப்படுகின்றனரா என்பதையும்;

(ii) அவ்வாறாயின், சிறைச்சாலையினுள் போதைப் பொருள் மற்றும் செல்லிடத் தொலைபேசிகளைக் கொண்டு வருபவர்கள் யாவர் என்பதையும்;

(iii) சிறைச்சாலையினுள் இடம்பெறும் முறை கேடான சம்பவங்களுக்கு சிறைச்சாலை உத்தி யோகத்தர்களின் ஒத்துழைப்பு கிடைக்கின்ற தென்பதை அவர் அறிவாரா என்பதையும்;

(i v) அவ்வாறாயின், அந்த உத்தியோகத்தர்கள் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவையென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) வெலிக்கடை சிறைச்சாலையினுள் இட வசதி வழங்கப்படக்கூடிய கைதிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) தற்போது மேற்படி சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he inform this House -

(i) whether visitors of the prison inmates and prison officers are checked when they enter prisons;

(ii) if so, the persons who smuggle drugs and mobile phones into prisons;

(iii) whether he is aware that the irregularities that take place within prisons are supported by prison officers; and

(iv) if so, the measures that will be taken regarding such officers?

(b) Will he state -

(i) the number of inmates that could be accommodated in Welikada Prison; and

(ii) the number of inmates detained in the said prison at present?

(c) If not, why?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර මෙසේයි:

(අ) (i) ඔව්. බන්ධනාගාරගත කර ඇති සිර සැකකරුවන් මුණ ගැසීමට පැමිණෙන ඥාතීන් හිතවතුන් අතරින් මරණීය දණ්ඩනය සහ විශේෂ ගණයෙහි ලා සැලකෙන සිර සැකකරුවන් බැලීමට පැමිණෙන පුද්ගලයින් හැර සෙසු සිර සැකකරුවන් බලා ගැනීම පිණිස එන අයවලුන් බන්ධනාගාරය තුළට යැවීමක් සිදු නොවේ.

මරණීය දණ්ඩනය සහ විශේෂ ගණයෙහි ලා සැලකෙන සිර සැකකරුවන් බැලීමට පැමිණෙන අමුත්තන් සහ ඔවුන් රැගෙන එන භාණ්ඩ බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරන අතර අමුත්තන් පෙන්වීමද ජේලර් වරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කරයි.

සෑම බන්ධනාගාර ආයතනයකටම පැමිණෙන නිලධාරීන් ප්‍රධාන දොරටුවේදී සෝදිසි කිරීමට ලක් වන අතර කොළඹ බන්ධනාගාර ආයතනවල ප්‍රධාන දොරටුවේ සෝදිසියට අමතරව බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරීන් විසින් පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිදි සෝදිසියට ලක් කිරීමක් සිදු කරනු ලැබේ. මීට අමතරව මේ වන විටත් බෝගම්බර දුම්බර බන්ධනාගාරයේ පරීක්ෂා කිරීමේ තාක්ෂණික උපකරණ සවි කොට ඇත.

(ii) ඉහත 1 අනුව සිර සැකකරුවන් බැලීමට පැමිණෙන අමුත්තන් සහ බන්ධනාගාර නිලධාරීන් සෝදිසි කිරීම සිදු වන අතර බන්ධනාගාර ආයතන තුළට පැමිණෙන රැඳවියන් ඉහත කී සෝදිසිවලට අමතරව හමුදා නිලධාරීන් විසින්ද සෝදිසියට ලක් කරනු ඇත.

මෙම සියලු සෝදිසි කිරීම් ශ්‍රමිකව සිදු කරන අතර තාක්ෂණික උපකරණ භාවිතයෙන් සෝදිසි කිරීමට (parcel scanners/body scanners) උපකරණ නොමැති තත්ත්වය තුළ රැඳවියන් විසින් ශරීරය අභ්‍යන්තරය තුළ සඟවා ගෙන එනු ලබන නීතිවිරෝධී

ද්‍රව්‍ය හඳුනා ගැනීමට හැකියාවක් ලැබී නැත. මෙය වළක්වාලීම සඳහා දැනටමත් සුනඛයින් යොදවා ගැනීමේ හා නව තාක්ෂණික උපකරණ මිල දී ගැනීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

(iii) නිලධාරීන්ගේ යම් ප්‍රමාණයක් අයතා සිද්ධීන්වලට සම්බන්ධ වී ඇති බව වාර්තා වී ඇත. එනම්,

2011 වර්ෂයේ නිලධාරීන් 04 (ඕවර්සියර් 01, නියාමක 03)

2012 වර්ෂයේ නිලධාරීන් 07 (නියාමක 06, ඖෂධ සංයෝජක 01)

2013 වර්ෂයේ නිලධාරීන් 03 (නියාමක 02, ඖෂධ සංයෝජක 01) - (මේ වන විට)

(iv) මෙම නිලධාරීන්ට විරුද්ධව දණ්ඩ නීති සංග්‍රහය යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත. මෙයට අමතරව සිද්ධිය සැල වූ වහාම ඔවුන් වැඩ තහනමකට ලක් කරන අතර, මූලික විමර්ශනයක් පවත්වා ඒ අනුව විධිමත් විනය පරීක්ෂණයකින් පසුව යම් හෙයකින් වැරැදිකරුවන් වන අයට ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24 වගන්තිය යටතේ උපරිම දඬුවම් ලබා දීම සිදු කරනු ලබයි.

(ආ) (i) රැඳවිය හැකි අනුමත සංඛ්‍යාව 1,683යි.

(ii) සිර සැක 4,142 දෙනෙකු 2013.05.20වන දිනට රඳවා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය අසන වේලාව වන විට මෙම ප්‍රමාණය හුඟක් අඩු කරලා තිබෙනවා.

මේ වන විටත් රැඳවියන් වැලිකඩින් ඉවත් කර ගැනීම සිදු කරමින් පවතින අතර, මේ වසරේ අගෝස්තු මාසය අවසන් වන විට වැලිකඩින් රැඳවියන් 2,500 දෙනෙකු විතැන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය දිනවල දිගින් දිගටම සිදු වූ කප්පම් ගැනීම්, ඒ වාගේම මත් ද්‍රව්‍ය ජාවාරම් බන්ධාගාරය තුළ ඉන්න සිරකරුවන් බන්ධනාගාරය තුළ ඉඳගෙන තමයි සැලසුම් කළේ.

[ගරු පී. හැරිසන් මහතා]

ගරු ඇමතිතුමනි, ඒ වාගේම බන්ධනාගාර තුළ සිදු වන මත් ද්‍රව්‍ය ජාවාරම් පරීක්ෂාවට ලක් කරනවා නම් ඔබතුමා කියන විධියට ඒවා ශරීරයේ සඟවාගෙන යන්නේ කොහොමද? සම්පූර්ණයෙන්ම ඇඳුම් ගලවලා පරීක්ෂාවට ලක් කරලායි ඒ අය ඇතුළට ගන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

සමහර උපකරණ ශරීර අභ්‍යන්තරයේ සඟවා ගෙන එනවා. මානව හිමිකම් නීති අනුව ඒවා සෝදිසි කරන්නට පුළුවන්කමක් නැහැ. ඇත්ත වශයෙන්ම ඒ සඳහා අපි තාක්ෂණික උපකරණ සපයා ගන්න ඕනෑ. දැන් ඒ කටයුතු සිදු වෙමින් තිබෙනවා. ඔබතුමා කියන කරුණ සත්‍යයක්.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, පසු ගිය දවස්වල වැලිකඩ බන්ධනාගාරය සෝදිසි කිරීම සඳහා එස්ටීඑෆ් එක යොදවා සෝදිසි කිරීමේදී සිදු වූ වෙඩි තැබීම නිසා රැඳවියන් ගණනාවකගේ ජීවිත නැති වුණා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, එදා රැඳවියන් පරීක්ෂා කිරීමට සෝදිසි වරෙන්තුවක් ගත්තාද? එහෙම නම් කුමන උසාවියෙන්ද ඒක ගත්තේ? ඒත් එක්කම ඔබතුමා කමිටුවක් පත් කරලා එම සිද්ධිය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරනවා කියලා කිව්වා. නමුත් තවම එහි විස්තරයක් අපට ලැබුණේ නැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
එතැන අතුරු ප්‍රශ්න කීයක්ද?

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)
එකයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

ප්‍රශ්න දෙකක් ඇහුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාරය තුළ සෝදිසි කිරීම කළේ බන්ධනාගාර බුද්ධි අංශය විසිනුයි.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)
නැහැ, STF එක-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

මම කියනකම් ඉන්න. බන්ධනාගාර බුද්ධි අංශය ඒ සෝදිසි කිරීමට විශේෂ කාර්ය බල කාය යොදා ගත්තේ දියුණු තාක්ෂණික උපකරණ ප්‍රමාණවත්ව නොතිබූ නිසායි. ඒ වාගේම ඒවා පරිහරණය කිරීමේ දැනුම තිබුණේ විශේෂ කාර්ය බල කායටයි. ඒ නිසා විශේෂ කාර්ය බල කායේ සහයෝගය මේ සඳහා ලබා ගත්තා. නමුත් මේ සෝදිසි කිරීම කරපු ඒ බන්ධනාගාර රැඳවි වාට්ටුවල මෙතෙක් කිසිම දිනෙක සෝදිසි කිරීමක් කරන්න ඉඩ තිබුණේ නැහැ. ඒක බන්ධනාගාරයේ හිටපු හැම කෙනකුම දන්නවා. කවදාවත් සෝදිසියට ලක් කරන්න ඉඩ දුන්නේ නැහැ. ඒකත් සමඟ ඇති වුණු සිද්ධියේදී පරීක්ෂණ කිරීම සඳහා කමිටුවක් පත් කළා. ඒ කමිටු වාර්තාව තවමත් අප අතට පත් වුණේ නැහැ. තවමත් දීර්ඝ සාක්ෂි විමර්ශනයක යෙදෙනවා. ඒ වාර්තාව ලැබුණු පසු ඒ ගැන කරුණු අනාවරණය කරන්නම්.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)

දෙවන අතුරු ප්‍රශ්නයටම අදාළව මා අහන්න කැමැතියි, ඒක අපට ඉදිරිපත් කරන්න කොච්චර කාලයක් යනවාද කියලා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

ඔබතුමාගේ කලින් ප්‍රශ්නයත් ඒකමයි. ත්‍රිපුද්ගල කමිටුවකිනුයි ඒ විමර්ශන කටයුතු කරන්නේ. ඔවුන් අපට වාර්තා කර තිබෙනවා, තවත් සාක්ෂි සටහන් කර ගැනීමට තිබෙනවා කියා. මා හිතනවා මේ මාසයේ අවසන් වන කොට හෝ ලබන මස මැද භාගයේවත් අපට ඒ වාර්තාව ලැබේවි කියලා. යම් කාලයක් දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටියා. අපි ඒකට එකඟ වුණා.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
නැහැ, දැන් අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)
නැහැ. මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

නියෝජ්‍ය කථානායකතුමා
(*පිරතිච් සපානායකර් අවර්කළ්*)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් අහන්න.

ගරු පී. හැරිසන් මහතා
(*මාණ්පුමිකු පී. හැරිසන්*)
(The Hon. P. Harrison)

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගත්තා වැලිකඩ බන්ධනාගාරයේ එක්දහස්තුන්සිය ගණනක් දමන්න පුළුවන් තැන හාරදහස් ගණනක් ඉන්නවා කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009.11.26 දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වනවා, සාමාන්‍යයෙන් කිලෝ 50ක් බර උෆරෙකුට වර්ග මීටර් තුනක ඉඩ ප්‍රමාණයක් අවශ්‍යයි කියලා. ඒ වාගේම අවුරුදු දෙකක මී ගවයකුට වර්ග අඩි 15ක ඉඩ ප්‍රමාණයක් ඕනෑය කියලා තිබෙනවා. ඔබතුමා පිළිගන්නවාද, අඩු ගණනේ සතුන්ට සලකන සැලකිල්ලවත් මේ හිර ගෙවල්වල මිනිස්සුන්ට නැහැ කියලා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිර ගෙය තුළ සිර දඬුවම් ලබන අය සහ සැකකරුවන් යනුවෙන් දෙවර්ගයක් ඉන්නවා.

නමුත් සැකකරුවන් නිශ්චිතව හැම වෙලාවේම ඒක ඇතුළේ ඉන්නේ නැහැ. ඒ අයගේ සංඛ්‍යාව නඩුවෙන් නඩුවට වෙනස් වෙනවා.

ඒ නිසා නිශ්චිත සංඛ්‍යාවක් කියන්න පුළුවන්කමක් නැහැ. බන්ධනාගාර තුළ පවතින තදබදය අඩු කරන්න බන්ධනාගාර ප්‍රතිසංස්කරණය යටතේ දැනට නිසි පියවර අරගෙන තිබෙනවා. නව බන්ධනාගාර සැලසුම් කර ගෙන යනවා. ඒ වාගේම වැලිකඩ බන්ධනාගාරය තුළ තදබදය අඩු කිරීමට පියවර ගත් නිසා, අගෝස්තු මාසය වන විට 2,500 දෙනෙක් ඉවත් කරන්න හැකියාව ලැබී තිබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8 -3290/'12- (2), ගරු රන්ජන් රාමනායක මහතා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසම : නිර්දේශ

கற்ற பாடங்கள் மற்றும் நல்லிணக்க சனாதிபதி ஆணைக்குழு: விதப்புரைகள்

LESSONS LEARNT AND RECONCILIATION COMMISSION : RECOMMENDATIONS

2591/'12

10.ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ඉදිරිපත් කරන ලද අන්තර්කාලීන නිර්දේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම නිර්දේශයන් ප්‍රසිද්ධියට පත් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විටත් ඉහත කොමිසම ඉදිරිපත් කළ අන්තර්කාලීන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට රජය සමත්වී තිබේද;

(ii) නොඑසේ නම්, මෙම අන්තර්කාලීන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න මෙම සභාවට එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

பிரதம அமைச்சரும் புத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கற்ற பாடங்கள் மற்றும் நல்லிணக்க சனாதிபதி ஆணைக்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட இடைக்கால விதப்புரைகள் தனித்தனியே யாவை என்பதையும்;

(ii) மேற்படி விதப்புரைகள் பகிரங்கப்படுத்தப்பட்ட திகதி யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஏற்கனவே மேற்படி ஆணைக்குழு சமர்ப்பித்த இடைக்கால விதப்புரைகளை நடைமுறைப் படுத்த அரசாங்கத்தால் இயலுமாயிருந்ததா என்பதையும்;

(ii) இன்றேல் மேற்படி இடைக்கால விதப்புரைகளை நடைமுறைப்படுத்த எதிர்வரும் காலத்தில் நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iii) ஆமெனில், அத் திகதி யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) separately, the interim recommendations, presented by the Presidential Commission on Lessons Learnt and Reconciliation; and

(ii) the date on which these recommendations were publicized?

(b) Will he inform this House -

(i) whether the Government has been able to implement the interim recommendations made by the aforesaid Commission by now;

(ii) if not, whether action will be taken to implement these interim recommendations in future; and

(iii) if so, the date on which it will be done?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) අන්තර්කාලීන නිර්දේශ

රඳවා තැබීම

A. චෝදනා රහිතව දිගු කාලීනව රැඳවුම් භාරයේ සිටින අයගේ සිද්ධි එකින් එක පරීක්ෂණය කිරීම සඳහා විශේෂ යාන්ත්‍රණයක් ඇති කිරීම සහ එම කටයුතු අවසන් කිරීමට ක්‍රියාවලියක් නිර්දේශ කිරීම.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

B. 1. රැඳවියන්ගේ නම් ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීම.

2. මුදා හරින ලද රැඳවියෙකුට එරෙහිව නව සාක්ෂ්‍ය ලැබුණේ නම් පමණක් හැර ඔහු නැවත අත් අඩංගුවට පත් වීම වැළකෙන පරිදි මුදා හරින අවස්ථාවේදී සහතිකයක් නිකුත් කිරීම.

3. රැඳවියන්ට චෝදනා ගොනු කිරීම හෝ ඔවුන් මුදා හැරීම කඩිනම් කිරීම සඳහා සාමාන්‍යයෙන් ඇති වන නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් විමසීම.

ඉඩම් ප්‍රශ්න

1. නැවත පදිංචි කිරීම් සඳහා කිසිදු රජයේ ආයතනයක් විසින් පුද්ගලික ඉඩම් උපයෝගි නොකරන බවට රජය විසින් පැහැදිලි ප්‍රකාශයක් නිකුත් කිරීම.

නීතිය හා සාමය

1. සාමය හා නීතිය ආරක්ෂා කිරීම සඳහා විශේෂයෙන් නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් නිරායුධ කිරීම සඳහා විශේෂ පියවර හඳුන්වා දීම.

පරිපාලනය හා භාෂා ප්‍රශ්න

1. දිගුකාලීන වැඩසටහන් ක්‍රියාත්මක වන තුරු රජයේ කාර්යාලවල සන්නිවේදනය පහසු කරලීම සඳහා සුදුසු පරිදි භාෂා පරිවර්තකයන් යොදා ගැනීම.

සමාජ ආර්ථික/ජීවනෝපාය ප්‍රශ්න

1. ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික ක්‍රියාකාරකම්වල සහභාගිත්වය සහතික කරනු වස් A-9 මාර්ගයේ නිදහස් ගමනාගමනය දිරිමත් කිරීම.

2. සිවිල් පරිපාලනය සාමාන්‍ය තත්ත්වයට පත් කිරීම උදෙසා දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ආරක්ෂක අංශ අතර සම්බන්ධීකරණය සහ සන්නිවේදනය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යෑම.

(ii) 2011.12.16.

(ආ) (i) සියලුම අන්තර්කාලීන නිර්දේශ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළින් ක්‍රියාත්මක කරනු ලැබීම පිණිස විධිවිධාන සලසා තිබේ. නිර්දේශ බහුතරයක් ක්‍රියාත්මක කරනු ලැබීම දැනට නිමාකොට තිබෙන අතර, අනෙකුත් ඒවා ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, සමාවන්න. (අ) (ii) පිළිතුර මට හරියට ඇහුනේ නැහැ. ප්‍රසිද්ධියට පත් කළ දිනය?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

2011.12.16 වෙනි දා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසම ස්ථාපනය කරන විට ගරු ජනාධිපතිතුමා විශ්වාසය පළ කරලා තිබෙනවා මෙහි සාමාජිකයන්ගේ විචක්ෂණශීලිභාවය, හැකියාවන්, ස්වායත්තත්වය සහ විශ්වාසනීයත්වය පිළිබඳව. මේ සියල්ල ගැනම මා සතුව තිබෙන පත්‍රිකාවේ සඳහන් වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මෙන්න මෙය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තාවේ අඩංගු වෙනවා, මේ අන්තර් කාලීන යෝජනා, නිර්දේශ ක්‍රියාත්මක කරලා නැහැ; ඒ පිළිබඳව සෑහීමකට පත් වන්නට බැහැ කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මට ප්‍රශ්නය හරියට ඇහුනේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අන්තර් කාලීන යෝජනා සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරලා නැහැයි කියලා මේ වාර්තාවේ සඳහන් වෙනවා. මෙපමණ විශ්වාසය පළ කරපු කණ්ඩායමක්, රජයේම නියෝජිතයන් කණ්ඩායමක් ඉදිරිපත් කළ මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරන්නට ඇයි මෙච්චර මැලිකමක් දක්වන්නේ?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම මැලිකමක් නැහැ. කොමිෂන් සභාවක් විසින් අන්තර් කාලීන යෝජනා සහ දීර්ඝ කාලීන යෝජනා ඉදිරිපත් කළ පසු, ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව විවිධ ප්‍රශ්න හා ගැටලු ඇති වන්නට පුළුවන්. නමුත් රජය සුවිශාල ප්‍රයත්නයක් දරලා මේ අවස්ථාවේදී ක්‍රියාත්මක කළ හැකි දේවල් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි ඒ වාර්තාවට ගරු කරලා තිබෙනවා. ඒ කොමසාරිස්වරුන්ගේ විචක්ෂණශීලිභාවය පිළිබඳව අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඔවුන් පත් කළේ ඔවුන්ගෙන් හොඳ නිර්දේශ ලබා ගන්නයි. එම නිර්දේශවලින්, -මම ප්‍රශ්නයේදී පිළිතුරු දුන් ආකාරයට- අපට මෙතෙක් කළ හැකි දේවල් දැනට කරලා තිබෙනවා. ඉතිරි ටික ඉදිරියේදී කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමන්ලා පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිසමේ සාමාජිකයන් පිළිබඳව ඔබතුමන්ලා මෙපමණ විශ්වාසය පළ කරනවා නම්, කරුණාකරලා මට කියන්න එම කොමිෂන් සභා වාර්තාවේ 382 වෙනි පිටුවේ යෝජනා කරලා තිබෙන ස්වාධීන පොලිස් කොමිසම කවදාද ස්ථාපනය කරන්නේ කියලා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් කොමිෂන් සභාවක් පත් කරලා, අපි ඒ කොමිෂන් සභාවෙන් ඉල්ලන්නේ නිර්දේශ පමණයි. නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණය තිබෙන්නේ රජයට. දැන් පොලිසිය ඉතාම ස්වාධීන විධියට වැඩ කටයුතු කරගෙන යනවා. ඒ නිසා අමුතුවෙන් ස්වාධීන කොමිෂන් සභා ඕනෑ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය, ගරු ඇමතිතුමනි.

ඔබතුමාගේ පිළිතුරෙන් ප්‍රකාශ කළා, මේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිසම් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අභිමතය තිබෙන්නේ රජයටයි කියලා. මෙහි නිර්දේශවල යහ පාලනය සඳහා යෝජනා කර තිබෙන ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම ස්ථාපනය කරන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද, නැද්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාම පැහැදිලිව කිව්වා, මේ යෝජනා අතුරින් ප්‍රායෝගිකව ඒ ඒ අවස්ථාවන්හිදී අපට ඉටු කළ හැකි සියල්ල අප ඉටු කරගෙන යනවා කියලා. ඒ නිසා ඒ කරුණු එකක්, එකක් වශයෙන් පිළිතුරු දීමට පුළුවන්කමක් නැහැ. අප සමස්තයක් වශයෙන් මෙහි අර්ථය ක්‍රියාත්මක කිරීමට බැඳී ඉන්නවා.

රූපවාහිනී නාලිකා සඳහා සංඛ්‍යාත : වෙන් කිරීම
தொலைக்காட்சி நிறுவன அலைவரிசைகள்:ஒதுக்கீடு
FREQUENCY FOR TV CHANNELS : ALLOCATION

2902/'12

11. ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදුලි සංදේශ නියාමන කොමිසම ක්‍රියාත්මක වන්නේ කවර අමාත්‍යාංශයක් යටතේද;

(ii) විදුලි සංදේශ නියාමන කොමිසමේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම සහ 2006 සිට මේ දක්වා එහි එම තනතුර දැරූ අයගේ නම් වාර්ෂික පදනමින් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂයේ සිට අද දින දක්වා, රූපවාහිනී නාලිකාවලට සංඛ්‍යාත වෙන් කරදීමෙන් ඉපැයූ ආදායම එක් එක් නාලිකාව අනුව, වාර්ෂික පදනමින් කොපමණද;

(ii) රූපවාහිනී නාලිකාවලට වෙන් කරන ලද ඇතැම් සංඛ්‍යාත ඉවත් කරගෙන, ඒවා යළි වෙනත් නව හෝ පැරණි රූපවාහිනී නාලිකා වෙත ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉහත කී පරිදි ඉහත සංඛ්‍යාත නැවත වෙන්කර දුන් සමාගම්වල නම් කවරේද;

(iv) එලෙස කලින් ඉවත් කරගත් සංඛ්‍යාත නැවත ලබාදීමෙන් උපයාගත් ආදායම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙලෙස රූපවාහිනී නාලිකාවලට සංඛ්‍යාත වෙන්කර දීම තුළින් ඉන්දියාව විශාල ප්‍රමාණයක ආදායමක් උපයන බවත්, ඉහත කී සංඛ්‍යාත වැරදි ලෙස වෙන් කර දීමේ විශාල පරිමාණයේ ජාවාරමක් ඉන්දියාවේ ක්‍රියාත්මක වූ බවත් එතුමා දන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எந்த அமைச்சின் கீழ் தொலைத்தொடர்புகள் ஒழுங்குபடுத்தல் ஆணைக்குழு (தொ.ஒ.ஆ) செயற்படுகிறது என்பதையும்;

(ii) தொ.ஒ.ஆ. இன் தற்போதைய பணிப்பாளர் நாயகத்தின் பெயர் மற்றும், 2006ஆம் ஆண்டு முதல் இப்பதவியை வகித்தவர்களின் பெயர்கள் ஆகியனவற்றை வருடாந்த அடிப்படையிலும்

அவர் கூறுவாரா?

(ஆ) (i) 2006 முதல் இற்றை வரை தொலைக்காட்சி நிறுவனங்களுக்கு அலைவரிசையை ஒதுக்கியமையினால் ஈட்டப்பட்ட வருமானத்தை வருடாந்த மற்றும் நிறுவனத்தின் அடிப்படையிலும்;

(ii) தொலைக்காட்சி நிறுவனங்களுக்கு ஒதுக்கப்பட்ட சில அலைவரிசைகள் மீளப் பெறப்பட்டு அவை புதிய அல்லது பழைய தொலைக்காட்சி நிறுவனங்களுக்கு மீள் ஒதுக்கப்பட்டதா என்பதையும்;

(iii) அவ்வாறெனில், மேற்கூறப்பட்டதன் பிரகாரம், மேற்குறிப்பிடப்பட்ட அலைவரிசைகள் மீள் ஒதுக்கப்பட்ட கம்பனிகளின் பெயர்களையும்;

(iv) மீளப் பெறப்பட்ட அலைவரிசைகளை மீள் ஒதுக்கீடு செய்ததிலிருந்து ஈட்டப்பட்ட வருமானம் எவ்வளவு என்பதையும்

அவர் கூறுவாரா?

(இ) தொலைக்காட்சி நிறுவனங்களுக்கு அலைவரிசையை ஒதுக்குவதன் மூலம் பாரிய அளவிலான பணத்தை இந்தியா சம்பாதித்தது என்பதையும், மேற்படி அலைவரிசைகளை பிழையான முறையில் ஒதுக்கீடு செய்ததன் மூலம் பாரியளவு மோசடி இந்தியாவில் இடம்பெற்றது என்பதையும் அவர் அறிவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -
  (i) the Ministry under which the Telecommunications Regulatory Commission - TRC - is functioning; and
  (ii) the names of present Director General of the TRC and the names of the persons previously occupied the same post since 2006 on per year basis?

(b) Will he also state -
  (i) the revenue earned by allocating frequencies to the TV channels from 2006 to date on per year, per channel basis;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) whether some frequencies allocated to TV channels have been withdrawn and reallocated to new or old TV channels;

(iii) if so, the names of the companies to which the aforesaid frequencies were reallocated as per the above; and

(iv) the revenue earned from the reallocation of withdrawn frequencies?

(c) Is he aware that India earns a huge amount of money through frequency allocation for TV channels and also there was a huge scam in India for wrongful allocation of the aforesaid frequencies?

(d) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Hon. Deputy Speaker, on behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I answer Question No. 11.

(a) (i) The Telecommunications Regulatory Commission of Sri Lanka is coming under the purview of the subject and functions of His Excellency the President of the Democratic Socialist Republic of Sri Lanka.

(ii) The name of the Present Director General is Mr. V.P.K. Anusha Palpita.

Name	Duration
Mr. Kanchana Rathwatta	21.12.2005 - 01.01.2008
Mr. Priyantha Kariyapperuma	02.01.2008 - 07.02.2010
Mr. V.P.K. Anusha Palpita	08.02.2010 - to date

(b) (i) Please refer to Annex 1, which I **table***.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Minister, can you tell me the total revenue earned?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

The total revenue is Rs. 109,122,607.

(ii) No.

Frequencies will be reserved for a particular broadcaster on submission of relevant application forms for a maximum period of 1 year. Within the said reservation period frequencies has to be used (ie. Should commence transmission). If not, frequencies will be automatically cancelled at the end of the reservation period. Thereafter frequencies once again become the property of TRCSL which will be reserved for the next user on request.

During the reference period, the Telecommunications Regulatory Commission has not withdrawn any frequency assigned to any broadcasting institution.

(iii) Not relevant.

(iv) Not relevant.

(c) No.

(d) Not applicable.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

Parliament Question No. 2902/12

Annexure - 1

	Name of the Broadcaster	Our Ref No.				Year 2006 Paid with VAT (Rs.)	2007 Paid with VAT (Rs.)	2008 Paid with VAT (Rs.)	2009 Paid with VAT (Rs.)	2010 Paid with VAT (Rs.)	2011 Paid with VAT (Rs.)	2012 Paid with VAT (Rs.)	2013 (As at 31/06/2013) Paid with VAT (Rs.)	Total
1	Sri Lanka Rupavahini Corporation	BT	0003	80	VHF	814,200	814,200	814,200	846,720	872,907	952,907	1,001,143	1,001,143	
		BT	0005	87	UHF	811,440	826,115	1,130,932	907,678	116,388	57,600	1,058,400	1,065,600	13,091,573
2	Independent Television Network	BT	0002	78	VHF	803,850	876,300	755,550	735,840	614,381	1,088,589	833,143	833,143	
		BT	0004	84	UHF	231,840	195,615	206,483	311,925	210,359	290,375	578,400	288,000	8,853,793
3	MTV Channel (Pvt) Ltd.	BT	0006	90	UHF	1,301,687	1,450,455	1,477,020	1,518,075	1,567,225	1,549,757	1,545,600	1,545,600	11,955,418
4	E.W.Balasooriya & Co. (Pvt) Ltd.	BT	0007	91	UHF	2,415,000	2,415,000	2,415,000	2,415,000	2,424,742	2,424,742	-	-	14,509,484
5	Telshan Network (Pvt) Ltd.	BT	0008	91	UHF	989,805	427,455	427,455	424,800	424,800	424,800	424,800	384,000	
		BT	0008	91	VHF		562,350	562,350	504,000	503,910	504,000	504,000	466,286	7,534,811
6	EAP Networks (Pvt) Ltd.	BT	0009	86	UHF	1,048,915	1,043,280	1,043,208	1,016,064	785,617	1,177,089	1,036,800	1,036,800	8,187,772
7	Sumathi Holdings	BT	0016	99	UHF	2,173,500	2,173,500	2,173,500	2,116,800	1,636,701	2,182,268	2,160,000		14,616,269
8	Asia Broadcasting Corporation (Pvt) Ltd.	BT	0034	10	UHF	-	-	-	-	-	900,000	1,520,400	86,400	2,506,800
9	Dialog Television (pvt) Ltd.	BT	0020	04	UHF	-	57,960	57,960	618,988	269,146	436,454	432,000		1,872,508
10	Television & Radio Networks	BT	0013	91	UHF	526,470	461,265	461,265	120,045	502,045	480,000	480,000		3,031,090
11	People's Media Networks (Pvt) Ltd.	BT	0027	06	UHF	289,800	43,470	234,255	121,916	145,485	144,000	144,000	144,000	1,266,926
12	Carlton Sports Networks (Pvt) Ltd.	BT	0035	11	UHF	-	-	-	-	-	1,697,600	1,399,200	825,600	3,922,400
13	Power House (Pvt) Ltd.	BT	0021	04	UHF	672,175	684,250	251,160	724,500	814,713	727,423	720,000	835,200	5,429,421
14	MGM Networks (Pvt) Ltd.	BT	0023	06	UHF	260,740	299,460	135,240	145,485	145,485	145,485	144,000	144,000	1,419,894
15	Sky Television & Radio Networks (Pvt) Ltd.	BT	0012	96	UHF	-	-	-	-	-	-	2,377,143	2,377,143	4,754,286
16	Voice of Asia Networks (Pvt) Ltd.	BT	0025	06	UHF	405,720	-	-	1,215,604	164,074	698,326	691,200	691,200	3,866,124
17	VIS Broadcasting (Pvt) Ltd.	BT	0031	08	UHF	-	-	-	887,456	881,023	153,600	76,800	76,800	2,075,679
18	Rangiri Dambulla Development Foundation	BT	0022	10	UHF	-	-	-	-	-	-	79,200	-	79,200
19	Lanka Television Network (Pvt) Ltd.	BT	0024	06	UHF	57,960	-	-	-	-	-	-	-	57,960
20	Lanka Broadcasting Network	BT	0037	12	UHF	-	-	-	-	-	-	43,200	48,000	91,200
Total						12,803,102	12,330,675	12,145,577	14,630,896	12,079,000	16,035,013	17,249,429	11,848,914	109,122,607

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This Annex is also placed in the Library.]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශාල පරිමාණයේ ජාවාරමක් ඉන්දියාවේ ක්‍රියාත්මක වූ බවක් දන්නේ නැතැයි කියා පිළිතුරේ සඳහන් වෙනවා. මා හිතන හැටියට පිළිතුර සැපයූ කෙනා ඒකේ වටිනාකම නොදන්නවා වෙන්න ඇති. ඒකෙන් අපේ පුංචි ලංකාවට ලොකු ආදායමක් සොයා ගන්න පුළුවන් අවස්ථාවකුයි ගිලිහී ගිහින් තිබෙන්නේ. ඔබතුමා දන්නවා, මේ අවස්ථාවේ මිලියන 109ක් ලබා ගන්නවා කියන්නේ ඉතාම අඩු ප්‍රමාණයක් බව. අපි දන්නා විධියට කිසිම මුදලක් අය කරන්නේ නැතුව ආණ්ඩුවේ මිතුරන්ට licence දීමෙන් රජයට ලබා ගත හැකි බදු මුදල අඩු වෙලා තිබෙනවාද, නැද්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
රජයේ මිතුරන්ට එලෙස අඩු මුදලකට දුන්නාය කියා අපට නම් ආරංචි වෙලා නැහැ. ඔබතුමා එහෙම කියනවා නම්, ඒක වෙනම ප්‍රශ්නයකින් අහන්න, අසවල් කෙනාට මෙපමණ මුදලකට දුන්නාද කියලා. එතකොට අපට ඒ පිළිබඳව තිරසාර උත්තරයක් ලබා දෙන්න පුළුවන්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඉන්දියාවේ 2G spectrum scam එකට ඇමතිවරු තුන් දෙනෙකුත් අසු වෙලා තිබෙනවා. ඒ නිසා US Dollars 38 billion ඉන්දියාවට ලබා ගන්න පුළුවන් හැකියාව අඩු වනවා කියලා ඇමතිවරු තුන් දෙනෙකුව හිර ගෙදරට යැව්වා. මෙවැනි කාරණා දැන ගෙනත් අපේ පුංචි ලංකාවට වටිනාකමක්, ආදායමක් උපයා ගන්න පුළුවන් අවස්ථාව ගිලිහී යන කොට ඒ වෙනුවෙන් පරීක්ෂණයක් කරන්න ඔබතුමන්ලා අකැමැතිද? පරීක්ෂණයක් නොකරන්නේ ඒවා පස්ස දොරෙන් දී තිබෙන නිසාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඉන්දියාවේ සිදු වුණු දේවල් ගැන ඉන්දියාව බලා ගන්න ඕනෑ. මේ උත්තරයෙන් කියා තිබෙන්නේ, ලංකාවේ එහෙම දෙයක් වෙලා නැහැ කියලානේ. සිදු නොවුණු දෙයක් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍යතාවක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ ගැන වටිනාකමක් නොදන්නවා වුණාට, අප මේ අවස්ථාවේදී කියනවා, එහි වටිනාකමක් තිබෙන බව. ඒ නිසා කරුණාකරලා හැම අවුරුද්දේම ඒකෙන් යම් මුදල් ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් ඇති කරන්න. මේ අහිංසක මිනිසුන්ගේ කිරි පැකට් එකෙන්, භූමිතෙල් ලීටරයෙන් ලබා ගන්නා බදු ප්‍රමාණය නවත්වලා, ඉතිරිව තිබෙන licence ප්‍රමාණය auction කරලා මුදල් ගෙවන්න හැකියාව තිබෙන අයගෙන් බදු මුදල් ලබා ගන්න කැමැතිද නැද්ද කියන එක රටට හෙළිදරවු කරන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
බොහොම වැදගත් අදහසක්. ඔබතුමාගේ අදහස මා අදාළ අමාත්‍යතුමාට ඉදිරිපත් කරන්නම්.

යෝජිත සත්වෝද්‍යානය : මූල්‍ය ප්‍රතිපාදන
உத்தேச விலங்கினக் காட்சிசாலை : நிதி ஏற்பாடு
PROPOSED ZOOLOGICAL GARDEN : FINANCIAL PROVISION

2924/'12

12.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පින්නවල අලි අනාථාගාරයට යාබදව සත්වෝද්‍යානයක් ඉදිකිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යෝජිත සත්වෝද්‍යානය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගනු ලබන්නේ දේශීය අරමුදල්වලින්ද: නැතහොත්, විදේශීය අරමුදල්වලින්ද;

(ii) එම ප්‍රතිපාදන සපයා ගනු ලබන ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

තාවරවියල් පූංකාක්කළ්, பொதுப் பொழுதுபோக்கு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பின்னவல யானைகள் சரணாலயத்திற்கு அருகில் விலங்கினக் காட்சிச் சாலையொன்றை நிர்மாணிக்கும் பணிகள் தற்போது ஆரம்பிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்துக்கு செலவிடுவதற்கு எதிர்பார்க்கப்பட்டுள்ள பணத்தொகை எவ்வள வென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) உத்தேச விலங்கினக் காட்சிசாலையை நிர்மாணிப்பதற்கான நிதி பெறப்படுவது உள் நாட்டு நிதியத்திலிருந்தா இன்றேல் வெளிநாட்டு நிதியத்திலிருந்தா என்பதையும்;

(ii) மேற்படி நிதி பெற்றுக்கொள்ளப்படும் நிறுவனத் தின் அல்லது நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) மேற்படி ஒவ்வொரு நிறுவனமும் பெற்றுக் கொடுக்கும் பணத்தொகை வெவ்வேறாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Botanical Gardens and Public Recreation:

(a) Will he state -

(i) whether activities for construction of a zoological garden adjoining the Pinnawala Elephant Orphanage have commenced by now; and

(ii) the amount of money expected to be spent on this project?

(b) Will he inform this House -

(i) whether provisions for construction of the proposed zoological garden are secured from local funds or foreign funds;

(ii) the name/s of institution or institutions from which such provisions are secured; and

(iii) separately, the amount of money provided by each of the said institutions?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ආරම්භ කර තිබේ.

(ii) රු. මි. 5,020

(ආ) (i) දේශීය අරමුදල් හා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල මඟින්.

(ii) මහා භාණ්ඩාගාරය හා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල.

(iii) මහා භාණ්ඩාගාරය - රු. මි. 3000

සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල - රු.මි. 2020

(ඇ) කරුණු ඉදිරිපත් කර නොමැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මම දැන ගන්නට කැමැතියි, මේ ඉදි කරන සත්වෝද්‍යානයේ වැඩ කටයුතු අවසන් කරන්නට යෝජිතව තිබෙන්නේ කොපමණ කාලයකින්ද කියලා. මොකද, දැන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ සත්වෝද්‍යානය හදමින් තිබෙනවා. වටේට ගහපු වැටවල් පවා දිරා ගිහින් තිබෙනවා. කැලෑ වැවිලා තිබෙනවා. ඉදි කරනවාය කිව්වාට බාහිරින් නම් පෙනෙන්නේ අමු කැලෑවක්. ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙන බව මෙහි සඳහන් කර තිබෙනවා. ඔබතුමා විෂය භාර අමාත්‍යවරයා නොවන නිසා ඔබතුමාට මෙයට පිළිතුරක් දෙන්න අමාරු ඇති.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඔබතුමා කලින් ඇහුවා නම් අදාළ අමාත්‍යාංශයෙන් ඒ විස්තර ලබා ගන්න තිබුණා. ඔබතුමා අපේ උපදේශක කාරක සභාවට ඇවිල්ලා මේ පිළිබඳව ප්‍රශ්න කරන්න. මම ඒ බව දන්වන්නම්. එහෙම නැත්නම් ඔබතුමාට එයට උත්තරයක් ලබා දෙන ලෙසට මා අදාළ අමාත්‍යතුමාට දන්වන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පින්නවල අලි අනාථාගාරයට යාබදව ඉදි කරන යෝජිත සත්වෝද්‍යානයේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසුව දෙහිවල සත්වෝද්‍යානය සම්පූර්ණයෙන් වහලා එහි සිටින සත්තු සහ නිලධාරීන් පින්නවලට ගෙන යන්නද බලාපොරොත්තුව? එහෙම නැත්නම් සත්වෝද්‍යාන දෙකක් පවත්වා ගෙන යන්නද බලාපොරොත්තුව?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මම අදාළ විෂය භාර අමාත්‍යවරයා නොවන නිසා ඒ ගැන දන්නේ නැහැ. නමුත් මම හිතන හැටියට ඒ සත්වෝද්‍යාන දෙකම පවත්වා ගෙන යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අතුරු ප්‍රශ්න දෙකයි.

සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාව : විස්තර

இணைந்த சுகாதார சிறப்புப் பட்ட கற்கைநெறி : விபரம்

ALLIED HEALTH SPECIALIZED DEGREE COURSE : DETAILS

3075/'12

13.ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2) :

(අ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම පාඨමාලාව සඳහා මේ දක්වා ලියා පදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම පාඨමාලාව හදාරා උපාධි ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය වර්ෂ 3 ක් දක්වා අඩුකිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

උයර් කල්වි අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) පේරාදෙනියේ විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විශේෂ උපාධි පාඨමාලාවක් ආරම්භ කරන ලද්දේ කවර වසරේදීද;

(ii) එම පාඨමාලාවේ ඇතුළත් කරගනු ලැබූ සිසුන් සංඛ්‍යාව වසර පිළිබඳව වෙන වෙනම හා ඒ අදාළ වන පරිදි;

(iii) මේ වන විට එම පාඨමාලාව හදාරා උපාධි ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය වර්ෂ 3 ක් දක්වා අඩුකිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

උයර් කල්වි අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාවක් ආරම්භ කරන ලද්දේ කවර වසරේදීද;

(ii) එම පාඨමාලාවේ ඇතුළත් කරගනු ලැබූ සිසුන් සංඛ්‍යාව වසර පිළිබඳව වෙන වෙනම හා ඒ අදාළ වන පරිදි;

(iii) මේ වන විට එම පාඨමාලාව හදාරා උපාධි ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සම සෞඛ්‍ය විශේෂඥවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය වර්ෂ 3 ක් දක්වා අඩුකිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

asked the Minister of Higher Education:

(a) Will he state -

(i) the year in which the Allied Health Specialized Degree Course was initiated in the University of Peradeniya;

(ii) separately, and in relation to each year, the number of students who got registered to follow that course; and

(iii) the number of graduates who have completed that course, at present?

(b) Will he also state -

(i) whether a decision has been taken to reduce the period of the Allied Health Specialized Degree Course to 3 years;

(ii) if so, the reasons for that?

(c) Will he inform this House the steps that have been taken to ensure quality of the above degree course?

If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු එස්.පි. දිසානායක - උයර් කල්වි අමෙච්සර්)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්ෂ 2007 දී.

(ii)

අධ්‍යයන වර්ෂය	සංඛ්‍යාව
2007/2008	119
2008/2009	118
2009/2010	141
2010/2011	151
2011/2012	190

(iii) 323කි.

(ආ) (i) සම සෞඛ්‍ය විශේෂවේදී උපාධි පාඨමාලාවේ කාලය වර්ෂ 04කි.

(ii) දේශීය හා විදේශීය වශයෙන් විශාල ඉල්ලුමක් පවතින උපාධිධාරීන් බිහි කරන සම සෞඛ්‍ය විශේෂවේදී උපාධිය සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය - GMOA - විසින් දක්වන ලද දැඩි විරෝධතා හේතුවෙන් හා ඒ පිළිබඳව එළඹී අධිකරණමය ක්‍රියා හේතුවෙන් 2009 ජූනි මස සිට සම සෞඛ්‍ය විශේෂවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාලය තුන් අවුරුදු සාමාන්‍ය උපාධිය සමඟ සිවි අවුරුදු විශේෂ උපාධිය ලෙස සැලකේ.

(ඇ) ඔව්.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ මේ සඳහා නව ගොඩනැගිල්ලක් හා රසායනාගාරයක් ඉදි කිරීම ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය, පාඨමාලාව සඳහා අවශ්‍ය නවීන උපකරණ මිලදී ගැනීමට කටයුතු කිරීම. සායනික පුහුණුව ක්‍රමවත් කිරීම හා වැඩි කිරීම, අවශ්‍ය ආචාර්යවරුන් සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කිරීම.

(ඈ) පැන නොනඟී.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

රට තුළ සහ රටින් පිටත ඉහළ වටිනාකමක් ඇති මේ උපාධියේ ගුණාත්මකභාවයට බාධා කිරීම කරන්නේ රජයේ වෛද්‍යවරුන් කියලාද ඔබතුමා කියන්නේ?

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.පි. දිසානායක)
(The Hon. S.B. Dissanayake)

ඔව්, පැහැදිලිවම. කුහකකමින් හා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඔවුන් විරුද්ධ වෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමා කියන ආකාරයට මේ උපාධිය පිළිබඳව කුහකකමින් හා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

රජයේ වෛද්‍යවරු විරුද්ධ වනවා නම්, ඉහළ වටිනාකමක් තිබෙන මේ උපාධිය ශක්තිමත්ව, වඩාත් ශක්තිමත්ව ජාත්‍යන්තරය පිළිගන්නා ආකාරයට පවත්වා ගෙන යන්න, තුනෙන් දෙකක බලයක් තිබෙන, විධායක ජනාධිපතිතුමා සිටින ශක්තිමත් රජයක් විධියට ඒ කුහක,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පරාජය කරලා ජනතා හිතවාදී මේ ආණ්ඩුව ධෛර්යවන්ත පියවරක් ගන්නේ නැත්තේ ඇයි?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ධෛර්යවන්ත පියවරක් ගත්තා. මේ අවුරුදු හතරේ විශේෂ පාඨමාලාව පමණක් පවත්වා ගැනීමට අවස්ථා ගණනාවකදීම අපි තීන්දු කළා. අපි වෛද්‍ය සංගමයේ මේ තීන්දුවට එකඟ වුණේ නැහැ. මෙය මා මේ ඇමති ධුරය භාර ගන්න කලින් වුණේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් මේ සඳහා එකඟ වුණේ නැහැ. පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව වුණේ -එදා හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් නන්ද සිල්වා මහතාගේ තීන්දුව වුණේ- නීතිපතිතුමා මැදිහත් වෙලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ වෛද්‍යවරුන්ගේ සංගමය එකඟ වන යෝජනාවක් ක්‍රියාත්මක කරන්න කියන එකයි. වෛද්‍යවරුන්ගේ සංගමය මේ පාඨමාලාව අවුරුදු තුනක එකක් කරන්න ඕනෑය කියලා දිගටම කිව්වා. අවසානයේ ඉතාම අමාරුවෙන් අවුරුදු තුනේ සාමාන්‍ය උපාධියක් සහ ඒකේ යම් කිසි වැඩි ලකුණු ප්‍රමාණයක් ගන්නා අයට අවුරුදු හතරේ විශේෂ උපාධියක් දීම පිළිබඳව එකඟත්වයකට ආවා. ඒ අධිකරණමය තීන්දුව නිසා එතැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එන්න වුණා. ඒක කැමැත්තෙන් වුණු දෙයක් නොවෙයි. ඉතාම අකමැත්තෙන් වුණු දෙයක්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශ්වවිද්‍යාල පරිපාලනය පිළිබඳව ඉතාම දැඩි විනයක් තිබෙන්න ඕනෑ, ඒ වාගේම විනය විරෝධී ලෙස හැසිරෙන අය මර්දනය කරන්න ඕනෑය කියලා ඉතාම දැඩි ස්ථාවරයක ගරු ඇමතිතුමා ඉන්නවා. එහෙම ස්ථාවරයක ඉඳලා විවිධාකාර පියවර ගැනීම්, අත් අඩංගුවට ගැනීම් සිද්ධ වෙද්දිත් විශ්වවිද්‍යාල පද්ධතිය තවමත් සාර්ථකව හා සාමකාමීව පවත්වා ගෙන යන්න බැරි වෙලා තිබෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙන අසාර්ථකත්වය නිසා කියලා ඔබතුමා පිළිගන්නවාද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ඉතාම සාර්ථකව විශ්වවිද්‍යාල කටයුතු කර ගෙන යනවා. අපි විශ්වවිද්‍යාල එක්ක බොහොම ළඟින් සම්බන්ධතා පවත්වා ගෙන යනවා. පසු ගිය දවස්වල ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අතිගරු ජනාධිපතිතුමා ගියා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ඇමතිවරයෙක් හෝ නියෝජ්‍ය ඇමතිවරයෙක් හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුවත් ඒ පැත්ත පළාතේ ගියේ නැහැ. එහෙම යන්න ගිය අයට "හූ" කියලා ගහලා එළෙව්වා. ඒ විධියට විශ්වවිද්‍යාලවලට යන්න ගිහිල්ලා ඊරියගොල්ල හොඳටම ගුටි කෑවා, ඒ.සී.එස්. හමීඩ් හොඳටම ගුටි කෑවා, ඇතුලත්මුදලි ගුටි නොකා යන්තම් බේරිලා ආවා. කිසි කථාවක් නැතිව පසු ගිය දවස්වල මම, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් එක්ක සබරගමුව විශ්වවිද්‍යාලයට ගියා. හෙට අනිද්දා අපේ ඇමතිවරු හත්, අට දෙනෙක් විවෘත කිරීම් ගණනාවකට වයඹ විශ්වවිද්‍යාලයට යනවා. දැන් මේ විශ්වවිද්‍යාලවල කටයුතු හොඳට කෙරී ගෙන යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

ගුරු අතුරු වැටුප් යෝජනාව : හිඟ වැටුප්
ஆசிரியர் இடைக்கால சம்பளத் திட்டம்: நிலுவை
INTERIM SALARY PROPOSAL OF TEACHERS : ARREARS

2982/'12

4. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවට)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அகில விராஜ் காரியவசம் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Akila Viraj Kariyawasam)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) ගුරුවරුන්ගේ වෘත්තීය ගෞරවය රැකෙන පරිදි ජීවන වියදමට සරිලන ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර නොමැති බවත්;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය එකඟ වී ඇති පරිදි අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබා දීමට තවමත් නිසි ක්‍රමවේදයක් සකස් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අතුරු වැටුප් යෝජනාව හිඟ වැටුප් සහිතව ලබා දීමට මෙතෙක් නොහැකිවීමට හේතු කවරේද;

(ii) එම අතුරු වැටුප් යෝජනාවට අනුව ගුරුවරුන්ට හිමි විය යුතු මුළු හිඟ වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) වැටුප් ගැටලුවට අමතරව ගුරු-විදුහල්පති එකමුතුව විසින් කළ අනෙකුත් ඉල්ලීම් ඉටු කර දීමට කටයුතු කරන්නේද;

(iv) ගුරුවරුන් හා විදුහල්පතිවරුන් වෙනුවෙන් ස්ථාවර වැටුප් ක්‍රමයක් සකස් කර ඔවුන්ගේ වැටුප් ගෙවීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) ஆசிரியர்களின் தொழில் கௌரவத்தை பாதுகாக்கும் விதத்தில் வாழ்க்கைச் செலவுக்கு ஏற்ப நிலையான சம்பளத் திட்டமொன்று தயாரிக்கப்படவில்லை என்பதையும்;

(ii) கல்வி அமைச்சு உடன்பட்டுள்ளவாறு, இடைக்கால சம்பளத் திட்டத்தை நிலுவைச் சம்பளத்துடன் வழங்குவதற்கான எந்தவொரு செயல்முறையும் இதுவரை தயாரிக்கப் படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே குறிப்பிட்டுள்ள இடைக்கால சம்பளத் திட்டத்தை நிலுவைச் சம்பளத்துடன் வழங்கு வதற்கு இதுவரை இயலாமற் போனமைக்கான காரணங்கள் யாவை;

(ii) மேற்படி இடைக்கால சம்பளத் திட்டத்துக்கு அமைய ஆசிரியர்களுக்கு கிடைக்க வேண்டிய மொத்த நிலுவைச் சம்பளம் யாது;

(iii) சம்பளப் பிரச்சினைக்கு மேலதிகமாக ஆசிரியர் - அதிபர் ஒன்றியத்தினால் முன்வைக்கப்பட்ட ஏனைய கோரிக்கைகளை நிறைவேற்றிக் கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

(iv) ஆசிரியர்கள் மற்றும் அதிபர்களுக்கான நிலையான சம்பளத் திட்டமொன்றைத் தயாரித்து இவர்களுக்கு சம்பளம் வழங்குவதற்கு எவ்வளவு காலம் எடுக்கும்

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) a stable salary scale which can meet the cost of living has not been formulated for teachers in order to safeguard their professional dignity; and

(ii) a proper methodology has not yet been prepared to grant the interim salary proposal with salary arrears, as agreed to by the Ministry of Education?

(b) Will he inform this House -

(i) the reason for failing to grant the aforesaid interim salary proposal with salary arrears up to now;

(ii) the total amount of salary arrears due for teachers as per the aforesaid salary proposal;

(iii) whether steps will be taken to grant the other requests made by the Teachers-Principals Association in addition to the salary problem; and

(iv) the period of time that will be taken to formulate a fixed salary scheme for teachers and principals and pay their salaries based on it?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පිළිගත නොහැක. මන්ද එය වැටුප් හා සේවක කොමිෂන් සභාවේ තීරණයකි.

(ii) අතුරු වැටුප් යෝජනාව සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී නොමැත.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අනෙකුත් ඉල්ලීම් මොනවාද යන්න සඳහන් කළ පසු පිළිතුරු ඉදිරිපත් කළ හැක.

(iv) ගුරු සේවා ව්‍යවස්ථාව අනුමත වූ පසු රා.ප.ව අංක 6/2006 (viii) මඟින් එය ඉටු වන අතර, රා.ප.ව. අංක 28/2010 අනුව ඊට අදාළ වැටුප් 2011.01.01 දිනට ගණනය කර ගෙවීමට කටයුතු කරනු ඇත.

ගුරුවරුන්ගේ හිඟ වැටුප් තීරණය වන්නේ ඔවුන්ගේ වර්තමාන වැටුප හා වැටුප් වර්ධකයේ වටිනාකම අනුවය. එක් ගුරු ශ්‍රේණියකට අයත් ගුරුවරුන් වුවද විවිධ වැටුප් පියවරයන් ලබන බැවින් ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණය ගණනය කිරීමට නම්, 2011 වර්ෂයේ සේවයේ නියුතුව සිටි ගුරුවරුන් 206,827 දෙනාගේම පුද්ගලික ලිපිගොනු එකින් එක රැගෙන ගණනය කළ යුතු වන අතර, එය කලක් ගත වන අසීරු කරුණක් බව දන්වමි.

(ඇ) අදාළ නොවේ.

විශ්‍රාම වැටුප් නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම: විස්තර
ஓய்வூதியம் பற்றிய சிபாரிசுகள் நடைமுறைப்படுத்தப்படாமை: விபரம்
NON-IMPLEMENTATION OF RECOMMENDATIONS OF PENSION : DETAILS

3283/'12

7. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු මොහමඩ් අස්ලම් මහතා වෙනුවට)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹமட் அஸ்லம் சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohamed Aslam)

ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) වර්ෂ 1967.01.05 දිනට පෙර ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ (සංස්ථාවක් ලෙස ස්ථාපනය කිරීමට පෙර) අනියම් පදනම මත සේවයේ යෙදී සිටි කේ. එල්. කරුණාසේන, එම්. ඩී. සී. පී. පෙරේරා, එල්. පී. කරුණාරත්න, ඊ. එම්. විමලසේන යන අයට විශ්‍රාම වැටුප් ලබා නොදීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමර්ශනය කිරීමෙන් අනතුරුව නිකුත් කරන ලද අංක HRC/5518/06/L-13 හා 2007.08.20 දිනැති නිර්දේශයන් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) අංක 17/2005 හා 2005.10.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත නම් සඳහන් අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

වෙකුසන ඌඩක, තකවල් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) 1967.01.05ආම් තිකතික්කු මුන්නර් ඔලිපරප්පුත් තිණෙක්කළත්තිල් (කූට්ටුත්තාපනමාක තාපික්කප්පටුවතර්කු මුන්නර්) අමෙය අටිප්පටෙයිල් සේවෙයාර්ට්රිය කේ.ඒ කරුණාසේන, එම්.ඩී.සී.පි පෙරේරා, එල්.පි. කරුණාරත්න, ඊ.එම්. විමලසේන ආකියෝරුක්කු ඔය්වූතියම් වළංක්කප්පටාමෙ තොටර්පාක, ඉලංක්කෙ මනිත උරිමෙකළ් ආණෙක්කුළුවිනාල් පුලනාය්වු සෙය්යප්පට්ටතන් පින්නර් වළංක්කප්පට්ට HRC/5518/06/L - 13ආම් ඉලක්ක 2007/8/20ආම් තිකතිය සිපාරිසුකළ් ඉතුවරෙ නටෙමුරෙප්පටුත්තප්පටවිල්ලෙ එන්පතෙ අවර් අරිවාරා?

(ආ) (i) මේර්කුරිප්පිට්ට සිපාරිසුකළ් ඉතුවරෙ නටෙමුරෙප්පටුත්තප්පටාමෙක්කාන කාරණංකළ් යාවෙයෙන්පතෙයුම්;

(ii) 17/2005ආම් ඉලක්ක, 2005/10/05ආම් තිකතිය පොතු නිර්වාකච් චුට්ටරික්කෙ තොටර්පාක කවනම් චෙලුත්ති මේලේ පෙයර් කුරිප්පිටප්පට්ටවර්කළ් තොටර්පාක තේවෙයාන නටවටික්කෙකළෙ මේර්කොළ්වාරා එන්පතෙයුම්

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Mass Media and Information:

(a) Is he aware that recommendations number HRC/5518/06/L-13 dated 20/08/2007 issued by the Human Rights Commission of Sri Lanka subsequent to an inquiry into non-payment of pensions to K.A. Karunasena, M.D.C.P. Perera, L.P. Karunaratne, E.M. Wimalasena who were employed in the Department of Broadcasting on casual basis (before being incorporated as a Corporation) before 5/1/1967 have still not been implemented?

(b) Will he inform this House -

(i) the reasons for not implementing the above mentioned recommendations; and

(ii) whether action will be taken as regards the above mentioned persons paying due attention to Public Administration Circular No. 17/2005 dated 05/10/2005?

(c) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) මෙම විශ්‍රාමිකයන් සිව්දෙනාගෙන් කේ.එල්. කරුණාසේන හා ඊ.එම්. විමලසේන යන මහතුන් දෙදෙනා විශ්‍රාම වැටුප් හිමිකම් ලබා නොදීම සම්බන්ධයෙන් අංක එච්ආර්සී/5518/6/12-13 යටතේ මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි කිරීමෙන් පසු ඔවුන් විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයට පත් කළ යුතු බව එම කොමිසම විසින් තීරණය කර ඇත. ඉතිරි විශ්‍රාමිකයින් දෙදෙනා ඉහත මානව හිමිකම් කොමිෂන් සභා අංක යටතේ පැමිණිලි කර නැත.

(ආ) (i) 1996 අංක 08 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ විශේෂ විධිවිධාන පනත යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබීම සඳහා 1967/01/05 දිනට පෙර ගුවන්විදුලි දෙපාර්තමේන්තුවේ ස්ථිර වැටුප් සහිත තනතුරක් දරා නිබිය යුතු අතර, පැමිණිලිකරුවන් දෙදෙනා එම සුදුසුකම් සපුරා නොමැත. ඒ බව 2007/09/21 දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

පොල් පර්යේෂණ ආයතනයට අයත් පොල් වතු : ලාභය/අලාභය

தெங்கு ஆராய்ச்சி நிறுவகத்திற்குரிய தென்னந் தோட்டங்கள் : இலாப நட்டம்
COCONUT ESTATES BELONGING TO COCONUT RESEARCH INSTITUTE : PROFIT/LOSS

3685/'13

9. ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු නිමල් විජේසිංහ මහතා වෙනුවට)
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு நிமல் விஜேசிங்க சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Nimal Wijesinghe)

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) පොල් පර්යේෂණ ආයතනයට අයත් පොල් වතු කවරේද;

(ii) එම එක් එක් වත්තට අදාළ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසු ගිය වර්ෂ 5 තුළ එම එක් එක් වත්තේ පොල් ඵලදාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පසු ගිය වර්ෂ 5 තුළ එක් එක් වත්තේ වියදම්, ආදායම සහ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

තෙංකු අපිවිරුත්ති, මක්කළ් තෝට්ට අපිවිරුත්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) තෙංකු ආරාය්ච්චි නිරුවකත්තිර්කු චොන්තමාන තෙන්නන් තෝට්ටංකළ් යාවෙ එන්පතෙයුම්;

(ii) මේර්පටි ඔව්වොරු තෝට්ටත්තිනුම් කාණියින් පරප්පළවු තනිත්තනියේ එව්වළවෙන්පතෙයුම්;

(iii) කටන්ත 5 වරුටංකළිල් මේර්පටි ඔව්වොරු තෝට්ටත්තිනුම් තේංකාය් විළෙච්චල් තනිත්තනියේ එව්වළවෙන්පතෙයුම්;

(iv) கடந்த 5 வருடங்களில் ஒவ்வொரு தோட்டத்தினதும் செலவினம், வருமானம் மற்றும் இலாபம் அல்லது நட்டம் தனித்தனியே எவ்வளவென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he inform this House -

(i) the coconut estates belonging to the Coconut Research Institute;

(ii) separately, the extent of land pertaining to each of the aforesaid estates;

(iii) separately, the coconut yield of each of those estates within the past five years; and

(iv) separately, the expenditure, income and profit made or loss incurred by each of those estates in the past five years?

(b) If not, why?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

- මාකඳුර
- ඛණ්ඩිරිප්පුව
- රත්මලාගාර
- වල්පිට
- පොත්තුකුලම
- මාදුරුඔය
- දුන්කන්නාව
- මීද්දෙනිය
- අඹකැලේ
- පල්ලම

(ii)

වත්තේ නම	මුළු අක්කර ගණන
මාකඳුර	130 (එකසිය තිහ)
ඛණ්ඩිරිප්පුව	365 (තුන්සිය හැට පහ)
රත්මලාගාර	264 (දෙසිය හැට හතර)
වල්පිට	44 (හතළිස් හතර)
පොත්තුකුලම	212 (දෙසිය දොළහ)
මාදුරුඔය	214 (දෙසිය දහහතර)
දුන්කන්නාව	25 (විසිපහ)
මීද්දෙනිය	75 (හැත්තෑ පහ)
අඹකැලේ	1126.81(එක්දහස් එකසිය විසි හයයි දශම අසූ එක)
පල්ලම	601 (හයසිය එකයි)

(iii)

					පොල් ගෙඩිවලිනි
වත්තේ නම	2008	2009	2010	2011	2012
ඛණ්ඩිරිප්පුව	715,483 (හත්ලක්ෂ පහළොස්දහස් හාරසිය අසූ තුන)	731,971 (හත්ලක්ෂ තිස්එක්දහස් නවසිය හැත්තෑ එක)	643,986 (හයලක්ෂ හතළිස්තුන්දහස් නවසිය අසූ හය)	573,302 (පන්ලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය දෙක)	745,665 (හත්ලක්ෂ හතළිස් පන්දහස් හයසිය හැට පහ)
රත්මලාගාර	684,181 (හයලක්ෂ අසූහතර දහස් එකසිය අසූ එක)	677,727 (හයලක්ෂ හැත්තෑ හත්දහස් හත්සිය විසි හත)	586,276 (පන්ලක්ෂ අසූහය දහස් දෙසිය හැත්තෑ හය)	580,738 (පන්ලක්ෂ අසූ දහස් හත්සිය තිස් අට)	648,327 (හයසිය හතළිස් අටදහස් තුන්සිය විසි හත)

අඹකැලේ	1,203,597 (දොළොස් ලක්ෂ තුන්දහස් පන්සිය අනූ හත)	1,472,768 (දහහතරලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය හැට අට)	1,163,000 (එකොළොස් ලක්ෂ හැටතුන් දහස)	1,091,375 (දසලක්ෂ අනූඑක්දහස් තුන්සිය හැත්තෑ පහ)	1,180,544 (එකොළොස් ලක්ෂ අසූදහස් පන්සිය හතළිස් හතර)
පොත්තුකුලම	886,865 (අටලක්ෂ අසූහයදහස් අටසිය හැට පහ)	609,092 (හයලක්ෂ නව දහස් අනූ දෙක)	674,188 (හයලක්ෂ හැත්තෑහතරදහස් එකසිය අසූ අට)	762,979 (හත්ලක්ෂ හැට දෙදහස් නවසිය හැත්තෑ නවය)	617,261 (හයලක්ෂ දහත්දහස් දෙසිය හැට එක)
වල්පිට	90,688 (අනූදහස් හයසිය අසූ අට)	75,474 (හැත්තෑපන් දහස් හාරසිය හැත්තෑ හතර)	72,436 (හැත්තෑ දෙදහස් හාරසිය තිස් හය)	76,209 (හැත්තෑ හයදහස් දෙසිය නවය)	127,245 (එක්ලක්ෂ විසිහත්දහස් දෙසිය හතළිස් පහ)
දුන්කන්නාව	25,254 (විසිපන්දහස් දෙසිය පනස් හතර)	33,491 (තිස්තුන්දහස් හාරසිය අනූ එක)	34,157 (තිස්හතර දහස් එකසිය පනස් හත)	45,591 (හතළිස්පන් දහස් පන්සිය අනූ එක)	53,983 (පනස්තුන්දහස් නවසිය අසූ තුන)
මාකඳුර	375,838 (තුන්ලක්ෂ හැත්තෑ පන්දහස් අටසිය තිස්අට)	563,038 (පන්ලක්ෂ හැටතුන්දහස් තිස්අට)	503,951 (පන්ලක්ෂ තුන්දහස් නවසිය පනස් එක)	416,615 (හාරලක්ෂ දහසයදහස් හයසිය පහළොව)	511,306 (පන්ලක්ෂ එකොළොස් දහස් තුන්සිය හය)
මාදුරුඔය	594,161 (පන්ලක්ෂ අතූහතර දහස් එකසිය හැටඑක)	621,903 (හයලක්ෂ විසිඑක් දහස් නවසිය තුන)	416,109 (හාරලක්ෂ දහසය දහස් එකසිය නවය)	592,034 (පන්ලක්ෂ අනූ දෙදහස් තිස්හතර)	697,827 (හයලක්ෂ අතූහත් දහස් අටසිය විසි හත)
පල්ලම	419,050 (හාරලක්ෂ දහනව දහස් පනහ)	519,922 (පන්ලක්ෂ දහනව දහස් නවසිය විසිදෙක)	471,026 (හාරලක්ෂ හැත්තෑ එක් දහස් විසිහය)	436,483 හාරලක්ෂ තිස්හය දහස් හාරසිය අසූ තුන)	382,095 (තුන්ලක්ෂ අසූ දෙදහස් අනූ පහ)
මීද්දෙනිය	-	-	1,910 (එක්දහස් නවසිය දහය)	7,590 (හත්දහස් පන්සිය අනූව)	23,691 (විසිතුන්දහස් හයසිය අනූ එක)

(iv)

2008			
වත්තේ නම	ආදායම (රු.මිලියන)	වියදම(රු.මිලියන)	ලාභය/අලාභය(රු.මිලියන)
ඛණ්ඩිරිප්පුව	14.15 (දහහතරයි දශම එකයි පහ)	11.51 (එකොළහයි දශම පහයි එක)	2.64 (දෙකයි දශම හයයි හතර)
පල්ලම	10.4 (දහයයි දශම හතර)	7.6 (හතයි දශම හය)	2.8 (දෙකයි දශම අට)
රත්මලාගාර	14.95 (දාහතරයි දශම නවයයි පහ)	10.48 (දහයයි දශම හතරයි අට)	4.47 (හතරයි දශම හතරයි හත)
පොත්තුකුලම	17.96 (දාහතයි දශම නවයයි හය)	8.31 (අටයි දශම තුනයි එක)	9.65 (නවයයි දශම හයයි පහ)
අඹකැලේ	31.94 (තිස් එකයි දශම නවයයි හතර)	17.41 (දාහතයි දශම හතරයි එක)	14.53 (දාහතරයි දශම පහයි තුන)
මාකඳුර	8.16 (අටයි දශම එකයි හය)	6.06 (හයයි දශම බින්දුවයි හය)	2.10 (දෙකයි දශම එක)
මාදුරුඔය	15.46 (පහළොවයි දශම හතරයි හය)	6.24 (හයයි දශම දෙකයි හතර)	9.22 (නවයයි දශම දෙකයි දෙක)
දුන්කන්නාව	1.7 (එකයි දශම හත)	1.95 (එකයි දශම නවයයි පහ)	(0.25) (බින්දුවයි දශම දෙකයි පහ)
වල්පිට	3.03 (තුනයි දශම බින්දුවයි තුන)	2.85 (දෙකයි දශම අටයි පහ)	0.18 (බින්දුවයි දශම එකයි අට)

2009			
වත්තේ නම	ආදායම(රු.මිලියන)	වියදම(රු.මිලියන)	ලාභය/අලාභය(රු.මිලියන)
ඛණ්ඩිරිප්පුව	13.01 (දහතුනයි දශම බින්දුවයි එක)	14.53 (දාහතරයි දශම පහයි තුන)	(1.52) (එකයි දශම පහයි දෙක)
පල්ලම	10.23 (දහයයි දශම දෙකයි තුන)	8.53 (අටයි දශම පහයි තුන)	1.697 (එකයි දශම හයයි නවයයි හත)
රත්මලාගාර	12.47 (දොළහයි දශම හතරයි හත)	12.68 (දොළහයි දශම හයයි අට)	(0.21) (බින්දුවයි දශම දෙකයි එක)
පොත්තුකුලම	14.97 (දාහතරයි දශම නවයයි හත)	9.97 (නවයයි දශම නවයයි හත)	5 (පහ)

අඹකැලේ	31.09 (තිස්එකයි දශම බින්දුවයි නවය)	22.85 (විසිදෙකයි දශම අටයි පහ)	8.24 (අටයි දශම දෙකයි හතර)
මාකඳුර	10.05 (දහයයි දශම බින්දුවයි පහ)	7.36 (හතයි දශම තුනයි හය)	2.69 (දෙකයි දශම හයයි නවය)
මාදුරුඔය	10.43 (දහයයි දශම හතරයි තුන)	7.88 (හතයි දශම අටයි අට)	2.55 (දෙකයි දශම පහයි පහ)
දුන්කන්නාව	2.18 (දෙකයි දශම එකයි අට)	2.5 (දෙකයි දශම පහ)	(0.32) (බින්දුවයි දශම තුනයි දෙක)
වල්පිට	1.44 (එකයි දශම හතරයි හතර)	3.19 (තුනයි දශම එකයි නවය)	(1.75) (එකයි දශම හතයි පහ)

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

2010			
වත්තේ නම	ආදායම(රු.මිලියන)	වියදම(රු.මිලියන)	ලාභය/අලාභය(රු.මිලියන)
බණ්ඩිරිප්පුව	17.59 (දාහතයි දශම පහයි නවය)	14.91 (දාහතරයි දශම නවයයි එක)	2.68 (දෙකයි දශම හයයි අට)
පල්ලම	13.13 (දහතුනයි දශම එකයි තුන)	11.67 (එකොළහයි දශම හයයි හත)	1.46 (එකයි දශම හතරයි හය)
රත්මලාගාර	13.29 (දහතුනයි දශම දෙකයි නවය)	11.99 (එකොළහයි දශම නවයයි නවය)	1.3 (එකයි දශම තුන)
පොත්තුකුලම	13.47 (දහතුනයි දශම හතරයි හත)	10.07 (දහයයි දශම බින්දුවයි හත)	3.4 (තුනයි දශම හතර)
අඹකැලේ	31.67 (තිස්එකයි දශම හයයි හත)	22.85 (විසිදෙකයි දශම අටයි පහ)	8.82 (අටයි දශම අටයි දෙක)
මාකඳුර	12.07 (දොළහයි දශම බින්දුවයි හත)	7.76 (හතයි දශම හතයි හය)	4.31 (හතරයි දශම තුනයි එක)
මාදුරුඔය	9.75 (නවයයි දශම හතයි පහ)	8.76 (අටයි දශම හතයි හය)	0.99 (බින්දුවයි දශම නවයයි නවය)
දුන්කන්නාව	1.56 (එකයි දශම පහයි හය)	2.6 (දෙකයි දශම හය)	(1.04) (එකයි දශම බින්දුවයි හතර)
වල්පිට	1.81 (එකයි දශම අටයි එක)	3.1 (තුනයි දශම එක)	(1.29) (එකයි දශම දෙකයි නවය)

2011			
වත්තේ නම	ආදායම(රු.මිලියන)	වියදම(රු.මිලියන)	ලාභය/අලාභය(රු.මිලියන)
බණ්ඩිරිප්පුව	19.20 (දහනවයයි දශම දෙක)	13.04 (දහතුනයි දශම බින්දුවයි හතර)	6.16 (හයයි දශම එකයි හය)
පල්ලම	9.72 (නවයයි දශම හතයි දෙක)	13.47 (දහතුනයි දශම හතරයි හත)	(3.75) (තුනයි දශම හතයි පහ)
රත්මලාගාර	18.6 (දහඅටයි දශම හය)	13.54 (දහතුනයි දශම පහයි හතර)	5.06 (පහයි දශම බින්දුවයි හය)
පොත්තුකුලම	21.18 (විසිඑකයි දශම එකයි අට)	10.73 (දහයයි දශම හතයි තුන)	10.45 (දහයයි දශම හතරයි පහ)
අඹකැලේ	31.56 (තිස්එකයි දශම පහයි හය)	24.44 (විසිහතරයි දශම හතරයි හතර)	7.12 (හතයි දශම එකයි දෙක)
මාකඳුර	14.78 (දාහතරයි දශම හතයි අට)	9.59 (නවයයි දශම පහයි නවය)	5.19 (පහයි දශම එකයි නවය)
මාදුරුඔය	11.45 (එකොළහයි දශම හතරයි පහ)	8.62 (අටයි දශම හයයි දෙක)	2.83 (දෙකයි දශම අටයි තුන)
දුන්කන්නාව	3.5 (තුනයි දශම පහ)	2.7 (දෙකයි දශම හත)	0.8 (බින්දුවයි දශම අට)
වල්පිට	2.91 (දෙකයි දශම නවයයි එක)	3.15 (තුනයි දශම් එකයි පහ)	(0.24) (බින්දුවයි දශම දෙකයි හතර)

2012			
වත්තේ නම	ආදායම(රු.මිලියන)	වියදම(රු.මිලියන)	ලාභය/අලාභය(රු.මිලියන)
බණ්ඩිරිප්පුව	18.05 (දහඅටයි දශම බින්දුවයි පහ)	14.03 (දාහතරයි දශම බින්දුවයි තුන)	4.02 (හතරයි දශම බින්දුවයි දෙක)
පල්ලම	14.56 (දාහතරයි දශම පහයි හය)	12.62 (දොළහයි දශම හයයි දෙක)	1.94 (එකයි දශම නවයයි හතර)
රත්මලාගාර	12.95 (දොළහයි දශම නවයයි පහ)	11.21 (එකොළහයි දශම දෙකයි එක)	1.74 (එකයි දශම හතයි හතර)
පොත්තුකුලම	13.44 (දහතුනයි දශම හතරයි හතර)	9.45 (නවයයි දශම හතරයි පහ)	3.99 (තුනයි දශම නවයයි නවය)

අඹකැලේ	28.34 (විසිඅටයි දශම තුනයි හතර)	23.72 (විසිතුනයි දශම හතයි දෙක)	4.62 (හතරයි දශම හයයි දෙක)
මාකඳුර	12.05 (දොළහයි දශම බින්දුවයි පහ)	7.8 (හතයි දශම අට)	4.25 (හතරයි දශම දෙකයි පහ)
මාදුරුඔය	17.98 (දාහතයි දශම නවයයි අට)	8.2 (අටයි දශම දෙක)	9.78 (නවයයි දශම හතයි අට)
දුන්කන්නාව	3.34 (තුනයි දශම තුනයි හතර)	3.08 (තුනයි දශම බින්දුවයි අට)	0.26 (බින්දුවයි දශම දෙකයි හය)
වල්පිට	3.65 (තුනයි දශම හයයි පහ)	2.35 (දෙකයි දශම තුනයි පහ)	1.3 (එකයි දශම තුන)

(ආ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ශෝක ප්‍රකාශය : ගරු එම්. මහරූෆ් මහතා

அனுதாபத் தீர்மானம்: மாண்புமிகு எம். மஹ்றூப்

VOTE OF CONDOLENCE : HON. M. MAHROOF

[අ.භා. 2.32]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ දිස්ත්‍රික් ජනතාව නියෝජනය කරමින් වසර ගණනාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ අභාවප්‍රාප්ත මොහමඩ් මහරූෆ් මැතිතුමා පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

කොළඹ මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ නීතිඥ කොලොන්දර් මරික්කාර් මොහමඩ් මහරූෆ් මැතිතුමාගේත්, නූර් ෂාෆිකා මහරූෆ් මහත්මියගේත් පුත්‍ර රත්නයක් ලෙස 1956 මාර්තු මස 7වැනි දින මොහමඩ් මහරූෆ් මහතා මෙලොව එළිය දුටුවේය. ෆාතිමා මාෂියා ජීස්ති හා සෙයිනාබ් සීනියා හරූන් නම් වූ වැඩිමහල් සොහොයුරියන් දෙදෙනෙක්ද එතුමාට සිටි අතර, ඔවුන් අතර දැඩි සහෝදර බැඳීමක්ද පැවතිණි.

කොළඹ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ මහරූෆ් ශිෂ්‍යයා උසස් අධ්‍යාපනය ඇක්වයිනාස් විද්‍යාලයෙන් ලබා ගත්තේය. ඉගෙනීම් කටයුතුවලදී විවිධ දක්ෂතාවන් දැක්වූ එම සිසුවා පාසලේ කැපී පෙනෙන ශිෂ්‍යයෙකු වූ අතර, තම පියාගේ අඩි පාරේ යමින් නීතිඥයකු වීමේ බලාපොරොත්තුවෙන් සිටියද, ආර්ථික අපහසුතා හේතුවෙන් එම අදහස අත්හැර දැමීමට සිදු විය.

ෂෙරීනා ෂෙයිනාබ් මහරූෆ් මහත්මිය සමඟින් යුග දිවිය ගත කළ එතුමා පාතිමා ඩීනා සහ ෂිනිනා පාතිමා නමැති දියණියන් දෙදෙනෙකුත්, මොහමඩ් අයුබ් නමැති පුත්‍රයෙකුත් මෙලොවට දායාද කළේය.

අයිසීඑම්ඒ විභාගය සමත්වීමෙන් පසු ව්‍යාපාරික කටයුතුවල නියැලුණු එතුමා පසු කාලීනව මහවැලි මැරින් සිමෙන්ති ව්‍යාපාරයේ හිමිකරුවාද විය. ජීවිතයේ තරුණ වියේ පසුවූ මහරූෆ් මහතා එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධ වෙමින් තම අනාගතය වෙනුවෙන් දේශපාලන ක්ෂේත්‍රය තෝරා ගත්තේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මැද කොළඹ නිව් බසාර් නාගරික කොට්ඨාසයට 1983 වර්ෂයේදී තරග කොට ජය ලබා කොළඹ මහ නගර සභා මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් විණි. යළි 1987 දී පැවති නගර සභා මැතිවරණයෙන් දෙවැනි වරටත් ජයගත් එතුමා 1991 දක්වා නාගරික ජනතාව වෙනුවෙන් අනුපමේය සේවාවක් සිදු කළේය. එම කාල සීමාව ඇතුළත දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ගම් උදා වැඩසටහනේ ප්‍රධාන සංවිධායකවරයකු වශයෙන් අනුරාධපුර, ඇඹිලිපිටිය, කතරගම, මහියංගනය ආදී දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි සිදු කළ සේවාව ජනතා සිත් සතන් තුළ සදාකල්හිම රැඳී පවතියි.

ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සමීපතමයෙකුවූ මහරුෆ් මහතා එතුමාගේ "ගම් උදාව" ඇතුළු විවිධ වැඩ සටහන්වලදී දක්වන ලද ක්‍රියාකාරී සහයෝගය නිසාවෙන්ම ජනතාව අතර කැපී පෙනෙන දේශපාලනඥයෙකුගේ තත්ත්වයට පත්විණි. එකී කාර්යශූරත්වය හේතුවෙන්ම තුන්වැනි වරටත් කොළඹ මහ නගර සභාවට තේරී පත් වූ එතුමා එහි නියෝජ්‍ය නගරාධිපති ධුරයේ වග කීම භාර ගනිමින් 1996 දක්වාම කටයුතු කළේය.

එම වසරේදීම මැද කොළඹ එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක වශයෙන් පත් කරනු ලැබූ මොහමඩ් මහරුෆ් මැතිතුමා 2000 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ජයග්‍රහණය අත්පත් කර ගනිමින් මෙම උත්තරීතර සභාවේ අසුන් ගැනීමේ භාග්‍ය පළමුවරට හිමි කර ගත්තේය. යළි 2001 වර්ෂයේදී පවත්වන ලද මහ මැතිවරණයෙන්ද කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්වුණු එතුමා නාගරික හා මහජන උපයෝගිතා අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දෙමින් පොදු ජන සුබසෙත උදෙසා උපරිම සේවාවක් ඉටු කළේය.

2004 වර්ෂයේ පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ද එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කළ ඒ මහතා තුන්වැනි වරට ද විශිෂ්ට ජයග්‍රහණයක් හිමි කර ගනිමින් කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම සභාවේ අසුන් ගත්තේය. තම මැතිවරණ බල ප්‍රදේශයේ පක්ෂ විපක්ෂ කාගේත් අවශ්‍යතා මැනවින් ඉටු කරමින් ඒ සෑම අවස්ථාවකදීම ක්‍රියා කළ ගරු මහරුෆ් මැතිතුමා සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස හා විදුලිය ආදි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඉමහත් සේවාවක් තම ජන්ද දායකයන් වෙනුවෙන් ඉටු කළේය. එවකට කථානායක ධුරය හෙබවූ වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාගේ නායකත්වය යටතේ එක්සත් රාජධානිය බලා ගිය පාර්ලිමේන්තු දූත කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන්ද එතුමා කටයුතු කළේය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ සටහන කෙරේ පැහැදීමට පත් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා සම්බන්ධ වෙමින් 2011 වර්ෂයේදී පැවැති කොළඹ මහ නගර සභා මැතිවරණයට එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ තරග කොට ජය ලබා ගත්තේය. නගර සභාව තුළ විපක්ෂ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ එතුමාට, මිලින්ද මොරගොඩ මහතා විපක්ෂ නායක ධුරයෙන් ඉවත් වීමෙන් පසු එම තනතුර භාර ගැනීමට සිදු විය. පාලක පක්ෂයේ සිටියද, විපක්ෂයේ සිටියද තමන්ගෙන් පොදු මහ ජනතාවට සිදු විය යුතු සේවාව කිසිදු අඩුවක් නොවන අයුරින් ඉටු කිරීමට එතුමා නිරතුරුව සැදී පැහැදී සිටි මානව හිතවාදී දේශපාලනඥයෙක් විය. නාගරික මන්ත්‍රීවරයකු වුවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වුවද, අමාත්‍යවරයකු වුව ද ඒ සෑම අවස්ථාකවකදීම එක ලෙසින් ජනතා සේවයෙහි නියැළීමට තරම් ගරු මහරුෆ් මැතිතුමා නිහතමානී විය; අවංක විය.

කොළඹ 14, අව්වාල් සාවියා දේවස්ථානයේ භාරකරු වශයෙන් ද, කොළඹ 12, මැසෙන්ජර් වීදියේ උම්මුල් සාවියා දේවස්ථානයේ කමිටු සාමාජිකයකු වශයෙන්ද ඉස්ලාම් ආගමේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉමහත් කැපවීමක් කළ එතුමා කොළඹ ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයකු වශයෙන් ද එම පාඨශාලාවේ අධ්‍යාපනය හදාරන දූ දරුවන්ගේ යහපත වෙනුවෙන් ද විශාල සහයෝගයක් ලබා දුන්නේය.

ජාති, ආගම් බේද කිසිවක් නොසලකමින්, ලොකු කුඩා කවුරුන් අතරත් එක ලෙසින් ජනප්‍රියත්වයට පත්ව සිටි ගරු මොහමඩ් මහරුෆ් මැතිතුමා හදිසියේ ඇතිවූ රෝගාබාධයක් හේතුවෙන් කිසිවකුත් බලාපොරොත්තු නොවූ මොහොතක අවුරුදු 56ක් ආයු වළඳා 2012 දෙසැම්බර් මස 03වන දින මෙලොවින් සමුගත්තේය. මහරුෆ් මැතිතුමා ඇදහූ ශුද්ධ වූ ඉස්ලාම් ආගමට අනුකූලව එතුමාට ජන්නතුල් පිර්දවුස් නම් ඉහළම ස්වර්ගය ලැබෙවායි ප්‍රාර්ථනය කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ දක්ෂ කථිකයකු වූ, කාගේත් හොඳ හිත දිනා ගැන්මට සමත්කම් දැක්වූ හිටපු කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ නාගරික හා මහජන උපයෝගිතා අමාත්‍ය ගරු මොහමඩ් මහරුෆ් මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවේ ශෝකය මෙයින් ප්‍රකාශ කරන අතර, වියෝවට පත් එතුමාගේ දයාබර භාර්යාව, දූ දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත අප සැමගේ ශෝකය දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[2.38 p.m.]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

Hon. Deputy Speaker, I got to know the Hon. Mohamed Mahroof in 1983, when he was contesting the election for the Colombo Municipal Council. His father had also been a Municipal Council Member. I remember the meeting where I met him; he came leading a large procession of supporters. The Hon. Mahroof was a part of the Colombo Central Organization of the UNP. The late President, Hon. R. Premadasa, had made it one of the best electoral organizations - if not, the best one - of the UNP in the country. He had a team of dedicated people who worked with him, both in local politics as well as the activities of his Ministry, led by the Hon. Sirisena Cooray and the others included the Hon. Mohamed Mahroof. He was involved in the *"Gam Udawa"* as well as many other political and public projects of President Premadasa.

Subsequently, he was the Deputy Mayor of Colombo in which role I had to deal with him on many occasions. Then, in 1996, I made him the Organizer for Colombo Central because he was a very active Member - even the Hon. Fowzie would agree with me - involved at grass roots level politics. Colombo Central is a good place for training in grass roots level politics: on how would you do it, how would you manage it and we used to watch who used to climb up that organization.

The Hon. Mohamed Mahroof happened to be one of those who came up and I was impressed with his work; I was impressed with his commitment to the Party and I made him the Organizer. It was for a short time just before he came to Parliament in 2001. He contested the 2001 Election and came to Parliament at the end of that year. The Hon. Mohamed Mahroof during that period, played a very important role in the Party agitation activities especially, in the City of Colombo. He had organized the crowds well. We had a *Jana Bala Meheyuma* and many other protest meetings in which the Hon. Mohamed Mahroof played a key role. I must recognize the role that he played during this eventful period of our modern history.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Subsequently, I made him the Minister of Urban Public Utilities. He kept a low profile but he knew the work. Having worked under President Premadasa when he was the Minister of Local Government and having worked with the Hon. Sirisena Cooray, he was quite aware of the functions of public utilities and he did a good job, both in regard to Colombo as well as the whole country. But, I must say that being a Member of Parliament, he paid special attention to the City of Colombo and the Colombo Central Electorate. There were very few issues that came up. He foresaw many of the problems and was able to deal with them long before it came up. I think that was one of his strengths.

Thereafter, he was in the Opposition with us. At the 2011 Municipal Council Elections, he parted company with us and went on to the UPFA and became the Leader of the Opposition.

His death was a sudden one. But, I do fondly remember the work I have done with him: how often he used to be involved, how often he used to come and meet us because he was a grass roots level organizer. He knew how to keep the grass roots going and he was quite successful in mobilizing the votes in the Colombo City itself. So, this period that he worked as Organizer from 1996 till 2011 was an eventful period and the period in which we worked together. Unfortunately, he had to part company but nevertheless, I remember the work he has done and we are grateful for it.

I wish to convey my condolences to the members of his family.

Thank you.

[2.43 p.m.]

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Bismillahir Rahmanir Raheem.

Mr. Deputy Speaker, I rise with deep sorrow to pay my tribute to the late Hon. Mohamed Mahroof, former Minister of Urban Public Utilities and a Member of this august Assembly, whose very calm and peaceful face lingers still before my eyes.

I am thankful to you, Mr. Deputy Speaker, for granting this opportunity to recall the memory of a highly pleasing personality who has been one of those rare politicians with great qualities. His services to the people of the Colombo District, particularly the people of Colombo Central, were vast and very great. Although he was many years younger to me in age, I had enjoyed his friendship as he was a politician of high eminence and a princely figure in politics.

He was held in high esteem by all political parties as he showed respect for other's views. He was one of the most honest, modest and a lovable personality who moved with men of all shades. He transcended the boundaries of race, religion, caste and creed and embraced all people alike. He was also in the forefront in social, cultural and economic activities pertaining to the people of his electorate.

As a philanthropist, he had a large heart in helping poor people who came seeking his help. He was a charitable person who was liberal in giving away from his wealth as charity. He was also an ardent religious and pious person who helped many organizations and institutions and also most temples, mosques, churches and kovils disregarding religious differences.

As a social worker with an objective vision, he was a quiet and an unassuming personality with very fine human qualities. Throughout his life, he served the people without fanfare.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

Mr. Deputy Chairman of Committees, the Hon. Mahroof, as a man who fostered fellowship among the different ethnic communities, was an ardent believer in the concept of multiculturalism and ethnic harmony. He always looked into the grievances of the people with great understanding. His approach to various issues had been unique in respect of each case. He played a silent role in building bridges between the different communities of the country. He was also a staunch democrat who was always ready to listen to many a descending view with his ears turned to the aggrieved. Compassion and human kindness were personified in him.

He began his political career as a member of the Colombo Municipal Council and had been privileged to hold the post of Deputy Mayor. At the time of his demise, he was holding the post of the Leader of the Opposition of the Municipal Council. He was extraordinarily considerate to others, giving priority to the welfare of others before him. He was particularly concerned about the educational upliftment of poor children and helped them with their needs.

The people of Colombo Central will remember him forever for his significant contribution to their welfare. Men of his calibre are very rare. He was truly a people's man who untiringly toiled for the welfare of the people.

Mr. Deputy Chairman of Committees, I join the Members of this House in paying my tribute to him and convey my deepest condolence to his family members: Mrs. Zareena Zainab Mahroof**,** his three children Fathima Deenah, Sithina Fathima, Mohamed Ayub and other members of his family.

May Allah grant him the felicity of the Heaven, "Jennathul-Firdouse"!

Thank you.

[2.49 p.m.]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Hon. Deputy Chairman of Committees, the late Hon. Mohamed Mahroof was a very strong supporter of the United National Party. I remember him because he was a very close associate of the late President J.R. Jayewardene and gave him the maximum support in his election campaigns. I am personally aware that he sacrificed quite a lot of his own wealth for the well-being of former Presidents and of the United National Party.

Subsequently, when he was appointed as the Leader of the Colombo Central on behalf of the United National Party, he served the people of the Colombo Central and sacrificed a major part of his wealth for the welfare work of the voters of the Colombo Central electorate. He was also a close associate of former President Ranasinghe Premadasa and undertook a great deal of charitable work assigned to him by President Premadasa .

In 1983, he became a Member of the Colombo Municipal Council and in 1996, became the Deputy Mayor. In 1998, he became the UNP Organizer for the Colombo Central; in 2001, a Member of Parliament and in 2002, he was not only a Member of Parliament but also a Minister in the then UNP Government.

We see that he had sacrificed the better part of his life for the cause of the people, more particularly when we consider the fact that even though he was a leading businessman with quite a lot of wealth at the time he entered into politics, towards the end he neglected his business and the wealth he had got, depleted. There were no allegations levelled against him as a politician, a Deputy Mayor, a Member of Parliament or as a Minister. He was truly a people's man who worked tirelessly for the people, whether he was in the United National Party or in the PA, subsequently having joined it.

Therefore, we are really saddened that we have lost him. It was not much of an age for a man to depart but nevertheless, the call had been there and he had to go. So, on behalf of the United National Party, let me extend my condolences to the bereaved family, his wife, children and relatives. As, when a person dies, we say in Catholicism, may he rest in peace!

Thank you.

[2.53 p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Chairman of Committees, I rise to pay my tribute to the late Hon. Mohamed Mahroof on behalf of the Sri Lanka Muslim Congress and on my personal behalf.

Sir, the Colombo City and more particularly, the Colombo Municipal Council, has virtually been the cradle from which many an illustrious Parliamentarian has been groomed. The Hon. Mohamed Mahroof was one such political leader from that long line of Municipal Councillors from Colombo, who adorned the national Parliament.

The political persona of the Hon. Mohamed Mahroof was, perhaps, not the same as that of some of the people who came to Parliament from the Colombo Municipal Council, who would have been very articulate in their oratory or whose personality could be considered as being very flamboyant. But, yet, he possessed certain qualities which are rare in men and one such quality was his philanthropy, which knew no bounds.

During this holy month of Ramazan, we, as Muslims, have to perform an obligatory function of our faith, give generously towards the underprivileged people. I am sure many people in the City of Colombo would remember the generous donations and contributions the late Hon. Mohamed Mahroof made to them and many of them had benefited from his philanthropy.

Sir, having said that, I must also say that he was a very popular and dedicated leader of the most deprived sections of Colombo, whom I would describe as those

[ගරු රවුෆ් හකීම් මහතා]

coming from the underbelly of our Capital City. I am referring to those hundreds and thousands of city dwellers who come from the so-called "gardens" or *wattas*, which should now be called as "underserved settlements" of Colombo. He had done so much to uplift the living conditions of those underprivileged people. Something that was very unique in his political career was that he not only attended to the day-to-day needs of his people but was also very keen to uplift the educational standards of those underprivileged tenement garden population. He would particularly be remembered for the help he had rendered for the upliftment of many schools within the Colombo City . As for the Muslims, I am sure they would remember the services he had rendered to a few of the oldest educational institutions in Colombo: Hameed Al-Husseiniya College, a National School, Al-Nasser Muslim School in Grandpass, Al-Hidaya Maha Vidyalaya in Sri Sangaraja Mawatha, Fathima Muslim Ladies' College in Bandaranaike Mawatha and Khairiya Muslim Girls' School. Those are a few schools that I could mention, which had benefited from the services of the late Hon. Mahroof.

As a Municipal Councillor and Deputy Mayor, he did another unique service, which should be mentioned while we pay tribute to him: upgrading the Ayurvedic dispensaries that were being run by the Municipal Council of Colombo. There, he introduced another novelty by bringing in one other indigenous medical system - the Yunani medicine - through a few Ayurveda dispensaries that were set up in Abdul Hameed Street, Prince of Wales Mawatha and perhaps many others, which I think is a unique attempt made by him.

Another important development with which he was involved together with the late President Ranasinghe Premadasa and a former Mayor of Colombo, the Hon. Sirisena Cooray, was the Nawagampura Stage 1 and Stage 2 Settlement Schemes. Those came about as a multifaceted facility to provide housing, water, sanitation and various other facilities for those underprivileged people who were settled there. What was unique in that settlement was that it was a multicultural setup with multireligious communities living within the same environment, which we see even up to date. Hindus, Christians, Buddhists and Muslims, all have got their separate places of religious worship and they live very much in harmony in a settlement of that nature.

That, we see all over Colombo. In many of these underprivileged areas, there is hardly a friction among these communities. Unfortunately, in some areas today we find that certain extremist forces are fanning the flames of tension among different communities on religious grounds but within the City of Colombo, people of the calibre of the Hon. Mohamed Mahroof did a service to all communities without discrimination whatsoever in uplifting their living standards.

Having said that, I must also mention here about his specific involvement with one of the revered sections of the Muslim faith, the Shazuliya Thareeqa in Colombo and various parts of this country where he was supposed to be an important member of that congregation. He followed the footsteps of his late father, Proctor C.M.M. Mahroof, who was a pioneer of the Shazuliya Thareeqa in Sri Lanka. He had been involved in this Movement and those who are involved in the religious functions of this Movement would very fondly remember the contributions that the Hon. Mohamed Mahroof made to the Shazuliya Thareeqa and its adherence in several parts of this country.

He was originally a member representing the Grandpass area in the Colombo Central, the New Bazaar area, which was originally nurtured by the legendary Muslim leader from Colombo who was one of those pioneers who built up the United National Party, the late Dr. M.C.M. Kaleel. That was his own ward. The New Bazaar Street - *Masangas Veediya* area was his cradle from which he entered politics and he was very much identified with President Premadasa and the former Mayor, Mr. Sirisena Cooray, and the Hon. Karu Jayasuriya who is present in the House now. As a Mayor, he worked tirelessly to uplift the living standards of the poor and downtrodden people who lived in underserved settlements of Colombo. He would be fondly and dearly remembered forever in their memory for the great services that he rendered to them.

He had built several Community Centres. There is one monument which exists in Centre Road, Barber Street junction. That is the water tank which has been named after him. It is called “Mahroof Tower” and it provides non-stop water supply to all the areas surrounding Barber Street. That was one achievement of the Hon. Mahroof which cannot be left out when you speak about him. His municipal career and Parliamentary career have earned him respect from people of all shades of opinion and he always had a very friendly and outgoing demeanour which brought us all very close to his heart. He had always been a friend of all those who associated with him; he hardly had enemies to speak of. That was one of those wonderful qualities of the Hon. Mohamed Mahroof.

In conclusion, according to Islam faith it is said in Arabic, “*Kullu Nafsin Daiqathul Mauth*” - whoever who is born has to die one day. It means that death embraces everyone. Perhaps, the Hon. Mahroof’s life had been snuffed away much earlier than it should be. From the way things happen, his demise is something very difficult for us to bear but still I must condole with his family, his children and his dear wife on behalf of my Party, the Sri Lanka Muslim Congress, and a vast number of supporters all over the Island, in paying this tribute to the Hon. Mohamed Mahroof.

Thank you very much, Mr. Deputy Chairman of Committees.

[අ.භා. 3.06]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු නියෝජ්‍ය නගරාධිපතිවරයකු හා හිටපු අමාත්‍යවරයකු වන මොහමඩ් මහරුෆ් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේ එතුමා ගැන කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මහරුෆ් මැතිතුමාගේ විශිෂ්ට ජීවිතය සම්බන්ධයෙන් අපේ මිත්‍ර රවුෆ් හකීම් ඇමතිතුමා දීර්ඝ විස්තරයක් කළා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් නායකයන් මහරුෆ් මැතිතුමා කළ අගනා සේවාව පැහැදිලි කළ නිසා ඒ කරුණු එකින් එක නැවතත් කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. මම ඒ සියලුම කරුණු අනුමත කරනවා.

මේ අවස්ථාවේදී අපට මහරුෆ් මැතිතුමා මතක් වන්නේ, නගර සභාවේ ඉන්න විටත්, පාර්ලිමේන්තුවේ ඉන්න විටත්, අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කරන විටත් මහ ජනතාවට සේවය කරන්න නිතරම කැප වුණු, මහ ජනතාව වෙනුවෙන් හඳවත උණු වුණු, කරුණාවන්ත මන්ත්‍රීවරයකු වශයෙන්.

මහරුෆ් මැතිතුමා උපන්නේ හොඳ වෙළෙඳ ව්‍යාපාරික පවුලකයි. එතුමා ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා, පියාගේ ඇවැමෙන් පසුව ව්‍යාපාරික කටයුතුවල යෙදුණා. එතුමා ජීවත් වුණේ හොඳ මුස්ලිම් මහත්මයකු වශයෙන්. එතුමා තමන්ට ලැබෙන දේ තමන්ගේ දැකින්ම දන් දෙන විධියේ කෙනෙක්. මට මතකයි, විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් අප මුණගැසෙන්න එනවා. ඔවුන් ඇවිත් කියනවා, "මහරුෆ් මහත්තයා දෙන්න ලියුමක් දෙන්න" කියලා. ඒ අයගේ දුක් කරදරවලට සහනයක් සලසා ගන්න, ගෙයක් හදා ගන්න, ලෙඩට දුකට බෙහෙත් ගන්න, මරණයකට උදවු කර ගන්න, ළමයෙක් පාසලට යවා ගන්න -ඒ විවිධ ප්‍රශ්නවලදී- මුදල් අවශ්‍ය වුණාම ඔවුන් මහරුෆ් මැතිතුමා ළඟට යනවා. අපෙනුත් ලියුමක් අරගෙන ගිහින් ඒ ලියමන එතුමාට දීලා ඔවුන් ඒ කටයුත්ත කර ගන්නවා. තමන් හමුවට පැමිණෙන ඕනෑම කෙනකුට උදවු කිරීමේ උතුම් මනුෂ්‍ය ගුණය එතුමා තුළ තිබුණා.

මහරුෆ් මැතිතුමා 1983 දී රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සමීපතමයකු වශයෙන් කටයුතු කරමින් මැද කොළඹ නිව් බසාර් නාගරික කොට්ඨාසය ජයග්‍රහණය කරලා තමයි පළමුවෙන්ම දේශපාලනයට ප්‍රවිශ්ට වුණේ. එතුමා පසුව නියෝජ්‍ය නගරාධිපති ධුරයෙන් පිදුම් ලැබුවා. මට මතකයි ඒ අවස්ථාව. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නගරාධිපතිවරයා තෝරන්නේ කොහොමද කියලා අප සාකච්ඡා කළා. පසුව අප තීරණය කළා ඒ තැනැත්තා ඡන්දයෙන් තෝරා ගන්න ඕනෑය කියලා. ඒ අනුව නාගරික මන්ත්‍රීවරු සියලු දෙනාම කැඳවලා පැවැත්වූ ඡන්දයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගෙන එතුමා නියෝජ්‍ය නගරාධිපති ධුරයට පත් වුණා.

එතුමා ඒ පදවිය දරන කොට විශාල සේවයක් කරපු ආකාරය මට මතක් වෙනවා. උදේ, දහවල්, රෑ, සෑම විටම ජනතා සේවය වෙනුවෙන් එතුමා කැප වුණා. තමන් නියෝජනය කරපු කොට්ඨාසයේ පමණක් නොවෙයි, ප්‍රදේශයේ සියලුම ජනතාව වෙනුවෙන් නියෝජ්‍ය නගරාධිපති වශයෙන් එතුමා විශිෂ්ට සේවයක් කළා. එතුමා කරපු සේවාව සම්බන්ධයෙන් ගරු රවුෆ් හකීම් මැතිතුමා දීර්ඝ විස්තරයක් කළ නිසා මා ඒ කරුණු එකින් එක නැවත සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම අඩු ආදායම් ලැබූ අය වෙනුවෙන් එතුමා කරපු ඒ උදාර සේවය හිටපු නගරාධිපතිවරයකු වශයෙන් මාද මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතුයි. මොකද, එය ඉතිහාසගත වන සේවාවක් නිසා.

2000 මහා මැතිවරණයේ දී එතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඉන්පසු 2001 මහ මැතිවරණයෙන් තේරී පත් වුණු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ රජය යටතේ නාගරික හා මහජන උපයෝගිතා අමාත්‍යාංශය එතුමාට භාර වුණා. ඊට පසුව විවිධ දේශපාලන හේතු මත 2011 දී එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයට බැඳුණා. පසුව එතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් මැතිවරණයට ඉදිරිපත් වෙලා කොළඹ නගර සභාවේ විපක්ෂ නායක ධුරයට පත්වුණා.

මොහමඩ් මහරුෆ් මහතා ඉතා සාර්ථක ව්‍යාපාරිකයෙක්. ඒ වාගේම එතුමා දක්ෂ සංවිධායකවරයෙක්. එතුමා ව්‍යාපාරිකයකු වශයෙන් මහවැලි සිමෙන්ති බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන ගියා. එයින් ලැබුණු ආදායම් සියල්ලම වාගේ එතුමා ජනතාව වෙනුවෙන් පුද කළ හැටි මට මතකයි. මා එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා වශයෙනුත්, ඒ වාගේම නියෝජ්‍ය නායකවරයා වශයෙනුත් කටයුතු කරපු සෑම අවස්ථාවකදීම දුටු දෙයක් සඳහන් කරන්න ඕනෑ. පක්ෂයේ මොකක් හරි උත්සවයක් වැනි අවස්ථාවලදීම, එහෙම නැත්නම් කොළඹ දිස්ත්‍රික්කයේ මොකක් හරි සංවිධායක කටයුත්තක් කරන්න වුවමනා හැම අවස්ථාවකදීම අපි ඒ කටයුත්ත භාර දුන්නේ මොහමඩ් මහරුෆ් මැතිතුමාටයි. එතැනින් එහාට අපට කරන්න දෙයක් ඉතිරි වෙලා තිබුණේ නැහැ. මොහමඩ් මහරුෆ් මැතිතුමාට ඒ කටයුත්ත භාර දීලා අපට තිබුණේ නියමිත වෙලාවට ඒ උත්සවයට සහභාගි වීම පමණයි. ඒ සෑම කටයුත්තක්ම මොහමඩ් මහරුෆ් මැතිතුමා භාර ගත්තා. එතුමා පක්ෂය වෙනුවෙන් විශාල මුදල් සම්භාරයක් වියදම් කළා. මේ අවස්ථාවේ දී ඒ ගැන සඳහන් කිරීම මගේ යුතුකමක් වෙනවා. සුළුපටු මුදලක් නොවෙයි, රුපියල් කෝටි ගණනක, මිලියන ගණනක මුදල් එතුමා එදා පක්ෂය වෙනුවෙන් වියදම් කළා.

1989 ත්‍රස්තවාදී අරගල පැවැති කාලයේ ජනාධිපතිවරණය වෙනුවෙන් රැස්වීමක් සංවිධානය කරමින් සිටින අතරේ දී එතුමා එදා ජීවිතක්ෂයට පත් වන තරම් අවස්ථාවකට මුහුණ දුන්නා මට මතකයි. නමුත් එතුමාගේ කුමක් හෝ වාසනාවකට ඒ අවස්ථාවේ ත්‍රස්තවාදීන් අත තිබුණු ටී.56 තුවක්කුව ක්‍රියා නොකිරීම නිසා වෙඩි තබන්න බැරි වුණා. ඊට පස්සේ බෝම්බයක් පිපිරීම නිසා එතුමාගේ පාදය තුවාල වුණා. නමුත් තවදුරටත් ජීවත් වෙන්න එතුමාට වාසනාව තිබුණා.

ඒ විතරක් නොවෙයි. මා පෞද්ගලික වශයෙන් මොහමඩ් මහරුෆ් මැතිතුමාට ගරු කරනවා. අපි විවිධ අවස්ථාවලදී විවිධ දේශපාලන මත දැරුවත් සමහර කරුණුවලට අපි එකඟ වුණා, සමහර කරුණුවලට අපි එකඟ වුණේ නැහැ. මා දේශපාලන ජීවිතයට ප්‍රවිෂ්ට වෙලා පළමුවෙන්ම කොළඹ නගරාධිපතිවරයා වශයෙන් තරග කිරීමට ඉදිරිපත් වුණු අවස්ථාවේදී මගේ මැතිවරණ ව්‍යාපාරයේ විශාල වැඩ කොටසක් මොහමඩ් මහරුෆ් මැතිතුමා කළා. මට ඒක කවදාවත් අමතක කරන්න බැහැ. එතුමා අපේ පක්ෂයෙන් ඈත් වන කොට මට කථා කළ අවස්ථාවේදී මා එතුමාට එම කාරණය මතක් කළා. එම අවස්ථාවේදී එතුමාගේ ඇස්වලින් කඳුළු ආවා. එතුමා කිව්වා, "මා කරපු උදව්ව ඔබතුමා මතක තියා ගන්න එක මට ලොකු දෙයක්" කියලා. එම මැතිවරණ

[ගරු කරු ජයසූරිය මහතා]

ව්‍යාපාරයේදී එතුමා මා වෙනුවෙන් දිවා රෑ නොබලා ක්‍රියා කළා. එම නිසා මා එම කාරණයත් මෙම අවස්ථාවේදී සඳහන් කරනවා. ඒ වාගේම මොහමඩ් මහරුෆ් මැතිතුමා හිත හොඳ, හොඳ ගති පැවතුම්වලින් හා මනුෂ්‍ය ගතිගුණවලින් පිරුණු දේශපාලනඥයකු බවත් මා මෙම අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

එතුමා ඉස්ලාම් දහමට අනුකූලව පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කළා. අවසාන වශයෙන් අප ගෙන යන්නේ කථා කළ යහපත් වචනත්, ඉටු කළ යහපත් දෙයත් පමණයි කියන කියමන මනාව ප්‍රකට කරමින්, එතුමා හිස් අතින් පැමිණ 56වන වියේදී හිස් අතින්ම මෙලොව හැර ගියා. අකල් මරණයක් සිදු නොවී තව කාලයක් ජීවත් වුණා නම් එතුමාට දේශපාලන ගමන් මහේ තව බොහෝ ඉදිරියට යන්න තිබුණා. එතුමා අහිමි වීම එතුමාගේ පවුලේ සෑමදෙනාට මෙන්ම විශේෂයෙන්ම දුප්පත් ජනතාවට විශාල පාඩුවක් වුණා.

මෙම අවස්ථාවේදී එතුමාගේ මැතිනිය, දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාටම මගේ පෞද්ගලික ශෝකයත්, එක්සත් ජාතික පක්ෂයේ ශෝකයත් පුද කරමින්, එතුමා පැතූ ස්වර්ගස්ථය ළඟා වේවා!යි කියා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[3.14 p.m.]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Allahummaghfirlahum Warhamhum - May Allah extend His pardon on him and also shower His mercy on him.

Today, I rise in this House to pay my tribute to one of the best known Parliamentarians who adorned the benches of this august Assembly. Mohamed Mahroof is a name that would remain etched in the hearts of not only the people of the Colombo Central but people in the entire country. He was the driving force in carrying forward the projects of the then Government. He always took a front seat in organizing the "Gam Udawa" project of the late President R. Premadasa. I can remember very well that he used to visit those "Gam Udawa" sites much earlier than the other officers did, along with the former Minister and Mayor of Colombo, Hon. Sirisena Cooray. He joined hands with people of the calibre of Jehan K. Cassim, who was at one time the Chairman of the Common Amenities Board and also the Chairman of the Bank of Ceylon and M. Mohinudeen Hajiar of Delmon fame.

Sir, Mohamed Mahroof was a person deeply involved in Islamic religious activities. He was a dutiful member of the Shazuliya Thareeqa in Sri Lanka. He also was an ardent supporter and benefactor of the Refai Thareeq. He frequented himself in every Mosque, particularly in Colombo, around Grandpass, Messenger Street, Kuruwe Street, Old Moor Street, New Moor Street, Barber Street and other areas.

Sir, I used to meet him at the All-Ceylon Refai Thareeqa Association Headquarters in First Mosque Lane, Colombo 12, which was earlier called "Siripina Mudukku". My thoughts go to about 30 years back. At Layards Broadway, lived Mr. A.L.M. Thassim Hajiar who was popularly known as "Thassim Baass". He was a great religious person. Dignitaries from the Androth Island in India visit this place annually. Religious personages like Pookoya Thangal, Attukoya Thangal, Nallakoya Thangal and other Thangals annually visit his house and conduct the Refai Ratheeb. Today, this Association is led by the dynamic figure His Eminence Alhaj Ashique Koya Thangal. In fact, the lane named Refai Thareeqa Lane.

The Hon. Mahroof extended not only monetary assistance but also supported its development.

Today, Sir, the people of Colombo in particular, do shed tears in the absence of Mohamed Mahroof as they are observing the holy fast in the month of Ramazan - Ramazan Kareem! This is the time one could observe the charitable disposition of the Hon. Mohamed Mahroof, who had no limits in extending his benevolence in abundance.

He did not leave out a single - what we sometimes call *muddukkus* - lane in Colombo. He helped the poor people in these areas to observe their fast and celebrate the Eid Festival. He was such a towering figure in Colombo. I should say that the poor in some of these areas shed tears when they are overcome with the thought of Mahroof.

At Awwal Zaviya Road in Grandpass, he used to have the students of the Ahadiya movement lined up to distribute uniforms, books et cetera to them. Once, he invited me also when I was the Minister of Muslim Affairs as the Chief Guest. It was a very beautiful and a serene sight to see such a large number of Muslim female children assembled there wearing the *purdah*.

"Thassim Baass" of Layards Broadway, whom I mentioned earlier, also frequently visited my uncle Mr. A.L.J. Deen who was fondly called “Deen Baass Maama” at Azhar Place, Maharagama. Incidentally, when we were rebuilding the Masjidul Azhariya Mosque in Azhar Place, Temple Road, Maharagama, he helped us by donating necessary cement for that venture.

Today, I am happy to mention in this House, that this Mosque has been renovated, upgraded and modernized by my cousin - a son of Alhaj A.L.J. Deen - Dr. Alhaj

M. Haris Z. Deen of Hertfordshire, London. He is an *Hafiz* and also an author of several books in Islam and Jurisprudence.

The Hon. Mohamed Mahroof had the sterling quality of associating himself closely with the Ulama community. He was a close friend of the All-Ceylon Jamiyyathul Ulama and helped in its revival and progress.

When I mention this Sir, it comes to my mind that a couple of days ago one of his admirers, a great scholar, Alhaj Moulavi Dr. H. Salahudeen (Bari) passed away. I know he very often visited him. Moulavi H. Salahudeen, by the way, is an author of 247 books on Islam and Jurisprudence in Tamil. He also translated many books into Sinhala for the benefit of the Sinhalese brethren in this country. And, at last, like the *Mahawansa*, Moulavi Salahudeen also produced a *Mahapotha***.** In all these ventures, we could see Mahroof always associating and extending a helpful hand. His benevolence and philanthropy never ceased until he breathed his last. He helped Colombo schools like Al-Hikma, Al-Nasser in Grandpass, Al-Iqbal in Slave Island and many other schools in which underprivileged and low income students studied.

He helped them by providing uniforms and books. He wanted to have an educated society in the Colombo District where he was a Member. Other very notable institutions were the Fathima Girls' School in Bandaranaike Mawatha, Aluthkade and also Khairiya Girls' School in Dematagoda. The Khairiya Girls' School goes down in history as the first Muslim girls' school which was started by the three ladies called, Khaleefatha, Oseelatha and Jaleelatha. They are the pioneers in the education of the Muslim females in Colombo.

All the other political and social activities of the Hon. Mahroof have been very clearly dealt by the Leader of the House, the Hon. Nimal Siripala de Silva.

He was educated at St. Benedict's College, Kotahena, where during his time he played football and took part in other sports activities. He gave a helping hand to the late Mr. V.A. Sugathadasa, a former Minister of Sports and Mayor, when the Sugathadasa Stadium was started by him. After that, he entered Aquinas University College and qualified himself in the ICMA examination.

His father, the late Mr. C.M.M. Mahroof was also an influential personality in Grandpass and Messenger Street area, sometimes called *Masangas Veediya*. He was also a Member of the Municipal Council and a well-known lawyer. Sir, Mohamed Mahroof, the son, also wanted to become a lawyer, but unfortunately that was not to be. Culanthai Marikkar Mohamed Mahroof was his father's full name.

His mother's name was Noor Shafiqa Mahroof. He had two sisters - Fathima Maziya Jisthi and Zainab Zeena Haroon. ඒ දෙදෙනා එතුමාගේ වැඩිමහල් සොහොයුරියන්. He was married to the graceful lady, Mrs. Shereena Zainab and they had three children. He had two daughters, Fathima Deenah and Sithina Fathima and also a young son, Mohamed Ayub.

He headed the Lafarge Mahaweli Marine Cement (Pvt.) Limited as mentioned earlier.

He entered the Colombo Municipal Council. He was always a formidable figure, not only a formidable candidate. In every election where the Hon. Mahroof contested, his rivals felt that they had no chance of overcoming the large number votes that would go into the ballot box of this candidate, Mohamed Mahroof. He was elected for the Colombo Municipal Council for the second time in 1987 and did his civic services to uplift the downtrodden people of the Colombo City. He was elected to the Colombo Municipal Council for the third time and became the Deputy Mayor in 1996. He was, in every sense, the most qualified person to become the first citizen of the City of Colombo, but tragically, it was not to be. When one considers the amount of funds, as the Hon. Karu Jayasuriya rightly said in this House that he gave, with no return, to his Party, the then United National Party, his philanthropic mind showed no end in helping this political party.

I remember going with him around Colombo in demonstrations organized by him. He used to be always in the forefront; thousands and thousands of party supporters and cadres in all those events were fed by the Hon. Mohamed Mahroof. That is an open secret. There had been Mr. S.H.M. Kamil, Mr. Rifai Bahaudeen, Mr. Premasiri Perera, who was a close associate of Mr. Vijaya Kumaranatunga, who worked for our great personality, the Hon. Mohamed Mahroof. Some people compare the water tank at Barber Street to his physical figure**.** It is such a massive tank.

All the people there, and particularly the Hameed Al-Husseini College benefited largely through the philanthropic mindedness of the Hon. Mohamed Mahroof.

From there, he makes a beeline to Rifai Thareeqa Mosque to meet Ashique Thangal.

Sir, the Hon. Mohamed Mahroof was the Minister of Urban Public Utilities, when I was the Minister of Muslim Affairs. Whatever occasion that arose, he always sought my assistance in the House to make his point of view heard by the Legislature and I never hesitated to help him. At last, I am sorry to say, heartbroken, he could not prolong any further with the party that he helped to resuscitate and build to be such a strong movement that he left the United National Party. He was so convinced of

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

the “Mahinda Chintana” and the dynamic personality who leads the SLFP, His Excellency President Mahinda Rajapaksa that he joined the ruling United People's Freedom Alliance in 2011. The CMC election then followed and he again won convincingly. It was under the leadership of Mr. Milinda Moragoda. After Mr. Milinda Moragoda resigned, dutifully and lawfully the Hon. Mahroof enjoyed that position.

As I told you, this is the holy month of Ramazan. During this month, we give charity and "*zakath"*. It is 2½

per cent of one's income, ordained by Islam. The Hon. Mohamed Mahroof was very helpful to the Colombo Dewatagaha Mosque, not only to the devotees who congregate there but all others too in the surrounding areas.

The Hon. Mohamed Mahroof is no more; Allah is great; He knows best!

The Hon. Mohamed Mahroof was a Member in this House for a total period of 9 years, 1 month and 8 days.

Sir, I would like to quote from the booklet, “40 - *Rabbana*” - ATHINA FIDDUNYA. It is the opening Verse of any prayer. This was incidentally - with personal nostalgia I recall - printed in memory of my own teacher at Zahira, Mr. M.S.M. Faleel, by his son M. Shahey Faleel and the family members, and was distributed to the people who attended the 40th "Kathamul Quran" of my teacher, M.S.M. Faleel. There are 40 Du'as - prayers. In conclusion, I would like to quote Du’a 37 from this booklet:

رَبَّنَا اغْفِرْ لَنَا وَلِإِخْوَانِنَا الَّذِينَ سَبَقُونَا بِالْإِيمَانِ وَلَا
تَجْعَلْ فِي قُلُوبِنَا غِلًّا لِّلَّذِينَ آمَنُوا رَبَّنَا إِنَّكَ رَءُوفٌ رَّحِيمٌ ۝

“RABBANAGHFIR LANA WA LI’IKHWANI-NAL-LADHINA SABAQUNA BIL IMANI WA LA TAJ AL FI QULUBINA GHILLAL-LIL-LADHINA AMANU RABBANA INNAKA RA’UFUR-RAHIM.

Our Lord! Forgive us and those of our brethren who preceded us in faith, and do not put any spite in our hearts towards those who believe, O our Lord! Verily You are the Most-Kind, the Ever Merciful.

- Al-Hashr 10"

That is the Quran. So, with these words, I wind up and pray for Allah *Subahana Tha'ala* in this month of Ramazan to grant his *Adiyan* - his follower, Mohamed Mahroof - the highest felicity in “Jennathul-Firdouse”.

[අ.භා. 3.36]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

අභාවප්‍රාප්ත ගරු එම්. මහරූ් මැතිතුමා පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ ඊට යමක් එකතු කරන්නට ලැබීම ගැන මා ප්‍රථමයෙන්ම සන්තෝෂ වෙනවා. කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ - අප පක්ෂය නියෝජනය කරමින්, අප රජය නියෝජනය කරමින්- අවසාන වශයෙන් කොළඹ නගර සභාවේ විපක්ෂ නායක හැටියට කටයුතු කළ, විශේෂයෙන්ම කොළඹ නගරයේ දුප්පත් පවුල්වල අඩු ආදායම් ලබන ජනතාවට විශාල සේවාවක් කළ මහරූ් මැතිතුමා අපි බොහොම ඕනෑකමින් සිහිපත් කරනවා. එතුමා බොහොම කෙටි කාලයකින් කොළඹ නගර සභාවට පැමිණිලා නාගරික ජනතාව වෙනුවෙනුත් විශේෂ සේවාවක් කළා. එතුමා නාගරික ජනතාව වෙනුවෙන් සේවය කර පසුව පාර්ලිමේන්තුව නියෝජනය කළා. යුද්ධය පැවැති කාලයේදී, මේ රටේ ඉතාම වැදගත් අවස්ථාවකදී අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය ලබා දෙමින් මේ රජයේ ස්ථාවරභාවයට සහයෝගය දැක්වූවා. ඒ වාගේම අවසාන කාලයේදී කොළඹ නගර සභාව නියෝජනය කරමින් එහි විපක්ෂ නායක හැටියට, නගර සභාව තුළ අපේ රජයේ ප්‍රධානම නියෝජිතයා බවට පත් වෙන්න එතුමාට පුළුවන් වුණා. ආමර් වීදිය ගත්තත්, මසංගස් හන්දිය ප්‍රදේශය ගත්තත්, ඒ වාගේම ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශය ගත්තත්, ජින්තුපිටිය, එහෙම නැත්නම් කොටහේන, මරදාන ප්‍රදේශ ගත්තත් එතුමා ඒ හැම තැනකම ජනතාව සමඟ ජීවත් වුණු කෙනෙක්. දෙමටගොඩ ප්‍රදේශයේ, ඒ වාගේම මාලිගාකන්ද ප්‍රදේශයේ අදටත් අපි දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙලා කටයුතු කරන කොට විශේෂයෙන්ම ඉස්ලාම් ජනතාවගේ ආගමික වතාවත් කරන මේ යුගයේ මොහමඩ් මහරූ් මැතිතුමාව බොහොම ඕනෑකමින් මතක් කරනවා. ඒකට හේතුව, එතුමා දුගී දුප්පත් ජනතාවට, ගම් මට්ටමින් ඇතුළේ තිබෙන වතුවල සිටි ජනතාවට, වතුර ටික නැතුව විදුලිය නැතුව සිටි ජනතාවට, ඉඩම් සඳහා නිවැරදි ඔප්පු තිරප්පු නැතුව අනවසරයෙන් සිටි ජනතාවට, රස්සාවල් නැතුව බොහොම අමාරුවෙන් pavement එකේ සිටි ජනතාවට, බොහොම අමාරුවෙන් එදා දවසේ ආදායම සොයා ගන්න බැරිව සිටි ජනතාවට අවංකව සේවය කරපු කෙනෙක් වීමයි.

රණසිංහ ප්‍රේමදාස මහතාගේ යුගයේ තමයි එතුමා දේශපාලනයට පැමිණෙන්නේ. ඒ නිසා තමයි එතුමාට සිරිසේන කුරේ මැතිතුමාගේ සහයෝගය ලැබුණේ. කරු ජයසූරිය මැතිතුමා කිව්වා වාගේ, එතුමා එම පක්ෂයටත් විශාල සේවාවක් කළා. ඒ යුගයේදී එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළත්, අවසාන කාලයේදී වර්තමාන රජයත් එක්ක එකතු වෙලා දේශපාලන කටයුතු කළා. දේශපාලනයේදී එතුමාගේ මතයට වඩා, එතුමා දරපු දේශපාලන ස්ථාවරයට වඩා බොහොම සරල අහිංසකකමක් මොහමඩ් මහරූ් මැතිතුමා පෙන්නුම් කළා. ඒක තමයි අපි එතුමා තුළ දුටු විශේෂත්වය. එතුමා බොහොම සරල අහිංසක මනුස්සයෙක්. හැඩි දැඩි හොඳ පෙනුමක් තිබුණත් එතුමා ඉතාම අහිංසක පුද්ගලයෙක් හැටියට තමයි අපි දැක්කේ. වැඩිපුර කථාබහ කරන්නේ නැහැ. නායකත්වයෙන් හෝ පක්ෂයෙන් තීන්දුවක් අරගෙන තමන්ට යම් කිසි කර්තව්‍යයක් හෝ වගකීමක් දුන්නොත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වුණා. කොළඹ නගරයේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් මේ ආණ්ඩුව නියෝජනය කළ, මුස්ලිම් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කළ කෙනෙක් තමයි මහරූ් මැතිතුමා. එතුමාගේ අවසාන කාලයේදී අපේ පක්ෂය සමඟ හුහක් සමීපව වැඩ කළත්, එතුමා එක්ක දේශපාලන කටයුතු කරන්න මට අවස්ථාවක් ලැබුණේ නැහැ. මොකද හේතුව, මම පළාත් සභාවේ ඉන්න කොට එතුමා පළාත් සභාවේ සිටියේ නැහැ.

මම පාර්ලිමේන්තුවට එන අවස්ථාවේත් එතුමා හිටියේ පාර්ලිමේන්තුවේ නොවෙයි. නමුත් එතුමා, අපේ පළාත්වල දේශපාලන කටයුතුවලදී නිරන්තරයෙන් මුණ ගැසුණු හොඳ මහත්මයෙක්. ඒ නිසා අපි එතුමාව සිහිපත් කරන්නේ, අප අතර සිටි හොඳ මිත්‍රයෙක්, බොහොම නිහතමානී අභිංසක මනුස්සයෙක් ලෙසටයි. එතුමා බොහොම අඩු වයසින් අප අතරින් වෙන් වුණා. මේ නගරයේ සිටින බොහොම දුප්පත්, අඩු ආදායම් තිබෙන, ආර්ථික ස්ථාවරය අඩු එහෙම නැත්නම් එදිනෙදා ජීවිතය යම්තමින් ගැට ගහගෙන ජීවත් වන අභිංසක ජනතාව, වතුකරයේ ජනතාව, ඒ වාගේම ඒ පළාත්වල බොහොම අමාරුවෙන් ජීවත් වන ජනතාවත් එතුමාව නිතර ගෞරවයෙන් මතක් කරනවා. උතුරු කොළඹ, මැද කොළඹ, බොරැල්ල, නැගෙනහිර කොළඹ, බටහිර කොළඹ කියන ආසන පහේ විශේෂයෙන්ම මුස්ලිම් ජනතාවගේ විශාල ආකර්ෂණයක් එතුමා කෙරෙහි තිබුණා. ඒ වෙනුවෙන් එතුමා නියෝජනය කළා. ඒ කළ නියෝජනය සඳහා එතුමා කැපවීමක් කළා. ඕනෑම වෙලාවක යම් කිසි පුද්ගලයෙකුට ප්‍රශ්නයක් වුණොත් එතුමා ලියුමක් දීලා ඒ අදාළ ස්ථානයට ඔවුන්ව යවනවා. මනුස්සයෙක් එතුමා හම්බ වෙන්න ආවාම කිසිම වේලාවක ඔහුව නිකම් යැව්වේ නැහැ. ඒ ප්‍රශ්නය හොයලා බලලා, ලියුමක් දුන්නා; මුණ ගැහෙන්න ඕනෑ අය වෙත යොමු කළා; අදාළ ආයතනයේ නිලධාරීන් එක්ක සාකච්ඡා කළා. හැම වේලාවෙම එතුමා උත්සාහ ගත්තා, එතුමා ළඟට ආ අයට උදව් කරන්න. එලෙස අවංකව වැඩ කළ, බොහොම නිහතමානී දේශපාලන නායකයාව අපි ගෞරවයෙන් සිහිපත් කරනවා.

බෞද්ධයන් හැටියට අපි මිය ගිය හැමෝටම පතන්නේ අජරාමර නිවනයි. නමුත් එතුමා අදහපු ආගම වන ඉස්ලාම් ආගමේ හැටියට එතුමා බලාපොරොත්තු වුණු ඒ අදාළ ස්ථානය එතුමාට ලැබේවා!

එතුමාගේ පවුලේ අයට එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ කනගාටුව ප්‍රකාශ කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම එතුමාගේ ආදරණීය පුතාට සහ දුවරුන්ට අපි ගෞරවයෙන් මතක් කරනවා, එතුමා කොළඹ දිසාවේ ගෞරවනීය විධියට ජීවත් වුණු පියතුමෙක්; ආදර්ශවත් පියතුමෙක් බව. ඕනෑම කෙනකුට ළඟට ගිහිල්ලා කථා කරන්න පුළුවන්, බොහොම සරල, නිහතමානී, අභිංසක හොඳ මනුස්සයෙකුයි අප අතරින් වෙන් වෙලා ගියේ. එතුමා, පවුලේ අයටත් ගෞරවනීය විධියට ජීවත් වෙන්න පුළුවන් පසුබිමක් හදපු පියතුමෙක්.

අපේ කොළඹ දිසාවේ නාගරික මන්ත්‍රීවරුන් වෙනුවෙනුත්, විපක්ෂයේ සිටියත් ඒ නාගරික මන්ත්‍රීවරුන් දහසය දෙනාගේ නායකයා වෙනුවෙනුත්, ඒ වාගේම කොළඹ ආසන පහ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙනුත්, පළාත් සභා මන්ත්‍රීවරුන් වෙනුවෙනුත්, විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ එදා මෙදා තුර අප පක්ෂය නියෝජනය කළ මැති ඇමතිවරුන් වෙනුවෙනුත් එතුමාගේ අභාවය පිළිබඳ අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

[ප.ප. 3.43]

ගරු හුනෙයිස් ෆාරූක් මහතා
(මාණ්පුමිකු ෆූනෙස් පාරූක්)
(The Hon. Hunais Farook)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

කෞරව කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, ඉන්‍රෙය තිනම් අල්හාජ් මොහමට් මහ්රූෆ් අවර්කළුටෙය මරෙවෙයොට්ටිය අනුතාපප් පිරේරණෙයින්මීතු උරෙයාට්රක් කිටෙත්තුළ්ළමෙක්කු මුතලිල් ඉරෙවනුක්කු නන්රි තෙරිවිත්තුක්කොළ්කින්රේන්. මුන්නාළ් අමෙච්චරාකවුම් *වපාත්* ආකුම්පොළුතු කොළුම්පු මානකර සපෙයින් එතිර්ක්කට්චිත් තලෙවරාකවුම් ඉරුන්ත අන්පුක්කුම් පෙරුමතිප්පුක්කුමුරිය අල්හාජ් මොහමට් මහ්රූෆ් අවර්කළුක්කු *ජෙන්නත්තුල් පිර්තෙළස්* එනුම් සුවන පාක්කියම් කිටෙක්ක වේන්ටුමෙන ඉන්තප් පුනිත රමළාන් මාතත්තිල් නාන් ඉරෙවනිටම් පිරාර්ත්තනෙ සෙය්කින්රේන්.

උණ්මෙයිල් *වපාත්* ආන චකෝතරර් මහ්රූෆ් අවර්කළ් පාක්කියම් පෙට්රවර් එන්රේ චොල්ලවේණ්ටුම්. ඒනෙනිල්, නපි සල්ලල්ලාහූ අලෙහි වසල්ලම් අවර්කළුටෙය කාලත්තිල් ඉස්ලාත්තෙ නිලෙනාට්ටුවතර්කු මුතලාවතාකත් තොටුක්කප්පට්ට *පත්ර්* යුත්තත්තිල් සහාපාක්කළ් ෂහීතාක්කප්පට්ටාර්කළ්. අන්ත *පත්ර්* යුත්තම් නටෙපෙට්රතු ඉන්රෙය තිනත්තිලාකුම්. අතාවතු රමළාන් මාතම් 17ආවතු පිරෙ වෙළ්ළික්කිළමෙ නාළිල් *පත්ර්* යුත්තම් නටෙපෙට්රතු. වළමෙයාක ඔව්වොරු වරුටමුම් රමළාන් මාතම් වන්තු චෙල්කින්රතු. ආනාල්, මක්කා වෙට්රිකොළ්ළප්පට්ට පත්තාවතු තිනමාකිය රමළාන් මාතත්තින් 17 ආවතු පිරෙ වෙළ්ළික්කිළමෙයාක අමෙන්තුළ්ළ ඉන්රෙය නාළුම් චකෝතරර් මොහමට් මහ්රූෆ් අවර්කළුක්කු අනුතාපම් තෙරිවික්කුම් නාළාක අමෙන්තුළ්ළතු. ඉන්සා අල්ලාහ්! ඉතිලිරුන්තු ඉරෙවන් අවරුක්කු සුවර්ක්කත්තෙක් කොටුප්පතර්කු නාටියුළ්ළාන් එන්පතෙ එන්තවිත සන්තේකමුම් ඉන්රි අනුමානික්කලාම්. අවර් ඔරු පාක්කියචාලි!

මේලුම්, වන්නි මාවට්ටප් පාරාළුමන්ර උරුප්පිනිරාන නාන් අවරුටෙය අනුතාපප් පිරේරණෙයින්මීතු අන්ත වන්නි මාවට්ට මුස්ලිම් මක්කළින් චාර්පිල් උරෙයාට්රුවතර්කුච් චන්තර්ප්පම් කිටෙත්තතෙයිට්ටුප් පෙරුමිතමටෙකින්රේන්. වවුනියා, මුල්ලෙත්තීවු, මන්නාර් මාවට්ටංකළෙ උළ්ළටක්කිය එමතු පිරතේචංකළ් මිකවුම් කෂ්ටප්පට්ට පිරතේචංකළාකුම්. එනතු පළ්ළිප්පරුව චිරු පරාය කාලත්තිල් එමතු පිරතේචත්තිලේ පළ්ළිවාචල් ඔන්රෙක් කට්ටුවතායින් අප්පිරතේචත්තිලුළ්ළ ඌර් මක්කළාල් මට්ටුම් අන්තප් පළ්ළිවාචලෙ මුට්රුමුමුතාතක් කට්ටි මුටික්ක මුටියාත නිලෙයිල් අවර්කළ් අතර්කාක කොළුම්පුප් පිරතේචත්තිලුළ්ළ වර්ත්තකර්කළින් උතවියෙ නාටි වරුවතු වළක්කම් එන්පතුම්, අතර්කාක අන්ත මක්කළ් පට්ටියල් තයාරික්කුම්පොළුතු වළක්කමාක චකෝතරර් මොහමට් මහ්රූෆ් අවර්කළුටෙය පෙයරෙ මුතලාවතාකප් පෝටුවතුම් එනක්කු ඥාපකමිරුක්කිරතු. පළ්ළිවාචලෙක් කට්ටුවතර්කාක අල්ලතු ඔරු පොතු වේලෙත්තිට්ටත්තුක්කාක අවරිතම් චෙල්ලුම්පොළුතු කුරෙන්තපට්චම් ඔරු චීමෙන්තුප් පෙක්කර්රෙයාවතු අවර් තර්මම් චෙය්තිරුක්කින්රාර්. අන්ත වකෙයිල් වන්නි මාවට්ට මුස්ලිම් මක්කළාකිය නාන්කළ් ඉන්තච් චන්තර්ප්පත්තිල් අවරුක්කාකප් පිරාර්ත්තනෙ චෙය්යවේණ්ටියතු අවචියමානතාකුම්.

අතේපෝන්රු චකෝතරර් මහ්රූෆ් අවර්කළ් මර්රෙයවර්කළුක්කු ඔර් එටුත්තුක්කාට්ටාන අරචියල් තලෙවරාක ඉරුන්තු ඉව්වුලකෙ විට්ටුච් චෙන්රිරුක්කිරාර්. කොළුම්පු මාවට්ටත්තිල් කුරිප්පාක චිරුපාන්මෙ ඉනත්තෙච් චේර්න්ත ඔරුවර් මානකර සපෙ උරුප්පිනිරාකවෝ අන්රි පාරාළුමන්ර උරුප්පිනිරාකවෝ තෙරිවුචෙය්යප්පටුවතායින් තනියාක අවරුටෙය ඉනත්තවර්කළ් මාත්තිරම් වාක්කළිත්තු අන්ත අങ්කත්තුවත්තෙප් පෙර මුටියාතු. චකෝතරර් මොහමට් මහ්රූෆ් අවර්කළුටෙය අරචියල් වාළ්විල් අවර් මූන්රු තටෙවෙකළුක්කු මේල් මානකර සපෙ උරුප්පිනිරාකවුම් ඉරණ්ටු තටෙවෙකළ් පාරාළුමන්ර උරුප්පිනිරාකවුම් මක්කළාල් තෙරිවුචෙය්යප්පට්ටිරුක්කින්රාර්. එනවේ, ඉව්වාරු

[ගරු ඉනෙයිස් ෆාරුක් මහතා]

சிறுபான்மை இனத்தைச் சேர்ந்த ஒருவர் மாநகர சபைக்கும் பாராளுமன்றத்துக்கும் உறுப்பினராகத் தெரிவுசெய்யப் பட்டதிலிருந்து அவர் கொழும்பு மாவட்டத்திலே இன, மத, மொழி பேதங்களுக்கப்பால் ஆற்றிய சேவையின்மூலமாக ஏனைய இன மக்களையும் கவர்ந்திருக்கிறார் என்பது புலனாகின்றது. அவருக்கு தமிழ் மக்கள் வாக்களித்திருக் கின்றார்கள்; சிங்கள மக்கள் வாக்களித்திருக்கின்றார்கள்; முஸ்லிம் மக்கள் வாக்களித்திருக்கின்றார்கள். அதாவது, பௌத்த, இந்து, கிறிஸ்தவ, இஸ்லாம் மதத்தைச் சேர்ந்தவர்கள் வாக்களித்திருக்கின்றார்கள். இதன் காரணமாகத்தான் அவர் ஒரு மாநகர சபை உறுப்பினராக, பிரதி மேயராக, பாராளுமன்ற உறுப்பினராகத் தனது பதவிகளைத் தக்கவைத்துக்கொண்டார்.

கடந்தகால வரலாற்றில் பல இஸ்லாம் மதத்தைச் சேர்ந்த அரசியல் தலைவர்கள் பள்ளிவாசல்கள் கட்டுவதற்கு மட்டுமன்றி கோவில்கள் கட்டுவதற்கும் கிறிஸ்தவ தேவாலயங்கள் கட்டுவதற்கும் பன்சலைகளைக் கட்டுவதற்கும் நிதி உதவி வழங்கியிருக்கின்றார்கள். அதேபோன்று, இந்து மதத்தைச் சேர்ந்தவர்கள் முஸ்லிம் பள்ளிவாசல்கள் கட்டுவதற்கும் பன்சலைகளைக் கட்டுவதற்கும் கிறிஸ்தவ தேவாலயங்கள் கட்டுவதற்கும் உதவி செய்திருக்கின்றார்கள். இவ்வாறு ஏனைய மதஸ்தலங்களைக் கட்டுவதற்கு உதவிசெய்யும் தலைவர்களாகத்தான் அன்றைய அரசியல் தலைவர்கள் இருந்தார்கள். மஹியங்கனையில் இருக்கின்ற சமாதியைக் - "Samadhi Statue" கட்டுவதற்கு முஸ்லிம்கள் உதவி செய்திருக்கின்றார்கள். இங்கே என்னிடம் ஒரு பட்டியல் இருக்கின்றது. இந்தப் பட்டியலின்படி, Maliban Textiles Garment, AMS Motors, Fahir Tyre Works, Bibila Tradings, Central Trading Company and Mr. Sulaiman உரிமையாளர்கள் பௌத்த பன்சலை கட்டுவதற்கு உதவி செய்திருக்கின்றார்கள். ஆனால், இன்றுள்ள தலைவர்களின் நிலையைப் பார்த்தால், அதற்கு முற்றுமுழுதாக மாற்றமாக இருக்கின்றது. தங்களது இனம் வளர வேண்டும்; தாங்கள் பின்பற்றுகின்ற மதமும் மொழியும்தான் வளர வேண்டும்; ஏனையவற்றை வளரவிடாது அழிக்கவேண்டும் என்ற சிந்தனைகளோடு செயற்படுகின்றவர்களையே நாங்கள் இன்று பார்க்கக்கூடியதாக இருக்கின்றது.

இன்று நான் இந்த இடத்தில் ஒரு விடயத்தைச் சொல்லவேண்டும். அதுவும் பல்லின மக்களின் மனங்களைக் கவர்ந்த ஒரு தலைவருக்கு அஞ்சலி செலுத்துகின்ற இந்த நாளில் அதை ஞாபகமூட்ட விரும்புகின்றேன். கடந்த 18ஆம் திகதி மஹியங்கனையில் ஓர் அரசியல்வாதி - ஆளும் கட்சியைச் சேர்ந்த ஓர் அமைச்சர் - அங்கு கடந்த 22 வருடங்களாக ஜும்ஆ தொழுகை நடைபெற்றுவந்த பள்ளிவாசலை மூடுமாறு உத்தரவிட்ட ஒரு சம்பவம் நடைபெற்றிருக்கின்றது. சில இனவாதிகளினால் இளைஞர்கள் தூண்டப்பட்டு, இஸ்லாம் மதத்தில் முஸ்லிம்களினால் எந்த மிருகம் வெறுக்கப்படுகின்றதோ - அல்குர்-ஆன், ஹதீஸில் எது அருவருக்கத்தக்கதெனக் கூறப்படுகின்றதோ - அந்த மிருகத்தின் உடற் பாகங்களை புனித ரமழான் மாதம் என்றுகூடப் பார்க்காமல் பள்ளிவாசலுக்குள் வீசியிருக்கின்றார்கள். இந்தப் புனித ரமழான் மாதத்தில் முஸ்லிம்கள் இரவு பகல் பாராது பள்ளிவாசல்களுக்குச் சென்று மார்க்கக் கடமைகளை - இபாதத்துகளை - அதிகமாகச் செய்யக்கூடிய, தங்களுடைய பிரார்த்தனைகளைக் கேட்கக்கூடிய இடம்தான் மஸ்ஜித். இவ்வாறானதொரு மஸ்ஜிதுக்குள்தான் இந்த வெறியாட்டம் நடத்தப் பட்டிருக்கின்றது. இதற்குப் பின்னணியில் ஓர் அரசியல் தலைமை இருக்கின்றது என்றால், அல்லது இனவாதிகள் இருக்கின்றார்கள் என்றால், இவர்களுக்குரிய தண்டனையை எல்லாம் வல்ல அல்லாஹுத்தஆலா வழங்க வேண்டுமென்று இந்தப் புனித ரமழான் மாதத்தில் நான் நோன்பு நோற்றவனாக இச்சபையிலிருந்துகொண்டு பிரார்த்திக்கின்றேன். இதற்கான தண்டனையை வழங்குவதற்குத் தகுதி பெற்ற ஒரே ஒருவன், அனைவரையும் படைத்த ஏக இறைவனைத் தவிர வேறுயாருமில்லை. இதுதொடர்பில் உரிய விசாரணைகள் நடத்தப்படாவிட்டால் அல்லது இதற்குரிய தண்டனை கொடுக்கப்படாவிட்டால் அல்லது இவ்வாறான இன மோதல்களை ஏற்படுத்துவதற்கு எதிரான நடவடிக்கைகள் முன்னெடுக்கப்படாவிட்டால், இதற்குப் பின்னணியில் இருக்கின்ற அத்தனை பேருக்கும் தண்டனையை வழங்க வேண்டுமென்று நான் இறைவனிடம் பிரார்த்திக்கின்றேன்.

தமிழீழ விடுதலைப் புலிகளுக்கு என்ன நடந்தது? முஸ்லிம்களை வடக்கிலிருந்து விரட்டினார்கள்; அங்கு முஸ்லிம்கள் தொழுத பள்ளிவாசல்களை அடித்து, நொருக்கித் தரைமட்டமாக்கினார்கள். இறுதியாக போர்வை ஜும்ஆ பள்ளிவாசலில் மீலாதுன் நபி விழா ஆரம்பித்த நேரத்தில் அவர்கள் தாக்குதல் நடத்தினார்கள். அதுதான் அவர்களின் கடைசித் தாக்குதல். அந்தப் பள்ளிவாசல்மீது கைவைத்தது, முஸ்லிம்களை வடக்கில் இருந்து வெளியேற்றியது, அங்கு முஸ்லிம் பள்ளிவாசல்களை மூடி ஐவேளை *'பாங்கு'* ஓசை ஒலிப்பதை நிறுத்தியது போன்ற செயல்களால் முழு உலகையும் ஆட்டிக்கொண்டிருந்த விடுதலைப் புலிகளின் அழிவு ஆரம்பமாகியது. விடுதலைப் புலிகளுக்கு இறைவன் தண்டனை கொடுத்து அவர்களை இருந்த இடமில்லாமல் அழித்தான். இன்று இலங்கையில் முஸ்லிம்களுக்கு எதிராகவும் முஸ்லிம்களின் பள்ளிவாசல்களுக்கு எதிராகவும் *ஷரீஆ* வுக்கு எதிராகவும் தாக்குதல் நடத்துதல், திட்டம் தீட்டுதல் போன்றவற்றில் ஈடுபடுபவர்களுக்கும் அதே நிலைமைதான் ஏற்படும். பள்ளிவாசல்களுக்கு எதிராக நடத்தப்படுகின்ற தாக்குதல்கள் இலங்கையில் மாத்திரமல்ல உலகத்தில் வாழ்கின்ற அத்தனை முஸ்லிம்களுக்கும் கவலையை ஏற்படுத்துகின்ற ஒரு விடயம் ஆகும். எனவே, இந்தப் புனித ரமழான் மாதத்தில், சகோதரர் மஹ்றூப் அவர்களை ஞாபகப்படுத்துகின்ற இந்தத் தினத்தில் நான் அனைத்து முஸ்லிம் மக்களையும் பார்த்து ஒரு வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன். அதாவது இந்தச் சதிகள் இடம்பெறாத வண்ணம் இந்தப் புனித ரமழான் மாதத்தில் ஐவேளை தொழுகையின்போது பிரார்த்தனை செய்ய வேண்டும். நோன்பு துறக்கின்ற வேளையில் கேட்கப்படுகின்ற *துஆ*க்கள் அதேபோன்று *'தஹஜ்ஜுத்'* தொழுகையில் கேட்கப்படுகின்ற *துஆ*க்கள் அங்கீகரிக்கப்படுவதாக இஸ்லாம் கூறுகின்றது. அதேநேரம் பாதிக்கப்பட்ட ஒருவர் அல்லது அநியாயத்துக்குள்ளான ஒருவர், அது முஸ்லிமாக இருக்கலாம் அல்லது வேறு எந்த ஓர் இனத்தைச் சேர்ந்தவராகவும் இருக்கலாம், அவர்களுக்கு நியாயம் வழங்கும்பொருட்டு அவர்களின் *துஆ*வை அங்கீகரிப்பதாகவும் அல்லாஹுத்தஆலா வாக்குறுதி அளித்திருக்கின்றான். இன்று நாங்கள் அநியாயத்தைத் தட்டிக் கேட்க முடியாத, அதற்கு எதிராக நடவடிக்கை எடுக்க முடியாத ஒரு சமூகமாக இருக்கின்றோம். எனவே, இந்தப் புனித ரமழான் மாதத்தில் இறைவன் காட்டித் தந்த, நபி (ஸல்) அவர்கள் காட்டித் தந்த அந்த வழியின் பிரகாரம் முஸ்லிம்கள் அனைவரும் ஒட்டுமொத்தமாக பிரார்த்தனை புரிய வேண்டும். இறைவன் இந்த அநியாயங்களைச் செய்பவர்களுக்கு மிக விரைவில் தண்டனை கொடுக்க வேண்டும்; அவற்றில்

சம்பந்தப்பட்டவர்களை எங்களுக்கும் இந்த உலகுக்கு வெளிக்காட்ட வேண்டும் என்று துஆ கேட்க வேண்டும். அத்துடன், எமது அரசியல் வழிகாட்டியாக இருந்த சகோதரர் மஹ்றூப் அவர்களை ஞாபகப்படுத்துகின்ற இந்த நாளில் நாங்கள் அவருக்குச் சுவர்க்கம் வேண்டிப் பிரார்த்திக்க வேண்டும் என்றும் நான் இந்த உயரிய சபையில் கேட்டுக்கொள்கின்றேன்.

சகோதரர் மஹ்றூப் அவர்களின் குடும்பத்தவர்கள் இன்று இந்தச் சபையின் பார்வையாளர் 'கலரி'யில் சமுகமளித்திருக்கின்றார்கள். அன்னாரின் பிரிவால் துயருறுகின்ற அவர்களுக்கும் அதேபோன்று அவருடைய நண்பர்கள், உறவினர்கள் மற்றும் கொழும்பு மாவட்ட வாக்காளர்கள் அனைவருக்கும் நான் இந்த நேரத்தில் எனது சார்பிலும் வன்னி மாவட்ட மக்கள் சார்பாகவும் எமது அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சி சார்பாகவும் அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்தப் புனித ரமழான் மாதத்தில் இன்று *"பத்ர் சஹாபா"*க்களுடைய ஞாபகார்த்த தினம் ஆகும். அதே தினத்தில் சகோதரர் மஹ்றூப் அவர்களையும் நாங்கள் இங்கு ஞாபகப்படுத்துகின்றோம். இறுதியாக, சகோதரர் மஹ்றூப் அவர்களுக்கு *"ஜென்னத்துல் பிர்தௌஸ்"* எனும் மேலான சுவர்க்கம் கிடைக்க வல்ல நாயன் அல்லாஹ்வுத்தஆலாவிடம் பிரார்த்தித்து விடைபெறுகின்றேன். நன்றி, வஸ்ஸலாம்.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I wish to associate myself with the sentiments expressed by both sides of Parliament on the death of the Hon. Mohamed Mahroof, ex-Member of Parliament.

I shall direct the Secretary-General of Parliament to send a copy of the Official Report, Hansard, to the Members of the bereaved family.

The next Vote of Condolence is on the Hon. K.Y.M. Wijeratna Banda, ex-Member of Parliament.

ශෝක ප්‍රකාශය :
කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මහතා
அனுதாபத் தீர்மானம் :
மாண்புமிகு கே.வை.எம். விஜேரத்ன பண்டா
VOTE OF CONDOLENCE :
HON. K.Y.M.WIJERATNA BANDA

[අ.භා. 3.58]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සොරණාතොට මැතිවරණ කොට්ඨාසයේ ජනතාව නියෝජනය කරමින් පර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස වසර ගණනාවක් තිස්සේ මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ අභාවප්‍රාප්ත කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මැතිතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මෙම ගරු සභාව වෙත මම ඉදිරිපත් කරන්නෙමි.

1927 අගෝස්තු මස 30 වැනි දින බදුල්ල, මුත්තෙට්ටුවේගමදී උපත ලද කොටුගොඩැල්ලේ යාපා මුදියන්සේලාගේ විජේරත්න බණ්ඩා මැතිතුමාගේ දයාබර පියාණන් වූයේ සොරණාතොට විවාහ, උප්පැන්න හා මරණ ලේකම් වශයෙන් හා සොරණාතොට කෝරළයේ කෝරාළේ තනතුර දැරූ කේ.වයි. එම්. පුංචි බණ්ඩා මැතිතුමායි. දයාබර මෑණියන් වූයේ රත්නායක මුදියන්සේලාගේ මද්දුම කුමාරිහාමි මැතිනියයි.

බදුල්ල සොරණාතොට විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලද විජේරත්න බණ්ඩා මහතා ඉන් අනතුරුව කයිලගොඩ ශ්‍රී සද්ධර්මානන්ද මහ පිරිවෙණට ඇතුළත්ව වැඩිදුර අධ්‍යාපනය ලබා ගත්තේය. කෘෂිකාර්මික කටයුතුවල මෙන්ම ව්‍යාපාරික කටයුතුවල යෙදෙමින් සිය ජීවන ගමන ඉදිරිය කරා ගෙන ගිය එතුමා, එච්.එම්. බණ්ඩාර මැණිකේ මෙනෙවිය සමඟින් විවාහ ජීවිතයට ඇතුළත්ව රටට දැයට වැඩදායී දූ දරුවන් හත් දෙනෙකු මෙලොවට දායාද කළේය. එතුමාගේ සෙවනැල්ල බඳුව සිටි එම මැතිනිය මේ වන විට මෙලොවින් වියෝවී ඇත.

ඔවුන් දෙපළගේ උගත් දූ දරුවන් වූ තිමිර විජේබණ්ඩාර යාපා බදුල්ල ලංකා බැංකුවේද, මංගල පී.බී. යාපා කොළඹ නැව් තටාකාංගනයේ ද, විපුල බණ්ඩාර යාපා කොළඹ විශ්ව විද්‍යාලයේ ද, අමිතා මල්කාන්ති කුමාරි යාපා උඹව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද සේවයේ නියැලී සිටින අතර, වසන්තා කුමාරි වැවල ආරච්චි සිංගප්පූරුවේ ද, උදේනි චන්ද්‍රලතා කුමාරි යාපා ඇමෙරිකා එක්සත් ජනපදයේ ද, ජගත් චන්දන බණ්ඩාර යාපා ඔස්ට්‍රේලියාවේද විවිධ රැකියාවල නිරතව සිටියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා සම්බන්ධවෙමින් දේශපාලන කටයුතුවල නියැලුණු විජේරත්න බණ්ඩා මහතා ප්‍රදේශවාසීන් අතර ඉක්මනින්ම ජනාදරයට පත් චරිතක් වූ හෙයින් ම සොරණාතොට ගම්කාර්ය සභා නියෝජිතයකු ලෙස තේරී පත්වීමේ වරම් ලැබීය. එම ගම් සභාවේ සභාපති තනතුර පවා දැරීමේ වාසනාව හිමි කර ගත් එතුමා 1960 මාර්තු මාසයේ පැවැති මහ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරගකොට අලුතින් ඇති කරන ලද සොරණාතොට මැතිවරණ කොට්ඨාසයේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් පාර්ලිමේන්තුව වෙත පළමුවරට පා නැගුවේය.

යළි 1965 වසරේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ද සුවිශේෂී ජයග්‍රහණයක් අත්පත් කර ගනිමින් දෙ වැනි වරටත් මෙම උත්තරීතර සභාව වෙත පැමිණි විජේරත්න බණ්ඩා එම අවස්ථාවේදී විපක්ෂ මන්ත්‍රීවරයෙකුගෙන් විය යුතු කාර්ය භාර නොපිරිහෙළා ඉටු කළේය.

ජනතාව සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර දීම සඳහා නිරතුරුව කටයුතු කළ එතුමා 1970 දී පැවති මහ මැතිවරණයෙන් ජයග්‍රහණය ලබා ගනිමින් තුන් වන වරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් විණි. ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා පාසල් ගොඩනැඟිලි ඉදි කරවා දෙමින්ද, ගුරු අවශ්‍යතාවන් සපුරා දෙමින්ද ජනතාවට ඉමහත් සේවාවක් සලසා දුන් එතුමා ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය හා ගමනාගමනය නංවාලීම සඳහාත්, මහා මාර්ග වැඩිදියුණු කිරීම සඳහාත් අනුපමේය මෙහෙවරක් ඉටු කළ බව නොරහසකි. පොදු ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

දෙමින් ඔවුන් හා සමීපව සිටි එතුමාට 1973 වසරේදී බදුල්ල දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරියේ සභාපති තනතුරද බාර ගැනීමට සිදු වූ අතර එමඟින් වඩාත් පුළුල් සේවාවක් සැපයීමට හැකියාව ලැබිණ.

1977 වසර දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් උදාර කාර්ය භාරයක නියැලුණු එතුමාණන් බදුල්ල මහ රෝහලේ රෝහල් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහජන විමසුම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද, දුන්හිඳ වත්ත එක්සත් අන්‍යොන්‍යාධාර සමිතිය හා බදුල්ල අසරණ සරණ සමිතියේ ගරු අනුශාසක වශයෙන්ද විවිධ තනතුරු උසුලමින් සිදු කළ සමාජ මෙහෙවර සුළු පටු නොවේ.

ආගමික වශයෙන්ද විජේරත්න බණ්ඩා මහතා පුළුල් මෙහෙවරක නියැලුණු අතර ප්‍රදේශයේ සෑම විහාරස්ථානයකම අභිවෘද්ධිය වෙනුවෙන් නිරතුරුව කටයුතු කළේ මහා සංඝරත්නයේ අවවාද, අනුශාසනා හිස්මුදුනින් පිළිගනිමිනි. ආගමානුකූල ජීවිතයක් ගත කළ විජේරත්න බණ්ඩා නම් වූ යුග පුරුෂයා වසර 86ක් ආයු වළඳා මෙම වසරේ පෙබරවාරි මස 4 වැනි දින බදුල්ල, සොරණාතොට ප්‍රදේශවාසීන්ටත්, පවුලේ ඥාතීන්ටත් වේදනාවක් ගෙන දෙමින් මෙලොවින් සමු ගත්තේ ය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්සභා නියෝජිතයකු ලෙස දේශපාලන ක්ෂේත්‍රයට පිවිස, ගම්සභා සභාපතිවරයකු හා මහජන මන්ත්‍රීවරයකු වශයෙන් අමිල සේවාවක නියැලුණු, කෘතහස්ත දේශපාලනඥයකු වූ අභාවප්‍රාප්ත කොටුගොඩැල්ලේ යාපා මුදියන්සේලාගේ විජේරත්න බණ්ඩා මැතිතුමාණන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර දූ පුතුන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස ඉල්ලා සිටිමි.

[අ.භා. 4.04]

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින මේ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ විජේරත්න බණ්ඩා මැතිතුමාගේ අභාවය පිළිබඳවයි. මට පෙර කථා කළ සභානායකතුමා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ දිවංගත විජේරත්න බණ්ඩා මැතිතුමා ගැන දීර්ඝ විස්තරයක් කළා. එතුමාගේ දේශපාලන ජීවිතය ගැනත්, සමාජ සේවය ගැනත් එහිදී කථා කරන්නට යෙදුණා. මමත් එතුමා ගැන විස්තර ටිකක් සොයා බැලුවා. මා පාර්ලිමේන්තුවට එන්නට ප්‍රථමයෙන් තමයි එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරලා ඒ යුගයේ මහා මෙහෙවරක් කර තිබෙන්නේ. සොරණාතොට ගම්කාර්ය සභාවෙන් තමයි එතුමාගේ දේශපාලන ජීවිතය ආරම්භ කර තිබෙන්නේ. පොදු මහජනතාවගේ ගම් මට්ටමේ නියෝජිතයෙක් හැටියට තමයි එතුමා දේශපාලන ජීවිතය ආරම්භ කර තිබෙන්නේ. ඉන් අනතුරුව එහි සභාපති පදවියට පත් වීමට පවා එතුමාට හැකියාව ලැබී තිබෙනවා. ඉන් අනතුරු, එතුමා පාර්ලිමේන්තු මහ මැතිවරණයට මුහුණ දීලා ජය ලබාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට අවුරුදු 12ක වාර්තාවක් හොබවා තිබෙනවා. අපට දැනගන්න ලැබී තිබෙනවා, ඒ කාල සීමාව තුළ එතුමාගෙන් ඒ ප්‍රදේශයට, ඒ දිස්ත්‍රික්කයට මහත් සේවයක් ඉටු වුණු බව. ඒ නිසා කුමන පක්ෂයක හිටියත් -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියත්, එක්සත් ජාතික පක්ෂයේ හිටියත්- මහජන නියෝජිතයකු හැටියට එතුමා කළ මෙහෙවර, සේවය අප අගය කළ යුතු වෙනවා. ඒක තමයි පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය. විපක්ෂ නායකතුමාට අද දින හදිසියේ පාර්ලිමේන්තුවෙන් බැහැරව යාමට සිදුවුණු නිසා දිවංගත කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මැතිතුමාගේ අභාවය පිළිබඳව එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂය වෙනුවෙන් අපේ කනගාටුව මේ අවස්ථාවේදී මෙහි පැමිණ සිටින එතුමාගේ භාර්යාව, දූ දරුවන් ආදී සියලු දෙනා වෙත පිළිගන්වමින් එතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. A.P. Jagath Pushpakumara. Before he starts, will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I propose that the Hon. Janaka Bandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, කථා කරන්න.

[අ.භා. 4.07]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උෂව වෙල්ලස්ස කියන්නේ, 1818 කැරැල්ල අවස්ථාවේ විදේශ ආක්‍රමණිකයන්ට විරුද්ධව සටන් පවත්වාගෙන ගොස් ජය ලැබූ ප්‍රදේශයයි. ඒ උත්තරීතර ප්‍රදේශයේ එවකට ඉහළ උෂව, සොරණාතොට මැතිවරණ කොට්ඨාසයේ ජනතාව නියෝජනය කරමින් දේශපාලනයට පැමිණ සුවිශාල සේවාවක් ඉටු කර, අප අතරින් වෙන් වූ ගරු කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගෙන එන මේ අවස්ථාවේදී, උෂව පළාතේම පහළ උෂව නියෝජනය කරමින් ශෝකය පළ කරන්නට මට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජේරත්න බණ්ඩා මැතිතුමා 1960 වර්ෂයේ මාර්තු මාසයේ පැවැති මහ මැතිවරණයෙන් සොරණාතොට මැතිවරණ කොට්ඨාසය ජයග්‍රහණය කළත්, එදා පත් වුණු ආණ්ඩුව බොහොම කෙටි කාලයක් තුළ වෙනස් වීමෙන් අනතුරුව, එතුමාටත් මන්ත්‍රී ධුරය අහිමි වුණා. නමුත් 1965 වර්ෂයේ පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කර 1977 වර්ෂය දක්වා අඛණ්ඩව මේ උත්තරීතර සභාව නියෝජනය කරන්න දිවංගත ගරු විජේරත්න බණ්ඩා මැතිතුමාට හැකියාව ලැබුණා පමණක් නොවෙයි, එදා ලෝකයේ ශ්‍රේෂ්ඨතම පළමුවැනි කාන්තා අගමැතිතුමිය හැටියට පත් වුණු දිවංගත සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ බදුල්ල දිසා පාලන අධිකාරියේ සභාපති තනතුරේ කටයුතු කරන්නත් හැකියාව ලැබුණු බව සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට මැතිවරණ කොට්ඨාසයේ එදා පැවැති සොරණාතොට ගම් කාර්ය සභාවේ නියෝජිතයකු හැටියටත් එතුමා තේරී පත් වුණා. පරම්පරාවෙන් දේශපාලනයට ආපු අයකුට වඩා ගමින් බිහි වුණු නායකයකු හැටියටයි අපි එතුමාව දකින්නේ. ගමේ ගම් කාර්ය සභාවේ නියෝජිතයකු හැටියට පත් වෙලා ඇවිල්ලා අනතුරුව අවුරුදු 12කට අධික කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට සේවය කරන්න එතුමාට අවස්ථාව ලැබුණා. ඒ කාලයේ කෙනකුට එක දිගට අවුරුදු 12ක් වාගේ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ලේසියෙන් අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ ගම්වල අවුරුදු පහෙන් පහට රැල්ලට වාගේ මන්ත්‍රී ධුර වෙනස් වන යුගයක් තිබුණේ. එවන් අවස්ථාවක අඛණ්ඩව එවැනි නියෝජනයක් කරන්න එතුමාට හැකියාව ලැබුණේ එතුමා තුළ පැවැති නිහතමානී ගුණයත්, ජනතාව ඒකරාශී කරගෙන ජනතාවගේ සිත් දිනා ගැනීමට තිබුණු සුවිශේෂී හැකියාවත් නිසා බව විශේෂයෙන් මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ උත්තරීතර සභාව නියෝජනය කරන කාලයේ ඒ වැඩ කටයුතු කරන ගමන් එතුමා තමන්ගේ දරුවන්ට හොඳට ඉගැන්නුවා. විශේෂයෙන් මේ ක්ෂේත්‍රයේ කටයුතු කරන කොට පවුලේ උදවිය අමතක වෙනවා. නමුත් එතුමා දරුවන් ගැන කල්පනා කරලා ඒ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම තුළ ඒ අය උගත් දරුවන් හැටියට අද සමාජයට සේවය කරනවා. ඒ අනුව, තිමිර විජේබණ්ඩාර යාපා මැතිතුමා බදුල්ල ලංකා බැංකුවේ සේවය කරනවා. මංගල පී.බී. යාපා මැතිතුමා කොළඹ නැව් තටාකාංගනයේ සේවය කරනවා. ඒ වාගේම විපුල බණ්ඩාර යාපා මැතිතුමා කොළඹ විශ්වවිද්‍යාලයේත්, අමිතා මල්කාන්ති කුමාරි යාපා මැතිනිය ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේත් සේවයේ යෙදී සිටිනවා. ඒ වාගේම වසන්තා කුමාරි වෑවල ආරච්චි මැතිනිය සිංගප්පූරුවේත්, උදේනි චන්ද්‍රලතා කුමාරි යාපා මැතිනිය ඇමෙරිකා එක්සත් ජනපදයේත්, ජගත් චන්දන බණ්ඩා යාපා මහතා ඕස්ට්‍රේලියාවේත් රැකියාවල නිරතව සිටිනවා.

රටට උගතුන් බිහි කළා පමණක් නොවෙයි, දේශා දේශාන්තරවල යවා හොඳ උගත් බුද්ධිමත් දරුවන් පිරිසක් මේ සමාජයට බිහි කරන්න කටයුතු කළ ශ්‍රේෂ්ඨ නායකයෙක් හැටියට සඳහන් කරන්න ඕනෑ. වර්තමානයේ සොරණාතොට මැතිවරණ කොට්ඨාසය නැති වුණත් එදා බදුල්ල, හාලි ඇළ ප්‍රදේශ සම්බන්ධ කරගෙන ඒ ප්‍රදේශයේ තිබුණු දුෂ්කර තත්ත්වය නැති කරන්න, අධ්‍යාපන කටයුතු නංවාලීමට අධ්‍යාපනය සඳහා සුවිශාල සේවාවක් ඉටු කළා. ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කරන්න සුවිශාල සේවාවක් ඉටු කළා. ප්‍රවාහන පහසුකම් ලබා දෙන්න, මහා මාර්ග පද්ධති වැඩිදියුණු කරන්න අනුපමේය සේවාවක් ඉටු කළ ශ්‍රේෂ්ඨ නායකයෙක් හැටියට විශේෂයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. එදා එක් එක් දිස්ත්‍රික්කයක් පාසා දිසා පාලන නැත්නම් දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ තනතුරු පත් කරන විට විවිධ දේශපාලන නායකත්වයන් අතරින් බදුල්ල දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ සභාපති තනතුරට විජේරත්න බණ්ඩා මන්ත්‍රීතුමා පත් කළේ අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තුළ එතුමා කෙරෙහි තිබුණු අනුපමේය විශ්වාසය නිසා කියන එක විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. ඒ වාගේම රෝහල් කමිටුවල, විවිධ ස්වේච්ඡා සංවිධානවල නායකත්වය දරමින්, අනුශාසනා දෙමින් කළ මෙහෙය අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ආගමික වශයෙන් පුළුල් මෙහෙවරක් ඉටු කළ නායකයෙක් හැටියට මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ විහාරස්ථානවල ගෞරවනීය මහා සංඝරත්නයේ අවවාද අනුශාසනා ලබමින් කටයුතු කළ විජේරත්න බණ්ඩා මැතිතුමා මේ අවුරුද්දේ අප අතරින් වෙන් වුණත් එතුමාගේ සේවාව අපට අමතක කරන්න බැහැ. ඒ වෙනුවෙන් පහළ ඌව නියෝජනය කරන, මොණරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන, වෙල්ලස්ස නියෝජනය කරන කෙනෙක් හැටියට ඉහළ ඌවට විශාල සේවාවක් ඉටු කළ විජේරත්න මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපේ පාර්ලිමේන්තුවේ -මේ උත්තරීතර සභාවේ- ශෝකය පළ කරන ගමන් එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරන්න වෙල්ලස්සේ ආදරණීය ජනතාව වෙනුවෙන් මෙය අවස්ථාව කර ගනිමින්, ඒ පවුලේ සියලු දෙනාට වෙල්ලස්සේ ජනතාව වෙනුවෙන් ශෝකය පළ කරන ගමන් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් හමාර කරනවා.

[අ.භා. 4.14]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මැතිතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. දිවංගත මන්ත්‍රීතුමාගේ කීර්තිමත් චරිතාපදානය බොහොම විස්තරාත්මකව සභානායකතුමා විසිනුත් ඒ වාගේම ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා විසින් පැහැදිලි කර දුන් නිසා කරුණු එකින් එක ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අපි විජේරත්න බණ්ඩා මැතිතුමා ගැන කථා කරන විට සිහි වන්නේ මහජන නියෝජිතයෙක්. එතුමා පාර්ලිමේන්තුවේ සිටින විට මා නොසිටියත් එතුමා කළ සේවාව සම්බන්ධවත්, මහජන නියෝජිතයෙක් වශයෙන් එතුමා ජීවිතය ආරම්භ කළ ආකාරය සම්බන්ධවත් සියලු විස්තර අපි හොඳින් දන්නවා. එතුමා හොඳ වැදගත් පවුලක උපත ලැබුවා. එතුමා ගම් සභාවෙන් දේශපාලනය ආරම්භ කළා. ඊට පසු ඉතා කෙටි කාලයක් තුළ ගම් සභාවේ සභාපති ධුරයට එතුමා පත් වුණා. ඒ තුළින්ම පෙනෙනවා, තමන්ගේ ප්‍රදේශයේ ජනතාවගේ ආදරයට කොතරම් ලක් වුණාද කියා. 1960 මාර්තු මාසයේ මහා මැතිවරණයෙන් සොරණාතොට මැතිවරණ කොට්ඨාසයට ඉදිරිපත් වෙලා 1960දී එතුමාට පත් වෙන්න බැරි වුණත් එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන රජයක් පිහිටුවන්න හැකි වුණා.

එතුමා ආසනය තුළ මෙන්න මේ ආකාරයේ සේවාවන් ඉටු කළා. පළමුව ගම්සභා මන්ත්‍රීවයෙක්, ගම් සභාපතිවරයෙක් වුණා. පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු 12ක් පාර්ලිමේන්තු සැසි වාර තුනක එතුමා සේවය කළා. ඒක ඉතා දීර්ඝ සේවාවක්. එවන් අඛණ්ඩ කාලයක් එතුමාට දිනා ගන්න හැකි වුණේ තමන්ගේ ප්‍රදේශයේ ජනතාව සමඟ ඉතාම කිට්ටුව ජීවත් වුණු පුද්ගලයෙක් වූ නිසයි.

[ගරු කරු ජයසූරිය මහතා]

එතුමා ජනතාවට ආදරය කළා; ජනතාව එතුමාට ආදරය කළා. ඒ වාගේම ගමේ පරිසරය තුළ මිනිසුන්ගේ ලෙඩට දුකට, මහුලට මරණයට වාගේ සෑම දෙයටම සහභාගි වෙලා ජනතාව සමඟ ජීවත්වීම නිසා මේ විධියට අඛණ්ඩව වැඩ කටයුතු කරන්නට එතුමාට හැකි වුණා.

එතුමා හොඳ මහජන නියෝජිතයෙකු වාගේම, හොඳ පවුල් ජීවිතයක් ගත කළ කෙනෙක්. හොඳ දු පුතුන් හත් දෙනෙකු මෙළොවට දායාද කළා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව විස්තර කළා. ඒ දරුවන් මේ රටෙත් විදේශවලත් විවිධ ක්ෂේත්‍රවල සිටිනවා. එතුමා ආඩම්බර වන්නට පුළුවන් හොඳ පවුල් ජීවිතයක් ගත කළා වාගේම හොඳ දු දරුවන් බිහි කළා. ඒ අය අද මේ සමාජයට සේවය කරනවා. ඒ වාගේම එතුමා වැවිලිකරුවෙක් වශයෙනුත්, ධාර්මික ව්‍යාපාරිකයෙකු වශයෙනුත් කටයුතු කළා. එතුමා අභාවයට පත් වන විට අවුරුදු 86ක් වුණත්, එතුමා ජීවත් වුණු කාලය තුළ කළ සෑම ක්‍රියාවක්ම ධාර්මිකව, සාධාරණව කළ කෙනෙක්, දේශපාලන බලය තිබුණත් නැතත්. එතුමා කුහක දේශපාලනයක් කළේ නැහැ; පළිගත්තේ නැහැ. එතුමා හැකි සෑම විටම ජනතාවට සේවයක් කළ පරමාදර්ශී දේශපාලනඥයෙකු වශයෙන් මට මේ අවස්ථාවේදී සඳහන් කරන්නට පුළුවන්. මෙවැනි දේශපාලනඥයින්ට ගෞරව කිරීම අපේ යුතුකමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී නැඟී සිටියේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් සහ මගේ පෞද්ගලික ශෝකය විජේරත්න මැතිතුමාගේ ආදරණීය දු පුතුන්, මුණුපුරු මිණිපිරියන් ඇතුළු පවුලේ සියලුම ඥාතීන්ට පුද කරන්නටයි. ඒ වාගේම මම ප්‍රාර්ථනා කරනවා එතුමාට අජරාමර නිවන් සුව ලැබේවා කියා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.18]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උඹ වෙල්ලස්ස ගමෙන් බිහි වුණු නායකයෙක් වුණු විජේරත්න බණ්ඩා මැතිතුමා අවසන් ගමන් ගිහින් ශෝක ප්‍රකාශ ඉදිරිපත් කරන වෙලාවේ උඹ වෙල්ලස්සේ පුද්ගලයෙක් විධියට ඒ ශෝකය බෙදා ගන්නට; එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන්නට මම අදහස් කරනවා. එතුමා ඉඩම් හිමි වැවිලිකරුවෙක් විධියට ජීවිතය ගත කරලා ගම් සභාවෙන් දේශපාලනයට පිවිසිලා තිබෙනවා. අපි දන්නවා, 40 දශකය 50 දශකය වන විට මේ පාර්ලිමේන්තුවට ආපු වැඩි දෙනා එදා ගම් සභාවෙන් දේශපාලනයට පිවිසිලා, ගම් සභාවෙන් පන්නරය ලබලා තමයි දේශපාලනයට ඇවිත් තිබෙන්නේ කියලා. අපි දන්නවා, විජේරත්න බණ්ඩා මැතිතුමා ගමේ පුද්ගලයෙක්, උඹ වෙල්ලස්සේ පුද්ගලයෙක්. නමුත් ඒ වකවානුව වන විට හුඟක් වෙලාවට බදුල්ල දිස්ත්‍රික්කය සහ මොනරාගල දිස්ත්‍රික්කය වෙනුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළේ වෙනත් පළාත්වලින් ඇවිල්ලා ඡන්දය ඉල්ලලා, වෙනත් පළාත්වල උදව්ය තමයි ඒ ප්‍රදේශ වෙනුවෙන් පාර්ලිමේන්තුවට ආවේ. ඒ යුගයේ ඒ ක්‍රමය වෙනස් කරන්නට විජේරත්න බණ්ඩා මැතිතුමා වෙල්ලස්සේ පුත්‍රයෙක් විධියට විශාල කාර්ය භාරයක් කරලා තිබෙනවා. එතුමා හතර සැරයක් ඡන්දය ඉල්ලලා එක සැරයක් පමණයි පරාජය වෙලා තිබෙන්නේ. 1965 - 1977 වෙනකම් සොරණාතොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට එතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, 1973 වසරේ බදුල්ල දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ සභාපතිවරයා විධියටත් බදුල්ල දිස්ත්‍රික්කයට මහ විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. ඒ යුගය වන විට උඹව පළාත, වෙල්ලස්ස පළාත හැම අතින්ම නොදියුණු ප්‍රදේශ වුණා. විදුලිය නැහැ; මං මාවත් නැහැ; අධ්‍යාපනයක් නැහැ. එවැනි යුගයක තමයි විජේරත්න බණ්ඩා මැතිතුමා මන්ත්‍රීවරයෙක් විධියට සේවය කරලා තිබෙන්නේ. එතුමා මන්ත්‍රීවරයෙක් විධියට සේවය කරලා, දේශපාලනයෙන් විශ්‍රාම ගිහින් නොබෝ දා අභාවප්‍රාප්ත වුණා. පුෂ්පකුමාර ඇමතිතුමා කිව්වා එතුමාගේ පවුලේ දු දරුවෝ විශාල තනතුරු හොබවමින් අද වෙල්ලස්ස ප්‍රදේශයට, උඹවට උදවු කරන්නට, සේවය කරන්නට කටයුතු කරනවා කියලා. එහෙම නම් උඹේ පුත්‍රයෙක් විධියට විජේරත්න බණ්ඩා මැතිතුමා කළ සේවය නැවත වරක් ගෞරවයෙන් සිහිපත් කරනවා. මම, විජේරත්න බණ්ඩා මැතිනියටත්, පවුලේ දු දරුවන්ටත්, ඥාතීන්ටත් එක්සත් ජාතික පක්ෂයේත්, අපේත් කනගාටුව ප්‍රකාශ කරමින් විජේරත්න බණ්ඩා මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.21]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ ගරු සභාව ප්‍රභාවත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු තමයි කොටුගොඩැල්ලේ යාපා මුදියන්සේලාගේ විජේරත්න බණ්ඩා මැතිතුමා. මෙතුමා දුප්පත් ජනතාව අතරයි වාසය කළේ; දුප්පත් ජනතාව වෙනුවෙනුයි සේවය කළේ. එතුමා සොරණාතොට කෝරළයේ කෝරාලේ තනතුර දැරූ කේ.වයි.එම්. පුංචි බණ්ඩා මැතිතුමාගේ සහ රත්නායක මුදියන්සේලාගේ මද්දුම කුමාරිහාමි මැතිනිය යන දෙපළගේ පුත්‍ර රත්නයයි. බදුල්ල, සොරණාතොට විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ විජේරත්න බණ්ඩා මහතා ඉන් අනතුරුව කයිලගොඩ ශ්‍රී සද්ධර්මානන්ද මහ පිරිවෙනට ඇතුළත්ව වැඩිදුර අධ්‍යාපනය ලැබුවා. එතුමාගේ ආදරණීය බිරිඳ තමයි එච්.එම්. බණ්ඩාර මැණිකේ මැතිනිය. එම දෙපළට දරුවන් හත් දෙනෙකු හිටියා. ඒ අය දැන් උසස් තානාන්තර දරමින් රටට ආදර්ශවත් පුද්ගලයන් වශයෙන් රාජ්‍ය සේවයේ යෙදී සිටිනවා. එය දිවංගත විජේරත්න බණ්ඩා මැතිතුමාගේ නාමයට ගරු කිරීමක් වෙනවා.

1960 දී තමයි ප්‍රථම වරට එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. එවකට තිබුණු සොරණාතොට ආසනය මා හිතන හැටියට දැන් ලග්ගල හා අනිකුත් ප්‍රදේශ ආවරණය කරන ආසනයක් වෙනවා. එතුමා ඊට පසුව 1965 දී පැවති මහ මැතිවරණයේදී විශාල ජයග්‍රහණයක් ලැබුවා. එතුමා පාඨශාලා, ආගමික සිද්ධස්ථාන, ඒ පළාතේ සෞඛ්‍ය සේවය, මහා මාර්ග ආදී විවිධ ක්ෂේත්‍රවල නියැළී කටයුතු කළා. විශේෂයෙන්ම ගොවි කම්කරු ජනතාව වෙනුවෙන් මහඟු සේවයක් කළ බව අප මේ අවස්ථාවේදී මතක් කර සිටිනවා.

එපමණක් නොවෙයි, අපේ ගරු පුෂ්පකුමාර ඇමතිතුමා ප්‍රකාශ කළා මෙන් සොරණාතොට එතිහාසික ප්‍රදේශයක්. 1818 කැරැල්ල ගැන අප මතක් කරන විට කැප්පෙටිපොල මහ දිසාව වැනි වීරෝදාර පුරුෂයින් උපන් බිමෙන් තමයි මෙතුමාත් මෙලොව එළිය දැක්කේ. ප්‍රථමයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයෙනුත්, පසුව බදුල්ල දිස්ත්‍රික්කයෙනුත් දේශපාලනයට පැමිණි එතුමා

අවුරුදු නිහක් වැනි දීර්ඝ කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සහ ඇමතිවරයකු වශයෙන් මේ රටට සේවය කර තිබෙනවා. රටේ ගෞරවනීය ආයතනයක් වන පාර්ලිමේන්තුවේ සභානායක තනතුර දරන අපේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ආභාසයත් එතුමාට ලැබුණා. සමහර විට විජේරත්න බණ්ඩා මැතිතුමාගෙන් දේශපාලන විඥානය ලබා ගන්නට නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාටත් පුළුවන්කම ලැබුණා. බදුල්ල මහ රෝහල් කමිටුවේ සාමාජිකයෙකු වශයෙනුත් එතුමා සේවය කර තිබෙනවා. සෞඛ්‍ය තත්ත්වය නහාලීම පිණිසත්, සෞඛ්‍ය තත්ත්වය ඉතාමත්ම උසස් ස්ථානයකට ගෙන ඒමටත් අපේ සභානායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට හැකි වීම එක අතකින් විජේරත්න බණ්ඩා මැතිතුමා ආරම්භ කළ එම වැඩ පිළිවෙළ මල්පල ගැන්වීමක් වුණාට කිසිම සැකයක් නැහැ.

විජේරත්න බණ්ඩා මැතිතුමා ජීවත් වුණු අය ගැන පමණක් නොවෙයි, දිවංගත වුණු අය පිළිබඳවත් තමන්ගේ අවධානය යොමු කළා. එතුමා අන්‍යෝන්‍යාධාර සමිතිවල සභාපති ධුරයත් දැරුවා. ගම්සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් ආරම්භ කළ එතුමාගේ පෘථුල සේවය, දේශපාලන බුද්ධිය ඒ ආසනයේ අයට පමණක් නොවෙයි, සමහර විට පාර්ලිමේන්තුවේ අනිකුත් මන්ත්‍රීවරුන්ටත් ආභාසයක් වුණා; උදාහරණයක් හැටියට ගන්නට පුළුවන් වුණා. අවුරුදු 86ක දීර්ඝ කාලයක් ආයු වළඳා එතුමා අවසන් හුස්ම හෙළුවා.

1960 මාර්තු මාසයේදී පැවැති මහා මැතිවරණයෙන් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට පැමිණි විජේරත්න බණ්ඩා මැතිතුමාට මාසයක් පමණයි පාර්ලිමේන්තුවේ ඉන්න සිදු වූයේ. මොකද, නැවත ජූලි මාසයේ මහා මැතිවරණයක් පැවැතුණා. 1965 දී පැවැති මහා මැතිවරණයෙන් නැවත පාර්ලිමේන්තුවට පත් වූ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් අවුරුදු පහක් ඉතාමත් අද්විතීය සේවයක් තමන් නියෝජනය කළ පළාතේ ජනතාවටත්, අනෙකුත් ප්‍රදේශවල ජනතාවටත් ඉටු කළා.

1970 මැතිවරණයෙන් පසුව අවුරුදු 1යි මාස 11ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමේ භාග්‍ය එතුමාට ලැබුණු අතර, 1972 මැයි 20වැනිදා සිට 1977 මැයි 18 වැනිදා දක්වා අවුරුදු 4යි මාස 11ක් එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් සේවය කර තිබෙනවා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ අවුරුදු 10කට වඩා සේවය කළ අද්විතීය ශ්‍රේෂ්ඨ ජනතා පුත්‍රයකු හා නායකයෙකු වශයෙන් අපට විජේරත්න බණ්ඩා මහතාව හඳුන්වන්න පුළුවන්. එතුමාගේ පූර්ණ කාලීන පාර්ලිමේන්තු සේවය අවුරුදු 12කුත් මාස 1ක් වුණා. එතුමා කළ ඒ සේවයෙන් ප්‍රතිලාභ ලබා ගත් ජනතාව වෙනුවෙනුත් අපි එතුමාට මේ අවස්ථාවේදී ශෝකය පළ කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභිවෘද්ධිය තකා, දියුණුව තකා කටයුතු කළ එතුමා සොරණාතොට මැතිවරණ කොට්ඨාසයේ පමණක් නොවෙයි, බදුල්ල දිස්ත්‍රික්කයේම උන්නතිය තකා වැඩ කළ, පක්ෂයට හිතවත්ම සාමාජිකයකු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී තව එක කාරණයක් මතක් කරන්නට ඕනෑ. ලග්ගල ආසනය භාරව ඉන්න අපේ හිතවත් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මැතිතුමා අපට දැනුම් දුන්නා, එතුමාට අද පාර්ලිමේන්තුවට එන්නට පුළුවන්කමක් නොමැති බැවින් ගරු විජේරත්න බණ්ඩා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ශෝකයත් පළ කරන්න කියලා. ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මැතිතුමාගේ ශෝකයත් මා මේ අවස්ථාවේ පළ කරමින්, ගරු විජේරත්න බණ්ඩා මැතිතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.28]

ගරු ජේ.ආර්.ජී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා පාර්ලිමේන්තුවට ගමෙන් පැමිණි මන්ත්‍රීවරයකු විධියට විතරක් නොවෙයි, 1818 කැරැල්ලේදී බ්‍රිතාන්‍ය හමුදාව විසින් විනාශ කරන ලද උඹව පළාතේ පුනර්ජීවනයට පළමුවැනි පියවර ගත්තා වූ මන්ත්‍රීතුමා හැටියටයි මා විජේරත්න බණ්ඩා මන්ත්‍රීතුමා ගැන අද වචන කීපයක් කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා සිහියමෙන් මකා දමා තිබුණු ප්‍රදේශයක් තමයි උඹව පළාත. ඒ පළාත විනාශ කරන්න හේතුව මෙකයි. මහනුවර රාජධානියේ බත් පාත්‍රය හැටියට සැලකුවේ උඹව පළාතයි. උඹව පළාත සිංහල රජ්ජුරුවන්ට හිමි වෙලා තිබෙන තුරු, උඹව පළාත මහනුවර රාජධානියේ කොටසක් වෙලා තිබෙන තුරු යටත් කර ගන්න බැරි බව ඉංග්‍රීසි ආණ්ඩුව වටහා ගත්තා. ඒ නිසා පළමුව මහනුවර යටත් කළාට පස්සේ කළ දෙවැනි ක්‍රියාව තමයි, අවුරුදු තුනකට පස්සේ උඹව පළාත සම්පූර්ණයෙන්ම පොළවට සමතලා කිරීම. 1818 කැරැල්ල ආරම්භ වන කොට, ජනතාවගේ විරෝධය පළ වන කොට ඉංග්‍රීසි ආණ්ඩුව ගැසට් එකේ නිවේදන පහක් කළා. එකක් තමයි, මුළු උඹව පළාතේම සිටින අවුරුදු 18ට වැඩි සෑම පිරිමි ළමයෙකුම වෙඩි තබා මරා දමන්න නියම කිරීම. දෙවැනි එක, ඒ පළාතේ ඉන්න ගව සම්පත වද කිරීම සඳහා සෑම ගවයෙකුම වෙඩි තබා මරා දමන්න නියම කිරීම. තුන්වැනි එක තමයි, මිනිසාට ප්‍රයෝජනවත් සෑම ගහක්ම කපා දමා ඒක කාන්තාර ප්‍රදේශයක් කරන්න නියම කිරීම. හතර වැනි එක තමයි, සෑම වැවකම වැව් කණ්ඩිය ඇතුන් දමා හිල් කර ජලාශ සම්පූර්ණයෙන්ම විනාශ කරන්න නියම කිරීම. මේ විධියට අවුරුදු ගණනක් තිස්සේ විනාශ කරපු ප්‍රදේශයක් ගැන තමයි අපි අද උඹව පළාත කියලා කථා කරන්නේ.

ඒ ප්‍රදේශයේ සොරණාතොට කියලා මහා දුෂ්කර ගම්මානයක් තිබෙනවා. ඒ සොරණාතොට ගම්මානයේ 1818 කැරැල්ලේ ඉඳලා 1843 වර්ෂය දක්වා අවුරුදු 25ක් තිස්සේ සුදු යුද්ධ හමුදාවක් නතර කරලා, අවුරුද්දක් පාසාම ඒ ප්‍රදේශය වටේටම ගිහිල්ලා ගෙවල් විනාශ කරලා, මිනිස්සු නැති කරලා ජන ශූන්‍යභාවයක් ඇති කර ගෙන ගියා. එක හමුදාවක් සොරණාතොට හිටියා. අනෙක් හමුදාව උඹව පරණගම වලකොටුවේ හිටියා. මේකෙන් අභාවයට ගිය ප්‍රදේශය වනාන්තරගත වුණා. මිනිස්සු ඒ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම අතහැරලා ගියා විතරක් නොවෙයි, ජීවත් වුණු කිහිප දෙනා නම් පවා මාරු කළා. සිංහල ජනතාව මුස්ලිම් නාම පවා ගත්තා. රත්නායක මුදියන්සේලාගේ යුසුප් ලෙබ්බේ වාගේ නම් අර ගෙන තමයි, ඉංග්‍රීසි ආණ්ඩුවෙන් මරණයෙන් බේරිලා හිටියේ. ඒ විධියේ මහා භයානක තත්ත්වයක් තිබුණේ. තවමත් ලංකාවේ පළාත්වලින් ඉතාම අඩුවෙන් සංවර්ධනය වුණු ප්‍රදේශයක් තමයි උඹව පළාත. ඒක බොහොම කනගාටුදායක කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පළාතේ 1960 පහළ වුණු, සම්පූර්ණ අර්ථය අනුවම ජනතා පුත්‍රයෙක් කියලා කියන්න පුළුවන් කෙනෙක් තමයි මේ ගරු විජේරත්න බණ්ඩා මැතිතුමා. එතුමා තමයි ගමෙන් පැමිණි පළමුවැනි නියෝජිතයා. මම එතුමාව හොඳට දන්නවා; මගේ ඥාතිවරයෙක්. එතුමා තමයි ඒ ගමේ තිබුණ දුක් සෝගින්න මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වේ. ගරු රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතෙක් කල් ගමෙන් පැන නැඟුණු අය බොහොම කලාතුරකින් තමයි ඉහළට මතු වෙලා ආවේ. එතුමාගේ අභාවය ගැන අද අපි කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය තිබෙන

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

කාලයේදී මෙතුමා කෙරෙහි එතුමිය ලොකු විශ්වාසයක් තියලා තිබුණා. ගමෙන් පැන නැඟුණු ඒ මන්ත්‍රීතුමාට ඇමතිකම් දීලා බොහොම ආදරයෙන් සැලකූ නායිකාවක් තමයි ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. 1960 දක්වා ගමේ ගම් කාර්ය සභාවේ කටයුතුවලින් පටන් ගෙන ඉහළට මතු වෙලා ආපු, පළපුරුද්දක් තිබුණු මේ මන්ත්‍රීතුමා 1977 දක්වා බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේ බදුල්ල නගර ප්‍රදේශයේ වගකීම භාර දී තිබුණු බොහොම වග කිව යුතු මහත්මයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් කාරණයක් මම ආඩම්බරයෙන් කියන්න ඕනෑ. දරුවන් වෙනුවෙන් උපරිම යුතුකම් කළ පියකු හැටියටයි මම විජේරත්න බණ්ඩා මැතිතුමාට ගෞරව කරන්නේ. මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ එතුමාගේ දරුවෝ පුදුමාකාර මහන්සියකින් අධ්‍යාපනය ලැබුවේ. ඌව පළාතේ එක පවුලකවත් මේ තරම් සාර්ථක අධ්‍යාපනයක් ලැබූ දරු පිරිසක් හැදූ පියෙක් ගැන මම දන්නේ නැහැ. නගරයට ඔරොත්තු දෙන ලෙසට ඉතාම දක්ෂ ලෙස ඉහළ අධ්‍යාපනයක් දීලා කාලයට ඔබින දරුවෝ ටිකක් එතුමා හැදුවා. ලංකාවේ කොළඹ වේවා, ගමේ වේවා, පිට රට වේවා ඕනෑම තැනකට ගිහිල්ලා සේවය කරන්න පුළුවන් ආඩම්බරකාර දරුවෝ ටිකක් හදපු පියෙක් තමයි මෙතුමා. පියකුගෙන් සිද්ධ විය යුතු ප්‍රධාන යුතුකමක් මේ මහත්මයා කරලා තිබෙනවා. අනෙක් අයටත් ඒක බොහොම වැදගත්. ඒ උත්තම පියාට මේ ගරු සභාවේ ගෞරවය පිරිනැමුවා. පියකුගේ යුතුකම් අතර, මවකගේ යුතුකම් අතර ඔය කොටස ප්‍රධානම තැනක් ගන්නවා.

එපමණක් විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අවුරුද්දකට ඉස්සරවෙලා මම බදුල්ල දිස්ත්‍රික්කයට ගියා. 1958 ඉඳලා බොහොම කාලයක් -ජේ.ඇම්.පී. රාජරත්න මහත්මයාගේ කාලයේ ඉඳලා- බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ, ඌව පරණගම ප්‍රදේශයේ ජනතාව ආශ්‍රය කරමින් පදිංචි වෙලා වාගේ කටයුතුවල යෙදෙමින් හිටියා. එදා සහ අද බදුල්ල දිස්ත්‍රික්කයේ වෙනස ගැන කිව්වත්, ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා ගිහින් බලන තුරු ඒක අදහන්නේ නැහැ.

එදා බදුල්ල නගරයේ තිබුණේ දුම්රිය ස්ථානය, කඩ පොළ සහ තානායම විතරයි. මේ ළඟදී මම ගියේ. තවම අවුරුද්දක්වත් ගත වුණේ නැහැ. මා කැටුව ගියේ ගරු අමාත්‍ය, අපේ සභානායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමායි. මම බදුල්ල නගරය දැක්කාම පුදුමයට පත් වුණා. මම කිව්වා, "ඇමතිතුමනි, මට රැස්වීමක විතරක් කථා කරලා මදි. කරුණාකරලා මට මුළු නගරයේම තදාසන්න ප්‍රදේශවල සංචාරය කරලා බලන්න ලැහැස්ති කරන්න" කියලා. ඊට පස්සේ එතුමාම මාව අරගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම ආඩම්බරයි කියන්න, එතුමා මාව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට එක්ක ගෙන ගියා. මම එතැන විනාඩි 10ක්, 15ක් රැඳී සිටියා. එතැන ඉතාම දර්ශනීය පිටිටනියක්, පඩිපෙළක්, ඒ වාගේම ගොඩනැඟිලි තිබුණා. මම ඒවා දිහා බලා එතුමාටත් කිව්වා, කොළඹ ඇවිල්ලා අතිගරු ජනාධිපතිතුමාටත් කිව්වා, මම පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ ගිහිල්ලා දුටු විශ්වවිද්‍යාලයට වඩා සිය වාරයකින් විස්මිත, ආකර්ෂණීය, සෞන්දර්යවාදී විශ්වවිද්‍යාලයක් හදලා තිබෙනවා කියලා. එය පුදුමාකාරයි. ඒ වාගේම ඉස්පිරිතාල හදා තිබුණා. අධිකරණ සංකීර්ණ හදලා තිබුණා.

කොළඹින් පිට ලංකාවේ එක්තරා නගරයක් දියුණු වෙලා තිබෙනවා නම්, ඒ නගරය බදුල්ල නගරය හැටියට මම තබනවා. බදුල්ල නගරය හා තදාසන්න ඌව ප්‍රදේශයටම අලුත් නවෝදයක් ඇති කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳ ගෞරවය මම එක හෙළාම අපේ සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාට -අතිගරු ජනාධිපතිතුමාටත් මම කිව්වා- ප්‍රදානය කළ යුතුයි. මට එදා ඉඳලා මේ ප්‍රදේශය ගැන පුදුම ගෞරවයක් ඇති වුණා.

1818 කැරැල්ලෙන් සිදු වුණු ආබාධ, විනාශ ඒ ඔක්කොම මකා ගැනීමේ ලොකු ව්‍යාපාරයක් දැන් ඇවිල්ලා තිබෙනවා. ඉතිහාසයේදී සිදු වුණු අසාධාරණකම් මකන ජනතා පුත්‍රයෙක් හැටියට ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසිවැනි සියවසේ අලුත් ශිෂ්ටාචාරයකට බදුල්ල නගරය ඇතුළු ඌව පළාත ලොකු පිම්මකින් අරගෙන ගිහිල්ලා තිබෙනවා.

මේ කටයුතුවලට පුරෝගාමී වුණු ගම්බද ජනතා පුත්‍රයකු වන අභාවප්‍රාප්ත ගරු විජේරත්න බණ්ඩා මැතිතුමා තමයි අද අප සිහිපත් කරන්නේ. මේ ප්‍රදේශ තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න ඕනෑ. සොරණාතොට කියන්නේ ඌව පළාතේ තිබෙන ඉතා දුෂ්කර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය නියෝජනය කරමින් පැමිණ, අවුරුදු 86ක් වන තුරු ජනතාවත් එක්ක සිටිමින්, ජනතාවට සේවය කරලා, ආඩම්බරකාර දරුවෝ ටිකක් බිහි කරලා ඒ ප්‍රදේශයට ගෞරවනීය නාමයක් බිහි කළ අභාවප්‍රාප්ත ගරු විජේරත්න බණ්ඩා මැතිතුමා ගැන අපි ශෝක වනවා. මගේ කිට්ටු ඥාතියෙකු නිසා එතුමා ගැන මම අතිශයින්ම ශෝක වනවා. මට බොහොම හිතවත්. ඒ වාගේම ළඟට ගියොත්, හම්බ වුණොත් බොහොම ආදරයෙන් කථා කරලා එතුමා අපට සංග්‍රහ කරනවා. දැන් එතුමා අප අතර නැහැ.

එතුමාගේ දරුවෝ ඉතාම වැඩ දායක ස්ථානවල සිටිනවා. ඒ ළමයින්ට මම එක දෙයක් කියන්න ඕනෑ. ලංකාවේ, ලෝකයේ, කොහේ ගියත් ඌව පළාතේ සොරණාතොට ගම අමතක කරන්න එපා. සොරණාතොට කියන්නේ ඉතිහාසයේ අසාධාරණයක් වුණු ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයට යහපතක් ඉෂ්ට වීම සඳහා පියා ගිය අඩි පාරේ යමින්, එතුමා කළ සේවය නැවත ඌව ප්‍රදේශයට ලබා දෙන්න මේ ළමයි ඇප කැප වන්න ඕනෑ. එසේ කියමින් වටිනා සේවයක් කරන ලද, එසේම නොනැසෙන නාමයක් පිහිටුවන ලද ගරු විජේරත්න බණ්ඩා මැතිතුමාට ඥාතියකු වශයෙනුත්, පුරවැසියකු වශයෙනුත්, මේ සභාවේ මන්ත්‍රීවරයකු වශයෙනුත් මගේ ගෞරවය පිරිනමමින්, එතුමාට නිවන් සුව ලැබෙවායි ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මම ඒ සමඟ එකතුවීමට කැමැත්තෙමි. රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි. දිවංගත ගරු කේ.වයි.එම්. විජේරත්න බණ්ඩා මහතාට නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
மெடிசினா ஓல்டனேடிவா நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
INSTITUTE OF MEDICINA ALTERNATIVA (INCORPORATION) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
"මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு "ஏ"க்கு

தலைமைதாங்கும் உறுப்பினர் அவர்களால் சாட்டப்பட்டது.

Bill accordingly read a Second time, and allocated by MR. PRESIDING MEMBER *to Standing Committee "A" under Standing Order 48(3).*

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කල් තැබීමේ යෝජනාව, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා.

පැරණි ජංගම දුරකථන අපහරණය
பாவனைக்குதவாத செல்லிடத்தொலைபேசிகளை அழித்தல்
DISPOSAL OF USED MOBILE PHONES

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Mr. Presiding Member, I move,

"A remarkable growth has been seen in the field of communication owing to the speedy development taking place in communication facilities at present. Further, the use of mobile phones has also increased rapidly. As a result, a large quantity of mobile phones and spare parts are dumped by the people to environment. The soil and water is faced with the threat of pollution due to the dumping of mobile phones and spares to environment.

Therefore, it is moved in this House that it is advisable to launch an island-wide programme with the intervention of the Ministry of Environment and Renewable Energy for the disposal of the used mobile phones."

I **table*** the Sinhala and Tamil versions of the Motion to be included in Hansard.

****සභාමේසය මත තබන ලද යෝජනාවේ සිංහල හා දෙමළ පරිවර්තනය:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட பிரேரணையின் சிங்கள மற்றும் தமிழ் மொழிபெயர்ப்புகள்:*
**Sinhala and Tamil versions of Motion tabled:*

"මේ වන විට සන්නිවේදන පහසුකම් සිදු වෙමින් පවතින වේගවත් සංවර්ධනය නිසා සන්නිවේදන ක්ෂේත්‍රය තුළ විශාල දියුණුවක් ලබා ඇත. එසේම රට තුළ ජංගම දුරකථන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම වාර්ෂිකව ජංගම දුරකථන හා අමතර කොටස් විශාල ප්‍රමාණයක් මහජනතාව විසින් පරිසරයට බැහැර කරයි. මෙම ජංගම දුරකථන අමතර කොටස් පරිසරයට බැහැර කිරීම තුළින් පස හා ජලය දූෂණය වීමේ තර්ජනයකට ලක්වී ඇත.

එබැවින් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මැදිහත් වී පැරණි ජංගම දුරකථන අපහරණය කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහනක් දියත් කිරීම සුදුසු යැයි මේ ගරු සභාවට මා යෝජනා කරමි."

"தற்போது தொடர்பாடல் துறையில் இடம்பெற்றுவரும் வேகமான அபிவிருத்தி காரணமாக, தொடர்பாடல் துறை பாரிய வளர்ச்சியை எட்டியுள்ளது. மேலும், நாட்டினுள் செல்லிடத் தொலைபேசிகளின் பாவனை துரிதமாக அதிகரித்துள்ளது. அதேபோன்று வருடாந்தம் பெருமளவு செல்லிடத் தொலைபேசிகள் மற்றும் உதிரிப்பாகங்கள் மக்களால் சுற்றாடலுக்கு நீக்கப்படுகின்றன. மேற்படி செல்லிடத் தொலைபேசி உதிரிப்பாகங்கள் சுற்றாடலுக்கு நீக்கப்படுவதன் மூலம் நிலமும் நீரும் மாசடையும் அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ளன.

ஆகவே, சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சு தலையிட்டு பழைய செல்விடத் தொலைபேசிகளை அகற்றுகின்ற நாடளாவிய நிகழ்ச்சித்திட்டமொன்றை ஆரம்பித்தல் உசிதமாகுமென இந்த கௌரவ சபைக்குப் பிரேரிக்கின்றேன்."

Sir, this is a remarkable world, what you call the 21st Century. The world is advancing and we are also advancing equally. We are now not an underdeveloped country. We are a developing country.

The total amount of telephones in Sri Lanka has increased to a titanic amount of 23.8 million during 2012, an 8.4 per cent increase compared to last year. A number

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

of 23.8 million telephones are there in the hands of Sri Lankan people: the young, the old, the middle-aged, school children, office workers and even housemaids carry telephones. The reason behind this huge increase is the recorded hike of mobile phones in the country in 10.9 per cent last year. At the end of 2011, the total count of telephones in Sri Lanka was 87.8 per cent. And during 2012, it has increased up to 100 per cent.

Sri Lanka has a population of around 20 million, but there are more phones than that. So, what an advanced state we have attained under the "Mahinda Chintana" so ably led by our dynamic President, His Excellency Mahinda Rajapaksa.

Sri Lanka's telephone density rose to 100.8 lines per 100 persons in 2010 showing that fixed and mobile connections had overtaken the population, in a telling demonstration of the results of ending state monopoly.

Telephone density rose from 86.6 in 2009 in a country with a population of 20.6 million, according to data published by the Central Bank. Two decades ago, in 1990, Sri Lanka's teledensity was one line per 100 persons.

Mobile phone users grew by 20.9 per cent in 2010 to 17.2 million. Industry analysts say owners of more than one mobile Subscriber Identity Module - SIM - are growing as there are no restrictions on use of SIMs, removable cards that store mobile phone identification data.

In 1992, there were only 2,644 mobile phones in Sri Lanka. Now, it has increased to over 20 million. You would see the amazing rise!

There is one other area I would like to give my thought to. That is the use of mobile phones by school children. They take in their satchels to schools mobile phones and they are more interested in calling even their own mates in the class or their friends rather than concentrating on the studies. Now, this is not a good phenomenon at all.

බුද්ධි වර්ධනය ඇති වෙන්නේ, පොත පත කියවීමෙන්; පාඨ ශාලාවෙන්. අපි ගෙදර ගිහිල්ලා ඒවා revise කරනවා. මට මතකයි, අපි පොඩි කාලයේ Zahira College එකේ ඉගෙන ගන්න කොට පොත් පත් අරගෙන ගිහිල්ලා Viharamahadevi Park එකේ - එදා Victoria Park එකේ- පාඩම් කරපු ආකාරය. එය අලංකාර, සුවිශාල උද්‍යානයක් බවට පරිවර්තනය කරන ඒ අනර්ඝ වැඩ කටයුත්ත අපේ ආරක්ෂක අමාත්‍යාංශය සහ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දැන් නිම කරමින් පවතිනවා. ඉස්සර අපි එහේ ගිහිල්ලා ඉගෙන ගත්තා. අපේ class work එහේ ගිහිල්ලා revise කරනවා. අපි පාඨ ශාලාවේ ඉගෙන ගත්තා. අපි ගෙදර පාඩම් කෙරුවා. Park එකට ඇවිදින්න ගියේ නැහැ. මල් කඩන්න ගියේ නැහැ. උසුළු විසුළු කරන්න ගියේ නැහැ. අපේ කාලයේදී, අපි පොත් පත් අරගෙන තමයි ඔය උද්‍යානවලට ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ දවස්වල මෝදර "ඩීප්ඩේන්" හි වාසය කරන කොට එහි තිබුණා, Ellie House Park කියලා එකක්. ඒක අලංකාර park එකක්. උතුරු කොළඹට ජලය සපයන වතුර ටැංකි එහේ තිබෙනවා. ඒ ආශ්‍රිතවත් උද්‍යානයක් - park එකක්- තිබෙනවා. ඒක මොන තරම් ලස්සනද? මම හිතන්නේ, අපේ ළමයින් දැන් මේකට පුරුදු කරන්න ඕනෑ කියලායි. අපේ පාඨශාලාවල ආචාර්ය මණ්ඩලයට මේ පිළිබඳව විශාල වග කීමක් තිබෙනවා. නැත්නම් මොකද වෙන්නේ? ළමයින් මොකක් හරි කියවලා, computer එකෙන් ඒ වැඩසටහන් සහ පාඨමාලා ලබා ගෙන විභාග pass කරන්න පුළුවන්. නමුත් බුද්ධිය? බුද්ධිය සෝදිසි කරලා බලන කොට අපි පාතාලය කරා ළං වෙන බව තමයි පෙනෙන්නේ.

අපේ ගරු සූරියප්පෙරුම මැතිතුමා මේ යෝජනාව ස්ථිර කරන්නට බලාපොරොත්තුවෙන් සිටිනවා. එතුමා දන්නවා, මේ ගැන. මම අද මේ පාර්ලිමේන්තුවේදී යෝජනා කරනවා, මේ පිළිබඳව දැනුවත් කරන්න හැම ඉස්කෝලයකටම සූරියප්පෙරුම මන්ත්‍රීතුමා යවන්න කියලා. මොකද එතුමා ලස්සනට මේවා විදහා දක්වනවා; ළමයින්ට කියලා දෙනවා. එතුමා තමයි කිව්වේ, මේ රටේ හැම තැනම වැවෙන කොස් කාපල්ලා; දෙල් කාපල්ලා; ඒවා කාලා ජවය ඇති දරුවන් හදපල්ලා කියලා. අපට සමාජයක් තිබෙන්නට ඕනෑ. ජනගහනයක් තිබෙන්නට ඕනෑ. අරලියගහ මන්දිරයේ පැවැත්වුණු රැස්වීම්වලදී ඒ වැදගත් දේශනය අපට, අපේ පක්ෂයට පැවැත්වූයේ -මම කියන්නේ එතුමාට ආචාර්යතුමා කියලා- ආචාර්ය සූරියප්පෙරුම මැතිතුමායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රටවල බුද්ධිය වර්ධනය නොවෙන ඉගෙනුම් ක්‍රම තහනම් කරලා තිබෙනවා. ඒ වාගේ අපේ ළමයින්ටත් මේක තහනම් කරන්න වුවමනා කරනවා. අද ඉස්තෝප්පුවේ ඉන්න නෝනා මහත්මිය කුස්සියේ ඉන්න ඒ වැඩකාර කෙනාට දුරකථනයෙන් කථා කරලා අහනවා, කෑම ලෑස්තිද, කෑම අරගෙන එන්න කියලා. ඉස්සරහ ඉන්න තෝට්ටිකාරයාටත් telephone එකෙන් කථා කරලා අහනවා, "ඒයි, මල්වලට වතුර දැම්මාද" කියලා. මෙවැනි පුදුමාකාර තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. මේ දියුණුවත් සමඟ බුද්ධිය වර්ධනය වෙන්නට ඕනෑ. ඥානය වර්ධනය වෙන්නට ඕනෑ. එසේ නොවුවහොත් සමතුලිත - balance - කරන්න බැරි සමාජයක් තමයි ගොඩ නඟන්නට අපට පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මා කියන්නේ ජංගම දුරකථන ගැනයි. මේ බලන්න, මා ළඟත් handphone එකක් තිබෙනවා. බය වෙන්න එපා, මේක off කරලායි තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Mobile phone ගැන තමයි මා මේ යෝජනාවේදී කථා කරන්නේ. ඉස්ලාමීය අර්ථ කථනයකින් මම මේ handphone එක ගැන කියනවා, "මේක සුල්තාන් සහ ෂෙයිතාන්" කියලා. 'සුල්තාන්' කියන්නේ, සාන්තුවරයෙක්. 'ෂෙයිතාන්' කියන්නේ සාතන්ට. ජංගම දුරකථනයෙන් හොඳ දේවල් කථා කරන්න පුළුවන්. වැරදි ආරංචි පතුරුවන්න පුළුවන්. අද අපේ මහ රැජිනට -එළිසබෙත් මහා රාජිනියට- මෙතැන ඉඳලාම මේකෙන් පණිවුඩයක් දෙන්න, SMS එකක් යනන්න අපට පුළුවන්. අපට එතුමියගෙන් අහන්න පුළුවන් සුව දුක්. මගේ මතකයේ හැටියට තුන්වැනි රජ්ජුරුවන් වීමේ, රජ කිරුළට හිමිකම් කීමේ වාසනාව ජෝර්ජ් ඇලෙක්සැන්ඩර් කුමරුට ලැබෙනවා. පොදු රාජ්‍ය මණ්ඩලීය නායකවරුන්ගේ සම්මේලනය පවත්වන්න ආසන්න මේ අවස්ථාවේදී අපි සුභ පතනවා ඒ රාජිනියට. ඊයේ මේ පාර්ලිමේන්තුවේදී ඉතාම පහත් ලෙස මහ රැජිනට බැණ වැදුණා; දෝෂාරෝපණය කළා. මට අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, අන්න රජ කුමරෙක් ඉපදිලා ඉන්නවා, ඔහු බලා ගන්න application ඉල්ලනවා, ඕනෑ නම් යන්න කියලා. ඔව්, කමක් නැහැ. රජ කුමරකු හදා වඩා ගන්නට භාග්‍යයක් මට තිබෙනවා

නම් මා කොයි තරම් වාසනාවන්තයකුද කියලා මොහොතකට හිතෙනවා. නමුත් ඝාතන සංස්කෘතියක් මේ රටේ ඇති කළ අයට රැජින වුවමනා කරන්නේත් නැහැ, හුස්නි මුබාරක් වුවමනා කරන්නේත් නැහැ, ඔබාමා වුවමනා කරන්නේත් නැහැ. ඒ බණින අයට මනුෂ්‍යයන් පිළිබඳව හැඟීමක් නැහැ; ජීවත් වන මනුෂ්‍යයන් පිළිබඳව හැඟීමක් නැහැ. ඒ නිසා තමයි එවැනි ප්‍රකාශයක් මේ ගරු සභාවේදී කළේ.

Sir, on behalf of the Members of Parliament, I take this opportunity to wish good luck to the newly-born Prince of Prince William and Princess Kate. It is very significant that when we are about to host the Commonwealth Heads of Government Meeting in our country, the Queen has already seen the third successor to the British Crown. British Crown means the Head of the Commonwealth of which we are also an honoured members. At this point, I must also say that the next two years is going to be a proud moment in Sri Lanka's history. In 1976, අපේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය නොබැඳි ජාතීන්ගේ සම්මේලනයේ නායිකාව වුණා. She became the Head of the Non-Aligned Movement. එදා ඒකට 'කාපිරි සම්මේලනය' කියපු අය තමයි අදත් මහ රැජිනට බැණ වදින්නේ. පුදුමයක් නොවෙයි එය. ඒ බණින අය මනුස්සකම දන්නේ නැති, සදාචාරය දන්නේ නැති අයයි. British people ළඟ හුඟක් හොඳ දේවල් තිබෙනවා. අප බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධ වුණත් ඒ රටේ මිනිසුන් බ්‍රිතාන්‍ය රජ පෙළපතට මොන තරම් ආදරයක් දක්වනවාද? ඩයනා කුමරිය සහ Prince Charles අතිනත ගත් දවසටත් වඩා රට වැසියන් විශාල සංඛ්‍යාවක් බකිංහැම් මාළිගාව ඉදිරිපිට රැස් වී සිටියා, රජ දරුවා පිළිබඳ පළමු ආරංචිය ලබා ගැනීමට. බලන්න, ඒක තමයි සම්ප්‍රදාය; ගරු කිරීම; සංස්කෘතිය. That is culture; that is civilization that we have to learn. නමුත් මිනී මරමින් දේශපාලනය කරමින් මේ පාර්ලිමේන්තුවට රිංගා ගත් අයට- [බාධා කිරීමක්] They cannot understand that.

Sir, I call this handphone a *Sultan* and a *Shaithan.* You can give a wrong message. You can spread a canard all over the world by pressing the keys in this phone. A good message is *Sultan*; a false message is *Shaithan*. Therefore, it has got to be assured that these mobile phones are used in the proper way so that we will enjoy the rapid advancement technologically in the 21st Century. At the same time, we should guard our children from falling into the pit of degradation.

The Hon. Minister has now arrived and I hope that he has a very good opportunity now to place before the House a comprehensive statement so that the threat of pollution caused due to dumping of mobile phones and spares to the environment could be saved.

Thank you very much.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெருமa)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවේ දිග පළල වශයෙන් බැලුවොත් පෙනෙනවා, 21වන ශත වර්ෂයට අප ඇතුළත් වන අවස්ථාවේ අපට ලොකු පණිවුඩයක් දෙන යෝජනාවක් තමයි ගරු අස්වර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ කියලා. වටිනා පුවත් පත්වේදීන් කිහිප දෙනෙක් ආතර් සී. ක්ලාක් මහත්මයාගෙන් ඇහුවා, 21වන ශතවර්ෂය ආරම්භ වුණේ කවදාද කියලා. ආතර් සී. ක්ලාක් මහත්මයා කිව්වා, 21වන ශතවර්ෂය ආරම්භ වුණේ, කැලැන්ඩරය අනුව නම් වර්ෂ 2000 දියි, නමුත් තාක්ෂණ දෘෂ්ටි කෝණයෙන් බැලුවොත් ඇත්ත වශයෙන්ම 21වන ශතවර්ෂය ආරම්භ වුණේ 1969 දියි කියලා. එදා තමයි fax machine එක සහ ජංගම ටෙලිෆෝනය - mobile phone එක- මහ ජනතාව අතට ආවේ. ජංගම ටෙලිෆෝනය අතට ආවාට පස්සේ, මෙතෙක් කල් යන්න බැරි වෙලා තිබුණු දුරක් යන්න පුළුවන් වුණා. මෙතෙක් කල් මේ ලෝකය තුළ සම්බන්ධතාව ගොඩ නැඟීම වයර් එකේ එල්ලිලා, වයර් එක මාධ්‍ය කර ගෙනයි කළ යුතුව තිබුණේ. නමුත් ජංගම ටෙලිෆෝනය ගුවන් විදුලියෙන් ඇති වුණා වාගේ තත්ත්වයක් ඇති කරලා මිනිසාට දුර කියන එක අමතක කරවුවා. අපි මෙතෙක් කල් ස්ථාන දෙකක් අතර පරතරය මැන්නේ සැතපුම්වලින්, කිලෝමීටර්වලින්. ජංගම ටෙලිෆෝනය ඒක කැඩුවා. සැතපුම් කිලෝමීටර් කියන ඒ චක්කරය අහකට වීසි කරලා රිට පස්සේ කැලැන්ඩරය වෙනුවට 'තත්පරය' කියන අලුත් චක්කරයක් දීලා, ජංගම ටෙලිෆෝනය - mobile phone එක- මිනිසුන් අතට දීලා තිබෙනවා. අපේ ළමයින් මේ අලුත් ශිෂ්ටාචාරයේ පීනන්නේ ඔය හපන්කම උඩයි. ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වා, ලංකාවේ ජනගහනය මිලියන 20යි, නමුත් මිලියන 23ක් ජංගම ටෙලිෆෝන - mobile phones - තිබෙනවා කියලා.

මේ සම්බන්ධයෙන් දෙමවුපියන් සහ වග කිව යුතු අය කල්පනා කරන්න ඕනෑ. මැද පෙරදිග ගිහින් අපේ සේවක සේවිකාවන් හම්බ කරන මුදලට වඩා වැඩි මුදලක් mobile phones මිලියන 23ක් නඩත්තු කරන්න, ඒ සඳහා අවශ්‍ය cards මිල දී ගන්න පිට රටට ඇදිලා යනවා. පිට රටින් අපට හම්බ කර දෙන මුදලට වඩා වැඩි මුදලක් මේ mobile phonesවලින් ඇමෙරිකාව ආපසු ඇදලා ගන්නවා. එම නිසා කාර්මික විප්ලවය, තාක්ෂණ විප්ලවය හැකි ඉක්මනින් ලංකාවේ ජනතාවගේ විප්ලවයක් කිරීම සඳහා මේ ආදායම ලංකාවේ සංසරණය කරන්න ක්‍රමයක් ගැන කල්පනා කළ යුතුයි.

අද අපේ දරුවන් සම්පූර්ණයෙන්ම ජීවත් වන්නේ මේ ශිෂ්ටාචාරය තුළයි. මේ ශිෂ්ටාචාරයෙන් ඉවත් වෙන්න බැහැ. ආතර් සී. ක්ලාක් මහත්මයා කිව්වා, "මට පුදුමයි. ලෝකයේ විශිෂ්ටත්වයේ එකක් තමයි ෆැක්ස් මැෂිම" කියලා. ආතර් සී. ක්ලාක් මහත්මයා කියන්නේ, ලෝකයේ ඉතාම විශිෂ්ට උතුම් මහත්මයෙක්. ඒ මහත්මයා තමයි, අපි හිටගත් තැන ඉඳලා සැතපුම් 23,000ක් ඉහළ අහසට, ඇහැට පෙනෙන්නේ නැති අහසට බෝලයක් විද්දේ. ඒ බෝලයට තමයි චන්ද්‍රිකාව - satellite - කියන වචනය ආවේ. ඒ චන්ද්‍රිකාව මඟින් මුළු ලෝකයටම ඇහෙන්න තත්පරයකට පණිවුඩ ලක්ෂ ගණනක් දින පතා යවන්න අලුත් ක්‍රමයක් හදා දීලා ඇස් දෙක පියා ගත් උත්තමයෙක් තමයි, ආතර් සී. ක්ලාක් මහත්මයා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා තමන්ගේ තරුණ කාලය පාවිච්චි කළේ කොම්පියුටරය හදන්නයි. ලෝකයේ පළමුවෙන්ම හදාපු කොම්පියුටරය ඉතා විශාලයි. 1946 හැදූ කොම්පියුටරය අක්කර 6ක් විශාලයි. අක්කර 6ක භූමි ප්‍රමාණයක් අවශ්‍ය වුණා, තනි කොම්පියුටරයක් හදන්න. එම කොම්පියුටරය ක්‍රමානුකූලව හදලා, හදලා දියුණු කර ගෙන අද ඒක ඔඩොක්කුවේ

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

තබා ගන්න පුළුවන් පොතක් හා සමාන laptop එකකට ඇවිත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. තව අවරුදු 5ක් ඇතුළත කොම්පියුටරය පුංචි telephone එකක් තරම් කුඩාම තත්ත්වයකට එන්න පුළුවන්. එපමණක් විතරක් නොවෙයි. අපේ සුළැහිල්ලේ නියපොත්තේ ප්‍රමාණයට වාගේ පියල්ලකට වචන 25,000ක් ගබඩා කරන්න පුළුවන් විශ්මිත ශිෂ්ටාචාරයක් එන්න පුළුවන්, ළමයින්ට අවුරුදු 18ක්, 20ක් වන කොට. නමුත් වචන 25,000ක් ගබඩා කළාට මදියි. ඒ වචන 25,000 ගබඩා කරන්න ඕනෑ, පුස්තකාලයේ නොවෙයි; ළමයින්ගේ ඔළුවේ. එම නිසා කියවීම කියන එක ඉතාම වේගයෙන් කරන්න ඕනෑ. මා කුඩා අවධියේදී උදේට ගෙදර ඉඳලා පාසලට යන කොට ඉංග්‍රීසි වචන 5ක් ලියා ගෙන, ඒවායේ අකුරු - spellings - කට පාඩම් කිරීම සඳහා සාක්කුවේ දමා ගෙන ගෙදර ඉඳලා පාසලට යන අතරදී කට පාඩම් කරනවා. පාසලේ ඉඳලා ගෙදර එන කොට තව වචන 5ක් මා කට පාඩම් කර ගත්තා. ඔය විධියට අමාරුවෙන් තමයි මා මගේ ඉංග්‍රීසි භාෂාව හදා ගත්තේ.

ඒ විතරක් නොවෙයි. වයස අවුරුදු 10 ඉඳලා මා ඇටලසේ සිතියම් පොත පාවිච්චි කරන්න පටන් ගත්තා. ඉගෙන ගන්නා සෑම ළමයකුගේම මේසය අසල බිත්තියේ අලවා තිබෙන්න ඕනෑ, ලෝක සිතියමයි, ලංකා සිතියමයි. මේ එක සිතියම් පොතක් රුපියලයි. පොත් සාප්පුවල තිබෙනවා. ඒක දෙමවුපියෝ ළමයින්ට අලවා දෙන්න ඕනෑ. ළමයා දැන ගන්න ඕනෑ, ලංකාවේ සිතියම ගැන. දරුවකුට සිතියම දිහා නොබලා මතකයෙන් සිතියම අඳින්න පුළුවන් වෙන්න ඕනෑ, මේ මගේ වටිනා මවු බිම කියලා. ඒ වාගේම කොළඹින් පිටත් වන නැවක් ලන්ඩන් නුවරට යන නැව් මාර්ගය මොකක්ද කියලා කෙනකුගෙන් අහලා දැන ගන්න ඕනෑ. නැව් මාර්ගයෙන් ජපන් රටට යන්නේ කොහොමද? මීට පස්සේ සිතියම නැතුව යන්න බැහැ.

කටුනායකට ගියාම අහස්යාත්‍රාවට නඟිනවා. අහස්යාත්‍රාව රටවල් ගණනාවකට ඉහළිනුයි යන්නේ; හැතැප්ම පහක් ඉහළිනුයි යන්නේ; වළකුළු තට්ටු තුනකට ඉහළිනුයි යන්නේ. ඒ යන ගමන කොහෙන් ද අප යන්නේ කියා ද දැන ගත යුතුයි. ලන්ඩන්වලට යනකොට, ජපන් රටට යනකොට මොන මොන රටවල් උඩින් ද අප යන්නේ කියා දැන ගත යුතුයි. ඒක තමයි අධ්‍යාපනය. එම නිසා භූගෝල විද්‍යාව අද සියල්ලටම වඩා වැදගත්. භූගෝල විද්‍යාව මුළු ලෝකයම ගෝලයක් හැටියට අරගෙන, ගෝලීයකරණය කර අරගෙන ළමයින්ට උගන්වනවා. ඉස්සරට වඩා ළමයි දැන් දක්ෂයි. ඉස්සරට වඩා ළමයි දැන් උනන්දුයි. සාගර සම්පත් ගැන සොයනවා. එම නිසා මේ අවස්ථාවේදී ඒ පැත්ත ගැන වැඩියෙ කථා කරන්නේ නැහැ. නමුත් ළමයිනි, තාක්ෂණ විප්ලවය කියා එකක් ඇවිත් තිබෙනවා. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ එකම ප්‍රාර්ථනාව අපේ මේ පුංචි ළමයින්ගේ කටේ තාක්ෂණ විප්ලවය පිළිබඳ රන්කිරි කටගාන්නටයි. මේ අධ්‍යාපන විප්ලවය කරන්නේ ඒකටයි. අපේ ළමයින්ට අප ඉගෙන නොගත් දේවල් උගන්වන්නට ඕනෑ. අප අවුරුදු 18දී ඉගෙන ගත් දේවල් මේ ළමයි අවුරුදු හතේදී ඉගෙන ගන්නවා. මේ ළමයින්ට තාක්ෂණික විප්ලවය පිළිබඳ, අලුත් ලෝකය පිළිබඳ රන්කිරි කට ගාන්නට ඕනෑ. මේ ළමයින් අවුරුදු 20 වෙනකොට මේ රටේ ඉංජිනේරුවෝ බවට පත් වෙන්නට ඕනෑ. මේ ළමයින් විශිෂ්ට විද්‍යාඥයන් බවට පත් වන්නට ඕනෑ. ඒකට අත්තිවාරම දාලා යි දැන් තිබෙන්නේ. මා ඒ ගැන මීට වඩා කථා කරන්නට යන්නේ නැහැ.

මේ වටිනා මන්ත්‍රීවරයෙක්, උගත් මන්ත්‍රීවරයෙක්, අපේ සභාවේ ඉන්න උගත්කම් තිබෙන, ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ ලොකු අවබෝධයක් තිබෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් තමයි ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා. එතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව, දුරදිග බලා, ගැඹුර බලා කළ යෝජනාවක්. මා එම යෝජනාවට සහයෝගය හා අනුමතිය දක්වමින් මගේ කථාව සමාප්ත කරනවා. මේ ගැන තමුන්නාන්සේලා තවදුරටත් සලකා බලන හැටියට ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

පිළිතුරු කථාව ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Environment and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා අද දින ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වූ, "මේ වන විට සන්නිවේදන පහසුකම් සිදුවෙමින් පවතින වේගවත් සංවර්ධනය නිසා සන්නිවේදන ක්ෂේත්‍රය තුළ විශාල දියුණුවක් ලබා ඇත. එසේම රට තුළ ජංගම දුරකථන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම වාර්ෂිකව ජංගම දුරකථන හා අමතර කොටස් විශාල ප්‍රමාණයක් මහජනතාව විසින් පරිසරයට බැහැර කරයි. මෙම ජංගම දුරකථන අමතර කොටස් පරිසරයට බැහැර කිරීම තුළින් පස හා ජලය දූෂණය වීමේ තර්ජනයකට ලක් වී ඇත. එබැවින් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මැදිහත් වී පැරණි ජංගම දුරකථන අපහරණය කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහනක් දියත් කිරීම සුදුසු යැයි මේ ගරු සභාවට යෝජනා කර සිටී යි" යන යෝජනාව ඉතාමත් කාලීන වූ වැදගත් යෝජනාවක්.

මේ යෝජනාවේ සඳහන් භාවිත කරන ලද ජංගම දුරකථන අපහරණය කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව අප පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයත්, ඊට අදාළ වන්නා වූ අනෙකුත් දෙපාර්තමේන්තු, ආයතන මඟින් මේ වන විට ගෙන ඇති ක්‍රියාදාමය පිළිබඳව මෙම ගරු සභාව තුළින් මාධ්‍ය තුළින් ජනතාව දැනුවත් කරන්නට ලැබීම ගැන මා ද සතුටු වෙනවා.

මේ සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයේ මගේ ප්‍රධානත්වයෙන් මීට සති තුනකට පෙර රැස්වීමක් කැඳවා තිබුණා. ඒ රැස්වීමේදී අප යම් යම් තීන්දු තීරණ කිහිපයක් ගත්තා. ජූලි මාසයේ 1 වන දා තමයි මේ පිළිබඳව සකච්ඡාව තිබුණේ. ඊළඟට මා විසින් මේ කාරණය සඳහා කමිටුවක් පත් කළා.

එම කමිටුවට අප පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ආයතනය, ඩයලොග් ආයතනය සහ සිංගර් පෞද්ගලික සමාගම අදාළ කර ගත්තා. මොකද පෞද්ගලික අංශය මේ ජංගම දුරකථන ආනයනය කිරීම බහුල වශයෙන් සිදු කරන නිසා. ඒ අනුව ඒ කමිටු වාර්තාවත් මේ වන විට ඉදිරිපත් වෙලා තිබෙනවා.

ඊට පෙර මා කැමතියි, දැනට ජංගම දුරකථන භාවිතයන් පිළිබඳව තිබෙන තත්ත්වය පැහැදිලි කරන්න. අපේ සූරියප්පෙරුම මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ, විශේෂයෙන්ම අප දකිනවා විද්‍යා හා තාක්ෂණ දියුණුවේ ප්‍රතිඵල හැටියට අද ලෝකයේ

ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපකරණ ඉතාම බහුල ලෙස භාවිත කරන බව. සාමාන්‍යයෙන් අප ඝන අපද්‍රව්‍ය කියන්නේ එදිනෙදා අපේ ගෙදර දොරේ, වැඩපළේ, ආපන ශාලාවේ, හෝටල්වලින් බැහැර ලන ඝන ද්‍රව්‍යවලටයි. ඒ කියන්නේ දියර නොවෙයි. දියරමය ඒවාට අප සාමාන්‍යයෙන් liquid කියලා නේ කියන්නේ. ඉංග්‍රීසි භාෂාවෙන් මේවාට කියන්නේ solid waste කියලායි. ඝන අපද්‍රව්‍ය. ගෙදර භාවිත කරලා ඉවත ලන කෑම ටික අයත් වන්නේ solid wasteවලටයි. ගෙදර ප්‍රයෝජනයට අරගෙන ඉවත ලන වතුර බෝතලය අයත් වන්නේත් ඒ solid waste ගණයටයි. සැමන් ටින් එකක නම් මාළු ටික අරගෙන ඉවත ලන ඒ හිස් ටින් එක අයත් වන්නේත් ඝන අපද්‍රව්‍යවලටයි. අපේ රටේ ඝන අපද්‍රව්‍ය වැඩිම ප්‍රමාණය එකතු වන්නේ කොළඹ ප්‍රදේශයේයි. මහ කොළඹ බල ප්‍රදේශය ගත්තොත්, කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල දිනකට ඝන අපද්‍රව්‍ය ටොන් 1,300ක් එකතු වෙනවා. ඒ සඳහා වෙනම වැඩ පිළිවෙළක් තිබෙනවා. හැබැයි අස්වර් මන්ත්‍රීතුමාගේ යෝජනාවේ කථා වෙන්නේ ඒ ගැන නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුතුව මේ රටේ යුද්ධය අවසන් කළාට පසුව, ඉතාම කෙටි කාලයක් තුළදී, අවුරුදු 4ක්, 5ක් ඇතුළත ජංගම දුරකථන ආනයනය කිරීම සහ ඉලෙක්ට්‍රොනික වශයෙන් - e-waste හැටියට අප හඳුන්වන- පරිගණක, ලැප්ටොප් වැනි දේවල් අපේ රටට ආනයනය කිරීම ඉතා බහුල ලෙස වැඩි වුණා. අපි මේ පිළිබඳව තිබෙන සංඛ්‍යා ලේඛන අරගෙන බලමු. ජංගම දුරකථන ගැන පමණක් කථා කළොත්, ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ ඒක පුද්ගල ජංගම දුරකථන භාවිතය වැඩිම රටක්. ලියා පදිංචි සංඛ්‍යා ලේඛන අනුව 2010 දී ලංකාවේ භාවිත වූ ජංගම දුරකථන ප්‍රමාණය මිලියන 17.3යි. අපේ රටේ ජනගහනය දැන් මිලියන 21කට ආසන්න වෙලා තිබෙන්නේ. 2010 සංඛ්‍යා ලේඛන අනුව අපේ රටේ නිල වශයෙන් ජංගම දුරකථන මිලියන 17.3ක් භාවිත වෙලා තිබෙනවා . 2011 වන විට - අවුරුද්දක් තුළදී- මේ සංඛ්‍යාව මිලියන 18.3ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා, 6.1ක වේගයකින්. 2011 වසරේ දත්ත අනුව ජංගම දුරකථන භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව සමස්ත ජනගහනයෙන් සියයට 87.8ක්. අපේ රට තමයි කලාපයේ වැඩිම සාක්ෂරතාව තිබෙන රට. ඒ නිසා ඉතාම කඩිනමින් මේ ක්‍රමවේදවලට හුරු වෙනවා; භාවිත වෙනවා. ඒ වාගේම රටේ කෙටි කාලීන ශීඝ්‍ර සංවර්ධනයක් සිදු වුණා. මෙන්න මේ දත්ත අනුව 2011 වෙන කොට මිලියන 18.3ක් දක්වා සියයට 6.1ක වේගයකින් වර්ධනය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ 18.3 අර 6.1ක වේගයේම පවත්වාගෙන ගියාය කියා උපකල්පනය කරලා ඊළඟ අවුරුදු දෙකට ගණන් හදලා බැලුවොත්, මේ වන විට අපේ රටේ තිබෙන මුළු ජංගම දුරකථන සංඛ්‍යාව ජනගහනය හා සමානයි. ඒ ගණන මිලියන 20 පනිනවා.

මෙන්න මේ තත්ත්වය තුළ ඉදගෙන තමයි මේ ප්‍රශ්නයට පිළිතුරු දිය යුත්තේ. තාක්ෂණය ඉතා ඉක්මනින් වර්ධනය වනවා. තාක්ෂණයේ දියුණුවත් එක්ක, නිෂ්පාදනයේ වැඩි වීමත් එක්ක මේ ජංගම දුරකථන මිල අඩු වනවා. එතකොට මිල දී ගැනීමේ හැකියාව - purchasing power - වැඩි වනවා. ඉතාම පහළ මට්ටමේ රැකියාවක් කරන, අඩු ආදායම්ලාභීන් ළඟ වුණත් අද ජංගම දුරකථනයක් දකින්නට තිබෙනවා. ඒක හොඳයි. ඉතාම කෙටි කලක් භාවිත කිරීමෙන් පසුව ඉවත ලන ජංගම දුරකථන සහ e-waste එකතු කිරීම, අපහරණය කිරීම, සෞඛ්‍යයට තර්ජනයක් නොවන ආකාරයට පවත්වා ගෙන යාම පිළිබඳව අභියෝගයකට ඉතාම කෙටි කලක් තුළ අපට මුහුණ දෙන්නට සිදු වනවා. මොකද, අනපේක්ෂිතව මේවායේ ශීඝ්‍ර වර්ධනයක් තිබෙනවා.

ජංගම දුරකථන අපද්‍රව්‍ය ඇති වන ක්‍රම හතරක් තිබෙනවා. එකක් තමයි, තාක්ෂණයේ වෙනස් වීම හා වර්ධනය.

දෙවැනි එක, මෝස්තරය හා මාදිලියේ වෙනස් වීම. දැන් අපේ තරුණ තරුණියන් ජංගම දුරකථනයේ මාදිලිය වෙනස් වුණු ගමන් පරණ එක ළඟ තිබුණා වුණත් අලුත්ම මෝස්තරය - latest model - මිල දී ගන්නවා. මම හිතන්නේ දැන් භාවිත වන අලුත් ජංගම දුරකථනය "Nokia Lumia 920" වෙන්න ඇති කියලායි. ඒක මේ පසු ගිය මාසයේ අලුතෙන්ම ආපු model එක. දැන් ඒක තමයි භාවිත කරන්නේ.

ඊළඟට තුන්වැනි එක, නිපදවන්නන් මඟින් ලබා දෙනු ලබන විවිධ දිරිගැන්වීම්. දැන් බලන්න, අපි රූපවාහිනියේ වාණිජ වෙළෙඳ දැන්වීම් බැලුවොත්, කොයි තරම් ප්‍රමාණයක් ජංගම දුරකථන පිළිබඳව සහ ඇමතීම් පිළිබඳව වර්ධනයක් ඇති කරන්නට කටයුතු කරනවාද කියලා. අපේ reality වැඩසටහන් ගත්තොත් වැඩි හරියක්ම - සමහරක් ඒවා සියයට 65ක් පමණ, සමහර ඒවා සියයට 100ම වාගේ - මෙහෙයවන්නේ SMS මඟින්. ඉතින් මේ SMS යවන්න භාවිත කරන්නේ ජංගම දුරකථනය නේ. ඒකෙනුත් promotion එකක් වෙනවා.

ඊළඟට හතරවැනි එක, සමහර උපකරණවල පවතින කෙටි ආයු කාලය. සමහර ඒවා කෙටි කාලයයි භාවිත වන්නේ, ඊට පසුව ඉවත් කරන්නට සිදු වනවා. මෙන්න මේ ක්‍රම හතර මඟින් ජංගම දුරකථන භාවිතයෙන් ඉවත් වෙනවා. මෙසේ ඉවත් වන ජංගම දුරකථන පරිසරයට එකතු වනවා. මොකද, ඒවා අපහරණය කිරීමේ - බැහැර කිරීමේ - නිශ්චිත ක්‍රමවේදයක් නැහැ. කෙනෙක් ලාච්චුවක දමා තියයි; තවත් කෙනෙක් පෙට්ටියක දමා තියයි; තවත් කෙනෙක් කුණු ගොඩකට විසි කර දමයි. මේ ආදී වශයෙන් විවිධ ක්‍රම භාවිත වනවා. මෙවායින් පිට වන දූෂ්‍යකාරක මිනිස් ශරීරයට ඇතුළු වීම තුළින් පෙනහළු පිළිකා ඇති වීම, හෘදය රෝග ඇති වීම, අක්මාව ඇතුළු ඉන්ද්‍රියයන්ට හානි සිදු වීම සිදු වන්නට පුළුවන්. ඒ වාගේම ක්‍රෝමියම් සහ ඊයම්, එහෙම නැත්නම් Lead වැනි මූල ද්‍රව්‍ය, ඒ වාගේම රසදිය මිනිස් සිරුරේ සෛලවල සංයුතිය වෙනස් කිරීමකට බලපාන්නට පුළුවන්. මිනිස් ශරීරයේ සෑම ඉන්ද්‍රියකටම අහිතකර සෞඛ්‍ය බලපෑම්වලට මුහුණ දෙන්නට සිදු වනවා. අපි දැකලා තිබෙනවා, සමහරුන් මේවා ගිනිගොඩවල්වලට දමලා පුළුස්සනවා. එහෙමත් සිදු වන අවස්ථා තිබෙනවා. ගිනි ගොඩේ අනෙක් ද්‍රව්‍යත් එක්ක මේවාත් එකට පිළිස්සෙනවා. එතකොට මොකද වෙන්නේ? මේවා දහනය වනකොට ඒ තුළින් ඩයොක්සීන් හා ෆියුරාන් යන විෂ වායු පිට වෙනවා. මෙන්න මේ විෂ වායු සහ ඊයම් - Lead - ජල ධාරාවට එකතු වීමෙන් - පොළොවෙන් පහළට seepage එකත් එක්ක - ජලය අපවිත්‍ර වන්නට පුළුවන්. මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය විශාල වශයෙන් සෞඛ්‍යයට තර්ජනයක් වනවා. අර මම මුලින් කිව්ව ඝන අපද්‍රව්‍ය, ගෙදර එදිනෙදා ඉතිරි වන ආහාර ද්‍රව්‍ය වැනි කාබනික ද්‍රව්‍ය නම් එළියේ කොහේ හරි තැනක දමලා තිබුණත්, දින 45ක්, 60ක් යනකොට ඒවා බැක්ටීරියා ක්‍රියාකාරිත්වය නිසා ඉබේම දිරා ගොස් කොම්පෝස්ට් බවට පත් වෙනවා. හැබැයි, මේවා එහෙම නොවෙයි. එක්කෝ අපි මේවා ආරක්ෂක උපක්‍රම යොදා ගෙන ප්‍රතිචක්‍රීකරණය කරන්නට ඕනෑ. එහෙම නැත්නම් මේවා අපහරණය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් ඇති කරන්නට ඕනෑ. අද ලෝකයේ පරිසර තර්ජනයන්වලට මෙය හේතු වෙලා තිබෙනවා.

ඊළඟ ප්‍රශ්නය, මේවා ප්‍රතිචක්‍රීකරණය කිරීම ගැනයි. දැන් මේ e-waste ප්‍රතිචක්‍රීකරණය කිරීමේ විශාල අභියෝගයක් තිබෙනවා. මේ සඳහා නවීන තාක්ෂණය යොදා ගන්නට ඕනෑ. එතකොට එය යොදා ගන්නේ කොහොමද? මෙම අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ලෝකය දැනට භාවිත කරන ප්‍රධාන ක්‍රමවේද තුනක් තිබෙනවා.

එකක් තමයි නීති, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. ඒ තුළින් මෙය පාලනය කරන්න පුළුවන්. දෙවැන්න ජනතාවගේ දැනුවත්භාවය - awareness - වර්ධනය කිරීම. ඒක ලෙහෙසි නැහැ. මොකද,

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නිවසේ එකතු වන දිරාපත් වන සන අපද්‍රව්‍ය -කාබනික-; දිරාපත් නොවන පොලිතීන්, ප්ලාස්ටික් වැනි දේ; වීදුරු සහ ලෝහ යන වර්ග තුනට වෙන් කර ගැනීමටත් සමහර දියුණුයි කියන රටවලත් අවුරුදු දහයක් පහළොවක් ගත වෙලා තිබෙනවා. දැන් අපි උත්සාහ කරන්නෙත් ඒකටයි. ඉතින් එහෙම නම් කොයි තරම් කාලයක් මේකට ගත වෙයිද? මෙය ලෝකයේ පිළිගත් ක්‍රමවේදයක්. විශේෂයෙන්ම මේ තත්ත්වය තුළ ජූලි 01 වන දා ප්‍රධාන ආනයනකරුවන් ගෙන්වලා, ආනයන හා අපනයන පාලක, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මේ සියල්ලම ඒකරාශි කරලා සති දෙකක් කල් දුන්නා, මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන්නට කියලා. ඇත්ත වශයෙන්ම මම සතුටු වනවා, අපේ නිලධාරීන් සති දෙකක් තුළ වාර්තාවක් සකස් කරලා, නිර්දේශයන් සමඟ දීලා තිබෙනවා. ඒ නිසා මට පහසු වුණා අද ඔබතුමාගේ මේ ප්‍රශ්නයට, මේ වන කොට පරිසර අමාත්‍යාංශය අරගෙන තිබෙන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ඉතාම පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න.

ඒ විතරක් නොවෙයි. මෙහි සඳහන් වනවා, දැනට පවතින දත්තවලට අනුව සෑම වසරකම මිලියන පහක් පමණ වූ ජංගම දුරකථන සංඛ්‍යාවක් ආනයනය කරන බව. දළ වශයෙන් වර්ෂයකට ආනයනය කරන නව ජංගම දුරකථන සංඛ්‍යාව මිලියන 5ක්.

අපි රටක් හැටියට බාසෙල් සම්මුතියේ කේන්ද්‍රීය ලක්ෂයක් ලෙස ක්‍රියා කරන නිසා, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය බැඳී සිටිනවා, මේ අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසර හිතකාමී ලෙස කිරීමට වගබලා ගැනීමට. බාසෙල් හා ස්ටොක්හෝම් කියලා Conventions දෙකක් තිබුණා. ඒ Conventions දෙකට අපි පාර්ශවකරුවන් වුණා. ඒ නිසා ජාත්‍යන්තර වශයෙන් අපි ඒ සඳහා බැඳීමකට ලක් වෙලා තිබෙනවා.

මේ ළඟදී මම ජිනීවා ගිය වේලාවේදී සම්පූර්ණයෙන්ම සාකච්ඡා කළේ මේ e-waste කළමනාකරණය - manage - කරන්නේ කොහොමද කියන කාරණය ගැනයි. ඒ අනුව නිර්දේශ කීපයක් මේ කමිටුව මඟින් ලබා දීලා තිබෙනවා. ඒ නිර්දේශයන්ගෙන් එකක් තමයි, අවම වශයෙන් වසරක වගකීමෙන් යුත් ජංගම දුරකථන ආනයනය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.

ඊළඟ කරුණ, දැනුවත් කිරීම, නීතිමය රෙගුලාසි ඇති කිරීම යන පිළිගත් ක්‍රම දෙකට අමතරව ආර්ථික උපකරණ මත තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම.

අපි දන්නවා, බොහෝ රටවල ක්‍රියාත්මක වන එක ක්‍රමයක් තමයි දැනුවත් කිරීම. නීති රෙගුලාසි ඇති කිරීම තවත් කරුණක්. වෙළෙඳ උපක්‍රමයක් හැටියට මෙය promote කරනවා වාගේම, අනෙක් පැත්තට භාවිත කරලා ඉවත ලන ජංගම දුරකථනයක් වෙනුවට අලුත් එකක් මිලදී ගැනීමේදී එය විකුණන ආයතනය ඒ සඳහා වට්ටමක් දෙනවායි කියලා කිව්වොත් මේ අය ඒක return කරනවා.

අපේ සූරියප්පෙරුම මන්ත්‍රීතුමනි, අපි කුඩා කාලයේ -පාසල් යන කාලයේ- දැන් තරම් පැණි බීම තිබුණේ නැහැ නේ. බීම ආයතන තිබුණේත් නැහැ, පැකට් කරලා තිබුණේත් නැහැ, import කළේත් නැහැ. අලියා බීම තමයි තිබුණේ. අලියා බීම ආවේ වීදුරු බෝතලයක. අලුත් අලියා බීම බෝතලයක් අපි මිලදී ගන්න නම් අර පරණ බෝතලය ගෙනිහින් දෙන්න ඕනෑ. නැත්නම් ඒකට වෙනම ගණුනක් ගන්නවා. ඒක එදා භාවිත කළ සරල ක්‍රමය. ඒක අපි සංවර්ධනය කරලා ඒ සඳහා යම් වට්ටමක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. අලුත් ජංගම දුරකථනයක් අරගන්න ඕනෑ පරණ ජංගම දුරකථනය ආපසු දීලායි. එතකොට අලුත් ජංගම දුරකථනයේ නියමිත ගණන රුපියල් 15,000 නම්, රුපියල් 14,000කට ඒක ගන්න පුළුවන් නම් රුපියල් 1,000ක වට්ටමක් ලැබෙනවා. එතකොට උනන්දු වනවා, මේ පරණ දුරකථනය ආපසු දෙන්න. ඒක වීසි කළොත් ඒ වීසි කරන්නේ මුදලක්; වටිනාකමක්. ඒ නිසා නැවත පරණ ජංගම දුරකථනය ආපසු දෙනවා. ඒක තමයි ඉතාම සාර්ථක ක්‍රමවේදය. E-waste පරිසරයට මුදා හරින්නේ නැතුව collecting centresවලින් එකතු කර ගැනීමත් මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක්. ලෝකයේ වෙනත් රටවල් බහුල වශයෙන් වශයෙන් භාවිත කරන ක්‍රමය ඒකයි.

ඊළඟ කාරණය තමයි ජංගම දුරකථන බැටරි. එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. විවිධ මට්ටම්වල බැටරි මේ ජංගම දුරකථනවලට පාවිච්චි කරනවා. මේ සඳහාත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ තමයි අන්තර් ජාතිකව ජංගම දුරකථන හඳුනා ගැනීම සඳහා ඇති අංකය - International Mobile Station Equipment Identity - IMEI - භාවිත කරලා ජංගම දුරකථන හා බැටරි සඳහා අනන්‍යතා සහතිකයක් නිකුත් කරලා පාරිභෝජනයෙන් ඉවත ලන ජංගම දුරකථන මොනවාද කියලා පරිගණක ජාලගත වැඩ පිළිවෙළක් තුළින් හඳුනා ගැනීම.

එහෙම වුණාම හැම item එකකටම සංකේත අංකයක් තිබෙනවා. එතකොට ඒක බැහැර වුණාද නැද්ද කියන එක ගැන දත්ත ගබඩා කරලා සොයා ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. ඒක තව ක්‍රමයක්. ඒ සඳහා අපට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහයෝගය ලබා ගන්න පුළුවන්. අපි ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලයේදී IMEI අංකයක් නිකුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මේ අනුව දී තිබෙන නිර්දේශයන් අතර, විශේෂයෙන්ම අලුතින් ජංගම දුරකථන ආනයනකරුවන් සහ අළෙවිකරුවන් පුහුණු කිරීම, දැනුවත් කිරීම තව කාරණයක් හැටියට තිබෙනවා. විශේෂයෙන්ම ජංගම දුරකථන භාවිත කරනවා නම් ඒ තුළින් ඇති වෙන්න පුළුවන් අහිතකර බලපෑම් ගැන දැනුවත් කිරීම. ඒක සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදහසක්. ඊළඟට අවම වශයෙන් වසරක වගකීම් සහතිකයක් තිබීම. ඊළඟට එකතු කිරීමේ මධ්‍යස්ථාන පද්ධතියක් ඇති කිරීම. ජංගම දුරකථන විකුණන representativesලා රට පුරාම ඉන්නවා නේ. ඒ නියෝජිතයන්ගේ ආයතනයම collecting centre එක හැටියට භාවිතා කරන්න පුළුවන්. එතකොට බොහොම පහසුයි.

